# දහම් පද මාලාව



# 2022 -23 වස්ස

# දහම් පද මාලාව



# Garland of Dhamma Words

**දහම් තිළිණයකි**

**2022 - 23 වස්ස**

**Gift of Dhamma**

**Rain Retreat 2022-23**

*******

අනුග්‍රහය: **Supported by**

ශාන්ති- භික්ඛුණී වනආරණ්‍ය

නිව්සවුත්වේල්ස් ප්‍රාන්තය, ඔස්ට්‍රේලියාව

**Santi -Buddhist Nuns Forest Monastery**

වෙබ්අඩවිය

**www.santifm.org**

**Email: santioffice@gmail.com**

ලිපිනය

**P.O .Box 132 100 Coalmines Road NSW 2578**

**Australia**

# නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස
# භාග්‍යවත්වූ අර්හත්වූ සම්මා සම්බුදුරජාණන් වහන්සේට අපගේ නමස්කාරය වේවා !!!

**හැඳින්වීම:**

පසුගිය වසර කිහිපයේදී ත්‍රිපිටකය හදාරනවිට අපගේ විශේෂ අවධානයට හසුවූ දහම්පද හා ඒවාට අදාළ කරුණු ඇතුලත්කර සටහන් ගොනුවක් සකස්කරන ලදී. දහම් පද මාලාව එම සටහන් එකතු කර පිළියෙළ කළ සංස්කරණයකි. මේ කෘතියේ මූලික පරමාර්ථය, සිංහලෙන් දහම ඉගනගන්නා කෙනෙකුට සූත්‍රවල සඳහන් විෂය කරුණු පහසුවෙන් සොයාගැනීමට උපකාරිවිමය.

▲ මෙහිදී සිංහල හා පාලි වචන හා විස්තර එකතුකර ගැනීමට මූලිකව භාවිතා කළේ බුද්ධ ජයන්ති ත්‍රිපිටක පොත් පෙළය:

දීඝනිකාය: **දීඝ.නි.** මජ්ජිමනිකාය:**ම.නි.** සංයුත්තනිකාය: **සංයු.නි.**
අංගුත්තරනිකාය:**අංගු.නි.** ඛුද්දකනිකාය:**ඛු.නි** විනයපිටකය**: වින.පි.**
අභිධර්මපිටකය: **අභි.ධ.පි.**

▼ ඉංග්‍රීසියෙන් ලියවුන මතු සඳහන් කෘතින්, සූත්‍ර විස්තර පැහැදිලි කරගැනීම පිණිස භාවිතා කරනලදී:

Anguttara Nikaya: EAN DighaNikaya: EDN
MajjhimaNikaya: EMN SamyuttaNikāya: ESN

**සටහන:** පරිහරණය කල ත්‍රිපිටක පොත් විස්තර ආශ්‍රිත ග්‍රන්ථ යටතේ දක්වා ඇත.

▲ **පරිහරණය කළ ශබ්දකෝෂ:**

▼ **සිංහල ශබ්දකෝෂය:**

**පා.සිං.ශ:** “පාලි-සිංහල ශබ්දකෝෂය”: මඩිතියවෙල සිරි සුමංගල හිමි.

▼**English Dictionaries:**

* B. D: “Buddhist Dictionary”: Manual of Buddhist Terms & Doctrines by Ven.Nyanatiloka
* E.P.D**: “**English-Pāli Dictionary” by A. P. Buddhadatta Mahathera
* G.B: “The Seeker’s Glossary of Buddhism” by Buddha Dharma Education Association
***** P.T.S: “Pāli English Dictionary” by The Pali Text Society

▲ විෂය කරුණු කොටස් කර ඇත්තේ සිංහල අකාරාදියට අනුවය:

**අ,ඉ,උ,ඍ,එ,ඔ,ක,ඛ,ග,ඝ,ච,ඡ,ජ,ඤ,ඥ,**
**ඨ,ත,ථ,ද,ධ,න,ප,බ,භ,ම,ය,ර,ල,ව,ස,ශ,ෂ,හ**

**උදාහරන:** **අ** අකුරඇතුලත් මුලික පද ඉදිරිපත් කර ඇත්තේ: **අ කොටස** ලෙසින්ය. **ඉ** අකුර ඇතුලත් මුලික පද ඉදිරිපත් කර ඇත්තේ: **ඉ කොටස** ලෙසින්ය

**▲ උපග්‍රන්ථ**

විෂය කරුණු සම්බන්ධ අතිරේක විස්තර උපග්‍රන්ථ ලෙසින් ඉදිරිපත්කර ඇත:

**උපග්‍රන්ථය1:** ශ්‍රාවක භික්ඛු සංඝ, **උපග්‍රන්ථය2**:ශ්‍රාවක භික්ෂුණී සංඝ **උපග්‍රන්ථය3:** බුදුන්සරණ ගිය උපාසක උපාසිකා **උපග්‍රන්ථය4:** බුදුසසුන අත්හල සංඝයා **උපග්‍රන්ථය5**: උපමා විස්තර **උපග්‍රන්ථය6**: අපගේ ගෝතම බුදුන් වහන්සේ පිලිබඳ මුලික විස්තර.

## බුදු සසුන බැබලේවා!

# පටුන


| | | | |
|---|---|---|---|
| හැඳින්වීම | i-iii | | |
| අ | පි.1-160 | ඉ | පි.160-170 |
| උ | 170-189 | ඍ | 189 |
| එ | 189-194 | ඔ | 194-198 |
| ක | 198-249 | ඛ | 149-252 |
| ග | 252-267 | ඝ | 267-268 |
| ච | 268-285 | ඡ | 285-289 |
| ජ | 289-301 | ඣ | 301-303 |
| ඤ | 303 | ට | 303-304 |
| ත | 304-339 | ථ | 339-341 |
| ද | 341-394 | ධ | 394-433 |
| න | 433-472 | ඥ | 472 |
| ප | 472-569 | ඵ | 569-570 |
| බ | 570-616 | භ | 616-654 |
| භ | 616-654 | ම | 654-709 |
| ය | 709-723 | ර | 724-739 |
| ල | 739-750 | ව | 750-802 |
| ස | 802-947 | ශ | 947-961 |
| ෂ | 961-962 | හ | 962-968 |
| සූචිය | | | 969-1010 |
| ආශ්‍රිත ග්‍රන්ථ | | | 1011-1017 |
| උපග්‍රන්ථ1,2,3,4,5,6 | | | 1018-1244 |
| සිතියම් | | | 1245 |

## අ කොටස: අක,අග,අඝ,අච,අජ,අඤ,අට, අත,අද, අධ, අනඅද,අප,අබ,අභ,අම,අඹ,අය,අර,අල,අව,අස අශ, අෂ, අහ

### අක

▲ **අකත-** un-created: අකත යනු කිසිවකින් සකස් නොකරන ලද බවය (අසංඛත), නිවන හඳුන්වන පදයකි. **බලන්න**: නිවන. **මූලාශ්‍රය**: ඛු.නි: ඉතිවුත්තක: 2.2.6 අජාත සූත්‍රය, පි.393.

▲**අකනිට්ඨගාමී:** පාලි: **අකනිට්ඨගාමී-**heading to the akaniṭṭha realm අකනිට්ඨගාමී යනු අකනිට්ඨ බ්‍රහ්මලෝකයේ පහළවීමය. මෙය අනාගාමී උතුමන් යළි උපතලබන ක්‍රමවිධි 5 න් එකකි. ඔරම්භාගිය සංයෝජන පහකරගත් ආරිය උතුමා, මෙලොව හැර කෙලින්ම අකණිටා බඹ ලොව පහළව, එහිදී අරහත්වයට පත්ව පරිනිබ්බානය ලබයි. ඒ පිලිබඳ දක්වා ඇති **උපමාව:** ගිනිපුපුර උපමාව: දවස මුළුල්ලේ ගින්නෙන් රත්වුණ යකඩගුලියක්, තළනවිට, ගිනිපුපුරක් මතුවී, ඉහලට ගොස්, නැවත පොළොවට පහත්වී, විශාල දර ගොඩක් හෝ පිදුරු ගොඩක් ඇති තැනකට වැටී, ඒ දර ගොඩ දවා, ඉන් ඔබ්බට පැතිර, කෙත් වතු වන ලැහැබ් ගිනි දවා, අවසානයේදී, තව ඉන්ධන නොමැති තැනකට පැමිණ: ගල්කන්දක් අද්දරට හෝ විලක් අද්දරට හෝ පැමිණ ගින්න නිවී යන ලෙසින් ඒ උතුමා පරිනිබ්බානය ලබයි. **බලන්න**:උපග්‍රන්ථය:5. **මූලාශ්‍ර**: අංගු.නි: (4) :7 නිපාතය: 7.2.1.2. පුරිසගති සූත්‍රය, පි. 402, අංගු. නි: (6) : 10 නිපාත: 10.2.2.3. නිට්ඨිත සූත්‍රය,පි.244, EAN: 10: 63.3. Certainty, p.519, EAN: 7: 55.2 Destinations of Persons, p. 387. **බලන්න**: අකණිටා බ්‍රහ්මලෝකය, අනාගාමී.**ශබ්දකෝෂ: පා.සිං.ශ:** පි.178: "**අකනිට්ඨගාමී** : අකනිටා බඹ ලොව වසන්නා... '**උද්දංසොත**': ජීවිතය නමැති දියපාරේ ඉහලට ගිය පුද්ගලයා".

▲**අකණිටා බ්‍රහ්මලෝකය: පාලි: අකනිට්ඨබ්‍රහ්මලොක-** akanita brhamaloka : රූප බ්‍රහ්මලෝක 16 අතුරින් අවසාන බ්‍රහ්මලෝකය අකණිටා බඹලොවය, අනාගාමී උතුමන් පහළවන සුද්දාවාසයකි. **බලන්න**: බ්‍රහ්මලෝක.**ශබ්දකෝෂ: පා.සිං.ශ:** පි. 21: "**අකනිට්ඨා**: අකණිටා බඹලොව..." **B.D**: p. 24: "**akaniṭṭha**: the 'Great Ones': Highest Gods-are the inhabitants of the 5th and higher heaven of the Pure Abodes...".

▼**පස් ආකාරයකට** මෙලොව හැර යන අනාගාමී උතුමන් අතුරින් පස්වෙනි වර් ගයේ ආරියෝ ඉහල සෝතය- ඉහළ (උඩ) දියපහර නම්වූ අකණිටා බ්‍රහ්මලෝකයේ පහළව එහිදී විමුක්තිය සාක්ෂාත් කරගන්නා බව බුදුන් වහන්සේ වදාළහ. **"...උද්ධංසොතස්ස අකනිට්ඨගාමිනො"** (...and one bound upstream, heading toward the Akaniṭṭha realm) **සටහන:** උද්ධංසොතස්ස යනු උඩයයි කියන ලද අරූප භවයන්හි යලි උපත ඇතිකරණ උද්ධම්භාගිය සංයෝජන පහය. මේවා පහකර ගැනීමෙන් අරහත්වයට පත්වේ. **බලන්න:** උද්ධම්භාගිය සංයෝජන. **මූලාශ්‍ර**: අංගු.නි : (6 ):10 නිපාතය: 10.2.2.3 නිට්ඨින්ගත සූත්‍රය, පි. 244, EAN:10:64.4 Unwavering, p. 519.

▲**අකර්මන්‍ය හා කර්මන්‍ය-** unwieldy & wieldy :අකර්මන්‍ය-අකම්මන්‍ය යනු තදබව, නො නැමෙන බවය. කර්මන්‍ය-කම්මන්‍යයනු මුදු, නැමෙන සුළු බවය. ධර්ම මාර්ගය වඩා ගැනීම පිණිස අකර්මන්‍ය සිත - නොදියුණු සිත බාධාවක්වේ. කර්මන්‍ය සිතක් තිබීම මාර්ගය වඩා ගැනීමට

උපකාරිවේ. **සටහන:** සමාධි සමාපත්ති ලබාගැනීමෙන් සිත කර්මන්‍ය බවට පත්වේ. **මූලාශ්‍ර:** අං.ගු.නි: (1): 1 නිපාත: අකර්මන්‍ය වග්ග:සූත්‍ර, පි. 48, EAN: 1: III Unwieldy: 21.1 Sutta, p. 37.

▲**අකාලික**: පාලි: **අකාලිකො**-akālika -timeless: අකාලික, කල්නොයවා විපාක දෙන බව, වහා විපාක දෙනබව, මෙලොවදීම විපාක දෙන බවය. (not delayed, immediate, directly visible in this world). **සටහන**: "අකාලික" ධර්මයේ එක් ගුණයකි.**බලන්න**: ධර්මගුණ. **ශබ්දකෝෂ : පා.සිං.ශ**: පි.22: "න+ කාලික **අකාලික**, කල්නොයවා විපාක දෙන බව, වහා විපාක දෙනබව". P.T.S: p. 497: "**akālika**: not delayed, immediate, in this world".

▼**ධර්ම යේ අකාලික ගුණය** යනු: කෙනෙකුට කාම වස්තුවක් දැක රාග ආදී කෙළෙස් සිතුවිල්ලක් ඇතිවූවිට: 'මට රාග සිතුවිල්ලක් ඇතිවුනා' හෝ 'ඒ ගැන මට රාගයක් ඇති නොවුනා' යන අවබෝධය- කල්නොයවාම- නොපමාවම සිහියට එයි. එම අවබෝධය නිසා ඔහුගේ සිතට පැමිණි කෙලෙසක් වහා පහකර ගැනීමට හැකිවේ. **මූලාශ්‍ර**:සංයු.නි: (4) :සළායතන සංයුත්ත: 1.7.8. උපවාන සූත්‍රය, පි. 118, ESN: 35: Salayatna samyutta, 70.8 Upavāṇa sutta, p. 1240.

▼**ධර්මයේ අකාලික බව** මේ සූත්‍රයේ විස්තරකර ඇත. **මූලාශ්‍ර**: සංයු.නි: (1) : මාර සංයුත්ත: 4.3.1 සම්බහුල සූත්‍රය, පි. 240, ESN: 4: Mārasamyutta: 21.1.A Number, p. 290.

▼**වෙනත් මූලාශ්‍ර: 1** "...යමක ඵලය ඒවේලේම ලැබේ නම් එය ආකලික නම්වේ. සර්වඥයන් වහන්සේ විසින් ප්‍රකාශිත දහම අකාලික ගුණයෙන් යුක්තය": **සුවිසිමහා ගුණය:** රේරුකානේ චන්ද්‍රවිමල මහානාහිමි,පි.409. **2.** "...ලෞකික කුසල දහම කල් නොයවාම විපාක ලබාදෙන නිසා දහම අකාලිකය...". : **ආර්යවංශ ධර්ම පුස්තක මාලා-**අංක 1: සප්ත බොජ්ඣංග, පි.77,මොරටුවේ සිරි සාසනවංශ තෙරුන්,1948.

▲ **අක්කුප්ප-** unshakable: දහමට අනුව අක්කුප්ප (කුපිත කළ නොහැකිබව) යනු සිත නොසෙල්විය හැකිබවය, එනම් අරහත්වය ලැබීමය. අරහත්වය ලැබූවිට, කිසිම කෙලෙසකට සිත යට කරගත නොහැකිය. **ශබ්දකෝෂ: පා.සිං.ශ:** පි.23: "**අකුප්ප:** නොකිපෙන, කෝප නොවන, කුපිත නොවෙන, නොසෙලවෙන බව" .

▼**අක්කුප්ප බව ලබා ගැනීමට** උපකාරීවන ධර්මතා: **1) සිව් පිළිසිඹියාව ලැබීම**: අර්ථ, ධම්ම, නිරුක්ති, ප්‍රතිභාන දියුණුකර, යථා විමුක්ත චිත්තය ප්‍රත්‍යවෙක්ෂ කිරීම. **බලන්න:** සිව් පිළිසිඹියා. **සටහන:** යථා විමුක්ත චිත්තය: සිත කෙළෙසුන්ගෙන් මිදුණුවිට ඒ බව ප්‍රත්‍යවෙක්ෂා කිරීමය. (He reviews the extent to which his mind is liberated).**2) ආනාපාන සතිය** වඩාගෙන, මතු දැක්වෙන ගුණයන්හි සමන්විතවීම: 1 අල්ප කෘති ඇතිබව (අප්පකිච්චො), 2 පහසුවෙන් පෝෂණය කළහැකිබව (සුභරොච) 3 සන්තුෂ්ටිය තිබීම 4 අල්පආහාරය (ආහාරය මදපමණින්ගැනීම) හා ආහාරයෙහි ගිජු නොවීම (භෝජනයේ මාත්‍රවීම). 5 ජාගරානුසතිය 6 අලසකම නැතිබව 7 බහුශ්‍රැතබව 8 දහම් කථා ඇසීමට තමන් කැමති ලෙසින් අවස්ථා ලැබීම 9 ආරණ්‍යසේනාසනවල හුදකලා වාසය 10 යථා විමුක්ත චිත්තය ප්‍රත්‍යවෙක්ෂ කිරීම. **මූලාශ්‍ර:** අං.ගු.නි: (3):5 නිපාත: 5.2.5.5 අක්කුප්ප සූත්‍ර 4 කි , පි. 214, EAN: 5: 95.5, 96.6, 97.7, 98.8, 4 suttas, p. 272.

▲**අක්කුප්ප චේතෝවිමුත්තිය**: පාලි: **අකුප්පා චෙතොවිමුත්ති** - Unshakeable deliverance of mind : අක්කුප්ප චේතෝවිමුත්තිය යනු අරහත්වයය, අරහත්ඵල විමුක්තිය ලැබීමය, සියලු කෙලෙසුන්ගෙන් සිත නිදහස් කර ගැනීමය. එම විමුක්තිය කිසිවෙකුට සෙලවිය නොහැකිය. **ශබ්දකෝෂ: B.D:** p.40: "**Ceto-Vimutti:** Deliverance of mind. In the highest sense it signifies the Fruition of Arahatship...It is also called 'Unshakeable deliverance of mind'-akuppa cetovimutti..."

▼**ආධ්‍යාත්මික වර්ධනය පිණිස:** අක්කුප්ප චේතෝවිමුත්තිය ප්‍රත්‍යක්ෂ කරගත යුතු, සාක්ෂාත් කරගත යුතු දහමකි, **බලන්න**: සච්ඡිකාතබ්බ ධර්ම. **මූලාශ්‍ර:** දීඝ.නි: (3): 11දසුත්තර සූත්‍රය, පි. 484, EDN: 34: Dasuttara Sutta: Expanding Decades, p. 384.

▲**අක්කුප්ප ඥානය**: පාලි: **අකුප්ප ඤානං-** Unshakeable knowledge අක්කුප්ප ඥානය -අක්කුප්ප ධර්මය, යනු වෙනත් කෙනෙකුට නො සෙල්විය හැකි නුවණය. මෙය ප්‍රත්‍යවේක්ෂණ ප්‍රඥාව ලෙසින් ද පෙන්වා ඇත. ආධ්‍යාත්මික වර්ධනය පිණිස උපදවා ගතයුතු නුවණකි. **බලන්න**: උත්පාදයිතව්‍ය ධර්ම. **මූලාශ්‍ර:** දීඝ.නි: (3) 11 දසුත්තර සූත්‍රය, පි. 483, EDN: 34: Dasuttara Sutta: Expanding Decades, p. 384. **ශබ්දකෝෂ: B.D**: p.8: "**Akuppa Dhamma**: Unshakeable is one who has attained full mastery over the absorptions (jnana)..."

▼**අක්කුප්ප පුද්ගලයා**: කවර පුද්ගලයෙක් අකුප්ප වේද? මේ ලෝකයෙහි අතැම් පුද්ගලයෙක් රූප සහගතවූ හෝ අරූප සහගතවූ (රූපාවචර, අරූපාවචර) හෝ සමාපත්ති ලබාගනී. එම සමාපත්ති ඔහු කැමැති විටක ලබයි, වෙහෙසට පත් නොවී ලබයි, ඔහු පතන අන්දමට ලබයි, කැමති තැනක ලබයි. කැමති කාලයක් සමවතට සමවැදී සිටිය හැකිය, කැමති අවස්ථාවක සමාධියෙන් නැගී සිටිය හැකිය. එම පුද්ගලයාගේ සමාපත්ති, අප්‍රමාදය නිසා බිඳේ යයි කීමට නොහැකිය. ඒ පුද්ගලයා අකුප්ප ඥානය ලබා ඇත. **මූලාශ්‍ර:** අභිධ.පි: 4. පුද්ගල ප්‍රඥාප්ති ප්‍රකරණය: අක්කුප්ප පුද්ගලයෝ, පි. 278.

▲ **අක්ෂාන්තිය**-Impatience: අක්ෂාන්තිය ලෙසින් පෙන්වා ඇත්තේ ඉවසීම නොමැතිකමය. ලෝකයා කෙරහි ඉවසීම නොමැති පුද්ගලයා බොහෝදෙනාට අප්‍රිය, අමනාප කෙනක්ය,මෙය අකුසලයකි, දුගතියට මගකි. **බලන්න**: ක්ෂාන්තිය. **මූලාශ්‍ර:**අංගු.නි: (3) : 5 නිපාත: 5.5.2.5 හා 5.5.2.6 අක්ඛන්තිසූත්‍ර,පි.432, EAN:5:215.5 & 216.6 Impatience, p. 306.

▲ **අක්ෂණය හා ක්ෂණය-** not an opportunity- opportunity : අක්ෂණය යනු අනවකාසය: යමක් කරගැනීමට නොලැබීමය- කාලය නැතිවීමය. ක්ෂණය යනු අවකාසය: යමක් කරගැනීමට හැකිවීමය- කාලය තිබීමය, මෙය **කාලය හා අකාලය** ලෙසින්ද පෙන්වා ඇත. පෘතග්ජනයා, ධර්මය පහළවූවිට, කළයුතු දේ නොදනී, ඒ නිසා දහම් මග වඩා ගැනීමට ඔහුට හැකියාව, වාසනාව නැතිවේ. එහෙත්, නුවණැති පුද්ගලයා, දහම පහළ වූවිට, කළයුතු දේ දනී, ඒ නිසා දහම්මග වඩා ගැනීමට ඔහුට හැකියාව, වාසනාව ලැබේ. මෙය **ක්ෂණසම්පත්තිය** (opportune moment) ලෙසින්ද පෙන්වා ඇත. බුදුන් වහන්සේ අක්ෂණ අවස්ථා 8 ක් පෙන්වා ඇත: 1) - 3) තථාගතයන්,පහළවූ සමයේ පුද්ගලයෙක් නිරයේ, තිරිසන් ලෝකයේ, ප්‍රේතලෝකයේ, උපත ලබාසිටි. 4) ... අසංඥතලයේ හෝ

අරූප බ්‍රහ්මලෝකවල උපත ලබාසිටි 5) ...ධර්මය නොමැති ප්‍රදේශයක උපත ලබාසිටි 6) ... පුද්ගලයෙක් හට මිථ්‍යා දිට්ඨිය ඇත 7) ... පුද්ගල යෙක් නුවණින් බාලය- ප්‍රඥාව නොමැත (බාලයා). 8) පුද්ගලයෙක් හට ධර්මය අවබෝධ කිරීමේ ශක්තිය, ප්‍රඥාව ඇත, එහෙත් තථාගතයන් ලෝකයේ පහළවී නොමැත. ඉහත කරුණු නිසා ඔහුන්ට දහම පිළිපැදීමට අවස්ථාව, වාසනාව නොමැත.**ක්ෂණය:** තථාගතයන් ලෝකයේ පහළවූ සමයේ මිනිසත්බව ලත්, ප්‍රඥාව ඇති, දහම ඇසීමට හැකි ප්‍රදේශයක ඉපදුන පුද්ගලයෙකුට, දහම අවබෝධ කරගැනීමට අවකාශය- කාලය- වාසනාව ලැබී ඇත. එම අවස්ථාවෙන් ප්‍රයෝජනය ගන්නා ඔහු, සසර දුකින් මිදීමට වාසනාව ඇති කෙනෙක්ය. **මූලාශ්‍ර:**අංගු.නි: (5): 8 නිපාත: 8.1.3.9 අක්ඛණ සූත්‍රය, පි. 150, EAN: 8: 29.9 Inopportune Moments, p. 427.

▲ **අකුසලය:** පාලි: **අකුසලං** - Unwholesome: අකුසලය යනු තුන් දොරින් සිදුකරණ පාපී ක්‍රියාය, අයහපත් කම්ම විපාක ගෙන දෙන ක්‍රියාවන්ය. අංගු.නි: (1): 2 නිපාත: අකුසල පෙයියාල වග්ගයේ සූත්‍රයන්හි අකුසල දහම විස්තරාත්මකව පෙන්වා ඇත. **බලන්න:** කුසල ධම්ම හා අකුසල ධම්ම.

▼ **අකුසලය ඇද දෙයක්ය,** එමගින් දුගතියේ පහලවේ. **බලන්න:** තිරිසන්ලෝකය.

▼**වෙනත් මූලාශ්‍ර: 1. "**අකුසලය: නිර්වචන වශයෙන් සලකන කල සියලු භය උපද්‍රවයන්ට හේතුවූ, හීන ධර්ම යන්ගේ පැවැත්මට හේතුවූ, දහම අකුසලවේ. **අකුසල මුල්**: ලෝභ දෝස මෝහ. අකුසලයෙන් මඩනා ලද පුද්ගලයා, මෙලොවදීම නානවිධ උපද්‍රව, චිත්ත වේදනා, කායික වේදනා ආදී බලවත් දුක් අනුභව කරයි, මහා විනාශයට පත්වේ. පරලොව, නරකය ආදී දුකට පිහිටි, දුකට භාජනවූ දුගතියට පැමිණේ…".
**සද්ධර්ම කෝෂය,** පි. 104.

▲**අකුසල ධර්ම-** Unwholesome Dhamma: අකුසල ධර්ම ලෙසින් පෙන්වා ඇත්තේ මිථ්‍යා -මිච්ඡා දිට්ඨිය පෙරටු කරගත් මිථ්‍යාත්වය- වැරදිමග ගැනීමය. **බලන්න**:මිථ්‍යාත්වය. **මූලාශ්‍ර:** සංයු.නි: (5-1): මහාවග්ග: මග්ගසංයුත්ත: 1.3.2 අකුසලධම්ම සූත්‍රය, පි. 58, ESN: 45: Maggasamyutta: 22.2 Unwholesome states, p. 1628.

▲ **අකුසල මූල:** පාලි**: අකුසලමූලානි-** unwholesome roots: අකුසල මූල- අකුසල මුල් යනු අකුසල ක්‍රියාවන්ට පදනම් වන මූලික කරුණුය එනම්: ලෝභය, දෝසය හා මෝහය ය **(රාග දෝෂ මෝහ-**lust, hatred, and delusion). මේවා ආධ්‍යාත්මික වර්ධනයට හානි කරණ ධර්මතාය. **බලන්න**: හානභාගිය ධර්ම. **මූලාශ්‍ර:** දීඝ.නි: (3): 11 දසුත්තර සූත්‍රය, පි. 483, EDN: 34: Dasuttara Sutta: Expanding Decades, p. 384, ඛු.නි: ඉතිවුත්තක: 3.1.1 අකුසල මූල සූත්‍රය**,** පි. 406.

▼**අකුසල් මුල් නිසා** සත්ත්‍වයන් තුල කෙළෙස් ඇතිවේ. ඒ පිළිබඳ අවබෝධය දුෂ්කරය. ඒවා දුෂ්ප්‍රතිවිධ්‍යා ධර්ම අවබෝධය පහසු නැති දහම්ය.**බලන්න**: දුෂ්ප්‍රතිවිධ්‍යා ධර්ම. **මූලාශ්‍ර:** දීඝ.නි : (3): 11 දසුත්තර සූත්‍රය, පි. 483, EDN: 34: Dasuttara Sutta: Expanding Decades, p. 384.

▼ **අකුසල මුල් ප්‍රහීණය**: ජාති ජරා මරණ ආදීවූ - සසර පවත්වන හේතු නැතිකරගැනීමට නම්, අකුසල මූල 3 පහකරගත යුතුවේ. සැකය - විචිකිච්ඡාව ඇති පුද්ගලයාට, ලෝභ දෝස මෝහ නැතිකර ගත

නොහැකිය. සක්කායදිට්ඨිය, විචිකිච්ඡාව, සීලබ්බත පරාමාස ප්‍රහිනය කරගැනීමෙන්, අකුසල් මුල් නැතිකර ගැනීමට හැකිවේ. **සටහන**: මේ සූත්‍රයේදී අකුසල පහකර ගැනීමේ පිළිවෙත විස්තරාත්මකව පෙන්වා ඇත. **මූලාශ්‍ර**: අං.ගු.නි.(6): 10 නිපාත10.2.3.6 තයොධම්ම සූත්‍රය, පි.284, EAN: 10: III-76.6. Incapable, p. 524.

▼ **අකුසල ප්‍රහීණය:** කයෙන් හෝ වචනයෙන් සිදුවන අකුසල්, යහපත් කාය කම්ම හා වචී කම්ම මගින් නතර කළහැකිය. මනසින් සිදුකරණ අකුසල නිතර නුවණින් විමසමින් ප්‍රඥාවෙන් (යෝනිසෝමනසි කාරයෙන්) පහකරගතයුතු බව බුදුන් වහන්සේ වදාළහ. එසේ ප්‍රඥාවෙන් ප්‍රහීණය කළයුතු අකුසල් 10 ක් (**දස අකුසල**) : 1තණ්හාව (ලොභො) 2 වෛරය (දොසො) 3 අවිජ්ජාව (මොහො) 4 තරහ (කොධො) 5 එදිරිය /සතුරුබව (උපනාහො) 6 ගුණමකුබව (මකෙඛා) 7 අහංකාරය (පළාසො) 8 මසුරුකම (මච්ඡරියං) 9 පාපික/ ලාමක ඉරිසියාව (පාපිකා ඉසසා) 10 පාපික/ලාමක ආසාව (පාපිකා ඉච්ඡා).**බලන්න**: දසඅකුසල. **සටහන**: මේ දස අකුසල ප්‍රහීණය නොකර රහත්බව සාක්ෂාත් කර ගත නොහැකිය. **මූලාශ්‍ර**:අං.ගු.නි. (6 )10: 10.1.3.4. මහා චුන්ද සූත්‍රය, කාය සූත්‍රය, පි. 100.

▼ **අකුසල් මුල් නිසා** අයහපත් කම්ම සකස්වේ. ඒවා විනාශ කිරීමෙන් කම්ම විපාක අවසන් කරගත හැකිබව මෙහි පෙන්වා ඇත. **බලන්න:** කම්ම. **මූලාශ්‍ර:** අං.ගු.නි:( 6 )10 නිපාත: ජානුසොණි වග්ග: 10.4.2.8, කම්ම නිදාන සූත්‍රය**,**පි.506, EAN:10: II, Jāṇussoṇī,174-8,Causes of Kamma, p.552.

▼ **අකුසල් ඇතිවීම**- Reasons for unwholesome :1) අකුසල්, **නිමිත්තක්** ඇතිව- (හේතුවක් නිසා -සනිමිත්තව- with a base) උපදී, නිමිත්තක් නොමැතිව ඇතිනොවේ. නිමිත්ත ප්‍රහීණය කළවිට අකුසල ඇති නොවේ. 2) අකුසල්, **නිදානයක්** හේතුකොට ගෙන උපදී (through a source- සනිදාන); නිදානයක් නැතිව (අනිදාන) ඇති නොවේ. එම නිදානය ප්‍රහීණය කළවිට අකුසල් ඇති නොවේ. 3) අකුසල්, **සහේතුකව** (through a cause) උපදිති. අහේතුකව නුපදි. ඒ හේතුන් ප්‍රහීණය කළවිට අකුසල් ඇති නොවේ. 4) අකුසල්, **සංස්කාර** (causal activities) සහිතව උපදී. සංස්කාර රහිතව නුපදි. ඒ සංස්කාර ප්‍රහීණය කලවිට අකුසල් ඇති නොවේ. 5) අකුසල් **ප්‍රත්‍ය** (පච්චයා- හේතු) සහිතව (with condition) උපදිති. ප්‍රත්‍ය රහිතව නුපදි. ප්‍රත්‍ය ප්‍රහීණය කලවිට අකුසල් ඇතිනොවේ. 6) අකුසල් **රූප** සහිතව (along with form) උපදිති. රූප රහිතව නුපදි. ඒ රූපය ප්‍රහීණ කළවිට අකුසල් ඇති නොවේ. 7) අකුසල් **වේදනා** සහිතව උපදිති. වේදනා රහිතව නුපදිති. ඒ වේදනා ප්‍රහීණය කළවිට අකුසල් ඇතිනොවේ. 8) අකුසල් **සංඥා** සහිතව උපදිති. සංඥා රහිතව නුපදිති. ඒ සංඥාවෝ ප්‍රහීණය කළවිට අකුසල් ඇති නොවේ. 9) අකුසල් **විඥානය** සහිතව උපදිති. විඥානය රහිතව නුපදිති. ඒ විඥානයෝ ප්‍රහීණය කළවිට අකුසල් ඇතිනොවේ. 10) අකුසල් **හේතු ප්‍රත්‍ය නිසා උපන් සංඛත** (conditioned) අරමුණු කොට උපදිති. අසංඛත අරමුණුකොට නුපදීති. ඒ සංඛත (සකස්කිරීම) ප්‍රහීණය කලවිට අකුසල් ඇති නොවේ. **මූලාශ්‍ර**: අං.ගු.නි:(1):2නිපාත:සනිමිත්තවග්ග,පි.196,EAN:2:With a Basis, p. 68.

▲ **අකුසල රාශිය**- Heap of Unwholesome: අකුසල රාශිය යනු පංච නීවරණයන්ය. **බලන්න**: නීවරණ . **මූලාශ්‍ර**:අං.ගු.නි: (3): 5 නිපාත: 5.2.1.2 අකුසල රාශිය සූත්‍රය, පි. 124, EAN: 5: 52.2 A Heap, Entering, p. 257.

▲ **අකුසල සමාපත්තිය-**Akusala samapathti : අකුසල සමාපත්තිය යනු

අකුසල ඇතිකර ගැනීමය (entering upon the unwholesome). එයට හේතු: අශ්‍රද්ධාව, හිරි ඔතප්පය නැතිවීම- අහිරිකය හා අනොත්තප්පය තිබීම, වීරිය නොමැතිකම- අලසකම, ප්‍රඥාව නොමැතිකම- අනුවණකම. එම කරුණු නැතිවිට අකුසලයට පැමිණීම නොමැත. **මූලාශ්‍ර**: අංගු.නි: (3): 5 නිපාත: 5.1.1.6 අකුසල සමාපත්ති සූත්‍රය, පි. 30, EAN: 5: 6.6. Entering, p. 239.

▲ **අකෘතඥ හා කෘතඥ:** පාලි: **අකතඤ්ඤු-කතඤ්ඤු-** Ingratitude & Gratitude: අකෘතඥ යනු, කෙළෙහිගුණ නොදත් බවය. එනම්, තමන්ට උදව් උපකාර කල අය පිළිබඳව තැකීමක් නොකිරීමය. මෙයඅකුසලයකි. කෘතඥ (කෘතඥතාව) යනු, කෙළෙහිගුණ ඇති බවය. තමන්ට සුළුවෙන් හෝ උපකාර කල පුද්ගලයන්ගේ ගුණ නිතර සිහිකිරීම හා අවශ්‍යතන්හි ඔවුනට පෙරලා උපකාර කිරීමය. මෙය කුසලයකි.

▼**කෘතඥ ගුණය මංගල කරුණක්**- සුභ කරුණක්ය: **"ගාරවො ච නිවාතො ච සන්තුට්ඨී ච කතඤ්ඤු තා- කාලෙන ධම්මසවණං එතං මඞගලමුත්තමං"** : **මූලාශ්‍රය:** ඛු.නි: ඛුද්දකපාත: 5. මඞගලසූත්‍රය, පි.34.

▼**වෙනත් මූලාශ්‍ර: 1. "අකෘතඥ:** කළගුණ නොදත් අයය. කළගුණ දත් අය දුලබය යි බුදුන් වහන්සේ පෙන්වා ඇත: ලෝකයේ පුද්ගලයෝ දෙදෙනෙක් දුලබ වෙති: පළමුව උපකාර කරන්නාවූ කෙනා, කෘතොපකාර දන්නා වූ, ඒ බව ප්‍රකට කොට දන්නා කෙනා. අකෘතඥ බව, අසත්පුරුෂ භූමිය වේ. නිතර අනුන්ගේ සිදුරු සොයන, තමාට කළ ගුණ නොදත් පුරුෂයාට, සියලු සක්විති රජසිරි ...ආදිය දුන්නත් ඔහු සතුටුකිරීමට හෝ පහදවන්නට නොහැකිය" : **සද්ධර්ම කෝෂය,** පි. 114.

▲**අක්‍රෝධය**- non-anger: අක්‍රෝධය - තරහ නැති බව, අවිහිංසාව- නොකිපීම ලෙසින්ද පෙන්වා ඇත. විමුක්තිය ලබාගැනීමට උපකාරීවන කුසල දහමකි. **බලන්න**: අනවද්‍ය ධර්මය හා සාවද්‍ය ධර්මය. **සටහන:** නොකිපෙන සුළුබව සුගතියට මගකි.**බලන්න**: සංයු.නි: (4) සළායතන වග්ග: මාතුගාමසංයුත්ත:3.2.2. අක්‍රෝධන සූත්‍රය, පි.486.

▼ **දමනයවී, සමදීවී ඇති,** යහපත් ලෙසින් මිදුන, තාදී ගුණ ඇති රහතුන් නොකිපෙන බව මෙහි දක්වා ඇත. අක්‍රෝධය ඇති තැනැත්තා, තමාටද, ක්‍රෝධය ඇති තැනත්තාටද යහපත කරයි. **මූලාශ්‍රය:** සංයු.නි: (1): සගාථවග්ග:බ්‍රාහ්මණසංයුත්ත:7.1.2 අක්කොස සූත්‍රය, පි.314.

▼**සක්දෙවිඳු**, සුධර්මා දේවසභාවේ රැස්වූ දෙවියන්ට මෙසේ පවසා ඇත: **"කිසිවිටක ක්‍රෝධය, ඔබව ජය ගැනීමට ඉඩ නොදෙන්න. අක්‍රෝධයෙන්, අවිහිංසාවෙන් යුතුව ආරියන් ලෙසින් වාසය කරන්න, කන්දක් පහලට ගලාවිත්, මිනිසුන් වනසන ලෙසින් ක්‍රෝධය, මිනිසුන් විනාශ කරයි".** **බලන්න**: සක්දෙවිඳු. **මූලාශ්‍ර**: සංයු.නි: (1): සගාථවග්ග: සක්කසංයුත්තය: 11.3.5 අක්‍රෝධ සූත්‍රය, පි. 452, ESN: 11: Sakkasamyutta: 25.5 Non-anger, p. 497.

▲ **ආකාරපරිවිතක්ක**: පාලි: **ආකාරපරිවිතක්කො-** reasoned cogitation යම්කිසි දෙයක් පිළිගැනීම පිණිස යොදාගතයුතු කරුණු 5 න් එකක් ලෙස ආකාරපරිවිතක්ක පෙන්වා ඇත. එම කරුණ පිළිබඳව විවිධ ලෙසින් සිතා බලා, නිගමනයට පැමිණීමය. **බලන්න**: පංච ධර්මතා, ක්‍රමානුකූලව ධර්මය පුහුණුවීම.

▲ **ආකාරවති ශ්‍රද්ධාව**- akaravati saddha: ආකාරවති ශ්‍රද්ධාව ලෙසින් පෙන්වා ඇත්තේ බුදුන් වහන්සේ පිළිබඳව ඇති අචල විශ්වාසයය-මුල් බැසගත් ශ්‍රද්ධාවය. බුදුන් වහන්සේගේ බුද්ධත්වය, උන්වහන්සේගේ

ඉගැන්වීම-දහම් ගැන විමසාබලා ඇතිවන පිළිගැනිම, මුල් බැසගත් ශ්‍රද්ධාවය. මේ ශ්‍රද්ධාව ඇතිවන්නේ සොතාපන්න මගඵල සාක්ෂාත්වූ විටය. එසේ මුල් බැසගත් ශ්‍රද්ධාව වෙනත් කිසිමකෙනකුට අස්කර දැමීමට නොහැකිය යි බුදුන් වහන්සේ වදාළහ. **සටහන:** කෙනක් තුල එම පිළිගැනීම මුල්බැස නැත්නම් එය අමුලිකා ශ්‍රද්ධාවය. **බලන්න**: EMN: Note: 490, p. 1110, ශ්‍රද්ධාව හා අශ්‍රද්ධාව, සෝතාපන්න. **මූලාශ්‍ර**:ම.නි: (1): 1.5.7 විමංසක සූත්‍රය, පි. 764, EMN: 47 Inquirer, p. 401. **ශබ්දකෝෂ: B.D:** p.154: "**Saddha**: …faith, however, should be 'reasoned & rooted in understanding' - akaravathi saddha…"

▲ **ආකාසානඤ්චායතනය-**the base of the infinity of space
**අරූපලෝක** 4 න් එකකි. කෙනක් ආකාසය අනන්තය යන සංඥාව දියුණුකර ලබාගන්නා සමාපත්තිය මගින් අරූපලෝකයේ පහලවේ, මෙය සත්ත්වයන් යලි උපත ලබන පස්වෙනි විඥාන ස්ථානයය. **බලන්න**: බ්‍රහ්ම ලෝක, විඥාණ ස්ථාන, අරූපලෝක, අරූපසමාපත්ති.

▼ **මේ සූත්‍රයේදී** සැරියුත් මහා තෙරුන්, ආකාසානඤ්චායතන සමාධිසමාපත්තිය ලැබීම විස්තරකර ඇත. **මූලාශ්‍රය:** සංයු.නි: (3): ඛන්ධ වග්ග: සාරිපුත්‍රසංයුත්ත: 7.1.5 ආකාසානඤ්චායතන සූත්‍රය, පි.498.

▼ **මේ සූත්‍රයේදී** මහා මුගලන් තෙරුන්, ආකාසානඤ්චායතන සමාධි සමාපත්තිය ලැබීම විස්තරකර ඇත. **මූලාශ්‍රය:** සංයු.නි: (4 ): සළායතන වග්ග: මොග්ගල්ලානසංයුත්ත: 6.1.5 ආකාසානඤ්චායතන සූත්‍රය, පි.522.

▲ **ආකාශ ධාතුව**- Space element: ආකාශ ධාතුව යනු අවකාශයය. ධාතු ගැන අවබෝධය ලබාගැනීම පිණිස එම ධාතුව ගැන දැනගනිම වැදගත් යයි බුදුන් වහන්සේ පෙන්වා ඇත. ආකාශ ධාතුව, කසිණ භාවනා අරමුණකි. **බලන්න**: ධාතු කුසලතාවය, කසිණ. **ශබ්දකෝෂ**: **B.B:** p.7: "Space is according to commentary of 2 kinds: 1 limited space 2 endless space. Limited space is space element…"

▼ **ආකාශ ධාතුව** ආකර 2කි. අභ්‍යන්තර හා බාහිර. කෙනෙක්ගේ කයේ ඇති ඉඩ-අවකාශය, අභ්‍යන්තර ආකාශ ධාතුවය. පිටත ඇති ආකාසය, හිස් ඉඩකඩ ආදිය බාහිර ආකාශ ධාතුවය. ධාතු පිලිබඳ භාවනාවට ( Meditation on Elements ) ආකාශ ධතුවද අයත්වේ. **බලන්න**: භාවනා, ම.නි: සම්මාදිට්ඨි සූත්‍රය.

▼**මෙහි දී** ධාතු 6 පිලිබඳ විස්තරයට ආකාශ ධාතුව ද ඇතුලත් කර ඇත. **බලන්න**: ධාතු. **මූලාශ්‍ර**: දිඝ.නි: (3 ) : 10 සංගිති සූත්‍රය, පි. 368, EDN: 33: Sangīti Sutta: The Chanting Together, p. 362.

▲ **ආකිඤ්චඤ්ඤායතනය -**the base of nothingness: මෙය අරූප ලෝකයකි**.** 'කිසිවක් නැත' යන සංඥාව වඩා ලබාගන්නා සමාපත්තිය මගින් කෙනෙක් ආකිඤ්චඤ්ඤායතනය අරූප තලයේ පහළවේ. මෙම සමාපත්තිය ලැබීම අරහත් බව ළඟාකරගැනීමේ මගකි. මේ අරූප ලෝකය, හත්වෙනි විඥාන ස්ථානයවේ. **බලන්න**: බ්‍රහ්මලෝක, විඥාණ ස්ථාන, අරූපලෝක, අරූප සමාපත්ති.

▼ **මේ සමාපාත්තිය** පිළිබඳව බුදුන් වහන්සේ මෙසේ වදාළහ:
**"උපසීව, සිහිඇතිව, අනිත්‍යආදිය දකිමින් ආකිඤ්චඤ්ඤායතනය සමාපත්තිය 'නත්ථි කිඤ්චි' යයි පැවති ඒ සංවත ඇසුරුකර, චතුඕසය**

**තරණය කර, වස්තුකාම කෙළෙසකාම හැරදමා, සියලු විචිකිච්ඡා වලින් වෙන්ව, දිවා රෑ තණ්හාක්‍ෂය නම් නිවන විභූත කොට දකින්නේය".**
**සටහන්:** * එලෙස උත්තම විමොක්ෂහි ඇලුන ඒ උතුමා, එයින් නොපිරිහී, ඒ බ්‍රහ්මලෝකයේ කප් 60,000 වාසය කරන බවද, ඒ සේඛමුණි (නාමකයින් මිදුන) එහිම අස්තයට යනබවද මෙහි දක්වා ඇත. ** **බලන්න**: උපග්‍රන්තය1:උපසිව තෙර. **මූලාශ්‍රය**: බු.නි.සුත්තනිපාත: පාරායනවග්ග:වස්තුගාථා: පි,326, 5-6 උපසීවමානවක, පි.348.

▼ **මෙහිදී බුදුන් වහන්සේ** පෙන්වා ඇත්තේ ආකිඤ්චඤ්ඤායතන ලාභීන් ගේ අධිමුත්තිය ගැනය. **සටහන:**මේ සූත්‍රය දේශනා කර ඇත්තේ බවාරි බ්‍රහ්මණ ගේ සිසුවෙක් වූ පෝසාල මානවක ඇසු ප්‍රශ්නයක් පැහැදිලි කිරීමටය. බුදුන් වහස්නේ වදාළ දහම අසා මොහු ඇතුළු සිසුන් හැමදෙනා බුදුන් සරණ ගියහ. **බලන්න**: උපග්‍රන්ථය1: පෝසාල තෙර. **මූලාශ්‍රය**: බු.නි.සුත්තනිපාත: පාරායනවග්ග:වස්තුගාථා: පි,326, 5-14 පොසාලමානවක, පි.362.

▼ **මේ සූත්‍රයේදී** සැරියුත් මහා තෙරුන්, ආකිඤ්චඤ්ඤායතන සමාධි සමාපත්තිය ලැබීම විස්තරකර ඇත. **මූලාශ්‍රය:** සංයු.නි: (3): ඛන්ධවග්ග: සාරිපුත්‍රසංයුත්ත: 7.1.7 ආකිඤ්චඤ්ඤායතන සූත්‍රය, පි.498.

▼ **මේ සූත්‍රයේදී** මහා මුගලන් තෙරුන්, ආකිඤ්චඤ්ඤායතන සමාධි සමාපත්තිය ලැබීම විස්තරකර ඇත. **මූලාශ්‍රය:** සංයු.නි: (4): සළායතන වග්ග: මොග්ගල්ලානසංයුත්ත: 6.1.7 ආකිඤ්චඤ්ඤායතන සූත්‍රය, පි.523.
▲**අක්කෝෂ භාරද්වාජ තෙර-** Akkosha bharadvaja Thera
**බලන්න:** උපග්‍රන්ථය:1.
▲**ආක්‍රෝශ පරිභව**- Insults: ආක්‍රෝශ පරිභව යනු වෙනත් කෙනකුට දැඩි ලෙසින් උපවාද- නින්දා කිරීමය. ක්‍රෝධ සිතින් කටයුතු කිරීමය, අකුසලයකි, දුගතියට හේතුවේ. යම් මහණ කෙනෙක්, සෙසු සංඝයාහට නින්දා කරන්නේ නම් එය ආර්ය උපවාදයක් බව බුදුන් වහන්සේ පෙන්වා ඇත, එමගින් දුගතිය ඇතිවේ.**බලන්න**: ආර්ය උපවාදය,ක්‍රෝධය. **මූලාශ්‍ර**: අංගු.නි: ( 3 ): 5 නිපාත: 5.5.2.1 අකොකාසක සූත්‍රය, පි. 428, EAN: 5: 211.1 One who insults, p. 306.

▼ **අක්‍රොස පරිභව කරන** පුද්ගලයෙකුට සිදුවන අයහපත් විපාක මෙහි විස්තරාත්මකව පෙන්වා ඇත. **මූලාශ්‍රය**: අංගු.නි: (6) 10 නිපාත: අකොකාසකවග්ග:10.2.4.8අකොකාසක සූත්‍රය, පි.330.
▼**යම් කෙනෙක් වෙනත් කෙනකුට** අක්‍රොස පරිභව කරනවිට, ඒ තැනැත්තා නොකිපී ඒවා භාර නොගන්නේ නම්, එය ආපසු හැරී අක්‍රොස කළ පුද්ගලයා වෙතම පැමිණේ යයි මෙහි පෙන්වා ඇත. මේ පිලිබඳ **උපමාව:** තෑගිදීම:කෙනෙක්, වෙනත් කෙනකුට යම් තෑගී ආදී දෙයක් ගෙනයයි. එහෙත්, ඒ පුද්ගලයා ඒවා භාර නොගන්නේ නම්, පළමු පුද්ගලයා ඒවා ආපසු ගෙනයායුතුය. **බලන්න**:උපග්‍රන්ථය:5 **සටහන**: මෙහිදී බුදුන් වහන්සේ පෙන්වා ඇත්තේ: දමනයවී, සමදීවී ඇති, යහපත් ලෙසින් මිදුන,තාදීගුණ ඇති රහතුන් නොකිපෙන බවය **මූලාශ්‍රය:** සංයු.නි: (1): සගාථවග්ග:බ්‍රාහ්මණසංයුත්ත:7.1.2 අක්කොස සූත්‍රය, පි.314.
▲ **අක්‍රියාවාදය-**doctrine of non-doing: අක්‍රියාවාදය ලෙසින් පෙන්වා ඇත්තේ තුන්දොරින් අකුසල නොකිරීමය. **බලන්න**:  ක්‍රියාවාදය හා අක්‍රියාවාදය, දිට්ඨි.

▲ **ආකඞ්ඛයා-**Wishing for: යමක් ලබාගැනීමට කැමතිවීම- පැතීම මින් අදහස් කරයි. **බලන්න**: පතන දේ ලබාගැනීම.
▲ **අකාපුරිසෝ** - Akapuriso: බුදු, පසේබුදු, රහතුන් ආදී උතුම් පුරුෂයන් අකාපුරිසෝ ලෙසින් හඳුන්වයි. **බලන්න:** පංචඥාන සම්මාසමාධිය.
**අග**
▲ **අගතිමග හා නාගති මග-** පාලි: **අගතිගමනා, නාගතිගමනා-** wrong course & right course: අගතිමග යනු ඇද-වැරදි- වක්ව යන බවය. ධර්මයට එරෙහිවූ නොමගය. අනාරිය මගය. නාගතිමග, ධර්මයට අනුකූලවූ නිවැරදි මගය, ආරිය අටමගය. **අගතිමග ගැනීමට හේතු: "...චත්තාරිමානි භික්ඛවෙ අගතිගමනානි... ඡන්දාගතිං ගච්ඡති... දොසාගතිං ...මොහාගතිං ...භයාගතිං ගච්ඡති"** කෙනෙක්: 1) ආශාව නිසා (**ඡන්දය-** desire) 2) **ක්‍රෝධය** නිසා (ද්වේෂය-hate) 3) **අවිද්‍යාව** නිසා (මෝහය- delusion) 4) බියගුළුකම නිසා (**භය-** fear) අගතිමගට- අධර්ම මගට පැමිණේ. මෙ ගැන යොදාඇති උපමාව. එසේ වැරදිමග ගමන් කරන අයගේ කිර්තිය අමාවක පොහෝය දින හඳ එළිය අඩුවී යන ලෙසින් නැතිවී යයි. එහෙත්, අගතියට යන මග හැර නාගතිමග- දහම් මග ගමන් කරන්නාගේ කිර්තිය පසලොස්වක පොහෝය දින පායන පුන්සඳ ලෙසින් පැතිරී යයි. **බලන්න**:උපග්‍රන්ථය:5 **මූලාශ්‍ර:** අංගු.නි: (2): 4 නිපාත: 4.1.2.7, 4.1.2.8 හා 4.1.2.9 අගති-නාගති සූත්‍ර, පි. 58, EAN:4: 17.7, 18.8 and 19.9 Wrong course, p. 154.

▲ **ආගාළ්හ ප්‍රතිපත්තිය** -The coarse way of practice : මෙය කාම සුඛල්ලිකානු යෝගයේ ඇලීසිටින අයගේ රළුපටිපදාවය. **බලන්න**:පටිපදා විධි තුන.
▲ **අගාරික-** Agārika: ගිහිගෙයට ලැදිවී සිටින පුද්ගලයා අගාරිකය. **බලන්න**: අනගාරික හා අගාරික.
▲ **අග්නි**-Fire: අග්නි යනු ගින්දරය-ගින්න. බුදුන් වහන්සේ වැඩසිටි සමයේ, බ්‍රහ්මණයෝ ගිනිදෙවියන් පිදීම පිණිස අග්නි හෝම පත්වා ඇත. **බලන්න**: ගින්න, යාග හෝම.
▲**අග්ගික භාරද්වාජ තෙර-** Aggikabhradvaja Thera: බලන්න: උපග්‍රන්ථය:1.
▲**අග්ගික භාරද්වාජ බ්‍රාහ්මණ**-Brahmin Aggika Bhradvaja: **බලන්න:** උපග්‍රන්ථය:3.

▲**අග්‍ර ශ්‍රාවක**: පාලි: **අග්ග සාවක යුගං**- Two Chief Disciples : ගෞතම බුදුන් වහන්සේ ගේ අගසව්දෙනම සැරියුත් මහා තෙරුන් (**ශාරිපුත්‍ර-** උපතිස්ස) හා මහා මුගලන් තෙරුන්ය.(මොග්ගල්ලාන- කෝලිත). සියලු බුදුවරුන්ට අගසව් දෙනමක් සිටිති. **බලන්න**:බු.නි.බුද්ධවංසචරියාපිටකය.
▼**අග්‍ර ශ්‍රාවකයන් බවට පත්වීම:** භාග්‍යවතුන් වහන්සේ වේළුවනා රාමයෙහි වැඩ වසන සමයේ, උපතිස්ස හා කෝලිත යන මිතුරන්දෙදෙනා වේළුවනාරාමයට පැමිනෙනවා දැක මෙසේ වදාළහ: **"**මහණෙනි, කෝලිත, උපතිස්ස යන මේ යහළුවෝ දෙදෙනා මෙහි එති. මේ දෙදෙනා මගේ ශ්‍රේෂ්ඨවූ භද්‍ර යුග්මය වූ ශ්‍රාවක දෙපොල වන්නේය". **"...එතෙ භික්ඛවෙ ද්වෙ සහයා ආගච්ඡන්ති කොලිතො උපතිස්සො ච. එතං මෙ සාවකයුගං භවිස්සති අග්ගං භද්දයුගන්ති...". මූලාශ්‍රය**: වින.පි: මහාවග්ග පාළිය1, ඡේදය 20, පි.165.

▼**අගසව් දෙනමගේ ගුණ**: බුදුන් වහන්සේ අගසව් දෙනමගේ ගුණ මෙසේ වදාළහ**: "මේ අගසව් දෙනමගේ අසිරිය හා පුදුමය නම්, ඔවුන්, ගුරුවරයාගේ අවවාද අනුශාසනා වලට අනුව ක්‍රියා කළෝය, සිව්පිරිසටම ඔවුන් ප්‍රියවූවෝය, සිව්පිරිසම ඔවුන්ට ගරුබුහුමන් දැක්වූහ"** (It is wonderful, bhikkhus, on the part of the disciples, it is amazing on the part of the disciples, that they will act in accordance with the Teacher's instructions and comply with his admonitions, that they will be dear and agreeable to the four assemblies, that they will be revered and esteemed by them) **සටහන:** සිව්පිරිස නම් භික්ෂු, භික්ෂුණී, උපාසක,උපාසිකාය. **මූලාශ්‍ර**: සංයු.නි: (5-1): මහාවග්ග: සතිපට්ඨාන සංයුත්ත: 3.2.4. උක්කචේල සූත්‍රය,පි. 322, ESN:47: Satipattāna samyutta: 14.4 Ukacelāsutta, p. 1873.

▼**අගසව් දෙනමගේ ස්කන්ධ පරිනිර්වානය:** බුදුන් වහන්සේ මෙසේ වදාළහ: **"මහණෙනි, සැරියුත් මුගලන් දෙනම පිරිනිවන් ගතවූ හෙයින් දැන් මේ සඟ මුළුව හිස්ය යයි මට වැටහේ. පෙරදී යම් දිසාවක සැරියුත් මුගලන් දෙනම වෙසෙත් නම් සඟ මුළුව හිස් නොවූහ... මහණෙනි, අතීත කාලයෙහි වැඩසිටි අරහත් සම්මා සම්බුදුවරුන් හට ද, මට සාරිපුත්ත මොග්ගල්ලාන දෙනම වැනි ශ්‍රාවක යුගලක් වූහ... අනාගතයෙහි යම් අරහත් සම්මා සම්බුදු වරුන් වහන්සේලා වන්නාහුද, මට සාරිපුත්ත මොග්ගල්ලාන දෙනමවැනි ශ්‍රාවක යුගලක් ඒ භාග්‍යවතුන් වහන්සේලාට ද වන්නාහ...". සටහන:** අටුවාවට අනුව සැරියුත් තෙරුන් පිරිනිවන් පෑවේ කාර්තික මස (ඔක්තෝම්බර්- නොවැම්බර්) පුරපසළොස්වක පොහෝය දිනයේය. ඉන් සති දෙකකට පසුව: පුරඅටවක පොහෝ දින මහා මුගලන් තෙරුන් පිරිනිවන් පෑහ. **බලන්න**: ESN: note:162, p. 2408. **මූලාශ්‍ර**: සංයු.නි: (5-1 ):මහාවග්ග: සතිපට්ඨානසංයුත්ත: 3.2.4. උක්කචේල සූත්‍රය,පි. 322, ESN:47: Satipattāna samyutta: 14.4 Ukacelāsutta, p. 1873.

▼**වෙනත් මූලාශ්‍ර: 1.** 'The Great Disciples of The Buddha': Nyanaponika Thera and Helmuth Hecker, edited by Bhikkhu Bodhi, Wisdom Publication, 2003. (අගසව් දෙනම ගැන විස්තර ඇතුළත්ය).

▲ **අග්‍ර ශ්‍රාවිකා දෙනම-** Two Female Chief Disciples : බුදුන් වහන්සේගේ අග්‍ර ශ්‍රාවිකා දෙනම, ඛේමා තෙරණිය හා උප්පලවන්නා තෙරණියය. **බලන්න**:උපග්‍රන්ථය 2.

▲**අග්‍ර:** පාලි: අග්ග- foremost: අග්‍ර යනු ප්‍රමුඛබව- ප්‍රධාන බව, ශ්‍රේෂ්ඨබවය (chief-superior-great). පිරිස අතර හෝ යම් දෙයක් අතුරින් අගතැන ගැනීමය. ලෝකයේ අග්‍රතම පුද්ගලයා නම් බුදුන් වහන්සේය. සැරියුත් හා මුගලන් මහා රහතුන්, සංඝයා අතරින් අග්‍රවූහ, ධර්මතා අතරින් අග්‍ර වන්නේ චතුරාර්ය සත්‍යයය.

▲**අග්‍ර කරුණු පහ**- Foremost Five : එක්සමයක, භද්දජී තෙරුන් විසින් විමසනු ලදුව, ආනන්ද තෙරුන්, අග්‍ර කරුණු 5 මෙසේ දක්වා ඇත: 1) අග්‍ර දර්ශනය: ආසව ක්ෂයවීම දැකීම 2) අග්‍ර ශ්‍රවනය: ආසව ක්ෂයවීම ඇසීම 3) අග්‍ර සුඛය: ආසව ක්ෂයවීමේ සැපය 4) අග්‍ර සංඥාව:ආසවක්ෂයවීමේ සංඥාව 5) අග්‍ර භවය: ආසව ක්ෂයවීමේන් ලැබෙන පශ්චිම බවය (අරහත්වය). **මූලාශ්‍රය**:අංගු.නි: (3) 5 නිපාත: 5.4.2.10 භද්දජී සූත්‍රය, පි.348.

▲ **අග්‍ර කරුණු අට-** Foremost eight: කරුණු 8 ක් අග්‍ර යයි බුදුන් වහන්සේ පෙන්වා ඇත: අග්‍රශීලය, අග්‍රසමාධිය, අග්‍රප්‍රඥාව, අග්‍රවිමුක්තිය, අග්‍රරූපය, අග්‍රවේදනාව, අග්‍ර සංඥාව, අග්‍ර භවය. **මූලාශ්‍ර:** අංගු.නි: (2): 4 නිපාත: 4.2.3.4 හා 4.2.3.5 අග්‍ර සූත්‍ර, පි. 170, EAN: 4: 75.5 & 76.6 Foremost suttas, p. 178.

▲**අග්‍රතම පුද්ගලයා-** foremost person: තුන්ලෝකයටම අග්‍රතම පුද්ගලයා බුදුන් වහන්සේය, උන්වහන්සේ, ලෝක සත්ත්වයන් හට මහා කරුණාවෙන් යුතුව සසර දුකින් මිදීමට මග පෙන්වූ උත්තම පුද්ගලයාය. **බලන්න**:තථාගත, උපග්‍රන්ථය:6. **මූලාශ්‍ර:** අංගු.නි: (2): 4 නිපාත: 4.1.2.5 අග්ගපඤ්ඤත්ති සූත්‍රය, පි. 56, EAN: 4: 15.5 Proclamations, p. 153.

▼**සියළු ලෝක සත්ත්වයන්** අතරින් තථාගතයන් වහන්සේ අග්‍රය**-** The Tathāgata is foremost among all beings: යම්තාක් සත්ත්වන් තුන් ලෝකයේ සිටිනම්: අපා, දෙපා, සිව් පා, බුහුපා, රූපී, අරූපී, සඤ්ඤී, අසඤ්ඤී, නෙව සඤ්ඤී නා සඤ්ඤී, ආදීවූ සියලු සත්ත්ව කොට්ඨාශ අතර තථාගත අරහත් සම්මා සම්බුද්ධයන් වහන්සේ අග්‍රය:**"යාවතා භික්ඛවෙ සත්තා අපාදා වා දිපාදා වා චතුප්පදා වා බහුප්පදා වා රූපිනො වා අරූපිනො වා සඤ්ඤිනො වා අසඤ්ඤිනො වා නෙවසඤ්ඤිනාසඤ්ඤිනො වා, තථාගතො තෙසං අග්ගමක්ඛායාති අරහං සම්මාසම්බුද්ධො..."** . **මූලාශ්‍ර:** අංගු.නි: (6): 10 නිපාත:10.1.2.5 අප්‍රමාද සූත්‍රය,පි.68, EAN: 10: 15-5 Heedfulness, p.497.

▼ **දෙපා ඇති පුද්ගලයන්** (ද්විපාද) අතුරින් ක්‍ෂත්‍රියා ශ්‍රෙෂ්ඨය යි දෙවියෙක් පැවසූ අවස්ථාවේ බුදුන් වහන්සේ වදාළේ දෙපා ඇති අය අතුරින් සම්මා සම්බුදුරජාණන් වහන්සේ අග්‍ර බවය: **"සම්බුද්ධො දිපදං සෙට්ඨො..."** **මූලාශ්‍ර:** සංයු. නි: (1): සගාථවග්ග:දේවතාසංයුත්ත: 1.2.4 ඛත්තිය සූත්‍රය, පි.38, ESN: 1: Devatasamyutta: 14.4 The Khattiya, p.73.

▼ **සියලු සත්ත්වන් අතර අග්‍රවූ** බුදුන් කෙරෙහි යමෙක් පහන්වූවාහු නම්, ඔහු අග්‍රයා කෙරෙහි පහන්වූහ. අග්‍රයා කෙරෙහි පහන්වූ අයට අග්‍ර විපාක ලැබේ යයි බුදුන් වහන්සේ වදාළහ: **"යාවතා භික්ඛවෙ සත්තා අපාදා වා... තථාගතො තෙසං අග්ගමක්ඛායාති අරහං සම්මාසම්බුද්ධො. යෙ භික්ඛවෙ බුද්ධෙ පසන්නා, අග්ගෙ තෙ පසන්නා, අග්ගෙ ඛො පනපසන්නානං අග්ගො විපාකො හොති"** (Those who have confidence in the Buddha have confidence in the foremost,& for those who have confidence in the foremost, the result is foremost). **මූලාශ්‍ර:** අංගු.නි: (2): 4 නිපාත: 4.1.4.4. අග්ගප්පසාද සූත්‍රය, පි. 92, EAN: 4: 34.4 Confidence, p.161, අංගු. නි: (3 ): 5 නිපාතය:2 චුන්දී සූත්‍රය,පි.75, EAN: 5: 32.2 Cundi, p.247, ඛු.නි: ඉතිවුත්තක: 3.5.1 අග්‍රප්‍රසාද සූත්‍රය, පි. 466.

▼**දේව, බ්‍රහ්ම, මනුෂ්‍ය ආදීවූ** සියළුම ලෝක සත්ත්වන් අතුරින් තථාගතයන් වහන්සේ අග්‍රය: **"සදෙවකෙ භික්ඛවෙ ලොකෙ සමාරකෙ සබ්‍රහ්මකෙ සස්සමණබ්‍රාහ්මණියා පජාය සදෙවමනුස්සාය තථාගතො අග්ගමක්ඛායාති අරහං සම්මාසම්බුද්ධො"**. **මූලාශ්‍ර:**අංගු.නි: (2): 4 නිපාත: 4.1.2.5.අග්ගපඤ්ඤත්තිසූත්‍රය**,**පි.56, EAN:4:15.5.Proclamations, p. 153.

▼ විජ්ජාචරණ සම්පන්නවූ බුදුන් වහන්සේ, දෙව්මිනිසුන් අතර අග්‍රවේ: **"...විජ්ජාචරණසම්පන්නො - සො සෙට්ඨො දෙවමානුසෙති"**

**සටහන**: මේ ගාථාව, බ්‍රහ්ම සනංකුමාර විසින් ප්‍රකාශ කර ඇත. **මූලාශ්‍ර**: අංගු.නි: (6 ):11නිපාත: 11.1.10, මොරනිවාප සූත්‍රය**,** පි.642 , EAN: 11: 10.10 The Peacock Sanctuary, p.569.
▼**අෂ්ටවිද්‍යා හා පසළොස්චරණ ධර්ම යන්ගෙන්** සමන්විත භාග්‍යවතුන් වහන්සේ, දෙවි මිනිසුන් අතර ශ්‍රේෂ්ඨයයි මෙහි පෙන්වා ඇත. **මූලාශ්‍රය**: සංයු.නි: (2) නිදානවග්ග: භික්ඛුසංයුත්ත:මහා කප්පින සූත්‍රය, පි.460.
▼**තථාගතයන්** වහන්සේ, සියලු දෙපා ඇතිඅයට අග්‍රවේ.” **...දිපදානං අග්ගොති”**. **මූලාශ්‍ර:** අංගු.නි: (1 කාණ්ඩය):1 නිපාත: 1.13 සූත්‍රය, පි. 82, EAN:1: 171-2, p. 43.
▲ **අග්‍ර ධර්මය-** The foremost Dhamma :අග්‍ර ධර්මය නම් අරහත්වය යයි බුදුන් වහන්සේ වදාළහ. අග්‍ර ධර්මය පිණිස කරුණු 6 ක් සපුරා ගත යුතුවේ: ශ්‍රද්ධාව, හිරි හා ඔත්තප්ප, වීරිය, ප්‍රඥාව, තම ජීවිතය හා කය පිලිබඳ අපේක්ෂා නැතිබව. **මූලාශ්‍ර:** අංගු.නි: (4 ): 6 නිපාත: 6.2 3.9 අග්ග ධම්ම සූත්‍රය, පි. 258, EAN:6: 83.9 The Foremost state, p. 361.
▲ **අග්‍ර ධර්මතා-** Foremost Dhammas: ආධ්‍යාත්මික මග වඩා ගැනීම පිණිස අග්‍රවන ධර්මතා: **1) චතුරාර්ය සත්‍ය :** බුදුන් වහන්සේ වදාළ චතුරාර්ය සත්‍ය ධර්මය අග්‍රය. **2) විරාගය** හෙවත් නො ඇල්ම (නිවන) **:** සංඛත හෝ වේවා අසංඛත හෝ වේවා යම්තාක් ධර්මයෝ ඇත්නම්, විරාගය ඒ හැමට වඩා අග්‍රය. **3) ආරිය අටමග:** සියලු සංඛත (හේතුවෙන් උපන්) ධර්මතා අතුරින් අරිය අටමග අග්‍රය. **4) අප්‍රමාදය:** සියළුම කුසල දහමට අග්‍ර වන්නේ, මුලික වන්නේ අප්‍රමාදයය. **මූලාශ්‍රය:** ඛු.නි: ඉතිවුත්තක: 3.5.1 අග්‍රප්‍රසාද සූත්‍රය**,** පි. 466.
▲ **අග්‍ර ධර්ම දාන-** Great gifts of Dhamma : බුදුන් වහන්සේ, දාන අතුරින් ධර්මය තකා දෙන දාන අග්‍ර යයි වදාළහ: 1) ධර්ම දානය (gift of the Dhamma), ආමිෂ දානයට (gift of material things) වඩා අග්‍රය. 2) ධර්ම යාගය (offering of Dhamma), ආමිෂ යාගයට (offering of material goods) වඩා අග්‍රය. 3) ධර්ම ත්‍යාගය (generosity with the Dhamma) ආමිෂ ත්‍යාගයට වඩා අග්‍රය. 4) ධර්ම පරිත්‍යාගය, ආමිෂ පරිත්‍යාගයට වඩා අග්‍රය. **සටහන**: පරිත්‍යාගය යනු දීමෙන් කරන අත්හැරීම- relinquishment by giving. 5) ධර්ම ධනය (භොගො- wealth) ආමිෂ ධනයට වඩා අග්‍රය. 6) ධර්ම ආස්වාදය, ආමිෂ ආස්වාදයට වඩා අග්‍රය. **සටහන:** ආස්වාදය-සමෙභාගො (enjoyment) සම්භෝගකිරීම. 7) එක්ව බෙදාගන්නා දේ (සංවිභාගයෝ) ධර්ම සංවිභාගය, ආමිෂ සංවිභාගයට වඩා අග්‍රය. **සටහන**: සංවිභාගා- අනුමෝදන්වීම- sharing 8) ධර්ම සංග්‍රහය, ආමිෂ සංග්‍රහයට වඩා අග්‍රය. **සටහන**: සංග්‍රහය යනු මනාප සමබන්ධතාවයක් පවත්වා ගැනිමය- sustaining a favorable relationship. 9) ධර්ම අනුග්‍රහය, ආමිෂ අනුග්‍රහයට වඩා අග්‍රය. **සටහන**: අනුග්‍රහය- assistance යනු පිහිටවීම, උපකාරකිරිම. 10) ධර්ම අනුකම්පාව, ආමිෂ අනුකම්පාවට වඩා අග්‍රය. **සටහන**: අනුකම්පා-කරුණාව- compassion – empathy (සහකම්පනය) . 11) සාදරයෙන් පිළිගන්නා දේ අතුරින්, ධර්ම සන්ථාරය (welcome in the teaching), ආමිෂ සන්ථාරයට වඩා අග්‍රය.12) අනුග්‍රහ සහිතව පිළිගන්නා දේ අතුරින් ධර්ම පටිසන්ථාරය hospitality in the teaching) ආමිෂ පටිසන්ථාරයට වඩා අග්‍රය. 13) ගවේෂණ- සෙවීම (search) අතුරින්, ධර්-ම ගවේෂණය, ආමිෂය ගවේෂණට (ආමිසෙසනා) වඩා අග්‍රය. 14) පරියේසන (quest) අතුරින්, ධර්ම පරියෙසනය (ධම්ම

පරියෙසනා), ආමිෂ පරියෙසනයට වඩා අග්‍රය. 15) මුදුන්පත්කරගැනීමට උත්සාහ කරණ දේවල් අතුරින් (kinds of seeking), ධර්මය මුදුන්පත් කරගැනීම ආමිෂය මුදුන්පත් කරගැනීමට වඩා අග්‍රය. 16) පූජාවන් (veneration) අතුරින්, ධර්ම පූජාව, ආමිෂ පූජාවට වඩා අග්‍රය. 17) ආගන්තුකයන්ට දෙන දාන අතුරින්, ධර්ම ආගන්තුකදානය ආමිෂ ආගන්තුකදානයට වඩා අග්‍රය. 18) සමෘද්ධිමත්බව (success) අතුරින්, ධර්ම සමෘද්ධිය, ආමිෂ සමෘද්ධියට වඩා අග්‍රය. 19) වර්-ධනය (growth) අතුරින්, ධර්ම වර්ධනය, ආමිෂ වර්ධනයට වඩා අග්‍රය. 20) රත්නයෝ (gems) අතුරින්, ධර්ම රත්නය, ආමිෂ රත්නයට වඩා අග්‍රය. 21) රැස්කිරීම් (accumulation-සංචිත අතුරින්, ධර්ම සංචිතය, ආමිෂ සංචිතය ට වඩා අග්‍රය. 22) ව්‍යාප්තකිරීම් (විපුලකිරීම- expansion) අතුරින්, ධර්ම ව්‍යාප්තය, ආමිෂ ව්‍යාප්තයට වඩා අග්‍රය. **මූලාශ්‍ර**: අංගු.නි: (1): 2 නිපාත: 13 දාන වග්ග සූත්‍ර: පි. 216-218, EAN:2: XIII: Gifts, p. 71.

▲ **අග්‍ර මිනිසුන්-** Foremost men: අග්‍ර මිනිසුන් ලෙසින් පෙන්වා ඇත්තේ යමකිසි දෙයක් පිලිබඳ විශේෂබවක් ගත් පුද්ගලයන්ය: 1) **පංචකාමයෙහි ඇලුණ** පුද්ගලයන් අතුරින් (කාමභෝගී) **මන්ධාත** (මානධාතෘ) නම් රජ අගතැන් ගනී. **බලන්න**: මන්ධාත රජ (King Mandhātā). **මූලාශ්‍ර:**අංගු.නි: (2): 4 නිපාතය: 4.1.2.5 අග්ගපඤ්ඤත්ති සූත්‍රය, පි.56, EAN:4: 15.5. Proclamations, p.153. 2) **ධාර්මිකව ධනය උපයා, භාවිතා කරන පුද්ගලයා අග්‍රය**: කාමභෝගී පුද්ගලයන් දසදෙනෙක් පිළිබඳව අනේපිඩුසිටානන්හට -අනාථපිණ්ඩික විස්තරකර, බුදුන් වහන්සේ පෙන්වා ඇත්තේ, ඔවුන් අතරින් දැහැමි ලෙසින් ධනය උපයාගෙන, දැහැමිව ඒ ධනය භාවිතා කරණ, ප්‍රඥාව ඇති පුද්ගලයා අග්‍ර බවය. **මූලාශ්‍ර:** අංගු.නි: (6 ):10 නිපාත, 10.2.5.1. කාමභොගි සූත්‍රය,පි.344 , EAN:10: 91.1 One who enjoys sensual pleasures, p. 531. **3) පුතුන්අතුරින්** කීකරු පුත්‍රයා අග්‍රය යි බුදුන් වහන්සේ වදාළහ**. මූලාශ්‍ර:** සංයු.නි: (1): සගාථවග්ග:දේවතාසංයුත්ත: 1.2.4 **ඛත්තිය සූත්‍රය,** පි.38, ESN:1: Devatasamyutta: 14.4 The Khattiya, p.73.

▲ **අග්‍ර අධිපති-** foremost of rulers: අධිපතිබව දරන්නන් අතුරින් (පාලනය කරන අය) මාරයා ප්‍රමුඛවේ යයි බුදුන්වහන්සේ පෙන්වා ඇත. **බලන්න**: මාරයා. **"මාරෙ ආධිපතෙය්‍යානං ඉද්ධියා යසසා ජලං"** (Māra is the foremost of rulers, blazing with power and glory) **සටහන**: මාර දිව්‍යපුත්‍ර, පරනිර්මිත වසවත්ති දිව්‍යලෝකයේ වසයි. වසවත්ති නම් දිව්‍යරාජයෙක් එහි රාජ්‍ය කරයි.**බලන්න: සද්ධර්ම කෝෂය,** පි. 119. **මූලාශ්‍ර:** අංගු.නි: (2 ) 4 නිපාතය: 4.1.2.5 අග්ගපඤ්ඤත්ති සූත්‍රය, පි.56, EAN:4: 15.5. Proclamations, p.153.

▲ **අග්‍ර ආත්මභාවියා-** Foremost of those with bodies ආත්ම භාවින්, එනම්, ශරීරයක් දරන අය අතර (those with bodies) අග්‍ර රාහු අසුරය, විශාලතම ශරීරයක් දරයි. **(රාහග්ගං අත්තභාවිනං). සටහන්:** * රාහු, අසුරයන්ගේ රජෙකි. ** රාහු අසුරේන්ද්‍ර ශරීර ප්‍රමාණයෙන් ආත්මභාව ඇති අයට අග්‍රය. විස්තර පිණිස **බලන්න**: සද්ධර්ම කෝෂය**,** පි. 119, අසුර. **මූලාශ්‍ර:** අංගු.නි: (2 ): 4 නිපාත: 4.1.2.5 අග්ගපඤ්ඤත්ති සූත්‍රය**,** පි.56, EAN:4: 15.5. Proclamations, p.153.

▲ **අග්‍ර ගෝත්‍රය**- Foremost of clans: බුදුන් වහන්සේ වැඩසිටි සමයේ අග්‍ර ගෝත්‍රය (කුල) ලෙසින් හඳුන්වා ඇත්තේ ශාක්‍ය-කැත් කුලයය. (The khattiya is the best among people). **මූලාශ්‍රය**: සංයු.නි: (2) නිදානවග්ග:

භික්ඛුසංයුත්ත:මහා කප්පින සූත්‍රය, පි.460.
▲ **අග්‍ර භික්ෂුව**- Foremost of Bhikkhus: උතුම් ගුණ ඇති භික්ෂුව - රහතන්වහන්සේ, දෙව් මිනිසුන් අතර අග්‍රයයි බුදුන් වහන්සේ වදාළහ. **බලන්න**: රහතුන්සතු උතුම් ගුණ. **මූලාශ්‍ර** : අංගු.නි: (6 ): 11 නිපාත, 11.1.10 මොරනිවාප සූත්‍රය, පි.642, EAN:11: Dependence, 10.10 The Peacock Sanctuary, p.569.
▲ **අග්‍ර දැහැමිදානය**- Foremost of rightful giving: කෙනෙක් අකුසල් කරමින්, වෙනත් අය තලා පෙලා, සතුන් ඝාතනය කරමින්, මහත් ධනයක් වැය කර දෙන දානය අදැහැමි දානයකි. එය, දැහැමින් කල සුළුවූ දානයක වටිනාකමට නො පැමිණේ. කෙනෙක් දැහැමෙන් දෙන සුළු දානය අග්‍රයයි බුදුන් වහන්සේ වදාළහ. **මූලාශ්‍ර**: සංයු.නි: (1 ): මහාවග්ග: දේවතා සංයුත්තය:මච්ඡරී සූත්‍රය පි. 62, ESN: 1: Devathasamyutta: 32. 2 stinginess, p. 97.
▲ **අග්‍ර පින**- Foremost of merits : ත්‍රිවිධ රත්නයේ අග්‍රබව බව සලකා කෙනෙක් පහන් සිතින් දන් දෙන්නේ නම් එම පින අග්‍ර යයි බුදුන් වහන්සේ වදාළහ. ඔහුගේ ආයුෂ, වර්-නය, යසස (පිරිවර), කිර්තිය, සුඛය හා බලය වැඩේ (සම්පත් 6- foremost life span, beauty, and glory, good reputation, happiness, and strength). **මූලාශ්‍ර:** අංගු.නි: (2 ): 4 නිපාත: 4.1.4.4. අග්ගප්පසාද සූත්‍රය, පි. 92, EAN: 4: 34.4 Confidence, p.161, අංගු. නි: (3 ): 5 නිපාත: 2 චුන්දී සූත්‍රය, පි.75, EAN: 5: 32.2 Cundi, p.247.
▲ **අග්‍ර සමුහය**- Foremost of assemblies: සියලු සමුහ අතුරින් තථාගතයන්ගේ ශ්‍රාවක සංඝයා අග්‍රය. යම්කෙනෙක් සංඝයා කෙරෙහි පහන්වූවේද, ඔහු අග්‍ර දේට පහන්වූයේය, එමනිසා ඔහුට අග්‍ර විපාක ලැබේ. **මූලාශ්‍ර:** අංගු.නි: (2 ): 4 නිපාත: 4.1.4.4. අග්ගප්පසාද සූත්‍රය, පි. 92, EAN: 4: 34.4 Confidence, p.161, අංගු. නි: (3 ): 5 නිපාත:2 චුන්දී සූත්‍රය,පි.75, EAN: 5: 32.2 Cundi, p.247, බු.නි: ඉතිවුත්තක: 3.5.1 අග්‍රප්‍රසාද සූත්‍රය, පි. 466.
▲ **අග්‍රතම සිව්පිරිස**- Fourfold assembly of the Buddha: බුදුන් වහන්සේගේ අග්‍ර සිව්පිරිස:භික්ෂුසංඝ, භික්ෂුණිසංඝ, උපාසක හා උපාසිකාවන්ය. **බලන්න**: උපග්‍රන්ථ: 1,2,3. **මූලාශ්‍ර**: සංයු.නි: (5-1): සතිපට්ඨාන සංයුත්ත: 2.4. උක්කචේල සූත්‍රය,පි. 322, ESN:47: Satipattāna samyutta: 14.4 Ukacelāsutta, p. 1873.
▲ **අග්‍රතම ශ්‍රාවක භික්ෂූන්**- Foremost Bhikkhu Disciples: 1) **ජ්‍යෙෂ්ඨ භික්ෂූන්** අතුරෙන් ප්‍රමුඛ: **අඤ්ඤා කොණ්ඩඤ්ඤ** තෙර 2) **මහා ප්‍රඥාවෙන්** අග්‍ර: **සැරියුත්** මහා තෙර 3) මහා **ඍද්ධිමතුන්** (psychic potency) අතරෙන් අග්‍ර: **මහා මුගලන්-මොග්ගල්ලාන** තෙර 4) **ධුතාංග** පුහුණුව (ධුතවාද-තපස්කම්-ascetic practices) ලැබුවන් අතරෙන් අග්‍ර: **මහා කාශ්‍යප** තෙර 5) **දිවැස්** ලැබූ භික්ෂූන් අතරෙන් අග්‍ර: **අනුරුද්ධ** තෙර 6) **උසස්කුලයෙන්** පැවිදිවූ භික්ෂූන් අතරෙන් අග්‍ර: **භද්දිය කාලි ගොධාය පුත්ත** තෙර 7) **මිහිරි කටහඬ** (මඤ්ජුස්සරානං) ඇති භික්ෂූන් අතරෙන් අග්‍ර: **ලකුන්ටක භද්දිය** තෙර 8) **සිංහනාද** කරන භික්ෂූන් අතරෙන් අග්‍ර: **පින්ඩොල භාරද්වාජ** තෙර 9) **ධර්-ම කථික** භික්ෂූන් අතරෙන් අග්‍ර: **පුණ්ණ මන්තානිපුත්ත** තෙර 10) **කෙටි දහම් කාරණා** අර්-ථ සහිතව විස්තරාත්මකව දේශනා කරන භික්ෂූන් අතරෙන් අග්‍ර **මහා කච්චාන** තෙර11) **මනෝමයකය** මැවිමට (mind-made body) හා **රූපධ්‍යානයෙහි-**

(චෙතොවිවට්ට-mental transformation) දක්ෂ භික්ෂූන් අතරෙන් අග්‍ර: **චූල්ලපන්ථක** භික්ෂුව 12) **අරූප** ධ්‍යානයෙහි (සඤ්ඤාවිවට්ට-transformation of perception) දක්ෂ භික්ෂූන් අතරෙන් අග්‍ර **මහාපන්ථක** තෙර13) **අරණවිහාරි-** ගැටීම් රහිත විහරණය ඇති, දක්ෂිණාවට-දක්ඛිණෙය්‍යා -තෑගී පූජාආදිය ලැබීමට සුදුසු භික්ෂූන් අතරෙන් අග්‍ර: **සුභූති** තෙර 14) ආරණ්‍යවාසි භික්ෂූන් අතරෙන් අග්‍ර: **රේවත ඛදිරවනිය** තෙර 15) **භාවනාමය-** ධ්‍යානයෙහි ඇලුන- භික්ෂූන් අතරෙන් අග්‍ර: **කඞ්ඛා රේවත- කංඛාරේවත** තෙර 16) **ආරද්ධ වීරිය-** සම්පූර්ණ විරිය- ඇති භික්ෂූන් අතරෙන් අග්‍ර:**සෝණකොළිවිස** තෙර17) **කලණබස්** තෙපලන භික්ෂූන් අතරෙන් අග්‍ර: **සෝණකුටිකන්න** තෙර 18) **සිව්පස** මනාව ලබන භික්ෂූන් අතරෙන් අග්‍ර: **සීවලී** තෙර 19) **බලවත් ශ්‍රද්ධාව** ඇති භික්ෂූන් අතරෙන් අග්‍ර: **වක්කලී** තෙර 20 ) පුහුණුව -**ශික්ෂාව-**සික්ඛාමානං-කැමති භික්ෂූන් අතරෙන් අග්‍ර: **රාහුල** තෙර 21) **ශ්‍රද්ධාවෙන්** පැවිදිවූ- සද්ධා පබ්බජිතානං- භික්ෂූන් අතරෙන් අග්‍ර: **රට්ඨපාල** තෙර 22) පළමුව **සලාකපත්** ලබාගන්නා භික්ෂූන් අතරෙන් අග්‍ර: **කුණ්ඩධාන** තෙර 23) ධර්මයේ පැහැදීම ඇතිකරණ ගී පැදි සකස් කරණ භික්ෂූන් අතරෙන් අග්‍ර-**පටිභානවන්තානං-**composing inspired verses**: වංගීස** තෙර 24) සෑම ආකාරයෙන්ම විශ්වාසය ඇති කරන-**සමන්තපාසාදිකානං** භික්ෂූන් අතරෙන් අග්‍ර: **උපසේන වංග නාථපුත්ත** තෙර 25)සෙනසුන් -**සේනාසන පණවන** භික්ෂූන් අතරෙන් අග්‍ර: **දබ්බ මල්ල පුත්‍ර** තෙර 26) දෙවියන්ට ප්‍රිය මනාපවූ-**දේවප්‍රිය-** භික්ෂූන් අතරෙන් අග්‍ර: **පිළින්දවච්ඡ** තෙර 27) ක්ෂණික අභිඥා -**ඛිප්පාභිඤ්ඤා-**ලත් භික්ෂූන් අතරෙන් අග්‍ර **බාහිය දාරුචාරිය** රහතුන් 28) විසිතුරු දහම් කතා-**චිත්තකථිකානං** ඇති භික්ෂූන් අතරෙන් අග්‍ර: **කුමාරකාශ්‍යප** තෙර29) **සිව්පිළිසිඹියා** ලත් භික්ෂූන් අතරෙන් (පටිසම්භිදා -analytical knowledge) අග්‍ර: **මහා කොට්ඨිත තෙර 30)** බොහෝ ඇසූ පිරූතැන් ඇති **(බහුශ්‍රැත),** යහපත් සිහිය ඇති **(සතිමන්තාන -ධාරණස්මෘති)**, ක්ෂණික අවබෝධය ඇති -ගතිමන්තාන- (ප්‍රඥාගති-quick grasp), නිශ්චිතබව ඇති-**ධිතිමන්තාන** (ධෘතිමත්-resolute) හා භාග්‍ය වතුන්වහන්සේගේ **උපස්ථායකයන්** අතරෙන් අග්‍ර: **ආනන්ද** තෙර 31) **මහා පිරිවර -**මහා පිරිස-ඇති භික්ෂූන් අතරෙන් අග්‍ර: **උරුවෙලකස්සප** තෙර 32) පවුල් අතර ශ්‍රද්ධාව ඇතිකරණ -**කුලපාසාදික-**භික්ෂූන් අතරෙන් අග්‍ර: **කාළුදායි** තෙර 33) නිරෝගීසුවය ඇති -**අප්පාබාධා-**භික්ෂූන් අතරෙන් අග්‍ර: **බක්කුල** තෙර34) **පෙර විසූ කඳපිළිවෙත** සිහිකරණ **පුබ්බේ නිවාසානුස්සතිය-** භික්ෂූන් අතරෙන් අග්‍ර: **සෝභිත** තෙර 35) **විනයධර** භික්ෂූන් අතරෙන් අග්‍ර: **උපාලි** මහා තෙර 36) මෙහෙණියන්ට ඔවාදෙන-**භික්ෂුණී ඔවාද** භික්ෂූන් අතරෙන් අග්‍ර: **නන්දක** තෙර 37) **ඉන්දිය සංවරය-ඉන්ද්‍රියේ ගුත්තද්වාර**: ඇති භික්ෂූන් අතරෙන් අග්‍ර: **නන්ද** (ගෝතම) තෙර 38) සංඝයාට ඔවාදෙන-භික්ෂු ඔවාද-භික්ෂූන් අතරෙන් අග්‍ර: **මහාකප්පින** තෙර 39) තේජෝධාතු සමාපත්තියට සම වැදීමෙහි දක්ෂ -**තේජෝධාතු කුසලය-** භික්ෂූන් අතරෙන් අග්‍ර**: සාගත** තෙර 40) ධර්ම දේශනා ප්‍රතිභාණයට ප්‍රත්‍යවන කථා ඇති -**පටිභානකතා-**භික්ෂූන් අතරෙන් අග්‍ර: **රාධ** තෙර 41) **දළචීවර දරන** භික්ෂූන් අතරෙන් අග්‍ර **මොඝරාජ** තෙර. **බලන්න:** උපග්‍රන්ථය 1. **මූලාශ්‍ර:** අංගු.නි: (1) 1 නිපාත: එතදග්ග පාළිය සූත්‍ර, පි. 84**,** EAN:1: Foremost, p. 44.

▲**අග්‍රතම ශ්‍රාවිකා භික්ෂුණියන්** -Foremost Bhikkhuni Disciples

1) ජ්‍යෙෂ්ඨ භික්ෂුණියන් අතරෙන් ප්‍රමුඛ: **මහාප්‍රජාපති ගෝතමී** තෙරණිය 2) **මහා ප්‍රඥාවෙන්** යුත් භික්ෂුණියන් අතරෙන් අග්‍ර: **අග්‍රශ්‍රාවිකා ඛේමා** තෙරණිය 3) මහා **ඍද්ධිමත්** (ඉද්දි බලඇති) භික්ෂුණියන් අතරෙන් අග්‍ර: **අග්‍රශ්‍රාවිකා උප්පලවන්නා** තෙරණිය 4) **විනයධර** භික්ෂුණියන් අතරෙන් අග්‍ර: **පටාචාරා** තෙරණිය 4) **ධර්ම කථික** භික්ෂුණියන් අතරෙන් අග්‍ර **ධම්මදින්නා** තෙරණිය 5) ධ්‍යානයට ඇලුණ- **භාවනාමය-** භික්ෂුණියන් අතරෙන් අග්‍ර: **නන්දා** (ගොතම) තෙරණිය 6) සම්පූර්-න විරිය ඇතිකරණ **- ආරද්ධ වීරිය** -භික්ෂුණියන් අතරෙන් අග්‍ර: **සෝණා** තෙරණිය 7) **දිවැස්** ඇති භික්ෂුණියන් අතරෙන් අග්‍ර: **සකුලා** තෙරණිය 8) ක්ෂණික අභිඥා- **ඛිප්පාභිඤ්ඤා** ලැබූ භික්ෂුණියන් අතරෙන් අග්‍ර: **භද්‍රා කුණ්ඩලකේසි** තෙරණිය 9) පෙරවිසූ කඳ පිළිවෙත- **පුබ්බේනිවාසානුස්සතිය**: සිහිකරන භික්ෂුණියන් අතරෙන් අග්‍ර: **මහා භද්‍රාකපිලාණි** තෙරණිය 10) **මහාඅභිඥා** ලද භික්ෂුණියන් අතරෙන් අග්‍ර: **භද්ද කච්චානා** (යශෝධරාව) තෙරණිය 11) **දළ චීවර-රලුචීවර** දරන භික්ෂුණියන් අතරෙන් අග්‍ර: **කිසා ගෝතමී** තෙරණිය 12) **ශ්‍රද්ධා** අධිෂ්ඨානය ලැබූ භික්ෂුණියන් අතරෙන් අග්‍ර: **සිඟාලමාතා** තෙරණිය. **බලන්න**: උපග්‍රන්ථය 2. **මූලාශ්‍ර:** අංගු.නි: (1 ) 1 නිපාත: එතදග්ග පාළිය-සූත්‍ර, පි. 84**,** EAN:1: Foremost, p. 44.

▲ **අග්‍රතම උපාසකයෝ** -foremost of male lay followers

1) **පළමුව (**බුදුන් දහම් ) සරණ ගිය උපාසකයන් අතරෙන් අග්‍ර: **තපස්සු හා භල්ලුක** වෙළෙඳුන් දෙදෙනා 2) දායක ගිහි ශ්‍රාවකයන් අතරෙන් **අග්‍ර: සුදත්ත- අනාථ පිණ්ඩික සිටුවරයා 3)** ගිහි **ධර්ම කථිකයන්** අතරෙන් අග්‍ර: **මච්ඡිකාසණ්ඩයේ චිත්ත ගහපති** 4)සතර සංග්‍රහ වස්තුවලින් පිරිස ඇදගන්නා හා පවත්වා ගන්නා අය අතරෙන් අග්‍ර: **හත්තක ආලවක රාජකුමාර** 5) අග්‍රවූ **ප්‍රනීතවූ** දේ දෙන අය අතරෙන් අග්‍ර: **මහානාම** ශාක්‍යයන් 6) **මනාප** දේ දෙන අය අතරෙන් අග්‍ර: **උග්ග විසාලා පුර ගහපති**7) **සංඝ උපස්ථායකයන්** අතරෙන් අග්‍ර: **උග්ග- උග්ගත හත්ථිගාම** උපාසක 8) **අවෙච්චා ප්‍රසාදය** ඇති අය අතරෙන් අග්‍ර: **සූර අම්බට්ඨ** සිටුවරයා 9) **පුද්ගලික ප්‍රසාදයෙන්** සමන්විත අය අතරෙන් අග්‍ර: **ජීවක කොමාරභච්ච වෛද්‍යවරයා** 10) තෙරුවන් කෙරේ **විශ්වාසය** ඇති අය අතුරින් අග්‍ර: **නකුල පිතා උපාසක.මූලාශ්‍ර:** අංගු.නි: (1) 1 නිපාත: එතදග්ග පාළිය-සූත්‍ර, පි. 84, EAN:1: Foremost, p. 44.

▲ **අග්‍රතම උපාසිකාවෝ -**foremost of female lay followers: 1) උපාසිකා වන් අතර අග්‍ර වන්නේ **පළමුව සරණයෙහි** පිහිටි, **සේනානි** ගේ **දියණිය** වන **සුජාතාව** 2) දායිකාවන් අතරෙන් **විසාකා සිටුදේවිය (මිගාර මාතාව-මහාඋපාසිකා)** අග්‍රය 3) **බහුශ්‍රැත** උපාසිකාවන් අතරෙන් අග්‍ර **කුජ්ජුත්තරා උපාසිකාව** 4) **මෛත්‍රී විහරණ**ය ඇති උපාසිකාවන් අතරින් අග්‍ර **සාමාවතී බිසව** 5) ධ්‍යාන ලබන උපාසිකාවන් අතරෙන් අග්‍ර **උත්තරා නන්ද මාතාව-වේළුකන්ටකි නන්දමාතාව** 6) ඉතා **ප්‍රනීතවූ** අහාර පූජා කරණ දායිකාවන් අතරෙන් අග්‍ර **කෝලියදියණි සුප්පවාසා දේවිය** 7) **ගිලාන උපස්ථායිකාවන්** අතරෙන් අග්‍ර **සුප්පියා** උපාසිකාව 8) **අවෙච්ච ප්‍රසාදය** ඇති උපාසිකාවන් අතරෙන් අග්‍ර **කාතියානි** උපාසිකාව 9) තෙරුවන් කෙරෙහි **විස්වාස කථා** ඇති අය අතරෙන් අග්‍ර **නකුලමාතා උපාසිකා** 10) **ධර්-මය අනු-ශ්‍රවනයෙන්** (hearsay) උපන් ප්‍රසාදය ඇති උපාසිකාවන් අතරෙන් අග්‍ර **කුරරඝර** වැසි **කාලි** උපාසිකාව. **බලන්න:**

උපග්‍රන්ථය 3. **මූලාශ්‍ර:** අංගු.නි: (1): 1 නිපාත: එතදග්ග පාළිය-සූත්‍ර, පි. 84**,** EAN:1: Foremost, p. 44.

▲ **අග්‍ර ශීලය-** Foremost Virtue: ආර්යයන් පසසන මාර්ග ඵල සම්ප්‍රයුක්තවූ, ආරිය කාන්ත ශීලය අග්‍රය. එම ශීලය පරිපූර්න කරගත් පුද්ගලයා අග්‍රදේ පරිපූර්න කරගත් අග්‍රවිපාක ලැබීමට සුදුසු කෙනෙකි. (the virtuous behavior loved by the noble ones).**බලන්න**: ආරිය කාන්ත ශීලය. **මූලාශ්‍ර:** අංගු.නි: (3): 5 නිපාත:2 චුන්දී සූත්‍රය,පි.75, EAN: 5: 32.2 Cundi, p.247.

▲ **අග්‍ර දේ විනාශවීම -**Diminishing of Great things :අග්‍රයයි සලකන සියලුදේ, සියලු පුද්ගලයන් වෙනස්වී, විපරිණාමයට පත්වී වැනසී යන බව ද, ඒ බව දකින ශ්‍රැතවත් අරිය ශ්‍රාවකයා කළකිරීමට පත්ව අග්‍ර යයි සලකන දේ ගැන නො ඇලෙන්නේය යි බුදුන් වහන්සේ වදාළහ: 1) කාසිකෝසල විජිතයට අග්‍රවූ **පසේනදී කෝසල රජු** 2) දහසක් ලෝක ධාතුවට අග්‍රවූ **මහා බ්‍රහ්ම රාජයා** 3) අග්‍ර දෙව්ලොව යයි සලකන **ආභස්සර දේවලෝකය** 4) අග්‍ර කසිණයවූ **විඥාන කසිණ සංඥාව** ඇති සත්‍වයෝ 5) **අභිභායතනයන්ට අග්‍ර අටවෙනි ආයතන** සංඥාව ඇති සත්‍වයෝ 6) ධර්-ම පුහුණු ප්‍රතිපදාවේ අග්‍රවූ **සතරවෙනි ප්‍රතිපදාව** පුහුණු කරන පුද්ගලයෝ 7) සංඥා අතරින් අග්‍ර වූ **ආකිඤ්චඤ්ඤ සංඥාව** ඇති සත්‍වයෝ 8) ධර්ම විනයට බැහැර **විවිධ දිට්ඨි දරන අය අතුරින් අග්‍ර පුද්ගලයෝ** (භව පැවැත්ම පිළිබඳව හෝ භව නිරෝධය පිළිබඳව පිළිකුලක් නැත යන දිට්ඨි දරන) 9) **ඉහළම විසුද්ධිය** ලෙසින් නෙවසඤ්ඤා-නාසඤ්ඤායතන සමාපත්තිය අග්‍රයයි සලකා එම සමාපත්තිය දරන අය.**මූලාශ්‍ර:** අංගු.නි: (6) : 10 නිපාත: 10.1.3.9. ප්‍රථමකෝසල සූත්‍රය,පි. 134, EAN-10: The Great Chapter, 29.9 Kosala-1, p. 505.

▲ **අගෝචර භූමිය-** Un-favorable place: අගෝචර භූමිය: සාමාන්‍ය පෘතග්ජනයා පස්කම් ගුණය සහිතව වාසය කිරීමය, දහම් පුහුණුවට සුදුසු නොවේ. **බලන්න:** ගෝචර භූමිය.

▲ **අගෞරව ධර්ම**: පාලි: **අගරවා ධම්මා**- disrespectful dhamma අගෞරව යනු, ගරු කලයුතු උතුමන්ට, ගරු කලයුතු ධර්මතාවන්ට ගරු පූජා නො කිරීම- යටහත් බවක් නොදැක්වීමය. බුදුන් වහන්සේ අගෞරව ධර්ම 6ක් පෙන්වා වදාළේ, ඒවා ආධ්‍යාත්මික මගට හානිය ගෙනදෙන කරුණු බවය. **බලන්න**: හානභාගිය ධර්ම. **අගෞරව ධර්ම සය**: 1) ශාස්තෘන් වහන්සේ කෙරෙහි, 2) දහම කෙරෙහි, 3) සංඝයා කෙරහි ගෞරවය නැත, යටහත් පැවතුම් නැත 4) පුහුණුවට 5) අප්‍රමාදයට 6) ආචාර සම්පන්න බවට ගරු නොකරයි. **බලන්න**: ආචාරසම්පන්න බව. **සටහන:** ආචාරසම්පන්න නැතිබව: **නපටිසනත්‍ථාරො. මූලාශ්‍ර:** දීඝ.නි : (3 ): 11 දසුත්තර සූත්‍රය, පි. 483, EDN: 34: Dasuttara Sutta, p.384, අංගු. නි: (3): 5 නිපාත: 5.1.1.9, 5.1.1.10 අගාරව සූත්‍ර**,** පි. 34,

▲ **අංගන**- With blemish: අංගන යනු දැඩි කෙළෙස් ඇතිබවය. දැඩි කෙළෙස් ඇති පුද්ගලයන් වර්ග 2 කි: 1) එක් පුද්ගලයෙක් හට දැඩි කෙළෙස් ඇත, එහෙත් ඒබව ඔහු නොදනී. එමනිසා ඔහු කෙළෙස් පහකර ගැනීම ගැන නොදනී. 2) තවත්, පුද්ගලයෙක් හට දැඩි කෙළෙස් ඇත, ඒබව ඔහු දනී, එමනිසා, කෙළෙස් පහකර ගැනීමට ඔහු කටයුතු කරයි. **බලන්න:** අනංගන. **මූලාශ්‍ර**: ම.නි: (1): 1.1.5 අනංගණ සූත්‍රය**,** පි.74, EMN: 5: Anangaṇa Sutta- Without Blemishes, p.94.

▲**අංගුලිමාල තෙර**-Angulimala Thera: බලන්න: උපග්‍රන්ථය 1.

**අඝ**

▲ **අඝමූල**-Aghamula: අඝ යනු දුකය, දුක ඇතිවීමේ මූලය, අඝමූල යයි මෙහි දක්වා ඇත. දුක යනු පංචඋපාදානස්කන්ධය නිසා ඇතිවෙන දුකය. දුකට මුල නම් තණ්හාවය: කාම, භව හා විභව යන ත්‍රිවිධ තණ්හාය. **මූලාශ්‍රය:**සංයු.නි (3) ඛන්ධසංයුත්ත:1.1.3.10 අඝමූල සූත්‍රය, පි.84

▲ **ආඝාතවත්ථු හා ආඝාතපටිවිනය**-Resentment & removing resentment: **ආඝාත**- āghāta **(පාලි)**- අමනාපය, වෛරය, **අනආඝාත**-anāghāta - **අවෛරය** -freedom from anger or ill-will. ධර්මයට අනුව **ආඝාතවතථු** (āghāta-vatthū- reasons for resentment) යනු, වෙනත් කෙනෙක් පිළිබඳව සිතේ ඇතිවන අමනාපයට මුල්වන කරුණුය. අමනාපය සිතේ ඇතිවන ඍනාත්මක ස්වභාවයයකි (negative emotion) හෝ උද්වේගභාවි ගතියකි. යම් පුද්ගලයෙක් පිළිබඳව සිතේ ඇති අසතුට, අකමැත්ත නිසා අමනාපය ඇතිවේ. එම අමනාපය ඉවත්කරගැනීමේ පිළිවෙත **ආඝාත පටිවිනය**වේ (āghātpaṭivinaya-removing resentment**)** **ශබ්දකෝෂ: පා.සි.ශ**:පි. 120: "වෛරය, කෝපය. **ආඝාතවතථු**: වෛර බැඳීමට හේතුවන කරුණු. **ආඝාතපටිවිනය:** කෝපය ඉවත්කරගැනීම, පි. 58: **අනාඝාත**: ක්‍රෝධනැතිබව" **P.T.S:** p. 534: "Kodha anger. Nearest synonyms are āghāta, p. 911: Paṭivinaya, p.1341 āghāta-vatthūni, p. 80: **Anāghāta** [an + āghāta] freedom from anger or ill-will"

▼**ආඝාතවතථු**: කරුණු 10 ක් මුල් කරගෙන ලෝකයා අමනාපකම් ඇතිකරගන්නා බව බුදුන් වහන්සේ පෙන්වා ඇත:1) පෙරදී මගේ අනර්ථය පිණිස ඔවුන් කටයුතු කළා 2) දැන්මට අනර්ථයක් කිරීමට ඔවුන් කටයුතු කරනවා 3) ඉදිරියේදී මට අනර්ථ යක් ඔවුන් කරාවි 4) පෙරදී මම කැමති අයගේ අනර්ථය පිණිස ඔවුන් කටයුතු කළා 5) දැන් මම කැමති අයට අනර්ථ යක් කිරීමට ඔවුන් කටයුතු කරනවා 6) මම කැමති අයට ඉදිරියේදී ඔවුන් අනර්ථ යක් කරාවී 7) පෙරදී මම අකැමති අයගේ අර්ථය පිණිස ඔවුන් කටයුතු කළා 8) මම අකැමති අයට දැන් අර්ථයක් කිරීමට ඔවුන් කටයුතු කරනවා 9) මම අකැමති අයට ඉදිරියේදී, ඔවුන් අර්ථ යක් කරාවී, යයි කෙනෙක් සිතේ අමනාපය ඇතිකර ගනී. 10) කිසි කරුණක් නොමැතිව ද කෙනෙක් අමනාප ඇතිකරගනි- අස්ථානයේ කිපෙයි. **ආඝාත පටිවිනයය:** ආඝාත පටිවිනය ලෙසින් හඳුන්වා ඇත්තේ, කෙනෙක් පිළබඳව සිතේ යම් අමනාපයක් ඇතිවූ විට එය නැතිකරගන්නා ක්‍රම පිළිවෙලය. ඉහත 1-9 දක්වවූ කරුණු මුල් කරගෙන ඇතිකරගන්නා අමනාපය නැති කරගැනීමට මෙසේ සිත හදාගත යුතුයයි බුදුන් වහන්සේ වදාළහ: **"ඒ ගැන කුමක් කරන්නද? (එය මගේ පාලනයෙන් පිටය) එවිට සිතේ ඇති අමනාපය පහවීයයි"** 10) අස්ථානයේ නොකිපී සිටීමෙන් අමනාප ඇතිනොවේ එනම්, කිසිවක් ගැන සිතේ අමනාපයක් ඇති නොකර ගෙන වාසය කිරීමය. **මූලාශ්‍ර:** අංගු.නි: (6):10 නිපාත, ආකඩ්ඛ වග්ග, 10.2.3.9 **ආඝාතවස්තු සූත්‍රය,** 10.2.3.10. හා ආඝාතපටිවිනය සූත්‍රය, පි.294, EAN:10: 79.9. Grounds-1 and 2, p.525.

**අච**

▲ **අචේලකස්සප තෙර 1 හා 2 -**Achelakassapa Thera 1 &2. **බලන්න:** උපග්‍රන්ථය:1.

▲**අචින්ත ධර්මතා:** පාලි: **අචින්තෙයියා ධම්මා** - Inconceivable-in calculable matters: සාමාන්‍ය පුද්ගලයෙකුට සිතාගත නොහැකි, අවබෝධ කළනොහැකි ධර්ම කරුණු, අචින්ත ධර්ම තාය. **ශබ්දකෝෂ: පා.සිං.ශ: පි.** 30: **"අචින්තිය- අචින්තෙයියා:** සිතිය නොහැකි, නොසිතියයුතු කරුණු...". **B. D:** p.4: "**Acinteyya**: That which cannot be or should not be thought-the unthinkable"

▼**අචින්ත ධර්මතා හතරක්ය:** බුද්ධවිෂය, ධ්‍යාන විෂය (ජානවිෂය), කම්ම විපාක විෂය, ලෝක විෂය. ඒ පිළිබඳව සාමාන්‍යකෙනෙකුට අවබෝධ කරගැනීම පහසුනැත, කෙනෙක් ඒවා සිදුවිය හැකිදේ ද? යයි විමසන්නේ නම් ඒ පුද්ගලයා උමතුවට හෝ ඉච්ඡාභංගත්වයට (frustration) පත්වේ. **" චත්තාරිමානි භික්ඛවෙ අචින්තෙයියානි න චින්තෙතබ්බානි, යානි චින්තෙනෙතා උම්මාදස්ස විඝාතස්සභාගී අස්ස... බුද්ධවිසයො ... ඣාන විසයො... කම්මවිපාකො ... ලොකචින්තා..." .** 1) **බුද්ධ විෂය-**the domain of the Buddhas: බුදුවරුන්ගේ පිළිවෙත, **ආධ්‍යාත්මික බල**: **සර්වඥතා ඥානය** ආදී බුදුවරු සතු විශේෂ බල, ඥාණ ගැන විමසීම. 2) ධ්‍යාන (ජාන) **විෂය** - the domain of one in jhāna: ජානසමාපත්ති ආදිය පිලිබඳ විමසීම. 3) **කම්ම විපාක විෂය**: මෙලොව හා පරලොව විදීමට ඇති කම්ම විපාක විමසීම. 4) **ලෝක විෂය (**speculation of the world) ලෝකය නිර්මාණයවූ ආකාරය- සත්ත්වයන් ඇතිවීම ගැන විමසීම. **බලන්න**: EAN: note 772, p. 620. **සටහන:** බුද්ධ විෂය පිලිබඳ විස්තර පිණිස බලන්න: **"සුවිසි මහ ගුණය":** රේරුකානේ චන්දවිමල මහානාහිමි. **මූලාශ්‍ර:** අංගු.නි: (2): 4 නිපාත: 4.2.3.7 අචින්තෙයියා සූත්‍රය, පි. 171, EAN:4: 77.7 Inconceivable Matters, p. 178.

▲**අචිරවත අග්ගිවෙස්සන සාමණේර-**Samanera Achiravata aggivessana. **බලන්න:** උපග්‍රන්ථය:1.

▲ **ආචයගාමී ධර්ම-** Dhamma that leads to building up: ආචයගාමී ධර්ම ලෙසින් පෙන්වා ඇත්තේ ධර්මයට අනුකුලනොවන ලෙසින් කටයුතු කිරීමය- වැරදිමග ගැනීමය. **බලන්න**: අපචයගාමී ධර්ම.

▲**ආචාරශීලි බව**: පාලි: **පටිසන්ථාරො** -politeness -paṭisanthāro: ධර්ම යේ ආචාරශීලිබව යනු මිත්‍රබැවින් සිටීම, කරුණාව දැක්වීම, ගරුකිරීම, අනුන්ගේ සුභසාධනය ගැන සැලකීම (friendly welcome, kind reception, honor, goodwill). භික්ෂුව ආචාරශීලිව හැසිරීම ගෞරව ධර්ම යක්ය.එය ආධ්‍යාත්මික මග වඩා ගැනීමට උපකාරීවේ.**බලන්න**: ගෞරව ධර්ම, අගෞරව ධර්ම, අපරිහානි ධර්ම.

▼**බුදුන් වහන්සේ** සංඝයා ආචාරශිලිව වාසය කලයුතුය යි අනුසාසන කර ඇත, යහපත් ලෙසින් වදාරා ඇත. ඒ ධර්මතාව සංඝයා එක්ව, ධර්මයේ චිරස්ථිතිය පිණිස සජ්ජායනා කිරීම සුදුසු ය යි සැරියුත් තෙරුන් සංඝයාට උපදෙස් දී ඇත.**මූලාශ්‍ර**: දිඝ.නි: (3):10 සංගිති සූත්‍රය, පි.372 හා **1**1 දසුත්තරසූත්‍රය,පි.483, EDN:33:Saṅgīti Sutta: The Chanting Together, p.362, & 34: Dasuttara Sutta: Expanding Decades, p. 384.

▲ **ආචාරියා අද්භූත ආශ්චර්යමත් ධර්මතා-**Wonderful & Marvelous qualities of the Teacher: තථාගතයන් සතු අද්භූත හා ආශ්චර්යමත් (අසිරිමත්) ධර්මතා මෙහි විස්තරාත්මකව පෙන්වා ඇත. **මූලාශ්‍ර:** ම.නි:(3) : 3.3.3 ආචාරියා අද්භූත සූත්‍රය, පි. 302, EMN: 123: Wonderful and Marvelous, p. 897.

**අජ**

▲**අජිත (මානවක) තෙර-**Ajitha (manawaka) Thera **බලන්න:** උපග්‍රන්ථය:1.
▲ **අජානිය අශ්වයා උපමා-**Simile of the Thoroughbred horse
1) මැනවින් පුරුදු පුහුණු කල අජානිය අශ්වයා රාජසේවයට උතුම්වේ. එලෙස දස ධර්ම ය (දසදහම) සහිත මහණ බුදුසසුනේ උතුම්බවට අග්‍රබවට පත්වේ. **සටහන්**: * දස ධර්මය ලෙසින් පෙන්වා ඇත්තේ: දස අසේඛිය දහමය. මෙය අජානිය අශ්ව උපමා ධම්ම පරියාය බව මෙහි පෙන්වා ඇත. ** මේ සූත්‍රය දේශනා කර ඇත්තේ භද්‍රාලි තෙරුන්ටය. **බලන්න**: උපග්‍රන්ථය:1. **මූලාශ්‍රය:**ම.නි: (2) 2.2.5 භද්‍රාලි සූත්‍රය, පි.190, EMN: Bhadrali Sutta. 2) රජෙකුගේ අජානිය අශ්වයා වර්න, බල, ජව හා ආරෝහපරිණාහ යන සතර කරුණු නිසා රාජකීය වේ. එම උපමාව යොදාගනිමින් බුදුන් වහන්සේ පෙන්වා ඇත්තේ සංඝගුණ සතරක් ඇති මහණ (අජානිය අශ්වයා මෙන්) සසුනේ **ආහුනෙය්‍ය, පාහුනෙය්‍ය, දක්ඛිනෙය්‍ය, අංජලීකරණිය**, ලෝකයට අනුත්තර **පුණ්‍යක්ෂේත්‍රය** ලෙසින් අග්‍රවන බවය. **සතර සංඝගුණ:** 1) ශිලසම්පන්නවීම, භික්ෂුව වර්න සම්පන්නවීමය 2) කුසල් දහම් පිලිබඳ ප්‍රධන් විරිය තිබීම භික්ෂුව බල සම්පන්නවීමය 3) චතුසත්‍ය අවබෝධය හා ආසව ක්ෂය කිරීම භික්ෂුව ජව සම්පන්නවීමය 4) සිව්පස ලැබීම භික්ෂුව ආරෝහපරිණාහ සම්පන්න වීමය. **සටහන්**: * ආහුනෙය්‍ය ආදී ගුණ ආරිය සංඝයා සතු ගුණයන්ය. **බලන්න**: සංඝ ගුණ.** **අංගු. නි: (3) 5 නිපාතයේ**:වෙනත් සංඝගුණ පහක් පෙන්වා ඇත: 1) ඍජුබව (අවංකබව) 2) ජවසම්පන්න (සූර වූ) නුවණ තිබීම 3) මෘදුබව 4) ඉවසීම (ක්ෂාන්තිය) තිබීම 5) සංවරබව. **මූලාශ්‍ර:** අංගු.නි: ( 2) 4 නිපාත: 4.6.6. හා 4.7.7 අජානිය සූත්‍ර, පි. 502, EAN:4: 259.6 & 260.7 Thoroughbred, p. 232, අංගු. නි: (3) 5 නිපාත: 5.5.1.3 සූත්‍රය, පි. 422, EAN:5: 203.3 Thoroughbred, p. 304.
▲ **අංජලිකරණිය-**Anjalikaraniya : අංජලිකරණිය ලෙසින් පෙන්වා ඇත්තේ දෙඅත් මුදුනේ තබා නමස්කාර කිරීමය. බෞද්ධයන්, ත්‍රිවිධ රත්නයට, සංඝයාට ගෞරව නමස්කාර කරන්නේ මෙලෙසය.
▲ **අජපාල නුගරුක-** Ajapaala Nugaruka: සම්බෝධිය ලැබූ බුදුන් වහන්සේ දෙවන සතිය අජපාල නුගරුක මුල ගතකලබව මෙහි දක්වා ඇත. එහිදී පැමිණි බ්‍රාහ්මණයෙක්, "බ්‍රාහ්මණ ධර්මය" ගැන විමසනු ලැබුව, බුදුන්වහන්සේ ඒ පිළිබඳව ඔහුට කළ දේශනාව මෙහි දක්වා ඇත. **බලන්න**: උපග්‍රන්ථය:6 .**මූලාශ්‍රය:** වි.පි: මහාවග්ග 1 : මහාඛන්ධක: 6 අජපාලකථා, පි.84.
▲ **අජර-**Un-agingඅජර යනු ජරාවට- දිරිමට පත්නොවන බවය. ජරාවෙන් ඈදුරු නොවන ධර්මය අජරය, නිවනය යයි බුදුන් වහන්සේ පෙන්වා ඇත. **සටහන**: අජර නිවන හඳුන්වන නමකි. **බලන්න**: නිවන **මූලාශ්‍ර**: සංයු.නි (4):අසංඛතසංයුත්තය: 9.2 අජර සූත්‍රය, පි. 684, ESN: 43: Asnkathasamyutta: 14.3 The Taint less, p. 1513.
▲ **අජාත -**Unborn: අජාත යනු හට නොගත් බවය (හේතු ප්‍රත්‍ය නිසා ඇති නොවූ). මෙය නිවන හඳුන්වන පදයකි. **බලන්න**: නිවන. **මූලාශ්‍රය**: ඛු.නි: ඉතිවුත්තක: 2.2.6 අජාත සූත්‍රය, පි. 393.
▲ **අජාසත් රජ-**King Ajasaththu: බිම්බිසාර රජතුමාගෙන් පසුව මගධයේ අධිපතිවුහ. **බලන්න**: උපග්‍රන්ථය: 3
▲ **අජ්ඣත්ත-** Internal: අජ්ඣත්ත ලෙසින් පෙන්වා ඇත්තේ ඇතුලය-සිත අභ්‍යන්තරයය. කෙනෙක්ගේ අභ්‍යන්තරයේ සුවය හෝ දුක

ඇතිවීමට හේතුව, පංච උපාදානස්කන්ධය තමාගේ යයි සැලකීම බව මෙහිදී පෙන්වා ඇත. **සටහන:** අංගු.නි:1 නිපාත: 10 අජ්ඣත්ත වග්ගයේ: අභ්‍යන්තර අර්ථය හා අනර්ථය පිලිබඳ විස්තරාත්මකව පෙන්වා ඇත. **මූලාශ්‍ර:** සංයු.නි: ( 3): ඛන්ධසංයුත්ත: 1.3.5.1 අජ්ඣත්ත සූත්‍රය, පි. 352, ESN: 22: Kahandasamyutta: 150.1 Internally, p. 1112.

▼ **අජ්ඣත්ත** ලෙසින් සලකන ඇස, කණ ආදී අභ්‍යන්තර ආයතන 6-සළායතන**,** අනිච්ච, දුක්ඛ හා අනාත්ම ස්වභාවය ගන්නා බව මෙහි දක්වා ඇත. **මූලාශ්‍ර:** සංයු.නි: ( 4 ):සළායතන සංයුත්ත: දේවදහ: 1.14.7, 1.14.8 හා 1.14.9 **සූත්‍ර**, පි.286, ESN: 35: Salayathnasamyutta: IV Devadaha: 140.7, 141.8 & 142.9 suttas, p.1290.

▲**ආජීවක-**Ājīvaka : බුදුන්වහන්සේ වැඩසිටි සමයේ සිටි මක්ඛලි ගෝසාල නම් ආගමික නායකයාගේ අනුගාමිකයන් ආජීවකයන් ලෙසින් හඳුන්වා ඇත. මක්ඛලි ගෝසාල (Makkhali Gosāla) ඉගැන්වුවේ දැඩි නියතවාදයය(strict determinism). එසේම ඔහු තම අනුගාමිකයන්ට අවධාරණයෙන් පෙන්වා දුන්නේ උග්‍ර තපස් ව්‍රත රැකීම ගැනය. **බලන්න**: EAN: note 490, p. 606, මක්ඛලි ගෝසාල.

▲**ආජීවකබිය**-Ajivakabiya :ජීවිතවෘත්තිය පිලිබඳ ඇති බිය මෙසේ හඳුන්වයි. **බලන්න**: සංග්‍රහවත්ථු බල.

▲ **ආජීව පාරිසුද්ධි ශීලය-**Ajivaparisuddhi Sila: සංඝයාගේ ආජීවය පිරිසිදුව පවත්වා ගැනීම පිණිස පනවා ඇති ශීලයකි. එනම් මිථ්‍යා ආජීවයෙන් වැලකී සම්මා අජීවය ඇතිව වාසය කිරීමය,මෙය භික්ෂු භික්ෂුණි විනයට ඇතුලත්වේ. **බලන්න**: ශීලය, සංඝවිනය. **ශබ්දකෝෂ:** B.D: p.7: “Ajivaparisuddhi Sila: Morality consisting in purification of livelihood, is one of the 4 kinds of perfect morality”.

▲**ආජීවාෂ්ටමක ශීලය**-Ajivaashtamaka Sila: මාර්ග බ්‍රහ්මචරියාවට අයත් ශීලයක් ලෙසින් පෙන්වා ඇත. ත්‍රිවිධ ආකාර අකුසල-කාය,වාක් හා මනෝ ක්‍රියා වළකාගැනීමට හා මිථ්‍යාඅජීවය පහ කර ගැනීම පිණිස මේ ශීලය සමාදන්වේ. ධර්ම මාර්ගයට පැමිණීම පිණිස සමාදන්විය යුතු ශීලයකි. **බලන්න**: ශීලය. **සටහන්:** * බලන්න: සිංහල විසුද්ධිමාර්ගය: 1 පරිච්ඡේදය, පි.60. ** මෙය ආදී බ්‍රහ්මචරියා ශික්ෂාව- ශීලය ලෙසින්ද පෙන්වා ඇත. **බලන්න**: ආදී බ්‍රහ්මචරියා ශික්ෂාව.

**අඤ්ඤ**

▲ **අඤ්ඤා-** Highest knowledge: ධර්මයට අනුව අඤ්ඤා ලෙසින් පෙන්වා ඇත්තේ උසස් අවබෝධයය- උතුම් නුවණ ලැබීමය. එනම්, සතරමග ඵල ලැබීමය, අරහත්ඵලය සාක්ෂාත් වීමය. **ශබ්දකෝෂ:** B.D: page:15: “Aññā: Higest knowledge, refers to the perfect knowledge of Arahant…” **සටහන්: *** කොණ්ඩඤ්ඤ තෙමෙ චතු සත්‍ය අවබෝධ කල හෙයින් (සෝතාපන්න වූ නිසා) අඤ්ඤා කොණ්ඩඤ්ඤ නම්විය. **බලන්න**: දීඝ.නි:ධම්මචක්කප්පවත්තන සූත්‍රය. ** අඤ්ඤා අවබෝධය යන අර්ථයෙන් ධම්මපදයේ මෙසේ දක්වා ඇත:

**“අඤ්ඤා හි ලාභූපනිසා- අඤ්ඤා නිබ්බානගාමිනි” :**ලාභ උපදවන අවබෝධය-පිළිවෙත එකකි, නිවන කරායන පිළිවෙත අනිකකි”**.**
**බලන්න**: ධම්මපදය:බාලවග්ග: 75 ගාථාව.

▲**අඤ්ඤා කොණ්ඩඤ්ඤ තෙර-**Aññākoṇḍañña Thera: **බලන්න:** උපග්‍රන්ථය:1.

▲**අඤ්ඤාන චරියා-** Aññā Chariya: චර්යා නානානත්ව ඥාණ 3 න්

එකකි. **බලන්න:** චර්යා නානානත්ව ඥාණ.

▲ **අඤ්ඤි ඉන්ද්‍රිය-** Aññi indriya :සේඛ පුද්ගලයාට අනඤ්ඤාත- ඤානස්සාමීති ඉන්ද්‍රිය පහළවීමෙන් පසුව අඤ්ඤිඉන්ද්‍රිය (Faculty of highest knowledge) ඇතිවේ. **බලන්න**: ඉන්ද්‍රිය, අවසාන ඥානය. **මූලාශ්‍රය**: ඛු.නි: ඉතිවුත්තක: 3.2.3 ඉන්ද්‍රිය සූත්‍රය, පි. 418.

▲ **අඤ්ඤඤාතවින්ද්‍රිය:** Final knower: සියලු ආසවයන් ක්ෂය කල බවත්, ඒවා නැවත ඇති නොවන බව දන්නා නුවණ. **"මගේ විමුක්තිය අක්කුප්ප යයි"** අවබෝධය, අඤ්ඤඤාතවින්ද්‍රිය- ප්‍රත්‍යවෙක්ෂාඥානය ඇතිවීමය යි මෙහි දක්වා ඇත. **බලන්න**: අවසාන ඥානය, ඉන්ද්‍රිය. :**මූලාශ්‍රය**:ඛු.නි: ඉතිවුත්තක: 3.2.3 ඉන්ද්‍රිය සූත්‍රය, පි. 418.

▲ **අඤ්ඤාව්‍යාකරණ**- Declaration of Final knowledge: අඤ්ඤා ව්‍යාකරණය ලෙසින් දක්වා ඇත්තේ අරහත්වයට පත්වීම ගැන කරන ප්‍රකාශයය. අඤ්ඤාව්‍යාකරණ 5 ක් බුදුන් වහන්සේ පෙන්වා ඇත: 1) අනුවණ මෝඩ අය තමන් අරහත්යයි පවසයි 2) ලාමක ඉරිසියාව හා ආශාව ඇති අය තමන් අරහත්යයි පවසයි 3) මනස විකෘතිවීම නිසා තමන් අරහත්යයි පවසයි 4) තමන් ලබාගත් ධර්ම ඵල අධි තක්සේරු කිරීම නිසා තමන් අරහත්යයි පවසයි 5) යහපත් ලෙසින්ම කෙළෙස් මුදාගෙන සත්‍ය ලෙසින්ම තමන් අරහත්යයි පවසයි. **බලන්න**: රහතන්වහන්සේ. **මූලාශ්‍ර:** අංගු.නි: (3 ): 5 නිපාත: 5.2.5.3 අඤ්ඤාව්‍යාකරණ සූත්‍රය, පි. 212, EAN:5: 93.3 Declaration, p. 272.

▲ **අඤ්ඤා විමොක්ඛ-** Aññã vimokkha : අඤ්ඤා විමොක්ඛ යනු අවසාන ඥානය ලැබීමෙන් විමුක්තිය සාක්ෂාත් කර ගැනීමය. අරහත්වයට පත්වීමය. **බලන්න**: අවසාන ඥාණය. **මූලාශ්‍ර**: අංගු.නි :(1 ): 3 නිපාත: දේවදූතවග්ග: 3.1.4.3 සාරිපුත්‍ර සූත්‍රය, පි. 284, EAN:3: Divine Messengers: 33.3 Sariputta, p.90, සංයු. නි: (5-1): මහාවග්ග: ඉන්ද්‍රිය සංයුත්තය: 4.3.3 අඤ්ඤඉන්ද්‍රිය සූත්‍රය, පි.392, ESN:48: Indriya samyutta: 23.3 The Faculty of Final Knowledge, p. 1938.

අට

▲**අටපැන්:** පාලි: අට්ඨපානානි- Eight types of drinks: බුදුන් වහන්සේ සංඝයාට කැප- අනුදැන වදාළ පැන් වර්ග 8 ක් වේ: අඹපැන්, දඹ පැන්, ඇට කෙසෙල් පැන්, මස් කෙසෙල් පැන්, මීපැනි, මිදිපැන්, ඕලු පැන්, බොරලඑදමුනු පැන්. එසේම ධාන්‍ය ඵල රස හැර සියලු ඵල රසද, පිසූ පලාකොළ රස හැර දිය මුසු කොට මිරිකාගත් සියලු කොළරස ද මීපුප්රසය හැර සියලු මල්රස ද, උක් රසය- ඉස්ම ද අනුදැන වදාළ සේක: **"... අනුජානාමි භික්ඛවෙ, අට්ඨපානානි: අම්බපානං ජම්බුපානං මධුපානං මුද්දිකපානං සාලූකපානං ඵාරුසකපානං... සබ්බං ඵලරසං ඨපෙත්වා ධඤ්ඤඵලරසං... සබ්බං පත්තරසං ඨපෙත්වා ඩාකරසං... සබ්බං පුප්ඵරසං ඨපෙත්වා මධුකපුප්ඵරසං... උච්ඡුරස**": **මූලාශ්‍රය**: වින.පි: මහාවග්ග 2- 43, පි.108.

▲ **අටපිරිස**: පාලි: අට්ඨපරිසා-assembly of eight: ධර්ම යේ අටපිරිස ලෙසින් දක්වා ඇත්තේ බුදුන් වහන්සේ වෙතින් දහම අසන දෙව් මිනිස් පිරිසය. තථාගතයන් වහන්සේ දසබල ඥාණයෙන් යුතුව අට පිරිසට දහම් දේශනා කරයි, සිංහ නාදය පවත්වයි, ධම්ම චක්කය පවත්වයි. **සටහන:** ක්ෂත්‍රිය, බ්‍රාහ්මණ, ගෘහපති, ශ්‍රමණ, චාතුර්මහාරාජික දෙවියෝ, තාවතිංස දෙවියෝ, මාර හා බ්‍රහ්ම ආදීය අට පිරිසය. **සටහන:** විස්තර පිණිස

**බලන්න**: "සුවිසිමහ ගුණය": දසබලඥාන, පි.108, රේරුකානේ චන්ද්‍රවිමල මහනාහිමි. **මූලාශ්‍ර**: අංගු.නි: (6): 10 නිපාත :10.1.3.1 සිංහනාද සූත්‍රය,පි. 90, EAN: 10: 21.1 The Lion, p. 499, දිඝ. නි: (3 ): 10 සංගිති සූත්‍රය,පි 368,EDN: 33: Saṅgīti Sutta: The Chanting Together, p. 362.

▲ **අටලෝදහම:** පාලි: **අට්ඨලොකධම්මා** - eight worldly conditions අටලෝදහම- අෂ්ටලෝක ධර්ම ය, ලෝක ධම්මතාවයකි, ඇතිවී නැතිවී යන දෙයකි. අටලෝදහම : 1-2 **ලාභය, අලාභය** (gain & loss), 3-4 **යස, අයස** (fame & disrepute), 5-6 **ප්‍රසංසා, නින්දා** (praise & blame), 7-8 **සැප, දුක (**pleasure & pain) යන ධර්මතාවන්ය.

▼ **අටලෝදහම ඇතිවී නැතිවී යන ස්වභාවයෙන් යුක්තය**: අටලෝදහම ලෝකය අනුව පෙරළේ, ලෝකය අටලෝදහම අනුව පෙරළේ යයි බුදුන් වහන්සේ වදාළහ: **"...අට්ඨීමෙ භික්ඛවෙ, ලොක ධම්මා ලොකං අනුපරිවත්තනති, ලොකො ච අට්ඨලොකධම්මෙ අනුපරිවත්තනති" .** මේ ධම්මතා අනිත්‍යය, ඇතිවී නැතිවීමේ ස්වභාවය දරයි. දහම නොදත් පුහුදුන් මිනිසා -පෘතග්ජන, අටලෝ දහමේ ස්වභාවය නොදත් නිසා එලදායක කරුණු ඇතිවූවිට (ලාභය, යසස ආදී) ඒවා කෙරෙහි ඇලි ගැලී යයි. එම ධම්මතා වෙනස්වූවිට (සැප නැතිවී දුක ඇතිවීම වැනි) මහා කම්පාවකට පත්වී දුක් විඳී. ඔහු සසරට බැඳී සිටින කෙනෙකි. එහෙත්, දහම දත් ආරිය ශ්‍රාවකයා, අටලෝදහමේ යථා ස්වරූපය අවබෝධ කර ඇති නිසා එල දායක කරුණු ඇතිවූවිට ඒවාට නොඇලේ, ඒවා වෙනස්වූ විට නො සැලේ. ඔහු සසර දුකින් මිදුන කෙනෙකි. **මූලාශ්‍ර:** අංගු.නි: (5 ): 8 නිපාත: ලෝකධර්-ම සූත්‍ර 1 හා 2, පි. 36, EAN:8: 5.5 & 6.5 World, p. 412.

▼ **අටලෝදහම යථා ලෙසින් අවබෝධ කිරීමෙන් දුක අවසන්කරගත හැකිය**: අටලෝදහම පිළිබඳව උකටලීනොවී, නොඇලී, ඒ පිළිබඳ යථා අවබෝධය ලබාගැනීම මගින් මේ ලෝකයේදීම දුක කෙලවර කරගත හැකිවේ: **"...අට්ඨසු ධම්මෙසු භික්ඛු සම්මා නිබ්බින්දමානො සම්මා විරජ්ජමානො සම්මාවිමුච්චමානො සම්මා පරියන්තදස්සාවී සම්මත්තා භිසමෙච්ච දිට්ඨෙව ධම්මෙ දුක්ඛස්සන්තකරො හොති..."**. **බලන්න**: මහා දසධර්ම ප්‍රශ්න. **මූලාශ්‍ර:** අංගු.නි: (6 ): 10 නිපාත: 10.1.3.7. ප්‍රථම මහාපඤ්හ සූත්‍රය, පි. 116, EAN: 10: 27.7 Great Questions -1, p. 503.

▼ **අටලෝදහමින්** මැඩිගියවිට, සිත නොසැලී, ශෝකනොකර, කෙළෙස් වලට යටනොවී සිටිමට හැකිවීම උතුම්මංගල කරුණක්y. **මූලාශ්‍රය:** ඛු.නි: ඛුද්ධකපාඨ: 5 මංගලසූත්‍රය, පි. 34.

▲**අටළොස් ධාතු**- 18 elements: ධාතු 18 ලෙසින් පෙන්වා ඇත්තේ: **සය ආයතන ,** ඒවා අල්ලා ගන්නා **බාහිර අරමුණු** 6 හා ඒවායේ **සය විඥාන** යන්ටය-චක්ඛුවිඥානය ආදීයටය. **බලන්න**:ධාතු කුසලතාවය. **සටහන**: සංයු.නි: ධාතුසංයුත්තයේ මේ පිළිබඳ විස්තරාත්මකව පෙන්වා ඇත.

▲**අටළොස් මූලපද:** පාලි: **අට්ඨාරස මූලපදානි-** Eighteen states: අටළොස් මූලපද ලෙසින් පෙන්වා ඇත්තේ: **අකුසල නවපදය** (9 unwholesome states) හා **කුසල නවපදය** (9- wholesome states) .**බලන්න:** කුසල හා අකුසල. **අකුසල නවපද-** අකුසල් ඇතිකරණ මුල්: තණ්හා-desire, අවිජ්ජා (අවිද්‍යාව) - ignorance, ලෝභය-greed, දෝෂය (දෝසය)-ill will, මෝහය- delusion හා සුභ සංඥා, සුඛ සංඥා, නිච්ච සංඥා, අත්ත සංඥා යන සතර විපල්ලාසයන්ය. **කුසල නවපද -** කුසල්

ඇතිකරණ මුල්: සමථ, විපස්සනා, අලෝභය, අදෝසය, අමෝහය, අසුභ සංඥා, දුක්ඛ සංඥා, අනිච්ච සංඥා, අනත්ත සංඥා. **මූලාශ්‍රය**: ඛු.නි: නෙත්තිප්‍රකරණ**: උද්දේසවාරය:**පි.26.

▲**අටළොස් මනෝපවිචාර-** eighteen mental examinations: අටළොස් මනෝපවිචාර යනු සළායතන මගින් අල්වාගන්නා බාහිර අරමුණු පිළිබඳ ඇතිවන සොම්නස, දොම්නස හා උපේක්ඛාව (ත්‍රිවිධවේදනා) පිළිබඳ 18 ආකාරයකින් විපරම් කිරීමය. **බලන්න**: මනෝ උපවිචාර**. මූලාශ්‍ර:** ම.නි: (3) සළායතන විභඞ්ග සූත්‍රය, පි. 474, EMN: 137- Saḷāyatanavibhanga Sutta- The Exposition of the Sixfold Base, p. 974.

▲ **අට සිල්**: පාලි: **අට්ඨඞ්ගසමන්නාගතං සීල** - Eight precepts අටසිල්, අෂ්ඨාංගික උපෝසථ ශීලය**,** උපෝසත අටසිල් -eight factors of uposatha ලෙසින්ද පෙන්වා ඇත. මෙය, ධර්මය අනුගමනය කරන උපාසක උපාසිකාවන් පොහෝය දිනයේ දී සමාදන්වන උතුම් සිලයකි. **බලන්න**: ශිලය. **සටහන**: ශ්‍රමණ ජිවිතයට ඇතුලත් වීමේ අදහසින් ගිහිගෙය හැර පන්සලක, ආරණ්‍යයක වාසය කරන අනගාරික හෝ අනාගරිකා පිරිස අටසිල් සමාදන්ව වාසය කරති.

▼**උපොසථ අට සීලය:** 1) ප්‍රාණඝාතයෙන් වැළකීම 2) නොදුන්දේ ගැනීමෙන් වැළකීම (අදින්නාදානය- සොරකමින්) 3) අබ්‍රහ්මචරියාවේ හැසිරීමෙන් වැළකීම 4) බොරුකීමෙන් (මුසාවාදය) වැළකීම 5) ප්‍රමාදය ඇතිකරන රහ මෙර ගැනීමෙන් වැළකීම (සුරාපානය) 6) විකාල භෝජන යෙන් වැළකීම 7) නැටුම් ගැයුම් වැයුම් විසුළු දැකුම්, මල් සුවඳ විලවුන්, සැරසිලිකිරීම් ආදියෙන් වැළකීම 8) උස් අසුන් මහා අසුන් භාවිතා කිරීමෙන් වැළකීම. උපෝසත ශිලය යහපත් ලෙස රැකීමෙන් මහත්ඵල මහා ආනිසංස ලැබෙනබවත්, මහත් ලෙසින් බබළන බවද, පැතිරීයන බව ද බව බුදුන් වහන්සේ වදාළහ: **"…අට්ඨඞ්ගසමන්නාගතො භික්ඛවෙ උපොසථො උපවුත්ථො භික්ඛවෙ මහප්ඵලො හොති මහානිසංසො මහාජුතිකො මහාවිප්ඵාරො"**. මහාරාජ්‍යයන්ට අධිපති මහා රජවරුන් ගේ යසඉසුරු, උපොසථ ශිලය නිසා ලැබෙන අනිසස් වලින් 16න් එක කොටසකටත් වඩා වටින්නේ නැත. දිව්‍ය සැපය හා සසඳනවිට රජ සැප දිළිඳුය. ශීලයේ බැබලීම, හිරු සඳු ගේ ආලෝකයට වඩා මහත්ය, සියලු රන් රුවන් වලට වඩා සිල්රැකිම අනගිය, උපෝසථ ශිලය පරිපූර්ණ කරගැනීම දෙව්ලොව සැප ලැබීමට හේතුවේ. මෙහිදී උපෝසථ අටසිලය මෙසේ වර්ණනා කර ඇත: **"පරපණ නොනසා, සොරකම් නොකර, - රහමෙර ඉවතලා, මුසාබස් දුරුකර, මෙවුන්දම වලකා රෑ බොජුන් ඉවතලා, -** නැටුම් ගැයුම් නොබලා මල් සුවඳ නොගල්වා, **මහා අසුන් උස් අසුන් නොමගෙන,- රැකිය යුතුවේ උපෝසත ශිලය,දුකනිමාකර සැප දෙන ශිලය. සඳ තරු හිරු ගේ ආලෝකය-ලොවේ මුතු මැණික් ආදියට, සමකල නොහැකිය ඒ දේ- බුදුන් වදාළ අනගි ශිලයට. එම කරුණු සිහිපත්කර-සිල්වත් අය හැමදෙන බොහෝ පින් ලබා දෙන- දෙව්ලොව සැප ගෙනදෙන රකිනු මැනවින් උපෝසථ ශිලය". මූලාශ්‍ර**: අංගු.නි: (5): 8 නිපාත:8.1.5.1හා 8.1.5.2. අට්ඨාන්ස උපෝසථ සූත්‍ර, පි.196, EAN: 8:41.1. In Brief & 42.2. In detail, p. 434.

▼**යහපත් ලෙස අටසිල් රැකිම,** දෙව් මිනිසුන් සහිත ලෝක සත්‍වයන්ගේ දිගුකාලීන හිත සුව පිණිස, සැප පිණිස පවතින බව පෙන්වාදුන් බුදුන්

වහන්සේ, **සල්ගස් උපමාව** දක්වමින් මෙසේ වදාළහ: **“...මේ සල් ගස් වලට සිතක් ඇතිව, උපෝසථ අටසිල් යහපත් ලෙසින් රැකීමට නියම කරගන්නේ නම් එය, මේ ගස් වලට දිගුකලක් හිත සුව පිණිස වේ. එසේනම්, (**අටසිල් ගැනීමෙන් මිනිසුන්ට වන යහපත ගැන**) මිනිසුන් ගැන කවර කතාද.”** . **“...ඉමෙ චෙපි වාසෙට්ඨ, මහාසාලා අට්ඨඞ්ගසමන්නාගතං උපොසථං උපවසෙය්‍යුං. ඉමෙසම්පිස්ස මහාසාලානං දීඝරත්තං හිතාය සුඛාය. කො පන වාදො මනුස්ස භූතස්සාති”** .**සටහන:** මේ සූත්‍රය, වාසෙට්ඨ උපාසකට දේශනා කරඇත. **බලන්න:** උපග්‍රන්ථ:3,5. **මූලාශ්‍ර:** අංගු.නි: (5 ): 8 නිපාත:8.1.5.4. වාසෙට්ඨ උපෝසථ සූත්‍රය, පි.212. EAN: 8: 44.4 Vāseṭṭha p. 434.

▼ **ශාක්‍යයන් උපෝසථ** අටසිල් සමාදන් වෙන්නේද? යයි බුදුන් වහන්සේ ඇසූ පැණයකට, පිළිතුරු ලෙසින් ඔවුන් පැවසුවේ සමහර අවස්ථාවල අටසිල් සමාදන්වන බවත්, සමහර අවස්ථාවල එසේ නොකරණ බවත්ය. ඒ පිළිබඳව බුදුන් වහන්සේ මෙසේ ශාක්‍යයන්ට උපදෙස් වදාළහ: “දුක හා මරණ යන උපද්‍රව නිසා අන්තරායට පත් මේ ජිවිතයේ උපෝසථ අටසිල් සමහර දිනවල සමාදන්වීම, සමහර දිනවල සමාදන් නොවීම, ඔබට අලාභයකි, නපුරුට හේතුවන කරුණකි”. **“...තෙසං වො සක්‍යා අලාභා, තෙසං දුල්ලද්ධං, යෙ තුම්හෙ එවං සොකසභයෙ ජීවිතෙ මරණ සභයෙ ජීවිතෙ අප්පෙකදා අට්ඨඞ්ග සමන්නාගතං උපොසථං උපවසථ, අප්පෙකදා න උපවසථ...”** බුදුන් වහන්සේගේ උපදේශ පිළිගත් ශාක්‍යයන් එදින සිට උපෝසථ සීලය සමාදන්වන බවට ප්‍රතිඥා දුන්හ.  **සටහන:** අංගු.නි: (5): 8 නිපාත: 8.1.5.3.විසාඛා උපෝසථ සූත්‍රය**,** පි.208 හා 8.1.5.5. බොජ්ඣා උපෝසථ සූත්‍රය, පි. 214, EAN: 8: 43.3.1. Visākha, and 45.5. Bojjhā, p. 436: උපෝසථ සීලය සමාදන්වීමේ යහපත් විපාක පෙන්වා ඇත. **මූලාශ්‍ර:** අංගු.නි: (6 ): 10 නිපාත:10.1.5.6. ශාක්‍ය සූත්‍රය, පි. 176, EAN: 10:46.6. Sakyans, p.511.

▲ **අට්ඨඅංගික පුද්ගල එක්වීම**- 8 elements that unite people: අට්ඨඅංගික පුද්ගල එක්වීම ලෙසින් මෙහි පෙන්වා ඇත්තේ සමාන අදහස් ඇති පුද්ගලයෝ එක්ව සැසඳියන බවය. මිථ්‍යා දිට්ඨි ඇති අය, මිථ්‍යා දිට්ඨි ඇති අය හා ගැලපි වාසය කරයි. එලෙස: මිථ්‍යාසංකල්ප-මිථ්‍යා සමාධිය දක්වා ඒ ඒ අංග අනුව සමාන අදහස් ඇත්තෝ එක්ව සිටි. එසේම, සම්මා දිට්ඨිය-සම්මා සමාධිය ආදී අංග ඇති අය එක්ව සැසඳි වාසය කරති. **සටහන්:** * මිථ්‍යා මගේ අංග අට හා සම්මා මගේ අංග අට මෙහිදී පෙන්වා ඇත. ** එසේ අදහස් අනුව ගැලපි වාසය කිරීම අයහපත් හෝ යහපත් කම්ම විපාක ඇතිවීමට බලපායි. **මූලාශ්‍රය**: සංයු.නි: (2) නිදානවග්ග: ධාතුසංයුත්ත:කම්මපථවග්ග:2.3.6 අට්ඨඅංගික සූත්‍රය,පි. 284.

▲ **අට්ඨ ධම්ම**-Eight Dhammas: රාගය යහපත් ලෙසින් අවබෝධ කරගැනීම පිණිස අට්ඨ ධම්ම වැඩිය යුතුය යි මෙහි පෙන්වා ඇත. අට්ඨ ධම්ම ලෙසින් පෙන්වා ඇත්තේ ආරියඅටමගය. **මූලාශ්‍රය**: අංගු.නි: (5): 8 නිපාත: සාමඤ්ඤවග්ග:8.11.1 අට්ඨමග්ග සූත්‍රය, පි.384.

▲ **අට්ඨපුරුෂ පුද්ගලයෝ**: පාලි: **අට්ඨපුරිසපුග්ගලා** - Eight persons අට්ඨපුරුෂ පුද්ගලයෝ (අෂ්ඨ පුරිස) ලෙසින් පෙන්වා ඇත්තේ, කරුණු 8ක් සාක්ෂාත් කරගත් බුදුන් වහන්සේගේ ශ්‍රාවක පිරිසය (භික්ෂු හා

භික්ෂුණී සංඝයාය). එනම්, සෝතාපන්න මග හා ඵලය, සකදාගාමී මග හා ඵලය, අනාගාමී මග හා ඵලය, අරහත් මග හා ඵලය (සතරමග ඵල) . එම ආරිය සංඝයා:ආහුනෙය්‍යා, පාහුනෙය්‍යා,දක්ඛිණෙය්‍යා, අංජලීකරණෙය්‍යා, ලෝකයාට අනුත්තර පුණ්‍යකෙතක් යයි බුදුන් වහන්සේ පෙන්වා ඇත. සතර මගඵල ඇති එම සංඝයා, ඍජුය, ප්‍රඥා, ශීල හා සමාධියෙන් යුක්තය. පින් ලබාගැනීමට කැමති අයට පින් කෙතකි- එම සංඝයාට පිළිගන්වන දාන ආදිය නිසා, දායකයන්ට මහත්ඵලලැබේ. **බලන්න:** සංඝගුණ. **මූලාශ්‍ර:** අංගු.නි: (5): 8 නිපාත: 8.2.6.9 හා8.2.6.10 අට්ඨපුග්ගල සූත්‍ර, පි. 276, EAN: 8: 59.9 & 60. 10 suttas, p. 443.

▲**අට්ඨකනුවර දසමගහපති**-householder Dasama of Aṭṭhakanāgara **බලන්න:** උපග්‍රන්ථය:3.

▲ **අට්ඨීනං නගරං**-The city of bones: මේ කය-ශරීරය: ජරාව, මරණය, මානය, මකුබව ඇති, මස් ලේ ගැල්වුන ඇට වලින් සැදුන නගරයකට උපමා කර ඇත. **බලන්න**: උපග්‍රන්ථය:5.

**"අට්ඨීනං නගරං කතං - මංසලෝහිත ලේපනං**
**යත්ථ ජරා ච මච්චු ච - මානෝ මක්ඛෝ ච ඕහිතෝ"**
**මූලාශ්‍රය:** ධම්ම පදය: ජරා වග්ගය: **150 ගාථාව.**

▲ **අට්ඨ විමොක්ඛ**-eight liberations
අට්ඨ විමොක්ඛ යනු විමුක්තිය ලබා ගැනීමට උපකාරීවන සමාපත්ති අටය. **බලන්න**: අෂ්ඨ විමොක්ක

▲ **අට්ඨික සංඥා භාවනාව**-meditation on perception of a skeleton
අට්ඨික සංඥා භාවනාව යනු ඇටසැකිල්ල අරමුණුකොට වඩන භාවනාවය. **බලන්න**: භාවනා. **සටහන**: දීඝ.නි. හා ම.නි: සතිපට්ඨාන සූත්‍රයන්හි මේ පිළිබඳව විස්තරාත්මකව පෙන්වා ඇත.

▲ **අට්ඨික සංඥාව:** පාලි: **අට්ඨිකසඤ්ඤා** -perception of a skeleton
අට්ඨික සංඥාව යනු ඇටසැකිල්ල අරමුණුකොට වඩන සංඥාවය. කයේ අසුභය පෙන්වන දසසංඥා වලින් එකකි: ඇට සැකිල්ල අරමුණුකොට භාවනා කිරීම, විදසුන් නුවණ වඩාගැනීමට මගකි, නිවන පිණිස පවතී. **බලන්න**: ගිරිමානන්ද සූත්‍රය.

▲ **අට්ඨ අභිභායතන**-8 abhibhāyatana: කසිණ අරමුණු කරගෙන ඇතිකරගන්නා අට විධි සමාපත්තින්ය. **බලන්න**: අභිභායතන **මූලාශ්‍ර**: අංගු.නි: (5 ): 8 නිපාත: 8.2.7.5 අභිභායතන සූත්‍රය, පි. 299, EAN: 8: 8.65. Overcoming, p. 446.

▼**රාගයේ අභිජානය-** රාගය යහපත් ලෙසින් අවබෝධ කරගැනීම පිණිස, අට්ඨ අභිභායතන සමාපත්ති වැඩිය යුතුබව මෙහි පෙන්වා ඇත. **මූලාශ්‍රය:** අංගු.නි: (5): 8 නිපාත: සාමඤ්ඤවග්ග:8.11.2 අට්ඨ අභිභායතන සූත්‍රය, පි.384.

▲ **අට්ඨසත ධම්මපරියාය-** Dhamma exposition of 108 themes
අට්ඨසත ධම්මපරියාය ලෙසින් බුදුන් වහන්සේ පෙන්වා ඇත්තේ 108 ක්වූ වේදනා පිලිබඳ වූ දහම් න්‍යාය ගැනය: **1) වේදනා:** කායික හා මානසික **2) වේදනා තුන:** සුඛ, දුඛ හා මධ්‍යස්ත **3) වේදනා පහ:** සොම්නස, දුක, ප්‍රීතිය, දොම්නස, උපේක්ඛා **4) වේදනා සය**: සළායතන නිසා ඇතිවන- ඇස, කණ ආදී... **5) වේදනා18**: ප්‍රීති වේදනා 6, දොම්නස්

වේදනා 6, උපේක්ඛා වේදනා සය **6) වේදනා 36:** පස්කම් සෝමනස්ස වේදනා 6, නෙක්ඛම්ම සෝමනස්ස වේදනා සය, පස්කම් දෝමනස්ස වේදනා 6, නෙක්ඛම්ම දෝමනස්ස වේදනා 6 , පස්කම් උපේක්ඛා වේදනා 6, නෙක්ඛම්ම උපේක්ඛා වේදනා 6. 7) **වේදනා 108:** වේදනා 36, අතීත, අනාගත, වර්තමාන ලෙසින් ගැනීම. **මූලාශ්‍ර:** සංයු.නි: (4 ): සළායතන වග්ග: වේදනා සංයුත්ත: 2.3.2 අට්ඨසත ධම්ම පරියාය සූත්‍රය, පි. 464, ESN: 36: Vedanasamyutta: 22.2 The theme of 108, p. 1359.

▲ඇටගොඩ-Heap of bones: ඇටගොඩ (අට්ඨිපුඤ්ජ) ලෙසින් පෙන්වා ඇත්තේ දිගු සසරේ, ඉපදී මැරී යළි ඉපදී හැසිරෙන එක පුද්ගලයෙක් ගේ ඇට, එක් කපයක් තුල ( ඒ, ඒ උපත හා මරණයට පැමිණීම නිසා) වේපුල්ල පව්ව ලෙසින් විශාල යයි මේ උපමාව දක්වමින් බුදුන් වහන්සේ වදාළහ . කෙනෙක්, ආරිය සත්‍ය දකින්නේනම් ඔහුට සසර ගමන අවසන් කලහැකිය**. බලන්න**: වෙපුල්ල පව්ව, සසර,උපග්‍රන්ථය:5. **මූලාශ්‍රය:** බු.නි: ඉතිවුත්තක: 1.3.4 අට්ඨිපුඤ්ජ සූත්‍රය, පි.370, සංයු.නි:(2) නිදානවග්ග: අනමතග්ග සංයුත්ත: දුග්ගතවග්ග: 3.2.10 වෙපුල්ල පබ්බත සූත්‍රය, පි.314.

**අත**

▲ **අතපනීය ධර්මය** - untormenting Dhamma :අතපනීය ධර්මය යනු පීඩා හිරිහැර නැති ධර්මතාය, පසුතැවිල්ල ඇති නොකරන කරුණුය, කුසල දහමය. මේවා මගින් තමාට හෝ අන්අයට පීඩා තැවීම් සිදු නොවේ. මේ දහම විමුක්තිය ලබා දෙන සම්මා දිට්ඨිය ඇතුළු මග ගැනීමය. **බලන්න:** තපනීය ධර්මය . **මූලාශ්‍ර**: අංගු.නි: ( 6): 10 නිපාත: සාධු වග්ග, 10.3.4.8 තපනීය සූත්‍රය, පි.472, EAN: 10: 135.2 Good: p.548.

▼**අතපණිය ධර්මය ත්‍රිවිධ සුචරිතයේ යෙදීමය**

1) කෙනෙක් කායික සුචරිතයේ යෙදේ එසේම, කායික දුෂ්චරිතයෙන් වෙන්ව සිටි. 2) කෙනෙක් වාචික සුචරිතයේ යෙදේ එසේම, වාචික දුෂ්චරිතයෙන් වෙන්ව සිටි. 3) කෙනෙක් මනසින් සුචරිතයේ යෙදේ එසේම, මනසින් දුශ්චරිතය නො කරයි. තමන් එලෙස ත්‍රිවිධ සුචරිතයේ යෙදුන බවද ,ත්‍රිවිධ දුෂ්චරිතය දුරු කලබව සිතන ඔහු නො තැවේ. **මූලාශ්‍ර:** අංගු.නි: (1): 2 නිපාත: 2.1.1.4 අතපණිය සූත්‍රය, පි. 136, EAN: 2: 3.3 Not Causing Torment, p. 56, බු.නි: ඉතිවුත්තක: 2.1.4 අතපනිය සූත්‍රය, පි.380.

▲ **අතප්ප දේව-** Atappa devas : අතප්ප දේව යනු අනාගාමී උතුමන් පහළවන සුද්ධාවාසයකි. **බලන්න**: බ්‍රහ්මලෝක, අනාගාමී.

▲ **අතවැසියා-** Attendant :භික්ෂුවකගේ උපස්ථායකයා, අතවැසියාය. අතවැසි මහණ කෙනෙක් තුල තිබිය යුතු **ගුණ 5 කි**: 1) ආචාර්ය වරයා කෙරහි අධිකවූ ප්‍රේමයක් ඇති 2) අධිකවූ පැහැදීමක් ඇති 3) අධිකවූ ලජ්ජාවක් ඇති 4) අධිකවූ ගෞරවය ඇති 5) අධිකවූ මයිත්‍රීය ඇති අතවැසි තෙමේ බැහැර කරන්නට සුදුසු නොවේ යයි බුදුන් වහන්සේ වදාළහ. **මූලාශ්‍රය:** වින.පි : මහාවග්ග පාලිය-1, පි, 232.

▲ **අතිනිවාස**- Residing too long: අතිනිවාස ලෙසින් පෙන්වා ඇත්තේ සංඝයා දීගු කාලයක් එකම ස්ථානයක වාසය කිරීමය. එමනිසා, දහම් මග වඩා ගැනීමට අනතුරුදායක කරුණු ඇතිවේ: බොහෝ ද්‍රව්‍යමය දේ හා බෙහෙත් ආදිය එකතුකිරීම, එම ස්ථානය පිලිබඳ බොහෝ වැඩ කටයුතු කිරීමට යොමුවීම, ගිහි පැවිදි පිරිස සමග අයහපත් ලෙසින් සම්බන්ධ

පවත්වාගැනීම, එම ස්ථානයෙන් පිටව යන්නේ නම් ඒ ගැන සිතේ බලපෑමක් ඇතිවීම. එසේම ආවාසය පිලිබඳ, පවුල්- කුලයන් පිලිබඳ, ලැබන ලාභ පිලිබඳ, ලැබෙන ප්‍රසංසා පිළිබඳව, ධර්-මය පිළිබඳව සිතේ තණ්හාව- මසුරුකම ඇතිවේ. එමනිසා, යම්තැනක සුදුසු කාලයක් පමණක් වාසය කිරීම යහපත් යයි බුදුන් වහන්සේ පෙන්වා ඇත.
**මූලාශ්‍ර:** අංගු.නි: ( 3 ): 5 නිපාත: 5.5.3.3. හා 5.5.3.4 අතිනිවාස සූත්‍ර, පි. 440, EAN: 5: 223. 4 & 224.4 suttas, p. 307.
▲ **අතීත බුදුවරු-** Buddhas of the Past :ගෞතම බුදුන් වහන්සේට පෙර වැඩසිටි සම්මා සම්බුදුවරුන් පිළිබඳව විස්තර පිණිස **බලන්න**: බු.නි: බුද්ධවංශ හා චරියා පිටකය.
▼**බුදුන් වහන්සේ** සංසයාට, තමන් වහන්සේට පෙර වැඩසිටි බුදුවරු (91 කල්පයක් තුල): විපස්සි, සිඛි, වෙස්සභූ, කකුසන්ධ, කෝණාගමන, හා කාශ්‍යප සම්මා සම්බුදුවරයන් පිලිබඳ වදාළ විස්තර මේ සූත්‍රයේ දැක්වේ.
**මූලාශ්‍ර:** දීඝ.නි: (2): 1.මහාපදාන සූත්‍රය, 4 ඡෙදය, පි. 18, EDN: 14 Mahâpadāna Sutta, p. 150.
▼ **පටිච්චසමුප්පාදය** ධර්මය ඇතිවීම හා නැතිවීම මනාලෙස අවබෝධ කරගැනීමෙන් තමන්වහන්සේ ද පෙර බුදුවරු වහන්සේලාද සම්බෝධිය ලැබූ බව, බුදුන් වහන්සේ මෙහිදී විස්තරාත්මකව පෙන්වා ඇත.
**මූලාශ්‍ර**: සංයු.නි: (2 ): නිදානවග්ග: බුද්ධවගග සූත්‍ර 1.1.4 සිට 1.1.10, පි.30-37, ESN: 12: Nidanasamyutta: The Buddhas: Sutta 4.4.to 1-.10, p. 614-620.
▼ **ගෞතම බුදුන් වහන්සේ ඇතුළු,** පෙර වැඩ සිටි බුදුවරු 25 ක් පිලිබඳ විස්තර: "**චතුරාසංඛකල්පලක්ෂයක් මුළුල්ලෙහි ඒ ඒ අවස්ථායෙහි සම්‍යක් සම්බෝධි සමධිගම කළ දීපංකර තථාගතයන් වහන්සේ පටන් කොට අප ගෞතම තථාගතයන් වහන්සේ තාක් පස්විසි බුදු කෙනෙකුන් වහන්සේගේ ප්‍රවේණි විස්තරකථාව 'බුද්ධවංස' නම් වෙයි". මූලාශ්‍රය**: බු.නි: බුද්ධවංස පාලි : සංඥාපනය, පි. 12.
▲ **අතිමානය-** Superiority conceit: අතිමානය යනු තමා උසස් යයි සිතීමය. අකුසලයකි. **බලන්න**: මාන.
▲**අත්ත**-Self: අත්ත යනු තමායන හැඟීමය, පංච උපාදානස්කන්ධය තමායයි සලකිමය. **බලන්න**: ආත්මය,සක්කායදිට්ඨිය.
▲**අත්තවාදී උපාදාන** -clinging to the personality belief උපාදානයකි, ආත්මයක් ඇතැයි සැලකීම- සක්කායදිට්ඨියය. **බලන්න**: ආත්ම,උපාදාන.
▲ **අත්තන්තප පුද්ගල**-Attanthapa pudgala :මොහු තමාට වද හිංසා පමුණුවා ගැනීමේ පිළිවෙත අනුගමනය කරයි. **බලන්න**:පුද්ගලයෝ සිව් වර්ගය.
▲ **අත්තන්තප-පරන්තප පුද්ගල-**Attanthapa- Paranthapa pudgala තමාටද, අනුන්ටද වද හිංසා කිරිමේ පිළිවෙත අනුගමනය කරයි. **බලන්න**:පුද්ගලයෝ සිව් වර්ගය.
▲ **අත්ත දීප-** Attha Dipa : තමා දීපයක් ලෙසින් ගෙන (දීපය උපමාව) සැලකීම මෙහිදී අදහස් කෙරේ. මහා පරිනිබ්බාන සූත්‍රයේදී බුදුන් වහන්සේගේ අනුසාසනය වුවේ, අනුන්ගෙ පිහිට ගැන නොබලා, තමන් දීපයක් ලෙසින් සලකා ගෙන, විමුක්තිය පිණිස සතර සතිපට්ඨානය පුහුණු කලයුතු බවය.**බලන්න**: දීපය, උපග්‍රන්ථ:5,6
▲ **අත්තවාද පටිසංයුත්ත දිට්ඨිය-** Aththavada patisanyuttha ditthi

අත්තවාද පටිසංයුත්ත දිට්ඨිය (ආත්මානු දිට්ඨිය) එනම්, අස්සුත පෘතග්ජන (දහම නො ඇසූ පුද්ගලයා) රූපය ආදිවූ පංචස්කන්ධයන් ආත්මය ලෙසින් සැලකීමය. මෙහි, ඒ ගැන විස්තරාත්මකව පෙන්වා ඇත. **මූලාශ්‍රය:** ඛු.නි:පටිසම්භිදා 1 : දිට්ඨි:13: අත්තවාද පටිසංයුත්ත දිට්ඨිය, පි.320.

▼ **මෙය අත්තානුදිට්ඨිය -**ආත්ම දිට්ඨිය-සත්කාය දිට්ඨිය, ලෙසින්ද පෙන්වා ඇත. තමාගේ යයි අල්වා ගැනීම ඇතිවන්නේ රූප, වේදනා... ආදීලෙසින් පංචඋපාදානස්කන්ධය උපාදාන කරගැනීමෙන්ය. **මූලාශ්‍රය:** සංයු.නි: (3): ඛන්ධසංයුත්ත: දිට්ඨිවග්ග: 1.3.5.3 සො අත්තා සූත්‍රය, පි. 354, ESN: 22: Khandasamyutta: 156.7 View of self, p. 1115.

▼ **ආත්ම දිට්ඨිය පහකර ගැනීම** (Abandoning the view of self) ඇස ද රූපයද, කණද ශබ්දයද ආදීවූ අභ්‍යන්තර හා බාහිර ආයතන යන්හි අනිච්ච බව, දුකබව, අනාත්ම බව ( ත්‍රිලක්ෂණය) අවබෝධ කර ගැනීමෙන් ආත්ම දිට්ඨිය පහකර ගත හැකිය. **මූලාශ්‍ර**: සංයු.නි: (4): සළායතනවග්ග: වේදනා සංයුත්ත: 1.6.12 අත්තානු දිට්ඨි පහාන සූත්‍රය, 320, ESN: 36: Vedanasamyutta: 167.12 Abandoning the View of Self, p. 1300.

▼ **මෙහි පෙන්වා ඇත්තේ**, ආත්මානු දිට්ඨිය පහ කරගැනීම පිණිස අනාත්ම සංඥාව වැඩිය යුතු බවය. **මූලාශ්‍රය:** අංගු.නි: (4) 6 නිපාත: 6.1.6 සූත්‍රය, පි.284.

▲ **අත්තකිලමතානු යෝගය**: පාලි: **අත්තකිලමථානුයොගො-** pursuit of self-mortification: අත්තකිලමතානු යෝගය යනු කයට පීඩාදෙමින් කරන තපස් ව්‍රතයකි. ආධ්‍යාත්මික වර්ධනය පිණිස අත් හැරදැමිය යුතු එක් අන්තයක් යයි බුදුන් වහන්සේ පෙන්වා ඇත. **බලන්න:** සංයු.නි: ධම්මචක්කප්පවත්තන සූත්‍රය.

▲ **අත්ත සංඥාව**-Perception of ego: අනාත්ම දේ ආත්මය සේ ගැනීම, අත්තසංඥාවය, මෙය විපල්ලාසයකි. **බලන්න**: සතර විපල්ලාස.

▲**අත්තරක්ඛිත-** Self-Protected: අත්තරක්ඛිත ලෙසින් පෙන්වා ඇත්තේ තමා විසින් තමාව ආරක්ෂා කර ගැනීමය. ත්‍රිවිධ සුචරිතයෙන් වාසය කිරිමෙන් අත්තරක්ඛිතය සිදුවේ යයි බුදුන් වහන්සේ පෙන්වා ඇත. **සටහන: ධම්මපද: 12** අත්තවග්ගයේ- තමාට, තමා ප්‍රිය වේ නම්, තමා රැකගත යුතුය යි දක්වා ඇත. **මූලාශ්‍ර**: සංයු.නි: (1): සගාථවග්ග: කෝසල සංයුත්ත: 3.1.5 අත්තරක්ඛිත සූත්‍රය, පි. 162, ESN: 3: Kosalasamyutta: 5.5. Self-Protected, p. 223.

▲**අත්තවධ-**own downfall :අත්තවධ ලෙසින් පෙන්වා ඇත්තේ කෙනෙක්, කරන අයහපත් කටයුතු නිසා තම විනාශය ඇතිකර ගැනීමය. විශේෂයෙන්, ලාභ සත්කාර සම්මාන නිසා සංඝයා විපතට පත්වෙන අන්දම මේ සංයුත්තයේ විස්තරාත්මකව පෙන්වා ඇත. **සටහන**: මේ සූත්‍රය දේශනා කර ඇත්තේ දේවදත්ත භික්ෂුව, සංඝභේදය ඇතිකර, බුදු සසුනෙන් නික්මීම හේතු කොටගෙනය.**මූලාශ්‍ර**:සංයු.නි: ( 2): නිදානවග්ග: ලාභසත්කාරසංයුත්ත: 5.4.1 සංඝභේද සූත්‍රය, පි. 388, ESN: 17: Labasathkarasamyutta: 35.5. Sutta, p. 862.

▲**අත්ත සම්පදා-** Accomplishment in self :අත්ත සම්පදා ලෙසින් පෙන්වා ඇත්තේ, චිත්ත සමෘද්ධියය- සම්පන්න චිත්තය- දියුණුවූ සිතය. (completeness of mind). අත්ත සම්පදා ඇතිවිට, ආරිය අටමග ඇතිකර

ගත හැකිය. **මූලාශ්‍ර:** සංයු.නි: ( 5-1): මහාවග්ග:මග්ගසංයුත්ත: 1.6.4 අත්තසූත්‍රය, පි. 80, ESN: 45: Maggasamyutta: 50.2 Sutta, p. 1654.
▲**අත්තහිත-** Aththahitha :අත්තහිත ලෙසින් පෙන්වා ඇත්තේ තමාගේ සුභසාධනය පිණිස කටයුතු කිරීමය. මෙහිදී තමාටද අනුන්ටද හිත පිණිස කටයුතු කරන පුද්ගලයන් ගැන විස්තර දක්වා ඇත. **බලන්න**: පරහිත. **මූලාශ්‍රය:** අංගු.නි: (2) 4 නිපාත: අසුරවග්ග:4.2.5.8 අත්තහිත සූත්‍රය, පි.210.
▼**කෙනෙක්**, තමන් ශීල, සමාධි, ප්‍රඥා, විමුක්ති හා විමුක්තිඥානදර්ශනය සම්පන්න නම් ඔහු, තමාගේ අර්ථය පිණිස කටයුතු කර ඇත. එහෙත් ඔහු අන්‍යයන් ඒ ගුණයන්හි සමාදන් කිරීමට කටයතු නොකරන්නේ නම් ඔහු පරහිත පිණිස කටයුතු නොකරයි, එසේම එමගුණ තමන් තුළ නො මැතිනම් ඔහු තම අර්ථය සලකාගෙන නැත.එහෙත් ඔහු අනුන් එම ගුණයන්හි සමාදන් කිරීමට කටයුතු කරයි. එහෙත්, එම කරුණු දෙකම සහිත පුද්ගලයා තමාටද අනුන්ටද යහපත ඇතිකරයි. **මූලාශ්‍රය:** අංගු.නි: (3) 5 නිපාත:බලවග්ග: අත්තහිත සූත්‍ර, පි.44.
▲**අත්තූපනායික ධම්මපරියාය-** Dhamma exposition applicable to oneself : ගිහියන්හට, ගිගිගෙයි වාසය කරමින් යහපත් ජීවිතයක් පවත්වා ගැනීම පිණිස බුදුන් වහන්සේ වදාළ උපදේශ, **අත්තූපනායික ධම්ම පරියාය-**තමා විසින්ම යොදාගත හැකි දහම් ප්‍රතිපදාවය ලෙසින් මෙහි දක්වා ඇත ( තමා එලවා දැක්වීම ඇති දහම් නියාමය). තමාට මෙන්ම අන්‍යන්ට ප්‍රියමනාප ලෙසින් ජීවිතය ගෙනයාම පිණිස නුවණින් කටයුතු කිරීමය. එලෙස කටයුතු කරන්නේ කෙසේද? 1. තමන් කාය, වචී හා මනෝ යන තුන්දොරින් යහපත් ලෙසින් ක්‍රියා කිරීම 2. එලෙස ක්‍රියා කිරීමට අනුන් සමාදන් කරවා ගැනීම 3. තුන් දොරින් යහපත් ක්‍රියා කිරිමේ ගුණ පැවසිම.මෙය ත්‍රිකොටිපාරිශුද්ධය (තුන් ආකාරයකින්ම පිරිසිදු වීම) ලෙසින් පෙන්වා ඇත. එය සත්ධර්මය සහිත වීමය: 1) ප්‍රාණඝාතය 2) සොරකම 3) කාමයෙහි වරදවා හැසිරීම 4) මුසාවාදා 5) පිශුනාවාචා 6) පරුෂාවාචා 7) සම්ප්‍රප්ඵලාපා යන අකුසල් ත්‍රිකොටි පාරිශුද්ධය සහිතව නොකිරිමය. එම පටිපදාව එලෙස පවත්වාගෙන යෑමට **ගුණ 4ක්** තිබිය යුතුය: බුද්ධ, ධම්ම හා සංඝ ගුණ විශ්වාසී ලෙසින් පිළිගැනීම, හා ආරිය කාන්ත ශීලය තිබීම. එම කරුණු සම්පූර්න කරගත් විට: සත්ධර්මය හා සතරගුණ, ඇති ඒ ආරිය ශ්‍රාවකයාට තමන් ගැන මෙසේ පැවසිය හැකිය යයි බුදුන් වහන්සේ පෙන්වා ඇත: **"මම සතර අපාය, දුගතිය... අවසන් කර ඇත්තෙමි, මම සෝතාපන්නවෙමි, මගේ මාර්ගය-විමුක්තිය නියතය". සටහන්:** * මේ දේශනාව අසා, සතුටුවූ, වේළුද්වාර බමුණුගමේ වැසියන් බුදුන් සරණ ගියෝය. ** Having related it to oneself, it is to be applied to others. As it is said: "What is displeasing and disagreeable to me is displeasing and disagreeable to the other too. "What follows are the first seven of the ten courses of wholesome action, each practiced in three ways: by observing them oneself, by enjoining others to observe them, and by speaking in their praise. **බලන්න:** ESN:note:328, p. 2427. **මූලාශ්‍ර:** සංයු. නි: (5-2) මහාවග්ග: සොතාපත්තිසංයුත්ත:වේලුද්වාර සූත්‍රය, පි.178, ESN: Sothapaththi Samyuththa:7.7 The people of Bamboo Gate p. 2191.
▲ **අත්ථදස්සි බුදුන් -**The Buddha Arthadarshi :ගෝතම

බුදුන්වහන්සේට පෙර පහළවූ, අත්ථදස්සි බුදුන් වහන්සේ සම්බෝධිය ලැබීම පිලිබඳ විස්තර මෙහි පෙන්වා ඇත. **මූලාශ්‍රය**: බු.නි: බුද්ධවංස පාලි: 14 අත්ථදර්ශි බුද්ධවංසය, පි.180.

▲ **අත්‍යන්ත බ්‍රහ්මචාරි-** ultimate consummation : අත්‍යන්ත බ්‍රහ්මචාරි ලෙසින් පෙන්වා ඇත්තේ මාර්ග බ්‍රහ්මචරියාව ධම්මතා 3 ක් සහිතව සපුරාගත් රහතන්වහන්සේය: 1) අසේඛ ශීලය 2) අසේඛ සමාධිය 3) අසේඛ ප්‍රඥාව. **සටහන:** රහතන්වහන්සේ 'අසේඛ' ලෙසින් හඳුන්වන්නේ පුහුනුව-සේඛබව අවසන් කර ඇති නිසාය. **බලන්න:** අසේඛ **මූලාශ්‍රය**: අංගු.නි: (1): 3 නිපාත:3.3.4.11 සූත්‍රය, පි. 562.

▼ **අත්‍යන්ත බ්‍රහ්මචාරි වීමට** හේතුවන වෙනත් ධම්මතා 3 කි: 1) ඍද්ධි ප්‍රාතිහාර්ය 2) ආදේශනාප්‍රාතිහාර්ය 3) අනුශාසනියප්‍රාතිහාර්ය. **බලන්න**: ප්‍රාතිහාර්ය **මූලාශ්‍රය**:අංගු.නි: (1): 3 නිපාත:3.3.4.12 සූත්‍රය, පි. 564.

▼ **අත්‍යන්ත බ්‍රහ්මචාරි වීමට** හේතුවන වෙනත් ධම්මතා 3 කි: 1) සම්මාදිට්ඨිය 2) සම්මාඥානය 3) සම්මාවිමුක්තිය. **මූලාශ්‍රය**:අංගු.නි: (1): 3 නිපාත:3.3.4.13 සූත්‍ර, පි. 564.

▲ **ආත්මය-** self : ආත්මය- අත්ත යනු තමා යයි කෙනෙක් ඇතැයි ගැනීමය. බුදු දහමේ මූලික ඉගැන්වීමවූ අනාත්මබවට විරුද්ධ පිළිගැනීම නම් ආත්මවාදය ය. එනම්, තමාට පාලනය කළහැකි දෙයක් ඇතිබව පිළිගැනීමය. සාමාන්‍ය ලෝකයා තමාගේ කය හා සිතට බාහිරව ඇති බලයක් ආත්මය ලෙසින් සලකයි. පටිච්චසමුප්පාද දහමට අනුව, මේ සිත හා කය - පංච උපාදානස්කන්ධයම හේතු ඵල අනුව සිදුවන ක්‍රියාවලියක් පමණි. **බලන්න**: අනාත්ම, පටිච්චසමුප්පාදය, අනත්ත ලක්ඛණ සූත්‍රය.

▼ **ලෝකයා ආත්මය විස්තර කරන ආකාරය** : 1) ලෝකයා ආත්මය ගැන ආකාර 4 කින් විස්තර කරනබව (පනවන බව) බුදුන් වහන්සේ පෙන්වා ඇත: a) මගේ ආත්මය වනාහි රූපීවූ සීමිතදෙයකි- **රූපී මෙ පරිත්තො අත්තා-** My self is material and limited b) මගේ ආත්මය වනාහි රූපිවූ අසීමිතදෙයකි- **රූපී මෙ අනන්තො අත්තා-** My self is material and unlimited c) මගේ ආත්මය වනාහි අරූපවූ සීමිතදෙයකි- **අරූපිං මෙ පරිත්තො අත්තා-** My self is immaterial and limited d) මගේ ආත්මය වනාහි අරූපවූ අසීමිතදෙයකි- **අරූපි මෙ අනන්තො අත්තා -** My self is immaterial and unlimited. **2) ආත්මයක් නො පනවන අය** ඉහතකී ආකාර 4 පිළිනොගනී. **3) ඇතැම්අය, ආකාර 3 කින් වේදනාව ආත්මය හා සමයයි සලකයි** ( some people equate the self with feeling in 4 ways): එනම්: **a) වේදනාව මගේ ආත්මය වේ (වෙදනා, මෙ අත්තා'ති-** Feeling is myself): එසේ සිතන අයට මෙසේ පැවසිය යුතුය යයි බුදුන් වහන්සේ වදාළහ: **"වේදනා 3 කි: සුඛ, දුක්, මැදහත්. මේ තුන් ආකාරවූ වේදනා අතුරින් මගේ ආත්මය යයි ඔබ සලකන්නේ කුමන වේදනාවක්ද?"**. සුඛ වේදනාවක් දැනෙන විට ඉතිරි වේදනා 2 දැනෙන්නේ නැත. (එලෙස, සෙසු වේදනා ගැන සැලකිය යුතුවේ). මේ වේදනා 3 ම අනිච්චය, සංඛතය ( සකස්වී ඇත)- හේතුවක් නිසා ඇතිවේ, හේතුව නැතිවීමෙන් නැති වී යයි. එමනිසා, කෙනෙක් සුඛ වේදනාව මගේ ආත්මය යි සලකන්නේ නම්, ඒ වේදනාව අවසන්වූවිට මෙසේ සිතනු ඇත: 'මගේ ආත්මය ගිහින්ය!' (එලෙස සෙසු වේදනා පිළිබඳවද). එසේ, වේදනාව මගේ ආත්මය යයි සලකන තැනැත්තා, සලකන්නේ වර්තමාන ජීවිතය පිළිබඳවූ අස්ථිර, සැප දුක මිශ්‍ර, ඇතිවී නැතිවී යන දෙයක් ගැනය.

එමනිසා ''වේදනාව මගේ ආත්මය' යයි සැලකීම සුදුසු නොවේ. b) **වේදනාව මගේ ආත්මය නොවේ, මගේ ආත්මය ප්‍රතිසංවේදනා රහිතය. (නහෙව ඛො මෙ වෙදනා අත්තා, අප්පටිසංවෙදනො මෙ අත්තාති-** Feeling is not myself, but my self is not impercipient). **සටහන**: හැඟීමක් නොලබන බව- Identifying the self with the body-aggregate **බලන්න**:EDN: note: 344, p. 426 එලෙස පිළිගන්නා අයගෙන් මෙසේ විමසිය යුතුවේ: කුමන ආකාරයකින් හෝ වේදනා දැනෙන්නේ නැත්නම් 'මම' යන සිතිවිල්ල ඇතිවේද? නියතලෙසින්ම, 'නැත' යන පිළිතුර ඔවුන් පවසනු ඇත. එමනිසා, ඉහතකී අදහස පිළිගැනීම සුදුසු නොවේ. c) **වේදනාව මගේ ආත්මය නොවේ, මගේ ආත්මය වේදනා රහිතවත් නොවේ, මගේ ආත්මය විඳින සුළුය. (නහෙව ඛො මෙ වෙදනා අත්තා, නො'පි අප්පටිසංවෙදනො මෙ අත්තා, අත්තා මෙ වෙදෙති-** Feeling is not myself, but my self is not impercipient, it is of a nature to feel) **සටහන:** Identifying the self with the aggregates of perception, mental formations and consciousness. Such are the commentarial explanations **බලන්න**: EDN: note: 345, p. 426. එම අදහස දරන අයගෙන් මෙසේ විමසිය යුතුවේ: සියලු වේදනා නිසැක ලෙසින්, මුළුමනින්ම නැතිවේ නම්, මේ මගේ ආත්මය' (I am this), යන සිතුවිල්ල තිබිය හැකිද? නියතලෙසින්ම, 'නැත' යන පිළිතුර ඔවුන් පවසනු ඇත. එමනිසා, ඉහතකී අදහස පිළිගැනීම සුදුසු නොවේ. බුදුන් වහන්සේ මෙසේ ද වදාළහ: යම් භික්ෂුවක්, (ඉහත දැක්වූ පරිදි) වේදනා පිලිබඳ පිළිනොගන්නේ නම්, ඔහු කිසි දෙයක් උපාදාන නොකරයි, උපාදාන රහිතවූ විට, කිසිම දෙයක් පිලිබඳ උද්වේගයක් ඔහුට ඇති නොවේ. උද්වේගය නොමැති නිසා ඔහු විමුක්තිය සාක්ෂාත් කර ගනී. **මූලාශ්‍ර:** දීඝ.නි: ( 2 ): 2 මහානිදාන සූත්‍රය, ඡෙද: 23-29 , පි. 95, EDN:15: Mahānidāna Sutta: The Great Discourse on Origination, p. 166.

▼**එක්සමයක** වච්චගොත්ත පරිබ්‍රාජක විසින් බුදුන් වහන්සේගෙන් ආත්මයක් ඇද්ද? ආත්මයක් නැද්ද? යයි විමසුහ. බුදුන් වහන්සේ එගැන පිළිතුරු නොවදාළහ. ඉන්පසු ඒ ගැන ආනන්ද තෙරුන් විමසුවිට බුදුන් වහන්සේ වදාළ පිළිතුර මෙහි දක්වා ඇත. **සටහන**: වච්චගොත්ත පරිබ්‍රාජක පසුව බුදුසසුනේ පැවිදිවූහ- වච්චගොත්ත තෙර. **බලන්න**: උපග්‍රන්ථය:1. **මූලාශ්‍රය:** සංයු.නි: (4) සළායතනවග්ග: අබ්‍යාකත සංයුත්ත:10.1.10 අත්ථත්තසූත්‍රය, පි.730.

▼ **වෙනත් මූලාශ්‍ර: 1. "Anattā and Nibbāna"** by Nyanaponika Thera: BPS: Wheel: 11, Online Edition, 2008 (අනාත්මය හා එයට පටහැනි මත- ආත්මය ආදීය පිලිබඳ විස්තරාත්මකව කරුණු පෙන්වා ඇත).

▲**ආත්මාර්ථකාමී**-Selfish :තමායයි කෙනෙක් ඇතැයි සලකා තණ්හාවෙන් කටයුතු කිරීම ආත්මාර්ථකාමී බවය. අන්‍යයන් ගැන ද තමන් ලෙසින්ම සැලකීම පරාත්ථකාමිබවය. ධම්මපදය, ආත්මවග්ගයේ දී තමායයි සලකන්නේනම්, ධර්මයට අනුකූලව ආත්මාර්-ථකාමී නොවී-තම අර්ථයද සලකමින් කටයුතු කලයුතු ආකාරය පෙන්වා ඇත: **"අත්තදත්ථං පරත්ථේන- බහුනාපි න හාපයේ අත්ථදත්තමභිඤ්ඤාය- සදත්ථපසුතෝ සියා"** 'බොහෝවූ පර අර්ථය හේතුකොටගෙන අරහත්වය ලබාගැනීමවූ ආත්ම අර්ථය පිණිස හානි ඇතිකර ගතයුතු නොවේ. ආත්ම අර්ථය විශේෂයෙන් දැනගෙන එහි යෙදීය යුතුය'.

:අත්තවග්ග: ගාථාව-166: **"අත්තාහි අත්තනො නාථෝ- කෝ හි නාථෝ පරෝසියා? අත්තනාව සුදන්තේන- නාථං ලභති දුල්ලභං"** 'තමාට පිහිට තමාමය, වෙන කවරෙක් තමාට පිහිටවේද? තමා මනාව දමනය කරගත්විට, තමන් හේතුකොටගෙනම දුර්ලභ ඵලය වූ අරහත්වය නම් පිහිට ලබාගත හැකිය'. අත්තවග්ග: ගාථාව-160. **බලන්න:** පරහිත.

▲ **ආත්ම ප්‍රේමය-** affection for oneself: තමායයි කෙනක් ඇතැයි සිතා, තමන් කෙරෙහි ඇතික් කරගන්නා බැඳීම ආත්ම ප්‍රේමයය. බුදුන්වහන්සේ වදාළේ ආත්ම ප්‍රේමය හා සම ප්‍රේමයක් නැතිබවය.**බලන්න:** ESN: note:22, p. 502. **මූලාශ්‍ර:** සංයු. නි: (1): සගාථවග්ග: දේවතාසංයුත්ත: 1.2.3 නතථිපුත්තසම සූත්‍රය, පි. 38, ESN:1: Devatasamyutta: 13.3 None Equal to That for a son, p. 72.

▲**ආත්මවිපත්ති-පරවිපත්ති හා ආත්මසම්පත්-පරසම්පත් -** own failings-failings of others & own achievements & achievements of others ආත්ම විපත්ති (**අත්තවිපත්තිං**) ලෙසින් මෙහි පෙන්වා ඇත්තේ තමා විසින් කරගන්නා අයහපත් ක්‍රියා නිසා දහම් මග පිරිහීමය. පරවිපත්ති (**පරවිපත්තිං**) යනු අන්‍යයන් ගේ අයහපත් කටයුතු නිසා ඔවුන්ගේ දහම් මග පිරිහියාමය. ආත්ම සම්පත් (**අත්ත සම්පත්තිං** ) යනු තමාගේ කුසල ක්‍රියා නිසා දහම් මග වැඩිමෙන් ලැබෙන යහපත් ඵලයය. පරසම්පත් (**පරසම්පත්තිං** )යනු අන්‍යයන්ගේ කුසල ක්‍රියා නිසා දහම් මග වැඩිමෙන් ඔවුන් ලබන ලාභයන්ය. ආත්මවිපත්ති හා පරවිපත්ති ලෙසින් දක්වා ඇත්තේ අටලෝදහම අවබෝධ නොකර ඇතිනිසා, අටලෝදහම පෙරලෙන අතට පෙරලියාමය, ඒවාට යටවීමය. අටලෝදහම අවබෝධ කරගත් ආරිය ශ්‍රාවකයා ඒවාට යට නොවීම ඔහු ලබන සම්පතකි. **ආධ්‍යාත්මික මගේ ගමන් කරනවිට,** අටලෝදහම අනුව තමනට සිදුවිය හැකි විපත්- අපදා හා ලාභ ආදිය මෙන්ම අනුන්ට සිදුවිය හැකි විපත්- අපදා, ලාභ පිලිබඳ කලින් කලට විමසා බැලීම යහපත් යයි බුදුන් වහන්සේ පෙන්වා ඇත. **" සාධු භික්ඛවෙ, භික්ඛු කාලෙන කාලං අත්තවිපත්තිං පච්චවෙක්ඛිතා හොති... පරවිපත්තිං පච්චවෙක්ඛිතා හොති... කාලෙන කාලං අත්ත සම්පත්තිං පච්චවෙක්ඛිතා හොති... පරසම්පත්තිං පච්චවෙක්ඛිතා හොති". විපත්ති ඇතිවීම:** 1) තමාට කිසියම් ලාභ ලැබෙනවිට, කෙනෙක් ඒවාට යටවී, ඒවායේ මත්වී වාසය කිරීම 2) තමාට කිසියම් අලාභ සිදුවූවිට, කෙනෙක් ඒ ගැන දුකට දොම්නසට පත්වී වාසය කිරීම 3) තමාට කිසියම් ප්‍රසංසා ලැබෙනවිට, කෙනෙක් ඒවාට යටවී, ඒවායේ මත්වී වාසය කිරීම 4) තමාට කිසියම් නින්දාවක් ඇතිවූවිට, කෙනෙක් ඒ ගැන දුකට-දොම්නසට පත්වී වාසය කිරීම 5) තමාට කිසියම් ගරුසැලකිලි ලැබෙනවිට, කෙනෙක් ඒවාට යටවී, ඒවායේ මත්වී වාසය කිරීම 6) තමාට ගරුසැලකිලි නොලැබෙන විට, කෙනෙක් ඒ ගැන දුකට-දොම්නසට පත්වී වාසය කිරීම 7) සිතේ පාපී ආසාවන් ඇතිවීම 8) පාප මිත්‍ර සේවනය. එම කරුණු නිසා ආසව ඇතිවී වැඩි දියුණුවේ, ඔහු දුකින් නොමිදුන කෙනෙකි. ඔහු ආරිය ශ්‍රාවකයකු නොවන නිසා එලෙස අට ලෝදහම ට යටවී කටයතු කරයි. **විපත්ති වලක්වාලීම:** ඉහත කරුණු 8 ඇතිවූවිට ඒවා ගැන සොම්නස හෝ දොම්නස ඇති නොකර ඒවාට යට නොවී සිටීමට පුහුණුවීමෙන්, ආත්ම විපත්ති මැඩ ගෙන ආත්ම සම්පත්ති ඇතිව වාසය කිරීමට හැකිවේ යයි බුදුන් වහන්සේ පෙන්වා දී ඇත. **සටහන්: *** සංඝභේදය කර, දෙව්දත් භික්ෂුව, සසුනෙන් ඈත්වීම අරභයා බුදුන් වහන්සේ මේ දේශනාව වදාළහ. දෙව්දත් භික්ෂුව, ආත්මවිපත්ති 8

ඇතිව වාසය කර ඇත. ** බුදුන් වහන්සේ වදාළ මේ අනුසසනාව, උත්තිය-උත්තර තෙරුන් විසින් සංඝයාට දේශනා කරනලද බව අංගු.8: උත්තර සූත්‍රයේ දක්වා ඇත. එම දේශනාව සක්දෙවිඳු විසින් පසසන ලදී . **බලන්න**: අංගු.නි: (5 ): 8 නිපාත: 8.1.1.8. උත්තර සූත්‍රය, පි. 45, EAN:8: 8.8 Uttara on Failing, p. 414. **මූලාශ්‍ර**:අංගු.නි: (5 ): 8 නිපාත: 8.1.1.7. දේවදත්ත විපත්ති සූත්‍රය, පි. 42, EAN:8: 7.7 Devadatta's Failing, p. 413, උපග්‍රන්ථය:1

▲ **ආතාපි** - ardent :ආතාපි යනු කෙළෙස් තැවීමට ඇති වීරියය- දැඩි උනන්දුව ය. දහම් මග වඩා ගැනීමට අවශ්‍යා අංගයකි. **සටහන: *** කෙළෙස්තවන අරුතින් 'ආතාප' යයි කියනු ලැබේ. ආතාප ඇත්තේ ආතාපි: සිංහල විසුද්ධිමග,1 පරිඡේදය පි.47. **ශබ්දකෝෂ: පා.සිංශ:** පි:125: **" ආතප්ප**: වීරිය,උත්සාහය, කෙලෙසුන් තැවීම පිණිස කරණ විරිය".

▼**ජීවිතය නමැති අවුල,** නිරවුල් කරගැනීම පිණිස එක්තරා දෙවියෙක් ඇසූ ප්‍රශ්නයකට පිළිතුරු ලෙසින් බුදුන් වහන්සේ පෙන්වා ඇත්තේ, එම කාර්ය කරගැනීම පිණිස ආතාපි- කෙළෙස් තවන විරිය ද අවශ්‍යා කරුණක් බවය: "පිළිසිඳ නුවණ ඇති, කෙළෙස් තවන වෙර ඇති, ප්‍රඥාවන්ත භික්ෂුව, ශිලයෙහි පිහිටා, සමාධිය හා ප්‍රඥාව වඩමින් මේ අවුල නිරවුල් කරගන්නේය" **"සීලෙ පතිට්ඨාය නරො සපඤ්ඤො චිත්තං පඤ්ඤඤ්ච භාවයං- ආතාපි නිපකො භික්ඛු සො ඉමං විජටයෙ ජටන්ති"** (A man established on virtue, wise, Developing the mind and wisdom, A bhikkhu ardent and discreet: He can disentangle this tangle). **සටහන**: මේ ගාථාව මුලිකකොටගෙන විසුද්ධිමාර්ගය කෘතිය සකස්කරඇත. **මූලාශ්‍ර:** සංයු.නි: (1): සගාථවග්ග:දේවතාසංයුත්ත: 1.3.3 ජටා සූත්‍රය, පි. 52, ESN: 1. Devatasamyutta, 23.3 Tangle, p. 84.

▼**සතර සති පට්ඨානය වැඩීම පිණිස** කෙළෙස් තවන වීරියය අවශ්‍යාවේ. කායානුපස්සනාව, වේදනානුපස්සනාව චිත්තානුපස්සනාව ධම්මානු පස්සනාව වැඩීමේදී, ආතපිය වැදගත් බව බුදුන් වහන්සේ මෙසේ පෙන්වා ඇත: "මේ සසුනේ මහණ, කෙළෙස් තවන විරිය ඇතිව, සතිසම්ප්‍රජන්‍යය ඇතිව, මේ ලෝකයට ඇති ඇල්ම හා ගැටීම නොමැතිව... කායානු පස්සනාව, වේදනානුපස්සනාව චිත්තානුපස්සනාව ධම්මානුපස්සනාව වඩාගෙන වාසය කරයි: **"ඉධ භික්ඛවෙ, භික්ඛු කායෙ කායානුපස්සී ...වෙදනාසු වෙදනානුපස්සී... චිත්තෙ චිත්තානුපස්සී... ධම්මෙසු ධම්මානු පස්සී විහරති ආතාපි සම්පජානො සතිමා විනෙය්‍ය ලොකෙ අභිජ්ඣා දොමනස්සං."** (…bhikkhu abides contemplating the body as a body… feelings as feelings… mind as mind… mind-objects as mind-objects, ardent, fully aware, and mindful, having put away covetousness and grief for the world) **මූලාශ්‍ර**: ම.නි: (1): 1.1.10: සතිපට්ඨාන සූත්‍රය, පි. 153, EMN:10: Satipaṭṭhāna Sutta- The Foundations of Mindfulness, p. 139.

▲**ඇතා-** An Elephant: සූත්‍ර දේශනාවල ඇතා, නාග ලෙසින්ද පෙන්වා ඇත. **බලන්න**: නාග. **සටහන්: * සංයු.නි. මාර සංයුත්තයේ**, මාරයා විශාල ඇතෙක් ලෙසින් පැමිණ බුදුන් වහන්සේ භය කිරීමට ගත් තැත ගැන විස්තර කර ඇත. **බලන්න**: නාගසූත්‍රය. ** **ඛු.නි: උදානපාලියේ: නාගසූත්‍රයේ**, බුදුන් වහන්සේ හුදකලාව පාරිලේයිය නම් වනයේ වාසය කරන සමයේ, එහිසිටි ඇතෙක්, උන්වහන්සේට, සැලකු අන්දම පෙන්වා

තිබේ. **ධම්ම පදය: නාගවග්ගයේ**, දැමුණු ඇතුන්ගේ ගේ ගුණ පෙන්වා ඇත ** ම.නි: **දන්තභූමි සූත්‍රයේ**: බුදුන් වහන්සේ ඇතුන් දමනය කරණ ලෙසින් ශ්‍රාවකයන් දහමේ දමනය කරන ආකාරය පෙන්වා ඇත. **බලන්න**:උපග්‍රන්ථය:5.

▲ **ඇතා හා අන්ධයන්-**Elephants & Blind men **:** අන්‍ය අගම්කයනේ දිට්ඨි, අන්ධ මිනිසුන් කටයුතු කරන ආකාරය යි, දැක්වීම පිණිස මෙ උපමාව යොදාගෙන ඇත.අන්ධයන් පිරිසක්, ඇතෙක් ගේ විවිධ කාය අංග ස්පර්ශකර, ඇතා එබඳු කෙනෙක්යයි නිගමනය කිරීමය. ඔවුන්, සම්පූර්ණ ඇතා පිළිබඳව නොදැන තමන් ගේ අවබෝධය අනුව ඇතා මෙවැනිය යයි වාදවිවාද කරති. **බලන්න**:උපග්‍රන්ථය:5 **මූලාශ්‍ර:** ඛු.නි: උදානපාලි: නානාතිත්ථික සූත්‍ර 3කි**,**පි.286.

▲ **ඇත් පියසටහන -** Elephant foot print: සියලු සත්වයන්ගේ පිය සටහන්, ඇතාගේ පිය සටහනට ඇතුලත් කළ හැකිය. එලෙසින්, සියලු කුසල් දහම, චතුසත්‍යයට ඇතුලත්වේ. **බලන්න**:උපග්‍රන්ථය:5. **මූලාශ්‍ර:** ම.නි:(1):1.3.8 මහාහත්ථිපදෝපම සූත්‍රය, පි. 468, EMN:28: The Greater Discourse on the Simile of the Elephant's Footprint, p.264.

**අද**

▲**අදත්තාදානය**: පාලි: **අදින්නාදානා** -Taking what is not given අදත්තාදානය-අදින්නාදානා හෙවත් අනුන්ගේ දේ ගැනීම-සොරකම (නුදුන්දේ -අනුන්සතු දේ ගැනීම) දස අකුසලයන්ගෙන් එකකි, පංච ශීලය කඩාගැනීමකි, නිරයට මගකි. **බලන්න**: දස කුසල හා දස අකුසල.

▼ **අදත්තාදානය නිරයට මගකි**: බුදුන් වහන්සේ සොරකම් කරන කෙනෙකුගේ ස්වභාවය මෙසේ දක්වා ඇත: මේ ලෝකයේ කෙනෙක් නුදුන්දේ ගන්නා සුලුවේ. ඔහු ගමේ හෝ වේවා වනයේ හෝ වේවා අනුන්ගේ ධනය, සම්පත් ආදිය උපායෙන් සොරකම්කරයි: **"ඉධ භික්ඛවෙ එකච්චො අදින්නාදායී හොති. යං තං පරස්ස පරවිත්තුපකරණං ගාමගතං වා අරඤ්ඤගතං වා, තං අදින්න ථෙය්‍ය සඞ්ඛතං ආදාතා හොති"** එවැනි අය ඒකාන්තයෙන්ම නිරයට යයි. **මූලාශ්‍ර**: අංගු.නි: (6 ): 10 නිපාත: කරජකාය වග්ග: 10.5.1.1. පඨම නිරය සූත්‍රය, පි. 548, EAN:10: The Deed-born body: 211.1 Hell, p. 556, සංයු. නි: (5-2): මහාවග්ග: සච්චසංයුත්ත: 12.8.2 අදින්නාදාන සූත්‍රය, පි. 362, ESN: 56: Saccha-samyutta: 72.2 Taking what is not given, p.2346.

▼වෙනත් **මූලාශ්‍ර: 1."අදත්තාදානය**: අනුන් සතු නුදුන්දේ ගැනීමය ...වංචා කිරීමය, සොරකමය. මෙයට අංග 5 කි: අනුන්සතු වස්තුවක් බව, අනුන්සතුය යන සංඥාව, සොරසිතය, අයත් කර ගැනීමට කරන උපක්‍රමය, ඒමගින් පැහැරගැනීම" :**සද්ධර්ම කෝෂය,** පි. 113.

▲**අදාන්ත**- Untamed: අදාන්ත- දමනය නොවීම, දහමෙහිහ සිතහික්මීම නොමැතිබවය. නොදැමුණු සිත මහා අනර්ථය පිණිස පවතී යයි මෙහි දක්වා ඇත. **මූලාශ්‍ර:**අංගු.නි: ( 1): 1 නිපාත:4 අදාන්ත වග්ග සූත්‍ර: පි. 50, EAN:1 Untamed. p. 38.

▲**අදළිද්ද**- Rich: අදළිද්ද- නොදිළිඳු යනු දුගී (දුප්පත්) නොවන බවය. සප්ත බොජ්ඣංග යහපත් ලෙසින් වඩා ගන්නේ නම් කෙනෙක් දහමේ දුගී බවට පත් නොවේ. **බලන්න**: දළිද්ද **මූලාශ්‍ර**: සංයු.නි: (5-1):මහාවග්ග: බොජ්ඣංගසංයුත්ත: 2.5.7 අදළිද්ද සූත්‍රය, පි.226, ESN: Bojjanghasamyutta: V: 47.7 Prosperous , p. 1783.

▲ **අද්ධව-** Time periods :අද්ධව යනු කාල සීමාවන්ය. **කාලසිමා 3ක්-** තුන්කාලය- ඇතිබව බුදුන් වහන්සේ පෙන්වා ඇත: අතීත, අනාගත හා වර්-තමාන. අතීතයේද, සත්ත්වයෝ, පංච උපාදානස්කන්ධය පිලිබඳ යථා අවබෝධය නොමැතිව මරුගේ වසඟයට පැමිණේ (සසර දික් කරගනි), වර්තමානයේද, අනාගතයේද එලෙසම සිදුවේ. එහෙත්, යම් කලක පංච උපාදාන ස්කන්ධය පිලිබඳ යථා අවබෝධය ලබාගන්නා පුද්ගලයා නිවන ලබා විමුක්තියට පත්වේ (නැවත කාල සීමාවන්ට නොමඑයි). **මූලාශ්‍ර:** බු.නි: ඉතිවුත්තක: 3.2.4 අද්ධව සූත්‍රය, පි. 418.

▲ **අද්ධාන මග-**Long Road : අද්ධාන මග - අදන්මග ලෙසින් පෙන්වා ඇත්තේ, දිර්ඝ සංසාරයය-සසරගමන. වෙනත් ආගමිකයන්, සංඝයා ගෙන් මෙසේ අසන්නේ නම්: 'කුමක් පිණිස, ගෝතමයන් වහන්සේ වෙත බඹසර වසන්නේද?' එවිට මෙසේ පිළිතුරු දිය යුතුය යයි බුදුන් වහන්සේ වදාළහ. **" සසර අදන්මග පිරිසඳ දැනගැනීම පිණිස බුදුන් වහන්සේ කෙරෙහි බඹසර වාසය කරමු" සටහන්**: * පිරිසිඳ දැනගැනීම පිණිස ආරියඅටමග වඩාගත යුතුවේ ** ආධ්‍යාත්මික පංච ඉන්ද්‍රිය වඩාගැනීම, සසර අදන්මග පිරිසිඳ දැනගැනීම පිණිස (අද්ධානපරිඤ්ඤාය) පවතී ය යි ඉන්ද්‍රිය සංයුත්තයේ දක්වා ඇත. **මූලාශ්‍ර**: සංයු.නි: ( 5-1): මහාවග්ග: මග්ග සංයුත්ත: 1.5.4 අද්ධාන සූත්‍රය, පි. 74, ESN: 45: Maggasamyutta: V.42.2 : sutta, p. 1648, හා ඉන්ද්‍රියසංයුත්ත: 4.7.3 අද්ධාන සූත්‍රය**,** පි. 440, ESN:48: Indriyasamyutta: 63.3 Full understanding, p. 1998.

▼ **ආනාපානසති සමාධිය** වඩාගැනීම, අද්ධානපරිඤ්ඤාය (සසර මග අවබෝධ කරගැනීම) පිණිස පවතී. **මූලාශ්‍ර**: සංයු.නි: ( 5-2):මහාවග්ග: ආනාපානසංයුත්ත: 10.2.9 අද්ධාන සූත්‍රය, පි. 160, ESN:54: Anapanasamyutta: 19.9 The course, p. 2179.

▲ **අදැහැමි දානය**- Unskillful giving: ධර්මානුකූළනොවූ දානය අදැහැමි දානයය. කෙනෙක් අකුසල් කරමින්, වෙනත් අයට කරදර කරමින්, සතුන් මරමින්, ආදී වැරදි පිළිවෙතට දෙන දානය දැහැමි නොවේ, එමගින් පුණ්‍ය සිදුනොවේ.**බලන්න**: දැහැමි දානය. **මූලාශ්‍ර:**සංයු.නි: (1) සගාථවග්ග: දේවතාසංයුත්ත: මච්චරිසූත්‍රය, පි. 62, ESN:1: devathasamyutta: 32.2. Stinginess, p.97.

▲ **අදෝසය**- None Hate: දෝස නැතිබව- තරහ නැතිබව,අව්‍යාපාදයය. කුසලමූල තුනෙන් එකකි (අලෝභ, අමෝහ), නිවනට මගකි. අදෝසය ඇතිවිට ඉන්ද්‍රිය සංවරවේ. **බලන්න:** කුසලමූල **සටහන**: විස්තර පිණිස බලන්න: බු.නි:නෙත්තිපකරණ: පි.7-26.

▲ **අද්භූත ධම්ම-** Adbhuta Dhamma: මින් අදහස් කරන්නේ තථාගතයන් සතු අසිරිමත් ධම්මතා ගැනය. **බලන්න:** තථාගත .**මූලාශ්‍ර:** ම.නි: (3 ): 3.3.3 ආචාරියා අද්භූත සූත්‍රය, පි. 302, EMN: 123: Wonderful and Marvelous, p. 897.

▲ **ආදිත්‍යබන්ධු-** Adittabandhu -Kinsman of the Sun : මෙය බුදුන් වහන්සේ හඳුන්වන ගරු පදයකි. බුදුන් වහන්සේගේ පරම්පරාව සූර්ය දෙවියන්ට සම්බන්ධ නිසා, බුදුන් වහන්සේ හිරු දේවිගේ ඥාතියෙක් ලෙසින් පෙන්වා ඇත. **බලන්න:** බුද්ධ නාම. **මූලාශ්‍ර:** අංගුනි: (2 ): 4 නිපාත: 4.2.2.9 පධාන සූත්‍රය, පි.160, EAN:4: 69.9 Striving, p. 176.

▲ **ආදිත්තපර්යාය ධර්ම න්‍යායය:** පාලි: **ආදීත්තපරියායො ධම්මපරියායො**- Dhamma exposition on the theme of burning ආදිත්තපර්යාය දහම් න්‍යායය ලෙසින් බුදුන් වහන්සේ පෙන්වා ඇත්තේ

සය ආයතන මගින් අල්ලා ගන්නා නිමිති නිසා ලබන ආස්වාදය දොස්සහගත බව, එමගින් දුගතියට යා හැකිබව හා ආරිය ශ්‍රාවකයා ඒවායේ ආදීනව මෙනෙහිකර විමුක්තිය ලබන ආකාරයය. **මූලාශ්‍ර:** සංයු.නි: ( 4 ): සළායතනවග්ග: වේදනාසංයුත්ත: 1.18.8 ආදිත්තපරියාය සූත්‍රය, පි. 358, ESN: Salayatanasamyutta:36: Vedanasamyutta: Ocean: 235.8 The Exposition on Burning, p. 1311.

▲ **ආදීනවය -**Danger: යම් දෙයකට කැමතිවී, එය වෙනස්වීම නිසා සිත දුක් සහගත වේ නම් එය ආදීනවය වේ. ධර්මතා පිලිබඳ ආදීනවය විමසා බැලීම නිබ්ද්දාව ඇතිකර ගැනීමට හේතුවේ. **බලන්න**: ආස්වාදය, ආදීනවය, නිස්සරණය. **සටහන**: සියලුම උපන් දෙය, භය ලෙසින් අවබෝධ කරගැනීම ආදීනවය. එම නුවණ ආදීනව ඤාණය ලෙසින් පෙන්වා ඇත. විස්තර පිණිස **බලන්න**: ඛු.නි: පටිසම්භිදා: ඤාණකථා: 8 ආදීනව ඥානය, පි. 134.

▲ **ආදීනව සංඥාව**: පාලි: **ආදිනවසඤ්ඤා-** perception of danger ආදීනව සංඥාව ලෙසින් පෙන්වා ඇත්තේ ලෝකයේ සකස්වූ ධර්මතා වලට ඇලීම නිසා, ඒවා තමාගේ යයි කරගැනීමට යාම නිසා ඇතිවෙන අන්තරාකාරීබව මෙනෙහි කිරීමය. නිවන සාක්ෂාත් කර ගැනීමට උපකාර වන භාවනා ක්‍රමයකි. **බලන්න**: භාවනා **සටහන: ගිරිමානන්ද සූත්‍රයේ**: ආදීනව සංඥාව ලෙසින් පෙන්වා ඇත්තේ කයේ ඇතිවෙන රෝග පිඩා පිලිබඳ මෙනෙහි කිරිමය.**බලන්න**: දස සංඥා.

▲ **ආදී බ්‍රහ්මචරියා ප්‍රඥාව**: පාලි: **ආදිබ්‍රහමචරියපඤ්ඤා-** wisdom fundamental to the spiritual life: ධර්මයේ ආදී බ්‍රහ්මචරියා ප්‍රඥාව ලෙසින් දක්වා ඇත්තේ, මෙතෙක්, සම්පූර්ණ නො කරගත් බ්‍රහ්මචරියාව- ආධ්‍යාත්මික මග- වඩා ගැනීමට මූලික වන සාධකයන්ය. 'ආදී' යනු මූලිකය, 'බ්‍රහ්මචරියාව' යනු නිවන් මගය, 'ප්‍රඥාව' යනු විදසුන් නුවණය. බලන්න: බ්‍රහ්ම'චරියාව. **එම ප්‍රඥාව ලබාගැනීමට උපකාරීවන කරුණු** 8 ක් බුදුන් වහන්සේ පෙන්වා ඇත: 1) තමන්ගේ ආචාර්ය වරයා ඇසුරු කරමින් වාසය කිරීම, ආචාර්ය වරයා, කෙරෙහි හිරිඔතප් ඇතිව, සෙනෙහස ඇතිව, ගෞරවය ඇතිව සිටීම 2) දහම පිලිබඳ පැහැදිලි නැති කරුණු ගැන නිතරම ගුරුවරයා ගෙන් ඇසීම. ගුරුවරයා, එම කරුණු යහපත් ලෙසින් පැහැදිලිකර දීම නිසා ඔහුට දහම යහපත් ලෙසින් අවබෝධවීම 3) දහම යහපත් ලෙසින් ශ්‍රවණය කර කාය විවේකය හා චිත්ත විවේකය ඇතිව වාසය කිරීම 4) ශිලසම්පන්න වීම 5) බහුශ්‍රැත වීම 6) ආරම්භක වීරිය ඇතිබව 7) සෙසු සංඝයා හා අනවශ්‍ය, හිස් කතාවේ නොයෙදීම, කතා කරනවා නම් දහම් කරුණු- අදාළ දෙයක් පමණක් කතා කිරිම නැතිනම් ආරිය තුෂ්නිම්භාවයෙන් සිටීම 8) පංච උපාදාන ස්කන්ධයේ යථාබව, ඇතිවීම, නැතිවීම පිළිබඳව මෙනෙහිකරමින් වාසය කිරීම. එම කරුණු අට සම්පූර්-ණ කරගැනීමෙන් ආධ්‍යාත්මික මග සාක්ෂාත් කරගත හැකිවේ. එම කරුණු අට සහිතව වාසය කරන භික්ෂුවට සෙසු සංඝයා ගරුකරති. **මූලාශ්‍ර**:අංගු.නි: (5): 8 නිපාත: 8.1.1.2. ආදී බ්‍රහ්මචරියා සූත්‍රය, පි. 26, EAN:8: 2.2 Wisdom, p. 411.

▲ **ආදී බ්‍රහ්මචරියා ශික්ෂාව-**the training fundamental to the spiritual life: ආදී බ්‍රහ්මචරියා ශික්ෂාව- ශිලය ලෙසින් පෙන්වා ඇත්තේ යහපත් කායික, වාචික ක්‍රියා හා යහපත් ජිවන පැවැත්ම-ආජීවයය. (සම්මාවාචා, සම්මාකම්මන්ත හා සම්මා ආජිව). මෙය සේඛ පුහුණුවකි. **ශබ්දකෝෂ:** B.D: p.5: "Adibrhmacariyaka sila: Morality of genuine pure conduct consists in right speech, right bodily actions & right

livelihood, forming the 3rd, 4th & 5th links of the Eightfold Path".
▼**බුදුන් වහන්සේ මෙසේ වදාළහ:** "...මහණෙනි, මා විසින් සර්ව ප්‍රකාරයෙන් මොනවට දුක් නස්නා පිණිස ශ්‍රාවකයන්ට ආදී බ්‍රහ්මචරියා (මාර්ග බ්‍රහ්මචරියාවට මුල්වූ) ශික්ෂා පණවන ලදී..." (…the training fundamental to the spiritual life has been prescribed by me to my disciples for the utterly complete destruction of suffering). එම ශිලය-ශික්ෂාව යහපත් ලෙසින් පවත්වා ගැනීම නිසා ඇතිවන අනුසස් මෙහි දක්වා ඇත.**බලන්න:** EAN: note: 956, p.630. **මූලාශ්‍ර**: අංගු.නි: (2) 4 නිපාත: 4.5.5.3 සික්ඛාපදආනිසංස සූත්‍රය, පි.490, EAN:4: 245.3 Training, p.230.

▲ **ආදේශනා ප්‍රාතිහාර්ය** -miracle of telepathy: අනුන්ගේ සිත් දැනගැනීමේ හැකියාව. **බලන්න**: ප්‍රාතිහාර්ය.

▲ **අදුකම සුඛ වේදනා-** neither-painful nor- pleasant feeling ත්‍රිවිධ වේදනා වලින් එක් වේදනාවකි. මධ්‍යස්ත වේදනා, උපේක්ඛා වේදනා ලෙසින්ද පෙන්වා ඇත. **බලන්න:** වේදනා.

**අධ**

▲ **අධර්මය හා අනර්ථය** - non-Dhamma & harmfulness
අධර්මය හා අනර්ථය ලෙසින් පෙන්වා ඇත්තේ ධම්මානුකූල නොවීම හා ඉන් සිදුවන හානියය. අදහම නිසා බොහෝ අකුසල ඇතිවේ.අධර්මය හා අනර්ථය යනු වැරදි මග මිථ්‍යාදිට්ඨිය ගැනීම යයි බුදුන් වහන්සේ පෙන්වා ඇත.දහමේ මගේ යනවිට, අධර්මය හා අනර්ථ යගැන අවබෝධය තිබිය යුතුය, එවිට, අදහම හැර දමා දහමට පැමිණිය හැකිවේ. **බලන්න**: ධර්මය හා අර්ථය. **සටහන:** දහම, අදහම ලෙසින් ප්‍රකාශ කිරීමේ අයහපත් විපාක, අංගු.නි: (1): 1 නිපාත, අධම්ම වග්ගයේ විස්තර කර ඇත. **මූලාශ්‍ර:** අංගු.නි: ( 6): 10: නිපාත: 10.3.2.1, 10.3.2.2, 10.3.2.3 අධම්ම සූත්‍ර, පි. 430, EAN:10: 113.1, 114.2 & 115.3 non-Dhamma suttas, p. 544.

▲**අධම්ම චරියාව-** Unrighteous conduct : අධම්ම චරියාව යනු දහමට අනුකූල නොමැති හැසිරිමය. අකුසල ඇති කරයි. අධම්ම චරියාව පහකිරීම පිණිස ධම්ම චරියාව වැඩිය යුතුවේ. **මූලාශ්‍රය:** අංගු.නි: (4) 6 නිපාත: 6.1.7සූත්‍රය, පි.284.

▲ **අධාර්මික-** Unrighteous: අධාර්මික යනු ධම්මානුකූල නොවීමය. අධාර්මික නිසා සිදුවන අයහපත බුදුන් වහන්සේ මෙසේ පෙන්වා ඇත: රජවරු අදැහිමි ලෙසින් කටයුතු කරන විට, රාජ පුරුෂයන් ද එලෙස කටයුතු කරයි...එලෙස, රටේ වැසියන්ද අදැහැම්වෙ. එමනිසා, සඳ හිරු පවත්නා කාලය, කාලගුණය, ඍතු, වැසි සුළං විෂමවේ. අදැහැම්බව නිසා දෙවියෝ කිපී, නියම කලට වැසි ලබා නොදේ. ඒ නිසා භොග හානි ඇතිවේ. හානි භෝග පරිහරණය නිසා මිනිසුන්ට බොහෝ රෝග ඇතිවේ, අල්ප ආයුෂ ඇතිවේ, රාජ්‍යයට, බලවත් හානි ඇතිවේ. **බලන්න**: ධාර්මික. **මූලාශ්‍ර:** අංගු.නි: (2): 4 : නිපාත:4.2.2.10 අධාර්මික සූත්‍රය, පි. 162, EAN: 4: 70.10 Unrighteous, p. 177.

▲ **අධිකරණ-** Disciplinary :සංඝයා පිළිබඳ විනය කටයුතු අධිකරණය ලෙසින් පෙන්වා ඇත. විස්තර පිණිස **බලන්න**: විනය පිටකය,අංගු.නි: 2 නිපාත:අධිකරණ වග්ග,7 නිපාත:විනය වග්ග:10 නිපාත: අධිකරණික සූත්‍රය.

▲ **අධිගමය-**Higher statutes: ධර්මයේ අධිගමය ලෙසින් පෙන්වා ඇත්තේ මාර්ග ඵල අවබෝධ ඥානය ලැබීමය, උසස් බවට පත්වීමය.

එනම්: සතර මග, සතර ඵල, ත්‍රිවිද්‍යාව, සය අභිඥා, සිව් පිළිසිඹියා යන උසස් දහම් ගුණ සාක්ෂාත් කරගැනීමය. **බලන්න**:රහතන්වහන්සේ, අභිඥා.

▼**සතිපට්ඨාන සූත්‍රයේදී** බුදුන් වහන්සේ පෙන්වා ඇත්තේ ඥානය උසස් කරගැනීම පිණිස- අධිගමය පිණිස සතර සතිපට්ඨානය වඩාගත යුතු බවය: “ **එකායනො අයං භික්ඛවෙ මග්ගො සත්තානං විසුද්ධියා සොකපරිද්දවානං සමතික්කමාය දුක්ඛදොමනස්සානං අත්ථගමාය ඤායස්ස අධිගමාය නිබ්බානස්ස සච්ඡිකිරියාය යදිදං චත්තාරො සතිපට්ඨානා”.** **බලන්න:** සතිපට්ඨාන සූත්‍රය.

▼**අධිගමය ලැබීම පිණිස සපුරා ගතයුතු කරුණු:** 1) **ආය කුසලය** (කුසල් ලැබීම- skilled in gain) කුසලය පිලිබඳ දක්‍ෂතාවය 2) **අපාය කුසලය** (හැරදැමීම- skilled in loss) පිලිබඳ දක්‍ෂතාවය 3) **උපාය කුසලය** (කුසල් ඇතිකරගැනීමට දක්ෂතාවය (skilled in means) 4) **අනධිගත කුසලය** (මෙතෙක් ඇතිවී නැති) කුසලය ඇතිකර ගැනීම පිණිස ඡන්දය වඩා ගැනීම 5) **අධිගත කුසලය** (ඇතිකරගත්) කුසල ආරක්ෂා කරගැනීමට වීරිය තිබීම 6) ලබාගැනීමට ඇති අධිගමය ලබාගැනීම පිණිස අඛන්ඩ උත්සාහයේ යෙදීම. **මූලාශ්‍ර**: අංගු.නි: ( 4 ): 6 නිපාත: 6.2.3.5 අධිගම සූත්‍රය, පි. 254, EAN:6: 79.5 Achievement, p. 360.

▲ **අධිගමය අතුරුදහන්වීම-** Disappearing of Higher statutes දහම නොදත් සංඝයාගේ හැසිරීම දහමේ- අධිගමයේ අතුරුදහන්වීමට හේතුවේ. **බලන්න**: ධර්මය අතුරුදහන්වීම, EAN: 1: note no. **63**: p. **584**. **මූලාශ්‍රය:** අංගු.නි: අංගු.නි: (1) 1 නිපාත: අධම්මවග්ගය: 1.10 සූත්‍ර, පි.78.

▼**වෙනත් මූලාශ්‍ර: 1**.“අධිගම පිරිහියාම, අධිගම අතුරුදහන්වීම වේ. එය ආරම්භ වන්නේ සිව් පිළිසිඹියාවෙනි. බුද්ධ පරිනිර්වාණයෙන් අවුරුදු දහසක් තෙක් සිව් පිළිසිඹියාව ඇතිකර ගත හැකිය. ඉන් ඔබ්බට සය අභිඥා ඇති කර ගත හැකිය. කල් යෑමෙන් එයද ඇති කර ගත නොහැකිය. ත්‍රිවිද්‍යාව ඇති කර ගත හැකිය. කල් යෑමෙන් එයද ඇති කර ගත නොහැකිය... කල් යත්ම අනාගාමී, සකුදාගාමී, සෝතාපන්න බව ඇති කර ගත හැකිය. යම් කලක අවසාන සෝතාපන්න පුද්ගලයා ජීවිතය ක්‍ෂය වූ විට අධිගමය අතුරුදහන්වේ”. :**සද්ධර්ම කෝෂය**, පි. 202.

▲ **අධිදේව ඤාණදස්සන-** Higher knowledge of Devas: අධිදේව ඤාණදස්සනය යනු දෙවියන් පිලිබඳ සම්පූර්ණ අවබෝධයය (දෙවගුණ- දෙවියන් හා කතාබහ ආදී). බුදුන් වහන්සේ එම අවබෝධය ලැබීම පිලිබඳ විස්තරය මේ සූත්‍රයේ විස්තරාත්මකව පෙන්වා ඇත. **මූලාශ්‍ර**: අංගු.නි: ( 5): 8 නිපාත: 8.2.7.4 අධිදේව ඤාණදස්සන සූත්‍රය, පි.296, EAN:8: 64.4 Gaya, p. 445.

▲ **අධිප්‍රමාණබල-** super normal powers: අධිප්‍රමාණබල (අතිසාමාන්‍ය බල) යනු ඉද්දිබලයන්ය. ඉද්දිවඩා ගැනීමෙන් විවිධ බල ඇතිකර ගත හැකිවේ. **බලන්න**: ඉද්දිපාද.

▲ **අධිමානය:** පාලි: **අධිමානිකො-**arrogance :අධිමානය, අතිමානය ලෙසින්ද හඳුන්වයි, කෙළෙස් ධර්මයකි. දහම් මගේ තමා නොලැබූ මග ඵල ආදී ලැබීම්, තමා ලබාගත් බව ප්‍රකශ කිරීම අධිමානය ය, මෙය මග අවහිර කරන කරුණකි. **බලන්න**: කෙළෙස්, මානය.

▼ **ධර්මයේ බහුශ්‍රැතවීම** ආදී ගුණාත්මක කරුණු පිළිබඳව වැරදි වැටහීමක් ඇතිවිට, යම් භික්ෂුවක් අධිමානයට පත්ව තමන් නොලැබූ සමාධි, මගඵල ආදිය ගැන ප්‍රකාශ කරයි. පහ නොකල කෙළෙස් ඇති බව

නොදන්නා ඔහු, පුරසාරම් කතා කරන බව මෙහි දක්වා ඇත. **මූලාශ්‍ර:** අංගු.නි: (6): 10.2.4.5. කත්ථී සූත්‍රය හා 10.2.4.6. අධිමාන සූත්‍රය පි. 308, EAN: 10: 85.5 The Boaster & 86.6 Final Knowledge, p. 528.

▲ **අධිමානුෂික පුද්ගල**- super human: අධිමානුෂික පුද්ගලයා යනු මනුෂ්‍යත්වය -මිනිස්බව ඉක්මවූ පුද්ගලයාය: බුදු, පසේබුදු, රහතන්. **බලන්න:** උත්තරීතර මනුෂ්‍යයා.

▲ **අධිවචන:** පාලි: **අධිවුත්තිපදානං**- Doctrinal principles: ධර්මයට නුව අධිවචන- අධිවුත්තිපද නම් මූලධර්ම: ධර්ම යේ සිද්ධාන්ත පෙන්වා දීම පිණිස, පැහැදිලි කිරිමට බුදුන් වහන්සේ යොදාගත් වචනයය- පදයන්ය. **ශබ්දකෝෂ: පා.සිං.ශ:** පි. 52: "**අධිවුතති:** කීම, අදහස, **අධිවුතතිපද**: අධිවචන පද, භූතාර්ථය මැඩ යථාස්වභාවය නොගෙණ පවත්නා දිට්ඨි පිලිබඳ පද, දිට්ඨි ප්‍රකාශන වචන..." **P.T.S:** p. 75: "**Adhivacana:** designation, term, attribute, metaphor, metaphorical expression..."

▼ **අධිවචන පිලිබඳව බුදුන් වහන්සේ ගේ විශාරද බව: " යෙ තෙ ආනන්ද, ධම්මා තෙසං තෙසං අධිවුත්තිපදානං අභිඤ්ඤා සච්ඡිකිරියාය සංවත්තන්ති. විසාරදො අහං ආනන්ද තත්‍ර පටිජානාමි ..."** තථාගතයන්ට දස බල ඥාන සහිතව විවිධ පිරිසට, විවිධ ආකාරයෙන් දහමේ මූලික සිද්ධාන්ත පිළිබඳව (අධිවචන) දේශනා කිරීමට, අවබෝධකරවීමට විශාරදතාවය ඇතය යි බුදුන් වහන්සේ පෙන්වා ඇත. **සටහන්**: * එලෙස අධිවචන යහපත් ලෙසින් පෙන්වා දුන් විට, කෙනෙක්, එම ඉගැන්වීම යහපත් ලෙසින් අවබෝධ කරගන්නේ නම් ඔහු යථාභූත ඥානය ලබා ගැනීමට සමත්වේ. ** අටුවාවට අනුව දහමේ ඇති විවිධ සිද්ධාන්තයන් පිලිබඳ ව (ස්කන්ධ, ආයතන, ධාතු ආදී මූල ධර්ම) බුදුන් වහන්සේට ඇති මනා අවබෝධය සර්වඥතා ඥානයය- The knowledge of various phenomena according to their essential nature by this he shows the knowledge of omniscience- **බලන්න**: EAN: note: 1989, p. 677. **මූලාශ්‍ර**: අංගු.නි: (6): 10 නිපාත: මහා වග්ග: 10.1.3.2 අධිවුත්තිපද සූත්‍රය,පි. 96. EAN: 10: Great Chapter: 22.2 Doctrinal Principles, p.500.

▼ **නිවන හඳුන්වන අධිවචන පදය 'ආසවක්ඛය' ය:** රාග දෝස හා මෝහ යන ආසව නැතිකිරීම- ආසවක්ඛය, නිවන හඳුන්වන අධිවචන පදයක් යයි බුදුන් වහන්සේ වදාළහ: **"...නිබ්බාන ධාතුයා ඛො එතං භික්ඛු, අධිවචනං රාගවිනයො දොසවිනයො මොහවිනයොති..."** . **මූලාශ්‍ර**:සංයු.නි : (5-1) :මහාවග්ග: මග්ගසංයුත්ත: 1.1.7 දුතිය භික්ඛු සූත්‍රය, පි. 40, ESN: 45: Maggasamyutta:7.7. A certain bhikkhu 2, p.1610.

▲ **අධිශිලශික්ෂාව-අධිචිත්තශික්ෂාව- අධිප්‍රඥාශික්ෂාව:** පාලි: **අධිසීලසික්ඛා, අධිචිත්තංසික්ඛා, අධි පඤ්ඤාසික්ඛා** - training in Higher Virtue, training in higher Samadhi & training in higher wisdom/insight. :අධිශිලශික්ෂාව, අධිචිත්තශික්ෂාව, අධිප්‍රඥාශික්ෂාව, බ්‍රහ්මචාරිව වාසය කරන භික්ෂුව (සේඛ) ලබන උසස්වූ ත්‍රිවිධ පුහුණුවය, ශිල සමාධි ප්‍රඥාවය, ත්‍රිවිධ ශික්ෂාවය-පුහුණුවය. **බලන්න**: ත්‍රිවිධ ශ්‍රමණ කාර්යය.

▼ **අධිශිලශික්ෂාව**: පිරිපුන් ශිලය ඇතිව වාසය කිරීම, පාතිමොක්ෂ ශිලය ඇතිව සිටීම, පාතිමොක්ෂයෙන් සංවරව වාසය කිරීම, ආචාරගෝචර සම්පන්නව සිටීම, සුළු වරදක් ගැන වුවද බිය දකිමින්, සික්ෂාපද සමාදන්ව, සික්ෂාපදයන් පුහුණුවෙමින් සංවරවීම: **"සම්පන්නසීලා**

**භික්ඛවෙ විහරථ සම්පන්නපාතිමොක්ඛා. පාතිමොක්ඛාසංවරසංවුතා විහරථ ආචාරගොචර සම්පන්නා. අණුමත්තෙසු වජ්ජෙසු භය දස්සාවී සමාදාය සික්ඛථ සික්ඛාපදෙසු" (**Bhikkhus, dwell possessed of virtue, possessed of the Pātimokkha, restrained with the restraint of the Pātimokkha, perfect in conduct and resort, and seeing fear in the slightest fault, train by undertaking the training precepts) **සටහන්:** * අටුවාවට අනුව: '**සම්පන්න සීල**' (possessed of virtue) යනු "පරිපූර්ණ ශීලය' (perfect in virtue) හෝ 'ශීලයසමන්නාගතව' විසීමය.
** '**ගෝචරසම්පන්න**'ලෙසින් අදහස් වන්නේ, පිණ්ඩපාතය ලබාගැනීමට හැකි සුදුසු සේනාසනය, වාසස්ථානය. භික්ෂුව හැසිරිය යුතු ආකාරය (ලීලාව) ද ඉන් අදහස් විය හැකිය. **බලන්න**: EMN: note: 76, p. 1069.
▼**අධිචිත්තශික්ෂාව:** සිතේ සමථබව (එකඟබව) ලබාගැනීම පිණිස කැපවීම, සමාධිය- සමථ භාවනාව වැඩිම අතපසු නොකර පුහුණුවීම.
**"...අජ්ඣත්තං චෙතොසමථමනුයුත්තො අනිරාකතජ්ඣානො..."**
(be devoted to internal serenity of mind, not neglect meditation)
▼**අධිප්‍රඥාශික්ෂාව:** විදසුන් නුවණ පිණිස පුහුණුව.
"...**විපස්සනාය සමන්නාගතො...**" (be possessed of insight)
**සටහන**: එම කරුණු සම්පූර්ණ කරගැනීමෙන් තමන් කැමති ලෞකික හා ලෝකෝත්තර දේ ලබාගත හැකිබව බුදුන් වහන්සේ මේ සූත්‍රයේදී පෙන්වා ඇත. **මූලාශ්‍ර:** ම.නි: ( 1 ): 1.1.6 ආකන්ඛෙයිය සූත්‍රය, පි. 94, EMN: 6: Ākankheyya Sutta - If a Bhikkhu Should Wish, p. 99.
▼ **අධිශීල ශික්ෂාව**, අධිචිත්ත ශික්ෂාව අධිප්‍රඥා ශික්ෂාව- ත්‍රිවිධ ශික්ෂාව, සංඝයා විසින් කළයුතු අවශ්‍යම කටයුතු යයි බුදුන් වහන්සේ පෙන්වා ඇත. පුහුණුව නොකර: "මගේ සිත කෙළෙස් වලින් මිදේවා" යයි පැතීමෙන් එය ඉටු නොවේ. එහෙත්, යම්කලක, මේ ත්‍රිවිධ ශික්ෂාව යහපත් ලෙසින් කරගත්විට, සිත උපාදාන වලින් මිදී නිදහස්බවට පත්වේ. **මූලාශ්‍ර:** අංගු.නි: ( 1 ): 3 නිපාත: ලොණවග්ග: 3.2.5.1 සූත්‍රය, පි. 464, EAN: 3: Lump of Salt: 92.1 Urgent, p. 125.
▼ **වෙනත් මූලාශ්‍ර**: **1."ත්‍රිවිධ ශික්ෂා නම්:** අධිශිල ශික්ෂා, අධිචිත්ත ශික්ෂා, අධිප්‍රඥා ශික්ෂා ය. එහි ශිලයෙන් අධිශිල ශික්ෂාවද, සමාධියෙන් අධිචිත්ත ශික්ෂාව වැඩේ, ප්‍රඥාවෙන් අධිප්‍රඥා ශික්ෂාවද දක්වන ලදී": **සිංහල විසුද්ධිමාර්-ගය**, 1 පරිච්ඡේදය, පි. 49.
▲ **ආධ්‍යාත්මික ආයතන-** spiritual bases :ආධ්‍යාත්මික ආයතන ලෙසින් පෙන්වා ඇත්තේ දහම් මග වඩාගැනීම පිණිස අවබෝධ කළයුතු අභ්‍යන්තර හා බාහිර ආයතනයන්ය. **බලන්න**: ආයතන.
▲ **ආධ්‍යාත්මික ඉන්ද්‍රිය-** spiritual faculties : ආධ්‍යාත්මික ඉන්ද්‍රිය යනු ආධ්‍යාත්මික පංච ඉන්ද්‍රියන්ය: ශ්‍රද්ධා, වීරිය, සති, සමාධි, ප්‍රඥා. මේවා සත්තිස් බෝධිපාක්‍ය ධර්මතාවලට ඇතුලත්වේ. **බලන්න: ඉන්ද්‍රිය. මූලාශ්‍ර:** සංයු.නි: (4) සළායතනවග්ග: සච්චසංයුත්ත: ඉන්ද්‍රිය සූත්‍ර, පි.661.** ඛු.නි: පටිසම්භිදා1: ඉන්ද්‍රියකථා, පි.399. **මූලාශ්‍රය:** අංගු.නි: (4) 6 නිපාත: 6.1.1.3 ඉන්ද්‍රිය සූත්‍රය, පි.26.
▲ **ආධ්‍යාත්මික ධනය-** spiritual wealth :බුදුන් වහන්සේ ආධ්‍යාත්මික ධන 7 ක් පෙන්වා ඇත**:** ශ්‍රද්ධා ධනය, ශිල ධනය, හිරි ධනය, ඔතප්ප ධනය, සුත ධනය, චාග ධනය හා ප්‍රඥා ධනය. **බලන්න**: ධනය.
▲ **ආධ්‍යාත්මික බල-** spiritual powers :ආධ්‍යාත්මික බල යනු පංච බලයන්ය. **බලන්න:** පංච බල.

▲ **ආධ්‍යාත්මික පරිහාණිය**- spiritual decline :ධම්මානුකූල ප්‍රතිපදාවට (ධම්ම විනයට අනුකූල) හානි හෝ බාධා ඇතිවන අන්දමට කටයුතු කිරීම ආධ්‍යාත්මික පරිහාණිය වේ. තමන් නොලැබූ ජාන සමාපත්ති, මගඵල ආදිය තමන් ලබා ඇතය යි පැවසීම නිසා ශ්‍රමණ ජීවිතය පිරිහේ, අකුසල වැඩේ, බ්‍රහ්මචරියාව සම්පූර්ණ කර ගත නොහැකිවේ. පැවිදිබව අත් හැරීමට සිදුවේ. සසර දික් කර ගනී. **බලන්න**: ආධ්‍යාත්මික වර්ධනය, අධිමානය. **සටහන**: ආධ්‍යාත්මික පරිහාණියට බලපාන කරුණු ගැන **බලන්න**:ධම්ම විනය.

▲ **ආධ්‍යාත්මික පංච ඉන්ද්‍රිය**: පාලි: **පඤ්චිඉන්ද්‍රියානි**- Five Spiritual faculties: ආධ්‍යාත්මික පංච ඉන්ද්‍රිය යනු ධර්ම මාර්ගයට විශේෂබවක් ලබාදෙන ඉන්ද්‍රිය 5ය. බෝධි පාක්ෂික ධර්-මතාවන්ට මේ පංච ඉන්ද්‍රිය ඇතුලත්වේ. මේවා අනිකුත් 'ඉන්ද්‍රියන්ට' වෙනස් වනේ එමගින් දහම් මග වැඩෙන නිසාය. ඒ ඒ සත්වයාගේ ඉන්ද්‍රිය දියුණුව හෝ පරිහානිය පිලිබඳ විශේෂ ඥානයක් බුදුවරුන් සතුය, එය **තථාගත** දස බල නුවණකි. **බලන්න**: බෝධි පාක්ෂික ධර්මතා, තථාගත.

▼**බුදුන් වහන්සේ** මෙසේ වදාළහ: **"මහණෙනි, මේ ඉන්ද්‍රිය පහක් වේ: සද්ධා ඉන්ද්‍රිය, වීරිය ඉන්ද්‍රිය, සති ඉන්ද්‍රිය, සමාධි ඉන්ද්‍රිය, ප්‍රඥා ඉන්ද්‍රිය".** (Faith, energy, mindfulness, concentration & wisdom). **මූලාශ්‍ර**: සංයු.නි: (5-1): මහාවග්ග:ඉන්ද්‍රිය සංයුත්ත: 4.1.1. සුද්ධක සූත්‍රය, පි. 374, ESN: 48: Indriyasamyutta: 1.1. Simple version, p. 1926.

▼**පංච ඉන්ද්‍රියන්** ආධ්‍යාත්මික මගට විශේෂ බවක් ගෙනදේ **"කතමෙ පඤ්ච ධම්මා විසෙසභාගියා? පඤ්චිඉන්ද්‍රියානි: සද්ධින්ද්‍රියං, විරියින්ද්‍රියං, සතින්ද්‍රියං, සමාධින්ද්‍රියං, පඤ්ඤින්ද්‍රියං..."**මේවා විශේෂභාගිය ධර්මතාය. **බලන්න**: විශේෂභාගිය ධර්ම. **මූලාශ්‍ර:**දීඝ.නි:(3 ): 11 දසුත්තර සූත්‍රය, පි. 483, EDN: 34: Dasuttara Sutta: Expanding Decades, p. 384.

▼ **පංචඉන්ද්‍රිය ධර්ම** යහපත් ලෙසින් වර්ධනය කරගන්නේ නම් (සම්මා සුභාවිතචිත්තො) මේ ජීවිතයේදීම දුක කෙළවර කරගත හැකිබව අංගු.නි. (6) 10 නිපාතය: 10.1.3.8. දෙවන මහාපඤ්හ සූත්‍රයේ දක්වා ඇත. **බලන්න**: දස ධර්ම ප්‍රශ්න.

▼**ආධ්‍යාත්මික මග** දියුණු කරගැනීම පිණිස පුහුණුවන ප්‍රතිපදා 4 ක් පෙන්වාදුන් බුදුන් වහන්සේ වදාළේ ඒ එක් එක් ප්‍රතිපදාව සම්පූර්ණ කරගැනීමට පංචඉන්ද්‍රිය ඉවහල්වන බවය. ඉන්ද්‍රිය ධර්ම නොවැඩුන කෙනෙක්හට දුකින් මිදීමට යන කාලය දිගය, එහෙත්, ඉන්ද්‍රිය ධර්ම මනාව වැඩුන කෙනෙක්හට දුකින් මිදීමට යන කාලය කෙටිය.**බලන්න**: සතර ප්‍රතිපදා.

▼ **ආසවක්ෂය** කළ භික්ෂුව මනාව, යහපත් ලෙසින්ම පංච ඉන්ද්‍රිය වර්ධනය කරගත් බවත්, එය ආසවක්ෂය කිරීම නිසා ඇතිවන දසබලයන්ගෙන් එක් බලයක්බව සැරියුත් තේරුන් වදාළහ. **බලන්න**: ආසවක්ෂය කිරීම**.**

▼**යම්කලක**, ආරිය ශ්‍රාවකයා, මේ පංච ඉන්ද්‍රියයන් ගේ ඇතිවීම, ප්‍රහාණය, ආස්වාදය, ආදීනවය හා නිස්සරණය, පිලිබඳ යථා අවබෝධය ලබන්නේ නම් ඔහු සෝතාපන්න බව ලබාගන්නේය. **මූලාශ්‍ර**: සංයු: (5-1) : මහාවග්ග: ඉන්ද්‍රියසංයුත්ත: 4.1.2 සෝත සූත්‍රය, පි. 374, ESN:48: Indriyasamyutta: 2.2 Stream Enterer, p. 1927.

▼**පංච ඉන්ද්‍රිය අවබෝධය අරහත්වය පිණිසවේ**: පංච ඉන්ද්‍රියයන් ගේ

ඇතිවීම, ප්‍රහාණය, ආස්වාදය, ආදීනවය හා නිස්සරණය, පිලිබඳ යථා අවබෝධය ලබා උපාදාන රහිතව, බඹසර වැස නිමකළ, සංයෝජන ක්ෂය කල, අවසාන ඥානය ලැබූ භික්ෂුව, අරහත්වය ලබයි. **මූලාශ්‍ර**: සංයු: (5-1): මහාවග්ග: ඉන්ද්‍රියසංයුත්ත: 4.1.4 අරහන්ත සූත්‍රය, පි. 374, ESN: 48 : Indriyasamyutta: 4.4 Arahant, p. 1929.

▼**පංච ඉන්ද්‍රිය** පිලිබඳ යථා අවබෝධය ලබාගැනීමෙන්, මහණ- බමුණන් මේ භවයේදීම ශ්‍රමණබව-බ්‍රාහ්මණබව පසක් කරගන්නේ යයි බුදුන් වහන්සේ වදාළහ. ( those ascetics and brahmins who understand Five faculties as it is, in this very life enter and dwell in the goal of asceticism and the goal of Brahmin hood) **මූලාශ්‍ර**: සංයු: (5-1): මහාවග්ග: ඉන්ද්‍රියසංයුත්ත: 4.1.7 සමණ සූත්‍රය, පි. 376, ESN:48: Indriyasamyutta: 7.7 Ascetics and Brahmins, p. 1931.

▼**පංච ඉන්ද්‍රිය දැකිය හැකි තැන්** : **1) ශ්‍රද්ධා ඉන්ද්‍රිය:** ශ්‍රද්ධා ඉන්ද්‍රිය දැක ගත හැක්කේ සෝතාපන්න අංග සතර තුලය. **බලන්න:** ශ්‍රද්ධා ඉන්ද්‍රිය, සෝතාපන්න. **2) වීරියඉන්ද්‍රිය:** දැක ගත හැක්කේ සතර සම්‍යක් ප්‍රධාන වීරිය තුලය. බලන්න: සතර සම්‍යක් ප්‍රධාන වීරිය**,** වීරියඉන්ද්‍රිය. **3) සති ඉන්ද්‍රිය:** දැක ගත හැක්කේ සතර සති පට්ඨානය තුලය. **බලන්න**: සතර සති පට්ඨානය. 4) **සමාධිඉන්ද්‍රිය**: දැක ගත හැක්කේ සිව් ජාන තුලය. **බලන්න**: සිව් ජාන. 5) **ප්‍රඥා ඉන්ද්‍රිය:** දැක ගත හැක්කේ චතුරාර්ය සත්‍ය තුලය. **බලන්න:** චතුරාර්ය සත්‍ය. **මූලාශ්‍ර**: සංයු: (5-1): මහාවග්ග: ඉන්ද්‍රිය සංයුත්ත: 4.1.8 දට්ඨබ්බ සූත්‍රය, පි. 377, ESN: 48: Indriyasamyutta: 8.8 To be seen, p. 1933.

▼ **පංච ඉන්ද්‍රිය විස්තර කර බෙදා දැක්වීම** :1) **ශ්‍රද්ධා ඉන්ද්‍රිය:** ආරිය ශ්‍රාවකයා සැදැහැවත්ය**,** බුදුන් වහන්සේගේ සම්බෝධිය පිළිගනි, නව අරහාදී ගුණ... විශ්වාසකරයි, එය, ශ්‍රද්ධා ඉන්ද්‍රිය ය. ( the noble disciple is a person of faith, one who places faith in the enlightenment of the Tathāgata thus: The Blessed One is an arahant... This is called the faculty of faith). **2) විරිය ඉන්ද්‍රිය**: ආරිය ශ්‍රාවක තෙමේ අකුසල් පහකිරීමට, කුසල් රැස් කිරීම පිණිස සම්පූර්-ණ වීරිය වඩයි, ඔහුට ස්ථිර (තිර) වීරිය ඇත, පරාක්‍රම වීරිය ඇත, එම ක්‍රියාව නිමාවනතෙක්ම වීරිය අත් නො හැර වාසය කරයි (නො බහා තැබූ ධූර ඇත), එය වීරිය ඉන්ද්‍රිය වේ. **බලන්න**: වීරිය. ( the noble disciple dwells with energy aroused for the abandoning of unwholesome states and the acquisition of wholesome states; he is strong, firm in exertion, not shirking the responsibility of cultivating wholesome states. This is called the faculty of energy). **3) සති ඉන්ද්‍රිය**: ආරිය ශ්‍රාවකයට සිහිය ඇත, උතුම් බලවත් සිහිය ඇත, බොහෝ කලකට පෙර කරන ලද කියන ලද දේ ගැන සිහිය ඇත, නිතරම සිහිය ඇතිව සිටී. ඔහු කෙළෙස් තවන වීරිය ඇතිව, නුවණ ඇතිව, ලෝකය කෙරෙහි ඇති ලෝභය හා දොම්නස දුරුකර වාසය කරයි, සතර සති පට්ඨානය වඩයි.මෙය සති ඉන්ද්‍රිය ය. (the noble disciple is mindful, possessing supreme mindfulness and discretion, one who remembers and recollects what was done and said long ago. He dwells contemplating the body in the body … feelings in feelings … mind in mind … phenomena in phenomena, ardent, clearly comprehending, mindful, having removed covetousness and displeasure in regard to the world. This is called

the faculty of mindfulness) **සටහන:** මෙහිදී සති ඉන්ද්‍රිය ලෙසින් පෙන්වා ඇත්තේ මතකය-සිහිය ය. **බලන්න**: ESN: note: 193, p. 2411. **4 ) සමාධි ඉන්ද්‍රිය**: අරිය ශ්‍රාවක තෙමේ නිවන අරමුණු කොටගෙන සිත නිසල කර සමාධිය ලබයි, සිතේ එකඟබව ලබයි. **(අරියසාවකො වොසසග්ගාරම්මණංමම කරිත්වා ලභති සමාධිං).** ඔහු පිළිවෙලින් සතර ජාන සම්පත් ලබයි. මෙය සමාධි ඉන්ද්‍රිය ය. (the noble disciple gains concentration, gains one-pointedness of mind, having made release the object. He enters and dwells in the 1st… 2nd …3rd … & 4th jhāna…This is called the faculty of concentration) **5) ප්‍රඥා ඉන්ද්‍රිය**: අරිය ශ්‍රාවක තෙමේ ප්‍රඥාවන්තය, පංච උපාදානස්කන්ධයයේ: ඇතිවීම-නැතිවීම (සමුදය-වය) අවබෝධය පිණිස ඔහු සිත යොමුකරයි. එමගින් ලැබෙන අවබෝධය උතුම්ය, තියුණුය, දුක සහමුලින් නැති කර ගැනීම පිණිස වේ. ඔහු චතු සත්‍ය යහපත් ලෙසින් දැනගැනී. මෙය ප්‍රඥා ඉන්ද්‍රිය ය.( the noble disciple is wise; he possesses wisdom directed to arising and passing away, which is noble and penetrative, leading to the complete destruction of suffering. He understands the 4 Noble Truths…This is called the faculty of wisdom) **සටහන:** එම ප්‍රඥාව නම් පංච උපාදානස්කන්ධ යේ ඇතිවීම හා නැතිවීම දකින ප්‍රඥාවය. **බලන්න**: ESN: note: 195, p. 2412. **මූලාශ්‍ර:** සංයු.නි : (5-1): ඉන්ද්‍රිය සංයුත්තය: 4.1.9 විභංග සූත්‍රය හා 4.1.10 දුතිය විභංග සූත්‍රය,පි. 378, ESN:48: Indriyasamyutta: 9.9 Analysis 1 & 2 p.1934.

▼**පංච ඉන්ද්‍රිය වර්ධනය වී ඇති ආකාරය අනුව විවිධ ආරියබව ලැබේ** බුදුන් වහන්සේ මෙසේ පෙන්වා ඇත: 1) පංච ඉන්ද්‍රිය සම්පූර්ණව, පරිපූර්ණ ලෙසින් ලබාගත් විට **අරහත්වය ලබයි.** 2) පළමු තත්වයට වඩා ටිකක් අඩුවෙන් පංච ඉන්ද්‍රිය පරිපූර්ණවිට **අනාගාමි වේ.** 3) දෙවන තත්වයට වඩා ටිකක් අඩුවෙන් පංච ඉන්ද්‍රිය **පරිපූර්ණවිට සකදාගමි වේ.**4) තෙවෙනි තත්වයට වඩා ටිකක් අඩුවෙන් පංච ඉන්ද්‍රිය පරිපූර්ණවිට **සෝතාපන්න වේ.**5) සිව්වෙනි තත්වයට වඩා ටිකක් අඩුවෙන් පංච ඉන්ද්‍රිය පරිපූර්ණවිට **ධම්මානුසාරී වේ.** 6) පස්වෙනි තත්වයට වඩා ටිකක් අඩුවෙන් පංච ඉන්ද්‍රිය පරිපූර්ණවිට ශ්‍රද්ධානුසාරී **වේ. මූලාශ්‍ර:** සංයු.නි : (5-1):මහාවග්ග: ඉන්ද්‍රිය සංයුත්තය: 4.2.2. සංඛිත්ත සූත්‍රය, පි. 384, ESN: 48: Indriya samyutta: 12.2 In Brief, p. 1938.

▼**ආධ්‍යාත්මික පංච ඉන්ද්‍රිය නිවන් මගය- අසංඛත මගය**
**මූලාශ්‍ර:** සංයු.නි: (4 **):**සළායතනවග්ග: අසංඛත සංයුත්ත: 9.1.8 ඉන්ද්‍රිය සූත්‍රය, පි. 662, ESN: 43: Asankatasamyutta: p. 1493.

▼**කෙළෙස් සංසිඳවීම** පිණිස කෙනෙක් ආධ්‍යාත්මික පංච ඉන්ද්‍රියන් වඩන්නේ නම් ඔහු **'ඉන්ද්‍රිය සම්පන්න'** යයි බුදුන් වහන්සේ වදාළහ. **බලන්න**: ඉන්ද්‍රියසම්පන්න.

▼**බුදුන් වහන්සේ මෙසේ වදාළහ:** " මහණෙනි, මේ පංච ඉන්ද්‍රිය දියුණු කලවිට, නිතර නිතර දියුණු කර විපුල කරගත්විට, ඔහුට ආසව ක්ෂය කර, තමාගේ විශිෂ්ඨ ඥානයෙන් , ඵල සමාධිය, ඵල ප්‍රඥාව (**චෙතෝ විමුක්ති, ප්‍රඥා විමුක්ති**) මේ ජීවිතයේදීම ලබා, විමුක්ති සුවයෙන් සිටිය හැකිය". **මූලාශ්‍ර**: සංයු.නි: ( 5-1): මහාවග්ග:ඉන්ද්‍රියසංයුත්ත**:** ආසවක්ඛය සූත්‍රය, පි. 390, ESN: 48: Indriya samyutta: 20.10, Destruction of the taints p. 1946.

▼**වෙනත් මූලාශ්‍ර**: :**1**. " **පංච ඉන්ද්‍රිය සත්‍ය අවබෝධය පිණිසය**" **බෝධිපාක්ෂික ධර්ම විස්තරය**, පි.119: රේරුකානේ චන්ද්‍රවිමල මාහිමි, 1955.

▲ **ආධ්‍යාත්මික පංචබල-** Five spiritual powers :ශ්‍රද්ධා, විරිය, සති , සමාධි හා ප්‍රඥාව ආධ්‍යාත්මික පංචබලයන්ය. මේවා බල ධර්ම ලෙසින් හඳුන්වන්නේ සෙලවිය නොහැකි නිසාය, ස්ථාවරය.

▼ **බුදුන් වහන්සේ මෙසේ වදාළහ**: "යම්සේ ගංගානම් ගඟ පෙර දිගට නැවී තිබේද, බරවී තිබේද, එලෙස මේ පංච බල වඩන, දියුණු කරන මහන තෙමේ, නිවනට නැඹුරුව සිටි, නිවනට බරවී සිටි" **බලන්න**: උපග්‍රන්ථය:5. **මූලාශ්‍ර:** සංයු.නි: ( 5-1 ): මහාවග්ග: බලසංයුත්ත: පචිනනින්නාදී සූත්‍රය, පි. 462, ESN: 50: Balasamyutta: The river Ganges, p. 2038.

▼**පංච බල වඩා ගැනීම නිවන් මගය- අසංඛත මගය .මූලාශ්‍ර:** සංයු.නි: (4)**:** සළායතනවග්ග: අසංඛත සංයුත්ත: 9.1.9 බල සූත්‍රය**,** පි. 662, ESN:43: Asankatasamyutta: p. 1493.

▼ **පංච බල වඩා ගැනීම** මගින් උද්ධම්භාගිය සංයෝජන පහකර ගත හැකිය. **මූලාශ්‍ර:** සංයු.නි: (5-1): මහාවග්ග:බලසංයුත්ත: උද්ධම්භාගිය සූත්‍රය, පි. 462, ESN:50: Bala samyutta: high fetters, p. 2047.

▼**වෙනත් මූලාශ්‍ර: 1."**මාර සේනාව පරදවා නිවන ලබාගනීමට යෝගාවචරයන්ට මේ බල 5 තිබිය යුතුය": **බෝධිපාක්ෂික ධර්මතා විස්තරය**, පි.121: රේරුකානේ චන්ද්‍රවිමල මාහිමි, 1955.

▲**ආධ්‍යාත්මික මග-**Spiritual path: ආධ්‍යාත්මික මග ලෙසින් පෙන්වා ඇත්තේ, දුකින් මිදී, නිවන ලබාගැනීම පිණිස අනුගමනය කලයුතු මගය, එනම්: බ්‍රහ්මචරියාවය. **සටහන**: * ආධ්‍යාත්මික මග විවිධ ලෙසින් හඳුන්වා ඇත: **නොවැරදිය හැකි මග** (අපණ්ණකතං පටිපදං- unmistaken way) ලෙසින්ද දක්වයි. ** අටුවාව මෙවැනි සමාන පද දක්වා ඇත: **ඒකාන්ත මග**- the definite way, **විමුක්ති මග**- the emancipating way, **හේතුඵල මග-** the causal way, **අවශ්‍ය මග-** the essential way, **විශිෂ්ඨ මග-** the exquisite way, **අවිරුද්ධ මග-** the unopposed way, **සහෝපකාරී මග-** the conducive way, **ධර්-මානුකූල මග-** the way in accord with the Dhamma. **බලන්න**: EAN: note 352,p. 597.**මූලාශ්‍ර:** අංගු.නි: (1): 3 නිපාත: 3.1.2.6.සූත්‍රය, පි. 252.

▲ **ආධ්‍යාත්මික වර්ධනය -** spiritual development :දහමට අනුව ආධ්‍යාත්මික වර්ධනය නම්, කෙනෙක් සසර දුකින් මිදීම පිණිස ධම්මානුකූල ප්‍රතිපදාව අනුගමනය කරමින් යහපත් ලෙසින් එම ක්‍රියාවලිය වර්ධනය කර විමුක්තිය ලඟාකරගැනීමය. බ්‍රහ්මචරියාව සම්පූර්ණ කරගැනීමය, සම්මාමග වඩාගැනීමය. **සටහන:** ධම්ම විනය පිලිබඳ විස්තරයේ ආධ්‍යාත්මික පරිහානිය වලක්වා ගැනීමට හා මාර්ගය පරිණත කරගැනීමට ආදාළ කරුණු පෙන්වා ඇත. **බලන්න**: බ්‍රහ්මචරියාව

▼**ආධ්‍යාත්මික වර්ධනයට උපකාරීවන කරුණු:** 1) ශිලසම්පන්න, සමාධිසම්පන්න, ප්‍රඥාසම්පන්න, විමුක්ති සම්පන්න, විමුක්ති ඥානදර්ශ න සම්පන්න භික්ෂූන් දැකීම, එවැනි භික්ෂූන් ගෙන් දහම ඇසීම, එවැනි භික්ෂූන් වෙත එළැඹීම,එවැනි භික්ෂූන් ඇසුරුකිරීම, එවැනි භික්ෂූන් සිහිකිරීම, එවැනි භික්ෂූන් ළඟ පැවිදිවීම. 2) එලෙස, කෙනෙක් ඒ උතුම් භික්ෂූන් වෙතින් දහම ශ්‍රවණය කර, නිතර නිතර ඒ දහම සිහිපත්

කරගතයුතුය. එසේ කරණ ඔහුට කායවිවේකය හා චිත්තවිවේකය ඇතිවේ (සාමාන්‍ය කටයුතුවලින් බැහැරවීමට හැකිවේ). 3) එලෙස, විවේකිව වෙසන ඔහු, දහම සිහිපත් කර ඒ ගැන සිතාබලයි, අරම්භක වීරිය ඇතිකරගනී. එම අවස්ථාවේ සති සම්බොජ්ඣංගය ඔහුතුළ වැඩි සම්පුර්ණ වේ. එලෙස, ක්‍රමයෙන් සෙසු බොජ්ඣංග ධම්මතා: ධම්මවිචය සිට උපෙක්කා සම්බොජ්ඣංගය දක්වා සප්ත බොජ්ඣංගයන් වැඩි සම්පුර්-ණා බවට පත්වේ. මේ භවයේදීම මහාඵල මහාආනිසංස ලබාගනී: අරහත්වයට හෝ අනාගාමී බවට පත්වේ.**සටහන**: ක්‍රමානුකූලව බොජ්ඣංග දහම සම්පුර්ණවීම හා නිවන සාක්ෂාත්වීම පිළිබඳව මේ සූත්‍රයේ විස්තරාත්මකව පෙන්වා ඇත. **බලන්න**: බොජ්ඣංග ධර්මතා. **මූලාශ්‍ර**: සංයු.නි: (5-1):මහාවග්ග: බොජ්ඣංගසංයුත්ත: 2.1.3 සීල සූත්‍රය, පි.174, ESN: The Great Book,46: Bojjhaṅgasaṃyutta: 3.3 Virtue, p. 1733.

▲ **ආධ්‍යාත්ම සංයෝජන බාහිර සංයෝජන**: පාලි: **අජ්ඣත්ත සඤ්ඤොජනො -බහිද්ධාසඤ්ඤොජනො**- Internal fetters & External fetters: මෙහිදී, සැරියුත් මහාතෙරුන් පුද්ගල වර්ග 2 ක් පෙන්වා ඇත: 1) **ආධ්‍යාත්ම සංයෝජන ඇති පුද්ගලයෝ**: එම භික්ෂුව සිල්වත්ය, පාති මොක්ෂ සංවර ශිලයෙන් සමන්විතය, ආචාර ගෝචර සම්පන්නය, අල්පවූ වරදෙහි බිය දකී, ශික්ෂා පදයන්හි මනාව හික්මීඇත. මරණින් මතු ඔහු එක්තරා දේව ලෝකයක පහලවේ. ඉන් චුතව මිනිස් ලොවට යලි පැමිණේ. **සටහන**: මෙහිදී පෙන්වා ඇත්තේ සෝතාපන්න හා සකදාගාමී මගඵල ලැබූ ආරිය පුද්ගලයන් ගැනය .**බලන්න**: EAN: note: 257, p. 593. 2) **බාහිර සංයෝජන ඇති පුද්ගලයෝ: 2.1** එම භික්ෂුව සිල්වත්ය... ශික්ෂා පදයන්හි මනාව හික්මීඇත. ශාන්ත චිත්ත විමුක්තිය ට සිත යොමු කොට එහි වාසය කරයි. මරණින් මතු ඔහු එක්තරා දේව ලෝකයක පහලවේ. ඉන් චුතව ඔහු මිනිස් ලෝකයට නැවත නොපැමිණේ, ඔහු අනාගාමීය. **සටහන්: *** ශාන්ත චිත්ත විමුක්තිය: නම් සතරවෙනි ජාන සමාපත්තියය. **බලන්න**: EAN: note: 258, p. 593. ** අනාගාමී උතුමා මිනිස් ලෝකයේ පංච උපාදානස්කන්ධයකට නො එයි, සුද්දාවාසයක පහලවේ. **බලන්න**: EAN: note: 259, p. 593. **2.2** එම භික්ෂුව සිල්වත්ය ... ශික්ෂා පදයන්හි මනාව හික්මීඇත. ඔහු කාමයන්ගේ (කාම ආශා) නිබ්ද්දාව පිණිස, විරාගය පිණිස, නිරෝධය පිණිස පුහුණු වේ. **සටහන:** මෙහිදී පෙන්වා ඇත්තේ සෝතාපන්න හා සකදාගාමී ආරිය පුද්ගලයන් ගැනය. ඔවුන් පංච කාමය ප්‍රහීණය පිණිස වෙර දරන්නේ අනාගාමී මාර්ගයට පැමිණීමටය. **බලන්න**: EAN: note: 260, p. 594. **2.3** එම භික්ෂුව සිල්වත්ය... ශික්ෂා පදයන්හි මනාව හික්මීඇත. ඔහු ත්‍රිවිධ භව පැවැත්ම කෙරෙහි නිබ්ද්දාව පිණිස, විරාගය පිණිස, නිරෝධය පිණිස පුහුණු වේ. **සටහන**: මෙහිදී පෙන්වා ඇත්තේ අනාගාමී උතුමෙක් විදසුන් නුවනින් යුතුව භව තණ්හාව දුරලා අරහත් මගට පැමිණීමට දරන විරියය. **බලන්න**: EAN: note: 261, p. 594. **2.4** එම භික්ෂුව සිල්වත්ය... ශික්ෂා පදයන්හි මනාව හික්මීඇත. ඔහු තණ්හාව ක්ෂය කිරීමට කටයුතු අරඹා ඇත. **සටහන:** මෙහිදී පෙන්වා ඇත්තේ සෝතාපන්න හා සකදාගාමී ආරිය පුද්ගලයන් ගැනය, ඔවුන් වෙර දරන්නේ අනාගාමී මගට පැමිණීමටය. **බලන්න**: EAN: note: 262, p. 594. **2.5** එම භික්ෂුව සිල්වත්ය... ශික්ෂා පදයන්හි මනාව හික්මීඇත. භව රාගය ප්‍රහීණය කිරීමට කටයුතු අරඹා ඇත. මරණින් මතු ඔහු යම් දේවලෝකයක

පහලවේ. එහි සිට චුතවන ඔහු අනාගාමිය. නැවත මිනිස් උපතකට නො එයි. **සටහන්:** *මෙහිදී පෙන්වා ඇත්තේ අනාගාමී උතුමෙක් විදසුන් නුවනින් යුතුව අරහත් මගට පැමිණීමට දරන විරියය. ** **අටුවාවට අනුව:** සැරියුත් තෙරුන්, විදර්ශනාව, ශීර්ෂ 6ක් යටතේ දේශනා කර ඇත: 1) පහළ මගඵල දෙකක් (සෝතාපන්න හා සකදාගාමී ආරියන්) ලැබූවන්; ඔවුන් විදර්ශ නා භාවනාව පිණිස ධාතු අරමුණු කර ගෙන ඇත. 2) මගඵල තුනක් ලැබූවන් (සෝතාපන්න- අනාගාමී), ඔවුන් සමාධි භාවනාව පුහුණු කරති 3) සෝතාපන්න හා සකදාගාමී ආරියන්, කාමරාගය දුරුකර අනාගාමීබව ලැබීමට කටයුතු කිරීම 4) භව රාගය දුරුකර අරහත්වය ලබා ගැනීමට අනාගාමී උතුමා කටයුතු කිරීම 5) සෝතාපන්න හා සකදාගාමී ආරියන් විදසුන් නුවනින් යුතුව කාමතණ්හාව දුරුකර අනාගාමීබව ලැබීමට කටයුතු කිරීම. 6) අනාගාමී උතුමා විදසුන් නුවණින් යුතුව භවරාගය දුරුකර අරහත්වය ලබා ගැනීමට කටයතු කිරීම. **බලන්න**: EAN: note: 262, 263, p. 594. **මූලාශ්‍ර:** අංගු. නි: (1): 2 නිපාත: 2.1.4.5 සූත්‍රය, පි. 162, EAN: 2: 36.5 Sutta, p.61.

**අන**

▲ **අනඅාඝාත-** anāghāta අනඅාඝත, අවෛරය (freedom from anger or ill-will).මෙය කුසලයකි. **බලන්න:** ආඝාතවත්ථු හා ආඝාතපටිවිනය.

▲**අනධිගත කුසලය** -Anadhigathakusla: අධිගමය සම්පූර්ණ කරගැනීම පිණිස සම්පූර්ණ කරගතයුතු කරුණකි. මෙතෙක් ඇතිවී නොමැතිකුසලය ඇතිකර ගැනීම පිණිස ඡන්දය වඩාගැනීම මින් අදහස් කෙරේ. **බලන්න**: අධිගමය **මූලාශ්‍ර**: අංගු.නි: ( 4 ): 6 නිපාත: 6.2.3.5 අධිගම සූත්‍රය, පි. 254, EAN:6: 79.5 Achievement, p. 360.

▲**අනභිනිවෘතිය-**Anabinivurtiya: අනභිනිවෘතිය ලෙසින් පෙන්වා ඇත්තේ යළි උපතක් නොවීමය, දුක නැතිවියාමය. **බලන්න**: අභිනිවෘතිය. **මූලාශ්‍ර:** අංගු.නි: (6 ): 10 නිපාත: 10.2.2.5 පඨම සුඛ සූත්‍රය, පි. 246, EAN:10: 65.5 Happiness 1,p. 519.

▲**අනර්ථය** -harmfulness : අනර්ථය ලෙසින් පෙන්වා ඇත්තේ ධර්ම මාර්ගයට හානිකරන (අලාභදායි) කරුණු ගැනය. මිථ්‍යාමග ගැනීම නිසා අනර්ථය සිදුවේ**. බලන්න:** අධර්මය හා අනර්ථය. **මූලාශ්‍ර:** අංගු.නි: ( 6): 10: නිපාත: 10.3.2.1, 10.3.2.2, 10.3.2.3 අධම්ම සූත්‍ර, පි. 430, EAN:10: 113.1, 114.2 & 115.3 Non-Dhamma suttas, p. 544.

▲ **අනවකාසය**-not an opportunity: අනවකසාය ලෙසින් පෙන්වා ඇත්තේ අවකාසය-ඉඩක් නැතිබවය. දහම්මග දියුණු කරගැනීමට අවශ්‍ය-සුදුසුබව- තත්ය නැතිවීමය. මෙය අක්ෂණය ලෙසින්ද පෙන්වා ඇත. **බලන්න**: අක්‍ෂණය හා ක්‍ෂණය. **මූලාශ්‍ර**:අංගු.නි: (5): 8 නිපාත: 8.1.3.9 අක්ඛණ සූත්‍රය, පි. 150, EAN: 8: 29.9 Inopportune Moments, p. 427.

▲**අනවජ්ජබල**-Anavajjabala: අනවජ්ජබල ලෙසින් පෙන්වා ඇත්තේ තුන්දොරින් යහපත් ක්‍රියා-කුසල කිරීම නිසා ලැබෙන බලයය. මෙය සතර සංග්‍රහවස්තු වලින් එකකි. **බලන්න**: සංග්‍රහ වත්ථු බල **මූලාශ්‍රය:** අංගු.නි: (5): 9 නිපාත:සම්බෝධිවග්ග:9.1.1.5 බලසංග්‍රහ වත්ථු සූත්‍රය, පි.408.

▲ **අන්‍යආගමික නිකායන්-** Other religious sectors: බුදුන් වහන්සේ වැඩසිටි සමයේ පැවති අන්‍ය ආගමික නිකායන් හා ආගමික නායකයන් පිළිබඳව සූත්‍ර දේශනාවල විස්තරාත්මකව පෙන්වා ඇත:**නිගණ්ඨන්ථයන් (**Niganṭha**), ආජීවකයන්**(Ājīvaka), **මුණ්ඩසාවක** (shaven-headed),

**ජටිල (**matted-hair ascetic), **පරිබ්‍රාජික** (wanderer), **මාගන්දික** (māgandika), **තෙදන්ඩික** (tedaṇḍika), **ආරුද්ධක** (āruddhaka), **ගොතමක** (gotamaka), **දේවධම්මික** (devadhammika). **සටහන්:** * මාගන්දික, තෙදන්ඩික, ආරුද්ධක, ගොතමක, දේවධම්මික තීර්- ලෙසින් පෙන්වා ඇත. විස්තර පිණිස **බලන්න**: නිගණ්ඨ, ආජීවක, ජටිල, පරිබ්‍රාජික, මක්ඛලිගෝසාල. ** පුරාණකස්සප හා නිගණ්ඨනාථ පුත්‍ර යන ආගමික නායකයන්, ඔවුන් සර්-වඥ යයි පවසා ඇත**. බලන්න**:අංගු.නි: (5): 9 නිපාත: මහාවග්ග:9.1.4.7 ලෝකායාතික බ්‍රාහ්මණ සූත්‍රය, පි.518. **මූලාශ්‍ර**:අංගු.නි:(3) 5නිපාත: අතිරේකවග්ග සූත්‍ර,පි.483, EAN:5:293. 8 & 302.17 suttas, p. 315.

▲**අන්‍යආගමික නායකයෝ**-Other religious leaders: බුදුන් වහන්සේ වැඩසිටි සමයේ විසූ, ප්‍රසිද්ධ අන්‍ය ආගමික නායකයන් සය දෙනා ගැන විස්තර: 1) **අජිත කේසකම්බිලි**- Ajita Kesakambali :කම්ම ඵල විපාක නොමැත, පරලොවක් නොමැත, මව්පිය උපකාර අපකාර කිරීමේ ඵල නැත. කයබිඳී මියගිය පසු යළි උපතක් නොවේ. මෙලොව පරලොව දන්නා, සම්‍යක් ප්‍රතිපත්ති ඇති මහණ බමුණෝ නැත. මෙය උච්චේදවාදයය. 2) **නිගණ්ඨනාථ පුත්‍ර**- Nigantha Nataputta: ඉගැන්වීම: සතර සංවරයෙන් යුතුබව: සිසිල් දිය ගැනීමෙන් වැලකීම, සර්-ව ප්‍රකාර සංවර ලක්ෂණයෙන් සමන්විතවීම, සියලු පව් හැර දමා ඇතිබව, මෝක්ෂය ස්පර්ශ කර සිටීම. එලෙස සංවර වීම නිසා නිගන්තයන්ට : සංයත ආත්මය ඇත, ආත්ම සංයමය ඇත, සිත යහපත් ලෙස පිහිටුවා ගෙන ඇත( selfperfected,self-controlled, self-established) යයි දක්වා ඇත. **සටහන්**: මොහු වර්ධමාන මහාවිර (Vardhamana Mahāvīra) ලෙසින්ද හඳුන්වයි, ජෛන ආගමේ නායකයාය. ** නිගණ්ඨ යනු සියලු බන්ධන වලින් නිදහස්බවය. 3) **පකුධ කච්චායන**- Pakudha Kaccayana කයේ ස්ථිරබව, සමූහ 7 කින් සකස්වී ඇතිබව, එය නසන කෙනක්, අස්වන කෙනක් නැත. කෙනෙක් කඩුවකින්, හිස සිඳින්නේනම් ඉන් ප්‍රාණඝාතයක් සිදුනොවේ යන වාදය ඇත. 4) **පුරාණ කාශ්‍යප-** Pūraṇa Kassapa: ඔහු නිරුවත් පරිබ්‍රාජක නිකායක ගුරුවරයාය. ඉගැන්වීම : අක්‍රියවාදය: හිංසාව, සොරකම ආදීවූ අකුසල කම්ම කිරීමෙන් (පස්පව් ආදී) පව් සිදුනොවේ. පුද පූජා, සිල් රැකීම ආදී කුසල කම්ම කිරීමෙන් පින් ඇතිනොවේ. 5) **මක්ඛලී ගෝසාල-** Makkhali Gosala: ඉගැන්වීම: සත්වයෝ හේතු ප්‍රත්‍ය නොමැතිව ඉබේ කෙළෙසෙති, ඉබේම පිරිසිදුවෙති. කම්මවිපාක පිලිනොගැනීම, නුවණැති හා අනුවණ සත්වයෝ සසර දිගුකලක් හැසිර දුක කෙළවර කරගනි. 6) **සංජය බෙලට්ටිපුත්‍ර**- Sañjaya Belatthaputta: මොහු බොහෝ පිරිස ඇති, දිගුකලක් පැවිදිව සිටි, රජවරුන්ගෙන් සම්මාන ලද, මහළු, කීර්තිමත් ආගමික නායකයෙක්යයි මෙහි දක්වා ඇත. **සටහන**: ඒ ඒ ආගමික නායකයන් තමන්ගේ ඉගැන්වීම් පිළිබඳව ප්‍රකාශ කොට ඇත්තේ අජාසත් රජතුමාටය. **මූලාශ්‍ර:** දීඝ.නි.(1) ශ්‍රමණඵල සූත්‍රය, EDN: The Fruits of the Homeless Life.

▲**අනංගණ**- No blemish: අනංගණ යනු දැඩි කෙළෙස් නොමැතිබවය. දැඩි කෙළෙස් නොමැති පුද්ගලයන් වර්-ග 2 කි: 1) එක් පුද්ගලයෙක් හට දැඩි කෙළෙස් නොමැත, එහෙත් ඒබව ඔහු නොදනී. එමනිසා ඔහු සියලු කෙළෙස් පහකර, විමුක්තිය ලබා ගැනීම ගැන නොදනී. 2) තවත්,

පුද්ගලයෙක් හට දැඩි කෙළෙස් නොමැත, ඒබව ඔහු දනි, එමනිසා, කෙළෙස් පහකර ගැනීමට ඔහු කටයුතු කරයි. **බලන්න:** අංගන. **මූලාශ්‍ර:** ම.නි: (1): 1.1.5 අනංගණ සූත්‍රය, පි.74, EMN: 5: Anangaṇa Sutta-Without Blemishes, p.94.

▲ **අනගාරික හා අගාරික-** Anagārika & Agārika: ආධ්‍යාත්මික ජීවිතය පිණිස ගිහිගෙයි කටයුතු වලින් නික්මුන පුද්ගලයා, පැවිදි ජීවිතයක් පිණිස පුරුදු පුහුණුවන තැනැත්තා අනගාරික ලෙසින් දක්වා ඇත. ශ්‍රමණ ජීවිතයට ඇතුල්වනතෙක් ඔවුන් අටසිල්රකි. අගාරික ලෙසින් පෙන්වා ඇත්තේ ගිහිගෙයට ලැදිවී සිටින පුද්ගලයාය. **ශබ්දකෝෂ: පා.සිං.ශ:** පි. 58: "**අනාගාර:** ශ්‍රමණභූමිය, ගෙයක් නැත්තා".

▼ **වෙනත් මූලාශ්‍ර:** 1."ගිහිගෙය හැර පැවිදිවීම අනගාරික ය. පබ්බජාවට නමකි. අගාරික යනු ගෙයට හිතවීමය, එනම්. අඹුදරුවන්ට, කර්මාන්ත කිරීමට ආදියට ඇලීම": **ශ්‍රී සද්ධර්-ම කෝෂය**, පි. 208.

▲**අනඤ්ඤාත-ඤානස්සාමීති ඉන්ද්‍රිය** - I shall come to know the unknown: මගඵල ලබන විට ඇතිවන ඉන්ද්‍රියකි. **බලන්න:** අඤ්ඤා, ඉන්ද්‍රිය.

▲ **අනත්ත සංඥාව:** පාලි: **අනත්ත සඤ්ඤා-** Perception of Non-self: අනත්ත සංඥාව යනු, සකස්වූ සියලු ධර්-මතාවන්හි 'මමය, මගේය, මගේ ආත්මය' යයි පාලනය කිරීමට දෙයක් නැති බව අවබෝධකර ගැනීමය. මෙම සංඥාව වැඩිම නිවන සාක්ෂාත්කරගැනීමට උපකාරිවේ. **බලන්න:** භාවනා, දසසංඥා.

▼**කරුණු 6 ක අනුසස් දැකීමේ ප්‍රතිලාභය** වන්නේ අසීමිතවූ අනත්ත සංඥාව - සියලු ධර්මතා අනත්ත යන වැටහීම- වඩා ගැනීමට හැකිවීම යයි බුදුන් වහන්සේ පෙන්වා ඇත: එනම්: 1) මම සියලු ලෝකය පිලිබඳ (තණ්හා, දිට්ඨි) හඳුනාගැනීම් නැතිව සිටින්නෙමි 2) මගේ (මානය) යන්න අහවර කරගනිමි 3) මගේය යන මමංකාරය අහවර කරගනිමි 4) පෘථග්ජ නයන් හා අනුමෝදනා නොවන අවබෝධයක්-නුවණක් මම ලබා ගන්නෙමි 5) හේතුප්‍රත්‍ය මම පැහැදිලිවම දැක ගන්නෙමි 6) හේතු ඵල නිසා ඇතිවන ධර්මතා මම පැහැදිලිවම දැක ගන්නෙමි. **"සබ්බලොකෙ ච අතම්මයො භවිස්සාමි. අහඞකාරා ච මෙ උපරුජ්ඣිස්සන්ති. මමඞකාරා ච මෙ උපරුජ්ඣිස්සන්ති. අසාධාරණෙන ච ඤාණෙන සමන්නාගතො භවිස්සාමි. හෙතු ච මෙ සුදිට්ඨො භවිස්සාමි. හෙතුසමුප්පන්නා ච ධම්මා"** (I will be without identification in the entire world, I-makings will cease for me. Mine-makings will cease for me. I will come to possess knowledge not shared with worldlings. I will have clearly seen causation. I will have clearly seen causally arisen phenomena) **මූලාශ්‍ර:** අං.ගු.නි: ( 4): 6 නිපාත: 6.2.5.9. අත්තමය සූත්‍රය, පි. 275, EAN: 6: 104. 9. without Identification, p. 363.

▼**අනත්ත සංඥාව වැඩිය යුතු ආකාරය**: **බලන්න:** භාවනා, ගිරිමානන්ද සූත්‍රය.

▲ **අනත්තානුපස්සනාව-** Anaththaanupassana: අනත්තානුපස්සනාව යනු පංච උපාදානස්කන්ධයේ, ඒ ඒ ස්කන්ධ (රූප, වේදනා...) අනාත්ම බව නුවණින් ආවර්ජනය කිරීමය, ප්‍රඥාවෙන් විපස්සනා කිරීමය. බුදුන්

වහන්සේ පෙන්වා ඇත්තේ, එසේ, පංච උපාදානස්කන්ධයේ අනාත්ම බව දකිමින් වාසය කරනවිට, ඒ පිලිබඳ පිරිසිඳ අවබෝධය ඇතිවේ, සියලු දුකින් මිදීමට හැකිවනබවය. **සටහන:** අං.ගු.නි: (4) 7 නිපාතය: අනුසය වග්ගයේ: අනත්තානුපස්සි සූත්‍රයේ, සත් ආරිය පුද්ගලයෝ, සියලු ධර්මතාවන්හි අනත්තානුපස්සිව වාසය කරන බව පෙන්වා ඇත. **බලන්න:** සත් ආරිය පුද්ගලයෝ. **මූලාශ්‍ර:** සංයු.නි: ( 3): ඛන්ධසංයුත්ත: 1.3.4.14 අනත්තානුපස්සනා සූත්‍රය, පි. 350, ESN: 22: Khandasamyutta: IV: 149.14 Contemplating non-self, p. 1111.

▼ **අනත්තානුපස්සි** වඩන ලෝකයට ආහුණෙයාා, පාහුණෙයාා වන උතුම් පුද්ගලයන් 7 ක් ගැන මෙහි විස්තර කර ඇත. **මූලාශ්‍රය**:අං.ගු.නි: (4) 7 නිපාත:අනුසයවග්ග: 7.1.2.6 අනත්තානුපස්සි සූත්‍රය, පි.318.

▲**අන්තරා පරිනිබ්බායි** (පාලි): **අතරතුර පරිනිර්වානය**-Attainer of nibbāna in the interval: ධර්මයේ අන්තරාපරිනිබ්බායි යනුවෙන් පෙන්වා ඇත්තේ අනාගමිව, මෙලොව හැර සුද්ධාවාසයක පහළවන කාලය අතරතුර අරහත්ව, පරිනිර්වානය -පරිනිබ්බානය ලැබීමය. **බලන්න**: අනාගාමි. **ශබ්දකෝෂ**: **පා.සිං.ශ**: පි.53: **"අන්තරා පරිනිබ්බායි**: ආයුෂයාගේ මැද කොටස නොගෙවා අතරදී කෙලේශ පරිනිර්වායෙන් පිරිනිවන්පානා පුද්ගලයා".

▼**අන්තරා පරිනිබ්බායි ලබන ආකාර 3 කි:**: 1) දවස මුළුල්ලේ ගින්නෙන් රත්වුණ යකඩ ගුලියක්, තළනවිට, ගිනි පුපුරක් මතුවී, සැනයෙන් නිවීයන ලෙසින්, අනාගාමි උතුමා මෙලෙව හැර යන අතරතුර පරිනිබ්බානය ලබයි. 2) දවස මුළුල්ලේ ගින්නෙන් රත්වුණ යකඩ ගුලියක්, තළනවිට, ගිනි පුපුරක් මතුවී, ඉහලට නැගී, උඩදී නිවීයන ලෙසින්, අනාගාමි උතුමා මෙලොව හැර යන අතරතුර පරිනිබ්බානය ලබයි. 3) දවස මුළුල්ලේ ගින්නෙන් රත්වුණ යකඩ ගුලියක්, තළනවිට, ගිනි පුපුරක් මතුවී, ඉහලට ගොස්, නැවත පොළොවට පහත්වී, පොළවට වදින්නට පෙර නිවීයන ලෙසින්, අනාගාමි උතුමා මෙලොව හැර යන අතරතුර පරිනිබ්බානය ලබයි. **බලන්න**: උපග්‍රන්ථය:5. **සටහන:** භික්ඛු බෝධිට අනුව: '... the three similes suggest that the "attainer of nibbāna in the interval" attains nibbāna before actually taking rebirth'. **බලන්න**: EAN: note: 1536, p. 655. **මූලාශ්‍ර:** අං.ගු.නි: (4): 7 නිපාත: 7.2.1.2. පුරිසගති සූත්‍රය, පි. 402, EAN:7: 55.2 Destinations of Persons, p. 387.

▲ **අනවද්‍ය ධර්ම හා සාවද්‍ය ධර්ම-** Blameless Dhamma and blameworthy Dhamma: අනවද්‍ය ධර්මය යනු නිදොස්-නිවැරදි දහමය. සාවද්‍ය ධර්මය යනු සදොස්- වැරදි දහමය. අනවද්‍ය දහම ලෙසින් පෙන්වා ඇත්තේ විමුක්තිය ලබාදෙන සම්මා දිට්ඨිය ඇතුළු අංග 10 යය. සාවද්‍ය දහම නම් වැරදිමග ගැනීමය. **මූලාශ්‍ර**: අං.ගු.නි: ( 6 ): 10 නිපාත සාධු වග්ග: 10.3.4.7 සාවජ්ජ සූත්‍රය, පි.470, EAN: 10: Good: p.548.

▼**අනවද්‍ය ධර්ම**: 1) අක්‍රෝධය 2) එදිරි නැතිබව 3) අනුන්ට අවමන් නොකිරීම 4) අහංකාර නොවීම-නිරහංකාර, 5) ඉරිසියා නොවීම 6) නොමසුරුබව 7) අමායාව 8) කපටිනැතිබව 9) හිරිය 10) ඔත්තප්පය (non-anger, non-hostility, non-denigration, non-insolence, non-envy, non-miserliness, non-deceitfulness, non- craftiness, moral shame, moral dread)

**සාවද්‍ය ධර්ම:** 1) ක්‍රෝධය 2) එදිරිය 3) අනුන්ට අවමන් කිරීම 4) අහංකාරය, 5) ඉරිසියාව6) මසුරුකම 7) මායාව 8) කපටිබව 9) හිරි නැතිබව-අහිරිකය 10) ඔත්තප්ප නැතිබව- අනොත්තප්ප.
**සටහන**: අංගු.නි: (1): 2 නිපාත:පුග්ගලවග්ග: 4.3.4.5 වජ්ජපුග්ගල සූත්‍රයේ: වැරදි ක්‍රියා කරන (තුන්දොරින්) පුද්ගලයන් 3  දෙනක් හා වැරදි ක්‍රියානොකරන-අනවද්‍ය පුද්ගලයෙක් ගැන විස්තර කර ඇත.
**මූලාශ්‍ර:**අංගු.නි: (1 ):2 නිපාත:17: 1 අකුසල පෙයයාලය සූත්‍ර, පි.230, EAN:2: XVII, Unwholesome R. , p. 74.

▲**අනවද්‍ය සුඛය** -happiness of blamelessness
අනවද්‍යසුඛය යනු තුන්දොරින් යහපත් ක්‍රියා පමණක් ඇතිව ගෙවන ජීවිතය ගැන සතුටුවීමය. **බලන්න**: ගිහිසුඛ.

▲**අනාගතභය**- Future perils
අනාගතභය ලෙසින් පෙන්වා ඇත්තේ දහම් මගේ ගමන් කරනවිට සිදුවිය හැකි හානි හා අනතුරුය, ඒ නිසා මග සාක්ෂාත් කරගැනීමට නොහැකිවේ: 1) සර්ප යෙක් දෂ්ඨ කිරීමෙන් මරණයට පත්වීම 2) වැළඳූ ආහාරයක් නොදිරවීම නිසා මරණයට පත්වීම 3) පය ගලකට හැපී වැටීම නිසා මරණයට පත්වීම 4) නපුරු වන සිව්පාවන්ට හසුවීම නිසා මරණයට පත්වීම 5) සොරුන්ට හසුවීම නිසා මරණයට පත්වීම 6) අමනුෂ්‍ය බියක් නිසා මරණයට පත්වීම 7) මතුවේ මහලුබවට පත්වීම නිසා පුහුණුව කරගැනීමට නොහැකිවීම 8) මතුවේ ලෙඩ රෝග පීඩා ඇතිම නිසා පුහුණුව කරගැනීමට නොහැකිවීම 9) මතුවේ දුර්-භික්ෂයන් ඇතිවී ආහාර හිඟ වීම නිසා පුහුණුව කරගැනීමට නොහැකිවීම 10) මතුකල වන ප්‍රදේශ වලට හානි සිදුවීම නිසා ඒවා අතහැර මිනිසුන් බහුල ස්ථාන වල වාසය කිරීමට සිදුවීම නිසා පුහුණුව කරගැනීමට නොහැකිවීම 11) මතුවේ සංඝභේදයක් සිදුවීම නිසා පුහුණුව කරගැනීමට නොහැකිවීම. එම කරුණු ආවර්-ජනය කර බලවත් වීරිය ඇතිකර මාර්ගය සාක්ෂාත් කරගැනීමට යුහුසුළු විය යුතුය යි බුදුන් වහන්සේ අවවාද වදාළහ. **සටහන්**: * මේ සූත්‍රය දේශනා කර ඇත්තේ ආරණ්‍ය වනසේනාසනයන්හි වාසය කරන සංඝයාටය ** ධම්ම විනයට ඇති අනාගත භය, පිළිබඳව **බලන්න**: ධර්ම විනය. **මූලාශ්‍ර:** අංගු.නි: (3 ): 5 නිපාත: 5.2.3.7 හ 5.2.3.8 සූත්‍ර, පි. 184, EAN: 5: 77.7 & 78.8 suttas, p. 267.

▲**අනාගාමී-** non-returner: ධර්මයට අනුව විමුක්ති මගේ තෙවනි ඵල සමාපත්තිය අනාගාමීය. ඕරම්භාගිය සංයෝජන පහකර ගැනීමෙන් අනාගාමීවේ. මේ ලෝකයේ අනාගාමීවූ උතුමා ඒ භවයේදී අරහත්බව නොලැබුවොත්, මරණින් මතු සුද්ධාවාස නම්වූ බ්‍රහ්මලෝකවල උපතලබා, එහිදී විමුක්තිය සාක්ෂාත් කරගනී. නැතහොත්, ඒ අතරතුර කාලයේ දී අරහත්වය ලබා පරිනිබ්බානයට පත්වේ.  **බලන්න:** ඕරම්භාගිය සංයෝජන, අන්තරා පරිනිබ්බායි. **සටහන**: සූත්‍ර දේශනාවන්ට අනුව, බුදුන් වහන්සේ වැඩසිටි සමයේ වාසය කල පුක්කුසාති භික්ෂුව, අනාථ පිණ්ඩික සිටුවරයා, දීඝායු උපාසක ආදීන් අනාගාමීව, මරණින් මතු සුද්ධාවාසයන්හි උපත ලබා ඇත.**බලන්න**: උපග්‍රන්ථය:1,2,3.
**ශබ්දකෝෂ: පා.සි.ශ**: පි. 58: "**අනාගාමි**: න+ අගාවී- අනාගාමි පුද්ගලයා, උත්පත්ති වශයෙන් කාමභාවයට නොඑන ස්වභාව ඇත්තා- **අනාගාමිතා**".

**B.D**: p.28: "**Non-Returner**, is a noble disciple on the 3rd stage of holiness". **P.T. S**: p.80: "**an + āgāmin**- one who does not return, a Never-Returner, one who has attained the 3rd stage … So near is the Anāgāmin to the goal, that after death he will be reborn in one of the highest heavens and there obtain Arahantship, never returning to rebirth as a man".

▼ **අනාගාමී උතුමන් දිට්ඨිසම්පන්නය, අවෙච්චාසහගත ප්‍රසාදයෙන් යුක්තය**: බුදුන් වහන්සේ පිලිබඳ නියත විශ්වාසය ඇති අනාගාමී උතුමන් දිට්ඨිසම්පන්නය (accomplished in view), අවෙච්චාසහගත ප්‍රසාදයෙන් යුක්තය (unwavering confidence). **මූලාශ්‍ර:** අංගු.නි: (6 ):10 නිපාත: 10.2.2.3 නිට්ඨිඞත සූත්‍රය හා 10.2.2.4. අවෙච්චප්පසන්න සූත්‍රය, පි.244, EAN:10:63.3 Certainty and 64 (4) Unwavering p. 519.

▼ **අනාගාමීබව ලැබූවිට කාමලෝකයේ කර්ම සුද්ධාවාසයෙහි ඵල නොදරයි**: මේ සසුනේ ආරිය ශ්‍රාවකයා, අභිජ්ජාව හා ව්‍යාපාදය පහකර, මනා සිහිය ඇතිව, සම්ප්‍රජන්‍යය ඇතිව, සතිය පිහිටුවාගෙන, මෙත්තා සහගත සිත ඇතිව, මෙත්තා භාවනාව වඩයි. තමාට මෙන්ම සියලු ලෝක සත්ත්වයන්ට- සිව් දිසාවට, උඩ හා යට යන සෑම දිසාවන්ටම අප්‍රමාණවූ, මහග්ගතවූ , විපුලවූ, මෙත්තා සහගත සිත, සතුරුබව නැතිව, ව්‍යාපාදය නැතිව, පතුරුවයි. එසේ භාවනා යෝගී භික්ෂුවට මෙසේ වැටහේ: " පෙරදී මගේ සිත සීමිතව, නොදියුණුව තිබුනේය. එහෙත්, දැන් මගේ සිත අප්‍රමාණය, මනාව වර්ධනයවී තිබේ. (කාමලෝකයට) ප්‍රමාණවූ කර්ම, මා කරා පරලොවට නො පැමිණේ". **"…සො එවං පජානාති: 'පුබ්බෙ ඛො මෙ ඉදං චිත්තං පරිත්තං අහොසි අභාවිතං. එතරහි පන මෙ ඉදං චිත්තං අප්පමාණං සුභාවිතං. යං ඛො පන කිඤ්චි පමාණකතං කම්මං, න තං තත්‍රාවසිස්සති, න තං තත්‍රාවතිට්ඨති' ති" (**Previously, my mind was limited and undeveloped, but now it is measureless and well developed. No measurable kamma remains or persists there).

**සටහන්:** * අටුවාවට අනුව, ප්‍රමාණවූ කර්ම නම් කාමලෝකයේ ඵල විපාක දීමට නියමිත කම්මවෙ. ආරිය ශ්‍රාවකයා, අනාගාමී බව ලබාගත් නිසා- හෝ අනාගාමීබවට පැමිණීමට නියත නිසා, ඔහු සුද්ධාවාසයක යළි උපත ලබා නැවත මිනිස්ලොව උපතකට නොපැමිණේ. කාමලෝකයේ කර්-මවලට, සුද්ධාවාසයකදී විපාක ඇතිකිරීමට හැකියාව නැත. **බලන්න:** EAN: notes: 2186 & 2191, p. 685. ** මෙත්තා චේතෝ විමුක්තිය ඇතුළු සියලු සතර බ්‍රහ්ම විහාර එසේ පුරුදු පුහුණු කරගැනීම මගින් අනාගමිබව ඇතිකරගෙන, කාමලෝකයේ ඵල දෙන කර්ම අවසන් කරගත හැකිවේ යයි බුදුන් වහන්සේ පෙන්වා ඇත. **බලන්න**: බ්‍රහ්මවිහාර. **මූලාශ්‍ර**:අංගු.නි: ( 6): 10 නිපාත:10.5.1.9. කරජකාය සූත්‍රය, පි.582, EAN:10: 219.9 The Deed Born Body, p.561.

▼**අනාගාමී ඵලය** ලැබීමට සාක්ෂාත් කරගතයුතු ධර්මතා: 1) අශ්‍රද්ධාව හැර ශ්‍රද්ධාව ඇතිකරගැනීම 2) අහිරිකය හැර හිරි ඇතිකරගැනීම 3) අනොත්තප්ප හැර ඔත්තප්ප ඇතිකරගැනීම 4) කුසිතකම හැර වීරිය ඇතිකරගැනීම 5) අසිහිය හැර සිහිය ඇතිකරගැනීම 6) අනුවණකම හැර ප්‍රඥාව ඇතිකරගැනීම. **මූලාශ්‍ර**:අංගු.නි: ( 4 ): 6 නිපාත:6.2.2.1 අනාගාමී ඵල සූත්‍රය, පි. 238, EAN:6: 65.1 Non-Returner, p. 358.

▼**අනාගාමී පුද්ගලයෙක් අරහත්බව ලැබීම**: අනාගාමි උතුමෙක්, අරහත්වයට පත්වීමට කරුණු 3 ක් සම්පූර්ණයෙන්ම පහකළ යුතුය: 1) **මාන අනුසය (**underlying tendency to conceit) 2) **භවරාග අනුසය** (underlying tendency to lust for existence) 3 **අවිද්‍යාව (**ignorance). උද්දම්භාගිය සංයෝජන 5 සහමුලින් පහකරගත්විට අරහත්මගඵල සාක්ෂාත්වේ යයි බුදුන් වහන්සේ වදාළහ. **බලන්න:**උද්දම්භාගිය සංයෝජන. **මූලාශ්‍ර:** අංගු.නි: (4 ):7 නිපාත: 7.2.1.2**.** පුරිසගති සූත්‍රය, පි. 402, EAN: 7: 55.2. Destinations of Persons, P. 387.

▼**අනාගාමී උතුමෙක් රහත්බව ලබාගන්නා ආකාර 7 කි: 1 -3** ආකාර හඳුන්වන්නේ **අන්තරා පරිනිබ්බායි** ලෙසින්ය (attainer of nibbāna in the interval). **4 උපහච්චපරිනිබ්බයි (**attainer of nibbāna upon landing) **5 අසංඛාර පරිනිබ්බායි (**attainer of nibbāna without exertion) **6 සසංඛාරපරිනිබ්බායි** (attainer of nibbāna through exertion) **7 අකනිට්ඨගාමී (**heading toward the akaniṭṭha realm). **බලන්න**: සප්ත පුරිස ගති. **සටහන: B.D** (ශබ්දකෝෂය) p.29 :එම ආකාර 7 පිළිබඳව විස්තරාත්මකව දක්වා ඇත. **මූලාශ්‍ර:** අංගු.නි: (4):7 නිපාත: 7.2.1.2. පුරිසගති සූත්‍රය, පි. 402, EAN: 7: 55.2. Destinations of Persons, P. 387.

▼**අනාගාමී උතුමන් බ්‍රහ්මලෝකයේ උපත ලැබීම**
ගෞතම බුද්ධ සාසනයේ අනාගාමී මගපල ලැබූ භික්ෂූන් හත් නමක්, අවිහ බ්‍රහ්මලෝකයේ උපත ලබා, එහිදී විමුත්තිය ලැබූබව ඝටිකාර සූත්‍රයේ දක්වා ඇත. ඒ උතුමන්: උපක, පලගන්ඩ, පුක්කුසාති, භද්දිය, භද්දදේව, බාහුදන්ති, පින්ගිය භික්ෂූන්වේ.
**මූලාශ්‍ර:** සංයු.නි: (1): දෙවපුත්ත සංයුත්තය: 2.3.4 ඝටිකාර සූත්‍රය, පි. 40, ESN: 2: Devaputta samyutta: 24.4 Ghaṭīkāra, p. 201.

▲ **අනාත්ම:** පාලි: **අනත්තා-** Not-self
අනාත්ම හෙවත් ආත්මයක් නොමැතිබව (අනත්ත) බුදුදහමේ ත්‍රිලක්ෂණය ලෙසින් පෙන්වා ඇති මුලික සිද්ධාන්තයේ තෙවෙනි ධර්මතාවයය.
**බලන්න**: අනිච්ච දුක්ඛ හා අනාත්ම.

▼ **පංච උපාදානස්කන්ධයේ** අනාත්මබව දැකීම විමුක්තිය ය:
**"රූපං භික්ඛවෙ අනත්තා ,වෙදනා ... සඤ්ඤා... සඞ්ඛාරා... විඤ්ඤාණං අනත්තා. එවං පස්සං ...සුතවා අරියසාවකො රූපස්මිම්පි ...වෙදනායපි... සඤ්ඤායපි... සඞ්ඛාරෙසුපි ... විඤ්ඤාණස්මිම්පි නිබ්බින්දති. නිබ්බින්දං විරජ්ජති, විරාගා විමුච්චති, විමුත්තස්මිං විමුත්තමිති ඤාණං හොති: ඛීණා ජාති වුසිතං බ්‍රහ්මචරියං කතං කරණියං නාපරං ඉත්ථත්තායාති පජානාතීති"**
රූපය...වේදනාව... (මුළු පංච උපාදානස්කන්ධයම) අනාත්ම යයි බුදුන් වහන්සේ පෙන්වා ඇත. ඒ දැක කළකිරීම ඇතිකරගන්නා ආරිය ශ්‍රාවකයා, ඒවාට නොඇලි විමුක්තිය ලබා ගනී. **සටහන:** සංයු.නි (3) ඛන්ධසංයුත්තයේ, අනිච්චවග්ගයේ: පංච උපාදානස්කන්ධයේ අනාත්ම බව විස්තරාත්මකව දක්වා ඇත. **මූලාශ්‍ර:** සංයු.නි: ( 4): සළායතනසංයුත්ත: අනිත්‍ය වග්ග: 1.1.2.3 අනත්ත සූත්‍රය, පි. 66, ESN: 35: Salayatana samyutta: 14.3 Impermanent, p. 1018.

▲ **අනාතාපි-**Non-ardent

අනාතාපි ලෙසින් පෙන්වා ඇත්තේ කෙළෙස් තවන වීරිය- දැඩිවීරිය- උනන්දුව නොමැතිබවය, අලසබවය. එවැනි පුද්ගලයන්හට ආරිය මග සපුරා ගත නොහැකිය. **බලන්න:** ආතාපි. **මූලාශ්‍රය:** ඛු.නි: ඉතිවුත්තක: 2.1.7 අනාතාපි සූත්‍රය, පි. 382.

▲**අනාථපිණ්ඩිකසිටු**-Anathapindikasitu:බලන්න:උපග්‍රන්ථය:3.

▲ **අනාදරය:** පාලි: **අනාදරියං**-no-affection- disrespect
අනාදරය යනු ආදරය නොමැතිබවය, තවත් කෙනෙක් කෙරෙහි සැලකිල්ලක්, ගෞරවකිරීමක් නැතිබවය. ධර්-මයට අනුව, අනුන්ට අනාදරය කිරීමට, අගෞරව කිරීමට බලපාන මුලික කරුණු නම්: 1) දහම පිලිබඳ අශ්‍රද්ධාව නිසා 2) පාපමිත්‍ර ඇසුර නිසා 3) මුරණ්ඩු සිතක් තිබීම නිසා මුරණ්ඩුබව-වැරදි නිවැරදි කරගැනීමට ඇති අකමැත්ත. මේ අවගුණ දහම් මගට බාධාවන්ය. හිරි ඔත්තප්ප හා අප්‍රමාදය ආදී ගුණ ඇතිකර ගැනීමෙන් එම අවගුණ පහකර ගත හැකිබව මෙහිදී පෙන්වා ඇත. **මූලාශ්‍ර:** අංගු.නි:(6 ):10 නිපාත:10.2.3.6.තයොධම්ම සූත්‍රය,පි.284, EAN:10: 76. 6. Incapable, p. 524.

▲ **ආනන්තරික කම්ම:** පාලි: **ආනන්තරිකම්ම**-Āanatarika-Kamma - actions with immediate destiny: ආනන්තරික කම්ම බලවත් කම්ම විපාක ඇති කරයි. එනම්, වෙනත් කම්මයක් ඵල දීමට ඉඩ නොතබා, එම කම්මයෙහි විපාක වහා ඵල දෙනබවය. මේ ගණයට වැටෙන යම් පාප කම්මයක් හෝ පුණ්‍ය කම්මයක් කලේ නම්, වෙනත් කම්මයක් පල විපාක දීමට පෙර ඒ කම්ම පළමුව විපාක විදීමට සිදුවේ. **බලන්න:** පංච ආනන්තරික කම්ම. **ශබ්දකෝෂ:** **පා.සිං.ශ:** පි. 128: "**ආනන්තරියකම්ම:** අනතුරු අත් බවේ විපාක දෙන කම්මවෙ. කුසල කම්ම : අෂ්ට සමාපත්ති, අකුසල: පඤ්චානන්තරිය කම්ම".
**B.D**: p. 10: "**Ānantarika-Kamma**: 'Actions with immediate Destiny'.

▼ **ආනන්තරික කම්ම** සිදුකළ කෙනෙකුට, යහපත් ධර්මය ශ්‍රවණය කළද, ආධ්‍යාත්මික මගට ඇතුළුවිය නොහැකිය. **මූලාශ්‍ර:** අංගු.නි: (4 ): 6 නිපාත: 6.2.4.3 වොරෝපිත සූත්‍රය, පි. 264, EAN:6: 87.3 Murderer, p. 361.

▲**ආනන්තරික චිත්තසමාධිය:** පාලි: **ආනන්තරිකො චෙතො සමාධියො-** Uninterruptd mental concentration: ආනන්තරික චිත්ත සමාධිය යනු අතරතුර නොනැවතී පවතින සිතේ එකඟතාවය -සමාධියය. (Un interrupted mental concentration). **ශබ්දකෝෂ:** **පා.සිං.ශ:** පි. 128: "**ආනන්තරිකසමාධි:** මාර්-ගයට අනුව ලැබිය යුතු ඵලය, සෝවාන් ආදී ඵල සතර". **B.D**: p.11: "**Ānantariya**: the 'immediacy' is a name for that concentration of mind which is associated with such insight (vipassanā) as is present in any one of the 4 kinds of super mundane path-consciousness (ariya-puggala) and which therefore is the cause of the immediately following consciousness as its result or fruition (phala)".

▼**ආනන්තරික චිත්ත සමාධිය** දුෂ්ප්‍රතිවිධ්‍ය ධර්මයකි, අවබෝධය පහසු නැති, දුකසේ අවබෝධ කරගතයුතු දහමකි. **බලන්න:** දුෂ්ප්‍රතිවිධ්‍ය ධර්ම. **සටහන:** * ආනන්තරික යනු අතරතුර සිදීමක් නොමැති බවය- සමාධිය ලැබූ පසු විදර්ශනා නුවණ ඇතිවී යම් මගඵලයක් ලැබීමය ** මේ සමාධිය

විදර්ශනාවට අනතුරුව ඇති මාර්ගය ලෙසින් බු.ජ.ත්‍රි: දක්වා ඇත. බලන්න: පි. 486 . ** The arising of a 'path-moment' (Stream-Entry, etc.) after insight. බලන්න: EDN: note: 1137, p. 384. **මූලාශ්‍ර:** දීඝ.නි : (3 ): 11 දසුත්තර සූත්‍රය, පි. 483, EDN: 34: Dasuttara Sutta: Expanding Decades, p. 384

▼**ආනන්තරික චිත්ත සමාධිඥානය**

නෙක්කම්මය නිසා සිතේ ඇතිවන එකඟ බව අවික්ෂේප සමාධිය වේ. එම සමාධිය නිසා සිතේ ඇතිවන පිරිසිදුබව නිසා ආසවයන් ( කාම, භව, දිට්ඨි, අවිද්‍යා ආදී ආශ්‍රව) බිඳදමා ගැනීමේ නුවණ- ප්‍රඥාව ආනන්තරික චිත්ත සමාධි ඥානයවේ. **"අවික්ඛෙපපරිසුද්ධත්තා ආසවසමුච්ඡෙදෙ පඤ්ඤා ආනන්තරිකසමාධිස්මිං ඤාණං'යි"**. **සටහන:** * නෙක්ක්මමය (නෛෂ්ක්‍රම්‍යය) නිසා ඇතිවන සිතේ එකඟබව- සමාධිය, ක්‍රමයෙන් මාර්ග ඥානය ඇති කිරීමට සමත්වේ. එමගින්, ආසවයන් ක්ෂය කිරීමට හැකියාව ලැබේ. සෝතාපන්න, සකදාගාමී, අනාගාමී හා අරහත් මග ඵල නුවණ අනුක්‍රමයෙන් ලැබී ආසව බිඳී යයි. **බලන්න**: ආසව. **මූලාශ්‍ර:** ඛු.නි: පටිසම්භිදා මග : 1 : 32. ආනන්තරික චිත්ත සමාධි ඥානය, පි. 202.

▼ **වෙනත් මූලාශ්‍ර: 1**. "ආනන්තරික සමාධිය යනු කුමක්ද? සෝතාපත්ති මග්ග, සකදාගාමි මග්ග, අනාගාමි මග්ග, අරහත්ත මග්ග, යන මේ මාර්ග හතරෙන් ඕනෑම එකක් සඳහා කියන නමකි ආනන්තරික සමාධිය යන්න". https://dhamma.lk.ingreesi.com/2019/12/590.html

▲**ආනන්ද තෙර -**Ānanda Thera: **බලන්න**: උපග්‍රන්ථය:1

▲**අනාපත්ති**- Anapaththi: අනාපත්ති ලෙසින් පෙන්වා ඇත්තේ යම් ඇවතක් පිළිබඳ වැරදි ලෙස ගැනීමය. ඇවැතක්, ඇවතක්-වරදක් නොවේයයි පැවසීම හා ඇවතක් නොවන දෙයක් ඇවතක් යයි පැවසීම. එම්නිසා බොහෝදෙනාට අයහපත, දුක ඇතිවන බවද, සසුනේ පිරිහීමට හේතුවන බව බුදුන් වහන්සේ පෙන්වා ඇත. **බලන්න**: ඇවත **සටහන:** විස්තර පිණිස බලන්න: අංගු.නි: 1 නිපාතය: 12 අනාපත්තිවග්ගය**.**

▲ **ආනාපාන සතිය**-Mindfulness on in and out breathing

ආනාපාන සතිය**:** හුස්ම ගැනීම පිටකිරීම පිළිබඳ සිහිය පැවැත්වීම, ආස්වාස-ප්‍රශ්වාසය පිළිබඳව සිහියෙන් හා නුවණින් යුතුව කරන භාවනාවය. 'ආන' යනු ආශ්වාසය වේ; 'අපාන' යනු ප්‍රශ්වාසය වේ. ආනාපානසතිය භාවනාවක් ලෙසින් වඩා ගැනීමෙන් මහත්ඵල මහා ආනිසංසස ලැබෙන බව බුදුන් වහන්සේ පෙන්වා ඇත. ගිරිමානන්ද සූත්‍රයේ ආනාපානසතිය සංඥාවක් ලෙසින් වඩාගැනීම විස්තරකර ඇත. විස්තර පිණිස **බලන්න**: ම.නි: ආනාපානසති සූත්‍රය හා ම.නි හා දී.ස.නි: සතර සති පට්ඨාන සූත්‍ර හා සංයු.නි: ආනාපානසංයුත්තය.

▼ **ආනාපානසති භාවනාව** යහපත්ලෙසින් වඩාගැනීමෙන්, දුක ඇතිකරන බාහිරවිතක්ක (කාමරාග ආදී) ය සන්සිඳේ, නිවන ලබාගැනීමට හැකිවේ යයි බුදුන් වහන්සේ පෙන්වා ඇත. **මූලාශ්‍ර**:ඛු.නි:ඉතිවුත්තක:3.4.6 අශුභානුදර්-ශි සූත්‍රය, පි. 453.

▼ **බුදුන් වහන්සේ** බහුලව කොට යෙදෙන විහරණය ආනාපානසති සමාධියය. එම විහරණය: ආරියවිහාර, බ්‍රහ්මවිහාර, තථාගතවිහාර ලෙසින් හැඳින්වීම සුදුසුය යි බුදුන් වහන්සේ පෙන්වා ඇත .(It is a noble dwelling, a divine dwelling, the Tathāgata's dwelling). **මූලාශ්‍ර:**

සංයු.නි: (5-2):මහාවග්ග: ආනාපානසංයුත්ත:10.2.1 ඉච්ඡානංගල සූත්‍රය, පි.136, ESN:54: Anapanasamyutta: 11.1 Icchanangala, p. 2168.

▲**අනායුෂ-** Anayusa: අනායුෂ ලෙසින් පෙන්වා ඇත්තේ ජීවත්වීමට ඇති කාලය, ආයුෂ කෙටිබවය. **බලන්න**: ආයුෂ. ආයුෂ කෙටිවිමට හේතු කරුණු: සතප්‍රයාකාරිවිම-කයට යහපත ඇතිලෙසින් අහාර නොගැනීම, ආහාරයෙහි මාත්‍රා නොමැතිවීම -පමණ නොදැනීම, අහාර යහපත් ලෙසින් දිරවා ගැනීමට නො හැකිවීම, නියමිත (සුදුසු) වේලාව තුල පිණ්ඩපාතය පිණිස නොහැසිරීම, බ්‍රහ්මචාරී ජීවිතයක් නොගෙනයාම, ශිලසම්පන්න නොවීම ,පාපමිත්‍ර සේවනය. **මූලාශ්‍රය**:අංගු.නි: (3) 5 නිපාත: ගිලානවග්ග: 5.3.3.5 හා 5.3.3.6 සූත්‍ර, පි.258.

▲ **අනාවරණ ඥානය** - Anawarana Nana

අනාවරණ ඥානය ලෙසින් පෙන්වා ඇත්තේ තථාගතයන්ට පමණක් ඇති සර්වඥතා ඥානයය. එම නුවණ ආවරණයවී නොමැත, එනිසා අනාවරණ ඥානය වේ. **"තථාගතයන් වහන්සේගේ සර්වඥතා ඥානය කවරේදයත්: හැම සංඛත අසංඛත දෙය නිරවශෙෂ කොට දනී...අතීතයේවූ... අනාගතයේ සිදුවන... වර්තමානයේ ඇති සියල්ල දනී..."** **සටහන:** මේ සූත්‍රයේ සර්වඥතා ඥාන විස්තරාත්මකව පෙන්වා ඇත. **මූලාශ්‍රය:** බු.නි: පටිසම්භිදාමග්ග -1: මහාවග්ග, ඥානකතා: 72-73 අණාවරණ ඥානය, පි. 258.

▲ **අනාවරණ ධම්ම-** Non-Obstructive Dhamma: අනාවරණ ධම්ම ලෙසින් පෙන්වා ඇත්තේ සප්ත බොජ්ඣංගයන්ය. ඒවා විමුක්තිය පිනිසවේ. මේ දහම් මගින් නීවරන යටපත්කර, යථා බව එළිකරන නිසා ඒවා අනාවරණ ධම්ම වේ. **බලන්න**: බොජ්ඣංග ධම්ම. **මූලාශ්‍රය:** සංයු.නි: ( 5-1):මහාවග්ග: බොජ්ඣංගසංයුත්තය: 2.4.4. අනාවරණ සූත්‍රය, පි. 216, ESN:46: Bojhangasamyutta: 34.4 Non Corruption sutta, p. 1769.

▲ **අනාවිල සඞකපෙසා (**පාලි**): පිරිසිදු සංකල්පනා-** Purified intention

දහමට අනුව අනාවිලසඞකප්ප යනු පිරිසිදු චේතනා ඇතිබවය- සම්මා සංකප්පය. එනම්, කාම, ව්‍යාපාද, හිංසා විතක්ක ප්‍රහීණය කර ඇතිබවය. මේ ගුණ ඇත්තේ ආරියන්ටය.**බලන්න**: ආරිය වාසස්ථාන. **සටහන**: **පා.සිං.ශ:** පි. 59: **අනාවිල:** නොකැළඹුණු, චංචල නොවන, මඩරහිත, කෙළෙස් රහිත".

▼**ආරියෝ,** වැරදි සංකල්පනා- කාම, ව්‍යාපාද, හිංසා- බැහැර කර ඔවුන්ගේ සංකල්පනා පිරිසිදු කර ගෙන ඇත: **"කථඤව භිකඛවෙ, භිකඛු අනාවිල සඞකපෙසා හොති. ඉධ භිකඛවෙ භිකඛුනා කාමසඞකපෙසා... බ්‍යාපාදසඞකපෙසා... විහිංසාසඞකපෙසා පහීනො හොති, එවං ඛො භිකඛවෙ, භිකඛු අනාවිල සඞකපෙසා හොති".** (Here, a bhikkhu has abandoned sensual intention, intention of ill will, and intention of harming. It is in this way that a bhikkhu has purified his intentions) **මූලාශ්‍ර**: අංගු.නි: (6 ):10 නිපාත: 10.1.2.9-10 පඨම ආරියවාස හා දෙවෙනි අරියවාස සූත්‍ර, පි.82-84, EAN:10: 19.9 & 20.10 Abodes of the Noble Ones, p. 498-499.

▲**අනාරියමග-**Anariyamaga: අනාරිය මග ලෙසින් පෙන්වා ඇත්තේ ආරිය මගට විරුද්ධ මගය: මිථ්‍යාදිට්ඨිය ගැනීමය. **බලන්න:** ආරියමග

▲ **අනාරිය අටමග-** Ignoble eightfold path: අනාරිය අටමග යනු ආරිය අටමගට විරුද්ධමගය, මිථ්‍යාදිට්ඨිය ආදී අංග අට ගැනීමය.

▲**ආනාරිය ධොවනය-** ignoble washing: අනාරිය ධොවනය- සේදීම, අවැඩදායකබව මෙහි පෙන්වා ඇත. දකුණුදිග පිහිටි (ඉන්දියාවේ) ගමක් වැසියන්, තමන්ගේ මියගිය නෑදෑයන් භූමදානය කරති. මළකඳ දිරාගිය පසු, ඔවුන් ඒ තැන හාරා මිණිඇට ගෙන, ඒවා සෝදා පවිත්‍ර කර ඒවාට මල් සුවඳ දුම් ආදියෙන් පුජාකරති. නැකත් ශාස්ත්‍රයට අනුව, ශුභ වේලාවක් පැමිණිවිට, ඔවුන් ඒ ඇට රැගෙන හඬමින් විලාප දෙති. ඉන්පසු නැකතට අනුව අහාර පාන ආදිය ගෙන, නැටුම් වැයුම් ආදිය රඟ දැක්වීම් කරති. **බලන්න:** EAN: note 2146, p. 683. එම ධොවනය තමන් වහන්සේ ප්‍රතික්ෂේප නොකරණ බව, එහෙත් එවැනි අනාරිය වූ, පහත්වූ, අවැඩදායකවූ සේදීම මගින් අර්-ථයක්- ආධ්‍යාත්මික මගේ දියුනුවක් නොවන බව බුදුන් වහන්සේ පෙන්වා ඇත**. බලන්න**: ආරිය ධොවනය. **මූලාශ්‍ර:**අංගු.නි: (6 )10 නිපාත, සමණසඤ්ඤා වග්ග: 10.3.1.7. ධොවන සූත්‍රය,පි.416, EAN:10: 107-7 Dhovana, p.542.

▲ **අනාරිය පරියේෂණය** -Ignoble search: දහමට අනුව අනාරිය පරියේෂණය යනු ආරිය නොවන සෙවීම: ආධ්‍යාත්මික ජීවිතය ගැන නො සෙවීම යයි බුදුන් වහන්සේ පෙන්වා ඇත. “ මේ ලෝකයෙහි ඇතැම් පුද්ගලයෝ, තමන් ජාතිය ස්වභාවය ... ජරාව ස්වභාවය ව්‍යාධිය ස්වභාවය... තමන් මරණය ස්වභාවය ඇතිව සිටින්නේ, ජාතිය... ජරාව... ව්‍යාධිය ...මරණය ස්වභාවය ඇති දෙයක් ගැනම සොයයි, තෙමේ ශෝකය ඇතිවසිටින්නේ, ශෝකය ඇති දෙයක් ගැනම සොයයි, තෙමේ කෙලෙස් ඇතිවසිටින්නේ, කෙලෙස් ඇති දෙයක් ගැනම සොයයි”. එලෙස තමන් ජාති, ජරා, මරණ ආදියට බැස ගෙන, එම ස්වභාවයම ඇති වෙනත් අය සොයමින් සසර පුරා සැරිසැරීම, දුක් ඇති කරයි, සසර දික්කරගනී. **මූලාශ්‍ර:**ම.නි:(1 )1.3.6 අරියපරියේසනසූත්‍රය,පි.414,EMN: 26,The Noble Search, p. 242.

▲ **අනාරිය වෝහාර** - Ignoble Declaration: අනාරිය වෝහාර යනු ආරිය නොවන- මිථ්‍යා ප්‍රකාශයන්ය: 1) අදෘෂටයෙහි දෘෂටවාදිත- නොදැක දුටු බව කීම 2) අශ්‍රුතයෙහි ශ්‍රුතවාදිත- නොඅසා ඇසුබව කීම 3) අමුතයෙහි මුතවාදිත- දැනීමක් නැතිව දැනීම ඇතිබව කීම 4) අවිඥතයෙහි විඥාත්වාදිත- විඥානයෙන් නොවිඳ, විඳිනලදබව කීම 5) දැක, නුදුටු බව කීම 6) අසා, නොඇසූ බව කීම 7) දැනීමක් ඇතිව නොදැනුනා යයි කීම8) විඳ, නොවින්ද යයි කීම. ( Saying that one has seen what one has not seen, saying that one has heard what one has not heard, saying that one has sensed what one has not sensed, saying that one has cognized what one has not cognized. There are these four ignoble declarations). **මූලාශ්‍ර**:අංගු.නි: ( 2 ): 4 නිපාත: 4.5.5.8 අනරියවොහාර සූත්‍ර2 කි, පි. 494, EAN:4: 250.8 Declarations-suttas, p. 231.

▲**අනාරිය සුඛය**-Anariyasukha: ආරියනොවන-පෘතග්ජනයා විඳින කම්සුව-සැපය මින් අදහස්කරයි. **මූලාශ්‍රය**: අංගු.නි: (1): 2 නිපාත: සුඛවග්ග සූත්‍ර, පි.192.

▲**අනාසවසුඛය**-Anasawasukha: අනාසවසුඛය ලෙසින් පෙන්වා ඇත්තේ ආසව-ආශ්‍රව රහිත සිතට ඇතිසුවයය. රහතන්වහන්සේට ඇති සුවයය. **මූලාශ්‍රය**: අං.ගු.නි: (1): 2 නිපාත: සුඛවග්ග සූත්‍ර, පි.192
▲**අනාරිය සුඛල්ලිකානුයෝගය-**Anariya sukallikaanuyoga සාමාන්‍ය පුහුදුන් මිනිසා සේවනය කරන කාමසේවනය මින් අදහස්කරයි. මෙය දහම් මග වැඩිම පිණිස හිතකරනොවේ. **බලන්න:**සුඛල්ලිකානු යෝගය. **මූලාශ්‍ර:** දීඝ.නි:(3) 6.පාසාදිකසූත්‍රය-ඡෙදය:17,පි. 210, EDN**:**29**.**The delightful discourse-Para:23,p. 318.
▲ **අනාසව ධම්ම හා සාසව ධම්ම** - The taintless Dhamma & the tainted Dhamma: අනාසව ධම්ම යනු කෙළෙස් ඇතිනොකරන දහමය, එනම් සම්මා මගය. සාසව ධම්ම යනු කෙළෙස් ඇති කරන (ආසව ඇතිකරන) දහමය, එනම් මිථ්‍යා දිට්ඨිය ගැනීමය. **මූලාශ්‍ර**: අං.ගු.නි: ( 6 ): 10 නිපාත: සාධු වග්ග: 10.3.4.6 සාසව සූත්‍රය, පි.470, EAN: 10: Good, p.548.
▲ **අනිච්ච, දුක්ඛ හා අනාත්ම:** පාලි: **අනිච්චං දුක්ඛං අනත්තා-** Impermanent, suffering, not-self: ත්‍රිලක්ෂණය ලෙසින් දක්වා ඇති අනිච්ච දුක්ඛ හා අනාත්ම දහම බුදුදහමේ මූලික සිද්ධාන්තයන්ය. **බලන්න:**ත්‍රිලක්ෂණය. **ශබ්දකෝෂ: පා.සිං.ශ**:පි. 58: "**අනාත්ම:** ආත්මය නොවන්නේ අනාත්මනම්. එයතමන් වශයෙහි නොපවත්නාවූ අරුතෙන්ද ද ස්වාමියෙක් නැති අරුතෙන්ද ද ශුන්‍යතා අරුතෙන්ද ආත්මය ප්‍රතික්ෂේප කරන යන අරුතෙන්ද අනාත්ම නම්" පි.59: "**අනිච්ච**: නිත්‍ය නොවන, සැමකල්හි නොපවතින". පි.321: **දුක්ඛ**: දුක...දුක්ඛඛන්ධ: දුක්රැස, දුක් ගොඩ...". **B.D**: p.12: "**Anattā**: Not-self, Non-ego…impersonality is the last of the 3 characteristics of existence. p. 14: "**Anicca**: Impermanent- is the 1st of the 3 characteristics of existence, the other 2 are suffering- dukkha & not-self-anattā. Impermanence is a basic feature of conditioned phenomena be they material or mental…" p.54: "**Dukkha**: Pain, painful feeling, which may be bodily and mental…".
▼**අනිච්ච දුක්ඛ හා අනාත්ම බව අවබෝධ කරගැනීම**: අභ්‍යන්තර සය ඉන්ද්‍රියන් -සළායතන: ඇස, කණ, නාසය, දිව, කය හා මනස යන සය ඉන්ද්‍රියන් හා ඒවා මගින් අල්ලා ගන්නා බාහිර අරමුණු 6 : රූප, ශබ්ද, ගඳසුවඳ, රස, පහස, දහම් කරුණු යන මේ හැම අනිච්ච ස්වභාවය ගනී. යමක් අනිච්චනම් එය දුකය. යමක් දුක නම් එය අනාත්මයය. යමක් අනාත්මනම් එය: **'මෙය මගේ නොවේ, මෙය මම නොවෙමි, මෙය මගේ ආත්මය නොවේ'** යයි යථාබව මනා නුවණින් දැකිය යුතුවේ. එලෙස දකින ආරිය ශ්‍රාවකයා, සය ඉන්ද්‍රියන් කෙරෙහි කලකිරේ; කළකිරීම-නිබ්ද්දාව නිසා විරාගය ඇතිවේ, විරාගය නිසා නිරෝධය- විමුක්තිය ඇතිවේ. **සටහන්:** * බුදුන් වහන්සේ පෙන්වා ඇත්තේ: අතීතයේ පැවති, අනාගතයේ පහළවන, වර්-තමානයේ පවතින සය ඉන්ද්‍රියන් හා බාහිර අරමුණු 6 : අනිච්චය දුකය අනාත්ම යයි නුවණින් දැකිය යුතු බවය. ** දහම් කරුණු (මනසට හසුවන අරමුණු-mental phenomena) ලෙස පෙන්වා ඇත්තේ තුන්ලෝකය: කාම,රූප හා අරූප ලෝක 3 පිලිබඳ අරමුණුය -**බලන්න:** ESN: note: 4, p.1354 ** **ගිරිමානන්ද සූත්‍රයේදී**

අනිච්ච හා අනාත්ම සංඥා ආවර්-ජනය කරණ ආකාරය පෙන්වා ඇත . **බලන්න**: භාවනා. **මූලාශ්‍ර:** සංයු.නි: ( 4 ): සළායතනසංයුත්ත: අනිච්ච වග්ග සූත්‍ර-12 , පි. 28, ESN:35: Salayatanasamyutta: The Impermanent, p. 1219, සංයු.නි: (3): ඛන්ධසංයුත්ත: සූත්‍ර, පි.65, ESN:22: Khanda Samyutta: Impermanent: suttas, p. 1018.
▼**වෙනත් සූත්‍ර මූලාශ්‍ර:** 1. සංයු.නි: ඛන්ධසංයුත්තයේ අනිච්ච වග්ගයේ සූත්‍ර. 2. සංයු.නි: සළායතන වග්ග: වේදනා සංයුත්තයේ අනිච්ච වග්ගයේ සූත්‍ර.
▼**අනිච්ච දුක්ඛ හා අනාත්ම බව (ත්‍රිලක්ෂණය) අවබෝධ කරගැනීමේ අනුසස්**: මෙහි අනුසස් 6 ක් පෙන්වා ඇත: 1) සියලු සංඛාරයන්හි ත්‍රිලක්ෂනය දකින පුද්ගලයා දහමට අනුකූලවූ අවබෝධය ලබාගනී (අනුලෝමක්‍ෂාන්තිය ඇතිවීම-will possess a conviction in conformity with the teaching) 2) අනුලෝමක්‍ෂාන්තිය ඇතිවිට, නියතලෙසින්ම කුසල දහමේ සමන්නාගතවේ (සම්‍යක්තව නියාමය- the fixed course of rightness) 3) සම්‍යක්තව නියාමය ඇතිවිට: සෝතාපන්නබව ඇතිවේ 4) ...සකදාගාමි බව ඇතිවේ 5)...අනාගාමිබව ඇතිවේ 6)...අරහත්බව ඇතිවේ. **මූලාශ්‍ර**:අංගු.නි: (4) 6 නිපාත:ආනිසංසවග්ග: 6.2.5.3-6.2.5.5 සූත්‍ර 3 කි, පි.272, EAN:6: 98.3 Impermanent, p.363.
▼වෙනත් මූලාශ්‍ර: **1**. "**The Three Signata: Anicca, Dukkha**, **Anattā"** by Dr. O.H. de A. Wijesekera, BPS: Wheel 20, 2008. **2. "The Three Basic facts of Existence I: Impermanence (Anicca)-Collected Essays**", BPS: Wheel 186-187, 2008. **3**. **"The Three Basic facts of Existence II: Suffering (Dukkha) - Collected Essays**", BPS: Wheel 191-193, 2006. **4**. **"The Three Basic facts of Existence III: Egolessness (Anattā) - Collected Essays**", BPS:Wheel 202-204, 2008. **5**. "**Anattā and Nibbāna Egolessness and Deliverance"** by Nyanaponika Thera, BPS: Wheel 11, 2008.
▲ **අනිච්ච:** පාලි: **අනිච්චං-** Impermanent: අනිච්ච හෙවත් අනිත්‍යබව-වෙනස්වීයනබව-විපරිනාමය, බුදුදහමේ ත්‍රිලක්‍ෂණය යනු, ධර්මයේ මූලික සිද්ධාන්තයේ පළමු ධර්මතාවය ය.
▼**අනිච්චබව අවබෝධය විමුක්තිය පිණිසය**: බුදුන් වහන්සේ පෙන්වා ඇත්තේ:රූපය, වේදනාව, සංඥාව, සංස්කාර හා විඥානය (පංච උපාදාන ස්කන්ධයම) අනිත්‍ය බවය. ඒබව නුවණින් අවබෝධ කරගත් ආරිය ශ්‍රාවකයා ඒ සියල්ල ගැන කලකිරේ, කලකිරීම නිසා ඒවාට නොඇලේ. නොඇලීම නිසා- විරාගය නිසා (කෙළෙසුන්ගෙන්) මිදෙයි. එවිට, මිදුනබව (විමුක්තිය) මෙසේ නුවණින් අවබෝධ කරගනී (ප්‍රත්‍යවෙක්ෂා ඥානයෙන්): 'ජාතිය අහවරවිය, මග බඹසර වැස නිමාකර ගතිමි, (නිවන) පිණිස කලයුතු හැම කරනලදී. රහත්බව පිණිස වෙනත් කළයුතු දෙයක් නොමැත'. **"රූපං භික්ඛවෙ අනිච්චං, වේදනා... සඤ්ඤා... සඞ්ඛාරා... විඤ්ඤාණං අනිච්චං. එවං පස්සං ...සුතවා අරියසාවකො රූපස්මිම්පි... වෙදනායපි... සඤ්ඤායපි... සඞ්ඛාරෙසුපි... විඤ්ඤාණස්මිම්පි නිබ්බින්දති. නිබ්බින්දං විරජ්ජති, විරාගා විමුච්චති, විමුත්තස්මිං විමුත්තමිති ඤාණං හොති: ඛීණා ජාති වුසිතං බ්‍රහ්මචරියං කතං කරණීයං නාපරං ඉත්ථත්තායාති පජානාතීති"**. **මූලාශ්‍ර:** සංයු.නි: ( 4 ): සළායතනසංයුත්ත: අනිත්‍ය වග්ග:

1.1.2.1.අනිත්‍ය සූත්‍රය, පි. 66, ESN:35: Salayatanasamyutta: 12.1 Impermanent, p. 1018.

▲ **අනිච්ච සංඥාව**: පාලි: **අනිච්චසඤ්ඤා- ** perception of impermanence: අනිච්ච සංඥාව ලෙසින් පෙන්වා ඇත්තේ සියලු ලෝකයේම සකස්වූ ධර්-මතා වෙනස්වී නැතිවී යන ස්වභාවය මෙනෙහි කිරීමය. නිවන සාක්ෂාත් කර ගැනීමට උපකාර කරගන්නා භාවනා ක්‍රමයකි. **බලන්න**: දස සංඥා.

▼**අනිච්ච සංඥාව මෙනෙහි කිරීම**:**බලන්න**: භාවනා

▼**අනිච්ච සංඥාව** බහුලව වඩා ගැනීමෙන් සියලු කාම රාග, සියලු රූපරාග, සියලු භවරාග, සියලු අවිද්‍යාව, සියලු අස්මිමානය ප්‍රහීණය වේ. **සටහන:** කාම රාගය, අනාගාමී බව ලැබීමෙන් පහවේ, භවරාග, අවිද්‍යාව, අස්මිමානය අරහත්වය මගින් පහවේ. **බලන්න**: ESN: note: 215, p. 1198. **මූලාශ්‍ර:** සංයු.නි: ( 3 ): ඛන්ධසංයුත්ත: 1.2.5.10 අනිච්චසංඥා සූත්‍රය, පි. 294, ESN:22: Khandasamyutta: 102.10 Perception of Impermanence, p. 1093.

▲ **අනිච්චානුපස්සි**- Mindful reflection of Impermanent
මෙය අනුසති භාවනාවකි. සැදැහැයෙන් පැවිදිවූ කුල පුත්‍රයන්ට සුදුසු භාවනාවක් යයි බුදුන් වහන්සේ වදාළහ. පංච උපාදානස්කන්ධයේ අනිච්චබව මෙනෙහි කරන භාවනාවකි, එම අනුසතිය යහපත් ලෙස දියුණු කරගැනීමෙන් සියලු දුකෙන් මිදේ යයි මෙහි පෙන්වා ඇත. **මූලාශ්‍රය**: සංයු.නි: (3) ඛන්ධසංයුත්ත:කුක්කුලවග්ග: 1.3.4.12 අනිච්චානුපස්සි සූත්‍රය, පි.348.

▼ **අනිච්චානුපස්සි** වඩන ලෝකයට ආහුණෙයා, පාහුණෙයා වන උතුම් පුද්ගලයන් 7 ක් ගැන මෙහි විස්තර කර ඇත. **මූලාශ්‍රය**:අංගු.නි: (4) 7 නිපාත:අනුසයවග්ග: 7.1.2.6 අනිච්චානුපස්සි සූත්‍රය, පි.318.

▲ **අනිකේතසාරි-** Roam without an abode: අනිකේතසාරි යනු ගෙයක් නොමැතිව, කෙළෙස් නොමැතිව හැසිරෙන මුණිවරයා. බුදුන් වහන්සේ හඳුන්වන පදයකි. මහාකච්චාන තෙරුන් මෙසේ වදාළහ: “ කෙනෙක් කෙසේනම් නිවසේ නො හැසිරෙන්නා වේද? (අනිකේතසාරි)- අභ්‍යන්තර සලායතන මගින් බාහිර අරමුණු (නිමිති) අල්වානොගෙන, සියළු කාම තණ්හා ප්‍රහිනය කළ භාග්‍යවතුන් වහන්සේ අනිකේතසාරීවේ” **මූලාශ්‍ර:** සංයු.නි: ( 3): ඛන්ධසංයුත්ත: හාලිද්දිකානි සූත්‍රය, පි. 42, ESN: 22: Kahandasamytta, 3.3 Haliddkani, p. 1011.

▲ **අනීතික ධම්ම**-Anitika Dhamma: අනීතික ලෙසින් පෙන්වා ඇත්තේ නිදුක්බවය. අනීතික ධම්ම නම් නිදුක්ස්වභාවය ඇති දහමය, එනම් නිවනය, නිවන් මගය. **මූලාශ්‍රය**:සංයු.නි: (4) සළායතනවග්ග: අසංඛත සංයුත්ත: 9.2 අනීතික හා අනීතික ධම්ම සූත්‍ර, පි.688.

▲ **අනිදර්ශන විඥානය**- Non manefestive consciousness: අනිදර්ශන විඥානය යනු විඥානය නො පිහිටන තැනය, විඥානය දැකීමට නොහැකි තැනය. එනම් නිවනය. **බලන්න**: නිවන.

▲ **අනිමිත්ත චෙතෝවිමුක්තිය:** පාලි: **අනිමිත්තා චෙතොවිමුත්ති**- mark less liberation of the mind: අනිමිත්ත චෙතෝ විමුක්තිය නිස්සාරණිය ධාතු 6 න් එකකි. අනිමිත්ත යනු නිමිති අල්වා නොගැනීමය. එනම්, විඥානය නිමිතිකරා ඇදීයාමෙන් මුදවා ගැනීමය. නිවන ලබා ගැනීමට

පිහිටවන විමොක්ක දොරටු 3 න් එකකි, චේතෝවිමුක්තියකි. **බලන්න:** නිස්සාරණිය ධාතු, විමොක්ක, චේතෝවිමුක්තිය. **සටහන**: අටුවාවට අනුව මේ විමුක්තිය බලවත් විදර්ශනාවකි (බල විපසසනා). මේ විමුක්තිය ඇතිවිට රාග නිමිති, රූප නිමිති, නිත්‍ය නිමිති (ස්ථිර) (the marks of lust, the marks of form, and the marks of permanence etc.) විඥානය විසින් අල්ලා නොගන්නා නිසා, එය, අරහත්ඵලය ලැබීමය යි ද (අරහත්ඵලසමාපත්ති) පවසයි . **බලන්න**:EAN: note: 1266, p. 643.
▼**සියලු නිමිති (**රූප නිමිති ආදී**)** අල්වා නොගැනීම අනිමිත්ත චෙතෝ විමුක්තිය ය : **නිස්සරණං හෙතං... සබ්බ නිමිත්තා නං යදිදං අනිමිත්තා චෙතොවිමුත්ති ති**- It is the escape from all marks, namely, the markless liberation of the mind). **මූලාශ්‍ර:** අංගු.නි: (4 ): 6 නිපාතය: 6.1.2.3 නිස්සාරණිය සූත්‍රය, පි. 40, EAN:6: 13.3 Escape, p. 321.
▲**අනිමිත්ත සමාධිය**- Sign less concentration: අනිමිත්ත සමාධිය, නිවනට මගකි. **බලන්න:** විමොක්ක දොරටු තුන. **මූලාශ්‍ර:** සංයු.නි: ( 4 ): අසංඛතසංයුත්ත:9.2.7 අනිමිත්තසමාධි සූත්‍රය, පි. 667, ESN:43: Asnkathasamyutta: Concentration-vii, p. 1509.
▲ **අනිමිසලෝචන පූජාව** - Animisalochna pujawa: අනිමිස යනු ඇසපිය නොගැසීමය. බුදුන් වහන්සේ, සම්බෝධිය ලබා දෙවන සතියේදී, තමාහට පිහිටවූ බෝධි රුක දෙස බලා කෘතඥතාව දක්වමින් කළ පූජාව අනිමිස ලොචන පූජාව ලෙසින් හඳුන්වයි. මෙය බෞද්ධයන්ගේ පිළිගැනීමකි. මේ පිළිබඳව සූත්‍ර දේශනාවන්හි සටහනක් නැත. බලන්න: උපග්‍රන්ථය:6, සත්සතිය. **ශබ්දකෝෂ: පා.සිං.ශ:** පි. 60: "අනිමිස ලොචනපූජා: තථාගතයන් වහන්සේ බුදුව දෙවන සතියේහිදී අනිමිස ලෝචනයෙන් කළ බෝධි පූජාව". **සටහන**: පූජ්‍ය නාරද හිමි මෙසේ පවසයි: "මේ ස්ථානයේ අශෝක මහා රජු විසින් 'අනිමිසලෝචන චේතිය' ඉදි කරනලදී. අදද ඒ සෑය එහි දැකිය හැකිය". **බලන්න**: සිංහල දීපවංශය- සම්පාදක: චන්ද්‍රදාස කහඳව ආරච්චි, පි. 31.
▲ **අනිස්සිත සීලය-** Anissitasila: ශිලය නිශ්චිතව නොගෙන, පුරන ලෞකික ලෝකෝත්තර සීලය මීන් අදහස්කරේ. **බලන්න**: ශිලය
▲ **අනිස්සිතෝව විහරති**- Dwell with independent: අනිස්සිතෝව විහරති යනු ලෝකයට ඇති ඇලීම හා ගැටීම නැතිව නිදහස්ව වාසය කිරීම. පරාධිනව නොව, ස්වාධීනව සිටීමය. මගඵල ලැබූ උතුමන්ගේ විහරනයකි. **සටහන්**: * **සතිපට්ඨාන සූත්‍රයේදී** කායානුපස්සනාව ආදී සෑම අනුපස්සනාවක් අවසානයේදීම, යෝගියා " **අනිස්සිතෝව විහරති න ච කිඤ්චි ලෝකේ උපාදියති**" යයි දක්වා ඇත. ** One is *independent* (*anissito*) of the dependencies of craving and views, and *fully quenched* by the quenching of defilements (*kilesaparinibbāna*) **බලන්න**: ESN: note: 27, p. 503. ** ඛු.නි: සුත්තනිපාත: **ද්වතානුපස්සනා සූත්‍රයේ,** මෙය නිවන පිණිස වැඩිය යුතු භාවනාවක් ලෙසින් පෙන්වා ඇත.
▲**අනුකම්පාව**-Compassion: අනුකම්පාව, දයාව-කරුණාව, ලෙසින්ද පෙන්වා ඇත. ආවාසයක වෙසෙන සංඝයා, ගිහියන් පිළිබඳව පස් ආකාරයකින් අනුකම්පාවෙන් කටයුතු කරති: 1) ඔවුන් අධිශිලයෙහි සාමදාන් කරවයි 2) චතුසත්‍ය ධර්ම යෙහි පිහිටවයි 3) ගිලන්ව සිටින්නේ නම් ඔවුන් වෙත එළඹී, සිහිය පිහිටුවා ගැනීමට උපදෙස් දෙයි 4) වෙනත්

පළාත් වලින් වැඩිහිටි සංඝයා පැමිණිවිට එබව ඔවුන්ට දන්වා පින් කරගැනීමට අවස්ථාව සලසා දෙයි 5) ඔවුන් දෙන ප්‍රණීත හෝ අප්‍රණීත බෝජන සතුටින් පිළිගනී. **මූලාශ්‍ර:**අංගු.නි: ( 3 ): 5 නිපාත: 5.5.4.5 අනුකම්පක සූත්‍රය, පි. 450, EAN: 5: 235.5, Compassionate, p. 309.

▲**අනුධර්ම**- Anudhamma: ධම්මානුධම්ම පටිපදාවට පිළිපන් සංඝයා, විහරණය කරන දහම අනුධර්ම වේ: පංච උපාදානස්කන්ධය : 1) ගැන නිබ්ද්දාව සහිතව වාසය කිරීම 2) එහි අනිච්ච බව මෙනෙහි කිරීම 3) එහි දුක්බව මෙනෙහි කිරීම 4) එහි අනත්ත බව මෙනෙහි කිරීම. එසේ විහරණය කිරීමෙන් යළි උපත නවතා, දුකෙන් මිදිය හැකිය යි බුදුන් වහන්සේ පෙන්වා ඇත. **මූලාශ්‍ර:** සංයු.නි: ( 3 ): ඛන්ධසංයුත්ත: අනුධම්ම සූත්‍ර 4 කි, පි. 97, ESN: 22: Khandasamyutta:39.7 In accordance with the Dhamma-4 suttas, p. 1029.

▲**අනුවණ-** Unwise: අනුවණ ලෙසින් පෙන්වා ඇත්තේ, ධර්මය අවබෝධ කරගැනීමට ප්‍රඥාව නැතිබවය. අනුවණ කම අකුසල ඇතිකිරීමට හේතුවේ. අනුවණ පුද්ගලයා, බාලයා ලෙසින්ද හඳුන්වයි. **බලන්න**: අකුසල, ප්‍රඥාව, බාලයා.

▲**අනුසතිය:** පාලි: **අනුස්සති** -Recollections: යම් දහම් කරුණක් පිලිබඳ සිහිකිරීම, නිතර නිතර මතකයේ තබා ගැනීම, ආවර්ජනය අනුසතියය. ආධ්‍යාත්මික මග වඩා ගැනීමට උපකාරිවේ. අනුසති භාවනා නිවන පිණිස පවතී. **බලන්න**: අනුසති භාවනා. **ශබ්දකෝෂ : පා.සි.ශ**: පි.72: "**අනුස්සති**: සිහිකිරීම, ආවර්ජනා කිරීම, **අනුසසරණ**: මෙනෙහිකිරීම" **B. D**: p. 17: "Recollection, contemplation, meditation".**P.T. S**: p.113: "Anussati: remembrance, recollection, thinking, mindfulness".

▼**ගිහි ශ්‍රාවකයන්** අනුසති දහම් සිහිපත්කරමින් වාසය කිරීම යහපත්යයි බුදුන් වහන්සේ වදාළහ. අනුසති වඩන විට සිත කෙළෙස්වලින් මිදී සමනයවේ. පෘතග්ජන ලෝකයා සමග සමසිත් ඇතිව, නිදුකින් වාසය කිරීමට හැකියාව ලැබේ. **මූලාශ්‍ර**: අංගු.නි: (6):11නිපාත: 2 අනුසති වගග: 11.2.1, මහානාම සූත්‍රය, 11.2.2 දුතිය මහානාම සූත්‍රය, පි.645-654 හා 11.2.3 නන්දිය සූත්‍රය,පි.658, EAN- 11: Recollection, 11.1 Mahanama, 12.1 Mahanama (2), p.570, 13.3. Nandiya, p.571, අංගු.නි: (1) 16**:** එකධම්මපාලිය, පි.100, EAN: 1: One thing, p. 47.

▼ **වෙනත් මූලාශ්‍ර: 1**. "නැවත නැවත සිහිකිරීම අනුස්සතිවේ. අනුස්සති දස වදැරුම්වේ. බුද්ධානුස්සතිය ...උපසමානුසතිය ආදීවූ: **සද්ධර්ම කෝෂය,** පි. 232.

▲**අනුසති භාවනා-**Anussathi bhavana: දහම් අරමුණක් පිළිබඳව සිත එකඟකර, ඒ අනුව සමාධිය වඩා ගැනීම අනුසති භාවනාවය**.** අනුසති භාවනා වැඩීම නිවනට මගය යි බුදුන් වහන්සේ වදාළහ. **සටහන්: *** විවිධ අනුසති භාවනා: 1 බුද්ධානු සතිය, 2 ධම්මානු සතිය, 3 සංඝානු සතිය,4 ශිලානු සතිය, 5 චාගානු සතිය, 6 දේවතානු සතිය, 7 කලණමිතුරු ගුණ සිහිපත්කිරීම,8 ආනාපාන සතිය, 9 මරණ සතිය, 10 අසුභානු සතිය, 11උපසමානුසතිය, 12 කායගතා සතිය. **බලන්න**: භාවනා. ** 1-6 දක්වා අනුසති පිළිබඳව: **බලන්න:** අංගු.නි: (4): 6 නිපාත: ආහුනෙය්‍ය වග්ග හා අනුත්තරිය වග්ග:අනුස්සතිට්ඨාන සූත්‍රය.

▲**අනුසය:** පාලි: **අනුසයා**- Underlying Tendencies -latent tendency

අනුසය, ප්‍රවණතා, නැඹුරුකම්, නිදිගත් කෙලෙස් (latent dispositions, Inclinations predispositions, sleeping along) ලෙසින්ද හඳුන්වයි. ධර්-මයේ අනුසය ලෙසින් පෙන්වා ඇත්තේ සිතට යටින් ඇති, කෙළෙස්වලට ඇති නැඹුරුකම් වලටය. සිතයට නිදාගෙන සිටින ප්‍රවණතාවන්ටය- කෙළෙස්වලටය. (which conveys a sense of something that "lies latent", a dormant disposition or proclivity of the mind). අපගේ සිතතුළ අප්‍රකටව- යටපත්ව, නැත්නම් නිදාගෙන සිටින කෙළෙස් අනුසය වේ. නිදසුනක් ලෙසින් පෙන්වා ඇත්තේ අළුයට ඇති ගිණි අඟුරුමෙන් අනුසය සිත තුළ අකර්-මන්‍යව සිටියත්, යම් සුළඟක් ඇතිවූවිට ගිනි පුපුරු ඇතිවී, ගිනිදැල් මතුවී ඉහලට නගින සේ, අවස්ථාව ඇතිවූවිට අනුසය එළියට පැමිණෙන බවය. නැවත නැවත එම කෙළෙස් මතුවී සිතේ පැලපදියම් වේ. මේවා අනුසය ධර්මතා වන්නේ එමගින් යලි උපතක් පිණිස කරුණු සකස් කර දෙන නිසාය. **ශබ්දකෝෂ : පා.සි.ශ**: පි.73: '**අනුසය**: සත්ත්වයන්ගේ සිත්තුළ නැවත නැවත උපදනා කෙලෙස් සත්දෙන...'. **B.D**: p. 42: '**Underlying Tendencies**: 7 proclivities, inclinations or tendencies…'. **P.T.S**: p. 111: '**Underlying Tendencies**: the persistence of a dormant or latent disposition, predisposition…'

▼**බුදුන්වහන්සේ** අනුසය ධම්ම හතක් (**සප්ත අනුසය** ) පෙන්වා වදාළේ ආධ්‍යාත්මික ජීවිතයේ -බ්‍රහ්මචරියාවේ පරමාර්ථය නම් අනුසය ප්‍රහාණය කිරීමය-සහමුලින්ම උපුටා දැමීම බවය: **"...සත්තන්නං භික්ඛවෙ අනුසයානං පහානාය සමුච්ඡේදාය බ්‍රහමචරියං වුසසති. කතමෙ සත්තන්නං: කාමරාගානුසයො, පටිඝානුසයො,දිට්ඨානුසයො, විචිකිච්ඡානුසයො, මානානුසයො, භවරාගානුසයො, අවිජ්ජානුසයො..."**. **1) කාමරාගානුසය-** kāmarāgānusayo : කාම රාගය පිළිබඳව සිත යට ඇති ආශාව (underlying tendency to sensual desire). පංචකාමයට සිත යටවී යාම කාමරාගානුසය ඇතිවීමට මුලිකහේතුව වේ. **2) පටිඝානුසය -** paṭighānusayo : ව්‍යාපාදය- තරහ ගැන සිත යට ඇති කැමැත්ත (underlying tendency to aversion). කිසියම් දෙයක්, පුද්ගලයෙක් ගැන අකමැත්තක්, ගැටීමක් ඇතිවීම පටිඝානුසයට මුල්වේ. **3) දිට්ඨානුසය -** diṭṭhānusayo : වැරදි දිට්ඨි (මිථ්‍යාදිට්ඨි) පිළිබඳව යටි සිතේ රැඳි පවතින මත (underlying tendency to wrong views). සක්කායදිට්ඨිය නිසා සිතේ ඇති කර ගන්නා විවිධ මත නිසා දිට්ඨානුසය ඇතිවේ. **4) විචිකිච්ඡානුසය**- vicikicchānusayo : ධර්-මතා ගැන යටි සිතේ රැඳි ඇති සැක (underlying tendency to doubt-uncertainty) බුද්ධ ධම්ම සංඝ ආදීවූ අටස්ථාන පිලිබඳ විශ්වාසය නොමැතිවීම විචිකිච්ඡානුසයට පදනමය. **5) මානානුසය**-mānānusayo: මානය-මමත්වය ගැන යටි සිතේ රැඳි පවතින අදහස්. (underlying tendency to conceit). මානය, අහංකාරය (pride) ලෙසින්ද පෙන්වා ඇත. **6) භවරාගානුසය**- bhavarāgānusayo**:** යළි යළි ඉපදීමට යටි සිතේ ඇති ආශාව. (underlying tendency to passion for continuation). එනම් කාමභවය,රූපභවය හා අරූප භවයන්හි යළි උපත ලබාගැනීමට ඇති ආශාව භවරාගානුසයට මුලික හේතුවවේ. **7) අවිජ්ජානුසය-** avijjānusayo : (අවිද්‍යාව**)** චතුසත්‍ය නොදැනීම පිළිබඳව යටි සිතේ රැඳි

පවතින අදහස් (underlying tendency to ignorance). ආරිය සත්‍ය - චතුරාර්-ය සත්‍යය ගැන ඇති අනවබෝධය අවිජ්ජානුසයට පදනමවේ. බුදුන් වහන්සේ වදාළේ තල්ගසේ මුල, සහමුලින්ම සිඳ දමා විනාශ කරණ ලෙසින් සියලු අනුසය ප්‍රහාණය කල භික්ෂුව: තණ්හාව සිඳ, සංයෝජන ගලවා, මානය සහමුලින්ම නැතිකර, සසර දුකින් මිදුන උතුමෙක් බවය: (තල්ගසේ මුල සිඳීමේ උපමාව). **"... යතො ච ඛො භික්ඛවෙ, භික්ඛුනො කාමරාගානුසයො... පටිඝානුසයො ... දිට්ඨානුසයො... විචිකිච්ඡානුසයො, මානානුසයො, භවරාගානුසයො, අවිජ්ජානුසයො පහීනො හොති... උච්ඡින්නමූලො තාලාවත්ථුකතො අනභාවකතො ආයතිං අනුප්පාදධම්මො, අයං වුච්චති භික්ඛවෙ, භික්ඛු නිරනුසයො අච්ඡෙච්ඡි තණ්හං වාවත්තයි සඤ්ඤොජනං සම්මා මානාභිසමයා අන්තමකාසි දුක්ඛස්සාති..."**
**මූලාශ්‍ර**: අංගු.නි: (4 ):7 නිපාත: 7.1.2.1. අනුසය සූත්‍රය හා අනුසය පහාන සූත්‍රය, පි. 312, EAN:7: 11.1 and 12.2. Underlying tendencies, p. 371.

▼**අනුසය පෝෂණයවීම: සලායතන මගින්** අල්ලා ගන්නා බාහිර අරමුණු පිළිබඳව කෙනෙක් තුල අකුසල සිතිවිලි හටගත් විට, ඒවා ගැන සතුටට පත් වේ නම්, ඒ ගැන නිතරම සිත යොමු කරයි නම් (ප්‍රපංච කරයි නම්), එම සිතුවිලි දිගින් දිගටම පවත්වාගෙන යන්නේ නම්, එමගින් අනුසය ධර්-මතා ඇතිවී විපුල බවට පත්වේ. අනුසය යනු කෙලෙස් ආරම්භවන මූලික අවස්ථාවය. ඒවා සිතේ දැඩිව අල්වාගෙන කටයුතු කිරීම නිසා ඒවා ආසව (ආස්‍රව-ආශ්‍රව - Taints) බවට පත්වේ. අයෝනිසෝමනසිකාරයෙන් කටයුතු කිරීම අනුසය ඇතිවීමට හේතුවේ. දහම් මග පිළිබඳව සිහි නුවණ ඇතිව කටයුතු කරන්නේ නම් (යෝනිසෝමනසිකාරයෙන්), ඉන්ද්‍රිය සංවරය ඇතිව සිටින්නේ නම් අනුසය ඇතිවීම වලකා ගැනීම පහසුවේ. දහම් මග නො වඩන්නේ නම්, අනුසය ධර්-මතා, ආසව බවට පත්වී නිවන දුර කරයි. **මූලාශ්‍ර**: ම.නි : (1): 1.2.8 මධුපිණ්ඩික සූත්‍රය**,** පි. 291, EMN:18 Madhupiṇḍika Sutta, p. 196.

▼ **බුදුන් වහන්සේ පෙන්වා** වදාළේ ළදරුවන් තුළ පවා අනුසය පවතින බවය. කුඩා ළමයෙක් හට පංච උපාදානස්කන්ධය ගැන නිසි අවබෝධය නොමැති වුවත්, සක්කාය දිට්ඨිය සිත තුළ අනුසය ලෙසින් රැඳී පවතී. එසේම ළදරුවෙකුට දහම ගැන දැනුමක් නොමැති වුවත්, විචිකිච්ඡාව අනුසය සිත යට ඇත. අනුසය ධර්මය පිළිබඳව පැහැදිලි අවබෝධය ලබාගැනීම මගින් ඒවා දුරු කරගැනීම පහසුවේ. **මූලාශ්‍ර:** ම.නි:(2 ): 2.2.4. මහා මාලුංක්‍යපුත්ත සූත්‍රය,පි.180, EMN: 64-The Greater Discourse to Mālunkyāputta, p. 503.

▼ **බුදුන් වහන්සේ වදාළේ** සප්ත අනුසයන් පිලිබඳ විශේෂ ඥානය- අභිඤ්ඤාය (direct knowledge) ලබාගැනීම පිණිස, පිරිසිඳ දැනගැනීම පිණිස- පරිඤ්ඤාය (full understanding), මුළුමනින්ම විනාශ කර දැමීම පිණිස-පරික්ඛයාය (utter destruction), දුරුකිරීම පිණිස- පහානාය (abandon) ආරිය අටමග වැඩිය යුතුබවය. ඒ කෙසේද යත් මේ සසුනේ මහණ විවේකනිස්සිත, විරාගනිස්සිත, නිරොධනිස්සිත, වොස්සග්ගපරිනාමි කොට සම්මා දිට්ඨිය... ආදී වශයෙන් ආරිය අටමග වඩා, අනුසය ධර්මතා පහකර ගන්නේය: **"...ඉධ භික්ඛවෙ භික්ඛු සම්මාදිට්ඨිං...සම්මාසමාධිං භාවෙති විවෙකනිස්සිතං විරාගනිස්සිතං නිරොධනිස්සිතං වොස්සග්ග පරිණාමිං. ඉමෙසං ඛො භික්ඛවෙ, සත්තන්නං අනුසයානං අභිඤ්ඤාය ...**

**පරිඤ්ඤාය... පරික්ඛයාය...පහානාය අයං අරියො අට්ඨඞ්ගිකො මග්ගො භාවෙතබ්බොති" .මූලාශ්‍ර**:සං.යු.නි: (5-1): මහාවග්ග: මග්ග සංයුත්ත:ඕඝ වග්ග-1.16 අනුසය සූත්‍රය, පි.162, ESN: 45: Maggasamyutta, Floods: 175-5 Underlying tendencies, p. 1722.

▼ **බුදුසසුනේ මහණවී,** බඹසර විසීමේ අරමුණ, සියලු අනුසය ධම්ම ප්‍රහාණය කර නිවන් මග සාක්ෂාත් කරගැනීම සඳහා යයි බුදුන් වහන්සේ වදාළහ. අනුසය ප්‍රහාණය කිරීම පිණිස ආරිය අටමග වර්ධනය කරගත යුතුවේ. **මූලාශ්‍ර:** බසං.යු.නි: (5-1): මහාවග්ග: මගග සංයුත්තය: 1.5.3 අනුසය සූත්‍රය, පි.72, ESN: 45: Maggasamyutta: 42.2 -Uprooting underlying tendencies sutta, p. 1651.

▼**කායගතා සතිය** වඩාගැනීමෙන්, විපුල කරගැනීමෙන් අනුසය ධර්ම සහමුලින්ම ඝාතනයවේ යයි බුදුන් වහන්සේ වදාළහ. **බලන්න**: කායගතා සතියේ ප්‍රතිලාභ. **මූලාශ්‍ර:** අං.ගු.නි: (1 ): 1 නිපාත: කායගතාසති වග්ග සූත්‍ර, පි. 125, EAN:1: Mindfulness Directed to the Body, p.52.

▼ **වෙනත් මූලාශ්‍ර: 1**. "...සිහිය හා විරිය නැතිව, ආයතන හයෙන් ගන්නා අරමුණු පිළිබඳව අයෝනිසෝ මනසිකාරයෙන් කටයුතුකිරිම නිසා අනුසය ධම්ම වර්ධනය වී, රාගය, දෝසය හා මානය ලෙසින් ප්‍රකට වේ. සක්කාය දිට්ඨිය ප්‍රහාණය වීමෙන් දිට්ඨානුසයත්, විචිකිච්ඡානුසයත් ප්‍රහාණය වෙයි. රාගානුසය හා පටිඝානුසය, අනාගාමී ඵලයට පත් වීමෙන් ප්‍රහාණය වෙයි. මානානුසය, භව- රාගානුසය සහ අවිජ්ජානුසය සම්පූර්ණයෙන් ප්‍රහාණය වන්නේ, අරහත් ඵලයට පත් වීමෙනි".
**"දුරු කළ යුතු අනුසස්, කෙලෙස්"** :අන්තර්ජාල ලිපිය:_පොතුහැර විපස්සී හිමි: බුදුසරණ අන්තර්ජාල කලාපය, 17.5.2009 https://www.budusarana.lk/budusarana/2009/05/17/tmp.asp?ID=vision02. **2.** **'**අනුසය නම් බලවත් ලෙස සිත්හි යටපත් ව පවතින කෙලෙස් ය. මේ කෙලෙස් අශ්‍රැතවත් පෘතග්ජන පුද්ගලයන් හා සමඟ භවයපුරා ම ගමන් කරනවා. ඉන් අදහස් වන්නේ කුමක් ද? සියලු කෙලෙසුන් නො නැසූ පුද්ගලයෙක් නම් චුතියෙන් අනතුරුව පටි සන්ධියක් ලබනවා. ඒ පටිසන්ධිය ලැබීම හඳුන්වන්නේ ගන්ධබ්බයාගේ පැමිණීම ලෙසයි. එසේ නැතිනම් පටිසන්ධි විඤ්ඤාණයේ පහළවීම ලෙසයි. මේ පටිසන්ධි විඤ්ඤාණය අලුත් ස්කන්ධ පංචකයක් හෝ පුංජයක් සකස් කිරීමට මූලාරම්භ වෙනවා. උපතක් හැටියට හඳුන්වන්නේ එයයි. මෙන්න මේ පටිසන්ධි විඤ්ඤාණය නැවත උපතක් ලබාදීමට හේතුවෙන අතර ඒ හා සමඟින් ම මේ අනුසය ධර්මයන්ගේ පැවැත්මක් එහි පවතිනවා. බලවත් ලෙස යටපත් වී තිබෙන මේ කෙලෙස් හඳුන්වන්නේ නිදිගත් කෙලෙස් හැටියටයි. ඉන් අදහස් කරන්නේ කුමක් ද? බලවත් ලෙස කෙලෙස් යටපත් වී පවතින නිසා සම්මතය අනුව යම් කෙනෙක් යහපත් වූ පුද්ගලයෙක් හැටියට හැසිරිය හැකියි. එනමුත් අර අනුසය ධර්ම නම් වූ කෙලෙස් බලවත් ලෙස යටපත්ව සිතෙහි පැවතිය හැකිය...' **'අනුසය ධර්මය'** :අන්තර්ජාල ලිපිය: මිරිස්සේ ධම්මික නාහිමි: බුදුසරණ අන්තර්ජාල කලාපය, 12.5.2019 https://www.budusarana.lk/budusarana/2019/05/12/tmp.asp?ID=vision04: **3**. **Underlying tendencies':** An article An article by Bhikkhu Anālayo, 2018,

https://www.buddhistinquiry.org/article/the-underlying-tendencies/ **4.** '**කෙළෙස් එක්දහස් පන්සියය**': සප්තඅනුසය විස්තරය,පි.258: :රේරුකානේ චන්දවිමල මහනාහිමි, 1973.
**5.** "**අනුසයෝ** යනු දුරුනොවීමෙන් සත්‍වයන්ගේ සිත් සතන්හි නැවත නැවත උපදනා කාමරාගය, පටිඝය, මානය, දිට්ඨිය, විචිකිච්ඡාය, භවරාගය, අවිජ්ජාය යන මේ කෙලේශයෝ 7 දෙනාය: **ශ්‍රී සද්ධර්ම කෝෂය**, පි. 234.

▲ **අනුසෝතගාමි** : පාලි: **අනුසොතගාමි** -Goes along with the stream
අනුසෝතගාමි යනු සසර ප්‍රවාහයට අනුව යෑමය. එසේ යන පුද්ගලයා අනුසෝතගාමිය- සසර ගමන් කරන තැනැත්තාය.
▼ **බුදුන් වහන්සේ අනුසෝතගාමි** පුද්ගලයා මෙසේ හඳුන්වා ඇත: මෙලොව පුද්ගලයෙක් වස්තුකාමය සේවනය කරයි. එමගින් පස්පව් ආදී පාප ක්‍රියා ද කරයි, ඔහු අනුසෝතගාමිය: **"කතමො ච භික්ඛවෙ, අනුසොතගාමි පුග්ගලො? ඉධ භික්ඛවෙ එකච්චො පුග්ගලො කාමෙ ච පටිසෙවති, පාපඤ්ච කම්මං කරොති අයං වුච්චති ... අනුසොතගාමි පුග්ගලො"**. ( Here, someone indulges in sensual pleasures and performs bad deeds. This is called the person who goes along with the stream) **සටහන**: මෙහිදී පෙන්වා ඇත්තේ ධර්මය නොදත් අසත්පුරුෂයෙක් ගැනය. **මූලාශ්‍ර:** අංගු.නි: ( 2 ): 4 නිපාත: 4.1.1.5 අනුසෝත සූත්‍රය, පි. 34, EAN:4: 5.5 Along with the Stream, p. 148.

▲ **අනුත්තර ධම්ම**Unsurpassed Dhamma: බුදුන් වහන්සේ අනුත්තර ධම්ම (උත්රිතර දහම) මෙසේ පෙන්වා ඇත: 1) **දර්ශන අනුත්තර** (unsurpassed sight): බුදුන් හා බුද්ධ ශ්‍රාවකයන් දැකීමට ලැබීම. 2) **ශ්‍රවණ අනුත්තර** (unsurpassed hearing): දහම ශ්‍රවණය කිරීමට ලැබීම. 3) **ලාභ අනුත්තර** (unsurpassed gain): ශ්‍රද්ධාව ඇතිවීමෙන් නිවන් මග ලබාගැනීමට හැකිවීම 4) **සික්ඛා අනුත්තර**- අනුත්තර පුහුණුව (unsurpassed training): නිවන පිණිස ඇති පුහුණුව ලැබීම 5) **පාරිචරියා අනුත්තර**- අනුත්තර සේවය (unsurpassed service): බුදුන් හා බුද්ධ ශ්‍රාවකයන් හට සේවය කිරීමට ලැබීම. 6) **අනුස්සතා අනුත්තර**- අනුත්තර සිහිකිරීම-අනුසතිය (unsurpassed recollection): බුදුන් හා බුද්ධ ශ්‍රාවකයන්, ශ්‍රද්ධාවෙන් සිහිකිරීම. **බලන්න**:අනුසති භාවනා. **මූලාශ්‍ර:** අංගු.නි: ( 4 ): 6 නිපාත: 6.1.3.10 අනුත්තරිය සූත්‍රය, පි. 92, EAN:6: 30.10 Unsurpassed Things, p. 329.

▲**අනුත්තර පුණ්‍යකෙත**-unsurpassed field of merit
අනුත්තර පුණ්‍ය කෙත යනු සංඝයා සතු ගුනයකි. යහපත් ලෙසින් දහම් මග පුහුණු කරන සංඝයාට කරන පුද පූජා සැලකිලි නිසා ලෝකයාට උතුම් යහපත් විපාක ඇතිවේ. මෙහිදී දක්වා ඇති උපමාව: සරු කෙතක වපුරන ධාන්‍ය මගින් සරු අස්වැන්නක් ලැබේ.එ ලෙසින්, සංඝරත්නයට කරන සැලකිලි නිසා ලෝකයාට මහා යහපත ඇතිවේ. **බලන්න**: සංඝගුණ., උපග්‍රන්ථය:5. **මූලාශ්‍ර:** අංගු.නි: (6): 11 නිපාත: අනුසතිවග්ග: 11.2.1 & 11.2.2 මහානාම සූත්‍ර, පි. 654, 11.2.3 නන්දිය සූත්‍රය, පි.658, EAN: 11: Recollection: 11.1 Mahanama, 12.1 Mahanama (2), p.570, 13.3. Nandiya, p.571.

▲**අනුත්තර යොගකේෂමය** -Unsurpassed security from bondage

අනුත්තර යොගක්ෂේමය යනු නිවනය. සියලු යොග-බැඳීම් වලින් මිදී රැකවරණය ඇති ස්ථානයය: නිවනය.පංචවිමුක්ති ආයතන මගින්, ආසව පහකළ භික්ෂුව අනුත්තර යොගක්ෂේමය ලබන බව මෙහි පෙන්වා ඇත. **මූලාශ්‍ර**:අංගු.නි: ( 3 ): 5 නිපාත: 5.1.3.6 විමුත්තායතාන සූත්‍රය**,** පි. 54, EAN:5: 26.6 Liberation, p.243.

▲ **අනුසාසන ප්‍රාතිහාර්ය**: පාලි: **අනුසාසනිපාටිහාරියං**-Miracle of instruction: දහම උගන්වනවිට, එම උපදෙස් ඒ අයුරින්ම පිළිපැද සසර දුකින් මිදී විමුක්තිය ලැබීම අනුශාසන ප්‍රාතිහාර්ය යි බුදුන්වහන්සේ වදාළහ**. බලන්න**: ප්‍රාතිහාර්ය.

▲ **අනුත්පාදයිතව්‍ය ධර්මය** : පාලි: **ධම්මො න උප්පාදෙතබ්බො-** Dhamma not to be aroused: ආධ්‍යාත්මික වර්ධනයට බාධා කරන ධම්ම අනුත්පාදයිතව්‍ය ධර්මය ය.මේවා උපදවා නොගතයුතු දහමය, එනම් දස අකුසලයය. **බලන්න**: අවදිකළයුතු ධර්ම හා අවදිනොකළයුතු ධර්ම, උත්පාදයිතව්‍ය ධර්ම. **මූලාශ්‍ර**: අංගු.නි:( 6 ):10 නිපාත 4.අරියමග්ග වග්ග: 10.4.4.5. උප්පාදෙතබ්බ ධම්ම සූත්‍රය.පි. 538, EAN: 10: IV Noble Path, 193, p.556.

▲**අනුපුබ්බ සංකාරනිරෝධය**-successive cessation of formations ජානසමාපත්ති ලබා ක්‍රමයෙන්-අනුපිළිවෙලින් නිරෝධය ලබාගැනීමේ පිළිවෙත මින් අදහස්වේ. **බලන්න**: සංකාර අනුපූර්ව නිරෝධය.

▲**අනුපුබ්බ කථා-අනුපූර්ව කථා**: පාලි**: අනුපුබ්බිකථං-** Anupubba katha-Gradual instructions: බුදුන් වහන්සේ ලෝකයාට දහම් දේශනා කරණ පිළිවෙල අනුපූර්ව කථාව- පිළිවෙල කථාව ලෙසින් පෙන්වා ඇත. ඒ ඒ පුද්ගලයන්ගේ ඉන්ද්‍රිය ධර්ම වැඩි ඇති ආකාරය අනුව-ඔවුන්ට ධර්මය අවබෝධය කරගැනීමට ඇති ශක්තිය හා නුවණ අනුව, විවිධාකාර ලෙසින් බුදුන් වහන්සේ දහම වදාළ බව බොහෝ සූත්‍රදේශනාවල පෙන්වා ඇත.

▼**යසකුලපුත්** හට ධර්මය අනුපූර්ව ලෙසින් දේශනා කිරීම: **"...එකමන්තං නිසින්නස්ස ඛො යසස්ස කුලපුත්තස්ස භගවා ආනුපුබ්බිකථං කථෙසි. සෙය්‍යථීදං: දානකථං සීලකථං සග්ගකථං කාමානං ආදීනවං ඔකාරං සංකිලෙසං නෙක්ඛම්මෙ ආනිසංසං පකාසෙසි. යදා භගවා අඤ්ඤාසි යසං කුලපුත්ත. කල්ලචිත්තං මුදුචිත්තං විනීවරණචිත්තං උදග්ගචිත්තං පසන්නචිත්තං, අථ යා බුද්ධානං සාමුක්කංසිකා ධම්මදෙසනා තං පකාසෙසි- දුක්ඛං සමුදයං නිරොධං මග්ගං. සෙය්‍යථාපි නාම සුද්ධං වත්ථං අපගතකාලකං සම්මදෙව රජනං පතිගණ්හෙය්‍ය. එවමෙව යසස්ස කුලපුත්තස්ස තස්මිංයෙව ආසනෙ විරජං වීතමලං ධම්මචක්ඛුං උදපාදි 'යං කිඤ්චි සමුදයධම්මං, සබ්බංතං නිරොධධම්ම' න්ති"**. "...පසෙක හුන්නාවූ යසකුලපුත්‍රයාට භාග්‍යවතුන් වහන්සේ පිළිවෙල කතාව වදාළසේක: එනම්, දාන කතාව, සීල කතාව, ස්වර්ගය කතාව, කාමයන්ගේ දෝසය, ලාමකභාවය, නිසා (සිත) කෙලෙසීමට හේතුවනබව, ගිහිගෙයින් නික්මීමෙහි අනුසස් යන, මේවා ප්‍රකාශ කළසේක. යම් කලෙක භාග්‍යවතුන් වහන්සේ යසකුලපුත්‍රයා හට (කාමච්ඡන්දය පහවීමෙන්) යෝග්‍යවූ සිතක් ඇතිබව, (ව්‍යාපාදය දුරුවීමෙන්) මුදුවූ සිතක් ඇතිබව, (උද්දච්චකුක්කුච්චය දුරුවීමෙන්) නො විසිරුණු සිතක් ඇතිබව, (ථිනමිද්ධය පහ වීමෙන් ) නො හැකුළුනු සිතක් ඇතිබව, (විචිකිච්චාව දුරු

වීමෙන්) නිසැක සිතක්-පහන් සිතක් ඇතිබව දත් සේක් ද, එකල්හි, බුදුවරයන්ගේ තමා ම උසස් බවට පැමිණි යම් දහම් දේශනාවක් වේද, දුක්ඛසත්‍ය, සමුදයසත්‍ය, නිරෝධසත්‍ය, මාර්ග සත්‍ය යන ඒ චතුරාර්ය සත්‍ය ප්‍රකාශ කළසේක. පහවූ කිළුටු ඇති පිරිසිදු වස්ත්‍රයක් මනාසේ සායම් ගන්නා ලෙසින්, යසකුලපුත්‍රයාහට (ඔහු හිඳ සිටි) ඒ අසුනේදීම: 'හටගැනීමේ ස්වභාවය ඇති යම් දෙයක් වේද, ඒ සියල්ල නිරුද්ධ වීමේ ස්වභාවය ඇතය යන රාගාදී රජස් රහිතවූ පහවූ කෙළෙස් මල ඇති දහම්ඇස (සෝතාපත්ති ඥාණය ) පහළ වූයේ ය". **සටහන**: යසකුල පුත්‍ර තෙරුන්ගේ පබ්බජාව මෙහිදී විස්තර කර ඇත. **මූලාශ්‍රය:** වින.පි: මහාවග්ග -1: 8: පි. 110

▼**වෙනත් මූලාශ්‍ර:** 1. "**අනුපූර්ව කතා**: පළමුකොට දන්දීමෙහි අනුසස් ප්‍රකාශ කිරීම, ඒ දාන කතාවට අනතුරුව සිල්සමාදන් වීමේ අනුසස් ප්‍රකාශ කිරීම. සීලකතාවට අනතුරුව ස්වර්ග සම්පත්ති ගැන ප්‍රකාශ කිරීම, අනතුරුව අනිත්‍ය, දුක්ඛ, ආදී වශයෙන් ප්‍රකාශ කිරීම...කාම සම්පත්ති බොහෝ දුක, අදිනව ඇතිබව...ආදීවශයෙන් කාමයේ ආදීනව ද, කාමය නිසා සත්ත්වයන් කෙළෙසන අන්දම ප්‍රකාශකිරීම. අනතුරුව ඊට විපක්‍ෂවූ නන් වැදෑරුම් අනුසස් සිද්ධකරදෙන හෙයින් නෙක්කම්මයෙහි ආනිසංස වර්ණනා කර ප්‍රකාශ කිරීම අනුපූර්ව කතා නම්වේ: **සද්ධර්ම කෝෂය,** පි. 215.

▲ **අනුප්පාද ඥානය:** පාලි: **අනුප්පාදෙ ඤාණං**- Anuppada Ñāṇa- Knowledge of that destructed defilements would not arise again අනුප්පාද ඥානය යනු නැසීගිය කෙළෙස් නැවත ඇති නොවන බව දන්නා නුවණය. මේ නුවණ ලැබෙන්නේ අරහත් ඵලය සාක්ෂාත් වූ විටය. මෙය උත්පාදයිතව්‍ය ධර්මයකි-උපදවාගතයුතු දහමකි. **බලන්න**: උත්පාදයිතව්‍ය ධර්ම. **මූලාශ්‍ර:** දීඝ.නි : (3 ): 11 දසුත්තර සූත්‍රය, පි. 483, EDN: 34: Dasuttara Sutta: Expanding Decades, p. 384.

▲ **අනුපාද පරිනිර්වානය**: පාලි: **අනුපාදා පරිනිබ්බාණං-** Nibbāna through non-clinging: අනුපාද පරිනිර්-වානය ලෙසින් පෙන්වා ඇත්තේ සියලු කෙළෙස් වලින් මිදී, සංයෝජන හැරදමා, උපාදාන වලින් මිදී නිවන සාක්ෂාත් කරගැනීමය. අරහත්වයට පත්වීමය. **බලන්න:** අනුපාදීසේස පරිනිබ්බාන ධාතුව. බුදුන් වහන්සේ මෙසේ වදාළහ: "උපසීවය, අනුපාදාපරිනිර්වාණයෙන් පිරිනිවී ගිය විට රූපාදී ප්‍රමාණයක් නැත, රාගදි යම් ප්‍රමාණයක් ඔහුට නැත, ස්කන්ධ ආදී සියලු ධර්මයන් නැසූවිට හැම වාදපථයෝ ද නසන ලද්දේ වේ". **බලන්න**: උපසිව තෙර. **මූලාශ්‍රය**: ඛු.නි.සුත්තනිපාත: පාරායනවග්ග:වස්තුගාථා: පි,326, 5-6 උපසීවමානවක,පි.348

▼ **කායගතා සතිය වැඩීමේ** ප්‍රතිලාභයක් ලෙසින් අනුපාදා පරිනිර්වානය සාක්ෂාත්වේ යයි බුදුන් වහන්සේ පෙන්වා ඇත.: (**අනුපාදා පරිනිබ්බාණාය සංවත්තති**- leads to nibbāna through non-clinging) බලන්න: කායගතා සති ප්‍රතිලාභ. **මූලාශ්‍ර:** අංගු.නි: (1 ): 1 නිපාත: කායගතාසති වග්ග, පි. 125,අමතවග්ග**,** පි. 130, EAN:1: Mindfulness Directed to the Body, p.52 & The Deathless, p. 53.

▼ **සුජාත තෙරුන්** (කෙළෙසුන්ගෙන්) වෙන්වූ සිතකින් යුතුව, සංයෝජන වලින් නිදහස්ව, උපදාන රහිතව නිවන සාක්ෂාත් කර ගෙන ඇත යයි

බුදුන් වහන්සේ වදාළහ: **" සොහති චතායං භික්ඛු උජුභූතෙන චෙතසා විප්පමුත්තො විසඤ්ඤුත්තො අනුපාදාය නිබ්බුතො..." බලන්න:** උපග්‍රන්ථය:1. **මූලාශ්‍ර**:සංයු.නි: (2 ): නිදානවගග, භිකඛුසංයුත්ත-9.1.5. සුජාත සූත්‍රය, පි.452, ESN: 21: Bhikkhusamytta: 5-Sujata, p. 926.

▲ **අනුපාදිසේස පරිනිබ්බාන ධාතුව:**පාලි: **අනුපාදිසෙසාය නිබ්බාන ධාතුයා-**Anupādisesa-parinibbāna-dhātu: අනුපාදිසේස පරිනිබ්බාන ධාතුව ලෙසින් පෙන්වා ඇත්තේ උපාදාන රහිතව, කය හැරදමා, පරිනිබ්බානයට පත්වීමය. කය හැර දැමීමය. මෙය ස්කන්ධ පරිනිබ්බානය ලෙසින්ද පෙන්වා ඇත. **ශබ්දකෝෂ: පා.සිං.ශ**:පි.67: "**අනුපාදිසෙස පරිනිබ්බාන ධාතු:** ස්කන්ධ පරිනිර්-වාණය, රහතුන් කාලක්‍රියාකිරීම" **B.D:** p.106: "The full extinction of the groups of existence (khandha parinibbāna) also called **'an-upādi-sesa-nibbānadhātu'**-nibbāna without the groups remaining: the coming to rest-no more continuing of this physico-mental process of existence: This takes place at the death of the Arahat"

▼ **තථාගතයන් වහන්සේ** අනුපාදිශේෂ පරිනිර්වවාණ ධාතුවෙන් පිරිනිවීගිය ස්ථානය සැදැහැති කුලපුත්‍රයෙක් විසින් දැකියයුතු සංවේග කටයතු ස්ථානයක් යයි බුදුන් වහන්සේ වදාළහ: **"ඉති තථාගතො අනුපාදිසෙසාය නිබ්බානධාතුයා පරිනිබ්බුතොති භික්ඛවෙ සද්ධස්ස කුලපුත්තස්ස දස්සනීයං සංවෙජනීයං ඨානං"** (The place where the Tathāgata attained final nibbāna by the nibbāna element without residue remaining is an inspiring place that should be seen by a clansman endowed with faith). **සටහන:** පිරිනිවන් පෑ ස්ථානය: කුසිනාරාවේ, මල්ල රජුන්ගේ සල්උයන. **බලන්න**:සිව් පූජනිය ස්ථාන. **මූලාශ්‍ර:** අංගු.නි: (2 ):4 නිපාත: 4.3.2.8. සංවේජනීය සූත්‍රය, පි. 254, EAN:4: 118.8 Inspiring, p. 191. දීඝ.නි (2): 2 මහාපරිනිර්වාණ සූත්‍රය, පි. ඡෙදය 34. පි. 158, EDN: 16 : MahāparinibbānaSutta: The Great Passing-The Buddha's Last Days, p.176.

▲**අනුපුබ්බ නිරෝධ-** Gradual Cessation: අනුපුබ්බ නිරෝධ ලෙසින් පෙන්වා ඇත්තේ, ආධ්‍යාත්මික වර්ධනය ක්‍රමානුකූලව වඩාගැනීමය- කෙළෙස් නිවාගැනීමය: සිව්ජාන,සිව් අරූපසමාපත්ති ලැබීම: 1) පළමු ජානය මගින් කාම සංඥා නිරෝධවීම2) දෙවෙනි ජානය මගින් විතක්ක හා විචාර නිරෝධවීම 3) තෙවෙනි ජානය මගින් ප්‍රීතිය නිරෝධවීම 4) සිව්වෙනි ජානය මගින් ආශ්වාස ප්‍රශ්වාස-කාය සංඛාර නිරෝධවීම 5) ආකාසානඤ්චායතන සමාපත්තිය මගින් රූප සංඥාව නිරෝධවීම .6) විඤ්ඤානඤ්චායතන සමාපත්තිය මගින් ආකාසානඤ්චායතන සංඥාව නිරෝධවීම.7) ආකිඤ්චඤ්ඤායතන සමාපත්තිය මගින් විඤ්ඤානඤ්චා යතන සංඥාව නිරෝධවීම.8) නෙවසඤ්ඤානාසඤ්ඤායතන සමාපත්තිය මගින් ආකිඤ්චඤ්ඤායතන සංඥාව නිරෝධවීම 9) සංඥාවේදිත නිරෝධ සමාපත්තිය මගින් නෙවසඤ්ඤානාසඤ්ඤායතන සංඥාව නිරෝධවීම. **මූලාශ්‍ර:** අංගු.නි: (5 ):9 නිපාත: 9.1.3.11අනුපුබ්බ නිරෝධ සූත්‍රය,පි. 486,EAN:9: 31.11 Progressive Cessation, p. 473.

▲ **අනුපුබ්බ විහාර**- Gradual Dwellings: අනුපුබ්බ විහාර ලෙසින් පෙන්වා ඇත්තේ අනුපිළිවෙලින් සමවැද වාසය කළයුතු ජාන සමාපත්ති-

විහරණයන් ගැනය. එවැනි විහරණ 9 කි: 1) - 4) සිව්ජාන 5) -8) අරූප සමාපත්ති හතර 9) සංඥාවේදිත නිරෝධ සමාපත්තිය. **සටහන**: මේ විහරණ නිසා ලැබෙන ආධ්‍යාත්මික ඵල මේ සූත්‍රයන්හි විස්තරව දක්වා ඇත. **මූලාශ්‍ර:** අං.නි: (5):9 නිපාත: 9.1.4.1 අනුපුබ්බ විහාර සූත්‍ර 2කි ,පි. 488,EAN:9: 32.1 & 32.2 Dwellings, 2 suttas, p. 473.

▲ **අනුපුබ්බසික්කා, අනුපුබ්බකිරියා, අනුපුබ්බපටිපාදා** - Gradual training, gradual practice, gradual progress: අරහත්වය ලබාගැනීම පිණිස මේ කරුණු වඩාගැනීම අවශ්‍යයය. **අනුපුබ්බසික්කා-**ක්‍රමානුකූල ශික්ෂාව, **අනුපුබ්බකිරියා-** ක්‍රමානුකූල පුහුණුව, **අනුපුබ්බපටිපාදා-** ක්‍රමානුකූල පටිපදාව වර්ධනය කර ගැනීම අවශ්‍යතාවයකි. **බලන්න**: ධර්මය ක්‍රමානුකූලව පුහුණුවීම.

▲ **අනුරුද්ධතෙර**-Anuruddha Thera: **බලන්න:** උපග්‍රන්ථය 1.

▲ **අනුස්සති ස්ථාන සය**- Six Anusati: 1) ත්‍රිවිධ ධ්‍යාන වැඩීම (පළමු, ද්විතිය, තෘතිය) මේ ජීවිතයේ සුබ විහරණය පිණිස 2) ආලෝක සංඥාව මෙනෙහිකිරීම (ථීන මිද්ධය හැර), දිවැස් නුවණ පිණිස 3) කාමරාග ප්‍රහිණය පිණිස කයේ (32ක්වූ) පිළිකුල මෙනෙහි කිරීම 4) සොහෝනේ දැමූ මළමිනියක් අරමුණු කරගනිමින් අසුභය වැඩීම මගින් අසමි මානය නැතිකරගැනීම 5) චතුර්ධ්‍යානය ලැබීම, අනේකධාතු අවබෝධය පිණිස 6) සති සම්පජානය ඇතිව වාසය කිරීම. **සටහන:** මේ සූත්‍රය, බුදුන් වහන්සේ ගේ අනුදැනුම ඇතිව ආනන්ද තෙරුන් වදාළහ. උදායි තෙරුන් අරහයා දේශනා කර ඇත. **මූලාශ්‍රය**: අං.ගු.නි: (4) 6 නිපාත:අනුත්තරිය වග්ග: 6.1.3.9 උදායි සූත්‍රය, පි.88.

▲ **අනුස්සරිතබ්බ ධර්ම**-Dhamma to be recollected: අනුස්සරිතබ්බ යනු සිහිකිරීම- ආවර්ජනා කිරීමය.දහම්මග වඩා ගැනීම පිණිස සිහිකළයුතු ධර්මතා නම් සම්මා දිට්ඨිය පෙරටු කරගත් නිවැරදි මගය. සිහි නොකර යුතු ධර්මතා නම් මිථ්‍යාදිට්ඨිය ඇති වැරදි මගය. **මූලාශ්‍ර:** අං.ගු.නි: (6 ): 10 නිපාත:10.3.5.9 අනුස්සරිතබ්බ සූත්‍රය, පි. 478, EAN:10: V Noble: 153 sutta, p. 548.

▲ **අන්ත**- End: අන්ත ලෙසින් පෙන්වා ඇත්තේ අවසානයය. මෙහිදී තණ්හාවේ අන්තය නිවන යයි බුදුන් වහන්සේ වදාළහ. **මූලාශ්‍ර**:සං.යු.නි: (4 ): අසංඛතසංයුත්ත: 9.2. 42.අන්තසූත්‍ර, පි.682, ESN: 43: Asankhata samyutta: II, p. 1507.

▲ **අන්ත දෙක-** Two Extreme views: බුදුන් වහන්සේ මෙසේ වදාළහ: “…සියල්ල ඇතය යන මෙය එක් අන්තයකි, සියල්ල නැත යන මෙය දෙවෙනි අන්තයය. මේ අන්ත දෙකට නොපැමිණ තථාගතයන් මැදුම්පිළිවෙත ගැන දහම් දෙසති: අවිද්‍යා ප්‍රත්‍යයෙන් සංස්කාර හට ගනී….”. **සටහන**: පටිච්චසමුප්පාද ධර්මය අවබෝධ කර දුක නැතිකරගැනීම මධ්‍යම ප්‍රතිපදාව බව මෙහි විස්තර කර ඇත. **මූලාශ්‍ර:** සං.යු.නි: (2 ):නිදානවග්ග: අභිසමයසංයුත්ත: 1.2.5 කච්චාන ගොත්ත සූත්‍රය, පි.50.

▲ **අන්ත දිට්ඨි සතර-** Four Extreme views: **දිට්ඨි පිලිබඳ අන්තසතර** ලෙසින් පෙන්වා ඇත්තේ: ශාශ්වත වාදය, උචෙඡද වාදය, කාම සුඛල්ලිකානුයෝගය, අත්තකිලමථානු යෝගය යන, අත්හළයුතු ලාමක දිට්ඨි 4 ය. **බලන්න**: උච්චේද දිට්ඨිය, ධම්මචක්කප්පවත්තන සූත්‍රය.

▼ **වෙනත් මූලාශ්‍ර: 1. ශාශ්වත වාදය**: ආත්මයද ලෝකයද...ඉන්ද්‍රකීලයක් ලෙසින් නිසලව, සඳ හිරු මෙන් නිති පවතින්නේය යන මතය. **උච්ඡේද වාදය:** සත්ත්වයා මරණින් මතු සිඳී යන්නේය, අදර්-ශනයට (නොදැකීමට) යන්නේය, නො ඉපදෙන්නේය යන භව විගමනය පැනවීමය. 62ක් වූ දිට්ඨි අතුරින් 55 ක් ශාශ්වත වාදයට ඇතුලත්ය, 7 ක් උච්ඡේද වාදය ට ඇතුලත්ය. **කාමසුඛල්ලිකානුයෝගය**: සෙවිය යුතු, සිත් ඇදගන්න මන පිනවන ප්‍රිය සවරුප අරමුණුකර උපදින කෙලේශ කාමය නිසා උපදින සැප සොම්නසය, රස විඳීමය, එහි නැවත නැවත ඇලීමය. **අත්ත කිලමථානු යෝගයය:** සසරින් පිරිසිදුවීම පිණිස, කටුමත, ඊතල මත හිඳිම ආදිය... ගව බලු ආදී නා නා ව්‍රත වල දීම- ආත්මය වෙහෙසා කරන දැඩි ආයාසය. අනන්තය නම්වූ නිවන පිණිස නො පවතින නිසා මේවා අන්තවේ:**සද්ධර්මකෝෂය**, පි. 201.

▲ **අන්තරාමල**- Inward stains: අන්තරාමල යනු සිත ඇතුලේ ඇති කෙළෙස්ය, එනම්: ලෝභය දෝසය හා මෝහයය. මේවා සිතේ ඇතිවන සතුරන් යයි බුදුන් වහන්සේ පෙන්වා ඇත. ඒවා නිසා බොහෝ අකුසල, අවැඩ ඇතිවේ. **මූලාශ්‍රය**: බු.නි: ඉතිවුත්තක: 3.4.9 අන්තරාමල සූත්‍රය, පි.460.

▲**අන්තරාකාරී ධර්ම** - Obstructive Dhamma

ධර්මය පුහුණුකරන සංඝයා විසින් වලකා ගත යුතු දහම අන්තරාකාරී ධර්ම වේ. යම්කිසි දෙයක් සේවනය කරනවිට, ඒ නිසා දහම් මග පරිහානියට පත්වෙනම්, ඒ නිසා, මෙලෙව හා පරලොව අයහපත් ප්‍රතිඵල ලැබේනම් ඒවා අන්තරාකාරී ධර්මතා වේ. කාමආස්වාදයේ යෙදීම, අන්තරාකාරී දහමක්ය , එහි ආදීනව බොහෝය යි බුදුන් වහන්සේ පෙන්වා ඇත. **බලන්න**: කාමයේ ආදීනව. **සටහන**: මේ සූත්‍රය, අරිට්ඨ නම් භික්ෂුවට අන්තරාකාරී ධර්ම ගැන ඇතිවූ වැරදි දිට්ඨිය අස්කරගැනීම පිණිස දේශනා කර ඇත. **මූලාශ්‍ර:**ම.නි: ( 1 ) : 1.3.2 අලගද්දූපම සූත්‍රය, පි.344, EMN: 22 The Simile of the Snake, p. 214.

▲ **අන්තරවාසක අඳනය-** Under robe: සංඝයාට කැප,අන්තරවාසක අඳනය තුන් සිවුරෙන් එක් කොටසකි. **බලන්න**: විනය පිටකය.

▼ **වෙනත් මූලාශ්‍ර**: **1.** "අන්තරවාසක අඳනය යට අඳිනා සිවුරය. දිග රියන් 4 ක් හා මිටි රියනකි, පළල රියන් 2කි. මහා කොටස්, කුඩා කොටස් කර මැසිය යුතුය. ශ්‍රාවකයන්ට අනුදැන වදාළ අඳනය බුදු අඳනය මෙන් නොව තනි පට විය යුතුය. දුහුල් පිළියක් නම් දෙපටක් කිරීම සුදුසුය. අඳනය වෙන්ව වැසීම නිසා ඇවැතක් වේ" : **සද්ධර්ම කෝෂය**, පි. 204 .

▲**අන්ණසුඛය** -freedom from debt: අන්ණසුඛය යනු කිසිවෙකුට ණය නොවීම නිසා සිතේ ඇති ප්‍රීතියය. **බලන්න**: ගිහිසුඛ

▲ **අන්ධකරණ හා අන්ධනොකරණ** -Making blind & making see

දහමේ **අන්ධකරණ** ලෙසින් (අඥාන) පෙන්වා ඇත්තේ නුවණ නමැති ඇස නොමැති නිසා යථාබව (යථාභූත ඥානය) නොදැකීමය, කෙළෙස් ඇතිකර දුකට පත්වීමය. අන්ධබවට පත්වීමට හේතු 3 ක් බලපාන බව බුදුන් වහන්සේ පෙන්වා ඇත: 1) කාම විතක්ක 2) ව්‍යාපාද විතක්ක 2) හිංසා විතක්ක. **අන්ධනොකරණ** යනු ප්‍රඥාව ඇතිවීමය- දහම් ඇස ඇතිවිමය, යථාභූත ඥානය ඇතිවිමය, කෙළෙස් ප්‍රහීණය වීමය, දුක

කෙළවර වීමය. එයට බලපාන හේතු 3කි: 1) නෙක්කම්ම විතක්ක 2) අව්‍යාපාද විතක්ක 2) අවිහිංසා විතක්ක. **මූලාශ්‍රය:** ඛු.නි: ඉතිවුත්තක: 3.4.8 අන්ධකරණ සූත්‍රය, පි. 458.

▲ **අන්ධකාරය**- Darkness: බුදුන් වහන්සේ ලෝකයේ ඇති බිහිසුණු අන්ධකාරය ලෙසින් පෙන්වා ඇත්තේ චතුසත්‍ය නොමදැන, සසර වටේ යෑමය, අනුවණ බවය. ලෝකාන්තරික නිරයේ ඇති අන්ධකාරයට වඩා, එම අඳුර මහත්ය. **බලන්න**: ලෝකාන්තරික නිරය.

▲ **අන්ඩජ**-Egg born: අන්ඩජ යනු බිත්තරයකින් හෝ කබල්ලක් බිඳගෙන උපත ලැබීමය: සර්පයන්, පක්ෂීන් ආදී සතුන්. (from the egg or a shell). බලන්න: උත්පත්ති විධි.

▲**අන්තිම දේහධාරී**: පාලි: **අන්තිමං දෙහං** - Bearer of the final body අන්තිම දේහධාරී යනු අවසාන කය - යළි උපතක් නොමැති කය, පරිනිබ්බානය තෙක් දරා සිටීමය. එලෙස, පශ්චිම ශරීරය දරණ උතුමන්: බුදුවරු, පසේබුදුවරු හා රහතුන්ය. විමුක්තිය ලබා යළි උපත ක්ෂය කළ නිසා එම උතුමන් දරන්නේ අන්තිම-අවසාන කයය. **සටහන**: * මෙය බුදුන් වහන්සේ, පසේබුදුවරු හඳුන්වන අපරනමකි ** මෙලොව අනාගම්බව ලබා සුද්දාවාස දේවලෝක වල පහළවූ ආරිය උතුමෝ, එහිදී විමුක්තිය ලබා ගැනීම නිසා නිසා ඔවුන් ද අන්තිම දේහධාරීන් ලෙසින් හඳුන්වයි.

▼ **සුජාත තෙරුන් අන්තිමදේහය දරන බව බුදුන් වහන්සේ ප්‍රකාශ කර ඇත:** ඉතා සෝභනවූ රූපයකින් දිලෙන මේ භික්ෂුවගේ සිත මුළුමනින්ම ඍජුය. (කෙළෙසුන්ගෙන්) වෙන්වූ සිතකින් යුතුව, සංයෝජන වලින් නිදහස්ව, උපදාන රහිතව ඔහු නිවන සාක්ෂාත් කර ගෙන ඇත. මාර සේනාව පරජය කළ ඔහු අන්තිම සිරුර දරයි: **" සොභති වතායං භික්ඛු උජුභූතෙන චෙතසා විප්පමුත්තො විසඤ්ඤුත්තො අනුපාදාය නිබ්බුතො ධාරෙති අන්තිමං දෙහං ජෙත්වා මාරං සාවාහිනින්ති"** (This bhikkhu shines with sublime beauty, Having a mind utterly straight. Detached is he, free from fetters, Attained to Nibbāna by nonclinging. He carries about his final body, Having conquered Māra and his mount). **මූලාශ්‍ර**:සංයු.නි: (2): නිදානවගග, භිකඛුසංයුත්ත-9.1.5. සුජාත සූත්‍රය, පි.452, ESN: Nidanasamytta: 21: Bhikkhu samytta: 5-Sujata, p. 926.

▼ **සටිකාර සූත්‍රය** අවසානයේ දී මෙසේ දැක්වේ: "...වඩන ලද සිත් ඇති, අන්තිම සිරුරු දරණ, පැරණි යහළුවන් දෙදෙනෙකුගේ හමුවීම එසේ සිදුවිය". (**...එවමෙතං පුරාණානං සහායානං අහු සඞගමො - උභින්නං භාවිතත්තානං සරීරන්තිමධාරිනන්ති). සටහන**: *මෙහි පැරණි මිත්‍රයන් දෙදෙනා ලෙසින් පෙන්වා ඇත්තේ බුදුන් වහන්සේ හා සටිකාර බ්‍රහ්මදෙවියා පිලිබඳවය. බුදුන් වහන්සේ දරන්නේ අන්තිම දේහයය, අරහත්බව ලබා බඹලොව වසන සටිකාර බ්‍රහ්ම දෙවියා දරන්නේද අන්තිම දේහයය.** **ම.නි. සටිකාර සූත්‍රයේ**: බුදුන් වහන්සේගේ පෙර ජීවිතයකදී - කාශ්‍යප බුදුන් සමයේ, ජෝතිපාල බ්‍රහ්මණ ලෙසින්, සටිකාර කුඹලා හා පවැති මිත්‍රත්වය විස්තර කර ඇත. **මූලාශ්‍ර**: සංයු.නි: (1 ): දේවපුත්ත සංයුත්ත: 2.3.4. සටිකාර සූත්‍රය, පි. 140, ESN: 2: Devaputta samyutta: 24.4 Ghatikāra, p. 201.

▼**අන්තිම දේහය දරණ රහතන්වහන්සේ** සියලු මානයන් නැතිකළ බැවින් තමා ගැන හෝ ලෝකයා ගැන කථාකරනවිට ලෝක ව්‍යවහාරයට අනුව කටයුතු කරණබව බුදුන් වහන්සේ පෙන්වා ඇත. **බලන්න:** රහතන්වහන්සේ. **මූලාශ්‍ර:**සංයු.නි: (1 ): දේවතාසංයුත්ත: 1.3.5 අරහන්ත සූත්‍රය, පි. 52, ESN:2: Devatasamyutta: 25.5 The Arahant, p. 87.

▲ **අනොත්තප්ප**- moral recklessness: අනොත්තප්ප යනු පවට බියනැතිබවය. මෙය අකුසලයකි. අනාගාමීබව ලැබීමට මේ අකුසලය හැර දැමිය යුතුවේ. **බලන්න:** අනාගාමි, අහිරිකය හා අනොත්තප්ප.

▲ **අනෝමදස්සි බුදුන්වහන්සේ**- The Buddha Anomadassi අනෝමදස්සි බුදුන්වහන්සේ, ගෝතම බුදුන් වහන්සේට පෙර වැඩසිටි සම්බුදුවරයෙකි. **මූලාශ්‍ර:** බු.නි. බුද්ධවංශ: 7 අනෝමදස්සි බුද්ධවංශය, පි.128.

▲ **අනේකධාතු නුවණ-**Knowledge of numerous elements මේ නුවණ තථාගතයන් සතු දසබල ඥාණයකි. **බලන්න**: තථාගත.

▲**ආනෙඤ්ජාභි සංස්කාර** - imperturbable karmic formations මේවා අරූපාවචර බ්‍රහ්මලෝකයන්හි යළි උපතට හේතුවන කුසල කම්මය. **බලන්න**: කම්ම

**අඳ**

▲ **අඳුන්වනය මිගදාය-**Andunwanaya deer park :සාකේත නුවර අසල පිහිටි මේ මිගදාය, බුදුන් වහන්සේ හා සංඝයා වැඩසිටි වනයකි. මුවන් ගේ අභයභූමියකි. **මූලාශ්‍රය:** සංයු.නි: (5-1) මහාවග්ග: බොජ්ඣංගසංයුත්ත :2.1.6 කුණ්ඩලිය සූත්‍රය, පි.182.

▲ **අඳුරෙන් අඳුරට**-From Dark to Dark :පහත් තත්වයක සිට තවත් පහතට පත්වීම මින් අදහස් කරයි. **බලන්න:**තමෝතමපරායන.

▲ **අඳුරෙන් එළියට-** From Dark to Light : පහත් තත්වයක සිට උසස් තත්වයකට පැමිණීම. **බලන්න:**තමෝජෝතිපරායන.

**අප**

▲ **අපචයගාමී ධර්ම හා ආචයගාමී** ධර්ම- Dhamma that leads to dismantling & Dhamma that leads to building up: අපචයගාමී ධර්මය ධම්මානුකූලය, ආචයගාමී ධර්මය ධම්මානුකූල නොවේ. අපචයගාමී දහම නම් විමුක්තිය ලබාදෙන සම්මාදිට්ඨිය ප්‍රමුක නිවරදි මග ගැනීමය. එම මග පුරුදු පුහුණු කරණවිට ආසවයන් කැඩීබිඳී නිවන සාක්ෂාත් කරගැනීමටට හැකියාව ලැබේ. ආචයගාමී දහම නිසා ආසවයන් ගොඩනැගේ- වර්ධනයවේ, එමනිසා නිවන දුරවේ. එම මග මිථ්‍යාදිට්ඨිය පෙරටු කරගත් වැරදි මගය. **බලන්න**: මිථ්‍යාත්වය හා සම්‍යක්තවය . **මූලාශ්‍ර**: අංගු.නි: ( 6): 10 නිපාත: සාධු වග්ග: 10.3.4.9 ආචයගාමී සූත්‍රය, පි.472, EAN: 10: Good: p.548.

▲ **අපදාන**- Apadana : අපදාන, ඛුද්දක නිකායට අයත් කෘතියකි, කොටස් 4 කි: බුද්ධ අපදාන, පච්චේක බුද්ධ අපදාන, ථෙර අපදාන හා ථෙරි අපදාන. අපදාන පාලියෙහි එන්නේ, සම්‍යක් සම්බෝධි, පච්චේක බෝධි, ශ්‍රාවක බෝධි යන තුන් බෝධීන් පතමින් බුදු පසේබුදු හා ශ්‍රාවක සංඝයා විසින් කරණ ලද, පෙරකම්ම පිලිබඳ වෘත්තාන්ත කතාසංග්‍රහය **මූලාශ්‍රය:** ඛු.නි: අපදාන පාලි-1, සංඥාපනය, පි. 9.

▲ **අපණ්ණක දහම හා පටිපදාව**: පාලි: **අපණ්ණකො ධම්මො, අපණ්ණක පටිපාදං-** incontrovertible teaching & Practice: අපණ්ණක දහම යනු බුදුන් වහන්සේ, සසර දුකින් මිදීම පිණිස වදාළ අප්‍රතිවාදනිය දහමය- කිසිවෙකුට බිඳහෙළිය නොහැකි ධම්මයය. මෙය අවිරුද්ධ ධර්මය. ඒකාන්ත සත්‍යයය ලෙසින් ද පෙන්වා ඇත. දහම පුරුදු පුහුණු කිරීම අපණ්ණක ප්‍රතිපදාවය. **සටහන්**: * අටුවාවට අනුව: අපණ්ණක දහමට විරුද්ධ වීමට කරුණු නැත, එහි අරුත් ව්‍යාකූල නැත- අවුල්නැත, ඒකාන්තයෙන්ම පිළිගත හැකි දහමකි- this as a teaching that is uncontradictable, free from ambiguity, definitely acceptable. **බලන්න:** EMN: note: 620, p. 1121 ** අටුවාව, අපණ්ණක පටිපදාව (Apaṇṇakapaṭipadaṃ) හඳුන්වන සමාන පද මෙසේ දක්වා ඇත ඇත: 1) the unmistaken way- **නිවැරදි මග** 2) the definite way- **ඒකාන්ත මග** 3) the emancipating way- **විමුක්ති මග** 4) the causal way- **හේතුඵල මග** 5) the essential way- **අවශ්‍යම මග** 6) the exquisite way- **විශිෂ්ඨ මග** 7) the unopposed way- **අවිරුද්ධ මග 8)** the conducive way- **සහෝපකාරි මග** 9) the way in accord with the Dhamma- **ධම්මානුකූල මග.** බලන්න: EAN: note. 352, p. 597 ** සූත්‍ර දේශනාවල යම් ස්ථානයන්හි අනුව අපණ්ණක දහම ලෙසින් පෙන්වා ඇත්තේ සම්‍යක්තවය- නිවැරදි මගය, එම මග වඩා ගැනීම පිණිස පුරුදු පුහුණු කල යුතු ප්‍රතිපදාව අපණ්ණක ප්‍රතිපදාවය. **ශබ්දකෝෂ: පා.සිං.ශ**: පි:79: “**අපණ්ණක:** අවිරුද්ධ, වැරදි නැති, නිදොස්, නෛර්යාණික- **අපණ්ණක පටිපදා:** අවිරුද්ධ ප්‍රතිපදාව, නිවැරදි පිළිපැදීම”.

▼**අපණ්ණක දහම-බුදුන්වදාළ දහමය**

තමන්ට ශ්‍රද්ධාව ඇතිකරගැනීමට සුදුසු ගුරුවරයෙක් නැත යයි සාලා ගම්වැසියන් බුදුන් වහන්සේට පැවසූ අවස්ථාවේ, උන්වහන්සේ වදාළේ, අපණ්ණක දහම යහපත් ලෙසින් සමාදන් විය යුතු බවය: එම දහම මැනවින් පුරුදු පුහුණු කරගැනීම මගින් දිගුකාලයක් සුවයෙන්, සතුටින් ජීවිතය ගතකිරීමට හැකිවේ: **“...මනාපං වො ගහපතයො සත්ථාරං අලභන්තෙහි අයං අපණ්ණකො ධම්මො සමාදාය වත්තිතබ්බො අපණ්ණකො හි ගහපතයො ධම්මො සමත්තො සමාදින්නො සො වො භවිස්සති දීඝරත්තං හිතාය සුඛාය...”** (Since, householders, you have not found an agreeable teacher, you may undertake and practice this incontrovertible teaching; for when the incontrovertible teaching is accepted and undertaken, it will lead to your welfare and happiness for a long time). **සටහන:** මේ සූත්‍රයේදී බුදුන් වහන්සේ, ඒ සමයේ ලෝකයේ පැවති විවිධ දිට්ඨි හා මත පිලිබඳව (ශූන්‍යවාදය/ නාස්තික දිට්ඨි -doctrine of nihilism ආදී කරුණු සාලා ගම් වැසියන්ට විස්තර කර,විවිධ දිට්ඨි හා මත පිළිබඳව ඔවුන් සිතන ආකාරය ගැන විමසූහ. අවසානයේදී මිථ්‍යා දිට්ඨි බැහැර කර සම්මා දිට්ඨිය ලබන පුද්ගලයා අපණ්ණක දහමෙහි හැසිරෙමින් සුවපත් වන අන්දම පෙන්වා වදාළහ. සූත්‍ර දේශනාව අවසානයේදී ඔවුන්ගේම නුවණින් අපණ්ණක දහම කුමක්ද යයි වටහාගත්, සාලාගම වැසියන්, බුදුන්සරණගිය උපාසකයන් බවට පත්වූහ. **බලන්න:** දිට්ඨි. **මූලාශ්‍ර**: ම.නි: (2 ): 2.1.10

අපණ්ණක සූත්‍රය, පි.124, EMN: 60: Apaṇṇaka Sutta- The Incontrovertible Teaching, p. 478.

▼**අපණ්ණක පටිපදාව යනු අවිරුද්ධ ප්‍රතිපත්තියය**: දහම් ගුණ 3 ක් ඇති භික්ෂුව අවිරුද්ධ ප්‍රතිපත්තියට ඇතුල්වී ඇතය යි බුදුන් වහන්සේ වදාළහ. එම භික්ෂුව ආසව ක්ෂයකිරීම පිණිස (අරහත්වය පිණිස) වැඩ ආරම්භ කර ඇත. එ ගුණ: 1) ඉන්ද්‍රිය සංවරය, 2) භොජනයේ මාත්‍රඥවීම, 3) නිදිවැරීම- ජාගාරානුසතිය: **"තීහි භික්ඛවෙ ධම්මෙහි සමන්නාගතො භික්ඛු අපණ්ණකතං පටිපදං පටිපන්නො හොති, යොනි චස්ස ආරද්ධා හොති. ආසවානං ඛයාය. කතමෙහි තීහි: ඉධ භික්ඛවෙ භික්ඛු ඉන්ද්‍රියෙසු ගුත්තද්වාරොහොති, භොජනෙ මත්තඤ්ඤූ හොති, ජාගරියං අනුයුත්තො හොති"** (... possessing three qualities, a bhikkhu is practicing the unmistaken way and has laid the groundwork for the destruction of the taints. What three? Here, a bhikkhu guards the doors of the sense faculties, observes moderation in eating, and is intent on wakefulness) **බලන්න**: ආස්‍රව හා ආස්‍රව ක්ෂය කිරීම. **සටහන: *** එම දහම් ගුණ 3 ඇති භික්ෂුව, මේ ජීවිතයේදීම සතුට හා සුවය ඇතිව ජීවත්වෙමින්, ආසවක්ඛය පිණිස කටයුතු කරන බව රථූපම සූත්‍රයේ දී පෙන්වා ඇත. **මූලාශ්‍ර:** සංයු.නි: (4 ): සළායතනසංයුත්ත: 1.19.2 රථූපම සූත්‍රය, පි. 370, ESN: 35: Salayatanasamyutta: IV: 239.2 The Simile of the Chariot, p. 1315.අංගු.නි: (1): 3 නිපාත: 3.1.2.6 සූත්‍රය, පි. 252, EAN:3: 16.6 The Unmistaken, p. 83

▼**ඉහත දක්වා ඇති** දහම් **ගුණ 3** ට අතිරේකව තවත් **ගුණ 8 කින්** සමන්විත භික්ෂුව, අවිරුද්ධ ප්‍රතිපත්තියට ඇතුල්වී, ආසව ක්ෂයකිරීම පිණිස (අරහත්වය පිණිස) කටයුතු කරන බව බුදුන් වහන්සේ පෙන්වා ඇත: **එම ගුණ 8:** 1) ශීලසම්පන්නබව- virtuous 2) බහුශ්‍රැතබව- learned 3) වීරිය ඇතිබව- energetic 4) ප්‍රඥාව ඇතිබව- wise 5) නෙක්කම්ම සිතුවිලි තිබීම-සංකල්පනා - thought of renunciation 6) අව්‍යාපාද සිතුවිලි තිබීම- thought of good will 7) අවිහිංසා සිතුවිලි තිබීම - thought of non-harming 8) සම්මාදිට්ඨිය තිබීම- right view. **මූලාශ්‍ර:** අංගු.නි :(2): 4 නිපාත: අපණ්ණක වග්ග: 4.2.3.1 හා 4.2.3.2. සූත්‍ර, පි. 166, EAN:4 : III Unmistakable: 71.1 & 72.2 suttas , p. 177.

▲**අපරගොයානය**- Aparagoyan

සක්විතිරජ පාලනය කරන සතරදීප වලින් එකකි. **බලන්න**: සක්විතිරජ.

▲**අපරිජාන**-Aparijana

අපරිජාන ලෙසින් මෙහි පෙන්වා ඇත්තේ දුක ක්ෂය කරගැනීමේ දහම පිරිසිඳ නොදැනීමය, යහපත් අවබෝධයක් නොමැතිබවය. සියල්ල පිරිසිඳ නොදැනීම නිසා දුක අවසන් කරගත නොහැකිය. **සටහන**: සියල්ල ලෙසින් පෙන්වා ඇත්තේ සළායතන, බාහිර අරමුණු, ඒ නිසා ඇතිවෙන ස්පර්-ශය, වේදනාව ආදීවූ දුකට මුල්වෙන කරුණුය. **මූලාශ්‍රය:** සංයු.නි: (4): සළායතනවග්ග:සබ්බවග්ග: අපරිජානසූත්‍ර 2කි, පි.58.

▲ **අපරිහානිය දහම**- Non-decline Dhamma

අපරිහානිය දහම ලෙසින් පෙන්වා ඇත්තේ, ආධ්‍යාත්මික මග පරිහානියට පත් නොකර ගැනීමට උපකාරීවන දහම් කරුණුය. මහාපරිනිර්වාණ සූත්‍රයේ මේ පිලිබඳ විස්තරාත්මකව පෙන්වා ඇත.

▼**සතර කරුණු සහිතව** වෙසෙන මහණ පරිහානියට පත් නොවේ: 1) ශිලසම්පන්න බව 2) ඉන්ද්‍රිය සංවරය 3) භෝජනයෙහි පමණ දැනීම - භොජනයේ මාත්‍රඥවීම 4) නිදිවැරීමේ යෙදීම. එලෙසින් වාසය කරණ මහණ නිවන හමුවේ සිටි. **මූලාශ්‍ර**: අංගු.නි: (2): 4 නිපාත: 4.1.4.7 අපරිහානිය සූත්‍රය, පි. 100, EAN: 4: 37.7 Non-Decline, p. 163.

▼ **සය කරුණු සහිතව** වෙසෙන මහණ පරිහානියට පත් නොවේ: 1) වැඩකටයුතු වලට නො ඇලීම-කර්මා රාම 2) කතාබහට නො ඇලීම - භාෂ්‍යාරාම 3) නින්දට නො ඇලීම-නිද්‍රාරාම 4) අන්‍ය ඇසුරට නො ඇලීම - සඞගණිකාරාම 5) සුවචභව- කීකරුබව6) කල්‍යාණ මිත්‍ර ඇසුර. එම කරුණු සහිතව වෙසෙන මහණ තුන්කාලයේදීම (අතීත, අනාගත, වර්තමාන) ආධ්‍යාත්මික දහම් මගේ දියුණුවට පත්වේ. **මූලාශ්‍ර**: අංගු.නි: (4 ): 6 නිපාත: 6.1.3.2 අපරිහානිය ධම්ම සූත්‍රය, පි. 72 EAN: 6 : 22.2 Non-Decline, p. 326

▼ **ගෞරව ධර්ම** ඇතිව වාසය කරන්නේනම් පරිහානියට පත්නොවේ: 1) ගුරු ගෞරවය තිබීම-සත්ථුගාරවතා 2) දහම කෙරහි ගෞරවය තිබීම - ධම්මගාරවතා 3) සංඝයා කෙරහි ගෞරවය තිබීම -සංඝගාරවතා 4) පුහුණුව කෙරහි ගෞරවය තිබීම -සික්ඛාගාරවතා 5) අප්‍රමාදයට ගරුකිරීම-අප්පමාදගාරවතා 6) පටිසන්ථාරයට ගරුකිරීම -පටිසන්ථාර ගාරවතා. 7) හිරි ඔතප්ප යට ගරුකිරීම. හිරිඔත්තප්ප ගාරවතා. **මූලාශ්‍ර**: අංගු.නි: (4 ): 6 නිපාත: 6.1.4.7 ප්‍රථම හා දුතිය අපරිහාන සූත්‍ර, පි.102 , EAN: 6 : 32.2 Non-Decline-1 & 2 , p. 331.

▼**සප්ත බොජ්ඣංග ධර්ම** සත් අපරිහාණිය දහම ලෙසින් බුදුන් වහන්සේ පෙන්වා ඇත. එම දහම් කරුණු වඩාගන්නේ නම් ආධ්‍යාත්මික මගෙ පරිහාණියට පත් නොවේ. **මූලාශ්‍ර**: සංයු.නි: (5-1): මහාවග්ග: බොජ්ඣංග සංයුත්ත: 2.3.5 අපරිහානිය සූත්‍රය,පි. 202,ESN: 46: Bojjhanga samyutta: 25.5 Non decline, p. 1759.

▲**අපාය-** Hell

අපාය, නිරය ලෙසින්ද හඳුන්වයි. අයහපත් කම්ම විපාක එල දීම පිණිස ලෝක සතුන් යළි උපත ලබන දුගතියකි. **බලන්න**: නිරය.

▼ **අපායගාමී අකුසල්**: ප්‍රාණඝාතය, අදින්නාදානය, කාමේසුමිච්චාචාරය, මුසාවාදය, පිසුනාවාචය, පරුෂාවාචය, සම්ඵප්‍රලාපය, සුරාමේරය ආදී අකුසලයෙහි යෙදීමය. **මූලාශ්‍ර**:අංගු.නි: (5): 8 නිපාත: 8.1.4.10 අපායසංවත්නික සූත්‍රය, පි. 192, EAN:8: 40.10: Conducive, p. 433.

▼ **අපායගාමී ධර්ම**: හානභාගිය ධර්ම අපායගාමීය. **බලන්න**: හානභාගිය ධර්ම.

▼ **අපාය භය මහත්ය**

අපාය භය මහත්ය, මහා දුකක්ය. ඒ බව දැක්වීමට බුදුන් වහන්සේ මේ **උපමාව** යොදාගෙන ඇත: මුළු දඹදිව ඇති දැව ආදිය යොදා සකස් කරගත් උල් සමුහයක් රැගෙන, එක් පුද්ගලයෙක්,මහමුහුදේ සිටිනා සියලු ප්‍රාණීන්, අමුණා ගැනීමට තැත් කරයි. එහෙත්, ඔහු සතු සියලුම උල් අවසන්වුවද, මහා මුහුදේ සිටිනා සියලු සතුන් අවසන් නොවේ. එයට හේතුව මහා මුහුදේ අප්‍රමාණ ප්‍රාණීන් සිටිනා නිසා. එලෙස, අපාය දුක මහාය. යම් කෙනක්, චතුසත්‍ය තතුසේ දන්නේ නම්, දිට්ඨිසම්පන්න (සෝතාපන්න) ඔහු, අප්‍රමානවූ අපාය දුක අවසන් කරඇත. **බලන්න**:

උපග්‍රන්ථය:5 **මූලාශ්‍ර:** සංයු.නි: (5-2): මහාවග්ග: සච්චසංයුත්ත: සිංසපාවනවග්ග:12.4.6 පාණ සූත්‍රය, පි.322.
▼**අපායභිය,** ලෝකයා මුහුණ දෙන පස්බියෙන් එකකි. **බලන්න**: සංග්‍රහ වත්ථුබල.
▲**අපාය කුසලය** -skilled in loss: අකුසල හැරදම්මට ඇති දක්ෂතාවය. **බලන්න**: අධිගමය.
▲ **අපරාපරියවේදනීය කම්ම-** aparapariya-vedaniya karma සසර සැරිසරන ඕනෑම අවස්ථාවක විපාකඵල දෙන කම්ම, අපරාපරියවේදනීය කම්ම වේ. **බලන්න:** කම්ම.
▲**අපාර හා පාර:** පාලි: **අපාරා පාරඞගමනාය**-here & going beyond අපාර ලෙසින් බුදුන් වහන්සේ පෙන්වා ඇත්තේ සසරය, පාර යනු නිවනය. මැනවින් වඩාගත් ආරිය අටමග- අට දහම, අපාර සිට පාරට යාම පිණිස පවතී: **"ඉමෙ බො භික්ඛවෙ, අට්ඨ ධම්මා භාවිතා බහුලීකතා අපරා පාරඞගමනාය සංවත්තන්ති". සටහන**: අපාර, මෙතෙර-සසර ලෙසින්ද පාර, එතෙර-නිවන ලෙසින්ද පෙන්වා ඇත. ඔරිමතීරය හා පාරිමතිරය ද සසරමග හා නිවන් මග හඳුන්වන පද වේ. **බලන්න**: ඔරිමතීරය හා පාරිමතීරය, එතෙර හා මෙතෙර. බුදුන් වහන්සේ පෙන්වා ඇත්තේ එතරට යන අය අල්පබවය. බොහෝදෙනා මෙතෙර එහේ මෙහේ දුවයයි. එතරවූ, රහතුන් නිසා ලොව බැබලේ යයි මෙහි පෙන්වා ඇත. **මූලාශ්‍ර:** සංයු.නි: (5-1 ) මහාවග්ග: මග්ගසංයුත්ත: 1.4.4.පාරඞගම සූත්‍රය, පි.65, ESN:45:Maggasamyutta: IV: Practice: 34.4. Going Beyond, p. 1641.
▼ **සප්ත** බොජ්ඣංග යහපත් ලෙසින් වඩා ගැනීම, මෙතෙර සිට එතර යෑම පිණිස පවතී. **මූලාශ්‍ර:** සංයු.නි: (5-1): මහාවග්ග: බොජ්ඣංගසංයුත්ත: 2.2.7 අපාර සූත්‍රය, පි.196, ESN: 46: Bojjhangasamyutta: 17.7 Going beyond, p. 1750.
▼ **ඉද්දිපාද යහපත්** ලෙසින් වඩා ගැනීමෙන් මෙතරින්, එතරට යනු පිණිස පවතී. **මූලාශ්‍ර:** සංයු.නි: (5-2)මහාවග්ග: ඉද්දිපාදසංයුත්ත: 7.1.1.අපාර සූත්‍රය, පි.26, ESN:51: Iddipadasamyutta: 1.1 From the near shore, p. 2057.
▲**අපරාමට්ඨ සීලය**- Aparamatta sila: පොදු ජනයා සමාදන්වන ශිලයකි. **බලන්න**: ශිලය.
▲**ආපාණකොටික සීලය-**Apanakotika sila: දිවිහිමියෙන් රකින ශිලයකි. **බලන්න**: ශිලය.
▲ **අපරියන්ත සීලය-**Apariyanta sila: කාලසීමාවක් නියම කරගෙන රකින ශිලය. **බලන්න**: ශිලය.
▲**අපලෝකීත දහම** - Apalokithadhamma: අපලෝකීත දහම ලෙසින් මෙහි පෙන්වා ඇත්තේ නිවන හා නිවනට යන මගය. **මූලාශ්‍රය:** සංයු.නි: (4): සළායතනවග්ග: අසංඛතසංයුත්ත:9.2 අපලෝකීත සූත්‍රය, පි.684.
▲ **අප්පකිච්ච** : පාලි: **අප්පකිච්චො-** Appakiccha: අප්පකිච්ච යනු ස්වල්ප කටයුතු- ක්‍රියාවල යෙදීමය (අල්පකෘත- few undertakings, few tasks) . නිවන සාක්ෂාත් කරගැනීමට අභිලාශය ඇති කෙනෙක් බොහෝ කටයුතුවල නිරතවීම මග දියුණුකර ගැනීමට බාධාවකි. **සටහන්: *** මේ ගුණය නිවන පිණිස අවශ්‍යබව කරණිය මෙත්තා සූත්‍රයේ පෙන්වා ඇත.

** අප්පකිච්ච, අකුප්ප බව (අරහත්වය) ලබාගැනීම පිණිස දියුණු කලයුතු ගුණයකි.
▼**මෙය නිවන** ලබාගැනීමට උපකාරී දහමකි **බලන්න**: අක්කුප්ප.
▲**අප්පබාධා**- Appabadha: අප්පබාධා-ලෙඩදුක් අඩුවීමය, දහම් මග වඩා ගැනීමට උපකාරී කරුණකි. බුදුන් වහන්සේගේ ශ්‍රාවකයන් අතුරින්, නිරෝගී සුවය ඇති භික්ෂූන් අතර බක්කුල තෙරුන් අග්‍රය. **බලන්න**: උපග්‍රන්ථය:1.
▲**අප්පමානාභා දේව**-Devas of Unbounded Radiance: රූප බ්‍රහ්මලෝකයකි. **බලන්න**:බ්‍රහ්මලෝක.
▲ **අප්පමානසුභා දේව-**Devas of unbounded Glory: **බලන්න**: බ්‍රහ්මලෝක.
▲ **අප්පණිහිත විමොක්ඛ-** Appanihita-Vimokkha: විමොක්ක දොරටු තුනෙන් එකකි. පංචස්කන්ධය දුක බව මෙනෙහි කරමින් එයට ඇති ආශාව දුරුකර ලබා ගන්නා විමුක්තියය. **බලන්න:** විමොක්ක දොරටු තුන.
▲**අප්පණිහිත සමාධිය-** Appanihita Samadhi-undirected concentration: පංචස්කන්ධය දුක බව මෙනෙහි කරමින් ලබාගන්නා සමාධියය, නිවනට මගකි. **බලන්න:** විමොක්ක දොරටු තුන. **මූලාශ්‍ර:** සංයු.නි: ( 4 ): අසංඛතසංයුත්ත:9.2.8 අප්පණිහිතසමාධි සූත්‍රය, පි. 667, ESN:43: Asnkathasamyutta: Concentration-viii, p. 1509.
▲**අපුණ්‍යාභිසංස්කාර** -De-meritorious karmic formations
එනම් සියලු අකුසල- අපුණ්‍ය ක්‍රියාය. ඒවා දුගතිය ඇතිකරයි.
**බලන්න**: කර්ම.
▲ **අප්‍රමාදය හා ප්‍රමාදය**: **පාලි**: **අප්පමාද, පමාද**-heedless & heedfulness
දහම් මගේ අප්‍රමාදය ලෙසින් පෙන්වා ඇත්තේ මග වඩා ගැනීමට උනන්දුවෙන් කටයුතු කිරීමය. අප්‍රමාදය අවිප්‍රවාසය (තැවුල) ලෙසින්ද දක්වාඇත. සසර බිය දැක, සතිය හා ප්‍රඥාව ඇතිකර, විරියෙන් මග වඩාගෙන විමුක්තිය ලබාගැනීමට කටයුතු කිරීම අප්‍රමාදය ය, සසර බිය දැකීම නිසා ඇතිවෙන අප්‍රමාද, මහා සංවේගය (දහමේ හැසිරීමට සිත නතුවීම) ලෙසින්ද දක්වයි. ප්‍රමාදය යනු දහමට අනුව කටයුතු නොකිරීමය, දහම අනුගමනය නොකිරීමය, දහමට උනන්දුනොවීමය, සසර දික්කර ගැනීමය. **සටහන:** විස්තර පිණිස **බලන්න**: ධම්මපද: අප්පමාද වග්ග. **ශබ්දකෝෂ:** **පා.සි.ශ**:පි.77: "**අප්‍රමාදය:** සමෘති, අවිප්‍රවාසය (සිහියෙන්සිටීම), නොපමාවීම". **B.D**: p.46: "**appamāda:** Zeal, non-laxity, earnestness, diligence, is considered as the foundation of all progress...In the commentaries, it is often explained as the presence of mindfulness (satiyā avippavāsa)". **P.T.S**: p.143: "**appamāda:** thoughtfulness, carefulness, conscientiousness, watchfulness, vigilance, earnestness, zeal".
▼ **සියළුම කුසල දහම අප්‍රමාදය මුල්කොට පවතී**: සියලුම කුසලදහම , කුසලයට අයත් කොටස්, කුසල පක්ෂයට වැටෙන දේ යන මේ හැම අප්‍රමාදය මුල්කර ගෙන ඇත, අප්‍රමාදයට ඇතුලත්වී ඇත, සියලු කුසල ධම්මයට අප්‍රමාදය අග්‍රවෙ. අප්‍රමාදයෙන් කටයුතු කරන භික්ෂුව සප්ත බොජ්ඣංග දහම් වඩාගැනීමට විපුල කරගැනීමට කටයතු කරයි -නිවනට

ළංවී සිටි. **“යෙ කෙචි භික්ඛවෙ, ධම්මා කුසලා කුසලභාගියා කුසල පක්ඛියා, සබ්බෙ තෙ අප්පමාදමූලකා, අප්පමාදසමොසරණා, අප්පමාදො තෙසං ධම්මානං අග්ගමක්ඛායති’ අප්පමත්තස්සෙතං භික්ඛවෙ, භික්ඛුනො පාටිකඞ්ඛං සත්ත බොජ්ඣඞ්ගෙ භාවෙස්සති, සත්ත බොජ්ඣඞ්ගෙ බහුලීකරිස්සති...”** ( Bhikkhus, whatever states there are that are wholesome, partaking of the wholesome, pertaining to the wholesome, they are all rooted in diligence, converge upon diligence, and diligence is declared to be the chief among them. When a bhikkhu is diligent, it is to be expected that he will develop and cultivate the seven factors of enlightenment) **මූලාශ්‍ර:** සංයු.නි: (5-1):මහාවග්ග:බොජ්ඣංග සංයුත්ත: 2.4.1 කුසල සූත්‍රය, පි. 212, ESN: 46: Bojjangasamyutta: 31.1 Wholesome-1, p.1766.

▼**කුසල දහම අතරින්** අග්‍ර වන්නේ, මූලික වන්නේ අප්‍රමාදයය. දහම් මග වඩාගැනීමට ප්‍රමාද නොවීම මගින් කුසලය වැඩි, දියුණුවට පත්වේ. (all wholesome qualities are rooted in heedfulness, heedfulness is declared foremost among them). **මූලාශ්‍ර:** අංගු.නි: (6):10 නිපාත: 10.1.2.5 අප්පමාද සූත්‍රය, පි.68, EAN: 10: 15-5 Heedfulness, p.497.

▼ **සියලු සත්ත්වයන් ගේ** පිය සටහන් ඇත් පිය සටහනට ඇතුළත් කිරීමට හැකි ලෙසින් සියලු කුසල දහම අප්‍රමාදයට ඇතුළත් කළ හැකිය, **බලන්න**: උපග්‍රන්ථය:5. **“සෙය්‍යථාපි භික්ඛවෙ යානි කානිචි ජඞ්ගමානං පාණානං පදජාතානි, සබ්බානි තානි හත්ථිපදෙ සමොධානං ගච්ඡන්ති... එව මෙව ඛො භික්ඛවෙ යෙ කෙචි  කුසලා ධම්මා සබ්බෙ තෙ අප්පමාදමූලකා...”**. **සටහන:** දහම් මග වඩාගැනීමට පමාද නොවීම මගින් සෙසු කුසලයන්ද දියුණුවට පත්වේ. **මූලාශ්‍ර:** අංගු.නි: (6 ):10 නිපාත: 10.1.2.5 අප්‍රමාද සූත්‍රය, පි.68, EAN: 10: 15.5 Heedfulness, p.497.

▼**අප්‍රමාදය කුසලයය, ප්‍රමාදය අකුසලයය**: කුසල සිත ඇතිකරගැනීමට අප්‍රමාදය වැනි වෙන්ත එකම කරුණක් නොමැතිබව මෙහි පෙන්වා ඇත. අප්‍රමාදය ඇතිවිට සිත ස්ථිරය, එනිසා දුසිරිත් ඇතිනොවේ. ප්‍රමාදය ඇතිවිට අකුසල වැඩේ, නිවන දුරවේ. අප්‍රමාදය කෙනකුගේ අර්ථය ඇතිකරයි. ප්‍රමාදය අනර්ථ යට හේතුවේ. **මූලාශ්‍ර:** අංගු.නි: (1) 1 නිපාත: 1.6.8 හා 1.9.1 සූත්‍ර, පි. 60,66, EAN:1 58.8 sutta,pi.40.

▼ **කුසල ඉපදවීමට** මූලික අප්‍රමාදයය. අප්‍රමාදය ඇතිවිට, ආරියඅටමග වඩා ගැනීමට කටයතු සැලසේ යයි බුදුන් වහන්සේ පෙන්වා ඇත. **සටහන:** අප්‍රමාද සම්පත්තිය ඇතිවීම ආරිය අටමග ඇතිවීමේ පෙර නිමිත්ත යයි මෙහි දක්වා ඇත. හිරු උදාවන බවට පෙර නිමිත්ත අරුණෝදයය. එලෙස අප්‍රමාදය ඇති පුද්ගලයා, ආරිය අටමග වඩා ගැනීමට පිළිපන් කෙනෙකි. **බලන්න:** උපග්‍රන්ථය:5, සංයු.නි: මග්ග සංයුත්ත: 1.6.6. අප්පමාද සූත්‍රය, පි.80, 1.6.13 සූත්‍රය, පි.84. **මූලාශ්‍ර:** සං.නි: (5-1):මහාවග්ග: මග්ගසංයුත්ත:අප්පමාද වග්ග: 1.1.31. තථාගත සූත්‍රය, පි 126. ESN: 45: Maggasamyutta:  Connected discourses on the Path: 139.1 The Thathagatha, p 1681.

▼ **භාග්‍යවතුන් වහන්සේ,** පිරිනිවන් පෑමට (පිරිනිවන්මන්වකයේදී) පෙර සංඝයාට වදාළ අවසාන අවවාදය වුවේ අප්‍රමාදව, එනම්, සිහිනුවණ ඇතිව

කටයුතු කරමින් සසරින් ගැලවීමට උත්සාහ කළයුතු බවය: **“ ...වය ධම්මා සඞ්ඛාරා අප්පමාදෙන සම්පාදෙනථා ති”**. සංස්කාරයෝ නැසෙන සුළුය, එබැවින් අප්‍රමාදව (එළැඹුවූ සිහියෙන්) රහත්බව පිණිස කළයුතු දේ සපුරාගන්න. **මූලාශ්‍ර:** දීඝ.නි: (2): 3 මහාපරිනිර්වාණ සූත්‍රය, පි.126, EDN: 16 Mahāparinibbāna Sutta: The Great Passing: The Buddha’s Last Days, p.171

▼**අප්‍රමාදය නිවන් මගය, ප්‍රමාදය මරණයට මගය:**

> **“අප්පමාදො අමත පදං - පමාදො මච්චුනො පදං**
> **අප්පමත්තා න මියන්ති - යෙ පමත්තා යතා මතා”**

අප්‍රමාදය නිවනට (අමතපදයට) මගය, අප්‍රමාද පුද්ගලයන් නොමැරෙති. ප්‍රමාදවීම මරණයට මගය, ඔවුන් මළවුන් වැනිය. **සටහන:** දහම් මගේ අප්‍රමාදව කටයුතු කරන අය යළිඋපත නැති අමතපද නම්වූ නිවන ලබති. එහෙත්, පමාදවූ මිනිසා මළගිය කෙනෙක් වැනිය, ඔහු යළි සසරට පැමිණේ. **මූලාශ්‍රය**: ධම්ම පදය:අප්පමාද වග්ග: ගාථාව: 21.

▼ **අප්‍රමාදය**ට ගරුකිරීම නිසා අපරිහානිය ඇතිවේ. **සටහන:** එක්සමයක දේවියක් බුදුන් වහන්සේ බැහැදැක අප්‍රමාදය, අපරිහාණි දහමක් යයි පැවසුහ. බුදුන් වහන්සේ එය අනුමතකොට වදාළහ. **මූලාශ්‍රය:** අංගු.නි: (4) 7 නිපාත: දේවතාවග්ග:7.1.4.1 අප්පමාදගාරව සූත්‍රය, පි.344.

▼**අට්ඨික සංඥා භාවනාව** විපුල කරගැනීමෙන් මහා සංවේගය- මහා අප්‍රමාදය ඇතිවේ.සසරබිය දැක නිවන් ලබාගැනීමට යුහුසුලුව කටයුතු කිරිමට පෙළෙඹේ. **මූලාශ්‍ර**: සංයු.නි: (5-1) මහාවග්ග:බොජ්ඣංග සංයුත්තය:7. ආනාපාන වග්ගය**:** 2.7.1 අට්ඨික සූත්‍රය, පි.268**,** ESN: 46: Bojjhaṅgasaṃyutta:VII. In and out Breathing, 57.1 The Skeleton, p. 1807

▼**හිරිඔතප් නැතිවීම ප්‍රමාදයට හේතුවේ, හිරි ඔතප් ඇතිවිට අප්‍රමාදවේ** කෙනෙක්තුල හිරිඔතප් නැතිවිට ඔහු දහමේ ප්‍රමාදවේ. කෙනෙක් ප්‍රමාදවූවිට, ඔහු තුල අගෞරවය- අනාදරය (disrespect), දොවචස්සතාවය ( මුරණ්ඩුබව- difficult to correct) හා පාපමිත්‍ර සේවනය ඇතිවේ. අප්‍රමාදය ඇතිකර ගැනිමෙන් එම අකුසල නැතිකර ගත හැකිය. **මූලාශ්‍ර**: අංගු.නි:(6):10 නිපාත: 10.2.3.6 තයෝධම්ම සූත්‍රය,පි.284, EAN:10: Tens,76-6.Incapable, p. 524.

▼**කුසලයේ අප්‍රමාද වීම (අප්පමාදො කුසලෙසු ධම්මෙසු)** ආධ්‍යාත්මික වර්ධනය පිණිස ඇති බහු උපකාර ධර්මයකි. **බලන්න**: බහු උපකාර ධර්ම. **මූලාශ්‍ර:** දීඝ.නි : (3 ): 11 දසුත්තර සූත්‍රය, පි. 483, EDN: 34: Dasuttara Sutta: Expanding Decades, p. 384.

▼**කායගතා සතිය** වඩාගැනීම, මහා සංවේගය ඇතිකර ගැනීම- අප්‍රමාදය ඇතිකර ගැනීම පිණිස පවතී. **බලන්න**: කායගතා සතියේ ප්‍රතිලාභ. **මූලාශ්‍ර:** අංගු.නි: (1): 1 නිපාත: කායගතාසති වග්ග සූත්‍ර, පි. 125, EAN:1: Mindfulness Directed to the Body, p.52

▼ **අප්‍රමාදය මෙලොව හා පරලොව අභිවෘද්ධිය පිණිස පවතී**
බුදුන් වහන්සේ, පසේනදී කෝසල රජතුමාට මෙසේ වදාළහ: “මහරජ යම් දහමක් මෙලොව හා පරලොව අභිවෘද්ධිය අත්පත් කොට සිටි නම්, අප්‍රමාදය ඒ එක් දහමය”: **“ එවමෙව බො මහාරාජ අප්පමාදො එකො ධම්මො යො උභො අත්ථෙ සමධිගය්හ තිට්ඨති දිට්ඨධම්මිකඤ්චෙව**

**සම්පරායිකඤ්චාති"** (...diligence is the one thing which secures both kinds of good, the good pertaining to the present life and that pertaining to the future life). **සටහන**: අවුවාවට අනුව ක්‍රියාකාරී අප්‍රමාදය නිසා කෙනෙක් 3 න් ආකාර පුණ්‍යක්‍රියා කරයි: දාන, ශිල හා සමාධි. ලොකුත්තර අප්‍රමාදය මගින් ජාන සමාපත්ති, මගඵල ලබාගැනීම ට හේතුවේ. **බලන්න**: ESN: note: 241, p. 535. **මූලාශ්‍ර**: සංයු.නි: (1 ) :සගාථවග්ග:කෝසලසංයුත්ත, 3.2.7**. අප්පමාද සූත්‍රය,** පි.186, ESN: 3: Kosalasmayutta: 18.8 Diligence -2, p. 242.

▼ **අප්‍රමාදයෙන් කලයුතු දහම් කරුණු:** කාය,වචී හා මනෝ දුශ්චරිතය හා මිථ්‍යා දිට්ඨිය හැර දැමීම. කාය,වචී හා මනෝ සුචරිතය හා සම්මා දිට්ඨිය ඇතිකර ගැනීම. එසේ අප්‍රමාදය ඇතිකර ගත්විට මරණය ගැන බිය යුතු නොවේ. **මූලාශ්‍ර**: අංගු.නි: (2 ): 4 නිපාත:4.3.2.6 අප්පමාද සූත්‍රය, පි. 252, EAN:4: 116.6 Heedfulness, p.190.

▼**දහමේ ප්‍රමාදවීම** උප කෙලෙසක් යයි බුදුන් වහන්සේ වදාළහ. **බලන්න**: උප කෙලෙස.

▼ **එක දහමක්** දියුණු කරගැනීමෙන් මෙලොව හා පරලොව ශුභ සිද්ධිය ඇති කරගත හැකිබව බුදුන් වහන්සේ මෙහිදී පෙන්වා ඇත. මේ පිළිබඳ යොදාගත් උපමා**: බලන්න**: උපග්‍රන්ථය:5. * **ඇත් පිය සටහන**: සියලු සතුන්ගේ පාසටහන් එක් ඇත්පා සටහනට ඇතුල් කලහැකිය. එලෙස, අප්‍රමාදය නම් එක දහමක් වඩාගැනීමෙන් මෙලොව පරලොව සුවය ලැබේ. * **කුටාගාරය:** කූටාගාර නිවසේ සියලු පරාල, එහි මුදුන් වහලේ එක්තැන්වේ. එලෙසඅප්‍රමාදය නම් එක දහම වඩාගැනීමෙන් මෙලොව පරලොව සුවය ලැබේ. * **බටමිටිය උපමාව:** බටකොළ කපන්නා, බටමිටියක් කපාගෙන එය උඩින් අල්වාගෙන, පහළද, දෙපසද මැනවින් තළා ගන්නාලෙස, අප්‍රමාදය නම් එක දහම වඩාගැනීමෙන් මෙලොව පරලොව සුවය ලැබේ. * **අඹ අත්ත උපමාව**: අඹ අත්තක් කැපුවිට එහි ඇති ගෙඩි හැම ඒ අත්තේ එකතුව තිබේ. එලෙස අප්‍රමාදය නම් එක දහම වඩාගැනීමෙන් මෙලොව පරලොව සුවය ලැබේ. * **සක්විතිරජු උපමාව:** සියලු සුළු කුමාරවරුරජවරු-පාලකයන්, සක්විති රජුගේ පාලනයට නතුවී සිටින ලෙසින්, අප්‍රමාදය නම් එක දහමක් වඩාගැනීමෙන් මෙලොව පරලොව සුවය ලැබේ. * **සඳ ආලෝකය උපමාව: සියලුම** තරකා එලියට වඩා සඳ එලිය ආලෝකමත්ය, එලෙස අප්‍රමාදය නම් එක දහම වඩා ගැනීමෙන් මෙලොව පරලොව සුවය ලැබේ. **මූලාශ්‍රය:** අංගු.නි: (4): 6 නිපාත:ධම්මිකවග්ග: 6.1.5.11 අප්පමාද සූත්‍රය, පි.156.

▼**වෙනත් මූලාශ්‍ර**: **1**. "...Verily, I say unto you now, O monks: 'All things are transient, work out your deliverance with earnestness'...These were the last words of the Buddha; for us a reminder not to give up the struggle against the fetters of greed..., in order to escape the misery of sams*ara*...':"**Earnestness**" by Vappo Thera, Bodhi leaves, Vol. I, BPS,1968. **2**. " පමාදය යනු යම්කිසි දෙයක් කලයුතු විට එය නොකර හැරීමය.අකුසලයකි...".**කෙලෙස් එක්දහස් පන්සීය**: පි. 46, රේරුකානේ චන්ද විමල නාහිමි, 2008.

▲ **අප්‍රමානය:** පාලි: **අපරිමානං**- immeasurable: අප්‍රමාන යනු ප්‍රමාණ කල නොහැකි, මැනිය නොහැකි බවය, අසීමිත බවය, ලෝකෝත්තර

බවය. සතර බ්‍රහ්ම විහාර වැඩිය යුත්තේ සියලු ලෝක සත්ත්වයන් කෙරෙහි අප්‍රමාණවූ සිතකින් යුක්තවය. **බලන්න**: බ්‍රහ්මවිහාර.

▲ **අප්‍රමාන සමාධිය-** Measureless Samadhi: අප්‍රමාන සමාධිය ඇතිව, ප්‍රඥාව සහිතව, සතිය වඩා ගැනීමෙන්, පස් ආකාර ඥාණ- පංචසමාධි ඥාන ඇතිවේ යයි බුදුන් වහන්සේ පෙන්වා ඇත: **"සමාධිං භික්ඛවෙ භාවෙථ අප්පමාණං නිපකානං පතිස්සතානං" (**Bhikkhus, being alert and mindful, develop concentration that is measureless).**පංච සමාධි ඥාන:** 1) මේ සමාධිය නිසා වර්-තමානයේදී සුඛවිපාක ඇත, මතුවේද සුඛවිපාක ඇත. **(අයං සමාධි පච්චුප්පන්න සුඛො චෙව ආයතිං ච සුඛවිපාකොති)** 2) මේ සමාධිය ආරියය, නිරාමිසය (කෙළෙසුන්ගෙන් තොරය ) **(අයං සමාධි අරියො නිරාමිසොති).** 3) මේ සමාධිය උතුම්නො වන අය පුහුණු කරන දෙයක් නොවේ **(අයං සමාධි අකාපුරිසසෙවිතො ති)** 4) මේ සමාධිය ශාන්තය, ප්‍රණීතය (උතුම්ය), සිත පස්සදියට පත්වී, ඒකාගතවීමෙන් මේ සමාධිය ඇතිවිය. උත්සාහකර කෙලෙස් යට කිරීමෙන් මේ සමාධිය ඇතිනොවේ **(අයං සමාධි සන්තො පණීතො පටිප්පස්සද්ධාලද්ධො එකොදිභාවාධිගතො න ච සසංඛාරනිග්ගය්හ වාරිතවතො ති)** 5) මම සිහි ඇතිව මේ සමාධියට සමවදිමි, සිහිඇතිව සමාධියෙන් නැගිටිමි යයි යෝගියා අදිටන් කරගනී. **(සො ඛො පනාහං ඉමං සමාධිං සතො ච සමාපජ්ජාමි සතො ච උට්ඨහාමි ති). මූලාශ්‍ර:** අංගු.නි: ( 3 ): 5 නිපාත: 5.1.3.7 සමාධි සූත්‍රය, පි. 58, EAN:5: 27.7 Concentration, p.244.

▲**අප්‍රසන්න ක්‍රියා**-Unpleasantness: මෙයින් පෙන්වා ඇත්තේ සංඝයා අප්‍රසන්න බවින් ගිහියන්ගේ අනර්ථය පිලිබඳ කටයුතු කරනවිට, ඔවුන් කෙරේහි, අප්‍රසාදය පලකිරීමට ගිහියන්ට හැකිබවය. කරුණු 8 ක් ඇතිව ඔවුන් අප්‍රසන්නව කටයුතු කරති: 1) ගිහියන්ට අලාභ ඇතිකරයි 2) අනර්-ථය ඇතිකරයි 3) ගිහියන්ට ආක්‍රෝෂ කරයි 4) ගිහියන්ට පරිභව කරයි 5) ගිහියන් අතර භේද ඇතිකරයි 6) බුදුන්වහන්සේ ගැන අගුණ පවසයි 7) දහම ගැන අගුණ පවසයි 8) සංඝයා ගැන අගුණ පවසයි. **බලන්න**: ප්‍රසාද **මූලාශ්‍රය:**අංගු.නි: (5):8 නිපාත: සතිවග්ග: 8.2.9.8 සූත්‍රය, පි.378.

▲ **අප්‍රසාදික පුද්ගල**: පාලි: **අපාසාදිකෙ**-Not inspiring person අප්‍රසාදික පුද්ගලයා යනු දහම් මග පිලිබඳ සතුට, විස්වාසය නොමැති කෙනාය. අන්‍යන්ට ඔහුගේ චරියාව ගැන ප්‍රසාදයක් ඇතිනොවේ. **බලන්න**: EAN:note:1222, p. 641. එවැනි පුද්ගලයන්ගේ ආධ්‍යාත්මික වර්-ධනයට අනතුරු -ආදීනව ඇතිවේ: 1) තමාට උපවාදකරගනී2) ප්‍රඥාවන්තයන්ගේ දෝෂාරෝපණයට ලක්වේ 3) ඔහු ගැන අපකීර්තිය පැතිරේ 4) සිහිය වියවුල්ව මරණයට පත්වේ 5) මරණින් මතු දුගතියේ යළි උපත ලබයි 6) මුලසිටම, විස්වාසිබව නොමැතිවූ නිසා, විස්වාසය ඇතිකර ගැනීමට හැකිනොවේ 7) යම් විස්වාසයක් ඇතිවුවත් එය වෙනස්වේ 8) ආචාර්ය වරයාගේ ඉගැන්වීම් අත හැර දමයි 9) එබඳු පුද්ගලයන්ගේ අයහපත් චරියාව, ඔහුගේ ගෝලයන් අනුගමනය කරයි 10) සිත ප්‍රසන්න බවට- ශාන්තබවට පත්නොවේ. **බලන්න**: ප්‍රසාදික පුද්ගල. **මූලාශ්‍ර**: අංගු.නි: ( 3): 5 නිපාත: 5.5.2.7 අපාසාදික සූත්‍ර 2 කි, පි.434, EAN:5: 217.7 Not Inspiring confidence -2 suttas, p. 307.

▲ **ආපෝ ධතුව-**Water element: ආපෝ ධාතුව: ජලයය. කය සකස්වී ඇති ජල -ද්‍රව කොටස් ද බාහිරව ඇති ජලයද ආපෝ ධාතුව ලෙසින් හඳුන්වයි . **බලන්න**: සතර මහා භූතයෝ.

▲**ඇපකාර නොවන දහම-**Dhamma that has no guarantor
දහම් 4 ක් පිලිබඳ කිසිවෙකුට ඇපකාරකිරිමට- සහතික කිරීමට නොහැකි යයි බුදුන් වහන්සේ පෙන්වා ඇත: 1) වයසට යෑම නතරකිරීමට 2) ලෙඩ දුක් ඇතිවීම නතරකිරීමට 3) මරණය නතරකිරීමට 4) අයහපත් කම්ම ඵල දීම නතරකිරීමට. **මූලාශ්‍රය:** අංගු.නි: (2): 4 නිපාත: බ්‍රාහ්මණවග්ග: 4.4.4.2 පාටිභොග සූත්‍රය, පි.356.

**අබ**

▲**අබ්‍යාකතාවත්ථු** -Undeclared points : අබ්‍යාකතාවත්ථු ලෙසින් මෙහි පෙන්වා ඇත්තේ බුදුන් වහන්සේ විසින් ප්‍රකාශ නොකරන ලද කරුණු 10 ගැනය. එනම්, ලෝකය නිත්‍යද ආදී දිට්ඨි 10 යය. විස්තර පිණිස **බලන්න:** දිට්ඨි. එවැනි දිට්ඨි, මත ඇතිවූ විට සාමාන්‍ය පෘතග්ජනයා කැළඹේ, එහෙත්, දහම දත් ආරිය ශ්‍රාවකයා නොකැළඹේ, ඒවා ගැන ඔහුට විචිකිච්ඡාවක් නොහටගනී. **බලන්න**:දිට්ඨි. **මූලාශ්‍රය:**අංගු.නි: (4) 7 නිපාත: 7.2.1.1 අබ්‍යාකතවත්ථු සූත්‍රය, පි.400.

▲**අබ්‍යාපජ්ජ ධම්ම**-Abbyapajja Dhammaමෙහි අබ්‍යාපජ්ජ ධම්ම ලෙසින් පෙන්වා ඇත්තේ දුක රහිත දහමය, එනම් නිවනය. **මූලාශ්‍රය:**සංයු.නි: (4) සළායතනවග්ග: අසංඛතසංයුත්ත: 9.2 අබ්‍යාපජ්ජ සූත්‍රය, පි.688.

▲**අබ්භවලාහක දෙවියෝ-** storm-cloud devas :වලාහක දෙවනිකායට (වලාකුළු දෙවියෝ) අයත් දෙවියන් සතර කොටසින් එක් කොටසක් මෙසේ හඳුන්වා ඇත.ඔවුන් කුණාටු වලාකුළු ඇතිකරති. සමහර අවස්ථාවන්හිදී ඔවුන්ගේ සතුට පෙන්වීම පිණිස, ඒ වලාකුළු ඇතිකරණ බව මෙහි පෙන්වා ඇත**. බලන්න**:වලාහකදේවනිකාය. **මූලාශ්‍රය**: සංයු.නි: (3) ඛන්ධවග්ග: වලාහකසංයුත්ත:11.1.55 අබ්භවලාහක සූත්‍රය, පි.544.

▲ **අබ්බහෝකාසික** -who dwell in the open air: ධුතාංග පුහුණුව ලෙසින් එළිමහණෙ වාසය කරන සංඝයා අබ්බහෝකාසික ලෙසින් පෙන්වා ඇත. **මූලාශ්‍රය:**අංගු.නි: (3) 5 නිපාත: ආරඤ්ඤකවග්ග: 5.4.4.7 අබ්බහෝකාසික සූත්‍රය, පි.380.

▲**අබ්භූත**-Abbhutha මෙහි අබ්භූත ලෙසින් පෙන්වා ඇත්තේ හටනොගත් බවය. හටනොගත් දහම නම් නිවනය. නිවන හේතුප්‍රත්‍යයෙන් හටගත් දහමක් නොවේ. **බලන්න**:නිවන. **මූලාශ්‍රය:** සංයු.නි: (4) සළායතනවග්ග: අසංඛතසංයුත්ත: 9.2 අබ්භූත සූත්‍රය, පි.688.

▲**අබිජ්ජාව හා විෂම ලෝභය**: පාලි: අභිජ්ඣාවිසම ලොභො- Covetousness and unrighteous greed :අබිජ්ජාව ( අභිජ්ජා) හා විෂම ලෝභය ලෙසින් දක්වා ඇත්තේ අනුන්ගේ සම්පත් ආදිය පිළිබඳව, කෙනෙක් තුල ඇති දැඩි ආශාව- තණ්හාවය. මෙය සිත කෙලෙසෙන කරුණකි, අකුසලයකි, දුගතිය ඇති කරයි. අබිජ්ජාව, දැඩිආසාව (longing) ලෙසින්ද පෙන්වා ඇත.**බලන්න:** උපකෙළෙස. **සටහන**: සතර සති පට්ඨානය වැඩීම පිණිස, ලෝකය පිලිබඳ ඇති අබිජ්ජාව පහ කර ගතයුතුවේ**. බලන්න**: සති පට්ඨාන සූත්‍රය.

▼ **බුදුන් වහන්සේ** අබිජ්ජාව ඇති කෙනෙකුගේ ස්වභාවය මෙසේ දක්වා ඇත: “මේ ලෝකයේ කෙනෙක් හට අබිජ්ජාව ඇත. අනුන් සතු ධනය

සම්පත් ආදිය ගැන ඔහුට දැඩි ලෝභයෙන් මෙසේ සිතයි: 'අහෝ, අනුන්සතු ඒ දේ (සම්පත්) මගේ වේවා' යයි ඔහු පතයි'.
**"ඉධ භික්ඛවෙ එකච්චො අභිජ්ඣාලු හොති යං තං පරස්ස පරවිත්තූපකරණං, තං අභිජ්ඣිතා හොති, 'අහොවත යං පරස්ස තං මම අස්සා'ති."** එවැනි අය ඒකාන්තයෙන්ම නිරයට යයි. **මූලාශ්‍ර:** අං.ගු.නි: (6 ): 10 නිපාත: කරජකාය වග්ග: 10.5.1.1. පඨම නිරය සූත්‍රය, පි. 548, ජානුසොණි වගග: 10.4.2.10: චුන්ද සූත්‍රය, පි.508, EAN:10: The Deed-born body: 211.1 Hell, p. 556, Jāṇussoṇī: 176.10: Cunda, p.553.
▼ **තමාට අබිජ්ජාව ඇති,** වෙනත් අය තුල ද අබිජ්ජාව ඇතිකරණ, එය අනුමත කරන, එහි ගුණ කියන පුද්ගලයෝ නිරයගාමිය. එම කරුණු අතහැර දහම පුරුදු පුහුණු කරන අය සුගතිගාමිය. අබිජ්ජාව නිසා කම්ම සිව්ආකාරයකට රැස්වේ: 1) තමන් අබිජ්ජාවේ යෙදීම 2) අනුන් අබිජ්ජාවේ යෙදවීම 3) අබිජ්ජාව අනුමත කිරීම 4) අබිජ්ජාව වර්ණනා කිරීම. **මූලාශ්‍ර:**අං.ගු.නි: (2): 4 නිපාත: 4.7.8 අභිජ්ජා සූත්‍රය, පි. 512, EAN:4: VII: Course of kamma: 265.2 sutta, p. 233.
▼**වෙනත් මූලාශ්‍ර: 1.** "අභිධ්‍යා:නම් අන්‍යයන්ගේ සම්පත්ති පිළිබඳව බලවත් ලෙස ඇලීම, ලෝභකිරීම, සිතීමය": සද්ධර්ම කෝෂය, පි. 114. **2.** "අභිද්‍යාව: අනුන්ගේ සම්පත් දැක (පරභාණ්ඩ) ඒවා තමාට අත්වේවා යයි සිතීම, එසේම තමාගේ දේ පිලිබඳ ඇති ලෝභය...": බෞද්ධයාගේ අත්පොත, පි. 81, රේරුකානේ චන්දවිමල මහා නාහිමි. **3.** "අභිජ්ජා හා විෂම ලෝභයට පදනම ලෝභ චේතනාවය. අභිජ්ජා යනු, කෙනෙක් තමන්ට අයත්යයි සිතන දේ පිලිබඳ ඇති ආසාවය-දැඩි බැඳීමය. උදා: තමාගේ කය, බිරිඳ/ස්වාමියා, දරුවන්, දේපල ආදියට ආසා කිරීම. අන්අය සතු දේට අසා කිරීම, ඒවා තමාට අත්කරගැනීමට ඇති බලවත් තණ්හාව විෂම ලෝභයවේ. අභිජ්ජාව ඇති තැනැත්තා වස්තුව රැස්කරනවා විනා අනුන්ට දීමට හෝ තමන්ට ප්‍රයෝජනයට ගැනීමට වස්තුව යොමු නොකරයි..." **: දිනමිණ සජීව ජාල පුවත්පතේ** පළවූ ලිපිය: 2012 අගෝස්තු 08. " වත්ථුපම සූත්‍රය" http://archives.dinamina.lk/2012/08/08/_art.asp?fn=a1208082)
▲ **අබ්‍රහ්මචරියාව**: පාලි: අබ්‍රහමචරියං - the unholy life :අබ්‍රහ්මචරියාව ලෙසින් පෙන්වා ඇත්තේ, බුදුසසුනේ ඇති බ්‍රහ්මචරියාව නොවන මිථ්‍යාදිට්ඨිය ඇති වැරදි මග අනුගමනය කිරීමය. අනාරිය (මිථ්‍යා) අටමග අනුගමනය කිරීමය**: "...අයමෙව බො ආවුසො අට්ඨඞ්ගිකො මිච්ඡා මග්ගො අබ්‍රහමචරියං...". සටහන:** මේ සූත්‍රය ආනන්ද තෙරුන් විසින් භද්දිය තෙරුන්හට වදාළහ. **මූලාශ්‍ර:** සංයු.නි: (5-1):මහාවග්ග: මග්ග සංයුත්තය: 1.2.7 කුක්කුටාරාම සූත්‍රය, පි. 54, ESN: Maggasamyutta: 18.8 The cock's park, p.1623.

**අභ**

▲ **අභූත-** un-become : අභූත යනු සකස්වි නැති බවය, මෙය නිවන හඳුන්වන පදයකි. **බලන්න**: නිවන. **මූලාශ්‍රය**: ඛු.නි: ඉතිවුත්තක: 2.2.6 අජාත සූත්‍රය, පි. 393.
▲**අභය**- Fearless : අභය- බියරහිත බවය, නිවන හඳුන්වන පදයකි. **අභයපත්ත** යනු නිවනට පැමිණීමය. **මූලාශ්‍ර**: අං.ගු.නි: (5 ): 9 නිපාත, 9.2.1.5 හා 9.2.1.6 සූත්‍ර, පි. 570, EAN: 9: I Security: 56.5 & 56.7 suttas, p. 485.
▲ **අභය රාජකුමාර**- Prince Abhaya : **බලන්න**: උපග්‍රන්ථය:1

▲ **අභය රාජකුමාර තෙර-** Abhaya ( Prince) Thera: **බලන්න**: උපග්‍රන්ථය:1

▲**අභා-**Bright lights : අභා ලෙසින් පෙන්වා ඇත්තේ විහිදෙන රශ්මිය ඇති ආලෝකයන්ටය. අභා 4 ක් වේ: චන්දඅභා (සඳ කිරණ), සූර්ය අභා (හිරු රශ්මිය), අග්නිඅභා (ගින්දර රශ්මිය), ප්‍රඥාඅභා (ප්‍රඥා රශ්මිය). මේ අතුරින් ප්‍රඥාඅභා අග්‍රයයි බුදුන් වහන්සේ පෙන්වා ඇත. **සටහන**: * මේ වග්ගයේ වෙනත් සූත්‍රයන්හි : මේ රශ්මි 4, පභා (දීප්තිමත් රශ්මි),ලෙසින්ද ආලෝක ලෙසින්ද, ඕභා- බබලන දේ (අවභාසයෝ) ලෙසින්ද, ප්‍රභාස්වර (පජ්ජතෝ) ලෙසින්ද පෙන්වා ඇත.**බලන්න**: 4.3.5.2-4.3.5.5. සූත්‍ර. **මූලාශ්‍රය:**අංගු.නි: (2): 4 නිපාත: අභාවග්ග:4.3.5.1 අභාසූත්‍රය, පි.290.

▲**අභිජාන**-Directly knowing :අභිජාන ලෙසින් මෙහි දක්වා ඇත්තේ පංච උපාදානස්කන්ධය පිලිබඳ පූර්ණ අවබෝධය තමන් විසින්ම යථාලෙසින් අවබෝධ කරගැනීමය. එනම්, ඥාතපරිඥාවෙන්, තිරණ පරිඥාවෙන් හා ප්‍රහාණ පරිඥාවෙන් දන්නා බවය. ඒ දැනුම දුක නැති කිරීම පිනිසවේ. **සටහන:** ඥාතපරිඥාව (the full understanding of the known) , තිරණපරිඥාව (full understanding by scrutinization), ප්‍රහාණ පරිඥාව (the full understanding as abandonment). **බලන්න**: ESN: note: 42,p.1176. **මූලාශ්‍ර**: සංයු.නි: (3) ඛන්ධවග්ග:භාරවග්ග: 1.1.3.3. අභිජාන සූත්‍රය, පි.76, ESN:22: Khandasamyutta: 24.3 Directly knowing, p.1022.

▲ **අභාවනිය හා භාවනිය-** Not esteem & esteem :අභාවනිය යනු බුහුමන්- ගරුසැලකිලි (ගෞරව) නොලැබිමය. භාවනිය යනු ගරු සැළකිලි ලැබීමය. සංඝයා බුහුමන් නොලැබීමට හා ලැබීමට හේතු, මේ සූත්‍රයේ විස්තර කර ඇත. **මූලාශ්‍ර**: අංගු.නි: (3 ): 5 නිපාත: 5.5.4.1 අභාවනිය සූත්‍රය, පි. 448, EAN:5: 231.1. Not to be esteemed, p.308.

▲**අභබ්බ-**Incapable :අභබ්බ ලෙසින් පෙන්වා ඇත්තේ කළ නො හැකිබවය. කෙළෙස් සහිත පුද්ගලයාට ආධ්‍යාත්මික මග සපුරා ගැනීමට නොහැකිය. එසේම සෝතාපන්න පුද්ගලයාගේ පහකරගත් කෙළෙස් නැවත ඇතිවීමක් නොවේ. ඔහු විසින් පහකළ සක්කායදිට්ඨිය, විචිකිච්චාව, සීලබ්බතපරාමාස, අපායගමනිය රාගය, දෝසය හා මෝහය නැවත ඇතිකරගැනීමට නොහැකිය.**බලන්න:** දිට්ඨිසම්පන්න, සෝතාපන්න. **මූලාශ්‍ර:** අංගු.නි: (4 ): 6 නිපාත: 6.2.4.7 අභබ්බ සූත්‍රය, පි. 268, EAN:6: 91.7 Incapable, p. 362.

▲ **අභව්‍ය**- Incapable :අභව්‍ය ලෙසින් පෙන්වා ඇත්තේ, සෝතාපන්න පුද්ගලයෙකුට කළ නොහැකි කරුණුය. **බලන්න:** සෝතාපන්න,අභබ්බ.

▲ **අභබ්බාගමන -** abhabbāgamana :අභබ්බා යනු ආරියමග අනුගමනය කිරීමට සුදුසුනොවන, හැකියාව නොමැති පුද්ගලයාය. ඔහු යන වැරදි මග අභබ්බාගමනයය. ඔහු ගමන් කරන්නේ අදහම් මගේය, පරිහාණියට යන මගේය, එය නුසුදුසු ගමනකි. **ශබ්දකෝෂ: පා.සි.ශ**: පි.87: “**න-භබ්බා අභබ්බාති අභබ්බා ය**. අභබ්බා යනු සුදුසු නොවන බවය”. **B.D**: p. 13: “abhabbāgamana: incapable of progressing”. **P.T.S**: p.153: “abhavya has a different meanings- impossible, not likely, unable”

▼**ධම්මපදයේ** අප්පමාද වග්ගයේ මෙසේ දක්වා ඇත:
**“අපපමාදරතෝ භික්ඛු - පමාදේ භයදස්සි වා**
**අභබ්බෝ පරිහාණාය - නිබ්බාණස්සේව සන්තිකෙ”** අප්‍රමාදයෙහි ඇලුන,

ප්‍රමාදයෙහි බිය දකින භික්ෂුව පරිහාණියට (අභබ්බාගමනට) පත්නොවේ, එතුමන් නිවන අසලය. **මූලාශ්‍ර:** ධම්ම පදය: අප්‍රමාද වග්ග: 32 **ගාථාව. සටහන්**: * **පුග්ගලප්‍රඥප්පතියට** අනුව: කෙනෙක් අභබ්බාගමනට පත්වන්නේ : අයහපත් කම්ම විපකයක් ඇති නිසා හෝ සිතතුල පවතින කෙළෙස් නිසා හෝ අකුසල් ක්‍රියාවල යෙදෙන නිසා හෝ දහම පිලිබඳ ශ්‍රද්ධාව, ඡන්දය, ප්‍රඥාව නොමැති නිසාය. එවන් පුද්ගලයන්ට ලෝකෝත්තර මගට පැමිණීමට හැකියාව නැත. ** **අටුවාවට** අනුව අයහපත් කම්ම විපාක ලෙස පෙන්වා ඇත්තේ පංචානන්තරිය කම්මයන්ය. කෙළෙස් ලෙසින් පෙන්වා ඇත්තේ මිථ්‍යාදිට්ඨියය. ** **ම.නි: චූල සකුළුදායි සූත්‍රයට** අනුව: සකුළුදායි පරිබ්‍රාජිකයා, භාග්‍යවතුන්වහන්සේ වෙතින් දහම් අසා පැහැද සසුනට ඇතුළුවීමට අවසර ඉල්ලා සිටිනවිට ඔහුගේ ශිෂ්‍යයන් එය වලකාලිය. එමනිසා දහම්මග ඔහුට අහිමිවිය. එසේවීමට හේතුවුවේ පෙර කම්ම විපාකයක් නිසා බව අටුවාවේ සඳහන්වේ. **බලන්න**:EMN: Note:786, p. 1137.

▲ **අභිඥා-** direct knowledge :අභිඥා (**අභිඤ්ඤා**) ලෙසින් පෙන්වා ඇත්තේ ප්‍රඥාවෙන් දැන (පරිඥෙය්‍යා) අවබෝධ කර ගතයුතු දහමය. යම් දහමක් පිලිබඳ විශේෂ නුවණින් අවබෝධ කරගැනීමය (තමා විසින්ම). එනම්, නිවන සාක්ෂාත් කරගැනීමට ඉවහල්වන **උත්තම ඥානය** අවබෝධ කිරිමය. මෙය විශේෂ ඥානය හෝ උසස් ඥාණය, අධිප්‍රමාණ බල, අතිසාමාන්‍ය බල, ප්‍රතිභානය හෝ සහජඥානය ලෙසින්ද හඳුන්වයි. බුදුන්වහන්සේ හෝ රහතන්වහන්සේ සතු අධ්‍යාත්මික බල අභිඥාය. සමාධි සමාපත්ති ලැබීමෙන් හා නිවන් මග සාක්ෂාත් කරගැනීමෙන් මේ උසස් අවබෝධය- විශේෂ ඥාන ලැබෙන බව බොහෝ සූත්‍ර දේශනාවල පෙන්වා ඇත. **බලන්න:** සය අභිඥා. **ශබ්දකෝෂ: පා.සිං.ශ:** පි. 89: "**අභිඤ්ඤා:** දැනීම, අවබෝධය, විශේෂයෙන් දන්නා බව".

▼**එම අවබෝධය සතර ආකාරය** :1) ප්‍රඥාවෙන් දැන අවබෝධ කලයුතු දහම් කරුණු: පංච උපාදානස්කන්ධය 2) ප්‍රඥාවෙන් දැන පහකලයුතු දහම් කරුණු: අවිද්‍යාව හා භව තණ්හාව3) ප්‍රඥාවෙන් දැන වැඩියයුතු (භාවිතබ්බ) දහම් කරුණු: සමථ හා විපස්සනා.4) ප්‍රඥාවෙන් දැන සාක්ෂාත් (ප්‍රත්‍යක්‍ෂ) කලයුතු දහම් කරුණු :විද්‍යාව හා විමුක්තිය. **මූලාශ්‍ර**:අංගු.නි: (2 ): 4 නිපාත: 4.6.1 අභිඤ්ඤා සූත්‍රය, පි. 496, EAN:4: 254.1 Direct knowledge, p. 231.

▼ **අරහත්වය පිණිස**: රාගය, දෝසය හා මෝහය ක්‍ෂය කිරීමට එම විශේෂ අවබෝධය - අභිඥාව ලබා ගත යුතුවේ. **මූලාශ්‍ර**: අංගු.නි: (2): 4 නිපාත: 8. රාගාදීපෙය්‍යාලය වග්ග සූත්‍ර, පි. 516, EAN:4: VIII: Lust & so forth, p. 233.

▲**අභිඥෙයිය ධම්ම**: පාලි: **අභිඤ්ඤෙය්‍යා ධම්මා** -Dhamma to be thoroughly learnt : අභිඥෙයිය ධම්ම ලෙසින් පෙන්වා ඇත්තේ විශේෂ නුවණින් (ඥාතපරිඥාවෙන් -විශේෂයෙන් දත යුතු), යහපත් ලෙසින්ම අවබෝධ කරගතයුතු ධම්මතාවන්ය. **සටහන්:** * මෙහිදී දක්වා ඇත්තේ සියල්ල (සබ්බ) වෙසෙසින් දැනගැනීම අභිඥෙයිය (අභිඤ්ඤෙය්‍යා) බවය. සියල්ල යනු සළායතන, බාහිර අරමුණු, එනිසා ඇතිවෙන විඥානය, ස්පර්ශය හා ත්‍රිවිධ වේදනා, ඒ හැම අනිච්ච බව අවබෝධ කරගතයුතුය. **බලන්න:**සංයු.නි: (4) සළායතනවග්ග: වේදනාසංයුත්ත: සබ්බ අනිච්චවග්ග: 1.5.4 අභිඤ්ඤෙය්‍යා සූත්‍රය, පි.87. ** මෙහිදී අභිඥා ධම්ම 4

ක් පෙන්වා ඇත. **බලන්න**: අංගු.නි: (2) 4 නිපාත: අභිඤ්ඤාවග්ග: 4.6.1 සූත්‍රය, පි.496.

▼**සය අභිඥා:** සියලු කෙළෙස් පහකර, දුක නිමකර නිවන ලබාගැනීම පිණිස අවබෝධ කලයුතු ධම්ම සමුදායේ, සය ධම්ම ලෙසින් පෙන්වා ඇත්තේ: **සය අභිඥාවන්ය** (ඡ අභිඤ්ඤා- සයං අභිඤ්ඤා- six super-knowledge) : **1) සියලු සත්වයෝ ආහාරය (**පෝෂණය) හේතු කොට ගෙන ජීවත්වේ. **(**සබ්බෙ සත්තා ආහාරට්ඨිතිකා**) 2) සංඛත ධාතුව** (සඞ්ඛත ධාතු - හේතු ප්‍රත්‍ය යෙන් හටගත් ධාතුන්-conditioned element (පංච උපාදානස්කන්ධය ආදී) **3) අසංඛත ධාතුව** (අසඞ්ඛත ධාතු**-** සකස් නොවූ ධාතුව, එනම් නිවනය- unconditioned element 4**) තුන් භවය:** කාම ධාතුව හෙවත් කාම භවය, රූප ධාතුව හෙවත් රූප භවය හා අරූප ධාතුව හෙවත් අරූප භවය. **5)** චතුසත්‍ය**. 6)** පංච විමුක්ති ආයතන- විමුක්තියට හේතුවන ධම්ම පහ. **බලන්න**: පංච විමුක්ති ආයතන. **මූලාශ්‍ර:** දීඝ.නි: (3 ): 11 දසුත්තර සූත්‍රය, පි. 483, EDN: 34: Dasuttara Sutta: Expanding Decades, p. 384.

▲**අභිනන්දන** - Delight :අභිනන්දන යනු යමක් නිසා සතුටුවීමය. මෙහිදී බුදුන් වහන්සේ පෙන්වා ඇත්තේ කෙනෙක්, සිව් ධාතු- සතර මහා භූත (පඨවි ආපෝ තේජෝ වායෝ) පතයි නම් ඔහු දුක කෙලවර කර නොමැති බවය. සිව්ධාතු ගැන සතුටුනොවන, ඒවා නොපතන කෙනා දුකින් මිදී ඇත. **මූලාශ්‍රය**: සංයු.නි: (2): නිදානවග්ග: ධාතුසංයුත්ත: 2.4.6 අභිනන්දන සූත්‍රය, පි.294.

▼**මෙහිදී පෙන්වා** ඇත්තේ කෙනෙක් පංච උපාදන්ස්කන්ධය අභිනන්දන කරන්නේ නම් ඔහු දුකින් මිදී නැති බවය. **මූලාශ්‍රය**: සංයු.නි: (3):ඛන්ධසංයුත්ත: භාරවග්ග: 1.1.3.8 අභිනන්දන සූත්‍රය, පි.82.

▼**මෙහිදී පෙන්වා** ඇත්තේ තණ්හා ආදී කෙළෙස් අභිනන්දනය කරන තැනැත්තා මාරයාගේ බැඳීමට-මාරපාශයට අසුවී ඇති බවය. ඒවා අභිනන්දන නොකරන පුද්ගලයා මාර බැඳීමෙන් නිදහස්වී ඇත. **මූලාශ්‍රය**: සංයු.නි: (3):ඛන්ධසංයුත්ත: අරහත්වග්ග: 1.2.2.3 අභිනන්දන සූත්‍රය, පි.158.

▼**මෙහිදී පෙන්වා** ඇත්තේ ඇස ආදී සය ඉන්ද්‍රිය පිළිගන්නා, ඒ ගැන අභිනන්දන කරන පුද්ගලයා දුකින් මිදී නැති බවය. එසේම, බාහිර අරමුණු අභිනන්දනය කරන පුද්ගලයාද දුකින් මිදී නැත. **මූලාශ්‍රය**: සංයු.නි: (4):සළායතනවග්ග:වේදනාසංයුත්ත: යමකවග්ග: 1.2.7 හා 1.2.8 අභිනන්දන සූත්‍රය, පි.52.

▲ **අභිනිවෙස-** Abhinivesa :අභිනිවෙස ලෙසින් පෙන්වා ඇත්තේ නැඹුරුවීමය (inclination), කැමැත්ත ඇතිවීමය. රූප, වේදනා, සංඥා, සංඛාර විඥාන ඇසුරු කොට, ඒවා ප්‍රත්‍ය කොට සංයෝජන අභිනිවෙස විනිබන්ධන උපදින බව මෙහි පෙන්වා ඇත. **මූලාශ්‍රය:**සංයු.නි (3) ඛන්ධසංයුත්ත:දිට්ඨිවග්ග: අභිනිවෙස සූත්‍ර 2කි, පි.362.

▲**අභිනිවෘතිය:** පාලි: අභිනිබ්බත්ති **-**Rebirth හා **අනභිනිවෘතිය:** පාලි: අභිනිබ්බත්ති -No birth :අභිනිවෘතිය ලෙසින් මෙහි පෙන්වා ඇත්තේ කෙළෙස් දුරු නොකිරීම නිසා යළි උපත ලැබීමය, එය දුකය. අනභිනිවෘතිය යනු සියළු කෙළෙස් පහකර, යළි උපත සහමුලින්ම නැතිකර ගැනීමය, එය සුඛය, සැපයකි. සැරියුත් තෙරුන් මෙසේ වදාළහ: **''අභිනිබ්බත්ති ඛො ආවුසො දුක්ඛා, අනභිනිබ්බත්ති සුඛා...'**. අභිනිවෘත්තිය (ඉපදීම) දුකය, අනභිනිවෘත්තිය (නො ඉපදීම) සුඛය. **මූලාශ්‍ර:** අංගු.නි: (6 )

: 10 නිපාත: 10.2.2.5 පඨම සුඛ සූත්‍රය, පි. 246, EAN:10: 65.5 Happiness 1,p. 519.

▲ **අභිභායතන**: පාලි: **අභිභායතනානි**- bases of overcoming: කසිණයන් අරමුණු කරගෙන සමවදින ජානසමාපත්ති අභිභායතන ලෙසින් පෙන්වා ඇත. සමාපාත්තියට අවහිරකරණ යම්කිසි සංඥාවක් ඇතිවූවිට එම සංඥාව අභිභවා (මැඩගෙන) යාමට ඇති හැකියාව නිසා මේ සමාපත්ති අභිභායතන ලෙසින් හඳුන්වයි. **බලන්න**:කසිණ. **ශබ්දකෝෂ : පා.සි.ශ**: පි.92 : **"අභිභව** යනු මැඩ පැවැත්වීමය- යටත් කරගැනීමය. අටවිධි අභිභායතන: කසිණ අරමුණු මගින් සමවදින ධ්‍යානසමාපත්ති අටය". **B.D**: p.13: "**abhibhāyatana**: the 8 stages of mastery are powers to be obtained by the means of kasina-exercises". **P.T.S**: p. 168: "position of a master or lord, station of mastery. The traditional account of these gives 8 stations or stages of mastery over the senses".

▼ **අභිභායතන අටකි**

**"අට්ඨිමානි භික්ඛවෙ අභිභායතනානි". 1) පළමු අභිභායතනය:** කසිණ භාවනාව අරමුණු කරගත් යෝගියා අභ්‍යන්තර රූප සංඥාව ලබයි; ඔහුට සීමිතවූ බාහිර රූපයන්ද පෙනේ; ධ්‍යානයෙන් එම රූප අභිබවා යැමට ඔහු සමත්වේ.න **2) දෙවෙනි අභිභායතනය: ...** අභ්‍යන්තර රූප සංඥාව ලබයි; ඔහුට අප්‍රමාණවූ බාහිර රූපයන්ද පෙනේ; ධ්‍යානයෙන් එම රූප අභිබවා යැමට ඔහු සමත්වේ. **3) තෙවෙනි අභිභායතනය: ...** අරූප සංඥාව ලබයි, ඔහුට සිමිතවූ බාහිර රූපයන්ද පෙනේ; ධ්‍යානයෙන් එම රූප අභිබවා යැමට ඔහු සමත්වේ.**4) සිව්වෙනි අභිභායතනය: ...**අරූප සංඥාව ලබයි; ඔහුට අප්‍රමාණවූ බාහිර රූපයන්ද පෙනේ; ධ්‍යානයෙන් එම රූප අභිබවා යැමට ඔහු සමත්වේ. **5) පස්වෙනි අභිභායතනය: ...**අරූප සංඥාව ලබයි; ඔහුට නීල කසිණ බාහිර රූපයන්ද (නිල් පැහැති මල් ආදිය) පෙනේ, ධ්‍යානයෙන් එම රූප අභිබවා යැමට ඔහු සමත්වේ. **6) සයවෙනි අභිභායතනය: ...**අරූප සංඥාව ලබයි; ඔහුට පීත කසිණ බාහිර රූපයන්ද (කහ පැහැති මල් ආදිය) පෙනේ, ධ්‍යානයෙන් එම රූප අභිබවා යැමට ඔහු සමත්වේ. **7) සත්වෙනි අභිභායතනය**: **...**අරූප සංඥාව ලබයි; ඔහුට ලොහිත කසිණ බාහිර රූපයන්ද (රතු පැහැති මල් ආදිය) පෙනේ, ධ්‍යානයෙන් එම රූප අභිබවා යැමට ඔහු සමත්වේ. **8) අටවෙනි අභිභා යතනය: ...**අරූප සංඥාව ලබයි; ඔහුට ඕදාත කසිණ බාහිර රූපයන්ද (සුදු පැහැති මල් ආදිය) පෙනේ, ධ්‍යානයෙන් එම රූප අභිබවා යැමට ඔහු සමත්වේ. **සටහන:** අභිභායතන අතුරින් 8 වන ආයතනය අග්‍රබවද, එසේවූවත් එම අග්‍ර සංඥාව ඇති සත්ත්වයෝ ද විපරිනාම, අනිච්ච ස්වභාවය ඇත්තෝ යයි බුදුන් වහන්සේ වදාළහ. ඒබව දකින ධර්මය දත් අරිය ශ්‍රාවකයා එම ජානසැපය පිළිබඳව කලකිරේ, ඒවාට නොඇලේ. **මූලාශ්‍ර**: අංගු.නි: (5 ): 8 නිපාත: 8.2.7.5 අභිභායතන සූත්‍රය, පි. 299, EAN: 8: 8.65. Overcoming, p. 446, අංගුනි: (6): 10 නිපාතය: 10.1.3.9. ප්‍රථම කෝසල සූත්‍රය, පි. 134, EAN: 10: 29.9 Kosala-1, p. 505.

▲ **අභිනිහාර කුසලය**- Abhinihara kusla :අභිනිහාර කුසලය ලෙසින් පෙන්වා ඇත්තේ සමාධිය පිලිබඳ ගන්නා අරමුණේ- කමටහනේ සිත තැන්පත් කරගැනීමේ කුසලතාවයය. **මූලාශ්‍රය:** සංයු.නි: (3) ඛන්ධ වග්ග:ජානසංයුත්ත:13.1.7 අභිනිහාර කුසල සූත්‍රය, පි.572.

▲ **අභිසංඛාර**-Abhisankaara :අභිසංඛාර ලෙසින් මෙහි පෙන්වා ඇත්තේ තුන්දොරින් (කාය වාක් මනෝ) උපදවන චේතනා රැසය- යහපත් හෝ අයහපත් විපාක ගෙනදෙන සංඛාරයන්ය. **මූලාශ්‍රය:** අංගු.නි: (1) 3 නිපාත: 3.1.3.3. සූත්‍රය, පි.266.

▲**අභිසන්ද**-Abhisanda : අභිසන්ද යනු සැපයට ප්‍රත්‍ය වන කරුණුය. සැපයට හේතුවන පුණ්‍ය කම්ම මෙහි විස්තර කර ඇත. **බලන්න**:සංයු.නි: (5-2) සෝතාපත්තිසංයුත්ත: පුඤ්ඤාභිසන්ධවග්ග සූත්‍ර. පි.241.
▲ **අභිභූ අගසව්**-Abhibhu Agrashrawaka : අභිභූ තෙරුන්, සිඛි බුදුන් වහන්සේ ගේ අග්‍ර ශ්‍රාවක දෙනමගෙන් එක් නමකි. සිඛි බුදුන්වහන්සේ ගේ ඇරයුම පරිදි අභිභූ තෙරුන් බ්‍රහ්මදෙවියන් ඉදිරියේ ඍද්ධි බල දැක්වීම මෙහි පෙන්වා ඇත. **මූලාශ්‍රය:** සංයු.නි: (1) සගාථවග්ග: බ්‍රහ්මසංයුත්ත:6.2.4 අරුණාවති සූත්‍රය, පි.304.
▲ **අභිරතිය** -Enjoyment **හා අනභිරතිය**- Dissatisfaction : ධම්ම විනයේ අභිරතිය ලෙසින් පෙන්වා ඇත්තේ සියලු ආධ්‍යාත්මික ක්‍රියා ගැන සතුටින් කටයුතු කිරීමය. අනභිරතිය යනු ඒ ක්‍රියා වලින් සතුටක් නො ලැබීමය. එය දුකකි. **මූලාශ්‍ර:** අංගු.නි: (6 ): 10 නිපාත: 10.2.2.6 දුතිය සුඛ සූත්‍රය, පි. 246, EAN:10: 65.5 Happiness 1,p. 519.
▼**කාම වස්තූන්ට ඇති දැඩි ඇල්ම**-ආශාව ද අභිරතිය ලෙසින් මෙහි පෙන්වා ඇත, කාමයට ඇති තණ්හාව -පංච කාමයට ඇලීම, සිතේ කාම රාගය ඇතිවීම. අභිරතියට විරුද්ධ පදය වන අනභිරතිය යනු එපාවීම හෝ කලකිරීමය. පංචකාමයට ඇති කැමැත්ත නැතිවීම අනභිරතියය. එසේම, යම් කිසි හේතුවක් නිසා ආධ්‍යාත්මික ජීවිතය එපාවීමද අනභිරතිය ලෙසින් පෙන්වා ඇත. වංගීස තෙරුන්ට, රූපත් කාන්තාවන් දැකීමෙන් ඇල්මක් ඇතිවී සිත රාගයෙන් දූශිතව බ්‍රහ්මචරියා ජීවිතය ගැන අනභිරතියක්-අසතුටක් ඇතිවූ බව පෙන්වා ඇත. **"...අථ ඛො ආයස්මතො වඞ්ගීසස්ස තා ඉත්ථියො දිස්වා අනභිරති උප්පජ්ජති, රාගො චිත්තං අනුද්ධංසෙති..."**. තමනට ඇතිවූ රාග සිතිවිලි නිසා දහම් මගට අලාභයක්, අයහපතක්වූ බව අවබෝධ කරගත් වංගීස තෙරුන් තමන්ම විරිය වඩා එම අකුසල සිත නැතිකර බ්‍රහ්මචරියාවට සිතේ කැමැත්ත- අභිරතිය උපදවාගත් බවද දක්වා තිබේ: **"...අලාභා වත මෙ, න වත මෙ ලාභා... යස්ස මෙ අනභිරති උප්පන්නා ...යන්නූනාහං අත්තනාව අත්තනො අනභිරතිං විනොදෙත්වා අභිරතිං උප්පාදෙය්‍යන්ති".** සටහන: අනභිරතිය (dissatisfaction) හා අරතිය (discontent) බොහෝදුරට සමාන පද බව භික්ඛු බෝධි හිමියන් දක්වා ඇත. සාමාන්‍යයෙන් ගත්කල අනභිරතිය ලෙසින් පෙන්වා දෙන්නේ කාම ආශාව නිසා සිතේ ඇතිවන නො සතුටුබව- බ්‍රහ්මචරියාව අතහැර ගිහිජීවිතයට නැවත යාමට සිතීමය. ඉහත දක්වා ඇති පරිදි වංගීස තෙරුන් විරිය කර ඇතිකරගත් අභිරතිය නම් ආධ්‍යාත්මික ජීවිතය පිලිබඳ ඇල්මය, පංචකාමයන්ට ඇති අභිරතිය- ආශාව නොවේ. **බලන්න**: ESN: note: 486,p. 563. **මූලාශ්‍ර**: සංයු.නි: ( 1) වංගීස වග්ග: 8.1.1. නික්ඛන්ත සූත්‍රය, පි. 356 හා 8.1.2 අරති සූත්‍රය, පි. 358, ESN: 8: Vaṅgīsa saṃyutta: 8.1 Renounced, p. 392 & 8.2 Discontent, p. 394.

▲ **අභිසමය**-Abhisamaya :අභිසමය, ධම්මාභිසමය ලෙසින්ද පෙන්වා ඇත. චතුසත්‍ය යහපත් ලෙසින් අවබෝධ කරගැනීම අභිසමයවේ. සෝතාපන්න පුද්ගලයා අභිසමයට පැමිණි ආරිය පුද්ගලයෙකි.

**ශබ්දකෝෂ: පා.සිං.ශ:** පි,96: “අභිසමය:අවබෝධය, දැනගැනීම”.
**B.D:**p.4: “Abhisamya: Truth realization, is the full & direct grasp of the Four Noble Truths by the stream winner”.

▼**අභිසමය-** ප්‍රතිවේධයය. ඥානය නැතිව අභිසමය නොකෙරේ. මෙහිදී අභිසමය පිළිබඳව විස්තරාත්මකව දක්වා ඇත. **මූලාශ්‍රය:** බු.නි:පටිසම්භිදා 2: පඤ්ඤාවග්ග:3.3 අභිසමයකථා, පි.208.

▲**අභිසම්බුද්ධ**-Perfectly Enlightened One: චතුසත්‍ය වෙසෙසින් අවබෝධ කළ බැවින් තථාගතයෝ ‘**අභිසම්බුද්ධ**’- අරහත් සම්මා සම්බුද්ධ යයි කියනු ලැබේ. **මූලාශ්‍රය**: සංයු.නි: (5-2): මහාවග්ග: සච්චසංයුත්ත: 12.3.3. අභිසම්බුද්ධ සූත්‍රය, පි.312, ESN:56: Sacchasamyutta: 23.3. The Perfectly Enlightened One, p. 2292.

▲ **ආභිසමාචරික ධම්ම-** ābhisamācārika dhamma- factor of proper conduct :ආධ්‍යාත්මික මගේ වැඩීම පිණිස අවශ්‍ය දහමකි. උත්තම ආචාර ධම්මය ලෙසින්ද හඳුන්වයි.තමන් හා එක්ව වාසය කරන සංඝයා (සබ්‍රම්සරුන්) කෙරෙහි ගෞරව නැති, ගරුසරු නැති මහණහට ආභිසමාචරික දහම ඇතිකර ගත නොහැකිය යි බුදුන් වහන්සේ පෙන්වා ඇත: ආභිසමාචරික ධම්ම නැතිවිට සේඛ දහම පූර්ණ කරගත නොහැකිය, ඒ නිසා ඔහුට ශීලසම්පන්න විය නොහැකිය. ශීලසම්පන්න නොවේ නම් සම්මා දිට්ඨිය ඇතිකරගත නොහැකිය. සම්මා දිට්ඨිය නොමැතිව සම්මා සමාධිය ඇතිකර ගැනීමට හැකි නොවේ. ඒ නිසා ඔහුට සම්මා ප්‍රඥාව ඇතිකර ගැනීමට හැකියාව නැත. එහෙත්, සබ්‍රම්සරුන් කෙරෙහි ගෞරව ඇති, ගරුසරු ඇති මහණහට ආභිසමාචරික ධම්ම ඇතිකර කර ගතහැකිවේ. **මූලාශ්‍ර**: අංගු.නි: ( 3) : 5 නිපාත: 5.1.3.1. අගාරව සූත්‍ර 1-2 , පි. 48, ESN: 5: 21.1. Irreverent -I & II, p. 241.

▲ **ආභස්සර දෙවියෝ** -Devas of Streaming Radiance: රූප බ්‍රහ්ම ලෝකයක වාසය කරන මේ දෙවිවරුගේ කයෙන් ගිනිදැල් වැනි විශාල දීප්තිමත් ආලෝකධාරා නිකුත්වන නිසා ආභස්සර දෙවියෝ ලෙසින් හඳුන්වයි. **බලන්න:** බ්‍රහ්ම ලෝක.

▲ **අභ්‍යන්තර ආකාශධාතුව-**Internal space element :කෙනෙක්ගේ කයේ ඇති ඉඩ, අවකාශය, අභ්‍යන්තර ආකාශ ධාතුවය. **බලන්න:** ආකාශ ධාතුව.

▲ **අභ්‍යන්තර ආයතන සය-** six internal bases :අභ්‍යන්තර ආයතන 6 (සය ආයතන) යනු සළායතනයන්ය. **බලන්න:** සළායතන.

▲ **අභ්‍යන්තර බන්ධන-** Internal bonds :අභ්‍යන්තර බන්ධන ලෙසින් මෙහි දක්වා ඇත්තේ දහම් මග නොදත් පුද්ගලයා, පංච උපාදානස්කන්ධයට ඇති බැඳීමය. **බලන්න**: ශ්‍රැතවත් ආරිය ශ්‍රාවක හා අශ්‍රැතවත් පෘතග්ජන.

**අම**

▲ **අමත හා අමතගාමී මග:** පාලි: **අමතං, අමතගාමී මග්ගො -**deathless & way to deathless : දහමට අනුව **අමත** - අමර (අමෘතය) යනු නිවනය. **අමතගාමී** මග යනු නිවන කරා ගෙනයන මග ආරිය අටමගය. **අමතපත්ත** යනු නිවන ලැබීමය. **බලන්න**:නිවන. **සටහන්**: * සංයු.නි: (5-1) සති පට්ඨාන සංයුත්තයේ: **අමතවග්ගයේ දී**, සතිපට්ඨානය වැඩීම අමතමග යයි පෙන්වා ඇත ** අංගු.නි: (1) 1 නිපාතයේ, **අමත වග්ගයේ**: කායගතා සතිය වැඩීමෙන් අමතමග ලැබෙන බව දක්වා ඇත. **මූලාශ්‍ර**: අංගු.නි: (5): 9 නිපාත, 9.2.1.3. හා 9.2.1.4 සූත්‍ර, පි. 568, EAN: 9: I Security- suttas.

p. 485, සංයු.නි:4: සළායතනවග්ග:අසංඛතසංයුත්ත: 9.2 අමත සූත්‍රය, පි. 685, ESN:43: Asankathasamyutta: 14.3 sutta, p. 1513.
▼ **සියලු කෙළෙස් ප්‍රහීණය** (රාග දෝස මෝහ) අමතය-හෙවත් නිවනය, ඒ සඳහා ඇති මග නම් අමතමගවූ ආරිය අට මගය යයි බුදුන් වහන්සේ පෙන්වා ඇත: **"...යො සො භික්ඛු රාගක්ඛයො දොසක්ඛයො මොහක්ඛයො ඉදං වුච්චති අමතං...අයමෙව අරියො අට්ඨඞ්ගිකො මග්ගො අමතගාමී මග්ගො..."**. **මූලාශ්‍ර**: සංයු.නි:(5-1 ): මග්ගසංයුත්ත: 1.1.7 දුතිය භික්ඛු සූත්‍රය, පි. 40, ESN: 45: Maggasamyutta: 6.6 A certain bhikkhu-2, p. 1610.
▲**අමනාපය :** පාලි: **උපනාහ -** resentment : අමනාපය, **උපනාහ-** සතුරුබව, **එදිරිය- බද්ධවෛරය** ලෙසින්ද දක්වයි. මෙය සිත කෙළෙසන අකුසල දහමකි,දුගතිය ඇතිකරයි,දස අකුසලයකි. **බලන්න**: උපකෙළෙස. **සටහන්**: *** ම.නි. සල්ලේඛ සූත්‍රයේ දී** පහකළ යුතු අකුසල දහම් 44 ට අමනාපය ද ඇතුලත්වේ. **බලන්න:** සල්ලේඛ පරියාය. ** අංගු.නි. **ආඝාතවත්තු හා ආඝාතපටිවිනය** සූත්‍රයන්හිදී අමනාපය ඇතිවන ආකාරය හා පහකර ගන්නා අන්දම පෙන්වා ඇත. **බලන්න**: ආඝාතවත්ථු හා ආඝාතපටිවිනය. **අංගු.නි. (6) **භබ්බාභබ්බ සූත්‍රයේ** අරහත්වය පිණිස පහකර ගතයුතු අකුසල දහම් 10න් එකක් ලෙස අමනාපය පෙන්වා ඇත, **බලන්න**: අරහත්බව.

▼ **වෙනත් මූලාශ්‍ර: 1. Per Bhikkhu Bodhi:** Resentment sets in after anger has repeatedly enveloped the mind. **බලන්න**: EMN: note : 87, p. 1179. **2.** "ගිනි දැල් විහිදුවමින් පැවති ගිනි අඟුරු අලුයෙන් යටවූ විට කලක් නිසලව පවතී. එමෙන් පටන් ගැන්මේ දී ක්‍රියාකාරීත්වයෙන් පැවති ක්‍රෝධය එහි අධික වේගය සන්සිඳී අලුයට ගිනි අඟුර මෙන් සිත්සතන්හි යටවී පවතී. එය අප්‍රකටය. එම තත්වයට පැමිණි ක්‍රෝධය නම් උපනාහයය-වෛරයය. මෙය ලෙහෙසියෙන් නො සංසිඳෙන දිගු කලක් පවතින අකුසලයකි. එක් ජාතියක කෙළෙවර නොවන්නේය. උදා: කාලි යකින්නගේ වෛරයය, දෙව්දත්ගේ වෛරයය. මෛත්‍රිය කිරීමෙන් මේ ගතිය නැතිකරගත හැකිය". **කෙලෙස් එක්දහස් පන්සියය**, පි.81, රේරුකානේ චන්දවිමල මහානාහිමි, 2008. **3.**"බද්ධ වෛරය උපනාහයවේ. බද්ධ වෛරය යනු වෙනත් කෙනෙක් තමන්ට කළ වරදක් සිත තුළ රඳවාගෙන සිටීමය. බද්ධ වෛරය නිසා කයේ විවිධ ආබාධ ඇතිවේ (උදා: හෘද රෝග). වෛරය නිසා පළිගැනීමට කටයුතු කරයි. එමගින් පවුල් පිටින් විනාශවන අවස්ථා දැකිය හැකිය". **දිනමිණ:** අන්තර්ජාල ලිපිය: https://www.budusarana.lk/budusarana/2019/07/25/tmp.asp?ID=vision09
▲ **අමෝහය-** Non-delusion : අමෝහය, මුලානොවීම,( ලෝකය පිලිබඳව) ත්‍රිවිධ කුසල් මූලයන්ගෙන් එකකි. ප්‍රඥාවඇතිවිට අමෝහය ඇතිවේ. **බලන්න**: කුසල මූල.
▲ **අමායාව-** non-deceitfulness :අමායාව ලෙසින් පෙන්වා ඇත්තේ තමන්ට නැති ගුණ නොපෙන්වීම, අනුන්ව නොරැවටීමය. කුසලයකි. **බලන්න**: අනවද්‍ය ධම්ම හා සාවද්‍ය ධම්ම, මායාව.
▲**අම්බට්ඨ බ්‍රාහ්මණ මානවක-** Brahamin student Ambattha පොක්ඛරසාති බ්‍රහ්මණයාගේ ශිෂ්‍යයෙක්වූ මොහු, ඒ බ්‍රහ්මණයාගේ නියමය පරිදි බුදුන් වහන්සේ ශ්‍රේෂ්ඨද? උන්වහන්සේට දෙතිස් මහා පුරුෂ

ලක්ෂණ තිබේද? ආදී කරුණු සොයා බැලීම පිණිස බුදුන් වහන්සේ හමුවට පැමිණීම මෙහි විස්තර කර අත. **බලන්න**: දීස.නි: (1) අම්බට්ඨ සූත්‍රය.

▲ **අම්බපාලි තෙරණිය-**Ambapali Therni: **බලන්න**: උපග්‍රන්ථය:2

▲ **ආමගන්ධ-** Putrefaction :ආමගන්ධ ලෙසින් පෙන්වා ඇත්තේ කුණුවී ගිය දේ- මස් ආදියේ ගඳ ය. මේ සූත්‍රයේ දී බුදුන් වහන්සේ 'ආමගන්ධය' යනු කුමක්ද යයි පෙන්වා ඇත: " ප්‍රාණඝාතය, හිංසාකිරීම, සොරකම, මුසාවාදය... ආදීවූ අකුසල ආමගන්ධ වේ, මාංස භෝජන ආමගන්ධ නොවේ" . **" පාණාතිපාතො වධඡෙද බන්ධනං - පෙයා මුසාවාදො ...එසාමගන්ධො න හි මංසභොජනං"** ( Killing living creatures, mutilation, murder, lying... this is putrefaction, not eating meat). **සටහන: *** මේ සූත්‍රයේ, මස්ගඳ වැනි පිළිකුල්වූ අකුසල දහම් විස්තරාත්මකව පෙන්වා ඇත. ** විනයට අනුව අමුමස් පිළිගැනිම සංඝයාට ඇවතකි. **මූලාශ්‍රය**: බු.නි:සුත්තනිපාත: 2.2 ආමගන්ධ සූත්‍රය**,**පි.94,Suttanipatha: Āmagandhasutta: Translated by Bhikkhu Sujato: Suttacentral.

▲**ආමච්ඡ-**non- miserliness :ආමච්ඡ යනු මසුරු නැතිබවය, ත්‍යාගශීලිබවය. මෙය කුසල ගුණයකි. සුගතියේ යළි උපතට හේතුවේ. **බලන්න**: ත්‍යාගශීලි, නොමසුරුකම :**මූලාශ්‍රය:**සංයු.නි: (4) සළායතන වග්ග:මාතුගාමසංයුත්ත:3.2.5 ආමච්ඡරි සූත්‍රය, පි.488.

▲**ආමිෂ-**Amisha : ආමිෂ ලෙසින් පෙන්වා ඇත්තේ ලෞකිකබවය, ආධ්‍යාත්මික (නිරාමිෂ) නොවනබවය. ආමිෂ පූජා ලෙසින් පෙන්වා ඇත්තේ භෞතික දාන පූජා ආදියය. ආමිෂ සුඛය වන්නේ කම් සැපය. බුදුන් වහන්සේ වදාළේ ආමිෂයට වඩා ධර්මය අග්‍ර බවය. මෙහිදී ආමිෂයට වඩා දහම අග්‍රබව පෙන්වා ඇත: ආමිෂ දානයට වඩා දහම් දානය... ආමිෂ ත්‍යාගයට වඩා දහම් ත්‍යාගය අග්‍රය, ආදීවශයෙන් විස්තර දක්වා ඇත. **මූලාශ්‍ර**: අංගු.නි: (1): 2 නිපාත: 13දාන වග්ග සූත්‍ර: පි.216-218, EAN:2 :XIII: Gifts, p.71.

▲**අමුලික ශ්‍රද්ධාව-**Amulika shraddha :අමුලිකා ශ්‍රද්ධාව යනු ත්‍රිවිධ රත්නය,දහම් මග පිළිබඳව අස්ථිරබවය.මුල් බැස නොගත් ශ්‍රද්ධාව තිබීමය. වෙනත් බලපෑම් නිසා එය වෙනස් විය හැකිය. **බලන්න**: ශ්‍රද්ධාව.

**අඹ**

▲**අඹ**:පාලි: **අම්බ**-Mangoes : අඹ පලතුරකි. බුදුන් වහන්සේ වැඩ සිටි සමයේ, දඹදිව බොහෝ අඹ උයන් පැවතිනි. ගිහි දායකයන්, සැදැහැ සිතින් තමන්ගේ අඹ උයන් බුදුසසුනට පූජා කර ඇති බව සූත්‍ර දේශනාවල පෙන්වා ඇත. **සටහන්**: *** දී.ස.නි: මහා පරිනිබ්බාන සූත්‍රයේ**, අම්බපාලිය, බුදුන් වහන්සේ ඇතුළු සංඝයාහට, ඇයගේ අඹ වනය, ආරණ්‍යයක් ලෙසින් පූජා කළ බව පෙන්වා ඇත. පසුකල පැවිදිවූ මෙතුමිය අම්බපාලි තෙරණිය ලෙසින් දක්වා ඇත. **බලන්න**: උපග්‍රන්ථය:1, ** එම සූත්‍රයේම, බුදුන් වහන්සේ, චුන්ද කර්මාකාර පුත්‍රගේ අඹවනයේ වැඩසිටිබවද, අවසාන ආහාර දානය එහිදී වැලඳු බව සඳහන්වේ. මොහු බුදුන් වහන්සේ සරණ ගිය ගිහියෙකි. **බලන්න**: උපග්‍රන්ථය:3.

▼ **අඹ සතර** ස්වභාවයකින් යුක්ත බව බුදුන් වහන්සේ පෙන්වා ඇත: 1) අමු එහෙත් පැසුන (ඉදුන) ස්වභාවය ඇති 2) පැසුන එහෙත් අමු ස්වභාවය ඇති 3) අමු, එසේම අමු ස්වභාවය ඇති 4) පැසුන, පැසුන ස්වභාවය ඇති. **බලන්න**: අඹ බඳුපුද්ගලයෝ**.**

▲ **අඹ බඳු පුද්ගලයෝ-** Persons similar to Mangoes
අඹ බඳු පුද්ගලයෝ සිව් දෙනක් ගැන බුදුන් වහන්සේ පෙන්වා ඇත: 1) අමු එහෙත් පැසුන (ඉදුන) ස්වභාවය ඇති: කය හැසිරවීම, සිවුරු දැරීම ආදී බාහිර ක්‍රියා මානව කරයි, එහෙත්, චතුසත්‍ය අවබෝධ කර නොමැත 2) පැසුන එහෙත් අමු ස්වභාවය : කය හැසිරවීම, සිවුරු දැරීම ආදී බාහිර ක්‍රියා මානව නොකරයි, එහෙත්, චතුසත්‍ය අවබෝධ කර ඇත 3) අමු, එසේම අමු ස්වභාවය ඇති : කය හැසිරවීම, සිවුරු දැරීම ආදී බාහිර ක්‍රියා මානව නොකරයි, එසේම, චතුසත්‍ය අවබෝධ කර නොමැත 4) පැසුන, පැසුන ස්වභාවය ඇති. කය හැසිරවීම, සිවුරු දැරීම ආදී බාහිර ක්‍රියා මානව කරයි, එසේම, චතුරාර්ය සත්‍ය අවබෝධ කර ඇත. **මූලාශ්‍ර:** අංගු.නි: (2 ): 4 නිපාත: 4.3.1.5 අඹ සූත්‍රය, පි. 228, EAN:4: 105.5 Mangoes, p. 185.

**අය**

▲ **අයගෝලය** - The Iron ball : අයගෝලය -යකගුලිය, රත්වන ආකාරය උපමා කරගෙන බුදුන් වහන්සේ, ඉද්දිපාද බල ඇතිකර ගැනීම මෙහි දක්වා ඇත. දවස මුළුල්ලේ රත්වූ අයගෝලය, ඉතා සැහැල්ලුවී, මෘදුවී,කර්-මණ්‍ය වී ප්‍රභාසර බවට පත්වේ. එලෙස තථාගතයන් හට කය සිතට නගා, සිත කයට නගා වාසය කලහැකිය. එවිට කයඉතා ලඝුවී, කර්මණ්‍ය වී ප්‍රභාසර බවට පත්වේ. එලෙස ඇතිවෙන ලඝුසංඥාව හා සුඛ සංඥාව නිසා තථාගත කය නිතැතින්ම පොළොවින් ඉහලට නගී, බඹලොව තෙක් කය පවත්වා ගැනීමට හැකිවේ. එසේ ඉහල නැගීම පිලිබඳ ව මේ **උපමාව** (පුළුන්කැටිය උපමාව) යොදාගෙන ඇත. පුළුන් කැටියක් එහි සැහැල්ලු බව නිසා සුළං හමනවිට ඉහලට නගී. එලෙස ඉද්දිබලයන් කය සැහැල්ලුවූවිට බොහෝ ඉද්දි ඇතිකර ගත හැකිබව මෙහි පෙන්වා ඇත. **බලන්න:** ආශ්චර්ය ධම්ම, උපග්‍රන්ථය:5. **මූලාශ්‍රය:** සංයු.නි: (5-2) ඉද්දිපාදසංයුත්ත:7.3.2 අයෝගුළ සූත්‍රය,පි.70.

▲ **අයෝනිසෝමනසිකාරය-** unwise attention :දහම් මගේ මූලික කරුණු පිලිබඳ අනුවණ ලෙසින් සිතා කටයුතු කිරීම - සිහිනුවණ නොමැතිව කටයුතු කිරීම අයෝනිසෝමනසිකාරයය. එනම්, අනිච්ච දේ නිච්චය, දුකගෙනදෙන දේ සැපයය, අනාත්ම දේ ආත්මයය, අසුබ දේ සුබය යයි වැරදි සංඥා අල්වාගෙන (**සතරවිපල්ලාස**), දහමට පටහැණිව කටයුතු කිරීමය. ආධ්‍යාත්මික මගට බාධා කරණ කරුණකි. **බලන්න**: යෝනිසෝමනසිකාරය, සතරවිපල්ලාස. **සටහන්:** * අයෝනිසෝ මනසිකාරය යනු අවිධිමත් අවධානය (අනුපාය මනසිකාර- un methodical attention) හා නොමගට ගෙනයන අවධානය (උප්පථමනසිකාරය- off-track attention)වේ. එසේ දක්වා ඇත්තේ අනුවණ ලෙසින් කටයුතු කිරීමෙන් කෙනෙකුගේ යහපත- සුභසිද්ධිය නැතිවීයන නිසාය: අනිච්ච, දුක්ඛ, අනාත්ම හා අසුභ යන, විපලස්ස පිළිබඳව වැරදි ලෙසින් කටයුතු කිරීමය**. බලන්න:** ESN: note: 54, p. 2394. ** **අටුවාවට** අනුව වැරදි දිට්ඨි ඇතිවීමට බලපාන කරුණු අතරින් එකක් ලෙස අයෝනිසෝ-මනසිකාරය පෙන්වා ඇත **බලන්න**: EAN: note: 2131, p. 682.

▼**අයෝනිසෝමනසිකාරය** ආධ්‍යාත්මික මගේ වැඩිමට හානිය ගෙන දෙන දහම් කරුණකි. "**අයොනිසො මනසිකාරො අයං එකො ධම්මො හානභාගීයො**" **බලන්න**: හානභාගීය ධම්ම්. **මූලාශ්‍ර:** දීඝ.නි : (3 ): 11 දසුත්තර සූත්‍රය, පි. 483, EDN: 34: Dasuttara Sutta: Expanding

Decades, p. 384.
▼ **බුදුන්වහන්සේ වදාළේ** අනුවණ ලෙසින් සිතන කෙනෙකුට නූපන් ආසව ඇතිවෙන බව හා උපන් ආසව වැඩියන බවය: **"...අයොනිසො භික්ඛවෙ මනසිකරොතො අනුප්පන්නා චෙව ආසවා උප්පජ්ජන්ති උප්පන්නා ආසවා පවඩ්ඪන්ති..." (පවඩ්ඪ= වැඩිම, දියුණුවීම) * සටහන:** භික්ඛු බෝධි හිමියන් පවසන්නේ අයෝනිසෝමනසිකාරය ඇතිවන්නේ වැරදි අවධානය නිසාය, වැරදි මග (wrong track) ගැනීම නිසාය: සත්‍යට පටහැනි දේ එනම්: අනිත්‍ය දේ නිත්‍ය ය, දුක ගෙනදේ සැපය, අනාත්ම දේ ආත්මය, අසුභ දේ සුභය ලෙසින් සිතීම නිසා අයෝනිසෝ මනසි කාරය ඇතිවේ.අටුවාවට අනුව භව පැවත්මට මුල අයෝනිසෝ මනසි කාරයය, අනුවණ ලෙස මනස හැසිරවීම නිසා අවිද්‍යාව හා තණ්හාව වැඩේ, සසර දික්වේ **බලන්න:** EMN, note 33, p. 1065**. මූලාශ්‍ර**: ම.නි: (1): 1.1.2 සබ්බාසව සූත්‍රය, පි. 38, EMN:2: Sabbāsava Sutta, p.73.
▼ **රාග, දෝස, මෝහය** යන අකුසල මුල් ඇතිවීමට මූලිකවන්නේ අයෝනිසෝ මනසිකාරයය. **මූලාශ්‍ර**: අංගු.නි: ( 1): 3 නිපාත: 3.2.2.8 සූත්‍රය, පි.394 , EAN: 3: 68.8 Other sects, p. 112.
▼ **සක්කායදිට්ඨිය**, විචිකිච්චාව, සීලබ්බත පරාමාස නැති කරගැනීමට නම් (සෝතාපන්නවීමට) අයෝනිසෝ මනසිකාරය නැතිකරගත යුතුය. **මූලාශ්‍ර**: අංගු.නි :( 6): 10-නිපාත:10.2.3.6, තයොධම්ම සූත්‍රය, පි.284, EAN:10: 76-6. Incapable, p. 524.

▼ **අකුසල ඇතිවීමට** හා වැඩිම පිණිස, අනුවණ ලෙසින් මෙනෙහි කිරීම - අයෝනිසෝ මනසිකාරය තරම් වෙන එකම දහමක් තමන් වහන්සේ දකින්නේ නැතය යයි බුදුන් වහන්සේ වදාළහ. **මූලාශ්‍ර**: අංගු.නි: (1):1 නිපාත: විරිය ආරම්භ වග්ග, 1.7.6. සූත්‍රය, පි. 62, EAN:1: VII: Arousal of energy, p. 40.
▼ **කෙනෙක්තුල බොජ්ඣංග දහම** ඇතිනොවීමට බලපාන මූලික හේතුව අයෝනිසෝ මනසිකාරය පැවැත්වීමය. **මූලාශ්‍ර**: අංගු.නි:( 1 ):1 නිපාත: කල්‍යාන මිත්‍ර වග්ගය**,** 1.8.4. සූත්‍රය, පි. 64, EAN:1- VIII: Good friendship, 74.4 sutta, p. 41.
▼ **දහම් මගේ** ගමන් කරන පුද්ගලයෙකුට සිදුවන බරපතලම හානිය අයෝනිසෝමනසිකාරය කිරීමය. **මූලාශ්‍ර**:අංගු.නි: (1 ):1 නිපාත: ප්‍රමාද වග්ග:1.9.11 සූත්‍රය,පි.68, EAN:1- IX: Heedlessness: 90- sutta, p. 41.
▼ **අයෝනිසෝමනසිකාරය** නිසා නීවරණ ඇතිවී වැඩි යයි. **මූලාශ්‍ර**: සංයු.නි: (5-1): මහාවග්ග: බොජ්ඣංග සංයුත්ත: 2.4.5. යොනිසෝ සූත්‍රය, පි. 215, ESN:46: Bojjhaṅgasaṃyutta, 35.5. Careful attention,p.1770.
▼**අයෝනිසෝමනසිකාරය,** සද්ධර්ම යේ පරිහානියට හා අතුරු දහන්වීමට (decline and disappearance of the good dhamma) බලපාන මූලික සාධකයක්ය. **මූලාශ්‍ර**: අංගු.නි: ( 1):1 නිපාත:ආධ්‍යාත්මික වග්ගය, 1.10.17. සූත්‍රය, පි. 74, EAN: 1: Internal, p.42.
▼ **එක් සමයක දේවතාවක්**, අයෝනිසෝමනසිකාරයෙන් යුතුව වනයේ වසන මහණකෙනකුට, පාපවිතර්ක බැහැර කර යෝනිසෝ මනසි කාරයෙන් කටයුතු කරන්න යයි අවවාද වදාළ බව මේ සූත්‍රයේ පෙන්වා ඇත. **මූලාශ්‍ර**: සංයු.නි: (1): සගාථවග්ග: වනසංයුත්ත: 9.1.11.

අයෝනිසො සූත්‍රය,පි. 388,ESN: 9: Vanasamyutta: 11 Unwholesome thoughts, p. 427.

▼**වෙනත් සූත්‍ර මූලාශ්‍ර**: අංගු.නි: (1): නීවරණ ප්‍රහාණ වග්ග- සූත්‍ර, පි. 44, EAN:1: Abandoning the hindrances, p. 36. මේ සූත්‍රවලින් පෙන්වා ඇත්තේ අයෝනිසෝමනසිකාරය මගින් නීවරණ ඇතිවෙන ආකාරයය.
▲**ආය කුසලය** - skilled in gain :ආයකුසලය-කුසල් ලැබීම, කුසලය පිලිබඳ දක්ෂතාවය ලෙසින් මෙහි පෙන්වා ඇත. අධිගමය සපුරා ගැනීමට අවශ්‍ය කරුණකි. **බලන්න**: අධිගමය. **මූලාශ්‍ර**: අංගු.නි: ( 4 ): 6 නිපාත: 6.2.3.5 අධිගම සූත්‍රය, පි. 254, EAN:6: 79.5 Achievement, p. 360.
▲ **ආයතන**: පාලි: **ආයතනානි**- the bases : ආයතන යනු යමක් නිෂ්පාදනය කරන, සාදාදෙන ස්ථානයන්ය. භවය සාදාදෙන නිසා මේවා ආයතන ලෙසින් පෙන්වා ඇත. ආයතන වර්ග 2 කි 1) **අභ්‍යන්තර ආයතන 6** :එනම් පංචඋපාදානස්කන්ධ යේ ඇති සය ඉන්ද්‍රියන්ය- ඇස, කණ, නාසය, දිව, කය හා මනස. **සටහන: අභ්‍යන්තර ආයතන:** සළායතන- ආධ්‍යාත්මික- ෂඩායතානය- ඡ අජ්ඣත්තිකානි ආයතනානි - Internal Sense Bases- six internal bases ලෙසින් ද හඳුන්වයි. 2) **බාහිර ආයතන 6**- six external bases : සළායතන මගින් අලවා ගන්නා බාහිර අරමුණුය: රූප, ශබ්ද, ගඳ සුවඳ, රස, කායපහස, මනසට එන සිතුවිලි ආදිය. (six internal and external bases: the eye and forms, the ear and sounds, the nose and odors, the tongue and flavors, the body and tangibles, the mind and mind-objects). ආයතන ඇතිවීමට හේතුව නාමරූපය ඇතිවීමය, ආයතන වලට ඇති තණ්හාව- ඡන්දරාගය නිසා භවපැවැත්ම ඇතිවේ. එම තණ්හාව ප්‍රහීණය පිණිස ආයතන පිලිබඳ මුලුමනින්ම වබෝධය ඇතිකරගතයුතුය. **ආධ්‍යාත්මික හා බාහිර ආයතන බෙදා දැක්වීම** : ආයතන 12 මෙසේ බෙදා දක්වා ඇත: **ආධ්‍යාත්මික ආයතන 6**: ඇස -චක්ඛායතන ( eye base) කන-සොතායතන (ear base) නාසය- ඝාණායතන (nose base) දිව-ජිව්හායතන (tongue base) කය-කායායතන (body base) මනස-මනායතන (mind base) . **බාහිර ආයතන 6:** රූපායතන (form-base) ශබ්දායතන (sound-base ) ගන්ධායතන (odor-base ) රසායතන (flavor-base) ස්පර්ෂ ආයතන (the tangible-base) ධර්ම ආයතන (mind- object-base). **මූලාශ්‍ර**: ම.නි (3) 3.4.7 සළායතන විභඞ්ග සූත්‍රය,පි. 474, EMN: 137: Saḷāyatanavibhanga Sutta- The Exposition of the Six fold Base, p. 974, සංයු.නි: (2): නිදාන වගග: 1.1.2 විභඞ්ග සූත්‍රය, පි.24, ESN: 12: Nidanasamyutta: 2.2 Analysis of Dependent Origination, p.610.
▼**ආයතන ඇතිවීම දුකය** යි බුදුන් වහන්සේ වදාළහ. **සටහන:** ආයතන නිසා ඇතිවන ස්පර්ශය හා වේදනාව සසරට ඇලීම, ගැටීම ඇතිකර සසර දික් කරයි. **බලන්න**: දුක **සටහන**: ස්පර්ශ ය ගැන දක්වනවිට එය, 'ස්පර්ශ ආයතන' ලෙසින්ද පෙන්වා ඇත. **මූලාශ්‍ර:** සංයු.නි: (5-2): මහාවග්ග: සච්චසංයුත්ත: 12.2.4 ආයතන සූත්‍රය, පි. 302 , ESN: 56: Sacca samyutta: 14.4 Internal Sense Bases, p. 2281.
▼**සයආයතන ඇතිවීම ලෝකය ඇතිවීමය :** එක්සමයක දෙවියෙක් බුදුන්වහන්සේ බැහැදැක ලෝකය කුමක්නිසා හටගත්තේද ? යයි විමසූහ. බුදුන් වහන්සේ වදාළේ ආයතන හටගත් කල ලෝකය ඇතිවෙනබවය. අභ්‍යන්තර ආයතන, බාහිර ආයතන සංසේවනය කරයි, ආයතන වලට

ඇලීම ලෝකයට ඇති පීඩාවය, දුකය. **සටහන:** විස්තර පිණිස බලන්න: ESN: note 126, p. 519. **මූලාශ්‍ර**: සංයු.නි:(1): සගාථවග්ග: දේවතාසංයුත්ත : 1.7.10 ලෝක සූත්‍රය, පි. 102, ESN: 1: Devata samyutta: 70.10 World, p. 151.

▲ **ආයතන කුසලතාවය**: පාලි: **ආයතනකුසලො-** skilled in the bases සළායතන හා බාහිර ආයතන 6 ගැන ඇති යහපත් අවබෝධය ආයතන කුසලතාවය වේ. මේ ගුණය පණ්ඩිතයන් සතු ගුණයකි. **බලන්න**:බාලයා හා පණ්ඩිතයා. **මූලාශ්‍රය**: ම.නි: ( 3): 3.2.5 බහුධාතුක සූත්‍රය, පි.209, EMN: 115: The Many Kinds of Elements, p. 840.

▼**බුදුන් වහන්සේ ආයතන** 12 පිළිබඳ කුසලතාවය යහපත් ලෙසින් වදාරා ඇත. ඒ දහම් කරුණු සංඝයා එක්ව, දහමේ චිරස්ථිතිය පිණිස සජ්ජායනා කිරීම සුදුසුය යි සැරියුත් මහා තෙරුන් සංඝයාට උපදෙස් දී ඇත. **මූලාශ්‍ර**:දිඝ.නි: (3):10 සංගිති සසූත්‍රය, පි. 372 , EDN: 33 Saṅgīti Sutta: The Chanting Together, p. 362.

▲ **ආයතන දෙක-** 2 realms :සත්ත්වයෝ යළි උපත ලබන ආයතන 2කි: **අසංඥ සත්වආයතන** ( the realm of unconscious beings) හා **නෙවසඤ්ඤානාසඤ්ඤායතන** ( the realm of neither –perception-nor-non-perception**)**. **බලන්න**: බ්‍රහ්මලෝක, විඥාන ස්ථාන. **මූලාශ්‍ර:** දීඝ.නි: (2): මහානිදාන සූත්‍රය, පි.118, EDN: 15 The Great Discourse on Origination, p.169.

▲ **ආයුෂ**: පාලි: **ආයුප්පමාණං** -Life span-Vitality: ආයුෂ යනු ජීවත්වීමට ඇති කාලයය. (මරණය පැමිණෙන තෙක්).ආයුෂයට හිතකරවන දහම් කරුණු බුදුන් වහන්සේ මෙසේ පෙන්වා ඇත: සතප්‍රයාකාරිවීම-කයට යහපත ඇතිලෙසින් අහාර ගැනීම, ආහාරයෙහි මාත්‍රා ඇතිවීම -පමණ දැනීම, අහාර යහපත් ලෙසින් දිරවා ගැනීමට හැකිවීම, නියමිත (සුදුසු) වේලාව තුල පිණ්ඩපාතය පිණිස සැරිසැරීම, බ්‍රහ්මචාරී ජිවිතයක් ගෙනයාම ,ශීලසම්පන්නවීම , කල්‍යාන මිත්‍ර සේවනය. **මූලාශ්‍රය**:අංගු.නි: (3) 5 නිපාත: ගිලානවග්ග: 5.3.3.5 හා 5.3.3.6 සූත්‍ර, පි.258.

▼ **මහාපදාන සූත්‍රයේදී** පෙර වැඩ විසූ සම්මා සම්බුදුවරු දිගු ආයුෂ වැළඳූ බවත්, තම ආයුෂ කෙටි බව බුදුන් වහන්සේ පෙන්වා ඇත:
**" මහණෙනි, මෙකල මගේ ආයුෂ ප්‍රමාණය අල්පය, ස්වල්පය, ලඝුය. යමෙක් මේ සමයෙහි බොහෝ කල් ජීවත් වන්නේ නම් හෙතෙම අවුරුදු 100ක් හෝ ස්වල්පයක් වැඩියෙන් හෝ ජීවත් වන්නේය"** .**සටහන:** දීර්ඝායුෂ, පතා ලැබීමට හැකි දෙයක් නොවේ. **බලන්න**: ලැබීමට දුෂ්කර දේ. **මූලාශ්‍ර**: දීඝ.නි: ( 2): 1: මහාපදාන සූත්‍රය, ඡෙදය 8, පි. 18, EDN: 14 Mahâpadāna Sutta: The Great Discourse on the Lineage, p. 151.

▼ **බුදුන් වහන්සේ මෙසේ වදාළහ:** "මිනිසුන්ගේ ආයුෂ අල්පය, ඔවුන් පරලොව යායුතුය. ඔවුන් කුසල් කළයුතුය, බඹසර හැසිරිය යුතුය. උපන් අයට නො මැරීමක් නැත. බොහෝකලක් ජීවත් වන්නේ නම්, ඔහු සියක් වසක් ජීවත්වේ". **සටහන**: වත්මන්කාලයේ මිනිස් ආයුෂ වසර 100 ක් හෝ ඊට ටිකක් වැඩියෙන් පමණි. මිනිස් ආයුෂ ස්වල්ප බව පෙන්වා දීමට බුදුන් වහන්සේ මේ සූත්‍රය දේශනා කර ඇත **බලන්න**: අංගු.නි: (4) 7 නිපාත:මහාවග්ග: 7.2.2.10 අරකසූත්‍රය, පි.496. **මූලාශ්‍ර**: සංයු.නි: ( 1) :

සගාථවග්ග: මාරසංයුත්ත: 4.1.9 හා 4.1.10 ආයු සූත්‍ර, පි. 224, ESN: 4: Marasamyutta: 9.9 & 10.10 Life span, p. 271.

▼ **අල්ප ආයුෂ :** බුදුන් වහන්සේගේ මෑණියන්- බුද්ධ මාතාව (මහාමායා දේවිය) අල්ප ආයුෂ ඇතිබවත්, බෝසතුන් උපන් සත්දවසකින් පසු කලුරිය කර තුසිත දේවනිකායේ පහළවන බව මෙහි දක්වා ඇත.කය ඇති සියලු දෙන මරණයට පත්වේ. **සටහන**: එම කරුණ බෝසත් උත්පත්තිය පිලිබඳ ආශ්චර්ය හා අද්භූත සිදුවීමකි. **මූලාශ්‍රය**: බු.නි: උදානපාලිය: 5.2 අප්පායුක සූත්‍රය, පි.250.

▲**ආයුසංඛාර-** Āyusankhara: ආයුසංඛාර ලෙසින් පෙන්වා ඇත්තේ ආයුෂ- වයස් ප්‍රමාණය-ජීවන කාලයය. **බුදුන් වහන්සේ**, විසාලානුවර, චාපාලචෛත්‍ය යේදී ආයුසංඛාරය අත්හලසෙක. විස්තර පිණිස **බලන්න**: දීඝ.නි: මහා පරිනිර්වාණ සූත්‍රය, උපග්‍රන්ථය:6.

▼ **උදාන පාලියේ** බුදුන් වහන්සේ ආයුසංඛාර හැරදැමීම මෙසේ දක්වා ඇත: " ඉක්බිත්තෙන් භාග්‍යවතුන් වහන්සේ චාපාල චෛත්‍යයේ දී එළැඹි සිටි සිහි ඇත්තාහු නුවණින් පිරිසිඳ දන්නාහු ආයුසසංසකාරය හළ සේක. භාග්‍යවතුන් වහන්සේ ආයුසසංසකාරය හළ කල්හි ම බිහිසුණු ලොමුදහ ගන්වන මහා භූමිකම්පනයක් විය. දෙව්බෙර නද දුන්හ... එකල්හි භාග්‍යවතුන් වහන්සේ මේ කරුණ සලකා ඒ වේලෙහි උදන් ඇනුහ: 'පුනර්භවය සකස් කරන, භවොත්පත්තියට කාරණවූ කාමාවචර රූපාවචර කම්මද අරූපාවචර කම්ම බුද්ධමුණි තෙමේ හළේය. නිජකාධ්‍යාත්මයෙහි ඇලුණේ (හෙවත් උපචාරපිණිස සමාධි විසින්) සමහිත වූයේ තමා කෙරෙහි වූ කෙළෙස් කවචයක් (සන්නාහයක්) මෙන් බිඳ දැමිය. නොහොත් පස්කඳ අනිසැ යි නිවන නිත්‍ය යැ යි ආදීන් තුලනය (තිරණය) කරනුයේ, බුද්ධමුණි තෙමේ භවගාමි කම්ම (කර්මක්‍ෂයකර) ආර්ය මාර්ග යෙන් හළේය. කෙසේද? විවසුන් විසින් සිය පස්කඳේහි ඇලුණේ ශමථ විසින් සමාහිත වූයේ, තමා කෙරහි වූ කෙළෙස් නමැති කවචය බෝමුලදීම හළ භවසංසකාර ඇත්තේ, සමාපත්ති බලයෙන් රැඳවූ අත්බව මෙයින් මතු එයට නො සමවදිමි යි ආයුසසංසකාරය හළේය'". **මූලාශ්‍ර:** බු.නි: උදාන පාලිය: 6.1 ආයුසංඛාරවොස්සජ්ජන සූත්‍රය, පි. 278.

▼**ආයුසංස්කාර** (රූප ජීවිත ඉන්ද්‍රියෝ) සිඝ්‍රයෙන් ක්‍ෂය වෙනබව බුදුන් වහන්සේ වදාළහ. ඒ පිලිබඳ දැක්වූ **උපමාව: දක්ෂ දුනුවායෝ** : ධනු ශිල්පයේ අති දක්ෂ දුනුවායෝ 4 දෙනක් ඊතල 4 ක් අහසට විදිති. එම ඊතල පොළවට පතිතවීමට පෙර ඒවා ගැනීමට ජවවේගය ඇති පුරුෂයෙක්ට හැකිවේ. ඔහුගේ ජව වේගයට වඩා හිරු හා සඳුට ඇති වේගය ඊටවඩා සිඝ්‍රය. යම් දේවතාවක්, සඳු හිරු ඉදිරියෙන් යන්නේ නම් එම දේවතාවගේ වේගය ඉතා සීග්‍රය. එහෙත්, ආයුෂ ගෙවීයාම- මරණය පැමිණීම මේ හැමට වඩා වේගවත්ය. **බලන්න**: උපග්‍රන්ථය:උපමා. **මූලාශ්‍රය:** සංයු.නි: (2) ඔපම්මසංයුත්ත: 8.1.6 ධනුග්ගහ සූත්‍රය, පි.432.

**අර**

▲**අරක ශාස්තෘ-**Araka the teacher : මෙතුමා පුරාණයේ විසූ ආධ්‍යාත්මික කණ්ඩායමක ගුරුවරයාය, කාමආසාව අත් හළ කෙනෙකි. ඔහුගේ ශ්‍රාවක පිරිස බොහෝය, මුලික උගැන්වීම වූවේ : "ජීවිතය අල්පය, බොහෝ දුක් සහිතය, ඒබව නුවණින් අවබෝධකර කුසලයේ යෙදී ආධ්‍යාත්මික ජීවිතය ගෙනයායුතුය. උපත ලදවිට මරණයෙන් මිදිය නොහැකිය". ජීවිතයේ කෙටිබව පෙන්වීම පිණිස එතුමා යොදාගත් උපමා: **බලන්න**: උපග්‍රන්ථය:5. 1) තණඅග පිනිබිඳුව උපමාව: ජීවිතය

තණ අග පිනිබින්දුව වැනිය 2) දියබුබුල උපමාව: වැසිවසිනවිට වැටෙන දියබුබුළු වහා නැතිවියන ලෙසින් ජීවිතය වහා නැතිවේ 3) දියේ ඇඳි ඉර උපමාව: දිය ඇඳි ඉර වහා මැකී යන ලෙසින්.... 4) කඳු මුදුනින් ගලාබසින දිය උපමාව: කඳු මුදුනින් පතිත වන දිය දහරාව, නොනැවතී පහළට ගලායන ලෙසින්, ජීවිතය වහා මරණය වෙත දුවයි 5) දිව අග ඇති කෙල පිඬුව උපමාව: දිවඅග ඇති කෙල පිඬුව, ඉතා ඉක්මනින්ම පිටතට දමන ලෙසින් ජීවිතය...6) රත්වූ යකඩ තැටිය උපමාව: දවස පුරා රත්වූ යකඩ තැටියට දමන මස් කැබැල්ල වහා නැතිවී යන ලෙසින් ජීවිතය... 7) මරන්නට ගෙනයන ගවදෙන උපමාව: ඝාතනය කිරීමට ගෙනයන ගවදෙන, තබන සෑම පියවරක්ම, මරණය වෙතටය, එලෙස ජීවිතයද වහා මරණය කරා ඇදේ. **බලන්න**: ආයුෂ, පුරාණ ශාස්තෘන්. **සටහන**: එම ගුරුවරයා ජීවත්ව සිටි සමයේ මිනිස් ආයුෂ 60,000කි. **මූලාශ්‍ර**: අංගු.නි: (4) 7 නිපාත:7.2.2.10 අරක සූත්‍රය, පි.496,EAN:7: 74.10 Araka, p.404.

▲ **අරතිය:** පාලි: **අරතියා**- discontent/ Boredom :කුසල දහම ඇති කරගැනීමට, විපුල කරගැනීමට ඇති උදාසීනබව අරතිය ය. මෙය අධිකුසලයේ නොඇලීම ලෙසින්ද පෙන්වා ඇත, නීවරනයකි. ශ්‍රද්ධා ඉන්ද්‍රිය වඩාගැනීමෙන් අරතිය පහකර ගත හැකිය. **සටහන්:** * පැවිදි ජීවිතය ගෙනයාමට ඇති උනන්දුව නැතිවීම ද අරතිය ලෙසින් පෙන්වා ඇත. **බලන්න**: EAN: note: 1264, p. 643. ** **අටුවාවට අනුව**: අරතිය ලෙසින් බොහෝ අවස්ථාවල පෙන්වා ඇත්තේ දුරසේනාසනවල වාසයට නොකැමත්ත හා භාවනාව පිලිබඳ උකටලිවීම, සසුන- **සාසනය** පිලිබඳ නොසතුටුබව ඇතිවීමය. **බලන්න:** ESN: note: 486, p. 563.

▼ **අරතියෙන් සිත මුදාගැනීම** පිණිස මුදිතාව, මුදිතා නිස්සාරණිය ධාතුව වඩා ගත යුතුවේ. **බලන්න**: නිස්සාරණිය ධාතු, මුදිතා චේතෝ විමුක්තිය. **මූලාශ්‍ර:** අංගු.නි: (4 ): 6 නිපාත: 6.1.2.3 නිස්සාරණිය සූත්‍රය, පි. 40 හා 6.1.7 අරති සූත්‍රය, පි. 283, 6.1.7 සූත්‍රය, පි.284, EAN:6: 13.3 Escape, p. 321 & 113.7 Discontentment, p. 364.

▼ **මාරයාගේ දස බල සේනාවේ**, දෙවැන්නා අරතිය වේ : **"කාමා තෙ පඨමා සෙනා දුතියා අරති වුච්චති..."** **බලන්න**: මාර සේනාව. **මූලාශ්‍ර :**ඛු.නි: සුත්ත නිපාත:පධාන සූත්‍රය, පි.146, Sutta Nipatha: Translated by Laurence Khanthipaalo Mills, The striving of Gothama, p. 139.

▼**අධිකුසලයේ නොඇලීම** නම් වූ අරතිය ජය ගැනීම පිණිස කායගතා සති භාවනාව වැඩිය යුතුය. **මූලාශ්‍ර:** ම.නි: (3): 3.2.9**.** කායගතාසති සූත්‍රය, පි. 254, EMN:119 Kāyagatāsati Sutta-Mindfulness of the Body, p.870.

▼**අරතිය, නීවරණයක්** වූ ථිනමිද්ධයේ එක් අංගයකි. **බලන්න**: නීවරණ. **මූලාශ්‍ර:**අංගු.නි: (1): 1 නිපාත:නීවරණ ප්‍රහාණ වග්ග, පි. 44, EAN:1: Abandoning the hindrances, p. 36.

▼ **පංච කාමය**ට ඇදීයාම නිසා සිත අරතියට පත්වී සසුනට නොඇල්ම ඇතිවේ. **මූලාශ්‍ර:** සංයු.නි: (1): සගාථවග්ග:8: වංගීස සංයුත්ත: 8.1.2. අරති සූත්‍රය, පි. 358, ESN: 8: Vaṅgīsasaṃyutta: 8.2 Discontent, p. 394.

▼**වෙනත් සූත්‍ර මූලාශ්‍ර:** සංයු.නි: (1): සගාථ වගග- 8.1.1.නික්ඛන්ත සූත්‍රය,පි.356,ESN: 8: Vaṅgīsasaṃyutta:8.1 Renounced, p. 392.

▲ **අරණ-**Non conflict: අරණ යනු ගැටීම් නොමැතිව සිටීමය, තමන් හා වාසය කරන සෙසු අය හා සමගියෙන් වාසය කිරීමය. මෙය සංඝයා ගේ

යහපත් ගුණයකි. ශ්‍රමණයන්, ගැටීම් රහිතව ශාන්ත විහරණයේ යෙදී සිටින බව බුදුන් වහන්සේ පෙන්වා ඇත. කෙළෙස් නැති ඔවුන්ට දෙමාපිය නෑදෑයන්ද, ක්‍ෂත්‍රියන්ද වැඳනමස්කාර කරති. **බලන්න**: ශ්‍රමණ. **සටහන:** ගැටීම නොමැතිව වාසය කරන පුද්ගලයා 'අරණවිහාරිය'. **මූලාශ්‍රය:** සංයු.නි: (1) සගාථවග්ග:දේවතාසංයුත්ත: 1.8.11 අරණසූත්‍රය, පි.110.

▲ **අරණවිභංග ප්‍රතිපදාව-** exposition of non-conflict: අරණවිභංග - නොගැටී සිටීමේ ප්‍රතිපදාව, ලෙසින් බුදුන් වහන්සේ පෙන්වා ඇත්තේ මධ්‍යම ප්‍රතිපදාවට අනුකූලව වාසය කිරීමය. මේ සූත්‍රයේ, එම ප්‍රතිපදාව විස්තරාත්මකව පෙන්වා ඇත. **මූලාශ්‍ර**: ම.නි: (3): 3.4.9 අරණවිභංග සූත්‍රය, පි.500, EMN:139: The Exposition of Non-Conflict, p. 985.

▲ **අරණවිහාර ඥාණය-**Wisdom of non-conflict: අරණවිහාර ඥාණය: ගැටීම් රහිතව වාසය කිරීමේ නුවණ : දස්සනආධිපත්‍යය, ශාන්තවිහාර අධිගමය, ප්‍රණීතඅධිමුක්තිය (විමොක්ක තුන: ශූන්‍යතා, අනිමිත්ත, අප්පණිත) යන ප්‍රඥාතුන ලැබීමය. සිව්ජාන හා අරූපසමාපත්ති, අරණවිහාරවේ- එය, ගැටීම් රහිතව වසන උතුමන්ගේ වාසස්ථානයන්ය. **මූලාශ්‍රය:**බු.නි:පටිසම්භිදා-1, ඥානකතා: 33 අරණවිහාර ඥාණය, පි. 206.

▲ **අරහත්වය**: පාලි: **අරහත්තො-** Arahantship : අරහත්-අරහං යනු බුදුගුණයකි, පිදීමට සුදුසුබවය. රහත්මග ඵල ලැබීම අරහත්වයය-අරහත්පත්ති. අරහත්තමග යනු රහත්බවට පත්වීමේ මගය. සියලු කෙළෙස් නසා විමුක්තිය-නිවන සාක්ෂාත් කරගත් උතුමා අරහත්ය. මෙය නිවන්මගේ අවසාන මාර්ග ඵලයය**. බලන්න**: රහතන්වහන්සේ. **සටහන**: ගිහිජීවිතයේ විවිධ වෙනස් කම් ඇති පුද්ගලයෝ අරහත්වය ලැබූ පසු ඔවුන් අතර වෙනසක් නැත, එක් කෙනෙකුගේ විමුක්තිය, අනිත් කෙනාගේ විමුක්තිය හා සමාන බව මෙහි දක්වා ඇත. **බලන්න:** අංගු.නි: (3) : 5 නිපාත:සුමණාවග්ග:5.1.4.1 සුමණා සූත්‍රය, පි.72.

▼ **අරහත් යනු සියලු අකුසල සන්සිඳුවාලීමය :**මතු කල ජාති ජරා මරණ දුක් ඇතිකරවන, සියලු ලාමක අකුසල්, හැම අකුසල් සන්සිඳවූ නිසා ඔහු 'අරහත්'- රහතන්වහන්සේ යයි හඳුන්වන බව මෙහි පෙන්වා ඇත. **මූලාශ්‍ර:** ම.නි: (1): 1.4.9 මහා අස්සපුර සූත්‍රය, පි.652,EMN: 39 Mahā-Assapura Sutta, p.342.

▼**අරහත්බව ලැබූ පළමු භික්ෂූන් 60 දෙනම** : අනත්ත ලක්ඛණ සූත්‍රය අසා අරහත් මගඵල ලැබූ පස්වග මහණුන්: අඤ්ඤා කොණ්ඩඤ්ඤ, වප්ප, භද්දිය, මහානාම, අස්සජි භික්ෂූන් (5); ඉන්පසු යසකුලපුත්‍ර (හා මිතුරන්) විමල, සුබාහු, පුන්ණජි, හා ගවම්පති භික්ෂූන් (5); හා යසකුලපුත්‍ර ගේ ජනපද මිතුරන්-50 අරහත් බව පළමුව ලැබූ භික්ෂූන් 60 දෙනාය. **බලන්න**: උපග්‍රන්ථය:1. **මූලාශ්‍රය:** වින.පි: මහාවග්ග පාළිය:1, පි. 108, 112, 118, 120.

▼ **අකුසල දහම් 10ක්** නැතිකරගැනීම මගින් අරහත්වය ලබා ගත හැකිවේ: රාගය (lust), ද්වේෂය (hatred) මෝහය (delusion), ක්‍රෝධය (anger) අමනාපය-එදිරිබව (උපනාහ-hostility), මකුබව- ගුණමකුබව (මක්ඛ- denigration), අහංකාරය (පළාස- insolence), ඉරිසියාව (ඉස්ස-envy ) මසුරුබව (මච්ඡරි-miserliness) මානය(මාන-conceit ). **බලන්න**: සල්ලේඛපරියාය. **සටහන**: අංගු.නි: (5): 9 නිපාත:ඛෙමවග්ගය: අරහන්ත භබ්බාභබ්බ සූත්‍රයයේ: අහංකාරය හැර සෙසු කරුණු 9 ගැන විස්තර දක්වා ඇත. **මූලාශ්‍ර**:අංගු.නි: (6) :10 නිපාත: 10.2.5.10 භබ්බාභබ්බ සූත්‍රය, පි.404, EAN: 10: 100.10 Incapable, p.540.

▼**කරුණු 7ක් දුරු කළහෙයින් 'අරහත්' වේ**: සක්කායදිට්ඨිය, විචිකිච්ඡාව,සීලබ්බතපරාමාස, රාගය, දෝසය, මෝහය, මානය.**මූලාශ්‍රය:** අංගු.නි; (4) 7 නිපාත:7.2.4.8 අරහන්තධම්ම සූත්‍රය, පි.512.
▼**අරහත්වය ප්‍රකාශ කිරීමේ ක්‍රම විධිය**- method of exposition in declaring the final knowledge :අරහත්වය ලැබූ භික්ෂුව ඒ බව ප්‍රකාශ කරන ක්‍රමවිධිය මෙහිදී විස්තරාත්මකව පෙන්වා ඇත. සළායතන මගින අල්ලා ගන්නා බාහිර අරමුණු නිසා සිතේ රාගය, ද්වේශය හෝ මෝහය ඇතිනොවූ බව ප්‍රඥාවෙන් දැකීම මගින්, භික්ෂුවට: "උපත අවසන් විය, බඹසර වැස නිමවනලදී, මේ රහත්බව පිණිස වෙනත් කලයුතු දෙයක් නැතය..." යයි අවසාන ඥාණය ලැබූ බව පැවසීමට හැකිය. (Destroyed is birth ... there is no more for this state of being). **මූලාශ්‍ර**: සංයු.නි: (4) සළායතනවග්ග: වේදනා සංයුත්ත:නවපුරාණවග්ග: 1.15.8 අත්ථිනුඛෝ පරියාය සූත්‍රය,පි.302, ESN:35: Salayathana samyutta:153.8 Is there a method?, p.1293.
▼**අරහත්වය ප්‍රකාශ කිරීමේ ක්‍රම -පටිපදා 4** : මෙහිදී ආනන්ද තෙරුන් භික්ෂු භික්ෂුණි සංඝයා අරහත්වය ප්‍රකාශ කරන ක්‍රම විධි 4 ක් පෙන්වා ඇත: 1) සමථය පෙරටුකර විදසුන් වඩන විට ප්‍රථම ලෝකෝත්තර මග උපදී. එමග බහුල කරගත්විට කෙළෙස් පහවී අරහත්වය ලැබේ 2) විදස්සනාව පෙරටුකර සමථය වඩන විට මග උපදී. එමග බහුල ක ර ගත්විට කෙළෙස් පහවී අරහත්වය ලැබේ 3) සමථ හා විදර්ශනාව එක්ව- යුගනද්ද- වඩන විට මග උපදී. එමග බහුල කරගත්විට කෙළෙස් පහවී අරහත්වය ලැබේ 4) සමථ විදර්ශනා වඩන විට කෙළෙස්නිසා අධිමානය ඇතිවේ. සිත විදස්සනාවෙ පිහිටුවා, සිත සමාහිත කරගත්විට මග උපදී. එ මග බහුල කරගත්විට කෙළෙස් පහවී අරහත්වය ලැබේ. **මූලාශ්‍රය**:අංගු.නි: (2) 4 නිපාත: 4.4.2.10 අරහත්පත්ති සූත්‍රය, පි.326.
▼**අරහත්වයට පත්වීම ප්‍රකාශ කරණ ආකාර 2ක්** මහාචුන්ද තෙරුන් පෙන්වා ඇත: 1) ඤාණවාදය: අවසාන ඥානය ලැබූ බව භික්ෂුව මෙසේ පවසයි: **"...ඤාණවාදං ආවුසො භික්ඛු වදමානො ජානාමිමං ධම්මං පස්සාමිමං ධම්ම නති"** (මම මේ මේ දහම දනිමි, මම මේ දහම දකිමි යයි ඥානවාදයෙන් පවසන්නේය - I know Dhamma, I see this Dhamma) .2) භාවනා වාදය: දහම් මග වඩාගත් භික්ෂුව මෙසේ පවසයි: **"...භාවනාවාදං ආවුසො භික්ඛු වදමානො භාවිතකායොම්හි භාවිතසීලො භාවිතචිත්තො භාවිතපඤ්ඤාති..."**. (මා හට භාවිතකාය- වැඩුන කයක් ඇත, භාවිතශිලය -වැඩුන ශීලයක් ඇත, භාවිත චිත්තය- වැඩුන සිතක් ඇත, භාවිත ප්‍රඥාව- වැඩුන ප්‍රඥාවක් ඇත යයි භාවනාවාදයෙන් පවසන්නේය (I am developed in body, virtuous behavior, mind, and wisdom). එලෙස ප්‍රකාශ කරන භික්ෂුව: රාගය, දෝසය, මෝහය, ක්‍රෝධය (අමනාපය- උපනාහය), ගුණමකුබව (මකබය) , අහංකාරය (පළාසය), පාපික ඉරිසියාව (ලාමක ඊර්ෂ්‍යාව), පාපික ආශාව යන කෙළෙස් හැම අවසන් කර ඇත්නම් ඔහු අරහත්වය ලබා ඇත. **සටහන්**: * කෙළෙස් පිලිබඳ විස්තර පිණිස **බලන්න**: කුසල හා අකුසල, සල්ලේඛ පරියාය. ** **අටුවාවට අනුව:** ඥානවාදය හා භාවනා වාදය ලැබීම අරහත්වයට පත්වීමය. **බලන්න**: EAN: note: 1993, p.677. **මූලාශ්‍ර**: අංගු.නි: (6 ): 10 නිපාත :මහා වග්ග: 10.1.3.4. මහාචුන්ද සූත්‍රය,පි. 106. EAN: 10: The Great Chapter: 24.4. Cunda, p. 501.
▼**අරහත්වය සියලු බාධා වලින් මිදීමය**: අරහත්වය ලැබූ උතුමා මෙසේ

ප්‍රකාශ කරයි:“ දක්නා ලද දේ වලට නොබැඳී, ඒවා පිළිකුල් නොකර, කිසිවකට වහල් නොවී නිදහස්ව, තැන්පත්වූ සිතකින්, නිදහස්ව, වෙන්වී, සියලු බාධා මිදුන සිතකින් මම වාසය කරමි. (...එලෙස ඇසෙන. දැනෙන, සිතෙන දේ පිළිබඳවද පෙරකී ලෙසින් වසය කරමි). **මූලාශ්‍රය:** ම.නි (2) ඡබ්බිසෝධන සූත්‍රය,EMN:112The six fold purity.

▼**අරහත්වය ලැබීමට පහකලයුතු අකුසල**: මේ අකුසල පහකරගැනීම අරහත්වය ලැබීමට අවශ්‍යයවේ: මානය ,ඕමානය අතිමානය, අධිමානය,ථම්භ (ක්‍රෝධය මානය යන දෙකින් තදබව- obstinacy), අතිනිපාතය. මේ කරුණු ඇතිවිට අරහත්වය පසක්කර ගත නොහැකිය. **බලන්න**: මාන.**මූලාශ්‍ර**: අං.ගු.නි: (4) 6 නිපාත: අරහන්තවග්ග: 6.2.3.2 අරහන්ත සූත්‍රය, පි.252,EAN:6: 76.2 Arahantship**,** p. 360.

▼**අරහත්වය ලැබීමට පහකලයුතු අකුසල 6** : ථීනය, මිද්ධය, උද්දච්චය, කුක්කුච්චය, අශ්‍රද්ධාව, ප්‍රමාදය හැර දැමුවිට අරහත්වය පසක් කරගත හැකි බව මෙහි දක්වා ඇත. **මූලාශ්‍රය:** අං.ගු.නි: (4) 6 නිපාත: අනාගාමීවග්ග: 6.2.2.2. අරහත්ඵල සූත්‍රය, පි.238.

▲ **අර්ථය හා අනර්ථය**: පාලි:**අත්‍ථ, අනත්‍ථ -**beneficial and harmful **අර්ථය:** යහපත -යහපත් ඵලය ලෙසින් පෙන්වා ඇත්තේ සසර කෙළවර කරගැනීමය. එනම් සම්මාමග වඩා විමුක්තිය ලබා ගැනීමය. **අනර්ථය**: අයහපත, ලෙසින් බුදුන් වහන්සේ පෙන්වා ඇත්තේ මිථ්‍යාදිට්ඨිය ගැනීමය (සසර ගමන දික්කරන ප්‍රතිපදාව) .**බලන්න**: මිථ්‍යාත්වය හා සම්‍යක්තවය. **මූලාශ්‍ර**: අං.ගු.නි: ( 6)10 නිපාත:සාධු වග්ග, 10.3.4.4. අර්ථ සූත්‍රය, පි.470, EAN: 10: Good: p.548.

▲ **අර්ථ සංදර්ශන ඤාණය**- Arthadasrshana nana :අර්ථ සංදර්ශන ඤාණය ලෙසින් පෙන්වා ඇත්තේ නානාධම්ම: පංචස්කන්ධය, ආයතන 12, ධාතු 18, කුසල ධම්ම, අකුසල ධම්ම, අව්‍යාකෘත ධම්ම (අබ්‍යාකතා), කාමාවචරධම්ම, රූපාවචරධම්ම, අරූපාවචරධම්ම, අපරියාපන්නධම්ම ආදියේ අරුත් ප්‍රකාශ කරන ප්‍රඥාවය. එනම්, ඒම දහම්හි ඇති අනිච්ච, දුක්ඛ, අනත්ත ස්වභාවය පෙන්වා දීමය. **මූලාශ්‍රය:** ඛු.නි: පටිසම්භිදා 1: 39 අර්ථසංදර්ශන ඤාණය, පි.220.

▲**අරූප තල-**Arupathala :අරූප තල 4 කි:1) **ආකාසානඤ්චායතනය** (Ākāsānañcâyatana- Sphere of Infinity of Space) ආකාශය අනන්ත යන සංඥාව උපදවා ලබාගන්නා සමාපත්තිය මගින් මේ බ්‍රහ්මලෝකයේ පහළවේ. 2) **විඤ්ඤාණඤ්චායතනය**(Viññāṇañcâyatana-Sphere of Infinity of Consciousness). විඥානය අනන්තය යන සංඥාව උපදවා ලබාගන්නා සමාපත්තිය මගින් මේ බ්‍රහ්මලෝකයේ පහළවේ. 3) **ආකිඤ්චඤ්ඤායතනය (**Ākiñcaññâyatana- Sphere of Nothingness ) කිසිවක් නොමැතිය යන සංඥාව උපදවා ලබාගන්නා සමාපත්තිය මගින් මේ බ්‍රහ්මලෝකයේ පහළවේ. 4) **නෙවසඤ්ඤා-නාසඤ්ඤායතනය** (Nevasaññānâsaññâyatana- Sphere of Neither- Perception-Nor-Non- Perception) ආකිඤ්චඤ්ඤායතන සමාපත්තිය අභිබවා යැමෙන් ඇතිකරගන්නා සමාපත්තිය මගින් මේ බ්‍රහ්මලෝකයේ පහළවේ. **සටහන්**: අරූපසමාපත්ති පිළිබඳ විස්තර පිණිස **බලන්න**: අං.ගු.නි: (6):10 නිපාත: 10.2.5.9. උපාලි සූත්‍රය,පි.390, EAN:10: V,99.9 Upaali, p. 538, අං.ගු.නි: (6 ): 11 නිපාත: 11.2.6, අට්ඨකනාගර සූත්‍රය, පි.674, EAN: 11: II Recollection, 16.6 Dasama, p.573.

▲ **අරූප නිස්සාරණීය ධාතුව: පාලි: ආරුප්පං නිස්සරණීයා ධාතුයො-** Arupa Nissaraniya Dhathu :අරූප නිස්සාරණීය ධාතුව ආධ්‍යාත්මික මග වඩාගැනීමට හා විමුක්තිය පිණිස වේ. මේ ධාතුව අවබෝධය අපහසු දුෂ්ප්‍රතිවිධ්‍ය දහමක්ය. රූපයන්ගෙන් මිදීමට, අරහත්මගට පිවිසීමට උපකාරීවන ධාතුවකි. **බලන්න**: නිස්සාරණීය ධාතු, දුෂ්ප්‍රතිවිධ්‍ය ධර්ම, අරූපලෝක. **මූලාශ්‍ර:** දීඝ.නි : (3 ): 11දසුත්තර සූත්‍රය, පි. 483, EDN: 34: Dasuttara Sutta: Expanding Decades, p. 384.

▲ **අරූප ලෝක-**immaterial world: අරූපලෝක ලෙසින් පෙන්වා ඇත්තේ රූපයක් නැති: අරූපකායික- රූපය නොමැති සිත පමණක් ඇති, උසස් බ්‍රහ්ම දෙවිවරු වාසය කරන දේවලෝක- අරූප තලයන් පිලිබඳවය. **බලන්න**: බ්‍රහ්මලෝක.

▲ **අරූප රාග**- lust for the formless: අරූප රාග ලෙසින් පෙන්වා ඇත්තේ රූපයක් නොමැති භවයකට ඇති ඇල්මය. (බ්‍රහ්මලෝකයක යළි උපත ලබා ගැනීමට ඇති ඇල්ම), භව රාගයකි, සසරට බැඳතබන සංයෝජන 10 න් එකකි. **බලන්න:** උද්ධම්භාගිය සංයෝජන, අරූපලෝක, බ්‍රහ්මලෝක.

▲**අරූප සමාපත්ති**- Immaterial Absorptions : අරූප සමාපත්ති යනු රූපජාන ඉක්මවා ලබන ශාන්ත විහරණයන්ය. මේ සමාපත්ති සහමුලින්ම දියුණු කරගැනීමෙන් අරූප බ්‍රහ්ම ලෝකයන්හි පහළවීමට හැකියාව ලැබේ. **බලන්න**: අරූප ලෝක. **සටහන:** බෝධිසත්වයන් ලෙසින් බුදුන් වහන්සේ අනුක්‍රමයෙන් අරූපසමාපත්ති ලබාගැනීමේ විස්තරය මෙහි දක්වා ඇත. **බලන්න:** අංගු.නි: (5) 9 නිපාත: 9.1.4.10 තපුස්ස ගහපති සූත්‍රය, පි.534.

▼**අෂ්ඨ විමොක්ඛ** ලබාගැනීමට අරූප සමාපත්ති වඩාගැනීම උපකාරීවේ. **බලන්න**: අෂ්ඨ විමොක්ඛ. **මූලාශ්‍ර:** දීඝ.නි: (2): 2 මහානිදාන සූත්‍රය, පි. 95, EDN: 15: The Great Discourse on Origination, p. 166,අංගු.නි: (5): 8 නිපාත:8.2.7.6.විමොක්ඛ සූත්‍රය,පි.302, EAN:8:66.6 Emancipations, p. 446.

▼**බුදුන් වහන්සේ,** කැමති පරිදි අරූප සමාපත්ති 4 ලබාගැනීම: ආකාසානඤ්චායතන, විඤ්ඤානඤ්චායතනය, ආකිඤ්චඤ්ඤායතනය හා නෙවසඤ්ඤානාසඤ්ඤායතනය පිලිබඳ මේ සූත්‍රයේ විස්තරාත්මකව පෙන්වා ඇත. **මූලාශ්‍ර**: සංයු.නි: ( 2): නිදානවග්ග: කස්සපසංයුත්ත: 4.1.9 ජාන අභිඤ්ඤා සූත්‍රය, පි. 342, ESN: Nidanavagga: 16: Kassapa samyutta: 9 Jhānas and Direct Knowledges, p. 817.

▲ **අරිට්ඨ තෙර-**Ariṭṭha Thera :**බලන්න**: උපග්‍රන්ථය:1

▲**අරිට්ඨ භික්ෂුව-** bhikkhu Ariṭṭha :**බලන්න**:උපග්‍රන්ථය:4

▲ **ආරියවිරේචනය-** noble purgative : වාත පිත සෙම දෝෂ ඇතිවිට, ඒවාට ප්‍රතිකාර කිරීම පිණිස වෙදුන් යම් යම් විරේචන නියම කරයි. සමහර අවස්ථාවල ඒවායින් ඵල ලැබේ, සමහර අවස්ථාවල ඒවා නිෂ්ඵල වේ. එහෙත්, ජාති ජරා මරණ ආදී දුක් ආබාධ වලින් සහනය ලැබීම පිණිස යොදාගන්නා 'ආරියවිරෙචනය', කිසිවිටක නිෂ්ඵල නොවේ, එමගින් යහපත් ඵල ලැබේ යයි බුදුන් වහන්සේ පෙන්වා ඇත. **ආරියවිරෙචන ක්‍රමය: 1)** සම්මා දිට්ඨිය ඇතිකර ගැනීමෙන්, මිථ්‍යා දිට්ඨිය පහවේ 2) සම්මා සංකප්ප මගින්, මිථ්‍යාසංකප්ප පහවේ 3) සම්මාවාචා මගින් මිථ්‍යාවාචා පහවේ 4)සම්මාකම්මන්ත මගින් මිථ්‍යාකම්මන්ත පහවේ 5) සම්මාආජීවය මගින් මිථ්‍යාආජීවය පහවේ 6) සම්මාවායාමය මගින්

මිථ්‍යාවායාමය පහවේ 7) සම්මාසතිය මගින් මිථ්‍යා සතිය පහවේ 8) සම්මාසමාධිය මගින් මිථ්‍යා සමාධිය පහවේ 9) සම්මා ඥාණය මගින් මිථ්‍යා ඥාණය පහවේ 10) සම්මා විමුක්තිය මගින් මිථ්‍යා විමුක්තිය පහවේ. සියලු අයහපත් අකුසල ප්‍රහීණයවී කුසලය වැඩේ. **මූලාශ්‍රය:** අංගු.නි: (6) 10 නිපාත: 10.3.1.8 තිකිච්ඡක් සූත්‍රය, පි.420.

▲ **ආරිය උපවාද:පාලි :අරියොපවාද-අරියූපවාද-**To insult noble ones ආරිය උපවාදය (ආරියන්ට නිගරුකිරීම) ලෙසින් පෙන්වා ඇත්තේ, යම්කිසි භික්ෂුවක් තමන් සමග වාසය කරන ආරිය පුද්ගලයන්ට නිකරුනේ අපවාද කිරීම, නින්දා අපහාස කිරීමය. මෙ උපවාදය නිසා අයහපත් කම්ම විපාක ඇතිවේ **(ආර්යෝපවාදී කම්ම)**, මෙලොවදී බොහෝ දුක් පිඩා විඳීමට සිදුවේ, මරණින් මතු දුගතියේ උපතට හේතුවේ. යම් කෙනෙක් එවැනි කම්මයක් සිදු කලේනම්, සහනයක් ලැබීම පිණිස යුහුසුළුව සමාව ලබාගතයුතුවේ. **සටහන:** * සොතපන්න ආදී මග ඵල ලබාගත් ආරිය ගිහියන්ට අපවාද කිරීමද අකුසලයකි. ** ආරියඋපවාදය නිසා ලැබෙන අයහපත් විපාක:දහම් මග පරිහානියට පත්වීම, ඇවත් වලට හසුවීම, දැඩි රෝගාබාධ ඇතිවීම, අසිහියෙන් මරණයට පත්වීම, දුගතියේ යළි උපතක් ලැබීම. විස්තර පිණිස **බලන්න**: අංගු.නි: (3) 5 නිපාතය, අක්කොසක වග්ගයේ සූත්‍ර. **ශබ්දකෝෂ: පා.සිං.ශ:** පි.101**: "අරියූපවාද-අරියොපවාද**: (අරිය + උපවාද) ආරිය පුද්ගලයන්ට කරන උපවාද... ගැරහිම"**. P.T.S:** p. 356: "**Upavāda** {Upavada} insulting, railing; blaming...'.

▼ **ආරිය උපවාදය නිසා 11 ආකාර විපත් ඇතිවේ:** භික්ෂුවක්, සබ්‍රම්සරුන්ට, ආරියන්හට නින්දාකරමින්, ගරහමින් ක්‍රියාකරමින් ආරිය උපවාදයේ යෙදෙන්නේ ද, ඔහුට 11ස් ආකාරවූ ව්‍යාසන වලින් එකක් හෝ විය නොහැකිය යි කිව නොහැකිබව බුදුන්වහන්සේ වදාළහ: **"යො සො භික්ඛවෙ භික්ඛු අක්කොසකපරිභාසකො අරියූපවාදී සබ්‍රහ්මචාරීනං අට්ඨානමෙතං අනවකාසො යං සො එකාදසන්නං ව්‍යසනානං අඤ්ඤතරං ව්‍යසනං න නිගච්ඡෙය්‍ය…"**. ව්‍යාසන- **විපාක 11 : 1)** දහම් මගේ මෙතක් මුදුන්පත් කරගැනීමට නොහැකිවූ දේ මුදුන්පත් කරගැනිමට හැකිනොවේ **(අනධිගතං නාධිගච්ඡති) 2)** මෙතෙක් ඉෂ්ට කරගත් යම් දේ තිබේද ඒවා පරිහානියට පත්වේ **(අධිගතා පරිහායති) 3)** ඔහු සතු යම් යහපත් ගුණ ඇත්නම් ඒවා මොටවී යයි- නො බැබලේ **(සද්ධම්මස්ස න වොදායති) 4)** තමන්හට යහපත් ගුණ ඇතැයි ඔහු අධි තක්සේරු කරයි **(සද්ධම්මෙසු වා අධිමානිකො හොති) 5)** උකටලීව බ්‍රහ්මචරියාව ගෙනයයි **(අනභිරතො වා බ්‍රහ්මචරියං චරති) 6)** දූෂ්‍යවූ අපචාර යේ යෙදේ **(අඤ්ඤතරං වා සඞ්කිලිට්ඨං ආපත්තිං ආපජ්ජති) 7)** පැවිදිබව (පුහුණුව) අතහැර පහත් ජීවිතයට (ගිහිබවට) පත්වේ **(සික්ඛං වා පච්චක්ඛාය හීනායාවත්තති) 8)** දැඩි රෝගආබාධයකට පත්වේ **(ගාළ්හං වා රොගාතඞ්කං ඵුසති) 9)** උමතුබවට පත්ව සිහිය විකල්වේ **(උම්මාදං වා පාපුණාති චිත්තක්ඛෙපං) 10)** සිහි විකල්ව මරණයට පත්වේ **(සම්මූළ්හො කාලං කරොති) 11)** මරණින් මතු දුගතියේ, නිරයේ, පහළ ලෝකයේ යළි උපත ලබයි.**( කායස්සභෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උප්පජ්ජති). සටහන: අකෝකාසක සූත්‍රයේ** විපාක 10ක් පෙන්වා ඇත, ව්‍යසන සූත්‍රයේ දී අතිරේක විපාක 1 ක් එකතු කර විපාක 11 ක් දක්වා ඇත.**මූලාශ්‍ර:** අංගු.නි: (6 ): 10 නිපාතය: ථෙර වග්ග, 10.2.4.8. අකෝකාසක සූත්‍රය, පි.330, 11 නිපාතය: 11.1.6. ව්‍යසන සූත්‍රය, පි. 624,

EAN:10: The Elders: 88.8 One who Insults, p. 530, EAN: 11: 6.6 Disaster, p. 567.

▼ **ආරිය උපවාදය** කිරීම නිසා කෝකාලික භික්ෂුව,අයහපත් කම්ම විපාක පලදීමෙන්, මෙලොවදී බොහෝ දුක් වේදනා විඳ පදුම නිරයේ යළි උපත ලැබිය. **සටහන්**: * කෝකාලික භික්ෂුව, ආරිය උපවාදය කලේ අගසව් දෙනමටය. ** අටුවාවට අනුව පදුම නිරය, අවීච්මහා නිරයේ කොටසකි. **බලන්න**: නිරය.** ඛු.නි: සුත්ත නිපාතයේ: 3-10: කෝකාලික සූත්‍රය, පි. 220 මෙම සූත්‍රයට සමානය. **මූලාශ්‍ර**: අංගු.නි: (6): 10 නිපාතය: 10.2.4.9 කොකාලික සූත්‍රය, පි. 332, EAN: 10: 89.9 Kokālika, p. 530.

▼**ආරිය උපවාද කම්ම** - Ariyaupavada Kamma: ලෙසින් පෙන්වා ඇත්තේ ආරිය උතුමන්ට නින්දා අපහාස කිරීම නිසා මෙලෙව හා පරලොව දී විඳීමට සිදුවන අයහපත් කම්ම විපාකයන්ය. විස්තර පිණිස **බලන්න**: අංගු.නි: (6) 10 නිපාත: කොකාලික සූත්‍රය.
▼**වෙනත් මූලාශ්‍ර: 1**. "**ආරිය උපවාද**: අකුසලයකි. බුදු, පසේබුදු, ආරිය ශ්‍රාවකයෝ, (ගිහිව වසන සෝවාන්වූ පුද්ගලයා ද එයට ඇතුලත්ය). ඒ ආරිය උතුමන්ට, අලාභ උපදවීමට...ගුණ නැසීමට කියන ලද උපවාද, ආක්‍රෝෂ, ගැරහීම්, පරුෂ වචන හැම ආරිය උපවාද අකුසල වේ. ආරිය උපවාද කම්ම ආනන්තරිය අකුසලයක් නිසා මහා ගරුපාප කම්මයක් වෙ, එමගින්, සුගති ගමනට හා නිවන් මගට අනතුරුවේ. ආරිය උපවාදය, (ආනන්තරික නොවීනම්) කමා කරගැනීමෙන් පවින් නිදහස්විය හැකිය. එසේ කමා නොකරගත් ආරිය උපවාදය සාවද්‍ය කම්මයකි, ආනන්තරික කම්ම හා සමානවේ. **සද්ධර්ම කෝෂය,** පි. 102.
▲ **ආරඤ්ඤ සේනාසන:** පාලි: **ආරඤ්ඤ වනපත්ථ සෙනාසනා**-Forest dwellings : ආරඤ්ඤ සේනාසන (ආරණ්‍ය) යනු මහා කැලෑවේ, ඝන වනයේ සංඝයා වාසය කරන හුදකලා ස්ථානයන්ය(remote lodgings in forests and jungle groves). දහම් පුහුණුව යහපත් ලෙසින් වඩන සංඝයාට එවැනි හුදකලා ස්ථානවල වාසය කිරීමට බුදුන් වහන්සේ අනුබල දී ඇත. **සටහන්: * 'ආරණ්‍යක**' (forest dwellers) යනු වනයේ වාසය කරන සංඝයාය. ආරණ්‍යක සංඝ කොටස් 5 ක් වේ. ** ආරණ්‍ය වාසි සංඝයා යහපත් ලෙසින් වාසය කලයුතු ආකාරය පිණිස **බලන්න**: ම.නි: (2) 2.2.9 ගුලිස්සානි සූත්‍රය, පි.244. **මූලාශ්‍රය**:අංගු.නි: (3)5 නිපාත:ආරඤ්ඤවග්ග:5.4.4.1 ආරඤ්ඤක සූත්‍රය, පි.378.
▼**එවැනි වන සේනාසනවල වාසය කිරීම** ගැන බුදුන් වහන්සේ මෙසේ වදාළහ: " මහණෙනි, කරුණු 2 ක් දකිමින් මම වන සේනාසන, ගැඹුරු වන ප්‍රදේශ සේවනය කරමි: 1) මේ ජීවිතයේම සුවය සැපය ඇතිව වාසයකිරීම පිණිස-දිට්ඨධම්මසුඛවිහරණය 2) අනාගත ජනතාවට- පච්ච්මජනයා අනුකම්පාව පිනිස". **"ද්වාහං භික්ඛවෙ අත්ථවසෙ සම්පස්සමානො අරඤ්ඤ වනපත්ථානි පන්තානිසෙනාසනානි පටිසෙවාමි. කතමෙ ද්වෙ? අත්තනො ච දිට්ඨධම්ම සුඛවිහාරං සම්පස්සමානො, පච්ඡිමඤ්ච ජනතං අනුකම්පමානො**..." ( Bhikkhus, seeing two advantages, I resort to remote lodgings in forests and jungle groves. What two? For myself I see a pleasant dwelling in this very life and I have compassion for later generations...) **සටහන**: දුර වන සේනාසනයන්හි වැඩ සිටිමෙන් බුදුන් වහන්සේ අනාගත ජනතාවට

අනුකම්පාව දක්වන්නේ කෙසේද?, ශ්‍රද්ධාව නිසා පැවිදිවූ අනාගතයේ තරුණයන්ට මෙසේ සිත්වේ: සම්බෝධිය ලැබූ බුදුන් වහන්සේට තවදුරටත් අවබෝධ කිරීමට, දියුණුකිරීමට, සාක්ෂාත් කර ගැනීමට කිසිවක් නැති වුවත් උන්වහන්සේ දුෂ්කර වනසේනාසනයන්හි වැඩ සිටිසේක. එසේ සිතන ඔවුන්, තමන් ද එවැනි සේනාසනවල වාසය කරමින් වහ වහා දුකින් මිදීමට කටයුතු කරගත යුතුය යයි කල්පනා කරති. **බලන්න**: EAN: Note: 248, p. 593. **මූලාශ්‍ර:** අංගු.නි: (1): 2 නිපාත: 2.1.3.10 සූත්‍රය, පි. 157, EAN: 2: 30.10 Sutta, p.60.

▼ **කරුණු 5 ක් සමන්විත භික්ෂුව**, දුර වන සෙනසුන් සේවනය කිරීමට සුදුසුය යි බුදුන් වහන්සේ වදාළහ: 1) ශීලසම්පන්නබව- පාතිමෝක්ෂ සංවරයෙන් හික්මීසිටීම 2) බහුශ්‍රැතබව, දහම නුවණින් පිරික්ෂා කිරීමේ හැකියාව තිබීම 3) කෙළෙස් නැසීම පිණිස, කුසල් වඩාගැනීම පිණිස ප්‍රධන්විරිය ඇතිබව 4) සිව්ජාන සමාපත්ති කැමති වේලාවක ලබාගැනීමට නිපුනවීම 5) ආසවක්ෂයකර- ආසවක්ඛය, මේ ජීවිතයේදීම චේතෝ විමුක්තිය හා ප්‍රඥාවිමුක්තිය සාක්ෂාත් කරගෙන සිටීම. **මූලාශ්‍ර:** අංගු.නි: ( 3): 5 නිපාත: 5.3.1.10 අරඤ්ඤ සූත්‍රය, පි. 238, EAN:5: 110.10 Forest, p. 276.

▼ **වනසේනාසන සේවනයට සුදුසුවීම** :භික්ෂුවකට, කාමච්ඡන්ද, ව්‍යාපාද, හිංසා සිතුවිලි ඇත්නම්, ප්‍රඥාව නොමැතිනම් (අනුවණනම්) ඔහු වන සේනාසන සේවනයට සුදුසු නොවේ. එහෙත්, නෙක්ඛම්ම, අව්‍යාපාද, අහිංසා සිතුවිලි ඇති ප්‍රඥාවන්ත භික්ෂුව වනසේනාසන සේවනයට සුදුසුවේ. **මූලාශ්‍ර**: අංගු.නි: (2): 4 නිපාත: 4.6.9 අරණ්‍යවනසේනාසන සූත්‍රය, පි. 504, EAN: 4: 262.9 Forest, p. 232.

▼**වන සේනාසනයන්හි** වාසය කරන, අතීතය ගැන ශෝක නොකරන, නොලත් දේ නොපතන, ලද දෙයින් සතුටුවන සංඝයාට පැහැපත් වර්ණයක් ඇතයයි මෙහි දක්වා ඇත. **මූලාශ්‍රය**: සංයු.නි: (1) සගාථවග්ග: දේවතාසංයුත්ත:1.1.10 අරඤ්ඤ සූත්‍රය, පි.36.

▼**පෙර කල වන සේනාසනයන්හි** වාසය කල සිල්වත්, කලණ දහම් ඇති ඉසිවරු හමුවීමට සක්දෙව්ඳු හා වේපචිත්ති අසුරරජු පැමිණියහ. වේපචිත්ති අසුරරජු ඒ ඉසිවරුන්ට ගරු නොකළහ. බොහෝකලක් වනයෙහි වාසය කරන හෙයින් තමන්ගේ කයින් අප්‍රචිත ගඳ හමන නිසා තමන් වෙතට නො එන ලෙස ඒ ඉසිවරු සක්දෙව්ඳුන්ට පැවසූ අවස්ථාවේ, එතුමන් මෙසේ පැවසුහ: "...වහන්ස, ඒ කායගඳ හිසෙහි පැළඳි විසිතුරු කුසුම් මල්දමක් ලෙසින් පිළිගන්නෙමි. දෙවියෝට මෙය පිලිකුල්ය යන හැඟීම නොමැත". **මූලාශ්‍රය**: සංයු.නි: (1) සගාථවග්ග :සක්ඛසංයුත්ත:11.1.9 අරඤ්ඤායතනඉසි සූත්‍රය, පි.428.

▲ **ආරාමය**-Ārāma: සංඝයා වාසය කරන ස්ථානය-විහාරය ආරාමයය- ආවාසයය.ආශ්‍රමය, උපවනය ලෙසින්ද පෙන්වා ඇත. යමෙක් ආවාස දෙන්නේනම් ඔහු සියල්ල දෙනබව බුදුන් වහන්සේ වදාළහ. **බලන්න**:ආවාස.

▼ **බිම්බිසාර රජු**, මගධ දේශයේ අධිපති වේළුවනාරාමය පූජාකිරීම: **"ස්වාමිනි, මම මේ වේළුවන උයන බුද්ධ ප්‍රමුඛ මහා සංඝයාවහන්සේට දෙමි' යයි බුදුහිමි ඉදිරියේ පැන් වත්කර ආරාමය පූජා කළහ. භාග්‍යවතුන්වහන්සේ ආරාමය පිළිගත්සේක. 'මහණෙනි, ආරාම පිළිගැනිම අනුදනිමි',** යයි බුදුන් වහන්සේ වදාලසේක". **මූලාශ්‍රය**: වින.පි: මහාවග්ග පාලිය 1, පි.159.

▲ **ආරබ්ධ විරිය:** පාලි: **ආරද්ධවිරියො-** energetic :ආරබ්ධ වීරිය -ආරද්ධ වීරිය ලෙසින් දක්වා ඇත්තේ අකුසල පහ කරගැනීමට හා කුසල් වඩා ගැනීම පිණිස වීරිය අරම්භ කර ගැනීමය. මෙය සම්මාවායාම, ප්‍රධන්වීරිය ලෙසින්ද පෙන්වා ඇත.**බලන්න**: වීරිය.

▼ **ආරද්ධවිරිය,** සුගතිය ලැබීමට උපකාරීවන බව මෙහි පෙන්වා ඇත. **මූලාශ්‍රය:**සංයු.නි: (4) සලායතනවග්ග: මතුගාමසංයුත්ත:3.2.9 ආරද්ධවීරිය සූත්‍රය, පි.490.

▼ **ආරබ්ධ විරිය** ඇති පුද්ගලයාට, උද්දච්චය, අසංවරය, හා දුසිරිත යන අකුසල පහ කර ගත හැකිවේ. "**සො ආරද්ධවිරියො සමානො භබ්බො උදච්චං පහාතුං අසංවරං පහාතුං දුස්සීල්‍යං පහාතුං**" One who is energetic is capable of abandoning restlessness, nonrestraint, and immorality). **මූලාශ්‍ර**: අංගු.නි: (6 ): 10 නිපාතය: 10.2.3.6 තයෝධම්ම සූත්‍රය,පි.284, EAN:10: 76-6.Incapable, p. 524.

▲**ආරිය-** Noble: ආරිය-අරිය යනු උතුම්බවය. දහම් මගේ අරියබව ලැබීම පිණිස කරුණු 7ක් කඩාබිඳ දැමීය යුතුබව බුදුන් වහන්සේ පෙන්වා ඇත: සක්කාය දිට්ඨිය, විචිකිච්ඡාව, සීලබ්බතපරාමාසය, රාගය, දෝෂය, මෝහය හා මානය. **මූලාශ්‍ර:** අංගු.නි: ( 4): 7 නිපාත: 7.2.4.7 අරිය ධම්ම සූත්‍රය, පි. 512, EAN:7: 91.7, Noble one, p. 406.

▲ **ආරියඅටමග:** පාලි: **අරියො අට්ඨඞ්ගිකො මග්ගො** -The Noble Eightfold Path: ආරිය අටමග (ආර්ය අෂ්ඨාංගික මග) යනු ආධ්‍යාත්මික ජීවිතය- බ්‍රහ්මචරියාව සපුරා ගැනීම පිණිස බුදුන් වහන්සේ වදාළ අංග 8 කින් සමන්විත මධ්‍යම ප්‍රතිපදාව නම්වූ උතුම් මගය: එනම්, සම්මා දිට්ඨිය, සම්මා සංකප්ප, සම්මා වාචා, සම්මා කම්මන්ත, සම්මා ආජීව, සම්මා වායාම,සම්මාසතිය, සම්මා සමාධිය යන අංග 8 කින් සමන්විත ආරිය මගය. **සටහන:** බුදුන් වහන්සේ, සිය ප්‍රථම දහම් දේශනාවේ: ධම්මචක්ක ප්පවත්තන සූත්‍රයේදී, එම මග විස්තර කර වදාළහ.

▼**තථාගතයන් පහළවීම නිසා අරිය අටමග පහළවේ:** පරිශුද්ධවූ (purified), පවිත්‍රවූ (cleansed), නිකැළැල්වූ (flawless), දූෂණ වලින් බැහැරවූ (free from corruptions) කරුණු 8 ක් තථාගතයන් පහළවීම සමග උපදී, එනම් ආරිය අටමගය. එම උතුම් මග බුදුසසුනේ-බුද්ධ ශාසනයේ හැර වෙනත් තැනක උපදින්නේ නැත. **මූලාශ්‍ර:**සංයු.නි: (5-1): මහාවග්ග: මග්ගසංයුත්ත:1.2.4. උප්පාද සූත්‍රය, 1.2.5. පරිශුද්ද සූත්‍රය, පි. 52, ESN: 45: Maggasamyutta, 14.4, 15.5 Arising, p. 1619.

▼ **ආරිය අටමග අග්‍ර මගය :**කෙනෙක් එම මග පිලිබඳ පහන්වූවානම් ඔහු අග්‍ර දේ කෙරේ ප්‍රසන්න (විශ්වාසී) බවට පැමිණි කෙනෙකි, එමගින් ඔහුට අග්‍රවිපාක ලැබෙන බව බුදුන් වහන්සේ වදාළහ." **යාවතා භික්ඛවෙ ධම්මා සඞ්ඛතා, අරියො අට්ඨඞ්ගිකො මග්ගො තෙසං අග්ගමක්ඛායති. යෙ භික්ඛවෙ අරියෙ අට්ඨඞ්ගිකෙ මග්ගෙ පසන්නා, අග්ගෙ තෙ පසන්නා, අග්ගෙ ඛො පන පසන්නානං අග්ගො විපාකො හොති**" . **මූලාශ්‍ර:** අංගු.නි: (2): 4 නිපාත: 4.1.4.4. අග්ගප්පසාද සූත්‍රය, පි. 92, EAN: 4: 34.4 Confidence, p.161.

▼**ආරිය අටමග යනු දුක නැතිකිරීමේ ප්‍රතිපාදාවය**: දුක්ඛ නිරෝධගාමිනි පටිපාදා ආරියසත්‍ය නම්, ආරිය අටමගය යි බුදුන් වහන්සේ වදාළහ: "**කතමඤ්ච භික්ඛවෙ දුක්ඛ නිරොධගාමිනි පටිපදා අරියසච්චං: අයමෙව අරියො අට්ඨඞ්ගිකො මග්ගො, සෙය්‍යථීදං: සම්මාදිට්ඨි.. සම්මාසමාධි**" **මූලාශ්‍ර**: අංගු.නි: (1): 3 නිපාත:මහාවග්ග: 3.2.2.1 සූත්‍රය, පි. 348, EAN:3:

The Great Chapter, 61.1 Sectarian, p. 104.
▼**ආරිය අටමග යනු මධ්‍යම ප්‍රතිපදාවය:** දුකින් මිදීම පිණිස: කාම සුඛල්ලිකානු මගද, කයට වෙහෙස ගෙනෙදෙන අත්තකිලමතානු මගද අත හැර මධ්‍යම ප්‍රතිපදාව වැඩිය යුතුය යි බුදුන් වහන්සේ වදාළහ. ඒ මැදුම් පිළිවෙත, ප්‍රඥාව ඇතිකිරීම පිණිස, නුවණ ලබාදීම පිණිස, කෙළෙස් සංසිඳවීම පිණිස, විශිෂ්ඨ ඥානය පිණිස, සම්බෝධිය පිණිස, නිවන පිණිස පවතී. ඒ කවර නම් මැදුම් පිළිවෙතක්ද? එය මේ ආරිය අටමගය. **මූලාශ්‍ර:** සංයු.නි: (5 -2): මහාවග්ග:සච්ච සංයුත්ත, ධම්මචක්කප්පවත්තන සූත්‍රය, පි. 294, ESN: 56: Saccasamyutta: Setting in motion the wheel of the dhamma, p.2276.
▼**ආරිය අටමග ඇතිවීම**: හිරිඔතප් දෙක සමග උපදින විද්‍යාව, කුසල් දහම් ඉපදවීමට පෙරටුවේ. විද්‍යාව ඇති නුවණැති පුද්ගලයාට සම්මා දිට්ඨිය පහලවේ. සම්මා දිට්ඨිය නිසා සම්මා සංකප්ප ඇතිවේ. සම්මා සංකප්ප ඇතිවිට සම්මා වාචා උපදී. සම්මා වාචා ඇතිවිට සම්මා කම්මන්ත ඇතිවේ. සම්මා කම්මන්ත ඇතිවිට සම්මා ආජීවය උපදී. සම්මා ආජීවය නිසා සම්මා වායාමය ඇතිවේ, සම්මා වායාමය ඇතිවිට සම්මාසතිය උපදී. සම්මා සතිය නිසා සම්මා සමාධිය ඇතිවේ. එලෙස ක්‍රමානුකූලව ආරිය අටමග වැඩේ. **මූලාශ්‍ර**: සංයු.නි: (5.1):මහාවග්ග:මග්ගසංයුත්ත: අවිජ්ජාවග්ග:1.1.1 අවිජ්ජා සූත්‍රය, පි. 30, ESN: 45: Maggasamyutta: 1.1 Ignorance, p. 1603.

▼ **ප්‍රඥාව ආරිය අටමග පිණිසය**: ප්‍රඥාවන්ත පුද්ගලයාට සම්මා දිට්ඨිය ඇතිවේ. සම්මා දිට්ඨිය ඇතිවිට සම්මා සංකප්ප ඇතිවේ... එලෙසින් සම්මා සමාධිය දක්වා ආරියමග වැඩේ. සම්මා දිට්ඨිය ප්‍රමුඛ කොට ගෙන ආරිය අටමග වැඩේ, අනතුරුව එනම් සම්මා ඥාණය හා සම්මා විමුත්තිය සාක්ෂාත්වී, ආධ්‍යාත්මික මග පරිපුණ්න වෙ.**මූලාශ්‍ර:** අංගු.නි: ( 6):10 නිපාත:සමණසඤ්ඤා වගග:10.3.1.5.විජ්ජාසූත්‍රය,පි.412 හා 10.3.1.4. බීජසූත්‍රය,පි.410,EAN:10:104.4 A Seed104.5TrueKnowledge,p. 541.
▼**ආරිය අටමග පිණිස කලණමිතුරු සේවනය අවශ්‍යමය**: කලණමිතුරු (කල්‍යානමිත්‍ර) ඇසුර නිසා කෙනෙක් සම්මා දිට්ඨියට පැමිණේ. සම්මා දිට්ඨිය ඇතිවිට සම්මා සංකප්ප ඇතිවේ... එලෙස ආරිය අටමගේ සියලු සාධක පිරේ. කලණමිතුරු සේවනය නිසා කෙනෙකුට අරිය අටමග වඩාගැනීමට, විපුලකරගැනීමට හැකිවේ.**බලන්න**: කල්‍යානමිත්‍ර සේවනය. **මූලාශ්‍ර**: සංයු.නි: (5-1) මහාවග්ග:මග්ගසංයුත්ත:1.1.2 උපඩ්ඪ සූත්‍රය, පි. 32, ESN: 45: Maggasamyutta: 2.2 Half of the holy life, p. 1604.
▼**ධම්ම විනයේ දිව්‍ය යානය ආරිය අටමගය**: ධම්ම විනයේ දිව්‍යයානය (බ්‍රහ්මයානය- උතුම් යානය) කුමක්ද? යයි ආනන්ද තෙරුන් ඇසුවිට බුදුන් වහන්සේ ආරිය අටමග: දිව්‍යයානය- බ්‍රහ්මයානය, ධම්මයානය හා අනුත්තර සංගාමවිජය යන තෙල නම් වලින් හැඳින්විය හැකිය යි වදාළහ: **"...ඉමස්සෙව ඛො එතං ආනන්ද අරියස්ස අට්ඨඞ්ගිකස්ස මග්ගස්ස, අධිවචනං බ්‍රහ්මයානං ඉතිපි ධම්මයානං, ඉතිපි අනුත්තරො සඞ්ගාම විජයො ඉතිපි".** (This is a designation for this Noble Eightfold Path: 'the divine vehicle', 'the vehicle of Dhamma' and 'the unsurpassed victory in battle.') "...නිරුත්තරවූ මේ බ්‍රහ්මයානය හෙවත් ශ්‍රේෂ්ඨ යානය තමා කෙරෙහි හටගත්තේ නම් ඒ ප්‍රඥාවන්තයෝ ඒකාන්තයෙන්ම රාගාදීවූ කෙලෙස් දිනමින් ලෝකයෙන් නික්මෙති (ලෝකය ජය ගත්තෝය) ...", **"...එතදත්තනි සම්භූතං - බ්‍රහ්මයානං අනුත්තරං නීයාන්ති**

**ධීරා ලොකම්හා- අඤ්ඤදත්‍ථු ජයං ජයන්ති"** **මූලාශ්‍ර:** සං.නි: (5-1): මහා වග්ග:මග්ගසංයුත්ත: 1.1.4 බ්‍රාහ්මණ සූත්‍රය, පි. 36, ESN: 45: Magga samyutta: 4.4 The Brahmin, p. 1606.

▼**ආරිය අට මග පෙර පුරාණ මාවතකි**: පෙරවිසූ සම්මා සම්බුදුවරයන් විසින් අනුගමනය කරන ලද පැරණි මග, පැරණි මාවත බුදුන් වහන්සේ දුටුබව ද, එම පැරණි මාවත අනුගමනය කර ජාති ජරා මරණ ආදීවූ පටිච්චසමුප්පාද දහම දැක, දැන, සංකාර නිරෝධගාමිණී පටිපදාව අවබෝධ කරගත් බව ද වදාළ බුදුන් වහන්සේ දක්වා ඇත්තේ එම පැරණි මග ආරියඅට මගබවය: **"...එවමෙව ඛවාහං භික්ඛවෙ අද්දසං පුරාණං මග්ගං පුරාණඤ්ජසං පුබ්බකෙහි සම්මාසම්බුද්ධෙහි අනුයාතං. කතමො ච සො භික්ඛවෙ, පුරාණමග්ගො? ...අයමෙව අරියො අරියො අට්ඨඞ්ගිකො මග්ගො... ...තමනුගච්ඡිං, තමනුගච්ඡන්තො ජරාමරණං අබ්භඤ්ඤාසිං... සඞ්ඛාරනිරොධගාමිනීපටිපදං අබ්භඤ්ඤාසිං".** **මූලාශ්‍ර**: සංයු.නි: (2): නිදානසංයුත්ත: 1.7.5 නගර සූත්‍රය, පි. 184, ESN:12: Nidana samyutta: 65.5 The city, p. 701.

▼**ආරිය අටමග විස්තරකිරීම** :බුදුන් වහන්සේ ආරියඅටමග විස්තරකර බෙදා පෙන්වා එය මැනවින් මෙනෙහි කරන්න යයි සංඝයාට වදාළහ: **සම්මා දිට්ඨිය**: දුක යනු කුමක්ද ? දුක යයි දැනගැනීම, දුක හටගැනීම ගැන දැනගැනීම, දුක නැතිකිරීම ගැන දැනගැනීම, දුක නැතිකිරීම පිණිස කලයුතු පිළිවෙත ගැන දැනගැනීමය (චතුරාර්-ය සත්‍ය අවබෝධය). **"කතමා ච භික්ඛවෙ, සම්මාදිට්ඨි ?... දුක්ඛෙ ඤාණං, දුක්ඛ සමුදයෙ ඤාණං, දුක්ඛ නිරොධෙ ඤාණං, දුක්ඛ නිරොධගාමිනියා පටිපාදාය ඤාණං...".** **සම්මා සංකප්ප:** නෙක්ඛම්ම සංකල්පය, අව්‍යාපාද සංකල්පය, අවිහිංසා සංකල්පයය. **සම්මා වාචා :** බොරුකීමෙන් (මුසාවාදා), කේලාම් කීමෙන් ( පිසුනාවාචා), රළු වචන කතා කිරීමෙන් (පරුෂාවාචා) හා හිස් කතා වෙන් (සම්ප්‍රප්ඵලාප) වැලකීමය. **සම්මා කම්මන්ත**: ප්‍රාණඝාතයෙන් (පානාතිපාතා), සොරකම් කිරීමෙන් (අදත්තාදානය- අදින්නාදානා), අබ්‍රහ්ම චරියාවෙන් වැලකීමය. **සම්මා ආජීවය:** මිථ්‍යා ආජීවය බැහැර කර, සම්මා අජීවයෙන් ජීවිකාව ගෙනයාම. **"...අරියසාවකො මිච්ඡාආජීවං පහාය සම්මාආජීවෙන ජීවිකං කප්පෙති..."** **සටහන: ම.නි. මහා අස්සපුර සූත්‍රයට අනුව:** සම්මා ආජීවය -පිරිසිදුවූ, විවෘතවූ, සංවරවූ, නිර්මල දිවිපෙවතක් සහිතව වාසය කිරීමය, ශ්‍රමණයෙකුට තිබිය යුතු ගුණයකි. **සම්මා වායාමය:** අකුසල පහ කරගැනීමට, කුසල ඇතිකර ගැනීමට වෙර දැරීම-වීරිය **බලන්න**: ප්‍රධාන විරිය. **සම්මා සතිය:** සතර සතිපට්ඨානයේ සිහිය පිහිටුවා ගැනීම. **බලන්න**: සතර සති පට්ඨාන. **සම්මා සමාධිය**: සිව්ජාන සමාපත්ති ඇති කරගැනීම. **බලන්න**: ජාන **මූලාශ්‍ර:** සංයු.නි: (5-1): මහාවග්ග:මග්ගසංයුත්ත:1.1.8 විභංග සූත්‍රය, පි 42, ESN: 45: Maggasamyutta: 8.8 Analysis, p 1611.

▼**ආරිය අට මගේ ප්‍රධාන අංග: ශිල සමාධි ප්‍රඥා**: සම්මා වාචා, සම්මා කම්මන්ත හා සම්මා ආජීවය **ශිලයට** ඇතුලත්ය. සම්මා වායාමය, සම්මා සතිය හා සම්මා සමාධිය, **සමාධියට** ඇතුලත්ය. සම්මා දිට්ඨිය හා සම්මා සංකප්ප, **ප්‍රඥාවට** ඇතුලත්වේ. **මූලාශ්‍ර:** ම.නි: (1 ): 1.5.4. චූලවෙදල්ල සූත්‍රය,පි. 721, EMN:44: Cūḷavedalla Sutta, p.379.

▼**ආරියඅට මග වැඩිම සක්කාය දිට්ඨිය නැතිකර ගැනීම පිණිසය**
සක්කාය එනම්, පංචඋපාදානස්කන්ධය තමායයි සැලකීම නැතිකර

ගැනීමට ඇති ප්‍රතිපදාව නම් සක්කාය නිරොධගාමිනි පටිපදාව නම්වූ ආරිය අටමගය, ඒ මග වඩා ගැනීමෙන් තමායයි කෙනෙක් ඇතය යන්න අවසන් කරගත හැකියයි ධම්මදින්නා තෙරණිය පෙන්වා ඇත. **බලන්න**: සක්කායදිට්ඨිය. **මූලාශ්‍ර:** ම.නි: (1): 1.5.4. චූලවෙදල්ල සූත්‍රය,පි. 721, EMN:44**:** Cūḷavedalla Sutta, p.379.

▼**ආරිය අටමග ඇත්තේ බුදුසසුනේ පමණය**: යම්කිසි සසුනක අරියඅටමග ඇත්නම් එහි: පළමු ශ්‍රමණයා (**සෝතාපන්න**) දෙවැනි ශ්‍රමණයා (**සකදාගාමී**) තෙවෙනි ශ්‍රමණයා (**අනාගාමී)** සිව්වැනි ශ්‍රමණයා (**අරහත්**) සිටිති (සතර ශ්‍රමණ). පෙර දැක්වූ ශ්‍රමනයන් සිව් පිරිසම මේ ධම්මවිනයේ (බුදු සසුනේ) දක්නට ඇත. අනෙක් සියලු ආගම්, දර්ශන ආදිය එබඳු ශ්‍රමණයන්ගෙන් හිස්ය. මේ සසුනේ භික්ෂු (හා භික්ෂුණියන්) නිසිපරිදි වසන්නේනම් (අරිය අටමගට අනුව) ලෝකයේ රහතුන්ගෙන් හිස් නොවේ යයි බුදුන් වහන්සේ වදාළහ. **මූලාශ්‍ර:** දීඝ.නි: (2): 3: මහා පරිනිබ්බාන සූත්‍රය, පි. 126, EDN: 16: Mahāparinibbāna Sutta, p.171.

▼**ආරිය අටමග උත්තමමගය**: රාග දෝස හා මෝහ යන සියලු කෙලෙස් (ආසව) ප්‍රහාණය කිරීමට ඇති එකම මගඅරිය අටමග බව වදාළ ආනන්ද තෙරුන්, එම මග හා ප්‍රතිපදාව උත්තම මගය, (භද්‍රමග- excellent**)** අනගී මගය, උත්තම ප්‍රතිපදාව බව මෙහිදී පෙන්වා ඇත. **මූලාශ්‍ර**: අංගු.නි: (1): 3 නිපාත: ආනන්දවග්ග: 3.2.3.1 සූත්‍රය, පි. 420, EAN:3: Ananda vagga, 71.1. Channa, p. 117.

▼**විමුක්තිය ලබාදෙන මග ආරිය අටමගය**: විමුක්තිය ලබාගැනීම පිණිස පවතින විමුක්ති ඥාන දස්සනය (knowledge and vision) පිණිස මග හා පිළිවෙත, ආරිය අටමග යයි බුදුන් වහන්සේ වදාළහ. **මූලාශ්‍ර:** සංයු.නි: ( 5-1):මහාවග්ග:මග්ගසංයුත්ත: 1.5.7 ඤාණදස්සන සූත්‍රය, පි. 76, ESN: 45: Maggasamyutta:42-48, knowledge and vision, p. 1651.

▼**ආරිය අටමග, දුක නැතිකිරීම පිණිසය** : "යම් කෙනෙක් අරිය අටමග වරදවන ලද්දේනම්, මැනවින් දුක් ගෙවිමට යන මග ඔහු විසින් වරදවන ලදය. යම් කෙනෙක් අරිය අටමග අරඹන ලද්දේනම්, මැනවින් දුක් ගෙවිමට යන මග ඔහු විසින් ආරම්භ කර ඇත" **"...යෙසං කෙසඤ්චි භික්ඛවෙ, අරියො අට්ඨඞ්ගිකො මග්ගො විරද්ධො, විරද්ධො තෙසං අරියො අට්ඨඞ්ගිකො මග්ගො සම්මා දුක්ඛක්ඛයගාමී. කෙසඤ්චි භික්ඛවෙ, අරියො අට්ඨඞ්ගිකො මග්ගො ආරද්ධො, ආරද්ධො තෙසං අරියො අට්ඨඞ්ගිකො මග්ගො සම්මා දුක්ඛක්ඛයගාමී" මූලාශ්‍ර**: සංයු.නි: (5-1): මහාවග්ග: මග්ගසංයුත්ත:4.3.විරද්ධ සූත්‍රය, පි.66, ESN: 45: Maggasamyutaa: IV: Practice: 33.3. Neglected, p. 1640.

▼ **ආරිය අටමගින් සසරින් එතරවීම පිණිසය** : බුදුන් වහන්සේ වදාළේ: කෙනෙක් අටදහම (ආරිය අටමග) වඩන ලද්දේනම්, බහුල කරන ලද්දේ නම්, එය මෙතෙරින් (සසරින්) එතෙරට (නිවනට) යෑම පිණිස පවතින බවය: "**...අට්ඨිමෙ භික්ඛවෙ, ධම්මා භාවිතා බහුලීකතා අපරා පාරඞ ගමනාය සංවත්තන්ති"** (... These eight things (noble eightfold path), when developed and cultivated, lead to going beyond from the near shore to the far shore...) **මූලාශ්‍ර:** සංයු.නි: (5-1): මහාවග්ග: මග්ග සංයුත්ත: 1.4.4.පාරඞගම සූත්‍රය**,** පි.65, ESN: 45: Maggasamyutta: IV: Practice: 34.4. Going Beyond, p. 1641.

▼**සිතට ඇති ආධරය ආරිය අටමගය**: බුදුන් වහන්සේ වදාළේ සිතට ඇති ආධරය ආරිය අටමගබවය. යම්සේ, කලයක් දරනුවක් මත තබා ඇත්නම්

එය පහසුවෙන් පෙරලිය නොහැකිය. එලෙස, සිතට ආධාර වසයෙන් ආරිය අටමග පවත්වා ගැනීමෙන් සිත යහපත්ව පවත්වා ගත හැකිය.**(කල දරනුව උපමාව) බලන්න:**උපග්‍රන්ථය:5 **මූලාශ්‍ර**: සංයු.නි: (5-1):මහාවග්ග: මග්ගසංයුත්ත:1.3.7 කුම්භ සූත්‍රය, පි. 62, ESN: 45: Magga samyutta:27.7.The Pot, p. 1633.

▼**ආරිය අටමග දහම් මගේ නිවැරදි පුහුණුව ගෙනෙදේ:** බුදුන් වහන්සේ වදාළේ: සම්මා දිට්ඨිය පෙරටුකරගත් සම්මා මග- ආරිය අටමග සේවනය කිරීම සම්මා ප්‍රතිපත්තිය (නිවැරදි පුහුණුව- right practice) බවය. එම ප්‍රතිපත්තිය අනුගමනය කරන පුද්ගලයා නිවැරදි දහම් මග පුහුණුවන කෙනෙකි. **මූලාශ්‍ර**: සංයු.නි: (5-1): මහාවග්ග:මග්ගසංයුත්ත: 4.1 හා 1.4.2 පටිපත්ති හා පටිපන්න සූත්‍ර, පි. 66, ESN:45: Maggasamyutaa: IV: Practice: 31.1 and 32.2 suttas, p. 1639.

▼**ශ්‍රමණභාවය, ශ්‍රමණඵල, ශ්‍රේෂ්ඨභාවය, ශ්‍රේෂ්ඨඵල ලබාදෙන්නේ ආරිය අටමගය** :බුදුන් වහන්සේ වදාළේ ශ්‍රමණබව (asceticism), ශ්‍රේෂ්ඨබව-බ්‍රහ්මබව (Brahmin hood) යනු ආරිය අටමග බවය. එම මග යහපත් ලෙසින් වැඩීමේ ඵලය වන්නේ (ශ්‍රමණ ඵල, ශ්‍රේෂ්ඨ ඵල) මගඵල ලැබීමය: සෝතාපන්න, සකදාගාමී, අනාගාමි, අරහත් බවට පත්වීමය (සතරමග සතරඵල). ශ්‍රමණබවේ, ශ්‍රේෂ්ඨබවේ ඉලක්කය (goal) නම් රාගය, දෝසය හා මෝහය යන ආසව විනාශ කිරීමය. (ආසවක්ෂය- destruction of taints). එම ඉලක්කය සපුරා ගත හැකි වන්නේ ආරිය අටමග වැඩිමෙන්ය. **මූලාශ්‍ර**: සංයු.නි: (5-1):මහාවග්ග: මග්ගසංයුත්ත: සාමඤ්ඤ, බ්‍රහ්මඤ්ඤ සූත්‍ර 1.4.5-1.4.9 සූත්‍ර, පි. 68, ESN:45: Maggasamyutta: IV: Practice: 35.5 -38.8 suttas, p.1643.

▼**මුළාවෙන් (මෝහයෙන්) මිදීමට ඇති මග ආරිය අටමගය**
දේවතාවක් බුදුන් වහන්සේ බැහැදැක, විමසුවේ අප්සරාවන්ගෙන් පිරුන නන්දන උයන නැමති මුලාවෙන් මිදීමට ඇති ක්‍රමය පිලිබඳවය. බුදුන් වහන්සේ වදාළේ, මිදීමට ඇති එකම මග ආරිය අටමග බවය. එම මග මෙසේ විස්තර කර ඇත: යානය උපමාව, **බලන්න**: උපග්‍රන්ථය:5. " ඒ මග: ඍජුය (උජුක- straight way); එහි ගමනාන්තය (දිසා-destination) අභයය (ක්ෂේම-fearless); ඒ රියට යහපත්වූ රෝද (ධම්ම චක්‍ර) ඇති නිසා ගැසෙන්නේ සෙලවෙන්නේ නැත (අකූජන-un rattling ); රථයේ පුවරුව (අපාලම්බ-හේත්තුවන ඇන්ද-leaning board) නම් හිරිය හා ඔත්තප්පයවේ. ඒ රථයේ සැරසිල්ල (පරිවාරනං- upholstery) සිහිය- සතිය ය. සම්මා දිට්ඨිය පෙරටු කරගෙන යන එම රියේ රියදුරා ධම්මයය. යම් ස්ත්‍රියකට හෝ පුරුෂයෙකුට මෙබඳු යානයක් ඇත්නම්, ඇය හෝ ඔහු ඒකාන්තයෙන්ම නිවන වෙතම යයි: **"උජුකො නාම සො මග්ගො අභයා නාම සා දිසා-රථො අකූජනො නාම ධම්මචක්කෙහි සංයුතො හිරි තස්ස අපාලම්බො සතස්ස පරිවාරණං-ධම්මාහං සාරථිං බ්‍රෑමි සම්මාදිට්ඨිපුරෙජවං යස්ස එතාදිසං යානං ඉත්ථියා පුරිසස්ස වා- ස වෙ එතෙන යානෙන නිබ්බාණස්සෙව සන්තිකෙ". සටහන්:** * රිජුමග= ආරිය අට මගය -කාය, වචී, මනෝ ක්‍රියා යහපත් නිසා මාර්ගය ඇද නැත, මර්ගඅන්තය අභයය: එනම් නිවනය; රැකවරණය ඇති තැනය -නිවන සාක්ෂාත් කලවිට කිසි බියක් ඇති නොවේ. රථය= ආරිය අට මගය: සමාන්‍ය ලෝකයේ රථ වාහන එහාට මෙහාට සෙලවේ, ශබ්ද කරයි, එහෙත් ආරිය අටමග එසේ නොවේ. එහි, රෝද- චක්‍ර- යහපත් කුසලතත්වයන්ය (ධම්මචක්ක). දහම,රථයේ රියදුරාය. රිය ඉදිරියෙන් යන්නේ සම්මා දිට්ඨිය -රජෙක් රියේ නැගී යනවිට, ඉදිරියෙන් යන සේවක පිරිස මග බාධා ආදිය අස්කර

දමන ලෙසින් සම්මා දිට්ඨිය පෙරටුව සිටිනවිට, සසර වටයෙන් ගැලවීම පිණිස නියම අවබෝධය ලැබේ. **බලන්න:** ESN: Note: 101, p 516. ** නන්දන උයන, තව්තිසාවේ ඇති දේව උයනකි, අප්සරා- අච්ඡරා දේවතාවියන්ය. **මූලාශ්‍ර:** සංයු.නි: (1):සගාථවග්ග:දේවතාසංයුත්ත 1.5.6 අච්ඡරාසූත්‍රය,පි.84,ESN:1:Devathasamyutta:46.6 nymphs,p.121.

▼**පස්කම් සැප ප්‍රහීණය කරගැනීමේ මග ආරිය අටමගය:** පංචකාමයට - පස්කම් සැපයට ඇති ඇල්ම නැතිකරගැනීමේ මග ආරිය අටමග යයි බුදුන්වහන්සේ වදාළහ. **මූලාශ්‍ර:** සං.නි :(5-1):මහාවග්ග: මග්ගසංයුත්ත :1.3.10 උත්තිය සූත්‍රය, පි. 63, ESN: 45: Maggasamyutta: 30.10 Uttiya, p. 1636.

▼**වේදනා පහකරගැනීමේ මග ආරිය අටමගය**:සියළු වේදනා පිළිබඳව සම්පූර්න අවබෝධය ලබාගැනීමට ආරිය අටමග වර්ධනය කළ යුතුයයි බුදුන් වහන්සේ වදාළහ. **මූලාශ්‍ර:** සං.නි: (5-1):මහාවග්ග: මග්ගසංයුත්ත :1.3.9 වේදනා සූත්‍රය, පි. 63, ESN: 45: Maggasamyutta: 29.9 Feeling, p. 1635.

▼**ආරිය අටමග සම්මා ප්‍රතිපදාවය:** සම්මා ප්‍රතිපදාව- සම්‍යක්ප්‍රතිපත්තිය (right practice) ආරිය අටමග යයි බුදුන් වහන්සේ වදාළහ. ආරිය අටමග සේවනය කරන පුද්ගලයා සම්මා ප්‍රතිපදාව ඇති කෙනෙකි. **මූලාශ්‍ර**: සංයු.නි: (5-1):මහාවග්ග: මග්ගසංයුත්ත:1.4.1 හා 1.4.2 පටිපත්ති හා පටිපන්න සූත්‍ර, පි. 66, ESN: 45: Maggasamyutaa: IV: Practice: 31.1 and 32.2 suttas, p. 1639.

▼**අරහත්බවට මග ආරිය අටමගය:** රාග දෝස හා මෝහ යන අකුසල මුල් ප්‍රහීණය කර අරහත්බව ලැබීමේ මග ආරිය අටමගය යි සැරියුත් තෙරුන් පෙන්වා ඇත. **මූලාශ්‍ර:** සංයු.නි : (4) සළායතන වග්ග: ජම්බුඛාදක සංයුත්ත: 4.1.2 අරහන්ත සූත්‍රය, පි. 500, ESN: 38 : Jambukhādakasaṃyutta:2 Arahantship, p. 1396.

▼**ආරියඅටමග නිවන් මගය- අසංඛත මගය**: **මූලාශ්‍ර:** සංයු.නි: (4 ) :සළායතනවග්ග**:** අසංඛත සංයුත්ත: 9.1.11. මග්ග සූත්‍රය, පි. 662, ESN: 43: Asankatasamyutta: p. 1493.

▼**ආරිය අටමග අවබෝධය පිණිස** එකම මග සතිපට්ඨානය වැඩීමය: **"...යම් සතිපට්ඨානයක් (සිව්සිවටන්) වේද, සත්‍වයන්ගේ විශුද්ධිය පිණිස ශෝක පරිදේවයන් ඉක්ම වීම පිණිස, දුක් දොම්නස් දුරු කිරීම පිණිස අරිය අටමග අවබෝධ කිරීම පිණිස නිවන පසක් කිරීම පිණිස එකම මග වේ" සටහන:** බුදුන් වහන්සේගේ ප්‍රකාශය පිළිබඳව, සහම්පති බ්‍රහ්ම රාජයා මෙසේ පැවසූ බව සූත්‍රයේ දක්වා ඇත: **"...නිවන දක්නාවූ හිතානුකම්පා ඇති භාග්‍යවතුන් වහන්සේ එකම මග දන්නා සේක. යම් කෙනෙක් චතුඕඝය තරණය කළාහුද, මතු තරණය කරන්නාහුද, දැන් තරණය කරයිද, ඔවුන් මේ මගින් තරණය කළහ, කරන්නාහ, කෙරෙති". බලන්න:**සංයු.නි: (5-1)මහාවග්ග: සතිපට්ඨානසංයුත්ත:3.2.8 බ්‍රහ්මසූත්‍රය,පි.328

▼වෙනත් **මූලාශ්‍ර: 1.** "**The Noble Eightfold Path"** by Bhikkhu Bodhi, BPS, 2016. **2. "The Noble Eightfold Path & its Factors Explained"** by Venerable Ledi Sayadaw, BPS: Wheel: 245-247, 1998. **3. "The Threefold Division of The Noble**

**Eightfold Path"** by Piyadassi Thera, B.P.S: Bodhi Leaf: 32, 2010.
▲**ආරිය උතුමා-**Noble person :සිත කෙලෙසන, මතු භවය ඇතිකරවන, කයට සිතට දුක් විපාක ලබාදෙන, මතු කල ජාති ජරා මරණ දුක් ඇති කරවන, සියලු ලාමක අකුසල්, හැම අකුසල් හැම සන්සිඳවූ නිසා ඔහු 'අරිය උතුමා'- ආර්-යායි හඳුන්වන බව මෙහි පෙන්වා ඇත. එනම්, රහතන්වහන්සේය. **මූලාශ්‍ර:** ම.නි: (1): 1.4.9 මහා අස්සපුර සූත්‍රය, පි.652,EMN: 39 Mahā-Assapura Sutta, p.342.

▲ **ආරියකාන්ත ශිලය**: පාලි: **අරියකාන්ත සීලං**-virtuous behavior loved by the noblesආරිය පුද්ගලයන් ප්‍රිය කරන, ආරක්ෂා කරන ශිලය ආරිය කාන්ත ශිලයය. සෝතාපන්න බව ලැබූ ආරිය පුද්ගලයන් සතු සිව් දහමට (සෝතාපන්න අංග) මෙම ශිලය ද ඇතුලත්වේ. **බලන්න**: සිව් දහම, සෝතාපන්න.
▼**ආරියකාන්ත ශිලයේ ගුණ:** බුදුන් වහන්සේ ආරියකාන්ත ශිලය මෙසේ විස්තර කර ඇත: **"...අරියකාන්ත සීලෙහි සමන්නාගතො හොති අඛණ්ඩෙහි අච්ඡිද්දෙහි අසබලෙහි අකම්මාසෙහි භූජිස්සෙහි විඤ්ඤුප්පසත්ථෙහි අපරාමට්ඨෙහි සමාධිසංවත්තනිකෙහි..."**. **ආරියකාන්ත ශිලයයනු**: ආරියන් ප්‍රිය කරන: නොකැඩුන, සිදුරුනැති, කැළැල් නැති, පැල්ලම් නැති, විමුක්තිය සහිතවූ, නුවණැතියන් ප්‍රසංසා කරන, ග්‍රහණය නොකරගත්, සමාධියට යොමු කරන- හිතකරවූ පරිපූර්ණ ශිලයය. **සටහන්**: * අටුවාවට අනුව ආරිය පුද්ගලයෝ මෙම ශිලයට ප්‍රිය කරයි. ඔවුන් කිසිවිටක පංච ශිලය බිඳින්නේ නැත, යම්හෙයකින් යලි උපතක් වේ නම් එම ශිලය ඒ භවය කරාද පැමිණේ. **බලන්න**: ESN: note: 320, p. 2426. ** **අඛණ්ඩෙහි**:නොකැඩුන- unbroken, **අච්ඡිද්දෙහි**: සිදුරුනැති-flawless, **අසබලෙහි**: පලුදුනැති-unblemished, **අකම්මාසෙහි:** කැළැල් නැති- un blotched, **විඤ්ඤුප්පසත්ථෙහි**: ප්‍රඥාවන්තයන් පසසන-praised by the wise, **අපරාමට්ඨෙහි**: තණ්හා දිට්ඨි ග්‍රහණය නොකරන-un grasped, **සමාධිසංවත්තනි**: සමාධියට හිත පිනිසවූ- leading to concentration. **මූලාශ්‍ර:** සංයු.නි: (5-2): මහාවග්ග:සොතාපත්තිසංයුත්ත: 11.1.1 රාජ සූත්‍රය, පි. 162, ESN: 55: Sotapattisamyutta: 1.1 Wheel-Turning Monarch, p. 2183.
▼**ආරියකාන්ත ශිලය අග්‍රය: "යාවතා චුන්දි සීලානි,අරියකාන්තානි තෙසං අග්ගමක්ඛායති- යදිදං අඛණ්ඩෙහි අච්ඡිද්දෙහි ... සමාධි සංවත්තනිකානි. යෙ ඛො... අරිය කන්තෙසු සීලෙසු පරිපූරකාරිනො, අග්ගෙ තෙ පරිපූරකාරිනො. අග්ගෙ ඛො පන පරිපූරකාරීනං අග්ගො විපාකො හොතිති"**. යම් තාක් සිල් තිබේ නම්, ආරියන් ප්‍රිය කරන, මගඵල යුක්තවූ ආරිය කාන්ත ශිලය අග්‍රශීලයය, උතුම්ය. නොකැඩුන... (ආදී වශයෙන්), සමාධියට හිතකරවූ, එම ශිලය යම් කෙනෙක් සපුරා ගන්නේ නම් ඔහු අග්‍ර දෙය පරිපූර්-ණ කරගත් පුද්ගලකි, ඔහුට අග්‍ර විපාක (යහපත් ඵල) ලැබේ. **මූලාශ්‍ර:** අංගු.නි: (3 ): 5 නිපාත: 5.1.4.2 චුන්දී සූත්‍රය,පි.75, EAN: 5: 32.2 Cundi, p.247.
▲**ආරියඥානය-**Ariya Nana: ප්‍රඥාඉන්ද්‍රිය ඇතිවීම ආරිය ඥානය ඇතිවිමය **බලන්න**: ප්‍රඥා ඉන්ද්‍රිය.
▲ **ආරිය තුෂ්නිම්භාවය**-Noble silence: තුෂ්නිම්භාවය යනු කථානොකර සිටීමය. මෙහිදී තුෂ්නිම්භාවය ලෙසින් දක්වා ඇත්තේ දහමට අදාළ නොවන කරුණු කථාකරන අවස්ථාවේ, සංසයා නිශ්ශබ්දව සිටීමය,

ආරිය නිශ්ශබ්දතාවය පවත්වා ගැනීමය. **බුදුන් වහන්සේ මෙසේ වදාළහ:** **" මහණෙනි, එකට රැස්වූ ඔබ විසින් දහම කථාවේ යෙදීම හෝ ආරිය තුෂ්නිම්භාවය යන දෙක කලයුතුය'**. **සටහන:** අටුවාවට අනුව ආරිය තුෂ්නිම්භාවය යනු 2නි ජානය හෝ කෙනෙකුගේ මූලික භාවනා කමටහන- විෂයය. 2නි ජානයට පැමිණීමට අපහසු කෙනෙකුට දෙන උපදෙස වන්නේ කතාවෙන් තොරව- නිශ්ශබ්දව, තමාගේ මූලික භාවනා විෂයට සිත යොමුකලයුතු බවය. **බලන්න**: EMN: note: 298, p.1092. **මූලාශ්‍ර:**ම.නි: (1): ආර්ය පර්යේෂණ සූත්‍රය, පි 413, EMN: 26,The Noble Search, p 242.

▼**මහා මුගලන් තෙරුන්** ආරිය තුෂ්නිම්භාවය ගැන මෙසේ වදාළහ; "... මෙහි මහණ තෙමේ විතක්කවිචාර සංසිදීමෙන් ස්වසන්තානයේ හි පැහැදීම ඇති, සිතේ උතුම් එකඟබව වඩන විතක්කවිචාර රහිත සමාධියෙන් හටගත් ප්‍රීතිය හා සැපය ඇති ද්විතියධ්‍යානය උපදවා වාසය කිරීම ආරිය තුෂ්නිම්භාවය යි කියනු ලැබේ". **සටහන**: එසේ ධ්‍යාන වඩන, මුගලන් තෙරුන් වෙත ඍද්ධි බලයෙන් වැඩම කළ බුදුන් වහන්සේ මෙසේ වදාළහ: " මුගලන්,... ආරිය තුෂ්නිම්භාවය නොවරදව...එහි සිත මැනවින් තබාගන්න...එහි සිත එකඟ කරගන්න....එහි සිත නගාලන්න" **මූලාශ්‍රය:** සංයු.නි: නිදානවග්ග: භික්ඛුසංයුත්ත:9.1.1. මොග්ගල්ලාන සූත්‍රය, පි.444.

▲ **ආරිය දර්ශනය:** to see the noble ones: ආරිය දැකීම: ආධ්‍යාත්මික මගේ දියුණුව පිණිස ආරිය පුද්ගලයන් දැකීම, ඔවුන්ගේ අවවාද, අනුසාසනා ඇසීම වැදගත්ය. මේවා සුභ-මංගල කරුණු යයි මංගල සූත්‍රයේ පෙන්වා ඇත.
▼ **බුදුන් වහන්සේ** පෙන්වා ඇත්තේ, කෙනෙක්හට දුසිරිතය, උද්දච්චය, අසංවර සිත ආදි අවගුණ ඇතිවිට, ඔහු ආරියන් දැකීමට ප්‍රිය නො කරයි. දහමේ ප්‍රමාදය ඇතිවිට අරිය පුද්ගලයන්ට ගරුකිරීම ද සිදුනොවේ. එම අවගුණ පහකර ගැනීමෙන්, ආරිය දැකීම ඇති කර ගත හැකිවේ. ශිල සම්පන්නවූවිට ආරියන් දැකීමට කැමැත්ත ඇතිවේ. **මූලාශ්‍ර**: අංගු.නි: (6 ): 10 නිපාතය: 10.2.3.6 තයොධම්ම සූත්‍රය,පි.284, EAN:10: Tens,76-6.Incapable, p. 524.

▲ **ආරියධම්ම හා අනාරියධම්ම-**Ariya Dhamma & Anariya Dhamma ආරිය ධම්ම යනු යනු උසස්බවය; දහමට අනුකූල බවය. අනාරිය යනු පහත් බවය, දහම් මගට පිටස්තර බවය. **ආරිය ධම්ම** ලෙසින් බුදුන් වහන්සේ පෙන්වා ඇත්තේ සම්මා දිට්ඨිය ඇතුළු අංග අනුගමනයය. අනාරිය ධර්මය නම් වැරදිමග- මිථ්‍යාදිට්ටිය ගැනීමය. **මූලාශ්‍ර**: අංගු.නි: (6 කාණ්ඩය): 10 නිපාත: 10.3.4.2 අරියධම්ම සූත්‍රය, පි. 468, EAN:10: IV: 135.2 Noble, p. 548.
▼**ආරියධම්ම යනු**: පස්කම්සැප, දුකය යන අවබෝධය, පස්කම්සැප නිරුද්ධ වීම සැපය යන අවබෝධය, සක්කායදිට්ඨිය පහවීම සැපයකි, එහෙත් එලෙස දැකීමට මුළු ලෝකයාම විරුද්ධ වේ. **අනාරිය ධම්ම යනු:** පස්කම්සැප සැපයක් සේ ගැනීම, පස්කම්සැපය නොමැතිවීම දුකක් සේ ගැනීම. **සටහන:** ආරියධම්ම ඇත්තේ කෙළෙස් තැවූ ආරිය පුද්ගලයන්ට ය, ආනාරිය ධම්ම ඇත්තේ කෙළෙස්බර දෙවියන් සහිත ලෝවැසියාය, අනාරියෝ සුවය යි පවසන දේ ආරියෝ දුක යයි පවසයි, අනාරියෝ දුකය යි පවසන දේ ආරියෝ සුවය යයි පවසන බව මෙහි පෙන්වා

ඇත.**මූලාශ්‍රය:** සංයු.නි: (4): සළායතනවග්ග: වේදනාසංයුත්ත : දේවදහවග්ග: 1.14.3 සගයිහ සූත්‍රය, පි.280.

▼**දසකුසල් ආරියධම්මයය, දසඅකුසල් අනාරිය ධම්මයය**: මෙහිදී ආරිය දහම ලෙසින් පෙන්වා ඇත්තේ දසකුසලයන්ය: පරපන වැනසීමෙන් වැළකීම ආදීවූ... සම්මා දිට්ඨීයය. අනාරිය දහම නම් දස අකුසලය: පරපන වැනසීම...මිථ්‍යා දිට්ඨිය. **බලන්න:** දසකුසල හා දසඅකුසල. **මූලාශ්‍ර**:අංගු.නි:(6):10 නිපාත:10.4.3.1සාධු සූත්‍රය,පි.528, EAN: 10:178.1. Good, p.555.

▼**සප්ත බොජ්ඣංග ආරිය ධම්මය ය:** මෙහිදී පෙන්වා ඇත්තේ, ආරියවූ, නියානිකවූ සප්ත බොජ්ඣංග යහපත් ලෙසින් වඩා ගැනීම දුක ගෙවීම පිණිස බවය. **මූලාශ්‍රය:** සංයු.නි: (5-1): මහාවග්ග: බොජ්ඣංග සංයුත්ත: 2.2.9 අරියසූත්‍රය, පි.198.

▼**සතර සතිපට්ඨානය ආරිය ධම්මය ය**: මෙහිදී පෙන්වා ඇත්තේ, ආරියවූ, නියානිකවූ සතර සතිපට්ඨානය යහපත් ලෙසින් වඩා ගැනීම දුක ගෙවීම පිණිස බවය. **මූලාශ්‍රය:** සංයු.නි: (5-1): මහාවග්ග: සතිපට්ඨාන සංයුත්ත: 3.2.7 අරියසූත්‍රය, පි.328.

▼**සතර ඉද්දිපාද ආරිය ධම්මයය**: මෙහිදී පෙන්වා ඇත්තේ, ආරියවූ, නියානිකවූ සතර ඉද්දිපාද යහපත් ලෙසින් වඩා ගැනීම දුක ගෙවීම පිණිස බවය. **මූලාශ්‍රය:** සංයු.නි: (5-2): මහාවග්ග: ඉද්දිපාදසංයුත්ත:7.1.3 අරියසූත්‍රය, පි.28.

▲ **ආරියධෝවනය හා ආනාරියධෝවනය**-noble washing & ignoble washing : ආරියධෝවනය යනු සම්මාදිට්ඨිය ඇතුළු අංග 10 අනුගමනය කර විමුක්තිය ලැබීමය. මිථ්‍යාදිට්ඨිය ඇතුළු අංග 10 අනුගමනය කිරීම අනාරිය ධෝවනය ය. **සටහන:** බුදුන්වහන්සේ වැඩසිටි සමයේ දකුණු ඉන්දියාවේ ධෝවන නම් ගමේ වැසියෝ පවුලේ කෙනෙක් මිගියපසු භූමදානය කර, මළකඳ දිරා ගියපසු මිණිඇට ගෙන සෝදා පවිත්‍ර කර පුදපූජා කරන මළවුන් සිහිකරන (අනුස්මරණ) පැරණි චාරිත්‍රයක් පැවතිනි .බලන්න: EAN: note:2146, p. 683. බුදුන්වහන්සේ මෙසේ වදාළහ: **"අහඤ්ච බො භිකඛවෙ අරියං ධොවනං දෙසිසසාමි. යං ධොවන එකනත නිබබිදාය විරාගාය නිරොධාය උපසමාය අභිඤ්ඤාය සමෙබාධාය නිබබානාය සංවතතති. යං ධොවනං ආගමම ජාතිධමමා සතතා ජාතියා පරිමුචචනති, ජරාධමමා සතතා ජරාය පරිමුචචනති, මරණධමමා සතතා මරණෙන පරිමුචචනති, සොකපරිදෙව දුකඛ දොමනසසුපායාස ධමමා සතතා සොකපරිදෙව දුකඛදොමනසසු පායාසෙහි පරිමුචචනති"** 'ආරියධෝවනය- ආරිය සේදීම, ඒකාන්තයෙන්ම, නිබ්ද්දාව, විරාගය, නිරෝධය, උපසමය, විශිෂ්ඨ ඥානය, සම්බෝධිය, නිවන පිණිස පවතී. එම ධෝවනය මගින් ජාතිය, ජරාව, මරණය, දුක දොම්නස ආදීවූ ... සවභාවය ඇති සත්වයෝ එම ස්වභාවයෙන් මිදේ'. ආරිය **ධෝවනය පිලිබඳ ක්‍රම වේදය:** යම් කෙනෙකුට, සම්මා දිට්ඨිය ඇතිවූවිට ඔහු තුළ පැවති මිථ්‍යා දිට්ඨිය හා අකුසල සේදීයාමෙන් ඔහු පිරිසුදුවේ. සම්මා දිට්ඨිය ඇතිවිට කුසල විපුලවී ඔහුට සම්මා සංකප්පය ඇතිවේ, එමගින් මිථ්‍යා සංකප්ප නැතිවේ. සම්මා සංකප්ප විපුලවීමෙන් සම්මා වාචා ඇතිවේ. එවිට මිථ්‍යා වාචාව නැතිවේ. සම්මාවාචාව විපුලවීමෙන් සම්මා කම්මන්තය ඇතිවේ. එවිට මිථ්‍යා කම්මන්තය නැතිවේ. සම්මා කම්මන්තය විපුලවීමෙන් සම්මා ආජීවය ඇතිවේ. එවිට මිථ්‍යා ආජීවය නැතිවේ. සම්මා අජීවය විපුලවිමෙන් සම්මා වායාමය ඇතිවේ, එවිට

මිථ්‍යාවායාමය නැතිවේ. සම්මා වායාමය විපුලවීමෙන් සම්මා සතිය ඇතිවේ. එවිට මිථ්‍යා සතිය නැතිවේ. සම්මා සතිය විපුලවීමෙන් සම්මා සමාධිය ඇතිවේ, එවිට මිථ්‍යා සමාධිය නැතිවේ. සම්මා සමාධිය විපුල වීමෙන් සම්මා ඥාණය ඇතිවේ. එවිට මිථ්‍යා ඥාණය නැතිවේ. සම්මා ඥාණය විපුල වීමෙන් සම්මා විමුත්තිය ඇතිවේ. එවිට මිථ්‍යා විමුත්තිය නැතිවේ. එලෙසින් සම්මාමග නිසා පිරිසිදුවන සත්වයෝ ජාති ජරා මරණ ආදීවූ දුකින් මිදී නිවන සාක්ෂාත් කරගනී. **අනාරියවූ දෝවනය** මගින් කිසි වැඩක්-ලාභයක් සිදුනොවන බව (විමුක්තිය ලබාගැනීම පිණිස පිහිටක්) බුදුන් වහන්සේ පෙන්වා ඇත.කෙනෙක් සම්මාමග අනුගමනය කර නිවන ලබාගැනීම ආරිය ධෝවනයවේ. **මූලාශ්‍ර**:අංගු.නි. (6):10 නිපාත: සමණ සඤ්ඤා වගග: 10.3.1.7. ධොවන සූත්‍රය, පි.416, EAN:10: 107-7 Dhovana, p.542.

▲ **ආරියනාායය:** පාලි: **අරියො ඤායො-** noble method: ආරියනාායය ලෙසින් පෙන්වා ඇත්තේ පටිච්චසමුප්පාදය-හේතුඵල දහමය. ආරිය නාායය බුදුන්වහන්සේ මෙසේ විස්තරකර ඇත: සෝතාපන්නවූ පුද්ගලයා ආරියනාායය ප්‍රඥාවෙන් මනා කොට දැක මනාව ප්‍රතිවේදනය කරඇත.ඔහු විසින් කවර ආරිය නාායයක්-ඉදපච්චයා නියාය-මනාව අවබෝධ කර තිබේද යත්: " මෙය ඇතිකල්හි එය ඇතිවේ - මෙය හටගත්විට එය හටගනී, මෙය නැතිකල එය ඇතිනොවේ - මෙය නිරුද්ධවීමෙන් එය නිරුද්ධවී යයි..." **'ඉති ඉමස්මිං සති ඉදං හොති, ඉමස්සුප්පාදා ඉදං උප්පජ්ජති, ඉමස්මිං අසති ඉදං න හොති, ඉමස්ස නිරොධා ඉදං නිරුජ්ඣති...''**. එනම්, අවිද්‍යාව නිසා සංඛාර ඇතිවේ, සංඛාර නිසා විඥානය ඇතිවේ ... **සටහන්**: * එලෙස ආරිය ශ්‍රාවකයා අවබෝධ කරගත් ආරිය නාායය, පටිච්චසමුප්පාද ක්‍රියාවලිය හා අවිද්‍යාව නැතිවීමෙන් එම ක්‍රියාවලිය අවසන්වීම- දුක නිරෝධවීම බව මේ සූත්‍රයේදී පෙන්වා ඇත. ** අටුවාවට අනුව: ආරිය නාායය යනු මග්ග ඥානය හා විදස්සනා ඥානයය. **බලන්න**: EAN: note: 2123, p. 682. **මූලාශ්‍ර**: අංගු.නි: (6):10 නිපාත, 10.2.5.2. භය සූත්‍රය,පි.354, EAN:10: 92.2. Enmity, p.533.

▲ **ආරිය ප්‍රඥාව-** Noble wisdom: දුක පිලිබඳ ආරියන් සතු අවබෝධය, ආරිය ප්‍රඥාවය ය. ආරිය ප්‍රඥාව ලෙසින් බුදුන් වහන්සේ පෙන්වා ඇත්තේ ආරිය නිබ්බේදය (සසර ගැන කළකිරිම) ඇති කරන, යහපත් ලෙසින්ම දුක කෙළෙවර කරගැනීම පිණිස පවතින, ඇතිවීම හා නැතිවීම දන්නා (සමුදය වය) නුවණය. (Here, a clansman is wise; he possesses the wisdom that discerns arising and passing away, which is noble and penetrative and leads to the complete destruction of suffering**)** **බලන්න**: ප්‍රඥාව. **මූලාශ්‍ර:** අංගු.නි: (5 ) අට නිපාත: 8.2.6.4 ව්‍යාගපජ්ජ සූත්‍රය, පි 256,EAN: 8: 54 .4 Dīghajāṇu, p 441.

▲ **ආරිය පරියේසණය හා අනාරිය පරියේසණය-**the noble search and the ignoble search :ආරිය පරියෙසනය යනු දුකින් ගැලවීම පිණිස කරන සෙවීමය. අනාරිය පරියෙසනය නම් පංචකාමය සොයා යාමය. 1) **ආරිය පරියෙසනය** නම් සසර දුක: ජාති, ජරා, මරණ ආදීවූ දහම් තාවයන්හි ආදීනව අවබෝධ කරගත් නුවණැති පුද්ගලයෙක් ඉන් මිදීම පිණිස ආධ්‍යාත්මික මගක් සොයායෑමය. මග අවබෝධ කරගන්නා ඔහු අවසානයේදී සසර ගමන නතරකර නිවන සාක්ෂාත්කරගනී. **සටහන**: බෝසතුන් ගිහිගෙයින් නික්ම ජරා මරණයෙන් මිදීමේ මග සෙවීම පිළිබඳව කටයුතුකල ආකාරය මේ සූත්‍රයේ පෙන්වා ඇත. **අනාරිය**

**පරියෙස්නය නම්:** ඇතැම් ලෝක සත්ත්වයෝ, ජාති, ජරා මරණ ස්වභාවය ඇතිව , එවැනි ස්වභාවය ඇති වෙනත් සත්ත්වයන් හෝ දේවල් පිළිබඳව කෙලෙස් ඇතිකරණ පංචකාම වස්තූන් සොයා යයි. ඔවුන්ගේ සසර ගමන දිගය. **බලන්න:**පරියෙසන,**මූලාශ්‍ර**:ම.නි: (1): 1.3.6 ආරියපරියෙසනසූත්‍රය, පි.414, EMN:26: Ariyapariyesanā Sutta- The Noble Search, p. 242.

▲ **ආරිය පුද්ගලයෝ**- Noble persons : දහමේ මගේ මගඵල ලබාගත් (සෝතාපන්න - අරහත්) උතුමන් ආරිය පුද්ගලයන් ලෙසින් දක්වා ඇත. මග සාක්ෂාත් කරගත් හා යහපත් ලෙසින් මග ගමන් කරණ ආරිය පුද්ගලයන් සත් දෙනක් සිටින බව බුදුන් වහන්සේ පෙන්වා ඇත. **බලන්න**: සත් ආරිය පුද්ගලයෝ, සේඛ හා අසේඛ.

▲ **ආරිය මග හා අනාරිය මග-** Nobel path & Ignoble path : ආරිය මග නම් සම්මා දිට්ඨිය සහිත නිවැරදි මගය. මිථ්‍යාමග -මිථ්‍යා දිට්ඨිය ඇති අනාරිය මගය, වැරදි මගය. **මූලාශ්‍රය**: අංගු.නි: (6): 10 නිපාත:ආරියවග්ග: 10.3.5.1 අරියමග්ග සූත්‍රය, පි.474.

▼ **දසකුසල** යෙහි යෙදීම අරියමගවේ, දසඅකුසලයෙහි දීම අනාරිය මගය **බලන්න**: දසකුසල හා අකුසල. **මූලාශ්‍ර**: අංගු.නි: (6 ): 10 නිපාත:10.4.4.1 අරියමග්ග සූත්‍රය, පි. 536, EAN:10: 189.1 The Noble Path, p. 556.

▼ **ථීන මිද්ධය** ඇතිවිට විරියවඩා එම නිවරණය පහකරගැනීමෙන් ආරියමග පිරිසුදු කරගත හැකිවේ. **මූලාශ්‍ර**:සංයු.නි: (1):සගාථවග්ග: දේවතාසංයුත්ත: 1.2.6 නිද්දාතන්නදී සූත්‍රය, පි. 40, ESN:1: Devata samyutta: 16.6 Drowsiness and Lethargy, p.75.

▲ **ආරියවිනය-** Noble One's discipline :ආරියවිනය ලෙසින් පෙන්වා ඇත්තේ බුදුන් වහන්සේ වදාළ ධම්මවිනයය. **බලන්න**: ධම්ම විනය.

▲**ආරියවිනයේ දිළිඳුබව**- Poor in Noble One's discipline :ආරියවිනයේ කෙනෙක් දිළිඳුබවට පත්වීමට හේතු මෙහි දක්වා ඇත: කුසල දහම පිලිබඳ: ශ්‍රද්ධාව නැතිකම, හිරිඔත්තප්ප නැතිකම, වීරිය නැතිකම, ප්‍රඥාව නැතිකම. **මූලාශ්‍රය**: අංගු.නි: (4) 6 නිපාත:ධම්මිකවග්ග: 6.1.5.3 ඉණසූත්‍රය, පි.138.

▲ **ආරියවිනයේ පච්චරෝහණී-** Paccorohanni of Noble One's discipline: බ්‍රාහ්මණයන්ගේ පච්චරෝහණය පිළිබඳව ජානුස්සොනි බ්‍රාහ්මණයා ගෙන් විස්තර අසා බුදුන් වහන්සේ ආරිය විනයේ පච්චරෝහණය පිළිබඳව මෙසේ කරුණු පෙන්වා ඇත: මේ සසුනේ ආරිය ශ්‍රාවකයෙක් මෙසේ සලකා බලයි. "මිථ්‍යාදිට්ඨිය නිසා ඇතිවන අයහපත් විපාක මේ ජීවිතයට මෙන්ම, මතු ජීවිතයටද අහිතකරය, එලෙස සිතන ඔහු මිථ්‍යාදිට්ඨිය හැරදමයි, ඉන් පහළටබසී". ඔහු අංග 10න් යුත් මිථ්‍යාදිට්ඨිය හැරදමා අංග 10න් යුක්ත සම්මාදිට්ඨිය අනුගමනය කරයි. **සටහන:** මේ සූත්‍රයේ බ්‍රාහ්මණයන්ගේ පච්චරෝහණය පිලිබඳ විස්තර ඇතුළත්වේ.**මූලාශ්‍ර**:අංගු.නි:(6):10 නිපාත,10.3.2.7,10.3.2.8 පච්චො රොහණී සූත්‍ර, පි.452, EAN: 10: 119-7 & 120-8, Paccorohaṇī, p.546.

▲ **ආරියවිනයේ පිරිසිදුබව හා අපිරිසිදුබව-**Purification & Non-purification in the Noble One's Discipline: **අපිරිසුදුවීම** ත්‍රිවිධාකාරය : කයෙන්, වචනයෙන් හා මනසින් කරන (තුන්දොරින්) අකුසල ක්‍රියා. ඒවා නිසා මිනිසුන් දුගතියට යයි. ආරියවිනයේ **පිරිසිදුවීම** යනු කයෙන්, වචනයෙන් හා මනසින් කරන කුසල ක්‍රියාය. ඒවා නිසා මිනිසුන් මෙලොව හා පරලොව සැප ලබයි.**සටහන:** අපිරිසිදු ක්‍රියා දස අකුසලයය, පිරිසුදු ක්‍රියා දස කුසලයය. **මූලාශ්‍ර**: අංගු.නි: ( 6 ): 10 නිපාත : 10.4.2.10

චුන්ද සූත්‍රය,පි.508, EAN: 10: 176.10, Cunda,p.553.
▲ **ආරිය වමනය-** The noble vomiting: අරිය වමනය ලෙසින් බුදුන් වහන්සේ පෙන්වා ඇත්තේ, යම් පුද්ගලයෙක් මිථ්‍යා ප්‍රතිපත්තිය (මිථ්‍යාදිට්ඨිය ) වමාරා දමා (ඉවතටහළා), සම්මා ප්‍රතිපත්තියට (සම්මාදිට්ඨිය) පැමිණ, දුකෙන් මිදීමය. **මූලාශ්‍රය:** අංගු.නි: (6): 10 නිපාත: 10.3.1.9 වමනසූත්‍රය, පි.422.
▲ **ආරිය වර්ධනය-** noble growth: දහම් මගේ ගමන් කරන පුද්ගලයෙක් දියුණුවට පත්වීම ආරියවර්ධනයවෙ. ආරිය ශ්‍රාවකයා, ආකාර 10 කින් ජීවිතයේ නියම සාරය වඩාගනි: ආධ්‍යාත්මික දියුණුව පිණිස අවශ්‍ය දේ හා ගිහි ජීවිතයට අවශ්‍ය යහපත් දේ ඔහු වඩා ගනී. 1 කෙත්වතු 2 ධනය හා ධාන්‍ය 3 අඹුදරුවන් 4 දාසයන් හා සේවකයින් 5 පශුසම්පත-(ගවයන්) ආදී ලෞකික ජීවිතයට අවශ්‍ය දේ හා 6 ශ්‍රද්ධාව 7 ශීලය 8 දහම්දැනුම-බහුශ්‍රැතබව 9 ත්‍යාගශීලිබව- දානය 10 ප්‍රඥාව ආදී ලෝකෝත්තර ජීවිතයට අවශ්‍යදේ දියුණු කරගනි.**මූලාශ්‍**:අංගු.නි: (6)10 නිපාත: ආකඩඛ වග්ග:10.2.3.4 වඩ්ඪි සූත්‍රය, පි.272, EAN: 10: 74.4.Growth, p.522.
▲ **ආරිය වෝහාර**-Noble declaration : ආරිය වෝහාර යනු සත්‍ය ප්‍රකාශ කිරීමය: 1) නොදැක නොදුටුබව කීම 2) නොඅසා නොඇසුබව කීම 3) දැනීමක් නැතිව, දැනීම නැතිබව කීම 4) විඥානයෙන් නොවිඳ, නොවිඳින ලදබව කීම. 5) දැක, දුටු බව කීම 6) අසා, ඇසූ බව කීම 7) දැනීමක් ඇතිව දැනුනා යයි කීම8) විඳ, වින්දබව කීම. (Saying that one has not seen what one has not seen, saying that one has not heard what one has not heard, saying that one has not sensed what one has not sensed, saying that one has not cognized what one has not cognized. There are these four noble declarations). **මූලාශ්‍**:අංගු.නි: ( 2): 4 නිපාත: 4.5.5.9 ආරියවොහාර සූත්‍ර 2කි,පි. 494, EAN:4: 251.9 Declarations-2 suttas, p. 231.

▲ **ආරියවංශය-** Noble Lineage :ආරියවංශය යනු බුදුවරු, පසේබුදුවරු හා ආරිය ශ්‍රාවකයන් ගේ පෙළපතය යි බුදුන් වහන්සේ වදාළහ. පුරාණවූ දිගුකලක් පැවතිගෙන පැමිණි, අතීත බුදුවරු බැහැර නොකරන ලද, අනාගත බුදුවරු විසින් බැහැර නොකරන, වත්මනේ වැඩසිටින බුදුන් වහන්සේ විසින් බැහැර නොකරන ලද, නොකිලිට්වූ, නුවණැතියන් විසින් නින්දා නොකරණ ආරියවංශ පුහුණුව මෙහි දක්වා ඇත. ඔවුන්ට සතර දහම ඇත: 1) තමන්ට ලැබෙන ඕනෑම චීවරයකින් සන්තුෂ්ටියට පත්වේ 2) තමන්ට ලැබෙන ඕනෑම පිණ්ඩපාතයකින් සන්තුෂ්ටියට පත්වේ 3 ) තමන්ට ලැබෙන ඕනෑම සේනාසනයකින් සන්තුෂ්ටියට පත්වේ 4 ) භාවනාව පිළිබඳව, භාවනාව වඩාගැනීම පිණිස, කෙළෙස් ප්‍රහාණය පිලිබඳ සන්තුෂ්ටියට පත්වේ, ඒවා ගැන වෙනත් අයට උදම් ඇනීමට හෝ වෙනත් අය හෙලා දැකීමට නොයති. එම සතර ධර්-මය සහිතව ආරියවංශය ගෙනයන උතුමාට, දෙවියන්ද ප්‍රසංසා කරති. **සටහන:** අටුවාවට අනුව, ඔහු සත්තිස් බෝධිපාක්ෂික දහම යහපත් ලෙසින් වඩාගනී.**බලන්න**:EAN:Note:680,p.616.**මූලාශ්‍**:අංගු.නි:(2):4 නිපාත: 4.1.3.8 ආරියවංශසූත්‍රය,පි.78,EAN:4 :28.8 NobleLineage, p. 158.
▼ **මෙහිදී ආරිය වංශයේ උතුමන්** ආරක්ෂා කරන සතර දහම් පද පෙන්වා ඇත: 1) අනභිජ්ජාව (Non-longing) 2) අව්‍යාපාදය (Good will) 3) සම්මා සතිය (Right mindfulness) 4) සම්මා සමාධිය (Right concentration). **මූලාශ්‍:** අංගු.නි: ( 2 ): 4 නිපාත: 4.1.3.9 ධම්මපද සූත්‍රය,

පි. 80 , EAN:4 : 29.9 Dhamma Factors, p. 159.

▲ **ආරිය වාසස්ථාන**:පාලි: **අරියවාසා**- abodes of the noble ones ආරිය වාසස්ථාන ලෙසින් පෙන්වා ඇත්තේ ආරිය පුද්ගලයන් වැඩවසන ස්ථානයන්ය, ඔවුන්ගේ විහරණයය. **බුදුන් වහන්සේ** ආරිය වාසස්ථාන 10ක් පෙන්වා ඇත. අතීතයේ වැඩවිසූ හෝ අනාගතයේ පහළවන හෝ වත්මන් කාලයේ වැඩසිටින ආරියෝ එම ස්ථාන පිහිටකොට සිටිති. **“ දස ඉමෙ භික්ඛවෙ අරියවාසා යදරියා ආවසිංසු වා ආවසන්ති වා ආවසිස්සන්ති වා.කතමෙ දස: ඉධ භික්ඛවෙ භික්ඛු පඤ්චඞ්ගවිප්පහීනො හොති ඡළඞ්ග සමන්නාගතො එකාරක්ඛො චතුරාපස්සෙනො පනුණ්ණපච්චෙකසච්චො සමවයසට්ඨෙසනො අනාවිලසඞ්කප්පො පස්සද්ධකායසඞ්ඛාරො සුවිමුත්තචිත්තො සුවිමුත්තපඤ්ඤො...”** . ( there are these ten abodes of the noble ones in which the noble ones of the past, present, or future abide. What 10? : Here, a bhikkhu (1) has abandoned five factors; (2) possesses six factors; (3) has a single guard (4) and four supports; (5) has dispelled personal truths, (6) totally renounced seeking, (7) purified his intentions, (8) tranquilized bodily activity, and become (9) well liberated in mind and (10) well liberated by wisdom). **ආරිය දසවාස්ථාන:** 1) **පංචඅංග ප්‍රහීණය - පඤ්චඞ්ගවිප්පහීනො (**abandonment of five factors) **:** කාමච්ඡන්ද, ව්‍යාපාදය, ථීන මිද්ධය, උදච්ච කුකුක්ච්ච, විචිකිච්චාව යන පංච නීවරණ (පංච අංග) ප්‍රහිණය කිරීමය. **බලන්න**: පඤ්චඞ්ගවිප්පහීනො 2**) අංග 6 ක් සතුවීම- ඡළඞ්ගසමන්නාගතො:** අංග 6 ලෙසින් පෙන්වා ඇත්තේ අභ්‍යන්තර ඉන්ද්‍රිය 6 ය: සළායතන. භික්ෂුව අංග 6 කින් සමන්විත වීම යනු: ඇසෙන් රූප දැක... කණෙන් ශබ්ද අසා... නාසයෙන් ගඳසුවඳ විඳ... දිවෙන් රස විඳ... කයෙන් පහස විඳ... සිතෙන් සිතුවිලි සිතා ... සොම්නස්නොවේ, දොම්නස් නොවේ, උපෙක්කා සහගතව, සති සම්ප්‍රජන්‍යය ( සති ප්‍රඥාව) ඇතිව සිටි. අභ්‍යන්තර ඉන්ද්‍රිය සයෙන් (සළායතන) අල්වා ගන්නා බාහිර අරමුණු හා නොඇලී නොගැටී උපේක්ඛා සහගතව, සති සම්පජානය ඇතිව සිටීම. **බලන්න**: ඡළඞ්ගසමන්නාගතො, සළායතන. 3**) එක් ආරක්ෂාවක් ඇතිබව- එකාරක්ඛො හොති :** ආරිය පුද්ගලයා සිතට ඇති එකම ආරක්ෂාව වූ සිහිය (සතිය-සමෘතිය) ඇතිව සිටී. **බලන්න:** එකාරක්ඛො 4) **සිව් උපකාර සහිතවීම- චතුරාපස්සෙනො හොති**: ආරියෝ සිව්උපකාර ඇතිව සිටි. සිව් උපකාර ලෙසින් පෙන්වා ඇත්තේ: 1) එක් දෙයක් නුවණින් සලකා සේවනය කරයි- සිව්පසය 2) එක් දෙයක් නුවණින් සලකා ඉවසා සිටි- කායික හා මානසික වේදනා 3) එක් දෙයක් නුවණින් සලකා මගහරි- නුසුදුසු ස්ථාන, පුද්ගලයින්: චන්ඩ සතුන් සර්ප අදින්, පාප මිත්‍රයන් ආදී 4) එක් දෙයක් නුවණින් සලකා අත හරි- සිතට එන ලාමක අකුසල් ආදිය. **බලන්න**: සිව් උපකාර, ආශ්‍රව හා ආශ්‍ර ක්‍ෂය කිරීම. 5) **පුද්ගලික සත්‍යයන් පහකිරීම- පනුණ්ණපච්චෙකසච්චො:** ලෝකයේ ඇති පුද්ගලික සත්‍ය නම් මිනිසුන් තුල ඇති විවිධ මත දිට්ඨි හා පිලිගැනිමය. ආරියෝ මේවා බැහැර කර ධර්මයේ සත්‍ය පමණක් පිළිගෙන සිටිති. **සටහන: බලන්න:** දිට්ඨි, පුද්ගලික සත්‍ය බැහැරකිරීම. 6) **සෙවීම (ගවේෂණ) සහමුලින්ම අතහැරීම- සමවයසට්ඨෙසනො හොති:** ආරියෝ කාමයන් සෙවීම අතහැර සිටි, සසර පවත්වා ගැනීම අත හැර සිටි, ආධ්‍යාත්මික ජීවිතය සෙවීම සන්සිඳුවා ගෙන ඇත යයි බුදුන් වහන්සේ වදාළහ. **බලන්න:**

පර්යේෂණ, සමවයසටෙඨසනො. 7) **පිරිසිදු-නොකැළඹුන සංකල්පනා - අනාවිලසංකප්පපෝ-අනාවිලසඞකපෙපා හොති**: ආරියයෝ ව්‍යාපාද චේතනා, හිංසා චේතනා අතහැර ඇත, පිරිසිදු සංකල්පනා ඇතිව සිටි. **බලන්න:** සම්මාසංකප්ප, අනාවිල සඞකපොා. 8) **කායසංඛාර පස්සද්දිය- පසසඩකායසඞඛාරො හොති** : සුඛ හා දුක් වේදනා පහකර, සොම්නස හා දොම්නස නොමැතිව, දුකනැති, සුඛ නැති, උපේක්ඛාවෙන් පිරිසුදුවූ සිත ඇති, සිව්වෙනි ජානය ලබාගැනීම කාය පස්සදිය ය .**බලන්න**: කායසංඛාර පස්සද්දිය, ජාන.9) **සිත සුවිමුත්ත වීම-සුවිමුත්ත චිත්තෝ - සුවිමුත්ත චිත්තො හොති**: සිත විමුක්තියට පත්වීම- රාග දෝස හා මෝහ යන අකුසල් සිත් සහමුලින්ම පහවීම. **බලන්න**: සුවිමුත්ත චිත්තො. 10) **මනාවූ ප්‍රඥාවෙන් විමුක්තියට පත්වීම (සුවිමුත්තපඤ්ඤො හොති)** රාගය දෝසය හා මෝහය, තල්ගසක මුල නැවත ඇති නොවෙන ලෙසින් සිඳදමන ලෙසින්, ප්‍රහීණය කර විමුක්තිය ලැබීම. **බලන්න**: සුවිමුත්තපඤ්ඤා. **සටහන:** ප්‍රඥාවිමුක්තිය ලැබීම අරහත්වය ය.**බලන්න**: ආරිය පුද්ගලයෝ. **මූලාශ්‍ර**: අංගු.නි: (6 ):10 නිපාත: 10.1.2.9 පඨමාරියවාස සූත්‍රය, 10.1.2.10 හා දෙවෙනි අරියවාස සූත්‍රය, පි.82-84, EAN:10:19.9 & 20.10 Abodes of the Noble Ones, p. 498-499.

▲ **ආරිය සත්‍ය**-Noble Truth: ආරිය සත්‍ය (ආර්ය සත්‍ය) යනු චතුරාර්ය සත්‍යයය. එම සත්‍ය වෙනස්නොවේ, අන්පරිදි නොවේ එනිසා, ආරිය සත්‍ය යයි කියනු ලැබේ. **බලන්න**: චතුරාර්ය සත්‍යය. **මූලාශ්‍රය:** සංයු.නි: (5-2): මහාවග්ග:සච්චසංයුත්ත: කොටිගාමවග්ග: 12.3.7 ,12.3.8 සූත්‍ර, පි.314.

▲ **ආරියසම්‍යක් සමාධිය:** පාලි: **අරියං සම්මාසමාධි -** noble right concentration: ආරිය සම්‍යක් සමාධිය යනු, ආරිය අටමගේ සම්මා දිට්ඨිය - සම්මා වායාම දක්වා ඇති අංග 7 මගින් ලැබෙන උපකාර සහිතව (ප්‍රත්‍ය), ඒවා පිරිවර කරගෙන (සම්බන්ධකරගෙන) සිතේ එකඟ බව ඇති කරන්නාවූ සමාධියටය. **බලන්න**: ආරිය අටමග, සමාධිය.

▼ **බුදුන්වහන්සේ,** ආරියසම්‍යක් සමාධිය මෙසේ පෙන්වා ඇත: **"අරියං වො භික්ඛවෙ, සම්මාසමාධිං දෙසිස්සාමි සඋපනිසං සපරික්ඛාරං…කතමො ච භික්ඛවෙ, අරියො සම්මාසමාධි සඋපනිසො සපරික්ඛාරො, සෙය්‍යථීදං: සම්මාදිට්ඨි සම්මාසඞකපෙපා, සම්මාවාචා, සම්මාකම්මනෙතා, සම්මා ආජීවො, සම්මාවායාමො, සම්මාසති යා ඛො භික්ඛවෙ. ඉමෙහි සත්තහඞෙගහි චිත්තසස එකගගතා සපරික්ඛාරතා අයං වුච්චති භික්ඛවෙ, අරියො සම්මාසමාධි සඋපනිසො ඉතිපි සපරික්ඛාරො ඉතිපීති"**

"මහණෙනි, ඔබට ප්‍රත්‍යය සහිත පිරිවර සහිත ආරියවූ සම්‍යක් සමාධිය දේශනා කරන්නෙමි... සප්‍රත්‍යය සපරිෂ්කාර ආර්ය සම්‍යක් සමාධිය කවරේද යත්: ... සම්මා දිට්ඨිය...සම්මාසතිය. මේ සත් අංගයෙන් සිතේ යම් එකඟබවක් වේ නම් එය සපරිෂ්කාර බවය. ... මේ ආරිය සම්‍යක් සමාධිය මෙසේ ප්‍රත්‍ය සහිතය ය, මෙසේ පිරිවර සහිතය යි කියනු ලැබේ" (And what, bhikkhus, is noble right concentration with its supports and its accessories? There are: right view ... right mindfulness. The one-pointedness of mind equipped with these seven factors is called noble right concentration 'with its supports', and also 'with its accessories') **සටහන**: විස්තර පිණිස **බලන්න**: ESN: note: 26, p.2391. **මූලාශ්‍ර**:සංයු.නි: ( 5-1 ): මහාවග්ග:මග්ගසංයුත්ත: 1.3.8 සමාධි

සූත්‍රය, පි. 62, ESN: 45: Maggasamyutta: 28.8 Concentration, p. 1634.

▲ **ආරිය ශ්‍රාවකයා-** noble disciple: බුද්ධාදී ආරියෝ දන්නා, දහම අසා ඒ අනුව පිළිපදින පුද්ගලයා ආරිය ශ්‍රාවකයාය (ශ්‍රැතවත් ආරිය ශ්‍රාවකයා). සත්පුරුෂයා ලෙසින්ද පෙන්වා ඇත. **බලන්න**: ශ්‍රැතවත් ආරිය ශ්‍රාවක හා අශ්‍රැතවත් පෘතග්ජන.

▼**ආරිය ශ්‍රාවකයා** හේතු ඵල දහම්- පටිච්චසමුප්පාදය යහපත් ලෙසින් අවබෝධ කොට ඇත යයි මෙහි දක්වා ඇත. **මූලාශ්‍රය:** සංයු.නි: (2) නිදානවග්ග:අභිසමයසංයුත්ත:ආරියසාවක සූත්‍ර 2කි, පි.142.

▲**ආරොගයය** -Good health: ආරෝග්‍ය යනු මනා යහපත් සෞඛ්‍යයය. මෙය ලෝකයේ ලබාගැනීමට දුලබා දෙයකි. කයට අහිතකර ක්‍රියා- අසත්ප්‍රායක්‍රියා නිසා යහපත් සෞඛ්‍යයය පවත්වාගැනීමට හැකිනොවේ. **බලන්න**: ඉෂ්ඨධම්ම. **මූලාශ්‍රය**: අංගු.නි: (6) 10 නිපාත:10.2.8.3 ඉෂ්ඨධම්ම සූත්‍රය, පි.270,EAN:10: 73.3 Wished for, p.522.

▲**ආරොගය මදය:** පාලි: **ආරොගයමදො**- health infatuation ආරොගයමදය ලෙසින් පෙන්වා ඇත්තේ තමන්ට යහපත් සෞඛ්‍ය තත්වයක් තිබීම නිසා ඉන් මත්වීමය. මෙය අකුසලයකි. **බලන්න**: මදය.

## අල

▲**අලං**-able : අලං ලෙසින් පෙන්වා ඇත්තේ සුදුසුබවය, හැකියාව ඇතිබවය. මෙහිදී සැරියුත් තෙරුන් පෙන්වා ඇත්තේ දහම් කරුණු 6ක් ඇති භික්ෂුව තමාට මෙන්ම අන්අයට පිහිටවීමට හැකියාව ඇතිබව- සුදුසුබවය. 1) කුසල් දහම වහා දකිනාසුළුබව (ඛිප්පනිසන්ති) 2) තමන් දන්නා දහමේ අරුත් පිරික්සා අවබෝධ කර තිබීම 3) දැනගත් දහමට අනුව ධම්මානුධම්මප්‍රතිපදාවට පිළිපන්බව 4) කල්‍යාන වචන,බස් ඇත 5) දහමේ අරුත් මනාව, නිවැරදිව දැක්වීමට හැකිබව 6) සබ්‍රම්සරුන්ට කරුණු දැක්වීමට ඔවුන් සමාදන් කරවීමට ආදියේ හැකියාව ඇතිබව. **සටහන: *** මෙහිදී භික්ෂුව තමාහට සුදුසු වීම හා අන්‍යන්ට (මෙරමා) නුසුදුසු වන අන්දම ද පෙන්වා ඇත. ** 8.2.7.2 අලංසූත්‍රයේ ද මේ කරුණු 6 බුදුන් වහන්සේ සංඝයාට පෙන්වා ඇත. **මූලාශ්‍රය**: අංගු.නි: (5): 8 නිපාත:යමකවග්ග: 8.2.8.8 අලං සූත්‍රය, පි.348, චපාලවග්ග: 8.2.7.2 අලංසූත්‍රය, පි.284.

▼ **දහම් කරුණු 5 ක්** ඇති මහණ සබ්‍රම්සරුන් හා සාකච්ඡාකිරීමට සුදුසුබව (අලංසාකච්ඡා) මෙහි පෙන්වා ඇත:1) ශීලසම්පන්නය- ශීලය පිලිබඳ ප්‍රශ්ණ විසඳීමට සුදුසුය 2)සමාධිසම්පන්නය- සමාධිය පිලිබඳ ප්‍රශ්ණ විසඳීමට සුදුසුය 3) ප්‍රඥාසම්පන්නය- ප්‍රඥාව පිලිබඳ ප්‍රශ්ණ විසඳීමට සුදුසුය 4) විමුක්තිසම්පන්නය- විමුක්තිය පිලිබඳ ප්‍රශ්ණ විසඳීමට සුදුසුය 5) විමුක්ති ඥානදර්ශන සම්පන්නය- ඒ පිලිබඳ ප්‍රශ්ණ විසඳීමට සුදුසුය. **සටහන**: 5.2.2.6 අලංසාජීව සූත්‍රයේදී, එම කරුණු 5 ඇති මහණ සබ්‍රම්සරුන් හා ආජීවයෙන්, සමානජීව ඇතිව කටයුතු කිරීමට හැකියාව ඇතිබව පෙන්වා ඇත. **මූලාශ්‍රය**: අංගු.නි: (3) 5 නිපාත: සඤ්ඤාවග්ග: 5.2.2.5 අලංසාකච්ඡා සූත්‍රය, 5.2.2.6 අලංසාජීව සූත්‍රය, පි.150.

▲**අලික**-Alika: අලික ලෙසින් පෙන්වා ඇත්තේ බොරුකීම-අසත්‍ය කථාකිරීමය. මෙය සුභාෂිතය නොවන බව- දුර්භාසිතයබව, බුදුන් වහන්සේ වදාළහ. **බලන්න**: සුභාෂිත.**මූලාශ්‍රය:** ඛු.නි:සුත්තනිපාත: 3-3- සුභාසිත සූත්‍රය, පි.150.

▲**අලීනචිත්ත**-Alinacitta: අලීනචිත්ත යනු අලසබව නොමැති සිතය

(නොඅලස් සිත) , පිබුදුන සිතය. ලීනචිත්තය නිවරණයකි. අලීනචිත්තය කුසලයකි, බ්‍රහ්මචරියාව වඩාගැනීමට උපකාරීවන බව මෙහි දක්වා ඇත. **මූලාශ්‍රය:** ඛු.නි:සුත්තනිපාත:මහාවග්ග:නාලක සූත්‍රය,ගාථාව 720, පි.242.

▲ **අලජ්ජී-** Shameless : අලජ්ජී යනු පව්කිරිමට, ලැජ්ජාව නැතිකමය- හිරිනැති බවය. අනුවණ -බාල පුද්ගලයන්ගේ ගතියකි, අකුසලයකි. **බලන්න**: අහිරිකය හා අනොත්තප්පය.

▲**අලබ්භනීය ධම්ම**- unobtainable things: අලබ්භනීය ධම්ම, නො ලැබිය හැකි දේය.කිසිවකු විසින් ලබාගැනීමට නොහැකි කරුණු 5 ක් බුදුන් වහන්සේ පෙන්වා ඇත:1 මහළුවියට පත්වීම නතර කරගැනීමට (ජරාධම්ම ස්වභාවය) 2 ලෙඩවන -ගිලන්බව ස්වභාවය නතර කරගැනීමට 3 මරණයට පත්වීම -මරණ ස්වභාවය නතර කරගැනීමට 4 විනශවී යන ස්වභාය -නතර කර ගැනීමට (ක්‍ෂය ධර්-ම) 5) නැසියන ස්වභාවය නතර කර ගැනීමට (නස්සන ධර්-ම). දහම නොදත් පෘතග්ජනයා, එ කරුණු නිසා දුකට දොම්නසට පත්වේ. එහෙත්, ආරිය ශ්‍රාවකයා එම කරුණුවල යථාබව අවබෝධ කරගෙන ඇතිනිසා ඒවා නිසා නොසැලේ. **මූලාශ්‍ර:** අංගු.නි: (3): 5 නිපාත: 5.1.5.8 අලබ්භනියඨාන සූත්‍රය, පි. 106, EAN: 5: 48.8 Situations, p. 254.

▲ **අලමරියඤාණදස්සනය** -superhuman distinction in knowledge and vision: අලමරියඤාණදස්සනය ලෙසින් පෙන්වා ඇත්තේ, උත්තරීතර, ආරිය බව ලබාදෙන මගඵල සාක්ෂාත් කරගැනීමය. පැවිද්දන් -පබ්බජ්ජා විසින් නිතර මෙනෙහි කලයුතු දස දහමට මේ කරුණද ඇතුලත්වේ. **බලන්න**: පබ්බජා.

▲ **අලසකම**: පාලි: **කොසජ්ජං-** laziness: අලසකම-(කුසිතබව- කුසීතස්ස) නිවරණයකි, දහම් මග අහුරයි. අලසකම නිසා මග දියුණු කර ගැනීමට වීරිය නැතිවෙ. එමනිසා අකුසල වැඩිවේ, කුසල අඩුවේ. **බලන්න**: නීවරණ.

▼**අකුසල ඇතිකිරීමට** හා කුසල් නැතිකිරීමට අලසකම, වැනි වෙනත් එකම දහමක් තමන් නොදකින බව බුදුන් වහන්සේ වදාරා ඇත. **මූලාශ්‍ර:** අංගු.නි: (1): 1 නිපාත: 1.6.10 සූත්‍රය, පි. 60, EAN:1: 60.10 sutta, p. 40.

▼ **සිත අලසවීම -** චිත්තලීනත්වය (**චෙතසොලීනත්තං**) නිසා සක්කායදිට්ඨිය, විචිකිච්චාව, සීලබ්බත පරාමාස ආදී අකුසල් ඇතිවේ. අලසබව පහකරගැනීමට නම් අවුල්වූ සිත, අසම්ප්‍රජන්‍යය හා වික්ෂිප්තසිත වීම නැතිකරගත යුතුබව බුදුන් වහන්සේ පෙන්වා ඇත. **මූලාශ්‍ර:**අංගු.නි:(6)10 නිපාත:10.2.3.6.තයොධම්ම සූත්‍රය,පි.284, EAN-10: 76-6. Incapable, p. 524.

▲ **අල්පආයුස-**Short lifespan අල්පආයුස යනු ජීවත්වන කාලය කෙටිබවය. බුදුන් වහන්සේගේ මව අල්ප ආයුස ඇතිව කලුරිය කළබව ආනන්ද තෙරුන් ගේ ප්‍රකාශ කලවිට බුදුන් වහන්සේ මෙසේ වදාළහ: "...ආනන්දයෙනි, බෝසත් මවුවරු අල්පආයුස-ආයුෂ වෙති. බෝසතුන් උපන් සත්දවසින්, මවුහු කලුරිය කරති, තුසිත දේවනිකායට පැමිණෙති". පෙර වූ හෝ මතු වේ ඇතිවෙන හෝ වත්මන් කලයේ වුවද ඔවුන් තම කය හැරදමා යයි. එනිසා නුවණැති අය කෙළෙස් තවන වීරිය ඇතිව බඹසර කරගතයුතු බව මෙහි පෙන්නා ඇත. **සටහන**: අතීතයේ වැඩසිටි සම්බුදුවරුන්ගේ ආයුකාලය දීගුය, අප බුදුන් වහන්සේගේ ආයුකාලය අල්පය. **මූලාශ්‍රය:** ඛු.නි: උදාන පාලිය: සෝණවග්ග: 5.2 අප්පායුක සූත්‍රය,පි.250.

▲ **අල්පආහාර**- Alpaahara: අල්ප ආහර ලෙසින් පෙන්වා ඇත්තේ මද පමණින් ආහාර ගැනීමය. දෙවියෝ, බුදුන් වහන්සේගේ ගුණ වණනවිට, උන්වහන්සේ ස්වල්ප ආහාර ගන්නා බව දක්වා ඇත. **මූලාශ්‍ර:** සංයු.නි: (1): සගාථවග්ග: දේවතාසංයුත්ත:1.3.10 එණිජංග සූත්‍රය, පි.58.
▲ **අල්පභාවය**: පාලි: **අප්පිච්ඡතා -** Fewness of wishes/desires අල්පභාවය ,ආධ්‍යාත්මික මග දියුණු කරගැනීමට උපකාරීවන ගුණයක්ය. එනම්,ඉතාමත් සුළු අවශ්‍යතා ඇතිව ජීවත්වීමය (අල්පෙච්ඡතාවය). කුසල් වැඩිමට හා අකුසල් ප්‍රහීණයට උපකාරීවන කරුණකි. **සටහන:** අටුවාවට අනුව**:** අල්පභාවය ලෙසින් මෙහිදී පෙන්වා ඇත්තේ ආශාවන් නොමැතිබවය- For one is not called ‘of few desires’ if one still has slight desire; it is through the absence of desire, through persistent greed-lessness, that one is said to be of few desires. **බලන්න**: EAN: Note: 53, p. 583. **මූලාශ්‍ර**: අංගු.නි: (1): 1 නිපාත: 1.7.3 සූත්‍රය, පි. 60, EAN:1: 63.3 sutta, p. 40.
▲ **අල්පශ්‍රැත-**Little Learning: අල්පශ්‍රැත ලෙසින් මෙහි පෙන්වා ඇත්තේ දහම් අවබෝධය සුළුබවය. එබඳු පුද්ගලයෝ දෙදෙනක් සිටිති: 1) එක් පුද්ගලයෙක් දහම ඉතා සුළුවෙන් අසයි, එහි අරුත් නොමදනී. ඔහු ශ්‍රැතයෙන් නුපන් අල්පශ්‍රැතපුද්ගලයාය. 2) තව පුද්ගලක් දහම්අසා ඇත්තේ ඉතා සුලුවෙන්ය. එහෙත් ඔහු එහි අරුත අවබෝධ කර ධම්මානුධම්මයට පිළිපන් කෙනෙක් වේ. ඔහු ශ්‍රැතයෙන් උපන් අල්පශ්‍රැත පුද්ගලයාය. **බලන්න**: බහුශ්‍රැත. **මූලාශ්‍රය**: අංගු.නි: (2) 4 නිපාත: භණ්ඩාගම වග්ග : 4.1.1.6 අප්පස්සුත සූත්‍රය, පි.36.
▲ **අලෝභ**-Non-greed: අලෝභ යනු ත්‍යාගශීලී බවය, මසුරුකම හැරදමා කටයුතු කිරීමය.කුසල මූලයකි. **බලන්න**: කුසල මූල,ත්‍යාගශීලී.
▲ **ආලාරකාළාම තවුසා**- Ascetic Alarakalama: සිද්ධාර්ථ තවුසා,(බෝධිසත්ව) ගේ පළමු ගුරුවරයා වුවේ මේ තවුසාය. ඔහුගේ ඉගැන්වීම මගින් දුක කෙළවර කිරීම අවබෝධ කරගත නොහැකි බව වටහාගත් බෝසතුන් ඔහු හැර යාම, සම්බෝධිය ලබා තමන් වහන්සේ අවබෝධ කරගත් දහම මේ තවුසාට ඉගැන්වීමට තීරණය කළද, ඔහු ඒ අවස්ථාවේ මරණයට පත්වී සිටි නිසා උතුම් දහම අවබෝධ කරගැනීමට වාසනාව නොමැතිවිම මෙහි විස්තර කර ඇත. **බලන්න**: ම.නි: බෝධිරාජ කුමාර සූත්‍රය හා ආරියපරියේසන සූත්‍රය, උපග්‍රන්ථය:6.

▲ **ආලෝක**-Lights : බුදුන් වහන්සේ ආලෝක (අභා) 4 ක් පෙන්වා ඇත: 1) චන්ද්‍රාලෝකය-සඳ එළිය 2) සූර්යාලෝකය - හිරුඑළිය 3) අග්නි ආලෝකය- ගිනි එලිය 4) ප්‍රඥා ආලෝකය. මේ ආලෝක 4 න් ප්‍රඥා ආලෝකය අග්‍රය. **මූලාශ්‍ර**: අංගු.නි: (2):4 නිපාත: 4.3.5.3. ආලෝක සූත්‍රය, පි. 292, EAN:4: 143.3 Lights, p. 198.
▲ **ආලෝක කසිණය**-Light Kasina: ආලෝක කසිණය ලෙසින් පෙන්වා ඇත්තේ ඕදාත කසිණයය. ආලෝකය, භාවනා නිමිත්තක් ලෙසින් ගෙන, සිත ඒකඟ කර ගැනීමය. මේ පිලිබඳව සිංහල විසුද්ධිමග, 5 පරිච්ඡේදය, පි. 286, විස්තර දක්වා ඇත. **බලන්න**: කසිණ- කසිණ ආයතන 10.
▲ **ආලෝකධාතුව**-The light element: ආලෝකධාතුව, අභාධාතුව ලෙසින්ද හඳුන්වයි. සප්ත ධාතු (ධාතු 7) වලින් එකකි. අඳුර නිසා ආලෝක ධාතුව අවබෝධ කරගත හැකිය. ආලෝක සංඥාසමාපත්තිය ආලෝකධාතුව ඇතිකර ගැනීමට උපකාරීවේ. මෙය කසිණ භාවනා

අරමුණකි. **බලන්න**: ධාතු හත, කසිණ. **සටහන:** අටුවාවට අනුව: ආලෝක ධාතුව යනු, ආලෝක කසිණය නිසා ඇතිවෙන ජාන සමාපත්තියකි The *light element* (*ābhādhātu*) is a name for the jhāna together with its object, that is, light(*āloka*) and the jhāna arisen after doing the preparatory work on the light-*kasiṇa*. **බලන්න**: ESN: Note: 231, p. 972. **මූලාශ්‍ර**:සංයු.නි: (2) නිදානවග්ග: ධාතුසංයුත්ත:2.2.1 සත්තධාතු සූත්‍රය, පි.255,ESN:14: Dhathu samyutta: 11.1 Seven elements, p.750.

▲ **ආලෝක සංඥාව**-Perception of light: ථිනමිද්ධය- නිදිමත හා අලසබව යන නීවරනය පහ කරගැනීම පිණිස ආලෝක සංඥාව වඩාගන්න යයි බුදුන් වහන්සේ මුගලන් තෙරුන්හට උපදෙස් වදාළහ. "...ඔබගේ ථිනමිද්ධය පහනොවේනම්, ආලෝක සංඥාව මෙනෙහි කරන්න. ආලෝක සංඥාව මෙලෙසින් මෙනෙහි කරන්න: 'දිවාකල යම්සේද, රාත්‍රීකාලයද ඒ පරිදිය. රාත්‍රිය යම් පරිදිවේද, දිවාකල ඒ පරිදිවේ'. එලෙසින්, කෙලෙසුන්ගෙන් නොවැසුන, විවෘත සිතක් ඇතිව, ආලෝකයෙන් පිරිගිය සිතක් ඇතිකරගන්න. එසේ වාසය කරණ විට ඔබගේ ථිනමිද්ධය ප්‍රහීණය යන කරුණ විද්‍යාමාන වේ". (... if you cannot abandon your drowsiness in such a way, you should attend to the perception of light; you should undertake the perception of day thus: 'As by day, so at night; as at night, so by day.' Thus, with a mind that is open anduncovered, you should develop a mind imbued with luminosity. By such means, it is possible that your drowsiness will be abandoned). **සටහන්**: * අටුවාවට අනුව මුගලන් තෙරුන්, දින 7 ක් පුරා සක්මන් භාවනාවේ යෙදී, විඩාවට පත්ව, සක්මන් මළුවේ අග වාඩිවීසිටිනවිට නිදිමත ඇතිවිය. ඒ අවස්ථාවේ, බුදුන් වහන්සේ, එහි පැමිණ නිදිමත නැතිකර ගැනීම පිණිස උපදෙස් වදාළහ. **බලන්න**: EAN: note: 1548, p. 656 ** **පචලායමානං නිසින්නං**= නිදිබරව සිටීම.**බලන්න**: ථිනමිද්ධය. **මූලාශ්‍ර**:අංගු.නි. (4 ): 7 නිපාත: 7.2.1.8 පචලායන සූත්‍රය, පි. 426, EAN: 7: 61.8 Dozing, p. 391.

**අව**

▲ **අවෛරය**- freedom from anger: අවෛරය යනු සිතේ තරහ ක්‍රෝධ අමනාප නැතිබවය, මෙත්තා සහගත සිතය. මෛත්‍රි භාවනාව පිණිස සිත අවෛරය සහිතවිය යුතුබව **මෙත්තා සූත්‍රයේ** පෙන්වා ඇත: **"මෙත්තං ච සබ්බ ලොකස්මිං- මානසං භාවයෙ අපරිමාණං-උද්ධං අධො ච තිරියං ච- අසම්බාධං අවෙරං අසපත්තං"**. **බලන්න**: බ්‍රහ්මවිහාර,ආඝාතවත්ථු, අනආඝාත.

▲**අව්‍යාකෘත ධම්ම**- Undeclared Dhamma : අව්‍යාකෘත ධම්ම, අබ්‍යාකතාවත්ථු ලෙසින්ද පෙන්වා ඇත. බුදුන් වහන්සේ වැඩසිටි සමයේ ලෝකයේ පැවති දිට්ඨි10 ක් පිළිබඳව, උන්වහන්සේ ප්‍රකාශ කර නොමැති දේය. **බලන්න**: අබ්‍යාකතවත්ථු, දිට්ඨි.

▲**අවකන්ති:** පාලි: **බැසගැනීම**- avakkanti- decent: අවකන්ති ලෙසින් පෙන්වා ඇත්තේ, මෙලොව පිහිටි විඥානය (මරණින් මතු), නාමරූප ලෙසින් මව්කුසයට බැස ගැනීමය- ප්‍රතිසන්ධිය-යළි උපතක් සකස්වීමය. (When consciousness is established and has come to growth, there is a descent of name-and-form). **බලන්න**: ප්‍රතිසන්ධි චිත්ත. **සටහන**:

*Nāmarūpassa avakkanti*: where the production of future renewed existence is placed between consciousness and the six sense bases. **බලන්න**: ESN: Note: 115. **මූලාශ්‍ර:** සංයු.නි: (2): නිදානවග්ග: අභිසමය සංයුත්ත:කළාරබත්තිය: චේතනා සූත්‍ර 3කි. පි. 124, හා 1.2.2 මොළිය එග්ගුන සූත්‍රය,පි. 44, ESN:12: Nidanasamyutta: The Karakhattiya: Volition 3 suttas p. 665 & 12.12 Moliyaphagguna, p. 625.

▲**අවකාසය-** opportunity moment: දහම අවබෝධ කරගැනීමට ඉඩලැබීම, අවස්තාව ලැබීම අවකාශය -ක්‍ෂණය ලෙසින් පෙන්වා ඇත. **බලන්න:** අක්‍ෂණය හා ක්‍ෂණය.

▲**අවකාශ ධාතුව-** Space element: අවකාශ ධාතුව, විවිධ ධාතුවලින් එකකි. **බලන්න**: ආකාශධාතුව, ධාතුකුසලතාවය.

▲ **අවකාශාධිගම මග: පාලි: ඔකාසාධිගමා-** gateways to the bliss අධිගම සුවය (උතුම් සුවය) ලබාදෙන කරුණු අවකාශාධිගම මගය. ඒවා තුනකි: **1)** කෙනෙක් කාමයට ඇති ආශාව සහිතවූ අකුසලයන් ඇතිව වාසය කරයි. පසුකලක, ආරිය දහම ශ්‍රවනය කර එම අකුසල පහකරගනී. එමගින්, ඔහුට කායික හා මානසික සුඛ වේදනා (pleasant feeling) ඇතිවේ, ප්‍රීති සුවය නිසා සොම්නස (gladness) පහලවේ (පළමු ජාන සමාපත්ති සුවය). එය පළමු අවකාශාධිගම මගය. **සටහන**: පංචනිවරණ පහවීමෙන් ලබන සමාධි සුවය. **2)** කෙනෙක් ඕළාරිකවූ කාය, වචී හා මනෝ සංඛාර (gross tendencies) සහිතව වාසය කරයි. පසුකලක, ආරිය දහම  ශ්‍රවනය කර එම ඕළාරික සංඛාර පහකරගනී. එමගින්, ඔහුට කායික හා මානසික සුඛ වේදනා ඇතිවේ, ප්‍රීති සුවය ඇතිවීම නිසා සොම්නස පහලවේ. එය දෙවෙනි අවකාශාධිගම මගය. **සටහන**: ඕළාරික සංස්කාර පහවීමනිසා චතුධ්‍යාන ඵලසමාපාත්තිය ලැබේ. **3)** කෙනෙක් කුසලය හා අකුසලය පිලිබඳ යථා අවබෝධය නැතිව වාසය කරයි. නිවැරදි දහම  හා වැරදි දහම (සාවජජං -අනවජජං -what is right and what is wrong), සෙවියයුතු දහම හා නොසෙවියයුතු දහම ( සෙවිතබබං- න සෙවිතබබං), පහත් ධම්ම හා උතුම් ධම්ම (හීනං- පණිතං) ගැන තත්වූපරිදි නොමදනී. පසුකලක, ආරිය දහම ශ්‍රවනය කර, ධම්මානු ධම්මප්‍රතිපදාව අනුගමනය කිරීම හා යෝනිසෝමනසිකාරය කිරීම නිසා කුසලය හා අකුසලය පිළිබඳව නියම අවබෝධය ලබාගනී. එලෙස දන්නා දකිනා ඔහුගේ අවිද්‍යාව ප්‍රහීණයවේ, විද්‍යාව පහළවේ. එමගින්, ප්‍රීති සුවය ඇතිවම නිසා සොම්නස පහලවේ. එය තෙවෙනි අවකාශාධිගම මගය. **සටහන**: විද්‍යාව ඇතිවීම නිසා රහත්මගනුවණ ඇතිවීමෙන්, රහත් ඵල සුවය ලැබේ. **මූලාශ්‍ර**: දීඝ.නි: (2 ) 5 ජනවසභ සූත්‍රය, පි,322, EDN: 18 Janavasabha Sutta (17), p. 209.

▲ **අවකාශාධිගමය -** Avakashadhigamaya : **අධිගමය පිණිස** බුදුන් වහන්සේ අවබෝධ කළ ෂඩ් අනුස්මෘථි -සය අනුස්සති නම්වූ අවකාශාධිගමය, මහා කච්චාන තෙරුන් සංඝයාට මෙහිදී විස්තර කර ඇත. එම කරුණු සලකා බලන  ආරිය ශ්‍රාවකයාගේ සිත විසුද්ධියට පැමිණේ: 1) භාග්‍යවතුන්ගේ අරහත්බව සිහිකිරීම 2) දහම් ගුණ සිහිකිරීම 3) සංඝගුණ සිහිකිරීම 4) තමාගේ ශිල ගුණ සිහිකිරීම 5) තමාගේ ත්‍යාග ශිලිබව සිහිකිරීම 6) දෙවියන්ගේ උතුම් ගුණ සිහිකිරීම. **බලන්න**: අනුසති භාවනා. **මූලාශ්‍රය:** අංගු.නි: (4) 6 නිපාත:අනුත්තරියවග්ග: 6.1.3.6 මහා කච්චාන සූත්‍රය, පි.78.

▲ **අවකුජ්ජ පඤ්ඤා-** Inverted wisdom: යටිකුරු ප්‍රඥාව ඇති අය

(අවකුජ්ජ පඤ්ඤා- Inverted wisdom): යහපත් දහම ඇසුවද දහම් කරුණු සිතේ නොපිහිටන අයවේ. **උපමාව**: යටිකුරු කල කළය.. කලයකට වතුර පුරවා, එය මුණින් නමා හිස්කරන ලෙසින්, ඇසූ දහම ඔවුන්ගේ සිතේ නොපවතී. **බලන්න**:පුද්ගලයෝ තිදෙනා. **මූලාශ්‍ර:**අංගු.නි: (1): 3 නිපාත: 3.1.3.10 සූත්‍රය, පි. 277, EAN: 3: 30.10 sutta, p. 88.
▲**අවජානි**- despises :අවජානි ලෙසින් පෙන්වා ඇත්තේ, කෙනෙක් තව කෙනක්හට යමක්දී, හෝ ඒ කෙනා සමග එකට ජීවත්ව පසුව අවමන් කිරීම, නින්දා කිරීමය. ලෝකයේ අවජානිය පුද්ගලයන් දෙදෙනක් සිටින බව මෙහි පෙන්වා ඇත. **බලන්න:** පුද්ගලයෝ පස් දෙනා **මූලාශ්‍ර:** අංගු.නි: (3): 5 නිපාත: තිකන්ඩකිවග්ග: 5.3.5.1 අවජානාති සූත්‍රය, පි.290, EAN: 5:V: 141.1 sutta, p.283.
▲ **අවදඤ්ඤුතාවය-**un-charitableness අවදඤ්ඤුතාවය ලෙසින් පෙන්වා ඇත්තේ ත්‍යාගශීලි නැතිබව, අනුකම්පා සහගත නොවීමය. මෙය අකුසලයකි, ආධ්‍යාත්මික මගට බාධාවකි. අගෞරවය -ගරුනොකිරීම, දොවචස්සතාවය-මුරණ්ඩුබව, නරක මිතුරු (පාපමිත්‍ර) සේවනය නැතිකරගැනීමෙන්, කලණ මිතුරු සේවනය මහින්,අවදඤ්ඤුතාවය පහකර ගත හැකිවේ. **මූලාශ්‍ර**: අංගු.නි:(6 ):10 නිපාත: 10.2.3.6 තයෝධම්ම සූත්‍රය,පි.284, EAN:10: Tens,76-6.Incapable, p. 524.
▲ **අවදිකළයුතු ධම්ම හා අවදිනොකළයුතු ධම්ම**:පාලි: **උප්පාදෙතබ්බො ධම්මො, න උප්පාදෙතබ්බො ධම්මො**- Dhamma to be aroused & the Dhamma not to be aroused : අවදිකළයුතු දහම (උපදවාගතයුතු) නම් නිවන සාක්ෂාත් කරගැනීමට, විරිය යොදා ඇතිකරගතයුතු කුසලයන්ය. අකුසල දහම (උපදවා නොගතයුතු) අනුප්පාදේතබ්බ ධම්ම- අවදි නොකළයුතු දහමය. ආධ්‍යාත්මික ජීවිතය සපුරා ගැනීම පිණිස අවදිකළයුතු කරුණු ලෙසින් බුදුන් වහන්සේ පෙන්වා ඇත්තේ සම්මාදිට්ටිය ඇතුළු නිවැරදි මගය. මිථ්‍යාදිට්ටිය ඇති වැරදි අවදි නොකළයුතු දහමය. **මූලාශ්‍ර:** අංගු.නි: (6): 10 නිපාතය:10.3.5.5 උප්පාදේතබ්බ සූත්‍රය, පි. 476, EAN:10: Noble, p. 548.
▼**අවදිකළයුතු දහම,** දසකුසලයේ යෙදීමය. දස අකුසලය **අවදි නොකළයුතු දහමය. මූලාශ්‍ර**: අංගු.නි: (6 ):10 නිපාත:10.4.4.5 උප්පාදේතබ්බ ධම්ම සූත්‍රය, පි. 538, EAN:10: 193 sutta, p. 556.
▲ **අවබෝධය දුෂ්කර ධම්ම-**පාලි: **දුප්පටිවිජ්ඣා**- Dhamma that is hard to penetrate: **පටිච්චසමුප්පාදය හා නිවන**, දුෂ්කර ධර්මතාය- දුෂ්ප්‍රතිවිද්‍යා ධම්මය.සාමාන්‍ය ලෝකයාට අවබෝධය දුෂ්කර ගැඹුරු ධම්ම 2ක් ඇතිබව බුදුන්වහන්සේ වදාළහ: 1) ඉදපච්චයතා නම්වූ පටිච්ච සමුප්පාදය 2) සංඛාර සංසිඳීම, සියළු උපධි අතහැර දැමීම, තණ්හාව ප්‍රහිනය කිරීම, විරාගය, සියල්ල නිවා දැමීම වූ නිරෝධය නම්වූ නිවන. **මූලාශ්‍රය:** වින.පි: මහා වග්ග පාළිය 1 : බෝධි කථා,පි. 88.
▼**ආනන්තරික චිත්ත සමාධිය** අවබෝධය දුෂ්කර දහමකි.
**"ආනන්තරිකො චෙතොසමාධි අයං එකො ධම්මො දුප්පටිවිජ්ඣා"** (Uninterrupted mental concentration) **සටහන: *** ආනන්තරික චිත්ත සමාධිය ලෙසින් පෙන්වා ඇත්තේ විදර්ශනාවට අනතුරුව ඇති මගය ** විදසුන් නුවණ ඇතිවීමෙන් පසුව, සෝතාපන්න ආදීවූ මගඵල ලබන අතර තුර කාලය- මොහොත (The arising of a 'path-moment' :Stream-Entry, etc. after insight. **බලන්න**: EDN: note: 1137, p. 475. **මූලාශ්‍ර:** දීඝ.නි : (3 ): 11 දසුත්තර සූත්‍රය,පි. 483, EDN: 34: Dasuttara Sutta:

Expanding Decades, p. 384.

▲**අවභාසයෝ** - Bright lights :අවභාසයෝ (අභා) ලෙසින් පෙන්වා ඇත්තේ ලෝකයේ ඇති ප්‍රභාවත් ආලෝක- රශ්මි ගැනය. **බලන්න**: අභා

▲ **අවමන් කිරීම හා අවමන් නොකිරීම-** insolence & non-insolence අනුන්ට අවමන් කිරීම -නින්දා -අපහාස කිරීම අකුසලයකි, දුගතිය ඇතිකරයි. කිසිවෙකුට අවමන් නොකරන තැනත්තාට, ආධ්‍යාත්මික මග වඩා ගත හැකිය. **බලන්න**: අනවද්‍ය ධම්ම හා සාවද්‍ය ධම්ම.

▲ **අවසාන ඥාණය:** පාලි: **අඤ්ඤාවිමොක්ඛං-** Final knowledge: අවසාන ඥාණය ලෙසින් පෙන්වා ඇත්තේ සියලු කෙලෙස් හැර විමුත්තිය ලැබීමය, අරහත්වය ලැබීමය, නිවනය. **මූලාශ්‍ර**: සංයු: (5-1): මහාවග්ග: ඉන්ද්‍රියසංයුත්ත: 4.1.4 අරහන්ත සූත්‍රය, පි. 374, ESN: 48 : Indriya samyutta: 4.4 Arahant, p. 1929.

▼ **අවසාන ඥාණය අරහත්වයය**: භික්ෂුවක් තමන් අවසාන ඥානය ලැබූ බව ඤානවාදයෙන් පවසන්නේය: **'මම මේ මේ දහම දනිමි, මම මේ දහම දකිමි'** **බලන්න**: අරහත්බව, ඤාණවාදය. **මූලාශ්‍ර**: අංගු.නි: (6):10 නිපාත :මහා වග්ග: 10.1.3.4. මහාචුන්ද සූත්‍රය,පි. 106. EAN: 10: The Great Chapter: 24.4. Cunda, p. 501.

▼**අවසාන ඥානය ලබා ගැනීමට පුහුණු විය යුතු ආකාරය**: 1) සවිඥනක කය (විඥානය සහිත කය) පිළිබඳව ඇති අහංකාරය, මමංකාරය හා මාන අනුසය පහ කර ගැනීම. 2) බාහිර නිමිති පිළිබඳව ඇති අහංකාරය, මමංකාරය හා මානඅනුසය පහ කර ගැනීම.3) කිසිම දෙයකට අහංකාරය, මමංකාරය හා මානඅනුසය නොමැතිව, චේතෝ විමුක්ති හා ප්‍රඥා විමුක්ති සමාධියට සමවැදීම. එසේ සමාධි සමාපත්ති ලැබූ භික්ෂුව, සියලු තණ්හා බිඳඇත; සංයෝජන ගලවා ඇත; මානය සහමුලින්ම කඩා ඇත, දුක නිමා කර ඇත ඔහු අවසාන ඥානය ලබා ඇත. **සටහන්:** * චේතෝවිමුක්තිය (liberation of mind) යනු එල සමාධියය, ප්‍රඥාවිමුක්තිය (liberation by wisdom) යනු එල ප්‍රඥාවයය ** අවසාන ඥානය පිළිබඳව තමන් වහන්සේ උදය මානවක පුත්‍රයාට පැවසූ පිළිතුර, මේ සූත්‍රයේ දී බුදුන් වහන්සේ සැරියුත් තෙරුන්හට වදාළහ: **"පහාණං කාමසඤ්ඤානං දොමනස්සානුභයං ථිනස්ස ච පනුදනං කුක්කුච්චානං නිවාරණං- උපෙක්ඛා සතිසංසුද්ධං ධම්මතක්කපුරේජවං- අඤ්ඤාවිමොක්ඛං පබ්‍රූමි අවිජ්ජාය පභෙදනං'ති** කාම සංඥා, දෝමනස්සය, ථිනමිද්ධ, කුක්කුච්ච ආදීවූ සියලු නීවරණ පහකර; උපේක්ෂාව හා පිරිසිදුවූ සිහිය ඇතිව, දහම් සංකල්පනා පෙරටු කරගෙන, අවිද්‍යාව බිඳ දැමීමෙන් ඇතිවන විමුක්තිය අවසාන ඥානය ලැබීමය. **** උදය මානවක පුත්‍රයා,** ඇසූ ප්‍රශ්ණය: "...අවිද්‍යාව බිඳී ගිය, අවසාන ඥානය නම්වූ නිවන මාහට පහදා දෙන්න ..." **බලන්න**: ඛු.නි: සුත්තනිපාතය: පරායන වග්ග: උදය මානවක ගාථා: 1110-1111, පි. 360. ** **අටුවාවට අනුව**, මෙහිදී අවසාන ඥානය ඇතිවන්නේ සිව්වෙනි ජාන සමාපත්තිය හේතු කොට ගෙනය (උපේක්ඛා සති පාරිසුද්ධිය ලැබීම සිව්වෙනි ජානය ය). **මූලාශ්‍ර**: අංගු.නි :(1): 3 නිපාත : දේවදූතවග්ග: 3.1.4.3 සාරිපුත්‍ර සූත්‍රය, පි. 284, EAN:3: Divine Messengers: 33.3 Sariputta, p.90.

▼ **අවසාන ඥානය ලැබීමේ අවස්ථා තුන,** ඉන්ද්‍රිය ධම්ම ලෙසින් බුදුන් වහන්සේ පෙන්වා ඇත: 1) **අනඤ්ඤාත-ඤානස්සාමීති ඉන්ද්‍රිය** - අවසාන ඥානය ලබාගනිමි යයි තහවුරු කරගැනීම (I shall come to know the

unknown). **සටහන**: අවබෝධ නොකළ නිවන හෝ චතුසත්‍ය දහම දැනගන්නෙමි යයි යොගාවචරයාහට උපදින අවබෝධය මින් අදහස්වේ. එම අවබෝධය සෝතාපන්න මග්ග ඥානය ය. **බලන්න**: විශුද්ධිමග්ග, පරිච්ඡේදය: 16. 2) **අඤ්ඤින්ද්‍රිය**: Final knowledge: අවසාන ඥානය (අරහත්) ලැබීම. 3) **අඤ්ඤාතාවින්ද්‍රිය:** Final knower: සියලු ආසවයන් ක්‍ෂය කල බවත්, ඒවා නැවත ඇති නොවන බව දන්නා නුවණ: රහතන් වහන්සේට ඇති අවබෝධය. **මූලාශ්‍ර:** සංයු.නි : (5-1): මහාවග්ග: ඉන්ද්‍රිය සංයුත්තය: 4.3.3 අඤ්ඤඉන්ද්‍රිය සූත්‍රය, පි.392, ESN:48: Indriyasamyutta: 23.3 The Faculty of Final Knowledg*e*, p. 1938.

▲ **ආවාස-**Monasteries: සංඝයා වාසය කරණ ස්ථාන ආවාස ලෙසින් පෙන්වා ඇත, යම් කෙනක්, ආවාස සාදන්නේ නම් එය පුණ්‍ය ක්‍රියාවකි, සුගතියට මග පාදයි. **බලන්න:** ආරම **මූලාශ්‍රය**: සංයු.නි: (1): සගාථවග්ග: දේවතාසංයුත්ත: 1.5.7 වනරෝප සූත්‍රය, පි.86.

▲**අව්‍යාපාද** - No Hate: අව්‍යාපාද-තරහ නොමැතිබව කුසල මූලයකි. **බලන්න:** කුසලමූල, අදොසය.

▲**අව්‍යාපාදරාම**- Abide without ill will: අව්‍යාපාදරාම ලෙසින් පෙන්වා ඇත්තේ තරහ, ක්‍රෝධ නොමැතිව මෛත්‍රියසහගතව වාසය කිරීමය. මෙය රහතුන්ගේ විහරණයකි. **බලන්න**: සුඛ සෝමනස්ස. **මූලාශ්‍ර:** අංගුනි: (4): 6 නිපාත: අරහත්වග්ග: 6.2.3.4 සුඛ සෝමනස්සසූත්‍රය, පි.254.

▲**අව්‍යාපාද විතක්ක**- the thought of good will : සිතේ ඇති මෛත්‍රි සහගත සිතිවිලි මින් අදහස් කරයි. කුසල සිතකි. මේ ජීවිතයේදීම සුවයෙන් සිටීමට උපකාරීවන දහමකි, රහතුන්ගේ සිතුවිලිය**. බලන්න**:සුඛ හා දුක ඇතිවීම. **මූලාශ්‍ර**: අංගු.නි: (4): 6 නිපාත: අරහන්තවග්ග: 6.2.3.1 දුක්ඛ සූත්‍රය, පි.252,EAN:6: 75.1 Suffering**,** p. 359.

▲ **අව්‍යාපාද සංඥා**- perception of good will :අව්‍යාපාද සංඥා, මෙත්තා සහගත සිතක ඇතිවන සංඥාවන්ය. මෙලොව හා පරලොව සුවය පිණිසය**. බලන්න**:සුඛ හා දුක ඇතිවීම. **මූලාශ්‍ර**: අංගු.නි: (4): 6 නිපාත: අරහන්තවග්ග: 6.2.3.1 දුක්ඛ සූත්‍රය, පි.252,EAN:6: 75.1 Suffering**,** p. 359.

▲**අවස්සුතපරියාය**-Exposition on the Corrupted :අවස්සුතපරියාය ලෙසින් පෙන්වා ඇත්තේ කෙනෙක් තුල දූෂිතබව- කෙළෙස් ඇතිවීමට හා නැතිවීමට හේතු කරුණු විස්තර කිරීමය. බුදුන් වහන්සේගේ අනුදැනුම ඇතිව මහා මුගලන් තෙරුන්, මේ පරියාය සංඝයාට වදාළහ: කෙනෙක්, සතිසම්ප්‍රජන්‍ය නැතිව සිටිනවිට, සය ඉන්ද්‍රිය මගින් අල්ලා ගන්නා බාහිර අරමුණු කෙරහි ඇලීම හෝ ගැටීම ඇතිවේ. කායගතා සතිය නොමැතිව ඔහු ඒ අරමුණු පිළිබඳව ඇලීම හෝ ගැටීම ඇතිව සිටි. උපන් ලාමක අකුසල කෙසේ නම් ප්‍රහීණය කරන්නේද යන්න ගැන ඔහුට අවබෝධය නැත.එලෙස ඔහුගේ සිත දූෂිතබවට පත්වේ.එවැනි පුද්ගලයා පහසුවෙන්ම මරුගේ වසඟයට පත්වේ. මේ පිළිබඳ දැක්වූ **උපමාව: බලන්න**: උපග්‍රන්ථය:5, වේලිගිය වහල: බොහෝ කලක් වේලි ගිය ගෙයක වහල (තණකොළ හෝ බට වලින් වැසුන), ඉතා ඉක්මනින්ම ගිනි තැබීමට හැකිය. එහෙත්, කායගතා සිහිය ඇතිව, අරමුණු අල්ලා නොගන්නා පුද්ගලයා හට ලාමක අකුසල නො ඉපදේ. ඔහු ප්‍රඥාවේන්, සියල්ල නිරුද්ධ කිරීම පිළිබඳව අවබෝධය ලබා ඇත. ඒ නිසා ඔහු මරුගේ වසඟයට පත්නොවේ. මේ පිළිබඳ දැක්වූ **උපමාව:** ඝන මැටි හෝ

තද ගලින් සකස්කල නිවසක් ගිනි තැබීමට නොහැකිය. එලෙස, කායගතා සතිය ඇති නුවණැති මහණ, මරුගේ ග්‍රහණයට හසුනොවේ. දේශනාව අවසානයේදී, බුදුන් වහන්සේ එම පරියාය අනුමත කළහ. **සටහන:**මේ පිලිබඳ භික්ඛු බෝධිහිමි ගේ විස්තරය: **බලන්න**: ESN:note:194, p.1552. **මූලාශ්‍ර:**සංයු.නි: (4) සළායතනවග්ග: වේදනාසංයුත්ත:ආසිවිසිවග්ග: 1.19.6 අවස්සුත පරියාය සූත්‍රය, පි.380, ESN:35:Salayatana samyutta: 243.6 Exposition on the Corrupted, p.1319.

▲**අවශ්‍ය මග-** the essential way: අවශ්‍යමග ලෙසින් පෙන්වා ඇත්තේ ආධ්‍යාත්මික මගය, බ්‍රහ්මචරියාව පිණිස ඇති මගය. **බලන්න**:ආධ්‍යාත්මික මග, බ්‍රහ්මචරියාව.

▲ **අවික්ෂේප සමාධිය-**Avikshepa :නෙක්කම්මය නිසා සිතේ ඇතිවන එකඟ බව අවික්ෂේප සමාධිය වේ, ආසව ප්‍රහීණය පිණිස උපකාරිවේ. **බලන්න**: ආනන්තරික චිත්ත සමාධිය. **මූලාශ්‍ර:** ඛු.නි: පටිසම්භිදා මග : 1 : 32. ආනන්තරික චිත්ත සමාධි ඥානය, පි. 202.

▲**අවිතක්ක අවිචාර**-Avitakka avichara :දෙවනි ජාන සමාපත්තිය ලැබීමෙන්, විතක්ක හා විචාර සංසිඳීම මගින් සිත අවිතක්ක අවිචාර සහිත ප්‍රීති සුඛයට පැමිණේ. **බලන්න**: ජාන **මූලාශ්‍රය:** සංයු.නි: (3) ඛන්ධවග්ග: සාරිපුත්තසංයුත්ත:7.1.2 අවිතක්ක සූත්‍රය, පි.496, (4) සළායතන වග්ග:මොග්ගල්ලානසංයුත්ත: 6.1.2 අවිතක්කසූත්‍රය, පි.518.

▼**බුදුන් වහන්සේ මෙසේ වදාළහ:** "මහණෙනි, නිවන් මග කවරේද යත් අවිතක්ක අවිචාර සමාධියය." .**මූලාශ්‍රය:**සංයු.නි: (4) සළායතනවග්ග: අසංඛතසංයුත්ත: 9.2.5 අවිතක්කඅවිචාර සූත්‍රය, පි.668.

▲ **අවීචි නිරය**- Avichi Hell: මහා නිරය ලෙසින්ද දක්වා ඇත. බරපතල අකුසල් විපාක විඳීමට ඇති දුගතියකි. ආරිය උපවාදය නිසා අවිචියේ දුක්විඳීමට සිදුවේ. **බලන්න:** ආරිය උපවාද, නිරය.

▲ **අවිඡ්ඡාඅනුසය-** avijjānusayo: අවිජ්ජා-අවිද්‍යාව- මෝහය ලෙසින් පෙන්වා ඇත්තේ යථාබව නොදැනීමය. සිතයට ඇති කෙලෙසක් නිසා එය අනුසයකි. අරහත්වය පිණිස මේ අනුසය ප්‍රහීණ කලයුතුය. **බලන්න**: අනුසය, අවිද්‍යාව.

▲ **අවිජ්ජාඔසය-** flood of ignorance: අවිජ්ජාව යනු චතුසත්‍ය නොමදැනීමය, ඔසය යනු ජල ප්‍රවාහය-සසර ඇදගෙන යන ප්‍රවාහයන්ය. අවිජ්ජා ඔසය ඒ ප්‍රවාහ 4 න් එකකි.**බලන්න**: ඔස, අවිද්‍යාව.

▲ අවිජ්ජා නීවරණ**-**Avijja nivarana: සියලු නීවරණයන්ට වඩා, සසර ගමන දික් කිරීමට බලපාන නීවරණය, අවිජ්ජාව ලෙසින් බුදුන් වහන්සේ පෙන්වා ඇත. **"...මහණෙනි, අවිද්‍යා නීවරණයෙන් ඇවුරුණ සත්වයෝ බොහෝ කලක්, ඒ ඒ භවයන්හි දුවති, හැසිරෙති".** යම් ආරිය ශ්‍රාවකක්, මෝහය දුරු කර, අරහත් මග නුවණින් මෝහස්කන්ධයම සිඳින්නේද, ඔහු නැවත සසර සැරිසරන්නේ නැත. **මූලාශ්‍ර:** ඛු.නි:ඉතිවුත්තක: 1.2.4 අවිජ්ජා නීවරණ සූත්‍රය**,**පි.358.

▲ **අවිජ්ජා යොගය**: පාලි: **අවිජ්ජා යොගො-** bond of ignorance: අවිජ්ජා යොගය යනු ලෝක සත්ත්වයා සසරට බැඳ තබන බැම්ම. මෙය කෙලෙස් බැඳීම් 4 න් - සතර යොගයන්ගෙන් එකකි. **බලන්න: සතර යොග.**

▲ **අවිද්‍යාව: පාලි: අවිජ්ජා:** Ignorance-delusion: අවිද්‍යාව-අවිජ්ජා-මෝහය යනු චතුසත්‍ය අවබෝධ නොකිරීමය, සම්මා දිට්ඨිය නොමැතිවීමය. මෙය උද්ධම්භාගිය සංයෝජනයකි. අවිද්‍යාව සසර

දික්කරයි. විද්‍යාව යනු චතුසත්‍ය අවබෝධ කරගැනීමය. **බලන්න**: විද්‍යාව.**සටහන:** සතර යොග විස්තර කරන අවස්ථාවේ සපර්ශ ආයතන පිලිබඳව, යථා භූත නුවණ නැතිවීම අවිද්‍යාව ලෙසින්ද පෙන්වා ඇත. **බලන්න:** සතර යොග. දුක, දුක ඇතිවීම, දුක නැතිවීම, දුක නැතිකිරීමේ මග නොදැනීම අවිද්‍යාව යයි සැරියුත් තෙරුන් මෙහිදී පෙන්වා ඇත. ආසව ඇතිවීම නිසා අවිද්‍යාව ඇතිවේ, ආසව නැතිවීම නිසා අවිද්‍යාව නැතිවේ. **මූලාශ්‍ර:** ම.නි: (1): 1.1.9 සම්මා දිට්ඨි සූත්‍රය, පි. 130, EMN: 9: Sammādiṭṭhi Sutta- Right View, p. 121. **ශබ්දකෝෂ: පා.සි.ශ**: පි.107 : "**අවිජ්ජා:** යනු නොදැනීම, මෝහය, චතුසත්‍ය නොදැනීම...'. **B.D**: p. 27: "**Avijjā**: ignorance, nescience, unknowing- delusion…". **P.T.S**: p. 209: "**Avijjā**: the main root of evil and of continual rebirth…".

▼**අවිද්‍යාව පටිච්චසමුප්පාද න්‍යායේ මුල් පුරුකය**: සංසයාට පටිච්චසමුප්පාද දහම් දේශනා කර බුදුන් වහන්සේ පෙන්වා දුන්නේ අවිද්‍යාව මුල්කරගෙන පටිච්චසමුප්පාදය ක්‍රියාත්මකවන ආකාරයය, අවිද්‍යාව නිසා සංඛාර ඇතිවේ. **"…අවිජ්ජා පච්චයා සංඛාරා…"** .එසේම, එම අවිද්‍යාව කිසිම ඉතිරියක් නොමැතිව අවසන් වීමෙන්-විද්‍යාව පහළවීමෙන් පටිච්චසමුප්පාදයේ සෙසු සාධකද නිරුද්ධවී, දුක අවසන්වේ. බලන්න: පටිච්චසමුප්පාදය. **" කතමා ච භික්ඛවෙ අවිජ්ජා ? යං ඛො භික්ඛවෙ දුක්ඛෙ අඤ්ඤාණං, දුක්ඛසමුදයෙ අඤ්ඤාණං, දුක්ඛනිරොධෙ අඤ්ඤාණං, දුක්ඛනිරොධගාමිනීයා පටිපදාය අඤ්ඤාණං, අයං වුච්චති අවිජ්ජා"** අවිද්‍යාව කුමක්ද? දුක කුමක්ද යයි අවබෝධ නොකිරීම, දුක ඇතිවීම පිළිබඳව අවබෝධ නොකිරීම, දුක නැතිවන ආකරය අවබෝධ නොකිරීම, දුක නැතිකිරීමේ මාර්ගය කුමක්ද? යයි අවබෝධ නොකිරීමය. චතුසත්‍ය අවබෝධයෙන් විද්‍යාව පහළවේ, අවිද්‍යාව ප්‍රහීණය පිණිස ආරිය අටමග වැඩිය යුතුවේ. **මූලාශ්‍ර**: සංයු.නි: (2): නිදාන වගග1.1.1 පටිච්චසමුප්පාද සූත්‍රය, පි.24 හා 1.1.2 විභංග සූත්‍රය, පි.26, ESN: 12: Nidanasamyutta: 1.1. Dependent Origination, p. 610 & ESN: 12: Nidanasamyutta: 1 2.2 Analysis of Dependent Origination, p.61.

▼**අකුසල දහම් අවිද්‍යාව පෙරටුකර ඇත. "…අවිජ්ජා භික්ඛවෙ පුබ්බඞ්ගමා අකුසලානං ධම්මානං සමාපත්තියා අනවදෙව අහිරිකං අනොත්තප්පං අවිජ්ජාගතස්ස භික්ඛවෙ අවිද්දසුනො මිච්ඡාදිට්ඨි පහොති. මිච්ඡාදිට්ඨිස්ස මිච්ඡාසඞ්කප්පො පහොති…"** .පවට ලැජ්ජා නැතිකම හා බිය නැතිකම (හිරි ඔතප් නැතිබව) සමගම උපදින අවිද්‍යාව, අකුසල් ඇතිකිරීමට පෙරටුව සිටී. අවිද්‍යාවෙන් යුත් අනුවණ මිනිසාට මිථ්‍යා දිට්ඨිය ඇතිවේ. මිථ්‍යා දිට්ඨිය ඇතිවිට මිථ්‍යා සංකප්ප ඇතිවේ... එලෙස පිළිවෙලින්, ඔහු තුල මිථ්‍යාසමාධි ය ඇතිවේ, මිථ්‍යා ප්‍රතිපදාවට නැඹුරුවේ. ඒ අනුවණ මිනිසා අකුසල් කරයි, කුසලයේ නොමයෙදේ. **මූලාශ්‍ර**: සංයු.නි: (5-1): මහාවග්ග: මග්ගසංයුත්ත: 1.1.1 අවිජ්ජා සූත්‍රය, පි. 30, ESN:45: Mggasamyutta: 1.1 Ignorance, p. 1603.

▼**අවිද්‍යාව ප්‍රහීණ කරගැනීමේ පිළිවෙත:** ඇස...ඇසෙන් දකිනා රූපය...ඇසේ විඥානය, (මේ 3 එක්වීමෙන් ඇතිවන) ඇසේ ස්පර්-ශ ය... ඇසේ ස්පර්-ශ යනිසා යම් වේදනාවක් ඇතිවේද: සැප වේදනා, දුක වේදනා, සැපත් නැති දුකත් නැති (මැදහත්) වේදනා ...මේ සියල්ල අනිත්‍යබව, දන්නා, දකිනා පුද්ගලයා ගේ අවිද්‍යාව පහවේ, විද්‍යාව

ඇතිවේ. **"චක්ඛුං ඛො භික්ඛු අනිච්චතො ජානතො පස්සතො අවිජ්ජා පහීයති, විජ්ජා උප්පජ්ජති. රූපෙ අනිච්චතො ජානතො පස්සතො අවිජ්ජා පහීයති, විජ්ජා උප්පජ්ජති. චක්ඛුවිඤ්ඤාණං අනිච්චතො ජානතො පස්සතො අවිජ්ජා පහීයති, විජ්ජා උප්පජ්ජති. චක්ඛුසම්ඵස්සං අනිච්චතො ජානතො පස්සතො අවිජ්ජා පහීයති, විජ්ජා උප්පජ්ජති. යම්පිදං චක්ඛු සම්ඵස්සපච්චයා උප්පජ්ජති වෙදයිතං සුඛං වා දුක්ඛං වා අදුක්ඛම සුඛං වා තම්පි අනිච්චතො ජානතො පස්සතො අවිජ්ජා පහීයති, විජ්ජා උප්පජ්ජති"** **සටහන්:** * සෙසු ආයතන 5 : කණ, නාසය ආදියද අනිත්‍ය යයි අවබෝධ කරන පුද්ගලයා ගේ අවිද්‍යාව නැතිවේ, ** අටුවාවට අනුව එම කරුණු දුකය, අනාත්මය ලෙසින් දන්නා දකිනා කෙනාගේ අවිද්‍යාව පහවීයයි. **බලන්න**: ESN: note:21, p.1537. **මූලාශ්‍ර:** සංයු.නි: ( 4) සළායතන සංයුත්ත: 1.6.1 අවිජ්ජාපහාන සූත්‍රය**,** පි. 94, ESN: 35: Salayathan asamyutta: Ignorance: 53.1 Abandoning , P. 1234.

▼ **මිථ්‍යාදිට්ඨිය අවිද්‍යාව ඇතිකරයි**: වැරදි ලෙසින් තබන ලද උලක්/ කූරක් (හැල්නන්ඩුව-යවනන්ඩුව) නිසා කෙනෙකුගේ අතපය තුවාලවේ. **උපමාව:** හැල්නන්ඩුව. මිථ්‍යා දිට්ඨිය නිසා අයහපත- අවිද්‍යාව ඇතිවී සසර දික්වේ.**බලන්න**: උපග්‍රන්ථය:5. **මූලාශ්‍ර:**සංයු.නි: ( 5-1): මහාවග්ග: මග්ගසංයුත්ත:1.1.9 සූක සූත්‍රය, පි.44, ESN: 45: Maggasamyutta: 9.9. The Spike, p. 1613.

▼ **අවිද්‍යාව** ගැන මනා අවබෝධය ලැබීම පිණිස සම්මා දිට්ඨිය ඇති කර ගත යුතුවේ. **මූලාශ්‍ර**: ම.නි: (1 ): 1.1.9 සම්මා දිට්ඨි සූත්‍රය, පි. 130, EMN: 9: Sammādiṭṭhi Sutta- Right View, p.1217.

▼ ආධ්‍යාත්**මික වර්ධනය** පිණිස පහකර ගත යුතු **(පහාතබ්බා ධර්ම) දහමක්** ලෙස අවිද්‍යාව පෙන්වා ඇත .**බලන්න**: පහාතබ්බා ධර්ම. **මූලාශ්‍ර:** දීඝ.නි : (3 ): 11 දසුත්තර සූත්‍රය, පි. 483, EDN: 34: Dasuttara Sutta: Expanding Decades, p. 384**.**

▼**කායගතා සතිය වඩාගැනීමෙන්**, විපුල කරගැනීමෙන් අවිද්‍යාව පහවේ. **මූලාශ්‍ර:** අංගු.නි: (1): 1 නිපාත: කායගතාසති වග්ග සූත්‍ර, පි. 125, EAN:1: Mindfulness Directed to the Body, p.52.

▼ **බුදුන් වහන්සේ** අවිද්‍යාව පිළිබඳව යහපත් ලෙසින් වදාරා ඇත. එම දහම සංඝයා එක්ව, දහමේ චිරස්ථිතිය පිණිස සජ්ජායනා කිරීම සුදුසු ය යි සැරියුත් මහා තෙරුන් සංඝයාට උපදෙස් දී ඇත.**මූලාශ්‍ර**:දිඝ.නි: (3 ):10 සංගිතිසූත්‍රය,පි.372,EDN:33 SangītiSutta:The Chanting Together, p.362.

▼ **අවිද්‍යාව පෝෂණය වීම**: බුදුන් වහන්සේ වදාළේ අවිද්‍යාව පටන්ගත් තැනක් දැකිය නොහැකිබවය. එමනිසා, මෙවකට පෙර අවිද්‍යාව නොවිය, ඉන්පසු අවිද්‍යාව පහළවී යයි කිව නොහැකිය. එහෙත් අවිද්‍යාව පෝෂණය වන ආකාරයක් ඇත. එනම්, පංච නීවරණ නිසා අවිද්‍යාව පෝෂණය වේ: **"...පුරිමා භික්ඛවෙ කොටි න පඤ්ඤායති අවිජ්ජාය ...ඉතො පුබ්බෙ අවිජ්ජාය නාහොසි, අථ පච්ඡා සමභවී'ති. එවමෙතං භික්ඛවෙ වුච්චති. අථ ච පන පඤ්ඤායති ...'ඉදප්පච්චයා අවිජ්ජා'ති. අවිජ්ජාම්පහං භික්ඛවෙ සාහාරං වදාමි නො අනාහාරං, කො චාහාරො අවිජ්ජාය: පඤ්ච නීවරණා තිස්ස වචනීයං..."** **සටහන**: අවිද්‍යාව පෝෂණය

වීමේ සිට සියලු අකුසල් එකින් එක පෝෂණය කරමින් සිදුවන ක්‍රියාවලිය මේ සූත්‍රයේදී බුදුන් වහන්සේ පැහැදිලිව පෙන්වා ඇත: **පංච නීවරන** පෝෂණය වන්නේ **ත්‍රිවිධ දුශ්චරිතය** නිසාය. **ත්‍රිවිධ දුශ්චරිතය** පෝෂණය වන්නේ **ඉන්ද්‍රිය අසංවරය** නිසාය. **ඉන්ද්‍රිය අසංවරය** පෝෂණය වන්නේ **අසතිය හා අසම්ප්‍රජන්‍යය** නිසාය. **අසතිය හා අසම්ප්‍රජන්‍යය** පෝෂණය වන්නේ **අයෝනිසෝමනසිකාරය** නිසාය. **අයෝනිසෝමනසිකාරය** පෝෂණය වන්නේ **අශ්‍රද්ධාව** නිසාය. **අශ්‍රද්ධාව** පෝෂණය වන්නේ **අසද්ධර්මය ඇසීම** නිසාය. **අසද්ධර්මය ඇසීම** පෝෂණය වන්නේ **අසත්පුරුෂ සේවනය- පාපමිත්‍ර සේවනය** නිසාය. **සටහන:** පාප මිත්‍ර සේවනය සංසාරය දික්වීමට මූලික කරුණකි. මේ ක්‍රියාවලිය පිලිබඳ බුදුන් වහන්සේ පෙන්වා වදාළ **උපමාව:** කඳු මුදුනට වැස්ස පතිතවූ විට, එම දිය ගලා ගොස් කඳු බෑවුමෙ ඇති විවර, පැලුම් ආදිය පිරේ. ඒවා පිරී ගොස් ගලායන දිය මගින් දොළ පාර පිරී යති. ඒවා පිරී ගොස් ගලායන දිය මගින් පොකුණු පිරී යති. ඒවා පිරී ගොස් ගලායන දිය මගින් විල් පිරී යති. ඒවා පිරී ගොස් ගලායන දිය මගින් ඇල ආදී කුඩා දිය පහර පිරී යති. ඒවා පිරී ගොස් ගලායන දිය මගින් නදී පිරී යති. ඒවා පිරී ගොස් ගලායන දිය මගින් ගංගා ද අනතුරුව මහා ගංගා ද පිරී යති. මහා ගංගා පිරී ගොස් ගලායන දිය මගින් මහා සාගරය පිරී යයි. එලෙසින් අකුසල ධර්ම නිසා අවිද්‍යාව නමැති සාගරය පෝෂණය වේ. **කඳුමුදුනට වැටෙන වැස්ස උපමාව. බලන්න:**උපග්‍රන්ථය:5 **මූලාශ්‍ර**:අංගු.නි: (6 ): 10 නිපාත: යමක වග්ග: 10.2.2.1 අවිද්‍යා සූත්‍රය, පි.232, EAN:10: II Pairs: 61.1.Ignorance, p. 517.

▼ **අවිද්‍යා සහගතබව** :අවිද්‍යාසහගතබව ලෙසින් පෙන්වා ඇත්තේ යථාබව අවබෝධ නොකිරීමය. අශ්‍රුතවත් පෘථගජනයා (දහම ශ්‍රවණය නොකළ සාමාන්‍ය මිනිසා) රූප... වේදනා... සංඥා... සංඛාර ... විඥාන ආදීය කුමක්ද? යයි නොදනී, ඒ ඒ දහම් කරුණු ඇතිවන්නේ කෙසේද?, නැතිවෙන්නේ කෙසේද? ඒවා නැතිකර ගැනීමේ මග කුමක්ද? යයි නොදනී, එය අවිද්‍යාව ය, ඒ පමණකින්ම අවිද්‍යා සහගතබව ඇතිවේ. **මූලාශ්‍ර**: සංයු.නි: ( 3): ඛන්ධසංයුත්ත: 1.3.2.1 අවිජ්ජා සූත්‍රය, 1.3.2.2. හා විජ්ජා සූත්‍රය, පි. 311, ESN: 22: Kahnadasamyutta: 113.1 Ignorance, 114.2 True knowledge, p. 1100.

▼**අවිද්‍යාව යනු චතු සත්‍ය නොදැනීමය යි** සැරියුත් තෙරුන් වදාළහ. අවිද්‍යාව පහ කරගැනීම පිණිස ආරිය අටමග වැඩිය යුතුය. **මූලාශ්‍ර:** සංයු.නි: (4 ) සළායතන වග්ග: ජම්බුඛාදක සංයුත්ත: 4.1.9 අවිජ්ජා සූත්‍රය**,** පි. 506, ESN: 38: Jambukhādaka -saṃyutta: 9 Ignorance, p. 1404.

▼**අවිද්‍යාව නිසා මිථ්‍යාදිට්ඨිය ඇති වැරදි මග ඇතිවේ. මූලාශ්‍ර:**අංගු.නි: (6): 10 නිපාත: සමණසඤ්ඤා වගග, 10.3.1.5. විජ්ජා සූත්‍රය,පි.412, EAN:10: 105.5 True Knowledge, p.541.

▲**අවිධිමත් අවධානය-** unwise attention: අවිධිමත් අවධානය යනු අයෝනිසෝමනසිකාරයේ යෙදීමය, අකුසලයකි. **බලන්න:** අයෝනිසෝමනසිකාරය.

▲ **අවිප්‍රතිසාරය:** පාලි: **අවිප්පටිසාරත්‍ථානි**-non-regret :අවිප්‍රතිසාරය ලෙසින් දක්වා ඇත්තේ පසුතැවිලි නොවීම ය. අවිප්‍රතිසාරය ඇතිවිට සිත පහසුවෙන් සමාධි ගත කර ගත හැකිවේ. **ශීලසම්පන්නවීම නිසා පසුතැවිල්ල ඇතිනොවේ:** බුදුන් වහන්සේ පෙන්වා ඇත්තේ කෙනෙකුට

කුසල ශීලය- ශීලසම්පන්නවීම- ඇත්නම් ඔහුට පසුතැවිල්ල ඇති නොවන බවය. එමගින් සිතේ ප්‍රමෝදය -පමොජ්ජා ඇතිවේ,අවිප්‍රතිසාරයේ අනුසස නම් සිත ප්‍රමෝදයට පත්වීමය. **"ඉති ඛො ආනන්‍ද කුසලානි සීලානි අවිප්පටිසාරත්‍ථානි, අවිප්පටිසාරානිසංසානි. අවිප්පටිසාරො පාමොජ්ජත්‍ථො පාමොජ්ජානිසංසො..." සටහන්: *** අවිප්‍රතිසාරය සමාධිය ඇතිවීමට උපකාරීවේ. ** මෙහිදී අවිප්‍රතිසාරය මගින් ක්‍රම ක්‍රමයෙන් කුසල දහම් සම්පූර්ණ යට පත්වී නිවන සාක්ෂාත් වීම විස්තරාත්මකව පෙන්වා ඇත. **මූලාශ්‍ර**:අං.ගු.නි: (6): 11 නිපාතය:නිස්සය වගග: 11.1.1.කිමත්ථිය සූත්‍රය හා 11.1.2. න චේතනාය කරණිය සූත්‍රය, පි.611-614, EAN:11: Dependence: 1.1 What Purpose & 1. 2 Volition p.566.

▲ **අවිරති ශීලය**-Avirathi sila: කුසල සිත නිසා සිතේ ඇතිවන අනිකුත් කුසල චේතනා අවිරති ශීලයය. **සටහන**: විසුද්ධිමග්ග, පරිච්ඡේදය1, පි.61 මේ ගැන විස්තර දක්වා ඇත.**බලන්න**: ශීලය.

▲**අවිරුද්ධ මග**- the unopposed way: ආධ්‍යාත්මික ජීවිතය සාර්ථක කරගැනීමට පදනම්වන බ්‍රහ්මචාරිමග, අවිරුද්ධ මග ලෙසින් පෙන්වා ඇත**. බලන්න:** ආධ්‍යාත්මික මග,බ්‍රහ්මචරියාව.

▲ **අවිසාරද**- Not skillful: අවිසාරද-අවිශාරද ලෙසින් පෙන්වා ඇත්තේ අදක්ෂ ලෙසින් ගිහි ජීවිතය ගෙනයාමය. පන්සිල් නොරකිමින් ජීවත්වීම, දස අකුසලය සහිතව ජීවත්වීම අවිසාරද බව මෙහි දක්වා ඇත. **මූලාශ්‍ර:** අං.ගු.නි: (3): 5 නිපාත: 5.4.3.2 විසාරද සූත්‍රය, පි.352 හා අං.ගු.නි: (6): 10 නිපාත: 10.5.1.5 විසාරද සූත්‍රය, පි.560.

▲ **අවිහ බ්‍රහ්මලෝකය**- Aviha Heaven: අවිහ දේවලෝකය, බ්‍රහ්ම ලෝකයකි, අනාගාමී උතුමන් යළි උපත ලබන සුද්ධාවාසයකි. **බලන්න**: බ්‍රහ්මලෝක.

▲**අවිහිංසාව**: පාලි: **අවිහිංසා**- Non-harming,Non cruelty:අවිහිංසාව: වෙනත් අයට හිංසා නොකිරීම, පිඩා නොකිරීම කුසලයකි, සම්මා සංකප්පයට ඇතුලත් ගුණයකි. බුදුන් වහන්සේ වදාළේ හිංසාකිරීමෙන් වැලකීම පිණිස අවිහිංසාව පුරුදු කරගත යුතු බවය. අවිහිංසාව ඇති පුද්ගලයන්ට කරුණාව යහපත් ලෙසින් වඩා ගත හැකිය. මෙය ආධ්‍යාත්මික වර්ධනය පිණිස උපකාරීවන කරුණකි. **බලන්න**: සල්ලේඛ පරියාය, සම්මා සංකප්ප. **සටහන:** අවිහිංසාව නිසා, අවිහිංසා විතක්ක, අවිහිංසා සංඥා ඇතිවේ. මේවා කුසලවේ, මෙලොව හා පරලොව සුවය ඇතිකරයි. **මූලාශ්‍ර**: අං.ගු.නි: (4): 6 නිපාත: අරහන්තවග්ග: 6.2.3.1 දුක්ඛ සූත්‍රය, පි.252,EAN:6: 75.1 Suffering**,** p. 359.

▼**බුදුන් වහන්සේ** අවිහිංසාව ගැන යහපත් ලෙසින් වදාරා ඇත. එම දහම සංඝයා එක්ව, දහමේ චිරස්ථිතිය පිණිස සජ්ජායනා කිරීම සුදුසු යයි සැරියුත් මහා තෙරුන් සංඝයාට උපදෙස් දී ඇත. **මූලාශ්‍ර**: දිඝ.නි: (3 ):10 සංගිති සූත්‍රය, පි. 372 , EDN: 33 Saṅgīti Sutta: The Chanting Together, p. 362.

▲ **අවෙච්චා සහගත ප්‍රසාදය:** පාලි: **අවෙච්චප්පසන්‍න**- unwavering confidence: ත්‍රිවිධරත්නය කෙරෙහි විශ්වාසි බව- නියත පිළිගැනීම අවෙච්චා සහගත ප්‍රසාදයය. සෝතාපන්නවීම මගින් එම විශ්වාසි බව ඇතිවේ: **"...යෙ කෙචි භික්ඛවෙ මයි අවෙච්චප්පසන්‍නා, සබ්බෙ තෙ සොතාපන්‍නා නං..."** **බලන්න**: දිට්ඨි සම්පන්න. **සටහන**: දිට්ඨි සම්පන්නවීම හා අවෙච්චා සහගත ප්‍රසාදය ඇතිවීම සමානය .

▼ **සෝතාපන්න** සිට අරහත්බව ලැබූ බුද්ධ ශ්‍රාවකයන්ට අවෙච්චා

සහගත ප්‍රසාදය ඇත. **මූලාශ්‍ර:** අංගු.නි: (6): 10 නිපාත: 10.2.2.4 අවෙච්චප්පසන්න සූත්‍රය, පි.244, EAN:10: 64 .4. Unwavering, p. 519. ▼**කෙනෙක් තුල අවෙච්චා** සහගත ප්‍රසාදය ඇතිවීමට සම්මා දිට්ඨිය තිබීම අවශ්‍යය. **මූලාශ්‍ර:** ම.නි: (1 ): 1.1.9 සම්මා දිට්ඨි සූත්‍රය, පි. 130, EMN: 9: Sammādiṭṭhi Sutta- Right View, p. 121.

▲ **අවුල නිරවුල් කරගැනීම-**The tangle & disentangling the tangle මෙහිදී පෙන්වා ඇත්තේ, අවුල යනු ලෝක ප්‍රජාව සසරට බැඳී තිබීම නිසා ඇතිවන දුක් ගැටළු ආදිය ගැනය. එම අවුල නිරවුල් කරගන්නේ තණ්හාවට ඇති බැඳීම් කපා දැමීමෙන්ය. එක් සමයක දෙවියෙක් බුදුන් වහන්සේගෙන් මෙසේ විමසුහ: " **අන්තො ජටා බහි ජටා ජටාය ජටිතා පජා, තං තං ගොතම පුච්ඡාමි කො ඉමං විජටයෙ ජටන්ති ?"** මිනිසුන්ගේ ඇතුළතත් අවුල්සහගතය, පිටත ද අවුල්සහගතය, සියලු දෙන අවුලෙන් බැඳී ඇත, ගොතමයන් වහන්ස, මේ අවුල නිරවුල් කරගන්නේ කවරෙක්ද? (A tangle inside, a tangle outside, This generation is entangled in a tangle. I ask you this, O Gotama, Who can disentangle this tangle?) බුදුන් වහන්සේ මෙසේ පිළිතුරු වදාළහ: **සීලෙ පතිට්ඨාය නරො සපඤ්ඤො චිත්තං පඤ්ඤඤ්ච භාවයං,ආතාපි නිපකො භික්ඛු සො ඉමං විජටයෙ ජටන්ති"**. පිළිසිඳ නුවණ ඇති, කෙළෙස් තවන වෙර ඇති, ප්‍රඥාවන්ත භික්ෂුව, ශිලයෙහි පිහිටා, සමාධිය හා ප්‍රඥාව වඩමින් මේ අවුල නිරවුල් කරගන්නේය. ( A man established on virtue, wise, Developing the mind and wisdom, A bhikkhu ardent and discreet: He can disentangle this tangle). **සටහන්:** * අටුවාවට අනුව:මෙහිදී පෙන්වා ඇත්තේ ශිල සමාධි හා ප්‍රඥා යන ත්‍රිවිධ පුහුණුව ඇති, වීරිය ඇති භික්ෂුවට (සේඛ), සසර අවුල නිරවුල් කරගත හැකිබවය. **උපමාව:** බටගාල කැපීම: බිමසිටගත් මිනිසෙක්, මුවහත් පිහියක් ගෙන, විරිය ඇතිව, පැටලීගිය බටගාල කපා දමන ලෙසින්, සීලය නමැති පොලවේ සිටගෙන, සමාධිය නමැති මුවහත් ගලේ, ප්‍රඥාව නමැති පිහිය හොඳින් මුවහත් කරගත් භික්ෂුවට,වීරියේ බලය ඇතිව තණ්හාව නමැති සසර අවුල මැනවින් කපා සිඳ දැමිය හැකිය. **බලන්න:** ESN: Note: 44, p. 85, උපග්‍රන්ථය:5. ** අවුල නිවරවුල් කරගන්නේ අරහත්වයට පත්විමෙන්ය. **බලන්න:** විසුද්ධිමග්ග: 1 පරිච්ඡේදය, පි.44. **මූලාශ්‍ර:** සංයු.නි: (1 ): දේවතාසංයුත්ත: 1.3.3 ජටා සූත්‍රය, පි. 52,ESN: 1. Devatasamyutta, 23.3 Tangle, p. 84.

▲ **අවුල්සිත-**Muddle-mindedness: අවුල්සිත යනු සිහිය මුලාවිමය, සතිසම්ප්‍රජන්‍ය නැතිවීමය. සිත අවුල්සහගත වූ විට අකුසල සිදුවේ, අයෝනිසෝමනසිකාරය ඇතිවේ ඒ නිසා වැරදි මග සේවනය කරයි, සිත අලසබවට පත්වේ. ආරිය සේවනය හා දහම ඇසීමට කැමති නැතිවීම හා නිතර අනුන්ගේ දොස් දැකීම නිසා සිත අවුල්වේ. එහෙත්, ආරියන් දැකීමට, දහම ඇසීමට කැමැත්ත ඇතිකරගැනිමෙන් හා අනුන්ගේ දොස් දැකීමට ඇති කැමත්ත නැති කරගැනීමෙන් සිතේ අවුල්බව නැතිකර සිහිය යථාබවට පත්කරගැනීමට හැකිවේ.**මූලාශ්‍ර:** අංගු.නි:(6 ): 10 නිපාත:10.2.3.6.තයොධම්ම සූත්‍රය,පි.284, EAN-10: 76-6. Incapable, p. 524.

▲**ආවරණ ධම්ම-** Obstructive Dhamma: ආවරණ ධම්ම යනු පංච නීවරණ යන්ය. ඒවා විමුක්ති මග අවහිර කරයි-ආවරණය කරයි. **බලන්න**: නීවරණ. **මූලාශ්‍ර:**සංයු.නි: ( 5-1): බොජ්ඣංගසංයුත්තය: 2.4.7

ආවරණ සූත්‍රය, පි. 217, ESN:46: Bojhangasamyutta: 37.7 Obstructions , p. 1772.

▲**ඇවත්**: පාලි: **ආපත්ති** -offences: සංඝයා අතින් සිදුවන අයහපත්, වැරදි ක්‍රියා ඇවත් ය. බුදුන් වහන්සේ, ඇවත් දැනීම හා ඇවතින් වෙන්වීම (ආපත්ති කුසලතාවය හා ඉන් නැගී සිටීමේ කුසලතාවය) පිළිබඳව යහපත් ලෙසින් වදාරා ඇත. ඒ දහම සංඝයා එක්ව, දහමේ චිරස්ථිතිය පිණිස සජ්ජායනා කිරීම සුදුසු යයි සැරියුත් මහා තෙරුන් සංඝයාට උපදෙස් දී ඇත. (Skill in [knowing] offences and [the procedure for] rehabilitation from them (*āpatti-kusalatā ca āpatti-vuṭṭhāna-kusalatā ca).* **සටහන:** විස්තර පිණිස **බලන්න:** අංගු.නි: 1 නිපාතය: 12 අනාපත්තිවග්ගය**,**විනය පිටකය. **මූලාශ්‍ර**: දිඝ.නි: (3 ):10 සංගිති සූත්‍රය, පි. 372 හා 11 දසුත්තර සූත්‍රය පි. 483, EDN: 33 Sangīti Sutta: The Chanting Together, p. 362, 34: Dasuttara Sutta: Expanding Decades, p. 384.

▼**විවිධ ඇවත්**: ලුහු ඇවත, ගුරු ඇවත, දුළුල් ඇවත, නොදුළුල් ඇවත, සාවසෙසාපාත්තිය හා අනවසෙසාපාත්තිය (remediable offense and an irremediable offense). **මූලාශ්‍රය**: අංගු.නි: (1) 2 නිපාතය, ආසාවග්ග: 2.3.11.10 සූත්‍ර 3 කි, පි. 208.

**අස**

▲ **අසංඛත**- Unconditioned: අසංඛත යනු හේතු ප්‍රත්‍ය නිසා හට නොගත් බවය. නිවන හඳුන්වන පදයකි. **බලන්න**: නිවන. **මූලාශ්‍රය**: ඛු.නි: ඉතිවුත්තක: 2.2.6 අජාත සූත්‍රය, පි. 393.

▲ **අසංඛත ධාතුව**: පාලි: **අසඞ්ඛත ධාතුයා-** Unconditioned element අසංඛත ධාතුව යනු සකස් නොවූ දහම වූ නිවනය. **බලන්න**: සංඛත **ශබ්දකෝෂ: පා.සිං.ශ:** පි.111: "**අසඞ්ඛත:** ප්‍රත්‍යයයානි විසින් රැස් නොකළ, සංස්කරණය නොකළ, **අසඞ්ඛත ධාතු:** නිර්වාණ ධාතුවය"
**B.D:** p.23: "**Asankhata:** The Unformed, Unoriginated, and Unconditioned is a name for Nirvana, the beyond of all becoming and conditionality".

▼**අසංඛත ධාතුව**, ආධ්‍යාත්මික වර්ධනය පිණිස විශේෂ නුවණින් (ඥාතපරිඥාවෙන්, විශේෂයෙන් දත යුතු), යහපත් ලෙසින්ම අවබෝධ කරගතයුතු, අභිඥෙයිය ධම්මයකි. **බලන්න**: අභිඥෙයිය ධම්ම. **මූලාශ්‍ර:** දීඝ.නි : (3 ): 11 දසුත්තර සූත්‍රය, පි. 483, EDN: 34: Dasuttara Sutta: Expanding Decades, p. 384.

▲**අසංඛත මග-** Unconditioned way: ආධ්‍යාත්මික පංච ඉන්ද්‍රිය මනාව අවබෝධ කිරීම පිණිස ඇති මග අසංඛතමගය -නිවන් මගය. **මූලාශ්‍රය:** සංයු.නි: (4 **):**සළායතනවග්ග: අසංඛත සංයුත්ත: 9.1.8 ඉන්ද්‍රිය සූත්‍රය, පි. 662.

▲ **අසංඛාරපරිනිබබායි -**attainer of nibbāna without exertion මෙය අනාගාමි උතුමන් අරහත්වය ලබා පරිනිබ්බානය ලබන එක්ආකාරයකි. ඔරම්භාගිය සංයෝජන පහකරගත් ආරිය උතුමා මෙලොවින් චුතව, සුද්ධාවාසයේ පහළව, නිරයාසයෙන්ම අරහත්වයට පත්ව පරිනිබ්බානය ලැබීම. එම අවස්තාව අසංඛාරපරිනිබබායි ය. මේ පිළිබඳ දක්වා ඇති **උපමාව- ගිනිපුපුර:** දවස මුළුල්ලේ ගින්නෙන් රත්වුණ

යකඩගුලියක්, තළනවිට, ගිනිපුපුරක් මතුවී, ඉහලට ගොස්, නැවත පොළොවට පහත්වී, දර ස්වල්පයක් හෝ පිදුරු සවල්පයක් ඇති තැනකට වැටී ගිනි ඇවිලී දුම් පිටකරයි. එහෙත්, ඉන්ධන ප්‍රමාණය මද නිසා ගින්න ඉක්මණින් නිවී යයි. ඒ ලෙසින්, ඒ උතුමා අරහත්වය- පරිනිබ්බානය ලබයි.**බලන්න**:උපග්‍රන්ථය:5 **මූලාශ්‍ර:** අංගු.නි: (4 ): 7 නිපාත: 7.2.1.2. පුරිසගතිසූත්‍රය, පි.402, EAN: 7 :55.2 Destinations of Persons, p. 387.

▲**අසනිවක්ක-**The Thunderbolt: අසනිවක්ක (හෙනගැසීම-හෙනසක), විදුලි අකුණ නිසා විනාශ ඇතිවේ. මෙහිදී පෙන්වා ඇත්තේ ලාභසත්කාර ආදියට යටවන පුද්ගලයා, හෙනයකට අසුවූ පුද්ගලයා විනාශ වන ලෙසින් දහම් මගේ විනාශවී යන බවය**.උපමාව:** විදුලි අකුණ, බලන්න: උපග්‍රන්ථය:5 **මූලාශ්‍රය:** සංයු.නි: (2): නිදානවග්ග: ලාභසත්කාරසංයුත්ත: 5.1.6 අසනිවක්ක සූත්‍රය, පි.370.

▲**අසංඛ්‍යෙයිය පුණ්‍ය**- Incalculable merits: අසංඛ්‍යෙයිය යනු ගණන්කිරීමට නොහැකි බවය. අසංඛ්‍යෙයිය පුණ්‍ය ලෙසින් පෙන්වා ඇත්තේ, ආරියශ්‍රාවකයෙක් හට කළහැකි මහා පිං, මහා කුසල්ය. ත්‍රිවිධ රත්නය කෙරේ ඇති අවෙච්චාසහගත ප්‍රසාදය හා ආරිය කාන්ත ශිලය ඇති ආරිය ශ්‍රාවකයාහට ඇති පුණ්‍ය ගණන්කිරීමට නොහැකිය. **බලන්න**: පුණ්‍ය නදී. **සටහන**: මෙහිදී පෙන්වා ඇත්තේ සෝතාපන්න උතුමෙක් සතු අසීමිත පිං සමුහයය. **මූලාශ්‍රය:**සංයු.නි: (5-2) මහාවග්ග: සෝතාපත්ති සංයුත්ත:5:11.5.1 අසංඛ්‍යෙයිය සූත්‍ර 3කි, පි.256.

▲ **අසංඥසත්ත:** පාලි: **අසඤ්ඤසත්ත**-unconscious beings: අසංඥසත්ත යනු සංඥානොමැති- හඳුනාගැනීම් නැති සත්ත්වයන්ය. සංඥා විරහිත වූ සත්ත්වයන්ගේ උත්පත්තිය සිදුවන රූප බ්‍රහ්මලෝකය-බඹලොව, අසංඥසත්තා ලෙසින් හඳුන්වයි. රූපස්කන්ධය පමණක් පහළ වන බැවින් මෙම අසංඥතලය **'ඒක වෝකාර භවය'** ලෙස ද හැඳින්වේ. **බලන්න**: බ්‍රහ්මලෝක. **ශබ්දකෝෂ: පා.සිං.ශ:** පි.112: "**අසඤ්ඤසත්ත:** 11 නි බඹතලය. සංඥා නොමැති... **අසඤ්ඤි:** හැඳිනිම් රහිත". **B.D:** p: 23: "**unconscious beings**: asañña-satta- are a class of heavenly beings in the fine-material world. p.122: only the one corporality group- eka-vokāra-bhava".

▼**මහානිදාන සූත්‍රයේ** විඥානය පිහිටන ආයතන 2 න් එකක් ලෙස අසංඥසත්වායතනය පෙන්වා ඇත. **බලන්න**: විඥානස්ථාන. **මූලාශ්‍ර:** දීඝ:නි: (2 ) 2 මහානිදාන සූත්‍රය: 40-41 ඡෙද, පි. 118, EDN: 15 Mahānidāna Sutta: The Great Discourse on Origination, para. 33, p. 169.

▲**අසංවරය**- non-restrain: කය හා සිත සංවරකර නොගැනීම- අභික්මීම අසංවරය ය. මෙය අකුසලයකි, ත්‍රිවිධ දුශ්චරිතයන්ට හේතුවේ. හිරි ඔතප් නැතිවීම අසංවරයට මූලිකවේ. ඉන්ද්‍රිය සංවරයෙන්, වීරිය ඇතිකර ගැනීමෙන් අසංවරබව නැතිකර ගත හැකිය. **බලන්න**: ඉන්ද්‍රිය සංවරය. **මූලාශ්‍රය:** අංගු.නි: (4) 6 නිපාත: 6.1.10 සූත්‍රය, පි.286.

▼**අශ්‍රද්ධාව**, අවදඤ්ඤුතාවය (un-charitableness) හා කුසීතබව නැතිකර ගැනීමෙන් අසංවරය පහවේ. ආරබ්ධ විරිය ඇති පුද්ගලයාට, අසංවරය නැතිකර ගත හැකිය. **මූලාශ්‍ර**: අංගු.නි: (6) : 10 නිපාතය: 10.2.3.6 තයොධම්ම සූත්‍රය,පි.284, EAN:10: Tens,76-6.Incapable, p. 524.

▲**අසත්‍ය-**Untruth: අසත්‍ය- බොරුකීමය, අකුසලයකි. **බලන්න**:

මුසාවාදා.

▲ **අසේඛ-** one beyond training: සේඛ නොවන්නේ අසේඛය. බ්‍රහ්මචරියාව සපුරාගත් උතුමා අසේඛය; රහතන්වහන්සේ හඳුන්වන නමකි. **බලන්න**: සේඛ හා අසේඛ, රහතන්වහන්සේ. **සටහන:** අසේඛශීලය, අසේඛසමාධිය,අසේඛප්‍රඥාව ඇති මහණ (රහතුන්) දෙව්මිනිසුන් අතර ශ්‍රේෂ්ඨවේ යයි බුදුන් වහන්සේ වදාළහ. **මූලාශ්‍රය:** අංගු.නි: (6) 11 නිපාත: අනුස්සතිවග්ග: මොරනිවාප සූත්‍රය.

▼**අසේඛ යනු**: අසේඛ සම්මා දිට්ඨිය -අසේඛ සම්මාවිමුක්තිය ලබාගත් රහතන්වහන්සේ බව මෙහි පෙන්වා ඇත. **අසේඛ ධම්ම** යනු (දස අසේඛිය ධර්ම): අසේඛ සම්මා දිට්ඨිය -අසේඛ සම්මාවිමුක්තිය ය. **මූලාශ්‍ර:** අංගු.නි: (6) 10 නිපාත:සමණසංඥාවග්ග: 10.3.1.11 හා 10.3.1.12 සූත්‍ර, පි.426.

▼ **අසේඛ විහරනය**: අසේඛ භික්ෂුව සතර සතිපට්ඨානය (සිව් සිවටන්) ඇතිකරගෙන වාසය කලයුතුබව මෙහි පෙන්වා ඇත. **මූලාශ්‍රය**: සංයු.නි: (5-2): මහාවග්ග: අනුරුද්ධසංයුත්ත: 8.1.5 කන්ටකී සූත්‍රය, පි.94.

▲ **අසතිය හා අසම්ප්‍රජන්‍යය:** පාලි:අසතාඅසම්පජඤ්ඤං- lack of mindfulness and clear comprehension: අසතිය යනු සතිය - සිහිය නොමැතිකමය, අමතකවීමය, අසිහියෙන් සිටීමය. අසම්ප්‍රජන්‍යය යනු නුවණ නැතිව කටයුතු කිරීමය, අයෝනිසෝමනසිකාරයෙන් ක්‍රියා කිරීමය.කය පිළිබඳව, ඇතිවන වේදනා ගැන, සිත පිළිබඳව, දහම් කරුණු ගැන අසිහියෙන් කටයුතු කිරීම, සිහිය නොමැතිකමය, සතර සති පට්ඨානයට අනුකූල නොවී වාසය කිරීමය. කය හසුරුවන අන්දම පිළිබඳව සිහිනුවණ නොමැතිව, යහපත් අවබෝධය නොමැතිව සිටීම අසම්ප්‍රජන්‍යයවේ. සතර සතිපට්ඨානය වඩා ගැනීමෙන් මේ අගුණ නැතිකර ගත හැකිවේ**. බලන්න**: සතිසම්ප්‍රජන්‍ය.

▼ **අසම්ප්‍රජන්‍යය යනු** අයෝනිසෝමනසිකාරය නිසා අනුවණ ලෙසින් කටයුතු කිරීමය. සම්ප්‍රජන්‍යය වැඩීමෙන්, අසම්ප්‍රජන්‍යය ප්‍රහීණකර ගත හැකිය. **බලන්න**: සම්ප්‍රජන්‍යය **මූලාශ්‍රය:** අංගු.නි: (4) 6 නිපාත: 6.1.8 සූත්‍රය, පි.284.

▼**අසතිය හා අසම්ප්‍රජන්‍යය** ඇතිවීමට මූලිකවන්නේ අයෝනිසෝ මනසිකාරයෙන් කටයුතු කිරීම නිසාය. අසතිය හා අසම්ප්‍රජන්‍යය නිසා ඉන්ද්‍රිය අසංවරය ඇතිවේ. **මූලාශ්‍ර**: අංගු.නි: (6 ):10 නිපාත:යමක වග්ග: 10.2.2.1.අවිද්‍යා සූත්‍රය,පි.232, EAN:10: II Pairs: 61.1.Ignorance, p. 517.

▼ **බුදුන් වහන්සේ** අසතිය හා අසම්ප්‍රජන්‍යය පිළිබඳව යහපත් ලෙසින් වදාරා ඇත. ඒ දහම සංඝයා එක්ව, දහමේ චිරස්ථිතිය පිණිස සජ්ජායනා කිරීම සුදුසු යයි සැරියුත් මහා තෙරුන් සංඝයාට උපදෙස් දී ඇත. **මූලාශ්‍ර**: දිඝ.නි: (3 ):10 සංගිති සූත්‍රය, පි. 372 , EDN: 33 Saṅgīti Sutta: The Chanting Together, p. 362.

▼**අසම්ප්‍රජන්‍යය ඇතිවිට** අයෝනිසෝමනසිකාරය ඇතිවේ, එසේම මිථ්‍යාදිට්ඨිය ඇතුළු දස අංග සේවනය කිරීමට නැඹුරුවේ. සිතේ අලසබව ඇතිවේ. අසම්ප්‍රජන්‍යය ඇතිවීමට බලපාන්නේ ආරියසේවනය හා දහම ඇසීමට ඇති අකමැත්ත (අරතිය) හා විවේචනය කිරීමට ඇති කැමත්ත ( **උපාරම්භ චිත්ත)** ආදී කරුණු නිසාය. මේ කරුණු පහකර ගන්නේ නම් අසම්ප්‍රජන්‍යය නැතිකර සම්ප්‍රජන්‍යය ඇතිකර ගත හැකිවේ. **මූලාශ්‍ර:**

අංගු.නි:(6 )10 නිපාත:10.2.3.6.තයොධම්ම සූත්‍රය,පි.284, EAN-10: 76-6. Incapable, p. 524.

▲**අසපත්තං-**Without hate: අසපත්තං යනු සතුරු නොවීම, එදිරි නොවීමය. මෛත්‍රිය වැඩීම පිණිස සිත තරහ නොමැතිවිය යුතුවේ: **"මෙත්තං ච සබ්බ ලොකස්මිං- මානසං භාවයෙ අපරිමාණං- උද්ධං අධො ච තිරියං ච- අසම්බාධං අවෙරං අසපත්තං" බලන්න**: මෙත්තා සූත්‍රය.
▲**අසමය හා සමය**-Asamaya Samaya : අසමය ලෙසින් මෙහි පෙන්වා ඇත්තේ නුසුදුසු කාලයය. සමය යනු සුදුසු කාලයය. ප්‍රධන් විරිය කරන පුද්ගලයාට අසමය වන්නේ: වයසට යාම (ජරාව), ලෙඩ ඇතිවීම (ව්‍යාධිය), පිඩු සිඟා යෑමට සුකර නොවීම, ජනයා අතර අසමගිය හා සොරබිය, සංඝභේදය. ප්‍රධන් විරිය පිණිස - සමය පිණිස අවශ්‍ය කරුණු: තරුණබව, අල්පාබාධ, පිඬුසිඟා යැමට මනා පරිසරය තිබීම, ජනයා අතර සමගිය, සංඝයා අතර සමගිය. **මූලාශ්‍රය:** අංගු.නි: (3) 5 නිපාත: 5.2.1.4 අසමය සමය සූත්‍රය, පි.126.

▲**අසමාහිත හා සමාහිත**- Inferior disposition & Superior disposition අසමාහිත ලෙසින් මෙහි පෙන්වා ඇත්තේ පහත් හීන ගති ඇතිබවය. සමාහිත යනු උසස්, යහපත් ගති ඇතිබවය. අසමාහිත ගති ඇති පුද්ගලයෝ එවැනි හීන පුද්ගලයන්ම ඇසුරු කරති. සමාහිත පුද්ගලයෝ, තමන් වැනි උතුම් පුද්ගලයන්ම ඇසුරු කරති. **සටහන**: සමාහිත: බුදුන් වහන්සේ හඳුන්වන නාම පදයකි. **මූලාශ්‍රය:** සංයු.නි: (2) නිදානවග්ග: ධාතුසංයුත්ත:කම්මපථවග්ග: 2.3.1 අසමාහිත සූත්‍රය, පි.280.
▲**අසම්බාධං**- Without barriers අසම්බාධං- බාධා නොමැතිව. මෛත්‍රිය වැඩීම පිණිස සිත බාධා නොමැතිවිය යුතුවේ. එනම්, අකුසල නොමැති සිත.
**"මෙත්තං ච සබ්බ ලොකස්මිං- මානසං භාවයෙ අපරිමාණං- උද්ධං අධො ච තිරියං ච- අසම්බාධං..." බලන්න**: මෙත්තා සූත්‍රය.
▲**අසත්පුරුෂයා**- Asathpurisa: අසත්පුරුෂයා ලෙසින් මෙහි පෙන්වා ඇත්තේ මිථ්‍යාදිට්ඨිය ඇතුළු දස අංග අනුගමනය කරන පුද්ගලයාය. **බලන්න**: සත්පුරුෂයා. **මූලාශ්‍රය**:සංයු.නි: (5-1) මහාවග්ග: මග්ගසංයුත්ත: 1.3.5 අසප්පුරිස සූත්‍ර 2කි, පි.60.
▼**අසත්පුරුෂයා ගේ ලක්ෂන**: ඔහු අනුන්ගේ අගුණ ප්‍රචාරකරති, අනුන්ගේ ගුණ නොකියයි, තමාගේ අගුණ සඟවාගනී, තමාගේ ගුණ ප්‍රචාර කරති. **මූලාශ්‍රය:** අංගු.නි: (2) 4 නිපාත:4.2.3.3. අස්ප්පුරිස වධුකා සූත්‍රය, පි.166.
▲**අසත්පුරුෂ දාන**- Asathpurisa dana: සකස් නොකර, ගරුසරු නොමැතිව දෙන අයහපත් දානය අසත්පුරිසදානයය. **බලන්න**: දාන. **මූලාශ්‍රය:**අංගු.නි: (3) 5 නිපාත:තිකන්ඩකවග්ග:5.3.5.7 අසත්පුරිසදාන,පි.300.
▲**අසත්පුරුෂ ධම්ම-**Asathpurisa Dhamma: අසත් පුරුෂ ධම්ම- අසප්පුරිස ධම්ම යනු මිථ්‍යාදිට්ඨිය ආදී දස අංගවලට නැඹුරුවිමය.. **බලන්න**: සත් පුරුෂ ධර්මය.
▲ **අසත්පුරුෂ භූමිය හා සත්පුරුෂ භූමිය:** පාලි: **අසප්පුරිසභූමි, සප්පුරිසභූමි-** plane of the bad person & plane of the good person. අසත්පුරුෂ භූමිය ලෙසින් බුදුන් වහන්සේ පෙන්වා ඇත්තේ, අකෘතඥබව හා අකෘතවේදි බවය. සත්පුරුෂ භූමිය නම් කෘතඥබව හා කෘතවේදි

බවය. (A bad person is ungrateful and unthankful, A good person is grateful and thankful) .**බලන්න**: සත්පුරුෂ හා අසත්පුරුෂ, කෘතඥබව හා අකෘතඥබව. **මූලාශ්‍ර**: අංගු.නි: ( 1): 2 නිපාත: සමචිත්තවග්ග: 2.1.4.1 සූත්‍රය, පි.157, EAN: 2: 32.11 Sutta, p.61.

▲ **අස්සුත**-Uninstructed: අස්සුත ලෙසින් පෙන්වා ඇත්තේ දහම නොඇසූබවය. අස්සුත පෘතග්ජන යනු දහම නොඇසූ සාමාන්‍ය ලෝකයාය. අසත්පුරුෂ ලෙසින්ද හඳුන්වයි.මෙහිදී පෙන්වා ඇත්තේ, කයේ ඇතිවන විවිධ වෙනස්කම් දකින (හටගැනීම, පිරිහීයාම ආදී) සාමන්‍ය ලෝකයා, ඒ ගැන උකටලීව කයෙන් නිදහස්වීමට කැමැත්ත ඇතිබවය. එහෙත්, සිත (මනස, විඥානය) පිළිබඳ කළකිරීමට ඔහුට කැමැත්තක් නැත. එයට හේතුව මමය මගේය යයි සිත අල්වාගෙන ඇතිනිසාය. **මූලාශ්‍රය:** සංයු.නි: (2): නිදානවග්ග: අභිසමයසංයුත්ත :මහාවග්ග:අස්සුතවන්තු සූත්‍ර 2කි, පි.170.

▲ **අසද්ධම්ම**-Not Dhamma: එනම් අසත්‍යවූ දහම අනුගමනය කිරීමය. සද්ධර්මය අනුගමනය නොකිරීමය. මෙහිදී අසද්ධම්ම 7ක් පෙන්වා ඇත: 1) අශ්‍රද්ධාව 2-3) හිරි ඔතප්ප නැතිබව 4)අල්පශ්‍රැතබව 5) කුසිතබව 6) අසිහිය (නටසිහිය) 7) ප්‍රඥානැතිබව- දුෂ්ප්‍රඥා. **මූලාශ්‍රය**: අංගු.නි: (4) 7 නිපාත:සමණවග්ග:7.2.4.9 අසද්ධර්ම සූත්‍රය, පි.512.

▲**අසන්තුෂ්ටිය**- No-contentment: අසන්තුෂ්ටිය යනු ලදදෙයින් සෑහීමට පත්නොවීමය. සංසයා සිව්පසයෙන් සැහිමට පත්නොවන්නේනම් එය දහම් මගේ දියුණුවට බාධාවකි. මෙහිදී පෙන්වා ඇත්තේ අසන්තුෂ්ටිය ප්‍රහීණ කර ගැනීමට සන්තුෂ්ටිය වැඩිය යුතුබවය. **බලන්න**: සන්තුෂ්ටිය. **මූලාශ්‍රය:** අංගු.නි: (4) 6 නිපාත: 6.1.8 සූත්‍රය, පි.284.

▲ **අසිත තවුසා-**Asita Thawusa**:** බෝධිසත්වයන් උපත ලැබූ අවස්ථවේ, උන්වහන්සේ දැකීමට පැමිණි මේ තවුසා, බෝසතුන්, ඒකාන්තයෙන්ම අනුත්තර වනබව ප්‍රකාශ කළහ. අසිත කාලදේව ලෙසින්ද මෙතුමා හඳුන්වා ඇත. විස්තර පිණිස **බලන්න**: ඛු.නි: සුත්තනිපාත: මහාවග්ග: 3-11 නාලක සූත්‍රය, පි.232.

▲**අස්තිසුඛය-**Joy of ownership: අස්තිසුඛය, යනු තමන්ට හිමි සම්පත්- ලෞකික සම්පත්නිසා ගිහියන්ට ඇතිවන සතුට- ප්‍රීතියය. **බලන්න**: ගිහිසුඛ.

▲ **අස්මිමානය**: පාලි: **අස්මිමානො**- Ego-conceit- the conceit 'I am' අස්මිමාන යනු මම වෙමි යන මානය, අහංකාරයය, මෙය සංයෝජනයකි, අරහත්වයට පත්වීමෙන් පසු ප්‍රහීණවේ . **බලන්න:** සංයෝජන, මාන. **ශබ්දකෝෂ**: **B.D**: p. 24: "**Asmi-Māna**: 'I am -conceit'- may range from the coarsest pride & self-assertion to a subtle feeling of one's distinctiveness or superiority that persists as the 8th Fetter until the attainment of Arhatship…"

▼**ආධ්‍යාත්මික වර්ධනය** පිණිස අස්මිමානය පහකරගතයුතුය. **බලන්න**:පහාතබ්බා ධර්ම. **මූලාශ්‍ර:** .නි : (3 ): 11 දසුත්තර සූත්‍රය, පි. 483, EDN: 34: Dasuttara Sutta: Expanding Decades, p. 384.

▼**කායගතා සතිය** වඩා ගැනීමෙන් විපුල කරගැනීමෙන් අස්මිමානය පහවේ යයි බුදුන් වහන්සේ වදාළහ. **බලන්න**: කායගතාසතියේ ප්‍රතිලාභ. **මූලාශ්‍ර:** අංගු.නි: (11 නිපාත: කායගතාසති වග්ග, පි. 125, EAN:1: Mindfulness Directed to the Body, p.52.

▲ **අස්වැසිල්ල:** පාලි: **අස්සාස**- consolation: අස්වැසිල්ල -සැනසිල්ල

යනු දහමට පිළිපන් පුද්ගලයා (සේඛ), එස්ස ආයතන 6 පිලිබඳ යථාබව අවබෝධ කරගැනීමය. එම අස්වැසිල්ල ලබාදෙන මග ආරියඅටමගය. **උතුම් අස්වැසිල්ල** (supreme consolation) යනු ස්පර්-ශ ආයතන 6 ගැන අවබෝධය ලබා උපාදාන රහිතව විමුක්තිය ලැබීමය- අරහත්මගඵල ලැබීමය. **සටහන: අස්සාසප්පත්තො:** එම මගට පිළිපන්පුද්ගලයා උතුම් පුද්ගලයාය සේඛය. **බලන්න**: ESN: note: 273, p. 1560. **මූලාශ්‍ර:** සංයු.නි: (4) සළායතන වග්ග: ජම්බුඛාදක සංයුත්ත: 4.1.5 අස්සාස සූත්‍රය හා 4.1.6 පරමස්සාය සූත්‍රය, පි. 504 , ESN: Salayatanasamyutta: IV: 38 Jambukhādaka -saṃyutta: 5 Consolation & Supreme Consolation , p. 1400.

▲**අස්සජි (පස්වග මහණ) තෙර**- Assaji (Pasvaga) Thera: **බලන්න**: උප ග්‍රන්ථය: 1

▲**අස්සජි භික්ෂුව (කිටාගිරිය)** – Bhikkhu Assaji (Kitagiri):**බලන්න**: උප ග්‍රන්ථය:4

▲**අස්සලායන බ්‍රාහමණමානවක-**Assalāyana brahmin student: **බලන්න**: උප ග්‍රන්ථය:3

▲ **අස්සාරෝහගාමිණී** - Assāroha the Cavalry Warrior:**බලන්න**: උප ග්‍රන්ථය:3

▲**අසස්සත**- not eternal: අසස්සත(ආශාශ්වත) යනු සදාකාලික නොවන බව-නිත්‍ය නොවන බවය. ලෝකය නිත්‍ය නොවේ යයි දරන දිට්ඨිය මින් හඟවයි. මෙය බුදුන් වහන්සේ වැඩසිටි සමයේ අන්‍ය ආගමිකයන් අතර පවැති දිට්ඨි 10න එකකි. මෙයට විරුද්ධ මතය, ශාශ්වත දිට්ඨිය ය. **බලන්න**: දිට්ඨි. **මූලාශ්‍රය**: සංයු.නි: (3) ඛන්ධවග්ග:දිට්ඨිසංයුත්ත: 3.1.10 අසස්සත සූත්‍රය, පි.432.

▲**අසාමන්ත ප්‍රඥාව**: පාලි: **අසාමන්තපඤ්ඤා-** unsurpassed wisdom කිසිවෙකුට මේ ප්‍රඥාව වෙනස් කිරීමට (ඉක්මවා යාමට) නොහැකි ස්වභාවය- අනුත්තර බව ඇති නිසා අසාමන්ත ප්‍රඥාව යයි හඳුන්වයි. **බලන්න**: ප්‍රඥාව.

▼**අසාමන්ත ප්‍රඥාව සම්පූර්ණවීම**: රූපයෙහි, වේදනාවේ, සංඥාවේ, සංඛාරයේ, විඥානයේ (පංච උපාදානස්කන්ධ යේ), ඇසේ හා ජරාව හා මරණයේ පටිනිස්සග්ගානු පස්සනාව වැඩීමෙන් නැවත නැවත එහි යෙදීමෙන් අසාමන්ත ප්‍රඥාව පූර්ණවේ. **"පටිනිස්සග්ගානුපස්සනා …රූපෙ… වේදනාය… සඤ්ඤාය … සඞ්ඛාරෙසු… විඤ්ඤාණෙ …චක්ඛුස්මිං… ජරාමරණෙ පටිනිස්සග්ගානුපස්සනා භාවිතා බහුලීකතා අසාමන්තපඤ්ඤං පරිපූරෙති". අසාමන්ත ප්‍රඥාව යනු කුමක්ද?** සිව්පිළිසිඹියා පිලිබඳ අධිගම කරනලද, ප්‍රත්‍යක්ෂකරන ලද ප්‍රඥාවෙන් දකිනලද අවබෝධය, වෙනත් කෙනෙකුට වෙනස් කලනොහැකිය.එය අසාමන්ත ප්‍රඥාව වේ. **මූලාශ්‍රය**: ඛු.නි: පටිසම්භිදා 2: ප්‍රඥාවග්ග: 3.1 ප්‍රඥා කථා, පි. 166-178.

▼**සතර ධර්මය (සෝතාපන්න අංග) ඇති පුද්ගලයාට** - සෝතාපන්න ආරියාට අසාමන්ත ප්‍රඥාව ඇතිවේ. එනම්: 1) සත්පුරුෂ සේවනය 2) සද්ධර්ම ශ්‍රවණය 3) යෝනිසෝ මනසිකාරය 4) ධර්මයට අනුකූලව පිළිපැදීම -ධර්මානුධර්ම ප්‍රතිපදාව. **"…ඉමෙ ඛො භික්ඛවෙ, චත්තාරො ධම්මා භාවිතා බහුලීකතා අසාමන්තපඤ්ඤාතාය සංවත්තනතිති"** (these four things, when developed and cultivated lead to the unsurpassed wisdom). **බලන්න**: සතර ධර්මය. **මූලාශ්‍ර**: සංයු.නි: (5-2): මහාවග්ග:

සෝතාපන්න සංයුත්ත:11.7.4 අසාමන්ත ප්‍රඥා සූත්‍රය, පි. 280, ESN: 55: Sotapatthisamyutta: Greatness of Wisdom, p. 2261

▼**කායගතා සතිය වැඩීමෙන්,** විපුල කරගැනීමෙන් අසාමන්ත ප්‍රඥාව ඇතිවේ (Mindfulness directed to the body...when developed and cultivated, leads to the unsurpassed wisdom ). **මූලාශ්‍ර:** අංගු.නි: (1): 1 නිපාත: **කායගතාසති වග්ග**, පි. 125 EAN:1: Mindfulness Directed to the Body, p.52 .

▼**වෙනත් මුලාශ්‍ර: 1.** වෙනත් කෙනෙක් විසින් යටපත් කිරීමට නොහැකි පුද්ගලයා ' අසාමන්ත' ය. ඔහුට ඇති නුවණ **අසාමන්තපඤ්ඤා** ය. අර්‍ථධර්‍ම නිරුක්ති ප්‍රතිභාණාදි ධර්‍මයන් දත් හෙයින් ඔහුව වෙනත් කෙනෙකුට මැඩලන්නට නො හැකිය"
https://pitaka.lk/dhammapada/ss/katha-28.html

▲ **ආසයඅනුසය ඤාණය**-Asaya anusaya nana: ආසයඅනුසය ඤාණය, තථාගතයන් සතු නුවණකි. **බලන්න**: තථාගත දසබල. **සටහන:** පටිසම්භිදාවේ මෙසේ දක්වා ඇත: "...තථාගතයන් තෙමේ සත්වයන්ගේ ආසය (සන්තානය- ඔවුන් තුල ඇති විවිධ දිට්ඨි ආදිය) දැනගනී, අනුසය ( සිත තුල ඇති කාම රාග ආදීවූ සප්ත අනුසය) දැනගැනී, පෙර කම්ම ආදීවූ චරිතය (පින්ඇතිබව, නැතිබව ආදී) දැනගැනී, අධිමුක්තිය- ඔවුන් තුල ඇත්තේ හීන අදහස්ද, උසස්-ප්‍රණීත අදහස්ද ආදීවූ දැනගැනී...". **බලන්න**: අනුසය. **මූලාශ්‍රය:**ඛු.නි:පටිසම්භිදා 1:ඤාණකථා: 69 ආශයානුශය ඥානය, පි.252.

▲ **ආස්වාදය, ආදීනවය, නිස්සරණය**-gratification, danger, escape දහම් කරුණු පිළිබඳව ඇති ආස්වාදය, ඒවායේ ආදීනවය හා ඒවායෙන් මිදීම- නිස්සරණය පිළිබඳ යහපත් අවබෝධය ලැබීම ආධ්‍යාත්මික වැඩීමට උපකාරවේ. ආස්වාදය යනු කාමවස්තූන් පිළිබඳ ඇති රාගය ය, එම වස්තූන් ලෝකදහමට අනුව වෙනස්වීම් වලට -විපරිනාමයට ලක්වීම නිසා ඇතිවන දුක ආදිනවයය, ඒවා පිළිබඳ නියම ස්වභාවය, අවබෝධකරගැනීම නිස්සරණය ය- සසරින් නිදහස්වීමය. සියලු දහම් පිළිබඳව මේ ක්‍රමයට බැලීමෙන් ප්‍රඥාව ඇතිකර ගත හැකිවේ.

▼**පංච උපාදානස්කන්ධය පිළිබඳ** ආස්වාදය, ආදීනවය හා නිස්සරණය 1) **රූපය-කය** නිසා කෙනෙකුට යම් සුවයක් සොම්නසක් ඇතිවන්නේ නම් එය රූපයේ ආස්වාදයය. 2) රූපයේ වෙනස්වීම, විපරිනාමය නිසා කෙනෙකුට ඇතිවන දුක දොම්නස රූපයේ ආදීනවය ය. 3) රූපය කෙරේ ඇතිවූ ආසාව, රාගය (ධර්ම අවබෝධයෙන්- යථාබව දැකීමෙන්) නැතිවී පහවී ගියේ නම් එය රූපයේ නිස්සරණය ය. (එලෙස සෙසු ස්කන්ධ: වේදනාව, සංඥාව, සංඛාර හා විඥානය පිළිබඳව බැලිය යුතුවේ) 4) ඇසින් දකින රූප, කණින් අසන ශබ්ද, නාසයෙන් විඳින සුවඳ, දිවෙන් විඳින රස, කයෙන් විඳින පහස හා සිතින් සිතන සිතුවිලි පිළිබඳව කෙනෙකුට ඇතිවන සතුට, සොම්නස සයඉන්ද්‍රිය නිසා ඇතිවන ආස්වාදයය. 5) එම ආස්වාදය වෙනස්වීම, නැතිවීම නිසා ඇතිවන දුක සයඉන්ද්‍රිය නිසා ඇතිවන ආදිනවය ය. 6) සය ඉන්ද්‍රිය නිසා ඇතිවූ රාගය, ඇල්ම නැතිවී පහවී ගියේ නම් එය සයඉන්ද්‍රියේ නිස්සරණය ය. යම් දිනක සත්ත්වයෝ පංචඋපාදානස්කන්ධය, සය ඉන්ද්‍රියයන් පිළිබඳව යථාබව (අනිත්‍ය, දුක, අනාත්ම) අවබෝධකරගත්විට, ඒවාට නො ඇලීමෙන් විමුක්තිය ලබති. **සටහන: *** උපාදානස්කන්ධ පහේ හා ඉන්ද්‍රිය සයේ ආස්වාදයක් නොමැතිනම් සත්ත්වයෝ ඒවාට නො ඇලේ, ඒවායේ වෙනස්වීමක් ඇති නිසා (අනිත්‍යබව) සත්ත්වයෝ ඒවා ගැන කලකිරේ,

ඒවායෙන් මිදීමට ක්‍රමයක් ඇතිනිසා සත්ත්‍වයෝ ඉන් මිදේ. **පංච උපාදානස්කන්ධය හා ආධ්‍යාත්මික ආයතන 6 පිළිබඳ යථාභූත ඥානය පහළවීමෙන් තමන්වහන්සේට ඥානදස්සනය පහළවී විමුක්තිය සාක්ෂාත්වූබව බුදුන් වහන්සේ මේ සූත්‍රවල දී පෙන්වා වදාළහ. **මූලාශ්‍ර:** සංයු.නි: (3): ඛන්ධසංයුත්ත**: අස්සාද සූත්‍ර** 1, 2, 3, පි. 78, ESN:22: Khandasamyutta: Gratification 1,2,3, p. 1022, සංයු.නි (4) සළායතන වග්ග: නො වෙ අසසාද සූත්‍ර 2, පි.46, ESN: 35: Salāyatanasamyutta: Sutta: 17.5, 18.6, p.1223.

▼**ආස්වාදය ආදීනවය** හා නිස්සරණය අවබෝධය සම්බෝධිය ලැබීමය. අභ්‍යන්තර සයඉන්ද්‍රියයන් හා බාහිර ආයතන සය පිලිබඳ ආස්වාදය ආදීනවය හා නිස්සරණය තතුලෙසි න් අවබෝධ කරගැනීම සම්බෝධිය ලැබීමට පදනම්වූ බව බුදුන් වහන්සේ පෙන්වාඇත. **සටහන:** සංයු.නි: ඛන්ධසංයුත්ත:**භාරවග්ග සූත්‍ර**: බෝසතුන් මේ කරුණු පිලිබඳ ආවර්ජනය කිරීම විස්තරාත්මකව පෙන්වා ඇත. **මූලාශ්‍ර:** සංයු.නි: (4 ): සළායතන වගග: සූත්‍ර 1.2.1, 1.2.2, 1.2.3,1.2.4, පි. 40, ESN: 35: Salāyatana samyutta: Suttas: 13.1, 14.2, 15.3, 16.4, p. 1222.

▼**අභ්‍යන්තර ආයතන 6 හා බාහිර ආයතන 6 පිළිබඳ** ආස්වාදය දුක ඇතිකරයි මේ ආයතන 12 පිළිබඳව කෙනෙක් සතුටුවන්නේ (අභිනන්දනය) නම්, ඒවා තමාගේ යයි පිළිගන්නේනම් හෙතෙම දුක ඇතිකර ගනී යයි බුදුන් වහන්සේ වදාළහ. එහෙත් නුවණින් එම ආයතන පිළිබඳව යථා අවබෝධය ලබාගන්නා පුද්ගලයා දුකින් මිදුනකෙනෙකි. **මූලාශ්‍ර:** සංයු.නි: (4 ): සළායතන වගග: අභිනන්ද සූත්‍ර 2 , පි.52, ESN: 35: Salāyatanasamyutta: Suttas 2 :19.7 & 20.8, p. 1224.

▲**ආසිවිෂෝපම පුද්ගලයෝ** - Persons with venom :ආසිවිෂම යනු පොළොගා වැනි විසකුරු සර්-පයන්ය. එවැනි විෂ සහිත පුද්ගලයෝ මේ ලෝකයේ සිටිති: 1) එක් පුද්ගලයෙක් නිතරම තරහගනී, එහෙත්, ඒ තරහ ඉක්මනින්ම නැතිවී යයි. 2) එක් පුද්ගලයෙක් නිතර තරහ නොගනී, එහෙත්, තරහ ගත්විට එය බොහෝ කාලයක් පවතී. 3) එක් පුද්ගලයෙක් නිතරම තරහගනී, ඔහුගේ තරහ බොහෝ කාලයක් පවතී 4) එක් පුද්ගලයෙක් තරහ ගන්නේ බොහෝ කලාතුරකිනි, ඔහුගේ තරහ ඉක්මනින්ම නැතිවී යයි. **සටහන:** සංයු.නි**: වේදනා සංයුත්තයේදී**, බුදුන් වහන්සේ, කය සකස්වී ඇති සතර මහා ධාතුව විසකුරු පොළොගුන් 4 දෙනක් ලෙසින් පෙන්වා ඇත. **උපමාව:** විසකුරු පොළෝගුන්: උපග්‍රන්ථය: 5 **මූලාශ්‍ර:** අංගු.නි: ( 2 ): 4 නිපාත:4.3.1.10. ආසිවිස සූත්‍රය, පි. 238, EAN:4: 110.10 Vipers, p. 188, සංයු.නි: (4): වේදනාසංයුත්ත: 19 ආසිවිසවග්ග: 1 ආසිවිසෝපම සූත්‍රය, පි. 365, ESN: Vedana samyutta: IV: 238.1 The simile of the vipers, p. 1314.

▲ **ආස්‍රව හා ආස්‍රව ක්‍ෂය කිරීම**: පාලි: **ආසව, ආසවක්කය**-taints (corruptions) & The destruction of the taints:ආස්‍රව **(**ආශ්‍රව-ආසව) යනු සිත කෙළෙසන කරුණුය. ආස්‍රව 4කි: කාම ආස්‍රව, භව ආස්‍රව, දිට්ඨි ආස්‍රව හා අවිද්‍යා ආස්‍රව.**ආස්‍රව ක්‍ෂයකිරීම (**ආසවක්කය) යනු සියලු උපාදාන වලින් මිදීමය. **ඛීණාසව**: සියලු ආසව යන්ගෙන් මිදුන උතුමා, රහතන්වහන්සේ හඳුන්වන නාම පදයකි. සූත්‍ර දේශනා වල බොහෝ තැන්හි දී ආසව 3 ක් පෙන්වා ඇත: කාම, භව, අවිද්‍යා, සමහර අවස්ථාවල දිට්ඨි ආසව සිව් වැන්න ලෙසින් ද පෙන්වා ඇත. **ශබ්දකෝෂ: පා.සිං.ශ**: පි. 145: "**ආසව**: කාම ආස්‍රව, භව ආස්‍රව, දෘෂ්ටි ආස්‍රව හා

අවිද්‍යා ආස්‍රව යන සතරය: **ආසවක්ඛය:** ආස්‍රව ක්‍ෂය කිරීම, නිවන", පි.267: **ඛීණාසව:** කෂීණාශ්‍රව, රහත්" **B.D:** p.53: **"āsava:** influxes, cankers, taints, corruptions, intoxicant biases…list of 4: canker of sense desire, desiring eternal existence, wrong views & ignorance … **āsavakkhaya:** the destruction of cankers through clinging no more… Khīṇāsava: One whose is canker free…"

▼**ආසව ක්‍ෂයකර,** ස්වයංඅභිඥාව ඇතිව, චේතෝ විමුක්තිය හා ප්‍රඥාවිමුක්තිය ලබා සසරින් එතරව, උතුම් බිමේ ස්ථිරව නැගී සිටින බ්‍රාහ්මණ ලෙසින්ද, ඛීණාසව රහතුන්, ලෙසින්ද බුදුන් වහන්සේ හඳුන්වා ඇත. **"…පුග්ගලො තිණ්ණො පාරගතො ථලෙ තිට්ඨති බ්‍රාහ්මණො"** ( with the destruction of the taints, some person has realized for himself with direct knowledge, in this very life, the taintless liberation of mind, liberation by wisdom, and having entered upon it, he dwells in it. This is called the person who has crossed over and gone beyond, the brahmin who stands on high ground) **මූලාශ්‍ර:** අංගු.නි: ( 2 ): 4 නිපාත: 4.1.1.5 අනුසෝත සූත්‍රය, පි. 34 ,EAN:4: 5.5 Along with the Stream, p. 148.

▼ **ආස්‍රව ක්‍ෂය කිරීමේ නුවණ:** මේ නුවණ පහළවන්නේ අරහත්වයට පත්වෙන අවස්ථාවේදිය. මෙය ත්‍රිවිධ ඥාණ යන්ගෙන් එකකි, සය අභිඥාවන්ගෙන් එකකි . ආසවක්ඛය- අපණ්ණක පටිපදාව ලෙසින් ද බුදුන් වහන්සේ පෙන්වා ඇත.**බලන්න:** ත්‍රිවිධ ඥාණ, අපණ්ණක ධර්මය හා පටිපදාව. ආසව ක්‍ෂය කිරීමේ නුවණ සච්ඡිකාතබ්බ ධම්ම- සාක්ෂාත් කර ගත යුතු දහමකි. **මූලාශ්‍ර:** දීඝ.නි : (3 ): **11** දසුත්තර සූත්‍රය, පි. 483, EDN: 34: Dasuttara Sutta: Expanding Decades, p. 384.

▼**ආසවක්‍ෂය** නුවණ: තුන් ඉන්ද්‍රිය වශීකර ගැනීමෙන ලබන ප්‍රඥාව ආසවක්‍ෂය නුවණය. **මූලාශ්‍ර**: ඛු.නි: පටිසම්භිදා 1: ඥානකතා: 55: ආසවක්‍ෂය ඥානය**,** පි. 240.

▼ **සසර ගමන දික්කරන ආස්‍රව:** කාම ආස්‍රව, භව ආස්‍රව, අවිද්‍යා ආස්‍රව (taint of sensuality, the taint of existence, the taint of ignorance). **මූලාශ්‍ර**: දිඝ.නි: (3 ): 10 සංගිති සූත්‍රය- ඡෙදය 10, පි. 380, EDN: 33 Sangīti Sutta: The Chanting Together- section 10, p. 366.

▼ **රාගවිනය** දෝසවිනය මෝහවිනය (රාගය දෝසය හා මෝහය නැතිකර ගැනීම) යනු නිවන් ධාතුවය. **ආසවක්ඛය** - ආස්‍රව ක්‍ෂය කරගැනීම පිළිබඳව එසේ කතා කරනු ලැබේ ය යි බුදුන් වහන්සේ වදාළහ: **"…නිබ්බානධාතුයා ඛො එතං, අධිවචනං රාගවිනයො දොස විනයො මොහවිනයොති. ආසවානං ඛයො තෙන වුච්චතීති…"** **සටහන:** අටුවාවට අනුව: රාග ආදීවූ කෙළෙස් පහකර ගැනීම- ආසවක්ඛය, අසංඛත වූ , අමතවූ නිබ්බාන ධාතුව හඳුන්වන ආකාරයකි. සියලු කෙළෙස් විනාශ කිරීම අරහත්වය ලැබීමය. **බලන්න**: ESN: Note: 15, p. 2390. **මූලාශ්‍ර**: සංයු.නි: (5-1):මග්ගසංයුත්ත: 1.1.7 දුතිය භික්ෂු සූත්‍රය,පි.40, ESN: 45: Magga samyutta: Connected discourses on the Path: 6 .6 A certain bhikkhu-2, p. 1610.

▼**ආස්‍රව ඇතිවීමට හේතුව** (ප්‍රත්‍ය) පහසය. එය පිරිසිඳ (පරිඤෙය්‍ය ධම්ම) දැන ගත යුතු දහමකි. **බලන්න**: ස්පර්ශය, පරිඤෙය්‍ය ධම්ම. **මූලාශ්‍ර:** දීඝ.නි : (3 ): 11 දසුත්තර සූත්‍රය, පි. 483, EDN: 34: Dasuttara Sutta: Expanding Decades, p. 384.

▼**ආධ්‍යාත්මික පංචඉන්ද්‍රිය** යහපත් ලෙස වඩාගැනීමෙන්, පරිපූර්-ණ කරගැනීමෙන් ආසව ක්‍ෂය කර ගත් භික්ෂුව, චිත්ත විමුක්තිය, ප්‍රඥා විමුක්තිය, තමන් විසින් පසක් කර මේ ජීවිතයේදීම නිවන ලබා වාසය කරන බව බුදුන් වහන්සේ පෙන්වා ඇත. **මූලාශ්‍ර:** සංයු.නි : (5-1): මහාවග්ග: ඉන්ද්‍රිය සංයුත්තය: 4.2.10. ආසවක්ඛය සූත්‍රය, පි. 390, ESN: 48: Indriya samyutta: 20.10, Destruction of the Taints,p, 1946.

▼**ආස්‍රව නැතිකිරිමේ ප්‍රතිපදාව-**Method of destruction of the taints ආස්‍රව නැතිකිරීම හෙවත් **ආසවක්කය** පිණිස කරුණු 10ක් නිතර භාවිතා කරමින් දියුණු කරගත යුතුයයි බුදුන් වහන්සේ වදාළහ: **"...දසඉමෙ භික්කවෙ ධම්මා භාවිතා බහුලිකතා ආසවානං ඛයාය සංවත්තතනති..."** එනම්, සම්මා දිට්ඨිය මුල්කරගත් අංග 10 කින් යුක්ත නිවරදි මග සාක්ෂාත් කරගැනීමය. **මූලාශ්‍ර:** අංගු.නි: (6 ): 10 නිපාතය: 10.3.2.10 ආසවක්ඛය සූත්‍රය, පි.458, EAN:10: 121.10 Taints , p. 547.

▼ **ආස්‍රව කෙරෙහි නිබ්ද්දාව ඇතිකරගැනීම**: ඒ සඳහා ඇති පිළිවෙත 6 ආකාරය: 1) **ආස්‍රව දත යුතුය-** taints should be understood**:** ආස්‍රව 3කි: කාම ආස්‍රව, භවආස්‍රව, අවිද්‍යාආස්‍රව. 2) **ආස්‍රවයන්හි නිදාන සම්භවය (උත්පත්ති කරුණ) දත යුතුය** (the source and origin of taints should be understood) නිදාන සම්භවය අවිද්‍යාවය. 3**) ආස්‍රවයන්හි විවිධත්වය** (වෙමත්තතාව) දත යුතුය (the diversity of taints be understood) නිරයගාමිණි ආස්‍රව, තිරිසන්යෝනි ගාමිණි ආස්‍රව, ප්‍රේතවිෂයගාමිණි ආස්‍රව මනුෂ්‍යලෝක ගාමිණිආස්‍රව, දේවලෝකගාමිණි ආස්‍රව. 4) **ආස්‍රවයන්හි විපාකය දත යුතුය** (the result of taints should be understood) අවිද්‍යාගත සත්වයා, එමගින් හටගන්නා පුණ්‍ය භාගිය හෝ අපුණ්‍ය භාගිය හෝ ආත්මභාවයක් ලබයි. (One immersed in ignorance produces a corresponding individual existence, which may be the consequence either of merit or demerit). 5) **ආස්‍රවයන්හි නිරෝධය දත යුතුය** (the cessation of taints should be understood) අවිද්‍යාවේ නිරෝධය, **ආස්‍රව** නිරෝධයය. 6) **ආස්‍රවනිරෝධගාමිණි ප්‍රතිපදාව දත යුතුය දත යුතුය** (the way leading to the cessation of taints should be understood) එනම්, ආරියඅටමගය. මේ කරුණු 6 යහපත් ලෙසින් දන්නා ආරිය ශ්‍රාවකයා, නිබ්බෙදික බ්‍රහ්මචරියාවවු ආස්‍රවනිරෝධය දන්නේය. **මූලාශ්‍ර**: අංගු.නි: (4) 6 නිපාත: 6.2.1.9 නිබ්බේධිකසූත්‍රය,පි.220,EAN:6: 63.9 Penetrative,p.355.

▼ **ත්‍රිවිධ ආස්‍රව** (කාම, භව, අවිද්‍යා) මැනවින් අවබෝධ කර ගැනීමට, ඒවා ප්‍රහීණය කරගැනීමට ආරිය අටමග යහපත් ලෙසින් අවබෝධ කරගත යුතුවේ. **මූලාශ්‍ර**: සංයු.නි: (5-1): මග්ගසංයුත්ත: 1.13 ආසව සූත්‍රය, පි.154, ESN: Magga samyutta: 163.3 Taints, p. 1708, සංයු.නි: (4 ): සළායතන වග්ග: ජම්බුඛාදක සංයුත්ත: 4.1.8 **ආසව සූත්‍රය,** පි. 506 , ESN: Salatatanasamyutta: IV: 38 Jambukhādaka saṃyutta: 8 Taints, p. 1403.

▼**සිව්ජාන සමාපත්ති ලැබීම ආසව ක්‍ෂය කරගැනීම පිණිසවේ**: සිව්ජාන සමාපත්ති ලබා සිත පිරිසුදු වූවිට, නිමල වූවිට, මුදුවූ විට ආස්‍රව පහ කරගැනීම පිණිස නුවණ ඇතිවේ. එනම්: චතුසත්‍ය සහමුලින්ම අවබෝධ වීමය : මේ දුකය, මේ දුක ඇතිවීමය, මේ දුක නැති කරගැනීමය, මේ දුක නැති කරගැනීමේ මගය. එමගින් **ආසවක්කය** සිදුවේ ය යි බුදුන් වහන්සේ පෙන්වා ඇත. **මූලාශ්‍ර**: ම.නි: (2): 2.1.1 කන්දරක සූත්‍රය පි. 18, EMN: 51:

Kandaraka Sutta, p. 425

▼ **ආශ්‍රව ක්‍ෂය කිරීමෙන් ලැබෙන බල-**Powers that gains from destructing taints: එක් සමයක බුදුන්වහන්සේ, ආශ්‍රව ක්‍ෂය කරගැනීමෙන් භික්ෂුවකට ඇති බල පිළිබඳව සැරියුත් මහා තෙරුන් විමසුහ: **"...කති නි බො සාරිපුත්ත ඛීණාසවස්ස භික්ඛු නො බලානි, යෙහි බලෙහි සමන්නාගතො ඛීණාසවො භික්ඛු ආසවානං ඛයං පටිජානාති 'ඛීණා මේ ආසවා ති'"** "සාරිපුත්‍රයෙනි, යම් බලයන්ගෙන් සමන්වාගත ක්ෂිණාශ්‍රව මහණ : ' මගේ ආශ්‍රවයෝ නැතිවි ය' යි ආශ්‍රව යන්ගේ ක්‍ෂය වීම ගැන හිමිකම් පවසන්නේ නම් ඔහුට ඇති බල කුමක්ද?' සැරියුත් තෙරුන් වහන්සේ, ආශ්‍රව ක්‍ෂයකළ භික්‍ෂුවකට බල 10 ක් ඇත (අසේඛබල) යයි මෙසේ පෙන්වා ඇත: 1) ඒ මහණ හට, සියලු සංස්කාර ධම්ම අනිත්‍යබව, ඇති සැටියෙන්, සම්මා ප්‍රඥාවෙන් යහපත් ලෙසින් දැකිමේ හැකියාව ඇත: **"... ඛිණාසවස්ස භික්ඛුනො අනිච්චතො සබ්බෙ සඞ්ඛාරා යථාභූතං සම්මාප්පඤ්ඤාය සුදිට්ඨා හොන්ති..."** 2 ) ඒ මහණහට කාම ආශ්‍රවයන්, ගිණිඅඟුරු වලක් මෙන් දුක් ඇති කරන බව, ඇති සැටියෙන්, සම්මා ප්‍රඥාවෙන් යහපතේ ලෙසින් දැකිමේ හැකියාව ඇත: **"...ඛිණාසවස්ස භික්ඛුනො අඞ්ගාරකාසූපමා කාමා යථාභූතං සම්මාප්පඤ්ඤාය සුදිට්ඨා හොන්ති..."..."** 3) ඒ මහණ, නිරන්තරයෙන්ම විවේක සුවය ප්‍රිය කරයි, විවේකයට නැඹුරුවේ, නෙක්කම්ම සුවයට කැමතිවේ. ඔහු සියලු කෙළෙස් අහවර කොට ඇත: **"...ඛිණාසවස්ස භික්ඛුනො විවෙකනින්නං චිත්තං හොති විවෙකපබ්භාරං ව්වකට්ඨං නෙක්කම්මාභිරතං ව්‍යන්තීභූතං සබ්බසො ආසවට්ඨානීයෙහි ධම්මෙහි..."** 4) ඒ මහණහට මැනවින් සතර සතිපට්ඨානය පිහිටුවා ගැනීමේ හැකියාව ඇත: **"...ඛිණාසවස්ස භික්ඛුනො චත්තාරො සතිපට්ඨානා භාවිතා හොන්ති සුභාවිතා..."**. 5) ඒ මහණහට,මැනවින් සතර සම්‍යක් ප්‍රධාන විරිය පිහිටුවා ගැනීමේ හැකියාව ඇත: **"...ඛිණාසවස්ස භික්ඛුනො චත්තාරො සම්මප්පධානා භාවිතා හොන්ති සුභාවිතා..."** 6) ඒ මහණහට, මැනවින් සතර ඉද්දිපාද පිහිටුවා ගැනීමේ හැකියාව ඇත: **"...ඛිණාසවස්ස භික්ඛුනො චත්තාරො ඉද්ධිපාදා භාවිතා හොන්ති සුභාවිතා..."** 7) ඒ මහණ හට, මැනවින් පංච ඉන්ද්‍රිය ධම්ම පිහිටුවා ගැනීමේ හැකියාව ඇත: **"...ඛිණාසවස්ස භික්ඛුනො පඤ්චින්ද්‍රියානි භාවිතා හොන්ති සුභාවිතා..."** 8) ඒ මහණහට, මැනවින් පංචබල ධම්ම පිහිටුවා ගැනීමේ හැකියාව ඇත: **"...ඛිණාසවස්ස භික්ඛුනො පඤ්චබලානි භාවිතා හොන්ති සුභාවිතා..."** 9) ඒ මහණහට, මැනවින් සප්ත බොජ්ඣංග ධම්ම පිහිටුවා ගැනීමේ හැකියාව ඇත: **"...ඛිණාසවස්ස භික්ඛුනො සත්ත බොජ්ඣඞ්ගා භාවිතා හොන්ති සුභාවිතා..."** 10) ඒ මහණහට, මැනවින් ආරිය අටමග පිහිටුවා ගැනීමේ හැකියාව ඇත: **"...ඛිණාසවස්ස භික්ඛුනො අරියො අට්ඨඞ්ගිකො මග්ගො භාවිතා හොන්ති සුභාවිතා..."** මූලාශ්‍ර: අංගු.නි: (6 ): 10 නිපාත: 10.2.4.10. ඛිණාස්‍රවබල සූත්‍රය,පි.331, EAN:10: 90.10. Powers, p. 531.

▼**ආශ්‍රව සංවර කරගැනීම -**restraint of all the taints: ආශ්‍රව සංවර කරගැනීමේ ක්‍රමය**: සබ්බාසව සංවරපරියාය** ලෙසින් බුදුන් වහන්සේ පෙන්වා ඇත. යෝනිසෝමනසිකාරය හා අයෝනිසෝමනසිකාරය, නුවණින් දකිනා පුද්ගලයාට ආශ්‍රව පහකර ගත හැකිය: කෙනෙක් අයෝනිසෝමනසිකාරයෙන් කටයුතු කරනවිට ඇති නොවූ ආශ්‍රව ඇති වේ, ඇතිවී ඇති ආශ්‍රව වැඩේ. යෝනිසෝ මනසිකාරයෙන් කටයුතු

කරනවිට ඇති නොවූ ආස්‍රව ඇති නොවේ, ඇතිවී ඇති ආස්‍රව පහවේ. **ආස්‍රව සංවර කරගැනීමේ ක්‍රමවේදය:** 1) දැකීමෙන් 2) සංවරවීමෙන් 3) භාවිතා කිරීමෙන් 4) ඉවසාදරා ගැනීමෙන් 5) වැළකීමෙන් 6) අස්කර දැමීමෙන් 7) දියණු කර ගැනීමෙන්. **"...අත්ථි භික්ඛවෙ ආසාවා දස්සනා පහාතබ්බා, අත්ථි ආසාවා සංවරා පහාතබ්බා, අත්ථි ආසාවා පටිසෙවනා පහාතබ්බා, අත්ථි ආසාවා අධිවාසනා පහාතබ්බා, අත්ථි ආසාවා පරිවජ්ජනා පහාතබ්බා අත්ථි ආසාවා විනොදනා පහාතබ්බා, අත්ථි ආසාවා භාවනා පහාතබ්බා".** 1) නුවණින් **දැකීමෙන් ආස්‍රව පහකර ගැනීම**: යෝනිසෝමනසිකාරයෙන් කටයුතු කිරීම. එමගින් ආස්‍රව ඇතිවන දේ ගැන අවධානය නොකර සිටීමෙන් නූපන් ආස්‍රව ඇති නොවේ උපන් ආස්‍රව නැතිවේ. **සටහන:** දැකීම-දස්සන ලෙසින් පෙන්වා ඇත්තේ සෝතාපන්න මග නුවණ ඇතිව පහ කලයුතු දේ පහකර ගැනීම හා වඩා ගත යුතු දේ වඩා ගැනීමට නුවණ තිබීමය. 2) **සංවරවීමෙන් ආස්‍රව පහකර ගැනීම:** නුවණින් යුතුව සය ඉන්ද්‍රිය සංවර කර ගැනීම මගින්, කෙළෙස්, සන්තාපය ආදී අයහපත ඇති කරන දේ වලකා ගැනීමට හැකිවේ. 3) **භාවිතා කිරීමෙන් ආස්‍රව පහකර ගැනීම:** (සේවනය කිරීම, පරිහරණය): නුවණින් සලකා සිව්පස (four requisites) භාවිතා කිරීමෙන් කෙළෙස්, සන්තාපය ආදී අයහපත ඇති කරන දේ වලකා ගැනීමට හැකිවේ. 4) **ඉවසාදරා ගැනීමෙන් ආස්‍රව පහකර ගැනීම:** නුවණින් සලකා අහිතකර දේශගුණ, මැසි මදුරු ආදී සතුන්ගෙන් වෙන උවදුරු, අනුන්ගේ කටුක, පරුෂ වචන, දරුණු කායික වේදනා ඉවසා ගැනීමෙන් කෙළෙස්, සන්තාපය ආදී අයහපත ඇති කරන දේ වලකා ගැනීමට හැකිවේ. 5) **වැළකීමෙන්** (දුරු කිරීමෙන්) **ආස්‍රව පහකර ගැනීම:** නුවණින් සලකා පීඩා කරදර ඇති කරන දේ, දහම් ජීවිතයට බාධා පමුණුවන දේ (චණ්ඩ සතුන් සර්-ප, නුසුදුසු ස්ථාන, පාප මිත්‍රයන් ආදී) වලකා ගැනීමෙන් කෙළෙස්, සන්තාපය ආදී අයහපත ඇති කරන දේ වලකා ගැනීමට හැකිවේ. **6) අස්කර දැමීමෙන්** (ඉවත දැමීමෙන්) **ආස්‍රව පහකර ගැනීම:** නුවණින් සලකමින් සිතේ යම් අකුසල සිතක් ඇතිවේ නම් (උපන් කාම , ව්‍යාපාද, හිංසා ආදීවූ ලාමක අකුසල) ඒවා වහා ඉවත දමයි, බැහැර කරයි, නැවත පැන නො නැගීමට කටයුතු කරයි. එලෙස කටයුතු කිරීමෙන් කෙළෙස්, සන්තාපය ආදී අයහපත ඇති කරන දේ වලකා ගැනීමට හැකිවේ. 7) **දියණු කර ගැනීමෙන්** (වඩා ගැනීමෙන්- භාවනාවෙන්) **ආස්‍රව පහකර ගැනීම:** නුවණින් සලකමින් විවේකය...විරාගය... නිරෝධය ඇසුරු කළ නිවනට නැඹුරුවූ සප්තබොජ්ඣංග දහම දියුණු කරගනී. බොජ්ඣංග දියුණුවීම නිසා කෙළෙස්, සන්තාපය ආදී අයහපත ඇති කරන දේ වලකා ගැනීමට හැකිවේ. **සටහන:** අටුවාවට අනුව ආසව විධි 5 කින් සංවර කළ හැකිය: ශීලය, සතිය, අවබෝධය-ඥානය,වීරිය හා ඉවසීම (virtue, mindfulness, knowledge, energy, and patience. **බලන්න**: EMN: note: 32, p. 1065 **මූලාශ්‍ර:** ම.නි: (1): 1.1.2 **සබ්බ ආසව සූත්‍රය**, පි. 38, EMN:2 Sabbāsava Sutta- All the Taints, p. 73

▼ **ආරිය ශ්‍රාවකයා** හට, ආස්‍රව පිළිබඳව මනා අවබෝධය ඇතිවීම මගින් ඔහු සම්මා දිට්ඨියට පැමිණේ. අවිද්‍යාව ඇතිවීම, ආස්‍රව ඇතිවීමට හේතුවේ. අවිද්‍යාව පහවූ විට ආස්‍රව පහවේ. ආස්‍රව නැතිකරගැනීමේ මග ආරිය අට මගය. **සටහන:** අවිද්‍යාව නිසා ආස්‍රව ඇතිවේ, එසේම, අවිද්‍යා ආස්‍රවය නිසා අවිද්‍යාව ලෝකයේ පවතී. මේ පිළිබඳව අටුවාව දක්වා ඇත්තේ: යම්කිසි භවයක ඇති අවිද්‍යාව- මෝහය පැවතීමට පෙර භවයක

පැවති අවිද්‍යාව බලපායි. මෙහිදී සිහිපත් කරගත යුත්තේ අවිද්‍යාව ආරම්බවූ පළමු ස්ථානයක් දැකිය නොහැකි බවය, සංසාරයේ මුල් පටන් ගැනීම අවබෝධ කල නොහැකි බවය **බලන්න**: EMN: note: 132, p. 1076. **මූලාශ්‍ර**: ම.නි: (1 ): 1.1.9 සම්මා දිට්ඨි සූත්‍රය, පි. 130, EMN: 9: Sammādiṭṭhi Sutta- Right View, p. 121.

▼ **ආශ්‍රව වැඩිවීම හා පහවීම: ආශ්‍රව වැඩිවවන අන්දම:** 1) පසුතැවිලි වීමට (කුක්කුසය) නුසුදුසු කරුණු ගැන පසුතැවිලිවිම හා පසුතැවිලිවිමට සුදුසු කරුණු ගැන පසුතැවිලි නොවීම 2) තමන්ට නොකැප දෙය කැපයයි ගැනීම, තමන්ට කැප දෙය නොකැපයයි ගැනීම 3) අනාපත්තිය ( නිවැරදි දේ) ගැන ආපත්ති (වැරදි) සංඥා ඇතිවීම, ආපත්තිය ගැන අනාපත්ති සංඥා ඇතිවීම 4) අධම්මය, ධම්මය සේ ගැනීම, ධම්මය අධම්මය ලෙසින් ගැනීම.5) අවිනය, විනයය සේ ගැනීම, විනය අවිනය සේ ගැනීම. **ආශ්‍රව පහවන අන්දම:** ඉහතකී ආකාර 5 ගැන නුවණින් සලකා ඒ අනුව කටයුතු නොකරන පුද්ගලයාගේ ආශ්‍රව නොවැඩේ. **බලන්න**: බාලයා හා පණ්ඩිතයා **මූලාශ්‍රය:** අංගු.නි: (1) 2 නිපාත: බාලවග්ග: සූත්‍ර, පි.200.

▼ **අතිරේක සූත්‍ර:** සංයු.නි: (5-1) මහාවග්ග: බොජ්ඣංගසංයුත්ත:2.3.6 බයසූත්‍රය, පි.204.

▲**ආසෙවිතබ්බ ධම්ම හා නසෙවිතබ්බ ධම්ම-** Dhamma to be pursued & Dhamma not to be pursued: ආසෙවිතබ්බ ධම්ම- සෙවිය යුතු දහම - නොනවත්වාම කරගෙන යායුතු කුසල ලෙසින් මෙහි පෙන්වා ඇත්තේ සම්මා දිට්ටිය සහිත දස ධම්මයය. නසෙවිතබ්බ ධම්ම- නොසෙවිය යුතු දහම නම් මිථ්‍යාදිට්ඨිය ඇති වැරදි මගය. **මූලාශ්‍ර**: අංගු.නි: (6 ):10 නිපාත: අරියවග්ග: 10.3.5.6. ආසෙවිතබ්බ සූත්‍රය,පි. 476.

▼ **ආසෙවීතබ්බ ධම්ම** (කරගෙන යායුතු- එළවා ගතයුතු දහම) නම් දස කුසලයේ යෙදීමය. අනාසෙවීතබ්බ ධම්ම**-** එළවා නොගතයුතු - නොකළ යුතු දහම නම් දස අකුසලයේ යෙදීමය. **මූලාශ්‍ර**: අංගු.නි: (6): 10 නිපාතය: 10.4.4.6 ආසෙවීතබ්බ ධම්ම සූත්‍රය, පි. 540, EAN: 10: 194, p. 556.

▲ **අසිපත් ගස් නිරය**-Hell of Sword trees: බියකරු කම්ම විපාක එල දෙන තැනකි. කඩු වැනි කොල නිසා අත් පා ආදිය කැපී මහා දුක් වේදනා ඇතිකරන දුගතියකි. **බලන්න**: නිරය.

▲**අසිඛන්ධකපුත්ත ගාමිණි-**Asikhandhakaputta Gamini: **බලන්න**: උපග්‍රන්ථය:3

▲ **අසිලෝම ප්‍රේත-** Asiloma: අසිලෝම යනු කඩුමෙන් මුවහත්- උල් ලෝම ඇතිබවය. මෙහිදී පෙන්වා ඇත්තේ අයහපත් කම්ම විපාක නිසා එවැනි උල් ඇති ලෝමසහිත ප්‍රේතයෙක් ගැනය. **බලන්න**: ප්‍රේත.**මූලාශ්‍රය**: සංයු.නි: (2) නිදානවග්ග: ලක්ඛණසංයුත්ත: 7.1.5 අසිලෝම සූත්‍රය, පි.416.

▲**අසිසක කවන්ධ ප්‍රේත**-Headless bodyඅසිසක කවන්ධ (අසිසකංකබනධං) ලෙසින් මෙහි පෙන්වා ඇත්තේ හිස නැති කයක් පමණක් ඇති ප්‍රේතයෙක්, කම්ම විපාක අනුව දුක් විඳින අන්දමය. **බලන්න**: ප්‍රේත. **මූලාශ්‍රය**: සංයු.නි: (2)නිදානවග්ග: ලක්ඛණසංයුත්ත: 7.2.6 අසිසක කවන්ධ සූත්‍රය, පි.421.

▲ **අසුභ නිමිත්ත-** the mark of the repulsive- the mark of the unattractive: සිතේ පිළිකුල ඇතිකරණ කරුණු, අසුභ නිමිත්ත ලෙසින් පෙන්වා ඇත: පංචස්කන්ධයේ ඇති පිළිකුල් ස්වභාවය, දිරායන ස්වභාවය, ලෙඩ රෝග සැදෙනබව, මරණයට පත්වීම, මළමිනිය දිරායන

ආකාර මේවා අසුභ නිමිතිවේ. මේ පිලිබඳ භාවනාව පිළිකුල් භාවනාවය. **සටහන**: අසුභ සංඥාව ලෙසින් ගිරිමානන්ද සූත්‍රයේ පෙන්වා ඇත්තේ කයේ කොටස් 31-32 ක පිළිබඳව මෙනෙහි කිරීමය. **බලන්න**: භාවනාව, සතරසති පට්ඨානය. **ශබ්දකෝෂ: පා.සි.ශ**: පි.114: "**අසුභ:** සුභනොවන, අයහපත්". **B.D**: p. 56: "**asubha**: impurity, loathsomeness, foulness, cemetery contemplation…" **P.T.S**: p. 220: "**asubha:** impure, unpleasant, bad, ugly, nasty- on term and the asubha-meditation, as well as on the 10 asubhas or offensive object).

▼**කාමච්ඡන්දය පහකර ගැනීමට** අසුභනිමිත්ත, යෝනිසෝ මනසිකාරයෙන් මෙනෙහි කිරීම තරම් වෙන එකම දහමක් බුදුනුවණින් නොදකිනබව පෙන්වා ඇත. අසුභ නිමිත්ත, කාමච්ඡන්දයට අනාහාරයය. **මූලාශ්‍ර:** අංගු.නි: (1): 1 නිපාත: 1.2.6 නීවරණ ප්‍රහාණ වග්ග, පි. 46, EAN:1: Abandoning the hindrances, p.36, සංයු.නි: (5-1):බොජ්ඣංග සංයුත්ත: 2.6.1 ආහාර සූත්‍රය, පි. 230, ESN:46: Bojjhaṅga saṃyutta: 51.1 Nutriment, p.1788.

▲ **අසුභ භාවනාව-** Meditation on Foulness of the body: අසුභ භාවනාව යනු කය සකස්වී ඇති අන්දම (කොටස් 31-32 ), හා එහි ඇති අසුභ බව- පිළිකුල්සහගත බව මෙනෙහිකර (පිළිකුල් භාවනාව) සිත සමාධියට පත් කර ගැනීමය. **බලන්න**: භාවනාව.

▼**අසුභානුපස්සි භාවනාව:** කයෙහි අශුභය දක්නා කෙනාගේ කාමරාග අනුසය ප්‍රහීණය වන බව බුදුන් වහන්සේ වදාළහ. එමගින් අරහත්වය ලබාගනී. **සටහන**: අසුභභාවනාව වඩා, නිරෝධය නොලැබූ, එහෙත්, කය ගැන මහා පිළිකුලට පත් බොහෝ සංඝයා සිය දිවි නැතිකිරීම ගැන විස්තර මෙහි දක්වා ඇත. එමනිසා සංඝයාහට ප්‍රණීත අරමුණක් ලෙසින් ගෙන ආනාපානසතිය වැඩිමට බුදුන් වහන්සේ උපදෙස් වදාළහ. **බලන්න**: සංයු.නි: (5-2) ආනාපානසතිසංයුත්ත:10.1.9 අසුභ සූත්‍රය, පි.128. **මූලාශ්‍රය**:ඛු.නි:ඉතිවුත්තක:3.4.6 අශුභානුදර්ශි සූත්‍රය, පි. 453.

▲ **අසුභ සංඥාව**: පාලි: **අසුභසඤ්ඤා-** perception of unattractiveness අසුභ සංඥාව ලෙසින් පෙන්වා ඇත්තේ කයේ- රූපයේ ඇති අසුභ බව- පිළිකුල්සහගත බව දැකීමය. මේ සංඥාව වඩා ගැනීම, නිවන සාක්ෂාත් කරගැනීමට උපකාරීවේ. **ගිරිමානන්ද සූත්‍රයේ** මේ සංඥාව විස්තරාත්මකව පෙන්වා ඇත. **බලන්න**: දස සංඥා, අසුභ නිමිත්ත.

▼ **අසුභ සංඥාව** වඩා ගැනීම මහත් පහසු විහරණය පිණිස පවතී. **මූලාශ්‍රය:** සංයු.නි: (5-1) මහාවග්ග: බොජ්ඣංගසංයුත්ත: නිරෝධවග්ග:2.8 අසුභසංඥා සූත්‍ර, පි.273.

▲ **අසුර-** asura: පාපකම්ම විපාක නිසා අසුර නිකායේ යළි උපත ලබන සත්ත්වයෝ අසුරයන්ය. ඔවුන් දෙවියන්ට විරුද්ධව ක්‍රියා කරති. මෙය දුගතියකි. **සටහන්:** *ධජග්ග **සූත්‍රයේ** දෙවියන් හා අසුරයන් (සුර අසුර සටන) අතර ඇතිවූ සටනක් ගැන දක්වා ඇත. ** **වේපචිත්ති අසුර රජු**, සක්දෙව් ඇතුළු දේවසේනාවට පැරදී, තව්තිසාවේ, සුධම්මා නම් දේව සභාවට සිරකරුවෙක් මෙන් ගෙන ඒමේ විස්තර මේ සූත්‍රයේ විස්තර කර ඇත. **බලන්න**: සංයු:සළායතනවග්ග:වේදනාසංයුත්ත: ආසිවිසවග්ග: 1.19.11 යවකලාපි සූත්‍රය. ** **අංගු.නි: (8): 8.1.2.9** පහාරාද සූත්‍රයේ: පහාරද අසුර රජු, බුදුන් වහන්සේ බැහැදැකීමට පැමිණීම විස්තරකර ඇත. අසුරයන්ගේ වාසස්ථානය මහා සාගරය බව එහි දක්වා ඇත. ** මෙහිදී අසුර වැනි අයහපත් ගුණ ඇති, අයහපත් පිරිස සේවනය කරන

පුද්ගලයන් පිලිබඳ විස්තර පෙන්වා ඇත. **බලන්න**:අංගු.නි: (2) 4 නිපාත: අසුරවග්ග:4.2.5.1 අසුර සූත්‍රය, පි.196. **ශබ්දකෝෂ: පා.සි.ශ**: පි.114 : "**අසුර:** සුරනොවන දෙවියන්ට විරුද්ධ අය අසුරය; ඔවුන් වසන ස්ථානය අසුරභවනය (කුලාවක ජාතකයට අනුව අසුරවාසස්ථානය මහමෙර පත්ලේ පිහිටා ඇත) ; අසුරකාය යනු අසුරයෝනිය, එනම් අපාය; අසුරින්ද: අසුරයන්ගේ අධිපතිය". **B.D**: p. 56: "**asura**: demons, titans, evil ghosts, inhabiting of the lower worlds" **P.T.S**: p. 220: "**a fallen angel**, a Titan; ... They are classed with other similar inferior deities, e. g. with garuḷā, nāgā, yakkha… Rebirth as an Asura is considered as one of the four unhappy rebirths or evil fates after death …" **සටහන:** සංයු.නි: සක්කසංයුත්තයේ, අසුරයන් ගැන විස්තර දක්වා ඇත.

▼**තව්තිසා දෙවියන් අසුරයන් පිරිහීම ගැන සතුටුවීම**:තව්තිසා දේවලෝකයට අලුතින් පැමිණෙන දෙවියෝ වර්ණ යෙන් යසසින් ... බබලන බවත්, එයට හේතුව මිනිස්ලෝකයේ සිටි කාලයේ ඔවුන් බුදුන් වහන්සේ වෙත බඹසර ජීවිතයක් ගතකල නිසායයි සතුටට පත් දෙවියෝ මෙසේ පැවසූහ: **' ප්‍රීතියකි, දෙව්පිරිස් පිරේ, අසුර පිරිස් පිරිහේ'** **මූලාශ්‍ර**:දීඝ.නි: (2 ) 5**. ජනවසභ සූත්‍රය**,10 ඡේදය, පි,332, EDN:18 Janavasabha Sutta, section 12, p. 210.

▼**නිහින පුද්ගලයන් අසුර යෝනියේ පහළවේ**: කොරක්ඛත්තිය නම් නිරුවත් තවුසා- (බලුව්‍රතය-බල්ලෙක් ලෙසින් වාසය කල) මියයෑමෙන් පසු කාලකඤ්ජ නම් අසුර නිකායේ උපත ලැබූබව බුදුන් වහන්සේ වදාළහ. **මූලාශ්‍ර**: දීඝ.නි: (3 **): පාථික සූත්‍රය,** 8 ඡේදය, පි. 26 , EDN: 24 Pāṭika Sutta, section 1.7, p. 287.

▼**බුදුන් වහන්සේ ලොව පහළවීම අසුරයන්ගේ පිරිහීමට හේතුවේ** බුදුන් වහන්සේ බැහැදැක සක්දෙවිඳු මෙසේ පැවසූහ: '...යම් කලෙක අරහත් සම්‍යක්සම්බුද්ධ තථාගත කෙනෙක් ලොව උපදින්නෝය, ඒ කල දෙව් මුළුව පිරේ, අසුර මුළුව පිරිහේ...යන මේ කරුණ මාවිසින් සියැසින්ම දක්නා ලද්දේය' **මූලාශ්‍ර**: දීඝ.නි:(2 ): සක්කපඤ්හ සූත්‍රය- ඡේදය 9, පි. 422 EDN: 21: Sakkapanha Sutta- Sakka's questions, section 1.11, p. 237.

▲**අසුරින්දක භාරද්වාජ** තෙර-Asurindika bhradvaja Thera: **බලන්න**: උපග්‍රන්ථය:1

**අශ**

▲ **අශ්වයන් බඳු පුද්ගලයෝ-**People who are similar to horses **බලන්න**: උපග්‍රන්ථය:5 **1**. **අශ්වයන් ගේ ස්වභාවය ඇති** පුද්ගලයන් තිදෙනකු ගැන මෙහි පෙන්වා ඇත: 1) එක් අශ්වයෙක් වර්ණ සම්පන්න නොවේ (යහපත් රූපය නැත) හෝ ආරෝහපරිණාහ සම්පන්න නොවේ, එහෙත්, ඌ ජවසම්පන්නය (වේගය ඇත). කිසියම් මහණකට චතු සත්‍ය අවබෝධය තිබේ එමනිසා ඔහු ජවසම්පන්නය. එහෙත්, දහම පිලිබඳ විමසුවිට ඔහු පැටලේ, නිසි උත්තරය සැපයිමට නොහැකිය. එනිසා වර්ණ සම්පන්න නොවේ, ඔහුට සිව්පසය මානව නොලැබේ, එනිසා, ආරෝහ පරිණාහ සම්පන්න නොවේ. එය හරියට ආරෝහපරිණාහබව නැතිකම වගේය.2) තවත් අශ්වයෙක් වර්ණ සම්පන්නය, ජවසම්පන්නය, එහෙත්

ආරෝහපරිණාහ සම්පන්න නොවේ. යම් මහණක් ගෙන් දහම පිලිබඳ විමසුවිට ඔහු යහපත් ලෙසින් දහම් කතාකරයි එනිසා වර්ණ සම්පන්නය, චතුසත්‍ය දන්නා නිසා ඔහු ජව සම්පන්නය, එහෙත්, ඔහුට සිව්පසය මානව නොලැබේ: ආරෝහපරිණාහ සම්පන්න නොවේ. 3) තවත් අශ්වයෙක්, වර්ණ සම්පන්නය, ජවසම්පන්නය, හා ආරෝහපරිණාහ සම්පන්න යන 3 ම ඇත. එලෙස මහණහට, චතුසත්‍ය අවබෝධය ඇත, යහපත් ලෙසින් දහම කතා කල හැකිය, සිව් පසය මානව ලැබේ. **බලන්න:** උපග්‍රන්ථය:5 **මූලාශ්‍රය:** අංගු.නි (1) :3 නිපාත: යෝධජීවවග්ග: 3.3.4.8 සූත්‍රය, පි.556. **2. කැලෑඅශ්වයන්** (නුපුහුණු-වල්) බඳු පුද්ගලයන් 3 ක් ගැන මෙහි විස්තර කර ඇත. **මූලාශ්‍රය:** අංගු.නි (5) :9 නිපාත:9.1.3.2 බලුන්කොපම සූත්‍රය, පි.462. **3. හොඳ අශ්වයන් බඳු පුද්ගලයෝ තිදෙනා** හොඳ අශ්වයන් (සදශ්වයන්) බඳු යහපත් ගුණ ඇති පුද්ගලයන් (සදෘශ) තිදෙනකු ගැන බුදුන් වහන්සේ පෙන්වා ඇත. ඉහත 3.3.4.8 සූත්‍රයේ දක්වා ඇති අශ්වයන් තිදෙනාට සමාන ලක්ෂණ ඇත. හොඳ අශ්වයන් බඳු මහණුන් තිදෙනාගේ ගුණයන්හි වෙනස්කම් ඇත: 1) මහණහට ජවය (ඥානජවය) ඇත: පංච ඕරම්භාගිය සංයෝජන පහකර ඔපපාතික ව බඹලොව පිරිනිවීම සිදුවේ. එහෙත්, වර්ණය හා ආරෝහපරිණාහ සම්පන්න බව නැත. 2) මහණහට ඥාන ජවය හා වර්-ණ (දහම මැනවින් ප්‍රකාශ කිරීම) ඇත. සිව්පසය යහපත් ලෙසින් නොලැබේ. 3) මහණ හට සම්පත් 3 ම ඇත. **සටහන: හොඳ** අශ්වයන් බඳු සංඝයා ගැන මෙහි විස්තර කර ඇත. **බලන්න**: අංගු.නි (5) :9 නිපාත:9.1.3.2 බලුන්කොපම සූත්‍රය, පි.462. **මූලාශ්‍රය:** අංගු.නි (1) :3 නිපාත: යෝධජීවවග්ග: 3.3.4.9 සූත්‍රය, පි.556. **4 භද්‍ර අජානිය අශ්වයා බඳු භද්‍ර අජානිය පුද්ගලයා-** Person who is similar to an excellent thoroughbred horse භද්‍ර අජානිය අශ්වයාට ජවය, වර්-ණ හා ආරෝහපරිණාහ සම්පන්නය ඇත, එලෙස භද්‍ර අජානිය මහණ ජව සම්පන්නය: ඥාන ජවය ඇතිව ආශ්‍රව පහකිරීමේ නුවණ ලබා විමුක්තියට පත්ව ඇත, දහම යහපත් ලෙසින් කථා කලහැකිය, ඔහුට සිව්පසය මනාව ලැබේ.වර්-ණ සම්පන්නය, ආරෝහපරිණාහ සම්පන්නය. **අජානිය** අශ්වයන් බඳු පුද්ගලයන් ගැන මෙහි විස්තර කර ඇත. **බලන්න**: අංගු.නි (5) :9 නිපාත:9.1.3.2 බලුන්කොපම සූත්‍රය, පි.462. **මූලාශ්‍රය:** අංගු.නි (1) :3 නිපාත: යෝධජීවවග්ග: 3.3.4.10 සූත්‍රය, පි.562. **5 නරක අශ්වයන්** බඳු සංඝයා 8 දෙනක් ගැන මෙහි දක්වා ඇත. ඔවුන් යම් ඇවතක්-වැරද්දක් පිලිබඳ අයහපත් ලෙස 8 ආකාරයකින් ක්‍රියා කරති**මූලාශ්‍රය:** අංගු.නි: (5) 8 නිපාත:8.1.2.4 බලුන්ක සූත්‍රය,පි.92.

▲ **ආශාව-** desires: ආශාව ලෙසින් මෙහි පෙන්වා ඇත්තේ යමක් ලබාගැනීමට ඇති කැමැත්තය (රුචිය- තණ්හාව). ලෝකයා කැමති ආශාවන් 2 ක්, හැර දැමීම පහසු නොවේ යයි මෙහි පෙන්වා ඇත: 1) ලාභආශාව 2) ජීවිත ආශාව (The desire for gain and the desire for life). **මූලාශ්‍රය:** අංගු.නි: (1) 2 නිපාත: ආසාවග්ග සූත්‍ර, පි.206
▲ **ආශ්චර්ය ධම්ම-**Wonderful Dhammas: ආශ්චර්ය ධම්ම- අසිරිමත් ගුණ ලෙසින් පෙන්වා ඇත්තේ බුදුන් වහන්සේ සතු උතුම් බලයන්ය. මෙහිදී පෙන්වා ඇත්තේ තථාගතයන් කය ඉතා සැහැල්ලුවට පත්කර, කයෙහි සිත බහා, සිතෙහි කය බහා සුඛසංඥාව හා ලඝුසංඥාව ඇති කරගෙන ඉද්දි බල දැක්වීමය. බඹ ලොව තෙක් කය නංවා ගැනීමට ඇති ඉද්දි බලයය. **බලන්න**: උපග්‍රන්ථය:5, අයගෝල උපමාව, ලඝු සංඥාව.

**මූලාශ්‍රය:**සංයු.නි: (5-2) මහාවග්ග: ඉද්දිපාදසංයුත්ත:7.3.2 අයෝගුළ සූත්‍රය,පි.70.

▲**අශාශ්වත දිට්ඨිය-**The view of the world is not eternal මෙය බුදුන් වහන්සේ වැඩසිටි සමයේ පැවති දිට්ඨි 10න් එකකි.**බලන්න:** අසස්සත, දිට්ඨි.

▲ **අශ්‍රද්ධාව**: පාලි: **අස්සද්ධා**: lack of faith/confidence: අශ්‍රද්ධාව යනු බුද්ධ,ධම්ම හා සංඝ රත්නය (ත්‍රිවිධරත්නය) කෙරේ සැදැහැ නො මැතිවීමය, ත්‍රිවිධ රත්නය පිලි නොගැනීමය. අශ්‍රද්ධාව ඇති කෙනෙක් බුදුසරණ ගිය කෙනක් නොවේ.**බලන්න**: ශ්‍රද්ධාව.

▼ **අශ්‍රද්ධාව පෝෂණය වන්නේ අසද්ධර්මය නිසාය.** සදහම් ශ්‍රවනය නොකිරීම අශ්‍රද්ධාව ඇතිවීමට මූලිකවේ. අශ්‍රද්ධාව ඇතිවිට අයෝනිසෝ -මනසිකාරයෙන් කටයුතු කරයි. එමනිසා, ආධ්‍යාත්මික වැඩීම ඇති නොවේ. අශ්‍රද්ධාව නැතිකර ගැනීම පිණිස සදහම් ශ්‍රවනය ඉතා වැදගත්වේ. සෝතාපන්නවීම පිණිස මේ කරුණ පහකර ගත යුතුවේ. **බලන්න**: අවිද්‍යාව හා විද්‍යාව. **මූලාශ්‍ර**:අංගු.නි: (6 ): 10 නිපාත: යමක වග්ග: 10.2.2.1 අවිද්‍යා සූත්‍රය, පි.232, EAN:10: II Pairs: 61.1. Ignorance, p. 517.

▼ **අශ්‍රද්ධාව පැවතීමට හේතුවන කරුණු**: උතුමන්ට ගරු නොකිරීමේ පුරුද්ද-අගෞරවය, මුරණ්ඩුබව- අවවාද පිළිගැනීමට ඇති නොකැමැත්ත, නරක මිතුරු (පාපමිත්‍ර) සේවනය මගින් කෙනෙකු තුල තෙරුවන් පිලිබඳ ඇති අශ්‍රද්ධාව වැඩිවේ. එම කරුණු 3 පහ කර ගැනීමෙන් අශ්‍රද්ධාව නැතිවේ යයි බුදුන් වහන්සේ පෙන්වා ඇත. යම් පුද්ගලයෙකුට කුසලය පිලිබඳ හිරිඔතප් තිබේ නම්, දහමේ අප්‍රමාදය ඇත්නම්, කලණ මිතුරු සේවනය කරයි නම් ඔහුට අශ්‍රද්ධාව ඇති නොවේ. **මූලාශ්‍ර**: අංගු.නි: (6 ): 10 නිපාත: 10.2.3.6 තයෝධම්ම සූත්‍රය,පි.284, EAN:10: Tens,76-6.Incapable, p. 524.

▲ **අශ්‍රැතවත් පෘතග්ජන:** පාලි: **අස්සුතවා පුථුජ්ජනො -** untaught ordinary person:අශ්‍රැතවත් පෘතග්ජන යනු ධර්මය නොඇසූ, බුද්ධාදී ආර්යන් නොදුටු, ධර්ම අවබෝධය නැති, සාමාන්‍ය පොදු මිනිසාය. **බලන්න**: ශ්‍රැතවත් ආරිය ශ්‍රාවක, අසත්පුරුෂ.

**අෂ**

▲ **අෂ්ඨ ආශ්චර්ය අද්භූතගුණ-**Eight wonderful & amazing qualities උග්ග විසාලානුවර ගහපති හා උග්ග හත්ථිගාම ගහපති යන ගිහි උපාසකයන් සතු අසිරිමත් ගුණ 8ක් මෙහිදී විස්තරාත්මකව දක්වා ඇත. 1) පළමු දැකීමෙන්ම බුදුන් වහන්සේ කෙරෙහි පහන්වීම-මහා ශ්‍රද්ධාවක් ඇතිවීම 2) බුදුන් වහන්සේ පිලිවෙලින් දේශනා කළ ධර්මය (අනුපුබ්බධම්ම) අසා එහිදීම දහම් ඇස පහළවීම, ත්‍රිවිධ සරණයට පැමිණ, බ්‍රහ්මචරිය පංචමශික්ෂපද සමාදන්වීම 3) බඹසර වාසය පිණිස ගිහි ජීවිතයේ සිටි භාර්යාවන් ඇල්ම හැර නිදහස් කිරීම 4) තමන් සතු භෝගසම්පත්, කලණදහම් ඇති සිල්වතුන් හා සාධාරණ ලෙසින් බෙදා ගැනීම 5) සකසාම-ගරුසරු සහිතව සංඝයා පයුරුපාසන කිරීම 6) සංඝයා දහම් දෙසනවිට සකසාම-ගරුසරු ඇතිව දහම් ඇසීම, සංඝයා දහම් නො දෙසයි නම් තමන් විසින් ඒ සංඝයාහට දහම් දෙසීම 7) දෙවියන් තමන් දැකීමට පැමිණ දහම ගැන සාකච්චා කිරීම නිතරවන සිදුවීමකි. එහෙත්, ඒ ගැන සිතේ මානය නැතිබව 8) සියලු ඔරම්භාගිය සංයෝජන පහ කරගත් බව

දැනීම (අනාගාමීබව). **බලන්න**: උපග්‍රන්ථය:3. **මූලාශ්‍ර:**අංගු.නි: (5): 8 නිපාත:ගපතිවග්ග: 8.1.3.1 හා 8.1.3.2 සූත්‍ර, පි.122, EAN:8: 21.1. & 22.2 suttas, p. 423.

▲**අෂ්ඨ ආශ්චර්ය ධම්මගුණ-**Eight wonderful & amazing qualities of Dhamma: ධම්මවිනයේහි, සංඝයා සිත අල්වාගෙන (අභිරමණය කරමින්) වාසය කිරීමට හේතු ලෙසින් පෙන්වා ඇත්තේ ධම්මයේ ඇති අෂ්ඨ ආශ්චර්ය ගුණයන්ය. මේවා අසිරිමත් ධම්ම ගුණයන්වේ: 1) මහා මුහුද අනුක්‍රමයෙන් ගැඹුරට ඇදීයන ලෙසින්, ධම්මවිනය අනුක්‍රමයෙන් ගැඹුරට- නිවනට ඇදියයි: අනුපුර්-ව ශික්ෂාව, අනුපුර්-ව ක්‍රියා හා අනුපූර්ව ප්‍රතිපදාව ක්‍රමයෙන් අරහත්වය දක්වාම ගෙනයයි. (Dhamma and discipline penetration to final knowledge occurs by gradual training, gradual activity, & gradual practice). 2) මහා සාගරයේ ස්ථිත ගුණය නිසා, එය සිමා ඉක්මවා නො යයි. එලෙස, පනවන ලද සිකපද (ශික්ෂාපද) ශ්‍රාවකයෝ, ජීවිතය ගැනවුවද නොතකා ඉක්මවා නොයයි. (they will not transgress it even for life's sake). 3) සාගරයට දමන මළමිනි වැනි අපවිත්‍ර දේ සාගරය තුල තබා නොගෙන ඉවතට දමයි. එලෙස, දුශ්ශීල පුද්ගලයන්ට, ධම්ම විනය තුල වාසය කලනොහැකිය. යහපත් සංඝයා එවැනි අය සේවනය නොකරයි. 4) විවිධ නමින් හඳුන්වන නදී මහා සයුරේ ජලයට එක්වූ විට, ඒ නම් ආදිය හැර දමයි. එලෙස, විවිධ කුල ගෝත්‍රවලින් සසුනේ පැවිදිබව ලබන සංඝයා, තම කුල ගෝත්‍ර හැර දමයි. ඔවුන් බුද්ධ ශ්‍රාවකබවට පත්වේ (ශ්‍රමණශාක්‍යපුත්‍ර). 5) සියලු නදී ජලය,වැසි ජලය පතිතවුවත් සාගරයේ ඉතිරි යාමක් හෝ අඩුවීමක් නොවේ, එලෙස, බොහෝ ශ්‍රාවකයෝ නිවන සාක්ෂාත් කරගත්තද නිබ්බාන ධාතුව ඉතිරීමක් හෝ අඩුවීමක් නොවේ. 6) මහා සාගරයේ ඇත්තේ එක රසයකි: ලුනුරසය. එලෙස, ධම්ම විනයේ ඇත්තේ එකම රසයකි: විමුක්ති රසය. 7) මහා සාගරය තුල විවිද රත්න ඇත (මුතු මැණික් ආදී). එලෙස ධම්ම විනයේ බොහෝ අනගි රත්න ඇත: 37ක්වු බෝධි පාක්ෂික දහමය. 8) මහා සගරෙයේ මහා සත්වයෝ සිටිති. එලෙස, ධම්ම විනයේ මහා සත්වයෝ සිටිති: සෝතාපන්න- අරහත් දක්වා. **බලන්න**: උප ග්‍රන්ථය:5. **සටහන**: මේ සූත්‍රය දේශනා කිරීමට හේතු වුවේ, පහාරාද අසුර රජු මහා සාගරයේ අසිරිමත් බව පවසා, ධම්ම විනයේ අසිරිමත් බව කුමක්ද යයි කළ විමසීමක් මතය. **මූලාශ්‍ර**: අංගු.නි: (5) 8 නිපාත: මහවග්ග:8.1.2.9 පහාරද සූත්‍රය, පි.104, EAN:8: 19.9 Pahārāda, p.421.

▲ **අෂ්ඨගරුධම්ම-** eight principles of respect: අෂ්ඨගරුධම්ම ලෙසින් පෙන්වා ඇත්තේ කාන්තවන් පැවිදිවෙන අවස්ථාවේ පිළිපැදිය යුතු කරුණු 8ක් ගැනය. මහා ප්‍රජාපති ගෝතමීයට, පැවිදිවීම පිණිස එම ගරුධම්ම පිළිපැදීය යුතුය යයි බුදුන් වහන්සේ වදාළහ**. බලන්න:** උපග්‍රන්ථය:2. **සටහන්: *** මේ පිලිබඳ විස්තර පිණිස **බලන්න**: භික්බු බෝධි හිමිගේ සටහන්: Aṭṭha garudhamme: EAN: notes: 1733-1735,p.664. **මූලාශ්‍ර**:අංගු.නි: (5) : 8 නිපාත: ගෝතමීවග්ග: 8.2.6.1 ගෝතමී සූත්‍රය, පි.242, EAN: 8: 51.1. Gothami, p.438.

▲ **අෂ්ටවිද්‍යා ඥාන-** eight true knowledge:අෂ්ටවිද්‍යා ඥාන ලෙසින් පෙන්වා ඇත්තේ සත්‍ය ඥානය- විජ්ජාවිමුක්තිය සාක්ෂාත් කරගැනීමට පදනම්වන ඥාන 8 පිලිබඳවය: විදස්සනා ඥානය, (insight knowledge), මනෝමය කාය (mindmade body) හා සය අභිඥාවන්ටය. (There are

eight kinds of true knowledge: insight knowledge, the mind-made body, and the six kinds of direct knowledge.බලන්න: EAN: note 205, p. 591, සය අභිඥා, විජ්ජාභාගිය ධම්ම.

▼**බුදුන් වහන්සේ මෙසේ වදාළහ:** "මහණෙනි, යම් කෙනෙක්, මහා සමුද්‍රය ගැන සිතන්නේ නම්, මහමුහුදට ගලා බසින සියලු කුඩා නදී ආදියද මහා සමුද්‍රයට ඇතුළත් වන බව ඔහුට පෙනේ. එලෙස, කාය ගතා සතිය බොහෝ ලෙසින් වඩනවිට, අෂ්ට විද්‍යාවන්ට- විජ්ජාභාගිය ධම්ම ඇතුලත් සියලු කුසලයන් කායගතා සතියට ඇතුලත්වේ".මහමුහුද උපමාව:උපග්‍රන්ථය:5 ( Bhikkhus, even as one who encompasses with his mind the great ocean includes thereby all the streams that run into the ocean, just so, whoever develops and cultivates mindfulness directed to the body includes all wholesome qualities that pertain to true knowledge). **මූලාශ්‍ර:** අංගු.නි: (1): 1 නිපාතය: කායගතාසති වග්ග සූත්‍ර, පි. 126, EAN:1: Mindfulness Directed to the Body, p.52.

▲**අෂ්ඨ විමොක්ක**: පාලි: **අට්ඨ විමොක්ඛා**- eight liberations අෂ්ඨ විමොක්කයනු විමුක්තිය (නිවන) ලබාගැනිමට ඉවහල්වන සිව් ජාන හා අරූප සමාපත්ති සතර ඇතිකරගන්නා ක්‍රම විධි අටය. නිවන සාක්ෂාත් කරගැනීම පිණිස මේ ප්‍රතිපදාවන් නැවත නැවත පුගුණ කරගතයුතුවේ. **බලන්න:** EDN:Note: 356, p. 427. **ශබ්දකෝෂ: පා.සි.ශ**: පි.476: "**විමොක්ඛා**: විමොක්‍ෂය, මිදීම, නිවණ". **B.D**: p.354: "**vimokkha:** liberation (deliverance); the 8 liberations (attha-vimokkha) occur frequently in the texts". **P.T.S**: p. 1417: "**Vimokkha** & Vimokha: deliverance, release, emancipation, dissociation from the things of the world, Arahantship…The eight vimokkhas or stages of emancipation".

▼ **අෂ්ඨ විමොක්ක විස්තරය**: **පළමු විමුක්තිය:** රූප ජාන සමාපත්ති තුලින් රූප දැකීම ( **රූපී රූපානි පස්සති**- One possessing form sees forms). **සටහන**: අටුවාවට අනුව කසිණ සමාපත්තියය. මෙහිදී පෙන්වන්නේ, අභ්‍යන්තර හෝ බාහිර කසිණ අරමුණක් තුලින් සිව් ජාන සමාපත්ති ලැබීමය. **බලන්න**: EAN: Note: 1777, p. 666. **දෙවන විමුක්තිය:** අභ්‍යන්තරයේ අරූප සංඥා ලබා බාහිර රූප දකී (**අජ්ඣත්තං අරූපසඤ්ඤී එකො බහිද්ධා රූපානි පස්සති**- One not percipient of forms internally sees forms externally) **සටහන:** මෙහිදී පෙන්වන්නේ, බාහිරව රූප ජාන ලැබීමය. **බලන්න**: EAN: Note: 1778 , p. 666 **තෙවන විමුක්තිය**: සුභ අරමුණක් මගින් අධිමුක්තිය ලැබීම (**සුභන්තෙව අධිමුත්තො** හොති- One is focused only on 'beautiful') මෙහිදී සුභ අරමුණ නම් බ්‍රහ්මවිහාර සතරය. **බලන්න**: EAN: Note: 1779 , p. 666. **සිව්වන විමුක්තිය**: ආකාසානඤ්චායතන අරූප සමාපත්තිය ලැබීම. **පස්වන විමුක්තිය**: විඥානඤ්චායතන අරූප සමාපත්තිය ලැබීම. **සයවන විමුක්තිය**: ආකිඤ්චඤ්ඤායතන අරූප සමාපත්තිය ලැබීම. **සත්වන විමුක්තිය**: නෙවසඤ්ඤානාසඤ්ඤායතන අරූප සමාපත්තිය ලැබීම. **අටවන විමුක්තිය**: සංඥාවෙදිත නිරෝධ සමාපත්තිය ලැබීම. **සටහන**: 8 වන විමොක්කය සාක්ෂාත් කරගැනීමෙන් අනාගාමී හෝ අරහත් මගඵල ලබාගැනීමට හැකිවේ. **බලන්න**: EDN: Note: 360, p. 427. මේ අට

විමොක්ක මුල සිට අගදක්වාද, අග සිට මුල දක්වාද සමවැදීමට සමත් භික්ෂුව ආසාවක්ෂය කර එල සමාධියද, ප්‍රඥාවිමුක්තිය ලබා- එල ඥාණය ලබා අර්හත්බවට පත්වේ යයි බුදුන් වහන්සේ වදාළහ. එසේ රූපකායෙන් හා නාම කායෙන් මිදුන උතුමා **උභතොභාග විමුක්තිය** (දෙපසින්ම මිදුන) ලබාගත් රහතන්වහන්සේය (චේතෝවිමුක්ති හා ප්‍රඥා විමුක්ති-liberation *of* the heart and by wisdom). **බලන්න:** උභතොභාග විමුක්තිය. **මූලාශ්‍ර:** දීඝ.නි: (2): 2 මහානිදාන සූත්‍රය**,** පි. 95, EDN**:** 15: The Great Discourse on Origination, p. 166, අංගු.නි: (5 ): 8 නිපාත: 8.2.7.6 විමොක්ඛ සූත්‍රය, පි.302 හා 8.1.13 අට්ඨ විමොක්ඛ සූත්‍රය, පි. 386, EAN:8: 66.6 Emancipations, p. 446.

▲ **අෂ්ඨ සමාපත්ති -** The eight attainments: බුදුන් වහන්සේ සමාපත්ති 8 ලෙසින් පෙන්වා ඇත්තේ රූප ජාන සමාපත්ති 4 හා අරූප සමාපත්ති 4 පිලිබඳවය. රූප ජාන සතර (1,2,3, හා 4 නි ජාන) ආරිය විනයේ හඳුන්වන්නේ: මේ ජීවිතයේදීම විඳිනා සුඛ විහරණ ලෙසින්ය- **දිට්ඨධම්මාසුඛවිහාරා.** අරූප සමාපත්ති: ආකසානඤ්ච, විඤ්ඤාණඤ්ච, ආකිඤ්චඤ්ඤා, නෙවසඤ්ඤානාසඤ්ඤා සමාපත්ති 4 ආරිය විනයේ හඳුන්වන්නේ **'ශාන්ත විහරණ'** ලෙසින්ය. **බලන්න**: දිට්ඨධම්මසුඛ විහරණය, සිව් ජාන.**මූලාශ්‍ර**: ම.නි: (1 ):1.1.8 සල්ලේඛ **සූත්‍රය**, පි. 112, EMN: 8-Effacement, p.108.

▲**අෂ්ටපුද්ගල-**Eight Individuals: අෂ්ටපුද්ගල- අට්ට පුග්ගල යනු බුදුන්වහන්සේගේ ආරිය ශ්‍රාවකයන් අට පිරිසය. එනම්: සෝතාපන්න, සකදාගාමී, අනාගාමී හා අරහත් මග එල ලැබූ උතුම් අරියන්ය. **බලන්න**: සංඝ ගුණ.

▼**අෂ්ට පුද්ගලයන්,** ආහුනෙය්‍ය, පාහුනෙය්‍ය, දක්ඛිනෙය්‍ය, අංජලිකරණිය ගුණ ඇතිව ලෝකයාට උතුම් පිං කෙතක්යයි මෙහි දක්වා ඇත. ඔවුන් සතර මග සතර එල ලබා ඇත. ඔවුන්ට දෙන දානය නිසා අග්‍ර විපාක ලැබේ. **මූලාශ්‍රය:** අංගු.නි: (5) 8 නිපාත:ගෝතමී වග්ග: අෂ්ට පුද්ගල සූත්‍ර 2කි,පි.275.

**අහ**

▲**අහංකාරය-** Insolence : අහංකාරය (පළාසො) උඩඟුකම ලෙසින්ද පෙන්වා ඇත. මෙය අනුන් කෙරෙහි අගරුලෙසින් හැසිරීමය. දස අකුසලයන්ගෙන් එක් අකුසලයකි. **බලන්න**: දසඅකුසල, සල්ලේඛ පරියාය.

▲ **අහංකාරය, මමංකාරය හා මානඅනුසය-** I-making, mine-making, and underlying- tendency to conceit : අහංකාරය, මමංකාරය හා මානඅනුසය යන මේවා කෙළෙස්ය. සසර ගමන දික්කරණ කරුණුය. **අහංකාරය** (I-making): මමය හෝ අනුන්ය ලෙසින් කය පිළිබඳව ඇති දිට්ඨියය. **මමංකාරය** තමාගේ හෝ අනුන්ගේ දේ මගේය යයි තණ්හාවෙන් අල්ලා ගැනීම, **මානඅනුසය:** ත්‍රිවිධ මානයෙන් බැඳීසිටීම. **බලන්න**: මාන.

▼**අහංකාරය,** මමංකාරය හා මානඅනුසය යන කෙළෙස් නැතිකරගැනීම, සමාධිය ඇතිකරගැනීමට හා නිවන් මග වඩා ගැනීමට හේතුවේ. **මූලාශ්‍ර**: අංගු.නි: (1): 3 නිපාතය: දේවදූතවග්ග: 3.1.4.2 හා 3.1.4.3. සූත්‍ර,පි. 282, EAN:3: Divine Messengers: 32.2 Ananda & 33.3 Sariputta, p.90.

▲ **අහිරිකය හා අනොත්තප්පය**: පාලි: **අහිරික, අනොත්‍තප්‍පං-**Lack of

moral shame & lack of moral dread (ahirikañ ca anottappan ca) අහිරිකය හා අනොත්තප්පය ලෙසින් පෙන්වා ඇත්තේ පවට- අකුසලයට ලැජ්ජා නොවීම හා බිය නොවීමය- හිරි ඔත්තප්ප නැතිකම. මේවා කෙලෙස්ය. **බලන්න**: හිරි ඔත්තප්ප.

▼ **අහිරිකය හා** අනොත්තප්පය, කළු ධම්ම හෙවත් පාපි ධම්ම වේ: **"ද්වෙමෙ භික්ඛවෙ ධම්මා කණ්හා... අහිරිකඤ්ච අනොත්තප්පඤ්ච"** (Moral shamelessness and moral recklessness. These are the two dark qualities). **මූලාශ්‍ර:**අං.ගු.නි: (1 ): 2 නිපාත: 2.1.1.7 කණ්හ සූත්‍රය, පි.140, EAN:2 : 7.7 Dark, p. 57.

▼**බුදුන් වහන්සේ** අහිරිකය හා අනොත්තප්පය පිළිබඳව යහපත් ලෙසින් වදාරා ඇත. ඒ කරුණු සංඝයා එක්ව, දහමේ චිරස්ථිතිය පිණිස සජ්ජායනා කිරීම සුදුසු යයි සැරියුත් මහා තෙරුන් සංඝයාට උපදෙස් දී ඇත. **මූලාශ්‍ර**: දිඝ.නි: (3 ):10 සංගිති සූත්‍රය, පි. 372 , EDN: 33 Saṅgīti Sutta: The Chanting Together, p. 362.

▼**අහිරික හා අනොත්තප්ප** ඇති පුද්ගලයා පාප මිත්‍ර සේවනය කරයි, උතුමන්ට- ආරියන්ට ගරු නොකරයි, අගෞරවය, මුරණ්ඩු-හිතුවක්කාර බව ඇත. ඔහු ධර්මයේ ප්‍රමාද වේ. **මූලාශ්‍ර**: අං.ගු.නි:(6): 10 නිපාත: 10.2.3.6.තයොධම්ම සූත්‍රය,පි.284, EAN:10:76.6. Incapable, p. 524.

▼**බුදුන් වහන්සේ වදාළේ**, අහිරික හා අනොත්තප්ප ඇති පුද්ගලයා පිරිස් මුළුවකට කැළලක් බවය. හිරිඔතප් නැතිවීම නිසා සිදුකරණ අකුසල කෙනෙක් දුගතියට යවයි. **මූලාශ්‍ර:** අං.ගු.නි: (2 ): 4 නිපාත: පරිසසෝභන වග්ගය, පි.451, EAN: 4: Adornments of the assembly, p. 224.

▼**අහිරික හා අනොත්තප්ප** ගුණයෙන් සමන්විත භික්ෂුව දහමේ පරිහාණියට පත්වේ. **මූලාශ්‍ර**: අං.ගු.නි: (4 ): 7 නිපාත: 7.1.4.2 හිරිගාරව සූත්‍රය, පි. 346, EAN:7: 33.2. Moral Shame, p. 377.

▼ **වෙනත් මූලාශ්‍ර:** 1. '**කෙලෙස් එක්දහස් පන්සියය**: අහිරික-අනොත්තප්ප 19-20, පි.100: රේරුකානේ චන්දවිමල මහනාහිමි, 1973.

▲ **අහිංසාව:** පාලි: **විහිංසකා** -Non-cruelty: අහිංසාව, අනුන්ට හිංසා කිරීමෙන් වැලකීම කුසලයකි. සම්මා සංකප්පයකි.බුදුන් වහන්සේ මෙසේ වදාළහ: **"වෙනත් අය හිංසා කටයුතු කරති, අපි ඒවායින් වැලකී අහිංසා වෙන් සිටීමට පුහුණුවෙමු" බලන්න:** සල්ලේඛ පරියාය.

▲ **අහෝසි කම්ම-**Ineffectual Kamma: දිට්ඨධම්මවේදනීය කම්ම මේ අත්බවේ විපාකයට නො පැමිණියේ නම්, උපපජ්ජවේදනීය කම්ම ඊළඟ අත්බවේ විපාකයට නො පැමිණියේ නම්, ඒවා අහෝසි කම්ම බවට පත්වේ. **බලන්න:** කම්ම-කර්ම.

▲ **ආහාර**: පාලි: **අන්න** - āhāra -nutriment -food :සත්ත්වයන්ගේ පෝෂණය - පැවැත්ම පිණිස ආහාර මූලිකවේ, අවශ්‍යම අංගයකි. බුදුන් වහන්සේ පෙන්වා වදාළේ ආහාරය කයේ පෝෂණයට පමණක් නොව සසරගමන පවත්වා ගැනීමට හේතුවනබවය. **ශබ්දකෝෂ: 1**. **BD**: p6, "... 4 kinds of nutriment which are material and mental…" 2. **PTS:** p285, "…comprises four kinds of nutriment, viz. (1) kabaḷinkāra āhāro (bodily nutriment, either oḷāriko gross, solid, or sukhumo fine), (2) phassāhāro n. of contact, (3) manosaṅcetanā° n. of volition (= cetanā S. A. on II.11 f.), (4) viññāṇ° of consciousness"

▼**උපන් සැම සත්ත්වයෙක්ම** ආහාර නිසා පෝෂණය වන බව බුදුන්

වහන්සේ වදාළහ: **"සබ්බෙ සත්තා ආහාරට්ඨිතිකා"** (All beings are maintained by nutriment āhāratthitikā) එය, ධම්මානුකූල අවබෝධය ඇති පුද්ගලයාහට දුක කෙළවර කරගත හැකිවේ. **බලන්න**: මහා ප්‍රශ්න 10. **සටහන්: *** සියලු සත්ත්වයෝ ආහාරය **(**පෝෂණය) හේතු කොටගෙන ජීවත්වේ යන්න **අභිඥෙයිය ධම්මයකි:** විශේෂ නුවණින -ඥාත පරිඥාවෙන් අවබෝධ කලයුතු දහමකි. **බලන්න:** අභිඥෙයිය ධම්ම. **මූලාශ්‍ර**: දිඝ.නි: (3): 10 සංගිති සූත්‍රය,පි. 374, EDN: 33 Saṅgīti Sutta: The Chanting Together-section, p. 363, අංගු.නි: (6 ): 10 නිපාත, මහා වග්ග, 10.1.3.7. ප්‍රථම මහාපඤ්හ සූත්‍රය,පි.116, EAN: 10:The Great Chapter-27.7 Great Questions -1, p. 503, දීඝ.නි: (3 කාණ්ඩය): 11 දසුත්තර සූත්‍රය, පි. 483, EDN: 34: Dasuttara Sutta: Expanding Decades, p. 384.

▼ **ආහාර සතර ආකාරය**: උපන් සත්ත්වයන්ගේ පැවැත්ම පිණිස හා ඉපදීමට සිටින සත්ත්වයන්ගේ (මව්කුසයේ සිටින) පෝෂණය පිණිස ආහාර 4 ක් අවශ්‍ය යයි බුදුන් වහන්සේ වදාළහ: **"...චත්තාරො භික්ඛවෙ ආහාරා භූතානං වා සත්තානං ඨිතියා සම්භවෙසීනං වා අනුග්ගහාය. කතමෙ චත්තාරො? කබලිඞ්කාරො අහාරො ඔළාරිකො වා සුඛුමො වා, ඵස්සො දුතියො, මනොසඤ්චෙතනා තතියා, විඤ්ඤාණං චතුත්ථං"**
1) සියුම්වූ හෝ ගොරෝසු වූ හෝ **භෞතික ආහාර (**දළ හෝ මුදු කබලිංක ආහාර- physical food) 2**) ස්පර්ශ** ආහාර (contact) 3) **මනෝ සංචේතනා** ආහාර (mental volition) 4) **විඥානආහාර** (consciousness). **සටහන**: ආහාරය ලෙසින් මෙහිදී අවබෝධ කර ගත යුතුව ඇත්තේ සත්ත්වයන්ගේ අඛණ්ඩ පැවැත්ම පිණිස අවශ්‍ය මූලික තත්වය ගැනය: එනම්: කයේ පැවැත්ම පිණිස ඉතා වැදගත්වන අහාර, මනෝ භෞතික පැවැත්ම පිණිස අදාළ කරුණු: වේදනා, ස්පර්-ශය, විඥාණය ,චේතනා, නාම රූප ක්‍රියාවලිය පිණිස. ආහාර ඇතිවීමට මූලික හේතුව තණ්හාවය: පෙර භව යන්හි පැවති තණ්හාව, නො සංසිඳුන නිසා මේ භව පැවැත්මට ද බලපායි. **බලන්න**: EMN: note: 120, p. 1074. මේ සතර ආහර, තණ්හාව: නිදාන කොට, උපත කොට, ජාත කොට, ප්‍රභූත කොට ඇත: **"තණ්හා චායං භික්ඛවෙ කිංනිදානා කිංසමුදයා කිඤ්ජාතිකා, කිම්පභාවා? තණ්හා වෙදනානිදානා වෙදනාසමුදයා වෙදානාජාතිකා වෙදානාපභාවා"** තණ්හාව ට හේතුවී ඇත්තේ වේදනාවය, වේදනාවට හේතුවී ඇත්තේ එස්සය, එයට හේතුවී ඇත්තේ සළායතනයන්ය, සළායතන වලට හේතුවී ඇත්තේ නාමරූපය ය. නාමරූප යට හේතුවී ඇත්තේ විඥාණය ය. විඥාණය ට හේතුවී ඇත්තේ සංඛාරායන්ය. සංඛාරයන්ට හේතුවී ඇත්තේ අවිද්‍යාවය ය. එලෙස අවිද්‍යාව නිසා පටිච්චසමුප්පාද ක්‍රියාවලිය ඇතිවී...සියලු දුක ඇතිවේ. **සටහන:** මෙහිදී බුදුන් වහන්සේ පටිච්චසමුප්පාදය ක්‍රියාවලිය තණ්හාව මුල් කර ගෙන දක්වා, එමගින් ඇතිවන අවිද්‍යාව දුකට හේතුවේ යයි පෙන්වා ඇත. අවිද්‍යාව සහමුලින් නැති කර ගැනීමෙන් දුක නිමාවේ. **මූලාශ්‍ර**: ම.නි : (1 ): 1.4.8 මහාතණ්හා සන්ඛය සූත්‍රය, ඡෙදය 16, පි. 622, EMN: 38: Mahātaṇhāsankhaya Sutta-The Greater Discourse on the Destruction of Craving section-15, p. 322.

▼ **සතර ආහාර (සිව් පෝෂණය) පිලිබඳ** මනා අවබෝධය ලබා ගැනීම දුකින් මිදීමට උපකාරිවේ. ආහාර හටගන්නේ තණ්හාව නිසාය. තණ්හාව

සහමුලින්ම නැති වූවිට අහාර පිලිබඳ ඇති ඇල්ම පහවී දුක නැති කරගත හැකිවේ. ඒ සඳහා ඇති ප්‍රතිපදාව, අරියඅටමග වඩාගැනීමය. **මූලාශ්‍ර**: ම.නි: (1):1.1.9 සම්මාදිට්ඨි සූත්‍රය, ඡෙදය 13, පි.131, EMN: 9: Sammādiṭṭhi Sutta, section 11, p. 123.

▼ **සිව් ආහර තණ්හාව මූලික කරගෙන ඇතිවේ.** සිව් ආහාර වලට මූලික වන තණ්හාව මගින් පටිච්චසමුප්පාද ක්‍රියාවලිය ඇතිවේ. **සටහන්: *** මේ සූත්‍රයේදී බුදුන් වහන්සේ තණ්හාව හේතු කොටගෙන පටිච්ච සමුප්පාදය ක්‍රියාත්මක වන ආකාරය පෙන්වා ඇත. ම.නි: **මහාතණ්හා සන්ඛය සූත්‍රය**ට සමානය. ** සත්ත්‍වයන්ගේ පැවැත්ම පිළිබඳව වෙනත් සාධක ඇති නමුත්, ඒ පිළිබඳව සිව් ආහාර- පෝෂණය, විශේෂයෙන්ම බලපායි: කබලිංක ආහාර ශරීරයේ පැවැත්ම පිණිස අවශ්‍යවේ. ස්පර්ශ ආහාරය නිසා (කායික මානසික) වේදනා 3 ක් විඳීමට සිදුවේ. මනෝ චේතනා ආහාර මගින් ත්‍රිවිධ ආකාර භව පැවැත්ම ඇතිවේ (කාම, රූප, අරූප). විඥාණ ආහාර නිසා නාම රූප ඇතිවී යළි උපත ඇතිකිරීමට මග පාදයි. **බලන්න:** ESN: note: 18, p. 938. **මූලාශ්‍ර**: සං‍යු.නි: (2 ): නිදානවග්ග: අභිසමයසංයුත්ත:අහාරවග්ග: 1.2.1 ආහාර සූත්‍රය, පි.42, ESN: 12: Nidanasamyutta: 11.1 Nutriment, p. 624.

▼ **විඥාණ ආහාරය ප්‍රතිසන්ධිය පිණිස හේතුවේ.** විඥාණ ආහාරය පුනර්භවය (ප්‍රතිසන්ධිය-යළි උපත), නාමරූප හටගැනීම පිණිස ප්‍රත්‍යවේ (හේතුව) යයි බුදුන් වහන්සේ පෙන්වා ඇත. නාම රූප ප්‍රත්‍යයෙන් සළායතන ඇතිවේ. සළායතන හේතු කොටගෙන ස්පර්ශය ඇතිවේ... එලෙස පටිච්චසමුප්පාද ක්‍රියාවලිය සිදුවේ. **බලන්න**: පටිච්චසමුප්පාදය, ප්‍රතිසන්ධි චිත්ත. **මූලාශ්‍ර**: සං‍යු.නි: (2): නිදානවග්ග: 1.2.2 මෝළියඵග්ගුන සූත්‍රය,පි.42, ESN:12:Nidanasamyutta:12.2 Moḷiyaphhagguna, p. 625.

▼ **සිව් ආහාර පිලිබඳ** සම්පූර්ණ අවබෝධය ලැබීමෙන් දුක අවසන් කළහැකිය. අහාරවලට මූලය තණ්හාවය, එම තණ්හාව නැතිකරගැනීම පිණිස සිව් අහාර පිළිබඳව නුවණින් අවබෝධ කරගැනීම අවශ්‍යයය. සිව් ආහාර පිලිබඳ යථාබව දැකීමෙන් ඒවා ගැන ඇති තණ්හාව නැතිවේ යයි බුදුන් වහන්සේ වදාළහ: **1) කබලිංක ආහාර:** කය පවත්වා ගැනීම පිණිස ගන්නා ආහාර ගතයුත්තේ විනෝදය පිණිස, ආස්වාදය පිණිස, කයේ රූපවත්විම හා ආකර්-ෂණය පිණිස නොවේ. ආහාර ගතයුත්තේ කය පවත්වා ගැනීම පිණිස හා දහම් මග දියුණුකරගැනීමට අවශ්‍ය කායික ශක්තිය හා මානසික සුවය ලබාගැනීම පිණිසය. මෙම කරුණ පිළිබඳව දක්වා ඇති **උපමාව:** වැලිකතර උපමාව: උපග්‍රන්ථය:5. මහා වැලි කතරකින් එතරවීමට යන යුවලක් අහාර නොමැති කමින් දුබලවී ගමන නතරවෙයි යන බියෙන් ගමන නිමාකරගැනීම පිණිස තම එකම දරුවා මරාගෙන (පුත්‍රමාංශ) ඒ මස් මහා දුකින් අනුභව කරයි. එලෙසින් සිතමින් අහාර ගතයුතුය යි බුදුන් වහන්සේ වදාළහ. ආහාර පිළිබඳව දැනීම ලැබූවිට පස්කම් සැප පිළිබඳ ඇති ආසාව අවබෝධවේ. පස්කම් සැප විඳීමට ඇති රාගය මුළුමනින්ම අවබෝධවූවිට ඒ පිලිබඳ ඇති සංයෝජන පහවීමනිසා ආරිය ශ්‍රාවකයා නැවත මිනිස්ලොව උපත ලබන්නේ නැත. “ **කබළීකාරෙ භික්ඛවෙ ආහාරෙ පරිඤ්ඤාතෙ පඤ්චකාම ගුණිකො රාගො පරිඤ්ඤාතො හොති. පඤ්චකාමගුණිකෙ රාගෙ පරිඤ්ඤාතෙ නත්‍ථි තං සඤ්ඤොජනං, යෙන සඤ්ඤොජනෙන සංයුත්තො අරියසාවකො පුන**

**ඉමං ලොකං ආගච්ඡෙයා”** **සටහන: *** අටුවාවට අනුව ‘නැවත මිනිස්ලොව උපත ලබන්නේ නැත’ යනුවෙන් අදහස්වන්නේ අනාගාමිබවය. පෙරකී ලෙස මනා අවබෝධය ඇතිව, පංච උපාදාන ස්කන්ධය ගැන විදසුන් නුවණ වඩා ගත්තේ නම් අරහත්මග ඵල සාක්ෂාත්වේ. **බලන්න**: ESN: note 163,p. 961. ** කබලින්ක අහාර පිලිබඳ යථා අවබෝධය ලැබීමෙන් පස්කම් සැප විඳීමට ඇති කැමැත්ත පහවීයයි. **2) ඵස්ස අහාර:** පිලිබඳ අවබෝධය ලබාගැනීම පිණිස දක්වා ඇති **උපමාව:** හමගසාදැමු එළදෙන: උපග්‍රන්ථය:5. හම ගසා දැමු එළදෙනක් යන යන තැන මැසි මදුරු ආදීන්ගෙන් සිදුවන හිරිහැර නිසා මහා දුකකට පත්වේ. සය ඉන්ද්‍රිය මගින් ස්පර්-ශ කරණ බාහිර අරමුණු නිසා ඇතිවන්නේ සැපක් නොව මහා දුකක්ය යි දැක ගතයුතුය, මනාව අවබෝධකරගතයුතුය. එම අවබෝධය නිසා සැප, දුක හා මධ්‍යස්ත වේදනා නිසා ඇතිවෙන තණ්හාව පිළිබඳව යථා අවබෝධය ඇතිවේ. එලෙස ඵස්ස ආහාරය පරිඥත කරගත් විට වේදනා තුන පරිඥානවේ. වේදනා තුන පරිඥත කරගත් අරිය ශ්‍රාවකයාට මතුවට (දහම් මගේ ) කිරීමට වෙනත් කටයුත්තක් නැතය යි බුදුන් වහන්සේ වදාළහ (අරහත්වය ලබා ඇතිනිසා). **සටහන:** අටුවාවට අනුව හම නැති එළදෙන කෘමි අදි සතුන්ගෙන් සිදුවන උවදුරු දැන එම සතුන් ගැවසෙන තැන් වලින් ආවරණයව සිටි. එලෙස, පහස  නිසා ඇතිවන වේදනා නිසා ඇතිවෙන සසර දුක දන්නා අරියශ්‍රාවකයා එහි ඇති ආස්වාදයන්ට නොඇලි සිටි. **බලන්න**: ESN: note 164, p. 961 **3) මනෝසංචේතනා ආහාර:** පිලිබඳ අවබෝධය ලබාගැනීම පිණිස දක්වා ඇති **උපමාව: -** ගිනිඅඟුරු වල: උපග්‍රන්ථය:5.ගිනි අඟුරු වලින් පිරුන විසාල වලක් ඇත. ජීවත්වීමට කැමති, මරණයට අකැමති, සැප පතන, දුක නොපතන මිනිසෙක් සිටි. ශක්තිමත් පුරුෂයන් දෙදෙනක් පැමිණ පෙරකී මිනිසා ඇදගෙන අඟුරු වලට ගෙනයයි. එම අවස්ථාවේ ඒ මිනිසාගේ චේතනාව වන්නේ ගිනි අඟුරු වලට නොවැටී සිටීමටය, එම ගිනිවලෙන් දුරස්ථව සිටීමටය. යම්හෙයකින් එම වලට වැටුනොත් තමාට මරණය හෝ මරණිය වේදනා ඇතිවන බව ඔහු දනී. එලෙසින් සිතේ ඇතිවන චේතනා පිලිබඳ අවබෝධ කරගතයුතුය, චේතනා නිසා කම්ම රැස්වෙන බව, එනිසා සසර දික්වන බව, දුක්විඳීමට සිදුවන බව අවබෝධ කරගතයුතුය. චේතනා පිලිබඳ මුළු අවබෝධය ලද විට ත්‍රිවිධ තණ්හාව (කාම, භව, විභව) පිලිබඳ යථා අවබෝධය ඇතිවේ. එලෙස තණ්හාව පරිඥත කරගත් අරිය ශ්‍රාවකයාට මතුවට කිරීමට වෙනත් කටයුත්තක් නැතය යි බුදුන් වහන්සේ වදාළහ. **සටහන:** අටුවාවට අනුව ගිනි අඟුරු වල යනු යළි උපත ඇතිවන ලෝක-භව 3 ය. ජීවත්වීම පතන මිනිසා නම් සසරට බැඳුන අනුවණ පෘථග්ජනයාය. ශක්තිමත් මිනිසුන් දෙදෙනා නම් කම්ම ඇතිකර යළි උපත ලබාදෙන කුසල අකුසලයන්ය. ගිනි අඟුරු වලට වැටීමෙන් ඇතිවෙන වේදනාව සසර ගමන නිසා විඳීමට ඇති දුකය. **බලන්න**: ESN: note 166, p. 962. **4) විඥාන ආහාර :** පිලිබඳ අවබෝධය ලබාගැනීම පිණිස දක්වා ඇති **උපමාව**:මහා සොරා විඳින දඬුවම්. උපග්‍රන්ථය:5. සොරකම්කිරීමේ දඬුවම්: රජතුමා ඉදිරියට පමුණුවන ලද මහා සොරෙකුට පෙරවරුවේ උල් 100 කින් ඇනීමට දඬුවම් නියම කරයි. ඔහු ජීවත්වුවහොත් දිවාකල තවත් උල් 100 ක් ඇනීමට නියම කරයි. ඔහු ජීවත්වුවහොත් සවස්කල තවත් උල් 100 ක් ඇනීමට නියම කරයි. එලෙස උල් 300 ක් ඇනීම නිසා එම සොරා මහා දුකකට වේදනාවකට පත්වේ. එලෙසින් විඥාන ආහාර නිසා මහා දුක්වේදනා ඇතිවෙන බව අවබෝධ

කරගතයුතුය. විඥාන ආහාර පිලිබඳ මුළු අවබෝධය ලද විට නාමරූප පිලිබඳ යථා අවබෝධය ඇතිවේ. එලෙස නාමරූප පරිඥත කරගත් අරිය ශ්‍රාවකයාට මතුවට කිරීමට වෙනත් කටයුත්තක් නැතය යි බුදුන් වහන්සේ වදාළහ. **බලන්න**: ESN: note 168, p. 962. **සටහන: *** අටුවාවට අනුව: රජතුමා යනු තමන් කරගත් කම්මයන්ය. මහා සොරා යනු අනුවණ පෘථග්ජනයාය. උල් 300 ඇනීමෙන් ලැබෙන වේදනාව යනු යළි උපතක් ලැබීමෙන් විඳීමට සිදුවන සසර දුකය. **බලන්න:** ESN: note 168, p. 962. **මූලාශ්‍ර :**සංයු.නි:(2): නිදානවග්ග:අභිසමයසංයුත්ත:1.7.3 පුත්තමංස සූත්‍රය , පි. 174, ESN: 13 :  Abhisamyasamyutta: 63.3 Son's Flesh, p. 697.
▼ **සිව් ආහාර පිලිබඳ ඇති රාගය යළි උපත ඇතිකරයි**. සිව් ආහාර පිලිබඳ ඇල්ම, තණ්හාව, රාගය හේතුකොට යළි උපත ඇතිවී සසර ගමන දික්වෙන ආකාරය බුදුන් වහන්සේ මෙසේ පෙන්වා ඇත: **"මහණෙනි කබලීකාර අහාර... (ආදීවූ සිව් ආහාර)** ගැන **රාගය, ඇල්ම ඇත්තේනම්, එම තණ්හාව නිසා විඥාණය පිහිටයි. විඥාණය ඇතිවී වැඩිවූ විට නාම රූපයේ බැසගැනීම වේ. යම් තැනක නාම රූපය පිහිටයිද එහි සංස්කාර යන්ගේ වැඩිම ඇතිවේ. සංස්කාර යන්ගේ වැඩීමක් ඇතිවූවිට අනාගත භවයක් සකස්වේ. අනාගත භවය ඇතිවිට යළි උපත-මහලුවීම-මරණය ඇතිවේ. යම් තැනක ජාති ජරා මරණ ඇතිවිට එය ශෝක සහිතය, කෙළෙස් නිසා ඇතිවන පීඩා සහිතය,** බලාපොරොත්තු **සුන්වීම ආදී නිසා දුක සහිතය"**. එහෙත් සිව්ආහාර පිලිබඳ තණ්හාවක් නොමැතිනම් විඥානය නොපිහිටයි, විඥානය නැති විට නාමරූප හට නොගනී, නාමරූප නැතිවිට සංස්කාර ඇතිනොවේ, සංස්කාර නැතිවිට භවය සකස්නොවේ, භවය නැතිවිට යළි උපතක් නොමැත; යළි උපත නොමැතිවිට ජරා මරණ ශෝක... ආදීවූ දුක් ඇතිනොවේ. **මූලාශ්‍ර :**සංයු.නි (2 ) නිදානවග්ග: අභිසමය සංයුත්ත: 1.7.4 අත්ථිරාග සූත්‍රය, පි. 174, ESN: 13: Abhisamayasamyutta: 64.4  If there is lust, p. 699.
▼ **ආධ්‍යාත්මික වර්ධනය පිණිස** සිව් ආහාර ගැන පිරිසිඳ අවබෝධය ඇතිවිය යුතුය **බලන්න**: පරිඥෙය්‍යා ධර්ම. **මූලාශ්‍ර:** දීඝ.නි : (3): 11දසුත්තර සූත්‍රය,පි.483, EDN: 34: Dasuttara Sutta: Expanding Decades, p. 384.

▼ **වෙනත් මූලාශ්‍ර: 1)** "… 'All beings subsist on nutriment'-this, according to the Buddha, is the one single fact about life that, above all, deserves to be remembered, contemplated and understood…": **The Four Nutriments of Life**:  An Anthology of Buddhist Texts by Nyanaponika Thera, BPS: Wheel 105-106, 2006.

▲**ආහාර දානය**-Offering food: ආහාර දානය, පහන් සිතින්, සැදැහැ සිතින් පූජා කිරීම මෙලොව හා පරලොව සුව පිණිස පවතී. ආහාර දෙන්නා බලය දෙයි, ඒ නිසා ඔහුටද පෙරලා බලය ලැබේ. **බලන්න**: දානය. **මූලාශ්‍ර**: සංයු.නි: (1) සගාථවග්ග: දේවතාසංයුත්ත: අන්නසූත්‍රය, පි. 84, ESN:1: Devatha samyuththa:43. 3.food, p. 118.
▲**අහාර අල්ප** ලෙසින්ගැනීම**-**Eating little: ආහාරයෙහි අල්පබව, හා ආහාරයෙහි ගිජුනොවන බව සංඝයා දියුණු කරගත යුතු ගුණයන්ය. අක්කුප්ප බව -අරහත්වය ලබාගැනීමට එම කරුණු උපකාරීවේ. **බලන්න**:

අක්කුප්ප. **මූලාශ්‍ර:** අංගු.නි: ( 3 ): 5 නිපාත: අක්කුප්ප සූත්‍ර 3, පි. 214, EAN: 5: 95.5 The Unshakable, p. 272.

▲ **ආහාරයෙහි පටිකුල සංඥාව-** Reflection on the loathsomeness of food: ආහාරයෙහි පටිකුල සංඥාව ලෙසින් පෙන්වා ඇත්තේ, තමන් ගන්නා ආහාරය ක්‍රමයෙන් කය තුල විවිධ ස්වභාවයන්ට පත්වීම මෙනෙහි කිරීමය. භාවනා අරමුණකි. **බලන්න**: භාවනා , සංඥා. එම භාවනාව, සප්ත බොජ්ඣංග ඇසුරු කරගනිමින් වඩන්නේනම් මහත් ඵල මහා ආනිසංස ඇතිවේයයි බුදුන් වහන්සේ වදාළහ. **මූලාශ්‍රය:** සංයු.නි: (5-1) මහාවග්ග: බොජ්ඣංගසංයුත්ත:8 නිරෝධවග්ග සූත්‍ර 6කි,පි.674.

▲**ආහාරයේ පමණ දැනිම: පාලි:** භොජනෙ මත්තඤ්ඤු- moderate in eating: උසස් පුහුණුවේ යෙදෙන සංඝයා (සේඛ) සතු ගුණයක් ලෙසින් ආහාරයේ පමණ දැන (භෝජනයේ මාත්‍රවීම) වාසය කිරීම දක්වා ඇත. එම අරිය ශ්‍රාවකයා නුවණින් සලකා අහාර වළඳයි. ආහාර ගැනීම, විනෝදය පිණිස හෝ මත්වීම පිණිස හෝ රූපවත් විමට හෝ දැකුම්කලුවීම පිණිස නොවේ, කයේ යැපීම පිණිස, වෙහෙස දරාගැනීම පිණිස හා බඹසර දිවිය සපුරා ගැනීම පිණිසය. පැරණි වේදනා අවසන් කිරීමට, නව වේදනා ඇති නොකර ගැනීමට, නිරෝගී සුවය ලබාගැනීමට, නිදොස් දිවියක් ගත කිරීමට හා සැනසිල්ලේ ජීවිතය ගෙනයාමේ චේතනාවෙන් අහාර භුක්ති විඳි. මේවා පබ්බජාට ආවර්ජනය කිරීමට ඇති කරුණුය. **බලන්න:** පබ්බජා. **මූලාශ්‍ර**: ම.නි. (2): 2.1.3 :සෙඛ සූත්‍රය, පි. 44, MN 53: Sekha Sutta, p. 436, ම.නි: (1) මහා අස්සපුර සූත්‍රය, පි.652, EMN: 39 The greater discourse at Assapura, p. 344.

▲ **ආහුනෙය්‍ය ආදී ගුණ**-Ahuneyiya and others: සංඝයා ආහුනෙය්‍ය, පාහුනෙය්‍ය, දක්ඛිණෙය්‍ය,අංජලිකරණිය, ලෝකයාට අනුත්තර පුණ්‍යක්ෂෙත්‍රක්වීම යන සුදුසු බව ඇතිවීමට ඔවුන් විවිධවූ ගුණයන්ගෙන් සම්පන්න විය යුතුය. **බලන්න**: සංඝගුණ.

▼ **ආහුනෙය්‍ය, පාහුනෙය්‍ය**, ආදී සුදුසු බව ඇතිවීම පිණිස සංඝයා තුල තිබිය යුතු ගුණ 5ක් මෙහි දක්වා ඇත: ශීලසම්පන්නබව, සමාධි සම්පන්නබව, ප්‍රඥා සම්පන්නබව, විමුක්ති සම්පන්නබව, විමුක්ති ඥාණදර්-ශනය සම්පන්නබව. **මූලාශ්‍රය**: අංගු.නි: (3): 5 නිපාත: ඵාසුවිහාරවග්ග: 5.3.1.7 සීලසම්පන්න සූත්‍රය, පි.236, රාජවග්ග: 5.3.4.9 අකන්ඛම සූත්‍රය, පි.277.

▼ **ආහුනෙය්‍ය, පාහුනෙය්‍ය**, ආදී සුදුසු බව ඇතිවීම පිණිස සංඝයා තුල තිබිය යුතු වෙනත් ගුණ:සළායතන මගින් අල්ලා ගන්නා බාහිර අරමුණු පිළිබඳව සම්මා ප්‍රඥාව ඇතිව, උපේක්ඛාවෙන් සිටීම, ඉද්දිබල තිබීම, දිවකන් තිබීම, පරසිත් දැකීමේ නුවණ තිබීම, පූර්ව නිවාස සිහිකිරීමේ නුවණ, දිවැස් තිබිම, ආසව ක්ෂය කර, ඒ බව විශිෂ්ඨ ඥානයෙන් දැන වාසය කිරීම. **මූලාශ්‍රය:** අංගු.නි: (4) 6 නිපාත: ආහුනෙය්‍යවග්ග: සූත්‍ර 2කි, පි.22.

▼ **ආහුනෙය්‍ය,පාහුනෙය්‍ය**, ආදී සුදුසු බව ඇතිවීම පිණිස සංඝයා තුල තිබිය යුතු වෙනත් ගුණ : සිල්වත්බව, බහුශ්‍රැතබව,කලණමිතුරුසේවනය, සම්මාදිට්ඨිය තිබිම, කැමති ලෙසින් සිව්ජාන ලබාගැනීමට හැකිවීම, පූර්වනිවාස සිහිකිරීමේ හැකියාව, දිවැස් තිබීම, ප්‍රධන් විරිය තිබීම, ආරණ්‍යකවීම, උපන්රතිය හා අරතිය මැඩගැනීමේ හැකියාව, ආසාවක්ෂය

කර තිබීම. **මූලාශ්‍රය:** අංගු.නි: (5) 8 නිපාත:ගෝතමීවග්ග:ආහුනෙය්‍ය සූත්‍ර2කි,පි. 276.

▲ **ආහුනෙය්‍ය පුග්ගල**-Ahuneyiya puggala: **ආහුනෙය්‍ය පාහුනෙය්‍ය** ආදී ගුණ ඇති පුග්ගල යනු ආරිය ශ්‍රාවකයාය. මෙහිදී දක්වා ඇත්තේ සත් ආරිය පුද්ගලයෝ, ආහුනෙය්‍ය ආදී ගුණයෙන් යුක්තබවය. **බලන්න**: සත් ආරිය පුද්ගලයෝ. **මූලාශ්‍රය:** අංගු.නි: (4) 7 නිපාත:අනුසයවග්ග:7.1.2.4 ආහුනෙය්‍යපුග්ගල සූත්‍රය,පි.314.

▼ **ආහුනෙය්‍ය පාහුනෙය්‍ය** ආදී ගුණ ඇති ඇති දසආරිය පුද්ගලයෝ ලෙසින් මෙහිදී පෙන්වා ඇත්තේ බුදුන් වහන්සේ, පසේ බුදුවරු, සත් ආරිය පුද්ගලයෝ හා ගෝත්‍රභූ උතුමාය. **බලන්න:** සත් ආරිය පුද්ගල, උත්තම දස පුද්ගලයෝ. **මූලාශ්‍රය:** අංගු.නි: (6) 10 නිපාත:නාථවග්ග: 10.1.2.6 ආහුනෙය්‍ය සූත්‍රය,පි.70.

▼ **ආහුනෙය්‍ය පාහුනෙය්‍ය** ආදී ගුණ ඇති සංඝයා කරුණු 7කින් සමන්විතය යි මෙහි දක්වා ඇත: 1) ධම්මඤ්ඤව 2) අර්ථඤ්ඤව 3) ආත්මඤ්ඤව 4) මාත්‍රඤ්ඤව 5) කාලඤ්ඤව 6) පර්ෂදඤ්ඤව 7) පුද්ගලපරාවරඤ්ඤව. **මූලාශ්‍රය:** අංගු.නි: (4) 7 නිපාත: 7.2.2.4 ධම්මඤ්ඤූ සූත්‍රය, පි.464.

## ඉ කොටස: ඉච,ඉඤ,ඉත,ඉද,ඉන,ඉණ,ඉප,ඉර,ඉව,ඉස,ඉෂ

### ඉච

▲ **ඉච්ඡාව**-Desire: ඉච්ඡාව යනු යමක් අත්පත් කරගැනිමට ඇති දැඩි ආශාවය (තණ්හාව), පාපී ලාමක ආශා ලෙසින්ද පෙන්වා ඇත. ආධ්‍යාත්මික මග බාධාකරන කරුණකි**.** **බලන්න**: පාපික ආශා

▼ **දැඩි ආශාව නිසා** දහම් මගේ පිරිහෙන පුද්ගලයන් 4ක් හා දැඩිආශාව ඇතිවූ විට ඒවා මැඩ ගෙන මග දියුණු කරගන්නා පුද්ගලයන් 4 ක් පිළිබඳ විස්තර මෙහි දක්වා ඇත: 1) සිව්පස ලබාගැනීම පිලිබඳ ආශාව ඇතිවී, ඒවා ගැනීමට වීරිය කර, ඒවා නොලැබීම නිසා දැඩි ශෝකයට පත්වන 2) සිව්පස ලබාගැනීම පිලිබඳ ආශාව ඇතිවී, ඒවා ගැනීමට විරිය කර ඒවා ලැබීම නිසා මත්වෙන 3) සිව්පස ලබාගැනීම පිලිබඳ ආශාව ඇතිවී, ඒවා ගැනීමට වීරිය නොකර, ඒවා නොලැබීම නිසා දැඩි ශෝකයට පත්වන 4) සිව්පස ලබාගැනීම පිලිබඳ ආශාව ඇතිවී, ඒවා ගැනීමට වීරිය නොකර, එහෙත්, ඒවා ලැබීම නිසා මත්වෙන 5) සිව්පස ලබාගැනීම පිලිබඳ ආශාව ඇතිවී, ඒවා ගැනීමට වීරිය කර, ඒවා නොලැබීම නිසා ශෝකයට පත් නොවන 6) සිව්පස ලබාගැනීම පිලිබඳ ආශාව ඇතිවී, ඒවා ගැනීමට විරිය කර ඒවා ලැබීම නිසා මත්නොවන 7) සිව්පස ලබාගැනීම පිලිබඳ ආශාව ඇතිවී, ඒවා ගැනීමට වීරිය නොකර, ඒවා නොලැබීම නිසා ශෝකයට පත්නොවන 8) සිව්පස ලබාගැනීම පිලිබඳ ආශාව ඇතිවී, ඒවා ගැනීමට වීරිය නොකර, එහෙත්, ඒවා ලැබීම නිසා මත්නොවන. **බලන්න:** ලාභසත්කාර. **සටහන්:** * 1-4 පුද්ගලයෝ මාර්ගය හානි කරගනි, 5-8 පුද්ගලයෝ මාර්ගය හානි නො කරගනි. ** එම කරුණුම සාරිපුත්‍ර මහා තෙරුන් සංඝයාට වදාළ බව ඉච්ඡා සූත්‍රයේ පෙන්වා ඇත. **මූලාශ්‍ර:** අංගු.නි: ( 5 ): 8 නිපාත: 8.2.7.1 ලාභීඉච්ඡා සූත්‍රය, පි. 280, 8.2.8.7 ඉච්ඡා සූත්‍රය, පි. 341, EAN: 8: 61.1 Desire, p. 443 & 77.7 Desire, p. 452.

▼ **ඉච්ඡාව**, ලෝකය බැඳගෙන ඇත, ඒ තණ්හාව දුරුකිරිමෙන්, සියලු බැඳීම් නැතිවෙන බව මෙහි දක්වා ඇත. **මූලාශ්‍රය:**සංයු.නි: (1) සගාථ වග්ග: දේවතාසංයුත්ත:අන්වයවග්ග: 1.7.9 ඉච්ඡා සූත්‍රය, පි.102.

▲**ඉච්චාකථාව**-flattery: ඉච්චාකතාව (ලපනං) යනු චාටුකථාය-අනුන් රැවටීමට කරන කථාය, අකුසලයකි.මේ අවගුණය ඇතිවිට උත්තරී මනුස්සධම්මය වූ ආරියභාවය ලබාගැනීම නොහැකිවේ. **බලන්න:** උත්තරීමනුස්සධම්ම **මූලාශ්‍ර:** අංගුනි: (4): 6 නිපාත: අරහත්වග්ග: 6.2.3.3 උත්තරීමනුස්සධම්ම සූත්‍රය, පි.254, EAN:6: 77.3 Superior, p.360.

**ඉඤ**

▲ **ඉඤ්ජිත**-agitation: ඉඤ්ජිත යනු සිත කැළඹීමය (වික්ෂෝභනය), කෙළෙස් නිසා සිත අසහනයට පත්වීමය. බුදුන් වහන්සේ මෙසේ වදාළහ: "මහණෙනි, '**මම වෙමි**' යි යන මෙය ඉඤ්ජිතයකි. '**මේ මම වෙමි**' යි ... '**මම වන්නෙමි**' යි... '**මම නොවන්නෙමි**' යි... '**රූප ඇත්තෙක් වන්නෙමි**' යි... '**රූප නැත්තෙක් වන්නෙමි**' යි... '**සංඥා ඇත්තෙක් වන්නෙමි**' යි... '**සංඥා නැත්තෙක් වන්නෙමි**' යි... '**නොම සංඥා ඇත්තෙකුත් සංඥා නැත්තෙකුත් වන්නෙමි**' යි ... යන මෙය ඉඤ්ජිතයකි... ඉඤ්ජිතය රෝගයකි...ගඩුවකි... හුලකි... ඒ නිසා මෙහි ලා ඉඤ්ජිතය රහිත සිතින් යුතුව වාසය කරන්නෙමු යයි ඔබ විසින් හික්මිය යුතුය." **සටහන**: සළායතන විසින් අල්ලා ගන්නා බාහිර අරමුණු නිසා සිත කැළඹීමට පත්වේ. **මූලාශ්‍ර**: සංයු.නි: (4) සළායතනවග්ග: වේදනා සංයුත්ත: ආසිවිසවග්ග:1.19.11 යවකලාපී සූත්‍රය, පි.410.ESN:36: Vedanasamyutta:248.11 The Sheaf of Barley, p.1327.

▼**තණ්හාව නිසා ඇතිවන** කම්පන ඉඤජයෝ බවත්, රාගය පහකල රහතුන් හට ඉඤජිතයෝ නැතය යයි බුදුන් වහන්සේ වදාළහ. **මූලාශ්‍රය**: බු.නි.සුත්තනිපාත: පාරායනවග්ග:වත්ථුගාථා: පි,326, 5-1 තිස්ස මෙත්තෙයිය මානවක, පි.338

**ඉත**

▲ **ඉතා මිහිරි-** Sweetest thing: සත්‍ය ඒකාන්තයෙන්ම මිහිරිය- රස අතුරින් සත්‍ය රසය අග්‍රයයි-බුදුන් වහන්සේ පෙන්වා ඇත. **"සච්චං හවෙ සාදුතරං රසානං"** (Truth is really the sweetest of tastes). **මූලාශ්‍ර:** සංයු.නි: ( 1): සගාථවග්ග:දේවතාසංයුත්ත: 1.8.3 චිත්ත සූත්‍රය, පි. 104, ESN: 1: Devatasmyutta: 1: 73.3. Treasure, p.155.

▲ **ඉතිවුත්තක-** Itivuththaka: සූත්‍ර පිටකයේ ඛුද්දක නිකායට අයත්, නවාංගශාසත්‍ෘ ශාසනයට ඇතුලත් ග්‍රන්ථයකි. ඉතිවුත්තක යනු : **"මෙය, මේ සඳහා කියන ලදී".** උදේනි රජුගේ බිසවවූ, සාමාවතීය ගේ සේවිකාව-කුජ්ජුත්තරා උපාසිකාව, බුදුන් වහන්සේ වෙතින් දහම් අසා, මතකයේ රඳවාගෙන විත් සමවාති බිසව ඇතුළු පිරිසට පැවසු දහම ඉතිවුත්තකයට ඇතුලත්වේ. **බලන්න:** උපග්‍රන්ථය:3 **මූලාශ්‍ර**: බු.නි. ඛුද්දකපාඨ: ඉතිවුත්තක පාලි: සංඥාපනය, පි.16, **පා.සිං.ශ**: පි. 152.

▲**ඉත්ථිබන්ධන-**Bondage of women: ඉත්ථිබන්ධන ලෙසින් පෙන්වා ඇත්තේ කම්සැපට ඇති ඇල්ම නිසා ස්ත්‍රීයක්, පුරුෂයා ගේ බන්ධනයට යටවීමය**: බලන්න:** බන්ධන. **මූලාශ්‍ර**: අංගු.නි: ( 5):8 නිපාත: 8.1.2.8 ඉත්ථිබන්ධන සූත්‍රය,පි.102, EAN:8: Bondage suttas, p. 421.

**ඉද**

▲ **ඉදපච්චයා න්‍යාය**-Idapachchaya: මෙය පටිච්චසමුප්පාදයට ඇතුලත් ආරියන්‍යායකි. මෙය අවබෝධය දුෂ්කර දහමකි - දුෂ්ප්‍රතිවිධ්‍යා ධර්ම ලෙසින්ද පෙන්වා ඇත. **බලන්න**: අවබෝධය දුෂ්කර ධර්ම, ආරියන්‍යාය,

පටිච්චසමුප්පාදය.
▲**ඉද්දි**-Iddi : ඉද්දි -ඍද්ධි (ඉද්දි බල) යනු අසාමාන්‍ය බලයන්ය. ඉද්දි පිළිබඳව විස්තර පිණිස බලන්න: ඛු.නි: පටිසම්භිදා2:ප්‍රඥාවග්ග: ඉද්දිකථා, පි.194. **බලන්න**: ඉද්දි බල.
▲**ඉද්දිපාද**-Iddipada ඉද්දිපාද සතර, බෝධිපාක්‍ෂධර්මයකි. **බලන්න**: සතර ඉද්දිපාද. උද්ධම්භාගිය සංයෝජන පහකිරීමට ඉද්දිපාදයන් මනාව වැඩිය යුතුය යි මෙහි පෙන්වා ඇත. **මූලාශ්‍ර**: සං.නි.(5 -2)මහාවග්ග: ඉද්දිපාදසංයුත්ත:උද්ධම් භාගිය සූත්‍රය පි. 84,ESN: Iddipada samyuththa, 86.10 Higher Fetters, p. 2108, අංගු.නි: (6) 10 නිපාත, නාථ වග්ග, 10.1.2.3 සංයෝජන සූත්‍රය, පි.60, EAN:10: II Protector, 13.3. Fetters, p. 496.

▼**ඉද්දිපාද යහපත්** ලෙසින් වඩාගැනීමෙන් ආනගාමී හෝ අරහත්වය ලැබිය හැකිය. බුදුන් වහන්සේ සම්බෝධිය ලැබීමට පෙර ඉද්දිපාද යහපත් ලෙසින් වඩාගත් බව මෙහි දක්වා ඇත. **මූලාශ්‍රය**:අංගු.නි: (3) 5 නිපාත: සඤ්ඤාවග්ග: ඉද්ධිපාද සූත්‍ර2 කි, පි.152.

**ඉන**

▲**ඉන්දක යක්‍ෂ**- Indaka Yakka :බුදුන් වහන්සේ වෙත පැමිණි මේ යක්‍ෂ තෙමේ, සත්ත්වයාගේ ඇතිවීම-පැවත්ම ගැන විමසා ඇත. **බලන්න:** යක්‍ෂ.
▲ **ඉන්ද්‍රකීලය**- Indrakila: ඉන්ද්‍රකීලය යනු නගරයේ සීමා කණුව-එසිකාස්ථම්භයය. අයස්කීලය ලෙසද, සීමා ස්ථම්භකය ලෙසින්ද හඳුන්වති. නගරයේ දොරටුව අසල, ඉතා ගැඹුරට හෑරූ වළක, ලී අරටු වෙන් (heart-wood) සෑදූ කණුවක්, සවිමත් ලෙසින් පිහිටුවා ගනී. එවැනි කණුවක අවශ්‍යතාවය වන්නේ, නගරයේ දොරටු දෙක, ඉතා තදින් බැඳ තබා ගැනීමට පුළුවන් වීමය. බලන්න: **EDN: note: 930, p. 463, පා.සිංශ: පි.154.** සටහන: ඉන්ද්‍රදෙවියන්ගේ ශක්තිමත් කනුව-නොසෙල්විය හැකි කණුවය.
▼ **බුදුන් වහන්සේ** වදාළ දහම ඉන්ද්‍රකීලයක් ලෙසින් යහපත් ලෙසින්, ස්ථිර ලෙසින් ස්ථාපනය කර ඇත. **මූලාශ්‍ර:** දීඝ.නි: ( 3):6 පාසාදික සූත්‍රය, ඡේදය 19, පි. 210, EDN :29 Pasadika Sutta: The Delightful Discourse, p. 318.
▼ **යම් පුද්ගලයෙක්** තුල තෙරුවන් කෙරෙහි ඇති ශ්‍රද්ධාව ඉන්ද්‍රකීලයක් මෙන් ස්ථාවරවිය යුතුය. **මූලාශ්‍ර:** අංගු.නි: ( 4): 7 නිපාත: 7.2.2.3 නගරූපම සූත්‍රය, පි. 454, EAN:7: 67.3 Simile of the Fortress, p. 397.
▼ **චතුසත්‍ය අවබෝධ** කරගත් ශ්‍රමණ බ්‍රාහ්මණ යන් ගේ ආධ්‍යාත්මික මග ස්ථාවරයය. මේ පිලිබඳ යොදාගෙන ඇති **උපමාව:** ඉන්ද්‍රකිල උපමාව:ඉන්ද්‍රකීලය මෙන් නොසෙල්වෙන බවය. **බලන්න:** උපග්‍රන්ථය:5. **මූලාශ්‍රය:** සංයු.නි: (5-2) මහාවග්ග: සච්චසංයුත්ත: සිංසපාවග්ග:12.4.9 ඉන්ද්‍රකීල සූත්‍රය, පි.326.
▲ **ඉන්ද්‍රිය**: පාලි: **ඉනද්‍රියානි**-Faculties :ඉන්ද්‍රිය ලෙසින් සූත්‍ර පිටකයේ බොහෝ තැන පෙන්වා ඇත්තේ: සද්ධා,වීරිය, සති,සමාධි හා ප්‍රඥා යන ආධ්‍යාත්මික පංච ඉන්ද්‍රියයන්ය. මේවා වඩා ගත් භික්ෂුව, ආහුනෙය්‍ය ආදීවශයෙන් පුද පුජා ලැබීමට සුදුසුවේ. **බලන්න**: ආහුනෙය්‍ය ආදී, ආධ්‍යාත්මික පංච ඉන්ද්‍රිය. **සටහන**: ඉන්ද්‍රිය ධම්ම 5 පිළිබඳ විස්තර පිණිස බලන්න: * සංයු.නි: (4) සළායතනවග්ග: සච්චසංයුත්ත: ඉන්ද්‍රිය සූත්‍ර, පි.661.** ඛු.නි: පටිසම්භිදා1: ඉන්ද්‍රියකථා, පි.399. **මූලාශ්‍රය:** අංගු.නි: (4)

6 නිපාත: 6.1.1.3 ඉන්ද්‍රිය සූත්‍රය, පි.26.
▼**ධර්මයේ ඉන්ද්‍රිය 22** ක් දක්වා ඇත. මේවා සමහරක් අර්ධ වශයෙන් කායික වේ, සමහරක් අර්ධ වශයෙන් මානසික වේ. සංයු.නි.**ඉන්ද්‍රිය සංයුත්තයේ** හා වෙනත් සූත්‍ර දේශනාවන්හි හා අභිධර්ම පිටකයේ මේ ඉන්ද්‍රිය 22 පිලිබඳ විස්තර ඇත. **සටහන**: ඉන්ද්‍රිය යනු කම්මය දක්වන ස්වභාවය ය. ඉන්ද්‍රිය පිලිබඳ විස්තර පිණිස **බලන්න: *සිංහල විශුද්ධිමග්ග**, පරිච්ඡේදය: 16**, ශබ්දකෝෂ**: B.D: p.65
▼**ඉන්ද්‍රිය විස්තරය:** 1) **සයඉන්ද්‍රිය:**චක්ඛු ඉන්ද්‍රිය-Eye 2) සොත ඉන්ද්‍රිය -Ear 3) ඝාණ ඉන්ද්‍රිය - Nose 4) ජිව්හා ඉන්ද්‍රිය -Tongue 5) කාය ඉන්ද්‍රිය -Body 6) මන ඉන්ද්‍රිය - Mind. **සටහන**: **1-6 ආයතන වේ.** 7) ස්ත්‍රී ඉන්ද්‍රිය -Femininity: ස්ත්‍රිය යන ව්‍යවහාරය- ස්වභාවය නිසා ස්ත්‍රී ඉන්ද්‍රිය වේ. 8) පුරිස ඉන්ද්‍රිය -Masculinity: පුරුෂ යන ව්‍යවහාරය- ස්වභාවය නිසා පුරිස ඉන්ද්‍රිය වේ. **සටහන**: **ස්ත්‍රී ඉන්ද්‍රිය හා පුරිස ඉන්ද්‍රිය යන 2 ම ජිවිත ඉන්ද්‍රියට සම්බන්ධය.** 9) ජිවිත ඉන්ද්‍රිය- Vitality: නාම රූප ලෙසින් කොටස් 2කි. ජිවිත ඉන්ද්‍රිය පවතින තෙක් වේදනා පවතී. 10) සුඛ ඉන්ද්‍රිය- Bodily pleasant feelings: කයට යම් ප්‍රසාදයක් ගෙනෙදෙන පහස නිසා ඇතිවන සැප වේදනාව. 11) දුක ඉන්ද්‍රිය - Bodily painful feelings: කයට යම් අසතුටක් ගෙනෙදෙන, දුක ඇතිකරන පහසක් නිසා ඇතිවන දුක වේදනාව. 12) සෝමනස්ස ඉන්ද්‍රිය -Gladness- mental feeling**:** සිතට සුවයක් දෙන, සැපයක් ඇතිකරන යම් පහසක් නිසා ඇතිවෙන සුව වේදනාව. 13) දෝමනස්ස ඉන්ද්‍රිය -Sadness- mental feeling: සිතට සුවයක් නොදැන, සැප ඇති නොකරන, යම් පහසක් නිසා සිතට ඇතිවෙන දුක් වේදනාව. 14) උපෙක්ඛා ඉන්ද්‍රිය- Indifference: වේදනාවකි. මෙහි කාර්-ය නම් ශාන්ත ප්‍රණීත බව හෝ මධ්‍යස්ත බවට පත් කිරීමය. කයට හෝ සිතට දැනෙන වේදනා පිළිබඳව සැපක් නැති දුකක් නැති මැදිහත් වේදනාව. **සටහන: 10-14 වේදනා ලෙසින් දක්වා ඇත.** 15) සද්ධා ඉන්ද්‍රිය- Faith 16) වීරිය ඉන්ද්‍රිය - Energy 17) සති ඉන්ද්‍රිය -Mindfulness 18) සමාධි ඉන්ද්‍රිය- Samadhi 19) ප්‍රඥා ඉන්ද්‍රිය- Wisdom **සටහන**: **15-19 පංච ඉන්ද්‍රිය-ආධ්‍යාත්මික ඉන්ද්‍රියන්ය** 20) අනඤ්ඤාත-ඤානස්සාමීති ඉන්ද්‍රිය - I shall come to know the unknown 21) අඤ්ඤිඉන්ද්‍රිය -Final Knowledge 22) අඤ්ඤඤාත වින්ද්‍රිය - Final knower. **සටහන:** මෙහිදී බුදුන් වහන්සේ, සේඛ පුද්ගලයාට සෝතාපත්ති මග ලැබීමේදී අනඤ්ඤාත-ඤානස්සාමීති ඉන්ද්‍රිය පහළවේ, ඉන්පසු අඤ්ඤිඉන්ද්‍රිය ඇතිවේ, භව සංයෝජන පහ කලපසු, මගේ විමුක්තිය අකුප්ප යයි අඤ්ඤඤාතවින්ද්‍රිය- ප්‍රත්‍යවෙක්ෂා ඥානය උපදී යයි පෙන්වා ඇත. **බලන්න**: ඛු.නි: ඉතිවුත්තක: 3.2.3 ඉන්ද්‍රිය සූත්‍රය, පි. 418. **සටහන**: ගිනිදඬු උපමාව: ගිනි දඬු 2 ක් ගැටීමෙන් ගිනි හටගනී, ඒ දෙක වෙන්කළ විට ගින්න නැතිවේ. එම උපමාව යොදාගෙන පෙන්වා ඇත්තේ සුඛ, දුක, සොම්නස, දොම්නස හා උපේක්ඛා යන ත්‍රිවිධ වේදනා ඇතිවීම හා නැතිවීමය. **බලන්න**: උපග්‍රන්ථය:5. **මූලාශ්‍ර:** සංයු.නි: ( 5-1): මහාවග්ග: ඉන්ද්‍රියසංයුත්ත: විභංග සූත්‍රය, පි. 400 හා ජිවිත ඉන්ද්‍රිය සූත්‍රය, හා අඤ්ඤිඉන්ද්‍රි සූත්‍රය, පි. 392, 4.4.9 කට්ඨෝපම සූත්‍රය, පි.404, ESN: 48: Indriyasamyutta, 36-6 Analysis, p. 1964 & 22.2 & 23. 3 The faculty of final knowledge, p.1949.
▼**ඉන්ද්‍රිය සයකි.** ඇස, කණ, නාසය, දිව, කය හා මනස, මේවා

සළායතන ලෙසින්ද පෙන්වා ඇත. මේ ඉන්ද්‍රියන්: අනිච්ච බව, දුකබව, අනත්තබව, ක්‍ෂයවීම, නැතිවීම (වය), විරාගය, නිරොධය, අතහැරීම ආවර්ජනා කිරීම ඉන්ද්‍රිය අනුපස්සනාවය. **මූලාශ්‍ර:**අංගු.නි: (6 )11 නිපාත, සාමඤ්ඤ වර්ග සූත්‍ර, පි.704, EAN:11: III Similarity,p.577.

▲**ඉන්ද්‍රිය අසංවරය**: **පාලි: ඉන්‍ද්‍රියෙසු අසංවරය**- None-restraint of the senses: ඉන්ද්‍රිය අසංවරය යනු අභ්‍යන්තර සය ඉන්ද්‍රියන් (සළායතන) ලෞකික අරමුණු කරා අයහපත් ලෙසින් ඇදීයාමය. ඉන්ද්‍රියන් විෂයෙහි නො රක්නා ලද දොර ඇතිබව (**ඉන්‍ද්‍රියෙසු අගුත්තද්වාරොහොති)** ලෙසින් ද ඉන්ද්‍රිය අසංවරය හඳුන්වයි. ඉන්ද්‍රිය අසංවරවීම, දහම් මගට බාධාවකි.

▼ **බුදුන් වහන්සේ** ඉන්ද්‍රිය අසංවරය පිළිබඳව යහපත් ලෙසින් වදාරා ඇත. ඒ දහම සංඝයා එක්ව, දහමේ චිරස්ථිතිය පිණිස සජ්ජායනා කිරීම සුදුසු යයි සැරියුත් මහා තෙරුන් සංඝයාට උපදෙස් දී ඇත. **මූලාශ්‍ර**: දිඝ.නි: (3 ):10 සංගිති සූත්‍රය, පි. 372 , EDN: 33 Saṅgīti Sutta: The Chanting Together, p. 362.

▼**ඉන්ද්‍රිය අසංවරය**, ත්‍රිවිධ දුශ්චරිතය පෝෂණය කරයි. අසතිය හා අසම්ප්‍රජන්‍යය ඇතිවීම නිසා ඉන්ද්‍රිය අසංවරය ඇතිවේ. **බලන්න**: අවිද්‍යාව හා විද්‍යාව. **මූලාශ්‍ර**:අංගු.නි: (6 ): 10 නිපාත: යමක වග්ග: 10.2.2.1 අවිද්‍යා සූත්‍රය, පි.232, EAN:10: II Pairs: 61.1.Ignorance, p. 517.

▼**ඉන්ද්‍රිය අසංවරය ඇතිවීමට**, අශ්‍රද්ධාව, ත්‍යාගශීලිනොවීම හා කුසිතබව බලපායි. මේ කරුණු පහකර ගැනීමෙන් ඉන්ද්‍රිය අසංවරය පහකර ගත හැකිවේ. **මූලාශ්‍ර:** අංගු.නි:(6 )10 නිපාත:10.2.3.6.තයොධම්ම සූත්‍රය, පි.284, EAN-10: 76-6. Incapable, p. 524.

▼**ඉන්ද්‍රිය අසංවරය නිවනට හේතු නොවේ**: ඉන්ද්‍රිය අසංවරය ඇතිවිට අසිල්වත්වේ, අසිල්වත් බව සම්මා සමාධියට බාධාවකි, සම්මා සමාධිය නොමැතිවිට, යථාභූත ඥාන දස්සනය ඇතිනොවේ, යථාභූත ඥානය නොමැතිවිට, නිබ්ද්දාව හා විරාගය ඇතිනොවේ, නිබ්ද්දාව හා විරාගය නොමැතිවිට විමුක්තිය- නිවන සාක්ෂාත් නොවේ. මේ පිලිබඳ **උපමාව:** ගස උපමාව: ගසක, කොළඅතු නො වැඩුනවිට, එහි මුල් නොවැඩේ, මුල් නොවැඩුන විට ගසේ පොත්ත, හරය නොවැඩේ, එනිසා ගස නිසරු ගසක් බවට පත්වේ. **මූලාශ්‍රය:** අංගු.නි: (4): 6 නිපාත:ධම්මිකවග්ග: 6.1.5.8 ඉන්ද්‍රියසංවර සූත්‍රය, පි.150.

▲**ඉන්ද්‍රියධම්ම**-Indriya Dhamma: අවසාන ඥානය ලැබීමේ අවස්ථා තුන, ඉන්ද්‍රිය ධම්ම ලෙසින් පෙන්වා ඇත. **බලන්න**: අවසාන ඥානය.

▲ **ඉන්ද්‍රිය නානත්‍වය, ඵලනානත්‍වය, පුද්ගලනානත්‍වය** :පාලි: **ඉන්‍ද්‍රියවෙමත්තතා ඵලවෙමත්තතා පුග්ගලවෙමත්තතා**-difference in the faculties-difference in the fruits-difference of persons **ඉන්ද්‍රිය නානත්‍වය**: ලෙසින් පෙන්වා ඇත්තේ ආධ්‍යාත්මික පංච ඉන්ද්‍රියන්ය: සද්ධා ඉන්ද්‍රිය, විරිය ඉන්ද්‍රිය, සති ඉන්ද්‍රිය, සමාධි ඉන්ද්‍රිය, ප්‍රඥා ඉන්ද්‍රිය වැදීමේ විවිධ බවය. **ඵලනානත්‍වය:** එලෙස වැඩුන විට එමගින් ලැබෙන ඵලය- ප්‍රතිලාභය වෙනස් වේ. **පුද්ගලනානත්‍වය**: ප්‍රතිලාභය වෙනස්වන අන්දම අනුව පුද්ගලයෝ විවිධ වේ. **පුද්ගල ප්‍රභේද: 1) පංචඉන්ද්‍රිය පරිපූර්ණවූ විට** ලැබෙන ඵලය අරහත්බව- රහතන්වහන්සේය. 2) අරහත්බවට ටිකක් අඩුවෙන් පංචඉන්ද්‍රිය වැඩුන විට,අනාගාමී ඵලය, අනාගාමී උතුමා. 3) අනාගාමීබවට ටිකක් අඩුවෙන් පංචඉන්ද්‍රිය වැඩුන විට, සකදාගාමී ඵලය-සකදාගාමී උතුමා. 4) සකදාගාමී බවට ටිකක්

අඩුවෙන් පංචඉන්ද්‍රිය වැඩුනවිට, සෝතාපන්න ඵලය- සෝතාපන්න උතුමා 5) සෝතාපන්නබවට ටිකක් අඩුවෙන් පංචඉන්ද්‍රිය වැඩුන විට ධම්මානුසාරී ඵලය- ධම්මානුසාරී උතුමා 6) ධම්මානුසාරීබවට ටිකක් අඩුවෙන් පංචඉන්ද්‍රිය වැඩුන විට ශ්‍රද්ධානුසාරී ඵලය, ශ්‍රද්ධානුසාරී උතුමා **බලන්න**: ආරියපුද්ගලයෝ. **මූලාශ්‍ර:** සංයු.නි : (5-1): මහාවග්ග: ඉන්ද්‍රිය සංයුත්තය: 4.2.3. දුතිය සංඛිත්ත සූත්‍රය, පි. 384, ESN: 48: Indriyasamyutta: 13.3 In Brief, p. 1939.

▲ **ඉන්ද්‍රිය පරෝපරියත්ත ඥානය:** පාලි: **ඉන්‍ද්‍රියපරොපරියත්තං ඤාණං-** knowledge of the faculties of other beings: ඉන්ද්‍රිය පරෝපරියත්ත ඥානය ලෙසින් පෙන්වා ඇත්තේ වෙනත් සත්ත්වයන් ගේ ඉන්ද්‍රිය වැඩීමේ තත්වය: උසස්ද? හීනද? ආදීවශයෙන්, ඉන්ද්‍රියන් වැඩි තිබෙන ආකාරය යථාභූත ලෙසින් දන්නා නුවණය. මේ නුවණ ඉන්ද්‍රියපරාවරභාවය ලෙසින්ද පෙන්වා ඇත. මෙය තථාගතයන් වහන්සේ සතු දසබල ඥානයන්ගෙන් එකකි, තමන්වෙත පැමිණෙන ලෝක සත්ත්වයන්ගේ ඉන්ද්‍රිය ධර්ම: පංච ඉන්ද්‍රිය: ශ්‍රද්ධා, විරිය, සති, සමාධි, ප්‍රඥා තත්වය දන්නා තථාගතයන්වහන්සේ, ඒ අනුව සුදුසු පරිදි ඔවුනට දහම් දෙසති. ( the Tathāgata understands as it really is the superior or inferior condition of the faculties of other beings).**බලන්න**: තථාගත-දසබල ඥාණ. **සටහන්:** * පටිසම්භිදාවේ, මෙම නුවණ විස්තරාත්මකව පෙන්වා ඇත. **බලන්න**: ඛු.නි: පටිසම්භිදා 1: ඤාණකථා:68 ඉන්ද්‍රියප්‍රාවාර්ත ඥානය, පි.248. ** එම නුවණ ඇතිව බුදුන් වහන්සේ මිනිසුන්ගේ ඉන්ද්‍රිය වැඩීම පිලිබඳව පෙන්වා දෙන අන්දම පිළිබඳව **බලන්න**: * ඉන්ද්‍රිය වර්ධනය අනුව පුද්ගලවෙනස්කම්. ** අංගු.නි: 6 නිපාත: 6.1.5.2 මිගසාලා සූත්‍රය, පි.130 හා 10 නිපාත: 10.2.3.5 මිගසාලා සූත්‍රය, පි.274.

▲ **ඉන්ද්‍රිය භාවනාව** - Indriya bhawanawa:ඉන්ද්‍රියන් සංවර කරගැනීමේ භාවනාවය. ආරියවිනයේ, ඉන්ද්‍රිය භාවනාව පිලිබඳ විස්තර පිණිස **බලන්න**: ම.නි: (3): ඉන්ද්‍රිය භාවනා සූත්‍රය.

▲ **ඉන්ද්‍රියභූමි**-Indriya Bhumi: සමථ, විපස්සනා, තුන්කුසල මූල :අලෝභ, අදෝස, අමෝහ, අශුභසංඥා, සතර සති පට්ඨානය ආදීය ඉන්ද්‍රිය භූමි වේ. **මූලාශ්‍ර**: ඛු.නි: නෙත්තිප්‍රකරණය, උද්දෙසවාරය, පි.26.

▲ **ඉන්ද්‍රිය සංවරය: පාලි: ඉන්‍ද්‍රියෙසු සංවරාය**- Restraint of the six senses : ඉන්ද්‍රිය සංවරය '**ඉන්‍ද්‍රියෙසු ගුත්තද්වාරොහොති**'- ඉන්ද්‍රියන් විෂයෙහි රක්නා ලද දොර ඇති බවය. එනම්: අභ්‍යන්තර සය ඉන්ද්‍රියන් (සළායතන) ලෞකික අරමුණු කරා අයහපත් ලෙසින් ඇදීයාම සංවර කරගැනිමය. ඉන්ද්‍රිය සංවරය ඇතිකර ගැනීම , අපණ්ණක පටිපදාවට - ආසව ක්‍ෂය කරගැනීම පිණිස කටයුතු කිරීමට එළඹීමයයි බුදුන් වහන්සේ පෙන්වා ඇත. සේඛ ප්‍රතිපදාව අනුගමනය කරණ භික්ෂුව තුල මෙම ගුණය ඇත. **බලන්න**: අපණ්ණක ධම්ම හා පටිපදාව, සළායතන, සේඛ හා අසේඛ. **සටහන:**ම.නි:ඉන්ද්‍රිය භාවනා සූත්‍රයේ ඉන්ද්‍රිය සංවරය පිලිබඳ විස්තරාත්මකව පෙන්වා ඇත.

▼ **ඉන්ද්‍රියන් විෂයෙහි** රක්නා ලද දොර ඇතිබව බුදුන් වහන්සේ මෙසේ විස්තර කරඇත: **"කතඤ්ච භික්ඛවෙ භික්ඛු ඉන්‍ද්‍රියෙසු ගුත්තද්වාරොහොති: ඉධ භික්ඛවෙ භික්ඛු චක්ඛුනා රූපං දිස්වා න නිමිත්තග්ගාහී හොති, නානුබ්‍යඤ්ජනගාහී යත්‍වාධිකරණ මෙනං චක්ඛුන්‍ද්‍රියං අසංවුතං විහරන්තං අභිජ්ඣා දොමනස්සා පාපකා අකුසලාධම්මා අනවාස්සවෙය්‍යුං,තස්ස සංවරාය පටිපජ්ජති, රක්ඛීති චක්ඛුන්‍ද්‍රියං, චක්ඛුන්‍ද්‍රියෙ සංවරං ආපජ්ජිති..."**

**ඉන්ද්‍රිය සංවර ප්‍රතිපදාව**: භික්ෂුවක් කෙසේ ඉන්ද්‍රිය විෂයෙහි රක්නා ලද දොර ඇතිව වාසය කරයිද? මේ සසුනේ භික්ෂුව, ඇසින් රූප දැක නිමිති නොගනී, අනුව්‍යංජන නොගනී. යම්හෙයකින්,ඔහු ඇස අසංවර කරගෙන සිටියේ නම්, අභිජ්ජා, දොම්නස් ආදී ලාමක අකුසල ඔහු ආක්‍රමණය කරයි. එමනිසා, ඔහු ඇස සංවර කරගැනීම පිණිස එළඹේ. ඇස ආරක්‍ෂා කරයි, සංවර කරගනී... එලෙසින් ඔහු සෙසු ඉන්ද්‍රියන්: කණට ඇසෙන ශබ්ද, නාසයට දැනෙන ගඳ සුවඳ, දිවට දැනෙන රස, කයට දැනෙන පහස, මනසේ ඇතිවෙන සිතුවිලි, රැකගැනී, ඔහු සංවර කර ගනී. මේ පටිපදාව ඉන්ද්‍රිය සංවරයය. (And how, bhikkhus, does a bhikkhu guard the doors of the sense faculties? Here, having seen a form with the eye, a bhikkhu does not grasp its marks and features. Since, if he left the eye faculty unrestrained, bad unwholesome states of longing and dejection might invade him, he practices restraint over it; he guards the eye faculty, he undertakes the restraint of the eye faculty) **මූලාශ්‍ර:** අංගු.නි: (1): 3 නිපාත: 3.1.2.6 සූත්‍රය, පි. 252, EAN:3: 16.6 The Unmistaken, p. 83.

▼**ඉන්ද්‍රිය සංවරය නිවනට හේතුවේ.** ඉන්ද්‍රිය සංවරය ඇතිවිට සිල්වත්වේ-ශිලසම්පන්න, සිල්වත් බව සම්මා සමාධිය වඩාගැනීමට හේතුවේ, සම්මා සමාධිය ඇතිවිට, යථාභූත ඥානය ඇතිවේ, යථාභූත ඥානය ඇතිවිට, නිබ්ද්දාව හා විරාගය ඇතිවේ, නිබ්ද්දාව හා විරාගය ඇතිවිට විමුක්තිය- නිවන සාක්ෂාත්වේ. මේ පිළිබඳ **උපමාව**:සරු ගස-ගසක, කොළඅතු මනාව වැඩුනවිට, එහි මුල් වැඩේ, මුල් වැඩුන විට ගසේ පොත්ත, හරය වැඩේ, එමගින්, ගස සරු ගසක් බවට පත්වේ. **බලන්න:** උපග්‍රන්ථය:5. **මූලාශ්‍රය:** අංගු.නි: (4): 6 නිපාත:ධම්මිකවග්ග: 6.1.5.8 ඉන්ද්‍රියසංවර සූත්‍රය, පි.150.

▼ **ඉන්ද්‍රිය සංවරය ඇති භික්ෂුව පිළිබඳ බුදුන් වහන්සේ මේ උපමාව දක්වා ඇත:** අශ්ව රථය උපමාව: යම්කිසි සම භූමියක ඇති සිව්මංසලක, අජානිය අශ්වයන් සහිත රථයක් ඇත. අසුන් හික්මවීමෙහි සමත් දක්ෂ රියදුරෙක් ඒ රියට නැගී වමතින් රැහැන් පටියද, දකුණු අතින් කෙවිට ද ගෙන තමන් කැමති දිසවකට යැමට අසුන් හසුරුවා ගෙන රිය ගෙනයයි, නැවත කැමති ලෙසින්, කැමති විටක පෙරලා පැමිණෙයි. එලෙසින්, සය ඉන්ද්‍රිය ආරක්ෂා කරගැනීම පුහුණු කරන භික්ෂුව (අසුන් හසුරවන ලෙසින්) එම ඉන්ද්‍රියන් පාලනය කර ගැනීමට දක්ෂ වේ, ඒවා හික්මවා ගැනීමට සමත් වේ, ඒවා නිසල කරගැනීමට දක්ෂවේ. එලෙසින්, භික්ෂුව ඉඳුරන්හි වසන ලද දොර ඇතිව වාසය කරයි, ඔහු ආසව ක්‍ෂය කිරීමේ පටිපදාව ආරම්භ කර ඇත යයි බුදුන් වහන්සේ වදාළහ. **බලන්න:** උපග්‍රන්ථය:5. **මූලාශ්‍ර**: සංයු.නි: ( 4 ): සළායතනවග්ග: 1.19.2 රථුපම සූත්‍රය, පි.369, ESN: 35: Salayatanasamyutta: 239.2 The Simile of the Chariot, p.1315.

▼ **බුදුන් වහන්සේ ඉන්ද්‍රිය සංවරය** පිළිබඳව යහපත් ලෙසින් වදාරා ඇත. ඒ දහම සංඝයා එක්ව, දහමේ චිරස්ථිතිය පිණිස සජ්ජායනා කිරීම සුදුසු යයි සැරියුත් මහා තෙරුන් සංඝයාට උපදෙස් දී ඇත. **මූලාශ්‍ර**: දීඝ.නි: (3):10 සංගිති සූත්‍රය, පි. 372 , EDN: 33 Saṅgīti Sutta: The Chanting Together, p. 362.

▼**යහපත් ඉන්ද්‍රිය සංවරය** යනු මනාව වැසූ ඉන්ද්‍රියන් සහිතව වාසය කිරීමය. අභ්‍යන්තර ඉන්ද්‍රිය සයෙන් (ඇස, කණ, නාසය, දිව, කය හා

මනස) රූප, ශබ්ද, ගඳසුවඳ, රස, පහස හා සිතිවිලි යන බාහිර අරමුණු අල්වා නොගෙන, ඒවා යේ ලක්ෂණ හෝ විශේෂබවට යට නොවී (නිමිති නොගෙන) ඒ ඒ ඉන්ද්‍රිය සංවරකර ගෙන වාසය කිරීමය- යහපත් ලෙසින් ඉන්ද්‍රිය හික්මවා ගැනීමය. එනම් ලාමක අකුසල් වන ලෝභය, දෝස ආදිය ඇතිවීමට අවස්ථාව නොදීසිටීමය. ඉන්ද්‍රිය සංවරය නිසා සිදුවන යහපත හා ඉන්ද්‍රිය අසංවරය නිසා සිදුවිය හැකි අයහපත පිලිබඳ මනා දැනුමක් අරිය ශ්‍රාවකයට ඇත. ඉන්ද්‍රිය සංවරය, උසස් දහම් පුහුණුවේ යෙදෙන සංසයා සතු ගුණයකි. **බලන්න**: සේඛ හා අසේඛ. **මූලාශ්‍ර**: ම.නි. (2): 2.1.3 :සෙඛ සූත්‍රය, පි. 44, MN 53: Sekha Sutta, p. 436.
▼ **ඉන්ද්‍රිය සංවරය නිසා** ත්‍රිවිධ සුචරිතය පෝෂණයවේ. සතිය හා සම්ප්‍රජන්‍යය ඇතිවිට ඉන්ද්‍රි සංවරය ඇතිවේ. **බලන්න**: අවිද්‍යාව හා විද්‍යාව. **මූලාශ්‍ර**:අංගු.නි: (6 ): 10 නිපාත: යමක වග්ග: 10.2.2.1 අවිද්‍යා සූත්‍රය, පි.232, EAN:10: II Pairs: 61.1.Ignorance, p. 517.
▲ **ඉන්ද්‍රිය සංවර ශිලය**: Indriya Samvara Sila: උසස් පුහුණුවේ යෙදන භික්ෂු/ භික්ෂුනියන් (සේඛ පුහුණුව), සය ඉන්ද්‍රිය සංවර කර ගැනීම පිණිස කරන පුහුණුව ඉන්ද්‍රිය සංවර ශිලය වේ. **බලන්න**: සේඛ, ශිලය. ආරිය අට මග ඇතිකර ගැනීමට මේ ශිලය අවශ්‍යතාවයකි. **සටහන**: විස්තර පිණිස බලන්න: විසුද්ධිමග්ග, පරිච්ඡේදය1. **මූලාශ්‍ර:**සංයු.නි: (5-1) මහාවග්ග: මග්ගසංයුත්ත: සීලසූත්‍රය, පි. 78, ESN: 45: Maggasamyutta: 50. 55 virtue, p 1654. **ශබ්දකෝෂය: පා.සිං.ශ:** පි. 155: " **ඉන්ද්‍රියසංවර**: චක්ෂු ආදී ඉන්ද්‍රියන් ආරක්ෂා කිරීම, පංචඉන්ද්‍රිය ආරක්ෂා කිරීමෙන් රක්නා ශිලය". **B.D:** p.67: "**Indriya Samvara Sila**: morality consisting of purity of restraint the senses".

▲ **ඉන්ද්‍රිය සම්පන්න**: පාලි: **ඉන්‍ද්‍රියසම්පන්‍නො**- equipped with faculties ඉන්ද්‍රිය සම්පන්න යනු, කෙනෙකුගේ පංචඉන්ද්‍රිය පූර්-ණ බවට පත්වීමය, නිවන ලැබීමය. **බලන්න**: පංච ඉන්ද්‍රිය.
▼ **ඉන්ද්‍රියසම්පන්න වීම** පිළිබඳව බුදුන් වහන්සේ මෙසේ පෙන්වා ඇත: "මේ සසුනේ මහණ කෙළෙස් සංසිඳීම ඇතිකරණ (උපසමය), නිවන ලබාදෙන පංච ඉන්ද්‍රිය වඩයි, පරිපූර්-ණ කරගනි, එය ඉන්ද්‍රියසම්පන්න බවය ය": **" ඉධ භික්ඛු, භික්ඛු සද්ධින්‍ද්‍රියං… විරියින්‍ද්‍රියං… සතින්‍ද්‍රියං… සමාධින්‍ද්‍රියං… පඤ්ඤින්‍ද්‍රියං …භාවෙති උපසමගාමිං සම්බොධගාමිං. එත්තාවතා ඛො භික්ඛු ඉන්‍ද්‍රියසම්පන්‍නො හොතී ති" (**a bhikkhu develops the faculty of faith... energy … mindfulness … concentration … wisdom, which leads to peace, leads to enlightenment). **මූලාශ්‍ර:** සංයු.නි : (5-1): මහාවග්ග: ඉන්ද්‍රියසංයුත්තය: 4.2.9**.** සම්පන්න සූත්‍රය, පි. 390, ESN:48: Indriyasamyutta: 19.9 Equipped p. 1945.

▲ **ඉන්‍ද්‍රියෙසු අගුත්තද්වාරොහොති**- not guarding the sense doors සය ඉන්ද්‍රිය නම්වූ දොරටු ආරක්ෂා නො කිරීම මින් අදහස් කෙරේ. **බලන්න**: ඉන්ද්‍රිය අසංවරය.
▲ **ඉන්‍ද්‍රියෙසු ගුත්තද්වාරොහොති**- guard the doors of the senses සය ඉන්ද්‍රිය නම්වූ දොරටු ආරක්ෂා කිරීම මින් අදහස් කෙරේ.**බලන්න**: ඉන්ද්‍රිය සංවරය. **සටහන**:ඉන්ද්‍රියේ ගුත්තද්වාර ඇති භික්ෂූන් අතරෙන් අග්‍ර නන්ද තෙරුන්ය. **බලන්න:** අග්‍රතම ශ්‍රාවක භික්ෂූන්.

**ඉණ**

▲**ඉණ-** debt: ඉණ ලෙසින් පෙන්වා ඇත්තේ ණයගැතිබවය. කාමභෝගී පුද්ගලයෙක්හට ණයගැති බාවය දුකකි, ලෝකයාට ණය වීම නිසා ඔහු දිළින්දෙක්- දුප්පත්කෙනක් බවට පත්වේ. ණයගැතිබව නිසා විඳින්නට සිදුවන දුක් පිඩා මෙහි විස්තරාත්මකව පෙන්වා ඇත. **මූලාශ්‍රය:** අංගු.නි: (4) 6 නිපාත:ධම්මිකවග්ග: 6.1.5.3 ඉණසූත්‍රය, පි.138.

**ඉප**

▲ **ඉපදවියයුතු ධම්ම හා නොඉපදවියයුතු ධම්ම-** Dhamma to be aroused & Dhamma not to be aroused : ඉපදවියයුතු ධම්ම: මග වැඩීම පිණිස ඇතිකරගතයුතු කුසල ධම්මය, නොඉපදවියයුතු ධම්ම නම් අකුසලයය. **බලන්න:** උත්පාදයිතව්‍ය ධම්ම, අනුත්පාදයිතව්‍ය ධම්ම.

**ඉර**

▲ **ඉරියාපථ**- Iriyapatha: ඉරියාපථ යනු කය හසුරුවන සතර ආකාරය: සිටීම, ඉඳීම, ඇවිදීම හා ඇලවීම. මෙය භාවනාව පිලිබඳ විෂයකි. සති පට්ඨාන සූත්‍රයේ කායානුපස්සනාව යටතේ ඉරියාපථ භාවනාව විස්තරකර ඇත. **බලන්න**: භාවනා

▲ **ඉරිසියාව**: පාලි: **ඉස්සා**-envy **හා ඉරිසියානොවීම** -non-envy ඉරිසියාව: අනුන්ට ලැබෙන ලාභ සත්කාර ආදිය ගැන සිතේ ඇති අකමැත්තය. මෙය සිත කෙලෙසන අකුසලයකි, දුගතිය ඇති කරයි. පාපික ලාමක දෙයකි. ඉරිසියාව නැතිවිට ආධ්‍යාත්මික මග වඩා ගත හැකිවේ. ඉරිසියාව සාවද්‍ය ධම්ම යකි.**බලන්න**: උප කෙළේස, සල්ලේඛ පරියාය. **මූලාශ්‍ර:**අංගු.නි: (1 ):2 නිපාත:17: 1 අකුසල පෙය්‍යාලය සූත්‍ර, පි.230, EAN:2: XVII, Unwholesome R. , p. 74.

▼**ඉරිසියාව** පහකරගැනීම පිණිස එය අකුසලයක් බව නිතරම නුවණින් දැකිය යුතුය. **මූලාශ්‍ර**:අංගු.නි.(6)10 නිපාත, මහා වග්ග, 10.1.3.3. කාය සූත්‍රය,පි. 100, EAN:10: III The Great Chapter, 23.3. Body, p. 500.

▼ **අරහත්වය පිණිස** නැතිකරගතයුතු අකුසල දහම් 10 ට ඉරිසියාවද ඇතුලත්වේ. **බලන්න**: අරහත්.

▼**වෙනත් මූලාශ්‍ර**: **1**. Per **Bhikkhu Bodhi**: Envy is resentment over the honors, etc., shown to others. **බලන්න**: EMN note 87, p. 1179. **2.**" අන්‍යයන්ට ලැබෙන ඇඳුම් පැළඳුම්, ගේදොර, තනතුරු පුද සත්කාර ආදිය නො ඉවසන ස්වභාවය ඉස්සා නම්වේ. ඊර්-ෂියාව ඇතිවිට අනුන්ගේ සම්පත්ති නැතිකිරීමට සිතයි. මෙය ඇති අය ඒ බව නොදනී. ලාමක පාපයකි" **කෙලෙස් එක්දහස් පන්සියය**: පි.83, රේරුකානේ චන්දවිමල මහානාහිමි, 2008. **3.** " ඉරිසියාව කාන්තාවන් තුළ බහුලව ඇති අකුසලයකි. මෙය භයානක අකුසලයක් වන්නේ එමගින් දුගතියට පත්වෙන නිසාය. මෙය නිසා කායික හා මානසික සුවය ඇතිනොවේ. බුදුන්වහන්සේ වදාළේ කෙනෙකුට සමාජයේ පිළිගැනීමක් නැතිවන්නේ එම පුද්ගලයා සසරේ කරනලද ඉරිසියාවනිසාය). මුදිතාව දියුණු කිරීමෙන් මෙය නැතිකරගත හැකිවේ. මහාමේඝ අන්තර්ජාල ලිපිය: https://mahamegha.lk/2020/07/09/irisiyawa-durala-mudithawa-wadamu/

▲ **ඉර්දී ප්‍රාතිහාර්ය** -miracle of psychic power :ඉද්දි- ඍද්ධි ලෙසින්ද පෙන්වා ඇත. විවිධවූ හාස්කම් දැක්වීමට ඇති හැකියාව- බලය. සතර ඉද්දි පාද සම්පූර්ණ කරගැනීමෙන් විවිධ ඉර්දීබල ලබාගත හැකිය. විස්තර පිණිස **බලන්න**: සංයු.නි: ඉද්දිපාද සංයුත්තය. **බලන්න**: ප්‍රාතිහාර්ය, සතර

ඉද්දිපාද, ඉර්දී බල.

▲ **ඉර්දීබල**: පාලි: **ඉද්ධිවිධං -**spiritual power: ඉද්දි- සෘද්ධිබල ලෙසින් පෙන්වා ඇත්තේ සතර ඉද්දිපාද වඩා ගැනීමෙන් ලැබෙන ආධ්‍යාත්මික බලයන්ටය. **ඉද්ධිමත්-සෘද්ධිමත්** ලෙසින්ද හඳුන්වයි. **බලන්න**: සතර ඉද්දිපාද. **සටහන්**: * සංයු. නි. ඉද්දිපාද සංයුත්තයේ ඉද්දි පිලිබඳ විස්තරාත්මකව පෙන්වා ඇත. ** බුදුන් වහන්සේගේ ශ්‍රාවකයන් අතුරින්, මහා මුගලන් තෙරුන් අග්‍ර සෘද්ධිමත් බව ලබා ඇත. **බලන්න**: උපග්‍රන්ථය: 1. **ඉද්දී බලඇති භික්ෂුණියන් අතරෙන් අග්‍ර: අග්‍රශ්‍රාවිකා උප්පලවන්නා තෙරණිය: **බලන්න**: උපග්‍රන්ථය:2. ** විවිධ ඉද්දිබල විස්තරය පිණිස **බලන්න**:දීඝ.නි: කේවඩ්ඩ සූත්‍රය.** පුරාණයේද, වත්මන් කාලයේද, අනාගතයේද, සිටින ශ්‍රමණ හා බ්‍රාහ්මණ යන් විවිධ ඉද්ධිබල සහිතවූ බව මෙහි පෙන්වා ඇත. **බලන්න:** සංයු.නි: (5-2) මහාවග්ග: ඉද්දිපාදසංයුත්ත: 7.2.7 ඉද්ධිවිධ සූත්‍රය, පි.58.

▼ **බුදුන් වහන්සේ** මෙසේ වදාළහ: "මහණෙනි, මම යම්තාක් කැමති වේ නම් ඒ තාක් විවිධ ඉද්දී පැවත්විය හැකිය" ( එක් පුද්ගලයෙක්ව බොහෝ දෙනෙක්වීම...සඳ හිරු ස්පර්-ශ කිරීම ආදීවූ...) **සටහන**: මේ සූත්‍රයේ එම ඉද්දී බල විස්තරාත්මකව පෙන්වා ඇත. **මූලාශ්‍ර**: සංයු.නි: ( 2): නිදානවග්ග: කස්සපසංයුත්ත: 4.1.9 ජාන අභිඥා සූත්‍රය, පි. 342, ESN: 16: Kassapasamyutta: 9 Jhānas and Direct Knowledges, p. 817.

▲ **ඉර්දීවිධ ඥානය-** Irdivida Nana: සතර ඉද්දිපාද යහපත් ලෙසින් වඩා ගැනීමෙන් ඇතිකරගන්නා සුඛසංඥාව හා ලඝු සංඥාව මගින් ලබා ගන්නා නුවණ ඉර්දීවිධ ඥානය-සෘද්ධිවිධඥානය ය. **මූලාශ්‍ර**:ඛු.නි: පටිසම්භිදා -1, ඤානකතා: 50 ඉර්දීවිධ ඥානය, පි. 232.

▲**ඉර්දී සම්පත්**-Irdisampath :ඉද්දී සම්පත් ලෙසින් පෙන්වා ඇත්තේ සක්විති රජුට ඇති සම්පත් 4 ගැනය. **බලන්න**: සක්විතිරජ.

**ඉව**

▲ **ඉවසීම**- Patience: ආධ්‍යාත්මික මග වඩා ගැනීම පිණිස අවශ්‍ය මූලික කරුණකි, කුසලයකි. **බලන්න:** ක්ෂාන්තිය. **සටහන්**: * ධර්ම පුහුණුව ලබන පුද්ගලයා, ඉවසීම පුරුදු කලයුතු ආකාරය පිණිස **බලන්න:** ම.නි. කකචූපම සූත්‍රය. ** ඉවසීම දස පාරමිතාවක් ලෙසින්ද පෙන්වා ඇත.

**ඉස**

▲**ඉසිදත්ත තෙර-**Isidattha Thera: **බලන්න**: උප ග්‍රන්ථය:1

▲**ඉසිදත්ත හා පුරාණ උපාසකයන්: -**Isidattha & Purana Upaska: **බලන්න**: උප ග්‍රන්ථය:3

▲ **ඉසිපතනය**-Isipathna: බුදුන් වහන්සේ ප්‍රථම දහම් දේශනාව පැවැත්වූවේ, ඉන්දියාවේ, බරණැස් නුවර, ඉසිපතන මිගදායේය. මෙය බෞද්ධයන් ගේ පූජනීය ස්ථානයකි. **බලන්න**: පූජනීය සිව් ස්ථාන.

▲ **ඉසිවරු**-Irshi :ඉසිවරු ලෙසින් පෙන්වා ඇත්තේ, ආධ්‍යාත්මික බල ඇති පුද්ගලයන්ය. බුදුන් වහනේ පසේබුදුවරු, ඉසිවරු ලෙසින් දක්වා ඇත. ඒ ඉසිවරු වාසය කල ස්ථනයක් ලෙසින් රජගහනුවර පිහිටි , ඉසිගිලි පව්ව ගැන මෙහි විස්තර කර ඇත. **මූලාශ්‍ර**: ම.නි: (3): 3.2.6 ඉසිගිලි සූත්‍රය, පි. 222, EMN:116 Isigili Sutta, p. 847.

▼**පුරාණ දඹදිව වාසය කල** යහපත් ගුණ ඇති ඉසිවරු බැහැදැකීමට, සක්දෙවිඳු පැමිණි විස්තරය මෙහි දක්වාඇත. **මූලාශ්‍රය**: සංයු.නි: (1) සගාථවග්ග:සක්කසංයුත්ත:11.1.9 අරඤ්ඤායතනඉසි සූත්‍රය, පි.428.

▼ **මුහුදු තෙර වාසය කල** යහපත් ඉසිවරු, අසුරයන්ගෙන් ඇතිවිය හැකි බිය නැතිකරගැනීම පිණිස, සම්හර අසුර රජු හමුවීම පිලිබඳ විස්තර මෙහි දක්වා ඇත. **මූලාශ්‍රය**: සංයු.නි: (1) සගාථවග්ග:සක්ඛසංයුත්ත:11.1.10 ඉසයෝ සමුද්දක සූත්‍රය, පි.430.
▼**ඉසිවරුන්ගේ ඉද්දි බලයෙන්** දණ්ඩක ආදී වනයන් ඇතිවීම පිළිබඳව **බලන්න**: ම.නි: (2) උපාලි සූත්‍රය.
▼ **අසිත දේවාල ඉසිවරයා** ගේ ඉද්දි බල ගැන විස්තර පිණිස බලන්න: ම.නි: (2) අසේලයාන සූත්‍රය.

**ඉෂ**

▲**ඉෂ්ඨධම්ම**- Ishtadhamma: ඉෂ්ඨධම්ම ලෙසින් පෙන්වා ඇත්තේ, ලබාගැනීමට කැමති දේය (things that are wished). ඒවා ලබාගැනීම පහසු නොවේ. මෙහි එවැනි කරුනු 10 ක් පෙන්වා ඇත. මානාවූ: ධනය (භෝග- Wealth) ,වර්ණ (රූමත්බව- Beauty) ,ආරෝග්‍ය, ශීලය, බ්‍රහ්ම චරියාව, කලනමිත්‍රයෝ, බහුශ්‍රැතබව, ප්‍රඥාව, යහපත් ගුණ දහම (Good qualities),ස්වර්ගය, **මූලාශ්‍රය**: අංගු.නි: (6) 10 නිපාත:10.2.8.3 ඉෂ්ඨධම්ම සූත්‍රය, පි.270,EAN:10: 73.3 Wished for, p.522.

## උ කොටස:උක,උග,උඩ,උච,උජ,උට,උත,උද,උණ,උප, උභ,උර,උල,උස

**උක**

▲**උක්කන්ටක රෝගය**- Ukkantaka rogaya :උක්කන්ටක රෝගය ලෙසින් පෙන්වා ඇත්තේ සමේ ඇතිවන හොරි, කුෂ්ඨ රෝගයකි. **උපමාව**: සිවලා. එවැනි රෝගයට ලක්වූ සිගාලයාට- සිවලෙකුට (නරියාට) එක තැන සිටිය නොහැකිය. එලෙසින් ලාභසත්කාර ආදියට යටවූ භික්ෂුවට එක්තැන්වී දහම් මග වඩා ගැනීමට නොහැකිය.බලන්න: උපග්‍රන්ථය:5. **මූලාශ්‍රය:** සංයු.නි: (2) නිදාන්වග්ග: ලාභසත්කාර සංයුත්ත:5.1.8 සිගාල සූත්‍රය, පි.372.
▲ **උකෙඛපනීයකම්ම**- Ukekhapaniya kamma :මෙය විනය කම්මයකි. වැරදිකල භික්ෂුවක් ඒ වැරැද්දට පිළියම් කර ගන්නාතෙක්, සංඝයා විසින් බැහැර කිරීමේ විනයය. එනම්, ඇවත් නොදැක්මය. ඡන්න කපිලවස්තු තෙර හික්මවීම පිණිස, අරිට්ඨ භික්ෂුවගේ පවිටු ලාමක දිට්ඨීය අවසන්කරගැනීම පිණිස, මේ විනය පැනවීම බුදුන් වහන්සේ අනුමත කළහ.**බලන්න**: උපග්‍රන්ථ:1, 4. **මූලාශ්‍රය:**වින.පි: චුලවග්ග පාලිය I, ඇවැත් නොදැකීමේ උකෙක්ඛපනීයකම්ය, පි.104.

**උග**

▲ **උග්ගහ මෙණ්ඩක සිටුපුත්**- Uggaha Medakasituputhra **බලන්න**: උපග්‍රන්ථය:3.
▲ **උග්ග විසාලානුවර ගහපති**-Ugga Householder of Visalapura **බලන්න**: උපග්‍රන්ථය: 3

▲ **උග්ග හත්ථිගාම ගහපති**- Ugga Householder of Hatthigāma **බලන්න**: උපග්‍රන්ථය: 3.
▲ **උග්ඝටිතඤ්ඤු**- Ugghatithannu :උග්ඝටිතඤ්ඤු, උසස් ප්‍රඥාව ඇතිබව මින් අදහස් කරයි. දහම් ඇසු කෙනෙහිම, චතුසත්‍ය අවබෝධ කරගැනීමේ හැකියාව ඇතිබවය. **බලන්න**: ප.සි.ශ,පි:163. **සටහන:** ක්ෂණික අභිඥා-ඛිප්පාභිඤ්ඤා ඇතිබව:උග්ඝටිතඤ්ඤුය. බාහිය දාරුචිරිය

රහතුන්හට එම උසස් ප්‍රඥාව පැවති නිසා දහම ඇසූ පමණින්ම අරහත්වය ලැබූබව පෙන්වා ඇත. **බලන්න**: බු.නි:උදාන පාලිය: බාහිය සූත්‍රය. **මූලාශ්‍ර:** අංගු.නි:(1) 1නිපාත:එතදග්ග පාළියසූත්‍ර,පි.84**,** EAN:1:Foremost, p. 44.

**උඩ**

▲ **උඩඟුකම**- Pride :උඩඟුකම-අහංකාරය ලෙසින්ද පෙන්වා ඇත. මෙය අකුසලයකි**. බලන්න**: අහංකාර.

**උච**

▲ **උච්චාසයන මහාසයන-** Ucchasayana Mahasayana :උච්චාසයන (higher seats)යනු උස් ආසනයන්ය, මහාසයන යනු සැපපහසු ආසනයන්ය. උපෝසථ අටසිල් හා සාමණේර දසසිල් රකිනා අය එවැනි ආසන භාවිතයෙන් වැලකි සිටිති. **බලන්න**: ශිලය. **සටහන:** පා.සි.ශ: පි.164: "උස් ආසනය-වඩු රියනකින් උස් ආසනය. බොහෝ සැපපහසු ලෙස සකස් කල ඇඳ පුටු ආදිය".

▲ **උච්චේද දිට්ඨිය**- Uccheda-diţţhi: Annihilation view : මෙය, බුදුන් වහන්සේ වැඩසිටි සමයේ අන්‍යපරිබ්‍රාජකයන් දැරූ විවිධ මතයන්ගෙන් එකකි. උච්චේද වාදය ලෙසින්ද පෙන්වා ඇත.එනම්, මරණින් මතු නැවත ඉපදීමක් නැතැයි යන ඇදහීම (වාදය). උචෙඡද දෘෂ්ටිකයා - ඒ අදහස දරන තැනැත්තාය. දිවි ඇතිතාක් සැපසේ ජිවත්විය යුතුය. නැවත මේ ශරිරයේ ඒමක් -පැමිණීමක් නැත ආදී අදහස් ඔවුන් දරයි. **බලන්න**: දිට්ඨි, අන්ත දිට්ඨි සතර. **සටහන**: අංගු.නි: (5) 8 නිපාත: වෙරඤ සූත්‍රයේ මේ ගැන විස්තරාත්මකව පෙන්වා ඇත.

▲ **උච්ඡඩ පඤ්ඤා**- lap-like wisdom :උච්ඡඩ පඤ්ඤා ලෙසින් පෙන්වා ඇත්තේ මද ප්‍රඥාවය. මෙය ඔඩොක්කුවේ ප්‍රඥාව ලෙසින්ද පෙන්වා ඇත. දහම අසන කෙනක්, නැගීසිටිවිට ඇසූ දහම අමතකවීම මින් අදහස් කෙරේ. **බලන්න:** පුද්ගලයෝ තිදෙනා, උපග්‍රන්ථය:5. **මූලාශ්‍ර:**අංගු.නි: (1): 3 නිපාත: 3.1.3.10 සූත්‍රය, පි. 277, EAN: 3: 30.10 sutta, p. 88.

▲ **උච්ඡින්න භවනෙත්තති-** Ucchintha bhavaneththi :උච්ඡින්න භවනෙත්තති ලෙසින් පෙන්වා ඇත්තේ සංසාරය නැවත ඇති නොවන ලෙස සිඳ දැමීමය. උසුන් මුල්කරනලද තල් ගසක් මෙන් සසර නිමා කිරීමය. **උපමාව:** තල්ගස, උපග්‍රන්ථය:5. **සටහන:** * තල්ගස සහමුලින්ම සිඳ දැමුවිට, එය නැවත හටනොගනී. එලෙස භික්ෂුව සියලු අනුසය සිඳ දමා නිවන ලබා ගත යුතුවේ. ** අංගු.නි: (5) 8 නිපාත: වෙරඤ සූත්‍රයේදී, තමන්වහන්සේ එලෙසින් කෙළෙස් නිමා කර ඇතිබව බුදුන් වහන්සේ පෙන්වා ඇත. **මූලාශ්‍ර**: අංගු.නි: (4 ):7 නිපාත: 7.1.2.1. අනුසය සූත්‍රය හා අනුසය පහාන සූත්‍රය, පි. 312, EAN:7: 11.1 and 12.2. Underlying tendencies, p. 371.

**උජ**

▲ **උජුපටිපන්න**- Ujupatipanna :උජුපටිපන්න යනු, ඍජු මගට- ආරිය අටමගට පැමිණිබවය. මෙය බුදුන් වහන්සේගේ ශ්‍රාවක සංඝයා සතු සංඝ ගුණයකි. **බලන්න**: සංඝගුණ.

**උට**

▲**උට්ඨාන වීරිය**- Uttanaviriya: කෙළෙස් ප්‍රහීණය පිණිස බලවත් වීරිය කිරීම- අලසබව නැතිකර ගැනීමේ උත්සාහය, උට්ඨාන වීරියය**.** එම විරිය ඇති තැනත්තා **උට්ඨායිකය**. බෝසතුන් උට්ඨාන වීරිය වඩා, බුද්ධත්වය ලැබුවෝහ: **බලන්න**: බු.නි: උදානපාලිය: බෝධිවග්ග සූත්‍ර, ප්‍රධන්විරිය.

▲ **උට්ඨාන සම්පත -**Uttanasampatha: උට්ඨාන සම්පත, සතර සංග්‍රහ වස්තුවලින් එකකි. තමන් කරන රැකියාව හෝ ජීවිකාව පිලිබඳ නිපුණතාවයෙන් සමත්බව, උත්සහාවන්තබව, පරික්ෂාකාරීව තීරණගැනීමේ හැකියාව, සංවිධානයට දක්ෂබවය. **බලන්න**: සතර සංග්‍රහ වස්තු.

**උත**

▲**උත්තම ආචාරධර්ම -**Utthama achara Dhamma :උත්තම ආචාර ධර්ම නම් ආධ්‍යාත්මික මග වඩාගැනීමට අවශ්‍ය කරුණුය. **බලන්න**: ආභිසමාචරික ධම්ම

▲ **උත්තම ඥානය-** Utthama nana: උත්තම ඥානය ලෙසින් පෙන්වා ඇත්තේ අභිඥාවන්ය. **බලන්න**: අභිඥා.

▲ **උත්තම-නීච හා උත්තම-උත්තම පුද්ගලයෝ-** Uththama- niche & Uththama-uththama pudgala :උත්තම-නීච පුද්ගලයා ( උන්නතොන්ත) නම්, උසස් කුලයක් ඉපදී, පහත් දේ- දුසිරිතය කරන තැනැත්තාය. මරණින්මතු ඔහු නිරයටයයි. උත්තම-උත්තමපුද්ගලයා (උන්නතුන්නත) උසස් කුලයක ඉපදී, උසස් ලෙස- සුචරිතය ඇති කටයුතු කරයි. ඔහු දෙව්ලොව උපත හිමිකර ගෙන ඇත. **බලන්න**: ඕනතොනත හා ඕනතුන්නත පුද්ගලයෝ **මූලාශ්‍රය:** අංගු.නි: (2) 4 නිපාත: 4.2.4.6 ඕනතෝනත සූත්‍රය, පි.186.

▲ **උත්තම පුරුෂයා:** පාලි: **උත්තමපුරිසො**: supreme person බුදුන් වහන්සේ, ධම්මවිනයේ උත්තම පුරුෂයා මෙසේ පෙන්වා ඇත: **"පඤ්චඞ්ගවිප්පහීනො භික්ඛවෙ භික්ඛු පඤ්චඞ්ග සමන්නාගතො ඉමස්මිං ධම්මවිනයෙ කෙවලී වුසිතවා උත්තමපුරිසොති වුච්චති"** පංච අංග පහ කර ගත්, පංච අංග යන්ගෙන් සමන්විතව, බඹසර පුරාගත් භික්ෂුව, ධම්ම විනයේ (මේ සසුනේ) උතුම් පුද්ගලයාවේ: රහතන්වහන්සේය. (...a bhikkhu who has abandoned five factors and possesses five factors is called, in this Dhamma and discipline, a supreme person who is consummate and has completely lived the spiritual life). **සටහන**: පහකරගත් පංච අංග නම්: පංච නීවරණයන්ය. සමන්විතවූ පංච අංග නම්: අසේඛ ශිලය, අසේඛ සමාධිය, අසේඛ ප්‍රඥාව, අසේඛ විමුක්තිය හා අසේඛ විමුත්ති ඥානදර්ශනය. මෙහිදී පෙන්වා ඇත්තේ රහතන්වහන්සේ ගේ ගුණයන්ය. **බලන්න**: නීවරණ, සේඛ හා අසේඛ. **මූලාශ්‍ර**: අංගු.නි: (6):10 නිපාත: 10.1.2.2 පංචඅංග සූත්‍රය, පි.58,EAN:10: 12.2 Five Factors, p. 495.

▲**උත්තම දසපුද්ගලයෝ-** Ten Superior persons :බුදුන් වහන්සේ උත්තම (ආරිය) පුද්ගලයෝ දස දෙනෙක් පෙන්වා ඇත: **" දස ඉමෙ භික්ඛවෙ, පුග්ගලා ආහුනෙය්‍යා පාහුනෙය්‍යා දක්ඛිණෙය්‍යා අඤ්ජලී කරණීයා අනුත්තරං පුඤ්ඤක්ඛෙත්තං ලොකස්ස…"**. " මහණෙනි, මේ පුද්ගලයන් දස දෙනා, ලෝකයාගෙන් තෑගි ලැබීමට, සත්කාර සංග්‍රහ ලැබීමට, පුදපූජා-දක්ෂිණා ලැබීමට, ගෞරව නමස්කාර ලැබීමට සුදුසුය. ඔවුන්ට කරන පුද පූජා නිසා ලෝකයාට බොහෝ පින් ලැබේ". එනම්: 1) තථාගත සම්මා සම්බුද්ධ 2) පසේ බුදුවරු 3) උභතෝභාගි රහතුන් 4) ප්‍රඥා විමුක්ති රහතුන්5) කායසක්ඛි උතුමන් 6) දිට්ඨිප්‍රාප්ත උතුමන් 7) ශ්‍රද්ධා විමුක්ත උතුමන් 8) ධම්මානුසාරි උතුමන් 9) ශ්‍රද්ධානුසාරි උතුමන් 10) ගෝත්‍රභූ උතුමන්. **බලන්න:** ආහුනෙය්‍ය පාහුනෙය්‍ය ආදී ගුණ.

**සටහන්**: * ඉහත ගුණ ආරිය සංඝයා සතු ගුණයන්ය .**බලන්න:** සංඝගුණ. ** 3-9 දක්වා වූ ආරියන් පිළිබඳ විස්තර පිණිස **බලන්න:** සත්ආරිය පුද්ගලයෝ. ** ගෝත්‍රභූ ලෙසින් පෙන්වා ඇත්තේ බුද්ධවංශයට ඇතුලවූ ආරිය පුද්ගලයාය. **බලන්න**: ගෝත්‍රභූ. **මූලාශ්‍ර**:අංගු.නි:(6):10 නිපාත: නාථ වග්ග, 10.1.2. ආහුණෙය්‍ය සූත්‍රය, පි.70, EAN: Protector: 16-6 Worthy of Gifts, p. 497.

▲**උත්තම ප්‍රතිපදාව**-Uttama prathipadawa : උත්තම ප්‍රතිපදාව යනු ඇත්තේ ආරියඅටමගය. **බලන්න**:ආරියඅටමග. **මූලාශ්‍ර**: අංගු.නි: (1): 3 නිපාත: ආනන්දවග්ග: 3.2.3.1 සූත්‍රය, පි. 420, EAN:3: Ananda vagga, 71.1. Channa, p. 117.

▲**උත්තම මග**-Uththama maga: උත්තම මග, ආරියඅටමගය. **බලන්න**:ආරියඅටමග.

▲**උත්තරකුරු ප්‍රදේශය**-Uttarakuru :උත්තර කුරු ලෙසින් පෙන්වා ඇත්තේ සක්විති රජ පාලනය කරන සතර දීප යන්ගෙන් උතුරේ පිහිටි ප්‍රදේශයය. **බලන්න**: සක්විතිරජු. **සටහන:** ජම්බුද්වීපයට, උතුරින් පිහිටි දේශය, සමහරවිට මධ්‍යම ආසියාව වියහැකිය. **බලන්න**: EAN:9:note 1884, p.672.

▼**උත්තරකුරු වාසින්-ජනයා** කරුණු 3 කින් තව්තිසා දෙවියන්ට හා දඹදිව වාසීන්ට වඩා ප්‍රබලයයි මෙහි දක්වා ඇත: 1) ආත්මාර්ථකාමී නොවීම හා අල්ලා නොගැනීම (without selfishness and possessiveness) 2) නියතවූ ආයුෂ තිබීම 3) විශේෂජීවන තත්වයක් තිබීම. **බලන්න**: ජම්බුද්වීපය , තාවතිංස දේවලෝකය. **මූලාශ්‍රය:** අංගු.නි: (5) 9 නිපාත: 9.1.3.1 ඨාන සූත්‍රය, පි.462.

▲**උත්තිය -උත්තර තෙර**- Utthara Thera :**බලන්න:** උපග්‍රන්ථය:1

▲ **උත්තරා උපාසිකාව-** Utthara Upasika: **බලන්න:** උපග්‍රන්ථය:3

▲ **උත්තර දේවපුත්‍ර**- Utthara Deva: මේ දේවපුත්‍ර බුදුන් වහන්සේ බැහැදැක, ජීවිතය හා මරණය ගැන විමසූ බවමෙහි දැක්වේ. **මූලාශ්‍රය:** සංයු.නි: (1) සගාථවග්ග: දෙවපුත්තසංයුත්ත: 2.2.9 උත්තර සූත්‍රය, පි.130.

▲ **උත්තර මානවක**- Utthara Manawaka : මොහු, කජන්ගලා නියම් ගමේ පාරාශරිය බ්‍රාහ්මණයා ගේ සිසුවෙකි. බුදුන් වහන්සේ, කජන්ගලා නියම් ගමේ, මූබෙලු වනයේ වැඩ වසන සමයේ බුදුන් වහන්සේ බැහැදැකීමට පැමිණ ඇත. බුදුන් වහන්සේ, ඔහුගෙන් පාරාශරිය බ්‍රාහ්මණයාගේ ඉන්ද්‍රිය භාවනාව පිලිබඳ විමසුහ. ඒ ක්‍රමය, ආරිය විනයේ ඉන්ද්‍රිය භාවනාවට වඩා වෙනස් බව පෙන්වීමට බුදුන් වහන්සේ මේ සූත්‍රය වදාළහ. **මූලාශ්‍රය:** ම.නි: (3) 3.5.10 ඉන්ද්‍රිය භාවනා සූත්‍රය, පි.632.

▲**උත්තරී මනුස්සධම්ම-** superhuman distinction :උත්තරී මනුස්සධම්ම- උත්තරීය මනුස්ස ධම්ම, ලෙසින් පෙන්වා ඇත්තේ ආරියභාවය ලබාදෙන ධම්මතාය: සතරමග සතරඵල: සෝතාපන්න- අරහත්වයලබාගැනීමට ඉවහල් වන ධර්මතාය. කරුණු 6 ක් පහකරගත් විට ආරියබවට සමත් ඥානදර්ශන විශේෂය පසක් කරගැනීමට හැකිවේ: **" ඉමෙ ඛො භික්ඛවෙ ඡ ධම්මෙ පහාය භබ්බො උත්තරිමනුස්‍ස ධම්මා අලමරියඤාණ දස්‍සනවිසෙසං සච්ඡිකාතුන්ති".** 1) සිහි මුලාව- මුට්ඨස්‍සච්චං- Muddle-mindedness 2) විමසුම් නුවණ නැතිබව- අසම්ප්‍රජන්‍යය -අසම්පජඤ්ඤං - lack of clear comprehension 3) ඉන්ද්‍රිය

දොර වසා නොතිබීම - ඉන්ද්‍රියෙසු අගුත්තද්වාරතං- not guarding the doors of the sense faculties 4) භෝජනයේ පමණ නොදන්නා බව- භොජනෙ අමත්තඤ්ඤුතං- lack of moderation in eating 5) දෙපිටකාට්ටු බව- වංචාසහගත බව-කුහනං- duplicity 6) චාටුකථාව- ඉච්චාකථාව-ලපනං- flattery. **මූලාශ්‍ර:** අංගු.නි: (4): 6 නිපාත: අරහත්වග්ග: 6.2.3.3 උත්තරීමනුස්සධම්ම සූත්‍රය, පි.254, EAN:6: 77.3 Superior, p.360.

▲**උත්තරීතර මනුෂ්‍යයා** -super human : උත්තරීතර මනුෂ්‍ය (උතුම් මිනිසා) යනු මනුෂ්‍යත්වය -මිනිස්බව ඉක්මවූ පුද්ගලයාය. අතිමානුෂික- අධිමානුසික- බව ලබාගත් පුද්ගලයා- උතුමාය. එනම්, සියලු කෙලෙස්වලින් මිදී, නිවන සාක්ෂාත් කරගත් ආරිය පුද්ගලයාය. ඔහු විමුක්තිය හා විමුක්ති ඥානදර්ශනය පසක් කර ඇත. **සටහන**: අටුවාවට අනුව දස කුසලයන් යනු මිනිස් ධර්මයන්ය- මනුෂ්‍ය ශිලයය. එම ශිලය මානව දියුණු කරගත් පුද්ගලයා මිනිස් ධර්මයන්ට වඩා උසස්ධර්මතා වන ජාන, විපස්සනා ඥාන, මග ඵල ආදීය ක්‍රමයෙන් සාක්ෂාත්කරගෙන උතුම් ආරියබව ලබාගැනීමට අවශ්‍ය ඥාණදර්ශනය අවබෝධ කරගනී- නිවන් සුවය ලබාගනී. **බලන්න**:EAN: note:44, p. 582. **මූලාශ්‍ර:** අංගු.නි.(1) 1 නිපාත: ශුක වගග, 1.5.5. සූත්‍රය, පි.54,EAN:1: A spike**,** p.38.

▲ **උතුම්**- Nob: උතුම් ලෙසින් දක්වන්නේ ආරිය බවය. **බලන්න**: ආරිය.

▲ **උතුම් අස්වැසිල්ල** -supreme consolation: උතුම් අස්වැසිල්ල ලෙසින් පෙන්වා ඇත්තේ සියලු දුක නිමකර අරහත්වය ලැබීමය. **බලන්න**:අස්වැසිල්ල.

▲ **උතුම් ගුරුවරයා-**The Noble Teacher: ලෝකයේ පහලවූ සියලුම ගුරුවරුන් (ශාස්තෘන්- ආචාර්යන්) අතුරින් බුදුන් වහන්සේ උතුම් ගුරුවරයාය. තමන්වහන්සේ අනුගමනය කරන පැවිදි, ගිහි හවතුන්ට මෙන්ම, අවස්ථානුකූලව දෙව් දේවතාවන්ටද, අන්‍යආගමික පිරිසටද, ඔවුන්ගේ සුවය, සහ යහපත පිණිස ධර්මය දේශනා කර ඇත, අවවාද අනුසාසනා කර ඇත, ධර්ම කරුණු සත්‍ය ලෙසින්ම පැහැදිලි කර ඇත. මුළු ත්‍රිපිටකය පුරා දැකිය හැක්කේ, බුදුන් වහන්සේ, මහා ප්‍රඥාවෙන්, මහා කරුණාවෙන්, මහා අවබෝධයකින් යුතුව අවලව, නිර්භයව, ලෝක සම්මත ගුරුවරයා ලෙසින් ධර්මය- සත්‍ය, සමස්ත ලෝකයාගේ හිත පිණිස සුව පිණිස දේශනා කර ඇති ආකාරයය.**බලන්න**: උපග්‍රන්ථය:6

▼ **නිවන් මග දේශනා කළ බුදුන් වහන්සේ මෙසේ වදාළහ:**"මහණෙනි, ඔබට නිවන හා නිවන්මග පෙන්වා දුන්නෙමි, ශ්‍රාවකයන් ගේ හිතසුවය කැමති, ඔවුන් කෙරේ අනුකම්පාව ඇති ගුරුවරයෙක් විසින් කලයුතු දේ මා විසින් ඔබට කර ඇත. මේ අවට රුක්මුල්, හිස්කුටි ඇත, පසුවට පසුතැවිලි නොවීම පිණිස අප්‍රමාද නොවී භාවනා කරන්න. මෙය අපගේ අනුසාසනය ය"." **ඉති ඛො භික්ඛවෙ දෙසිතං වො මයා අසඞ්ඛතං දෙසිතො අසඞ්ඛතගාමී මග්ගො. යං භික්ඛවෙ සත්ථාරා කරණීයං සාවකානං හිතෙසිනා අනුකම්පකෙන අනුකම්පං උපාදාය, කතං වො තං මයා එතානි භික්ඛවෙ රුක්ඛමූලානි එතානි සුඤ්ඤාගාරානි, ඣායථ භික්ඛවෙ, මා පමාදත්ථ, මා පච්ඡා විප්පටිසාරිනො අහුවත්ථ, අයං ඛො අම්හාකං අනුසාසනී"**. **මූලාශ්‍ර:** සංයු.නි: (4 ): සළායතනවග්ග: අසංඛත සංයුත්ත, 9.1.1සූත්‍ර, පි. 659, ESN: 43: Asankatasamyutta: p. 1493.

▲**උතුම්දේ -**Noble things :ලෝකයේ ඇති උතුම් දේ ගැන දෙවියෙක් විමසුවිට, බුදුන් වහන්සේ මෙසේ වදාළහ: 1) ජරාවට (වයසට යෑම) පත්වෙන කෙනාට ශිලය උතුමය. 2) මනා ලෙසින් පිහිටුවා ගත් විට

ශ්‍රද්ධාව උතුම්ය 3) අනගිරුවන් ලෙසින් පුද්ගලයෙකුට උතුම් වන්නේ ප්‍රඥාවය. 4) සොරුන් හට පැහැර ගත නොහැකි උතුම් දේ පිනය. **මූලාශ්‍රය**: සංයු.නි: (1) සගාථවග්ග: දේවතාසංයුත්ත: ජරාවග්ග: ජරාසූත්‍රය, අප්සරා සූත්‍රය, පි. 92.

▲**උතුම් නුවණ**- Highest knowledge: සතර මග සතර ඵල ලැබීමේ නුවණ උතුම් නුවණය. **බලන්න**: අඤ්ඤා.

▲ **උතුම් පුද්ගල**-Noble person :ආරිය මගට පිළිපන් පුද්ගලයා උතුම් පුද්ගලයාය. **බලන්න**: අසේඛ. **මූලාශ්‍ර:** සංයු.නි: (4) සළායතන වග්ග: ජම්බුඛාදක සංයුත්ත: 4.1.5 අස්සාස සූත්‍රය හා 4.1.6 පරමස්සාය සූත්‍රය, පි. 504 , ESN: Salayatanasamyutta: IV: 38 Jambukhādaka -saṃyutta: 5 Consolation & Supreme Consolation, p. 1400.

▲ **උතුම් සිතිවිලි-** great reflections: අධ්‍යාත්මික මාර්ගය සාක්ෂාත් කරගැනීම සඳහා පුද්ගලයකු තුල තිබිය යුතු උතුම් සිතිවිලි- මහා පුරුෂ විතක්ක ලෙසින් පෙන්වා ඇත. මේවා 8කි. 1) අවශ්‍යතා අල්පබව- fewness of wishes 2) සන්තුෂ්ටිය- contentment 3) හුදකලාවාසය (විවේකය) ප්‍රියකිරීම-resort to solitude 4) උත්සාහය ඇතිබව - energetic 5) පිහිටුවා ගත් සතිය ඇතිබව- established mindfulness 6) සිතේ එකඟබව-සමාධිය- focused mind 7) ප්‍රඥාවන්තබව - wise 8) නිවන්සුවය ප්‍රියකිරීම delight in nibbãna. **සටහන**: බුදුන් වහන්සේගේ උපදෙස් අනුව එම කරුණු 8 ආවර්ජනා කර සිව්ජාන සම්පත් ලබා, අනුරුද්ධ තෙරුන් අරහත්වයට පත්විය. **බලන්න**: උපග්‍රන්ථය:1. **මූලාශ්‍ර**:අංගු.නි: ( 5 ): 8 නිපාත: 8.1.3.10 අනුරුද්ධ සූත්‍රය, පි. 156, EAN: 8: 30.10 Anuruddha, p. 428.

▲ **උතුම් සැපය**- Highest Bliss :උතුම් සැපය සසර දුක නිමකර නිවන ලබාගැනීමය. බුදුන් වහන්සේ මෙසේ වදාළහ: **"සුඛො විවෙකො තුට්ඨස්ස සුතධම්මස්ස පස්සතො අබ්‍යාපජ්ජං සුඛං ලොකෙ පාණභූතෙසු සංයමො සුඛා විරාගතා ලොකෙ කාමානං සමතික්කමො අස්මිමානස්ස යො විනයො එතං වෙ පරමං සුඛන්ති"**. "නිවන නම්වූ උපධි විවේකය (උපධි හැරදැමීම) සැපවේ. චතුර්මාර්ග ඥානය ලැබීමේ සතුට ඇති, ප්‍රකට වූ දහම් ඇති, ඒ උපධි විවේකය නුවණ නමැති ඇසින් දකිනා අයට නොකිපීම සැපවේ. ලෝක සතුන් කෙරෙහි හිංසා නොකිරීම -අවිහිංසාව සැප වේ. ලෝකයට නො ඇලීම, වස්තු කාම කෙලෙස් ඉක්මවීම සැපවේ. අස්මිමානයේ වැනසීමක් වේද මෙය ඒකාන්තයෙන්ම උතුම්වූ සැපය වේ (අරහත්වය ලැබීම). **මූලාශ්‍රය**:වින.පි: මහාවග්ග පාළි (1 කාණ්ඩය) මහාඛන්ධකය**:** මුචලින්ද කතා, පි.86.

▲ **උතුම් සෙවීම**-Noble search තමන් සෙවීම- තමා ගැන සොයා බැලීම උතුම් සෙවීම යයි බුදුන් වහන්සේ පෙන්වා ඇත.**සටහන්:** *මේ උපදේශය වදාළේ භද්දවග්ගිය කුමාරවරු (පසුව තෙරුන්) 30 දෙනාටය. **බලන්න**: උපග්‍රන්ථය:1 ** ම.නි ආරිය පරියේෂණ සූත්‍රයේ: ගිහිගෙය හැර ආධ්‍යාත්මික ජීවිතය-බ්‍රහ්මචාරී බව සොයා යෑම උතුම්-ආරිය සෙවීම යයි දක්වාඇත.**මූලාශ්‍ර**:වින.පි :මහවග්ගපාලිය1:භද්දවග්ගියකුමාරවරු,පි. 127.

▲ **උතුපරිණාම**- Change of seasons : උතුපරිණාමය යනු දේශගුණය වෙස්විම- ඍතු වෙනස්වීමය. ඍතු වෙනස්වීම නිසා ඇතිවන ආබාධ- උතුපරිනාම අබාධ ලෙසින් පෙන්වා ඇත. මෙය කයේ ආදීනවයක්ය. **සටහන**:ගිරිමානන්ද සූත්‍රයේ,ආදීනවසංඥා යටතේ මේ පිලිබඳ දක්වා ඇත.

▲ **උත්ථාන සංඥාව**: පාලි: **උට්ඨානසඤ්ඤං**- wake-up sign :උත්ථාන සංඥාව යනු, නිදාගැනිමට පෙර, අවදිවන වේලාව සිතේ සටහන් කරගැනීමය. බුදුන් වහන්සේ සයනය කිරීමට පෙර උත්ථාන සංඥාව සිතේ සටහන් කරගෙන නින්දට යන්නේය. නිදිවැරීමේ යෙදෙන ආරිය ශ්‍රාවකයා ද නිදාගැනිමට පෙර මේ සංඥාව සිහිකර නින්දට යයි, නියමිත වේලාවට අවදිවේ. **බලන්න**: ජාගරානු සතිය. **මූලාශ්‍ර**:ම.නි: (2 ): 2.1.3 :සේඛ සූත්‍රය, පි. 44, MN 53: Sekha Sutta, p. 436.

▲**උත්පාදයිතව්‍ය ධර්ම** : පාලි: **ධම්මො උප්පාදෙතබ්බො-** Dhamma to be aroused: ආධ්‍යාත්මික වර්ධනය පිණිස උපදවා ගතයුතු ධර්මතා උත්පාදයිතව්‍ය ධර්මවේ. **උත්පාදයිතව්‍ය ධර්ම:** 1) **අකුප්ප ඥානය-** අකුප්ප ඤානං -Unshakeable knowledge **බලන්න**: අකුප්ප ඥානය, අකුප්ප ධර්මතා. 2) **ඛය ඤාණං -**ක්‍ෂය නුවණ- Knowledge of the destruction of defilements: ආසවක්ඛය හෙවත් සියලු කෙළෙස් නසන නුවණ **බලන්න:** ඛය ඤාණං, ආස්‍රව හා ආස්‍රව ක්‍ෂය කිරීම. 3) **අනුප්පාදෙ ඤාණං-** කෙළෙස් නැවත ඇති නොවන බව දන්නා නුවණ Knowledge of that destructed defilements would not arise again) **බලන්න**: අනුප්පාදෙ ඤාණං**.** 4) **තුන් කාල පිලිබඳ ඥාණයෝ**: අතීත ඥාණය, වර්තමාන ඥාණය හා අනාගත ඥාණය (තුන් කාලය පිලිබඳ අවබෝධය) **බලන්න**: තුන් කාල පිලිබඳ ඥාණයෝ 5) **සතර ඥාණයෝ** (චත්තාරි ඤාණානි): **ධම්මේඥානය** ( ධම්මෙ ඤාණං**) අන්වයේඥානය** (අනවයෙ ඤාණං) **පර්යයයෙහි ඥානය** (පරියෙ ඤාණං) **සම්මුතියෙහි ඥානය** (සම්මුතියා ඤාණං) 6**) පංචඥාණ සම්මාසමාධිය**: ඥාන 5 ක් සහිතව ලබන සම්මා සමාධිය .**බලන්න:** පංචඥාණ සම්මාසමාධිය, අනුත්පාදයිතව්‍ය ධම්ම, අනුප්පාද ඥානය, අක්කුප්ප ඥානය. **මූලාශ්‍ර:** දීඝ.නි : (3 ): 11 දසුත්තර සූත්‍රය, පි. 483, EDN: 34: Dasuttara Sutta: Expanding Decades, p. 384.

▼ **උත්පාදයිතව්‍ය ධර්ම** නම් දස කුසලයය. **බලන්න**: දසකුසල. **මූලාශ්‍ර**: අංගු.නි:( 6):10 නිපාත 4.අරියමගග වග්ග: 10.4.4.5.උප්පාදෙතබ්බ ධම්ම සූත්‍රය.පි. 538, EAN: 10: IV Noble Path, 193,p.556.

▲**උත්පත්ති විධි**- modes of generation :ලෝක සත්ත්වයෝ උත්පත්ති ලබන විධි 4 (යෝනි) ක් බුදුන් වහන්සේ පෙන්වා ඇත: 1) **අන්ඩජ-** බිත්තරයකින් හෝ කබල්ලක් බිඳගෙන උපත ලැබීම: සර්පයන්, පක්ෂීන් (from the egg or a shell) 2) **ජලා භුජ-** මවකගේ ගැබයෙන්-කුසයේ-වැදැමහ බිඳ උපත ලැබීම: මිනිසුන්, තිරිසන්සතුන් (from the mother's womb) 3) **සංසේදිත** - තෙතමනය නිසා-, කුණුවීගිය මළකඳන්, සතුන්, කුණුවී ගිය ආහාර, දුගඳ නිසා උපත ලැබීම: පනුවන් ආදී (from moisture) 4) **ඕපපාතික** -ස්වයංජාත- නිරායාසයෙන්ම නිරයේ-අපායේ හෝ දෙව්ලොව යළිඋපත- ඉපදීම, (Spontaneous rebirth in hell or heaven). **මූලාශ්‍ර**: ම.නි: ( 1 ): 1.2.2 මහාසීහනාද සූත්‍රය, ඡෙදය.32, පි. 184, EMN: 12: The Greater Discourse on the Lion's Roar, para. 32, p. 160.

▲ **උත්සහාය-** Energetic: උත්සහාය- වෙරදැරීම, ආධ්‍යාත්මික මග වඩාගැනීමට අවශ්‍ය ගුණයකි. **බලන්න**: උතුම් සිතිවිලි, විරිය.

**උද**

▲ **උද්‍යාන-**Parks :යම් කෙනක්, අන්‍යයන්ගේ යහපත පිණිස උයන්වතු කරන්නේ නම් එය පුණ්‍ය ක්‍රියාවකි, සුගතියට මග පාදයි. **මූලාශ්‍රය:** සංයු.නි: (1): සගාථවග්ග: දේවතාසංයුත්ත: 1.5.7 වනරෝප සූත්‍රය, පි.86.
▲**උද්දක රාමපුත්‍ර තවුසා-** Ascetic Uddaka Ramputhra :සිද්ධාර්ථ තවුසා, (බෝධිසත්ව) ගේ දෙවන ගුරුවරයා වුවේ මේ තවුසාය. ඔහුගේ ඉගැන්වීම මගින් දුක කෙළවර කිරීම අවබෝධ කරගත නොහැකි බව වටහාගත් බෝසතුන් ඔහු හැර යාම, සම්බෝධිය ලබා තමන් වහන්සේ අවබෝධ කරගත් දහම මේ තවුසාට ඉගැන්වීමට තීරණය කළද, ඔහු ඒ අවස්ථාවේ මරණයට පත්වී සිටි නිසා උතුම් දහම අවබෝධ කරගැනීමට වාසනාව නොමැතිවිම මෙහි විස්තර කර ඇත. **බලන්න**: ම.නි: බෝධිරාජ කුමාර සූත්‍රය හා ආරියපර්යේෂණ සූත්‍රය,උපග්‍රන්ථය:6
▲ **උදයත්තගාමිණි ප්‍රඥාව:** පාලි: **උදයබ්බයානුපස්සනෙ ඤාණං-** Knowledge of arising and passing away :උදයත්තගාමිණි ප්‍රඥාව - උදයබ්බ ඥාණය (සමුදය-වය නුවන)ලෙසින් පෙන්වා ඇත්තේ හේතුප්‍රත්‍ය යෙන් හටගත් ස්කන්ධ ධර්මයන්ගේ ඇතිවීම හා නැතිවීම දැකීමෙහි ප්‍රඥාව. එම අවබෝධය, ආරිය ශ්‍රාවකයෙක් තුල ඇති ප්‍රඥා බලයකි- ඔහුට සමුදය හා වය ධර්මතා ගැන මනා අවබෝධය ඇත. මේ නුවණ නිබ්ද්දාව ඇතිකිරීමට, නිවන ලබා ගැනීමට උපකාරිවේ. **බලන්න**: ප්‍රඥාව, සේඛ හා අසේඛ. **ශබ්දකෝෂ: පා.සිං.ශ**: පි: 175: **"උදයබ්බයඤාණ:** උදයව්‍යය ඥානය (සමුදය වය), යථා භූත ඥාන දර්ශනය: '**යථාභූත ඤාණ දස්සනන්ති තරුණ විපස්සනා, උදයබ්බයඤාණස්සෙතං අධිවචනං**'". **සටහන්: *** සංයු.නි: (5-2) සෝතාපන්නසංයුත්ත:11.2.2 බ්‍රාහ්මණ සූත්‍රයේදී බුදුන් වහන්සේ, '**උදයගාමිණි පටිපදාව**' විස්තර කර ඇත. **බලන්න**: බ්‍රාහ්මණ උදයගාමිණි පටිපදාව.** විස්තරපිණිස **බලන්න**:ඛු.නි: පටිසම්භිදා: ඥාණකථා:6උදයබ්බඥානය,පි. 126.
▼**උදයත්තගාමිණි ප්‍රඥාව,** සේඛ බල පහෙන් එකක් වන ප්‍රඥාබලය- නිබ්ද්දාව ඇතිකරන, දුක මුළුමනින්ම නැතිකරණ - ප්‍රඥාව යයි බුදුන් වහන්සේ වදාළහ: **" ඉධ භික්ඛවෙ අරියසාවකො පඤ්ඤවා හොති: උදයත්ථගාමිනියා පඤ්ඤාය සමන්නාගතො ආරියාය නිබ්බෙධිකාය සම්මාදුක්ඛක්ඛයගාමිනියා..."** ( Here, a noble disciple is wise; he possesses the wisdom that discerns arising and passing away, which is noble and penetrative and leads to the complete destruction of suffering). **සටහන:** අටුවාවට අනුව, පංච උපාදාන ස්කන්ධය ඇතිවීම හා නැතිවීම-සමුදය, වය- පිලිබඳ ඇති තියුණු ප්‍රඥාව උදයත්තගාමිණි ප්‍රඥාව ය. මෙය මාර්ග ඥාණය හා විදර්ශනා ඥාණයය. **බලන්න**: EAN: Note: 977, p. 631. **මූලාශ්‍ර**: අංගු.නි: (3): 5 නිපාත: 5.1.1.2. සේඛබලවිතථත සූත්‍රය, පි. 24, EAN:5: The Trainee's Powers-2.2.In Detail, p. 238.

▼ **හේතු ප්‍රත්‍යයෙන් ඇතිවූ ස්කන්ධ** ධර්මයන්ගේ විපරිණාමය දැකීමෙහි ප්‍රඥාව උදය වය දර්ශන ඥානයවේ: **"පච්චුප්පන්නානං ධම්මානං විපරිනාමානුපස්සනෙ පඤ්ඤා උදයබ්බයානුපස්සනෙ ඤාණං" මූලාශ්‍ර**:ඛු.නි: පටිසම්භිදා මග 1: මහාවග්ග**:** මාතෘකා**,** පි. 24.

▲ **උදයමානවක පුත්‍ර**-Udaya manawakaputhra: උදයමානවක පුත්‍ර, බාවෙරි බ්‍රහ්මණයාගේ ශිෂ්‍යයෙකි. බුදුන් වහන්සේ වෙතින් දහම අසා පැහැදී බුදු සරන ගියහ, පසුව සසුනේ පැවිදිවිය **බලන්න**: අවසාන ඥානය,

උපග්‍රන්ථය:1: උදය මානවක තෙර. **මූලාශ්‍රය:** ඛු.නි: සුත්තනිපාතය: පරායන වග්ග: උදය මානවක ගාථා: 1110-1111, පි. 360.
▲**උදාන-** Happy utterings :උදාන ලෙසින් පෙන්වා ඇත්තේ බුදුන් වහන්සේ දහම් කරුණු ගැන සිතා, පලකළ උතුම් වාක්‍යයන්ය. **බලන්න:** ඛු.නි: උදානපාලි.
▲**උදායි තෙර-**Udayi Thera: **බලන්න**: උපග්‍රන්ථය:1

▲ **උද්දච්චය-** restlessness: උද්ධම්භාගිය සංයෝජනයකි, නීවරණ ධර්මයකි . උද්දච්චය ප්‍රහීණය පිණිස සමථය වැඩිය යුතුය. අරහත්වය ලබාගැනීමට පහකලයුතු කරුණකි. **බලන්න**: අරහත්වය **මූලාශ්‍රය:** අංගු.නි: (4) 6 නිපාත: 6.1.10 උද්දච්ච සූත්‍රය, පි.286.
▼ **උද්දච්චය නැතිකරගැනීමට**: අශ්‍රද්ධාව, අවදඤ්ඤුතාවය (un-charitableness) හා කුසීතබව නැතිකරගත යුතුය. ආරබ්ධ විරිය ඇති පුද්ගලයාට, උද්දච්චය පහකර ගත හැකිය. **මූලාශ්‍ර**: අංගු.නි: (6):10 නිපාත: 10.2.3.6 තයොධම්ම සූත්‍රය,පි.284, EAN:10: Tens,76-6.Incapable, p. 524.

▲ **උද්ධම්භාගිය සංයෝජන-** the higher fetters: සසරට බැඳතබන සංයෝජන 10න් ඉහළ සංයෝජන 5 උද්ධම්භාගිය සංයෝජනවේ. මේ සංයෝජන නිසා ලෝක සත්ත්‍වයා රූප ධාතුවට හා අරූප ධාතුවට බැඳේ. අරහත්බව ලබාගැනීමෙන් මේ සංයෝජන 5 ප්‍රහීණයවේ. **බලන්න**: සංයෝජන, අනාගාමි, ආධ්‍යාත්මික පංචඉන්ද්‍රිය, අවිද්‍යාව, ශ්‍රැතවත් ආරිය ශ්‍රාවක හා අශ්‍රැතවත් පෘතග්ජන. **ශබ්දකෝෂ: පා.සි.ශ**: පි.178: "**උඩංභාගිය සංයොජන**: උඩයයි කියන ලද රූප අරූප භවයන්හි උපදවන සංයෝජන පහ". **B.D**: p. 300: "**uddhambhāgiya-saṃyojana**: …they tie to the higher worlds, i.e. the fine-material and immaterial words".

▼ **උද්ධම්භාගිය සංයෝජන 5 කි**. රූපරාග- lust for form, අරූප රාග- lust for the formless, මාන- conceit, උද්දච්ච restlessness, අවිජ්ජා- ignorance. මේ සංයෝජන පහකරගත්විට, අනාගම්බව ලබා කාම ලෝකයට වඩා උසස්වූ සුද්ධාවාස යන්හි පහළවීමට වාසනාව ඇත. උද්ධම්භාගිය සංයෝජන අවබෝධකරගැනීමට, වැනසීමට හා පහකිරීමට නම් සතර ඉද්දිපාදයන් මනාව වැඩිය යුතුය යි බුදුන් වහන්සේ වදාළහ. **මූලාශ්‍ර**:සං.නි:(5-2): ඉද්දිපාදසංයුත්ත: උද්ධම්භාගිය සූත්‍රය, පි. 84, ESN: 51: Iddipadasamyutta: 86.10 Higher Fetters , p. 2108, අංගු.නි: (6):10 නිපාත: 10.1.2.3 සංයෝජන සූත්‍රය, පි.60, EAN: 10: 13.3. Fetters, p. 496.

▼ **උද්ධම්භාගිය සංයෝජන ප්‍රහීණය**:මේ සංයෝජන අවබෝධ කිරීමට, ඒවා ක්ෂය කරගැනීමට අරිය අටමග වැඩිය යුතුය. **මූලාශ්‍ර:** සංයු.නි: (5-1) :මහාවග්ග: මග්ගසංයුත්ත: ඕසවග්ග: 1.16 උද්ධම්භාගිය **සංයෝජන සූත්‍රය,**පි. 166,ESN: 45: Maggasamyutta: 180.10 Higher Fetters, p. 1727.

▲**උද්ධුමාතක සංඥාව:**පාලි: **උද්ධුමාතකසඤ්ඤා** -perception of a bloated corpse :මළමිණිය දිරා යන ආකාරය (ඉදිමී) පෙන්වන සංඥාව. සතිපට්ඨාන සූත්‍රයේ මේ ගැන විස්තරාත්මකව පෙන්වා ඇත. උද්ධුමාතක

සංඥා භාවනාව **:** ඉදිමුණ මළකඳක් අරමුණුකොට භවනාකිරීම මගින් විදසුන් නුවණ වැඩේ. සතර සති පට්ඨානයේ කායානුපස්සනාවට අයත්වේ. බලන්න: භාවනා. **ශබ්දකෝෂ: පා.සිංශ**: පි. 179: "**උද්ධුමාතකං**: ඉදිමුණ මළසිරුර, **උද්ධුමාතකසඤ්ඤා**: ඉදිමිගිය මෘත ශරීරයක් අරමුණු කරගෙන වඩන භාවනාව"**.**

▲**උදේන-උදේනි රජ-**King Udena:බලන්න: උපග්‍රන්ථය:3

**උණ**

▲**උණබටගස්-** Bamboo trees: උණගසේ ඵලය නිසා ඒ ගස විනාශයට පත්වේ, එසේ ලාභ ආදිය නිසා සංසයා විනාශයට පත්වන අන්දම මෙහි දක්වා ඇත. **බලන්න:** උපග්‍රන්ථය:5. **මූලාශ්‍රය**:සංයු.නි:2: නිදානවග්ග: ලාභසත්කාර සංයුත්ත: සංඝභේදවග්ග:5.4.5 අත්තවධ සූත්‍රය, පි.388.

▲**උණ්ණාභ බ්‍රාහ්මණ-**Brahmin Uṇṇābha **බලන්න**: උපග්‍රන්ථය: 3

▲ **උණු අළු නිරය** - Hell of Hot Embers: මේ නිරය, **කුක්කුල නිරය** ලෙසින් ද හඳුන්වයි. කර්ම විපාක නිසා මෙහි පහළවේ. උණු අළුවලින් පිච්චි මහා දුක් වේදනා ඇතිකරන නිරයකි. **බලන්න**: නිරය.

**උප**

▲**උපක තෙර-**Upaka Thera: බලන්න: උපග්‍රන්ථය:1

▲ **උපකෙළෙස**: පාලි: **උපක්කිලෙසො**-imperfections of the mind/Defilements: උපකෙළෙස ලෙසින් පෙන්වා ඇත්තේ, සිත කෙලෙසන- කිලිටුකරන ධර්මතාවන්ටය (**චිත්තස්ස උපක්කිලෙසො** ). මේ කරුණුනිසා අකුසල් ඇතිවේ, සමාධිය ලබාගැනීම අපහසුවේ, ආධ්‍යාත්මික වර්ධනය දුබලවේ, දුගතියක යලි උපතට හේතුවේ.**බලන්න**: සල්ලේඛ පරියාය, අබිජ්ජාව, අමනාප.

▼ **උපකෙළෙස ප්‍රහීණය**, ජාන සමාපත්ති ලබාගැනීමට උපකාරීවේ. **"...භික්ෂුව සිතට උපක්ලේශවූ ප්‍රඥාව දුබල කරණ පංච නිවරණ දුරුකොට ප්‍රථම ජානය ඇතිව වෙසෙයි" සටහන:** මෙහිදී සිත කෙලෙසන ධර්මතා ලෙසින් පෙන්වා ඇත්තේ පංච නීවරණයන්ය. **මූලාශ්‍ර**:ම.නි: (2): 2.1.1 කන්දරක සූත්‍රය පි. 18, EMN: 51: Kandaraka Sutta, p. 425.

▼ **සිත කිලිටිවූ කල්හි** දුගතිය කැමතිවිය යුතුය යයි බුදුන් වහන්සේ වදාළහ. **" එව මෙව බො භික්ඛවෙ චිත්තෙ සඞ්කිලිට්ඨෙ දුග්ගති පාටිකඞ්ඛා"**. මේ සූත්‍රයේ **උපකෙලෙස් 16** ක් පෙන්වා ඇත: 1) **අබිජ්ජාව-** විෂම ලෝභය (**අභිජ්ඣාවිසම ලොභො-** Covetousness and unrighteous greed) 2) **ව්‍යාපාදය** (බ්‍යාපාදො - ill will) 3) **ක්‍රෝධය** (**කොධො** -anger) 4) **අමනාපබව-**උපනාහ (**උපනාහො-** resentment) 5) **මකුබව-**ගුණමකු බව (**මක්ඛො** -contempt) 6) **පලාසය** -අනාදරබව- ගරුනැතිබව (**පළාසො**-insolence) 7) **ඉරිසියාව** -ඊර්ෂ්‍යාව(**ඉස්සා**-envy) 8) **මසුරුබව-** තණ්හාව (**මච්ඡරියං**- avarice) 9) **රැවටීම**-මුලාකිරීම (**මායා** -deceit) 10) **කපටිබව**-වංචාව (**සාඨෙය්‍යං** -fraud) 11) **මුරණ්ඩුබව** (**ථම්භො-** obstinacy) 12**) සාරම්භය-** අනුන් පරදවාලීමට කටයුතු කිරීම- එකට එක කිරීම (**සාරම්භො**-rivalry) 13) **මානය** (**මානො**- conceit) 14) **අධි මානය** - අහංකාරය-උඩඟුබව (**අතිමානො**-arrogance) 15) **මදය-** මත්වීම (**මදො**- intoxication) 16) **ප්‍රමාදය** (පමාදො-negligence). **මූලාශ්‍ර:** ම.නි: (1):1.1.7 වත්ථුපම සූත්‍රය, පි. 101, EMN: 7: The Simile of the Cloth, p. 102.

▼ **ශ්‍රමණ හා බ්‍රාහ්මණයන්ගේ** සිත් කිලිටි කරන උපකෙලෙස් 4 ක් බුදුන් වහන්සේ පෙන්වා ඇත: 1) සුරාමේරය භාවිතය 2) මෙවුන්දම් සේවනය 3) රන් රිදී මුදල් ආදිය පිළිගැනීම 4) මිථ්‍යා ජීවිතය පවත්වා ගැනීම. ඔවුන් ගේ කෙළෙස් නිසා, පුනර්භවය නැවත නැවත ඇතිවේ. **මූලාශ්‍ර:** අං.ගු.නි: (2): 4 නිපාත: 4.1.5.10 උපකෙලෙස් සූත්‍රය, **පි**. 124, EAN:4: 50.10 Defilements, p. 168.

▼**සමාධියට අහිතකර උපකෙලෙස-** Factors of Corruptions: not conducive to Samadhi: විචිකිච්චාව, අමනසිකාරය (සමාධි නිමිත්තට සිත යොමුනොකරීම), ථීනමිද්ධය, භිය ඇතිවීම, අධික ප්‍රීතිය ඇතිවීම, උනන්දුව නැතිවීම, අධික වීරිය, වීරිය අඩුවීම, දැඩි ආසාව (සමාධිය ඇති කර ගැනීමට), විවිධ සංඥා ඇතිවීම, රූප පිලිබඳ අධික සමාධිය ඇතිකරගැනීම ආදී කරුණු සමාධියට අහිතකර උපකිලේස යයි බුදුන් වහන්සේ පෙන්වා ඇත. කෙළෙස් තවන වීරිය ඇතිව එම කරුණු පහකර ගැනීමෙන් සමාධිය, ජාන සමාපත්ති යහපත් ලෙසින් වඩා ගත හැකිවේ. **සටහන්**: * මේ සූත්‍රය දේශනා කර ඇත්තේ අනුරුද්ධ, නන්දිය හා කිම්බිල තෙරුන්ටය. ** බුදුන් වහන්සේ, බෝසතුන් ලෙසින් උපකිලේස හැර දමා සමාධිය වඩා විමුක්තිය සාක්ෂාත් කර ගැනීම මෙහිදී විස්තරකර ඇත.**මූලාශ්‍ර**: ම.නි: ( 3): 3.3.8 උපකිලේස සූත්‍රය, පි. 359, EMN: 128: Upakkilesa Sutta, Imperfections, p. 920.

▼**ආධ්‍යාත්මික මග අවුරන උපකිලේස-** Defilements that obstruct the spiritual path: 1) සුරාමේරය පානය කිරීම 2) මෛථුන සේවනය 3) රන් රිදී (මුදල්) ආදිය පරිහරණය 4) මිථ්‍යා ආජීවය. මේ උපකිලෙස (ශික්ෂාපද කැඩීම) නිසා මහණබමුණන් ගේ ගුණ කිලිටි වන බව බුදුන් වහන්සේ පෙන්වා ඇත. **මූලාශ්‍ර**: අං.ගු.නි : ( 2): 4 නිපාත: 4.1.5.10 උපකිලේස සූත්‍රය, පි. 124, EAN: 4: 50.10. Defilements, p. 168.

▼**උපකෙළෙස පහකර ගැනීම ඉර්දී පිණිසවේ-**Abandonment of defilements for spiritual powers: උපකිලේස දුරු කරගැනීමෙන් විවිධ ඉර්දී බලලබාගත හැකිවේ යයි බුදුන් වහන්සේ පෙන්වා ඇත. **සටහන: *** මෙහිදී, දුරුකර ගතයුතු උපකිලේස ලෙසින් පෙන්වා ඇත්තේ පංච නීවරණයන්ය. ** ලබාගත හැකි අභිඥා හා විවිධ ඉද්ධි පිළිබඳව මෙහිදී විස්තර කර තිබේ. **මූලාශ්‍ර**: අං.ගු.නි : ( 3): 5 නිපාත: 5.1.3.3. උපකිලේස සූත්‍රය, පි.50 , EAN: 5 : 23.3 . Defilements, p. 242.

▼**අනාපානසතිය පිණිස පහකලයුතු උපකෙලෙස-** Defilements to be abandoned for Breath meditation : අනාපානසතිය වඩන විට වලකා ගතයුතු 18 ක් උපකිලෙස හා ඒ සඳහා යොදාගත යුතු ඥාන පිළිබඳ විස්තර මෙහි දක්වා ඇත. **මූලාශ්‍රය:** බු.නි: පටිසම්භිදා මග 1 : ආනාපානසති කථා: උපකිලේස ඥාන**,** පි. 332.

▼**පංච නීවරණ උපකෙලෙසයකි-** Five hindrances corrupts the mind යම්සේ අපිරිසුදු රන්, (ස්වර්ණ) මැනවින් භාවිතා කිරීමට නොහැකිසේ, පංච නීවරණ යෙන් කිලිටු සිත, මුදු නැත, කර්මණ්‍ය නැත, ප්‍රභාවත් නැත, බිඳෙන සුළුය, සමාධියට හිතකර නැත, ආසව ක්‍ෂය කිරීම (ආසවක්ඛය) පිණිස නොවන බව බුදුන් වහන්සේ වදාළහ: **බලන්න**:උපග්‍රන්ථය:5. **"එවමෙව ඛො භික්ඛවෙ පඤ්චිමෙ චිත්තස්ස උපක්කිලෙසා යෙහි උපක්කිලෙසෙහි උපක්කිලිට්ඨං චිත්තං න චෙව මුදු හොති න ච කම්මනියං න ච පභස්සරං පභඞ්ගු ච, න ච සම්මාසමාධියති ආසවානං ඛයාය…"**

(So too, bhikkhus, there are these five corruptions of the mind, corrupted by which the mind is neither malleable nor wieldy nor radiant but brittle and not rightly concentrated for the destruction of the taints). **මූලාශ්‍ර**:සංයු.නි: (5-1): මහාවග්ග: බොජ්ඣංගසංයුත්ත: 2.4.3 කිලේස සූත්‍රය, පි.214**,** ESN: The Great Book: Bojjhaṅga saṃyutta : 33.3 Corruptions,p.1768.

▲ **උපඝාතක කර්මය-** Upagathaka karma: කර්ම විපාක ඵල දෙන ආකාරයකි. **බලන්න**: කර්ම.

▲ **උපතිස්ස**-Upatissa: සැරියුත් තෙරුන්ගේ ගිහිනම උපතිස්ස ය. **බලන්න**: අග්‍ර ශ්‍රවකයෝ.

▲ **උපාදධ්‍යායයා**:පාලි: **උපජ්ඣායං**- Upaddhya: උපාදධ්‍යායයා -උප්පජ්ජා (උපදෙස් දෙන ගුරුවරයා) යනු සංඝයාහට, පබ්බජාව (සාමණේර) හා උපසම්පදාව යන කරුණු දෙකේදීම ප්‍රධානවන භික්ෂුව/ භික්ෂුණිය. සසුන යහපත් ලෙසින් පවත්වා ගැනීමට එම ජ්‍යේෂ්ඨ භික්ෂූන් උපකාරීවේ යයි බුදුන් වහන්සේ පෙන්වා ඇත.**"මහණෙනි, උපාදධ්‍යායයකු අනුදනිමි ... උපාදධ්‍යාය තෙමේ සද්ධිවිහාරිකයා කෙරෙහි "මේ තෙමේ මගේ පුතුය' යි සිත උපදවන්නේය. සද්ධිවිහාරික තෙමේ උපාදධ්‍යායයා කෙරෙහි :" මේ තෙමේ මගේ පියා' යි සිත උපදවන්නේය" සටහන:** උපාදධ්‍යායයා පත්කිරීම, වගකීම් ආදිය මෙහි විස්තරාත්මකව පෙන්වා ඇත.**මූලාශ්‍ර**: විනා:පි: මහාවග්ග පාලිය 1: පි. 172.

▲ **උපධි** (පාලි): **අත්කරගැනීම්**: Upadhi- acquisitions: උපධි යනු අත්කරගැනීම්- ප්‍රතිග්‍රහනය කරගැනීමය. සසර බැඳ තබන උපධි 4 කි:1) ස්කන්ධ උපධි: පංච උපාදානස්කන්ධය අල්වා ගැනීම 2) කෙළෙස් උපධි-කෙළෙස් වලට යටවීම 3) අභිසංඛාර උපධි: සය ආයතන වලින් අල්වා ගන්නා අරමුණු පිළිබඳ චේතනා පහළ කරමින් ඒවාට යටවීම 4) කාම ගුණ උපධි: පංච කාම වස්තූන් අල්වා ගැනීම. සියළු උපධි ජාති ජරා මරණ ස්වභාවයෙන් යුක්තය; ඒවා නිසා සිත කෙළසේ, ඒවා නිසා දුක ඇතිවේ. උපධි -අල්ලාගත් දේට බැඳුන සත්ත්වයන් සසරේ සැරිසරයි. එහෙයින්, සියලු උපධි හැර දැමීම නිවන ලෙසින් පෙන්වා ඇත. **බලන්න**:සුඛ. **සටහන්: * බලන්න:** EMN: Note: 674: p. 1271 ** Upadhi: The root meaning is foundation, basis, ground (In the commentaries various kinds of *upadhi* are enumerated, among them the five aggregates, objects of sensual pleasure, defilements, and kamma **බලන්න**: EMN: Note: 299, p. 1093. ** **උපධි විවේකය-** උපධි නොමැතිවීම නිවන හඳුන්වන පදයකි. **මූලාශ්‍රය**:ඛු.නි: සුත්තනිපාත: ද්වයතානුපස්සනා සූත්‍රය, පි. 244.

▼ **සියළු උපධි කෙළෙස් හා දුක ඇතිකරයි**. සාමාන්‍ය ලෝක සත්ත්වයා තමාගේ යයි අල්වාගෙන තබාගන්නා, රැස්කරගන්නා උපධි ලෙසින් බුදුන් වහන්සේ පෙන්වා ඇත්තේ අඹුදරුවන්, සේවකයන්, ගවසම්පත් ආදී හිලෑ කරගත් සතුන්, රන් රිදී මුදල් ආදී ධන සම්පත් හා වස්තූන්ය. සියළු උපධි ජාති ජරා මරණ ස්වභාවයෙන් යුක්තය. මේවාට බැඳීමෙන් සිත කෙළසේ, දුක ඇතිවේ". **"කිඤ්ච භික්ඛවෙ ජාතිධම්මං වදෙථ? පුත්තභරියං... දාසිදාසං... අජෙළකා... ජාතරූපරජතං ... ධම්මාහෙතෙ භික්ඛවෙ උපධයො..." මූලාශ්‍ර**: ම.නි: (1): 1.3.6 ආරියපරියෙසන සූත්‍රය,

පි. 414, EMN:26: Ariyapariyesanā Sutta- The Noble Search, p. 242.

▼ **උපධි නැතිවීම සතුට ඇතිකරයි**: දෙවියෙකනක් බුදුන් වහන්සේ ට මෙසේ පැවසුහ: "පුතුන් ඇති අය පුතුන් නිසා සතුටුවේ, ගවහිමියා ගවසම්පතින් සතුටුවේ. මේ කාම උපධි මින්සුන්හට ප්‍රීතිය ගෙනෙදේ. උපධි නැතිවීට ඔවුන් අසතුටුවේ" බුදුන් වහන්සේ මෙසේ පිළිතුරු වදාළහ: **"පුතුන් ඇතිඅය පුතුන් නිසා ශෝක කරයි, ගවහිමියා, ගවසම්පත නිසා ශෝක කරයි. මේ කාම උපධි මිනිසුන්ට ශෝක ඇතිකරයි. යමෙක්හට උපධි නැත්නම් හෙතෙම ශෝක නො කරයි". මූලාශ්‍ර:** සංයු.නි: (1): සගාථවග්ග: දේවතාසංයුත්ත: 1.2.2 නන්දති සූත්‍රය, පි. 38, ESN: 1: Devatasamyutta: 12.2 Delight, p. 71.
▼ **උපධි හැර දැමීම නිවනය**:සියලු සංස්කාර යන්ගේ සංසිඳීම, සියලු අල්වාගැනීම් (උපධි) පහකිරීම, තණ්හාව ක්‍ෂයකර ගැනීම මගින් ඇතිවන විරාගය නිවන යයි බුදුන් වහන්සේ වදාළහ.**" සබ්බ සඞ්ඛාරසමථො සබ්බුපධිපටිනිස්සග්ගො, තණ්හක්ඛයො විරාගො නිබ්බානන්ති" මූලාශ්‍ර:** අංගු.නි: ( 6): 10 නිපාත: 10.2.1.10 ගිරිමානන්ද සූත්‍රය, පි. 221, EAN: 10: 60.10. Girimānanda, p. 516.
▼ **බුදුන් වහන්සේ**, උපධි වලට යටවී කටයුතු කරණ හා උපධි හැර දැමීමට කටයුතු කරන පුද්ගලයන් ගේ ස්වාභවය පෙන්වා ඇත. එම පුද්ගලයන් 4 දෙනා අතුරින් යම් කෙනෙක්: "දුකේ මුල උපධිබව අවබෝධ කර, ඒවා අතහැර දමා, විනාශ කර දමා, උපධි වලින් මිදේ'. ඒ පුද්ගලයා සියලු උපධි වලින් මිදී ඇතිබව (අරහත්ය) බුදුන් වහන්සේ වදාළහ: ඔහු විසංයුක්තය:සංයෝජන වලින් මිදීඇත. (…such a person I called unfettered). **මූලාශ්‍ර:** ම.නි: ( 2): 2.2.6 ලටුකිකොපම සූත්‍රය, පි. 206, EMN: 66 The simile of the Quail, p. 551.
▲**උපනාහ-**Anger: උපනාහ, ක්‍රෝධය, බද්ධ වෛරය ලෙසින්ද පෙන්වා ඇත. අකුසලයකි, දුගතියට මගකි. අරහත්වය ලබාගැනීම පිණිස පහකර ගතයුතුය. **බලන්න**:අරහත්වය, අමනාපය, සල්ලේඛ පරියාය, අකුසල ප්‍රහීණය. **මූලාශ්‍ර**:අංගු.නි. (6 )10: 10.1.3.4. මහා චුන්ද සූත්‍රය, කාය සූත්‍රය, පි. 100.

▲ **උපපැවිදි -** Upapavidi: උපපැවිදි ලෙසින් පෙන්වා ඇත්තේ පැවිදිබව හැර ගිහිබවට පත්වීමය (සිවුරුහැරීම). එය ධර්ම මාර්ගයේ පහතට ඇදී යාමකි. ඔවුන් ජිවත්වුවත් මළ අය ලෙසින් සලකයි. **සටහන:** පැවිදිව, නැවත ගිහිගෙයට පැමිණි පුතු ගැන සානුගේ මව වැළපීම මෙහි විස්තර කර ඇත.**බලන්න**: සංයු.නි: (1) සගාථවග්ග: යක්ඛසංයුත්ත: සානු සූත්‍රය.
▲ **උපපිඩක කර්මය** - Upapidaka karma:කර්ම විපාක එල දෙන ආකාරයකි. **බලන්න**: කර්ම.
▲**උපවනය-** Upavāṇa: උපවනය යනු සංඝයා වාසය කරන ආරාමයය. **බලන්න**:ආරාමය.
▲ **උපවාන තෙර**- Upavāṇa Thera:**බලන්න**: උපග්‍රන්ථය:1
▲ **උපසමාය:** පාලි: **උපසමො** -upasama -Peace: උපසමාය ලෙසින් ධර්මයේ පෙන්වා ඇත්තේ, කෙළෙස් සංසිඳීම- නිවීම නිසා සිත නිසල බවට, සාමකාමී බවට පත්වීමය. උපසමය, නිවන හඳුන්වන පදයකි. උපසමානුසති භාවනාව ලෙසින් පෙන්වා ඇත්තේ නිවනේ ගුණ ආවර්ජනය කරමින් භාවනාව වඩා ගැනීමය **බලන්න**: නිවන, භාවනාව.

**සටහන:** අටුවාවට අනුව උපසමය (ශාන්තිය) යනු සියලු කෙළෙස් මුදාහැරීමය. **බලන්න**: EAN: note: 160, p. 588. **ශබ්දකෝෂ: පා.සි.ශ**: පි.184,196: "**උපසම**: 'සංසිඳීම, කෙලෙසුන් ගෙන් සංසිඳීම, ' උපසමාය අභිඤ්ඤාය සම්බොධාය නිබ්බාණාය සංවත්තති', **උපසමානුසසති**: කෙලෙසුන් සංසිඳීවීම පිණිස උපදනා සිහිය". **B.D**: p. 344: "**upasamānussat**i: 'recollection of the peace of Nibbāna'. **P.T.S**: p. 358: "calm, quiet, appeasement, allaying, assuagement, tranquillizing" (in freq. phrase upasamāya abhiððāya sambodhāya nibbānāya saṃvattati; see nibbāna".

▼ **බුද්ධානුස්සති** ආදීවූ අනුසති භාවනා බහුල කරගැනීමෙන්, උපසමය ඇතිවේ-කෙළෙස් සන්සිඳේ. **මූලාශ්‍ර**: අංගු.නි: (1): 1 නිපාතය**:** එකධම්ම පාලිය, පි.100, EAN:1: XVI: One Thing, p. 47.

▼ **සතර ඉද්දිපාද වර්ධනය කරගැනීමෙන් උපසමය ඇතිවේ**: මානව වැඩුන, බහුල කල ඉද්දිපාද නිසා උපසමය ඇතිවේ .**බලන්න**: ඉද්දිපාද. **මූලාශ්‍ර**: සංයු.නි: (5-2) මහාවග්ග: ඉද්දිපාද සංයුත්ත: 7.1.4 නිබ්බිදා සූත්‍රය, පි. 28,ESN: 48: Iddhipādasamyutta: 4.4 Revulsion**,** p. 2060.

▲ **උපසම්පදාව-** Full Ordination-higher ordination: උපසම්පදාව යනු, සාමණේර ජීවිතය යහපත් ලෙසින් ගතකර, ආධ්‍යාත්මික ජීවිතයේ උසස් පුහුණුව සාක්ෂාත් කරගැනීමට භික්ෂු, භික්ෂුණියන් තබන ඉදිරි පියවරය. එය විනය කර්මයකි. උපසම්පදාව ලැබීමට අපේක්ෂා කරන සාමණේර/ සාමණේරි වරුන්ට ඒ පිණිස අවශ්‍ය සුදුසුකම් තිබිය යුතුය, ඔවුන් උපසම්පදා කරන වැඩිහිටි ආචාර්යවරයා/ ආචාර්යවරියට ද ඒ පිණිස සුදුසුකම් තිබිය යුතුය. මේ කරුණු ඇතුලත් වන්නේ විනයටය. බුදුන් වහන්සේ වැඩසිටි සමයේ පැවති උපසම්පදා ක්‍රමය පිලිබඳ විස්තර පිණිස **බලන්න**: විනය පිටකය, මහාවග්ග පාලිය1: 156,162,පි.239. **සටහන**: උපසම්පදා ශිලය ගැන බලන්න: ශිලය. **ශබ්දකෝෂ: පා.සිං.ශ:** පි.196: "**උපසම්පදා**: අධිසීල සික්ඛාවෙහි පිහිටීම".

▼ **වෙනත් මූලාශ්‍ර**: **1**. "උපසම්පදා කිරීම යනු පුද්ගලයකු බුදුරජාණන් වහන්සේගේ උසස් ශ්‍රාවක පිරිස වන භික්ෂු පිරිසට ඇතුළු කිරීම වශයෙන් සාමණේරයන් උසස් කිරීමය..." **උපසම්පදා ශිලය**:පි.1: රේරුකානේ චන්දවිමල මහනාහිමි, 2008. **2**. "සසර දුක නුවණින් වටහාගත් සත් පුරුෂයා, ඉන් මිදීමේ මාර්ගය ලෙස, උතුම් බුදු සසුනෙහි පැවිදි බවට පත්වේ. . එතැන් පටන් සාමණේර දස ශීලයෙහි හික්මෙන ඒ පැවිද්දා, ප්‍රාතිමොක්ෂ සංවර ශීලය, ඉන්ද්‍රිය සංවර ශීලය, ප්‍රත්‍ය සන්නශ්‍රිත ශීලය, ආජීව පාරිශුද්ධ ශීලය යන සතර සංවර සිල් ගුණ දහම් වලින් යුක්ත උත්තම උපසම්පදාවට පත්වී අධිශීලයෙහි පිහිටයි. **බුදුසරණ**: අන්තර්ජාල ලිපිය: "සසුන් කෙත ඔපවත් කරන උපසම්පදා විනය කර්මය: තම්මැන්නාවේ ධම්මරතන හිමි, 2010, ජුලි, http://www.budusarana.lk/budusarana/2010/07/11/tmp.asp?ID=fea02

▲ **උපස්තම්භක කර්මය-** Upasthambaka karma: කර්ම විපාක එල දෙන විධියකි.**බලන්න**: කර්ම.

▲**උපස්ථායක-** Upasthayaka: උපස්ථායක ලෙසින් පෙන්වා ඇත්තේ සංඝයාට උපස්ථාන කරන පුද්ගලයන්ය. බුදුන් වහන්සේට උපස්ථායක

කළ සංඝයා පිළිබඳව **බලන්න**:උපග්‍රන්ථය:1 . සංඝයාට උපස්ථායකයන් පත්කිරීම ගැන විනය පිටකයේ විස්තර දක්වා ඇත. **බලන්න**: සංඝයා. ගිහි උපස්ථායකයන් පිළිබඳව **බලන්න**: අග්‍රතම උපාසකයෝ- උපාසිකාවෝ.
▲**උපසේන වංගනාථපුත්ත තෙර**-Upasena Vaṅgantaputta Thera **බලන්න**: උපග්‍රන්ථය:1

▲ **උපහච්චපරිනිබ්බායි** (පාලි) **-** attainer of nibbāna upon landing: අනාගාමී උතුමන් අරහත්වය- පරිනිබ්බානය ලබන ආකාර 5 න් එකකි. ඕරම්භාගිය සංයෝජන පහකරගත් ආරිය උතුමා, සුද්දාවාසයේ පහළවූ සැනයෙන් අර්හත්වයට පත්ව පරිනිබ්බානයට පත්වීම, එම අවස්ථාව **උපහච්චපරිනිබබයි** ලෙසින් දක්වාඇත. මේ පිළිබඳ දක්වා ඇති **උපමාව:** ගිනිපුපුර උපමාව: දවස මුළුල්ලේ ගින්නෙන් රත්වුණ යකඩගුලියක්, තළනවිට, ගිනිපුපුරක් මතුවී, ඉහලට ගොස්, නැවත පොළොවට පහත්වී, පොළව ස්පර්ශ කළ සැනයෙන් නිවීයන ලෙසින්, ඒ උතුමා පරිනිබ්බානය ලබයි. **බලන්න:** අනාගාමී, උපග්‍රන්ථය:5. **මූලාශ්‍ර:**අංගු.නි: (4): 7 නිපාතය: 7.2.1.2. පුරිසගති සූත්‍රය, පි. 402, EAN: 7 : 55.2 Destinations of Persons, p. 387.

▲ **උපාදාන හා උපාදානීය ධර්ම:**පාලි: **උපාදානං, උපාදානීයා ධම්මා-** clinging & things that can be clung to: ධර්මයට අනුව **උපාදාන** කිරීම යනු, සළායතන මගින් අල්ලා ගන්නා බාහිර අරමුණු කෙරේ ආශාව ඇතිකර - තණ්හාව ඇතිකර ( ඡන්දරාගය සහිතව) ඒවා තමන්ගේ දෙයක් ලෙසින් අල්වා ගැනීමය. **උපාදානීය ධර්මතා** නම් බාහිර ලෝකයේ ඇති ඒ ඒ අරමුණුය. ධර්මයේ උපාදාන 4 ක් පෙන්වා ඇත: 1) **කාම උපාදාන** (sensuous clinging): යනු සිතේ කාම රාගය ඇතිකරන අරමුණුය. 2) **දිට්ඨි උපාදාන** (clinging to views): යනු ලෝකයේ ඇති මත වාද අල්වා ගැනීමය 3) **සීලබ්බත උපාදාන** (clinging to mere rules & rituals): යනු, සසුනට බාහිරවූ ඇදහීම්, ව්‍රත සමාදන්ව එමගින් නිවන ලබා ගත හැකිය යන පිළිගැනීමය.4) **අත්තවාදී උපාදාන** (clinging to the personality belief): යනු ආත්මයක් ඇතැයි සැලකීම- සක්කායදිට්ඨියය**. බලන්න:** අත්තවාදීඋපාදාන. **සටහන:** සළායතන නිසා උපාදාන සකස්වන අන්දම සංයු.නි: (4) වේදනාසංයුත්ත : යොගකඛෙමිවග්ග: 1.11.7 උපාදාන සූත්‍රයේ විස්තර කර ඇත.
▼ **බඹසර විසීමේ අරමුණ** වන්නේ උපාදාන රහිතව පිරිනිවන්පෑම බව මෙහි පෙන්වා ඇත. ඒ සඳහා ඇති ක්‍රම වේදය නම් අරිය අටමග වර්ධනය කරගැනීමය. **මූලාශ්‍ර**: සංයු.නි: (5-1): මහාවග්ග: මග්ගසංයුත්ත:1.5.8. අනුපාදා සූත්‍රය, පි. 76, ESN: Maggasamyutta: V: Nibbāna without clinging, p. 1651.

▼**බුදුන් වහන්සේ පෙන්වා වදාළේ**: රූපය, වේදනාව, සංඥාව, සංඛාර, විඥාන-පංච උපාදානස්කන්ධය, උපාදානීය ධර්මතා බවය. ඒ ඒ ධර්මතා පිළිබඳව පුද්ගලයෙක් තුල ඇතිවන කැමත්ත-තණ්හාව, උපාදානය ය. **“ රූපං භික්ඛවෙ, උපාදානීය ධම්මො…වෙදනා… සඤ්ඤා… සඞ්ඛාරා… විඤ්ඤාණං උපාදානීය ධම්මො. යො තත්‍ථ ඡන්‍දරාගො තං තත්‍ථ උපාදානං…”** (And what, bhikkhus, are the things that can be clung to, and what is the clinging? Form, bhikkhus, is a thing that can be clung to; the desire and lust for it is the clinging there. Feeling …

Perception … Volitional formations … Consciousness is a thing that can be clung to; the desire and lust for it is the clinging there)**මූලාශ්‍ර**: සංයු.නි: (3): ඛන්ධවග්ග: 1.3.2.9 උපාදානීය සූත්‍රය, පි.320, ESN: 22: Khandasamyutta: 121.9 Things That Can Be Clung To, p. 1103,

▼ **උපාදාන අවබෝධය පිණිස සම්මා දිට්ඨිය අවශ්‍යවේ: මූලාශ්‍ර**:ම.නි: (1 ) : 1.1.9 සම්මා දිට්ඨි සූත්‍රය, පි. 130, EMN: 9: Sammādiṭṭhi Sutta- Right View, p. 121.

▼ **උපාදාන පටිච්චසමුප්පාදයේ 9 නි පුරුකය.** තණ්හාව නිසා උපාදාන හටගනී, තණ්හාව නිරෝධ වීමෙන් උපාදාන නිරෝධවේ: **"...**තණ්හා පච්චයා උපදානං**..." "...**තණ්හා නිරොධා උපාදාන නිරොධො**"** උපාදාන නිසා භවපැවැත්ම ඇතිවේ. බලන්න: පටිච්චසමුප්පාදය. **මූලාශ්‍ර:** සංයු.නි: (2) නිදානවග්ග: 1.1.1. පටිච්චසමුප්පාද සූත්‍රය, හා **1.1.2 විභඞ්ග සූත්‍රය,** පි.24, ESN:12: Nidanasamytta: 1.1. Dependent Origination & 2.2 Analysis of Dependent Origination, p.610, සංයු.නි (5-1) :මග්ගසංයුත්ත: ඕඝවග්ග: 1-16 **උපාදාන සූත්‍රය,** පි. 160, ESN: 45: Maggasamyutta: 173-3 Clinging, p. 1720, සංයු.නි : (4 ) සළායතන වග්ග: ජම්බුඛාදක සංයුත්ත: 4.1.12 උපාදාන සූත්‍රය, පි. 508 , ESN: 38 : Jambukhādakasaṃyutta: 12 Clinging, p. 1407.

▼ **උපාදාන ඇතිවීමට හේතුව (ප්‍රත්‍ය) ස්පර්ශයය.** එයපිරිසිඳ (පරිඥෙය්‍ය ) දැන ගත යුතු ධර්මයකි. **බලන්න**: **ස්පර්ශය,** පරිඥෙය්‍ය ධර්ම. **මූලාශ්‍ර:** දීඝ.නි : (3): 11 දසුත්තර සූත්‍රය, පි. 483, EDN: 34: Dasuttara Sutta: Expanding Decades, p. 384.

▲ **උපාදානස්කන්ධය** -groups of clinging: උපාදානස්කන්ධය ලෙසින් පෙන්වා ඇත්තේ පංච උපාදානස්කන්ධයය. **බලන්න**: පංච උපාදානස්කන්ධය.

▲**උපාය කුසලය**-Upayakuslaya: අධිගමය ලබාගැනීමට අවශ්‍ය කරුණකි, කුසල් ඇතිකරගැනීමට දක්ෂතාවයය. **බලන්න:** අධිගමය.

▲ **උපාරම්භ චිත්ත**: පාලි: **උපාරම්භචිත්තං** -mind bent on criticism ධර්මයට අනුව උපාරම්භ චිත්ත යනු අනුන්ගේ දොස් දැකීමට පුරුදුවූ සිතය. මෙය අකුසලයකි, ධර්ම මාර්ගයට අවහිරයකි. **බලන්න**: සල්ලේඛපරියාය.

▼ **උපාරම්භ චිත්තය නැති කර ගැනීමට:** දුසිරිතය, උද්දච්චය, අසංවරය-ඉන්ද්‍රිය, යන අකුසල පහ කර ගත යුතුවේ. **බලන්න**: අසම්ප්‍රජන්‍යය. **මූලාශ්‍ර**: අංගු.නි: (6):10 නිපාතය: 10.2.3.6 තයොධම්ම සූත්‍රය,පි.284, EAN:10: Tens,76-6.Incapable, p. 524.

▲**උපාලි මහා තෙර**- Upāli Maha Thera:**බලන්න:** උපග්‍රන්ථය:1

▲**උපාලිගහපති-** Upāli householder: **බලන්න:** උපග්‍රන්ථය:3

▲**උපාසක හා උපාසිකා**- Upasaka & Upasika :බුදුන් වහන්සේ වැඩසිටි සමයේ මෙන්ම, වර්තමානයේද, උන්වහන්සේ අනුගමනය කරන- ධර්මය

පිළිපදින, ගිහි පුරුෂ හා ස්ත්‍රීන්, උපාසක හා උපාසිකා ලෙසින් දක්වා ඇත. ඔවුන් නිති පංච ශීලය ආරකෂා කරති. උපෝසථ පොහෝදින යන්හි අටසිල් සමාදන් වේ. බුදුන් වහන්සේගේ සිව් පිරිසට ඇතුලත්වේ. **බලන්න**:උපග්‍රන්ථය:3. **සටහන:** බුදුන් වහන්සේගේ අග්‍ර උපාසක හා උපාසිකා , පළමුව සරණගිය අය ගැන විස්තරය පිණිස **බලන්න**: අග්‍ර උපාසක- උපාසිකා.

▼ **උපාසක හා උපාසිකා ගුණ**: 1) ගිහියෙක්, තෙරුවන් සරණ ගිය දින සිට උපාසක/උපසිකා බවට පත්වේ 2) පංච ශීලය ආරක්ෂා කරගැනීමෙන් ඔහු ශීලසම්පන්නවේ 3) තමාගේ හා අනුන්ගේ ශුභ සාධනය පිණිස කටයුතු කරයි: ශ්‍රද්ධාව ඇතිව, සෙසු අය ශ්‍රද්ධාවේ පිහිටුවීම; ශීලසම්පන්නව සෙසු අය ශීලසම්පන්න කිරීම ,දානශීලිව, සෙසු අය දානශීලි කිරීම, සංඝයා දැකීමට කැමැත්ත, සෙසු අය තුල සංඝයා දැකීමට කැමැත්ත ඇතිකිරීම, ධර්මය ඇසීමට කැමැත්ත, සෙසු අය තුල ධර්මය ඇසීමට කැමැත්ත ඇතිකිරීම, ඇසූ ධර්මයේ සිතේ ධරා ගැනීම, සෙසු අය තුල ඇසූ ධර්මය ධරා ගැනීමට කැමැත්ත ඇතිකිරීම, දැරූ ධර්මයේ අරුත් විමසීමට කැමැත්ත, සෙසු අය තුල දැරූ ධර්මයේ අරුත් විමසීමට කැමැත්ත ඇතිකිරීම, අරුත් අවබෝධ කර, ධර්මානුකූලව පුහුණුවීම, සෙසු අයටද ධර්මානුකූලව පුහුණුවීමට කැමැත්ත ඇතිකිරීම. **සටහන:** මේ සූත්‍රයේ ගිහි උපාසක බවට පත්වීමට අවශ්‍ය ගුණ පෙන්වා ඇත: 1)තෙරුවන් සරණ යාම 2) ශීලසම්පන්න වීම (පංච ශීලය රැකීම) 3) ශ්‍රද්ධා සම්පන්නවීම 4) ත්‍යාග සම්පන්න වීම 5) ප්‍රඥාසම්පන්නවීම. **බලන්න**: සංයු.නි: (5-2) සෝතාපත්තිසංයුත්ත : පුඤ්ඤාභිසන්දවග්ග: 11.4.7 මහානාම සූත්‍රය. **මූලාශ්‍ර:** අංගු.නි: ( 5): 8 නිපාත: 8.1.3.5 මහානාම සූත්‍රය හා 8.1.3.6 ජීවක සූත්‍රය, පි.142, EAN:8: 25.5 Mahānāma & 26.6 Jivaka, p. 426.

▲**උප්පථමනසිකාරය**- off-track attention: මෙය අයෝනිසෝ මනසිකාරය හඳුන්වන විදියකි. **බලන්න**: අයෝනිසෝමනසිකාරය

▲ **උප්පාදේතබ්බ ධම්ම හා න උප්පාදෙතබ්බ ධම්ම-** Dhamma to be aroused & Dhamma not to be aroused: කුසල ධර්මය උප්පාදේතබ්බ ධම්මය එනම් දස කුසලයය. දසඅකුසලය, නඋප්පාදෙතබ්බ ධම්මයය. **බලන්න:** උත්පාදයිතව්‍ය ධර්ම. **මූලාශ්‍ර:** අංගු.නි: (6 ):10 නිපාත: අරියවග්ග: 10.3.5.5. උප්පදේතබ්බ සූත්‍රය,පි. 476.

▲ **උප්පජ්ජවේදනීය කර්ම -**Uppachchavedeniya kamma: උපපජ්ජවේදනීය කර්මය, කර්ම විපාක දෙන අවස්ථාව පෙන්වන කර්මයකි. **බලන්න**: කර්ම, අහෝසිකර්ම.

▲ **උප්පලවන්නා තෙරණිය**- Uppalavanna Therni: **බලන්න**: උපග්‍රන්ථය:2

▲ **උපෙක්ඛාව:** පාලි**: උපෙක්ඛා** -equanimity, even-mindedness: ධර්මයට අනුව උපෙක්ඛාව යනු අන්‍යන් පිලිබඳව වෙනස්කමක් හෝ නොසැලකිල්ලක් නොමැතිව සිතේ ඇති අපක්ෂපාති, මධ්‍යස්ථ ආකල්පයය. බ්‍රහ්මවිහාරයන්ගෙන් එකකි, භාවනා අරමුණකි, නිරාමිෂ වේදනාවකි, සප්ත බොජ්ඣංග ධර්මතා වලින් 7න් එකකි. සිව්වෙනි ජානය නිසා ලබන උපේක්ෂා සුඛය- උපේක්ෂාලම්භන සුඛය අග්‍රය. **බලන්න**: බ්‍රහ්මවිහාර, වේදනා, අදුකම සුඛ වේදනා, සුඛය.**ශබ්දකෝෂ: පා.සිං.ශ**: පි. 198: "**උපෙක්ඛා:** බැලීම, පරීක්ෂණය, මධ්‍යස්ථතාවය".

**B.D**: p. 187: “Upekkhā: equanimity… is one of the 4 sublime abodes- brahma-vihāra and of the Factors of Enlightenment - bojjhaṇga” .

▼ **උපෙක්ඛාව වඩා ගැනීමෙන්** රාගය පහ කර ගැනීමට හැකිවේ. **මූලාශ්‍ර:** අංගු.නි: (4 ): 6 නිපාත: 6.1.2.3 නිස්සාරණීය සූත්‍රය, පි. 40, EAN:6: 13.3 Escape, p. 321.
▲ **උපෙක්ඛා චේතෝවිමුක්තිය**: පාලි: උපෙක්ඛා චෙතොවිමුත්ති- liberation of the mind by equanimity: උපෙක්ඛා චේතෝ විමුක්තිය ලෙසින් පෙන්වා ඇත්තේ, උපෙක්ඛා භාවනාව වර්ධනය කර ගැනීමෙන් සිතේ ඇති පක්ෂපාතිබව (personal bias) නැතිකර ගැනීමය, මධ්‍යස්තව කටයුතු කිරීමට ඇති හැකියාවය. මෙය සතර බ්‍රහ්මවිහරණ වලින් එකකි. මේ විමුක්තිය උපෙක්ඛා නිස්සාරණීය ධාතුව ලෙසින්ද පෙන්වා ඇත**.**
▼**උපෙක්ඛා චේතෝ** විමුක්තිය රාගය පහ කර ගැනීම පිණිසවේ. **මූලාශ්‍ර:** අංගු.නි: (4): 6 නිපාත: 6.1.2.3 නිස්සාරණීය සූත්‍රය, පි. 40, EAN:6: 13.3 Escape, p. 321.

▲ **උපෝසථ-** uposatha : උපෝසථය යනු අටවක හා පාලොස්වක පොහෝදින සංඝයා රැස්වී පාතිමොක්ඛ- පාමොක් සජ්ජායනා කිරීමය, මෙය විනය රීතියකි .එම දිනයේ සංඝයාට, ධර්මය සාකච්ඡා කිරීමට බුදුන් වහන්සේ අවසර දී ඇත. උපෝසථය ඇතිකිරීම පිලිබඳ විස්තර පිණිස **බලන්න**: වින.පි.මහාවග්ග 1: උපෝසතඛන්ධය, පි.326.
▲ **උපෝසථ අටශිලය** පාලි: **අට්ඨඞගසමන්නාගතං සීල උපොසථ ශිලං** - eight uposatha precepts: අට අංගයෙන් යුතු පෙහෙවස් ශිලය, පොහොය දින සමාදන්වන අටසිල්, උපෝසථ ශිලය ලෙසින් පෙන්වා ඇත. **බලන්න**: ශිලය, අටසිල්.

**උභ**

▲ **උභතෝභාග විමුක්තිය**: පාලි: **උභතොභාග විමුත්තො** ubhato-bhāga-vimmutta -both ways of liberation: ධර්මයට අනුව උභතොභාග විමුක්තිය යනු ආකාර දෙකකින්ම විමුක්තිය ලබා ගැනීමය-: **චෙතෝ විමුක්තිය හා ප්‍රඥාවිමුක්තිය** ලැබීමය **-** අරහත්වය ලැබූ ආරිය පුද්ගලයාය **(**liberation by heart- liberation by wisdom). **බලන්න**: සත් ආරිය පුද්ගලයෝ, අෂ්ඨවිමොක්ඛ. **ශබ්දකෝෂ: පා.සි.ශ**: පි. 202: “**උභතොභාග විමුත්ත**: අරූප සමාපත්ති යෙන් රූප කයෙන්ද, මාර්ගයෙන් නාම කයින්ද යන දෙකින් මිදුන තැනැත්තා”. **B.D**: p. 338: “**the both-ways-liberated one:** is the name of one class of noble disciples…”. **P.T.S**: p. 1138: “**free in both ways**: … free both by insight and by the intellectual discipline of the 8 stages of Deliverance…”.
▼**උභතොභාග විමුක්තිය උසස්ම විමුක්තියය**: බුදුන් වහන්සේ මෙසේ වදාළහ: යම්කලෙක භික්ෂුවක්, අෂ්ටවිමොක්කයන් අනුලෝම වශයෙන් සමවදි ද, ප්‍රතිලෝම වශයෙන් සමවදීද. අනුලෝම ප්‍රතිලෝම වශයෙන් සමවදීද, කැමති තැනක, කැමති සමවතක, කැමති තාක් කල් සමවැදීමත්, එයින් නැගී සිටීම කරයිද, ආශ්‍රවයන්ක්ෂය කිරීමෙන් අනාශ්‍රව වූ චිත්ත විමුක්තිය (ඵල සමාධිය) ද, ප්‍රඥා විමුක්තිය (ඵල ඥානය) ද මේ අත්බවෙහිම, තමාගේ විශේෂ නුවණින් දැන පසක් කොට සපයා වෙසේද, ඒ භික්ෂුව උභතෝභාගවිමුක්තිය ලබාඇත: අරූප සමාපත්තියෙන්

රූපකාය කෙරෙන්ද, මාර්ගයෙන් නාමකාය කෙරෙන්ද යයි දෙපසින්ම මිදුනේ වේ. මේ උභතෝභාගවිමුක්තිය උත්තරීතරය, ප්‍රණීතය, මෙයට වඩා උසස් විමුක්තියක් නැත: **"යතො බො ආනන්‍ද, භික්ඛු ඉමෙ අට්ඨ විමොක්ඛෙ අනුලොමම්පි සමාපජ්ජති පටිලොමම්පි සමාපජ්ජති, අනුලොමම්පි... පටිලොමම්පි සමාපජ්ජති, යත්‍ථිච්ඡකං යදිච්ඡකං යාවදිච්ඡකං සමාපජ්ජති පි වුට්ඨාති පි,** ආසවානඤ්ච ඛයා අනාසවං **චෙතොවිමුත්තිං පඤ්ඤාවිමුත්තිං දිට්ඨෙව ධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරති, අයං වුච්චතානන්‍ද, භික්ඛු උභතොභාග විමුත්තො. ඉමාය ච ආනන්‍ද උභතොභාගවිමුත්තියා අඤ්ඤා උභතොභාගවිමුත්ති උත්තරිතරාවා පණීතතර වා නත්‍ථී'ති**" ( Ananda, when once a monk attains these eight liberations in forward order, in reverse order, and in forward-and-reverse order, entering them and emerging from them as and when, and for as long as he wishes, and has gained by his own super-knowledge here and now both the destruction of the corruptions and the uncorrupted liberation of heart and liberation by wisdom, that monk is called 'both-ways liberated' and, Ananda, there is no other way of ″both-ways-liberation″ that is more excellent or perfect than this). **සටහන:** 'liberation of the heart and by wisdom.**බලන්න**: EDN: note: 361, p. 327. **මූලාශ්‍ර:** දීඝ.නි: ( 2 ): 2 මහානිදාන සූත්‍රය, පි. 95, EDN**:** 15: The Great Discourse on Origination, p. 166.

▼ **උභතෝභාග විමුක්තිය** ලැබූ රහතන්වහන්සේ උතුම් පුද්ගලයන් සත් දෙනාට ඇතුලත්ය: **මූලාශ්‍ර**: දීඝ.නි: (3): 5 සම්පසාදනිය සූත්‍රය-ඡෙදය-8, පි. 182 EDN: 28: Sampasādanīya Sutta: section 8- Serene Faith, p.313.

▼ **උභතෝභාග විමුක්තිය ලැබූ උතුමා නිවන පිණිස කටයුතු නිමාකර** ඇත: "මහණෙනි, මේ සසුනේ ඇතැම් පුද්ගලයෙක්, රූප සමාපත්තීන් ඉක්මවා අරූපවූ යම් ශාන්ත විමුක්තියක් වේද, එය නාමකයෙන් ස්පර්ශය කර වාසය කරයි. ඔහු ප්‍රඥාවෙන් ද ආර්යසත්‍ය දැක, ආසව ක්‍ෂයකර ඇත. ඒ පුද්ගලයා උභතෝභාග විමුක්තිය ලබා ඇත. එම මහණහට, 'අප්‍රමාදයෙන් කටයුතු කරන්න යයි' මම නො කියමි. එයට හේතුව නම්, ඔහු අප්‍රමාදයෙන් කළයුතු දේ කර ඇති නිසාය. (ඒ උතුමා රහතන් වහන්සේය)". **" කතමොච භික්ඛවෙ පුග්ගලො උභතොභාග විමුත්තො: ඉධ භික්ඛවෙ එකච්චො පුග්ගලො යෙ තෙ සන්තා විමොක්ඛා අතික්කම්ම රූපෙ අරූප්පා තෙ කායෙන ඵස්සිත්වා විහරති, පඤ්ඤාය චස්ස දිස්වා ආසවා පරික්ඛීණා හොන්ති, අයං වුච්චති භික්ඛවෙ පුග්ගලො උභතොභාග විමුත්තො. ඉමස්ස බො අහං භික්ඛවෙ භික්ඛුනො න අප්පමාදෙන කරණීයන්ති වදාමි. තං කිස්ස හෙතු: කතං තස්ස අප්පමාදෙන අහබ්බො සො පමජ්ජිතං"**: **මූලාශ්‍ර**:ම.නි: ( 2): 2.2.10 කීටාගිරි සූත්‍රය, පි. 252, EMN: 70: Kīṭāgiri Sutta- para:15, p. 536.

▲**උභයලෝක අර්ථ සිද්ධිය-** Ubayaloka artha siddi: උභයලෝක අර්ථ සිද්ධිය ලෙසින් පෙන්වා ඇත්තේ මෙලොව හා පරලොව යහපත පිණිස යහපත් කම්ම සිදුකිරීමය- කුසලධම්ම පිලිබඳ සිහිය පවත්වා ගැනීමය. මෙය පණ්ඩිතයන් සතු ගුණයකි. **බලන්න**: මෙලොව හා පරලොව: **මූලාශ්‍රය:** ඛු.නි: ඉතිවුත්තක: 1.3.3. උභෝඅර්ථ සූත්‍රය, පි. 370.

### උර

▲**උරුවෙලකස්සප තෙර** -Uruvelakassapa Thera: **බලන්න:** උපග්‍රන්ථය:1

### උල

▲ උල-Spike: වැරදිලෙසින් තබන ලද උලක් නිසා විපත් ඇතිවේ, එලෙස අවිද්‍යාව නිසා අයහපත ඇතිවෙන අන්දම මෙහි දක්වා ඇත. **බලන්න**: අවිද්‍යාව, යවනන්ඩුව උපමාව: උපග්‍රන්ථය:5 **මූලාශ්‍ර:**සංයු.නි: ( 5-1): මහාවග්ග: මග්ගසංයුත්ත:1.1.9 සූක සූත්‍රය, පි.44, ESN: 45: Maggasamyutta: 9.9. The Spike, p. 1613.

### උස

▲ **උසස්ඥානය**- Higher knowledge :උසස් ඥානය ලෙසින් පෙන්වා ඇත්තේ අභිඥාවය. **බලන්න**: අභිඥා.

## ඍ කොටස: ඍජ,ඍද

### ඍජ

▲ **ඍජුබව**: පාලි: **අජ්ජවංඤ්ච** -Straightforwardness: ආධ්‍යාත්මික මාර්ගය වඩා ගැනීම පිණිස ඍජු බව (වක් නොවනබව- මාර්ගයේ ඇද නොවී ගමන් කරන බව) ප්‍රතිපත්ති ගරුකබව, අවංක බව අවශ්‍ය අංගයකි. **සටහන**: උජුපටිපන්නෝ- ඍජුව සිටීම සංඝගුණයකි.

▼**ආධ්‍යාත්මික ජීවිතය** සම්පූර්ණ කරගෙන, නිවන ලබා ගැනීමට කැමති පුද්ගලයන් දියුණු කරගත යුතු යහපත් ගුණ අතරට ඍජු බව- ඍජුව වාසය කිරීම, දිවි ඇතිතෙක් මනාවූ ඍජු බවින් යුතුව සිටිම (උජුව) වැදගත් යයි බුදුන් වහන්සේ පෙන්වා ඇත. එය නිවන පිණිස ඇතිකර ගතයුතු ගුණයකි. **"කරණීයමත්ථකුසලෙන- යන්ත සන්තං පදං අභිසමෙච්ච- සක්කො උජූ ච සුජූ ච- සුවචො චස්ස මුදු අනතිමානී"** **මූලාශ්‍ර:** ඛු.නි : **මෙත්තා සූත්‍රය,** පි. 47.

▼ **බුදුන් වහන්සේ** ඍජු ව වාසය කිරීම පිළිබඳව යහපත් ලෙසින් වදාරා ඇත. ඒ ධර්මය සංඝයා එක්ව, ධර්මයේ චිරස්ථිතිය පිණිස සජ්ජායනා කිරීම සුදුසු යයි සැරියුත් මහා තෙරුන් සංඝයාට උපදෙස් දී ඇත. **මූලාශ්‍ර:** දිඝ.නි: (3):**10 සංගිති සූත්‍රය,** පි. 372 , EDN: 33 Saṅgīti Sutta: The Chanting Together, p. 362.

### ඍද

▲ **ඍද්ධි**-Super normal powers : අසමාන්‍ය බල: **බලන්න**: ඉද්දී, ඉද්දිබල, සතර ඉද්දිපාද.

## ඒ කොටස : එක,එජ,එත,එද,එන,එණ,එළ,එස,එහ

### එක

▲**එකග්ගත-** Ekaggata : සිත සමාධි අරමුණේ යහපත් ලෙස පිහිටුවා ගැනීම එකග්ගතය. **බලන්න:** සමාධි.

▲ **එකධර්මය:** පාලි:**එකො ධම්මා**- eko dhammo: සසුන දිගුකලක් පවත්වා ගැනීම පිණිස, බොහෝදෙනාට වැඩ පිණිස මේ එක ධර්මය යහපත් ලෙස අවබෝධ කර ගත යුතුවේ, එක්ව සජ්ජායනා කලයුතුවේ. "සියලු සත්ත්වයෝ:ආහාරයෙන් යැපේ, සියලු සත්ත්වයෝ සංඛාර හේතුකොට සිටි". **"සබ්බෙ සත්තා ආහාරට්ඨිතිකා, සබ්බෙ සත්තා සඞ්ඛාරට්ඨිතිකා**"(All beings are maintained by nutriment &

conditions). **මූලාශ්‍ර:** දීඝ.නි: (3 ): 10 සංගීති සූත්‍රය, පි. 368, EDN: EDN: 33: Sangīti Sutta: The Chanting Together, p. 362. **සටහන්**: * සංයු.නි: (5-1) බොජ්ඣංගසංයුත්ත:3:උදායිවග්ගයේ: 2.3.9 එකධම්ම සූත්‍රයේදී බුදුන් වහන්සේ පෙන්වා ඇත්තේ, සංයෝජන පහ කිරීම පිණිස, සප්ත බොජ්ඣංග වර්ධනය බඳු වෙන එකම ධර්මයක් තමන්වහන්සේ නොදකින බවය. ** සංයු.නි: (5-2) ආනාපාන සංයුත්තය: ඒකධම්ම වග්ග: 10.1.1. එකධම්ම සූත්‍රයේදී, ආනාපාන සතිය නම්වූ එක ධර්මය යහපත් ලෙසින් වර්ධනය කරගන්නේ නම්, මහත් ඵල,මහා ආනිසංස ලැබෙන බව බුදුන් වහන්සේ පෙන්වා ඇත.

▼**භාවනාව පිණිස වැඩිය යුතු ඒක ධම්ම**: එක ධර්මයක් යහපත් ලෙසින් භාවනාවක් ලෙසින් වඩන්නේ නම්, එය සසර කලකිරීම පිණිස, නිවන පිණිස පවතී යයි බුදුන් වහන්සේ පෙන්වා ඇත: බුද්ධානුස්සතිය, ධම්මානුසතිය, සංඝානුසතිය, ශීලානුසතිය, ත්‍යාගානුසතිය, දේවතානුසතිය, ආනාපානසතිය, මරණානුසතිය, කායගතාසතිය, උපසමානුසතිය. **බලන්න**: භාවනා. **මූලාශ්‍රය:** අංගු.නි: (1) නිපාත: ඒකධම්මපාලිය සූත්‍ර, පි.100.

▲ **එකලා විහරණය-**Living in solitude: එකලා විහරණය ලෙසින් පෙන්වා ඇත්තේ, ධර්ම මාර්ගය වඩා ගැනීම පිණිස හුදකලාව වාසය කිරීමය. **බලන්න**: හුදකලාවිවේකය, ඒකවිහාරි.

▲ **එකාරකෙඛා:** පාලි: **එක් ආරක්ෂකයා-** a single guard: ධර්මයට අනුව එකාරකෙඛා යනු එක ආරක්ෂාකයකු ඇතිව ධර්ම මාර්ගයේ ගමන් කිරීමය. එක් ආරක්ෂාකයා, රැකවලා ලෙසින් බුදුන් වහන්සේ පෙන්වා ඇත්තේ සිහිය-සතිය ඇති බවය (a mind guarded by mindfulness). සිතට ඇති ආරක්ෂාකයා නම් සිහිය ය. ආරියෝ, සිහියෙන් යුතුව, සිත ආරක්ෂාකරගෙන සිටි. **බලන්න**: ආරිය වාසස්ථාන, සිහිය.

▼**භික්ෂුව ගේ සිත රකින**, එකම ආරක්ෂකයා නම් සිහිය ය. සිහිය-සතිය හා සම්ප්‍රජන්‍යය ඇතිව භික්ෂුව ආරක්ෂා සහිතව සිටි: **"කථඤ්ච භික්ඛවෙ, භික්ඛු එකාරක්ඛො හොති: ඉධ භික්ඛවෙ භික්ඛු සතාරක්ඛෙන චෙතසො සමන්නාගතො හොති"** ( how does a bhikkhu have a single guard? Here, a bhikkhu possesses a mind guarded by mindfulness) **මූලාශ්‍ර**: අංගු.නි: (6):10 නිපාත: 10.1.2.9 පඨමාරියවාස සූත්‍රය,10.1.2.10 හා දෙවෙනි අරියවාස සූත්‍රය,පි.82-84, EAN:10:19.9 & 20.10 Abodes of the Noble Ones, p. 498-499.

▲**ඒක ධර්ම ප්‍රශ්නය** - A question about one: එක් ධර්මයක් දැකීමෙන් දුක කෙළවර කරගත හැකි බව බුදුන් වහන්සේ වදාළහ. කවර එක් ධර්මයක්ද? **:** "සියලු සත්ත්වයෝ, අහාරනිසා පෝෂණයවේ" **බලන්න**: මහා දස ධර්ම ප්‍රශ්න. **සටහන:** බුදුන් වහන්සේ සෝපාක සාමණේර යන්ගෙන් ඇසූ පළමු ප්‍රශ්නය "එක නාමය කුමක්ද? (එකං නාම කිං ?). **පිළිතුර: "**සියලු සත්වයෝ ආහාරයෙන් පෝෂණය වේ".**බලන්න**:කුමාර ප්‍රශ්ණය. **මූලාශ්‍රය:**බු.නි:බුද්දකපාඨපාළි:4 කුමාරපඤ්හා,පි. 31.

▲**ඒකබීජ:** පාලි: **ඒකබීජසස-** one- seeder : සෝතාපන්නවූ පුද්ගලයෙක් එම ජීවිතයේදී නිවන සාක්ෂාත් නොකර ගත්තේ නම්, ඔහු ආකාර තුනකට මෙලොවට යළි පැමිණ අරහත්වය ලබයි. පළමු ආකාරය, ඒකබිජසසය ය: සෝතාපන්න බව ලබා**,** උපරිම උපත් එකකින් පසු දුක කෙළවර කරගන්නා පුද්ගලයාය. **බලන්න**: සෝතාපන්න. **මූලාශ්‍ර:** සංයු.නි : (5-1): මහාවග්ග:ඉන්ද්‍රිය සංයුත්තය: 4.3.4 ඒක බීජී සූත්‍රය, පි.

394, ESN: 48: Indriyasamyutta: 24.4 One-Seeder, p. 1951.

▲ **ඒකවිහාරි-** alone dweller: ඒකවිහාරි යනු තනිව හැසිරීම- එකලාව වසනසුළුබව, හුදකලාව වාසය කිරීම, එනම් තණ්හාව නොමැතිව සිටීම. මෙය ඒකචරියා ලෙසින්ද දක්වා ඇත. **බලන්න**: එකලාව වාසය, හුදකලා විවේකය.

▼ **බුදුන් වහන්සේ මෙසේ වදාළහ:** " මිගජාල, ඇසින් දකින රූප, කණෙන් අසන ශබ්ද, නාසයෙන් ...ගඳ, දිවෙන් රස..., කයෙන් පහස... සිතින් සිතිවිලි ආදිය (සය ආයතන මගින් ස්පර්ශ කරන බාහිර අරමුණු ) ගැන සතුටුනොවන භික්ෂුව ඒකවිහාරි වේ. එවැනි, මහණ, ප්‍රජාව සහිත ගමේ කෙලවර ඇති සෙනසුණේ විසුවද ඔහු ඒකවිහාරිය. ඒ කවර හෙයින්ද යත්: දෙවැන්නා වූ තණ්හාව ඔහු පහකොට ඇති නිසාය". **සටහන:** මෙ දේශනය වදාළේ මිගජාල තෙරුන්ටය. **බලන්න**: උපග්‍රන්ථය:1. **මූලාශ්‍ර**:සංයු.නි: (4 ): සලායතන සංයුත්ත, මිගජාල සූත්‍ර 1 හා 2 , පි 106, ESN: 35: Salayathanasamyutta, 63.1 & 64. 2 Migajaala, p. 1237.

▲ **ඒක වෝකාර භවය-** eka-vokāra-bhava: සංඥා විරහිත වූ සත්ත්වයන්ගේ උත්පත්තිය සිදුවන රූප බඹ ලෝකය, ඒක වෝකාර භවය වේ. **බලන්න**: අසංඥසත්ත, බ්‍රහ්මලෝක.

▲ **එකම පුත්‍රයා හා එකම දියණිය-** Only son & only daughter
සැදැහැවත් උපාසිකාවකට එකම පුත්‍රයෙක් ඇත්නම් ඔහු, ගිහිගෙයි වාසය කරන්නේනම්, ඒ එකම පුතා චිත්ත ගෘහපති (මචඡිකාසණ්ඩයේ**)**, හත්ථ ආලවක රාජ කුමාර බඳු, බුදුන් වහන්සේගේ අග්‍ර උපාසකයන් ලෙසින් ජීවත්වෙවා යයි පැතීම හෝ ඔහු සසුනේ පැවිදි වූව හොත්, සැරියුත් මුගලන් අගසව් දෙනාම බඳු වේවායි පැතීම යහපත්වේ. එවැනි උපාසිකාවකට එකම දියණියක් සිටි නම් ඇය, කුජ්ජුත්තරා උපාසිකාව, උත්තරා නන්ද මාතාව-වේළුකන්ටකි නන්දමාතාව බඳු බුදුන් වහන්සේගේ අග්‍ර උපාසිකාවන් ලෙසින් ජීවත්වෙවා යයි පැතීම හෝ ඇය සසුනේ පැවිදි වූව හොත්, ඛේමා,උප්පලවන්නා යන අග්‍ර ශ්‍රාවිකා භික්ෂුණියන් බඳු වේවායි පැතීම යහපත්වේ යයි බුදුන් වහන්සේ වදාළහ. **බලන්න**:උපග්‍රන්ථය:1,2,3. **මූලාශ්‍ර:**සංයු.නි: ( 2): නිදානවග්ග: ලාභසත්කාර සංයුත්ත: 3.3.3. එකපුත්ත සූත්‍රය හා 5.3.4 එකධිතු සූත්‍රය, පි.380, ESN:17: Labasakkarasamyutta: 23.3. Only son & 24.4 Only daughter, p. 848.

▲ **එක පුද්ගලයෙක් පහළවීමේ අසිරිය**-Wonders of one person arising
එක පුද්ගලයෙක් - තථාගත අරහත් සම්මා සම්බුදුන්වහන්සේ ලෝකයේ පහළවීමේ අසිරිමත්ය. දෙව් මිනිසුන්ගේ හිත සුවය පිණිසය, පහළවීම දුර්ලභය, පහළවීම ආශ්වර්යමත් දෙයකි, කාලක්‍රියාව බොහෝදෙනාට දුක සංවේගය පිණිස පවතී, ලෝකයේ අසමසම...අද්විතීය... ඒ එක් පුද්ගලයෙක් ගේ පහළවීම නිසා ඇතිවූ අසිරිමත්, උතුම් දේ ගැන මේ වග්ගයේ විස්තරාත්මකව පෙන්වා ඇත. **මූලාශ්‍ර**:අංගු.නි: (1): 1 නිපාත: 13 එකපුග්ගල වග්ගයේ සූත්‍ර, පි. 80, EAN:1: XIII: One person, p. 43.

▲ **එක රසය-** One taste: ධර්මයේ ඇත්තේ එක රසයකි. එනම් විමුක්ති රසය යි බුදුන් වහන්සේ වදාළහ. **මූලාශ්‍ර:**අංගු.නි: 8 නිපාත: 8.1.2.9 පහාරාද සූත්‍රය, පි.103, EAN:8:19.9 Pahārāda,p.421.

▲ **එකලාව හැසිරීම-** Ekalawahasirima: දහමට අනුව, තන්හාව පහකර හැසිරීමය, බුදුන් වහන්සේ එකලාව හැසිරේ යයි දෙවියන් යන් මෙහිද

පවසා ඇත. **බලන්න:** ඒකවිහාරි. **මූලාශ්‍ර:** සංයු.නි: (1): සගාථවග්ග: දේවතාසංයුත්ත:1.3.10 එණිජංග සූත්‍රය, පි.58.

▲ **ඒකායන මග-** Ekayana maga: ධර්මයේ ඒකායන මග ආරිය අටමගය. ඒ මාර්ගයට පිලිපන්විට, ගෙනයන්නේ එක අතකටය- දුකින් මිදීමටය, නිවන ලැබීමටය. **බලන්න:** ආරිය අටමග.

▲ **එකාසනිකයෝ-** who observe the one-session practice ධුතාංග පුහුණුව ලෙසින් එක් වේලක් (අහාර එක්වේල) ගෙන වාසය කරන සංඝයා එකාසනිකයෝ ලෙසින් පෙන්වා ඇත.**බලන්න**:අංගු.නි: (3) 5 නිපාත: ආරඤ්ඤකවග්ග: 5.4.4.9 එකාසනිකසූත්‍රය, පි.380.

**එජ**

▲**එජා**-Eja: එජා ලෙසින් පෙන්වා ඇත්තේ තණ්හාවය. **බලන්න:** තණ්හාව. **මූලාශ්‍රය**: සංයු.නි (4) සළායතනසංයුත්ත: 1.9.7 එජාසූත්‍රය, පි.167.

**එත**

▲ **එතෙර හා මෙතෙර**: පාලි: **ඔරිමං තීර, පාරිමං තිර**- far shore and near shore : ධර්මයේ එතෙර ලෙසින් පෙන්වා ඇත්තේ නිවනය, දුක කෙලවරවීමය, මෙතෙර යනු සසරය, දුක විඳීමය. **බලන්න**: අපාර හා පාර, ඔරිමතීරය හා පාරිමතිරය.

▼ **මැනවින් වැඩූ සතර ඉද්දිපාද සසරින් එතෙරවීමට උපකාරිවේ**. සතර ඉද්දිපාද කෙනෙක් වඩන ලද්දේනම්, බහුල කර ඇත්නම්, මෙතෙරින් එතෙරට යාම පිණිස පවතී යයි බුදුන් වහන්සේ වදාළහ. **බලන්න**: ඉද්දිපාද. **මූලාශ්‍ර**: සංයු.නි: (5-2 ):මහාවග්ග: ඉද්ධිපාද සංයුත්ත: 7.1.1. අපාර සූත්‍රය, පි. 26, EDN: 51: Iddhipāda-samyutta:1.1 From the Near Shore, p.2057.

▼**මාරයාගේ විෂයට** අයත් නොවන එතර-පරතෙර-අමතමග-නිවන ගැන විමසන ජනයාට එම සත්‍යමග තමන්වහන්සේ (කිසිම අල්වාගැනීමක් නැතිව) පෙන්වා දෙනබව බුදුන් වහන්සේ වදාළහ: **"අමච්චුධෙය්‍යං පුච්ඡන්ති යෙ ජනා පාර ගාමිනො, තෙසාහං පුට්ඨො අක්ඛාමි යං සච්චං තං නිරූපධින්ති". සටහන: අමච්චුධෙය්‍යං-** මාරවිෂයය. **මූලාශ්‍ර:** සංයු.නි: (1 ): සගාථවග්ග:මාරසංයුත්ත: 4.3.4 සත්තවස්ස සූත්‍රය, පි. 248, ESN: 4: Marasamyutta: 24.4 Seven Years of Pursuit, p. 295.

▼ **බුදුන්වහන්සේ** එතෙර හා මෙතෙර මෙසේ දක්වා ඇත: **1) ප්‍රාණඝාතය** මෙතෙරය, ඉන් වැලකීම එතෙරය. **2) සොරකම** මෙතෙරය, ඉන් වැලකීම එතෙරය. **3) කාමයෙහි වරදවා හැසිරීම** මෙතෙරය, ඉන් වැලකීම එතෙරය.**4) බොරුකීම** මෙතෙරය, ඉන්වැලකීම එතෙරය. 5) **කේලාම්කීම** මෙතෙරය, ඉන් වැලකීම එතෙරය. **6) පරුෂවචනකීම** මෙතෙරය, ඉන්වැලකීම එතෙරය.**7)නිෂ්ඵලකතා**මෙතෙරය, ඉන් වැලකීම එතෙරය. **8) දැඩිආසාව** මෙතෙරය, ඉන් වැලකීම එතෙරය. **9) ක්‍රෝධය- තරහ** මෙතෙරය, ඉන් වැලකීම එතෙරය.**10) මිථ්‍යාදිට්ඨිය** මෙතෙරය, ඉන් වැලකීම එතෙරය.දසකුසලය එතෙරය, දස අකුසලය මෙතෙරය. **මූලාශ්‍ර**:අංගු.නි: ( 6 ): 10 නිපාත:10.4.2.3 සංගාරව සූත්‍රය, පි.488, EAN:10: 169.3, Saṅgārava, p.550.

**එද**

▲ **එදිරිය හා එදිරිය නැතිබව-** hostility & non-hostility: අනුන් කෙරහි එදිරිය ඇතිව සිටීම අකුසලයකි, දුගතිය ඇතිකරයි. එදිරිය නැතිබව

විමුක්තිය ලබා ගැනීමට උපකාරීවන ධර්මයකි, කුසලයකි. **බලන්න:** අනවද්‍ය ධර්ම හා සාවද්‍ය ධර්ම, සල්ලේඛපරියාය.

▲ **ඒදඬු පාලම්**-Bridges: දිය පහරවලින් එතරවීම පිණිස සදා ඇති ගස් කඳ එදඬුය, ඊට වඩා ක්‍රමවත්ව සකස් කර ඇත්තේ පාලමය. යම් කෙනක්, අන්‍යයන්ගේ යහපත පිණිස එදඬු පාලම් සාදා දෙන්නේනම් නම් එය පුණ්‍ය ක්‍රියාවකි, සුගතියට මග පාදයි. **මූලාශ්‍රය**: සංයු.නි: (1): සගාථවග්ග: දේවතාසංයුත්ත: 1.5.7 වනරෝප සූත්‍රය, පි.86.

**එන**

▲**එන්දිත-** palpitation: එන්දිත ලෙසින් පෙන්වා ඇත්තේ සිත සැලීමය-සලිතවීමය. බුදුන් වහන්සේ මෙසේ වදාළහ: "මහණෙනි, '**මම වෙමි**' යි යන එන්දීතයකි. '**මේ මම වෙමි**' යි ...'**මම වන්නෙමි**' යි... '**මම නොවන්නෙමි**' යි... '**රූප ඇත්තෙක් වන්නෙමි**' යි... '**රූප නැත්තෙක් වන්නෙමි**' යි... '**සංඥා ඇත්තෙක් වන්නෙමි**' යි... '**සංඥා නැත්තෙක් වන්නෙමි**' යි... '**නොම සංඥා ඇත්තෙකුත් සංඥා නැත්තෙකුත් වන්නෙමි**' යි ... යන මෙය එන්දිතයකි ... එන්දිතය රෝගයකි...ගඩුවකි... හුලකි... ඒ නිසා මෙහි ලා එන්දිතා රහිත සිතින් යුතුව වාසය කරන්නෙමු යයි ඔබ විසින් හික්මිය යුතුය."**මූලාශ්‍ර:** සංයු.නි: (4) සළායතනවග්ග: වේදනාසංයුත්ත: ආසිවිසවග්ග:1.19.11 යවකලාපී සූත්‍රය, පි.410, ESN: 36: Vedanasamyutta:248.11 The Sheaf of Barley, p.1327.

**එණි**

▲**එණිමුවා-** Eni muwa: මෙහිදී බුදුන් වහන්සේගේ රූපය වර්ණනා කරණ දෙවියන්, උන්වහන්සේගේ කෙණ්ඩා එණිමුවකුගේ කෙණ්ඩා වලට සම කර ඇත. **මූලාශ්‍ර:** සංයු.නි: (1): සගාථවග්ග: දේවතා සංයුත්ත:1.3.10 එණිජංග සූත්‍රය, පි.58.

**එළ**

▲ **එළකිරි -**the Cow milk: සමාධි සම්පත් ලබාගැනීමේ අග්‍ර බව මෙහිදී පෙන්වා ඇත. එළදෙනට වඩා කිරිද, කිරිවලට වඩා දිහිද, එයට වඩා වෙඬරුද, එයට වඩාගිතෙල් ද එයට වඩා මණ්ඩය ද අග්‍රයයි කියයි. එලෙස, ධ්‍යාන පුද්ගලයෙක් ගේ සමාධියද, එයට වඩා සමාධි කුසලයද, එයට වඩා සමාධි සමාපත්ති කුසලයද අග්‍රවේ. **බලන්න**: සමාධිය. උපග්‍රන්ථය:5. **මූලාශ්‍ර**: සංයු.නි: (3): ඛන්ධකවග්ග: ජානසංයුත්ත:13.1.1. සමාපත්ති කුසල සූත්‍රය, පි.566, ESN: 34 Jhānasaṃyutta: 1 Attainment in relation to Concentration, p.1163.

▲**එළදෙන** -the Cow: හම ගැසූ එළදෙන ආරක්ෂිත තැනක් සොයායන ලෙසින්, ස්පර්ශ ආයතන යන්ට යට නොවී සිටීම සුවයක් බව මෙහි පෙන්වා ඇත. **බලන්න**: ස්පර්ශ ආහාර, උපග්‍රන්ථය:5 **මූලාශ්‍ර :**සංයු.නි: (2): නිදානවග්ග: අභිසමය සංයුත්ත: 1.7.3 පුත්තමංස සූත්‍රය, පි. 174, ESN: 13 : Abhisamyasamyutta: 63.3 Son's Flesh, p. 697.

**එස**

▲ **එසිකාස්ථම්භය**-Eskiasthmbaya: පුරාණ ඉන්දියාවේ, නගරයකට ඇතුළුවන ස්ථානයේ ඉදිකර ඇති ශක්තිමත් කුළුන එසිකාස්ථම්භයය. **බලන්න:** ඉන්ද්‍රකීලය.

▲ **ඒසුකාරී බ්‍රාහ්මණ**- Esukari Brahmin:**බලන්න**: උපග්‍රන්ථය:3

**එහ**

▲ **එහිපස්සිකෝ-**Ehipassiko: ධම්ම ගුණයකි: ධර්මය "**ඒව බලව යයි කීමට සුදුසු බවය**". ධර්මය විවෘතය, ඕනෑම කෙනෙකුට ධර්මය විමසා බැලිය හැකිය. **බලන්න:** ධම්ම ගුණ.

▲ **එහි භික්ඛු-** Ehi bhikkhu: එහි භික්ඛු "**ඒව මහණ**" යන්න බුද්ධ වචනයය. බුදුන් වහන්සේ වැඩසිටි සමයේ සමහර සංඝයා මහණකම ලබා ඇත්තේ ඒ අයුරින්ය. බුදුන් වහන්සේ එසේ වදාළවිට ඒ භික්ෂුවට සෘධියෙන් ලැබෙන පාත්‍ර සිවුරු ඇතිව, ශ්‍රමණබව ලැබේ, උපසම්පදාව ලැබේ. **සටහන:** එම උපසම්පදාවට හේතුවී ඇත්තේ පෙර කරනලද යහපත් කම්මයන්ය.**ශබ්දකෝෂ: පා.සි.ශ:** පි. 217: "**එහි භික්ඛු-** එලෙස පැවිදිවූ භික්ෂුව, **එහි භික්ඛුනි-** එලෙස පැවිදිවූ භික්ෂුණිය. එහි භික්ඛු චිවරය- සෘද්ධියෙන් උපන් චිවරය. එහි භික්ඛු උපසම්පදාව යනු අට වැදෑරුම් උපසම්පදා වලින් එකකි.

▼ **අගසව්දෙනම එහි භික්ඛු බවින් පැවිදිවීම : "...ඉක්බිති සැරියුත් මුගලන් දෙදෙනා භාග්‍යවතුන් වහන්සේ වෙතට පැමිණියහ. පැමිණ භාග්‍යවතුන් වහන්සේගේ පාමුල්හි හිඳින් වැටි ' ස්වාමිනි, අපි භාග්‍යවතුන් වහන්සේ වෙත පැවිදිබව ලබන්නෙමු, උපසම්පදාව ලබන්නෙමු' යි දැන්වූහ" 'එවූ, මහණෙනි, ධර්මය හොඳින් දේශනා කරණ ලද්දේය. හොඳින් දුක් කෙළවර කරනු පිණිස බ්‍රහ්මචරියාවේ හැසිරෙවූ" යි භාග්‍යවතුන් වහන්සේ වදාළ සේක. ඒ ම ඒ ආයුෂ්මත්වරුන්ට උපසම්පාදාව වී ය". සටහන්:*** මහා කප්පින තෙරුන් හා ඔහුගේ රජපිරිස, අගබිසව ඇතුළු කාන්තාවන්,එහි භික්ඛු භාවයෙන්, බුදුන් වහන්සේ වෙතින් පැවිද්ද ලැබූහ. EAN: note no. 112, p. 586, ESN: note: 400, p.991. **මූලාශ්‍ර:** වින.පි: මහවග්ග පාලිය 1, ඡෙදය 21, පි. 166.

## ඔ කොටස:ඔක,ඔඝ,ඔඩ,ඔත,ඔද,ඔන,ඔප,ඔභ,ඔම,ඔර,ඔල,ඔව,ඔස

### ඔක

▲ **ඔකය-** House : ඔකය යනු නිවසය-පදිංචිතැනය. මෙහිදී ඔකය ලෙසින් පෙන්වා ඇත්තේ ලෝකයා පදිංචිසිටින තැන හෙවත් පංච උපාදානස්කන්ධය. ගෙදර හැසිරෙන්නා - පංච උපාදානස්කන්ධ තමාගේ යයි අල්වාගෙන සිටින තැනැත්තා, ඔකසාරිය. **බලන්න**: අනිකේතසාරි. **මූලාශ්‍ර:** සංයු.නි: ( 3): ඛන්ධසංයුත්ත: හාලිද්දිකානි සූත්‍රය, පි. 42, ESN: 22: Kahandasamytta, 3.3 Haliddkani, p. 1011.

▲ **ඔකාසාධිගමා-** gateways to the bliss: අධිගම සුවය ලබාදෙන මග. **බලන්න:** අවකාශාධිගම මාර්ග.

### ඔඝ

▲ **ඔඝය හා ඔඝ තරණය: පාලි: ඔඝ, ඔඝතිණ්ණ-** flood & crosser of the flood: ධර්මයේ ඔඝය ලෙසින් පෙන්වා ඇත්තේ ජල ප්‍රවාහ සතරක් - සැඩදිය පහර 4 ක් : කාම භව දිට්ඨි අවිජ්ජා - ඇති සසරටය. (චතුර්විධ ඔඝ- මහා ඔඝ ලෙසින්ද හඳුන්වයි) එම ජල කඳ 4 ට හසුවූ මිනිසුන් ඉන් එතරවීමට මග නොදැන දිගින් දිගටම සසරේ පාවී යති. එම සතර ප්‍රවාහයන් මැඩ පවත්වා, එතරවූ පුද්ගලයා රහතන්වහන්සේය, '**ඔඝතිණ්ණන**' යයි කියනු ලැබේ. **ශබ්දකෝෂ : පා.සි.ශ**: පි. 221: "**ඔඝ:** මහා සැඩපහර, චතුර්විධ ඔඝය".**B.D**: p.112: "**Ogha**: Floods is a name for the 4 cankers-āsava…" **P.T.S**: p. **'Ogha:** a flood of

water; usually as mahogha a great flood: the flood of ignorance and vain desires which sweep a man down, away from the security of emancipation…'

▼**ඔසය තරණය කරණ අන්දම:** එක්සමයක දේවතාවක්, 'භික්ෂුව ඔසයතරණය කරන්නේ කෙසේද' ය යි බුදුන් වහන්සේ ගෙන් විමසුහ. බුදුන් වහන්සේ මෙසේ වදාළහ: **"පඤ්ච ඡින්දෙ පඤ්ච ජහෙ පඤ්ච චුත්තරි භාවයෙ, පඤ්ච සඞගාතිගො 'භික්ඛු ඔඝතිණ්ණො' ති වුච්චතීති".** 5 ක් සිඳ දමා (පංච ඕරම්භාගිය සංයෝජන), 5 ක් ප්‍රහිණය කර (පංච උද්දම්භාගිය සංයෝජන), 5ක් වඩා ගැනීමෙන් (පංච ඉන්ද්‍රියන්: සද්ධා, වීරිය, සති, සමාධි, ප්‍රඥා:අධ්‍යාත්මික ඉන්ද්‍රිය) හා බැමි 5 ක් කඩා දැමීමෙන් (රාග, දෝස, මෝහ-අවිජ්ජා, මාන, දිට්ඨි යන ආසවයන්) සසර ඔසය තරණය කලහැකිබවය. ඔසය ඉක්මවූ මහණ **'ඔඝතිණ්ණ'** ලෙසින් හඳුන්වයි. **සටහන**: මේ පිළිබඳ අටුවාව දක්වා ඇති විස්තර පිණිස **බලන්න**: ESN: note: 12, p. 500. **මූලාශ්‍ර**:සංයු.නි:(1): සගාථවගග:1.1.5 කතිඡින්ද සූත්‍රය**,** පි.32, ESN: 1: Devataha samyutta: 5.5 How many one must cut?, p. 63.

▼**බුදුන් වහන්සේ ඔසය තරණය කළ අන්දම**: දෙවියෙක් ඇසූ පැණයකට පිළිතුරු ලෙසින්, ඔසය තරණය කළ අන්දම බුදුන් වහන්සේ මෙසේ පෙන්වා ඇත**: "අප්පතිට්ඨං ඛ්වාහං ආවුසො අනායූහං ඔඝමතරිනනි... යදා ස්වාහං ආවුසො සනතිට්ඨාමි. තදාස්සු සංසිදාමි. යදා ස්වාහං ආවුසො ආයුහාමි තදාස්සු නිබ්බුය්හාමි..."** 'මම නොනැවතී- විරාමයක් නොගන, මහා වෙහෙසට පත්නොවී සසර තරණය කෙළෙමි, නැවතුනේනම් මා ගිලියනු ඇත, දැඩිවෙහෙසට පත්වුයේනම් මා පාවීයනු ඇත, එලෙස මම ඔසය තරණය කෙළෙමි'. **සටහන**: අටුවාවට අනුව: මෙහිදී නොනැවතීම (Not halting) ලෙසින් පෙන්වා ඇත්තේ කෙළෙස්වලට හසුනොවී නිවනබලා යාමය; පිහිනීම නැවතුවහොත් ජලෙයේ (සසරේ) ගිලියයි. මහා වෙහෙසට පත්නොවීම යනු කෙළෙස්වළ නො පිහිටා සිටීමය; කෙළෙස් පිහිටුවාගත්විට ඉන් මිදීම පහසුනොවේ, කෙළෙස් නිසා වෙහෙසට පත්වූවිට පිහිනීමට නොහැකිව සැඩ දියේ (සසරේ) පාවී යයි. ඒ සැම අන්තයන්ම හැර මධ්‍යම ප්‍රතිපදාව අනුගමනය කර බුදුන් වහන්සේ සසර තරණය කළහ. **බලන්න**: ESN: notes 2 & 3, p. 498. **මූලාශ්‍ර:** සංයු.නි: ( 1): සගාථවග්ග: දේවතාසංයුත්ත: 1.1.1 ඔඝතරණ සූත්‍රය, පි. 28, ESN:1: Devatāsaṃyutta:1.1 Crossing the Flood, p. 59.

▲**ඔඝ සතර-**The 4 floods: ඔඝ සතරකි: කාමඔසය, භවඔසය, දිට්ඨිඔසය හා අවිජ්ජාඔසය (the flood of sensuality, of existence, of views, of ignorance). එම ඔඝ-සැඩ දිය, මිනිසුන් සසර ජල ප්‍රවාහයේ ගිල්වා දමයි. ඔඝ 4 අවබෝධය කරගනිමට, සහමුලින් නැතිකරගැනීම පිණිස ආරිය අටමග සම්පූර්ණ කරගතයුතුවේ.**සටහන:** අටුවාවට අනුව: **කාමඔසය**: පංචකාමයන්ට ඇති ආසාව හා බැඳීම. **භවඔසය:** රූප හා අරූප භවයන්ට ඇති ඇලීම හා ජාන වලට ඇති බැඳීමය. **දිට්ඨිඔසය**: මත හා දිට්ඨිවලට ඇති බැඳීම. **අවිජ්ජාඔසය**: මෝහය- චතුසත්‍ය නොම දැනීමය. **බලන්න**: ESN: note 1, p. 498. **මූලාශ්‍ර**: සංයු.නි : (5-1): මග්ගසංයුත්ත: ඔඝ වග්ග: 1.16 **ඔඝ සූත්‍රය**, පි.160 , ESN: 45: Maggasamyutta: 171-1 Floods, p. 1718, සංයු.නි: (4): සළායතන වග්ග: ජම්බුඛාදක සංයුත්ත: 4.1.11 ඔඝ සූත්‍රය, පි. 508 , ESN: IV: 38 Jambukhādaka saṃyutta:11 Floods, p.

1406.

▼**ආධ්‍යාත්මික වර්ධනය** පිණිස සිව් ඔසය පහ කර ගත යුතුය. **බලන්න:** පහාතබ්බ ධර්ම.**මූලාශ්‍ර:** දීඝ.නි : (3): 11 දසුත්තර සූත්‍රය, පි. 483, EDN: 34: Dasuttara Sutta: Expanding Decades, p. 384.

**ඔඩ**

▲ **ඔඩොක්කුවේ ප්‍රඥාව උපමාව**-Simileof the lap-like wisdom දහම අසන පුද්ගලයෙක් එය අවබෝධ කරගන්නා ආකාරය පෙන්වීම පිණිස මෙ උපමාව යොදාගෙන ඇත. මොවුන් වාඩිවී සිටිනා තෙක් දහම අසති, එහෙත් නැගිට ගත්විට දහම් කරුණු අමතකවෙ. එය හරියට වාඩිවී සිටින කෙනක් ඔඩොක්කුවේ කැම තියාගෙන සිටිනා ලෙසය. ඔහු නැගීසිටින විට එ කැම බිමට වැටේ. එලෙසින් දහම් කරුණු සිහියෙන් පිටවී යයි. **බලන්න:** උච්ඡඞ පඤ්ඤා, උපග්‍රන්ථය:5. **මූලාශ්‍ර:**අංගු.නි: (1): 3 නිපාත: 3.1.3.10 සූත්‍රය, පි. 277, EAN: 3: 30.10 sutta, p. 88.

**ඔත**

▲ **ඔත්තප්ප**: පාලි: **ඔත්තප්ප-** moral fear: ඔත්තප්ප යනු අකුසල් කිරීමට ඇති භයය. මෙය කුසලයකි.**බලන්න:** හිරි හා ඔත්තප්ප.

**ඔද**

▲**ඔදාතකසිණය**- Odathakasina: සුදුකසිණයය, භාවනා අරමුණකි. **බලන්න**: කසිණ.

**ඔන**

▲ **ඔනතොනත හා ඔනතුන්නත පුද්ගලයෝ -** Onathonatha & Onathunnatha Persons: ඔනතෝනත යනු නීච- පහත් බවය. උපතින් ඉතා පහත් කුලයක ඉපදී, දුස්සිසල වූ පුද්ගලයා මෙසේ හඳුන්වයි. ඔහු ඒකාන්තයෙන්ම නිරයේ උපත ලබයි. එහෙත්, ඔනතුන්නත පුද්ගලයා එසේ නොවේ. ඔහු පහත් කුලයක උපත ලැබුවද, සුචරිතය ඇත. එනිසා මරණින් මතු දෙව්ලොව ඉපදීමට වාසනාව ඇත. **බලන්න**: උත්තම නීච පුද්ගල හා උත්තම- උත්තම පුද්ගල. **මූලාශ්‍රය:** අංගු.නි: (2) 4 නිපාත: 4.2.4.6 ඔනතෝනත සූත්‍රය, පි.186.

**ඔප**

▲**ඔපනයික**-Opanaika: ධර්මගුණයකි. **බලන්න:** ධර්මගුණ.

▲ **ඕපපාතික** -Spontaneous birth: ඕපපාතික යනු සත්ත්වයන් උපත ලබන විධියකි. ස්වයංජාත ( දෙමාපියන්ගේ ආධරය නොමැතිව) ලෙසින්ද හඳුන්වයි. දෙව්ලොව දෙවියන් හා නිරයේ සත්ත්වයන් යළි උපත ලබන්නේ මේ ආකාරයටය. **බලන්න**: උත්පත්ති විධි.

**ඔභ**

▲**ඔභා**-Bright lights: ඔභා යනු දීප්තිමත් ආලෝකයය. **බලන්න**: අභා

**ඔම**

▲ **ඔමානය-** Omana: ඔමානය- හීනමානය, ආධ්‍යාත්මික මග වඩා ගැනීමට බාධාවකි. **බලන්න**: ත්‍රිවිධමාන.

**ඔර**

▲**ඔරිමතීරය හා පාරිමතීරය**: පාලි: **ඔරිමං තීරං, පාරිමං තීරං** -far shore and near shore: ඔරිමතීරය ලෙසින් බුදුන් වහන්සේ පෙන්වා ඇත්තේ සම්මා දිට්ඨිය පෙරටුකටගත් මගය- නිවනය. පාරිමතිරය නම් මිථ්‍යා දිට්ඨිය ඇති වැරදි මගය, එනම් සසරය, දුකය. **බලන්න**: එතෙර හා

මෙතෙර. **මූලාශ්‍ර:** අංගු.නි: (6):10 නිපාත: 10.3.2.5. සඞගාරව සූත්‍රය, පි.448 හා 10.3.2.6. ඔරිමතීර සූත්‍රය, පි.450, EAN: 10: 117-5 Saṅgārava, p.546 & 118-6 Near, p.546.

▲ **ඔරම්භාගිය සංයොජන:** පාලි: **ඔරම්භාගියසංයොජන** -The five lower fetters: සංයෝජන 10යේ පහළ සංයෝජන 5 ඔරම්භාගිය සංයෝජන ලෙසින් හඳුන්වයි. මේවා කාමලෝකයට බැඳ තබන කෙළෙස්ය. **බලන්න**: සංයෝජන. **ශබ්දකෝෂ: පා.සි.ශ**: පි.210: "**ඔරම්භාගිය සංයොජන**: පහත් භවය භාජනය කරණ සංයොජන".**B.D**: p.300: "**orambhāya- saṃyojana:** lower fetters…they tie to the sensuous world'.

▼**ඔරම්භාගිය සංයෝජන 5 කි:** සක්කායදිට්ඨිය, විචිකිච්චාව, සීලබ්බතපරාමාසය, කාමච්ඡන්දය, ව්‍යාපාදය, ඔරම්භාගිය සංයෝජන වේ. (Identity view, doubt, the distorted grasp of rules and vows, sensual desire, ill will) **සටහන:** පහළ සංයෝජන ලෙසින් හඳුන්වන මේවා, සත්ත්වයා කාමලෝකයට බැඳතබති. 1-3 සංයෝජන පහකිරීමෙන් සෝතාපන්න හෝ සකදාගාමී මගඵල ලැබේ, සියල්ල ප්‍රහීණය කළවිට අනාගාමීවේ. **බලන්න**: අනාගාමී. **මූලාශ්‍ර**:අංගු.නි: (6): 10 නිපාත: 10.1.2.3 සංයෝජන සූත්‍රය,**පි**.60, EAN:10: 13.3. Fetters, p. 496, දීඝ.නි: (3): 10 සංගීති සූත්‍රය- ඡෙදය 10, පි. 380 , EDN: 33 Sangīti Sutta: The Chanting Together-section 10 , p. 366.

▼ **ඔරම්භාගිය සංයෝජන ප්‍රහීණය කිරීම**: ආරිය අටමග සම්පූර්ණයෙන්ම වර්ධනය කරගැනීමෙන් මේ සංයෝජන 5 ගැන මනා අවබෝධය ලබා ඒවා පහකර ගැනීමට හැකිබව බුදුන් වහන්සේ පෙන්වා ඇත. **මූලාශ්‍ර:** සංයු.නි: (5-1 කාණ්ඩය): මග්ගසංයුත්ත: ඔඝ වග්ග, 1.16 ඔරම්භාගිය සංයෝන සූත්‍රය, පි. 164, ESN: 45: Maggasamyutta: 179.9 Lower Fetters, p. 1726.

**ඕල**

▲ **ඕලාරික**- Olarika : ඕලාරික යනු තද ගොරෝසු බවය. සංයු.නි: **අනත්ත ලක්ඛණ සූත්‍රයේදී** බුදුන් වහන්සේ පෙන්වා ඇත්තේ රූප වේදනා ආදීවූ පංච උපාදානස්කන්ධයම ඕලාරික, සියුම්, හීන ප්‍රණීත ආදීවූ විවිධ ස්වරූප ඇතිබවය: **" යං කිඤ්චි රූපං අතීතානාගතපච්චුප්පන්නං… ඔළාරිකංවා සුඛුමං වා…".**

**ඕව**

▲ **ඕවාද**- Advice: ඕවාද-අවවාද අනුසාසනා ආධ්‍යාත්මික වර්ධනය පිනිස අවශ්‍ය කරුණකි. ජේෂ්ඨ සංඝයාගෙන් අවවාද අනුසාසනා නිතර නිතර ලබාගැනීම සුදුසු බව බුදුන් වහන්සේ වදාළහ. **බලන්න**: විනය පිටකය.

▼ **අවවාද අනුසාසනා කරන**, අනුන් පාපයෙන් වළකන, පුද්ගලයා සත්පුරුෂයන්ට ප්‍රියවේ, අසත්පුරුෂයන්ට අප්‍රියවේ:
**"ඔවදෙය්‍යානුසාසෙය්‍ය අසබ්භා ච නිවාරයෙ- සතං හි සො පියො හොති අසතං හොති අප්පියො". මූලාශ්‍ර**: ඛු.නි: ධම්මපදපාලි: 6 පණ්ඩිතවග්ග, ගාථාව 77.

▼ **බුදුන් වහන්සේ** වැඩසිටි කාලයේම, සමහර සංඝයා අවවාද ඇසීමට හිත යොදන්නේ නැතිබව, ප්‍රිය නොකරන බව, කීකරු නොමැතිබව මහා කාශ්‍යප තෙරුන්, බුදුන් වහන්සේට පවසා ඇත. **මූලාශ්‍ර**: සංයු.නි: (2):

නිදානවග්ග:කස්සපසංයුත්ත: ඕවාද සූත්‍ර 3 කි, පි. 332, ESN:16: Kassapasamyutta: Ekhortation 3 suttas, p. 813.

▼ **භික්ෂුණී සංඝයාහට** ඕවාද දෙන භික්ෂූන් අතුරින් නන්දක තෙරුන් අග්‍රය. එතුමන්, භික්ෂුණී සංඝයාට ඕවාද දීම පිළිබඳ විස්තර මෙහි දැක්වේ. **බලන්න:** ම.නි: (3) නන්දඕවාද සූත්‍රය.

**ඔස**

▲ **ඔසග්ග**: පාලි: **වොස්සග්ග-** Osagga :ඔසග්ග (වොසග්ගය) යනු අතහැර දැමීම, කාම ලෝකය අතහැර නිවන අරමුණුකර භාවනාව වඩාගැනීමය. නිවනට නැමීමය. බොජ්ඣංග ධර්ම වඩා ගැනීම පිණිස, භාවනාව වර්ධනය පිණිස කාමලෝකය හැරදැමූ නිවනට නැමුණු සිත (වොසග්ගපරිනාමි) අවශ්‍ය බව සූත්‍රදේශනාවල පෙන්වා ඇත. **බලන්න**: සංයු.නි. අසංඛතසංයුත්තය.

▼ **බුදුන් වහන්සේ** මෙසේ වදාළහ: "මහණෙනි නිවන් මග නම්: මෙහි මහණ විවේකය ඇසුරු කළ විරාගය ඇසුරු කළ නිරෝධය ඇසුරු කළ නිවනට නැමුණු සම්මා සමාධිය වඩයි, මේ නිවන් මගය". **"ඉධ භික්ඛවෙ, භික්ඛු සම්මාසමාධිං භාවෙති විවෙකනිස්සිතං විරාගනිස්සිතං නිරොධනිස්සිතං වොස්සග්ගපරිණාමිං, අයං වුච්චති භික්ඛවෙ අසඞ්ඛතගාමි මග්ගො". මූලාශ්‍ර:** සංයු.නි: (4): සළායතනවග්ග: අසංඛතසංයුත්ත: 9.2.4 සම්මාසමාධි සූත්‍රය, පි. 682, ESN: 43: Asankathasamyutta: 12.1 The unconditioned, p. 1507.

## ක කොටස:කක,කච,කට,කඨ,කඩ,කඬ,කත,කධ,කන, කණ, කප,කබ,කම,කය,කර,කල,කළ,කළු,කව,කස,කෂ, කෂ,කහ

**කක**

▲ **කකචූපම -**The simile of the Saw :දෙපත් කැපෙන කැත්ත උපමාව යොදාගත්තේ, අනුන් කෙරෙහි තරහයෙන් (ක්‍රෝධය ඇතිව) වාසය නො කිරීමේ යහපත්බව පෙන්වා දීම පිණිසය. සොරුන් පිරිසක්, තමන්ගේ දෙපය, දෙපත් කියතකින් කපන විට වුවද, ඔවුන් කෙරේ හිත අනුකම්පාව ඇතිව, මෙත්තා සහගත සිත ඇතිව වාසය කළයුතු ය, එම අවවාදය නිතර සිහි කලයුතුය. එවැනි හික්මීම නොමැති තැනත්තා, බුදුන් වහන්සේගේ, අවවාද අනුසාසන පිළිගන්නා කෙනෙක් නොවේ. **බලන්න**:උපග්‍රන්ථය:5 **සටහන**: මෝලියඵග්ගුණ භික්ෂුවට අවවාද කිරීම පිණිස මේ සූත්‍රය දේශනාකරන ලදී. **මූලාශ්‍ර:** ම.නි: (1): 1.3.1 කකචූපම සූත්‍රය,පි.328, EMN:21: Kakacūpama Sutta-The Simile of the Saw, p. 209.

▲ **කක්කට තෙර**- Kakkaṭa Thera: **බලන්න**:උපග්‍රන්ථය:1

▲ **කකුධ දේවපුත්‍ර**-Kakudha Deva : බුදුන්වහන්සේ සාකේත නුවර, අඳුන්වනයේ මිගදායේ වැඩවසන සමයේ මේ දේවපුත්‍ර, උන්වහන්සේ බැහැදැකීමට පැමිණ, මෙසේ පවසා ඇත: **"ලොව තණ්හාව තරණය කළ, ඇලුම් නැති, දුක්නැති, පිරිනිවී, පාප බහා තැබූ (බාහිතපාපී) මහණකෙනෙක්, ඒකාන්තයෙන්ම කලකින් දකිමි".**

**මූලාශ්‍රය:** සංයු.නි:(1) සගාථවග්ග: දේවපුත්තසංයුත්ත: 2.2.8 කකුධ සූත්‍රය, පි.128.

▲ **කකුසඳ බුදුන්-** The Buddha Kakusanda :කකුසඳ බුදුන් වහන්සේ, ගෝතම බුදුන් වහන්සේට පෙර වැඩසිටි සම්මා සම්බුදුවරයෙකි. **මූලාශ්‍ර:** බු.නි:බුද්ධවංශ පාලි: 22: කකුසඳ බුදුන් වහන්සේ, පි. 235.

▼**කකුසඳ බුදුන්**, සම්මා සම්බෝධිය ලැබීම පිලිබඳ විස්තරය මේ සූත්‍රයේ පෙන්වා ඇත. **මූලාශ්‍ර:** සංයු.නි: (2): නිදානවග්ග:අභිසමයසංයුත්ත: 1.1.7 කකුසඳ සූත්‍රය, පි.37,ESN:12: Nidanasamyutta: I The Buddhas: 7.7. Kakusandha, p. 617.

▼**කකුසඳ බුදුන්වහන්සේගේ** අගසව් දෙනම: විධුර හා සංජීව තෙරුන්ය. **බලන්න**: මිනිස් ආයුෂ. **මූලාශ්‍රය:**සංයු.නි: (2) : නිදානවග්ග:අන්මතග්ග සංයුත්ත: දුග්ගතවග්ග: 3.2.10 වෙපුල්ල පබ්බත සූත්‍රය, පි.314.

▲**කීකරුපුත්‍ර**-Obedient son :පුතුන්අතුරින් කීකරු පුත්‍රයා අග්‍රය යි බුදුන් වහන්සේ වදාළහ. **මූලාශ්‍ර:** සංයු.නි: (1): සගාථවග්ග:දේවතාසංයුත්ත: 1.2.4 ඛත්තිය සූත්‍රය, පි.38, ESN:1: Devatasamyutta: 14.4 The Khattiya, p.73.

▲**කොකනදා දේවතාවිය**-Kokanada Devi බුදුන් සරණ ගිය මේ දේවතාවිය, පජ්ජුන නම් වැස්සවලාහක දේවියගේ දියණියය. මෙහිදී, ඒ උත්තමිය බුදුන් වහන්සේගේ ධර්මය ගරුකරනබව පෙන්වා ඇත. **මූලාශ්‍රය:**සංයු.නි: (1): සගාථවග්ග: දේවතාසංයුත්ත: පජ්ජුන්තධිතු සූත්‍ර 2කි, පි. 78.

▲ **කෝකාලික භික්ෂුව**- Kokalika Bikkh :අගසව් දෙනමට, ආරිය උපවාදය කිරීම නිසා කෝකාලික භික්ෂුව,කර්මවිපාක පලදීමෙන්, මෙලොවදී බොහෝ දුක් වේදනා විඳ පදුම නිරයේ යළි උපත ලැබිය. **බලන්න**: ආරිය උපවාද. **මූලාශ්‍ර**: අංගු.නි: (6): 10 නිපාතය: 10.2.4.9 කොකාලික සූත්‍රය, පි. 332, EAN: 10: 89.9 Kokālika, p. 530, බු.නි: සුත්ත නිපාත: 3-10: කෝකාලික සූත්‍රය, පි. 220.

▲**කුක්කුල නිරය-** Hell of Hot Embers: උණුඅළු නිරය මේ නමින්ද හඳුන්වයි. රූප වේදනා ආදී පංච උපාදානස්කන්ධයම ඇවිලගත් උණුඅළු රැසක්ය. **බලන්න**: නිරය, පංච උපාදානස්කන්ධය.

▲ **කුක්කුච්ච**-Uneasiness : වැරදි දේ කිරීම හා නිවැරදි දේ නොකිරීම නිසා සිතේ ඇතිවන අසහනකාරීබව මින් අදහස් කරයි. මෙය නීවරණයකි. **බලන්න**: නීවරණ.

▲ **කුක්කුටාරාමය-** Kukkutaramaya: මේ අරණ්‍යය, පාටලිපුත්‍ර නුවර (පැළලුප්නුවර-පැට්නා) පිහිටි බුදුන් වහන්සේ හා සංඝයා වැඩසිටි ආරාමයකි. **බලන්න**: පාටලිපුත්‍ර නුවර. **බලන්න:** සංයු.නි: (5-1) මහාවග්ග: මග්ගසංයුත්ත: විහාරවග්ග: කුක්කුටාරාම සූත්‍ර 3 කි.

**කච**

▲ **කච්චාන මහා තෙර-**Kachchana Thera: **බලන්න:**උපග්‍රන්ථය:1

▲ **කච්චාන ගොත්ත තෙර-**Kachchana Thera: **බලන්න:**උපග්‍රන්ථය:1

**කජ**

▲**කජඞනගලා තෙරණිය**- Kajaṅgalā Thereniya: **බලන්න**: උප ග්‍රන්ථය:2

▲**කජඞන්ගලා නියම්ගම**: Kajaṅgalā Niyangama :බුදුන් වහන්සේ මෙ නියම්ගමේ,මුබෙලු වනයේ වැඩ වසන සමයේ මෙ සූත්‍රය වදාළහ. **මූලාශ්‍රය:** ම.නි: (3) 3.5.10 ඉන්ද්‍රිය භාවනා සූත්‍රය, පි.632.

▲**කුජ්ජුත්තරා උපාසිකා**-Kujjuthtara upasika: **බලන්න**: උප ග්‍රන්ථය: 3

**කට**

▲ **කටත්තා කම්ම**-Katatta Karma: කටත්තා කම්ම යනු විපාක දීමට රැස්වී ඇති කර්මයන්ය. ගරුක, බහුල හා ආසන්න කර්ම මරණාසන්න

යේදී විපාකදීම පිණිස නොපැමිණියේනම්, කටත්තා කර්මය එල දේ. **බලන්න**:කම්ම.

▲ **කටුව**-Thorn : භාවනාව වඩාගැනීමට අහිතකර ශබ්ද කටු වැනිය (ධ්‍යානයෝ ශබ්දකණ්ටකය). ජාන සම්පත් ලබාගැනීම අවහිර කරන කටු 10ක් පෙන්වාදුන් බුදුන් වහන්සේ වදාළේ: **'රහතුන් කටු නොමැතිව වාසය කරන බවය'. මූලාශ්‍රය**:අංගු.නි: (6) 10 නිපාත:යමකවග්ග: 10.2.3.2 කණ්ටක සූත්‍රය, පි.268.

▲ **කටු වනය -**The thorn bush :කයේ බොහෝ තුවාල ඇති මිනිසක් කටුවනයකට පිවිසේ. ඒ වනයේ ඇති විවිධ කටු සහිත ගස් ඔහුගේ තුවාල (වන) වලට ඇනිම නිසා ඔහුට බොහෝ දුක් වේදනා ඇති කරයි. එලෙසින්, අසංවර මහණ ගමකට ගිය විට ඔහු නිසා ගමේ වැසියන්ට අයහපත සිදුවන බව දැක්වීමට මේ උපමාව යොදාගෙන ඇත. **බලන්න:** උපග්‍රන්ථය:5 **මූලාශ්‍ර:** සංයු.නි: (4): සළායතනවග්ග:වේදනාසංයුත්ත: අසිවිසවග්ග:1.19.10 ඡප්පානක සූත්‍රය, පි.404.

▲ **කටිස්සභ උපාසක**-Katissabha Upasaka: **බලන්න:**උපග්‍රන්ථය:3

▲ **කිටාගිරිය-**Kitagiriya : කිටාගිරිය, කසීරටේ නුවරකි. කිටගිරි ආවාසය බුදුන් වහන්සේ ඇතුළු සංඝයා වැඩසිටි ස්ථානයකි. මෙහි සිටි සමහර සංඝයා, බුදුන් වහන්සේ, එකවෙල භෝජනය ගැන කරන ලද අවවාද පිලිනොගත් බව මෙහි විස්තර කර ඇත. **බලන්න**:උපග්‍රන්ථය:4. **මූලාශ්‍රය:** ම.නි:(2) 2.2.10 කිටාගිරි සූත්‍රය, පි. 252.

▲**කූටාගාරය**-The Peaked House: කුටාගාරය (කුළුගෙය) ලෙසින් පෙන්වා ඇත්තේ මුදුන් මුල කුටයක් බඳු වහලක් ඇති ගෙයකටය. විසාලානුවර, මහාවනයේ-ආරණ්‍යයේ, ලිච්ඡවී රජදරුවන් සැදූ කුටාගාර ශාලාවේ බුදුන් වහන්සේ හා සංඝයා වැඩසිටි බව සූත්‍ර දේශනා වන්හි පෙන්වා ඇත. මහා පරිනිබ්බාන සූත්‍රයේදී, බුදුන් වහන්සේ එම ශාලාවේ සංඝයා රැස්කොට, තමන්වහන්සේ තෙමසකින් පිරිනිවන්පාන බව වදාළහ. කුටගාරයේ වහලේ රිප්ප ආදිය මුදුන් වහලට නැඹුරුවී සිටින ලෙසින්, සප්ත බොජ්ඣංග ධර්ම වඩන මහණ නිවනට බරවී සිටින බව මේ උපමාවෙන් විස්තර කර ඇත. **බලන්න**: උපග්‍රන්ථය:5,6.
**සටහන්**: * කුටාගාරය ගොඩනංවනවිට පළමුව යටගෙය ගොඩ නැංවියයුතුවේ, ඉන්පසු, උඩකොටස සදා ගතයුතුය. මේ උපමාව යොදාගෙන බුදුන් වහන්සේ පෙන්වා ඇත්තේ, දුක අවසන් කිරීම පිණිස පළමුව චතුසත්‍ය අවබෝධ කරගතයුතුබවය. එවිට, යහපත් ලෙසින්ම දුක කෙළවර කරගත හැකිවේ. ** ප්‍රඥා ඉන්ද්‍රිය, කූටය වේ, සෙසු ඉන්ද්‍රිය සතර පරාලවේ. ප්‍රඥා ඉන්ද්‍රිය ස්ථාවර වූවිට, සෙසු ඉන්ද්‍රිය ස්ථාවරවේ. **බලන්න**: සංයු.නි: (5-2): සච්චසංයුත්ත:12.5.4 කුටාගර සූත්‍රය, පි.338. **මූලාශ්‍රය**:සංයු.නි: (5-1) මහාවග්ග: බොජ්ඣංගසංයුත්ත: 2.1.7 කූටාගාර සූත්‍රය, පි.186.

▲**කූටදන්ත බ්‍රාහ්මණ-**Kutadantha Brhamin: **බලන්න**: උපග්‍රන්ථය:3

▲ **කුටි පූජාකිරීම**- Offering accommodation: බුදුන් වහන්සේ හා සංඝයාට වැඩ වාසය කිරීම පිණිස කුටි, නිවාස ආදිය පූජකිරීම පුණ්‍ය කම්මයකි, මෙලොව හා පරලොව සුවය පිණිස වේ. **සටහන**: බු.නි: ථෙර ථෙරි ගාථා හා අපදාන යන්හි පෙර වැඩසිටි බුදුවරුන්ට කුටි පූජා කිරීම නිසා ලැබුන මහාආනිසංස විස්තර කර ඇත.**බලන්න**: උපග්‍රන්ථය:1 හා 2.

▲**කැටකිරිල්ලි හා ගිජුලිහිණියා උපමාව**-Simile of the quail & eagle

මඩේ හැසිරෙන කැට කිරිල්ල, වියලි බිමක හැසිරෙන්නේ නම්, පහසුවෙන්ම ගිජුලිහිණියා ට හසුවේ. එහෙත්, තමාගේ විෂයවූ මඩගොඩේ හැසිරේ නම්, ඌට ගිජුලිහිණියා මැඩගෙන, ආරක්ෂාව ලබා ගත හැකිය. එලෙස, පස්කම් ගුණයේ නො ඇලි සතර සතිපට්ඨානයේ (පිය උරුමය- බුදුන් වහන්සේ පෙන්වා දුන් ධර්මයේ) හැසිරෙන මහණහට, මරුගේ විෂයෙන් මිදිය හැකිය. **බලන්න:** ගෝචර භූමිය.**මූලාශ්‍රය**:සංයු.නි: (5-1): මහාවග්ග:සතිපට්ඨානසංයුත්ත:අම්බපාලි වග්ග: සකුනග්ඝි සූත්‍රය, පි.296.

**කඨ**

▲ **කඨ තෙර-**Kaṭa Thera: **බලන්න**: උප ග්‍රන්ථය:1

▲ **කඨින චීවරය** - Katina Robe: කඨින චීවරය යනු තෙමස් වස් විසූ (වස්ස) භික්ෂු, භික්ෂුණියන් හට අනුමතවූ, කැපවූ සිවුරුය. **සටහන**: * මෙය විනයට අදාළය. මේ ඛන්ධකයේ කඨින හා කඨින චීවර පිළිබඳ විස්තරාත්මකව දක්වා ඇත. ** වසරකට එක් වරක් පමණක් සිදුකරන කඨින සිවුරු පූජාව අනුසස් දෙන පිංකමකි, බොදුබැතිමතුන්හට කළහැකි ශ්‍රේෂ්ඨ දානමය පිංකමකි. වස් අවසානයේදී සිදුකරන මේ පිංකම බොහෝ ආනිසංස ලබා දෙයි. අටමහා කුසල් අතර මෙය ප්‍රධානවේ. **මූලාශ්‍ර**: වින.පි: මහාවග්ගපාලි 2 : 7 කඨිනඛන්ධක, පි.121.

▲**කඨිම්භ තෙර -**Kaṭimbha Thera: **බලන්න**: උප ග්‍රන්ථය:1

▲**කඨිස්සංඝ තෙර-** Kaṭissaṅga Thera: **බලන්න**: උප ග්‍රන්ථය:1.

**කඩ**

▲ **කඩුවකින් පහරදීම-**Attacked by a sword :සක්කාය දිට්ඨිය නැතිකර ගැනීමට අප්‍රමාදව කටයුතු කිරීමෙ අවශ්‍ය බව මේ උපමාවෙන් පෙන්වා ඇත. **බලන්න**: උපග්‍රන්ථය5. **මූලාශ්‍ර:** සංයු.නි:(1 ):සගාථවග්ග: දේවතා සංයුත්ත: 1.3.1 සත්ති සූත්‍රය, පි. 50, ESN:1: Devatasamyutta: 21.1 A Sword, p. 83.

▲ **කොඩිය-**Flag :කොඩිය, ධජය ලෙසින්ද පෙන්වා ඇත. රජවරු, ආගමික නායකයන්, ප්‍රදේශ නායක ආදීන් තමන්ගේ සංකේතය ලෙසින් කොඩිය භාවිතා කර ඇත. **බලන්න:** සංකේත.

**කඩ**

▲**කඞ්ඛාරේවත තෙර-** Kaṅkhārevata Thera: **බලන්න**:උපග්‍රන්ථය:1

**කත**

▲ **කතාව-** Talk: කතාව වාචික කර්මයකි. කතාවෙන් කුසල හෝ අකුසල ඇතිවේ. බොරුකීම, කේලාම්කීම, සැරවැර -පරුෂ වචන කතාව, හිස්කතා (සම්ප්‍රප්ඵලාප) නිසා අකුසල ඇතිවේ. සත්‍ය කතාකිරීම, සමගිය ඇතිකිරීමට කතා කිරීම, කාරුණික ලෙසින් කතාකිරීම හා ධර්මයට අනුකූලවව කතා කිරීම කුසලය බව බුදුන් වහන්සේ පෙන්වා ඇත.

▼**හිස් නිෂ්ඵල කතා ආධ්‍යාත්මික මගට බාධාවකි**: බුදුන් වහන්සේ පෙන්වා ඇත්තේ හිස් දේ කතා කිරීම වැඩදායක නොවන බවය, බඹසර ජීවිතයට හිතකර නොවන බවය. ධර්ම මාර්ගයේ යන කෙනෙක් කතා කරන්නේ නම් ඔහු දුක හා දුකෙන් මිදීම- චතු සත්‍ය ගැන කථා කළයුතුවේ. එය, මග බඹසරට, විමුක්තිය ලැබීමට උපකාරිවේ. **බලන්න:** ආරිය තුණ්හිම්භූත. **සටහන**: මේ සූත්‍රයේ 32 ක් වූ හිස් නිෂ්ඵල කතා (තිරිසන් කතා- තිරච්ඡානකතා) විස්තරාත්මකව පෙන්වා ඇත. **මූලාශ්‍ර:** සංයු.නි: (5-2): මහාවග්ග: සච්චසංයුත්ත: 12.1.10 තිරච්ඡානකථා සූත්‍රය, පි. 292, ESN: 56: Sacchasamyutta: 10.10 Pointless Talk, p. 2274.

▼**සුදුසු හා නුසුදුසු කතා: සුදුසු කතා** ලෙසින් බුදුන් වහන්සේ පෙන්වා ඇත්තේ පැවිදි ජීවිතයට ආදාළ කතාය, **දශකථා වස්තුය:** මහණෙනි, මේ දසකතා පිළිබඳව ඔබ කතාබහ කරන්නේ නම්, ඔබගේ අසිරිය, මහත්ආනුභාව ඇති සඳ හිරු අභිබවා පැතිර යනු ඇතයයි බුදුන් වහන්සේ වදාළහ: 1 අල්පබව, 2 සන්තුෂ්ටිය, 3 හුදකලාවිවේකය, 4 වෙනත් අය සමග නොබැඳීම, 5 විරිය ඇරඹීම,6 සීලය, 7 සමාධිය, 8 ප්‍රඥාව, 9 විමුක්තිය, 10 විමුක්ති ඥාණදර්ශනය. (Talk on: fewness of desires, contentment, solitude, not being bound up with others, arousing energy, virtuous behavior, concentration, wisdom, liberation, knowledge and vision of liberation). **නුසුදුසු කථා,** තිරිසන්කථා ලෙසින් බුදුන් වහන්සේ පෙන්වා ඇත. මාර්ගයේ ගමන් කරනවිට එම කතා වලින් වැලකීම (විශේෂයෙන් සංඝයාට) ඵල දායකය: රජවරු, සොරු, ඇමතිවරු, යුදසේනා, උවදුරු බිය, යුද්ධ, අහාර, පාන, වස්ත්‍ර, ශයන, මල්දම්, සුවඳවිලවුන්, ඥාතින්, වාහන, ගම්, නගර, ජනපද, ස්ත්‍රීන්, වීරයන්, වීථියේ-සිදුවන, ලිඳළඟ, නැතිවූඅය, විවිධ දේ, ලෝකය ගැන, මුහුදු ගැන, ඇතිවීම-ඉතිභවා භව, යන කතා. (talk about kings, thieves, ministers, armies, perils, wars; food, drink, garments, beds; garlands, scents; relatives, vehicles, villages, towns, cities, countries; women ,heroes; street talk, talk by the well; about the departed; miscellaneous talk; speculation about the world and the sea; about becoming this or that). **මූලාශ්‍ර**:අංගු.නි:( 6):10 නිපාත: යමක වග්ග, 10.2.2.9. පඨම කථාවත්ථු සූත්‍රය, පි.258, EAN: 10: Pairs.69.9. Topics of Discussion, p. 520.

▼**කතාව කලයුතු යහපත් ආකාරය**: කෙනෙක් කතා කරන්නේ නම් යහපත් ලෙසින් කතා කලයුතුවේ. ඒ පිළබඳව බුදුන් වහන්සේ ආකාර 5 ක් පෙන්වා ඇත: 1.නිසිකාලයේදී- සුදුසු අවස්ථාවේ දී පමණක් කතාකිරීම 2. සත්‍ය පමණක් කතා කිරීම 3. මුදු වචනයෙන් පමණක් කතාකිරීම 4 තව කෙනෙකුට යහපත සැලසෙන ලෙස කතා කිරීම 5. මෛත්‍රා සහගත සිතින් පමණක් කතා කිරීම. එම භාෂිතය, සුභාෂිතයවේ. **බලන්න**: සුභාෂිතය ( speak at a proper time, not at an improper time, speak truthfully, not falsely, speak gently, not harshly, speak in a beneficial way, not in a harmful way, speak with a mind of loving-kindness, not while harboring hatred) **මූලාශ්‍ර**: අංගු.නි: ( 6): 10 නිපාත: 10.1.5.4 ,කුසිනාරා සූත්‍රය, පි. 169, EAN:10: 44.4 Kusinārā, p. 510 හා අංගු:නි: (3): 5 නිපාත: සොනවග්ග: 5.4.5.8 සුභාෂිත වාචා සූත්‍රය, පි.414.

▼**අසත්‍ය කතා කිරීම අකුසලයකි**: එක් සමයක කෝකාලික භික්ෂුව, අගසව් දෙනම පිළිබඳව අසත්‍ය ප්‍රකාශයක් පැවසිය ඒ බව දැනගත් තුදු බ්‍රහ්මරාජයා, අගසව් දෙනම ගැන එවැනි වැරදි ප්‍රකශ නො කරන්න යයි ඒ භික්ෂුවට අවවාද කළේය. ඔහු එම අවවාදය නො පිළිගත් නිසා, බ්‍රහ්ම තුදු මෙසේ පැවසුවේය: **"මිනිසෙක් මෙලොව උපත ලබන්නේ මුවේ පොරවක් ඇතිවය. ඔහු අසත්‍ය කතා කරනවිට, ඒ පොරවෙන් තමාම කපාගනී- නින්දා කලයුතු අය පසසමින්, ගරු කලයුතු අයට ගරහමින් වැරදි ලෙස කතා කිරීමේ අකුසලය ඔහු නිරයට ගෙනයයි". සටහන:** ආර්ය උපවාදය නිසා කොකාලික භික්ෂුව නිරයේ යළි උපත ලැබිය. **මූලාශ්‍ර**: අංගු.නි: (6 )10 නිපාත: 10.2.4.9. කොකාලික සූත්‍රය,පි.331,

EAN: 10: 89.9. Kokalika, p. 530.
▼ **ප්‍රසංශා කතා**: දස කතා කරුණු තමා තුළ ඇතිකරගෙන ඒවා ගැන සෙසු අයට වර්ණනා කිරීම මගින් ප්‍රසංශාව ඇතිවේ යයි බුදුන් වහන්සේ පෙන්වා ඇත**. බලන්න:** ප්‍රසංශාව. **මූලාශ්‍ර**:අං.ගු.නි: ( 6): 10 නිපාත: යමක වග්ග, 10.2.2.10. දුතිය කථාවත්ථු සූත්‍රය**,** පි.260, EAN: 10: Pairs: 69.9. Topics of Discussion -2, p. 520.
▲**කතපුඤ්ඤ**-Kathapunna: මින් පෙන්වා ඇත්තේ පින්කලබවය. පින්කලබව මංගල කරුණක් යයි මංගල සූත්‍රයේ පෙන්වා ඇත:

**"...පුබ්බෙච කතපුඤ්ඤතා..." .** **බලන්න**: මංගල සූත්‍රය.

▲ **කතමොරක තිස්ස භික්ෂු**-bhikkhu Katamorakatissaka : මේ භික්ෂුව, දේවදත්ත භික්ෂුව හා එක්ව සංඝභේදය කිරීමට සහායවී ඇත. ඒ භික්ෂුවගේ අවගුණ, පච්චේක බ්‍රහ්ම සුද්ධාවාස, බුදුන් වහන්සේට පැවසූ අන්දම මෙහි පෙන්වා ඇත: ඔහු අවකුජ්ජපඤ්ඤ අඥානයෙක්ය. **බලන්න**: ESN: note: 401,p.553. **මූලාශ්‍ර:** සං.යු.නි: (1) බ්‍රහ්ම සංයුත්ත: 6.1.8 කතමොරක තිස්ස සූත්‍රය, පි.294, ESN: 6: Brhmasamyutta: 8.8 Tissaka, p.338.
▲**කෘත ඥානය-** krutha Nana :කෘත ඥානය යනු චතුසත්‍ය අවබෝධය පිණිස කළයුතු දේ නිම කරගත්තේය යන නුවණ ඇතිවීමය.**බලන්න**: චතුරාර්ය සත්‍ය.
▲ **කෘත්‍ය ඥානය-** kruthya Nana: කෘත්‍ය ඥානය ලෙසින් පෙන්වා ඇත්තේ චතුසත්‍යයේ, එක් එක් සත්‍ය පිළිබඳව අනුගමනය කළයුතු දේ කිරීම: දුක කුමක්ද යන අවබෝධය, දුක ඇතිවෙනනේ කෙසේද? තණ්හාව නිසා දුක ඇතිවේ යන අවබෝධය, දුක නැතිවෙන්නේ කෙසේද? තණ්හාව ප්‍රහීණය කිරීමෙන් දුක නැතිවේ යන අවබෝධය, දුක නැතිකර ගැනීමේ මග කුමක්ද? අරියඅටමගය යන අවබෝධය.**බලන්න**: චතුරාර්ය සත්‍ය.
▲ **කෘතඥ හා අකෘතඥ-** පාලි: **කතඤ්ඤ හා අකතඤ්ඤ**- grateful & ungrateful: ධර්මයට අනුව කෘතඥබව ලෙසින් පෙන්වා ඇත්තේ, වෙනත් කෙනෙක් කරන ලද උපකාර ආදිය යහපත් ලෙසින් සිහියේ තබාගෙන, අවශ්‍යතන්හි ප්‍රති උපකාර කිරීමය. මෙය සත්පුරුෂ ගතියකි. අකෘතඥබව යනු වෙනත් කෙනෙක් කරන ලද උපකාර ආදිය සිහිපත් නොකිරීමය. අවශ්‍යතන්හි ප්‍රති උපකාර නොකිරීමය. මෙය අසත්පුරුෂ ගතියකි. **බලන්න: සත්පුරුෂ හා අසත්පුරුෂ, අසත්පුරුෂභූමි හා සත්පුරුෂභූමි.** අකෘතඥ හා කෘතඥ. **සටහන:** මංගල සූත්‍රයේ: **කතඤ්ඤුතා** – කළගුණ දන්නා බව මංගල-සුභ කරුනක් බව පෙන්වා ඇත. **මූලාශ්‍ර:** අං.ගු.නි: (1): 2 නිපාත: 2.1.4.1 සූත්‍රය, පි. 157 , EAN: 2: 32.11 Sutta, p.61 .
▲**කෘතවේදී-** grateful: කෘතවේදී ලෙසින් පෙන්වා ඇත්තේ, තමන් වෙනුවෙන් වෙනත් කෙනක් කල දේ පිළිබඳ ස්තුති වීම. මෙය කෘතඥ වීමය, සත්පුරුෂ ගුණයකි. **බලන්න**: කෘතඥ.
▲**කාතියානි උපාසිකා**-Kathiyani upasika: **බලන්න**: උපග්‍රන්ථය:3

**කධ**

▲ **ක්‍රෝධය:** පාලි: **කොධො** -anger/ill will : අන් අය පිළිබඳව සිතේ ඇති කෝපය, කිපීම,එදිරිය- ක්‍රෝධය වේ. ක්‍රෝධය සිත කෙලෙසන අකුසලයකි, දුගතිය ඇති කරයි, සාවද්‍ය ධර්මයකි, උපකෙලෙසයකි. අරහත්වය ලබා ගැනීමට පහකරගතයුතු කරුණකි.**බලන්න**:

උපකෙළෙස, සල්ලේඛපරියාය, අරහත්. **සටහන**: මනසින් සිදුකරණ අකුසලයක්වූ (මනෝකම්ම) ක්‍රෝධය නැතිකර ගැනීමට, නිතර යෝනිසෝමනසිකාරයෙන් බැලිය යුතුය. **මූලාශ්‍ර**:අංගු.නි. (6 )10: 10.1.3.4. මහා චුන්ද සූත්‍රය, කාය සූත්‍රය, පි. 100.

▼ **බුදුන් වහන්සේ,** ක්‍රෝධය ඇති පුද්ගලයකුගේ ස්වභාවය මෙසේ පෙන්වා ඇත: "කෙනෙක් තරහ සිතින් සිටියි; 'මේ සත්වයෝ නැසෙත්වා! බන්ධනයට පත්වේවා! කපා දමත්වා!, විනාශවීයත්වා! සහමුලින්ම නැතිවේවා!' යයි ඔහු සිතින් සිතයි" **මූලාශ්‍ර**:අංගු.නි: (6 ): 10 නිපාත: ජානුසොණි වගග: 10.4.2.10: චුන්ද සූත්‍රය, පි.508, EAN:10: Jāṇussoṇī: 176.10: Cunda, p.553.

▼**ක්‍රෝධය** විශිෂ්ඨ ඥානයෙන් අවබෝධකර දුගතියෙන් මිදිය යුතුය. ක්‍රෝධය සම්මා ප්‍රඥාවෙන් අවබෝධ කරගත් පුද්ගලයෝ කිසිවිට මේ ලෝකයට පෙරළා නොඑන බව බුදුන් වහන්සේ පෙන්වා ඇත. **"මහණෙනි, එක් කෙළෙස් ධර්මයක්...ක්‍රෝධය පහකරගන්නේ නම්, මම ඔබට අනාගාමී භාවය පිණිස කැපවෙමි" . මූලාශ්‍ර:** බු.නි:ඉතිවුත්තක: 1.1.4 ක්‍රෝධ සූත්‍රය,පි.348, 1.2.2. ක්‍රෝධපරිඤ්ඤා සූත්‍රය, පි. 356.

▼ **දමනයවී, සමදීවී ඇති, යහපත් ලෙසින් මිදුන**, තාදී ගුණ -උතුම්ගුණ ඇති රහතුන් නොකිපෙන බව මෙහි දක්වා ඇත. යමෙක් ක්‍රෝධය පල කරනවිට එය ඉවසාසිටීමෙන් ඔහු දෙදෙනාටම යහපත ඇතිකරයි. **මූලාශ්‍රය:** සංයු.නි: (1): සගාථවග්ග:බ්‍රාහ්මණසංයුත්ත:7.1.2 අක්කොස සූත්‍රය, පි.314.

▼ **එක්සමයක** සක්දෙවිඳු බුදුන් වහන්සේගෙන් මෙසේ ඇසුහ: "කුමක් දවා (ඣත්‍වා) සුවසේ සිටීද?..." .බුදුන් වහන්සේ මෙසේ වදාළහ: **"...ක්‍රෝධය දවා සුවසේ වෙසෙයි...ශෝක නොකරයි...විෂවූ මුල ඇති මිහිරි අග ඇති ක්‍රෝධය නැසීම ආරියෝ පසසති." මූලාශ්‍රය:** සංයු.නි: (1): සගාථවග්ග: සක්කසංයුත්ත:11.3.1 ඣත්‍වා සූත්‍රය, පි.448 හා දේවතා සංයුත්ත: 1.8.1 සූත්‍රය, පි. 102, ESN:11: Sakka samyutta: 21.1 Having slain, p.493 & ESN:1: Devatasamyutta: 71.1 Sutta, p. 152.

▼**ක්‍රෝධය** මිනිසුන් විනාශ කරන නිසා, ක්‍රෝධයට ජය ගැනීමට ඉඩ නොදිය යුතුය යයි සක් දෙවිඳු පෙන්වා ඇත. **මූලාශ්‍ර**: සංයු.නි: (1): සගාථවග්ග: සක්කසංයුත්තය: 11.3.5 අක්‍රෝධ සූත්‍රය, පි. 452, ESN: 11: Sakkasamyutta: 25.5 Non-anger, p. 497.

▼ **සබ්‍රහ්මචාරීන්** හා උතුම් බුද්ධ ශ්‍රාවකයන්හට ක්‍රෝධ පරිභව කරන අය ඒකාන්තයෙන්ම දුගතියට යයි. එමනිසා කිසිවෙකුට හිංසා නොකර සිටීමෙන් අනුන්හටද, තමන්හටද ආරක්ෂාව ලැබේ යයි බුදුන් වහන්සේ වදාළහ. **සටහන:** මේ සූත්‍රය දේශනා කලේ ධම්මික භික්ෂුව ගේ අයහපත් හැසිරීම පිළිබඳවය. **බලන්න**: උපග්‍රන්ථය:1. **මූලාශ්‍ර:** අංගු.නි: (4) : 6 නිපාත:ධම්මිකවග්ග: 6.1.5.12 ධම්මික සූත්‍රය,පි.160, EAN:6: 54.12 Dhammika, p.343.

▼**අතිරේක සූත්‍ර මූලාශ්‍ර:** අංගු.නි: 1 නිපාත: **ක්‍රෝධවග්ග**, අංගු.නි: 2 නිපාත: **ක්‍රෝධගරු සූත්‍ර** 2, අංගු.නි: 4 නිපාත: **කොධන සූත්‍රය, ධම්මපද:** ක්‍රෝධවග්ග.

▼**වෙනත් මූලාශ්‍ර**:: **1**. "අනුන්ට බණින තර්ජනය කරන පහරදෙන අනුන් මරණ වස්තුව විනාශකරන, සමහරවිට තමාගේ වස්තුව පවා විනාශකරන, රෞද්‍ර, විරුද්ධ ස්වභාවය ක්‍රෝධයය. බලවත් ක්‍රෝධය මිනිසා උමතු කරයි. ක්‍රෝධය මහාසාවද්‍යාවේ. ක්‍රෝධය නිසා ඇතිවන පව් විපාක

නැතිකරගැනීම අපහසුය. (දෙමාපියන් මැරීම ආදිවූ). මහා අනර්ථකාරිවූ ක්‍රෝධය නිවසට ඇතුල්වූ සර්පයෙක් මෙන් වහා දුරුකරගත යුතුය''. **කෙලෙස් එක්දහස් පන්සියය**, පි. 80, රේරුකානේ චන්දවිමල මහානාහිමි, 2008. **2**. " මෙය ව්‍යාපාදයට වඩා ප්‍රබල හා බරපතළ කෙළෙසකි. බුදුරජාණන් වහන්සේ ''ක්‍රෝධ සිත'' උපමා කර ඇත්තේ දණ්ඩෙන් පහර කෑ සර්පයෙකුට නැතහොත් ගින්නටය. ඉන් ප්‍රකට වන්නේ ගින්න තමාව මෙන්ම අන් අයවත් පීඩාවට පත් කරනවා වගේ ක්‍රෝධයත් ක්‍රියාත්මක වන බවයි. සිතේ ඇති වන ක්‍රෝධය කායිකව ප්‍රකට වන ආකාරය මොනතරම් විචිත්‍රද? මුහුණ රතු වෙනවා, දහඩිය දමනවා, මස් පිඩු නලියනවා, ප්‍රසන්නතාව අහිමි වෙනවා, පුද්ගලයා නොසන්සුන් කරනවා. ව්‍යාපාදයේ ඉදිරි පියවරක් වන ක්‍රෝධය නිසා අසත්පුරුෂයෝ අස්ථානයේද කිපෙනවා. තම නොසැලකිල්ල නිසා අනතුරක් සිදු වුවත් ක්‍රෝධයෙන් ඊට ප්‍රතිචාර දැක්වීම ක්‍රෝධ සිතැත්තාගේ ස්වභාවයයි. **දිනමිණ**: අන්තර්ජාල ලිපිය: http://archives.dinamina.lk/2012/08/08/_art.asp?fn=a1208082

**කන**

▲ **කන්දරක පරිබ්‍රාජක-**Kandaraka Paribrajaka : චම්පා නුවර ගහපතියෙක් වූ මොහු අන්‍යආගමිකයෙකි, බුදුන් සරණ ගිය පෙස්ස හස්ථාරෝහ පුත්‍රයාගේ මිත්‍රයෙකි. මෙතෙම, බුදුන් වහන්සේ ගැන පැහැදී සිටි කෙනෙක් බව මෙහි දක්වා ඇත. **මූලාශ්‍රය**: ම.නි: (2) 2.1.1. කන්දරක සූත්‍රය,පි.18.

▲ **කාන්තාව**-Woman : කාන්තාව-මාගම-ස්ත්‍රිය-කුලදුව-පතිනිය ආදී ලෙසින් සූත්‍ර දේශනාවල විස්තර කර ඇත. බුදුන් වහන්සේ සරණගිය උතුම් කාන්තාවන් පිලිබඳ විස්තර පිණිස **බලන්න:** උපග්‍රන්ථය:2, 3 **සටහන්**: සංයු.නි: (4) සළායතනවග්ග: මාතුගාමසංයුත්තයේ: කාන්තාවන්ගේ යහපත් හා අයහපත් බව පෙන්වා ඇත. ** අංගු.නි: (2) 4 නිපාත: අපන්නකවග්ග:4.2.3.10 කම්බෝජ සූත්‍රයේ කාන්තවන් ගේ අවගුණ පෙන්වා ඇත.

**කණ**

▲ **කණ්ටකීවනය-** Kantaki grove: සාකේත නුවර අසල පිහිටි කණ්ටකීවනය, සංඝයාට කැපකල වනයකි. **මූලාශ්‍රය**: සංයු.නි: (5-2): මහාවග්ග: අනුරුද්ධසංයුත්ත: කන්ටකී සූත්‍ර 3කි, පි.94.

▲ **කණ්ණකත්ථල මිගදාය-** Kannakathtala deer park: කොසොල් දනව්වේ, උජුකා රටපිහිටි මේ වනය- මුව වනය, බුදුන් වහන්සේ හා සංඝයා වාසය කල ස්ථානයකි. **මූලාශ්‍රය:** ම.නි: (2): 2.4.10 කණ්ණකත්ථල සූත්‍රය, පි.578.

▲ **කණ්හධර්ම-**Unwholesome: මෙයින් පෙන්වා ඇත්තේ අකුසල ධර්මයන්ය: පාපී ධර්ම, කෘෂ්ණධර්ම-කළුධර්ම ගැනය. අහිරිකය හා අනොත්තප්ප (පවට ලජ්ජා නොවීම හා භිය නොවීම) කණ්හධර්ම වේ. **මූලාශ්‍රය:**අංගු.නි: (1) 2 නිපාත: 2.1.7 කණ්හ සූත්‍රය, පි.140.

▲ **කණ්හ මග්ග -** Unwholesome way : කණ්හ මග්ග -කළුමග නම් අකුසල මගය, මිථ්‍යාදිට්ටිය ඇති වැරදි මගය. **මූලාශ්‍රය:**අංගු.නි: (6) 10 නිපාත:ආරියමග්ග වග්ග: 10.4.4.2 කණ්හ මග්ග සූත්‍රය, පි.536.

▲ **කණ්හසප්ප-** Black snake: කණ්හසප්ප යනු කළු නයාය. එම සර්පයාට ආදීනව ඇත: අපවිත්‍රබව, දුගඳබව, භියකරුබව (සභිරුකය), අනතුරු ඇතිකරයි (ප්‍රතිභය), මිත්‍රද්‍රෝහීබව, කිපෙනසුළුබව, වෛර

බඳිනබව, සෝරවිෂ ඇතිබව, දිව දෙකක් ඇතිබව. එවැනි ගති ඇති කාන්තාව- මාගම ද මේ ලෝකයේ ඇතිබව මෙහි දක්වා ඇත. **සටහන:** දිවදෙක යනු කේලාම්කීමය. **මූලාශ්‍රය:**අං.ගු.නි: (3) 5 නිපාත: දීඝචාරිකා වග්ග: කණ්හසප්ප සූත්‍ර 2කි, පි.445.

▲**කුණ්ඩධාන තෙර -**Kundadana Thera: **බලන්න**:උපග්‍රන්ථය:1

▲**කුණ්ඩලිය පරිබ්‍රාජක-** Kundaliparibrajaka: **බලන්න**:උපග්‍රන්ථය:3

▲**කොණ්ඩඤ්ඤ බුදුන් -**The Buddha Kondanna: ගෝතම බුදුන්ට පෙර වැඩසිටි මේ බුදුන් වහන්සේ පිලිබඳ විස්තර මෙහි දක්වා ඇත. **බලන්න**:බු.නි: බුද්ධවංශ පාලි:2: කොණ්ඩඤ්ඤ බුදුන්වහන්සේ.

▲**කොණාගමන බුදුන්-**The Buddha Konagamana: ගෝතම බුදුන්ට පෙර වැඩසිටි මේ බුදුන් වහන්සේ පිලිබඳ විස්තර මෙහි දක්වා ඇත. **බලන්න**:බු.නි:බුද්ධවංශ පාලි:23: කොණාගමන බුදුන්වහන්සේ.

▼**කොණාගමන බුදුන් වහන්සේගේ** අගසව් දෙනම: භිහියෝස තෙර, උත්තරතෙර. **බලන්න**: මිනිස් ආයුෂ. **මූලාශ්‍රය:**සංයු.නි: (2) : නිදානවග්ග:අන්මතග්ග සංයුත්ත: දුග්ගතවග්ග: 3.2.10 වෙපුල්ල පබ්බත සූත්‍රය, පි.314.

▼ **ගෝතම බුදුන් වහන්සේට** පෙර වැඩසිටි කොනාගමන බුදුන් වහන්සේ ගේ සම්බෝධිය පිලිබඳ මෙහි විස්තර කර ඇත. **මූලාශ්‍රය:**සංයු.නි: (2): නිදානවග්ග: අභිසමයසංයුත්ත: 1.1.8 කොනාගමන සූත්‍රය, පි.37, සංයු.නි: (2) : නිදානවග්ග:අන්මතග්ග සංයුත්ත: දුග්ගතවග්ග: 3.2.10 වෙපුල්ල පබ්බත සූත්‍රය, පි.314.

**කප**

▲**කපය-**aeon : කපය -කප්ප-කල්පය යනු ඉතා දීර්ඝ කාලසිමාවක්ය. **බලන්න**: කල්පය.

▲ **කපටිබව හා කපටිනැතිබව :** පාලි: **සාඨෙය්‍යං** -craftiness & non-craftiness: කපටිබව: වංචාව, ප්‍රෝඩාව, කෛරාටිකබව ලෙසින්ද හඳුන්වයි. මෙය අකුසලයකි, දුගතියට ගෙන යයි. කපටිනැතිබව කුසලයකි, ආධ්‍යාත්මික මග වඩා ගැනීමට උපකාරවේ. **බලන්න**: උප කෙලෙස, සල්ලේඛපරියාය, අනවද්‍ය ධර්ම හා සාවද්‍ය ධර්ම.

▼**වෙනත් මූලාශ්‍ර: 1.** "සාඨෙය්‍ය කියන්නේ කෛරාටික කමයි. මිනිස් ලෝකයේ මෙන්ම වෙළඳ ලෝකයේද මෙය බහුලව දැක්ක හැකිය. ප්‍රමිතියෙන් අඩු දේ හොඳ භාණ්ඩ හැටියටත් කල් ඉකුත් වූ දේ කූට ක්‍රමවලින් නැවත සකස් කරමිනුත් අලෙවි කරන්නේද මෙබඳු අයයි. මෙබඳු අයගේ දිවි ගෙවෙන්නේ වංචාවෙන්. විවිධ අසත්‍යදේ ප්‍රකාශ කරමින් අන් අය මුලා කරවයි...": **දිනමිණ**: අන්තර්ජාල ලිපිය: http://archives.dinamina.lk/2012/08/08/_art.asp?fn=a1208082

**2.** " ලාභසත්කාර අසාවෙන් තමා තුළ නැති ගුණ ඇතැයි හැඟවීම සාඨෙය්‍ය නම්වේ. උදා: දුස්සිලව හිඳ සිල්වතෙක් යයි පෙන්වීම. මායාව හා සාඨෙය්‍ය යන මේ දෙක තරමක් එකිනෙකට සමානය". **කෙලෙස් එක්දහස් පන්සියය**: පි. 90, රේරුකානේ චන්දවිමල මහානාහිමි, 2008.

▲ **කපිලවස්තු නුවර-**Kapilawastu: කිඹුල්වත් නුවර ලෙසින්ද පෙන්වා ඇත. ගෝතම බුදුන් වහන්සේ, තම පියාවූ සුද්ධෝදන රජ හා පවුලේ පිරිස සමග ගිහිකල වාසය කළ නුවරය. මෙය ශාක්‍ය දනව්වේ පිහිටා ඇත. බුදුන් වහන්සේ වෙත පැවිදිවූ බොහෝ සංඝයයා, උපාසක උපාසිකා මෙ නුවරින් පැමිණි පිරිස බව සූත්‍ර දේශනා වල දක්වා ඇත. **බලන්න:**

උපග්‍රන්ථය:1,2,3.
▲ **කප්ප මානවක**-Kappa manawaka: බලන්න: උපග්‍රන්ථය:3
▲ **කප්ප මානවක තෙර** -Kappa manawaka Thera: බලන්න: උපග්‍රන්ථය:1
▲ **කාපටික භාරද්වාජ බ්‍රාහ්මණ**-Kapatika Brahamin බලන්න: උපග්‍රන්ථය:3
▲**කපුටා**-crow: කපුටා, කවුඩා, කාක (කාක්කා) ලෙසින්ද දක්වා ඇත. කපුටාට අවගුණ 10ක් ඇත. එම අවගුණ ඇති පාපී සංඝයා ද සිටින බව මෙහි විස්තර කර ඇත.**බලන්න:** සංඝයාගේ පාපී ගුණ **,**කපුටා උපමාව:උපග්‍රන්ථය:5: **මූලාශ්‍ර**: අංගු.නි: (6 ) 10 නිපාත, ආකඩ්ඛ වග්ග, 10.2.3.7. කාකසූත්‍රය,පි.292, EAN:10: III-77.7. The Crow, p. 525.
▲ **කිප්පාභින්ඥා-** Kippabhinna: කිප්පාභින්ඥා යනු අභිඥාව ඉතා ඉක්මනින් සාක්ෂාත් කර ගැනීමය- ශීග්‍රයෙන් ධර්මය වටහාගැනිම. බුදුන් වහන්සේගේ සසුනේ ක්ෂණික අභිඥා ලත් භික්ෂූන් අතරෙන් අග්‍ර බාහිය දාරුචිරිය රහතුන්ය, ක්ෂණික අභිඥා ලැබූ භික්ෂුණියන් අතරෙන් අග්‍ර: භද්‍රා කුණ්ඩලකේසි තෙරණිය. **බලන්න:** උපග්‍රන්ථය:1,2, අභිඥා.

**කබ**

▲ **කබලිංකආහාර-** physical food: උපන් සත්ත්වයන්ගේ පැවැත්ම පිණිස අවශ්‍ය ආහාර 4 න් එකකි. **බලන්න**: ආහාර, සිව් පෝෂණය.

**කම**

▲ **කම්ම-** volition: කම්ම-කර්මය යනු, කයෙන්, වචනයෙන් හා සිතින් (තුන්දොරින්) කරණ යහපත් හෝ අයහපත් ක්‍රියාවන්ය- චේතනාය. ඒවා මගින් යහපත් හෝ අයහපත් විපාක ඇතිවේ. යහපත් විපාක ගෙන දෙනනේ කුසලකම්මය, අයහපත් විපාක ඇති කරන්නේ අකුසල කම්ම මගින්ය. කම්මය, සිතින් ඇතිකරන චේතනාය. බලන්න: කුසල අකුසල. **සටහන්**: * යහපත් හා අයහපත් කම්ම ඒවායේ විපාක, ම.නි. **මහාකම්ම විභංග සූත්‍රයේ** හා **චූළකම්ම විභංග සූත්‍රයේ** විස්තරාත්මකව පෙන්වා ඇත. ** **බලන්න**: EAN: note: 2180, p. 684. ** කම්ම පිලිබඳ විස්තර පිණිස **බලන්න**:ඛු.නි: පටිසම්භිදා:1:කම්ම කථා. ** අයහපත් කම්ම පාපී ක්‍රියාය. **බලන්න:**අකුසල. ** ඉන්ද්‍රිය යනු කර්මය දක්වන ස්වභාවය ය. බලන්න:ඉන්ද්‍රිය. **ශබ්දකෝෂ**: **පා.සි.ශ**: පි.244: "**කම්ම**: කර්මය, ක්‍රියාව, සිතිවිල්ල, යම් ක්‍රියාවක් කිරීමට සිතීම... **කම්මක්ඛය**: කර්මය ක්ෂයවීම".. **B.D**: p.77: '**Karma-Kamma**: Actions…wholesome or unwholesome volitions…and their /concomitant mental factors causing rebirth and shaping the destiny of beings…'.
▼**බුදුන් වහන්සේ** චේතනාව, කර්මය ලෙසින් වදාළහ. කෙනක්, සිතින් සිතා, කයෙන්, වචනයෙන් හා මනසින් කර්ම කරති. "**චේතනා අහං භික්ඛවෙ කම්මං වදාමි, චෙතයිත්වා කම්මං කරොති කායෙන වාචාය මනසා...**" ( It is volition, bhikkhus, that I call kamma. For having willed, one acts by body, speech, or mind.) **මූලාශ්‍ර**: අංගු.නි: (4) 6 නිපාත:නිබ්බෙදික සූත්‍රය, පි.220, EAN:6: 63.9 Penerative, p.355.
▼**කම්ම කෙරෙහි නිබ්ද්දාව ඇතිකරගැනීම- (**කම්ම නිරෝධ ප්‍රතිපදාව) ඒ සඳහා ඇති පිළිවෙත 6 ආකාරය: 1) **කම්ම-කර්මයදත යුතුය-** kamma should be understood කම්මය නම් චෙතනාවය, සිතින් සිතා, කයින්, වචනයෙන් හා මනසින් කම්ම කරයි. 2) **කම්මයේ නිදාන සම්භවය**

**(උත්පත්ති කරුණ) දත යුතුය** (the source and origin of **-** kamma should be understood) ස්පර්ශය කම්ම නිදානයවේ. **3) කම්මයේ විවිධත්වය (වෙමත්තතාව) දත යුතුය (**the diversity of kamma be understood**)** නිරයේ විපාකදෙන කම්ම, තිරිසන්යෝනියේ විපාකදෙන කම්ම, ප්‍රේතවිෂයෙහි විපාකදෙන කම්ම, මිනිස්ලෝකයේ විපාකදෙන කම්ම, දේවලෝකයේ විපාකදෙන කම්ම. 4) **කම්මයේ විපාකය දත යුතුය** (the result of kamma should be understood) කම්ම විපාක තුන් ආකාරයකට සිදුවේ: 1. මේ ජීවිතයේදීම- දිට්ඨධම්මවේදනීය කම්ම (to be experienced in this very life) 2) ඊළඟ අත්භවයේදී- උප්පජ්ජවේදනීය කම්ම ( to be experienced in the next rebirth) 3) වෙනත් අත්භවයක- අපරාපරියවේදනීයකම්ම (on some subsequent occasion). 5) **කම්ම නිරෝධය දත යුතුය** (the cessation of kamma should be understood) ස්පර්ශ නිරෝධය, කම්ම නිරෝධයය. 6) **කම්ම නිරෝධගාමිණී ප්‍රතිපදාව දත යුතුය දත යුතුය** (the way leading to the cessation of kamma should be understood) එනම්, ආරියඅටමගය. මේ කරුණු 6 යහපත් ලෙසින් දන්නා ආරිය ශ්‍රාවකයා, නිබ්බෙදික බ්‍රහ්මචරියාවවූ කම්ම නිරෝධය දන්නේය. **මූලාශ්‍ර**: අංගු.නි: (4) 6 නිපාත: 6.2.1.9 නිබ්බෙධික සූත්‍රය,පි.220,EAN:6: 63.9 Penetrative,p.355.

▲**කම්ම සත්ත්වයන්ගේ උරුමයය-** beings are owners of their actionsඑක්සමයක, සුභ මානවකයා ඇසූ ප්‍රශ්නයකට පිළිතුරු ලෙසින්, සත්ත්වයන්, කර්මය උරුමකර ගෙන ඇති ආකාරය**,** බුදුන් වහන්සේ මෙසේ පෙන්වා ඇත: **1) සත්ත්වයෝ** කර්මය ස්වකීය කොට ඇත්තාහ. කර්මය දායාද කොට ඇත්තාහ. කර්මය උත්පති කොට ඇත්තාහ. කර්මයට බැඳී සිටි. කර්මය පිළිසරණ (රක්ෂාස්ථනය) කොට ඇත්තාහ. සත්ත්වයන්ගේ හීනබව හා ශ්‍රේෂ්ඨබව යන විශේෂතාවය ඇතිවන්නේ ඔවුන් කළ කර්මයන්ගේ විපාක යන්ට අනුවය: **"කම්මස්සකා මාණව, සත්තා කම්මදායාදා, කම්මයොනි, කම්මබන්ධු, කම්මපටිසරණා. කම්ම සතෙත විභජති යදිදං හීනප්පණිතතායා'ති'** (...beings are owners of their actions, heirs of their actions; they originate from their actions, are bound to their actions, have their actions as their refuge. It is action that distinguishes beings as inferior and superior). **සටහන:** කර්මය පිලිබඳ ඉහත ප්‍රකාශනය, සංඝයා විසින් නිතර ප්‍රත්‍යවෙක්ෂා කලයුතු ධර්මතා 10 ට ඇතුලත්වේ. **බලන්න:** පබ්බජා දස ධර්ම: අංගු.නි: (6): 10 නිපාත: 10.1.5.8 දසධම්ම සූත්‍රය, පි. 184. **2) ආයුෂ කෙටිවීමට හෝ දීර්ඝවීමට හේතු**: මිනිස්ලොව දී සෙසු සත්ත්වයන් කෙරහි හිංසා සිත් ඇතිව ප්‍රාණඝාතය කළ කෙනෙක් ඔහු විසින් කරන ලද අයහපත් කර්ම විපාකයේ ඵලය ලෙසින් මරණින්මතු, දුක්ඇති නිරයේ යළි උපතලබයි. මිනිස්ලොව ඔහු යළි උපත ලැබුවොත් ඔහුගේ ආයුෂ කෙටිය. ප්‍රාණඝාතයෙන් වැලකී, සතුන් කෙරෙහි දයාව ඇති පුද්ගලයා, කුසල විපාක ලෙසින් මරණින් මතු සැප ඇති සුගතියේ- දෙව්ලොව උපත ලබයි. ඔහු මිනිස්ලොව යළිඋපත ලැබුවොත් ඔහුට දීර්ඝ ආයුෂ ලැබේ. **3) බොහෝ ආබාධ ඇතිවීමට (රෝගී) හෝ නිරෝගීබව ලැබීමට හේතු**: මිනිස්ලොව දී වෙනත් අයට නන්අයුරින් පීඩා හිරිහැර කළ පුද්ගලයා ඔහු විසින් කරන ලද අයහපත් කර්ම විපාකයේ ඵලය ලෙසින් මරණින්මතු, දුක්ඇති නිරයේ යළි උපතලබයි. මිනිස්ලොව ඔහු යළි උපත ලැබුවොත් ඔහුට බොහෝ ලෙඩ රෝග පිඩා ඇතිවේ. කිසිවෙකුට හිංසා පීඩා

නොකළ, දයාව ඇතිව ජීවත්වූ තැනැත්තා කුසල විපාක ලෙසින් මරණින් මතු සැප ඇති සුගතියේ- දෙව්ලොව උපත ලබයි. ඔහු මිනිස්ලොව යළිඋපත ලැබුවොත් ඔහුට නිරෝගීසුවය ලැබේ, අල්ප ආබාධ සහිත වේ. **4)** මිනිස්ලොවදී කෙනෙක්, නිතරම තරහ සිත් ඇතිව, කේන්තියෙන්, කෝපයෙන් අන් අය හා ගැටෙමින් අසතුටින් වාසය කරයි. ඔහු විසින් කරන ලද අයහපත් කර්ම විපාකයේ ඵලය ලෙසින් මරණින්මතු, දුක්ඇති නිරයේ යළි උපතලබයි. ඔහු මිනිස්ලොව උපත ලැබුවොත්, දුර්වර්ණව, අරුපිබව ලබයි. තවත් කෙනෙක්, තරහ, ක්‍රෝධය ආදී ය නොමැතිව සතුටින් වාසය කරයි. ඔහු විසින් කරන ලද යහපත් කර්ම විපාකයේ ඵලය ලෙසින් මරණින්මතු, සැප ඇති සුගතියේ- දෙව්ලොව යළි උපතලබයි. ඔහු මිනිස්ලොව උපත ලැබුවොත්, රූපත්වේ, පැහැපත් වර්ණය ඇතිවේ. **5)** මිනිස්ලොව දී කෙනෙක්, අන් අයට ලැබෙන සම්පත්, ලාභ, ගරු බුහුමන් ආදිය පිළිබඳව නිතරම ඉරිසියාව ඇතිව සිටි. ඔහු විසින් කරන ලද අයහපත් කර්ම විපාකයේ ඵලය ලෙසින් මරණින්මතු, දුක්ඇති නිරයේ යළි උපතලබයි. මිනිස්ලෝකයේ යළි උපත ලැබුවහොත්, අල්පශාක්‍යව සිටි- ගරු බුහුමන් නොමැතිව, සමාජයේ පහත් තත්වයක ජීවිතයක් ලැබේ. තවත් කෙනෙක් අනෙක් අයට ලැබෙන ලාභ සත්කාර ආදිය ගැන ඊර්ෂ්‍යා නොකරයි. ඔහු විසින් කරන ලද යහපත් කර්ම විපාකයේ ඵලය ලෙසින් මරණින්මතු, සැප ඇති සුගතියේ- දෙව්ලොව යළි උපතලබයි. මිනිස්ලෝකයේ උපත ලැබුවහොත් මහේශාක්‍යබව ලබයි. සමාජයේ උසස් තැනක වැජඹේ. **6)** මිනිස්ලොව දී කෙනෙක්, පූජා කලයුතු ශ්‍රමණ බ්‍රහ්මණ ආදී උතුමන්ට, ආහාර, දාන මාන, මල් පහන්, ආදිය පූජා නොකරයි. ඔහු විසින් කරන ලද අයහපත් කර්ම විපාකයේ ඵලය ලෙසින් මරණින්මතු, දුක්ඇති නිරයේ යළි උපතලබයි. මිනිස්ලෝකයේ යළි උපත ලැබුවහොත් ඔහු දුගීයෙක් වේ. වෙනත් කෙනෙක්, මිනිස්ලොවදී පූජා කලයුතු ශ්‍රමණ බ්‍රාහ්මණ ආදී උතුමන්ට, ආහාර, දාන මාන, මල් පහන් ආදිය පූජා කරයි. ඔහු විසින් කරන ලද යහපත් කර්ම විපාකයේ ඵලය ලෙසින් මරණින්මතු, සැප ඇති සුගතියේ- දෙව්ලොව යළි උපතලබයි. මිනිස්ලෝකයේ උපත ලැබුවහොත් ධනවතෙක් වේ. **7)** මිනිස්ලොව දී කෙනෙක් ගරු බුහුමන් සත්කාර කලයුතු උතුමන්ට ගරු නොකරයි. අහංකාරය ඇතිව, මුරණ්ඩු, අකීකරුබව ඇතිව ජීවත්වේ. ඔහු විසින් කරන ලද අයහපත් කර්ම විපාකයේ ඵලය ලෙසින් මරණින්මතු, දුක්ඇති නිරයේ යළි උපතලබයි. මිනිස්ලෝකයේ යළි උපත ලැබුවහොත් ඔහු උපදින්නේ පහත් කුලයකය. වෙනත් කෙනෙක්, ගරු බුහුමන් සත්කාර කලයුතු උතුමන්ට ගරු කරයි. අහංකාරය නොමැතිව යහපත්ව වාසය කරයි. ඔහු විසින් කරන ලද යහපත් කර්ම විපාකයේ ඵලය ලෙසින් මරණින්මතු, සැප ඇති සුගතියේ- දෙව්ලොව යළි උපතලබයි. මිනිස්ලොව යළි උපත ලබන්නේ නම් ඔහු උපදින්නේ උසස් කුලයකය. **8)** මිනිස්ලොව දී කෙනෙක්, ශ්‍රමණ හෝ බ්‍රහ්මණ උතුමන් මුණ ගැසී කුසල අකුසල්, මාර්ගය ආදී තම යහපත පිණිස වන ධර්ම කරුණු ගැන ප්‍රශ්න නො විමසයි. එම පැවැත්ම නිසා ඔහු නුවණින් බාලවේ. වෙනත් කෙනෙක්, ශ්‍රමණ හෝ බ්‍රහ්මණ උතුමන් මුණ ගැසී කුසල අකුසල්, මාර්ගය ආදී තම යහපත පිණිස වන ධර්ම කරුණු ගැන ප්‍රශ්න විමසයි. එම පැවැත්ම නිසා ඔහු ගේ නුවණ වැඩේ, ප්‍රඥාව මහාබවට පත්වේ.
**මූලාශ්‍ර**: මනි: (3): 3.4.5 චූළකම්ම වීභංග සූත්‍රය, පි. 448, EMN: 135: The Shorter Exposition of Action, p. 964.

▲**කම්ම නිදාන**- Causes of Kamma: කම්ම නිදාන යනු කර්ම

සකස්වීමට බලපාන හේතුය. ලෝභය දෝසය හා මෝහය යන අකුසල මූල අයහපත් කම්මවලට හේතුවේ. අලෝභය අදෝසය හා අමෝහය යන කුසල මූල යහපත් කම්මවලට හේතුවේ. **බලන්න**: කුසල මූල, අකුසල මූල. **සටහන:** අංගු.නි: (4) 6 නිපාතයේ: 6.1.4.9 කම්ම නිදාන සූත්‍රයේ එම කරුණු විස්තරාත්මකව පෙන්වා ඇත. **මූලාශ්‍ර:** අංගු.නි: ( 6): 10 නිපාත: 10.4.2.8 කම්ම නිදාන සූත්‍රය,පි.506, EAN: 10: 174-8,Causes of Kamma, p.552.

▼**කම්ම සකස්වීම ආකාර 3කි**: වර්තමාන ජීවිතයට හා මතු ජීවිතයට විපාක වශයෙන් බලපාන කර්ම සකස්වීම් ආකාර 3 ක් ධර්මයේ පෙන්වා ඇත: 1) **පුඤ්ඤාභිසංස්කාර** (meritorious karmic formations) : කාමාවාචර (කාම ලෝකයේ ) හා රූපාවචර (බ්‍රහ්ම ලෝක) ලෝකයන්හි යළි උපතට හේතුවන කුසල චේතනා- කුසල කර්ම. 2) **අපුඤ්ඤාභි සංස්කාර** (de-meritorious karmic formations): සියලු අකුසල චේතනා- අකුසල කර්ම: දුගතියේ යළි උපතට බලපායි. 3**) ආනෙඤ්ජාභි සංස්කාර** ( imperturbable karmic formations) : අරූපාවචර බ්‍රහ්ම ලෝකයන්හි යළි උපතට හේතුවන කුසල චේතනා. **මූලාශ්‍ර**: දීඝ.නි: (3 ):10 සංගිති සූත්‍රය- පි. 381 , EDN: 33 Saṅgīti Sutta: The Chanting Together, p. 367.

▼**කම්ම ඇතිවීම හා අවසන්කරගැනීම** : කර්ම ඇතිකරන සියලු කෙළෙස්, ලෝභය දෝසය හා මෝහය යන අකුසල මුල්පදනම් කර ගෙන ඇත:**"පාණාතිපාතම්පහං භික්ඛවෙ තිවිධං වදාමි ලොභහෙතුකම්පි දොස හෙතුකම්පි මොහ හෙතුකම්පි. අදින්නාදානම්පහං ... කාමෙසුමිච්ඡා චාරම්පහං... මුසාවාදම්පහං... පිසුණංවාචම්පහං... ඵරුසංවාචම්පහං... සම්ඵප්පලාපම්පහං ... අභිජ්ඣම්පහං... ව්‍යාපාදම්පහං... මිච්ඡාදිට්ඨිම්පහං භික්ඛවෙ තිවිධං වදාමි ලොභහෙතුකම්පි දොස හෙතුකම්පි මොහ හෙතුකම්පි" එනම්:** පරපණ නැසීම, සොරකම, කාමයේ වරදවා හැසිරීම්, බොරුකිම, කේළාම්කීම, පරුෂවචනකීම, හිස්වචනකීම, අභිජ්ජාව- දැඩිආසාව, ව්‍යාපාදය, මිථ්‍යාදිට්ඨිය ආදීවූ සියලු කෙළෙස්, ලෝභය දෝසය හා මෝහය යන ත්‍රිවිධ අකුසල මුල්පදනම් කර ගෙන ඇත යයි බුදුන් වහන්සේ පෙන්වා ඇත. **කර්ම අවසන්කර ගැනීම**: කර්ම උපද්දවන අකුසල් මුල් 3 සහමුලින්ම විනාශ කර දැමීමෙන් (ක්‍ෂයකිරීමෙන්) කර්ම ඇති කරන සියලු මුල් අවසන්වේ.**" ඉති ඛො භික්ඛවෙ ලොභො... දොසො... මොහො කම්මනිදාන සම්භවො, ලොභක්ඛයා ...දොසක්ඛයා... මොහක්ඛයා කම්මනිදාන සඞ්ඛයොති"**. **සටහන:** අබිජ්ජාව නිසා කර්ම සිව්ආකාරයකට ඇතිවේ. **බලන්න**: අබිජ්ජාව. **මූලාශ්‍ර:** අංගු.නි: (6 ) 10 නිපාත: ජානුසොණි වගග: 10.4.2.8, කර්ම නිදාන සූත්‍රය, පි. 506, EAN:10: Jāṇussoṇī: 174.8 Causes of Kamma, p.552.

▲ **කම්මපථ-** kamma-patha- Courses of kamma: කම්මපථ යනු කර්මය සකස්කරන මාර්ගයය. කයෙන්, වචනයෙන් හා මනසින් කරන යහපත් හෝ අයහපත් ක්‍රියා -තුන්දොරින්, මගින් කෙනෙකුගේ කම්ම පථය-කර්ම මාර්ගය සකස්වේ. දස අකුසල් නිසා අකුසල කම්මපථය සැදේ, දස කුසල් මගින් කුසල කම්මපථය සකස්වේ. **බලන්න**:දස කුසල් හා දස අකුසල්.

▼ **අවගුණ ඇති අය** ඇසුරු කිරීම නිසා පුද්ගලයෝ අයහපත් කම්ම පථඇති කරගනි. ගුණවත් අය හා ඇසුර නිසා පුද්ගලයෝ යහපත්

කම්මපථ ඇති කරගනි. **සටහන:** මේ වග්ගයේ, විවිධ ලෙසින් කර්මපථ සකස්වන අන්දම පෙන්වා ඇත. **මූලාශ්‍ර:** සංයු.නි: (2 ): නිදානවග්ග: ධාතුසංයුත්ත: 3 කම්මපථවග්ග, පි. 280, ESN: 14: Dhathusamyutta, III Courses of Kasmma, p. 764.

▲**කම්ම ක්‍රියාවලිය-** Kamma procedure : 1) සසර වටය ගෙනයන අයහපත් විපාක දෙන කර්ම ඇතිවීමට, රැස්වීමට ලෝභය, දෝසය හා මෝහය යන කෙළෙස් මූලිකවේ. 2) එම අයහපත් කර්මයන්හි විපාක මේ ජීවිතයේදී හෝ ඊළඟ භවයේදී හෝ වෙනත් මතු භවයන්හිදී හෝ ඉඩලද විට එලදේ. (දිට්ඨධම්මවේදනීය කර්ම, උප්පජ්ජවේදනීය කර්ම, අපරාපරිය වේදනීය කර්ම- either in this very life, or in the next rebirth, or on some subsequent rebirth). **බිජ උපමා. බලන්න:** උපග්‍රන්ථය:5 : * උණුසුම හෝ සුළං හෝ ආදීයෙන් නරක්නොවූ බීජ, සුදුසු බිමක වපුරා, එයට අවශ්‍ය තෙතමනය හොඳින් ලැබෙන්නේනම්, එම බීජ වැඩි, විපුලවී, හොඳින් පැසියයි. එලෙස කෙනක් චේතනාවෙන් සිදුකරන කර්ම වල විපාක, වර්තමාන ජීවිතයේදී හෝ ඊළඟ උපතේදී හෝ මතු උපත්වලදී හෝ විඳීමට සිදුවේ. 3) සසර පැවත්ම පිණිස, ආලෝභය, අදොසය හා අමෝහය මගින්ද යහපත් කර්ම ඇතිවේ. 4) අලෝභය නිධාන කොට හටගන්නා කර්ම, ලෝභය සම්පූර්ණයෙන්ම පහවීමෙන් නැතිවී යයි, මතු විපාක ඇතිනොවන ලෙසට විනාශවී යයි. එසේම අදොසය...අමෝහය නිධාන කොට හටගන්නා කර්ම අදොසය...අමෝහය සම්පූර්ණයෙන්ම පහවීමෙන් නැතිවී යයි, මතු විපාක ඇතිනොවන ලෙසට විනාශවී යයි. **උපමාව:** ** කෙනෙක් තමා ළඟ ඇති නරක් නොවූ බීජ, ගින්නෙන් පුළුස්සා දමයි, අලුබවට පත්කරයි. සුළඟ හෝ දියපහරක් එම අලු ගෙනයයි. එම අලු මගින් පැල හට නොමගනී, අස්වැන්නක් නොලැබේ. 5) අනුවණ පුද්ගලයා ලෝභය නිසා හෝ දෝසය නිසා හෝ මෝහය නිසා සුළුවූ හෝබොහෝවූ කර්ම රැස් කරයි, ඔහු කළ කර්මයන්හි විපාක (සසර සැරිසරන තෙක්) ඔහු විසින් විඳිය යුතුවේ. 6) නුවණැති භික්ෂුව, අරහත් මාර්ග ඥානය උපදවා, ලෝභ දෝස හා මෝහයෙන් උපන් කර්ම හා සියලු දුගතියන් (යළි උපත-මතු ඉපදීම) දුරලයි. **මූලාශ්‍ර:** අංගු.නි: (1 ): 3 නිපාත:දේවදූතවග්ග: 3.1.4.4 සූත්‍රය, පි. 286, EAN:3: Divine Messengers: 34.4 Causes, p.90.

▼**කම්ම ක්‍රියාවලිය සිදුවන ආකාරය:** කම්ම ක්‍රියා තුන්දොරින් සිදුවේ. තුන්දොර යනු කය, වචනය හා සිතය, එමගින් අකුසල කර්ම හා කුසල කර්ම සිදුවේ: **අකුසල කර්ම**: 1) **කාය කර්ම** 3කි: සතුන්මැරීම, සොරකම හා කාමයේ වරදවා හැසිරීම 2) **වචී කර්ම** 4 කි: එනම්, බොරුකීම, කේලාම්කීම, සැරවචන කතාකිරීම, හිස්වචන කතා කිරීම 3) **මනෝ කර්ම** 3 කි: දැඩිලෝභය, ක්‍රෝධය හා මිථ්‍යා දිට්ඨිය. **කුසල කර්ම: 1)** කාය කම්ම 3කි: සතුන් නොමැරීම, සොරකම් නොකිරීම, කාමයේ වරදවා නොහැසිරීම. 2) වචී කම්ම 4 කි: සත්‍යකතාකිරීම, කේලාම් නොකියා සමගිය ඇතිකරන කතාකිරීම, ප්‍රසන්න, කාරුණික, මෘදු වචන කතාකිරීම, ඵලදායක, ධර්මයට අනුකූල කතාකිරීම. 3) මනොකමම 3 කි**:** නිර්ලෝභය**,** තරහ නැති, හොඳ යහපත් හිත. යහපත් හෝ අයහපත් කර්ම ඇතිවන්නේ චේතනා පහළ කිරීමෙන්ය. අකුසල කර්ම කෙනෙක් දුගතියට ද කුසල කර්ම කෙනෙක් සුගතියටද ගෙනයයි. මේ පිළිබඳව යොදාගත් **උපමාව-දාදු කැටය .බලන්න:** උපග්‍රන්ථය5 : කෙනෙක් උඩට විසිකරන දාදු කැටය, පතිත වන තැන ස්ථිර ලෙසින් පිහිටනසේ, නරක ක්‍රියාකරණ අය නියතලෙසින්ම දුගතියකට වැටේ, හොඳ ක්‍රියාකරණ අය,

නියතලෙසින්ම සුගතියේ පහළවේ. **මූලාශ්‍ර:** අංගු.නි:(6) 10 නිපාත: කරජකාය වගග,10.5.1.7.පඨම සඤ්චෙතනික සූත්‍රය හා 10.5.1.8 දුතිය සඤ්චෙතනික සූත්‍රය, පි.566, EAN: 10:The Deed Born Body:Volitional 1 & 2, p.558.

▼**කම්ම ක්‍රියාවේ ස්වභාවය** :කර්ම ක්‍රියා වකුටු හෝ ඍජු ස්වභාවය ගනී. **වකුටු කම්ම ක්‍රියා**: දස අකුසලයේ යෙදන කෙනෙක් ගේ අකුසල ක්‍රියා, ඇද, වකුටු ස්වභාවයකින් යුක්තය. මරණින් මතු නිරයේ හෝ තිරිසන් ලෝකයේ ඔවුන් උපත් ලබති. ඔවුන් තිරිසන් ලෝකයේ උපත ලබන්නේ බඩගාගෙන, වකුටුව බිම ඇදීයන සතුන් ලෙසය. **ඍජු කම්ම ක්‍රියා**: දස කුසලයේ යෙදන කෙනෙක් ගේ කුසල ක්‍රියා ඍජුය, මරණින් මතු දෙව්ලොව හෝ මිනිස්ලොව ධනවත්, ගුණවත් කුලවල ඔවුන් යලි උපත ලබති. **බලන්න**: සංසප්පනිය ධර්ම පරියාය. **මූලාශ්‍ර**: අංගු.නි: (6 ):10 නිපාත: කරජකාය වගග,10.5.1.6. සංසප්පනිය පරියාය සූත්‍රය, පි.560, EAN:10: 216.6 Creeping , p.558.

▲**කම්ම විපාක -** Karma vipaka: රැස්කරගත් කර්ම, විපාක නොදී අවසන් නොවේ, අවස්ථා තුනකදී විපාක ලබාදෙයි: **1** මේ ජීවිතයේදීම විදිමට සිදුවන කර්මවිපාක: **දිට්ඨධම්මවේදනීය කර්ම** **2** ඊළඟ ජීවිතයේදී විදිමට සිදුවන කර්මවිපාක : **උප්පජ්ජවේදනීය කර්ම** **3** සසර සැරිසරන ඕනෑම අවස්ථාවක විපාක එල දෙන කර්මවිපාක: **අපරාපරියවේදනීය කර්ම.** එසේම, චේතනාකර සිදුකළ කර්මයන්ගේ විපාක නො විඳ දුකේ කෙලවරවීමක් ඇතය යයි තමන් වහන්සේ ප්‍රකාශ නොකරන බව බුදුන් වහන්සේ වදාළහ: **" නාහං භික්ඛවෙ සඤ්චෙතනිකානං කම්මානං කතානං උපචිතානං අප්පටිසංවිදිත්වා ව්‍යන්තිභාවං වදාමි. තඤ්ච ඛො දිට්ඨෙ වා ධම්මෙ උප්පජ්ජෙ වා අපරෙවා පරියායෙ. නත්වෙවාහං භික්ඛවෙ සඤ්චෙතනිකානං කම්මානං කතානං උපචිතානං අප්පටිසංවිදිත්වා දුක්ඛස්සන්තකිරියං වදාමි"** ( Bhikkhus, I do not say that there is a termination of volitional kamma that has been done and accumulated so long as one has not experienced [its results], and that may be in this very life, or in the [next] rebirth, or on some subsequent occasion. But I do not say that there is making an end of suffering so long as one has not experienced [the results of] volitional kamma that has been done and accumulated). **සටහන්:** * ඉහත කරුණ පිළිබඳව භික්ඛු බෝධිගේ අදහස පිළිබඳව **බලන්න**: EAN: note: 2181, p. 684. ** මෙත්තා, කරුණා, මුදිතා, උපේක්ඛා චේතෝ විමුක්තිය වර්ධනයකර අනාගාමී වූ ආරිය පුද්ගලයන් කාමලෝකයේ සිදුකල කර්ම, මරණින් මතු සුද්ධාවාසය කරා නොයයි. එතෙක්, විදීමට ඇති කර්ම විපාක ඇත්නම් ඒවා මෙලොවදී විපාක දෙන බව මේ සූත්‍රයේ විස්තර කර ඇත. ** යම් කර්ම විපාක නොදී අහෝසිවේ. **බලන්න**: අහෝසිකර්ම. ** අනාගාමීවූ උතුමන් කාමලෝකයේ සිදුකල කර්ම, කාමලෝකයට පමණක් ප්‍රමානවේ. **බලන්න**: අනාගාමී. අයහපත් කර්ම විපාක එල දෙන නිරයන්: **බලන්න:** උණු අළු නිරය. **මූලාශ්‍ර**:අංගු.නි:( 6) :10 නිපාත: කරජකායවග්ග,10.5.1.9. කරජකාය සූත්‍රය, පි.582 , EAN: 10: The Deed Born Body, p.561.

▼**කම්ම විපාක වෙනස්කම්** : 1) **මෙලොව දී දසඅකුසල් කරන පුද්ගලයෙක් මරණින් මතු දුගතියේ පහලවේ. එයට හේතු:** එමපුද්ගලයා: පෙර කාලයකදී වේදනා සහගත අකුසල ක්‍රියාවක් කර ඇත හෝ

පසුකාලයක වේදනා සහගත අකුසල ක්‍රියාවක් කර ඇත හෝ මරණය සිදුවන අවස්ථාවේ මිථ්‍යා දිට්ඨිය වැළඳ ගෙන ඇත. එමනිසා, මරණින් මතු ඒ පුද්ගලයා දුගතියේ යළි උපත ලබා ඇත. ඔහු, මෙලොවදී දස අකුසලයේ යෙදුන නිසා, එහි අයහපත් විපාක, මේ භවයේදී හෝ ඊළඟ භවයේදී හෝ පසුව ඇතිවෙන භවයකදී හෝ ඔහුට විඳීමට සිදුවේ. 2) **මෙලොව දී දසඅකුසල් කරන පුද්ගලයෙක් මරණින් මතු සුගතියේ පහලවේ. එයට හේතු:** එම පුද්ගලයා: පෙර කාලයකදී සුබ වේදනා ඇති යහපත් ක්‍රියා සිදු කර ඇත හෝ පසු කාලයක සුබ වේදනා ඇති යහපත් ක්‍රියා සිදු කර ඇත හෝ මරණය සිදුවන අවස්ථාවේ සම්මා දිට්ඨිය වැළඳ ගෙන ඇත. ඒ හේතුවෙන් ඔහු සුගතියේ යළි උපත ලබා ඇත. එහෙත්, ඔහු, මෙලොවදී දස අකුසලයේ යෙදුන නිසා, එහි අයහපත් විපාක, මේ භවයේදී හෝ ඊළඟ භවයේදී හෝ පසුව ඇතිවෙන භවයකදී හෝ ඔහුට විඳීමට සිදුවේ. 3) **මෙලොව දී දසඅකුසල් නො කරන පුද්ගලයෙක් මරණින් මතු සුගතියේ පහලවේ. එයට හේතු:** එමපුද්ගලයා: පෙර කාලයකදී සුබ වේදනා ඇති යහපත් ක්‍රියා සිදු කර ඇත හෝ පසු කාලයක සුබ වේදනා ඇති යහපත් ක්‍රියා සිදු කර ඇත හෝ මරණය සිදුවන අවස්ථාවේ සම්මා දිට්ඨිය වැළඳ ගෙන ඇත. ඒ හේතුවෙන් ඔහු සුගතියේ යළි උපත ලබා ඇත. ඔහු, මෙලොවදී දස අකුසලයේ නො යෙදුන නිසා, එහි යහපත් විපාක, මේ භවයේදී හෝ ඊළඟ භවයේදී හෝ පසුව ඇතිවෙන භවයකදී හෝ ඔහුට විඳීමට සිදුවේ. **4) මෙලොව දී දසඅකුසල්** නො කරන පුද්ගලයෙක් මරණින් මතු දුගතියේ පහලවේ. **එයට හේතු:** එමපුද්ගලයා: පෙර කාලයකදී වේදනා සහගත අකුසල ක්‍රියාවක් කර ඇත හෝ පසුකාලයක වේදනා සහගත අකුසල ක්‍රියාවක් කර ඇත හෝ මරණය සිදුවන අවස්ථාවේ මිථ්‍යා දිට්ඨිය වැළඳ ගෙන ඇත. ඒ හේතුවෙන් ඔහු දුගතියේ යළි උපත ලබා ඇත. ඔහු, මෙලොවදී දස අකුසලයේ නො යෙදුන නිසා, එහි යහපත් විපාක, මේ භවයේදී හෝ ඊළඟ භවයේදී හෝ පසුව ඇතිවෙන භවයකදී හෝ ඔහුට විඳීමට සිදුවේ. මේ සූත්‍රය අවසානයේදී බුදුන් වහන්සේ මෙසේද වදාළහ: **“ මෙලෙසින්, අකුසලය මැඩලන අකුසල කර්මයක් ඇත. අකුසලය මැඩලන කුසල කර්මයක් ඇත. කුසලය මැඩලන කුසල කර්මයක් ඇත. කුසලය මැඩලන අකුසල කර්මයක් ඇත” . “ ඉති ඛො ආනන්‍ද, අත්‍ථි කම්මං අභබ්බං අභබ්බාභාසං, අත්‍ථි කම්මං අභබ්බං භබ්බාභාසං, අත්‍ථි කම්මං භබ්බඤ්චෙව භබ්බාභාසඤ්ච, අත්‍ථි කම්මං භබ්බං අභබ්බාභාසන්ති”** (Thus, Ānanda, there is action that is incapable and appears incapable; there is action that is incapable and appears capable; there is action that is capable and appears capable; and there is action that is capable and appears incapable)මූලාශ්‍ර: මනි: (3): 3.4.6 මහාකම්ම විභංග සූත්‍රය, පි. 460, EMN: 136 : The Greater Exposition of Action, p. 968.

▼**වෙනත් මූලාශ්‍ර: 1. දිට්ඨධම්මවේදනීය** කර්ම මේ අත්බවේ විපාකයට නො පැමිණියේ නම්, **උප්පජ්ජවේදනීය කර්ම** ඊළඟ අත්බවේ විපාකයට නො පැමිණියේ නම්, ඒවා **අහෝසි කර්ම** වේ. විපාක දෙන කර්මයන් හි **ගරුක හා අගරුක** අතරින් අකුසල පක්ෂයේ **ආනන්තරික කර්ම** හෝ කුසල පක්ෂයේ ප්‍රථම ජාන ආදී **මහද්ගත කර්ම** හෝ වේනම් ඒවා **ගරුක කර්මයන්ය** , ප්‍රථම කොට විපාක දේ. **බහුල-අබහුල කර්ම** අතරින් යමක් බහුල නම් එය ප්‍රථම කොට විපාක දේ. මරණාසන්න කාලයෙහි කල කර්ම **ආසන්න කර්මවේ**, ඒවා මතුභවයෙහි පළමු කොට විපාක දේ.

පෙරකී කර්ම නැතිකළ **කටත්තා කර්ම** විපාකදේ. **ජනකකර්ම**, කුසල හෝ අකුසල වේ. ඒවා ප්‍රතිසන්ධියේද, ප්‍රවෘත්තියෙහි ද රූප- අරූප (ලෝක) වල විපාක උපදවයි. **උපස්තම්භක කර්මයට** විපාක ඉපදවිය නො හැකිය. අන්‍යකර්මයකින් උපන් සුව හෝ දුක් විපාක වලට රුකුල් දීමට හැකිය. **උපපීඩක කර්මය** අන්‍ය කර්මයකින් උපන් සුව හෝ දුක් විපාක වලක්වාලයි. **උපඝාතක කර්මය** කුසල් හෝ අකුසල්වේ. දුර්වල කර්මය නිසා එහි විපාකයට අවකාශය ඇති කරයි. මේ 12 ස් වැදැරුම් කර්ම, එහි ප්‍රභේද හා විපාක බුදුවරයන්ගේ කර්මවිපාක දන්නා ඥානය ය. **සිංහල විසුද්ධිමාර්ගය**, 19 පරිඡේදය, පි. 952. **2. Kamma and its Fruit:** Selected Essays: Edited by Nyanaponika Thera, BPS: 2006. **3. Good, Evil and Beyond**: Kamma in the Buddha's Teaching: by Bhikkhu P.A. Payutto, BuddhaDhamma Education Association. Inc. **4. කර්මවිපාක:** සම්පාදක: පූජ්‍ය රිදියගම සුධම්මාභිවංශ හිමි. **5**. Volition: An Introduction to the Law of Kamma: by Sayadaw U Silananda, BuddhaDhamma Education Association. Inc. **6 Karma & Rebirth in Early Buddhism**: Course of study & workshop by Bhante Sujato & Ajahn Brahmali, Presented by The Buddhist Society of Western Australia (BSWA).

▲**කම්ම විපාක ඥානය -**Knowledge of Kammavipaka: ලෝක සත්ත්වයන් ගේ සියලු කර්ම පිලිබඳ: කර්ම විපාක දන්නා නුවණ, තථාගතයන්ට ඇති එක් විශේෂ ඥාන බලයකි. **බලන්න**: තථාගත දසබල.

▲ **කම්ම විවිධාකාරය-** Diversity of karma :බුදුන් වහන්සේ, විශිෂ්ඨ ඥානයෙන් අවබෝධ කරගත් කර්ම 4 ක් පෙන්වා ඇත: 1) **කළු කර්ම-** අඳුරු කර්ම-අකුසල විපාක කර්ම (කෘෂණ-dark): කයෙන්, වචනයෙන් හා මනසින් (තුන් දොරින්) කරණ අයහපත් ක්‍රියා කළු කර්මයන්ය. එම කර්ම නිසා අයහපත් විපාක ලැබේ: මෙලොව ඇතිවන දුක් වේදනා, පරලොව: දුගතියේ උපත ලැබීමට, නිරයේ දරුණු දුක් වේදනා විඳීමට සිදුවේ. **කළු කර්ම මොනවාද**? පරපණනැසීම, සොරකම, කාමයේ වරදවා හැසිරීම, මුසාවාදය, පිශුනාවාචාය, පරුෂා වාචාය, හිස්වචන කතා කිරීම, ධර්මයේ ප්‍රමාදය ඇතිකරන මත්ද්‍රව්‍ය හා මත් පැන් භාවිතය, මව්පිය ඝාතනය, රහතතුන්ගේ ජීවිත නැතිකිරීම, වෛරය ඇතිව තථාගතයන් ගේ ලේ සෙලවීම, සංඝභේදය කිරීම කළු කර්මයෝය.**බලන්න**: ආනන්තරික කර්ම. 2) **සුදු කර්ම**- දීප්තිමත් කර්ම-කුසල විපාක කර්ම (ශුකල-bright) :තුන් දොරින් කරණ යහපත් ක්‍රියා සුදු කර්මයන්ය. එම කර්ම නිසා යහපත් විපාක ලැබේ: සුගතියේ -දෙව්ලොව උපත ලැබීමට, සුභකින්න දෙවියන් ලෙසින් ප්‍රසන්න වේදනා විඳීමට හැකිවේ. **සුදු කර්ම මොනවාද? : 1.** ඉහත දක්වා ඇති කළු කර්මයන් නොකිරීම 2 දැඩිආසාවන් නොමැතිබව 3 සැමදෙනා කෙරෙහි යහපත් සිතින් සිටීම 4 සම්මා දිට්ඨිය තිබීමය. **සටහන:** දසකුසල කිරීම හා ජාන සමාපත්ති ලැබීම සුදුකර්ම ලෙසින් පෙන්වා ඇත-**බලන්න**: EAN: note: 943, p. 630. 3) **කළු හා සුදු කර්ම-** කුසල විපාක හා අකුසල විපාක කර්ම: කෙනෙක් තුන්දොරින් කළු කර්ම මෙන්ම සුදු කර්මද කරයි. විපාක වශයෙන් ඔහුට දුක් වේදනා ද සැප වේදනා විඳීමට ලැබේ. 4) **කළුත් නොවන සුදුත් නොවන කර්ම-** මෙහිදී කර්ම විපාක ඇතිනොවේ. මේ කර්ම මගින් කර්මවිපාක ක්ෂය කරගත හැකිය. කෙනෙක් ඉහත දැක්වූ **කර්ම 3 ම** පහකරගැනීමට චේතනා කර, ඒ අනුව කටයුතු කරයි. එනම්, සසර වටය නැතිකරගැනීම

පිණිස චේතනා කර අධ්‍යාත්මික මග වඩාගැනීමය, අරහත්වයට පත්වීමය. **කර්මක්ෂය කරගැනීමේ ක්‍රමවේදය:** ආරිය අටමග, සප්ත බොජ්ඣංග ධර්ම වර්ධනය කරගැනීම මගින්. **සටහන**: අටුවාවට අනුව කර්ම විපාක ක්ෂය කරගැනීම යනු අදිටන්කර- චේතනා කර සසර නිමා කරගැනීමට කටයුතු කිරීමය. '**විවට්ඨ ගාමිණී මග්ග චෙතනා**'- බලන්න: EAN: note: 946, p. 630. **කර්ම විපාක ඵල**: කුසල කර්ම විපාක මගින් සුගතියක යළි උපතඇතිවේ. අකුසල කර්ම විපාක නිසා දුගතියක යළි උපතඇතිවේ. **මූලාශ්‍ර:** අංගු.නි: (2):4 නිපාත: කම්ම වග්ග සූත්‍ර, පි. 468, EAN:4: Kamma: p. 227.

▼ **කම්ම විවිධ බව: පාපික හා කල්‍යාන කම්ම: පාපික කර්ම:** ඇතිවීමට බලපාන කරුණු 5 කි: a) ලෝභය-greed b) දෝෂය- hatred c) මෝහය- delusion d) අයෝනිසෝමනසිකාරය-Careless attention e) අසති අසම්ප්‍රජන්‍යය - wrongly directed mind **කල්‍යාන කම්ම:** ඇතිවීමට බලපාන කරුණු 5කි a) අලෝභය b)අදෝෂය c) අමෝහය d) යෝනිසෝමනසිකාරය e) සති සම්ප්‍රජන්‍යය. බුදුන් වහන්සේ පෙන්වා දුන්නේ ඉහත දැක්වූ කරුණු 10 ලෝකයේ පවතින නිසා අධර්මිෂ්ඨ හැසිරීම- ධර්මයට එරෙහිව හැසිරීම හා ධර්මිෂ්ඨ හැසිරීම- ධර්මයට අනුකූලව හැසිරීම, ලෝකයේ දැකිය හැකිබවය. **මූලාශ්‍ර**: අංගු.නි: (6): 10 නිපාත: 5 අකෝෂ වග්ග, 10.1.5.7.මහාලි සූත්‍රය,පි.182, EAN:10: 47.7 Mahali, p. 511.

▼**කම්ම විවිධය** : **අලුත් හා පැරණි කම්ම** ඇස ආදීවූ සළායතන හේතුවෙන් කරනලද, චේතනාව විසින් පිළියෙළ කරනලද වේදනාවට වස්තුවූ වූ (වේදනාවක් ඇතිකළ) දේ **පැරණි කර්මයන්ය**. වර්තමානයේ කයින් වචනයෙන් හා සිතින් යම් කර්මයක් කරයි නම් **ඒවා අලුත් කර්මයන්ය**. කෙනෙක්, තුන්දොරින් කරන කර්මයන්ගෙන් නිරෝධවී, විමුක්තිය ස්පර්ශ කරන්නේනම් එය **කර්ම නිරෝධයය.** ඒ පිලිබඳ ඇති මාර්ගය-කර්ම නිරෝධ ගාමිණී ප්‍රතිපදාව නම් ආරියඅටමග සම්පූර්ණ කරගැනීමය යි බුදුන් වහන්සේ පෙන්වා ඇත. **මූලාශ්‍ර**: සංයු.නි:(4 ): සළායතනවග්ග:වේදනාසංයුත්ත: නවපුරාණ වග්ග: 1.15.1 කම්ම සූත්‍රය, පි. 292, ESN: 36: Vedanasamyutta: V: 146.1 Kamma, p. 1291.

▼ **කම්ම සත්ත්වයන් පසුපසින් එයි-** Kamma that follow the beings. යහපත් කර්ම, යහපත් විපාක ගෙනදෙමින්, අයහපත් කර්ම අයහපත් විපාක ගෙනදෙමින් සත්ත්වයන් පසුපස එයි. **සටහන**: ධම්මපදය: 1 **යමකවග්ග**: අයහපත් කර්ම විපාක ගොනා ගේ පය පසුපස එන කරත්ත රෝදය ලෙසින් ද 2 යහපත් කර්ම විපාක, පසුපස එන සෙවනැල්ල මෙන් ද පසුපසින් එයි. **බලන්න**:උපග්‍රන්ථය: 5.

▼ **නිර්දෝෂී, පිරිසිදු** ජීවිතයක් ඇති, කෙළෙස් රහිත පුද්ගලයෙකුට කෙනෙක් ද්වේශ කරන්නේ නම් වැරදි කරන්නේ නම්, එමගින් අයහපත් කර්ම විපාක ඇතිවේ. යම්කෙනක් සියුම් දූවිලි උඩුසුළඟට විසිකළවිට ඒ දූවිල්ල ඒ තැනැත්තා ගේ කයටම පතිතවන ලෙසින් කෙනෙක් සිදුකරණ අයහපත් ක්‍රියා නිසා අයහපත් කර්ම විපාක ඇතිවේ. දූවිලි උපමාව, **බලන්න**:උපග්‍රන්ථය:5. **මූලාශ්‍ර:** සංයු.නි: (1) සගාථවග්ග:දේවතාසංයුත්ත: 1.3.2 ඵුසතිසූත්‍රය,පි. 50, ESN:1:Devatasamyutta: 22.2. It Touches, p. 84.

▲**කම්ම හා භවය-**Existence & kamma: කර්මය හා භව පැවැත්ම අතර දැඩි සම්බන්ධයක් ඇත. බුදුන් වහන්සේ, මෙසේ වදාළහ: " කර්මය නම්

කෙතය (පොළවය), විඥාණය බීජය (ඇටය) වේ, තණ්හාව එම බීජය පෝෂණය කරන ජලය (උදක) වේ. අවිද්‍යාවෙන් වැසුන, තණ්හාවෙන් බැඳුන, සත්ත්වයන්ගේ විඥානය,කාම ලෝකයේ (කාම ධාතුවේ) පිහිටයි. එලෙස සත්ත්වයන්ගේ පුනර්භවය ඇති කරණ භවය සකස්වේ"
**" ඉති ඛො ආනන්ද, කම්මං ඛෙත්තං, විඤ්ඤාණං බීජං, තණ්හා සිනෙහො. අවිජ්ජානීවරණානං සත්තානං තණ්හාසංයොජනානං හීනාය ධාතුයා විඤ්ඤාණං පතිට්ඨිතං. එවං ආයති පුනබ්භවාභිනිබ්බත්ති හොති"** (Thus, Ānanda, for beings hindered by ignorance and fettered by craving, kamma is the field, consciousness the seed, and craving the moisture for their consciousness to be established in a superior realm. In this way there is the production of renewed existence in the future). **බලන්න**: බීජ උපමාව:උපග්‍රන්ථය:5. **මූලාශ්‍ර**:අං.ගු.නි: (1): 3 නිපාතය: 3.2.3.6 සූත්‍රය, පි. 432, EAN:3: 76.6 Existence, p. 119.

▲**කම්ම හා විඥානය-** Karma & Consciousness : විඥානය පිහිටි කල්හි තණ්හාව ඇතිවේ, තණ්හාව ඇති කල, කර්ම අරමුණු ඇතිවේ, එය විඥානයේ පැවත්මය. **මූලාශ්‍ර:** සං.යු.නි: (2): නිදානවග්ග: අභිසමය සංයුත්ත:කළාරඛත්තිය: චේතානා සූත්‍ර 3කි. පි. 124, ESN:12: Nidanasamyutta: IV: The Karakhattiya: Volition 3 suttas p. 665.
▲ **කම්සැපය-** Sensual happiness: කම්සැපය ලෙසින් මෙහිදී පෙන්වා ඇත්තේ ස්ත්‍රී පුරුෂ අතර ඇති බැඳීම නිසා ලබන සැපයය. **බලන්න**: ඉත්ථිබන්ධන,පුරිෂබන්ධන.
▲ **කාමය:** පාලි: **කාමො**-sensual pleasures: ධර්මයේ කාමය ලෙසින් පෙන්වා ඇත්තේ කාමලෝකයට ඇති ඇල්මය- රාගයය. එම බැඳීම නිසා මිනිසුන් සසරේ ගමන් කරයි. කාමය නිසා කෙළෙස් ඇතිවේ, මෙය නීවරණ ධර්මයකි **බලන්න**: නීවරණ. **ශබ්දකෝෂ: B.D:** p: 73: "**Kāma**: may denote 1.subjective sensuality- sense desire 2 objective sensuality- the 5 sense objects…"
▼ **කාමය හඳුන්වන විවිධ නාම**: භය, දුක,රෝග, ගඩුව (ගන්ඩ), ඇලීම (සඞග), මඩ (පංක). **විස්තර පිණිස බලන්න**: අං.ගු.නි: (4) 6 නිපාත: අනුත්තරියවග්ග: භය සූත්‍රය.
▼**මහා ධන සම්පත්** ඇති අයද කම්සැප සොයයි, කාමයන් නො සොයන්නේ කව්රුද? යයි දෙවියෙක් බුදුන් වහන්සේ විමසුහ. බුදුන් වහන්සේ මෙසේ වදාළහ: " **ගිහිගෙය හැර, සියලු කාමවස්තූන් හැර පැවිදිව, රාග දොස මෝහ දුරුකළ රහතුන් -රහතන්වහන්සේ කාමය සොයා නොයති" මූලාශ්‍ර:**සං.යු.නි: (1): සගාථවග්ග: දේවතාසංයුත්ත: 1.3.8 මහද්ධන සූත්‍රය, පි. 56, ESN: 1: Devatasamyutta: 28.8 Those of Great Wealth, p. 91. **සටහන:** අං.ගු.නි: (1) 3 නිපාත: 1 කම්මපථ පෙය්‍යාලය සූත්‍ර, පි. 576: කම්මපථ පිළිබඳ විස්තර දක්වා ඇත.
▲ **කාමආස්වාදය-** Sensual Pleasures : වස්තුකාමයේ හා කෙළෙස කාමයේ ආස්වාදය: හීන, මධ්‍යම, උසස්-ප්‍රනීත යයි **ත්‍රිවිධ ආකර වේ.** හීනකුලයන් විඳින කාම ආස්වාදය හීනකාමයෝය,මධ්‍යම සත්වයෝ විඳින කාම ආස්වාදය මධ්‍යම කාමයෝය, රජවරු ආදීන් විඳින කාම ආස්වාදය ප්‍රණීත කාමයෝය. මේ සියල්ල කාම ආස්වාදයන්ය. ගිහිකම් සැප හැර පැවිද්ද ලැබුවන්, සෝතාපන්න බව ලබන තෙක් ඔවුන්, තමන්වහන්සේ විසින් රැකබලාගත යුතුවේ යයි බුදුන් වහන්සේ මෙහිදී පෙන්වා ඇත. ඒ පිළිබඳ යොදාගත් **උපමාව**: අතදරුවෙක්, ඔහු ගේ

කිරිමවගේ ප්‍රමාදයක් නිසා යම්කිසි දෙයක් මුවේ බහාගනී. ඒ දුටු කිරිමව ආදරය හා අනුකම්පාව නිසා වහා එය බැහැරට ගැනීම පිණිස හැකි හැම ක්‍රමයක්ම යොදයි. පසුකල ඒ දරුවා තරුණවියට පත්වූ කල ඔහුට තමාව බලාගැනීමට හැකි බව කිරිමව දනී. එලෙස, පබ්බජා, කුසලධර්මයේ ප්‍රමාද නම්, ඔහු කෙරේ ඇති අනුකම්පාවෙන්: 'මා විසින් ඒ මහණ රැකිය යුතුය යි' බුදුන් වහන්සේ වදාළහ. එහෙත්, ධර්ම මාර්ගයේ ඔහු අප්‍රමාදව කටයුතු කරනවිට ඔහුට, තමා රැක ගැනීමට හැකිවේ. **මූලාශ්‍ර:** අංගු.නි :(3 ) : 5 නිපාත:සේඛබලවග්ග: 5.1.1.7 කාමේසුපලාලිත සූත්‍රය, පි.30.

▲ **කාමආසව-**Kamaasava: සසරට බැඳ තබන ආසවයකි (ආශ්‍රව). ආසව ක්‍ෂය කළ භික්ෂුව, කාමයට ඇති කැමත්ත, ගිණිඅඟුරු වලකට වැටීම ලෙසින්, ඇතිසැටියෙන්- යථාබවින්, සම්මා ප්‍රඥාවෙන් දකින බවත්, එම අවබෝධය, ආසවක්‍ෂය කිරීම නිසා ලැබෙනබලය, දසබලයන් ගෙන් එකක් ය යි සැරියුත් මහා තෙරුන් වදාළහ, **බලන්න**: සේඛබල, ආස්‍රව හා ආස්‍රව ක්‍ෂය කිරීම, **ගිනිඅඟුරු වල උපමාව-**උපග්‍රන්ථය:5.

▲**කාම ඔඝය-** the flood of sensuality: කාම ඔඝය යනු, සත්‍වයා සසර ඇදගෙනයන ජල ප්‍රවාහ 4 න් එකකි. **බලන්න**: ඔඝ සතර.

▲ **කාමගුණ**:පාලි: **කාමගුණා** -five strands of sense-desire : කාමගුණ -පංචකාමගුණ ලෙසින්ද හඳුන්වයි. **බලන්න**: පංච කාමගුණ.

▲ **කාමගුණ උපධි-** five strands of sense acquisitions : කාමගුණ උපධි ලෙසින් පෙන්වා ඇත්තේ පංච කාම වස්තූන් අල්වා ගැනීමය. **බලන්න**: උපධි.

▲ **කාමචන්දය-**Sensuous desire : කම්සැපට ඇති ආශාව, පංච කාමයට ඇති කැමත්ත. මෙය නීවරණයකි. කාමසංකල්පනා නිසා කාමච්ඡන්දය ඇතිවේ. කාමච්ඡන්දය ඇතිවිට කාමපරිදාහය ඇතිවේ. කාමචඡන්දය පහකර ගැනීමට අසුභනිමිත්ත වැඩිය යුතුය. **බලන්න**: අසුභනිමිත්ත, නීවරණ, කාමධාතුව.

▲ **කාමතණ්හාව-** Sensuous craving : කාම තණ්හාව, ත්‍රිවිධ තණ්හාවෙන් (කාම-භව-විභව) එකකි. කම්සැපයට ඇති ඇල්මය. මෙය නිසා සත්‍වයෝ නැවත නැවත සසරට පැමිණේ.**බලන්න:** තණ්හා.

▲ **කාමධාතුව-** the sensual desire element: කාමධාතුව, සය ධාතුවලින් එකකි. **බලන්න**: ධාතු. බුදුන් වහන්සේ මෙසේ පෙන්වා ඇත: " කාම විතර්ක (කාමවස්තු ගැන සිතීම) හේතු සහිතව ඇතිවේ, හේතු නොමැතිව නූපදී...කාමධාතුව නිසා කාම සංඥාව උපදී. කාම සංඥාව නිසා කාම සංකල්පනා උපදී. කාම සංකල්පනා නිසා කාමච්ඡන්දය උපදී. කාමච්ඡන්දය නිසා කාමපරිදාහය (කාමයේ ගිලීම) උපදී. කාම පරිදාහය නිසා කාම පර්යේෂණය (කාමය සෙවීම) උපදී. කාමය සොයායන නුගත් ( ධර්මය නොදත්) පුහුදුන්-පෘතග්ජන මිනිසා කයින්, වචනයෙන් හා සිතින් -තුන්දොරින් අයහපත් දේ කරයි, පිළිපදී. **මූලාශ්‍ර:** සංයු.නි: ( 2 ): නිදානවග්ග: ධාතුසංයුත්ත: 2.2.2 සනිදාන සූත්‍රය,පි. 258, ESN: 14: Dathusamyutta: 12.2 With a source, p. 751.

▲ **කාම නිබ්ද්දා ප්‍රතිපදාව-** Kama Nibidda Partipada : ඒ සඳහා ඇති පිළිවෙත 6 ආකාරය: 1) **කාමය දත යුතුය-** Sensual pleasures should be understood**:** කාමගුන පහ : රූප,ශබ්ද,ගන්ධ,රස,ස්පර්ශ, ආරිය විනයේ කාමය ලෙසින් හඳුන්වන්නේ නැත, ඒවා කාමගුනයන්ය (objects of sensual pleasure) . කාමය නම්, යම්කෙනකුට ඇතිවෙන කාම සංකල්පනාවය- සංකල්පරාගයය-කාමචේතනාවය ((A person's sensual

pleasure is lustful intention): **"සඞකප්පරාගො පුරිසස්ස කාමො- නෙතෙ කාමා යානි චිත්‍රානි ලොකෙ, සඞකප්පරාගො පුරිසස්ස කාමො- තිට්ඨන්ති චිත්‍රානි තථෙව ලොකෙ, අථෙත්ථ ධීරා විනයන්ති ඡන්දන්ති".** ලෝකයේ ඇති විසිතුරු දේ කාමය නොවේ, කෙනෙක්ගේ සිතේ ඇතිවන රාග චේතනාව, කාමයය. ලෝකයේ විසිතුරු දේ එලෙසින්ම පවතී, එහෙත්, ප්‍රඥාවන්තයා ඒවාට ඇති ඇල්ම පහකරගනී. 2) **කාමයේ නිදාන සම්භවය (උත්පත්ති කරුණ) දත යුතුය** (the source and origin of sensual pleasures should be understood) කාමයේ උත්පත්ති කරුණ, ස්පර්ශයය. **සටහන**:අටුවාව මෙය 'සහජාතඵස්ස- coexistent contact ලෙසින් දක්වා ඇත. 3**) කාමයේ විවිධත්වය** (වෙමත්තතාව) දත යුතුය (the diversity of sensual pleasures should be understood) රූපය පිලිබඳ කාමය එකකි, එලෙස, ශබ්දය...ගන්ධය... රසය... ස්පර්ශය ආදියේ කාමය එකිනෙකට වෙනස්ය.( Sensual desire for forms is one thing... for sounds is another...etc.) 4) **කාමයේ විපාකය දත යුතුය** (the result of sensual pleasures should be understood) තමන් කැමති දෙයක් කෙරහි ඇති කාමයට අනුරූපව කෙනෙක්, යහපත් (පුණ්‍ය) හෝ අයහපත් (අපුණ්‍ය) ආත්මභාවයක් ඇතිකරගනි. (One produces an individual existence that corresponds with whatever [sense pleasures] one desires and which may be the consequence either of merit or demerit) **සටහන:** දේවලෝක සැප පතන කෙනක් යහපත් කටයුතු කිරීමෙන් සුගතියේ උපත ලබා තමන් කල කර්මය අනුව විපාක විඳි. තවකෙනෙක් අයහපත් ක්‍රියා නිසා දුගතියේ උපත ලබා තමන් කල කර්මය අනුව විපාක විඳි. (One produces an individual existence that corresponds with whatever [sense pleasures] one desires and which may be the consequence either of merit or demerit) 5) **කාමයේ නිරෝධය දත යුතුය** (the cessation of sensual pleasures should be understood) ස්පර්ශයේ නිරෝධය, කාමයේ නිරෝධයය. 6) **කාම නිරෝධ ගාමිණී ප්‍රතිපදාව දත යුතුය දත යුතුය** (the way leading to the cessation of sensual pleasures should be understood) එනම්, ආරියඅටමගය. මේ කරුණු 6 යහපත් ලෙසින් දන්නා ආරිය ශ්‍රාවකයා, නිබ්බෙදික බ්‍රහ්මචරියාවැවු කාම නිරෝධය දන්නේය. **මූලාශ්‍ර:** අංගු.නි: (4) 6 නිපාත: 6.2.1.9 නිබ්බේධිකසූත්‍රය,පි.220,EAN:6: 63.9 Penetrative,p.355.

▲ **කාමපරිදාහය**-sensual passion: කාමපරිදාහය යනු, සිත පංච කාමයන්ට යටවිමය, වශිවියාමය. කාමච්ඡන්දය නිසා කාමපරිදාහය ඇතිවේ. **බලන්න**: කාමධාතුව.

▲ **කාම පර්යේෂණය**- sensual quest: කාම පර්යේෂණය යනු කාම වස්තුන් සොයා යැමය. කාමච්ඡන්දය නිසා කාමපරිදාහය ඇතිවේ. එම සෙවීම නිසා ආධ්‍යාත්මික මග දියුණු කරගැනීමට නොහැකිවේ.**බලන්න**: කාමධාතුව.

▲ **කාමභවය**- Sensuous existence: යළි උපත ලබන භව තුනෙන් එකකි. **බලන්න**: භව.

▲ **කාමභෝගී පුද්ගලයෝ**-kamabhogi puggala: කාමභෝගී බව නිසා සතුටට පත්වෙන පුද්ගලයන් දසදෙනෙකු මේ ලෝකයේ සිටිනබව බුදුන් වහන්සේ පෙන්වා ඇත: 1) කෙනෙක් අධර්මයෙන් ධනය උපයාගනී. එහෙත්, ඔහුගේ සිතේ සතුට නැත, සිත පිනායාමක් ද නැත; තම ධනය

අනුන් හා බෙදා නොගනි; ඔහු පින් නොකරයිඔහුට **අවගුණ** 3කි: i අධාර්මිකව ධනය ඉපයීම ii සිතේ නොසතුටුබව iii ධනය බෙදා නොගැනීම හා පින් නොකිරීම. 2) කෙනෙක් අධර්මයෙන් ධනය උපයාගනී. ඔහුට සතුට ඇත, සිත පිනා ගොස්ය, එනමුත් ඔහු තම ධනය අනුන් හා බෙදා නොගනි; ඔහු පින් නොකරයි. ඔහුට **අවගුණ** 2කි: i අධාර්මිකව ධනය ඉපයීම ii ධනය බෙදා නොගැනීම හා පින් නොකිරීම. ඔහුට **ගුණ** 1 කි: සිතේ සතුට තිබීම. 3) කෙනෙක් අධර්මයෙන් ධනය උපයාගනී. ඔහුට සතුට ඇත, සිත පිනා ගොස්ය, ඔහු තම ධනය අනුන් හා බෙදා ගනි; ඔහු පින් කරයි. ඔහුට **අවගුණ** 1 කි: අධාර්මිකව ධනය ඉපයීම. ඔහුට **ගුණ** 2 කි:i සිතේ සතුට තිබීම ii ධනය බෙදා ගැනීම හා පින් කිරීම 4) කෙනෙක් අධර්මයෙන් හා ධර්මයෙන් ධනය උපයාගනී. එහෙත්, ඔහුගේ සිතේ සතුට නැත, පිනායාමක් ද නැත; තම ධනය අනුන් හා බෙදා නොගනි; ඔහු පින් නොකරයි. ඔහුට **ගුණ** 1 කි: ධාර්මිකව ධනය ඉපයීම. ඔහුට **අවගුණ** 3 කි: i අධාර්මිකව ධනය ඉපයීම ii සිතේ නොසතුටුබව iii ධනය බෙදා නොගැනීම හා පින් නොකිරීම. 5) කෙනෙක් අධර්මයෙන් හා ධර්මයෙන් ධනය උපයාගනී. ඔහුට සතුට ඇත, සිත පිනා ගොස්ය, එනමුත් ඔහු තම ධනය අනුන් හා බෙදා නොගනි; ඔහු පින් නොකරයි. ඔහුට **ගුණ 2 කි**: i ධාර්මිකව ධනය ඉපයීම ii සිතේ සතුට තිබීම. ඔහුට **අවගුණ 2 කි**: i අධාර්මිකව ධනය ඉපයීම ii ධනය බෙදා නොගැනීම හා පින් නොකිරීම. 6) කෙනෙක් අධර්මයෙන් හා ධර්මයෙන් ධනය උපයාගනී. ඔහුට සතුට ඇත, සිත පිනා ගොස්ය, ඔහු තම ධනය අනුන් හා බෙදා ගනි; ඔහු පින් කරයි. ඔහුට **අවගුණ 1 කි**: අධාර්මිකව ධනය ඉපයීම. ඔහුට **ගුණ 3 කි**: i ධාර්මිකව ධනය ඉපයීම ii සිතේ සතුට තිබීම iii තම ධනය අනුන් හා බෙදාගැනීම හා පින් කිරීම. 7) කෙනෙක් ධර්මයෙන් ධනය උපයාගනී. එහෙත්, ඔහුගේ සිතේ සතුට නැත, පිනායාමක් ද නැත; තම ධනය අනුන් හා බෙදා නොගනි; ඔහු පින් නොකරයි. ඔහුට **ගුණ 1 කි**: ධාර්මිකව ධනය ඉපයීම. ඔහුට **අවගුණ 2** කි: ii සිතේ නොසතුටුබව iii ධනය බෙදා නොගැනීම හා පින් නොකිරීම. 8) කෙනෙක් ධර්මයෙන් ධනය උපයාගනී. ඔහුට සතුට ඇත, සිත පිනා ගොස්ය, එනමුත් ඔහු තම ධනය අනුන් හා බෙදා නොගනි; ඔහු පින් නොකරයි. ඔහුට **ගුණ 2 කි**: i ධාර්මිකව ධනය ඉපයීම ii සිතේ සතුට තිබීම. **අවගුණ 1** කි: තම ධනය අනුන් හා බෙදානොගැනීම හා පින් නොකිරීම. 9) කෙනෙක් ධර්මයෙන් ධනය උපයාගනී. ඔහුට සතුට ඇත, සිත පිනා ගොස්ය, ඔහු තම ධනය අනුන් හා බෙදා ගනි; ඔහු පින් කරයි. එහෙත්, ඔහු තම ධනය භාවිතා කරන්නේ එයට ඇලිය; ඔහු ධනය නිසා මත්වී සිටි, අන්ධ (අනුවණ) ලෙසින් ධනයේ ගිලී සිටි. එහි ඇති ආදීනවය (අනතුර) ඔහු නොදකී, ඉන් මිදියාම (නිස්සරනය) ගැන ඔහුට අවබෝධයක් නැත. ඔහුට **ගුණ 3 කි**: i ධාර්මිකව ධනය ඉපයීම ii සිතේ සතුට තිබීම iii තම ධනය අනුන් හා බෙදාගැනීම හා පින් කිරීම. **අවගුණ 1 කි**: ඔහු තම ධනය භාවිතා කරන්නේ එයට ඇලී, ඒ නිසා මත්වී, අනුවණ ලෙසින් එහි ගිලී, ආදීනවය හා නිස්සරනය ගැන අවබෝධයක් නැතිනිසාය. 10) කෙනෙක් ධර්මයෙන් ධනය උපයාගනී. ඔහුට සතුට ඇත, සිත පිනා ගොස්ය, ඔහු තම ධනය අනුන් හා බෙදා ගනි; ඔහු පින් කරයි. ඔහු ධනය භාවිතා කරන්නේ එයට නොඇලිය, ඉන් මත්නොවිය,අනුවණ ලෙසින් එහි නොගැලිය. ඔහු එහි ඇති ආදීනවය දකියි, ඉන් මිදෙනඅයුරු දනී. ඔහුට ගුණ 4 කි: i ධාර්මිකව ධනය ඉපයීම ii සිතේ සතුට තිබීම iii තම ධනය

අනුන් හා බෙදාගැනීම හා පින් කිරීම iv ඔහු තම ධනය භාවිතා කරන්නේ එයට නොඇලී, ඒ නිසා මත්නොවී, නුවණින් එහි නොගිලී, ආදීනවය හා නිස්සරනය ගැන අවබෝධයක් ඇතිනිසාය. ඔහු අග්‍ර පුද්ගලයකි. **බලන්න**: අග්‍රමිනිසුන්. **සටහන:** කාමභෝගීවීම නිසා මිනිසුන් දිළිඳු බවට පත්වේ, එනිසා ණයගැතිවී බෝහෝ දුක් විදිති. **බලන්න**: ඉණ. **මූලාශ්‍ර**: අංගු.නි : (6 ): 10 නිපාත: 10.2.5.1. කාමභොගි සූත්‍රය, පි. 344, EAN:10: 91.1 One who enjoys sensual pleasures, p. 531.

▲ **කාම-මිථ්‍යාචාරය**: පාලි: **කාමෙසුමිච්ඡාචාරා** - Sexual misconduct කාම-මිථ්‍යාචාරය- කාමයෙහිවරදවා හැසිරීමදස අකුසලයන් ගෙන් එකකි. මෙය පරදාරසේවනය ලෙසින්ද පෙන්වා ඇත. **බලන්න**: දස අකුසල, පරදාරසේවනය.

▼**කාමයෙහි වරදවා හැසිරෙන අය නිරයට යයි:** බුදුන් වහන්සේ කාමයෙහි වරදවා හැසිරෙන කෙනෙකුගේ ස්වභාවය මෙසේ දක්වා ඇත:

මේ ලෝකයේ කෙනෙක් කාමමිථ්‍යාචාරයේ යෙදෙයි. මව විසින් රකින, පියා විසින් රකින, මව්පියන් විසින් රකින, සහෝදරයෙක් විසින් රකින, සහෝදරියක් විසින් රකින ගෝත්‍රය (කුලය) විසින් රකින, ස්වාමි පුරුෂයෙක් සිටින, වරදක්කර දඬුවමකට යටත්වූ, මල්මාලා හුවමාරුකර විවාහ ගිවිසගත් ආදී වශයෙන් වූ ස්ත්‍රියක් සමග වැරදි කාම සේවනය කරයි, එවැනි අය ඒකාන්තයෙන්ම නිරයට යයි. **"ඉධ භික්ඛවෙ එකච්චො කාමෙසුමිච්ඡාචාරි හොති. යා තා මාතුරක්ඛිතා, පිතුරක්ඛිතා, මාතා පිතුරක්ඛිතා, භාතුරක්ඛිතා, භගිනීරක්ඛිතා, ඤාතිරක්ඛිතා, ගොත්තරක්ඛිතා, ධම්මරක්ඛිතා, සසාමිකා, සපරිදණ්ඩා, අන්තමසො ගුලපරික්ඛිත්තාපි, තථා රූපාසු චාරිත්තං ආපජ්ජිතා හොති"** සටහන:මේ නිසා කම්ම සිව් ආකාරයකට රැස්වේ: 1) තමන් එම අකුසලය කිරීම, 2) අනුන්ලවා කරවීම 3) අනුමත කිරීම 4) වර්ණනා කිරීම. **බලන්න**: අංගු:4 නිපාත: කම්මපථවග්ග:4.7.3 සූත්‍රය. **මූලාශ්‍ර**: අංගු.නි: (6 ): 10 නිපාත: කරජකාය වග්ග: 10.5.1.1. පඨම නිරය සූත්‍රය, පි. 548, ජානුසොණි වගග, 10.4.2.10,චුන්ද සූත්‍රය,පි.508EAN:10: The Deed-born body: 211.1 Hell, p. 556, Jāṇussoṇī: 176.10, Cunda, p.553.

▼**වෙනත් මූලාශ්‍ර: 1. "කාමමිථ්‍යාචාරය:** මෛථුන ධර්මය- ඒකාන්තයෙන් නින්දිතවූ හැසිරීමකි. පරස්ත්‍රී-පරපුරුෂ සේවනය -වරදවා මෛථුන්දම් සෙවුම යයිද කියයි. මෙයට අංග 4කි: නොඑළඹිය යුතු ස්ත්‍රී පුරුෂයන් අතරෙන් කෙනෙක් වීම, සේවනය කරන සිත්, ඒ සඳහා කරන උපක්‍රමය, එය යෙදීම": **සද්ධර්ම කෝෂය,** පි. 113.

▲**කාමයොගය**: පාලි: **කාමයොගො**- the bond of sensuality: කාම යොගය යනු ලෝක සත්ත්වයා සසරට බැඳ තබන බැමි- කෙලෙස් බැඳීම් 4 න් එකකි. මෙය ධර්ම මාර්ගයට හානි කරන කරුණකි. **බලන්න:** සතර යොග, හානභාගිය ධර්ම.

▲ **කාම රාගය-** sensual desire: පංචකාමයට ඇලීම- කාම රාගයය. අනිච්චසංඥාව වඩා ගැනීමෙන් කාම රාගය ප්‍රහීණ කර ගත හැකිය. **බලන්න**: නීවරණ, අනිච්චසංඥාව.

▲ **කාමරාග අනුසය:**පාලි: **කාමරගානුසා-** underlying tendency to sensual desire: ධර්මයට අනුව පංචකාමය පිළිබඳව සිත යට ඇති ආශාව කාමරාග අනුසය වේ, සත් අනුසයන්ගෙන් එකකි. **බලන්න**: අනුසය.

▼**වෙනත් මූලාශ්‍ර: 1. "කාමරාගඅනුසය** නම්: සොම්නස හා එක්ව පවත්නා කාමසේවනාදියෙහි දොස් නැත යන මිථ්‍යා දෘෂ්ටිය හා යෙදුන

අනුන් විසින් මෙහෙයිමක් නොකරනලද සිතය. එසේම, කාම සේවනාදියෙහි දොස් නැත යන මිථ්‍යා දෘෂ්ටිය හා යෙදුන අනුන් විසින් මෙහෙයවනලද සිත ආදි සිත් 8 ය. මේ සිත් ලෝභ මූලික අකුසල් සිත්වේ". **සද්ධර්ම කෝෂය**, පි. 234.

▲ **කාමලෝකය -**Sensuous world: කාමයට ලැදිවූ සත්ත්වයන් යළි උපත ලබන භවයකි. සතර අපාය, මිනිස්ලෝකය හා කාමාවචර දේවලෝක මෙයට ඇතුලත්වේ .**බලන්න**: භවය, දේවලෝක, සතරඅපාය.

▲ **කාමවිතක්ක-** sensual thought: කාමවිතක්ක යනු පංචකාමයන් පිලිබඳව සිතමින් එහි ඇලී සිටීමය. කාමවිතක්ක ඇතිවන්නේ හේතු නිසාය, හේතු නොමැතිව කාම විතක්ක නූපදී යයි බුදුන් වහන්සේ පෙන්වා ඇත. **සටහන**: ධර්මයේ අන්ධවීමට කාමවිතක්ක හේතුවේ. **බලන්න**: අන්ධකරණ හා අන්ධනොකරණ.

▲ **කාමසංඥාව**- sensual perception: කාමසංඥාව යනු, කාමවස්තූන් පිලිබඳ, හඳුනාගැනීමය. බුදුන් වහන්සේ පෙන්වා ඇත්තේ කාම ධාතුව නිසා කාමසංඥාව ඇතිවන බවය. කාමසංඥාව ඇතිවීම නිසා කාමසංකල්පනා ඇතිවේ. **බලන්න**: කාම ධාතුව.

▲ **කාමසංකල්පනා-** sensual intention: කාමසංකල්පනා යනු කාමවස්තූන් පිලිබඳ සිතිවිලි ඇතිකරගැනීම. කාම සංඥාව නිසා කාමසංකල්පනා ඇතිවේ. කාමසංකල්පනා නිසා කාමච්ඡන්දය ඇතිවේ. **බලන්න**: කාමධාතුව.

▲ **කාමසුඛය**- sensual happiness : ගිහියන් විඳින සුඛය මින් අදහස් කෙරේ. මේ සුඛය හීනය, නෙක්ඛම්ම සුඛය අග්‍රය. **බලන්න:** සුඛය.

▲ **කාමාවචර-** Sensuous sphere: කාමයට බැඳීම නිසා යළි උපත ලබන භවයකි, කාමලෝකය හඳුන්වන පදයකි. **බලන්න**: කාමලෝකය, භව.

▲ **කාමාවචරධර්ම**- Kamavachara Dhmma: කාමාවචර ධර්ම, අර්ථසන්දර්ශන ඥානයට ඇතුලත් කරුණකි. **බලන්න**: අර්ථසංදර්ශන ඥාණය.

▲**කාමසුඛල්ලිකානු යෝගය**- pursuit of sensual pleasures කාමසුඛල්ලිකානු යෝගය- කාමයට ඇලීම, ආධ්‍යාත්මික වර්ධනය පිණිස අත් හැරදැමිය යුතු එක් අන්තයක් ලෙසින් බුදුන් වහන්සේ පෙන්වා ඇත .**බලන්න:** අන්ත දිට්ඨී සතර, සතර අන්ත, ආරියඅටමග. **සටහන**: ධම්මචක්කප්පවත්තන සූත්‍රයේ මේ ගැන දක්වා ඇත.

▲ **කිම්බිල තෙර**- Kimbila Thera:**බලන්න**: උප ග්‍රන්ථය:1.

▲ **කුම්භ-**Pots: කුම්භ යනු වළඳය (හැලිය). බුදුන් වහන්සේ කුම්භ 4 ක් පෙන්වා ඇත: 1) ඇතුලත හිස්ය, වසා ඇත 2) ඇතුලත පිරුන, නොවැසූ 3) ඇතුලත හිස්ය, වසා නොමැත 4) ඇතුලත පිරුන වැසූ. එවැනි ස්වභාවය ඇති පුද්ගලයන් 4 දෙනක් ලෝකයේ සිටිති. **බලන්න**: කුම්භ වැනි පුද්ගලයෝ.

▲ **කුම්භවැනි පුද්ගලයෝ-** Persons similar to pots: කුම්භ හෙවත් වළං බඳු පුද්ගලයෝ සිව් දෙනක් **(කුම්භොපම)**ගැන බුදුන් වහන්සේ පෙන්වා ඇත: 1) එක් පුද්ගලයෙක් කය හැසිරවීම, සිවුරු ඇරීම ආදී බාහිර ක්‍රියා මානව කරයි, එහෙත්, චතුරාර්ය සත්‍ය අවබෝධ කර නොමැත. ඔහුගේ පිටත වැසි ඇත, ඇතුලත හිස්ය 2) එක් පුද්ගලයෙක් කය හැසිරවීම, සිවුරු ඇරීම ආදී බාහිර ක්‍රියා මානව නොකරයි, එහෙත් චතුරාර්ය සත්‍ය අවබෝධ කර ඇත. ඔහුගේ පිටත විවෘතය, ඇතුලත වැසි ඇත 3) එක්

පුද්ගලයෙක් කය හැසිරවීම, සිවුරු දැරීම ආදී බාහිර ක්‍රියා මානව නොකරයි, එසේම, චතුරාර්ය සත්‍ය අවබෝධ කර නොමැත. ඔහුගේ පිටත විවෘතය, ඇතුලත හිස්ය. 4) එක් පුද්ගලයෙක් කය හැසිරවීම, සිවුරු දැරීම ආදී බාහිර ක්‍රියා මානව කරයි, චතුරාර්ය සත්‍ය අවබෝධ කර ඇත. ඔහුගේ ඇතුලත පිරිඇත, පිටත වැසි ඇත. කුම්භ-වලං වල ස්වභාවය උපමා කරමින් පුද්ගල විවිධබව පෙන්වා ඇත. කුම්භ උපමාව:**බලන්න:** උපග්‍රන්ථය:5 **මූලාශ්‍ර**:අං.ගු.නි: (2): 4 නිපාත: 4.3.1.3 කුම්භ සූත්‍රය, පි. 222, EAN:4: 103.3 Pots, p. 185.

▲**කුමාරකාශ්‍යප තෙර**-Kumarakasyapa Thera: **බලන්න:** උපග්‍රන්ථය:1

**කය**

▲ **කය**: පාලි: **කාය-**body/form: ධර්මයේ කය ලෙසින් පෙන්වා ඇත්තේ ශරීරයය, පංච උපාදානස්කන්ධයේ රූප ස්කන්ධයය: සතර මහා භූතයන් ගෙන් සකස්වූ භෞතික ස්වරූපයය (physical form). අං.ගු.නි: (6) 10 නිපාත: **කරජකාය සූත්‍රයේ** දී, මේ කය: **කරජකාය-** මරණ ස්වභාවය ඇතිදෙයක් ලෙස, කර්ම නිසා සකස්වූ දෙයක් ලෙස පෙන්වා ඇත. කය පිලිබඳ භාවනාව- කායාගතා සතිය ආවර්ජනය කිරීමේදී පෙන්වා ඇත්තේ කයේ ඇති 31-32 කොටස් ගැනය. කයෙන් කරන කර්ම ලෙසින් පෙන්වා ඇත්තේ ශරීරය ආධර කරගෙන කරන ක්‍රියා ගැනය. **බලන්න**: කායගතා සතිය, පංච උපාදානස්කන්ධය, ශරීරය. **සටහන්**: * කයේ පැවැත්ම පිණිස ආහර මූලිකවේ. **බලන්න:** ආහාර.** කයට ඇති ඇල්ම නැතිකර ගැනීමට - කයේ අසුභය දැකීමට අට්ඨික සංඥාව වැඩිය යුතුය**. බලන්න**: අට්ඨික සංඥාව. **කයේ නියම ස්වභාවය ගැන **බලන්න**: ශරීරයානය. **කයේ පැහැය අනුව කුල- පංති බෙදා ඇත. **බලන්න**: ශරීරවර්ණය. **කය නිසා පවතින ධර්මතා ගැන **බලන්න**: ශරීරස්ථ ධර්ම ** බුදුන් වහන්සේ ඇතුළු ආරිය උතුමන්, පිරිනිවන් පා සිදුකරන ආදාහනයෙන් පසු ඉතිරිවන කාය කොටස් ධාතු ලෙසින් පෙන්වා ඇත. **බලන්න**: ශාරීරික ධාතු. **කයේ වේදනා ගැන **බලන්න:** වේදනා, අට්ඨසත ධම්මපරියාය. **කයේ ඉන්ද්‍රියන් ගැන **බලන්න**: ඉන්ද්‍රිය. ** කය, අභන්තර ආයතනයකි**.** **බලන්න**: ආයතන. ** භාවනාව පිණිස කාය විවේකය අවශ්‍යයය. **බලන්න:** සුඛසෝමනස්ස,හුදකලාවිවේකය.

▼**කය මෙලොවට පමණි-**Body is only for this world :බුදුන් වහන්සේ මෙසේ වදාළහ: "ස්ත්‍රියකගේ හෝ පුරුෂයකුගේ හෝ මේ කය පරලොව ගෙන යා නොහැකිය, මරණස්වභාවය ඇති අයට සිත හරය ලෙසින් ඇත ( චිත්ත ක්ෂණාන්තරයක් ඇත)". **"ඉත්ථියා වා භික්ඛවෙ පුරිසස්ස වා නායං කායො ආදාය ගමනීයො. චිත්තන්තරො අයං භික්ඛවෙ මච්චො"** (A woman or a man cannot take this body with them when they go. Mortals have mind as their core). **සටහන්**: * කය පරලොව නොගියද සිතින් කරනලද කම්ම විපාක, යළි උපත ඇති කරයි **බලන්න**: කම්ම. ** අටුවාවට අනුව: They have mind as their cause, or their interior is due to mind -*cittakāraṇo, atha vā citten'eva antariko*. For with the mind at rebirth that follows without interval the mind at death, one becomes a deva, a hell-being, or an animal. බලන්න: EAN: Note: 2189, p. 685. **මූලාශ්‍ර**: අං.ගු.නි:( 6):10 නිපාත: කරජකාය වග්ග,10.5.1.9. කරජකාය සූත්‍රය, පි.582 , EAN: 10: The Deed Born Body, p.561.

▲ **කාය කම්ම-** Bodily Kamma: භවය සකස් වීමපිණිස (සසර

පැවැත්මට) කර්ම ඇතිකරණ කරුණු 10ක්, කය උපකාර කරගෙන **(**කයනිසා සිදුවන) ඇතිවන බව බුදුන් වහන්සේ පෙන්වා ඇත: **1** ශීත- Cold **2** උෂ්ණය- heat, **3** බඩගින්න- hunger **4** පිපාසය- thirst **5** මලපහකිරීම- defecation **6** මූත්‍රාකිරීම-urination 7 කාය සංවරය- bodily restraint **8** වචීසංවරය- verbal restraint **9** ජීවිත පැවැත්මේ සංවරය- restraint in one's livelihood **10** කම්ම ඇති කරණ චේතනා - volition. **බලන්න**: කම්ම. **මූලාශ්‍ර**:අංගු.නි: (6 ): 10: නිපාත: 5 අකෝෂ වග්ග, 10.1.5.9. ශරිරට්ඨධම්ම සූත්‍රය,පි.186, EAN:10 : V,49.9. Subsisting through the body, p. 512.

▲ **කායගතාසතිය** - mindfulness of the body: කායගතා සතිය (Mindfulness directed to the body) ලෙසින් ධර්මයේ පෙන්වා ඇත්තේ සතර සති පට්ඨානයේ කායානුපස්සනාවට අනුව කය පිලිබඳ සිහිය පැවැත්වීමය. කායානුපස්සනාවේ, කායගතා සතිය පවත්වාගැනීම විස්තරාත්මකව පෙන්වා ඇත. කායගතාසති භාවනාව නිවනට මගකි. කායගතා සතිය වැඩීමෙන් බොහෝ ප්‍රතිලාභ ඇතිවෙන බව බුදුන් වහන්සේ පෙන්වා ඇත. **බලන්න**: භාවනාව, සතරසතිපට්ඨානය. **සටහන: පසුපස කඩුගත් මිනිසෙක්, තම හිස සිඳීමට සැරසී සිටින විට, මුවවිට තෙක් පිරුණ තෙල් බඳුනක් නොසොල්වා, ජනපද කල්‍යාණිය රඟදෙන ස්ථානයක සිටින මහාජන සමූහයක් මැදින් ගමන් කරන පුද්ගලයෙක් ලෙසින්, සිත යහපත් ලෙසින් පවත්වා ගත යුතුබව මෙහිදී පෙන්වා ඇත. උපමාව: ජනපදකල්‍යාණි:බලන්න:** උපග්‍රන්ථය:5 මූලාශ්‍රය: සංයු.නි: (2) නිදානවග්ග: සතිපට්ඨානසංයුත්ත: නාලන්දවග්ග: 3.2.10 ජනපදකල්‍යාණි සූත්‍රය, පි.331.

▼ **සුඛ වේදනාව සහිතවූ කාය ගතා සතිය,** ආධ්‍යාත්මික මාර්ගය වඩා ගැනීම පිණිස වැඩියයුතු ධර්මතාවකි **(භාවේතබ්බ ධම්ම** ). **බලන්න**: භාවෙතබ්බ ධම්ම හා නභාවෙ තබ්බ ධම්ම. **මූලාශ්‍ර:** දීඝ.නි : (3 ): 11 දසුත්තර සූත්‍රය, පි. 483, EDN: 34: Dasuttara Sutta: Expanding Decades, p. 384.

▼ **කායගතාසතිය** වැඩීමෙන්, බහුල කරගැනීමෙන් : සසරට කලකිරේ, සසරට නොඇලේ, කෙළෙස් ප්‍රහීණයවේ, අනුසය ධර්ම ප්‍රහීණය වේ, විරාගය ඇතිවේ, නිවන පිණිස පවතී. **මූලාශ්‍ර:**අංගු.නි: (1): 1 නිපාතය: 16 එකධම්මපාලිය**,** පි. 100, EAN:1:One thing, p. 47, කායගතාසති වග්ග සූත්‍ර, පි. 125, EAN:1: Mindfulness Directed to the Body, p.52. **සටහන්:** * අරතිය පහ කරගැනීමට කායගතා සතිය වැඩිය යුතුවේ. **බලන්න**: අරතිය. ** අවිද්‍යාව -අවිජ්ජාව පහ කර ගැනීමට කායගතා සතිය වැඩිය යුතුවේ**. බලන්න**: අවිද්‍යාව. ** කායගතා සතිය වඩා ගැනීමෙන් අස්මිමානය පහකර ගත හැකිය. **බලන්න**: අස්මිමානය ** අසාමන්ත ප්‍රඥාව ඇතිකර ගැනීමට කායගතා සතිය වැඩිය යුතුවේ: **බලන්න**: අසාමන්ත ප්‍රඥාව. ** සියලු කුසල ධර්මයන්ට කායගතා සතිය ඇතුලත්වේ**. බලන්න**: අෂ්ටවිද්‍යා ඥාන. ** කායගතා සතිය සසර කලකිරීම පිණිස ඇති එක් භාවනාවකි: **බලන්න**: එක ධර්මය. ** කායගතා සතිය වැඩීමෙන් සීඝ්‍ර ප්‍රඥාව ඇතිවේ. **බලන්න:** සීඝ්‍ර ප්‍රඥාව. ** කායගතා සතිය වැඩීමෙන් හාසුප්‍රඥාව ඇතිවේ. **බලන්න:** හාසු ප්‍රඥාව.

▼**කායගතාසතිය නිවන් මගය- අසංඛත මගය** :**මූලාශ්‍ර:** සංයු.නි: (4)**:**සළායතනවග්ග: අසංඛත සංයුත්ත: 9.1.1 කායගතාසති සූත්‍රය, පි. 659, ESN:43: Asankatasamyutta: p. 1493.

▼ **කායගතා සතියේ ප්‍රතිලාභ-** Fruits of Mindfulness: ආධ්‍යාත්මික වර්ධනය ඇති කරගැනීමට ඉමහත් ලෙසින් උපකාරවන කායගතා සතිය වැඩීමෙන්, විපුල කරගැනීමෙන් විවිධ ප්‍රතිලාභ ඇතිවෙන බව බුදුන් වහන්සේ පෙන්වා ඇත. **බලන්න**: සතර සති පට්ඨානය.

▼ **කායගතා සතියේ ප්‍රතිඵලය** සත්‍ය ඥාණ අවබෝධය පිණිසය.

**"යස්ස කස්සචි භික්ඛවෙ මහාසමුද්දො චෙතසා ඵුටො, අන්තොගධා තස්ස කුන්නදියො යා කාචි සමුද්දඞ්ගමා. එවමෙව ඛො භික්ඛවෙ යස්ස කස්සචි කායගතාසති භාවිතා බහුලීකතා, අන්තොගධා තස්ස කුසලා ධම්මා, යෙ කෙචි විජ්ජාභාගියා"** . යම්කිසිකෙනෙක්, මහාසමුද්‍රය ගැන සිතා බලන්නේ නම්, මහමුහුදට ගලා බසින සියලුම කුඩා ගංගාවන් ද මහාසමුද්‍රයට ඇතුළත් බව ඔහු දනී. එලෙස, කෙනෙක්, කායගතාසතිය වඩන්නේ ද, බහුල කරගන්නේද, විද්‍යාව ඇතිකරන කුසල ධර්මතා (සත්‍යඥාන අවබෝධය පිණි ඇති ධර්ම කොටස්- **විජ්ජාභාගියා ධම්මා)** කායගතා සතියට ඇතුලත් වේ. (as one who encompasses with his mind the great ocean includes thereby all the streams that run into the ocean, just so, whoever develops and cultivates mindfulness directed to the body includes all wholesome qualities that pertain to true knowledge).**බලන්න**: සත්‍ය ඥානය, විජ්ජාභාගීය ධර්ම. **මූලාශ්‍ර:** අංගු.නි: (1): 1 නිපාත: කායගතාසති වග්ග: 1.16.7.1 සූත්‍රය. පි. 125, EAN:1: Mindfulness Directed to the Body, p.52.

▼**කායගතා සතිය වැඩීමේ ප්‍රතිලාභ: 1)** මහා සංවේගය ඇතිකරයි. **බලන්න:** මහා සංවේගය, මහත්ඵල මහාආනිසංස**. 2)** මහා අර්ථය -මහත් ඵල පිණිස පවතී **(මහතො අත්ථාය සංවත්තති-** leads to great good): සතර මගඵල ලැබීම පිණිස පවතී (සෝතාපන්න මග - අරහත් මග). **3)** මහත්වූ යොගක්ෂේමය පිණිස පවතී **(යොගක්ඛෙමාය සංවත්තති-** leads to great security from bondage): සසර බැමි ක්ෂයකර ආරක්ෂාව ලැබීම -නිවන පිණිස: කාමයොග, භවයොග, දිට්ඨියොග හා අවිජ්ජායොග යන බැමි වලින් නිදහස්වීම, සතර සමණ ඵල පිණිස: සෝතාපන්න- අරහත් ඵල ලැබීමට. **බලන්න**: සතර යොග, සතර ශ්‍රමණ ඵල). **4)** සති සම්ප්‍රජන්‍යය පිණිස පවතී **(සතිසම්පජඤ්ඤාය සංවත්තති-** leads to mindfulness and clear comprehension .**බලන්න**: සතිසම්ප්‍රජන්‍යය. **5)** ඥාණදර්ශනය ලැබීම පිණිස පවතී **(ඤාණදස්සනපටිලාභාය සංවත්තති-** leads to the attainment of knowledge and vision) දිවැස් නුවණ ලැබීම පිණිස. **6)** මේ භවයේදීම සැප විහරණය ඇතිව වාසය කිරීමට ලැබීම **(දිට්ඨධම්මාසුඛවිහාරාය සංවත්තති-** leads to a pleasant dwelling in this very life). **7)** විද්‍යාවිමුක්තිය පිණිසවේ **(විජ්ජාවිමුත්තිඵල සච්ඡිකිරියාය සංවත්තති-** leads to realization of the fruit of knowledge and liberation) **බලන්න**: විජ්ජා විමුක්තිය. **8)** කයේ සංන්සිඳීම, සිතේ සංන්සිඳීම, විතර්ක හා විචාර සංන්සිඳීම මගින් භාවනාව (සමාධිය ලැබීම) පරිපූර්ණව, විද්‍යාවිමුක්තිය පිණිසවූ කුසල ධර්ම සම්පූර්ණබවට පත්වේ. **(කායොපි පස්සම්භති... චිත්තම්පි පස්සම්භති... විතක්කවිචාරාපි වූපසම්මන්ති...කෙවලාපි විජ්ජාභාගියා ධම්මා භාවනා පාරිපූරිං ගච්ඡන්ති-** the body becomes tranquil, the mind becomes tranquil, thought and examination subside, and all wholesome qualities that pertain to true knowledge reach fulfillment by development) **9)** නුපන් අකුසල ඇතිනොවේ, උපන් අකුසල ප්‍රහීණයවේ ...නුපන් කුසල ඇතිවේ,

උපන් කුසල වැඩිවී විපුල බවට පත්වේ (**අනුප්පන්නා චෙව අකුසලා ධම්මා නුප්පජ්ජන්ති, උප්පන්නා ච අකුසලා ධම්මා පහීයන්ති... අනුප්පන්නා චෙව කුසලා ධම්මා උප්පජ්ජන්ති, උප්පන්නා ච කුසලා ධම්මා භියෙය්‍යාභාවාය වෙපුල්ලාය සංවත්තන්ති** - unarisen unwholesome qualities do not arise and arisen unwholesome qualities are abandoned... unarisen wholesome qualities arise and arisen wholesome qualities increase and expand) **10)** අවිද්‍යාව පහවේ, විද්‍යාව ඇතිවේ (**අවිජ්ජා පහීයති, විජ්ජා උප්පජ්ජති-**ignorance is abandoned, true knowledge arises) **11)** අස්මිමානය පහවේ (**අස්මිමානො පහීයති-** the conceit 'I am' is abandoned) බලන්න: අස්මිමාන. **12)** අනුසය ධර්ම සහමුලින්ම ඝාතනයවේ (**අනුසයා සමුග්ඝාතං ගච්ඡන්ති** -underlying tendencies are uprooted) බලන්න**:** අනුසය. **13**) සංයෝජන ප්‍රහීණය වේ (**සඤ්ඤොජනා පහීයන්ති** -fetters are abandoned). බලන්න: සංයෝජන. **14)** ප්‍රඥාප්‍රභේදය පිණිස පවතී (**පඤ්ඤාපභෙදාය සංවත්තන්ති**- leads to differentiation by wisdom) **15)** අනුපාදා පරිනිර්වානය පිණිස පවතී (**අනුපාදා පරිනිබ්බාණාය සංවත්තන්ති**- leads to nibbāna through non-clinging) **16)** අටළොස්-18 ක්වූ අනේක ධාතුන්ගේ ලක්ෂණ, විවිධබව අවබෝධවේ, ධාතුන්ගේ විවිධත්වය අවබෝධවේ අනේක ධාතුන්ගේ පටිසම්භිදා නුවණ පහලවේ.(**අනෙකධාතුපටිවෙධො හොති...නානාධාතු පටිවෙධො හොති ... අනෙකධාතුපටි සම්භිදා හොති** -penetration of numerous elements occurs …penetration of the diversity of elements occurs … analytical knowledge of numerous elements occurs). බලන්න: ධාතු. **17)** සෝතාපන්න සිට අරහත්වය දක්වාවූ මගඵල ලැබීම පිණිස හේතුවේ (**සොතාපත්තිඵල සච්ඡිකිරියාය... සකදාගාමි ඵලසච්ඡිකිරියාය... අනාගාමිඵලසච්ඡිකිරියාය... අරහත්තඵලසච්ඡිකිරියාය සංවත්තන්ති-** realization of the fruit of stream-entry … fruit of once-returning … fruit of non-returning … fruit of arahantship) **18)** ප්‍රඥාව ලැබීම පිණිස වේ: 1. ප්‍රඥා පටිලාභය පිණිස 2. ප්‍රඥා වෘද්ධිය පිණිස 3. ප්‍රඥා විපුලබව පිණිස 4. මහා ප්‍රඥාව පිණිස 5. පුථු ප්‍රඥාව පිණිස 6 විපුලවූ ප්‍රඥාව පිණිස 7 ගාම්භීර ප්‍රඥාවපිණිස 8 අසාමන්ත ප්‍රඥාව පිණිස 9 භූරි ප්‍රඥාව පිණිස 10 ප්‍රඥා බහුලත්වය පිණිස 11 සීඝ්‍ර ප්‍රඥාව පිණිස 12 ලහුප්‍රඥාව පිණිස 13 හස ප්‍රඥාව පිණිස 14 ජවන ප්‍රඥාව පිණිස 15 තීක්ෂණ ප්‍රඥාව පිණිස 16 නිබ්බේදික ප්‍රඥාව පිණිස.බලන්න: ප්‍රඥාව. (**පඤ්ඤාපටිලාභා... පඤ්ඤා වුඩ්ඪියා... පඤ්ඤාවෙපුල්ලාය... මහාපඤ්ඤතාය... පුථුපඤ්ඤතාය ... විපුලපඤ්ඤතාය... ගම්භීරපඤ්ඤතාය... අසාමන්තපඤ්ඤතාය... භූරිපඤ්ඤතාය... පඤ්ඤා- බාහුල්ලාය...සීඝපඤ්ඤතාය... ලහුපඤ්ඤතාය... හාසුපඤ්ඤතාය...ජවනපඤ්ඤතාය... තික්ඛපඤ්ඤතාය... නිබ්බෙධිකපඤ්ඤතාය... සංවත්තන්ති-**) leads to the obtaining of wisdom … to the growth of wisdom … to the expansion of wisdom … to greatness of wisdom … to extensiveness -diversity of wisdom …to vastness of wisdom … to depth of wisdom … to a state of unsurpassed wisdom … to breadth of wisdom… to abundance of wisdom … to rapidity of wisdom … to buoyancy of wisdom … to joyousness of wisdom … to swiftness of wisdom … to sharpness of wisdom … to

penetrativeness of wisdom) **19)** කායගතා සතිය වඩාගැනීම, විපුල කරගැනීම, එහි ප්‍රමාදනොවීම ආදීය මගින් අමතය හෙවත් නිවන් මග සාක්ෂාත් කර ගැනීමට හැකිවේ. **සටහන:** කායගතා සතිය අතපසු කිරීමෙන් නිවන අතපසුවීම ආදීවූ අයහපත්විපාක පිළිබඳවව අමතවග්ගයේ විස්තරාත්මකව පෙන්වා ඇත. **මූලාශ්‍ර:** අංගු.නි:(1):1 නිපාත:කායගතාසති වග්ග, පි. 125 හා අමත වග්ග, පි. 130, EAN:1: Mindfulness Directed to the Body, p.52 & The Deathless, p. 53.

▲**කායගන්ථ: පාලි: කායගන්ථා** **-**The bodily knots :කායගන්ථ (කායගැට, බැඳතබන- ගොතාදමන) ලෙසින් ධර්මයේ පෙන්වා ඇත්තේ, යළි උපතට හේතුවන, සසර දික්කරන කෙළෙස්වලටය. **කායගන්ථ 4 කි:** 1) **අබිජ්ඣාව** (තණ්හාව-covetousness), 2) **ව්‍යාපාදය** (ක්‍රෝධය- ill will) 3) **සීලබ්බතපරාමාස** (ධර්මයට බාහිර සීල හා ව්‍රත පිළිපැදීම- distorted grasp of rules and vows) 4) **මෙයම සත්‍යය** යයි ගැනීම ( දිට්ඨි මත වලින් බැඳීම: මෙය පමණක් නිවැරදිය ආදී ලෙසින්- adherence to dogmatic assertion of truth). මේ ගැටසතර ගැන අවබෝධ කරගැනීමට හා ඒවා ප්‍රහීණය කිරීම පිණිස ආරිය අටමග මනාව වැඩිය යුතුයයි බුදුන් වහන්සේ වදාළහ. **මූලාශ්‍ර**: සංයු.නි: (5-1 කාණ්ඩය): මහාවග්ග: මග්ගසංයුත්තල ඕඝවග්ග: 1.16 **ගන්ථ සූත්‍රය**, පි. 162, ESN: 45: Maggasamyutta: 17.4. Knots, p. 1721.

▲ **කායසක්ඛි: පාලි: කායසක්ඛී -** body-witness :කායසක්ඛි යනු සත් ආරිය පුද්ගලයන්ගෙන් කෙනෙකි, සිව්ජාන, අරූප සමාපත්ති ලබා, ප්‍රඥාවෙන් චතු සත්‍ය දැක, ඇතම් ආසවයන් ක්‍ෂය කරගත් ආරිය ශ්‍රාවකයාය. **බලන්න**: සත් ආරිය පුද්ගලයෝ, උත්තම දසපුද්ගලයෝ. **ශබ්දකෝෂ: B.D:** p: 82: "**Kāya-sakkhi:** He is one who 'in his own person (body) has attained the 18 deliverances (vimokkha) and after wisely understanding the phenomena, the cankers have partly come to extinction …"

▼**කායසක්ඛි ආරිය ශ්‍රාවකයා,** අරූපසමාපත්ති ඇතිව, ප්‍රඥාවෙන් ආරිය සත්‍ය දැක, ඇතැම් ආසවයන් ප්‍රහීණයකර වාසයකරති. අරහත්වය ලබා නොමැතිනිසා ඔවුන් අප්‍රමාදව කටයුතු කළයුතුවේ යයි බුදුන් වහන්සේ වදාළහ. ඒ සඳහා ඔවුන් සුදුසු සෙනසුන්වල වාසය, කලණමිතුරු සේවනය, අධ්‍යාත්මික ඉන්ද්‍රිය වර්ධනය කළයුතුවේ. ( Here some person contacts with the body and abides in those liberations that are peaceful and immaterial, transcending forms, and some of his taints are destroyed by his seeing with wisdom. This kind of person is called a body-witness). **සටහන**: අටුවාවට අනුව මේ ගණයට වැටෙන්නේ සෝතාපන්න, සකදාගාමී, අනාගාමී හා අරහත්මර්ගය ලබාගත් උතුමන්ය, ඔවුන්, පසුව මාර්ගය සම්පූර්ණ කර අරහත්වය ලබයි. **බලන්න**: EMN: note: 704, p. 1129. **මූලාශ්‍ර**: ම.නි: ( 2): 2.2.10 කීටාගිරි සූත්‍රය, පි. 252, EMN: 70: Kīṭāgiri Sutta, p. 536.

▼ **බුදුන් වහන්සේ** කායසක්ඛි ආරිය ශ්‍රාවකයා හඳුන්වා ඇති අන්දම, ආනන්ද තෙරුන්, මෙසේ පෙන්වා ඇත: 1) **සිව් ජාන සමාපත්ති ලැබූ පුද්ගලයෝ**: මේ සසුනේ මහණ, පළමු...දෙවෙනි...තෙවෙනි... සිව්වෙනි ජාන සමාපත්තියට පැමිණ, එය නාමකායෙන් ස්පර්ශ කර වාසය කරයි. මෙලෙසින් භාග්‍යවතුන් වහන්සේ විසින් පර්යායෙන් (කාලීන ලෙසින්) කායසක්ඛි පුද්ගලයා හඳුන්වා ඇත. (Here, friend, secluded from

sensual pleasures … a bhikkhu enters and dwells in the first jhāna …fourth jhāna… He dwells having contacted that base with the body in whatever way [it is attained].To this extent the Blessed One has spoken of a body witness in a provisional sense) **2) සිව් අරූපසමාපත්ති ලැබූ පුද්ගලයෝ:** මේ සසුනේ මහණ: ආකාසාන ඤ්චායතන ... විඤ්ඤානඤ්චායතනය ...ආකිඤ්චඤ්ඤායතනය... නෙවසඤ්ඤානාසඤ්ඤායතනය යන අරූප සමාපත්තියට පැමිණ, එය නාමකායෙන් ස්පර්ශ කර වාසය කරයි. මෙලෙසින් භාග්‍යවතුන් වහන්සේ විසින් පර්යායෙන් (කාලීන ලෙසින්) කායසක්ඛි පුද්ගලයා හඳුන්වා ඇත. **සටහන**: පර්යායෙන් (කාලීන ලෙසින්) කායසක්ඛි පුද්ගලයා හඳුන්වා ඇත්තේ, ඔහු එතෙක් අරහත්වයට නොපැමිණි නිසාය. **මූලාශ්‍ර**:අංගු.නි: (5) : 9 නිපාත: 9.1.5.2 කායසක්ඛි සූත්‍රය, පි. 557, EAN:9: 43.2 Body Witness, p. 484.

▲**කාය සංඛාර** -bodily formations : කාය සංඛාර යනු ත්‍රිවිධ සංඛාර (කාය වචී මනෝ) වලින් එකකි; කයෙන් කරන කටයතු නිසා ඇතිවන කුසල හෝ අකුසල චේතනාය. **බලන්න**: සංඛාර.

▲**කාය සංඛාර පස්සද්දිය:** පාලි: **පස්සද්ධකායසඞ්ඛාරො**-tranquilization of bodily activity : සිව්වෙනි ජාන සමාපත්තිය ලබා කය සංසුන්විම, කාය සංඛාර පස්සද්දිය ලෙසින් පෙන්වා ඇත. එම තත්වය ලබන ආරියයෝ,ආරිය වාසස්ථාන හිමි කරගනී.**බලන්න**:ආරියවාසස්ථාන

▼ **සුඛ හා දුක් වේදනා පහකර**, සොම්නස හා දොම්නස නොමැතිව, දුකනැති, සුඛ නැති, උපේක්ඛාවෙන් පිරිසුදුවූ සිත ඇති, සිව්වෙනි ජානය ඇතිව සිටීම කාය සංඛාර පස්සදිය යයි බුදුන් වහන්සේ පෙන්වා ඇත: **"කථඤ්ච භික්ඛවෙ, භික්ඛු පස්සද්ධකායසඞ්ඛාරො හොති: ඉධ භික්ඛවෙ භික්ඛු සුඛස්ස ච පහානා දුක්ඛස්ස ච පහානා පුබ්බෙව සොමනස්ස දොමනස්සානං අත්ථඞ්ගමා අදුක්ඛමසුඛං උපෙක්ඛාසතිපාරිසුද්ධිං චතුත්ථජ්ඣානං උපසම්පජ්ජ විහරති. එවං ඛො භික්ඛවෙ, භික්ඛු පස්සද්ධකායසඞ්ඛාරො හොති"** ( Here, with the abandoning of pleasure and pain, and with the previous passing away of joy and dejection, a bhikkhu enters and dwells in the fourth jhāna, neither painful nor pleasant, which has purification of mindfulness by equanimity. It is in this way that a bhikkhu has tranquilized bodily activity). **මූලාශ්‍ර**: අංගු.නි: (6):10 නිපාත: 10.1.2.9 පඨමාරියවාස සූත්‍රය, 10.1.2.10 හා දෙවෙනි අරියවාස සූත්‍රය, පි.82-84, EAN:10:19.9 & 20.10 Abodes of the Noble Ones, p. 498-499.

▲ **කාය සංවරය**- Restrain of bodily activities: කාය සංවරය ලෙසින් පෙන්වා ඇත්තේ කය පදනම් කරගෙන කරන ක්‍රියා-කටයුතු යහපත් ලෙසින් කිරීමය. ආධ්‍යාත්මික මාර්ගය දියුණු කරගැනීමට උපකාරීවේ. **බලන්න**: ඉන්ද්‍රිය සංවර, තුන්දොර.

▲ **කාය සුචරිතක්‍රියා හා කාය දුශ්චරිත ක්‍රියා-** Bodily Good conduct & Miscondut: කාය සුචරිතක්‍රියා: කය ඇසුරුකොට කරන යහපත් කුසල ක්‍රියාය. කාය දුශ්චරිතක්‍රියා: කය ඇසුරුකොට කරන අයහපත් අකුසල ක්‍රියාය. **විස්තර පිණිස බලන්න**: සුචරිතක්‍රියා හා දුශ්චරිත ක්‍රියා.

▲ **කායානුපස්සනාව**- Kayanupassana: කායානුපස්සනාව යනු කය පිලිබඳව සිහිය පවත්වා ගැනීමය, අනුසති භාවනාවකි. සතර සතිපට්ඨාන

සූත්‍රයේ මේ ගැන විස්තර දක්වා ඇත. **බලන්න:** භාවනා, ඉරියාපථ.
▲ **කයේ ගිලන්බව-** affliction of the body: බුදුන් වහන්සේ කය පිළිබඳව මෙසේ වදාළහ: " මේ කය ලෙඩදුක් සහිතය, සියුම් සිවියකින් වැසී ඇති නිසා බිත්තරයක් මෙන් දුබලය- වහා බිඳීයන සුළුය. එවැනි කයක් ඇතිවිට, තම කය නිරෝගී යයි මොහොතකට හෝ කෙනෙක් සිතන්නේනම් එය අනුවණ කමකි. එමනිසා, නුවණැති පුද්ගලයා මෙසේ හික්මිය යුතුය: ' **මගේ කය ගිලන්වුවද, මම මගේ සිත ගිලන් නොකර ගනිමි'** ". **" ...ආතුරො හයං ගහපති කායො, අණ්ඩභූතො පරියොනද්ධො ... ඉමං කායං පරිහරන්තො මුහුත්තම්පි ආරොග්‍යං පටිජානෙය්‍ය කිමඤ්ඤත්‍ර බාලය්‍යා. තස්මාතිහ තෙ ගහපති, එවං සික්ඛිතබ්බං: ආතුරකායස්ස මෙ සතො චිත්තං අනාතුරං භවිස්සතීති" සටහන්:** * බුදුන් වහන්සේ මේ අවවාදය වදාළේ නකුලපිතා උපාසකටය. ** කය ගිලන්වුවත් සිත ගිලන් නොකරගන්නා විධිය පිණිස **බලන්න**: සිත ගිලන් නොකරගැනීම. ** නකුලපිතා උපසක, බුදුන් වහන්සේගේ අග්‍රතම උපාසකයෙකි. **බලන්න**: උපග්‍රන්ථය:3. **මූලාශ්‍ර:** සංයු.නි: (3): ඛන්ධ සංයුත්ත: 1.1.1.1. නකුල පිතු සූත්‍රය, පි 30, ESN:22: Khandasamyutta: 1.1 nakulapita, p. 1007.
▲**කයේ ස්වභාවය-** Nature of the body: කය යානයක් වැනිය: සක් 4 ක් ඇත, දොරවල් 9 කි, අශුචියෙන් පිරිඇත, ලෝභයෙන් යුක්තය, මඩ වලක උපත ලබා ඇත, එවන් කයකින් මිදෙන්නේ කෙසේද? යයි දෙවියෙක්, බුදුන් වහන්සේ විමසුහ. බුදුන්වන්සේ මෙසේ වදාළහ: **" ශරීරයානයේ රැහැන හා වරපට ගලවා, ලාමක ආසාව හා ලෝභය සිඳ දමා, තණ්හාව සහමුලින්ම උදුරාදැමීමෙන්, කයෙන් නිදහස්විය හැකිවේ". සටහන:** * අටුවාවට අනුව **සක් 4** යනු කය හැසිරෙන ආකාර 4: ඇවිදීම, සිටගැනීම, හිඳගැනීම හා ඇලවීසිටීම. **නව දොර**: කයේ වැගිරීම් ඇති දොරටු 9 -ඇස් 2, කන් 2, නාස්පුඩු 2, කට, ලිංගය, මල මාර්ගය, **අශුචි**: 32ක්වූ කාය කොටස්, **මඩවල**: ගර්භාසය, ලෝභයෙන් බැඳී ඇත යනු තණ්හාවෙන් කය බැඳගැනීමය. ** **රැහැන**: වෛරය, **වරපට**: ඉතිරි කෙලෙස්ය, පාපික- **ලාමක ආසාව**: නැතිගුණ පෙන්වීමට ඇති ආසාව, **ලෝභය:** අවිජ්ජාව පදනම් කරගත් තද ආසාවය .**බලන්න:** ESN: notes 55 & 56, p. 509. **බලන්න**: යානය උපමාව-උපග්‍රන්ථය 5. **සටහන:** ඛු.නි:සුත්තනිපාත: උරගවග්ග:1-11 විජය සූත්‍රය, පි.80 දී කය පිලිබඳ මේ සමාන විස්තරයක් දක්වා ඇත. **මූලාශ්‍ර**:සංයු.නි: (1 ): දේවතාසංයුත්ත: 1.3.9 චතුචක්ක සූත්‍රය, පි. 56, ESN: 1: Devatasamyutta: 29.9 Four Wheels, p. 91.
▲ **කායික ශක්තිය**-Body energy: කය යහපත් ලෙසින් පවත්වා ගැනීමෙන් කායික ශක්තිය ඇතිවේ. මෙය ආධ්‍යාත්මික මග වඩාගැනීමට උපකාරී කරුණකි. **බලන්න**:ශක්තිය.
▲ **කායික සුඛ-**Bodily joy: කායික සුඛ ලෙසින් පෙන්වා ඇත්තේ කය නිසා ලබන සුවයය, මෙය හීනය, පහත්ය, මානසික සුඛය අග්‍රය. **බලන්න:**සුඛය.
▲ **ක්‍රියාවාදය හා අක්‍රියාවාදය:** පාලි: **කිරියවාදී, අකිරියවාදී**-doctrine of deeds & doctrine of non-doing.: ක්‍රියාවාදයය හා අක්‍රියවාදයය, බුදුන් වහන්සේ වැඩසිටි කාලයේ පැවති මතයකි, දිට්ඨියකි. එක් සමයක, බමුණෙක් බුදුන් වහන්සේ ගෙන්, උන්වහන්සේගේ වාදය (පිළිගැනීම) කුමක්ද ? යයි විමසුහ. ඒ අවස්ථාවේ බුදුන් වහන්සේ වදාළේ: "මම ක්‍රියාවාදය හා අක්‍රියාවාදය පිලිගනිමි': **" කිරියාවාදී චාහං බ්‍රාහ්මණ**

**අකිරියාවාදී වාති**" (I assert a doctrine of deeds and a doctrine of non-doing). **ධර්මයට අනුව ක්‍රියාවාදය** යනු: කයෙන්, වචනයෙන් හා සිතින් කරන යහපත් ක්‍රියා, විවිධවූ කුසල ක්‍රියා කිරීමය. **ධර්මයට අනුව අක්‍රියාවාදය** යනු: කයෙන්, වචනයෙන් හා සිතින් අයහපත් ක්‍රියා නොකිරීම, විවිධවූ අකුසල ක්‍රියා නොකිරීමය. **මූලාශ්‍ර:** අංගු.නි: (1): 2 නිපාත: 2.1.4.3 සූත්‍රය, පි. 160, EAN: 2: 34.3 Sutta, p.61.

**කර**

▲**කිර්තිය-** Fame කිර්තිය-යසස, අටලෝදහමකි. ලෝකයා අනුමත කිරීම නිසා කෙනෙක්ගේ කිර්තිය පැතිරේ. එහෙත්, අටලෝදහම අනුව එය වෙනස්වේ. කිර්තිය අයහපත් ලෙසින් ගැනීමෙන් සංඝයා, මාර්ගයට අනතුරු ඇතිකර ගනී. **බලන්න**: ලාභ සත්කාර.

▲ **කර්මන්‍යසිත -**wieldy mind : ජාන අවස්ථාවන්හිදී සිත පිවිතුරුව මුදුබවට පත්වීම නිසා සිත කර්මන්‍යබවට පත්වේ. එනම්, යෝගියාට කැමති පරිදි සිත හික්මවා ගැනීමට හැකිවීමය. එසේ සිත කර්මන්‍යවූ විට ත්‍රිවිධ ඥාණ-තෙවිජ්ජා ලබාගැනීමට සිත මෙහෙයවූ බව බුදුන් වහන්සේ පෙන්වා ඇත. **බලන්න**: අංගු.නි: (5): 8 නිපාත: වෙරඤ්ජසූත්‍රය, සිව්ජාන, සමාධිය. **මූලාශ්‍ර:** අංගු.නි: (1): 1 නිපාත: අකර්මන්‍ය වග්ග:සූත්‍ර, පි. 48, EAN: 1: III Unwieldy: 21.1 Sutta, p. 37.

▲ **කරුණාව:** පාලි: **කරුණා-** Compassion: කරුණාව (දයාව) යනු සියලු ලෝක සත්ත්‍වයන් ගේ දුක පිළිබඳව සිතේ ඇති අනුකම්පාවය-සහකම්පනය. කරුණාවෙන් ජිවත්වීමෙන්, හිංසාකාරී සිතුවිලි ඇති නොවේ. එම ගුණය ආධ්‍යාත්මික වර්ධනය පිණිස අවශ්‍යම සාධකයක් වේ. කරුණාව, බ්‍රහ්මවිහාර වලින් එකකි, භාවනා අරමුණකි. බුදුන් වහන්සේ "**මහා කාරුණිකයන් වහන්සේ**" ලෙසින් හඳුන්වන්නේ, සියලු ලෝක සත්ත්‍වයා කෙරෙහි උන්වහන්සේ තුල ඇති අසීමිත දයාව නිසාය, එය බුදුවරුන්ට පමණක් ඇති විශේෂ ගුණයකි. **බලන්න**: බ්‍රහ්මවිහාර. **ශබ්දකෝෂ: පා.සිං.ශ:** පි. 245: "**කරුණා**: දයාව, අනුන්ගේ දුකෙහි හිත කම්පාවීම". **B.D**: p. 80: "**Karuṇā**: Compassion is one of the 4 sublime abodes- brahma-vihāra"

▼ **විහිංසාවෙන්** (අනුන්ට හිංසා කිරීම) මිදීමට කරුණාව වඩා ගත යුතුවේ. **බලන්න**: සල්ලේඛ පරියාය. **මූලාශ්‍ර:** අංගු.නි: (4 ): 6 නිපාතය: 6.1.2.3 නිස්සාරණිය සූත්‍රය, පි. 40, EAN:6: 13.3 Escape, p. 321.

▲ **කරුණා චේතෝ විමුක්තිය:** පාලි: **කරුණා චෙතොවිමුත්ති-** liberation of the mind by compassion : කරුණා චේතෝ විමුක්තිය ලෙසින් පෙන්වා ඇත්තේ කරුණා භාවනාව වර්ධනය කර ගැනීමෙන් සිත විහිංසාවෙන් (හිංසා කිරීමෙන්) මුදවා ගැනීමය. මේ විමුක්තිය කරුණා නිස්සාරණිය ධාතුව ලෙසින්ද පෙන්වා ඇත. **බලන්න**: බ්‍රහ්ම විහාර, නිස්සාරණිය ධාතු. **සටහන:** විස්තර පිණිස **බලන්න:** සිංහල විසුද්ධි මාර්ගය, 3 පරිච්ඡේදය.

▲ **කුරු ජනපදය-**Kuru janapadaya: බුදුන් වහන්සේ වැඩසිටි සමයේ උතුරු භාරතයේ පිහිටි සාරවත් ප්‍රදේශය මෙ නමින් හඳුන්වා ඇත. සතර සති පට්ඨාන සූත්‍රය දේශනා කළේ මෙහිදීය. මාගන්දිය, රට්ඨපාල ආදී බුදුන් වහන්සේගේ ශ්‍රාවක සංඝයා ගෙ උත්පත්ති භූමිය මෙ ජනපදයය. බුදුන් වහන්සේ කුරු ජනපදයේ චාරිකාවක යෙදන අවස්ථාවේ මාගන්දිය බ්‍රාහ්මණ හා බ්‍රාහ්මණිය, එතුමන් හමුව, බුදුන් සරණ ගිය උපාසකයන්විය. **බලන්න:** සති පට්ඨාන සූත්‍රය, උපග්‍රන්ථය:1,3.

▲ **කුරරඝරවැසිකාලි උපාසිකා-**Kuraraghara Kali upasika:බලන්න: උපග්‍රන්ථය: 3

▲ **කොරක්ඛත්තිය නිරුවත් තවුසා-**Korakkhathtiya naked ascetic බලුව්‍රතය-බල්ලෙක් ලෙසින් වාසය කල මේ තවුසා, මියයෑමෙන් පසු කාලකඤ්ජ නම් අසුර නිකායේ උපත ලැබූබව මෙහි පෙන්වා ඇත. **මූලාශ්‍ර:** දීඝ.නි: (3 ): පාථික සූත්‍රය, 8 ඡේදය, පි. 26 , EDN: 24 Pāṭika Sutta, section 1.7, p. 287.

**කල**

▲**කල්‍යාන කථා-** Kalyana speech: කල්‍යාන කථා, යහපත් මිත්‍රශීලි, අන්‍යයන්ට ප්‍රිය ඇතිකර කථාය. බුදුන් වහන්සේගේ සසුනේ, සෝණකුටිකන්න තෙරුන් කලනබස් තෙපලන භික්ෂූන් අතර අග්‍රවූහ. **බලන්න:**උපග්‍රන්ථය: 1

▲**කල්‍යාන කම්ම-** Kalyana kamma: මෙ කම්ම ඇතිවීමට බලපාන කරුණු: අලෝභය, අදෝෂය , අමෝහය යෝනිසෝමනසිකාරය, සති සම්ප්‍රජන්‍යය.**බලන්න**: කම්ම විවිධාකාරය.

▲**කල්‍යාණධර්මය-** Kalyana Dhamma : කල්‍යාණධර්මය නම් දස කුසලයය, සම්මාදිට්ඨිය... සම්මා විමුක්තිය ඇතුළු දස අංග -නිවැරදි මග අනුගමනය කිරීමය. කල්‍යාණධම්මතරයා නම් තමන් නිවරදි ධර්ම කරමින් අනුන්ටද ඒවා කිරීමට අනුබල දෙන පුද්ගලයාය.**බලන්න:** දසකුසලය. **මූලාශ්‍රය:** අංගු.නි: (2) 4 නිපාත: කල්‍යාණධර්ම සූත්‍ර 2කි, පි.448.

▼**කල්‍යාණධර්මය** ඇති භික්ෂුව ගැන බුදුන් වහන්සේ මෙසේ වදාළහ: "කල්‍යාණධර්මය (කලණ දහම්) ඇති මහණ කෙබඳු වේද? ...හෙතෙම, බෝධිපාක්ෂික ධර්මයන් පිලිබඳ භාවනායෝගීව වාසය කරයි... ආර්යමාර්ග ඥානයට පමුණුවන බෝධි බෝධිපාක්ෂික ධර්මයන් වඩනලද, රාග ආදී කෙළෙස් රහිතවූ ඔහුට කල්‍යාණධර්මය ඇත..." **සටහන**: මෙයින් දක්වා ඇත්තේ රහතන්වහන්සේය. **මූලාශ්‍ර**:බු.නි: ඉතිවුත්තකපාලිය: 3.5.8 කල්‍යාණශිල සූත්‍රය, පි. 478.

▲**කල්‍යාණප්‍ර ඥාව-** Good wisdom : කල්‍යාණප්‍රඥාව- උතුම් ප්‍රඥාවය, රහතන්වහන්සේ සතු ප්‍රඥාවය. බුදුන් වහන්සේ මෙසේ වදාළහ: "කල්‍යාණප්‍රඥාව ඇත්තේ කෙබඳු වේද? ... මහණ තෙමේ ආසවයන් ක්ෂය කිරීමෙන් ආසව රහිත වූ ඵලසමාධියත්, ඵලප්‍රඥාවත් මේ අත්බවෙහිම, විශිෂ්ඨ ඥානයෙන් දැන ප්‍රත්‍යක්ෂ කොට වාසය කරයි... ඔහු මේ අත්බවයේදීම දුකනැතිකිරීම මැනවින් දනී, ආසව රහිතවූ ඔහුට කල්‍යාණප්‍රඥාව ඇත". **මූලාශ්‍ර**:බු.නි: ඉතිවුත්තකපාලිය: 3.5.8 කල්‍යාණශිල සූත්‍රය, පි. 478.

▲**කල්‍යාණ මිත්‍ර සේවනය**: පාලි: **කල්‍යාණමිත්තො-** good friendship ධර්ම යට අනුව කල්‍යාණ මිත්‍රයා- කලනමිතුරු යනු ධර්මානුකූල ජීවිතයක් ගත කරන යහපත් පුද්ගලයා ය. ඔහු තමන් සමග සිටින සෙසු අය, ධර්ම මාර්ගයේ ගමන් කරවීමට උනන්දු කරයි, උපකාර කරයි. සත්පුරුෂයන් ලෙසින්ද ඔවුන් හඳුන්වයි. එවැනි කල්‍යාණ මිත්‍රයන් සේවනය කිරීම යහපත්වේ. **සටහන්**: * විස්තර පිණිස **බලන්න:** අංගු.නි:1 නිපාත: කල්‍යානමිත්‍රවග්ග. ** කල්‍යාන මිත්‍රයන් ලබා ගැනීම ලෝකයේ දුර්ලභ ධර්මයකි. දෙපිටකාවටුබව- ඍජු නැතිබව කලන මිතුරන්

ලබාගැනීමට බාධාවකි. **බලන්න**: ඉෂ්ඨධම්ම. ** කලනමිතුරු සේවනය නිසා අයහපත් ගුණ නැතිකර ගත හැකිවේ. **බලන්න**: අවදඤ්ඤුතාවය. ** සේඛ පුහුණුව සාර්ථක කරගැනීමට කලනමිතුරන් සිටීම උපකාරයකි. **බලන්න:** සේඛ. ආරියඅටමග දියුණු කරගැනීමට කලන මිතුරු සේවනය අවශ්‍යතාවයකි. **බලන්න:**ආරියඅටමග. ** අශ්‍රද්ධාව පහකරගැනීමට කලනමිතුරු සේවනය උපකාරිවේ. **බලන්න:** අශ්‍රද්ධාව **මූලාශ්‍රය**: අංගු.නි: (6) 10 නිපාත:10.2.8.3 ඉෂ්ඨධම්ම සූත්‍රය, පි.270,EAN:10: 73.3 Wished for, p.522.

▼ **කලණ මිතුරු සේවනය නිසා ධර්ම මාර්ගය වැඩේ**: කලණ මිත්‍රයන් සේවනය කිරීම නිසා කෙනකුට තෙරුවන් පිලිබඳ ඇති අශ්‍රද්ධාව, ත්‍යාගශීලි නැති බව (අවදඤ්ඤුතාවය un-charitableness) හා කුසිතබව- අලසකම පහකරගත හැකිය. **මූලාශ්‍ර**: අංගු.නි: (6):10 නිපාත: 10.2.3.6 තයෝධම්ම සූත්‍රය,පි.284, EAN:10: Tens,76-6.Incapable, p. 524.

▼ **කලණ මිතුරු සේවනය නිසා සද්ධර්මය ඇසීමට හැකිවේ**: යම් කෙනකුට සද්ධර්මය ඇසීමට ඉඩ ලැබෙන්නේ, ධර්මය අනුගමනය කරණ යහපත් මිතුරන් ඇති විටය. අවිජ්ජාව නැතිවී විජ්ජාව ඇතිවීමට, ආධ්‍යාත්මික මග සාර්ථක කර ගැනීමට කලණ මිතරු සේවනය මූලිකවේ. **"...ඉති ඛො භික්ඛවෙ සප්පුරිසංසෙවො පරිපූරො සදධම්ම සවනං පරිපූරෙති"**. කලණ මිතුරු සේවනය- සත්පුරුෂ ආශ්‍රය නිසා සද්ධර්මය ශ්‍රවනය පෝෂණය වේ. **මූලාශ්‍ර**:අංගු.නි: (6): 10 නිපාත: යමක වග්ග: 10.2.2.1 අවිද්‍යා සූත්‍රය, පි.232, EAN:10: II Pairs: 61.1.Ignorance, p. 517.

▼ **කලන මිතුරු සේවනය** ආධ්‍යාත්මික මාර්ගයට විශේෂත්වයක් ගෙන දෙන ධර්මයකි: **බලන්න:** විශේෂභාගිය ධර්ම. **මූලාශ්‍ර:**දීඝ.නි : (3 ): 11 දසුත්තර සූත්‍රය, පි. 483, EDN: 34: Dasuttara Sutta: Expanding Decades, p. 384.

▼ **මුළු බඹසර ජීවිතය ගෙනයාමට කලණ මිතුරු සේවනය අවශ්‍යමය** එක්සමයක, ආනන්ද තෙරුන් විසින්, කලණ මිතුරු සේවනය බඹසර ජීවිතයේ හරි අඩක්ය යි පැවසූ විට බුදුන් වහන්සේ වදාළේ, එසේ නො පැවසිය යුතුබවය. කලණ මිතුරු සේවනය- මුළු බඹසර ජීවිතයම පිණිස පවතින බවය: **"...මා හෙවං ආනන්‍ද...සකලමෙව හිදං ආනන්‍ද, බ්‍රහ්මචරියං යදිදං කල්‍යාණමිත්තතා කල්‍යාණසහායතා කල්‍යාණසම්පවඞ්කතා..."** (...Not so, Ānanda! This is the entire holy life, Ānanda, that is, good friendship, good companionship, good comradeship...) බුදුන් වහන්සේ මෙසේද වදාළහ: "...ආනන්ද, කලණ මිත්‍රවූ මා කරා පැමිණීමෙන් උපත... ජරාව... මරණය... ශෝකය ... පරිදේවය...දුක් දොම්නස් ස්වභාව කොට ඇති සත්ත්‍වයෝ ...ඒවායින් මිදේ" ඒ අනුව කලණ මිතුරු සේවනය මුළු මග බඹසර ජීවිතය වේ. **සටහන:** සංයු. නි.(5-1) මග්ගසංයුත්ත:සාරිපුත්‍ර සූත්‍රයේ දී සැරියුත් මහා තෙරුන් විසින්: මුළු බඹසර ජීවිතය පිණිස කලණ මිතුරු සේවනය අවශ්‍යබව පැවසූ විට බුදුන් වහන්සේ එම ප්‍රකාශය අනුමත කර ඇත. **බලන්න**: බ්‍රහ්මචරියාව. **මූලාශ්‍ර:** සංයු.නි: (5-1): මහාවග්ග: මග්ගසංයුත්ත: 1.1.2 උපඩ්ඪ සූත්‍රය හා 1.1.3 සාරිපුත්‍ර සූත්‍රය, පි.32, ESN: 45: Magga samyutta: 2.2 Half the Holy life, p. 1604 & 3.3 Sariputta, p. 1604.

▼ **ස්වාක්ඛාත ධර්මය කලණ මිත්‍රයන් පිණිසය**: බුදුන් වහන්සේ යහපත් ලෙසින් වදාළ ධර්මය, කලණ මිතුරන් ඇති අයටය, පව්ටු මිතුරන් ඇති අයට නොවේ යයි පසේනදී කොසොල් රජතුමා ගේ ප්‍රකාශය අනුමත කළ බුදුන් වහන්සේ මෙසේ වදාළහ: **"මහරජ, මා විසින් වදාළ ධර්මය ස්වාක්ඛාතය. එය කලණ මිතුරන්, යහළුවන් ඇති අයටය, කලණයන් කෙරෙහි නැමුණු අයටය. පව්ටු මිතුරන් සේවනය කරන අයට නොවේ"** **මූලාශ්‍ර**: සංයු.නි: (1):සගාථවග්ග: කෝසලසංයුත්ත, 3.2.8 කල්‍යාණ මිත්‍ර සූත්‍රය, පි.186, ESN: 3: Kosalasmayutta: 18.8 Diligence -2, p. 242.
▼ **බුදුන් වහන්සේ** කල්‍යාන මිත්‍ර සේවනය පිළිබඳව යහපත් ලෙසින් වදාරා ඇත. ඒ ධර්මය සංඝයා එක්ව, ධර්මයේ චිරස්ථිතිය පිණිස සජ්ජායනා කිරීම සුදුසු යයි සැරියුත් මහා තෙරුන් සංඝයාට උපදෙස් දී ඇත. **මූලාශ්‍ර**: දිඝ.නි: (3 ):10 සංගිති සූත්‍රය, පි. 372, 11 දසුත්තර සූත්‍රය, පි. 483, EDN: 33 Saṅgīti Sutta: The Chanting Together, p. 362 & Dasuttara Sutta: Expanding Decades, p. 384.

▲**කල්‍යාණශීලය-** Good virtue: කල්‍යාණ ශීලය ලෙසින් පෙන්වා ඇත්තේ රහතන්වහන්සේ සතු උතුම් පිරිසිදු ශීලයටය. බුදුන් වහන්සේ මෙසේ වදාළහ: " කෙසේ නම් මහණ කල්‍යාණශීලය (කලණ සිල්) ඇත්තේවේද? ...මෙතෙම සිල්වත් වූයේ, ප්‍රාතිමොක්ෂසංවරයෙන් යුක්තව වාසය කරයි, ආචාරයෙන් හා ගොචරයෙන් යුක්තව අනුප්‍රමාණ වූ ද වරදෙහි භය දක්නා සුලුය, ශික්ෂාපදයන්හි මනාකොට සමාදන්ව හික්මී වාසය කරයි...ඔහුට කයින් හෝ වචනයෙන් හෝ මනසින් වන අකුශලයක් නැත, හිරිඔතප්ප ඇත, ඔහු ඒකාන්තයෙන්ම කලණ සිල් ඇත්තේය...". **බලන්න**: ශීලසම්පන්න. **මූලාශ්‍ර**:ඛු.නි: ඉතිවුත්තකපාලිය: 3.5.8 කල්‍යාණශීල සූත්‍රය, පි. 478.

▲ **කලය-** the pot: පුද්ගලයන් දහම අසන ආකාරයේ විවිධ බව පෙන්වීම ට කලය උපමා කරගෙන ඇත. 1) අවකුජ්ජ පඤ්ඤා-යටිකුරු ප්‍රඥාව Inverted wisdom ඇති අය දහම ඇසුවද, කරුණු සිතේ නො පිහිටයි. එය හරියට කලයකට වතුර පුරවා, එය මුණින් නමා හිස්කරන ලෙසය. 2) විපුල ප්‍රඥාව ඇති අය -පුථුපඤ්ඤා- wide wisdom: යහපත් ධර්මය මැනවින් අවබෝධ කරගනි**.** උඩුකුරුව තැබූ කලයකට දැමූ වතුර එහි රඳා පවතින ලෙස ඔවුන් ඇසූ දහම මැනවින් සිතේ රැඳී සිටී.බලන්න: කල උපමා-උපග්‍රන්ථය:5 **මූලාශ්‍ර:**අංගු.නි: (1): 3 නිපාත: 3.1.3.10 සූත්‍රය, පි. 277, EAN: 3: 30.10 sutta, p. 88.
▲**කලහ විවාද-** Disputes & Debates: තම මතය පමණක් ඇතිව සෙසු අයගේ මත ඉවතට දැමීම කලහ විවාද ඇතිවීමට හේතුවේ. කැමති අකමැති දේ ගැන විතර්ක කිරීම කලහ විවාද වලට හේතුවන බව ම.නි. මධුපිණ්ඩික සූත්‍රයේ පෙන්වා ඇත.
▼ **කලහ විවාද** ප්‍රිය වස්තූන් නිසා උපදී, මසුරුකම නිසා ඇතිවේ, කේලාම්කීම- පිසුනුබස් නිසා ඇතිවේ. **මූලාශ්‍ර:** ඛු.නි: සුත්තනිපාත: අට්ඨකවග්ග**:** 4-11 කලහවිවාද සූත්‍රය, පි.292.
▼**ලෝක සත්ත්වයෝ** අසමගියෙන්- විවාද කරමින් ජීවත්වීමට හේතු මසුරුබව හා ඉරිසියාව යයි මේ සූත්‍ර යේ පෙන්වා ඇත. **මූලාශ්‍ර**: දීඝ.නි: (2): සක්කපඤ්හ සූත්‍රය- ඡේදය 12, පි. 430, EDN: 21: Sakkapanha Sutta- Sakka's questions, section 2.1 , p. 241.
▼ **කලහයට පෙර,** විවාද ඇතිවේ. සියලු දෙනා එකිනෙකා හා විවාද කර,

අනතුරුව කලහ, සංඩු කරගන්නා ආකාරය මෙහිදී විස්තරාත්මකව පෙන්වා ඇත. **මූලාශ්‍ර**: ඛු.නි: මහානිද්දේසපාලි: කලහවිවාද සුත්ත නිද්දේස:පි. 369.

▲**කලිඞග**-Block of wood: කලිඞග- දැව කොටයක්-ශක්තිමත් ලි කොටයක් උපමා කරගනිමින් බුදුන් වහන්සේ පෙන්වා ඇත්තේ සංඝයාගේ වීරිය ය. බුදුන් වහන්සේ වැඩවසන සමයේ සංඝයා, දැව කොටයක් මෙන් සවිමත්ව ප්‍රධන් වීරිය කිරීම නිසා, මාරයාහට ඔවුන් තම වසඟයට ගැනීමට නොහැකිය. එහෙත්, අනාගතයේ, සංඝයා ගේ ප්‍රධන් වීරිය අඩුය, ඔවුන් හිරු උදාවනතෙක් සයනය කරයි. එවිට, මාරයාහට පහසුවෙන් ඔවුන් වසඟ කරගත හැකිවේ. **බලන්න**: උපග්‍රන්ථය:5. **සටහන**: සවිමත් දැව කොටයක සිදුරු නැත. එලෙස සවිමත් ලෙසින් සිටීම නම් ප්‍රධන් වීරිය ඇතිව මාර්ගය වඩා ගැනීමය. එම උපමාව යොදාගනිමින් බුදුන් වහන්සේ ලිච්ඡවි රාජකුමාරයන් ගේ පරිහාණිය පෙන්වා ඇත. ඔවුන්, වීරිය ඇතිව කටයුතු කරනතෙක්, අජාසත් රජුට ලිච්ඡවි රාජකුමාරයන් පැරදිය නොහැකිය. එහෙත්, ඔවුන්, අලසව කටයුතුකරනවිට ඔවුන්ගේ පරිහානිය සිදුවේ. මේ පිලිබඳ විස්තර, මහා පරිනිර්වාණ සූත්‍රයේ දක්වා ඇත. **මූලාශ්‍ර**:සංයු.නි: (2) නිදානවග්ග :ඔපම්මසංයුත්ත:8.1.8 කලිඞගරූප සූත්‍රය,පි.436, ESN:20: Opammasamyutta: 8 Blocks of wood, p.915.

▲**කාලකඤ්ජ අසුර නිකාය-** Kalakanna Asura: යළිඋපත ලබන දුගතියකි. **බලන්න**: අසුර.

▲ **කාලදාන-** Timely gifts: කාලදාන ලෙසින් පෙන්වා ඇත්තේ සුදුසු කාලයේදි දන්දීමය. බුදුන් වහන්සේ කාලදාන 5 ක් පෙන්වා ඇත: 1) ආගන්තුකයෙකුට දීම 2) ගමනක් යෑමට පිටත්වෙන කෙනෙකුට දීම 3) රෝගියෙකුට දීම 4) සාගත කාලයේදී දීම 5) තමන්ගේ වතු පිටි වලින් ලැබුන අලුත් අස්වැන්න ශිල්වත් උතුමන්ට පිරිනැමීම. මසුරුබව නැති කරගෙන, නුවණැති මිනිසුන් දෙන එවැනි දානයන්හි එල, මෙලොව හා පරලොව සැප පිණිස වේ. පහන්සිතින් ආරිය උතුමන්ට දෙන දානය බොහෝ පින් සහිතවේ. **මූලාශ්‍ර**:අංගු.නි: (3):5 නිපාත: 5.1.4.6 කාලදාන සූත්‍රය,පි.84,EAN:5: 36.6 Timely, p. 249.

▲ **කාලය-** Time: කාලය ලෙසින් පෙන්වා ඇත්තේ ධර්මයේ නිරත වීමට අවස්ථාව ලැබීමය. **බලන්න**: අක්‍ෂණය හා ක්‍ෂණය.

▲ **කාලපරියන්ත සීලය-**Kalapariyantha sila: පොහෝදිනයේ රකින අටසිල් මෙන් කාලසීමාවක් ඇතිව රකින සීලය මින් අදහස්වේ. **බලන්න:** ශිලය. **සටහන**: විස්තර පිණිස බලන්න**:** විසුද්ධිමාර්ගය, පරිච්ඡේදය1.

▲ **කාල සීමා-** Time periods: කාල සීමා යනු අතීත, අනාගත හා වර්තමාන කාලයන්ය. **බලන්න**: අද්ධව

▲ **කල්පවිනාශය හා කල්ප ඇතිවීම-** Dissolving of an eon & Evolving of an eon: කල්පය යනු ලෝක ඇතිවී නැතිවී යන, මැනීමට නොහැකි දීර්ඝ කාලපරිච්ඡේදයක්ය. බ්‍රහ්මලෝක දෙවිවරුන්ගේ ආයුෂ මහාකල්ප ගණන්ය. **බලන්න**: බ්‍රහ්මලෝක. **කල්ප විනාශය හා කල්ප ඇතිවීම-** Dissolving of an eon & Evolving of an eon ලෙසින් පෙන්වා ඇත්තේ ගිණිය නොහැකි, මැනිය නොහැකි කාලයක් තුල ලෝකය නැතිවී- සංකෝචන වියාම හා ඇතිවී- ප්‍රසාරණය වියාමය්. එම කාල සිමා ගිණිය නොහැකි, මැනිය නොහැකි නිසා ඒවා අසඞඛයා

කාල ( incalculable time) ලෙසින්හඳුන්වයි. **සටහන: *** අටුවාවට අනුව : කල්ප විනාශය සිදුවන්නේ ජලය, ගින්න, සුළං මගින්ය. කල්පයක් ගින්නෙන් විනාශවනවිට එම ගින්න ආභස්සර දේවලෝකය තෙක් පැතිරේ; කල්පයක් ජලයෙන් විනාශවනවිට එම ගින්න සුභකින්න දේවලෝකය තෙක් පැතිරේ; කල්පයක් සුළඟින් විනාශවනවිට එම සුළං වෙහප්ඵල දේවලෝකය තෙක් පැතිරේ. **බලන්න**: EAN: Note: 839, p. 624. ** සංසාරයේ දීර්ඝබව ගැන **බලන්න**: සංයු.නි: අනමතග්ග සංයුත්තය.

▼ **කල්පයක් තුල** සතර අසඬෙඛයයක් ඇතිබව බුදුන් වහන්සේ පෙන්වා ඇත: **1)** කල්පයක් නැතිවී යනවිට, එම කාලසීමාව දස දහස්ගණන් කාලයක් යයි මැනීමට නොහැකිය. **2)** කල්පයක් නැතිවීයන අවස්ථාව තුල එම කාලසීමාව දස දහස්ගණන් කාලයක් යයි මැනීමට නොහැකිය **3)** කල්පයක් ඇතිවනවිට, එම කාලසීමාව දස දහස්ගණන් කාලයක් යයි මැනීමට නොහැකිය **4)** කල්පයක් ඇතිවෙන අවස්ථාව තුල එම කාලසීමාව දස දහස්ගණන් කාලයක් යයි මැනීමට නොහැකිය. **මූලාශ්‍ර:** අංගු.නි: ( 2): 4 නිපාත: 4.4.1.6 අසඬෙඛයය සූත්‍රය, පි. 298, EAN: 4: 156.6 Eon, p. 199.

▼ **කල්පයක දීර්ඝබව** බුදුන් වහන්සේ මේ උපමා වලින් පෙන්වා ඇත: **1)** යොදුනක් උස, දිග හා පළල ඇති ගල්පර්වතයක් ඇත. සෑම වසර 100ක් ගිය විට, පුද්ගලයෙක් පැමිණ ඒ පර්වතය කසිසලුවකින් පිරිමදී. එසේ සෑම සියවසක් ඇවෑමෙන් ඒ මහා පර්වතය ගෙවී අවසන්වේ, එහෙත්, කල්පය අවසන් නොවෙන්නේය. ගල් පර්වත උපමාව. 2) අබඇට ගොඩ උපමාව: යොදුනක් උස, දිග හා පළල ඇති , යකඩ පවුරකින් වටවුන නුවරක් ඇත. එහි, අබ ඇට පුරවා ඇත. සෑම වසර 100ක් ගිය විට, පුද්ගලයෙක් පැමිණ ඒ නුවරින් අබ ඇටයක් ගනී, එසේ සෑම සියවසක් ඇවෑමෙන් ඒ මහා අබඇට ගොඩ අවසන්වේ, එහෙත්, කල්පය අවසන් නොවෙන්නේය.**බලන්න**: උපග්‍රන්ථය:5 **මූලාශ්‍ර:** සංයු.නි: ( 2):නිදානවග්ග: අනමතග්ගසංයුත්ත: 3.1.5 පර්වත සූත්‍රය හා 3.1.6 සාසප සූත්‍රය**,** පි. 302, ESN:15: Anamataggasamyutta: 5.5 The Mountain & 6.6 The Mustard seed, p. 791.

▼ **අතීත බුදුවරු** වැඩ වාසය කල කල්ප ගැන විස්තර පිණිස **බලන්න**: දීඝ.නි: ( 2 ): 1: **මහාපදාන සූත්‍රය,**ඡෙදය18, පි. 18, EDN: 14 Mahâpadāna Sutta: The Great Discourse on the Lineage, p. 151.

▼ **යම්කලක කල්ප (ලෝක) විනාශය** සිදුවනවිට, බොහෝ සත්ත්‍වයෝ ආභස්සර බඹලොව උපත ලබන බව බුදුන් වහන්සේ වදාළහ. **බලන්න**: බ්‍රහ්මලෝක. **මූලාශ්‍ර:** අංගු.නි (6) 10-නිපාත: මහා වග්ග, 10.1.3.9. ප්‍රථම කෝසල සූත්‍රය,පි. 134 , EAN-10: The Great Chapter, 29.9 Kosala-1, p. 505.

▼ **තමන්වහන්සේ** සත්වසක් මෙත්සිත වැඩීමෙන් ලැබූ පුණ්‍ය විපාක ලෙසින්, නැසියන, වැඩෙන කප් සතක් තුල මෙලොව උපතක් නොලබා බ්‍රහ්ම ලෝකවල උපත් ලැබූ බව බුදුන් වහන්සේ මේ සූත්‍රයේ පෙන්වා ඇත. **මූලාශ්‍ර:** අංගු.නි: (4): 7 නිපාත: 7.2.1.9 මාපුඤ්ඤාභායි සූත්‍රය, පි. 432, EAN: 7: 62.9. Donot be afraid of merit, p. 391.

▲ **කොලංකොල**- Kolangkola: කොලංකොල යනු සෝතාපන්න ආරිය

පුද්ගලයා අරහත්වයට පත්වන එක් ආකාරයකි (උත්පත්ති 2-3 අතරදී) . **බලන්න**: සෝතාපන්න.

▲ **කේලාම්කීම-** Divisive speech: කේලාම්කීම - පිසුණාවාචා, පන්සිල් කඩාගැනීමකි.මෙය දස අකුසලයකි, මිථ්‍යා වාචාය. නිරයේ උපතට හේතුවේ. **බලන්න**: පිසුණාවාචා.

▲ **කුලය-**Cast: බුදුන් වහන්සේ වැඩසිටි සමයේ ඉන්දියාවේ ප්‍රධාන කුල ගෝත්‍ර 4 ක් විය. **බලන්න**:ගෝත්‍රය.

▲**කුලපති**-Leader of a clan: කුලපති ලෙසින් මෙහි පෙන්වා ඇත්තේ කුලයක- පවුලක ප්‍රධානියාය, ඔහුට ශ්‍රද්ධාව තිබේනම් ඔහුගේ කුලය ධර්මයේ දියුණුවට පත්වේ. **මූලාශ්‍රය:** අංගු.නි: (3) 5 නිපාත: සුමනාවග්ග: 5.1.4.10 මහාසාල සූත්‍රය, පි.90.

▲**කෝලිත-**Kolitha: මුගලන් මහා තෙරුන්ගේ ගිහිනම, පවුලේ නම කෝලිතය. **බලන්න:** උපග්‍රන්ථය:1

▲ **කල දරනුව-**the Potholder: කළදරනුව නිසා කලය බිමට පතිත නොවේ. එලෙස ආරියඅටමග, සිතට ආධාරයක්ය. **බලන්න:** උප ග්‍රන්ථය:5.

**කළ**

▲**කෙළෙහිගුණ-** Gratitude: කෙළෙහිගුණ යනු කෘතඥබවය**. බලන්න**: අකෘතඥ හා කෘතඥ.

▲ **කෙළෙස්**: පාලි: **කිලෙස-** Defilements: සිත කෙළෙසන - කිලිටි කරන, කයින්, වචනයෙන් හා සිතින් කරන අයහපත් ක්‍රියා කෙළෙස් ය. ලෝභ දෝස හා මෝහය යන අකුසල මුල් කෙළෙස් ඇතිවීමට හේතුවේ. ආධ්‍යාත්මික මග පරිපූර්ණ කර ගැනීමට සියලු කෙළෙස් දුරු කර ගතයුතුවේ. නිකෙළෙස් යනු කෙළෙස් නොමැතිබවය, සිත නිර්මල- පිරිසුදු බවය. '**නිකෙළෙස් මුණි**' යනු බුදුන් වහන්සේ හඳුන්වන පදයකි. **බලන්න**: කුසල අකුසල,සල්ලේඛ පරියාය. **සටහන්**: * දැඩිකෙළෙස්, අංගන ලෙසින් පෙන්වා ඇත, දැඩිකෙළෙස් නොමැති බව අනංගණ**ය. බලන්න**: අංගන හා අනංගණ .** ආතාපි, කෙළෙස් ප්‍රහීණය කරගැනීමට අවශ්‍ය විරියය. **බලන්න:**ආතාපි. * සිතතුල ඇති කෙළෙස් අන්තරාමල ලෙසින් පෙන්වා ඇත**. බලන්න**: අන්තරාමල. ** කෙළෙස් ඇතිවිට ආධ්‍යාත්මික මග බිඳ වැටේ: **බලන්න**: අභබ්බ. ** කෙළෙස් පහවී අරහත්වය ලැබීම ගැන **බලන්න**:අරහත්. ** කෙළෙස් සංසිඳීම උපසමය ය. **බලන්න**: උපසමය, ඉන්ද්‍රිය සම්පන්න. ** සකදාගාමී ආරියෝ යම් පමණකට කෙළෙස් බිඳ ඇත. **බලන්න:** සකදාගාමි.** කෙළෙස්, උපධි 4 න් එකකි. **බලන්න:** උපධි. **ශබ්දකෝෂ: පා.සිං.ශ:** පි. 253: "**කිලෙස:** කෙලෙස්, ලෝභ දෝස හා මෝහය. **කිලෙසකාම**:කෙළෙස් කාමය, වත්ථු කාමය". **B.D**: p. 86: "Kilesa: defilements are mind-defiling, unwholesome qualities…"

▼ **බුදුන් වහන්සේ** වදාළේ සිත ස්වභාවයෙන්ම පිරිසිදු- පබාසර බවය (ප්‍රභාස්වර**-** දීප්තිමත්- luminous). බාහිර කෙළෙස් (රාග, දෝස හා මෝහ) එම සිත කිලිටිවේ. ධර්මය නොදත් පුහුදුන් මිනිසාට කෙළෙස් ගැන අවබෝධයක් නොමැත. එමනිසා, කෙළෙස් පහකර ගැනීමට ඔහුට නොහැකිය. එහෙත්, ධර්මය දන්නා අරිය ශ්‍රාවකයා, කෙළෙස් නිසා සිත අපිරිසිඳුවන බව නුවණින් අවබෝධකර, කෙළෙස් පහකර ගැනීමට

සමත්වේ. **මූලාශ්‍ර**: අං.ගු.නි: (1): 1 නිපාතය:ප්‍රභාස්වර වග්ග සූත්‍ර, පි. 58, EAN: 1: Luminous, p. 39.

▼ **බුදුන් වහන්සේ පහකරගතයුතු කෙළෙස් 44 ක් පෙන්වා ඇත.** **බලන්න** :සල්ලේඛ පරියාය.**මූලාශ්‍ර**: ම.නි. (1)1.1.8 සල්ලේඛ සූත්‍රය, පි. 112, EMN: 8-Effacement, p.108.

▼ **සප්ත බොජ්ඣංග** ධර්ම වැඩීමෙන්, සිත කෙළෙස් වලින් මුදා ගත හැකිවේ. එමගින්, සිත පවිත්‍රවේ, සිත පිරිසිදු වූ විට විජ්ජා විමුත්තිය ලබා ගත හැකිය.**බලන්න**: සප්ත බොජ්ඣංග ධර්ම. **මූලාශ්‍ර**: සං.යු.නි: (5-1): මහාවග්ග: බොජ්ඣංගසංයුත්ත: 2.4.4. අනාවරණ **සූත්‍රය,** පි. 216, ESN: 46: Bojjanghangasamyutta: 34.4. Non- corruptions, p. 1768.

▼**සිත කෙළෙසන ධර්මතා**: **වත්ථුපම සූත්‍රයේ** සිත කෙළෙසන ධර්මතා 17ක් පෙන්වා ඇත: 1) අභිජ්ජා (තණ්හාව-Covetousness) තමාගේ වස්තුගැන ඇති තණ්හාව 2) විෂම ලෝභය (unrighteous greed) අනුන්ගේ වස්තුගැන ඇති ආශාව) 3) ව්‍යාපාදය (ill will) 4)ක්‍රෝධය (තරහ-anger) 5) වෛරය (උපනාහය-එදිරිය- අමනාපය-resentment) 6) ගුණමකුබව (මකඛය- contempt) 7) අහංකාරය-පළාසය- යුගග්‍රාහය-insolence) 8) ඉරිසියාව (envy) 9) මසුරුකම (avarice) 10) මායාව (රැවටිල්ල-deceit) 11) කපටිබව (වංචාව-fraud) 12) මුරණ්ඩුබව (තදබව-ථමහය-හිතුවක්කාර-obstinacy) 13) එකටඑක කිරීම (සාරමහය-තරඟය-rivalry) 14) මානය (conceit) 15) අතිමානය- අධිමානය (arrogance) 16) මදය (මත්වී ම-අහම්මානය-vanity) 17) ප්‍රමාදය (negligence). **මූලාශ්‍ර:**ම.නි: (1):1.1.7. වත්ථුපම සූත්‍රය, පි. 102, EMN:7:Vatthūpama Sutta, p. 102.

▼**සියලු කෙලෙස් මලවලට** වඩා වැඩිම කෙලෙස් මලය අවිද්‍යාවය. අවිද්‍යාව පහකරගත් විට සිත නිමල වේ. රන්කරුවා, රිදියෙ ඇති මල ක්‍රමයෙන් ඉවත්කර ගෙන රන් බවට පත්කරගන්නා ලෙසින්, නුවණැත්තා ක්‍රම ක්‍රමයෙන් කෙළෙස් පහකර ගැනීමට දක්ෂයයි බුදුන් වහන්සේ වදාළහ: **"...අනුපුබ්බෙන මෙධාවී - ථොක ථොකං ඛණේ ඛණේ- කම්මාරෝ රජතස්සෙව -නිද්ධමෙ මල මත්තනො"**. **මූලාශ්‍ර**: ධම්ම පදය, මල වග්ගය, 239, 243 ගාථා.

▼ **රාගය දෝසය හා මෝහය** යන කෙලෙස් මුල් ප්‍රහාණය නොකරන්නේ නම් දුක නැතිකර ගත නොහැකිය, කෙලෙස් නිමා නොවේ. එම කෙළෙස් ප්‍රහීණය කරගැනීමේ මාර්ගය නම් ආරිය අටමග සාක්ෂාත් කරගැනීමය. **මූලාශ්‍ර**: අං.ගු.නි: (1): 3 නිපාත, ආනන්දවග්ග: 3.2.3.1 සූත්‍රය, පි. 420, EAN:3: Ananda vagga, 71.1. Channa, p. 117.

▼**කෙළෙස් ප්‍රහීණය**: කයෙන් පහකළහැකි අකුසල්, වචනයෙන් පහකළහැකි අකුසල්, කයෙන් හා වචනයෙන් නොව ප්‍රඥාවෙන් ප්‍රහිණය කළහැකි අකුසල්: **1 කයෙන් පහකලහැකි වචනයෙන් පහකළ නොහැකි කෙලෙස්**: යම් භික්ෂුවක් අතින් අයහපත් කාය කර්මයක් සිදුවී ඇත. ඒ බව දැනගත්, ඔහුගේ සබ්‍රහමචාරින්, එවැනි අයහපත් කාය කර්ම නැතිකර, යහපත් කාය කර්ම දියුණු කරගන්නා ලෙස ඔහුට අවවාද කරති. එම අවවාද පිළිගත් භික්ෂුව කාය අකුසල අත්හැර කාය කුසල ධර්ම දියණුකරගනී. **2 වචනයෙන් පහකලහැකි කයෙන් පහකළ නොහැකි කෙලෙස්**: යම් භික්ෂුවක් අතින් අයහපත් වචීකර්මයක් සිදුවී ඇත. ඒ බව දැනගත්, ඔහුගේ සබ්‍රහමචාරින්, එවැනි අයහපත් වචී කර්ම

නැතිකර, යහපත් වචී කර්ම දියුණු කරගන්නා ලෙස ඔහුට අවවාද කරති. එම අවවාද පිළිගත් භික්ෂුව වචනයෙන් සිදුවන අකුසල අත්හැර වචනයෙන් සිදුවන කුසල ධර්ම දියුණුකරගනී. **3 කයෙන් හෝ වචනයෙන් පහකල නොහැකි, නිතර නුවණින් විමසමින්, ප්‍රඥාවෙන් පහකළ හැකි කෙලෙස්-මනෝකම්ම:** 1 ලෝභය-තණ්හාව 2 ද්වේශය-වෛරය 3 මෝහය- අවිජ්ජාව 4 ක්‍රෝධය-කිපීම 5 උපනාහසස-එදිරිකිරීම- hostility6 අවමන්කිරීම-ගුණමකාදැමීම-මක්ඛසස-denigration 7 අහංකාරය-පලාසය- insolence 8 මච්චරියසස-මසුරුබව-miserliness 9 පාපික ඊර්ෂ්‍යාව-ඉසසාය-evil envy 10 පාපික ආසාව-මනදොල- evil desire. මේ සියලු කෙලෙස් මැඩ ගැනීමට භික්ෂුව දක්‍ෂ වේනම්, කෙළෙස් වැඩීමක් නොවේ, ප්‍රහිනවීම සිදුවේ. **බලන්න**: ඊර්ෂ්‍යාව, පාපික ආසාව. **මූලාශ්‍ර:**අංගු.නි: (6 ): 10 නිපාත: මහා වග්ග, 10.1.3.3. කාය සූත්‍රය,පි.100, EAN: 10: The Great Chapter, 23.3. Body, p. 500.

▲ **කෙළෙස් කටු**- Keleskatu: රාගය, දෝසය හා මෝහය කෙළෙස්, කටුය, ඒවා ජානසමාපත්ති වලට බාධාකරයි. එමනිසා, කටු රහිතව වාසය කරනලෙස, බුදුන් වහන්සේ සංඝයාට අවවාද වදාළහ. **මූලාශ්‍ර:** අංගු.නි: (6 ) : 10 නිපාත: 10.2.3.2 කණ්ටක සූත්‍රය,පි. 267, EAN:10: 72.2 Thorns, p. 521.

▲ **කෙළෙස් භූමි**- Kelesbhumi: තණ්හාව, අවිද්‍යාව, ලෝභය, ද්වේශය, මෝහය**,** සතර විපර්යාස - විපල්ලාස :සුභ, සුඛ, නිච්ච, අත්ත සඥා යන නව පදයෝ කෙලෙස් භූමි ය". **මූලාශ්‍රය**:ඛු.නි: නෙත්තිප්‍රකරන, පි 26.

▲ **කෙළේස පරිනිබ්බානය -** Keles Parinibbana: කෙළේස පරිනිබ්බානය සිදුවන ආකාර 4 ක් බුදුන් වහන්සේ පෙන්වා ඇත: 1) **මෙලොවදීම සිදුවන සසංඛාර පරිනිබ්බානය:** මේ සසුනේ මහණ කයේ අශුභය පිලිබඳ සංඥාව, ආහාරයේ පිළිකුල් සංඥාව, සියලු ලෝකයේ අනභිරත සංඥාව නුවණින් වඩා, සියලු දේ පිලිබඳ අනිත්‍ය සංඥාව ඇතිව, මරණසංඥාව වඩා ඇත. ඔහු සේඛබල පහ (ශ්‍රද්ධා බලය, හිරිබලය, ඔත්තප්ප බලය, විරියබලය හා ප්‍රඥා බලය) සහිතව වාසය කරයි. ඔහුගේ පංච ඉන්ද්‍රිය ධර්ම අධිකව ඇත, එමනිසා වෙරවඩා ඔහු මෙලොවදීම සසංඛාර පරිනිබ්බානයට පත්වේ (අරහත්වය ලබයි). 2) **කයබිඳී යාමෙන් පසු සිදුවන සසංඛාර පරිනිබ්බානය**: මේ සසුනේ මහණ කයේ අශුභය පිලිබඳ සංඥාව... මරණසංඥාව වඩා ඇත. ඔහු සේඛබල පහ සහිතව වාසය කරයි. ඔහුගේ පංච ඉන්ද්‍රිය ධර්ම අධිකව නැත. එමනිසා ඔහු වෙරවඩා, කය බිඳී යාමෙන් පසුව (මරණයෙන්) සසංඛාර පරිනිබ්බානයට පත්වේ. 3**) මෙලොවදීම සිදුවන අසසංඛාර පරිනිබ්බානය:** මේ සසුනේ මහණ සිව් ජාන සමාපත්ති ලබාගනී. ඔහු සේඛබල පහ සහිතව වාසය කරයි. ඔහුගේ පංච ඉන්ද්‍රිය ධර්ම අධිකව ඇත. එමනිසා ඔහු වෙහෙස නොවී, මේ ජිවිතයේදීම අසසංඛාර පරිනිබ්බානය ලබයි. 4**) කයබිඳී යාමෙන් පසු සිදුවන අසසංඛාර පරිනිබ්බානය**: මේ සසුනේ මහණ සිව් ජාන සමාපත්ති ලබාගනී. ඔහු සේඛබල පහ සහිතව වාසය කරයි. ඔහුගේ පංච ඉන්ද්‍රිය ධර්ම අධිකව නැත. ඔහු වෙහෙස නොවී, කය බිඳී යාමෙන් පසුව අසසංඛාර පරිනිබ්බානය ලබයි. **බලන්න**: අනාගාමී. **මූලාශ්‍ර:** අංගු.නි: ( 2): 4 නිපාත: 4.4.2.9 කෙළෙස පරිනිබ්බාන සූත්‍රය, පි. 322, EAN:4: 169. 9 Through exertion, p. 203.

▲**කැළල**-Blemish: කැළල යනු අපවිත්‍ර-නරක දෙයකි. අහිරික හා අනොත්තප්පය, පුද්ගලයාට කැළැලකි. **බලන්න**: අහිරික හා

අනොත්තප්පය.

**කළු**

▲ **කළුකම්ම-** Dark kamma:කළුකර්ම -පාපී කර්ම අයහපත් අකුසල කර්මයන්ය.**බලන්න**:කම්ම

▲ **කළුධම්ම**- Dark Dhamma: කළුධර්ම -පාපී ධර්ම නම් අහිරිකය හා අනොත්තප්පය. **බලන්න:** අහිරිකය හා අනොත්තප්පය. **මූලාශ්‍ර:**අංගු.නි: (1 ): 2 නිපාත: 2.1.1.7 කණ්හ සූත්‍රය, පි.140, EAN:2 : 7.7 Dark, p. 57.

▲ **කාළුදායි තෙර-**Kaludai Thera: **බලන්න**: උපග්‍රන්ථය:1

**කව**

▲ **කවියෝ-** Poets: කවියෝ යනු ගිපැදි සකස්කරන අයය. මෙහි කවියෝ 4 දෙනක් ගැන පෙන්වා ඇත. **සටහන**: වංගීස තෙරුන්, ධර්මය පිළිබඳව ප්‍රමෝදය දනවන කවි පද සකස් කිරීමේ අග්‍ර බව දැරූහ. **බලන්න:** උප ග්‍රන්ථය:1 **මූලාශ්‍රය:** අංගු.නි: (2) 4 නිපාත: සුචරිතවග්ග: 4.5.3.11 කවිසූත්‍රය, පි.466.

▲ **කෙවඩ්ඩ ගහපති-** Householder Kewadda:**බලන්න:** උප ග්‍රන්ථය:3

**කස**

▲**කස්සක -**Farmer: කස්සක යනු ගොවියාය. මෙහිදී පෙන්වා ඇත්තේ, බුදුන් වහන්සේ ධර්මය දේශනා කරන අවස්ථාවකදී, මාරයා කස්සක-ගොවියෙක්ගේ ස්වරූපය ගෙන බාධා කිරීමට පැමිණීමය. **බලන්න**: මාරයා. **මූලාශ්‍රය:** සංයු.නි: (1): මාරසංයුත්ත:4.2.9 කස්සකසූත්‍රය, පි.236.

▼ **බුදුන් වහන්සේ ගොවියෙක් ලෙසින් දහම වැපිරීම**: තමන් වහන්සේ ගොවියක් ලෙසින් ධර්ම කෙත වපුරා ඇතයයි බුදුන් වහන්සේ මෙහි විස්තර කර ඇත: "කෙතේ වපුරන බිජු නම් ශ්‍රද්ධාවය, වැස්ස නම් තපසය, ප්‍රඥාව වියදණ්ඩ හා නගුලය, හිරිය (ලජ්ජාව) නම් රිටය, සිහිය යොත-නගුල්දත හා කෙවිටය. කාය වචී සුචරිතය ඇතිව, ආහරයේ සංවරය ඇතිව, සත්‍ය නම් අංකුසයෙන් වල් උදුරා දමමි, අරහත්වය මගේ විමුක්තියය ( වියගහෙන් මිදීම). ප්‍රධන් වීරිය (නගුල ඇදගෙන යන) ගොනුන්ය, එය නොනැවතීම නිවනවෙතට ගෙනයයි. එලෙසින් ධර්ම කෙත සානලදී, වපුරන ලදී, ව අස්වැන්න අමත ඵලයය, ඒ සීසෑම සියලු දුකින් මිදීමය".**සටහන්**: * සු.නි: උරගවග්ග: 1-4 කසීභාරද්වාජ සූත්‍රය, පි.42 හි මේ සමාන විස්තරයක් ඇත. ** මේ සූත්‍රය දේශනා කර ඇත්තේ කසීභාරද්වාජ බමුණාටය. **බලන්න:** ගොවියා උපමාව: උපග්‍රන්ථය:5. **මූලාශ්‍රය:**සංයු.නි: (1) බ්‍රාහමණසංයුත්ත: උපාසකවග්ග: 7.2.1 කසීසූත්‍රය: පි.332.

▲**කසිණ-**kasiṇa: කසිණ ලෙසින් හඳුන්වන්නේ යම් මූල ධාතුවක් හෝ වර්ණයක් නිරූපනය කරණ දෙයකටය. භාවනාව පිණිස අරමුණු කරගත හැකි කසිණ 10ක් ඇත. එම බාහිර අරමුණක් යහපත් ලෙසින් වඩා ගැනීමෙන්- සමාධියට පත් කරගැනීමෙන් රූප හා අරූප සමාපත්ති ලබා ගත හැකිය. **බලන්න**: භාවනා, අභිභායතන. **සටහන්:** * කසිණ පිළිබඳ විස්තර පිණිස **බලන්න**: සිංහල විසුද්ධිමග, පරිච්ඡේද: 4 හා 5.. ** ආකාශ ධාතුව කසිණ භාවනා අරමුණකි. **බලන්න:** ආකාශ ධාතුව. ** ආලෝක කසිණය, ඕදාත කසිණය ලෙසින්ද දක්වා ඇත. **බලන්න**: ආලෝක කසිණය. **ශබ්දකෝෂ: B.D:** p: 80: "kasiṇa: …purely external device to produce and develop concentration of mind and attain the 4 absorptions…"

▼ **කසිණ ආයතන 10 කි**: 1) පඨවි කසිණආයතනය (earth kasiṇa) 2) ආපො කසිණආයතනය (water kasiṇa) 3) තෙජෝ කසිණආයතනය( fire kasiṇa) 4) වායො කසිණආයතනය (air kasiṇa) 5) නීල කසිණ ආයතනය (blue *kasiṇa*) 6) පීත කසිණආයතනය yellow kasiṇa 7) ලොහිත කසිණආයතනය(red kasiṇa ) 8) ඔදාත කසිණආයතනය (white kasiṇa) 9 ) ආකාස කසිණආයතනය (space kasiṇa) 10) විඤ්ඤාණ කසිණආයතනය (consciousness kasiṇa). **සටහන**: විසුද්ධිමාර්ගය: 5 පරිච්ඡේදය: ඔදාත කසිණය, ආලෝක කසිණය ලෙසින් විස්තර කර ඇත. **බලන්න**: ආලෝක කසිණය. **මූලාශ්‍ර**:අංගු.නි: (6):10 නිපාත: 10.1.3.5. කසිණ සූත්‍රය,පි.112, EAN: 10: 25.5 Kasinas, p. 502.

▼ **දස කසිණ** අතුරින් විඥාන කසිණය අග්‍ර බව බුදුන් වහන්සේ වදාළහ. එහෙත්, එම සංඥාව ඇති සත්ත්වයෝ ද අනිච්ච ස්වභාවය දරයි, විපරිනාමයට පත්වේ. **මූලාශ්‍ර:**අංගු.නි: (6): 10 නිපාත: 10.1.3.9.ප්‍රථම කෝසල සූත්‍රය,පි. 134 , EAN: 10: The Great Chapter: 29.9 Kosala-1, p. 505.

▲ **කාසි කෝසල දේශය**- Kasi & Kosala country: මෙය පසේනදී කෝසල රජුගේ රාජ්‍යයය, විජිතයය. **බලන්න:** අග්‍ර දේ විනාශවීම. **සටහන**: කාසි රට-කසීරට, අනගි කසිසලු වලට ප්‍රසිද්ධයය.

▲**කුසලතා**- skills: යම් දෙයක්, කටයුත්තක් යහපත් ලෙසින් කරගැනීමට ඇති දක්ෂතාවය- නිපුන බව කුසලතාවය. **වැඩියයුතු විවිධ කුසලතා:** 1) **ආපත්ති කුසලතාවය** (Skill in knowing offences): ධර්ම විනයට අනුව සිදුවියහැකි වරද- ඇවත් පිළිබඳව ඇති නිපුණත්වය- ඇවත් දැනීම 2) **ආපත්ත්‍යයුත්ථාන කුසලතාව** (skill in rehabilitation from offences): ඇවත් වලින් නැගීසිටීම පිණිස - පුනරුත්ථාපනය පිණිස ගතයුතු ක්‍රියා මාර්ගය පිලිබඳ නිපුණතාවය. 3) **සමාපත්ති කුසලතාව** (skill in entering jhāna): ජානයන්ට ඇතුළුවීමට ඇති දක්‍ෂබව. 4) **සමාපත්තිවුට්ඨාන කුසලතාවය** (skill in returning from jhāna): ජානයෙන් එළියට පැමිණීමට ඇති දක්‍ෂබව. 5) **ධාතු කුසලතාවය (**skill in knowing the 18 elements) : 18 ක්වූ ධාතු කවරේද යයි දන්නාබව **6) මනසිකාර කුසලතාවය (**skill in paying attention to the 18 elements) ධාතු 18 පිලිබඳ සිත යෙදවීමට ඇති නිපුණතාවය. **මූලාශ්‍ර**: දිඝ.නි: (3): 10 සංගිති සූත්‍රය, පි. 374, EDN: 33 Saṅgīti Sutta: The Chanting Together, from p. 363.

▲ **කුසල ධර්ම හා අකුසල ධර්ම: පාලි: කුසලා ධම්මා, අකුසලා ධම්මා** Wholesome & Unwholesome: ධර්මයේ **කුසල ධර්මය** ලෙසින් හඳුන්වන්නේ ආධ්‍යාත්මික මග වර්ධනය කිරීමට උපකාරීවන යහපත් ක්‍රියාවන්ටය, එනම් තුන්දොරින් සිදුකරන යහපත් ක්‍රියා-සදාචාරාත්මක ක්‍රියාවන්ටය. කුසල ක්‍රියා, පුණ්‍ය ක්‍රියා, යහපත් කම්ම, පින්, නිපුණ ක්‍රියා ලෙසින් ද හඳුන්වති (meritorious, good, clever, skillful actions).කෙනෙකුට අලෝභය, අදෝසය හා අමෝහය ඇතිවිට ඔහු කුසල ක්‍රියා කිරීමට උනන්දුවේ. කුසලය, සුගතියේ උපත ලැබීමට හේතුවේ. **අකුසල ධර්මය** යනු ආධ්‍යාත්මික මග අවුරන, තුන්දොරින්

කරණ අයහපත් ක්‍රියාවන්ටය, සදාචාරයට විරුද්ධ දේටය. අකුසලය: පාප ක්‍රියා, පාප කර්ම, පව්, අයහපත් - නරක ක්‍රියා ලෙසින් හඳුන්වති (bad actions, bad kamma, de-meritorious, evil actions). අකුසල් ක්‍රියා සිත කෙළසයි. අකුසලය දුගතියේ යළි උපතට හේතුවේ. **බලන්න**: ත්‍රිවිධ සුචරිතය හා ත්‍රිවිධ දුශ්චරිතය, කෙළෙස්. **සටහන්**: සියලු කුසල, අප්‍රමාදය පිහිටකොට ඇත, අකුසලය, ප්‍රමාදය මුල් කොට ඇත. **බලන්න**: අප්‍රමාදය, ප්‍රමාදය.

▼වෙනත් මූලාශ්‍ර**: 1. "The Simile of the Cloth and the Discourse on Effacement"** by Nyanaponika Thera, BPS :Wheel 61-62, 2008. **2." The Roots of Good and Evil"** by Nyanaponika Thera, BPS: Wheel 251-253, 2008.
▼ **කුසල ධර්ම කුමක්ද? අකුසල ධර්ම කුමක්ද?**: **කුසල**: 1) අක්‍රෝධය 2) එදිරි නැතිබව 3) අනුන්ට අවමන් නොකිරීම 4) අහංකාරනොවීම, 5) ඉරිසියා නොවීම 6) නොමසුරුකම 7) අමායාව 8) කපටිනැතිබව 9) හිරිය 10) ඔත්තප්පය. (non-anger, non-hostility, non-denigration, non-insolence, non-envy, non-miserliness, non-deceitfulness, non-craftiness, moral shame, moral dread). **අකුසල :** 1) ක්‍රෝධය 2) එදිරිය 3) අනුන්ට අවමන් කිරීම 4) අහංකාරය, 5) ඉරිසියාව 6) මසුරුකම 7) මායාව 8) කපටිබව 9) හිරි නැතිබව 10) ඔත්තප්ප නැතිබව. සියළු **අකුසල් දහම්**- වැරදි ධර්මයය, ඒ නිසා දුක ඇතිවේ, දුක්විපාක (දුගතිය) ඇතිකරයි. **සියළු කුසල් දහම් -** නිවැරදි ධර්මවේ, එමගින් මෙලොව සැපසේ වාසය කලහැකිවේ, සැප විපාක (සුගතිය) ඇතිවේ. **මූලාශ්‍ර:** අංගු.නි: (1):2 නිපාත:17: 1 අකුසල පෙයාාලය සූත්‍ර, පි.230, EAN:2: XVII, Unwholesome, p. 74.

▼ **කුසල ධර්ම** යනු සම්මා දිට්ඨිය පෙරටු කරගත්, නිවැරදිමගය. **අකුසල ධර්ම** යනු මිච්ඡා දිට්ඨිය පෙරටු කරගත්, වැරදිමගය. **මූලාශ්‍ර:** සංයු.නි: (5-1); මහාවග්ග: මග්ගසංයුත්ත: 1.3.2 අකුසලධම්ම සූත්‍රය, පි. 58, ESN: 45: Maggasamyutta: 22.2 Unwholesome states, p. 1628, අංගු.නි: (6) :10 නිපාත: 10.3.4.3 කුසල සූත්‍රය, පි. 468, EAN:10: IV: 135.2 Wholesome, p. 548.

▼ **කුසල හා අකුසල ඇතිවීමට හේතු**:සියලු කුසල ධර්මතා ඇතිවීමට මූලික කරුණු: ධර්මයේ **අප්‍රමාදවීම** හා **යෝනිසෝ මනසිකාරයෙන්** කටයුතු කිරීමය. එමගින්, සප්ත බොජ්ඣංග ධර්ම වර්ධනයවේ, නිවන ලඟාවේ. **ප්‍රමාදය හා අයෝනිසෝමනසිකාරයෙන්** කටයුතුකිරීම අකුසල ධර්ම ඇතිවීමට මූලිකවේ. **මූලාශ්‍ර:**සංයු.නි: (5-1) මහාවග්ග: බොජ්ඣංග සංයුත්ත: 2.4.1 හා 2.4.2 කුසල සූත්‍ර, පි. 212, ESN: 46: Bojjanga samyutta: 31.1 & 32.2.Wholesome, p.1766, අංගු.නි: (6): 10 නිපාත :10.1.2.5 අප්‍රමාද සූත්‍රය, පි.68,EAN:10: 15-5 Heedfulness, p. 497.
▼**පහකලයුතු අකුසල හා වැඩිය යුතු කුසල**: බුදුන් වහන්සේ ප්‍රහාණය කළයුතු **අකුසල් 44** ක් හා ඇතිකරගතයුතු **කුසල් 44** ක් පෙන්වා ඇත. අකුසල හැර කුසල ධර්මයේ යෙදීම මගින් බොහෝ අනුසස් ලැබේ: මේ ජීවිතයේදීම සුවපත්ව වාසය කිරීමට හැකිවීම, සුගතියක යළිඋපත ලබාගැනීමේ වාසනාව, ධර්ම මාර්ගය වර්ධනය කර නිවන සාක්ෂාත් කරගැනීමට හැකිවීම. විස්තර පිණිස **බලන්න**: සල්ලේඛ පරියාය. **මූලාශ්‍ර:**

ම.නි: (1): 1.1.8 සල්ලේඛ සූත්‍රය, පි. 112, EMN: 8. Sallekha Sutta-Effacement, p.108.

▼ **අකුසල් ප්‍රහීණය හා කුසල් ඇතිකරගැනීම**: අකුසල්, කයෙන්, වචනයෙන් හා මනසින් සිදුවේ. යහපත් කාය කර්ම (කාය සුචරිතය) මගින්, කයෙන් සිදුවන අකුසල නැතිකරගත හැකිය. යහපත් වචී කර්මමගින් (වාක් සුචරිතය), වචනයෙන් සිදුවන අකුසල නැතිකරගත හැකිය. එහෙත්, මනසින් සිදුවෙන අකුසල ප්‍රහීණය කරගත හැක්කේ නිතර නුවණින් විමසමින් ප්‍රඥාවෙන් කටයුතු කිරීමෙන් (මනෝ සුචරිතය ඇතිකර ගැනීමෙන්) යයි බුදුන් වහන්සේ පෙන්වා ඇත. **නුවණින් සලකා බලමින් පහකර ගතයුතු අකුසල්:** 1) තණ්හාව-ලෝභය 2) දෝසය - ව්‍යාපාදය 3) අවිජ්ජාව (මොහය) 4) ක්‍රෝධය 5) අමනාපය (උපනාහ) 6) ගුණමකුබව 7) අහංකාරය (පළාස) 8) මසුරුකම 9) පාපික/ලාමක ඊර්ෂ්‍යාව (පාපිකා ඉස්සා), 10) පාපික/ලාමක ආසාව (පාපිකා ඉච්ඡා) **බලන්න:** පාපික ඊර්ෂ්‍යාව, පාපික ආසාව. **මූලාශ්‍ර:**අංගු.නි :(6):10 නිපාතය: 10.1.1.3 කාය සූත්‍රය, පි. 100, EAN:10: 23.3 Body, p. 500.

▼ **කුසල් හා අකුසල් පිළිබඳ බුද්ධ අනුසාසනා:** සියලු බුදුවරුන්ගේ අනුසාසනය වුවේ අකුසලය හැර කුසලය වැඩිය යුතුබවය. පව්කම්-අකුසල් හැර කුසලය වඩා සිත පිරිසිදු කරගන්න: "**සබ්බ පාපස්ස අකරණං කුසලස්ස උපසම්පදා- සචිත්ත පරියො දපනං- එතං බුද්ධානුසාසනං". මූලාශ්‍රය:** ධම්ම පදය**,** බුද්ධ වග්ග, 183නි ගාථාව.

▼ **බුදුන් වහන්සේ** මෙසේ වදාළහ: "**අකුසලය දුරුකරගන්න**, අකුසලය දුරුකර ගත හැකි නිසා මම එසේ කියමි, එය දුරු කරන්නට නොහැකි නම් මම එසේ නොකියමි. අකුසලය ප්‍රහීණය මගින් අහිතක් (විපතක්) , දුකක් ඇති වේ නම් අකුසලය දුරුකරගන්න යයි මම නොකියමි. අකුසල ප්‍රහීණය හිතබව පිණිස, සුව පිණිස වේ, එමනිසා අකුසලය දුරුකරගන්න යයි මම කියමි" (**අකුසලං භික්ඛවෙ පජහථ-** Bhikkhus, abandon the unwholesome!). "**කුසලය වඩන්න**, කුසලය දියුණුකර ගත හැකි නිසා මම එසේ කියමි, එය දියුණු කරන්නට නොහැකි නම් මම එසේ නොකියමි. කුසලය වැඩීමෙන් මගින් අහිතක් (විපතක්) , දුකක් ඇති වේ නම් කුසලය වඩාගන්න යයි මම නොකියමි. කුසල්වැඩීම හිතබව පිණිස, සුව පිණිස වේ, එමනිසා කුසලය වඩාගන්න යයි මම කියමි" (**කුසලං භික්ඛවෙ භාවෙථ-** Bhikkhus, develop the wholesome!) **මූලාශ්‍ර:** අංගු.නි: (1):2 නිපාත: 2.1.2.9 සූත්‍රය, පි.152, EAN:2:19.9 Sutta, p. 59.

▼**කුසල් හා අකුසල් පිළිබඳ ක්‍රම විධිය**: අකුසල් මග හැරදැමීමට කුසල් මගක් ඇත, ඒ මග ගත යුතුය: විෂම මගක් දුටුවිට එය හැරදැමීමට සමමගක් ඇතිලෙසින්, විෂම තොටුපළක් දුටුවිට එය හැරදැමීමට සම තොටුපළක් ඇතිලෙසින්, අකුසල හැර දැමීමට කුසල් මගක් ඇතය යයි බුදුන් වහන්සේ පෙන්වා ඇත:

"**සෙය්‍යාථාපි චුන්ද විසමො මග්ගො,තස්සාස්ස අඤ්ඤො සමො මග්ගො පරික්කමනාය. සෙය්‍යාථාපි පන චුන්ද විසමං තිත්ථං, තස්සාස්ස අඤ්ඤං සමං තිත්ථං පරික්කමනාය"**. එලෙස, හිංසා කරන පුද්ගලයාට එයින් දුරුවීම පිණිස අහිංසා ව ඇත... එලෙසින් සෙසු අකුසල්ද එයට ප්‍රති විරුද්ධ කුසලය භාවිතා කර ගැනීමෙන් හැර දැමිය හැකිවේ. අකුසල් කෙනෙක් පහළටද (දුගතියට) කුසල් කෙනෙක් ඉහළටද (සුගතියට)

ගෙනයති, එමනිසා අකුසල හැර කුසලයේ යෙදිය යුතුවේ: **“ යෙ කෙචි අකුසලා ධම්මා සබ්බෙ තෙ අධොභාවං ගමනියා , යෙ කෙචි කුසලා ධම්මා සබ්බෙ තෙ උපරිභාවං ගමනියා”**. කුසලයේ යෙදෙන කෙනෙකුට, අකුසලයේ යෙදෙන කෙනෙක් ඉන් මුදා ගත හැකිවේ. මඩෙහි එරුණු කෙනෙකුට එම මඩ වලේම සිටින වෙනත් කෙනෙක් ඉන් එළියට දැමීමට හැකියාව නොමැත. එලෙසින් අකුසලහි යෙදෙන කෙනෙකුට වෙනත් කෙනක් කුසලයට ගැනීමට හැකියාව නොමැති යයි බුදුන් වහන්සේ වදාළහ. කුසලයේ යෙදෙන පුද්ගලයාට තව කෙනෙක් කුසලයට ඇදගැනීමට හැකියාව ඇත. **මූලාශ්‍ර**: ම.නි: (1): සල්ලේඛ සූත්‍රය, පි. 112, EMN: 8-Effacement (Inclination of mind), p.108.

▼ **කුසලයට හා අකුසලයට හේතු**: කුසල දහම යනු යහපත් වූ කායික, වාචික, මානසික ක්‍රියාකාරකම්ය, එයට විරුද්ධ දේ අකුසලයය. **කුසල දහම වැඩිවීමට හා අකුසල් පිරිහීමට** හේතු : ධර්මයේ අප්‍රමාදවීම, අලසකම නොමැතිවීම, වීරිය, අල්පෙච්ඡතාව, ලදදෙයින් සතුටුවීම, යෝනිසෝමනසිකාරය, සම්ප්‍රජන්‍යය, කල්‍යාණ මිත්‍ර සේවනය. කුසල් පිරිහීමට හා අකුසලයට හේතු: ධර්මයේ ප්‍රමා වීම, ධර්මයේ යෙදීමට අලසවීම, වීරිය නැතිකම, මහෙච්ඡතාව, ලද දෙයින් නොසතුටුවීම, අසම්ප්‍රජන්‍යය, අයෝනිසෝමනසිකාරය, පාපමිත්‍ර සේවනය. යහපත් කුසලක්‍රියා කරණවිට, අකුසල් පිරිහී, කුසල් වැඩේ, එහෙත්, කෙනෙක් අයහපත් අකුසල් ක්‍රියා වල යෙදෙන්නේනම්, කුසල් පිරිහී, අකුසල් වැඩේ. සියලු කුසල ධර්මතා... අකුසල ධර්මතා... සිත පෙරටු කරගෙන ඇත, සිත ඒ ධර්මතා වලට පළමුව ඇතිවෙන බව බුදුන් වහන්සේ වදාළහ. **මූලාශ්‍ර**: අංගු.නි: (1) 1 නිපාත, කල්‍යාණ මිත්‍ර වග්ග, පි. 58, EAN:1: 56.6 & 57.7, p. 39.

▼ **කුසල හා අකුසල අවබෝධ කරගැනීම -** Knowledge of wholesome & unwholesome: කුසල හා අකුසල මූලයන් පිළිබඳ යහපත් අවබෝධය ලබන ආරිය ශ්‍රාවකයා (සේඛ), සම්මා දිට්ඨියට පැමිණ, සියලු අනුසය ප්‍රවණතා පහකර ගෙන සත්‍ය ඥානය අවදි කර, සියලු දුක නිමා කරගනී. **බලන්න**: අනුසය, සම්මා දිට්ඨිය. **සටහන**: අටුවාවට අනුව ඔහු එම අවබෝධය ලබා ගන්නේ චතුසත්‍ය තුළින්ය: සියලු ක්‍රියාවන් නිසා දුක ඇතිවේ (දුක්ඛ සත්‍ය) කුසල් හා අකුසල මූල ඇතිවෙන්නේ දුක නිසාය (දුක්ඛ සමුදය සත්‍ය), අකුසල හා කුසල මූල අවසන් කිරීමෙන් දුක නැතිවේ (දුක්ඛ නිරෝධ සත්‍ය), ඒ සඳහා ගත යුතු ක්‍රියා මාර්ගය නම් ආරිය අටමග වඩා ගැනීමය (මාර්ග සත්‍ය). **බලන්න:** EMN: note: 118, p. 1074. **මූලාශ්‍ර**:ම.නි: (1 ): 1.1.9 සම්මා දිට්ඨි සූත්‍රය, පි. 130, EMN: 9: Sammādiṭṭhi Sutta- Right View, p. 121.

▼ **කුසල ධර්ම වර්ධනය -** Developing the wholesome: තමන් තුල ඇති කුසල, නිශ්චලව (standstill) තබාගැනීම හෝ හානියට පත්කර ගැනීම නොකර ගත යුතු යයි බුදුන් වහන්සේ අවවාද කර ඇත. **කුසල් නිශ්චලව** තබා ගැනීම යනු, තමා තුල ඇති යහපත් කුසල් දියුණු නොකර, එලෙසම තබා ගැනීමය. **කුසල් හානියට** පත්කර ගැනීම යනු තමා තුල ඇති යහපත් කුසල් ආරක්ෂා කර දියණු නොකර ගැනීමය. **කුසල් දියුණුව**ට පත්කර ගැනීම යනු, තමා තුල ඇති: ශ්‍රද්ධාව, ශීලසම්පන්නබව, බහුශ්‍රැතබව, නෙක්ඛම්මය, ප්‍රඥාව , ප්‍රතිභානය- සියුම්නුවණ (discernment) ආදී ගුණ වඩාගෙන, ආසාව ක්ෂය කිරීමට කටයුතු කිරීමය.

**මූලාශ්‍ර**: අංගු.නි: (6 ): 10 නිපාත: සචිත්තවග්ග: 10.2.1.3 ඨිති සූත්‍රය, පි. 200 , EAN:10: 53.3 Standstill, p. 513.

▲ **කුසල ධර්මයේ ප්‍රතිලාභ-** Gains due to wholesome: බුදුන් වහන්සේ මෙසේ වදාළහ: "...මම, කුසල ධර්මතා කිරීම පිණිස සිත උපද්දවා ගැනීම බොහෝ උපකාර යයි කියමි. කයින් හා වචනයෙන් කුසල කර්ම කිරීම හා කරවීම පිලිබඳ අනුසස් ගැන කියනුම කවරේද?" **"චිත්තුප්පාදම්පි ඛො අහං චුන්ද, කුසලෙසු ධම්මෙසු බහුකාරං වදාමි. කො පන වාදො කායෙන වාචාය අනුවිධීයනාසු"** (Cunda, I say that even the inclination of mind towards wholesome states is of great benefit, so what should be said of bodily and verbal acts conforming [to such a state of mind). **සටහන:** අටුවාවට අනුව සිත කුසල් කිරීමට නැඹුරුකිරීම මහා ලාභයකි-The inclination of mind is of great benefit because it entails exclusively welfare and happiness, and because it is the cause of the subsequent actions that conform to it. **බලන්න**: EMN: note: 110, p. 1073 **මූලාශ්‍ර**:ම.නි: (1): 1.1.8 සල්ලේඛ සූත්‍රය, පි. 112, EMN: 8. Sallekha Sutta- Effacement, p.108.

▲**කුසලනදී**- Streams of Wholesome: කුසල නදී ලෙසින් පෙන්වා ඇත්තේ ආරිය ශ්‍රාවකයා තුළ ඇති උතුම් ගුනයන්ය. **බලන්න**: පුණ්‍යානදී.

▲ **කුසලමග හා අකුසල මග-** Kusala maga & Akusala maga සම්මාදිට්ඨිය මුල්කරගත් අංග 10කින් යුත් සම්මත්වය කුසල මගය, එම මගට විරුද්ධවූ මිථ්‍යාත්වය අකුසල මගය. **මූලාශ්‍ර**:අංගු.නි: ( 6) : 10 නිපාත:සාධුවග්ග,පි. 468, EAN:10:Good, p. 548,සංයු.නි:(5-1) මග්ගසංයුත්ත: 1.3.2 අකුසල ධම්ම සූත්‍රය, පි. 58, ESN:45: Magga samyutta: 22.2 Unwholesome States, p. 1628.

▲ **කුසල මූලිකය-**Base for wholesome: කුසලයට මූලික වන්නේ සම්මාදිට්ඨියය**.** බුදුන් වහන්සේ වදාළේ උදාවන හිරුට පෙර නිමිත්ත නම් අරුනෝදයය. එලෙස, සියලු කුසල ධර්මයනට පෙරනිමිත්ත- පෙරටුව සිටින්නේ සම්මා දිට්ඨියය. සම්මා දිට්ඨිය ඇතිවිට සම්මා සංකප්පය ඇතිවේ. එලෙසින් සම්මා විමුක්තිය දක්වා, ආධ්‍යාත්මික මග (සම්මා මග) වර්ධනය වේ. **මූලාශ්‍ර:** අංගු.නි: (6 ): 10 නිපාත: 10.3.2.9 පුබ්බංගම සූත්‍රය, පි.458, EAN:10: 121.9 Forerunner, p. 547

▲ **කුසල මුල් හා අකුසල මුල්-** wholesome roots and unwholesome roots: **කුසල මුල් 3කි:** අලෝභය, අදෝසය හා අමෝහය (none lust, none- hate, and none delusion). සියලුම කුසල ඇතිවන්නේ කුසල් මුල් නිසාය. **අකුසල මුල් 3 කි:** ලෝභය, දෝසය හා මෝහය (lust, hatred, and delusion). සියලුම කෙළෙස් ඇතිවන්නේ අකුසල මුල් නිසාය.

▼ **ජාති ජරා මරණ** ආදීවූ සසර පවත්වන හේතු නැතිකර ගැනීමට අකුසල මූල ප්‍රහීණය කරගත යුතුවේ. සක්කායදිට්ඨිය, විචිකිච්චාව, සීලබ්බත පරාමාස නැතිකරගැනීම මගින් අකුසල මූල නැතිකර ගැනීමට හැකිවේ. **සටහන:** ම.නි: සම්මාදිට්ඨි සූත්‍රයට අනුව කුසල හා අකුසල මූලයන් ගැන පූර්ණ අවබෝධය ලබන ආරිය ශ්‍රාවකයා (සේඛ) සියලු උපාදාන හැර, සත්‍ය අවබෝධකර මේ ජීවිතයේදීම නිවන සාක්ෂාත් කරගනී. **මූලාශ්‍ර**: දිඝ.නි: (3 ): 10 සංගිති සූත්‍රය-ඡෙදය 10 , පි. 377, EDN: 33 Saṅgīti Sutta: The Chanting Together-section 10.1, p. 365, ම.නි: (1 ): 1.1.9 සම්මාදිට්ඨි සූත්‍රය, පි.130, EMN: 9: Sammādiṭṭhi Sutta-Right View,

p.121, අංගු.නි:(6): 10 නිපාත: 10.2.3.6 තයෝධම්ම සූත්‍රය, පි.284, EAN: 10: 76-6.Incapable, p. 524.

▲**කුසල් ලැබීම-නොලැබීම-** not getting or getting the wholesome **අංග 3 ක්** ඇති භික්ෂුව නොලත් කුසල් දහම් ලබා ගැනීමට හෝ ලැබූ කුසල් දහම් දියුණු කර ගැනීමට අසමත්වේ: 1) ඔහු උදෑසන, සමාධිය ලබාගැනීම පිණිස භාවනා අරමුණේ අනලස්ව, උත්සාහවන්තව කටයුතු නොකරයි 2) දිවාකල, සමාධිය ලබාගැනීම පිණිස භාවනා අරමුණේ අනලස්ව, උත්සාහවන්තව කටයුතු නොකරයි 3) සවස්කළ, සමාධිය ලබාගැනීම පිණිස භාවනා අරමුණේ අනලස්ව, උත්සාහවන්තව කටයුතු නොකරයි. එහෙත්, **වෙනත් අංග 3 ක්** ඇති භික්ෂුව නොලත් කුසල් දහම් ලබා ගැනීමට හෝ ලැබූ කුසල් දහම් දියුණු කර ගැනීමට සමත්වේ: 1) ඔහු උදෑසන, සමාධිය ලබාගැනීම පිණිස භාවනා අරමුණේ අනලස්ව, උත්සාහවන්තව කටයුතු කරයි 2) දිවාකල, සමාධිය ලබාගැනීම පිණිස භාවනා අරමුණේ අනලස්ව, උත්සාහවන්තව කටයුතු කරයි 3) සවස්කළ, සමාධිය ලබාගැනීම පිණිස භාවනා අරමුණේ අනලස්ව, උත්සාහවන්තව කටයුතු කරයි. **මූලාශ්‍ර:**අංගු.නි: (1):3 නිපාත, 3.1.2.9 සූත්‍රය, පි. 256, EAN:3 : 19.9 sutta, p. 84.

▲ **කුසලශීලය හා අකුසලශීලය**: පාලි: **කුසලානි සීලානි අකුසලානි සීලානි** -wholesome virtuous behavior & Un virtuous behaviorකුසල සීලය යනු යහපත් ලෙසින් ශීලසම්පන්න වීමය. තුන්දොරින් කරන සියලු ක්‍රියා යහපත් බවය. මෙය ආධ්‍යාත්මික වර්ධනය පිණිස අවශ්‍යතම සාධකයකි. අකුසල සීලය අයහපත් චරියාවය, මාර්ගය අවහිර කරණ මූලික කරුණකි. **බුදුන් වහන්සේ මෙසේ පෙන්වා ඇත: 1. කුසලශීලය ඇති පුද්ගලයා ගේ ස්වභාවය:** යම්කිසි පුද්ගලයෙක්හට, දස ධර්ම ගුණ තිබේනම්, ඔහු කුසලශීලයෙන් සමන්විත (පිරිපුන් කුසල් ඇත), උත්තරීතර, අනභිභවනීය ශ්‍රමණයෙක්ය: **" දසහි ඛො අහං ථපති, ධම්මෙහි සමන්නාගතං පුරිසපුග්ගලං පඤ්ඤාපෙමි සම්පන්නකුසලං පරමකුසලං උත්තමපත්තිපත්තං සමණං අයොජ්ඣං...".** (When a man possesses ten qualities, carpenter, I describe him as accomplished in what is wholesome, perfected in what is wholesome, an ascetic invincible attained to the supreme attainment) **සටහන:** සමණං අයොජ්ඣං**:** අනභිභවනීය**=** පරාජය කළනොහැකි, එනම්, රහතන් වහන්සේය. **කුසල ශිලය ඇති ශිලසම්පන්න පුද්ගලයාට ඇති ගුණ 10:** 1-8. අසේඛ සම්මා දිට්ඨිය - අසේඛ සම්මා සමාධිය (ආරිය අටමග) 9. අසේඛ සම්මා ඤාණය (the right knowledge of one beyond training 10. අසේඛ සම්මා විමුක්තිය (right deliverance of one beyond training) **සටහන: * අසේඛ:** රහතන්වහන්සේ හඳුන්වන ආකාරයකි. **කුසල ශිලය කුමක්ද?** 1.යහපත් කාය කර්ම 2. යහපත් වචී කර්ම හා 3. පිරිසිදු ආජීවය ඇතිබව. **කුසල ශිලය ඇතිවන්නේ (සමුදය) කෙසේද?** සිත නිසා (චිත්ත සමුට්ඨානය) -රාග දෝස හා මෝහයෙන් මිදුන සිතේ (වීත රාග, වීත දෝස වීත මෝහ) කුසල ශිලය ඇතිවේ. **කුසල ශිලය අවසන්වෙන්නේ (නිරෝධය) කුමන අවස්ථාවේද?** භික්ෂුව සිල්වත්ය, එහෙත් එම ශිලය තමාගේ යයි නොගනී. ඔහුට චේතෝ විමුක්තිය හා ප්‍රඥා විමුක්තිය පිලිබඳ නුවණ ඇත. එමගින්, කුසල ශිලය ඉතිරි නොමැතිව අවසන්වේ (අරහත්වයට පත්වීම). **කුසල ශිලය නිරෝධවන**

**ප්‍රතිපදාව කුමක්ද? :** අකුසල ඇතිනොවීම පිණිස, උපන් අකුසල පහ කර ගැනීම පිණිස, නූපන්කුසල ඇතිකර ගැනීම පිණිස, උපන් කුසල වැඩි දියුණු කර ගැනීම පිණිස සිතේ උනන්දුව ඇතිකර ගැනීම (කුසල ඡන්දය- zeal). ප්‍රධාන වීරිය ඇතිව කටයුතු කිරීම. **කුසල සංකල්පනා යනු කුමක්ද?:** නෙක්කම්ම සංකල්පනා, අව්‍යාපාද සංකල්පනා, අවිහිංසා සංකල්පනා **කුසල සංකල්පනා ඇතිවෙන්නේ කෙසේද?** සංඥාව නිසා විවධ කුසල සංකල්පනා ඇතිවේ: නෙක්කම්ම සංකල්පනා, අව්‍යාපාද සංකල්පනා, අවිහිංසා සංකල්පනා. **කුසල සංකල්පනා නිරෝධය වෙන්නේ කෙසේද?** දෙවෙනි ජාන සමාපත්තිය ලැබීමෙන්. **කුසල සංකල්පනා නිරෝධය පිණිස ඇති ප්‍රතිපදාව කුමක්ද?** අකුසල සංකල්පනා ඇතිනොවීම පිණිස, උපන් අකුසල සංකල්පනා පහ කර ගැනීම පිණිස, නූපන්කුසල සංකල්පනා ඇතිකර ගැනීම පිණිස, උපන් කුසල සංකල්පනා වැඩි දියුණු කර ගැනීම පිණිස සිතේ උනන්දුව ඇතිකර ගැනීම, ප්‍රධාන වීරිය ඇතිව කටයුතු කිරීම. **2 කුසලශීලය නොමැති පුද්ගලයා දුෂ්ශීල ලෙසින් හඳුන්වයි.** (මිථ්‍යා මග ගමන් කරන පුද්ගලයාය) **අකුසල ශීලය යනු කුමක්ද?** අයහපත් කාය කර්ම, අයහපත් වචී කර්ම, අයහපත් ජීවිත පැවැත්ම. **අකුසල ශීලය ඇතිවන්නේ (සමුදය) කෙසේද?** සිත නිසා: රාග දෝස හා මෝහයෙන් වැසුන සිතේ අකුසල ශීලය ඇතිවේ. **අකුසල ශීලය සම්පූර්ණයෙන්ම අවසන්වෙන්නේ (නිරෝධය) කුමන අවස්ථාවේද?** කායදුශ්චරිතය පහකර කායසුචරිතය වැඩීමෙන්, වාක්දුශ්චරිතය පහකර වාක් සුචරිතය වැඩීමෙන්**,** මනෝ දුශ්චරිතය පහකර මනෝ සුචරිතය වැඩීමෙන්, මිථ්‍යා ආජීවය හැර සම්මා ආජීවය ඇතිකර ගැනීමෙන්. **සටහන:** අටුවාවට අනුව මේ අවස්ථාව යනු සෝතාපන්න වීමය. බලන්න: EMN: note: 773, p. 1136. **අකුසල ශීලයේ නිරෝධය පිණිස ඇති ප්‍රතිපදාව කුමක්ද?** ලාමක අකුසල ඇතිනොවීම පිණිස, උපන් අකුසල පහ කර ගැනීම පිණිස, නූපන්කුසල ඇතිකර ගැනීම පිණිස, උපන් කුසල වැඩි දියුණු කර ගැනීම පිණිස සිතේ උනන්දුව ඇතිකර ගැනීම (කුසල ඡන්දය- zeal). ප්‍රධාන වීරිය ඇතිව කටයුතු කිරීම. **අකුසල සංකල්පනා යනු කුමක්ද?** කාම සංකල්පනා (කාමඡන්දය) , ව්‍යාපාද සංකල්පනා, හිංසාකාරී සංකල්පනා (විවිහිංසාව). **අකුසල සංකල්පනා ඇතිවෙන්නේ කෙසේද?** අකුසල සංකල්පනා ඇතිවන්නේ සංඥාව නිසාය (perception). සංඥාව විවිදාකාරය: කාම සංකල්පනා, ව්‍යාපාද සංකල්පනා, විවිහිංසා සංකල්පනා මගින් අකුසල සංකල්පනා උපදී. **අකුසල සංකල්පනා නිරෝධය වෙන්නේ කෙසේද?:** ප්‍රථම ජාන සම්පත්තිය ලැබීමෙන්.**අකුසල සංකල්පනා නිරෝධය පිනිස ඇති ප්‍රතිපදාව කුමක්ද?** ලාමක අකුසල සංකල්පනා ඇතිනොවීම පිණිස, උපන් අකුසල සංකල්පනා පහ කර ගැනීම පිණිස, නූපන්කුසල සංකල්පනා ඇතිකර ගැනීම පිණිස, උපන් කුසල සංකල්පනා වැඩි දියුණු කර ගැනීම පිණිස සිතේ උනන්දුව ඇතිකර ගැනීම, ප්‍රධාන වීරිය ඇතිව කටයුතු කිරීම. **මූලාශ්‍ර:** ම.නි: (2): 2.3.8. සමනමණ්ඩික සූත්‍රය, පි. 382, EMN: 78: Samaṇamaṇḍikā Sutta,p.593.

▲ **කුසල් පද හා අකුසල් පද-** Base of wholesome & base of unwholesome: කුසලයට හේතු, පදනම්වන කරුණු 9 කි ඒවා කුසල පදවේ. කුසල භූමි ලෙසින්ද පෙන්වා ඇත. **කුසල් පද 9කි:** 1) සමථ භාවනාව 2) විදර්ශනා භාවනාව 3) අලෝභය 4) අද්වේෂය 5) අමෝහය 6) අසුභ සංඥාව 7) දුක්ඛ සංඥාව 8) අනිත්‍ය සංඥාව 9) අනාත්ම

සංඥාව.අකුසලයට හේතුව, පදනම්වන කරුණු 9කි. ඒවා අකුසල පද වේ. මේවා අකුසල භූමි ලෙසින්ද පෙන්වා ඇත: **අකුසල් පද 9 කි:** 1) තණ්හාව 2) අවිද්‍යාව 3) ලෝභය 4) ද්වේෂය 5) මෝහය 6) සුභ සංඥාව 7) සැප සංඥාව 8) නිත්‍ය සංඥාව 9) ආත්ම සංඥාව. **මූලාශ්‍ර**: ඛු.නි: නෙත්තිප්ප්‍ර කරණය: විභාගවාරෝ.

▲ **කුසල් භූමිය හා අකුසල් භූමිය**- Plane of wholesome & Plane of Unwholesome **කුසල් භූමිය යනු:** සමථ, විදර්ශනා භාවනා 2, අලෝභය, අද්වේශය,අමෝහය යන කුසල් මුල් 3 හා සතර සතිපට්ඨානයය. මේව ශ්‍රද්ධා ආදී ඉන්ද්‍රිය ධර්මයන්ගේ පදනම හෙවත් කුසල් භූමියවේ. **අකුසල් භූමිය යනු:** තණ්හාව, අවිද්‍යාව, ලෝභය, දෝෂය, මෝහය හා සතර විපල්ලාසයන්ය. මේ 9 කෙලෙස්වල පදනම හෙවත් කෙළෙස් භූමිය වේ. **මූලාශ්‍ර**: ඛු.නි: නෙත්තිප්ප්‍රකරණය: විභාගවාරෝ.

▲ **කුසලයේ අපරිමාණවීම -** Wholesome to be measureless

**අංග තුනක් ඇති** භික්ෂුව නොබෝකලකින් කුසලධර්මයේ අපරිමානබවට, මහත්බවට, විපුලබවට පත්වනබව බුදුන් වහන්සේ වදාළහ:1) ඔහුට නුවණැස ඇත (චකඛුමා හොති) 2) ප්‍රඥාව ඇත - කළයුතු නිසි දේ දනී ( විධුරො) 3) උපකාරය පිණිස හිතවතුන් ඇත ( නිස්සයසමපනෙනා).. **ඔහුට කෙසේ නුවණැස තිබේද?** හෙතෙම, යථාපරිද්දෙන් 'මේ දුක' බව දනී, ... 'මේ දුක නැතිකිරීමේ ප්‍රතිපදාව' බව දනී -සිව්සස් අවබෝධ කරගනී. **ඔහුට කෙසේ ප්‍රඥාව තිබේද?** අකුසල ධර්ම පහ කරීම පිණිස ඔහු වීරිය වඩයි; කුසල් දහම් ඇතිකරගැනීමට, වැඩිකරගැනීමට වීරිය කරයි; ඔහු ශක්තිමත්ය, ඔහුගේ විරිය-උත්සාහය ස්ථාවරය, කුසල ධර්ම වර්ධනය පිණිස කළයුතු දේ අතහැර නොදමයි. **ඔහුට කෙසේ උපකාර කරන හිතවතුන් සිටීද?** මේ භික්ෂුව, කලින් කලට බහුශ්‍රැත , ධර්මය දායදකරගත් (ආගතාගමා), ධර්මයේ (ධම්මධර) හා විනයේ නිපුනවූ (විනය ධර) , පාතිමොක්ඛ (භික්ෂු හා භික්ෂුණී පාතිමොක්ඛ) පිලිබඳ දක්ෂවූ (මාතිකාධර ) ජේෂ්ඨ භික්ෂුන් හමුවී, තමනට නොපැහැදිලි, නොතේරුම් ගිය ධර්මතා පිළිබඳව අරුත් විමසයි. එවිට, ඒ උතුම් භික්ෂුන් ඔහුට යහපත් ලෙසින් අවවාද අනුසාසනා කරති. එම අනුසාසනා ඇසීමෙන්- කලින් අප්‍රකට ධර්ම කරුණු ප්‍රකටවේ; අපැහැදිලි ධර්ම කරුණු පැහැදිලිවේ, කලින් විමතිය-සැකය ඇතිකළ කරුණු පිළිබඳව, විමතිය -සැකය දුරුවේ. මේ ධර්මතා තුන ඇති භික්ෂුව නොපමාව කුසල ධර්මතා මහත්කොට, විපුල බවට පත්වේ. **මූලාශ්‍ර**:අංගු.නි: (1):3 නිපාත:3.1.2.10. සූත්‍රය,පි.256,EAN: 3: 20.10 sutta, p. 84.

▲ **කුසීතබව** - laziness: කුසිතබව- අලසකම නිවරණයකි, ධර්ම මාර්ගයට අවහිරයකි. කුසීත පුද්ගලයාට, උද්දච්චය, අසංවරබව හා දුසිරිතය නැතිකරගැනීමට නොහැකිය. අගෞරවය -ගරුනොකිරීම, දොවචස්සතාවය-මුරණ්ඩුබව, නරක මිතුරු (පාපමිත්‍ර) සේවනය නැතිකර ගැනීමෙන් - කලණ මිතුරු සේවනයෙන් කුසීතබව පහවේ. **බලන්න:** අලසකම. **සටහන්**: * බුදුන් වහන්සේ වදාළේ උපන් කුසල ධර්ම පිරිහීමට,අකුසල ධර්ම ඇතිවී, වැඩිවියාමට, කුසිතබව තරම් වෙනත් ධර්මයක් දැකනැතිබවය. අලසකම නීවරණ ධර්මයකි. **බලන්න**: අංගු.නි: (1) 1නිපාත සූත්‍ර, පි. 60, ** කුසිතබව අසද්ධර්මයකි. **බලන්න**: අසද්ධර්මය. ** කුසිතබව නැතිවීම උද්දච්චය නැතිකරගැනීමට උපකාරිවේ, **බලන්න:** උද්දච්චය. **මූලාශ්‍ර**: අංගු.නි: (6):10 නිපාතය:

10.2.3.6 තයොධම්ම සූත්‍රය,පි.284, EAN:10: Tens,76-6.Incapable, p. 524.

▲ **කුසිනාරා-**Kusinara: බුදුන් වහන්සේගේ මහා පරිනිර්වාණය සිදුවූ මේ ස්ථානය 'මල්ල රජ දරුවන්ගේ සල් උයන', උතුරු ඉන්දියාවේ පිහිටි ස්ථානයකි. සැදැහැති කුලපුත්‍රයෙක් විසින් දැකියයුතු සංවේග කටයතු ස්ථානයකි. **බලන්න:** මහා පරිනිර්වාණ සූත්‍රය,පූජනිය සිව් ස්ථාන. **මූලාශ්‍රය:** අංගු.නි: (2 ):4 නිපාත: 4.3.2.8. සංවේජනීය සූත්‍රය, පි. 254, EAN:4: 118.8 Inspiring, p. 191.
▲ **කිසාගෝතමී තෙරණිය**-Kisagothami Therani:බලන්න: උප ග්‍රන්ථය:2

▲ **කේසකම්බිලි පොරෝනාව -** Matted hair blanket: මේ උපමාව යොදාගෙන ඇත්තේ මක්ඛලිගෝසාල නම් අන්‍ය ආගමික නායකකගේ දහමේ අයහපත පෙන්වා දීමටය. කේසකම්බිලි නම් පොරෝනය- කෙස්වලින් ගොතා ඇති වස්ත්‍රයකි, එය සියලු වස්ත්‍ර අතුරින් නරකම වස්ත්‍රයවේ. එය ශිතකාලයේ ශිතය, උෂ්ණ කාලයේ උෂ්ණය, දුගඳය, දුරුවර්ණය. එලෙසින් මක්ඛලිගෝසාල ගේ ඉගැන්වීම් සෑම කාලයකම අයහපත ගෙනදේ.**බලන්න:** මක්ඛලිගෝසාල, උපග්‍රන්ථය:5. **මූලාශ්‍රය:** අංගු.නි: (1): 3 නිපාත:3.3.4.5 සූත්‍රය, පි.554.

▲ **කෙසල්ගස-** Banana tree: කෙසෙල්ගසේ ඵලය නිසා ඒ ගස විනාශයට පත්වේ, එලෙස ලාභ සත්කාර වලට යටවීම නිසා සංඝයා විනාශයට පත්වීම මෙහි දක්වා ඇත. **බලන්න:**නිදානවග්ග: ලාභසත්කාර සංයුත්ත: 5.4.5 අත්තවධ සූත්‍රය.
▲**කැසබුවා-**Turtle : කැසබුවා -කුම්ම-කච්චප ලෙසින්ද පෙන්වා ඇත. බුදුන් වහන්සේ, පෙර කාලයක විලක ජිවත්වූ කැසබුවන් පිලිබඳ කතාවක් වදාළ බව මෙහි විස්තර කර ඇත. කැසබු පියා, එම විලෙන් බැහැරට නොයන ලෙස කැසබු පුතාට අවවද කළද, ඒ නො ඇසූ පුතා විලෙන් බැහැරට ගොස් මස් වැද්දකුට හසුවිය. වැද්දා යකඩකටුවක් සහිත හුයකින් (ලනුව) ඒ කැසබු පුතාට විද ඌ විනාශට පත් කරන ලදී. ලාභසත්කාර ආදියට යටවීමෙන්, සංඝයා විනාශයට පත්වීම පෙන්වා දීමට බුදුන් වහන්සේ මේ කථාව පවසා ඇත. මෙහි වැද්දා යනු මාරයාය, යකඩ කටුව ලාභ සත්කාර ආදියය, හුය තණ්හාවය. තණ්හාව නිසා ලාභසත්කාර ආදියට ගිජුවන මහණ මාර්ගයේ පරිහානියට පත්වේ. **බලන්න:** කැසබුවා උපමාව. උපග්‍රන්ථය:5. උපමා. **මූලාශ්‍රය:**සංයු.නි: (2): නිදානවග්ග: ලාභසත්කාරසංයුත්ත:5.1.3 කුම්මසූත්‍රය, පි.368.
▲ **කොසඹෑනුවර**-Kosamba Nuwara: කොසඹෑනුවර, ඝෝසිතආරාමය, එ නුවරේ වැසියෙක් වූ ඝෝසිත ගහපති බුදුන් වහන්සේ ඇතුළු සංඝයාට පූජා කර ඇත. **බලන්න:**උපග්‍රන්ථය:3.

**කශ**

▲ **කාශ්‍යප බුදුන් වහන්සේ-** The Buddha Kassapa: ගෝතම බුදුන් වහන්සේට පෙර වැඩසිටි බුදුන් වහන්සේය. ගෝතම බුදුන්වහන්සේ පෙර ජීවිතයක, කාශ්‍යප වහන්සේ ගේ සසුනේ පැවිදිව වාසය කල විස්තරය මෙහි දක්වා ඇත. **බලන්න:** බු.නි: බුද්ධවංශ, ඝටිකාර බ්‍රහ්ම. **මූලාශ්‍ර:** සංයු.නි: (1 ): දේවපුත්ත සංයුත්ත: 2.3.4. ඝටිකාර සූත්‍රය, පි. 140, ESN: 2: Devaputtasamyutta: 24.4 Ghatikāra, p. 201.

▲**කාශ්‍යප දේවපුත්‍ර**- Kassapa Devaputtha: මේ දේවපුත්‍රයන් බුදුන් වහන්සේ හමුවීමට පැමිණීම මෙහි විස්තර කර ඇත. **සටහන**: උදයවය නුවණ දැක ධ්‍යාන වඩා අරහත්වය ලබන අන්දම මෙහි සඳහන් කර ඇත. **මූලාශ්‍ර**: සංයු.නි: (1 ): දේවපුත්ත සංයුත්ත:සුරියවග්ග: කස්සප සූත්‍ර2කි, පි.112.

▲ **කාශ්‍යප මහා තෙර**-Kassapa mahathera: **බලන්න**: උප ග්‍රන්ථය:1

**කෂ**

▲**ක්‍ෂත්‍රියන්**- khattiyas: ක්‍ෂත්‍රිය (ඛත්තිය) යනු ශාක්‍ය වංශයට අයත් පිරිසය. බුදුන් වහන්සේ ශාක්‍යවංශයේ උපත ලද හෙයින් උන්වහන්සේ ‘‘ශාක්‍යමුණි’’ලෙසින් හඳුන්වයි. උන්වහන්සේගේ ශ්‍රාවක භික්ෂූන්, ‘‘ශාක්‍යපුත්ත’’ ලෙසින් දක්වා ඇත. එක් සමයක ජානුස්සෝනි බ්‍රාහමණයා විසින් විමසානු ලැබුව බුදුන් වහන්සේ ක්‍ෂත්‍රියන් ගැන මෙසේ පවසා ඇත:‘‘ඔවුන්ගේ අභිප්‍රාය (අරමුණ-aim) නම් ධනයය (භෝග-Wealth).ඔවුන්ගේ සෙවීම (ගවේශනය-quest) ප්‍රඥාවයය, ඔවුන්ට ඇති ආධරය (support) බලයය (power), ඔවුන්ගේ කැමැත්ත රට-දේශය ලබා ගැනීමය, ඔවුන්ගේ අවසාන ඉලක්කය රාජ්‍යත්වයය’’. **මූලාශ්‍රය:** අංගු.නි: (4): 6 නිපාත:ධම්මිකවග්ග: 6.1.5.10 ඛත්තිය සූත්‍රය, පි.154.

▲ **කෘෂ්ණමග**-Black way: කෘෂ්ණමග-කළුමග- දුක්දෙන මග ලෙසින් පෙන්වා ඇත්තේ මිථ්‍යාදිට්ඨිය සහිත වැරදි මගය. **මූලාශ්‍රය:** අංගු.නි: (6): 10 නිපාත: අරියවග්ග: 10.3.5.2 සුඛමග සූත්‍රය, පි. 474.

▲**ක්‍ෂණය -** opportunity: ක්‍ෂණය යනු අවකාශය: යමක් කරගැනීමට හැකිවීමය. ධර්මය ලබාගැනීමට කාලය ලැබීම, අවස්තාව ලැබීමය. **බලන්න**: අක්‍ෂණය හා ක්‍ෂණය.

▲ **ක්‍ෂණසම්පත්තිය -**opportune moment: ධර්මය ලෝකයේ පවතින විට එය අවබෝධ කරගැනීමට කෙනෙකුට ඇති වාසනාව, අවස්ථාව ක්‍ෂණසම්පත්තිය ය. **බලන්න**: අක්‍ෂණය හා ක්‍ෂණය. **මූලාශ්‍ර**:අංගු.නි: (5): 8 නිපාත: 8.1.3.9 අක්ඛණ සූත්‍රය, පි. 150, EAN: 8: 29.9 Inopportune Moments, p. 427.

▲**ක්‍ෂණික අභිඥා**-Kshanika Abhinna: ක්‍ෂණික අභිඥා - ඛිප්පාභිඤ්ඤා - ක්‍ෂණිකව අවබෝධය යනු ධර්මය ඇසූ පමණින් අවබෝධ කර අරහත්වය ලැබීමය. බුදුන් වහන්සේගේ සසුනේ ක්‍ෂණික අභිඥා ලැබූ සංඝයා අතුරින් අග්‍ර ස්ථාන ගෙන ඇත්තේ: බාහිය දාරුචිරිය රහතුන් හා භද්‍රා කුණ්ඩල කේසි තෙරණිය. **බලන්න**: උපග්‍රන්ථය:1,2

▲ **ක්‍ෂය නුවණ**-Knowledge of the destruction of defilements: ක්‍ෂය නුවණ- ක්‍ෂය ඥානය යනු සියලු කෙළෙස් ප්‍රහීන කරගත් බව- ආසවක්ඛය - දන්නා නුවණ. මෙය ඇතිවන්නේ අරහත්වයට පත් විමෙන්ය. තෙවිජ්ජා - ත්‍රිවිධ විද්‍යා අතුරින් අවසාන නුවණය. මෙය උත්පාදයිතව්‍ය ධර්ම **යකි. බලන්න**: ආස්‍රව හා ආස්‍රව ක්‍ෂය කිරීම, උත්පාදයිතව්‍ය ධර්ම, තෙවිජ්ජා.**මූලාශ්‍ර:** දීඝ.නි : (3 ): 11 දසුත්තර සූත්‍රය, පි. 483, EDN: 34: Dasuttara Sutta: Expanding Decades, p. 384.

▲**ක්‍ෂාන්තිය**:පාලි:**ඛන්ති**- Patience: ධර්මයේ ක්‍ෂාන්තිය ලෙසින් පෙන්වා ඇත්තේ කුමන කාරණයක් උදෙසාවත් නොකිපී, ඉවසීම ඇතිව කටයුතු කිරීමය. බුද්ධත්වය ලබාගැනීමට පතන බෝසත්වරු විසින් සම්පූර්ණ කරගත යුතු උතුම් ගුණයකි-පාරමිතාවකි.**බලන්න**: අක්‍ෂාන්තිය.

▼ **ඉවසීම උතුම් තපස** යයි බුදුන් වහන්සේ වදාළහ:**"ඛන්ති පරමං තපො තිතික්ඛා..." සටහන්: *** දීඝ.නි: මහාපාදන සූත්‍රයේ ද ක්ෂාන්තිය උතුම් තපස යයි බුදුන් වහන්සේ පෙන්වා ඇත.** ම.නි: කකචූපම සූත්‍රයේදී ඉවසීම පුරුදු පුහුණු කරන අන්දම විස්තර කර ඇත. **මූලාශ්‍ර:**ඛු.නි : (1): ධම්මපද: බුද්ධ වග්ග: 6 නි ගාථාව, පි. 99.

▼ **බුදුන් වහන්සේ** ක්ෂාන්තිය පිළිබඳව යහපත් ලෙසින් වදාරා ඇත. ඒ ධර්මතාවය සංඝයා එක්ව, ධර්මයේ චිරස්ථිතිය පිණිස සජ්ජායනා කිරීම සුදුසු ය යි සැරියුත් මහා රහත් සංඝයාට උපදෙස් දී ඇත. **මූලාශ්‍ර**: දිඝ.නි: (3):10 සංගිති සූත්‍රය, පි. 372, EDN: 33 Saṅgīti Sutta: The Chanting Together, p. 362.

▼ **ක්‍ෂාන්තිය** - ලෝකයා කෙරෙහි ඉවසීම ඇති පුද්ගලයා බොහෝදෙනාට ප්‍රියමනාප කෙනෙක් බව බුදුන් වහන්සේ පෙන්වා ඇත. මේ ගුණය සුගතියට මගකි. **මූලාශ්‍ර:** අංගු.නි: (3): 5 නිපාත: 5.5.2.5 හා 5.5.2.6 අක්ඛන්ති සූත්‍ර, පි. 432, EAN: 5: 215.5 & 216.6 Impatience, p. 306.
▲ **කුෂ්ඨ සැදුන සිවලා**-the fox with skin disease: **බලන්න:** සිවලා උපමාව: උපග්‍රන්ථය:5

**කහ**

▲ **කහවනු**-kahawanu: බුදුන් වහන්සේ වැඩසිටි සමයේ මුදල් ලෙසින් භාවිතා කර ඇත්තේ කහවනුය. ඒවා පිළිගැනීම සංඝයාට අකැපය. **බලන්න:** විනය.
▲ **කුහකබව:** පාලි: **කුහනං-** duplicity: කුහකබව යනු ඍජු නැතිබවය, දෙපිටකාට්ටු ලෙසින්ද හඳුන්වයි, අකුසලයකි. මේ ගුණය ඇතිවිට ආධ්‍යාත්මික මර්ගය වඩා ගැනීමට නොහැකිවේ.**බලන්න**:උත්තරිය මනුස්ස ධම්ම.
▼**කුහකගති** ඇති සංඝයා බුදුන් වහන්සේගේ ශ්‍රාවකයන් නොවේ, ඔවුන්හට ආධ්‍යාත්මික මග වඩා ගත නොහැකිය. එහෙත්, එම ගති නැති සංඝයා ඒකාන්තයෙන්ම සද්ධර්මයේ වැඩීමට පත්වේ. **මූලාශ්‍ර**: ඛු.නි: ඉතිවුත්තක: 4.1.9 කුහ සූත්‍රය, පි. 500.
▼ **කුහකගති ඇති** භික්ෂුව, ඔහු සමග වසන සෙසු සංඝයාට අප්‍රියවේ, අගරුවේ. එහෙත්, එම ගති නොමැති මහණ සෙසු අයට ප්‍රියවේ, ගරුවේ. **මූලාශ්‍ර**: අංගු.නි: ( 3 ): 5 නිපාත: 5.2.4.3 කුහක සූත්‍රය, පි. 200, EAN:5: 83.3 A Schemer, p. 269.

## ඛ කොටස:ඛග,ඛජ,ඛත,ඛන,ඛණ,ඛප,ඛම,ඛය,ඛල

**ඛග**

▲ **ඛග්ග** (පාලි): **කඟවේනා-** the Rhinoceros: කඟවේනා ගේ අඟ **(විසාණ)** ලෙසින් හුදකලාව (ඒකචාරීව) හැසිරීමේ යහපත් වේ. වනයේ සිටින තිත්මුවා නොබැඳි (වැද්දාටහසුනොවී) , ගොදුරු පිණිස සුදුසු තැනකට යන්නේද, එලෙස, නුවණැති මිනිසා, සෛවරීත්වය (නිදහස-නිවන) පිණිස කඟවේනා ගේ අඟ ලෙසින් එකලාව හැසිරෙන්නේය:
**"මිගො අරඤ්ඤම්හි යථා අබද්ධො- යෙනිච්ඡකං ගච්ඡති ගොචරාය, විඤ්ඤූ නරො සෙරිතං පෙක්ඛමානො- එකො චරෙ ඛග්ගවිසාණකප්පො"**
.**බලන්න**:කඟවෙනා උපමාව:උපග්‍රන්ථය:5 **මූලාශ්‍ර:** ඛු.නි: සුත්ත නිපාත: උරගවග්ග: 1-2 ඛග්ගවිසාණ සූත්‍රය, පි. 31, Khaggavisanasutta: Translated by Bhikkhu Sujato: Suttacetral.

**ඛජ**

▲ **ඛජ්ජනීය**(පාලි): බිඳීයාම - Being devoured : ඛජ්ජනීය ලෙසින් පෙන්වා ඇත්තේ විනාශවීයාම, බිඳීයාමය. බුදුන් වහන්සේ පෙන්වා ඇත්තේ රූපය -කය බිඳීයන ස්වභාවය ඇතිබවය. ශිතය, උෂ්ණය, බඩගින්න, පිපාසය මගින්ද, මැසි මදුරු ආදී ලේ උරාබොන සතුන් නිසාද, සුළං, හිරුඑළිය, සර්පයන් දෂ්ඨ කිරීම නිසාද රූපය බිඳී යයි. **බලන්න**: පංචඋපාදානස්කන්ධය. **මූලාශ්‍ර**: සංයු.නි: (3 ) ඛන්ධසංයුත්ත: 1.2.3.7 ඛජ්ජනීය සූත්‍රය, පි. 176, ESN:22: 79.7 Being Devoured, p. 1059.

**ඛත**

▲**ඛත්තිය**-khattiya: ඛත්තිය යනු ක්ෂත්‍රියන්ය, ශාක්‍ය වංශයට අයත් පිරිසය. **බලන්න**: ක්ෂත්‍රියන්

▲**ඛත්තිය රජ**-khattiya king: ඛත්තිය (ක්ෂත්‍රිය) රජ කෙනෙක් හට ගුණ අංග 5 ක් ඇත: 1) පරම්පරා සතක් පුරාම මව හා පියාගේ පාර්ශ්වයන් ගේ පිරිසිදු කුලය ඇතිව උපත ලබා ඇතිබව 2) ඔහුට මහා ධන ස්කන්ධයක් ඇත 3) සිව් යුද සේනා සහිත ඔහු මහා බලසම්පන්නය 4) ඔහුගේ උපදේශක- පුරෝහිත මහා ප්‍රඥාවන්තයෙකි 5) එම ගුණ 4 සහිතව මහා යසස් කීර්තියක් ඇතිව, ඛත්තිය රජ ජයග්‍රාහිව තමන්ගේ රාජ්‍යයේ, කැමති දිසාවක වාසය කරයි. **මූලාශ්‍රය**: අංගු.නි: (3) 5 නිපාත: රාජවග්ග: ඛත්තිය රාජ සූත්‍රය, පි.268

**ඛන**

▲ **ඛන්ති** Khanti: ඛන්ති: 1) ක්ෂාන්තිය -ඉවසීම ලෙසින් ද, 2) යම් දෙයක් පිලිබඳ විමසා ලබන නුවණ, අවබෝධය ලෙසින්ද පෙන්වා ඇත. **බලන්න:** ක්ෂාන්තිය, දිට්ඨිනිජ්ඣානඛන්ති.

▲ **ඛන්තිඥානය**-Khanti Nana: ඛන්තිඥානය (ක්ෂාන්ති ඥානය) නම් රූප වේදනා සංඥා සංඛාර විඥාන (පංච උපාදානස්කන්ධය) අනිත්‍ය ලෙසින්, දුක ලෙසින්, අනාත්ම ලෙසින් දැකීමය. **මූලාශ්‍රය:**ඛු.නි: පටිසම්භිදා 1: මහාවග්ග: ඥාණකථා: 41 ඛන්තිඥානය, පි. 222.

▲ **ඛන්ධ**- aggregates: ධර්මයේ ඛන්ධ ලෙසින් පෙන්වා ඇත්තේ පංච උපාදානස්කන්ධයට ඇතුලත් පංච ස්කන්ධයන්ය:රූප, වේදනා, සංඥා, සංඛාර,විඥාන යන උපාදානස්කන්ධයන්ය. සියලු ඛන්ධ -ස්කන්ධ යන්ගේ යථාබව අවබෝධ කරගැනීම විමුක්ති මාර්ගය බව බුදුන් වහන්සේ පෙන්වා ඇත. විස්තර පිණිස **බලන්න**: සංයු.නි: (3) ඛන්ධසංයුත්තය.

▼**සියලු ඛන්ධ** (පංචඋපාදානස්කන්ධය) අනිත්‍ය බව අවබෝධ කරගැනීමෙන් කලකිරීම ඇතිවේ. කිසිවකට නො ඇලි, දුකින් මිදේ, මග බඹසර අවසාන කරගනී. **සටහන**: මේ සූත්‍රය දේශනා කර ඇත්තේ, රාහුල තෙරුන්හටය. **මූලාශ්‍රය**:සංයු.නි: (2) නිදානවග්ග: රාහුලසංයුත්ත: 6.1.10 ඛන්ධසූත්‍රය, පි.402.

▼ **ඛන්ධ විස්තර කරන වෙනත් සූත්‍ර:**: සංයු.නි: (3) ඛන්ධසංයුත්ත: අත්තදීපවග්ග: 1.1.5.6 ඛන්ධසූත්‍රය, පි.112, ඔක්කන්තිසංයුත්ත: 4.1.10 ඛන්ධසූත්‍රය, පි.476, උප්පාදසංයුත්ත: 5.1.10 ඛන්ධසූත්‍රය, පි.482, කෙළෙසසංයුත්ත:කෙළෙසවග්ග: 6.1.10, ඛන්ධසූත්‍රය,පි.492.

▲ **ඛිනාසවබල**- Powers of destroying taints: ඛිනාසවබල ලෙසින් පෙන්වා ඇත්තේ, ආසාව පහකර ගත් භික්ෂුවට (අසේඛ- රහතන් වහන්සේ) ඇති බලයන්ය: 1) සියලු සංඛාර අනිච්චබව යථා භූත නුවණින්

දැනීම 2) සියලු කාම ආසා ගිනිඅඟුරු වලක් ලෙසින් යථා භූත නුවණින් දැනීම 3) හුදකලා විවේකයට බරවී නෙක්කම්ම සුවය විඳීම 4) සතර සති පට්ඨානය මනාව පිහිටුවා ගැනීම 5)- 8) සතර ඉද්දිපාද, ආධ්‍යාත්මික පංච ඉන්ද්‍රිය, සප්ත බොජ්ඣංග, ආරිය අටමග යහපත් ලෙසින්ම වර්ධනයවීම. **මූලාශ්‍ර:** අංගු.නි: ( 5): 8 නිපාත: 8.1.3.8 ඛිනාසවබල සූත්‍රය, පි. 148, EAN:8: 28.8 Powers-2, p. 426.

**ඛණ**

▲ **ඛීණාසවො** (පාලි): **අසවක්ෂය**- destroyed the taints: ඛීණාසවො යනු සියලු ආසව පහ කරගත් පුද්ගලයාය, එනම් රහතන්වහන්සේය. මෙය රහතුන් හඳුන්වන පදයකි. **බලන්න**: රහතන්වහන්සේ.

**ඛප**

▲ **ඛිප්පාභිඤ්ඤා** -Kippabinna: ඛිප්පාභිඤ්ඤා ලෙසින් පෙන්වා ඇත්තේ ධර්මය ශ්‍රවනය කළ විගසින්ම, අවබෝධ කරගැනීමේ හැකියාවය. **බලන්න:** උග්ඝටිතඤ්ඤු, බාහිය දාරුචාරි රහතුන්, භද්‍රා කුණ්ඩලකේසි තෙරණිය, අභිඥා.

▲ **ඛිප්පනිසන්ති-**Khippanisanti: ඛිප්පනිසන්ති යනු කුසල් දහම වහා දකිනාසුළුබවය**. බලන්න**: අලං.

**ඛම**

▲ **ඛේම**-Security: ඛේම: රැකවරණය-ආරක්ෂාව, සුරක්ෂිත බව, නිරුපද්‍රව බව ය. මෙය නිවන හඳුන්වන පදයකි. සිව්ජාන සමාපත්තියට සම වැදීම, සංඥාවේදිත නිරෝධ සමාපත්තියට සම වැදීම සුරක්ෂිත බවය. **ඛේමපත්ත** (attained security) : නිරුපද්‍රැබව ලැබීම- නිවනලැබීමය. **මූලාශ්‍ර**: අංගු.නි: (5): 9 නිපාත, ඛේමවග්ග සූත්‍ර, පි. 568, EAN: 9: I Security- suttas. p. 485.

▲**ඛේමතෙර-** Khema Thera: **බලන්න**: උපග්‍රන්ථය:1.

▲ **ඛේමාතෙරණිය-**Khema Thersaniya **බලන්න**: උපග්‍රන්ථය:2

▲ **ඛේමදේවපුත්‍ර**- Khema Devaputhra: මේ දේවපුත්‍රයා, බුදුන් වහන්සේ බැහැදැක, අයහපත් කම්ම විපාක පිලිබඳ ව කළ සාකච්ඡාව මේ සූත්‍රයේ දක්වා ඇත. **මූලාශ්‍රය**:සංයු.නි: (1) සගාථවග්ග:දේවපුත්‍ර සංයුත්ත:2.3.2 ඛෙමසූත්‍රය, පි.136.

▲**ඛේමකතෙර-** Khemka Thera:**බලන්න**: උපග්‍රන්ථය:1

▲**ඛේමිය අඹවනය-**Khemiya Mango grove: බරණැස්නුවර පිහිටි, සංඝයා වැඩසිටි අරණකි. උදේන තෙරුන් මෙ වනයේ වැඩසිටි බවසූත්‍ර දේශනාවල පෙන්වා ඇත**. බලන්න**: උදේන තෙර:උපග්‍රන්ථය1.

▲ **ඛෝමදුස්ස ගම-**Khomaduss village: මෙ ගම ශාක්‍යා ජනපදයේ ගමකි. බුදුන් වහන්සේ දෙසූ දහම අසා මෙ ගම් වැසියෝ උපාසකයන් විය. **බලන්න**:උපග්‍රන්ථය:3

**ඛය**

▲**ඛය**-Khaya: ඛය ලෙසින් මෙහිදී පෙන්වා ඇත්තේ ක්ෂය කිරීමය, ආසව නැතිකරගනිමය. **බලන්න:** ආස්‍රව හා ආස්‍රව ක්ෂය කිරීම **මූලාශ්‍රය:**සංයු.නි: (5-1) මහාවග්ග: බොජ්ඣංගසංයුත්ත:2.3.6 ඛයසූත්‍රය, පි.204

▲**ඛයඤාණං** (පාලි): **ක්ෂය නුවණ** - Knowledge of the destruction of defilements: ධර්මයේ ඛය ඤාණං ලෙසින් පෙන්වා ඇත්තේ අරහත් මාර්ගය ලැබීමෙන්, සියලු කෙළෙස් නැති කර ගත් බව දන්නා

අවබෝධයය. ආසවක්ඛය ලෙසින්ද පෙන්වා ඇත. එම නුවණ, උත්පාදයිතව්‍ය ධර්මයකි- උපදවාගතයුතු ධර්මතාවයකි. **බලන්න:** උත්පාදයිතව්‍ය ධර්ම, ආශ්‍රව හා ආශ්‍රව ක්‍ෂය කිරීම. **මූලාශ්‍ර:** දීඝ.නි : (3 ): 11 දසුත්තර සූත්‍රය, පි. 483, EDN: 34: Dasuttara Sutta: Expanding Decades, p. 384.

▲**ඛයධම්ම-**Khayadhamma: ඛයධම්ම යනු නැතිවීයන බවය. සියල්ල ක්ෂය-ඛය වැනසුළුය යි බුදුන් වහන්සේ පෙන්වා ඇත. **මූලාශ්‍රය:**සංයු.නි: (4): සළායතනවග්ග:වේදනාසංයුත්ත:ජාතිධම්මවග්ග: 1.4.7 ඛයධම්ම සූත්‍රය, පි.84.

▼**රූප…විඥාන** ආදි ඛන්ධ 5, ඛයධම්ම යයි මෙහි පෙන්වා ඇත. ඒවා නැසෙනසුළුබව අවබෝධ කිරීම අරහත්වය ලැබීමය. නැසෙනසුළු සියල්ල කෙරහි කැමැත්ත පහ කර ගත යුතුවේ. **සටහන**: මේ දේශනා කර ඇත්තේ රාධ තෙරුන්හටය. **මූලාශ්‍රය:**සංයු.නි: (4): සළායතනවග්ග :රාධසංයුත්ත:2.2.9 ඛයධම්මසූත්‍රය, පි.384,2.3.9 ඛයධම්මසූත්‍රය, පි.394, 2.4.9 ඛයධම්මසූත්‍රය, පි.401

**ඛල**

▲**ඛලුපච්ඡාභත්තිකයෝ-** who observe the later-food-refuser's practice: ධූතාංග පුහුණුව ලෙසින්, වලදා අවසන්වූ පසුව ලබන බොජුන් පිළිනොගෙන වාසය කරන සංඝයා ඛලුපච්ඡාභත්තිකයෝ ලෙසින් පෙන්වා ඇත.**බලන්න**:අංගු.නි: (3) 5 නිපාත: ආරඤ්ඤකවග්ග: 5.4.4.10 ඛලුපච්ඡාභත්තික සූත්‍රය, පි.380.

▲ **ඛීල** (පාලි)**: උල-** spike: ඛීල යනු උල හෝ හුල හෝ කටුවය. ධර්මයේ උල් ලෙසින් පෙන්වා ඇත්තේ දුක ගෙනදෙන ධර්මතාවයන්ටය. **සටහන:** ඛීල, නිසරු, ශූන්‍ය (barren) ලෙසින්ද පෙන්වා ඇත**. බලන්න**: ESN: p.1711: **දුක ඇතිකරන උල් 3 කි:** රාග ඛීල, දෝසඛීල හා මෝහ ඛීල. මේ උල්- කෙළෙස්, අවබෝධ කරගැනීමට, ඒවා ප්‍රහීණය කර ගැනීමට අරියඅටමග යහපත් ලෙසින් වර්ධනය කරගත්යුතුවේ. **මූලාශ්‍ර:** සංයු.නි: (5-1): මහාවග්ග:මග්ගසංයුත්ත: 1.15 ඛීල සූත්‍රය, පි.154, ESN: 45: Maggasamyutta: 166.6 Barrenness, p. 1711.

## ග කොටස: ගග,ගච, ගජ,ගඩ,ගත,ගථ,ගද,ගධ,ගන,ගණ, ගප,ගම,ගය,ගර,ගල,ගව,ගස,ගහ

**ගග**

▲ **ගංගානම් ගඟ-**River Ganges : ගංගා නදිය ලෙසින්ද හඳුන්වයි. හිමාල කඳුකරයේ සිට ගලා එන මෙ නදිය බුදුන් වැඩ සිටි සමයේ මෙන්ම අදද, ඉන්දියාවේ ප්‍රධාන ගංගාවක් ලෙසින් සලකනු ලැබේ. අතීත බුදුවරු වැඩසිටින සමයේ මෙ ගඟ, භාගිරථී නදිය ලෙසින් හඳුන්වා ඇත.මෙ නදිය මුල් කරගත් සූත්‍ර ගණනාවක්ම සූත්‍ර පිටකයට ඇතුලත්වි ඇත. **බලන්න**: ධොතක තෙර, ගංගා නදිය උපමා: උපග්‍රන්ථය:5, ගෝතම තිර්ථය.

▼**ගංගානම් නදීය** ආරම්භ වූ ස්ථානයේ සිට මහා සාගරයට එක්වන ස්ථානය අතර ඇති වැලි ප්‍රමානය මෙතෙක්ය යයි කිව නොහැකිය. එම උපමාව යොදාගනිමින් බුදුන් වහන්සේ පෙන්වා ඇත්තේ, කල්පයක්, ඉතා දීර්ඝ නිසා, එය මෙතක් කාලයක් යයි දැක්වීම ම පහසු නොවන බවය. **බලන්න**: උපග්‍රන්ථය:5, කල්පය, **මූලාශ්‍රය**:සංයු.නි: (2) නිදානවග්ග:අනමතග්ගසංයුත්ත: 3.1.8 ගංගාසූත්‍රය, පි.306

**ගච**

▲ **ගෝචර කුසලතා-**Gocharakusalatha: ගොචරකුසලතා ලෙසින් පෙන්වා ඇත්තේ ජානසාමපත්ති ඇති උතුමන් සතු කුසලතාය, ධ්‍යායි පුද්ගලයන්ට ඇති දක්ෂතාවන්ය. මෙහි ඒ ගැන විස්තර කර ඇත.**මූලාශ්‍රය:** සංයු.නි: (3) ඛන්ධවග්ග:ජානසංයුත්ත:13.1.6 ගොචරකුසලතා සූත්‍රය, පි.570.

▲**ගෝචරනානත්ත ඤාණය-**Gochарananaththa nana:බාහිර ආයතන- රූප, ශබ්ද ආදීවූ ධර්මතා පිරිසිඳ දැනගැනීමේ නුවණ ගෝචරනානත්ත ඤාණය වේ. **බලන්න**: ඛු.නි: පටිසම්භිදා:ඤාණකථා: 16 ගෝචරනානත්ත ඤාණය, පි. 170.

▲**ගෝචර භූමිය-**Favorable place: ආධ්‍යාත්මික වර්ධනය පිණිස ගෝචර භූමියේ: සුදුසු බිම, වාසය කළයුතුය. ගෝචර භූමිය-පියා ගේ උරුම භූමිය (පියාසතු විෂය-ancestral domain) ලෙසින් බුදුන් වහන්සේ පෙන්වා ඇත්තේ සතරසතිපට්ඨානය ඇසුරු කරගෙන ජීවත්විමය. ගෝචර භූමිය නොවන්නේ (අගෝචර භූමිය), සාමාන්‍ය පෘතග්ජනයා වාසය කරන පස්කම් ගුණය සහිතව වාසය කිරීමය. එසේ අගෝචර භූමියේ වාසය කරන්නේ නම් මාරයා ගේ විෂයට පහසුවෙන්ම හසුවේ. මේ පිලිබඳ බුදුන් වහන්සේ පෙන්වා ඇති **උපමා**: 1) **කැටකිරිල්ල හා ගිජුලිහිණියා උපමාව**:මඩේ හැසිරෙන කැට කිරිල්ල, වියලි බිමක හැසිරෙන්නේ නම්, පහසුවෙන්ම ගිජුලිහිණියා ට හසුවේ. එහෙත්, තමාගේ විෂයවූ මඩගොඩේ හැසිරේ නම්, ඌට ගිජුලිහිණියා මැඩගෙන, ආරක්ෂාව ලබා ගත හැකිය. එලෙස, පස්කම් ගුණයේ නො ඇලී සතර සතිපට්ඨානයේ (පිය උරුමය- බුදුන් වහන්සේ පෙන්වා දුන් ධර්මයේ) හැසිරෙන මහණහට, මරුගේ විෂයෙන් මිදිය හැකිය.**බලන්න**: උපග්‍රන්ථය:5:**මූලාශ්‍රය**:සංයු.නි: (5-1): මහාවග්ග: සතිපට්ඨානසංයුත්ත:අම්බපාලි වග්ග: සකුනග්ඝී සූත්‍රය, පි.296. 2**) වඳුරා හා මස්වැද්දා උපමාව:** මස් වැද්දෙක්, වඳුරන් දඩයම් කරගැනීම පිණිස දැවයක ලාටු (කොහොල්ලෑ වැනි) තවරා වඳුරන් ගැවසෙන තැනක උගුලක් අටවයි. නුවණැති වඳුරෝ ඒ උගුලක් බව දැන එහි නො පැමිණේ. එහෙත්, අනුවණ මෝඩ වඳුරෙක්, ලාටු කෑමට කැමතිව එහි පැමිණ උගුලේ අසුවේ. පළමුව එක් අතකින් ලාටු අල්ලාගෙන ඒ අත ඇලුන විට ඉන් මිදීමට අනිත් අත යොදාගනී. එලෙස ඌගේ දෙඅත්ද, දෙපයද, මුවද ලාටුවේ ඇලේ, බේරීයාමට අවකාශ නැතිවේ. වැද්දාට, වඳුරා අල්වාගෙන රිසි ලෙසින් කටයුතු කල හැකිවේ. එලෙස, පස් කම් ගුණයේ ඇලෙන මහණ පහසුවෙන්ම මාර විෂයට යටත් වේ. **බලන්න**: උපග්‍රන්ථය:5. **සටහන:** ගොචර භූමිය, ගෝචර විෂය ලෙසින්ද පෙන්වා ඇත. **මූලාශ්‍රය**:සංයු.නි: (5-1): මහාවග්ග: සතිපට්ඨානසංයුත්ත:අම්බපාලි වග්ග:3.1.7 මක්කට සූත්‍රය, පි.298.

**ගජ**

▲ **ගිජ්ජකූට පර්වතය-**Gijjakuta: රජගහනුවර අසල පිහිටි මේ පව්ව ගිජුකුළු පව්ව ලෙසින්ද පෙන්වා ඇත. බුදුන් වහන්සේ හා සංඝයා මෙ ස්ථානයේ වාසය කර ඇති බව බොහෝ සූත්‍ර දේශනාවල දක්වා ඇත.**බලන්න:** උ.ග්‍ර:1,2.

**ගඩ**

▲ ගඩුව: පාලි: **ගණ්ඩො** -Boil: බුදුන් වහන්සේ මේ කය පෙන්වා ඇත්තේ, තැන් 9 කින් සැරව ගලන පැරණි ගඩුවක් (තුවාලයක්) ලෙසින්ය. තුවාලයකින් අපවිත්‍ර දේ ගලා යන ලෙසින්, කයේ නව දොරින්

අපවිත්‍ර, දුගඳ දේ ගලාබසී. මේ කය එසේ සකස්වී ඇත්තේ කර්මය හේතු කොටගෙනය. කයේ යථාබව අවබෝධ කරගත්විට කය පිලිබඳ ඇල්ම නැතිවේ. **බලන්න:** කය,ගඩුව උපමාව-උපග්‍රන්ථය:5 :**මූලාශ්‍ර:** අං.ගු.නි:(5 ) : 9 නිපාත: 9.1.2.5 ගන්ඩෝපම සූත්‍රය, පි. 446, EAN: 9: 15.5 Boil, p. 467.

**ගත**

▲ **ගති-** Destination: ගති- ගතිසම්පත්තිය ලෙසින් පෙන්වා ඇත්තේ කෙනෙක්ගේ භවය- යලි උත්පතිය ඇතිවෙන ස්වභාවය ගැනය.**සටහන**: ගති සම්පත්ති පිලිබඳ විස්තර පිණිස **බලන්න**: ඛු.නි:පටිසම්භිදාමග්ග**:** 6 ගතිකථා.

▼ **බුදුන් වහන්සේ** ගති 5 ක් පෙන්වා ඇත:1) නිරය 2) තිරිසන් ලෝකය 3) ප්‍රේත ලෝකය 4) මිනිස් ලෝකය 5) දේව ලෝක. සතර සතිපට්ඨානය දියුණු කරගැනීමෙන්, ගති -නැවත උපත අවසාන කර ගත හැකිය. **සටහන:** දීඝ.නි. සංගිති සූත්‍රයේ මේ ගති ගැන විස්තර කර ඇත. **මූලාශ්‍ර:** අං.ගු.නි: ( 5): 9 නිපාත: 9.2.2.6 ගති සතිපට්ඨාන සූත්‍රය, පි. 578, EAN:9: 68.6 Destinations, p. 486.

▼**ආනන්ද තෙරුන්ගේ** විමසීමක් අනුව, බුදුන් වහන්සේ සසුනේ සිට මියගිය සංඝයා හා ගිහිඋපාසක යන්ගේ ගතිය-මරණින් මතු ස්වභාවය දක්වා ඇත. **මූලාශ්‍රය**:සං.යු.නි: (5-2) මහාවග්ග: සෝතාපත්ති සංයුත්ත:11.1.8 හා 11.1.9, 11.1.10 ගිඤ්ජකාවස්ථ සූත්‍ර, පි.184.

▼ **ධාතු අනුව කෙනෙක්ගේ ගතිය-** පරලොව උපත වෙනස්වන අන්දම මෙහි දක්වා ඇත. ධාතු හේතුකොටගෙන සංඥාව, දිට්ඨිය, විතර්ක උපදී. අවිධ්‍යා ධාතුව මහත්ය, හීනය. 1) **හීනධාතුව** නිසා ඇතිවෙන්නේ: හීනසංඥාව, හීන දිට්ඨිය, හීන විතර්ක, හීන චේතනාව, හීන ආසාව, හීන ප්‍රාර්ථනාව, හීන පුද්ගලයාය. එවිට හීන වචන උපදී, හීන දේ දේශනා කරයි, පණවයි, පිහිටුවයි, විවෘත කරයි, බෙදයි, විස්තර කරයි. එනිසා ඔහුගේ ගතිය, යළිඋපත හීනවේ. 2) **මධ්‍යම ධාතුව** නිසා... ඉහතකී ආකාරයට ... එනිසා ඔහුගේ ගතිය, යළි උපත මධ්‍යමවේ. 3) **ප්‍රණීත (උසස්)** ධතුව නිසා... ඉහතකී ආකාරයට ... එනිසා ඔහුගේ ගතිය, යළිඋපත උසස්වේ. **මූලාශ්‍රය**:සං.යු.නි: (2) නිදානවග්ග: ධාතුසංයුත්ත:2.2.3 ගිඤ්ජකාවස්ථ සූත්‍රය, පි.260.

▲ **ගීතස්වරයෙන් දහම සජ්ජායනාකිරීම**- Reciting the Dhamma like a song :ගීතස්වරයෙන් ධර්මය සජ්ජායනාකිරීම සංඝයාට සුදුසු නොවේ යයි බුදුන් වහන්සේ පෙන්වා ඇත. **මූලාශ්‍ර**: අං.ගු.නි: (3): 5 නිපාත: 5.5.1.9 ගීතස්සර සූත්‍රය, පි. 426, EAN: 5: 209. 9 Intonation, p. 305.

▲ **ගෝත්‍රභූ** -Matured one: ධර්මයට අනුව, ගෝත්‍රභූ ලෙසින් පෙන්වා ඇත්තේ බුද්ධවංශයට ඇතුලත් පරිණත පුද්ගලයා -ආරිය ශ්‍රාවකයා පිලිබඳවය. ඔහු, උත්තම දස පුද්ගලයන් ගෙන් කෙනෙකි. **බලන්න:** උත්තම දස පුද්ගලයෝ. **සටහන**: විස්තර පිණිස **බලන්න**: ඛු.නි: පටිස්සම්භිදාමග්ග 1,ඥානකතා: 10. ගෝත්‍රභූ ඥානය, පි. 146. **ශබ්දකෝෂ: පා.සිං.ශ:** පි. 279: "**ගෝත්‍රභූ:** කාමලෝකයෙන් එතෙර වන්නා- "**ගෝත්‍රභූචිත්ත:** පෘතග්ජන බව ඉක්මවා ආර්ය ගෝත්‍රයට ඇතුලත් සිත: **ගෝත්‍රභූඤාණ:** කාමලෝකයෙන් එතෙරවන ඥානය". **B.D:** p. 60: "**Gothrabhū:** who has entered the lineage of the Noble ones…".

▲**ගෝතම බුදුන් වහන්සේ-** The Buddha Gothama :අපගේ ගෝතම බුදුන් වහන්සේ පිලිබඳ විස්තර මෙහි දක්වා ඇත. **බලන්න**: බු.නි: බුද්ධවංශය: ගෝතම බුද්ධවංශය,පි.262,උපග්‍රන්ථය:6.
▼**බුදුන්වහන්සේ** බුද්ධත්වය ලබාගැනීම පිණිස කටයුතු කළ ආකාරය මෙහි විස්තරාත්මකව පෙන්වා ඇත. **බලන්න:** උපග්‍රන්ථය:6. **මූලාශ්‍රය**:සංයු.නි: (2) නිදානවග්ග: අභිසමයසංයුත්ත: 1.1.10 ගෝතම සූත්‍රය, පි.38.
▲**ගෝතම ද්වාරය හා ගෝතම තීර්ථය**-Gothma gate & Gothama port බුදුන් වහන්සේ අවසාන චාරිකාවේදී පාටලීගම-නුවර සිට විසාලාමහා නුවරට යෑම පිණිස නුවරින් නික්මුණ දොරටුව **"ගෝතම ද්වාරය"** ලෙසින් නම්කර ඇත. උන්වහන්සේ, ඒ නුවර සිට ගංගානම් නදිය තරණය කල තොටුපොල **"ගෝතම තීර්ථය"** ලෙසින් හඳුන්වා ඇත. **මූලාශ්‍ර**: වින.පි: මහාවග්ග 2: පි 70 හා දීස.නි: (2): මහාපරිනිර්වාන සූත්‍රය, පි.156, EDN : 16 Mahaparinibbana Sutta, p 175.
▲ **ගෝතමී තෙරණිය-** Gothami Therani: මහාප්‍රජාපති ගෝතමීය, ගෝතමී ලෙසින්ද පෙන්වා ඇත. ගිහිකල සුද්ධෝදන රජුගේ බිසවය, සිදුහත් කුමරු ගෙ සුළු මවය.**බලන්න**: උපග්‍රන්ථය:2.
▲**ගෝත්‍රය**-Gothra: ගෝත්‍රය-කුලය-වංශය ලෙසින්ද පෙන්වා ඇත.බුදුන් වහන්සේ වැඩ සිටි සමයේ ප්‍රධාන කුල 4 ක් පැවතිනි: ශාක්‍ය, බ්‍රාහ්මණ, වෛසයා, සුද්ධ. ශාක්‍ය කුලය: රාජකීය කටයුතුද, බ්‍රාහ්මණ කුලය: ආගමික කටයුතුද, වෛසයා කුලය: වෙළඳ කටයුතුද, ශුද්‍ර කුලය: සේවක, කම්කරු ආදී කටයුතු වලද නිරතවුහ. යම් කුලයක උපත ලබා එම කුලයේම ජීවත්වී, මිය යායුතුය යන්න එවක පැවති සම්ප්‍රදායය. බුදුන් වහන්සේ ඒ සම්ප්‍රදායෙන් ඉවත්ව, සම්බෝධිය ලබා, තමන් වහන්සේගේ සසුනට ඇතුළුවීමට ඕනෑම කුලයකින් පැමිණෙන පුද්ගලයන්ට අවස්ථාව ලබා දී ඇත. බුදුන් වහන්සේ දේශනා කර ඇත්තේ කෙනක් උසස් බව ලබන්නේ උපතින් නොව, ධර්මානුකූල යහපත් ජීවිතයක් ගත කිරීමෙන් බවය. **බලන්න**: වසල සූත්‍රය. **සටහන:** ජනසමූහය අතරින් ශාක්‍ය ප්‍රජාව අග්‍රයයි මෙහි දක්වා ඇත. **මූලාශ්‍රය**: සංයු.නි: (2) නිදානවග්ග: භික්ඛුසංයුත්ත:9.1.1. මහා කප්පින සූත්‍රය,පි.460.

**ගථ**

▲**ගූථකූප**-Guthakupa: ගූථකූප ලෙසින් පෙන්වා ඇත්තේ කම්මවිපාක එලදීම පිණිස ප්‍රේතයෙක්ව උපත ලබා හිස අශූචි වලක තබාගෙන ජීවිතය ගතකිරීමය. පෙර ජීවිතයේ පරදාර සේවනය- කාමයෙහි වරදවා හැසිරීමේ විපාකයක් ලෙසින් මෙලෙස දුක් විපාක විඳීමට හේතුවී ඇත. **මූලාශ්‍රය**: සංයු.නි: (2) නිදානවග්ග: ලක්ඛණසංයුත්ත: 7.2.1. ගූථකූප සූත්‍රය, පි.420.
▲**ගූථඛාදී**-Guthakhadi: ගූථඛාදී ලෙසින් පෙන්වා ඇත්තේ කම්මවිපාක එලදීම පිණිස ප්‍රේතයෙක්ව උපත ලබා අසුචි අනුභව කරමින් ජීවිතය ගතකිරීමය. පෙර ජීවිතයේ - කාශ්‍යප බුදුන් සමයේ, රජගහනුවර විසූ දූෂ්‍ය බමුණෙක්, සංඝයාට දනය දෙන බත් ඔරු, අශූචියෙන් පුරවා දීමේ විපාකයක් ලෙසින් මෙලෙස දුක් විපාක විඳීමට හේතුවී ඇත. **මූලාශ්‍රය**: සංයු.නි: (2) නිදානවග්ග: ලක්ඛණසංයුත්ත: 7.2.2. ගූථඛාදී සූත්‍රය, පි.420.
▲**ගූථභාණී**-Guthabhani: ගූථභාණී ලෙසින් පෙන්වා ඇත්තේ, පිරිසක් මැද, නොදුටු නොඇසූ දේ ගැන අසත්‍ය කථා කරන පුද්ගලයාය. ඔහු නිරයගාමීය. **බලන්න**: පුද්ගල වර්ග. **මූලාශ්‍රය:** අංගු.නි: (1) 3 නිපාත: 3.1.3.8 සූත්‍රය, පි.274.

▲ **ගාථා-**verses: ගාථා ලෙසින් පෙන්වා ඇත්තේ, ධර්මය දේශනා කිරීම පිණිස බුදුන් වහන්සේ අනුගමනය කළ ක්‍රමයකි. බුදුන් වහන්සේ වැඩසිටි සමයේ මෙන්ම වර්තමානයේද, සංඝයා හා ගිහි බොදු පිරිස ගාථා, සජ්ජායනා කරති. දෙවියෙක් විසින් විමසනු ලදව, බුදුන් වහන්සේ ගාථා පිලිබඳ මෙසේ දක්වා ඇත: **මාත්‍රාව-ඡන්දස** Meter, ගාථාවක පලංචිය-ඉනිමග හෙවත් මූල කාරණාවය,අක්ෂර මගින් වාක්‍ය- පද සකස්වේ- අරුත ප්‍රකාසවේ, සංඥා- නාම අසුරුකොටගෙන ගාථාවෝ පවතී, ගාථාවේ නිවස කවියාය. විස්තර පිණිස **බලන්න:**ESN:1: note : 120, p. 518. **මූලාශ්‍ර**: සංයු.නි: (1) දේවතාසංයුත්ත: 1.6.10 කවි සූත්‍රය, පි.96, ESN:1: Devathasamyutta: 60.10 Poetry, p, 139.

**ගද**

▲ **ගොදත්ත තෙර**- Godaththa Thera:**බලන්න**: උපග්‍රන්ථය:1

▲ **ගද්දූලබද්ධ**- The leash: ගද්දූලබද්ධ යනු බල්ලෙක් ගැට ගසා තබන කනුවය. එසේ ගැට ගසා ඇති බල්ලා ඒ කනුව වටා දුවයයි. එලෙස, තණ්හාව පහ නොකළ සත්ත්වයෝ, ආරිය ධර්මය නොදත් නිසා, පංච උපාදානස්කන්ධය තමාගේ යයි අල්වාගෙන සසර වටේ කැරකේ යයි බුදුන් වහන්සේ පෙන්වා ඇත. එහෙත්, ධර්මය දත් ආරිය ශ්‍රාවකයා, ඒ බන්ධනයෙන් මිදේ. **බලන්න**:සසර, බල්ලා උපමාව:උපග්‍රන්ථය:5. **මූලාශ්‍ර**:සංයු.නි: ( 3): ඛන්ධසංයුත්ත: 1.2.5.7 ගද්දූලබද්ධ සූත්‍රය, පි. 284, ESN: 22: Khandasamyutta: 99.7 The leash, p. 1090.

**ගධ**

▲**ගොධික තෙර-** Godikha Thera:**බලන්න**: උපග්‍රන්ථය:1

▲ **ගොධා ශාක්‍ය හා කාලි ගොධා-**Godha Sakyan & Kali Godha: **බලන්න:** උපග්‍රන්ථය:5

**ගන**

▲**ගන්ථ:** පාලි: **ගනෙඨා-** knots: ධර්මයේ ගන්ථ - ගැට ලෙසින් පෙන්වා ඇත්තේ ලෝකයා සසර බැඳ තබන ගැට 4 ක් ගැනය. **බලන්න**: කායගන්ථ.

▲ **ගාන්ධර්ව දේවනිකාය-** Celestial musicians: ගාන්ධර්ව යනු සංගීත දෙවියන්ය. මේ දේවනිකාය සියලු දේවලෝකවලට වඩා පහත්ය. තිසරණ සරණ කරගත් යහපත් ශීලය පවත්වාගත් පුද්ගලයන් මරණින් මතු මේ දේව නිකායේ පහළවේ. **බලන්න**: දේවනිකාය **සටහන:** පංචසිඛ ගාන්ධර්ව (පන්සිළු) දේවපුත්‍ර පිලිබඳ විස්තර පිණිස **බලන්න**:සංයු.නි: වේදනාසංයුත්ත: 1.12.6 පංචසිඛ පඤහ සූත්‍රය හා දිඝ:නි: සක්බපඤහ සූත්‍රය. **මූලාශ්‍ර**: දීඝ.නි: (2): 5.ජනවසභ සූත්‍රය, පි,322, EDN: 18 Janavasabha Sutta (17), p. 209.

▲ **ගන්ධබ්බකායික දේවනිකාය-** devas of the gandhabba order: ගන්ධබ්බකායික දේවියන් ලෙසින් පෙන්වා ඇත්තේ සුවඳට අරක් ගත් දෙවියන්ය. ඔවුන්: සුවඳ මුල් ඇති ගස්, සුවඳ හරය ඇති ගස්, සුවඳ පොතු ඇති ගස්, සුවඳ අතු ඇති ගස්, සුවඳ කොළ ඇති ගස්, සුවඳ මල් ඇති ගස්, සුවඳ ඵල ඇති ගස්, සුවඳ පැණි ඇති ගස් ආදිය අරක්ගෙන සිටි. තුන් දොරින් සුචරිත ක්‍රියාවල යෙදුන පුද්ගලයන් මරණින් මතු ගන්ධබ්බ කායික දේවියන් ලෙසින් පහළවේ. **සටහන**: සංයු.නි: එම දේවනිකාය ගැන විස්තරාත්මකව පෙන්වා ඇත. **මූලාශ්‍ර**: සංයු.නි: ( 3 ): ඛන්ධවග්ග:10

ගන්ධබ්බකාය සංයුත්ත, පි. 532, ESN: 31:Gandhabba saṃyutta, p. 1156.

▲**ගින්න**: පාලි**: අග්ගි-** fire: ධර්මයට අනුව ගින්න-අග්නි ලෙසින් පෙන්වා ඇත්තේ සිත දවන කෙළෙස් ගිනි පිලිබඳවය. **බලන්න**: ආදිත්තපරියාය සූත්‍රය, අග්නි. **සටහන**: බුදුන් වහන්සේ වැඩසිටි සමයේ අන්‍යආගමිකයන් ගිනිදෙවියාට පූජා- අග්නිහොම ආදිය කළබව සූත්‍ර දේශනා වල දක්වා ඇත.

▼**සියල්ල ගිනිගෙන ඇත: ගිනි 11 කි:** රාග, දෝස, මෝහ, ජාතිය, ජරාව, මරණය, ශෝකය, පරිදේවය (වැළපීම්), දුක, දෝමනස්ස , උපායාස (බලාපොරොත්තු කඩවීමෙන්). ( Burning with the fire of lust, with the fire of hatred, with the fire of delusion; burning with birth, aging, and death; with sorrow, lamentation, pain, displeasure, and despair) **සියල්ල -සබ්බ යනු**: 1) ඇස 2) රූප 3) ඇසේ විඥානය - චක්ඛුවිඥාණය 4) චක්ඛු සම්ඵස්සය 5) චක්ඛුසම්ඵස්සය නිසා ඇතිවෙන ත්‍රිවිධ වේදනා (දුක, සැප, මැදහත්) 6) කණ 7) ශබ්ද 8) සෝතවිඥානය 9 ) සෝතසම්ඵස්සය 10) සෝතසම්ඵස්සය නිසා ඇතිවෙන ත්‍රිවිධ වේදනා 11) නාසය 12) ගඳසුවඳ 13) ඝානවිඥානය 14) ඝානසම්ඵස්සය 15) ඝානසම්ඵස්සය නිසා ඇතිවෙන ත්‍රිවිධ වේදනා 16) දිව 17) රස 18) ජිව්හා විඥානය 19) ජිව්හා සම්ඵස්සය 20) ජිව්හා සම්ඵස්සය නිසා ඇතිවෙන ත්‍රිවිධ වේදනා 21) කය 22) ඵොට්ඨබ්බ 23) කායවිඥානය 24) කාය සම්ඵස්සය 25) කාය සම්ඵස්සය නිසා ඇතිවෙන ත්‍රිවිධ වේදනා 26) මනස 27) ධර්මතා 28) මනෝවිඥානය 29) මනෝ සම්ඵස්සය 30) මනෝ සම්ඵස්සය නිසා ඇතිවෙන ත්‍රිවිධ වේදනා. ඒ බව දකින ශ්‍රැතවත් ආරිය ශ්‍රාවකයා ඇස... ආදීවූ ඒ සැමදෙය ගැන කලකිරේ, කලකිරීම නිසා ඒවාට නො ඇලේ, නො ඇල්ම නිසා මිදේ, මිදුනවිට, 'මිදුනා' යයි දැන ගනී. ජාතිය අහවරවිය, බඹසර වාසය නිමාකරගති, අරහත්වය පිණිස කලයුතු දේ කර නිමකරන ලදී, ඒ පිලිබඳ වෙනත් කිසි දෙයක් කිරීමට නැතය යි දැනගනී. **සටහන**: මේ සූත්‍රය ශ්‍රවණය කල භික්ෂූන් 1000 කගේ සිත් උපාදාන රහිතව කෙළෙස් වලින් මිදී අරහත්වයට පත්වුහ. **මූලාශ්‍ර:** සංයු.නි: ( 4 ): සළායතනසංයුත්ත: සබ්බවග්ග 1.3.6 ආදිත්තපරියාය සූත්‍රය, පි. 64, ESN: 35: Salayathnasamytta: III: The All: 28.6 Burning, p. 1227.

▼**සියල්ල ගිනිගෙන ඇත යන ආදිත්ත පරියාය ධර්මන්‍යාය:ඒ ධර්ම න්‍යාය කුමක්ද?** 1) ඇසේ විඥානයයට බැඳී, ගන්නා නිමිති ආස්වාදය නිසා කර්ම විපාක ඇතිවේ. එම අවස්ථාවේ කෙනෙක් මරණයට පත්වුවේනම් ඔහු දුගතියේ උපත ලබයි. ඒ ස්පර්ශය වෙනුවට ගිනිදැල් සහිත යකඩ උලකින් ඇස ස්පර්ශය කිරීම වඩා හොඳය. 2) එලෙස, කණේ විඥානයට බැඳී, ගන්නා නිමිති ආස්වාදය නිසා..... ඒ සප්ර්ශය වෙනුවට ගිනිදැල් සහිත යකඩ උලකින් කණ ස්පර්ශය කිරීම වඩා හොඳය 3) ... ගිනිදැල් සහිත තියුණු නියනකින් නාසය ගලවා දැමීම හොඳය 4) ගිනිදැල් සහිත තියුණු කතුරකින් දිව කපා දැමීම හොඳය 5) .... ගිනිදැල් සහිත තියුණු පිහියකින් කය කපා දැමීම හොඳය 6)...එලදායි නොවන සිතුවිලි (සංඝ භේදය වැනි) සිතින් සිතනවාට වඩා නිදගැනීම හොඳය. **සටහන**: නින්ද වනාහි, ජීවත්වන මිනිසුන්ට වඳ බව-නිසරුබව ගෙනදෙන, ඵල රහිත දෙයක් යයි වදාළ බුදුන් වහන්සේ මෙහිදී පෙන්වා ඇත්තේ, සිතින් අයහපත් අරමුණු අල්වා ගෙන ඒවාට බැඳෙනවාට වඩා නිදාගැනීම

හොඳබවය. එලෙස, ආයතන (අභ්‍යන්තර හා බාහිර) මගින් ඇතිවන ස්පර්ශයේ විඳීම් වල අනිත්‍යබව, ඒවායේ ආදීනව මෙනෙහිකරන ආරිය ශ්‍රාවකයා, ඒවා ගැන කලකිරේ, කලකිරී ඒවාට නො ඇලේ. නො ඇල්මෙන් මිදේ, මිදුනවිට විමුක්තිය ලැබුබව අවබෝධ කරගනී. (අරහත්වය ලැබුබව).උපමාව:ගිනිදැල්;උපග්‍රන්ථය:5.**මූලාශ්‍ර**:සංයු.නි:( 4 ): සළායතනවග්ග: වේදනාසංයුත්ත: 1.18.8 ආදිත්තපරියාය ධර්ම න්‍යාය සූත්‍රය, පි. 358, ESN: 36: Vedanasamyutta: Ocean: 235.8 The Exposition on Burning, p. 1311.

▲ **ගින්න විවිධබව-**Variety of fire: **1) ගිනිතුනක්**: රාග ගින්න, දෝස ගින්න හා මෝහ ගින්න යයි කෙළෙස් ගිනි 3 ක් ඇතය යි බුදුන් වහන්සේ වදාළහ: **රාගගින්න**: කාමයෙන් මුලාවූ මිනිසුන් මේ ගින්නෙන් දැවේ. **දෝසගින්න**: ව්‍යාපාදයෙන් පෙලුණ, ප්‍රාණඝාතය කරන මිනිසුන් මේ ගින්නෙන් දැවේ. **මෝහගින්න:** ආරිය ධර්මයේ අදක්‍ෂ, පංච උපාදානස්කන්ධය ට ඇලුන මිනිසුන් මේ ගින්නෙන් දැවේ. ඔවුන් මාර බන්ධනයෙන් මිදී නැත, දුගතියේ උපත හිමිය. **ගිනිනිවීම:** කෙනෙක් ධර්මයෙහි යෙදි, අශුභය (අශුභ භාවනාව) වඩයි නම් ඔහුට රාග ගින්න නිවාගත හැකිය; මෙත්තාව (මෙත්තා භාවනාව) වඩන්නේ නම් දෝස ගින්න නිවාගත හැකිය, ප්‍රඥාව වඩා ගැනීමෙන්- විදර්ශනා භාවනාව මෝහ ගින්න නිවාගත හැකිය. **මූලාශ්‍රය**:ඛු.නි: ඉතිවුත්තක: 3.5.4 අග්නි සූත්‍රය, පි. 472.

▼**වෙනත් ගිනි 3** ක් ගැන සංගිති සූත්‍රයේ පෙන්වා ඇත: 1) මාපිය නමැති ගින්න (ආහුනෙය්‍යඅග්නිය) : මාපියන් හට ගරුකිරීම මින් අදහස් වේ 2) ගෙහිමියා නමැති ගින්න (ගෘහපත්‍යඅග්නිය): ගෙහිමියාට ගරු කිරීම 3) ධර්ම ගුරුවරු නමැති ගින්න (දක්ෂිණේය අග්නිය): දහම උගන්වන ගුරුවරුන්- සංඝයාට ගරු කිරීම. **මූලාශ්‍ර**: දිඝ.නි: (3): 10 සංගිති සූත්‍රය- පි. 381 , EDN: 33 Saṅgīti Sutta: The Chanting Together, p. 367.

▼**ගිනි හතක්** ගැන මේ සූත්‍රයේ පෙන්වා ඇත: 1-3) රග, දෝස,මෝහ 4) ආහුනෙය්‍ය ගින්න: මාපියන්ට නොසැලකීම නිසා නිරයේ විඳීමට ඇති දුක 5) ගහපති ගින්න: ගෙහිමියාට යහපත් ලෙසින් නො සැලකීම නිසා බිරිඳට ඇතිවන දුක 6) දක්ෂිණාගර්භ ගින්න:සංඝයාට නින්දා පරිභව කිරීමෙන් ඇතිවෙන දුක7) කාෂ්ටකගින්න: දර ආදිය නිසා ඇතිවෙන ගින්න. **මූලාශ්‍ර:**අංගු.නි: (4): 7 නිපාත:මහායඤ්ඤවග්ග: 7.1.5.3 අග්ගි සූත්‍රය, පි.364.

▲**ගිනි කන්ද**-Mass of fire: රාගයට යටවීම ගිනි කන්දකට ඇතුළුවීමට වඩා දුක් ගෙනදෙන බව බුදුන් වහන්සේ පෙන්වා ඇත. **මූලාශ්‍ර:** අංගු.නි: ( 4): 7 නිපාත: 7.2.2.8 අග්ගිකන්ධඋපමා සූත්‍රය, පි. 484, EAN:7: 72.8 Fire, p. 402.

▲**ගින්නේ ආදීනව-**Dangers of fire: ගින්න නිසා සිදුවන ආදීනව 5 ක් බුදුන් වහන්සේ පෙන්වා ඇත: 1) ඇසට අහිතකරය 2) සමේ වර්ණය අඳුරු කරයි 3) දුබලබව ඇතිකරයි 4) වෙනත්අය හා ඇසුර ඇතිකිරීමට හේතුවේ 5) නිෂ්ඵල කතා කිරීමට නැඹුරු කරයි. **මූලාශ්‍ර:** අංගු.නි: ( 3) 5 නිපාත: 5.5.2.9 අග්ගි සූත්‍රය, පි. 436, EAN:5: 219.9 Fire, p. 307.

▲**ගිනිදෙවියන් පිදීම-** Fire sacrifice: ගිනි දෙවියන් පිදීම, බුදුන් වහන්සේ වැඩසිටි සමයේ බ්‍රාහ්මණයන් විසින් පැවැත්වූ ආගමික චාරිත්‍රයකි. **බලන්න**: යගහෝම. **මූලාශ්‍ර:** සංයු.නි: (1): බ්‍රාහ්මණසංයුත්ත: 7.1.8

අග්ගිකසූත්‍රය, පි. 322,ESN: 7: Brahmanasamytta: 8.8 Aggika, p. 364.
▲**ගුන්දාවනය-**Gunda forest: මධුරා පුරයේ, පිහිටි මේ වනය, මහා කච්චාන තෙරුන් හා සංඝයා වැඩසිටි ස්ථානයකි: **බලන්න:**මහා කච්චාන තෙර.

**ගණ**

▲ **ගණකමොග්ගල්ලාන බ්‍රාහ්මණ-** Brahmin Ganakamoggallana **බලන්න**: උපග්‍රන්ථය: 3

▲ **ගණිකාව**-courtesan: ගණිකාව, නගර ශෝභනිය ලෙසින්ද පෙන්වා ඇත. බුදුන් වහන්සේ රජගහ නුවර වැඩවාසය කරන සමයක, නගරයේ පිරිස් කාණ්ඩ 2ක්, එහි වාසය කල නගර ශෝභනිය ගැන සණ්ඩු සරුවල්, ගහගැනීම් ආදිය කරගැනීම නිසා බොහෝ දුක් කරදරවලට පත්වුහ. ඒ පිලිබඳව බුදුන් වහන්සේ මෙසේ වදාළහ: **" පස්කම් සැප සොයන විට, පතන විට, දැන් හෝ මතුවේ, කෙළෙස්වලින් පිඩාවට පත්වේ, දුකට පත්වේ, රාගය, ද්වේශය වලින් බැඳී විනාශවේ...".** **මූලාශ්‍රය**: බු.නි: උදානපාලිය:ජාතිඅන්ධවග්ග: 6.8. ගණිකා සූත්‍රය, පි.300.
▲ **ගුණමකුබව**: පාලි: **මක්ඛ** - denigration: ගුණමකුබව, මකුබව ලෙසින්ද හඳුන්වයි. අනුන්ගේ ගුණ යටකිරිමට ඇති කැමැත්ත. අයහපත් කර්මවිපාක ඇතිකරන කෙලෙසකි. **බලන්න**: සල්ලේඛපරියාය.

**ගප**

▲**ගෝපක තෙර-**Gopaka Thera: බලන්න: උපග්‍රන්ථය:1
▲**ගෝපක මොග්ගලාන බ්‍රාහ්මණ-** Brahmin Gopakamoggallana **බලන්න**: උපග්‍රන්ථය:3
▲**ගෝපාල-**Cow herd: බුදුන් වහන්සේ කොසොල් දනව්වේ සැරිසරන විට හමුවූ ගොපල්ලෙක්, බුදුන් වහන්සේ වෙතින් දහම අසා පැහැදී බුදුන්වහන්සේ ඇතුළු සංඝයාට දන් පිරිනමා සතුටින් සිටින අවස්ථාවේ, ඔහුගේ සතුරෙක්, ඒ ගොපල්ලාගේ ජීවිතය නැති කළේය. ඒ පිළිබඳ බුදුන් වහන්සේ මෙසේ උදානයක් වදාළහ: **" සතුරෙක් සතුරෙකුට හෝ වෛරඇත්තෙක්, වෛරඇත්තෙකුට යම් විනාශයක් කරන්නේනම්, වරදවා පිහිටුවා ගත් සිත ඔහු මහා පාපී තරයෙක් කරන්නේය".** **මූලාශ්‍රය**: බු.නි: උදානපාලිය: මෙඝියවග්ග: 4.3 ගෝපාල සූත්‍රය, පි.230.
▼**අයහපත් ගුණ 11ක් ඇති** ගොපල්ලෙකුට (ගවපාලකයෙක්) තමාගේ ගව පට්ටිය හොඳින් රැක බලා ගත නොහැකිය. එහෙත්, යහපත් ගුණ 11ක් ඇතිවිට ඔහුට ගව පට්ටිය හොඳින් රැක බලා ගත හැකිවේ. එලෙස අවගුණ 11ක් ඇති මහණහට ධර්ම මාර්ගය වඩාගත නොහැකි බව බුදුන් වහන්සේ මෙහිදී පෙන්වා ඇත. එහෙත්, ගුණ 11 ක් ඇති මහණ මාර්ගය සාක්ෂාත් කරගනි:ගෝපාලක උපමාව:උපග්‍රන්ථය:5. 1) **රූපඥවීම**: සතරමහා භූතයන්ගෙන් හටගත් උපාදාය රූපයේ යථාභූත බව අවබෝධකිරීම. 2) ලක්ඛණකුසලය ඇතිවීම: බාලයා හා පණ්ඩිතයා ගේ ලක්ෂණ දැනගැනීම 3) අකුසල විතක්ක: කාමවිතක්ක, ව්‍යාපාදවිතක්ක, විහිංසාවිතක්ක දුරුකිරීමට සමත්ය 4) ඉන්ද්‍රිය සංවරය තිබීම 5) තමන් අවබෝධ කරගත් ධර්මය යහපත් ලෙසින් අන්‍යයන්ට දේශනා කිරීම 6) ධර්මවිනය දත් ජේෂ්ඨතම භික්ෂුන් වෙතින් නොදත් දහම් කරුණු අසා දැනගැනීම 7) ධර්මය දේශනා කරනවිට ඔහු අර්ථය, ධර්මය මැනවින් අවබෝධ කර සිත ප්‍රමෝදය කරගනි (අර්ථවේදය, ධම්මවේදය). 8) ආරියඅටමග යථාභූත කොට අවබෝධ කරගැනීම 9) සතර සතිපට්ඨානය

(සිවු සීවටන්) යථාභූත කොට අවබෝධ කරගැනීම 10 ) ගිහියන් පිරිනමන සිව්පසය යහපත් ලෙසින් පිළිගැනීමට අවබෝධය ඇත (මාත්‍රය දැනීම). 11) වැඩිහිටි, ප්‍රසිද්ධ තෙරුන් කෙරෙහි ගෞරව, භක්තිය ඇතිව සිටීම. **මූලාශ්‍රය:** අංගු.නි: (6) 11 නිපාත: අනුස්සතිවග්ග: 11.2.7 ගෝපාලක සූත්‍රය, පි.682.

**ගම**

▲**ගම්භිර ප්‍රඥාව:**පාලි: **ගම්භීරපඤ්ඤා-** depth of wisdom: ධර්මතා පිළිබඳ ඇති ගැඹුරු අවබෝධය ගම්භිර ප්‍රඥාව වේ. රූපය පිළිබඳව නිරෝධානුපස්සනාව**,** වැඩීමෙන් නැවත නැවත එහි යෙදීමෙන් ගම්භිර ප්‍රඥාව පරිපූර්ණවේ: "**නිරොධානුපස්සනා, රූපෙ නිරොධානුපස්සනා භාවිතා බහුලීකතා ගම්භීරපඤ්ඤං පරිපූරෙති**". **ගම්භිර ප්‍රඥාව යනු කුමක්ද?** ස්කන්ධ...ධාතු...ආයතන...හේතුඵල (පටිච්චසමුප්පන්න), ශූන්‍යතාඵල ලැබීම්...සිව්පිළිසිඹියාව...ශිල සමාධි ප්‍රඥා ස්කන්ධ...විමුක්ති ස්කන්ධය හා විමුක්ති ඥාන දර්ශන ස්කන්ධය ...ස්ථාන අස්ථාන... විහාරසමාපත්ති...ආර්යසත්‍ය සත්තිස්බෝධි පාක්‍යධර්ම... ආර්යමාර්ගය... ශ්‍රමණඵල...අභිඥා...පරම අර්ථයවූ නිවන යන ධර්මතාවන් පිළිබඳ ඇති ගැඹුරු අවබෝධය, නුවණය. තවද, රාගය, දෝෂය, මෝහය, ක්‍රෝධය, උපනාහය, මක්ඛය, පළාසය, ඊර්ෂ්‍යාව, මාත්සර්යය, මායාව, සාඨෙය්‍ය, ස්තම්භය, මානය, අතිමානය, මදය, ප්‍රමාදය, යන සියලු කෙළෙස්, සියලු දුශ්චරිත, සියලු අභිසංස්කාර, සියලු භවගාමී කර්ම අභිභවනය කිරීම, මැඩලීම ගම්භිර ප්‍රඥාව නම්වේ. **මූලාශ්‍රය:**ඛු.නි: පටිසම්භිදා මග්ගපකරණය (3): ප්‍රඥාවග්ග: 3.1 ප්‍රඥා කථා, පි. 166-176.

▼ **ගම්භිර ප්‍රඥාව ඇතිවීම පිණිස සතර ධර්මය උපකාරිවේ:** 1) සත්පුරුෂ සේවනය 2) සද්ධර්ම ශ්‍රවණය 3) යෝනිසෝමනසිකාරය 4) ධර්මයට අනුකූලව පිළිපැදීම (ධර්මානුධර්ම ප්‍රතිපදාව) සෝතාපන්නඅංග ඇති පුද්ගලයාට ගම්භිර ප්‍රඥාව ඇතිවේ. **"...ඉමෙ ඛො භික්ඛවෙ, චත්තාරො ධම්මා භාවිතා බහුලීකතා ගම්භීරපඤ්ඤාතාය සංවත්තනතිති"** (...these four things, when developed and cultivated lead to the depth of wisdom) **සටහන:** මෙයින් පෙන්වා දෙන්නේ සෝතාපන්න ආරිය ශ්‍රාවකයාය. **බලන්න**: ප්‍රඥාව, සතර ධර්මය. **මූලාශ්‍ර**:සංයු.නි: (5-2): මහාවග්ග: සෝතාපන්න සංයුත්ත:11.7.4. ගාම්භීර ප්‍රඥා සූත්‍රය, පි. 280, ESN: 55: Sotapatthi samyutta: Great Wisdom: p. 2262.

▼**කායගතා සතිය වැඩීම,** විපුල කරගැනීම ගම්භිර ප්‍රඥාව ඇතිවීමට හේතුවේ. (Mindfulness directed to the body...when developed and cultivated, leads to the depth of wisdom). **මූලාශ්‍ර:** අංගු.නි: (1): 1 නිපාත: කායගතාසති වග්ග සූත්‍ර, පි. 125 EAN:1: Mindfulness Directed to the Body, p.52.

▼**වෙනත් මූලාශ්‍ර: 1.** "ගැඹුරු වූ ස්කන්ධාදීන් කෙරෙහි පැවැති දැනීම ගම්භීරපඤ්ඤා නම් වේ" .**අන්තර්ජාල ලිපිය**: https://pitaka.lk/dhammapada/ss/katha-28.html

▲ **ගොමපිඬුව** - Pinch of Cow dung: පංචඋපාදානස්කන්ධයේ අනිත්‍ය ස්වභාවය පෙන්වීම පිණිස බුදුන් වහන්සේ ගොමපිඬුව උපමාව පෙන්වා ඇත**. බලන්න**: උපග්‍රන්ථය:5. **මූලාශ්‍රය:** සංයු.නි: (3) ඛන්ධසංයුත්ත: පුප්ඵවග්ග: 1.2.5.4 ගෝමයපිඬුඋපමා සූත්‍රය, පි.274.

**ගය**

▲ **ගයාකාශ්‍යප තෙර**-Gayakassapa Thera : **බලන්න**: උපග්‍රන්ථය:1

▲ **ගයිහ**-Attached: මෙහිදී ගයිහ -ග්‍රහණය කරගැනීම ලෙසින් පෙන්වා ඇත්තේ දෙවියෝ හා මිනිසුන් පංචකාම සැපයට ඇලීමය. එනිසා ඔවුන් දුක් විඳී. බුදුන් වහන්සේ හා රහතුන් ඒ ඇලීම් පහකර ඇත, ඒ උතුමෝ සුවයෙන් වෙසෙති. **මූලාශ්‍රය:** සංයු.නි: (4): සළායතනවග්ග: වේදනා සංයුත්ත:දේවදහවග්ග: 1.14.3 සගයිහ සූත්‍රය, පි.280.

**ගර**

▲**ගර්භිණිය**- Garbhini: ගර්භිණිය යනු දරුවෙක් කුසේ දරා සිටින (දරුගැප්) කාන්තාවය. බුදුන් වහ්සේ සැවැත්නුවර වැඩ වාසය කරන සමයක, එක්තරා ගර්භිණී පරිව්‍රාජිකාවක්, සිය සැමියාට කතාකර, දරුවා ප්‍රසූතිකිරීමට උපකාරවන තෙලක් ගෙනඑන ලෙස ඉල්ලා සිටියාය. ඒ පරිව්‍රාජකයා, පසේනදී රජුවිසින් ශ්‍රමණ හා බ්‍රාහ්මණයන් හට තලතෙල්, ගිතෙල් ආදිය සපයන ස්ථානයට පැමිණියහ. එහි පානය කිරීමට මිස ගෙනයාමට තෙල් නොදෙන නිසා, ඔහු හැකිතාක් තෙල් බී, නිවසට පැමිණ එය වමාරා බිරියට දීමට තැත් කලත් එසේ කළ නොහැකිවිය. ඔහු මහා දුක් පීඩා නිසා බිම පෙරලී වේදනාවෙන් පසුවෙන අයුරු දැක බුදුන් වහන්සේ මෙසේ වදාළහ: "කෙනෙක් හට රාග ආදී කෙළෙස් නොමැති නම් ඔහු සුඛිතවේ. එහෙත්, රාගය නිසා අනුන් හා  බැඳුණ ජනයා දුකට පැමිණේ". **මූලාශ්‍රය**: ඛු.නි: උදානපාලිය:මුචලින්දවග්ග: 2.6 ගර්භිණී සූත්‍රය, පි.182..

▲ **ගෞරවය හා අගෞරවය** -respect & disrespect: ආධ්‍යාත්මික වර්ධනය පිණිස අන් අයට ගෞරව කිරීම වැදගත්වේ. අන්‍යන්ට අගෞරව කිරීම අකුසලයකි, ධර්ම මාර්ගයට බාධාවකි. **කෙනෙක් ධර්මයේ** ප්‍රමාදනම්, අන් අයට අගෞරවය කිරීම පහ කරගැනීම පහසු නොවේ. හිරිඔත්තප්ප තිබීම, අප්‍රමාදය මගින් අන් අයට අගෞරවය කිරීම පහකර ගත හැකිය. **මූලාශ්‍ර**: අංගු.නි: (6):10 නිපාතය: 10.2.3.6 තයොධම්ම සූත්‍රය,පි.284, EAN:10: Tens,76-6.Incapable, p. 524.

▲ **ගෞරව ධර්ම:** පාලි: ගාරවා ධම්මා- respectful dhamma: ගෞරවය යනු, ගරු කලයුතු උතුමන්ට, ගරු කලයුතු ධර්මතාවන්ට ගරු පූජා කිරීම-යටහත් බවක් දැක්වීමය. බුදුන් වහන්සේ ගෞරව ධර්ම 6ක් පෙන්වා වදාළේ, ඒවා ආධ්‍යාත්මික මාර්ගයට විශේෂත්වයක් ගෙනදෙන කරුණු බවය. **බලන්න**: විශේෂභාගිය ධර්ම, අගෞරව ධර්ම.

▼**ගෞරව ධර්ම 6**: 1) ශාස්තෘන් වහන්සේ කෙරෙහි 2) ධර්මය කෙරෙහි 3) සංඝයා කෙරහි ගෞරවය ඇත, යටහත් පැවතුම් ඇත. 4) පුහුණුවට 5) ප්‍රමාදයට 6) ආචාර සම්පන්න බවට ගරු කරයි. **සටහන**: ආචාරසම්පන්න බව (**පටිසනඤාරො**). **බලන්න**: ආචාරසම්පන්න බව. **මූලාශ්‍ර:** දීඝ.නි : (3 ): 11 දසුත්තර සූත්‍රය, පි. 483, EDN: 34: Dasuttara Sutta: Expanding Decades, p. 384, අංගු.නි: (3 ): 5 නිපාත: 5.1.1.9, 5.1.1.10 අගාරව සූත්‍ර, පි. 34 හා 5.1.3.1 හා 5.1.3.2  අගාරව සූත්‍ර පි. 48, EAN: 5: 8.8 & 9.9 Falling away, p. 239 & 21.1 & 22.2. Irreverent, p. 241.

▼ **බුද්ධත්වය ලැබීමෙන් පසු** කවරෙකුහට ගෞරවකරමින් වාසය කලයුතුද යයි බුදුන් වහන්සේට විතර්කයක් ඇතිවූ බව, ඒ පිලිබඳ සොයා බැලීමේදී උන්වහන්සේ අවබෝධ කරගත් සද්ධර්මයට ගරු සත්කාර කරමින් වාසය කලයුතුය යන අදහස ඇතිවූ බව මෙහි පෙන්වා ඇත. එම අවස්ථාවේ සහම්පති බ්‍රහ්මරාජයා, බුදුන් වහන්සේ හමුවට පැමිණ, සියලු බුදුවරු සද්ධර්මයට සත්කාර ගෞරව කරමින් වාසය කරන්නේය යයි

පවසා ඇත.**බලන්න**:උපග්‍රන්ථය:6. **මූලාශ්‍රය:** සංයු.නි: (1) සගාථවග්ග: බ්‍රහ්මසංයුත්ත: 6.1.2 ගාරව සූත්‍රය, පි.278.

▲ **ගරුකකර්ම-**Garuka kamma: ගරුක කර්ම ලෙසින් පෙන්වා ඇත්තේ අකුසල වූ ආනන්තරික කර්ම හෝ කුසලවූ, ජානසමාපත්ති ලැබීමය. කර්ම විපාක දෙන අවස්ථාව් ඒවා බලවත් නිසා සෙසු කර්මයන්ට පෙරටුව සිටි. **බලන්න**: කම්ම.

▲**ගරුපුද්ගල-** garu pauggala: ගරු පුද්ගල යනු ධර්මයේ හැසිරෙන උතුම් පුද්ගලයන්ය. එවැනි පුද්ගලයන් 4ක් ගැන මෙහි දක්වා ඇත: ශිලගරුක, සමාධි ගරුක, ප්‍රඥා ගරුක. **මූලාශ්‍රය**: අංගු.නි: (2) 4 නිපාත: 4.3.4.7 ගරුපුග්ගල සූත්‍රය, පි.286.

▲**ගරුබව හා අගරුබව-**Respectful & not respectful: ගරුබව යනු වෙනත් පුද්ගලයෙක් කෙරෙහි ප්‍රියමනාප ඇතිව සැලකිලි ඇතිව කටයතු කිරීමය. එලෙස නොකිරීම අගරුබවය. සංඝයා තමන් සමග වාසය කරන අය හා ගරුකටයුතු ලෙසින් හැසිරිය යුතු ආකාරය මෙහි පෙන්වා ඇත. **සටහන**: මංගල සූත්‍රයේදී, උතුමන්ට ගරුකර සැලකීම (**ගාරවො ච**) මංගල කරුණක් බව පෙන්වා ඇත. **මූලාශ්‍රය**:අංගු.නි: (3): 5 නිපාත: ථෙරවග්ග: 5.2.4.5 අකන්ඛම සූත්‍රය, පි. 202

▲ **ගුරුලා-**Gurula: ගුරුලා ලෙසින් මෙහි පෙන්වා ඇත්තේ සුපණ්ණයන් ගැනය. **බලන්න**: සුපණ්ණ

▲ **ගිරිමානන්ද තෙර-** Girimananda Thera:**බලන්න:** උපග්‍රන්ථය:1

**ගල**

▲ **ගිලන්බව-** sickness: ගිලන්බව ආකාර 2 කි: කය ගිලන්වීම හා සිත ගිලන්වීම. බුදුන් වහන්සේ පෙන්වා ඇත්තේ කය ගිලන් වුවත් සිත ගිලන් නොකරගෙන වාසය කලයුතුබවය. **බලන්න**: කය ගිලන්බව, සිත ගිලන් නොකරගැනීම. **මූලාශ්‍ර:** සංයු.නි:(3), ඛන්ධසංයුත්ත:නකුල පිතු සූත්‍රය, පි 30,ESN: 22: Khandasamyutta, 1.1 nakulapita, p. 1007.

▼**ගිලන් පුද්ගලයන්** තිදෙනක්ගේ ස්වභාවය මෙහිදී පෙන්වා ඇත**.** **බලන්න**: පුද්ගලවර්ග. **මූලාශ්‍රය**:අංගු.නි: (1) 3 නිපාත: 3.1.3.2 සූත්‍රය, පි. 264.

▼**ගිලනුන්ට උපදෙස්:** දැඩිව ගිලන්වූ, නුවණැති ගිහි උපාසකයන් පිළිබඳව ක්‍රියා කලයුතු ආකාරය ගැන බුදුන් වහන්සේ මෙසේවදාළහ. එම කටයුතු කලයුත්තේ වෙනත් නුවණැති කෙනෙක් විසින්ය. 1) දැඩිසේ ගිලන්වූ, දුකට පත් කෙනෙක්, ඔහුට ඇති සිව් දහම (තෙරුවන් කෙරහි ඇති ප්‍රසාදය හා ආරියකාන්ත ශිලය) සිහිකර අස්වැසිය යුතුය. 2) දෙමාපියන්, අඹුදරුවන් කෙරෙහි යම් අපේක්ෂාවක් ඇත්නම් එය හැර දැමීමට උනන්දු කලයුතුය: 'ඔබ මැරෙන ස්වභාවය ඇත, අන්‍යන් කෙරෙහි අපේක්ෂාවක් තිබුනද, නැතිවුවද ඔබ මරණයට පත්වේ. එනිසා ඒ අපේක්ෂා ප්‍රහීණය කරගන්න'. 3) මිනිස් ලෝකයට යළි පැමිණීමට අපේක්ෂාවක් ඇත්නම් එය හැර දැමීම පිණිස සදෙව්ලෝකයේ දෙවියන්ගේ යහ ගුණ පෙන්වා දිය යුතුය. චාතුර්මහා රජකිය දෙව්ලොව ගැන අපේක්ෂාවක් ඇත්නම්, එයට වඩා උසස් තව්තිසා දෙව්ලොව ගුණ ...එලෙස ක්‍රමයෙන් සෙසු දේවලෝක වල සිත පිහිටුවා ගැනීමට උපකාරීවීම. 4) බ්‍රහ්ම ලෝක ඒවාට වඩා උසස් බව පෙන්වා දීම, ඒවායේ සිත පිහිටුවා ගැනීමට උපකාරීවීම. 5) බ්‍රහ්ම ලෝක පවා අනිච්ච ස්වාභාවය ඇතිබව පෙන්නාදී, 'සත්කායනිරෝධය' පිළිබඳ සිත පිහිටුවා

ගැනීමට උපකාරීවීම. එලෙසින්, ගිලන් පුද්ගලයා සත්කායනිරෝධයේ සිත පිහිටුවා ගත්තේ නම්, ඔහු, වසර 100ක් මිදුණ සිත ඇති මහණ අතර විමුක්තිය ලැබීම පිලිබඳ වෙනසක් නැතය යි බුදුන් වහන්සේ පෙන්වා ඇත.**සටහන්:** * මේ සූත්‍රය දේශනා කර ඇත්තේ මහානාම ශාක්‍යයන්හටය ** නුවණැති උපාසක ලෙසින් පෙන්වා ඇත්තේ සෝතාපන්න ගිහියාය. **මූලාශ්‍රය:** සංයු.නි: (5-2): මහාවග්ග: සෝතාපත්තිසංයුත්ත: 11.6.4 ගිලාන සූත්‍රය, පි. 270.

▼**ගිලන්බවට පත් මහණ** සතර සතිපට්ඨාන වඩමින්, ස්කන්ධ පරිනිර්වානය අපෙක්ෂා කරමින් වාසය කලයුතු යයි බුදුන් වහන්සේ අනුසාසනා වදාළහ. **සටහන:** බුදුන් වහන්සේ ගිලන් සංඝයා හමුවීම පිණිස විටින් විට ගිලන් ශාලාවන් වෙත වැඩම කර ඔවුන් ගේ සිත සුවපත් කිරීම පිණිස ධර්මයෙන් අනුසාසනා වදාළ බව සූත්‍ර පිටකයේ බොහෝ ස්ථාන වල දක්වා ඇත. **මූලාශ්‍රය:** සංයු.නි: (4) සළායතනවග්ග: වේදනාසංයුත්ත:1.20.7 හා 1.20.8 ගෙලඤ්ඤ සූත්‍ර, පි.424.

▼**ගිලන් මහණ පංචධම්ම** ආවර්ජනය කරමින් වාසය කරන්නේ නම් ඔහුට පහසුවිහරණය ඇතිවේ යයි මෙහි දක්වා ඇත. 1) අශුභ සංඥාව 2) ආහාරයෙහි ප්‍රතිකූල සංඥාව 3) සබ්බ ලෝකයේ අනභිරති සංඥාව 4) සියලු සංස්කාරයන්හි අනිත්‍ය සංඥාව 5) මරණ සංඥාව. **මූලාශ්‍රය:** අංගු.නි: (3) 5 නිපාත: ගිලානවග්ග:5.3.3.1 ගිලානසූත්‍රය, පි.254.

▲ **ගිලාන උපස්ථානය**-Caring for sick people: ගිලන්වූ අයට උපස්ථානය කිරීමේ වැදගත්කම බුදුන් වහන්සේ මෙසේ පෙන්වා ඇත: **"මහණෙනි, ... ඔබලාට මවක් නැත, පියෙක් නැත. ඔබහැම ඔවුනොවුනට උවැටන් නො කරන්නහු නම් එකල්හි කවරෙක් උවැටන් කරන්නේද? මහණෙනි, යමෙක් මගේ අවවාදය කරන්නේනම්, හෙතෙම ගිලන්අයට උවැටන් කරන්නේය". සටහන:** කිසිවෙක් විසින් උපස්ථාන නොකළ බලවත්ව රෝගීව සිටි භික්ෂුවක්, බුදුන් වහන්සේ විසින් උපස්ථාන කරන ලදී. අනතුරුව, බුදුන් වහන්සේ ඉහත අනුසසනාව වදාළහ. **සටහන්:** ගිලනුන්හට උවැටන් කරන අය තුළ (උපස්ථායක) තිබිය යුතු සුදුසුකම් ගැන විස්තර පිනිස **බලන්න:** අංගු.නි: (3) 5 නිපාත: ගිලානවග්ග: 5.3.3.3 ,5.3.3.4 සූත්‍ර, පි.256. **මූලාශ්‍රය**: වින.පි. මහා වග්ග පාළිය 2: චීවරඛන්ධ:39, පි 228.

▲ **ගුලිස්සානි භික්ෂුව**-Bhikkhu Gulissaani: මේ භික්ෂුව ආරණ්‍යවාසි වුවද ඔහු සතුවූවේ පහත් ගුණයන්ය. සැරියුත් තෙරුන් එම භික්ෂුව අරභයා මේ සූත්‍රය වදාළහ, මුගලන් මහා තෙරුන්ද එම කරුණු අනුමතකළහ. ආරණ්‍යවාසි සංඝයා ජීවත්විය යුතු ආකාරය මෙහි විස්තරාත්මකව පෙන්වා ඇත. **මූලාශ්‍රය**: ම.නි: (2) 2.2.9 ගුලිස්සානි සූත්‍රය, පි.244.

**ගව**

▲**ගවදෙන-** the cow: යම්කිසි පර්වතයක කන්දක හැසිරෙන ගවදෙන (ගාවි) ඒ පර්වතය ගැන නොදත් නිසා, එහි හොඳින් හැසිරීමට අසමත්වේ. එසේ හැසිරෙන නිසා ඌ දුකට පත්වේ, නිදුකින් පෙරළා යාමට අසමත්වේ. මේ උපමාව යොදාගෙන බුදුන් වහන්සේ පෙන්වා ඇත්තේ අනුවණ- බාල මහණ, තම ක්ෂේත්‍රය නොදැන ජාන සමාපත්ති ලබා ගැනීමට උත්සාහ කර, එය සාර්ථක කර ගැනීමට නොහැකිව සිටි. එහෙත්, කඳු මුදුනේ සැරිසැරීමට දක්ෂ ගවදෙන, රිසිසේ එහි සැරිසරා,

පෙර නොකෑ තණකොළ කා, පෙර නොගත් දිය පානය කර සුවසේ පෙරලා යයි. එලෙස පණ්ඩිත-ප්‍රඥාව ඇති මහන යහපත් ලෙසින් සමාධි සමාපත්ති ලබා ගැනීමට දක්ෂවේ, විවිධ ඉද්දි ආදිය ලබා ගැනීමට සමත්වේ. එසේම ඔහුට සියලු ආසව ක්ෂය කර විමුක්තිය ලබා ගැනීමටද හැකිවේ යයි මෙහි පෙන්වා ඇත. **මූලාශ්‍රය:** අංගු.නි: (5) 9 නිපාත: 9.1.4.4. ගාවි උපමා සූත්‍රය, පි.502.

▲**ගවම්පති තෙර-** Gavampathi Thera: **බලන්න**: උපග්‍රන්ථය:1

▲ **ගවේසී භික්ෂුව-** Gavesi Bhikkhu: කාශ්‍යප බුදුන් වහන්සේ වැඩසිටි සමයේ විසූ ගවේසී නම් සිල්වත්, ගුණවත් උපාසක පිලිබඳ විස්තරය මෙහි දැක්වේ. එතුමන්, යහපත් ලෙසින් ධර්ම මාර්ගය වඩාගෙන, කාශ්‍යප බුදුන් වහන්සේ ගේ සසුනේ පැවිදිවූහ. ඒ ගවේසී භික්ෂුව අරහත්වයට පත්වූහ. එතුමන් ගිහි ජීවිතයේ ඇසුරු කළ 500ක් පමණ මිතුරන්ද ඒ අනුව යමින් අරහත්වය ලබා ගත්තෝය. **සටහන:** කොසොල්දනව්වේ චාරිකාවේ යෙදුන බුදුන් වහන්සේ අතරමග සල්උයනක් දැක සිනා පහළ කිරීම ගැන ආනන්ද තෙරුන් කල විමසීමක් අනුව මේ සූත්‍රය දේශනා කර ඇත. බුදුන් වහන්සේගේ පෙරනිවාස සිහිකිරීමේ නුවණ මෙහිදී පෙන්වා ඇත. **මූලාශ්‍රය:** අංගු.නි: (3) 5 නිපාත: උපාසකවග්ග: 5.4.3.10 ගවෙසි සූත්‍රය, පි.370.

▲**ගොවියා-**Farmer : ගොවියා, කෙත්වතු වගාකර ජීවිකාව ගෙනයයි. බුදුන් වහන්සේ වැඩසිටි සමයේ බොහෝ ගොවියන් බුදුන් සරණ ගියබව පෙන්වා ඇත. **බලන්න**: කස්සක.

**ගස**

▲ **ගස උපමා-**Simile of the tree**: බලන්න:** උපග්‍රන්ථය:5

▲**ගෝසිංග සාල වනය-**Gosinga Sala Grove**:** බුදුන් වහන්සේ හා සංඝයා විවේකි සුවය පිණිස වැඩ වාසය කළ සුන්දර වනයකි. මහා ගෝසිංග හා චූල ගෝසිංග සූත්‍රයන් දේශනා කර ඇත්තේ මෙහිදීය. **බලන්න**:ම.නි: මහා ගෝසිංග හා චූල ගෝසිංග සූත්‍ර, උපග්‍රන්ථය:1.

**ගහ**

▲**ගහපති-** Householder: ගහපති-ගෘහපති-ගැහැවි ලෙසින් පෙන්වා ඇත්තේ පවුලක ප්‍රධානියාය. බුදුන් වහන්සේ වැඩවිසූ සමයේ, ධනවත් බලවත් ගහපතිවරු වාසය කළබව සූත්‍ර දේශනාවල පෙන්වා ඇත. එක් සමයක ජානුස්සෝනි බ්‍රාහමණයා විසින් විමසනු ලැබුව බුදුන් වහන්සේ ගෘහපති- යන් ගැන මෙසේ පවසා ඇත: **"ඔවුන්ගේ අභිප්‍රාය (අරමුණ-aim) නම් ධනයය (භෝග-Wealth).ඔවුන්ගේ සෙවීම (ගවේශනය-quest) ප්‍රඥාවයය, ඔවුන්ට ඇති ආධරය (support) ශිල්ප පුහුණුව, ඔවුන්ගේ කැමැත්ත කර්මාන්තයේ යෙදීම, ඔවුන්ගේ අවසාන ඉලක්කය කර්මාන්තය නිමාකරගැනීමය ". මූලාශ්‍රය:** අංගු.නි: (4): 6 නිපාත: ධම්මිකවග්ග: 6.1.5.10 ඛත්තිය සූත්‍රය, පි.154.

▲ **ගිහියන්ට උපදෙස්-**Advices to laypeople: ගිහිජීවිතය යහපත්ව, ධර්මානුකූලව ගත කිරීමට අදාළ කරුණු මෙහි විස්තරාත්මකව දක්වා ඇත. **මූලාශ්‍රය:** දීඝ.නි: (3): 8 සිඟාලක සූත්‍රය, පි.304.

▼ **අටසිල් සමාදන්වීම පිලිබඳ උපදෙස්**: ගිහියන්, පොහෝදිනයන්හි සිල්සමාදනවීම මහා ඵල මහා ආනිසංස ලැබීමට හේතුවේ යයි මේ දේශනාවල පෙන්වා ඇත. **බලන්න**: අටසිල්, උපෝසථ. **මූලාශ්‍ර**:අංගු.නි: (6 )10 නිපාත: අකෝෂ වග්ග, 10.1.5.6.ශාක්‍ය සූත්‍රය,පි.176, EAN:10:

V,46.6. Sakyans.p.511, අංගු.නි. (5) 8 නිපාත, උපෝසථ වග්ග,8.1.5.1 සංඛිතත අට්ඨාන්ස උපෝසථ සූත්‍රය,පි.196,EAN:8:Uposatha, 1.41 In Brief, p. 434.

▼**ගිහියන්ට කටයුතු බහුල ජීවිතයක්** ඇතිවිට වාසය කලයුතු ආකාරය: කරුණු 11 ක් සහිතව ගිහියන් වාසය කලයුතුවේ: 1) අශ්‍රද්ධාව නොමැතිව **ශ්‍රද්ධා** සම්පන්න වීම (සදෙධා-faith ) 2) කුසිතබවින් තොරව (නො කුසිතො -lazy), **විරිය** සහිතවීම (energetic) 3) සිහියනැතිකම (නො මුටඨසසති-muddle-minded) නොමැතිව,**සිහිනුවණ** සහිතවීම (උපටඨිතසති-mindfulness 4) අසමාහිත නොමැතිව, එකඟ සිත-**සමාධිය** (සමාහිතො) ඇතිබව 5) අනුවණ බව නැතිව (නො දුපපඤෙඤා-unwise ) ප්‍රඥාව සහිතවීම, යන කරුණු 5 පිහිටුවා ගතයුතුය. ඉන්පසු, තවත් කරුණු 6ක් වැඩියයුතුය. 6) බුද්ධානු සතිය 7) ධම්මානුසතිය 8) සංඝානුසතිය 9) ශිලානු සතිය 10) චාගනු සතිය 11) දේවතානුසතිය යන අනුසති භාවනා. **සටහන්**: *මේ අනුසති වඩන අරිය ශ්‍රාවකයා ගේ සිත තණ්හාවෙන්, ද්වේශයෙන් හා මෝහයෙන් දුරුවේ. එමගින් සිත ප්‍රමෝදයට පත්වේ, ප්‍රීතියට පත්වේ; ශාන්තබවට පත්වේ එමගින් සිත සමාධියට පත්වේ. ** අනුසති හවනා, සතර ඉරියව්වෙන්ම වැඩිය යුතු බවය. (සිටගෙන සිටිනවිට, ඇවිදිනවිට, ඉදගෙනසිටිනවිට, ඇලවී සිටිනවිට ) එසේම දරුවන් සමග ගිහිගෙයි සිටින වීටද, තමන් කරන යම් කර්මාන්තයක යෙදී සිටිනවිටද මේ අනුසති හවනා වැඩිය යුතුබවය. **බලන්න**: භාවනා. ** මේ දේශනා වදාළේ මහානාම හා නන්දිය ශාක්‍යයන්ටය. ඉහත කරුණුවලට අමතරව, මනෝමය කය ඇතිව උපන්, අරහත්බව ලැබූ දෙවියන් ගේ ගුණ සිහිකිරීම ගැන නන්දිය සූත්‍රයේ දක්වා ඇත. **බලන්න**: උපග්‍රන්ථය:3 මේ පිළිබඳව යොදාගත් **උපමාව**: මුනින් නමා ඇති කලයකට දිය පුරවාලීමට නොහැකිය; වියළි වනගොමුවක්, ලැව්ගින්නෙන් දැවුණ පසු, ඒ ගින්න නැවත එහි නොපැමිණෙන ලෙස අකුසල ධර්ම ඔහු වෙතට නොපැමිණේ. එලෙස යහපත් ජීවිතය ගතකරන ගිහියන්ට ධර්මයේ ආරක්ෂව ලැබේ.**බලන්න:** උපග්‍රන්ථය :5කලය උපමාව, ලැව්ගින්න උපමාව. **මූලාශ්‍ර**: අංගු.නි.(6 )11 නිපාත,අනුසති වගග,11.2.1, මහානාම සූත්‍රය,11.2.2 දුතිය මහානාම සූත්‍රය, පි.645-654, 11.2.3,නන්දිය සූත්‍රය,පි.658, EAN:11: II Recollection, 11.1 Mahanama, 12.1 Mahanama (2), p.570, 13.3. Nandiya, p.571.

▼ **එක් සමයක** වේළුද්වාර බමුණුගමේ වැසියන් විසින් විමසනු ලැබුව, යහපත් ගිහි ජීවිතයක් ගතකිරීම පිළිබඳ උපදෙස් බුදුන් වහන්සේ මෙහිදී පෙන්වා ඇත. **බලන්න**: අත්තුපනායික ධම්මපරියාය. **මූලාශ්‍ර:**සංයු.නි: (5-2) මහාවග්ග: සොතාපත්තිසංයුත්ත:වේලුද්වාර සූත්‍රය, පි.178, ESN: Sothapaththi Samyuththa:7.7 The people of Bamboo Gate p. 2191.

▼ **ගිහිසුව විඳින පිරිස යහපත්** ලෙසින් මෙලොව හා පරලොව සුවය ලබා ජිවත්වීමට අපේක්ෂා කරන්නේ නම්, ඔවුන් සතර සංග්‍රහවස්තු අනුව ජිවත්වීම යහපත් යයි මෙහි දක්වා ඇත. **බලන්න**: සතර සංග්‍රහවස්තු. **මූලාශ්‍ර:**අංගු.නි: (5) 8 නිපාත:ගෝතමී වග්ග: 8.2.6.4 ව්‍යග්ඝපජ්ජ සූත්‍රය, පි.256.

▲ **ගිහි උපාසක, උපාසිකා-**lay followers- Upāsaka, Upāsika: බුදුන් වහන්සේ කෙරේහි ශ්‍රද්ධාව පිහිටුවා ගෙන, පන්සිල් හෝ අටසිල් රකිමින්,

ධර්මානුකූලව, ගිහි ජීවිතයක් ගතකරන පුරුෂයන් හා කාන්තාවන්, උපාසක, උපාසිකා ලෙසින් පෙන්වා ඇත. බුදුන් වහන්සේ ගේ සිව්පිරිසට වැටෙන ගිහි උපාසක, උපාසිකාවන් පිලිබඳ බොහෝ විස්තර සූත්‍රපිටකයේ පෙන්වා ඇත. **බලන්න**:අග්‍රතම සිව්පිරිස, උපග්‍රන්ථය :3.
▼**බුදුන් වහන්සේ** උපාසක උපාසිකාවන් සතු ගුණ මෙසේ පෙන්වා ඇත: 1) කෙනෙක් ත්‍රිවිධ රත්නය සරණකර ගෙන වාසය කරයිනම් ඔහු/ඇය බුදුසසුනේ උපාසක උපාසිකාවකි 2) පස්පවින් වැලකි සිටීමෙන්- පංච ශිලය ආරක්ෂා කරගැනීමෙන් උපාසක ශිලය සම්පුර්ණ වේ 3) බුදුන් වහන්සේ කෙරහි ඇති විශ්වාසය -නව අරහදී ගුණ පිළිගැනීම- මගින් උපාසක සැදැහවත්වේ 4) නිර්ලෝභීව, දීමට ඇලුන සිත් ඇතිව, සතුටු සිතින් දීම හා බෙදාගැනීම ඇති උපාසක දානශීලිය. 5) දුක සහමුලින්ම නැති කිරීම පිණිස ඇතිවීම හා නැතිවීම (සමුදය වය) ධර්මතා, තියුණු නුවණින් මෙනෙහි කිරීමෙන්, ප්‍රඥාව ඇති උපසකයෙක් වේ. **සටහන**: බුදුන් වහන්සේ මේ දේශනාව වදාළේ මහානාම ශාකයන්හටය. **මූලාශ්‍ර**:සංයු.නි: (5-2):මහාවග්ග: සෝතාපත්ති සංයුත්ත, මහානාම සූත්‍රය, පි. 248, ESN: 55: Sothapaththi Samyutta: 37.7, Mahanama, p. 2231.
▼**ගිහි උපාසක** පන්සිල් රකිමින්, සතර අපායෙන් මිදී, ජීවිතය ගතකළයුතු ආකාරය මෙහි විස්තරාත්මකව පෙන්වා ඇත. **මූලාශ්‍රය**:අංගු.නි: (3) 5 නිපාත:උපාසකවග්ග: 5.4.3.9 ගිහි සූත්‍රය, පි.364.
▲ **ගිහිජීවිතය යහපත්ව ගතකිරීම**- For a beneficial lay life: මෙලොව සුවය හා පරලොව සැපත පතන ගිගියන්, යහපත් ලෙසින් ජීවිතය ගෙනයාම පිණිස **සතර සංග්‍රහ වස්තු** සහිතව ජිවත්විය යුතුයයි බුදුන් වහන්සේ පෙන්වා ඇත: **1) උට්ඨාන සම්පත-** Accomplishment in initiative: තමන් කරන රැකියාව හෝ ජීවිකාව පිලිබඳ නිපුණතාව යෙන් සමත්බව, උත්සහාවන්තබව, පරික්ෂාකාරීව තීරණගැනීමේ හැකියාව, සංවිධානයට දක්ෂබව 2) **ආරක්ෂා සම්පත-** accomplishment in protection: තමන් විරියෙන්, දැහැමින් උපයා ගත් භෝග හා වස්තු- රජඋවදුරු, සොරසතුරන්ගේ උවදුරු, ස්වාභාධර්මයෙන් ඇතිවියහැකි උවදුරු වලින් මනාව ආරක්ෂා කරගැනීමට දක්ෂවීම 3) **කල්‍යාණ මිත්‍ර සම්පත**: තමන් වාසය කරන ප්‍රදේශයෙහි ශ්‍රද්ධා සම්පන්න හෝ ශිලසම්පන්න හෝ ත්‍යාගසම්පන්න හෝ ප්‍රඥාසම්පන්න ධර්මයේ හැසිරෙන පුද්ගලයන් සමග යහපත් සම්බන්ධතා පවත්වා ගෙන, ඔවුන්ගෙන් ලැබෙන අවවාද හා උපදෙස් වලින් හික්මී ඒ අනුව දිවිපෙවත ගෙනයාමට දක්ෂවීම 4) **සමජිවිතය පවත්වා ගැනීම**- balanced living: තමනට ලැබෙන ආදයම අනුව ජීවත්වීමේ දක්ෂබව- නාස්තිකාර ජීවිතයක් හෝ පහත් (ලෝභ සහිත) ජීවිතයක් නොමැතිව තමාට හා සෙසු අයට යහපත ඇතිවෙන ලෙසින් ජීවිතය සම ලෙසින් ගෙනයාම. **ධන සම්පත් ආරක්ෂා කරගැනීම:** ඉහත දක්වා ඇති කරුණු 4 ට අමතරව, තමන් උපයාගත් ධන සම්පත් ආරක්ෂා කර ගැනීම ද යහපත් ජීවිතයකට අවශ්‍යවේ. ඒ සඳහා උවදුරු 4 ක් දුරු කරගත යුතුය: 1.**සල්ලාල හැසිරීම** 2. **සුරාවට ගිජුවීම** 3. **සූදුකෙළිම** 4. **පාපමිත්‍රසේවනය .මතු යහපත් ජිවිතයක් ලැබීමට:** කරුණු 4 ක් උපකාරීවේ: 1. ශ්‍රද්ධාව තිබීම2. ශිලසම්පන්නබව 3. දානශීලිබව 4. ආරිය ප්‍රඥාව තිබීම: සමුදය හා වය දැකීමේ නුවණ. **බලන්න**: ආරිය ප්‍රඥාව. **මූලාශ්‍ර:** අංගු.නි: (5 ) 8 නිපාත: 8.2.6.4 ව්‍යාගපජ්ජ සූත්‍රය, පි 256,EAN: 8: 54 .4 Dīghajāṇu, p 441.

▲ **ගිහිසාමීචිපටිපදාව-** The Layperson’s Proper Practice
ගිහිසාමීචිපටිපදාව යනු, ගිහියන් ආකාර 4 කට සංඝයාට කරන සේවාවය- සිව්පසය ලබාදීමය: 1 සිවුරු පිරිනැමීම 2 පිණ්ඩපාතය පිරිනැමීම 3 සේනාසන පිරිනැමීම 4 ගිලන්පස හා බෙහෙත් පිරිනැමීම. මේ ප්‍රතිපදාව ගිහියන්ට සුදුසු යහපත්වූ-මනාවූ ප්‍රතිපදාව යයි බුදුන් වහන්සේ පෙන්වා ඇත. එසේ පුහුණුවන ගිහියන්ට මෙලොව කීර්තියද, පරලොව දෙව්ලොව සැපද ලැබේ. **මූලාශ්‍ර:** අං.ගු.නි: (2 ): 4 නිපාත: 4.2.1.10 ගිහිසාමීචිපටිපදා සූත්‍රය**,** පි. 143, EAN: 4: 60.10 The Layperson’s Proper Practice, p. 172.

▲ **ගිහිසුඛ-** Happiness of layperson: ගිහිජීවිතය ගෙනයන පුද්ගලයන් ලබන සැප 4 ක් බුදුන් වහන්සේ පෙන්වා ඇත:1) **අස්තිසුඛය:** හිමිකම (ownership): දැඩි වීරිය ඇතිව සම්පත් ලබාගැනීමේ සැපය 2) **භෝග සුඛය** (Happiness of enjoyment): තමන් ලබාගත් සම්පත් විඳීමේ සැපය3) **අනණසුඛය** (freedom from debt )- ණයනොමැති බව නිසා ලබන සුඛය 4) **අනවද්‍ය සුඛය** (happiness of blamelessness): තුන් දොරින් යහපත් ක්‍රියා පණක් කිරීම නිසා සිතේ ඇතිවන සැපය.**මූලාශ්‍ර:** අං.ගු.නි: ( 2 ): 4 නිපාත: 4.2.2.2. අනණසූත්‍රය, පි. 152.EAN: 4: 62.2 Freedom from debt, p. 174.

▲ **ගුහාව-** Cave: බුදුන් වහන්සේ ශරීරය ගුහාවක් ලෙසින් පෙන්වා ඇත. සත්ත්‍වයෝ කාමආදී කෙලෙස්වලින් බැඳී, ඒවා අත් හැර ගැනීමට බැරිව සිටි. එහෙත්, තණ්හාවේ නො ඇලුන උතුමන්, මෙලොව, පරලොව නො පතන්නේය. **මූලාශ්‍ර:** ඛු.නි: සුත්තනිපාත: අට්ඨකවග්ග: 4-2 ගුහට්ඨක සූත්‍රය, පි. 264.

## ඝ කොටස:ඝට,ඝස

**ඝට**

▲**ඝටිකාර බ්‍රහ්ම දෙවියෝ-**Ghatikara Brahma: ඝටිකාර බ්‍රහ්ම දෙවියෝ, කාශ්‍යප බුදුන් වහන්සේ වැඩවිසූ සමයේ ඝටිකාර නම් වළංසාදන පුද්ගලයෙක් ලෙසින් වාසය කරමින්, බුදුන් වහන්සේගේ ගිහි දායකත්වය දැරිය. ඒ සමයේ අපගේ බුදුන් වහන්සේ ජෝතිපාල නම් බ්‍රාහ්මණයෙක් ලෙසින් උපත ලබා, ඝටිකාර කුඹලා හා මිතුරුව, ඔහුගේ උපදෙස් නිසා කාශ්‍යප බුදුන් වහන්සේ වෙත පැමිණ, පැවිදිබවට පත්වූහ. ඝටිකාර කුඹලා මියයාමෙන් පසු (අනාගාමීබව ලබාසිටිනිසා) ඝටිකාර බ්‍රහ්ම දෙවියන් ලෙසින් බ්‍රහ්මලෝකයේ පහළවූහ. ගෝතම බුදුන් වාසය කරන සමයේ, ඝටිකාර බ්‍රහ්ම දෙවියෝ බුදුන් වහන්සේ බැහැදකිමට පැමිණිබව සූත්‍රයන්හි පෙන්වා ඇත. **බලන්න: ම.නි**. ඝටිකාර සූත්‍රය, **සංයු.නි**:දේවතා සංයුත්ත: ඝටිකාර සූත්‍ර 2 කි.

▲**ඝොටමුඛ බ්‍රාහ්මණ**-Brahmin Ghotamukha:බලන්න: උපග්‍රන්ථය:3

▲ **ඝොටමුඛ ශාලාව-**Ghotakukha Hall**:** පාටලීපුත්‍ර නුවර පිහිටි මේ ශාලාව, ඝොටමුඛ බ්‍රාහ්මණ විසින් කහවනු 500ක් යොදා සකස් කර සංඝයාට පිරිනැමූ බව මෙහි පෙන්වා ඇත. **මූලාශ්‍රය:** ම.නි: (2) 2.5.4 ඝොටමුඛ සූත්‍රය, පි.644.

**ඝස**

▲ **ඝෝසිත ගහපති-** Householder Ghositha: **බලන්න**: උපග්‍රන්ථය:3

▲ **ඝෝසිතාරාමය**- Ghositha's aramaya: කොසඹෑනුවර පිහිටි මෙ ආරාමය ඝෝසිත ගහපති විසින්, බුදුන් ප්‍රමුක සංඝයට පිරිනමා ඇත. **බලන්න**:උපග්‍රන්ථය:3.

## ච කොටස:

### චක,චග,චට,චත,චද,චන,චණ,චප,චම,චර,චල, චව

### චක

▲ **චංකම**- Walking path: චංකම (චඞකම) ලෙසින් පෙන්වා ඇත්තේ භාවනාව සඳහා යොදාගන්නා සක්මන් පථයය. **බලන්න**: සක්මන් භාවනාව.

▲ **චංකි බ්‍රහ්මණ-**Brahamin Chanki: මොහු කොසොල්දනව්වේ, ඔපසාද බමුනුගමේ වාසය කල ප්‍රසිද්ධ බ්‍රාහ්මණකි. බුදුන් වහන්සේ ඒ ගම අසල දේවවන නම් සල්උයනේ වැඩසිටින අවස්ථාවේදී උන්වහන්සේ බැහැදැකීමට පැමිණි බව මෙහි පෙන්වා ඇත. තමාගේ ගමේ පිරිසට, බුදුන් වහන්සේ ගැන මහා ගුණ ගායනාවක් මොහු පවසා ඇත. **බලන්න**:බුදුගුණ. **මූලාශ්‍රය**:ම.නි: (2) 2.5.5 චංකිසූත්‍රය, පි.662.

▲ **චක්ඛායතන** -eye base: ආධ්‍යාත්මික ආයතන 6න් එකකි, ඇස ආයතනය ය.**බලන්න**:ආයතන

▲ **චක්ඛු-** Eye: චක්ඛු-ඇස, අභ්‍යන්තර ඉන්ද්‍රිය (සළායතන) 6න් එකකි. ඇසෙහි ස්වභාවය අනිත්‍යයය, වෙනස්වේ, විපරිනාමබවට පත්වේ. ඒ පිළිබඳ යථා අවබෝධය ලැබීම -ධම්මචක්ඛු ලැබීම සෝතාපන්නවීමය. **බලන්න:** සලායතන, සෝතාපන්න, සළායතන. **සටහන්**: ධම්මචක්ඛ ප්පවත්තන සූත්‍රයේදී, කොණ්ඩඤ්ඤ තෙරුන් සෝතාපන්න වීම, ධම්ම චක්ඛු පහළවීම යයි පෙන්වා ඇත. ** සෙසු ඉන්ද්‍රිය පිළිබඳව මේ ආකරයෙන් දැකිය යුතුය. **මූලාශ්‍ර:** සංයු.නි: (3 ): ඛන්ධවග්ග: ඔක්කන්තිසංයුත්ත: 4.1.1. චක්ඛු සූත්‍රය, පි. 470, ESN: 25: Okkanti samyutta: 1 The eye, p. 1140.

▼**ඇස ඇතිවීම නිසා** දුක ඉපදෙන ආකාරය -ජරා රෝග මරණ- පිළිබඳව මෙහි විස්තර කර ඇත. ඇස පිළිබඳ තණ්හාව පහවීම, දුක නැතිවීමය. **සටහන:** සෙසු ඉන්ද්‍රිය පිළිබඳව මේ ආකරයෙන් දැකිය යුතුය. **මූලාශ්‍රය:** සංයු.නි: (3 ): ඛන්ධවග්ග: උප්පාදසංයුත්ත:5.1.1. චක්ඛු සූත්‍රය, පි. 478.

▼ **ඇසනිසා ඡන්දරාගය** ඇතිවීම කෙළෙස් හටගැනීම බව මෙහි පෙන්වා ඇත. ධර්මඅවබෝධය මගින් ඒ කෙළෙස් පහකර ගත හැකිවේ. **සටහන:** සෙසු ඉන්ද්‍රිය පිළිබඳව මේ ආකරයෙන් දැකිය යුතුය. **මූලාශ්‍රය:** සංයු.නි: (3 ): ඛන්ධවග්ග: කෙළෙසසංයුත්ත:6.1.1. චක්ඛු සූත්‍රය, පි. 486.

▲ **චක්ඛු ඉන්ද්‍රිය-**Eye faculty: ධර්මයේ පෙන්වා ඇති ඉන්ද්‍රිය 22න් එක් ඉන්ද්‍රියකි. **බලන්න**:ඉන්ද්‍රිය.

▲ **චක්ඛු තුන**- The three eyes: බුදුන් වහන්සේ චක්ඛු 3 ක් පෙන්වා ඇත: මස්ඇස -භෞතික ඇස(physical eye), දිවැස- දිබ්බ චක්ඛු (divine eye), පැනස -ප්‍රඥා ඇස(eye of wisdom): **" තිණිමානි භික්කවෙ චක්ඛුනි...මංසචක්ඛු, දිබ්බචක්ඛු, පඤ්ඤාචක්ඛු"**. මස්ඇස, දිවැස් ලබාගැනීමට හේතුවේ. දිවැස- ඉද්දිබලයකි. ප්‍රඥා ඇස ලැබීමෙන් ආසව ක්‍ෂය කිරීමේ ඥානය ඇතිවී- ආසවක්ඛය, දුක අවසන්වේ. **සටහන:**

මස්ඇස- සළායතන 6 න් එකකි. **මූලාශ්‍ර**: ඛු.නි: ඉතිවුත්තක: 3.2.2 චක්ඛු සූත්‍රය, පි. 416.

▲ **චක්ඛුපාල තෙර**- Chakkhupaala Thera **බලන්න**: උපග්‍රන්ථය:1
▲ **චක්ඛු විඤ්ඤාණය**-Eye consciousness: සය විඥානයන්ගෙන් එකකි. **බලන්න:** විඥානය.
▲ **චක්‍රවර්ති රජ**- Wheel-Turning Monarch: සතර දීපයන්ට අධිපති, බොහෝ යස ඉසුරු ඇති උතුම් පාලකයාය. **බලන්න:** සක්විතිරජ.
▲ **චක්‍ර සතර: පාලි: චත්තාරි චක්කානි**- The four wheels: බුදුන් වහන්සේ චක්‍ර 4ක් පෙන්වා ඇත. එමචක්‍ර සම්පත්තිය ඇති දෙවියන් හා මිනිසුන් අග්‍ර බවට පත්වේ, ධනසම්පත්ති බහුලව ලබා ගනී. 1) සුදුසු දේශයක වාසය කිරීම (**පතිරූපදෙසවාසො)** 2) සත්පුරුෂයන් සේවනය (**සප්පුරිසූප නිස්සයො**) 3) තමා තුලශ්‍රද්ධාව ආදී ගුණ ධර්ම තිබීම - යහපත් පෞරුෂත්වය (**අත්තසම්මාපණිධිච**) 4) පෙර කළ පින් ඇති බව (**පුබ්බෙ ච කත පුඤ්ඤතා**). ඒ සම්පත් නිසා ඔවුන්ට සතුටින් වාසය කරති. **සටහන**: * මංගල සූත්‍රයේ 2 නි හා 3 නි ගාථාවන්හි එම ගුණ 4 මංගල-සුභ කරුණු ලෙස පෙන්වා ඇත. **මූලාශ්‍ර:**අංගු.නි: (2): 4 නිපාත: චක්කවග්ග: 4.1.4.1.චක්ක සූත්‍රය, පි. 88, EAN:4: 31.1 The wheel, p. 160
▼**චක්‍ර 4 තිබීම** ආධ්‍යාත්මික වර්ධනයට බොහෝ උපකාරීවේ- ඒවා බහුඋපකාර ධර්ම යන්ය**. බලන්න**: EDN: note: 1139, p. 475. **මූලාශ්‍ර:** දීඝ.නි : (3): 11 දසුත්තර සූත්‍රය, පි. 483, EDN: 34: Dasuttara Sutta: Expanding Decades, p. 384.

**චග**

▲ **චාගය-** Generosity: චාග යනු සතුටු සිතින් දීමය- දානයය, ත්‍යාගයය. මෙය කුසල ක්‍රියාවකි, පින් ලැබේ. සියලු දෙය අතහැරීම, එනම්, තණ්හාව හැරදැමීම ද චාගය ලෙසින් පෙන්වා ඇත. **බලන්න**:දානය. **සටහන**: ධම්මචක්කපවත්තන සූත්‍රයේ : දුක නිරෝධ කරගැනීම පිණිස තණ්හාව හැරදැමීම චාගය යයි පෙන්වා ඇත. **" ඉදං ඛො පන භික්ඛවෙ, දුක්ඛ දුක්ඛනිරොධො අරිය සච්චං: යො තස්සායෙව තණ්හාය අසෙස විරාගනිරොධො චාගො පටිනිස්සග්ගො මුත්ති අනාලයො..."**. මහණෙනි, මේ දුක්ඛ නිරෝධ සත්‍යය: ඒ තණ්හාව, ඉතිරි නොමැතිව දීලාදැමීම, අත්හැරීම, නිදහස්වීම, ඇල්ම හැරදැමීමය. **බලන්න:** තණ්හාව.
▼**වෙනත් මූලාශ්‍ර: 1**. " ...චාග කියන ගුණයේ අවසාන කෙළවර, අවසාන ප්‍රතිඵලය, නෙක්කම්මයට ශක්තිය ඇතිවීම". "**අභිනික්මන":** කටුකුරුන්දේ ඤාණානන්ද භික්ෂු: පි.16, 2003,
▲ **චාගානුසතිය -** Chaganusati: චාගානුසතිය, අනුසති භාවනාවකි. තමන්ගේ ත්‍යාගශීලිබව සිහිපත් කර සිත ප්‍රීතියට පත්කරගැනීම මගින් සිතේ එකඟබව- සමාධිය ලබාගැනීම. ගිහියන් විසින් වැඩිය යුතු භාවනාවකි. **බලන්න**: භාවනා, ගිහියන්ට උපදෙස්.

**චට**

▲ **චාටුකථා-** flattery: අනුන් රැවටීමට කරන කථාය, අකුසලයකි, ධර්ම මාර්ගයේ පරිහාණියට හේතුවේ. **බලන්න**: ඉච්චාකතාව, උත්තරී මනුස්සධම්ම.

**චත**

▲**චෛත්‍ය-**Chetiya: බුදුන් වහන්සේ ඇතුළු ආරිය පුද්ගලයන් සිහිකිරීම

පිණිස ගොඩනගන ස්මාරකයන් චෛත්‍ය -චේතිය -ථූප -දාගැබ ලෙසින් හඳුන්වයි. **බලන්න**: ස්ථූප. **සටහන**: සක්විතිරජ සිහිකිරීම පිණිසද චෛත්‍ය සාදයි. **බලන්න:** සක්විතිරජ.

▼ **චෛත්‍යය තුන**: අටුවාවට අනුව චෛත්‍යය තුන් ආකාරයකි: **පාරිභෝග චෛත්‍යය** නම් බුදුන් වහන්සේ පරිහරණය කල බෝධිරුක, චිවරය, පාත්‍රය. **උද්දේසික චෛත්‍යය** නම් බුදුපිළිම වේ. **ස්ථූප චෛත්‍යය** නම් ධාතු තැන්පත් කර ඇති ස්ථූපයන්ය. චෛත්‍යයන්ට ගරු පුජා කිරීම පුණ්‍ය ක්‍රියාවක්වේ.**බලන්න:** ශාරීරික ධාතු, මහාපරිනිර්වාණසූත්‍රය. **මූලාශ්‍රය**: ඛු.නි:ඛුද්දකපාඨ: 8 නිධිකණ්ඩ සූත්‍රය, සටහන් 2: පි. 46.

▲**චෛතසික සුඛය -**Mental happiness: චෛතසික සුඛය ලෙසින් පෙන්වා ඇත්තේ, ඣානසමාපත්ති ලැබීමෙන්, නීවරණ පහවීම නිසා සිතේ ඇතිවන සැපැයටය. මානසික සුවය ලෙසින්ද පෙන්වා ඇත. මෙය කායික සුඛයට වඩා අග්‍රය. **බලන්න**: ඣාන, සුඛය.

▲ **චේතනා-** Chetana – Volition: කයෙන් වචනයෙන් හා සිතින් (තුන්දොර) කරන කුසල්හෝ අකුසල් චේතනා ය. කම්ම සකස් කරන්නේ චේතනා මගින්ය. **"චේතනා අහං භික්ඛවෙ කම්මං වදාමි"** යයි බුදුන් වහන්සේ වදාළහ. චේතනා :සංඛාර, අභිසංඛාර ලෙසින්ද පෙන්වා ඇත. **බලන්න:** සංඛාර, කම්ම, අභිසංඛාර.

▼ **කෙනෙක් සිතන**, කල්පනා කරන, සිත නැඹුරුකරන දේ -චේතනාවය. චේතනා නිසා විඥානය පිහිටයි, මතු ජාතිය ඇතිවීම ආදී සසර දුක ඇතිවේ. චේතනා නොමැතිනම් විඥානයේ පිහිටීමක් නැත, සසර දුක නිමාවේ. **බලන්න**: විඥානය, පටිච්චසමුප්පාදය. ( Bhikkhus, what one intends, and what one plans, and whatever one has a tendency towards: this becomes a basis for the maintenance of consciousness). **මූලාශ්‍ර:** සංයු.නි: (2): නිදානවග්ග: අභිසමය සංයුත්ත:කළාරඛත්තිය: **චේතානා සූත්‍ර** 3කි. පි. 124, ESN:12: Nidanasamyutta: IV: The Karakhattiya: Volition 3 suttas p. 665.

▼ **සියලු චේතනා** (රූපසංචේතනා,ශබ්දසංචේතනා, ගන්ධ සංචේතනා,රසසංචේතනා, ඵොට්ඨබ්බසංචේතනා,ධම්මසංචේතනා) අනිත්‍යය ය. එලෙස, දකිනා පුද්ගලයා '**සද්ධානුසාරී**' ය, ඒබව, විදසුන් නුවණින්, ඣානසමාපත්ති ලබා අවබෝධ කරගන්නා පුද්ගලයා '**ධම්මානුසාරී**' ය. ඔවුන් සම්බෝධිය පිහිට කරගෙන ඇත. **බලන්න**: සත් ආරිය පුද්ගලයෝ. **මූලාශ්‍රය:**සංයු.නි: (3): ඛන්ධවග්ග: ඔක්කන්ති සංයුත්තය: චක්ඛුවග්ග:4.1.7 සූත්‍රය, පි.474.

▲ **චේතෝඛිල** : පාලි: **චෙතොඛීලා-** mental barrenness:චේතෝඛිල ලෙසින් පෙන්වා ඇත්තේ, සිතේ තද බව- අනම්‍ය බව, ආධ්‍යාත්මික මග නගා ගැනීමට යොදාගතයුතු ගුණයන් දැරීමට ඇති තද බවය. මේවා නිසා මාර්ගය හානියට පත්වේ. **බලන්න:** චේතෝඛීල, හානභාගිය ධර්ම. **ශබ්දකෝෂ: පා.සිං.ශ:** පි: 290: "**චෙතො**: සිත, පි. 267: **ඛීල**: තදබව". **B.D:** p. 40: **"Cetokhila:** mental obduracies are 5 things which stiffen and hinder the mind from making right exertion: doubt about the master, about the doctrine, about the holy brotherhood, about the training and anger against the one's fellow monks".

▼ **හානිය ඇති කරන චේතෝඛිල 5 ක්** වේ. පංච චේතෝඛිල: 1) ගුරුවරයා පිලිබඳ විශ්වාසය, පිළිගැනීම නොමැතිබව. 2) ධර්මය පිලිබඳ

විශ්වාසය, පිළිගැනීම නොමැතිබව 3) සංඝයා පිලිබඳ විශ්වාසය, පිළිගැනීම නොමැතිබව 4) ශික්ෂාව -පුහුණුව පිලිබඳ විශ්වාසය, පිළිගැනීම නොමැතිබව 5) තමන් සමග සිටින සෙසු අය (සබ්‍රහ්මසරුන්) සමග තරහ සිතින්, ගැටුන සිතින් සිටීම. එමනිසා, ඔහුට මාර්ගය වඩා ගැනීමට සිත නො පෙළඹේ, විරිය නො මැතිවේ. එම අවගුණ පහ කර ගැනීම පිණිස සතර සතිපට්ඨානය වඩා ගත යුතුවේ: **"කතමෙ පඤ්ච ධම්මා හානභාගීයා: පඤ්ච චෙතොඛීලා: ඉධාවුසො භික්ඛු සත්ථරි කඞ්ඛති විචිකිච්ඡති නාධිමුච්චති න සම්පසීදති තස්ස චිත්තං න නමති ආතප්පාය අනුයොගාය සාතච්චාය පධානාය, අයං පඨමො චෙතොඛීලො. පුන ච පරං ආවුසො භික්ඛු ධම්මෙ කඞ්ඛති... සඞ්ඝෙ කඞ්ඛති... සික්ඛාය කඞ්ඛති... සබ්‍රහ්මචාරීසු කුපිතො හොති අනත්තමනො ආහතචිත්තො ඛීලජාතො, තස්ස චිත්තං න තස්ස චිත්තං න නමති ආතප්පාය අනුයොගාය සාතච්චාය පධානාය. යස්ස චිත්තං න නමති ආතප්පාය අනුයොගාය සාතච්චාය පධානාය, අයං පඤ්චමො චෙතොඛීලො..."**. පංච චේතෝඛිල පහ නොකරගත් පුද්ගලයා, අමාවක පෝයට හඳ එළිය නැතිවී යන ලෙසින්, හානියට පත්වේ (නො බැබලේ) යයි බුදුන් වහන්සේ වදාළහ. එහෙත්, අකුසල හැර දැමූ භික්ෂුව ආධ්‍යාත්මික මග වඩාගනී. **බලන්න**: උපග්‍රන්ථය:5 **සටහන**: ම.නි. චේතෝඛිල සූත්‍රයේ මේ කරුණු විස්තරාත්මකව පෙන්වා ඇත. **මූලාශ්‍ර**: අංගු.නි: (3): 5 නිපාත: 5.5.1.5 චේතෝඛිල සූත්‍රය, පි.422, EAN:5: 205.5 Barrenness, p. 305, අංගු.නි: (5): 9 නිපාත: 9.2.2.9 චේතෝඛිල සතිපට්ඨාන සූත්‍රය**,** පි.580, EAN: 71.9 Mental Barrenness, p. 487,දීඝ.නි : (3): 11 දසුත්තර සූත්‍රය, පි. 483, EDN: 34: Dasuttara Sutta: Expanding Decades, p. 384, අංගු.නි (6): 10 නිපාත: 10.1.2.4 චේතෝඛිල සූත්‍රය, පි. 62, EAN:10: 14.4 Mental Barrenness, p. 496.

▲**චේතෝපරිය ඤාණය-**understand the minds of other beings
අන්‍යයන්ගේ සිත් දැනගැනීමේ නුවණ චේතෝපරිය ඤාණය වේ. පරචිත්ත විජානන ඤාණය ලෙසින්ද පෙන්වා ඇත. ඉද්ධිපාද වඩාගැනීමෙන් එම නුවණ ලැබේ. මෙය බුද්ධ ඤාණයකි. **බලන්න**:පටිසම්භිදා 1:ඤාණකතා:52 චේතෝපරියඤාණය, පි. 234.

▼**බුදුන් වහන්සේ මෙසේ වදාළහ:** " මහණෙනි, මම යම් තාක් කැමති වේ නම් ඒ තාක් අන්‍ය සත්ත්‍වයන් ගේ අන්‍ය පුද්ගලයන්ගේ සිත, තම සිතින් පිරිසිඳ දැන ගනිමි... සරාග සිතක් නම් සරාග සිත යයි...විමුක්ත සිත විමුක්ත සිත ලෙසින් දනිමි". ( Bhikkhus, to whatever extent I wish, I understand the minds of other beings and persons, havingencompassed them with my own mind. I understand a mind with lust as a mind with lust... a liberated mind as liberated and an unliberated mind as unliberated) **සටහන්: *** සිතේ විවිධ බව මේ සූත්‍රයේ පෙන්වා ඇත. ** චිත්තානු පස්සනාවේදී සිතේ විවිධ බව මෙනෙහි කරයි. **මූලාශ්‍ර**: සංයු.නි: ( 2 ): නිදානවග්ග: කස්සපසංයුත්ත: 4.1.9 ජාන අභිඥා සූත්‍රය, පි. 342, ESN:12 Nidanavagga: Kassapasamyutta: 9 Jhānas and Direct Knowledges, p. 817.

▼**අනුරුද්ධ තෙරුන් මෙසේ වදාළහ:** " ඇවත්නි, සතර සති පට්ඨානය යහපත් ලෙසින් දියුණු කරගත් නිසා, වෙනත් අයගේ සිත: සරාගී සිතක්ද...විරාගී සිතක්ද ආදී ලෙසින් තම සිතින් පිරිසිඳ දනිමි..." **මූලාශ්‍ර:** සංයු.නි: (5-1): මහාවග්ග: අනුරුද්ධසංයුත්ත: 8.2.4 චේතෝපරිය සූත්‍රය,

පි. 104, ESN: 52 Anuruddhasamyutta: 14.4 Encompassing the Mind, p. 2127.

▼**වෙනත් මූලාශ්‍ර: 1.**" චිත්තයේ සරාග (රාගීබව) ආදී ස්වභාවය පිරිසිඳ දැනීම චේතෝපරිය ඥානය ය. තමාගේ හා අන් අයගේ සිතෙහි ස්වභාවය දැනීම...දිබ්බ චක්ඛු ඥාණය, චේතෝපරිය ඥානය ඉපදවීමට හේතුවේ...": **සිංහල විශුද්ධිමාර්ගය:** 13 පරිඡේදය: පි. 595. **2.** "**මෙය බුද්ධ ඥානයකි.** සියලු සත්ත්වයන්ගේ සිතේ ස්වභාවය දන්නා නුවණ- සිත රාග, ද්වේශ, මෝහ සහිතබව හෝ රහිතබව, ථිනමිද්‍යයෙන් හැකුළුන සිතක්ද, උද්දච්ඡ සිතක්ද, මහද්ගත ද අමහද්ගතද, ලෞකිකද, ලොකොත්තරද, සමාහිතද අසමාහිතද, විමුක්ත ද විමුක්ත නොවූ යන 16 ආකාර ලෙසින් අනුන්ගේ සිත් පිලිබඳ දන්නා නුවණ". **ආර්යවංශ ධර්ම පුස්තක මාලා 1-4,** අංක **1** සප්තබෝජ්ජංගය- පි. **77,** සම්පාදනය- මොරටුවේ සිරි සාසනවංශ තෙරුන්**, 1948.**

▲ **චේතෝවිනිබන්ධ:** පාලි: **චෙතසො විනිබන්ධා** bondages of the mind චේතෝවිනිබන්ධ ලෙසින් පෙන්වා ඇත්තේ සිත වෙළා බැඳ ගන්නා අකුසල ධර්මයන් ගැනය. බුදුන් වහන්සේ චේතෝවිනිබන්ධ 5 ක් පෙන්වා ඇත: 1) පහනොවූ කාමච්ඡන්දය 2) කය පිලිබඳ පහ නොවූ තණ්හාව 3) රූප කෙරෙහි පහනොවූ තණ්හාව 4) කුසපුරා ආහාර ගෙන අලසව, නිදිවැදීම 5) බඹසර රැකීමේ අරමුණ වන්නේ මරණින් මතු දෙව්ලොවක උපත ලැබීම පිණිසය යන විස්වාසය ඇතිව කටයුතු කිරීම. එම අවගුණ නිසා ඔහුට මාර්ගය වඩා ගැනීමට සිත නො පෙළඹේ, විරිය නො මැතිවේ. **මූලාශ්‍ර**: අංගු.නි: (3): 5 නිපාත: 5.5.1.6 චේතෝවිනිබන්ධ සූත්‍රය, පි.424, EAN:5: 206.6 Bondages, p. 305.

▼**පංච චේතෝ විනිබන්ධනයෙන්** බැඳුන පුද්ගලයා, අමාවක පෝයට හඳ එළිය නැතිවී යන ලෙසින්, හානියට පත්වේ (නො බැබලේ) යයි බුදුන් වහන්සේ වදාළහ. එහෙත්, මේ බන්ධන හැර දැමූ භික්ෂුව ආධ්‍යාත්මික මග වඩාගනී. **බලන්න**: උපග්‍රන්ථය:5. **මූලාශ්‍ර**: අංගු.නි (6): 10 නිපාත: 10.1.2.4 චේතෝඛිල සූත්‍රය, පි. 62, EAN:10: 14.4 Mental Barrenness, p. 496.

▲ **චෙතෝ විමුක්තිය**: පාලි: **චෙතොවිමුත්තිං**-Deliverance of mind-ceto vimutti: ධර්මයේ චෙතෝ විමුක්තිය ලෙසින් පෙන්වා ඇත්තේ සමාධි සමාපත්ති ලබා ගැනීමෙන්, අරහත් මග සාක්ෂාත් කර ගැනීමය. උභතොභාග විමුක්තිය ලබන උතුමා ප්‍රඥාවිමුක්තිය මෙන්ම චෙතෝ විමුක්තියද ලබාගනී.**බලන්න**: සත් ආරිය පුද්ගලයෝ, විජ්ජා විමුක්තිය, සමථ හා විදර්ශනාව, අවසානඥානය, උභතෝභාගවිමුක්තිය.

▼ **චේතෝවිමුක්තිය ඇති කරගන්නා ක්‍රමවිධිය** බුදුන් වහන්සේ මෙසේ පෙන්වා ඇත: "සමථ භාවනාව වැඩීමෙන් කවර ප්‍රතිලාභයක් අත් දකින්නේද? **සිත දියුණුවීමය.** සිත දියුණුවීම මගින් කවර ප්‍රතිලාභයක් අත් දකින්නේද? **රාගය පහවීම**. රාගයෙන් වෙළුන සිතක් ඇතිවිට විමුක්තිය ඇතිනොවේ. රාගය පහවූවිට සිත විමුක්තියට පත්වේ, චේතෝවිමුක්තිය ඇතිවේ""**ඉති ඛො භික්ඛවෙ රාගවිරාගා චෙතොවිමුත්ති". මූලාශ්‍ර**: අංගු.නි: (1): 2 නිපාත: 2.1.3.11 සූත්‍රය, පි.158, EAN: 2: 31.11 Sutta, p.60..

▼ **අරහත්ඵල සමාධිය** සාක්ෂාත් කරගැනීම චේතෝ විමුක්තියවේ. **මූලාශ්‍ර**: අංගු.නි: (1): 2 නිපාත**:** ධම්මවග්ග,පි.198, EAN:2: Dhamma, p. 68.

▼**පංචඉන්ද්‍රිය දියුණු කිරීම මගින්** චේතෝවිමුක්තිය-ඵලසමාධිය

ඇතිවේ.**මූලාශ්‍ර**: සංයු.නි: ( 5-1): මහාවග්ග:ඉන්ද්‍රියසංයුත්ත: ආසවක්ඛය සූත්‍රය, පි. 390, ESN: 48: Indriya samyutta: 20.10, Destruction of the taints p. 1946.

▼ **රාග දෝස මෝහ** යන ආසවයන්ගෙන් සිත යහපත් ලෙසින් විමුක්තියට පත් කරගත් - චේතෝවිමුක්තිය ලැබූ භික්ෂුව සුවිමුත්ත චිත්තෝය. **බලන්න**: සුවිමුත්තචිත්ත. **මූලාශ්‍ර**: අංගු.නි: (6):10 නිපාත: 10.1.2.9 පඨමාරියවාස සූත්‍රය හා 10.1.2.10 දෙවෙනි අරියවාස සූත්‍රය පි.82-84, EAN: 10: II Protector, 19.9 & 20.10 Abodes of the Noble Ones 1 & 2, p. 498-499.

▲**චෙතොවිවට්ට**-mental transformation: චෙතොවිවට්ට ලෙසින් පෙන්වා ඇත්තේ රූපධ්‍යානයය. බුදුන් වහන්සේගේ ශ්‍රාවක සංඝයා අතුරින් එම ධ්‍යානයේ අග්‍ර භික්ෂුව ලෙසින් පෙන්වා ඇත්තේ චූලපන්තක තෙරය. **බලන්න**: උපග්‍රන්ථය:1
▲**චතුආරක්ෂක භාවනා**- Four protective meditation: චතුආරක්ෂක භාවනා ලෙසින් පෙන්වා ඇත්තේ, භාවනාව වැඩීමේදී, පංච නිවරණයන් ගෙන් සිදුවන බාධා වලින් ආරක්ෂාවීම පිණිස යොදාගන්නා 4 විධි භාවනා අරමුණුය: 1) මාර්ගය පිලිබඳ ඇතිවෙන යම් සැකයක්, විචිකිච්චාවක් පහකර ගැනීම පිණිස බුද්ධානුස්සතිය වැඩීම යහපත්වේ. 2) ව්‍යාපාදය-තරහ පහකර සිත සමාහිත කරගැනීමට මෙත්තා භාවනාව වැඩීම යහපත්වේ. 3) සිතේ ඇතිවන රාගය- කාමඡන්දය පහකර ගැනීමට සුදුසු වන්නේ අසුභ භාවනාවය. 4) ථිනමිද්ධය-අලසකම-කුසිතබව- අරතිය නැති කර අප්‍රමාදය අතිකර ගැනීමට උපකාරී වන්නේ මරණසතිය වැඩීමය. මේ අරමුණු 4 වඩාගැනීමෙන්, උද්දච්ච කුක්කුච්ච නීවරණය පහවේ**. බලන්න:** භාවනා.
▲ **චතු ඉද්දිපාද-** Four Iddipada: චතු ඉද්දිපාද -සතර ඉද්දිපාද යනු ඡන්ද, විරිය, චිත්ත හා විමංසා යන ඉද්දිපාදයෝය.රාගය පිලිබඳ අභිඥාව පිණිස සතර ඉද්දිපාද වැඩිය යුතුය. **බලන්න**: සතර ඉද්දිපාද.**මූලාශ්‍රය**:අංගු.නි: (2) 4 නිපාත:4.8.1 චතුසතිපට්ඨාන සූත්‍රය, පි.51ය6.
▲ **චතුඕසය**- Four floods: චතු ඕසය ලෙසින් පෙන්වා ඇත්තේ සසර ඇදගෙන යන ජල ප්‍රවාහයන් 4 ය. මෙය තරණය කිරීමට ඇතිමග ආරිය අටමගය. **බලන්න**: ඔසය, ආරියඅටමග. **මූලාශ්‍රය:** සංයු.නි: (5-1) මහාවග්ග: සතිපට්ඨානසංයුත්ත:3.2.8 බ්‍රහ්මසූත්‍රය,පි.328.
▼**සිහිය ඇතිව** (සතිමත්ව) හැසිරෙන පුද්ගලයා නුවණින් දහම දැක චතු ඕසය තරණය කිරීමට සමත්වේ. **මූලාශ්‍රය**: ඛු.නි.සුත්තනිපාත: පාරායනවග්ග:වස්තුගාථා: පි,326, 5-4 මෙත්තගුමානවක,පි.340.
▲ **චතුදිසා**- Four Quarters: චතුදිසා**-**දිසා 4 නම්: උතුර, දකුණ, නැගෙනහිර හා බටහිරයන දිසවන්ය. කරුණු 5 කින් සමන්විත මහණට, චතු දිසාවන්හි, කිසිම අපහසුවක්, බාධාවක් නොමැතිව හැසිරිය හැකියයි බුදුන් වහන්සේ වදාළහ: 1) ශිලසම්පන්නවීම 2) බහුශ්‍රැතබව 3) සිව්පස පිලිබඳ සන්තුට්ඨිය තිබීම 4) මේ ජීවිතයේදීම සිව් ජාන සමාපත්ති ලබා පහසු විහරණය තිබීම 5) ආසව ක්‍ෂය කිරීමෙන් මේ අත්භවයේදීම අරහත්වය ලබා තිබීම. (Possessing these five qualities, a bhikkhu is at home in the four quarters). **මූලාශ්‍ර:** අංගු.නි: (3):5 නිපාත: 5.3.1.9. චතුදිසා සූත්‍රය, පි. 238, EAN:5: 109.9. At Home in the Four Quarters, p. 275.

▲ **චතුධාතු**- Four elements: චතුධාතු-ධාතු සතර: පඨවි, ආපෝ,තේජෝ හා වායෝ ධාතුය, මේවා සතර මහා භූතයන් ලෙසින්ද පෙන්වා ඇත. පංච උපාදානස්කන්ධය සකස්වී ඇත්තේ මේ ධාතුවලින්ය. ධාතු 4 නිසා ඇති **ආදීනව:**බොහෝ දුක් ඇතිවේ, ලෙඩරෝග ඇතිවේ, මහලුබවට පත්කරයි, මරණය ලබාදෙයි. ධාතු 4 නිසා යම් සොම්නසක්, සතුටක් ඇතිවේ නම් එය චතුධාතුවේ **ආස්වාදයය,** ඒවායේ වෙනස්වීමක් ඇතිවේද, එය ආදීනවයය, ඒවා පිළිබඳ ඇති ඇල්ම දුරුකිරීම එහි **නිස්සරණය** යවේ,එසේ චතු ධාතු පිළබඳව යථා අවබෝධය ලබා ගැනීම, ආධ්‍යාත්මික මගට ඇති බාධා ඉවත්කර ගැනීමය, බ්‍රහ්මචරියාව සාක්ෂාත් කර ගැනීමයයි බුදුන් වහන්සේ පෙන්වා ඇත. **බලන්න:** ධාතු. **සටහන**: විස්තර පිණිස **බලන්න**: විසුද්ධිමග, ධාතුකතා,පි. 720. **මූලාශ්‍ර**: සංයු.නි: (2): නිදානවග්ග: ධාතුසංයුත්ත: චතුධාතුවග්ග, පි. 285, ESN: 14. Dhatu samytta: IV: Four elements, p. 773.

▲ **චතුධාතු වවට්ඨාන**-Analysis of the four elements: චතුධාතු වවට්ඨාන ලෙසින් පෙන්වා ඇත්තේ පඨවි, ආපෝ, තේජෝ හා වායෝ යන ධාතු ගැන විමසා බලා යථා අවබෝධය ලබා ගැනීමය .**බලන්න**: ධාතු. **සටහන:** විස්තර පිණිස **බලන්න:** විසුද්ධිමග්ග, 15 පරිඡේදය.

▲**චතු බ්‍රාහ්මණ සත්‍ය**- The four brahmin truths: බුදුන් වහන්සේ විශිෂ්ඨ ඥාණයෙන් දැන ප්‍රත්‍යක්ෂ කොට ප්‍රකාශ කරන ලද චතු බ්‍රාහ්මණ සත්‍ය නම්, සතර ආකාර ක්ෂිණාශ්‍රව-අසාව ක්‍ෂය කිරීමය: 1**. සියලු සත්ත්‍වයෝ ගළවාගත යුතුය**. එය සත්‍යකි. එසේ කියන ඔහු තමන් ශ්‍රමණයෙක් හෝ බ්‍රාහ්මණයෙක් යයි මානයක් නොගනී, මම උසස්ය, සමානය, හීනය යි ඔහු නොගනී. සත්‍ය, විශිෂ්ඨ ඥාණයෙන් දැනගත් ඔහු, හුදෙක් සත්ත්‍වයන් කෙරෙහි දයාවෙන් හා අනුකම්පාවෙන් කටයුතු කිරීමට පිළිපන්නේවේ 2. **සියලු කාමයෝ අනිත්‍ය, දුකය, විපරිණාමයට පත්වේ.** එය සත්‍යකි. එසේ කියන ඔහු තමන් ශ්‍රමණයෙක් හෝ බ්‍රාහ්මණයෙක් යයි මානයක් නොගනී, මම උසස්ය, සමානය, හීනය යි ඔහු නොගනී. සත්‍ය, විශිෂ්ඨ ඥාණයෙන් දැනගත් ඔහු, කාමයන් කෙරෙහි නිබ්ද්දාව, විරාගය, නිරෝධය පිණිස පිළිපන්නේවේ. 3. **සියලු භවයෝ අනිත්‍ය, දුකය, විපරිණාමයට පත්වේ.** එය සත්‍යකි. එසේ කියන ඔහු තමන් ශ්‍රමණයෙක් හෝ බ්‍රාහ්මණයෙක් යයි මානයක් නොගනී, මම උසස්ය, සමානය, හීනයයි ඔහු නොගනී. සත්‍ය, විශිෂ්ඨ ඥාණයෙන් දැනගත් ඔහු, භවය කෙරෙහි නිබ්ද්දාව, විරාගය, නිරෝධය පිණිස පිළිපන්නේවේ. 4. **මම කිසි තැනක ආත්මයක් නොවෙමි,** මම කිසිවෙකුගේ ආත්මයක් ද නොවෙමි, මගේ ආත්මය යයි කියන දෙයක් කිසිතැනක නොදකිමි, කිසිවෙකුගේ ආත්මය මගේ නොවේ. එසේ **චතු කොටික සුඤ්ඤතාව** ප්‍රකාශ කරන ඔහු සත්‍යක්ම කියයි, ඔහු තමන් ශ්‍රමණයෙක් හෝ බ්‍රාහ්මණයෙක් යයි මානයක් නොගනී, මම උසස්ය, සමානය, හීනය යි ඔහු නොගනී. සත්‍ය, විශිෂ්ඨ ඥාණයෙන් දැනගත් ඔහු, ආකිඤ්චඤ්ඤායතන ප්‍රතිපදාවට පිළිපන් කෙනෙකි. **බලන්න**: චතු කොටික සුඤ්ඤතාව. **මූලාශ්‍ර**: අංගු.නි: (2 ): 4 නිපාත: 4.4.4.5 චතු කොටික සුඤ්ඤතා සූත්‍රය, පි.364, EAN:4: 185. 5 Brahmin Truths, p. 209.

▲ **චතුකොටික සුඤ්ඤතාව**-Four-pointed emptiness - catukkoṭisuññatā: චතුකොටික සුඤ්ඤතාව ලෙසින් පෙන්වා ඇත්තේ

ආකිඤ්චඤ්ඤායතන ප්‍රතිපදාවට පිළිපන්වීමය. ඔහු සුඤ්ඤතාව 4 ආකාරයකින් පුරුදු කරයි: මම කිසි තැනක ආත්මයක් නොවෙමි, මම කිසිවෙකුගේ ආත්මයක් ද නොවෙමි, මගේ ආත්මය යයි කියන දෙයක් කිසිතැනක නොදකිමි, කිසිවෙකුගේ ආත්මය මගේ නොවේ. **බලන්න:** චතු බ්‍රාහ්මණ සත්‍ය, සුඤ්ඤත විහරනය. **සටහන්:*** අටුවාවට අනුව: "This is an explanation of four-pointed emptiness (*catukkoṭisuññatā*). *I am not anywhere* (*nāhaṃ kvacana*): He does not see [his] self anywhere. *The belonging of anyone* (*kassaci kiñcanatasmiṃ*): He does not regard his self as an entity that could be taken up by anyone else, that is, he cannot be taken up by thinking of him as a brother in the position of a brother, a friend in the position of a friend, an employee in the position of an employee. *Nor is there anywhere anything … that is mine* (*na ca mama kvacana*): Here, we temporarily put aside the word 'mine' (*mama*). ** *Ākiñcaññaṃyeva paṭipadaṃ paṭipanno hoti*. Mp says that he is practicing the way without impediments, without grasping (*nippalibodhaṃ niggahaṇameva paṭipadaṃ paṭipanno hoti*). MN 106.8, II 263,33–264,3, however, offers this formula as a meditation device for attaining the base of nothingness (*ākiñcaññāyatanaṃ samāpajjati*). **බලන්න:** EAN: Notes: 896 & 897, p. 628. **මූලාශ්‍ර:** අංගු.නි: (2 ): 4 නිපාත: 4.4.4.5 චතුකොටික සුඤ්ඤතා සූත්‍රය, පි.364, EAN:4: 185. 5 Brahmin Truths, p. 209.

▲ **චතුරනවජ්ජ -** Blameless four requisites: චතුරනවජ්ජ යනු සංඝයා නිදොස්ලෙසින් ලබන සිව්පසය. **බලන්න**: සිව්පස

▲ **චතුවෙසාරජ්ජ -**Chatuvesarajja: චතුවෙසාරජ්ජ, බුදුන් වහන්සේ හඳුන්වන නමකි. බුදුන් වහන්සේ සතර ආකාරයෙන් විශාරද බව මින් පෙන්වා ඇත:1) සම්මාසම්බුදුව දහම අවබෝධ කලබව 2) ආසව ක්‍ෂයකලබව3) මාර්ගඵල දහම අන්තරාකාරී නොවන බව 4) ධර්මය යහපත් ලෙසින් සේවනය කිරීමෙන් දුක නැතිවන බව. **බලන්න**: වෙසාරජ්ජ, බුද්ධනාම. මූලාශ්‍රය:අංගු:4 නිපාත:භනඩාගමවග්ග: චතුවෙසාරාජ්ජ සූත්‍රය.

▲ **චතුවොකාර භව**- Chatu Vokara Bhava: අරූපලෝක 4, චතුවොකාර භව ලෙසින් පෙන්වා ඇත**, බලන්න:** අරූප ලෝක.

▲ **චතුවොහාර -**Chathuvohara: **චතුවොහාර** (සතර වෝහාර ) four kinds of expression) ලෙසින් මෙහි පෙන්වා ඇත්තේ: 1) දක්නා ලද දෙය පිළිබඳව දෘෂ්ට වාදීබව 2) අසන ලද දෙය පිළිබඳව ශ්‍රැතවාදී බවය 3) ගන්ධ, රස, ස්පර්ශය පිළිබඳව මුතයෙහි මුතවාදීබව, 4) ධර්මතා පිලිබඳ විඥානයෙහි විඥානවාදීබව. (One speaks of the seen as it was seen; one speaks of the heard as it was heard; one speaks of the sensed as it was sensed; one speaks of the cognized as it was cognized). **සටහන්:** *රහතුන්ගේ සය ආකාරවූ පාරිශුද්ධත්වය පිණිස මෙම කරුණ එක සාධකයක් බව මේ සූත්‍රයේ පෙන්වා ඇත ** මේ පිලිබඳ භික්ඛු බෝධි හිමි මෙසේ දක්වා ඇත: In these four sections the phenomena comprising personal identity are considered as objects of perception classified into the four categories of the seen, heard, sensed, and cognized. Here, *sensed* (*muta*) signifies the data of

smell, taste, and touch, *cognized* (*viññata*) the data of introspection, abstract thought, and imagination. The objects of perception are “conceived” when they are cognized in terms of “mine,” “I,” and “self,” or in ways that generate craving, conceit, and views. බලන්න:EMN: note: 17, p.1063. **මූලාශ්‍ර**: ම.නි: (3) 3.2.2 ඡබ්බිසෝධන සූත්‍රය, පි.158, EMN:112: The sixfold purity, p.815.

▲**චතුසතිපට්ඨාන-**Chathu satipatthana: චතුසතිපට්ඨාන යනු: කායානුපස්සනාව, වේදනානුපස්සනාව, චිත්තානුපස්සනාව, ධම්මානුපස්සනාව. රාගයේ අභිඥාව පිණිස සතර සති සතිපට්ඨානය වැඩිය යුතුය. **බලන්න**: සතිපට්ඨානය, භාවනා. **මූලාශ්‍රය**:අංගු.නි: (2) 4 නිපාත:4.8.1 චතුසතිපට්ඨාන සූත්‍රය, පි.51ය6.

▲ **චතුසම්මප්පධාන**-Chatusammapphadana: චතුසම්මප්පධාන යනු ප්‍රධන්විරිය වඩන ආකාර 4 ය. 1) නුපන් අකුසල ඇතිනොවීම පිණිස 2) උපන් අකුසල නැතිකර ගැනීම පිණිස 3) නුපන් කුසල ඇතිකර ගැනීම පිණිස. 4) උපන් කුසල දියුණු කර ගැනීම පිණිස,ඡන්දය ඇතිකර මහා විරියකින් කටයුතු කිරීම. රාගයේ අභිඥාව පිණිස චතුසම්මප්පධානය වැඩිය යුතුය. **බලන්න**: ප්‍රධන්විරිය, විරිය. **මූලාශ්‍රය**:අංගු.නි: (2) 4 නිපාත:4.8.1 චතුසතිපට්ඨාන සූත්‍රය, පි.51ය6.

▲ **චාතුර්මහාරාජික දෙව්ලොව -**devas ruled by the four great kings කාමාවචර දේවලෝක 6 න් පළමුවැනි දේවලෝකයය, සක්දෙවිඳු මෙහි අධිපතිය. **බලන්න**: දේවලෝක, සක්‍ර දෙවියෝ, සිව්වරම් දෙවියෝ.

▲ **චතුරාර්යසත්‍ය: පාලි: චත්තාරි අරියසච්චානි** -The four noble truths: චතුරාර්යසත්‍ය: සතර ආර්ය සත්‍ය, සිව්සස්- චතුඅරිය සත්‍ය, චතු සත්‍ය ලෙසින්ද දක්වා ඇත. මෙය අග්‍රතම ධර්මයය. **මූලාශ්‍රය:** බු.නි: ඉතිවුත්තක: 3.5.1 අග්‍රප්‍රසාද සූත්‍රය**,** පි. 466.

▼**සසර දුකින් මිදීම පිණිස** බුදුන් වහන්සේ පෙන්වා දුන් සත්‍ය සතර, චතුරාර්යසත්‍යය වේ: **1) දුක්ඛ ආරිය සත්‍ය: දුක යනු කුමක්ද? “ඉද ඛො පන භික්ඛවෙ, දුක්ඛං අරියසච්චං: ජාතිපි දුක්ඛා ජරාපි දුක්ඛා ව්‍යාධිපි දුක්ඛා මරණම්පි දුක්ඛං අප්පියෙහි සම්පයොගො දුක්ඛො පියෙහි විප්පයොගො දුක්ඛො යම්පිච්ඡං න ලභති තම්පි දුක්ඛං සඞ්ඛිත්තෙන පඤ්චුපාදානක්ඛන්ධා දුක්ඛා…”**. දුක යනු ඉපදීම, වයසට යෑම, ලෙඩවීම, මරණය, අකමැති අය හා එක්වීම, කැමති අයගෙන් වෙන්වීම, පතන දේ නොලැබීම, කෙටියෙන් දක්වන්නේ නම් මේ මුළු පංචඋපාදානස්කන්ධයම දුකය. **2) දුක්ඛ සමුදය ආරියසත්‍ය- දුක ඇතිවීම: “ ඉද ඛො පන භික්ඛවෙ, දුක්ඛසමුදයො අරියසච්චං: යායං තණ්හා පොනොභවිකා නන්දිරාගසහගතා තත්‍ර තත්‍රාභිනන්දිනී, සෙය්‍යථීදං: කාම තණ්හා භවතණ්හා විභවතණ්හා…”**. දුක ඇතිවීමට හේතුව තණ්හාවය, පුනර්භවය ඇතිකරන, ඒ ඒ තැන ගැන ඇල්ම ඇතිකරන, සතුට ඇතිකරන කාම, භව හා විභව තණ්හාවය. **සටහන:** බුදුන් වහන්සේ දුක ඇතිවීම පටිච්චසමුප්පාද ක්‍රියාවලිය තුළින් පෙන්වා ඇත: “අවිද්‍යාව නිසා සංඛාර හටගනී… සංඛාර නිසා විඥාණය හටගනී…” **බලන්න:** පටිච්චසමුප්පාදය. **3) දුක්ඛ නිරෝධ ආරිය සත්‍ය- දුක නැතිවීම: “ ඉද ඛො පන භික්ඛවෙ දුක්ඛනිරොධො අරියසච්චං: යො තස්සායෙව තණ්හාය අසෙසවිරාගනිරොධො චාගො පටිනිස්සග්ගො මුත්ති අනාලයො ”**. දුක නැතිවීම යනු තණ්හාව අවසන්වීමය: තණ්හාව, කිසිම ඉතිරියක් නැතිව අවසන්වීමය. එනම්, තණ්හාව අත්හැරදැමීම, දුරලීම (දීලාදැමීම),

විසිකරදැමීම, ඉන් මිදීමය, ඇල්ම නැතිකර ගැනීමය. **සටහන:** පටිච්චසමුප්පාදයේ දී බුදුන් වහන්සේ දුක නැතිවීම ලෙසින් පෙන්වා ඇත්තේ පටිච්චසමුප්පාද ක්‍රියාවලිය බිඳී යෑමය. **4 ) දුක්ඛ නිරෝධගාමිනි පටිපාදා ආරිය සත්‍ය- දුක නැති කරගැනීමේ මග:**

**"ඉද ඛො පන භික්ඛවෙ දුක්ඛනිරොධගාමිනි පටිපාදා අරියසච්චං: 'අයමෙව අරියො අට්ඨඞ්ගිකො මග්ගො, සෙය්‍යථීදං: සම්මාදිට්ඨි... සම්මාසමාධි'"**.දුක නැතිකිරීමේ ප්‍රතිපදාව යනු අරියඅටමග සම්පූර්ණ කරගැනීමය. **චතුරාර්යසත්‍ය අවබෝධ කරගැනීමේ ක්‍රමවිධිය:** සත්‍ය සතර තුන් ආකාරයකින් අවබෝධ කරගතයුතුවේ: 1) **සත්‍ය ඥානය:** එක් එක් සත්‍ය, මෙය සත්‍යය යි අවබෝධ කරගැනීම 2) **කෘත්‍ය ඥානය:** එක් එක් සත්‍ය පිළිබඳව අනුගමනය කළයුතු දේ කිරීම: දුක අවබෝධය, තණ්හාව නිසා දුක ඇතිවේ යන අවබෝධය, තණ්හාව ප්‍රහීණය කිරීමෙන් දුක නැතිවේ යන අවබෝධය, දුක නැතිකර ගැනීමේ මග ආරියඅටමගය යන අවබෝධය. 3) **කෘත ඥානය:** චතුසත්‍ය අවබෝධය පිණිස කළයුතු දේ නිම කරගත්තේය යන නුවණ ඇතිවීම. **සටහන**: එලෙස, තුන් ආකාරයෙන්: ත්‍රිපරිවෘත්ත යෙන්- එක් එක් සත්‍ය තුන් ආකාරයෙන්- (4x3) 12 ස් අයුරින් පැහැදිලිව අවබෝධකිරීමෙන් තථාගතයන් වහන්සේ උතුම් සම්මා සම්බෝධිය සාක්ෂාත් කරගත්හ. **මූලාශ්‍ර**: වින.පි: මහාවග්ග පාලිය1 : 10 ඡෙදය, පි.98, සංයු.නි: (5-2)මහාවග්ග : සච්ච සංයුත්ත: 12.2.1 ධම්මචක්කප්පවත්තන සූත්‍රය, පි. 294 හා 12.2.2 තථාගත සූත්‍රය, පි. 298, ESN: 56: Saccasamyutta:Setting in motion the wheel of the dhamma, p.2276 & 12.2 Tathāgatas, p. 2279, අංගු.නි (1): 3 නිපාතය: මහාවග්ග: 3.2.2.1 සූත්‍රය, පි. 348, EAN:3: The Great Chapter, 61.1 Sectarian, p. 104.

▼ **ප්‍රඥා ඉන්ද්‍රිය:** දැක ගත හැක්කේ චතුරාර්ය සත්‍ය තුලය. **බලන්න:**ආධ්‍යාත්මික පංචඉන්ද්‍රිය **මූලාශ්‍ර**: සංයු: (5-1): මහාවග්ග: ඉන්ද්‍රියසංයුත්ත: 4.1.8 දට්ඨබ්බ සූත්‍රය, පි. 377, ESN: 48: Indriyasamyutta: 8.8 To be seen, p. 1933.

▼ **චතුසත්‍ය,** ආරිය සත්‍යයවේ. **බලන්න**: ආරියසත්‍ය.

▼ **චතුසත්‍ය අවබෝධ** කරගත් උතුමා ඉන්ද්‍රකීලයක් ලෙසින් නොසැලේ. **බලන්න**: ඉන්ද්‍රකීලය.

▼ **දුක අවසන් කරගැනීමට** චතුසත්‍ය අවබෝධ කළයුතුවේ. **මූලාශ්‍රය:** සංයු.නි: (5-2): සච්චසංයුත්ත:12.5.4 කූටාගර සූත්‍රය, පි.338.

▼ **චතුසත්‍ය** අභිඥෙයිය ධර්මයකි. **බලන්න:** අභිඥෙයිය ධර්ම.

▼ **සම්මා දිට්ඨිය** ඇතිවීමෙන් චතුසත්‍ය අවබෝධය ඇතිවේ. **බලන්න**: ආරියඅටමග.

▼ **අවිජ්ජාව** යනු චතුසත්‍ය නොමදැනීමය. **බලන්න**: අවිජ්ජා ඕසය, අවිද්‍යාව.

▼ **සිව්ජානසමාපත්ති** ලැබීම චතුසත්‍ය අවබෝධය පිණිසය. **බලන්න**: සිව්ජාන.

▼**වෙනත් මූලාශ්‍ර: 1**. **"Foundations of Buddhism: The Four Noble Truths"** by Francis Story: BPS: Wheel: 34-35, Online Edition, 2008 (චතුඅරිය සත්‍යය පිලිබඳ විස්තරාත්මකව දක්වා ඇත).

▼ **චතුරාර්යසත්‍යය සත්‍යධර්මයය -**The Four Noble Truth is the Truth චතුරාර්ය සත්‍ය පිලිබඳ බුද්ධ දේශනාව අසත්‍යයයි ඔප්පු කළනොහැකිය,

කෙලෙසන්නට නොහැකිය, නින්දාකිරීමට නොහැකිය, විශෝධනය කිරීමට - ඉවත්කිරීමට නොහැකියයි බුදුන් වහන්සේ වදාළහ. **බලන්න**: ධර්මයේ සද්භාවය.**එසේ පැවසීමට හේතු**: ධාතු සය නිසා කළලය මව් කුසේ හටගනී (ගර්භාවක්‍රාන්තිය), ගැබෙන් නික්මීම (අවක්‍රාන්තිය) ඇති වනවිට නාම රූපය ඇතිවේ. නාම රූප හේතුකොටගෙන සළායතන ඇතිවේ. සළායතන හේතු කොටගෙන සය ආකාර ස්පර්ශය ඇතිවේ. ස්පර්ශය හේතු කොටගෙන වේදනා ඇතිවේ. වේදනා විඳින්නාට සතර සත්‍ය ( දුක, දුක ඇතිවීම, දුක නැතිවීම, දුක නැතිකිරීමේ මග) තමන් වහන්සේ ප්‍රකාශ කරණ බව බුදුන් වහන්සේ වදාළහ. **බලන්න**: සය ධාතු. **සටහන**: මේ සූත්‍රයේදී සතර සත්‍ය පිලිබඳව හා පටිච්චසමුප්පාද ක්‍රියාවලිය හා එම ක්‍රියාවලිය අවසන් වන අන්දම විස්තරාත්මකව පෙන්වා ඇත.**මූලාශ්‍ර**:අංගු.නි : ( 1 ): 3 නිපාතය: මහාවග්ග: 3.2.2.1 සූත්‍රය, පි. 348, EAN:3: The Great Chapter, 61.1 Sectarian, p. 104.

▼ **චතුරාර්යසත්‍ය විමුක්තිය පිණිසය-** Four Noble Truth is for liberation: චතුරාර්යසත්‍ය අවබෝධ නොකළ නිසා තමන්වහන්සේ මෙන්ම සියලු සත්ත්වයෝ ද දිගුකලක් සසරේ හැසිරුණ බව බුදුන් වහන්සේ වදාළහ. එම ආර්ය සත්‍ය යථා ලෙසින්ම අවබෝධ කරගැනීමෙන්, යළි උපත ඇති කරන තණ්හාව සහමුලින්ම කපා දමන ලදී, භවය ඇතිවීම විනාශ කරනලදී, පුනර්භවයක් නැවත ඇතිනොවේ:
**"චතුන්නං අරියසච්චානං යථාභූතං අදස්සනා**
**සංසිතං දීඝමද්ධානං තාසු තාසෙවව ජාතිසු**
**තානි එතානි දිට්ඨානි භවනෙත්ති සමූහතා,**
**උච්ඡින්නං මූලං දුක්ඛස්ස නත්ථිදානි පුනබ්භවො'ති"** (…it is through not understanding, not penetrating the Four Noble Truths that I as well as you have for a long time run on and gone round the cycle of birth and-death… And by the understanding, the penetration of the same Noble Truth …the craving for becoming has been cut off, the support of becoming has been destroyed, there is no more re-becoming) **මූලාශ්‍ර**: දීඝ.නි: (2): මහාපරිනිර්වාන සූත්‍රය, ඡෙදය 34. පි. 158, EDN: 16 : Mahāparinibbāna Sutta: The Great Passing, The Buddha's Last Days, p. 176.

▼ **චතුරාර්යසත්‍ය අනවබෝධය -**Not knowing the 4 Truths
එක්සමයෙක දෙවියෙක් බුදුන් වහන්සේ බැහැදැක මෙසේ පැවසුහ: **'…චතුආරිය සත්‍ය අවබෝධ නොකරණ ලද සත්ත්වයෝ පරවාදයට යති, ඔවුන් අවදිවී නොමැත"** .බුදුන් වහන්සේ වදාළේ, කෙනෙක් චතුරාර්යසත්‍ය අවබෝධ කරගත්තේ නම් ඔහු පරවාදයට නොයන බවය, බුදුවරු,පසේබුදුවරු, රහතුන් දහම අවබෝධ කර විසම ලෝකයේ සම සිතින් හැසිරෙනබවය. **මූලාශ්‍ර:** සංයු.නි :(1): දේවතාසංයුත්ත: 1.1.7 අප්පටිවිදිත සූත්‍රය, පි. 34, ESN: 1: Devata samyutta: 7.7: Not penetrated, p. 65.

▼**චතුරාර්යසත්‍ය සියලුම කුසල්ය-**The four Noble Truth & Wholesome: සැරියුත් මහා තෙරුන්, **ඇත් පිය සටහන උපමාව** අනුව මෙසේ වදාළහ: **' යම්සේ පොළව මතුපිට හැසිරෙන පා සහිත සතුන්ගේ පියසටහන් ඇත් පාසටහනට ඇතුළත් කළහැකිය. එලෙස, සියලු කුසල් දහම් ( සියලු ධර්ම ඉගැන්වීම්) චතුරාර්යසත්‍යට ඇතුලත්වේ'**: බලන්න**:** උපග්‍රන්ථය:5. **මූලාශ්‍ර:** ම.නි:(1):1.3.8 මහාහත්ථිපදෝපම සූත්‍රය, පි. 468,

EMN:28: The Greater Discourse on the Simile of the Elephant's Footprint, p.264.

▼ **පැවිද්ද චතුසත්‍ය අවබෝධය පිණිසය -** Monkhood is to realize the Four Truths: අතීතයේ හෝ අනාගතයේ හෝ වර්තමානයේ දී යම්කෙනෙක් බුදුසසුනේ මහණදම් පුරන්නේ චතුරාර්යසත්‍ය අවබෝධ කර දුකින් මිදීමටය. සත්‍ය අවබෝධය පිණිස විරිය නොපමාව වැඩියයුතු වේ යයි බුදුන් වහන්සේ පෙන්වා දී තිබේ. **මූලාශ්‍ර:** සංයු.නි: ( 5-2):මහාවග්ග: සච්චසංයුත්ත: කුලපුත්‍ර සූත්‍ර 1 හා 2, පි.284, ESN: 56: Sacchasamyutta: Clansmen 1 & 2 , p. 2267.

▲ **චතුසත්‍ය හා දහම-** The Four Nobel Truths & the Dhamma
1) **සම්මා දිට්ඨිය, චතුරාර්යසත්‍ය අවබෝධය පිණිසය -** Right View is to realize the Four Truths **මූලාශ්‍ර:**:ම.නි: ( 1): 1.1.9 සම්මා දිට්ඨි සූත්‍රය, පි. 130, EMN: 9: Sammādiṭṭhi Sutta - Right View, p. 121.
2) **සමාධි සමාපත්ති චතුසත්‍ය අවබෝධය පිණිසය-** Samadhi is to realize the Four Truths**මූලාශ්‍ර:** සංයු.නි: (5-2): මහාවග්ග:සච්චසංයුත්ත: 12.1.1. සමාධි සූත්‍රය, පි. 284, ESN: 56: Sacchasamyutta: 1.1. Concentration, p. 2265. 3) **චතුරාර්යසත්‍ය අභිඥෙයිය ධර්මතාවකි -** The Four Truths are Higher Dhammas .චතුරාර්යසත්‍ය, විශේෂ නුවණින්- ඥාතපරිඥාවෙන් අවබෝධ කරගතයුතු ධර්මයකි. **බලන්න:** අභිඥෙයිය ධර්ම.**මූලාශ්‍ර:** දීඝ.නි: ( 3): 11 දසුත්තර සූත්‍රය, පි. 483, EDN: 34: Dasuttara Sutta: Expanding Decades, p. 384.
4) **චතුසත්‍ය සැමවිටම සිහිකළ යුතුය -** The Four Truths to be remembered always. යමක් ගැන සිතන්නේ නම්, ලෝකයේ ඇති විවිධ දිට්ඨි ආදිය ගැන නොසිතා, චතුරාර්යසත්‍ය පිලිබඳ සිතන්න යයි බුදුන් වහන්සේ සංඝයාට අවවාද වදාරා ඇත. **"චින්තෙන්තා ච වො තුම්හෙ භික්ඛවෙ, ඉදං දුක්ඛන්ති... දුක්ඛසමුදයොති... දුක්ඛනිරොධොති...අයං දුක්ඛනිරොධගාමිනි පටිපදාති චින්තෙය්‍යාථ. තං කිස්ස හෙතු, එසා භික්ඛවෙ, චින්තා අත්ථසංහිතා, එසා ආදිබ්‍රහ්මචරියකා , එසා නිබ්බිදාය විරාගාය නිරොධාය උපසමාය අභිඤ්ඤාය සම්බොධාය නිබ්බානාය සංවත්තති..."**. මේ දුකය, මේ දුක ඇතිවීමය, මේ දුකේ නිරෝධයය, මේ දුක නැතිකරගන්නා ප්‍රතිපදාවය යි චතුසත්‍ය සිහිකරන්න. එයට හේතු: එම සිතිවිල්ල වැඩදායකය, මග බඹසර ට හේතුවේ, එය කළකිරීම ඇති කරගැනීමට-නිබ්බිදාව, විරාගයට, නිරෝධයට, උපසමය (කෙළෙස් නිවා ගැනීමට), අභිඥාව ලැබීමට, සම්බෝධියට හා නිවන පිණිස වේ. **මූලාශ්‍ර:** සංයු.නි: (5-2): මහාවග්ග: සච්චසංයුත්ත: 12.1.8 චින්තා සූත්‍රය, පි. 290, ESN: 56: Sacchasamyutta: 8.8 Reflection, p. 2272.

▲ **චුතිය හා උත්පත්තිය-** Death & rebirth: චුතිය යනු කඳ බිඳී මරණයට පත්වීමය. කෙළෙස් අහවර නොකර මියයාම නිසා උත්පත්තියක්- යළි උපත ඇතිවේ. චේතනා පහළ කර, කර්ම අරමුණු සකස්වීම නිසා පවතින විඥානය ඇති කල්හි චුතිය හා උත්පත්තිය සිදුවේ යයි බුදුන් වහන්සේ පෙන්වා ඇත. **බලන්න:** චුතුප්පාතනුවණ. **මූලාශ්‍ර:** සංයු.නි: (2 ): නිදානවග්ග: අභිසමයසංයුත්ත:කළාරඛත්තිය: චේතානා සූත්‍ර 3කි. පි. 124, ESN:12: Nidanasamyutta: IV: The Karakhattiya: Volition 3 suttas p. 665.

▲ **චුතුප්පාතනුවණ:** පාලි: **චුතූපපාතෙ ඤාණං**-Knowledge of the

vanishing & reappearing of beings: චුතිඋත්පත්ති නුවණ: දිවැස්- දිව්‍ය චක්ෂු -දිබ්බ චක්ෂු ලෙසින්ද පෙන්වා ඇත. මේ නුවණ පහළවන්නේ අරහත්වයට පත්වෙන අවස්ථාවේදිය. කර්මානුකූලව ඒ ඒ සත්වයා මරණින් මතු යළි උපත ලබන ස්ථාන දැකීමේ නුවණ වූ මෙය ත්‍රිවිධ ඥාණ යන්ගෙන් එකකි, සය අභිඥාවන්ගෙන් එකකි . **සටහන**: ඇසින් ප්‍රත්‍යක්‍ෂ කළයුතු ධර්ම : සත්වයන්ගේ චුතිය හා උත්පත්තිය- චුතුප්පාත නුවණ (දිවැස). **මූලාශ්‍ර:** අංගු:නි: (2) : 4 නිපාත: බ්‍රාහ්මණවග්ග: 4.4.4.9 සච්ඡිකරණීය සූත්‍රය, පි. 376, EAN: 4: 189.9 Realization, p.211. **ශබ්දකෝෂ:පා.සිං.ශ:** පි. 289: "**චුතූපපාත ඤාණ:** චුති උත්පත්ති දැනගන්නා නුවණ". **B.D:** p. 43: "**Cutūpapāta- ñāṇa**: The of the vanishing & reappearing of beingsis identical with the Divine Eye".

▼**චුති උත්පත්ති නුවණ** ,ආධ්‍යාත්මික වර්ධනය පිණිස සච්ඡිකාතබ්බ - සාක්ෂාත් කර ගත යුතු ධර්මතාවයකි. **මූලාශ්‍ර:** දීඝ.නි : (3 ): 11 දසුත්තර සූත්‍රය, පි. 483, EDN: 34: Dasuttara Sutta: Expanding Decades, p. 384.

▼**වෙනත් මූලාශ්‍ර: 1." චුතුපාප්ත ඤාණය**: සත්ත්වයින් ගේ චුති උත්පත්ති දැනගන්නා ඤාණය දිව්‍ය චක්ෂු ඥානය ය- මිනිස් ඇස පිලිබඳ විෂය ඉක්මවා සිටි නුවන...".**සිංහල විශුද්ධිමාර්ගය:** 13 පරිච්ඡේදය: පි. 610**.**

▲ **චුතධර්ම පහ**- Five Falling away Dhamma:චුතධර්ම ලෙසින් පෙන්වා ඇත්තේ, සද්ධර්මයෙන් නික්මීයෑමට (චුතවීමට) හේතුවන කරුනුය. ඒවා 5කි: 1) අශ්‍රද්ධාව 2) හා 3) හිරි හා ඔත්තප්ප් නැතිකම 4) අලසකම 5) ප්‍රඥාව නැතිකම (දුෂ්ප්‍රාඥ). මේ ධර්මතා පහකර ගැනීමෙන්, සද්ධර්මයේ ස්ථාපිතවිය හැකිය.**මූලාශ්‍ර:** අංගු.නි: (3): 5 නිපාත: 5.1.1.8 චවන සූත්‍රය, පි. 32, EAN:5: 8.8. Falling away, p. 239.

▲ **චිත්ත-**citta: චිත්ත: විඥානය, සිත, මනස ලෙසින් ද පෙන්වා ඇත. **බලන්න**: සිත. **සටහන**: චිත්ත සමෘද්ධිය- හෙවත් සිතේ වර්ධනය අත්ත සම්පදාවකි (අර්ථය ඇතිකරයි). **මූලාශ්‍ර:** සංයු.නි: ( 5-1): මහාවග්ග: මග්ගසංයුත්ත: 1.6.4 අත්තසූත්‍රය, පි. 80, ESN: 45: Maggasamyutta: 50.2 Sutta, p. 1654.

▲ **චිත්ත ඉද්දිපාද** - Citta Iddipada:සතර ඉද්දිපාදයන්ගෙන් එකකි. **බලන්න:** සතර ඉද්දිපාද.

▲ **චිත්ත එකග්ගතා**- One pointedness of mind :චිත්ත එකග්ගතා ලෙසින් පෙන්වා ඇත්තේ, යම් අරමුණක් පිළිබඳව සිත එකඟ කරගැනීම- එක්තැන් කර සමාධියට පත්වීමය. මෙය සමථ භාවනාවය. **බලන්න**: සමාධිය, සමථභාවනාව.

▲ **චිත්තකථික**- Chithtakathika: මෙයින් හඳුන්වා ඇත්තේ ධර්මය විසිතුරු ලෙසින් දේශනා කිරීමය. බුදුන් වහන්සේගේ ශ්‍රාවකසංඝයා අතුරින්,කුමාරකාශ්‍යප තෙරුන් අග්‍රය.**බලන්න**:උපග්‍රන්ථය: 1.

▲**චිත්ත ගහපති- මච්ඡිකාසණ්ඩයේ -** householder Citta of Macchikāsaṇḍa:**බලන්න**: උපග්‍රන්ථය:1

▲ **චිත්ත පරිදාය:** පාලි: චිත්තං පරියාදාය - obsesses the mind චිත්ත පරිදාය ලෙසින් පනවා ඇත්තේ කෙළෙස් මගින් සිත යටකර ගැනීමය. එනම්, පංච කාමයට (රූපය, ශබ්දය, ගන්ධය, රසය හා පහස) සිත වසඟ වීමය. **බුදුන් වහන්සේ** වදාළේ ස්ත්‍රියකගේ රූපය, ශබ්දය, ගන්ධය, රසය හා පහස, පුරුෂයකුගේ සිත වසඟ කරගන්නා බවය-

ග්‍රහණය කරගන්නා බවය, කුසල් සිත පැහැර ගන්නා බවය. එසේම පුරුෂයකුගේ රූපය, ශබ්දය, ගන්ධය, රසය හා පහස, ස්ත්‍රියකගේ සිත දැඩිව බැඳ ගනී.එසේ අයෝනිසෝමනසිකාරයෙන් කටයුතු කිරීමෙන් සිත පංච කාමයන්ට යටවීම නිසා ධර්ම මාර්ගය බාධාවේ, අකුසල් ඇතිවේ. **සටහන**: කාමරාගයෙන් තම සිත වැනසී ගිය බව වංගීස තෙරුන් පැවසූ අවස්ථාවේදී, ආනන්ද තෙරුන් වදාළේ කාමරාගයෙන් යටවූ සිත මුදාගැනීම පිණිස කයේ අසුභය මෙනෙහිකර (අසුභ භාවනාව) සිත සංසුන්කර ගන්නා ලෙසය. **මූලාශ්‍ර**: අංගු.නි: (1): 1 නිපාත**:** චිත්ත පරියාදාන වග්ග: 1.1.- 1.1.10 සූත්‍ර, පි.40, EAN:1: Obsession of the mind: 1.1 to 10.10, p. 36, සංයු.නි:(1):සගාථවග්ග: වංගීස සංයුත්ත: 8.1.4 ආනන්ද සූත්‍රය, පි. 362, ESN: Part I: 8: Vangīsasamyutta, 4-Ãnanda sutta, p. 397, 8.1.2 අරති සූත්‍රය, පි. 358, ESN: 8: Vaṅgīsasaṃyutta: 8.2 Discontent, p. 394.

▲ **චිත්තලීනත්වය**: පාලි: **චෙතසොලීනත්තං**- mental sluggishness චිත්තලීනත්වය යනු ධර්මයේ යෙදීමට සිත මැලිවීමය (අරතිය), උනන්දුවක් නොමැතිවීමය. එමගින් අකුසල ධර්ම වැඩේ, සසර දික්වේ, ලීනචිත්තය නිවරණයකි. **බලන්න**: අරතිය. **මූලාශ්‍රය:** ඛු.නි:සුත්තනිපාත: මහාවග්ග: නාලක සූත්‍රය, ගාථාව 720, පි.242.

▼ **චිත්තලීනත්වය** (ධර්මය පිලිබඳ සිතේ ඇති උදාසීන බව) නැති කර ගැනීම, සක්කාය දිට්ඨිය නැතිකර ගැනීමට උදව්වේ. **මූලාශ්‍ර:** අංගු.නි: (6 ):10 නිපාත: ආකංඛවග්ග:10.2.3.6 තයෝධම්ම සූත්‍රය,පි.284, EAN: 10: Tens,76-6.Incapable, p. 524.

▼ **චිත්තලීනත්වය ඇතිඅයට**: සක්කාය දිට්ඨිය, විචිකිච්ඡාව, හා සීලබ්බතපරාමාසය නැති කරගන්ට නොහැකිය. මුළාවූ සිහිය (මුටඨසච්චං), අසම්ප්‍රජන්‍යය හා චිත්ත වික්ෂෙපය (සිත විසිරීයාම) යන ධර්මතා පහ කර ගැනීමෙන් චිත්තලීනත්වය නැති කර ගත හැකිවේ. **සටහන**: චිත්තලීනත්වය ඇතිවිට සෝතාපන්න විය නොහැකිය. **මූලාශ්‍ර**: අංගු.නි: (6):10 නිපාත: 10.2.3.6 තයොධම්ම සූත්‍රය,පි.284, EAN:10: Tens,76-6.Incapable, p. 524.

▲ **චිත්ත වික්ෂෙපය**: පාලි: **චෙතසො විකෙඛපං -** mental distractionධර්මයට අනුව චිත්ත වික්ෂෙපය- විසිරුණ සිත යනු අකුසල දෙසට සිත නැමියාම නිසා සිතේ ඇති සංසුන් බව නැතිවීමය. මෙය, ආධ්‍යාත්මික මාර්ගයට බාධාවකි. සිත විසිරීයාම නිසා සමාධිය ලබා ගැනීමට හැකිනොවේ. චිත්ත වික්ෂෙපය නැතිකර ගැනීමට ආනාපානසතිය වැඩිය යුතුය. **මූලාශ්‍රය:** අංගු.නි: (4): 6 නිපාත: 6.1.9 සූත්‍රය, පි.286.

▼**චිත්ත වික්ෂෙපය** නිසා අයෝනිසෝමනසිකාරය, මිථ්‍යාමග සේවනය (කුමමගගසෙවනං) හා සිතේ ලීනත්වය නැති කරගැනීමට නොහැකිය. ආරියන් දැකීම හා ඇසුරුකිරීම (ආරියසේවනය) ධර්මය ඇසීම- ධර්මශ්‍රවනය, හා අනුන්ගේ දොස් දැකිම නතර කරගැනීම (**උපාරම්භ චිත්ත**- mind bent on criticism) යන ධර්මතා 3 මගින් චිත්ත වික්ෂෙපය පහවේ. **මූලාශ්‍ර:** අංගු.නි:(6):10 නිපාත: 10.2.3.6 තයොධම්ම සූත්‍රය,පි.284, EAN:10: Tens,76-6.Incapable, p. 524.

▲ **චිත්ත විමුක්තිය-** Chitta vimykthi: කාම, ව්‍යාපාද, විහිංසා ආදීවූ ලාමක අකුසල පහ කර ගැනීම චිත්ත විමුක්තියය. සිත සාමකාමීවීම, වඩා ගන්නා අන්දම මෙහි විස්තරාත්මකව පෙන්වා ඇත. **පළමුව පංච ධර්මතා**

**ඇසුරුකරගැනීම**: 1) කල්‍යානමිත්‍ර සේවනය 2) මනාවූ සංවර ශීලය පරිපූර්ණ කරගැනීම 3) සමථය හා විදර්ශනාව වඩා ගැනීමට උපකාරීවන ධර්ම කථා පහසුවෙන්ම සිතට නගා ගැනීම 4) දළපරාක්‍රම විරිය ඇතිකරගැනීම 5) උදය වය දන්නා ප්‍රඥාව වඩා ගැනීම. **දෙවනුව සතර ධර්ම වර්ධනය කර ගත යුතුය**: 1) රාග ප්‍රහීණය පිණිස අසුභය වැඩීම 2) ව්‍යාපාදය ප්‍රහීණය පිණිස මෙත්තාව වැඩීම 3) විතර්ක සංසිඳුවීම පිණිස ආනාපානසතිය වැඩීම 4) අස්මි මානය ප්‍රහීණය පිණිස අනිත්‍ය, අනත්ත සංඥා වැඩීම. මේ කරුණු යහපත් ලෙස වඩාගැනීම නිවන ලබා ගැනීමය.**මූලාශ්‍රය**: අං.ගු.නි: (5) 9 නිපාත: සම්බෝධිවග්ග: 9.1.1.3 මේඝිය සූත්‍රය, පි.394.

▲**චිත්තවිවේකය-** Cittaviveka: හුදකලා විවේකය ඇතිකර ගැනීම චිත්ත විවේකය ඇතිකර ගැනීමට උපකාරීවේ, සමාධිය ඇතිකර ගැනීමට හේතුවේ. **බලන්න**: හුදකලාවිවේකය.

▲ **චිත්ත සංඛාර**- Cittasankhara: සිත පදනම්කොට ඇතිවෙන, සංඥා හා වේදනා චිත්ත සංඛාර ලෙසින් පෙන්වා ඇත. **බලන්න**: සංඛාර.

▲ **චිත්ත සමාධි ඉද්දිපාද**- Citta Samadhi Iddipada: චිත්ත සමාධිය ලෙසින් පෙන්වා ඇත්තේ, සමාධිය ලබාගැනීමට සිත මුල්කරගෙන, ප්‍රධාන විරිය (පධන්විරිය) ඇතිව, චිත්ත ඉද්දිපාදය පිහිට කොට, අකුසල මැඩ, සිත සමාධියට පත්කර ගැනීමය. **මූලාශ්‍ර:** සංයු.නි: (5-2):මහාවග්ග: ඉද්දිපාද සංයුත්ත:7.2.3 ඡන්ද සූත්‍රය, පි.48,ESN: 51: Iddipada samyutta: 13.3 Concentration due to desire, p. 2073.

▲ **චිත්තානුපසසනා -** Mindfulness of the mind:සතර සති පට්ඨානයට අයත් එක් අනුපස්සනාවකි. සිතේ ස්වභාවය බැලීමය. **බලන්න:** සතර සතිපට්ඨානය,භාවනා.

▲ **චිත්තසස උපක්කිලෙසා** (පාලි): **සිත කෙළෙසන කරුණු-** corruptions of the mind: චිත්තසස උපක්කිලෙසා ලෙසින් පෙන්වා ඇත්තේ සිත කෙළෙසන, කිලුටුකරන, ආධ්‍යාත්මික වර්ධනය බාධා කරණ කරුණුය. එනම්, පංච නීවරණ, ශික්ෂාපද කැඩීම ආදීවූ, සමාධියට බාධා කරණ අකුසලයන්ය. **බලන්න**: උපකෙළෙස.

**චද**

▲ **චෝදනාකිරීමේ ක්‍රමය-** Method of reproving: වෙනත් කෙනෙක්හට, චෝදනා කිරීමේදී කරුණු 5 ක් ගැන සලකා බලා එසේ කිරීම - කතා කිරීම-සුදුසුය යි සැරියුත් මහා තෙරුන් පෙන්වා ඇත: 1) සුදුසු කාලය බලා කතාකිරීම 2) සත්‍ය පමණක් කතාකිරීම 3) මොළොක් බසින් පමණක් කතාකිරීම 4) ඔහුගේ යහපත උදෙසා කතාකිරීම 5) කරුණාසහගත සිත ඇතිව- දයාවෙන් කතාකිරීම.**බලන්න**: සංඝවිනය. **මූලාශ්‍ර:** අං.ගු.නි: (3): 5 නිපාත**:** 5.4.2.7 චෝදනා සූත්‍රය, පි. 340, EAN: 5: 167.7 Reproving, p. 291.

**චන**

▲ **චන්ඩ ගාමිණී -**Chandagamini: බලන්න:උපග්‍රන්ථය:3

▲ **චන්ඩප්‍රද්‍යෝත රජ-** King Chandapradotha: මධුරාපුර අවන්තිපුත්‍ර රජලෙසින්ද හඳුන්වයි. මෙතුමා, මහා කච්චායන තෙරුන්ගෙන් දහම අසා බුදුන් සරණ ගියහ. **බලන්න:** උපග්‍රන්ථය:1,3.

▲**චන්දඅභා** -Moon light: චන්දඅභා -සඳකිරණ -චන්ද්‍රාආලෝකය ලෙසින් පෙන්වා ඇත්තේ සඳේ ආලෝකයටය. මෙය ලෝකයේ ඇති දීප්තිමත් ආලෝක 4 න් එකකි. **බලන්න**: අභා, ආලෝකය.

▲ **චන්දන දේවපුත්‍ර**-Chandana devaputtha: මේ දේවපුත්‍රයා බුදුන් වහන්සේ බැහැදැක, ඕඝතරණය ගැන පැවති සංවාදය මෙහි දක්වා ඇත. **මූලාශ්‍ර:** සංයු.නි: (1):සගාථවග්ග: දේවපුත්‍රසංයුත්ත: 2.2.5 චන්දන සූත්‍රය, පි.126.

▲ **චන්දිම-**Moon: චන්දිම නම් රාත්‍රියේදී ලෝකයට ආලෝකය දෙන සඳය- චන්ද්‍රයාය.  චන්දිම දෙව්පුත් ලෙසින්ද පෙන්වා ඇත.එක් සමයක සඳු , රාහු අසුරයා විසින් යටපත් කරගත් අවසථාවේ, ඒ දෙව්ඳු, බුදුන් වහන්සේගෙන් ආරක්ෂාව පැතිය. සඳු බුදුන් සරණ ගිය දෙව්යෙක් නිසා ඔහු රාහුගේ ග්‍රහණයෙන් මුදාහරින්න යයි බුදුන් වහන්සේ වදාළහ. එසේ නොකොළොත් තම හිස සත් කඩකට පැළෙන බව දන්නා, රාහු, සඳු මුදාහැරියේය. **බලන්න**: හිස සත්කඩකට පැලීම. **මූලාශ්‍ර:** සංයු.නි: (1 ):සගාථවග්ග: දේවපුත්‍ර සංයුත්ත: 2.1.10 සූරිය සූත්‍රය, පි. 122, ESN:2: Devaputtasamyutta: 10.10 Suriya, p. 179.
▼**සඳ එළිය,** තරකා එළියට වඩා මහත්ය, එනිසා තරුවලට, සඳ අග්‍රවේ. **මූලාශ්‍ර:** සංයු.නි: (5-1): මහාවග්ග:මග්ගසංයුත්ත: අප්පමාදවග්ග: 1.13- චන්දිම සූත්‍රය, පි.130,ESN: 45: Maggasamyutta: XIII: Diligence: 146.8: The Moon, p. 1688.
▼ **කිසිවක් කෙරෙහි නො ඇලී** අහසට නගින සඳ ලෙසින්, කය හා සිත ඉවත්කොට, ආගන්තුකයෙක් ලෙසින් කුලයන් වෙත (පිඬුපිණිස-පිඬුසිගා යෑම ) එළඹිය යුතුය යි බුදුන් වහන්සේ සංඝයාට උපදෙස් ඇත. සඳ උපමාව යොදාගනිමින් බුදුන් වහන්සේ වදාළේ, මහා කාශ්‍යප තෙරුන් මෙන් කුලයන් හා නොගැටී කටයුතු කලයුතු බවය.**බලන්න:** උපග්‍රන්ථය:5 **මූලාශ්‍ර:** සංයු.නි: (2) නිදානවග්ග: කස්සපසංයුත්ත: 4.1.3 චන්දඋපමා සූත්‍රය, පි.324.
▲**චන්දිමස දේවපුත්‍ර**-Chandimasa devaputtha: මේ දේවපුත්‍රයා බුදුන් වහන්සේ බැහැදැක, ධ්‍යාන ගැන පැවති සංවාදය මෙහි දක්වා ඇත. **මූලාශ්‍ර:** සංයු.නි: (1):සගාථවග්ග: දේවපුත්‍රසංයුත්ත: 2.2.1 චන්දිමස සූත්‍රය, පි.124.
▲ **චන්දනංගලික උපාසක-** Chndanangalika upasaka**: බලන්න:** උපග්‍රන්ථය:3

▲ **චන්ද්‍රභාගා නදිය-**Chndrabhaga River**:** මේ නදිය හිමාල කඳු මුදුනින් පටන්ගෙන, කුක්කුට පුරය අසලින් ගලාගිය මහා ගැඹුරු ගඟාවක් බව මෙහි දක්වා ඇත. එ පුරයේ රජකල කප්පින රජතුමා (මහා කප්පින තෙර) ශ්‍රද්ධාව උපදවා සිය පිරිවර සමග මෙ නදිය තරණය කර බුදුන් වහන්සේ වෙත පැමින පැවිදි විය. **සටහන**: වර්තමාන ඉන්දියාවේ ප්‍රධාන නදියක් වූ සින්දුනදිය විය හැකිය. **බලන්න:**මහා කප්පින තෙර උ.ග්‍ර:1,පි.40.
▲**චින්තාමණි-** cintamani: චින්තාමණි නම් විද්‍යාව පුරුදු පුහුණු කළ කෙනෙකුට අනුන්ගේ සිත් දැනගත හැකිය. **බලන්න**: ප්‍රාතිහාර්ය.
▲ **චින්තාමය ප්‍රඥාව-** Wisdom based on thinking:ධර්මතා පිලිබඳ සිතින් සිතා -ආවර්ජනය කර, ලබාගන්නා අවබෝධය, චින්තාමය ප්‍රඥාවය. **බලන්න**: ත්‍රිවිධ ප්‍රඥා.
▲**චුන්දී රජකුමරිය හා චුන්ද රාජ කුමාර-** Princess Chundi & Prince Chunda:**බලන්න:** උපග්‍රන්ථය: 3

▲ **චුන්ද අඹවනය-** Chunda's Mango grove: අවසාන චාරිකාවේ යෙදුන බුදුන් වහන්සේ, පාවානුවර, චුන්දගේ අඹ වනයේ වැඩසිටි බව මහා පරිනිබ්බාන සූත්‍රයේ දක්වා ඇත. **බලන්න:** උපග්‍රන්ථය:3,6.
▲ **චුන්ද කර්මාකාරපුත්‍ර**-Chunda Karmakaara puthra: **බලන්න:** උපග්‍රන්ථය:3
▲ **චුන්ද සාමනේර-**Chunda Samanera:**බලන්න:** උපග්‍රන්ථය:1

**චණ්‍ඩ**

▲**චණ්ඩාල**-Chandala: බුදුන් වහන්සේ වැඩසිටි කාලයේ ඉතා පහත් කුලයක් ලෙසින් චණ්ඩාල-සැඩොල් කුලය සමාජයේ හඳුන්වා ඇත. බුදුන් වහන්සේ වදාළේ කෙනෙක් වසල- පහත් කුලයකට වැටෙන්නේ උත්පත්තිය අනුව නොව ඔහුගෙ අයහපත් ක්‍රියා අනුවය. කුල භේදය නොතකා, යහපත් පුද්ගලයන්ට බුදුසසුනට ඇතුළුවීමට ඉඩප්‍රස්ථාව ඇත. බුදුන් වහන්සේ මෙසේ වදාළහ: **"...පටන් ගන්නා ලද වීරිය ඇති, නිවන පිණිස මෙහෙයවූ සිත් ඇති, දැඩි පරාක්‍රමය ඇති,ක්‍ෂත්‍රියාද, බ්‍රාහ්මණයාද, වෛශ්‍යයාද, ශුද්‍රයාද, චන්ඩාලයාද, පුප්සඬුවාඩ උත්තම සුද්ධිය නම් නිවනට පැමිණේ..."** **මූලාශ්‍රය**: සංයු.නි: (1) සගාථවග්ග: බ්‍රාහ්මණ සංයුත්ත: 7.1.7 සුද්ධික සූත්‍රය, පි.322. **බලන්න:**උපග්‍රන්ථය:1, සෝපාක සාමණේර, සුනිත තෙර, වසල සූත්‍රය. **සටහන:** CANDALA:The lowest class in the Indian caste system, beneath even the lowest of the four formal castes. Its members are fishermen, jailers, slaughterers, and so on. See: **The Seekers Glossary of Buddhism** , p.148

**චප**

▲ **චාපා තෙරණිය-**Chapa Therani: **බලන්න:** උපග්‍රන්ථය: 2
▲ **චාපාල චෛත්‍යය-** Chapala Cheiya: විසාලා නුවර පිහිටි මේ ස්තුපය අසලදී, ගෝතම බුදුන් වහන්සේ ආයුසංඛාර අත්හලසේක. **බලන්න:** මහාපරිනිබ්බාන සූත්‍රය, ආයුසංඛාර,උපග්‍රන්ථය:6.

**චම**

▲ **චම්පා නුවර**-Chmpa Nuwara: මගධ දේශයට බටහිරින් පිහිටි අංග දේශයේ නුවරකි. මේ නුවර අසල ගග්ගාරා පොකුණු තෙර බුදුන් වහන්සේ වැඩසිටි සේක. **බලන්න:** අංගු.නි: (6) 10 නිපාත: ථෙරවග්ග:10.2.4.1 බාහුන සූත්‍රය, පි.296.

**චර**

▲ **චරණ චිත්‍ර-** Charana cithra: චරණ චිත්‍රය යනු විවිධත්වය මතුකර පෙන්වන චිත්‍රයකි. බුදුන් වහන්සේ වදාළේ, සිත එයට වඩා විවිධත්වයෙන් යුක්ත බවය. **බලන්න:** සිත. **මූලාශ්‍ර**:සංයු.නි: ( 3): ඛන්ධසංයුත්ත: 1.2.5.8 දුතිය ගද්දුලබද්ධ සූත්‍රය, පි. 286, ESN: 22: Khandasamyutta: 100.8 The leash-2 , p. 1090.
▲ **චරපුරුෂ**-Charapurusha: චරපුරුෂ ලෙසින් පෙන්වා ඇත්තේ, රජෙකුගේ රහස් සේවයේ යෙදුන රාජ භටයන්ය. පසේනදී කෝසල රජුගේ පැවිදි වේශයෙන් සිටින චර පුරුෂයන් පිලිබඳ රජතුමා පැවසූ විස්තර අසා බුදුන් වහන්සේ ශ්‍රාවක සංඝයා ගේ පිළිවෙත මෙසේ වදාළහ: "මහණ තෙමේ, ( දූතමෙහෙවර, චර පුරුෂ මෙහෙවර) ආදී සියලු ලාමක ක්‍රියාවන්හි කටයුතු නොකරයි. අනිත් කෙනෙකුගේ සේවකයෙක් ද නොවේ, වෙනත් කෙනක් අධිපති කොට ජීවත් නොවේ. ධර්මය

විකුණන්නේද නැත (ධනය ලබා ගැනීමට බණ කියන්නේ නැත)".
**මූලාශ්‍රය:**ඛු.නි:උදාන පාලිය: ජච්චන්ධවග්ග: 6.2 ජටිල සූත්‍රය, පි. 282.
▲ **චරියාව-** Chariya: චරියාව- යහපත් හැසිරීම, ආධ්‍යාත්මික මග දියුණු කරගැනීමට අවශ්‍ය කරුණකි. යහපත් චරියාවට පදනම් වන්නේ හිරිඔත්තප්ප යන ශුකල ධර්ම 2 ක ය (සුදුධම්ම). **බලන්න:** හිරිඔත්තප්ප.
**මූලාශ්‍රය:**අංගු.නි: (1) 2 නිපාත:2.1.1.9 චරියා සූත්‍රය, පි.140.

▲ **චරියා කථා-** Chariya katha: චරියා කථා ලෙසින් පෙන්වා ඇත්තේ චර්යා 8 ක් ගැනය: 1) ඉරියාපථචරියාව: සතර ඉරියව්ව පැවැත්වීම 2) ආයතන චරියාව: අභ්‍යන්තර හා බාහිර ආයතන දෙක 3) සතිචරියාව: සතර සතිපට්ඨානය 4) සමාධි චරියාව: සතර ජාන 5) ඤාණචරියාව: සතර ආරිය සත්‍ය 6) මග්ග චරියාව: සතර ආරිය මාර්ග 7) පත්තිචරියාව:සතර ශ්‍රමණ ඵල 8) ලෝකඅර්ථචරියාව: සම්මාසම්බුද්ධ, පසේබුදු, ශ්‍රාවකයෝ කෙරහි පවත්වන චරියාවන්. **මූලාශ්‍රය:** ඛු.නි: පටිසම්භිදා 2:පඤ්ඤාවග්ග: 3.5 චරියාකථා, පි.222.

▲ **චර්යානානානත්ව ඥාණය-** Charyananathva Nana: චර්යානානානත්ව ඥාණය යනු, අන්‍යයන්ගේ චරියාවන්, පිරිසිඳ දැනීමේ ප්‍රඥාවය. චර්යා 3 කි: 1) විඥාන චරියාව 2) අඥාන (අඤාන) චරියාව 3) ඥාන (ඤාන) චරියාව. **මූලාශ්‍රය:**ඛු.නි:පටිසම්භිදා1 : මහාවග්ග: 1 ඥාන කතා: පි. 174.

▲ **චාරිත්ත සීලය-**Chariththa sila: ශික්ෂාපද ඒ අයුරින්ම සමාදන්ව, රැක ගැනීම චාරිත්ත ශීලයය. **බලන්න:** ශීලය.

**චල**

▲ **චාල තෙර-**Chala Thera: බලන්න: උපග්‍රන්ථය:1
▲ **චාලාතෙරණිය-**Chala Therani: **බලන්න**: උපග්‍රන්ථය:2
▲ **චුල්ලකොට්ඨිත නියම්ගම-**Chullakottitha Village: මේ නියම් ගම, කුරු ජනපදයේ පිහිටි ධනවත් ගමකි, බුදුන් වහන්සේ වැඩසිටි ස්ථානයකි, බුද්ධශ්‍රාවක, රට්ඨපාල තෙරුන්ගේ උපන් භූමියය. **බලන්න**: උපග්‍රන්ථය:1
▲ **චුල්ලපන්ථක භික්ෂුව-** Cullapanthaka Thera: බලන්න: උපග්‍රන්ථය:1

**චව**

▲**චීවර-** Robes: චීවර යනු සංඝයා පොරවන සිවුරුය, මෙය සංඝයාට කැප සිව්පසයෙන් එකකි. **බලන්න**: සිව්පසය. **සටහන්:** ** චීවර සකස්කිරීම, බෙදාදීම ආදිය ගැන **බලන්න:** විනය පිටකය.** බුදුන් වහන්සේ, තම චීවරය, මහා කාශ්‍යප තෙරුන් සමග හුවමාරු කරගැනීම පිලිබඳ විස්තර පිණිස **බලන්න**: සංයු.නි: (2): නිදානවග්ග: කස්සප සංයුත්ත: 4.1.11 චීවර සූත්‍රය,පි.352, ESN: 16: Kassapasamyutta: 11 The Robe, p. 821.

## ඡ කොටස: ඡඡ, ඡග, ඡන, ඡඵ, ඡබ, ඡළ, ඡව

**ඡඡ**

▲**ඡ ඡක්ක ධම්මා** (පාලි): ධර්මතා 36 - Six sets of six: ඡ ඡක්ක ධම්මා- ධර්මතා 36, ලෙසින් බුදුන් වහන්සේ පෙන්වා ඇත්තේ උතුම් බ්‍රහ්මචරියාව ප්‍රකට කරන ධර්ම කරුණුය: 1) ආධ්‍යාත්මික ආයතන සය 2)

බාහිර ආයතන සය 3) විඥානකාය සය 4) ස්පර්ශකාය සය 5) වේදනා කාය සය 6) තණ්හාකාය සය (The six internal bases should be understood. The six external bases should be understood. The six classes of consciousness should be understood. The six classes of contact should be understood. The six classes of feeling should be understood. The six classes of craving should be understood). එම ධර්මතා යහපත් ලෙසින් අවබෝධ කරගැනීම මගින් සක්කාය දිට්ඨිය, අනුසයන්, ආසවයන් ආදී කෙළෙස් පහ කර විමුක්තිය ලබා ගත හැකිය. **සටහන**: මේ දේශනාව අවසානයේ දී 66 භික්ෂූන් අරහත්වයට පත්වූහ. **මූලාශ්‍ර:** ම.නි: (3 ): 3.5.6 ඡ ඡක්ක සූත්‍රය, පි. 598, EMN: 148: Chachakka Sutta- Six sets of six, p. 598.

**ඡග**

▲ **ඡිග්ගල -** Yoke with a Hole: ඡිග්ගල යනු එක් හිලක් ඇති වියදණ්ඩය. මිනිසත්බව ලැබීමේ දුර්ලභබව පෙන්වීම පිණිස, බුදුන් වහන්සේ මේ උපමාව යොදාගෙන ඇත**:** "යම් පුරුෂයෙක් එක් හිලක් ඇති වියදණ්ඩක්,මහා මුහුදට විසිකරයි. ඒ මුහුදේ, එක් ඇසක් අන්ධ කැස්බෑවෙක් (කණ කැස්බෑවා) සිටී. ඌ සෑම අවුරුදු 100 ට වරක් සාගරයේ මතුපිටට පැමිණේ. එසේ පැමිණෙන කැස්බෑවාට, එක් හිලක් ඇති විය දණ්ඩේ උගේ ගෙල දැමිය හැකිද? ... එසේ දිගු කලක් ගතවූ පසු ඒ කැස්බෑවාට, තම ගෙළ, වියදණ්ඩේ එක් හිලට දැමීමට හැකිවෙනු ඇත. එහෙත්, අපායගාමී බාලයාට, නැවත මිනිසත්බව ලබා ගැනීම සුලබ නොවේ... අපාය ආදී දුගතියේ පින්කිරිමට හැකියාව නැත..." එසේ හෙයින්, විරිය කර චතු සත්‍ය වහා අවබෝධ කරගන්න යයි බුදුන් වහන්සේ වදාළහ.**කණ කැස්බෑවා උපමාව**: උපග්‍රන්ථය5. **සටහන**: ම.නි. බාලපණ්ඩිත සූත්‍රයේ දී ද මේ උපමාව දක්වා ඇත. **මූලාශ්‍ර:** සංයු.නි: (5-2): මහාවග්ග: සච්චසංයුත්ත: 12.5.7 හා 12.5.8 ඡිග්ගල සූත්‍ර, පි. 341, ESN: 56: Sacchasamyutta: 47.7 Yoke with a Hole, p. 2318.

**ඡන**

▲ **ඡන්දය-** Desire: ඡන්දය යනු කැමැත්තය. බුදුන් වහන්සේ වදාළේ: සියලු ධර්මතා කැමැත්ත මුල් කරගෙන ඇතිවෙන බවය. "**ඡන්‍දමූලකා සබ්බෙ ධම්මා**". **මූලාශ්‍ර**: අංගු.නි: (6):10 නිපාත: සචිතතවග්ග: 10.2.1.8. මූලක සූත්‍රය, පි.218, EAN:10: 58.8. Roots, p. 516.

▼ **සියලු කුසල ධම්ම** අතිකර ගැනීමට ඇති ඡන්දය, ආරිය අටමග ඇතිකර ගැනීමට හේතුවේ.එලෙස කැමැත්ත ඇති මහණ "ඡන්දසම්පන්න" ය. **මූලාශ්‍ර**: සංයු.නි: (5-1) මහාවග්ග: මග්ගසංයුත්ත: 1.6.3, 1.6.10 ,1.7.3 ඡන්ද සූත්‍ර, පි. 80

▲ **ඡන්ද රාගය-** Desire for lust :ඡන්ද රාගය- කාමයට ඇති කැමැත්ත (කාමච්ඡන්දය) නීවරණයකි. බුදුන් වහන්සේ වදාළේ: රූප, වේදනා, සංඥා, සංඛාර හා විඥාන ස්කන්ධ (පංචඋපාදානස්කන්ධය) යන්ට ඇති ඡන්ද රාගය, සහමුලින්ම පහ කරගැනීමෙන්, යළි උපත ඇති නොවන බවය. සසර නිමාවීමය. **බලන්න**: නීවරණ. **සටහන:** එකලා විහරණය පිරිපුන් වීම පිණිස ඡන්දරාගය දුරුකලයුතුවේ. **බලන්න**: හුදකලා විවේකය. **මූලාශ්‍ර:** සංයු.නි: (3): ඛන්ධසංයුත්ත: 1.1.3.4 ඡන්ද රාග සූත්‍රය, පි. 76 හා 1.3.1.9 ඡන්ද රාග සූත්‍ර 3කි, පි.308, ESN: 22: Kahndasamyutta: 25.4 Desire & lust, p. 1022 & 111.9, 3 suttas, p. 308.

▲ **ඡන්ද ඉද්දිපාද-** Chanda Iddipada: ඉද්දිපාදයකි. **බලන්න**: සතර ඉද්දිපාද.ඉද්දි ලබාගැනීම පිණිස ඡන්දය-කැමැත්ත ඇතිව ක්‍රියා කිරීම ඡන්ද ඉද්දිපාදයය. **මූලාශ්‍ර:** සංයු.නි: (5-2): මහාවග්ග:ඉද්දිපාද සංයුත්ත:7.2.3 ඡන්ද සූත්‍රය, පි.48,ESN: 51: Iddipadasamyutta: 13.3 Concentration due to desire, p. 2073.

▲ **ඡන්දසමාධි ඉද්දිපාද-** Chanda Samadhi Iddipada: ඡන්දසමාධි ඉද්දිපාද ලෙසින් පෙන්වා ඇත්තේ, සමාධිය ලබාගැනීම පිණිස ඡන්දය-කැමැත්ත ඇතිව, ප්‍රධාන විරිය ඇතිව, ඡන්ද ඉද්දිපාදය පිහිට කොට, අකුසල මැඩ, සිත සමාධියට පත් කර ගැනීමය. **මූලාශ්‍ර:** සංයු.නි: (5-2): මහාවග්ග:ඉද්දිපාද සංයුත්ත:7.2.3 ඡන්ද සූත්‍රය, පි.48,ESN: 51: Iddipadasamyutta: 13.3 Concentration due to desire, p. 2073.

▲ **ඡන්දසමාධි විමංසා ඉද්දිපාද-**Chanda Samadhi VimansaIddipada: ඡන්දසමාධි විමංසා ඉද්දිපාද ලෙසින් පෙන්වා ඇත්තේ, සමාධිය ලබාගැනීම පිණිස විමංසාව ඇතිව, කැමත්ත ඇතිව ප්‍රධාන විරිය ඇතිව, අකුසල මැඩ, සිත සමාධියට පත් කර ගැනීමය. **මූලාශ්‍ර:** සංයු.නි: (5-2): මහාවග්ග:ඉද්දිපාද සංයුත්ත:7.2.3 ඡන්ද සූත්‍රය, පි.48,ESN: 51: Iddipadasamyutta: 13.3 Concentration due to desire, p. 2073.

▲ **ඡන්න (කපිලවස්තුනුවර)තෙර 1 -**Channa (Kapilavasthu) Thera **බලන්න**: උපග්‍රන්ථය:1

▲ **ඡන්න (රජගහනුවර)තෙර 2-**Channa (Rajagaha)Thera **බලන්න**: උපග්‍රන්ථය: 1

**ඡඵ**

▲**ඡඵස්ස ආයතන-**Six contact base: ඡඵස්ස ආයතන ලෙසින් පෙන්වා ඇත්තේ සය වැදෑරුම් ස්පර්ෂ ආයතනයන්ය. ඒවායේ, ඇතිවීම හා නැතිවීම (සමුදයවය) ,ආස්වාදය, ආදිනවස් හා නිස්සරනය යථා පරිදි අවබෝධය ලබාගැනීම මග බඹසර වාසය පූර්ණ කර ගැනීමය. **බලන්න:** ස්පර්ශය. **මූලාශ්‍රය:** සංයු.නි: (4) සළායතනසංයුත්ත:මිගජාලවග්ග: ඡඵස්ස ආයතන සූත්‍ර 3 කි, පි.119.

▼**සය වැදෑරුම් ස්පර්ෂ ආයතන** දමනය නොකිරීම දුකට හේතුවේ. **මූලාශ්‍රය:** සංයු.නි: (4) සළායතනසංයුත්ත: ඡලවග්ග:1.101 ඡඵස්ස ආයතන සූත්‍රය, පි.178.

**ඡබ**

▲ **ඡබ්බිසොධන-** sixfold purity: රහතුන් ආකර සයකින් පිරිසිදුවී අරහත්වයට පැමිණීම පිළිබඳව මෙහි විස්තරාත්මකව පෙන්වා ඇත.**මූලාශ්‍ර**: ම.නි: (3) 3.2.2 ඡබ්බිසෝධන සූත්‍රය, පි.158, EMN:112: The sixfold purity, p.815.

**ඡළ**

▲ **ඡළඅංග දානය-**Offering with 6 factors: ඡළඅංග දානය, ලෙසින් පෙන්වා ඇත්තේ අංග 6 කින් සමන්විත දානය: **දානය දෙන්නාහට (දායක) තිබිය යුතු අංග:** 1) දානය පිරිනැමීමට පෙර ඇති සතුට 2) පහන් සිතින් දානය පිරිනැමීම 3) දානය පිරිනැමීමෙන් පසු ඇති සතුට. **දානය ලබන්නාට (ප්‍රතිග්‍රාහක) තිබිය යුතු අංග:** 1) වීතරාගී වීම (අරහත්) හෝ විතරාගී වීමට පිළිපන්කෙනෙක් වීම 2) වීතදෝස වීම හෝ වීතදෝස වීමට පිළිපන්කෙනෙක් වීම 3) වීතමෝහ වීම හෝ වීතමෝහ වීමට පිළිපන්කෙනෙක් වීම. එවැනි දානයකින් ලබන පින අසිමිතය,අප්‍රමානය,

පුණ්‍ය නදියක් වැනිය යි බුදුන් වහන්සේ වදාළහ. **සටහන**: මේ සූත්‍රය දේශනා කර ඇත්තේ වේළුකණ්ටකී නන්දමාතා උපාසිකාව, සැරියුත් හා මුගලන් මහා රහතුන් (අගසව්) ප්‍රමුඛ සංඝයාට පිරිනැමූ දානය මුල් කරගෙනය. **බලන්න:** පුණ්‍යනදීය. **මූලාශ්‍ර**: අංගු.නි: (4 ): 6 නිපාත: 6.1.4.7 ඡළඅංග දානය, පි. 112, EAN:6 : 37.7 Giving, p. 332.

▲ **ඡළඞගසමන්නාගතො** (පාලි): **අංග 6ක් සතුවීම** -possesses six factors: ඡළඞගසමන්නාගතො ලෙසින් පෙන්වා ඇත්තේ අංග 6ක් සතුව සිටීමය. එනම්: අභ්‍යන්තර හා බාහිර ආයතන සමනය කරගෙන සිටීමය. ආරිය වාසස්ථාන හිමි ආරියෝ, සය ඉන්ද්‍රිය- සළායතන ය (ඇස, කණ ආදීවූ) මගින් අල්ලා ගන්නා බාහිර අරමුණු (රූප, ශබ්ද ආදී) පිළිබඳව, සොම්නස හෝ දොම්නස නොමැතිව, උපේක්ඛා සහගතව සති සම්ප්‍රජන්‍යය ඇතිව සිටීම අංග 6 ක් සතුකර ගැනීමය: **බලන්න**: සළායතන, ආරිය වාසස්ථාන. **"කථඤ්ච භික්ඛවෙ, භික්ඛු ඡළඞගසමන්නාගතො හොති: ඉධ භික්ඛවෙ භික්ඛු චක්ඛුනා රූපං දිස්වා... සොතෙන සද්දං සුත්වා... ඝානෙන ගන්ධං ඝායිත්වා... ජිව්හාය රසං සායිත්වා... කායෙන ඵොට්ඨබ්බං ඵුසිත්වා... මනසා ධම්මං විඤ්ඤාය නෙව සුමනො හොති න දුම්මනො උපෙඛකො විහරති සතො සම්පජානො. එවං ඛො භික්ඛවෙ භික්ඛු ඡළඞගසමන්නාගතො හොති".** (how does a bhikkhu possess six factors? Here, having seen a form with the eye, a bhikkhu is neither joyful nor saddened, but dwells equanimous, mindful and clearly comprehending. Having heard a sound with the ear … Having smelled an odor with the nose … Having experienced a taste with the tongue … Having felt a tactile object with the body … Having cognized a mental phenomenon with the mind, a bhikkhu is neither joyful nor saddened, but dwells equanimous, mindful and clearly comprehending). **මූලාශ්‍ර**: අංගු.නි: (6):10 නිපාත: 10.1.2.9 පඨමාරියවාස සූත්‍රය,10.1.2.10 හා අරියවාස සූත්‍රය, පි.82-84, EAN:10:19.9 & 20.10 Abodes of the Noble Ones, p. 498-499.

▲ **ඡළඅභිජාති-** Six class of people: ඡළඅභිජාති යනු පුද්ගලයන් පංන්ති 6 කට බෙදීමය. බුදුන් වහන්සේ වැඩසිටි සමයේ පුරාණ කාශ්‍යප නම් අන්‍ය ආගමික ගුරුවරයෙක් පුද්ගලයන් එසේ කොටස් කර දක්වා ඇත. **බලන්න**: පුරාණ කාශ්‍යප. බුදුන් වහන්සේ පුද්ගලයන්ගේ උත්පත්තිය , ස්වභාවය, නැඹුරුකම් අනුව ඔවුන් කොටස් 6 කට බෙදා පෙන්වා ඇත: 1) **කළු ජාති ඇතිව (**කණ්හාභිජාති), **කළු ස්වභාවය** (කෘෂණ) ඇති අය: පහත් කුලයක උපදින ඔහු, තුන් දොරින් අකුසල් කරයි, දුගතියට පැමිණේ 2) **කළු ජාති ඇතිව, සුදු ස්වභාවය** (ශුකල) ඇති අය: පහත් කුලයක උපදින ඔහු, තුන් දොරින් කුසල් කරයි, සුදුබවට පත්වේ, සුගතියට පැමිණේ. 3) **කළු ජාති ඇතිව, කළු නොවූ හෝ සුදු නොවූ නිවනට** පැමිණි අයය: පහත් කුලයක උපදින ඔහු, පැවිදිව, සියලු කෙළෙස් හැර නිවන ලබාගනී 4) **සුදු ජාති ඇතිව, කළු කළු ස්වභාවය** ඇති අය: උසස් කුලයක (සුක්කාභිජාති) උපදින ඔහු, තුන් දොරින් අකුසල් කරයි, දුගතියට පැමිණේ 5) **සුදු ජාති ඇතිව, සුදු ස්වභාවය ඇති** අය: උසස් කුලයක උපදින ඔහු, තුන් දොරින් කුසල් කරයි, සුගතියට පැමිණේ **6) සුදු ජාති ඇතිව, කළු නොවූ හෝ සුදු නොවූ නිවනට** පැමිණි අයය: උසස් කුලයක උපදින ඔහු, පැවිදිව, සියලු කෙළෙස් හැර නිවන ලබාගනී.

**මූලාශ්‍ර:** අංගු.නි: (4 ): 6 නිපාත: 6.2.6.3 ඡළඅභිජාති සූත්‍රය, පි.184, EAN:6: 57.3 Six classes, p. 358.

**ඡව**

▲ **ඡවිය-** Skin: මෙහිදී පෙන්වා ඇත්තේ ලාභ සත්කාර ආදියට යටවීමේ දරුණුකමය. ඒවා, කෙනෙක්ගේ ඡවිය-හම-සිවිය සිඳීමට සමත්වේ. එලෙස ඇට මිදුළු දක්වා යයි. ඒ නිසා ඒවා දුරුකිරීමට හික්මිය යුතුය යයි බුදුන් වහන්සේ අවවාද වදාළහ. **මූලාශ්‍රය:**සංයු.නි: (2) නිදානවග්ග: ලාභසත්කාරසංයුත්ත: 5.3.8 ඡවිසූත්‍රය, පි.384.

# ජ කොටස:ජග,ජට,ජත,ජන,ජම,ජය,ජර,ජල,ජව,ජෂ

**ජග**

▲ **ජාගරානුසතිය**: පාලි: **ජාගරියං අනුයුත්තො-** devoted to wakefulness ජගරානුයෝගය ලෙසින්ද පෙන්වා ඇත. ජාගර යනු අවදිව සිටීමය, නොනිදාසිටිමය- නිදිවැරීමය. ජාගරානුසතිය වැඩීම යනු ධර්ම මාර්ගයේ පුහුණුවන භික්ෂුව, නොනිදා සිහියෙන් භාවනායෝගීව සිටීමය. එමගින් පංච නීවරණ පහ කර සමාධිය වැඩිය හැකිවේ. බුදුන් වහන්සේ, උසස් පුහුණුවේ යෙදෙන සංඝයාට ජාගරානුසතියේ යෙදීම සුදුසු යයි අනුසාසන කර ඇත. ජාගාරානුසතිය ඇතිකර ගැනීම, අපණ්ණක පටිපදාවට - ආසව ක්‍ෂය කරගැනීම පිණිස කටයුතු කිරීමට එළඹීමය යි බුදුන් වහන්සේ පෙන්වා ඇත. **බලන්න**: අපණ්ණක ධර්මය හා පටිපදාව. **සටහන:** ජාගාරානුසතිය, අකුප්පබව ලබාගැනීමට හේතුවන කරුණකි. **බලන්න**: අකුප්ප. **ශබ්දකෝෂ: පා.සිං.ශ:** පි.296: '**ජාගර**: නිදිවර්ජිත, නිදිමැරීම. **ජාගරික**: නිදිවර්ජිතයා'.

▼**ජාගරානු සතියේ යෙදෙන අන්දම**: කෙසේනම් භික්ෂුව නිදි වැරිමෙහි යෙදෙන්නේද? මේ සසුනේ භික්ෂුව දහවල මුළුල්ලෙහිම සක්මන් භාවනාවේ යෙදෙමින්ද, ඉඳගෙන භාවනාකරමින් ද නීවරණ වලින් සිත පිරිසිදු කරගනී. රෑ පෙරයම සක්මන්කිරීමෙන් හා හිඳීමෙන් (භාවනා කරමින්) නීවරණයන්ගෙන් සිත පිරිසිදු කර ගනී. රෑ මැදියම දකුණු පයෙහි වම්පය මදක් මැත්කොට තබා සිහිය නුවණ ඇතිව, මෙතෙක් වේලාවෙන් පසු නැගිටිමි යන හැඟීම- සිහිය පිහිටුවාගෙන, දකුණු ඇලයෙන්- සිංහයා නිදාගන්නා ලෙසින්- **සිංහසෙයියාව-**නින්දට යයි. අළුයම අවදිවී, සක්මන් කිරීමෙන් හා හිඳීමෙන්, නීවරණයන්ගෙන් සිත පිරිසිදු කර ගනී. මෙලෙස භික්ෂුව ජාගාරානුසතිය වඩයි: **"කතඤ්ච භික්ඛවෙ, භික්ඛු ජාගරියං අනුයුත්තො හොති: ඉධ භික්ඛවෙ, භික්ඛු දිවසං චඞ්කමෙන නිසජ්ජාය ආවරණියෙහි ධම්මෙහි චිත්තං පරිසොධෙති, රත්තියා පඨමං යාමං චඞ්කමෙන නිසජ්ජාය ආවරණියෙහි ධම්මෙහි චිත්තං පරිසොධෙති, රත්තියා මජ්ඣිමං යාමං දක්ඛිණෙන පස්සෙන සීහසෙය්‍යං කප්පෙති පාදෙ පාදං අච්චාධාය සතො සම්පජානො උට්ඨානසඤ්ඤං මනසිකරිත්වා. රත්තියා පච්ඡිමං යාමං පච්චුට්ඨාය චඞ්කමෙන නිසජ්ජාය ආවරණියෙහි ධම්මෙහි චිත්තං පරිසොධෙති..."** එලෙස, නිදිවැරීමේ යෙදෙන භික්ෂුව, ආසවක්‍ෂය කිරීමේ පටිපදාව ආරම්භ කර ඇත. **සටහන:** ජාගාරානුසතිය බ්‍රහ්මචාරී ජීවිතයට අවශ්‍ය අංගයකි. **මූලාශ්‍ර**: සංයු.නි: ( 4 ): සළායතන වග්ග: 1.19.2 රථූපම සූත්‍රය, පි.369, ESN: 35: Salayatanasamyutta: 239.2 The Simile of the Chariot, p.1315, අංගු.නි:(1) : 3 නිපාත: 3.1.2.6 සූත්‍රය, පි. 252, EAN:3: 16.6 The Unmistaken, p. 83, ම.නි: (2): 2.1.3:සෙඛ සූත්‍රය, පි. 44, MN 53: Sekha Sutta, p. 436, ම.නි (1):

මහාඅස්සපුර සූත්‍රය, පි. 652, EMN : 39 The greater discourse at Assapura , p.344.

▼ **ජාගාරානුසතිය -නිදිවැරීමේ ආනිසංස**: බුදුන් වහන්සේ මෙසේ වදාළහ: " යම් කෙනෙක් නිදන්නට ගියද, ඔබ, පිබිදිය යුතුවේ, නිදීමට වඩා නිදිවැරිම ශ්‍රේෂ්ඨය, නිදි වරන්නාට අත්තානුවාදී ආදී බිය නැත. නින්ද දුරුවූ කල, සම්මා ප්‍රඥාව ඇතිවේ, සිත ඒකඟබවට පත්වේ, ප්‍රමුදිතවේ, විප්‍රසන්නවේ, බෝධිපාක්ෂික ධර්මතා විමසා බැලීමට හැකිවේ, සමාධිය ශ්‍රේෂ්ඨවේ, අවිද්‍යාව පහවේ. එමනිසා කෙළෙස් තවන විරිය ඇතිව, ජාතිජරා පිලිබඳ සංයෝජන නසා නිරුත්තර සම්මා සම්බෝධිය ලබාගන්න". **මූලාශ්‍ර:** බු.නි: ඉතිවුත්තක: 2.2.10 ජාගයිය සූත්‍රය, පි. 400.

**ජට**

▲ **ජටා**- tangle: ධර්මයට අනුව ජටා ලෙසින් පෙන්වා ඇත්තේ, සිත තණ්හාවෙන් ගැට ගැසී තිබීමය. **ශබ්දකෝෂ: පා.සිං.ශ**:පි: 294: "ජටා: ...ශාඛා ජාලය, අවුල් හිසකේ, තණ්හාව".

▼ **එක් සමයක** දෙවියෙක් බුදුන් වහන්සේට මෙසේ පැවසුහ:"**අන්තො ජටා බහි ජටා ජටාය ජටිතා පජා...**" . මිනිසුන්ගේ ඇතුළතත් අවුල්සහගතය, පිටත ද අවුල්සහගතය, සියලු දෙන අවුලෙන් බැඳී ඇත. ඒ අවුල ලිහන්නේ කවරෙක්ද?" බුදුන් වහන්සේ වදාළේ, එම ජටාව- අවුල, නිරවුල් කරගන්නේ රහතන් වහන්සේ බවය. **බලන්න**: අවුල නිරවුල් කරගැනීම**. සටහන්: *** විසුද්ධිමාර්ගය රචනා කර ඇත්තේ එම ගාථාව මුලික කරගෙනය. **බලන්න:** සිංහල විසුද්ධිමාර්ගය: 1 පරිඡේදය. ** **සංයු.නි: බ්‍රාහ්මන සංයුත්තය**: ජටාසූත්‍රය: එම ප්‍රශ්නයම, ජටාභාරද්වාජ බමුණා බුදුන් වහන්සේගෙන් අසා ඇත. බුදුන් වහන්සේ මෙසේ වදාළහ: "යම් තැනක නාමයද, රූපයද ප්‍රතිඝයද රූපසංඥාව යන මේවා නිරවශේෂයෙන් නිරුද්ධ වෙත්ද, එහි මේ තණ්හා අවුල සිඳේ" -එනම්, නිවන ලැබීමය.

▲ **ජටිල**- Jatila: ජටිල ලෙසින් පෙන්වා ඇත්තේ, බුදුන් වහන්සේ වැඩසිටි සමයේ විසූ, සැඩපලු කෙස් ඇති තාපස නිකායකටය. ඔවුන් ගිනි දෙවියා පුදයි, පව් සෝදා ගැනීම පිණිස දියේ ගිලේ. ශිත ඍතුවේ, ගයා තිර්ථයේ, දියෙහි ගිලෙන හා ගිනි පුදන ජටිල තාපසයන් දැක බුදුන් වහන්සේ මේ උදානය වදාළහ: **" මේ ගයා තිර්ථයේ බොහෝ දෙනක් ජල ස්නානය කරති, එහෙත්, ජලයෙන් (කෙළෙස්) පිරිසිදුවීමක් නැත. කෙනෙක්හට, සත්‍ය හා ධර්මය ඇත්නම්, ඔහු පිරිසිදුය (කෙළෙස් රහිතය), ඔහු බ්‍රාහ්මණයෙකි (රහතන් වහන්සේය)". සටහන්: *** උරුවෙල කාශ්‍යප හා ඔහුගේ සහෝදරයන් ජටිල නිකායේ නායකයන්ය. බුදුන් වහන්සේ වෙතින් ධර්මය අසා ඔවුන් බුදුසුනේ පැවිදිව, ආදිත්‍ය පරියාය සූත්‍රය අසා අරහත්වයට පත්වූහ. විස්තර පිණිස **බලන්න**: වින.පි: මහාවග්ග (1) : 48: මහාඛන්ධක: 48 උරුවෙලපටිහාරිය කතා, පි. 127. ** **බලන්න**: අන්‍යආගමික නිකායන්. **මූලාශ්‍රය**: බු.නි:උදාන පාලිය: බෝධිවග්ග: 1.9 ජටිල සූත්‍රය, පි. 168.

**ජත**

▲ **ජතුකන්නි මානවක -Jathukanni manawaka**: **බලන්න:** උපග්‍රන්ථය:3

▲ **ජතුකන්නි මානවක තෙර** -Jathukanni manawaka Thera: **බලන්න:** උපග්‍රන්ථය:1

▲ **ජාතරූප-** Jatarupa: ජාතරූප යනු රන් රිදී මසුරන් කහවනු ආදී ධනයය-මුදල්ය. ඒවා පිළිගන්නා අය බොහෝය. ඒවා පිළිගැනීමෙන් වැලකීම දස ශිලයට ඇතුලත්වේ. සසුනේ පැවිදිබව ලැබූවිට මුදල් ආදිය පරිහරණය නොකරයි. විරියකර, මුදල් ආදිය පරිහරණය නොකිරීමෙන් ,මාර්ගය වඩා ගත හැකිබව මෙහි පෙන්වා ඇත.**බලන්න**:විනය. **මූලාශ්‍ර**: සංයු.නි: (5-2): මහාවග්ග: සච්චසංයුත්ත: 12.9.3 ජාතරූප සූත්‍රය, පි. 366, ESN: 56: Sacchasamyutta: 83.3 Gold & silver, p. 2358.
▼**ශ්‍රමණ ශාක්‍යපුත්‍රයන්**ට රන් රිදී ආදිය අකැප බව බුදුන් වහන්සේ මෙහිදී පෙන්වා ඇත. **සටහන:** මේ සූත්‍රය දේශනා කිරීමට හේතුවුවේ, රජගහනුවර, රාජ මාලිගාවෙදී, රජපිරිස, සංසයා රන් රිදී පිළිගන්නා බව පැවසුවිට එහිසිටි, මණිචූලක ගාමිණී එය එසේ නොවේ යයි පවසා, ඒ ගැන බුදුන් වහන්සේට විස්තර කිරීම නිසාය. **මූලාශ්‍රය:** සංයු.නි: (4) සළායතනවග්ග:ගාමිණිසංයුත්ත:8.1.10 මණිචූලක සූත්‍රය, පි.614.
▲ **ජාතිය ජරාව හා මරණය:** පාලි:**ජාතිං ජරං මරණං-** birth aging and death: ධර්මයේ **ජාතිය** (උත්පත්තිය- ඉපදීම ) ලෙසින් පෙන්වා ඇත්තේ යළි උපතක් ලැබීමය. යළි උපත ඇති කරන කර්ම ඇතිතාක් සත්ත්වයෝ සසරේ ඇවිදිති. **ජරාව** යනු මහලුවීම-වයසට යෑමය. **මරණය** යනු ජීවිත ආයුෂ අවසන්වීමය-කය අතහැර දැමීමය. ජරාවට හා මරණයට පත්වීමට හේතුව ජාතිය ය. **බලන්න:** පටිච්චසමුප්පාදය. **සටහන**: සංයු.නි: සලායතන වග්ග: වේදනා සංයුත්තය: ජාතිධම්ම වග්ගයේ : ජාතිය ජරාව හා මරණය නිසා දුක ඇතිවීමද, ඒවා පිලිබඳ යථා අවබෝධය ලබාගැනීම, අරහත්වයට මග බවද පෙන්වා ඇත.
▼**ජාති ජරා මරණ හා පටිච්ච සමුප්පාදය: ජාතිය (උපත) පටිච්චසමුප්පාදයේ 11 නි පුරුකය.** හවය නිසා ජාතිය ඇතිවේ, හව නිරෝධය නිසා ජාතිය නිරෝධයවේ: **"...භවපච්චයා ජාති...භව නිරොධා ජාති නිරොධො.."** (...with existence as condition, birth... with the cessation of existence, cessation of birth): **ජාතිය කුමක්ද?** ජාතිය යනු යළි උපතක් ඇතිවීමය. ජාතිය අවසන්වීම සියලු දුක අවසන්වීමය. විවිධාකාරවූ සත්ත්වයන්ගේ, ඒ ඒ සත්ත්වනිකායන්හි හටගැනීමක්, පිරිපුන් හටගැනීමක් (උපත ලැබීමක්), (මව්) කුසට බැසගැනීමක්, ඉපදීමක්, විශේෂ ඉපදීමක්, ස්කන්ධයන්ගේ පහළවීමක්, ආයතන ලැබීමක් වේද ඒ ජාතිය යි බුදුන් වහන්සේ වදාළහ: **"...කතමාච භික්ඛවෙ, ජාති? යා තෙසං තෙසං සත්තානං තම්හි තම්හි සත්තනිකායෙ ජාති සඤ්ජාති ඔක්කන්ති නිබ්බත්ති අභිනිබ්බත්ති ඛන්ධානං පාතුභාවො ආයතනානං පටිලාභො, අයං වුච්චති...ජාති"** (The birth of the various beings into the various orders of beings, their being born, descent [into the womb], production, the manifestation of the aggregates, the obtaining of the sense bases. This is called birth). **ජරාව හා මරණය පටිච්ච සමුප්පාදයේ අවසාන (12 නි) පුරුකය.**ජාතිය- උපත හේතුකොට ගෙන ජරා-මරණ, සෝක, වැළපීම්, දුක්වේදනා, දොම්නස (අසතුට), බලාපොරොත්තු සුන්වීම් ආදීය හට ගනී. එලෙස, දුක- දුක් ගොඩ-දුක්ඛස්කන්ධයම ඇතිවේ. ජාතිය නිරෝධවීමෙන්, ජරාමරණ සෝක... ආදීවූ දුක්ගොඩ නිරෝධයට පත්වේ. **"...ජාති පච්චයා ජරාමරණං, සොකපරිදෙව දුක්ඛ දොමනස්සුපායාසා සම්භවන්ති". "...ජාති නිරොධා ජරාමරණං, සොකපරිදෙව දුක්ඛ දොමනස්සුපායාසා නිරුජ්ඣන්ති..."** (with birth as condition, aging-and-death, sorrow, lamentation,

pain, displeasure, and despair come to be- with the cessation of existence, cessation of birth; with the cessation of birth, aging-and-death, sorrow, lamentation, pain, displeasure, and despair cease.) **ජරාව යනු:** : විවිධ සත්ව නිකායේ සත්ත්වයන් වයසට යාමය, දිරායාමක් ඇතිවීම- දත්කැඩීයාම, කෙස්පැසීම, ඇඟ රැළි වැටීම, ජීවබලය (ආයුෂ) පිරිහීම, ඉන්ද්‍රියන් දුබලවීමය.**"කතමඤ්ච භික්ඛවෙ, ජරා යා තෙසං තෙසං සත්තානං තම්හි තම්හි සත්තනිකායෙ ජරා ජීරණතා ඛණ්ඩිච්චං පාලිච්චං වලිත්තචතා ආයුනො සංහානි ඉන්‍ද්‍රියානං පරිපාකො, අයං වුච්චති ජරා** (what, bhikkhus, is aging-and-death? The aging of the various beings in the various orders of beings, their growing old, brokenness of teeth, greyness of hair, wrinkling of skin, decline of vitality, degeneration of the faculties: this is called aging). **මරණය යනු**: විවිධ සත්ව නිකායේ සත්ත්වයන්ගේ චුතිය (කය වැනසීම), කය බිඳීයාම, අන්තර්ධානවීම, මරණයට පත්වීම, මරණය, කාලක්‍රියාව, (පංච) ස්කන්ධය කැඩීයාම, මළමිනිය බහාතැබීම, ජීවිත ඉන්ද්‍රිය අවසන්වීම ය. **"කතමඤ්ච භික්ඛවෙ, මරණං? යා තෙසං තෙසං සත්තානං තම්හා තම්හා සත්තනිකායා චුති චවනතා භෙදො අන්තරාධානං මච්චුමරණං කාලකිරියා ඛන්ධානං භෙදො කලෙබරස්ස නික්ඛෙපො ජීවිතින්‍ද්‍රියස්ස උපච්ඡෙදො. ඉදං වුච්චති මරණං"**. (The passing away of the various beings from the various orders of beings, their perishing, breakup, disappearance, mortality, death, completion of time, the breakup of the aggregates, the laying down of the carcass: this is called death). **මූලාශ්‍ර:** සංයු.නි:(2 ): නිදාන වග්ග: 1.1.1 පටිච්චසමුප්පාද සූත්‍රය හා 1.1.2 විභඞ්ග සූත්‍රය, පි.24, ESN: 12: Nidanasamyutta: 1.1. Dependent Origination & 2.2 Analysis of Dependent Origination, p.610, ම.නි: (1): 1.1.9 සම්මා දිට්ඨි සූත්‍රය, පි. 130, EMN: 9: Sammādiṭṭhi Sutta- Right View, p. 121, දීඝ.නි: (2): 2 මහානිදාන සූත්‍රය, පි. 95, EDN:15: Mahānidāna Sutta: The Great Discourse on Origination, p. 166.

▼**ජාති ජරා මරණ ස්වභාවය බිය ඇතිකරයි**: ජීවිතය, වහා වහා මරණය කරා ගෙනයයි, සත්ත්වයන්ගේ ආයුෂ කෙටිය, ඔවුන්ට ආරක්ෂාවක් නොමැත. මරණ භය දකින මිනිසුන්, සතුට ගෙන දෙන පුණ්‍ය කර්ම කල යුතුය යයි දෙව්වරු දෙදෙනෙක්, බුදුන් වහන්සේ බැහැදැක ප්‍රකාශ කළහ.ඒ පිළිබඳව බුදුන් වහන්සේ පෙන්වා දුන්නේ: **"මරණ භය දකින මිනිසා, ශාන්තිය-නිවන ලබා ගැනීම පිණිස 'ලෝක ආමිෂය' - ලෝකය නමැති ඇම අත් හල යුතු බවය". සටහන: අටුවාවට අනුව:** * දීර්ඝ ආයුෂ ඇති දෙවියෝ, මිනිස් ආයුෂ කෙටි නිසා, දේව ලෝකයේ ඉපදීමට පින් කිරීම සුදුසුය යි දක්වා ඇත. එහෙත්, කුමන භවයක ඉපදුනත් සසර දුක පවතින නිසා බුදුන් වහන්සේ පෙන්වා ඇත්තේ භව පැවැත්මෙන් නිදහස් වීම සුදුසු බවය. ** ලෝක ආමිෂය (world's bait): ලෝක ඇමය: ලෞකිකබව පවත්වා ගැනීම. එනම්, භව ආශාව, ජීවිතය ගෙනයාමට අවශ්‍ය මූලික කරුණු 4 :ඇඳුම්, ආහාර, වාසස්ථාන, බෙහෙත් අදියය. **බලන්න**: ESN: note 10, p. 500. ** ජාති ජරාමරණ බිය ලෝකයාට ඇති මහා භයය. **බලන්න**: භය.**මූලාශ්‍ර**: සංයු.නි: ( 1): දේවතාසංයුත්ත: 1.1.3 උපනියති සූත්‍රය හා 1.1.4 අච්චෙන්ති සූත්‍රය, පි.30,ESN: 1:Devata samyutta:3.3 Reaching & Time Flies by, p.60

▼ **ජාති ජරා මරණ දුක** නැතිකර ගැනීමට, ලෝභය දෝසය මෝහය

(අකුසල මුල්) පහකර ගතයුතුබව මෙහි පෙන්වා ඇත. **මූලාශ්‍ර**:අංගු.නි:(6 ) 10 නිපාත, ආකඞ්ඛ වග්ග: 10.2.3.6 ,තයොධම්ම සූත්‍රය,පි.284, EAN: 10: III-76-6. Incapable, p. 524.

▼**ජාති ජරා මරණ ධර්ම** 3 ලෝකයේ නොපවති නම් තථාගතයන් ලෝකයේ පහළවනොවේ. එහෙත්, එම ධර්මතා 3 ලෝකයේ පවතින නිසා තථාගතයන් පහලවේ, ධම්ම විනය ලෝකයේ බැබලේ: **"යස්මා ච ඛො භික්ඛවෙ ඉමෙ තයො ධම්මා ලොකෙ සංවිජ්ජන්ති, තස්මා තථාගතො ලොකෙ උප්පජ්ජති අරහං සම්මාසම්බුද්ධො. තස්මා තථාගතප්පවෙදිතො ධම්මවිනයො ලොකෙ දිප්පති"**. ජාතිය, ජරාව හා මරණය යන ධර්මතා 3 නැතිකර ගැනීමට ලෝභය දෝසය හා මෝහය යන අකුසල පහ කර ගතයුතුය. **මූලාශ්‍ර**:අංගු.නි: (6):10 නිපාත: 10.2.3.6 තයොධම්ම සූත්‍රය,පි.284, EAN:10: Tens,76-6.Incapable, p. 524.

▼ **ජාතිජරා මරණය,** යාග ආදිය පැවැත්වීමෙන් තරණය කලනොහැකිය. ලෝකස්වභාවය යථා පරිදි අවබෝධකල, සියලු දුසිරිතය බැහැර හල, ක්ෂිණාශ්‍රව රහතුන් ජාති ජරා තරණය කළ බව මෙහි පෙන්වා ඇත. **මූලාශ්‍රය**: ඛු.නි.සුත්තනිපාත: පාරායනවග්ග:වස්තුගාථා: පි,326, 5-3 පුන්නක මානවක, පි.338

▼ **ජාති ජරා මරණ ධර්මතා** යහපත් ලෙසින් අවබෝධ කරගැනීමට සම්මා දිට්ඨිය ඇතිකර ගත යුතුවේ. **මූලාශ්‍ර**: ම.නි: (1 ): 1.1.9 සම්මා දිට්ඨි සූත්‍රය, පි. 130, EMN: 9: Sammādiṭṭhi Sutta- Right View, p. 121.

▼**වෙනත් මූලාශ්‍ර: 1.** "...ඇත්ත වශයෙන්ම ආර්යව්‍යවහාරයට අනුව- උපතක් කියල කියන්නේ: ලෝකයක් මැනීමට ලෝකයක් තැනීමට කුඤ්ඤයක් ගැහුවා වගෙයි...ජාතිය වශයෙන් කෙනෙක් උපදින කොටම, ඉපදීමත් එක්කම ලබන පළමුවෙනිම 'උපන්දින තෑග්ග' තමයි මරණය. **"උප්පත්තියා සහෙවෙදං- මරණං ආගතං සදා"** යන ගාථාව වැදගත් : 'උපතක් සමගම හැම කල්හිම මරණය එනවා': **දියසුළිය:** පි.7: කටුකුරුන්දේ ඤාණනන්ද භික්ඛු, පහන්කනුව ධර්ම දේශනා, ධර්මග්‍රන්ථ මුද්‍රණ භාරය, 2005.

▲ **ජාතිධම්ම-** Jatidhamma: උපදිනසුළු සියලු ධර්මතා, ජාති ධම්මවේ. එනම්: ඇස ආදී සය ඉන්ද්‍රිය, රූප ආදී බාහිර අරමුණු සය, එනිසා ඇතිවන චක්ඛුවිඤ්ඤාණය ආදීය, ඒවා ගැටීමෙන් ඇතිවන ස්පර්ශය: චක්ඛුසම්ඵස්සය ආදී, ඒ නිසා ඇතිවන ත්‍රිවිධ වේදනා, මේ සියල්ල, උපදින සුළුය -ජාති ධම්මයන්ය. **මූලාශ්‍රය:** සංයු.නි: (4): සළායතනවග්ග: වේදනාසංයුත්ත: ජාතිධම්මවග්ග: 1.4.1 ජාතිධම්ම සූත්‍රය, පි.84.

▲**ජෝතික ගහපති**-Householder Jothika: බලන්න:උපග්‍රන්ථය:3

▲**ජෝතිපාල බ්‍රාහ්මණ**-Brahamin Jotipala: අපගේ බුදුන්වහන්සේ කාශ්‍යප බුදුන් සමයේ, ජෝතිපාල බ්‍රාහ්මණ ලෙසින් උපතලබා, ඝටිකාර නම්වූ තම මිත්‍රයාගේ උපදෙස් අනුව, ඒ බුදුන්ගේ ශ්‍රාවකයෙක්වීම පිලිබඳ විස්තර මෙහි දක්වා ඇත. **බලන්න: ම.නි**. ඝටිකාර සූත්‍රය, **සංයු.නි**:දේවතා සංයුත්ත: ඝටිකාර සූත්‍ර 2 කි.

▲**ජෝතිතමපරායන**-Jotithamaparayana : ජෝතිතමපරායන ලෙසින් පෙන්වා ඇත්තේ 'එළියෙන් අඳුරට' යෑමය. එබඳු පුද්ගලයාගේ ස්වභාවය: උසස් කුලයක ඉපදීම, ධනසම්පත්ඇතිබව, තුන්දොරින් දුෂ්චරිතය කිරීම. මරණින් මතු දුගතියේ උපත ලබයි. **මූලාශ්‍රය**: අංගු.නි: (2) 4 නිපාත: 4.2.4.5 තමෝතමපරායන සූත්‍රය, පි.184.

▲**ජෝතිජෝතිපරායන**-Jotijotiparayana: ජෝතිජෝතිපරායන ලෙසින්

පෙන්වා ඇත්තේ 'එළියෙන් එළියට' යැමය. එබඳු පුද්ගලයාගේ ස්වභාවය: උසස් කුලයක ඉපදීම, ධනසම්පත්ඇතිබව, තුන්දොරින් සුචරිතය කිරීම. මරණින් මතු සුගතියේ උපත ලබයි. **මූලාශ්‍රය**: අං.ගු.නි: (2) 4 නිපාත: 4.2.4.5 තමෝතමපරායන සූත්‍රය, පි.184.

▲**ජේතවනාරාමය**-Jetavanaaramaya: සැවැත්නුවර, ජේතවනාරාමය, බුදුන් වහන්සේ වැඩිම කාලයක් වාසය කල ස්ථානයය. අනාථ පිණ්ඩික සිටුතුමා මේ විහාරය සදා, බුදුන් වහන්සේ ඇතුළු සංඝයාහට පුජාකරන ලදී. එතුමා මරණින් මතුව අනාගාමිව ශුද්ධාවාස බ්‍රහ්ම ලෝකයක පහලව, අනථපිණ්ඩික දෙව් ලෙසින් ජේතවනාරාමයට පැමිණම, මෙහි විස්තර කර ඇත. මෙ ස්ථානය බොදුබැතිමතුන්ගේ පුජනිය ස්ථානයකි. **බලන්න**: උපග්‍රන්ථය:3 **මූලාශ්‍රය:**සං.යු.නි: (1) සගාථවග්ග: දේවතා සංයුත්ත :1.5.8 ජේතවන සූත්‍රය, පි.86.

**ජන**

▲ **ජෛන ආගම**-Jain Religion: බුදුන් වහන්සේ වැඩසිටි සමයේ ප්‍රචලිතව පැවති ආගමකි, නිගණ්ඨනාථ පුත්ත ආගමික නායකයය. **බලන්න:** නිගණ්ඨනාථ

▲ **ජනකකර්මය-** Janakakarma: ජනකකර්මය ප්‍රතිසන්ධියට බලපාන කර්මයය, එය කුසල හෝ අකුසල විය හැකිය. **බලන්න**: කම්ම.

▲ **ජනපදකල්‍යාණි-** Janapadaklayani: ජනපදකල්‍යාණිය ලෙසින් පෙන්වා ඇත්තේ, ප්‍රදේශයක මනහර- ශෝභාමත් රූ සපුව ඇති කාන්තාවය. ඇයගේ රූපයට මිනිසුන් වසඟවී, පරිහානියට පත්වෙන ලෙසින්, ලාභසත්කාර, සංඝයා වසඟකර, ධර්මයේ පරිහානියට පත් කරයි. **බලන්න:** ලාභසත්කාර. **උපමාව:**ජනපද කල්‍යාණි. උපග්‍රන්ථය :5.**මූලාශ්‍රය**:සං.යු.නි: (2) නිදානවග්ග: ලාභසත්කාරසංයුත්ත: 3.3.2 ජනපදකල්‍යාණි සූත්‍රය, පි.380.

▼**ජනපදකල්‍යාණිය** ඇති තැන මහා පිරිසක රැස්වේ. එම කරුණ යොදාගෙන බුදුන් වහන්සේ  කායගතා සතිය වඩන ආකාරය පෙන්වා ඇත: ජීවත්වීමට කැමති මිනිසකුට, පිරුණ තෙල්බඳුනක් හිසේ තබාගෙන ජනපදකල්‍යාණිය බැලීමට රැස්වී සිටින මහා ජනසමූහය මැදින් ගමන් කිරීමට නියෝගදෙන්නේය. ඔහු පසුපස කඩුගත් මිනිසක් ගමන් කරයි. යම්හෙයකින්, තෙල් බඳුන ස්වල්ප ලෙසින් හෝ විසිරීගිය හොත ඔහුගේ හිස කපා දමන බව ඔහුට දන්වා ඇත. එලෙස, අණකල පුද්ගලයෙක්, තෙල් බඳුන මානව රැකගන්නේද? පමාවට පත්වන්නේද? යයි බුදුන් වහන්සේ විමසුවිට සංඝයා පිළිතුරු දුන්නේ ඔහු (මරණභය නිසා) පමාවට නො පැමිණෙන බවය. **උපමාවිස්තරය:** පිරුණ තෙල්බඳුන, කායගතා සිහිය දක්වන උපමාවය. කායගතාසතිය එලෙස, සිහිඇතිව, පවත්වා ගත යුතුය. **බලන්න:** කායගතාසතිය, උපග්‍රන්ථය:5. **මූලාශ්‍රය**: සං.යු.නි: (2) නිදානවග්ග: සතිපට්ඨානසංයුත්ත: නාලන්දවග්ග: 3.2.10 ජනපද කල්‍යාණි සූත්‍රය, පි.331.

▲ **ජනප්‍රසාදය-**Janaprasada: ජනප්‍රසාදය- ජනයාගෙන් පැසසුම් ලැබීම, ලාභ සත්කාර ආදිය ලැබීමය. බුදුසසුනේ මාර්ග බ්‍රහ්මචරියාව පැවැත්වීම, ජනයාගේ පැසසුම් පිණිස නොවන බව බුදුන් වහන්සේ පෙන්වා ඇත. **බලන්න**: බ්‍රහ්මචරියාව.

▲ **ජනවසභ දේව**-janavasabha deva: මගධයේ රජව සිටි සේනිය බිම්බිසාර රජ, මරණින් මතු චාතුර්මහාරාජිකය දෙවලොකයේ ජනවසභ නම් දෙවියෙක් ලෙසින් පහළවීම හා එතුමා බුදුන් වහන්සේ බැහැදකිමට

පැමිණීම මෙහි දක්වා ඇත. **බලන්න**: බිම්බිසාර රජ. **මූලාශ්‍රය**: දීඝ.නි: (2) 5 ජනවසභ සූත්‍රය, පි. 322.

▲**ජාන**- ධ්‍යාන: පාලි: **ඣානං**-jhānas: සමථ භාවනාව මගින් සිත එකඟ කරගැනීම - සමාධි සමාපත්ති ලැබීම ජාන ලෙසින් පෙන්වා ඇත. ධර්මයට අනුව ජාන යනු සිව් ජාන සමාධිය- සමාපත්ති ලැබීමය. **බලන්න**: සිව්ජාන. **සටහන්**: * **සංයු.නි: ජානසංයුත්තයේ**, සිව් ජාන පිලිබඳ විස්තරාත්මකව පෙන්වා ඇත. ** **බලන්න:** සිංහල විසුද්ධිමාර්ගය: 3 පරිච්ඡේදය ** **දීඝ.නි**: පාසාදික සූත්‍රය, **ම.නි:** ගෝපක මොග්ගල්ලාන සූත්‍රය, **අංගු.නි**: වේරඤ්ජ සූත්‍රය හා **වින.පි: මහාවග්ග**: වේරඤ්ජ සූත්‍රය: ජාන පිලිබඳව විස්තර දක්වා ඇත. ** ජානවිෂයපිළිබඳව සාමාන්‍ය කෙනෙකුට අවබෝධ කරගැනීම පහසුනැත. **බලන්න**: අචින්ත ධර්මතා. ** 2නි ජානයට පැමිණීමට අපහසු කෙනෙකුට දෙන උපදෙස වන්නේ කතාවෙන් තොරව- නිශ්ශබ්දව, තමාගේ මූලික භාවනා විෂයට සිත යොමුකලයුතු බවය. **බලන්න**: ආරිය තුෂ්නිම්භාවය. ** දෙවනි ජාන සමාපත්තිය ලැබීමෙන්, විතක්ක හා විචාර සංසිඳීම ඇතිවේ. **බලන්න:** අවිතක්ක අවිචාර.

▼ **ජාන සමාපත්ති ලැබීමේ නිපුණබව**: 1) සමාපත්ති කුසලය 2)ඨිති කුසලය 3) වුට්ඨාන කුසලය 4) කල්ලිත කුසලය 5) ආරම්මණ කුසලය 6) ගෝචර කුසලය 7) අභිනීහාර කුසලය (කමටහන් පිලිබඳ) 8) සමාධිය සකස්කරන කුසලය (සක්කච්චකාරී)  9) සමාධිය නිතර කිරිමේ කුසලය ( සාතච්චකාරී) 10) සප්පායකාරී කුසලය (සමාධියට උපකාරීවන කරුණු වැඩීම) ආදීවශයෙන් ජාන සමාපත්ති ලබාගැනීමට අවශ්‍ය නිපුණතාවයන් මෙහි දී විස්තරාත්මකව පෙන්වා ඇත. **බලන්න:** සංයු.නි: (3): ඛන්ධක වග්ග : ජානසංයුත්තය (ඣාන). **සටහන:** * උපකෙළෙස් නැතිවිට ජානසමාපත්ති ලබාගැනීම පහසුවේ. **බලන්න**: උපකෙළෙස. ** සංඛාර අනුපුර්ව සංසිඳීම පිණිස සිව්ජාන සමාපත්ති අවශ්‍යවේ. **බලන්න**: සංඛාර අනුපුර්ව සංසිඳීම. ** ජානසමාපත්ති ඇති අයට ගෝචරකුසලතාවය ඇත. **බලන්න**: ගෝචරකුසලතා. ** ජානසම්පත්තිය ලබා ගැනීම පිණිස කෙනෙක් තමාගේ කේෂ්ත්‍රය අවබෝධ කරගතයුතුය. **බලන්න**:අංගු.නි: (5) 9 නිපාත: 9.1.4.4. ගාවි උපමා සූත්‍රය, පි.502. ** ජනාසමාපත්ති ලබාගැනීමේ සුඛය චෛතසික සුඛයය. **බලන්න:** චෛතසික සුඛය. ජානසමාපත්ති නිසා ඇතිවන සුඛ ගැන **බලන්න**:සුඛය.

▼**බුදුන්වහන්සේ** ජාන සමාපත්ති, කැමති පරිදි ලබාගන්නා අන්දම මේ සූත්‍රයේදී විස්තරාත්මකව පෙන්වා ඇත. **මූලාශ්‍ර:** සංයු.නි: ( 2): නිදානවග්ග: කස්සපසංයුත්ත: 4.1.9 **ජාන අභිඥා සූත්‍රය**, පි. 342, ESN: Nidanavagga: Kassapasamyutta: 9 Jhānas and Direct Knowledges, p. 817.

▼ **ජාන ලබන පුද්ගලයන් සතර දෙනෙකි:** 1) එක් පුද්ගලයෙක් සිත සමාධිමත් කරගැනීමට දක්ෂය (සමාධි කුසලය- skilled in concentration), එහෙත් සමාපත්තිය ලබා ගැනීමට (සමාපත්ති කුසලය- skilled in attainment regarding concentration) දක්ෂ නැත. 2) තවත් පුද්ගලයෙක් සිත සමාධිමත් කරගැනීමට අදක්ෂය, එහෙත් සමාපත්තිය ලබා ගැනීමට දක්ෂය. 3) වෙනත් පුද්ගලයෙක් සිටි, ඔහු පෙරකී කරුණු 2 හිම අදක්ෂය. 4) තවත් පුද්ගලයෙක් සිටි, ඔහු පෙරකී කරුණු 2 හිම දක්ෂය, මෙහිලා ඔහු අග්‍රය. මේ පිලිබඳ **උපමාව**: එළෙදෙන ගෙන් කිරි ලැබේ, ඒ කිරිවලට වඩා දිහි (cream) අග්‍රය, දිහි නිසා ලැබෙන

වෙඬරු(butter) අග්‍රය. වෙඬරු නිසා ලැබෙන ගිතෙල් අග්‍රය. ගිතෙල් නිසා ලැබෙන මණ්ඩය (cream-of-ghee) අග්‍රය. එලෙස, කරුණු 4 ම ඇති පුද්ගලයා සමාධි සමාපත්තිය පිලිබඳ අග්‍රබව ලබයි. **බලන්න:** උපග්‍රන්ථය: 5.**මූලාශ්‍ර**: සංයු.නි: (3): ඛන්ධකවග්ග: ජානසංයුත්ත:13.1.1. සමාපත්ති කුසල සූත්‍රය, පි.566, ESN: 34 Jhānasaṃyutta: 1 Attainment in relation to Concentration, p.1163.

▼ **ජානලබන උතුමන්ට දෙවියෝ නමස්කාර කිරීම**: උතුම් පුරුෂයෙක් සිත දමනයකොට භාවනාවේ යෙදිසිටිනවිට බ්‍රහ්ම, ඉන්ද්‍ර ආදීවූ දෙවියන් ඔහුට මෙසේ නමස්කාර කරන බව බුදුන් වහන්සේ වදාළහ: " පුරුෂ උත්තමයාණෙනි, ඔබගේ භාවනා අරමුණ අපි නොදනිමු, ඔබට නමස්කාරවේවා!"

**"න මො තෙ පුරිසාජඤ්ඤ - න මො තෙ පුරිසුත්තම යස්ස තෙ නාභිජානාම - යම්පි නිස්සාය ඣායසීති"** .**මූලාශ්‍ර**: අංගු.නි: (6 ): 11 නිපාත: නිසසය වගග,11.1.9, **සන්ධ සූත්‍රය**, පි.636, EAN: 11: I Dependence, 9.9 Sandha, p.568.

▼ **බුදුන් වහන්සේ ප්‍රසංසා කළ හා ප්‍රසංසා නොකළ ජාන**: භාග්‍යවතුන් වහන්සේ පංච නීවරණ සහිත භාවනා වැඩිම ප්‍රසංසා නොකළහ. උන්වහන්සේ, රූප ජාන 4 වර්ණනා කළසේක, ප්‍රසංසා කළසේක. **සටහන**: බුදුන් වහන්සේ මහා පරිනිබ්බානයට පත්වීමෙන් පසු ආනාන්ද තෙරුන් වදාළ සූත්‍රයකි. **මූලාශ්‍ර**: ම.නි: (3): ගෝපක මොග්ගල්ලාන සූත්‍රය, පි. 116, EMN: 108, Gopaka Moggallaana Sutta, p. 795.

▼ **ජානපිලිබඳ නුවණ**: අචින්ත ධර්මතාවක්වූ ජාන පිළිබඳව බුදුවරු තත්වාකාරයෙන්ම අවබෝධ කර ඇත. එය තථාගතයන්ගේ එක් දසබලයකි. **බලන්න:** තථාගත දසබලඥාන, අචින්ත ධර්මතා.

▼ **ජාන සම්පත්තියට බාධා**: **ජානවඩා ගැනීමට,** ශබ්දය බාධාවක්ය-කටුවක් යයි බුදුන් වහන්සේ වදාළහ:**"සද්දකණ්ටකා හි භික්ඛවෙ ඣානා වුත්තා මයා". බලන්න:** දසකටු. **මූලාශ්‍ර**: අංගු.නි: (6): 10 නිපාත: 10.2.3.2 කණ්ටක සූත්‍රය, පි. 268, EAN: 10: 72.2 Thorns. p. 521.

▲**ජානඅනාගාමී-**jhāna non-returner: බුදුන් වහන්සේගේ ගිහි ශ්‍රාවකයෙක් වූ උණ්ණාභ බ්‍රාහ්මණ අනාගාමීබව ලැබීම මෙහි දක්වා ඇත. අටුවාවට අනුව ඔහු 'ජාන අනාගාමිය': සෝතාපන්නබව ලැබූ ඔහු පළමු ජාන සමාපත්තිය ලබා පංච නීවරණ පහකර ඇත- jhāna nonreturner: meaning that he was a stream enterer who had abandoned the five hindrances by the first jhāna. If he were to die without having fallen away from jhāna he would be reborn in a higher world and attain final Nibbāna there, while if he were to lose the jhāna his destiny would be undetermined. However, he did not lose it, so his destiny wasdetermined; thus the Buddha made this declaration to indicate he was a "jhāna non returner." **බලන්න**: උපග්‍රන්ථය:3 **මූලාශ්‍ර:** සංයු.නි: (5-1): මහාවග්ග: ඉන්ද්‍රියසංයුත්ත: 4.5.2 උණ්ණාභ බ්‍රාහ්මණ සූත්‍රය, පි.412, ESN:48:Indriyasamyutta: 42.2. Brahmin Uṇṇābha, p. 1973.

▲**ජානවිමොක්ෂ සමාධි සම්පත්තිය-**the jhānas, deliverances, concentrations, & attainments: අනුරුද්ධ තෙරුන් මෙසේ වදාළහ:

"සතර සතිපට්ඨානය යහපත් ලෙසින් වර්ධනය කරගත් නිසා ජානවිමොක්ෂ සමාධි සම්පත්තියේ කෙළෙසීම, පිරිසිදුවීම හා නැගීසිටීම මම තතු දේ දනිමි". **මූලාශ්‍ර:** සංයු.නි: (5-2 ): අනුරුද්ධ සංයුත්ත:8.2.11. ජාන සූත්‍රය, පි. 106, ESN: 52: Anuruddha samyutta:21.11. The jhānas, p.2134.

▲**ජන්තුදේවපුත්‍ර**-Jantyu Deva: එක්සමයක, කොසොල්දනව්වේ, හිමවත් පෙදෙස් වනයක් වාසය කළ අසංවර සංඝයා දැක, ඔවුන් අප්‍රමාදයට පමුනුවන පිණිස මේ දේවපුත්‍රයා කටයුතු කළ ආකාරය මෙහි දක්වා ඇත. **මූලාශ්‍රය:** සංයු.නි:සගාථවග්ග: දේවපුත්‍රසංයුත්ත: 2.3.5 ජන්තු සූත්‍රය, පි.142.

▲**ජානුස්සොනි බ්‍රාහ්මණ**-Janussoni Brahamin: **බලන්න**: උපග්‍රන්ථය:3

**ජම**

▲ **ජම්බුද්වීපය**- Rose-Apple Continent: වත්මන් ඉන්දියාව, බුදුසමයේදී **ජම්බුද්වීපය** නමින් හැඳින්විය. **බලන්න:** දඹදිව. ජම්බුද්වීපයේ වැසියන් කරුණු 3 කින්, උත්තර කුරු වාසීන් හා තව්තිසා දෙවියන්ට වඩා ප්‍රබලයයි මෙහි දක්වා ඇත: 1) ශුරබව 2) සතිය තිබීම 3 බ්‍රහ්මචාරි ජීවිතය ගතකිරීමට හැකියාව ලැබීම.**බලන්න**: තාවතිංස දේවලෝකය, උත්තරකුරු දේශය. **සටහන**: ජම්බුද්වීපය,සක්විති රජු අනසක පවත්වන ප්‍රදේශයකි. **බලන්න**: සක්විතිරජ. **මූලාශ්‍රය:** අංගු.නි: (5) 9 නිපාත: 9.1.3.1 ඨාන සූත්‍රය, පි.462.

▲ **ජම්බුඛාදක පරිබ්‍රාජක**-Jammukhadaka paribrajika: බලන්න: උපග්‍රන්ථය: 3

**ජය**

▲ **ජයගැනීම හා පැරදීම**-Victory & defeat: ජයගැනීම හා පැරදීම දෙකම සිතේ අසහනයට, අසතුටට හේතුවේ. බුදුන් වහන්සේ මෙසේ වදාළහ: " දිනන අය, වෛරී ජනයා ලබයි. පැරදුන අය දුකින් වාසය කරයි. දිනුම් පැරදුම් දෙක හැර දමා සංසින්දුනවිට සුවයෙන් සැතපේ". **බලන්න:** සංග්‍රාම. **මූලාශ්‍ර**: සංයු.නි: (1) සගාථවග්ග: කෝසලසංයුත්ත: ප්‍රථම හා දෙවනි සංග්‍රාම සූත්‍ර, පි.180, ESN:3: Kosalasamyutta, 14.4.& 15.5 suttas, p. 237.

▲ **ජයසේන රාජකුමාර**-Prince Jayasena: මොහු, රජගහනුවර, සේනිය බිම්බිසාර රජතුමාගේ පුත්‍රයෙකි. අචිරවත අග්ගිවෙස්සන සාමනේර හමුව දහම් සාකච්චාවක් කලබව මෙහි දක්වා ඇත. බුදුසසුනේ සංඝයා, කෙළෙස් තවන වීරිය ඇතිව,නිවනට මෙහෙයවූ සිත ඇතිව වාසය කරනවිට, චිත්තඑකග්‍රතාවය ලබන බව, සාමණේරයන් අනුමත කළද, ඔහු එය පිළිනොගත්තේය. සාමණේරයන්, බුදුන් වහන්සේ වෙත එළඹ එම සිද්ධිය විස්තර කළ අවස්ථාවේ, බුදුන් වහන්සේ, සංඝයා ක්‍රමානුකූලව පුහුණුව ලබා දමනයට පත්වෙන අන්දම වදාළහ. **ඇතුන් දමනය කිරීමේ උපමාව**:උපග්‍රන්ථය:5. ම.නි: (3) 3.3.5 දන්තභූමි සූත්‍රය, පි.320.

**ජර**

▲ **ජරාව**-Decay: ජරාව, වයසටයෑම- මහළුවීමය. වයසට යනතෙක්ම ශීලය යහපත්වේ යයි මෙහි පෙන්වා ඇත. **සටහන**: කය ජරාවට පත්වීම පිලිබඳ විස්තර පිණිස **බලන්න**: ඛු.නි: ධම්මපද: ජරාවග්ග. **මූලාශ්‍රය:** සංයු.නි: (1): සගාථවාග්ග: දේවතාසංයුත්ත: ජරාවග්ග:1.6.1 ජරාසූත්‍රය,

පි.92.

▼**බුදුන්වහන්සේ ගේ කය ජරාවට පත්වීම**: එක්සමයක, ආනන්ද තෙරුන් බුදුන් වහන්සේගේ කය මහළුබවට පත්වීම දැක එය පුදුමයක් යයි පැවසුහ. ඒ අවස්ථාවේ බුදුන් වහන්සේ මෙසේ වදාළහ:**"යොවුන් බවේ දිරන ස්වභාවය ඇත...සියලු අවයවයෝ ලිහිල්වේ, රැලි ගැසේ...මනරම් සිරුර ජරාවෙන් මඩනා ලද්දේය" මූලාශ්‍රය:** සංයු.නි: (5-1) :මහාවග්ග: ඉන්ද්‍රියසංයුත්ත: ජරාවග්ග: 4.5.1 ජරාසූත්‍රය, පි.412.

▼**මිනිස්ජීවිතය අල්ප බවද**, දිගුකලක් ජීවත්වුවද, ඒකාන්තයෙන්ම ජාරාවට පත්වී මියයන බව මෙහි පෙන්වා ඇත:**"අප්පං වත ජීවිතං ඉදං - ඔරං වස්සසතාපි මීයති යො චෙපි අතිච්ච ජීවති - අථ ඛො සො ජරසාපි මීයති" මූලාශ්‍රය:** ඛු.නි: සුත්තනිපාත: අට්ඨකවග්ග: 4-6 ජරාසූත්‍රය, පි.273.

▲ **ජරාධම්ම**-Jaradhamma: සියල්ල ජරාවට -දිරීමට පත්වේ යයි බුදුන් වහන්සේ පෙන්වා ඇත. **මූලාශ්‍රය:**සංයු.නි: (4): සළායතන වග්ග: වේදනා සංයුත්ත:ජාතිධම්මවග්ග: 1.4.2 ජරාධම්ම සූත්‍රය, පි.84.

▲ **ජරාමරණ**-Jaramarana: ජරාමරණය කුමක්ද: එහි සමුදය, නිරෝධය හා නිරෝධගාමිණි පටිපදාව නොදන්නේ නම් ඔහු සමණ හෝ බ්‍රාහ්මණ නොවේ. එම අවබෝධය ඇතිවිට, සමණබ්‍රාහ්මණ ඵලය සාක්ෂාත්වේ. **මූලාශ්‍රය:**සංයු.නි: (2): නිදානවග්ග:සමණබ්‍රාහ්මණවග්ග: 1.8.1 ජරාමරණ සූත්‍රය, පි.222.

▼**ජරාමරණය පිළිබඳ** යථා ලෙසින් අවබෝධ කරගැනීමට ශාස්තෘවරයෙක් ගේ පිහිට සෙවිය යුතුය. **මූලාශ්‍රය:**සංයු.නි: (2): නිදානවග්ග:සත්ථුවග්ග: 1.9.1.1.ජරාමරණ සූත්‍රය, පි.226.

▼**ජරා මරණ තතු** සේ අවබෝධ කරගැනීමට ත්‍රිවිධ ශික්ෂාව පුහුණු කරගත යුතුය. **මූලාශ්‍රය:**සංයු.නි: (2): නිදානවග්ග: සික්ඛාවග්ග: 1.9.2 ජරාමරණ සූත්‍ර, පි.230.

**ජල**

▲**ජලංග බ්‍රාහ්මණ-**Brahamin Jalanga: **බලන්න:**උපග්‍රන්ථය:3

▲ **ජලස්නානය**-Bathing: බුදුන් වහන්සේ වැඩසිටි සමයේ , ජල ස්නානය සමහර බ්‍රාහ්මණ නිකායන්හි පුරුදු කල ව්‍රතයකි. දිය නැමෙන් පව්සෝදා හැරීමට හැකිය යන විශ්වාසය ඔවුන්ට තිබිණි. බුදුන් වහන්සේ වෙතින් ධර්මය අසා, පැහැදුන අය, එම සිරිත හැර බුදු සසුනේ පැවිදිවූහ, උපාසකයන් වූහ. **බලන්න:**උදක සුද්ධක බ්‍රාහ්මණ,ගයා කස්සපතෙර, සුද්ධික භාරද්වාජ තෙර, පුණ්ණා තෙරණිය,සංගාරව බ්‍රාහ්මණ 2 , ම.නි:වත්ථුපම සූත්‍රය,සංයු.නි:බ්‍රාහ්මණසංයුත්ත:7.2.11 සංගාරව සූත්‍රය, පි.352,

▲ **ජලාභුජ-** Jalabhuja: ජලාභුජ යනු ජලයෙන් ඇතිවන උපතය, උත්පත්ති විධියකි. මවකගේ ගැබයෙන් ලබන උපත. මිනිසුන් හා තිරිසන් සතුන් උපත ලබන විධියය. **බලන්න:** උත්පත්ති විධි. **මූලාශ්‍ර**: ම.නි: ( 1 ): 1.2.2 මහාසීහනාද සූත්‍රය, ඡෙදය.32, පි. 184, EMN: 12: The Greater Discourse on the Lion's Roar, para. 32, p. 160.

▲ **ජාලිය පරිබ්‍රාජක**-Jaliya paribrajika: මේ පරිබ්‍රාජකයා,කොසඹෑනුවර,ඝෝසිතාරාමයෙහි දී, මන්ඩිස්ස පරිබ්‍රාජක සමග බුදුන් වහන්සේ හමුවූ බව,උන්වහන්සේ දෙසු ධර්මය පිළිබඳ

පැහැදීමට පත්වූබව මෙහි දක්වා ඇත. **මූලාශ්‍රය:** දීඝ.නි: (1) 7 ජාලිය සූත්‍රය, පි.364.

▲ **ජාලිනි දෙව්දුව-Jalini Deva**: අනුරුද්ධ තෙරුන්ගේ පෙර ජීවිතයක බිරිඳවූ මෙතුමිය, දෙව්දුවක ලෙස උපත ලබාසිටිනවිට අනුරුද්ධ මහා රහතුන් හමුවට පැමිණීම හා එතුමන් ඇයටඅවවාද කිරීම මෙහි දක්වා ඇත. **බලන්න**:සංයු.නි:වනසංයුත්ත:9.1.6 අනුරුද්ධ සූත්‍රය, පි:382,

**ජව**

▲**ජවන ප්‍රඥාව**: පාලි: **ජවනපඤ්ඤා-** swiftness of wisdom: ධර්මයේ ජවන ප්‍රඥාව ලෙසින් පෙන්වා ඇත්තේ ධර්මතාවයන්, වේගවත් ලෙසින්, ඉක්මනින් අවබෝධ කරගැනීමට ඇති නුවණය. ජවසම්පන්න ප්‍රඥාව ලෙසින්ද හඳුන්වයි. **බලන්න**: ප්‍රඥාව.

▼ **ජවන ප්‍රඥාව පරිපූර්ණවීම: :i** අනිච්චානුපස්සනාව ... ii රූපයෙහි, වේදනාවේ, සංඥාවේ, සංඛාරයේ, විඥානයේ (පංච උපාදානස්කන්ධ යේ), ඇසේ හා ජරාව හා මරණයේ iii අතීත-අනාගත-වර්තමාන රූප පිළිබඳව, අනිච්චනු පස්සනාව වැඩීමෙන්, නැවත නැවත එහි යෙදීමෙන් ජවන ප්‍රඥාව පරිපූර්ණවේ, iv අතීත-අනාගත-වර්තමාන රූප පිළිබඳව දුක්ඛානුපස්සනාව වැඩීමෙන්, නැවත නැවත එහි යෙදීමෙන් ජවන ප්‍රඥාව පරිපූර්ණවේ v අතීත-අනාගත-වර්තමාන රූප පිළිබඳව අනත්තානු පස්සනාව, වැඩීමෙන්, නැවත නැවත එහි යෙදීමෙන් ජවන ප්‍රඥාව පරිපූර්ණවේ vi අතීත-අනාගත-වර්තමාන රූප පිළිබඳව නිබ්ද්දානු පස්සනාව වැඩීමෙන්, නැවත නැවත එහි යෙදීමෙන් ජවන ප්‍රඥාව පරිපූර්ණවේ vii අතීත-අනාගත-වර්තමාන රූප පිළිබඳව විරාගානු පස්සනාව වැඩීමෙන්, නැවත නැවත එහි යෙදීමෙන් ජවන ප්‍රඥාව පරිපූර්ණවේ viii අතීත-අනාගත-වර්තමාන රූප පිළිබඳව පටිනිස්සග්ගානු පස්සනාව වැඩීමෙන්, නැවත නැවත එහි යෙදීමෙන් ජවන ප්‍රඥාව පරිපූර්ණවේ. **“අනිච්චානුපස්සනා… රූපෙ…වේදනාය… සඤ්ඤාය … සඞ්ඛාරෙසු… විඤ්ඤාණෙ… චක්ඛුස්මිං… ජරාමරණෙ… අතීතානාගත පච්චුප්පන්න රූපෙ අනිච්චානුපස්සනා, භාවිතා බහුලීකතා ජවනපඤ්ඤං පරිපූරෙති… අතීතානාගතපච්චුප්පන්න රූපෙ දුක්ඛානුපස්සනා, භාවිතා බහුලීකතා ජවනපඤ්ඤං පරිපූරෙති… අතීතානාගත පච්චුප්පන්න රූපෙ අනත්තානුපස්සනා භාවිතා බහුලීකතා ජවනපඤ්ඤං පරිපූරෙති… අතීතානාගතපච්චුප්පන්න රූපෙ නිබ්බිදානුපස්සනා භාවිතා බහුලීකතා ජවනපඤ්ඤං පරිපූරෙති… අතීතානාගතපච්චුප්පන්න රූපෙ විරාගානු පස්සනා භාවිතා බහුලීකතා ජවනපඤ්ඤං පරිපූරෙති… අතීතානාගත පච්චුප්පන්න රූපෙ නිරොධානුපස්සනා භාවිතා බහුලීකතා ජවනපඤ්ඤං පරිපූරෙති”** . **ජවන ප්‍රඥාව යනු කුමක්ද?** ආධ්‍යාත්මික, බාහිර, ඕලාරික, සුක්ෂම, හීන, ප්‍රණීත, දුර, ලඟ, අතීත, අනාගත, වර්තමාන රූප, වේදනා, සඥා, සංස්කාර, විඥානය (පංච උපාදානස්කන්ධයම) අනිත්‍යබව, දුකබව, අනාත්මබව වහා අවබෝධ කරගැනීමේ නුවණය. එම නුවණ තුලනය කර පංච උපාදානස්කන්ධය, ජරාමරණය, චක්ෂුය ක්‍ෂයවීම අනුව අනිත්‍යබව, භ යඅනුව දුකබව, අසාර අර්ථයෙන් (හරයක් නොමැතිබව) අනාත්ම බව තුලනය කර, ජරාමරණ නිරෝධය වූ නිවන වෙත වහා පැමිණීම, ජවන ප්‍රඥාවය වේ. **මූලාශ්‍ර**: ඛු.නි: පටිසම්භිදා 3 : ප්‍රඥාවග්ග: 3.1 ප්‍රඥා කථා, පි. 166-186.

▼**සතර ධර්ම වඩාගැනීමෙන්, විපුල කරගැනීමෙන් ජවන ප්‍රඥාව ඇතිවේ.**

**සතර ධර්ම**: සත්පුරුෂ සේවනය 2) සද්ධර්ම ශ්‍රවණය 3) යෝනිසෝ මනසිකාරය 4) ධර්මයට අනුකූලව පිළිපැදීම -ධර්මානුධර්ම ප්‍රතිපදාව. **බලන්න**: සතරධර්ම.**මූලාශ්‍ර:** සංයු.නි: (5-2): **සෝතාපන්න සංයුත්ත:** සප්ත ප්‍රඥාවග්ග හා මහා ප්‍රඥා වග්ග **සූත්‍ර**: 11.6.5 - පි. 276, ESN: 55: Sotapatthisamyutta: VI The Wise One- Great Wisdom, 55.5, p. 2253.

▼**ජවන ප්‍රඥාව,** කායගතා සතිය වැඩිමෙන්, විපුල කරගැනීමෙන් ලැබෙන යහපත් ඵලයකි. **බලන්න**: කායගතා සතියේ ප්‍රතිලාභ. **මූලාශ්‍ර:** අංගු.නි: (1): 1 නිපාත: කායගතාසති වග්ග සූත්‍ර: 1.16.7-සිට, පි. 126, EAN:1: Mindfulness Directed to the Body, p.52.

▼ **වෙනත් මූලාශ්‍ර:: 1**. “රූප-වේදනා-සඤ්ඤා-සඞ්ඛාර-විඤ්ඤාණ යන ස්කන්ධ පසෙහි අනිත්‍ය-දුඃඛ-අනාත්ම වශයෙන් පැතිර යන්නා වූ නුවණ ජවනපඤ්ඤා නම්වේ” **අන්තර්ජාල ලිපිය**: https://pitaka.lk/dhammapada/ss/katha-28.html

▲**ජීවකකොමාරභච්ච**- Jivaka Komarabacha:**බලන්න**: උපග්‍රන්ථය:3

▲**ජීවිකාව-**Jivikava: ජීවිකාව ලෙසින් පිඩු සිගමනේ යෑම ලෝකවාසීන් පහත් කර සළකන දෙයකි. එහෙත්, බුදුසසුනේ පැවිදි සංඝයා ජීවිකාව පිණිස පිඩු සිගායන්නේ, දුක දැනගෙන ඉන් මිදීමට ඇති කැමැත්ත නිසාබව මෙහි පෙන්වා ඇත. යම්හෙයකින් අසංවර සංඝයා රට වැසියන් විසින් ලබාදෙන අහර වැළඳීමේ අකුසලය, රත්වූ ලෝ ගුලියක් අනුභව කිරීම වැනිය යයි බුදුන් වහන්සේ වදාළහ. **මූලාශ්‍රය**:බු.නි: ඉතිවුත්තක: 3.5.2 ජීවිකා සූත්‍රය, පි.468.

▲**ජීවිතය-** Life : දිවා රෑ දෙකෙහිම ජීවිතය නොනැවතී විනාශය වෙතට (මරණයකරා) ඇදෙන බව මෙ පෙන්වා ඇත. **මූලාශ්‍රය:** සංයු.නි: (1) සගාථවග්ග: දේවතාසංයුත්ත:උප්පඨ සූත්‍රය, පි.96.

▲ **ජීවිත ඉන්ද්‍රිය**- The Life Faculty- Vitality: ත්‍රිවිධ ඉන්ද්‍රියන්ගෙන් එකකි, නාම රූප ලෙසින් කොටස් 2කි. ජීවිත ඉන්ද්‍රිය පවතින තෙක් වේදනා පවතී. **බලන්න**: ත්‍රිවිධ ඉන්ද්‍රිය. **මූලාශ්‍ර**: සංයු.නි: (5-1): මහාවග්ග: ඉන්ද්‍රිය සංයුත්ත: 4.3.2 ජීවිතඉන්ද්‍රිය සූත්‍රය, පි. 391, ESN: 48: Indriyasamyutta: 22.2 The Life Faculty, p. 1949.

▲**ජීවිතය හා ශරීරය**: පාලි: **ජීවං සරීරං**- body & the soul: ජීවිතය ලෙසින් පෙන්වා ඇත්තේ ජිවිත ඉන්ද්‍රියය (Life-principle). ආත්මය ලෙසින්ද සලකයි. ශරීරය යනු කයය, පංච උපාදානස්කන්ධ යේ රූපය ලෙසින් පෙන්වා ඇති, සතර මහා භූතයන් ගෙන් සැකසුන කය ය. බුදුන් වහන්සේ වැඩ සිටි සමයේ, කය හා ජීවිතය යනු එකම දෙයක්ද, වෙනස් දෙයක් ද යන මත පැවතිනි. මේවා එවක ලෝකයාතුල පැවති දිට්ඨි 10න් දෙකකි. මේ සූත්‍රයන්හි, ඒ ගැන විස්තරාත්මකව පෙන්වා ඇත. **මූලාශ්‍ර**: සංයු.නි: ( 3): දිට්ඨිසංයුත්ත: 3.1.13 හා 3.1.14 **සූත්‍ර,** පි. 437, ESN: 24: Dhittisamyutta: 13.13. & 14.14.suttas, p. 1133.

▼ **යථාභූත ඥානයෙන්** පසක් කර, දන්නා දකිනා තමන්වහන්සේ, ජීවිතය හා ශරීරය යනු එකම දෙයක් හෝ ඒවා වෙනම දෙයක් හෝ යයි ප්‍රකාශ නොකරණ බව බුදුන් වහන්සේ වදාළහ: **“ අහං ඛො පනෙතං ආවුසො එවං ජානාමි එවං පස්සාමි. අථ ච පනාහං න වදාමි ‘තං ජීවං තං සරීරන්ති’ වා ‘අඤ්ඤං ජීවං අඤ්ඤං සරීරන්ති’ වාති”** ( But, I thus know and see, and I do not say that the soul is either the same as, or different

from the body). **මූලාශ්‍ර**: දීඝ.නි: (1): 6 මහාලි සූත්‍රය, පි. 340, EDN: 6: Mahāli Sutta: About Mahāli-Heavenly Sights, Soul and Body, p. 118.

▲ **ජීවිතයේ කෙටිබව**-Short is the life span: ජීවිතය ඉතා කෙටි නිසා අප්‍රමාදව සසරින් එතර වීමට කටයුතු කරන්න යයි බුදුන් වහන්සේ නිරතුරුව සංඝයාට අවවාද අනුසාසනා වදාළහ.**බලන්න**:මහා පරිනිබ්බාන සූත්‍රය. අංගු.නි: (4) 7 නිපාත:7.2.2.10 අරක සූත්‍රය, පි.496,.මේ පිලිබඳව දක්වා ඇති උපමා **බලන්න**: උපග්‍රන්ථය:5, අරක ශාස්තෘ.
▲**ජීවිත මදය**: පාලි: **ජීවිතමදො**-life infatuation: යහපත් ආයුෂ තිබීම නිසා, මත්වීම ජිවිත මදය ඇතිවීමට හේතුවය. තමන් ගේ ජීවිතය, මගේය කියා මත්වේ. මේවා සිත කෙලසන අකුසල්ය. දුගතිය ඇති කරයි. **බලන්න**: මදය.
▲**ජිව්හාඉන්ද්‍රිය-** Tongue faculty: ජිව්හාඉන්ද්‍රිය, රස වේදනාව ඇතිකරයි, සළායතන යන්ගෙන් එකකි. මෙය ජිව්හායතන ලෙසින්ද පෙන්වා ඇත.**බලන්න**: ආයතන,ඉන්ද්‍රිය, සළායතන.

▲**ජිව්හා විඥානය-** Tongue Conciseness: **බලන්න**: ආයතන.

**ජෂ**

▲ **ජොෂ්ඨ භික්ෂුව හා භික්ෂුණිය-**The most senior Bhikkhu & Bhikkhni: බුදුන් වහන්සේ වැඩසිටි සමයේ සිටි ජොෂ්ඨ භික්ෂුන් අතුරින් අග්‍ර අඤ්ඤා කොණ්ඩඤ්ඤ තෙරුන්ය, අග්‍රතම භික්ෂුණිය, මහා ප්‍රජාපති ගෝතමී තෙරණියය**. බලන්න:** අග්‍ර, උපග්‍රන්ථ:1,2.

## ඤ කොටස: ඤත,ඤණ

**ඤත**

▲ **ඤාතගම**-Nathagama: මල්ල ප්‍රදේශයේගමකි, නාදික ගම ලෙසින්ද හඳුන්වයි. රජගහනුවරට උතුරින්, ගංගානම් නදියේ උතුරු දෙසින් පිහිටි මෙ ගමේ, ගඩොලින් කරනලද ශාලාවේ ,බුදුන් වහන්සේ අවසාන චාරිකාවේදී  වැඩසිටියහ. මෙ ගමේ බුදුන් වහන්සේ සරණගිය බොහෝ ගිහි පැවිදි භවතුන් සිටිබව මෙහි දක්වා ඇත. **බලන්න**: මහාපරිනිබ්බාන සූත්‍රය, උපග්‍රන්ථය:1,2,3. **මූලාශ්‍රය**:සංයු.නි: (5-2) මහාවග්ග:සෝතාපත්ති සංයුත්ත:11.1.8 හා 11.1.9,11.1.10 ගිඤ්ජකාවස්ථ සූත්‍ර, පි.184.

**ඤණ**

▲**ඤාණය-**Nana: ඤාණය, ඥානය, ප්‍රඥාව, නුවණ  ලෙසින්ද දක්වා ඇත. ධර්මය අවබෝධ කරගැනීම පිනිස පිහිටවන විවිධ ඤාණ පිලිබඳ මෙහි විස්තරාත්මකව පෙන්වා ඇත. **බලන්න**: ඛු.නි: පටිසම්භිදා1: ඤාණ කථා, පි.31.
▼**ඤාණය ලැබීම** ගැන බුදුන් වහන්සේ මෙසේ වදාළහ: **“ ඉමා වෙදනාති මෙ භික්ඛවෙ පුබ්බෙ අනනුස්සුතෙසු ධම්මෙසු චක්ඛුං උදපාදී ඤාණං උදපාදී පඤ්ඤා උදපාදි විජ්ජා උදපාදි ආලොකො උදපාදි…”** සටහන්: * මෙහිදී පෙන්වා ඇත්තේ වේදනාපිලිබඳ අවබෝධය ඇතිවිමය. ** ඉද්දිපාද පිලිබඳ ඤාණය ඇතිවීම ගැන **බලන්න:** සංයු.නි: (5-2) මහාවග්ග: ඉද්දිපදසංයුත්ත: 7.1.9 ඤාණසූත්‍රය, පි. 34. **මූලාශ්‍රය**: සංයු.නි: (4) සළායතනවග්ග: වේදනාසංයුත්ත:2.3.5 ඤාණසූත්‍රය, පි.468.
▲**ඤාණචක්ඛු**-Nanachakkhu: ධර්මය යථා පරිදි දැකීම ඤාණචක්ඛුය. ධම්මචක්ඛු ලෙසින්ද පෙන්වා ඇත. සෝතාපන්න මග ඵල ලැබුවිට ධම්ම

චක්ඛු පහළවේ. ධම්මචක්කපවත්වන සූත්‍රයේදී, සම්බුද්ධත්වය ලැබූ බුදුන් වහන්සේ, තමන්වහන්සේට ඤාණය පහළවූ බව පෙන්වා ඇත. එය නුවණනමැති ඇස (නුවණැස) පහලවීමය. **බලන්න**: සෝතාපන්න.
▲ **ඤාණචරියාව-**Nanachariya: ඤාණචරියාව ලෙසින් පෙන්වා ඇත්තේ සතර ආරිය සත්‍ය පිලිබඳ නුවණ **බලන්න**:චරියාකථා.
▲ **ඤාණත්‍රය**-Nanathraya: ඤාණත්‍රය ලෙසින් පෙන්වා ඇත්තේ: අනිත්‍ය, අනිමිත්ත, විහාරසමාපත්ත ආදීය පිලිබඳ තුන් ආකාර නුවණය. **මූලාශ්‍රය:** ඛු.නි: පටිසම්භිදා 1: ඤාණකථා: 29-31 ඤාණත්‍රය, පි.196.
▲ **ඤාණදර්ශනය**-Nanadarshanaya: ඤාණදර්ශනය ((knowledge and vision), ලෙසින් පෙන්වා ඇත්තේ මාර්ගඵල ලැබීමේ ඤාණයය. ශිලය යහපත් පදනමක පවත්වාගෙන, අනුක්‍රමයෙන් ඤාණදර්ශනය හා විමුක්තිය ලැබීම මෙහි දක්වා ඇත. **සටහන**: පා.සි.ශ: පි. 300: "ඤානදස්සන: ශ්‍රමණ ඵලය, විදර්ශනා ඥානය, දිවැස්, සර්වඥතා ඥානය, ප්‍රත්‍ය වෙක්ෂ ඥානය, ආර්ය මාර්ගය, මාර්ග ඥානය, ඵලඥානය, ඤාණ දසසන වේ. **මූලාශ්‍ර:** අංගු.නි: (6) 10 නිපාත: ආනිසංසවග්ග: 10.1.1.1. කිමත්ථිය සූත්‍රය, පි.30, අංගු.නි:(1):1 නිපාත:කායගතාසති වග්ග, පි. 125 හා අමත වග්ග, පි. 130, EAN:1: Mindfulness Directed to the Body, p.52 & The Deathless, p. 53.
▼**බුදුන් වහන්සේ වෙත**, බඹසරවසන්නේ ඤාණදර්ශනය පිණිසය. ඒ පිලිබඳ මග ආරිය අටමගය. **මූලාශ්‍රය:** සංයු.නි: (5-1) මහාවග්ග: මග්ගසංයුත්ත: 1.5.7 ඤාණදර්ශන සූත්‍රය, පි.76.
▲ **ඤාණපඤ්චකය**-Nanapanchakaya: පස් ආකාර නුවණ ලැබීම මෙහි පෙන්වා ඇත: 1) අභිඥාප්‍රඥාව 2) පරිප්‍රඥාව 3) ප්‍රහාන ප්‍රඥාව 4) භාවනා ප්‍රඥාව 5) සාක්‍ෂාත්ක්‍රියා ප්‍රඥාව. **මූලාශ්‍රය:** ඛු.නි: පටිසම්භිදා 1: ඤාණකථා: 20-24 ඤාණපඤ්චකය, පි.188.
▲ **ඤාණරාසිඡක්කං**-Nanarasichkka: සමාධි වශයෙන් ලබන සුවිසි නුවණ (24) මෙහි විස්තර කර ඇත. **මූලාශ්‍රය:** ඛු.නි: පටිසම්භිදා 1: ඤාණකථා: 11 ඤාණරාසිඡක්කං, පි.396.
▲ **ඤාණවත්ථු**-Nanavathtu: මෙහි දී පෙන්වා ඇත්තේ, මාර්ගය වැඩීම පිණිසවූ 44ක්වූ අවබෝධයන්ය: 1) ජරාමරණ දැනගැනීම, හටගැනීම, නැවත්වීම, නැවැත්වීමේ පිළිවෙත ඤාණ4 කි. 2) ඉපදීම දැනගැනීම, හටගැනීම, නැවත්වීම, නැවැත්වීමේ පිළිවෙත ඤාණ4 කි. 3) භවය හටගැනීම, නැවත්වීම, නැවැත්වීමේ පිළිවෙත ඤාණ4 කි. 4) උපාදාන හටගැනීම, නැවත්වීම, නැවැත්වීමේ පිළිවෙත ඤාණ4 කි. 5) තණ්හාව හටගැනීම, නැවත්වීම, නැවැත්වීමේ පිළිවෙත ඤාණ4 කි. 6) වේදනාව හටගැනීම, නැවත්වීම, නැවැත්වීමේ පිළිවෙත ඤාණ4 කි. 7) ස්පර්ශය හටගැනීම, නැවත්වීම, නැවැත්වීමේ පිළිවෙත ඤාණ4 කි.8) සළායතන හටගැනීම, නැවත්වීම, නැවැත්වීමේ පිළිවෙත ඤාණ4 කි. 9) නාමරූප හටගැනීම, නැවත්වීම, නැවැත්වීමේ පිළිවෙත ඤාණ4 කි. 10) විඥානය හටගැනීම, නැවත්වීම, නැවැත්වීමේ පිළිවෙත ඤාණ4 කි. 11) සංඛාර හටගැනීම, නැවත්වීම, නැවැත්වීමේ පිළිවෙත ඤාණ4 කි. **සටහන:** * එම කරුණු මෙහිදී විස්තරාත්මකව පෙන්වා ඇත. ** මේවා යහපත් ලෙස අවබෝධ කර ගැනීම පිණිස ආරියඅටමග වර්ධනය කරගතයුතුය. **මූලාශ්‍රය:** සංයු.නි: (2) නිදානවග්ග: අභිසමයසංයුත්ත: 1.4.3 ඤාණවත්ථු සූත්‍රය 1, පි.110.

▼ **මෙහි දී පෙන්වා ඇත්තේ**, මාර්ගය වැඩිම පිණිසවූ 77 ක්වූ ඥාණයන් ගැනය. 1) **ජාතිය** i හේතුකොට ජරාමරණ වේයයන නුවණ ,ජාතිය නැතිකළ ජරාමරණ නැතිවේය යන නුවණ ii ) අතීතයේද ජාතිය හේතුකොට ජරාමරණ ඇතිවූවේය, ජාතිය නැතිවූකළ ජරාමරණ නැතිවූවේ යන නුවණ iii ) අනාගතයේද ජාතිය හේතුකොට ජරාමරණ ඇතිවේය ජාතිය නැතිවූකළ ජරාමරණ නැතිවේය යන නුවණ iv ) එම අවබෝධයද ක්‍ෂය ස්වභාවය ඇතිබව v) එම අවබෝධයද වය ස්වභාවය ඇතිබව vi) එම අවබෝධයද විරාග ස්වභාවය ඇතිබව vii ) එම අවබෝධයද නිරෝධ ස්වභාවය ඇතිබව දන්නා නුවණ. **එලෙස**: එක් කරුණක් පිලිබඳ 7ත් ආකාර නුවණ, 11 කරුණු පිලිබඳව 77 ත් ආකාර නුවණ- පටිච්චසමුප්පාද ක්‍රියාවලිය 11 අනුව: 2) භවය 3) උපාදාන 4) තණ්හාව 5) වේදනා 6) ස්පර්ශය 7) සළායතන 8) නාමරූප 9 ) විඥානය 10) සංඛාර 11) අවිද්‍යාව. **මූලාශ්‍රය:** සංයු.නි: (2) නිදානවග්ග: අභිසමය සංයුත්ත: 1.4.3 ඥාණවත්ථු සූත්‍රය 2 , පි.114.

▲ **ඥාණවාදය**-Nanavadaya: රහත්බව ලැබූ භික්ෂුව ඒ බව ප්‍රකාශ කරන එක් ක්‍රමයකි. **බලන්න**: අරහත්. **මූලාශ්‍ර**: අංගු.නි: (6 ): 10 නිපාත :මහා වග්ග: 10.1.3.4. මහාචුන්ද සූත්‍රය,පි. 106. EAN: 10: The Great Chapter: 24.4. Cunda, p. 501.

## ඥ කොටස: ඥත,ඥණ

### ඥත

▲ **ඥාතපරිඥා**-Nathaparinna: ඥාතපරිඥා ලෙසින් පෙන්වා ඇත්තේ ධර්මතා පිලිබඳ විශේෂ නුවණින් අවබෝධ කරගැනීමය (the full understanding of the known). මෙය අභිඥෙයිය ධර්මය ලෙසින්ද පෙන්වා ඇත. **බලන්න**: සංඛත ධාතු, අසංඛත ධාතු, අභිඥෙයිය ධර්ම,ආහාර, චතුරාර්යසත්‍ය.**මූලාශ්‍ර**: සංයු.නි: (3) ඛන්ධවග්ග:භාරවග්ග: 1.1.3.3. අභිජාන සූත්‍රය, පි.76, ESN:22: Khandasamyutta: 24.3 Directly knowing, p.1022.

### ඥණ

▲**ඥාණය**-Nana: ඥාණය, නුවණ, අවබෝධයය. ඥාණය ලෙසින්ද පෙන්වා ඇත. ධර්මයට අනුව ඥාණය ලැබීම යනු ධර්මය අවබෝධ කරගැනීම ධර්මානුකූලව ආධ්‍යාත්මික ජීවිතය ගෙනයාමේ හැකියාවය. එම නුවණ ඇති අය නුවණැතියන්- ප්‍රඥාවන්තයන්-පණ්ඩිතයන ලෙසින් පෙන්වා ඇත. එම අවබෝධය නොමැති අය අඥාණය, බාලයන්ය. **බලන්න**: බාල පණ්ඩිත.

## ඨ කොටස: ඨත, ඨන

### ඨත

▲**ඨිති කුසලය-** ṭhitikusala: මෙය ජාන සමාධි සමාපාත්ති කුසලය කලක් පවත්වාගැනීමට ඇති හැකියාවය. **බලන්න:** ජාන **මූලාශ්‍රය**: සංයු.නි: (3): ඛන්ධකවග්ග: ජානසංයුත්ත:13.1.2. ඨිති කුසල සූත්‍රය, පි.566.

▲**ඨිතත්ත පුද්ගලයා**: පාලි: **ඨිතත්තො පුග්ගලො-** the person who is inwardly firm: ධර්මයට අනුව ඨිතත්ත යනු අභ්‍යන්තරය- ආධ්‍යාත්මය ස්ථිරකරගත් පුද්ගලයාය, අනාගාමී උතුමාය. බුදුන් වහන්සේ ඨිතත්ත පුද්ගලයා මෙසේ හඳුන්වා ඇත: මෙලොව ඇතැම් පුද්ගලයක්, පංච ඔරම්භාගිය සංයෝජන ක්‍ෂය කර, (මරණින් මතු) සුද්ධාවාස නම් වූ බ්‍රහ්ම

ලෝකයේ ඕපපාතික උපතක් ලබා, (නැවත මෙලොවට නො එයි), එහිදී ම (අරහත්වය ලබා) පිරිනිවන් පාති.**"කතමො ච භික්ඛවෙ, ඨිතත්තො පුග්ගලො? ඉධ භික්ඛවෙ එකච්චො පුග්ගලො පඤ්චන්නං ඔරම්භාගියානං සඤ්ඤොජනානං පරික්ඛයා ඔපපාතිකො හොති, තත්‍ථ පරිනිබ්බායී අනාවත්තිධම්මො තස්මා ලොකො. අයං වුච්චති ඨිතත්තො පුග්ගලො"** (Here, with the utter destruction of the five lower fetters, some person is of spontaneous birth, due to attain final nibbāna there without ever returning from that world. This is called the person who is inwardly firm). **සටහන**: මෙහිදී දක්වා ඇත්තේ අනාගාමී උතුමා පිලිබඳවය. පංච ඔරම්භාගිය සංයෝජන ක්‍ෂය කර ඇතිනිසා ඔහු ස්ථිරවශයෙන්ම නිවන ලබන කෙනෙකි. **බලන්න:** පංච ඔරම්භාගිය සංයෝජන, අනාගාමී. **මූලාශ්‍ර:** අංගු.නි: ( 2 ): 4 නිපාත: 4.1.1.5 අනුසෝත සූත්‍රය, පි. 34 , EAN:4: 5.5 Along with the Stream, p. 148.

**ඨන**

▲ **ඨාන-**Situation: ඨාන ලෙසින් පෙන්වා ඇත්තේ යම්කිසි තත්වයක් හෝ අවස්ථාවක් ගැනය. මෙය තථාගතයන් සතු විශේෂ ඥානයකි:**"...ඉධ භික්ඛවෙ තථාගතො ඨානඤ්ච ඨානතො අට්ඨානඤ්ච අට්ඨානතො යථාභූතං පජානති..."**. වියහැකි දේ වියහැකිබව, වියනොහැකි දේ වියනොහැකි බව යථා පරිදි දන්නා නුවණ. **බලන්න**: තථාගත දස බල ඥාන. **සටහන්:** විස්තර පිණිස බලන්න: සංයු.නි. (4) මාතුගාමසංයුත්තය, ඨාන සූත්‍රය, සංයු.නි: (5-1) මහාවග්ග: බොජ්ඣංග සංයුත්ත: ඨාන සූත්‍රය, අංගු.නි: 2 නිපාත: ඨාන සූත්‍ර 2, අංගු.නි: 5 නිපාත: ඨාන සූත්‍රය.

## ත කොටස: තක,තග,තජ,තට,තත,තථ,තද,තන,තණ,තප, තඹ,තම,තය,තර,තල,තව,තස

**තක**

▲**තක්ෂිලා නුවර-**Takshila Nuwara: බුදුන් වහන්සේ වැඩවසන සමයේ වයඹදිග ඉන්දියාවේ පිහිටි ප්‍රසිද්ධ නුවරකි. මෙ නුවර වාසය කල උගත් අචාර්යවරුන්ගෙන් (දිසාපාමොක් වැනි) ශිල්ප හැදෑරීමට භාරතයේ සෑම ප්‍රදේශයකින් පාහේ සිසුන් පැමිණිබව බෞද්ධසාහිත්‍යයේ දක්වා ඇත. බුදුන් වහන්සේගේ වෛද්‍යවරයා වූ ජීවක, ශිල්ප හැදෑරීම පිණිස තක්ෂිලාවට පැමිණ ඇත. බලන්න: උපග්‍රන්ථය:3. බුදුන් වහන්සේගේ ශ්‍රවක, පුක්කුසාති තෙර, ගිහිකල එම නුවර රජකම් කළහ. **බලන්න**: උපග්‍රන්ථය:1.

▲ **තිකභෝජනය-**Thika bhojanaya: බුදුන් වහන්සේ විසින් සංඝයාට පනවන ලද විනය නීතියකි. එනම්, පවුල් විසින් දෙන භෝජන, දුර්භික්ෂ ආදීය නැති කාලයේදී, සතර දෙනක් එකතුව වැළඳීම ඇවතක්ය. කරුණු 3 ක් නිසා තික භෝජනය පනවා ඇතයයි ආනන්ද තෙරුන් පෙන්වා ඇත: "දුස්ශීල භික්ෂූන්ට නිග්‍රහ කිරීම පිණිසද , ප්‍රියශීලී භික්ෂූන්ගේ පහසු විහරණය පිණිසද, 'ලාමක අදහස් ඇති අය බෙදී, සංඝභේදය නොකරත්වා' යන අදහස ඇතිව හා පවුල් කෙරෙහි දයාව ඇති නිසාය". (The Blessed One laid down this rule for three reasons...: for restraining ill-behaved persons and for the comfort of well-

behaved bhikkhus, with the intention,'May those of evil wishes, by forming a faction, not create a schism in the Saṅgha and out of sympathy towards families). * **බලන්න**: විනය: පාචිත්තිය 32. ** **බලන්න**: ESN: Note: 295, p. 979. **මූලාශ්‍ර**: සංයු.නි: (2): නිදානවග්ග: කස්සප සංයුත්ත: 4.1.11 චීවර සූත්‍රය,පි.352, ESN: 16: Kassapa samyutta: 11 The Robe, p. 821.

▲ **තීක්ෂණ ප්‍රඥාව**: පාලි: **තික්ඛපඤ්ඤා-** sharpness of wisdom: ධර්මතා තියුණු ලෙසින් අවබෝධ කරගැනීමේ නුවණ තීක්ෂණ ප්‍රඥාව වේ. **තීක්ෂණ ප්‍රඥාව පරිපූර්ණවීම.** නිබ්බිදානුපස්සනාව**:** රූපය පිලිබඳ නිබ්බිදානුපස්සනාව, වැඩීමෙන් නැවත නැවත එහි යෙදීමෙන් තීක්ෂණප්‍රඥාව (තික්ඛප්‍රඥා) පරිපූර්ණවේ: **"නිබ්බිදානුපස්සනා… රූපෙ නිබ්බිදානුපස්සනා, භාවිතා බහුලීකතා තික්ඛපඤ්ඤං පරිපූරෙති". තීක්ෂණ ප්‍රඥාව යනු කුමක්ද?** වහා කෙළෙස් සිඳිය යුතුය, උපන් කාම, ව්‍යාපාද, විහිංසා විතර්ක වහා බැහැර කර විනාශ කර ගතයුතුය, උපන් නුපන් අකුසල දුරුකර ගත යුතුය, උපන් රාග දෝෂ මෝහ...ආදී කෙළෙස් බැහැර කර ගත යුතුය යන නුවණ. තවද එකම (භාවනා) අසුනේ හිඳ සතර මග සතර ඵල, සතර ප්‍රතිසංවිධි, සය අභිඥා පිලිබඳ අධිගමය, ප්‍රත්‍යක්ෂ නුවණ තීක්ෂණ ප්‍රඥාව වේ. **මූලාශ්‍ර**:ඛු.නි:පටිසම්භිදා 2: ප්‍රඥාවග්ග: 3.1 ප්‍රඥා කථා, පි. 166-188.

▼ **තීක්ෂණ ප්‍රඥාව ඇතිවීම:** 1) සත්පුරුෂ සේවනය 2) සද්ධර්ම ශ්‍රවණය 3) යෝනිසෝමනසිකාරය 4) ධර්මයට අනුකූලව පිළිපැදීම (ධර්මානුධර්ම ප්‍රතිපදාව) යන සතර ධර්මය ඇති පුද්ගලයාට (සෝතාපන්න) තීක්ෂණ ප්‍රඥාව ඇතිවේ.**"…ඉමෙ ඛො භික්ඛවෙ, චත්තාරො ධම්මා භාවිතා බහුලීකතා තික්ඛපඤ්ඤාතාය සංවත්තනතීති"** (these four things, when developed and cultivated lead to the sharpness of wisdom) **බලන්න**: ප්‍රඥාව, සතර ධර්මය. **මූලාශ්‍ර**: සංයු.නි: (5-2): මහාවග්ග: සෝතාපන්න සංයුත්ත:11.7.12 තික්ඛ ප්‍රඥා සූත්‍රය, පි. 282 , ESN: 55: Sotapatthisamyutta: Greatness of Wisdom: p. 2262.

▼ **තීක්ෂණ ප්‍රඥාව** කායගතා සතිය වැඩීමෙන්, විපුල කරගැනීමෙන් ලැබෙන යහපත් ඵලයකි. **බලන්න**: කායගතා සතියේ ප්‍රතිලාභ. **මූලාශ්‍ර:** අංගු.නි: (1): 1 නිපාත: කායගතාසති වග්ග සූත්‍ර: 1.16.7-සිට, පි. 126, EAN:1: Mindfulness Directed to the Body, p.52.

**තග**

▲ **ත්‍යාගසම්පන්බව-** accomplishment in generosity: ත්‍යාගසම්පන්බව යනු දුරුකළ මසුරුකම ඇතිව, දානශිලිව, නිර්ලෝභීව, අතහැරීමට පුරුදුව විසීමය, කුසලයකි.එම ගුණය මෙලොව හා පරලොව යහපත හා සුවය පිණිස හේතුවේ යයි බුදුන් වහන්සේ පෙන්වා ඇත. **මූලාශ්‍ර:** අංගු.නි:(5):8 නිපාත: ව්‍යාගපජ්ජ සූත්‍රය,පි.256, EAN:8: 54.4 Dīghajāṇu, p. 441.

▼ **ත්‍යාගසම්පන්බව** ගිහි උපාසකයෙක් තුල ඇති ගුණයකි.: **බලන්න:** සංයු.නි: (5-2) සෝතාපත්තිසංයුත්ත:පුඤ්ඤාභිසන්දවග්ග: 11.4.7 මහානාම සූත්‍රය.

▲**ත්‍යාගානුස්සති භාවනාව**-Thyagganusati bhavana: ත්‍යාගානුස්සති භාවනාව- චාගානුසතිය, අනුසති භාවනාවකි, සමාධිය වඩාගැනීමට, සසර කලකිරීම පිණිස, නිවන පිණිස පවතී. **බලන්න**: භාවනා, චාගානුසතිය. **මූලාශ්‍රය:** අංගු.නි: (1) නිපාත: ඒකධම්මපාලිය සූත්‍ර, පි.100.

▲ **ත්‍යාගශීලී-** Generous: ත්‍යාගශීලී බව කුසලයකි. මසුරුකම හැර දමා, තමන්සතු දේ, නිදහසේ දීමට කැමති බවය. අනුසති භාවනා අරමුණකි, ආධ්‍යාත්මික වර්ධනයට උපකාරී වේ. ශ්‍රද්ධාව ඇතිවිට ත්‍යාගශීලීබව ඇතිවේ. අන්‍යන්ට ගරුකිරීම, වැරදි නිවැරදි කරගැනීමට ඇති කැමත්ත - කීකරුකම හා කල්‍යාණ මිත්‍ර සේවනය, ත්‍යාගශීලීවීමට උපකාරීවේ. **බලන්න**: දාන, ත්‍යාගානුස්සති භාවනාව, ආමච්ඡ, අලෝභය. **සටහන්: *** ත්‍යාගශීලීබව, ආමච්ඡ-මසුරු නැතිබව, අලෝභය, ලෙසින්ද පෙන්වා ඇත. සුගතියේ යළි උපතට හේතුවේ. ** ත්‍යාගශීලී වීම ඉන්ද්‍රිය සංවරයට උපකාරිවේ. **බලන්න**: ඉන්ද්‍රිය සංවරය. **මූලාශ්‍ර:** අංගු.නි:(6 ): 10 නිපාත:10.2.3.6.තයොධම්ම සූත්‍රය,පි.284, EAN-10: 76-6. Incapable, p. 54.

▲ **ත්‍යාගශීලීනොවීම-** uncharitable: ත්‍යාගශීලීනොවීම යනු දයාව, අනුකම්පාව නොමැතිබවය. අකුසලයකි. නොසන්සුන්සිත (උද්දච්ඡය), අසංවරබව හා දුෂ්චරිතබව (දුසිල්වත්බව) නිසා සිතේ ත්‍යාගශීලීබව ඇතිනොවේ. **බලන්න**: අවදඤ්ඤුතාවය **මූලාශ්‍ර:** අංගු.නි:(6): 10 නිපාත:10.2.3.6.තයොධම්ම සූත්‍රය,පි.284, EAN-10: 76-6. Incapable, p. 524. තැගිදීම උපමාව: උපග්‍රන්ථය:5.

**තජ**

▲ **තේජෝ ධාතුව-** the fire element: සතර මහා භූතයන් ගෙන් එකකි. **බලන්න**: චතුධාතු, ධාතු.

▲**තේජෝ ධාතු සමාපත්තිය-**Thejo dhatu samapatti: තේජෝකසිණය වඩා ලබාගන්නා සමාපාත්තිය, තේජෝ ධාතු සමාපත්තියය. බුදුන් වහන්සේ හා මහා මුගලන්, මහා කාශ්‍යප, මහාකප්පින, අනුරුද්ධ ආදීවූ ශ්‍රාවක සංඝයා, බ්‍රහ්මලෝකයකට පැමිණීම, එහි තේජෝධාතු සමාපත්තියෙන් වැඩසිටීම මෙහි දක්වා ඇත. **සටහන**: තේජෝධාතු සමාපත්තියට සම වැදීමෙහි දක්ෂ -තේජෝධාතු කුසලය- ඇති භික්ෂුන් අතරෙන් අග්‍ර සාගත තෙරුන්ය. **බලන්න**: උපග්‍රන්ථය:1 **මූලාශ්‍ර:** සංයු.නි: (1) සගාථවග්ග: බ්‍රහ්මසංයුත්ත:6.1.5 අපරාදිට්ඨි සූත්‍රය, පි.286.

**තට**

▲ **තුට්ට උපාසක-**Tutta Upaska: **බලන්න**: උපග්‍රන්ථය:3

**තත**

▲ **තිත්ත ඇට උපමාව-** Simile of the bitter seeds: මේ උපමාව යොදාගෙන ඇත්තේ මිථ්‍යාදිට්ඨිය ඇති වැරදි මගේ ගමන් කරනවිට ලැබෙන ප්‍රතිඵල අයහපත් බව පෙන්වීමටය. කරවිල ඇටය නිසා ඇතිවෙන ගෙඩි තිත්ත රසය ගනී. **බලන්න**:මිථ්‍යාත්වය. **මූලාශ්‍ර**:අංගු.නි: (6): 10 නිපාත: සමණසඤ්ඤා වගග: 10.3.1.4. බීජ සූත්‍රය,පි.410, EAN:10: 104. 4-A Seed, p.541.

▲**තිත්මුවා උපමාව**-Simile of the dotted deer: මෙහි පෙන්වා ඇත්තේ, තිත්මුවා, වැද්දාට හසුනොවී, ගොදුරු පිණිස සුදුසු තැනකට යයි, වැද්දා හැසිරෙන තැන්වලින්, දුර හුදකලා තැනකට යයි. එනිසා ඌ මළපුඩු වලට හසුනොවේ. එලෙස එකලාව හැසිරෙන විට බාධා වලට හසුනොවී (මාරයා නමැති වැද්දාට හසුනොවී) මාර්ගය වඩා ගත හැකිය. **බලන්න**: උපග්‍රන්ථය:5. **මූලාශ්‍ර:** බු.නි: සුත්ත නිපාත: උරගවග්ග: 1-2 ඛග්ගවිසාණ සූත්‍රය, පි. 31,

**තථ**

▲ **තථාගතයන් වහන්සේ**: පාලි: **තථාගතො** -Tathāgata -the Perfect One: තමන් හඳුන්වා දීම පිණිස හෝ පෙර වැඩවිසූ බුදුවරු පිලිබඳව, බුදුන් වහන්සේ 'තථාගත' යන පදය යොදාගෙන ඇත. එහි අර්ථය නම්:

**" එලෙස ගිය උතුමා" ( තථා-ගත-one who has thus gone)**

**"එලෙස පැමිණි උතුමා" (තථා-ආගත- one who has thus come).** **බලන්න**:බුදුන් වහන්සේ. **ශබ්දකෝෂ: B.D**: p.326: 'tathāgata: the Perfect One…the one who has "thus gone", or "thus come", is an epithet of the Buddha used by him when speaking of himself' **G.B:** p. 766: 'tathāgata: … refers to one who has attained Supreme Enlightenment. It is one of the ten titles of the Buddha…'

▼**වෙනත් මූලාශ්‍ර: 1.** "බුදුරදුන් තමන් වහන්සේ ගැන බෙහෙවින් ව්‍යවහාර කර තිබෙනු පෙනෙන්නේ තථාගත යන වචනය ය. බුදුරදුන් විසින් ද තථාගත යන වචනයේ අර්ථ විවරණයක් දීඝනිකායේ පාසාදික සූත්‍රයෙහි කර ඇත්තේය. අටුවාවල එහි අර්ථවිවරණය කර ඇත්තේ මෙසේ ය. අට කරුණකින් භාග්‍යවතුන් වහන්සේ තථාගතවනසේක: 1) තථා ආගතොති තථාගතො-පෙර බුදුවරු ආ පරිදි ආ බැවින් (ලෝක සත්ත්වයන් හට පිහිටවීමට). 2) තථා ගතොති තථාගතො- පෙර බුදුවරු ගිය පරිදි ගිය බැවින් (නොවරදින ගමනක් -නිවනට ගිය නිසා) 3) තථලක්ඛණං ආගතොති තථාගතො- තථ යනු සත්‍යට නමකි. උන්වහන්සේ සත්‍යයේ ලක්ෂණ යථා පරිදි දැනගත්තේය 4) තථධම්මෙ යථාවතො අභිසම්බුද්ධොති තථාගතො- චතු සත්‍ය ආදී සත්‍ය අවබෝධ කල නිසා 5) තථ දස්සිතාය තථාගතො- සකල සත්ත්වයන් විසින් දකින ලද, අසන ලද, සොයාගත් ආදි සියල්ල ඇති සැටියෙන් දක්නා නිසා 6 ) තථවාදිතාය තථාගතො- නොවරදිනන දෙයක්ම ප්‍රකාශ කරන නිසා 7) තථා කාරිතාය තථාගතො- යමක් කියන්නේද, ඒ දේ ඒ ආකාරයෙන්ම කරන්නේය. 8) අභිභවනට්ඨෙන තථාගතො- නොවරදින බෙහෙත-ඖෂධය ඇතිනිසා.". "**සුවිසිමහාගුණය**": පි. 210: රේරුකානේ චන්දවිමල මහානාහිමි, 2005.

▼**තථාගතයන් ලෙසින් හැඳින්වීම**: එලෙසින් හඳුන්වාදීම පිළිබඳව උන්වහන්සේ මෙසේ වදාළහ: 1) " මහණෙනි, දෙවියන් සහිත... ප්‍රජාව විසින් යම් රූප...ශබ්ද...ගන්ධ...රස... ස්පර්ශ ... ආයතනයක්, ධර්මයට ඇලීමක් ලබන ලදද , සොයන ලදද, සිතින් ලුහුබැඳ ගන්නාලදද, ඒ හැම තථාගතයන් විසින් අවබෝධ කරණ ලදී. ඒ නිසා 'තථාගත' යයි කියනු ලැබේ. **" යං භික්ඛවෙ සදෙවකස්ස ලොකස්ස…සදෙවමනුස්සාය දිට්ඨං සුතං මුතං විඤ්ඤාතං පත්තං පරියෙසිතං අනුවිචරිතං මනසා, සබ්බං තං තථාගතෙන අභිසම්බුද්ධං. තස්මා තථාගතො'ති වුච්චති"**. 2) "...යම් රැයක තථාගතයන් චතුසත්‍ය අවබෝධ කරයිද, යම් රැයක තථාගතයන් පිරිනිවන් පානා සේක්ද, ඒ අතර තුර කාලයේදී තථාගතයන් විසින් යමක් කථා කර ...පවසා... විස්තර කර තිබේද, ඒ හැම ඒ පරිද්දෙන්ම වේ, වෙනස් නවේ. එනිසා, 'තථාගත' යයි කියනු ලැබේ" (whatever the Tathāgata speaks, utters, or expounds in the interval between the night when he awakens to the unsurpassed perfect enlightenment and the night when he attains final nibbāna, all that is just so and not otherwise; therefore he is called the Tathāgata). 3)"තථාගතයන්, කියන දේ කරයි, කරන දේ කියයි. තථාගතයන් තමන් කියන දේ කරන,

කරන දේ කියන හෙයින් 'තථාගත' යයි කියනු ලැබේ". **"යථාවාදී භික්ඛවෙ තථාගතො තථාකාරී, යථාකාරි තථාවාදී, ඉති යථාවාදී තථාකාරී යථාකාරි තථාවාදී. තස්මා තථාගතො'ති වුච්චති"**. 4) "දෙවියන්... සහිත ප්‍රජායෙහි තථාගතයන් හැම මැඩ (අභිභවා) සිටිති, අන්‍යයන්, තථාගතයන් මැඩ නොසිටි, ඒකාන්තයෙන්ම, සෑම දෙයක්ම තථාගතයන් දකින්නේය (අවබෝධ කලහ), විශාරදය, ඒ නිසා, 'තථාගත' යයි කියනු ලැබේ".**" සදෙවකෙ... සදෙවමනුස්සාය තථාගතො අභිභූ අනභිභූතො, අඤ්ඤදත්ථු දසො වසවත්තී. තස්මා තථාගතො'ති වුච්චති"** (... in this world with its devas... and humans, the Tathāgata is the vanquisher, the unvanquished, the universal seer, the wielder of mastery; therefore he is called the Tathāgata). **බලන්න**:EAN: Notes: 656- 659, p. 615, උපග්‍රන්ථය:6. **මූලාශ්‍ර**: අංගු.නි:(2):4 නිපාත:උරුවෙලවග්ග: 4.1.3.3 ලෝක සූත්‍රය,පි.69, EAN:4: Uruwela:23.3 The World p.156, ඛු.නි:ඉතිවුත්තක:4.1.13 ලෝක අවබෝධ සූත්‍රය, පි. 510.

▼**තථාගතයන් අග්‍රය-** Tathāgata is the greatest: තථාගතයන් සියලු ලෝක සත්ත්වයන්ට අග්‍රය.(Tathāgata is the chief among all beings). **බලන්න:** අග්‍ර දේ. **මූලාශ්‍ර:** අංගු.නි: (6): 10 නිපාත:10.1.2.5 අප්‍රමාද සූත්‍රය,පි.68, EAN: 10: 15-5 Heedfulness, p.497. සංයු.නි: (5-1): මහාවග්ග: මග්ගසංයුත්ත: 1.13.1 තථාගත සූත්‍රය, පි. 126, ESN: 45: Maggasamyutta: 139.1 The Tathāgata, p. 1681.

▼**තථාගතයන් පහළවීම** - Arising of Tathāgata: ජාති ජරා හා මරණ යන ධර්මතා 3 ලෝකයේ නො පවතින්නේ නම් තථාගතයන්ගේ පහළවීම සිදු නොවේ, ධර්මවිනයේ බැබලීමක් නොමැත. එම ධර්මතා ලෝකයේ පවතින නිසා තථාගතයන් ලෝකයේ පහළවේ, ධර්මවිනය ප්‍රකශයට පත්කරයි, බබලවයි. **සටහන**:උපාලි සූත්‍රයේ- තථාගතයන් ලොව පහළවීම, ධර්මය දේශනා කිරීම ආදී වූ විස්තර දක්වා ඇත. **බලන්න:** අංගු.නි:(6): 10 නිපාත: උපාලි වගග: 10.2.5.9. උපාලි සූත්‍රය, පි.390. EAN: 10: 99.9 Upaali, p. 538. **මූලාශ්‍ර**:අංගු.නි: (6):10 නිපාතය: 10.2.3.6 තයෝධම්ම සූත්‍රය,පි.284, EAN:10: Tens,76-6.Incapable, p. 524.

▼ **තථාගතයන්ගේ පහළවීම ලෝකයාගේ සුව සෙත පිණිසය**

"...**තථාගතයන්ගේ උපත**, බොහෝ දෙනාගේ හිත සුව පිණිසය. ලොවට අනුකම්පාව පිණිසය,දෙවි මිනිසුන් ගේ යහපත පිණිසය … **තථාගතයන්ගේ** ඉපදීම ලොව දුර්ලභ දෙයකි... තථාගතයෝ අසිරිමත් මිනිස්බවක් ඇතිව උපත ලබති ... තථාගතයන්ගේ කාලක්‍රියාව බොහෝ දෙනාට ශෝචනීය සිදුවීමකි". "....**තථාගතයන්වහන්සේ**, ලොව ඉපදීම- අද්විතය (unique), අසාහය (without a peer), අප්‍රතිමය (without counterpart), අප්‍රතිසමය (incomparable), අප්‍රතිභාගය (matchless), අප්‍රතිපුද්ගලය (unrivaled), අසමය (unequaled) අසම සමය (without equal), දෙපා ඇතියනට අග්‍රය (the foremost of bipeds)".

"... **තථාගතයන් ගේ පහළවීම නිසා**: 1 මහත්වූ මහා ප්‍රඥාවක්ෂු ඇතිවේ (manifestation of great vision) 2 මහා ප්‍රඥාආලෝකය පහළවේ (the manifestation of great light) 3 මහා ප්‍රඥා දීප්නයක් (ප්‍රඥාවභාසය) (manifestation of great radiance) ඇතිවේ 4 අනුත්තරිය ධර්මයන් 6 කගේ ඇතිවීම වේ (manifestation of the six things unsurpassed) 5 සිව් පිළිසිඹියාවන්ගේ සාක්ෂාත් වීම සිදුවේ (realization of the four

analytical knowledges) 6 අටලොස් වැදෑරුම් අනෙක ධාතුන්ගැන විනිවිදයන අවබෝධය ඇතිවේ (the penetration of numerous elements) 7 අටළොස් වැදෑරුම් නානා ධාතුන්ගැන විනිවිද යන අවබෝධය ඇතිවේ (the penetration of the diversity of elements) 8 විද්‍යාවිමුක්ති ඵලයන්ගේ සාක්ෂාත් කිරීම වෙයි (the realization of the fruit of true knowledge and liberation) 9 සොතාපත්ති සිට අරහත් දක්වා මාර්ග ඵලයන්ගේ සාක්ෂාත් කිරීම වෙයි.**බලන්න:** සය අනුත්තර ධර්ම, ධාතු, සිව් පිළිසිඹියා. **මූලාශ්‍ර:** අං.ගු.නි: (1) 1නිපාත: ඒකපුගගල වග්ග, පි. 79-82, හා 2 නිපාත:2.2.6.1- 2.2.6.4 සූත්‍ර, පි. 184, EAN:1: One person, p.43 & EAN: 2: VI People: p.66, අං.ගු.නි: (6) : 10 නිපාත: උපාලි වගග: 10.2.5.9. උපාලි සූත්‍රය,පි.390, EAN: 10: V,99.9 Upaali, p. 538.

▼**තථාගතයන්,** දුකින් මැඩුන ලෝකය දෙස අවිහිංසාවෙන් බලති "එකසනවූ ගල් පව්වක් මුදුනේ සිටින කෙනෙක්හට හාත්පස සිටින ජනයා පහසුවෙන් දැකිය හැකිය. එලෙස, සුන්දර ප්‍රඥාව ඇති, සමතැස් ඇති, පහවූ ශෝක ඇති බුදු රජාණන්වහන්සේ ඒ සෙල්පව්ව නම් උපමාවූ දහම් පහයට නැගී, ජාති ජරාවෙන් මඩනා ලද ශෝකයෙහි ගැලුනු ජන සමුහයා බලන සේක". **බලන්න:** උපග්‍රන්ථය: උපමා. **මූලාශ්‍රය:**ඛු.නි: ඉතිවුත්තක: 2.2.1 විතක්ක සූත්‍රය, පි.388.

▼**තථාගතයන් හඳුන්වන නම්**- Designations for Tathāgata: **ශ්‍රමණ** (Ascetic), **බ්‍රාහ්මණ (**Brahmin), **වෙදගු** (Healer), **භිසක්ක** (Master of knowledge), **නිර්මල** (One unstained), **විමල** (Stainless one), **ඤාණී** (Knower), **විමුත්ත** (Liberated one). **සටහන්: *** තථාගතයන්, තුන්ලෝකයෙහි දතයුතු සියල්ල දන්නා නිසා, උන්වහන්සේ **'සමන්තචක්ඛු'** ලෙසින් හඳුන්වයි. **බලන්න**: ඛු.නි: පටිසම්භිදාමග්ග 1: මහාවග්ග, ඤානකතා: 72-73 සර්වඥතා අනාවරණ ඥානයෝ, පි. 264. ** තථාගතයන්, චතුසත්‍ය අවබෝධ කළනිසා '**බුද්ධ**'ය, උපද්‍රවයන් ඉවසන නිසා කෙළෙස් නසන නිසා '**නිරුත්තර සිංහ**' ය, විත්විසාරද නිසා '**චතුවෙසාරද්‍ය**'ය. **බලන්න**: ඛු.නි: ඉතිවුත්තක: 4.1.13 ලෝකඅවබෝධ සූත්‍රය, පි. 510. **මූලාශ්‍ර**: අං.ගු.නි:(5):8 නිපාත:8.2.9.5 තථාගතඅධිවචන සූත්‍රය, පි.368, EAN:8: 85.5 Designations, p. 454.

▼ **තථාගතයන් බ්‍රහ්මචක්‍රය පැවැත්වීම-**The Tathāgata teaches the Wheel of Brahmā: තථාගතයන් අට පිරිසට බ්‍රහ්මචක්‍රය පවත්වයි (to the eight assembly). තථාගතයන්, සිංහයා මෙන් අග්‍ර ස්ථානය ඇතිව, බල දහයක් ඇතිව, අටපිරිසට, විශිෂ්ට ධර්ම චක්‍රය -බ්‍රහ්මචක්‍රය පවත්වයි: **"දස ඉමානි භික්ඛවෙ තථාගතස්ස තථාගතබලානි යෙහි බලෙහි සමන්නාගතො තථාගතො ආසභං ඨානං පටිජානාති,පරිසාසු සීහනාදං නදති, බ්‍රහ්මචක්කං පවත්තෙති". සටහන්**: * **සිංහ:** තථාගතයන් හඳුන්වන අපර නමකි ** **පිරිස:** ධර්මය අසන පිරිස **බලන්න**: අටපිරිස. ** **බ්‍රහ්මචක්‍රය:** ඉතා උතුම්වූ, ශ්‍රෙෂ්ඨවූ අනර්ඝවූ චක්‍රය, ධර්ම චක්‍රය හඳුන්වන නමකි. **බලන්න:** EMN: note: 181, p. 1081. හා ධම්ම චක්‍රය. **මූලාශ්‍ර**: අං.ගු.නි: (6): 10 නිපාත :10.1.3.1 සිංහනාද සූත්‍රය,පි. 90, EAN: 10: 21.1 The Lion, p. 499, දීඝ.නි: (3 ): 10 සංගිති සූත්‍රය, පි, 368, EDN: 33: Saṅgīti Sutta: The Chanting Together, p. 362.

▼**තථාගතයන් අසිරිමත්ය විස්මිත දහමින් යුක්තය**: බුදුන් වහන්සේ මෙසේ වදාළහ: "...ආනන්ද, තථාගතයෝ, අසිරිමත්ය, අසිරිමත් දහම්

ඇත, විස්මිතය, විස්මිත ගුණ ඇත". (The Tathāgatas, Ānanda, are wonderful and possess wonderful qualities; the Tathāgatas are amazing and possess amazing qualities). **සටහන්** * බුදුන් වහන්සේ එසේ වදාළේ, තථාගතයන් සතු ඉද්ධිබල පිලිබඳ ආනන්ද තෙරුන් කළ විමසීමකට පිළිතුරු ලෙසිනි ** ඉද්ධිබල වඩාගත් නිසා තථාගතයන්ට බඹලොව තෙක් කයෙන් විවිධ ඉර්දී ප්‍රතිහාර්ය පෑමට ඇති හැකියාව මේ සූත්‍රයේ විස්තර කර ඇත. **මූලාශ්‍ර:** සංයු.නි: (5-2 ): මහා වග්ග: ඉද්දිපාද සංයුත්ත: 7.3.2 අයගෝලසූත්‍රය, පි. 70, ESN: 51: Iddipadasamyutta: 22.2 The Iron Ball, p. 2087.

▼ **මේ සූත්‍රයේ තථාගතයන්** සතු අද්භූත හා ආශ්වර්යමත් ධර්මතා විස්තරාත්මකව දක්වා ඇත.**මූලාශ්‍ර:** ම.නි: (3 ): 3.3.3 ආචාරියා අද්භූත සූත්‍රය, පි. 302, EMN: 123: Wonderful and Marvelous, p. 897.

▼ **තථාගතයන්ගේ සතර ආශ්වර්ය අද්භූත ධර්මතා:** තථාගතයන් පහළවීම නිසා සතර ආශ්වර්ය අද්භූත ධර්මතා පහළවේ: 1) බෝසතුන් තුසිත දෙව් ලොව සිට මව්කුසයට පැමිණෙන අවස්ථාවේ, ලෝකය ආලෝක කරමින්, දේව අලෝකයට වඩා අග්‍රවූ මහා ආලෝකයක් පැතිරේ 2) බෝසතුන් මව්කුසින් එළියට පැමිණෙන අවස්ථාවේ, ලෝකය ආලෝක කරමින්, දේව අලෝකයට වඩා අග්‍රවූ මහා ආලෝකයක් පැතිරේ 3) තථාගතයන් සම්මා සම්බුද්ධත්වයට පත්වන අවස්ථාවේ, ලෝකය ආලෝක කරමින්, දේව අලෝකයට වඩා අග්‍රවූ මහා ආලෝකයක් පැතිරේ 4) තථාගතයන් ධම්ම චක්‍රය පවත්වන අවස්ථාවේ, ලෝකය ආලෝක කරමින්, දේව අලෝකයට වඩා අග්‍රවූ මහා ආලෝකයක් පැතිරේ. **සටහන:** ම.නි: ආචාරියා අද්භූත සූත්‍රයේ බෝසතුන්ගේ පහළවීම සම්බන්ධ ආශ්වර්ය ධර්ම විස්තරාත්මකව පෙන්වා ඇත. **බලන්න:** ආචාර්යවරයා සතු අද්භූත හා ආශ්වර්යමත් ධර්මතා **මූලාශ්‍ර:** අංගු.නි: (2): 4 නිපාත: 4.3.3.7 තථාගත අචඡරිය සූත්‍රය, පි. 272, EAN:4: 127.7 Astounding-1, p. 195.

▼ **යම් කලෙක** අරහත් සම්‍යක්සම්බුද්ධ තථාගත කෙනෙක් ලොව උපදින්නෝය, ඒ කල දෙව් මුළුව පිරේ, අසුර මුළුව පිරිහේ. **බලන්න:** අසුර.

▼**තථාගත සම්මා සම්බුද්ධයන්** වහන්සේ උත්තම දස පුද්ගලයන් අතරින් පළමු තැන ගනී. **බලන්න**: උත්තම දස පුද්ගලයෝ.

▼**තථාගතයන්** ලෝකයාට ධර්මය දේශනා කරන්නේ ඔවුන් කෙරේ ඇති හිතානුකම්පාව නිසාය. **මූලාශ්‍ර**: සංයු.නි: (1 ): සගාථවග්ග: මාරසංයුත්ත: 4.2.4 පතිරූප සූත්‍රය, පි. 230, ESN:4: Marasamyutta:14.4 Suitable, p.280.

▼ **තථාගත ඣාන නුවණ:** අචින්ත ධර්මතාවක්වූ ඣාන පිළිබඳව බුදුවරු තත්වාකාරයෙන්ම අවබෝධ කර ඇත. එය තථාගතයන්ගේ එක් දසබලයකි. **බලන්න:** තථාගත දසබලඥාන, අචින්ත ධර්මතා.

▼ **තථාගත දසබලඥාන**: තථාගතයන් සතු විශේෂ නුවණ, බල දසය, දසබල ඥාන (දසබලානි) ලෙසින් දක්වා ඇත. **බලන්න**: "සුවිසි මහාගුණය". **1) පළමු දසබල ඥානය: වියහැකි දේ වියහැකිබව, වියනොහැකි දේ වියනොහැකි බව යථා පරිදි දන්නා නුවණ** (the possible as possible and the impossible as impossible) .**"...ඉධ භික්ඛවෙ තථාගතො ඨානඤ්ච ඨානතො අට්ඨානඤ්ච අට්ඨානතො යථාභූතං පජානාති..."**. සටහන්: * එම නුවණ 'ස්ථාන අස්ථාන දන්නා

**නුවණ'**, '' **කාරණය කාරණය වශයෙන්ද අකාරණය අකාරණය වශයෙන්ද තතු ලෙසින් දන්නා නුවණ**'' ලෙසින්ද හඳුන්වයි. ** **ඨාන** යන වචනයෙන් දක්වන්නේ ඒ ඒ කරුණු සිදුවීම හා ඒ ඒ දෙය ඇතිවීමේ හේතුවය. **අට්ඨාන:** හේතු නොවනදෙයය. ** පළමු දස බල නුවණ මගින්, යම් යම් දේ සිදුවීමට හේතුව නිවැරදිව දැනගන්නේය, එසේම, අහේතුවද නිවැරදිව දනගන්නේය. හේතු හා අහේතු පිළිබඳ නිවැරදිව දන්නා නුවණ- යථා භූත ඥානය, තථාගතයන්ගේ බලයකි. **2 ) දෙවෙනි දසබල ඥානය: තුන්කාලයේම සමාදන්වූ කර්ම විපාක පිළිබඳ (හේතු හා ඵල) යථා ලෙසින් දන්නා නුවණ** (the result of the undertaking of kamma past, future, and present in terms of possibilities and causes). **"තථාගතො අතීතානාගත පච්චුප්පන්නානං කම්ම සමාදානානං ඨානසො හෙතුසො විපාකං යථාභූතං පජානාති…". සටහන:** * කර්ම විපාක නුවණ ඉතා ගැඹුරුය, බුදුවරුන්ට මිස ශ්‍රාවකයනට අවිශය කරුණකි. ශ්‍රාවකයනට දත හැක්කේ කර්මවිපාකවල සුළු කොටසක පමණි. ** මේ නුවණ මගින් පෙන්වන්නේ බුදුන් වහන්සේට කර්මය විභාගකර දැක්වීමට ඇති අවබෝධය ය. **බලන්න**: EMN: note: 183, p. 1081. **3 ) තෙවෙනි දසබල ඥානය: සර්වත්‍රගාමිනීප්‍රතිපාදා ඥානය-** the ways leading everywhere. **"… තථාගතො සබ්බත්‍ථගාමිනිං පටිපදං යථාභූතං පජානාති". සටහන්**:* අපාය, තිරිසන් ලෝකය, ප්‍රේත ලෝක, අසුර ආදී දුගතියට, මිනිස්ලෝකයට, දේව ලෝක, බ්‍රහ්ම ලෝකහා හා නිවන කරා යන සියලු මාර්ග පිළිබඳ තථාගතයන්යට ඇති යථා අවබෝධය මේ නුවණින් පෙන්වා දේ. **බලන්න**: EAN: note: 1984, p. 677. ** තථාගතයන් ...අරහත් ආදී මග ඵලයන්ට පැමිණීම දන්නා සේක **4 ) සිව්වෙනි දසබල ඥානය: ලෝකයේ අනේකධාතු නානාධාතු දන්නා නුවණ-** the world with its numerous and diverse elements **''තථාගතො අනෙකධාතු නානාධාතු ලොකං යථාභූතං පජානාති'' සටහන්**: * පංචඋපාදානස්කන්ධයේ, ආයතනයන්හි, විවිධ ධාතු නියම ලෙසින්ම දන්නා නුවණ මින් පෙන්වා ඇත. **බලන්න**: EAN: note 1985, p. 677. ** සම්පූර්ණයෙන්ම නැතිවන නිසා, බිඳී...යන නිසා ස්කන්ධ, ආයතන ලෝක නම්වේ. ධාතුවල තම තමන්ගේම ස්වභාවය ඇති නිසා ...පෙනෙන නිසා රූප ධතුවවේ...එලෙස, රූප,වේදනා, සංඥා, සංඛාර, විඥාණ ආදීවූ ධාතු පිළිබඳව තථාගතයන්ට යථා අවබෝධය ඇත.
**5) පස්වෙනි දසබල ඥානය: සත්ත්වයන් ගේ විවිධවූ චරිත ස්වභාවය දන්නා නුවණ-** the diversity in the dispositions of beings **"..තථාගතො සත්තානං නානාධිමුත්තිකතං යථාභූතං පජානාති" සටහන්**: * ලෝක සත්ත්වයන්ගේ චරිත සවභාවය: උසස් හෝ පහත් බව, සමාන ගුණ ඇති සත්වයෝ එකට එකතුවීම පිළිබඳ තථාගතයන්ගේ අවබෝධය.**බලන්න**: EAN: note 1986, p. 677. ** අධිමුක්ති යනු අදහස ය. එය සත්ත්වයන් තුළ ඇති, තේරුම් ගැනීමට දුෂ්කරවූ අනුශය ධාතුවකි. බොහෝවිට පුද්ගලයෝ අනුශය වශයෙන් යටපත්වී ඇති තම අදහස් නොදනිති. තථාගතයන්, තමන්වෙත පැමිණෙන සෑම දෙනාගේම අදහස් නිවැරදි ලෙස දනී. සත්ත්වයන්ගේ අදහස් විවිධ, සමහරු අනුනට දුක දීමට කැමතිය; සමහරු සොරකම් කිරීමට…අනුන් රැවටීමට කැමතිය… එලෙස ලාමක අදහස් ඇති අය හීනාධිමුක්තික යයි හඳුන්වයි. තවත් අයට උසස් අදහස් ඇත... වැඩිහිටියනට ගරු කිරීම, දහමට කැමතිවීම...ඔවුන් ප්‍රනිතාධිමුක්තික ලෙසින් හඳුන්වයි. **6) සයවෙනි දසබල ඥානය: උසස්**

**හෝ පහත් අදහස් ඇති ලෝක සත්ත්වයන්ගේ, පුද්ගලයන්ගේ ඉන්ද්‍රිය දියුණුඇත්ද දියුණුවී නැත්ද යයි දන්නා නුවණ-** superior or inferior condition of the faculties of other beings and persons (ඉන්ද්‍රිය පරියෝපරියත්ත ඥානය- ධර්මය අවබෝධකරගැනීමට ඉන්ද්‍රියන් කෙතෙක් වැඩි තිබේද යයි අවබෝධ කරගැනීම). "...**භිකඛවෙ තථාගතො පරසත්තානං පරපුග්ගලානං ඉන්ද්‍රියපරොපරියත්තං යථාභූතං පජානාති**". **සටහන්:** * ලෝක සත්ත්වයන්ගේ විවිධවූ අදහස්-නැඹුරුකම්, ඔවුන් තුල ඇති අනුසය ධර්ම, සිතේ නියම ස්වභාවය, චරිත ස්වභාවය, ප්‍රතිභානය, ඉන්ද්‍රියන්, ගතිගුණ, යමක් ග්‍රහණය කරගැනීමේ තත්වය, සම්භාව්‍ය-යමක් දියුණු කරගැනීමට ඇති ශක්තිය ආදීය පිලිබඳ තථාගතයන්ට මනා අවබෝධය ඇත. අටුවාවට අනුව පුද්ගලයෙක් ගේ පංච ඉන්ද්‍රිය (ශ්‍රද්ධා, විරිය ආදී...) දියුණුව තිබේද, පසුබැස තිබේද යන්න අවබෝධ කිරීමය. බලන්න: EAN: note: 1987, p. 677) ** තථාගතයන් ප්‍රධාන සත්ත්වයන්ගේ, හීන සත්ත්වයන්ගේ ඉන්ද්‍රිය මේරීම - ඉන්ද්‍රිය පරාවරතාව දනී. **7) සත්වෙනි දසබල ඥානය: ඣාන, විමොක්ඛ, සමාධි සමාපත්තීන් කෙළෙසීම, පිරිසිදුවීම, සමාධි ඣාන සමාපත්ති වලින් නැගීසිටීම පිලිබඳ අවබෝධය -** knowledge of the defilement, the cleansing, and the emergence in regard to the jhānas, emancipations, concentrations, and meditative attainments **"...තථාගතො ඣානවිමොක්ඛ වීමොක්ඛසමාසමාධිසමාපත්තිනං සංකිලෙසං වොදානං වුට්ඨානං යථාභූතං පජානාති". සටහන්:** * ඣානසමාපත්ති කෙළෙසීම, පිරිසුදුකරගැනීම, ඣානවලින් නික්මීම, විමුක්තිය, සමාධිය, ඣානසමාපත්ති ලැබීම පිලිබඳ තථාගතයන්ගේ අවබෝධය ** සිව්ඣාන, අෂ්ඨවිමොක්ඛ, ඣානසමාපත්ති, සංක්ලේශ- ව්‍යවදාන-ව්‍යුත්ථාන, ආදිය දන්නා තථාගත නුවණ. **8) අටවෙනි දසබල ඥානය: අනෙකවූ, විවිධවූ පෙර ජාති දන්නා නුවණ- පූර්වනිවාසානු සමෘතිය- පෙරවිසූ කඳ පිළිවෙත දන්නා නුවණ-** the Tathāgata recollects his manifold past abode. **"...තථාගතො අනෙකවිහිතං පුබ්බෙනිවාසං අනුස්සරති ..."** සටහන්: * අනෙකවිධි අතීත ජාති දන්නා නුවණ ** සීමාවක් නොමැතිව පෙර ජාති දැකිය හැකි නුවණ තථාගතයන්ට ඇත. **9) නවවෙනි දසබල ඥානය: සත්ත්වයන් මරණින් මතුඋපත ලබන ස්ථාන ගැන දන්නා නුවණ- දිවැස-**divine eye. "**...තථාගතො දිබ්බෙන චක්ඛුනා විසුද්ධෙන අතික්කන්තමානුසකෙන සත්තෙන පස්සති චවමානෙ උප්පජ්ජමානෙ හීනෙ පනීතෙ සුවණ්ණෙ දුබ්බණ්ණෙ සුගතෙ දුග්ගතෙ..." . සටහන්:*** චූතුප්පාතඤාණය - කර්මානුරූපව සත්ත්වයෝ උපත ලබාගන්නා අන්දම අවබෝධකරගැනීම ** ඒ ඒ භවයන්ගෙන් චූතවන සත්ත්වයෝ ඔවුන් කළ පින්පව් අනුව සුගතියක හෝ දුගතියක උපදිනා අන්දම තථාගතයන් මැනවින් අවබෝධ කර ඇත. **10 ) දසවෙනි දසබල ඥානය: ආශ්‍රවක්ෂය ඥානය-** සියලු ආසවයන් ක්‍ෂය කළබව දන්නා නුවණ- knowledge of the destruction of Taints. **"... තථාගතො ආසවානං ඛයා අනාසවං චෙතොවිමුත්තිං පඤ්ඤාවිමුත්තිං දීට්ඨෙවධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරති...". සටහන්:** * තථාගතයන් වහන්සේ, සියලු ආසවයන් ක්‍ෂය වීමෙන් අනාශ්‍රව, චිත්ත විමුක්තිය, ප්‍රඥා විමුක්තිය ලබා, ඒ බව විශිෂ්ඨ ඥානයෙන් දැන, සාක්ෂාත් කොටගෙන වාසය කරයි. එය තථාගතයන් යන් සතු බලයකි. ** අංගු.නි: (3): 5 නිපාතයේ: බලවග්ග: තථාගත බල සූත්‍රයේ: තථාගතයන්: ශ්‍රද්ධාබලය, හිරිබලය, ඔත්තප්ප

බලය. විරියබලය හා ප්‍රඥා බලය ඇතිව බ්‍රහ්මචක්‍රය පවත්වන බව පෙන්වා ඇත. **මූලාශ්‍ර:** අංගු.නි: (6):10 නිපාත: 10.1.3.1 සිංහනාද සූත්‍රය, පි. 90, EAN:10: 21.1. The Lion, p. 499, ම.නි: (1): 1.2.2. මහාසීහනාද සූත්‍රය, පි. 184, EMN: 12: The Greater Discourse on the Lion's Roar, p.160.

▼**වෙනත් මූලාශ්‍ර:1. දසබල ඥාන පිලිබඳ ගාථාව:**

ඨානාඨානෙ විපාකෙ ච-මගගෙ සබබතථ ගාමිනා,
නානාධතුම්හි ලොකසමිං - අධිමුතතම්හි පාණිනං,
පරොපරියනතෙ ඤානං - ඉන්ද්‍රියානඤ්ච ජනතුනං
ඣනාදීසු ඤානං පුබබෙ - නිවාසෙ දීබබචකඛු ච,
ආසවකඛයඤානකනති - දසඤානබලං මතං:
"**සුවිසිමහාගුණය**": පි.162, රේරුකානේ චන්දවිමල මහානාහිමි, 2005.
▼ **ඒ ඒ සත්වයාගේ ඉන්ද්‍රිය** දියුණුව හෝ පරිහානිය පිලිබඳ විශේෂ ඥානයක් බුදුවරුන් සතුය, එය **තථාගත** දස බල නුවණකි. **බලන්න**: ආධ්‍යාත්මික පංච ඉන්ද්‍රිය.

▼ **තථාගතයන්ට** පමණක් ඇති සර්වඥතා ඥානය: අනාවරණ ඥානය ලෙසින් පෙන්වා ඇත්තේ **බලන්න:**අනාවරණ ඥානය.
▼ **ආසයඅනුසය ඤාණය**, තථාගතයන් සතු නුවණකි. **බලන්න**: ආසයඅනුසය ඤාණය.
▼ **දහසක් ලෝකධාතු පිලිබඳව තථාගත අවබෝධය**: බුදුන් වහන්සේ, දහසක් ලෝක ධාතු පිලිබඳ විස්තර ප්‍රථම කොසල සූත්‍රයේ පෙන්වා ඇත. අංගු.නි (1) 3 නිපාතයේදී: ලෝකධාතු තුල සිටින සත්ත්වයන් හට ඇසෙන පරිදි තථාගතයන්හට හඬ පැතිරීවිය හැකිබව පෙන්වා ඇත.**බලන්න**: දහසක් ලෝක ධාතුව. **මූලාශ්‍ර:** අංගු.නි: (6): 10 නිපාත: 10.1.3.9.ප්‍රථම කොසල සූත්‍රය,පි. 134 , EAN: 10: The Great Chapter, 29.9 Kosala-1, p. 505, අංගු.නි: (1): 3 නිපාත: ආනන්දවග්ග**: 3.2.3.10 සූත්‍රය**, පි. 440, EAN:3: Ānanda: 80.10 Abhibhū, p. 120.
▼ **තථාගතයන් සියලු මූලධර්ම පිලිබඳ විශාරදය**: තථාගතයන් ට සියලු ධර්මතා ගැන නිසැක අවබෝධය ඇත. ඒ නිසා විවිධ පුද්ගලයන්හට (නොයෙක් දිට්ඨි ඇති, මත ඇති) විවිධ ලෙසින් ධර්මය ඉගැන්වීමට තථාගතයන් සමත්ය. එලෙස නොයක් ක්‍රම මගින් තථාගතයන් ධර්මය දේශනා කරනවිට, ඒ අනුව කෙනෙක් පුහුණු වන්නේනම්, දහම ප්‍රගුණ කරන්නේනම්, ඔහු, ඇති දේ(exists)ඇති බව හා නැති දේ නැතිබව දැනගනි; පහත් දේ (හීන -inferior) පහත්බව, උසස් දේ (ප්‍රණීත-sublime) උසස්බව දැන ගනී, ඉක්මවා යාහැකි දේ (surpassable) ඉක්මවා යා හැකිබව, ඉක්මවා ගිය නොහැකිදේ ඉක්මවා ගිය නොහැකි බව දනී. එලෙසින්, කෙනෙකුට නියම ලෙසින්, දැනගතයුතු, දැකියයුතු, අවබෝධ කලයුතු දේ , දැනගැනීමට, දැකගැනීමට, අවබෝධකරගැනීමට හැකිවේ. **මූලාශ්‍ර**: අංගු.නි: (6 ): 10 නිපාත: 10.1.3.2 අධිවුත්තිපද සූත්‍රය,පි. 96, EAN: 10: III The Great Chapter: 22.2 Doctrinal Principles, p. 500.
▼ **උසස් හා පහත් පුද්ගලයන් පිලිබඳ තථාගත ඥානය**: පුද්ගලයන් ගේ ආධ්‍යාත්මික වෙනස්කම්: ඔවුන්ගේ ශිලය, ලබා ඇති මාර්ග ඵල ආදී කරුණු පිලිබඳ තීරණය කිරීමට සමාන්‍ය පුද්ගලයෙක් සමත් නොවේ.

එවැනි තීරණ ගත හැක්කේ තථාගතයන්ට හෝ ඒ සමාන ගුණ ඇති උතුමෙකුට පමණක් බව බුදුන් වහන්සේ පෙන්වා ඇත. ඔවුන් ගැන හිතු මානපයේ තීරණ ගැනීමෙන් බොහෝ අකුසල් රැස්වේ. එම නිසා අන්‍යන්ගේ ආධ්‍යාත්මික තත්වයන් සංසන්දනය කරමින්, ඔවුන් විනිශ්වය නොකළ යුතුවේ. ( Therefore, Ānanda, do not be judgmental regarding people. Do not pass judgment on people. Those who pass judgment on people harm themselves. I alone, or one like me, may pass judgment on people). **සටහන්**: * මෙහිදී ආධ්‍යාත්මික වෙනස්කම් ඇති පුද්ගලයන් දස දෙනෙක් ගැන පෙන්වා ඇත ** මේ සූත්‍රය දේශනා කිරීමට මුල්වුවේ, මිගසාලා උපාසිකාව, තම පියා (පුරාණ,) හා මාමා (ඉසිදත්ත) සකදාගාමී බව ලැබීම ගැන ආනන්ද තෙරුන්ගෙන් ඇසූ ප්‍රශ්නයක් පිලිබඳවය. **මූලාශ්‍ර:** අංගු.නි: (6): 10 නිපාත: 10.2.3.5 මිගසාලා සූත්‍රය, පි. 274, EAN:10: 75.5 Migasālā, p. 522.

▼**තථාගතයන් ධර්ම රාජයාය**: තථාගතයන් ධර්මයම ආශ්‍රය කර, ධර්මයටම සත්කාර කර, ධර්මයට ගරුකර, ධර්මය පුදමින් වාසය කරන බව බුදුන් වහන්සේ වදාළහ. තථාගතයන්ගේ ධජය, ධර්මය ය. කලයුතු හා නොකළයුතු කාය, වචී හා මනෝ කර්ම කුමක්ද යයි පෙන්වා, (සක්විති රජ තම පිරිස රැකගන්නා ලෙසින්) තථාගතයන් පිරිසට ආරක්ෂාව ලබාදේ. **මූලාශ්‍ර:** අංගු.නි: ( 1 ): 3 නිපාත: 3.1.2.4 සූත්‍රය, පි. 246 , EAN:3: 14.4 Wheel turning Monarch p. 82.

▼ **තථාගතයන් ගේ ධර්මයේ ආශ්වර්යබව**: තථාගතයන් ධර්මය දේශනා කරනවිට ඇතිවෙන අසිරිමත් හා ආශ්වර්යමත් කරුණු: 1) තණ්හාවෙන් බැඳුන ලෝකයාට, තථාගතයන්, තණ්හාව පහකිරීම පිළිබඳව ධර්මය දේශනා කරනවිට ඔවුන් කන්යොමු කරති, ධර්ම කරුණු අවබෝධ කරගැනීමට සිත යොදවති. 2) මානයෙන් මත්වූ ලෝකයාට, තථාගතයන්, මානය පහකිරීම පිළිබඳව ධර්මය දේශනා කරනවිට ඔවුන් කන්යොමු කරති, ධර්ම කරුණු අවබෝධ කරගැනීමට සිත යොදවති. 3) උද්වේගය (අනුපශමය- excitement) ට ඇලුන ලෝකයාට, තථාගතයන් සාමය-ශාන්තබව පිළිබඳව ධර්මය දේශනා කරනවිට ඔවුන් කන්යොමු කරති, ධර්ම කරුණු අවබෝධ කරගැනීමට සිත යොදවති. 4) අවිද්‍යාවෙන් බරවූ ලෝකයාට, තථාගතයන්, විද්‍යාවඇතිකර ගැනීම පිළිබඳව ධර්මය දේශනා කරනවිට ඔවුන් කන්යොමු කරති, ධර්ම කරුණු අවබෝධ කරගැනීමට සිත යොදවති. **මූලාශ්‍ර:** අංගු.නි: (2): 4 නිපාත: 4.3.3.8 දුතිය තථාගත අච්ඡරිය සූත්‍රය, පි. 274 , EAN:4: 128.8 Astounding- 2 , p. 195.

▼**තථාගතයන් පහළවීම නිසා අරිය අටමග පහළවේ. මූලාශ්‍ර:**සංයු.නි: (5-1): මහාවග්ග: මග්ගසංයුත්ත:1.2.4. උප්පාද සූත්‍රය, 1.2.5. පරිශුද්ද සූත්‍රය, පි. 52, ESN: 45: Maggasamyutta, 14.4, 15.5 Arising, p. 1619.

▼**තථාගතයන් ඇතිකල බුදුසසුන බැබලේ**: ආනන්ද තෙරුන් ඇසූ පැණයකට පිළිතුරු ලෙසින් බුදුන් වහන්සේ මෙසේ වදාළහ: “ යම්තාක් කල් ලොව තථාගතයන් නො උපදිත්ද, ඒ තාක් ම අන්‍ය ආගමිකයන් ගේ බැබලීම වේ. යම්කලක තථාගතයන් උපදි ද, එකල බුදුසසුන බබලයි”. ඒ පිලිබඳ දැක්වූ **උපමාව**: යම්තාක් හිරු නො නගිද, ඒ තාක් කදෝපැණි (කළාමැදිරියා) තෙම බබලයි. හිරු නැගී කල්හි කදෝපැණි තෙම, නො බබලයි. **මූලාශ්‍ර:** ඛු.නි: උදාන පාලිය: 6.10 තථාගත උත්පාද සූත්‍රය, පි. 304.

▼**තථාගතයන් සිහිකර ස්තූප සෑදීම:** තථාගතයන් සිහිකර - අනුස්මරණය කර ස්තූප සෑදීම, ඒවාට පුද පූජා කිරීම නිසා බොහෝ පින් ලැබේ. **බලන්න:** ස්තූප, දීඝ.නි: මහා පරිනිබ්බාන සූත්‍රය.
▼ **තථාගතයන් වහන්සේ** අනුපාදිශේෂ පරිනිර්වාණ ධාතුවෙන් පිරිනිවීගිය ස්ථානය සැදැහැති කුලපුත්‍රයෙක් විසින් දැකියයුතු සංවේග කටයතු ස්ථානයක්ය-පූජනිය ස්ථානයක්ය. **බලන්න:** අනුපාදිසේස පරිනිබ්බාන ධාතුව, මහාපරිනිබ්බාන සූත්‍රය, සිව් පූජනිය ස්ථාන.
▼ **තථාගතයන් ශ්‍රාවකයන්ට ධර්මය දේශනා කිරිමේ අරමුණ** තථාගතයන්**,** විශිෂ්ඨ ඥානයෙන් දැන, සත්වයන්ගේ විශුද්ධිය පිණිස, සෝක විලාප මැඩපවත්වා ගැනීම පිණිස, දුක්වේදනා හා දොම්නස අහවරකරගැනීම පිණිස, මාර්ගය ලැබීම පිණිස, නිවන සාක්ෂාත් කරගැනීම පිණිස, ශ්‍රාවකයනට ධර්මය දේශනා කරනබව බුදුන් වහන්සේ වදාළහ. **මූලාශ්‍ර:** අංගු.නි: (6 ): 10 නිපාත, 10.2.5.5 උත්තිය සූත්‍රය,පි.374, EAN: V,95-5 Uttiya, p.536.
▼**තථාගතයන් ධර්මය දේශනා කරන ක්‍රමය: ආකාර 2 කින් දේශනා කරන්නේය**: 1) සැකෙවින් (**සඞ්ඛිත්තෙන** -සංඛිත්තෙන-in brief **)** 2) විස්තරාත්මකව(**විත්ථාරෙන**-විත්ථාරේන- in detail) **සටහන:** අටුවාවට අනුව: සැකෙවින් දේශනා කිරීම යනු ධර්ම කරුණ පිලිබඳ සැකිල්ල-කෙටි සටහන (මාතිකා) දැක්වීමය .විස්තරාත්මව දේශනා කිරීම යනු, ධර්ම කරුණ විස්තරකර, විභාග කර දැක්වීමය. කෙටියෙන් ධර්මය දේශනා කරන්නේ නුවණැතියන්ටය- ප්‍රඥාව අධික අයටය. සාමාන්‍ය හෝ අවම නුවණ ඇති අය පිණිස විස්තරාත්මකව ධර්මය දේශනා කරයි.**බලන්න**: EAN: note: 230, p. 592. **මූලාශ්‍ර:** අංගු.නි: (1): 2 නිපාත: 2.1.2.4 සූත්‍රය, පි. 144, EAN: 2: 14.4 Sutta, p. 58.
▼ **තථාගත ධර්මය වරදවා ගැනීම**: තථාගත ධර්මය විකෘති කරන අයද, ඒ පිලිබඳ යහපත් අවබෝධය ඇති අයද ලෝකයේ සිටිති. **ධර්මය විකෘති කරන අය:** 1. තථාගතයන් කෙරෙහි ද්වේශය ඇති අය 2. තථාගතයන් කෙරෙහි විශ්වාසයක් ඇතිවුවද ධර්මය වරදවා වටහාගත් අය. ඔවුන් ධර්මය විකෘති කරන අන්දම: 1) තථාගතයන් නොවදාළ ධර්මය උන්වහන්සේ විසින් වදාරනලදී යයි පැවසීම 2) තථාගතයන් වදාළ ධර්මය උන්වහන්සේ විසින් නොවදාරනලදී යයි පැවසීම 3) තථාගතයන් වදාළ ධර්මය, අර්ථ විවරණය අවශ්‍ය තැන්හි, එය අවශ්‍ය නොවේ යයි පැවසීම. 4 ) තථාගතයන් වදාළ ධර්මය, අර්ථ විවරණය අවශ්‍ය නොවන තැන්හි, අර්ථ විවරණ අවශ්‍යයයි පැවසීම. **ධර්මය විකෘති නො කරන අය:**1) තථාගතයන් නොවදාළ ධර්මය උන්වහන්සේ විසින් නො වදාරනලදී යයි පැවසීම 2 ) තථාගතයන් වදාළ ධර්මය උන්වහන්සේ විසින් වදාරනලදී යයි පැවසීම 3 ) තථාගතයන් වදාළ ධර්මය, අර්ථ විවරණය අවශ්‍ය තැන්හි, එය අවශ්‍යබව පැවසීම 4 ) තථාගතයන් වදාළ ධර්මය, අර්ථ විවරණය අවශ්‍ය නොවන තැන්හි, ඒවා අවශ්‍ය නොවන බව පැවසීම. **මූලාශ්‍ර:** අංගු.නි: (1 ): 2 නිපාත: 2.1.3.2- 2.1.3.5 සූත්‍ර, පි. 154 , EAN: 2: 22.2-25.5, Suttas, p.60.
▼**තථාගතයන් හැර දැමූ දස ධර්මතා:** එක් සමයක බාහුන තෙරුන් බුදුන් වහන්සේගෙන් මෙසේ විමසුහ: "කුමන ධර්මතාවලින් මිදී, සීමාවලින් නිදහස්වූ සිතක් ඇතිව තථාගතයන් වැඩ වාසය කරන්නේද?". තථාගතයන් ධර්මතා 10කින් වෙන්ව විමුක්ති සුවය ඇතිව වාසය කරණ බව බුදුන් වහන්සේ වදාළහ. 1 රූප 2 වේදනා 3 සංඥා 4 සංස්කාර 5

විඥාන 6 ජාතිය 7 ජරාව 8 මරණය 9 දුක 10 කෙලෙස්. ඒ පිළිබඳ **උපමාව:** යම් ලෙසකින්, උපුල්මලක් ...රතුනෙළුමක්...සුදු නෙළුමක්, දියෙහි ඇතිවී, දියේම හැදී, දියෙන් මතුවී, දියනිසා කිලිටිනොවී, නැගී සිටින්නේද, එලෙසින්, දස ධර්මයන් ගෙන් මිදී, වෙන්වී, විමුක්තවී තථාගතයන්, සීමාවලින් නිදහස්වූ සිතක් ඇතිව වැඩ වාසය කරති. **"සෙය්‍යථාපි බහුන උප්පලංවා පදුමං වා පුණ්ඩරීකංවා උදකෙ ජාතං උදකෙ සංවඩ්ඪං උදකා අච්චුග්ගම්ම තිට්ඨති අනුපලිත්තං උදකෙන. එවමෙව බො බාහුන ඉමෙහි දසහි ධම්මෙහි තථාගතො නිස්සටෙඨා විසංයුත්තො විප්පමුත්තො විමරියාදීකතෙන චෙතසා විහරතීති"** "Bāhuna, it is because the Tathāgata is released, detached, and emancipated from ten things that he dwells with a mind free from boundaries: Form, feelings, perceptions, volitional activities, consciousness birth … old age … death … suffering … defilements). **මූලාශ්‍ර:** අං.ගු.නි: (6):10 නිපාත: 10.2.4.1. බාහුන සූත්‍රය,පි.296, EAN:10: The Elders: 81.1. Bahuna, p. 526.

▼ **තථාගත ධර්මය ඉගෙනගන්නා ක්‍රමය:** යම් භික්ෂුවක් ගුණ 10කින් සමන්විත නම් ඔහුට ධර්මය උගැන්වීමට, දේශනා කිරීමට තථාගතයන් නැඹුරුවේ, එහෙත්, භික්ෂුවකට එම ගුණ නොමැතිනම් ඔහුට ධර්මය උගැන්වීමට, තථාගතයන් නැඹුරුනොවේ: 1 භික්ෂුව සද්ධා සම්පන්නය 2 තථාගතයන් වෙත පැමිණේ 3 තථාගතයන් ඇසුරු කරයි 4 ප්‍රශ්න විමසයි 5 කන්යොමා ධර්මය අසයි 6 ඇසූ ධර්මය සිතේ දරාගනී 7 සිතේ දරාගත් ධර්මය විමසා බලයි 8 අර්ථය දැන ධර්මය අවබෝධ කරගනී 9 ඔහු ධර්ම කතාවේ දක්ෂය; අසා සිටින අයට ඉගැන්වීමට දක්ෂය; කතාවට ශූරය; ඇසූ ධර්මය අර්ථය පැහැදිලිකර, කරුණු ඔපකර, කියා පෑමට හැකියාව ඇත. 10 සබ්‍රම්මචාරීන්හට ඔහු ධර්මය උගන්වයි, ඔවුන්ව උනන්දුකරයි; ඔවුන් පොළඹවාගනී, ඔවුන් සතුටු කරති. **මූලාශ්‍ර:** අං.ගු.නි: (6)10 නිපාත: ථෙර වග්ග: 10.2.4.3. පුන්ණිය සූත්‍රය,පි.302, EAN: 10: The Elders: 83.3. Punniya, p. 526.

▼ **තථාගත ශ්‍රාවකයන්:** තථාගතයන් වහන්සේගේ අනුත්තර අරහත්වය දකිමින් රහත් මහණ, සසුනේ ඉතා යටත්ව වාසය කරන බව සැරියුත් තෙරුන් මෙහි දී දක්වා ඇත.**බලන්න:**උපග්‍රන්ථය:1,2 **මූලාශ්‍රය:** සං.යු.නි: (5-1) මහාවග්ග: ඉන්ද්‍රියසංයුත්ත: 4.6.8 සූකරඛත සූත්‍රය, පි.436.

**තද**

▲ **තදංග නිබ්බාන**- Nibbāna in a particular respect: ප්‍රථම ජාන ආදී ඒ ඒ අංගයන්ගේ නිවීම තදංග නිබ්බානයය. තදංග නිබ්බානය පිළිබඳව බුදුන් වහන්සේ මෙසේ පෙන්වා ඇතිබව ආනන්ද තෙරුන් වදාළහ: "ඇවැත්නි, මේ සසුනේ මහණ...ප්‍රථම ජානයට පැමිණ වාසය කරයි…( එලෙස සිව් ජාන) එපමණකින්ම, තදංග නිබ්බානය යයි අවස්ථානුරූපව (පර්යායෙන්) බුදුන් වහන්සේ දෙසනා කරන ලදී" ." මේ සසුනේ මහණ... ආකාසානඤ්චායතන සමාපත්තියට පැමිණ වාසය කරයි... (එලෙස සිව් අරූප සමාපත්ති) එපමණකින්ම, තදංග නිබ්බානය යයි අවස්ථානුරූපව, බුදුන් වහන්සේ දෙසනා කරන ලදී". "...මේ සසුනේ මහණ මුළුමනින්ම, නෙවසඤ්ඤානාසඤ්ඤායතනය ඉක්මවා සඤ්ඤාවෙදයිත නිරෝධයට පැමිණ වාසය කරයි. නෙවසඤ්ඤානාසඤ්ඤා විපස්සනා ප්‍රඥාවෙන් දැකීමෙන් ඔහුගේ ආසව ක්ෂයවේ. එපමණකින්ම, තදංග නිබ්බානය යයි අවස්ථානුරූපව, බුදුන් වහන්සේ දෙසනා කරන ලදී" **මූලාශ්‍ර:** අං.ගු.නි: (5):

9 නිපාත: සාමඤ්ඤවග්ග: 9.1.5.9 තදංග නිබ්බාන සූත්‍රය, **පි**. 566, EAN:9: 50.9 Nibbāna in a particular respect, p. 485.

▲**තාදීගුණ**-Tadiguna: තාදීගුණ ලෙසින් පෙන්වා ඇත්තේ උතුම්, ශ්‍රේෂ්ඨ ගුනයන්ය. එනම්, බුදු, පසේබුදු, රහතුන් සතු නිර්මල ගුණයන්ය. **බලන්න**: ක්‍රෝධය.

▲ **තෙදන්ඩික**- tedaṇḍika: බුදුන් වහන්සේ වැඩසිටි සමයේ පැවති අන්‍ය ආගමික නිකායන් අතුරින් එකකි. **බලන්න:** අන්‍ය ආගමික නිකායන්.

▲**තොදෙය්‍ය තෙර**- Thodeiya Thera**: බලන්න:** උපගුන්ථය:1

▲ **තොදෙය්‍ය මානවක-** Thodeiya Manawka: **බලන්න**: **:** උපගුන්ථය:3.

▲ **තුදු බ්‍රහ්මරාජ-**Brhama Tudu: කෝකාලික භික්ෂුවගේ ගුරුවරයාවූ මෙතුමා, මරණින් මතු බ්‍රහ්ම ලෝකයේ පහලවූහ. මෙතුමා පච්චේක බ්‍රහ්මය. ඒ  භික්ෂුව, අගසව් දෙනම ගැන අසත්‍ය කතා කරන අවස්ථාවේ එලෙස නොකරන්න යයි ඔහුට අවවාද කරන ලද බව මෙහි පෙන්වා ඇත. ආර්යන්ට ගරහන පුද්ගලයන්, ඒකාන්තයෙන්ම නිරයේ බොහෝ කලක් දුක්විදින බව මෙහි දක්වා ඇත. **මූලාශ්‍ර**: අංගු.නි: (6 )10 නිපාත: 10.2.4.9. කොකාලික සූත්‍රය,පි.331, EAN: 10: 89.9. Kokalika, p. 530, සංයු.නි: (1) සගාථවග්ග: බ්‍රහ්මසංයුත්ත:6.1.9 තුදුබ්‍රහ්ම සූත්‍රය, පි.296.

**තන**

▲ **තාන-** Thana: **තාන** -රක්ෂා ස්ථානය-රැකවරණය සහිත තැන, නිවන හඳුන්වන නමකි.**බලන්න**: නිවන.

▲**තුන්කාලය-** Three times: තුන්කාලය ලෙසින් පෙන්වා ඇත්තේ වර්තමාන, අතීත හා අනාගත කාලයන්ය. මෙය අද්ධව ලෙසින් පෙන්වා ඇත. **බලන්න:** අද්ධව.

▲ **තුන්කාලය දන්නා නුවණ-**පාලි: *තීණි ඤාණානි***-** knowledge of 3 times: ධර්මයට අනුව තුන් කාල දන්නා නුවණ ලෙසින් පෙන්වා ඇත්තේ අතීතය දන්නා නුවණ , අනාගතය දන්නා නුවණ හා වර්තමානය දන්නා නුවණය (තුන් කාලය පිලිබඳව අවබෝධ ඥාණය). මෙය බුදුවරු සතු විශේෂ නුවණකි. **ආධ්‍යාත්මික වර්ධනය** පිණිස මේ ඥාණ 3 උපදවා ගත යුතුවේ: **"... අතීතංසෙ ඤාණං, අනාගතං සෙ ඤාණං, පච්චුප්පන්නං සෙ ඤාණං"**. **බලන්න**: උත්පාදයිතව්‍ය ධර්ම. **මූලාශ්‍ර:** දීඝ.නි : (3): 11දසුත්තර සූත්‍රය, පි. 483, EDN: 34: Dasuttara Sutta: Expanding Decades, p. 384.

▼ **වෙනත් මූලාශ්‍ර: 1. "ත්‍රිවිධ අධ්වයෝ-**තුන් වැදැරුම් කාල: 1) අතීත භව පර්යාන්ත වූ හේතුන්: අවිද්‍යා සංස්කාර යන මේ දෙක පැවත එන අතීත කාලය 2) වර්තමාන හේතුවෙන් අනාගතයෙහි ජාති ජරා මරණ ඇතිවන අනාගත කාලය 3) අතීත හා අනාගත යන දෙදෙනාගේ මධ්‍යයෙහි ඉපදුන නිසා විඥාන නාම රූප ආදී සෙසු අංග 8 ප්‍රත්‍යයුත්පන්න නිසා ඇති වර්තමාන කාලය.**සද්ධර්ම කෝෂය,** පි. 177.

▲ **තුන්දොර-** The 3 doors: තුන්දොර ලෙසින් දක්වා ඇත්තේ කය, වචනය හා මනසටය. තුන්දොරින් දස කුසල හෝ දස අකුසල සිදුවේ. අපිරිසිදු ක්‍රියා නිසා කෙනෙක් පිරිහේ. එහෙත් තුන්දොරින් කරන යහපත් ක්‍රියා මගින් ආරිය විනයේ පිරිසුදුබව ලබාගැනීමට හැකිවේ. පෙන්වා ඇත. **බලන්න:** දස කුසල් හා දස අකුසල්, අංගු.නි: (1): 2 නිපාත: අකුසල පෙයියාල වග්ගයේ සූත්‍රයන්හි තුන්දොරින් කරන අකුසල විස්තරාත්මකව පෙන්වා ඇත. **මූලාශ්‍ර**: ම.නි: (1 ):1.1.9.සම්මා දිට්ඨි සූත්‍රය, පි. 130, EMN:

9 Sammādiṭṭhi Sutta, p. 121, අංගු.නි :( 6 ) 10 නිපාත: 10.4.2.10 චුන්ද සූත්‍රය, පි.508, EAN: 10: 176.10.Cunda, p.553.
▼**තුන්දොරින්** උපදවන චේතනා අභිසංඛාර ලෙසින් පෙන්වා ඇත. **බලන්න**: අභිසංඛාර.
▼**තුන්දොරින්** කරණ යහපත් හෝ අයහපත් ක්‍රියාවන් කම්මවේ. මේවා කම්ම පථ ලෙසින් පෙන්වා ඇත. **බලන්න:** කම්ම.
▲**තුන් භවය: පාලි: තිස්සො භවො-** Three Realms: ධර්මයේ තුන් භවය ලෙසින් පෙන්වා ඇත්තේ යළි උපත ලබන ස්ථාන ගැනය. එනම්: කාම ලෝකය, රූප ලෝකය හා අරූප ලෝකය. මේවා කාම ධාතු, රූප ධාතු හා අරූප ධාතු ලෙසින්ද පෙන්වා ඇත. ආධ්‍යාත්මික වර්ධනය පිණිස මේ තුන් භවය, විශේෂ නුවණින්, යහපත් ලෙසින්ම අවබෝධ කරගතයුතු ධර්මතාය.**බලන්න**: අභිඥෙයිය ධර්ම, ධාතු, විඥානය පිහිටන ස්ථාන. **මූලාශ්‍ර:** දීඝ.නි : (3 ): 11 දසුත්තර සූත්‍රය, පි. 483, EDN: 34: Dasuttara Sutta: Expanding Decades, p. 384.
▲**තුන්ලෝකය-**Three worlds: තුන්ලෝකය, තුන් භවය ලෙසින්ද පෙන්වා ඇත. මේවා සත්වයා යලි උපත ලබන ස්ථානයන්ය. **මූලාශ්‍රය:** සංයු.නි: ( 4 ): සළායතනසංයුත්ත: අනිච්ච වග්ග සූත්‍ර-12 , පි. 28,

▲ **තුන් සමාධිය**: පාලි: **තයො සමාධි**-3 Samadhis: තුන් සමාධිය ලෙසින් පෙන්වා ඇත්තේ පළමු, දෙවෙනි හා තෙවෙනි ජාන සමාපත්තින්ය: i විතක්ක හා විචාර ඇති 1 නි ජානය (**සවිතක්කසවිචාරො සමාධි**) ii විතක්ක නොමැති විචාර ඇති 2 නි ජානය (**අවිතක්කසවිචාරො සමාධි**) iii විතක්ක හා විචාර නොමැති 3 නි ජානය (**අවිතක්ක විචාරො සමාධි**). මේ සමාධි , ආධ්‍යාත්මික ජීවිතය වර්ධනය කරගැනීම පිණිස වඩා ගත යුතු ධර්මතාවන්ය.**බලන්න**: භාවේතබ්බ ධර්ම, ජාන. **මූලාශ්‍ර:** දීඝ.නි : (3): 11 දසුත්තර සූත්‍රය, පි. 483, EDN: 34: Dasuttara Sutta: Expanding Decades, p. 384.

**තණ**

▲ **තණඅග පිනිබිඳුව උපමාව-**Simile of the dew drop: **බලන්න:** ජීවිතයේ කෙටිබව දක්වන උපමා-උපග්‍රන්ථය:5, අරක ශාස්තෘ.
▲ **තණ්හාව**: පාලි: **තණ්හා:** craving-greed: තණ්හාව, ලෝභය, අබිජ්ජාව, ආශාව ආදී ලෙසින් හඳුන්වයි. **බලන්න**: ලෝභය, අබිජ්ජාව.ධර්මයට අනුව තණ්හාව, සසරගමන දික්කරණ කෙළෙස් මුල් තුනෙන් 1 කි. ලෝභය ලෙසින්ද පෙන්වා ඇත. මෙය දස අකුසලයකි. තණ්හාවේ ආදීනව හා ඉන් මිදීමෙන් ලැබෙන සැනසීම ආදී විස්තර පිණිස **බලන්න**: ධම්ම පදය: තණ්හා වග්ග.
▼**තණ්හාව පටිච්චසමුප්පාදයේ 8 නි පුරුකය.** වේදනා නිසා තණ්හාව හටගනී, වේදනා නිරෝධ වීමෙන් තණ්හාව නිරෝධවේ: **"...වෙදනා පච්චයා තණ්හා..."** . **"...වෙදානා නිරොධා තණ්හා නිරොධො.." තණ්හාව** නිසා උපාදාන ඇතිවේ, තණ්හාව නිරෝධ වීමෙන් උපාදාන නිරෝධවේ. **තණ්හාව සය ආකාරයට ඇතිවේ- සළායතනමගින්: 1)** රූප තණ්හාව- ඇසෙන් දකින රූප කෙරේ ඇති ඇල්ම **2)** ශබ්ද තණ්හාව - කණෙන් ඇසෙන ශබ්ද කෙරේ ඇති ඇල්ම.**3)** ගන්ධ තණ්හාව- නාසයට දැනෙන ගඳසුවඳ කෙරේ ඇති ඇල්ම **4)** රස තණ්හාව- දිවට දැනෙන රස පිලිබඳ ඇති ඇල්ම **5)** ස්පර්ශ තණ්හාව - කයට දැනෙන පහස පිලිබඳ ඇති ඇල්ම **6)** ධර්ම තණ්හාව - සිතින් සිතන සිතුවිලි පිලිබඳ ඇති ඇල්ම. (craving

for forms, craving for sounds, craving for odors, craving for tastes, craving for tactile objects, craving for mental phenomena- mind objects). **සටහන්**: * **ධර්ම තණ්හාව** (dhammataṇhā) යනු විඥාණය නිසා හටගන්නා තණ්හාවය- ආශාවන්ය-(පස් ඉඳුරන්ගෙන් අල්ලා ගන්නා දේ පිලිබඳ ඇති ඇල්මය-විඥාණ හැර). අපූර්වදේ ගැන, මනස්කල්පිත දේ ගැන, දුරඅවබෝධ-භවාත්මක කරුණු, බුද්ධිමය පර්යාය, වේදනා හා චිත්තවේගී අවස්ථා ආදිය පිලිබඳ විඥාණයේ ඇතිවන ආශාවන්ය. **බලන්න**: EMN: note: 126, p. 1075. ** ආධ්‍යාත්මික වර්ධනය පිණිස මේ තණ්හා 6 පහකර ගතයුතුය. **බලන්න**: පහාතබ්බ ධර්ම. **මූලාශ්‍ර:** සංයු.නි: (2 ): නිදානවග්ග: 1.1.1 පටිච්චසමුප්පාද සූත්‍රය හා 1.1.2 විභඞග සූත්‍රය, පි.24, ESN: 12: Nidanavagga: 1.1. Dependent Origination & Analysis of Dependent Origination, p. 610, ම.නි: (1):1.1.9 සම්මා දිට්ඨි සූත්‍රය, පි.130, EMN: 9: Sammādiṭṭhi Sutta, p. 121.

▼ **එජා** ලෙසින් පෙන්වා ඇත්තේ තණ්හාවය. **බලන්න:** තණ්හාව. **මූලාශ්‍රය**: සංයු.නි (4) සළායතනසංයුත්ත: 1.9.7 එජාසූත්‍රය, පි.167.

▼**තණ්හාව** හැරදැමීම චාගය වේ. **බලන්න**: චාගය, ධම්මචක්කපවත්තන සූත්‍රය.

▼**දුකට මුල** නම් තණ්හාවය. **මූලාශ්‍රය:** සංයු.නි (3): ඛන්ධසංයුත්ත: භාරවග්ග: 1.1.3.10 අඝමූල සූත්‍රය, පි.84

▼ **ආහාර ඇතිවීමට** මූලික හේතුව තණ්හාවය. එම තණ්හාව නැතිකරගැනීම පිණිස සිව් අහාර පිළිබඳව නුවණින් අවබෝධ කරගැනීම අවශ්‍යයය **බලන්න**: අහාර.

▼ **තණ්හාවේ** අන්තය නිවන ය.**මූලාශ්‍ර**:සංයු.නි: (4 ): අසංඛතසංයුත්ත: 9.2. 42.අන්තසූත්‍ර, පි.682, ESN: 43: Asankhatasamyutta: II, p. 1507.

▼**තණ්හාව ඇතිවීම**: සළායතන මගින් අල්ලා ගන්නා බාහිර අරමුණු කෙරේ ඇති බැඳීම හෝ ඒවා නැතිකරගැනීමට ඇති කැමැත්ත නිසා තණ්හාව ඇතිවේ. පංච කාමවස්තු කෙරේ ඇති ලෝභය (රූප,ශබ්ද, ගඳ සුවඳ, රස හා කාය ස්පර්ශය) කාමතණ්හාව ඇති කරයි. භව තණ්හාවට හේතු වන්නේ නැවත නැවත උපත් ලබා ගනිමින් කම් සැප විඳීමට ඇති කැමත්තය. නැවත උපතක් ලබා ගැනීමට ඇති අකමැත්ත විභව තණ්හාවය. **බලන්න**: පංචකාම ගුණ.

▼ **සියලු තණ්හා** (රූප තණ්හාව, ශබ්ද තණ්හාව, ගන්ධ තණ්හාව,රස තණ්හාව,ඵොට්ඨබ්බ තණ්හාව,ධම්ම තණ්හාව) අනිත්‍යය ය. එලෙස, දකිනා පුද්ගලයා '**සද්ධානුසාරී**' ය, .ඒබව, විදසුන් නුවණින්, ජාන සමාපත්ති ලබා අවබෝධ කරගන්නා පුද්ගලයා '**ධම්මානුසාරී**' ය. ඔවුන් සම්බෝධිය පිහිට කරගෙන ඇත. **මූලාශ්‍රය:**සංයු.නි: (3): ඛන්ධවග්ග: ඔක්කන්තිසංයුත්තය: චක්ඛුවග්ග: 4.1.8 සූත්‍රය, පි.474.

▼ **තණ්හාව ත්‍රිවිධය**: ත්‍රිවිධ තණ්හාව: කාම, භව හා විභව තණ්හාවන්ය. ඒ තණ්හා ප්‍රහීණය කරගැනීම, අරහත්වය ලැබීමය, සසර වටයේ දුක නැතිකරගැනීමය. **මූලාශ්‍ර**: අංගු: නි: (4): 6 නිපාත: 6.2.5.11 තණ්හා සූත්‍රය, පි. 278, ESN: 6: 106.11 Craving, p. 364.

▼ **තණ්හාව නිසා සක්කාය දිට්ඨිය ඇතිවේ.**කෙනෙක් තුල සක්කාය (මමය කියා ඇතිවන හැඟීම-සක්කාය දිට්ඨිය) ඇතිවන්නේ, යළිඋපත ගෙනදෙන, ඒ...මේ තැන සිත අලවන තණ්හාව මගින්ය. එනම් කාම

තණ්හාව, භව තණ්හාව හා විභව තණ්හාව යයි බුදුන් වහන්සේ වදාරා ඇත. **“ යායං … තණ්හා පොනොභාවිකා නන්දිරාගසහගතා තත්‍ර තත්‍රාභිනන්දිනී, සෙය්‍යථීදං: කාමතණ්හා භවතණ්හා විභවතණ්හා…අයං ඛො… සක්කායසමුදයො වුත්තො භගවාති’ (…** it is craving, which brings renewal of being, is accompanied by delight and lust, and delights in this and that; that is, craving for sensual pleasures, craving for being, and craving for nonbeing. This is called the origin of identity). **බලන්න:** සක්කාය දිට්ඨිය. **මූලාශ්‍ර:** ම.නි: (1 ):1.5.4. චූල වෙදල්ල සූත්‍රය,පි. 721, EMN:44*:* Cūḷavedalla Sutta, p.379.

▼ **තණ්හාව දැලක් වැනිය.** එය ලෝකයා වටකර බැඳ තබා ඇත. පංච උපාදානස්කන්ධය මමය ලෙසින් අල්වා ගැනීම නිසා ඇතිවෙන, ආධ්‍යාත්මික තණ්හාව හා බාහිර තණ්හාව දැලක් ලෙසින් මිනිසා වටලාගෙන ඇති අන්දම මෙහි විස්තර කර ඇත. **බලන්න**: උපග්‍රන්ථය:5 **මූලාශ්‍ර:** අංගු.නි: (2): 4 නිපාත: 4.4.5.9 තණ්හාජාලිනි සූත්‍රය, පි.424.

▼**තණ්හා පහ**: සාමාන්‍ය ලෝකයාතුල තණ්හා 5 ක් ඇත: **1) කාම තණ්හාව: (**sensual craving ) කාමලෝකයට ඇති ආසාව හා කාම වස්තු පිලිබඳ ඇලීම. **2) භව තණ්හාව:** සසර පවත්වාගෙන යෑමට ඇති ආසාව - ත්‍රිවිධ භවයන්හි යලි යලි ඉපදීමට ඇති කැමැත්ත (craving for becoming). **3) විභව තණ්හාව:** (craving for extinction) නැවත උපතක් ඇතිවීමට ඇති අකැමැත්ත, මෙය උච්ඡෙද වාදයය (සසර නැතිකරගැනීම නොවේ). මේ භවයෙන් පසු නැවත කයක් ඇතිනොවේ යන මතය. **බලන්න**: දිට්ඨි. **4) රූප තණ්හාව**: ජාන සමාපත්ති ලබා රූප බ්‍රහ්ම ලෝකවල පහළවීමට ඇති කැමැත්ත. **5) අරූප තණ්හාව**: අරූප සමාපත්ති ලබා අරූප බ්‍රහ්මලෝකවල පහළවීමට ඇති කැමැත්ත. **මූලාශ්‍ර:** දිඝ.නි: (3): 10 සංගිති සූත්‍රය- ඡෙදය 10, පි. 378 , EDN: 33 Sangīti Sutta: The Chanting Together-section 10 , p. 365.

▼ **තණ්හාව සියල්ල පාලනය කරයි**: ලෝකයේ සියල්ල පාලනය කරන්නේ තණ්හාවය; ලෝකය ඇදගෙන යන්නේ තණ්හාවය, සියල්ල තණ්හාවේ වසඟයට පත්වීසිටි යයි බුදුන් වහන්සේ වදාළහ: **“තණ්හාය නීයති ලොකො තණ්හාය පරිකස්සති, තණ්හාය එක ධම්මස්ස සබ්බෙව වසමන්වගූති”**. (The world is led around by craving; By craving it’s dragged here and there. Craving is the one thing that has all under its control). **මූලාශ්‍ර:** සංයු.නි: (1): සගාථවග්ග: දේවතා සංයුත්ත: 1.7.3 තණ්හා සූත්‍රය, පි. 98, ESN: 1. Devatasamyutta: 63.3 Craving, p. 144.

▼ **දුක ඇතිකරන්නේ තණ්හාවය**: කාම, භව හා විභව තණ්හාව- දුක ඇතිවීමය, **‘දුක්ඛසමුදය අරිය සත්‍යය’** යි බුදුන් වහන්සේ වදාළහ. **මූලාශ්‍ර:** සංයු.නි:(5-2): මහාවග්ග:සච්ච සංයුත්ත, 12.2.1 ධම්මචක්කප්පවත්තන සූත්‍රය, පි. 294 හා 12.2.3 ඛන්ධසූත්‍රය, පි.299, ESN: 56 : Saccasamyutta: 11.1 Setting in motion the wheel of the dhamma, p.2276 & 13 .3 Aggregates, p. 2280.

▼ **තණ්හාව ප්‍රහාණය කිරීම**: කාම, භව හා විභව තණ්හා නැතිකිරීමේ මග ආරිය අටමග සම්පූර්ණ කරගැනීමය. **මූලාශ්‍ර:** සංයු.නි:(4 ):සළායතන වග්ග: ජම්බුඛාදක සංයුත්ත: 4.1.10 තණ්හා සූත්‍රය, පි.508, ESN: IV Salayathnavagga: 38 Jambukhādakasaṃyutta: 10 Craving, p. 1405.

▼ **තණ්හාවෙන් එතර වීම**: ආර්ය මාර්ගය නැමති පාලම හදාගත් පුද්ගලයා, ගැඹුරුවූ, පලල්වූ තණ්හා නමැති නදිය තරණය කොට එතෙර

නමැති නිවනට සැපත්වේ. ඒ තණ්හා නදිය තරණය කල ප්‍රඥාවන්තයන්ට (තමන් ලැබූ අනුභාවය මගින්) ඕනෑම නදියක් සැනින් තරණය කල හැකිවේ. **සටහන**: ගංගානම් ගඟ පිරිතිබෙන අවස්ථාවේ, ඉර්දී බලයෙන් සංඝයා හා එතෙරට පැමිණි බුදුන් වහන්සේ එම ප්‍රකාශය වදාළහ. **මූලාශ්‍ර**: දීඝ.නි: (2)මහාපරිනිර්වානසූත්‍රය,පි149, EDN:16 Mahaparinibbana Sutta, p. 175.

▼ **සම්මාදිට්ඨිය නිසා තණ්හාව අවබෝධවේ**: තණ්හාව පිළිබඳ මනා අවබෝධය ලබාගැනීම පිණිස සම්මා දිට්ඨිය ඇතිවිය යුතුය.**මූලාශ්‍ර**: ම.නි: (1 ): 1.1.9 සම්මා දිට්ඨි සූත්‍රය, පි. 130, EMN: 9: Sammādiṭṭhi Sutta-Right View, p. 121.

▼ **තණ්හාව පහාතබ්බා ධර්මයකි**:ආධ්‍යාත්මික වර්ධනය පිණිස පහකර ගත යුතු **(පහාතබ්බා ධර්ම)** ධර්මතා ලෙස කාම, භව හා විභව තණ්හාව පෙන්වා ඇත. **බලන්න**: පහාතබ්බා ධර්ම. **මූලාශ්‍ර:** දීඝ.නි : (3): 11 දසුත්තර සූත්‍රය, පි. 483, EDN: 34: Dasuttara Sutta: Expanding Decades, p. 384.

▼ **තණ්හා සතර -** The four cravings:සතර ආකාරයට, සංඝයා තුළ තණ්හාව ඇතිවේ යයි බුදුන් වහන්සේ වදාළහ. එනම්: 1) චීවර 2) පිණ්ඩපාත 3) සේනාසන 4) මේ ජාතිය-උපත පිළිබඳව හෝ අනාගත ජාතිය ගැන ඇතිවෙන ආශාවන්. **මූලාශ්‍ර:** අංගු.නි: ( 2): 4 නිපාත: 4.1.1.9 තණ්හා සූත්‍රය, පි. 42, EAN:4: 9.9 Craving, p. 150, ඛු.නි: ඉතිවුත්තක: 4.1.6 තණ්හාඋත්පාද සූත්‍රය, පි. 494, The Itivuttaka: translated by Peter Masefield: PTS: 105 The Craving Arising sutta, p. 103.

▼ **තණ්හාව මිනිසාගේ සහායිකාවය**: මේ දීර්ඝ සසරේ, එක් භවයක සිට තවත් භවයකට ආදී වශයෙන්, ගමන් කරන මිනිසාගේ සහායිකාව - දෙවෙනියා ලෙසින් ගමන් කරන්නේ තණ්හාව යයි බුදුන් වහන්සේ පෙන්වා ඇත. තණ්හාවට බැඳුන ඔහුට සසර මැඩ ගත නොහැකිවේ. තණ්හාවේ ආදීනවය, එනම්, දුකේ මුල, තණ්හාවය යයි අවබෝධ කර, එය පහකර, උපාදාන නොකර, සිහිනුවණ ඇතිව භික්ෂුව වාසය කළයුතුවේ: **"තණ්හාදුතියො පුරිසො දීඝමද්ධාන සංසාරං- ඉත්ථභාවඤ්ඤථාභාවං සංසාර නාතිවත්ත ති. එතමාදීනවං ඤත්වා තණ්හං දුක්ඛස්ස සම්භවං-වීතතණ්හො අනාදානො සතො භික්ඛු පරිබ්බජෙ'ති"** **මූලාශ්‍ර:** අංගු.නි: ( 2): 4 නිපාත: 4.1.1.9 තණ්හා සූත්‍රය, පි. 42, EAN:4: 9.9 Craving, p. 150.

▼ **වේදනාව නිසා තණ්හා දෙකක් ඇතිවේ**: වේදනාව හේතු කොටගෙන ඇතිවන තණ්හා දෙකකි: 1) **වට්ටමූලක තණ්හාව:** මූලික තණ්හාව ලෙසින්ද පෙන්වා ඇත. මේ නිසා සසර ගමන දික්කරන යළිඋපත සකස්වේ. (as primary craving, the basis of rebirth). 2) **සමුදාචාර තණ්හාව:** යම් දෙයක් පිළිබඳව ඇතිවෙන තණ්හාව නිසා ඒ දේ ගැන සෙවීමට යාම, ඒ දේ තමාගේ කරගැනීමට සිතීම, ඒ දේ රැකගැනීමට යාම. එලෙසින් තණ්හාව ක්‍රියාත්මක වීම නිසා අකුසල් ඇතිවේ. **බලන්න:** EDN: Note: 335, p. 425, **මූලාශ්‍ර:** දීඝ.නි: ( 2): 2 මහානිදාන සූත්‍රය, ඡෙදය:18. පි. 95, EDN:15: Mahānidāna Sutta: The Great Discourse on Origination, p. 166.

▼ **භව තණ්හාවේ මුල -** First point of craving for existence භවතණ්හාව පටන්ගත් මුල්තැනක් දැකිය නොහැකිය යි බුදුන් වහන්සේ

වදාළහ. එමනිසා, භවතණ්හාව මෙවකට පෙර නොවිය, ඉන්පසු භවතණ්හාව පහළවී යයි කිවනොහැකිය. එසේවුවද, භවතණ්හාව ඇතිවීමට හේතු ඇත. එමගින් භවතණ්හාව පෝෂණය වේ. (A first point of craving for existence, is not seen such that before this there was no craving for existence and afterward it came into being.' Still, craving for existence is seen to have a specific condition...that craving for existence has a nutriment; it is not without nutriment).**සටහන:** මේ සූත්‍රයේදී භව භවතණ්හාව,අවිද්‍යාව නිසා පෝෂණයවන ආකරය විස්තරාත්මකව පෙන්වා ඇත. **මූලාශ්‍ර:** අංගු.නි.(6):10 නිපාත, යමක වග්ග: 10.2.2.2. තණ්හා සූත්‍රය, පි.238, EAN: II Pairs: 62.2 Craving, p.518.

▼ **තණ්හා මූලක ධර්මතා නමය**: 1) තණ්හාව නිසා සෙවීම (පර්යේෂණ) ඇතිවේ (කාම වස්තු සෙවීම) 2) සෙවීම නිසා ලැබීම ඇතිවේ 3) ලැබීම නිසා විනිශ්චය (කුමන දේ තෝරා ගන්නේද යන ) ඇතිවේ. 4) විනිශ්චය නිසා කැමත්ත හා ආශාව ඇතිවේ (ඡන්දරාගය) 5) කැමත්ත හා ආශාව නිසා බැඳීම (මමය මාගේය යන) ඇතිවේ 6) බැඳීම නිසා තණ්හා, දිට්ඨි ලෙසින් පරිග්‍රහණය කිරීම වේ 7) පරිග්‍රහණය නිසා මසුරුකම ඇතිවේ 8) මසුරුකම නිසා ආරක්ෂාකිරීම (වස්තුව රැකීමට) ඇතිවේ 9) ආරක්ෂාකිරීම නිසා දඬු මුගුරු, අවි ආදිය ගැනීම කළහ කරගැනීම ඇතිවේ. **සටහන්:** * මේ පිලිබඳ අටුවාව පෙන්වා ඇති විස්තර පිණිස **බලන්න**: EAN: Note: 1889, p. 672. ** දීඝ.නි: මහානිදාන සූත්‍රය, ම.නි: මධුපිණ්ඩික සූත්‍රය: මේ කරුණු විස්තරාත්මකව පෙන්වා ඇත. **මූලාශ්‍ර:** අංගු.නි: (5) : 9 නිපාත: 9.1.3.3.තණ්හාමූලක සූත්‍රය, පි. 470, EAN: 9: 23.3 Craving, p. 470.

▼**තණ්හක්ඛය**: තණ්හක්ඛය- තණ්හාව ක්‍ෂය කිරීම යනු නිවනය, තණ්හාව සහමුලින්ම නැතිකිරීමය. සතර සති පට්ඨානය මැනවින් වඩා ගැනීමෙන් තණ්හාව විනාශ කරගැනීමට හැකිවේ. **මූලාශ්‍ර**: සංයු.නි: ( 5-2 ): මහාවග්ග: අනුරුද්ධසංයුත්ත: 8.1.7 තණ්හක්ඛය සූත්‍රය, පි. 96, ESN:52: Anuruddhasamyutta: 7.7 Destruction of Craving, p. 2117, සංයු.නි: (4): අසංඛතසංයුත්ත: 9.2 -042 සූත්‍ර, පි.686.

▼ **තෘෂ්ණාසංක්‍ෂය විමුක්තිය**: තෘෂ්ණාසංක්‍ෂය විමුක්තිය (තණ්හාවෙන් ගැලවීම) ලෙසින් පෙන්වා ඇත්තේ රහත් ඵල සමවතය-අරහත්වය ලැබීමය. **මූලාශ්‍ර**: ඛු.නි: උදාන පාලිය: 7.6 තණ්හක්ඛය සූත්‍රය, පි. 310.

▼ **තණ්හා සංයෝජනය**: තණ්හා සංයෝජනය තරම් සත්ත්වයන් සසරට බැඳගන්නා වෙනත් එකම සංයෝජනයක් බුදුනුවණින් නො දකින බව බුදුන් වහන්සේ වදාළහ. තණ්හාවෙන් බැඳුන ඔවුන් දිගුකලක් සසර සැරිසරයි. එමනිසා, තණ්හාව පහකර දුකින් ගැලවීමට කටයුතු කළයුතුවේ. **මූලාශ්‍ර**: ඛු.නි: ඉතිවුත්තක: 1.2.5 තණ්හා සංයෝජන සූත්‍රය, පි. 360, The Itivuttaka: translated by Peter Masefield: PTS: 15 The Fetter that is Craving sutta, p. 7.

▼ **තණ්හා ගංගාව**: තණ්හාව ගලයන ගංගාවක් බඳුය, එවැනි ගඟක් පාලනය කල හැකිවන්නේ -සංවරය ඇතිව , සිහියෙන් (සතිය) කටයුතු කිරීමෙනි, මාර්ග ප්‍රඥාව ඇතිකරගැනීමෙන්, තණ්හාව නමැති නදිය වසාදැමිය හැකිය.**බලන්න:** ගංගා උපමාව:උපග්‍රන්ථය:5 **මූලාශ්‍රය**: ඛු.නි.සුත්තනිපාත: පාරායනවග්ග:වස්තුගාථා: පි,326, 5-1 අජිතමානවක, පි.336

▼ **රහතුන් තණ්හාව** තරණය කළ උතුමන්ය.**මූලාශ්‍රය**: ඛු.නි.සුත්තනිපාත: පාරායනවග්ග:වස්තුගාථා: පි,326, 5-8 හෙමක මානවක,පි.354.
▼**සියලු කාලයන්** පිලිබඳ ඇති තණ්හාව දුරුකිරීම, මාර බන්ධනයෙන් ගැලවීමය. **මූලාශ්‍රය**: ඛු.නි.සුත්තනිපාත: පාරායනවග්ග:වස්තුගාථා: පි,326, 5-12 භද්‍රාවුධමානවක, පි.358.
▲**තණ්හාකාය සය**- The six classes of craving: තණ්හාකාය සය ලෙසින් පෙන්වා ඇත්තේ, වේදනා ඇතිවීම නිසා, ඇතිවන සය තණ්හාවන්ය. **බලන්න:** ඡ ඡක්ක ධම්මො.
▲ **තණ්හා නිස්සය-**Thanha nissaya: මෙය විවිධ ශිල සමාදන් වීම් වලින් එකකි. භව සම්පත් පැතීම මින් අදහස් කෙරේ. **බලන්න**: ශිලය

**තප**

▲ **තපනීය ධර්ම-** the tormenting Dhamma: තපනීය ධර්ම මගින් තමාට හා අන් අයට පීඩා හිරිහැර සිදුවේ, පසුතැවිල්ල ඇති වේ, අකුසල ධර්මයකි. කෙළෙස් ඇතිවේ, එය මිථ්‍යා මගය.**බලන්න**: අතපනීය ධර්ම.**මූලාශ්‍ර**: අංගු.නි: ( 6): 10 නිපාත: සාධු වග්ග, 10.3.4.8 තපනීය සූත්‍රය, පි.472, EAN: 10: 135.2 Good: p.548.

▼ **දසඅකුසල** තපනිය ධර්ම යයි මෙහි පෙන්වා ඇත. **මූලාශ්‍රය**: අංගු.නි: ( 6): 10.4.3.8 තපනීය සූත්‍රය,පි.532.
▼**තපණිය ධර්ම ඇතිවීම**: 1) කෙනෙක් කායික දූෂ්චරිතයේ යෙදේ එසේම, කායික සුචරිතය පැහැර හරි. 2) කෙනෙක් වාචික දූෂ්චරිතයේ යෙදේ එසේම, වාචික සුචරිතය පැහැර හරි.3) කෙනෙක් මනසින් දූෂ්චරිතයේ යෙදේ එසේම, මනසින් සුචරිතය කිරීම පැහැර හරි. තමන් එලෙස ත්‍රිවිධ දූෂ්චරිතයේ යෙදුන බව, ත්‍රිවිධ සුචරිතය පැහැර හැරිය බව සිතන ඔහුට තැවිල්ල ඇතිවේ. **මූලාශ්‍ර:** අංගු.නි: (1): 2 නිපාත: 2.1.1.3 තපණිය සූත්‍රය, පි. 136 , EAN: 2: 3.3 Causing Torment, p. 56.
▼**තපනිය ධර්ම** නිසා, ලෝකයා මෙලොව හා පරලොව දුක් තැවිලි ඇතිවේ, මරණින් මතු දුගතියක උපත ලබති. **මූලාශ්‍රය:** ඛු.නි: ඉතිවුත්තක:2.1.3 තපනිය සූත්‍රය, පි.378.
▲ **තපස්කර්ම**- Thapaskarma: තපස්කර්ම (තපොකර්ම) යනු, තාපසයන්, විමුක්තිය ලබා ගැනීම පිණිස පුරුදු පුහුණු කරන දුෂ්කර ව්‍රතයන්ය,තපස් ව්‍රත ලෙසින්ද පෙන්වා ඇත. අත්තකිලමතානු යෝගය ලෙසින්ද දක්වා ඇත. බුදුන් වහන්සේ වැඩ සිටි සමයේ විවිධ තාපස නිකායන් පැවතිණි. සය-සත් වසරක් දුෂ්කර ක්‍රියා අනුගමනය කර, එහි නිෂ්ඵලබව අවබෝධකර ඒවා හැර, මධ්‍යම ප්‍රතිපදාවට එළඹ, විමුක්තිය - බුද්ධත්වය ලබා නෙරංජනා නදීතිරයේ, අජපාල නුගරුක මුල විවේක සුවයෙන් වැඩ සිටි බුදුන් වහන්සේ මෙසේ වදාළහ: " ඒ දුෂ්කර ක්‍රියාවලින්, ... අවැඩදායක ක්‍රියාවලින් ඒකාන්තයෙන්ම මිදුනෙමි, මැනවින්ම මිදුනෙමි, සිත ස්ථිරය, එළඹී සිහි ඇත්තේමි, මැනවින් සත්‍ය අවබෝධ කෙළෙමි"."**මුත්තො වතම්හි තාය දුක්කරකාරිකාය. සාධු මුත්තො වතම්හි තාය අනත්‍ථසංහිතාය දුක්කරකාරිකාය. සාධු ඨිතො සතො බොධිං සමජ්ඣගන්ති**" (I am indeed freed from that grueling asceticism! It is good indeed that I am freed from that useless grueling asceticism! It is good that, steady and mindful, I have attained enlightenment!). ඒ අවස්ථාවේ මාරයා පැමිණ පැවසුවේ තපස් කර්ම නිසා මිනිසුන් පිරිසුදුවන බවත්, එය හැර දැමූ ඔබ පිරිසුදු මග වරදවා

ගත් බවය. බුදුන් වහන්සේ මෙසේ වදාළහ: "අමරබව (නිවන) ලබාගැනීමට ඇති තපස අනර්ථය, හරියට වැලිකතරේ, නැවක්, රිටි හා පොලුවලින් ගෙනයනවා වැනිය. ඒ නිසා ඒ මග අත් හළෙමි. ශිලයද සමාධියද ප්‍රඥාවද යන ආරිය මාර්ගය, සත්‍ය අවබෝධය පිණිස වඩා, පරම ශුද්ධියට පැමිණියෙමි. මාරය! ඔබව පැරදුවෙමි" **බලන්න**: අත්ත කිලමතානු යෝගය. උපමාව: නැව: උපග්‍රන්ථය:5. **මූලාශ්‍ර:** සංයු.නි: (1 ): සගාථවග්ග:මාරසංයුත්ත: 4.1.1. තපොකර්ම සූත්‍රය, පි. 214, ESN:4: Marasamyutta: 1.1 Austere Practice, p. 264.

▲ **තපස්සු හා භල්ලුක උපාසකයන්** -Thapassu & Bhallukha upasaka **බලන්න**: උපග්‍රන්ථය :3.

▲**තපුස්ස ගහපති**-Householder Thapussa:**බලන්න**: උපග්‍රන්ථය :3

▲ **තෘප්තිමත්බව**- satisfied: තෘප්තිමත්බව (තර්පණය) යනු ලද දෙයින් සෑහීමට පත්වීමය (සන්තුෂ්ටිය). දායකයා විසින් තෘප්තිමත් කළනොහැකි පුද්ගලයන් 2ක් සිටිති: දෙනදේ (ලෝභයෙන්) තැන්පත් කිරීමට පුරුදු කෙනා හා දෙනදේ අනුවණ ලෙසින් වියදම් කරන (නාස්තිකරන) කෙනා. එහෙත්, එම අගුණ නැති අයව, දායකයාට පහසුවෙන්ම තෘප්තිමත් කළ හැකිවේ. **මූලාශ්‍රය:** අංගු.නි: (1) 2 නිපාතය, ආසාවග්ග: 2.3.11.4 සූත්‍ර 2කි,පි. 206.

▲ **ත්‍රිපිටකය-**Thripitakaya: ත්‍රිපිටකය යනු බුදුන් වහන්සේ වදාළ ධම්ම විනය ඇතුලත් පොත් පෙළටය: විනයපිටකය, සූත්‍රපිටකය හා අභිධර්ම
▼**වෙනත් මූලාශ්‍ර**: **1. බුද්ධජයන්ති ත්‍රිපිටකය:** https://www.thripitakaya.org/tipitakaya/Index/633?s=21208 (thripitakaya.org, tipitaka.lk)- info@thripitakaya.org **2. "Reference Table of Pali Literature"**: Compiled by Bhikkhu Nyanatusita, 2008 (මෙහි ත්‍රිපිටකයේ ඇතුලත් සියලු පොත් පිලිබඳ විස්තරාත්මකව දක්වා ඇත) **3. "A Guide to the Udāna":** by Ernesto Fernandez: (මෙහි බුද්ධකනිකාය: උදාන පාලියේ ඇතුළත් සූත්‍ර නාමාවලිය දක්වා ඇත) **4. ත්‍රිපිටක සූචිය: පොල්වත්තේ බුද්ධදත්ත මහානායක හිමි, 1953 (**තුන්පිටකයේ ඇතුලත් සූත්‍ර, ගාථා, ශික්ෂා පද ආදියේ නාමවලිය).

▲ **ත්‍රිපරිවෘත්ත**-Thriparivatta: ත්‍රිපරිවෘත්ත ලෙසින් පෙන්වා ඇත්තේ චතුසත්‍ය, තුන් ආකාරයෙන් අවබෝධ කිරීමය. **බලන්න**: චතුරාර්යසත්‍ය.

**තඹ**

▲**තුඹස ප්‍රහේලිකාව-** Puzzle of the anthill: දහම් මග ගමන්කරන පුද්ගලයෙකුට හමුවන බාධක හා ඒවා මගහැර විමුක්තිය ලබාගැනීම පිලිබඳ විස්තරය මෙහි දක්වා ඇත.මේ දේශනාව් වදාළේ කුමාරකාශ්‍යප තෙරුන්ටය.**මූලාශ්‍ර:** ම.නි: (1): 1.3.3 වම්මික සූත්‍රය, පි.374, EMN:23 Vammika Sutta, p.228.

**තම**

▲**තමෝතමපරායන-**Thamothamaparayana: තමෝතමපරායන ලෙසින් පෙන්වා ඇත්තේ 'අඳුරෙන් අඳුරට' යැමය. එබඳු පුද්ගලයාගේ ස්වභාවය: පහත් කුලයක ඉපදීම, දිළිඳුබව, තුන්දොරින් දුශ්චරිතය කිරීම. මරණින් මතු දුගතියේ උපත ලබයි. **මූලාශ්‍රය**: අංගු.නි: (2) 4 නිපාත: 4.2.4.5 තමෝතමපරායන සූත්‍රය, පි.184.

▲ **තමෝජෝති පරායන**- Thamojotiparayana: තමෝජෝතිපරායන ලෙසින් පෙන්වා ඇත්තේ 'අඳුරෙන් එලියට' යෑමය. එබඳු පුද්ගලයාගේ ස්වභාවය: පහත් කුලයක ඉපදීම, දිළිඳුබව, තුන්දොරින් සුචරිතය කිරීම. මරණින් මතු සුගතියේ උපත ලබයි. **මූලාශ්‍රය**: අං.ගු.නි: (2) 4 නිපාත: 4.2.4.5 තමෝතමපරායන සූත්‍රය, පි.184.
▲**තිම්බරුක පරිබ්‍රාජක**Thimbaruka paribrajaka. **බලන්න**: උපග්‍රන්ථය:3

**තය**

▲**තායනගාථා-**Thayanagatha: තායන ගාථා ලෙසින් පෙන්වා ඇත්තේ, තායන නම් දේවපුත්‍ර, බුදුන් වහන්සේ බැහැදැක පැවසූ ගාථාවන්ය. එම ගාථා අර්ථසහිත නිසා, මග බඹසරට මුල්වන නිසා එම ගාථා ඉගෙන ගැනීමට, සජ්ජායනා කිරීමට බුදුන් වහන්සේ සංඝයාට උපදෙස් වදාළහ: "විරිය කර තණ්හාව නැමති ජල ප්‍රවාහය නවත්වා ගන්න, කාමය දුරු කර ගන්න, කාමය ප්‍රහීණ නොකර ධ්‍යාන ලබා ගැනීමට නොහැකිය. වීරිය දැඩිව කරන්න, පැවිද්ද ලිහික්ව ගැනීමෙන් කෙලෙස් වැගිරේ. දුසිරිතය කළවිට පසු තැවිලි ඇතිවේ, සුචරිතය මගින් පසුතැවිලි ඇති නොවේ, එය උතුම්ය. කුසතණ, වරදවා අල්ලා ගත්විට තමග්ගේ අත කැපේ, එලෙස, වරදවා ගන්නා ලද මහණකම් නිරයට ගෙනයයි. ලිහිල් කටයුතු, කිලිටි ව්‍රත, සැකකටයුතු හැසිරීම බඹසර නොවේ, ඉන් මහත් එල නොලැබේ". **මූලාශ්‍රය**:සං.යු.නි: (1) සගාථවග්ග: දේවපුත්‍ර සංයුත්ත: 2.1.8 තායන සූත්‍රය, පි.118.

**තර**

▲**තරහ**- Anger: තරහ: කිපීම, ක්‍රෝධය ලෙසින්ද දක්වා ඇත. මෙය අකුසලයකි. **බලන්න**: අකුසල. **සටහන්:** * විවිධ ලෙසින් තරග ගන්නා පුද්ගලයන් පිලිබඳ විස්තර පිණිස **බලන්න**:* ආසිවිෂෝපම පුද්ගලයෝ. ** මිනිස්ලොවදී කෙනෙක්, නිතරම තරහ සිත් ඇතිව, අසතුටින් වාසය කරයි නම්, මරණින් මතු උපදින්නේ දුගතියකය. ඔහු මිනිස්ලොව උපත ලැබුවහොත්, අරුපිවේ. **බලන්න**: මනි: (3): 3.4.5 චූළකම්ම විභංග සූත්‍රය, පි. 448.

▲ **තරුණ රුක-** Young tree: සංයෝජන ධර්මතා පිලිබඳ කෙනෙක් නිතර නිතර ආස්වාදය කිරීම නිසා ඔහුගේ තණ්හාව වැඩෙන පිළිවෙල, තරුණ රුකක් නිතර නිතර පස් පොහොර ආදිය දමනවිට හොඳින් වැඩි එන ලෙසින් වැඩේ යයි බුදුන් වහන්සේ පෙන්වා ඇත. එසේ තණ්හාව ඇතිවීම දුක ඇතිවීමය. එහෙත්, සංයෝජනයන්හි ආදීනව දකින්නේ නම්, එම පුද්ගලයාට තණ්හාව නිරුද්ධ කර, දුකින් මිදීමට හැකිවේ. හැදීගෙන එන තරුණ රුකක් මුලින්ම ගලවා, ගින්නෙන් පුළුස්සා අළු ගඟේ පාකර හැරීමෙන් ඒ ගසේ වැඩීමක් සිදුනොවේ. එලෙස, සංයෝජන වල ආදීනව නිතර බලමින්ජ්වා පහ කර දුකින් මිදියයුතුය යි බුදුන් වහන්සේ වදාළහ.**උපමාව**:තරුණ රුක:උපග්‍රන්ථය:5. **මූලාශ්‍ර:** සං.යු.නි: (2): නිදානවග්ග: අභිසමයසංයුත්ත:1.6.7 තරුණරුක සූත්‍රය,පි. 162, ESN:12: Nidanasamyutta: 57.7. The sapling, p.689.
▲ **තෙර**: පාලි: **ථෙර**-elder: තෙර -ථෙර (ස්ථවිර) ලෙසින් හඳුන්වන්නේ, වසර 10 ක් හෝ ඊට වැඩි උපසම්පදාව ඇති වැඩිහිටි භික්ෂුවය. භික්ෂුවක් **'තෙර'**- වැඩිහිටි භික්ෂුවක් ලෙසින් හැඳින්වීම පිණිස අවශ්‍ය ගුණ අතරින් ශීලසම්පන්න බව එක් ගුණයකි. **බලන්න**: ශීලසම්පන්න. **සටහන:** එවැනි

භික්ෂුණිය, තෙරණිය- ත්ේරිකා- ථෙරිකා (ස්ථවිරි) ලෙසින් දක්වා ඇත.
▼ **ගුණ 4 කින් සමන්විත මහණ**, තෙර බවට- වැඩිහිටි බවට පත්වේ යයි බුදුන් වහන්සේ වදාළහ: 1) ශිලසම්පන්නබව 2) බහුශ්‍රැතබව 3) සිව්ජාන සමාපත්ති පහසුවෙන්ම ලබාගැනීමේ හැකියාව 4) ආසව ක්‍ෂයකර, චේතෝවිමුක්තිය හා ප්‍රඥාවිමුක්තිය ලබා වාසය කිරීම . **මූලාශ්‍ර:** අංගු.නි: (2): 4 නිපාත: 4.1.3.2.දෙවෙනි උරුවෙල සූත්‍රය, පි.66, EAN: 4: 22.2 uruwela-2, p. 155.

▼**අගුණ 5ක් ඇති** තෙරුන් ලෝකයාට අනර්ථය ඇති කරති. **ගුණ 5ක්** සමන්නාගත තෙරුන් ලෝකයාට අර්ථය ඇති කරයි. විස්තර පිණිස **බලන්න**: අංගු.නි: (3) 5 නිපාත:ථෙර වග්ග: 5.2.4.8 ථෙර සූත්‍රය.
▼**ගුණ 10ක්** ඇති තෙර පහසුවෙන්ම ඕනෑම දිසාවක වාසය කරයි. විස්තර පිණිස **බලන්න**: අංගු.නි: (6) 10 නිපාත:උපාලි වග්ග: 10.2.5.8 ථෙර සූත්‍රය.
▼**බුදුන් වහන්සේ,** තෙරුන්-ස්ථවිර වරුන් බ්‍රාහ්මණ ලෙසින්ද හඳුන්වා ඇත. විස්තර පිණිස **බලන්න:** ඛු.නි: උදාන: 1.5 ස්ථවිර සූත්‍රය.
▲**තෙරවාදය-** Theravada: බුදුන් වහන්සේගේ පැරණිම ඉගැන්වීම් තෙරවාදය ලෙසින් පෙන්වා ඇත. එම ඉගැන්වීම් අනුගමනය කරණ පිරිස තෙරවාදීන් ලෙසින් හඳුන්වයි. **ශබ්දකෝෂ: B.D:** p.179: "**Theravada**: Doctrine of the Elders, is a name of the oldest from of the Buddha's teaching…".

▲ **තෙරුවන් සරණ**-Theruwan sarana.තෙරුවන් සරණ :බුද්ධ ධම්ම හා සංඝ රත්නය සරණ යාම සෑම බෞද්ධයෙක් විසින්ම කරණ මූලික නමස්කාරයකි. **බලන්න**: ත්‍රිවිධ රත්නය. **සටහන**: ධජග්ග හා රත්න සූත්‍රයන්හි තෙරුවන් සරණ යාමේ යහපත විස්තරාත්මකව පෙන්වා ඇත.
▲ **තීරණපරිඥා** -full understanding by scrutinization: ධර්ම කරුණු පිළිබඳ පූර්ණ අවබෝධ ලැබීම පිණිස, එම කරුණු ගැන විමසා බලා ලබාගන්නා අවබෝධය මින් අදහස් කෙරේ. **බලන්න**: අභිජාන.
▲ **තිරිසන් කතා**-Pointless talks: ධර්මයට අනුව තිරිසන් කතා ලෙසින් පෙන්වා ඇත්තේ මාර්ගයට අවහිර වන නුසුදුසු දේ ගැන කතාකිරීමය. ඒ කතා මග බඹසර පිණිස උපකාරී නොවේ. **බලන්න**: කතාව. **සටහන**: සංයුනි:සච්චසංයුත්ත:සමාධිවග්ග: 12.1.10 තිරිසන්කථා සූත්‍රයේ, තිරිසන් කතා කුමක්ද යයි විස්තරකර ඇත.
▲ **තිරිසන් ලෝකය**: පාළි: **තිරච්ඡාන යොනියො** - animal realm ධර්මයට අනුව තිරිසන් ලෝකය -තිරිසන් යෝනිය: අකුසල කර්ම විපාක එලදීම පිණිස යළි උපත ලබන දුගතියකි, සතර අපායෙන් එක් අපායකි. **බලන්න**: සුගතිය හා දුගතිය, සතර අපාය. **සටහන**:සංයු.නි:සච්චසංයුත්ත: පංචගතිපෙයියාල වග්ගය: තිරච්ඡානචුති සූත්‍ර 6: බුදුන් වහන්සේ පෙන්වා ඇත්තේ තිරිසන් යෝනියේ සිට මිනිස් ලෝකයට- මනුෂ්‍ය උත්පත්තියට- යළි උපත ලබා ගැනීම දුෂ්කර බවය.
▼**තිරිසන්ලෝකයේ සිටින සතුන්-ප්‍රාණීන් ගේ ස්වභාවය:** 1) **තණකොළ ආහාරයෙන්** ජීවත්වන සතුන්:අශ්ව, ගව, බූරුවෝ, එළුවන්, මුවන් ආදීන්. 2) **අසුචි අහාර ලෙසින්** ගන්නා සතුන්: කුකුළෝ, ඌරෝ, බල්ලෝ, සිවලෝ ආදීන්. 3**) අඳුරේ: උපත ලබා, ජීවත්ව, මැරි** යන ප්‍රාණීන්: කාව- ඉපියා, පණුවෝ, ගැඩවිල්ලෝ ආදීන්. 4) **බිජුවකින්, ජලයේ** උපත ලබා, ජීවත්ව, ජල්යේම මියයන සතුන්: මාළුවෝ, කැස්බෑවෝ, කිඹුලෝ ආදීන්.

5) **අශුචියේ, කුණු** (කුණුවූ මාළුන්, මළ සිරුරු) ආදියේ උපතලබා, එහිම ජීවත්වී මියයන විවිධ ප්‍රාණීන්. මේ සියලු සතුන්, මිනිස් ලෝකයේදී රස තණ්හාව බැඳුන, අකුසල කළ අනුවණ මිනිසුන්ය. තිරිසන් සතෙකුට, මරණින් මතු මිනිස් ලොව උපත ලැබීම පහසු නොවේ, එයට හේතුව ධර්මයේ හැසිරීමට අවස්ථාව, කුසල කර්ම කිරීමට අවස්ථාව විරල නිසාය. තිරිසන් ලෝකයේ සතුන් එකිනෙකා මරා කයි, දුබල සතුන්, ප්‍රභල සතුන් විසින් මරා කයි. **තිරිසන් සතෙකුට**: මිනිස්බව ලබාගැනීමේ අපහසුව පිළිබඳව මේ උපමාව බුදුන් වහන්සේ පෙන්වා ඇත: එක් ඇසක් ඇති කැස්බෑවා, අවුරුදු 100 කට වරක් මුහුද පතුලේ සිට ගොඩට එයි, එම අවස්ථාවේදී එක් සිදුරක් ඇතිවිය වියදණ්ඩක් මුහුදේ පාවී එයි. ඒ කැස්බෑවාට, වියදන්ඩේ ඇති එක් සිදුර, පෙනෙන ඇසින් බලා, උගේ ගෙල දමාගැනීම දුර්ලභ දෙයකි, එසේ මිනිසත්බව ලැබීම දුර්ලභය. **මූලාශ්‍ර**: ම.නි :(3) : 3.3.9 බාල පණ්ඩිත සූත්‍රය, පි. 376, EMN: 129: Fool & Wise Men, p. 929.

▼ **තිරිසන් ලෝකය**, දසඅකුසල් කරණ මිනිසුන් යළිඋපත ලබන දුගතියකි. කෙනෙක් මියගිය පසු තිරිසන්ලොව උපන්නේනම්, ඔහුගේ ඥාතීන්,මෙලොව සිට ඔහුවෙනුවෙන් කරන පුදපූජා වල එල - පින්දීම ඔහුට ලබාගැනීමට නොහැකිය. කෙනෙක් දසඅකුසල් කරමින්, ශ්‍රමණබ්‍රාහ්මණයන්ට දාන ආදීවූ පුදපූජා කරන්නේනම්, ඔහු මතුබවයේ, තිරිසන් යෝනියේ උපත ලැබුවද, පෙරකළ දානවල අනුසස් නිසා ඔහුට ආහාර පාන ආදිය ලබෙනබව බුදුන් වහන්සේ වදාළහ. **බලන්න**: පින්දීම. **සටහන:** තිරිසන් ලෝකයේ සිට සුගතියේ උපතක් ලැබීම පහසු නැතිබව මෙහි දක්වා ඇත. **බලන්න**: සංයු.නි: (5-2) මහාවග්ග: සච්චසංයුත්ත: තිරිසන් චුත සූත්‍ර, පි.380. **මූලාශ්‍ර**: අංගු.නි (6 ) 10: නිපාතය:10.4.2.11 ජාණුස්සොණි සූත්‍රය, පි. 518, EAN:10: 177.11: Jāṇussoṇī, p. 554.

▼ **අකුසලයන් ඇද දෙයක්ය**-වැරදි අතට යන දෙයක්ය. එලෙස, අකුසල කරන මිනිසුන් ගේ ගති ස්වභාවය වකුටුය, මෙබඳු අය නිසැකයෙන්ම යළිඋපත ලබන්නේ නිරයේ හෝ බඩගාගෙන යන සතුන් (සර්පයින් ආදී) අතරයයි බුදුන් වහන්සේ පෙන්වා ඇත. **සටහන්:** * සර්ප, ගෝනුසු, පත්තෑ, මුගටි, මීයෝ වැනි සතුන් බඩගාගෙන යන සතුන්ය. ** මේ පිලිබඳ විස්තර පිණිස **බලන්න**: සංසප්පනිය ධර්ම පරියාය. **මූලාශ්‍ර**: අංගු.නි: ( 6 ):10 නිපාත: කරජකාය වගග:10.5.1.6. සංසප්පනිය පරියාය සූත්‍රය, පි.560, EAN:10: The Deed Born Body, 216.6, Creeping , p.558.

▲ **තිර්ථක**-Thirthaka: බුදුන් වහන්සේ වැඩසිටි සමයේ සිටි අන්‍යආගමික නිකායන් අතුරින් එකක් තිර්ථක ලෙසින් පෙන්වා ඇත. **බලන්න**: අන්‍යආගමික නිකායන්.

▲**තිරෝකුඩ්ඩ සූත්‍රය**- Thirokuddasutta: මියගිය ඥාතින්, ප්‍රේතභවයක උපත ලබා, පිං ගැනීම පිණිස ඔවුන්ගේ දොරකඩ අසලට පැමිණීම මෙහි විස්තර කර ඇත. ඔවුන්හට පිං දීමෙන්, ඒ ප්‍රේතයන්ට යහපත් විපාක ලැබේ. එසේම, දාන පූජා කරන අයටද පින් ඇතිවේ. **බලන්න**: ඛු.නි: තිරෝකුඩ්ඩ සූත්‍රය,ප්‍රේත.

**තල**

▲ **තාලපුත්‍ර තෙර**-Talaputhra thera.**බලන්න**: උපග්‍රන්ථය:1

▲ **තාලාවත්‍ථු**- Talavatthu : තාලවත්‍ථු: තල්ගසය. බුදුන් වහන්සේ පෙන්වා ඇත්තේ තමන්වහන්සේ, කරටිය මුලින්ම සිඳිනලද තල් ගසක්

මෙන්, රූපය, ශබ්දය ආදී සියලු රස- කෙලෙස් පහ කරණ ලද බවය. එය උච්ඡින්ත භවනෙත්තති ලෙසින්ද පෙන්වා ඇත. **"රූපරසා...තෙ තථාගතස්ස පහීනා, උච්ඡින්නමූලා තාලාවත්‍ථු කතා අනභාවකතා ආයතිං".** **සටහන**: කරටිය මුලින්ම සිඳිනලද තල් ගස නැවත පැල නොවේ. කෙළෙස් සහමුලින්ම පහ කිරීම පිණිස මේ උපමාව බොහෝ සූත්‍රවල දක්වා ඇත**. බලන්න:** උපග්‍රන්ථය:5, උච්ඡින්ත භවනෙත්තති. **මූලාශ්‍ර:** අංගු.නි: ( 5 ): 8 නිපාත: 8.1.2.1 වේරඤ්ජ සූත්‍රය, පි. 62, EAN: 8: The 11 .1 Verañjã, p 416.

▲ **තිලෝක** - Three worlds: තිලෝක යනු තුන් ලෝකයය (ත්‍රයිලෝක) : කාමලෝකය, රූප ලෝකය හා අරූප ලෝකයය. **බලන්න**: තුන් භවය.

▲ **තිලෝගුරු** - Teacher of the 3 worlds: තිලෝගුරු - තුන්ලෝකයට ගුරු,බුදුන් වහන්සේ , මිනිසුන්ට (මනුෂ්‍යලෝකය) දේවියන් හා බ්‍රහ්මයන්ට (දේවලෝක, බ්‍රහ්මලෝක) ධර්මය දේශනා කරන උතුම් ශාස්තෘන් වහන්සේය. **බලන්න:** බුදුගුණ.

▲ **තුලාව**- Weights: තුලාව යනු තරාදියය.  වෙළඳ කටයුතු වලදී වැරදි තුලා (කූට තුලා) භවිතා කිරීම වංචාවකි, වැරදි ජීවන ක්‍රමයකි, අකුසලයකි. බුදුන් වහන්සේ පෙන්වා ඇත්තේ නිවැරදි තුලා භාවිතා කරන අය ලෝකයේ දුලබය, වැරදි තුලා භාවිතා කරන අය ලෝකයේ සුලභය. **බලන්න**: සම්මා ආජීවය. **මූලාශ්‍ර**: සංයු.නි: (5-2): මහාවග්ග: සච්චසංයුත්ත: 12.10.4 තුලාකූටාදී සූත්‍රය, පි. 370, ESN: 56: Saccha samyutta: 94.4 False Weights, p. 2370.

▲ **ත්‍රිලක්ෂණය**: පාලි: **තිලක්ඛන**- tri-lakshanya - Three characteristics of existence: ත්‍රිලක්ෂණය ලෙසින් පෙන්වා ඇත්තේ බුදුදහමේ මූලික සිද්ධාන්ත වන අනිච්ච, දුක්ඛ හා අනාත්ම යන ධර්මතාවයන්ටය. **බලන්න:** අනිච්ච දුක්ඛ හා අනාත්ම. **ශබ්දකෝෂ: B.D**: p. 179: "**The 3 characteristics** of existence are impermanency, suffering and not-self…' **P.T.S**: p. 1298: "**The 3 properties** (tilakkhaṇaṃ) of existing things or of the phenomenal world are anicca, dukkha, anatta, or impermanence, suffering, unreality… through contemplating them arises vipassanā & pacceka-bodhi-ñāṇa…"

**තව**

▲ **තාවතිංස දේවලෝකය -**Tāvatiṃsa devaloka: තව්තිසා දෙවලෝකය ලෙසින්ද හඳුන්වයි, කාමාවචර දේවලෝකයකි, සක්දෙවිඳු මෙහි අධිපතිය, එහි දේවසභාව 'සුධර්මා දේව සභාව' ලෙසින් හඳුන්වයි. **බලන්න**: දේවලෝක,අසුර,සක්‍රදෙවියෝ.

▼කරුණු 3 කින්, තව්තිසා දෙවියන්, උත්තර කුරු හා ජම්බුද්වීප වාසීන්ට වඩා ප්‍රබලයයි මෙහි දක්වා ඇත: 1) දිව්‍යආයුෂ 2) දිව්‍ය රූපය 3) දිව්‍ය සැපය. **බලන්න**: ජම්බුද්වීපය, උත්තරකුරු දේශය. **මූලාශ්‍රය:** අංගු.නි: (5): 9 නිපාත: 9.1.3.1 ඨාන සූත්‍රය, පි.462.

▼ **මරණාසන්න පුද්ගලයෙක්** යළි උපත සුගතියක පිහිටුවා ලීමට උපකාරිවීම පිණිස, ඔවුන්ට දෙවලොක ගැන- තව්තිසාව ගැනද විස්තර කරන බව මෙහි පෙන්වා ඇත. **මූලාශ්‍රය:** සංයු.නි: (5-2): මහාවග්ග: සෝතාපත්තිසංයුත්ත: 11.6.4 ගිලාන සූත්‍රය, පි. 270.

▲ **තෙවෙනි ශ්‍රමණ**-Theveni shramana :තෙවෙනි ශ්‍රමණ ලෙසින් පෙන්වා ඇත්තේ අනාගාමී උතුමාය, එතුමන් ඇත්තේ, ආරියඅටමග ඇති බුදුසසුනේ පමණය. **බලන්න**: ආරියඅටමග. **මූලාශ්‍ර:** දීඝ.නි: (2): 3: මහා

පරිනිබ්බාන සූත්‍රය, පි. 126, EDN: 16: Mahāparinibbāna Sutta, p.171.
▲ **ත්‍රිවිද්‍යා**: පාලි: **තෙවිජ්ජා-**Three knowledges: ත්‍රිවිද්‍යා, ත්‍රිවේද- තෙවිජ්ජා ලෙසින්ද හඳුන්වයි. ධර්මයට අනුව අරහත්වය සාක්ෂාත් කරගැනීමෙන් පහළ වන තුන් ආකාර වූ උසස් අවබෝධය ත්‍රිවිද්‍යාවය: පෙරවිසූ කඳ පිළිවෙත දන්නා නුවණ, චුතඋත්පත්ති නුවණ, ආසව ක්ෂය කිරීමේ නුවණ. **බලන්න**: ත්‍රිවිධ ඥාණ. බුදුන් වහන්සේ වැඩසිටි සමයේ, සිටි බ්‍රාහ්මණයන් ත්‍රිවේදය- මන්ත්‍ර ලෙසින් කටපාඩම් කර හැදෑරූ බැවින් ඔවුන් ත්‍රිවෙදකයන් ලෙසින් හඳුන්වා ඇත. බුදුන් වහන්සේ පෙන්වා ඇත්තේ බ්‍රාහ්මණ ත්‍රිවිද්‍යාවට වඩා තමන්වහන්සේ අවබෝධ කළ ත්‍රිවිද්‍යාව වෙනස්බවය. **"එවං ඛො අහං භික්ඛවෙ ධම්මෙන තෙවිජ්ජං බ්‍රාහ්මණං පඤ්ඤාපෙමි නාඤ්ඤං ලපිතලාපනමත්තෙනා'ති"**. ත්‍රිවිධ නුවණ ලැබූවන් 'තෙවිජ්ජා බ්‍රාහ්මණ' ලෙසින් දක්වමි. පෙර සිටි ඍෂින් කියන ලද දේ කී පමණින්ම 'තෙවිජ්ජා බ්‍රාහ්මණ' ලෙසින් නො පනවමි. (It is due to these three knowledges that one becomes three-veda Brahmin, it is of this three-Veda one that I speak, not of that other of muttered mumblings). **සටහන්:** * 'තෙවිජ්ජා බ්‍රාහ්මණ': රහතන් වහන්සේය. ** විස්තර පිණිස **බලන්න**: දීඝ.නි: (1) තෙවිජ්ජා සූත්‍රය.

**මූලාශ්‍ර:** ඛු.නි: ඉතිවුත්තක: 3.5.10 ත්‍රිවිද්‍යා සූත්‍රය, පි. 482, The Itivuttaka: translated by Peter Masefield:PTS: 99 The Three-Veda sutta, p. 84.

▼**ජානසමාපත්ති** මගින් සිත කර්මණ්‍යබවට පත්වීමෙන්, බුදුන් වහන්සේට, තෙවිජ්ජා නුවණ පහළවූ බව මෙහි දක්වා ඇත. **බලන්න**: අංගු.නි: (5): 8 නිපාත: වෙරඤ්ජසූත්‍රය.
▲ **ත්‍රිවිධ අකුසල මූල:** පාලි: **තීනි අකුසලමූලානි**- Three un-wholesome roots: ත්‍රිවිධ අකුසල මූල නම් ලෝභය (රාගය),දෝසය හා මෝහයය. සියලු කෙළෙස් ඇතිවන්නේ මේ මුල් පදනම් කර ගෙනය. මේ අකුසල්, ආධ්‍යාත්මික මාර්ගයට හානිය ගෙනදේ, හානභාගිය ධර්මයන්ය. **බලන්න**: අකුසල මූල, හානභාගිය ධර්ම. **මූලාශ්‍ර:** දීඝ.නි: (3):11 දසුත්තර සූත්‍රය,පි. 483, EDN: 34: Dasuttara Sutta: Expanding Decades, p. 384.

▲ **ත්‍රිවිධ අගති-** Three wrong paths: ධර්මයේ ත්‍රිවිධ අගති ලෙස පෙන්වා ඇත්තේ අගතියට- පරිහානියට ගෙනයන රාග දෝස හා මෝහ යන අකුසල් මුල් 3 පිලිබඳවය. **බලන්න**: අකුසල මූල. **සටහන:** ත්‍රිවිධ අගතිය: රාග දෝස හා මෝහය ය. මේවා තියුණු ලෙසින් උපදින නිසා ඒවා ගිනි ලෙසින්ද පෙන්වා ඇත. සද්ධර්ම **කෝෂය,** පි. 116.
▲ **ත්‍රිවිධ අනුමෝදනා-** Three gratitude's: ත්‍රිවිධ අනුමෝදනා යනු**:** සංඝයාට පිරිනමන බත්දානය, මංගල කරුණක් හෝ අවමංගල කරුණක් නිසා පිරිනමන දාන. එම දානයන් පිරිනැමූ පසු, සංඝයා විසින් දායකයන්ට කරන අනුමෝදනා- ආශීර්වාදයන්ය. **සටහන**: සංඝයා ත්‍රිවිධ අනුමෝදනා උගත යුතුය යි බුදුන් විසින් වදාරන ලදී. දානයේ ආනිසංස ප්‍රකාශ කිරීම අනුමෝදනා වය. සංඝයාට පිරිනැමූ දානයෙන් පසු දායකයන්ට දාන ආනිසංස, දහම් කතා -බනක් පැවසීම කල යුතුවේ. මංගල දාන (විවාහ, ඔටුනු පැළඳවීම් ආදිය) දී මංගල සූත්‍රය, රතන සූත්‍රය, පිරිත් සජ්ජායනය කල යුතුය. අවමංගල දාන- මතක දාන, මළවුන් සිහිකර දෙන දාන අදියේද, තිරෝකුඩ්ඩ සූත්‍රය දේශනා කිරීම,

අනුමෝදනා බන කිවයුතුවේ. **බලන්න**: ශ්‍රී සද්ධර්ම කෝෂය, අනුමෝදනා, පි. 223.

▲**ත්‍රිවිධ ආශ්‍රව** -Three taints: ත්‍රිවිධ ආශ්‍රව -ආශ්‍රව- ආසවලෙසින් පෙන්වා ඇත්තේ කාම, භව, අවිද්‍යා ආශ්‍රවයන්ය. **බලන්න**: ආශ්‍රව හා ආශ්‍රව ක්‍ෂය කිරීම.

▲**ත්‍රිවිධ කල්‍යාන ශාසනය**- Thrivida kalyanasasanay: ත්‍රිවිධ කල්‍යාන ශාසනය ලෙසින් පෙන්වා ඇත්තේ ශිල සමාධි හා ප්‍රඥා යන ත්‍රිවිධ ශික්ෂාවටය. **බලන්න:** ශිල සමාධි ප්‍රඥා.

▲ **ත්‍රිවිධ ඉන්ද්‍රිය**: පාලි: ***තීනි ඉන්‍ද්‍රියානි***- three faculties: ආධ්‍යාත්මික පංච ඉන්ද්‍රියන්ට බාහිරව, බුදුන් වහන්සේ පෙන්වා ඇති ඉන්ද්‍රියන් පිලිබඳ විස්තරයේ ත්‍රිවිධ ඉන්ද්‍රිය යුගල 2ක් දක්වා ඇත: **බලන්න**: ඉන්ද්‍රිය. **පළමු ත්‍රිවිධ ඉන්ද්‍රියන්**: 1) ස්ත්‍රී ඉන්ද්‍රිය (**ඉත්‍ථින්‍ද්‍රියං** -femininity faculty), 2) පුරුෂ ඉන්ද්‍රිය (**පුරිසින්‍ද්‍රියං-** masculinity faculty) 3) ජීවිත ඉන්ද්‍රිය (**ජීවිතින්‍ද්‍රියං-** life faculty). **සටහන්:** * ස්ත්‍රී ඉන්ද්‍රිය හා පුරුෂ ඉන්ද්‍රිය පිළිබඳ නිකායන්හි වැඩි විස්තර නැත. අභිධර්ම පිටකයේ ‘උපාද රූප’ යටතේ මේවා දක්වා තිබේ.** අටුවාවට අනුව: ස්ත්‍රී ඉන්ද්‍රිය මගින් කැපිපෙනෙන ස්ත්‍රී ලක්ෂණ, ස්වභාවය පාලනය කරයි, පුරුෂ ඉන්ද්‍රිය, පුරුෂභාවය පාලනය කරයි *** ජීවිත ඉන්ද්‍රිය, කයේ පැවැත්මට වගකියයි. ධම්මසංඝානි , විභංග හා විසුද්ධි මාර්ගයේ මේ පිලිබඳ විස්තර දක්වා ඇත. **බලන්න**: ESN: note: 205, p. 2413. **දෙවන ත්‍රිවිධ ඉන්ද්‍රියන්:** 1) අනඤ්ඤාත-ඤානස්සාමීති ඉන්ද්‍රිය (සෝවාන්ඵල නුවන) 2) අඤ්ඤිඉන්ද්‍රිය (සෝවාන්ඵලයේ සිට රහත් මග දක්වා ඇති නුවන) 3) අඤ්ඤාඤාතවින්ද්‍රිය (රහත්මග නුවන). **මූලාශ්‍ර:** සං.යු.නි : (5-1):මහාවග්ග: ඉන්ද්‍රිය සංයුත්තය: 4.3.2 ජීවිතඉන්ද්‍රිය සූත්‍රය, පි. 392, ESN: Indriya samyutta: 22.2 The Life Faculty p. 1949, ඛු.නි: ඉතිවුත්තක: 3.2.3 ඉන්ද්‍රිය සූත්‍රය, පි. 418.

▲ **ත්‍රිවිධ චක්ෂු** - Three Eyes: බුදුන් වහන්සේ ත්‍රිවිධ චක්ෂු - තුන් ඇස්, මෙසේ පෙන්වා ඇත: **මසැස** (ඇස), **දිවැස** හා **පැණැස**. **මසැස**: කයේ ඇති ඇස (භෞතික ඇස). **දිවැස:** සාමාන්‍ය ලෝකයාට නො පෙනෙන, ඉර්දී බල නිසා ඇතිවෙන ආධ්‍යාත්මික බලය. **පැණැස:** ප්‍රඥා ඇස, මාර්ගය වඩා ගැනීමෙන් ඇතිවන නුවණ. ඇසෙහි පැවැත්ම දිවැසට කාරණය වේ. ආසවක්ඛය නුවණ පහළවීම පැණැසය. ඒ ඇස ලැබීමෙන් සියලු දුකින් මිදේ. **මූලාශ්‍ර:** ඛු.නි: ඉතිවුත්තක: 3.2.2 චක්ෂු සූත්‍රය, පි. 416.

▲ **ත්‍රිවිධ ඥාණ**: පාලි: **තෙවිජ්ජා-** Threefold knowledge: ධර්මයේ ත්‍රිවිධ ඥාණ ලෙසින් පෙන්වා ඇත්තේ අරහත්වය සාක්ෂාත් කරගැනීමෙන් පහළ වන තුන් ආකාර වූ අවබෝධයන්ය. ත්‍රිවිද්‍යා-තෙවිජ්ජා ලෙසින්ද හඳුන්වයි. 1) පෙරවිසු කඳ පිළිවෙත දන්නා නුවණ, 2) දිවැස -චුති උත්පත්ති නුවණ 3) ආසවක්‍ඛය- ආශ්‍රව ක්‍ෂය කරගැනීමේ නුවණ. (Knowledge of recollection of manifold past abodes, the divine eye, the knowledge of destruction of the taints). නිවන සාක්ෂාත් කර ගැනීම පිණිස ත්‍රිවිධ ඥාණ ලැබීම අවශ්‍යතාවයකි. **බලන්න**: ආශ්‍රව හා ආශ්‍රව ක්‍ෂයකිරිම, කර්මන්‍යාසිත. **ශබ්දකෝෂ: පා.සිං.ශ**: පි.310: “**තෙවිජ්ජා:** ත්‍රිවිද්‍යාව: බාහිර ත්‍රිවිද්‍යාව, සාසනික ත්‍රිවිද්‍යාව යයි දෙයාකාරය”. **B.D:** p.179: “**Te-Vijja**: One endowed with the 3 fold

higher knowledge: in Brahmanism: 'Knower of the 3 Vedas', in Buddhism: one who has realized 3 kinds of knowledge: Remembrance of past lives, Divine Eye, Extinction of all cankers" **සටහන්: *** ම.නි: **තෙවිජ්ජාවච්චගොත්ත සූත්‍රයේදී** බුදුන් වහන්සේ, ත්‍රිවිධ ඥාණ ලැබීම ගැන විස්තර කර ඇත. ** **පටිසම්භිදාවේ**: ත්‍රිවිධ ඥාන-ඥානත්‍රය ලෙසින් පෙන්වා ඇත්තේ: විහාරත්ථ ඥානය-අනිත්‍යාදර්ශනය දන්නා නුවණ, සමාපත්ති ඥානය-අනිමිත්ත සමාපත්තියේ නුවණ, විහාරසමාපාත්තියේ නානත්වය දැකීමේ නුවණ- විහාර සමාප්‍රත්‍යත්ත ඥානය වේ.**බලන්න**:බු.නි:පටිසම්භිදා1:ඥාණකථා: 29-31ඥානත්‍රය,පි. 196.

▼**ත්‍රිවිධ ඥාණ,මාර්ගය වැඩීම පිණිසය**: එම ඥාන සාක්ෂාත් කරගැනීම මගින් භික්ෂුව පරිපූර්ණබව ලබාගනී යයි බුදුන් වහන්සේ වදාළහ. **මූලාශ්‍ර**: අංගු.නි:( 6 කාණ්ඩය): 10 නිපාත:ආනිසංස වගග, 10.1.1.10 **විජ්ජා සූත්‍රය**, පි.50, EAN:10: Benefits: 10.10.True Knowledge, p. 494.

▼ **ත්‍රිවිධ ඥාණ,** සච්ඡිකාතබ්බ ධර්මයකි, නිවන පිණිස සාක්ෂාත් කරගත යුතු ධර්මයකි. **මූලාශ්‍ර:** දීඝ.නි : (3 ): 11දසුත්තර සූත්‍රය, පි. 483, EDN: 34: Dasuttara Sutta: Expanding Decades, p. 384.
▼ **සප්ත බොජ්ඣංග** වර්ධනය කරගැනීමෙන් ත්‍රිවිධ ඥාන සාක්ෂාත්වේ. **මූලාශ්‍ර**:අංගු.නි: (6):10 නිපාත: සමණසඤ්ඤා වගග: 10.3.1.2.බොජ්ඣංගසූත්‍රය, පි.406, EAN:10: 102.2. Factors of Enlightenment, p. 540.

▲ **ත්‍රිවිධ කුසල මූල:** පාලි: **තීනි කුසලමූලානි**- Three wholesome roots ත්‍රිවිධ කුසල මූල නම් අලෝභය, අදෝසය හා අමෝහය. මේ කුසල් තුන, ආධ්‍යාත්මික මාර්ගයට විශේෂබවක් ගෙනදේ. **බලන්න**: කුසල මූල, විශේෂභාගිය ධර්ම. **මූලාශ්‍ර:** දීඝ.නි : (3 ): 11දසුත්තර සූත්‍රය, පි. 483, EDN: 34: Dasuttara Sutta: Expanding Decades, p. 384.
▲ **ත්‍රිවිධ තණ්හා:** පාලි: **තිස්සො තණ්හා -** Three cravings :ත්‍රිවිධ තණ්හා ලෙසින් පෙන්වා ඇත්තේ කාම, භව හා විභව තණ්හාවන්ය. **බලන්න**: තණ්හාව, ආහාර. **ශබ්දකෝෂ: පා.සිංශ:** පි.249: "**කාම තණ්හා:** කාම තෘෂ්ණාව, කාමආශාව, වස්තුකාම - කෙලෙශ කාමයන්හි ආශාව...පි. 406: **භව තණ්හා:** භව තෘෂ්ණාව, භවාසාව...පි.475: **විභව තණ්හා:** උච්ඡෙදදෘෂ්ටි සහගත රාගය". **B.D:** p. 74: "**Kāma-Tanhā**: Sensuous craving…p.: 33: **Bhava- Tanhā**: Craving for eternal existence …p.190: **Vibhava-Tanhā**: Craving for Non- existence or for Self-anihilation".

▲ **ත්‍රිවිධ දුක**- Three Sufferings: ත්‍රිවිධ දුක ලෙසින් බුදුන් වහන්සේ පෙන්වා ඇත්තේ: 1) **දුක්ඛදුක්ඛ** 2) **සංඛාර දුක්ඛ** 3) **විපරිනාම දුක්ඛ. බලන්න**: දුක.
▲ **ත්‍රිවිධ ධම්මඅංග**-Three Dhamma factors: ධර්මයේ ත්‍රිවිධ අංග ලෙසින් පෙන්වා ඇත්තේ ශීලය, සමාධිය හා ප්‍රඥාවය. බුදුදහම එම කරුණු මත පදනම්ව ඇත. බුදුන් වහන්සේ නිරතුරුවම මේ අංග වඩාගැනීම පිණිස සංඝයාට අවවාද අනුසාසන කර ඇත. අවසාන චාරිකාවේ යෙදුන බුදුන් වහන්සේ මේ ගුණයන් වැඩීමේ ආනිසංස වදාළ

බව මෙහි පෙන්වා තිබේ: "...සිල ...සමාධිය...ප්‍රඥාව මෙබඳුය. ශිලයෙන් වඩනලද සමාධිය මහත් ඵල මහා අනුසස් ඇත්තේය. සමාධියෙන් වඩනලද ප්‍රඥාව මහත් ඵල මහා අනුසස් ඇත්තේය. ප්‍රඥාවෙන් වඩන ලද සිත කාම...භව...අවිද්‍යා යන ආසව කෙරන් මොනවට මිදේ".**"ඉති සීලං, ඉති සමාධි, ඉති පඤ්ඤා. සීලපරිභාවිතො සමාධි මහප්ඵලො හොති මහානිසංසො. සමාධි පරිභාවිතා පඤ්ඤා මහප්ඵලො හොති මහානිසංසො. පඤ්ඤා පරිභාවිතං චිත්තං සම්මදෙව ආසවෙහි විමුච්චති, සෙය්‍යථීදං කාමාසවා භවාසාවා අවිජ්ජාසාවා'ති".** **මූලාශ්‍රය**: දීඝ.නි: (2): 3: මහාපරිනිබ්බාන සූත්‍රය, 14 ඡේදය,පි.142.

▲ **ත්‍රිවිධ ධම්මතා**-Three types of Dhamma: ත්‍රිවිධ ධම්ම-ධර්මතා ලෙසින් පෙන්වා ඇත්තේ කිසියම් ධර්මතා 3 ක් පහ කර ගැනීම පිණිස, වෙනත් ධර්මතා 3ක් වඩා ගැනීමය: 1) **රාගය දෝසය හා මෝහය**: රාගය ප්‍රහීණය පිණිස **අශුභය,** දෝසය ප්‍රහීණය පිණිස **මෛත්‍රීය,** මෝහය ප්‍රහීණය පිණිස **ප්‍රඥාව** වැඩිය යුතුය. 2) **ත්‍රිවිධ දුශ්චරිතය** ප්‍රහාණය පිණිස **ත්‍රිවිධ සුචරිතය** වැඩිය යුතුය 3) **කාමවිතක්ක-** ප්‍රහීණය පිණිස **නෙක්ඛම්ම විතක්ක, ව්‍යාපාදවිතක්ක-** ප්‍රහීණය පිණිස **අව්‍යාපාදවිතක්ක, විහිංසා විතක්ක-** ප්‍රහීණය පිණිස අවිහිංසා විතක්ක වැඩිය යුතුය 4) **කාමසංඥා-** ප්‍රහීණය පිණිස **නෙක්ඛම්මසංඥා, ව්‍යාපාද සංඥා-** ප්‍රහීණය පිණිස **අව්‍යාපාද සංඥා, විහිංසාසංඥා-** ප්‍රහීණය පිණිස **අවිහිංසා සංඥා** වැඩිය යුතුය. 5) **කාමධාතු-** ප්‍රහීණය පිණිස **නෙක්ඛම්ම ධාතු, ව්‍යාපාදධාතු-** ප්‍රහීණය පිණිස **අව්‍යාපාද ධාතු, විහිංසාධාතු** ප්‍රහීණය පිණිස **අවිහිංසා ධාතු** වැඩිය යුතුය 6) **ආසවාද දිට්ඨිය** (ශාශ්තවත-view of gratification) ප්‍රහීණය පිණිස **අනිත්‍යසංඥා, ආත්මානු දිට්ඨිය** (සක්කාය- view of self) ප්‍රහීණය පිණිස **අනත්ත සංඥාව, මිථ්‍යා දිට්ඨිය** (62 ක්වූ දිට්ඨි) ප්‍රහීණය පිණිස **සම්මා දිට්ඨිය** වැඩිය යුතුය. 7) **අරතිය** (Discontent) ප්‍රහීණය පිණිස **මුදිතාව, විහිංසාව** ප්‍රහීණය පිණිස **අවිහිංසාව, අධර්මචරියාව-** ප්‍රහීණය පිණිස, **ධර්මචරියාව** වැඩිය යුතුය. 8) **අසන්තුෂ්ටිය** ප්‍රහීණය පිණිස **සන්තුෂ්ටිය, අසම්ප්‍රජන්‍යය** ප්‍රහීණය පිණිස **සම්ප්‍රජන්‍යය, දැඩි ආශාව** (මහේච්ඡතාවය-strong desires) ප්‍රහීණය පිණිස, **අල්පේච්ඡතාවය** (Fewness of desires) වැඩිය යුතුය. 9**) දොවචස්සතාවය** (difficult to correct) ප්‍රහීණය පිණිස **සුවචභාවය, පාපමිත්‍ර සේවනය** ප්‍රහීණය පිණිස **කලණමිතුරු-කල්‍යාණමිත්‍ර සේවනය, චිත්තවික්ෂේපය** (mental distraction ) ප්‍රහීණය පිණිස **ආනාපානසතිය** වැඩිය යුතුය. 10) **උද්දච්චය** ප්‍රහීණය පිණිස **සමථය, අසංවරය** (ඉන්ද්‍රිය) ප්‍රහීණය පිණිස **සංවරය, ප්‍රමාදය** ප්‍රහීණය පිණිස **අප්‍රමාදය** වැඩිය යුතුය. **මූලාශ්‍ර**:අංගු.නි: ( 4 ): 6 නිපාත**:** තික වග්ග සූත්‍ර, පි. 280, EAN:6: I Triads, p. 364.

▲ **ත්‍රිවිධ නිස්සාරණිය ධාතු:** පාලි: **තිස්සො නිස්සරණියා ධාතුයො**-Three elements making for deliverance -nissāraṇīyā dhātuyo: ත්‍රිවිධ නිස්සාරණිය ධාතු ලෙසින් බුදුන් වහන්සේ පෙන්වා ඇත්තේ **:** නෙක්ඛම්මය, අරූපය හා නිරෝධය ය. මේවා කෙළෙස්වලින් නිදහස් වීමට, විමුක්තිය පිණිස උපකාරිවන ධර්මතාය. ත්‍රිවිධ නිස්සාරණිය ධාතු, විනිවිදව අවබෝධ කරගැනීමට දුෂ්කර (පහසු නැති) දුෂ්ප්‍රතිවිධ්‍ය ධර්ම යන්ය. **බලන්න**: නිස්සාරණිය ධාතු, දුෂ්ප්‍රතිවිධ්‍ය ධර්ම. **මූලාශ්‍ර:** දීඝ.නි : (3 ): 11 දසුත්තර සූත්‍රය, පි. 483, EDN: 34: Dasuttara Sutta: Expanding Decades, p. 384.

▲ **ත්‍රිවිධ ප්‍රඥා** - Three wisdoms: ධර්මයේ ත්‍රිවිධ ප්‍රඥා ලෙසින් පෙන්වා ඇත්තේ: **1) සුතමය ප්‍රඥාව-** ධර්මය අසා-ශ්‍රවනය, ඉගෙන ඒ ගැන ලබාගන්නා අවබෝධය නිසා ඇතිවන දහම් නුවණ **2) භාවනාමය ප්‍රඥාව-** භාවනා අරමුණක් මගින් සිත සමාධියට පත්කර ගැනීමෙන් ඇතිවන දහම් නුවණ. **3) චින්තාමය ප්‍රඥාව-** ධර්මය සිතින් ආවර්ජනය කර ලබාගන්නා දහම් නුවණ. **විස්තර පිණිස බලන්න**: * **පටිසම්භිදා** 1: ඥාණකථා, ** **සිංහල විසුද්ධිමග**,14 පරිච්ඡේදය, පි. 631 ** **අභි.ධ.පි: විභංගප්‍රකරණ** 2: ඥානවිභංග. **මූලාශ්‍ර:** දීඝ.නි: (3 ): 10 සංගීති සූත්‍රය, පි. 368, EDN: EDN: 33: Sangīti Sutta: The Chanting Together, p. 362.

▲ **ත්‍රිවිධ පුණ්‍යක්‍රියා වස්තු**- Three kinds of merits: දානය, ශිලය හා භාවනාව ත්‍රිවිධ පුණ්‍යක්‍රියා වස්තු යයි බුදුන් වහන්සේ වදාළහ. මෙලොව හා පරලොව උතුම් සැප විපාක පිණිස පින්ක්‍රියාවල යෙදීම යහපත්වේ. දානය මෙලොව පරලොව සැප පිණිස, ශිලය සම හැසිරීම පිණිස, භාවනාව මෙත්තා සහිත සිත වැඩීමට උපකාරීවේ. මේ කුසල ධර්මතා 3 දියුණු කරගැනීම බඹලොව උපතට හේතුවේ. **මූලාශ්‍ර:** බු.නි: ඉතිවුත්තක: 3.2.1 පුණ්‍යක්‍රියා වස්තු සූත්‍රය, පි. 416.

▲ **ත්‍රිවිධ පිරිසිදුබව** -Three purification: කයෙන්, වචනයෙන් හා මනසින් (තුන් දොරින්) කරන දසකුසල් ක්‍රියා නිසා මිනිසුන්ගේ පිරිසිදුබව -පාරිශුද්ධිය ඇතිවේ. දස අකුසල නිසා මිනිසුන් අපිරිසිදුවේ. **බලන්න:** දසඅකුසල්, දස කුසල්,ආරියවිනයේ පිරිසිදුබවලැබීම.
▲ **ත්‍රිවිධ භය-** Three Fears: ධර්මයේ ත්‍රිවිධ භය ලෙසින් පෙන්වා ඇත්තේ ලෝක සත්වයාට අනිවාර්යෙන්ම මුහුණ දීමට ඇති ජාති ජරා හා මරණ භයටය. **බලන්න**: ජාති ජරා මරණ.

▲**ත්‍රිවිධ භව**-Three bhava : ත්‍රිවිධ භව, කාම, රූප, අරූප භව 3 ය. **බලන්න:** තුන්භවය, ආහාර, යළිඋපත.
▲ **ත්‍රිවිධ මාන:**පාලි: **තීසු වීධාසු-තයො මානො**- three discriminations මානය, විධා ලෙසින්ද පෙන්වා ඇත. සාමාන්‍යලෝකයා පංච උපාදානස්කන්ධය, සිය ආත්මය ලෙසින් ගැනීම විවිධ මාන-මැනීම් වලට හේතුවේ. ඒ අනුව ලෝකයේ මාන 3 ක් ඇති පුද්ගලයන් දැකිය හැකිය. මේවා අකුසල්ය. **බලන්න**: මාන.
▼**බුදුන් වහන්සේ ත්‍රිවිධ මාන** මෙසේ පෙන්වා ඇත: "මහණෙනි, මේ මාන 3 ක්වේ: 1) මම ශ්‍රේෂ්ඨ වෙමි -I am superior (අතිමානය ලෙසින්ද පෙන්වා ඇත) 2) මම සමාන වෙමි -I am equal (මානය ලෙසින්ද පෙන්වා ඇත) 3) මම හීනවෙමි-හීනමානය -I am inferior. (ඔමානය - අවමානය ලෙසින්ද පෙන්වා ඇත)". එම මාන යථා ලෙසින් අවබෝධ කරගැනීමට හා ඒවා ප්‍රහීණය කරගැනීමට ආරිය අටමග මනාව වැඩියයුතුවේ. **"තිස්සො ඉමා භික්ඛවෙ, විධා... 'සෙය්‍යො හමස්මී'ති විධා, 'සදිසො හමස්මී'ති, විධා, 'හීනො හමස්මී'ති විධා..."** **මූලාශ්‍ර**: සංයු.නි: (5-1): මහාවග්ග:මග්ගසංයුත්ත: 1.15 විධා සූත්‍රය, පි.154, ESN: Maggasamyutta: 162.2 Discriminations, p. 1707.

▼ **ත්‍රිවිධමානය ඇතිවීම**: යමෙක්, මම අන්‍යයන් හා සමවෙමි හෝ විශිෂ්ඨ වෙමි හෝ හීන වෙමි යයි සලකයි, ඒ ගැන විවාද කරයි, එමගින් මානය උපදී. එහෙත් එවැනි සංකල්පනා රහතන්වහන්සේට නොමැත යයි බුදුන් වහන්සේ පෙන්වා ඇත. **මූලාශ්‍ර**: සංයු.නි: (1):සගාථවග්ග: දේවතා

සංයුත්ත: 1.2.10 සමිද්ධි සූත්‍රය, පි. 44, ESN: 1: Devata samyutta: 20.10 Samiddhi, p. 79. **සටහන:**සංයු.නි: (4) වේදනාසංයුත්ත: යොගක්ඛෙමිවග්ග: 1.11.5 සෙයා සූත්‍රයේදී, ඇස, කණ... ආදී අභ්‍යන්තර ආයතන සයේ ක්‍රියා කාරිත්වය නිසා ත්‍රිවිධ මාන ඇතිවෙන බව විස්තර කර ඇත.

▼ **මානය පහ කිරීම නිවනය**: සියලු තණ්හා අහවරකර, මානය, අවමානය හා අතිමානය (මානො, ඔමානො, අතිමානො- Conceit, the inferiority complex, and arrogance) පහකර, සංයෝජන උදුරාදැමූ මහණ අර්හත්වය ලබා සසර දුක නිමා කරඇත-නිවන ලබාඇත. **මූලාශ්‍ර:** අංගු.නි: ( 4 ): 6 නිපාත: 6.2.5.11. තණ්හා සූත්‍රය, පි. 278 , EAN: 6: 106.11. Craving, p. 364.

▼**වෙනත් මූලාශ්‍ර: 1. "සෙයියොහමස්මීති මානය"** යනු මම ජාතියෙන්, කුලයෙන්... රූපයෙන්... ශිල්පශාස්ත්‍රයකින් හෝ වෙනත් කරුණකින් අන් අයට වඩා උසස් යයි කියා සිතීමය. (මෙහිදී මානය කොඩියක් මෙන් ඉහලට ඔසවා ඇත). **සදිසෝ මාන** යනු (පෙරකී කරුණු වලින්) අන්‍යයන් හා සමාන යයි සිතීමය. **හීන මානය** (පෙරකී කරුණු වලින්) අන්‍යයන්ට වඩා පහත් යයි සිතීමය. ත්‍රිවිධ මාන ලෝභ, ද්වේශ තරම් නපුරු කෙලෙස් නොවේ, එහෙත්, කෙනෙක්ගේ පිරිහීමට හේතුවේ". **කෙලෙස් එක්දහස් පන්සීය**: පි. 66, රේරුකානේ චන්දවිමල නාහිමි, 2008.

▲ **ත්‍රිවිධ මල-** Three stains: ත්‍රිවිධ මල යනු සිත කිලිටිකරණ කෙළෙස් 3 ය: රාග දෝස හා මෝහ .**බලන්න**: මල. **සටහන:** අංගු.නි: **(1)** බාල වග්ගය : බාලයන්ගේ ගති ලක්ෂණ පෙන්වීමේදී ඔවුන්ට ත්‍රිවිධ මල ඇතිබව බුදුන් වහන්සේ වදාළහ: දුස්ශීලය, ඉරිසියාව-ඊර්ෂ්‍යාව, මසුරුකම. එම අවගුණ නිසා ඔවුන් දුගතියට යයි. **මූලාශ්‍ර**:අංගු.නි: (1)3 නිපාත: 3.1.10 සූත්‍රය,පි. 240, EAN: 3:10.10 Stains, p. 81.

▲ **ත්‍රිවිධ රත්නය-** Three Jewels: ත්‍රිවිධ රත්නය**-** තෙරුවන්, බෞද්ධයන්ට ඇති අනර්සම රත්නයන්ය: බුද්ධ, ධර්ම හා සංඝ. **රතන සූත්‍රයේ** ත්‍රිවිධ රත්නයේ ගුණ විස්තර කර ඇත. **බලන්න**: තිසරණ, තෙරුවන්.

▼ **ත්‍රිවිධ රත්නය සරණකරගැනීම** යහපත පිණිසය: දිගුකලක් මුළුල්ලේ ගිහියෙක්, ත්‍රිවිධ රත්නය සරනකොටගෙන සිටි නම් ඔහු දුගතියක යළි උපත නොලබන බව බුදුන් වහන්සේ මේ සූත්‍රයේදී පෙන්වා ඇත: අනාගාමී, සකදාගාමී, සෝතාපන්න පුද්ගලයන් දුගතියෙන් මිදිඇත, ඔවුන් ත්‍රිවිධ රත්නය කෙරෙහි අවෙච්චාසහගත ප්‍රසාදය ලැබූ උතුමන්ය. අවෙච්චාසහගත ප්‍රසාදය නොලැබූ එහෙත්, තිසරණය කෙරහි යම් ප්‍රසාදයක් ඇති පුද්ගලයෙක් සිටි. ඔහුගේ පංච ඉන්ද්‍රිය වර්ධනය වී ඇත. විමසා බලා ධර්මය ඔහු පිළිගනී. එවන් පුද්ගලයා දුගතිගාමී නොවේ. **මූලාශ්‍ර:**සංයු:නි: (5-2) සෝතාපත්තිසංයුත්ත: සරකානි වග්ග:සරකානි සූත්‍ර 2**,** පි. 214.

▼**ත්‍රිවිධ රත්නයේ ගුණ** දැක පැහැදීමක් ඇති, ආරිය කාන්ත ශීලය ඇති පුද්ගලයා දහම් ගඟට පිළිපන් කෙනකි, ආශ්‍රවක්‍ෂයකර ඔහු පරතෙරට-නිවනට පැමිණේ. ඒ පිලිබඳ බුදුන් වහන්සේ වදාළ **උපමාව**: කන්දක් මතට පතිතවන වැස්ස, මුදුනේ සිට ක්‍රමයෙන් පහළට ගලාවිත් කෙළවර සාගරයට ඇතුළුවේ, එලෙස, තෙරුවන් ගුණ ගැන පැහැදී, යහපත් ශීලය ඇති තැනැත්තා සියලු කෙළෙස් හැර, නිවන ලබයි. **මූලාශ්‍ර:** සංයු.නි: (5-2) මහාවග්ග: සෝතාපත්තිසංයුත්ත: පුඤ්ඤාභිසන්ද වග්ග:11.4.8 වස්ස

සූත්‍රය, පි. 250.
▼ **ත්‍රිවිධ රත්නයේ** අග්‍රබව බව සලකා කෙනෙක් පහන් සිතින් දන් දෙන්නේ නම් එම පින අග්‍රවේ. **බලන්න**: අග්‍රපින.
▼ **ත්‍රිවිධ රත්නය කෙරේ** ඇති අවෙච්චාසහගත ප්‍රසාදය හා ආරිය කාන්ත ශීලය ඇති ආරිය ශ්‍රාවකයාහට ඇති පුණ්‍ය ගණන්කිරීමට නොහැකිය. **බලන්න**: අසංඛ්‍යෙයිය පුණ්‍ය, ශ්‍රද්ධාව,අශ්‍රද්ධාව, සෝතාපන්න, ඉන්ද්‍රකීලය.
▲ **ත්‍රිවිධ වේදනා** : පාලි: **තිස්සො වෙදනා**-Three feelings: ත්‍රිවිධ වේදනා නම්: සැප වේදනාව, දුක වේදනාව හා සැපත් නොවන දුකත් නොවන වේදනාව-උපේක්ඛා. (සුඛා වෙදනා, දුක්ඛා වෙදනා, අදුක්ඛමසුඛා වෙදනා). ආධ්‍යාත්මික වර්ධනය පිණිස, ත්‍රිවිධ වේදනා පිරිසිඳව අවබෝධ කල යුතුවේ. **බලන්න**: වේදනා, පරිඥෙය්‍ය ධර්ම. **මූලාශ්‍ර:** දීඝ.නි : (3): 11 දසුත්තර සූත්‍රය, පි. 483, EDN: 34: Dasuttara Sutta: Expanding Decades, p. 384.

▲ **ත්‍රිවිධ සුචරිතය හා ත්‍රිවිධ දූෂ්චරිතය:** පාලි: **තීනි සුචරිතං, තීනි දුච්චරිතං**-Three good conduct & three bad conduct: ධර්මයේ ත්‍රිවිධ සුචරිතය සේ පෙන්වා ඇත්තේ කයෙන්, වචනයෙන් හා මනසින් (තුන්දොරින්) කරන යහපත්- හොඳ ක්‍රියා ගැනය. ත්‍රිවිධ දූෂ්චරිතය නම් කයෙන්, වචනයෙන් හා මනසින් කරන අයහපත්- නරක ක්‍රියාය. **බලන්න**: තපනිය හා අතපනිය ධර්ම, අසංවරය, ඉන්ද්‍රිය සංවරය, ඉන්ද්‍රිය අසංවරය.
▼**ඒකාන්තයෙන්ම** ත්‍රිවිධ සුචරිතයේ හැසිරිය යුතුය; ත්‍රිවිධ දූෂ්චරිතය දුරු කල යුතුය යයි බුදුන් වහන්සේ පෙන්වා ඇත:

**"එකංසෙනාහං ආනන්ද අකරණියං වදාමි කාය…වචී…මනො දුච්චරිතන්ති… … එකංසෙනාහං ආනන්ද කරණියං වදාමි කාය… වචී…මනො සුචරිතං"**. කෙනෙක් ත්‍රිවිධ දූෂ්චරිතයේ යෙදෙනවිට ඔහුට ආදීනව ඇතිවේ: ඒ පිලිබඳ කෙනක් තමාටම උපවාද කරගනී, ප්‍රඥාවන්තයන් ඒ පිලිබඳ විමසා බලා ඔහුට නිගරුකරති, ඔහු ගැන අපකීර්තිය පැතිරේ, සිහි මුලාවෙන් මියයයි, මරණින් මතු දුගතියේ- සතර අපායේ යලි උපත ලබයි. කෙනෙක් ත්‍රිවිධ සුචරිතයේ යෙදෙනවිට ඔහුට ප්‍රතිලාභ ඇතිවේ: ඒ පිලිබඳ කෙනක් තමාටම උපවාද නොකරගනී, ප්‍රඥාවන්තයන් ඒ පිලිබඳ විමසා බලා ඔහුට ප්‍රසංසා කරති, සිහියෙන් මියයයි, මරණින් මතු සුගතියේ-දෙව්ලොව උපත ලබයි. **බලන්න:** ධර්මචරියාව හා අධර්මචරියාව. **මූලාශ්‍ර:** අංගු.නි: (1 ): 2 නිපාත: 2.1.2.8 සූත්‍රය, පි. 150, EAN: 2: 18.8 Sutta, p. 59.
▼ **ඉන්ද්‍රිය අසංවරය නිසා** ත්‍රිවිධ දූශ්චරිතය පෝෂණය වේ. ත්‍රිවිධ දූශ්චරිතය නිසා පංච නීවරන පෝෂණයවේ. **ඉන්ද්‍රිය සංවරය** නිසා ත්‍රිවිධ සුචරිතය පෝෂණය වේ. ත්‍රිවිධ සුචරිතය නිසා සතර සති පට්ඨානය පෝෂණය වේ. **බලන්න**: අවිද්‍යාව හා විද්‍යාව. **මූලාශ්‍ර**:අංගු.නි: (6 ): 10 නිපාත: යමක වග්ග: 10.2.2.1 අවිද්‍යා සූත්‍රය, පි.232, EAN:10: II Pairs: 61.1.Ignorance, p. 517.
▼ **ත්‍රිවිධ සුචරිතයෙන්** වාසය කිරිමෙන් අත්තරක්ඛිතය සිදුවේ: තමා විසින් තමාව ආරක්ෂා කර ගැනීමට හැකිවේ. **බලන්න:** අත්තරක්ඛිතය.
▲ **ත්‍රිවිධ සෝතාපන්න පුද්ගලයෝ**- Three kinds of Stream Winners සෝතාපන්න මග ඵල ලබා ආධ්‍යාත්මික වර්ධනයේ වෙනස් කම් නිසා, අරහත්වයට පත්වීමට ගත කරන කාලසීමාව අනුව, සෝතාපන්න

පුද්ගලයෝ තුන් වර්ගයකි: **1) ඒක බීජ** (එකබීජීසා - the one-seed attainer): සංයෝජන 3 පහකර සෝතාපන්න බව ලබාගත් මේ උතුම් පුද්ගලයා එක් මිනිස් භවයක් තුල දුක කෙලවර කරගනී: **"සො තිණ්ණං සඤ්ඤොජනානං පරික්ඛයා එකබීජී හොති: එකඤ්ඤෙව මානුසකං භවං නිබ්බත්තෙත්වා දුක්ඛස්සන්තං කරොති".** (with the utter destruction of three fetters, he is a one-seed attainer who, after being reborn once more in human existence, makes an end of suffering). **සටහන:** සංයෝජන 3 : සක්කායදිට්ඨි, සීලබ්බත පරාමාස, විචිකිච්ඡා. **2) කොලංකොල** (කොලඞකාලො -the family-to-family attainer): සංයෝජන 3 පහකර සෝතාපන්න බව ලබාගත් මේ උතුම් පුද්ගලයා උත්පත්ති භව 2 ක් හෝ 3 ක් අතර සසර සැරිසරා දුක කෙලවර කරගනී: **"සො තිණ්ණං සඤ්ඤොජනානං පරික්ඛයා කොලඞකාලො හොති. ඩ්වා තීණි වා කුලානි සන්ධාවිත්වා සංසරිත්වා දුක්ඛස්සන්තං කරොති"** (with the utter destruction of three fetters, he is a family-to-family attainer who, after roaming and wandering on among g families two or three times, makes an end of suffering). 3) **සත්තඛත්තුපරම- උපරිම සත්වරක්:** (සත්තක්ඛත්තුපරමං -seven-times-at-most attainer): සංයෝජන 3 පහකර සෝතාපන්න බව ලබාගත් මේ උතුම් පුද්ගලයා උපරිම උත්පත්ති භව 7 ක් තුල, දෙව් මිනිස් ලෝක වල සැරිසරා දුක කෙලවර කරගනී: **"සො තිණ්ණං සඤ්ඤොජනානං පරික්ඛයා සත්තක්ඛත්තුපරමො හොති:සත්තක්ඛත්තුපරමං දෙවෙච මනුස්සෙ ච සන්ධාවිත්වා සංසරිත්වා දුක්ඛස්සන්තං කරොති". (**with the utter destruction of three fetters, he is a seven-times-at-most attainer who, after roaming and wandering on among devas and humans seven times at most, makes an end of suffering) **මූලාශ්‍ර**: අංගු.නි: (1 ) : 3 නිපාත: 3.2.4.7 සූත්‍රය**,** පි. 450, EAN: 3: 88. 8 The Process of Training -3, p. 123.

▲ **ත්‍රිවිධ සංඛාර-** Three Sanskara: කාය සංඛාර -සංස්ඛාර, වචී සංඛාර හා මනෝ සංඛාර, ත්‍රිවිධ සංඛාරවේ. **බලන්න:** චේතනා, සංඛාර. ත්‍රිවිධ සංස්ඛාරයන්හි යෙදෙන පුද්ගලයන් තිදෙනෙක් ගැන බුදුන් වහන්සේ පෙන්වා ඇත: 1) පුද්ගලයෙක් දුක්සහිතවූ කාය, වචී හා හා මනෝ සංස්ඛාරයේ යෙදේ. එහි විපාක වශයෙන් යලි උපත ලැබූ ඔහුට : දුක් සහිත ස්පර්ශය ඇතිවේ; එම ස්පර්ශය නිසා දුක් වේදනා ඇතිවේ. එම වේදනා, ඒකාන්තයෙන්ම දුකසහිතය, හරියට නිරයේ ඇති දුක් වේදනාවන් ලෙසින් පීඩා ගෙනදේ. 2) පුද්ගලයෙක් නිදුක් කාය,වචී හා හා මනෝ සංස්ඛාරයේ යෙදේ. එහි විපාක වශයෙන් යලි උපත ලැබූ ඔහුට : සුඛ සහිත ස්පර්ශය ඇතිවේ; එම ස්පර්ශය නිසා සැප වේදනා ඇතිවේ. ඒ සුඛ වේදනා ඒකාන්තයෙන්ම ප්‍රසන්නය. හරියට, සුභකින්න දෙව්ලොව සිටින දෙවියන් ලබන ප්‍රසන්න සුඛය මෙන් සැප සහිතය. 3) පුද්ගලයෙක් දුක්සහිත හා දුක්රහිත, කාය,වචී හා හා මනෝ සංස්ඛාරයේ යෙදේ. එහි විපාක වශයෙන් යලි උපත ලැබූ ඔහුට : දුක් සහිත හා සැප සහිත ස්පර්ශ ඇතිවේ, එමගින්, දුක් සහිත හා සැප සහිත වේදනාවෝ ඇතිවේ. එම දුක් සහිතවූ , දුක් නැති ප්‍රසන්නවූ, මිශ්‍ර වේදනාවෝ, හරියට සමහර දෙවියන්ට, මිනිසුන්ට හෝ පහත් ලෝකවල සිටින සත්ත්වයන්ට (විමානක ප්‍රේතයන් වැනි) ඇතිවෙන දුක් හා සැප වේදනාමෙන්වේ. **මූලාශ්‍ර**: අංගු.නි: (1): 3 නිපාත:3.1.3.3 සූත්‍රය,පි. 266,EAN:3:23-3

volitional activities, p. 86.
▲**ත්‍රිවිධ සමාධි**-Three samdhi: ත්‍රිවිධ සමාධි ලෙසින් බුදුන් වහන්සේ පෙන්වා ඇත්තේ සුඤ්ඤත සමාධිය, අනිමිත්ත සමාධිය, අප්පණිහිත සමාධිය (emptiness samdhi , sign-less samdhi , undirected samdhi) යන විමොක්ක යන්ය. **බලන්න**: විමොක්ක දොරටු තුන. මේ තුන් සමාධිය නිවනට මගය. **සුඤ්ඤත සමාධිය** ඇතිකරගන්නේ විදර්සනා - විපස්සනා නුවණින් අනාත්ම ස්වභාවය අවබෝධ කරගැනීමෙන්ය; **අනිමිත්ත සමාධිය,** ඇතිකරගන්නේ සියලු දේ අනිච්චබව අවබෝධ කරගැනීමෙන්ය- නිමිති අල්වා නොගැනීමය. **අප්පණිහිත සමාධිය:** ඇතිකරගන්නේ සසර දුක අවබෝධය මගින්ය- සියල්ල දුක ගෙනෙදෙන බව- කිසිවක් ප්‍රණීත නොවන බව, එමනිසා සසරට ඇලීම පහවී යයි. **සටහන්:** Suññata samādhi, animitta samādhi, appaṇihita samādhi- One who, at the stage of advanced insight, contemplates things as non-self, acquires the emptiness concentration on arriving at the path and fruit (because he has seen things asempty of self); one who contemplates things as impermanent acquires the sign-less concentration (because he has seen through the 'sign of permanence'; one who contemplates things as suffering acquires the undirected concentration (because he has no leaning to things seen as painful). See too the discussion of the 'triple gateway to liberation' at Vism 657–59. බලන්න: ESN: Note: 368, p. 1570. **මූලාශ්‍ර:** සංයු.නි: (4): සළායතනවග්ග:අසංඛත සංයුත්ත, 9.1.4 සුඤ්ඤත සමාධිය සූත්‍රය, පි. 662, ESN: 43: Asankatasamyutta: p. 1493.

▲ **ත්‍රිවිධ ශ්‍රමණ කාර්ය**: පාලි: **තීණි සමණකරණීයානි**-Three ascetic tasks: ත්‍රිවිධ ශ්‍රමණ කාර්ය ලෙසින් බුදුන් වහන්සේ පෙන්වා ඇත්තේ ශ්‍රමණජීවිතය පිණිස භික්ෂුන් විසින් පුරුදු පුහුණු කළයුතු කාර්යය 3 ක් ගැනය. එනම්, අධි ශීලශික්ෂා සමාදානය, අධි චිත්තශික්ෂා සමාදානය, අධිප්‍රඥා ශික්ෂා සමාදානය (The undertaking of the training in : the higher virtuous behavior, higher mind, and higher wisdom). **බලන්න**: අධිශීලශික්ෂාව, අධිචිත්තශික්ෂාව, අධිප්‍රඥාශික්ෂාව.
▼ **ත්‍රිවිධ ශ්‍රමණ කාර්ය** ගැන බුදුන් වහන්සේ මෙසේ වදාළහ:**"තීණිමානි භික්ඛවෙ සමණස්ස සමණකරණීයානි.කතමානි තීණි: අධිසීල සික්ඛාසමාදානං, අධිචිත්තසික්ඛාසමාදානං, අධිපඤ්ඤාසික්ඛාසමාදානං. ඉමානි ඛො භික්ඛවෙ තීණි සමණස්ස සමණකරණීයානි".** එම පුහුණුව පිණිස මෙසේ හික්මිය යුතුය: අපට, අධි ශීලශික්ෂා සමාදානය... අධි චිත්තශික්ෂා සමාදානය... අධිප්‍රඥා ශික්ෂා සමාදානය පිලිබඳ තදබල කැමැත්තක් ඇත: **"තස්මාතිහ භික්ඛවෙ එවං සික්ඛිතබ්බං: තිබ්බො නො ඡන්දො භවිස්සති අධිසීල සික්ඛාසමාදානෙ... අධිචිත්තසික්ඛාසමාදානෙ... අධිපඤ්ඤාසික්ඛාසමාදානෙති".** එලෙස, අධිශීලයේ, අධිචිත්තයේ, අධිප්‍රඥාවේ හික්මෙන භික්ෂුවගේ, රාගය දෝසය හා මෝහය ප්‍රහාණය වන බවද ඔහු කිසියම් අකුසලයක හෝ පාපි ක්‍රියාවන් හි නො යෙදෙන බව ද බුදුන් වහන්සේ වදාළහ. **මූලාශ්‍ර**: අංගු.නි: (1 ): 3 නිපාත: ශ්‍රමණ වග්ග: 1.2.4.1, 3.2.4.4. සූත්‍ර, පි. 450, EAN: 3: Ascetics: 81.1 Ascetics, p. 121.

▲ **ත්‍රිවිධ ශික්ෂාව**- The three training: ත්‍රිවිධ ශික්ෂාව-පුහුණුව ලෙසින් පෙන්වා ඇත්තේ බඹසර ජීවිතය සාක්ෂාත් කරගැනීම පිණිස පිළිපදින පුහුණුවය: අධිශිලශික්ෂාව, අධිචිත්තශික්ෂාව, අධිප්‍රඥාශික්ෂාව. **බලන්න:** අධිශිලශික්ෂාව-අධිචිත්තශික්ෂාව- අධිප්‍රඥාශික්ෂාව, ත්‍රිවිධ ශ්‍රමණ කාර්යය, ශික්ෂාව. **සටහන:** ත්‍රිවිධ ශික්ෂාව-පුහුණුව නිසා ලැබෙන ආනිසංස පිළිබඳව **බලන්න**: ඛු.නි: ඉතිවුත්තක: 2.2.9 ශික්‍ෂා ආනිසංස සූත්‍රය,පි.398.

▲**ත්‍රිවිධ ශිලය-** Three virtues: ශීලයේ විවිධත්වය යටතේ ත්‍රිවිධ ශිලය පෙන්වා ඇත: 1. හීන සීලය: කිර්තිය පිණිස සමාදන්වේ 2. මධ්‍යම සීලය: දේවලෝක උත්පත්ති ආදිය සලකා සමාදන්වන ආනිසංස සීලයය 3. ප්‍රණීත සීලය: ප්‍රඥාව ඇතිව සමාදන්වන සීලය**. බලන්න:** ශිලය.

**තස**

▲ **තිසරණය**- Three Refuges: බුද්ධ ධම්ම හා සංග රත්නය සරණය-පිහිට කරගත් අය බෞද්ධයන්ය. තිසරණය යහපත් ලෙසින් පිහිටුවා ගැනීම ආධ්‍යාත්මික මගට පදනමවේ. තිසරණය සිහිපත් කිරීමෙන් සිත සුවපත් කර ගත හැකිවේ, භිය හා තැතිගැනීම පහවේ. තිසරණය, අනුසති භාවනාවකි. **බලන්න**: ධජග්ග සූත්‍රය, භාවනා, ත්‍රිවිධ රත්නය, තෙරුවන්. **සටහන:** භාග්‍යවතුන්වහන්සේ තිසරණ මහිමය ගැන ගාථා 3ක් උගන්වා චත්ත නම් මානවකයාට මරණයෙන් පසු සුගතියක යලි උපත ලබාගැනීමට මග සලසා දුන්බව ඛු.නි: විමානවත්ථු, චත්ත මානවක කතාවේ පෙන්වා ඇත.

▼වෙනත් මූලාශ්‍ර:: **1. The Threefold Refuge** by Nyanaponika Thera: Wheel: 76: BPS: 2008. **2. තිසරණ මහිම:** කටුකුරුන්දේ ඤාණානන්ද භික්ෂු, පහන්කනුව ධර්ම දේශනා, 2012

▼ **තිසරණ සරන ගිය පළමු උපාසක හා උපාසිකාව**: යසකුල පුත්‍රයාගේ පියා ඔහු සොයමින් යන්නේ බුදුහිමි දැක දහම් අසා තිසරණ සරණ ගියහ. හෙතෙම ලෝකයෙහි පළමු තේවාචික උපාසක වූයේය. යසකුල පුත්‍රයාගේ (යසකුලපුත්‍ර තෙර) මව,හා ගිහිකල බිරිඳ, බුදුහිමි වෙතින් දහම් අසා තිසරණ සරණ ගියහ. ඒ දෙදෙනා ලෝකයේ පළමුවෙන් තිසරණ සරණ ගිය උපාසිකාවන්ය. **මූලාශ්‍රය**: වින.පි**:** මහාවග්ග පාලිය 1:මහාඛන්ධක**:** 14 පබ්බජා කතා, පි. 107.

▼ **තිසරණ සරණ යාම උතුම් සරණය**: බියට, දුකට පත් මිනිසුන් කඳු, වනයන් ආදී තැන් සොයා යති. එහෙත්, ඒවායින් පිහිටක් නැත. උතුම් සරණය තිසරණයය, ඒකාන්තයෙන්ම බිය නැතිකරයි, දුක නැතිකරයි, උතුම් පිහිටය.

**"එතං ඛො සරණං ඛෙමං එතං ඛො සරණමුත්තමං**
**එතං සරණමාගම්ම සබ්බ දුක්කා පමුච්චති"** . **මූලාශ්‍රය:** ඛු.නි: ධම්මපද: බුද්ධවග්ග, ගාථා 188- 192

▲**තිස්ස තෙර1-** Tissa Thera 1.බලන්න: උපග්‍රන්ථය:1

▲**තිස්ස තෙර2 (කපිලවස්තු)-**Tissa Thera:බලන්න: උපග්‍රන්ථය:1

▲ **තිස්ස බුදුන්වහන්සේ** -The Buddha Tissa: ගෝතම බුදුන් වහන්සේට පෙර වැඩසිටි, තිස්ස බුදුන් වහන්සේ සම්බෝධිය ලැබීම පිලිබඳ විස්තර

මෙහි පෙන්වා ඇත. **මූලාශ්‍රය**: ඛු.නි: බුද්ධවංස පාලි: 17 තිස්ස බුද්ධවංසො, පි.197.

▲ **තිස්ස බ්‍රහ්ම-Brhma Tissa**: බුදුන් වහන්සේගේ ශ්‍රාවකව වැඩසිටි තිස්ස තෙරුන් මරණින් මතු තිස්ස බ්‍රහ්ම ලෙසින් බ්‍රහ්ම ලෝකයේ උපත ලැබුබව, එතුමා මහා ඉර්දී ඇතිබව, මහා මුගලන් තෙරුන්, එතුමා හමුවීමට දෙව්ලොවට වැඩි බව මෙහි දක්වා ඇත. **මූලාශ්‍රය:** අංගු.නි: 6 නිපාතය:දේවතාවග්ග:6.1.4.4 මොග්ගල්ලාන සූත්‍රය.

▲ **තිස්නවයක් භික්ෂූන්වහන්සේ** - 39 Bihhukus: පාවානුවර වැසි 39ක් භික්ෂූන්හට, දීර්ඝ සංසාර දුක පිළිබඳව බුදුන් වහන්සේ වදාළ දේශනය අසා, ඒ භික්ෂූන් සැමදෙනාම අර්හත්වය ලැබූ අන්දම මෙහි විස්තර කර ඇත. **බලන්න:** සංයු.නි: අනමතග්ග සංයුත්ත: 3.2.3 තිංසමත්ත සූත්‍රය.

▲ **තුසිත දේවලෝකය**- Tusita Devaloka: කාමාවචර දේවලෝකයකි. බුද්ධත්වය පතා පෙරුම්පුරන බෝසතුන්-බෝධිසත්වයන්, මිනිස් ලොව පහළවීමට පෙර උපත ලබන දේවලෝකයය. **බලන්න**: දේව ලෝක, බෝධිසත්ව. **සටහන**: අපගේ බුදුන් වහන්සේගේ මව:මහමායා දේවිය මරණින් මතු තුසිත දේවලෝකයේ උපත ලැබූ බව මෙහි දක්වා ඇත. **මූලාශ්‍රය**: ඛු.නි: උදානපාලිය: 5.2 අප්පායුක සූත්‍රය, පි.250.

▲ **තස්සපාපියාසිකා කර්මය**- Tassapāpiyasikakamma: මෙය බරපතල කර්මයක් කළ සංඝයාට පනවන විනය කර්මයකි. එවැනි කර්මයක් කළ භික්ෂුව කරුණු 8 කට යටත්ව කටයුතු කලයුතුය යි බුදුන් වහන්සේ පෙන්වා ඇත **බලන්න**: වින.පි: සංඝකර්ම.

## ථ කොටස: ථන,ථප,ථම,ථර,ථල,

### ථන

▲ **ථිනමිද්ධ**- Drowsiness and Lethargy: ථිනමිද්ධය- අලසබව යනු නීවරණ ධර්මයකි, ධර්ම මාර්ගය අහුරා තබයි. **බලන්න:** නීවරණ.
▼ **ථිනමිද්ධ යනු** නිදිමත, අලසකම, ඇහමැලිකැඩීම, අරතිය, බත්මතය යන නීවරණ ධර්මතාය. ඒවා ඇතිතාක් ආරිය මග දර්ශනය නොවේ. වීරිය ඇතිකර ගැනීමෙන්, ථිනමිද්ධය පහකර, ආරිය මග උදාකරගත යුතුවේ. **බලන්න**: අරතිය, **මූලාශ්‍ර**: සංයු.නි: (1 ): සගාථවග්ග:දේවතාසංයුත්ත: 1.2.6 නිද්දාතන්නදී සූත්‍රය, පි. 40, ESN: 1: Devatasamyutta: 16.6 Drowsiness and Lethargy, p.75.

▼ **නූපන් ථිනමිද්ධය ඇතිවීමට**, උපන් ථිනමිද්ධය වැඩීමට, හේතුවන කරුණු: 1) අරතිය (**අරති**) මාර්ගය පිලිබඳ ඇල්ම නැතිවීම) 2) අලසකම (**තන්දි**) 3) ඇහමැළි කැඩීම (**විජම්භිකා**) 4) බත්මත (**භත්තසම්මදො**)5) සිතේ හැකුලුනු බව (**චෙතසොලීනත්තං**) මේ කරුණු පිලිබඳව අයෝනිසෝ මනසිකාරයෙන් කටයුතු කිරීමය. බුදුන් වහන්සේ පෙන්වා ඇත්තේ, ථිනමිද්ධය ඇතිවීම හා වැඩීම පිණිස, අයෝනිසෝ මනසිකාරයෙන් කටයුතු කිරීම මේ හැර, වෙනත් එකම කරුණක් වත් බුදුඇසට නො පෙනෙනබවය. (Bhikkhus, I do not see even one other thing on account of which unarisen dullness and drowsiness arise and arisen dullness and drowsiness increase and expand so much

as discontent, lethargy, lazy stretching, drowsiness after meals, and sluggishness of mind). **මූලාශ්‍ර**: අංගු.නි: (1): 1 නිපාත: 1.2.3 සූත්‍රය, පි. 44, EAN:1: 13.3 sutta, p. 37, සංයු.නි: (5-1): මහාවග්ග:බොජ්ඣංග සංයුත්ත: 2.6.1 ආහාර සූත්‍රය, පි. 230, ESN: 46: Bojjanghasamyutta: 51.1 Nutriment, p. 1787.

▼ **ථිනමිද්ධය ප්‍රහාණය කිරීම**: ථිනමිද්ධය ප්‍රහාණය කිරීමට උපකාරී ධර්ම: 1) ආරම්භක ධාතුව 2) නික්කම ධාතුව 3) පරාක්‍රම ධාතුව. ඒවා පිළිබඳව යෝනිසෝමනසිකාරයෙන් කටයුතු කිරීම. බුදුන් වහන්සේ පෙන්වා ඇත්තේ, ථිනමිද්ධය පහකිරීමට, මේ කරුණු හැර, වෙනත් එකම කරුණක් වත් බුදුඇසට නො පෙනෙනබවය. **සටහන්**: * **ආරම්භක ධාතුව, නික්කම ධාතුව, පරාක්‍රම ධාතුව** යනු පටන් ගත් කටයුත්ත කර ගැනීමට වීරිය ක්‍රමයෙන් බලවත්විමය. **බලන්න**: වීරිය. ** අලසබව හා නිදිමත මැඩ ගැනීමට උපකාරීවන අතිරේක කරුණු: සීමාවක් ඇතිව ආහාර ගැනීම; තමන් සිටිනා ඉරියව්ව (posture) මාරුකිරීම; ආලෝක සංඥාවට සිත යොමුකිරීම; එළිමහනේ සිටීම; කල්‍යාණ මිත්‍ර ආශ්‍රය; සුදුසු යහපත් ධර්ම කතාවේ යෙදීම, ආහාර ගන්නාවිට, කුසට තව කටවල් කිහිපයක් ගැනීමට හැකිවුවද ඒඅවස්ථාවේ ආහාර ගැනීම නැවත්වීමෙන් කුසට පහසුව ඇතිවේ. **බලන්න:** EAN:Notes: 33 & 34, p 581. **මූලාශ්‍ර**: අංගු.නි: (1 ):1 නිපාත: 1.2.8 සූත්‍රය, පි. 46 , EAN:1: 18.8 sutta, p. 37, සංයු.නි: (5-1 ): මහාවග්ග: බොජ්ඣංග සංයුත්ත: 2.6.1 ආහාර සූත්‍රය, පි. 230, ESN: 46: Bojjanghasamyutta: 51.1 Nutriment, p. 1787.

▼ **භාවනාව වැඩීම පිණිස** ථිනමිද්ධය ප්‍රහාණය කරගතයුතු ආකාරය: 1) භාවනාවේ යෙදී සිටිනවිට නිදිමත ඇතිවුවේනම්, භාවනාව පිණිස මුල් කරගත් සංඥාව-අරමුණ වෙනස් කිරීම 2) තමන් ඇසූ, ඉගෙනගත් ධර්මය ගැන සිහිකිරීම-අවර්ජනා කිරීම 3) ධර්මය සජ්ජායනා කිරීම 4) දෙකන් හා ගාත්‍ර, අතින් පිරිමැදීම 5) අසුනින් නැගිට ගොස්, දියෙන් ඇස් පිරිමැදීම, සැම දිසාවක් මැනවින් බැලීම, ආකශය හා තරකා දෙස බැලීම 6) ආලෝක සංඥාව පිහිටුවා ගැනීම. **බලන්න**: ආලෝක සංඥාව. 7) සක්මන් කිරීම- ඉදිරියට යනවිට හා ආපසු හැරී එනවිට, ඉදිරියේ ඇති දේ හා පසුපස ඇතිදේ පිලිබඳ සිතේ අවධානය ඇතිකරගැනීම (ඉන්ද්‍රිය පිහිටුවා ගැනීම- perceiving what is behind you and what is in front, with your sense faculties drawn in and your mind collected). එම කරුණු මගින් නිදිමත පහකර ගත නොහැකි නම්, අවදිවන වෙලාව සිතේ සටහන් කර කෙටි නින්දක් ගැනීම. අවදිවූ සැනෙන්, නිදිසැප යෙහි නොයෙදීමට, ථිනමිද්ධයට යට නොවීමට අදිටන් කර ගැනීම. **සටහන:** බුදුන් වහන්සේ මේ සූත්‍රය, මුගලන් තෙරුන්ට වදාළහ. **මූලාශ්‍ර**:අංගු.නි. (4 ): 7 නිපාත: 7.2.1.8 පචලායන සූත්‍රය, පි. 426, EAN: 7: 61.8 Dozing, p. 391.

▼**අරහත්වය පසක්කරගැනීම** පිණිස ථිනමිද්ධය පහකරගැනීම අවශ්‍යවේ. **මූලාශ්‍රය:** අංගු.නි: (4) 6 නිපාත: අනාගාමීවග්ග: 6.2.2.2. අරහත්ඵල සූත්‍රය, පි.238.

▼**ථිනමිද්ධය,** පහ කරගැනීම පිණිස ආලෝක සංඥාව ඇති කරගතයුතුවේ. **බලන්න**: ආලෝකසංඥාව.

**ථප**

▲**ථූප-**Thupa: ථූප-ස්ථූප ලෙසින් පෙන්වා ඇත්තේ ආරියපුද්ගලයන් සිහිකිරීම පිණිස, ධාතු තැන්පත් කිරීමට ගොඩ නංවන ස්මාරකයන්ය. එලෙස ස්මාරකයන් ඉදිකිරිම පිණිස සුදුසු උතුමන් : බුදුන්වහන්සේ, පසේ බුදුන් වහන්සේ, තථාගත ශ්‍රාවකයෝ, සක්විති රජ. **බලන්න**: ස්ථූප. **සටහන**: 'ථූපවංසය' පැරණි සිංහල ග්‍රන්ථයේ, පැරණි ලංකාවේ ස්තූප ගැන විස්තර දක්වා ඇත. **මූලාශ්‍රය:**අං.ගු.නි: (2) 4 නිපාත:4.5.5.5. ථූපාරහ සූත්‍රය, පි.492.

**ථම**

▲**ථම්භය-** obstinacy: ථම්භය යනු සිතේ ඇති තද බවය (අකීකරුබව), දහම් අවවාද ඇසීමට,: පිළිපැදීමට ඇති අකමැත්තය. මෙය උපකෙලෙසහයකි, මෙය අකුසලයකි, අරහත්වය පිණිස පහකරගතයුතු කරුණකි. **බලන්න:** අරහත්, මුරණ්ඩුබව, උපකෙළෙස.

**ථර**

▲ **ථෙර-ථෙරි-**Thera  Theri: වැඩිහිටි භික්ෂු භික්ෂුණියන් ථෙර ථෙරි ලෙසින් හඳුන්වයි. **බලන්න:** තෙර-තෙරි.

▲ **ථෙර ගාථා ථෙරී ගාථා-** Thera gatha Theri gatha : ථෙර ථෙරී ගාථා පාළිය, ත්‍රිපිටකයේ, ඛුද්ධක නිකායට අයත් 8 නි ග්‍රන්ථය වේ. බුදුන් වහන්සේගේ, ශ්‍රාවක ශ්‍රාවිකාවන් විසින්, තමන් මගඵල ලබාගැනීම නිසා උපන් ප්‍රීතිය පළකිරීමට පැවසූ උදාන, තමන් තුල ඇති උතුම් ගුණ ප්‍රකාශ කරන ගාථා, බුදුරජාණන් වහන්සේ ගේ ගුණ පවසන ගාථා, බුදුහිමියන් වෙතින් අසා දැනගත් ගාථා, ඒ ඒ අවස්ථාවන්හි ප්‍රකාශ කළ ගාථා මෙහි ඇතුලත්වේ.  මේ සියලු  ගාථාවන් එක්කොට ප්‍රථම සංගායනාවේදී සජ්ජායනා කරන ලදී. තෙරුන් 264 කගේ ගාථා ථෙර ගාථා නිපාතයට ඇතුලත්වේ. තේරී ගාථා 73කි.**බලන්න**: ඛු.නි:ථෙර ථෙරී ගාථා.

▲ **ථෙර නම් භික්ෂුව-** Bhikkhu Threa: **බලන්න**: උප ග්‍රන්ථය:1.

**ථල**

▲ **ථුල්ල තිස්සා මෙහෙණ-Thulla Tissa Meheniya:** බලන්න: උප ග්‍රන්ථය:4.

▲ **ථුල්ල නන්දා මෙහෙණ-Thulla Nanda Meheniya:** බලන්න: උප ග්‍රන්ථය:4.

## ද කොටස: දක,දග,දභ,දස,දඩ,දට,දත,දන,දණ,දප,ද බ,දඹ, දම,දය,දර,දල, දළ,දව,දස,දශ,දෂ,දහ

**දක**

▲**දක්ඛිණාව**(පාලි): **දක්ෂිණාව-**Dakkina: දක්ෂිණාව යනු උතුම් දානයය. බුදුන් වහන්සේ ඇතුළු සංඝයාට පිරිනමන සිව්පස දක්ෂිණාව ය. **බලන්න**: දානය. දක්ෂිණාව, පූජා පිළිගැන්වීම, එහි ඵල විපාක-ආනිසංස ආදී විස්තර

පිණිස **බලන්න**: ම.නි: දක්ඛිණාවිභංග සූත්‍රය. **ශබ්දකෝෂ: පා.සිං.ශ:** පි: 313: "**දක්ඛිණා:** සත්කාර සහිතව දෙන දානය, උත්තම දානය, චීවරාදී සිව්පසය".

▼**දක්ෂිණාවට සුදුසු උතුමන් දෙදෙනක්** බුදුන් වහන්සේ පෙන්වා ඇත:
"දානය පිළිගැන්වීමේ නිරත පුද්ගලයන්ට-ත්‍යාගශීලි අයට, දාන මාන පිළිගැන්වීමට සුදුසු දෙදෙනක් මේ ලෝකයේ සිටි: සේඛ හා අසේඛය. කයින් වචනයෙන් හා සිතින් ඍජුව හැසිරෙන ඔවුන්, ත්‍යාගශිලින්ට, පින් ඇතිකරන කෙතකි, ඔවුන්ට කරන පුජා මහා ඵල ඇතිකරයි". **" සෙඛො අසෙඛො ච ඉමස්මිං ලොකෙ - ආහුණෙය්‍යා යජමානා නං හොන්ති, තෙ උජ්ජුභූතා කායෙන වාචාය උද චෙතසා- ඛෙත්තං තං යජමානානං එත්ථ දින්නං මහප්ඵලන්ති"** In this world the trainee and one beyond training are worthy of the gifts of those practicing charity; upright in body, speech, and mind, they are the field for those practicing charity; what is given to them brings great fruit) **.බලන්න**: සේඛ හා අසේඛ. **සටහන්: *** ම.නි: **දක්ඛිණාවිභංග සූත්‍රයේ** මේ පිලිබඳ විස්තරාත්මකව පෙන්වා ඇත.** සේඛ:පුහුණුවේ යෙදීසිටින, අසේඛ: රහතන්වහන්සේ. **මූලාශ්‍ර:**අංගු.නි:(1):2 නිපාත:2.1.4.4 සූත්‍රය, පි. 162 , EAN: 2: 35.5 Sutta, p.61.

▲ **දක්ඛිණෙය්‍යා** (පාලි): **දක්ශිනාවට සුදුසු -** worthy of offerings දක්ඛිණෙය්‍යාලෙසින් පෙන්වා ඇත්තේ දාන මාන පුජා කිරීමට සුදුසු, සිල්වත් ගුණවත් උතුම් පුද්ගලයන් ගැනය. මෙය සංඝයා සතු ගුණයකි. **බලන්න**: සංඝ ගුණ. **මූලාශ්‍ර:** අංගු.නි: (6): 10 නිපාත: 10.1.2.6 ආහුණෙය්‍ය සූත්‍රය,පි.70, 11 නිපාත 11.2.1 හා 11.2.2. මහානාම සූත්‍ර, පි.645.

▲**දක්ඛිණෙය්‍ය අග්නි**-Dakkinwyya agni: ධර්ම ගුරුවරු නමැති ගින්න. මේ ගින්නටද -ගුරුවරුන්ටද පුද සත්කාර කලයුතුබව මෙහි පෙන්වා ඇත. **මූලාශ්‍ර**: දිඝ.නි: (3): 10 සංගිති සූත්‍රය- පි. 381 , EDN: 33 Sangīti Sutta: The Chanting Together, p. 367.

▲ **දක්ෂිණාගර්හ ගින්න**-Dakkinagarha ginna: මින් පෙන්වා ඇත්තේ උතුම් සංඝයාට නින්දා පරිභව කිරිමෙන් ඇතිවෙන දුක-අයහපත් කම්මවිපාක ගැනය. **බලන්න:** ආරියඋපවාද. **මූලාශ්‍ර:**අංගු.නි: (4): 7 නිපාත:මහායඤ්ඤවග්ග: 7.1.5.3 අග්ගි සූත්‍රය, පි.364.

▲ **දක්ඛිණගිරිය**-Dakkinagiri: මගධ දේශයට දකුණින් පිහිටි කඳු ප්‍රදේශයකි. මහා සැරියුත්, මහා මුගලන් ඇතුළු බුදුන් වහන්සේගේ සංඝයා, දහම් චාරිකාව සඳහා මෙහි වැඩම කර ඇත. මෙහිදී, උත්තරා නන්ද මාතා උපාසිකාව, අගසව් දෙනම ඇතුළු සංඝයාට මහා දනක් පිරින්මනලදී. බුදුන් වහන්සේ එම දානය ප්‍රසංසා කර වදාළ බව මෙහි පෙන්වා ඇත. **බලන්න**: උපග්‍රන්ථය:3. බුදුන් වහන්සේ පරිනිබ්බානයෙන් පසු ආනන්ද තෙරුන්, නවක සංඝ පිරිසක් සමග මේ ප්‍රදේශයේ සංචාරය කළ බව මෙහි දක්වා ඇත.**බලන්න**: උපග්‍රන්ථය:4 **මූලාශ්‍රය:** සංයු.නි: (2) කස්සපසංයුත්ත: 4.1.11 චීවර සූත්‍රය, පි.352.

▲ **දක්ඛිණාවිසුද්ධි**- Purification of offerings: දක්ඛිණාවිසුද්ධි ලෙසින් පෙන්වා ඇත්තේ දක්ෂිනාව- බුදුන්වහන්සේ ඇතුළු සංඝයාට පිරිනමන දාන පිරිසුදුබවට පත්වන ක්‍රමයය: **1)** දායකයා නිසා පිරිසුදු වන, ප්‍රතිග්‍රාහකයා නිසා පිරිසුදු නොවන දානය: දායකයා සිල්වත්ය, ප්‍රතිග්‍රාහකයා දුසිල්වත්වීම. **2)** ප්‍රතිග්‍රාහකයා නිසා පිරිසුදුවන, දායකයා නිසා පිරිසුදු නොවන දානය: ප්‍රතිග්‍රාහකයා සිල්වත්ය, දායකයා දුසිල්වත්වීම. **3)** දායකයා හා ප්‍රතිග්‍රාහකයා යන දෙදෙනාම නිසා පිරිසුදු නොවන දානය : දෙදෙනාම දුසිල්වත්වීම.**4)** දායකයා හා ප්‍රතිග්‍රාහකයා යන දෙදෙනාම නිසා පිරිසුදුවන දානය දෙදෙනාම සිල්වත්වීම. **බලන්න**: ම.නි: දක්ඛිණාවිභංග සූත්‍රය, දාන **මූලාශ්‍ර**: අං.ගු.නි: (2 ): 4 නිපාත: 4.2.3.4 පඨම අග්‍ර හා 4.2.3.5 දුතිය අග්‍ර සූත්‍ර, පි. 170, EAN: 4: 74.4 & 75.5 foremost suttas, p. 178.

▲**දක්ෂිණ දේශය**-Southern Province: බුදුන් වහන්සේ වැඩ සිටි සමයේ දක්ෂිණ දේශය ලෙසින් විස්තර කර ඇත්තේ වර්තමාන ඉන්දියාවේ දකුණු ප්‍රදේශයය- දකුණු ඉන්දියාව.එම ප්‍රදේශයේ පැවති මළවුන් අනුස්මරණය ක්‍රමයක් ගැන මෙහි විස්තර කර ඇත. **බලන්න**: ආරියධෝවනය හා ආනාරියධෝවනය.

▲ **දුක:** පාලි: **දුක්ඛං-** suffering: දුක්ඛ හෙවත් දුක (කායික හා මානසික වේදනා) බුදුදහමේ ත්‍රිලක්ෂණය ලෙසින් පෙන්වා ඇති මූලික සිද්ධාන්තයේ දෙවන ධර්මතාවය. සියලුදේ දුකය **(සබ්බං... දුක්ඛං)** යයි බුදුන් වහන්සේ වදාළහ. දුක සත්‍යයකි, චතුරාර්ය සත්‍යයේ පළමු සත්‍යයය. එය යහපත් ලෙසින් අවබෝධ කරගැනීමෙන් **(පරිඤ්ඤෙය්‍ය)** දුකින් මිදිය හැකිබව **ධම්මචක්කප්පවත්තන සූත්‍රයේ** පෙන්වා ඇත. **බලන්න**: අනිච්ච දුක්ඛ අනාත්ම. **සටහන්:** දුක අවබෝධ කිරීම පිළිබඳව **බලන්න**: සං.යු.නි: (4 ): සළායතන වග්ග: ජම්බුඛාදක සංයුත්ත: 4.1.14 දුක්ඛ සූත්‍රය, පි. 510, ESN: 35: Salayathanasamyutta: 38 Jambukhādaka-Saṃyutta: 14 Suffering, p. 1409. **මූලාශ්‍ර:** සං.යු.නි: ( 4): සළායතනවග්ග: වේදනා සංයුත්ත: 1.5.2 දුක්ඛසූත්‍රය, පි.87.ESN:35: Vedanasamyutta: 23.1 All, p. 1225.

▼**දුකේ උපත**: සියලු දුක් තණ්හාව මුල් කර ඇත, අනුවණ පුද්ගලයා ඒ නිසා පුනපුනා සසරට පැමිණේ. එහෙත්, සංඛාරයන්හි අනිත්‍යබව දකින, සසර දුක ජාතිය ප්‍රභව කොට ඇතය දකින ප්‍රඥාවන්තයා, උපධි හැර සසරෙන් මිදේ (දුක්ඛනිරෝධය). **මූලාශ්‍රය**: ඛු.නි.සුත්තනිපාත: පාරායනවග්ග:වස්තුගාථා: පි,326, 5-4 පුන්නක මානවක, පි.340.

▼**දුක තුන්ආකාරවේ -** Three kinds of sufferings: බුදුන් වහන්සේ මෙසේ වදාළහ:

**"තිස්සො ඉමා භික්ඛවෙ, දුක්ඛතා. කතමා තිස්සො: දුක්ඛදුක්ඛතා, සඞ්ඛාරදුක්ඛතා විපරිණාම දුක්ඛතා. ඉමාසං ඛො භික්ඛවෙ, තිස්සන්නං දුක්ඛතානං අභිඤ්ඤාය, පරිඤ්ඤාය, පරික්ඛයාය, පහානාය අරියො අට්ඨඞ්ගිකො මග්ගො භාවෙතබ්බො..."** . තුන් ආකාර දුක: 1) **දුක්ඛදුක්ඛ** - as pain (කායික හා මානසික වේදනා නිසා ඇතිවෙන දුක) 2) **සංඛාර දුක්ඛ** -(as inherent in formations) (චේතනා-සකස්කිරීම් නිසා ඇතිවෙන දුක) 3) **විපරිනාම දුක්ඛ** (as due to change) (වෙනස්වීම-

විපරිනාමය නිසා ඇතිවෙන දුක). දුක පිලිබඳ විශේෂ දැනුම පිණිස (**අභිඤ්ඤාය** - direct knowledge ), දුක පරිපූර්ණලෙසින් අවබෝධ කරගැනීම පිණිස(**පරිඤ්ඤාය-** full understanding**),** දුක මුළුමනින්ම විනාශ කිරීම පිණිස (**පරික්ඛයාය-** utter destruction) දුක සහමුලින්ම ප්‍රහිණය කරගැනීම පිණිස, (**පහානාය** -abandoning ) ආරිය අටමග යහපත් ලෙසින් වඩා ගතයුතුවේ. **සටහන**: සැප වේදනා අවසන්වීම විපරිනාම දුකකි, සකස්කිරීම් ඇතිව නැතිවීම සංකාර දුකකි. **බලන්න:** ESN: note: 274, p. 1560, ත්‍රිවිධ දුක. **සටහන:** සංයු.නි: (4) සළායතනවග්ග:ජම්බුඛාදාකසංයුත්ත: 4.1.14 දුක්ඛ සූත්‍රය, පි.510, සැරියුත් තෙරුන් ත්‍රිවිධ දුක පෙන්වා ඇත. **මූලාශ්‍ර**: දිඝ.නි: (3): 10 සංගිති සූත්‍රය- ඡෙදය 10, පි. 380 , EDN: 33 Saṅgīti Sutta: The Chanting Together-section 10, p. 366, සංයු.නි: (5-1): මහාවග්ග:මග්ගසංයුත්ත: 1.15 දුක්ඛතා සූත්‍රය, පි.156, ESN: 45: Maggasamyutta: 165.5 Suffering, p. 1710.

▼**දුකට මුල-**Root cause for suffering: දුක**,** අඝ ලෙසින්ද පෙන්වා ඇත. දුක යනු රූපය, වේදනාව, සංඥාව, සංස්කාර හා විඥාණය ය (පංචඋපාදානස්කන්ධය).
**"…කතමඤ්ච භික්ඛවෙ, අඝං: රූපං… වෙදනා… සඤ්ඤා… සඞ්ඛාරා… විඤ්ඤාණං අඝං". දුකට මුල** (අඝමූලඤ්ච): තණ්හාවය: පුනර්භවය ඇතිකරන, නන්දිරාග සහගත, ඒ ඒ භවයන් ගැන අභිනන්දනය කරණ තණ්හාවය. එනම්: කාම, භව හා විභව තණ්හාවය:

**"…කතමඤ්ච භික්ඛවෙ, අඝමූලඤ්ච: යායං තණ්හා පොනොභවිකා නන්දිරාගසහගතා තත්‍රතත්‍රාභි නනන්දනී, සෙය්‍යථීදං:කාමතණ්හා, භවතණ්හා, විභවතණ්හා. ඉදං වුච්චති භික්ඛවෙ, භික්ඛවෙ අඝමූලන්ති…"** **සටහන:** දුක ඇතිවීමට හේතුව පංච ස්කන්ධය උපාදාන කිරීමය. **මූලාශ්‍ර:** සංයු.නි: (3) ඛන්ධසංයුත්ත:1.1.3.10 අඝමූල සූත්‍රය, **පි**. 84, ESN: 22: Khandasamyutta: 30.10 The Root of Misery, p. 1025.

▼ **දුක ඇතිවීම හා නැතිවීම**: සළායතන මගින් බාහිර අරමුණු අලවාගැනීමෙන් ඇතිවන වේදනාව පිලිබඳ ඇති තණ්හාව, දුක ඇතිවීමය. එම තණ්හාව සහමුලින්ම අවසන්කිරීම නිසා ඇතිවන උපාදාන නිරෝධය, ඒ නිසා ඇතිවන භව නිරෝධය දුක නැතිවීම යයි බුදුන් වහන්සේ පෙන්වා ඇත. **සටහන්: *** මෙහිදී පෙන්වා ඇත්තේ පටිච්චසමුප්පාද ක්‍රියාවලිය හා එය අවසන්වීමය. ** සංයු.නි: ඛන්ධසංයුත්තය: අරහත්තවග්ගය: දුක්ඛ සූත්‍රය: යමක් පිලිබඳ ඇති තණ්හාව අවසන් කරගැනීම දුක නැතිවීමයයි පෙන්වා ඇත. **මූලාශ්‍ර:** සංයු.නි: (2 ): නිදානවග්ග: අභිසමයසංයුත්ත: 1.5.3 දුක්ඛ සූත්‍රය**,** පි. 134, ESN:12 Nidanasamutta: V Householders: 43.3 Suffering, p. 672.

▼ **දුක හා දුක ඇතිවීම චතුරාර්ය සත්‍යයේ 1 නි හා 2 නි සත්‍යයන්වේ. දුක යනු**: ඉපදීම… මහලුවීම…ලෙඩරෝග ඇතිවීම..මියයාම…අප්‍රියන් හා එක්වීම …ප්‍රියයන්ගෙන් වෙන්වීම…පතන දේ නොලැබීම දුකය. කෙටියෙන් පවසන්නේ නම් මේ මුළු පංචඋපාදානස්කන්ධ යම දුකය:

**" ඉද ඛො පන භික්ඛවෙ, දුක්ඛං අරියසච්චං: 'ජාතිපි දුක්ඛා ජරාපි දුක්ඛා ව්‍යාධිපි දුක්ඛා මරණම්පි දුක්ඛං අප්පියෙහි සම්පයොගො දුක්ඛො**

**පියෙහි විප්පයොගො දුක්ඛො යම්පිච්ඡං න ලභති තම්පි දුක්ඛං සඞ්ඛිත්තෙන පඤ්චුපාදානක්ඛන්ධා දුක්ඛා’...”** (Now this, bhikkhus, is the noble truth of suffering: birth is suffering, aging is suffering, illness is suffering, death is suffering; union with what is displeasing is suffering; separation from what is pleasing is suffering; not to get what one wants is suffering; in brief, the five aggregates subject to clinging are suffering). **දුක ඇතිවීම යනු තණ්හාවය:** යළිඋපත ඇති කරන, කාමය හා ඒ පිළිබඳ ඇල්ම ඇති, ඒතැන හා මේ තැන සතුට සොයායන, ඒ ඒ භවයන් හි ඇල්ම ඇති කරන තණ්හාවය: කාමතණ්හාවය, භවතණ්හාවය, විභව තණ්හාවය:

**“ ඉද ඛො පන භික්ඛවෙ, දුක්ඛසමුදයො අරියසච්චං: ‘යායං තණ්හා පොනොභවිකා නන්දිරාගසහගතා තත්‍ර තත්‍රාභිනන්දිනී, සෙය්‍යථීදං: කාම තණ්හා භවතණ්හා විභවතණ්හා’...” සටහන්:** * කාමතණ්හාව: කාම වස්තූන් පිළිබඳ ඇති ඇල්ම **භවතණ්හාව: ශාශ්වත දිට්ඨි සහගත තණ්හාවය- සසර පැවැත්ම ගෙනයාමට ඇති ඇල්ම **විභවතණ්හාව: සහමුලින්ම නැතිවීමට ඇති ඇල්ම- උච්චේද දිට්ඨි සහගත තණ්හාවය. (Now this, bhikkhus, is the noble truth of the origin of suffering: it is this craving which leads to renewed existence, accompanied by delight and lust, seeking delight here and there; that is, craving for sensual pleasures, craving for existence, craving for extermination). **මූලාශ්‍ර:** වින.පි: මහාවග්ග: 1: 22 : පි. 101, සංයු.නි: (5-2): සච්චසංයුත්ත: 12.2.1 ධම්මචක්කප්පවත්තන සූත්‍රය, පි. 294, ESN: 56: Saccasamyutta: 11.1 Setting in Motion the Wheel of the Dhamma, p. 2276.

▼ **සළායතන නිසා දුක ඇතිවේ**: අභ්‍යන්තර සළායතන 6 ක්‍රියාත්මකවීම දුක ඇතිවිමය: ඇසෙහි, කණෙහි, නාසයෙහි, දිවෙහි, කයෙහි, සිතෙහි යම් ඉපදවීමක්, පැවැත්මක්, නිපදවීමක්, පහළවීමක් වේ නම් එය දුක ඇතිවීමය, රෝගයන්ගේ ඇතිවීමය, ජරාමරණය පහළවීමය යි බුදුන් වහන්සේ පෙන්වා ඇත:

**“යො භික්ඛවෙ චක්ඛුස්ස... සොතස්ස... ඝානස්ස... ජිව්හාය...කායස්ස... මනස්ස උප්පාදොඨිති අභිනිබ්බත්ති පාතුභාවො, දුක්ඛස්සෙසො උප්පාදො රොගානං ඨිති ජරාමරණස්ස පාතුභාවො”. සටහන්:** ඉපදවීම යනු නිමිති ගැනීම: ඇසෙන් රූප, කණෙන් ශබ්ද ආදී වශයෙන්. **සළායතන සමනය වීම දුක නිමාවීමය:** ඇසෙහි, කණෙහි, නාසයෙහි, දිවෙහි, කයෙහි, සිතෙහි යම්, නිරෝධයක්, සමනයවීමක් (වූපසම), රෝග නැතිවීමක්, ජරාමරණය අවසන්වීමක් වේනම් එය දුක නිමාවිමය. **බාහිර නිමිති නිසා දුක ඇතිවේ:** බාහිර නිමිති -අරමුණු 6:රූපයේ, ශබ්දයේ, ගඳසුවඳේ, රසේ, පහසේ, සිතුවිලි වල යම්, යම් ඉපදවීමක්, පැවැත්මක්, නිපදවීමක්, පහළවීමක් වේ නම් එය දුක ඇතිවීමය, රෝගයන්ගේ ඇතිවීමය, ජරාමරණය පහළවීමය. **බාහිර නිමිති සමනය වීමෙන් දුක නිමාවේ:** රූපයේ, ශබ්දයේ, ගඳසුවඳේ, රසේ, පහසේ, සිතුවිලි වල යම්, නිරෝධයක්, සමනයවීමක් (වූපසම), රෝග නැතිවීමක්, ජරාමරණය අවසන්වීමක් වේනම් එය දුක නිමාවිමය. **මූලාශ්‍ර:** සංයු.නි: (4): සළායතන වගග: 1.2.9 හා 1.2.10 උප්පාද සූත්‍ර, පි. 54, ESN: 35: Salāyatanasamyutta: 21.9 & 22.10 Arising of suffering,  p. 1224.

▼**සයඅංග පිලිබඳ ඇල්ම ප්‍රහීණය දුකින් මිදීමය-**Terminating the pleasures for six factors is end of suffering: පස්කම් සැපය (පංචකාම ගුණ) හා මනස යන සයඅංග -ආයතන පිලිබඳ ඇති ඇල්ම දුරු කර ගැනීම දුකෙන් මිදීමය යි බුදුන් වහන්සේ පෙන්වා ඇත:

**"පඤ්ච කාම ගුණාලොකෙ මනොඡට්ඨා පවෙදිතා එත්ථ ඡන්දං විරාජෙත්වා එවං දුක්ඛා පමුච්චතී ති". බලන්න**: පංචකාම ගුණ **මූලාශ්‍ර**:සං.යු.නි: (1):සගාථවග්ග:දේවතාසංයුත්ත: 1.3.10 එණිජන්ඝ සූත්‍රය, පි. 58, ESN: 1: Devatasamyutta: 30.10 Antelope Calves, p. 93.

▼**දුක කෙරෙහි නිබ්ද්දාව ඇතිකරගැනීම-**:ඒ සඳහා ඇති පිළිවෙත 6 ආකාරය: 1) **දුක දත යුතුය-** Suffering should be understood.ජාතිය-උපත... ජරාව-මහළුවීම... ව්‍යාධිය-ලෙඩවීම... මරණය... ශෝකය... පරිදේව-විලාපදීම... දුක්වේදනා...දොම්නස, උපායාස, කැමති දේ නොලැබීම දුකය. කෙටියෙන් පවසන්නේ නම් , පංච උපාදාන ස්කන්ධයම දුකය.

**"ජාතිපි දුක්ඛා ජරාපි දුක්ඛා ව්‍යාධිපි දුක්ඛා මරණම්පි දුක්ඛං සොක පරිදෙව දුක්ඛදොමනස්සුපයාසපි දුක්ඛා යම්පිච්ඡං න ලභති තම්පි දුක්ඛං, සඞ්ඛිත්තෙන පඤ්චුපාදානක්ඛන්ධා දුක්ඛා"**
2) **දුකේ නිදාන සම්භවය (උත්පත්ති කරුණ) දත යුතුය** (the source and origin of **-**Suffering should be understood) තණ්හාව දුකේ නිදානයය.

3**)** **දුකේ විවිධත්වය** (වෙමත්තතාව) දත යුතුය (the diversity of Suffering be understood). අධිමාත්‍රදුක (extreme suffering) අල්පමාත්‍රදුක (slight suffering) සෙමින් පහවෙන දුක (දන්ධවිරාගී -suffering that fades away slowly) ඉක්මනින්ම පහවෙන දුක ( ක්ෂිප්‍රවිරාගී -suffering that fades away quickly).

4) **දුකේ විපාකය දත යුතුය** (the result of suffering should be understood): දුකේ විපාක දෙආකාරය: සම්මෝහ විපාක- දුකට පැමිණි කෙනක් විලාප කියමින්, සෝකකරමින් සිහිමුලාවට පත්වේ. පර්යේෂණ විපාක; දුකට පත් කෙනක්, ඒ දුක නැතිකර ගැනීමට කවරෙක් පිහිට වේද කියා සොයයි. 5) **දුක්ඛ නිරෝධය දත යුතුය** (the cessation of suffering should be understood) තණ්හාවේ නිරෝධය, දුක්ඛ නිරෝධයය. 6) **දුක්ඛ නිරෝධගාමිණි ප්‍රතිපදාව දත යුතුය දත යුතුය** (the way leading to the cessation of suffering  should be understood) එනම්, ආරියඅටමගය. මේ කරුණු 6 යහපත් ලෙසින් දන්නා ආරිය ශ්‍රාවකයා, නිබ්බෙදික බ්‍රහ්මචරියාවවු දුක්ඛ නිරෝධය දන්නේය. **මූලාශ්‍ර**: අං.ගු.නි: (4) 6 නිපාත: 6.2.1.9 නිබ්බේධිකසූත්‍රය,පි.220,EAN:6: 63.9 Penetrative,p.355.

▼ **අනභිනිවෘතිය-**යළි උපතක් නොවීම දුක නැතිවීයාමය. **බලන්න**: අභිනිවෘතිය.

▼ **අභිඥෙයිය ධර්මතා** ඇතිකර ගැනීම දුක කෙළවර කරගැනීමේ මගය. **බලන්න**:අභිඥෙයිය ධර්ම.

▼**පංචඋපාදානස්කන්ධය** මගේ යයි අභිනන්දනය නොකරන්නේ නම් ඔහු දුකින් මිදී ඇත. **බලන්න:** අභිනන්දනය.

▼**ආයතන** ඇතිවීම දුකය. **බලන්න**:ආයතන.

▼ **දුක ගෙනදෙන** මග ( කෘෂ්ණමග) වැරදි මගය. **බලන්න**:සුඛ මාර්ගය-දුක්ඛ මාර්ගය.

▼ **දුකට මුල** නම් තණ්හාවය. **මූලාශ්‍රය:** සංයු.නි (3): ඛන්ධසංයුත්ත: භාරවග්ග: 1.1.3.10 අඝමූල සූත්‍රය, පි.84

▼ **දුක** යනු සසර ගමනය. **බලන්න**:සුඛ හාදුක.**මූලාශ්‍ර:** අංගු.නි: (6 ): 10 නිපාත: 10.2.2.5 පඨම සුඛ සූත්‍රය, පි. 246, EAN:10: 65.5 Happiness 1,p. 519.

▼ **අටලෝදහම** යථා ලෙසින් අවබෝධ කිරීමෙන් දුක අවසන්කරගත හැකිය. **බලන්න**: අටලෝදහම. **මූලාශ්‍ර:** අංගු.නි: (6 ): 10 නිපාත: 10.1.3.7. ප්‍රථම මහාපඤ්හ සූත්‍රය, පි. 116, EAN: 10: 27.7 Great Questions -1, p. 503.

▼**දුක අවබෝධය විමුක්තිය පිණිසය**: දුක, යථා පරිදි අවබෝධ කරගැනීම විමුක්තිය පිණිසය.

**"රූපං භික්ඛවෙ දුක්ඛං,**වෙදනා ... **සඤ්ඤා... සඞ්ඛාරා... විඤ්ඤාණං දුක්ඛං. එවං පස්සං ...සුතවා අරියසාවකො රූපස්මිම්පි ...වෙදනායපි... සඤ්ඤායපි... සඞ්ඛාරෙසුපි... විඤ්ඤාණස්මිම්පි නිබ්බින්දති. නිබ්බින්දං විරජ්ජති, විරාගා විමුච්චති, විමුත්තස්මිං විමුත්තමිති ඤාණං හොති: ඛීණා ජාති වුසිතං බ්‍රහ්මචරියං කතං කරණීයං නාපරං ඉත්ථත්තායාති පජානාතීති"** .රූපඋපාදානස්කන්ධය...වේදනා... (මුළු පංච උපාදානස්කන්ධයම) දුක යයි බුදුන් වහන්සේ පෙන්වා ඇත. ඒ දැක කළකිරීම ඇතිකරගන්නා ආරිය ශ්‍රාවකයා, ඒවාට නොඇලී විමුක්තිය ලබා ගනී. **බලන්න**:අනත්තලක්ඛණ සූත්‍රය. **මූලාශ්‍ර:** සංයු.නි: ( 4): සළායතනසංයුත්ත: අනිත්‍ය වග්ග**:** 1.1.2.2 දුක්ඛ සූත්‍රය, පි. 66, ESN:35: Salayatanasamyutta: 13.2  Impermanent, p. 1018.

▼**පංච උපාදානස්කන්ධයම දුකය**: තණ්හාවෙන් පංච උපාදානස්කන්ධය, මමය, මගේය, මගේ ආත්මය (මමංකාරය) යයි අල්වාගැනීම දුකය. එම තණ්හාව දුරුකර ගත යුතුය. ඒ සඳහා ඇති පටිපදාව නම් ආරිය අටමගය.**සටහන**: පංචඋපාදානස්කන්ධයම දුක බව විදසුන් නුවණින් දැනගනිම අරහත්වය ලැබීම බව බුදුන් වහන්සේ පෙන්වා ඇත. **බලන්න**: සංයු.නි: (3) ඛන්ධසංයුත්ත:අනිච්චවග්ග. **මූලාශ්‍ර**: සංයු.නි: (3): ඛන්ධසංයුත්ත: 1.3.1.2 දුක්ඛ සූත්‍රය, පි. 302, ESN: 22: Khanda samyutta: 104.2 suffering, p. 1096.

▼**සතර මහා ධාතු දුකය**: සතර මහා ධාතු (මහාභූත) ඇතිවීම, ඒවාට ඇලීම දුකයයි මෙහි පෙන්වා ඇත. **මූලාශ්‍ර:** සංයු.නි: (2): නිදානවග්ග: ධාතුසංයුත්ත: 2.4.5, 2.4.6 . 2.4.7 සූත්‍ර, පි. 291, ESN:14: Dhatusamutta: 34.5, 35.6, 36.7 suttas, p. 778.

▼ **යළිඋපත නිසා දුක ඇතිවේ**: සැරියුත් මහා තෙරුන්, වදාළේ යළි උපත දුක බවය. යළි උපතක් නැතිනම් දුක් විඳීමක් නොමැත. යළි උපතක් ඇතිවිට දුක ඇතිවීම අපේක්ෂා කළයුතුවේ. ශිතය, ග්‍රීෂ්මය, බඩගින්න, පිපාසය, මළපහකිරීම, මුත්‍රාපහකිරීම, ගින්නෙන් අපදාවීම, පොලු, පිහි, වලින් අපදාවිම, නෑදෑ මිතුරන්ගේ බැණුම් ඇසීමට සිදුවීම ආදිය දුකකි. එහෙත්, යළිඋපතක් නොවේ නම් පෙරකී දුක් ඇතිනොවේ. එය සැපයකි. **බලන්න**:යළි උපත. **මූලාශ්‍ර:** අංගු.නි: (6): 10 නිපාත: 10.2.2.5 පඨම සුඛ සූත්‍රය, පි. 246, EAN:10: 65.5 Happiness 1,p. 519**.**

▼ **දුක කෙළවර කිරීම**: දුක කෙළවර කරගැනීමට පිහිටවන ධර්මතා 10 ක් බුදුන් වහන්සේ පෙන්වා ඇත. ඒ එක් ධර්ම කරුණක්, යහපත් ලෙසින් දන්නා දකිනා භික්ෂුවට දුක අවසන් කර නිවන සාක්ෂාත් කරගත හැකිවේ: **1**සියලු සත්ත්වයෝ අහාරනිසා පෝෂණයවේ **2** නාමරූප **3** ත්‍රිවිධ වේදනා **4** සිව් ආකාර (ආහාර) පෝෂණය **5** පංච උපාදාන ස්කන්ධය **6** සළායතන **7** විඥාණය ස්ථාන හත **8** අටලෝදහම **9** සත්ත්වාවාස නමය **10** දස අකුසල්. **බලන්න**: මහා දස ධර්ම ප්‍රශ්න.**මූලාශ්‍ර:** අංගු.නි: (6): 10 නිපාත: 10.1.3.7. ප්‍රථම මහාපඤ්හ සූත්‍රය,පි. 116 ,EAN: 10: 27.7 Great Questions -1, p. 503.

▲ **දුක්ඛානුපස්සී**- Mindful reflection of suffering: මෙය අනුසති භාවනාවකි. සැදැහැයෙන් පැවිදිවූ කුල පුත්‍රයන්ට සුදුසු භාවනාවක් යයි බුදුන් වහන්සේ වදාළහ. පංච උපාදානස්කන්ධයේ දුක මෙනෙහි කරමින් කරන භාවනාවකි, එම අනුසතිය යහපත් ලෙස දියුණු කරගැනීමෙන් සියලු දුකෙන් මිදේ යයි මෙහි පෙන්වා ඇත. **මූලාශ්‍රය**: සංයු.නි: (3) ඛන්ධසංයුත්ත:කුක්කුලවග්ග: 1.3.4.13 දුක්ඛානුපස්සී සූත්‍රය, පි.348.

▼ **දුක්ඛානුපස්සී** වඩන ලෝකයාට ආහුණෙයා, පාහුණෙයා වන උතුම් පුද්ගලයන් 7 ක් ගැන මෙහි විස්තර කර ඇත. **මූලාශ්‍රය**:අංගු.නි: (4) 7 නිපාත:අනුසයවග්ග: 7.1.2.7 දුක්ඛානුපස්සී සූත්‍රය, පි.318.

▲ **දුක්ඛ ආරිය සත්‍ය**-Dukka Ariya saccha: චතුරාර්යසත්‍යයේ පළමු සත්‍යයය. **බලන්න**: චතුරාර්යසත්‍ය

▲ **දුක්ඛ සමුදය ආරියසත්‍ය-**Dukkasamudaya Ariya saccha: දුක ඇතිවීම මින් පෙන්වා දේ. **බලන්න**: චතුරාර්යසත්‍ය

▲**දුක්ඛ නිරෝධ ආරියසත්‍ය-**Dukka nirodha Ariya saccha: දුක නැතිවීම මින් පෙන්වා දේ. **බලන්න**: චතුරාර්යසත්‍ය

▲**දුක්ඛ නිරෝධ ගාමිණී පටිපදා ආරියසත්‍ය-**Dukka nirodhagaamini patipada Ariya saccha: දුක නැතිකිරීමේ ප්‍රතිපදාව මින් පෙන්වා දේ. **බලන්න**: චතුරාර්යසත්‍ය,ආරියඅටමග.

▲ **දුකඉන්ද්‍රිය**-Duka indriya: ඉන්ද්‍රිය 22න් එක් ඉන්ද්‍රියක් ලෙස දුක ඉන්ද්‍රිය පෙන්වා ඇත. **බලන්න**:ඉන්ද්‍රිය.

▲ **දුක්ඛුද්‍රය ධම්ම**- Dukkhudraya Dhamma : දුක්ඛුද්‍රය ධම්ම (දුකගෙනදන) ලෙසින් පෙන්වා ඇත්තේ: ප්‍රාණඝාතය. සොරකම- අදත්තාදනය, කාමයේ වරදවා හැසිරීම- කාමමිථ්‍යාචාරය, මුසාවාදය, පිසුණාවාචය, පරුෂාවාචය, සම්ප්‍රප්ඵලාප, ලෝභය, ව්‍යාපාදය, මිථ්‍යා

දිට්ඨිය. මේවා මිථ්‍යා දස ධම්ම, මිථ්‍යාමග ලෙසින්ද පෙන්වා ඇත. **මූලාශ්‍රය:** අංගු.නි: (6) 10 නිපාත: සාධුවග්ග: 10.4.3.10 දුක්ඛුද්‍රය සූත්‍රය, පි.534.

▲ **දුක්ඛධම්මය**- Nature of suffering:දුක්ඛධම්මය යනු දුකේ ස්වාභාවයය. බුදුන් වහන්සේ මෙසේ වදාළහ:

"රූපය...වේදනාව...සංඥාව...සංඛාර...විඥානය දුක් ස්වභාවය ඇත්තේය" (Form...Feeling … Perception … Volitional formations … Consciousness is of a painful nature). **මූලාශ්‍ර**:සංයු.නි: (3): ඛන්ධවග්ග: රාධසංයුත්ත: 2.2.6 දුක්ඛධම්ම සූත්‍රය, පි.382, ESN: Radhasamyutta: 16.6 Painful nature, p. 1123.

▲**දුක්වේදනා**-Dukvedana: දුක් වේදනා ලෙසින් පෙන්වා ඇත්තේ කායික වේදනාය. **බලන්න**: ත්‍රිවිධ වේදනා, ඉන්ද්‍රිය.

▲ **දුකින් විසීම හා සැපෙන් වීසීම**- Dwell in suffering & dwell in happiness: දුකින් වාසය කිරීමට හේතුවන ධර්මතා : ක්‍රෝධය, උපනාහය, මකඛය, පළාසය, ඊෂ්‍යාව, මසුරුබව, මායාව , සටකපටබව, අහිරිකය හා අනොත්තප්පය. මේ කෙළෙස් ඇති පුද්ගලයා දුකසේ වාසය කරණ කෙනෙක්ය. එහෙත්, ඒවා අත හැර: අක්‍රෝධය, අනුපනාහය, අමක්ඛය, අපළාසය, අනීෂ්‍යාව, නොමසුරු-මසුරු නැතිකම, අමායාව, සටකපට නැතිබව, හිරි හා ඔත්තප්ප ආදී කුසල ධම්ම ඇතිකර ගන්නේ නම් ඔහු සැපසේ වාසය කරණ කෙනෙකි. **මූලාශ්‍ර**: අංගු.නි: (1) 2 නිපාත: ක්‍රෝධ වග්ග-සූත්‍ර,පි. 226, EAN:2: XVI Anger: Suttas, p. 73.

▲ **දුක්කථා කථා-** Dukkatha katha: දුක්කථා කථා ලෙසින් පෙන්වා ඇත්තේ කිසියම් කතාවක් නිසා අසතුටට පත්වීම, අප්‍රසාදය ඇතිවීම හා කතා කරන කෙනා ගැන කිපිමට පත්වීමය. 1) අශ්‍රද්ධාවත් කෙනෙකුට ශ්‍රද්ධාව ගැන කතාකිරීම 2) දුසිල්වත් කෙනෙකුට ශිලය ගැන කතාකිරීම 3) අල්පශ්‍රැත (අඩු දැනුම) කෙනෙකුට බහුශ්‍රැතබව ගැන කතාකිරීම 4) මසුරු කෙනෙකුට ත්‍යාගශීලිබව ගැන කතාකිරීම 5) ප්‍රඥාව නැති කෙනෙකුට ප්‍රඥාව ගැන කතාකිරීම. **බලන්න**: සුකථා කථා. **මූලාශ්‍ර**: අංගු.නි: (3): 5 නිපාත: 5.4.1.7 දුක්කථා සූත්‍රය, පි. 316, EAN: 5: 1567.7 Wrongly Addressed Talk, p. 288.

▲ **දුක්ඛාපටිපදා දන්ධාභිඤ්ඤා -** Practice that is painful with sluggish direct knowledge: ආධ්‍යාත්මික මාර්ගය වඩා ගැනීම පිණිස අනුගමනය කරන ප්‍රතිපදා 4 න් එකකි. අවබෝධය කල්ගතවන, දුක් පිළිවෙතය. **බලන්න:** සතර මාර්ග ප්‍රතිපදා.

▲ **දුක්ඛාපටිපදා ඛිප්පාභිඤ්ඤා-** practice that is painful with quick direct knowledge: ආධ්‍යාත්මික මාර්ගය වඩා ගැනීම පිණිස අනුගමනය කරන ප්‍රතිපදා 4 න් එකකි. අවබෝධය ඉක්මන්-ක්ෂණික, එහෙත් පිළිවෙත දුකය. **බලන්න:** සතර මාර්ග ප්‍රතිපදා.

▲ **දුක්විපාක**- Dukvipaka: දුක් විපාක ලෙසින් පෙන්වා ඇත්තේ තුන් දොරින් අයහපත් ක්‍රියා කිරීම නිසා මෙලොව හා පරලොව විඳීමට සිදුවන දුක් වේදනාය. දුක්ඛ විපාක ධර්මය නම් මිථ්‍යාදිට්ඨිය මුල් කරගත් මිථ්‍යාමගය. **බලන්න**: කම්ම. **මූලාශ්‍ර:** අංගු.නි: (6): 10 නිපාත: 10.3.4.112

දුක්විපාක සූත්‍රය, පි. 472, EAN:10: 135.2 The Noble Dhamma, p. 548.

**දග**

▲ **දාගැබ-**Dagaba: උතුම් පුද්ගලයන් සිහිපත් කිරීමට, වන්දනා මාන කිරීම පිණිස බෞද්ධයන් සදා ඇති ථූප ආදිය දාගැබ් ලෙසින්ද හඳුන්වයි. **බලන්න**: ස්තූප.

▲**දුගතිය-**bad destinations: දුගතිය ලෙසින් පෙන්වා ඇත්තේ අයහපත් කර්ම විපාක ඵල දීම පිණිස -දුක්විඳීමට සිදුවන, යළි උපත ලබන නරක ස්ථානයන්ය: නිරය, තිරිසන්ලෝකය, ප්‍රේත ලෝකය, අසුරනිකාය ආදීයය. කෙනක් තුන්දොරින් අකුසලක්‍රියා කරන්නේනම්, මිථ්‍යාදිට්ඨිය ඇත්නම් ඔහු ගේ යළි උත්පතිය දුගතියය. **බලන්න**: සතර අපාය, අසුරනිකාය, ප්‍රේත, තිරිසන්ලෝකය, නිරය. **සටහන:** බරපතල අකුසල නිසා කෙනක් දුගතියේ- අවීචිනිරයේ බොහෝ දුක් විඳි. **බලන්න**: අවීචිනිරය. **මූලාශ්‍ර:** අංගු.නි: (2 ) 4 නිපාත: කම්ම වග්ග සූත්‍ර, පි. 468, EAN:4: Kamma: p. 227, අංගු.නි (1) 3 නිපාත: දේවදූතවග්ග: 3.1.4.6 සූත්‍රය, පි. 292, EAN:3: Divine Messengers: 36. 6 Messengers, p.92, මනි: (3) 3.3.10, දේවදූත සූත්‍රය, පි. 400, EMN:130: The Divine Messengers, p.941.

▼**දස අකුසල** කිරීම නිසා දුගතියේ යළි උපත සකස්වනබව මෙහි පෙන්වා ඇත. **මූලාශ්‍ර**: අංගු.නි:( 6):10 නිපාත: ජානුසොණි වග්ග: 10.4.2.10,චුන්ද සූත්‍රය**,** පි.508, EAN: 10: Jāṇussoṇī: 176.10, Cunda,p.553.

▼**අයහපත් ධර්ම චරියාව -අධම්ම චරියා, දුගතියට මගකි.මූලාශ්‍ර**:අංගු.නි:( 6):10 නිපාත: කරජකාය වග්ග:10.5.1.10. අධම්ම චරියා සූත්‍රය, පි.588, EAN: 10: 220.10 Conduct contrary to the Dhamma, p.561

▼**සතර ධර්මය** ඇති ආරිය ශ්‍රාවකයා (සෝතාපන්න) සියලු දුගතියෙන් මිදී ඇත. **මූලාශ්‍ර**:සංයු.නි: (5-2): මහාවග්ග: සෝතාපත්තිසංයුත්ත:11.2.4 දුග්ගති සූත්‍රය, පි.196, ESN:55 Sithapatthisamyutta:14.4.Bad destination, p.2200.

▼**ඉවසීම නැතිකම**, ක්‍රෝධය, අමනාපය, හිරිඔතප් නැතිවීම, උපකෙළෙස නිසා ඇතිවන කෙළෙස්, කෙනෙක් දුගතියට පත්කරයි. ආර්යන්ට නින්දා කිරීමද (ආර්යඋපවාදය) දුගතියට හේතුවේ. **බලන්න**: අක්‍ෂාන්තිය, ආර්ය උපවාද, ක්‍රෝධ, අමනාපය, අහිරිකය හා අනොත්තප්පය, උපකෙළෙස.

▲**දුගීබව-**Poverty: දුගීබව-දිළිඳුබව-දුප්පත්කම- දළිද්ද, කාමභෝගී ලෝකයාට දුකකි. ණයගැතිබව, දුගීබවට හේතුවේ. **බලන්න**: කම්ම, ඉණ,දළිද්ද **සටහන්**: * මසුරුකම, ලෝභය නිසා කෙනෙක් මතු භවයේ දී දුගීබවට පත්වේ. ** මිනිස්ලොව දී කෙනෙක්, පූජා කලයුතු ශ්‍රමණ බ්‍රහ්මණ ආදී උතුමන්ට පූජා නොකිරීම -දන්නොදීම දුගී බවට හේතුවකි: **බලන්න**: මනි: (3): 3.4.5 චූළකම්ම වීභංග සූත්‍රය, පි. 448. ** කාම භෝගීවීම නිසා මිනිසුන් දිළිඳු බවට පත්වේ. **බලන්න:** කාමභෝගී

පුද්ගලයෝ. **මූලාශ්‍රය**: අංගු.නි: (4) 6 නිපාත:ධම්මිකවග්ග: 6.1.5.3 ඉණසූත්‍රය, පි.138.

**දඟ**

▲ **දැඟුල් නුවණ-** Two finger wisdom**:** එක්සමයක මාරයා, සෝමා තෙරණිය අසලට පැමිණ දැඟුල් නුවණ ඇති ස්ත්‍රීන්ට උත්තම බව ලබාගැනීමට නොහැකිය යයි පවසා ඇත. **බලන්න**:උපග්‍රන්ථය:2:සෝමා තෙරණිය,පි.10 **සටහන:** කාන්තාවන්, බත් පිසනවිට, ඇඟිලි දෙකක් ඔබා බත් පිසි තිබේද යයි බලන නිසා සාමන්‍ය සමාජයේ දැඟුල් නුවණ, කාන්තවකගෙ ප්‍රඥාව දක්වීමට යොදාගෙන ඇත.

**දස**

▲ **දීඝ චාරිකා**- Lengthy Wandering: දීඝ චාරිකා ලෙසින් පෙන්වා ඇත්තේ සංඝයා ධර්ම මාර්ගය වඩාගැනීම පිණිස, ගිහියන්ට ධර්මය දේශනා කිරීම පිණිස යන දූර ගමන්ය. ලෝකයාගේ සුවය සැපය පිණිස දහම් චාරිකාවල යෙදීමට බුදුන් වහන්සේ සිය ශ්‍රාවකයන්ට අනුසාසනා වදාළහ. නියම අරමුණ නොමැතිව, නුසුදුසු අවස්ථාවේ (අවස්ථිත), චාරිකාවේ යෙදීමෙන් විපත්-ආදීනව ඇතිවෙන බව බුදුන් වහන්සේ පෙන්වා ඇත: 1) නොඇසූ ධර්මය ඇසීමට නොලැබීම 2) ඇසූ ධර්මයේ නො පැහැදිලි තැන් පිරිසිදු කරගැනීමට නොහැකිවීම 3) ඇසූ ධර්මය පිලිබඳව විසාරද නොවීම 4) දරුණු රෝගාබාධ ඇතිවීම 5) මිත්‍රයන් නොසිටීම 6) මෙතක් නො ලැබූ අධිගමය නොලැබීම 7) ලැබූ අධිගමයක් ඇත්නම් එය වැටියාම 8) තමන් යම් අධිගමයක් ලැබුවේ නම් ඒ පිලිබඳ ස්ථිර බව- විසාරද බව නොමැතිකම. එහෙත්, අවස්ථානුරූපව (සමවස්ථිත) චාරිකාවේ යෙදන සංඝයාට එම කරුණු ඇති නොවීම නිසා චාරිකාවේ යහපත් ප්‍රතිඵල - ආනිසංස ලබා ගත හැකිවේ. **මූලාශ්‍ර**: අංගු.නි: ( 3 ): 5 නිපාත, 5.5.3.1 හා 5.5.3.2 දීඝචාරික සූත්‍ර, පි. 438, EAN:5 : 221.1 & 222.2 Lengthy wanderings, p. 307.

▲ **දීඝායු උපාසක-**Digayu upasaka: **බලන්න:** උපග්‍රන්ථය:3

▲**දීඝජානු කෝලිය පුත්‍ර-**Dighajanu Koliyaputtha**:** බලන්න: උපග්‍රන්ථය:3

▲**දීඝනක පරිබ්‍රාජක**-Diganaka paribrajaka: **බලන්න:** උපග්‍රන්ථය: 3

▲ **දීඝපරාජන යක්සෙනවි-**Dighaparajana Yakka**:** අනුරුද්ධ, නන්දිය හා කිම්බිල තෙරුන්, අරහතත්වයට පත්වීම ගැන මෙතුමා බුදුන් වහන්සේට පැවසීම පිලිබඳ විස්තර මෙහි දක්වා ඇත. **බලන්න:** උපග්‍රන්ථය:නන්දිය තෙර.

**දඩ**

▲**දැඩි ආශාව-** strong desires: මෙය ලෝභය, අබිජ්ජා, මහේච්ඡතාවය ලෙසින්ද පෙන්වා ඇත. අකුසලයකි. **බලන්න**: ලෝභය, ත්‍රිවිධ ධම්මතා.

**දට**

▲**දට්ඨබ්බං -**To see: දට්ඨබ්බං යනු දැකිමය -ධර්මයට අනුකුලව දැකීමය. බුදුන් වහන්සේ පෙන්වා ඇත්තේ, ධර්මතා පිලිබඳ යථාබව - ඇත්ත ඇති සැටියෙන් දැකිය යුතු බවය. එමගින්, සත්‍ය අවබෝධ වේ. **බලන්න**: යථාභූතඥානය.

▼ ත්‍රිවිධ වේදනා දැකිම පිළිබඳව **බලන්න**: සංයු.නි: සළායතන වග්ග: වේදනාසංයුත්ත: සගාථාවග්ග: 1.20.5 **දට්ඨබ්බ සූත්‍රය.**

▼**පංචඋපාදානස්කන්ධය,සළායතන හා බාහිර අරමුණු** දැකීම පිළිබඳව **බලන්න**: අනත්තලක්ඛණ සූත්‍රය, ආදිත්තපරියාය සූත්‍රය.

▼ **ශ්‍රද්ධා ඉන්ද්‍රිය ආදීවූ ඉන්ද්‍රිය 5** දැකිම පිළිබඳව **බලන්න:** සංයු.නි: මහාවග්ග: ඉන්ද්‍රියසංයුත්ත: 4.1.8 **දට්ඨබ්බ සූත්‍රය.**

▲**දිට්ඨී:** පාලි**: දිට්ඨී**- Views: දිට්ඨී යනු මිනිසුන්තුල ඇති විවිධ මත, විශ්වාස, දර්ශන (දැකීම), අදහස්, ආකල්ප ආදියය. ධර්මයට අනුව ඇති කරගතයුතු දිට්ඨීය නම් සම්මා දිට්ඨීයය. සම්මා දිට්ඨීය තිබීම සසරින් ගැලවීමට මගය, මිථ්‍යා දිට්ඨීය සසර ගමන දික් කරයි. **සටහන:** දිට්ඨී පිලිබඳ වැඩිවිස්තර පිණිස බලන්න:ම.නි: (1) චූළ වෙදල්ල සූත්‍රය**,** ම.නි: (2) මහාමාලුන්කය සූත්‍රය හා අග්ගිවච්චගොත්ත සූත්‍රය**,** ම.නි.(3 ) පඤ්චත්තය සූ**ත්‍රය**, දීඝ.නි: (1) බ්‍රහ්මජාල සූත්‍රය.

▼**අලාමක දිට්ඨී අනර්ථය පිණිසවේ**: අලාමක දිට්ඨී නිසා කුසල් සිතක් ඇති නොවේ. එම දිට්ඨී: 1) වැඩදායක නොවේ 2) මගඵසරට මුල් නොවේ 3) නිර්වේදය පිණිස නොවේ 4) විරාගය පිණිස නොවේ 5) නිරෝධය පිණිස නොවේ 6) උපසමය-කෙළෙස් හැර දැමීම පිණිස නොවේ 7) අභිඥාණය- විශේෂ දැනුම පිණිස නොවේ 8) සම්බෝධිය පිණිස නොවේ 9) නිවන- සසරින් ගැලවීම පිණිස නොවේ. එම නිසා, යමක් ගැන සිතන්නේ නම් චතුසත්‍ය මෙනෙහි කරන්න, විරිය වඩා නිවන ලබා ගැනීමට කටයුතු කරන්න යයි බුදුන් වහන්සේ සංඝයාට අවවාද කර ඇත. **මූලාශ්‍ර:** සංයු.නි: (5-2):මහාවග්ග: සච්චසංයුත්ත: 12.1.8 චින්තා සූත්‍රය, පි. 290, ESN: 56: Sacchasamyutta: 8.8 Reflection, p. 2272.

▼ **පහකරගත යුතු දිට්ඨී** :අපණ්ණක ධර්මය-දුකින්මිදීමේ මග-වඩාගැනීම පිණිස පහකරගතයුතු දිට්ඨී හා මත: **1) ශූන්‍යවාදය/ නාස්තික දිට්ඨී (**doctrine of nihilism 2) **අකිරියවාදය (**The doctrine of non-doing) ක්‍රියාවන් පිළිනොගැනීම 3) **අහේතුක වාදය-** හේතුඵල ධර්මය පිළිනොගැනීම (doctrine of non-causality) 4) **අරූප බ්‍රහ්ම ලෝක නැතය යන පිළිගැනීම 5) භව නිරෝධය- නිවන පිළිනොගැනීම. බලන්න:** අපණ්ණක ධර්මය. **සටහන:** ඉහත මත පිලිබඳ වැඩිදුර විස්තර පිණිස **බලන්න**: දීඝ.නි: ශ්‍රමණඵල සූත්‍රය. **මූලාශ්‍ර**: ම.නි: (2 ): 2.1.10 අපණ්ණක සූත්‍රය, පි.124, 2.1.1 හා කන්දරක සූත්‍රය පි. 18, EMN: 60: Apaṇṇaka Sutta- The Incontrovertible Teaching, p. 478 & EMN: 51: Kandaraka Sutta, p. 425.

▼ **දිට්ඨී පහකර ගැනීමේ ක්‍රමය**: බුදුන් වහන්සේ මෙසේ වදාළහ:

" ලෝකය හෝ ආත්මය පිළිබඳව නොයක් ආකාර දිට්ඨී උපදියි. යම් දෙයක් ආශ්‍රිත එම දිට්ඨී ඇතිවෙන්නේ නම්, එහි ලැග සිටින්නේ නම්, ඒවා භාවිතා කරන්නේ නම්, ඒ බව යථා නුවණින් යුතුව දැකිය යුතුය

(යථාභූත ඥානයෙන්): **'මෙය මගේ නොවේ, මෙය මම නොවේ, මෙය මගේ ආත්මය නොවේ ය'** යි දැකීමෙන් එම දිට්ඨී පහ කර ගත හැකිය, විසිකර දැමිය හැකිය'' (... as to those various views that arise in the world associated either with doctrines of a self or with doctrines about the world: if [the object] in relation to which those views arise, which they underlie, and which they are exercised upon is seen as it actually is with proper wisdom thus: 'This is not mine, this I am not, this is not myself,' then the abandoning and relinquishing of those views comes about). **සටහන්**: * අටුවාවට අනුව 'යම් දෙයක්' ලෙසින් පෙන්වා ඇත්තේ පංචස්කන්ධය ය. එනම්, ජිවත්වන පුද්ගලයෙක්: රූපය, වේදනාව, සංඥාව, සංස්කාර හා විඥානය යන ස්කන්ධ 5 තමායයි - පුද්ගලයෙක් යයි සැලකීමය. ** එම ප්‍රකාශයෙන් පෙන්වා ඇත්තේ: පංචස්කන්ධය, ආත්මය නොවේ (මගේ නොවේ ආදී) යයි විදසුන් නුවණ පහළ වන්නේ සෝතාපත්ති මගඵල සාක්ෂාත් කරගැනීමෙන් බවය. **බලන්න**:EMN: notes: 104 & 105, p. 1072. **මූලාශ්‍ර:** ම.නි:(1): 1.1.8 සල්ලේඛ සූත්‍රය, පි. 111, EMN: 8 Effacement, p. 108.

▼ **බුද්ධ අනුගාමිකයන්ගේ දිට්ඨිය**:අන්‍ය ආගමික පිරිසක් විමසනු ලදුව අනේපිඬු (අනාථපිණ්ඩික) මහසිටානන්, බුදුන් වහන්සේගේ ධර්මය අනුගමනය කරන කෙනෙක් ලෙසින් තමා දරන දිට්ඨිය මෙසේ පෙන්වා ඇත: **1)** අන්‍ය ආගමිකයන් දිට්ඨී 10 ක් දැරීමට හේතුව එම කරුණු පිළිබඳව අයෝනිසෝ මනසිකාරයෙන් බැලීම හෝ වෙනත් කෙනක් පැවසූ දෙයක් නිසා මතයක් ඇති කරගැනීම නිසාය:

'දැන් ඒ දිට්ඨී ඇතිවී තිබේ, එය හෙතුභූතය (හෙතුවක් නිසා ඇතිවිය), චේතනා නිසා ඇතිවිය, හේතුඵල සම්බන්ධයක් නිසා හටගෙන ඇත, එනිසා, ඒවා අනිච්ච ස්වභාවය දරයි. අනිච්ච ස්වභාවය ඇති ඕනෑම දෙයක් දුකකි. මේ දුක, තමාගේ මතය යයි ඔබ හැම අල්ලා ගෙන සිටී' 2) සිටුතුමා තමා දරන දිට්ඨිය මෙසේ පවසා ඇත:

''ඇතිවූ ඕනෑම දෙයක් හේතුභූතය, චේතනා නිසා ඇතිවිය, හේතුඵල සම්බන්ධයක් නිසා හටගෙන ඇත, අනිච්චය. අනිච්චදේ දුකය. දුක ගනදෙන දේ මගේ නොවේ. මම එය නොවේ, මෙය මගේ අත්තමය නොවේ'. මේ තමා' මගේ දිට්ඨිය.'' **සටහන්**:* ඉන්පසුව පරිබ්‍රාජකයෝ මෙසේ ඇසූහ: ''ගහපතිය, ඇතිවූ ඕනෑම දෙයක් හේතුභූතය, චේතනා නිසා ඇතිවිය, හේතුඵල සම්බන්ධයක් නිසා හටගෙන ඇත, අනිච්චය. අනිච්චදේ දුකය. මේ දුකටද ඔබ ඇලී සිටින්නේ? අල්ලාගෙන සිටින්නේ?' ** **පිළිතුර:** ''භාන්තේ, ඇතිවූ ඕනෑම දෙයක් හේතුභූතය, චේතනා නිසා ඇතිවිය, හේතුඵල සම්බන්ධයක් නිසා හටගෙන ඇත, අනිච්චය. අනිච්චදේ දුකය. දුක පිළිබඳව ඇති සැටියෙන්, පැහදිළිලෙසින්ම, ප්‍රඥාවෙන් මෙසේ දැක්කෙමි: මෙය මගේ නොවේ, මම මෙය නොවේ, මෙය මගේ ආත්මය නොවේ'. මේ තමා උතුම් ලෙසින්ම ඉන් මිදීම, එය මම අවබෝධකළෙමි''.

**'' යං ඛො භන්තෙ කිඤ්චි භූතං සංඛතං චෙතයිතං පටිච්චසමුප්පන්නං තදනිච්චං යදනිච්චං, තං දුක්ඛං, යං දුක්ඛං තං 'නෙතං මම, නෙසොහමස්මි, න මෙසො අත්තාති'. එවමෙතං යථාභූතං සම්මාප්පඤ්ඤාය සුදිට්ඨං තස්ස ච උත්තරිං නිස්සරණං යථාභූතං**

**පජානාමිති"**. ( Bhante, whatever has come into being and is conditioned, a product of volition, dependently originated, is impermanent. Whatever is impermanent is suffering. Having clearly seen what is suffering as it really is with correct wisdom thus: 'This is not mine; I am not this; this is not my self,' I understand as it really is the superior escape from it." ****** සිටුවරයා එම සිදුවීම බුදුන් වහන්සේට පැවසූ අවස්ථාවේ, උන්වහන්සේ, සිටුවරයාට ප්‍රසංසා කොට ඔහුගේ පිළිතුරු අනුමත කළහ. **මූලාශ්‍ර:** අංගු.නි:(6 ):10 නිපාත, 10.2.5.3. කිංදිට්ඨික සූත්‍රය, පි.360, EAN:10: 93-3 View, p. 534.

▼ **අන්‍යආගමික දිට්ඨි -**Views of other sectors: බුදුන් වහන්සේ වැඩසිටි සමයේ අන්‍ය ආගමිකයන් අතර පැවති දිට්ඨි දහයකි: 1 ලෝකය සදාකාලිකය 2 ලෝකය සදාකාලිකය නොවේ 3 ලෝකය අසීමිතය, 4 ලෝකය අසීමිත නොවේ 5 ආත්මය හා කය එකමදෙයකි, 6 ආත්මය එකකි, කය වෙනත් එකකි, 7 තථාගතයන් මරණින් පසු සිටි, 8 තථාගතයන් මරණින් පසු නොසිටි,9 තථාගතයන් මරණින්පසු සිටි හා නොසිටි, 10 තථාගතයන් මරණින්පසු සිටින්නේ ද වේ නොසිටින්නේද වේ. **"සස්සතො ලොකොති වා අසස්සතො ලොකොති වා, අන්තවා ලොකොති වා අනන්තවා ලොකොති වා, තං ජීවං තං සරීරන්ති වා අඤ්ඤං ජීවං අඤ්ඤං සරීරන්ති වා හොති, තථාගතො පරම්මරණාති වා න හොති තථාගතො පරම්මරණාති වා හොති ච න හොතිච තථාගතො පරම්මරණාති වා නෙව හොති න න හොති තථාගතො පරම්මරණාති වා"** (The world is eternal'or 'The world is not eternal' 'The world is finite' or 'The world is infinite', 'The soul and the body are the same' or 'The soul is one thing and the body another','The Tathāgata exists after death' or 'The Tathāgata does not exist after death' or 'The Tathāgata both exists and does not exist after death' or 'The Tathāgata neither exists nor does not exist after death')

**සටහන**: සංයු.නි (3) ඛන්ධවග්ග:දිට්ඨිසංයුත්තයේ, මේ දිට්ඨි 10 ගැන විස්තරාත්මකව පෙන්වාඇත.**මූලාශ්‍ර**: අංගු.නි: (6):10 නිපාත: 10.1.2.9 පඨමාරියවාස සූත්‍රය, 10.1.2.10 හා දෙවෙනි අරියවාස සූත්‍රය, පි.82-84, 10.2.5.3. කිංදිට්ඨික සූත්‍රය,පි.360, EAN:10:19.9 & 20.10 Abodes of the Noble Ones, p. 498-499, 93-3 View, p. 534.

▼ **අන්‍යආගමික දිට්ඨි 10 පිලිබඳ බුද්ධ දේශනාව**: එක් සමයක උත්තිය පරිබ්‍රාජික, දිට්ඨි 10 ගැන විමසූවිට, බුදුන් වහන්සේ මෙසේ වදාළහ: ඒ කරුනු 10 ගැන තමන්වහන්සේ ප්‍රකාශ කර නොමැත. එයට හේතුව: **"** උත්තිය, මම විශිෂ්ඨ ඥානයෙන් දැන, සත්ත්වයන් විශුද්ධිය පිණිස, සෝක විලාප මැඩපවත්වා ගැනීම පිණිස, දුක්වේදනා හා දොම්නස අහවරකරගැනීම පිණිස, මාර්ග ය ලැබීම පිණිස, නිවන සාක්ෂාත් කරගැනීම පිණිස, ශ්‍රාවකයනට ධර්මය දේශනා කරමි" **"අභිඤ්ඤාය ඛො අහං සාවකානං ධම්මං දෙසෙමි සත්තානං විසුද්ධියා සොකපරිද්දවානං සමතික්කමාය දුක්ඛදොමනස්සානං අත්ථඞ්ගමාය ඤායස්ස අධිගමාය නිබ්බානස්ස සච්ඡිකිරියායාති"**
**සටහන්:** * ඉන්පසුව, උත්තිය, බුදුන් වහන්සේගෙන් මෙලෙස විමසුහ:

" ගුරු ගෝතම, එසේ ... ශ්‍රාවකයනට ධර්මය දේශනා කරනවිට, මුළු ලෝකයම, එහෙමත් නැත්නම් ඉන් අඩක් නැත්නම් තුනෙනේ එක් පංගුවක් වත් නිවන් දකිනවාද?" . ඒ අවස්ථාවේදී බුදුන් වහන්සේ පිළිතුරු නොදී නිශ්ශබ්දවූහ. ** එවිට, ආනන්ද තෙරුන්, බුදුන් වහන්සේගේ නිහඬ වීම පිළිබඳව උත්තිය වැරදි ලෙසින් සිතා ඔහුට අයහපතක් වේ යයි දැන මෙසේ වදාළහ:

" උත්තිය, ඔබගේ ප්‍රශ්නය පිළිබඳව මම **උපමාවක්** කියන්නම්, සමහර නුවණැති පුද්ගලයෙක් උපමාවකින් පැවසූ විට ඒ පිලිබඳ තේරුම් ගනී: රජෙක් සතු ප්‍රාන්ත නුවරක් ඇත. එම නුවර-නගරය සවිමත් පවුරු ප්‍රාකාර, ආදියෙන් වටකර ඇත; ඇතුල්වීමට ඇත්තේ එක් දොරටුවක් පමණි. එහි දොරටුපාලකයා නුවණැති, දක්‍ෂ, බුද්ධිමත් කෙනෙකි. නුවර ප්‍රකාරය පරික්ෂා කරණ ඔහුට, බළලෙක් වැනි කුඩා සතෙකුට උවත් ඇතුළුවීමට නොහැකි, විවර නැතිබව පෙනේ. නුවරට කොපමණ සෙනගක් ඇතුළුවෙනවාද, පිට වෙනවාද යයි ගණනක් කීමට ඔහු නොදනී. එහෙත්, යම්කිසි ලොකු සත්ත්‍වයෙක් නුවරට ඇතුළු වෙනවානම් හෝ පිට වෙනවානම්, එම සතා නුවර දොරකඩින් ඇතුළුවී හෝ පිටවිය යුතු බව ඔහු දනී. එලෙස, උත්තිය, මුළුලොවම හෝ ඉන් අඩක් හෝ තුනෙනේ දෙකක් හෝ විමුක්ත්තියට පත්වෙනවා ද යන්න ගැන තථාගතයන්ට අදාළ නොවේ. එහෙත් තථාගතයන් මේ පිළිබඳව නියතවම දනී:

"විමුක්තිය ලැබූ හෝ ලබන හෝ මතුවට ලබාගන්නා ලෝකයේ ඕනෑම පුද්ගලයෙක් පළමුව ප්‍රඥාව දුර්වල කරන පංච නිවරණ ප්‍රහීණය කලයුතුය; ඉන්පසු සතර සතිපට්ඨානය මනාව පිහිටුවාගත් සිතකින්, නිවැරදි ලෙසින් සප්ත බොජ්ඣංග ධර්ම වැඩිය යුතුය. මේ ක්‍රමයට සත්ත්‍වයෝ ලෝකයෙන් නිකුත්ව (සසරින්) විමුක්තිය ලබාගති, ලබති, (මතුවට) ලබාගනි. උත්තිය, ඔබ පළමුව ඇසූ ප්‍රශ්නයම, නැවත වෙනත් ආකාරයකින්, භාග්‍යවතුන්වහන්සේගෙන් විමසූහ; එමනිසා, උන්වහන්සේ ඔබට පිළිතුරු නොවදාළහ". **බලන්න**: උපග්‍රන්ථය:5- උපමා:ප්‍රඥාවන්ත දොරටු පාලයා, **මූලාශ්‍ර:** අංගු.නි: (6):10 නිපාත, 10.2.5.5. උත්තිය සූත්‍රය,පි.374, EAN:10: 95-5 Uttiya, p.536.

▼**දිට්ඨි 10 පිළිබඳ ආනන්ද තෙරුන් ගේ ප්‍රකාශය**: එක් සමයක, කොකනද පරිබ්‍රාජක, දිට්ඨි 10 පිළිබඳව විමසූ විට, ආනන්ද තෙරුන් පැවසුවේ: තමන්හට එම දිට්ඨී නොමැතිබවය. එවිට**,** පරිබ්‍රාජකයා නැවත මෙසේ ඇසූහ: "එයට හේතුව එම දේ ගැන ඔබ නොදන්න නිසාද? දකින්නේ නැති නිසාද?' තෙරුන් මෙසේ වදාළහ**:**

**'මිත්‍රය, මම නොදන්නවා නොවේ, නොදකිනවා නොවේ, මම දනිමි, මම දකිමි'**. එසේ දන්නා දකිනා අයුරු කෙසේද? යයි පරිබ්‍රාජකයා විමසූවිට තෙරුන් මෙසේ වදාළහ:

" ඒ දිට්ඨි (10) , මනසින් ඇතිකරගත් දේය; ඒවා දිට්ඨි ඇතිකරණ පදනම්ය (මුලය), ඒවා දිට්ඨි ඇතිකරණ අඩිතාලමය, ඒවා සිත උන්මාදකරන දිට්ඨියන්ය, ඒවා දිට්ඨි ඇතිකරයි, ඒවා දිට්ඨි ගලවාදායි. ඒ බව මම දනිමි, දකිමි. ඒ ගැන මම දන්නා දකිනා නිසා "මම නොදනිමි නොදකිමි' යයි මම කියන්නේ මන්ද?"'. **"යාවතා ආවුසො දිට්ඨිගතා යාවතා දිට්ඨිට්ඨානං දිට්ඨාධිට්ඨානං දිට්ඨිපරියුට්ඨානං දිට්ඨිසමුට්ඨානං**

**දිට්ඨිසමුග්ඝාතො. තමහං ජානාමි, තමහං පස්සාමි, තමහං ජානන්තො, තමහං පස්සන්තො ක්‍යාහං වක්ඛාමි 'නජානාමි, නපස්සාමී' ති. 'ජානාමහං ආවුසො පස්සාමී'ති''' සටහන:** තෙරුන්ගේ ප්‍රකශය අසා, උන්වහන්සේ ආනන්ද තෙරුන් බව දැනගත් පරිබ්‍රාජයාක මෙසේ පැවසුහ:

" ඇත්තවශයෙන්ම, මා දැන සිටියේ නැහැ, මම ඔබ වහන්සේ වැනි මහා ඇදුරුතුමෙක් ගෙන් ප්‍රශ්න අසන බව; ඒ බව දැන සිටියා නම් මෙතෙක් දුරට මම කතා කරන්නේ නැහැ. ඔබ වහන්සේ මා කමාකරන සේක්වා'' **මූලාශ්‍ර**: අංගු.නි:(6): 10 නිපාත: 10.2.5.6.කොකනද සූත්‍රය, පි.378, EAN: 10: 96-6. Kokanada, p. 536.

▼**බුද්ධ දේශනා පිලිබඳ අන්‍යආගමිකයන් ගේ දිට්ඨි හා මත**-Views of other sectarians on the teaching of the Buddha.: බුදුන් වහන්සේ වැඩසිටි සමයේ විසූ අන්‍ය ආගමිකයන්, බුද්ධ දේශනා පිළිබඳව මෙවැනි මත පළකර ඇත: 1) ශ්‍රමණ ගෝතම, හැම තපස්බවක්, හැම දුෂ්කරවූ තවුස්දමක් ගරහයි. 2) ශ්‍රමණ ගෝතම, සෑමදෙයක්ම අහෝසිකරන්නෙකි (වෙනයිකො -abolitionist), ඔහු නිශ්චිත ප්‍රකාස කිරීමෙන් වැලකිසිටි.**සටහන්**: ඔවුන්ගේ ඒ මත පිළිබඳව චම්පා නුවර, වජ්ජියමාහිත ගහපති මෙසේ කරුණු දක්වා ඇත: **1)** " ...භාග්‍යවතුන්වහන්සේ, හැම තපස්බවක්, හැම තවුස්දමක් ගරහන්නේ නැත. යමක් ගැරහිය යුතුනම්, උන්වහන්සේ ඒදේ ගරහති; යමක් පැසසිය යුතු නම් උන්වහන්සේ ඒදේ පසසති. ගැරහියයුතු දේ ගරහන, පැසසිය යුතු දේ පසසන ,භාග්‍යවතුන් වහන්සේ, **විභජ්ජවාදීය**, එක් පසක් පමණක් ගෙන කටයුතු නො කරන්නේය''. **2)** "... භාග්‍යවතුන්වහන්සේ නියතලෙසින්ම, 'මේ කුසල ධර්මය' 'මේ අකුසල ධර්මය' යයි ප්‍රකාශකර ඇත; එලෙස, භාග්‍යවතුන්වහන්සේ, කුසල දහම කුමක්ද අකුසල දහම කුමක්ද ? යයි ප්‍රශ්න කලවිට, උන්වහන්සේ, ඒ ගැන නිශ්චිතවම පෙන්වා ඇත. උන්වහන්සේ අහෝසි කරන්නෙක් හෝ නියත ප්‍රකාශ නොකරන කෙනෙක් නොවේ''. **සටහන**: වජ්ජියමාහිත ගහපතිගේ ප්‍රකාශය බුදුන් වහන්සේ අනුමත කර ඇත. **මූලාශ්‍ර**:අංගු.නි: (6): 10 නිපාත:10.2.5.4. වජ්ජියමාහිත සූත්‍රය,පි.368, EAN:10: 94-4 Vajjiyamāhita, p.535.

▼ **දිට්ඨි -බුදුසසුනට බාහිර -**Views external to Buddhasasana බුදු සසුනෙනේ බැහැර විවිධවූ දිට්ඨි ඇති පුද්ගලයන් අතුරින් මෙබඳු දිට්ඨියක් ඇති අය අග්‍ර බව බුදුහිමි වදාළහ:

''අතීතයෙහි නොසිටියේ නම්, වර්තමානයේ කර්ම සකස් කරන ආත්මභාවයක් විය නොහැකිය. වර්තමානයේ නොසිටීනම්, අනාගතයක් සඳහා කර්ම සකස්වීමක් නැත, අනාගතයේ ඇතිවීමක් නොවේ''.එවැනි දිට්ඨියක් ඇතිකෙනෙකුට භවපැවැත්ම (සසර) පිළිබඳව පිළිකුළක් නොමැත, එසේම භවනිරෝධය පිළිබඳව ද පිළිකුලක් නැත''. **මූලාශ්‍ර:** අංගු.නි: (6): 10 නිපාත: 10.1.3.9.ප්‍රථම කොසල සූත්‍රය,පි.134, EAN:10: The Great Chapter, 29.9 Kosala-1, p. 505.

▲ **දිට්ඨිගතවීම-**Established in views: දිට්ඨිගතවීම ලෙසින් පෙන්වා ඇත්තේ මිථ්‍යාදර්ශන 2ක් ඇතිව භවයට ඇලීමය. 1) ලෝකය ශාශ්වත යන දිට්ඨිය -ආත්මය හා ලෝකය ස්ථිරයයි සැලකීම 2) උච්ඡේවාද දිට්ඨිය (ආත්මය හා ලෝකය මරණින් මතු නැතය යයි සැලකීම). එහෙත් නුවණැස ඇති ප්‍රඥාවන්තයෝ එම අන්ත දෙක්ට නොපැමිණ, පංච

උපාදානස්කන්ධයේ යථා තත්වය අවබෝධ කර දිට්ඨීවලට නොපැමිණ සිටිති. **මූලාශ්‍රය:**බු.නි: ඉතිවුත්තක: 2.2.12 දිට්ඨිගත සූත්‍රය, පි.402.

▲**දිට්ඨි අනුසය -** diṭṭhānusayo: මෙය අනුසය ධර්මයකි, විවිධ මත ගැන සිත යට පවතින කෙළෙස්ය. **බලන්න:** අනුසය.

▲**දිට්ඨි ආශ්‍රව-**Ditti asrava: ආශ්‍රව -ආසව 4 න් එකකි, සිත කෙළෙසන කරුණකි. **බලන්න:** ආශ්‍රව.

▲ **දිට්ඨි ඔඝය-** the flood of views:සසර ඇද ගෙනයන, අකුසල් ජලප්‍රවාහ 4න එකකි. **බලන්න:** ඔඝ සතර.

▲ **දිට්ඨධම්ම**: පාලි: **දිට්ඨධම්ම-**in the present life-diṭṭha-dhamma දිට්ඨධම්ම යනු මෙලොව දී දැකිය හැකි ධර්මතාවයන්ය. උදාහරණයක් ලෙසින් මෙලොව දී ඵල දෙන කර්ම දිට්ඨධම්ම වේදනීය කර්ම ලෙසින් පෙන්වා ඇත. පරලොව දී විපාක දෙන කර්ම සම්පරායික ලෙසින් පෙන්වා ඇත. නිවන මේ ජීවිතයේදීම දැකිය හැකි ධර්මයකි. **බලන්න:** කම්ම, සම්පරායික ධර්ම.

▲**දිට්ඨධම්ම වේදනීය කර්ම-**Diṭṭha-Dhamma-Vedaniya-Kamma කර්ම විපාක ඇතිකරන එක අවස්ථාවක් ලෙසින් දිට්ඨධම්ම වේදනීය කර්ම බුදුන් වහන්සේ පෙන්වා ඇත. තමන් විසින් කරනලද යහපත් හෝ අයහපත් කර්ම වල ප්‍රතිවිපාක මේ ජීවිතයේදීම විඳීමය. **බලන්න:** කම්ම, කම්මවිපාක.

▲ **දිට්ඨධම්ම නිබ්බාන:** පාලි: **දිට්ඨධම්ම නිබ්බානපඤ්ඤත්තො -** Nibbāna in this very life: දිට්ඨධම්ම නිබ්බානපඤ්ඤත්තො යනු මේ ජීවිතයේදීම නිවන ලබාගැනීමය- නිවීමය. **දිට්ඨධම්ම නිබ්බානය** පිළිබඳව බුදුන් වහන්සේ මෙසේ පෙන්වා ඇතිබව ආනන්ද තෙරුන් වදාළහ:

"ඇවැත්නි, මේ සසුනේ මහණ...ප්‍රථම ජානයට පැමිණ වාසය කරයි…( එලෙස සිව් ජාන) එපමණකින්ම, මේ ජීවිතයේදීම නිවන ලබාගැනීම යයි අවස්ථානුරූපව (පර්යායෙන්බුදුන් වහන්සේ දෙසනා කරන ලදී" " මේ සසුනේ මහණ... ආකාසානඤ්චායතන සමාපත්තියට පැමිණ වාසය කරයි... (එලෙස සිව් අරූප) එපමණකින්ම, මේ ජීවිතයේදීම නිවන ලබාගැනීම යයි අවස්ථානුරූපව, බුදුන් වහන්සේ දෙසනා කරන ලදී" "...මේ සසුනේ මහණ මුළුමනින්ම, නෙවසඤ්ඤානාසඤ්ඤායතනය ඉක්මවා සඤ්ඤාවෙදයිත නිරෝධයට පැමිණ වාසය කරයි. නෙවසඤ්ඤානාසඤ්ඤා විපස්සනා ප්‍රඥාවෙන් දැකීමෙන් ඔහුගේ ආසව ක්ෂයවේ. එපමණකින්ම, මේ ජීවිතයේදීම නිවන ලබාගැනීම යයි අවස්ථානුරූපව, බුදුන් වහන්සේ දෙසනා කරන ලදී".**මූලාශ්‍ර:** අංගු.නි: (5 ): 9 නිපාත: සාමඤ්ඤවග්ග: 9.1.5.10 දිට්ඨධම්ම නිබ්බාන සූත්‍රය, **පි**. 566, EAN:9: 51.10. Nibbāna in this very life, p. 485.

▼ **රහතන්වහන්සේ මේ ජීවිතයේදීම නිවන ලබාඇත.** රූප, වේදනා, සංඥා, සංඛාර, විඥාන යන ධර්මතා ( පංච උපාදානස්කන්ධය) පිළිබඳ කළකිරි, නොඇලි, නිරෝධවී, උපාදාන රහිතව විමුක්තිය ලබා, මේ ජීවිතයේදීම නිවන ලබාගත් ආරිය උතුමානම් රහතන්වහන්සේය. ( if one, through revulsion towards form… feeling … perception … volitional formations … consciousness, through its fading away

and cessation, one is liberated by non-clinging, one can be called a bhikkhu who has attained Nibbāna in this very life) **මූලාශ්‍ර**: සංයු.නි: (3): ඛන්ධසංයුත්ත: 1.3.2.3 හා 1.3.2.4. සූත්‍ර, පි. 312, ESN: 22: Khandasamyutta: 115.3 & 116.4 A speaker on the Dhamma, p. 1101.

▲ **දිට්ඨධම්මසුඛ විහරණය**: පාලි: **දිට්ඨධම්මාසුඛවිහාරා**- pleasant abiding here and now. ආරිය විනයේ දිට්ඨධම්මසුඛ විහරණය**-** මෙලොවදීම සුවපත්ව වාසය කිරීම ලෙසින් බුදුන් වහන්සේ පෙන්වා ඇත්තේ, සිව් ජාන සමාපත්ති (1-4 ජාන) ලබා ගැනීමය.**බලන්න:** අෂ්ඨ සමාපත්ති, සිව් ජාන**. සටහන්: *** රහතන්වහන්සේ මේ ජීවිතයේදීම දිට්ඨධම්මසුඛ විහරණය ඇතිව සිටී. ** මේ ජීවිතයේම සුවය සැපය ඇතිව වාසයකිරීම පිණිස-දිට්ඨධම්මසුඛවිහරණය පිණිස බුදුන් වහන්සේ දුර ආරණ්‍යසේනාසන වල වැඩ වාසය කලබව මෙහි පෙන්වා ඇත. **බලන්න**: ආරඤ්ඤ සේනාසන, අංගු.නි: (1): 2 නිපාත: 2.1.3.10 සූත්‍රය,පි. 157. **මූලාශ්‍ර**: ම.නි: (1): 1.1.8 සල්ලේඛ සූත්‍රය, පි. 112, EMN: 8. Sallekha Sutta- Effacement, p.108.

▼**ආරියවිනයේ**, සිව්ජාන සමාපත්ති හඳුන්වා ඇත්තේ මේ ජීවිතයේදීම විඳිනා සුඛ විහරණ ලෙසින්ය- **දිට්ඨධම්මාසුඛවිහාරා.** බලන්න: අෂ්ඨ සමාපත්ති.

▼**කායගතා සතිය** වැඩි දියුණු කරගැනීමේ ඵලයක් ලෙස මේ භවයේදීම සැප විහරණය ඇතිව වාසය කිරීමට ලැබේ **(දිට්ඨධම්මාසුඛවිහාරාය සංවත්තති).බලන්න:**කායගතාසතිය.

▲ **දිට්ඨීනිජ්ජානඛන්ති:**පාලි: **දිට්ඨිනිජ්ඣානක්ඛන්ති**- reflective acceptance of a view :දිට්ඨිනිජ්ජානඛන්ති යනු, යම්දෙයක් යහපත් ලෙසින්ම පිළිගැනීම පිණිස භාවිතා කළයුතු ධර්මතා 5 න් එකකි. මෙය ධර්මය ක්‍රමානුකූලව පුහුණුකිරීම පිණිස අවශ්‍ය අංගයකි. **සටහන**:* දිට්ඨී=යම්කිසි කරුණක් ගැන සිතේ ඇති මතය-විශ්වාසය, නිජ්ජාන= ඒ පිළිබඳව විමසා බැලීම, ඛන්ති= එසේ විමසා බලා ඇති කරගන්නා නුවණ. මෙය අවබෝධයකි. එහෙත්, ප්‍රත්‍යවෙක්ෂ ඥානය නොවේ. **බලන්න**: පංච ධර්මතා-ක්‍රමානුකූල පුහුණුව පිණිස. **මූලාශ්‍ර**: ම.නි: ( 2 ): 2.5.5. චඞ්කී සූත්‍රය, පි. 672, EMN: 95 Cankī Sutta, p. 704.

▲**දිට්ඨීනිස්සය**-Dittinissaya: දිට්ඨීනිස්සය ලෙසින් දක්වා ඇත්තේ සීලය මගින් පාරිශුද්ධ බව පැතීමය.**බලන්න**: ශීලය.

▲ **දිට්ඨීප්‍රාප්ත**:පාලි: **දිට්ඨප්පත්තො** -the one attained to view: දිට්ඨියට පැමිණි ආරිය උතුමාය (vision attainer). සත් ආරිය පුද්ගලයන් ගෙන් කෙනෙකි. ප්‍රඥා ඉන්ද්‍රිය බලවත්ය. තථාගත ධර්මය ප්‍රඥාවෙන් විමසා බලා විභාගකර ආරිය සත්‍ය නුවණින් දැක ඇත. අප්‍රමාදව කටයුතු කරන්නේ නම මේ භවයේදීම අරහත්වය ලබාගත හැකිය. **බලන්න**. උත්තම දස පුද්ගලයෝ,සත් ආරිය පුද්ගලයෝ. **සටහන:** බුදුන් වහන්සේ, සැරියුත් මහා තෙරුන්හට දිට්ඨීප්‍රාප්ත පුද්ගලයා පිලිබඳ වදාළ විස්තරය පිණිස **බලන්න:** අංගු.නි: (1) 3 නිපාත: 3.1.3.1සූත්‍රය ,පි. 260, EAN:3:

21.Saviṭṭha, p. 85. **මූලාශ්‍ර:** ම.නි: (2) 2.2.10 කිටාගිරි සූත්‍රය, පි. 251, අංගු.නි: (6) 10 නිපාත: 10.1.2.6 ආහුණෙය්‍ය සූත්‍රය, පි.70,

▲ **දිට්ඨි යොගය**: පාලි: **දිට්ඨියොගො-** the bond of views: දිට්ඨි යොගය යනු ලෝක සත්ත්‍වයා සසරට බැඳ තබන බැමි- කෙලෙස් බැඳීම් 4 න් එකකි, හානභාගිය ධර්මයකි.**බලන්න:** සතර යොග, හානභාගිය ධර්ම.

▲ **දිට්ඨිසම්පන්න:** පාලි: **දිට්ඨිංසම්පන්නානං-** attend to certainty: දිට්ඨිසම්පන්න ලෙසින් ධර්මයේ පෙන්වා ඇත්තේ, යම් පුද්ගලයෙකුට බුදුන් වහන්සේ කෙරහි ඇති විශ්වාසය තහවුරුවීමය, ශ්‍රද්ධාවෙන් පිලිගැනීමය, සම්මා දිට්ඨියට පැමිණීමය- දිට්ඨිය සම්පුර්ණවීමය. දිට්ඨිසම්පන්නබව පළමුවම ඇතිවන්නේ සෝතාපන්න වූ විටය. **සටහන**: දිට්ඨිසම්පන්නවීම හා අවෙච්චාසහගත ප්‍රසාදය ඇතිවීම සමානය. **බලන්න**: අවෙච්චාසහගත ප්‍රසාදය, සෝතාපන්න.

▼ **යම් කෙනෙක් මා කෙරෙහි නිසැකබවට-** නියතබවට පත්වේද, ඔවුන් හැම දිට්ඨි සම්පන්න ය යි බුදුන් වහන්සේ වදාළහ:

**“ යෙ කෙචි භික්ඛවෙ, මයි නිට්ඨංගතා, සබ්බෙ තෙ දිට්ඨිසම්පන්නා නං...”** . **සටහන:** සෝතාපන්න- අරහත්වයට පත්වන සියලු ආරිය පුද්ගලයෝ දිට්ඨි සම්පන්නය. **මූලාශ්‍ර:** අංගු.නි: (6):10 නිපාත: 10.2.2.3 නිට්ඨඞ්ගත සූත්‍රය, පි.244, EAN:10: 63.3 Certainty, p. 519.

▼ **දිට්ඨි සම්පන්න** සෝතාපන්න පුද්ගලයාගේ ස්වභාවය: ඔහු ධර්මතා **6 ක් ප්‍රහීණය කර ඇත**: සක්කායදිට්ඨිය, විචිකිච්චාව, සීලබ්බතපරාමාස, අපායගමනිය රාගය, දෝසය හා මෝහය. **ඔහුට කළනොහැකිදේ (**අභබ්බදේ): 1 තමාගේ ගුරුවරයාට ගෞරවනොකර, සමාදරය නොකර සිටීම 2 ධර්මයට ගෞරවනොකර, සමාදරය නොකර සිටීම 3 සංඝයාට ගෞරව නොකර, සමාදරය නොකර සිටීම 4 ශික්ෂා පුහුණුවට ගෞරවනොකර, සමාදරය නොකර සිටීම 5 පන්සිල් හැරදැමීමට හා 62ක්වූ දිට්ඨිවලට පැමිණීමට 6. කාමාවචර ලෝකයේ අටවැනි උපතක් ලැබීමට, කිසිම සංඛාරයක්: 7 නිත්‍ය 8 ශුභ ලෙසින් ගැනීමට 9 කිසිම ධර්මයක් ආත්ම ලෙසින් ගැනීමට 10 ආනන්තරිය කර්ම කිරීමට 11 අන්ධවිශ්වාස හා භක්තිය මගින් ආධ්‍යාත්මික පිරිසිදුබව ලැබේ යයි කටයුතු කිරීමට 12 බුදුසසුනට බාහිර පුද්ගලයෙක් ගුරුවරයා කර ගැනීමට. **මූලාශ්‍ර:** අංගු.නි: (4 ): 6 නිපාත: 6.2.4.6 සිට 6.2.4.10 සූත්‍ර, පි. 268, EAN:6: 90.6 to 94.10 p. 362.

**දූත**

▲ **දූත කර්ම-** Missionary: දූත කර්ම ලෙසින් පෙන්වා ඇත්තේ, ධර්ම දූතසේවයය. සංඝයා, පිරිස- සමූහය වෙතට පැමිණ ධර්මය යහපත් ලෙසින් දේශනා කිරීමය. දූත කර්මය පිලිබඳ තිබිය යුතු ගුණ:1) යහපත් ලෙසින් ඇසීමට හැකිබව 2) යහපත් ලෙසින් අනුන් (ධර්මය) ඇසීමට පොලඹවා ගැනීමට හැකිබව 3) යහපත් ලෙසින් ඉගෙනීමට හැකිබව 4) යහපත් ලෙසින් අනුන්ට උගැන්වීමට හැකිබව 5) යහපත් ලෙසින් අවබෝධ කරගැනීමට හැකිබව 6) යහපත් ලෙසින් අනුන්ට අවබෝධ කරවීමට හැකිබව 7) අදාළ දේ හා අදාළ නොවන දේ කුමක්ද යන්න දැනගැනීමේ හැකියාව තිබීම 8) සන්ඩු සරුවල්-කළහ ආදිය නොකරන

කෙනක් වීම. මේ කරුණු 8 සමන්විත සැරියුත් තෙරුන් ධර්ම දූත සේවයට අනගියයි බුදුන් වහන්සේ වදාළහ. "යමෙක්, විවාදසුළු පිරිස අතරට පැමිණ නොසැලී සිටීද, වචන අතනොහරිද, දහම් පණිවිඩය නොසඟවයිද, සැකනැතිව (දෙගිඩියාව) කතා කරයිද, ප්‍රශ්න අසනවිට අවිනිශ්චිත නොවේද- නොකිපේද, එවැනි මහණ ඒකාන්තයෙන්ම දූතකර්මයට සුදුසුවේ, අනගිවේ". **මූලාශ්‍ර**: අංගු.නි: (5) 8 නිපාත: 8.1.2.6 දූතෙය්‍ය සූත්‍රය, පි.100, EAN:6: 16.6.Mission, p.421.

▲ **දූත සේවය-** Messenger service: දූතසේවය ලෙසින් පෙන්වා ඇත්තේ පණිවිඩ ආදීය කිරීමය. ගිහියන්ගේ පණිවිඩ පත් ආදී සේවයේ වැලකුණ සංඝයා ස්වල්පයය, එහෙත්, එසේ කරණ අය බොහෝය යි බුදුන් වහන්සේ පෙන්වා ඇත. **මූලාශ්‍ර**: සංයු.නි: (5-2 ) මහාවග්ග: සච්චසංයුත්ත:12.10.3 දූතෙය්‍ය සූත්‍රය, පි.370, ESN:56: Saccha samyutta: 93.3 Messages, p. 2369.

▲ **දුතිය ඣානය-**The second jhana: සතර ඣානයන් ගෙන් දෙවැනියට එළඹෙන ඣානය දුතිය-ද්විතිය ඣානය ලෙසින් පෙන්වා ඇත. **බලන්න**: ඣාන,සිව්ඣාන.

▲ **දුතියා-** The second: දුතියා යනු දෙවැන්නාය- සහකාරයා/ සහායිකාවය.මේ දීර්ඝ සසරේ, එක් භවයක සිට තවත් භවයකට ආදී වශයෙන්, ගමන් කරන මිනිසාගේ (පෘතග්ජන) සහායිකාව - දෙවෙනියා ලෙසින් ගමන් කරන්නේ තණ්හාව යයි බුදුන් වහන්සේ වදාළහ:

**"තණ්හාදුතියො පුරිසො දීඝමද්ධාන සංසාරං..."** .**මූලාශ්‍ර:** අංගු.නි: ( 2): 4 නිපාත: 4.1.1.9 තණ්හා සූත්‍රය, පි. 42, EAN:4: 9.9 Craving, p. 150.

▼**මිනිසාගේ සහයිකාව**-දෙවැන්නිය කව්රුද? යයි දෙවියෙක් ඇසූ පැණයට, පිළිතුරු ලෙසින් බුදුන් වහන්සේ මෙසේ වදාළහ:

**"ශ්‍රද්ධාව, පුරුෂයාට දෙවැන්නියවේ..."**

**සටහන**: * මෙහිදී පුරුෂයා ලෙසින් පෙන්වා ඇත්තේ සත්පුරුෂයාය ** එම පුද්ගලයාට අනුසාසනා කරන්නේ ප්‍රඥාවය,නිවනට මැනවින් ඇලුන ඔහු සියලු දුකින් මිදේ. **මූලාශ්‍ර:**සංයු.නි: (1): සගාථවග්ග: දේවතා සංයුත්ත:1.6.9 දුතියා සූත්‍රය, පි. 96, ESN:1: Devatasamyutta: 59.9 Partner,p.139.

▲ **දෙතිස් මහාපුරිස ලක්ෂණ-**Thirty two marks of the great man සියලු මහා පුරුෂයන්හට ඇති උතුම් කායික ලක්ෂණ දෙතිස් මහා පුරුෂ ලක්ෂණ ලෙසින් පෙන්වා ඇත.උත්තම පුරුෂයන්ට 32 ක් වූ මහා පුරිස ලක්ෂණ ඇතිබව, බුදුන් වහන්සේ වැඩසිටි සමයේ ඉන්දියානු සමාජයේ පැවති පිළිගැනීමකි. සූත්‍රදේශනාවන්ට අනුව එබඳු ලක්ෂණ ඇත්තේ බුදුවරු හා සක්විති රජවරුන්ටය. **බලන්න**: බුදුන් වහන්සේ, ලක්‍ෂණ, මහාපුරුෂ ලක්ෂණ. **සටහන :**දීඝ.නි: (1) අම්බට්ඨ සූත්‍රය, ම.නි:සේලසූත්‍රය ආදි සූත්‍ර ගණනාවකම මහා පුරිස ලක්ෂණ විස්තර කර ඇත.

▼ **බාවෙරි බ්‍රහ්මණයා,** තම සිසුන්ට බුදුන් වහන්සේ හඳුනා ගන්නා ආකාරය මෙසේ පවසා ඇත:"පිළිවෙලින් විස්තර කරණ ලද පරිපුර්ණවූ

දෙතිස් මහපුරිස් ලකුණු වේදයෙහි ආයේය.යම් පුරුෂයකු ගෙ ශරිරාවයන්හි තෙල මහපුරිස් ලකුණු වෙත් නම්, ඔහුට දෙගතියක් ම එයි, තෙවැන්නක් නොවේ. ඉදින් හේ ගිහිගෙයි වෙ නම්...සක්විති රජය. ඉදින් ගිහිගෙයින් නික්ම සසුන් වැඩි නම්...අරහත් අනුත්තර සම්බුද්ධ වේ"**සටහන:** බාවෙරි බ්‍රහ්මණ හට මහා පුරිස ලක්ෂණ වලින් 3 ක් ඇතිබව් බුදුන් වහන්සේ වදාළහ, බලන්න: 1023 ගාථාව්. **මූලාශ්‍රය**: ඛු.නි:සුත්තනිපාත:පාරායනවග්ග:වස්තු ගාථා: 1004-1007.

**දද**

▲ **දාදු කැටය උපමාව-**Simile of the gambling cube**:** **බලන්න:**උපග්‍රන්ථය:5

**දන**

▲ **දානය-** offerings: දානය යනු දීමය, ත්‍යාගශීලි බවය, මසුරුකම නැතිබවය. අහාර, පාන,ඇඳුම්, නිවාස, බෙහෙත් -සිව්පසය ආදිය ලෝභය නැතිව, තව කෙනෙකුගේ යහපත තකා දීමය. දානය කුසලය ක්‍රියාවකි, යහපත් විපාක ඇතිකරයි. දානපාරමිතාව, බෝසතුන්ගේ දස පාරමිතාවන් ගෙන් එකකි. **බලන්න**: දක්ඛිණා, ත්‍යාගශීලි. **සටහන්:** * අංගු.නි: 5: නිපාත: **දානවග්ග**යේ දාන පිළිබඳව විස්තරාත්මකව පෙන්වා ඇත. ** දානය, චාගය ලෙසින්ද පෙන්වා ඇත. **බලන්න:** චාගය. ** දානය දීම හා නොදීම නිසා දෙව්ලොව හා මිනිස් ලොව ලැබෙන විපාක වල වෙනස හා පැවිදිබවට පත්වූවිට ලැබෙන විපාක වල වෙනස මෙහිදී විස්තරකර අත. ඒ පිළිබඳව කරුණු 5 ක් බුදුන් වහන්සේ වදාළහ. **බලන්න:** අංගු.නි: (3): 5 නිපාත: සුමණාවග්ග:5.1.4.1. සුමණා සූත්‍රය, පි.72.

▼ **දානය,** ත්‍රිවිධ පුණ්‍යක්‍රියා වස්තුවලින් එකකි, උතුම් සැප විපාක ලැබේ. **බලන්න**: ත්‍රිවිධ පුණ්‍යක්‍රියා වස්තු

▼**දානය පිරිනමන** ආකාරය හා එහි යහපත් විපාක මේ සූත්‍ර යේ පෙන්වා ඇත. **බලන්න**: මහා දානය. **මූලාශ්‍ර:**අංගු.නි: (5): 9 නිපාත:9.1.2.10 වේලාම සූත්‍රය, පි.456, EAN:9:20.10 Velāma, p.469.

▼ **දානය පිරිනැමීමේදී** අංග 6 ක් සම්පූර්ණ විය යුතුවේ. **බලන්න**: ඡළඅංග දානය.

▼**දානය පිරිනැම්ම යහපත් විපාක -ආනිසංස ඇති කරයි**: කප් 91 ක කාලය බලනවිට දන් දුන් කුලයක් පිරිහීමට පත් නොවූ බව බුදුන් වහන්සේ මෙහිදී පෙන්වා ඇත. එසේම, සිල්ඇතිව, බොහෝ දන්දුන් ධනවත් කුලයන්ද, දාන අනුසස් නිසා මහත්වයට පත්වී ඇත. **මූලාශ්‍රය:** සංයු.නි: (4) සළායතනවග්ග:ගාමිණිසංයුත්ත: 8.1.9 කුල සූත්‍රය, පි.610

▼ **බුදුන් සරණගිය**, සිල්වත්, ප්‍රඥාවන්ත කෙනෙක් දාන පුජා කරයි, එවැනිම වෙනත් පුද්ගලයෙක් දාන පුජා නොකරයි. ඔවුන්ට මෙලොව හා පරලොව ලැබෙන විපාකයන්හි වෙනස මෙහි පෙන්වා ඇත. **මූලාශ්‍රය:**අංගු.නි: (3) 5 නිපාත: සුමණාවග්ග: 5.1.4.2 චුන්දීසූත්‍රය, පි.76.

▼**දානය පිරිනැමීමෙන්** පසු සුදුසු අනුමෝදනා කල යුතුය. **බලන්න**: ත්‍රිවිධ අනුමෝදනා.

▼**දානය පිරි නැමීමේ ඵල**: යහපත් ලෙසින් උතුමන්ට දානය දෙන පුද්ගලයාට මේ ජීවිතයේදීම දැකිය හැකි ඵල - සාන්දෘෂ්ටික, හතරක් ( සතර සාන්දෘෂ්ටික දාන ඵල) මෙහි දක්වා ඇත: ඒ දානපතියා: බොහෝ දෙනාට ප්‍රියවේ, සත්පුරුෂයෝ ඔහු ඇසුරු කරති, සමාජයේ ඔහු ගැන කිර්තිය පැතිරේ, ඔහුට ඕනෑම සභාවකට බිය රහිතව එළඹීමට හැකියාව ඇත. මරණින් මතු සුගතියේ උපත ලබයි. **මූලාශ්‍රය:**අංගු.නි: (3) 5 නිපාත: සුමණාවග්ග: 5.1.4.4 සිහසේනාපති සූත්‍රය, 5.1.4.5 දානආනිසංස සූත්‍රය,පි.82,

▼**කවරෙකුට දනය දීම සුදුසුද?** පසේනදී කෝසල රජු කල විමසීම පිළිබඳව බුදුන් වහන්සේ මෙසේ පෙන්වා ඇත: යම් කෙනෙක් කෙරේහි සිත පහදින්නේ නම් ඔහුට දීම සුදුසුය. **කවරෙකුට දෙන දානය මහත්ඵල වේද? :** සිල්වතාට දන් දීමෙන් මහාඵල ලැබේ, පංච නීවරණ පහ කළ උතුමාට දෙන දානය මහා ඵල ඇතිකරයි. අසේඛවූ රහතුන්ට දෙන දානය මහා ඵල ඇතිකරයි. **සටහන**: අසපු, පැන්පොකුණු , සක්මන්මලු , වනසේනාසන, අහාර පැන් ආදියද රහතුන් කෙරෙහි පහන් සිතින් දීම අග්‍ර බව මෙහි පෙන්වා ඇත. **මූලාශ්‍රය**: සංයු.නි: (1) කෝසල සංයුත්ත: 3.3.4 ඉස්සත්ථ සූත්‍රය, පි.206.

▼ **කුමක් දිය යුතුද?** එක්සමයක දෙවියෙක්, බුදුන් වහන්සේගෙන් මෙසේ ඇසුහ: 1) කුමක් දීමෙන්, කෙනෙක් බලය දෙන්නේද? 2) කුමක් දීමෙන්, කෙනෙක් වර්ණය දෙන්නේද? 3) කුමක් දීමෙන්,කෙනෙක් සැපය දෙන්නේද? 4) කුමක් දීමෙන්, කෙනෙක් ඇස් දෙන්නේද? 5) සියල්ල දෙන තැනැත්තා කවුද? බුදුන් වහන්සේ මෙසේ වදාළහ: " **ආහාර** දෙනකෙනා බලය දෙයි. **වස්ත්‍ර** දෙනකෙනා වර්ණය ( අලංකාරය) දෙයි**.** **යාන** දෙන කෙනා සැප දෙයි. **පහන්** -ආලෝක දෙනකෙනා (පහන්පුජා) **ඇස් (පෙනීම)** දෙයි. යමෙක් **ආවාස** දෙන්නේනම් හෙතෙම **සියල්ල දෙන්නෙක්වේ (සබ්බ දාන)** . යමෙක් **ධර්මය අනුශාසනා** කරන්නේ නම් ඔහු **අමෘතය** (deathless- නිවන) දෙන්නේය". **මූලාශ්‍ර**: සංයු.නි: (1) : සගාථවග්ග: දේවතා සංයුත්ත: ආදිත්ත වර්ගය, කිංදද සූත්‍රය , පි. 82, ESN: 1: Devathasamyutta: 42.2 Giving what ? , p. 117.

▼**දාන දීමට හේතු**: පුදගලයන් විවිධ හේතුමත දාන පිරිනමන බව බුදුන් වහන්සේ පෙන්වා ඇත: 1) පළමුව නින්දා අපහාස කර දෙන දානය 2) බිය නිසා දෙන දානය 3) පෙරදී කෙනක් තමාට දුන්බව සිහිකර දෙන දානය 4) දන්දීම නිසා, ලබන තැනැත්තා තමාටත් පෙරලා දෙයි යන සිත ඇතිව දෙන දානය 5) දීම යහපත්බව සිතා දෙන දානය 6) ඉවුම් පිහුම් නොකරන මිනිසුන් ගැන සිතා, තමන් උයන පිහන නිසා ඔවුනට දියයුතුය යයි සිතා දෙන දානය 7) දීම නිසා තමන්ට නම්බුනාම ලැබේ යයි සිතා දෙන දානය 8) තමන්ගේ සිත පිරිසුදු කරගැනීමට, පහන් කර ගැනීමට දෙන දානය 9) කැමැත්ත නිසා දෙන දානය 10) තරහ සිතින් දෙන දානය 11) අවිද්‍යාව නිසා දෙන දානය 12) අනුන් විවේචනය කරයි යන බිය නිසා දෙන දානය 13) පරම්පරාවේ පුරුද්ද තබාගැනීම පිණිස දෙන දානය 14) දෙව්ලොව සැප පතා දෙන දානය. **මූලාශ්‍ර**: අංගු.නි: ( 5): 8 නිපාත: 8.1.4.**1 දාන සූත්‍රය** හා 8.1.4.3 දානවස්තු සූත්‍රය, පි. 172, EAN:8: 31.1 Giving & 33.3 Grounds, p. 430.

▼ **ගුණවත් සිල්වත් සංඝයාට** දන්දීම නිසා දේවලෝක උත්පත්තිය ලබන බව මෙහි පෙන්වා ඇත. දානය පිරිනැමීමට සුදුසු ගුණ 6 ක් මෙහි මෙහි විස්තර කර ඇත. **මූලාශ්‍ර**: අංගු.නි: (4 ): 6 නිපාත: මහාවග්ග:6.2.1.5 දාරුකම්මික සූත්‍රය,පි.194.

▼**අහාර දාන**: කෙනෙක් මසුරුකම දුරුකර පහන් සිතින් හා සැදැහැයෙන් ආහාර දෙන්නේද, එමගින් ලබන පින් මෙලොව හා පරලොව යහපත පිණිස වේ. **මූලාශ්‍ර**:සංයු.නි:( 1 ): සගාථවග්ග: දේවතා සංයුත්ත: **අන්න සූත්‍රය,** පි. 84, ESN:1: Devatha samyutta : 43-3 food, p. 118.

▼ **කැඳබත් දන්දීමේ අනුසස්-** Offering of Rice porridge: කැඳබත් අවුසදයක් යයි බුදුන් වහන්සේ වදාළහ, එම දානයේ දීමේ අනුසස් 10 ක්වේ: කැඳබත් දෙන තැනැත්තා 1) ආයුෂ දෙයි 2) වර්ණය දෙයි 3) සැපය දෙයි 4) බලය දෙයි 5) නුවණ දෙයි 6) පානය කළ කැඳ බඩගිනි නසයි 7) පිපාසාව දුරු කරයි 8) වාතය අනුලොම් කරයි 9) වස්තිය පිරිසිඳු කරයි 10) නොපැසි ඉතිරිවූ (කුසේ) අහාර පැසවයි. මිනිස් සම්පත් හෝ දෙව් සම්පත් ලබනු කැමැත්තා නිති කැඳ දන්දීම සුදුසුය. **මූලාශ්‍රය**:වින.පි: මහා වග්ග පාළි 2 , පි 56.

▼ **දානයේ අනුසස්**: උතුමන්ට, සතුටු සිතින් දාන පිරිනැමීම නිසා අනුසස්- පින් ඇතිවෙන බව බුදුන් වහන්සේ පෙන්වා ඇත. ම.නි: **දක්ඛිණාවිභංග සූත්‍රයේ,** දානය පිරිනැමීමේ අනුසස් විස්තරාත්මකව දක්වා ඇත. දානය දෙන තැනත්තා, ප්‍රතිග්‍රාහකයාට (ලබන තැනැත්තාට) කරුණු 5 ක් දෙයි: ආයුෂ, ශරීර වර්ණය, සැපය (කායික හා මානසික), බලය (ශක්තිය) හා ප්‍රතිභානය (නුවණ).

**"ආයුං දෙති, වණ්ණං දෙති, සුඛං දෙති, බලං දෙති, පටිභාණං දෙති"** ( One gives life, beauty, happiness, strength, and discernment)

යහපත් සිතින් දානය දෙන පුද්ගලයන්හට: මෙලොව හා පරලොව සැප ලැබේ, දීර්ඝ ආයුෂ හා කීර්තිය ලැබේ. **මූලාශ්‍ර**: අංගු.නි: (3): 5 නිපාත:5.1.4.7 භෝජන සූත්‍රය, පි.86, EAN: 5: 37.7 Food, p. 249.

▼ **යහපත් සිතෙන්** දෙන දානයේ යහපත් විපාක මෙලොව මෙන්ම පරලොවදී ද විඳීමට හැකිවේ. **බලන්න**: පින්දීම. **මූලාශ්‍ර**: අංගු.නි: (6): 10 නිපාත:10.4.2.11 ජාණුස්සොණි සූත්‍රය, පි. 518, EAN:10: Jāṇussoṇī,177.11, p.554.

▼ **යහපත් ලෙසින්** දෙන දානය නිසා යහපත් උත්පත්ති -දානූපත්ති 8 ක් ලැබීම මෙහි පෙන්වා ඇත. **මූලාශ්‍ර**: අංගු.නි: (5): 8 නිපාත:දානවග්ග: 8.1.4.5 දානූපත්ති සූත්‍රය, පි.178.

▼**දානයේ අනුසස් 5 ක්**: 1) බොහෝදෙනාට ප්‍රියවීම 2) සත්පුරුෂ ආශ්‍රය ලැබීම 3) පන්සිල් නොකඩා සිටීමට හැකිවීම 4) කිර්තිය පැතිරීම 5) මරණින් මතු ස්වර්ගයේ උපත ලැබීම. **මූලාශ්‍ර**: අංගු.නි: (3): 5 නිපාත:5.1.4.5 දානආනිසංස සූත්‍රය, පි. 84, EAN:5: 35.5 The Benefits of giving, p. 249.

▼ **බ්‍රහ්මචාරින්ට දන් පිරිනැමීම**: බුදුන් වහන්සේ ඇතුළු සංඝයාට, සුනිධ හා වස්සකාර යන අජාසත් රජුගේ, මහා ඇමතියන් විසින් දෙනලද දාන යේ අනුසස්, බුදුන් වහන්සේ මෙසේ පෙන්වා ඇත:

"යම් පෙදෙසක පණ්ඩිත අය වාසය කරනවිට, ඔවුන් සිල්වත්වූ බ්‍රහ්මචාරින් හට දන් දී, එහි සිටින යම් දෙවිවරුනට පිං පුදයි. ඒ පින් ලද දෙවියෝ ඔවුනට බුහුමන් කරති. මවකු තම ඇකයෙහි සිටින පුතුට මෙන් දෙවියන් ඔවුනට අනුකම්පා කරති. එලස දෙවියන්ගේ දයාව ලත් ඔවුන්හට සැම කල්හිම යහපත ඇතිවේ". **මූලාශ්‍ර**: වින.පි: මහාවග්ග 2: පි 70 හා දීඝ.නි: (2): මහාපරිනිර්වාන සූත්‍රය, පි.156, EDN : 16 Maha parinibbana Sutta, p 175.

▼ **සංඝයාට දන්දීම**: එක්සමයක**,** විසාඛා සිටුදුව-විසඛා මහා උපාසිකාව**,** ආහාර දාන, කැඳ දාන, වස්ත්‍ර දාන සංඝයාට පුජාකිරීමට අවසර ලබාගත් අවස්ථාවේ, බුදුන් වහන්සේ මෙසේ වදාළහ:

"සුගතයන්වහන්සේගේ ශිල සම්පන්නවූ යම් ශ්‍රාවිකාවක් ප්‍රමුදිතව ආහාර පාන දේද, මසුරුමල මැඩ ස්වර්ගයට හිතවූ, ශෝක දුරු කරන්නාවූ, සුව එලවන්නාවූ දන් දේද, ඕ තෝමෝ දිව්‍යමය ආයුෂ (පරලොවදී) ලබයි. පහවූ රාගාදී රජස් ඇති, පව් නැති මාර්ගයට පැමිණ, පින් කැමති ඕ තොමෝ සුවපත්ව රෝග රහිතව ස්වර්ග ලෝකයෙහි බොහෝ කලක් සතුටු වෙයි". **මූලාශ්‍රය:**වින.පි: මහාවග්ග 2: පි. 214.

▼**දෙවියන් දාන වර්ණනා කිරීම**: එක්සමයක සතුල්ලප්කායික දෙවිවරු සමුහයක්, බුදුන් වහන්සේ වෙත පැමිණ දානය පිරිනැමීමේ අනුසස් පැවසුහ: 1) පින් කැමති අය දන්දීම මැනවි 2) ස්වල්පයක් ඇති කල්හිද දීම මැනවි 3) ශ්‍රද්ධාවෙන් දෙන දානය මැනවි 4) දැහැමින් ලත් දෙයක් ආරියන්හට දීම මැනවි 5) දීමට සුදුසු අය තෝරාගෙන දීම මැනවි 6) දනය දීමේදී ප්‍රාණඝාතයෙන් වැලකිම මැනවි. ඒ දෙවිවරුන්ගේ ප්‍රකාශ මානාව පවසන ලදබව පැවසු බුදුන් වහන්සේ මෙසේ වදාළහ:

**" සැදැහැයෙන් දෙන දානය නන් අයුරින් පසසන ලදී. දානයට වඩා ධර්ම පදය හෙවත් 'නිවන' ශ්‍රේෂ්ඨය. පෙරද, ඉතා පෙරද, නුවණැති සත්පුරුෂයෝ නිවනම අවබෝධ කලාහුය". මූලාශ්‍ර:** සංයු.නි: (1): සගාථවග්ග: දේවතාසංයුත්ත: සාධු සූත්‍රය. පි. 64, ESN: 1 Devatha samyutta: 33.3 Good, p 100.

▼ **දන් දීම හා නොදීම**: එක්සමයක සතුල්ලප්කායික දෙවිවරු සමුහයක් බුදුන් වහන්සේ බැහැදැක දානය නොදීම හා දීම පිලිබඳ ගුණ හා අගුණ පැවසුහ: 1) මසුරුකම හා අප්‍රමාදය නිසා කෙනෙක් දන් නොදේ, පින් කැමති අය දන් දියයුතුය. 2) දන් දීමනිසා -තමන් දුගිබවට පත්වේ, බඩගින්න හා පිපාස දුක ඇතිවෙය- යන බියෙන් මසුරු පුද්ගලයා දන් නොදේ. ඒහෙත්, නොදෙන නිසා ඔහුට මෙලොවද පරලොවද බඩගින්න හා පිපාස දුක ඇතිවේ. 3) මසුරුකම දුරුකොට දන් දෙන්නේනම් මෙලොවද, පරලොවද යහපත් විපාක විදීමට හැකිවේ. 4) සමහර මිනිසුන් තමනට ස්වල්පයක් තිබුනද, තමාසමග සිටින අය සමග ඒදේ බෙදාගනී-බෙදාදී වැළදීම, එය පැරණි චාරිත්‍රයකි. ඔවුන් මසුරුකමින් මියගිය මිසුන් අතර නොමළ මිනිසුන්ය. **සටහන:** අටුවාවට අනුව මසුරුමිනිසුන් තමන් සතුදේ බෙදාහදා නොගන්නා නිසා එම දේ මැරුන දේ වැනිය. **බලන්න**:

ESN: note 64, p. 510. 5) බොහෝසම්පත් ඇති සමහර මිනිසුන් දන් නොදේ, එහෙත් දුප්පත් මිනිසා තමනට ඇති දෙයින් දන් දේ, එවැනි දානය, දහස් ගුණයකින් වටින්නේය. 6) ස්වල්පයක් ඇතිකළ දීම දුෂ්කරවුවද සත්පුරුෂයා යහපත් දේ කරයි, එහෙත්, අසත්පුරුෂයා එසේ නොකරයි. සත්පුරුෂයා සුගතියේ උපත ලබයි, අසත් පුරුෂයා දුගතියට යයි. බුදුන් වහන්සේ දෙවියන්ගේ ප්‍රකාශ අනුමතකර මෙසේ වදාළහ:

**"යමෙක් දුකසේ උපයා ගන්නා දෙයින් තම පවුල නඩත්තුකර, ස්වල්ප දෙයින් වුවද දන්දෙමින් දහමේ හැසිරේ. ඒ දුගී මිනිසාගේ දානයේ අගය, ධනවත් කෙනෙකුගේ මහා දානයකට වඩා දසදහස් ගුණයකින් වැඩිය"**. ධනවතා දහස්ගණන් වැය කර දෙන දානය දුගියාගේ දනය තරම් අගය නොවීමට හේතුව කුමක්ද? යයි දෙවියෙක් බුදුන් වහන්සේ විමසුවිට උන්වහන්සේ මෙසේ වදාළහ: " කෙනෙක් අධර්මයෙන් වෙනත් අය පෙලා, දඬුවම්කර, ඔවුනට දුක ඇතිකර දෙන මහා දානය 'දැහෙමින් සෙමින්' කළ දානයේ' (දැහැමිදානය) නො ගැනෙන්නේ එය අධාර්මික දානයක් (අදැහැමි දානය) නිසාය" **සටහන**: 'දැහෙමින් සෙමින් කළදානය': ධාර්මිකව, තමන් සතු ස්වල්පදෙයින්, ධාර්මිකව දෙන දානයවේ. **මූලාශ්‍ර:** සංයු.නි: (1): සගාථවග්ග: දේවතාසංයුත්ත: 1.4.2 මච්ඡරි සූත්‍රය, පි. 62, ESN: Devatasamyutta: 32.2 Stinginess, p. 97.

▼ **ධර්මදානය අග්‍රය**: බුදුන් වහන්සේ, දාන අතුරින් ධර්මය තකා දෙන දාන අග්‍ර යයි වදාළහ.**බලන්න**: අග්‍ර ධර්ම දාන.

▼ **මනාප දේ දන්දීම**: එක් සමයක, විසල්පුරවැසි උග්ග ගෘහපති, ඔහු කැමති ආහාර ආදිය දේ බුදුන් වහන්සේට සතුටු සිතින් පිළිගැන්වූහ. එම පුණ්‍යකර්මය නිසා මරණින් මතු දෙව්ලොව උපත ලැබූහ. **සටහන**: දෙව්ලොව උපත ලබා, බුදුන් වහන්සේ වෙත පැමිණ තමන් මනාප දේ පූජා කළ නිසා තමන් මනාපවූ දෙව්සැප ලැබූ බව පැවසූහ**. බලන්න**: උපග්‍රන්ථය:3. **මූලාශ්‍ර:** අංගු.නි: (3): 5 නිපාත: 5.1.5.4 මනාපදායි සූත්‍රය, පි. 98, EAN:5: 44.4 The Giver of the Agreeable, p. 252.

▼ **ආමිෂ දානය හා ධර්ම දානය**: ආමිෂ දානය හා ධර්ම දානය අතුරින් ධර්ම දනය අග්‍රයයි බුදුන් වහන්සේ වදාළහ.**බලන්න**: අග්‍රදාන. **මූලාශ්‍ර**:ඛු.නි: ඉතිවුත්තක: 3.5.9 දාන සූත්‍රය, පි. 480.

▼ **ආරියන්ට දානය පිරිනැමීම**: ආරියන්: සේඛ හා අසේඛ උතුමන්ට දානය දීම මහත් ඵල මහා ආනිසංස ලැබීමට හේතුවන බව බුදුන් වහන්සේ පෙන්වා ඇත. **බලන්න:** දක්ඛිණා. සිල්වත්, පහකළ රාගය ඇති යහපත් පුද්ගලයන්, ආරියන්ට දෙන දාන නිසා දිව්‍ය ලෝක, බ්‍රහ්ම ලෝකවල යලි උපත ලැබෙන අන්දම **අංගු.නි: 8 නිපාත, දානවග්යේ** විස්තරාත්මකව පෙන්වා ඇත. සරුබිමක වැපිරූ බීජ නිසා සරු අස්වැන්නක් ලැබේ, එලෙස, ආරිය අටමග පරිපූර්ණ කරගත් ශ්‍රමණ බ්‍රාහ්මණ උතුමන්ට දන්දීම මහත් ඵලයක් මහා ආනිසංස ලැබීමට හේතුවේ. බලන්න" බීජ උපමාව: උපග්‍රන්ථය:5 **මූලාශ්‍ර**: අංගු.නි: ( 5): 8 නිපාත: 8.1.4.4 ඛෙත්තූපම සූත්‍රය, පි. 174, EAN:8: 34.4 The Field, p. 430.

▼ **සංඝ දානය** බුදුන් වහන්සේ ප්‍රමුකකොටගෙන සංඝයාට පිරිනමන දානයය. **බලන්න**: සංඝ දානය.

▼ **මළවුන් අනුස්මරණ දාන**: මළවුන් අනුස්මරණය කිරීමට දෙන දානයේ යහපත් විපාක ඇත. **බලන්න**: මළවුන් අනුස්මරණය.

▼ **සත්පුරුෂයන්ගේ දානය**: ශ්‍රද්ධාව, හිරිඔතප්ප හා කුසල සිත ඇතිව සත්පුරුෂයන් දෙන දාන නිසා ඔවුන්ට දෙව්ලොව සැප ලැබේ. බුදුන් වහන්සේ සත්පුරුෂ දාන 8ක් පෙන්වා ඇත: 1) පිරිසුදු දේ දෙයි 2)ප්‍රණීත දේ දෙයි 3) සුදුසුකල දෙයි 4) කැප දේ දෙයි 5) පරික්ෂා කර දෙයි 6) නිරතුරුවම දෙයි 7) පහන් සිතින් දෙයි 8) සතුටු සිතින් දෙයි. **මූලාශ්‍ර**: අංගු.නි: ( 5): 8 නිපාත: 8.1.4.2 ද්විතිය දාන සූත්‍රය, පි.172 හා 8.1.4.7 සප්පුරිස දාන සූත්‍රය, පි. 186 , EAN:8: 32.2 Giving, p. 430 & 37.7 Good person's gift, p. 432.

▼ **බෙදාදී වැළඳීම**: බෙදාදී ආහාර වැළඳීම බොහෝ අනුසස් ගෙනෙදෙන බව බුදුන් වහන්සේ මේ සූත්‍රයේ දී පෙන්වා ඇත. **මූලාශ්‍රය** : ඛු.නි: ඉතිවුත්තක: 1.3.6 දානසංවිභාග සූත්‍රය, පි. 372.

▼ **දැහැමිදානය අග්‍රයයි** බුදුන් වහන්සේ පෙන්වා ඇත. **බලන්න:** අග්‍ර දැහැමිදානය.

▼ **යහපත් ගුණ ඇති** උපාසක/උපාසිකා දානශිලිය. **බලන්න**: ගිහිඋපාසක උපාසිකා.

▼ **කාලදානය**: කාලදානය ලෙසින් පෙන්වා ඇත්තේ සුදුසු අවස්ථාවේ තෑගි, දාන ආදිය පිරිනැමීමය: 1) ආගන්තුකයන්ට දීම 2) චාරිකාවක යන අයට දීම 3) ගිලන් අයට දීම 4) සාගත කාලයෙහි දීම 5) තමන් ගේ වතුපිටිවලින් ලැබුණ ධාන්‍ය, පලතුරු ආදී වූ පළමු අස්වැන්න අන්‍යයන් හා බෙදාගැනීම. **මූලාශ්‍ර:** අංගු.නි: (3): 5 නිපාත: 5.1.4.6 කාලදාන සූත්‍රය, පි. 84, EAN:5: 36.6 Timely, p. 249.

▲**දන්ඩපාණි ශාක්‍ය-**Dandapaani Sakkya: බුදුන් වහන්සේ, කපිල්වත්තු නුවර, මහා වනයේ වැඩසිටින අවස්ථාවක, දන්ඩපාණි සාක්‍යයන්, බුදුන් වහන්සේගෙන්, එතුමන්ගේ වාදය-ඉගැන්වීම පිලිබඳ විමසුහ. **බලන්න**: බුදුන්වහන්සේ. ඒ විමසීම, මධුපිණ්ඩික සූත්‍රය දේශනා කිරීමට හේතුව විය. **සටහන:** අටුවාවට අනුව ඔහු, දේවදත්ත භික්ෂුවගේ පක්ෂය ගත් කෙනෙකි. තරුණයෙක් වුවද, ඔහු රන් හැරමිටික් ඇතිව, ව්‍යායාම පිණිස වනයේ ඇවිදියි. **බලන්න**:EMN: note: 226, p.1085. **බලන්න**: ම.නි: මධුපිණ්ඩික සූත්‍රය.

▲**දාන්ත**- Tamed: දාන්ත- දමනය ලෙසින් පෙන්වා ඇත්තේ, සිත ධර්මයේ දමනය වීමය. දැමුණු සිත මහා අර්ථය පිණිස පවතී යයි බුදුන් වහන්සේ වදාළහ. අදාන්ත වග්ගයේ මේ පිළිබඳව විස්තරාත්මකව පෙන්වා ඇත. **මූලාශ්‍ර:**අංගු.නි: ( 1 ): 1 නිපාත: 4 අදන්ත වග්ග: පි. 50, EAN:1 : IV Untamed. p. 38.

▼**බුදුන් වහන්සේ ශ්‍රාවකයන්** දමනය කරන ආකාරය- ක්‍රමානුකූල පුහුණුව අනුව, මෙහි විස්තරාත්මකව පෙන්වා ඇත. මැනවින් දමනය කරන ලද හස්තියෙක් සුවිනීතවන ලෙසින්, එම පුහුණුව යහපත් ලෙසින් පිළිපදින මහණ, තරුණ හෝ වේවා, මධ්‍යම වයසේ හෝ වේවා, මහලුවියේ හෝ වේවා, ක්ෂීණාශ්‍රව ලබා, දාන්තව, කාලක්‍රියා කරන්නේය

යයි බුදුන් වහන්සේ වදාළහ. **මූලාශ්‍රය:** ම.නි: (3) 3.3.5 දන්තභූමි සූත්‍රය, පි.320.

▲**ද්‍රෝන බ්‍රාහමණ**-Brahmin Doṇa: **බලන්න**: උප ග්‍රන්ථය:3

**දණ**

▲**දණ්ඩ**-Punishment: දණ්ඩ යනු ලීය-පොල්ල, මුගුර වැනි අවියකි. අනුන්ට ගැසීමට භාවිතා කරන ආයුධයක්ය. අනුන්ට දඬුවම් කිරීම වධ හිංසා කිරීමද දණ්ඩ ලෙසින් පෙන්වා ඇත. කෙනෙක් යම්කිසි අපරාධයක්, වැරද්දක් කළවිට රටේ පාලකයන් හෝ සමාජය විසින් ඒ පුද්ගලයාට නිසි දඬුවම් පමුණුවයි. ඇතැම් අවස්ථාවල බලවත් මිනිසුන්, නිරපරාදේ බලහින මිනිසුන්ට දඬුවම් හිංසා කරයි. ඒවා අකුසල කර්මවේ, අයහපත් විපාක ඇති කරයි. **ධම්ම පදයේ: දණ්ඩ වග්ගයේ**: රහතන්වහන්සේ හැර සෙසු සියලු සත්ත්වයෝ (මිනිසුන් මෙන්ම තිරිසන් සතුන්ද) දණ්ඩනයට බිය බව දක්වා ඇත. තමන් දඬුවම්වලට බිය නිසා, වෙනත් අයද දඬුවම්වලට බියනිසා වධ හිංසා නොකළ යුතුවේ. එසේ හිංසා පිඩා කරන අය, නිවන් සුවය ලබන්නේ නැත, ඔවුන් අපායගාමිය. විස්තර පිණිස **බලන්න**: ධම්මපදය: දණ්ඩවග්ග.

▼**සසර බිය පෙන්වීම පිණිස** බුදුන් වහන්සේ දණ්ඩ උපමාව යොදාගෙන ඇත. උඩට විසිකළ දණ්ඩ, බිමට පතිත වන ආකාරය වරින් වරට වෙනස්වේ. යම් අවස්ථාවක මුලින් වැටේ, සමහර විටක අගින් වැටේ. එලෙස දීර්ඝ සසරේ ගමන් කරන සත්ත්වයෝ වරක මෙලොවින් පරලොවට යයි, වරක පරලොවින් මෙලොවට පැමිණේ. **සටහන:** මේ උපමාව: සංයු.නි: මහාවග්ග:සච්චසංයුත්තයේ:සිංසපාවග්ගයේ: දණ්ඩසූත්‍රයේ ද දක්වාඇත.**බලන්න**: උපග්‍රන්ථය:5. **මූලාශ්‍ර:**සංයු.නි (2): නිදානවග්ග: අන්මතග්ගසංයුත්ත:3.1.9 දණ්ඩ සූත්‍රය, පි. 306,ESN:15: Anamataggasamyutta:9.9. The stick, p. 795.

▼ **දණ්ඩ භාවිතා කරමින්** සතුන්ට හිංසා කිරීම දුගතියේ කම්ම විපාක ලැබීමට හේතුවන බව බුදුන් වහන්සේ වදාළහ. එසේ හිංසා නොකරන අයට (දඬු මුගුරු නොගන්නා අය) සුගතියේ සැප කම්ම විපාක ලැබේ. **සටහන:**මේ සූත්‍රයට මුලික වී ඇත්තේ, නයෙකුට හිංසා කරන දරුවන් පිරිසක් සම්බන්ධවය. **මූලාශ්‍ර:**බු.නි:උදානපාලිය:2.3 දණ්ඩ සූත්‍රය**,** පි.178.

**දප**

▲ **දීප්තිමත් කම්ම-** Bright kamma: දීප්තිමත් කම්ම ලෙසින් පෙන්වා ඇත්තේ යහපත් කුසල විපාක ඇතිකරන ක්‍රියාය. මේවා සුදුකම්ම ලෙසින්ද පෙන්වා ඇත. **බලන්න**: කම්ම.

▲ **දීප්තිමත් ධම්ම-** Bright Dhamma: හිරි ඔත්තප්ප යන ධර්මතා දීප්තිමත් ධම්ම යයි පෙන්වා ඇත. **බලන්න**: හිරි ඔත්තප්ප.

▲**දීප්තිමත් මග හා අඳුරු මග:** පාලි: **සුකකමගග-කණහමගග-** bright path & dark path: ධර්මයට අනුව දීප්තිමත් මග කුසල මගය, අඳුරු මග අකුසල මගය. දීප්තිමත් මග ලෙසින් බුදුන්වහන්සේ පෙන්වා ඇත්තේ සම්මා දිට්ඨිය පෙරමුණ කරගත් ධර්මතා 10යය. අඳුරු මග නම් මිථ්‍යා

දිට්ඨිය පෙරමුන කරගත් ධර්මතා 10යය. **මූලාශ්‍ර:** අං.ගු.නි: (6): 10 නිපාතය:10.3.5.2 සුක්ක මග්ග සූත්‍රය, පි. 474, EAN:10: Noble,p. 548.

▼ **දීප්තිමත් මග** -ශුක්ලමග- සුදු මග ලෙසින් ද හඳුන්වයි, දසකුසලයේ යෙදීම ඒ මගය. **අඳුරු මග:** කණ්හමග්ග - කෘෂ්ණ මග ලෙසින් ද හඳුන්වයි, දසඅකුසලයේ යෙදීම ඒ මගය. **මූලාශ්‍ර**: අං.ගු.නි: (6): 10 නිපාත:10.4.4.2 කණ්හමග්ග සූත්‍රය, පි. 536, EAN:10: 190-2 bright path, p. 556.

▲ **දීපය-** An Island: දීපය ලෙසින් බුදුන් වහන්සේ පෙන්වා ඇත්තේ නිවනය. දීපයට යන මග අරිය අටමගය. **මූලාශ්‍ර**: සංයු.නි: (4 ): සළායතනවග්ග: අසංඛතසංයුත්ත: 9.2-සූත්‍රය, පි. 689, ESN: 43: Asankathasamyutta: 14.3 sutta, p. 1513.

▼ **බුදුන් වහන්සේ** සංඝයාට අවවාද කර ඇත්තේ දීපයක් ලෙසින් තමා සරණ කොටගෙන, වෙනත් සරණක් නොමැතිව, ධර්මය, දීපය ලෙසින් ගෙන, ධර්මය, සරණය කොටගෙන ජිවත්වෙන ලෙසය. එසේ ජීවත්වීම පිණිස, සතර සතිපට්ඨානයට අනුව කටයුතු කලයුතු බව, බුදුන් වහන්සේ පෙන්වා ඇත.

**“ එවං ඛො ආනන්ද, භික්ඛු අත්තදීපො විහරති අත්තසරණො අනඤ්ඤසරණො, ධම්මදීපො ධම්මසරණො අනඤ්ඤසරණො…”** (Therefore, Ananda, you should live as islands unto yourselves, being your own refuge, with one else as your refuge, with the Dhamma as an island, with the Dhamma as your refuge, with no other refuge). **මූලාශ්‍ර**: දීඝ.නි: (2): 3 මහාපරිනිබ්බාන සූත්‍රය**,** පි. 126, ඡේදය-52, EDN: 16 Mahāparinibbāna Sutta: The Great Passing , p. 171, para 2.26, සංයු.නි: ඛන්ධසංයුත්ත: 1.1.5.1 අත්තදීප සූත්‍රය, පි.104, ESN: 22:Khandasamyutta: 43.1 Wirth yourselves as an Island, p. 1031.

▲ **දීපංකර බුදුන්වහන්සේ -** Buddha Dipankara: දීපංකර බුදුන්වහන්සේ වෙතින් සුමේධ තාපසයෝ (ගෝතම බුදුන්වහන්සේ), මතු බුද්ධත්වය පතා විවරණ ගැනීම මෙහි විස්තරාත්මකව දක්වා ඇත. **මූලාශ්‍රය**: බු.නි: බුද්ධවංස පාළි: 1 දීපංකරබුද්ධවංසො, පි.81.

▲ **දුප්පඤ්ඤ** - Unwise: දුප්පඤ්ඤ යනු අනුවණ බව- ප්‍රඥාව දුබල බවය. සප්ත බොජ්ඣංග ධර්මයන් වර්ධනය නොකරගැනීම නිසා කෙනක් අනුවණවේ. **මූලාශ්‍ර**: සංයු.නි: (5-1): මහාවග්ග: බොජ්ඣංග සංයුත්ත: 2.5.4 දුප්පඤ්ඤ සූත්‍රය, පි. 226,ESN: 46: Bojjanghasamyutta: 44.4 Unwise, p. 1780.

▲ **දුප්පටිවිනොදය-** Hard to dispel: දුප්පටිවිනොදය ලෙසින් පෙන්වා ඇත්තේ, වරක් ඇතිවූ පසු හැරදැමීමට අපහසු දේය. ධර්මයේ හැරදැමීමට අපහසු කරුනු ලෙසින් පෙන්වා ඇත්තේ: රාගය, දෝසය, මෝහය, ප්‍රතිභානය - අවබෝධය හා ගමික චිත්තය (සංචාරය-ගමන් යැමට ඇති තද ආශාව). (once arisen, are hard to dispel: Lust, Hatred, Delusion,Discernment ,The urge to travel). **මූලාශ්‍ර**: අංගු.නි: ( 3): 5

නිපාත: 5.4.1.10 දුප්පටිවිනොදය සූත්‍රය, පි. 322, EAN:5: 160.10 Hard to dispel, p. 289.

▲**දෙපිටකාවටු-** duplicity: දෙපිටකාවටු බව- වංචාසහගත බව-කුහනං ලෙසින්ද පෙන්වා ඇත. අව ගුණයක්වූ මේ කරුණ පහ නොකර උත්තරීමනුස්සධම්ම ලෙසින් පෙන්වා ඇත්තේ ආරියභාවය ලබාගැනීමට නොහැකිය. **මූලාශ්‍ර:** අංගුනි: (4): 6 නිපාත: අරහත්වග්ග: 6.2.3.3 උත්තරීමනුස්සධම්ම සූත්‍රය, පි.254, EAN:6: 77.3 Superior, p.360.

▲ **දෙපත් කියත-** double edge Saw: බුදුන් වහන්සේ අනුගමනය කරන පිරිස තරහ නොගෙන වාසය කලයුතු අන්දම පෙන්වීම් පිණිස මේ දෙපත් කියත උපමාව පෙන්වා ඇත. **බලන්න**: කකචූපම උපමාව-උපග්‍රන්ථය:5

**දබ**

▲**දබ්බමල්ල පුත්ත තෙර-** Dabbamalla Thera:**බලන්න**: උපග්‍රන්ථය:1

▲ **දිබ්බචක්ඛු ඤාණය-** divine eye element: දිබ්බ චක්ඛු හෙවත් දිවැස්, විශිෂ්ඨ ඤාන (අභිඤා) 6 න්එකකි. මිනිස් ඇස ඉක්මවා ගිය තැන් බැලීමට හැකි බලයකි. **චුතුප්පාතඤාණය**-චුතිඋත්පත්ති නුවණ ලෙසින්ද පෙන්වා ඇත. මෙය බුදුවරු සතු දසබල ඤානයෙන් එකකි. සත්ඣයෝ ඔවුන් කළ කුසල හෝ අකුසල කර්මයන්ගේ විපාක වශයෙන්, සුගතියේ හෝ දුගතියේ යළි උපතලබති: පහත් හෝ උසස් ස්ථානවල, රූපිව හෝ අරූපීව, වාසනාවන්තව හෝ අවාසනාවන්තව උපත් ලබන අන්දම බුදුන් වහන්සේ ඒ ආකාරයෙන්ම (තත්වාකාරයෙන්ම) දකී. බුදුන් වහන්සේට, විශ්වයම දැකිය හැක්කේ දිවැස් නිසාය. **සටහන්**: * **ම.නි: මහාසකුලදායි සූත්‍රයේ** බුදුන් වහන්සේ, තම ශ්‍රාවකයන්ට දිවැස් ලබාගැනීම පිණිස උපදෙස් දෙන බව පෙන්වා ඇත. ** The divine eye (*dibbacakkhu*) is the ability to see objects at remote distances, including distant world systems; to see other realms of existence; and to see beings dying and being reborn in accordance with their kamma. **බලන්න**: EAN, note no 78, p. 584. ** විස්තර පිණිස **බලන්න**: සංයු.නි. (5-2) ඉද්දිපාද සංයුත්තය හා පටිසම්භිදා 1: ඤානකතා: 54. දිව්‍යචක්ෂු ඤානය, පි. 238. **ශබ්දකෝෂ: B.D**: p. 3: "**Divine eye:** dibba chakkhu- he sees being vanishing and re-appearing, low & noble ones, beautiful & ugly…"

▼ **සතර සතිපට්ඨානය** වැඩූ බැවින්, බහුල කළ බැවින්, තමන් වහන්සේට දිවැස් ලැබූ බව අනුරුද්ධ තෙරුන් පෙන්වා ඇත. **සටහන:** බුදුන් වහන්සේගේ දිවැස් ලැබූ ශ්‍රාවකයන් අතුරින් අනුරුද්ධ තෙරුන් අග්‍රය **බලන්න**: අග්‍ර ශ්‍රාවකයන්. **මූලාශ්‍ර**: සංයු.නි: ( 5-2): මහාවග්ග: අනුරුද්ධසංයුත්ත: 8.2.13 දිබ්බචක්ඛු සූත්‍රය, පි. 106 , ESN: Mahavagga: 52: Anuruddhasamyutta: 23.13 Divine Eye, p. 2135.

▲**දිබ්බසෝත ඤාණය-** divine ear element: දිබ්බසෝත ඤාණය හෙවත් දිවකන, ඉද්දිපාද වඩා ගැනීමෙන් ලැබෙන ත්‍රිවිධ අභිඥා වලින් එකකි. දිවකණ ඇතිවිට ළඟක හෝ වේවා, දුරක හෝ වේවා ඇති කතා, ශබ්ද ඇසීමේ හැකියාව ලැබේ. **සටහන්**: * ම.නි: **මහාසකුලදායි සූත්‍රයේ** බුදුන් වහන්සේ, තම ශ්‍රාවකයන්ට දිවකන් ලබාගැනීම පිණිස උපදෙස් දෙන බව

පෙන්වා ඇත. ** විස්තර පිණිස බලන්න: සංයු.නි. **ඉද්දිපාද සංයුත්තය. ශබ්දකෝෂ: B.D**: p. 3: "**Divine ear**: with the divine ear -dibbasota he hears sounds both heavenly and human, far and nearer"

▼ **බුදුන් වහන්සේ මෙසේ වදාළහ: "** මහණෙනි, මම යම් තාක් කැමති වේ නම්, ඒ තාක් විසුද්ධ වූ මිනිස් විෂය ඉක්මවා ඇති දිව කණින්, දිව්‍ය වූ, මිනිස්වූ, දුරවූ ළඟවූ ශබ්ද අසමි" ( Bhikkhus, to whatever extent I wish, with the divine ear element, which is purified and surpasses the human, I hear both kinds of sounds, the divine and human, those that are far as well as near...) **මූලාශ්‍ර**: සංයු.නි: ( 2): නිදානවග්ග: කස්සපසංයුත්ත: 4.1.9 ඣාන අභිඥා සූත්‍රය, පි. 342, ESN: 16: Kassapa samyutta: 9 Jhānas and Direct Knowledges, p. 817.

▼**අනුරුද්ධ තෙරුන් මෙසේ වදාළහ: "**...සතර සතිපට්ඨානය වැඩූ බැවින්, බහුල කළ බැවින් මම මිනිස්බව ඉක්මවා පැවති විශුද්ධ වූ දිව්‍යමය ශ්‍රෝතධාතුවෙන් දුරවූද ලඟවූද දෙව් මිනිස් ශබ්ද අසමි..." **මූලාශ්‍ර**: සංයු.නි: ( 5-2): මහාවග්ග: අනුරුද්ධසංයුත්ත: 8.2.3 දිබ්බසෝත සූත්‍රය, පි. 102, ESN:Mahavagga: 52: Anuruddhasamyutta: 13.3 Divine Ear, p. 2126.

▼**වෙනත් මූලාශ්‍ර: 1.** " ඒ යොගාවචර භික්ෂුව... චතුධ්‍යාන සමාධින් සමාධිමත් වූ කල්හි... පිරිසුදු වූ, මිනිස් කන්හි ශබ්ද ඇසීමේ ශක්තිය ඉක්මා ඇති, දෙවියන්ගේ සෝතය වැනි හෙයින් දිබ්බසෝත යයි කියන නුවණ ලබයි. දිව්‍යමය වූ ද මනුෂ්‍යමය වූ ද ශබ්ද ඇසීම...".**සිංහල විශුද්ධිමාර්ගය:** 13 පරිඡේදය**:** පි. 593.

▲ **දුබ්බන්ණිය මිටියක්ෂයා-**Ugly yakka: සක්දෙවිඳුගේ උතුම් ගුණයක් වන නොකිපෙන බව පෙන්වීමට, බුදුන් වහන්සේ මේ දේශනාව වදාළහ: "දුබ්බණ්ණිය (දුර්වර්ණවූ), මිටිවූ, එක්තරා යක්ෂයෙක්, සක්දෙවිඳුගේ අසුනේ වාඩිවී සිටියේය. ඒ බව දුටු තව්තිසා වැසි දෙවියෝ, ඔහුට දොස් පැවසුහ, අවමන් කළහ. දෙවියන් එසේ අවමන් කරනවිට යක්ෂයාගේ රූපය අලංකාර බවට පත්විය. එබව දුටු දෙවියෝ, පුදුමයට පත්ව සක්දෙවිඳුවෙත පැමිණ 'ක්‍රෝධය බුදින' යකෙක්, සක්දෙවිඳුගේ අසුනේ වාඩිවී සිටින බව සැලකළහ. අනතුරුව, ඒ යක්ෂයා ඉදිරියට පැමිණි සක්‍රදෙව්, ඔහුට නමස්කාර කර, 'නිදුකානෙනි, මම සක්දෙවිඳු වෙමි' යයි තෙවරක් පැවසිය. එසේ පවසනවිට, ඒ යක්ෂයා අතිශයෙන් දුර්වර්ණව, මිටිව අතුරුදහන්විය. ඉන්පසු, සක්දෙවිඳු තම අසුනේ වැඩසිට මෙසේ පැවසුහ: "...මම නොගැටුණු සිත් ඇත්තෙමි, නො කිපෙමි, මා කෙරහි ක්‍රෝධය නො පිහිටයි". **සටහන්**: * සක්දෙවිඳුගේ ආසනය 'පාණ්ඩුකම්බල ශෛලාසනය' වේ. අටුවාවට අනුව, බ්‍රහ්මදෙවිකෙනක්, සක්දෙවිඳු ගේ ඉවසීම ගැන අසා, ඒ බව පරික්ෂා කිරීම පිණිස, දුර්වර්ණ යක්ෂයෙක් ලෙසින් එහි පැමිණියහ. **මූලාශ්‍ර:**සංයු.නි: (1): සගාථවග්ග: සක්කසංයුත්ත:11.3.2 දුබ්බන්ණිය සූත්‍රය,පි.448, ESN: 11: Sakkasamyutta:22.2 Ugly, p. 494.

**දඹ**

▲ **දඹදිව:** පාලි: **ජම්බුදීප-** Jambudipa- India: බුදුසමයේ, වර්තමාන ඉන්දියාව හැඳින්වූවේ දඹදිව ලෙසින්ය (**ජම්බුද්වීපය-** Rose-Apple

Continent), දඹනම්වූ පලතුරුගස් බොහොමයක් පැවති නිසා ජම්බුදීපය යයි කියයි. බුදුන් වහන්සේ උපත ලැබුවේ මේ රටේය. එවක, මහාදීප 4 ක් ගැන දක්වා තිබේ. දකුණු මහාදීපය, ජම්බුද්වීපය ලෙසින්ද, බටහිරින් පිහිටි මහාදීපය අපරගොයාන ලෙසින්ද, උතුරේ පිහිටි මහාදීපය උත්තරකුරු ලෙසින්ද, නැගෙනහිරින් පිහිටි මහාදීපය පුබ්බවිදේහ ලෙසින්ද සඳහන්වේ. අටුවාවට අනුව හිමාල කඳු අසල මහා විශාල ජම්බු ගස් නිසා, ජම්බුද්වීපය ලෙසින් හඳුන්වා ඇත. **බලන්න**: EAN: Note: 183, p. 589, ජම්බුදිපය.

▼ **බුදුන් වහන්සේ මෙසේ වදාළහ:**"...මේ දඹදිව ආරණ්‍ය, වන, බිම් පොකුණු රමණීයය, අල්පය. කඳු, බෑවුම්, ගංගා, කටු හා ලඳු බිම්, රළු උස් බිම් බොහෝය...". **සටහන**: දඹදිව පිලිබඳ විස්තර පිණිස බලන්න: අං.ගු.නි: (1) :1 නිපාත: ජම්බුද්වීපපෙය්‍යාලවග්ග. **මූලාශ්‍ර**: අං.ගු.නි: (1) : 1 නිපාත: ජම්බුද්වීපපෙය්‍යාලය: 1.16.4.1 සූත්‍රය, පි. 11, EAN: 1: Jambudīpa Repetition Series, 333.1, p. 49.

▼ **බුදුසමයේ දඹදිව පැවතී ගණිත ක්‍රමය**: 1) **එක කෝටිය**=දස ලක්ෂ 10කි 2) එක් කෝටි ඒවා කෝටියක් = එක **ප්‍රකෝටියකි**. 3) ප්‍රකෝටි ඒවා කෝටියක්= **කෝටිප්‍රකෝටියකි** 4) කෝටිප්‍රකෝටි ඒවා කෝටියක්= එක **නහුත** යකි 5) නහුත කෝටියක්= **නින්නාහුත** එකකි 6) නින්නාහුත කෝටියක් = එක් **අබ්බුද** යකි 7) අබ්බුද 20ක් = එක **නිබ්බුද** යකි. **බලන්න:**EAN:note: 2115, p. 682. **සටහන**: බුදුන් වහන්සේ එම ගණිත ක්‍රමය පෙන්වා ඇත්තේකෝකාලික භික්ෂුවට නිරයේ විඳීමට ඇති දීර්ඝ කාලය පෙන්වාදීමටය. **මූලාශ්‍ර**: අං.ගු.නි:(6):10 නිපාත: ථෙර වග්ග, 10.2.4.9. කොකාලික සූත්‍රය,පි.331, EAN:10: The Elders: 89.9. Kokalika, p. 530.

**දම**

▲**දුම-**Smoke: ගින්නට සලකුණ-සංකේතය දුමය. **බලන්න:** සංකේතය.

▲**දෝමනස්ස ඉන්ද්‍රිය**-Domanassa indriya: සිතට සුවයක් නොදැන, සැප ඇති නොකරන, යම් පහසක් නිසා සිතට ඇතිවෙන දුක් වේදනාව දෝමනස්ස ඉන්ද්‍රියවේ. මෙය ඉන්ද්‍රිය 22න් එකකි. **බලන්න**: ඉන්ද්‍රිය.

**දය**

▲**දයාව-**Dayawa: දයාව, අන්‍යයන් කෙරෙහි ඇති අනුකම්පාව දයාව ලෙසින් පෙන්වා ඇත. සතර බ්‍රහ්මවිහරණයක් වන කරුණාව, දයාව ලෙසින්ද හඳුන්වයි. **බලන්න**:කරුණාව.

▲**දායකයා-** Dayakaya: බුදුන් වහන්සේ ප්‍රමුඛ සංඝයාට, සිව්පස පිරිනමන, සේවාවන් කරන පුද්ගලයා දායකයාය. අනාථපිණ්ඩික සිටුවරයා, විශාකා මහා උපාසිකාව, වෙළුකන්ට නන්දමාතා උපාසිකාව, පසේනදී කෝසල රජ, සේනිය බිම්බිසාර රජ ආදීන් බුදුන් වහන්සේගේ අග්‍ර දායක පිරිස ලෙසින් සූත්‍ර පිටකයේ පෙන්වා ඇත. **බලන්න**: උප ග්‍රන්ථය:3. දායකයා ලෙසින් මෙහි පෙන්වා ඇත්තේ දානය පිරිනමන පුද්ගලයාය. ඔහුට, දානයට පෙරද, දන් දෙන අවස්ථාවේද, දානය පිරිනැමීමෙන් පසුවද සිතේ සොම්නස, සතුට, පහන්බව තිබීම මගින්

දානය දීමේ කුසලය සම්පුර්ණවේ. **බලන්න**: සංඝදානය, දානය. **මූලාශ්‍ර:** අංගු.නි: (4 ): 6 නිපාත: 6.1.4.7 ඡළාඞගදාන සූත්‍රය, පි. 112, EAN:6: 37.7 Giving, p. 332.

▲ **දියනෑම-**Bathing: බුදුන් වහන්සේ වැඩසිටි සමයේ සමහර බ්‍රාහ්මණ නිකායන්, දිය නෑමෙන් විසුද්ධිය ඇතිවේ යන දිට්ඨිය දැරුහ. **බලන්න:** ජල ස්නානය.

▲ **දියබුබුල උපමාව-**Similes of Water drop**: බලන්න:** උපග්‍රන්ථය:5

▲ **දියේ ඇඳි ඉර උපමාව-**Similes of drawing a line on the water**: බලන්න:** උපග්‍රන්ථය:5

**දර**

▲ **දර්ශන අනුත්තර** -unsurpassed sight: බුදුන් වහන්සේ හා බුද්ධ ශ්‍රාවකයන් දැකීම උතුම් දර්ශනයක් බව මෙහි පෙන්වා ඇත. එයට වඩා උතුම් දර්ශනයක් නොමැත. **මූලාශ්‍ර:** අංගු.නි: ( 4 ): 6 නිපාත: 6.1.3.10 අනුත්තරිය සූත්‍රය, පි. 92, EAN:6: 30.10 Unsurpassed Things, p. 329.

▲**දර්ශනවිසුද්ධි ඤාණය**-Darshnavisuddhi nana: සියළු සංඛත අසංඛත ධර්මයන්ගේ ඒකසංග්‍රහත්වයද, කාමච්ඡන්ද ආදියේ නානත්වයද, නෙක්ඛම්ම ආදියේ ඒකත්වය ද ප්‍රතිවේධ- අවබෝධ කිරීමේ ප්‍රඥාව දර්ශනවිසුද්ධි ඤාණය ය. **මූලාශ්‍රය:** බු.නි: පටිසම්භිදා 1: 40 දර්ශනවිසුද්ධි ඤාණය, පි.220.

▲ **දාරුකම්මික ගහපති**- Householder Darukammika: **බලන්න:** උපග්‍රන්ථය: 3.

▲**දාරුක්ඛන්ධ-**large block of wood: දාරුක්ඛන්ධ යනු මහා දැවකඳක්ය. සැරියුත් තෙරුන්, මහා දැවකඳක් මුල් කරගෙන, ඉද්දිබල ඇති සිත වසඟයට පත්කරගත් භික්ෂුවක්, එම දැවකඳ සලකා බලන අයුරු පෙන්වා වදාළහ: **(භික්ඛු ඉද්ධිමා චෙතසොවසිප්පත්තො-** a bhikkhu possessing psychic potency who has attained mastery of mind**)**. **සටහන**: එම දැවකඳ: සතර මහා ධාතු ලෙසින් (පඨවි ආදී), සුභ ලෙසින්, අසුභ ලෙසින් සැලකිය හැකිය. එම දැවකදේ ඒ ලක්ෂන 6 ඇතුළත්ව තිබේ. **මූලාශ්‍ර:**අංගු.නි: (4 ): 6 නිපාත:6.1.4.11 දාරුක්ඛන්ධ සූත්‍රය**,** පි.120, EAN:6: 41.11 A block of wood, p. 334.

▼**දාරුක්ඛන්ධ උපමාව**: එක්සමයක, බුදුන් වහන්සේ, අයෝධ්‍යා නුවර අසල, ගංගා නදී (ගංගානම් ගඟේ) ඉවුරේ වැඩවසන කල, ගඟේ පාවියන මහා දැවකඳක් උපමා කොට මේ සූත්‍රය වදාළහ. යම් බාධාවන්ට හසු නොවී යන්නේ නම්, ඒ දරකඳ මහා මුහුදටම පාවීයන්නේය. එයට හේතුව නම්, නදියේ සැඩපහර මුහුද වෙතට නැමී ඇති නිසාය. එලෙසින්, සම්මාදිට්ඨිය ඇතිවිට, වෙනත් බාධා වලට හසු නොවන්නේ නම්, ඒකාන්තයෙන්ම,නිවනට පැමිණෙන්නේය. එම ගමනේදී **හසුවන බාධා - මාර්ගබාධා** 8 උපමාවෙන් මෙසේ පෙන්වා ඇත: 1) ගඟේ මේ ඉවුරට ගසාගෙන ඒම: - සළායතන වලට හසුවීම වැනිය 2) ගඟේ එහා ඉවුරට ගසාගෙන ගසාගෙන යාම - බාහිර අරමුණු 6 ට (බාහිර ෂඩායතන) හසුවීම වැනිය. 3) ගඟ මැද කිමිදීම-නන්දිරාගයට හසුවීම වැනිය.4) පාවී

යන්නේ නැතිව ගොඩට ගැසීම- අස්මිමානයට හසුවීම වැනිය. 5) පාවියන කොටය, මිනිසුන් ගැනීම- ගිහියන් හා බැඳීමට පත්වීම වැනිය 6) නො මිනිසුන් ගැනීම- දේවනිකායක් පතමින් මග බඹසර කිරීම වැනිය. 7) සුළියකට හසුවීම නිසා ගමන නතරවීම - පස්කම් සැපයට යටවීම වැනිය 8) පාවීයන්නේ නැතිව ගඟේ රඳා සිටීම නිසා කොටයේ ඇතුළත කුණුවීම- කෙළෙස්වලට යටවීම නිසා මග බඹසර අයහපත්වීම වැනිය. එ බාධා සැම ජය ගත්තේ නම් විමුක්තිය **සටහන:*** මේ සූත්‍රය අසා, අවබෝධය ලැබූ නන්ද නම් ගොපල්ලා, බුදුන් වහන්සේ වෙත පැවිදිව, අරහත්වයට පත්වූහ. ** දුතිය **දාරුක්ඛන්ධ උපමා සූත්‍ර**යේදී, බුදුන් වහන්සේ කිම්බිල තේරුන්හට එම උපමාව විස්තර කර වදාළහ. එහිදී, භික්ෂුවගේ ඇතුළත කුණුවීම ලෙසින් පෙන්වා ඇත්තේ, යම් ඇවතකට පැමිණි මහණ, එම ඇවත පිරිසිදු නොකර වාසය කිරීමය.**බලන්න**: උපග්‍රන්ථය:5 **මූලාශ්‍ර**: සංයු.නි: (4 ): සළායතනවග්ග:වේදනා සංයුත්ත: 1.19.4 දාරුක්ඛන්ධ උපමා සූත්‍රය, පි.1.19.4,ESN:33: Vedanasamyutta:IV Vipers:241.4 The simile of the great log, p.1317.

▲**දරුණුබව-**Dreadful: සංසයාට ලැබෙන, ලාභ සත්කාර කීර්ති ප්‍රසංසා ආදිය, දරුණුයයි (දාරුණ) බුදුන් වහන්සේ පෙන්වා ඇත. ඒවා අරහත්වය ලැබීම වලක්වයි. එමනිසා, මාර්ගයේ පුහුණුවන සංසයා, ලාභ ආදිය මගින් සිත වසඟ නොකරගෙන-යට නොකරගෙන වාසය කලයුතුවේ. **සටහන:**ලාභ යනු සිව්පසයය, සත්කාර (honor) යනු සම්මාන, ගෞරව ලැබීමය. **මූලාශ්‍ර**: සංයු.නි: ( 2): නිදානවග්ග: ලාභසත්කාර සංයුත්ත: දාරුණවග්ග: 5.1.1. දාරුණ සූත්‍රය, පි. 366, ESN:17: Labhasatkarasamyutta: 1.1 Dreaful, p.829.

▲**දුර්භාෂිතය-**badly spoken speech: දුර්භාෂිතය යනු අයහපත් කතාවය, අකුසලයකි, කරුණු 5 ක් නිසා දුර්භාෂිතයක් වේ: 1) නුසුදුසු අවස්ථාවේ කතාකිරීම 2) අසත්‍ය කතා කිරීම 3) රළු වචන භාවිතය 4) අනාගත්ට අයහපත සැලසෙන ලෙස කතා කිරීම 5) ක්‍රෝධ සහගත කතා කිරීම. එවැනි කතාව, වැරදිය, ප්‍රඥාවන්තයන් ඒ ගැන දොස් පවසති. **බලන්න**: සුභාෂිතය. **මූලාශ්‍රය:** අංගු:නි: (3): 5 නිපාත: සොනවග්ග: 5.4.5.8 සුභාෂිත වාචා සූත්‍රය, පි.414.

▼**අසත්‍ය කතා** කිරීම දුර්භාෂිතයකි. එය අලික ලෙසින්ද පෙන්වා ඇත. **බලන්න**: අලික. **මූලාශ්‍රය:** ඛු.නි:සුත්තනිපාත: 3-3- සුභාසිත සූත්‍රය, පි.150.

▲ **දුර්ලභ දේ-**Rare things: ලෝකයේ දුර්ලභ දේ ලෙසින් සලකනකරුණු 6කි: සම්මා සම්බුදුවරුන්ගේ පහළවීම, තථාගත ධර්මවිනය දේශනා කරන පුද්ගලයන් ඇතිවීම, ආරියආයතනය- ආරියන් පහළවන ප්‍රදේශයක ඉපදීමට ලැබීම, ඉන්ද්‍රිය අවිකාලභාවය-ඉන්ද්‍රිය විකලාංගනොවීම, (unimpaired faculties), බුද්ධිමත්බව හා නිපුනබව තිබීම, යහපත් ධර්මය පිණිස කැමැත්ත- කුසල ඡන්දය තිබීම. **මූලාශ්‍ර**: අංගු.නි: (4 ): 6 නිපාත: 6.2.5.1 පාතුභාව සූත්‍රය, පි. 272, EAN:6: V: 96.1 Manifestation, p.362.

▼**ලෝකයේ** ලබාගැනීමට දුර්ලභ ධර්මතා 10 ක් මෙහි පෙන්වා ඇත.**බලන්න**: ඉෂ්ඨධම්ම. **මූලාශ්‍රය**: අංගු.නි: (6) 10 නිපාත::10.2.8.3 ඉෂ්ඨධම්ම සූත්‍රය, පි.270.

▼ **තථාගතයන්** ලෝකයේ පහළවීම දුර්ලභ කරුණකි. **බලන්න**: තථාගතයන්වහන්සේ.

▼ **යහපත් සෞඛ්‍යයය**, ලෝකයේ ලබාගැනීමට දුර්ලභ දෙයකි. **බලන්න**: ආරෝග්‍ය.

▼**ලෝකයේ දුර්ලභ පුද්ගලයෝ** තිදෙනෙකි:1) සෙසුඅයට උපකාර කිරීම පිණිස පළමුව ඉදිරිපත් වන තැනැත්තා- පුබ්බකාරී 2)කෘතඥ හා කෘතවේදී පුද්ගලයා- කෙළෙහිගුණ ඇති, ස්තුතිවන්ත තැනැත්තා (grateful & thankful) 3) තෘප්තිමත්- සංතෘප්ත පුද්ගලයා -තිතෙතා 4) තෘප්තිය සලසන -පමුණුවන පුද්ගලයා- තපෙපතා. **සටහන්**: * දුර්ලභ පුද්ගලයන් 2ක් ගැන මෙහිදී පෙන්වා ඇත; 1) තෘප්තිමත් (satisfied) බව ලැබූ තැනැත්තා හා අන්‍යයන් තෘප්තිමත් කිරීමට කටයුතු කරන තැනැත්තා ලෝකයේ දුර්ලභය. **මූලාශ්‍රය**: අංගු.නි: (1) 2 නිපාතය,ආසාවග්ග: 2.3.11.2 සූත්‍රය,පි. 206.

▲**දුර්වචභාවය-**Durvacahabhavaya: දුර්වචභාවය**-** දෝවචස්සතාවය නම් ධර්මයේ කීකරු නොවීමය. මෙය හානභාගිය ධර්මයකි.**බලන්න**: දෝවචස්සතාවය, හානභාගිය ධර්ම.

## දල

▲ **දෙලොව-** Two worlds: මෙලොව හා පරලොව යන දෙක දෙලොව ලෙසින් පෙන්වා ඇත. අයහපත් හෝ යහපත් කම්ම විපාක දෙලොවදීම විඳීමට සිදුවේ. **බලන්න:** මෙලොව හා පරලොව. **මූලාශ්‍රය:** ඛු.නි: ඉතිවුත්තක: 1.3.3. උභෝඅර්ථ සූත්‍රය, පි. 370.

## දළ

▲ **දළචීවර-** coarse robes : දළචීවර යනු රළු සිවුරුය. පාංශුකූල වස්ත්‍ර, ඉවත විසිකළ රෙදි, මිනීඔතා තැබූ රෙදි ආදීයෙන් සකස් කරගත් මුදුනොවන සිවුරු දැරූ සංඝයා, බුදුන් වහන්සේගේ ශ්‍රාවක සංඝයා අතර වූහ.දළචීවර දරන භික්ෂූන් අතරෙන් අග්‍ර මොඝරාජ තෙරුන්ය, භික්ෂුණියන් අතරෙන් අග්‍ර: කිසා ගෝතමී තෙරණියය. **බලන්න**: අග්‍රතම ශ්‍රාවකයන්. මහා කාශ්‍යප හා උන්වහන්සේගේ ශිෂ්‍ය සමූහයද, ධූතාංග පුහුණුවේ යෙදීසිටි හෙයින් රළු චීවර දැරූහ. **විස්තර පිණිස බලන්න**: සංයු.නි: කාශ්‍යප සංයුත්තය.

▲**දළිද්ද-** Poor: දළිද්ද- දිළිඳු යනු දුගී බවය. සප්ත බොජ්ඣංග යහපත් ලෙසින් වඩා නොගන්නේ නම් කෙනෙක් ධර්මයේ දුගී බවට පත්වේ. **බලන්න**: අදළිද්ද **මූලාශ්‍ර**: සංයු.නි: (5-1 කාණ්ඩය): මහාවග්ග: බොජ්ඣංගසංයුත්ත: 2.5.6 දළිද්ද සූත්‍රය, පි.226, ESN: Bojjangha samyutta: V: 46.6 Poor , p. 1783.

## දව

▲**දෙවන ශ්‍රමණ**-Second ascetic: දෙවන ශ්‍රමණ ලෙසින් පෙන්වා ඇත්තේ සකදාගාමි ආරිය ශ්‍රාවකයාය. **බලන්න**: ආරිය අටමග.

▲**දෙවහිත බමුණා-**Brahamin Devahitha**:** **බලන්න:** උපග්‍රන්ථය:3

▲ **දේවඅසුර සංග්‍රාමය** - Deva & Asura war: පෙර කල ඇතිවූ දේව හා අසුර සටන් පිලිබඳ විස්තර මෙහි පෙන්වා ඇත. **බලන්න**: අසුර, සංයු.නි: ධජග්ග සූත්‍රය, සංයු.නි: (1) සක්කසංයුත්ත. **මූලාශ්‍ර:** අංගු.නි: ( 5): 9 නිපාත: 9.1.4.8 දේවඅසුර සංග්‍රාමය, පි. 524, EAN: 9: 39.8 Devas, p. 479.

▲ **දේවචුති-** Passing away of Devas: දේවචුති යනු දෙවියන්, දේව ආයුෂ ඉක්මවා ගිය පසු දේවලෝකයෙන් චුත වීමය- යළි උපතකට පැමිණීමය. බුදුන් වහන්සේ පෙන්වා ඇත්තේ, එලෙස චුතවන දෙවියන්ගෙන් ඉතා සුළු ප්‍රමාණයක් පමනක් නැවත දෙවලෝකයේ පහළ වනබවය. බොහොමයක් දුගතියේ යළි උපත ලබයි, සුළු කොටසක් මිනිස්ලොවට පැමිණේ. **මූලාශ්‍ර**: සංයු.නි: (5-2) මහාවග්ග: සච්චසංයුත්ත: 12.11.7 සිට දේවචුති සූත්‍ර 4 කි, පි. 200, ESN: 56: Sacchasamyutta: 108.7 to 4 suttas: Passing away as Devas, p. 2378.

▼**දෙවියන් චුතවන** අවස්ථාවේ, අනිකුත් දෙවියෝ, ඔහුට මිනිස්ලොවට යෑමට උපදෙස් දෙන බව මෙහි පෙන්වා ඇත. **මූලාශ්‍රය:** ඛු.නි:ඉතිවුත්තක: චතුවග්ග:3.4.4 පුර්වනිමිත්ත සූත්‍රය,පි.450.

▲ **දේවචාරිකා-** Visiting the Devas: දේවචාරිකා ලෙසින් පෙන්වා ඇත්තේ, මිනිස් ලෝකයේ සිට දේවලෝකවලට සංචාරය කිරීමය. මේ සූත්‍රයන්හි පෙන්වා ඇත්තේ මුගලන් මහා තෙරුන්, ඉද්ධිබලයෙන් තව්තිසා දෙව්ලොවට පැමිණීම හා දෙවියන්හට තිසරණ ගුණ මහිම විස්තර කිරීම ගැනය. **මූලාශ්‍ර**: සංයු.නි: (5-2) මහාවග්ග: සෝතාපන්න සංයුත්ත: 11.2.8, 11.2.9, 11.2.10 දේවචාරිකා සූත්‍ර, පි. 200, ESN: 55: Sotapatthisamyutta: 18.8, 19.9, 20.10 Visiting the Devas, p. 2204.

▲**දේවතානුසතිය**-Devathanusati : දෙවියන්ගේ ගුණ සිහිකර කරන අනුසති භාවනාවකි. මෙය එය සසර කලකිරීම පිණිස, නිවන පිණිස පවතී යයි බුදුන් වහන්සේ පෙන්වා ඇත. **බලන්න**: භාවනා. **මූලාශ්‍රය:** අංගු.නි: (1) නිපාත: ඒකධම්මපාලිය සූත්‍ර, පි.100.

▲ **දේවදත්ත භික්ෂුව-** Devadatta Bhikkhu: **බලන්න**: උපග්‍රන්ථය:4

▲ **දේවදූතයෝ-**divine messengers: ධර්මයේ දේවදූතයන් ලෙසින් පෙන්වා ඇත්තේ ලෝක සත්ත්වයාට සසර බිය පෙන්වා අප්‍රමාදය ඇතිකරගනිමට උපකාරීවන දහම්කරුණුවලටය. විස්තර පිණිස **බලන්න:** අංගු.නි: (1): 3 නිපාත: දේවදූත වග්ග.

▼ **දේවදූතයන් පස් දෙනෙකි:** 1) තමාගේ අශූචි හා මුත්‍රා තැවරී උඩුකුරුව වැතිර සිටින අලුත උපන් දරුවා 2) මහලුව වයසට ගිය, දුබලව දුකට පත් මිනිසා 3) රෝගීව දරුණු කායික හා මානසික වේදනා විඳින මිනිසා 4) සොරකම් කිරීමේ වරදට රජතුමාවිසින් බොහෝ වධ පීඩාවන් ආදී දඬුවම් ලබන සොරා 5 ) මිගිය කෙනෙක්- කුණුවී ගිය මළ සිරුරක්. **සටහන්:** * එම කරුණු දේවදූතයන් ලෙසින් දක්වා ඇත්තේ ඒවා දකින නුවණැති

පුද්ගලයෙකුට තමාටද එම දේ සිදුවනබව: යළිඋපතක් ඇතිවනබව, මහළුවනබව, ලෙඩවෙනබව, වැරදි කිරීමෙන් මහා දඬුවම් ලබනබව, මරණයට පත්වෙන බව අවබෝධවී, අප්‍රමාදව සසරින් එතෙර වීමට කටයුතු කිරීමට පෙළඹෙන නිසාය. ** තුන්දොරින් අකුසල කර්ම කළ කෙනෙක් මියගියපසු නිරය ආදී දුගතියක යළි උපත ලබයි. මරණයට අධිපති යමරජු එවැනි, පුද්ගලයන් අමතා දේවදූතයන් මිනිස් ලෝකයේ දී දැක තිබේද? යයි ප්‍රශ්ණකරණ බව හා අපායේ විඳීමට සිදුවන විවධ දුක්වේදනා පිලිබඳ මේ සූත්‍රවල විස්තරකර ඇත. **බලන්න**: නිරය. **මූලාශ්‍ර**: අංගු.නි: (1 ):3 නිපාත: දේවදූතවග්ග: 3.1.4.6 සූත්‍රය, පි. 292, EAN:3: Divine Messengers: 36. 6 Messengers, p.92, මනි: (3): 3.3.10, දේවදූත සූත්‍රය, පි. 400, EMN:130: The Divine Messengers, p.941.

▲ **දේවධම්ම**- Deva Dhamma:හිරිඔත්තප්ප ධර්මතා දේවධම්ම යයි හඳුන්වයි. **බලන්න**: හිරි ඔත්තප්ප.

▲ **දේවධම්මික** -devadhammika: බුදුන් වහන්සේ වැඩසිටි සමයේ පැවති අන්‍යආගමික නිකායකි. **බලන්න**: අන්‍යආගමික නිකායන්.

▲ **දේවනිකාය**-Devanikaya: දේවනිකාය ලෙසින් පෙන්වා ඇත්තේ, සදෙව්ලෝකයට වඩා පහත් නිකායන්වල උපත ලැබූ දේව පිරිසය. **බලන්න**: ගාන්ධර්ව දේව නිකාය, ගන්ධබ්බකායික දේව නිකාය, වලාහක දේව නිකාය.

▲ **දේවපාද**- Deva pada:දේවපාද ලෙසින් පෙන්වා ඇත්තේ දෙවියන් ගමන් කරන මාර්ගයට පැමිණීමට ඇතිකරගත යුතු ගුණය. එම ගුණ ඇතිවිමෙන්, ආධ්‍යාත්මික පිරිසිදු බව නොලත් අය පිරිසුදුබවට පත්වේ යයි බුදුන් වහන්සේ පෙන්වා ඇත: 1-3: ත්‍රිවිධ රත්නය පිලිබඳ ඇති අචල විශ්වාසය 4 ආරිය කාන්ත ශිලය තිබීම. 5 කරුණ ලෙසින්: අවිහිංසාවෙන් ජිවත්වීම පෙන්වා ඇත ( දෙවියන් අවිහිංසාව උතුම් යයි පිළිගන්නා බව නුවණින් වටහා ගන්නා ආරිය ශ්‍රාවකයා තමන් තුල එම ගුණය ඇති කරගනි). **මූලාශ්‍ර**: සංයු. නි: (5-2 ): මහාවග්ග: සෝතාපන්න සංයුත්ත: 11.4.4. හා 11.4.5 දේවපාද සූත්‍ර, පි. 244, ESN:55: Sacchasamyutta: 34.4 & 35.5 Divine Tracks, p. 2228.

▲ **දේවප්‍රසාද**-Devaprasada: සිව්දහමින් යුත් ආරිය ශ්‍රාවකයෝ ගැන දෙවියෝ ප්‍රසාදයට පැමිණේ යයි බුදුන් වහන්සේ වදාළහ. දෙවියෝ දේව සභාවේදී මෙසේ පවසති:

"අපද, මිනිස් ලොවේ වාසය කරනවිට බුදුන් කෙරේ, දහම කෙරේ, සංඝයා කෙරේ අචල ප්‍රසාදයකින් යුතුව වාසය කළෙමු, අපහට ආරිය කාන්ත ශිලයද තිබිණි. එම නිසා, අපි දැන් දෙව්ලොව වෙසෙමු. මේ අරිය ශ්‍රාවකයාද, මියගිය පසු දෙවියන් ගේ සභාවට පැමිණෙනු ඇත" **මූලාශ්‍රය**:සංයු.නි: (5-2) මහාවග්ග: සෝතාපත්තිසංයුත්ත: සභාගත සූත්‍රය, පි.246.

▲**දේවප්‍රිය**-Devapriya: ධර්මානුකූලව හැසිරෙන ගිහි හා පැවිදි පිරිස දෙවියන්ට ප්‍රිය බව සූත්‍ර දේශනාවල දක්වා ඇත. දෙවියන්ට ප්‍රිය සංඝයා අතුරින් පිළින්දවච්ඡ තෙරුන් අග්‍රය. **බලන්න**: උපග්‍රන්ථය: 1

▲ **දේවලොක-**Devaloka: දේවලොක, ස්වර්ගය ලෙසින්ද හඳුන්වයි, යළි උපත ලබන සුගතියකි. යහපත් කර්ම විපාක නිසා දේවලෝකවල උත්පත්තිය ලබයි. කාමාවචර දේවලෝක 6 කි, සදෙව්ලෝකය ලෙසින් ද හඳුන්වයි. මේ දේවලෝකවලට ඉහළින් ඇත්තේ බ්‍රහ්ම දේව ලෝකයන්ය, සදෙව්ලෝකයට පහළින් ඇත්තේ මිනිස්ලෝකය හා සතර අපායය. තිසරණ සරණ ගිය, සිල්වත්වූ මිනිසුන් මරණින් මතු සදෙව්ලොව උපත ලබයි. **බලන්න**: බ්‍රහ්මලෝක. **සටහන**: දීඝ.නි: ජනවසභ සූත්‍රයේ දේවලෝක ගැන විස්තර දක්වා ඇත.

▼ **දේවලෝක හය:** මිනිස්ලොවට ඉහලින් ඇති දේවලෝක 6: සදෙව්ලෝකය,කාමවාචාර දේවලෝක ලෙසින්ද හඳුන්වයි. **සටහන**: සදෙව්ලොව පහලවූ සැම දෙවියෙක්ම දුගතියේ උපත අවසන් නොකර ඇත. සෝතාපන්නවූ දෙවියෝ දුගතිය-නිරයේ උපත අවසන් කර ඇත. **බලන්න**:අංගු.නි: 6 නිපාතය:දේවතාවග්ග:6.1.4.4 මොග්ගල්ලාන සූත්‍රය.

**1) චාතුර්මහාරාජික දෙව්ලොව (**devas ruled by the four great kings) මේ දේවලෝකයට අධිපති දෙවියෝ 4 කි, සිව්වරම් දෙවියෝ (සතර දිශාවන් පාලනය කරන) ලෙසින්ද පෙන්වා ඇත. එම දෙව්ලොවේ ආයුෂ දිව්‍යවසර 500 කි. එහි එක් දිනක්, මිනිස්ලෝකයේ වසර 50 ට සමානය. **සටහන්: *** සිව්වරම් මහා රජවරු: ධෘතරාෂ්ට්‍ර- නැගෙනහිර පාලක, විරුඪක- දකුණුදිග පාලක, විරූපාක්ෂ - බටහිර පාලක, වෙසවුණු- වෙසමුනි - උතුරු දිග පාලක, ඔවුන්ගේ නායකයා සක්දෙවිඳුන්ය (ඉන්ද්‍ර). **බලන්න**: දීඝ:නි: ජනවසභ සූත්‍රය. ** අංගු:නි: (1): 3 නිපාත:3.1.4.7 සූත්‍රයේ: පොහෝදිනයන්හි, සිව්මහා රජුන්ගේ ඇමතිවරු, මිනිසුන් යහපත් ලෙසින් වාසය කරනවාද: දෙමාපියන්, ශ්‍රමණ බ්‍රාහ්මණයන්, කුලදෙටුවන් ආදීන් පුදනවාද? උපෝසතදීන සිල් ගන්නේද? පින් කරන්නේද යයි මිනිස් ලෝකය සිසාරා සොයාබලා, ඒ බව තව්තිසා දෙවියන්ට පවසන බව පෙන්වා ඇත. **2) තාවතිංස දේවලෝකය (**Tāvatiṃsa devas) තව්තිසා- දෙව්ලොවේ ආයුෂ දිව්‍යවසර 1000 කි, එහි එක් දිනක්, මිනිස්ලෝකයේ වසර 100 ට සමානය. සක්දෙවිඳු මේ දෙව්ලොවට අධිපතිය .**බලන්න**:සක්දෙවිඳු. **3) යාමදේවලෝකය** (Yāma devas): එම දෙව්ලොවේ ආයුෂ දිව්‍යවසර 2000 කි, එහි එක් දිනක්, මිනිස්ලෝකයේ වසර 200 ට සමානය. **4) තුසිත දේවලෝකය** (Tusita devas) එම දෙව්ලොවේ ආයුෂ දිව්‍යවසර 4000 කි, එහි එක් දිනක්, මිනිස්ලෝකයේ වසර 400 ට සමානය. **සටහන**: මතු බුදුබව පතන බෝසතුන් මිනිස් ලොවට පැමිණීමට පෙර තුසිත දේවලෝකයේ වැඩසිටි. **5) නිර්මාණරති දේවලෝකය (**devas who delight in creation) එම දෙව්ලොවේ ආයුෂ දිව්‍යවසර 8000 කි, එහි එක් දිනක්, මිනිස්ලෝකයේ වසර 800 ට සමානය. **6) පරනිර්මිතවසවත්ති දේවලෝකය (**devas who control what is created by others) එම දෙව්ලොවේ ආයුෂ දිව්‍යවසර 16,000 කි, එහි එක් දිනක්, මිනිස්ලෝකයේ වසර 1600 ට සමානය. **සටහන්: *** සදෙව්ලෝකයට ඉහළින් බ්‍රහ්මකායික දෙවියෝ වසති, ඉන් මතුයෙහිද දෙවියෝ වාසය කරති**. බලන්න**: ධම්මචකප්පවත්වන සූත්‍රය.** දේවලෝක වල වසන දෙවියන්ගේ ගුණ සිහිකිරීම අනුසති භාවනාවකි.**බලන්න**: භාවනා. ** මනෝමය කය ඇති, අරහත්බව ලැබූ දෙවියන්ගේ ගුණ සිහිපත් කිරීම යහපත්ය. **බලන්න**: නන්දිය සූත්‍රය ** වැඩි විස්තර පිණිස **බලන්න**: දීඝ.නි: (2 ) 5. ජනවසභ සූත්‍රය, පි,322 හා

දීඝ.නි: (3 ) 9.ආටානාටිය සූත්‍රය, පි. 328, EDN: 18 Janavasabha Sutta (17), p. 209 & 32 Āṭānāṭiya Sutta, p.353. **මූලාශ්‍ර:** අංගු.නි: (5): 8 නිපාතය: උපෝසථ වග්ග: උපෝසථ සූත්‍ර, පි.196, EAN:8:Uposatha: 41.1 & 42.2 , p. 434, අංගු.නි: (6): 11-නිපාත: 2 අනුසති වගග, 11.2.1, මහානාම සූත්‍රය, 11.2.2 දුතිය මහානාම සූත්‍රය, පි.645-654, 11.2.3, නන්දිය සූත්‍රය, පි.658, EAN: 11: Elevens: Recollection, 11.1 Mahanama, 12.1 Mahanama (2), p.570, 13.3. Nandiya, p.571.

▼**දේවලෝක උත්පත්ති**: දේවලෝක උත්පත්තිය යනු මෙලොව යහපත් කුසල කර්මයේ යෙදීම නිසා මරණින් මතු කාමාවචර දේවලෝකයන්හි යළි උපත ලැබීමය. **බලන්න**: සුගතිය. අනාගාමීව මියයන ආරිය පුද්ගලයෝ සුද්ධාවාස නම්වූ ඉහළ බ්‍රහ්ම දේවලෝකවල පහළවේ. අරූපසමාපත්ති, සතරබ්‍රහ්මවිහාර වර්ධනය කරගත් උතුමන් බ්‍රහ්මලෝකවල උත්පත්තිය ලබයි. **බලන්න**: අනාගාමි, බ්‍රහ්මලෝක.

▼**දේවලෝක උත්පත්තියට මග දසකුසලයය**: දසඅකුසලයෙන් වැලකි, දසකුසල් කරණ මිනිසුන් දේවලෝකයේ යළි උපත ලබති. **මූලාශ්‍ර**: අංගු.නි:(6) 10: නිපාතය:10.4.2.11 ජාණුස්සොණි සූත්‍රය, පි. 518, 10.5.1.1**.** පඨම නිරය සූත්‍රය හා 10.5.1.2.දුතිය නිරය සූත්‍රය , පි. 548EAN:10: Jāṇussoṇī,177.11, p.554, The Deed Born Body, 211.1 Hell (1) & (2) , p.556.

▼ **දේවලෝක සැප**: ඒකාන්තයෙන්ම: පැතියයුතු, ප්‍රසන්නවූ, ප්‍රියකරවූ දෙයක් ගැන කතා කරනවා නම් එය දේවලෝක සැපයය. රත්න 7ක් සතු මහා සැප සම්පත් විඳින සක්විතිරජුට වඩා අප්‍රමාණවූ සැප සම්පත්, දෙවියන්ට ඇත. **බලන්න**: සක්විතිරජ. **සටහන:** බිඳුන සංඝයා එකමුතුකිරීමේ අනුසස් දෙව්ලොව සැපට හේතුවේ. එවැනි පුද්ගලයෙක් දිව්‍ය පුණ්‍ය (divine merit) ලබාගනී; කල්පයක් දෙව් සැප විඳි. **මූලාශ්‍ර**: ම.නි:(3 ):3.3.9 බාල පණ්ඩිත සූත්‍රය, පි. 376, EMN: 129: Fool & Wise Men, p. 929, අංගු.නි: (6): 10 නිපාත: 10.1.4.10. ද්විතිය ආනන්ද සූත්‍රය,පි.164, EAN:10: 40.10 Ananda -2,p. 509.

▼ **දෙව්ලොව සැපට වඩා බඹසර උතුම්ය**: අන්‍යආගම්කයන්, බුදුන් වහන්සේ වෙත බඹසර වසන්නේ දෙව්ලොව උපත පිණිසද? යයි අසන්නේ නම් සංඝයා ඒ ගැන ලජ්ජාවිය යුතුයයි බුදුන් වහන්සේ වදාළහ. දෙවලෝක සැප ගැන කලකිරීම ඇතිකර ගත යුතුය. එයටත් වඩා තුන් දොරින්, අකුසල කිරීම ගැන කලකිරීම ඇතිකර ගත යුතුය. බුදුන් වහන්සේ වෙත බඹසර වසන්නේ (දෙව්ලොව සැපට වඩා අනගි) උතුම් නිවන් සුවය පිණිසය.**මූලාශ්‍ර:** අංගු.නි: (1 ): 3 නිපාත: 3.1.2.8 දේවලෝකඋත්පත්ති සූත්‍රය, පි. 254, EAN: 3: 18.8 Deva, p. 84.

▲ **දේවසත්වත පද-** Deva's 7 vows: දේවසත්වත පද ලෙසින් පෙන්වා ඇත්තේ, සක්දෙවිඳු, මිනිස් ලෝකයේ උපත ලබා සිටි කාලයේ රකින ලද උතුම් සත්පදයන් පිලිබඳවය. එම පදයන් රැකීමේ විපාක ලෙසින් සක්දෙවිඳු බවට පත්වූහ. එනම්: **දිවිහිමියෙන්**: 1) මව් පියන් රකින බව 2) කුලදෙටුවන් පුදන බව 3) මිහිරි වචන භාවිතා කරන බව 4) කේලාම් නොකියන බව 5 ) දානශීලිබව 6) සත්‍ය කතා කරන බව 7) තරහ නොගන්නා බව, යම් හෙයකින් තරහක් ඇති වුවහොත් වහා එය නැති

කරගන්නා බව**. බලන්න**: සක්දෙව්දු. **මූලාශ්‍ර**: සංයු.නි: (1): සගාථවග්ග: සක්කසංයුත්ත: 11.2.1 දේවසත්තවතපද සූත්‍රය, පි. 432, ESN: 11: Sakkasamyutta: 11.1 Vows, p. 477.

▲ **දේවශබ්ද-** The Deva sounds: දෙවියන් අතර ප්‍රීතිරාවයන් තුනක් ඇතයි බුදුන් වහන්සේ පෙන්වා ඇත: 1) ගිහිගෙය හැර පබ්බජාවට පැමිණෙන බුද්ධ ශ්‍රාවකයකු දැකීමෙන් දෙවියන් මෙසේ ප්‍රීති ශබ්ද කරති:
“ මේ අරිය ශ්‍රාවකයා මාරයා සමග සටන් කිරීම ආරම්භ කර ඇත”.

2) යම් කලක අරිය ශ්‍රාවකයා බෝධිපාක්ෂික ධර්මතා වඩමින් වාසය කරනවා දැකීමෙන් දෙවියන් මෙසේ ප්‍රීති ශබ්ද කරති:
“ මේ අරිය ශ්‍රාවකයා මාරයා සමග සටන්කරයි”.
3) යම් කලක අරිය ශ්‍රාවකයා, අරහත්වයට පත්වූවිට, දෙවියන් මෙසේ ප්‍රීති ශබ්ද කරති:
“ මේ අරිය ශ්‍රාවකයා මාරයා සමග වූ සටනින් ජය ගත්තේය”
**මූලාශ්‍ර:** බු.නි: ඉතිවුත්තක: 3.4.3 දේවශබ්ද සූත්‍රය**,** පි. 446, The Itivuttaka: translated by Peter Masefield: PTS: 82 The Deva sounds sutta, p.67.

▲ **දේවියෝ**-Deities: දෙවිවරු ලෙසින් පෙන්වා ඇත්තේ මෙලොව දී කුසලයේ හැසිරී, එහි යහපත් විපාක ලෙසින් දේවලෝකවල පහලවූ උතුම් පුද්ගලයන්ය. දෙවිවරු, දේවතා, දේවපුත්‍ර ලෙසින්ද හඳුන්වයි. දෙවිවරු, බුදුන් වහන්සේ හමුවට පැමිණ නොයක් දහම් කතාවන්හි යෙදුන බව සූත්‍ර දේශනාවන්හි දක්වා ඇත. **බලන්න**: මංගල සූත්‍රය, පාරභව සූත්‍රය ආදී. **සටහන්**: * සංයු.නි: දේවපුත්ත සංයුත්ත හා සක්කසංයුත්ත යේ දෙවියෝ බුදුන් හමුවීමට පැමිණීම ගැන විස්තරාත්මකව දක්වා ඇත. **දී.ස.නි: මහාසමය සූත්‍රයේ, මහා දේවසභාවක එක්වීම, හා බුදුන් වහන්සේ බැහැදැකීම දක්වා ඇත. ** දෙවියන්ගේ ආයුෂ දීර්ඝය, එහෙත් සසර දුක නැති නොකරගත් දෙවියන්ට බුදුන් වහන්සේ අනුසාසනා කර ඇත්තේ භව පැවැත්මෙන් මිදිය යුතු බවය. ** මහා මොග්ගල්ලාන රහතුන්, තව්තිසාවට වැඩි අවස්ථාවේදී, සක්දෙව්දු හා දේවපිරිස එතුමන් හමුවීම, නන්දන දේව, සුයාම දේව, සන්තුසිත දේව,සුනිම්මිත දේව, වසවත්ති දේව, මහා තෙරුන් හා ධර්මය සාකච්ඡා කිරීම ගැන විස්තර පිණිස **බලන්න:** සංයු.නි: (4) සළායතනවග්ග: මොග්ගල්ලාන සංයුත්තය. **මූලාශ්‍ර**: සංයු.නි: ( 1): සගාථවග්ග: දේවතාසංයුත්ත: 1.1.3 උපනියති සූත්‍රය හා 1.1.4 අච්චෙන්ති සූත්‍රය,පි.30,ESN: 1:Devatasamyutta:3.3 Reaching & Time Flies by, p.60

▼ **බ්‍රහ්ම, ඉන්ද්‍ර** ආදී **දෙවියෝ,** ජාන සමාපාත්ති ලද උතුමන්ට නමස්කාර කරන බව මෙහි දක්වා ඇත. **මූලාශ්‍ර**: අංගු.නි: (6 ): 11 නිපාත: නිසසය වගග,11.1.9, සන්ධ සූත්‍රය, පි.636, EAN: 11: I Dependence, 9.9 Sandha, p.568

▼**සතුල්ලප්කායික දෙව්වරු බුදුන් වහන්සේ බැහැදැකීම**: එක්සමයක සතුල්ලප්කායික දෙව්වරු (බ්‍රහ්මදෙව්වරු) සමූහයක් බුදුන් වහන්සේ බැහැදැක සත්පුරුෂ සේවනයේ අගය පවසාඇත .**බලන්න:** සත්පුරුෂ හා අසත්පුරුෂ **සටහන**: අටුවාවට අනුව සතුල්ලප්කායික දෙව්වරු

මිනිස්ලොවදී ධර්මය අගය කළ නිසා, මරණින් මතු බ්‍රහ්ම දෙව්ලොව උපත ලදහ.**බලන්න**: ESN:note: 59, p. 509, බ්‍රහ්මලෝක. **මූලාශ්‍ර**: සංයු.නි: (1):සගාථවග්ග: දේවතාසංයුත්ත:1.4.1 සබ්භි සූත්‍රය, පි. 58, ESN: Devatasamyutta, 31.1. With the Good, p. 95.

▼ **එක්සමයක සතුල්ලප්කායික දෙවිවරු** සමුහයක් බුදුන් වහන්සේ බැහැදැක මසුරුමිනිසුන් දන් නොදීම නිසා ඔවුනට අයහත සිදුවන බව පවසා ඇත. **බලන්න**: මසුරුකම, දානය. **මූලාශ්‍ර:** සංයු.නි: (1 ): සගාථවග්ග: දේවතාසංයුත්ත: 1.4.2 මච්ඡරිය සූත්‍රය, පි. 62, ESN: Devatasamyutta: 32.2 Stinginess, p. 97.

▼ **දෙවිවරු දහමට ප්‍රියය**: එක් සමයක සැරියුත් මහා තෙරුන්**,** ආධ්‍යාත්ම සංයෝජන හා බාහිර සංයෝජන ගැන සංසයාට වදාළ දේශනාව අසා දෙවිවරු සතුටුවූ බව මේ සූත්‍රයේ දක්වා ඇත. **බලන්න:** ආධ්‍යාත්ම සංයෝජන හා බාහිර සංයෝජන ඇති පුද්ගලයෝ. **මූලාශ්‍ර:** අංගු.නි: (1 ): 2 නිපාත: 2.1.4.5 සූත්‍රය, පි. 162 , EAN: 2: 36.5 Sutta, p.61. **සටහන්:** * දීඝ:නි: ජනවසභ සූත්‍රයේ දෙවිවරු ධර්මය ඇසීමට ප්‍රිය බව පෙන්වා ඇත.

▼**සක්දෙවිඳු** ධර්මය ඇසීම පිණිස, ධර්මකරුණු නිරවුල්කරගැනීම පිණිස බොහෝ බුදුන් වහන්සේ හමුවීමට පැමිණි බව, සංයු.නි.(1) සක්ඛ සංයුත්තයේ දක්වා ඇත. දීඝ.නි: සක්ඛපඤ්හ සූත්‍රයේ සක්දෙවිඳු ඇසූ ප්‍රශ්න මාලාව විස්තරාත්මකව දක්වා ඇත**.**

▲ **ද්වයධර්ම-** the dyad: ද්වයධර්ම යනු - දෙකොටසක් ලෙසින් ධර්මය සලකා බැලීමය. ද්වයධර්මයේ එක් කොටසක් ලෙසින් බුදුන් වහන්සේ පෙන්වා ඇත්තේ: අභ්‍යන්තර ඉන්ද්‍රිය 6 ය, ඇස ආදීවූ (සළායතන). දෙවනි කොටස වන්නේ: බාහිර අරමුණුය: එනම් රූපය ආදීවූ. විඥානය මේ ධර්ම කොටස් 2 ම මත පවතී: එනම්: ඇස හා රූපය නිසා චක්ඛු විඥානය ඇතිවේ (එලෙස සෙසු ධර්මතාද). **මූලාශ්‍ර:** සංයු.නි: (4 ): සළායතනසංයුත්ත: 1.9.9 හා 1.9.10 ද්වය සූත්‍ර 2කි. පි. 172, ESN:35: Vedanasamyutta: 92.9 & 93.10 **-** The dyad, p. 1254.

▲**ද්වයතානුපස්සනාව-** Observation of Dualities: ද්වයතානුපස්සනාව ලෙසින් බුදුන් වහන්සේ පෙන්වා ඇත්තේ ධර්මතා 2 ක් ගැන ආවර්ජනය කිරීමය-භාවනා කිරීමය- අනුපස්සනා කිරීමය. එම අනුපස්සනාව මගින් යථාභූත ඥාණය පහළවේ. එලෙස යහපත් ලෙසින් ද්වයධර්මතා ආවර්ජනා කරන්නේනම් ඵල 2ක් ඇතිකර ගත හැකිවේ: මේ භවයේදීම අරහත්වය ලැබීම, කිසියම් කෙලෙසක් ඉතිරිවූයේ නම් අනාගාමී ඵලය ලැබීම.**මේ සූත්‍රයේ ද්වයතානු ධර්මතා 16 ක් පෙන්වා ඇත:**
**1:** i මේ දුකය මේ දුක ඇතිවීමය ii මේ දුක නිවීමය, මේ දුක නිවීමේ මගය. **සටහන:** දුක ඇතිවීම පංච උපාදානස්කන්ධය පහළවීමය. **2:** i **උපධි** නිසා (attachments) දුක ඇතිවේ ii උපධි ක්‍ෂය කිරීම දුක නැතිවීමය. **3:** i **අවිද්‍යාව** නිසා දුක ඇතිවේ ii අවිද්‍යාව ක්‍ෂය කිරීම දුක නැතිවීමය. **4:** i **සංඛාර** නිසා දුක ඇතිවේ (චේතනා නිසා) ii **සංඛාර** අවසන් කරගැනීම දුක නැතිවීමය. **5:** i **විඥාණය** නිසා දුක ඇතිවේ ii විඥාණය අවසන් කරගැනීමෙන් දුක නැතිවේ. **6:** i **ස්පර්ශය** නිසා දුක ඇතිවේ ii **ස්පර්ශය** අවසන් කරගැනීමෙන් දුක නැතිවේ. **7:** i **වේදනා**

නිසා දුක ඇතිවේ ii වේදනා අවසන්කරගැනීමෙන් දුක නැතිවේ. **8:** i **තණ්හාව** නිසා දුක ඇතිවේ ii තණ්හාව අවසන් කරගැනීමෙන් දුක නැතිවේ . **9:** i **උපාදාන** නිසා දුක ඇතිවේ ii උපාදාන අවසන් කරගැනීමෙන් දුක නැතිවේ . **10:** i **කාර්මික ක්‍රියා**- කර්ම ඇතිකරන (ආරම්භපච්චයා) නිසා දුක ඇතිවේ ii කාර්මික ක්‍රියා අවසන් කර ගැනීමෙන් දුක නැතිවේ **11:** i **ආහාර -පෝෂණය** (ආහාර පච්චයා) නිසා දුක ඇතිවේ ii ආහාර පිලිබඳ යථා අවබෝධය ඇති කරගැනීම මගින් දුක නැතිවේ. **12:** i **කැළඹීම නිසා** (ඉඤ්ජිත පච්චයා) දුක ඇතිවේ ii කැළඹීම අවසන්වීම දුක නැතිවීමය. **සටහන**: ඉඤ්ජිත පච්චයා යනු තණ්හා, දිට්ඨි, මාන, කම්ම, කෙළෙස වේ. **13:** i **පරායත්ත**- අනෙකුගෙන් යැපීම නිසා (නිස්සිතස්ස චලිතං- dependent are vulnerable) අනතුරුසහගතබවට පත්වේ ii ස්වාධිනත්වය නිසා අනතුරුබව නැතිවේ (independent are not vulnerable). **සටහන:** පරායත්ත ලෙසින් පෙන්වා ඇත්තේ තණ්හා, දිට්ඨි, මාන ආදිය ඇසුරු කිරීම නිසා භය, චංචල බව ඇතිවේ. අනිශ්චිත වූ විට සැලීමක් නැත, සසර බිය නැත. **14**: i **අරූපලෝක**, රූප ලෝකවලට වඩා යහපත්වේ (non-physical realms are better than the physical realms) ii අරූපලෝකයට වඩා නිරෝධය උසස්ය. **සටහන**: රූප අරූප ලෝක භව පැවැත්මය. සියලු භව නිරෝධය උතුම්ය. **15: i ලෝකසත්‍ය** (සැමදේ ස්ථිරය, ශුභය, සුඛය, ආත්මය ඇත- සතර විපල්ලාස) ලෙසින් සාමාන්‍ය ලෝකයා පිළිගන්නා දේ සත්‍ය නොවේ ii ආරියන් පිළිගන්නා සත්‍ය : (සැමදේ අස්ථිරය, අශුභය, දුඛය, ආත්මයක් නොමැත) නිවන සත්‍යයය. **බලන්න**: විපල්ලාස. **16: i ලෝකයා සුඛය** යයි ගන්නා දේ ( රූප, ශබ්ද ආදී පස්කම් සැප) සුඛ නොවේ ii ආර්යන් ඒ දේ දුක යයි අවබෝධ කර ඇත. **මූලාශ්‍ර:** ඛු.නි:සුත්තනිපාත: 3-12 ද්වයතානුපස්සනා සූත්‍රය, පි.244, Sutta Nipata: Translated by Laurence Khantipalo Mills: 3.12 Observation of dualities, p. 227.

▲ **ද්විපාද**-Dvipada : ද්විපාද යනු දෙපාඇති බවය. දෙපා ඇති අය අතුරින් සම්මා සම්බුදුරජාණන් වහන්සේ අග්‍රය.**බලන්න**: අග්‍රතම පුද්ගලයා.

▲ **ද්විධාපථ**-Two roads: ද්විධාපථ යනු මාර්ග දෙකය. නිවැරදි මග හා වැරදි මගය. එක් සමයක බුදුන් වහන්සේ, අතවැසි නාගසමාල තෙරුන් හා කොසොල් රට සැරිසරන අවස්ථාවේ, දෙමංසන්ධියකට පැමිණියහ. නාගසමාල තෙරුන් එහි ඇති මාර්ග දෙකින් එක් මගක් පෙන්වා එම මගින් යෑම පිණිස බුදුන් වහන්සේට ඇරයුම් කළහ. බුදුන් වහන්සේ වදාළේ: “යායුතු මග නම් අනෙක් මග බවය’.

බුදුන් වහන්සේගේ ප්‍රකාශය පිළිනොගත්, ඒ තෙරුන්, බුදු පාත්‍ර සිවුරු බිම තබා ඔහු කැමති මග ගියේය. ඒ මග සිටි සොරු පිරිසක්, තෙරුන් හට වධ හිංසා කළේය. ඉන්පසු තෙරුන් බුදුන් වහන්සේ වෙත පැමිණ සිදුවූ කරදර පැවසුහ. එම අවස්ථාවේ බුදුන් වහන්සේ උදානයක් වදාරා පෙන්වා ඇත්තේ: සත්‍ය අවබෝධ කළ ප්‍රඥාවන්තයෝ, අනුවණ ජනයා හා එක්ව හැසිරෙන නමුදු, ඔවුන්ගේ ලාමක ක්‍රියා හා එක් නොවේ. හරියට කොස්වාලිහිණියා, දියමුසු කිරි දුන්විට, දිය හැර කිරි පමණක් පානය කරන ලෙසින්ය. **බලන්න**: කොස්වාලිහිණියා උපමාව.උපග්‍රන්ථය5. **සටහන්: *** බුදුන් වහන්සේ සත්‍යම පෙන්වන නිසා උන්වහන්සේ පෙන්වන මග පිළිගැනීම යහපත පිණිසය. බුදුන් වදාළ අවවාද නොඇසූ

කෝකාලික භික්ෂුව, සුනක්ඛත්ත ලිච්චවී භික්ෂුව ආදීන් විපතට පත්වූ ආකාරය සූත්‍ර දේශනා වල පෙන්වා ඇත: **බලන්න:** කෝකාලික භික්ෂුව, දීඝ.නි: පාටික සූත්‍රය ** බුදුන් වහන්සේගේ අතවැසි භික්ෂුවක්, උන්වහන්සේගේ පාසිවුරු බිම දමා යෑමේ සිද්ධිය සංවේගය ඇති කරයි. **බලන්න**: උපග්‍රන්ථය:1 **මූලාශ්‍ර:**ඛු.නි: උදාන පාලි: 8.7 ද්විධාපථ සූත්‍රය, පි.338.

▲**ද්විදා විතක්ක-**Two kinds of thoughts: ද්විදා විතක්ක යනු සිතිවිලි වර්ග 2ක්ය- විතක්ක දෙකක්: අකුසල විතක්ක හා කුසල විතක්ක. මේ සූත්‍රයේ බුදුන් වහන්සේ පෙන්වා ඇත්තේ බුදුවීමට පෙර, බෝධිසත්වයන් ලෙසින් තමන් වහන්සේ සිතට එන සිතිවිලි කොටස් දෙකකට බෙදා වාසය කළබවය. **පළමු වර්ගය**: කාමවිතක්ක, ව්‍යාපාදවිතක්ක, විහිංසාවිතක්ක. **දෙවන වර්ගය:** නෙක්ඛම්මවිතක්ක, අව්‍යාපාද විතක්ක,අවිහිංසාවිතක්ක. පළමු වර්ගයේ විතක්ක නිසා සිදුවන හානිය ගැනද දෙවන වර්ගයේ විතක්ක නිසා මාර්ගය වැඩෙන අන්දම- සිව්ජාන සමාපත්ති ලැබීම, ආදිය මේ සූත්‍රයේ විස්තරාත්මක දක්වා ඇත. **සටහන**: අකුසල විතක්ක මැඩලීම හරියට ගොපල්ලා, ගවයන්ට, පැසුන ධාන්‍ය ඇති කෙතකට යන්නට නොදී රකින ලෙසින් වලක්වා ගත් බව බුදුන් වහන්සේ පෙන්වා ඇත. කුසල විතක්ක වර්ධනය කරගත් පසු සිතට ඇති විවේකය, හරියට ගිම්හානයේ අස්වැන්න කපා ගත් පසු ගවයන්ට නිදහසේ හැසිරීමට ඉඩදී ගොපල්ලා ලබන නිදහස වැනිය. **බලන්න**: ගොපල්ලා උපමාව:උපග්‍රන්ථය:5 **මූලාශ්‍ර:**ම.නි: (1): 1.2.9 දෙවධාවිතක්ක සූත්‍රය, පි. 308, EMN: 19: Dvedhāvitakka Sutta-Two kinds of thoughts, p.201.

▲**ද්වේශය-** anger: ද්වේශය- දෝසය (දෝසා) අකුසල මූලයකි, සසර දික් කරයි. **බලන්න:** අකුසල මූල.ද්වේශය අවබෝධ කරගැනීම හා පහ කරගැනීමට සමත හා විදර්ශනාව වැඩිය යුතුවේ. **බලන්න**: සමත හා විදර්ශනා. කරුණු 2 ක් නිසා ද්වේශය ඇතිවේ: පටිඝනිමිත්ත හා අයෝනිසෝමනසිකාරය. **බලන්න**: අංගු.නි: (1) 2 නිපාත: 2.3.11.6 සූත්‍රය, පි. 208.

▼**වෙනත් මූලාශ්‍ර:1. "ද්වේශය:** නම් අන්‍යයා කෙරෙහි උපදනා චිත්තදූෂණ ලක්‍ෂණ- දුෂ්ටවූ - ක්‍රෝධ චිත්තය වේ... දසවිධි ක්‍රෝධයෝ ය. **බලන්න**: ආඝත වත්තු හා ආඝත පටිවිනය. **සද්ධර්ම කෝෂය,** පි. 104.

▲ **දිවකණ-** divine ear element: ඉද්ධිපාද වඩාගැනීමෙන් ලබන බලයකි. **බලන්න:** දිබ්බසෝත ඥාණය.

▲ **දිවැස්-** Divine Eye: ඉද්ධිපාද වඩාගැනීමෙන් ලබන බලයකි, දිබ්බචක්ඛු ඥාණය, චුතිඋත්පත්ති නුවණ ලෙසින්ද පෙන්වා ඇත. මෙය තථාගතයන්වහන්සේගේ එක් දසබල ඥානයකි. දිවැස් ලැබූ භික්ෂූන් අතරෙන් අග්‍ර අනුරුද්ධ තෙරුන්ය, භික්ෂුණියන් අතරින් අග්‍ර සකුලා තෙරණිය. **බලන්න:** උපග්‍රන්ථය:1. කායගතාසතිය වැඩීමේ ඵලයක් ලෙසින් දිවැස් ලැබේ: **බලන්න:**කායගතාසතිය.

▼**ධර්ම මාර්ගය** වඩාගැනීම පිණිස සාක්ෂාත් කලයුතු ධර්මයක්- සච්චිකාතබ්බ ධම්මයක් ලෙස දිවැස් ලැබීම පෙන්වා ඇත. **බලන්න**:සාක්ෂාත් කරගතයුතු ධර්මතා.

▼ **බුදුන් වහන්සේ** පෙන්වා දී ඇති ඇති චක්ඛු 3න්, දිවැස ද එකකි. **බලන්න:** චක්ඛුතුන, ත්‍රිවිධ චක්ෂු.

▲**දිව්‍යයානය**- Divine vehicle: ධර්ම විනයේ දිව්‍යයානය ආරිය අටමගය යි බුදුන් වහන්සේ පෙන්වා ඇත. **බලන්න**: ආරියඅටමග. **මූලාශ්‍ර:** සංනි: (5-1):මහාවග්ග:මග්ගසංයුත්ත:1.1.4 බ්‍රාහ්මණ සූත්‍රය, පි. 36, ESN: 45: Maggasamyutta: 4.4 The Brahmin, p. 1606.

▲**දෝවචස්සතාවය**: පාලි: **දොවචස්සතා**- difficult to correct. ධර්මයට අනුව දෝවචස්සතාවය- දුර්වචභාවය, අකීකරුබව, හිතුවක්කාරබව (අවවාද පිළිගැනීමට ඇති අකමැත්ත) නුගුණයකි. ආධ්‍යාත්මික මාර්ගයට හානි ගෙනදෙන කරුණකි, අකුසලයකි. **ශබ්දකෝෂ: පා.සි.ශ:** පි. 325: "**දොවචස්සතා**: දුර්වචභාවය".

▼**දුර්වචභාවය** (අකීකරුබව) නුගුණයකි. එය අතහැර ගැනීම පිණිස සුවචබව (කීකරුබව) වඩා ගත යුතුවේ:

"**දොවචස්සතා පහානාය සොවචස්සතා භාවෙතබ්බා...**"

**මූලාශ්‍ර**: :අංගු.නි: (4 ):6 නිපාත: තිකවග්ග: 6.1.9 දෝවචස්සතා සූත්‍රය, පි. 285, EAN: 6: 115.9. Difficult to correct, p. 365.

▼**දෝවචස්සතාවය, හානභාගිය ධර්මයකි**: දෝවචස්සතාවය, ආධ්‍යාත්මික මගට හානිය ඇති කරයි. **බලන්න**: හානභාගිය ධර්ම. **මූලාශ්‍ර:** දීඝ.නි : (3): 11 දසුත්තර සූත්‍රය, පි. 483, EDN: 34: Dasuttara Sutta: Expanding Decades, p. 384.

▼**ධර්මයේ ප්‍රමාද පුද්ගලයාට** දොවචස්සතාවය නැතිකරගැනීම අපහසුය. හිරිඔත්තප්ප තිබීම, අප්‍රමාදය මගින් දොවචස්සතාවය නැතිවේ.

**මූලාශ්‍ර**: අංගු.නි:(6):10 නිපාත: 10.2.3.6 තයොධම්ම සූත්‍රය,පි.284, EAN:10: Tens,76-6.Incapable, p. 524.

▼ **බුදුන් වහන්සේ** දොවචස්සතාවය පිළිබඳව යහපත් ලෙසින් වදාරා ඇත. ඒ ධර්මතා සංඝයා එක්ව, ධර්මයේ චිරස්ථිතිය පිණිස සජ්ජායනා කිරීම සුදුසු යයි සැරියුත් මහා තෙරුන් සංඝයාට උපදෙස් දී ඇත. **මූලාශ්‍ර**: දිඝ.නි: (3):10 සංගිති සූත්‍රය, පි. 372 , EDN: 33 Sangīti Sutta: The Chanting Together, p. 362.

▼ **දොවචස්සතාවය**- දුර්වචභාවය සංඝයා තුළ ඇතිවීමට බලපාන මූලික හේතු මුගලන් තෙරුන් විසින් විස්තරාත්මකව පෙන්වා ඇත. **මූලාශ්‍ර**: ම.නි: (1): 1.2.5 අනුමාන සූත්‍රය, පි. 248, EMN:15: Inference, p.184.

▼ **දොවචස්සතාවය** නැතිකර ගැනීම පිණිස, කීකරුබව-සුවචභාවය වැඩිය යුතුය. **මූලාශ්‍රය:** අංගු.නි: (4) 6 නිපාත: 6.1.9 දොවචස්සතා සූත්‍රය, පි.286.

▲ **දැවකොටය උපමාව**-Simile of Block of wood: දැව කොටයක් උපමා කරගනිමින් බුදුන් වහන්සේ පෙන්වා ඇත්තේ සංඝයාගේ වීරිය ය. **බලන්න:** උපග්‍රන්ථය:5, කලිඞග.

**දස**

▲ **දස අංග හා කම්මපථ-**Ten factors & kammapatha: දස අංග ලෙසින් පෙන්වා ඇත්තේ **1)** මිථ්‍යාදිට්ඨි... මිථ්‍යාවිමුක්ති යන අංග 10 .**2)** සම්මා දිට්ඨි....සම්මාවිමුක්ති යන අංග 10. සමාන අදහස් ඇති සත්ත්වයෝ, සමාන අදහස් ඇති අය හා එක්ව කටයුතු කරමින් කර්ම මාර්ගය-කම්මපථය සකස් කරගන්නා අන්දම මෙහිදී පෙන්වා ඇත. මිථ්‍යාදිට්ඨි... මිථ්‍යාවිමුක්ති යන අංග 10 අනුගමනය කරන අය එක්වී අයහපත් කර්ම සකස්කරගනී. එසේම, සම්මා දිට්ඨි....සම්මාවිමුක්ති යන අංග 10 අනුගමනය කරන අය එක්වී යහපත් කර්ම සකස්කරගනී. **මූලාශ්‍ර**:සංයු.නි: ( 2 ): නිදාන: ධාතුසංයුත්ත: 2.3.7 දසඅංගික සූත්‍රය, පි. 284, ESN: 14: Dhatusamyutta: 29.7 Ten Factors, p. 771.

▲ **දස අසේඛියධම්ම**: පාලි: **දස අසෙඛියා ධම්මා-** Ten Dhammas of one beyond training: අසේඛිය ධම්ම ලෙසින් පෙන්වා ඇත්තේ, උසස ධර්ම පුහුණුව අවසන් කළ, අසේඛ යයි හඳුන්වන රහතන්වහන්සේ සතු ගුණයන්ය. **බලන්න**: සේඛ හා අසේඛ. **අසේඛිය ධර්මතා 10**:

**"දස ඉමෙ භික්ඛවෙ අසෙඛියා ධම්මා. කතමෙ දස: අසෙඛා සම්මාදිට්ඨි, අසෙඛො සම්මාසඞ්කප්පො, අසෙඛා සම්මාවාචා, අසෙඛො සම්මාකම්මන්තො, අසෙඛො සම්මාආජීවො, අසෙඛො සම්මාවායාමො, අසෙඛො සම්මාසති, අසෙඛො සම්මාසමාධි, අසෙඛො සම්මාඤාණං, අසෙඛා සම්මා විමුත්ති..."**. එනම්: රහතන්වහන්සේ පූර්ණකරගත් ආරිය අටමග හා සම්මා ඥානය හා සම්මා විමුක්තය යන දස ධර්මයය.**මූලාශ්‍ර:** අංගු.නි: ( 6): 10 නිපාත: සමණසඤ්ඤා වගග: 10.3.1.12. අසේඛියධම්ම සූත්‍රය, පි.428 , EAN: 10: 111.11 One beyond training 2, p.543.

▲**දසකටු-** Ten Thorns : ධර්මයේ දසකටු ලෙසින් පෙන්වා ඇත්තේ ආධ්‍යාත්මික මග වඩා ගැනීමට, ජාන සමාපත්ති ආදිය ඇතිකර ගැනීමට බාධා කරන කරුණුය. බුදුන් වහන්සේ එවැනි, කටු 10ක් පෙන්වා ඇත: 1) අන්‍යයන් ගේ ඇසුර-ආශ්‍රය, විවේකසුවයට බාධාවකි 2) අසුභාවනාවට සුභනිමිත්ත බාධාවකි 3) විසුළු දර්ශන, ඉන්ද්‍රිය සංවරය ඇතිකරගැනීමට බාධාවකි 4) කාන්තාවන් ඇසුරුකිරීම, බ්‍රහ්මචරියාවට බාධාවකි 5) ශබ්ද, පළමු ජානයට බාධාවකි 6) විතක්ක හා විචාර, දෙවන ජානයට බාධාවකි 7) ප්‍රීතිය,තෙවෙනි ජානයට බාධාවකි 8) හුස්ම ගැනීම හා පිටකිරීම, සිව්වෙනි ජානයට බාධාවකි 9) සංඥා හා වේදනා, සංඥාවේදිත නිරෝධසමාපත්තියට බාධාවකි 10) රාගය, දෝසය හා මෝහය, අරහත් මගඵලයට බාධාවකි. **මූලාශ්‍ර**:අංගු.නි: (6): 10 නිපාත: ආකඞ්ඛ වග්ග, 10.2.3.2 කණ්ටක සූත්‍රය, පි.268. EAN: 10: 71.2. Thorns, p. 521.

▲**දසකතා වස්තු-** Ten subjects to talk: ධර්ම මාර්ගයේ ගමන් කරන පුද්ගලයන් විසින් කතා කිරීමට සුදුසු -යහපත් කතා, දසකතා වස්තු ලෙසින් බුදුන් වහන්සේ පෙන්වා ඇත. **බලන්න**: කතාව.

▲ **දසකම්මපථ**- Ten courses of Kamma: කම්මපථ යනු කර්මය සකස්වන මාර්ගයය. දස කම්මපථ යනු දස කුසල් හා දස අකුසල් ය. බුදුන් වහන්සේ පෙන්වා ඇත්තේ සත්ත්වයෝ අදහස් වශයෙන් සමාන අදහස් ඇති අය හා එක්වේ: පරපණ නසන අය එකතුවේ, එකතුවී අයහපත් කර්ම මාර්ගය සකස් කරගනී. එලෙසින්, පරපණ නො නසන අය එකතුවේ, එකතුවී යහපත් කර්ම මාර්ගය සකස් කරගනී.

මූලාශ්‍ර:සංයු.නි: ( 2 ): නිදාන: ධාතුසංයුත්ත: 2.3.5 දසකම්මපථ සූත්‍රය, පි. 282, ESN: 14: Dhatusamyutta: 27.5 Ten courses of Kamma, p. 769.

▲ **දස කුමාර ප්‍රශ්න**- Dasa kumara prashna: බුදුන් වහන්සේ, සෝපාක සාමණේරයන් ගෙන් ඇසූ ප්‍රශ්ණ 10, දස කුමාර ප්‍රශ්න වේ: 1) **එක කුමක්ද?** සියලු සත්ත්වයෝ ආහාරයෙන් පෝෂණය වේ 2) **දෙක කුමක්ද?** නාමය හා රූපය.3) **තුන කුමක්ද?** ත්‍රිවිධ වේදනා 4) **සතර කුමක්ද?** චතු සත්‍ය 5) **පහ කුමක්ද?** පංච උපාදානස්කන්ධය 6) **සය කුමක්ද?** සළායතන 7) **සත කුමක්ද?** සප්ත බොජ්ඣංග 8) **අට කුමක්ද?** ආරිය අට මග 9) **නමය කුමක්ද?** සත්තාවාස 9ය. **බලන්න**:සත්ත්වයන් උපත ලබන ස්ථාන. 10) **දහය කුමක්ද?** අසෙඛ ගුණ 10. **බලන්න:** දස අසේඛියධම්ම, උපග්‍රන්ථය:1 **මූලාශ්‍රය:** ඛු.නි: ඛුද්දකපාඨ පාළි, 4 කුමාර ප්‍රශ්න, පි. 31.

▲ **දසකසිණ** - 10 kasiṇa: භාවනාව පිණිස අරමුණු කරගන්නා කසිණ ආයතන 10 කි. **බලන්න**: කසිණ.

▲ **දසකුසල හා දසඅකුසල** -10 wholesome actions & 10 unwholesome actions: දස කුසල යනු, සුගතිය ඇතිකරණ යහපත් කර්ම (තුන්දොරින් සිදුකරන) ක්‍රියාය. දස අකුසල, දුගතිය ඇතිකරන අයහපත් ක්‍රියාය. මේවා සාධු ධර්ම හා අසාධු ධර්ම ලෙසින්ද හඳුන්යි. **බලන්න**: සාධු හා අසාධු ධර්ම, කුසල හා අකුසල. **සටහන**: දසකුසල හා දසඅකුසල පිළිබඳව, **අංගු.නි: 10 නිපාත**: සාමඤ්ඤ වග්ගයේ විස්තරාත්මකව පෙන්වා ඇත.

▼ **දස කුසල හා දස අකුසල ධර්ම**: **දස කුසල් යනු**: 1) පරපන වැනසීමෙන් වැළකීම-ප්‍රාණඝාතය 2) නුදුන්දේ ගැනීමෙන් වැළකීම-සොරකම 3) කාමයෙහි වරදවා හැසිරීමෙන් වැළකීම- කාමමිච්චාචාරය 4) බොරුකීමෙන් වැළකීම 5) කේලාම් කීමෙන් වැළකීම 6) සැර පරුස වචන කීමෙන් වැළකීම-පරුෂකතා 7) හිස්වචන කථා කිරීමෙන් වැළකීම-සම්ප්‍රප්ඵලාප 8) අබිජ්ජාව නැතිබව - අලෝභය 9) හොඳහිත ඇතිව සිටීම (අක්‍රෝධය-අද්වේශය - good will) 10) සම්මා දිට්ඨිය ඇතිව සිටීම. **දස අකුසල් යනු**: 1) පරපන වැනසීම 2) නුදුන්දේ ගැනීම 3) කාමයෙහි වරදවා හැසිරීම 4) බොරුකීම 5) කේලාම් කීම 6) සැර පරුස වචන කීම 7) හිස්වචන කථා කිරීම 8) අභිජ්ජාව 9) ක්‍රෝධය 10) මිථ්‍යාදිට්ඨිය. **සටහන**: කුසල් හා අකුසල් ක්‍රියා ත්‍රිවිධාකාරය: 1-3 කායික ක්‍රියා, 4-7 වාචික ක්‍රියා 8-10 මානසික ක්‍රියා. **බලන්න**: කුසල හා අකුසල. **මූලාශ්‍ර**: ම.නි:(1 ):1.1.9 සම්මාදිට්ඨි සූත්‍රය, පි. 130, EMN:9: Sammādiṭṭhi Sutta-Right View, p. 121, අංගු.නි: (6): 10 නිපාත: ජානුසොණි වගග: 10.4.2.8 කම්ම නිදාන සූත්‍රය, පි. 506, EAN:10: Jāṇussoṇī: 174.8 Causes of Kamma, p.552.

▼ **දසකුසල ධර්මානුකූලවේ, දසඅකුසල අධර්මානුකූලය**: ධර්මානුකූලව ජීවත්වීම යනු තුන් දොරින් යහපත් ක්‍රියා කිරීමය. එම පිළිවෙත අනුව ක්‍රියාකරන මිනිසුන් සුගතියේ උපත ලැබීමට වාසනාව ඇත. ධර්මයට අනුකූල නොවන ලෙසින් ජීවත්වීම යනු තුන් දොරින් අයහපත් ක්‍රියා කිරීමය, එම පිළිවෙත අනුගමනය කරන්නෝ දුගතියට යති.**සටහන**: ධර්මානුකූලව ජීවත්වන පුද්ගලයාට මේ ජීවිතයේදීම නිවන සාක්ෂාත්

කරගැනීමට හැකිබව මේ සූත්‍රයේදී පෙන්වා තිබේ. **මූලාශ්‍ර**: ම.නි: (1):1.5.1 සාලේයියාක සූත්‍රය, පි.682, EMN:41: Sāleyyaka Sutta-The Brahmins of Sālā, p.358.

▼ **දසකුසලය** වැඩිය යුතු ධර්මයෝය- **භාවේතබ්බ ධර්ම** -වර්ධනය කරගතයුතු ධර්මයය. දසඅකුසලය පහකර ගත යුතු ධර්මයෝය **-නභාවේ තබ්බ ධර්මය** වර්ධනය නොකර ගතයුතු ධර්මයය. **බලන්න**: භාවෙතබ්බ ධමම හා නභාවෙ තබ්බ ධමම. **මූලාශ්‍ර**: අංගු.නි: (6) :10 නිපාතය:10.4.4.7. භාවේතබ්බ ධර්ම සූත්‍රය, පි. 540, EAN: 10: **194,** p. 556.

▼**වෙනත් මූලාශ්‍ර:1. "අකුසල චිත්ත** (ලෝභ දෝස මෝහ නිසා) වශයෙන් දස අකුසල පහළවේ.එමගින්, අයහපත් දුක් විපාක ලැබේ. එනිසා, සැප කැමති සත්පුරුෂයන් අකුසල ධර්ම දැන, ඉන් වෙන්ව කුසල ධර්ම පිරිය යුතුය..." : **සද්ධර්ම කෝෂය,** පි. 113.

▲**දසධර්ම**- Ten Dhammas: විවිධ දස ධර්ම පිලිබඳ සූත්‍ර දේශනාවල සඳහන්වේ. **සටහන**: සංසයා පිළිබඳව පෙන්වා ඇති දස ධර්ම පිළිබඳව **බලන්න**: සංසයා

▼**සුගත විනයේ දස ධම්මය:**: සුගත විනයේ දස ධම්මය ලෙසින් මෙහි පෙන්වා ඇත්තේ සම්මා දිට්ඨිය...සම්මා විමුක්තිය යන දස අංගයන්ය. එම දස ධම්ම ඇතිවන්නේ හා එමගින් යහපත් ප්‍රතිඵල ලබා ගැනීමට හැකිවන්නේ සුගත විනයේ පමණක් යයි මෙහි විස්තරාත්මකව පෙන්වා ඇත. **සටහන**: මේවා දස සම්‍යක්තවය ලෙසින්ද පෙන්වා ඇත. **බලන්න:** මිථ්‍යාත්වයට පැමිණීම හා සම්‍යක්තවයට පැමිණීම. **මූලාශ්‍රය**:අංගු.නි: ( 6): 10 නිපාත: පරිශුද්ධ වග්ග: 10.3.3.1-10.3.3.9 සූත්‍ර, පි.462.

▼ **පබ්බජා විසින්** ආවර්ජනය කලයුතු දසධර්ම ඇත. **බලන්න**: පබ්බජා.

▼ **තථාගතයන්ගේ** විමුක්ති සුවයට හේතුවූ, උන්වහන්සේ පහකළ දස ධර්ම ඇත: විමුක්තිය පිණිස අත්හල දස කරුණු. **බලන්න**: තථාගතයන්වහන්සේ.

▼ **දසධර්ම ප්‍රශ්න-** අන්‍ය ආගමික පරිබ්‍රාජකයන්, ධර්මය ගැන ප්‍රශ්න විමසනවිට ඔවුනට පිළිතුරු දීම පිණිස, බුදුන් වහන්සේ විසින් සංසයාට මේ දස ධර්ම ප්‍රශ්ණ උගන්වා වදාළහ. **බලන්න:** මහා දසධර්ම ප්‍රශ්න.

▲ **දස පාරමිතා -** Ten Parami: මතු බුදුබව පතන බෝධිසත්‍වයන් විසින් සම්පූර්ණ කරගතයුතු උතුම් ගුණ දස පාරමිතාවන්ලෙසින් චරියාපිටකයේ පෙන්වා ඇත. දස පාරමිතා පිලිබඳ සූත්‍ර දේශනාවන්හි විස්තර නොමැත. බොහෝ බෞද්ධයන් තුල දසපාරමිතා පිලිබඳ විශ්වාසය ඇත. මෙය මහායානයේ බලපෑමක් විය හැකිය යන මතය ප්‍රචලිතය. දසපාරමිතා විස්තරය: **1) දාන-**giving **2) ශිල -**morality **3) නෙක්කම්ම -** renunciation **4) ප්‍රඥා -**wisdom **5) වීරිය-** energy **6) ඛන්ති -**patience **7) සච්ච -**Truthfulness **8) අධිට්ඨාන-**Resolution **9) මෙත්තා -**Loving-kindness **10) උපේක්ඛා -**equanimity**.** බලන්න:බෝධිසත්‍ව. **ශබ්දකෝෂ: B.D:** p: 125: "Parami-Paramita: 10 qualities leading to Buddha-hood…" **මූලාශ්‍රය:** බු.නි: බුද්ධවංස පාලි-චරියා පිටක පාලි: පි.278.

▲ **දස පුණ්‍ය ක්‍රියා වස්තු-** Dasa punnakriyavasthu: පිං ලැබෙන ක්‍රියා පුණ්‍ය වස්තුය. **බලන්න:** පුණ්‍යක්‍රියා හා පුණ්‍යක්‍රියා වස්තු. ලෝකයාට පින් ලබගත හැකි ක්‍රියා 10 ක් අටුවාවේ විස්තර කර ඇත: 1) **දානය:** දානමය පූජා හෝ අනුග්‍රහයන් 2) **සීලය:** බුදුන් වහන්සේ පෙන්වා ඇති සිල්පද- සිඛපද රැකගැනීමෙන් පාපී කියා හැර දැමීම 3) **භාවනාව** 4) **ගරුකලයුතු අයට** ගරුබුහුමන් දක්වීම- ගෞරව (අපචායනය) 5) **තෙරුවන් පිදීම,** දෙමාපියන් ට සැලකීම, වැඩිහිටි හා රෝගීන් රැක බලාගැනීම - ගිලානසේවය- (වෙයාාවච්චය) 6) **පින්දීම:** තමන් විසින් සිදුකළ දානමය පිං සෙසු අයට අනුමෝදන් කිරීම 7) **පින් අනුමෝදන්වීම**: අනුන් සිදුකළ දානමය පින්කම් ගැන සතුටට පත්වීම- මුදිතාව ඇතිකර ගැනීම 8) **දහම් සවනය-ධර්ම ශ්‍රවනය**: බැතියෙන් හා ඕනෑකමින් යුතුව ධර්මය ඇසීම 9) **දහම් දේශනය-ධර්ම දේශනා**: තමා හෝ අනුන්ලවා යහපත් ලෙසින්, ධර්මය අනුන්ගේ යහපත පිණිස දේශනා කිරීම හා කරවීම 10) **දිට්ඨිය ඍජු කරගැනීම**: සම්මා දිට්ඨියට පැමිණීම. **විස්තර පිණිස බලන්න:** බෞද්ධයාගේ අත්පොත: රේරුකානේ චන්දවිමල මහානාහිමි: දසපුණ්‍යක්‍රියාවස්තු පි. 104.

▲ **දසබලඥාන:** පාලි: **දසබලානි-**Ten powers: තථාගතයන් සතු විශේෂ නුවණ, බල දසය, '**දසබල ඥාන'** ලෙසින් දක්වා ඇත. **බලන්න**: තථාගතයන්වහන්සේ.

▲ **දසබල මාර සේනාව -**Mara's 10 force: දසබල මාර සේනාව යනු, මාරයාගේ සේනාවය. **බලන්න**: මාරයා.

▲ **දසවාසස්ථාන-**Ten dwellings :අතීතයේ වැඩ සිටි හෝ අනාගතයේ පහළවන හෝ වර්තමානයේදී වැඩ සිටින (තුන් කාලය) ආරියබව ලැබූ පුද්ගලයන් වාසය කරන ස්ථාන 10, දසවාසස්ථානවේ. **බලන්න**: ආරිය වාසස්ථාන**.**

▲ **දස සංඥා**: පාලි: **දසසඤ්ඤා-** Ten Perceptions: සසර කලකිරීම පිණිස වඩාගතයුතු සංඥා, දස සංඥාවේ. මේවා වඩා ගැනීම නිවන පිණිස වේ. **දසසංඥා**: අනිච්චසංඥාව, අනාත්මසංඥාව, අශුභසංඥාව, ආදීනවසංඥාව, ප්‍රහාණසංඥාව, විරාගසංඥාව, නිරෝධසංඥාව, සබ්බලෝකේ අනභිරතිසංඥාව, සබ්බසංඛාරයෙහි අනිච්ච සංඥාව හා ආනාපාන සතිය. විස්තර පිණිස **බලන්න: සංඥා. සටහන්: *** මේ භාවනා වැඩිම පිළිබඳව **බලන්න**: භාවනා. **රෝග ආබධ සුවපත් කරගැනීම පිණිස දස සංඥා මෙනෙහිකිරීම සුදුසු ය. ගිරිමානන්ද සූත්‍රයේ දී දස සංඥා පිලිබඳ බුදුන් වහන්සේ මෙසේ වදාළහ: "ආනන්ද, ගිරිමානන්ද තෙරුන් වෙත එළඹ දසසංඥා සජ්ජායනා කරන්න, එය ඇසීමෙන්, ගිරිමානන්ද තෙරුන්ගේ ආබාධයට හේතු සන්සිඳී යනු ඇත".

**"සචෙ බො ත්වං ආනන්ද ගිරිමානන්දස්ස භික්ඛුනො උපසංකමිත්වා දසසඤ්ඤා භාසෙය්‍යාසි, ඨානං බො පනෙතං විජ්ජති යං ගිරිමානන්දස්ස භික්ඛුනො දසසඤ්ඤා සුත්වා සො ආබාධො ඨානසො පටිප්පස්සම්භෙය්‍ය".** **(** If, Ānanda, you visit the bhikkhu Girimānanda and speak to him about ten perceptions, it is possible that on hearing about them his affliction will immediately subside). **මූලාශ්‍ර:** අංගු.නි: ( 6 ): 10 නිපාත:

10.2.1.10 ගිරිමානන්ද සූත්‍රය, පි. 221, EAN: 10: 60.10. Girimānanda, p. 516.

▲ **දස සංයෝජන**-10 Fetters: සසරට බැඳ තබන ධර්මතා සංයෝජන වේ. **සංයෝජන10:** 1) සක්කායදිට්ඨිය- personal-existence view 2) විචිකිච්චාව- doubt 3) සීලබ්බතපරාමාසය- wrong grasp of behavior and observances 4) කාමච්ඡන්දය- sensual desire 5) ව්‍යාපාදය- ill will. 6) රූපරාග- lust for form 7 ) අරූපරාග- lust for the formless 8 ) මානය-conceit 9 ) උද්ධච්චය-restlessness 10 ) අවිජ්ජා- ignorance. **බලන්න:** සංයෝජන, ඕරම්භාගිය සංයෝජන, උද්ධම්භාගිය සංයෝන. **මූලාශ්‍ර**: අංගු.නි: ( 6 )10 නිපාත: නාථ වග්ග, 10.1.2.3 සංයෝජන සූත්‍රය, පි.60, EAN:10: Protector: 13.3. Fetters, p. 496.

▲ **දසසිල්:** පාලි: **දසසික්ඛාපදං**-Ten Precepts: දස සිල්, දස සිඛ පද ලෙසින්ද සාමණේර- සාමණේර සීලය ලෙසින්ද හඳුන්වයි. සමහර ගිහි උපාසක උපසිකාවන් පෝය දිනයේ දස සීල් සමදන්වේ. **දස සිල් පද**: 1) ප්‍රාණ ඝාතයෙන් වැළකීම 2) සොරකම් කිරීමෙන් වැළකීම 3) මෛථුන්දම් සේවනයෙන් වැළකීම 4) බොරුකීමෙන් වැළකීම 5) මත්පැන්, මත්ද්‍රව්‍ය ගැනීමෙන් වැළකීම -සුරාපානය 6) විකාලයේ ආහාර ගැනීමෙන්-විකාල භෝජනය වැළකීම 7) නැටුම්, ගැයුම්, වැයුම්, විසුළු දර්ශන ආදියේ යෙදීමෙන් වැළකීම 8) සැරසීලි හා මල් සුවඳ විලවුන් ආදිය දැරීමෙන් වැළකීම 9) උස් අසුන් හා මහා අසුන් පරිහරණයෙන් වැළකීම 10) රන් රිදී හා මුදල් පිළිගැනීමෙන් වැළකීම. **මූලාශ්‍ර**:ඛු.නි: ඛුද්දකපාඨ: 2. දසසිකපද, පි. 30.

▲ **දසසූත්තර ධර්මය:** පාලි: **දසුත්තරං ධම්මං-** Dhamma under ten headings: එකේ සිට දහය දක්වා, ගණනින් වැඩිවී යන පරිදි දක්වා ඇති ධර්මසමුදාය, දසසූත්තර ධර්මය වේ. මේ ධර්ම සමුදාය දේශනා කොට සැරියුත් මහා තෙරුන් වදාළේ, එම ධර්මතා නිවනට පැමිණීම පිණිස, දුක කෙළවර කරගැනීම පිණිස, සියලු කෙළෙස් ගැට ලිහා ගැනීම පිණිස පවතින බවය: **"දසුත්තරං පවක්ඛාමි ධම්මං නිබ්බාන පත්තියා දුක්ඛස්සන්තකිරියාය සබ්බගන්ථප්පමොචනං" සටහන්**: * මේ ධර්ම සමුදායට ධර්ම කරුණු 550 ක් පමණ ඇතුළත් වේ (1: 10, 2: 20, 3:30, 4:40, 5:50, 6:60, 7:70, 8: 80, 9:90, 10: 100. එම සියලු ධර්මතා, සත්‍ය ධර්මයෝ ය, තථාගතයන් විසින් යහපත් ලෙසින් අවබෝධ කරන ලද ධර්මතාවන්ය. ආධ්‍යාත්මික වර්ධනය පිණිස උපකාරීවන එම ධර්මතා කණ්ඩායම් 10 ට බෙදා පෙන්වා ඇත: 1) බහු උපකාර ධර්මතා 2) භාවේතබ්බ ධර්මතා (වැඩියයුතු) 3) පරිඤ්ඤෙය්‍ය ධර්මතා (පිරිසිඳ දැන ගතයුතු) 4) පහාතබ්බ ධර්මතා (පහ කල යුතු) 5) හානභාගිය ධර්මතා (හානිකාරී) 6) විශේසභාගිය ධර්මතා (විශේෂ ගුණ පිණිස) 7) දුෂ්ප්‍රතිවිධ්‍ය ධර්මතා (අවබෝධය දුෂ්කර) 8) උත්පාදයිතව්‍ය ධර්මතා (උපදවාගතයුතු) 9) අභිඤ්ඤෙයිය ධර්ම (විශේෂ නුවණින් දතයුතු) 10) සාක්ෂාත් කරගතයුතු ධර්මතා. ** This is largely a rearrangement of Dhamma under ten heads found in DN 33, Sāriputta gives the systematic instruction **බලන්න**: EDN: note: 1133, p. 475. **මූලාශ්‍ර:** දීඝ.නි : (3 ): **11** දසුත්තර සූත්‍රය, පි. 483, EDN: 34: Dasuttara Sutta: Expanding Decades, p. 384.

▲ **දස්සනආධිපත්‍ය** -Dassana adhipaththiya: මෙය ප්‍රඥාවකි, ගැටීම් රහිතව ආධ්‍යාත්මික මග ගෙනයාමට උපකාරීවන නුවණක්ය, **බලන්න:** අරණවිහාර ඥාණය.

▲ **දාසදාසි-** Male & female slaves: බුදුන් වහන්සේ වැඩසිටි සමයේ ධනවත් පවුල්, තමන්ගේ බැල මෙහෙවර පිණිස, දාස දාසින් යොදවාගති. විනයට අනුව, සංඝයාට දාස දාසින් පිළිගැනීම කැප නොවේ. මේ සූත්‍රයේ, බුදුන් වහන්සේ පෙන්වා ඇත්තේ, දාස හා දාසින් පිළිගන්නා අය ලෝකයේ බහුලබවය. එසේ පිළිනොගන්නා අය ඉතා ටික දෙනෙකි. **සටහන:** පුන්ණා -පුන්ණිකා තෙරණිය, ගිහිකල, අනේපිඩුමහසිටානන් ගේ නිවසේ දාසියක් ලෙසින් සේවය කළහ. දහම අසා සෝතාපන්නවූ පුන්ණා ගැන ප්‍රසාදයට පත්වූ සිටුතුමා, ඇය දාසිබවින් මුදවා පැවිදිවීමට අවස්ථාව සලසා දුන්හ. විස්තර පිණිස **බලන්න:** ථෙරිගාථා, උපග්‍රන්ථය:2 **මූලාශ්‍ර:** සංයු.නි: (5-2 ):මහාවග්ග: සච්චසංයුත්ත:9: 12.9.7 දාසිදාස සූත්‍රය, පි. 368, ESN:56: Sacchasamyutta: 87.7 Slaves, p.2362.

▲ **දුසිරිතය හා සුසිරිතය-** wrong conduct and right conduct: දුසිරිතය- දුෂ්චරිතය යනු ධර්මයට පටහැනි ජීවිතයක් ගෙන යාමය. සුසිරිතය**-** සුචරිතය යනු ධර්මානුකූල ජීවිතයක් ගෙන යාමය. කයෙන්, වචනයෙන් හා සිතෙන් (තුන්දොරින්) කරන අයහපත් ක්‍රියා- වැරදි ක්‍රියා දුසිරිතයවේ. කයෙන්, වචනයෙන් හා සිතෙන් කරන යහපත් ක්‍රියා- නිවැරදි ක්‍රියා සුසිරිතයවේ. **මූලාශ්‍ර**: දිඝ.නි: (3 ) 10 සංගිති සූත්‍රය- ඡෙදය 10 , පි. 378 , EDN: 33 Saṅgīti Sutta: The Chanting Together-section 10, p. 365.

▲ **දුසිල්වතා හා සුසිල්වතා** -immoral person & moral person **දුසිල්වතා**: ශිලසම්පන්න නැති පුද්ගලයාය. **සුසිල්වතා:** ශිලසම්පන්න පුද්ගලයාය. **දුසිල්වතාට-** දුශ්ශිලයාට, ආරිය දර්ශනයට ඇති අකමැත්ත, සද්ධර්මය ශ්‍රවණයට ඇති අකැමැත්ත හා උපාරම්භ චිත්තය (අනුන් විවේචනයට ඇති කැමැත්ත mind bent on criticism) නැතිකරගැනීමට නොහැකිය. අශ්‍රද්ධාව,අවදඤ්ඤුතාවය (un-charitableness) අවදඤ්ඤුතාවය නැතිකරගැනීමෙන් දුසිරිතය පහවේ. ආරබ්ධ විරිය ඇති පුද්ගලයාට දුසිරිතය පහ කර ගත හැකිවේ. **මූලාශ්‍ර:** අංගු.නි: ( 6): 10 නිපාත: 10.2.3.6 තයොධම්ම සූත්‍රය,පි.284, EAN:10: Tens,76- 6.Incapable, p. 524.

▼ **දුසිල්වතා,** ශිලසම්පන්න නොවීම නිසා ඔහුට සමාධිය ඇතිනොවේ. සමාධිය නොමැතිනිසා යථාභූතඥානදර්ශනය ලබා ගත නොහැකිය, එමනිසා නිබ්ද්දාව හා විරාගය ඇතිනොවේ. නිබ්ද්දාව හා විරාගය නොමැතිවිට විමුක්තිඥානදර්ශනය ඇතිනොවේ. මේ පිළිබඳව බුදුන් වහන්සේ දැක්වූ **උපමාව:** අතු කොළ නොමැති ගසක පොත්ත හරය ආදිය මානව නොවැඩේ, එලෙසින් දුසිල්බව මාර්ගය වර්ධනය අවහිර කරයි. **සුසිල්වතා,** ශිලසම්පන්න වීම නිසා ඔහුට සමාධිය ඇතිවේ, සමාධිය නිසා යථාභූතඥානදර්ශනය ලබා ගත හැකිවේ. එමනිසා නිබ්ද්දාව හා විරාගය ඇතිවේ. නිබ්ද්දාව හා විරාගය ඇතිතිවිට විමුක්තිඥානදර්ශනය ඇතිවේ. මේ පිළිබඳව බුදුන් වහන්සේ දැක්වූ **උපමාව:** අතු කොළ සරුවට ඇති ගසක පොත්ත හරය ආදිය මානව වැඩේ, එලෙසින් ශිලසම්පන්නවූවිට මාර්ගය වර්ධනය වේ. **මූලාශ්‍ර:**

අංගු.නි: (3 ): 5 නිපාත: 5.1.3.4 දුස්සීල සූත්‍රය, පි. 52, EAN:5: 24.4 Immoral, p. 243.

▲ **දෝසය-** hate: දෝසය - ද්වේෂය -තරහ-ව්‍යාපාදය අකුසල මූලයකි. **බලන්න**: අකුසල මූල. කෙනෙක් දෝසය නම්වූ සංකෙලේස ධර්මය (සිත කෙලෙසන) පහ කර ගන්නේ නම්, තමන් වහන්සේ ඒ පුද්ගලයාට අනාගාමීබව ලැබීම පිණිස ඇප වෙන බව බුදුන් වහන්සේ වදාරාඇත. දෝසය නිසා ලෝකයා දුගතියට යයි, සම්මා ප්‍රඥාවෙන් දැක ඒ දෝසය සහමුලින්ම පහකරගත් විට, මේ ලෝකයට නැවත පෙරලා නොඑයි. **සටහන්**: *දෝසය ගින්නක් -දෝසගින්න ලෙසින් පෙන්වා ඇත. **බලන්න**: ගින්න, ආදිත්තපරියාය සූත්‍රය ** දෝසය නැතිකරගැනීම දෝසවිනයය. **බලන්න**: ආශ්‍රව හා ආශ්‍රව ක්ෂය කිරීම. **මූලාශ්‍රය:** ඛු.නි: ඉතිවුත්තක: 1.1.2 දෝසසූත්‍රය, පි. 346, 1.1.10 දෝසපරිඤ්ඤා සූත්‍රය, පි.353.

▼**දෝසය ඇතිවීමට** හේතු 2 කි: පටිසමිත්ත හා අයෝනිසෝමනසිකාරය.: **මූලාශ්‍රය**: අංගු.නි: (1) 2 නිපාතය, ආසාවග්ග: 2.3.11.7 සූත්‍රය,පි. 208.

**දශ**

▲**දශ්සන විසුද්ධි ඥානය-** Dassana visuddhi Nana: සියලු සංඛත අසංඛත ධර්මතාවල ඒකීයබව හා විවිධ බව අවබෝධ කරගැනීමේ නුවණ, දශ්ශන විසුද්ධි ඥානය ය. **මූලාශ්‍රය**: ඛු.නි: පටිසම්බිදා-1: ඤාණකතා: 40 දශ්ශන විසුද්ධි ඥානය**,** පි. 220.

▲ **දේශනා වාර**-Types of discourses: දේශනා වාර ලෙසින් මේ සූත්‍රයේ පෙන්වා ඇත්තේ, බුදුන් වහන්සේ ධර්මය දේශනා කරණ වාර-නොහොත් කාරණා වශයෙන් වර්ග 2 ක් බවය:1) "පාපය ලාමක වශයෙන් බලන්න". 2) " පාපය ලාමක වශයෙන් දැක ඒ ගැන කලකිරෙන්න, නො ඇලෙන්න, මිදෙන්න". **මූලාශ්‍ර:** ඛු.නි: ඛුද්දකපාඨ: ඉතිවුත්තක: 2.2.2 දේශනා සූත්‍රය, පි.390.

▲ **දුශ්චරිත-**Dushcarita: දුශ්චරිත (දුච්චරිත) යනු තුන් දොරින් කරන අයහපත් ක්‍රියාය: කාය, වචී හා මනෝ දුශ්චරිත. මේවා නැතිකර ගැනීම පිණිස ත්‍රිවිධ සුචරිතය: කාය, වචී හා මනෝ සුචරිත වඩා ගත යුතුය. **මූලාශ්‍රය:** අංගු.නි: (4) 6 නිපාත: 6.1.2 දුච්චරිත සූත්‍රය, පි.280.

**දෂ**

▲ **දුෂ්කර දේ-** Difficult things: කිරීමට අපහසු දේ දුෂ්කර දේය. මහණදම පිරිම දුෂ්කර දෙයකි. අනුවණ පුද්ගලයාට මහණදම පිරිම දුෂ්කරයයි දෙවියෙක්, බුදුන් වහන්සේට පැවසුහ. සිතේ ඇති අකුසල් සිතුවිලි (රාගය දෝෂය හා හිංසාව) පහකර ගැනීමට ඔහු අසමත්ය. බුදුන් වහන්සේ මෙසේ වදාළහ:"කෙනෙකුට සිත අකුසලයෙන් වළකා ගැනීමට නොහැකිනම් මහණදම කෙසේ කරයිද? පාප විතර්ක නිසා ඔහු මාර්ගයේ පසුබසී. එහෙත්, ඉදිබුවා සිය අවයව ඉබිකටුව තුලට ගන්නා ලෙසින් අකුසල සිත අස්කර, භාවනාවට සිත ඇතුළුකරගෙන, ස්වාධීනව, වෙනත්, අය නොපෙළමින්, කිසිවෙකුට දොස් නොපවරන මහණ, සියලු ආසව සන්සිඳුවා අරහත්වයට පත්වේ (මහණදම සම්පූර්ණකරගනී)" **බලන්න**:

ESN: note: 27, p. 503. **මූලාශ්‍ර**:සංයු.නි: සගාථවග්ග: දේවතාසංයුත්ත: 1.2.7 දුෂ්කර සූත්‍රය, පි.40, ESN: 1: Devatasamyutta: 17.7 Difficult to Practice, p.76.

▲**දුෂ්කර ක්‍රියා-** Difficult actions : දුෂ්කර ක්‍රියා ලෙසින් මෙහි පෙන්වා ඇත්තේ බෝධිසත්වයෝ, බුදුවීමට පෙර වසර 6-7 ක් පමණ කාලය තුල කරනලද දුෂ්කර තපස් ව්‍රත පිලිබඳවය-අත්තකිලමතානු යෝගය. ඒවායේ අවැඩදායක බව ප්‍රඥාවෙන් අවබෝධ කර, මධ්‍යම ප්‍රතිපදාවට එළඹී, බෝසතුන් සම්බුද්ධත්ව සාක්ෂාත්කරගති. **බලන්න:** තපස්කර්ම, බුදුන්වහන්සේ. **සටහන**: ම.නි. ආරියපරියේෂණ සූත්‍රයේ එම දුෂ්කර ක්‍රියා විස්තරාත්මකව පෙන්වා ඇත.

▲ **දුෂ්ප්‍රඥා**-Dushpranna: ධර්මය දැකීමට ප්‍රඥාව නොමැතිබව දුෂ්ප්‍රඥා ලෙසින් පෙන්වා ඇත. **බලන්න:** අසද්ධර්මය. **මූලාශ්‍රය**: අංගු.නි: (4) 7 නිපාත:සමණවග්ග:7.2.4.9 අසද්ධර්ම සූත්‍රය, පි.512.

▲**දුෂ්ප්‍රතිවිධ්‍ය ධර්ම:** පාලි: **දුප්පටිවිජ්ඣා-** Dhamma that are hard to penetrate: විනිවිදව අවබෝධ කරගැනීමට දුෂ්කර (පහසු නැති) ධර්ම, දුෂ්ප්‍රතිවිධ්‍ය ධර්ම යන්ය. **සටහන**: මේ ධර්මතා දුකසේ අවබෝධ කර ගත යුතුවේ. **දුෂ්ප්‍රතිවිධ්‍ය ධර්මතා:** 1) **ආනන්තරික චිත්ත සමාධිය** (ආනන්තරිකො චෙතො සමාධි**) බලන්න:** ආනන්තරික චිත්ත සමාධිය. 2**) අකුසල මූල**- සත්ත්‍වයන් තුල කෙළෙස් ඇති වීමට බලපාන කරුණු හා ඒවාට හේතු (මූලය හා හේතු- පච්චයා) **(** යො ච හෙතු යො ච පච්චයො සත්තානං සංකිලෙසාය **-** That which is the root, the condition of the defilement of beings) 3) **කුසල මූල**: සත්ත්‍වයන් ගේ පිරිසිදු භාවය ඇති වීමට බලපාන කරුණු හා ඒවාට හේතු (මූලය හා හේතු) **(** යො ච හෙතු යො ච පච්චයො සත්තානං විසුද්ධියා**-** that which is the root, the condition of the purification of beings).4**) ත්‍රිවිධ නිස්සාරණිය ධාතු (**තිස්සො නිස්සරණියා ධාතුයො): නෙක්ඛම්මය, අරූපය, නිරෝධය (නෙක්ඛම්මං, ආරුප්පං, නිරොධො).**5) සතර සමාධිය: හානභාගිය, ඨිතිභාගිය, විසේසභාගිය හා නිබ්බේදකභාගිය සමාධි. බලන්න:** සතර සමාධිය. **6) පංච නිස්සරණිය ධාතු:** 1) නෙක්ඛම්ම නිස්සාරණිය ධාතුව 2) මෛත්‍රිය -මෙත්තා නිස්සාරණිය ධාතුව 3) කරුණා නිස්සාරණිය ධාතුව 4) අරූප නිස්සාරණිය ධාතුව 5) නිරෝධ නිස්සාරණිය ධාතුව. **බලන්න**: **නිස්සරණිය ධාතු. මූලාශ්‍ර:** දීඝ.නි : (3 ): 11 දසුත්තර සූත්‍රය, පි. 483, EDN: 34: Dasuttara Sutta: Expanding Decades, p. 384.

**දහ**

▲ **දහම්කතා-**Dhamma talks: ධර්මය පිළිබඳව, බුදුන් වහන්සේ හෝ ශ්‍රාවකයන් පවසන කතා-සාකච්චා මින් අදහස් කෙරේ. මංගල සූත්‍රයේ කාලීනව ධර්මය සාකච්ඡා කිරීම සුභයයි පෙන්වා ඇත. දහම් කථා ඇසීමට තමන් කැමති ලෙසින් අවස්ථා ලැබීම, අකුප්පබව- අරහත්වය ලැබීමට උපකාරීවන කරුණකි. **බලන්න:** අක්කුප්ප.

▲ **දහම් කැඩපත-**Dhamma mirror: දහම් කැඩපත ලෙසින් පෙන්වා ඇත්තේ බුදුන් වහන්සේ පෙන්වා දුන් ධම්ම න්‍යායකටය. යම් අරිය ශ්‍රාවකයෙක් සෝතාපන්නවී නම් ඔහු, සතර අපාය දුරු කළ බවද,

ඒකාන්තයෙන්ම සම්බෝධිය පිහිටාකර ගෙන ඇතිබව දන්නේය. එනිසා ඔහු ගේ පරලොව සුගතියක් බව ඔහු දන්නේය. **සටහන**: මියගිය සංඝයා හා උපාසක උපාසිකා වන්ගේ පරලොව ගමන ගැන ආනන්ද තෙරන් කළ විමසීමක් මත, බුදුන් වහන්සේ මේ සූත්‍රය වදාළහ. **බලන්න**: ගති. **සටහන**: මහාපරිනිබ්බාන සූත්‍රයේ දීද දහම් කැඩපත ගැන විස්තරකර ඇත. **මූලාශ්‍රය**:සංයු.නි: (5-2) මහාවග්ග: සෝතාපත්තිසංයුත්ත:11.1.8 හා 11.1.9 ගිඤ්ජකාවසථ සූත්‍ර, පි.184.

▲**දහර-**Young: දහර යනු තරුණ බවය. තරුණ හෙවත් ලාබාලවියේ පසුවන සිව්දෙනක් ලදරු යයි අවමන්-පරිභව නොකොට (පරිභව නොකළයුතු සිව් දෙනා) යුතුයයි බුදුන් වහන්සේ පෙන්වා ඇත: 1) **තරුණ ක්‍ෂත්‍රිය**: යම් කලක රජබවට පත්වන්නේය. යම්හෙයකින් කෙනක් ලාබාල යයි ඔහුට අවමන් කළේ නම්, පසු කල රාජ දණ්ඩනයට පත්විය හැකිය. 2) **ලදරු සර්පයා** - ලාබලවුවත් සර්පයා විෂ සහිතය. සර්පයෝ නන් වැදැරුම් වෙසින් හැසිරේ, කෙනක් එම සතාට අවමන්-හිරිහැර කළේනම් ඌ ඒ පුද්ගලයාට දෂ්ටකර දිවි තොර කරනු ඇත. 3) **ලදරු-කුඩා ගින්න**, පසුව මහා ගින්නක් බවට පත්වේ. එම ගින්නට කෙනක් අවමන් කරයි නම්, ගින්න ඒ පුද්ගලයාට අනතුරු කරනු ඇත. 4) **තරුණ-ලාබාල මහණ**: වයසින්, පැවිද්දෙන් ලාබාලවුවත්, භික්ෂුව සියලු කෙළෙස් දවා අරහත්වය ලබා ඇත. එබඳු කීර්තිමත් මහණ මැනවින් ඇසුරු කිරීම යහපත පිණිසය. එමනිසා මේ සතර දෙනා පිළිබඳව නුවණැති ලෙසින් කටයුතු කළයුතුවේ. **සටහන්**: * මේ සූත්‍රය දේශනා කළේ පසේනදී කෝසල රජතුමා බුදුන් වහන්සේ වයසින් හා පැවිද්දෙන් තරුණ නිසා සම්මා සම්බෝධිය ලැබුවේ යන විමසීම පදනම් කර ගෙනය. **බලන්න**: සම්මා සම්බුද්ධ. ** ඉන්දියානු සම්ප්‍රදායට අනුව, සර්පයන්ට තමන් කැමති වෙසක් ගත හැකිය. අටුවාව පෙන්වා ඇත්තේ, ගොදුරු සොයා යන සර්පයා, කැමති වෙසක්-ලේනෙක් ලෙසින් හෝ- ගැනීමට හැකිබවය **සිල්වත් භික්ෂුව තමන්ට පරිභව කරණ අය ඉවසයි, පෙරළා පළි නොගනී. එහෙත්, එසේ කළ පුද්ගලයාට අයහපත් කර්ම විපාක විඳීමට සිදුවේ. **බලන්න:** ESN:note :202, p.530.**බලන්න:** වැඩිහිටිබව හා තරුණබව.**මූලාශ්‍ර:** සංයු.නි: (1 ): කෝසලසංයුත්ත:3.1.1. දහර සූත්‍රය,පි. 156, ESN:3: Kosalasamyutta: 1.1 Young, p. 216.

▼**එක්තරා තරුණ මහණෙක්**, පිණ්ඩපාතයෙන් පසු වෙහෙරට පිවිස නිහඬව වාසය කරයි, අන්‍යයන්ගේ කටයුතු වලට සහභාගී නොවේ. සංඝයා ඒ පිළිබඳව බුදුන් වහන්සේට සැලකළහ. බුදුන් වහන්සේ ඒ මහණ කැඳවා, ඔහුගේ සිත, උන්වහන්සේගේ සිතින් පරික්ෂාකර සෙසු සංඝයාට මෙසේ වදාළහ: "ඒ දහර (යොවුන්) මහණ, උතුම්ය, මාර සේනාව දිනා අන්තිම ශරිරය දරයි". **මූලාශ්‍රය**: සංයු.නි: (2) නිදාන්වග්ග: භික්ඛුසංයුත්ත: 9.1.4 නවභික්ඛු සූත්‍රය, පි. 450.

▲ **දහසක් ලෝක ධාතුව**: පාලි: **සහස්‍සධා ලොකො-** thousand fold world system: දහසක් ලෝක ධාතුව-ලෝකධාතු 1000- සහශ්‍ර ලෝක මණ්ඩලයන්ය. **සටහන: ධම්මචක්කප්පවත්තන සූත්‍රය** දේශනා කරන අවස්ථාවේ දහසක් ලෝක ධාතුව සැලී ගිය බව ද, දෙවියන්ගේ ආනුභාවයට වඩා මහත්වූ ආලෝකධාරාවක් පැතිර ගිය බව පෙන්වා ඇත.

▼**බුදුන් වහන්සේ** මෙසේ වදාළහ:: සඳ හා හිරු යම්තාක් දුර බ්‍රමනය වන්නේද, යම් තාක් දුරට ආලෝකය පතුරන්නේද, ඒතාක් දුරට දහසක් ලෝක ධතුව පැතිර ඇත:

**"යාවතා භික්ඛවෙ චන්දිමසුරියා පරිහරන්ති, දිසා** භන්ති විරොචනා, තාව **සහස්සධා ලොකො..."**. (Bhikkhus, as far as sun and moon revolve and light up the quarters with their brightness, so far the thousandfold world system extends). **සටහන්**: * ඒ ලෝක ධාතුවේ 1000, සඳ හිරු ආදී දේ 1000 බැගින් ඇතිබව මෙහි විස්තර කර ඇත ** අංගු: 3 නිපාත:ආනන්දවග්ගයේ: **3.2.3.10 සූත්‍රයේදී** බුදුන් වහන්සේ, දහසක් ලෝක ධාතු තුල ඇති **සහසසි චූලනීය ලෝක ධාතුව** (thousandfold minor world system) ගැන විස්තර කර ඇත. එම ලෝකධාතුවේ, ද්විසහස්සි, ත්‍රිසහස්සි, මහාසහස්සි ආදී ලෝක ධාතු ඇත .**බලන්න**: EAN:3: 80.10 Abhibhu, p. 120. **මූලාශ්‍ර:** අංගු.නි: (6 ): 10 නිපාත: 10.1.3.9.ප්‍රථම කොසල සූත්‍රය,පි. 134 , EAN: 10: The Great Chapter, 29.9 Kosala-1, p. 505.

▼**අනුරුද්ධ තෙරුන්**, සතර සතිපට්ඨානය යහපත් ලෙසින් වඩාගැනීම නිසා, දිවැස් ලැබූ බවද, දිවැස් නිසා, එතුමන්හට, දහසක් ලෝක ධාතුව බැලිය හැකිබව මේ සූත්‍රයේ විස්තර කර ඇත. **මූලාශ්‍ර**: සංයු.නි: ( 5-1 කාණ්ඩය):මහාවග්ග: සතිපට්ඨාන සංයුත්ත: 3.3.8 ලෝක සූත්‍රය, පි. 342, ESN:47: Satipatthanasamutta: III: 28.8 The World, p. 1888.

▲ **දැහැටි**: පාලි: **දන්තකට්ඨ**-tooth wood: බුදුන් වහන්සේ වැඩ සිටි සමයේ, ජනයා (මෙන්ම සංඝයාද), දත් හා මුව පිරිසිදු කරගත්තේ, බෙහෙත් පැළෑටි හා ගස් වලින් ගත් දැහැටි වලිනි. වර්තමානයේද, ආසියාතික රටවල මේ ක්‍රමය දැකිය හැකිය. සංඝයාට ගිලන්පස පූජා කරන අවස්ථාවේ දැහැටි පිළිගැන්වීම ශ්‍රී ලංකාවේ බෞද්ධයන් අතර ඇති චාරිත්‍රයකි.
▼**බුදුන් වහන්සේ**, දැහැටි භාවිතා නො කිරීමෙන් (මුව හා දත් පිරිසිදුකර නොගැනීම) සිදුවන අයහපත පෙන්වා ඇත: 1) ඇසට හිතකර නොවේ 2) මුව දුගඳ වේ 3) රසනහර පිරිසිදු නොවේ 4) පිත හා සෙම, ගන්නා ආහාරයට බාධා කරයි 5) ගත් ආහාරය රිසිනොවේ. දැහැටි භාවිතය මගින් ඒ අයහපත් වලකා ගත හැකිය. **මූලාශ්‍ර**: අංගු.නි: (3): 5 නිපාත: 5.5.1.8 දන්තකට්ඨ සූත්‍රය, පි.424, EAN:5: 208.8 Brushing, p. 305.

▲ **දැහැමි හා අදැහැමි -** Well behaved & Not well behaved: දැහැමි ලෙසින් පෙන්වා ඇත්තේ ධර්මයේ කිකරුබව- දමනයවී සිටීමය. අදැහැමි යනු ධර්මයේ දමනය නොමැතිබවය. දැහැමි පෙසල ලෙසින්ද, අදැහැමි පාපී ලෙසින්ද පෙන්වා ඇත. බුදුන් වහන්සේ පෙන්වා ඇත්තේ, යම්කලක අදැහැමි භික්ෂූන් බලවත්වනවිට දැහැමි භික්ෂූන් දුබලවී යනබවය. එවිට දැහැමි භික්ෂූන් වෙන පළාත් වලට යයි. එය බොහෝදෙනාගේ අයහපත පිණිස වේ. බුමේ පිළිබඳව දැක්වූ උපමාව වුවේ, රටක, සොරුන් බලවත්වනවිට, රජතුමා දුබලවන බවය. එය රටවැසියාට හිතකර නොවේ. එහෙත්, රජතුමා බලවත් නම්, සොරුන් දුබලවේ. එය රට වැසියාට හිතකරය. එලෙසින්, යම්කලක, දැහැමි භික්ෂූන් බලවත් නම් අදැහැමි භික්ෂූන් දුබලවේ. එවිට අදැහැමි භික්ෂූන්

වෙන පළාත් වලට යයි එය බොහෝදෙනාගේ යහපත පිණිස වේ. **මූලාශ්‍රය**: අංගු.නි: (1 ) 2 නිපාතය, 2.1.4.8 සූත්‍රය,පි. 172.

## ධ:කොටස: ධජ,ධත,ධන,ධම,ධය,ධර,ධව

### ධජ

▲ **ධජය-**Flag: ධජය ලෙසින් පෙන්වා ඇත්තේ කොඩියය. යම් කිසි සටනක් සිදුවන විට ඒ ඒ පක්ෂයේ නායකයන් ගේ ධජය අනුගමනය කිරීමට සේනාව පුරුදුවීඇත. ධජග්ග සූත්‍රයේදී, සක්දෙවිඳු, (සුර අසුර සටනේදී) දෙවියන්ගේ ධජ -දේවධජ-විස්තර කර ඇත. බුදුන් වහනසේගේ ධජය, ධර්මයය- දහම් කොඩිය. **බලන්න**: කොඩිය, ස.නි: (1) ධජග්ග සූත්‍රය.සංයු.නි: (1): සගාථවග්ග: දේවතාසංයුත්ත:1.8.2. රථ සූත්‍රය, පි.104. ** සක්විතිරජ, ධර්මය ධජය කොටගෙන, ධර්මය ආධිපත්‍ය කොටගෙන දැහැමින් රජකරයි. **බලන්න**: සක්විතිරජ.

▲ **ධජ පූජා-** Offering flags: බුදු පසේබුදු ආදී උතුමන් වෙනුවන් ගොඩනගනලද ස්ථූප ආදිය කොඩිවලින් සැරසීම, ශ්‍රද්ධාවෙන් පූජාකිරීම, ආදියෙන් යහපත් කම්ම විපාක ඇතිවේ. **සටහන්**: * උපවාන තෙරුන්ගේ අපදානයේ, පදුමුත්තර බුදුන්ගේ පිරිනිවන් සෑයට ධජයක් පූජාකිරීම නිසා ලැබූ ආනිසංස විස්තර කර ඇත. ** බුදුන් වහන්සේ වෙතින් පැවිද්ද ලැබූ අන්තිම ශ්‍රාවක භික්ෂුව වූ සුභද්‍ර තෙර, එතුමන්ගේ අපදානයේදී, පදුමුත්තර බුදුන්ගේ පිරිනිවන් සෑයට ධජයක් පූජාකර ලැබූ යහපත් විපාක පෙන්වා ඇත. **බලන්න:**උප ග්‍රන්ථය:1

### ධත

▲**ධෘතරාෂ්ට්‍ර දෙව්රජ -**Drutharashtra Devaputta: මෙතුමා, චාතුර්මහාරාජික දෙවලෝකයේ අධිපති සතරවරම් රජවරුන්ගෙන් (සතරවරවරම් දෙවියෝ) කෙනෙකි, ලෝකයේ නැගෙනහිර දිසාව පාලනය කරයි. **බලන්න**: චාතුර්මහාරාජික දෙව්ලොව.

▲ **ධෘතිමත්-** resolute: ධෘතිමත්- ධිතිමත්තාන ලෙසින් පෙන්වා ඇත්තේ ධර්මය පිලිබඳ නිශ්චිත බව තිබීමය. මේ කරුණ ඇති බුද්ධ ශ්‍රාවකයන් අතුරින් ආනන්ද තෙරුන් අග්‍රය. **බලන්න**: උපග්‍රන්ථය:1

▲ **ධාතු:** පාලි: **ධාතුයො-** elements **-dhātu**: ධාතු ලෙසින් දක්වා ඇත්තේ ධර්මතාවන්හි ඇති ස්වභාවයය. ධාතු පිලිබඳ යථා අවබෝධය ලබාගැනීම, ධර්ම මාර්ගය වර්ධනය කරගැනීමට උපකාරීවේ. **සටහන්**: * අටලොස් වැදැරුම් අනෙක ධාතුන්ගැන හා නානා ධාතුන්ගැන විනිවිද යන අවබෝධය ඇතිවෙන්නේ තථාගතයන් ගේ පහළවීම නිසාය. **බලන්න**: තථාගත, ** ධාතු පිලිබඳ විස්තර පිණිස **බලන්න:** සංයු.නි: ධාතුසංයුත්තය. ** බුදු, පසේබුදු, අරහත් ආදී උතුමන්ගේ අභාවයෙන් පසු, ඉතිරිවන ඇට ආදියද ධාතු ලෙසින් දක්වයි. දීඝ.නි: මහා පරිනිබ්බාන සූත්‍රයට අනුව බුදුන් වහන්සේගේ ධාතු තැන්පත්කර ස්ථූප ගොඩනගන ලද බව සඳහන්වේ. **ශබ්දකෝෂ: B.D**: p. 99: "**dhātu**: elements are the ultimate constituents of a whole... 4 physical elements…18 physical & mental elements…". **P.T.S**: p. 774: "**dhātu**: a primary element, of which the usual set comprises the four paṭhavī, āpo,

tejo, vāyo (earth, water, fire, wind), otherwise termed cattāro mahābhūtā…"

▼**දී.ස:නි. සංගිති සූත්‍රයේ විවිධ ධාතු දක්වා ඇත: 1) කුසල ධාතු 3කි:** 1නෙක්කම්ම ධාතුව 2 අව්‍යාපාද ධාතුව 3 අවිහිංසා ධාතුව (renunciation, non-enmity, of non-cruelty). **2) අකුසල ධාතු 3කි:** 1කාම ධාතුව 2 ව්‍යාපාද ධාතුව 3 විහිංසා ධාතු (sensuality, enmity, cruelty),**3) ලෝක ධාතු 3 කි:** තුන්ලෝකය (ත්‍රිවිධ භව):1 කාම ධාතුව (කාම ලෝකය-කාමාවචර) 2 රූප ධාතුව (රූප බ්‍රහ්ම ලෝක ) 3 අරූප ධාතුව (අරූප බ්‍රහ්ම ලෝක) (element of sense-desire, the element of form, the formless element) **4) නිරෝධ ධාතුව** (element of cessation) : ලොකොත්තර ධාතුව (supramundane): නිවනය. **5 ) ධාතු 3 කි:** 1 හීන ධාතු 2 මධ්‍යම ධාතු 3 ප්‍රණීත ධාතු (the low element, the middling element, the sublime element) **6) භෞතික ධාතු 4 කි:** ශරීරිය සකස්වී ඇත්තේ ධාතු 4 කින්ය: 1) පඨවි ධාතුව (පෘතුවිය), 2 ආපෝ ධාතුව (ජලය) 3 තෙජෝ ධාතුව (උෂ්ණුසුම) 4 වායෝ ධාතුව (වායුව-සුළං) ලෝකය සකස්වී ඇත්තේ මේ සතර ධාතු වලින්ය. මේවා මහාභූත ලෙසින්ද හඳුන්වයි. **7) නිස්සරණීය ධාතු 5 කි:** 1**කාම නිස්සරණීය ධාතුව** : කාම වස්තු කෙරෙහි සිත නොයෙදවා ඉන් මිදීමට ඇති හැකියාව හා නෙක්ඛම්ම සහගත සිතක් වඩා ගැනීමට හැකියාව ඇතිවීම (අසුභ භාවනාව වැඩිම මගින් සිත කාමයෙන් මුදා ගත හැකිය) 2 **ව්‍යාපාද නිස්සරණීය ධාතුව:** ක්‍රෝධය තරහ ආදී පටිසයෙහි සිත නොයෙදවා ඉන් මිදීමට ඇති හැකියාව හා මෛත්‍රිය සහගත සිතක් වඩා ගැනීමට හැකියාව ඇතිවීම (මෛත්‍රි භාවනාව වැඩිම මගින් සිත ව්‍යාපාදයෙන් මුදා ගත හැකිය). 3 **වීහිංසා නිස්සරණීය ධාතුව:** හිංසාව, පිඩා කිරීමආදී නපුරු සිතිවිලි කෙරෙහි සිත නොයෙදවා ඉන් මිදීමට ඇති හැකියාව හා කරුණා සහගත සිතක් වඩා ගැනීමට හැකියාව ඇතිවීම ( කරුණා භාවනාව වැඩිම මගින් සිත වීහිංසාවෙන් මුදා ගත හැකිය) 4 **රූප නිස්සරණීය ධාතුව:** රූපයට නො ඇලි, ඒවා කෙරෙහි සිත නොයෙදවා ඉන් මිදීමට ඇති හැකියාව (අරූප සමාපත්ති වැඩිම මෙහිදී උපකාරිවේ) 5 **සක්කාය නිස්සරණීය ධාතුව:** පංච උපාදානස්කන්ධය පිලිබඳ නො ඇලි, එහි සිත නොයෙදවා ඉන් මිදීමට ඇති හැකියාව. **සටහන: *** නිස්සරණීය- අකුසලයෙන් මිදීම, නිදහස් වීම (elements making for deliverance) ** නිස්සරණීය ධාතු 5 ගැන විස්තර පිණිස **බලන්න:** නිස්සරණීය ධාතු **8) ධාතු 6 කි:** ඉහත **1.6** දක්වා ඇති **භෞතික ධාතු** 4 හා 5 ආකාශ ධාතුව හා 6 විඥාන ධාතුව. **9) නිස්සරණීය ධාතු 6 කි:** 1 චේතෝ විමුක්ති නිස්සරණීය ධාතුව **(**emancipation of the heart) : මෛත්‍රිය වඩා සිත විමුක්ත කර ගැනීම, 2 කරුණා විමුක්ති නිස්සරණීය ධාතුව (emancipation of the heart through compassion) 3 මුදිතා විමුක්ති නිස්සරණීය ධාතුව (emancipation of the heart through sympathetic joy) 4 උපේක්ඛා විමුක්ති නිස්සරණීය ධාතුව (emancipation of the heart through equanimity) 5 අනිමිත්ත චේතෝ විමුක්ති නිස්සරණීය ධාතුව the signless emancipation of the heart): නිමිති අල්වා නොගෙන සිත මුදා ගැනීම- රහත් ඵල සමාපත්තිය 6 අසම්මාන විමුක්ති නිස්සරණීය ධාතුව: මම මාගේ යන අසමි මානය නැතිකර ගැනීම. **සටහන:** විස්තර පිණිස **බලන්න**: නිස්සරණීය ධාතු. **මූලාශ්‍ර**: දිස.නි: (3) :

10 සංගීති සූත්‍රය, පි. 368, EDN: 33: Sangīti Sutta: The Chanting Together, p. 362.

▼ **ධාතුහත විස්තරය-** Sevan Elements: ධාතුහත-සප්ත ධාතු ගැන බුදුන් වහන්සේ මෙසේ පෙන්වා ඇත: **1) ආලෝක ධාතුව** (අභාධාතු- light element) **2) සුභ** ධාතුව (beauty element) **3) ආකාසානඤ්චායතනධාතු 4) විඤ්ඤානඤ්චායතන ධාතු 5) ආකිඤ්චඤ්ඤායතන ධාතු 6) නෙවසඤ්ඤානාසඤ්ඤායතන ධාතු 7) සංඥාවේදිතනිරෝධ ධාතු. එම ධාතු තේරුම් ගන්නා ක්‍රමය**: අඳුර නිසා ආලෝක ධාතුව අවබෝධ කරගත හැකිය. අසුභය නිසා සුභ ධාතුව අවබෝධ කරගත හැකිය. රූපය නිසා ආකාසානඤ්චායතන ධාතුව අවබෝධ කරගත හැකිය. ආකාසානඤ්චායතනධාතුව නිසා විඤ්ඤානඤ්චායතනධාතුව අවබෝධ කරගත හැකිය. විඤ්ඤානඤ්චායතනධාතුව නිසා ආකිඤ්චඤ්ඤායතන ධාතුව අවබෝධ කරගත හැකිය. ආකිඤ්චඤ්ඤායතන ධාතුව නිසා නෙවසඤ්ඤානාසඤ්ඤායතන ධාතුව අවබෝධ කරගත හැකිය. නාමස්කන්ධය නිරෝධවීම නිසා සංඥාවේදිතනිරෝධ ධාතුව අවබෝධ කරගත හැකිය. **එම ධාතු සමාපත්ති ලබන ආකාරය**: 1-5 දක්වාවූ ධාතු සමාපත්ති ලබන්නේ සංඥාසමාපත්ති මගින්ය. නෙවසඤ්ඤානාසඤ්ඤායතන ධාතු සමාපත්ති ලබන්නේ සංස්කාරාවශේෂ සංඥාසමාපත්ති මගින්ය. සංඥාවේදිතනිරෝධ ධාතු සමාපත්ති ලබන්නේ නිරෝධ සංඥාසමාපත්ති මගින්ය. **සටහන්:** * 3-6 අරූප බ්‍රහ්ම ලෝක ** විස්තර පිණිස **බලන්න**: ESN: Notes: 231 - 233, p. 972. **මූලාශ්‍ර:** සංයු.නි: (2): නිදානවග්ග: ධාතුසංයුත්ත: 2.2.1 සත්ත ධාතු සූත්‍රය, පි. 256, ESN: 14: Dhathusamyutta,11.1 seven elements, p. 750.

▼ **ධාතු සතර විස්තරය-** Four elements:ධාතු සතර ලෙසින් පෙන්වා ඇත්තේ සතර මහා භූතයන්ය. **බලන්න**: චතුධාතු.

▼**ධාතු සය විස්තරය-** Six elements: ෂඩ්ධාතු-පඨවි, ආපෝ, තේජෝ, වායෝ, ආකාස ධාතුව හා විඥාන ධාතුව පිලිබඳ බුදුන් වහන්සේ වදාළ ධර්මය- සත්‍යය, කිසිවෙකුට වෙනස් කිරීමට, බැහැර කිරීමට නොහැකි ධර්මතාවයකි. **මූලාශ්‍ර**: අංගු.නි : ( 1): 3 නිපාතය: මහාවග්ග: 3.2.2.1 සූත්‍රය, පි. 348, EAN:3: The Great Chapter, 61.1 Sectarian, p. 104

▼ **කාමධාතුව, ව්‍යාපාද ධාතුව, විහිංසා ධාතුව ප්‍රහාණය**: කාම ධාතුව ප්‍රහීණය පිණිස නෙක්ඛම්ම ධාතුව වැඩිය යුතුය. ව්‍යාපාද ධාතුව ප්‍රහීණය පිණිස අව්‍යාපාද ධාතුව වැඩිය යුතුය. විහිංසා ධාතුව ප්‍රහීණය පිණිස අවිහිංසා ධාතුව වැඩිය යුතුය. **මූලාශ්‍රය:** අංගු.නි: (4) 6 නිපාත: 6.1.5 ධාතු සූත්‍රය, පි.282.

▼ **සියලු ලෝක ධාතු** පිළිබඳව බුදුන් වහන්සේගේ අවබෝධය දසබල නුවණින් එක නුවණකි. **බලන්න**: තථාගතයන්වහන්සේ.

▼ **සියලු ධාතු** (පඨවි, ආපෝ, තේජෝ, වායෝ, ආකාස, විඤ්ඤාණ) අනිත්‍යය ය. එලෙස, දකිනා පුද්ගලයා **'සද්ධානුසාරී'** ය, .ඒබව, විදසුන් නුවණින්, ජානසමාපත්ති ලබා අවබෝධ කරගන්නා පුද්ගලයා **'ධම්මානුසාරී'** ය. ඔවුන් සම්බෝධිය පිහිට කරගෙන ඇත.

**මූලාශ්‍රය:**සංයු.නි: (3): ඛන්ධවග්ග: ඔක්කන්තිසංයුත්තය: චක්ඛුවග්ගය: 4.1.9 ධාතු සූත්‍රය, පි.474.

▲ **ධාතු කුසලතාවය**: පාලි**: ධාතුකුසලො හොති**- skilled in the elements: ධර්මයට අනුව ධාතු කුසලතාවය යනු සියලු ධාතු (බහු ධාතු) පිලිබඳව ඇති යහපත් අවබෝධයවේ. එම කුසලතාවය තිබීම පණ්ඩිතයන් සතු ගුණයක් ය යි බුදුන් වහන්සේ පෙන්වා ඇත. **බලන්න**: බාලයා හා පණ්ඩිතයා.

▼ **18 ක්වූ ධාතු පිලිබඳ කුසලතාවය** (අටළොස් ධාතු- skilled in the 18 elements): 1) ඇසධාතුව-චක්ඛු 2) රූප ධාතුව 3) චක්ඛු විඥාන ධාතුව 4) කණධාතුව- සොත 5) ශබ්දධාතුව 6) සෝත විඥාන ධාතුව 7 ) නාසය ධාතුව- ඝාන 8 ) ගඳ සුවඳ ධාතුව- ගන්ධ 9) ඝාන විඥාන ධාතුව 10) දිව ධාතුව-ජිව්හා 11) රසධාතුව ධාතුව 12) ජිව්හා විඥාන ධාතුව 13) කාය ධාතුව 14 ) කායසප්ර්ෂ ධාතුව-ඵොට්ඨබ්බ ධාතුව 15) කාය විඥාන ධාතුව 16) මනෝ ධාතුව 17) මනසට දැනෙන කරුණු- ධම්ම ධාතුව 18) මනෝ විඥානධාතුව. (the eye element, the form element, the eye consciousness element; the ear element, the sound element, the ear-consciousness element; the nose element, the odor-element, the nose-consciousness element; the tongue element, the flavor element, the tongue- consciousness element; the body element, the tangible element, the body-consciousness element; the mind element, the mind-object element, the mind-consciousness element). **සටහන:** විස්තර පිණිස **බලන්න**: EMN: note: 1017, p. 1161.

▼ **සයධාතු පිලිබඳ කුසල තාවය:** පෘතුවි ධාතුව: පඨවි ධාතුව,ජල- ආපො ධාතුව, ගිනි -තේජෝ, වායු-වායො ධාතුව, ආකාශ ධාතුව, විඥාන ධාතුව. (the earth element, the water element, the fire element, the air element, the space element, and the consciousness element)

▼ **අතිරේක සය ධාතු පිලිබඳ කුසල තාවය:** සුඛ ධාතුව, දුක්ඛ ධාතුව, සෝමනස්ස ධාතුව, දෝමනස්ස ධාතුව, උපේක්ඛා ධාතුව, අවිද්‍යා ධාතුව

(the pleasure element, the pain element, the joy element, the grief element, the equanimity element, and the ignorance element). **සටහන**: විභංගයට අනුව: සුඛ ධාතුව හා දුක්ඛ ධාතුව යනු කායිකවූ සුඛ හා දුක වේදනාය. සෝමනස්ස ධාතුව හා දෝමනස්ස ධාතුව:ප්‍රීතිය හා දොම්නස යනු මානසික හා කායික සුඛ හා දුක වේදනාය. උපේක්ඛා ධාතුව: දුකත් නැත සැපත් නැති මධ්‍යස්ත වේදනාවය. **බලන්න**: EMN: note: 1078, p. 1161.

▼ **අතිරේක සය ධාතු පිලිබඳ කුසල තාවය:** කාම ධාතුව,නෙක්ඛම්ම ධාතුව, ව්‍යාපාද ධාතුව, අව්‍යාපාද ධාතුව, විහිංසා ධාතුව, අවිහිංසා ධාතුව (the sensual desire element, the renunciation element, the ill will element, the non-ill will element, the cruelty element, and the non-cruelty element).**සටහන**: විභංගයට අනුව මේවා සය ආකාර විතක්කයන්ය. **බලන්න**: EMN: note: 1079, p. 1161.

▼ **තුන් ධාතු පිලිබඳ කුසල තාවය**: කාමලෝක ධාතුව, රූපලෝක ධාතුව, අරූපලෝක ධාතුව (the sense-sphere element, the fine material element, and the immaterial element). **සටහන**: අටුවාවට අනුව කාමලෝක ධාතුව යනු පංච උපාදානස්කන්ධයට, කාමලෝකයට බැඳීම- (කාමාවචාර), රූපලෝක ධාතුව යනු, රූපලෝකයට බැඳීම- (රූපාවචාර), අරූපලෝක ධාතුව යනු සිව් උපාදානස්කන්ධය (රූපය හැර) අරූපලෝකයට බැඳීම(අරූපාවචාර) **බලන්න**: EMN: note: 1080, p. 1161.

▼ **ධාතු 2 පිලිබඳ කුසල තාවය:** සංඛත ධාතුව හා අසංඛත ධාතුව (the conditioned element and the unconditioned element). **සටහන**: සංඛත ධාතුව යනු හේතු ප්‍රත්‍ය නිසා ඇතිවූ සියලු දේය, අසංඛත ධාතුව යනු නිවනය. **බලන්න**: EMN: note: 1081, p. 1162. **මූලාශ්‍රය**: ම.නි: ( 3): 3.2.5 බහුධාතුක සූත්‍රය, පි.209, EMN: 115: The Many Kinds of Elements, p. 840.

▲ **ධාතු නානත්වය**- Diversity of Elements: ධාතු නානත්වය ලෙසින් බුදුන් වහන්සේ පෙන්වා වදාළේ: 18 ක්වූ ධාතු පිලිබඳ ඇති විවිධ බව අවබෝධ කරගැනීමය. **සටහන**: ධාතු 18: චක්ඛුධාතුව, රූපධාතුව, චක්ඛුවිඥානධාතුව,සෝතධාතුව,සද්ධධාතුව, සෝත විඥානධාතුව, ඝානධාතුව, ගන්ධධාතුව, ඝානවිඥානධාතුව,ජිව්හාධාතුව, රසධාතුව, ජිව්හා විඥානධාතුව, කායධාතුව, ඵොට්ඨබ්බධාතුව, කායවිඥානධාතුව, මනෝධාතුව, ධම්මධාතුව, මනෝ විඥානධාතුව. **1)** ධාතු වල විවිධබව නිසා ස්පර්ශයේ විවිධත්වයක් ඇතිවේ. මෙහිදී බුදුන් වහන්සේ පෙන්වා දුන්නේ:

**"ධාතුවල විවිධාකාර බව නිසා ස්පර්ශයේ විවිධාකාර බව ඇතිවේ. එහෙත්, ධාතුවල විවිධබව, ස්පර්ශයේ විවිධ බව නිසා ඇතිනොවේ"**. (...it is in dependence on the diversity of elements that there arises the diversity of contacts. The diversity of elements does not arise in dependence on the diversity of contacts). **2)** ස්පර්ශයේ විවිධ බව නිසා, වේදනා වල විවිධබවක් ඇතිවේ, වේදනාවන්හි විවිධබව නිසා ස්පර්ශයේ විවිධබව ඇති නොවේ.

**3)** ධාතුවල විවිධත්වය නිසා සංඥාවේ විවිධ බව ඇතිවේ; සංඥාවේ විවිධ බව නිසා සංකල්පනා (චේතනා) වල විවිධත්වය ඇතිවේ. සංකල්පනා වන්හි විවිධබව නිසා ඡන්දයේ (කැමැත්ත) විවිධබව ඇතිවේ. ඡන්දයේ විවිධබව නිසා ලැදියාව-ඇල්ම (රාගය-passion) විවිධබව ඇතිවේ. ලැදියාවේ විවිධබව නිසා, සොයාගෙනයෑමේ (සෙවීම-quest) විවිධබව ඇතිවේ. සොයාගෙනයෑමේ විවිධබව නිසා ලැබීමේ (ලාභ- gain) විවිධබව ඇතිවේ. **සටහන්: ***ධාතු නානාත්වය පිළිබඳව ආනන්ද තෙරුන්, සෝසිත උපසකහට විස්තරකර ඇත**. බලන්න**: සංයු.නි: (4): සළායතනසංයුත්ත: ගහපතිවග්ග: 1.13.6 සෝසිත සූත්‍රය, පි.260. ** මහාකච්චායන තෙරුන්, හාලිද්දකානි උපාසකහට, ධාතු නානාත්වය පිලිබඳ විස්ත්‍රකිරීම මෙහි දක්වා ඇත: **බලන්න**: සංයු.නි: (4): සළායතනසංයුත්ත: ගහපතිවග්ග: 1.13.7 හාලිද්දකානි සූත්‍රය, පි.262. ** ඉසිදත්ත තෙරුන්, චිත්ත ගහපතිට බුදුන් වහන්සේ වදාළ ධාතු නානාත්වය විස්තර කර ඇත.**බලන්න**: සංයු.නි: (4) සළායතනවග්ග:චිත්තසංයුත්ත: 7.1.2 ඉසිදත්ත සූත්‍රය,

පි.550. **මූලාශ්‍ර:** සංයු.නි : ( 2): ධාතුසංයුත්ත සූත්‍ර 2.1.1. සිට, පි. 244, ESN: 14: Dhathusamyutta, p. 738.

▲ **ධූතාංග පුහුණුව** -Ascetic Practice: ධූතාංග යනු තපස් පුහුණුවය. අල්ප අසාව (fewness of desires), පහසුවෙන් යැපීම (being easy to support) හා ආත්මසංවරය ( self-restraint) ඇතිකරගැනීම පිණිස භික්ෂූන් ධූතාංග පුහුණුවේ යෙදේ. ඔවුන් වනයේ, ගස් මුල, එළිමහනේ, සුසාන භූමියේ ආදී හුදකලා තැන්වල වාසය කරයි. ඔවුන් තුන් සිවුර පමණක් භාවිතා කරයි. ඒවාද රළු සිවුරු -රළු චීවර (ඉවත විසිකළ රෙදි කැලි මුට්ටු කර සකස් කරගත් හෝ පාංශුකූල චීවර) වේ. ඔවුන් වළඳන්නේ පිඬු සිගා ලබාගත් ආහාර -පිණ්ඩපාතය පමණි. නිදන්නේ (නිදන ඉරියව්ව) ඉඳගන්නා ඉරියව්වෙනි. **බලන්න**: EAN: note 77, p. 584. **සටහන**: සිංහල විසුද්ධි මාර්ගය: පරිච්ඡේදය 2 හි මේ පිළිබඳව විස්තරාත්මකව දක්වා ඇත.

▼ **බුදුන් වහන්සේ ධූතාංග පුහුණුව පසසා ඇත.** එම පුහුණුවේ යෙදන, භික්ෂූන්: ආරණ්‍ය පරිහරණය, පංසුකූලික චීවර දැරීම, පිංඩපාතයෙන් පමණක් යැපීම, රුක්මුල්හි විසීම, සොහනෙහි විසීම, එළිමහන් බිමේ විසීම, ඉඳීම ඉරියව්ව පමණක් ඇතිව වාසය කිරීම ආදී ධූතාංග පුහුණුව පිලිබඳ විස්තර මෙහි දක්වා ඇත. එම පුහුණුවේ අරමුණවිය යුත්තේ අල්පබව, සන්තුෂ්ටිය, කෙළෙස් ප්‍රහීණය, හුදකලා විවේකය, සරලජීවිතය ආදී උතුම් ගුණ සහිතව වාසය කරමින්, විමුක්තිය ලබා ගැනීමය. **සටහන්**: * ධූතාංග පුහුණුවේ යෙදී ඇති භික්ෂූන් අතරෙන් අග්‍ර, **මහා කාශ්‍යප** තෙරුන්ය **බලන්න**: අග්‍රතම ශ්‍රාවක භික්ෂූන් ** මහා කාශ්‍යප තෙරුන්, තමන්වහන්සේ ධූතාංග පුහුණුවේ යෙදීමට හේතු ප්‍රයෝජන 2 ක් දැකීමෙන් බව පවසා ඇත: 1 මේ ජීවිතයේ පහසු විහරණය පිණිස 2 මතු ජනතාවට (පශ්චිම ජනතාව) අනුකම්පා පිණිස. මතු ජනතාව, බුදුවරු, බුදුසව්වන් ආරණ්‍යවාසය කිරීම ආදීවූ කරුණු ගැන ප්‍රසාදයට පත්වීම ඔවුන්ගේ හිත සුව පිණිසවේ. **බලන්න**: සංයු.නි: නිදානවග්ග: කස්සප සංයුත්තය. ** ධූතාංග පුහුණුව ලෙසින් එළිමහණෙ වාසය කරන සංඝයා අබ්බහෝකාසික ලෙසින් පෙන්වා ඇත. **බලන්න**: අබ්බහෝකාසික. **මූලාශ්‍ර:** අංගු.නි: (3): 5 නිපාත: අරඤ්ඤ වග්ග සූත්‍ර, පි. 378, EAN:5: IV Forest Dwellers, p. 297.

▼**මහා කාශ්‍යප තෙරුන් ,** බුදුන්වහන්සේට තමන් ධූතාංග පුහුණුවේ යෙදීමට ඇති කැමැත්ත මෙහි දක්වා ඇත. **මූලාශ්‍රය:** සංයු.නි: (2) නිදානවග්ග: කස්සපසංයුත්ත: 4.1.5 ජින්ණසූත්‍රය, පි.330.

▲ **ධොතක තෙර-** Dothaka Thera:**බලන්න:** උපග්‍රන්ථය:1

▲ **ධොතක මානවක**:Dothaka manawaka:**බලන්න:** උපග්‍රන්ථය:3

**ධන**

▲ **ධනංන්ජනි උපාසිකාව-** Dhānañjānī the layfollower: බලන්න: උපග්‍රන්ථය:3

▲**ධනඤ්ජානි බ්‍රාහ්මණී** -Dananjani Brahamini: බලන්න: උපග්‍රන්ථය:3

▲**ධනඤ්ජානි බ්‍රාහ්මණ-** Dananjani Brahamana: **බලන්න**: උපග්‍රන්ථය:3

▲ **ධනය:** පාලි: ධනං **-** Wealth: ධනය ආකාර 2 කි: 1) **භෞතික ධනය- සම්පත්:** කෙනෙක් සතු: අඹුදරුවන්, නෑදෑ හිත මිතුරන්, සේවකපිරිස, ගවසම්පත් ආදිය, වතුපිටි, මිල මුදල්, රන්, රිදී ආදී වස්තූන්ය. මෙලොව සැපවත්ව වාසය කිරීමට ධනය උපකාරිවේ.ධනය යහපත් ලෙසින්ද, අයහපත් ලෙසින්ද රැස්කරගත ගැකිය. ධර්මයට අනුව යහපත් ලෙසින් ධනය රැස්කරගැනීම කුසලයකි. යහපත් ලෙසින් ධනය ලබාගෙන, එය යහපත් අන්දමට පරිහරණය කිරීම (දන්දීම ආදී) මෙලොව හා පරලොව සැප පිණිස පවතින බව බුදුන් වහන්සේ පෙන්වා ඇත. **බලන්න**: දානය. 2) **ආධ්‍යාත්මික ධනය:** සසර දුකින් මිදීම පිණිස මාර්ගය වඩා ගැනීමට උපකරිවන දහම් කරුණු පිළිපැදීම. **බුදුන්වහන්සේ** පෙන්වා ඇත්තේ: **භෞතික ධනය** ගින්නෙන්, ජලයෙන් විනාසවේ, රජවරු හෝ සොරු අත්කරගැනීමෙන් නැතිවේ, අකීකරු දරුවන් නිසා වැනසී යයි. එහෙත් **ආධ්‍යාත්මික ධනය** කෙනෙක් සතුනම් ඒවා පෙරකි පරිදි වෙනත් අයට අත්පත් කරගැනීමට හැකියාවක් නැත. එම ධනය සතු පුද්ගලයා කිසිකලක දිළිඳු නොවේ, ඔහුගේ ජීවිතය හිස්බවට පත්නොවේ. **බලන්න**: ගිහිජීවිතය යහපත්ව ගතකිරීම. **ආධ්‍යාත්මික ධන 7**කි: ශ්‍රද්ධා ධනය, ශිල ධනය, හිරි ධනය, ඔතප්ප ධනය, සුත ධනය, චාග ධනය හා ප්‍රඥා ධනය. **1. ශ්‍රද්ධා ධනය (**wealth of faith) : ආරිය ශ්‍රාවකයා සැදැහැත්ව බුදුන්වහන්සේගේ නවගුණ, බෝධිය ප්‍රසාදයෙන් පිළිගනී. 2. **ශිල ධනය** (wealth of virtuous behavior**):** ආරිය ශ්‍රාවකයා සිල්වත්ය, ඔහු පංචශිලය මනාව රකීයි. 3. **හිරිධනය** (wealth of moral shame): ආරිය ශ්‍රාවකයා පව් කිරීමට ලැජ්ජාවේ: ඔහු කයෙන් වචනයෙන් හා මනසින් දුසිරිත් නොකරයි, ලාමක අකුසල් ක්‍රියා බැහැරකර යහපත් ජීවිතයක් ගත කරයි 4. **ඔත්තප්ප ධනය** (wealth of moral dread): ආරිය ශ්‍රාවකයා පව් කිරීමට බියය. ඔහු කයෙන් වචනයෙන් හා මනසින් දුසිරිත් කිරීමට බියය. ලාමක අකුසල් ක්‍රියා බැහැරකර යහපත් ජීවිතයක් ගත කරයි 5. **සුත ධනය** (wealth of learning): ආරිය ශ්‍රාවකයා බහුශ්‍රැතය: ඔහු ධර්මය මනාව අසයි, හදාරයි, මතකයේ තබාගනී, නිතර සජ්ජායනා කරයි, ධර්ම අර්ථ විමසා බලයි, ප්‍රඥාවෙන් අවබෝධ කර සම්මා දිට්ඨියට පැමිණේ 6. **චාග ධනය** (wealth of generosity): ආරිය ශ්‍රාවකයා දාන ශිලිය, මසුරුකම බැහැර කර සිටි, දාන දීම ඔහුට සතුටකි 7. **ප්‍රඥා ධනය** (wealth of wisdom): ආරිය ශ්‍රාවකයා නුවණැතිය, දුක ඇතිවීම හා නැතිවීම පිලිබඳ උතුම් අවබෝධය ඔහුට ඇත. තමාගේ ප්‍රඥාවෙන් දුක නැති කරගැනීමට ඔහු සමත්ය. **සටහන්: *** යම් කෙනෙකුට මේ ධන 7 ඇත්නම් ඔහු ලෝකයේ "නො දිළිඳු පුද්ගලයාය, ජිවිතය නොහිස් පුද්ගලයය යි මෙහි දක්වා ඇත. ** උග්ග මහාඇමති (කෝසල රජුගේ), බුදුන් වහන්සේ බැහැදැක, රෝහණ සිටුවරයාගේ මුනුපුරු, මිගාර සිටුවරයා මහා ධනසම්පත් (රන් රිදී ආදී) ඇතිබව පවසා ඇත. ඒ අවස්ථාවේදී, බුදුන් වහන්සේ වදාළේ ඒවා පහසුවෙන්ම විනාශවනබවය. එහෙත්, පෙරකී ධන 7 එසේ විනාශයට නොයන බවය. ****විස්තර පිණිස බලන්න**: "**Treasures of the Noble'**: by Soma Thera, Bodhi Leaves: Vol II (B), BPS, 1965. **මූලාශ්‍ර:** අං.ගු.නි: (4 ): 7 නිපාත: 7.1.1.5. හා 7.1.1.6 ධන සූත්‍ර හා 7.1.1.7.උග්ග සූත්‍රය, පි.303, EAN: 7: 5.5 &6.6 Wealth & 7.7. Ugga, p. 370.

▼**ධනය** (භෝග- භෞතිකදේ) ලබාගැනීමට දුර්ලභ කරුණකි. උදාසීනබව (අලසකම- ආලස්‍යය) හා ඒ පිලිබඳ කටයුතු ආරම්භ කිරීමට (මුල් පිරීමට- අනුත්ථානය) ශක්තිය නොමැති බව, ධනය ලබාගැනීමට බාධා කරයි. **බලන්න**: ඉෂ්ඨධම්ම. **මූලාශ්‍රය**: අංගු.නි: (6) 10 නිපාත:10.2.8.3 ඉෂ්ඨධම්ම සූත්‍රය, පි.270,EAN:10: 73.3 Wished for, p.522

▼ **ධනය ආරක්ෂා කිරීම**: ගිහි ජීවිතය යහපත් ලෙසින් පවත්වා ගැනීම පිණිස, තමන් නිවැරදි ලෙසින් ලබාගත් ධන සම්පත් ආදිය 1.**සල්ලාල හැසිරීම** 2. **සුරාවට ගිජුවීම** 3. **සූදුකෙළිම** 4. **පාපමිත්‍රසේවනය** යන උවදුරු 4 කින් ආරක්ෂා කරගතයුතුවේ. **බලන්න**: ගිහිජීවිතය යහපත්ව ගතකිරීම. **මූලාශ්‍ර:** අංගු.නි: (5) අට නිපාත: 8.2.6.4 ව්‍යාගපජ්ජ සූත්‍රය, පි 256,EAN: 8: 54 .4 Dīghajāṇu, p 441.

▼ **ධනය උපයාගැනීම**: ධර්මයෙන් ධනය උපයාගන්නා පුද්ගලයන් දස දෙනෙක් (ධාර්මික පුද්ගලයෝ) ගැන හා අධර්මයෙන් ධනය උපයාගන්නා පුද්ගලයන් දස දෙනෙක් (අධාර්මික පුද්ගලයෝ) ගැන බුදුන් වහන්සේ මේ සූත්‍රයේ විස්තර කර ඇත.**මූලාශ්‍ර**:අංගු.නි: (6): 10 නිපාත: 10.2.5.1. කාමභොගි සූත්‍රය, පි.344, EAN:10: V, 91.1 One who enjoys sensual pleasures, p. 531.

▼ **ශ්‍රේෂ්ඨ ධනය**: ලෝක සත්ත්වයාට ඇති ශ්‍රේෂ්ඨ ධනය ශ්‍රද්ධාව යයි බුදුන් වහන්සේ වදාළහ:

**"සද්ධීධ විත්තං පුරිසස්ස සෙට්ඨං"**

**මූලාශ්‍ර:** අංගු.නි: (1):දේවතාසංයුත්ත:1.8.3 විත්ත සූත්‍රය, පි. 104, ESN:1: Devatasmyutta: 1: 73.3.Treasure, p.155.

▼**ධනය භාවිතා කිරීම**: ධනය භාවිතා කලයුතු ආකාර හා ඉන් ලැබෙන ප්‍රතිලාභ බුදුන් වහන්සේ මෙසේ පෙන්වා ඇත: **1**) තමාත්, තමාගේ පවුලේ අය, සේවකයන් ආදීන් සුවපත්කිරීම පිණිස යෙදවීම, ඒ නිසා ලැබෙන සතුට 2) තමාගේ මිතුරන් සුවපත්කිරීම පිණිස යෙදවීම ඒ නිසා ලැබෙන සතුට 3) සොර සතුරු අපදා ආදියෙන්, තමන් සොයාගත් ධනය නැතිවීයාමට නොදීම පිණිස කටයුතු කිරීමට හැකිවීම 4) ධනය යහපත් ලෙසින් භාවිතා කිරීම නිසා ඔහුට, ඥාතිලාභ, ආගන්තුක ලාභ, මියගිය ඥාතීන්ට පින් ලබාදීමට හැකිවීම, රජුන්ගේ ප්‍රසාදය ලැබීම, දෙවියන්ගේ ආශීර්වාදය ලැබීම ට හැකිවීම 5) මෙලොව හා පරලොව සුවය සැපය ලැබීමට හේතුවන දාන, ධර්මයේ යහපත් ලෙසින් හැසිරෙන උතුමන්ට පුජාකිරීමට හැකිවීම. එලෙස, ධනය පරිහරණය කෙනෙක් ගේ ධනය, ඉහතකී ලෙසින් යහපත් කටයුතු පිණිස යෙදවීමෙන් පසු අවසන්වූවත් ඔහුට තැවීමක් නැත යයි බුදුන් වහන්සේ වදාළහ. එසේම, ඔහුගේ ධනය වැඩිදියුණුවේ නම් තමා යහපත් ලෙසින් ධනය පරිහරණය කළබව සිතා ඔහුට සතුටුවිය හැකිය. එවැනි පුද්ගලයා ආරිය ධර්මයේ පිහිටි කෙනෙකි. ප්‍රඥාවන්තයෝ ඔහු පසසති, සුගතියේ යහපත් විපාක ලබයි. **සටහන:** මේ සූත්‍රය දේශනා කරන ලද්දේ අනාථපිණ්ඩික සිටුවරයාටය. **මූලාශ්‍ර:** අංගු.නි: ( 3): 5 නිපාත: 5.1.5.1 භෝගආදිය සූත්‍රය, පි. 92, EAN: 5: 41.21 Utilization, p. 251.

▲**ධනවත්**-Wealthy: ධනවත්- පෝසත් යනු භව බෝග සම්පත් අධිකව ඇතිබවය. සූත්‍ර දේශනාවලට අනුව අනාථපිණ්ඩික සිටුවරයා, විශකා සිටුදෙවිය ආදී දායකයන්ට මහා ධන සතුව තිබිණි. මෙලොව, යහපත් ලෙසින් දානකටයුතු කරන පුද්ගලයෝ, මිනිස් ලොව යළි උපතක් ලබන්නේ නම් ඔවුන් මහා ධනවතුන් වේ. **බලන්න**: මනි: (3): 3.4.5 චූළකම්ම විභංග සූත්‍රය, පි. 448

▲ **ධ්‍යාන**-Dyana: ධ්‍යාන-ජාන ලෙසින් පෙන්වා ඇත්තේ භාවනා අරමුණක් අනුව සිත සමාධියට පත්කර ගැනීමය. රූප ධ්‍යාන -රූපජාන ලෙසින් පෙන්වා ඇත්තේ සිව් ජානයන්ය. අරූප ධ්‍යාන නම්, අරූප සමාපත්ති - රූපජාන ඉක්මවා ලබන ශාන්ත විහරණයන්ය. **බලන්න**: සිව්ජාන, අරූප සමාපත්ති. ධ්‍යාන විෂය (ජානවිෂය) අචින්ත ධර්මතා 4න් එකකි. **බලන්න**: අචින්ත ධර්මතා. **සටහන්:** * ධ්‍යායි පුද්ගල ලෙසින් පෙන්වා ඇත්තේ ධ්‍යාන ලබාගැනීමේ දක්ෂ පුද්ගලයාය. **බලන්න**: ගොචරකුසලතා.** ධ්‍යානයෙහි ඇලුන- භික්ෂූන් අතරෙන් අග්‍ර කංඛාරේවත තෙරුන්ය, භික්ෂුනියන් අතරෙන් අග්‍ර නන්දා තෙරණිය. **බලන්න**: උපග්‍රන්ථය:1,2. ** සංයු.නි: (3) ඛන්ධවග්ගයේ: ජාන සංයුත්තය, සංයු.නි: (5-2) මහාවග්ගයේ: ජානසංයුත්තය: ධ්‍යාන පිලිබඳ විස්තරාත්මකව දක්වා ඇත. ** ධ්‍යානයෝ ශබ්දකණ්ටකය- ශබ්ද ධ්‍යාන වඩාගැනීමට බාධාවකි. **බලන්න**: කටුව.

▲ **ධ්‍යාන විෂය-** Subject on Jana: මෙය අචින්ත ධර්මයකි. **බලන්න**: අචින්ත ධර්ම

▲ **ධනිය ගොපල්ලා**-Dhaniya cowherd: **බලන්න:**උපග්‍රන්ථය:3

▲ **ධනුශිල්පින්**- Dhanusilpi: ඊතල හැසිරවීමේ දක්ෂ ධනුශිල්පින්-දක්ෂ දුනුවායෝ පිලිබඳ උපමාව ඇසුරු කොට බුදුන් වහන්සේ පෙන්වා ඇත්තේ ආයුසංස්කාර ඉතා වේගයෙන් ක්ෂය වී යාමය. **බලන්න**: ආයුසංස්කාර, උපග්‍රන්ථය:5.

**ධම**

▲**ධම්මික උපාසක-** Dhammika upasaka:**බලන්න:** උපග්‍රන්ථය:3

▲**ධම්මික තෙර**-Dhammika Thera: **බලන්න:**උපග්‍රන්ථය:1

▲**ධම්ම හා අධම්ම -** Dhamma & Non- Dhamma: ධම්ම- ධර්මය යනු බුදුන් වහන්සේ වදාළ ඉගැන්විම්ය. එයට පටහැනි ඉගැන්වීම් අධම්ම- අධර්මය වේ.

"මහණෙනි, අධර්මය හා අනර්ථය (හානිය) දතයුතුය, ධර්මය හා අර්ථය (ඵල-ලාභය) දතයුතුය... ධර්මය යම් පරිදි වේනම්, අර්ථය යම් පරිදිවේනම් ඒ අනුව පිළිපැදිය යුතුය" යයි බුදුන් වහන්සේ වදාළහ. **සටහන්**: * ධර්මය යනු සම්මා දිට්ඨිය පෙරටු කරගෙන සම්මා විමුක්තියෙන් අවසන්වන නිවැරදි මගය, සසර දුක නිවන මගය. අධර්මය නම් අකුසල වැඩිකර, සසර දික් කරන මිථ්‍යා දිට්ඨිය පෙරටු කරගත් වැරදි මගය. ** බුදුන් වහන්සේ වදාළ ධර්මය ඉන්ද්‍රකීලයක් ලෙසින් ස්ථිර ලෙසින් ස්ථාපනය කර ඇත. **බලන්න**: ඉන්ද්‍රකීලය. **මූලාශ්‍ර:** අංගු.නි: (6 ):10 නිපාත 10.3.2.1 හා 10.3.2.2 හා 10.3.2.3 අධම්ම සූත්‍ර, පි. 430 හා

10.3.2.4. අජිත සූත්‍රය, පි. 444 හා 10.3.4.5. ධම්ම සූත්‍රය, පි.470, , EAN:10: 113.1 and 114.2 and 115.3 p. 543, and 116.4 Ajitha, p.545 and Good: p.548.

▲ **ධම්මය හා අර්ථය** - Dhamma & Benifits: ධම්ම-ධර්මය හා අර්ථය ලෙසින් පෙන්වා ඇත්තේ ධර්මානුකූල වීම හා ඉන් සිදුවන යහපතය. ධර්මය නිසා බොහෝ කුසල ඇතිවේ, සසරින් එතර වීමට හැකිවේ. ධර්මය හා අර්ථය යනු සම්මාමග ගැනීම යයි බුදුන් වහන්සේ පෙන්වා ඇත. ධර්ම මාර්ගයේ යනවිට, ධර්මය හා අර්ථය ගැනද, අධර්මය හා අනර්ථය ගැනද අවබෝධය තිබිය යුතුය, එවිට, අධර්මය හැර දමා ධර්මයට පැමිණිය හැකිවේ. **බලන්න**: අධර්මය හා අනර්ථය. **සටහන**: ධර්මය, ධර්මය ලෙසින් ප්‍රකාශ කිරීමේ යහපත් විපාක, **අංගු.නි: 1 නිපාත**, අධම්ම වග්ගයේ විස්තර කර ඇත. **මූලාශ්‍ර:** අංගු.නි: ( 6): 10: නිපාත: 10.3.2.1, 10.3.2.2, 10.3.2.3 අධම්ම සූත්‍ර, පි. 430, EAN:10: 113.1, 114.2 & 115.3 Non-Dhamma suttas, p. 544.

▲ **ධම්ම අනුග්‍රහය-** Support with Dhamma: බුදුන් වහන්සේ පෙන්වා ඇත්තේ ආමිෂ අනුග්‍රහයට (help with material things) වඩා ධම්ම අනුග්‍රහය අග්‍ර බවය. **බලන්න**: අග්‍ර දේ. **මූලාශ්‍ර**:ඛු.නි: ඉතිවුත්තක: 3.5.9 දාන සූත්‍රය, පි. 480, The Itivuttaka: 98 The Gift sutta, p. 83, Translated by Peter Masefield, PTS, 2001.

▲ **ධම්ම අනුසාසනා-** Dhamma anusasana: ධම්ම අනුසාසනා කරන උතුමන්, අන් අයට අමෘතය- නිවන දෙනබව මෙහි පෙන්වා ඇත. **මූලාශ්‍ර**: සංයු.නි: (1) : සගාථවග්ග: දේවතා සංයුත්ත: ආදිත්ත වර්ගය, කිංදද සූත්‍රය , පි. 82, ESN: 1: Devathasamyutta: 42.2 Giving what ? , p. 117.

▲ **ධම්ම අනුශ්‍රවනය-** Dhamma hearsay: ධම්ම අනුශ්‍රවනය කිරීම යනු, වෙනත් අය ධර්මය ගැන කරන කථාවන් ඇසීම, ඒ පිලිබඳ ප්‍රීතියට පත්වීමය. බුදුන් වහන්සේගේ උපාසිකාවක්වූ, කුරරඝර වැසි කාලි උපාසිකාව, ධර්මය අනුශ්‍රවනය මගින් මාර්ග ඵල ලබා ඇත. **බලන්න**: උපග්‍රන්ථය:3

▲ **ධම්ම ආයතනය-** Dhmmayatana: බාහිර ආයතන 6 න් එකක් ලෙස ධම්ම ආයතනය පෙන්වා ඇත. **බලන්න**: ආයතන.

▲ **ධම්ම අසිරිය -** Dhamma is wonderful: තථාගත ධර්මයේ අසිරිමත් බව නිසා තණ්හාවෙන් බැඳුන, මානයෙන් පිම්බුණ, උද්වේගයට යටවූ ලෝකයා දහමට නැඹුරුවන අන්දම මෙහි පෙන්වා ඇත. **බලන්න**: තථාගතයන්වහන්සේ. **මූලාශ්‍ර:** අංගු.නි: (2): 4 නිපාත: 4.3.3.8 දුතිය තථාගත අච්ඡරිය සූත්‍රය, පි. 274 , EAN:4: 128.8 Astounding- 2 , p. 195.

▲ **ධම්ම ඉගෙනීම-** Learning the Dhamma: ධර්මය ඉගෙනගැනීමේදී අනුගමනය කලයුතු ක්‍රමය: 1) ධර්මය: සූත්‍ර, ගෙයිය, ව්‍යාකරණ, ගාථා, උදාන, ඉතිවුත්තක, ජාතක, අද්භූතධම්ම, වේදල්ල (the discourses, mixed prose and verse, expositions, verses, inspired utterances, quotations, birth stories, amazing accounts, and questions-and-

answers) යහපත් ලෙසින් ඉගෙනගැනීම 2) තමන් ඇසූ, ඉගෙනගත් ධර්මය අන්‍යයන්ට උගැන්වීම 3) අන්‍යන් ඉගෙනගත් හා ඇසූ ධර්මය විස්තරවශයෙන් ඔවුන්ගෙන් අසා දැනගැනීම 4) තමන් ඇසූ, ඉගෙනගත් ධර්මය නිතර සජ්ජායනා කිරීම 5) තමන් ඇසූ, ඉගෙනගත් ධර්මය ගැන මනසින් විමසා බැලීම, පරික්ෂාකිරීම 6) වස්සාන සමයේදී, ධර්මය උගත්, ජේෂ්ඨ භික්ෂූන් වාසය කරන ආරාමයක පැමිණි එහි වස්වසා, ධර්මය ගැන නොදත්, නොපැහැදිලි, සැකසහිත කරුණු ආදිය ගැන විමසා, ප්‍රශ්නකර, ඒවා ගැන පැහැදිලි අවබෝධය ඇතිකර ගැනීම. **සටහන:** සැරියුත් තෙරුන් හා ආනන්ද තෙරුන් අතරවූ කතාබහක් නිසා ආනන්ද තෙරුන් මේ දේශනාව වදාළහ. සූත්‍රය අවසානයේදී, සැරියුත් තෙරුන්, ආනන්ද තේරුන් ඉහත ගුණ අංග 6ක් සහිතව වැඩසිටින්නේ යයි, සැරියුත් තෙරින් ප්‍රසංසා වදාළහ. **මූලාශ්‍රය:** අංගු.නි: (4): 6 නිපාත:ධම්මිකවග්ග: 6.1.5.9 ආනන්ද සූත්‍රය, පි.152.

▲ **ධම්ම උගැන්වීම** - Teaching the Dhamma:ධර්මය උගැන්වීමේදී අනුගමනය කලයුතු පිළිවෙල: යම්කෙනෙක්, මෙසේ සිතන්නේ නම්:
“ අන්‍යයෝ මගේ ඉගැන්වීම අසත්වා, එයින් ප්‍රසදයට පත්වෙත්වා, ඒ බව මට ප්‍රකාශ කරත්වා”. එලෙස සිතා කරන ඉගැන්වීම අපිරිසිදුය. කෙනෙක් මෙසේ සිතන්නේනම්: “ බුදුන් වහන්සේ දෙසූ ධර්මය ස්වාක්ඛාතය... (දහම්ගුණ)... මවිසින් උගන්වන දහම, අන්‍යයන්, අසයිනම්, ඒ අනුව පිළිපදින්නේ නම් ඉතා මැනව”. එලෙස සිතා, ධර්මයේ සුධර්මත්වය-පිරිසිදුබව සලකා, දයාව, කරුණාව, අනුකම්පාව ඇතිව කරන ඉගැන්වීම පිරිසිදුය. මෙහිදී බුදුන් වහන්සේ පෙන්වා වදාළේ මහා කාශ්‍යප තෙරුන්ගේගේ දහම් ඉගැන්වීම ඒ ආකාරබවය. **බලන්න**: උපග්‍රන්ථය:1. **මූලාශ්‍ර**: සංයු.නි: (2): නිදානවග්ග: කස්සප සංයුත්ත: 4.1.3 චන්දූපම සූත්‍රය, පි. 324, ESN: Kassapasamyutta: 3 Like the Moon, p. 809.

▼**බුදුන් වහන්සේ ධර්මය උගැන්වීම**: යම් භික්ෂුවක් ගුණ 10කින් සමන්විත නම් ඔහුට ධර්මය උගැන්වීමට, දේශනා කිරීමට තථාගතයන් නැඹුරුවේ, එහෙත්, භික්ෂුවකට එම ගුණ නොමැතිනම් ඔහුට ධර්මය උගැන්වීමට, තථාගතයන් නැඹුරුනොවේ. **මූලාශ්‍ර**: අංගු.නි: (6)10 නිපාත: ථෙර වග්ග: 10.2.4.3. පුන්ණිය සූත්‍රය,පි.302, EAN: 10: The Elders: 83.3. Punniya, p. 526.

▲ **ධම්ම කථික**: පාලි: **ධම්මකථිකො**-A Speaker on the Dhamma: රූප, වේදනා, සංඥා, සංඛාර, විඥාන උපාදාන ස්කන්ධ-පංච උපාදාන ස්කන්ධය, යන ධර්මතා පිලිබඳ කළකිරීම පිණිස, නොඇල්ම පිණිස, නිරෝධය පිණිස ධර්මය දේශනා කරණ භික්ෂුව ‘**ධම්මකථික**’ යයි බුදුන් වහන්සේ වදාළහ. **සටහන**: ධර්ම කථික භික්ෂූන් අතරෙන් අග්‍ර: පුණ්ණ මන්තානිපුත්ත තෙරුන්ය, භික්ෂුණියන් අතරෙන් අග්‍ර ධම්මදින්නා තෙරණියය. **බලන්න**: උපග්‍රන්ථය:1,2. **මූලාශ්‍ර**: සංයු.නි: (3): ඛන්ධසංයුත්ත: 1.3.2.3 හා 1.3.2.4. සූත්‍ර, පි. 312, ESN: 115.3 & 116.4 A speaker on the Dhamma, p. 1101.

▼**ජරා මරණ පිලිබඳ** කළකිරීම පිණිස දහම් දෙසන භික්ෂුව/භික්ෂුණිය ධම්ම කථික යයි මෙහි දක්වා ඇත. එසේම උපත, භවය, උපාදාන, තණ්හාව, වේදනාව, ස්පර්ශය,සළායතන, නාමරූප, විඥානය, සංඛාර,

අවිජ්ජාව ආදීවූ පරිච්චසමුප්පන්න ධර්මතා ගැන කළකිරීම පිළිබඳව දහම් දේශනා කරයිනම්, ඒ මහණ, ධම්ම කථික යයි කීමට සුදුසුය. **මූලාශ්‍රය:** සංයු.නි: (2): නිදානවග්ග:අභිසමයසංයුත්ත:1.2.6 ධම්මකථික සූත්‍රය, පි.50.

▼**ඇස, කණ ආදී 6** ඉන්ද්‍රියන්හි නිර්වේදය ... විරාගය පිණිස දහම් දෙසන භික්ෂුව/භික්ෂුණිය ධම්ම කථික යයි කීමට සුදුසුය. **මූලාශ්‍රය**: සංයු.නි: (4 ):සළායතනවග්ග: වේදනාසංයුත්ත:නවපුරාණවග්ග: 1.15.10 ධම්ම කථික සූත්‍රය, පි. 306.

▼ **මෙහිදී ධම්ම කථිකයන්** වර්ග 4ක් පෙන්වා ඇත.: 1) අදක්‍ෂ පිරිසට, කෙනෙක් අදක්ෂ වශයෙන්, අල්පලෙසින් ධර්මය දේශනා කරණවිට, ඒ පිරිස ඔහු ධම්ම කථිකයෙක් යයි සිතති 2) දක්‍ෂ පිරිසට, කෙනෙක් අල්ප ලෙසින්, අර්ථය පෙන්වමින් ධර්මය දේශනා කරණවිට, ඔහු දක්ෂ පිරිසෙහි ධම්ම කථිකයෙක් ගණයට වැටේ 2 අදක්‍ෂ පිරිසට, කෙනෙක් අදක්ෂ වශයෙන් බොහෝකොට ධර්මය දේශනා කරණවිට, ඒ පිරිස ඔහු ධම්ම කථිකයෙක් යයි සිතති, 4) දක්‍ෂ පිරිසට, කෙනෙක් බොහෝ ලෙසින් ලෙසින්, අර්ථය පෙන්වමින් ධර්මය දේශනා කරණවිට, ඔහු දක්ෂ පිරිසෙහි ධම්ම කථිකයෙක් ගණයට වැටේ. **මූලාශ්‍රය**: අංගු.නි: (2) 4 නිපාත: 4.3.4.9 ධම්ම කථික සූත්‍රය, පි.288.

▲**ධම්ම කාමය:** පාලි: **ධම්මකාමො-** Dhamma kamaya: ධම්ම කාමය ලෙසින් පෙන්වා ඇත්තේ, ධම්මවිනය පිලිබඳව කෙනෙක් තුල ඇති අධික කැමැත්ත- රුචියය. **ධම්ම කාමය** තිබීම ආධ්‍යාත්මික වර්ධනයට ආරක්ෂාවක් යයි බුදුන් වහන්සේ පෙන්වා ඇත:

**"...භික්ඛු ධම්මකාමො හොති පියසමුදාහාරො අභිධම්මෙ අභිවිනයෙ උළාර පාමොජ්ජො"**. භික්ෂුවහට, ධර්මය පිලිබඳ කැමැත්ත ඇත, ධර්මවිනය පිලිබඳ නිශ්චිතවූ ප්‍රිය බව ඇත, ප්‍රමෝදබව ඇත (a bhikkhu loves the Dhamma and is pleasing in his assertions, filled with a lofty joy pertaining to the Dhamma and discipline). මේ ගුණය නාථකරණ ධර්මයකි .**බලන්න:** නාථකරණ ධර්ම. **මූලාශ්‍ර**:අංගු.නි: (6 ): 10-නිපාත: 2 නාථ වග්ග, 10.1.2.7 ප්‍රථම නාථකරණ සූත්‍රය, EAN:10: II Protector: 17.7 Protector I, p.497.

▲**ධම්මය ක්‍රමානුකූලව පුහුණුවීම**- Gradual Dhamma training : ධම්ම පුහුණුවේ අවසාන ඉලක්කය සසර දුකින් මිදීමය- විමුත්තිය-නිවන සාක්ෂාත් කරගැනීමය, සත්‍ය අවබෝධ කරගැනීමය. ඒ සඳහා ක්‍රමානුකූලව, දහම පුහුණු කරගැනීම අවශ්‍යයයි බුදුන් වහන්සේසංඝයාට අනුසාසනා වදාළහ. **බලන්න**: අසේඛ.

▼**ක්‍රමානුකූලව පුහුණුවීම ලබාගන්නා ආකාරය**: අවසාන අවබෝධය (**අඤ්ඤා** - final knowledge) මුදුන්පත් කර ගැනීම, එක්වරම සිදුවන දෙයක් නොවේ, ඒ සඳහා භික්ෂුව ධර්ම මාර්ගය, ක්‍රමානුකූල ශික්ෂාව (සේඛ ලෙසින්) ඇතිකරගතයුතුය, ක්‍රමානුකූලව පුහුණුවේ යෙදිය යුතුය (ක්‍රියාමාර්ගය), ක්‍රමානුකූලව පටිපදාවේ ප්‍රගතිය (දියුණුව) ඇතිකර ගතයුතුය:

**“ නාහං භික්ඛවෙ ආදීකෙනෙව අඤ්ඤාරාධනං වදාමි. අපි ච භික්ඛවෙ අනුපුබ්බසික්ඛා, අනුපුබ්බකිරියා, අනුපුබ්බපටිපාදා අඤ්ඤාරාධනා හොති”**. ( Bhikkhus, I do not say that final knowledge is achieved all at once. On the contrary, final knowledge is achieved by gradual training, by gradual practice, by gradual progress). **ක්‍රමානුකූල ධම්ම පුහුණුව,** ප්‍රතිපදාව හා ප්‍රගතිය ඇති කරගන්නා ක්‍රමය:

**“කතඤ්ච භික්ඛවෙ අනුපුබ්බසික්ඛා, අනුපුබ්බකිරියා, අනුපුබ්බපටිපාදා අඤ්ඤාරාධනා හොති? ඉධ භික්ඛවෙ සද්ධාජාතො උපසඞ්කමති, උපසඞ්කමන්තො පයිරුපාසති, පයිරුපාසන්තො සොතං ඔදහති, ඔහිතසොතො ධම්මං සුණාති, සුත්වා ධම්මං ධාරෙති, ධතානං ධම්මනං අත්ථං උපපරික්ඛති, අත්ථං උපපරික්ඛතො ධම්මා නිජ්ඣානං ඛමන්ති, ධම්මානිජ්ඣානක්ඛන්තියා සති ඡන්දො ජායති, ඡන්දජාතො උස්සහති, උස්සහිත්වා තුලෙති, තුලයිත්වා පදහති, පහිතත්තො සමානො කායෙන චෙව පරමං සච්චං සච්ඡිකරොති; පඤ්ඤාය ච නං පටිවිජ්ඣ පස්සති”**. කවර ආකාරයකින්, (අරහත්වය පිණිස) ක්‍රමානුකූල පුහුණුව, ප්‍රතිපදාව, ප්‍රගතිය ඇතිවේද? “කිසියම් කෙනෙක් (ගුරුවරයා පිලිබඳ) **ශ්‍රද්ධාව** ඇතිවීමෙන් ඔහු කරා එළඹේ, එසේ ගුරුවරයා හමුවී ඔහුට ගරුබුහුමන් කරයි, **සේවනය** කරයි (සමීපයේ හිඳියි). එසේ සිටිනවිට **ධර්මය ඇසේ**, එසේ ඇසෙන ධර්මයට **කන් යොමු කරයි.** ඇසූ ධර්මය ඔහු **මතකතබා ගනී** (සිහියේ තැන්පත් කර ගනී- දරා ගනී). සිහියේ තබාගත් ධර්මයේ **අර්ථ නුවණින් මෙනෙහි කරයි**. එසේ අරුත් විමසන ඔහුට **ධර්මයේ අර්ථ** වැටහේ. ධර්මයේ අර්ථ පිළිගන්නා ඔහු තුල ධර්මය ගැන **කැමැත්තක් (**කුසල ඡන්දයක්) ඇතිවේ. කුසල ඡන්දය ඇතිවූ විට ඔහු (දහම් මගේ ගමන් කිරීමට) **වෙර ඇතිකරගනී** (උත්සාහවන්ත වේ). එසේ වෙරදරන ඔහු **ධර්මය තුලනය කර බලයි** (තිරණප්‍රඥාවෙන් අනිච්ච, දුක්ඛ හා අනාත්ම ධර්මතා ගැන). එසේ ධර්මය තුලනය කරනවිට ඔහුතුල **වීරිය** (ප්‍රධන්වීරිය) ඇතිවේ. එබඳු වීරිය ඇති ඔහු (නිවනට මෙහයවූ සිත් ඇතිව) කයෙන් පරම සත්‍ය ප්‍රත්‍යක්ෂ කරගනි (**සමාධිය**). එම සත්‍යය, **ප්‍රඥාවෙන්** (තියුණු නුවණින් බලමින්) ඔහු දැක ගනී”.

**සටහන්:** * අටුවාවට අනුව: With the mental body he realises Nibbāna, the ultimate truth, and he penetrates it with the wisdom pertaining to the supra-mundane path. බලන්න: EMN: note: 708, p. 1129 ** සමාධිසමාපත්ති ලැබීමෙන් නිවන් මග ඔහු දකියි, ප්‍රඥාවෙන් නිවන සාක්ෂාත් කර ගත් බව අවබෝධ කරගනී.මූලාශ්‍ර: ම.නි: ( 2 ): 2.2.10 කීටාගිරි සූත්‍රය, පි. 252, EMN: 70: Kīṭāgiri Sutta, p. 536.

▼**ක්‍රමානුකූල පුහුණුවේ යෙදෙන ආකාරය: ම.නි. කීටාගිරි සූත්‍රයේදී හා චඞ්කී සූත්‍රයේදී** බුදුන්වහන්සේ අරහත්වය ලබාගැනීම- සත්‍යඅවබෝධය පිණිස කටයුතු කලයුතු ආකාරය පෙන්වා ඇත. “අනුපූර්වශික්ෂාවෙන්, අනුපූර්වක්‍රියාවෙන්, අනුපූර්වප්‍රතිපදාවෙන් කටයුතු කර අරහත්බව ලබයි”

**“කතඤ්ච භික්ඛවෙ අනුපුබ්බසික්ඛා අනුපුබ්බකිරියා අනුපුබ්බපටිපාදා අඤ්ඤාරාධනා හොති: ඉධ භික්ඛවෙ සද්ධාජාතො උපසඞ්කමති, උපසඞ්කන්තො පයිරුපාසති, පයිරුපාසන්තො සොතං**

**ඔදහති, ඔහිතසොතො ධම්මං සුණාති, සුත්වා ධම්මං ධාරෙති, ධතානං ධම්මානං අත්ථං උපපරික්ඛති, අත්ථං උපපරික්ඛතො ධම්මා නිජ්ඣානං ඛමන්ති, ධම්මනිජ්ඣානක්ඛන්තියා සති ඡන්දො ජායති, ඡන්දජාතො උස්සහති, උස්සහිත්වා තුලෙති, තුලයිත්වා පදහති, පහිතත්තො සමානො කායෙන චෙව පරමං සච්චං, සච්ඡිකරොති, පඤ්ඤාය ච නං පටිවිජ්ඣ පස්සති". 1) ශ්‍රද්ධාව** ඇතිකරගැනීම (faith): සුදුසු ගුරුවරයකු සොයාගතයුතුය. කරුණු 3 ක් පිළිබඳව දිගු කලක් ඔහුව පරික්ෂා කළයුතුය: ඔහු කායිකව හා වාචිකව, ලෝභ, දෝස හා මෝහ යන අකුසල් කරන්නේද? නැද්ද? එසේ පරික්ෂාකරන විට එම අකුසල ඔහු තුල නොමැතිබව, ඔහු ධර්මය යහපත් ලෙසින් පිළිපදින බව, උගන්වන බව අවබෝධවේ. එම අවබෝධය නිසා ශ්‍රද්ධාව පිහිටයි. (he places faith in the teacher) **2) බැහැදැකීම:** ශ්‍රද්ධාව නිසා නිතර ගුරුවරයා හමුවට යයි (filled with faith he visits the teacher) 3) **සේවනය හා ගරුකිරීම**: නිතර ගුරුවරයා බැහැදැකීම නිසා ඔහු සේවනය කරයි, ඔහුට ගරුකරයි (he visits and pays respect to the teacher) 4 **) කන්දීම**: ගුරුවරයාට ගරුකරන නිසා ඔහු පවසන දේ අසයි having paid respect to the teacher he gives ear) **5) දහම ඇසීම:** ගුරුවරයාට කන්දීම නිසා ධර්මය ඇසේ (when he gives ear to the teacher, he hears the Dhamma-teaching) **6) මතකයේ තබාගැනීම:** ඇසූ ධර්මය සිහියේ දරාගැනීම (having heard the Dhamma, he memorises it)**7) අරුත් පිරික්සීම-** විභාගකිරීම: සිහියේ රඳවා ගත් ධර්ම කරුණුවල අර්ථය පරික්ෂාකිරීම (he examines the meaning of the teachings he has memorised) 8) **පිළිගැනීම**: අර්ථ විමසනවිට ධර්මය වැටහී ධර්මය පිළිගනි (when he examines their meaning, he gains a reflective acceptance of those teachings) **9) කැමැත්ත-ඡන්දය**:ධර්මය වැටහුනවිට එහි යෙදීමට විශාල කැමැත්තක්, උනන්දුවක් ඇතිවේ (when he has gained a reflective acceptance of those teachings, zeal springs up) **10) උත්සාහය-** වැයම්කිරීම : ධර්මයේ යෙදීමට සිත කැමතිවීම නිසා වැයම්කරයි (when zeal has sprung up, he applies his will) **11) විමර්ශනය-**තුලනය කිරීම-විභාගකිරීම: උත්සාහ කරනවිට ධර්මය විමර්ශනය කරයි. ( having applied his will, he scrutinizes) .

**සටහන**: අටුවාවට අනුව මෙහි ධර්ම විමර්ශනය ලෙසින් දක්වන්නේ අනිච්ච, දුක්ඛ, අනාත්ම ආදී ත්‍රි ලක්ෂණ විමසා බැලීමය: **බලන්න**: EMN: note 889, p. 1146. **12) ප්‍රධාන වීරිය**: තුලනය කර විරිය වඩයි-සම්මා ප්‍රධාන විරිය-ප්‍රධන් විරිය (having scrutinised, he strives). **සටහන:** බලන්න: EMN: note 890, p. 1146: Although applying the will (*ussahati*) appears similar to striving (*padahati*), the former may be understood as the exertion undertaken prior to insight contemplation, the latter as the exertion that brings insight up to the level of the supra-mundane path. **13) සත්‍ය දැකීම:** නිවනට මෙහෙයවූ සිත්ඇතිව- දැඩි විරිය කරමින් නාම කයෙන් නිවන-සත්‍ය දකියි, ප්‍රඥාවෙන් කෙළෙස් විනිවිද දැක නිවන දකී (resolutely striving, he realises with the body the supreme truth and sees it by penetrating it with wisdom) . **සටහන්: *** අටුවාවට අනුව: "He realises Nibbāna with the mental body (of the path of stream-entry), and

having penetrated the defilements, he sees Nibbāna with wisdom, making it clear and evident" බලන්න: EMN: note 891, p. 1146, ** **නාම කයෙන් නිවන-සත්‍ය දකියි**: **මූලාශ්‍ර**: ම.නි: (2): 2.2.10 කීටාගිරි සූත්‍රය, පි. 252 හා 2.5.5. චඞ්කී සූත්‍රය, පි. 672, EMN: 70: Kīṭāgiri Sutta, p. 536, 95-Cankī Sutta, p. 704.

▼**ම.නි: කන්දරක සූත්‍රයට අනුව: ධර්මය ඇසීම:** නිසා ශ්‍රද්ධාව ඇතිකරගැනීම **පබ්බජ්ජාව ලබාගැනීම**: ගිහිගෙය හැරදැමීම **ශීලසම්පන්නවීම**: තුන්දොරින් සිදුකරන සියලු අකුසල පහකරගැනීම **සිව්පසය පිළිබඳ සන්තුෂ්ටිය**: ලැබෙන දෙයින් සැහැයිමට පත්වීම **ඉන්ද්‍රිය සංවරය**: සය ඉඳුරන් මගින් අකුසල ඇතිනොවීමට පරික්ෂාකාරීවීම **සම්පජානකාරීවීම:** කයේ හැසිරීම සිහිනුවණින් පවත්වාගැනීම **විවේකසම්පන්නවීම:** කාය හා චිත්ත විවේකය ලබාදෙන හුදකලාවාසයට ප්‍රියවීම **සමාධිය ලැබීම**: පංචනිවරණ පහකර සිත එකඟකර ගැනීම **සිව්ජාන සමාපත්ති ලැබීම**: සමාධිමත් සිත දියුණුකරගැනීම **ත්‍රිවිධ ඥාන ලබාගැනීම**: සිත සහමුලින්ම එකඟව පිරිසිදුව ස්ථාවර බවට පත්වූ විට පෙරවිසූ කඳ පිළිවෙත, චුතප්පත්ති ඥානය හා ආසවක්ඛ ඥානය ලබාගැනීම (recollection of past lives, divine eye: knowledge of the passing away and reappearance of beings, knowledge of the destruction of the taints). **ආසවක්ඛය ඥාණය මගින් චතුසත්‍ය අවබෝධවේ:** එමගින් කාමයට, භවයට ඇති බැඳීම පහවේ, අවිද්‍යාව නැතිවේ. සිත විමුක්තියට පත්වූ බව අවබෝධවේ. අරහත්වයට පත්වේ. **මූලාශ්‍ර**: ම.නි: (2 ): 2.1.1 කන්දරක සූත්‍රය, පි. 18, EMN:51 Kandaraka Sutta, p. 425

▼**ක්‍රමානුකූල පුහුණුවට උපකාරීවන සාධක:**: ක්‍රමානුකූල පුහුණුව සම්පූර්ණ කර සත්‍ය ලබාගැනීමට උපකාරීවන කරුණු බුදුන් වහන්සේ මෙසේ පෙන්වා වදාළහ: පළමුව **ප්‍රධාන විරිය** කලයුතුය, වීරිය නිසා මාර්ගය සම්පූර්න කරගැනීමට හැකිවේ; විරිය ඇතිකරගැනීමට **තුලනය**- ධර්ම විමංසනය කලයුතුය, එවිට ධර්මය දැකීම නිසා ප්‍රධාන විරිය ඇතිකරගනී. විමංසනය ඇතිකරගැනීමට උපකාරිවන්නේ සිතේ ඇතිවන **උත්සහායය**. උත්සහාය කරනවිට ධර්මය විමසා බැලීමට සිත පෙළඹේ. උත්සහායට උපකාරිවන්නේ **ඡන්දයය**. ධර්මයට ඇති කැමැත්ත නිසා උත්සාහකරයි. ඡන්දය ඇතිකරගැනීමට උදව්වෙන්නේ ධර්මය **පිළිගැනීමය**. පිළිගැනීම නිසා ධර්මය කෙරෙහි ඡන්දයක් ඇතිවේ. ධර්මය පිළිගැනීමට උපකාරිවන්නේ **අරුත් විමසා බැලීමය**. ධර්මයේ අර්ථ අවබෝධවීම නිසා පිළිගැනීම වේ. අරුත් විමසා බැලීමට සහායවන්නේ ධර්මයේ **සිහියේ දරාගැනිමය**. මතකතබාගැනීම නිසා දහම් අරුත් විමසීමට කැමත්තක් ඇතිවේ. ධර්මය සිහියේ දරා ගැනීමට උපකාරිවන්නේ **ධර්ම ශ්‍රවණයය**. ධර්මය අසා පැහදි දහම් කරුණු සිතේ දරා ගනී. ධර්ම ශ්‍රවණය කිරීමට උපකාරිවන්නේ **කන්යෝමුකිරීමය.** ගුරුවරයා පවසන කරුණු ගැන ඇහුම්කන්දීම නිසා දහම ඇසේ. දහම ඇසීමට කන් යොමුකිරීමට උපකාරීවන්නේ ගුරුවරයා කෙරෙහි ඇති **ගෞරවයය**. ගරුකිරීම නිසා, ගුරුවරයා කියන දේ ඇසීමට සිත පෙළඹේ. ගෞරවය ඇතිවන්නේ නිතර **නිතර හමුවීමට යන නිසාය**. නිතර සේවනය කරනවිට ගුරුවරයා පිලිබඳ ගරුත්වය ඇතිවේ. ගුරුවරයා නිතර සේවනය කිරීමට සිත දෙන්නේ ඔහු කෙරෙහි **ශ්‍රද්ධාව** - විස්වාශය ඇතිවීමය.

බුදුන්වහන්සේ පෙන්වා ඇත්තේ ධර්මය අවබෝධය පිණිස ශ්‍රද්ධාව මූලික පදනමබවය. **මූලාශ්‍ර**: ම.නි: (2):2.5.5. **චඞ්කී සූත්‍රය**, පි. 661, EMN:95- Cankī Sutta, p. 704.

▲ **ධම්මානුකූලවාසය-** Living in accordance with the Dhamma ධම්මානුකූල වාසය-ජීවිතය ලෙසින් මෙහිදී පෙන්වා ඇත්තේ කායික, වාචික හා මානසික- (තුන් දොරින්) කුසල ක්‍රියාවන්හි  හැසිරීමය (දසකුසලයේ හැසිරීම). එසේ ධර්මයට අනුව යහපත්ලෙසින් හැසිරෙන පුද්ගලයාට මේ ජීවිතයේදීම නිවන සාක්ෂාත් කරගැනීමට හැකියාව ඇත.**බලන්න**: දස කුසල. **සටහන**: ධර්මයට අනුව වාසය කිරීම පිණිස ධම්මානුකූල මගවඩාගත යුතුවේ. **බලන්න**:අංගු.නි: (1): 3 නිපාත: 3.1.2.6.සූත්‍රය, පි. 252, ආධ්‍යාත්මික මග. **මූලාශ්‍ර**: ම.නි: (1) 1.5.1 සාලෙය්‍යක සූත්‍රය, පි.682, EMN:41: Sāleyyaka Sutta-The Brahmins of Sālā, p.358

▲ **ධම්ම ගුණ-**Qualities of Dhamma: ත්‍රිවිධරත්න අතුරින්, දෙවැනි රත්නය වන්නේ ධර්ම රත්නයය. පළමු රත්නය **බුද්ධරත්නය** වේ, තෙවැන්න **සංඝරත්නයය**. ධම්ම ගුණ යනු බුදුන් වහන්සේ වදාළ සත්‍ය-ධර්මයේ ඇති උතුම් ලක්ෂණයන්ය.

▼**වෙනත් මූලාශ්‍ර: 1. "An Introduction to the Teaching of the Buddha Gotama"** by Subhadra Bhikshu: BPS: Wheel: 152 -154, 2008 (On line edition) (ධර්මය හඳුන්වාදීම, මූලික ධර්ම කරුණු විස්තර කර ඇත)

▼ **ධම්මයේ මූලික ගුණ 6 කි:**: 1) **සවාක්ඛාතෝ** (svākkhāto ) : ධර්මය, බුදුන් වහන්සේ මනාව දේශනා කරඇති හෙයින්, මුල මැද අග යන තුන් තැනේදීම යහපත්වන බැවින් ස්වාක්ඛාතවේ. **සටහන**: ආධ්‍යාත්මික මගේ මුල මැද හා අග යන සෑම තැන්හිම, මාර්ගඵල සාක්ෂාත් කරගැනීමට ධර්මය පදනම්වේ. මුල ලෙසින් ශිලයද, මැද ලෙසින් භාවනාවද, අග ලෙසින් ප්‍රඥාවද දක්වා තිබේ. 2) **සන්දිට්ඨිකො** (sandiṭṭhiko)*:* ධර්මයට අනුව පිළිපදින පුද්ගලයාටම වර්තමාන ජීවිතයේදීම ආධ්‍යාත්මික මග ප්‍රත්‍යක්ෂ කර ගැනීමට උපකාරීවන ගුණ ධර්මයේ ඇතිබව, සංන්දිට්ඨික ගුණයය. තමා විසින්ම දැකිය යුතුය තමන්ම, තම අභ්‍යන්තරහි  පවතින කෙලෙස්, ආරියමග වර්ධනය නිසා ප්‍රහීණවූ බව අවබෝධ කර ගැනීම/ දැක ගැනීම සංදිට්ඨිකය. 3) **අකාලිකො** (timeless, directly visible, immediately effective): ධර්මය එක් කලයකයට සීමිත නොවේ, ධර්ම ගුණ සෑම කාලයන්ටම ගලපා ගත හැකිය, ඕනෑම කාලයකදී යහපත ගෙනදේ, එමනිසා ධර්මය අකාලිකය. නුවනැත්තාට ධර්ම ගුණ අප්‍රමාදව-කල්නොයවා දිස්වේ, එමනිසා අකාලිකය. ධර්ම මාර්ගයේ ගමන් කරනවිට තමන් විසින් කරන ලෞකික කුසල් කල්නොයවා විපාක දෙනබව තමන් විසින්ම දකින්නේය, කල් නොයවා විපාක දෙන, වහා විපාක දෙන ස්වභාවය පෙන්නුම් කරයි. ධර්මයේ ඇති ලෝකෝත්තර බව (supra-mundane state) නිසා, මාර්ගයේ ගමන් කරන පුද්ගලයාට, කල් නොයාවම තම උත්සාහයේ ප්‍රතිඵල දැක ගත හැකිවේ.**බලන්න**: අකාලික. 4) **එහිපස්සිකො** (inviting one to come and see): ධර්මය ඇවිත් බලන්න යයි කීමට සුදුසුය, ඕනෑම කෙනකුට ධර්මයට පැමිණිය හැකිය, ප්‍රශ්නකල හැකිය, එය සත්‍ය යය. 5) **ඕපනයිකො** (applicable): වෙනත්

දේට වඩා ධර්මය පළමුකොටම සිතෙහි දැරීමට සුදුසු බව ඔපනයික ගුණයෙන් පෙන්වාදේ. ධර්මය භාවිතා කර තමාගේ සිතෙහි උපදවා ගැනීමටද, අරමුණු කිරීමට ද සුදුසුය. එසේ යෙදියහැකි ගුණය ඔපනයික ගුණයවේ. ධර්මයේ සිත පිහිටුවා ගත්විට, ධර්මය විසින්ධර්මයේ ගමන්කරන්නා ධර්මය තුලට කැඳවාගෙනයන ගුණය ඔපනයිකය. 6) **පච්චත්තං වේදිතබ්බො විඤ්ඤූහීති** (to be personally experienced by the wise)**:** නුවණැත්තන් විසින් තමා විසින්ම ධර්මය වඩන ලද බව ද, ඵල ලබා ගත් බවද අවබෝධ කරගන්නා බව මේ ගුණයෙන් පෙන්වාදෙයි. ධර්මය අනුව පිළිපදින පුද්ගලයාට, තම සිත් තුලින්ම ධර්මයේ යහපත්බව වැටහේ. තම තමන්ගේ ප්‍රඥාවේ මට්ටම අනුව, කර්ම ශක්තිය අනුව ධර්ම අවබෝධය සිදුවේ. **සටහන: දහම් ගුණ :** විස්තර පිණිස **බලන්න: සුවිසි මහ ගුණය**, සම්පාදක: රේරුකානේ චන්දවිමල මහනාහිමි, 2005. **මූලාශ්‍ර:** සංයු.නි: (4 ): සලායතවග්ග: 1.7.8. උපවාණ සූත්‍රය, පි. 118, ESN: Saḷāyatana saṃyutta:70.8.Upavāṇa sutta, p.1240, අංගු.නි: (6):11-නිපාත: 11.2.1. හා 11.2.2.මහානාම සූත්‍ර,පි.645, EAN:11- II Recollection, 11.1 & 12.1 Mahanama, p.570.

▼**ධම්මගුණ-සළායතන තුලින් අවබෝධකිරීම**: බුදුන් වහන්සේ මෙසේ වදාළහ: " යම්කිසි භික්ෂුවක් ඇසින් රූප දැක ඒවාට ඇලුන බව දන්නවා, ඒ නිසා සිත තුල රූප කෙරෙහි රාගයක් ඇතිවූ බව දන්නවා... 'රූපය දැකීම නිසා මා තුල රාගයක් හටගත්තා' කියා ඔහු අවබෝධ කරගනි. 'රූපය දැකීම නිසා මා තුල රාගයක් හටගත්තේ නැහැ' කියා ඔහු අවබෝධ කරගනි . එලෙසින් සිතේ රාගය ඇතිවූ බව දැනගැනීම ... හෝ රාගයක් ඇතිනොවූ බව දැනගැනීම නිසා ධර්මය සන්දිට්ඨික, අකාලික, එහිපස්සිකය, ඔපනයික හා නුවණැත්තන් තමන් විසින්ම අවබෝධකර ගැනීම ආදීවූ ගුණයන්ගෙන් යුක්තය...". **සටහන්**: * සෙසු සලායතන නිසා :කණ නිසා ඇසෙන ශබ්ද... ආදීයෙන් ඇතිවෙන හෝ ඇතිනොවන රාගය, ඇල්ම ගැන ඉහත පරිදි අවබෝධ කරගතයුතුවේ.** මේ සූත්‍රය දේශනා කළේ උපවාන තෙරුන්ටය. **මූලාශ්‍ර**:සංයු.නි: (4 ): සලායතන සංයුත්ත: 1.7.8**.** උපවාන සූත්‍රය, පි. 118, ESN: Salayatnasamyutta, 70.8 Upavāṇa sutta, p. 1240.

▼ **ධම්මය අකාලිකබව**: ලොවුතුරු දහම ආකාලිකය, කම්සැප කාලික බව මේ සූත්‍රයේ පෙන්වා ඇත. එක්සමයක මාරයා, බමුණු වෙසක් ගෙන, භාවනාවෙහි යෙදුන භික්ෂු සමූහයක් වෙත පැමිණ මෙසේ පැවසුහ:

"...භවත්වූ මිනිස් කම්සුව විඳිත්වා. මේ අත්බවේ වින්ද යුතු සුව හැර කල් ගෙවා වින්ද යුතුවූ සුව කරා නොදුවත් වා" එවිට භික්ෂූන් මෙසේ පිළිතුරු දුන්හ: "...අපි මේ අත්බවේදීම විඳින්නට ඇති සුව හැර, කල්ගෙවා විඳින්නට ඇති සුව කරා නොදුවමු... අපි කල්ගෙවා විඳින්නට ඇති සුව හැර මේ අත්බවේම විඳින්නට ඇති සුව විඳින්නෙමු ...කාමයෝ කාලිකය... බොහෝ දුක් ඇත, මේ ලොවුතුරු දහම (අකාලිකය) කල් නොයවා විපාක දෙන සුළුය...". **මූලාශ්‍ර**: සංයු.නි: (1): සගාථවග්ග: මාරසංයුත්ත: 4.3.**1 සම්බහුල සූත්‍රය**, පි. 240, ESN: Mārasamyutta: 21.1.A Number, p. 290.

▼ **ධම්මගුණ බල සම්පන්නය**: ධම්මගුණ සිහිපත් කරනවිට, කෙනෙක්තුල ඇතිවන බිය, තැතිගැනීම ආදී අප්‍රසන්න තත්වයන් මග හරවා ගත හැකිබව බුදුන් වහන්සේ වදාළහ. **මූලාශ්‍ර**: සංයු.නි: (1): සක්බ

සංයුත්ත: 11.1.3. ධජග්ග සූත්‍රය, පි. 414, ESN: 11: Sakkasamyutta: 3.3. The Crest of the Standard-dhajagga, p. 461.

▼ **ධර්මයේ සත්‍යගුණ** සිහිකිරීමෙන් ලෝක සත්ත්වයාට සෙතක්, ශාන්තියක් ලැබෙනබව රතන සූත්‍රයේ පෙන්වා ඇත. **මූලාශ්‍ර**:බු.නි: බුද්දකපාඨ: 6- රතන සූත්‍රය, පි. 35, බු.නි: සුත්තනිපාත: චූල වග්ග, රතන සූත්‍රය, පි. 87, Sutta Nipatha, The Minor Chapter: The Threefold Gem, p. 76, Translated by L Khantipalo Mills, Published by SuttaCentral, 2015.

▼ **ධම්මගුණ ආවර්ජනය සමාධිය පිණිසය**: ධර්මගුණ ආවර්ජනය කිරීම-අනුසතිය, සමාධියට හිතකර බව බුදුන් වහන්සේ පෙන්වා ඇත: යම් පුද්ගලයෙක් ධර්මගුණ සිහිපත්කරන අවස්ථාවේදී, ඔහුගේ සිතේ ඇති රාග දෝස හා මෝහ යන කෙළෙස් පහවියයි. එමගින් ඔහුගේ සිත ඍජුවී ධර්මය පිලිබඳ අර්ථවේදය (අර්ථ වැටහීම), ධර්මවේදය (ධර්මය නිසා සතුට ලැබීම) ඔහුට  ලැබේ. එවිට ඔහුගේ සිත ප්‍රමෝදවේ. ප්‍රමෝදමත් සිතේ ප්‍රීතිය ඇතිවේ. ප්‍රීතිය නිසා කාය පස්සදිය ලැබේ, එමනිසා සිත සුවපත්වේ. සුවපත් සිත සමාධිය ලබාදෙයි. එම අවස්ථාවේ දී ඒ පුද්ගලයා, විෂමසහගත සිත් ඇති අය අතර ශාන්ත සිතක් ඇති, දුකට පත් අය අතර නිදුක් සිතක් ඇති කෙනෙක්වේ. ඒ ආරිය ශ්‍රාවකයා ධර්මය ප්‍රවාහයට ඇතුළුවූ, ධම්මානුසතිය වඩන කෙනෙක් බවට පත්වේ:

> **"...යස්මිං මහානාම සමයෙ අරියසාවකො ධම්මං අනුස්සරති, නෙවස්ස තස්මිං සමයෙ රාගපරියුට්ඨිතං චිත්තං හොති, න දොසපරියුට්ඨිතං චිත්තං හොති, න මොහ පරියුට්ඨිතං චිත්තං හොති, උජුගතමෙවස්ස තස්මිං සමයෙ චිත්තං හොති ධම්මං ආරබ්භ, උජුගතචිත්තො ඛො පන මහානාම අරියසාවකො ලභති අත්ථවෙදං ලභති ධම්මවෙදං ලභති ධම්මූපසංහිතං පාමොජ්ජං, පමුදිතස්ස පීති ජායති, පීතමනස්ස කායො පස්සම්භති, පස්සද්ධකායො සුඛං වෙදියති, සුඛිනො චිත්තං සමාධියති, අයං වුච්චති මහානාම අරියසාවකො විසමගතාය පජාය සමප්පත්තො විහරති, සබ්‍යාපජ්ඣාය පජාය අබ්‍යාපජ්ඣො විහරති, ධම්මසොතසමාපන්නො ධම්මානුස්සතිං භාවෙති"**

**සටහන්: *** මේ සූත්‍රය වදාළේ මහානාම ශාක්‍යයන්ටය. අනුරුද්ධ තෙරුන් ගේ සහොදරයාවූ ඔහු බුදුන් වහන්සේගේ අග්‍රතම උපාසකයෙක්ය. **බලන්න**: උපග්‍රන්ථය:3 **මූලාශ්‍ර**:අංගු.නි: (6): 11-නිපාත: 2 අනුසති වගග, 11.2.1, 11.2.2. මහානාම සූත්‍ර,පි.645, EAN-11: Recollection, 11.1 & 12.1, Mahanama , p.570.

▼ **ධම්මගුණ ආවර්ජනය කුසලය පිණිසය**: ධර්මගුණ සිහිකර ඒ ගුණ සිතතුළ දාරණය කරගන්නා ශ්‍රාවකයෙක්, ලාමක අකුසල් පහ කරගැනීමට හා කුසල් සිත වඩා ගැනීමට සමත්වන බව බුදුන් වහන්සේ වදාළහ. **මූලාශ්‍ර**:අංගු.නි: (6): 11 නිපාත: අනුසති වගග:11.2.3. නන්දිය සූත්‍රය,පි.658, EAN-11: Recollection, 13.3, Nandiya,  p.571.

▼ **ධම්මගුණ දෙවියෝ අගයකරයි**: ජනවසභ සූත්‍රයේදී, සනංකුමාර බ්‍රහ්මරාජයා විසින් දේවසභාවට ධර්ම ගුණ විස්තර කර, බුදුන් වහන්සේ වදාළ ධර්මය මනාව දේශනාකර ඇතිබව ද අමරණියබව - නිවන පිණිස

දොරටුව විවෘත කරන ලද බවද පවසා ඇත. **මූලාශ්‍ර**: දීඝ.නි: (2 ): 5. ජනවසභ සූත්‍රය, පි,322, EDN: 18 Janavasabha Sutta (17), p. 209.

▼**ධම්ම ගුණ විස්තර කරන වෙනත් සූත්‍ර**: **බලන්න**: අංගු.නි: (4) 6 නිපාත: ධම්මිකවග්ග: සන්දිට්ඨික සූත්‍ර 2කි, පි.144.

▲ **ධම්ම ගුරුවරු-** Dhamma teachers: දහම උගන්වන මහා ගුරුවරයා- ශාස්තෘන් වහන්සේ නම් බුදුන් වහන්සේය. ධම්ම ගුරුවරු -පුදපූජා කලයුතු ගින්නක්ය- දක්ඛිණෙය්‍යා අග්නි. **බලන්න**: දක්ඛිණෙය්‍යා අග්නි.

▲**ධම්ම චක්‍රය-**Dhamma wheel: තථාගත සම්බුදුරජාණන් වහන්සේ කරුනු 5 ක් සහිතව නවලෝකෝත්තර ධම්ම චක්‍රය පවත්වන සේක. ඒ ශ්‍රේෂ්ඨ චක්‍රය ලෝකයේ බ්‍රහ්ම, දේව, මාර, මිනිස් ආදීවූ කිසිවෙකුට ආපසු පෙරලිය නොහැකිය (ප්‍රතිවර්තනය): 1) **අර්ථය දන්නේය** (අත්‍ථඤ්ඤූ ච හොති). කුමක් යහපත්ද ? යන්න පස් ආකාරයකින් අවබෝධ කර ඇත (පංචවිධ අර්ථ): තමාගේ අර්ථය, අන්‍යයන්ගේ අර්ථය, දෙපක්ෂයේම අර්ථය, වර්තමානය පිණිස ඇති අර්ථය, අනාගතය පිණිස ඇති අර්ථය. 2) **ධර්මය දන්නේය** (ධම්මඤ්ඤූ ච හොති). සතර ධර්මය අවබෝධ කර ඇත: චතුසත්‍ය. 3) **මාත්‍රය දන්නේය** (මත්තඤ්ඤූ ච හොති ) සිව්පසය ගැනීම පිලිබඳ පමණ දන්නේය. 4) **කාලය දන්නේය** (කාලඤ්ඤූ ච හොති ): එනම් විවෙකසුවයෙන් වාසය කලයුතු කාලය, ජානසමාපත්ති ඇතිව වැඩසිටීමේ කාලය, ධර්මය දේශනා කිරීමේ කාලය, චාරිකාවේ යෙදීමේ කාලය. 5) **පිරිස (පර්ෂදය) දන්නේය** (පරිසඤ්ඤූ ච හොති ): එනම් තමන්වහන්සේ හමුවට එන පිරිස කවරේද යන්න: ශාක්‍ය, බ්‍රාහ්මණ, වෛශ්‍ය, ශුද්‍ර, ශ්‍රමණ ආදී ලෙසින්. **සටහන්**: * මෙහිදී බුදුන් වහන්සේ පෙන්වා ඇත්තේ, තමන් වහන්සේගේ දෙටු පුත්වැනි, සැරියුත් තෙරුන් (ජේෂ්ඨ ශ්‍රාවක) ඉහත කරුණු 5 සහිතව, ධම්ම චක්‍රය පවත්වන බව පෙන්වා ඇත. ** ධම්මරාජවූ බුදුන් වහන්සේ, ධර්මය ඉහලින් තබාගෙන, ධර්මයට පුද සත්කාර කරමින්, ධර්මය ධජය ලෙසින් ගෙන, ධම්ම චක්‍රය පවත්වන සේක. ** උන්වහන්සේ භික්ෂු භික්ෂුණින් හට, උපාසක, උපාසිකාවන්ට, මග පෙන්වා දෙමින් ඔවුන්ට යහපත් රැකවරණය ලබාදේ. සෙවිය යුතු දහම සෙවීමට, නො සෙවියයුතු දහම නො සෙවීමට, වාසය සුදුසු හා නුසුදුසු තැන් ආදිය ගැන අවශ්‍ය උපදෙස් ලබාදේ.

**සටහන**: බුදුසසුනේ ප්‍රථමවරට ධම්ම චක්‍රය පැවැත්වුවේ බුදුන් වහන්සේගේ ප්‍රථම ධම්ම දේශනාවේදිය. **බලන්න**: ධම්මචක්කප්පවත්තන සූත්‍රය, සංයු.නි: (5-2), පටිසම්භිදා 2: ධම්මචක්ක කථා. **මූලාශ්‍රය:** අංගු.නි: (3) 5 නිපාත:රාජවග්ග: 5.3.4.1, 5.3.4.2, 5.3.4.3 සූත්‍ර, පි.264.

▼**ධම්මචක්‍ර**ය ලෙසින් පෙන්වා ඇත්තේ බුදුන් වහන්සේ වදාළ ධර්මයය. එය, ඉතා උතුම් නිසා, ශ්‍රෙෂ්ඨනිසා අනර්ඝනිසා, බ්‍රහ්මචක්‍රය (The Wheel of Brahmā) ලෙසින්ද හඳුන්වයි. **සටහන:** බුදුන් වහන්සේ ධම්ම චක්‍රය හැරවීම පිලිබඳ විස්තර: **බලන්න:** ධම්මචක්කප්පවත්තන සූත්‍රය. **මූලාශ්‍ර:** අංගු.නි: (6):10 නිපාත: 10.1.3.1 සිංහනාද සූත්‍රය, පි. 90, EAN:10: 21.1. The Lion, p. 499, ම.නි: (1 ): 1.2.2. මහාසීහනාද සූත්‍රය, පි. 184, EMN: 12: The Greater Discourse on the Lion's Roar, p.160.

▼ **ධම්මචක්‍රය පැවත්වීම**

**"...මහණෙනි, සැරියුත් තෙමේ, තථාගතයන් විසින් පවත්වන ලද**

**අනුත්තරවූ ධම්මචක්‍රය, මනා කොටම පවත්වයි"**. (Sāriputta properly continues to keep in motion the unsurpassed wheel of the Dhamma set in motion by the Tathāgata.). **මූලාශ්‍ර:**අංගු.නි: (1):1 නිපාත: එතග්ගපාළිය:**1.13.26 සූත්‍රය**, පි.84, EAN:1: 187.18: sutta,p.44.

▲ **ධම්ම චක්ඛු**:පාලි: **ධම්මචක්ඛුං-**Eye of the Dhamma: ධම්මචක්ඛු - දහම්ඇස ලෙස පෙන්වා ඇත්තේ සෝතාපත්ති මාර්ගඵල ලැබීමය. පංචනීවරණ පහවීමෙන් පිරිසුදුවූ සිත, චතුසත්‍ය අවබෝධය පිණිස යහපත් ලෙසින් යොමු කරන පුද්ගලයාහට ධර්මයේ මූලික න්‍යායයක් වූ 'හටගැනීමේ ස්වභාවය ඇති දේ, නැතිවියාමේ ස්වභාවය ඇත' ය යන නුවණ පහළවේ. එම නුවණ ඇතිවීම - හේතු ප්‍රත්‍ය පිලිබඳ ඥානය ඇතිවීම දහම් ඇස පහළවීමය, දහම් මගේ පළමු පියවරවූ සෝතාපන්න වීමය. **සටහන:** බුදුන් වහන්සේගේ ප්‍රථම දහම් දේශනාව වූ, ධම්මචක්ක ප්පවත්වන සූත්‍රයේ දී චතුසත්‍ය අවබෝධ වීම මගින් තමන්වහන්සේට පෙර නො ඇසූ ධර්මය පිලිබඳ දහම් ඇස පහළවූ බව වදාරා ඇත. එලෙස, බුදුන් වහන්සේ, සියලු කෙළෙස් පහකර උතුම් සම්බෝධිය සාක්ෂාත් කරගත්හ.

▼**ධම්මචක්කප්පවත්වන සූත්‍රය** ශ්‍රවනය කල ආයුෂ්මත් කොණ්ඩඤ්ඤ තෙරුන්හට, 'යම්කිසි ධර්මයක් ප්‍රත්‍යයෙන් උපන්නේ වේ ද, ඒ සියලු ධර්මතා නිරුද්ධවීමේ ස්වභාවය කොට ඇතය'යි රාගාදී රජස් රහිතවූ, පහවූ (දිට්ඨිවිචිකිච්ඡා) මල ඇති සෝතාපත්ති මාර්ග ඥානය -දහම් ඇස පහල වුයේය: **"ඉමස්මිඤ්ච පන වෙය්‍යාකරණස්මිං භඤ්ඤමානෙ ආයස්මතො කොණ්ඩඤ්ඤස්ස විරජං වීතමලං ධම්මචක්ඛුං උදපාදි 'යං කිඤ්චි සමුදයධම්මං, සබ්බං තං නිරොධධම්ම' න්ති" (**And while this discourse was being spoken, there arose in the Venerable Kondañña the dust-free, stainless vision of the Dhamma: 'Whatever is subject to origination is all subject to cessation')**මූලාශ්‍ර:** වින.පි: මහාවග්ග 1: 22 : පි. 101, සංයු.නි: (5-2): මහාවග්ග: සච්චසංයුත්ත: 12.2.1 ධම්මචක්කප්පවත්තන සූත්‍රය, පි. 294, ESN: Saccasamyutta: 11.1 Setting in Motion the Wheel of the Dhamma, p. 2276.

▼**චතුරාර්ය සත්‍ය ධර්මය** බුදුන් වහන්සේ, යසකුලපුත්‍රයාහට (පසුව යසකුලපුත්‍ර තෙර) දේශනා කල අවස්ථාවේදී, ඔහුට දහම් ඇස පහළවිය. **බලන්න**: අනුපූර්ව කථා. **මූලාශ්‍රය:** වින.පි: මහාවග්ග 1: 8: පි. 110.

▼ **උග්ග විසාලානුවර** ගහපති හා උග්ග හත්ථිගාම ගහපති යන ගිහි උපාසකයන්හට, බුදුන් වහන්සේ පළමු හමුවීමේදීම, දේශනා කල ධර්මය අසා දහම් ඇස පහලවූහ. එම ගුණය ඔවුන්ට ඇති අෂ්ඨ ආශ්වර්ය අද්භූත ගුණයන්ගෙන් එකකි. **බලන්න**: අෂ්ඨ ආශ්වර්ය අද්භූත ගුණ.

▼ **වෙනත් මූලාශ්‍ර:1. ධම්මචක්ඛු- දහම් ඇස : "ධම්මචක්ඛු** හෙවත් දහම් ඇස පහළවීම යනු මේ ලෝකයේ පැවැත්ම පිළිබඳව තත්වය අවබෝධවීමය- යථාබව (සෝතාපන්න විමය) එනම් ඉදපපච්චයතා - හේතු ප්‍රත්‍ය ධර්මතාව අවබෝධ වීම. " යං කිඤ්චි සමුදයධම්මං සබ්බං තං නිරෝධ ධම්මං- යම් හේතුවක් නිසා ඇතිවන දේ ඒ හේතුව නැතිවීමෙන්

නැතිවී යනවා". "දිය සුලිය: පි.7: කටුකුරුන්දේ ඤාණනන්ද හික්මු, පහන්කනුව ධර්ම දේශනා, ධර්මග්‍රන්ථ මුද්‍රණ භාරය, 2005.

▲ **ධම්ම චේතිය-** Dhamma chetiya: ධම්ම චේතිය ලෙස මෙහිදී පෙන්වා ඇත්තේ, ත්‍රිවිධ රත්නයේ අනගිබවය. පසේනදී කෝසල රජ, මෙහිදී ධම්ම චේතිය ගුණ වර්ණනා කර ඇත. එම ධම්ම චේතිය, ඉගෙනගැනීමට, සිහියේ දරාගැනීමට, පුහුණු කිරීමට බුදුන් වහන්සේ සංඝයාට අවවාද වදාළහ. ධම්ම චේතිය, අර්ථසහිතය, ආදී බ්‍රහ්මචාරිකය යි මෙහි පෙන්වා ඇත. **මූලාශ්‍රය**: ම.නි: (2): 2.4.9 ධම්මචේතිය සූත්‍රය, පි.566.

▲ **ධම්ම චරියාව හා අධම්ම චරියාව-** conduct in accordance with the Dhamma & conduct contrary to the Dhamma: ධම්මචරියාව යනු ධර්මයට අනුකූලව හැසිරීමය, කුසල් සහගතය. අධම්මචරියාව යනු ධර්මයට එරෙහිව- පටහැනිව හැසිරීමය, අකුසල් සහගතය. **කය වචන හා සිත** යන තුන් දොරින් යහපත් ක්‍රියාවන්හි යෙදීම ධම්මචරියාව යයි බුදුන් වහන්සේ පෙන්වා ඇත. එසේම, තුන් දොරින් කරන අයහපත් ක්‍රියා- විෂම ක්‍රියා වන්හි යෙදීම අධම්මචරියාව වේ. ධම්මචරියාව මගින් කෙනෙක් සුගතියට පමුණුවන අතර අධම්මචරියාව නිසා කෙනෙක් දුගතියට යයි. **බලන්න**: දසකුසල හා දස අකුසල. **මූලාශ්‍ර**: අංගු.නි: ( 6):10 නිපාත: කරජකාය වගග: 10.5.1.10. අධම්ම චරියා සූත්‍රය, පි.586, EAN:10: 220.10: Conduct contrary to the Dhamma, p. 561.

▼**ගිහිගෙය හැර පැවිදිවූ** සංඝයා විසින් අධම්ම චරියාව හැර ධම්ම චරියාවට අනුව වාසය කලයුතු ආකාරය මෙහි දක්වා ඇත.**මූලාශ්‍රය**: ඛු.නි: සුත්තනිපාත: චූලවග්ග: 2-6 කපිලසූත්‍රය, පි.104.

▼**මෙහිදී සැරියුත් මහා තෙරුන්**, කෙනෙක් අධම්ම චරියාවේ හැසිරීමට හේතු හා කෙනෙක් ධම්ම චරියාවේ හැසිරීමට හේතු විස්තරාත්මකව පෙන්වා ඇත. **මූලාශ්‍රය**: ම.නි: (2): 2.5.7 ධනඤ්ජානි සූත්‍රය, පි.696

▲ **ධම්ම ඤාණය-** Dhammanana: ධම්ම ඤාණය (**ධම්මේඥානය**-ධම්මෙ ඤාණං) යනු ධර්මය පිලිබඳ ඇති පූර්ණ අවබෝධයය. මෙය ආධ්‍යාත්මික මාර්ගය වඩා ගැනීම පිණිස උපදවගතයුතු සතර ඥානයන්ගෙන් එකකි. **බලන්න**: උත්පාදයිතව්‍ය ධර්ම.

▲ **ධම්මඤ්ඤු-** Dhammannu: ධම්මඤ්ඤු ලෙසින් පෙන්වා ඇත්තේ බුදුන් වහන්සේ දේශනා කර වදාළ සූත්‍ර, ගෙයිය... ආදීවූ නව අංග ධම්මයන් යහපත් ලෙසින් අවබෝධ කරගත මහණ/මෙහිණිය ධම්මඤ්ඤු ලෙසින් හඳුන්වයි. **බලන්න**: නවාංග ශාසතෘශාසනය. **මූලාශ්‍රය:** අංගු.නි: (4) 7 නිපාත: 7.2.2.4 ධම්මඤ්ඤු සූත්‍රය, පි.464

▲**ධම්මට්ඨිති ඤාණය-** Dhammattihi nana: හේතුප්‍රත්‍ය ධර්මතා පිලිබඳ පිරිසිඳ දැනගැනීමේ නුවන ධම්මට්ඨිති ඤාණයය. විස්තර පිණිස **බලන්න**: ඛු.නි: පටිසම්භිදා 1:ඥාණකථා: 4 ධම්මට්ඨිති ඤාණය, පි.116.

▲ **ධම්ම තණ්හාව-** craving for mental phenomena: සිතින් සිතන සිතුවිලි පිලිබඳ ඇති ඇල්ම, ධම්ම තණ්හාවය. විඥාණය නිසා හටගන්නා තණ්හාවය- ආශාවන්ය-(පස් ඉඳුරන්ගෙන් අල්ලා ගන්නා දේ පිලිබඳ ඇති ඇල්මය-විඥාණ හැර). අපූර්වදේ ගැන, මනස්කල්පිත දේ ගැන, දුරඅවබෝධ-භවාත්මක කරුණු, බුද්ධිමය පර්යාය, වේදනා හා චිත්තවේගී

අවස්ථා ආදිය පිලිබඳ විඥාණයේ ඇතිවන ආශාවන්ය. **බලන්න**: තණ්හාව.

▲**ධම්මස්ථ**-Dhammastha:සත්‍යකථා කරණ, ධම්ම විනිශ්චය යහපත් ලෙසින් පිහිටි පුද්ගලයා ධම්මස්ථය යි මෙහි දක්වා ඇත.**මූලාශ්‍රය:**ඛු.නි: ධම්මපදය: 19: ධම්මස්ථ වග්ග: පි.116.

▲ **ධම්ම දූතසේවය**- Missionary: ධම්ම දූතසේවය ලෙසින් පෙන්වා ඇත්තේ සංඝයා පිරිස අතරට පැමිණ ධර්මය දේශනා කිරීමය, ප්‍රචලිත කිරීමය. **බලන්න**: දූත කර්ම

▲ **ධම්මදින්න උපාසක-**Dhammadinna upasaka:**බලන්න**: උපග්‍රන්ථය:3

▲**ධම්මදින්නා තෙරණිය**-Dhammadinna Therani: **බලන්න**: උපග්‍රන්ථය:2

▲ **ධම්මමගේ දියුණුව**- Progress in the Path: වෙළඳාමේ දක්ෂ වෙළෙන්දා, මහා ධන සම්පත් ලබා තමාගේ ජීවිතමග දියුණු කරගනී. ගුණ 3 ක් ඇති භික්ෂුව මහා කුසල් ඇතිකර දහම් මග දියුණු කරගැනීමට සමත්වේ. 1) **තීක්ෂණ ඇස**: චතු සත්‍ය යහපත් ලෙසින් දැකීමේ හැකියාව ඇතිබව 2) **වගකීම:** අකුසල පහ කර ගැනීමට හා කුසල් ඇතිකර ගැනීමට අවශ්‍ය වීරිය උපදවා ගැනීමේ වගකීම අවබෝධකිරීම 3) **අනුග්‍රාහකයන් ලැබීම**- ධර්මයේ බහුශ්‍රැත, ධර්මයේ දක්ෂ උතුම් භික්ෂූන් නිතර හමුවූ, ධර්ම කාරණා පිලිබඳ කරුණු පහදා ගැනීමට හැකිවීම. එම ගුණ නැති කෙනා, අදක්‍ෂ වෙළෙන්දා නො දියුණුවන ලෙසින්, දහම් මගේ පිරිහීමට පත්වේ. **බලන්න**: වෙළෙන්දා උපමාව:උපග්‍රන්ථය:5. **මූලාශ්‍ර**: අංගු.නි: (2): 3 නිපාත: 3.1.2.9 -10 සූත්‍ර 2කි, පි. 256, EAN:3: 19.9 & 20.10 Shopkeeper, p. 84.

▼**ධම්මමග ආරක්ෂා** කරගැනීමට උපකාරීවන ධර්මතා 10ක් මෙහිදී පෙන්වා ඇත. **බලන්න:** නාථකරණ ධම්ම. **මූලාශ්‍ර**: අංගු.නි: (6): 10 නිපාත: 10.1.2.7 ප්‍රථම නාථකරණ සූත්‍රය.

▼**ධම්ම මග අවහිර** කරන ධර්මතා 10ක් මෙහිදී පෙන්වා ඇත. **මූලාශ්‍ර**: අංගු.නි: (6): 10 නිපාත: 10.1.2.3 චෙතොඛිල සූත්‍රය.

▲**ධම්ම දායාදය-**Heirs in Dhamma: ධම්ම දායාදය ලෙසින් පෙන්වා ඇත්තේ බුදුන් වහන්සේ වදාළ ධම්මවිනය උරුම කරගෙන වාසය කිරීමය.

"මහණෙනි, මගේ ධර්මයට දායාද වන්න, ආමිෂයට දායාද නොවන්න". **සටහන්:** * ආමිෂය යනු සිව්පසයය. ** භික්ෂුව, ධර්මය දායාද කරගන්නා පිළිවෙත, සැරියුත් තෙරුන් මේ සූත්‍රයේදී පෙන්වා ඇත. **මූලාශ්‍ර**:ම.නි: (1): 1.1.3 ධම්මදායාද සූත්‍රය, පි. 50,EMN:3 Heirs in Dhamma, p.85.

▲ **ධම්මදේශනාව**- Discoursing Dhamma: බුදුන් වහන්සේ, ධර්මය දේශනාකොට වදාළේ, ලෝක සත්ත්වයන් හට සසරින් ගැලවීමේ මාර්ගය පෙන්වා දීම පිණිසය. තථාගතයන් ධර්මය දේශනා කරන ක්‍රම 2කි: 1)

සැකෙවින් 2) විස්තරාත්මකව. **මූලාශ්‍ර:** අංගු.නි: (1): 2 නිපාත: 2.1.2.4 සූත්‍රය, පි. 144, EAN: 2: 14.4 Sutta, p. 58.

▼**නිවැරදි අර්ථයද** නිවැරදි ධර්මයද සහිතව, භික්ෂූන් ධර්මය දේශනා කරන්නේ නම්, ඔවුන් බොහෝ දෙනාගේ හිත සුව පිණිස, අර්ථය පිණිස කටයුතු කරන බව බුදුන් වහන්සේ පෙන්වා දී ඇත. එලෙස කටයුතු කරණ සංඝයා බොහෝ කුසල් රැස්කරගනී, සසුන පවත්වා ගැනීමට, ආරක්ෂා කිරීමට කටයුතු කරයි. එහෙත්, වැරදි අර්ථයද වැරදි ධර්මයද සහිතව, සංඝයා ධර්මය දේශනා කරන්නේ නම්, ඔවුන් බොහෝ දෙනාගේ හිත සුව පිණිස, අර්ථය පිණිස කටයුතු නො කරයි. එසේ කිරීමෙන් ඔවුනට බොහෝ අකුසල සිදුවේ, සසුනට හානි ඇතිවේ, සසුන අතුරුදහන් වීමට කටයුතු සිදුවේ. **මූලාශ්‍ර:** අංගු: (1): 2 නිපාත:2 .1.4.10 සූත්‍රය, පි.172, EAN: 2 : 41.10 Sutta, p. 63.

▼**ධර්මය දේශනා කිරීමේ** පරමාර්ථය වන්නේ, මෙලොවදී ඇතිවන ආසව සංවරකරගැනීමට හා පරලොව විපාක දෙන ආසව විනාශ කිරීම පිණිස බව බුදුන් වහන්සේ වදාළහ. **බලන්න**: ආසව. **මූලාශ්‍ර:** දීඝ.නි: (3): 6 පාසාදික සූත්‍රය-(16), පි. 210, EDN**:** 29**.**The delightful discourse-(22), p. 318.

▲**ධම්මදස්සි බුදුන් වහන්සේ-** Buddha Dhammadassi: ගෝතම බුදුන් වහන්සේට පෙර වැඩසිටි ධම්මදස්සි බුදුන් වහන්සේ පිලිබඳ විස්තර මෙහි දක්වා ඇත. **බලන්න**:බුද්ධවංශ පාලි:15: ධම්මදස්සි බුදුන්වහන්සේ.

▲ **ධම්ම ධාතුව:** පාලි**:ධම්මධාතු**:Dhamma Dhathu- penetration of the principles of Dhamma: තථාගතයන් වහන්සේ සතු **'සියල්ල දක්නා නුවණ'** ධම්මධාතුව ලෙසින් පෙන්වා ඇත.

" යම් ධර්ම ධාතුවක් යහපත් ලෙසින් පිළිසිඳ දන්නා නිසා තථාගතයන් වහන්සේ, පෙර විසූ බුදුවරු මෙබඳු උපත් ඇත්තෝවූහ, මෙබඳු නම් ඇත්තෝවූහ, මෙබඳු ගෝත්‍ර ඇත්තෝවූහ, මෙබඳු සිල් ඇත්තෝවූහ,මෙබඳු දහම් ඇත්තෝවූහ, මෙබඳු නුවණ ඇත්තෝවූහ, මෙබඳු විහරණ ඇත්තෝවූහ..." ආදී ලෙසින් තමන්වහන්සේට පෙර වැඩ විසූ බුදුවරු පිලිබඳ දැනගතයුතු සියලු දේ දැකිය හැකිබව, දත හැකි බව බුදුන් වහන්සේ පෙන්වා ඇත:

**"තථාගතස්සෙවෙසා භික්ඛවෙ ධම්මධාතු සුප්පටිවිද්ධා යස්සා ධම්මධාතුයා සුප්පටිවිද්ධත්තා තථාගතො අතීතෙ බුද්ධෙ පරිනිබ්බුතෙ ඡින්නපපඤ්චෙ ඡින්නවටුමෙ පරියාදින්නවට්ටෙ සබ්බදුක්ඛවීතිවත්තෙ ජාතිතොපි අනුස්සරති, ගොත්තතොපි අනුස්සරති, සාවකසන්නිපාතතොපි අනුස්සරති....".** (The Tathāgata understands these things...by his own penetration of the principles of Dhamma) **සටහන්**: * මෙහිදී විපස්සි සිට කාශ්‍යප තෙක් පෙර බුදුවරු සත්දෙනා පිලිබඳව විස්තර දක්වා ඇත. **බලන්න**: අතීතයේ වැඩසිටි සම්මා සම්බුදුවරු. **මූලාශ්‍ර:** දීඝ.නි: (2): 1.මහාපදාන සූත්‍රය, 14 ඡෙදය, පි. 18, EDN: 14 Mahâpadāna Sutta, p. 150.

▼ **බුදුන් වහන්සේ පෙන්වා** ඇත්තේ තථාගතයන් පහළවුවද, පහළ නොවුවද: සියලු සංඛාර අනිත්‍ය...දුකය...අනාත්මය යන ධම්මධාතුව

එලෙසම පවතින බවය. **මූලාශ්‍රය:**අං.ගු.නි: (1)3 නිපාත:යොධාජීවවග්ග:3.3.4.4. සූත්‍රය, පි.552.

▲ **ධම්ම නානත්වඤානය-** Dhamma Nanathwanana: ධම්ම නානත්වඤානය ලෙසින් පෙන්වා ඇත්තේ නවධර්මයන් පිරිසිඳ දැනගැනීමේ ප්‍රඥාවයය. **මූලාශ්‍රය:** ඛු.නි. පටිසම්භිදා 1: 19 ධම්ම නානත්වඤානය, පි.184.

▲ **ධම්මානුසාරී:** පාලි: **ධම්මානුසාරි**-Dhamma-follower/devotee: ධර්මය යහපත්ලෙසින් දැක පිළිගත් ආරිය ශ්‍රාවකයා ධම්මානුසාරී ය. ඔහු උත්තම දසපුද්ගලයන්ගෙන් කෙනෙකි, ආරිය පුද්ගලයන් සත්දෙනාගෙන් කෙනෙකි. ඔහුගේ දහම් මග තියුණුය, ධර්මය නිරුත්සාහයෙන් අවබෝධවේ. ඔහුට මාර්ගය ඉක්මනින් සාක්ෂාත් කර ගැනීමට හැකිය. මුවහත් පිහියකින් කෙසෙල් බඩයක් කපන ලෙසින් පහසුවෙන් කෙලෙස් කපාදැමිය හැකිය. **බලන්න**: ESN: note: 198, p. 2412. **සටහන්**: * සෝතාපන්න බවට වඩා ටිකක් අඩුවෙන් පංච ඉන්ද්‍රිය පරිපූර්ණ පුද්ගලයා ධම්මානුසාරීය. **බලන්න**: ආධ්‍යාත්මික පංචඉන්ද්‍රිය, ඉන්ද්‍රියනානත්වය.

▼**අභ්‍යන්තර ආයතන 6** (චක්ඛු ආදී) -අනිත්‍යය, වෙනස්වේ, විපරිනාමවේ. ඒ බව යථා ලෙසින් දකින ආරිය පුද්ගලයෝ සෝතාපන්න නොවී කලුරිය නොකරයි, ඔහු ධම්මානුසාරී ආරිය පුද්ගලයෙකි. **බලන්න:** සෝතාපන්න. **මූලාශ්‍ර:** සංයු.නි: (3): ඛන්ධවග්ග: ඔක්කන්තිසංයුත්ත: 4.1.1. චක්ඛු සූත්‍රය, පි. 470, ESN: 25: Okkantisamyutta: 1 The eye, p. 1140.

▲**ධම්මානුස්සති භාවනාව-** Recollection of the qualities of Dhamma ධම්මානුස්සති (අනුසති) භාවනාව (ධම්මානු සතිය) දහම් ගුණ සිහිපත්කර සිත එකඟ කර ගැනීමය- සමාධිය ලැබීමය. මේ භාවනාව නිවන පිණිස පවතී. **බලන්න**: අනුසති භාවනා, ධම්මගුණ. **සටහන**: කටයුතු බහුල ජීවිතයක් ඇති ගිහියන්ට සුදුසු භාවනාවකි. **බලන්න**: ගිහියන්ට උපදෙස්. **මූලාශ්‍රය:** අංගු.නි: (1) නිපාත: ඒකධම්මපාලිය සූත්‍ර, පි.100.

▲ **ධම්මානුපස්සනාව-**Dhammanupassana: දීඝ.නි: හා ම.නි: සතිපට්ඨාන සූත්‍රයන්හි, දහම් කරුණු විමසා බැලීම ධම්මානුපස්සනාව බව පෙන්වා ඇත. **බලන්න:** චතුසතිපට්ඨාන.

▼ **ධම්මවිනයේ දක්ෂ** භික්ෂුව කරුණු 11ක් සපුරා ගෙන ධම්මානුපස්සනා සාක්ෂාත් කරගන්නා බව මෙහි පෙන්වා ඇත. **මූලාශ්‍රය:** අංගු.නි: (6) 11 නිපාත:සාමඤ්ඤවග්ග සූත්‍ර, පි.704.

▲ **ධම්මානුධම්ම පටිපන්න:** පාලි: **ධම්මානුධම්මපටිපන්නො-** Dhmmanudamma patipanna: රූප, වේදනා, සංඥා, සංඛාර, විඥාන යන ධර්මතා පිලිබඳ කළකිරීම පිණිස, නොඇල්ම පිණිස, නිරෝධය පිණිස පුරුදු පුහුණුව ලබන භික්ෂුව '**ධම්මානුධම්මපටිපන්න- ධම්මානුධම්ම ප්‍රතිපන්න**' යයි බුදුන් වහන්සේ වදාළහ. **මූලාශ්‍ර**: සංයු.නි: (3): ඛන්ධසංයුත්ත: 1.3.2.3 හා 1.3.2.4. සූත්‍ර, පි. 312, ESN: 115.3 & 116.4 A speaker on the Dhamma, p. 1101.

▲ **ධම්මානුධම්ම ප්‍රතිපදාව:** පාලි: **ධම්මානුධම්මපටිපත්ති -**Dhammanu Dhamma patipada: ධර්මයට අනුකූලව, දුකින් මිදීමට කටයුතු කිරීම, ධම්මානුධම්ම ප්‍රතිපදාවයය (practising in accordance with the Dhamma). එම ප්‍රතිපදාවට බැසගත් පුද්ගලයා "**ධම්මානුධම්මප්‍රතිපන්න**" යයි හඳුන්වයි. එවැනි පුද්ගලයා කතා කරන්නේ නම්: දසධර්ම කතා පමණක් කතා කරයි, සිතන්නේ නම් නෙක්කම්ම ආදී ධර්ම විතක්ක පමණක් මෙනෙහි කරයි. උපෙක්කා සහගතව, සිහි ඇතිව, නුවණ ඇතිව වාසය කරයි. එවැනි මහණ, ධර්මය අරමුණු කොට ඇති සමථ හා විදර්ශනාව වඩයි, ඔහුට 37ක්වූ බෝධි පාක්ෂික ධර්මතා පිහිටයි. සෑම ඉරියව්වකදීම,කෙළෙස් සන්සිඳවීම ගැන සිත යොදන ඔහු ඒකාන්තයෙන්ම නිවන ලබයි යයි බුදුන් වහන්සේ වදාළහ. **සටහන:** අටුවාවට අනුව: "when he is practising the preliminary portion of the practice thatis in conformity with the ninefold supramundane Dhamma (the four paths, their fruits, and Nibbāna)". **බලන්න**: ESN:note 51: p.1177. **මූලාශ්‍ර**:ඛු.නි:ඉතිවුත්තක:3.4.6 අශුභානුදර්ශී සූත්‍රය, පි. 45, 3.4.7 ධම්මානුධම්මප්‍රතිපන්න සූත්‍රය, පි.456.

▼ **ධම්මානුධම්මප්‍රතිපන්න** පුද්ගලයා, පංචඋපාදානස්කන්ධය (රූපය ආදී) ගැන නිබ්ද්දාව ඇතිකරගනිමින්, ඒවායේ අනිත්‍යබව මෙනෙහි කරමින්, ඒවා නිසා ඇතිවන දුක දකිමින්, ඒවායේ අනාත්මබව දකිමින් වාසය කලයුතුය යි මෙහි දක්වා ඇත. එය, දුකින් මිදීමේ මගය. **මූලාශ්‍ර**:සංයු.නි (3) ඛන්ධසංයුත්ත: නතුම්හාකවග්ග: 1.1.4.7-10 අනුධම්ම සූත්‍ර, පි.98, ESN: Khandasamyutta: 39.7 - 42.10 suttas 4, In accordance with the Dhamma, p. 1029.

▼ **ධම්මානුධම්ම ප්‍රතිපදාව** අනුගමනය, සෝතාපන්න වීමට අවශ්‍ය අංග 4 න් එකකි. **බලන්න**: සෝතාපන්න.

▼ **ආධ්‍යාත්මික වර්ධනය** පිණිස ධම්මානුධම්ම ප්‍රතිපදාව බොහෝ උපකාරීවේ-බහු උපකාර ධර්මයකි. **මූලාශ්‍ර:** දීඝ.නි : (3): 11 දසුත්තර සූත්‍රය, පි. 483, EDN: 34: Dasuttara Sutta: Expanding Decades, p. 384.

▲ **ධම්මපරියාය:** පාලි: **ධම්මපරියායං-** Dhamma Theme: ධම්ම පරියාය ලෙසින් මෙහිදී දක්වා ඇත්තේ ධර්ම දේශනාවය, දේශනාවට ඇතුලත් ධර්ම කරුණුය-තේමාවය. **බලන්න**: සංසප්පනිය ධර්ම පරියාය.

▼**බහුධාතුක සූත්‍රයේ දී** බුදුන් වහන්සේ 1) ධාතු කුසලතාවය 2) ආයතන කුසලතාවය 3) පටිච්චසමුප්පාදය පිලිබඳ කුසලතාවය 4) ස්ථාන අස්ථාන දන්නා කුසලතාවය පිලිබඳ විස්තරකර ඇත. සූත්‍රය අවසානයේදී ආනන්ද තෙරුන් එම දේශනාවේ-පරියායේ නම-තේමාව ඇසූ විට බුදුන් වහන්සේ වදාළේ එම ධර්මකරුණු: "බහුධාතු" , "චතුචක්‍ර" (චතුපරිවටෙටා), "දහම් කැඩපත"(ධම්මාදාසොති), "අමත බෙරය"(අමතදුන්දුභිතිපි) , "අනුත්තර සංග්‍රාමවිජය" (අනුත්තරො සඞගාමවිජයො) ලෙසින් සිහියේ දරා ගත යුතුබවය. (The Many Kinds of Elements, The Four Cycles, The Mirror of the Dhamma, The Drum of the Deathless, The Supreme Victory in Battle). **මූලාශ්‍ර**: ම.නි: ( 3): 3.2.5 බහුධාතුක සූත්‍රය, පි.209, EMN: 115: The Many Kinds of Elements, p. 840.

▲ **ධම්ම පරියාය -ඉන්ද්‍රිය පිලිබඳ** - Method of exposition of faculties: මේ ධම්ම පරියාය ලෙසින් පෙන්වා ඇත්තේ ඉන්ද්‍රිය පහ හා බලපහ (**පංච ඉන්ද්‍රිය හා පංච බල**) අතර ඇති අන්‍යොන්‍ය සම්බන්ධයය. එනම්, පංච ඉන්ද්‍රිය, පංච බල බවට පත්වීම හා පංචබල, පංච ඉන්ද්‍රිය බවට පත්වීමය. පංච බල ඇත්නම් පංච ඉන්ද්‍රිය ඇත, පංච ඉන්ද්‍රිය ඇත්නම් පංච බල ඇත. **සටහන**: භික්බු බෝධි හිමිට අනුව මේ දෙක අතර ඉතා වැදගත් වෙනස්කමක් නැත. **බලන්න**: ESN: note: 230, p.2415. මේ පිලිබඳ දැක්වූ **උපමාව**: එක් ගංගාවක් නැගෙනහිරට බරව ගලයයි, එහි මැද දූපතක් වේ. එම ගංගාව එකක් ලෙසින් හෝ ගංගා 2ක් ලෙසින් හෝ පෙන්විය හැකිය. පළමු ක්‍රමයට අනුව දූපතේ නැගෙනහිර ඇති ජලය හා දූපතේ බටහිරට ඇති ජලය එකම ගංගාව ලෙසින් සැලකීම. දෙවන ක්‍රමයට අනුව: දූපතේ උතුරින් ඇති ජලය එක් ගඟක් ලෙසින්ද, දූපතට දකුණින් ඇති ජලය දෙවන ගඟ ලෙසද සැලකීම. එලෙස සලකන විට සද්ධා ඉන්ද්‍රිය, සද්ධා බලයය (ආදීවශයෙන්). **බලන්න**: දූපත උපමාව:උපග්‍රන්ථය:5 **මූලාශ්‍ර**: සංයු.නි: (5-1): මහාවග්ග: ඉන්ද්‍රියසංයුත්ත: ජරාවග්ග: 4.5.3 සාකෙත සූත්‍රය, පි.414.ESN:48: Indriyasamyutta: 43.3. Saketha, p.1975.

▲ **ධම්මපරියාය සෝකසල්ලහරණ**- Method of exposition of extraction of the dart of sorrow: මේ ධම්ම පරියාය භාවිතා කරන්නේ සිතේ ඇතිවන මහා දුක්-ශෝකය නැතිකර ගැනීම පිණිසය. එක්සමයක්, නාරද තෙරුන්, මුණ්ඩ රජුගේ ශෝකය පහ කිරීම් පිණිස වදාළ දේශනය, සෝකසල්ලහරණ ධම්ම පරියාය බව මෙහි දක්වා ඇත. **බලන්න**:උපග්‍රන්ථය:1,3. **මූලාශ්‍රය**: අංගු.නි: (3) 5 නිපාත: 5.1.5.10 සෝකසල්ලහරණ සූත්‍රය, පි.112.

▲**ධම්ම ප්‍රවාහය**- Dhamma Stream: ධම්ම ප්‍රවාහය -ධම්ම සෝතය- දහම නැමති දිය පහර, ලෙසින් බුදුන් වහන්සේ පෙන්වා ඇත්තේ, යම් කෙනෙක් ශීලය පරිපුර්ණ කරගත්විට, එම ගුණය සෙසු ධර්ම ගුණ පූර්ණ කරමින් ක්‍රම ක්‍රමයෙන් එම පුද්ගලයා විමුක්තිය දෙසට ගෙනයෑමය.

"**ධර්මය විසින්**, ධර්මය අනුක්‍රමයෙන් සපුරාගත්විට, ධර්ම ප්‍රවාහය විසින් මෙතෙර (සසර) සිට එතෙරට (නිවන) දක්වා ගෙනයයි":
**"ඉති ඛො භිකඛවෙ ධම්මා ච ධමෙම අභිසනන්‍දනති. ධම්මා ච ධමෙම පරිපූරෙනති අපරා පාරඞගමනායාති"** ( Thus, bhikkhus, one stage flows into the next stage, one stage fills up the next stage, for going from the near shore to the far shore.). **මූලාශ්‍ර**: අංගු.නි:(6):11 නිපාත:නිසසය වග්ග: 11.1.2 න චෙතනාය කරණිය සූත්‍රය,පි.614, EAN: 11 : Dependence:2.2 Volition p.566.

▼ **කෙනෙක් බුදුගුණ**, දහම්ගුණ, සඟගුණ, ශිලයේ ගුණ, චාගගුණ, දේවගුණ ආවර්ජනාකරනවිට (අනුසති භාවනා) , ඔහු, අසමවූ ජනයා (රාග දෝස මෝහයෙන් මැඩුන මිනිසුන්) අතර සමතුලිතව වාසය කරයි, දුකින් පෙළෙන ජනයා අතර නිදුකින් වාසය කරයි. ඔහු ධර්ම ප්‍රවාහයට (ධර්ම සොතයට) ප්‍රවිෂ්ඨව ඇතිබව බුදුන් වහන්සේ පෙන්වා ඇත. **බලන්න**: අනුසති භාවනා. **මූලාශ්‍ර**: අංගු.නි: (6 ):11 නිපාත: අනුසති වග්ග: 11.2.1 මහානාම සූත්‍රය,පි.645, EAN: 11: Recollection: 11.1 Mahanama , p.570.

▲**ධම්ම යුගල**- Pairs of Dhamma: ධම්ම යුගල (ද්වම ධම්ම) ලෙසින් මෙහිදී පෙන්වා ඇත්තේ දහම් කාරණා දෙකක් යුගලයක් ලෙසින් ගැනීමය. **බලන්න**: යුගල ධම්ම කරුණු .

▲ **ධම්මයෝගී**-Dhamma specialists: ධම්මයෝගින් ලෙසින් පෙන්වා ඇත්තේ ධර්මයේ විශාරදබව ඇති ධම්ම කථික භික්ෂූන්ය. ඔවුන් විස්මය දනවන (astounding) පුද්ගලයන්ය, ඔවුන් ධර්මයේ ගැඹුර- ස්කන්ධධාතු, අර්ථ, විදර්ශනා සහිත මාර්ග ප්‍රඥාව විනිවිද දුටු උතුමන්ය. ඔවුන් දුර්ලභය.එමනිසා, ධ්‍යායි භික්ෂුන් (භාවනායෝගී) පමණක්නොව, ධර්මයෝග (ධම්මකථික) භික්ෂුන් කෙරෙහිද පැහැදී , ඔවුන්ගේ ගුණ පවසමින් වාසය කලයුතුය. මේ හැම ලෝකයාගේ සුව සෙත පිණිස කටයුතු කරති. **සටහන:** මහාචුන්ද තෙරුන්, මේ අවවාද අනුසාසනා වදාළේ ඇතැම් සංඝයා, භවනා යෝගීන් පමණක් පසසන නිසා එම වැරදි ආකල්පය නිවැරදි කිරීම පිණිසය. **බලන්න**:ධ්‍යායි **මූලාශ්‍රය:** අංගු.නි: (4) 6 නිපාත: ධම්මිකවග්ග:1.6.5.4 මහාචුන්ද සූත්‍රය, පි.142.

▲ **ධම්ම යානය**-Dhamma vehicle: ධම්ම යානය නම් ආරියඅට මගය. **බලන්න**: ආරියඅටමග.

▲ **ධම්මරාජ**- King od the Dhamma: තථාගතයන්වහන්සේ ධම්ම රාජයාය, දහමේ ස්වාමියාය**. බලන්න**: තථාගතයන්වහන්සේ, බුද්ධනාම. **මූලාශ්‍රය**: අංගු.නි: (3) 5 නිපාත: රාජවග්ග: 5.3.4.3 ධම්මරාජ සූත්‍රය, පි.266.

▲**ධම්මරත්නය**-Dhammarathna: ධම්මරත්නය, ත්‍රිවිධ රත්නයේ දෙවෙනි රත්නයය. රතනසූත්‍රයේ, ධම්ම රත්නයේ ගුණ පෙන්වා ඇත.**බලන්න**: ත්‍රිවිධරත්නය.

▲ **ධම්මාරාම**-Dhammaraama: ධම්මාරාම ලෙසින් පෙන්වා ඇත්තේ ධර්මය ආරාමයක්- වාසස්ථානයක් කරගෙන ජීවත්විමය. එවැනි පුද්ගලයෝ, මේ ජීවිතයේදීම සුවයෙන් හා සැපයෙන් සිටිති.

**මූලාශ්‍ර:** අංගුනි: (4): 6 නිපාත: අරහත්වග්ග: 6.2.3.4 සුඛ සෝමනස්සසූත්‍රය, පි.254.

▲ **ධම්මරසය-** Flavor of Dhamma: බුදුන් වහන්සේ වදාළ ධර්මයේ ඇත්තේ එක් රසයකි, එනම් විමුක්ති රසය. මාර්ග ඵල සාක්ෂාත් කරගැනීම නිසා ආරියෝ ලබන විමුක්ති රසය අග්‍රතම රසයවේ. මාර්ගය සාක්ෂාත් වීම නිසා ලබන අර්ථරසය හා ඵල සාක්ෂාත් වීම නිසා ලබන ධම්ම රසය, මගින් විමුක්ති රසය ඇතිවේ. **මූලාශ්‍රය:** අංගු.නි: (1) 1 නිපාත:එකධම්මපාළිය: 1.16.4.15 සූත්‍රය, පි. 114.

▲ **ධම්මය වරදවා ගැනීම**- Taking the Dhaama in wrongway: ධම්මය වරදවා ගැනීම ලෙසින් පෙන්වා ඇත්තේ, දහම පිලිබඳ හරි අවබෝධය නොමැති අය, එය විකෘති කර දැක්වීමය. මෙය ධර්මයේ පරිහානියට බලපායි. එහෙත්, දහම නිවැරදි ලෙසින් අවබෝධ කරගත් අය ධර්මයේ දියුණුව ඇති කරයි. **බලන්න**: තථාගතයන්වහන්සේ. **මූලාශ්‍ර:** අංගු.නි: (1 ): 2 නිපාත: 2.1.3.2- 2.1.3.5 සූත්‍ර, පි. 154 , EAN: 2: 22.2-25.5, Suttas, p.60.

▲ **ධම්ම විග්‍රහය-**analysis of Dhamma: ධම්ම විග්‍රහය යනු ධර්මය විභාග කර බැලීමය. ධර්ම විග්‍රහයේ මූලික පරමාර්ථය වන්නේ, ධර්මය යහපත් ලෙසින් අවබෝධ කරගැනීමට උපකාරිවීමය, ධර්මය රැගෙන යාමය. ධර්මය රැගෙන යාම 'හාරය' වේ. **ධර්ම හාරය කොටස් 16** ක් සහිතව මහා කච්චාන මහා රහතන්වහන්සේ විසින් වදාරා ඇත: 1) **දේශනා හාරය-** ධර්මය දේශනා කිරීම: ආස්වාදය, ආදීනවය, නිස්සරණය හා උතුම් ඵලය (නිවන) හා ඒ පිණිස ඇති මාර්ගය පෙන්වාදීම පිණිස බුදුන් වහන්සේගේ උපදේශය, ධර්මය රැගෙන යාම පිණිස වූ ධර්ම දේශනාව, දේශනා හාරය වේ. 2) **විචය හාරය-** එම දේශනාව පිලිබඳ විමසීම: ධර්ම දේශනාව තුළ ප්‍රශ්නයෙන් අසන ලද කරුණු හා එම ප්‍රශ්න විසඳීම, සූත්‍රයේ ඇති පද, ගාථා, විමසීම් විචය හාරය වේ. 3) **යුත්ති හාරය-** එම දේශනාවේ කරුණු ගලපා බැලීම: දේශනාවේ ඇතුලත් අර්ථ ව්‍යංජන පිළිබඳව ගැලපීම-නොගැලපීම ආදීය බැලීම යුක්තිහාරය වේ. 4) **පදට්ඨාන හාරය-**එම දේශනාවට ආසන්න කරුණු සොයා බැලීම: දේශනාව ට ආසන්නවූ කරුණු ගැන බැලීම. 5) **ලක්ඛණ හාරය-** එම දේශනාවේ ලක්ෂණ බැලීම: සූත්‍රයේ දක්වා ඇති ධර්මයට සමානවූ ධර්ම පිලිබඳ ලක්ෂණ මතුකර පෙන්වා දීම. 6) **චතුබ්‍යූහ-** එම දේශනාව 4 ආකාරයකින් බෙදා දැක්වීම: 1.නිරුක්තිය (පද ව්‍යංජන විග්‍රහය) 2. සූත්‍රයේ අදහස්කල කාරනාව 3. සූත්‍රයට පසුබිම 4. පෙර අපර සන්ධි ගැලපීම. 7) **ආවට්ට හාරය-** එම දේශනාවට අනුව කුසල් අකුසල් නැවත විමසා බැලීම: යම්කිසි කුසල ධර්මයකට ආසන්න කරුණ එක් දහම් පදයකින් පෙන්වා ඇතිවිට, එයට සහායවන හා විරුද්ධ වන ධර්මයන්ගේ ආසන්න කරුණු පිළිබඳව කැරකි බැලීම. 8) **විභත්ති හාරය-** දේශනාවේ ඇතුලත් කරුණු විග්‍රහ කර දැක්වීම: දේශනාවේ ඇති ධර්මය, එය වැඩි දියුණුවට ආසන්න කරුණු, එයට අදාළ භූමිය ආදිය විග්‍රහකර දැක්වීමය. 9) **පරිවර්තන හාරය-** දේශනාවේ කුසල හා අකුසලයන් දක්වා ඇති විට, දියුණු කරගත යුතු කුසල්, ප්‍රහීණය කරගත යුතු අකුසල් හා ඒවාට විරුද්ධව ඇති කරුණු පෙන්වා දීම. 10) **වේවචන හාරය**: දේශනාවේ ඇති වචන පිළිබඳව සමාන අරුත් ඇති වචන දැක්වීම. 11) **පඤ්ඤත්ති හාරය-** දේශනාවේ පැනවීම් විග්‍රහ කිරීම: දේශනාවේ ඇතුලත් එක් ධර්මයක් පිළිබඳව බොහෝ සමාන වචන අරුත් පෙන්වා විග්‍රහ කිරීම. 12) **ඔතරණ හාරය-**දේශනාවේ අර්ථ අවබෝධයට බැසගැනීම: දේශනාවේ යම් පටිච්ච සමුප්පන්න ධර්ම, ඉන්ද්‍රිය, ස්කන්ධ, ධාතු, ආයතන ඇත්නම් ඒ ඒ ධර්මතා තුලින් දහම් මගට බැසගැනීමක් තිබේද යායි බැලීම. 13) **සෝධන හාරය-** දේශනාවේ අර්ථ පිරිසිදුකර බැලීම: යමක් අරහයා ඇසූ කරුණු ගැන ඇති විසඳුම- ලබාදීතිබේද යන්න විමසීම.14) **අධිට්ඨාන හාරය**: දේශනාවේ-සූත්‍රයේ අර්ථ දරා ගැනීම: තනිව හෝ විවිධ ලෙසින් හෝ දක්වා ඇති ධර්ම සැක නොකරයුතු බව පෙන්වීම. 15) **පරික්ඛාර හාරය-** හේතු ප්‍රත්‍ය ධර්මයෝ එකිනෙකට උපකාරීවීමෙන් ධර්මතා ඇතිවීම, ඒ හේතු ප්‍රත්‍ය වලට මුල්වන කරුණු සොයා බැලීම. 16) **සමාරෝපණ හාරය-** දේශනාවේ ඇතුලත් ධර්ම කාරනා වල අර්ථ මතුකර පෙන්වා දීම: යම් කුසල ධර්ම, ඊලඟ කුසල ධර්මවලට මුල්වේද, ඒවා සියල්ල තුලින් එකම අර්ථයක් ලබාදෙන බව බුදුන් වහන්සේ පෙන්වා ඇතිබව, ඉස්මතු කර පෙන්වාදීම. **බලන්න**: **නෙත්තිප්පකරණය:** විභාගවාරය: පි. 17, පරිවර්තනය: පූජ්‍ය කිරිබත්ගොඩ ඤාණානන්ද ස්වාමින් වහන්සේ. **මූලාශ්‍ර**: ඛු.නි: නෙත්තිප්පකරණය: විභාගවාරය: 1.උද්දේසවාරය,පි.22,

▲ **ධම්මවාදීන්**-Proponents of Dhamma: ධම්මවාදීන් යනු ධර්මයට පක්ෂපාතිව කථාකරණ, කෙළෙස් ප්‍රහිණය ගැන උගන්වන ආරිය උතුමන්ටය.**රාග, දෝස හා මෝහ** යන අකුසල ප්‍රහාණය පිණිස දහම්දෙසන උතුමෝ ලෝකයේ ධම්මවාදීන්ය යි සැරියුත් තෙරුන් දක්වා ඇත. **සටහන:** තථාගතයන් හා රහතුන් ධම්මවාදීන්ය. **මූලාශ්‍ර:** සංයු.නි: (4 ): සළායතන වග්ග: ජම්බුඛාදක සංයුත්ත: 4.1.3 ධම්මවාදී සූත්‍රය, පි. 502, ESN: Salayatanasamyutta: IV: 38 Jambukhādaka : 3 Proponents of Dhamma, p. 1398.

▲ **ධම්මවේදය**-Dhmmavedaya: ධම්මවේදය ලෙසින් පෙන්වා ඇත්තේ ධර්මය යහපත් ලෙසින් අවබෝධ කරගැනීමය, එවැනි පුද්ගලයා **ධම්මවේදීයාය**. ධර්මය දේශනා කරනවිට ඔහු ධර්මයේ අර්ථය (අර්ථවේදය), තේරුම්ගනී, ඉන්පසු ධර්මය මැනවින් අවබෝධ කර (, ධම්මවේදය) ප්‍රමෝදමත් සිතක් ඇතිව  සිටී. මේ ගුණය, ධර්ම මරේගය දියුණු කරගැනීමට උපකාරීවන කරුණකි. **මූලාශ්‍රය:** අංගු.නි: (6) 11 නිපාත: අනුස්සතිවග්ග: 11.2.7 ගෝපාලක සූත්‍රය, පි.682.

▲ **ධම්මවිනය-**The Dhamma and discipline: බුදුන් වහන්සේ සංඝයාට වදාළ උගැන්වීම, අවවාද අනුසාසනා  විනය උපදෙස්, ධම්ම විනයවේ. සුගත විනය ලෙසින්ද පෙන්වා ඇත. ලෝකයේ ධර්ම විනය පවත්නා තෙක් බුදුසසුන චිරාත් කාලයක් වැජඹේ යයි බුදුන් වහන්සේ වදාළහ.**බලන්න**: විනය.

▼**තථාගතයන් වහන්සේ ලෝකයේ පහළව ධර්ම විනය ප්‍රකාශ කරයි** ජාති ජරා මරණ යන ත්‍රිවිධ ධර්මතා ලෝකයේ පවතිනවිට තථාගතයන් පහලවේ, ධම්ම විනය ඇතිවේ, බැබලේ. **මූලාශ්‍ර**:අංගු.නි: (6) : 10 නිපාත: 10.2.3.6 තයෝධම්ම සූත්‍රය,පි.284, EAN:10: 76-6.Incapable, p. 524.

▼ **ධම්ම විනයේ** අට ආකාර අසිරිමත් ගුණ ඇතිබව මෙහිදී පෙන්වා ඇත. **බලන්න**: අෂ්ඨ ආශ්චර්ය ධම්මගුණ. **මූලාශ්‍රය**: අංගු.නි: (5) 8 නිපාත: මහවග්ග:8.1.2.9 පහාරද සූත්‍රය, පි.104.

▼ **අනාවරණය කලවිට ධම්ම විනය බබලයි**: බුදුන් වහන්සේ මෙසේ වදාළහ:"...තථාගතයන් වහන්සේ විසින් වදාළ ධම්මවිනය විවෘතවූ විට බබලයි. වැසුන විට නො බබලයි".**"තථාගතප්පවෙදිතො ධම්මවිනයො භික්ඛවෙ විවටො විරොචති නො පටිච්ඡනෙනා". මූලාශ්‍ර**: අංගු.නි: (1 ): 3 නිපාතය: 3.3.3.9 සූත්‍රය, පි. 510, EAN:3: 131.9. Concealed, p. 137.

▼ **ධම්ම විනය සත්‍යයය**: බුදුන් වහන්සේ වදාළ ධර්මවිනය සත්‍යයය:

**" අයං බො පන භික්ඛවෙ මයා ධම්මො දෙසිතො අනිග්ගහිතො අසඞ්කිලිට්ඨො අනුපවජ්ජො අප්පතිකුට්ඨො සමණෙහි බ්‍රාහ්මණෙහි විඤ්ඤූහි"**. (මා විසින්  (බුදුන් වහන්සේ විසින්) උගන්වා වදාළ ධර්මය: වැරදිය යි (අසත්‍යයයි) ඔප්පු කල නොහැකිය, නොකිළිටිය (කෙළෙස් රහිතය), කෙනෙකුට නින්දා කිරීමට (ගැරහීමට) නොහැකිය, නුවණැති ශ්‍රමණබ්‍රහ්මණයන් විසින් විවේචන නොකළ (සංසෝධනය නොකල ) ධර්මයකි. (the Dhamma taught by the Buddha is unrefuted, undefiled, irreproachable, and un censured by wise ascetics and brahmins). **සටහන:** ඒ ධර්මතා නම්: සය ධාතු, ස්පර්ශ ආයතන සය,

මනෝ උපවිචාර 18, චතුරාර්ය සත්‍යය යි මේ සූත්‍රයේ පෙන්වා ඇත. **බලන්න**: ධර්මයේ සද්භාවය. **මූලාශ්‍ර**: අංගු.නි: ( 1): 3 නිපාත: මහාවග්ග: 3.2.2.1 සූත්‍රය, පි. 348, EAN:3: The Great Chapter, 61.1 Sectarian, p. 104.

▼ **ධම්ම විනය දසධර්මයෙන් යුක්තය**: ධම්ම විනයේ දස ධර්මය ලෙසින් මෙහිදී පෙන්වා ඇත්තේ 1-8 සම්මාදිට්ඨිය මුල් කරගත් ආරිය අටමග හා 9 සම්මා ඤානය 10 සම්මා විමුක්තිය යන දස ධර්මතාය. 1) එම දස ධර්ම ඇත්තේ... 2) දස ධර්ම නිර්මලව හා පවිත්‍රව ඇත්තේ ... 3) නුපන් දසධර්ම උපදින්නේ...4 ) ඒවා නිසා මහත් ඵල මහා ආනිසංස ලැබෙන්නේ... 5) ඒවා නිසා රාග දෝස හා මෝහය යන අකුසල් ප්‍රහාණය වන්නේ... 6) ඒවා නිසා ඒකාන්ත නිබ්ද්දාව, විරාගය, නිරෝධය, උපසමය, අභිඤ්ඤාය, සම්බෝධිය හා නිවන සාක්ෂාත් වන්නේ... 7) ඒවා භාවිතය මගින්, නිතර දියුණු කිරීම මගින්, නුපන් ධර්මතා උපදින්නේ... 8) ඒවා වර්ධනය කර ගැනීමෙන් මහා අර්ථලාභ උපදින්නේ... 9) ඒවා වර්ධනය කිරීමෙන් අකුසල මුල් නැති කර ගැනීමට හැකිවන්නේ... 10) ඒවා වඩා ගැනීමෙන් මාර්ගය වැඩි විමුක්තිය සාක්ෂාත් වන්නේ සුගත්යන්ගේ ධම්ම විනයේ පමණි. **මූලාශ්‍ර:** අංගු.නි: (6 ): 10 නිපාතය: පාරිශුද්ධ වග්ග සූත්‍ර, පි. 462, EAN:10: III Purified, p. 547.

▼ **ධම්ම විනයට ඇති අනාගත භය**: ධම්ම විනයට අනාගතයේදී සිදු විය හැකි **භය 5** ක් (ධර්ම විනය පිරිහීයාමට හේතුවන කරුණු) පෙන්වා දුන් බුදුන් වහන්සේ සංඝයාට වදාළේ, එම කරුණු දැන, ඒවායේ ප්‍රහාණය පිණිස විරිය ඇතිව කටයුතු කලයුතු බවය: **1 හා 2 :** අනාගතයේදී අධි ශිලය, අධි චිත්තය, අධි ප්‍රඥාව නොමැති භික්ෂූන්, සංඝයා උපසම්පදා කරයි.ආධුනික සංඝයා රැකබලාගන්නා ගුරුවරුන් මෙන් කටයුතු කරයි, නිස්සය දෙයි. ගුරුවරුන් යහපත් ලෙසින් ධම්ම විනය අනුගමනය නොකරන නිසා ඔවුන්ගේ ශිෂ්‍ය පරම්පරාව ද දිගින් දිගටම ධර්මානුකූලව කටයුතු නොකිරීමට නැඹුරුවේ.**3** අනාගතයේදී අධි ශිලය, අධි චිත්තය, අධි ප්‍රඥාව නොමැති භික්ෂූන් ධර්ම කථාවල යෙදේ. යහපත් ධර්මය නොදන්නා නිසා ඔවුන්ගේ දේශනා අධර්මය දෙසට බරවේ.**4** අනාගතයේදී අධි ශිලය, අධි චිත්තය, අධි ප්‍රඥාව නොමැති භික්ෂූන් තථාගතයන් වහන්සේ දෙසූ දහම් කරුණු අවබෝධ කරගැනීමට උත්සාහය නොකරයි, සසුනට බාහිරවූ පුද්ගලයන්ගේ ප්‍රකාශන ගැන සිතඅලවයි.**5** අනාගතයේදී අධි ශිලය, අධි චිත්තය, අධි ප්‍රඥාව නොමැති භික්ෂූන් සිවුපස ලැබීම ආදී කරුණු කෙරේ සිත යොමුකරයි. අධිගමය (නිවන) ලබා ගැනීමට කටයුතු නොකරයි. ඔවුන්ගේ ශිෂ්‍ය පරම්පාරවන්ද එලෙසින් කටයුතු කිරීමට නැඹුරුවේ. **මූලාශ්‍ර:** අංගු.නි: ( 3): 5 නිපාත: 5.2.3.9 අනාගත භය සූත්‍රය, පි.192, EAN:5: 79.9 Future Perils, p. 268.

▼**ධම්මවිනය පරිහාණිය හා වර්ධනය-**Dhamma vinaya decline & growth: ආරිය ශිලය, ආරියසමාධිය,ආරිය ප්‍රඥාව, ආරිය විමුක්තිය නොමැති විට කෙනෙක් ධර්ම විනයේ පිරිහිමට පත්වේ. එහෙත්, එම ගුණ සතු පුද්ගලයා ධර්මවිනයේ වර්ධනයට පත්වේ. **මූලාශ්‍රය:** අංගු.නි: (2) 4 නිපාත:භන්ඩාගමවග්ග:4.1.1.2 පප්තිත සූත්‍රය, පි.26.

▼ **ධම්මවිනය පැවතීම හා පරිහානිය**: **ධම්මවිනය පැවතීමට කරුණු:** අප්‍රමාදය, විරිය, අල්පබව, සන්තුෂ්ටිය, යෝනිසෝමනසිකාරය,

සම්පජඤ්ඤය, කල්‍යාණ මිත්‍ර සේවනය, කුසල් කිරීම, ධර්මය යහපත් ලෙසින් දේශනා කිරීම. **ධම්මවිනය පරිහානියට කරුණු:** ප්‍රමාදය, කුසිතකම, මහා ලෝභය, අසන්තුෂ්ටිය, අයෝනිසෝමනසිකාරය, අසම්පජඤ්ඤය, පාප මිත්‍ර සේවනය, අකුසල් කිරීම. වැරදි ධර්මය දේශනා කිරීම. **මූලාශ්‍රය:** අංගු.නි: (1) 1 නිපාත: 1.10.21 සූත්‍රය, පි. 76.

▼ **ධම්ම විනයේ දිව්‍ය යානය -උතුම් යානය** ආරිය අටමගය. **බලන්න**: ආරියඅටමග.

▼ **ධම්ම විනයේ දුෂ්කර දේ**- Difficult things in Dhamm Vinaya: ධම්ම විනයේ දුෂ්කර කරුණු සැරියුත් මහා තෙරුන් මෙසේ දක්වා ඇත: 1) පැවිදි ජීවිතයට පැමිණීම- (පබ්බජා- Going forth) 2) පැවිදිජීවිතය ගෙනයාමට ඇල්ම ඇතිකරගැනීම 3) පැවිදි ජීවිතයට ඇල්ම ඇති අයට ධර්මානු ධම්ම ප්‍රතිපත්තිය ගෙනයාම දුෂ්කරය. එහෙත් ධර්මානු ධම්ම ප්‍රතිපත්තිය යහපත් ලෙසින් ගෙනයන්නේ නම් නොබෝකලකින් අරහත්මගඵල ලබාගත හැකිය. **මූලාශ්‍ර**: සංයු.නි: ( 4 ): සළායතන වග්ග: ජම්බුඛාදකසංයුත්ත: 4.1.1. දුක්කර සූත්‍රය, පි. 512, ESN: Salayathnasamyutta: IV: 38 Jambukhādaka: Difficult to do: Suffering, p. 1411.

▼ **භික්ෂුවක් ධම්ම විනයෙහි පිරිහීමට** පත්වන අන්දම මහා මුගලන් තෙරුන් පෙන්වා ඇත: **1)** ක්‍රෝධයෙන් සිටීම (anger ) 2) බද්ධ වෛරයෙන් සිටීම (උපනාහ- hostile) 3) ගුණමකුබව (මකඛ- denigration) 4) අහංකාරය -ගරුසරු නැතිබව (යුගග්‍රාහ- insolent) 5) ඊර්ෂ්‍යාව-ඉරිසියාව ඇතිබව (envious) 6) මසුරුබව (miserliness) 7) කපටිබව (ශඨ-craftiness) 8) මායා සහිත බව (වංචනික-deceitful) 9) පාපික ඉච්ඡා (ලාමක ආශා- evil desires) 10) මුළා සිහිය ඇති නිසා මතු ආධ්‍යාත්මික දියුණුවට- අධිගමයට කටයුතු කිරීමට උත්සාහ නොගැනීම.

**"...සො වතාවුසො භික්ඛු ඉමෙ දස ධම්මෙ අප්පහාය ඉමස්මිං ධම්මවිනයෙ වුඩ්ඪිං විරූළ්හිං වෙපුල්ලං ආපජ්ජිස්සතීති නෙතං ඨානං විජ්ජති. සො වතාවුසො භික්ඛු ඉමෙ දස ධම්මෙ පහාය ඉමස්මිං ධම්මවිනයෙ වුඩ්ඪිං විරූළ්හිං වෙපුල්ලං ආපජ්ජිස්සතීති ඨානමෙතං විජ්ජති"** එම අකුසල ධර්ම 10 ය, පහ නොකර, ධම්ම විනයේ දියුණුව ලබාගැනීමට, වර්ධනය ඇතිකර ගැනීමට, පරිණතබවට පත්වීම ට හැකියාව නැත. එහෙත්, ඒවා පහකර ගැනීමෙන් ධම්ම විනයේ දියුණුව ලබාගැනීමට, වර්ධනය ඇතිකර ගැනීමට, පරිණතබවට පත්වීම ට හැකියාව ඇත, එය විද්‍යාමාන කරුණකි. **සටහන්: * අධිමාන සූත්‍රයේ** ධම්ම විනයේ පරිහානිය ඇතිවන තවත් කරුණු 10 ක් මහා කාශ්‍යප තෙරුන් පෙන්වා ඇත: 1) දැඩි ආශාව (අබිජ්ජා) 2) ව්‍යාපාදය 3) අලසකම හා නිදිමත 4) සිතේ ඇති නොසන්සුන්බව -උද්දච්චය 5) විචිකිච්චාව-සැකය 6) වැඩ බහුල කර ගැනීම හා වැඩට ඇලීම-කර්මාරාමතාව 7) කථාවට ඇලුම් කිරීම- දොඩමළුබව 8) නින්දට ඇලුම් කිරීම 9) සෙසු අය හා නිතර ආශ්‍රය කිරීම ඇලුම් කිරිම 10) මාර්ගයේ සුළු වූ අත්දැකීම් ලබා ඉන් සෑහීමට පත්වී දුක කෙළවර කරගැනීමට උනන්දු නොවීම. එම කරුණු පහ කරගත්විට ආධ්‍යාත්මික වර්ධනය පරිණත කරගත හැකිවේ. ** **කත්ථී සූත්‍රයේදී** මහා චුන්ද තෙරුන් ධම්ම විනයේ පරිහානිය ඇති කරණ අතිරේක කරුණු පෙන්වා ඇත: 1) දුශ්ශීල බව 2) අශ්‍රද්ධාව 3) දහම් දැනුම

අල්ප බව හා අයහපත් හැසිරීම 4) අකීකරුබව - අවවාද පිළිගැනීමට ඇති අකමැත්ත 5) පාපමිත්‍ර සේවනය 6) කුසීත බව- අලසකම 7)මුලාවූ සිහිය ඇති බව - සිත අවුල් කර ගෙන සිටීම 8) කුහකබව 9) නඩත්තු කිරීම අපහසුබව- දුබ්භරො 10) ප්‍රඥාව නොමැතිබව- දුප්ප ප්‍රඥා. ධම්ම විනය වර්ධනය කරගැනීමට නම් මේ අකුසල පහ කර ගත යුතුවේ. **මූලාශ්‍ර:** අංගු.නි: (6 ): 10 නිපාත: 10.2.4.4. ව්‍යාකරණ සූත්‍රය, පි. 304, 1.2.4.6 අධිමාන සූත්‍රය, 316, 10.2.4.5 කත්ථී සූත්‍රය, පි. 308 EAN: 10: 84.4 Declaration p. 526 &  86.6. Final Knowledge, p. 528, 85.5 The Boaster, p. 527.

▼**ධම්ම විනයේ සුඛ හා දුක**: ධම්ම විනය පිලිබඳ අනභිරතිය (ඇල්ම නැතිබව) දුකය, අභිරතිය (ඇල්ම) සුඛය යයි සැරියුත් මහා තෙරුන් පෙන්වා ඇත. ධර්ම මාර්ගය වඩන භික්ෂුව: (භාවනාව පිණිස) ඇවිදීම, ඉඳීම, සිටීම, හා සයනය-ඇලවීම-සතර ඉරියව්ව, (පිණ්ඩපාතය පිණිස) ගමට ගියවිට, (හුදකලා විවේකය පිණිස) වනයට, රුක්මුලකට, හිස් කුටියකට, එළිමහන් තැනකට ගියවිට, සංඝයා සමග හැසිරෙනවිට, ඔහුට සතුටක්, සැපයක් ඇති නොවීම ධම්ම විනයේ දුකය. එහෙත්, එම කටයුතු වල යෙදන භික්ෂුවට ඒ පිලිබඳ සතුටක්, සැපක් ඇතිවේනම් එය ධම්ම විනයේ සුඛය වේ. **මූලාශ්‍ර:** අංගු.නි: (6) 10 නිපාත: දුතිය සුඛසූත්‍රය, පි.246, EAN:10: 66.6 Happiness ,p. 519.

▼ **ධම්ම විනය වර්ධනය කරගැනීමට** භික්ෂුව, කරුණු 11ක් සපුරා ගතයුතු යයි බුදුන් වහන්සේ පෙන්වා ඇත: 1) **රූපය** අවබෝධකිරීම - රූපඥ: සියලු රූප සතර මහා ධාතුන් ගෙන් හටගෙන ඇතිබව 2) **ලක්ෂණ** අවබෝධකිරීම- බාල පණ්ඩිත බව හඳුනාගැනීම  3) **අකුසල විතක්ක** පහකරගැනීමේ හැකියාව 4) මනා **ඉන්ද්‍රිය සංවරය** තිබීම 5) **ධර්මය ප්‍රගුණ** කර, දේශනා කිරීමේ හැකියාව තිබීම 6) **ජේෂ්ඨ**, බහුශ්‍රැත භික්ෂූන් නිතර හමුවී දහම් කරුණු විමසීම 7) ධර්මය අසනවිට එහි අර්ථයද, ධර්මයද මැනවින් දැන සතුටට පත්වීම (**අර්ථවේදී-ධම්මවේදී**) 8) **ආරිය අටමග** ගැන යහපත් අවබෝධය තිබීම 9) **සතර සති පට්ඨානයේ** දක්ෂවීම 10) **සිව්පස** පමණ දැන පිළිගැනීමේ දක්ෂවීම 11) වැඩිහිටි සංඝයා කෙරෙහි ගරු සැලකිලි කිරීම-ගෞරවය. **සටහන:** එම කරුණු 11 න් සමන්විත භික්ෂුව දක්ෂ ගොපල්ලවයෙක් යයි බුදුන් වහන්සේ උපමා කර ඇත.**බලන්න**: උපග්‍රන්ථය:5 **මූලාශ්‍ර**: ම.නි: (1 ) 1.4.3 මහා ගෝපාලක සූත්‍රය, පි.546, EMN:33: The greater discourse on the cowherd, p.292.

▲ **ධම්මයේ විශේෂභාවය-** Specialty in Dhamma: ධම්ම 6 කින් සමන්විතතවීම මගින්, භික්ෂුවට ධම්මයේ විශේසභාවය ඇතිවේ:1) හානභාගිය ධර්ම යථා භූත ලෙසින් දැනගැනීම (qualities that pertain to deterioration) 2) ස්ථිතිභාග ධර්ම යථා භූත ලෙසින් දැනගැනීම (qualities that pertain to stabilization)  3) විශේෂභාගිය ධර්ම යථා භූත ලෙසින් දැනගැනීම (qualities that pertain to distinction) 4) නිබ්බේදභාගිය ධර්ම ධර්ම යථා භූත ලෙසින් දැනගැනීම (qualitiesthat pertain to penetration) 5) යපත් ලෙසින් පුහුණුවීම (practices carefully) 6) සුදුසු දේ කිරීම (does what is suitable). **සටහන:** විශේසභාවය ලෙසින් පෙන්වා ඇත්තේ අනාගාමීබව ලැබීමය. **මූලාශ්‍ර:**

අංගු.නි: (4): 6 නිපාත:අනාගාමිවග්ග: 6.2.2.7 සක්ඛිභබ්බ සූත්‍රය, පි.246, EAN:6: 71.7 Capable of Realizing, p.359.

▲**ධම්ම විහාරි-**Dhamma vihara: ධම්මවිහාරි ලෙස මෙහිදී පෙන්වා ඇත්තේ, සූත්‍ර ආදී නවඅංග සාසන ධර්මය ප්‍රගුණ කරන, එහෙත්, ඒ ධර්ම පරියාපත්තියෙන් දවස නො ගෙවන, ප්‍රඥාවෙන් ඒ ධර්මතාවල අර්ථය දන්නා, ඒකීය භාවය ඇති, ආධ්‍යාත්ම චිත්ත සමථයෙහි යෙදන භික්ෂුව/ භික්ෂුණිය ය. **සටහන**: 1. පර්යාප්ති බහුල පුද්ගලයා 2. සංඥාප්ති බහුල පුද්ගලයා 3. සජ්ජායනා බහුල පුද්ගලයා4. විතක්ක බහුල පුද්ගලයා , මොවුන් ධම්මවිහාරින් නොවේ යයි මෙහිදී පෙන්වා ඇත. **මූලාශ්‍ර:** අංගු.නි: (3): 5 නිපාත: අනාගතභය වග්ග: 5.2.3.3 හා 5.2.3.4 සූත්‍ර, පි.160.

▲**ධම්ම සාකච්ඡා-** Dhamma Discussions: ධම්ම සාකච්ඡා කිරීම සුභ කරුණක්යයි මංගල සූත්‍රයේ පෙන්වා ඇත. ධර්මය සාකච්ඡාවක් කිරීමට සුදුසු පුද්ගලයෙක් සතු ගුණ මෙහි දක්වා ඇත. **බලන්න**: සාකච්ඡා. **මූලාශ්‍රය:** අංගු.නි: (3): 5 නිපාත: ආඝාතවග්ග: 5.4.2.3 සාකච්ඡා සූත්‍රය, පි.330.

▲**ධම්ම සංචේතනා** -Dhamma sanchethana: ධර්මය පිලිබඳ ඇතිකරගන්නා යහපත් චේතනා ධම්ම සංචේතනා ලෙසින් පෙන්වා ඇත. **බලන්න**: චේතනා.

▲ **ධම්ම සජ්ජායනා**: පාලි: **ධම්මො සඞගායිතබ්බං** Chanting the Dhamma: ධම්ම සජ්ජායනය යනු, සංඝයා එක්ව හිඳ ධර්මය ගායනය කිරීම, පිරිත් මෙන් දේශනා කිරීමය.තමන් වහන්සේ විශේෂ නුවණින් අවබෝධකළ ධර්මය: 37ක්වූ බෝධිපාක්‍ය ධර්මය- සංඝයා එක්රැස්ව, අර්ථ, ව්‍යංජන සසඳා බලමින් සජ්ජායනය කලයුතුයයි බුදුන් වහන්සේ සංඝයාට අනුසාසනා කර ඇත. ධර්මය සජ්ජායනා කිරීම, සසුන දිගුකලක් පවත්වා ගැනීම පිණිස, දෙව්මිනිසුන්ගේ හිතසුව පිණිස, වැඩ පිණිස පවතී.**බලන්න**: සජ්ජායනා. **මූලාශ්‍ර:** දීඝ.නි: (3): 6 පාසාදික සූත්‍රය- ඡෙදය14, පි. 228, EDN: 29 Pasadika Sutta: The Delightful Discourse -section 17, p. 320.

▼**සම්මා සම්බුදුවූ** භාග්‍යවතුන් වහන්සේ වදාළ ස්වක්ඛාත ධර්මය, සංඝයා එක්ව, සමගියෙන් යුතුව සජ්ජායනා කලයුතුවේ යයි මහා සැරියුත් තෙරුන් වදාළහ: ධර්මය සජ්ජායනා කිරීමේ අරමුණු: බ්‍රහ්මචාරී ජීවිතය යහපත් ලෙසින් පවත්වා ගැනීම පිණිස, ධර්මයේ චිරස්ථිතිය බව පිණිස, දෙව් මිනිසුන්ගේ යහපත, සුවය හා සැපය පිණිස, ඔවුනට අනුකම්පාව දක්වීම පිණිසය ය. **මූලාශ්‍ර**: දිඝ.නි: (3 ):10 සංගිති සූත්‍රය- ඡෙදය7, පි. 372 , EDN: 33 Saṅgīti Sutta: The Chanting Together-section 1.7, p. 362.

▲ **ධම්මපද සතර-** Four Dhammas: ධම්මපද 4 ලෙසින් මෙහි පෙන්වා ඇත්තේ: 1) අනභිධ්‍යා ධම්මපදය 2) අව්‍යාපාද ධම්මපදය 3) සම්‍යක් සති ධම්මපදය 4) සම්‍යක් සමාධි ධම්මපදය. මේවා දිගුකලක් තිස්සේ පැවැතඑන, ආර්යවංශය ලෙසින් හඳුන්වන, පුරාණික-පෙර බුදුවරුන්ද දේශිත, තුන් කලයේ බැහැර නොකරන ලද, නුවණැතියන් නොගරහන ලද ධර්මය වේ. **මූලාශ්‍රය**: අංගු.නි: (2) 4 නිපාත: උරුවෙලවග්ග: 4.1.3.9 ධම්මපද සූත්‍රය, පි.80.

▲ **ධම්මයේ යේ සද්භාවය-** Truthfulness of Dhamma: ධම්මය සද්භාවය සහිතය- සත්‍යයය, කිසිවෙකුට අසත්‍යයයි ඔප්පු කළ නොහැකිය.බුදුන් වහන්සේ මෙසේ වදාළහ:

**" අයං ඛො පන භික්ඛවෙ මයා ධම්මො දෙසිතො අනිග්ගහිතො අසංකිලිට්ඨො අනුපවජ්ජො අප්පතිකුට්ඨො සමණෙහි බ්‍රාහ්මණෙහි විඤ්ඤූහි".** 'මහණෙනි, ශ්‍රමනයන් විසින් හෝ බමුණන් විසින් හෝ නුවණැත්තන් විසින් හෝ නිග්‍රහ කළ නොහැකි, කෙලෙසන්නට නොහැකි, උපවාද කරන්නන්ට නොහැකි, බැහැර කරන්නට නොහැකි මේ ධර්මයක් මා විසින් දෙසන ලද්දේය' (...bhikkhus, this Dhamma taught by me is unrefuted, undefiled, irreproachable, and uncensured by wise ascetics and brahmins).**ඒ ධර්මතා : 1) ධාතු සය (**six elements) 2) **ස්පර්ශ ආයතන සය** (six bases for contact) 3) **මනෝ උපවිචාර 18** (eighteen mental examinations) 4) **සතර ආර්ය සත්‍ය** (the four noble truths). **බලන්න**: ධාතු, ස්පර්ශ ආයතන සය, මනෝ උපවිචාර, චතුරාර්ය සත්‍ය. **මූලාශ්‍ර**: අංගු.නි: (1): 3 නිපාතය: මහාවග්ග: 3.2.2.1 සූත්‍රය, පි. 348, EAN:3: The Great Chapter, 61.1 Sectarian, p.104.

▲ **ධම්ම සැපය**: කම්සැපට වඩා දහම් සැපය අග්‍රබව මේහි පෙන්වා ඇත: එක්සමයක දේවතාවියක් සමිද්ධි තෙරුන්හට: මෙලොව දැකිය හැකි පස්කම් සුවය විඳීම සුදුසුයයි පැවසුහ. එවිට සමිද්ධි තෙරුන් මෙසේ පැවසුහ:

" කම්සැප කාලික බව (කෙටිබව) එහි බොහෝ දෝස ඇතිබව, මේ ධර්මය තමන් විසින්ම දැකිය යුතුය, කල්නොයවා විපාක දෙන සුළුය, එව බලව යයි කීමට සුදුසුය, තමන්ගේ සිතේ දරාගෙන සිටීමට සුදුසුය. නුවණැත්තන් විසින්ම අවබෝධ කරගතයුතුය' යි බුදුන් වහන්සේ වදාළහ', එමනිසා තමන්-මම මොලොවදීම ලැබෙන දහම් සැප හැර කෙටි කම් සැප ලුහුබඳින්නේ නැත".**සටහන**: සමිද්ධ තෙරුන්-බලන්න: උපග්‍රන්ථය:1 **මූලාශ්‍ර**:සංයු.නි:(1 ):සගාථවග්ග: දේවතාසංයුත්ත: 1.2.10 සමිද්ධි සූත්‍රය, පි. 44, ESN: Devatasamyutta: 20.10 Samiddhi, p. 79.

▼ **යහපත් ලෙසින් ධර්මය** පුරුදු පුහුණු කරනවිට සතුට සැපය ලැබේ යයි බුදුන් වහන්සේ වදාළහ:

**"ධම්මො සුචිණ්ණො සුඛමාවහාති"** (Dhamma practiced well, brings happiness).**මූලාශ්‍ර:** සංයු.නි: ( 1): සගාථවග්ග:දේවතාසංයුත්ත: 1.8.3 විත්ත සූත්‍රය, පි. 104, ESN: Devatasmyutta: 1: 73.3. Treasure, p.155.

▲ **ධම්ම සමාදානය-**ways of undertaking things: ධම්ම සමාදානය ලෙසින් පෙන්වා ඇත්තේ ධර්ම කරුණු පිලිබඳ කටයුතු කල යුතු ආකාරයය. මේ සූත්‍රයේ ධර්ම සමාදාන 4 ක් පෙන්වා ඇත. යම් ලෙසකින් කටයුතු කිරීමෙන්: 1. **මෙකල දුක් විපාක ඇතිවේ, මතු කලද දුක් විපාක ඇතිවේ**: 1) අනුවණ, දහම නොදත් පුද්ගලයා අවිද්‍යාව නිසා යථාබව නොදැන, වර්ධනය නොකළ යුතු අකුසල වර්ධනය කරයි. ඒ නිසා යහපත් ධර්මතා පිරිහේ, අයහපත වැඩේ. 2) එහෙත්, නුවණැති දහම දත් පුද්ගලයා යම් ලෙසකින් කටයුතු කිරීමෙන්: මෙකලද දුක ඇතිවේ,

මතුකලද දුක ඇතිවේ යයි යථා බව දැන අකුසලයේ නොයෙදේ. ඔහුගේ අයහපත් අකුසල පිරිහේ, යහපත් කුසල වැඩේ. **සටහන**: මෙහිදී පෙන්වා ඇත්තේ දස අකුසලයේ යෙදීමය. **ඒ පිලිබඳ උපමාව**: වස යොදා ඇති කරවිල වැනි තිත්ත පානයක් ඇත. ජීවත්වීමට කැමති, සැප ලැබීමට කැමති, දුක් වේදනා නැතිකර ගැනීම ට කැමති කෙනෙක් සිටිති. එම පානය ගතහොත් එහි විස නිසා ඔහු ට බොහෝ වේදනා ඇතිවේ, මරණයට පත්වේ යයි අන් අය ඔහුට කියති. ඒ අවවාද නො අසන ඔහු ඒ පානය ගැනීම නිසා මෙලොව දුක් විඳ මරණයට පත්වේ. **බලන්න**:උපමා. උපග්‍රන්ථය:5 2. **මෙකල සුඛ විපාක ඇතිවේ, මතු කල දුක් විපාක ඇතිවේ.** 1) අනුවණ, දහම නොදත් පුද්ගලයා අවිද්‍යාව නිසා යථාබව නොදැන- වර්තමානයේ සුඛ ඇතිකරන, එහෙත්, අනාගතයේ දුක ඇතිකරන අකුසල ධර්මයේ යෙදේ. ඒ නිසා යහපත් ධර්මතා පිරිහේ, අයහපත වැඩේ. 2) එහෙත්, නුවණැති දහම දත් පුද්ගලයා යම් ලෙසකින් කටයුතු කිරිමෙන්: මෙකල සුඛ ඇතිවේ, මතුකලද දුක ඇතිවේ යයි යථා බව දැන අකුසලයේ නොයෙදේ. ඔහුගේ අයහපත් අකුසල පිරිහේ, යහපත් කුසල වැඩේ. **සටහන:** කෙනෙක් දස අකුසලය කිරීමනේ සතුට ලබයි. එනිසා මතුකළ දුක් විපාක විඳි. ඒ **පිලිබඳ උපමාව**: වස ඇති එහෙත් මිහිරිවූ පානයක්, ලස්සන බඳුනක ඇත. ජීවත්වීමට කැමති, සැප ලැබීමට කැමති, දුක් වේදනා නැතිකර ගැනීම ට කැමති කෙනෙක් සිටිති. අන් අය ඒ පානය විස සහිත යයි පැවසුවද, ඒ නොසලකා ඔහු එම පානය ගනී. දැන් මිහිරි රස විඳ, වස නිසා මතුවේ ඔහු මියයයි. 3. **මෙකල දුක් විපාක ඇතිවේ, මතු කල සුඛ විපාක ඇතිවේ** . 1) අනුවණ, දහම නොදත් පුද්ගලයා අවිද්‍යාව නිසා යථාබව නොදැන- යම් දේ කිරීමෙන් දැන් දුක ඇතිවුවත්, අනාගතයේ සුඛ ඇතිවේ යන්න නොදැන කටයුතු වල දේ. ඒ නිසා යහපත් ධර්මතා පිරිහේ, අයහපත වැඩේ. 2) එහෙත්, නුවණැති දහම දත් පුද්ගලයා යම් ලෙසකින් කටයුතු කිරිමෙන්: මෙකල දුක ඇතිවේ, මතුකලද දුක ඇතිවේ යයි යථා බව දැන කුසලයේ යෙදේ. ඔහුගේ අයහපත් අකුසල පිරිහේ, යහපත් කුසල වැඩේ. **සටහන:** දසඅකුසලයේ නොයෙදීම නිසා, දසකුසලයේ හැසිරීම නිසා කෙනක් හට දුක් වේදනා මෙකල ඇතිවේ, එහෙත්, මතුවේ සුඛ විපාක ලැබේ. **ඒ පිලිබඳ උපමාව**: පාණ්ඩු රෝගය ඇති කෙනෙක් සිටි. අරළු ආදී තිත්ත පානයක් ඇත, එහෙත් එය පානය කරයි නම් ඔහු සුවපත්වේ යයි කෙනෙක් කියයි. අමිහිරි නිසා මෙකල දුක් වේදනා ඇතිවුවත්, ගුණය නිසා මතු කල ඔහු සුව පත්වේ. 4. **මෙකල සුඛ විපාක ඇතිවේ, මතු කලද සුඛ විපාක ඇතිවේ**. 1) අනුවණ, දහම නොදත් පුද්ගලයා අවිද්‍යාව නිසා යථාබව නොදැන- යම් දේ කිරීමෙන් දැන් සැප ඇතිවේ, අනාගතයේ සැප ඇතිවේ යන්න නොදැන කටයුතු වල දේ. ඒ නිසා යහපත් ධර්මතා පිරිහේ, අයහපත වැඩේ. 2) එහෙත්, නුවණැති දහම දත් පුද්ගලයා යම් ලෙසකින් කටයුතු කිරිමෙන්: මෙකල සුඛ ඇතිවේ, මතුකලද සුඛ ඇතිවේ යයි යථා බව දැන කුසලයේ යෙදේ. ඔහුගේ අයහපත් අකුසල පිරිහේ, යහපත් කුසල වැඩේ. **සටහන**: මෙකල දසකුසලයේ හැසිරීම නිසා සුඛ ඇතිවේ, මතු කල යහපත් විපාක නිසා සුඛ ඇතිවේ. **ඒ පිලිබඳ උපමාව**: මී ගිතෙල් පැණි ආදිය යෙදූ රස පානයක් ඇත. රක්තඅතීසාරය ඇති පුද්ගලයෙක් හට ඒ පානය රස බවද, ගුණ බවද කෙනෙක් පවසයි. ඒ පානය ගත් පුද්ගලයට මෙවක එහි රස දැනේ, මතුවේ ඔහු සුවපත්වේ. **බලන්න**:වස හා මිහිරි පාන උපමා: උපග්‍රන්ථය: 5 **සිව්වෙනි, ධර්ම සමාදානයට පිළිපන්**

පුද්ගලයා - බුදු සසුන පිළිගත් කෙනා, වර්ෂා කාලයේ අවසානයේ, අඳුර දුරුකර, නිල්වන් අහසේ දීලෙන හිරු මෙන්, අන්‍ය ආගමිකයන් අතර බැබලේ ය යි බුදුන් වහන්සේ වදාළහ. **බලන්න**: උපග්‍රන්ථය:උපමා. **මූලාශ්‍රය**:ම.නි: (1) මහා ධම්ම සමාදාන සූත්‍රය.

▼ **ම.නි. චූල ධම්ම සමාදාන සූත්‍රයේ ද** සමානවූ ධර්ම සමාදාන 4 ක් පෙන්වා ඇත. 1) **මෙකල සුඛ විපාක ඇතිවේ, මතු කල දුක් විපාක ඇතිවේ:** සමහර ආගමික නිකායන් හි පුද්ගලයන්: කමසැප විඳීම හානියක් නොවේ යන දිට්ඨිය ඇතිවසිටිති. මෙලොව කාමසැප විඳින ඔවුන් හට පරලොව දුගතියක දුක් විඳීමට සිදුවේ. ඒ **පිළිබඳ උපමාව**: මලුවා වැල, ගසක එතියන මුල් කාලයේ, එය මෘදුය. පසුව, මුලු ගසම වෙලාගෙන ගස විනාශ කරයි. **බලන්න**: උපග්‍රන්ථය:5 2) **මෙකල දුක් විපාක ඇතිවේ, මතු කලද දුක් විපාක ඇතිවේ** කෙනක්, අත්තකිලමතානු යෝගයේ යෙදී බොහෝ කායික දුක් වේදනා මෙකලද විඳි, මරණින් මතු දුගතියේ උපත ලබා දුක් විඳි. 3) **මෙකල දුක් විපාක ඇතිවේ, මතු කල සුඛ විපාක ඇතිවේ** කෙනෙක්හට, රාගය, ද්වේශය හා මෝහය ඇත. ඒවා නිසා ඔහුට දුක් වේදනා ඇතිවේ. එහෙත්, දුක්වේදනා විඳිමින් ඔහු යහපත් ආධ්‍යාත්මික ජීවිතයක් ගත කරයි. මරණින් මතු සුගතියේ සැප ඔහුට ලැබේ. 4) **මෙකල සුඛ විපාක ඇතිවේ, මතු කලද සුඛ විපාක ඇතිවේ** කෙනෙක්හට, දැඩි ලෙසින් රාගය, ද්වේශය, මෝහය නැත. එමනිසා ඔහු නිතරම දුකට පත්නොවේ. ඔහු සිව් ජාන සමාපත්ති ලබා ගැනීමට සමත්වේ. එමනිසා, මරණින් මතු සුගතියේ සැප ඔහුට ලැබේ. **මූලාශ්‍රය**:ම.නි: (1) චූල ධම්ම සමාදාන සූත්‍රය.

▲**ධම්ම ශ්‍රවනය**-Dhamma shravanaya: පළමුව, බුදුන් වහන්සේ වදාළ ධර්මය ශ්‍රවනය කළ පිරිස වුවේ පස්වග-තවුසන් (පස්වග මහණුන්)ය. **බලන්න**: උපග්‍රන්ථය:1 සම්මා දිට්ඨිය ඇතිවීම පිණිස දහම ඇසීම අවශ්‍යම කරුණකි. **බලන්න:** සම්මා දිට්ඨිය.

ධර්මයේ බහුශ්‍රැත වීම පිණිස දහම ඇසීම අවශ්‍යතාවයක් බව සූත්‍ර දේශනා වල දක්වා ඇත.මංගල සූත්‍රයේ, ධර්ම ශ්‍රවනය සුභ කරුණක් යයි පෙන්වා ඇත. ක්‍රමානුකූලව දහම පුහුණු කිරීම පිණිස ධර්ම ශ්‍රවණයය අවශ්‍යතාවයක් බව පෙන්වා ඇත. **බලන්න**: ධම්මය ක්‍රමානුකූලව පුහුණුවීම. ධර්මශ්‍රවනය මගින් සිතේ අවුල්සහගත බව නැතිකර ගත හැකිවේ. **බලන්න**: චිත්ත වික්ෂෙපය යහපත් ලෙසින් ධර්මය ශ්‍රවනය කිරීම සෝතාපන්නබව ලබාගැනීමට උපකාරීවේ. **බලන්න**: සෝතාපන්න.

▼**ධම්ම ශ්‍රවනය** නිසිකල කිරීම, නිසිකල අර්ථ පරික්ෂාකිරීම නිසා එල 6 ක් ලැබේ: 1) මෙතක් විමුක්තිය නොලැබූ , පංචඔරම්භාගිය සංයෝජන වලින් නොමිදුන භික්ෂුව හට මරණය ආසන්නයේදී තථාගතයන් වහන්සේගෙන් දහම ඇසීමට ලැබේ. ඒ අවස්ථාවේදී, පංචඔරම්භාගිය සංයෝජන වලින් මිදීමට ඔහුට හැකිවේ. **සටහන**: එග්ගුන තෙර, මරණාසන්නයේදී, බුදුන්වහන්සේ වෙතින් දහම ඇසීමට ලැබුන නිසා එතුමන් අනාගාමිව අපවත්වුහ. **බලන්න**: උපග්‍රන්ථය:1. 2) මෙතක් විමුක්තිය නොලැබූ , පංචඔරම්භාගිය සංයෝජන වලින් නොමිදුන භික්ෂුව හට මරණය ආසන්නයේදී, තථාගතයන්ගේ ශ්‍රාවක උතුමෙක් වෙතින් දහම ඇසීමට ලැබී අනාගාමිව අපවත්වීමට ලැබීම.3) මෙතක්

විමුක්තිය නොලැබූ , පංචඕරම්භාගිය සංයෝජන වලින් නොමිදුන භික්ෂුව හට මරණය ආසන්නයේදී ආරිය උතුමෙක් ගෙන් දහම ඇසීමට නොලැබේ, එහෙත්, තමන් ඇසූ, දන්නා දහම සිතින් අවර්ජනා කිරීම මගින්, අනාගාමීව අපවත්වීමට ලැබීම.4) පංචඕරම්භාගිය සංයෝජන වලින් මිදුන භික්ෂුව හට මරණය ආසන්නයේදී, බුදුන්වහන්සේ වෙතින් දහම ඇසීමට ලැබී, සියලු උපධි හැර අපවත්වීමට (පිරිනිවන්පෑමට) ලැබීම.5) පංචඕරම්භාගිය සංයෝජන වලින් මිදුන භික්ෂුව හට මරණය ආසන්නයේදී, තථාගතයන්ගේ ශ්‍රාවක උතුමෙක් වෙතින් දහම ඇසීමට ලැබී, සියලු උපධි හැර අපවත්වීමට (පිරිනිවන්පෑමට) ලැබීම. 6) පංචඕරම්භාගිය සංයෝජන වලින් මිදුන භික්ෂුව හට මරණය ආසන්නයේදී, ආසන්නයේදී ආරිය උතුමෙක් ගෙන් දහම ඇසීමට නොලැබේ, එහෙත්, තමන් ඇසූ, දන්නා දහම සිතින් අවර්ජනා කිරීම මගින්, සියලු උපධි හැර අපවත්වීමට (පිරිනිවන්පෑමට) ලැබීම. **මූලාශ්‍රය**: අංගු.නි: (4) 6 නිපාත: මහාවග්ග: 6.2.1.2 එග්ගුන සූත්‍රය, පි.178.

**ධය**

▲ **ධ්‍යායි-**meditator: ධ්‍යායින් ලෙසින් මෙහිදී පෙන්වා ඇත්තේ භාවනාවේ යෝගී භික්ෂූන්ය. ඔවුන් විස්මය දනවන (astounding) පුද්ගලයන්ය, ඔවුන් නිර්වාන ධාතුව නාමකයින් ස්පර්ශ කර වාසය කරන උතුමන්ය, ඔවුන් දුර්ලභය, එමනිසා, ධර්මයෝග (ධම්මකථික) භික්ෂූන් පමණක්නොව, ධ්‍යායි භික්ෂූන් කෙරෙහිද පැහැදී , ඔවුන්ගේ ගුණ පවසමින් වාසය කලයුතුය. **සටහන:** මහාචුන්ද තෙරුන්, මේ අවවාද අනුසාසනා වදාළේ ඇතැම් සංඝයා, ධම්මකථිකයන් පමනක් පසසන නිසා හා ඇතැම් සංඝයා, භවනායෝගීන් පමණක් පසසන නිසා එම වැරදි ආකල්පය නිවැරදි කිරීම පිණිසය.**බලන්න**: ධම්මයෝග **මූලාශ්‍රය:** අංගු.නි: (4) 6 නිපාත: ධම්මිකවග්ග:1.6.5.4 මහාචුන්ද සූත්‍රය, පි.142.

**ධර**

▲ **ධර්මය අතුරුදහන්වීම-** Disappearing the Dhamma: ධර්මය නොදත් සංඝයාගේ හැසිරීම ධර්මයේ- සද්ධර්මයේ අතුරුදහන්වීමට හේතුවන ආකාරය මෙහිදී විස්තරාත්මකව පෙන්වා ඇත. **සටහන**: අටුවාවට අනුව සද්ධර්මය අතුරුදහන් දහන් වීමට කරුණු 5 ක් හේතුවේ; භික්බු බෝධි හිමි ඒවා මෙසේ සාරාංශ කර දක්වා ඇත: 1) අධිගමය ලැබීම අතුරුදහන් වීම (අධිගම අන්තරධාන): මාර්ග ඵල ලැබීම හා; ඒවා ලබාගැනීමට උපස්තම්භක වන පටිසම්භිදා ඥාණය, අභිඥා ඥාණය ක්‍රමයෙන් නැතිවීම 2) ධර්ම පුහුණුව අතුරුදහන්වීම ( පටිපත්ති අන්තරධාන ): ජාන, විදසුන් නුවණ, මග හා ඵල හා සිල්වත් හැසිරීම ක්‍රමයෙන් නැතිවීම 3) ධර්මය ඉගෙනගැනීම අතුරුදහන්වීම (පරියත්ති අන්තරධාන): ත්‍රිපිටකය ක්‍රමයෙන් නැතිවීම 4) ලාංජනය අතුරුදහන්වීම (ලිංග අන්තරධාන): සංඝයා දරන සිව්රු ක්‍රමයෙන් නැතිවී යාම, අවසානයේදී ඉතිරිවන්නේ සංඝ බව දැක්වීමට හිරියල් පාට රෙදි කැල්ලක් කරේ එල්ලා ගෙන සිටීමය 5) ධාතු අතුරුදහන්වීම (ධාතු අන්තරධාන): ගෝතම බුදුන් වහන්සේගේ සසුන (ඉගැන්වීම අවාසානවනවිට) අවසන්වනවිට , උන්වහන්සේගේ ධාතු, බුද්ධ ගයාවේ බෝධි රුක ඉදිරියේ එක් රැස්වී, බුදුඅනුරුවක් මැවී, මහා දීප්තිමත් ගිනි ජාලාවකින්, ශ්‍රී විභූතිය දක්වා

අතුරුදහන් වේ. **බලන්න**: EAN: 1: note no. 63: p. 584. **මූලාශ්‍රය:** අංගු.නි: අංගු.නි: (1) 1 නිපාත: අධම්මවග්ගය: 1.10 සූත්‍ර, පි.78.

▼**ධර්මයේ අතුරුදහන් වීමට බලපාන කරුණු 2ක්** 1) අයහපත් ලෙස යොදාගත් වචන හා වැකිකඩ (වාක්‍ය ඛණ්ඩ) 2) අයහපත් ලෙස යොදාගත් අර්ථ කථනය. එම කරුණු නොමැතිවිට ධර්මය වර්ධනය වේ. **මූලාශ්‍රය:** අංගු.නි: (1) 2 නිපාත:2.1.2.10 සූත්‍රය, පි. 154 හා 2.1.4.10 සූත්‍රය, පි.172.

▼**ධර්මයේ අතුරුදහන් වීමට බලපාන කරුණු**: මේ සසුනේ මහණ සකස්කොට 1) දහම ගරුත්වය ඇතිව නො ඇසීම 2) දහම ගරුත්වය ඇතිව පුහුණු නොවීම 3) දහම ගරුත්වය ඇතිව සිතේ ධාරණය නොකර ගැනීම 4) ඇසූ දහම ගරුත්වය ඇතිව අර්ථ නො විමසීම 5) ගරුත්වය ඇතිව ධර්මානුකූල පුහුණුවේ නොයෙදීම 6) ධර්ම පරියාය යහපත් ලෙසින් ඉගෙන නොගැනීම 7) ධර්මය යහපත් ලෙසින් දේශනා නොකිරීම 8) තමන් ඇසූ , උගත් දහම, යහපත් ලෙසින් අනුන් ලවා කියවීමට පුරුදු නොකිරීම 9) තමන් ඇසූ , උගත් දහම, යහපත් ලෙසින් සජ්ජායනා නොකිරීම10) තමන් ඇසූ , උගත් දහම, යහපත් ලෙසින් අවර්ජනා නොකිරීම 11) අයහපත් ලෙසින් ඇති ධර්මය ඉගෙන ගැනීම 12) පහසුවෙන් කීකරුකරගැනීමට අපහසු (දුර්වචභාවය) සංඝයාසිටීම 13) ධර්මයේ බහුශ්‍රැත භික්ෂූන්, අනිකුත් සංඝයාට ධර්මය වනපොත් කිරීමට පුරුදු පුහුණු නොකිරීම 14) ජ්‍යේෂ්ඨතම සංඝයා සුඛෝපභෝගී ජීවිතයට බැසීම නිසා ඔවුන්ගේ අනුගාමීන් ද එම පිළිවෙතට පුරුදු වීම 15) සංඝභේදය ඇතිවීම. එහෙත්, එම කරුණු පහකර ගන්නේ නම් ධර්මය අතුරුදහන් නොවන්නේය. **මූලාශ්‍රය:** අංගු.නි: (3) 5 නිපාත: සද්ධර්මවග්ග: 5.4.1.4 - 5.4.1.6 සූත්‍ර 3කි,පි.308.

▲ **ධර්ම දානය-** gift of the Dhamma:ආමිෂ දානයට වඩා, ධර්ම දානය අග්‍රවේ. **බලන්න**: අග්‍ර ධර්මදාන**.**

▲**ධර්මය නිවැරදි හා වැරදි -**Right & wrong Dhamma

නිවැරදි ධර්මය බුදුන් වහන්සේගේ දේශනාය, වැරදි ධර්මය බුදුන් වහන්සේ දේශනා නොකළ දේය. කෙනෙක්, නිවැරදි දහම දෙසනවිට පටන්ගත් විරිය ඇතිකරගනිද, ඔහු ද සුවසේ සිටින කෙනෙක්ය, එහෙත්, කුසිතව සිටින්නේ නම් ඔහු දුකසේ වෙසන කෙනෙක්ය. කෙනෙක් වැරදි දහම දෙසන විට කුසීත වන්නේ නම්, ඔහු සුවසේ වෙසෙන කෙනෙකි, එහෙත්, ඔහු විරිය ඇති කරගන්නේ නම් දුකසේ වෙසන කෙනෙක්ය. **මූලාශ්‍රය:** අංගු.නි: (1) 1 නිපාත: 1.16.3.9-12 සූත්‍ර, පි.108.

▲**ධර්මය පහළවීම-** Appearance of the Dhamma: තථාගතයන්වහන්සේ ගේ පහළවීම, ධර්මයේ පහළවීමය. **බලන්න:** තථාගතයන් **මූලාශ්‍රය:** අංගු.නි: (6) 10 නිපාත: ආකඩ්ඛ වග්ග, 10.2.3.6.තයොධම්ම සූත්‍රය,පි.284.

▲ **ධර්මය පැහැදිළි කිරීම-**Clarifying the Dhamma: ධර්මය නොදත් අය ධර්මය පිළිබඳව විවාද කරණ විට කරුණු සහගතව ධර්ම කරුණු පැහැදිලි කිරීම අවශ්‍යබව බුදුන් වහන්සේ පෙන්වා ඇත. කලින් කලට අනුවණ මිනිසුන්, ඔවුන්තුළ ඇති වැරදි අදහස් ගැන විවාද කරනවිට, බුද්ධ

ශ්‍රාවකයන්, යුක්තිසහගත හේතු -ධර්ම කරුණු පෙන්වා ඔවුන්ගේ විවාදය නිෂ්ඵල කලයුතු ය, වැරදි බව ඔප්පුකළයුතුය:

**“ ...එවං ඛො තෙ ගහපති මොඝපුරිසා කාලෙන කාලං සහධම්මෙන සුනිග්ගහීතං නිග්ගහෙතබ්බාති”.** (...householder! It is in such a way that those hollow men should from time to time be thoroughly refuted with reasoned argument) **සටහන්**: * අටුවාවට අනුව: sahadhammena as ‘with a cause, with a reason, with a statement’-sahetukena kāraṇena vacanena. **බලන්න**: EAN:Note: 2125, p. 682.** මේ අවවාදය වදාළේ අනාථපිණ්ඩික සිටුවරයාටය. **බලන්න:** දිට්ඨි. ** වජ්ජියමාහිත සූත්‍රයේදී, බුදුන් වහන්සේ එම අවවාදය සංඝයාට වදාළහ. **මූලාශ්‍ර**: අංගු.නි:(6 ):10 නිපාත: 10.2.5.3. කිංදිට්ඨික සූත්‍රය,පි.360, 10.2.5.4. වජ්ජියමාහිත සූත්‍රය,පි.368, EAN:10: 93. 3 View, p. 534, 94. 4 Vajjiyamāhita, p.535.

▲ **ධර්මිෂ්ඨ හා අධර්මිෂ්ඨ-** Dharmistha & Adharmistha:ධර්මිෂ්ඨ යනු ධර්මයට අනුව ඇති යහපත් හැසිරීමය. අධර්මිෂ්ඨ යනු ධර්මයට එරෙහිව ඇති අයහපත් හැසිරීමය. කල්‍යාන කම්ම නිසා ලෝකයේ ධර්මිෂ්ඨ බව ඇත. පාපික කම්ම නිසා ලෝකයේ අධර්මිෂ්ඨ බව ඇත. **බලන්න:**කම්ම.**මූලාශ්‍ර**: අංගු.නි: (6): 10 නිපාත: 5 අක්කෝෂ වග්ග, 10.1.5.7.මහාලි සූත්‍රය,පි.182, EAN:10: 47.7 Mahali, p. 511.

▲ **ධර්මයේ මූලධර්ම-** Doctrinal principles: ධර්මයේ මූලධර්ම අධිවුත්තිපද/ අධිවචන ලෙසින් හඳුන්වයි. එනම්, ස්කන්ධ, ආයතන, ධාතු ආදීයය. **බලන්න**: අධිවුත්තිපද. **මූලාශ්‍ර**:අංගු.නි: (6) 10 නිපාත: අධිවුත්තිපද සූත්‍රය, පි.96.

▲**ධාරණස්මෘතිය -**Dharnasmriti: ධාරණස්මෘතිය- සතිමත්තාන ලෙසින් පෙන්වා ඇත්තේ, ඇසූ ධර්මය යහපත් ලෙසින් සිහියේ දරාගැනීමට හැකි කුසල්තවයය. ආනන්ද තෙරුන්, මේ කුසලතාවය ඇති භික්ෂුන් අතුරින් අග්‍රය. **බලන්න:** උපග්‍රන්ථය:1

▲ **ධාර්මික**- Righteous: ධාර්මික යනු ධර්මානුකූලවීමය. ධාර්මික නිසා සිදුවන යහපත බුදුන් වහන්සේ මෙසේ පෙන්වා ඇත:

“රජවරු ධාර්මිකව කටයුතු කරන විට, රාජ පුරුෂයන් ධාර්මික වේ. එලෙස, රටේ වැසියන්ද ධාර්මිකවේ. එමනිසා, සඳ හිරු පවත්නා කාලය, කාලගුණය, ඍතු, වැසි සුළං යහපත්වේ, ධාර්මික නිසා දෙවියෝ සතුටුව, නියම කලට වැසි ලබා දේ. ඒ නිසා භොග යහපත් ලෙස වැඩේ. හොඳ භෝග පරිභරණය නිසා මිනිසුන් නිරෝගිව දීර්ඝ ආයුෂ ලබති. රාජ්‍යයට, බලවත් යහපත ඇතිවේ”. **සටහන**: සක්විති රජ ධාර්මික රජෙකි. **බලන්න**: සක්විති රජ **මූලාශ්‍ර:** අංගු.නි: (2): 4 : නිපාත:4.2.2.10 අධාර්මික සූත්‍රය, පි. 162, EAN: 4: 70.10 Unrighteous , p. 177.

ධව

▲ **ධුව-** stable: ධුව-ස්ථිර ධර්මය ලෙසින් පෙන්වා ඇත්තේ නිවනය. මෙය නිවන හඳුන්වන පදයකි. **බලන්න**:නිවන. **මූලාශ්‍රය**: සංයු.නි: (4) සළායතනවග්ග: අසංඛතසංයුත්ත: 9.2 - ධුව සූත්‍රය, පි.684.

▲ **ධෝවන ගම** - Village Dhovana: බුදුන් වහන්සේ වැඩසිටි කාලයේ දක්ෂිණ ප්‍රදේශයේ පිහිටි ගමකි. එම ගම් වැසියන් මළවුන් අනුස්මරණය කිරීම ගැන බුදුන් වහන්සේ විස්තර වදාළහ. **බලන්න**: ආරියධෝවනය හා ආනාරියධෝවනය.

## න කොටස:නඋ,නක,නඛ,නග,නඝ,නච,නජ,නට,නත, නථ,නද,නධ,නන,නප,නබ,නභ,නම,නය,ණය,නර,නල,නළ, නව,නස,නශ,නෂ,නහ

### නඋ

▲**න උප්පදේතබ්බ ධම්ම-** Dhamma not to be aroused:නඋප්පදේතබ්බ ධම්ම, නො ඉපදියයුතු ධම්ම යනු දස අකුසලය යි මෙහි දක්වා ඇත. **බලන්න**: උප්පාදේතබ්බ ධම්ම. **මූලාශ්‍ර**: අංගු.නි: (6 ):10 නිපාත: අරියවග්ග: 10.3.5.5. උප්පදේතබ්බ සූත්‍රය,පි. 476

### නක

▲ **නකුලමාතා හා නකුල පිතා**-Nakula matha & pitha

මේ දෙදෙනා බුදුන් වහන්සේගේ අග්‍රතම උපසිකා හා උපාසකයන් ගනයට වැටේ. **බලන්න**: උපග්‍රන්ථය:3

▲ **නිකට්ඨ පුග්ගල**- Nikatthapuggala: බුදුන් වහන්සේ නිකට්ඨ පුද්ගලයන් 4 දෙනක් ගැන පෙන්වා ඇත. 1) කයින් ආරණ්‍යය-වන සේනාසන වල හුදකලා විවේකසුවය පිනිස පැමිණි එහෙත් සිතින් නොපැමිණි (කාම, ව්‍යාපාද, හිංසා විතක්ක -මිථ්‍යාසංකප්ප සිහිකරමින් සිටින පුද්ගලයා ) 2) කයින් ආරණ්‍යය-වන සේනාසන වල හුදකලා විවේක සුවය පිනිස නොපැමිණි එහෙත්, සිතින්, නෙක්කම්ම, අව්‍යාපාද, අවිහිංසා සිතුවිලි -සම්මා සංකප්ප ආවර්ජනය කරමින් විවේකිව සිටින පුද්ගලයා 3) ආරණ්‍යය-වන සේනාසන වල හුදකලාවිවේක සුවය පිනිස නොපැමිණි, සිතින්, මිථ්‍යාසංකප්ප සිහිකරමින් සිටින පුද්ගලයා 4) කයින් ආරණ්‍යය-වන සේනාසන වල හුදකලාවිවේක සුවය පිනිස පැමිණි, සිතින් සම්මා සංකප්ප සිතුවිලි ඇති පුද්ගලයා. **මූලාශ්‍ර**: අංගු.නි: (2): 4 නිපාත: 4.3.4.8 නිකට්ඨ පුග්ගලසූත්‍රය, පි. 286, EAN:4: 138.8 retreat, p. 197.

▲ **නික්කම ධාතුව**- Nikkama Dhathu- the element of persistence නික්කම ධාතුව (නික්කම විරිය- නික්මීමේ විරිය) ලෙසින් පෙන්වා ඇත්තේ යම්කිසි කටයුත්තක් ආරම්භකරගත් පසු එම කටයුත්ත දිගටම කරගැනීමට උත්සාහය- වීරිය පවත්වා ගැනීමය. මෙය ථිනමිද්ධය ප්‍රහාණය කිරීමට උපකාරිවේ. **බලන්න**: වීරිය, ථිනමිද්ධය, ශක්තිය.

▲**නික්ඛ උපාසක**-Nikkha Upasaka: බලන්න:උපග්‍රන්ථය:3

▲ **නිකේතසාරි**-Nikethasari: නිකේතසාරි යනු ගිහිගෙයට ඇලී සිටීමය. අනිකේතසාරි යනු ගෙයක් නොමැතිව- කෙළෙස් නොමැතිව හැසිරීමය. **බලන්න**: අනිකේතසාරි.

▲ **නිකෙළෙස් මුණි-**Nikelesmuni: බුදුන් වහන්සේ සියලු කෙලෙස්වලින් මිදුන නිසා උන්වහන්සේ 'නිකෙළෙස් මුණි' ලෙසින්ද හඳුන්වයි. **බලන්න**: බුද්ධනාම, කෙළෙස්.

▲ **නෙක්ඛම්මය:**පාලි: **නෙක්ඛම්මං** -renunciation: ධර්මයේ නෙක්ඛම්මය ලෙසින් පෙන්වා ඇත්තේ නික්මියාමය, අත හැරීමය. කුමකින් නික්මී යෑමද? කාමයෙන් වෙන්වී යාමය (ගිහිගෙය අත හැරීම). **සටහන:** බුද්ධත්වය ප්‍රාර්ථනා කරන බෝධිසත්වයන් විසින් සම්පූර්ණ කරගත යුතු දස පාරමිතාවන් ගෙන් එක් පාරමිතාවකි .**බලන්න**: බෝධිසත්ව, දස පාරමිතා. **ශබ්දකෝෂ**: **පා.සිං.ශ:** පි.344: "**නෙක්ඛම්මං:** නෛෂ්ක්‍රම්‍යය, අභිනිෂ්ක්‍රමණය, ප්‍රථම ධ්‍යානය, නිවන, විදර්ශනාව, සියලු කුසල ධර්ම- **නෙක්ඛම්මං ධාතු:** නෛෂ්ක්‍රම්‍යය පිලිබඳ කල්පනාව, සියලුම කුසල ධර්ම". **B.D:** p. 105: "Nekkhamma: Freedom from sensual lust: to go forth into the homeless life"

▼**නෙක්ඛම්මය,** කාමරාගයෙන් මිදීමට, වඩාගත යුතු ධර්මතාවකි. **බලන්න**: නිස්සාරණීය ධාතු. **මූලාශ්‍ර:** අංගු.නි: ( 3 ): 5 නිපාත: 5.4.5.10 නිස්සාරණීය සූත්‍රය, පි. 415, EAN:5: 200.10 Escape, p. 303.

▼**නෙක්ඛම්මය** : විනිවිදව අවබෝධ කරගැනීමට දුෂ්කර (පහසු නැති) ධර්මයකි; ධර්මයකි. **බලන්න**: දුෂ්ප්‍රතිවිධ්‍ය ධර්ම. **මූලාශ්‍ර:** දීඝ.නි : (3 ): 11 දසුත්තර සූත්‍රය, පි. 483, EDN: 34: Dasuttara Sutta: Expanding Decades, p. 384.

▼ **නෙක්කම්මය-**renunciation: සියලු කෙළෙස් ප්‍රහීනය කළ භික්ෂුවගේ සිත නෙකකම්මය නිසා සතුටු වේ, ඔහුගේ සිත,විවේකය කරා ඇදීයයි, නැඹුරුවියයි. එම බලය, ආසවක්ෂය කිරීම නිසා සේඛ භික්ෂුව තුල ඇතිවන දසබලයන්ගෙන් එකක් බව (සේඛබල) සැරියුත් මහාතෙරුන් වදාළහ. **බලන්න**: ආස්‍රව හා ආස්‍රව ක්‍ෂය කිරීම, සේඛ **මූලාශ්‍ර**: අංගු.නි: (6 ):10 නිපාත: ථෙර වග්ග, 10.2.4.10. ඛිණාසවබල සූත්‍රය,පි.339, EAN: 10: IV-The Elders: 90.10. Powers, p. 531.

▼**කාමයේ ආදීනව දැක,** නෙක්කම්මයේ අනුසස් දැක බෝධිසත්වයන් එහි සිත පිහිටුවා ගැනීම මෙහි පෙන්වා ඇත. **මූලාශ්‍රය**: අංගු.නි: (5) 9 නිපාත: 9.1.4.10 තපුස්ස ගහපති සූත්‍රය, පි.534.

▲ **නෙක්ඛම්මධාතු**- Nekkamma dhathu: කාමධාතුව ප්‍රහීණය පිණිස නෙක්ඛම්මධාතුව වැඩිය යුතුය. **බලන්න**: ත්‍රිවිධ ධම්මතා **මූලාශ්‍ර**:අංගු.නි: ( 4 ): 6 නිපාත**:** තික වග්ග සූත්‍ර, පි. 280, EAN:6: I Triads, p. 364.

▲**නෙක්ඛම්ම විතක්ක**- Nekkamma vitakka: කාමවිතක්ක- ප්‍රහීණය පිණිස නෙක්ඛම්ම විතක්ක වැඩිය යුතුය. **බලන්න**: ත්‍රිවිධ ධම්මතා. **මූලාශ්‍ර**:අංගු.නි: ( 4 ): 6 නිපාත**:** තික වග්ග සූත්‍ර, පි. 280, EAN:6: I Triads, p. 364.

▲ **නෙක්ඛම්මසංකල්ප-** Nekkamma sankalpa: නෙක්ඛම්මසංකල්ප**-** නෙක්ඛම්ම සංකප්ප, ආරියඅටමගේ 2 නි පියවරවූ සම්මා සංකප්ප යේ පළමු සාධකයය. **බලන්න**: ආරියඅටමග. **මූලාශ්‍ර:** සංයු.නි: (5-1):

මහාවග්ග:මග්ගසංයුත්ත:1.1.8 විභංග සූත්‍රය, පි 42, ESN: 45: Maggasamyutta: 8.8 Analysis, p 1611.

▲**නෙක්ඛම්ම සංඥා-** Nekkamma Sanna: කාමසංඥා- ප්‍රහීණය පිණිස නෙක්ඛම්මසංඥා වැඩිය යුතුය. **බලන්න**: ත්‍රිවිධ ධම්මතා: **මූලාශ්‍ර**:අංගු.නි: ( 4 ): 6 නිපාත**:** තික වග්ග සූත්‍ර, පි. 280, EAN:6: I Triads, p. 364.

▲ **නෙක්ඛම්ම සුඛය-** Nekkamma suka: නෙක්ඛම්ම සුඛය, ලෙසින් පෙන්වා ඇත්තේ ගිහිසැප හැර පැවිදිබවට පත්වීම නිසා සිතේ ඇතිවන සුවයය. නෙක්ඛම්ම සුඛය ලැබීම ආශ්‍රව ක්‍ෂය කිරීමේ බලයක් ලෙසින් පෙන්වා ඇත. කාම සුඛයට වඩා නෙක්ඛම්ම සුඛය අග්‍රයය. **බලන්න**: ආස්‍රව හා ආස්‍රව ක්‍ෂය කිරීම, සුඛය, කාමසුඛය.**මූලාශ්‍ර**: අංගු.නි: (6 ): 10 නිපාත: 10.2.4.10. ඛිණාස්‍රවබල සූත්‍රය,පි.331, EAN:10: 90.10. Powers, p. 531.

▲ **නොකිපීම** - None anger: නොකිපීම කුසලයකි. මෙය අක්‍රෝධය - තරහ නැති බව ලෙසින්ද පෙන්වා ඇත. ආරිය උතුමන් නොකිපෙන පුද්ගලයෝය. **බලන්න:** අක්‍රෝධය. **සටහන්**: * නොකිපෙන සුළුබව සුගතියට මගකි.**බලන්න**: සංයු.නි: (4) සළායතනවග්ග: මාතුගාමසංයුත්ත :3.2.2. අක්‍රෝධන සූත්‍රය, පි.486.

▼**උපධි විවේකය** -නිවන, නුවණ නමැති ඇසින් දකිනා අයට නොකිපිම සැපවේ යයි බුදුන් වහන්සේ වදාළහ. **මූලාශ්‍රය**:වින.පි: මහාවග්ග පාලි 1: මහාඛන්ධකය**:** මුචලින්ද කතා, පි.86.

**නඛ**

▲**නඛසිඛා** -Bit of soil in the  finger nail: නඛසිඛා උපමාව යනු බුදුන් වහන්සේ, නියපොත්තට ගත් පස් පිඩක් උපමා කරමින් සසර දුක නිමා කිරීම පිළිබඳ කළ දේශනාවය. නියපොත්තට ගස් පස්කැටිය ට වඩා මහා පොළවේ ඇති පස් ප්‍රමාණය විශාලය. එලෙස, සෝතාපන්න බව ලබාගැනීමෙන්- දිට්ඨිසම්පන්නවූ  ආරිය ශ්‍රාවකයා විසින් නිමාකල (ක්‍ෂයකළ) දුක් ප්‍රමාණය, මහා පොලවේ පස්වලට වඩා මහත්ය, අවසන් කිරීමට ඇති දුක නියපොත්තට ගස් පස්කැටිය මෙන් සුළුය. එලෙස ධර්ම අවබෝධය ලබා ගැනීම, මහා අර්ථයක්- ලාභයක් ලැබීමය, දහම් ඇස (ධම්ම චක්ඛු) ලැබීමය යයි බුදුන් වහන්සේ වදාළහ. **බලන්න**: දිට්ඨිසම්පන්න, ධම්මචක්ඛු, උපග්‍රන්ථය:5 **සටහන්: *සංයු.නි**: මහාවග්ග :සච්චසංයුත්තයේ: 12.6.1 **නඛසිඛා සූත්‍රයේ ද** මේ උපමාව පෙන්වා ඇත. ** **සංයු.නි**: ඔපම්මසංයුත්ත:8.1.2. **නඛසිඛා සූත්‍රයේ**: මේ උපමාව වදාළ බුදුන් වහන්සේ වදාළේ, මිනිසත් බව ලබන සත්වයන් අල්පබවය, එමනිසා අප්‍රමාදව, හික්මිය යුතුබවය. ** **සංයු.නි:**ඛන්ධසංයුත්තය: පුප්ඵවග්ග:1.2.5.5 නඛසිඛඋපමා සූත්‍රයේ මේ උපමාව යොදාගෙන ඇත්තේ පංච උපාදානස්කන්ධයේ අනිච්ච බව පෙන්වීමටය. **මූලාශ්‍ර**: සංයු.නි: (2): නිදානවග්ග: අභිසමයසංයුත්ත: 1.10.1 නඛසිඛා සූත්‍රය**,** පි.234, ESN:13: Abhisamayasamutta-II:1 The Fingernail, p.724.

**නග**

▲ **නගරය-** City: බුදුන් වහන්සේ වැඩසිටි සමයේ, රජෙක් සතු සර්ව සම්පූර්ණ නගරයක් පිලිබඳ විස්තර මේ සූත්‍රයේ පෙන්වා ඇත. එවැනි ශක්තිමත් නගරයක් සතුරන්ට දිනාගත නොහැකිය. එලෙස, සප්ත සද්ධර්මය සහිත භික්ෂුව, මාරයා හට පරාජය කල නොහැකිය යි බුදුන් වහන්සේ නගර උපමාව පෙන්වමින් වදාළහ. **බලන්න:** සප්ත ධර්මතා. **සටහන්:*** සංයු.නි:නිදානවග්ග:අභිසමයසංයුත්ත 7: 1,7,5 **නගර සූත්‍රයේදී**, ආරියඅටමග අනුගමනය කර නිවන ලැබීම, පැරණි මාවතක (පුරාණමග) යමින් පැරණි නගරයක් සොයා ගැනීම ලෙසින් පෙන්වා ඇත. ** ලෝක සත්ත්වයෝ විමුක්තිය ලැබීම පෙන්වා දීම පිණිස ආනන්ද තෙරුන් නගර උපමාව යොදා ගෙන . **විස්තර පිණිස බලන්න**: අංගු.නි: (6):10 නිපාත, 10.2.5.5. උත්තිය සූත්‍රය,පි.374.**බලන්න:** උපග්‍රන්ථය:5. **මූලාශ්‍ර:** අංගු.නි: ( 4 ): 7 නිපාත: 7.2.2.3 නගරූපම සූත්‍රය**,** පි. 454, EAN:7: 67.3 Simile of the Fortress, p. 397.

▲ **නගර ශෝභනිය** - courtesan: පස්කම් සැප සොයා යාමේදී ඇතිවන දුක පෙන්වීම පිණිස නගර ශෝභනිය පිලිබඳ කතාව බුදුන් වහන්සේ වදාළහ. **බලන්න:** ගණිකා. **මූලාශ්‍රය**: ඛු.නි: උදානපාලිය:ජාතිඅන්ධවග්ග: 6.8. ගණිකා සූත්‍රය, පි.300.

▲ **නාග** පාලි:**නාගා-** Nāgas: බුදුන්වහන්සේ හා රහතුන් 'නාග' (උතුම්) ලෙසින් හඳුන්වයි. නාගයන් විශේෂ බල ඇති අමනුෂ්‍ය කොට්ඨාශයක් ලෙසින්ද පෙන්වා ඇත. සාමාන්‍ය ව්‍යවහාරයේ නාග යනු සර්ප විශේෂයකි. **සටහන:** සූත්‍ර දේශනාවල මහා ඇත් රාජයා, නාග ලෙසින් පෙන්වා ඇත. **බලන්න**: ඇතා.

▼ **බොහෝ විෂ ඇති සතර අභිරාජකුල නාගයන්** ගැන මෙහි පෙන්වා ඇත: විරූපක්ඛ, එරාපථ, ඡබ්‍යාපුත්ත, කණ්හාගොතමක. ඔවුන් කෙරේ මෙත්තා සිත පතුරු වන්නේ නම්, සර්පදෂ්ඨය වලකා ගත හැකිය. **බලන්න**: මෙත්තා ආනිසංස. **මූලාශ්‍රය:** අංගු.නි: (2): 4 නිපාත: 4.2.2.7 අහි මෙත්ත සූත්‍රය, පි.156.

▼**එක්සමයක**, පසේනදී කෝසල රජුගේ සේත (සුදු) නම් රාජ හස්තියා දැක ජනයා, ඇතා ගැන ප්‍රසංසා කරමින් මෙසේ පවසා ඇත: ' මේ ඇතා නම් ඒකාන්තයෙන්ම නාගය'.

ඒ පිළිබඳව උදායි තෙරුන් ගේ විමසීමක් අනුව, බුදුන් වහන්සේ මෙසේ වදාළහ:

**"උදායි, මිනිසුන් විශාල කයක් ඇති ඇතෙක්... අශ්වයෙක් ...ගොනෙක්... සර්පයෙක්...මිනිසෙක්,විශාල ගසක්, දුටුවිට ' ඒ මහා නාගයෙක්' යයි පවසති. එහෙත්, දෙවියන්, මිනිසුන්... සහිත ලෝකයේ, කයෙන්, වචනයෙන් හා මනසින් අකුසල නොකරන උතුමාට මම 'මහානාග' යයි කියමි". සටහන:** උදායි තෙරුන් ඒ අවස්ථාවේ බුදුන් වහන්සේ 'මහා නාග' යයි පවසමින් බුදුගුණ වැනු ගාථා පිළිබඳව මේ සූත්‍රයේ විස්තරාත්මකව පෙන්වා ඇත. **බලන්න:**බුදුගුණ, බුද්ධනාම. **මූලාශ්‍රය**:අංගු.නි:6 නිපාතය: ධම්මික වග්ග: 6.1.5.1 නාගසූත්‍රය, පි.126.

▼ **සංයු.නි:භික්ෂුසංයුත්ත:**මහානාග සූත්‍රයේ දී, සැරියුත් හා මුගලන් මහා තෙරුන්, 'මාහානාග' ලෙසින් පෙන්වා ඇත.

▼ **උත්පත්ති ස්වභාවය** අනුව නාග වර්ග 4 ක් පෙන්වා ඇත: බිත්තරයකින් උපන්, ජලාභූජ- ගැබකින් උපන්, තෙතමනය -සංසෙදජ නිසා උපන්, ඕපපාතිකව උපන්- මේ වර්ගය සෙසු අයට වඩා අග්‍රවේ. ස්වර්ගයේ උපත ලැබීම පිණිස නාගයන් පෙහෙවස් සමාදන්වන බව (පුන්පොහොය දින) මෙහි පෙන්වා ඇත. **සටහන:** අටුවාවට අනුව, පෙහෙවස් සමාදන්වන නාගයන් ඔවුන්ගේ කය හැරදමයි: 'ඕනෑම කෙනෙ මගේ සම, ලේ, ඇට ගනිත්වා!'. **බලන්න:** ESN: note: 285. **මූලාශ්‍ර:** සංයු.නි: ( 3): 8 නාගසංයුත්ත සූත්‍ර, පි. 506, ESN: 29: Nāgasaṃyutta, p. 1152.

▼**විනය පිටකයේ:** බුදුන් වහන්සේ සත් සතිය ගත කරන අවස්ථාවේ, මහා වැස්සක් ඇතිවූවිට මුචලින්ද නම් නාගරාජයා බුදුන් වහන්සෙට ආවරණ සැපයූ බව පෙන්වා ඇත:

**"ඉක්බිති මුචලින්දනාරජ තෙමේ ස්වකිය භවනයෙන් නිකම භාග්‍යවතුන් වහන්සේගේ සිරුර සත්වරක් දරණවැලින් හාත්පසින් වට කොට 'ශිතය භාග්‍යවතුන් වහන්සේ නො පෙළවා… යි ' හිස මුදුනෙහි මහත් පෙණයක් කොට සිටියේය… සත් දවසක් ඇවෑමෙන් පහවූ වලාපටල ඇතිබව දැන… සියවේසය අතුරුදහන් කොට තරුණ මිනිස් වෙසක් මවා ගෙන බුදුරජුන්ගේ ඉදිරියෙහි ඇඳිලි බැඳ භාග්‍යවතුන් වහන්සේ වඳිමින් සිටියේය"**. **මූලාශ්‍ර:** වින.පි: මහාවග්ග පාලි 1: 6 මුචලින්ද කථා, පි. 84.

▼**නාගයන්** පිළිබඳව බුදුන් වහන්සේ මෙසේ පවසා ඇත: නාගයන් හිමාලකඳුවැටියේ ජල පොකුණුවල වෙසෙමින් කායබලය ලබාගනී. කායබලය ලැබූ ඔවුන් පොකුණුවල සිට විල්වලට ද, එතැන් සිට දියපාරවලට ද පැමිණේ. අනතුරුව, ගංගාවලට පැමිණෙන ඔවුන් ක්‍රමයෙන් මහා සයුරට පැමිණ එහිදී මහාබවට හා පුළුල්බවට පත්වේ. **සටහන්**: * අටුවාවටඅනුව: ස්ත්‍රීනාගයෝ පැටවුන් බිහිකිරීම පිණිස මහා සමුද්‍රයේ සිට නදිවලට පැමිණ, ඒවායේ සිට හිමාල කඳුවැටිය අසල ජලපොකුණුවලට පැමිණ පැටවුන් වදයි. තමපැටවුන්ට, පිහිණීම පුරුදුකර, ඉන්පසු ඔවුන් මහා සමුදුරට පමුණුවාගනී. **බලන්න**: ESN: note 39, p. 2392 & note 51, p. 2393 ** ඉහත කරුණ උපමා (නාගඋපමාව) කොටගත් බුදුන්වහන්සේ පෙන්වා දුන්නේ කෙනෙක් ශීලයේ පිහිටා: ආරියඅටමග හා සප්ත බොජ්ඣංග වඩාගැනීම පිලිබඳවය. **බලන්න**: උපග්‍රන්ථය:5 **මූලාශ්‍ර:** සංයු.නි: (5-1): මග්ගසංයුත්ත: බලකරණිය වග්ග:1.14 නාගසූත්‍රය,පි.138 හා බොජ්ඣංගසංයුත්ත: 2.1.1**.** හිමවන්ත සූත්‍රය, පි. 168, ESN: Maggasamyutta: XIV:151.3 Nāgas, p. 1694 & 46 Bojjhaṅgasaṃyutta: 1.1.The Himalayas, p. 1730.

▼ **මෙහිදී පෙන්වා ඇත්තේ මාරයා,** බුදුන් වහන්සේට බිය ඇතිකිරීම පිණිස මහානාග- ඇත් වෙසක් ගෙන පැමිණීමය. **මූලාශ්‍රය**:සංයු.නි: (1) සගාථවග්ග: මාරසංයුත්ත: 4.1.2 නාගසූත්‍රය, පි.216.

▼ **මෙහිදී ඇතා** ,නාග ලෙසින් යොදගත් ධම්ම උපමාවක් පෙන්වා ඇත. **බලන්න**: සංයු.නි: (2) නිදානවග්ග: ඔපම්මසංයුත්ත:8.1.9 නාගසූත්‍රය, පි.436.

▼ **මෙහිදී ඇතා** ,නාග ලෙසින් දක්වා ඇත. **බලන්න**: අංගු.නි: (2) 4 නිපාත: 4.3.2.4 නාගසූත්‍රය, පි.248.

▲**නාගතිමග-** Right course: නාගති යනු අගතිනොවන -අගතිමග නොවනබවය, වැරදි නොවන බවය. නාගති මග, ධර්මයට අනුකූලවූ නිවැරදි මගය එනම් ආරිය අටමගය. නාගතිමගමග ගමන් කරන්නාගේ කිර්තිය පසලොස්වක පොහෝය දින පායන පුන්සඳ ලෙසින් පැතිරේ **බලන්න**: උපග්‍රන්ථය:5,අගති මාර්ගය හා අගති නොවන මාර්ගය. **මූලාශ්‍ර:** අංගු.නි: (2): 4 නිපාත: 4.1.2.7, 4.1.2.8 හා 4.1.2.9 අගති-නාගති සූත්‍ර, පි. 58, EAN:4: 17.7, 18.8 and 19.9 Wrong course, p. 154.

▲ **නාගදත්ත තෙර-Nagadataththa Thera:බලන්න**: උපග්‍රන්ථය:1

▲**නාගසමාල තෙර-** Nagasamala Thera:**බලන්න:** උපග්‍රන්ථය:1

▲ **නාගිත තෙර-**Nagitha Thera: **බලන්න:** උපග්‍රන්ථය:1

▲**නාගිත කාශ්‍යප තෙර-**Nagita Kashyapa Thera:**බලන්න:** උපග්‍රන්ථය:1

▲**නිගණ්ඨ-** Niganthas: බුදුන් වහන්සේ වැඩසිටි සමයේ මහාවීර -නිගණ්ඨනාථ පුත්‍ර නම්වූ ආගමික නායකයාගේ අනුගාමීන් නිගණ්ඨ වේ. **බලන්න**: අන්‍යආගමික නිකායන්. **සටහන**: * නිගණ්ඨනාථ පුත්‍රගේ අභාවය පිලිබඳ විස්තර මහා පරිනිබ්බාන සූත්‍රයේ දක්වා ඇත. ** Nigaṇṭha Nātaputta is identical with Mahāvīra, the historical progenitor of Jainism. Though he makes several personal appearances in the Pāli Canon (see particularly MN No. 56), there is no report of him meeting the Buddha. His followers were called nigaṇṭhas, "knotless ones." **බලන්න**: ESN: note: 318, p. 1565.

▼**නිගණ්ඨයන් පිලිබඳ අවගුණ** 10ක් බුදුන් වහන්සේ පෙන්වා වදාළහ: 1 ඔවුන් තුල ශ්‍රද්ධාව නොමැත 2 දුසිල්වත්ය 3 පවට ලජ්ජානැත 4 සීලයේ නොසැලකිලිවන්තය 5 නරක මිනිසුන් හා ලෙන්ගතුය 6 තමන් උසස් කරගනිමින් අනුන් පහත් කර දමති 7 ඔවුන් තමන්ගේ දිට්ඨිය: ග්‍රහණය කරගෙන, තදින් අල්ලාගෙන සිටිති; ඒවා අතහරින්නේ ආමාරුවෙන්ය 8 වංචනිකය 9 පාපි අදහස් ඇත 10 මිච්චාදිට්ඨිකය. **මූලාශ්‍ර**: අංගු.නි: (6):10 නිපාත: ආකඞ්ඛ වග්ග: 10.2.3.8. නිගණ්ඨ සූත්‍රය,පි.294, EAN:10: -78.8 The Niganthas, p.525.

▼ **පස්පව් කිරීම නිසා** නිගණ්ඨයන්, දුගතියේ යලි උපත ලබයි.:**මූලාශ්‍ර**: අංගු.නි: (3 ): 5 නිපාත: වග්ගඅතිරේක: නිගණ්ඨ සූත්‍රය, පි. 486, EAN: 5: 294.9 sutta, p. 315.

▼ **නිගණ්ඨනාථ පුත්‍ර** හා බුදුන් වහන්සේගේ ගිහි ශ්‍රාවක, චිත්ත ගහපති අතර සමාධිය පිලිබඳ වූ සාකච්චාක් ගැන මේ සූත්‍රයේ විස්තර කර ඇත. **සටහන:** චිත්ත ගහපති බුදුන් වහන්සේගේ අග්‍ර උපාසකයෙකි. **බලන්න**: උපග්‍රන්ථය:3 **මූලාශ්‍ර**: සංයු.නි: (4 ): සළායතන: චිත්තසංයුත්ත: 7.1.8 නිගණ්ඨ සූත්‍රය**,** පි.570, ESN: 41: Cittasamyutta: 8 Nigaṇṭha Nātaputa, p. 1444.1710.

▲**නිග්‍රෝධකප්ප තෙර**-Nigrodhakappa Thera: **බලන්න**: උපග්‍රන්ථය:1.

▲ **නිග්‍රෝධාරාමය-**Nigrowdharama: ශාක්‍යයන්, බුදුන් ඇතුළු සංඝයාට පුජා කර ඇති මෙ ආරාමය කපිලවස්තු නුවර අසබඩ මහා වනයේ පිහිටා ඇත.**බලන්න:**උපග්‍රන්ථය:1.

**නඝ**

▲ **නීඝ-**Suffering: නීඝ යනු දුකය. බුදුන් වහන්සේ නිඝ 3ක් පෙන්වා ඇත: රාග නීඝ, දෝස නීඝ, මෝහ නීඝ **බලන්න**: දුක, අකුසල මූල. **මූලාශ්‍ර**: සංයු.නි: (5-1):මහාවග්ග: මග්ගසංයුත්ත: 1.15 නීඝ සූත්‍රය, පි. 158, ESN: 45: Maggasamyutta: 165.5 Suffering, p. 1710.

**නච**

▲ **නච්චගීත-**Nacchagitha: නච්චගීතවාදිතවිසුකදස්සනා පටිවිහරනා- නැටුමෙන්, ගැයුමෙන්,වැයුමෙන්, විසුළු දර්ශන බැලීමෙන් වැලකීම සාමනේර සිල් පදයකි. එම ක්‍රියාවලින් වැළකුණ අය මදය, එහෙත් ඒවායේ නිරත අය බොහෝය. එමනිසා, විරිය කර ඉන් වැලකි මාර්ගය දියුණු කරගන්න යයි බුදුන් වහන්සේ සංඝයාට අවවාද වදාළහ. **බලන්න:** සිල්පද. **මූලාශ්‍රය:**සංයු.නි: (5-2) මහාවග්ග:සච්චසංයුත්ත: 12.9.1 නච්චගීත සූත්‍රය, පි.366.

▲ **නචේතනා**- Nachetana: නචේතනා යනු චේතනා නොකිරීමය. ශිලසම්පන්න පුද්ගලයෙකුට, පසුතැවිල්ල (අවිප්‍රතිසාරය) ඇතිනොවේවා! යයි පැතීම අවශ්‍යනොවේ, ඔහුට පසුතැවිල්ල ඇතිනොවේ යයි මෙහි දක්වා ඇත. **මූලාශ්‍රය:** අංගු.නි: (6) 11 නිපාත: නිස්සයවග්ග: 11.1.2 න චේතනා කරණිය සූත්‍රය, පි.97.

**නජ**

▲ **නජීරති-** Najirati: නජීරති (not decay) යනු දිරා නොයනබව-මහළු නොවන බවය. එක්සමයක දෙවියෙක් ඒ ගැන විමසුවිට බුදුන් වහන්සේ මෙසේ වදාළහ:

> **"රූපං ජීරති මච්චානං නාමගොත්තං න ජීරති"**

සත්වයන්ගේ රූපය දිරයි, එහෙත් නාමගෝත්‍රය නො දිරයි. (The physical form of mortals decays, Their name and clan does not decay). **මූලාශ්‍ර**: සංයු.නි: (1) සගාථවග්ග:දේවතාසංයුත්ත:1.8.6 නජීරති සූත්‍රය, පි.106, ESN:1: Devatasamyutta: 76.6. Does Not Decay, p.158.

▲ **නිජ්ජර-**Wearing Away: නිජ්ජර ලෙසින් පෙන්වා ඇත්තේ ගෙවියාමය. කුසල ධර්මතා වඩා ගැනීමෙන් අකුසල ධර්ම ගෙවීයන බව බුදුන් වහන්සේ පෙන්වා ඇත. මේ සූත්‍රයේ විස්තරාත්මකව දක්වා ඇත්තේ සම්මාදිට්ඨිය ඇතුළු අංග 10 වර්ධනය මගින් මිථ්‍යා- වැරදි මග ගෙවීයාමය. **මූලාශ්‍ර:** අංගු.නි: (6): 10 නිපාත: 10.3.1.6 නිජ්ජර සූත්‍රය, පි. 414, EAN:10: 106.6 Wearing Away**,** p. 541.

නට

▲ **නටසිහිය-** Natasihiya: සිහිය නොමැතිබව-අසිහිය, නටසිහියය. මෙය නිසා කෙනෙක් තුල අසද්ධර්ම ඇතිවේ. **මූලාශ්‍රය:** අංගු.නි: (4) 7 නිපාත:සමණවග්ග:7.2.4.9 අසද්ධර්ම සූත්‍රය, පි.512.

▲ **නිට්ඨංගත-**Certainty: නිට්ඨංගත ලෙසින් පෙන්වා ඇත්තේ නිෂ්ඨාවට පැමිණීමය. බුදුන් වහන්සේ පිළිබඳව දිට්ඨිසම්පන්න වීම, අවෙච්චා සහගත ප්‍රසාදයට පත්වීම නිට්ඨංගත වීමය. **බලන්න:** දිට්ඨිසම්පන්න, අවෙච්චා සහගත ප්‍රසාදය. **මූලාශ්‍ර:** අංගු.නි: (6 ): 10 නිපාත: 10.2.2.3 නිට්ඨංගත සූත්‍රය, පි. 244, EAN:10: Wearing Away**,** p. 541.63.3 Certainty, p.518.

නත

▲ **නෙත්තිප්‍රකරන-** Nettippakarana: නෙත්තිප්‍රකරනය, බුද්ධක නිකායට ඇතුලත් ත්‍රිපිටක ග්‍රන්ථයකි. " මෙය බුද්දක නිකායේ 18 වැනි ග්‍රන්ථය වසයෙන් අප විසින් සලකන ලද්දේය. බුද්ධ වචන අර්ථ වශයෙන් ද ව්‍යාඤජන වශයෙන්ද විභාග කරමින්, මහා කච්චායන රහතුන් නෙත්තිප්පකරනය් වදාළහ. එය, බුදුහිමි විසින්ද පිළිගෙන වදාළ හෙයින් බුද්ධ භාෂිතයම වේ. නෙත්ති දේශනාව, හාර, නය, පට්ඨාන ලෙසින් තුන් වැදෑරුම් ව දේශනා කර ඇත" **බලන්න:** බු.නි: නෙත්ති ප්‍රකරණ: සංඥාපනය, පි. 9.

▲ **නිත්‍ය-**Permanent: නිත්‍ය යනු ස්ථිරබව- නොවෙනස්වනබවය. සාමාන්‍ය ලෝකයා ගේ පිලිගැනීම බොහෝදෙ නිත්‍ය බවය. ධර්මයට අනුව සියලුදේ වෙනස්වේ, නිත්‍ය නොවේ, අනිච්ච ස්වභාවය ගනී. ශාශ්වත දිට්ඨිය ඇති අය මේ මතය පිළිගනී. බුදුන් වහන්සේ පෙන්වා ඇත්තේ පංච උපාදානස්කන්ධය පිලිබඳ තමාගේ යන දිට්ඨිය ඇතිවිට- සක්කායදිට්ඨිය, නිත්‍ය යන සංකල්පනාව ඇතිවනබවය. එවිට ඔවුන්ට මෙවැනි දිට්ඨි ඇතිවේ: 'වාතය හමා නොයයි, නදීහු ගලා නොබසී, ගැබිණි අය ප්‍රසව නොකරති, සඳ හිරු උදා නොවේ, බැස යන්නේද නැත, ඉන්ද්‍රකීලය ලෙසින් නොසැලී සිටිති'. (The winds do not blow, the rivers do not flow, pregnant women do not give birth, the moon and sun do not rise and set but stand as steady as a pillar). එහෙත් දුක පිලිබඳ යථා අවබෝධය ඇතිවිට නිත්‍ය යන දිට්ඨිය නැතිවේ.

**සටහන්: * සංයු.නි: ගමනවග්ගයේ** සූත්‍රවල, නිත්‍ය යයි සලකන දේ ගැන විස්තර කර ඇත. **මූලාශ්‍ර**:සංයු.නි: ( 3): ඛන්ධකවග්ග: දිට්ඨිසංයුත්ත: ගමනවග්ග: 3.2.1 වාත සූත්‍රය, පි. 446, සෝතාපත්ති වග්ග: 3.1.9 සස්සත සූත්‍රය, පි.430

▲**නතුම්හාක:**පාලි:**නතුම්හාක**-Not yours: නතුම්හාක යනු ඔබට අයත් නැතිබවය. බුදුන් වහන්සේ, සංඝයාට පෙන්වා වදාළේ පංච උපාදානස්කන්ධය ඔබට අයත් නොවන දෙයක් නිසා, හිතසුව පිණිස, එයට ඇති ඡන්දරාගය-කැමැත්ත අතහැරිය යුතුබවය. **සටහන:** මේ පිළිබඳව දක්වා ඇති **උපමාව**: ජේතවනාරාමයේ ඇති දර ආදිය මිනිසුන් ගිනි දැවීම පිණිස ගෙනයන විට ඒ ගැන අකැමත්තක් ඇති නොවන අයුරින්, පංච උපාදානස්කන්ධයට ඇති ඇල්ම පහ කරගතයුතුය**.**

**බලන්න**: උපග්‍රන්ථය:5 **සටහන:** විස්තරපිණිස බලන්න: සංයු.නි: (4) සළායතනවග්ග:වේදනාසංයුත්ත: 1.10.8 හා1.10.9 සූත්‍ර. පි. 198. **මූලාශ්‍ර**: සංයු.නි: ( 3): ඛන්ධසංයුත්ත:4 නතුම්හාකවග්ග:සූත්‍ර 3 කි, පි.88, ESN:22:Khnadasamyutta:IV Not yours, 3 suttas, p. 1026.

**නථ**

▲**නාථ කරණ ධර්ම**: පාලි: **නාථකරණා ධම්මා -** Dhamma that protects ධර්මයේ නාථ කරණ ධර්ම ලෙසින් පෙන්වා ඇත්තේ ආධ්‍යාත්මික ජීවිතය ආරක්‍ෂා කර දෙන ගුණාත්මක කරුණු ගැනය- ආරක්ෂා ධර්ම. **සටහන:** අටුවාවට අනුව නාථකරණ ධර්මතා, කෙනෙකුට ආරක්ෂාව ලබාදේ, ආධ්‍යාත්මික ජීවිතයට උපකාරීවේ: They act as protectors for oneself, meaning that they act as supports (*attano sanāthabhāvakarā patiṭṭhākarā ti attho*). **බලන්න**: EAN: note: 1979, p. 676.

▼**නාථ කරණ ධර්ම 10 කි: බුදුන් වහන්සේ මෙසේ වදාළහ:**

"මහණෙනි, ආරක්‍ෂාව ඇතිව වාසය කරන්න, ආරක්‍ෂාව නැතිවිට දුක ඇතිවේ". **" සනාථා භික්ඛවෙ විහරථ, මා අනාථා. දුක්ඛං භික්ඛවෙ අනාථො විහරති"**. 1) **ශිලසම්පන්නවීම (සීලවා හොති)** 2) **බහුශ්‍රැතවීම (බහුස්සුතො)** 3) **කල්‍යාන මිත්‍රයන් සිටීම: (කල්‍යාණමිත්තො) 4) කීකරුබව (සොවචස්සතා) 5) නිපුණතාවය හා අනලස්බව:** තමන් සමග වෙසෙන සංඝයා පිළිබඳ කටයුතු වල දක්‍ෂවීම **6) ධර්මය රුචිකිරීම** 7) **වීරිය තිබීම**: අකුසල පහකිරීමට කුසල් ඇතිකරගැනීමට 8) **සන්තුෂ්ටිය ඇතිබව - සිව්පස පිළිබඳව** 9) **සතිය ඇතිබව** 10) **ප්‍රඥාව ඇතිබව -** ඇතිවීම හා නැතිවීම ගැන ඇති නුවණ- සමුදය වය නුවණ. **මූලාශ්‍ර**: අංගු.නි: (6): 10-නිපාත: 2 නාථ වග්ග, 10.1.2.7 ප්‍රථම නාථකරණ සූත්‍රය, EAN:10: II Protector: 17.7 Protector I, p.497.

▲ **නාථ පරිඥා**-Full understanding: නාථපරිඥා යනු ධර්මතා පිළිබඳ නුවණින් අවබෝධ කිරීමය. **බලන්න**: පරිපූර්ණ අවබෝධය.

**නද**

▲**නදිය -**the river: බුදුන් වහන්සේ වේගයෙන් ගලායන නදියක් ලෙසින් පෙන්වා ඇත්තේ සසර ගමනය. එවැනි නදියකට හසුවුන මිනිසෙකුට ගොඩට ඒම දුෂ්කරය. එලෙසින්, ධර්මය නොදත් මිනිසා-අසත්පුරුෂයා, පංච උපාදානස්කන්ධය, ආත්මය ලෙසින් (තමාගේ යයි) අල්වා ගෙන සිටින නිසා සසර ප්‍රවාහයෙන් මිදීමට හැකියාව නැත. පංච උපාදානස්කන්ධයේ අනිත්‍ය ස්වභාවය අවබෝධ කරගත් රහතන් වහන්සේ සසර ප්‍රවාහයෙන් මිදීඇත. **බලන්න**: උපග්‍රන්ථය:5. **සටහන**: සංයු.නි:මග්ගසංයුත්ත:14 බලකරනියවග්ග: (1.14) නදී සූත්‍රයේදී, (පි.146) බුදුන් වහන්සේ ආරියඅටමග, සාගරයට වේගයෙන් ගලායන නදියකට උපමා කර ඇත. එලෙස, ආරියඅටමගට වැටුන පුද්ගලයා වේගයෙන් නිවනට සෙන්දුවේ. නැගෙනහිරට ගලායන ගංගානම් ගඟ බටහිරට හැරවීමට යමෙක් තැත් කරයි නම් එය සාර්ථක නොවේ. එලෙස, ආරියඅටමග වඩාගත් මහණ, එමගින් ආපසු හැරවීමට වෙනත් කෙනෙකුට නොහැකිය. **මූලාශ්‍ර**: සංයු.නි: (3 ): ඛන්ධසංයුත්ත:5: 1.2.5.1

නදීසූත්‍රය, පි.264, ESN:22: Khandasamyutta:V: 93.1 The River, p.1084.

▲ **නදීකස්සප තෙර-** Nadikassapa Thera: **බලන්න:** උපග්‍රන්ථය:1

▲ **නාදික ගම -**Nadika village: මෙ ගම ඤාතගම ලෙසින්ද දක්වා ඇත. **බලන්න**: ඤාතගම

▲ **නිදිවැරීම**- wakefulness:නිදිවැරිමේයෙදීම සේඛ පුහුණුවේ යෙදෙන ආරිය ශ්‍රාවකා සතු ගුණයකි. **බලන්න**: ජාගාරානුසතිය, උත්ථාන සංඥාව. **බුදුන් වහන්සේ පෙන්වා ඇත්තේ:** පුද්ගලයන් පස් දෙනෙක් අල්ප නින්දට (නිදිවැරීම) පත්වේ: 1) ස්ත්‍රියක් ගැන කැමත්තක් ඇතිව සිටින පුරුෂයා 2) පුරුෂයෙක් ගැන කැමත්තක් ඇතිව සිටින ස්ත්‍රිය 3) වස්තු පැහැර ගැනීමට සිතන සොරා 4) රාජකාරි බහුල රජතුමා 5) කෙළෙසුන්ගෙන් මිදීමට වීරිය කරණ මහණ. **සටහන**: බුදුවරු, පසෙබුදුවරු ආදී ආරියන් සුවසේ නිදාගන්නා හවතුන්ය. **බලන්න:** සුවනින්ද. **මූලාශ්‍ර**:අංගු.නි: ( 3): 5 නිපාත: 5.3.4.7 අප්පංසුපති සූත්‍රය, පි. 276, EAN:5: 137.7 Little sleep, p. 281.

▼**නිදිවැරීම පුහුණු** කරණ භික්ෂුව, ආසව ක්ෂය කිරීමේ මග ආරම්භ කර ඇතිබව මෙහි පෙන්වා ඇත. නිදිවැරීමේ ප්‍රතිපදාව - ජාගරියං, පිලිබඳව මෙහි විස්තරාත්මකව පෙන්වා ඇත. **මූලාශ්‍ර**:අංගු.නි: ( 1): 3 නිපාත:3.1.2.6 සූත්‍රය,පි252.

▲ **නිද්දාතන්දී**- Drowsiness & lethargy: නිද්දාතන්දී ලෙසින් පෙන්වා ඇත්තේ නිදිමත හා අලසකමය. මෙය නීවරණයකි. **බලන්න**: ථීනමිද්ධ එක්සමයක දේවියක් පැවසුවේ නින්ද අලසකම ආදී අකුසල ඇතිවිට ආරිය මර්ගය ප්‍රකට නොවන බවය. ඒ අවස්ථවේදී බුදුන් වහන්සේ වදාළේ : එම අකුසල, වීරියෙන් පහකරගත්විට ආරිය මාර්ගය ප්‍රකටවනබය. **මූලාශ්‍ර**:සංයු.නි: (1) සගාථවග්ග: දේවතාසංයුත්ත:1.2.6 නිද්දාතන්දී සූත්‍රය, පි. 40, ESN:1: Devatasmayutta: 16.6. Drowsiness & lethargy, p.74.

▲ **නිදාන**- Causation: ධර්මයට අනුව නිදාන ලෙසින් පෙන්වා ඇත්තේ සසර පැවැත්මට හේතුවන මූල ධර්මයන් ගැනය. එනම්: පටිච්චසමුප්පාද ක්‍රියාවලියය. **බලන්න:** පටිච්චසමුප්පාදය **සටහන**: සංයු.නි: (2) නිදාන සංයුත්තයේ: පටිච්චසමුප්පාද ක්‍රියාවලිය විස්තර කර තිබේ.

▲ **නිද්ධමනිය ධර්ම**- Niddhamaniya Dhamma : නිද්ධමනිය ධර්ම ලෙසින් පෙන්වා ඇත්තේ පහකර ගතයුතු ධර්මතාය. එනම්: මිථ්‍යාදිට්ඨිය ප්‍රමුඛ, වැරදි මගය. ඒ ධර්මතා පහකර ගැනීම පිණිස සම්මා දිට්ඨිය ඇතුළු නිවැරදි මග වඩා ගතයුතුය. සම්මා දිට්ඨිය මගින්, මිථ්‍යා දිට්ඨිය පහවේ. එලෙස, නිවැරදි මගේ සෙසු අංග දියුණු කරගෙන වැරදි මග පහ කර ගත හැකිවේ. **මූලාශ්‍ර:** අංගු.නි: (6 ):10 නිපාත: 10.3.1.10 නිද්ධමනිය සූත්‍රය, පි. 424, EAN: 10: 110.10 Ejected, p. 543.

▲ **නිද්දස වස්තු** - Niddasa vasthu-Bases for being 10 less: නිද්දස වස්තු (නිද්දේස) ලෙසින් පෙන්වා ඇත්තේ, ධම්මවිනයේ පරිපූර්ණ භික්ෂුවක් වීමට ඇති ගුණයන්ය-( වසර 10ට අඩුයයි පැවසීමට - bhikkhu as ten-less) හුදු වස්විසූ අවුරුදු ගණනින් 'නිද්දේස මහණ' යයි පැනවිය

නොහැකිබව, බුදුන් වහන්සේ පෙන්වා ඇත. සත් ගුණයෙන් සමන්විත භික්ෂුව 'නිද්දේස මහණ' ලෙසින් හැඳින්විය හැකිබවය: 1) ශික්ෂාව (පුහුණුව) කෙරෙහි බලවත් කැමැත්ත හා එම කැමත්ත පවත්වාගෙනයාම 2) ධර්මය කෙරෙහි ඇති ප්‍රේමය හා එම ප්‍රේමය පවත්වාගෙනයාම 3) ලාමක ආශාවන් නැතිකරගනීමට ඇති බලවත් උනන්දුව හා එම උනන්දුව පවත්වාගෙනයාම 4) හුදකලා විවේකයට ඇති ඇල්ම හා එම ඇල්ම පවත්වාගෙනයාම 5) වීරිය ඇතිකර ගැනීමට ඇති බලවත් කැමැත්ත හා එම කැමත්ත පවත්වාගෙනයාම 6) සති සම්ප්‍රජන්‍යය ඇති කර ගැනීමට ඇති බලවත් උනන්දුව හා එම උනන්දුව පවත්වාගෙනයාම 7) දිට්ඨිප්‍රතිවේදය (to penetrate by view) ගැන ඇති බලවත් කැමැත්ත හා එම කැමත්ත පවත්වාගෙනයාම. **සටහන්**: * බුදුන් වහන්සේ පෙන්වා ඇත්තේ එලෙස, ආධ්‍යාත්මික පිරිසුදුබවින් යුතුව භික්ෂුවක්, වසර 12ක් හෝ වසර 24 ක් හෝ 36 ක් හෝ 48 ක් වාසය කරන්නේ නම් ඔහු නිද්දස භික්ෂුව සේ හැඳින්වීමට සුදුසුවේ ** මේ පිලිබඳ භික්ඛු බෝධි හිමියන් ගේ සටහන් **බලන්න**: EAN:note:1472, p. 652 ** අංගු: (4) 7 නිපාත: 7.1.4.11 සූත්‍රය මෙයට සමානය. එම සූත්‍රය දේශනා කර ඇත්තේ සැරියුත් තෙරුන්ටය. **මූලාශ්‍ර:**අංගු.නි: (4 ): 7 නිපාත:7.1.2.10 නිද්දසවත්තු සූත්‍රය, පි. 322, EAN: 7: 20.10. Bases for being 10 less, p. 373.

▼**නිද්දස වස්තු** - Niddasa vasthu-Bases for being 10 less: මේ සූත්‍රයේදී බුදුන් වහන්සේ වෙනත් නිද්දස වස්තු 7 ක් ගැන ආනන්ද තෙරුන්ට විස්තර කරඇත: 1) ශ්‍රද්ධාව 2) හිරිය 3) ඔත්තප්ප 4) බහුශ්‍රැත 5) වීරිය 6) සති සම්ප්‍රජන්‍යය7) ප්‍රඥාව. **මූලාශ්‍ර:** අංගු.නි: (4 ): 7 නිපාත:7.1.4.12.නිද්දසවත්තු සූත්‍රය, පි. 358, EAN: 7: 43.12.Bases for being 10 less, p. 379.

▲ **නිද්දේස**-Niddesa: සූත්‍ර දේශනා පිළිබඳව මහා සැරියුත් හිමි විසින් කල ධර්ම විභාගය නිද්දෙස නම්වේ. ධර්ම සෙනෙවි වූ ආයුෂ්මත් සැරියුත් මහ තෙරනුවන් විසින් ලෝකානුකම්පායෙන් දෙසනලද ඒ මහා නිද්දේස පාලිය ධර්ම භාණ්ඩාගාරික ආනන්ද තෙරුන් අසා ඉගෙන ප්‍රථම සංගායනාවේදී දෙසනා කළහෙයින් සංගායනාරොපිත විය.**බලන්න**: ඛු.නි: මහානිද්දේස පාලි, සංඥාපනය, පි 11.

**නධ**

▲ **නිධානය-** Treasure : නිධානය යනු සඟවා තබන ලද වස්තුන්ය. සමහර පුද්ගලයෝ මතු ප්‍රයෝජනය පිණිස තමන්ගේ ධන සම්පත් පොලවේ යට තැන්පත් කරති. එහෙත්, ඒ නිධාන ස්වභාවික හේතු නිසා හෝ අන්‍යයන් සොරකම් කිරීම නිසා හෝ නැතිවේ. එහෙත් කෙනක් දානමය පින්කම්, ශීලයරැකීම, ශ්‍රද්ධාව, මච්පිය,නෑදෑයන්ට සැලකීම, ආදී ක්‍රියා **පුණ්‍ය නිධාන** ලෙසින් බුදුන් වහන්සේ පෙන්වා ඇත. කෙනෙක් එසේ රැස්කරගත් නිධාන-යහපත් කුසල ඔහුට පරලොව ගෙන යා හැකිය. **මූලාශ්‍රය**:ඛු.නි:ඛුද්දකපාඨ: 8 නිධිකණ්ඩ සූත්‍රය, පි. 44.

**නන**

▲ **නන්දක තෙර-** Nandaka Thera: **බලන්න**: උපග්‍රන්ථය:1

▲ **නන්ද තෙර-** Nanda Thera: **බලන්න**: උපග්‍රන්ථය:1

▲ **නන්ද ගෝතම තෙර-** Nanda GothamaThera:**බලන්න**: උපග්‍රන්ථය:1

▲ **නන්දා තෙරනිය-** Nanda Therani:**බලන්න**: උපග්‍රන්ථය: 2

▲ **නන්දා ගොතමතෙරණිය-** Nanda Gothama Therani: **බලන්න**: උපග්‍රන්ථය: 2

▲ **නන්දගෝපාල-**Nanda Cow heard: අයෝධ්‍යා නුවර අසල වාසය කල මොහු, බුදුන් වහන්සේ , මාර්ග බාධා හැර නිවන සාක්ෂාත් කර ගැනීම පිළිබඳව දෙසූ දහම අසා පැවිදිව, අරහත්වය ලැබූ බව මෙහි දක්වා ඇත. **මූලාශ්‍ර**: සංයු.නි: (4 ): සළායතනවග්ග:වේදනා සංයුත්ත: 1.19.4 දාරුක්ඛන්ධ උපමා සූත්‍රය, පි.1.19.

▲ **නන්දාරාමය-**Nandarama: ඵුස්ස බුදුන් වහන්සේ වැඩසිටි ආරාමයකි. **බලන්න**:  ලකුණ්ටකභද්දිය තෙර

▲ **නන්ද දේවපුත්‍ර-** Nandadevaputhra: බුදුන් වහන්සේ බැහැදැක, මේ දෙවියා මරණබිය දකින මිනිසා පින්කිරීම සුදුසුය යයි පැවසිය, ඒ පිලිබඳ බුදුන් වහන්සේ මෙසේ වදාළහ:

"...මරණබිය දකින මිනිසා ලෝක ආමිෂය හැර නිවන පැතීමට කටයුතු කළයුතුවේ: **මූලාශ්‍රය:** සංයු.නි: (1) සගාථවග්ග: දේවතා සංයුත්ත:2.3.7 නන්දසූත්‍රය, පි.146.

▲ **නන්දන දේවපුත්‍ර-** Nandanadevaputhra: බුදුන් වහන්සේ බැහැදැක, මේ දෙවියා, සිල්වතා, නුවණැතියා හා දුක නැතිව වාසය කරන්නා හා දෙවියන් පුදනුලබන මින්සුන් ගැන විමසුහ. බුදුන් වහන්සේ වදාළේ:

" යමෙක් සිල්වත්ද, නුවණඇත්ද, වඩනලද සිත ඇත්ද, සමාහිතද, සිහිඇත්ද, ශෝකපහකර ඇත්ද, කෙළස් ක්‍ෂය කොට ඇත්ද ඔහු 'අන්තිම සිරුර' -අන්තිමදේහය දරයි, ඔහු සිල්වතාය, නුවනැත්තාය, දුක ඉක්මවූ තැනත්තය, එබඳු උතුමන් දෙවියෝ පුදති" **සටහන:** අන්තිම සිරුර දරන්නේ බුදු, පසේබුදු හා රහතුන්ය. **මූලාශ්‍රය:** සංයු.නි: (1) සගාථවග්ග:දේවතා සංයුත්ත: 2.2.4 නන්දන සූත්‍රය, පි.126.

▲ **නන්දමානවක**- Nandamanawaka: **බලන්න:** උපග්‍රන්ථය:3

▲ **නන්දමානවක තෙර**- Nandamanawaka Thera:**බලන්න:** උපග්‍රන්ථය:3

▲ **නන්දමාතා**- Nandamaatha: මේ උපාසිකාව, වේලුකන්ථකි නන්දමාතා-උත්තරා නන්දමාතා ලෙසින්ද හඳුන්වා ඇත. **බලන්න**: උපග්‍රන්ථය: 3

▲ **නන්දිය පරිබ්‍රාජක-**Nandiya paribrajika: **බලන්න**: උපග්‍රන්ථය: 3

▲ **නන්දක ලිච්ඡවී** -Nandaka Lichchavi: **බලන්න**: උපග්‍රන්ථය: 3

▲ **නන්දිය ශාක්‍ය-** Nandiya sakya: **බලන්න**: උපග්‍රන්ථය:3

▲**නන්දිවිසාල දෙව්-** Nandivisala Deva: ශරීරය නමැති යානය-වාහනය පිලිබඳ මේ දෙවියා බුදුන් වහන්සේ හමුව විමසීම මෙහි දක්වා ඇත.

තණ්හාව නැතිකරගත්විට ඒ යානයෙන් මිදීයා හැකිබව බුදුන් වහන්සේ පෙන්වා ඇත. **මූලාශ්‍රය:** සංයු.නි: (1) සගාථවග්ග: දේවතාසංයුත්ත: 2.3.8 නන්දිවිසාල සූත්‍රය, පි.146.

▲ **නන්දන උයන-**Nandana Grove: නන්දන උයන යනු තව්තිසා දේවලෝකයේ ඇති ප්‍රියජනක උයනකි.**බලන්න**: ESN: note 19, p. 36. හා තව්තිසා දේවලෝකය.

▼**එක්සමයක** තව්තිසා වැසි දෙවියෙක් සැපය යනු නන්දන උයනේ දිව්‍ය සැප විඳීමයයි පැවසුහ. වෙනත් දෙවියක් මෙසේ පැවසුහ: "...සියලු සංස්කාර අනිත්‍ය ස්වභාවය දරයි, ඉපදී නැසීයයි. සංස්කාරයන්ගේ සංසිඳීම සැපය යයි රහතුන්ගේ වදන් ඔබ නොම දනී' **බලන්න**: ESN: note 20, p. 501. **මූලාශ්‍ර:** සංයු.නි :(1): දේවතා සංයුත්ත: 1.2.1 නන්දන සූත්‍රය, පි.36, ESN: 1: Devatasamyutta: 11.1 Nandana, p. 70.

▼**නන්දන උයන අප්සරාවන්ගෙන්** පිරුන මුලාවක් යයි, බුදුන් වහන්සේට පැවසු දෙවතාවක්, ඉන් මිදීම පිණිස උපදෙස් ඇසුහ. බුදුන් වහන්සේ වදාළේ, මිදීමට ඇති එකම මග ආරියඅටමග බවය. **බලන්න**: ආරියඅටමග. **මූලාශ්‍ර:** සංයු.නි: (1): සගාථවග්ග:දේවතා සංයුත්තය 1.5.6 අච්ඡරා සූත්‍රය,පි. 84, ESN:1: Devathasamyutta: 46.6 nymphs, p. 121.

▲**නන්දීති**- Delight: නන්දීති (නන්දන) යනු සතුටට පත්වීමය. ලෝකයා උපධි- තමන් සතු කරගත් කාම වස්තූන් නිසා සතුටට පත්වේ. එහෙත්, උපධි නිසා දුක ඇතිවේ. එමනිසා නියම සතුට ලබාගැනීම පිණිස උපධි අත්හළ යුතුය යයි බුදුන් වහන්සේ වදාළහ. **බලන්න**: උපධි. **මූලාශ්‍ර:**සංයු.නි :(1): සගාථවග්ග: දේවතා සංයුත්ත: 1.2.2 නන්දති සූත්‍රය, පි.38, ESN: 1: Devatasamyutta: 12.2 Delight, p. 71,

▼**එක්සමයක මාරයා**, බුදුන් වහන්සේ හමුවේ මෙසේ පැවසුහ: " උපධිහු මිනිසාගේ නන්දනයෝය, උපධි රහිත වූවිට ඔහු සතුටුනොවේ". ඒ අවස්ථවේදී බුදුන් වහන්සේ වදාළේ: "උපධි මිනිසුන්ගේ ශෝචනයෝය, උපධි රහිතවූ විට ශෝක නොකෙරේ". **මූලාශ්‍ර:** සංයු.නි: (1): මාර සංයුත්ත: 4.1.8 නන්දති සූත්‍රය, පි. 222, ESN: 11: Marasamyutta: 8.8 He Delights, p. 271.

▲ **නන්දික්ෂය**- Destruction of delight: නන්දික්ෂය යනු කාමතණ්හාව, භවතණ්හාව හා විභවතණ්හාව සහමුලින්ම නැතිකර ගැනීමය. ඒවාට ඇති නන්දිය- ඇල්ම පහකර ගැනීමය (නිබ්ද්දාව) - නිරෝධසත්‍යය. පංච උපාදානස්කන්ධයේ අනිත්‍ය ස්වභාවය, යෝනිසෝමනසිකාරයෙන් දැක අවබෝධ කරගත් ආරියශ්‍රාවකයා, නන්දිසහගත තණ්හාව ක්‍ෂය කරගැනීම නන්දික්ෂයය, රාගයෙන්, කෙලෙසුන්ගෙන් මිදීමය. සිත මුළුමනින්ම විමුක්තියට (සුවිමුත්ත) පත්වීමය.

**"...නන්දික්ඛයා රාගක්ඛයො, රාගක්ඛයා නන්දික්ඛයො. නන්දිරාගක්ඛයා චිත්තං සුවිමුත්තන්ති..."** (With the destruction of delight and lust the mind is liberated and is said to be well liberated) **මූලාශ්‍ර:** සංයු.නි :(3 ): ඛන්ධසංයුත්ත: 1.1.5.9 හා 1.1.5.10 නන්දික්ෂය

සූත්‍ර, පි. 118, ESN: 22: Khandasamyutta: 51.9 & 52.10 Destruction of delight, p. 1035.

▲ **නින්ද** -Sleep: නින්ද- සැතපීම, සාමාන්‍ය ලෝකයාට සැපයකි, බොහෝදෙනා දිග නින්ද ප්‍රිය කරයි. ආධ්‍යාත්මික පුහුණුවේ යෙදන සංඝයා නිදාගන්නේ ඉතා කෙටි කාලයකි. **බලන්න:** ජාගරානුසතිය.

▼**නින්දට යායුතු පිළිවෙල** ගැන බුදුන් වහන්සේ මෙසේ වදාළහ:
"මහණෙනි, එළඹී සිහි ඇතිව, සම්‍යක් ප්‍රඥාව ඇතිව නින්දට බසින්නහුට අනුසස් 5 ක්වේ:1) සුවසේ නිදයි, 2) සුවසේ පිබිදෙයි 3) පවිටු සිහින නොදකියි 4) දෙවියෝ රකිති 5) ශුක්‍ර නො මිදේ". **මූලාශ්‍රය**: වින.පි: මහා වග්ග පාළි- 2: 1. චීවරඛන්ධක, පි 216.

▼ **සියලු උපධි ක්ෂය කල** සර්වඥයන් වහන්සේ, සුවසේ නිදාගන්නා බව, බුදුන් වහන්සේ පෙන්වා ඇත. **සටහන**: බුදුන් වහන්සේ සැතපෙන්නේ, ඉතා කෙටි වේලාවකි, මැදියම් රය අවසන්වූ පසුව, අලුයම, නැගිටින වේලාව සිතේ සටහන් කරගෙන, සිංහසෙයියාවෙන් සැතපේ. **මූලාශ්‍ර:** සංයු.නි: (1): සගාථවග්ග: මාර සංයුත්ත: 4.1.7 සොප්පසි සූත්‍රය, පි. 222, ESN: 11: Marasamyutta: 7.7. Sleep, p. 269.

▼ **නින්ද වනාහි**, ජීවත්වන මිනිසුන්ට වඳ බව-නිසරුබව ගෙනදෙන, ඵල රහිත දෙයක් ය, එහෙත් කෙළෙස් සිතුවිලි පවත්වනවාට වඩා නිදාගැනීම සුදුසුවේ යයි මෙහි දක්වා ඇත. **මූලාශ්‍ර**: සංයු.නි: ( 4 ): සළායතනවග්ග: වේදනාසංයුත්ත: 1.18.8 ආදිත්තපරියාය ධර්ම න්‍යාය සූත්‍රය, පි. 358, ESN: 36: Vedanasamyutta: Ocean: 235.8 The Exposition on Burning, p. 1311.

▲ **නානත්තතාකාය**- different in body: නානත්තතාකායා යනු සත්ත්වයන් ගේ කයේ විවිධ බවය. **බලන්න**: විඥානය පිහිටන ස්ථාන.

▲ **නානත්තසඤ්ඤා**- different in perceptions: නානත්තසඤ්ඤා යනු සත්ත්වයන් ගේ සංඥාවන්හි විවිධ බවය .**බලන්න**: විඥානය පිහිටන ස්ථාන.

▲ **නානාතිත්ථිය-**Various sectarians: නානාතිත්ථිය යනු අන්‍ය තීර්තකයන්ය. දේවපුත්ත පිරිසක්, බුදුන් වහන්සේ බැහැදැක අන්‍ය ආගමික නායකයන් වන: පූරාණකාශ්‍යප, මක්ඛලිගෝසාල, නිගණ්ඨනාතපුත්‍ර පිළිබඳ ගුණ වර්ණනා කළබව මේ සූත්‍රයේ පෙන්වා ඇත. ඉන්පසුව, මානවගාමිය දේව පුත්‍රයෝ, බුදුන් වහන්සේ, සියල්ලටම වඩා ශ්‍රේෂ්ඨ බව පැවසූහ. **බලන්න**: ESN:notes: 190 & 191, p. 528.

**මූලාශ්‍ර:** සංයු.නි: (1) :සගාථවග්ග: දේවතාසංයුත්ත: 2.3.10 නානාතිත්ථිය සාවක සූත්‍රය, පි.152, ESN: 2: devaputtasamyutta: 30.10 Various sectarians, p. 210.

▼ **අන්‍ය ආගමිකයන්ගේ දිට්ඨී** හා මත පිලිබඳ මේ සූත්‍රයන්හි විස්තරාත්මකව දක්වා ඇත. ඒ පිළිබඳව බුදුන් වහන්සේ වදාළේ ඔවුන් අන්ධයන් ලෙසින් කටයුතු කරනබවය. එම ගැන යොදාගත් **උපමාව** : අන්ධයන් පිරිසක්, ඇතෙක් ගේ විවිධ කාය අංග ස්පර්ශකර, ඇතා එබඳු කෙනෙක්යයි නිගමනය කිරීමය. ඔවුන්, සම්පූර්ණ ඇතා පිළිබඳව

නොදැන තමන් ගේ අවබෝධය අනුව ඇතා මෙවැනිය යයි වාදවිවාද කරති.උපග්‍රන්ථය:5 **මූලාශ්‍ර:** ඛු.නි: උදානපාලි: නානාතිත්ථිික සූත්‍ර 3කි,පි.286.

▲ **නානාධර්ම**- Nana Dharma: පංචස්කන්ධය, ආයතන 12, ධාතු 18, කුසල ධර්ම, අකුසල ධර්ම ආදී ධර්මතා නානා ධර්මයය.**බලන්න**: අර්ථසංදර්ශන ඤාණය.

▲ **නානාධාතු නුවණ-**Nanadhatu nana: මෙය තථාගතයන්ගේ දස බල ඥානයන්ගෙන් එකකි. විස්තර පිණිස **බලන්න**: ධාතු, තථාගත.

▲ **නානාධිමුත්ති ඥානය-** Nanadhimutti Nana-Diverse Dispositions නානාධිමුත්ති ඥානය ලෙසින් පෙන්වා ඇත්තේ සත්ත්වයන් ගේ විවිධවූ චරිත ස්වභාවය දන්නා නුවණය**.** මෙය තථාගතයන් සතු දසබල ඥාණයකි .**බලන්න**: තථාගත. **සටහන**:සංයු.නි: (5-2)මහාවග්ග: අනුරුද්ධසංයුත්ත:8.2.9 නානාධිමුත්ති සූත්‍රයේදී අනුරුද්ධ තෙරුන් වදාළේ, සතර සති පට්ඨානය මැනවින් වැඩූ බැවින් උන්වහන්සේට එම නුවණ ලැබූබවය.

**නප**

▲ **නපටිසනකාරො-** Napatisantharo: නපටිසනකාරො ලෙසින් පෙන්වා ඇත්තේ ආචාරසම්පන්න නැතිබවය, අගෞරවයය, අගුනයකි, මාර්ගයේ දියුණුවට බාධාවකි. **බලන්න**: අගෞරව ධම්ම.

▲ **නිපපඤ්ච**-un proliferated**:** තණ්හා, දිට්ඨි හා මාන -කෙළෙස් නොමැති ධර්මතාවය නිපපඤ්ච ය- ප්‍රපංච නොමැතිබවය. මෙය නිවන හඳුන්වන පදයකි. **බලන්න**: ප්‍රපංච, නිවන. **මූලාශ්‍ර**: සංයු.නි: (4 ): සළායතනවග්ග: අසංඛතසංයුත්ත:9.2 නිප්පපඤ්ච සූත්‍රය, පි. 684, ESN:43: Asankhatasamyutta: 14.3 unproliferated, p 1513.

▲**නිපුණ-**Subtle: නිපුණ යනු සියුම්- අවබෝධය පහසු නැති බවය. නිවන හඳුන්වන පදයකි. **සටහන:** යම්දෙයකට දක්ෂ වීම නිපුණ ලෙසින් දක්වා ඇත. **මූලාශ්‍ර**: සංයු.නි: (4) සළායතනවග්ග: අසංඛතසංයුත්ත:9.2 නිපුණ සූත්‍රය, පි.683, ESN:43: Asankhatasamyutta: 14.3 The subtle, p.1513.

▲ **නිපුණතාවය හා අනලස්බව -** skillful and diligent : නිපුණතාවය හා අනලස්බව**:** ධර්ම මාර්ගයේ ගමන් කරන භික්ෂුවක් තුළ තිබිය යුතු ගුණයන් වේ. එම ගුණ ඇතිවීම, ආධ්‍යාත්මික මගට ආරක්ෂාව ලබාදෙන බව බුදුන් වහන්සේ පෙන්වා ඇත: තමන් සමග වාසය කරන සෙසු සංඝයා පිළිබඳ කළයුතු විවිධ කටයුතු නිපුණබවින් යුතුව, අනලස්ව- අප්‍රමාදව කිරීමට ඇති හැකියාව තිබීම, ඒ කටයුතු මැනවින් හා අනුපිළිවෙලින් සංවිධානය කරගැනිම පිණිස, නිවැරදි තීරණ ගැනීමට දක්ෂබව භික්ෂුවට ඇති ආරක්ෂක ධර්මයකි.

**“ … භික්ඛු යානි තානි සබ්‍රහ්මචාරීනං උච්චාවචානි කිංකරණීයානි, තත්‍ථ දක්ඛො හොති අනලසො තත්‍රුපායාය වීමංසාය සමන්නාගතො අලං කාතුං අලංසං විධාතුං…”**. (a bhikkhu is skillful and diligent in attending to the diverse chores that are to be done for his fellow

monks; he possesses sound judgment about them in order to carry out and arrange them properly) .**බලන්න**: නාථකරණ ධර්මතා. **මූලාශ්‍ර**: අංගු.නි: (6): 10 නිපාත: 2 නාථ වග්ග, 10.1.2.7 ප්‍රථම නාථකරණ සූත්‍රය, EAN:10: II Protector: 17.7 Protector I, p.497.

**නබ**

▲ **නිබිද්දාව**: පාලි: **නිබ්බිදා-**Disenchantment: නිබිද්දාව (නිර්වේදය) යනු සසර පිලිබඳව ඇතිවන කළකිරිමය, කාමලෝකය ගැනඇල්ම නැති වීමය. ආධ්‍යාත්මික මාර්ගය දියුණු කරගන්නා පුද්ගලයාට පහසුවෙන්ම නිබිද්දාව ඇති කර ගත හැකිවේ. **සටහන: අටුවාවට අනුව:** නිබිද්දාව යනු සසර ගමන- යළි උපත පිලිබඳ කළකිරිමය. **බලන්න**: EAN: note: 160, p. 588. **ශබ්දකෝෂ: පා.සිං.ශ:** පි. 339: "**නිබ්බිදා:** කළකිරිම, **නිබ්බින්දති:** කලකිරෙයි",

▼ **ඒකාන්තයෙන්ම නිබිද්දාව** ඇතිවීමට උපකාරීවන ධර්මතා 5 ක් මෙහිදී පෙන්වා ඇත: 1) අසුභය නුවණින් දැකීම 2) ආහාරයේ පිළිකුල් සංඥාව ඇතිවීම 3) අනභිරති සංඥාව ඇතිවීම 4) සර්ව සංඛාරයන්හි අනිත්‍යය නුවණින් දැකීම 5) මරණ සංඥාව තමා තුළම ඇතිකර ගැනීම. මේවා, නිවන පිණිසය. **මූලාශ්‍ර**: අංගු.නි: (3): 5 නිපාත**:**5.2.2.9 නිබිද්දා සූත්‍රය, පි.154.

▼**බුද්ධානුස්සතිය** ආදී අනුසති භාවනා වැඩීම, බහුල කර ගැනීම නිබිද්දාව ඇතිකරගැනීමට උපකාරීවේ. **බලන්න**: අනුසති භාවනා. **මූලාශ්‍ර**: අංගු.නි: (1): 1 නිපාත**: එකධම්ම පාලිය**, පි.100, EAN:1: XVI: One Thing, p. 47.

▼**යථාභූත ඥානය** ඇතිවීමෙන් නිබ්බිදාව ඇතිවේ. නිබ්බිදාව නිසා විරාගය ඇතිවේ.

**" යථාභූතඤාණදස්සනං ඛො ආනන්ද නිබ්බිදත්ථං නිබ්බිදානිසංසං…නිබ්බිදා ඛො ආනන්ද විරාගත්ථා විරාගානිසංසා"** (The purpose and benefit of the knowledge and vision of thing as they really are is disenchantment ….purpose and benefit of disenchantment is dispassion". **සටහන**: මේ සූත්‍රය වදාළේ ආනන්ද තෙරුන්ටය. **මූලාශ්‍ර**: අංගු.නි: (6 ): 11 නිපාත:නිසසය වගග: 11.1.1.කිමත්ථිය සූත්‍රය හා 11.1.2 න චේතනාය කරණිය සූත්‍රය**,** පි.611-614, EAN:11: Dependence: 1.1 What Purpose & 1-2 Volition p.566.

▼**ධම්මානුධම්ම ප්‍රතිපදාවට** ඇතුල්වූ පුද්ගලයාට ඇතිවෙන අනුධර්ම, නිබිද්දාව බහුල කර වාසය කිරීමට උපකාරිවේ යයි මෙහි පෙන්වා ඇත**. බලන්න**: ධම්මානුධම්ම ප්‍රතිපදාව. **සටහන:** මෙහිදී පෙන්වා ඇත්තේ ධම්මානුධම්ම ප්‍රතිපදාව නිසා පංච උපාදානස්කන්ධය පිලිබඳ අවබෝධය ලැබී ඒ ගැන නිබිද්දාව ඇතිවීමය. **මූලාශ්‍රය:** සංයු.නි: (3) ඛන්ධසංයුත්ත: නකුම්භාකවග්ග: 1.1.4.7-10 සූත්‍ර, පි.98.

▼ **සප්ත බොජ්ඣංග** වඩාගැනීමෙන් නිබිද්දාව ඇතිවේ යයි මෙහි පෙන්වා ඇත. **මූලාශ්‍රය**: සංයු.නි: (5-1) මහාවග්ග: බොජ්ඣංගසංයුත්ත: 2.2.10 නිබිද්දා සූත්‍රය, පි.198.

▼**සතර ඉද්දිපාද වර්ධනය කරගැනීමෙන් නිබිද්දාව ඇතිවේ**: මානව වැඩුන, බහුල කල ඉද්දිපාද නිසා නිබ්බිද්දාව ඇතිවේ .**බලන්න**: ඉද්දිපාද. **මූලාශ්‍ර**: සංයු.නි: (5-2) මහාවග්ග: ඉද්දිපාද සංයුත්ත: 7.1.4 නිබ්බිදා සූත්‍රය, පි. 28,ESN: Iddhipādasamyutta: 4.4 Revulsion, p. 2060.

▲ **නිබිද්දානුපස්සනා**- Nibiddaanupassana: කළකිරිම ඇතිකරන අරමුණු පිලිබඳ සිහිය පිහිටුවා ගැනීම, අනුසති භාවනාව මින් අදහස් කෙරේ. රූපය ආදිවූ පංචඋපාදානස්කන්ධය පිළිබඳව නිබිද්දානුපස්සනාව වැඩිම, තීක්‍ෂණප්‍රඥාව ඇතිකර ගැනීමට, නිවන සාක්ෂාත් කර ගැනීමට හේතුවේ. **බලන්න**: තීක්ෂණ ප්‍රඥාව. **මූලාශ්‍ර**:ඛු.නි:පටිසම්භිදා 2: ප්‍රඥාවග්ග: 3.1 ප්‍රඥා කථා, පි. 166-188.

▲ **නිබ්බේධභාගිය මාර්ගය**- Nibbedhabhagiya margaya-the path that partakes of penetration: නිබ්බේධභාගිය මාර්ගය ලෙසින් පෙන්වා ඇත්තේ කෙළෙස් නැසීමට යොදාගතයුතු මගය. ඒ මාර්ගය නම් සප්ත බොජ්ඣංගයන්ය. **සටහන**: උදායි තෙරුන් ගේ විමසීමකට අනුව බුදුන් වහන්සේ ඒ මාර්ගය වඩාගන්නා අන්දම විස්තර කර ඇත. **මූලාශ්‍ර**: සංයු.නි: (5-1 ): මහාවග්ග: බොජ්ඣංගසංයුත්ත: 2.3.8 නිබ්බේධසූත්‍රය, පි.206, ESN:46: Bojjhngasamyutta: 28.8 Partaking of Penetration,p.1762.

▲ **නිබ්බේධික ධර්ම පරියාය**- Nibbedhika Dhammapariyaya: නිබ්බේධික ධර්ම පරියාය (penetrative exposition of the Dhamma ) ලෙසින් මෙහි පෙන්වා ඇත්තේ: කාමය, වේදනාව, සංඥාව, ආශ්‍රව, කම්ම, දුක, ආදී ධර්මතා පිලිබඳ පරිපූර්ණ අවබෝධයය. එම අවබෝධය දුකින් මිදීම පිණිසය. ඒ පිළිබඳව මෙහි විස්තරාත්මකව පෙන්වා ඇත. **බලන්න**: කාමය, වේදනාව, සංඥාව, ආශ්‍රව, කම්ම, දුක. **මූලාශ්‍රය**: අංගු.නි: (4) 6 නිපාත: 6.2.1.9 නිබ්බේධික සූත්‍රය, පි.220.

▲ **නිබ්බේධික ප්‍රඥාව:පාලි: නිබ්බෙධිකපඤ්ඤා**- Nibbedhika panna penetrativeness of wisdom: සසර කලකිරීම ඇතිකරන නුවණ නිබ්බෙදික ප්‍රඥාවය. **නිබ්බේධික ප්‍රඥාව පරිපූර්ණවීම**: දුක්ඛානුපස්සනාව , රූපය පිළිබඳ දුක්ඛානුපස්සනාව වැඩීමෙන් නැවත නැවත එහි යෙදීමෙන් නිබ්බේධික ප්‍රඥාව පරිපූර්ණවේ:

**"දුක්ඛානුපස්සනා...රූපෙ දුක්ඛානුපස්සනා භාවිතා බහුලීකතා නිබ්බෙධිකපඤ්ඤං පරිපූරෙති" නිබ්බේධික ප්‍රඥාව යනු කුමක්ද?**

"මේ සසුනේ භික්ෂුව සෑම සංස්කාරයන් කෙරෙහි... අරතිය...අනභිරතිය (නොඇල්ම) ඇත්තේය... ඒවායේ නොඇලේ...රාග දෝස මෝහය (අකුසලමූල) ...ක්‍රෝධය ආදී සියලු කෙලෙස්, දුශ්චරිත, අභිසංස්කාර (කර්මසකස්කිරීම), භව කර්ම (යලිඋපත ගෙනදෙන) ප්‍රහාණය කිරීමේ අවබෝධය, නුවණ ඇත, එය නිබ්බේධික ප්‍රඥාව වේ". **මූලාශ්‍ර**:ඛු.නි: පටිසම්භිදා 2 : ප්‍රඥාවග්ග: 3.1 ප්‍රඥා කථා, පි. 166-188.

▼**සතර ධර්මය** මගින් නිබ්බෙදික ප්‍රඥාව ඇතිවේ. 1) සත්පුරුෂ සේවනය 2) සද්ධර්ම ශ්‍රවණය 3) යෝනිසෝමනසිකාරය 4) ධර්මයට අනුකූලව පිළිපැදීම (ධර්මානුධර්ම ප්‍රතිපදාව) ඇති පුද්ගලයාට නිබ්බෙදික ප්‍රඥාව ඇතිවේ.**බලන්න**: සෝතාපන්න පුද්ගලයා.

**"...ඉමෙ ඛො භික්ඛවෙ, චත්තාරො ධම්මා භාවිතා බහුලීකතා නිබ්බෙධිකපඤ්ඤාතාය සංවත්තනතීති"**. (these four things, when developed and cultivated lead to the penetrativeness of wisdom) **මූලාශ්‍ර**: සං.යු.නි: (5-2): මහාවග්ග:සෝතාපන්න සංයුත්ත:11.7.13 නිබ්බෙදික ප්‍රඥා සූත්‍රය, පි. 282, ESN: Sotapatthisamyutta: Greatness of Wisdom: p. 2262.

▼**නිබ්බෙදික ප්‍රඥාව** කායගතා සතිය වැඩීමෙන්, විපුල කරගැනීමෙන් ලැබෙන යහපත් ඵලයකි. **බලන්න**: භාවනා , කායගතා සතියේ ප්‍රතිලාභ. **මූලාශ්‍ර:** අං.ගු.නි: (1 ): 1 නිපාත: කායගතාසති වග්ග සූත්‍ර : 1.16.7-සිට, පි. 126, EAN:1: Mindfulness Directed to the Body, p.52.

▼ **වෙනත් මූලාශ්‍ර: 1.** ස්කන්ධයන් කෙරෙහි කළකිරීම බහුල වීම පිළිබඳ නුවණ **නිබ්බෙධිකපඤ්ඤා** නම් වේ.
**https://pitaka.lk/dhammapada/ss/katha-28.html**

**නභ**

▲ **නභාවෙතබ්බ ධම්ම-** Nabavethabba Dhamma: මෙයින් අදහස් කරන්නේ ධර්ම මාර්ගය වැඩීම පිණිස අනුගමනය නොකළයුතු-නොවැඩිය යුතු ධර්මතාය. එනම්, දසඅකුසලය. **බලන්න**: භාවෙතබ්බ ධම්ම, දසකුසල හා දස අකුසල. **මූලාශ්‍ර**: අං.ගු.නි: (6) :10 නිපාතය:10.4.4.7. භාවේතබ්බ ධර්ම සූත්‍රය, පි. 540, EAN: 10: **194,** p. 556.

**නම**

▲ **නමස්කාරය-** Namaskaraya: ත්‍රිවිධරත්නයට, ගරුකටයුතු පුද්ගලයන්ට, ගරුසරු ඇතිව නමස්කාර කිරීම-වැඳීම බෞද්ධයන් ගේ චාරිත්‍රයකි. ධාර්මික පුද්ගලයන්ට දෙවියෝ පවා නමස්කාර කරති. උතුම් පුරුෂයෙක් ජානසමාපත්ති ලබා සිටිනවිට, බ්‍රහ්ම, ඉන්ද්‍ර ආදී දෙවියන් ඔහුට නමස්කාර කරන බව මෙහි දක්වා ඇත. **බලන්න**: ජාන, සුනිත තෙර. **මූලාශ්‍ර**: අං.ගු.නි: (6 ): 11 නිපාත: නිසසය වගග,11.1.9, සන්ධ සූත්‍රය, පි.636, EAN: 11: I Dependence, 9.9 Sandha, p.568.

▲ **නාමය**: පාලි:**නාම**- Name -Nāma: ධර්මයේ නාමය ලෙසින් පෙන්වා ඇත්තේ: වේදනා, සංඥා, චේතනා, ඵස්ස -ස්පර්ශය හා මනසිකාරයටය. **බලන්න:** නාමරූප. **ශබ්දකෝෂ:** B.D:p.103: **"Nāma:** Mind, mentality..."

▼ **නාමය සැමදෙයම පාලනය කරයි**: නාමය සියල්ල යටපත්කර ගෙන සිටි; නාමයට වඩා වැඩි දෙයක් නොමැත, සියලුදෙන නාමයේ වසඟයට පත්වී සිටි යයි බුදුන්වහන්සේ පෙන්වා ඇත. **මූලාශ්‍ර:** සං.යු.නි:

(1):දේවතාසංයුත්ත: 1.71.නාම සූත්‍රය,පි.98,ESN: Devatasamyutta: 61.1 Name, p. 142.

▲ **නාමරූප:** පාලි: **නාමරූපං**-name-and-form/ Mind and body (nāmañ ca rūpañ ca): නාමය: වේදනා, සංඥා, චේතනා, ඵස්ස -ස්පර්ශය හා මනසිකාරයය. රූපය යනු සතර මහා භූතයන් නිසා උපන් රූපය ය, කයය. **නාමරූප පටිච්චසමුප්පාදයේ 4 නි පුරුකය**: විඥාණය හේතුකොට නාමරූප ඇතිවේ, විඥාණය නිරෝධවීමෙනේ නාමරූප නිරෝධවේ, සංඛාර නිරෝධවීමෙන් විඥානය නිරෝධවේ:
**"...විඤ්ඤාණ පච්චයා නාමරූපං..."**
**"...සඞ්ඛාර නිරොධා විඤ්ඤාණ නිරොධො..."** . **මූලාශ්‍ර:** සංයු.නි : (2): නිදාන වග්ග: අභිසමයසංයුත්ත 1.1.1. පටිච්චසමුප්පාද සූත්‍රය හා 1.1.2 විභඞ්ග සූත්‍රය, පි. 24, කළාරඛත්තියවග්ග: චේතානා සූත්‍ර 3කි. පි. 124, ESN: Nidanavagga: 1.1. Dependent Origination & 1 2.2 Analysis of Dependent Origination, p.610, The Karakhattiya: Volition 3 suttas p. 665.

▼**සංයෝජන ධර්මතා** වල ආස්වාදය නැවත නැවත දකිමින් වාසය කරනවිට නාමරූපයන්හි බැසගැනීම සිදුවේ යයි බුදුන් වහන්සේ පෙන්වා ඇත. නාමරූප නිසා සළායතන ඇතිවේ...එලෙස දුක් රැසේ හටගැනීම වේ. මේ පිළිබඳ දක්වා ඇති **උපමාව: මහා රුක**: යම්කිසි මහා රුකක් ඇතිවිට එහි යට ඇති මුල්ද, හරස්ව ඇති මුල්ද, ගසට අවශ්‍ය පෝෂණය ගෙනදේ. එමනිසා ඒ රුක බොහෝකලක් පවතී. එලෙස, නාම රූප නිසා දිගුකලක් දුක් විඳිමින් සසරේ සැරි සැරීමට සිදුවේ. **බලන්න**: විඥානය හා නාමරූප, උපග්‍රන්ථය:5. **මූලාශ්‍ර**: සංයු.නි: (2 ): නිදානවග්ග: අභිසමයසංයුත්ත:1.6.8 නාමරූප සූත්‍රය, පි. 164, ESN:12: Nidana samyutta: Fetters, p.685.

▼ **විඥානය පිහිටි කල්හි**, වැඩුන කල්හි නාම රූපයේ බැස ගැනීමවේ (**නාමරූපස්ස අවක්කන්ති**). නාම රූප නිසා සලායතන ඇතිවේ... (පටිච්චසමුප්පාදක්‍රියාවලිය)...එලෙස දුක් රැසම ඇතිවේ. (When consciousness is established and has come to growth, there is a descent of name-and-form). **සටහන**: *Nāmarūpassa avakkanti*: where the production of future renewed existence is placed between consciousness and the six sense bases. **බලන්න**: ESN: Note: 115. **මූලාශ්‍ර:** සංයු.නි: (2 ): නිදානවග්ග: අභිසමයසංයුත්ත :කළාරඛත්තියවග්ග: චේතානා සූත්‍ර 3කි. පි. 124, ESN:12: Nidanasamyutta: IV: The Karakhattiya: Volition 3 suttas p. 665.

▼ **නාමරූප යනු කවරේද**? සැරියුත් මහා තෙරුන් මෙසේ වදාළහ:
"...වේදනා, සංඥා, චේතනා, ස්පර්ශය හා මනසිකාර ය නාමය යයි කියනු ලැබේ. රූපය යනු සතර මහා භූත හා සතර මහා භූතයන් නිසා උපන් කය-රූපය, රූපය වේ. විඥානය ඇතිවීමෙන් නාමරූප ඇතිවේ, විඥානය නිරෝධ වීමේන් නාමරූප නිරෝධවේ. ආරිය අටමග, නාම රූප නිරෝධ කිරීමේ ප්‍රතිපදාවය. නාම රූප ගැන මනා අවබෝධය ලැබීම පිණිස සම්මා දිට්ඨිය ඇති කර ගත යුතුවේ". **සටහන**: සංයු.නි: අභිසමයසංයුත්තය:1.7.7. නළකලාප සූත්‍රයේදී සැරියුත් තෙරුන්,
**නාමරූප හේතුකොට විඥාණය ඇතිවේ, විඥාණය හේතුකොට**

**නාමරූප ඇතිවේ යයි පෙන්වා ඇත-** ඒ දෙක අතර ඇති අන්‍යෝන්‍ය සම්බන්ධය. ඒ සඳහා උපමා කොට ඇත්තේ නළකලාප 2ක් (උණබට මිටි 2 ක්) එකිනෙකට හෙත්තුවී සිටිනා තාක් නොවැටී සිටීමය. එකක් අස්කලවිට අනික බිම වැටේ. එලෙස නාම රූප නැතිවිට විඥානය නොපවතී, විඥානය නැතිවිට නාම රූප නොපවතී. **බලන්න:** උපග්‍රන්ථය:5 **මූලාශ්‍ර:** බු.ජ.ත්‍රි:ම.නි: (1 කාණ්ඩය): 1.1.9 **සම්මා දිට්ඨි සූත්‍රය,** පි. 130, EMN: 9: Sammādiṭṭhi Sutta- Right View, p. 121.

▼**නාමරූප නිරුද්ධවීම**: යම් තැනක සතර මහා ධාතූන් නො පිහිටයිද, එහි නාමරූපය ඉතිරි නැතිවම අවසන්වේයයි බුදුන් වහන්සේ පෙන්වා ඇත. එනම්, නිවනය. **මූලාශ්‍ර**: සංයු.නි : (1): සගාථවග්ග: දේවතාසංයුත්ත: 1.3.7 සර සූත්‍රය, පි. 56, ESN: 1:Devatasamyutta: 27.7 Streams, p. 90.

▼ **ආධ්‍යාත්මික වර්ධනය** පිණිස නාම රූප පිළිබඳව පිරිසිඳ අවබෝධය **(පරිඥෙය්‍ය)** ලැබිය යුතුවේ. **බලන්න**: පරිඥෙය්‍ය ධර්ම. **මූලාශ්‍ර:** දීඝ.නි : (3): 11 දසුත්තර සූත්‍රය, පි. 483, EDN: 34: Dasuttara Sutta: Expanding Decades, p. 384

▼**බුදුන් වහන්සේ** නාම රූප පිළිබඳව යහපත් ලෙසින් වදාරා ඇත. ඒ ධර්මතා සංඝයා එක්ව, ධර්මයේ චිරස්ථිතිය පිණිස සජ්ජායනා කිරීම සුදුසු ය යි සැරියුත් මහා තෙරුන් සංඝයාට උපදෙස් දී ඇත. **මූලාශ්‍ර**: දිඝ.නි: (3 ):10 සංගිති සූත්‍රය, පි. 372 , EDN: 33 Sangīti Sutta: The Chanting Together, p. 362.

▲ **නිමොක්ඛය, පාමොක්ඛය හා විවේකය -**emancipation, release, seclusion: ධර්මයට අනුව නිමොක්ඛය දුකනැතිකිරීමේ මගය, එම මග අනුගමනය කිරීමෙන් ලබන ඵලය පාමොක්ඛය ය, විවේකය යනු දුකින් මිදීමය-විමුක්තිය ලැබීමය. **සත්ත්වයන්ගේ නිමොක්ඛය,** පාමොක්ඛය හා විවේකය පිළිබඳව දෙවියෙක් ඇසූ පැණයකට පිළිතුරු ලෙසින් බුදුන් වහන්සේ මෙසේ වදාළහ: භව පැවැත්මට ඇති කැමැත්ත සහමුලින් නැතිකරගැනීමෙන්, සංඥාව හා විඥානය නිරෝධ කරගැනීමෙන්, වේදනා අවසන් කර සංසිඳගැනීමෙන් සත්ත්වයන්ගේ නිමොක්ඛය ද පාමොක්කයද විවේකයද වේ:

**"නනදීභවපරිකඛයා සඤඤාවිඤඤාණසඞඛයා, වෙදනානං නිරොධා උපසමා එවං ඛවාහං ...ජානාමි, සතතානං නිමොකඛං පාමොකඛං විවෙකනති' සටහන:** අටුවාවට අනුව නිමොක්ඛය යනු මගය, එම මග අනුගමනය කිරීමෙන් සත්ත්වයන්ට කෙලෙසුන්ගෙන් මිදියහැකිවේ. පාමොක්කය යනු ඵලයය: කෙළෙස් බන්ධනයෙන් මිදීමය. විවේකය යනු නිවන ලැබීමය. නිවන ලැබීමෙන් ඔවුන් දුකින් මිදේ. **බලන්න**: ESN: note: 6, p. 499. **මූලාශ්‍ර:** සංයු.නි: (1 ): සගාථවග්ග: දේවතාසංයුත්ත: 1.1.2 නිමොක්ඛ සූත්‍රය, පි. 30, ESN: 1: Devatasamyutaa: 2.2 Emancipation, p. 60.

▲ **නොමග**-Nomaga: නොමග (deviant path) යනු ධර්මමගට විරුද්ධ මගය. රාගය නොමගය යයි කියනු ලැබේ යයි බුදුන් වහන්සේ වදාළහ. **මූලාශ්‍රය:** සංයු.නි: (1): සගාථ වග්ගදේවතාසංයුත්ත: 1.8.6 නජීරතිසූත්‍රය, පි.106.

▲ **නොමළමිනිසුන්-** Nomalaminisun: නොමළමිනිසුන් ලෙසින් පෙන්වා ඇත්තේ මසුරුකම හැර තමාසතුදේ අන්‍යයන් හා බෙදාගන්නා පිරිසය. එවැනි අය දේවියෝ වර්ණනා කරති. මසුරුකමින් ජීවත්වන පිරිස, ජීවත්වුවද මළවුන් වැනිය. **බලන්න**: දානය. **මූලාශ්‍ර:** සංයු.නි: (1): සගාථවග්ග: දේවතාසංයුත්ත: 1.4.2 මච්ඡරි සූත්‍රය, පි. 62, ESN: Devatasamyutta: 32.2 Stinginess, p. 97.

▲ **නොමසුරුකම-** non-miserliness: නොමසුරුකම යනු ත්‍යාගශීලි බවය. තමන් සතු දේ අන් අය හා බෙදාගැනීමට ඇති කැමත්තය. මෙය කුසල ධර්මයකි, නිදොස් ධර්මයකි. **බලන්න**: අනවද්‍ය ධර්ම හා සාවද්‍ය ධර්ම.

▲ **නෑම**-Bathing: පිරිසිදුවීම පිණිස මිනිසුන් දිය නෑම කරති. පිරිසිදුබව-කෙළෙස් නැතිබව පිණිස ඇති දිය රහිත නෑම නම් තපස හා බඹසරයයි මෙහි පෙන්වා ඇත. (Austerity and the holy life, That is the bath without water).**බලන්න:** ජලස්නානය. **මූලාශ්‍ර:** සංයු.නි: (1 කාණ්ඩය): දේවතාසංයුත්ත: 1.8.6 නජීරතිසූත්‍රය, පි.106, ESN:1: Devatasamyutta: 76.6 Does not decay, p.157.

▼**බුදුන් වහන්සේ වෙතින්** සෝතාපන්න මාර්ගඵලයේ ගුණ අසා සතුටට පත්වූ නන්දිය ලිච්ඡවී මෙසේ පැවසුහ: "...දැන් මේ බාහිර නෑමෙන් කම් නැත, භාග්‍යවතුන් වහන්සේ කෙරහි යම් ඒ පැහැදීමක් වේ නම් එය ඇතුළත නෑම වන්නේය". **මූලාශ්‍රය:** සංයු.නි: (5-2) මහාවග්ග: සෝතාපත්ති වග්ග: 11.3.10 නන්දක සූත්‍රය, පි.238

**නය**

▲ **න්‍යායපටිපන්න**-Niyayapatipaana : එනම්, පටිච්චසමුප්පාද න්‍යාය පිළිපැදීමට ඇතුළුවී ඇතිබවය. මෙය සංඝගුණයකි. **බලන්න**: සංඝගුණ.

▲ **නෙය්‍ය පුග්ගල**-Neyiyapuggala: ධර්මය අවබෝධ කරගන්නා ආකාරය අනුව පුද්ගලයන් 4 දෙනක් ලෝකයේ සිටිති. නෙය්‍ය පුග්ගලඉන් කෙනෙකි. ක්‍රම ක්‍රමයෙන් ධර්මය අවබෝධ කර මේ භවයේදීම විමුක්තිය ලබාගැනීමට හැකියාව ඔහුට ඇත: **බලන්න**: පුද්ගල ස්වභාවයන්. **මූලාශ්‍රය**: අංගු.නි: (2) 4 නිපාත: 4.3.4.3 නෙය්‍ය පුග්ගල සූත්‍රය, පි.282.

**නර**

▲ **නාරද තෙර-** Narada Thera: **බලන්න:** උපග්‍රන්ථය: 1

▲ **නාරද බුදුන් වහන්සේ -**The Buddha Narada: ගෝතම බුදුන් වහන්සේට පෙර වැඩසිටි, නාරද බුදුන් වහන්සේගේ සම්බෝධිය පිලිබඳ විස්තර මෙහි දක්වා ඇත. **මූලාශ්‍රය:** ඛු.නි:බුද්ධවංශපාළි:9 නාරද බුද්ධවංශය, පි.142.

▲ **නිරය**-Hell: ධර්මයට අනුව නිරය-අපාය-නරකය යනු අකුසල කම්ම විපාක විඳීම පිණිස, සත්ත්වයෝ යළි උපත ලබන දුගතියකි, සතර අපායන්ගෙන් එකකි, අකුසල කර්මවිපාක නිසා අප්‍රමාණවූ දුක්විඳීමට සිදුවන පහළ ලෝකයකි. **බලන්න**: සුගතිය හා දුගතිය, අපාය, සතර

අපාය, දේවදූතයෝ. **සටහන්:** නිරයගාමී අකුසල විස්තර පිණිස **බලන්න**: ***අංගු.නි: (2) 4නිපාතය**: පත්ත කම්මවග්ග: 4.2.2.4 නිරය සූත්‍රය හා පරිසොහනවග්ගයේ නිරය සූත්‍ර 9 කි ** **අංගු.නි: (3) 5** නිපාතය: 5.3.5.5. නිරය සූත්‍රය, හා උපාසකවග්ග:5.4.3.3. නිරය සූත්‍රය ***අංගු.නි**: **(6) 10** නිපාත: කරජකායවග්ග:නිරය සූත්‍ර 2 කි. **ශබ්දකෝෂ: පා.සි.ශ:** පි. 82: "**අපාය**: සැප රහිත ස්ථානය, නිරය, විනාසය...**අපාය මග**: නිරයට යන මග, අකුසල ක්‍රියාව". **B. D**: p. 108: "**Niraya**: the downward path, the nether or infernal world, usually translated by hell…". **P.T.S**: p. 135: "**Apāya:** …a transient state of loss and woe after death…"

▼**නිරය දුගතියකි**: දිවැසින් සත්ත්වයන්ගේ යළි උපත දකින බුදුන් වහන්සේ පෙන්වා ඇත්තේ, තුන්දොරින් අකුසල කර්ම කරණ, ආරිය උතුමන්ට නිගරු-නිග්‍රහ කරන, මිථ්‍යාදිට්ඨිය ඇති මිනිසුන් නිරය ආදීවූ දුගති ස්ථාන වල උපත ලබා දිගුකලක් ඒ ස්ථානයේ දුක්වේදනා විඳින බවය. ඔවුන් කළ අකුසල විපාක අවසන් වනතෙක් නිරී සත්ත්වයෝ නිරයේ සිටිති. **සටහන්:** * පරපණනැසීම, සොරකම, කාමයේ වරදවා හැසිරීම, මුසාවාදය, පිසුනාවාචාය, පරුෂාවාචාය, හිස්වචනකතා කිරීම, ධර්මයේ ප්‍රමාදය ඇතිකරන මත්ද්‍රව්‍ය හා මත් පැන් භාවිතය, මව්පිය ඝාතනය, රහතතුන්ගේ ජීවිත නැතිකිරීම, වෛරය ඇතිව තථාගතයන් ගේ ලේ සෙලවීම, සංඝභේදය කිරීම ආදිය නිරයගාමී අකුසල යයි බුදුන්වහන්සේ පෙන්වා ඇත. **බලන්න:** කර්ම. **විවිධ නිරයන් හා එහිදී ලැබෙන දඬුවම් මේ සූත්‍රවල විස්තර කර ඇත: **ලොහොකුඹු නිරය-**Red hot hell: රත්වූ අඟුරු වලින් ගිනිගත් නිරය. **මහා නිරය-**Great Hell: යකඩ පවුරු 4 කින් වටවූ මේ නිරයේ සතර වටයද, උඩ හා බිමද සැම තැනම ගිනිගෙන ඇත, ගිනිදැල් සියක් යොදුන් පැතිරඇත. **මහාගූථ නිරය-** Vast Hell of Excrement: අශුචි පිරුණ තැනකි, එහි සිටින උල් ඇති සතුන් නිසා බොහෝ වේදනා ඇතිවේ. **උණු අළු නිරය (කුක්කුල නිරය)** - Hell of Hot Embers: අළුවලින් පිච්චී මහා දුක් වේදනා ඇතිවේ. **සිම්බලි උල්කටුගස් නිරය** -Hell of Simbali Thorns Tress: උල් කටු ඇනීමෙන් මහා දුක් වේදනා ඇතිවේ. **අසිපත් ගස් නිරය-**Hell of Sword trees: කඩු වැනි කොල නිසා අත් පා ආදිය කැපී මහා දුක් වේදනා ඇතිවේ. **වේතරණී නරකය-** Hell of caustic water: ගිනිගත් ගංගාවට වැටී මහා දුක් වේදනා ඇතිවේ. ** නිරය හා නිරිසත්වයෝ විඳින දුක් තමන්වහන්සේ ගේම අවබෝධයෙන් විස්තර කර ඇතිබව බුදුන් වහන්සේ වදාළහ. **බලන්න**: ලෝකාන්තරිකය.

**මූලාශ්‍ර**: ම.නි: (3 ): 3.3.10, දේවදූත සූත්‍රය, පි. 400, EMN:130: The Divine Messengers, p.941, අංගු.නි (1 ) 3 නිපාතය:දේවදූතවග්ග: 3.1.4.6 සූත්‍රය,පි. 292, EAN:3: Divine Messengers: 36.6 Messengers, p.92.

▼ **නිරයේ යළි උපත** ලබා එහිදී චුතව නැවත නිරයේම උපදින සත්වයන් බොහෝවේ. **බලන්න**: සංයු.නි: (5-2) සච්චසංයුත්ත:පංචගති පෙයියාල වග්ග: නිරයචුති සූත්‍ර 6කි.

▼**බුදුන්වහන්සේ නිරය මෙසේ හඳුන්වා ඇත**

**"යං ඛො තං භික්ඛවෙ සම්මා වදමානො වදෙය්‍ය: 'එකන්තං අනිට්ඨං එකන්තං අකන්තං එකන්තං අමනාපන්ති'. යාවඤ්චිදං භික්ඛවෙ, උපමාපි න සුකරා යාව දුක්ඛා නිරයාති"** . ඒකාන්තයෙන්ම: නොපැතියයුතු, අප්‍රසන්නවූ, අප්‍රියකරවූ දෙයක් ගැන කතා කරනවා නම්, එය නිරය ය, නිරයේ දුක පිළිබඳව උපමාවකින් පවා දැක්වීම පහසුනොවේ. **නිරිසතුන් විඳින දුක:** රජතුමා විසින් දඬුවම් පමුණුවන ලද සොරෙක් උදය කාලයේද, දිවාකලද, සවස්කලද පිලිවෙලින්, ඊතල සියකින් හිංසා ලබයි, එසේ ඊතල 30 කින් පිඩාලැබූ ඒ සොරා මහා දුක්වේදනාවන් විඳි. එම සොරා විඳින දුක්වේදනාව කුඩා ගල් ඇටයකට සමාන කළහොත්, නිරයේ විඳීමට ඇතිදුක හිමාල කඳුවැටියටත් වඩා විශාලය. බුදුන් වහන්සේ පෙන්වා වදාළේ නිරයේ දුක තමන්වහන්සේට පවා විස්තර කර අවසන් කිරීම පහසු නොවන බවය.**බලන්න**: උපග්‍රන්ථය:5 **මූලාශ්‍ර**: ම.නි: (3 ): 3.3.9 බාල පණ්ඩිත සූත්‍රය, පි. 376, EMN: 129: Fool & Wise Men, p. 929.

▼ **ආර්ය උපවාද කර්ම විපාක** ලෙසින් කෝකාලික භික්ෂුව, මියගොස් පදුම නිරයේ පහළවිය. **බලන්න**: ආර්ය උපවාද. **සටහන**: * අටුවාවට අනුව පදුම නිරය (red-lotus hell) අවීචිමහා නිරයේ කොටසකි. **බලන්න**: EAN: Note: 2116). ** **පදුම නිරය** නිරයේ ආයුෂ ගණන් කිරීමට නොහැකි තරමට දීර්ඝය යි බුදුන් වහන්සේ පෙන්වා ඇත. මේ සූත්‍රයේදී බුදුන් වහන්සේ විවිධ නිරයන් දක්වා ඇත: **අබ්බුද නිරය**- abbuda hell, **නිරබ්බුද නිරය**-nirabbuda hell, **අබබ නිරය**- ababa hell, **අහහා නිරය**- ahaha hell, **කුමුදුනිරය**- water-lily hell, **සොගන්ධික නිරය**- sweet-fragrance hell, **උත්පලක නිරය**- blue-lotus hell, **පුණ්ඩරික නිරය**- white-lotus hell. **මූලාශ්‍ර**: අංගු.නි: (6): 10 නිපාතය: 10.2.4.9 කොකාලික සූත්‍රය, පි. 332, EAN: 10: 89.9 Kokālika, p. 530.

▲ **නිරයගාමිණි හා නිරයගාමිණි නොවන**- Going to the hell & not going to the hell: නිරයගාමි යනු, අකුසල කර්ම කරන පුද්ගලයා ඒවායේ අයහපත් විපාක නිසා නිරයේ යළි උපත ලැබීමය.එවැනි අකුසල නම්: ක්‍රෝධය හා උපනාහය (anger and hostility) ; මකබය හා පලාසය (denigration and insolence); ඊර්ෂ්‍යාව හා මාතසර්‍යය (envy and miserliness), මායාව හා සටකපටබව (deceitfulness and craftiness) ; අහිරිකිතය හා අනොත්තප්පය (moral shamelessness and moral recklessness). එම අවගුණ පහකරගත් පුද්ගලයා නිරයගාමී නොවේ. **මූලාශ්‍රය**: අංගු.නි: (1) 2 නිපාත: 2.16.21-25 සූත්‍ර, පි. 226.

▲**නිරහංකාර-** Nirahankaara : මෙයින් අදහස්වන්නේ මානය නොමැතිබවය, මෙය කුසල ධර්මයකි, අනවද්‍ය ධර්මයකි. රහතුන් ඇතුළු ආරිය පුද්ගලයෝ **නිරහංකාරය. බලන්න:** අනවද්‍ය ධර්ම හා සාවද්‍ය ධර්ම.

▲ **නිර්මල** -unstain: සියලු කෙළෙසුන්ගෙන් පිරිසිදුවී ඇතිනිසා, තථාගතයන් "නිර්මල" (මල නොමැති) ලෙසින් හඳුන්වයි. **බලන්න:** තථාගතයන්, බුද්ධනාම.

▲ **නිර්මාණරති දේවලෝකය**-Nirmaanarati Devaloka: සදෙව්ලෝකයන්ගෙන් එකකි. **බලන්න**: දේවලෝක.

▲ **නිර්වාන ධාතු**- Nirvaana Dhathu: බුදුන් වහන්සේ නිර්වාන ධාතු 2 ක් පෙන්වා ඇත: 1) **සෝපාදීශේෂ නිර්වාන ධාතුව:** මේ සසුනේ මහණ ...පහකළ ආසව ඇතිව, වැස නිමවූ බඹසර ඇතිව, සිව්මග කිස සම්පූර්ණකර, කෙළෙස් බර බහා තබා , රහත්බවට පත්ව, කෙළෙසුන්ගෙන් මනාව මිදුනබව දැන, පංච ඉන්ද්‍රිය නිරුද්ධ නොකළ හෙයින් ඉටු අනිටු අරමුණු ලබා සැප දුක් විඳිමින් පස් ඉඳුරන් පවත්වමින් වාසය කරති. ඒ රහතුන්ගේ රාගක්‍ෂය, ද්වේෂක්‍ෂය, මෝහක්‍ෂය එනම් කෙලෙස් පරිනිර්වාණය, සෝපාදීශේෂ නිර්වාන ධාතුව වේ. 2) **අනුපාදීශේෂ නිර්වාන ධාතුව:** මේ සසුනේ මහණ පිළිවෙලින් රහත්බවට පැමිණ, කෙළෙසුන්ගෙන් මනාව මිදීඇත. ඒ රහතුන්ගේ සියලු වේදනාවෝ මේ අත්භවයේදීම, තණ්හා ආදී කෙළෙස් නොරුස්සනා ලදහෙයින්, අතිශයෙන් සංසුන්වූ බැවින් සිහිල් වන්නාහුය. මේ ස්කන්ධ පරිනිර්වානය - කය බහාතැබිම අනුපාදීශේෂ නිර්වාන ධාතුව වේ. **මූලාශ්‍රය:**ඛු.නි: ඉතිවුත්තක: 2.2.7 නිර්වානධාතු සූත්‍රය, පි. 396.

▼ **නිර්වාන ධාතුව-** the element of Nibbāna: නිර්වාන ධාතුව යනු ලෝභය දෝසය හා මෝහය -අකුසල මූල නැතිකරගැනීම ය. **ආසවක්කය-**ලෙසින්ද හඳුන්වයි. අරහත්වයට පත්වීම නිර්වාන ධාතුව ලැබීමය. **බලන්න**: ආස්‍රව හා ආස්‍රව ක්‍ෂය කිරීම. **මූලාශ්‍ර:**සංයු.නි: (5-1) මහාවග්ග: මග්ගසංයුත්ත: 1.1.7 දුතිය භික්ඛු සූත්‍රය, පි. 40, ESN: Maggasamyutaa, 7.7. A Certain Bhikkhu, p.1605

▲ **නිර්වේද ප්‍රඥාව-** penetrative wisdom: නිර්වේද ප්‍රඥාව (නිබ්බේදික ප්‍රඥාව) ලෙසින් මෙහිදී පෙන්වා ඇත්තේ, චතුසත්‍ය තියුණු නුවණින් යුතුව අවබෝධ කිරීමය. **මූලාශ්‍රය:** අංගු.නි: (2): 4 නිපාත: 4.4.4.6 බහුශ්‍රැත සූත්‍රය, පි.366.

▲ **නිරෝගී -**Healthy : නිරෝගී ලෙසින් පෙන්වා ඇත්තේ කායික සුවය ඇතිබවය. අවිහිංසාවෙන් ජීවත්වන පුද්ගලයා, නිරෝගී බව ලබයි. මෙය ලෝකයේ ලබාගැනීමට දුර්ලභ දෙයකි. **බලන්න**: කම්ම සත්ත්‍වයන්ගේ උරුමය, දුර්ලභදේ.

▲ **නිරෝධය-** cessation: ධර්මයට අනුව නිරෝධය- නිවීම යනු සියලුම ආශාවන් නිවීයාමය. සසර ගමන නැවතීමය, නිවනය. චතුසත්‍යයේ තුන්වන සත්‍යයය- එනම් සියලු තණ්හා ක්‍ෂය කර ගැනීමය. නිරෝධය ලබා ගැනීමේ මග ආරිය අටමගය. **බලන්න**: EAN: note: 160, p. 588

▼ **සප්ත බොජ්ඣංග** වඩා ගැනීමෙන් තණ්හා නිරෝධය ඇතිවේ. **මූලාශ්‍රය:** සංයු.නි: (5-1) මහාවග්ග: බොජ්ඣංගසංයුත්ත: 2.3.7 නිරෝධසූත්‍රය, පි.204.

▼**බුද්ධානුස්සතිය** ආදී අනුසති භාවනා වැඩිම, බහුල කර ගැනීම නිරෝධය ඇති කර ගැනීමට උපකාරීවේ **බලන්න**: අනුසති භාවනා. **මූලාශ්‍ර**: අංගු.නි: (1 ): 1 නිපාතය**:** එකධම්ම පාලිය සූත්‍ර, පි.100, EAN:1: XVI: One Thing, p. 47.

▼**සතර ඉද්දිපාද වර්ධනය කරගැනීමෙන් නිරොධය ඇතිවේ**: මානව වැඩුන, බහුල කල ඉද්දිපාද නිසා නිරෝධය ඇතිවේ .**බලන්න**: ඉද්දිපාද.

**මූලාශ්‍ර**:සංයු.නි: (5-2) : මහාවග්ග: ඉද්දිපාද සංයුත්ත: 7.1.4 නිබ්බිදා සූත්‍රය, පි. 28,ESN: Iddhipādasamyutta: 4.4 Revulsion, p. 2060.

▲ **නිරෝධ ධාතුව-** Nirodha Dhatu: නිරෝධ ධාතුව- element of cessation යනු : ලොකොත්තර ධාතුවය, නිවනය. **බලන්න:** ධාතු.

▲ **නිරෝධ ධම්ම-** Nirodha Dhamma: නිරෝධ ධම්ම යනු නිරුද්ධ වනසුලු ධර්මතාවයන්ය. බුදුන් වහන්සේ මෙසේ වදාළහ:
"...රූපය නිරෝධධම්මය...වේදනාව...සංඥාව... සංස්කාර ...විඥාණය නිරෝධධම්මය. එසේ දකිනා ආරිය ශ්‍රාවකයාට රහත්බව පිණිස අනෙකක් නැත". **සටහන**: මේ සූත්‍රයේ, සියල්ල නිරුද්ධවන සුළු බව පෙන්වා ඇත. **බලන්න**: :සංයු.නි: (4): සළායතනවග්ග :වේදනාසංයුත්ත:ජාතිධම්මවග්ග: 1.4.10 නිරෝධධම්ම සූත්‍රය, පි.84. **මූලාශ්‍රය:** සංයු.නි: (3) ඛන්ධවග්ග: රාධසංයුත්ත: 2.2.12 නිරෝධධම්මසූත්‍රය,පි.386.

▼**එක් සමයක රාධ තෙරුන්**, නිවන යොමුකරගත් සිත ඇතිව වාසය කිරීම පිණිස උපදෙස් ඉල්ලුවිට, බුදුන් වහන්සේ, තෙරුන්හට නිරෝධධම්ම පිළිබඳව අවර්ජනා කිරීමට උපදෙස් වදාළහ. පංච උපාදානස්කන්ධය, නිරුද්ධවන ස්වාභාවය ඇතිනිසා, එයට ඇති ඡන්දරාගය පහකරගතයුතුය. **මූලාශ්‍රය:** සංයු.නි: (3) ඛන්ධවග්ග: රාධසංයුත්ත: 2.3.12, 2.4.123 නිරෝධධම්මසූත්‍ර,පි.396, 404.

▲ **නිරෝධ නිස්සාරණිය ධාතුව:** පාලි: **නිරොධො නිස්සරණියා ධාතුයො-** Nirodha Nissaraṇiyadhathu: නිරෝධ නිස්සාරණිය ධාතුව ආධ්‍යාත්මික මාර්ගය වර්ධනයට හා විමුක්තිය පිණිස වේ. මේ ධාතුව අවබෝධය අපහසු දුෂ්ප්‍රතිවිධ්‍ය ධර්මයක්ය. හේතු ප්‍රත්‍ය නිසා සකස්වූ, පහලවූ දෙයින් මිදීම (අසංඛත) නිරෝධ නිස්සාරණිය ධාතුව ය. **බලන්න**: නිස්සාරණිය ධාතු, දුෂ්ප්‍රතිවිධ්‍ය ධර්ම. **මූලාශ්‍ර:** දීඝ.නි:(3): 11 දසුත්තර සූත්‍රය, පි. 483, EDN: 34: Dasuttara Sutta: Expanding Decades, p. 384.

▲ **නිරෝධ සංඥාව**: පාලි: **නිරොධ සඤ්ඤා-** perception of cessation: නිරෝධ සංඥාව ලෙසින් පෙන්වා ඇත්තේ ලෝකයේ සකස්වූ ධර්මතා වලට ඇති ඇල්ම- තණ්හාව නැතිවියාමය. දසසංඥා භාවනාවකි- නිවන සාක්ෂාත් කර ගැනීමට උපකාර කරගන්නා භාවනා ක්‍රමයකි. **බලන්න**: භාවනා,දස සංඥා, ගිරිමානන්ද සූත්‍රය.

▼ **සප්ත බොජ්ඣංග** ඇසුරු කොට නිරෝධ සංඥාව වැඩීම මහාඵල මහා ආනිසංස ලැබීමට හේතුවේ. එලෙස දියුණු කරගත් නිරෝධ සංඥාව නිසා අරහත් හෝ අනාගාමි බව සාක්ෂාත්වේ, මහා වැඩ පිණිස,යොගක්ෂෙමය පිණිස, මහා සංවේගය පිණිස, මහා පහසු විහරණය පිණිස පවතී. **මූලාශ්‍රය:** සංයු.නි: (5-1) මහාවග්ග: බොජ්ඣංගසංයුත්ත:නිරෝධවග්ග සූත්‍ර 8කි, පි.276.

▲ **නිරෝධ සමාපත්තිය**-Nirodha samapatthi: සංඥාවේදිත නිරෝධ සමාපත්තිය, නිරෝධ සමාපත්තිය ලෙසින්ද පෙන්වා ඇත. **බලන්න**: සංඥාවේදිත නිරෝධ සමාපත්තිය.

▼**නිරෝධ සමාපත්ති ඥානය**: සමථ විදර්ශනා යන බල දෙකින් සමන්විත වන බැවින් ද, වාචාදී තුන් සංඛාරයන් ( විතක්කවිචාර, ආශ්වාස ප්‍රශ්වාස, සංඥා වේදනා) නිරුද්ධ කිරීමෙන්, සොළොස් ඥාන චරියාවෙන්, නව සමාධි චරියාවෙන් වශිභාවය ඇති ප්‍රඥාව නිරෝධ සම්පත්ති ඥානය ලෙසින් පෙන්වා ඇත. **මූලාශ්‍රය**: ඛු.නි: පටිසම්භිදා1 :ඥාණකථා: 34 නිරෝධ සමාපත්ති ඥානය, පි. 208.

▼ **මේ සූත්‍රයේදී** සැරියුත් තෙරුන්, නිරෝධ සමාපත්තිය ලැබීම විස්තරකර ඇත. **මූලාශ්‍රය:** සංයු.නි: (3): ඛන්ධවග්ග: සාරිපුත්‍රසංයුත්ත: 7.1.9 නිරෝධ සමාපත්ති සූත්‍රය, පි.500.

▲ **නිරෝධානුපස්සනාව** - Nirodhanupassana : නිරෝධානු- පස්සනාව, නිරෝධය පිළිබඳව සිහිය ඇතිව ආවර්ජනා කිරීමය. රූපය ආදී පංච උපාදානස්කන්ධය පිලිබඳ නිරෝධානුපස්සනාව වැඩීමෙන් ගම්භීර ප්‍රඥාව පරිපූර්ණවේ. **බලන්න**: ගම්භිර ප්‍රඥාව. **මූලාශ්‍රය**:ඛු.නි: පටිසම්භිදා මග්ගපකරණය (3): ප්‍රඥාවග්ග: 3.1 ප්‍රඥා කථා, පි. 166-176.

▲ **නිරාමිසය** -Spiritual: නිරාමිසය ලෙසින් පෙන්වා ඇත්තේ පස්කම් ගුණයන්ට නො ඇලීමය- කෙළෙස් වලින් දුරුවීමය. මෙය ආමිෂයට වඩා උතුම්ය. ආරියන් විඳින සුවය, නිරාමිෂ සුවය ය. මේ සුවය කම්සැපට වඩා අග්‍රය.**බලන්න:** සාමිසය, ආමිෂය, සුඛය. නිරාමිසය විවිධය: 1) **නිරාමිස ප්‍රීතිය-**spiritual rapture: පළමු හ දෙවන ජාන සමාපත්ති නිසා ලබන ප්‍රීතිය. 2) **නිරාමිස තර ප්‍රීතිය-** rapture more spiritual than the spiritual**:** සියලු සංයෝජනවලින් මිදුන භික්ෂුව, තම සිත රාග දෝස හා මෝහ යන අකුසල මුල්වලින් මිදුනබව ආවර්ජනය කිරීමෙන් ලබන සතුට- රහතන්වහන්සේ ට ඇති සතුට. 3) **නිරාමිස සුවය**: පළමු ,දෙවන හා තෙවන ජාන සමාපත්ති නිසා ලබන සතුට 4) **නිරාමිස තර සුවය:** සියලු අකුසල පහ කිරීමෙන් රහතුන් ලබන සොම්නස 5) **නිරාමිස උපේක්ෂාව**: සුව නොමැති දුක නොමැති සොම්නස හා දොම්නස නැති උපේක්ෂාව ඇති සතරවෙනි ජාන සමාපත්තිය නිසා ලබන සුවය. 6) **නිරාමිසතර උපේක්ෂාව:** රාග දෝස හා මෝහ යන අකුසල පහ කිරීමෙන් සිතේ ඇතිවන උපේක්ෂාසුවය. **7) නිරාමිස විමොක්ෂය**: අරූප සමාපත්ති නිසා ලබන විමුක්ති සුවය. 8) **නිරාමිස තර විමොක්ෂය**: රාග දෝස හා මෝහ යන අකුසල පහ කිරීමෙන් සිතේ ඇතිවන විමුක්ති සුවය. **සටහන**: අටුවාවට අනුව නිරාමිස තර ප්‍රීතිය -rapture more spiritual than the spiritual- ජානසම්පත් ලබාගන්නා සතුටට වැඩි සතුටකි. **බලන්න**:ESN:note:260, p. 1559. **මූලාශ්‍ර:** සංයු.නි: (4): සළායතනවග්ග: වේදනා සංයුත්ත:2.3.11 නිරාමිස සූත්‍රය, පි. 470, ESN: 36: Vedana samyutta: 31.11. Spiritual, p. 1368.

▲ **නිරාශ සංඝයා-** Nirasha sangha: ශිලසම්පන්න නැති, ධර්මානුකූල නොවන සංඝයා මෙලෙසින් හඳුන්වයි**. බලන්න**: සංඝයා ත්‍රිවිධ ආකාරය.

▲ **නිරුත්තරසිංහ-**Niruththara Sinha: නිරුත්තර සිංහ- උතුම් සිංහරාජ, තථාගතයන් හඳුන්වන ගුණ පදයකි. තථාගතයන් වහන්සේ, භිය රහිතව ධම්ම චක්‍රය පැවත්වූහ. **බලන්න:** තථාගතයන්, බුද්ධනාම, ධම්මචක්‍රය.

▲ **නිරුපධිසුඛ**- Nirupadisukha: නිරුපධි සුඛය ලෙසින් පෙන්වා ඇත්තේ සියලු උපධි ප්‍රහීණය කරගත් රහතුන් විඳින සුඛයය.මෙය උපධි සුඛයට වඩා අග්‍රය. **බලන්න**: සුඛය.

**නල**

▲ **නාලක ගම-** Nalaka Village: මගධ දේශයේ පිහිටි ගමකි. **බලන්න:** ජම්බුඛාදක පරිබ්‍රාජක.

▲ **නාලක තවුසා-**Ascetic Nalaka: බෝධිසත්වයන් (ගෝතම බුදුන්) උපතලද අවස්ථාවේ, ළදරු කුමරා බැලීමට පැමිණි අසිත තවුසා (අසිත දේවාල ඉසිවරයා) , එතුමන්, ඒකාන්තයෙන්ම බුද්ධත්වයට පැමිණෙන බව දැක, තමාගේ බෑණාවූ නාලක කෙරහි ඇති දයාව නිසා, ඔහුට බෝසතුන්, බුද්ධත්වයට පැමිනෙන තෙක් තවුස්දම් පිරීමට උපදෙස් දුන්හ. පසුව, නාලක තවුසා, බුදුන් වහන්සේ, ඉසිපතනයේදී හමුව, උන්වහන්සේගෙන්, මුණිබවට පත්වීම ගැන විමසුහ. බුදුන් වහන්සේ ඔහුට ඒ පිලිබඳ වදාළ ධර්මය මෙහි විස්තරාත්මකව පෙන්වා ඇත. **මූලාශ්‍රය:** ඛු.නි: සුත්තනිපාත: මහාවග්ග: 3-11 නාලක සූත්‍රය, පි.232.

▲ **නාලන්දා නුවර**-Nalanda Nuwara: බුදුන් වහන්සේ වැඩසිට සමයේ, මගධ ප්‍රදේශයේ නාලන්දාව ප්‍රසිද්ධ නගරයකි. එහි බුදුන් සරණ ගිය බොහෝ ශ්‍රාවකයෝ මෙන්ම නිගණ්ඨනාථ පුත්‍ර සරණගිය බොහෝ මිනිසුන් සිටි බව සූත්‍ර දේශනාවල දක්වා ඇත. මෙ නුවර සැරියුත් මහා තෙරුන්ගේ උපන් භූමියය. බුදුන් වහන්සේ අවසාන චාරිකාවේදී නාලන්දා නුවර වැඩ වාසය කළබව මහාපරිනිබ්බාන සූත්‍රයේ දක්වා ඇත. **බලන්න:** දීඝ.නි: (1) 11 කේවඩ්ඩ සූත්‍රය, පි.499, ම.නි: උපාලි සූත්‍රය, උපාලි ගහපති,අසිබන්ධක පුත්ත ගාමිණි,කේවඩ්ඩ ගහපති.

▲**නිලවාසි තෙර-**Nilavasi Thera: **බලන්න:** උපග්‍රන්ථය:1.

**නළ**

▲ **නළකලාප-** bamboo bundles: නළ යනු උණබටය. උණබට මිටි 2ක් එකට හෙත්තු කොට ඇතිවිට බිම නොවැටී සිටි. එක් මිටියක් වැටුන විට අනිත් එකද බිම පතිතවේ. මේ උපමාව යොදා ගෙන ඇත්තේ නාම රූප හා විඥාණය අතර ඇති සම්බන්ධතාවය දැක්වීමටය. **බලන්න**: නාමරූප, සංයු.නි: අභිසමයසංයුත්තය:1.7.7. නළකලාප සූත්‍රය.

**නව**

▲ **නවඅංග උපෝසථය-** Nine factors of Uposatha: අංග 9 කින් යුක්ත උපෝසථ ශීලය සමාදන්වීම මහත් ඵල මහා ආනිසංස ලබදීමට, මහා දීප්තිමත් බවක් ඇතිකිරීමට (මහාජුතික) , විශ්වණීය වීමට (මහාවිස්ථාර). හේතුවන බව බුදුන් වහන්සේ පෙන්වා ඇත. **අංග 9:** 1-8 අටසිල් 9: මෛත්‍රිය සිව්දිසාවට පැතිරවීම **බලන්න**: උපෝසථ, අටසිල්. **මූලාශ්‍ර**: ඛු.ජ.ත්‍රි:අංගු.නි: (5 කාණ්ඩය): 9 නිපාතය:9.1.2.8 **නවඅංග උපෝසථ සූත්‍රය,** පි. 450, EAN: 9: 18.8 Loving kindness, p.468.

▲**නවාංග ශාසතෘශාසනය-** Navaanga sasthrusasanaya: නවාංග ශාසතෘශාසනය මෙසේ විස්තරකර ඇත: 1) සූත්‍ර (සුත්තං discourses) 2)

ගද්‍ය හා පද්‍ය (ගෙය්‍යං mixed prose and verse) 3) විවරණ (වෙය්‍යාකරණං - expositions ) 4) ගාථා (ගාථා- verses) 5) උදාන (උදානං- inspired utterances) 6) ඉතිවුත්තක (ඉතිවුත්තකං- quotations) 7) ජාතක කථා (ජාතකං- birth stories) 8) විස්මයට පත්කරණ ධර්ම (අබ්භූතධම්මං- amazing accounts) 9) ප්‍රශ්න හා උත්තර ( වෙදල්ලං- questions-and-answers). (suttaṃ, geyyaṃ, veyyākaraṇaṇ, gāthā, udānaṃ, itivuttakaṃ, jātakaṃ, abbhutadhammaṃ, vedallaṃ). **සටහන**: මේ පිලිබඳ භික්බු බෝධි හිමියන්ගේ ප්‍රකාශය **බලන්න**: EAN: note: 631, p. 614 **මූලාශ්‍ර:** අංගු.නි: ( 2 ): 4 නිපාත: 4.1.1.7 සොභනේති සූත්‍රය, පි. 38, EAN:4: 6.6 One of Little Learning, p. 149.

▼ **එම අංග** යහපත් ලෙසින් දන්නා මහණ ධම්මඤ්ඤුය. **බලන්න:** ධම්මඤ්ඤු.**මූලාශ්‍රය:** අංගු.නි: (4) 7 නිපාත: 7.2.2.4 ධම්මඤ්ඤු සූත්‍රය, පි.464

▲**නවකම්මික භාරාද්වාජ බමුණා-**brahmin Navakammika Bhāradvāja **බලන්න**: උපග්‍රන්ථය:3

▲**නවබුදුගුණ-** Nava Buduguna: බුදු ගුණ සජ්ජායනා කරන බෞද්ධයින් බුදුන් වහන්සේගේ නව අරහාදී බුදුගුණ සිහිකරති: අරහං- සම්මා සම්බුද්ධ-විජ්ජාචරණ සම්පන්නෝ- සුගතෝ- ලෝකවිදූ - අනුත්තරෝ පුරිසධම්මසාරති- සත්තාදේවමනුස්සා, බුද්ධෝ භගවා ලෙසින් බෞද්ධයෝ බුදුගුණ සිහිකරති. ආරිය ශ්‍රාවකයා නව බුදුගුණ අදහයි, එමනිසා ඔහු ශ්‍රද්ධාසම්පන්නය. බුදුගුණ සිහිකිරීම ආරක්ෂාව, සිතට සැනසීම ලබාදෙන බව ධජග්ග , රතන ආදී සූත්‍රයන්හි පෙන්වා ඇත **බලන්න:** අනුසති භාවනා.

▲ **නව ප්‍රඥා**- Ninewisdom: ජවන, නිබ්බේධික, මහා, තීක්‍ෂණ, විපුල, ගාම්භීර හා අසාමන්ත, පණ්ඩිත හා පෘථු යන ප්‍රඥාවන්, නව ප්‍රඥා ලෙසින් මෙහි පෙන්වා ඇත. ඒ ප්‍රඥා 9 ය වඩා ගැනීමෙන් හාසුප්‍රඥාව පරිපූර්ණවේ. **බලන්න**: හාසුප්‍රඥාව. **මූලාශ්‍රය**:ඛු,නි: පටිසම්භිදා 2 : ප්‍රඥාවග්ග: 3.1 ප්‍රඥා කථා, පි. 166-186.

▲ **නව සංඥා**-Nine perceptions: නව සංඥා ලෙසින් පෙන්වා ඇත්තේ: අසුභ, මරණ, ආහාරයෙහි පටික්කූල, සර්වලෝකයෙහි අනභිරති, අනිච්ච, අනිත්‍යහි දුක්ඛ, දුක්ඛෙහි අනත්ත, පහාන, විරාග යන සංඥාවන්ය. මේ සංඥා වැඩීම, බහුලකරගැනීමෙන් මහත් ඵල මහා ආනිසංස ලැබේ, නිවනට ගෙනයයි, නිවන සාක්ෂාත්වේ.**බලන්න**: සංඥා. **මූලාශ්‍ර**: අංගු.නි: (5): 9 නිපාතය:9.1.2.6 සංඥා සූත්‍රය**,** පි. 448, EAN: 9: 16.6 perceptons, p.467.

▲**නවසීවථිකා භාවනාව-** Contemplation of a corpse in 9 stages: මළකඳ දිරා යාමේ අවස්ථා 9 දකිමින් භාවනා කිරීමය, අසුභ භාවනාවකි . **සටහන:** සතර සති පට්ඨාන සූත්‍රයේ, කායානුපස්සනාව යටතේ මේ භාවනා ක්‍රමවේදය විස්තරාත්මකව පෙන්වා ඇත.

▲නැව-the ship: වේවැල්වලින් බඳිනා ලද නැවක්, මාස 6ක් මුළුල්ලේ ජලයෙන් තෙත්වී දිරායන ලෙසින්, ආරිය අටමග බහුල කරනලද භික්ෂුවගේ සංයෝජන දිරා, ක්‍ෂයවී යන බව බුදුන් වහන්සේ මේ උපමාව

යොදගෙන පෙන්වා ඇත.**බලන්න**: උපග්‍රන්ථය:5. **සටහන:** මේ උපමාව භික්ෂුවකගේ භාවනා වර්ධනය නිසා සංයෝජන පිරිහී යාම පෙන්වීමට ද යොදාගෙන ඇත.**බලන්න:** අංගු.නි: (4) 7 නිපාත:මහාවග්ග:7.2.2.7 භාවනානුයුත්ත සූත්‍රය, පි.482. **මූලාශ්‍ර:** සංයු.නි: (5-1):මහාවග්ග: මග්ගසංයුත්ත:14 බලකරණීය: 1.14. නාවා සූත්‍රය, පි. 144, ESN:45: Maggasamyutta:158.10 The ship, p.1701.

▲ **නිවන**-Nivana-Nibbāna: නිවන: නිබ්බාන, අසංඛතය, අමතය, මොක්ෂය-විමුක්තිය (Liberation), විරාගය, නිරෝධය ආදී විවිධ නම් වලින් හඳුන්වයි. ධර්මයට අනුව බඹසර වැස නිමකිරීම නිවනය; සසර දුකින් මිදීම, යළි උපතකට නොඒම නිවනය. සිහිඇතිව අනිත්‍ය දුටු රහතුන් නිවන දැන කෙළෙස්පරිනිර්වාණයෙන් පිරිනිවීගියහ. ඔවුන් මාරවසඟයට ගොස් නැත, ඔවුන් මාරයාගේ මග යන පරිවාරකයන් නොවේ. **මූලාශ්‍රය**: ඛු.නි.සුත්තනිපාත: පාරායනවග්ග:වස්තුගාථා: පි,326, 5-10 කප්පමානවක, පි.356.

▼ ක්ෂේමය, ශාන්තිය හා ශාන්තිපදය නිවන ලෙසින් පෙන්වා ඇත. නිවන පිණිස සියලු කෙළෙස හැරිය යුතුය. **මූලාශ්‍රය**: ඛු.නි.සුත්තනිපාත: පාරායනවග්ග:වස්තුගාථා: පි,326, 5-11 ජතුකන්නිමානවක, පි.358.

▼ **තණ්හාවේ වීප්‍ර**හාණය නිවන ය.**මූලාශ්‍රය**: ඛු.නි.සුත්තනිපාත: පාරායනවග්ග:වස්තුගාථා: පි,326, 5-13 උදයමානවක,පි.360.

▼**නිවන අසංඛතය, නිවන්මග අසංඛත මගය (අසඞ්ඛතගාමී මග්ගො)**- unconditioned and the path leading to the unconditioned. **සටහන:** නිවන හා නිවන් මග විවිධ ලෙසින් හඳුන්වා ඇත. විස්තර පිණිස **බලන්න**: සංයු.නි: (4): සළායතනවග්ග: අසංඛතසංයුත්ත සූත්‍ර. රාගය, දෝසය හා මෝහය ක්ෂය කිරීම, අසංඛතය- නිවනය:

**"කතමඤ්ච භික්ඛවෙ අසඞ්ඛතං? රාගක්ඛයො දොසක්ඛයො මොහක්ඛයො, ඉදං වුච්චති අසඞ්ඛතං..."**

**නිවන්මග - අසංඛත මග කුමක්ද? :** 1) කායගතාසතිය 2) සමථ හා විපස්සනාව 3) සවිතර්කසවිචාර සමාධිය, අවිතර්කවිචාර සමාධිය, අවිතර්කඅවිචාර සමාධිය 4) සුඤ්ඤත සමාධිය, අනිමිත්ත සමාධිය, අප්පණිහිත සමාධිය 5) සතර සතිපට්ඨානය 6) සම්මා පධාන විරිය 7) සතර ඉද්දිපාද 8) ආධ්‍යාත්මික පංච ඉන්ද්‍රිය 9) ආධ්‍යාත්මික පංච බල 10) සප්ත බොජ්ඣංග 11) ආරිය අට මග ආදී අසංඛත ධර්මතා යහපත් ලෙසින් අවබෝධකිරීම නිවන් මගය. **මූලාශ්‍ර:** සංයු.නි: (4 ): සලායතනවග්ග: අසංඛත සංයුත්ත**,** 9.1.1 -සූත්‍ර. පි. 659, ESN: 43: Salayatanasamyutta: Asankatasamyutta: p. 1493.

▼ **සැරියුත් තෙරුන් මෙසේ වදාළහ:**

**"...යම් රාගය...දෝසය...මෝහය දුරලීමෙක් වේ නම් ඒ නිවන යයි කියනු ලැබේ ...ඒ නිවන පසක් කිරීමට ඇති මග...පිළිවෙත ආරිය අටමගය'.** මූලාශ්‍ර: සංයු.නි :(4 ): සළායතන වග්ග: ජම්බුඛාදක සංයුත්ත:4.1.1නිබ්බාන සූත්‍රය,පි.500.

▼**කිසිවක් ඉතිරිනොවී ක්ෂයවීම නිවනය යයි බුදුන් වහන්සේ වදාළහ**

**“විඤ්ඤාණං අනිදස්සනං අනන්තං සබ්බතො පභං**
**එත්ථ ආපො ච පඨවි තෙජො වායො න ගාධති**
**එත්ථ දීඝඤ්ච රස්සඤ්ච අණුං ථූලං සුභාසුභං**
**එත්ථ නාමඤ්ච රූපඤ්ච අසෙසං උපරුජ්ඣති.**
***විඤ්ඤාණස්ස  නිරොධෙන එත්ථෙතං උපරුජ්ඣතී ති”*** . අනන්තවූ, අනිදස්සනවූ (නොපෙනෙන) විඥානය සහමුලින්ම හැරදැමු කල, පෘතුවිය, ජලය, තෙද (උෂ්ණසුම) හා වායුව යන සිව්මහා භූතයන්ට පය තැබීමට ඉඩක් නොමැත. එවිට, දිග හා කෙටි, සියුම් හා දළ, ලස්සණ හා අවලස්සන ආදීය (ව්‍යවහාර) - නාමය හා රූපය කිසිවක් ඉතිරිනොවී ක්ෂයවේ; විඥානය නිරෝධවේ; ඒ සැම නිරෝධවීම නිවනය. “Consciousness that’s invisible, infinite, entirely given up: that’s where water and earth, fire and air find no footing. And that’s where long and short, fine and coarse, beautiful and ugly—that’s where name and form cease with nothing left over. With the cessation of consciousness, where they cease.”. **සටහන: “යම් තැනක නාමයත්, රූපයත්, ඒ වගේම ප්‍රතිඝයත් (රූපසංඥාවේ ගැටීම), රූප සංඥාවත් සම්පූර්ණයෙන්ම වළකාලනු ලැබේද : උපරොධනය වෙයිද - ඒ නිවනය…”** .බලන්න: “නිවනේ නිවීම”- දේශනා අංක 1, කටුකුරුන්දේ ඤානානන්ද භික්ෂුව. **මූලාශ්‍ර:** දීඝ.නි: (1): 11 කෙවඩ්ඩ සූත්‍රය,ඡේදය-88, පි.500, EDN:11 Kevaddha Sutta, para-85, p. 135.

▼ **බුදුන් වහන්සේ** මෙසේ වදාළහ:“**මහණෙනි, හේතු ප්‍රත්‍යයෙන් හට නොගත් නිසා අජාත නම්වූ, ඉබේ පහළ නොවූ හෙයින් අභූත නම්වූ, කිසිවකින් නොකරන ලද හෙයින් අකත නම්වූ, සකස්නොවූ හෙයින් අසංඛත නම්වූ නිවන ඇත. නිවන නොමැතිනම්, ජාත- භූත- කත- සංඛත, සංස්කාර ධර්මයන්ගේ සන්දීමක් නොවන්නේය” (**There exists, monks, that which is unborn, that which is unbecome, that which is uncreated, that which is unconditioned…)     “ එම අනිත්‍යවූ සංඛතධර්මය: ජරා මරණ සහිත, රෝගයන්ට කැදැල්ලක් බඳු, වහා බිඳෙන සුළු, අහාර තණ්හාව ප්‍රභව කොට ඇති, පංච උපාදානස්කන්ධයේ සිත ඇලවීම සුදුසු නොවේ.  ඒ පංච උපාදානස්කන්ධයෙන් නික්මීම නිවනය, එය ශාන්තය, තර්කඥානයට විෂය නොවේ, නිත්‍යවේ, අජාත වේ, අසමුත්තපන්නවේ ( ඇතිවීමක් නැත), අශෝකවේ, විරජ වේ (කෙළෙස් නොමැති), දුක්ඛනිරෝධයය”. **මූලාශ්‍ර**: බු.නි: ඉතිවුත්තක: 2.2.6 අජාත සූත්‍රය, පි. 393, The Itivuttaka: translated by Peter Masefield: PTS:43: The Unborn sutta, p. 34.

▼ **අරියඅටමග සපුරාගැනීම නිවනය**: නිවනට ගෙනයන, නිවන පිහිටිකොට ඇති, නිවන කෙළවර කර ඇති ධර්මතා පිළිබඳව බුදුන් වහන්සේ මෙසේ වදාළහ:

**“…අරිය අට දහම කෙනක් වඩන ලද්දේනම්, බහුල කර ඇත්නම්, එය නිවනට යන මගය, එය නිවන පිහිටිකොට ඇත, එහි කෙළවර නිවනය”. මූලාශ්‍ර**: සංයු.නි: (5-1): මහාවග්ග: මග්ගසංයුත්ත:1.1.10 නන්දිය සූත්‍රය, පි. 46, ESN: Maggasamyutta: 10.10 Nandiya, p. 1614.

▼**සැරියුත් තෙරුන්** නිවන යනු රාගය, දෝසය හා මෝහය (අකුසල මූල) දුරුකිරීමය, නිවනට මග: අරියඅටමග සම්පූර්ණකරගැනීමය යි පෙන්වා ඇත. **මූලාශ්‍ර:** සංයු.නි: (4):සළායතන වග්ග: ජම්බුඛාදක: 4.1.1 නිබ්බාන සූත්‍රය, පි. 500, ESN: Salayatanasamyutta: IV: 38 Jambukhādaka: Question on Nibbāna, p. 1396

▼ **නිවන ලඟාකර දෙන ධර්මතා**: එක් ධර්මයක් මනාව වැඩීමෙන්, බහුල කරගැනීමෙන් ඒකාන්තයෙන්ම නිවන සාක්ෂාත් කරගත හැකිවේ යයි මෙහි පෙන්වා ඇත:

**"එක ධම්මො භික්ඛවෙ, භාවිතො බහුලීකතො එකන්ත නිබ්බිදාය විරාගය නිරොධාය උපසමාය අභිඤ්ඤාය සම්බොධාය නිබ්බාණාය සංවත්තති". එම ධර්මතා:** බුද්ධානුස්සතිය, ධම්මානුස්සතිය, සංඝානුස්සතිය, ශීලානුස්සතිය, චාගානුස්සතිය, දේවතානුස්සතිය, ආනාපානසතිය, මරණසතිය, කායගතාසතිය, උපසමානුස්සතිය ආදී අනුසති භාවනාය. **බලන්න**: භාවනා, අනුසතිභාවනා **මූලාශ්‍ර**: අංගු.නි: (1 ): 1 නිපාත **:** 16: එකධම්ම පාලිය සූත්‍ර, පි.100, EAN:1: XVI: One Thing, p. 47.

▲**නිවන දක්වන පද-**Names for Nivana**:** සංයු.නි. **අසංඛත සංයුත්තයේ** නිවන හඳුන්වන, විවිධ පද හා අර්ථ පෙන්වා ඇත**: 1) අන්ත (**අන්තඤ්ච) සසරගමනේ අන්තය-අවසානය-**අන්තගාමී**: තණ්හාව කෙළවර. **2) අනාසාව (**අනාසවඤ්ච) සියළු ආසවයන් ප්‍රහීණය කිරීමය.**3) සත්‍ය (**සච්චංඤ්ච**)** පරම අර්ථයය, සත්‍යය **4) පාර** (පාරඤ්ච) සසර ගමනේ කෙලවරය - එතෙරය **5) නිපුණ** (නිපුණඤ්ච)**-** සියුම් ධර්මයය **6 ) සුදුද්දස (**සුදුද්දංසඤ්ච) :දැකීමට අපහසු-දුරවබෝධය **7) අජර (**අජරඤ්ච)-ජරාවට පත්නොවන-මහලුනොවන **8) ධුව** (ධුවඤ්ච)- ස්ථිර ධර්මතාවය **9) අපලොකික (**අපලොකිතඤ්ච) නොබිඳෙන ධර්මතාවය **10) අනිදස්සන (**අනිදස්සනඤ්ච)- සාමාන්‍ය ඇසින්දැකිය නොහැකි (නුවණින් දැකිය හැකි) **11)නිප්පපඤ්ච (**නිප්පපඤ්ච)- ප්‍රපංචනොමැති -තණ්හා, මාන, දිට්ඨි ආදී ප්‍රපංච නොමැති **12) ශාන්ත** (සන්තඤ්ච) - නිසල බව ඇති **13) අමත-** අමතඤ්ච) අමරණිය වූ **14) ප්‍රණීත**(පණීතඤ්ච) **-** උතුම්වූ **15) සිව (**සිවඤ්ච) සුභවූ **16) ඛේම-සුරක්ෂිත(**ඛෙමඤ්ච) උපද්‍රව රහිත**17) තණ්හාව ක්‍ෂයකල** (තණ්හක්ඛයඤ්ච)තණ්හාව නැති **18)අපූර්ව** (අච්ඡරියඤ්ච) අසිරිමත්වූ **19) අබ්භූත-** නොහටගත්-අභූත (අබ්භූතඤ්ච) **20) නිදුක් (**අනීතිකඤ්ච) දුක්වේදනා නැති **21) නිදුක් ස්වභාවය ඇති** ධර්මතාවයවූ (අනීතිකධම්මඤ්ච) **22) නිවීම**(නිබ්බානඤ්ච)-තණ්හාව නිවිගිය **23) දුක්පීඩා නැති**(අබ්‍යාපජ්ඣඤ්ච) **24) රාගයනැති** (විරාගඤ්ච) **25) නිර්මල** (සුද්ධිඤ්ච)- පරමාර්ථ ශුද්ධියවූ **26) මුක්තිය (**මුත්තිඤ්ච) **-**භවයෙන් මිදීම **27) ආලයනැති (**අනාලයඤ්ච)**-** භව ආලය නොමැති **28 ) දීපය** (දීපඤ්ච) - දූපතක් ලෙසින් පිහිටවන (සසර ප්‍රවාහයෙන්) **29) ලෙන-රක්ෂිත (**ලෙණඤ්ච) ලෙනක් ලෙසින් ආරක්ෂාව ඇති **30) ආරක්ෂිත - තාන (**තාණඤ්ච) රැකවරණය ගෙනදෙන **31)** තාන**- සරණය ඇති**(සරණඤ්ච) සරණය ඇති- බිය නැති **32)** පරායාන- **ගමනාන්තය** (පරායනඤ්ච**)-** සසරමග අවසන්වූ තැන- රාග දොස මෝහ අවසන්වීම. **මූලාශ්‍ර:**සංයු.නි: (4 ): සලායතනවග්ග: අසංඛත සංයුත්ත සූත්‍ර, පි. 681, ESN: 43: Asankatasamyutta: p. 1512.

▼**නිවන හඳුන්වන අතිරේක පද**: ඛේම හා ඛේමපත්ත, අමත, අමතපත්ත, අභය, අභයපත්ත, පස්සද්ධි, නිරෝධ. **මූලාශ්‍ර**: අංගු.නි: (5): 9 නිපාත, ඛේමවග්ග සූත්‍ර, පි. 568, EAN: 9: I Security- suttas. p. 485.

▼**නිවන හඳුන්වන අතිරේක පද**: අජාත = ජරාවට නොයන, අභූත= ඉබේ පහළ නොවූ, අකත= කිසිවකින් නොකරනලද හෙයින්, අසංඛත= හේතු ප්‍රත්‍යයෙන් හට නොගත්. **මූලාශ්‍රය:** ඛු.නි: ඛුද්දකපාඨ: ඉතිවුත්තක: 2.2.6 අජාත සූත්‍රය, පි. 394.

▲**නිවන හා සසර:** පාලි: **නිබ්බානං, සංසාර-** Nibbāna & Saṃsāra ධර්මයේ නිවන ලෙසින් පෙන්වා ඇත්තේ, සියලු කෙළෙස් වලින් මිදී, දුක නිමාකර ගැනීමය (නිවාගැනීමය). සසර යනු නැවත නැවත උපත ලබමින්, දුක විඳිමින්, භවයේ සැරිසැරිමය. සසර **'මෙතෙර'** (near shore) ලෙසින්ද නිවන **'එතෙර'** (පරතෙර- far shore) ලෙසින්ද හඳුන්වයි. සසරින් ගැලවී, නිවන ලබා ගැනීමේ මාර්ගය ආරිය අටමග බව බුදුන් වහන්සේ පෙන්වා ඇත.**බලන්න**: නිවන, භවය, දුක, ආරියඅටමග.

▼ **නිවන ලබන්නෝ ස්වල්පය**, බොහෝදෙනා සසරේ ගමන් කරති මිනිසුන් අතරින්, පරතෙරට-නිවනට යන්නේ ටිකදෙනෙකි. සෙසු අය මෙතෙර, ඉහලට පහළට දුවන අයය. මනාකොට දෙසූ ධර්මයට අනුව පිළිපදින මිනිසුන්, මහත් අමාරුවෙන් එතෙර වියයුතු සසර සාගරය- මාරයාගේ බල ප්‍රදේශය, තරණය කර පරතෙරට- නිවනට පැමිණේ යයි බුදුන් වහන්සේ වදාළහ:

**"අප්පකා තෙ මනුස්සෙසු යෙ ජනා පාරගාමි නො**
**අථායං ඉතරා පජා තීරමෙවානුධාවති.**
**යෙ ච ඛො සම්මදක්ඛාතෙ ධම්මෙ ධම්මානුවත්තිනො**
**තෙ ජනා පාරමෙස්සන්ති මච්චුධෙය්‍යං සුදුත්තරං. සටහන:** ධම්මපදයේ, පණ්ඩිත වග්ගයේ 85 හා 86 ගාථා මේ හා සාමානය. **මූලාශ්‍ර:** සංයු.නි: (5-1): මහාවග්ග: මග්ගසංයුත්ත:1.4.4.පාරන්ඩගම සූත්‍රය**,** පි.65, ESN: 45: Maggasamyutta: Practice: 34.4. Going Beyond, p. 1641.

▼ **ධර්ම පදය** හෙවත් 'නිවන' ශ්‍රේෂ්ඨය. පෙරද, ඉතා පෙරද, නුවණැති සත්පුරුෂයෝ නිවනම අවබෝධ කලාහුය" යයි බුදුන් වහන්සේ වදාළහ. **මූලාශ්‍ර:** සංයු.නි: (1): සගාථවග්ග: දේවතාසංයුත්ත: සාධු සූත්‍රය. පි. 64, ESN: 1 Devatha samyutta: 33.3 Good, p 100.

▲ **නීවරණ:** පාලි- **නීවරණා-** hindrances: ධර්මයට අනුව නීවරණ යනු ධර්ම මාර්ගය ආවරණය කරණ බාධාකරන- අවහිර කරන කරුණුය. කුමක් ආවරණය කරයිද, වසා දමයිද? කුසලය වසා දමයි, සමාධිය අවහිර කරයි. නීවරණ සංයෝජනයකි, අකුසලයකි. ආධ්‍යාත්මික වර්ධනය අවහිර කරයි. නීවරණ 5 කි, පංච නීවරණ ලෙසින් හඳුන්වයි. **ශබ්දකෝෂ : පා.සි.ශ**: පි.341: "**නීවරණා**: ආවරණය, වැලැක්වීම" **B.D**: p. 209: "**nīvarana**: are 5 qualities which are obstacles to the mind and blind our mental vision" **P.T.S**: p. 856: "**Nīvaraṇa**: an obstacle, hindrance… obstacles in an ethical sense & usually referred to in a set of 5- panca nīvaraṇāni"

▼**ධර්ම මාර්ගය අවහිර කරන නිවරණ පහ**: 1) **කාමච්න්දය** (කාමච්ඡන්දො - Sensuous desire ): කාමයට ඇති ආශාව, පස්කම් සැපය (පංචකාමය) විඳීමට ඇති තන්හාව-ආසාව; කාම ලෝකයට ඇති බැඳීම. කාමවස්තූන් ප්‍රියයයි අල්වාගෙන අයෝනිසෝ මනසිකාරයෙන් කටයුතුකිරීම කාමච්න්දයට මූලික හේතුවය. 2) **ව්‍යාපාදය** (ව්‍යාපාදො- ill will and hatred): ක්‍රෝධය හා තරහ- පටිඝය , සිතේ ඇති තරහ, අමනාපබව. ප්‍රිය නොකරන අප්‍රසන්න, නුරුස්සන දෙයක් හෝ පුද්ගලයෙක් කෙරේ සිතේ ඇතිවන තරහ. අයෝනිසෝමනසිකාරයෙන් කටයුතුකිරීම ව්‍යාපාදයට මූලික හේතුවය. 3) **ථීනමිද්ධය** (ථීනමිද්ධං- dullness and drowsiness ) අලසකම, උදාසීනබව හා කුසිතකම: මෙය ඇතිවීමට මූලික කරුණු 5 කි: **අරතිය** (අරති) ධර්මය පිළිබඳව උද්යෝගයයක් නොමැතිකම. **තන්දිය (**තන්දි)  කුසල් සිත ඇතිකර ගැනීමට ඇති මැලිබව. **කුසීතබව** (විජම්භිකා): ධර්මයේ යෙදෙනවිට ඇති උදාසීනබව. **බත්මත** (භත්තසම්මදො) අහාරගැනීමෙන් පසු ඇතිවෙන කුසීතබවය නිසා භාවනා කිරීම ආදී කටයුතු කරගැනීමට නොහැකිබව. **සිතේ හැකිලීම** (චෙතසො ච ලීනත්තං)  ධර්මය ඇසීමට,  ආදී කටයුතු කිරීමට සිත නොපෙළඹීම. 4) **උද්දච්ඡ කුක්කුච්ච** (උද්ධච්චකුක්කුච්චං- restlessness and remorse) සිතේ ඇති නොසන්සුන්කම හා පසුතැවීම: සිත විසිරියාම, කැළඹීම හා තමන් කළ අයහපත් ක්‍රියා ගැන පසුතැවීම. 5) **විචිකිච්චාව** විචිකිච්ඡා -doubt ) සැකය , සාංකාව (kankhā -skeptical doubt ) ලෙසින්ද හඳුන්වයි. ත්‍රිවිධ රත්නය පිලිබඳ විස්වාසය නොමැතිබව, ශ්‍රද්ධාව හීනවීම නිසා විචිකිච්චාව ඇතිවේ**. සටහන්: * විචිකිච්චාව**: සෝතාපන්න මගඵල ලබාගැනීම පිණිස ප්‍රහීණය කළයුතු සංයෝජන තුනෙන් එකකි.   ****** සිතේ සැකය ඇතිවීමට බලපාන කරුණු පහක් පිළිබඳව අංගු.නි: පෙන්වා ඇත: 1) තම ගුරුවරයා ගැන විස්වාසය නොමැතිබව 2) ඉගැන්වීම- ධර්මය පිළිබඳව විස්වාසය නොමැතිබව 3) සංඝයා පිලිබඳ විස්වාසය නොමැතිබව  4) ධර්ම පුහුණුව පිලිබඳ විස්වාසය නොමැතිබව 5) තමන් සමග වාසය කරණ සෙසු සංඝයා පිලිබඳ සිතේ තරහ ඇතිවීම හා නොසතුටු බව. **බලන්න**:අංගු.නි: (3 ): 5 නිපාත: 5.1.5 චෙතෝඛිල සූත්‍රය, පි. 422,  EAN:5: 205-Barrenness, p. 305. **මූලාශ්‍ර:** අංගු.නි: (1):1 නිපාත:නීවරණ ප්‍රහාණ වග්ග සූත්‍ර, පි. 44, EAN:1: Abandoning the hindrances, p. 36.

▼**ආර්යවිනයේ** පංච නීවරණ හඳුන්වාඇත්තේ: මාර්ගය බාධාකරණ, අවහිරකරණ, වසාදමන, වටලාදමන කරුණු  යයි බුදුන් වහන්සේ වදාළහ:          **" … පඤ්චිමෙ නීවරණා අරියස්ස විනයෙ ආවරණා ති නීවරණා ති… ඔනහා ති …පරියොනාහා'ති පි වුච්චන්ති"** (obstacles, hindrances, coverings-up, enveloping). **මූලාශ්‍ර**: දිඝ.නි: (1): 13 තේවිජ්ජා සූත්‍රය, පි. 610, EDN: 13 Tevijja Sutta: The Threefold Knowledge -The Way to Brahma, p.142.

▼**පංච නීවරණ සිත කෙලෙසයි**: පංච නීවරණ නිසා සිත කිලිටිවේ. එවන් සිත ආධ්‍යාත්මික වර්ධනයට අවශ්‍ය මෘදුබව, කර්මන්‍යබව, ප්‍රභාස්වරබව ලබා නොදේ, එවන් සිත බිඳෙන සුළු නිසා අසාවප්‍රහිනය (ආසවක්කය) පිණිස සමාධිය ඇතිකරගැනීමට අවස්ථාව ලබාදෙන්නේ නැත- නිවන්මග වසාදමයි. **සටහන**: පංචනීවරණ, සිත කෙලෙසන කරුණු (**චිත්තස්ස උපක්කිලෙසා**) ලෙසින් මෙහිදී පෙන්වා ඇත. **බලන්න**: උපකෙලේස.

**මූලාශ්‍ර**: සංයු.නි: (5-): මහාවග්ග: බොජ්ඣංගසංයුත්ත**:** 2.4.3 කිලෙස සූත්‍රය, පි.214**,** ESN: 46: Bojjhaṅgasaṃyutta : 33.3 Corruptions,p.1768

▼**නිවරණ ප්‍රහාණය පිණිස බොජ්ඣංග ධර්මතා දියුණුකරගත යුතුය.** සප්ත බොජ්ඣංග ධර්ම සිත ආවරණය නොකරයි, නො කෙලෙසයි, ඒවා දියුණුකරගැනීමෙන් නිතර බහුල කරගැනීමෙන් සත්‍යඅවබෝධය හා විමුක්තිය ලබාගතහැකියයි (විජ්ජාවිමුත්ති ඵල) බුදුන් වහන්සේ වදාළහ. **මූලාශ්‍ර**: සංයු.නි: (5-1): මහාවග්ග:බොජ්ඣංගසංයුත්ත: 2.4.4 අනාවරණ සූත්‍රය, පි.216**,** ESN:46: Bojjhaṅgasaṃyutta : 34.4 Non-corruptions, p.1769.

▼**ආරිය ශ්‍රාවකයා**, ඕනෑකමින් ධර්මය අසන්නේ නම්, දහම් කරුණුවල වැදගත්කමගැන සිත සහමුලින්ම යොමුකරන්නේ නම්, එවන් අවස්ථාවේදී ඔහුට සප්ත බොජ්ඣංග ධර්ම ඇතිවේ, ඔහුගේ පංච නීවරණ නැතිවියයි. **මූලාශ්‍ර**: සංයු.නි: (5-1): මහාවග්ග: බොජ්ඣංගසංයුත්ත: 2.4.8 අනීවරණ සූත්‍රය, පි.218**,** ESN: 46: Bojjhaṅgasaṃyutta : 38.8 Without Hindrances ,p.1773.

▼**යෝනිසෝමනසිකාරයෙන් කටයුතු කරන්නේ නම් නීවරණ ඇතිනොවේ**: අයෝනිසෝමනසිකාරයෙන් කටයුතු කරන්නේනම් නුපන් පංච නීවරණ ඇතිවේ, උපන් පංච නීවරණ බහුලවේ. එහෙත් යෝනිසෝ මනසිකාරයෙන් කටයුතු කරන්නේ නම් සිත පංච නීවරණ මගින් ආවරණය නොවේ, සප්ත බොජ්ඣංග ධර්මතා ඇතිවේ. **මූලාශ්‍ර**:සංයු.නි: (5-1): මහාවග්ග:බොජ්ඣංගසංයුත්ත**:** 2.4.5 යොනිසෝ සූත්‍රය, පි.216**,** ESN: 46: Bojjhaṅgasaṃyutta : 35.5 Careful-attention,p.1770

▼**නීවරණ නිසා ප්‍රඥාව දුබලවේ**: නීවරණ නිසා සිත කෙලෙසේ, ධර්ම මාර්ගය වැසේ, ප්‍රඥාව දුර්වලවේ යයි බුදුන් වහන්සේ පෙන්වා ඇත. **මූලාශ්‍ර**: සංයු.නි: (5-1): මහාවග්ග:බොජ්ඣංගසංයුත්ත: 2.4.7 ආවරණ සූත්‍රය, පි.218**,** ESN: 46: Bojjhaṅgasaṃyutta : 37.7 Obstructions,p.1772.

▼**නීවරණ ආධ්‍යාත්මික ජීවිතය විනාශ කරයි**: මහා ගස් -මහා රුක්, වනයේ ඇති සෙසු ගස් විනාශකර වැඩෙන ලෙසින්, පංච නීවරණ සිත වටකර, යටකර ආධ්‍යාත්මික ජීවිතය වනසාදමන බව බුදුන් වහන්සේ වදාළහ. ආධ්‍යාත්මික ජීවිතය වර්ධනය කරගැනීමට සප්ත බොජ්ඣංග ධර්මයන් වැඩිය යුතුය. **බලන්න**:උපග්‍රන්ථය:5. **මූලාශ්‍ර**: සංයු.නි: (5-1): මහාවග්ග:බොජ්ඣංගසංයුත්ත: 2.4.9 මහා රුක්ඛ සූත්‍රය, පි.220**,** ESN: 46: Bojjhaṅgasaṃyutta : 39.9 Trees,p.1774

▼**නිවරණ ධර්මතා නිවන පිණිස නොපවතී**: පංචනීවරණ කෙනෙක් අන්ධ බවට පත් කරයි, නුවණ නැමති ඇස වසාදමයි, අවබෝධය නැතිකරයි, ප්‍රඥාව වලක්වයි, සිතේ සන්තාපය ඇතිකරයි, නිවන ඇත්කරයි යයි බුදුන් වහන්සේ වදාළහ:

**"…පඤ්චිමෙ භික්ඛවෙ, නීවරණා අන්ධකරණා අචක්ඛුකරණා අඤ්ඤාණකරණා පඤ්ඤානිරොධියා විඝාත පක්ඛියා අනිබ්බාන සංවත්තනිකා…"**. ( Bhikkhus, these five hindrances are makers of

blindness, causing lack of vision, causing lack of knowledge, detrimental to wisdom, tending to vexation, leading away from Nibbāna). **මූලාශ්‍ර**: සංයු.නි: (5-1):මහාවග්ග: බොජ්ඣංගසංයුත්ත: 1.4.10 නිවරණ සූත්‍රය, පි.222 **,** ESN: 46: Bojjhaṅgasaṃyutta : 40.10 Hindrances, p.1775 .

▼ **නීවරණ පිලිබඳ අවබෝධයට හා ඒවා විනාසකර දැමීමට අරිය අටමග වැඩියයුතුය**: නීවරණ පිලිබඳ විශේෂයෙන්ම දැනගැනීම පිණිස (**අභිඤ්ඤාය** -direct knowledge), ඒවා පිලිබඳ පූර්ණ අවබෝධය පිණිස (**පරිඤ්ඤාය** -full understanding), ඒවා සහමුලින් විනාශ කිරීම පිණිස (**පරික්ඛයාය** -utter destruction), ප්‍රහාණය පිණිස (**පහානාය -**to abandon) **අරිය අටමග** -අරියො අට්ඨංගිකො මග්ගො යහපත් ලෙසින්ම වැඩිය යුතුය යි බුදුන් වහන්සේ වදාළහ. **මූලාශ්‍ර:** සංයු.නි: (5-1): මහාවග්ග: මගග සංයුත්ත: 1.16. නීවරණ සූත්‍රය, පි. 164, ESN: 46: Maggasamyutta: 177.7 Hindrances, p. 1724.

▼**පංච නිවරණ පෝෂණය වන අන්දම හා ඒවා පහකරගැනීම (අනාහාරකිරීම)**: 1) **කාමච්ඡන්දයට** ආහාරය: සුභ නිමිත්තය. අසුභ නිමිත්ත වඩා ගැනීමෙන් එය පහකර ගත හැකිය. 2) **ව්‍යාපාදයට** ආහාරය පටිඝ නිමිත්තය. මෙත්තා චේතෝ විමුක්තිය වඩා ගැනීමෙන් එය පහකර ගත හැකිය. 3) **ථිනමිද්ධයට** ආහාරය කුසලයට ඇති අරතියය, අලසකම, මැලිකැඩීම, නිදිමත-බත්මත, සිතේ උදාසීනබවය. ප්‍රධාන වීරිය ඇතිකර ගැනිමෙන් එය පහකර ගත හැකිය. 4) **උද්දච්ච කුක්කුච්චයට** ආහරය සිතේ ඇති නොසන්සුන්බව හා පසුතැවිල්ලය. සිතේ සංසුන් බව ඇතිකරගැනීමෙන් එය පහකර ගත හැකිය. 5) **විචිකිච්චාවට** ආහාරය දහම් කරුණු පිලිබඳ සිතේ ඇති සැකය. කුසලඅකුසල ධර්ම, සාවද්‍ය නිරවද්‍ය ධර්ම, හීන ප්‍රණීත ධර්ම, දීප්තිමත් හා අඳුරු ධර්ම ගැන නුවණින් මෙනෙහි කිරීමෙන් විචිකිච්චාව පහවේ. **සටහන**: නීවරණ ධර්ම ගැන අයෝනිසෝමනසිකාරයේ යේදීම නිසා ඒවා, පොෂණය වේ. **මූලාශ්‍ර:** අංගු.නි: (1 ) :1 නිපාත:නීවරණ ප්‍රහාන වග්ගසූත්‍ර, පි.44, EAN:1: Abandoning the Hindrances, p. 36, සංයු.නි: (5-1): මහාවග්ග :බොජ්ඣංග සංයුත්ත: 2.1.2 කායසූත්‍රය, පි. 168, 2.6.1 ආහාර සූත්‍රය, පි. 230, ESN: 46: Bojjhaṅgasaṃyutta: 2.2. The Body, p. 1731, 51.1 Nutriment, p. 1788.

▼**නීවරණ වලින් සිත යටවූවිට යථාබව අවබෝධනොවේ**: යම් කෙනෙක් ගේ සිත පංච නිවරණ වලට යටවූවිට, ඔහු ඒවායින් මිදීම (නිස්සරනය) නොමදනී; එම නීවරණ තමන්ගේ යහපත පිණිස, අනුන්ගේ යහපත පිණිස, දෙපක්ෂයේ යහපත පිණිස නොවන බව නොමදනී යයි බුදුන් වහන්සේ වදාළහ. එලෙස නීවරණවලින් මැඩුන සිතින් වාසය කරනවිට දිගුකාලීනව උගත්, යහපත් දේ පවා නොවැටහේ. පංච නීවරණ වලින් සිත වැසීයාම පිලිබඳ මෙබඳු උපමා දක්වා ඇත: **කාමච්ඡන්දයට සිත යටවීම** පෙන්වා ඇත්තේ රතු හෝ කහ ආදී සායමක්- වර්ණයක් මිශ්‍ර කළ දිය බඳුනකටය. සායම නිසා ජලය පැහැදිලි නැත. සිත කාමයට යටවූ විට පිරිසුදු නැත. **ව්‍යාපාදය** නිසා කැළඹුන සිත දක්වා ඇත්තේ බුබුළු දමන උණුවතුර ඇති දිය බඳුනකටය. උණුදිය ඇල්ලීම නිසා පිඩා ඇතිවේ. තරහ සිත,තමාට මෙන්ම අනුන්ටද පිඩා ඇතිකරයි. **ථිනමිද්ධයෙන්** වැසුන සිත

දියසෙවෙල් පිරීගිය විලක් වැනිය, සෙවල නිසා ජලය පැහැදිලි නැත, එලෙස අලසව ගිය සිත අකුසලයෙන් වැසී ඇත. **උද්ධච්චකුක්කුච්චය** ඇති සිත නිතර හටගන්නා ජලරැලි නිසා කැළඹුන විලක් බඳුය. එලෙස කැළඹුන සිත සමාධියට හිතකර නොවේ. **විචිකිච්ඡාවට** යටවූ සිත මඩ ආදියෙන් පිරීගිය දිය බඳුනක් වැනිය. අකුසල නිසා සිත ධර්මයට යොදාගැනීම අපහසුවේ. එලෙස පංච නීවරනයන්ට යටවූ සිතේ පැහැදිලිබවක්, නිසල බවක් නොමැතිනිසා, සමාධිය ඇතිකර ගැනීමට, සත්‍ය දැකීමට පහසුනොවේ. එහෙත්, නීවරණ තොර පිරිසිදු සිතට යථාබව අවබෝධ කරගත හැකිවේ, දිගුකලක් ඉගෙනගත් යහපත් ධර්මය මනාව අවබෝධවේ. **බලන්න**: උපග්‍රන්ථය:5. **මූලශ්‍ර:** අං.ගු.නි: (3 ): 5 නිපාත: 5.4.5.3 සන්ඝගාරව සූත්‍රය, පි. 396, EAN:5:193.3 Saṅgārava sutta, p.300.

▼**පංච නීවරණ ප්‍රහීණය කරගැනීමෙන් ආරිය වාසස්ථාන ලබාගත හැකිය**: පංච නීවරණ ප්‍රහාණය කරගත් පුද්ගලයා ආරිය උතුමෙකි, ආරිය වාසස්ථානය හිමිකරගෙන ඇත. **මූලාශ්‍ර:** අං.ගු.නි: (6) 10 නිපාතය: 10.1.2.9-10 ආරියවාස සූත්‍ර 2කි. පි.82,84, EAN: 10: 19.9 & 20.10 Abodes of the noble ones, p. 498.

▲**නුවණ-** Wisdom: නුවණ: ඤාණය-ඥානය, ප්‍රඥාව, අවබෝධ ලෙසින්ද පෙන්වා ඇත. දහම යහපත් ලෙසින් අවබෝධ කරගැනීමට නුවණ අවශ්‍යතම අංගයකි. එම ගුණය ඇති පුද්ගලයා පණ්ඩිතයාය. **බලන්න**: ඤාණය, බාල පණ්ඩිත.

▲ **නුවණැත්තෝ**- Wise one's: ධර්මයට අනුව නුවණැත්තෝ යනු මාර්ග සත්‍ය අවබෝධ කළ ආරිය පුද්ගලයාය. නුවණැත්තෝ, අනුවණ මිනිසුන් හා එක්ව හැසිරෙන නමුදු, ලාමක දේ දුරලන්නේ, කොස්වාලිහිණියා, දියමුසු කිරි ලැබුන විට, දිය හැර කිරිපමණක් ගන්නා ලෙසිනි. **සටහන්:** මේ උදානයට හේතුවූයේ, බුදුන් වහන්සේගේ, අතවැසි මහණවූ, නාගසමාල තෙර, උන්වහන්සේගේ අවවාද නොපිළිගෙන, පාත්‍ර සිව්රු බිම තබා වෙන මගක් ගැනීම නිසා ඔහුට සිදුවූ විපත මුල් කරගෙනය. **මූලාශ්‍ර**: බු.නි: උදානපාලිය: 8.7 ද්විධාපථ සූත්‍රය, පි. 338.

▲ **නෙවසඤ්ඤානාසඤ්ඤායතනය-**base of neither-perception-nor-non-perception.අරූප බ්‍රහ්ම ලෝකයකි- අරූප තලයකි. කෙනෙක් ආකිඤ්චඤ්ඤායතනය සහමුලින්ම මැඩ පවත්වාගෙන, **'මෙය ශාන්තය මෙය ප්‍රනීතය'** යයි අවබෝධකර, උසස්වූ නෙවසඤ්ඤානාසඤ්ඤායතන සමාපත්තිය ලබා මේ අරූප තලයේ පහළවේ. නේවසඤ්ඤානා සඤ්ඤායතන සමාපත්තියේ දී, ආකිඤ්චඤ්ඤායතන සංඥා නිරුද්ධවේ.

**බලන්න**: බ්‍රහ්මලෝක, අරූපසමාපත්ති, අරූපතල, සංකාර අනුපූර්ව නිරෝධය. **සටහන:** මේ සමාපත්තිය 'ශාන්තවිහරණ' යකි. **බලන්න**: අං.ගු.නි: (6): 10:10.1.1.8 සද්ධා සූත්‍රය,10.1.1.9. සන්ත විමොක්ඛ සූත්‍රය,පි.50.

▼ **නෙවසඤ්ඤා-නාසඤ්ඤායතන** සමාපත්තිය ඉහලම-අග්‍ර විසුද්ධිය ලෙසින් සලකා, පුද්ගලයෝ එම සමාපත්තිය ලබති, එහෙත්, ඔවුන්ද විනාශයට පත්වේ යයි මෙහි පෙන්වා ඇත. **මූලාශ්‍ර:** අං.ගු.නි: (6 ): 10

නිපාත: 10.1.3.9.ප්‍රථම කෝසල සූත්‍රය,පි. 134, EAN-10: The Great Chapter, 29.9 Kosala-1, p. 505.

▼ **නෙවසඤ්ඤානාසඤ්ඤායතන ධාතුව**, සප්ත ධාතු වලින් එකකි. **බලන්න**: ධාතු

▼ **මේ ආයතනය,** සත්ත්වයෝ යළි උපත ලබන ආයතන 2න් එකකි. **මූලාශ්‍ර:** දීඝ.නි: (2): මහානිදාන සූත්‍රය, පි.118, EDN: 15 The Great Discourse on Origination, p.169.

▼ **මේ සූත්‍රයේදී** සැරියුත් තෙරුන්, නෙවසඤ්ඤානාසඤ්ඤායතන සමාධිසමාපත්තිය ලැබීම විස්තරකර ඇත. **මූලාශ්‍රය:** සංයු.නි: (3): ඛන්ධවග්ග: සාරිපුත්‍රසංයුත්ත: 7.1.8 නෙවසඤ්ඤානාසඤ්ඤායතන සූත්‍රය, පි.498.

▼ **මේ සූත්‍රයේදී** මහා මුගලන්තෙරුන්, නෙවසඤ්ඤානාසඤ්ඤායතන සමාධිසමාපත්තිය ලැබීම විස්තරකර ඇත. **මූලාශ්‍රය:** සංයු.නි: (4 ): සළායතනවග්ග: මොග්ගල්ලානසංයුත්ත: 6.1.8 නෙවසඤ්ඤානා සඤ්ඤායතන සූත්‍රය, පි.523.

▲**නොවැරදිය හැකි මග**- unmistaken way: නොවැරදිය හැකි මග (අපණ්ණකතං පටිපදං-අපණ්නක පටිපදාව) ලෙසින් පෙන්වා ඇත්තේ ආධ්‍යාත්මික මගය. **බලන්න**: ආධ්‍යාත්මික මග.

**නස**

▲ **නසෙවිතබ්බධම්ම-** Dhamma not to be pursued: මෙයින් පෙන්වා ඇත්තේ, මාර්ගය වඩාගැනීම පිණිස, නොසෙවිය (සේවනය නොකළ යුතු) යුතු දහම් කරුණුය. එනම්, මිථ්‍යාදිට්ඨිය සහිත වැරදිමගය, දසඅකුසලය. **බලන්න**: ආසෙවිතබ්බ ධම්ම.

▲ **නොසෙවියයුතු පුද්ගලයා-** Person not to be associated: නොසෙවියයුතු පුද්ගලයා -භජනය නොකළ යුතු පුද්ගලයා ලෙසින් පෙන්වා ඇත්තේ, ශිලය සමාධිය හා ප්‍රඥාව හීන තැනැත්තාය. එවැනි අය සේවනය කිරීමෙන් කෙනකුගේ ධර්ම මාර්ගය පිරිහේ.**බලන්න:** සෙවිතබ්බ පුද්ගලයෝ **මූලාශ්‍රය:** අංගු.නි: (1) 3 නිපාත: 3.1.3.6 සූත්‍රය, පි.270.

▲ **නාස්තික දිට්ඨි-** doctrine of nihilism: මෙය ශුන්‍යවාදය ලෙසින්ද හඳුන්වයි. අපණ්ණක ධර්මය-දුකින්මිදීමේ මග-වඩාගැනීම පිණිස පහකරගතයුතු දිට්ඨියකි. **බලන්න**: දිට්ඨි.

▲ **නිසරු ගස** - the  Barren Tree : ඉන්ද්‍රිය අසංවරය නිසා මාර්ගය පරිහානියට පත්වීම පෙන්වා දීමට මේ උපමාව යොදාගෙන ඇත.**බලන්න**: ඉන්ද්‍රිය අසංවරය, උපග්‍රන්ථය:5.

▲ **නිස්සය-** Dependence: විනයට අනුව නිස්සය යනු, සාමණේර හා උපසම්පදා ලැබූ සංඝයා, තමන්ගේ කටයුතු කරගැනීම පිණිස, වැඩිහිටි, පුහුණුවලත්, ජේෂ්ඨ භික්ෂුවක්, උපාදධ්‍යායයා -උප්පජ්ජා ලෙසින් ලබා ගෙන එම භික්ෂුව යටතේ පුරුදු පුහුණුවීමය. මේ සූත්‍රයේ නිස්සය ලබාදීමට තිබිය යුතු සුදුසුකම් පෙන්වා ඇත. **බලන්න**: උපාදධ්‍යායයා

**සටහන්**: * අංගු.නි: (6) 10 නිපාත:10.1.4.5 නිස්සය සූත්‍රයේ, බුදුන් වහන්සේ නිස්සය ලබාදීමට ඇති සුදුසුකම් 10 ක් උපාලි තෙරුන්ට පෙන්වා ඇත. ** නිස්සය පිලිබඳ බෝධි භික්ඛුගේ සටහන **බලන්න:** EAN:note:1085. **මූලාශ්‍ර**: අංගු.නි: (3 ): 5 නිපාත:5.6.1.2 නිස්සය සූත්‍රය, පි. 466, EAN:5: 252.2 Dependence, p. 311.

▲ **නිස්සයසම්පන්න**-Nissayasampana: නිස්සයසම්පන්න වීම පිණිස සංඝයා සාක්ෂාත් කරගතයුතු ගුණ මේ සූත්‍රයේ විස්තරාත්මකව පෙන්වා ඇත. **සටහන**: අටුවාවට අනුව නිස්සයසම්පන්න වීම ලෙසින් දක්වා ඇත්තේ අරහත් බව පිණිස උපකාරීවන ධර්මතාවය. **බලන්න**: EAN: note:1825, p. 669. **මූලාශ්‍ර**: අංගු.නි: (5): 9 නිපාත: 9.1.1.2 නිස්සයසම්පන්න සූත්‍රය, පි.392, EAN:9: 2.2 Support, p. 459.

▲ **නිස්සරණය** - Nissaranaya: නිස්සරණය (escape) ලෙසින් පෙන්වා ඇත්තේ නික්මීමය, කෙළෙස් වලින් මිදී යාමය. මේ සූත්‍රයේ නිස්සරණ ධර්මතා 3 ක් පෙන්වා ඇත: 1) කාමයෙන් නික්මීම පිණිස ප්‍රථම ජාන සමාපත්තිය 2) රූපයෙන් නික්මීම පිණිස අරූපාවචර සමාපත්තිය 3) හේතු ප්‍රත්‍ය නිසා උපන් ධර්මයෙන් නික්මීම පිණිස නිරෝධය-නිවන ලබාගැනීම. **සටහන:** ලෝකධර්මය අවබෝධකර ඉන් මිදියාම නිස්සරණය ය- සසරින් නිදහස්වීමය. **බලන්න**: ආස්වාදය, ආදීනවය, නිස්සරණය. **මූලාශ්‍ර:** ඛු.නි: ඉතිවුත්තක: 3.3.3 නිස්සරණිය සූත්‍රය, පි. 430.

▲ **නිස්සාරණිය ධාතු:** පාලි: **නිස්සරණියා ධාතුයො** -elements of escape කෙළෙස් වලින් මිදීමට, වෙන්වීම පිණිස උපකාරීවන ධර්මතා නිස්සාරණිය ධාතුය. **සටහන**: අටුවාවට අනුව නිස්සාරණියා යනු වියුක්තවීමය; වෙන්වීමය. **බලන්න**: EAN: note: 1204, p. 641. **ශබ්දකෝෂ:පා.සිං.ශ:** පි. 343: "**නිස්සාරණ:** පිටත යාම, එලවා දැමීම"

▼**නිස්සාරණියා ධාතු 6: 1)** ව්‍යාපාදය පහකිරීම පිණිස මෙත්තා චේතෝවිමුක්තිය සම්පූර්න කරගත යුතුය. 2) විහිංසාව පහකිරීම පිණිස කරුණා චේතෝවිමුක්තිය සම්පූර්න කරගත යුතුය. 3) අරතිය පහකිරීම පිණිස මුදිතා චේතෝවිමුක්තිය සම්පූර්න කරගත යුතුය. 4) රාගය පහකිරීම පිණිස උපේක්ඛා චේතෝවිමුක්තිය සම්පූර්න කරගත යුතුය. 5) බාහිර නිමිති අල්ලා නොගැනීම පිණිස අනිමිත්ත චේතෝවිමුක්තිය සම්පූර්න කරගත යුතුය. 6) විචිකිච්චාව හා සම්මෝහය (මුලාව) (doubt and bewilderment) පහකිරීම පිණිස අස්මි මානය දුරු කරගත යුතුය. **මූලාශ්‍ර:** අංගු.නි: ( 4 ) 6: නිපාත: 6.1.2.3 නිසසාරණිය සූත්‍රය, පි. 40, EAN:6: 13.3 Escape, p. 321.

▼**නිස්සාරණියා ධාතු 5:** 1) කාමයෙන් මිදීම පිණිස නෙක්ඛම්මය වැඩිය යුතුය. 2) ව්‍යාපාදයෙන් මිදීම පිණිස මෙත්තා භාවනාව වැඩිය යුතුය. 3) විහිංසාවෙන් මිදීම පිණිස කරුණා භාවනාව වැඩිය යුතුය. 4) රූපයෙන් මිදීම පිණිස අරූප සමාපත්ති වැඩිය යුතුය5) සක්කාය දිට්ඨියෙන් මිදීම පිණිස සත්කාය නිරෝධය වැඩිය යුතුය. **මූලාශ්‍ර**: අංගු.නි: (3 ): 5 නිපාත: 5.4.5.10 නිස්සාරණිය සූත්‍රය**,** පි. 415, EAN:5: 200.10 Escae, p. 303

▲**නිස්සිත සීලය**- Nissitha sila: නිස්සිත සීලය ලෙසින් පෙන්වා ඇත්තේ යම් අරමුණක් සිතාගෙන පවත්වන සීලයය. අරමුණු 2කි: **තණ්හා**

**නිස්සය:** භව සම්පත් පැතීම (දෙව්ලොව ආදීය) දිට්ඨි නිස්සය**:** සීලය මගින් පාරිශුද්ධ බව පැතීම. **බලන්න**: ශීලය.

▲ **නෙසජ්ජිකයෝ-**who observe the sitter's practice: ධුතාංග පුහුණුව ලෙසින් හිඳින ඉරියව්වෙන් වාසය කරන සංඝයා නෙසජ්ජිකයෝ ලෙසින් පෙන්වා ඇත.**බලන්න**:අංගු.නි: 5 නිපාත: ආරඤ්ඤකවග්ග: 5.4.4.7 නෙසජ්ජික සූත්‍රය, පි.380.

▲ **නුසුදුසු කතා-** Inappropriate Talks: නුසුදුසු කතා-හිස් කථා ආධ්‍යාත්මික වර්ධනය අහිතකරය. මේවා තිරිසන්කථා ලෙසින් බුදුන් වහන්සේ පෙන්වා ඇත. **බලන්න**: කතාව.

**නශ**

▲ **නිශ්චිතබව**- resolute: නිශ්චිතබව ලෙසින් මෙහිදී පෙන්වා ඇත්තේ ධර්මතා පිලිබඳ ස්ථිර අවබෝධය -නොවෙනස්වන-ඇතිබවය. මෙය ධිතිමත්තාන- ධෘතිමත් ලෙසින්ද හඳුන්වයි. මේ ගුණය ඇති භික්ෂූන් අතරින් ආනන්ද තෙර අග්‍රය. **බලන්න**: උපග්‍රන්ථය:1.

**නෂ**

▲ Nishprithika sukha: මින් අදහස් කරන්නේ, 3නි හ4 නි ජානසමාපත්ති නිසා ඇතිවෙන ප්‍රීතිය රහිත සුඛයය. **බලන්න**: සුඛය, ජාන.

▲ **නිෂ්ප්‍රීතිකාලම්භන සුඛය**-Nishprithikalambhana sukha: මින් අදහස් කරන්නේ, 3නි හ4 නි ජානසමාපත්තිය ආලම්බනය කිරීමෙන් ප්‍රීතිය නොමැතිව හට ගන්නා සුඛයය. **බලන්න**: සුඛය, ජාන.

▲ **නිෂ්ප්‍රපඤ්චාරාම**-Nisprapancharama: නිෂ්ප්‍රපඤ්චාරාම යනු ප්‍රපංච නොමැතිව වාසය කිරීමය. එනම් නිවන කෙරේ ඇල්ම ඇති විහරණයය. මේ ජීවිතයේදීම මහා සුවයෙන් හා සොම්නසින් වාසය කිරීමට මෙය උපකාරී වේ. **බලන්න**: සුඛ සෝමනස්ස.

**නහ**

▲**නහතක-** washed: නහතක යනු පාපි අකුසලයන් සහමුලින්ම සෝදාගත් පුද්ගලයාය. රහතන්වහන්සේය. **සටහන**: 'The term "washed" (*nhātaka*) refers to a brahmin who, at the end of his discipleship under his teacher, has taken a ceremonial bath marking the end of his training. See Sn 521'. **බලන්න**: EMN:note: 420, p.1104. **මූලාශ්‍ර:** ම.නි: (1): 1.4.9 මහා අස්සපුර සූත්‍රය, පි.652,EMN: 39 Mahā-Assapura Sutta, p.342.

▼**ධර්මතා සතක් ප්‍රහීණ** කරගත් නිසා 'නහාතක' වේ යයි මෙහි දක්වා ඇත.සක්කායදිට්ඨිය, විචිකිච්ඡාව, සීලබ්බතපරාමාස, රාගය, ද්වේශය, මෝහය, මානය. **මූලාශ්‍රය:** අංගු.නි: (4) 7 නිපාත: සමානවග්ග: 7.2.4.5 නහාතක සූත්‍රය, පි.510.

▲ **නිහතමානිබව**-Nihathamani: නිහතමානි හැසිරීම (**නිවාතො ච**) ධර්ම මර්ගය වඩා ගැනීමට උපකාරිවේ. මෙය මංගල කරුණක් බව මංගල සූත්‍රයේ පෙන්වා ඇත. **මූලාශ්‍රය:** ඛු.නි: ඛුද්දකපාත: 5. මඞගලසූත්‍රය, පි.34.

## ණ කොටස:

**ණය**

▲ **ණයගැති**-Debt: ණයගැති ලෙසින් පෙන්වා ඇත්තේ කාමභෝගී ජීවිතයක් ගත කිරීම පිණිස අනුන්ගේ ධනය- මුදල් ණයට ගැනීමය. ණයගැතිබව දුකකි. ණයගැතිබව, දුගීබවට හේතුවේ.**බලන්න**: ඉණ, කාමභොගිපුද්ගලයෝ,දුගීබව. **මූලාශ්‍ර**: අංගු.නි : (6 ): 10 නිපාත: 10.2.5.1. කාමභොගි සූත්‍රය, පි. 344, EAN:10: 91.1 One who enjoys sensual pleasres, p. 531.

## ප කොටස: පක,පග,පංච,පච,පජ,පඤ,පඦ,පඩ,පට,පඨ, පත,පථ,පද,පධ,පන,පණ,පප,පබ,පභ,පම,පය,පර, පල,පළ, පව,පස,පශ,පහ

**පක**

▲ **පකුධ කච්චායන**-Pakuda kachchayana: **බලන්න**: අන්‍යආගමික නායකයෝ.

▲**පොක්ඛරසාතිබ්‍රහ්මණ** - Brahamin Pokkharasati: **බලන්න:** උපග්‍රන්ථය:3

▲ **පොකුණු බඳු පුද්ගලයෝ** -People similar to lakes: පොකුණු- විල් (දහරතළා) සතරක් ඇත:1) නොගැඹුරුය,නමුත්ගැඹුරු වැනිය 2) ගැඹුරු, නමුත් නොගැඹුරු වැනිය3)නොගැඹුරුය, එලෙසම පෙනෙන 4) ගැඹුරු ය, එලෙසම පෙනෙන. එවැනි, සිව් පුද්ගලයන් ඇතිබව මෙහි දක්වා ඇත.* එක් පුද්ගලයෙක් පළමු විල වැනිය: කය හැසිරවීම, සිවුරු දැරීම ආදී බාහිර ක්‍රියා මානව කරයි, එහෙත්, චතුසත්‍ය නොදනි ** තව කෙනෙක් දෙවෙනි විල වැනිය: කය හැසිරවීම... ආදී බාහිර

ක්‍රියා මානව නොකරයි, එහෙත් චතුසත්‍ය දනී.** අනිත්කෙනා තුන්වැනි විල වැනිය: කය හැසිරවීම... ආදී බාහිර ක්‍රියා මානව නොකරයි, චතුසත්‍ය නොදනි ** අන්තිමයා, සිව්වැනි විල වැනිය: බාහිර ක්‍රියා යහපත්ය, චතුසත්‍ය දනී, ඔහු අග්‍රය. **බලන්න:**උපග්‍රන්ථය:5. **මූලාශ්‍ර**: අංගු.නි: (2 ): 4 නිපාත: 4.3.1.4 උදකරහද සූත්‍රය, පි. 226 , EAN:4: 104.4 Pools of Water, p. 186.

▲**පුක්කුසාතිභික්ෂුව**-Pukkusathi Bhikkhu: **බලන්න**: උපග්‍රන්ථය:1

**පග**

▲ **පිංගලකොච්ච බ්‍රාහමණ** -Pingalakochcha Brahamin: **බලන්න:** උපග්‍රන්ථය:3

▲ **පිංගියමානවක තෙර**-Pingiyamanawaka Thera: **බලන්න:** උපග්‍රන්ථය:1,3

▲ **පිංගියානි බ්‍රාහ්මණ-** Brahamin pingiyaani: **බලන්න**: උපග්‍රන්ථය:3

**පංච**

▲ **පංචඅංග:** පාලි: **පඤ්චඞ්ග-** five factors: පහකරගතයුතු පංචඅංග හා සතු කරගතයුතු පංච අංග මෙහි විස්තර කර ඇත. 1) **අරහත්වය ලැබීම පිණිස** පහකර ගතයුතු අංග 5 **(පඤ්චඞ්ගවිප්පහීනො)** :පංච නීවරණ: කාමච්ඡන්දය, ව්‍යාපාදය, ථීන මිද්ධය, උද්ධච්ච කුකුක්කුච්චය, විචිකිච්චාව.2) **අරහත්වය ලැබීම පිණිස**- ආරිය වාසස්ථාන පිණිස- සතු කර ගතයුතු අංග 5 **(පඤ්චඞ්ග සමන්නාගතො):** අසේඛ ශීලය, අසේඛ සමාධිය, අසේඛ ප්‍රඥාව, අසේඛ විමුක්තිය හා අසේඛ විමුත්ති ඥානදර්ශනය.**බලන්න**: ආරිය වාසස්ථාන, උත්තම පුරුෂයා. **මූලාශ්‍ර**: අංගු.නි: (6):10 නිපාත: 10.1.2.2 පංචඅංග සූත්‍රය, පි.58,EAN:10: 12.2 Five Factors, p. 495,10.1.2.9 -10 පඨම හා දෙවෙනි ආරියවාස සූත්‍ර, පි.82-84, EAN: 10: 19.9 & 20.10 Abodes of the Noble Ones, p. 498-499.

▲ **පංචඅංගීක සම්මාසමාධිය**:පාලි:**පඤ්චඞ්ගිකො සම්මාසමාධි -**Fivefold perfect samadhi: පංච අංගීක සම්මා සමාධිය,භාවේතබ්බ ධර්මතාවකි. **බලන්න**: භාවේතබ්බ ධර්ම.

▼**බුදුන් වහන්සේ මෙසේ වදාළහ: " කතමෙ පඤ්ච ධම්මා භාවෙතබ්බා? පඤ්චඞ්ගිකො සම්මාසමාධි: පීතිඵරණතා, සුඛඵරණතා, චෙතොඵරණතා, ආලොකඵරණතා, පච්චවෙක්ඛණනිමිත්තං..."** වර්ධනය කර ගත යුතු පංච අංගීක සම්මා සමාධිය (ජාන සමාපත්ති ලැබීම) : 1) ප්‍රීතිය හාත්පස පතුරුවමින් උපදනා ප්‍රථම හා ද්විතිය ජාන සමාධිය 2) සුඛ වේදනාව හාත්පස පතුරුවමින් උපදනා ප්‍රථම, ද්විතිය හා තෘතිය ජාන සමාධිය 3) පරසිත් දැනගැනීමේ නුවණ (පරචිත්ත විජානනය) සහිත සමාධිය 4) ආලෝකය පතුරුවන දිවැස් නුවණ - පරචිත්ත විජානනය සහිත සමාධිය 5) ප්‍රත්‍යවෙක්ෂණ නුවණ සහිත සමාධිය. **සටහන:** This refers to the various jhāna states: (a) is the first two jhānas, and (b) the first three. (c) and (d), according to DA, refer to telepathic awareness of others' minds, and clairvoyance respectively. **බලන්න**: EDN: note: 1140, p. 475. **මූලාශ්‍ර:** දීඝ.නි : (3 ): 11 දසුත්තර සූත්‍රය, පි. 483, EDN: 34: Dasuttara Sutta: Expanding Decades, p. 384, අංගු.නි: (3): 5 නිපාත: 5.1.3.8 පංචඅංගිකසමාධි සූත්‍රය, පි. 58, EAN:5: 28.8 five-factored, p. 244.

▲ **පංච ආධ්‍යාත්මික ඉන්ද්‍රිය-** Five spiritual faculties: පංච ආධ්‍යාත්මික ඉන්ද්‍රිය: සද්ධා ,වීරිය,සති,සමාධි යය. මේවා බෝධිපාක්ෂික ධර්මතාය. ප්‍රඥා ඉන්ද්‍රිය, සෙසු ඉන්ද්‍රියන්ට වඩා වෙනස්වේ. **බලන්න:** ආධ්‍යාත්මික පංච ඉන්ද්‍රිය, ඉන්ද්‍රිය.

▼ **පංච ආධ්‍යාත්මික ඉන්ද්‍රියන්** දියුණුවී ඇත්නම්, පංච නිවරණ ඇතිනොවේ. බුදුන්වහන්සේ මෙසේ වදාළහ: **"පස්දෙනක් නිදාගනිද්දී පස් දෙනක් පිබිදීසිටී".** පංචඉන්ද්‍රිය අවදිනොවූ විට පංච නිවරණ ධර්ම ක්‍රියාත්මකවේ- අවදිවේ. එහෙත්, පංච ඉන්ද්‍රිය අවදිව ඇත්නම්, පංච

නිවරණයන් ක්‍රියාත්මක නොවේ-ඒවා නිදිය.පංච නීවරණ අවදිවූ විට කෙළෙස් ඇතිවේ. පංච ඉන්ද්‍රිය ධර්මතා ඇතිවිට කෙළෙස් පහවේ. **බලන්න**: ESN: note: 13, p. 500. **මූලාශ්‍ර:** සංයු.නි: (1): සගාථවග්ග: දේවතාසංයුත්ත: 1.1.6 ජාගරසූත්‍රය, පි.32, ESN: 1: Devata samyutta:6.6 Awake, p. 64.

▲**පංච ආධ්‍යාත්මික බල-** Five spiritual powers**:** ශ්‍රද්ධා, විරිය, සති ,සමාධි හා ප්‍රඥාව, ආධ්‍යාත්මික පංචබලයන්ය. මේවා බෝධිපාක්ෂික ධර්මතාය.**බලන්න**: ආධ්‍යාත්මික පංචබල.

▲**පංච ආනන්තරික කම්ම:** පාලි: **පඤ්චානන්තරිකකම්ම**- Five heinous actions: මේ පාප කම්ම ක්‍රියා නිසා බරපතලවූ, භයානක කම්ම් විපාක විඳීමට සිදුවේ.පාපකර්ම 5කි:මව, පියා, රහතුන් ඝාතනය, දුෂ්ට සිතින් බුදුන්ගේ ලේ සෙලවීම, සංඝභේදය කිරීම. විපාක වශයෙන්, නියතයෙන්ම අපායගාමී, නිරයගාමී වේ. සෝතාපන්න වූ පුද්ගලයා අතින් මේ පාප කර්ම සිදුනොවේ. **බලන්න:** ආනන්තරික කර්ම, සෝතාපන්න. **ශබ්දකෝෂ: B.D**: p. 10: "**The 5 heinous 'Actions** with immediate Destiny' are: parricide, matricide, killing an Arahant, wounding a Buddha, creating schism in the monk's order".

▼ **පංච ආනන්තරික් කර්ම** කරන අය නියතයෙන්ම අපායගාමී, නිරයගාමී වේ, ඔවුන්ට පිළියම් කළ නොහැකිය. **"පඤ්චිමෙ භික්ඛවෙ ආපායිකා නෙරයිකා පරිකුප්පා අතෙකිච්ඡා. කතමෙ පඤ්ච:මාතා… පිතා…අරහං ජීවිතා වොරොපිතො හොති, තථාගතස්ස දුට්ඨෙන චිත්තෙන ලොහිතං උප්පාදිතං හොති, සංඝො භින්නො හොති"**.සටහන්: * සංඝභේදය හා බුදුන් වහන්සේගේ ශරීරයෙන් ලේ සෙලවීමේ විපාක ලෙසින් දෙවදත්ත භික්ෂුව නිරයේ පහළවිය. **බලන්න**: අංගු.නි: (5 ): 8 නිපාත: 8.1.1.7. දේවදත්ත විපත්ති සූත්‍රය, පි. 42, EAN:8: 7.7 Devadatta's Failing, p. 413. ** මේ කර්ම සිදුකල පුද්ගලයාට, ආධ්‍යාත්මික මගට ඇතුළුවිය නොහැකිය. **බලන්න:** අංගු.නි: (4 ): 6 නිපාත: 6.2.4.3 වොරෝපිත සූත්‍රය, පි. 264 ** අජාසත් රජු සිය පියා, සේනිය බිම්බිසාර රජු මරණයට පත් කළ නිසා, සෝතාපන්න බව ලැබීමට තිබු වාසනාව නැතිවී ගිය බව, දීඝ.නි; ශ්‍රමණඵල සූත්‍රයේදී බුදුන් වහන්සේ පෙන්වා ඇත. **මූලාශ්‍ර**: අංගු.නි: (3 ): 5 නිපාත: 5.3.3.9 පරිකුප්ප සූත්‍රය, පි. 262, EAN: 5: 129.9 Lesions, p. 279.

▲**පංච ඉට්ඨ ධර්ම**-Five desirable Dhamms: පංච ඉට්ඨ (කැමති) ධර්ම ලෙසින් පෙන්වා ඇත්තේ ලෝකයේ ඇති, ලබාගැනීමට කැමති මන වඩන ධර්මයන්ය: දීර්ඝ ආයුෂ, රූපත්බව-ශරීර වර්ණය, කායික මානසික සුවය, යසස (භෝග සම්පත් හා පරිවාර-පිරිස් සම්පත ) හා ස්වර්ගය. මේවා ලබා ගැනීම දුර්ලභය. ඒවා යැදීමෙන්, පැතීමෙන් ලබා ගත නොහැකිය. ඒ දේ ලබාගැනීම පිණිස අනුගමනය කලයුතු ප්‍රතිපදාව මෙහි විස්තරාත්මකව පෙන්වා ඇත. **බලන්න**: දුර්ලභදේ. **සටහන:** මේ සූත්‍රය දේශනා කර ඇත්තේ අනාථපිණ්ඩික සිටුවරයාටය. **මූලාශ්‍ර**: අංගු.නි: (3): 5 නිපාත:5.1.5.3 ඉට්ඨ ධර්ම සූත්‍රය, පි. 96, EAN:5: V:43.3. Wished for, p. 252.

▲ **පංච ඉන්ද්‍රියන්**: පාලි: **පඤ්චිඉනද්‍රියානි -** Five Faculties: කායික හෝ මානසික වේදනා අනුව මේවා විස්තර කර ඇත,ආධ්‍යාත්මික පංච ඉන්ද්‍රියන්ට වඩා වෙනස්ය. 1) සුඛ ඉන්ද්‍රිය 2) දුක ඉන්ද්‍රිය 3) සෝමනස්ස ඉන්ද්‍රිය 4) දෝමනස්ස ඉන්ද්‍රිය 5) උපේක්ඛා ඉන්ද්‍රිය. මේවා කායික හෝ මානසික වේදනා පදනම් කොට ඇතිවේ. පංච ඉන්ද්‍රිය පිලිබඳ යථා අවබෝධය ලබා ගැනීමෙන් (ඒවායේ ඇතිවීම, නැතිවීම-සමුදය වය, ආස්වාදය, ආදීනවය හා නිස්සරණය) සෝතාපන්න බව ලැබිය හැකිය. එම අවබෝධය ඇතිව උපාදාන රහිතව ආසවක්‍ෂය කිරීමෙන් අරහත්වයට පත්වේ. **බලන්න:** ඉන්ද්‍රිය. **මූලාශ්‍ර:** සංයු.නි : (5-1): මහාවග්ග: ඉන්ද්‍රිය සංයුත්තය: 4.4.1 සුද්ධක සූත්‍රය, 4.4.2 සෝතාපන්න සූත්‍රය, 4.4.3 අරහන්ත සූත්‍රය, පි. 397, ESN: 48: Indriyasamyutta: 31.1 Simple Version , 32.2 Stream enterer, 33.3 Arahant, p. 1959.

▼**පංච ඉන්ද්‍රිය බෙදා විස්තරකිරීම-විභංග:** 1) **සුඛ ඉන්ද්‍රිය** (pleasure faculty): කය හේතු කොට ලබන සුවය, සැපය, කයේ ස්පර්ශය නිසා ඇතිවන සැප වේදනාව සුඛ ඉන්ද්‍රියවේ. **(කායිකං සුඛං, කායිකං සාතං, කායකසම්ඵස්සජං සුඛං සාතං වෙදයිතං**- Whatever bodily pleasure there is, whatever bodily comfort, the pleasant comfortable feeling born of body-contact: is called the pleasure faculty). 2) **දුක ඉන්ද්‍රිය** (pain faculty): කය හේතු කොට ලබන දුක, දුක්බව, කයේ ස්පර්ශය නිසා ඇතිවන දුක් වේදනා දුක ඉන්ද්‍රියවේ. **(කායිකං දුක්ඛං, කයිකං අසාතං කායකසම්ඵස්සජං දුක්ඛං අසාතං වෙදයිතං**- Whatever bodily pain there is, whatever bodily discomfort, the painful uncomfortable feeling born of body-contact: this, is called the pain faculty). 3) **සෝමනස්ස ඉන්ද්‍රිය** (joy faculty): සිත හේතු කොට ලබන (මානසික) සතුට, සැපය, මනසේ ස්පර්ශය නිසා ඇතිවන සොම්නස් වේදනා සෝමනස්ස ඉන්ද්‍රිය වේ.**(චෙතසිකං සුඛං, චෙතසිකං සාතං, මනොසම්ඵස්සජං සුඛං සාතං වෙදයිතං** -Whatever mental pleasure there is, whatever mental comfort, the pleasant comfortable feeling born of mind-contact: is called the joy faculty) 4) **දෝමනස්ස ඉන්ද්‍රිය** (displeasure faculty): සිත හේතු කොට ලබන අසතුට, දොම්නස, මනසේ ස්පර්ශය නිසා ඇතිවන දොම්නස් වේදනා, දෝමනස්ස ඉන්ද්‍රිය වේ.**(චෙතසිකං දුක්ඛං, චෙතසිකං අසාතං, මනොසම්ඵස්සජං දුක්ඛං අසාතං වෙදයිතං**- Whatever mental pain there is, whatever mental discomfort, the painful uncomfortable feeling born of mind-contact: is called the displeasure faculty). 5) **උපේක්ඛා ඉන්ද්‍රිය** (equanimity faculty): කායික හෝ වේවා මානසික හෝ වේවා යම් සැපත් නැති දුකත් නැති යම් වේදනාවක් (මධ්‍යස්ත වේදනාව) ඇත්නම් එය උපේක්ඛා ඉන්ද්‍රිය වේ. **(කායිකං වා චෙතසිකං වා නෙව සාතං නාසාතං වෙදයිතං**- Whatever feeling there is, whether bodily or mental, that is neither comfortable nor uncomfortable: is called the equanimity faculty) .විභංග විස්තරයට අනුව පංච ඉන්ද්‍රිය, පහක් වුවත් වේදනා අනුව 3ක් ය. තුන් වේදනා, ඉන්ද්‍රිය 5ක් බවට පත්වන්නේ යයි මෙහි පෙන්වා ඇත. (according to the method of exposition, these five faculties, having been five, become three; and having been three, become five). **මූලාශ්‍ර:** සංයු.නි : (5-1): මහාවග්ග: ඉන්ද්‍රිය

සංයුත්තය:4.4.6 -4.4.8 විභංග සූත්‍ර, පි. 399, ESN: 48: Indriyasamyutta: 36.6 Analysis 1-3  sutta, p. 1964.

▲**පංච උපාදානස්කන්ධය:** පාලි: **පඤ්චුපාදානක්ඛන්ධා** -five aggregates subject to clinging: පංච උපාදානස්කන්ධය: රූප, වේදනා, සංඥා, සංස්කාර හා විඥාන යන උපාදාන ස්කන්ධ පහය. සාමාන්‍ය ලෝකයා තමාගේ කය හා සිත (ආත්මය) යයි සලකන්නේද මෙයමය. රූපය යනු සතර මහා භූතයන් ගෙන් සකස්වූ මේ කයය. සළායතන මගින් අල්ලා ගන්නා බාහිර අරමුණු ස්පර්ශ කිරීම නිසා ඇතිවන යම් හැඟීමක් ඇත්නම් එය වේදනාවය, එම බාහිර අරමුණු හඳුනා ගැනීම (ස්පර්ශය මගින්) සංඥාව වේ. සංස්කාර -සංඛාර යනු එලෙස බාහිර අරමුණු නිසා සිතේ පහළවන විවිධ චේතනාවන්ය. නාම රූප මගින් සකස්කරදෙන අරමුණු පිලිබඳ විවිධ ලෙසින් මනස ක්‍රියාකිරීම විඥානය වේ. බුදුන් වහන්සේ පෙන්වා වදාළේ, මේ පංච උපාදානස්කන්ධයේ ඇතිවීම දුකබවය. එම දුකට මූලික වන්නේ පංච උපාදානස්කන්ධය මමය, මාගේය, මගේ ආත්මය යයි, එහි යථා ස්වරූපය -යථාබව නොමදැන, දිට්ඨියෙන්, තණ්හාවෙන් හා මානයෙන් අල්වා ගැනීම නිසාය. එම තණ්හාව සහමුලින්ම නැතිකර ගැනීම දුක නැතිවීම-නිවනය. සසර ගමන නිමාවීමය. **සටහන:** සංයු.නි: (3) ඛන්ධසංයුත්තයේ, සූත්‍රයන්හි පංච උපාදානස්කන්ධය විස්තරාත්මකව පෙන්වා ඇත. **ශබ්දකෝෂ: පා.සිං.ශ**: පි. 352: "**පඤ්චුපාදානක්ඛන්ධා:** උපාදානස්කන්ධ 5: කෙළෙස් සහිත රූප ආදීවූ ස්කන්ධ 5". **B.D:** p.185: **"Upādāṇa-kkhandha:** The 5 group of clinging… the 5 group of existence which form the objects of clinging".

▼ **පංච උපාදානස්කන්ධය,**11 ස් ආකාරයෙන් බැලිමෙන්, එයට ඇති තණ්හාව පහකර ගත හැකිවේ:1) **අනිච්ච** දෙයක් ලෙසින් -වෙනස්වී යනබව 2) **දුක** ගෙනදෙන දෙයක් ලෙසින් 3) **රෝගයක්-** ලෙඩක් ලෙසින් 4) **තුවාලයක්**-වනයක් ලෙසින් (නිතර පැරීම නිසා වේදනා ගෙනදෙන) 5) **උලක්**-කටුවක් ඇනුන ලෙසින් 6) **පිඩාකාරී** දෙයක් ලෙසින් 7) **ආබාධයක්** ලෙසින් 8) **අනුන් සතු** දෙයක් ලෙසින් 9) **පහසුවෙන්ම බිඳී** යන දෙයක් ලෙසින් 10) **හිස් දෙයක්** ලෙසින්- එහි මමය මාගේය කියා දෙයක් නැතිනිසා.  11) **අනාත්ම** ලෙසින්- තමාගේ පාලනයෙන් බැහැර නිසා. එලෙස,යෝනිසෝ මනසිකාරයෙන් බැලිය යුතුවේ.

**"…භික්ඛුනා පඤ්චුපාදානක්ඛන්ධා අනිච්චතො, දුක්ඛතො, රොගතො, ගණ්ඩතො, සල්ලතො, අඝතො, පරතො, පලොකතො, සුඤ්ඤතො, අනත්තතො යොනිසො මනසිකාතබ්බා". සටහන්**: * එසේ, 11 ස් ආකාරකින්, යෝනිසෝමනසිකාරයෙන් බැලීමෙන් සමථ භාවනාවද, විපස්සනා භාවනාව ද වඩාගැනීමෙන්, සම්මා ප්‍රඥාව ඇතිකර ගත හැකිවේ. ** එමගින් ඇතිවන ප්‍රතිලාභ: සතරමග සතර ඵල සාක්ෂාත්වීමය.1) සිල්වත් මහණ- ආරිය ශ්‍රාවකයා සෝතාපන්න වීම 2) සෝතාපන්න පුද්ගලයා සකදාගාමී වීම 3) සකදාගාමී පුද්ගලයා අනාගාමී වීම 4) අනාගාමී පුද්ගලයා අරහත්වයට පත්වීම 5) අරහත්වයට පත්වූ ආරියන්ට නැවත කිරීමට දෙයක් හෝ සපුරා ගැනීමට දෙයක් නොමැතිය. එහෙත්, රහතන්වහන්සේ මේ ජීවිතයේදීම ලැබෙන සුව විහරණය (දිට්ඨධම්මසුඛ විහරණය) පිණිස ඒලෙසින් භාවනාව වඩන බව සූත්‍රයේ පෙන්වා ඇත. **මූලාශ්‍ර**: සංයු.නි: (3 ): ඛන්ධවග්ග: 1.3.2.10-1.3.2.11

ශීලවන්ත හා සුතවන්ත සූත්‍ර, පි.323, ESN:22: Khandasamyutta:122.10 & 123.11: Virtuous, p. 1103.

▼ **පංචඋපාදානස්කන්ධය** පිළිබඳව යහපත් ලෙසින් දකිනා දන්නා විට දුක කෙළවර කරගත හැකිය. **බලන්න**: මහා දස ධර්ම ප්‍රශ්න.

▼ **පංච උපාදානස්කන්ධය** අවබෝධ කරගැනීම පිණිස ආරිය අටමග වඩාගත යුතුය. පංච උපාදානස්කන්ධය පිලිබඳ විශේෂ අවබෝධය ලබාගැනීමට, පිරිසිඳ දැන ගැනීමට, එය ගෙවීම පිණිස ( ක්‍ෂයකිරීමට), ප්‍රහාණය කිරීම පිණිස ආරිය අටමග සම්පූර්ණයෙන්ම වැඩිය යුතුයය. කවර ලෙසින්ද යත්: මේ සසුනේ මහණ විවේකය... විරාගය... නිරෝධය... ඇසුරුකළ, නිවනට නැමුන සිතින් යුතුව සම්මා දිට්ඨිය ආදී අංග 8 න් සමන්විත ආරිය අටමග වඩා ගත යුතුවේ. **"පඤ්චිමෙ භික්ඛවෙ උපාදානක්ඛන්ධා. කතමෙ පඤ්ච: රූපූපාදානක්ඛන්ධො, වෙදනූපාදාන ක්ඛන්ධො, සඤ්ඤූපාදානක්ඛන්ධො, සඞ්ඛාරූපාදානක්ඛන්ධො, විඤ්ඤාණූපාදානක්ඛන්ධො. ඉමෙසං ඛො භික්ඛවෙ, පඤ්චන්නං උපාදානක්ඛන්ධානං අභිඤ්ඤාය... පරිඤ්ඤාය... පරික්ඛයාය... පහානාය අරියො අට්ඨඞ්ගිකො මග්ගො භාවෙතබ්බො... ඉධ භික්ඛවෙ, භික්ඛු සම්මාදිට්ඨිං... සම්මාසමාධිං භාවෙති: විවෙකනිස්සිතං විරාගනිස්සිතං නිරොධනිස්සිතං වොස්සග්ගපරිණාමිං"**. (This Noble Eightfold Path is to be developed for direct knowledge of these five aggregates subject to clinging, for the full understanding of them, for their utter destruction, for their abandoning). **මූලාශ්‍ර:** සංයු.නි: (5-1): මහාවග්ග: මග්ගසංයුත්ත: ඔඝ වග්ග: 1.16 උපාදානස්කන්ධ සූත්‍රය**,** පි. 164, ESN: 45: Maggasamyutta: 178.8. Aggregates subject to clinging, p. 1725

▼**පංචඋපාදානස්කන්ධයට ඇලීම දුකය**: කෙනෙක් පංච උපාදාන ස්කන්ධය සතුටින් පිළිගනිනම් (මමය, මාගේය, මගේ ආත්මය යයි අභිනන්දනය කරයිනම්) ඔහු දුක පිළිගත් කෙනෙක්ය, දුකින් නො මිදුන කෙනෙක්ය යි බුදුන් වහන්සේ වදාළහ. එහෙත්, ධර්මය අවබෝධකරගත් තැනැත්තා පංච උපාදානස්කන්ධය සතුටින් පිළිගන් නැත, එහි යථාබව දන්නා ඔහු දුකින් මිදුන කෙනෙකි. **මූලාශ්‍ර:** සංයු.නි: (3 ): ඛන්ධසංයුත්ත: 1.1.3.8. අභිනන්දන සූත්‍රය, පි.82 , ESN: 22: Khandasamyutta: 29.8 Delight p. 1024

▼ **පංචඋපාදානස්කන්ධය ඇතිවීම දුක ඇතිවීමය**: පංචඋපාදාන ස්කන්ධයේ ඇතිවීම, පහළවීම, පැවතීම දුක ඇතිකරයි, කාය රෝගපීඩා ඇතිකරයි, මහළුබව, මරණය ඇතිකරයි. පංචඋපාදානස්කන්ධය ඇතිනොවන්නේ නම්, පහළ නොවන්නේ නම් දුක ඇතිනොවේ, රෝගපීඩා, මහළුවීම, මරණයට පත්වීමක් වෙන්නේ නැත, දුක සන්සිඳේ. **සටහන: ඛන්ධ සූත්‍රයේදී** බුදුන් වහන්සේ පංච උපාදානස්කන්ධය නම් දුක්ඛ ආරිය සත්‍ය යයි පෙන්වා ඇත. **මූලාශ්‍ර:** සංයු.නි: (3): ඛන්ධසංයුත්ත: 1.1.3.9 උප්පාද සූත්‍රය**,** පි.84, ESN: 22: Khandasamyutta: 30.9 Arising, p. 1024, සංයු.නි: (5-2): මහාවග්ග: සච්ච සංයුත්ත: 12.2.3 ඛන්ධසූත්‍රය, පි. 300, ESN: 56: Sacchasamyutta : 13.3 Aggregates, p. 2280

▼ **පංචඋපාදානස්කන්ධය බිඳෙන සුළුය:** පංචඋපාදානස්කන්ධය කැඩී බිඳී යන ස්වභාවයෙන් **(**අනිච්ච ස්වභාවය) යුක්තය. යම් කෙනක්හට එම අවබෝධ ඇත්නම්, තමාට පංචඋපාදානස්කන්ධය පාලනය කළ නොහැකිබව (ආත්මයක් නැති බව) ඔහුට වැටහේ. **මූලාශ්‍ර:** සංයු.නි: (3): ඛන්ධසංයුත්ත: 1.1.3.11 පභන්ඞගු සූත්‍රය**,** පි.86, ESN:22: Khandasamyutta: 32.11. The Fragile, p. 1025

▼ **පංචඋපාදානස්කන්ධයේ අනිච්ච බව අවබෝධ කළයුතුය**:පංච උපාදානස්කන්ධය මුළුමනින්ම අනිච්ච- අනිත්‍ය ස්වාභවයෙන් යුක්තය. එබව විදසුන් නුවණින් වටහාගන්නා නුවණැති පුද්ගලයා (ප්‍රඥාවන්තයා) , පංච උපාදානස්කන්ධය කෙරේ කළකිරේ. කළකිරිම-නිබිද්දාව නිසා විරාගය ඇතිවේ. විරාගය නිසා විමුක්තිය ඇතිවේ. ඒබව අවබෝධවූ විට දුකින් මිදුන බව, විමුක්තිය -නිවන ලැබූ බව නුවණින් දකී. **මූලාශ්‍ර:** සංයු.නි: (3): ඛන්ධසංයුත්ත: 1.1.2.1 අනිත්‍ය සූත්‍රය, පි.66, ESN:22: Khanda Samyutta, 12-1 Impermanent, p, 1018.

▼ **පංච උපාදානස්කන්ධය අස්ථිරය:** පොඩි ගොම පිඩුවක් තරම් වූ පුද්ගලික පැවතීමක් පංචඋපාදානස්කන්ධයේ නොමැත. පංච උපාදාන ස්කන්ධය චිරස්ථායි නොවේ, ස්ථිර නොවේ, සදාකලික නොවේ, විපරිණාමයට පත්වේ. එම අවබෝධය ඇතිව සසර දුක නැතිකර ගැනීම පිණිස බඹසර විසීමේ වැදගත්කම අවබෝධ කරගතයුතුය යි ගොම පිඩුව උපමාව දක්වමින් බුදුන් වහන්සේ වදාළහ. **බලන්න**: උපග්‍රන්ථය:5 **මූලාශ්‍ර:**සංයු.නි: (3): ඛන්ධසංයුත්ත: 1.2.5.4 ගොම පින්ඩුපම සූත්‍රය, පි. 274, ESN:22: Khandasamyutta: 96.4 A Lump of Cow dung, p. 1087.

▼ **ආධ්‍යාත්මික වර්ධනය** පිණිස, පංචඋපාදානස්කන්ධය ගැන පිරිසිඳව (පරිඥෙය්‍ය) අවබෝධ කර ගත යුතුවේ. **බලන්න**: පරිඥෙය්‍ය ධර්ම. **මූලාශ්‍ර:** දීඝ.නි : (3 ):11 දසුත්තර සූත්‍රය, පි. 483, EDN: 34: Dasuttara Sutta: Expanding Decades, p. 384

▼ **ශ්‍රැතවත් ආරිය ශ්‍රාවකයාට** පංච උපාදානස්කන්ධය ගැන යථා අවබෝධය ඇත. ඒ බව ඔහු මනා නුවණින් දකී: '**...මම නොවේ, මාගේ නොවේ, මාගේ ආත්මය නොවේ**'. එවිට, පංච උපාදානස්කන්ධය පිළිබඳව ඔහු කළකිරේ (නිබිද්දාව ඇතිවේ), එමගින්, ඇල්ම පහවේ (විරාගය ඇතිවේ). විරාගය ඇතිවීමෙන්, විමුක්තිය ඇතිවේ. එලෙස ඒ ලැබූ අරහත්වය පිණිස කළයුතු වෙනත් කිසිවක් නැත යයි ඔහු දැනගනි: **" ...රූපං...වෙදනං... සඤ්ඤං... සඞ්ඛාරෙ... විඤ්ඤාණං: 'නෙතං මම නෙසොහමස්මි න මෙ සො අත්තා ති' එවමෙතං යථාභූතං සම්මප්පඤ්ඤාය දට්ඨබ්බං...එවං පස්සං භික්ඛවෙ සුතවා අරියසාවකො රූපස්මිම්පි... වෙදනායපි...සඤ්ඤායපි...සඞ්ඛාරෙසුපි ... විඤ්ඤාණස්මිම්පි නිබ්බින්දති, නිබ්බින්දං විරජ්ජති විරජ්ජං විමුච්චති නාපරං ඉත්ථත්තායාති පජානාතී ති"** මූලාශ්‍ර: සංයු.නි: (3 ): ඛන්ධසංයුත්ත: 1.3.2.6 හා 1.3.2.7 පරිපුච්ඡිත සූත්‍ර, පි. 318, ESN:22: 118.6 & 119.7 Interrogation, p. 1102.

▲ **පංචකාම ගුණ** :පාලි: **පඤ්ච කාමගුණා-** five strands of sense-desire ලෝකයේ ඇති විසිතුරු දේ පංචකාම ගුණයන්ය (පස්කම් ගුණ). ඒවාට ඇති බැඳීම කාමයය. කාමලෝකයට, පස්කම් සැපයට ලෝක සත්ත්වයන්

බැඳතබන පංචකාම ගුණ: රූප (forms),ශබ්ද (sounds), ගඳ සුවඳ (odors), රසය (tastes) හා කාය ස්පර්ශ (tactile objects).මේවා ආරිය විනයේ කාමය ලෙසින් හඳුන්වන්නේ නැත, ඒවා කාමගුනයන්ය (objects of sensual pleasure) . මේවා පංච කාමවස්තු ලෙසින්ද පෙන්වා ඇත. **බලන්න**: කාමය. **මූලාශ්‍ර**: අංගු.නි: (4) 6 නිපාත: 6.2.1.9 නිබ්බේධික සූත්‍රය,පි.220,EAN:6: 63.9 Penetrative,p.355.

▼**පංචකාම ගුණ කවරේද?**: උත්තිය තෙරුන් පංචකාම ගුණ කවරේද? යයි විමසුවිට බුදුන් වහන්සේ මෙසේ පංචකාම ගුණ පෙන්වා ඇත**:** 1) **රූප**: ආශාව ඇතිකරණ, පියකරුවූ, සිත කැමතිකරණ, සිත්කලු, කාමයට පොළඹවන, සිත වශිකරන ඇසින් දකින රූප. (**චක්ඛුවිඤ්ඤෙය්‍යා රූපා ඉට්ඨා කන්තා මනාපා පියරූපා කාමූපසංහිතා රජනියා…**Forms cognizable by the eye that are desirable, lovely, agreeable, pleasing, sensually enticing, tantalizing, enticing). 2) **ශබ්ද (**sounds)**:** ආශාව ඇතිකරණ ...කණින් අසන සද්ද (**සොතවිඤ්ඤෙය්‍යා සද්දා**) 3) **ගඳ සුවඳ** (odor's): ආශාව ඇතිකරණ ...නාසයෙන් විඳින ගඳ සුවඳ (**ඝානවිඤ්ඤෙය්‍යා ගන්ධා)** 4) **රස** (tastes): ආශාව ඇතිකරණ... දිවෙන් විඳින රස (**ජිව්හාවිඤ්ඤෙය්‍යා රසා)** 5) **කයට දැනෙන ස්පර්ශ** (tactile objects): ආශාව ඇතිකරණ...කයෙන් විඳින පහස (**කායවිඤ්ඤෙය්‍යා ඵොට්ඨබ්බා**). පස්කම් ගුණයන් ප්‍රහීණය පිණිස ආරියඅටමග වැඩිය යුතුය. **සටහන්**: * සංයු.නි: (4) වේදනාසංයුත්ත :ලෝකකාමගුණවග්ග: 1.12.4 කාමගුණසූත්‍රයේ: කාමගුණ හා ඒවායින් මිදීම විස්තරාත්මකව පෙන්වා ඇත. ** අංගු.නි.(1): 1 නිපාත: චිත්ත පරියාදන වග්ගයේ සූත්‍රවල පංචකාමය විස්තර කර ඇත. **මූලාශ්‍ර:** සං.නි:(4): සළායතනවග්ග: වේදනාසංයුත්ත: 1.3.10 උත්තිය සූත්‍රය, පි. 63 හා 1.16 කාමගුණ සූත්‍රය**,** පි. 162, ESN:36: 30.10 Uttiya, p. 1636 & 176.6 Cords of Sensual pleasures, p. 1723.

▼ **පස්කම් ගුණයෝ කාම බන්ධනවේ**: බුදුන් වහන්සේ පෙන්වා ඇත්තේ පස්කම්ගුණ (කාමබන්ධන පස) '**ආරියවිනයේ දම්වැල, බැම්ම**' බවය. (bonds and fetters). කාම ගුණයන්ගේ ආදීනව නොදැන මිනිසුන් පස්කම්ගුණ පරිභෝග කරති, ඒවායින් මිදීමේ මග නොදනිති. පස්කම් සැප විඳින පුද්ගලයන් හට බ්‍රහ්මලෝක උත්පත්තිය (යළි උපත) ලැබිය නොහැක. අනාගාමි මගඵල සාක්ෂාත්වූ විට පංචකාමයට ඇති ආශාව ප්‍රහිනයවේ. **මූලාශ්‍ර:** දීඝ.නි:(1 ) 13 තෙවිජ්ජා සූත්‍රය, ඡෙදය28, පි.610, EDN: 13 Tevijja Sutta: The Threefold Knowledge-The Way to Brahma, p. 143.

▼ **කාමගුණ පිළිබඳ පූර්ණ අවබෝධය** ලැබීමට හා ඒවා ප්‍රහාණය පිණිස අරිය අටමග වැඩිය යුතුය. **මූලාශ්‍රය**:සංයු.නි: (5-1) :මහාවග්ග: මග්ග සංයුත්ත:1.16 කාමගුණ සූත්‍ර, පි.162.

▼ **මෙහි පෙන්වා** ඇත්තේ පංචකාම ගුණ ප්‍රහීණය කිරීම පිණිස සතර සතිපට්ඨානය වැඩිය යුතුබවය. **මූලාශ්‍රය:** අංගු.නි: (5) 9 නිපාත: 9.2.2.3 කාමගුණ සතිපට්ඨාන සූත්‍රය, පි.576.

▲ **පංච චේතෝඛීල:** පාලි: **පඤ්ච චෙතොඛීලා**- Five mental blockages පංච චේතෝඛීල ලෙසින් පෙන්වා ඇත්තේ ආධ්‍යාත්මික මගට හානි

ගෙනදෙන කරුණුවලටය- හානභාගිය ධර්මයන්ය. මේවා නිසා සිත තදබවට- මුරණ්ඩු බවට පත්වේ, වීරිය දුබල වේ. **බලන්න:** චේතෝඛිල, හානභාගිය ධර්ම. **සටහන**: පංචචේතෝඛිල: 1) ගුරුවරයා පිලිබඳ විශ්වාසය, පිළිගැනීම නොමැතිබව. 2) ධර්මය පිලිබඳ විශ්වාසය, පිළිගැනීම නොමැතිබව 3) සංඝයා පිලිබඳ විශ්වාසය, පිළිගැනීම නොමැතිබව 4) ශික්ෂාව -පුහුණුව පිලිබඳ විශ්වාසය, පිළිගැනීම නොමැතිබව 5) තමන් සමග සිටින සෙසු අය (සබ්‍රහ්මසරුන්) සමග තරහ සිතින්, ගැටුන සිතින් සිටීම. **බලන්න**: අංගු.නි: (3): 5 නිපාත: 5.5.1.5 චේතෝඛිල සූත්‍රය.

▲ **පංච චේතෝ විනිබන්ධන**: පාලි: **පඤ්ච චෙතසො විනිබන්ධා-**five bondage of the mind: පංච චේතෝ විනිබන්ධන ලෙසින් පෙන්වා ඇත්තේ සසරට බැඳ තබන අකුසල්ය. **බලන්න**: චේතෝ විනිබන්ධන, අකුසල.

▲ **පංච ඤාණ-**pancha nana: පංච ඤාණ- ඥානපඤ්චකය ලෙසින්ද පෙන්වා ඇත. අභිප්‍රඥාව- ඥාතාර්ත නුවණ, පරිප්‍රඥාව- තීරණාර්ථ නුවණ, ප්‍රහාණ ප්‍රඥාව- පරිත්‍යාගාර්ථ නුවණ, භාවනා ප්‍රඥාව- එකරාසාර්ථ නුවණ, සාක්ෂාත්ක්‍රියා ප්‍රඥාව- ස්පර්ශනාර්ත නුවණ, ඥානපඤ්චකය ය. **බලන්න:** ත්‍රිවිධ ප්‍රඥා. **මූලාශ්‍රය**: ඛු.නි: පටිසම්භිදා 1 :ඥාණකථා: 20-24 ඥානපඤ්චකය, පි. 188.

▲ **පංච ඥාණ සම්මාසමාධිය**:පාලි: **පඤ්ච ඤානීකො සම්මාසමාධි-** fivefold knowledge of right Samadhi: පංච ඥාණ සම්මාසමාධිය, උත්පාදයිතව්‍ය ධර්මයකි (Dhamma to be arise). **බලන්න**: උත්පාදයිතව්‍ය ධර්ම, සමාධිය.

▼ **පංචඥාන සම්මාසමාධිය ලැබීමේ ඵල:** 1) මේ සමාධිය ය මගින් වර්තමාන සැප විපාක ඇත, එමගින් අනාගතයෙහි සැප විපාක ඇත්තේය යන නුවණ ඇතිවීම: **(අයං සමාධි පච්චුප්පන්නසුඛො චෙව ආයතිඤ්ච සුඛවිපාකො ති, පච්චත්තඤ්ඤෙව ඤාණං උප්පජ්ජති-**This concentration is both present happiness and productive of future resultant happiness) 2) මේ සමාධිය ආරියවේ, නිරාමිසවේ(කෙලෙසුන්ගෙන් තොරය- ලෞකික (ආමිස) නොවේ-ලෝකෝත්තරය) යන නුවණ ඇතිවීම: **(අයං සමාධි අරියො නිරාමිසො ති පච්චත්තඤ්ඤෙව ඤාණං උප්පජ්ජති-** This concentration is Ariyan and free from worldliness). 3) මේ සමාධිය අලාමක -උතුම් පුද්ගලයන් විසින් පුරුදු කරන ලදය යන නුවණ ඇතිවීම: **(අයං සමාධි අකාපුරිසසෙවිතො ති පච්චත්තඤ්ඤෙව ඤාණං උප්පජ්ජති-**This concentration is practiced by the worthy) **සටහන: * අකාපුරිසෝ** - උතුම්: බුදු, පසේබුදු අරහත් ආදීන්. ** ප.සිංශ: පි. 22: **අකාපුරිස**: උත්තම පුරුෂයා, න+කාපුරිස : කාපුරිස-නින්දිත පුද්ගලයා. 4) මේ සමාධිය ශාන්තය, උතුම්ය (ප්‍රණීතය), පස්සදිය ඇතිකරයි, සිත එකඟබවට (ඒකග්ගතාව) පත්කරයි, අයහපත (අකුසල) පිණිස නොවේ; වෙනත් කෙනෙකුට මේ සමාධිය නැතිකිරීමට හෝ වලක්වාලීමට හැකියාව නැත යන නුවණ ඇතිවීම: **(අයං සමාධි සන්තො පණීතො පටිප්පස්සද්ධාලද්ධො එකොදිභාවාධිගතො න සඞ්ඛාර නිග්ගය්හවාරිතාවතො ති පච්චත්තඤ්ඤෙව ඤාණං උප්පජ්ජති-**This concentration is calm and perfect, has attained tranquillization, has

attained unification, and is not instigated, it cannot be denied or prevented) .5) යෝගියා: මම සතිසම්ප්‍රජන්‍යය ඇතිව මේ සමාධියට ඇතුලු වූ වෙමි, එසේම, එම සතිසම්ප්‍රජන්‍යය ඇතිවම සමාධි සමාපත්ති යෙන් නැගිටගතිමි යන නුවණ ඇතිවීම:(**සො ඛො පනාහං ඉමං සමාධිං සතො'ව සමාපජ්ජාමි, සතො වුට්ඨහාමි ති පච්චත්තඤ්ඤෙව ඤාණං උප්පජ්ජති-** I myself attain this concentration with mindfulness, and emerge from it with mindfulness).**මූලාශ්‍ර:** දීඝ.නි : (3):11 දසුත්තර සූත්‍රය,පි. 483, EDN: 34: Dasuttara Sutta: Expanding Decades, p. 384.

▲**පංච ධන**-Five wealth: ධර්මයේ, පංච ධන ලෙසින් පෙන්වා ඇත්තේ: ශ්‍රද්ධාව, ශීලය, ශ්‍රැතය, ත්‍යාග හා ප්‍රඥාවය. (faith, virtuous behavior, learning, generosity, wisdom). **ශ්‍රද්ධාධනය**: තථාගතයන් ගේ සම්බෝධිය පිළිගැනීම. **ශීලධනය**: පන්සිල් රැකීම. **ශ්‍රැතධනය:** ධර්මයේ බහුශ්‍රැතවීම. **ත්‍යාගධනය**: නොමසුරුව දන්දීම. **ප්‍රඥාධනය:** දුක නිමාකිරීම පිලිබඳ නුවණ තිබීම. **බලන්න**: පංච සම්පදා. **මූලාශ්‍ර**: අංගු.නි: (3): 5 නිපාත:5.1.5.7 පංච ධන සූත්‍රය, පි. 96, EAN:5: V:47.7 Wealth, p. 252.

▲ **පංච ධම්ම පුද්ගලයෝ-**Five kind of Dhamma persons: ධර්මයදැනගෙන, අකාර 5 කින් හැසිරෙන පුද්ගලයන් 5 දෙනක් ගැන මෙහි විස්තර කර ඇත: : 1. පර්යාප්ති බහුල පුද්ගලයා 2. සංඥාප්ති බහුල පුද්ගලයා 3. සජ්ජායනා බහුල පුද්ගලයා 4. විතක්ක බහුල පුද්ගලයා 5. ධම්මවිහාරි. **මූලාශ්‍ර:** අංගු.නි: (3): 5 නිපාත: අනාගතභය වග්ග: 5.2.3.3 හා 5.2.3.4 සූත්‍ර, පි.160.

▼ **පංචධම්ම පහසුවිහරණය පිණිස**- Five Dhamma for comfortable abiding : ගිලන් -මරණාසන්න සංඝයාට පහසු විහරණය පිණිස ධර්මතා 5ක් උපකාරීවන බව මෙහි පෙන්වා ඇත: 1) අශුභය 2) ආහාරයෙහි ප්‍රතිකූලබව 3) සියලු සංස්කාරයන්හි අනභිරතිය 4) සියලු සංස්කාරයන්හි අනිත්‍යබව 5) මරණ සතිය වැඩීම. **බලන්න**: ගිලන්බව. **මූලාශ්‍රය:** අංගු.නි: (3) 5 නිපාත: ගිලානවග්ග:5.3.3.1 ගිලානසූත්‍රය, පි.254.

▼ **පංච ධර්ම-ක්‍රමානුකූල පුහුණුව පිණිස**-Five Dhammas for gradual training: ධර්මය ක්‍රමානුකූලව පුහුණුවීම පිණිස පංච ධර්මතා (**පඤ්ච ධම්මා** ) උපකාරවන බව මෙහි පෙන්වා ඇත. ඒවා මගින්, යම්කිසි කරුණක් පිළිබඳව ස්ථිර විශ්වාසය ඇතිකර ගැනීමට- යහපත් ලෙසින් එම දෙය අවබෝධ කරගැනීම පහසුවේ. **"...පඤ්ච ඛො ඉමෙ භාරද්වාජ, ධම්මා දිට්ඨෙව ධම්මෙ ද්විධා විපාකා. කතමෙ පඤ්ච? සද්ධා, රුචි, අනුස්සවො, ආකාරපරිවිතක්කො, දිට්ඨිනිජ්ඣානක්ඛන්ති. ...ඉමෙ පඤ්ච ධම්මා... ද්විධා විපාකා..."**. මේ ධර්මයෝ පස් දෙනෙක්, මෙහිදිම, ආකාර 2 කින් විපාක ඇතිකරයි: 1) **ශ්‍රද්ධාව**: පිළිගැනීම, විශ්වාසය 2) **රුචිය**: කැමැත්තෙන්ම අනුමත කිරීම 3) **අනුශ්‍රවනය**: නැවත නැවත ඇසීම 4) **ආකාරපරිවිතක්ක**:තර්කකර, හේතු විමසාබලා ලබාගන්නා අවබෝධය 5) **දිට්ඨිනිජ්ජානඛන්ති**: යම් දිට්ඨියක්, මතයක්, මැනවින් මෙනෙහිකර (පරාවර්තනයකර) පිළිගැනීම. (There are five things, Bhāradvāja, that may turn out in two different ways here and now. What five? Faith, approval, oral tradition, reasoned cogitation, and reflective

acceptance of a view). එම කරුණු 5 අනුව යම්කිසි දෙයක් පිළිගැනීමේදී, විධි 2කට අනුව එය සිදුවිය හැකිය: 1) යමකිසි දෙයක් ගැන ශ්‍රද්ධාව ඇතිව, කැමත්ත ඇතිව මැනවින් විමසා බලා පිළිගත්තාවුවද, එය හිස්, ඵලයක් නැති අසත්‍යයක් වියහැකිය.2) යමකිසි දෙයක් ගැන නැතිව, කැමැත්ත නැතිව, මැනවින් විමසා බලා නො පිළිගත්තාවුවද, ඒ දේ සිධාන්තසහිත, සත්‍ය, නිවැරදි දෙයක් විය හැකිය. එමනිසා, සත්‍ය ආරක්ෂා කිරීමට කැමති නුවණැති පුද්ගලයෙක්: **"මේ දේ පමණක් සත්‍යයවේ, අනිත් හැම අසත්‍ය යයි'**,තීරණයකට පැමිණීම සුදුසු නැත යයි බුදුන් වහන්සේ වදාළහ. **සටහන:** කාපටික භාරද්වාජ බ්‍රහ්මණ මානවකයාට, ධර්මයට පැමිණෙන ක්‍රම විධිය විස්තරකරදීම පිණිස මේ සූත්‍රය දේශනා කර ඇත. **බලන්න:**ක්‍රමානුකූලව පුහුණුවීම. **මූලාශ්‍ර:**ම.නි: ( 2 ): 2.5.5. චඞ්කී සූත්‍රය, පි. 672, EMN: 95 Cankī Sutta, p. 704.

▲ **පංච නීවරණ:** පාලි: **පඤ්ච නීවරණානි** -Five hindrances:පංච නීවරණ -පස් නීවරණ යනු ධර්ම මාර්ගය අවහිර කරණ අකුසලයන්ය: කාමච්ඡන්දය, ව්‍යාපාදය, ථීනමිද්ධය, උද්දච්ච කුක්කුච්ච, විචිකිච්චා. **බලන්න:** නීවරණ.

▼**පංච නීවරණ** ආධ්‍යාත්මික මග අවහිර කරයි, ඒවා පහාතබ්බ ධර්මතාය. **" කතමෙ පඤ්ච ධම්මා පහතබ්බා? පඤ්ච නීවරණානි: කාමච්ඡන්දනීවරණං, බ්‍යාපාදනීවරණං, ථීනමිද්ධනීවරණං, උද්ධච්චකුක්කුච්චනීවරණං, විචිකිච්ඡානීවරණං" බලන්න:** පහාතබ්බ ධර්ම. **මූලාශ්‍ර:** දීඝ.නි : (3): 11 දසුත්තර සූත්‍රය, පි. 483, EDN: 34: Dasuttara Sutta: Expanding Decades, p. 384

▼ **පංච නීවරණ ප්‍රහානය** (පඤ්චඞ්ගවිප්පහීනො) ආරිය වාසස්ථාන ලැබීමට හේතුවේ. **බලන්න**: ආරිය වාසස්ථාන, පඤ්චාඞ්ගවිප්පහීනො.

▼ **පංච නීවරණ**, සිත කිලිටිකරණ, ප්‍රඥාව දුබල කරන ධර්මතාය, උප කෙලේසයෝය. භාවනාව වඩා ඡාන සාක්ෂාත් කරගැනීමෙන් පංචනිවරණ පහවේ. නිවරණ පහකර සිත පිරිසුදුබවට පත්කරගැනීමේ ක්‍රම විධිය: " වනඅරණකට හෝ ගස්මුලකට හෝ හිස්ගෙයකට හෝ පැමිණි භික්ෂුව, දෙපා හරස්අතට තබාගෙන වාඩිවී; කය ඍජුව තබාගෙන, සිහිය පෙරමුණකරගෙන බවුන්වඩයි. a) ලෝකය පිලිබඳ තන්හාව අතහැර, තණ්හා විරහිත පිරිසිදු සිතකින් වාසය කරයි. b) ව්‍යාපාදය හා තරහ අතහැර, පිරිසිදු සිතෙන්, සියලු සත්ත්වයන්ගේ සුභසාධනය කෙරෙහි දයාවන්තව -මෙත්තාව ඇතිව වාසය කරයි. c) උදාසීනබව හා කුසිතකම පහකර පිරිසුදු සිතකින්, ආලෝක සංඥාව හා සති සම්ප්‍රජන්‍යය සහිතව වාසය කරයි d) නොසන්සුන්කම හා පසුතැවීම අතහැර, පිරිසිදු සිත ඇතිව, ඇතුළෙහි ශාන්තබවින් වාසය කරයි e) සැකය පහකර, පිරිසිදු සිතෙන් කුසලධර්ම පිලිබඳ නිරවුල්ව වාසය කරයි". **මූලාශ්‍ර**: අංගු.නි:(6 ):10 නිපාත,: උපාලි වගග : 10.2.5.9. උපාලි සූත්‍රය,පි.390, EAN:10: 99.9 Upaali, p. 538.

▼ **පංචනිවරණ** ඇතිවීමට හේතුව ත්‍රිවිධ දුශ්චරිතයය, පංචනිවරණ නිසා අවිද්‍යාව පෝෂණය වේ. **බලන්න**: අවිද්‍යාව.

▲ **පංච ප්‍රාධානිකඅංග**: පාලි: **පඤ්ච පධානියඞ්ගානි-** Five factors of endeavor: පංච ප්‍රාධානික අංග ලෙසින් පෙන්වා ඇත්තේ ප්‍රධන් වීරිය

වඩන භික්ෂුව සතු ගුණ පිලිබඳවය. එම ධර්මතා ආධ්‍යාත්මික මාර්ගය දියුණු කරගැනීමට බොහෝ උපකාර වන (බහු උපකාර) ධර්මවේ: **" කතමෙ පඤ්ච ධම්මා බහුකාරා? පඤ්ච පධානියඞ්ගානි: ඉධාවුසො භික්ඛු සද්ධො හොති සද්දහති තථාගතස්ස බොධිං: ඉති පි සො භගවා අරහං සම්මාසම්බුද්ධො විජ්ජාචරණ සම්පන්නො සුගතො ලොකවිදූ අනුත්තරො පුරිසදම්මසාරථි සත්ථා දෙවමනුස්සානං බුද්ධො භගවා'ති, අප්පාබාධො හොති අප්පාතඞ්කො සමවෙපාකිනියා ගහණියා සමන්නාගතො නාතිසීතාය නාච්චුණ්හාය මජ්ඣිමාය පධානක්ඛමාය, අසඨො හොති අමායාවී යථාභූතං අත්තානං ආවිකත්තා සත්ථරි වා විඤ්ඤූසු වා සබ්‍රහ්මචාරීසු, ආරද්ධවීරියො විහරති අකුසලානං ධම්මානං පහානාය කුසලානං ධම්මානං උපසම්පදාය ථාමවා දළ්හපරාක්කමො අනික්ඛිත්තධුරො කුසලෙසු ධම්මෙසු, පඤ්ඤවා හොති උදයත්ථගාමිනියා පඤ්ඤාය සමන්නාගතො අරියාය නිබ්බෙධිකාය සම්මා දුක්ඛක්ඛයගාමිනියා. ඉමෙ පඤ්ච ධම්මා බහුකාරා".**බහුඋපකාර ධර්ම පහ **කුමක්ද?** ප්‍රාධානික අංග පහය: එම භික්ෂුව 1) සැදැහැ-ශ්‍රද්ධාව ඇත්තේය. භාග්‍යවතුන් වහන්සේගේ නව ගුණ පිළිගනී, බෝධිය අදහයි. 2) රෝග නැත-නිරෝගී, නිදුක්ව සිටී. ඉතා ශීත නැති, ඉතා උෂ්ණය නැති, මධ්‍යම වූ, ප්‍රධන් වීරිය වැඩීමට සුදුසුවූ, සම ලෙස ආහාර පැසවන (දිරවන) උදරයක් ඇතිව සිටී 3 ) තමන්ගේ වැරදි ක්‍රියා ශාස්තෘන් වහන්සේ ට හෝ තමන් හා වෙසෙන සබ්‍රහ්මචාරීන් හට හෝ නියම ලෙසින් හෙළි කරන්නේය -අවංකය. කපටිකම් හා රැවටීම් (සටකපට හා මායා) නැත. 4) කුසල් කිරීමට බහා නොතැබූ වීරිය ඇත. අකුසල් පහ කර ගැනීමට, කුසල් ඇති කර ගැනීමට පිරිපුන් වීරිය ඇතිව වාසය කරයි. කෙළෙසුන් දැවීමට සමත්, දුක නැතිකිරීමට හැකි පිරිසුදුවූ නුවණ ඇත 5) සංස්කාර යන්ගේ ඇතිවීම, ඒවායේ නැතිවීම පිරිසිඳ දකින්නට හැකි ආරිය ප්‍රඥාව (සමුදය හා වය නුවණ) ඇත. **බලන්න**: බහු උපකාර ධර්ම. **මූලාශ්‍ර:** දීඝ.නි : (3 ): 11 දසුත්තර සූත්‍රය, පි. 483, EDN: 34: Dasuttara Sutta: Expanding Decades, p. 384.

▲**පංච බැමි**- Five Ties: පංච බැමි යනු කෙනෙක් සසරට බැඳ තබන රාග, දෝස, මෝහ, මාන, දිට්ඨි යන ආසවයන්ටය, ඒවා තදබල බැමිය. **බලන්න**: සතර යොග.

▲ **පංච භය හා වෛර:** පාලි: පඤ්චභයානි වෙරානි- five perils and enmities: ධර්මයට අනුකූල නොවන ලෙසින් ජීවිතය ගෙන යාම නිසා පංච භය හා වෛර (සතුරුබව) ඇතිවේ. ලෞකික ජීවිතයක් ගෙනයන පුද්ගලයෙකුට ඇති පස් ආකාරවූ භය හා වෛර, (**පඤ්ච විතෙතා ත්‍රාසභයයො** හා **අකුශල වෛරයො**) ඇතිවන්නේ පංච ශිලය නොරකින නිසාය. එම අකුසල නිසා කෙනෙකුගේ මෙලොව ජීවිතයටද පරලොව ජීවිතයන්ටද අයහපත් විපාක ඇතිවේ, මානසික වේදනා ඇතිවේ, දුර්මුඛ බවට (අධෛර්යයට) පත්වේ. **සටහන්:** * පංච භය හා සතුරුකම් (**පඤ්ච විතෙතා ත්‍රාසභයයො අකුශල**) පංචශිලයට විරුද්ධ කරුණුය ** මොලොව දීම පංච භය හා වෛර ප්‍රහීණය කරගත් පුද්ගලයාට සෝතාපන්නබවට අවශ්‍ය අංග 4 සම්පුර්ණකර ගැනීමට හැකියාව ඇත.එමගින්, ආරියන්‍යාය (හේතුඵල දහම) අවබෝධ කරගැනීමේ හැකියාව ලබන ඔහුට අරහත්මග ඵල සාක්ෂාත් කරගත හැකිවේ.

**බලන්න:** සෝතාපන්න, ආරියනාාය. **මූලාශ්‍ර:** අංගු.නි: (6 ): 10 නිපාත, 10.2.5.2. භය සූත්‍රය,පි.354, EAN:10: 92-2. Enmity, p.533.

▲ **පංචාලචන්ඩ දේවපුත්‍ර-** Panchalachanda devaputtha:මේ දෙව්පුත්, බුදුන් වහන්සේ බැහැදැකීම හා නිවන පිලිබඳව බුදුන් වහන්සේ ඔහුට දුන් උපදෙස් මෙහි දක්වා ඇත. **මූලාශ්‍රය:** සංයු.නි: (1) සගාථවග්ග: දේවපුත්‍ර සංයුත්ත: 2.1.7 පංචාලචන්ඩ සූත්‍රය, පි.118.

▲ **පංච රාජ-** Five kings: මෙහිදී පෙන්වා ඇත්තේ පසේනදී කෝසල ඇතුළු රජවරුන් පස් දෙනෙක්, බුදුන් වහන්සේ හමුව, කාමවස්තුන් පිළිබඳව විමසීමය. බුදුන් වහන්සේ වදාළ ධර්මය, එම පිරිසේ සිටි චන්දනංගලික උපාසකයාට අවබෝධවී, ඒතුමා බුදුගුණ වර්ණනාකිරිමද, ඔහු ගැන ප්‍රසාදයට පත් පස් රජවරු, ඔහුට උතුරු සළු 5ක් දීම, ඒ උපාසක, එම උතුරුසළු බුදුන් වහන්සේට පුජාකිරිම මෙහි විස්තර කර ඇත. **මූලාශ්‍රය**: සංයු.නි: (1) සගාථවග්ග: කෝසලසංයුත්ත:3.2.2 පංචරාජ සූත්‍රය, පි.174

▲**පංච වග්ගිය භික්ෂු**-Panchavaggiya Bhikkhu: පංච වග්ගිය භික්ෂු - පස්වග මහණුන්, බෝසතුන් (සිද්ධාර්ථ තවුසා) බුදුවීමට පෙර, උන්වහන්සේට ඇප උපස්ථාන කළ පස්වග තවුසන්ය: කොණ්ඩඤ්ඤ, වප්ප, භද්දිය, මහානාම හා අස්සජි තෙරුන්ය. ධම්මචක්කපවත්තන සූත්‍රය අසා බුදු සසුනේ පළමු පැවිදි පස්නම වුහ, අඤ්ඤාකොණ්ඩඤ්ඤ තෙරුන් සෝතාපන්නබව ලැබුහ. අනත්තලක්ඛණ සූත්‍රය අසා පස්නම අරහත්වයට පත්වුහ. බුදුන් වහන්සේගේ පළමු අරහත් ශ්‍රාවකයෝ ඒ පස්නමය. **බලන්න**: උපග්‍රන්ථය:1. **මූලාශ්‍ර**: ධම්මචක්කපවත්තන සූත්‍රය, අනත්ත ලක්ඛණ සූත්‍රය, සංයු.නි (3) ඛන්ධසංයුත්ත:1.2.1.7 පංච වග්ගිය සූත්‍රය, වින.පි:මහාවග්ග:1: මහාඛන්ධක: 14 පංච වග්ගිය කථා, පි. 90.

▲ **පංච විමුක්ති ආයතන-** Five bases of deliverance: විමුක්තිය පිණිස-නිවන පිණිස හේතුවන ධර්මතා 5, පංච විමුක්ති ආයතන ලෙසින් පෙන්වා ඇත.මේවා ආධ්‍යාත්මික මාර්ගය වර්ධනය කර ගැනීම පිණිස - විශේෂ නුවණින් (ඥාතපරිඥාවෙන් විශේෂයෙන් දතයුතු- අභිඥෙයිය ධර්ම වේ.**බලන්න:** අභිඥෙයිය ධර්ම. **පංච විමුක්ති ආයතන:** 1) **පළමු ආයතනය:** ගුරුවරයෙක් වෙතින් භික්ෂුවක් ධර්මය අසයි (ධර්ම ශ්‍රවනය). ඒ ධර්මයේ අරුත් හා ධර්ම කරුණු අවබෝධ කරගන්නා ඔහුට ප්‍රමෝදය ඇතිවේ. ප්‍රමෝදය නිසා ප්‍රීතිය හටගනී. සිත ප්‍රීතියට පත් වූවිට නාමකය සන්සිඳේ. කය සන්සිඳුවූ විට සිත සුව පත්වේ. සුවපත් සිත එකඟ බවට - සමාධියට පත්වේ. එලෙස ධර්ම ශ්‍රවණය මගින් සමාධිය ලබයි. (...**තස්ස අත්ථපටිසංවෙදීනො ධම්ම පටිසංවෙදීනො පමුජ්ජං ජායති පමුදිතස්ස පීති ජායති, පීතිමනස්ස කායො පස්සම්භති පස්සද්ධකායො සුඛං වෙදෙති, සුඛිනොචිත්තං සමධියති).** 2) **දෙවෙනි ආයතනය:** භික්ෂුව තමන් ඇසු පුරුදු පුහුණු කල ධර්මය, අන්‍යන්ට දේශනා කරයි-ධර්ම දේශනාව (**ධම්මං විත්ථාරෙන පරෙසං දෙසෙති**). එසේ කරනවිට, ධර්මයේ අරුත් හා ධර්ම කරුණු අවබෝධ කරගන්නා ඔහුට ප්‍රමෝදය ඇතිවේ. ප්‍රමෝදය නිසා ප්‍රීතිය හටගනී. සිත ප්‍රීතියට පත් වූවිට නාමකය සන්සිඳේ. කය සන්සිඳුවූ විට සිත සුව පත්වේ. සුවපත් සිත එකඟ බවට - සමාධියට පත්වේ. එලෙස, ධර්මය දේශනා කිරීමෙන් සමාධිය ලබයි. 3) **තෙවෙනි ආයතනය:** භික්ෂුව තමන් ඇසු පුරුදු පුහුණු කල ධර්මය පුන පුනා

සජ්ජායනා කරයි (**සජ්ඣායං කරොති**). එසේ කරනවිට, ධර්මයේ අරුත් හා ධර්ම කරුණු අවබෝධ කරගන්නා ඔහුට ප්‍රමෝදය ඇතිවේ. ප්‍රමෝදය නිසා ප්‍රීතිය හටගනී. සිත ප්‍රීතියට පත් වූවිට නාමකය සන්සිඳේ. කය සන්සිඳුවූ විට සිත සුව පත්වේ. සුවපත් සිත එකඟ බවට - සමාධියට පත්වේ. එලෙස, ධර්මය සජ්ජායනා කිරීමෙන් සමාධිය ලබයි. 4 ) **සිව්වෙනි ආයතනය:** භික්ෂුව තමන් ඇසූ පුරුදු පුහුණු කල ධර්මය පුන පුනා ආවර්ජනය කරයි. මනසින් විමසා බලයි (**මනසානුපෙක්ඛති**). එසේ කරනවිට, ධර්මයේ අරුත් හා ධර්ම කරුණු අවබෝධ කරගන්නා ඔහුට ප්‍රමෝදය ඇතිවේ. ප්‍රමෝදය නිසා ප්‍රීතිය හටගනී. සිත ප්‍රීතියට පත් වූවිට නාමකය සන්සිඳේ. කය සන්සිඳුවූ විට සිත සුව පත්වේ. සුවපත් සිත එකඟ බවට - සමාධියට පත්වේ. එලෙස, ධර්මය ආවර්ජනා කිරීමෙන් සමාධිය ලබයි. **5) පස්වෙනි ආයතනය:** භික්ෂුව තමන් පුරුදු පුහුණු කල එක්තරා සමාධියක් (කමටහනක්) පුන පුනා ප්‍රඥාවේන් මැනවින් විමසා බලයි. (**සුප්පටිවිද්ධං පඤ්ඤාය**). එසේ කරනවිට, ධර්මයේ අරුත් හා ධර්ම කරුණු අවබෝධ කරගන්නා ඔහුට ප්‍රමෝදය ඇතිවේ. ප්‍රමෝදය නිසා ප්‍රීතිය හටගනී. සිත ප්‍රීතියට පත් වූවිට නාමකය සන්සිඳේ. කය සන්සිඳුවූ විට සිත සුව පත්වේ. සුවපත් සිත එකඟ බවට - සමාධියට පත්වේ. එලෙස, ධර්මය ආවර්ජනා කිරීමෙන් සමාධිය ලබයි. **මූලාශ්‍ර:** දීඝ.නි : (3 ): 11 දසුත්තර සූත්‍රය, පි. 483, EDN: 34: Dasuttara Sutta: Expanding Decades, p. 384, අංගු.නි: (3): 5 නිපාත: 5.1.3.6 විමුක්තිආයතන සූත්‍රය, පි. 54, EAN: 5: 26.6 Liberation, p. 243.

▲**පංචසිඛ ගාන්ධර්ව පුත්‍ර-**Pañcasikha, son of the gandhabbas: පංචසිඛ ගාන්ධර්ව-පන්සිළු, දිව්‍ය සංගීත ගායකයෙක් ලෙසින් විස්තර කරඇත. **බලන්න:** දේවලෝක: ගාන්ධර්ව දේව නිකාය. මෙතුමා, බුදුන් වහන්සේ හමුව, පිරිනිවන පිලිබඳ ඇසූ ප්‍රශ්න මෙහිදී විස්තර කර ඇත. **මූලාශ්‍රය**: සංයු.නි: (4) සළායතනවග්ග: වේදනාසංයුත්ත: 1.12.6 පංචසිඛප්ඤහ සූත්‍රය, පි.240.

▼ **පංචසිඛ ගාන්ධර්ව පුත්‍ර** බුදුන් වහන්සේ බැහැදැක තව්තිසා දෙව් සභයේදී ,බුදුගුණ වැනිම, බුදුන් වහන්සේගේ ශ්‍රාවකයන්, මරණින් මතු දෙව්ලොව පහළවීම පිලිබඳ විස්තර, සක්දෙව්දු බුදු ගුණ වැනිම ආදී විස්තර මෙහි දක්වා ඇත. **මූලාශ්‍රය**:දීඝ.නි: (2) 6 මහා ගෝවින්ද සූත්‍රය, පි.350.

▲ **පංච සම්පදා-** Pancha sampada: පංචසම්පදා- පංච සම්පත් ලෙසින් මෙහි පෙන්වා ඇත්තේ: ශ්‍රද්ධා, ශිල, ශ්‍රැත, ත්‍යාග හා ප්‍රඥාවය. මේවා ඉන්ද්‍රිය හා බල ධර්මතාය. **බලන්න**: පංචධන. **මූලාශ්‍රය**: අංගු.නි: (3) 5 නිපාත: මුන්ඩරාජවග්ග: 5.1.5.6 පංචසම්පදා සූත්‍රය, පි.104.

▲ **පංචශිලය** -Five precepts: බොදු ගිහියන් රකින සිල්පද පහ-පංච ශික්ෂාපද- පංචශිලය-පන්සිල්: 1 ප්‍රාණඝාතය නොකිරීම 2 සොරකම නොකිරීම 3 කාමයෙහි වරදවා නොහැසිරීම 4 බොරුනොකීම 5 අප්‍රමාදය ඇතිකරන රහමෙර ගැනීමෙන් වැලකීමය. **සටහන්:** සංයු.නි: (2): නිදානවග්ග: ධාතුසංයුත්ත:2.3.3 පන්චසිඛපද සූත්‍රයේ: පන්සිල් පද රකින අය එකිනෙකා හා සැසදෙනබව පෙන්වා ඇත.** සංයු.නි (4): සළායතනවග්ග: මතුගාමසංයුත්ත:3.2.11. පංචශිල සූත්‍රය: පන්සිල් රැකීමෙන් ස්වර්ගයේ උපත ලබන බව පෙන්වා ඇත.

▼ **පන්සිල් වැඩීමෙන්** -පස්පව් ප්‍රහිනය කිරීම නිසා, පස් බිය හා එදිරිවාදිකම් 5 කින් මිදිය හැකිබව මේ සූත්‍රයේ පෙන්වා ඇත. එවිට, දුගතියක ඉපදීම නැතිකරගත හැකිවේ. **බලන්න**:පංච භය හා වෛර. **මූලාශ්‍ර**: අංගු.නි: (6): 10 නිපාත, 10.2.5.2. භය සූත්‍රය,පි.354, EAN:10: 92.2. Enmity, p.533.

▼ **පන්සිල් රැකීම** නිසා සුගතියේ උපත ඇතිවන බව මෙහි පෙන්වා ඇත. **මූලාශ්‍රය:** සංයු.නි: (4) සළායතනවග්ග: මාතුගාමසංයුත්ත: 3.2.11 පංචශිල සූත්‍රය, පි. 490.

▲ **පංච සේඛබල** -Five trainee powers: පංච සේඛබල -පංච සෙඛ බලානි ලෙසින් පෙන්වා ඇත්තේ සේඛබල 5ය : 1) ශ්‍රද්ධාබලය 2) හිරිබලය 3) ඔත්තප්ප බලය 4) වීරියබලය 5) ප්‍රඥාබලය. **බලන්න**: සේඛ හා අසේඛ. **සටහන:** මෙහිදී සේඛ ලෙසින් පෙන්වා ඇත්තේ සෝතාපන්න සිට අරහත්මග ලැබූ ආරියපුද්ගලයන්ය. **මූලාශ්‍ර:** අංගු.නි : (3 ): 5 නිපාත: 5.1.1.1. හා 5.1.1.2 සූත්‍ර, පි. 24, EAN:5: The Trainee's Powers- 1.1.In Brief, p. 238.

▲ **පංචස්කන්ධය**-Five aggregates: පංචස්කන්ධය නම් කෙලෙස් රහිත රූප, වේදනා, සංඥා, සංඛාර හා විඥානය යන ස්කන්ධ 5 ය. මේවා උපාදාන රහිත නිසා පංචස්කන්ධය ලෙසින් පෙන්වා ඇත. රහතුන් දරන්නේ මේ ස්කන්ධ පහය. **බලන්න**: රහතන්වහන්සේ.

**පච**

▲ **පචලායමානං නිසින්නං** -Pachalayamanan nisinna: මෙයින් පෙන්වා ඇත්තේ, නිදිබරව සිටීමය. භාවනාවේ යෙදී සිටින විට නිදිමත ඇතිවේ නම්, ආලෝක සංඥාව මෙනෙහි කිරීමෙන් නිදිමත පහවේ. **බලන්න:** ආලෝක සංඥාව.

▲ **පච්චෙකබුද්ධ (පාලි): පසේබුදු**-Paccekabuddha: ස්වකිය උත්සාහයෙන් සම්බෝධිය ලබාගෙන උතුම් විමුක්තිය සාක්ෂාත් කරගත් මුණිවරයා පච්චේකබුදුන් වහන්සේය- පසේබුදුවරයාය. සම්මා සම්බුදු හා පසේබුදු අතර ඇති වෙනස: පසේබුදුන් හට සසරදුක නිමාකරගැනීම පිණිස දහම් දෙසීමට හා බුදුසසුන පිහිටුවීමට හැකියාව නොමැත. බුදුසසුන ලෝකයේ නොපවතින කාලයන්හි පසේබුදුවරයන් ලෝකයේ පහළවේ. **සටහන්**: * විස්තර පිණිස **බලන්න**: ඛු.නි: අපදාන: පච්චේක බුද්ධ අපදානය.** පසේබුදුවරයා, දසආරිය පුද්ගලයන් ගෙන් එක් උතුමෙකි. **බලන්න**: ආහුනෙය්‍යා පුග්ගල, උත්තම දස පුද්ගලයෝ. ** පසේබුදුවරු, ඉසිවරුන්ය. **බලන්න**: ඉසිවරු.**ශබ්දකෝෂ: පාසිශ**: පි.350: 'පච්චෙක-වෙනම**,** පසේ බුදුරජ, පච්චෙකමුණි'. **BD**: p. 225: "pacceka-buddha: an 'Independently Enlightened One; or separately Enlightened One…comprehends the truth independent of any teacher, by his own effort". **PTS:** p.1112: "pacceka-buddha who attain to complete enlightenment, but do not preach the way of deliverance to the world".

▼**පන්සියක් පසේබුදුහු** බොහෝකලක් ඉසිගිලි පව්වේ වාසයකල බව බුදුන්වහන්සේ සංඝයාට වදාළහ. "...එම උතුමෝ, භව තණ්හාව අවසන්

කළෝය, මහා ආනුභාව ඇත්තෝය. එම පසේබුදුන් 500ක් දෙනා වහන්සේ ඇතුළු සියලු පසේබුදුවරු සියලු කෙලෙස් නිමවා (භවය ක්‍ෂය කර) ස්කන්ධ පරිනිර්වානයෙන් පිරිනිවන්පෑහ. මහා ආනුභාව ඇති ඒ මහා ඉසිවරුන්ට නමස්කාර කරන්න": **" එතෙ ච අඤ්ඤෙ ච මහානුභාවා - පච්චෙකබුද්ධා භවනෙත්තිඛීණා තෙ සබ්බසඞ්ගාතිගතෙ මහෙසී- පරිනිබ්බුතෙ වන්දථ අප්පමෙය්‍යා'ති".** **සටහන:** 500ක් පසේබුදු වරුන්ගේ නම් සූත්‍රයේ පෙන්වා ඇත. **මූලාශ්‍ර**: ම.නි: (3 ): 3.2.6 ඉසිගිලි සූත්‍රය, පි. 222, EMN:116 Isigili Sutta, p. 847.

▼**බුදුවරු දෙදෙනෙකු පිළිබඳව** බුදුන්වහන්සේ වදාළහ:එනම්: තථාගත අරහත් සම්මා සම්බුද්ධයන් වහන්සේ හා පසේබුදුන් වහන්සේ ය. **මූලාශ්‍ර:** අංගු.නි: (1):2 නිපාත: පුග්ගල වග්ග: 2.2.6.5 සූත්‍රය,පි.184, EAN:2: People: 56.5,p. 66. **සටහන: බලන්න:** EAN: note : 292, p. 595: පුග්ගල ප්‍රඥාප්තියේ පසේබුදුන්වහන්සේ පිලිබඳ මෙසේ දක්වා ඇත: "*Paccekabuddha* is defined at Pp 14,16–20 , as 'a person who, in regard to things not heard before, awakens to the [four noble] truths by himself but does not attain all-knowledge regarding them or mastery over the powers" (*ekacco puggalo pubbe ananussutesu dhammesu sāmaṃ saccāni abhisambujjhati; na ca tattha sabbaññutaṃ pāpuṇāti, na ca balesu vasībhāvaṃ, ayaṃ vuccati puggalo paccekabuddho*)

▼ **පසේබුදුවරු සිහිකර ස්තූප පූජා කිරීම සුදුසුය**: පසේබුදුවරු සිහිකොට ථූප-ස්තූප සකස්කර පුදපූජා ගරුකිරීම සුදුසුයයි බුදුන් වහන්සේ වදාළහ. එම ස්තූප දැක වැඳ නමස්කාර කරන සැදැහැතියන්ගේ සිත් ශාන්තවේ, මරණින් මතු සුගතියේ- දේවලෝකයේ යළි උපත ලැබීමට හේතු වාසනා ඇත. **"කිඤ්චානන්ද අත්ථවසං පටිච්ච පච්චෙකසම්බුද්ධො ථූපාරහො? අයං තස්ස භගවතො පච්චෙකසම්බුද්ධස්ස ථූපොති...බහුජනා චිත්තං පසාදෙන්ති. තෙ තත්ථ චිත්තං පසාදෙත්වා කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපජ්ජන්ති".** **මූලාශ්‍ර**: දීඝ.නි: (2): 3 මහා පරිනිබ්බාන සූත්‍රය -ඡෙදය 97, පි.125, EDN 16:Mahāparinibbāna Sutta, p.171.

▼**වෙනත් මූලාශ්‍ර: 1** "The Paccekabuddha is an important figure in the Buddhist tradition who exemplifies the ascetic and introspective tendencies of the Buddhist and pre-Buddhist Indian heritage. Most of the textual references—canonical as well as commentarial—concerned with the Paccekabuddha relate the popular stories which describe the individual Paccekabodhisatta's search for enlightenment, rather than elaborate on the doctrinal aspects of the phenomenon of the solitary enlightened one": "**The Paccekabuddha: A Buddhist Ascetic"-** A study of the concept of the Paccekabuddha in Pali and Commentarial Literature by Ria Kloppenborg-Wheel 305-307, BPS, 2006.

▲ **පච්චේක බ්‍රහ්ම**- Pacceka Brhma: බ්‍රහ්මලෝකයේ පහළවන බ්‍රහ්ම කොට්ඨාශයක් පච්චේක බ්‍රහ්ම- independent brahmā , ලෙසින් හඳුන්වයි. තුදු බ්‍රහ්ම, සුබ්‍රහ්ම, සුද්ධාවාසබ්‍රහ්ම, පච්චේක බ්‍රහ්මයන්

ලෙසින් පෙන්වා ඇත. **බලන්න**: තුදු බ්‍රහ්මරාජ. **සටහන**: සුබ්‍රහ්ම, සුද්ධාවාසබ්‍රහ්ම රජුන්, බුදුන් වහන්සේ බැහැදැකීමට පැමිණීම, සංයු.නි: (1) සගාථවග්ග: බ්‍රහ්මසංයුත්ත: 6.1.6 පමාද සූත්‍රය හා 6.1.7 කෝකාලික සූත්‍රයේ (පි.290) විස්තර කර ඇත.

▲**පච්චත්තං වේදිතබ්බො විඤ්ඤූහීති** -to be personally experienced by the wise: මෙය ධර්ම ගුණයකි. ධර්මය දන්නා නුවණැති පුද්ගලයා, තමාගේ ධර්ම වර්ධනය, ඵල තමන් විසින්ම අවබෝධ කරගන්නා බව මින් අදහස් කරයි. **බලන්න**: ධම්ම ගුණ

▲ **පච්චනීකසාත බ්‍රාහ්මණ**- Brahamin Pacchanikasatha:**බලන්න**: උපග්‍රන්ථය:3

▲**පච්චවෙක්ඛණ ඤාණය**-Pacchavekkhana Nana: පච්චවෙක්ඛණ ඤාණය-ප්‍රත්‍යවෙක්ෂණ නුවණ ලෙසින් පෙන්වා ඇත්තේ සියලු කෙළෙස් පහකර නිවන සාක්ෂාත් කරගත්බව දන්නා අවබෝධයය. මෙහිදී පෙන්වා ඇත්තේ බුදුන් වහන්සේ, තමන්ගේ ප්‍රහීණයවූ ලාමක අකුසල පිලිබඳව ප්‍රත්‍යවෙක්ෂණය කරමින් වැඩසිටි බවය. **සටහන: බලන්න**:ඛු.නි: පටිසම්භිදා 1:මහාවග්ග:ඤාණකතා:14 පච්චවෙක්ඛණ ඤාණය, පි.160. **මූලාශ්‍ර**:ඛු.නි: උදානපාලි:6.3 ප්‍රත්‍යවෙක්ෂණ සූත්‍රය, පි. 286.

▲**පච්ඡාසමණ**-Attendant monk: පච්ඡාසමණ යනු, භික්ෂුව, උවැටන් පිණිස තමන් සමග කැටුව යන අතවැසි මහණය. උවැටන් පිණිස පත්කරගත යුතු හා පත් නොකර ගත යුතු මහණ පිලිබඳ ගුණ-අවගුණ මේ සූත්‍රයේ විස්තර කර ඇත. **මූලාශ්‍ර**: අංගු.නි: (3): 5 නිපාත:5.3.2.2. පච්ඡාසමණ සූත්‍රය,පි.242, EAN:5: II: 112.2 An attendant monk, p.276.

▲ **පච්චොරොහණී**- Paccorohaṇī: බමුණු කුලයේ පැරණි ව්‍රතයක් වූ පච්චොරොහණී උත්සවය බුදුන් වහන්සේ වැඩසිටි සමයේ දී ඉන්දියාවේ පැවතිනි. ඒ පිළිබඳව ජානුසෝනි බමුණා හා සාකච්ඡාවක යෙදුන බුදුන් වහන්සේ පෙන්වා ඇත්තේ ආරියවිනයේ පච්චොරොහණී ක්‍රමය, බමුණු ක්‍රමයට වඩා වෙනස් බවය.

▼**ආරිය විනයේ පච්චොරොහණී පිළිවෙත**:1. “මේ සසුනේ ආරිය ශ්‍රාවකයා නුවණින් සලකා බලා පරපන වැනසීමේ ආදීනව- මේ ජීවිතයේදී හා මතුජීවිතයේදී අයහපත් විපාක ගෙනෙදෙනබව අවබෝධ කර එම අකුසලය හැරදමයි... (එලෙස සියලු තුන්දොරින් සිදුවන **අකුසල් හැර දමයි**). 2. “මේ සසුනේ... නුවණින් සලකා බලා මිථ්‍යා දිට්ඨිය ගැනීමෙන් මේ ජීවිතයේදී හා මතු ජීවිතයේදී ඇතිවන අයහපත් විපාක අවබෝධ කර මිථ්‍යා දිට්ඨිය අත හරියි ( එලෙස, මිථ්‍යා මග ගැනීමෙන් සිදුවන අයහපත් කර්ම විපාක දන දැක එම මග හැරදමා සම්මාදිට්ඨිය ඇතුළු දස අංග පුරුදු කරයි) **සටහන්**: * ආරිය විනයේ පච්චොරොහණී දෙආකාරය. ** දේසනාව අසා සතුටුවූ ජානුස්සෝනි බමුණා තෙරුවන් සරණ ගිය උපාසකයෙක් විය. ** පසුව, බුදුන් වහන්සේ, සංඝයාට ද එම පිළිවෙත වදාළහ. **මූලාශ්‍ර:** අංගු.නි: (6 ): 10 නිපාත: 10.3.2.7. පඨමපචෙචාරොහණී සූත්‍රය, පි. 452 හා 10.3.2.8 දුතිය පචෙචාරොහණී සූත්‍රය**,** පි.457 හා 10.4.2.1 බ්‍රාහ්මණ පචෙචාරොහණී සූත්‍රය,පි. 484 හා

10.4.2.2. අරිය පචෙචාරොහණී සූත්‍රය, EAN:10: 119.7 Paccorohaṇī -1 and 120.8. Paccorohaṇī -2, p. 546 and 167.1 and 168.2, p. 549.

▲ **පච්චිම ජනතාව**- Future generation-Pachchima janatha: පච්චිම ජනතාව-පශ්චිමජනතා ලෙසින් මෙහි පෙන්වා ඇත්තේ, බුදුන් වහන්සේගේ පරිනිබ්බනයෙන් පසු උපත ලබන මිනිසුන් ගැනය. අනාගත ජනතාවට, අනුකම්පාව පිනිස, තමන්වහන්සේ වනසේනාසන යන්හි වාසය කරණ බව බුදුන් වහන්සේ වදාළහ: **බලන්න**: ආරඤ්ඤ සේනාසන. **මූලාශ්‍ර:** අංගු.නි: (1): 2 නිපාත: 2.1.3.10 සූත්‍රය, පි. 157, EAN: 2: 30.10 Sutta, p.60.

▲ **පාචීනනින්න** - Towards east: පාචීනනින්න යනු නැගෙනහිරට- පෙර දිගට නැමුණ බවය. ගංගානම් නදිය නැගෙනහිරට බරව ගලායයි. ඒ උපමාව යොදගෙන පෙන්වා ඇත්තේ, ආරියඅටමග වඩන පුද්ගලයා., නිවන දෙසට බරවී, නැඹුරුවී සිටින බවය. **බලන්න**: උපග්‍රන්ථය:5 **මූලාශ්‍රය:**සංයු.නි: (5-1) මහාවග්ග:මග්ගසංයුත්ත: පාචීනනින්න සූත්‍ර, පි.102.

**පජ**

▲ **පජ්ජාභූමි බ්‍රාහ්මණ**- Pajjabhumi Brahamin: බුදුන් වහන්සේ වැඩසිටි සමයේ විසූ මේ බ්‍රාහ්මණයන්, මළවුන් වෙතට පැමිණ, ඔවුන් සුගතියට යැවීමට මන්ත්‍ර කියන බව මෙහි දක්වා ඇත. එහත්, ඔවුන්ගේ ක්‍රියාව නිෂ්ඵලය. මෙය මිථ්‍යාදිට්ඨියකි. **බලන්න**: සුගතිය, පැරණි චාරිත්‍ර **මූලාශ්‍රය:** සංයු.නි: (4) සළායතනවග්ග:ගාමිණිසංයුත්ත:8.1.6 අසිබන්ධක සූත්‍රය, පි.592.

▲ **පජ්ජතෝ-** Bright lights: ඉතා දීප්තිමත් බබලන ආලෝකය පජ්ජතෝ-පහා ලෙසින් පෙන්වා ඇත. ලෝකයේ දීප්තිමත් එළි 4ක් ඇතිබව මෙහිදී පෙන්වා ඇත: 1) හිරුගේ ආලෝකය 2) සඳුගේ ආලෝකය3) ගින්නෙන් හටගන්නා ආලෝකය 4) සර්වඥයන් ගේ ආලෝකය. ඒ ආලෝක අතුරින්, උත්තරීතර ආලෝකය (නිරුත්තර ආලෝකය) ලබාදෙන්නේ සර්වඥයන් වහන්සේය.(He is the light unsurpassed) **බලන්න:** අභා, ප්‍රභා, ආලෝකය.

**මූලාශ්‍රය:** සංයු.නි: (1) සගාථවග්ග: දේවතාසංයුත්ත: 1.3.6 පජ්ජතෝ සූත්‍රය, පි. 54.

▲**පජ්ජුන දේවතා**-Pajjunna Deva: පජ්ජුන දේවතා ලෙසින් පෙන්වා ඇත්තේ වැස්ස වලාහක දෙවියන්ය. පජ්ජුන දෙවියෝ හා ඔහුගේ දියණියන් දෙදෙනා: කොකනදා දේවතාවිය හා චූල කොකනදා දේවතාවිය, බුදුන් වහන්සේ සරණ ගිය, දහම මැනවින් අවබෝධ කළ දෙවිවරු බව මේ සූත්‍ර වල පෙන්වා ඇත. **සටහන**: අටුවාවට අනුව පජ්ජුන දෙවියෝ, චාතුර්මහාරාජික දේවලෝකයට අයත්වේ. ESN: note: 90: p. 515. **බලන්න**: වලාහක දේව නිකාය. **මූලාශ්‍ර:** සංයු.නි: (1)සගාථවග්ග: දේවතාසංයුත්ත:1.4.9 හා 1.4.10 පජ්ජුන්න ධිතු සූත්‍ර,පි. 78, ESN:1: Devathasamyutta:IV: 39.9 & 40.10 Pajjunna’s Daughters,p.113.

▲ **පූජනීය ස්ථාන-** Holy places: බෞද්ධයන්ගේ පූජනීය ස්ථාන ලෙසින් සූත්‍ර දේශනාවල පෙන්වා ඇත්තේ, ශ්‍රද්ධාවෙන් දැකිය යුතු සිව් ස්ථාන ගැනය. 1) බෝසතුන් උපන් ස්ථානය 2) බුදුන් වහන්සේ සම්මා සම්බෝධිය ලැබූ ස්ථානය 3) පළමු ධර්ම දේශනාව පැවැත්වූ ස්ථානය 4) පරිනිබ්බානය සිදුවූ ස්ථානය. **බලන්න**: ශ්‍රද්ධාවෙන් දැකිය යුතු සිව් ස්ථාන. **සටහන්**: අපගේ බුදුන් වහන්සේගේ ධාතු තැන්පත් කර ඉදි කර ඇති ස්තූප, රහතුන්ගේ ධාතු නිදන් කර ඇති ස්තූප ආදියද, බෞද්ධයන්, පුදපූජා පවත්වන ස්ථාන යන්ය**. බලන්න**: ස්තූප.

▲ **ප්‍රජාපති ගෝතමිය**-Prajapathi Gothami: බලන්න: මහාප්‍රජාපති ගෝතමිය.

**පඤ්ච**

▲ **පඤ්චත්තය-** five and three: පඤ්චත්තය ලෙසින් පෙන්වා ඇත්තේ ලෝකයාතුල ඇති දිට්ඨි පහක්, ආකාර තුනකින් බැලීම ගැනය. 1) ආත්මය සංඥා සමන්විතය, මරණින් මතු නිත්‍ය වේ (The self is percipient and unimpaired after death). 2) ආත්මය සංඥා සමන්විතනොවේ, මරණින් මතු නිත්‍ය වේ (The self is non-percipient and unimpaired after death). 3) ආත්මය නේවසංඥා නසංඥාවේ, මරණින් මතු නිත්‍ය වේ (The self is neither percipient nor non-percipient and unimpaired after death) 4) විද්‍යාමාන ආත්මයක් මරණින් මතු උච්චේදයට - සහමුලාඝාතනයට, විනාශයට, සහමුලින්ම නැතිවීමට පත්වේ- (they describe the annihilation, destruction, and extermination of an existing being at death) 5) සමහරු, මේ ජීවිතයේදීම නිවන ලබාගැනීම ගැන කියයි (some assert Nibbāna here and now). ඒවාගැන බලන තුන් ආකාරය: i) ඔවුන් විද්‍යාමාන ආත්මයක් මරණින් මතු නිත්‍ය යයි හෝ ii) විද්‍යාමාන ආත්මයක් මරණින් මතු උච්චේදයට, විනාශයට, සහමුලින්ම නැතිවීමට පත්වේ ය හෝ iii) නිවන මේ ජීවිතයේදීම ලබාගැනීම ගැන පවසයි. එලෙස, එම දිට්ඨි පහ, තුනක් බවට පත්වේ, එසේම, ඒ මත තුන, පහක් වේ. **මූලාශ්‍ර**: ම.නි: (3) 3.1.2 පඤ්චත්තය සූත්‍රය, පි.46, EMN:102: The Five and Three,p.758.

▲ **පඤ්චඞ්ගවිප්පහීනො** (පාලි): **පංචඅංග ප්‍රහීණය-** abandonment of five factors: පංච අංග ප්‍රහීණය ලෙසින් පෙන්වා ඇත්තේ පංචනීවරණ දුරුකරගැනීමය. එය, ආරිය වාසස්ථාන ලැබීමට ගුණයකි. බුදුන් වහන්සේ මෙසේ වදාළහ: **"කථඤ්ච භික්ඛවෙ භික්ඛු පඤ්චඞ්ගවිප්පහීනො හොති: ඉධ භික්ඛවෙ භික්ඛුනො කාමච්ඡන්දො ... බ්‍යාපාදො... ථිනමිද්ධං... උද්ධච්චකුක්කුච්චං...විචිකිච්ඡා පහීනා හොති, එවං ඛො භික්ඛවෙ භික්ඛු පඤ්චඞ්ගවිප්පහීනො හොති".** (how has a bhikkhu abandoned five factors? Here, a bhikkhu has abandoned sensual desire, ill will, dullness and drowsiness, restlessness and remorse, and doubt). **බලන්න**: පංච නීවරණ, ආරිය වාසස්ථාන. **මූලාශ්‍ර**: අං.ගු.නි: (6):10 නිපාත: 10.1.2.9 -10 ආරියවාස සූත්‍ර2කි. පි.82-84, EAN:10:19.9 & 20.10 Abodes of the Noble Ones, p. 498-499.

▲ **පඤ්චඞ්ග සමන්නාගතො** (පාලි): **පංච අංගයන්ගෙන් යුක්තවීම-** Realization of five factors: පඤ්චඞ්ග සමන්නාගතො යනු උසස් ධර්ම

පුහුණුව සාක්ෂාත් කරගත් භික්ෂුව (රහතන්වහන්සේ) සතු පංච කුසල ධර්මතාය: අසෙඛ ශිලය, අසෙඛ සමාධිය, අසෙඛ ප්‍රඥාව, අසෙඛ විමුක්තිය, අසෙඛ විමුත්ති ඥානදර්ශනය. **බලන්න**:අසේඛ, රහතන්වහන්සේ. **මූලාශ්‍ර:** අංගු.නි: (6 ): 10 නිපාත: නාථ වග්ග: 10.1.2.2 පංචඅංග සූත්‍රය, පි.58, EAN: 10: Protector: 12.2 Five Factors, p. 495.

▲**පඤ්ඤාපරිචිත-**well consolidated by wisdom: පඤ්ඤාපරිචිත ලෙසින් පෙන්වා ඇත්තේ සිත මනාලෙසින් ප්‍රඥාවෙන් වර්ධනය වී ඇතිබවය.සිත වීතරාග, වීතදෝස, වීතමෝහයට පත්වීමෙන්-කෙළෙස් ප්‍රහිනයෙන්, අරහත්වය ලැබූ බව අවබෝධ වීමය. **මූලාශ්‍ර:**අංගු.නි: (5): 9 නිපාත: 9.1.3.5 පඤ්ඤාපරිචිත සූත්‍රය,පි.472, EAN:9: 25.5 Wisdom,p.471.

**පඥ**

▲ **ප්‍රඥාව: පාලි: පඤ්ඤා** -wisdom: ප්‍රඥාව, නිපකො, නුවණ ලෙසින්ද හඳුන්වයි. ධර්මයේ ප්‍රඥාව නම් ආරිය සත්‍ය දැක, දුක නැතිකර ගැනීම පිළිබඳව ඇතිවන ආරිය නුවණ ය, සමුදය වය දැකීමේ නුවණය, ප්‍රඥාවන්තබවය. ආධ්‍යාත්මික මග පරිපූර්ණ කරගැනීමට ප්‍රඥාව අත්‍යඅවශ්‍ය අංගයකි. සියලු ධර්මතා-සබ්බේ ධම්මා ප්‍රඥාව උතුම් කොට ඇතයි බුදුන් වහන්සේ වදාළහ: **"පඤ්ඤුත්තරා සබ්බෙ ධම්මා". බලන්න**: ප්‍රඥා ඉන්ද්‍රිය, ආරිය ප්‍රඥාව, සබ්බෙ ධම්මා.

▼ **කෙනෙකුගේ ප්‍රඥාව පරිහානිය**, සෙසු පරිහානිවලටට: ධනය, ඥාතින් ...ආදියට වඩා අයහපත ගෙනෙදේ යයි මෙහි දක්වා ඇත. **මූලාශ්‍රය:** අංගු.නි: (1) 1 නිපාත: 18.6 සිට 18.9 සූත්‍ර.

▼**ප්‍රඥාව, ලෝකයේ** ලබාගැනීමට දුර්ලභ ධර්මතාවයකි. ධර්මය මනා ලෙස ශ්‍රවණය නොකිරීම, නොදත් දේ ගැන ප්‍රශ්න නොකිරීම ප්‍රඥාව ඇතිකර ගැනීමට බාධාවකි. **බලන්න**: ඉෂ්ඨධම්ම. **මූලාශ්‍රය**: අංගු.නි: (6) 10 නිපාත:10.2.8.3 ඉෂ්ඨධම්ම සූත්‍රය, පි.270,EAN:10: 73.3 Wished for, p.522.**ශබ්දකෝෂ: පා.සිං.ශ:** පි.352: "**පඤ්ඤා:** ප්‍රඥාව, පැණ, නුවණ". **B.D**: page, 122: "**Paññā**: Understanding, knowledge, wisdom…that intuitive knowledge which brings about the 4 stages of "Holiness' and the realization of Nibbāna…"

▼**වෙනත් මූලාශ්‍ර: 1.** 'නිපකො': ප්‍රඥාව ඇත්තේය. නෙපක්ක නම් ප්‍රඥාවෙන් යුක්ත වූයේ නිපක. **සිංහල විසුද්ධිමග,** 1 පරිච්ඡේදය, පි. 48. **2.** 'ප්‍රඥාව, සතර ධර්ම මගින් පෝෂණය කරගත යුතුය...' ආර්යාවංශ ධර්ම පුස්තක මාලා **1-4,** අංක **1** සප්තබෝජ්ජංගය- පි. **44,** සම්පාදනය- මොරටුවේ සිරි සාසනවංශ තෙරුන්**, 1948.**

▼ **බුදුන් වහන්සේ** පෙන්වා ඇත්තේ ප්‍රඥාවට සම ආලෝකයක් නොමැතිබවය. **සටහන**: අටුවාවට අනුව ප්‍රඥාව ඇතිවිට දසදහසක් ලෝක ධාතුව බැබලේ, ත්‍රිවිධ කාලයන් (අතීත, අනාගත, වර්තමාන) පිලිබඳ ඇති අඳුර (මෝහය) පහවේ. **බලන්න**:ESN: note 22, p. 502. **මූලාශ්‍ර:** සංයු.නි :(1): සගාථවග්ග: දේවතාසංයුත්ත: 1.2.3 නත්ථිපීපුත්තසම සූත්‍රය, පි. 38, ESN:1: Devatasamyutta: 13.3 None Equal to That for a Son, p. 72.

▼ **කායගතාසතිය** වඩාගැනීමෙන්, විපුල කර ගැනීමෙන් ආධ්‍යාත්මික වර්ධනය පිණිස උපකාරීවන, විවිධ ප්‍රඥා- නුවණ ඇතිවේ. **බලන්න**: කායගතා සතියේ ප්‍රතිලාභ. **මූලාශ්‍ර:** අංගු.නි: (1 ): 1 නිපාත: කායගතාසති වග්ග: 1.16.7 සූත්‍ර, පි. 126, EAN:1: Mindfulness Directed to the Body, p.52.

▼ **සතර ධර්මය-සිව්දහම ප්‍රඥාව ඇති කරයි**: 1) සත්පුරුෂ සේවනය 2) සද්ධර්ම ශ්‍රවණය 3) යෝනිසෝමනසිකාරය 4) ධර්මයට අනුකූලව පිළිපැදීම (ධර්මානුධර්ම ප්‍රතිපදාව) ඇති පුද්ගලයා-සෝතාපන්න, විවිධ ප්‍රඥාවන් ලැබීමට සමත්වේ: **ප්‍රඥා පටිලාභ, ප්‍රඥා වෘද්ධිය, ප්‍රඥා විපුලබව, මහා ප්‍රඥාව, පුථු ප්‍රඥාව, විපුල ප්‍රඥාව, ගම්භීර ප්‍රඥාව, අසාමන්ත ප්‍රඥාව, භූරි ප්‍රඥාව, ප්‍රඥා බහුලත්වය, සීඝ්‍ර ප්‍රඥාව, ලඝුප්‍රඥාව, හාසුප්‍රඥාව, ජවන ප්‍රඥාව, තීක්ෂණ ප්‍රඥාව, නිබ්බේධික ප්‍රඥාව.** මූලාශ්‍ර: සංයු.නි: (5-2 ):මහාවග්ග: සෝතාපන්න සංයුත්ත: 7: සප්පපඤ්ඤා වග්ග හා මහා පඤ්ඤාවග්ග සූත්‍ර, පි. 280, ESN:55: Sotapatthisamyutta, p. 2257.

▼ **ආධ්‍යාත්මික මග සාක්ෂාත් කරගැනීමට උපකාරීවන ප්‍රඥාවෝ: 1) ජවන ප්‍රඥාව**-swiftness of wisdom **2) නිබ්බේධික ප්‍රඥාව-** penetrativeness of wisdom **3) මහා ප්‍රඥාව-** greatness of wisdom **4) තීක්ෂණ ප්‍රඥාව**- sharpness of wisdom **5) විපුල ප්‍රඥාව**- vastness of wisdom**6) ගම්භීර ප්‍රඥාව**- depth of wisdom **7) අසාමන්ත ප්‍රඥාව**- unsurpassed wisdom **8) පණ්ඩිත ප්‍රඥාව 9) පුථු ප්‍රඥාව**- extensiveness of wisdom**10) හාසු ප්‍රඥාව-** joyousness of wisdom . මූලාශ්‍ර: ඛු.නි: පටිසම්භිදා මග්ගපකරණය 2-: ප්‍රඥාවග්ග: 3.1 ප්‍රඥා කථා, පි. 166.

▼ **උසස් ධර්ම පුහුණුව ලබන භික්ෂුව** (සේඛ) සතු සේඛබල පහ (පංච සෙඛ බලානි) අතුරින් එකක් ලෙස ප්‍රඥා බලය පෙන්වා ඇත. සේඛ සූත්‍රයේ ප්‍රඥාව මෙසේ පෙන්වා ඇත: **"පඤ්ඤා ච හොති උදයත්ථගාමිනියා පඤ්ඤාය සමන්නාගතො අරියාය නිබ්බෙධිකාය දුක්ඛක්ඛයගාමිනියා..."** ආරිය නිබ්බේදය ඇති කරන, යහපත් ලෙසින්ම දුක කෙළෙවර කරගැනීම පිණිස පවතින, ඇතිවීම හා නැතිවීම දන්නා ප්‍රඥාව -සමුදය-වය ඔහු සතුය. (He is wise; he possesses wisdom regarding rise and disappearance that is noble and penetrative and leads to the complete destruction of suffering)

**බලන්න**: සේඛ හා අසේඛ, සප්ත සද්ධර්මය. **සටහන්: *** ප්‍රඥාව ආරක්ෂක ධර්මයක් යයි බුදුන් වහන්සේ වදාළහ **බලන්න**: නාථකරණ ධර්ම. ** සමුදය හා වය දැකීමේ නුවණ ආරිය ප්‍රඥාව යයි බුදුන් වහන්සේ පෙන්වා ඇත.**බලන්න**: ගිහිජීවිතය යහපත්ව ගතකිරීම. **මූලාශ්‍ර:** අංගු.නි (3): 5 නිපාතය: 5.1.1.1 හා 5.1.1.2. සේඛබල සන්ඛිත-විතථත සූත්‍ර, පි. 24, EAN:5: The Trainee's Powers-1.1 & 2.2 p. 238, ම.නි. (2): 2.1.3 :සේඛ සූත්‍රය, පි. 44, MN 53: Sekha Sutta, p. 436.

▼ **ප්‍රඥාව ඇතිව ජීවත්වීම** ශ්‍රේෂ්ඨතම ජීවිතය යි බුදුන් වහන්සේ වදාළහ **"පඤ්ඤාජීවිං ජීවිතමාහු සෙට්ඨන්ති"** (One living by wisdom is best) **සටහන**: අටුවාවට අනුව: ප්‍රඥාවෙන් ජීවත්වන ගිහියා, පන්සිල් රකිමින්, නිතර දාන පූජාකරමින් දැහැමි ජීවිතයක් ගත කරයි. පැවිදි ජීවිතය ප්‍රඥාවෙන් ගත කරනවිට, ලැබෙන සිව්පසය පිලිබඳ යහපත් ලෙසින්

ආවර්ජනා කරමින්, මැනවින් භාවනාව වඩමින්, විදසුන් නුවණ ඇතිකර, මාර්ග ඵල ලබාගනී. **බලන්න**: ESN: Note: 130, p. 520. **මූලාශ්‍ර:** අංගු.නි: ( 1): සගාථවග්ග: දේවතාසංයුත්ත: 1.8.3 චිත්ත සූත්‍රය, පි. 104, ESN:1: Devatasmyutta: 1: 73.3. Treasure, p.155.

▲ **ප්‍රඥාකථා-**Panna katha: අනිච්චානු පස්සනාව, දුක්ඛානු පස්සනාව, පටිනිස්සග්ගානු පස්සනාව වර්ධනය කරගැනීමෙන් ඇතිවන ප්‍රඥා පිලිබඳ විස්තර ප්‍රඥා කථා ලෙසින් දක්වා ඇත. **මූලාශ්‍රය:** ඛු.නි: පටිසම්භිදා 2: 3.1 ප්‍රඥාකථා, පි.166

▲ **ප්‍රඥා ආලෝකය**- Light of wisdom: ලෝකයේ ඇති දීප්තිමත් ආලෝක අතුරින්, ප්‍රඥා ආලෝකය (අවිද්‍යා අඳුර නැතිකරන), අග්‍ර යයි මෙහි දක්වා ඇත. **බලන්න**: අභා, ආලෝකය.

▲ **ප්‍රඥා ඇස**-Wisdom eye: ප්‍රඥා ඇස- පැනස, ලැබීමෙන් දුක කෙළවරවේ. **බලන්න:** චක්ඛු තුන.

▲ **ප්‍රඥා ඉන්ද්‍රිය**: පාලි: **පඤ්ඤින්ද්‍රියං-**faculty of wisdom: ප්‍රඥා ඉන්ද්‍රිය, ආධ්‍යාත්මික ඉන්ද්‍රිය පහෙන් එකකි, මාර්ගයට විශේෂතාවයක් (විශේෂභාගි ධර්මයකි) ලබා දෙයි. බෝධි පාක්ෂික ධර්මතාවයකි.

▼ **ප්‍රඥා ඉන්ද්‍රිය බුදුන් වහන්සේ මෙසේ පෙන්වා ඇත: "කතමඤ්ච භික්ඛවෙ පඤ්ඤින්ද්‍රියං: ඉධ භික්ඛවෙ, අරියසාවකො පඤ්ඤාවා හොති උදයත්ථගාමිනියා පඤ්ඤාය සමන්නාගතො, අරියාය නිබ්බෙධිකාය සම්මාදුක්ඛක්ඛය ගාමිනියා. ඉදං වුච්චති පඤ්ඤින්ද්‍රියං"** ආරිය ශ්‍රාවකයාට, ප්‍රඥාව ඇත. ඔහු ආර්යවූ, පිරිසිඳ දකින්නාවූ, නුවණින්, ඇතිවීම හා නැතිවීම දකියි (සමුදය වය). එම නුවණ නිර්වේදයට සමත්වූ, මැනවින් දුකගෙවා දැමීමට හේතුවන ප්‍රඥාවය, ප්‍රඥා ඉන්ද්‍රිය ය. චතුරාර්ය සත්‍ය තුලින් ප්‍රඥා ඉන්ද්‍රිය දැකිය හැකිය. **සටහන**: එම ප්‍රඥාව නම් පංච උපාදානස්කන්ධ යේ ඇතිවීම හා නැතිවීම යහපත් ලෙසින් අවබෝධ කිරීමය. **බලන්න**: ESN: note: 195, p. 2412. **මූලාශ්‍ර**: සංයු: (5-1): මහාවග්ග: ඉන්ද්‍රියසංයුත්ත: 4.1.8 දට්ඨබ්බ සූත්‍රය හා 4.1.9. විභංග සූත්‍රය, පි. 377, ESN: Mahavagga: 48: Indriyasamyutta: 8.8 To be seen & 9.9 Analysis, p. 1933.

▼**ප්‍රඥා ඉන්ද්‍රිය ඇතිවීම ආරිය ඥානය ඇතිවීමය** : ප්‍රඥා ඉන්ද්‍රිය ඇතිවීම සෙසු ඉන්ද්‍රිය සතරේ (ශ්‍රද්ධා, වීරිය, සති, සමාධි) ස්ථාවරබව ඇතිවීමට පදනමය. ආරිය ඥානය පහළවීම (ලෝකෝත්තර නුවණ) සමගම සෙසු ඉන්ද්‍රිය වර්ධනයට පත්වේ. **සටහන**: මේ පිලිබඳ දක්වා ඇති උපමාව: කූටය (මුදුන) සහිත වහලක් ඇති ගෙයක, මුදුන ස්ථාවර කරණ තෙක් පරාල ස්ථිර ලෙසින් රඳන්නේ නැත. මුදුන ස්ථාවරබවට පත්වූ විට පරාල ස්ථිර ලෙසින් පවතී.**බලන්න**: උපග්‍රන්ථය:5 **මූලාශ්‍ර:**සංයු.නි.(5-1) මහාවග්ග: ඉන්ද්‍රියසංයුත්ත:සූකරඛතවග්ග:4.6.2 මල්ලක සූත්‍රය, පි.428.

▲ **ප්‍රඥාගති**-quick grasp: ධර්මය ක්ෂණිකව අවබෝධ කිරීම ප්‍රඥාගති- ගතිමත්තාන ලෙසින් මෙහි පෙන්වා ඇත. මේ ගුණය ඇති, බුද්ධ ශ්‍රාවකයන් අතුරින් ආනන්ද තෙරුන් අග්‍රවේ. **බලන්න**: උපග්‍රන්ථය:1

▲ **ප්‍රඥාගරුක පුද්ගල**- Panna garuka pudgala: කෙනෙක්, ප්‍රඥාගරුකව, ප්‍රඥාඅධිපතිනම්, ඒ පුද්ගලයා ප්‍රඥාගරුක පුද්ගලයාය. **බලන්න**: ගරුපුද්ගල. **මූලාශ්‍රය**: අංගු.නි: (2) 4 නිපාත: 4.3.4.7 ගරුපුග්ගල සූත්‍රය, පි.286.

▲ **ප්‍රඥා ධනය**- Wealth of wisdom: ආරිය ශ්‍රාවකයා සතු නුවණ- දූක ඇතිවීම හා නැතිකිරීම, ප්‍රඥා ධනය ලෙසින් මෙහි පෙන්වා ඇත.**බලන්න**: ධනය.

▲ **ප්‍රඥාපරිචිත**- Pannaparicita: ප්‍රඥාපරිචිත ලෙසින් පෙන්වා ඇත්තේ, ප්‍රඥාව සහමුලින්ම වර්ධනයවී අරහත්වය ලැබීමය. **මූලාශ්‍රය**: අංගු.නි: (5) 9 නිපාත: 9.1.3.5 ප්‍රඥාපරිචිත සූත්‍රය, පි.472.

▲ **ප්‍රඥා පටිලාභ**: පාලි: **පඤ්ඤාපටිලාභා**- obtaining of wisdom: ආධ්‍යාත්මික මාර්ගය අනුගමනය කරනවිට, යම් ධර්මතා දියුණුවීම නිසා ඇතිවන ප්‍රඥාව, ප්‍රඥා පටිලාභය -ප්‍රඥා ප්‍රතිලාභයය. **ප්‍රඥා ප්‍රතිලාභය නම් කවරෙක්ද යත්:** සතර මාර්ග ඥානය, සතර ඵල ඥානය, සතරප්‍රතිසංවිධ ඥානය, සයඅභිඥා ඥානය, තෙසැත්තා නුවණ (73), සත්සැත්තා නුවණ (77), යන මේ ධර්මතා අවබෝධවීම, දියුණුවීම ප්‍රඥාව ලැබීමය: **"... කතමො පඤ්ඤාපටිලාභා: චතුන්නං මග්ගඤාණානං චතුන්නං ඵලඤාණානං චතුන්නං පටිසම්භිදාඤාණානං ඡන්නං අභිඤ්ඤාඤාණානං තෙසත්තතීනං ඤාණානං සත්තසත්තතීනං ඤාණානං ලාභො පටිලාභො පත්ති සම්පත්ති ඵස්සනා සච්ඡිකිරියා උපසම්පදා පඤ්ඤාපටිලාභාය සංවත්තතන්ති අයං පඤ්ඤාපටිලාභො"**.**මූලාශ්‍ර**:ඛු.නි: පටිසම්භිදා 2: ප්‍රඥාවග්ග: 3.1 ප්‍රඥා කථා, පි. 172.

▼ **සතර ධර්මය** ඇති පුද්ගලයාට-සෝතාපන්නහට ප්‍රඥා ප්‍රතිලාභය ඇත: **"...ඉමෙ ඛො භික්ඛවෙ, චත්තාරො ධම්මා භාවිතා බහුලීකතා පඤ්ඤාපටිලාභාය සංවත්තන්ති"**.(these four things, when developed and cultivated lead to the obtaining of wisdom). **බලන්න**: ප්‍රඥාව, සතර ධර්මය, සෝතාපන්න. **මූලාශ්‍ර**: සංයු.නි: (5-2): මහාවග්ග: සෝතාපන්න සංයුත්ත:සප්ප්‍රඥාවග්ග:11.6.9 පටිලාභ සූත්‍රය, පි. 278, ESN: 55: Sotapatthisamyutta: 59 .9 The Obtaining of Wisdom p. 2257

▼ **කායගතා සතිය වැඩීම, විපුල කරගැනීම මගින් ප්‍රඥා ප්‍රතිලාභය වේ**

(Mindfulness directed to the body...when developed and cultivated, leads to the great wisdom). **මූලාශ්‍ර:** අංගු.නි: (1 ): 1 නිපාත: කායගතාසති වග්ග සූත්‍ර, පි. 125 EAN:1: Mindfulness Directed to the Body, p.52

▲ **ප්‍රඥා ප්‍රභේදය :**පාලි: **පඤ්ඤාපභෙදා**- differentiation by wisdom ප්‍රඥා ප්‍රභේදය: ආධ්‍යාත්මික වර්ධනයේදී ලබන ප්‍රඥාවන්හි විශේෂණය, වෙනස්කොට දැක්වීමේ කුසලතාවය මෙයින් හැඟවේ. **සටහන**: "skilled in his own infinite distinctions, 'having knowledge that has attained infinite differentiations" **බලන්න**: EAN:1: note :211, p. 591.

▼කායගතා සතිය යහපත් ලෙසින් වඩා ගැනීම, ප්‍රඥාප්‍රභේදය පිණිස පවතී. (**පඤ්ඤාපභෙදාය සංවත්තති**- leads to differentiation by wisdom). **මූලාශ්‍ර:** අංගු.නි: (1): 1 නිපාත: කායගතාසති වග්ගසූත්‍ර, පි. 125 හා අමත වග්ගසූත්‍ර**,**පි.130, EAN:1: Mindfulness Directed to the Body,p.52 &The Deathless, p.53.

▲ **ප්‍රඥා පරිහාණි-**Decline of wisdom: ආරිය ප්‍රඥාව (දුක නැතිකිරීම අවබෝධ කිරීම- විදර්ශනා මාර්ග ප්‍රඥාව) නොමැතිවීම,ප්‍රඥාපරිහාණිය ලෙසින් පෙන්වා ඇත. එසේවීම ලෞකික, ලෝකෝත්තර සියලු සැපයෙන් පිරිහිමය. ඔවුන් දුගති ගාමිය. ආරිය ප්‍රඥාව ඇති පුද්ගලයා සුගති ගාමිය. **මූලාශ්‍ර**: බු.නි:ඉතිවුත්තක:2.2.4 ප්‍රඥාපරිහාණි සූත්‍රය, පි.392.

▲ **ප්‍රඥාබලය**- Power of wisdom: ප්‍රඥාබලය ලෙසින් මෙහි පෙන්වා ඇත්තේ, උදයත්තගාමිණි ප්‍රඥාව තිබීමය. **බලන්න**: උදයත්තගාමිණි ප්‍රඥාව

▲ **ප්‍රඥා බහුලත්වය**: පාලි: **පඤ්ඤා- බාහුල්ලාය-** abundance of wisdom කෙනකුට ආධ්‍යාත්මික මාර්ගය පිණිස ඇති ධර්මතා පිලිබඳ බොහෝවූ නුවණක් තිබීම ප්‍රඥා බහුලත්වයය. **ප්‍රඥා බහුලත්වය:** මේ සසුනේ කිසියම් කෙනෙක් ප්‍රඥාගරුකය, ප්‍රඥාචරිත ඇත, ප්‍රඥාශයවූහ, ප්‍රඥාධිමුක්ත වූහ, ප්‍රඥාව ධජය කරගෙන සිටි, ප්‍රඥාව කේතු කරගෙන ඇත, ප්‍රඥාව අධිපති කර ගෙන ඇත, ධර්මය විමසීම, විවිධ ධර්ම කරුණු විමසීම බහුල කරගෙන සිටි, ප්‍රඥාවෙන් ධර්මය බහුල ලෙස, යහපත්ලෙස ප්‍රකට කරයි, ධර්මය මනාකොට දන්නේය, විභූතවිහරණ ඇත. මෙය ප්‍රඥා බහුලත්වය වේ. **මූලාශ්‍ර**: බු.නි: පටිසම්භිදා2 : ප්‍රඥාවග්ග: 3.1 ප්‍රඥා කථා, පි.182.

▼ **සතර ධර්මය** ඇති පුද්ගලයාට ප්‍රඥාව බහුලත්වය ඇත. මේවා සෝතාපන්න අංගවේ. **"...ඉමෙ බො භික්ඛවෙ, චත්තාරො ධම්මා භාවිතා බහුලීකතා පඤ්ඤා- බාහුල්ලාය සංවත්තනතිති"**.(these four things, when developed and cultivated lead to abundance of wisdom) **බලන්න**: ප්‍රඥාව, සතර ධර්මය. **මූලාශ්‍ර**: සංයු.නි: (5-2): මහාවග්ග: සෝතාපන්න සංයුත්ත:11.7.7 ප්‍රඥා බාහුල්ල සූත්‍රය, පි. 280, ESN: 55: Sotapatthisamyutta: 62.1 Greatness of Wisdom p. 2262.

▼ **කායගතා සතිය වැඩීමෙන්, විපුල කරගැනීමෙන් ප්‍රඥා බහුලත්වය ඇතිවේ**

(Mindfulness directed to the body...when developed and cultivated, leads to the abundance of wisdom )..**මූලාශ්‍ර:** අංගු.නි: (1 ): 1 නිපාත: කායගතාසති වග්ග සූත්‍ර, පි. 125 EAN:1: Mindfulness Directed to the Body,: p.52 .

▼**වෙනත් මූලාශ්‍ර:1. "**යමෙක් ප්‍රඥාව අධිපති කොට සිටියේ ද, ඔහු ට ඇති නුවණ බාහුල්ලපඤ්ඤා නම් වේ"
https://pitaka.lk/dhammapada/ss/katha-28.html.

▲ **ප්‍රඥා වෘද්ධිය**: පාලි: **පඤ්ඤාවුඩ්ඪියා-**growth of wisdom:ආධ්‍යාත්මික මාර්ගයේ ගමන්කරන කෙනෙකුට ධර්මය යහපත් ලෙසින් අවබෝධවීම ප්‍රඥා වෘද්ධිය-ප්‍රඥාව වැඩීමය. **ප්‍රඥා වෘද්ධිය:** සප්ත සේඛයන්ගේ ද

කල්‍යාන පෘථග්ජනයාගේ ද ප්‍රඥාව වැඩේ. රහතුන්ගේ ප්‍රඥාව වැඩි පරිපූර්ණව ඇත. මෙය ප්‍රඥාවෘද්ධිය නම්වේ: **"... කතමො පඤ්ඤාවුඩ්ඪි: සත්තන්නඤ්ච සෙඛානං පුථුජ්ජනකල්‍යාණකස්ස ච පඤ්ඤා වඩ්ඪති, අරහතො පඤ්ඤා වඩ්ඪිතවඩ්ඪනා පඤ්ඤාවුඩ්ඪියා සංවත්තතනති අයං පඤ්ඤාවුඩ්ඪි". සටහන:** සප්ත සේඛයන් යනු සෝතාපන්න සිට අරහත් මග ලැබූ, උසස් ධර්ම පුහුණුවේ යෙදෙන සේඛ භික්ෂූන්ය. ඔවුන් අරහත්බවට පත්වූවිට ප්‍රඥාව වැඩීම පරිපූර්ණව. **බලන්න**: සේඛ හා අසේඛ. **මූලාශ්‍ර**: බු.නි: පටිසම්භිදා 2: ප්‍රඥාවග්ග: 3.1 ප්‍රඥා කථා, පි. 172

▼ **සතර ධර්මය** ඇති පුද්ගලයාගේ (සෝතාපන්න) ප්‍රඥාව වැඩේ: **"...ඉමෙ ඛො භික්ඛවෙ, චත්තාරො ධම්මා භාවිතා බහුලීකතා පඤ්ඤාවුඩ්ඪියා සංවත්තන්ති"** (these four things, when developed and cultivated lead to the growth of wisdom).**බලන්න**: ප්‍රඥාව, සතර ධර්මය. **මූලාශ්‍ර**: සංයු.නි: (5-2): මහාවග්ග: සෝතාපන්න සංයුත්ත: සප්ප්‍රඥවග්ග:11.6.10 වුඩ්ඪි සූත්‍රය, පි. 278, ESN: 55: Sotapatti samyutta: 60.10 The growth of wisdom, p. 2258, අංගු.නි: (2) 4 නිපාත: ප්‍රඥාවුද්ධි සූත්‍රය, පි.492.

▼ **කායගතා සතිය වැඩීම,** විපුල කරගැනීම ප්‍රඥාවේ වැඩීමට හේතුවේ. (Mindfulness directed to the body... when developed and cultivated, leads to the growth of wisdom).**මූලාශ්‍ර:** අංගු.නි: (1 ): 1 නිපාත: කායගතාසති වග්ග සූත්‍ර, පි. 125 EAN:1: Mindfulness Directed to the Body, p.52 .

▲ **ප්‍රඥා විපුලබව**: පාලි: **පඤ්ඤාවෙපුල්ලාය-** the expansion of wisdom ආධ්‍යාත්මික දියුණුව නිසා ධර්ම අවබෝධය, පළල්වීම මගින් ප්‍රඥාව විපුල බවට පත්වේ. **ප්‍රඥා විපුලබව:** සේඛයන් 7 දෙනාගේ ද කල්‍යාන පෘථග්ජනයාගේ ද ප්‍රඥාව විපුල බවට පත්වේ. රහතුන්ගේ ප්‍රඥා විපුලබව පරිපූර්ණය: **"... කතමං පඤ්ඤාවෙපුල්ලං: සත්තන්නං සෙඛානං පුථුජ්ජනකල්‍යාණකස්ස ච පඤ්ඤා වෙපුල්ලං ගච්ඡති, අරහතො පඤ්ඤා වෙපුල්ලං ගතා, පඤ්ඤා වෙපුල්ලාය සංවත්තතනති ඉදං පඤ්ඤා වෙපුල්ලං" සටහන:** සේඛයන් 7 යනු, සෝතාපන්න සිට අර්හත් මග ලැබූ, රහත්ඵලය පිණිස උසස් පුහුණුවේ යෙදන භික්ෂූන්ය. කල්‍යාන පෘථග්ජනයා යනු යහපත් ලෙසින් ධර්මය දන්නා පිරිසය. **බලන්න**: සේඛ හා අසේඛ. **මූලාශ්‍ර**: බු.නි: පටිසම්භිදා 2-: ප්‍රඥාවග්ග: 3.1 ප්‍රඥා කථා, පි. 172

▼ **සතර ධර්මය** ඇති සෝතාපන්න පුද්ගලයාගේ ප්‍රඥාව විපුල බවට පත්වේ: **"...ඉමෙ ඛො භික්ඛවෙ, චත්තාරො ධම්මා භාවිතා බහුලීකතා පඤ්ඤාවෙපුල්ලාය සංවත්තන්ති"**.(these four things, when developed and cultivated lead to the expansion of wisdom). **බලන්න**: ප්‍රඥාව, සතර ධර්මය. **මූලාශ්‍ර**: සංයු.නි: (5-2): මහාවග්ග: සෝතාපන්න සංයුත්ත: සප්ප්‍රඥාවග්ග: 11.6.11 වෙපුල්ල සූත්‍රය, පි. 278, ESN: 55: Sotapatthisamyutta: 61.11. The expansion of wisdom, p. 2259

▼**කායගතා සතිය වැඩීමෙන්, විපුල කරගැනීමෙන් ප්‍රඥාව විපුලබවට පත්වේ**. (Mindfulness directed to the body...when developed and cultivated, leads to the expansion of wisdom). **මූලාශ්‍ර:** අංගු.නි: (1): 1

නිපාත: කායගතාසති වග්ග සූත්‍ර, පි. 125 EAN:1: Mindfulness Directed to the Body, p.52.

▲ **ප්‍රඥා විමුක්තිය: පාලි: පඤ්ඤාවිමුත්තිං** - Deliverance through wisdom (paññā- vimutti): ධර්මයේ ප්‍රඥා විමුක්තිය -විමුත්තිය ලෙසින් පෙන්වා ඇත්තේ නුවණින්- ප්‍රඥාවෙන් ආරිය සත්‍ය අවබෝධ කර අවිද්‍යාවෙන් නිදහස්වීමය, විමුක්තිය ලැබීමය. ප්‍රඥා විමුක්තිය, අරහත්වය ලබන එක් ආකාරයකි. ප්‍රඥා විමුක්තිය ලැබූ උතුමා සත් ආරිය පුද්ගලයෙක්ය. **බලන්න**: සත් ආරිය පුද්ගලයෝ, විජ්ජා විමුක්තිය, සුවිමුත්තපඤ්ඤා. **සටහන**: ප්‍රඥා විමුක්තිය ලැබූ උතුමෙක් සතු ගුණ මෙහි විස්තර කර ඇත**. බලන්න**:අංගු.නි: (5) 9 නිපාත: 9.1.5.3 ප්‍රඥා විමුක්ති සූත්‍රය, පි. 560.

▼ **ප්‍රඥා විමුක්තිය ඇතිකර ගැනීම:** බුදුන් වහන්සේ මෙසේ පෙන්වා ඇත: විදර්සනාව වැඩිම නිසා මාර්ග ප්‍රඥාව වැඩේ; මාර්ග ප්‍රඥාව වැඩිම නිසා අවිද්‍යාව ප්‍රහීණය වේ. (අවිද්‍යාව ඇතිවිට ප්‍රඥාව නොවැඩේ), එසේ අවිද්‍යාව ක්ෂය වීමෙන් (ඵලප්‍රඥාසංඛාත) ප්‍රඥා විමුක්තිය ඇතිවේ. **"...විපස්සනා භික්ඛවෙ භාවිතා ... පඤ්ඤා භාවීයති... පඤ්ඤා භාවිතා... අවිජ්ජා සා පහීයති...ඉති ඛො භික්ඛවෙ, අවිජ්ජාවිරාගා පඤ්ඤාවිමුත්තීති".** ( When insight is developed, ...Wisdom is developed. When wisdom is developed, ... Ignorance is abandoned [wisdom defiled by ignorance is not developed] through the fading away of ignorance there is liberation by wisdom) **බලන්න**: සමථ හා විපස්සනාව **මූලාශ්‍ර:** අංගු.නි: ( 1 ): 2 නිපාත: 2.1.3.11 සූත්‍රය: පි.158, EAN: 2: 31.11 Sutta, p.60.

▲ **ප්‍රඥාසම්පන්න-** Pannasampanna: ප්‍රඥාසම්පන්න ලෙසින් පෙන්වා ඇත්තේ උදයවය (ඇතිවීම නැතිවීම ) පිළිබඳව පිරිසිඳ දැනගැනීමට හැකිබව, ආර්ය නිරෝධය දන්නා, දුක් ගෙවීමට කරුණු අවබෝධය කරගැනීමය. මෙය ගිහි උපාසකයෙක් තුල ඇති ගුණයකි. **මූලාශ්‍රය:** සංයු.නි: (5-2) මහාවග්ග: සෝතාපත්ති සංයුත්ත:පුඤ්ඤාභිසන්දවග්ග: 11.4.7 මහානාම සූත්‍රය.

▲**ප්‍රඥාවන්ත**- Wise man: ප්‍රඥාවන්ත ලෙසින් මෙහි පෙන්වා ඇත්තේ සම්මා දිට්ඨිය ඇති තැනැත්තාය. සම්මා දිට්ඨිය ඇතිවිට අනු ක්‍රමයෙන්, සම්මා සමාධියද, සම්මා ඤානයද, සම්මා විමුත්තියද ඇතිකර ගැනීමට හැකිවේ.**බලන්න**: ආරියඅටමග. **මූලාශ්‍ර:** අංගු.නි: ( 6):10 නිපාත: සමණසඤ්ඤා වගග: 10.3.1.5. විජ්ජා සූත්‍රය, පි.412 හා 10.3.1.4. බීජ සූත්‍රය,පි.410, EAN:10: 104.4 A Seed & 104.5.True Knowledge, p. 541.

▲ **ප්‍රඥාවන්තයාගෙ හැසිරීම** -Conduct of the Wise man: ප්‍රඥාවන්තයා - නුවණැති පුද්ගලකු හැසිරිය යුතු ආකාරය මහාකච්චාන තෙරුන් මෙසේ පෙන්වා ඇත: 1) නුවණැති පුද්ගලයා ඇසූ, දුටු සැම දෙයක්ම අත් හරින්නේ නැහැ. එහෙත්, අත්හැරිය යුතු දේ තිබෙනවා: ඇස් ඇති නමුත් සමහර අවස්ථාවල- කෙලෙස් ඇතිකරන දෙයක් , වියවුල් ඇති කරන දෙයක් දකින්නට ලැබෙනවානම්, අවස්ථාවට අනුව **අන්ධයකු** මෙන් හැසිරෙන්න. 2) එසේම කන් ඇසෙන නමුත් කෙලෙස් ඇතිකරන

දෙයක් , වියවුල් ඇති කරන දෙයක් අසන්නට ලැබෙනවා නම් අවස්ථාවට අනුව **බිහිරෙක්** මෙන් හැසිරෙන්න. 3) එසේම ප්‍රඥාව ඇති නමුත් කෙලෙස් ඇතිකරන දෙයක් , වියවුල් ඇති කරන දෙයක් අන්අය කතා කරනවානම් අවස්ථාවට අනුව **මෝඩයෙක්** මෙන් හැසිරෙන්න. 4) එසේම, ශක්තිය තිබුනත්, කෙලෙස් ඇතිකරන දෙයක් , වියවුල් ඇති කරන දෙයක්නම්, අවස්ථාවට අනුව **දුබලයෙක්** මෙන් හැසිරෙන්න. 5) එසේම යම්කිසි ක්‍රියා මාර්ගයක් තුලින් තමන්ගේ මෙලොව හා පරලොව දියුණුව වැලකෙනවානම්, අවස්ථාවට අනුව **මළ කෙනෙක්** වගේ (ක්‍රියා විරහිතව) හැසිරෙන්න. **මූලාශ්‍රය:** බු.නි: ථෙර ගාථා, 8-1 මහා කච්චායන 494-501, පි. 175.

**පඩ**

▲ **පිඩුසිඟායෑම**-Alms round: බුදුන් වහන්සේ වැඩසිටි කාලයේ මෙන්ම වර්තමානයේද සංඝයා, කයේ යැපීම පිණිස පිඩුසිඟායෑමේ යෙදේ. මෙය සංඝයාට කැප දෙයකි.**බලන්න**: පිණ්ඩපාත,විනය.

**පට**

▲ **පටාචාරා තෙරණිය-**Patachara Therani: **බලන්න**: උප ග්‍රන්ථය:2

▲ **පාටලිය ගාමිණි-**Pataliya Gamini: **බලන්න**: උප ග්‍රන්ථය:3

▲ **පාටලීපුත්‍ර නුවර-** Pataliputhra city: බුදුන් වහන්සේ වැඩසිටි සමයේ, මගධයේ පිහිටි පාටලීග්‍රාමය, පසුකල පාටලීපුත්‍ර නුවර ලෙසින් හඳුන්වා ඇත. මහා පරිනිබ්බාන සූත්‍රයට අනුව, මෙය, අජාසත් රජුගේ මගධ රාජධානියේ, ගංගානම් ගං ඉවුර අසබඩ පිහිටි මහා ගමකි. බුදුන් වහන්සේ අවසාන චාරිකාවේදී මේ ගමේ වැඩසිටියහ. මේ ගම, අනාගතයේදී, මහා නගරයක්බවට පත්වන බවද, ගින්න, ජලය හා අභ්‍යන්තර ආරවුල් මගින් ඒ නගරයට හානි පැමිණෙන බවද බුදුන් වහන්සේ වදාළහ. කුක්කුටා රාමය නම් අරණ්‍යය, පාටලිපුත්‍ර නුවර පිහිටි බුදුන් වහන්සේ හා සංඝයා වැඩසිටි ආරාමයකි. **බලන්න:** සංයු.නි: (5-1) මහාවග්ග: මග්ගසංයුත්ත: විහාරවග්ග: කුක්කුටාරාම සූත්‍ර. **සටහන**: * පාටලීගම් වැසියෝ, ආවාසයක් සදා බුදුන් වහන්සේට පුජා කලබව, බු.නි: උදානපලිය: 8.6. පාටලීගාමීය සූත්‍රයේ දක්වා ඇත. මේ සූත්‍රයේ දි, බුදුන් වහන්සේ ඒ ගම, මතුකළ ප්‍රසිද්ධ පාටලීපුත්‍ර නගරය වනබව වදාළහ. ** මේ නුවර පැළලුප් නුවර ලෙසින්ද පෙන්වා ඇත. ඉතිහාසයට අනුව පසුකල, මේ නගරය අශෝක අධිරාජයාගේ -මගධයේ, මහානුවර- පාටලීපුත්‍ර නගරය බවට පත්විය. වර්තමානයේදී, මෙය පැට්නා ලෙසින් හඳුන්වයි.

▲ **පටිඝානුසය -** paṭighānusayo: අනුසය ධර්මයකි, සිත යට ව්‍යාපාදය-තරහ නොනිවී තිබීමය, එමනිසා සසරදික්වේ. **බලන්න**: අනුසය.

▲ **පටිඝ නිමිත්ත**: පාලි: **පටිඝනිමිත්තං**- Paṭighanimitta- object of aversion -disagreeable mark: සිතට ආවේගයක්- තරහක් ඇති කරණ කරුණු - අරමුණු පටිඝ නිමිත්තය. උදා: තරහ, ක්‍රෝධය ආදී සිත කලඹවන කරුණුවේ. **ශබ්දකෝෂ: පා.සි.ශ**: පි.354: "**පටිඝ:** ප්‍රතිඝය, ක්‍රෝධය, ද්වේශය, හිංසනය". **B.D**: p. 255: "**paṭigha:** In an ethical

sense, it means repugnance, grudge, resentment, anger…". **P.T.S**: p.896: "**paṭigha**: repulsion, repugnance, anger".

▼ **පටිඝ නිමිත්ත** පිළිබඳව අයෝනිසෝමනසිකාරය කිරීම නිසා ව්‍යාපාදය- ක්‍රෝධය- තරහ ඇතිවේ, වැඩිවේ. මෛත්‍රිය වැඩීමෙන් පටිඝ නිමිත්ත ප්‍රහීණය කරගැනීමට හැකිවේ. **බලන්න:** නීවරණ, බ්‍රහ්මවිහාර, ආසන පටිවිනය. **මූලාශ්‍ර:** අංගු.නි: (1):1 නිපාත: 1.2.2. නීවරණ ප්‍රහාණ වග්ග, පි. 44, EAN:1:Abandoning the hindrances, p. 36, සංයු.නි: (5-1):මහාවග්ග: බොජ්ඣංග සංයුත්ත, 2.6.1 ආහාර සූත්‍රය, පි. 230, ESN:46: Bojjhaṅgasaṃyutta: 51.1 Nutriment, p. 1788.

▲ **පටිච්ඡන්න කම්ම හා අප්පටිච්ඡන්න කම්ම**: පාලි: **පටිච්ඡන්නකම්ම, අපටිච්ඡන්නකම්ම**- concealed actions & unconcealed actions: පටිච්ඡන්න කම්ම යනු සඟවා- රහසේ කරන පාපී-අකුසල ක්‍රියාය. අප්පටිච්ඡන්න කම්ම යනු නොසඟවා කරන යහපත් කුසල ක්‍රියාය. **කෙනෙක් පටිච්ඡන්න** කම්මයක් කර ඒ ගැන අවබෝධවී තමා කල වැරැද්ද පවසා, සමාව ගෙන, ඒවා අත්හැර කුසල කම්ම කිරීමෙන්, පෙර කල අයහපත් කර්මයේ අකුසල විපාක තුනී කර ගත හැකිවේ. **බලන්න**: EAN: note: 244, p. 593. පටිච්ඡන්න කම්ම කරන පුද්ගලයන් මරණින් මතු නිරයේ හෝ තිරිසන් ලෝකයේ යලි උපත ලබන බව බුදුන් වහන්සේ පෙන්වා ඇත. අප්පටිච්ඡන්න කම්ම කරන පුද්ගලයන් මරණින් මතු දේවලෝකයේ පහලවේ, නැත්නම් මිනිස් ලොව යලි උපත ලබයි. **බලන්න**: සුගතිය හා දුගතිය. **මූලාශ්‍ර:** අංගු.නි: (1): 2 නිපාත: 2.1.3.6 සූත්‍රය, පි. 154 , EAN: 2: 26.6 Sutta, p.60.

▲ **පටිපත්ති අන්තරධාන**- Disappearing of Dhamma practice:පටිපත්ති අන්තරධාන, ලෙසින් පෙන්වා ඇත්තේ, ධර්ම පුහුණුව අතුරුදහන්වීමය. **බලන්න**: ධර්මය අතුරුදහන්වීම.

▲**පටිපදාව-**The practice: ධර්මය අනුගමනය කිරීමේ පටිපදාව- පටිපත්ති, පිළිවෙත දෙකක් ලෙසින් පෙන්වා ඇත. එනම් සම්මා දිට්ඨිය ඇතුළු දසඅංග අනුගමනය කර සම්මා විමුක්තිය ලැබීම. 2)සම්මාප්‍රතිපදාව ලෙසින් දක්වා ඇති පටිච්චසමුප්පාද ක්‍රියාවලිය අවබෝධ කර දුකින් මිදීම. මේවා ධර්මය අනුගමනය කිරීමට සුදුසු නිවැරදි ක්‍රමවේ, එමගින් දුකින් මිදීමට හැකිවේ.

මිථ්‍යාදිට්ඨිය -මිථ්‍යා විමුක්තිය අනුගමනය, වැරදිමගට ගෙනයයි. එසේම, පටිච්චසමුප්පාද ක්‍රියාවලිය අනුගමනය කිරීම මිථ්‍යා ප්‍රතිපදාවවේ. මේවා නිසා සසර දික්වේ. **සටහන:** වෙනත් පටිපදා පිළිබඳව **බලන්න:**අංගු.නි: (2) 4 නිපාත: පටිපදාවග්ග:සතර ප්‍රතිපදා. **මූලාශ්‍ර**: සංයු.නි: (2) නිදාන වග්ග: අභිසමයසංයුත්ත:1.1.3 පටිපදා සූත්‍ර, සංයු.නි: (5-1): මහාවග්ග: මග්ගසංයුත්ත:1.3.3**.** පටිපදා සූත්‍ර 2, පි.58.

▲ **පටිපදා විධි දෙක-**2 modes of practice: ලෝකයා අනුගමනය කරන පටිපදා 2 කි: 1) මිථ්‍යාපටිපදාව- වැරදි පිළිවෙත එනම් අනාරිය අටමග 2) සම්මා පටිපදාව- නිවැරදි පිළිවෙත, එනම් ආරියඅටමග. **මූලාශ්‍රය**: සංයු.නි: (5-1) මහාවග්ග: මග්ගසංයුත්ත: 1.3.3. පටිපදා සූත්‍රය, පි. 58

▲ **පටිපදා විධි තුන-**Three modes of practice: ලෝකයා තුල ඇති මත, වාද, දිට්ඨි ආදිය, පටිපදා -ප්‍රතිපදා විධි තුන ලෙසින් පෙන්වා ඇත: 1) **ආගාළ්හ ප්‍රතිපත්තිය** (රළු-The coarse way of practice): මේ මතය දරන අය, කම්සුව විඳීම වැරදි නොවේ යයි සිතයි, කම් සුවයේ ගැලී සිටි (කාමසුඛල්ලිකානු යෝගය). 2) **පරිතප්ත ප්‍රතිපත්තිය** (අන්ත- the blistering way of practice): මේ මතය දරන අය- කායික වධ හිංසා පමුණුවා ගනී, (අත්තකිලමතානු යෝගය) , විවිධ ව්‍රත පුරුදු කරයි. 3) **මධ්‍යම ප්‍රතිපත්තිය** (the middle way of practice): සතර සති පට්ඨානය වැඩීම, සම්මා පධාන විරිය වැඩීම, සතර ඉද්දිපාද වැඩීම, ආධ්‍යාත්මික පංච ඉන්ද්‍රිය වැඩීම, ආධ්‍යාත්මික පංච බල වැඩීම, බොජ්ඣංග ධර්ම වැඩීම, ආරිය අට මග වැඩීම. මෙය බුදුන් වහන්සේ පෙන්වා දුන් ධර්ම ප්‍රතිපත්තියය. **සටහන:** 37ක්වූ බෝධි පාක්ෂික ධර්මතා පුහුණු කිරීම මධ්‍යම ප්‍රතිපදාවයය. **මූලාශ්‍ර**: අං.ගු.නි: (1 ): 3 නිපාත:පටිපදාවග්ග: 3.6.1 සූත්‍ර, පි.570, EAN:3: VI: 156.1, p. 141.

▲ **පටිනිස්සග්ග**-Patinissagga: පටිනිස්සග්ග යනු අත්හැරීමය (relinquishment). දුක ඇතිකරන සියලු දෙය හැර දැමීමය, මෙය නිවනට මගය.

▲ **පටිනිස්සග්ගානුපස්සනා**- Patinissagganupassana: පටිනිස්සග්ගානුපස්සනාව යනු අත්හැරීම පිලිබඳ අනුපස්සනා කිරීමය. ආනාපාන සතිසූත්‍රයේදී: සතරවටය පූර්ණ කරගැනීම මහාඵල මහා ආනුභාව ලබාගැනීම පිණිස බව දක්වා ඇත. පටිනිස්සග්ගානුපස්සනාව ද එහි ඇති අංග 4න් එකකි: "...පටිනිස්සග්ගානුපස්සි අස්සසිස්සාමිති සික්ඛති...සිස්සාමිති සික්ඛති...".පටිනිස්සග්ගානුපස්සනාව බහුල කරගැනීමෙන් ආසමන්ත ප්‍රඥාව වැඩේ. **බලන්න**: ආසමන්ත ප්‍රඥාව.

▲**පටිප්පස්සද්ධ සීලය**-Patippassada sila: කෙළෙස් ප්‍රහීණය පිණිස ආරියන් සතු සීලය, පටිප්පස්සද්ධ සීලයය, මෙය විවිධ ශිලයන් ගෙන් එකකි. **බලන්න**: ශිලය.

▲**පටිභාන-** Discernment: **බලන්න**: ප්‍රතිභානය

▲**පටිභානකතා** -Patibhanakatha: ධම්ම දේශනාවේ ප්‍රතිභානය (හැකියාව) පටිභානකතා ලෙසින් පෙන්වා ඇත.ධර්ම දේශනාපිලිබඳ පටිභානකතා (පටිභානවන්තානං) ඇති භික්ෂුන් අතුරින්, රාධ තෙරුන් අග්‍රය. **බලන්න**: උපග්‍රන්ථය: 1, ප්‍රතිභාන.

▲**පටිසම්භිදා නුවණ-**Analytical knowledge: ධර්මය විශ්ලේෂණය කිරීම, විභාගකර බැලීමේ දක්ෂබව පටිසම්භිදා -පිළිසිඹියා නුවණ ලෙසින් පෙන්වා ඇත. එම විශ්ලේෂණය සිව් ආකාර වේ, මේ නුවන සිව් පිළිසිඹියා ලෙසින්ද පෙන්වා ඇත: 1) අර්ථ පටිසම්භිදාව 2) ධම්ම පටිසම්භිදාව 3) නිරුක්ති පටිසම්භිදාව 4) ප්‍රතිභාන පටිසම්භිදාව. මේ සිව් අවබෝධය ඇති, සංඝයා පිලිබඳ කටයුතු වල නිපුන මහණ, සෙසු අයට ප්‍රියවේ, අනුන්ගේ ගරුසැලකිලි ලැබීමට සුදුසු බව මේ සූත්‍රයේ පෙන්වා ඇත. **බලන්න**: සිව් පිළිසිඹියා. **සටහන්**: * අං.ගු.නි: 7 නිපාතය: දේවතාවග්ග: පටිසම්භිදා සූත්‍ර-2: ගුණ 7 ක් ඇති භික්ෂුවට, ඉතා ඉක්මනින්ම පටිසම්භිදා නුවණ ලබා ගත හැකිබව පෙන්වා ඇත. ** එම ගුණ ඇති සැරියුත් තෙරුන් පටිසම්භිදා නුවන විශිෂ්ඨ ඥානයෙන්

අවබෝධ කර ඇතැයි බුදුන් වහන්සේ වදාළහ. ** විස්තර පිණිස **බලන්න**: ඛු.නි: පටිසම්භිදා-1: 25-28:පටිසම්භිදා ඤාණය, පටිසම්භිදා-2: 6 පටිසම්භිදා කතා. **මූලාශ්‍ර:** අං.ගු.නි: (3 ): 5 නිපාත:5.2.4.6 පටිසම්භිදා සූත්‍රය, පි.202, EAN:5: 86.6 Analytical knowledges, p. 270.

▲ **පටිච්චසමුප්පාදය:** පාලි: **පටිච්චසමුප්පාදො -** Dependent Origination පටිච්චසමුප්පාදය, හේතු ප්‍රත්‍ය(හේතුඵල දහම) මගින් ධර්මතා ඇතිවී නැතිවී යන ආකාරය පෙන්වා දේ, මෙය බුදු දහමේ මූලික සිද්ධාන්තයකි, බුදුන් වහන්සේගේ මූලික අවබෝධයකි. සසර පැවැත්ම හා සසර දුකින් මිදීම පිළිබඳ යහපත් අවබෝධය මින් ලබාදේ. බුදුන් වහන්සේ දෙසූ ධර්මය පිළිබඳ යථා අවබෝධය ලබාගැනීමට පටිච්චසමුප්පාදය යහපත් ලෙස දැකිය යුතුය, දත යුතුය. එම කුසලතාවය පණ්ඩිතයන් සතු ගුණයක් බව බුදුන් වහන්සේ වදාළහ. **සටහන්: *** පටිච්චසමුප්පාදය පිළිබඳ දහම් න්‍යාය-ධර්ම න්‍යාය, සජ්ජායනා කළ බුදුන් වහන්සේ එම දහම් නියාය ඉගෙනිම, සිහියේ දරාගැනීම වැඩදායක බවද, මග බඹසරට මුල් වනබව සංඝයාට වදාළහ. **බලන්න**: සංයු.නි: (4) වේදනාසංයුත්ත: යොගකඛෙම් වග්ග: 1.1.10:උපස්සුති සූත්‍රය. ** සංයු.නි (2) අභිසමයසංයුත්ත:1.2.10 පච්චය සූත්‍රයේදී: පටිච්චසමුප්පාදය හා පටිච්චසමුප්පන්න ධර්ම-ඉදපච්චයා විස්තරාත්මකව පෙන්වා ඇත.

▼**වෙනත් මූලාශ්‍ර: 1. නිවනේ නිවීම**: දෙසනා 2, කටුකුරුන්දේ ඤාණානන්ද භික්ෂු, පහන් කනුව ධර්ම දේශනා. **2. පටිච්ච සමුප්පාද ධර්ම දේශනා,** 2016: කටුකුරුන්දේ ඤාණනන්ද භික්ෂු, පි. 20.

▼ **පටිච්චසමුප්පාදය ඇතිවීම හා නැතිවීමේ ක්‍රියා පිළිවෙත**: අවිද්‍යාව මුල් පුරුක ලෙසින් ගෙන පුරුක් 12 කින් සමන්විත පටිච්චසමුප්පාදය ඇතිවීම හා අවිද්‍යාව සහමුලින්ම අවසන්වීමෙන් සෙසු පුරුක් අවසන්ව සියලු දුක නැතිවෙන අන්දම බුදුන් වහන්සේ සංඝයාට පෙන්වා වදාළහ: අවිද්‍යාව හේතු කොටගෙන සංඛාර ඇතිවේ, සංඛාර හේතුකොට ගෙන විඥානය. ..එලෙස හේතු ප්‍රත්‍ය ක්‍රියාවලිය මගින් දුක් රැසක්ම ඇතිවේ, එය පටිච්චසමුප්පාදය ය. එම අවිද්‍යාව ඉතිරියක් නැතිව වැනසීයාමෙන් සංඛාර නැතිවේ. සංඛාර නැතිවිට විඥානය ඇතිනොවේ... එලෙස, ජාතිය අවසන් වීමෙන්, ජරා මරණ ආදීවූ දුක්රැසම අවසන්වේ. **සටහන**: මේ සූත්‍ර 2 හි, පටිච්චසමුප්පාද පුරුක් 12 ක්‍රියාකාරීවීමෙන් සසර ගමනද, එම ක්‍රියාවලිය නිරෝධ වීමෙන් සසර ගමන නැවතීම විස්තරාත්මකව පෙන්වා ඇත.

**මූලාශ්‍ර**: සංයු.නි: (2 ): නිදාන වගග: 1.1.1 පටිච්චසමුප්පාද සූත්‍රය, 1.1.2 විභඞග සූත්‍රය, පි.24, ESN:12:Nidanasamyutta: 1.1. Dependent Origination, and 2.2 Analysis of Dependent Origination, p.610.

▼ **සම්බෝධිය** ලැබූ බුදුන් වහන්සේ, පටිච්චසමුප්පාදය අනුලෝම වශයෙන්ද ප්‍රතිලෝම වශයෙන්ද අනුලෝම හා ප්‍රතිලෝම වශයෙන්ද අවර්ජනා කළහ. **මූලාශ්‍රය**: වින.පි: මහාවග්ග පාලි 1: මහාඛන්ධකය**:** බෝධිකතා, පි.80.

▼ **පටිච්චසමුප්පාදය** ක්‍රියාත්මකවීම මිථ්‍යා ප්‍රතිපදාව ඇතිවීමය, පටිච්චසමුප්පාදය අවසන්වීම සම්‍යක් ප්‍රතිපදාව ඇතිවීමය. අවිද්‍යාව මුල්කරගත් පටිච්චසමුප්පාද ධර්මයේ පුරුක් 12 ක්‍රියාත්මක වීම නිසා

මිථ්‍යා ප්‍රතිපදාව ඇතිවේ. අවිද්‍යාව සහමුලින් නැතිවීමෙන් පටිච්චසමුප්පාද ධර්මයේ පුරුක් 12 නැවතීම නිසා සම්‍යක් ප්‍රතිපදාව ඇතිවේ. **මූලාශ්‍ර**: සංයු.නි: (2): නිදාන වගග: 1.1.3 පටිපදා සූත්‍රය, පි.30, ESN:12: Nidanasamyutta: 3.3 The two ways, p. 613.

▼ **සම්බෝධිය** සාක්ෂාත් වීමට පටිච්චසමුප්පාද ධර්ම අවබෝධය පදනම්වේ. සංයු.නි. (2) නිදානසංයුත්ත: බුද්ධ වග්ගයේදී : පටිච්චසමුප්පාදය ධර්මය ඇතිවීම හා නැතිවීම මනාලෙස අවබෝධ කරගැනීමෙන් තමන්වහන්සේ ද, පෙර බුදුවරු වහන්සේලාද සම්බෝධිය ලැබූ බව, බුදුන් වහන්සේ විස්තරාත්මකව පෙන්වා ඇත: "මහණෙනි, බුදුවීමට පෙර, බෝසත්වූ මට මේ සිත පහළවිය: 'ඒකාන්තයෙන්ම මේ ලෝකයා දුකට පත්ව සිටි. උපදී, වයසට යයි, මිය යයි, නැවත උපදී... එහෙත් දුකින් මිදීම ගැන නොදනී. කවර විටක ජරා මරණ ආදී වූ දුකින් මිදීම අවබෝධවේද?...' " .**"පුබ්බෙව මෙ භික්ඛවෙ, සම්බොධා අනභිසම්බුද්ධස්ස බොධිසත්තස්සෙව සතො එතදහොසි: 'කිච්ඡං වතායං ලොකො ආපන්නො. ජායති ච, ජීයති ච, මීයති ච, චවති ච, උප්පජ්ජති ච. අථ ච පනිමස්ස දුක්ඛස්ස නිස්සරණං නප්පජානාති ජරාමරණස්ස. කුදස්සු නාම ඉමස්ස දුක්ඛස්ස නිස්සරණං පඤ්ඤායිස්සති ජරාමරණස්සා' ති"** "කුමක් ඇති කල්හි ජරා මරණය ඇතිවේද? එසේ සිතන මට ඉපදීම - උපත ඇති කල්හි ජරා මරණය ඇතිවේ යයි අවබෝධ විය. කුමක් ඇති කල්හි ජාතිය වේද? භවය ඇති කල්හි ජාතිය ඇතිවේ යන්න අවබෝධ විය". එලෙස... බෝසතුන්ට, අවිද්‍යාව නිසා සංඛාර... සංඛාර නිසා විඤ්ඤානය හටගනී... ආදී වශයෙන් දුක් රැසේ ඇතිවීම අවබෝධවිය....එම අවිද්‍යාව පහ වීමෙන්... දුක අවසන්වන බව අවබෝධවිය. එසේ, පෙර නො ඇසුවිරු දහම පිලිබඳ දර්ශනය (ඇස) ...නුවණ ... ප්‍රඥාව... විද්‍යාව...ආලෝකය බෝසතුන්ට පහළවිය.**" ...භික්ඛවෙ පුබ්බෙ අනනුස්සුතෙසු ධම්මෙසු චක්ඛුං උදපාදී, ඤාණං උදපාදී, පඤ්ඤා උදපාදී, විජ්ජා උදපාදී, ආලොකො උදපාදී"**. **මූලාශ්‍ර**: සංයු.නි: (2 ): නිදානවගග: බුද්ධවගග: සූත්‍ර 1.1.4 සිට 1.1.10, පි.30-37, ESN:12: Nidanasamyutta:The Buddhas: Sutta 4.4.to 1-.10, p. 614-620.

▼ **බුදුන් වහන්සේ** පටිච්චසමුප්පාද ධර්මතාවය යහපත් ලෙසින් වදාරා ඇත. ඒ ධර්මතාවය සංඝයා එක්ව, ධර්මයේ චිරස්ථිතිය පිණිස සජ්ජායනා කිරීම සුදුසු ය යි සැරියුත් මහා තෙරුන් සංඝයාට උපදෙස් දී ඇත.

**මූලාශ්‍ර**: දිඝ.නි: (3):10 සංගිති සූත්‍රය, පි. 372 , EDN: 33 Saṅgīti Sutta: The Chanting Together, p. 362.

▼ **පටිච්චසමුප්පාද ධර්මය අනවබෝධය, සසරට බැඳ තබයි**: එක් සමයක ආනන්ද තෙරුන්, බුදුන් වහන්සේ බැහැදැක, පැවසුවේ, ආශ්වර්යමත් පටිච්චසමුප්පාද ධර්මය කොතරම් ගැඹුරු වුවත්, තමන්හට එය ඉතා ප්‍රකට ලෙසින් වැටහෙන බවය. ආනන්ද තෙරුන්ගේ එම ප්‍රකාශය පිළිබඳව බුදුන් වහන්සේ මෙසේ වදාළහ: " ආනන්ද එසේ නො කියන්න. මේ පටිච්චසමුප්පාද ධර්මය ගැඹුරුය, ගැඹුරු ස්වභාවයෙන් යුක්තය. මේ ධර්මය අවබෝධ නොකිරීම නිසා, තීක්ෂණ නුවණින් නොදුටු නිසා, මේ ප්‍රජාව, පැටලීගිය නූල් බෝලයක් මෙන් අවුල්වී සිටි, දිලීරයෙන් වැසීගිය කොළමෙන් විනාශවී ඇත, කැරකි, වෙලි පැටලී ගිය මුන්ජා තණකොළ මෙන් පැටලී සිටි. එමනිසා දුක්විපතින්, දුගතියෙන් ඔබ්බට යෑමට නො

හැකිව ජාති මරණ වටා කැරකෙන සසරට ඇලි ඇත": **" මා හෙවං ආනන්‍ද අවච... ගම්භීරො වායං... පටිච්චසමුප්පාදො ගම්භීරාවභාසොච. එතස්ස ආනන්‍ද, ධම්මස්ස අනනුබොධා අප්පටිවෙධා එවමයං පජා තන්තාකුලක ජාතා ගුළාගුණ්ඨිකජාතා මුඤ්ජබබ්බජභූතා අපායං විනිපාතං සංසාරං නාතිවත්තති".** ( Do not say that, Ananda, ... This dependent origination is profound and appears profound. It is through not understanding, not penetrating this doctrine that this generation has become like a tangled ball of string, covered as with a blight, tangled like coarse grass, unable to pass beyond states of woe, the ill destiny, ruin and the round of birth-and-death). **මූලාශ්‍ර:** දීඝ.නි: ( 2): 2 මහානිදාන සූත්‍රය, පි. 95, EDN:15: Mahānidāna Sutta: The Great Discourse on Origination, p. 166.

▲ **පටිච්චසමුප්පාද කුසලතාවය**: පාලි: **පටිච්චසමුප්පාදො කුසලො-** skilled in dependent origination: පටිච්චසමුප්පාද කුසලතාවය යනු පටිච්චසමුප්පාද ධර්මතාවය- හේතු ප්‍රත්‍ය- යහපත් ලෙසින් දැනීම හා දැකීමය. මෙය පණ්ඩිතයන් සතු ගුණයකි. භික්ෂුව, පටිච්චසමුප්පාද කුසලතාවය ලබා ගන්නා ආකාරය බුදුන් වහන්සේ මෙසේ පෙන්වා ඇත: **"ඉධානන්‍ද භික්ඛු එවං පජානාති: ඉමස්මිං සති ඉදං හොති. ඉමස්සුප්පාදා ඉදං උප්පජ්ජති. ඉමස්මිං අසති ඉදං න හොති. ඉමස්ස නිරොධා ඉදං නිරුජ්ඣති. යදිදං අවිජ්ජා පච්චයා සඞ්ඛාරා...**". "එය ඇතිවිට මෙය ඇතිවේ, එය උපදිමෙන් මෙය ද ඉපදේ, එය නැතිවිට මෙය නැතිවේ , එය අවසන්වීමෙන් මෙය ද අවසන් වේ" ... එලෙසින් පටිච්චසමුප්පාදය ඇතිවීම හා නැතිවීම පිළිබඳව භික්ෂුව මනා අවබෝධය ලබාගැනීම පටිච්චසමුප්පාද කුසලතාවය යයි බුදුන් වහන්සේ වදාළහ. විස්තර පිණිස **බලන්න**: සංයු.නි (2 ) නිදාන වගග1.1.1 පටිච්චසමුප්පාද සූත්‍රය, 1.1.2 විභඞ්ග සූත්‍රය, පි.24, ESN:12: Nidanasamyutta: 1.1. Dependent Origination, and 2.2 Analysis of Dependent Origination, p.610. **මූලාශ්‍ර**: ම.නි: ( 3): 3.2.5 බහුධාතුක සූත්‍රය,පි.209, EMN: 115: The Many Kinds of Elements, p. 840.

▲ **පටිසංඛාන බල:** පාලි: **පටිසඞ්ඛානබලං-**Power of reflection: ධර්මයේ පටිසංඛාන බල ලෙසින් පෙන්වා ඇත්තේ නුවණින් ධර්මතා පිලිබඳ අවර්ජනා කර ගැනීමට ඇති බලය-ශක්තිය ය. එමගින් අධර්මය බැහැර කර ධර්ම මාර්ගය වඩා ගත හැකිවේ. බුදුන් වහන්සේ මෙසේ වදාළහ: "මහණෙනි, පටිසංඛාන බලය කවරේද: මේ ලෝකයේ පුද්ගලයෙක් කාය...වාක්... මනෝ දුශ්චරිත (ත්‍රිවිධ දුශ්චරිත) ගැන මෙලෙස නුවණින් සලකා බලයි: 'මේ ක්‍රියා නිසා මේ ලොවෙහිද, පර ලොවෙහිද නරක විපාක විදීමට සිදුවේ'. එසේ ආවර්ජනය කරන ඔහු කාය, වාක් හා මනෝ දුශ්චරිත දුරු කරයි, යහපත් කාය, වාක් හා මනෝ ක්‍රියා කරමින් පිරිසිදු- පවිත්‍ර බවට පැමිණ හොඳින් වාසය කරයි. එය පටිසංඛාන බලය වේ" , එමගින්, මෙලොවද, පරලොවද සුවපත්ව වාසය කරයි. (And what is the power of reflection? Here, someone reflects thus: 'Bodily... verbal ... mental misconduct has a bad result in the present life and in the future life. Having reflected thus, he abandons bodily... verbal ...mental misconduct and develops bodily... verbal & mental good conduct; he maintains himself in

purity. This is called the power of reflection). **සටහන**: පටිසංඛාන බලය, ආධ්‍යාත්මික වර්ධනය පිණිස ලබාගත යුතු බල 2න් එකකි. **බලන්න:** බල දෙක. **මූලාශ්‍ර**: අං.ගු.නි: (1):2 නිපාත: අධිකරණ වග්ග: 2.1.2.1, 2.1.2.2. හා 2.1.2.3 සූත්‍ර, පි.142. EAN: 2: II Diciplinary: 11.1, 12.2., 13.3, Sutta, p. 57.

▼ **බුදුන් වහන්සේ** පටිසංඛාන බලය පිළිබඳව යහපත් ලෙසින් වදාරා ඇත. ඒ ධර්මතා සංඝයා එක්ව, ධර්මයේ චිරස්ථිතිය පිණිස සජ්ජායනා කිරීම සුදුසු ය යි සැරියුත් මහා තෙරුන් සංඝයාට උපදෙස් දී ඇත. **මූලාශ්‍ර**: දිඝ.නි: (3 ):10 සංගිති සූත්‍රය, පි. 372, EDN: 33 Saṅgīti Sutta: The Chanting Together, p. 362.

▲**පටිසෝතගාමී පුද්ගලයා**: පාලි: **පටිසොතගාමී පුග්ගලො-** person who goes against the stream: පටිසෝතගාමී යනු සසර ප්‍රවාහයට එරෙහිව යන පුද්ගලයාය. **බලන්න**: අනුසොතගාමී. **බුදුන් වහන්සේ** පටිසෝතගාමී පුද්ගලයා මෙසේ හඳුන්වා ඇත: මෙලොව යම් පුද්ගලයෙක් වස්තුකාමය සේවනය නො කරයි. පාප ක්‍රියා නො කරයි. දුක, දොම්නස ඇතිව කඳුළු හලමින් වුවත් ඔහු පිරිපුන් පිරිසිදු බඹසර ජීවිතය සම්පූර්ණ කරගනී: **"කතමො ච භික්ඛවෙ, පටිසොතගාමී පුග්ගලො? ඉධ භික්ඛවෙ එකච්චො පුග්ගලො කාමෙ න පටිසෙවති, පාපඤ්ච කම්මං න කරොති, සහාපි දුක්ඛෙන සහාපි දොමනස්සෙන අස්සුමුඛො'පි රුදමානො පරිපුණ්ණං බ්‍රහ්මචරියං චරති. අයං වුච්චති පටිසොතගාමී පුග්ගලො"** ( Here, someone does not indulge in sensual pleasures or perform bad deeds. Even with pain and dejection, weeping with a tearful face, he lives the complete and purified spiritual life. This is called the person who goes against the stream) **සටහන**: මෙහිදී පෙන්වා ඇත්තේ ධර්ම පුහුණුවේ යෙදී ඇති පුද්ගලයෙක් ගැනය. ඔහු දුෂ්කර සසර ජල ප්‍රවාහයට විරුද්ධව යමින් බ්‍රහ්මචරියාව සම්පූර්ණ කර දුකෙන් මිදී ඇත. **මූලාශ්‍ර:** අං.ගු.නි: ( 2 ): 4 නිපාත: 4.1.1.5 අනුසෝත සූත්‍රය, පි. 34 , EAN:4: 5.5 Along with the Stream, p. 148.

▲ **පටිසන්ථාරො** -paṭisanthāro: පටිසන්ථාරො යනු ආචාරශීලිබවය. ආධ්‍යාත්මික මග වඩා ගැනීමට උපකාරීවන ධර්මයකි. **බලන්න**: ආචාරශීලි බව, ගෞරව ධර්ම.

▲ **පටිසාරණියකම්ම**-Paṭisāraṇiyakamma: පටිසාරණියකම්ම යනු සංඝයා විසින් ගිහියන් ගේ අයහපත පිණිස කරන ක්‍රියාවන්ය, විනය කර්මයකි. මේ සූත්‍රයේ, එවැනි කරුණු 8 ක් පෙන්වා ඇත. පටිසාරණියකම්ම සන්සිඳුවා ගැනීම පිණිස පුරුදු කලයුතු කරුණු 8 ක් ද මෙහි දක්වා ඇත. **සටහන**: පටිසාරණියකම්මයෙන් මිදීම පිණිස භික්ෂුව, ගිහියන්ගේ සමාව ලබා ගත යුතුවේ. සුධර්ම භික්ෂුව, යහපත් දායකයෙක්වූ චිත්ත ගහපතිට පරිභව කිරීම නිසා ඔහුට මේ කම්මය පනවා ඇත. **බලන්න:** උපග්‍රන්ථය:1,3, EAN:Note: 1812, p. 668. **මූලාශ්‍ර:** අං.ගු.නි: (5) 8 නිපාත: 8.2.9.9 පටිසාරණියකම්ම සූත්‍රය, පි. 380, EAN:8: 89.9 Reconciliation, p. 455, වින.පි.චුලවග්ග 1: කම්මක්ඛන්ධය- පටිසාරණියකම්ම, පි. 84.

▲ **පටිසල්ලාන-** Patisallana: පටිසල්ලාන (පිළිසලන) යනු ආධ්‍යාත්මික මග වඩා ගැනීම පිණිස කාය හා චිත්ත විවේකය ඇතිව සිටීමය. **බලන්න:** හුදකලා විවේකය.

▼ **පටිසල්ලානයේ ඇලී,** යහපත් ලෙසින් භාවානාව වඩාගන්නා මහණ අනාගාමී හෝ අරහත් මගඵල ලබාගන්නා බව බුදුන් වහන්සේ පෙන්වා ඇත. **මූලාශ්‍රය:** ඛු.නි: ඉතිවුත්තක:2.2.8 පටිසල්ලාන සූත්‍රය, පි.398.

▼ **බුදුන් වහන්සේ** සංඝයාට අනුසාසන කර ඇත්තේ පටිසල්ලානයේ- විවේකසුවය ඇතිව වාසය කරනලෙසය. එමගින්, පංච උපාදාන ස්කන්ධයේ යථාබව -ඇතිවීම හා අවසන්වීම අවබෝධකර ගත හැකිය. ඒ දුක අවසන් කර ගැනීමය. **සටහන්:** * සංයු.නි: (4) වේදනාසංයුත්ත: බලවග්ග:1.10.7 පටිසල්ලාන සූත්‍රය: පටිසල්ලානයේ නිරත මහණ, සය ඉන්ද්‍රිය අවබෝධකර යථා භූතඥානය ලබාගන්නා බව පෙන්වා ඇත. ** සංයු.නි: (5-2) මහාවග්ග: සච්චසංයුත්ත: 12.1.2 පටිසල්ලාන සූත්‍රය**:** පටිසල්ලානයේ නිරත මහණ, දුක ඇතිවීමහා නැතිකිරීම පිළිබඳ යථා අවබෝධය ලබාගන්නා බව පෙන්වා ඇත. **මූලාශ්‍ර:** සංයු.නි: (3) ඛන්ධ සංයුත්ත:1.1.1.6 පටිසල්ලාන සූත්‍රය**,** පි.54,ESN:22: Kahndasamytutta: I:6.6.Seclusion,p.1015.

▲**පොට්ඨපාද පරිබ්‍රාජක**-Pottapada paribrajaka: **බලන්න**:උපග්‍රන්ථය: 3

**පඨ**

▲ **පඨවි**-Earth: පඨවි-පෘතුවිය, ලෙසින් දක්වා ඇත්තේ මහා පොළවය. එය අසීමිතය, අප්‍රමාණය. බාහිර පඨවිය ලෙසින් පෙන්වා ඇත්තේ පොළවේ ඇති ඝන ස්වාභවයය. අභ්‍යන්තර පඨවි- ධාතුව ලෙසින් පෙන්වා ඇත්තේ කයේ ඇති ඝන ස්වාභවයය. මහායයි සලකන මහා පොළවද, වෙනස්වී විනාශවී, නැතිවී යයි. **බලන්න:** ම.නි: (1) මහා හත්ථිපදෝපම සූත්‍රය.

▲ **පඨවි ධාතුව**- Earth element: පඨවි ධාතුව ලෙසින් පෙන්වා ඇත්තේ මහාපොළවේ ඝනබව හා කයේ ඇති ඝනබවය. පඨවි ධාතුව, කය සකස්වී ඇති සතර මහා භූතයන්ගෙන් එකකි. බුදුන් වහන්සේ පඨවි ධාතුව උපමා කොට ධර්මය මෙසේ වදාළහ:

**පඨවිය උපමාව 1:** මහා පොළවේ ප්‍රමාණය මැනිය නොහැකිය. එලෙස දහම් ඇස ලැබීම (ධම්ම චක්ඛු) -සෝතාපන්නබව ලැබීම මහා අර්ථයක්- ලාභයක් බවය. මහා පොළව මෙන් එම ලාභය අප්‍රමාණබය. **මූලාශ්‍ර:** සංයු.නි: (2): නිදානවග්ග:අභිසමය සංයුත්ත:1.10.5 හා 1.10.6 පඨවි සූත්‍ර 2කි, පි. 238, ESN:13: Abhisamyutta: 5-1 & 6.2 Earth, p.729. **පඨවිය උපමාව 2:** සසර දීර්ඝ බව පෙන්වීම පිණිස මේ උපමාව යොදාගෙන ඇත. දීර්ඝ කාලයක් ඇවෑමෙන් මහා පොළව අවසන්වන නමුදු සසර ගමන අවසන්වීමට ඊටත් වඩා කල් යයි. **මූලාශ්‍ර:** සංයු.නි: (2 කාණ්ඩය) අනමතග්ගසංයුත්ත: 3.1.2 පඨවි සූත්‍රය,පි.298, ESN:15: Anamataggasamyutta: 2.2 The earth, p. 788. **පඨවිය උපමාව 3:** කායබලයෙන් කලයුතු කටයුතු, පොළව ආධාර කරගෙන කරන ලෙසින්, මේ සසුනේ මහණ ශිලයේ පිහිටා, අකුසල මුල් ප්‍රහීණය කිරීමෙන්, සම්මා දිට්ඨිය ආදී අංග දියුණු කරමින්, ආරිය අටමග වඩනබව මේ උපමාවෙන්

පෙන්වා ඇත. ආරිය අටමග පොළොව ලෙසින්,ධර්ම මාර්ගය වඩා ගැනීමට ආධාරවේ. **මූලාශ්‍ර**: සංයු.නි: (5-1): මහාවග්ග: මග්ගසංයුත්ත:බලකරණීය: 1.14.1 බලසූත්‍ර 4කි, පි. 134, ESN: 45: Maggasamyutta: XIV: 149.1 - 4 suttas, p. 1692. **පඨවිය උපමාව 4:** දිට්ඨිසම්පන්න (සෝතාපන්න) ආරිය ශ්‍රාවකයා විසින් නිමා කරනලද දුක, මහා පොලව මෙන් අප්‍රමාණය, ගෙවීමට ඇති දුක පස්ගුලි 7ක් වැනි කුඩා ප්‍රමාණයක් යයි බුදුන් වහන්සේ මේ උපමාවෙන් පෙන්වා ඇත. **මූලාශ්‍ර**: සංයු.නි: (5-2): මහාවග්ග: සච්චසංයුත්ත: 12.6.5 පඨවි සූත්‍රය,පි. 350,ESN:56: Sacchasamyutta: VI:55.5 The Earth, p.2327.

**පත**

▲ **පෘතග්ජන -** Worldly person: ධර්මයට අනුව පෘතග්ජන- පුහුදුන් මිනිසා ලෙසින් පෙන්වා ඇත්තේ ආරියන් නොදුටු, ආරිය ධර්මය නොඇසූ සාමාන්‍ය ලෝකයාය.**බලන්න**: අසත්පුරුෂ, අටලෝදහම.

▲ **පතන දේ ලබාගැනීම-**The way to fulfill wishes: තමන් පතන- කැමැති, ලෞකික හා ලෝකෝත්තර දේ ලබාගැනීම පිණිස ධර්මානුකූල ජීවිතයක් ගත කිරීම අවශ්‍ය බව බුදුන් වහන්සේ පෙන්වා ඇත. පළමුව, ශීලය පරිපූර්ණත්වයට කර ගතයුතුය. එසේම සමාධිය- ජාන ඇතිව, ප්‍රඥාව- විදසුන් නුවණ ඇතිව, හුදකලා විවේකය සහිතව වාසය කලයුතුවේ: **"...සීලෙසෙවස්ස පරිපූරකාරී අජ්ඣත්තං චෙතොසමථ මනුයුත්තො අනිරාකතජ්ඣානො විපස්සනාය සමන්නාගතො බ්‍රෑහෙතා සුඤ්ඤාගාරානං" (**...let him fulfil the precepts, be devoted to internal serenity of mind, not neglect meditation, be possessed of insight, and dwell in empty huts). **සටහන්**: * යමක් පැතීම, කැමතිවීම: ආකඞ්ඛෙය්‍ය යය. ** ඒ සඳහා ශීල සමාධි ප්‍රඥා යන ත්‍රිවිධ ශික්ෂණය සහිතව වාසය කිරීම අවශ්‍යවේ. ** හුදකලා විවේකය: කාය හා චිත්ත විවේකය, සමථ භාවනාව වැඩීමට හා විපස්සනා නුවණ ලබාගැනීමට උපකාරිවේ. **ඉටු කරගැනීමට හැකිදේ**: 1) තමන් සමග වාසය කරන අනිකුත් සංඝයාට (සබ්‍රහ්මචාරින් හට) ප්‍රියමනාපව ඔවුන්ගේ ගරු සම්මාන ලබාගෙන සිටීමට කැමති වන්නේ නම් එය ඉටු කර ගත හැකිය. 2) යහපත් ලෙසින් සිව්පසය ලබා ගැනීමට කැමති වන්නේ නම් එය ඉටු කර ගත හැකිය. 3) සිව්පසය ලාබාදෙන දායකයන්ට මහාත්ඵල මහා ආනිසංස ලබාදීමට කැමති වන්නේ නම් එය ඉටු කරගත හැකිය. 4) තමන්ගේ මියගිය නෑදෑයන්-මළවුන් එම භික්ෂුව ගැන පහන් සිත් ඇතිව ඔහු සිහිකරන්නේද, එම සිහිකිරීම මගින් ඔවුනට මහාත්ඵල මහා ආනිසංස ලබාදීමට කැමති වන්නේ නම් එය ඉටු කරගත හැකිය. **සටහන:** මියගිය නෑදෑයන්, ප්‍රේතලෝකයේ හෝ පහළ දේව ලෝකයක ඉපදී, තමාගේ ඥාති භික්ෂුවගේ ශීලසම්පන්න ආදී ගුණ සිහිපත් කරනවිට එය ඔවුන්ට පින් ඇතිවීමට හේතුවේ, නරක යළි උපත් වලක්වාලීම පිණිස, මතු කල නිවන ලබාගැනීමට හේතුවන කරුණු ඇති කර ගැනීමට උපකාරිවේ. **බලන්න**: EMN: note: 78, p. 1070. 5) අධිකුසල ධර්මයෙහි හැසිරීමට ඇති අරතිය- නො ඇලීම හා කම්සැප කෙරහි ඇති ඇලීම මැඩ ගෙන වාසය කිරීමට කැමති වන්නේ නම් නම් එය ඉටු කරගත හැකිය. 6) තමනට ඇතිවන ඕනෑම භයක් තැති ගැනීමක් (කායික හෝ මානසික) ඇතිවනවිට, ඒවාට යටනොවී, ඒවා මැඩ පවත්වාගෙන සිටිමට කැමති

වන්නේ නම් නම් එය ඉටු කරගත හැකිය. 7) අධිචිත්තය ලබාදෙන සිව්ජාන සමාපත්ති සහිතව මේ ජීවිතයේම සුවය හා සැපය ඇතිව වාසය කිරීමට කැමති වන්නේ නම් නම් එය ඉටු කරගත හැකිය. 8) ශාන්ත විහරන වූ අරූපසමාපත්ති ලබාගෙන සිටිමට කැමති වන්නේ නම් නම් එය ඉටු කරගත හැකිය. 9) තුන් සංයෝජන (සක්කායදිට්ඨිය, විචිකිච්ඡා, සීලබ්බතපරාමාස) පහකර සෝතාපන්න වීමට කැමති වන්නේ නම් නම් එය ඉටු කරගත හැකිය. 10) තුන් සංයෝජන පහකර- ලෝභ දෝස මෝහ (අකුසල මූල්) යන සංයෝජන තුනී කරගැනීමෙන් සකදාගාමි වීමට කැමති වන්නේ නම් නම් එය ඉටු කරගත හැකිය. 11) ඕරම්භාගිය සංයෝජන පහ කරගැනීමෙන් අනාගාමි වීමට කැමති වන්නේ නම් නම් එය ඉටු කරගත හැකිය. 12) මහා ඉර්දී ප්‍රාතිහාර්ය ලබාගැනීමට කැමති වන්නේ නම් නම් එය ඉටු කරගත හැකිය. **මූලාශ්‍ර:**ම.නි: ( 1): 1.1.6 ආකන්ඛෙයිය සූත්‍රය, පි. 94, EMN: 6: Ākankheyya Sutta - If a Bhikkhu Should Wish, p. 99.

▲ **පත්තිචරියාව**-Pathtichariya: චරියාවන් 8 න් එකක් ලෙස පත්තිචරියාව පෙන්වා ඇත. **බලන්න**: චරියා කථා **මූලාශ්‍රය:** ඛු.නි:පටිසම්භිදා 2:පඤ්ඤාවග්ග: 3.5 චරියාකථා, පි.222.

▲ **පත්තනික්කුජ්ජන කම්ම**- Overturning the alms-bowl: පත්තනික්කුජ්ජන කම්මය විනය කර්මයකි. එනම්, අවගුණ 8 ක් ඇති උපාසක හට සංඝයා විසින් පනවන කර්මයකි- සංඝයා ගේ අනර්ථය පිණිස කටයුතු කරන ගිහියන් ගෙන් පිඩු නොගැනීම-පිණ්ඩපාතය, පාත්‍රය යටිකුරු කිරීමට තීරණය කිරීම. මේ සූත්‍රයේ එම අවගුණ විස්තර කර තිබේ. **සටහන:** *පත්ත- පාත්‍රය ** කලින් පැනවූ පත්තනික්කුජ්ජන කම්මය, අවලංගු කිරීම පිණිස සිදු කරන විනය කර්මය මගින් ගිහිකෙනෙකුගේ, පෙර අවගුණ අවසන් කිරීම නිසා නැවත තම පාත්‍රය පිඩු පිණිස පිළිගැන්වීමට (පාත්‍රය උඩුකුරු කිරීම) සංඝයා තීරණය කිරීම. එම යහපත් ගුණ 8 මෙහි විස්තර කර ඇත. **මූලාශ්‍ර:** අංගු.නි: ( 5): 8 නිපාත: පත්තනික්කුජ්ජන සූත්‍රය**,** පි.375, EAN: 8: 87.7 Almsbowl, p. 455.

▲ **පත්තපිණ්ඩික**-Patthapindika: පත්තපිණ්ඩික ලෙසින් පෙන්වා ඇත්තේ පාත්‍ර, සංඥාව ලෙස තබාගෙන පිණ්ඩපාතයෙන් යැපෙන සංඝයාය. මේ සූත්‍රයේ පත්තපිණ්ඩික වර්ග 5 ක් බුදුන් වහන්සේ පෙන්වා ඇත.

**මූලාශ්‍ර:** අංගු.නි: ( 3): 5 නිපාත: ආරඤ්ඤවග්ග: 5.4.4.11 පත්තපිණ්ඩික සූත්‍රය, පි.382, EAN:5:IV:182.2 sutta, p. 298.

▲ **පතිකුලය**-Patikulaya: පතිකුලයට යෑම යනු යුවතියක් විවාහවී, වාසය කිරීම පිණිස සැමියාගේ නිවසට පැමිණීමය (පති-ස්වාමියා) . එවැනි යුවතියට යහපත් විවාහ ජීවිතයක් ගෙනයාම පිණිස බුදුන් වහන්සේ මෙසේ අවවාද වදාළහ: 1) ස්වාමියාට පෙර උදැසන නැගිටීම සුදුසුය 2) ස්වාමියාට පසුව නින්දට යෑම සුදුසුය 3) නිවසේ කුමන කටයුතු කිරීමට තිබේද යයි සොයා බැලීම 4) අන් අයට ප්‍රීතිය ඇතිවෙන පරිදි හැසිරීම 5) ප්‍රිය බස් කථා කිරීම 6) වැඩිහිටි මහණ බමුණු, දෙමාපිය ආදීන්ට සත්කාර ගරුබුහුමන් කලයුතුය 7) ගේදොර ඇති කටයුතු ආදී ඇති කර්මාන්ත කිරීමට දක්ෂවියයුතුය 8) සැමියාගේ කටයුතු කරන පිරිස, සේවක

සේවිකා ආදීන්ට යහපත් ලෙසින් ආහාර පාන ආදිය සැපයිය යුතුය 9) ස්වාමියා රැස් කරන ධනය නිසිලෙස භාවිතා කිරීමට, ආරක්ෂා කිරීමට කටයුතු කලයුතුය. එසේ යහපත් ලෙසින් දිවිය ගෙවන පතිනිය-බිරිද, මරණින් මතු සුගතියේ- නිර්මාණරති දේව නිකායේ යළි උපත ලැබීමට වාසනාව ඇත. **මූලාශ්‍රය:**අංගු.නි: (3): 5 නිපාත: සුමණාවග්ග: 5.1.4.3 උග්ගහ සූත්‍රය, පි.78.

▲**පතිතවීම-**Falling down: පතිතවීම (පපතිත) ලෙසින් පෙන්වා ඇත්තේ ගිලිහියාමය. කරුණු 4 ක් නිසා මහණ බුදු සසුනෙන් පතිතවීයයි. 1) ශිලසම්පන්න නොවීම 2) යහපත් සමාධිය නොලැබීම 3) යහපත් ප්‍රඥාව නොමැතිවීම 4) යහපත් විමුක්තිය නොලැබීම. එහෙත් එම කරුණු යහපත් ලෙසින් ලබා ඇති මහණ, සසුනේ ගිලිහි නොයයි (අප්පතිතො). **මූලාශ්‍ර**:අංගු.නි: (2):4 නිපාත:4.1.1.2 පපතිත සූත්‍රය, පි. 26, EAN:4: 2.2. Fallen, p. 147.

▲**පතිට්ඨිත**- Establishment: පතිට්ඨිත- පිහිටුවා ගැනීමය. අප්‍රමාදය ඇති භික්ෂුව, ආධ්‍යාත්මික පංච ඉන්ද්‍රිය (පස ඉඳුරන්) යහපත් ලෙසින් පිහිටුවාගනී. අප්‍රමාදය ඇතිව,කෙළෙස්වලින් (ආසව ධර්මතා වලින්) සිත යහපත් ලෙස ආරකෂා කරගැනීමෙන්, පංච ඉන්ද්‍රිය වර්ධනය වේ. **මූලාශ්‍ර**:සංයු:නි: (5-1): මහාවග්ග:ඉන්ද්‍රියසංයුත්ත:4.6.6. පතිට්ඨිත සූත්‍රය, පි.434, ESN: 48: Indriyasamyutta: 56.6 Established, p. 1990.

▲ **පතිරූපදෙසවාසො** - Living in suitable places: පතිරූපදෙසවාසො යනු ධර්මානුකූල ජිවිතයක් ගත කිරීමට සුදුසු ප්‍රදේශයක ජිවත්විමය, මේ සුභ- මංගල කරුණකි. **බලන්න**: චක්‍ර සතර, මංගල සූත්‍රය.

▲**පතිලීන**-Gone into solitude: ධර්මයට අනුව පතිලීන ලෙසින් පෙන්වා ඇත්තේ, ධර්මය අවබෝධ කරගත් භික්ෂුව, හුදකලා විවේකයට යාමය- ලෝකයෙන් සැඟවී යාමය. **බලන්න**:EAN: note: 703, p.617. භික්ෂුව පතිලීන වන්නේ කෙසේද? 1) සත්‍යදර්ශනය අවබෝධකිරීම (**පුද්ගලික සත්‍යයන් පහකිරීම- පනුණණපච්චෙකසච්චො). බලන්න:** පුද්ගලික සත්‍ය බැහැරකිරීම. 2) සෙවීම (ගවේෂණය- ආධ්‍යාත්මික මගසෙවීම ) සහමුලින්ම අතහැරීම **(සමවයසට්ඨෙසනො හොති). බලන්න:** පර්යේෂණ, සමවයසට්ඨෙසනො. 3) සංසුන් කායසංස්කාර ඇතිවීම. **(කායසංඛාර පස්සද්දිය- පසසද්ධකායසඞ්ඛාරො හොති). බලන්න**: කායසංඛාර පස්සද්දිය, ජාන. 4) හුදකලාවීම-එකලාවීම: සහමුලින්ම අසම්මානය දුරුවීම. එම කරුණු සාක්ෂාත් කරගත් මහණ, 'පතිලීන' යයි කියනු ලැබේ. **සටහන:** 1-3 විස්තර පිණිස බලන්න: ආරිය වාසස්ථාන. **මූලාශ්‍ර:**අංගු.නි: (2): 4 නිපාත: 4.1.4.8 පතිලීන සූත්‍රය, පි.102, EAN:4: 38.8 Drawn back, p. 164.

▲ **පාතුභාව** - manifestation: පාතුභාව යනු ඇතිවීම- උපතක්ලැබීමය. **බලන්න**: පහළවීම

▲ **පාතිමොකඛ (පාලි): පාමොක්**- Pātimokkha: බුදුන් වහන්සේ ශ්‍රාවක සංඝයාගේ යහපත පිණිස පනවනලද ශික්ෂාපද-විනය, පාතිමොක්ඛ ලෙසින් දක්වා ඇත. එම ශික්ෂාපද අනුව පුහුණුවන සංඝයා පාතිමොක්ඛ සංවර ශිලය ආරක්ෂා කරති. **සටහන:** සංයු.නි: (5-1 ) මහාවග්ග:

සතිපට්ඨාන සංයුත්තයේ:3.5.6 පාතිමොක්ඛ සූත්‍රයේදී, පාතිමොක්ඛ සංවර ශීලය ආරක්ෂා කරමින් අරහත්වය ලැබීම ගැන පෙන්වා ඇත.

▼ **පාතිමොක්ඛ පැනවීමට හේතු (පාතිමොකඛං උදදිටයං)**: 1) සංඝයා ගේ ශුභසිද්ධිය පිණිස 2) සංඝයා ගේ පහසුබව පිණිස 3) දුසිල් පුද්ගලයන්ගේ වැරදි පරීක්‍ෂා කිරීම පිණිස (නිග්‍රහ පිණිස) 4) සිල්වත් සංඝයාගේ පහසු විහරණය පිණිස 5) වර්තමාන ජීවිතයේ ඇතිවිය හැකි ආසව සංවර කරගැනීම පිණිස 6) අනාගතයේ ඇතිවිය හැකි ආසව සංවරය කරගැනීම පිණිස 7) ශ්‍රද්ධාව නොමැති අයට ශ්‍රද්ධාව ඇතිකර ගැනීම පිණිස 8) ශ්‍රද්ධාව ඇති අයගේ ශ්‍රද්ධාව වර්ධනය පිණිස 9) සද්ධර්මයේ තිර පැවැත්ම පිණිස (සථිතිය) 10) විනයේ ප්‍රවර්ධනය පිණිස (විනයානුග්‍රහය). **මූලාශ්‍ර**:අං.ගු.නි: (6 ): 10 නිපාත: 10.1.4.1 උපාලි සූත්‍රය,පි. 152, EAN:10: 31.1. Upali-1, p. 508.

▼**පාතිමොක්ඛ අත්හිටුවීම**: පාතිමොක්ඛ අත්හිටුවීම (පාතිමොකඛටඨපනා-suspending the Pātimokkha) යනු විනය කරුණක් නිසා භික්ෂුවකට හෝ භික්ෂුණියකට උපෝසථ දිනයේ පාතිමොක්ඛ සජ්ජායනාවට සහභාගිවීමට ඉඩ නොදීමය. මේ පිළිබඳව බුදුන්වහන්සේ කරුණු 10ක් පෙන්වා ඇත: 1) පාරජිකාවක් කල තැනැත්තා රැස්වීමේ සිටීම 2) පාරජිකාවක් කල තැනැත්තා පිලිබඳ සාකච්චාව සිදුවෙමින් තිබෙනවිට 3) උපසම්පාදව නොලැබූ කෙනෙක් රැස්වීමේ සිටීම 4) උපසම්පාදව නොලැබූ කෙනෙක් ගැන සාකච්චාව සිදුවෙමින් තිබෙනවිට 5) සිකපද පුහුණුව අත්හළ කෙනෙක් රැස්වීමේ සිටීම 6) සිකපද පුහුණුව අත්හළ කෙනෙක් පිලිබඳ සාකච්චාව සිදුවෙමින් තිබෙනවිට 7) නපුංසක පුද්ගලයෙක් රැස්වීමේ සිටීම . **සටහන:** නපුංසක-පණ්ඩක-eunuch. 8) නපුංසක පුද්ගලයෙක් පිලිබඳ සාකච්චාව සිදුවෙමින් තිබෙනවිට 9) භික්ෂුණී දූෂකයෙක් රැස්වීමේ සිටීම 10 ) භික්ෂුණී දූෂකයෙක් පිලිබඳ සාකච්චාව සිදුවෙමින් තිබෙනවිට. **මූලාශ්‍ර**:අං.ගු.නි: (6):10 නිපාත,10.1.4.2. පාතිමොක්ඛටඨපන සූත්‍රය,පි. 152, EAN:10: Suspending, p. 508.

▲ **පාතිමොක්ඛ සංවර ශීලය**: පාලි: **පාතිමොකඛසංවර සීලා-** Pātimokkha restrained: උසස් පුහුණුවේ යෙදන භික්ෂුන්/ භික්ෂුණියන් ගේ ආධ්‍යාත්මික වර්ධනය පිණිස බුදුන් වහන්සේ පනවන ලද ශික්ෂා පද සමාදන්ව, නොකඩා රැකීම පාතිමොක්ඛ සංවර ශීලය ය.

▼**මේ සසුනේ භික්ෂුව**, ශීල සම්පන්නව, පාතිමොක්ඛ සංවරය ඇතිව, ආචාර ගෝචර සම්පන්නව, සුළු වරදෙහි පවා බිය දකිමින්, සිල්පද සමාදන්ව, ඒවා ආරක්ෂා කරගනී: **"සමපනනසීලා භිකඛවෙ විහරථ සමපනනපාතිමොකඛා. පාතිමොකඛසංවරසංවුතා විහරථ ආචාරගොචර සමපනනා. අණුමත්තෙසු වජ්ජෙසු භය දසසාවී සමාදාය සිකඛථ සිකඛාපදෙසු"** (Bhikkhus, dwell possessed of virtue, possessed of the Pātimokkha, restrained with the restraint of the Pātimokkha, perfect in conduct and resort, and seeing fear in the slightest fault, train by undertaking the training precepts). **සටහන:** යම් සීලයක් රකිනවිට, අපාය ආදී දුකෙන් මුදා ගන්නේද ඒ සීලය පාතිමොක්ඛ සීලයවේ. සංවරවීම යනු: ඒ සිල් පද නො කඩා වාසය කිරීමය. **බලන්න**: සිංහල විසුද්ධිමාර්ගය**,** පරිච්ඡේදය1.පි.69. **මූලාශ්‍ර:** ම.නි: ( 1 ): 1.1.6

ආකන්ඛේයිය සූත්‍රය, පි. 94, EMN: 6: Ākankheyya Sutta - If a Bhikkhu Should Wish, p. 99.

▼ **පාතිමොක්ඛ** සංවරයයෙන් සීලසම්පන්නවීම සේඛ පුහුණුව ලබන සංඝයා සතු උතුම් ගුණයකි. **බලන්න:** සේඛ හා අසේඛ. **මූලාශ්‍ර**: ම.නි: (2 ): 2.1.3 :සෙඛ සූත්‍රය, පි. 44, MN 53: Sekha Sutta, p. 436.

▲**පාතාලය**-bottomless abyss: පෘතග්ජන ජනයා, මහා සාගරයේ පතුළේ, පතුලක් දැකිය නොහැකි ස්ථානයක් ඇතිබවත්, එය පාතාලය ලෙසින් හඳුන්වන බව බුදුන් වහන්සේ වදාළහ. ධර්මයට අනුව 'පාතාලය' ලෙසින් පෙන්වා ඇත්තේ, මහා වේදනාසහිතවූ කායික වේදනාවන්ටය. ධර්මය නොදත් පුද්ගලයා- (අශ්‍රුතවත්) මහා කායික දුක් වේදනා ඉවසාගත නොහැකිව හඬා වැළපේ, මුළාවට පැමිණේ. ඔහු පාතාලයෙන් ඉහළට පැමිණ නැත- පය තැබීමට තැනක් සොයාගෙන නැත. එහෙත්, ශ්‍රැතවත් ආරිය ශ්‍රාවකයා, මහා කායික වේදනා ඇතිවූවිට නොසැලේ, ඔහු පාතාලයෙන් ඉහළට පැමිණ ඇත- පය තැබීමට තැනක් සොයාගෙන ඇත යයි බුදුන් වහන්සේ පෙන්වා ඇත. **මූලාශ්‍ර**: :සංයු.නි: (4): සළායතනවග්ග: වේදනාසංයුත්ත: 1.20.4 පාතාල සූත්‍රය, පි.418, ESN: 36: Vedanasamyutta: 4.4 The Bottomless Abyss, p. 1335.

▲ **පුත්‍රයා**-Son: ගුණ 5 ක් ඇති පුතෙක් ලැබීමට දෙමාපියන් කැමති බව බුදුන් වහන්සේ පෙන්වා ඇත: 1) දෙමාපියන් හට උපකාරවන 2) දෙමාපියන්ගේ කටයුතු කරණ 3) කුල පරම්පරාව දිගුකලක් ගෙනයාමට හැකිවන 4) පරම්පරා දායාද රැකගැනීමට හැකිවන 5) දෙමාපියන් මිය ගිය පසු ඔවුන්ට පින් අනුමෝදනා කිරීමට කටයුතු කරන. එවැනි පුත්‍රයෙක් ප්‍රසංසා ලැබීමට සුදුසුය. **මූලාශ්‍ර**: අංගු.නි: (3): 5 නිපාත: සුමනාවග්ග: 5.1.4.9 පුත්තසූත්‍රය, පි. 88, EAN:5: 39.9.Son, p. 250.

▼**පුත්‍ර වර්ග 3 කි**: 1) **අතිජාත**: දෙමාපියන් දහම් මග නොගියද, දහම් මග යන පුත්‍රයා-දෙමාපියන්ට වඩා උසස් 2) **අනුජාත**: දෙමාපියන් මෙන් දහම් මග යන පුත්‍රයා-දෙමාපියන් හා සම 3) **අවජාත**: දෙමාපියන් මෙන් දහම් මග නොයන පුත්‍රයා-දෙමාපියන්ට වඩා පහත්. **මූලාශ්‍රය:** ඛු.නි: ඉතිවුත්තක: 3.3.5 පුත්‍රසූත්‍රය, පි. 432.

▲ **පුත්‍ර මාංශ** -Son's flesh: කය පෝෂණය පිණිස ගන්නා ආහාර (කබලින්ක) ගතයුත්තේ, විනෝදය පිණිස නොව සසර දුක නැති කරගැනීමට කටයුතු කිරීම පිණිස බව බුදුන් වහන්සේ මේ උපමාවෙන් පෙන්වා ඇත. කාන්තාරයකින් එතර වීමට යන දෙමාපියන්, ආහාර නොමැති කමින්, තමාගේ එකම පුත්‍රයා මරා ඔහුගේ මස් දුකින් විලාප කියමින් අනුභව කරන ලෙසින්, ආහාරෙයේ පිළිකුල දකිමින් එයට නො ඇලි ආහාර ගතයුතුවේ. එමගින් කාමආශාව දුරුකර ගත හැකිවේ. **බලන්න**: උපග්‍රන්ථය:5. **මූලාශ්‍ර**:සංයු.නි: (2): නිදානවග්ග: අභිසමයසංයුත්ත: 1.7.3 පුත්‍රමාංශ සූත්‍රය, පි. 174, ESN: 12: Nidanasamyutta: VII: 63.3. Son's Flesh, p. 696.

▲ **ප්‍රතිග්‍රාහක**- Receiver: ප්‍රතිග්‍රාහක ලෙසින් මෙහි පෙන්වා ඇත්තේ දානය ලබන සංඝයාය. දානය ලැබීම පිණිස තිබිය යුතු ගුණඅංග පිණිස **බලන්න:** සංඝදානය, දක්ඛිණාවිසුද්ධි, දානය.

▲ **ප්‍රතිභාන**-discernment: ප්‍රතිභාන (පටිභාන) ලෙසින් පෙන්වා ඇත්තේ අවබෝධය-යමක් වටහා ගැනීමේ හැකියාව-සියුම් නුවණය. **බලන්න**: පටිභානකතා. ප්‍රතිභානය: ධර්මය වැටහීම, හැකියාව, අවබෝධය අනුව පුද්ගලයෝ වර්ග 4ක් මෙහි පෙන්වා ඇත: 1) අර්ථය සහිතව අවබෝධය ඇත (අර්ථයුක්ත ප්‍රතිභානය) එහෙත්, යම් අවුල්සහගත කරුණු ඇත්නම් ඒවා නිරවුල් කිරීමට හැකියාව නැත. 2) අවුල්සහගත කරුණු ඇත්නම් ඒවා නිරවුල් කිරීමට හැකියාව ඇත, එහෙත් අර්ථයුක්ත ප්‍රතිභානය නැත. 3) අර්ථයුක්ත ප්‍රතිභානය ඇත, එසේම අවුල්සහගත කරුණු ඇත්නම් ඒවා නිරවුල් කිරීමට හැකියාව ඇත. 4) ඉහතකී කරුණු 2 ම නැත, අප්‍රතිභාන පුද්ගලයාය. මේ සතර පුද්ගලයන් අතරින් 3 වෙනි පුද්ගලයා ධර්මය වහා අවබෝධ කරගනී. ප්‍රතිභානය සිව් ආකාරය: 1) අවබෝධය තියුණුය (අත්ථයුක්ත ප්‍රතිභාන), එහෙත් ප්‍රශ්න විමසීමේදී පිළිතුරු දීම ඉක්මන් නැත 2) අවබෝධය තියුණු නැත, එහෙත්, ඉක්මනින් පිළිතුරු දෙයි 3) අවබෝධය තියුණුය, එසේම ඉක්මනින් පිළිතුරු දෙයි 4) අවබෝධය තියුණු නැත, එස්ම පිළිතුරු දීම ඉක්මන් නැත. **සටහන**: ප්‍රතිභානය සිව් පිළිසිඹියා ධර්මතාවයකි. **බලන්න**: සිව් පිළිසිඹියා. **මූලාශ්‍ර**: අංගු.නි: (2): 4 නිපාත: 4.3.4.2 පටිභාන පුග්ගල සූත්‍රය, පි.282, EAN:4: 132.2. Discernment ,p.196.

▲ **ප්‍රතිසන්ධි චිත්ත**- rebirth-consciousness: ප්‍රතිසන්ධි චිත්ත ලෙසින් මෙහි පෙන්වා ඇත්තේ යළිඋපතට හේතුවන සිතය. බුදුන් වහන්සේ පෙන්වා ඇත්තේ විඥාන ආහරය මගින් ප්‍රතිසන්ධිය- මතු පුනර්භවය (නාම රූප හටගැනීම) සිදුවන බවය. (The nutriment consciousness is a condition for the production of future renewed existence). **බලන්න**: අවකන්ති, පුනර්භවය, විඥානය, කම්ම. **සටහන:** අටුවාවට අනුව: The nutriment consciousness: rebirth-consciousness (paṭisandhicitta). The production of future renewed existence (āyatiṃ punabbhavābhinibbatti): the name-and-form arisen along with that same consciousness. **බලන්න:** ESN: Note: 24, p. 939. **මූලාශ්‍ර:** සංයු.නි: (2): නිදානවග්ග: අභිසමයසංයුත්ත: 1.2.2 මොළියඵග්ගුන සූත්‍රය, පි.44, ESN: 12: Nidanasamyutta:12.12 Moliyaphagguna, p. 625.

▼ **විඥාණ ආහාරය** ප්‍රතිසන්ධිය පිණිස හේතුවේ. **බලන්න**: ආහාර.

▲ **ප්‍රත්‍යවේක්ෂණ ප්‍රඥාව**- Prathyavekshana panna:අක්කුප්ප ඥානය, අරහත්වය සාක්ෂාත් කරගැනීම පිණිස උපදවාගතයුතු නුවණ, ප්‍රත්‍යවේක්ෂණ ප්‍රඥාව ලෙසින් පෙන්වා ඇත. **බලන්න**: අක්කුප්ප ඥානය, උත්පාදයිතව්‍ය ධර්ම, ඉන්ද්‍රිය.

▲ **ප්‍රත්‍යසන්නිශ්‍රිත ශීලය-**Prathyasannishritha sila: ආරිය අටමග උපදවා ගැනීමට හේතුවන ශීලයක් ලෙසින් ප්‍රත්‍යසන්නිශ්‍රිත ශීලය පෙන්වා ඇත. **බලන්න**: ශීලය. **මූලාශ්‍ර:**සංයු.නි: (5-1) මහාවග්ග: මග්ගසංයුත්ත: සීලසූත්‍රය, පි. 78, ESN: 45: Maggasamyutta: 50. 55 virtue, p 1654.

▲ **ප්‍රාතිහාර්ය**: පාලි: **පාටිහාරියං**- miracles: ඉර්දී වඩාගැනීමෙන් ලැබෙන විශේෂවූ දක්ෂතා, ප්‍රාතිහාර්ය ලෙසින් දක්වා ඇත. ඉදු පෙළහර ලෙසින්ද

පෙන්වා ඇත. ඉර්දිවඩා ගැනීම පිළිබඳ විස්තර පිණිස **බලන්න**: සංයු.නි. (5-2) මහාවග්ග:ඉද්දිපාද සංයුත්තය.

▼ **තමන්වහන්සේ** විශේෂ ඥානයෙන් අවබෝධ කළ **ප්‍රාතිහාර්ය 3** ක් ඇතිබව බුදුන් වහන්සේ වදාළහ: 1) **ඉද්දි -ඉර්දි ප්‍රාතිහාර්ය** (ඉද්ධිපාටිහාරියං- miracle of psychic power) : විවිධවූ හාස්කම් දැක්වීමට ඇති හැකියාව. සමාධිය තුලින් විදසුන් නුවණ වඩා සිතේ කෙළෙස් නොමැතිවිට ඉර්දි වැනි අතිසාමාන්‍ය බල භික්ෂුවකට ලබාගත හැකිය. බුදුන් වහන්සේ වැඩසිටිසමයේ පැවති '**ගාන්ධාරි;** නම් විද්‍යාව පුරුදු පුහුණු කළ කෙනෙකුට ද ඉර්දි හාස්කම් දැක්විය හැකිනිසා ශ්‍රාවකයන්, ගිහියන් පැහැදවීම පිණිස ඉර්දි ප්‍රාතිහාර්යය කරන්න යයි තමන්වහන්සේ දහම් නොදෙසන බව බුදුන් වහන්සේ වදාළහ. **සටහන:** මෙහිදී ඉර්දිබලයෙන් කළහැකි ප්‍රාතිහාර්යන් පිලිබඳ විස්තර පෙන්වා ඇත. 2) **ආදේශනා ප්‍රාතිහාර්ය** (ආදෙසනාපාටිහාරියංmiracle of telepathy) : අනුන්ගේ සිත් දැනගැනීමේ හැකියාව. සමාධිය තුලින් විදසුන් නුවණ වඩා සිතේ කෙළෙස් නොමැතිවිට අනුන්ගේ සිත් දැනගැනීමේ නුවණ වැනි අතිසාමාන්‍ය බල භික්ෂුවකට ලබාගත හැකිවේ. බුදුන් වහන්සේ වැඩසිටිසමයේ පැවති '**මණිකා- චින්තාමණි**' නම් විද්‍යාව පුරුදු පුහුණු කළ කෙනෙකුට ද අනුන්ගේ සිත් දැනගත හැකිනිසා තම ශ්‍රාවකයන්ට ගිහියන් පැහැදවීම පිණිස ආදේශනා ප්‍රාතිහාර්ය කරන්න යයි තමන්වහන්සේ දහම් නොදෙසන බව බුදුන් වහන්සේ වදාළහ. **බලන්න**: මණිකා චින්තාමණි විද්‍යාව3) **අනුශාසන ප්‍රාතිහාර්ය** (අනුසාසනි පාටිහාරියං-miracle of instruction) : ධර්මය උගන්වනවිට, එම උපදෙස ඒ අයුරින්ම පිළිපැද සසර දුකින් මිදී විමුක්තිය ලැබීම. මේ ප්‍රාතිහාර්ය ධර්මයේ විශේෂත්වයක්ය, කෙනෙකුගේ සිතතුලට කාවදින ප්‍රාතිහාර්යක්ය. මෙය හය ආකාර යෙන් සිදුවේ : i) මෙසේ සිතිවිලි පවත්වන්න ii ) මෙසේ සිතිවිලි නොපවත්වන්න iii) මෙසේ මෙනෙහි කරන්න iv) මෙසේ මෙනෙහි නොකරන්න v) මෙය අතහරින්න vi) මෙය ලබාගන්න. එම උපදෙස් ධර්මානුකූලව පිළිපදින විට ශිල, සමාධි, ප්‍රඥා පරිපූර්ණව උතුම් විමුක්තිය සාක්ෂාත්වේ. විමුක්තිය පිණිස ඉර්දි හා ආදේශනා හාස්කම් උපකාරිනොවේ. එමනිසා, බුදුන් වහන්සේ තම ශ්‍රාවකයන්ට අනුමත කර ඇත්තේ අනුශාසන ප්‍රාතිහාර්ය පමණි. **සටහන්**: * කෙනෙක් ධර්මානුකූලව පුරුදු පුහුණුවන ක්‍රමවිධිය මේ සූත්‍රවල පෙන්වා ඇත. ** මේ ගුණ සහිතවූ රහතන්වහන්සේ සියලු දෙවි මිනිසුන් අතර අග්‍රවේ- උතුම්වේ ය යි බුදුන් වහන්සේ වදාළහ. **බලන්න**: රහතුන්සතු උතුම් ගුණ.** අංගු.නි(1) 3 නිපාතයේදී: බුදුන් වහන්සේ එම ප්‍රාතිහාර්ය 3 ගැන විස්තර දක්වා ඇත. එම තුන් ප්‍රාතිහාර්ය දැක්විය ඇති බොහෝ භික්ෂුන්, සසුනේ වැඩ වසන බව ද දක්වා ඇත. ** ඛු.නි: පටිසම්භිදා 2: 3-6 ප්‍රාතිහාර්ය කථා: මේ පිළිබඳව විස්තරාත්මකව පෙන්වා ඇත. ** දීඝ.නි: පාථික සූත්‍රයේදී, බුදුන් වහන්සේ මෙසේ වදාළහ: **"...ප්‍රාතිහාර්ය සිදුකළේ හෝ නොකළේ වුවද, මගේ ඉගැන්වීමේ අරමුණ වන්නේ, ඒ ඉගැන්වීම් පුරුදු පුහුණු කරන අය, දුක සහමුලින්ම විනාශකර දැමීමය". මූලාශ්‍ර:** දීඝ.නි: (1): 11 කෙවඩ්ඩ සූත්‍රය, පි. 500, EDN: 11, Kewaddaha sutta, p. 136,අංගු.නි: (1 ): 3 නිපාත: 3.2.1.10 සූත්‍රය, පි. 338, EAN:3: 60.10 Saṅgārava, p. 102.

▼ **ඉර්දි ප්‍රාතිහාර්ය**, ආදේශනා ප්‍රාතිහාර්ය, අනුශාසනිය ප්‍රාතිහාර්ය, යන ගුණ ඇති උතුමා (අරහත්) අත්‍යන්ත නිෂ්ඨ බව ලබා ඇත (අවසාන නිගමනය-ultimate conclusion), අත්‍යන්ත යෝගක්ෂෙම් (සියලු කෙලෙස් බැඳීම් හැර දැමීම-ultimate security from bondage, අත්‍යන්ත පර්යාසනය: බ්‍රහ්මචරියාව අවසන් කිරීම (ultimate consummation). එබඳු ගුණ ඇති රහතන්වහන්සේ සියලු දෙවි මිනිසුන් අතර ශ්‍රේෂ්ඨය යි බුදුන් වහන්සේ වදාළහ. **බලන්න**: අත්‍යන්ත බ්‍රහ්මචාරි. **මූලාශ්‍රය:**අංගු.නි: (1) 3 නිපාත:යෝධාජීවවග්ග: 3.3.4.12 සූත්‍රය, පි. 564.

▲ **ප්‍රීතිය**: පාලි: **පීති** - rapture: ධර්මයේ ප්‍රීතිය ලෙසින්පෙන්වා ඇත්තේ සිත සමාධියට පත් කරගැනීමට උපකාරීවන අංගයක් -සමාධිඅංගයක් ලෙසින්ය. අකුසල පහවීම නිසා සිත ප්‍රීතියට පත්වේ.**බලන්න**: සමාධිය, සුඛය

▼ **ප්‍රමෝදය ඇතිවීම** නිසා ප්‍රීතිය ඇතිවේ, ප්‍රීතිය ඇතිවිට සිත සංසුන්වේ: **"...පාමොජ්ජං ඛො ආනන්ද පීතත්ථං පීතානිසංසා... පීති ඛො ආනන්ද පස්සද්ධත්ථා පස්සද්ධානිසංසා"** (The purpose and benefit of joy is rapture... purpose and benefit of rapture is tranquility) **මූලාශ්‍ර**:අංගු.නි: (6): 11 නිපාතය:නිසසය වගග: 11.1.1.කිමත්ථිය සූත්‍රය හා 11.1.2 න චේතනාය කරණිය සූත්‍රය, පි.611-614, EAN:11: Dependence: 1.1 What Purpose & 1-2 Volition, p.566.

▼ **ඣානසමාපත්ති** ලබා ගැනීමෙන් ඇතිවන ප්‍රීතිය නිසා අකුසල ධර්ම 5 ක් පහවේ: 1) කාමඋපාදාන නිසා ඇතිවන දුක්දොම්නස 2) කාමඋපාදාන නිසා ඇතිවන සුඛසොම්නස3) අකුසල නිසා ඇතිවන දුක්වේදනා 4) අකුසල නිසා ඇතිවනසැප වේදනා 5) කුසල නිසා ඇතිවන සැප වේදනා. **මූලාශ්‍ර**: අංගු.නි: (3): 5 නිපාත: 5.4.3.6 පීතිසූත්‍රය, පි. 358, EAN:5: 176.6 Rapture, p. 294.

▲**ප්‍රේත-** Pretha: අයහපත් කම්ම විපාක නිසා සත්‍වයෝ ප්‍රේත භවයක් ලබති. ඛු.නි: ප්‍රේතවත්ථු පාලියේ, ප්‍රේතභව ලබාගත් සත්‍වයෝ පිලිබඳ විස්තර දක්වා ඇත.

▲ **ප්‍රේතලෝකය-** sphere of afflicted spirits: ප්‍රේතලෝකය, දසඅකුසලේ යෙදන මිනිසා යළි උපත ලබන දුගති ස්ථානයකි- සතර අපායෙන් එක් අපායකි. **බලන්න**: සතරඅපාය, පින්දීම, මළවුන් අනුස්මරනය.

**සටහන්: *** ඛු.නි: ඛුද්දකපාඨ, තිරෝකුඩ්ඩ සූත්‍රයේ ප්‍රේතයන්, තම නෑදැයන්ගෙන්, පින් ලබාගැනීමට බලා සිටින ආකාරය විස්තර කර ඇත. මළවුන් සිහිපත් කර දෙන දාන පූජා ආදියෙන් එල ලබාගත හැක්කේ ප්‍රේතලෝකයේ සිටින ප්‍රේතආදීන්ට පමණක්ය. ** ප්‍රේතයන් ගේ චුතිය හා යළි උපත පිලිබඳ විස්තර පිණිස **බලන්න**: සංයු.නි: (5-2) සච්චසංයුත්ත: 12.11.25 ප්‍රේතචුති සූත්‍ර. **මූලාශ්‍ර**: අංගු.නි (6 ) 10: නිපාතය:10.4.2.11 ජාණුස්සොණි සූත්‍රය, පි. 518, EAN:10: Jāṇussoṇī,177.11, p.554.

▼**ඇටසැකිල්ලක් බඳු ප්‍රේත දර්ශනය**: එක් සමයක, ලක්ඛණ තෙරුන්ගේ විමසීමක් අනුව මහා මුගලන් තෙරුන්, බුදුන් වහන්සේ සමීපයේදී,

ගිජ්ඣකූළපබ්බ අසල ගැවසෙන ඇටසැකිල්ලක් බඳු ප්‍රේතයෙක් (අට්ඨසංඛලික) දිවැසින් දැකීම ගැන විස්තර කිරීම මෙහි පෙන්වා ඇත. බුදුන් වහන්සේ ද එම ප්‍රේතයා දැක ඇතිබව වදාළහ. ඒ සත්වයා පෙරදී ගව ඝාතකයෙක්ව, මස් ඇට කපා විකිණීමේ ආදීනව වශයෙන්- නරක කම්ම විපාක වසයෙන් දිගුකලක් නිරයේ දුක්විඳ, ඉතිරි විපාක ගෙවීම පිණිස මෙහි ප්‍රේතයෙක් ලෙසින් පහළවී ඇත. **සටහන: විවිධ ප්‍රේත විස්තර**: මස්වැදැල්ලක් බඳු ප්‍රේත, මස්පිඬක් බඳු ප්‍රේත, ඇඟසිවිය නැති ප්‍රේත, කඩුමුවහතක් බඳු ප්‍රේත, කඩුමුවහතක් බඳු ලොම් ඇති ප්‍රේත, ඊතල බඳු ලොම් ඇති ප්‍රේත, හිදිමුව ලොම් ඇති ප්‍රේත, කළයක් වැනි අන්ඩ ඇති ප්‍රේත විස්තර මේ සංයුත්තයේ විස්තරාත්මකව දක්වා ඇත. **මූලාශ්‍රය:** සංයු.නි: (2) නිදානවග්ග: ලක්ඛණසංයුත්ත:7.1.1. අට්ඨසංඛලික සූත්‍රය, පි.412.

▲ **පොතලිය ගෘහපති-** Householder Pothaliya:**බලන්න**: උපග්‍රන්ථය:3

▲ **පොතලිය පරිබ්‍රාජක-** Pothaliya Paribrajaka: **බලන්න**:උපග්‍රන්ථය: 3

**පඨ**

▲**ප්‍රථම ඣානය-** First Jhāna: සිව් ඣාන සමාපත්තියේ පළමුවැන්න ප්‍රථම ඣානය ය. **බලන්න**: සමාධිය. ප්‍රථම ඣානය ලබාගැනීම පිණිස කරුණු 6 ක් සම්පූර්ණ කරගත යුතුවේ: 1-5) කාමච්ඡන්දය ඇතුළු පංච නීවරන ප්‍රහීණය 6) කාමයෙහි ආදීනව සම්‍යක් ප්‍රඥාවෙන්- යථාභූත ඥානයෙන් දැකීම. **සටහන**: දෙවෙනි සූත්‍රයේ වෙනත් කරුණු 6 ක් පහකර ගැනීමෙන් ප්‍රථම ඣානය ලබා ගන්නා අන්දම පෙන්වා ඇත: 1) කාමවිතක්ක 2) ව්‍යාපාද විතක්ක 3) විහිංසාවිතක්ක 4) කාමසංඥා 5) ව්‍යාපාදසංඥා 6) විහිංසාසංඥා. **මූලාශ්‍ර**:අංගු.නි: (4): 6 නිපාත: 6.2.2.9 හා 6.2.2.10 සූත්‍ර,පි.248, EAN:6: 73.9 & 74.10 suttas, p.359.

▲ **පුථු ප්‍රඥාව:** පාලි: **පුථුපඤ්ඤා-** extensiveness of wisdom:විවිධ ධර්මතා පිලිබඳ පැතිරීගිය අවබෝධය-ඥානය පුථු ප්‍රඥාව ය. ජවන ප්‍රඥාව, නිබ්බේධික ප්‍රඥාව, මහා ප්‍රඥාව, තීක්ෂණ ප්‍රඥාව, විපුල ප්‍රඥාව, ගාම්භීර ප්‍රඥාව හා අසාමන්ත ප්‍රඥාව හා පණ්ඩිත ප්‍රඥාව යන අෂ්ඨ (8) ප්‍රඥාවන් වැඩීමෙන් නැවත නැවත එහි යෙදීමෙන් පුථු ප්‍රඥාව පරිපුර්ණවේ: **"ඉමා අට්ඨපඤ්ඤා භාවිතා බහුලීකතා පුථුපඤ්ඤං පරිපූරෙති"**

**පුථු ප්‍රඥාව යනු කුමක්ද**? නානා ස්කන්ධ...නානාධාතු... නානාආයතන ...හේතුඵල ධර්ම (පටිච්චසමුප්පන්න)...ශුන්‍යතාඵල...සිව්පිළිසිඹියාව... ශීල-සමාධි-ප්‍රඥා ස්කන්ධ...විමුක්ති හා නවිමුක්ති ඥානදර්ශන ස්කන්ධ...ස්ථාන හා අස්ථාන නුවණ...විහාර සමාපත්ති... ආර්යසත්‍ය... සත්තිස් බොධිපාක්‍ය අංග... ආර්ය මාර්ගය...ශ්‍රමණඵල... අභිඥා ... පරමඅර්ථය නම්වූ නිවන ආදී ධර්මතා පිලිබඳ ඇති පැතිරීගිය නුවණ පුථු ප්‍රඥාවය.**මූලාශ්‍ර**: ඛු.නි: පටිසම්භිදා 2 :3.1 ප්‍රඥා කථා, පි. 166-174.

▼**සතර ධර්මය** ඇති පුද්ගලයාට (සෝතාපන්න) පුථු ප්‍රඥාව ඇතිවේ.

**"...ඉමෙ ඛො භික්ඛවෙ, චත්තාරො ධම්මා භාවිතා බහුලීකතා පුථුපඤ්ඤාතාය සංවත්තනතිති"**. (these four things, when developed and cultivated lead to the - extensiveness of wisdom). **බලන්න**:

ප්‍රඥාව, සතර ධර්මය. **මූලාශ්‍ර:** සංයු.නි: (5-2): මහාවග්ග: සෝතාපන්න සංයුත්ත:11.7.2 පුථු ප්‍රඥා සූත්‍රය, පි. 280, ESN: Sotapatthisamyutta: 63.2 Extensiveness of wisdom, p. 2262.

▼ **කායගතා සතිය වැඩීමෙන්, විපුල කරගැනීමෙන් පුථු ප්‍රඥාව ඇතිවේ.** (Mindfulness directed to the body...when developed and cultivated, leads to the extensiveness of wisdom).**මූලාශ්‍ර:** අංගු.නි: (1): 1 නිපාත: කායගතාසති වග්ග සූත්‍ර, පි. 125 EAN:1: Mindfulness Directed to the Body, p.52.

▼ **වෙනත් මූලාශ්‍ර:1. "**බොහෝ වූ නානාප්‍රකාර වූ ස්කන්ධ ධාතු ආයතන ප්‍රතීත්‍යසමුත්පන්න ශූන්‍යතානුපලභ්‍යමාන ධර්‍මයන් විෂයෙහි ද සීල සමාධි ප්‍රඥාදි ධර්‍මයන් විෂයෙහි ද පැවැති දැනීම පුථුපඤ්ඤා නම්වේ" https://pitaka.lk/dhammapada/ss/katha-28.html

**පද**

▲ **පදුට්ඨ පුග්ගල-**Padutta puggala:කෙනකුගේ සිත දූෂිතනම් (පදුට්ඨ චිත්ත), ඔහු ඒකාන්තයෙන්ම මරණින්මතු දුගතියේ උපත ලබයි. **මූලාශ්‍රය:** ඛු.නි: ඉතිවුත්තක: 1.2.10 පදුට්ඨ පුග්ගල සූත්‍රය, පි.364.

▲ **පදුමා උපාසිකා-**Paduma Upasika:**බලන්න**: උපග්‍රන්ථය:3

▲ **පදුම නිරය-** Paduma niraya: මෙය අවීචිනිරයේ කොටසක් ලෙසින් පෙන්වා ඇත. අයහපත් කම්ම විපාක ඵලදීම පිණිස සත්වයෝ යළි උපත ලබන දුගතියකි. **බලන්න**:කම්ම, නිරය, ආරිය උපවාද.

▲**පදුම බුදුන්වහන්සේ-**The Buddha Paduma: ගෝතම බුදුන් වහන්සේට පෙර ලොව පහලවූ පදුම බුදුන් වහන්සේ පිලිබඳ විස්තර මෙහි දක්වා ඇත. **මූලාශ්‍ර:** ඛු.නි: බුද්ධවංශ: 8 පදුම බුද්ධ වංශය, පි. 135.

▲**පදුමුත්තර බුදුන්වහන්සේ-** The Buddha Padumutthra:ගෝතම බුදුන් වහන්සේට පෙර ලොව පහලවූ පදුමුත්තර බුදුන් වහන්සේ පිලිබඳ විස්තර මෙහි දක්වා ඇත. **මූලාශ්‍ර:** ඛු.නි: බුද්ධවංශ: 10 පදුමුත්තර බුද්ධ වංශය, පි. 149.

▲ **පදෙස විහාර ඥානය-**Padesa vihara nana: පදෙස විහාර ඥානය- ප්‍රදේශ විහාර ඥානය යනු: ස්කන්ධආදීන්ගේ එකදෙශ වූ වේදනා ධර්මය පිඩු කරන ප්‍රඥාවය. **මූලාශ්‍ර:** ඛු.නි:පටිසම්භිදා 1:මහාවග්ග: ඥාණ කතා: 43 ප්‍රදෙශ විහාර ඥානය, පි. 224.

▲ **පුදපූජා-** Puda puja: පුදපූජා ලෙසින් පෙන්වා ඇත්තේ ගරුකිරීමට සුදුසු පුද්ගලයන් හට (බුදුන් වහන්සේ ප්‍රමුඛ සංඝරත්නය) කරන සැලකිලි, නමස්කාර ආදියය. ආමිස පුදපූජා නම් සිව්පසය පූජාකිරීම, වැඳ නමස්කාරය කිරීමය. නිරාමිස පුදපූජා වන්නේ, ත්‍රිවිධ රත්නය වෙනුවෙන් කරන පුදපූජාවන්ය: ශිලසම්පන්නවීම, භාවනාව වැඩිම ආදී සිත පෙරටු කරගෙන සිදු කරන කටයුතුය. **බලන්න**: උත්තම දසපුද්ගලයෝ.

▲ **පුද්ගල අයහපත් කරුණු -**Factors that brings harm to people පුද්ගලයන් තුළ ඇතිවන කරුණු 3 ක් නිසා-ලෝභය ද්වේශය, මෝහය නිසා ඔවුන්ට අයහපත ඇතිවේ, හානි සිදුවේ, දුක ඇතිවේ, ජීවිතයේ

අපහසුබව ඇතිවේ යයි බුදුන් වහන්සේ පෙන්වා ඇත. **සටහන්**: * ඒ පිලිබඳ උපමාව: බට, කෙසෙල් ආදීයේ, ඒවා තුළ ඇතිවන ඵලය නිසා විනාශයට පත්වේ, එලෙස, සිත තුල හටගන්නා අකුසල නිසා මිනිසා විනාශයට පත්වේ. **බලන්න**: උපග්‍රන්ථය-උපමා (ඵලය නිසා විනාශය). **මූලාශ්‍ර:** සංයු.නි: (1): සගාථවග්ග: කෝසල සංයුත්ත: 3.1.2 පුරිස සූත්‍රය, පි. 158, ESN: 3: Kosalasamyutta: 2.2 A Person, p. 219.

▲ **පුද්ගල දෙවර්ගය-** Two kind of persons: **1. කෙළෙස් ස්වභාවය** අනුව පුද්ගල වර්ග 2කි: 1) එක් පුද්ගලයෙක් හට දැඩි කෙළෙස් නොමැත, එහෙත් ඒබව ඔහු නොදනි 2) තවත්, පුද්ගලයෙක් හට දැඩි කෙළෙස් නොමැත, ඒබව ඔහු දනි. **බලන්න**: අනංගණ. **2. ධර්මයේ අල්පශ්‍රැත** බව අනුව පුද්ගල වර්ග 2කි: 1)ධර්මය ඉතා සුළුවෙන් අසයි, එහි අර්ථ නොමදනී 2) ධර්මය සුළුවෙන් අසා ඇත, එහෙත් එහි අර්ථය දනී. **බලන්න:** අල්පශ්‍රැත. **3. අපණ්ණක ධර්මය** අනුව: 1) සම්මා දිට්ඨිය ඇති පුද්ගලයා අපණ්ණක ප්‍රතිපදාවට ඇතුලත්වී ඇත. 2) සම්මා දිට්ඨිය නැති (මිථ්‍යාදිට්ඨිය ඇති) පුද්ගලයා අපණ්ණක ප්‍රතිපදාවට ඇතුලත්වී නොමැත. **බලන්න**: අපණ්ණක ධර්මය හා පටිපදාව. **4. ආශ්‍රව අනුව:** 1) ආශ්‍රව වැඩිවන අන්දමට කටයුතු කරන්නා 2) ආශ්‍රව පහවන අන්දමට කටයුතු කරන්නා. **බලන්න**: ආශ්‍රව හා ආශ්‍රව ක්‍ෂය කිරීම. **5. උපත හා සිල්වත්, දුසිල්වත් බව** අනුව පුද්ගලයෝ 2 කි: **බලන්න**: ඕනතොනත හා ඕනතුන්නත පුද්ගලයෝ. **6. කුසල ශිලය ඇති** හා කුසල ශිලය නැති පුද්ගල වර්ග 2කි. **බලන්න**: කුසලශිලය හා අකුසලශිලය**.**

▲ **පුද්ගල තුන් වර්ගය-** Three kind of persons: **1. සිත අනුව:** 1) පැරණි වනයක් බඳු සිත ඇති පුද්ගලයා (whose mind is like an open sore): නිතර කෝපයට පත්වෙන තැනැත්තා 2) විදුලිය බඳු සිත ඇති පුද්ගලයා (whose mind is like lightning): චතුසත්‍ය වහා අවබෝධ කරගන්නා තැනැත්තා 3) දියමන්තියක් (විදුරක්) බඳු සිත ඇති පුද්ගලයා (පැහැදිලි සිතක් ඇති-whose mind is like a diamond): සියලු ආසව ක්‍ෂය කළ රහතන්වහන්සේ. **මූලාශ්‍ර:** අංගු.නි: (1 ): 3 නිපාත: 3.1.3.5 සූත්‍රය, පි. 268, EAN: 3: 25.5 Diamond, p. 86.

**2. ආධ්‍යාත්මික දියුණුව අනුව:** කායසක්ඛි, දිට්ඨිප්පත්ත, සද්ධාවිමුත්ත: විස්තර පිණිස **බලන්න**:අංගු.නි:3 නිපාත: 3.1.3.1 සූත්‍රය, පි.260 හා සත් ආරිය පුද්ගලයෝ.

**3. ධර්මය ලැබීම අනුව:** 1) ධර්මය ඇසු හෝ නොඇසු මේ පුද්ගලයා ආධ්‍යාත්මික මගට පිවිසි නැත. මේ පිලිබඳ **උපමාව**: ගිලන් පුද්ගලයෙක් සිටි, ඔහුට සුදුසු ආහාර, බෙහෙත් හෝ උපස්ථාන නොලැබීම නිසා සුවපත්නොවේ. 2) ධර්මය ඇසු හෝ නොඇසු, කුසල දහම ඇති මේ පුද්ගලයා ආධ්‍යාත්මික මගට පිවිසි ඇත. මේ පිලිබඳ **උපමාව**: ගිලන් පුද්ගලයෙක් සිටි, ඔහුට සුදුසු ආහාර, බෙහෙත් හෝ උපස්ථාන නොලැබේ, එහෙත් ඔහු සුවපත්වේ. 3) මේ පුද්ගලයාහට තථාගතයන් දැකීමට ලැබේනම්, ධර්මය අසන්නට ලැබේනම් ඔහුට ආධ්‍යාත්මික මගට පිවිසිය හැකිය. එමනිසා ධර්මය දේශනා කලයුතුවේ. මේ පිලිබඳ **උපමාව**: ගිලන් පුද්ගලයෙක් සිටි, ඔහුට සුදුසු ආහාර, බෙහෙත් හෝ උපස්ථාන ලැබේනම්, එහෙත් ඔහු සුවපත්වේ, ඒවා නොලැබේ නම් ඔහු සුවපත් නොවේ. එවැනි ගිලන් අයට සුදුසු අහර ආදියය නියම කර ලැබෙනවිට,

අනිකුත් ගිලන් අයටද එම සේවා ලැබීම නිසා ඔවුන්ද සුවපත්වේ. **බලන්න:** උපග්‍රන්ථය-උපමා (ගිලන් උපමාව) **මූලාශ්‍ර**: අංගු.නි: (1 3 නිපාත:3.1.3.2 සූත්‍රය, පි. 264, EAN:3: 22-2 sutta, p. 85.

**4.අත්‍යන්ට ධර්මයට පිවිසීමට උපකාරීවන අන්දම අනුව** 1) යම් පුද්ගලයෙක් හට තිසරණ සරණ ලබාදෙන ගුරුවරයා 2) යම් පුද්ගලයෙක් හට චතුසත්‍ය අවබෝධ කර සෝතාපන්න වීමට උපකාරිවන ගුරුවරයා 3) යම් පුද්ගලයෙක් හට අරහත් වීමට උපකාරිවන ගුරුවරයා. **සටහන:** එවැනි ගුරුවරයෙකු ලබාදුන් උතුම් සේවයට ප්‍රත්‍යුපකාර -කළගුණ කර අවසන් කළ නොහැකිය. **මූලාශ්‍ර:**අංගු.නි: (1): 3 නිපාත: 3.1.3.4 සූත්‍රය, පි. 268, EAN: 3: 24.4 Helpful, p. 86.

**5. ශිල සමාධි ප්‍රඥා මට්ටම අනුව :1)** කෙනෙක් ශිල සමාධි හා ප්‍රඥාවෙන් තමන්ට වඩා හීන නම් ඔහුගේ ආශ්‍රය නුසුදුසුය. එහෙත්, අවස්ථානුකූලව ඔහුට දයාවන්ත වියයුතුය. **2)** කෙනෙක් ශිල සමාධි හා ප්‍රඥාවෙන් තමන් හා සමාන නම් ඔහුගේ ආශ්‍රය සුදුසුය. 3) කෙනෙක් ශිල සමාධි හා ප්‍රඥාවෙන් තමන්ට වඩා උසස්නම් ඔහුට නිසි ගරුබුහුමන් කලයුතුවේ.

තම ගුණ වලට නොසම මිනිසුන් - ඇසුර නුසුදුසුය, පිරිහීම ඇතිවේ;
තමගුණ හා සමවූ මිනිසුන්- ඇසුර සුදුසුය, පිරිහීම ඇති නොවේ;
තමගුණ වලට වැඩි උතුමන්- ඇසුර සුදුසුය, දියුණුව ලඟාවේ;
එම කරුණ සිතට ගෙන එවන් උතුමන් - නිතිපතා ඇසුරු කළයුතු වේ.
**මූලාශ්‍ර:** අංගු.නි: (1): 3 නිපාත: 3.1.3.6 සූත්‍රය, පි. 270, EAN: 3: 26.6 sutta, p. 86.

**6. ගති අනුව:** 1) දුශ්ශිල පුද්ගලයා ඇසුරු නොකළ යුතුය 2) ද්වේශ සහගත පුද්ගලයා: ඔහු පිළිබඳව උපේක්ෂාව ඇතිකරගත යුතුවේ 3) ශිල්වත් යහපත් පුද්ගලයා ඇසුරු කිරීම මැනවි. **මූලාශ්‍ර:** අංගු.නි: (1 ): 3 නිපාත: 3.1.3.7 සූත්‍රය, පි. 272, EAN: 3: 27.7 sutta, p. 87.

**7.කථාව යහපත් හා අයහපත්:** 1) අයහපත් කතාවේ යෙදෙන-අසත්‍ය කතා කරන අය-ගොමවැනි කතා කියන (ගූථභාණි) 2) යහපත් කතාවේ යෙදෙන-සත්‍ය කතා කරන අය-මල්වැනි කතා කියන (පුප්ඵභාණි) 3) ආචාරශීලිව-මෘදු , ප්‍රසන්න වචන කතා කරන අය-මීපැණි වැනි කතා කියන (මධුභාණි) **මූලාශ්‍ර:**අංගු.නි: (1 ): 3 නිපාත: 3.1.3.8 සූත්‍රය, පි. 273, EAN: 3: 28.8 sutta, p. 87.

**8.ඇස්ඇති හා ඇස්නොමැති** 1) ඇස්නොමැති- අන්ධ :සම්පත් ලබාගැනීමට හැකියාව නැති කුසල අකුසල නොදත් අනුවණ අය 2) එක් ඇසක්ඇති (ඒකචක්ඛු):සම්පත් ලබාගැනීමට හැකියාව ඇත, එහෙත් කුසල අකුසල නොදනී 3) ඇස් ඇති( දැස් ඇති-ද්වි චක්ඛු): සම්පත් ලබාගැනීමට හැකියාව ඇත, කුසල අකුසල දන්නා නුවණ ඇත.

> අනුවණ බාල අන්ධයා හට-නොමැත වාසනාව, ධනයට.
> ඔහු කුසල් නොකරයි- දෙව්ලොව උපත නොලබයි.
>
> එකැස් ඇත්තා -කුහක ගති ඇත්තා
> ඔහු ලබයි සම්පත්- දහමින් අදහමින්,
> සොරකම, කපටිකම හා මුසාවෙන්,
> මහා සම්පත් ගොඩකර ගනිමින්

මෙලොව කම් සැප නිති විඳිමින්,
නිරයට පැමිණ, ලබයි මහා පීඩාවන්.

දැස් ඇත්තා ඉහළම පුඟුලා වෙයි;
තම වෙහෙසෙන්ම ධනය උපයයි.
යහපත් ලෙසින් ලැබූ ධනයෙන්,
ඉහළින්ම දන්දෙයි හොඳ අරමුණින්.
යහපත් තැනක යළි උපත ලබා
ඔහු වෙසෙයි, දුක් කරදර ඉවතළා.

අඳ මිනිසා හා එකැස් ඇත්තා
දුර දකිනවිටම  මග හරින්න.
දුටුවොත් ඔබ දැස් ඇත්තා,
වහා හමුවී මිතුරෙක් කරගන්න,
ඔහු උතුමෙකි ඇසුරු කළයුතු.

**මූලාශ්‍ර:**අංගු.නි: (1): 3 නිපාත: 3.1.3.9 සූත්‍රය, පි. 275, EAN: 3: 29.9 sutta, p. 87.

**9. ප්‍රඥාව ඇති හා ප්‍රඥාව නොමැති:** 1) යටිකුරු ප්‍රඥාව ඇති අය (අවකුජ්ජ පඤ්ඤා- Inverted wisdom): යහපත් ධර්මය ඇසුවද දහම් කරුණු සිතේ නොපිහිටන අය. **උපමාව**: කලයකට වතුර පුරවා, එය  මුණින් නමා හිස්කරන ලෙස දහම සිතේ නොපවතී (යටිකුරුකල  කලය උපමාව) 2) ඔඩොක්කුවේ ප්‍රඥාව ඇති අය (උච්ඡඞ පඤ්ඤා- lap-like wisdom): යහපත් ධර්මය අසයි, එහෙත්, නැගීසිටිනවිට දහම් කරුණු සිහියේ නැත. **උපමාව**: වාඩිවී සිටිනවිට ලැබෙන කෑම ඔඩොක්කුවේ තබාගනී, නැගිටගත්විට ඒවා බිම විසිරී යයි (ඔඩොක්කුව උපමාව) විපුල ප්‍රඥාව ඇති අය ( පුථුපඤ්ඤා- wide wisdom): යහපත් ධර්මය මැනවින් අවබෝධ කරගනී**. උපමාව**: උඩුකුරුව තැබූ කාලයකට දැමූ වතුර එහි රඳා පවතින ලෙස. (උඩුකුරු කලය උපමාව).

යටිකුරුවූ  නුවණ ඇති මිනිසා;
අනුවණය, දහම වටහානොගනී.

නිතර, යතිඳුන් සොයා යන ඔහු;
දහම ඇසුවද, නුවණ මඳ නිසා;
සිතේ තැන්පත් නොකරගනී.

උකුලේ නුවණ ඇති මිනිසා;
පෙරකී අයට වඩා හොඳයි.
ඔහුද නිතර සඟ හමුවට යයි;
වාඩිවී මැනවින් බණ අසයි.
එහෙත්, නැගීසිට ගත් කළ,
උකුලේ ඇතිදේ බිම පතිත වනලෙස
ඇසූ දහම සිතින් ගිලිහී යයි.

මේ හැම මිනිසුන් අතරින්;
විපුල නුවණ ඇති මිනිසා;
උතුම්ය, ඔහු ඉහලින්ම සිටී.

දහමට කැමති ඔහු, සඟ වෙතින්,
නිතර බණ අසා, සිතේ දරා ගනී.
නොවිසිරෙන සිත ඇතිව,
දහම සිත තුළට ගෙන,
දහමට අනුව පුහුණුවන.
ඔහුට, නිමකළ හැකිය සසර දුක.

**බලන්න:** උපග්‍රන්ථය:5. **මූලාශ්‍ර:**අංගු.නි: (1): 3 නිපාත: 3.1.3.10 සූත්‍රය, පි. 277, EAN: 3: 30.10 sutta, p. 88.

**10**) මානය අනුව පුද්ගල වර්ග 3කි: අතිමානය, මානය, හීනමානය. **බලන්න**: මානය.

▲ **පුද්ගල සිව්වර්ග-** 4 kind of persons

**1) ක්‍රියාඅනුවතුන්දොරින් සාවද්‍ය (**වැරදි**)** ක්‍රියා කරන පුද්ගලයන් තිදෙනකි, තුන්දොරින් අනවද්‍ය (නිවැරදි) ක්‍රියා කරන එක් පුද්ගලයකි. **බලන්න**: අනවද්‍ය ධර්ම හා සාවද්‍ය ධර්ම. **මූලාශ්‍ර**: අංගු.නි: ( 6 ): 10 නිපාත සාධු වග්ග: 10.3.4.7 සාවජ්ජ සූත්‍රය, පි.470, EAN: 10: Good: p.548.

**2) හිංසා කිරීම අනුව1.**අත්තන්තප පුද්ගල : තමාට වද හිංසා පමුණුවා ගැනීමේ පිළිවෙත අනුගමනය කරයි: නිර්වස්ත්‍රව, ආචාර ධර්ම නොපිළිගෙන, විවිධවූ යෝග ක්‍රියාවල යෙදෙමින් කයට වේදනා ගෙනදේ. **2.**පරන්තප පුද්ගල: අනුනට වද හිංසා කිරීමේ පිළිවෙත අනුගමනය කරයි: අනුන් ලවා සතුන් මරවයි, වෙනත් අයට වද හිංසා පමුණුවයි. **3.** අත්තන්තප-පරන්තප පුද්ගල: තමාටද, අනුන්ටද වද හිංසා කිරිමේ පිළිවෙත අනුගමනය කරයි. රජවරු ආදී බලසම්පන්න පුද්ගලයෝ තමනට කායික හිංසා කරමින් යෝගකර්මයේ යෙදේ. ඔවුන් තමන්ගේ සේවකයන්, යටත් වැසියන් ලවා යාග හෝම පිණිස සතුන් මරවවමින් ඔවුන්ට ද දුක ගෙනෙදේ. **4.** අහිංසක -සුවපත්වූ උතුම් පුද්ගලයා: ඔහු 1, 2 හා 3 යන පුද්ගලයන් අනුගමනය නොකරයි. සියලු කෙළෙස් හැර මගඵල සුවය මෙලොවදීම ලබන ආරිය උතුමා. (රහතන්වහන්සේ).

**මූලාශ්‍ර**:ම.නි: (2 ) 2.1.1 කන්දරක සූත්‍රය, පි. 18 හා 2.1.10 අපන්ණක සූත්‍රය, පි.124, EMN: 51: Kandaraka Sutta, p. 425 & 60: Apaṇṇaka Sutta- The Incontrovertible Teaching, p. 478.

**3) ධර්මය අවබෝධකරන අන්දම අනුව-දහම් නුවණ අනුව** ධර්මය අවබෝධ කරගන්නා ආකාරය අනුව මේ ලෝකයේ පුද්ගලයන් සිව්දෙනෙක් වේ: 1) **උග්ඝටිතඤ්ඤූ** (understands quickly): ධර්මය වහා අවබෝධකර ගන්නා පුද්ගලයා. ඔහුට දහම් දැනුම ඇත, එමනිසා, දහම ඇසූ පමණින්ම, චතුසත්‍ය අවබෝධය ලැබී විමුක්තිය ලබාගැනීමට සමත්වේ. 2) **විපචිතඤ්ඤූ** (understands through elaboration): ධර්මය විස්තරාත්මකව පහදා දීම අවශ්‍ය පුද්ගලයා. කෙටි දහම් කරුණු විස්තරකරදීම නිසා ලබන අවබෝධය තුලින් ඔහුට විමුක්තිය ලබා ගැනීමට හැකියාව ඇත. 3) **නෙය්‍ය පුද්ගල** (needs to be guided): මග පෙන්වීම මගින් ධර්මය ක්‍රමයෙන් අවබෝධ කරගන්නා පුද්ගලයා.

ඉගැන්වීම් මගින්, ප්‍රශ්න ඇසීමෙන්, යෝනිසෝමනසිකාරයෙන් ධර්ම කරුණු සලකා බැලීමෙන්, කල්‍යාන මිත්‍ර සේවනය නිසා ඔහුට ක්‍රම ක්‍රමයෙන් ධර්මය අවබෝධ කර විමුක්තිය ලබා ගැනීමට හැකිවේ 4) **පදපරම**: බොහෝ දහම් කරුණු අසා සිතේ දරා ගෙන සිටියද, මේ භවයේ විමුක්තිය ලබාගැනීමට අවබෝධය නොමැති පුද්ගලයා.**බලන්න**: බෝධි භික්ඛු හිමිගේ සටහන: EAN: note: 831,p.623. **මූලාශ්‍ර:** අංගු.නි: ( 2): 4 නිපාත:4.3.4.3 නෙය්‍යාපුග්ගල සූත්‍රය, පි. 281, EAN:4: 133.3 Of Quick Understanding,p.196.

**4) කෙළෙස් අනුව:** කෙළෙස් ඇතිබව දන්නා හෝ නොදන්නා පුද්ගල වර්ග 4 ක් පිළිබඳව සැරියුත් තෙරුන් විස්තර කර ඇත. ලාමක ආශාවන්ට යට විමනිසා භික්ෂුව තුළ කෙළෙස් හටගනී. **බලන්න**: කෙළෙස්. **මූලාශ්‍ර**:ම.නි:(1)1.1.5 අනගංණ සූත්‍රය,පි.74,EMN:5 Without blemishes, p. 94.

**5) තමාට හා ලෝකයාට හිතබව හා අහිතබව:**මේ ගණයට ගැනෙන පුද්ගලයන් 4 දෙනක් ගැන මේ සූත්‍රයේ විස්තරාත්මකව පෙන්වාඇත. **මූලාශ්‍රය:** අංගු.නි: (2): 4 නිපාත: අසුරවග්ග: 4.2.5.6 රාගවිනය සූත්‍රය, පි.204.

**6) ගරු පුද්ගලයන් 4 ක්** ගැන මෙහි දක්වා ඇත. **බලන්න**: ගරු පුද්ගල.

**7) ඣානසමාපත්ති ලබන පුද්ගල** වර්ග 4ක් මෙහි දක්වා ඇත. **බලන්න**: ඣාන.

▲**පුද්ගල පස් වර්ගය-**5 kind of persons: ස්වභාවය අනුව: **1)** පළමු අවජානිපුද්ගල-(දත්වා අවජානි -one who gives and then despises) :මොහු සිව්පසය දේ, ඉන්පසු දුන් පුද්ගලයාට අවමන් කරයි 2) දෙවෙනි අවජානිපුද්ගල (සංවාස අවජාන-one who despises as a result of living together): මොහු කෙනෙක් සමග එක්ව වාසය කර, ඉන්පසු තමා හා එක්ව සිටි කෙනා ගැන අවමන් කරයි. 3) ග්‍රහණමුඛ පුද්ගල (පහසුවෙන් රැවටෙන- person gullible for gossip: මොහු අන්‍යන්ගේ ගුණ හෝ නුගුණ ඇසුවිට එය වහා පිළිගනී.4) ලොලෝ පුද්ගල (අත්තනොමිතික-චපල-capricious person): ඔහුට ශ්‍රද්ධාව, පිළිගැනීම, ආදර ගෞරවය ආදී ගුණ නැත.5) පුද්ගල ලොලෝ:

(මන්දබුද්ධික- dull and stupid): කුසල අකුසල පිලිබඳ අවබෝධය නැත **මූලාශ්‍ර:** අංගු.නි: (3): 5 නිපාත: තිකන්ඩකිවග්ග: 5.3.5.1 අවජානාති සූත්‍රය, පි.290, EAN: 5:V: 141.1 sutta, p.283.

▲**පුද්ගල සය වර්ගය-** 6 kind of persons: මෙහිදී, පුද්ගලයන්ගේ උත්පත්තිය , ස්වභාවය, නැඹුරුකම් අනුව ඔවුන් කොටස් 6 කට බෙදා පෙන්වා ඇත. **බලන්න**: ඡළඅභිජාති.

▲**පුද්ගල අට වර්ගය** -8 kind of persons: **දැඩි ආශාව නිසා** ධර්ම මාර්ගයේ පිරිහෙන පුද්ගලයන් 4ක් හා දැඩිආශාව ඇතිවූ විට ඒවා මැඩ ගෙන ධර්ම මාර්ගය දියුණු කරගන්නා පුද්ගලයන් 4 ක් ගැන මෙහි විස්තර කර ඇත. **බලන්න**: ඉච්ඡාව

▲**පුද්ගල දස වර්ගය**- Ten kind of persons: 1) **ධනය ධාර්මිකව** හා අධාර්මිකව උපයා, කාමයෙහි සතුටුවන (කාමභෝගී) පුද්ගලයන් දස දෙනෙක් සිටි. **බලන්න:** කාමභෝගී පුද්ගලයෝ. 2) **ආධ්‍යාත්මික වෙනස්කම්** ඇති පුද්ගලයන් දස දෙනෙක් ගැන මෙහි පෙන්වා ඇත. **බලන්න**: තථාගතයන් වහන්සේ. **මූලාශ්‍ර:** අංගු.නි: (6): 10 නිපාත: 10.2.3.5 මිගසාලා සූත්‍රය, පි. 274, EAN:10: 75.5 Migasālā, p. 522.

▲ **පුද්ගලනානත්‍වය-** Differentiation of people: පුද්ගල නානත්‍වය ලෙසින් පෙන්වා ඇත්තේ, සද්ධා, විරිය, සති, සමාධි හා ප්‍රඥා ඉන්ද්‍රියයන්, ආධ්‍යාත්මික ඉන්ද්‍රිය වර්ධනය අනුව, ධර්මමාර්ගයේ ගමන් කරන පුද්ගලයන් ලබන ප්‍රතිලාභ විවිධබවය: ඉන්ද්‍රිය ධර්ම වර්ධනය අනුව සතරමග ඵල ලබා ගැනීම වෙනස්වේ. **බලන්න**: ඉන්ද්‍රිය නානත්‍වය, ඵලනානත්‍වය, පුද්ගලනානත්‍වය.

▼**බ්‍රහ්මචාරි හා බ්‍රහ්මචාරි** නොවන පුද්ගලයන්, මරණින් මතු සමානවූ ස්ථානයක පහළවීම පිළිබඳව ගිහිඋපාසිකාවක් වූ මිගජාලා, ආනන්ද තෙරුන් වෙතින් කරන ලද විමසීමක් අනුව බුදුන් වහන්සේ මේ සූත්‍රයන් වදාළහ. සාමන්‍ය ලෝකයාට පුද්ගලයන් ගේ ඉන්ද්‍රිය වර්ධනය පිළිබඳ තීරණය කිරීමේ හැකියාව නොමැත. එම හැකියාව ඇත්තේ තථාගතයන් හෝ උන්වහන්සේට සමාන උතුමෙක්හට පමණි. **බලන්න**: ඉන්ද්‍රිය පරෝපරියත්ත ඥානය **සටහන:** පළමු සූත්‍රයේ ඉන්ද්‍රිය වර්ධනයේ වෙනස්කම් අනුව, පුද්ගලයන් 6 දෙනක් ගේ පරලොව ගමන වෙනස්වන ආකාරය පැහැදිලි කර ඇත. දෙවන සූත්‍රයේ පුද්ගලයන් 10 දෙනක් ගැන විස්තර පෙන්වා ඇත. **මූලාශ්‍ර:** අංගු.නි: 6 නිපාත: 6.1.5.2 මිගසාලා සූත්‍රය, පි.130, 10 නිපාත: 10.2.3.5 මිගසාලා සූත්‍රය, පි.274.

▲ **පුද්ගලික ප්‍රසාදය-** personal confidence: පුද්ගලික ප්‍රසාදය ලෙසින් මෙහි පෙන්වා ඇත්තේ බුදුන් වහන්සේ කෙරෙහි ඇති ප්‍රසාදයය, දැඩි විශ්වාසයය. පුද්ගලික ප්‍රසාදය ඇති ගිහි උපාසකයන් අතුරින්, ජීවක කොමාරභච්ච වෛද්‍යවරයා, අග්‍ර බව බුදුන් වහන්සේ වදාළහ. **බලන්න**: උපග්‍රන්ථය:3

▲**පුද්ගලික සත්‍යයන් පහකිරීම:** පාලි : **පනුණ්ණපච්චේකසච්චො** -dispel of personal truths: ලෝකයේ ඇති පුද්ගලික සත්‍ය නම් මිනිසුන් තුල ඇති විවිධ මත දිට්ඨි හා පිළිගැනීම්ය. ආරියෝ මේවා බැහැර කර සිටි. **බලන්න**: දිට්ඨි, ආරිය වාසස්ථාන.

▼ **ආරියෝ** ලෝකයේ ඇති සියලු පුද්ගලික සත්‍ය බැහැර කර ඇතය යයි බුදුන් වහන්සේ පෙන්වා ඇත. ඔවුන්, විසින් ඒ දේ මැනවින් දුරලා ඇත, පහ කර ඇත, අත හැර දමා ඇත, ප්‍රතික්ෂේපකර ඇත, ප්‍රහීනය කර ඇත, තබා ගෙන නැත, ප්‍රහාණය කර ඇත, සහමුලින්ම පහකර ඇත. එකල, ලෝකයේ පැවති දිට්ඨි 10 ඔවුන් පිළිනොගනී. **මූලාශ්‍ර**: අංගු.නි: (6 ):10 නිපාත: 10.1.2.9 පඨමාරියවාස සූත්‍රය, 10.1.2.10 හා දෙවෙනි අරියවාස සූත්‍රය, පි.82-84, EAN:10:19.9 & 20.10 Abodes of the Noble Ones, p. 498-499.

**පධ**

▲**පධාන-**Striving: පධාන ලෙසින් ධර්මයේ පෙන්වා ඇත්තේ මාර්ගය වඩා ගැනීම පිණිස කරන විරියය- ප්‍රධාන වීරියය- ප්‍රධන් විරිය. **බලන්න**: වීරිය, සම්‍යක් ප්‍රධාන වීරිය. **සටහන්**: * බෝසතුන් බුදුවීමට පෙර ප්‍රධාන වීරිය වඩා මාරයා ජයගැනීම පිලිබඳ විස්තර පිණිස **බලන්න**: ඛු.නි: සූත්ත නිපාත: 3 මහාවග්ග: 3-2 පධාන සූත්‍රය. ** ප්‍රධන්විරිය පිණිස, තරුණබව, අල්පාබාධ, පිඩුසිඟා යැමට මනා පරිසරය තිබීම, ජනයා අතර සමගිය, සංඝයා අතර සමගිය උපකාරිවේ. **බලන්න**: අසමය හා සමය.

▲**පධාන සතර-** The 4 strivings: පධාන සතර- සතර ප්‍රධාන වීරිය -සතර සම්‍යක් ප්‍රධාන විරිය ලෙසින්ද පෙන්වා ඇත: 1) **සංවර ප්‍රධාන වීරිය** (Striving by restraint):නුපන් ලාමක අකුසල ඇතිනොවීම පිණිස: ඡන්දය උපදවීම, වැයම් කිරීම, සිත තිර කොට ගැනීම, වීරිය ආරම්භ කිරීම. 2) **ප්‍රහාන ප්‍රධාන වීරිය** (striving by abandonment): ලාමක අකුසල ප්‍රහීණය පිණිස: ඡන්දය උපදවීම... 3) **භාවනා ප්‍රධාන වීරිය** (striving by development ): නුපන් කුසල් ධර්ම ඇතිකර ගැනීම පිණිස: ඡන්දය උපදවීම... 4) **අනුරක්ෂණා -අනුරක්ඛනා ප්‍රධාන වීරිය** (striving by protection): උපන් කුසල ධර්මයන්ගේ ස්ථිතිය පිණිස, විනාශ නොවීම පිණිස, බොහෝකර ගැනීම පිණිස, විපුල කර ගැනීම පිණිස, පරිපූර්ණ කරගැනීම පිණිස ඡන්දය උපදවීම...). දුක නැතිකරගැනීමට, කෙළෙස් ප්‍රහීණය පිණිස මේ සතර ප්‍රධන් වීරිය වැඩිය යුතුවේ. **සටහන්**: * මේ සූත්‍රයේදී බුදුන් වහන්සේ **ආදිත්‍ය බන්ධු** (Kinsman of the Sun) ලෙසින් පෙන්වා ඇත. **බලන්න**:බුද්ධනාම ** සතර සම්‍යක් ප්‍රධාන විරිය, අසේඛබල 10 න් එකකි. **බලන්න**: ආස්‍රව හා ආස්‍රව ක්‍ෂය කිරීම. ** ප්‍රධන් විරිය වඩන ආකාරය, චතුසම්මප්පධාන ලෙසින් පෙන්වා ඇත. **බලන්න**: චතුසම්මප්පධාන. **මූලාශ්‍ර:** අංගුනි: (2 ): 4 නිපාත: 4.2.2.9 පධාන සූත්‍රය, පි.160, EAN:4: 69.9 Striving, p. 176.

▲**පධානිය අංග-**five factors of striving: ප්‍රධන් විරිය කරන මහණ සතු ගුණ පධානිය අංග ලෙසින් පෙන්වා ඇත: 1) බුදුන් වහන්සේ පිලිබඳ ඇති ශ්‍රද්ධාව 2) නිරෝගීබව-අල්ප අබාධ සහිතවීම 3) අවංකබව 4) දැඩි වීරිය තිබිම 5) කෙළෙස් ප්‍රහීණයට සමත් ප්‍රඥාව තිබීම. **බලන්න:** පංච ප්‍රාධානික අංග. **මූලාශ්‍ර:** අංගු.නි: (3): 5 නිපාත: 5.2.1.3 පධානියඅංග සූත්‍රය, පි. 126, EAN:5: 53.3 Factors, p. 257.

**පන**

▲ **පන්සිල්-** Five precepts: පන්සිල්-පංචශිලය බෞද්ධයන් රකින මූලික ශික්‍ෂා පදයන්ය. **බලන්න:** පංච ශිලය.

▲ **පානවර්ග**- Kind of drinks: පාන වර්ග ලෙසින් පෙන්වා ඇත්තේ ගිලන්පස පිණිස කැප බීම වර්ගයන්ය. **බලන්න**: සංඝයාට කැප පානවර්ග.

▲**පානාතිපාතා-**Panatipatha: පානාතිපාතා යනු ප්‍රාණඝාතයය, සත්වයන්ට හිංසා කිරීම. ඉන් වැලකීසිටීම පංච ශිලයේ එක් ශික්ෂා පදයකි: "පානාතිපාතා වේරමණී ශික්ඛා පදං සමාදියාමි". **බලන්න:** පංච ශිලය, ප්‍රාණඝාතය.

▼**පරපන නසන අය නිරයට යයි**: බුදුන් වහන්සේ පරපණ නසන කෙනෙකුගේ ස්වභාවය මෙසේ දක්වා ඇත: මේ ලෝකයේ කෙනෙක් ප්‍රාණඝාතය කරයි. ඔහු දරුණුය, අත් ලේවලින් වැසි ඇත. පහර දීම් කරයි, ප්‍රචණ්ඩය, සෙසු ප්‍රාණීන් ගැන සිත්පිත් නැති (දයාව නැති) කෙනකි: **"ඉධ භික්ඛවෙ එකච්චො පාණාතිපාති හොති ලුද්දො ලොහිතපාණි හතපහතෙ නිවිට්ඨො අදයාපන්නො සබ්බපාණභූතෙසු".** එවැනි අය ඒකාන්තයෙන්ම නිරයට යයි. **සටහන**: ප්‍රාණඝාතය කරන අය නිරයේ උපදින බව: විස්තර පිණිස **බලන්න**: * අංගු:නි; (2) 4 නිපාත: 4.2.4.1 පානාතිපාතා සූත්‍රය, ** 4.7.1 පානාතිපාතා සූත්‍රය: ප්‍රාණඝාතය පිණිස අනුන් උනන්දු කිරීම, සහභාගී කිරීම හා එහි ගුණවැනීමද නිරයට ගෙනයන අකුසලයක් බව මේ සූත්‍රයේ පෙන්වා ඇත. ** සංයු.නි: (5-2) මහාවග්ග: සච්චසංයුත්ත: 12.8.1 සූත්‍රයේදී, ප්‍රාණඝාතය කරන ලෝකයා බොහෝ යයි බුදුන් වහන්සේ වදාළහ. **මූලාශ්‍ර**: අංගු.නි: (6 ): 10 නිපාත: කරජකාය වග්ග: 10.5.1.1. පඨම නිරය සූත්‍රය, පි. 548, ජානුසොණි වගග:10.4.2.10,චුන්ද සූත්‍රය**,** පි.508, EAN:10: The Deed-born body: 211.1 Hell, p. 556, Jāṇussoṇī: 176.10, Cunda, p.553.

▼ **වෙනත් මූලාශ්‍ර: 1.** ප්‍රාණය විනාශ කිරීමය-පානාතිපාතය ය, ප්‍රාණවධය යයි ද කියයි. එයට අංග 5 ක්වේ: ජීවය ඇති සත්වයෙක් වීම, සත්වයෙක් යන සංඥාව ඇතිවීම, 'මරන්නෙමි' යන වධක චේතනාව, ඒ සඳහා කරණ උපක්‍රමය, එයින් දිවි තොර කිරීම. **සද්ධර්ම කෝෂය,** පි. 113.

▲ **පින්:** පාලි:**පුඤ්ඤ**-Merit: ධර්මයට අනුව පින් - පිං -පුඤ්ඤ යනු කාර්මිකව යහපත් එලවිපාක ලබාදෙන කුසල් ක්‍රියාවලටය. පින්කළබව- පින්කරතිබීම, සුභ කරුණක් යයි මංගල සූත්‍රයේදී පෙන්වා ඇත. **බලන්න**: කතපුඤ්ඤ,කුසල හා අකුසල, දානය, අග්‍ර පින. **සටහන්**: * එක් සමයක සක් දෙව්දු මිනිස් වෙසක් ගෙන මහා කාශ්‍යප තෙරුන්ට දානය පිළිගැන්වීම පිලිබඳ විස්තර මෙහි දක්වා ඇත. දුගී මිනිසුන්ට පින් ලබාගැනීමේ අවස්ථාව පැහැර ගැනීම ගැන තෙරුන් අවවාද කලවිට සක්දෙව්දු මෙසේ පවසා ඇත:" වහන්ස, අපටත් පිනෙන් වැඩ ඇත, අපටත් පිනෙන් කටයුතු ඇත".

**බලන්න:** බු.නි:උදානපාලිය:නන්දවග්ග: 3.7 කාශ්‍යප සූත්‍රය, පි.212. ** අන් කිසිවෙකුට පැහැර ගැනීමට නොහැකි දේ, කෙනෙක් කරගත් පින්ය. **බලන්න**:සංයු.නි: (1) සගාථවග්ග: දේවතාසංයුත්ත: ජරාවග්ග: ජරාසූත්‍රය, අප්සරා සූත්‍රය, පි. 92.

▲**පින් කිරීම**-Meritorious actions: පින් කිරීමට (පුඤ්ඤක්‍රියා **)** කිරීමට කිසිවිටක බිය නොවිය යුතුය යි බුදුන් වහන්සේ වදාළහ. පින්-පුඤ්ඤ යන ශබ්දය, සුඛයට- සැපයට නමකි. දීර්ඝවූ සසරේ බොහෝ පින් කළනිසා තමන්වහන්සේ බොහෝ දෙව්සැප සම්පත් ලැබූබව මේ සූත්‍රයේ දී බුදුන් වහන්සේ පෙන්වා ඇත. **මූලාශ්‍ර:** අංගු.නි: (4 ): 7 නිපාත: 7.2.1.9 මාපුඤ්ඤභායි සූත්‍රය, පි. 432, EAN: 7: 62.9. Donot be afraid of merit, p. 391.

▲**පින් වැඩෙන අන්දම-** Development of merit: යම් කෙනෙක් ධර්මයේ පිහිටා, ශීල සම්පන්නව, අනුන් උදෙසා මල්වතු, උද්‍යාන, වනගොමු සකස්කරයිද, ඒදඬු, පාලම් සාදයිද, පැන්හල්, පැන් පොකුණු

ඉදි කරයිද ඔවුන්ට දිවා රාත්‍රියේ, හැම කාලයේදීම පින් වැඩෙන බව බුදුන් වහන්සේ වදාළහ. එවැනි අය ස්වර්ගයට යති. **මූලාශ්‍ර:** සංයු.නි: (1 ): සගාථවග්ග: දේවතාසංයුත්ත: 1.5.7 වනරෝප සූත්‍රය, පි. 86, ESN: 1: Devatasmayutta: 47.7 Planters of groves, p. 122.

▲ **පින්දීම-** offering merits: මියගිය ඥාති මිත්‍රයන් සිහිපත්කර ඔවුනට පින්දීම පිණිස(පින් අනුමෝදනා කිරීම), සංඝයාට දාන වස්තු පිරිනැමීම බෞද්ධයන්ගේ චාරිත්‍රයකි. බුදුන්වහන්සේ වැඩසිටි සමයේ විසූ බ්‍රාහ්මණයන්ද මළවුන් අනුස්මරණය කර දන්දීම කලබව සූත්‍රවල දක්වා ඇත. **බලන්න**: දානය, මළවුන් අනුස්මරණය.

▼**පින්දීම-මියගිය අයට-** Offering merits for departed ones: මළවුන් අනුස්මරණයකිරීම පිණිස දෙන දාන මගින් මියගිය නෑදෑයනට පින්අනුමෝදන් සිදුවේද? යයි ජාණුස්සොණි බ්‍රාහ්මණයා ඇසූ ප්‍රශ්ණ වලට පිළිතුරු ලෙසින් බුදුන් වහන්සේ මෙසේ කරුණු පෙන්වා ඇත: **1)** මියගිය අය සිහිපත්කර දෙන දානය මගින් ඔවුනට යහපතක් වේද: ඔවුන්ට ඉන් පින් ලැබේද? (Can our gift, Master Gotama, actually be of benefit to our departed relatives and family members? Can our departed relatives and family members actually partake of our gift?). **2) "...ඨානෙ ඛො බ්‍රාහමණ, උපකප්පති, නො අට්ඨානෙති**" පින්ගැනීමට හැකි ස්ථානයක ඔවුන් යළි උපත ලබාඇත්නම් ඔවුන්ට පින්ලබාගත හැකිය, අස්ථානයක යළි උපත ලබාඇත්නම් පින්ලබා ගත නොහැකිය. On a right occasion, brahmin, it can be of benefit, not on a wrong occasion). **3 ) ස්ථානය හා අස්ථානය කුමක්ද?** ( what is a right occasion and what is a wrong occasion) **4) ස්ථානය:** ප්‍රේත ලෝකය. **අස්ථානය:** නිරය, තිරිසන් ලෝකය, මිනිස්ලෝකය, දේවලෝක. **සටහන:**ස්ථානඅස්ථාන දන්නා නුවණ තථාගතයන්ගේ දස බල ඥානයන්ගෙන් එකකි. **5)** මේ භවයේ සිටි නෑදෑ මිතුරන් ප්‍රේතලෝකයේ යළි උපත ලබා නොමැතිනම් ඔවුන් වෙනුවන් දෙන දානයේ පින කවරෙක් අනුමෝදන්වේද? ("But, Master Gotama, who partakes of the gift if that deceased relative or family member has not been reborn in that place?)

**6) "අඤ්ඤෙපිස්ස බ්‍රාහමණ පෙතා ඤාති සාලොහිතා තං ඨානං අනනුපපන්නා** හොන්ති. **තෙ තං දානං පරිභුඤ්ජන්ති ති"**. පෙර ජතිවල සිටි නෑදෑයන් ප්‍රේතලෝකයේ සිටි නම් ඔවුන්එම පින් අනුමෝදන් කරගනී. (Other departed relatives or family members who have been reborn in that place partake of the gift). **7)** පෙර ජතිවල නෑදෑයන් ප්‍රේතලෝකයේ නොසිටිනම් කවරෙක් එම පින් අනුමෝදන් කරගනීද? (But, Master Gotama, who partakes of the gift if neither that deceased relative or family member nor any others have been reborn in that place?) **8) "අට්ඨානං ඛො බ්‍රාහමණ, අනවකාසො යංතං ඨානං විවිත්තං** අස්ස **ඉමිනා දීසෙන අද්ධුනා යදිදං පෙතෙහි ඤාති සාලොහිතෙහි. අපි ච බ්‍රාහමණ දායකොපි අනිප්ඵලො හොති"**.මේ දීර්ඝ සසර ගමනේදී කෙනෙක්ගේ, මියගිය නෑදෑහිතවතුන් ගෙන් ප්‍රේතලෝකය හිස්ය යයි කීම සිදුවිය නොහැකි, සිතා ගැනීමට නුපුළුවන් දෙයක්ය. එමනිසා මළවුන් සිහිකර දෙන දාන දායකයන්ට ඵලයක්ය, නිශ්ඵලයක් නොවේ. (Over this long stretch of time [in saṃsāra],

brahmin, it is impossible and inconceivable for that place to be devoid of one's departed relatives and family members. Further, for the donor too it is not fruitless.). **9 ) අස්ථානයේ දෙන දානවල විපාක තිබේද? (**Does Master Gotama posit [the value of giving] even on the wrong occasion?) .කෙනෙක් දෙන දානය නිෂ්ඵල නොවේ, මෙලොවදී මෙන්ම පරලොවදී පවා ඉන් යහපත් ප්‍රතිඵල ලැබේ. ( Brahmin, I posit [the value of giving] even on the wrong occasion). **සටහන:** මේ දේශනාව අවසානයේදී, ජාණුස්සොණි බ්‍රහ්මණයා, බුදුන් වහන්සේ සරණ ගියහ. **බලන්න**:උපග්‍රන්ථය:3.**මූලාශ්‍ර**: අංගු.නි (6 ) 10: නිපාතය:10.4.2.11 ජාණුස්සොණි සූත්‍රය, පි. 518, EAN:10: 177.11: Jāṇussoṇī, p. 554.

▼**පින් දීම ප්‍රේතයන්ට** -Offering merits for Prethas: ප්‍රේතඋත්පති ලබා සිටින සත්ත්වයෝ තමන්ගේ ඥාතින් ගෙන් පින් බලාපොරොත්තුවෙන් පසුවේ. යම් නෑදෑයන් පිරිසක්, මියගිය ඥාතීන් සිහිකර, යම් ආහාර පාන දන්දෙති- ප්‍රේතදාන, පින් අනුමෝදන් කරති. ප්‍රේතඋත්පති ලබා, එම ස්ථානයට පැමිණි ඒ සත්ත්වයෝ ඒ ලැබූ පින් අනුව සතුටට පත්වේ, තම නෑදෑයන්ට තුති කරති. ඒ දන් දුන් දායකයන්ට ද යහපත් ඵල ලැබේ. එමනිසා, මියගිය අය වෙනුවෙන් ශෝක වැළපීම් ආදී නිෂ්ඵල දේ කරනවා වෙනුවට, ඔවුන් සිහිකර, ඔවුන් පෙරදී තමනට කරණ ලද උපකාර සිහිකර දන් දිය යුතුවේ. එමගින් දන් දෙන අයටද පින් රැස්වෙන බව බුදුන් වහන්සේ වදාළහ. **මූලාශ්‍ර**: බු.නි: බුද්දකපාඨ: 7 තිරෝකුඩ්ඩ සූත්‍රය, පි. 42:Tirokuṭṭasutta: Bhikkhu Sujato: Suttacentral.

▲ **පින්ගිය තෙර-** Pingiya Thera: **බලන්න**: උපග්‍රන්ථය:1

▲ **පුන්නජි තෙර-** Punnaji Thera: **බලන්න**: උපග්‍රන්ථය: 1

▲ **පුන්ණිකා තෙරණිය-**Punnika Therani: **බලන්න**: උපග්‍රන්ථය:2

▲ **පුන්බ්බසුක භික්ෂුව (කිටාගිරිය)** - Punabbasuka Bhikkhu (Kitagiri): **බලන්න**: උපග්‍රන්ථය: 4.

▲ **පුනබ්බසු යක්ඛ-** Punabbasu Yakka: **බලන්න**: යක්ඛ

▲**පුන්සඳ -** the full moon: නාගතිමග- දහම් මගගමන් කරන පුද්ගලයාගේ කිර්තිය, පසළොස්වක දින පායන පුන්සඳ මෙන් පැතිරේ.**බලන්න:** අගතිමග හා නාගති මග, උපග්‍රන්ථය:5

▲ **පුනර්භවය**: පාලි: **පුනබ්භව-** Rebirth: ධර්මයේ පුනර්භවය-(ප්‍රතිසන්ධිය) ලෙසින් පෙන්වා ඇත්තේ කෙනෙක් මේ ජීවිතය අවසන් කර මිය යාමෙන් පසු -කෙළෙස් ප්‍රහීණ නොකර ගත් නිසා, ත්‍රිවිධ භවයන් ගෙන් එකක (කාම රූප අරූප) යළි උපත ලබාගැනීමය. **සටහන්**: * සම්මා සම්බෝධිය ලැබීමෙන් පුනර්භවය නැති කළ බව බුදුන් වහන්සේ ධම්ම චක්කපවත්වන සූත්‍රයේ දී පෙන්වා ඇත. ** සංයු.නි. (5-1) මහාවග්ග: ඉන්ද්‍රිය සංයුත්ත:4.3.1 පුනබ්භව සූත්‍රයේද එම කරුණ පෙන්වා ඇත. **ශබ්දකෝෂ:** පා.සිං.ශ: පි.390: "**පුනබ්භව: පුනර්භවය, නැවත හටගැනීම"** **B.D:**p.145: **"Punabbhava:** re-becoming, renewed existence is a sutta terma for rebirth… in later litreture it is called 'patisandhi'."

▼**විඥාණ ආහාරය** පුනර්භවය (ප්‍රතිසන්ධිය-යළි උපත) නාමරූප හටගැනීම පිණිස ප්‍රත්‍ය (හේතුවේ) වේ ය යි බුදුන් වහන්සේ පෙන්වා ඇත. **බලන්න**: ආහාර. **මූලාශ්‍ර**: සංයු.නි: (2): නිදානවග්ග: 1.2.2 මෝළිය එග්ගුන සූත්‍රය, පි. 42, ESN: Nidanasamyutta: 12.2 Moḷiyaphhagguna, p. 625.

▼ **තණ්හාව පුනර්භවය** ඇතිකරයි, එය දුක්ඛ සමුදය යයි බුදුන් වහන්සේ පෙන්වා ඇත. **"ඉද ඛො පන භික්ඛවෙ, දුක්ඛසමුදයො අරියසච්චං: 'යායං තණ්හා පොනොභවිකා නන්දිරාගසහගතා තත්‍ර තත්‍රාභිනනන්දිනී, සෙය්‍යථිදං: කාම තණ්හා භවතණ්හා විභවතණ්හා'..** බලන්න: චතුරාර්ය සත්‍ය. **සටහන:** පුනර්භවය ඇති නොවීමට තණ්හාව දුරුකර ගතයුතුය, මේ ප්‍රශ්ණය විමසුවේ පිංගියමානවක තෙරුන්ය. **මූලාශ්‍රය**: ඛු.නි. සුත්තනිපාත: පාරායනවග්ග:වස්තුගාථා: පි,326, 5-16 පිංගියමානවක,පි.364.

▼ **විඥානය පිහිටි** කල්හි, වැඩුන කල්හි, මතු පුනර්භවය- යළි උපත හට ගැනීම වේ. පුනර්භවය ඇතිකළ ජාති ජරා... ආදීවූ දුක් රැස ඇතිවේ. පුනර්භවය නැතිවීම සසර දුක නිමාවීමය. **මූලාශ්‍ර:** සංයු.නි: (2 ): නිදානවග්ග: අභිසමයසංයුත්ත:කළාරඛත්තිය: චේතානා සූත්‍ර 3කි. පි. 124, ESN:12: Nidanasamyutta: IV: The Karakhattiya: Volition 3 suttas p. 665.

▼ වෙනත් මූලාශ්‍ර**: 1. "Does Rebirth Make Sense"** by Venerable Bhikkhu Bodhi (පුනර්භවය පිළිගැනීමට ඇති හේතු ගැන කරුණු පෙන්වා ඇත).

▲ **පැන්හල් හා පැන්පොකුණු**- Watering places & ponds: බුදුන් වහන්සේ වැඩසිටි සමයේදී ද මගින් ගේ පහසුව තකා පැන්හල්, පැන් පොකුණු මං සන්ධි අසල සාදා තිබුන බව සූත්‍ර දේශනාවල සඳහන් වේ. යම් කෙනක්, අන්‍යයන්ගේ යහපත පිණිස පැන්හල් ආදිය කරවන්නේ නම් එය පුණ්‍ය ක්‍රියාවකි, සුගතියට මග පාදයි. **මූලාශ්‍රය**: සංයු.නි: (1): සගාථවග්ග: දේවතාසංයුත්ත: 1.5.7 වනරෝප සූත්‍රය, පි.86.

▲ **පැනස**- eye of wisdom: පැනස- ප්‍රඥා ඇස ලෙසින් පෙන්වා ඇත්තේ, ආසව ක්‍ෂය කිරීමේ නුවණ ලැබීමය. **බලන්න**: චක්ඛු තුන, ත්‍රිවිධ චක්ෂු.

**පණ**

▲**පණ්ඩිතයා**: පාලි: **පණ්ඩිතො**-The wise person: ධර්මයට අනුව පණ්ඩිතයා- නුවණැති පුද්ගලයා යනු ධර්මය යහපත්ව අවබෝධ කරගත් තැනැත්තාය. **සටහන**: ඛු.නි: ධම්මපද: 6 පණ්ඩිතවග්ගයේ: පණ්ඩිතයා සේවනය කිරීමේ වැදගත්කම පෙන්වා ඇත.

▼ **බුදුන් වහන්සේ පණ්ඩිතයා මෙසේ හඳුන්වා ඇත:** මෙලොව දියුණුව හා පරලොව දියුණුව පිළිබඳව අප්‍රමාදව කටයුතු කරන, ඒ දෙවැදෑරුම් වූ දියුණුව ලබන ධෘතිසම්පන්න- ප්‍රඥාව ඇති පුද්ගලයා පණ්ඩිතයා යයි කියනු ලැබේ. **සටහන**: මෙලොව හා පරලොව දියුණුව පතන පුද්ගලයා පුණ්‍ය ක්‍රියා කරයි. දාන, ශිල හා සමාධි . **බලන්න**: පුණ්‍යක්‍රියා හා පුණ්‍යවස්තු, අප්‍රමාද හා ප්‍රමාද, ඥානය. **මූලාශ්‍ර**: සංයු.නි: (1):මහාවග්ග:

කෝසලසංයුත්ත, 3.2.7. අප්පමාද සූත්‍රය, පි.186, ESN: Kosala smayutta: 18.8 Diligence -2, p. 242

▲ **පණ්ඩිත ප්‍රඥාව** -Panditha Paññā: ආරියන් ගේ උතුම් අවබෝධය (නිවන ලබාගැනීම පිණිස) පණ්ඩිත ප්‍රඥාවය. ජවන, නිබ්බේධික, මහා, තීක්‍ෂණ, විපුල, ගාම්භීර හා අසාමන්ත යන සප්ත ප්‍රඥාවන් වැඩීමෙන් නැවත නැවත එහි යෙදීමෙන් පණ්ඩිත ප්‍රඥාව (පාණ්ඩිත්‍යය) පරිපූර්ණවේ: **"ඉමා සත්තපඤ්ඤා භාවිතා බහුලීකතා පණ්ඩිච්චං පරිපූරෙති"**. **මූලාශ්‍ර**: ඛු.නි: පටිසම්භිදා 2 :ප්‍රඥාවග්ග: 3.**1 ප්‍රඥා කථා,** පි.166.

▲ **පාණ්ඩුකම්බල ශෛලාසනය-** Pandukambala sailasanaya සක්දෙවිඳුගේ ආසනය පාණ්ඩුකම්බල ශෛලාසනය ලෙසින් දක්වා ඇත. **බලන්න**: දුබ්බන්ණිය මිටියක්ෂයා.

▲ **පිණ්ඩපාත-**Alms: පිණ්ඩපාත යනු පිඩුසිඟා යෑමය. බුදුන් වහන්සේ මෙන්ම,ගිහිගෙය හැර, බුදුසසුනට ඇතුළුවූ ශ්‍රාවක සංඝයාද, කය පවත්වා ගැනීම පිණිස පිඩුසිඟා යාමේ චාරිත්‍රයේ යෙදී සිටි. මෙය සංඝයාට කැප සිව්පසයෙන් එකකි. පිණ්ඩපාතයෙන් පමණක් යැපෙන සංඝයා, පිණ්ඩපාතිකයෝ ලෙසින් හඳුන්වයි, එය ධුතාංග පුහුණුවකි. **බලන්න**: සිව්පසය. **සටහන්: *** අංගු.නි: (3) 5 නිපාත: අරඤ්ඤවග්ග සූත්‍ර**:** පිණ්ඩපාතයෙහි යෙදන සංඝයා වර්ග 5ක් පෙන්වා ඇත. ඔවුන් අතුරින්, අල්පේච්ඡතාවය, සන්තුෂ්ටිය, කෙළෙස් පහකරගැනීම අරමුණු කොට, පිඩුසිඟා යන මහණ අග්‍රයයි බුදුන් වහන්සේ පෙන්වා ඇත. **බුදුන් වහන්සේ පිඩුසිඟා වඩින අවස්ථාවක, මාරයා, උන්වහන්සේට පිණ්ඩපාතය ලැබීම වළකාලිම පිලිබඳ සිද්ධිය, සංයු.නි: (1) මාරසංයුත්ත: පිණ්ඩ සූත්‍රයේ විස්තර කර ඇත.

▼ජීවිකාවන් අතුරුන් ලෝකයා පිඩුසිඟායෑම ලාමකයයි සිතයි, ගරහයි. එහත්, පැවිදිවන කුල පුත්‍රයෝ, එහි අර්ථය දැනම පිඩුසිඟා වඩින බව බුදුන් වහන්සේ මෙහිදී පෙන්වා ඇත. **මූලාශ්‍රය**:සංයු.නි: (3) ඛන්ධසංයුත්ත: 1.2.3.8 පිණ්ඩොල්‍යා සූත්‍රය, පි. 184.

▼ **තමන් පිලිබඳ යසෝරාවය** නොපතන, අටලෝදහමින් නොසැලෙන, පිණ්ඩපාතික අංග රකිනා මහණහට දෙවියෝ ආදරය කරති යයි බුදුන් වහන්සේ වදාළහ. **මූලාශ්‍රය**: ඛු.නි: උදානපාලිය: 3.8 පිණ්ඩපාතික සූත්‍රය, පි. 216.

▼ **පිඩු සිඟා යෑමේ පිළිවෙල**: කය හා සිත ඉවත්කොට, ආගන්තුකයෙක් ලෙසින් කුලයන් වෙත පිඩුපිණිස-පිඩුසිගා එළඹිය යුතුය යි බුදුන් වහන්සේ සංඝයාට උපදෙස් ඇත. **සඳ උපමාව** යොදාගනිමින් බුදුන් වහන්සේ වදාළේ, මහා කාශ්‍යප තෙරුන් මෙන් කුලයන් හා නොගැටී කටයුතු කලයුතු බවය**. බලන්න**: චන්දිම, උපග්‍රන්ථය:5. **මූලාශ්‍ර:** සංයු.නි: (2) නිදානවග්ග: කස්සපසංයුත්ත: 4.1.3 චන්දඋපමා සූත්‍රය, පි.324.

▲ **පිණ්ඩපාත පාරිශුද්ධිය-** The Purification of Alms food: පිණ්ඩපාත පාරිශුද්ධිය ලෙසින් පෙන්වා ඇත්තේ, පිඩුසිඟායන භික්ෂුව, අයහපත් අකුසල් සිත නොමැතිව, ලෝභ දෝස මෝහ ආදී කෙළෙස් වලින් තොරව,පිණ්ඩපාතය ලබා ගැනීමට කටයතු කිරීමය. මේ සූත්‍රයේදී බුදුන්

වහන්සේ එම ක්‍රම විධිය විස්තරාත්මකව පෙන්වා ඇත. **සටහන්:** * සැරියුත් තෙරුන්, ශූන්‍යතා විහරණයෙන් වාසය කිරීම අගය කරමින්, බුදුන් වහන්සේ මේ සූත්‍රය දේශනා කර ඇත. **බලන්න:** ශූන්‍යතා විහරණය. ** පිණ්ඩපාතික අංග රකිමින්, අටලෝදහමින් නොසැලී යහපත් ලෙසින් පිඩුසිඟායන භික්ෂුවට දෙවියෝ ආදරය කරයි. **බලන්න**: ඛු.නි: උදාන පාලිය: නන්දවග්ග: 3.8 පිණ්ඩපාතික සූත්‍රය, පි.216. **මූලාශ්‍ර:** ම.නි: (3): 3.5.9 පිණ්ඩපාත පාරිශුද්ධි සූත්‍රය**,** පි. 624, EMN: p.1047.

▲ **පිණ්ඩොල භාරද්වාජ තෙර-** Piṇḍola Bhāradvāja Thera: **බලන්න:** උපග්‍රන්ථය1

▲ **ප්‍රාණඝාතය**: පාලි: පාණාතිපාතා- destruction of life: ධර්මයට අනුව ප්‍රාණඝාතය - පරපන නැසීම -ජීවිත හානි කිරීම දස අකුසලයන් ගෙන් එකකි, නිරයට මගකි. පංච ශීලය හා අනිකුත් ඉහළ ශීල යන්හි, ප්‍රාණඝාතය නොකිරීම සිල් පදයක් ලෙසින් පෙන්වා ඇත. **බලන්න**: පානාතිපාතා.

▲ **ප්‍රාණීන්-** beings: සියලුම ප්‍රාණීන්, සිව් ඉරියව්ව පැවතීම පිණිස පොළොව පිහිට කරගනී. එලෙස, ශීලයේ පිහිටා සප්ත බොජ්ඣංග වැඩිය යුතු බව මෙහිදී පෙන්වා ඇත. **බලන්න**: උපග්‍රන්ථය:5. **මූලාශ්‍රය**: සංයු.නි: (5-1) මහාවග්ග: බොජ්ඣංගසංයුත්ත:2.2.1 පාණ සූත්‍රය, පි.190.

▼ **මහාමුහුදේ ඇති ප්‍රාණීන්** බොහෝය, බොහෝ සියුම් ප්‍රාණීන් ද සිටී. යම් පුද්ගලයෙක්, මුළු දඹදිව ඇති ලී රැගෙන, ඒවා උල්කර, මුහුදේ ඇති සියලු ප්‍රාණීන් ඇල්ලීමට උත්සාහ කලද එය සිදුනොවේ. එලෙස, අත්භවය සියුම්ය, ආපය දුක මහත්ය. එම දුකෙන් ගැලවීම පිණිස චතුසත්‍ය අවබෝධ කර විරිය කළයුතුවේ.**බලන්න**: උපග්‍රන්ථය:5. **මූලාශ්‍රය**: සංයු.නි: (5-2 ) මහාවග්ග:සච්චසංයුත්ත: 12.4.6 පාණ සූත්‍රය, පි. 322.

▲ **පුණ්‍ය ක්‍රියා-** Meritorious actions:පුණ්‍ය යනු යහපත් එල ලබාදෙන ක්‍රියාවන්ය. **බලන්න**: පින්.

**සටහන්**: * අන්‍යයන්ගේ සුවය පිණිස උයන්වතු කිරීම පුණ්‍යක්‍රියාවකි. **බලන්න**: උද්‍යාන. ** සංඝයාගේ යහපත පිණිස ආවාස සදා පූජාකිරීම පුණ්‍ය ක්‍රියාවකි. **බලන්න:** ආවාස. ** අන්‍යයන්ගේ යහපත පිණිස එදඬු, පාලම් ආදිය සෑදීම පුණ්‍ය ක්‍රියාවකි. **බලන්න**: එදඬු පාලම්. ** ආරිය උතුමන් සිහිපත් කිරීමට ස්ථූප සෑදීම, ඒවාට පුද පූජා පැවැත්වීම පුණ්‍ය ක්‍රියාවකි. **බලන්න**: ස්ථූප, චෛත්‍ය.

▲ **පුණ්‍ය කෙත-** Field of merits: පුණ්‍ය කෙත- පින් කෙත ලෙසින් පෙන්වා ඇත්තේ දානය පිළිගැනිමට සුදුසු උතුමන්ය: බුදු, පසේ බුදු හා සංඝයාය. කෙතක වපුරන ධාන්‍ය ආදියන් යහපත් අස්වැන්න ලැබෙන ලෙසින්, උතුමන්ට පිළිගන්වන දාන පූජා නිසා මහා පින් ලැබේ. **බලන්න:** දක්ශිනාවට සුදුසු, සංඝ ගුණ. උපග්‍රන්ථය:5 (බීජ උපමාව)

▲ **පුණ්‍යක්‍රියා හා පුණ්‍යක්‍රියා වස්තු:** පාලි: **පුඤ්ඤකිරියා පුඤ්ඤකිරියවත්ථු** -deeds of merit & grounds based on merit . ධර්මයට අනුව පුණ්‍යක්‍රියා යනු කුසල ක්‍රියාය. මෙලොව හා පරලොව යහපත පිණිස

පවතින හොඳ ක්‍රියාවන්ය. පුණ්‍යක්‍රියා වස්තු ලෙසින් ධර්මයේ පෙන්වා දෙන්නේ කුසල ක්‍රියාව හා එයට අයත් ආනිසංස ගැනය. **බලන්න**: පින්

▼ **පුණ්‍යක්‍රියා වස්තු 3 කි:** දානමය පුණ්‍යක්‍රියා වස්තු, ශීලමය පුණ්‍යක්‍රියා වස්තු හා භාවනාමය පුණ්‍යක්‍රියා වස්තු. එමගින්, යහපත් ලෙසින් දන්දීම, ශීලසම්පන්නවීම හා සමාධි සමාපත්ති ලබාගැනීමට හැකිවීම. **මූලාශ්‍ර**: දීඝ.නි:(3):10 සංගීති සූත්‍රය- පි. 381, EDN: 33 Saṅgīti Sutta: The Chanting Together, p. 367. **සටහන්:** * බුදුන් වහන්සේ පෙන්වා ඇත්තේ, මතු උතුම් සැප විපාක පතන කෙනෙක් මේ තුන් පුණ්‍යක්‍රියා කරමින්, සම හැසිරීම හා මෙත්තාසහගත සිත වඩා ගත යුතුය. එවැනි අය බඹලොව උපදී. **මූලාශ්‍රය**: ඛු.නි: ඉතිවුත්තක: 3.2.1 පුණ්‍යක්‍රියාවස්තු සූත්‍රය**,** පි. 416.

▼**යහපත් කම්ම** ප්‍රතිඵල ලබා ගැනීම පිණිස පුණ්‍යක්‍රියා කලයුතු ආකාරය පිලිබඳ විස්තර පිණිස **බලන්න**: අංගු.නි: (5) 8 නිපාත: 8.1.4.6 පුඤ්ඤකිරියවත්ථු සූත්‍රය.

▼ **පුණ්‍යක්‍රියා කිරීම ගැන ප්‍රඥාවන්තයෝ ප්‍රසංසා කරති**: බුදුන් වහන්සේ මෙසේ වදාළහ: ආයුෂ, නීරෝගිබව, ශරීර වර්ණය, දෙව්ලොව උපත, උසස්කුලයක උපත, උදාරබව, අන්‍යන්ට ප්‍රියබව, කැමතිදේ ලැබීම ආදිය පතන අය විසින් නොපමාව පුණ්‍ය ක්‍රියා කළයුතුවේ. නුවණැති අය පින් කිරීම පසසති. **මූලාශ්‍ර**: සංයු.නි: ( 1) සගාථවග්ග: කෝසලසංයුත්ත: 3.2.7 අප්පමාද සූත්‍රය, පි. 186, ESN: 1: Kosalasmayutta: 18.8 Diligence -2, p. 242.

▲ **පුණ්‍යනදි** - Streams of merits: අග්‍රදානයන් පිරිනැමීම, ආරිය ශ්‍රාවකයා තුල ඇති උතුම් ගුණ පුණ්‍යනදි ලෙසින් බුදුන් වහන්සේ පෙන්වා ඇත. **අංග 6 කින් පරිපූර්ණ දානය,** පුණ්‍ය නදියක් යයි බුදුන් වහන්සේ පෙන්වා ඇත. එම දානය නිසා ලැබෙන පින අප්‍රමාණය, අසීමිතය . **බලන්න**: ෂළඅංග දානය

▼**දානය නිසා ඇතිවන පුණ්‍යනදී 5කි.**

1) යම් කෙනෙක් පූජා කළ සිවුරු පොරවා ගෙන, භික්ෂුවක් අරහත්ඵල සමාධිය ලබන්නේද, එය දායකයාට පුණ්‍ය නදියකි 2) යම් කෙනෙක් පූජා කළ පිණ්ඩපාතය වළඳා, භික්ෂුවක් අරහත්ඵල සමාධිය ලබන්නේද, එය දායකයාට පුණ්‍ය නදියකි 3) යම් කෙනෙක් පූජා කළ සේනාසනයක් පරිහරණය කරමින් භික්ෂුවක් අරහත්ඵල සමාධිය ලබන්නේද, එය දායකයාට පුණ්‍ය නදියකි. 4) යම් කෙනෙක් පූජා කළ ඇඳ පුටු ආදිය පරිහරණය කරමින් භික්ෂුවක් අරහත්ඵල සමාධිය ලබන්නේද, එය දායකයාට පුණ්‍ය නදියකි 5) යම් කෙනෙක් පූජා කළ ගිලන්පස අවුසද ආදිය පරිහරණය කරමින් භික්ෂුවක් අරහත්ඵල සමාධිය ලබන්නේද, එය දායකයාට පුණ්‍ය නදියකි. මේ පුණ්‍ය ක්‍රියා අප්‍රමාණය, දායකයාගේ හිත සුව පිණිසය, මතු දෙව්ලොව සැප පිණිසය. **මූලාශ්‍ර:** අංගු.නි: (3): 5 නිපාත: 5.1.5.5 පුඤ්ඤාභිසන්ද සූත්‍රය, පි.102, EAN:5: 45.5 Streams, p. 253.

▼**සැප ලබාදෙන පුණ්‍යනදී (කුසල නදී): 1) ආරිය ශ්‍රාවකයාට ඇති උතුම් ගුණ 4ක්** පුණ්‍ය නදි ලෙසින් දක්වා ඇත: 1-3. ත්‍රිවිධ රත්නය පිලිබඳ

අවෙච්චා ප්‍රසාදය 4. ශීලසම්පන්න බව- ආරිය කාන්ත ශීලය තිබීම. **2) ආරිය ශ්‍රාවකයාට ඇති තවත් උතුම් ගුණ 4ක්** පුණ්‍ය නදියන්ය: 1-3 ඉහත පරිදිය. 4. ත්‍යාගශීලිබව. **3) ආරිය ශ්‍රාවකයාට ඇති තවත් උතුම් ගුණ 4ක් පුණ්‍ය නදියන්ය**: 1-3 ඉහත පරිදිය. 4. ප්‍රඥාව තිබිම- දුක නැතිකර ගැනීමේ අවබෝධය. **මූලාශ්‍ර:** සංයු.නි: (5-2 ): මහාවග්ග: සච්චසංයුත්ත: අභිසන්ද සූත්‍ර 3 කි, පි. 242, ESN: 55: Sothapannasamyutta: Streams of Merit- 3 suttas, p. 2225.

▲ **පුණ්‍යනිධාන-** Treasures of merits: කෙනෙක් මෙලොව කරන කුසල ක්‍රියා, පරලොවදී ඔහුට පුණ්‍යනිධානයක් වන ආකාරය මේ සූත්‍රයේ විස්තර කර ඇත. **බලන්න**: නිධානය. **මූලාශ්‍රය**: බු.නි:බුද්දකපාඨ: 8 නිධිකණ්ඩ සූත්‍රය, පි. 44.

▲ **පුණ්ණ තෙර** - Punna Thera: **බලන්න**: උප ග්‍රන්ථය:1

▲ **පුණ්ණමන්තානිපුත්ත තෙර-** Punna mantaniputtha Thera: **බලන්න**: උප ග්‍රන්ථය:1

▲ **පුණ්ණක** මානවක **තෙර**- Punnaka manawaka Thera: **බලන්න**: උප ග්‍රන්ථය:1,3

▲ **පුණ්ණිය තෙර-** Punniya Thera: **බලන්න**: උප ග්‍රන්ථය:1.

▲ **පුණ්‍යාභිසංස්කාර** -meritorious karmic formations: මින් අදහස් කරන්නේ, කාම ලෝකයේ හා රූප ලෝකයන්හි යළි උපතට හේතුවන කුසල චේතනාය, පූර්ණ කර්මයන්ය. **බලන්න**: කම්ම නිදාන. **මූලාශ්‍ර:** දිඝ.නි: (3 ):10 සංගිති සූත්‍රය- පි. 381 , EDN: 33 Saṅgīti Sutta: The Chanting Together, p. 367.

▲ **පුණ්ඩරික නිරය**- Pundarika Hell: මේ නිරය සුදුනෙලුම් නිරය- white-lotus hell ලෙසින්ද පෙන්වා ඇත. අයහපත් කම්ම විපාක එලදීම පිණිස මේ නිරයේ උපත ලබයි. **බලන්න**: නිරය.

▲**ප්‍රණීත**-Excellent: ප්‍රණීත-පණීත යනු උතුම් බවය, අග්‍රබවය. ධර්මයේ ප්‍රණීත ලෙසින් පෙන්වා ඇත්තේ නිවනය, මෙය නිවන හඳුන්වන පදයකි. **සටහන**: සංයු.නි: (4) සළායතනවග්ග: අසංඛතසංයුත්තයේ: 9.2 පණීත සූත්‍රයේදී**:** නිවන ප්‍රණීත යයිද, ප්‍රණීතගාමී මග- නිවන් මග බවද පෙන්වා ඇත.

▲ **ප්‍රණීතඅධිමුක්තිය-**Pranitha-adhimukti: ප්‍රණීතඅධිමුක්තිය නම් නිවනට යොමුකරන දොරටු- විමොක්ක දොරටු තුනය: ශුන්‍යතා, අනිමිත්ත, අප්පණිත විමොක්ක. අරණවිහාර ඥාණය පිණිස අවශ්‍ය අංගයකි. **බලන්න**: අරණවිහාර ඥාණය, විමොක්ක දොරටු. **මූලාශ්‍රය:** බු.නි: පටිසම්භිදා-1, ඥානකතා: 33 අරණවිහාර ඥාණය, පි. 206.

▲ **ප්‍රණීත කාම**-Pranitha kama: ලෝකයා විඳින කාම ආස්වාද වලින් ඉහළම ආස්වාදය මෙයය. එනම්, රජවරුන් ආදීන් විඳින අග්‍ර කාම සැපයය. **බලන්න**: කාමආස්වාදය.

▲ **ප්‍රණීත ධාතුව-**Pranita dhatu: ප්‍රණීත (උසස්) ධතුව මගින්, උසස් ගතියක්, ඉහළ උපතක් ලැබේ. **බලන්න**: ගති. **මූලාශ්‍රය**:සංයු.නි: (2) නිදානවග්ග: ධාතුසංයුත්ත:2.2.3 ගිඤ්ජකාවස්ථ සූත්‍රය, පි.260.

▲ **ප්‍රණීත සීලය**-Pranita sila: මෙය ත්‍රිවිධ ශීලයන් අතුරින් එකකි. ප්‍රඥාව සහිතව සමාදන්වන සීලයය. විසුද්ධිමාර්ගය, පරිච්ඡේදය1 හි මේ පිලිබඳ විස්තර දක්වා ඇත. **බලන්න**: ශීලය.

**පප**

▲ **පාපය**- Bad: පාපය -නරක- අයහපත්දේ ලෙසින් ධර්මයේ පෙන්වා ඇත්තේ ධර්මයට එරෙහි ක්‍රියාය. **සටහන**: "පාපය ලාමක වශයෙන් බලන්න, ඒ බව දැක ඒ ගැන කලකිරෙන්න, නො ඇලෙන්න, මිදෙන්න" යයි බුදුන් වහන්සේ වදාළහ. **බලන්න**: දේශනා වාර.

▼**දස අකුසලයේ** යෙදීම, මිථ්‍යා දිට්ඨිය ඇතිවීම පාපය වේ. එවැනි කටයුතු කරන පුද්ගලයෝ, අන් අය එවැනි ක්‍රියාවලට යොමුකරයි ඒ පුද්ගලයෝ **පාපතර** පුද්ගලයන්ය. එවැනි පාපකර්ම නොකරන්නා කල්‍යාන- භද්‍ර පුද්ගලයාය. විස්තර පිණිස **බලන්න:** අංගු.නි: (2) 4 නිපාත: 4.51.7 - සූත්‍ර 4කි, පි.446.

▲ **පාපික (ලාමක) ආසාව**: පාලි: **පාපිකා ඉච්ඡා**- Evil desire: තමන්ට නොමැති උතුම් ගුණ එනම්, ශ්‍රද්ධාව, සීලය, බහුශ්‍රැතබව, හුදකලාවාසයට ප්‍රියබව, විරිය ඇතිබව, සිහිනුවණ ඇතිබව, සමාධිඇතිබව, ප්‍රඥාව ඇතිබව, ආසව නැතිකලබව ආදී ගුණ තමනට ඇතැයි පෙන්වීමට ඇති කැමැත්ත පාපික ආසාව ය ය. මෙය, සිත නිසා හටගන්නා අකුසලයක් ය යි බුදුන් වහන්සේ පෙන්වා ඇත. **බලන්න**: කුසල හා අකුසල.

▼ **පාපික අසාව** පහ කරගත හැකිවන්නේ නිතර නිතර ප්‍රඥාවෙන්, එහි ආදීනව (ඇතිවෙන අයහපත් කර්ම විපාක ආදිය ගැන) බලමින්, විදසුන් නුවණින් කටයතු කිරීමෙන්ය. **මූලාශ්‍ර**:අංගු.නි :(6 ): 10 නිපාතය: 10.1.1.3 කාය සූත්‍රය, පි. 100, EAN:10: 23.3 Body, p. 500.

▲ **පාපික (ලාමක) ඊර්ෂ්‍යාව:** පාලි: **පාපිකා ඉස්සා**- Evil envy

වෙනත් කෙනෙක් ගේ සම්පත් පිළිබඳව සිතේ හටගන්නා දැඩි ඉරිසියාව, පාපික ඊර්ෂ්‍යාව ය. මෙය, සිත නිසා හටගන්නා අකුසලයක් ය යි බුදුන් වහන්සේ පෙන්වා ඇත. **බලන්න**: කුසල හා අකුසල.

▼**යම්කිසි පුද්ගලයෙකු**, වෙනත් කෙනෙක් සතු ධන සම්පත්, ලාභ ගැන දැඩි ඉරිසියාවක් ඇතිවේ. තමන්ට නොමැති ඒ සම්පත් වෙනත් අයට තිබීම ගැන අසතුටුව, ඔහු මෙසේ පතන බව බුදුන් වහන්සේ පෙන්වා ඇත: **"අහෝ ඒ පුද්ගලයාට, එම ධන සම්පත්, ලාභ ආදිය ඇති නොවේවා"**. පාපික ඉරිසියාව පහ කරගත හැකිවන්නේ නිතර නිතර ප්‍රඥාවෙන්, එහි ආදීනව (ඇතිවෙන අයහපත් කර්ම විපාක ආදිය ගැන) බලමින්, විදසුන් නුවණින් කටයතු කිරීමෙන්ය. **මූලාශ්‍ර**:අංගු.නි :(6): 10 නිපාතය: 10.1.1.3 කාය සූත්‍රය, පි. 100, EAN:10: 23.3 Body, p. 500.

▲**පාපික කම්ම**- Evil actions: පාපික කම්ම ලෙසින් පෙන්වා ඇත්තේ අයහපත් විපාක ගෙනදෙන, දුගතියක යළි උපත ඇතිකරන අකුසල ක්‍රියාය. **බලන්න:** අකුසල, කෙළෙස්, කම්ම.

▲**පාපික ධම්ම**- Evil Dhamma: පාපික ධම්ම-ධර්ම ලෙසින් පෙන්වා ඇත්තේ ධර්මයට එරෙහි ක්‍රියාවන් අනුගමනය කිරීමය. අහිරිකය හා අනොත්තප්පය, කළු ධර්ම හෙවත් පාපි ධර්මලෙසින් පෙන්වා ඇත.**බලන්න**: අහිරිකය හා අනොත්තප්පය,කණ්හධර්ම. **සටහන**: ධම්ම පදය:9 පාප වග්ගයේ පාපධම්ම විස්තරාත්මකව දක්වා ඇත.

▼**පාපධර්මය නම්** දස අකුසලයය, මිථ්‍යාදිට්ඨිය... මිථ්‍යා විමුක්තිය ඇතුළු දස අංග- වැරදිමග අනුගමනය කිරීමය. පාපධම්මතරයා නම් තමන් පාපධර්ම කරමින් අනුන්ටද ඒවා කිරීමට අනුබල දෙන පුද්ගලයාය. **මූලාශ්‍රය:** අංගු.නි: (2) 4 නිපාත: පාපධර්ම සූත්‍ර 2කි, පි.448.

▲ **පාපික පුද්ගල**- Evil person: පාපික- නරක පුද්ගලයා, ලාමක ශීලය හා ලාමක දිට්ඨිය ඇති තැනැත්තාය. එම කරුණු නිසා ඔහු ඒකාන්තයෙන්ම නිරයට පැමිණේ. **මූලාශ්‍රය:** ඛු.නි: ඉතිවුත්තක: 2.1.5 පාපික ශීලය, පි.380.

▲ **පාපමිත්‍රසේවනය:** පාලි: **පාපමිත්තතා** -bad friendship: ධර්මයේ පාපමිත්‍රයන්- නරක මිතුරන්-පව්ටු මිතුරුන් ලෙසින් පෙන්වන්නේ සද්ධර්මයට ගරු නොකරන අයටය. ඔවුන් අසත් පුරුෂයන් ලෙසින්ද හඳුන්වයි. පාපමිත්‍ර සේවනය නිසා කෙනෙක් අකුසල ක්‍රියාවනට පෙළඹේ, සසර දික්කරගනි. **බලන්න**: සත්පුරුෂ හා අසත්පුරුෂ. පාප මිත්‍ර- පව්ටු මිතුරන් සේවනය පහ කර ගැනීම පිණිස කලාන මිතුරු සේවනය වැඩිය යුතුය. **මූලාශ්‍රය:** අංගු.නි: (4) 6 නිපාත: 6.1.9 සූත්‍රය, පි.286.

▼ **ධර්මයේ ප්‍රමාදවන** තැනැත්තාට පාපමිත්‍රසේවනය නැතිකරගැනීම පහසු නොවේ. පාපමිත්‍ර සේවනය කරන්නාට අශ්‍රද්ධාව, ත්‍යාගශීලි නැතිබව (අවදඤ්ඤුතාව) හා කුසිත- අලස බව පහකරගැනීම හැකිනොවේ. හිරිඔතප්ප ඇතිවීම හා අප්‍රමාදය ඇතිවීම නිසා කෙනෙක් පාපමිත්‍ර සේවනය අතහැර කල්‍යාන මිත්‍රයන් සේවනය කිරීමට පෙළඹේ. **මූලාශ්‍ර**: අංගු.නි: (6):10 නිපාතය: 10.2.3.6 තයොධම්ම සූත්‍රය,පි.284, EAN:10: Tens,76-6.Incapable, p. 524.

▼**පාප මිතුරුන් සේවනය නිසා අසද්ධර්මය ඇසේ.**

පාප මිත්‍ර සේවනය, මුළු ධර්ම මාර්ගය වර්ධනය කරගැනීමට ඇති බාධාවකි. එමගින් අසද්ධර්මය ඇසීමට සිදුවේ: **"...එවමෙව බො භික්ඛවෙ අසප්පුරිසංසෙවො පරිපූරො අසද්ධම්ම සවනං පරිපූරෙති"** අසත්පුරුෂයන්-පාප මිත්‍රයන් ඇසුරු කිරීම අසද්ධර්මය පෝෂණය වීමට හේතුවය. **මූලාශ්‍ර**:අංගු.නි: (6 ): 10 නිපාත: යමක වග්ග: 10.2.2.1 අවිද්‍යා සූත්‍රය, පි.232, EAN:10: II Pairs: 61.1.Ignorance, p. 517.

▼ **පාපමිත්‍ර සේවනය** ආධ්‍යාත්මික මගට හානිය ඇති කරයි. **බලන්න**: හානභාගිය ධර්ම. **මූලාශ්‍ර:** දීඝ.නි : (3): 11 දසුත්තර සූත්‍රය, පි. 483,EDN:34: Dasuttara Sutta: Expanding Decades, p.384.

▼**පාපමිත්‍ර සේවනය** නුගුණයකි. එය අතහැර ගැනීම පිණිස කල්‍යාන මිත්‍රයන් (සත්පුරුෂයන්) සේවනය කල යුතුවේ: “**පාපමිත්තතාය පහානාය කල්‍යාණමිත්තතා භාවේතබ්බො**...”.**මූලාශ්‍ර**: අංගු.නි: (4 ):6 නිපාත: තික වග්ග: 6.1.9 දෝවචස්සතා සූත්‍රය, පි. 285, EAN: 6: 115.9. Difficult to correct, p. 365.

▼ **බුදුන් වහන්සේ** පාපමිත්‍ර සේවනය පිළිබඳව යහපත් ලෙසින් වදාරා ඇත. ඒ ධර්මය සංඝයා එක්ව, ධර්මයේ චිරස්ථිතිය පිණිස සජ්ජායනා කිරීම සුදුසු ය යි සැරියුත් මහා තෙරුන් සංඝයාට උපදෙස් දී ඇත. **මූලාශ්‍ර**:දිඝ.නි: (3):10 සංගිති සූත්‍රය,පි. 372 , EDN: 33 Sangīti Sutta: The Chanting Together, p. 362.

▲**පපඤ්චිතය-**proliferation: පපඤ්චිතය ලෙසින් පෙන්වා ඇත්තේ ප්‍රපංචකිරීමය, එනම් අකුසල සිත දිගින් දිගට පවත්වාගෙන යාමය. බුදුන් වහන්සේ මෙසේ වදාළහ: “මහණෙනි, **‘මම වෙමි’** යි යන එන්දීතයකි. **‘මේ මම වෙමි**’ යි ...**‘මම වන්නෙමි**’ යි... **‘මම නොවන්නෙමි’** යි... **‘රූප ඇත්තෙක් වන්නෙමි’** යි... **‘රූප නැත්තෙක් වන්නෙමි’** යි... **‘සංඥා ඇත්තෙක් වන්නෙමි’** යි... **‘සංඥා නැත්තෙක් වන්නෙමි’** යි... **‘නොම සංඥා ඇත්තෙකුත් සංඥා නැත්තෙකුත් වන්නෙමි’** යි ... යන මෙය එන්දිතයකි ... එන්දිතය රෝගයකි...ගඩුවකි... හුලකි... ඒ නිසා මෙහි ලා එන්දිතා රහිත සිතින් යුතුව වාසය කරන්නෙමු යයි ඔබ විසින් හික්මිය යුතුය.” **මූලාශ්‍ර:** සංයු.නි: (4) සළායතනවග්ග: වේදනාසංයුත්ත :ආසිවිසවග්ග:1.19.11 යවකලාපී සූත්‍රය, පි.410,

ESN: 36: Vedanasamyutta:248.11 The Sheaf of Barley, p.1327.

▲ **පපඤ්චක්ඛය-** Papanchakaya: පපඤ්චක්ඛය ලෙසින් දක්වා ඇත්තේ සියලුම ප්‍රපංච විනාශ කර ගැනීමය- අරහත්වය ලැබීමය: ‘ ඒ සමයෙහි භාග්‍යවතුන් වහන්සේ ප්‍රපංච සංඥාවන්ගේ ප්‍රහාණය නුවණින් සලකා බලමින් වැඩහුන්සේක... මේ උදානය පලකළසේක:’. “ යමෙකුට ප්‍රපංචයෝ ද ඔවුන් විසින් කරන ලද සසර සිටීම නැද්ද, සංඥා සංඛාත තෘෂ්ණා දිට්ඨි නැද්ද, පටිස සංඛාත අවිද්‍යාව ඉක්මවා ඇත්ද, සිව් ඉරියව්වෙන් කල් යවන, තණ්හා රහිත වූ ඒ මුණිහට දෙවියන් සහිත ලෝකය අවඥා නො කරයි’. **මූලාශ්‍ර**: බු.නි: උදාන පාලිය: 7.7 පපඤ්චක්ඛය සූත්‍රය, පි. 312.

▲ **ප්‍රපංච** -proliferations: ප්‍රපංච ( පපඤ්ච) ලෙසින් පෙන්වා ඇත්තේ, කෙනක්, සය ඉන්ද්‍රිය මගින් අල්ලා ගන්නා බාහිර අරමුණු කෙරෙහි ඇලි හෝ ගැටී, ඒ පිළිබඳව දිගින් දිගට විතර්ක කරමින්, සිතමින්, අකුසල සිතුවිලි පවත්වා ගැනීමය. එමනිසා දිට්ඨි, මාන ආදී කෙළෙස් ඇතිවේ, ඒවා ධර්ම මාර්ගයට බාධාවකි. මෙයට විරුද්ධ පදය **නිපපංචය** යනු නිවනය: සියලු සංඛාර අවසන් කිරීමය. **බලන්න:** නිපපඤ්ච. **ශබ්දකෝෂ: B.D:**p. 123: “Papańca: It signifies the expansion, differentiation, diffuseness, or manifoldness of the world…”.

▼ **මේ සූත්‍රයේදී** මහාකච්චාන තෙරුන්, බුදුන් වහන්සේ සැකවින් දෙසූ ධර්මය (ප්‍රපංච ක්‍රියාවලිය) විස්තරාත්මකව පෙන්වා ඇත, බුදුන් වහන්සේ අනුමත කරවදාළහ. **සටහන**: අංගු:නි: 4 නිපාත: 4.4.3.3. මහාකොට්ඨිත සූත්‍රය: සය ඉන්ද්‍රිය මගින් අරමුණු අල්ලා ගැනීම නතරවීම- ප්‍රපංච

නතරවීම යයි පෙන්වා ඇත. **මූලාශ්‍ර:** ම.නි: (1): 1.2.8 මධුපිණ්ඩික සූත්‍රය, පි. 292, EMN: 18: The Honey -ball, p. 196.

▼**ප්‍රපංච ක්‍රියාවලිය**: එක්සමයක සක්දෙවිඳු, ලෝකයා වෛරසිතින්, තරහින් අන්අයට හිංසා කරමින් ජීවත්වීමට හේතු විමසුහ. මෙහිදී බුදුන් වහන්සේ පෙන්වා වදාළේ: එවැනි හැසිරීමට හේතුව ඉරිසියාව හා ආත්මාර්ථකාමී යන සංයෝජන නිසාය (jealously & selfishness). ඒ සංයෝජන වලට හේතුව, ප්‍රියබව හා අප්‍රිය බවය (like & dislike), ප්‍රිය අප්‍රිය සංඛාර ඇතිවන්නේ, චන්දය නිසාය, චන්දයට හේතුව විතක්ක කිරීමය. විතක්කය නිසා ප්‍රපංච- අකුසල සිතිවිලි හටගනී. **ප්‍රපංච නිරෝධ** කරගැනීමේ පිළිවෙල: ත්‍රිවිධ වේදනා (සොම්නස, දොම්නසා, උපේක්ඛා) ඇතිවෙනවිට, ආකාර 2 කින් කටයුතු කලයුතුය: 1) ඇතිවීම ගැන සෙවිය යුතුය 2) වේදනා නිසා අකුසල සිත් හටගන්නේ නම් ඒ ගැන සිතීම අත්හළයුතුය. කිසියම් වේදනාවක් නිසා කුසල සිතක් ඇතිවේනම් එය පුරුදු කලයුතුය. එලෙස පුරුදු පුහුණුවීම මගින්, කෙනෙක් ප්‍රපංච සංඥා අල්වා නොගන, ඒවා නිරෝධ කරගැනීමට හැකිවේ යයි මෙහි පෙන්වා ඇත. **මූලාශ්‍ර:** දීඝ.නි: ( 2) සක්කපඤ්හ සූත්‍රය පි 412, EDN: 21, Sakkapanha Sutta- Sakka's questions, p234.

▼ **වෙනත් මූලාශ්‍ර: 1.** Concept & Rality in Early Buddhist Thought: *An essay on Papancha & Papancha-Sanna=Sankha* by Bhikkhu Nanananda: BPS 1971. (මෙහි, ප්‍රපංච පිලිබඳව විස්තරාත්මකව දක්වා ඇත)

▲**ප්‍රපාතය** -the precipice: චතුසත්‍ය අවබෝධ නොකිරීම නිසා අත්වෙන ඉමහත් දුක්වේදනා ඇති සසර ගමන, බිහිසුණු ප්‍රපාතයකින් ඇදවැටීම වැනිය යයි බුදුන් වහන්සේවදාළහ. සත්‍ය අවබෝධ කරගත් ප්‍රඥාවන්තයන්, මහාදුක් සහිත ප්‍රපාතයෙන් නොවැටේ. ඔවුන් යළි උපත ආදී වූ දුක් කඳෙන් මිදී සිටිති. **බලන්න**: උපග්‍රන්ථය:5 **මූලාශ්‍ර:** සංයු.නි: ( 5-2): මහාවග්ග: සච්චසංයුත්ත: 12.5.2 පපාත සූත්‍රය, පි. 332, ESN:56: Sacchasamyutta: 42.2 The Precipice, p. 2313.

▲ **පිප්පිලි සිටුවරයා-** Pipali situ: මහා කාශ්‍යප තෙරුන්ගේ ගිහිනමය. බලන්න: උපග්‍රන්ථය:1

**පබ**

▲ **පබ්බජා-** One who has gone forth

පබ්බජා යනු ගිහිගෙය හැර බුදු සසුනේ පැවිදිවූ, සාමණේර සංඝයා හඳුන්වන ආකාරයකි. උපසම්පදාව ලබාගැනීමට පුරුදු පුහුණුවන පැවිදි ශ්‍රාවකයාය. **සටහන**:ඛු.නි:සුත්තනිපාත:2 චූල්ලවග්ග:සම්මා පරිබ්බජනිය සූත්‍රයේදී, ගිහිගෙය හැර, පබ්බජාවූ මහණ ලෝකයට නොඇලී යහපත් ලෙසින් වාසය කරණ ආකාරය පෙන්වා ඇත.

▼ **බුදුන් වහන්සේ,** පබ්බජා විසින් නිතර නිතර ආවර්ජනා ( ප්‍රත්‍යවෙක්ෂා -reflections ) කලයුතු ධර්මතා 10ක් පෙන්වාඇත: **1**) මම පන්ති භේදයකින් තොර සමූහයකට පිවිසි වාසය කරමි- වීවර්ණභාවයට පැමිණ වෙසෙමි. **සටහන**: බුදුන් වහන්සේ වැඩසිටි සමයේ ඉන්දියානු සමාජයේ පැවති ප්‍රධාන කුල 4 'වර්ණ' ලෙසින් හඳුන්වා ඇත. වීවර්ණභාවය යනු

කුල භේදය නැතිබවය. බුදුසසුනට ඇතුළුවූ පසු, පැවිද්දන්, ගිහිකල අයත්ව සිටි කුලය හැර දමා 'ශ්‍රමණ' බවට පත්වේ. **බලන්න**: EAN:note: 2053, p. 679, කුලය. **2)** මම අන්‍යයන්ගේ උපකාරයෙන් දිවිපැවැත්ම ගෙනයමි. **3)** මගේ හැසිරීම-ගිහියන්ගේ හැසිරීම මෙන් නොවිය යුතුය **4)** මගේ ශිලය යහපත්ද? යයි සොයා බැලිය යුතුය.**5)** මගේ සබ්‍රහ්මචාරිවරු, මා ගැන සොයාබලා, මගේ ශිලය ගැන මට දොස් කියන්නේද? යයි සොයා බැලිය යුතුය. **6)** ප්‍රියවූ, මනාපවූ හැම දෙනාගෙන්, හැම දෙයකින්ම මට ඇත්විමට, වෙන්වීමට සිදුවේ. **7)** මම මගේ කර්මයේ හිමිකාරයාවෙමි... **8)** මම මගේ දිවාකාලය රාත්‍රී කාලය යහපත් ලෙසින් ගතකරන්නේද? **9)** හිස්වූ කුටිවල (හුදකලාව- විවේකිව) සිටීම මට සතුට ගෙනදෙන්නේද? **10)** උත්තරිය මිනිස් දහමින් යුත්, ආරියබව ලබාදෙන, ඤාන දර්ශන විශේෂයක් (අලමරියඤාණදස්සනය ) මම ලබාගෙන තිබේද? (මම බුදුසසුනේ ආරියෙක්ද?) මගේ අවසන් මොහොතේ, සබ්‍රහ්මචාරින් ඒ පිලිබඳ මා විමසනවිට, අපහසුවට පත්නොවී සිටීමට මට හැකිද? **"අත්‍ථිනු බො මෙ උත්‍තරිමනුස්‍සධම්මා අලමරියඤාණදස්‍සන විසෙසො..."**. බලන්න**:** උත්තරීය මනුස්ස ධම්ම, සමණසංඥා. **මූලාශ්‍ර**: අංගු.නි: (6 ): 10 නිපාත: අකෝෂ වග්ග, 10.1.5.8.දසධර්ම සූත්‍රය,පි.182, EAN: 10:48.8. Things, p. 512.

▲**පබ්බජා පුහුණුවියයුතු දසසංඥා -**The 10 perceptions to be trained by one who has gone forth: නුපන් අකුසල ධර්ම වලින් සිත ආරක්ෂා කරගැනීම පිණිස, පබ්බජා විසින් සංඥා පුහුණුවියයුතු, හික්මිය යුතු සංඥා 10: 1.අනිච්චසංඥාව 2. අනාත්ම සංඥාව ... 3.අසුභ සංඥාව... 4. ආදීනව සංඥාව... 5.ලෝකයේ සමබව හා විසම බව ... ( ලොකස්‍ස සමඤ්ච විසමඤ්ච) 6. ලෝකයේ ඇතිවීම හා නැතිවීම ... (ලොකස්‍ස සම්භවඤ්ච-විභවඤ්ච) 7. ලෝකයේ ඇතිවීම නැතිවීම... (ලොකස්‍ස සමුදයඤ්ච අත්‍ථගමඤ්ච) 8. පහානසංඥාව 9. විරාගසංඥාව ... 10.නිරෝධසංඥාව මේවා වඩා ගනිමින් සිත ශක්තිමත්-ප්‍රබලව තබාගතයුතුය. මේ දසසංඥාවන් වඩා ගැනීමේ ප්‍රතිලාභනම්: අනාගාමි හෝ අරහත්වයට පත්වීමය. **සටහන්**: * මෙහිදී ලෝකය සේ පෙන්වා ඇත්තේ පංච උපාදානස්කන්ධය ය *5-7 සංඥා හැර සෙසු සංඥා 7 ගිරිමානන්ද සූත්‍රයේ දක්වා ඇත. **මූලාශ්‍ර**: අංගු.නි: (6 ):10 නිපාත:සචිත්ත වග්ග: 10.2.1.9.පබ්බජා සූත්‍රය,පි.220, EAN: 10: 59.9. Going Forth.p.516.

▲ **පබ්බාජනිය කම්ම-**pabbajaniya Kamma

පබ්බාජනිය කම්ම යනු, සසුනේ පාපික ලෙසින් හැසිරෙන සංඝයා නෙරපීමේ විනය කර්මය ය. **සටහන**: කීටාගිරි ආරණ්‍යයේ, අදහැමි ලෙසින් වාසය කල අස්සජි හා පුනබ්බසුක යන භික්ෂූන්, නෙරපීම පිලිබඳ මෙහිදී විස්තර දක්වා ඇත. **බලන්න**:උපග්‍රන්ථය:4 **මූලාශ්‍ර**:වින.පි: චූලවග්ග පාලිය:1: 3 පබ්බාජනිය කම්ම, පි.52.

▲**පබ්බතය-** the mountain: **1)** කල්පයක දීර්ඝකාලීන බව පෙන්වීම පිණිස බුදුන් වහන්සේ මේ උපමාව දක්වා ඇත. යොදුනක් දිග, පළල හා උස ඇති මහා ගල් පව්වක්, සිනිඳු සළුවකින් සෑම වසරකට එක්වරක් මැදීමෙන් ගෙවිඅවසන්වූවද, කල්පයක් අවසානයට පත්නොවේ. **බලන්න**: කල්පය.**මූලාශ්‍ර**:සංයු.නි: (2 ): නිදානවග්ග:

අනමතග්ගසංයුත්ත:3.1.5 පබ්බත සූත්‍රය, පි.301, ESN:15: Anamataggasamyutta:5.5 The Mountain, p. 301.

**2)** මහා ගල් පව්වක් -පබ්බතයක් සෑම දෙසින් පැමිණ සියල්ල යට කරන ලෙසින්, ජරා මරණය සෑම අතින්ම පැමිණ මිනිසුන් යට කරන අන්දම පෙන්වීමට මේ උපමාව දක්වා ඇත. **මූලාශ්‍ර**:සංයු.නි: (1):සගාථවග්ග: කෝසලසංයුත්ත:3.3.5 පබ්බතූපමා සූත්‍රය, පි.210, ESN:3:Kosalasamyutta:III:25.5 The simile of the mountain, p.259.

**3-5)** සෝතාපන්න බව ලැබීම, දිට්ඨිසම්පන්නවීම (දහම් ඇස ලැබීම) නිසා ලැබෙන මහා අර්ථය පෙන්වීමට බුදුන් වහන්සේ, හිමාලය, සිනෙරු වැනි මහා පර්වත මේ සූත්‍රවලදී උපමාකර පෙන්වා ඇත. **මූලාශ්‍ර**:සංයු.නි: (2) නිදානවග්ග: අභිසමයසංයුත්ත:1.10.9-1.10.11 **සූත්‍ර3කි**, පි. 240, ESN:13:Abhisamayasamyutta: 9-11 suttas, p.733.

**6)** පටිභාන පර්වතයේ මහා බෑවුම් වලට වඩා බිහිසුණු වන්නේ චතු සත්‍ය අවබෝධ නොකර සසර දුක් ප්‍රපාතයට ඇදවැටීමය යයි බුදුන් වහන්සේ පෙන්වා ඇත. **මූලාශ්‍ර**:සංයු.නි: (5-2 කාණ්ඩය):මහාවග්ග: සච්චසංයුත්ත :පබ්බතවග්ග:12.5.2 පපාත සූත්‍රය, පි. 332, ESN: 56: Saccha samyutta:42.2 The Precipice, p.2312.

▲**පුබ්බංගම**- forerunner: පුබ්බංගම යනු පූර්වනිමිත්තය-යමක් සිදුවීමට පෙර ඇති ලක්ෂණයය. හිරු උදාවීමේ පූර්ව නිමිත්ත අරුණෝදයය. එලෙසින්, කුසල ධර්මයට පෙර නිමිත්ත, සම්මා දිට්ඨියයි බුදුන් වහන්සේ වදාළහ. සම්මා දිට්ඨිය නිසා සම්මා සංකප්ප ඇතිවේ...එලෙසින්, ක්‍රමානුකූලව, දස සම්මාධර්ම අංග වර්ධනය වේ. **මූලාශ්‍ර**:අංගු.නි: (6): 10 නිපාත: 10.3.2.9. පුබ්බංගම සූත්‍රය, පි.458, EAN:10: 121.9. forerunner, p.547.

▼**දේවලෝකයෙන් චුතවීමට** පෙර පූර්ව නිමිති 5 ක් ඇතිවේ: 1) පැළඳි මල්මාලා පරවේ 2) හැඳි වස්ත්‍ර කිලිටුවේ 3) දාඩිය වැගිරේ 4) කය දුර්වර්ණ වේ 5) දිව්‍ය ආසනයට නො ඇලේ. **බලන්න**: සුගතිගමන. **මූලාශ්‍ර**:ඛු.නි:ඉතිවුත්තක:චතුවග්ග:3.4.4 පූර්වනිමිත්ත සූත්‍රය,පි.450.

▲ **පුබ්බෙචකතපුඤ්ඤතා**- Pubbechakathapunnata: මින් අදහස් කරන්නේ පෙරකළ පින්-පුණ්‍ය ඇතිබවය. මෙය අග්‍රබව ලබාදෙන චක්‍රසතරෙන් එකකි, මංගල සූත්‍රයේ, මෙය සුභ කරුණක් ලෙසින් පෙන්වා ඇත. **බලන්න:** චක්‍රසතර.

▲**පුබ්බේනිවාසානුස්සති ඤාණය-** knowledge of the recollection of past abodes: පෙර භවයන් සිහිකිරීමට ඇති හැකියාව-නුවණ. **බලන්න**: පූර්ව නිවාස සිහිකිරීමේ නුවණ. **සටහන**: පටිසම්භිදාවේ: හේතු ප්‍රත්‍යයෙන් ඇතිවූ ධර්මතා වල නානත්වය හා ඒකත්වය කර්ම වශයෙන් දැනගැනීමේ ප්‍රඥාව පූර්ව නිවාස සිහිකිරීමේ නුවණ සේ පෙන්වා ඇත. **මූලාශ්‍රය:** ඛු.නි: පටිසම්භිදා 1: 53 පූර්ව නිවාස සිහිකිරීමේ නුවණ**,** පි.236.

▲ **පුබ්බාවිදේහය-**Pubbavidehaya: සක්විති රජ පාලනය කරන සතර දිපයන්ගෙන් එකකි. **බලන්න**: සක්විතිරජ, දඹදිව.

**පභ**

▲ **පභංන්ගු-**Fragile: පභංන්ගු යනු බිඳෙනසුළුබවය. බුදුන් වහන්සේ, බිඳෙනසුළු දේ ලෙසින් පෙන්වා ඇත්තේ පංච උපාදානස්කන්ධයය. පංච උපාදානස්කන්ධයය පිලිබඳ යම් නිරෝධයක් වේනම් එය නො බිඳෙනසුළුය. එනම් නිවනය. **බලන්න**: පංච උපාදානස්කන්ධයය. **මූලාශ්‍ර:**සංයු.නි: (3) ඛන්ධසංයුත්ත:භාරවග්ග:1.1.3.11 පභංන්ගු සූත්‍රය**,**පි.86, ESN:22:Khandasamyutta:32.11, The Fragile,p.1025.

▲**පභා**-Radiances: පභා-ප්‍රභාව යනු දීප්තිමත්බවය. බුදුන් වහන්සේ මේ ලෝකයේ ප්‍රභා 4 ක් ඇතිබව වදාළහ: 1) චන්ද්‍රප්‍රභා 2) සූර්යප්‍රභා 3)අග්නිප්‍රභා 4) ප්‍රඥාප්‍රභා. ඒ අතුරින් ප්‍රඥාප්‍රභාව අග්‍රය. **මූලාශ්‍ර**:අංගු.නි: (2 ): 4.නිපාත:4.3.5.2 පභා සූත්‍රය, පි.290,EAN:4: V: 142.2. Radiances, p.198.

▲**ප්‍රභාස්වර**-Luminous: ප්‍රභාස්වර යනු ආලෝකමත් බවය. බුදුන් වහන්සේ පෙන්වා ඇත්තේ, සිත ප්‍රභාස්වරබවය, එහෙත්, උප කෙළෙස නිසා කිලිටිවීමෙන් ඒ ආලෝකමත්බව නැතිවේ. **බලන්න**: සිත-චිත්ත. **සටහන:** මේ වග්ගයේදී ප්‍රභාස්වර සිත කිළිටිවන අන්දම හා ආරිය ශ්‍රාවකයා ගේ සිත ප්‍රභාස්වරබවට පත්වීම ආදී කරුණු පෙන්වා ඇත. **මූලාශ්‍ර**:අංගු.නි: (1): 1 නිපාත:6 ප්‍රභාස්වර වග්ග:පි.58, EAN:1:VI: Luminous, p.39.

**පම**

▲**පාමොක්ඛය-** release: ධර්මයට අනුව පාමොක්ඛය යනු, දුකනැතිකිරීමේ මග අනුගමනය කිරීමෙන් ඇතිවන ඵලයය. **බලන්න**: නිමොක්ඛය.

▲**ප්‍රේමය-**Affection: ප්‍රේමය (ඇල්ම-ආලය) හේතුවෙන් ප්‍රේමය උපදී; ප්‍රේමය හේතුවෙන් ද්වේශය උපදී, ද්වේශය හේතුවෙන් ප්‍රේමය උපදී යයි බුදුන් වහන්සේ පෙන්වා ඇත. 1) ප්‍රේමය හේතුවෙන් ප්‍රේමය උපදී: පුද්ගලයෙක්හට, කෙනෙක් ප්‍රියමනාප වේ. වෙනත් අයද එම කෙනා කෙරෙහි ප්‍රිය මනාප ලෙසින් හැසිරේ. ඒ හේතුව නිසා ඒ පුද්ගලයා ඔවුන් කෙරෙහි ප්‍රේමය ඇතිකරගනී. 2) ප්‍රේමය හේතුවෙන් ද්වේශය උපදී: පුද්ගලයෙක්හට, කෙනෙක් ප්‍රියවේ, එහෙත්, වෙනත් අය එම කෙනා කෙරෙහි ප්‍රිය මනාප ලෙසින් නො හැසිරේ. එවිට ඒ පුද්ගලයාට ඔවුන් කෙරෙහි දෙවිශය ඇතිවේ 3) ද්වේශය හේතුවෙන් ප්‍රේමය උපදී: පුද්ගලයෙක්හට, කෙනෙක් ප්‍රියමනාප නොවේ වේ. වෙනත් අයද එම කෙනා කෙරෙහි ප්‍රිය මනාප ලෙසින් නො හැසිරේ. ඒ හේතුව නිසා ඒ පුද්ගලයා ඔවුන් කෙරෙහි ප්‍රේමය ඇතිකරගනී. **සටහන**: මේ සූත්‍රයේදී, ද්වේශය නිසා ද්වේශය හටගන්නා බව ද පෙන්වා ඇත. **මූලාශ්‍ර:** අංගු.නි: (2 ): 4 නිපාත: 4.4.5.10 ප්‍රේම දෝශ සූත්‍රය, පි. 428, EAN:4: 200.10 Affection, p. 221.

▲ **ප්‍රමාදය-** heedless : ධර්මයට අනුව ප්‍රමාදවීම (පමාදය) යනු ආධ්‍යාත්මික මාර්ගය වඩා ගැනීම අතපසු කිරීමය, මෙය අකුසලයකි. **බලන්න**: අප්‍රමාදය හා ප්‍රමාදය. **සටහන්**: * "...ප්‍රමාදය මරණයට මගය...ප්‍රමාදවුවෝ මළවුන් වැනිය": ධම්මපදය:2. **අංගු.නි: (1)1 නිපාත:ප්‍රමාදවග්ගයේ, ධර්මයේ ප්‍රමාදවීම නිසා සිදුවන අනර්ථය, අයහපත විස්තරාත්මකව පෙන්වා ඇත.

▼**ප්‍රමාදය** පහකිරීම පිණිස අප්‍රමාදය වැඩිය යුතුය. **මූලාශ්‍රය:** අංගු.නි: (4) 6 නිපාත: 6.1.10 සූත්‍රය, පි.286.

▲ **ප්‍රමාදවිහාරි හා අප්‍රමාදවිහාරි-** Dwelling in heedless & Dwelling in diligence: ප්‍රමාදවිහාරි -පමාදවිහාරි - ප්‍රමාදව වාසය කරන, යනු ඉන්ද්‍රිය අසංවරයෙන් කටයුතු කිරීමය, එමනිසා,සිත එකඟ කරගැනීමට නොහැකිව සමාධිය ලබාගැනීමට නොහැකිවේ, ඔහු ආධ්‍යාත්මික වර්ධනය පමාකරගනී. ඉන්ද්‍රිය සංවරය ඇති පුද්ගලයා:අප්‍රමාදවිහාරිය,( නොපාමාවිහරණ ඇත) ඔහුට සිත එකඟ කරගැනීමට පහසුවේ, ඒ නිසා සමාධිය ඇතිකර ගැනීමට හැකිවේ, එමගින් ආධ්‍යාත්මික දියුණුව ඔහු ලබාගනී. **බලන්න**: අප්‍රමාදය. **මූලාශ්‍රය:** සංයු.නි: සළායතනවග්ග: වේදනාසංයුත්ත: 1.10.4 පමාදවිහාරි සූත්‍රය, පි.192.

▲ **ප්‍රමෝදය**: පාලි: **පාමොජ්ජා** - joy: ප්‍රමෝදය, සිත සමාධියට පත් කරගැනීමට උපකාරීවන අංගයක්ය. අකුසල පහවීම නිසා සිතට ප්‍රමෝදය ඇතිවේ. **බලන්න**: අවිප්‍රතිසාරය, පසුතැවිල්ල, ප්‍රීතිය, සමාධිය.

▼ **පසුතැවිලි නොවන පුද්ගලයාට ප්‍රමෝදය ඇතිවේ. "...අවිප්පටිසාරො බො ආනන්ද පාමොජ්ජත්ථො පාමොජ්ජානිසංසො ... පාමොජ්ජං පීතත්ථං පීතානිසංසා..."**. පසුතැවිල්ල නැතිවීම නිසා ලබන ආනිසංසය, ඵලය නම් සිත ප්‍රමෝදයට පත්වීමය. සිත ප්‍රමෝදවූවිට ප්‍රීතිය ඇතිවේ (The purpose and benefit of non-regret is joy... purpose and benefit of joy is rapture). එමගින් සමාධියට සිත නැමේ. **මූලාශ්‍ර**:අංගු.නි: (6 ): 11 නිපාතය:නිසසය වගග: 11.1.1.කිමත්ථිය සූත්‍රය හා 11.1.2 න චේතනාය කරණිය සූත්‍රය, පි.611-614, EAN:11: Dependence: 1.1 What Purpose & 1-2 Volition p.566.

**පය**

▲ **පායාසි රජ -**King Payasi: **බලන්න:** උපග්‍රන්ථය:3

▲**පියා-** father: අවිද්‍යාවෙන් වැසුන මුලක් නොපෙනෙන සසරේ, යම් කෙනෙකුට පියෙක් නොවූ සත්වයෙක් දැකීම සුලභ නැත යයි බුදුන් වහන්සේ වදාළහ. **මූලාශ්‍රය**: සංයු.නි: (2) නිදානවග්ග: අනමතග්ගසංයුත්ත: 3.2.5 පිතුසූත්‍රය, පි.312.

▲ **පියඋරුමය-** ancestral domain: පියා ගේ උරුම භූමිය ලෙසින් පෙන්වා ඇත්තේ සතරසතිපට්ඨානය ඇසුරු කරගෙන ජීවත්විමය. **බලන්න**: ගෝචර භූමිය.

▲ **ප්‍රියබව හා අප්‍රියබව:** පාලි: **පිය, අප්පිය-** pleasing & displeasing ධර්මයේ ප්‍රියභාවය ලෙසින් පෙන්වා ඇත්තේ තමන් හා වාසය කරන අයගේ සිත් දිනාගෙන, ඔවුන්ගේ ගරු සැලකිලි ලබාගෙන යහපත් ලෙසින් වාසය කිරීමය. එලෙස නො හැසිරීම මගින් අන්‍යයන්ට අප්‍රිය වේ. **සටහන:** ඛු.නි: ධම්මපදය: පියවග්ගයේ ප්‍රියමානප බව විස්තර කර ඇත.

▼**සෙසු සංඝයාගේ ප්‍රියබව,** ගරුබව ලාබා ගැනීම පිණිස භික්ෂුවක් හැසිරිය යුතු ආකාරය බුදුන් වහන්සේ මෙසේ පෙන්වා ඇත: 1) යම්කිසි කෙනක් අප්‍රිය ලෙසින් වාසය කරන්නනේ නම්,ඔහු වර්ණනා නොකිරීම- ඔහුට ප්‍රසංසා නොකිරීම 2) යම්කිසි කෙනක් ප්‍රිය ලෙසින් වාසය

කරන්නනේ නම්,ඔහු විවේචනය නොකිරීම 3) ලාභ සත්කාර ලබා ගැනීමට ආසා නොවීම 4) ගරු බුහුමන් ලබාගැනීමට ආසා නොවීම. 5) පව්කිරීමට ලැජ්ජාවීම (හිරි) 6) පව්කිරීමට බිය තිබීම (ඔතප්) 7) අල්ප ආසා ඇතිව සිටීම- අල්පේච්ඡතාවය 8) සම්මා දිට්ඨිය ඇතිව වාසය කිරීම 9) කිර්තිය-ප්‍රසිද්ධියට අකැමතිවීම 10) කටයුතු කිරීමට සුදුසු වේලාව දන්නාබව 11) සිමාව ඉක්මවා කටයුතු නො කිරීම 12) පිරිසිදු කාය වචී හා මනෝ කර්ම තිබීම 13) බොහෝලෙසින් කතාවේ නොයෙදීම 14) තමන් සමග වාසය කරන සෙසු සංඝයාට නින්දා අපහාස නො කිරීම. **සෙසු සංඝයාට අප්‍රියබව ඇතිකරන අයහපත් හැසිරීම**: 1) අප්‍රිය ලෙසින් වාසය කරන අය, ඔහු වර්ණනා කිරීම 2) ප්‍රිය ලෙසින් වාසය කරන අය ඔහු විවේචනය කිරීම 3) ලාභ සත්කාර ලබාගැනීමට ආසාවීම 4) ගරු බුහුමන් ලබාගැනීමට ආසාවීම 5) පව්කිරීමට ලැජ්ජා නොවීම 6) පව්කිරීමට බිය නොමැතිවීම 7) පාපික ආසා ඇතිව සිටීම 8) සම්මා දිට්ඨිය නොමැතිවීම 9) කිර්තිය-ප්‍රසිද්ධියට කැමතිවීම 10) කටයුතු කිරීමට සුදුසු වේලාව නො දැනීම 11) සිමාව ඉක්මවා කටයුතු කිරීම 12) අපිරිසිදු කාය වචී හා මනෝ කර්ම තිබීම 13) බහුල ලෙසින් අනවශ්‍ය කතාවේ යෙදීම 14) තමන් සමග වාසය කරන සෙසු සංඝයාට නින්දා අපහාස කිරීම. **සටහන:**සංයු.නි: (1) කෝසලසංයුත්ත:3.1.4 පිය සූත්‍රයේ: තුන්දොරින් සුචරිතයෙහි යෙදන පුද්ගලයා ප්‍රිය කෙනෙකි, එහෙත්, දුශ්චරිතයේ යෙදන පුද්ගලයා අප්‍රිය කෙනෙක් ලෙසින් පෙන්වා ඇත. **මූලාශ්‍ර**:අංගු.නි: (5): 8 නිපාත: 8.1.1.3 හා 8.1.1.4 ප්‍රිය සූත්‍ර, පි. 34, EAN:8: 3.3 & 4.4 Pleasing, p. 412.

▼ **බුදුන් වහන්සේ මෙසේ වදාළහ: "සබ්බා දිසා අනුපරිගම්ම චෙතසා- නෙවජ්ඣගා පියතරමත්තනා ක්වචි, එවං පියො පුථු අත්තා පරෙසං - තස්මා න හිංසෙ පරං අත්තකාමොති"**: "සියලු දිසාවන් සිතින් තරණය කර බලනවිට, තමන්ට වඩා ප්‍රිය කෙනෙක් කිසි තැනක නොපෙනේ. එලෙසින්, අන්‍යයන්හටද, තමන්ම ප්‍රියවේ. එනිසා, තම අර්ථය කැමති පුද්ගලයා සෙසු අය නො පෙලිය යුතුවේ". **සටහන:** මේ සූත්‍රය දේශනා කර ඇත්තේ පසේනදී කෝසල රජු හා මල්ලිකා දේවිය අතර ප්‍රියයන් ගැන වූ සංවාදයක් අරභයාය. **මූලාශ්‍ර:** සංයු.නි: (1) සගාථවග්ග: කෝසලසංයුත්ත:3.1.8 මල්ලිකා සූත්‍රය, පි.166.

▲**පියදස්සි බුදුන් වහන්සේ-**The Buddha Piyadassi

ගෝතම බුදුන් වහන්සේට පෙර වැඩසිටි මේ බුදුන් වහන්සේගේ විස්තර පිණිස බලන්න: ඛු.නි: බුද්ධවංශය.

▲**ප්‍රියංකර-**Priyankara: බලන්න: යක්ඛ

▲ **පියක භාන්ඩාගාරික**-Piyaka the Treasurer: **බලන්න**: නාරද තෙර.

**පර**

▲ **පරචිත්ත පරියාය-** skilled in the ways of others' minds: පරචිත්ත පරියාය යනු අනුන්ගේ මනස අවබෝධය කිරීමේ කුශලතාවයය. බුදුන් වහන්සේ ගේ අවවාදය වුවේ පරචිත්ත පරියාය හැර දමා, සචිත්ත පරියාය වර්ධනය කරගන්නා ලෙසය. **බලන්න:**සචිත්ත පරියාය.

▲ **පරචිත්ත විජානන ඥානය** -To understand the minds of other beings: අනුන්ගේ සිතේ ස්වභාවය දන්නා නුවණ. **බලන්න**: චේතෝපරිය ඥානය.

▲**පරදාරසේවනය-** Paradarasevanaya: පරදාරසේවනය ලෙසින් පෙන්වා ඇත්තේ, විවාහකව සිටි තමාගේ බිරිද-සැමියා හැර වෙනත් කාන්තාවක් හෝ පුරුෂයෙක් සමග වැරදි කාමසේවනයය. මෙය අකුසලයකි. **බලන්න**: කාම-මිථ්‍යාචාරය.

▲**පරම අස්වැසීම-** supreme consolation: පරම අස්වැසීම -පරමස්සාය- උතුම් අස්වැසීම ලෙසින් පෙන්වා ඇත්තේ සියලු උපාදාන ප්‍රහීණය කර විමුක්තිය ලැබීමය. **සටහන:** මේ සූත්‍රය, සැරියුත් තෙරුන්, තමන්ගේ බෑණා වූ,ජම්බුඛාදක පරිබ්‍රාජකට දේශනා කරන ලදී. **මූලාශ්‍ර:**සංයු.නි: (4 ): සළායතනවග්ග: ජම්බුඛාදකසංයුත්ත: 1.4.6 පරමස්සාය සූත්‍රය, පි. 504, ESN:38: Jambukhadhakasamyutta:6 supreme consolation, p. 1401.

▲ **පරම උත්තරසමාපත්තිය-** Parama uththra samapathtiya: පරම උත්ත සමාපත්තිය ලෙසින් පෙන්වා ඇත්තේ ශුන්‍යතා විහරණයය. **බලන්න**: ශුන්‍යතා විහරණයය.

▲**පරම දිට්ඨධම්ම නිර්වාන වාදය**: පාලි: **පරමදිට්ඨධම්ම නිබ්බානං** -View on: supreme nibbāna in this very life: පරම දිට්ඨ ධම්ම නිර්වානවාදය (මේ ජීවිතයේදීම නිවන ලබාගැනීම) ලෙසින් පෙන්වා ඇත්තේ නිවන පිළිබඳව බුදුන් වහන්සේ වැඩ සිටි සමයේ පැවති විවිධ මත හා දිට්ඨි වලින් එක දිට්ඨියක් ගැනය.**බලන්න**: දිට්ඨි.

▼ **සමහර මහණබමුණන්**, ජීවත්ව සිටින සත්ත්‍වයන් (විද්‍යාමාන) පිළිබඳව පරම දිට්ඨි ධර්ම නිර්වාන වාදය ගැන, මත 5 ක් පනවා ඇතැයි බුදුන් වහන්සේ පෙන්වා ඇත: 1) මේ අත්බව, පස්කම් සැපයෙන් සපුරුවාගෙන, ඉඳුරන් පිණවා ගැනීම, මේ හවයේම දීම නිවන ලැබීමය යන මතය: **"යතො ඛො භො යං අත්තා පඤ්චහි කාමගුණෙහි සමප්පිතො සමඞ්ගිභූතො පරිචාරෙති, එත්තාවතා ඛො භො අයං අත්තා පරමදිට්ඨධම්ම නිබ්බානං පත්තො හොතී'ති"**

(In as far as this self, being furnished and endowed with the fivefold sense-pleasures, indulges in them, then that is when the self realizes the highest Nibbāna here and now). 2) පස්කම් සැප අනිත්‍ය, දුක ගෙනදේ. එහෙත්, මේ ආත්මය යම්විටක විතක්ක විචාර සහිත විවේකයෙන් උපන් ප්‍රීතිය හා සුඛය ඇති පළමු ජානය ලැබීම මේ හවයේම දීම නිවන ලැබීමය යන මතය. 3) විතක්ක විචාර රහිත, සමාධියෙන් උපන් ප්‍රීතිය හා සුඛය ඇති දෙවෙනි ජානය ලැබීම මේ හවයේම දීම නිවන ලැබීමය යන මතය. 4) ප්‍රීති නොමැති, උපෙක්කාව හා සිහිය ඇති දෙවෙනි ජානය ලැබීම මේ හවයේම දීම නිවන ලැබීමය යන මතය. 5) සියලු සැප දුක රහිත, සොම්නස හා දොම්නස පහකරඇති, උපේක්කාව හා සිහිණුවන ඇති සිව්වෙනි ජානය ලැබීම මේ හවයේම දීම නිවන ලැබීමය යන මතය. **සටහන:** මේ සැම මතයක්ම බුදුන් වහන්සේ ප්‍රතික්ෂේප කර ඇත. **මූලාශ්‍ර:** දීඝ.නි: (1 ) 1.බ්‍රහ්මජාල සූත්‍රය, ඡේදය:95, පි.18, EDN: 1.Brahmajāla Sutta: The Supreme Net, section: 3.19, p.82.

▼ **මේ ජීවිතයේදීම** නිවන සාක්ෂාත් කරගැනීම-දිට්ඨධම්ම නිබ්බාන ගැන බුදුන් වහන්සේ මෙසේ වදාළහ: සළායතනයන්ගේ, ඇතිවීම නැතිවීම, ආස්වාදය, ආදීනවය හා නිස්සරණය තත්වූ පරිදි දැන අනුපාද විමොක්ෂය (උපාදාන රහිත) ලැබීම- අරහත්වය ලැබීම මේ ජීවිතයේදීම සාක්ෂාත් කරගත හැකි නිවනය. (එම නිවන අග්‍රය) : **"...එතදග්ගං භික්ඛවෙ පරමදිට්ඨධම්ම නිබ්බානං පඤ්ඤාපෙන්තානං යදිදං ඡන්නං ඵස්සායතනානං සමුදයඤ්ච අත්ථගමඤ්ච අස්සාදඤ්ච ආදිනවඤ්ච නිස්සරණඤ්ච යථාභූතං විදිත්වා අනුපාදා විමොක්ඛො..."** .**මූලාශ්‍ර:** අං.ගු.නි: (6 ): 10 නිපාත: 10.1.3.9.ප්‍රථම කොසල සූත්‍රය,පි. 134, EAN-10: The Great Chapter, 29.9 Kosala-1, p. 505.

▲ **පරනිර්මිත-වසවත්තිය-**Paranirmithavasavathtiya: මෙය කාමාවචර දේවලෝකයකි. **බලන්න**: දේවලෝක.

▲**පරලොව**-Paralova: පරලොව -එලොව යනු වර්තමාන භවයෙන්- මෙලොවින්, මියයාමෙන්- චුතවීමෙන් පසු, කර්මානුරූපව, යළි උපත ලබන භවයය. **බලන්න**: සුගතිය, දුගතිය, යළිඋපත.

▲ **පරවාදය-** others' doctrines: ධර්මයේ පරවාදය ලෙසින් පෙන්වා ඇත්තේ බුදුදහමට අනුව කටයුතු නොකිරීමය. වැරදි මත- දිට්ඨි ගැනීමය. **බලන්න**: දිට්ඨි,මිථ්‍යා දිට්ඨිය. **යම්කෙනෙක්** චතුසත්‍ය අවබෝධ කර ඇත්නම් ඔවුන් පරවාදයට නොපැමිණේ. **මූලාශ්‍ර:** සංයු.නි: (1):සගාථවග්ග: දේවතාසංයුත්ත: 1.1.7 අප්පටිවිදිත සූත්‍රය, 1.1.8 සුසම්මුට්ඨ සූත්‍රය**,** පි. 34, ESN: Devatasamyutaa: 7.7 Not Penetrated,p.65.

▲ **පරවිපත්ති හා පරසම්පත්**-Paravipathti & Parasampath: පරවිපත්ති ලෙසින් පෙන්වාත්තේ, අනුන් කරන අයහපත් කටයුතු නිසා ඔවුන්ගේ ධර්ම මාර්ගය පිරිහීමය. පරසම්පත් යනු අනුන් කරන යහපත් කටයුතු නිසා ඔවුන්ගේ ධර්ම මාර්ගය දියුණුවට පත්වීමය. **බලන්න:** ආත්මවිපත්ති-පරවිපත්ති.

▲ **පරසතු මල් රුක**-Parasathu flower tree

තව්තිසා දෙව්ලොව, නන්ද උයනේ ඇති පරසතු මල්රුක (පාරිච්ඡත්‍රක වෘක්ෂය- *pāricchattaka* coral tree), කොවිදාර ලෙසින් ද හඳුන්වයි. එම රුක පිලිබඳ විස්තර මේ සූත්‍රයේ පෙන්වාඇත. **බලන්න**: EAN:note:1586, p.657. **සටහන**: පරසතු රුක ක්‍රම ක්‍රමයෙන් වැඩි මල් හටගෙන දස අත සුවඳ හමන ලෙසින්, ගිහිගෙය හැර, ශ්‍රමණබව ලබාගෙන, ධර්මය ක්‍රමානුකූලව පුරුදුවන භික්ෂුව, සියලු කෙළෙස් හැර, උතුම් විමුක්තිය ලැබීමේ අසිරිය එම උපමාව තුලින් බුදුන් වහන්සේ විස්තර කොට වදාළහ. **බලන්න:** උපග්‍රන්ථය:5 (පරසතු මල්) **මූලාශ්‍ර**:අංගු.නි: (4): 7 නිපාත:7.2.2.5 **පාරිච්ඡත්‍රක සූත්‍රය**, පි.468, EAN:7: 69.5 Pāricchattaka, p.400.

▲**පරහිත**- Welfare of others: පරහිත යනු අන්‍යයන්ගේ යහපත පිණිස කටයුතු කිරීමය. මෙය පරාත්ථකාමීබව ලෙසින්ද පෙන්වා ඇත. අනුන්ගේ ආධ්‍යාත්මික ජීවිතය වඩා ගැනීම පිණිස උපකාරිවීම, සහයවීම පරහිත පිණිස කටයුතු කිරීමය යි බුදුන් වහන්සේ පෙන්වාඇත. අත්තහිත යනු

තමන්ගේ ආධ්‍යාත්මික ජීවිතය වඩා ගැනීමට කටයුතු කිරීමය. අත්තහිත-පරහිත යනු තමන්ගේ මෙන්ම අනුන්ගේ යහපත පිණිස කටයුතු කිරීමය. **බලන්න**: අත්තහිත, ආත්මාර්ථකාමී. **මූලාශ්‍ර**: අංගු.නි: (3 ): 5 නිපාත:බලවග්ග: 5.1.2.8 -5.1.2.10 සූත්‍ර, පි.44, EAN:5:II Powers:17.7-20.10,p.241.

▲ **පරික්ඛයාය** (පාලි)- **විනාශකිරීම**-the utter destruction: පරික්ඛයාය ලෙසින්පෙන්වා ඇත්තේ කෙළෙස් සහමුලින්ම විනාශ කර නිවන ලැබීමය. අරහත්වය පිණිස රාගය, දෝසය හා මෝහය -අකුසල මුල් විනාශ කිරීම අවශ්‍යවේ. **මූලාශ්‍ර:** අංගු.නි: (2): 4 නිපාත: 8. රාගාදීපෙය්‍යාලය වග්ගසූත්‍ර, පි. 516, EAN:4: VIII: Lust & so forth, p. 233.

▲ **පරිකුප්ප-**Parikuppa: පරිකුප්ප යනු කිපෙන සුළුබවය. එවැනි අය අතින් සිදුවන ආනන්තරිය කම්ම විපාක, පැරණි තුවාලයක්-වනය මෙන් පිළිම් කල නොහැකි බව මෙහි පෙන්වා ඇත. ඔවුන් නියතයෙන්ම නිරයගාමිවේ. **බලන්න**: ආනන්තරිය කම්ම, කුප්ප. **බලන්න**: උපග්‍රන්ථය:උපමා (පැරණි තුවාලය) **මූලාශ්‍රය**: අංගු.නි: (3): 5 නිපාත:ගිලානවග්ග: 5.3.3.9 පරිකුප්ප සූත්‍රය, පි.262. EAN: 5: 129.9 Lesions, p. 279.

▲ **පරිජාන හා අපරිජාන-**fully understanding & not fully understanding: පරිජාන ලෙසින් පෙන්වා ඇත්තේ යහපත් ලෙසින් අවබෝධ කිරීමය- පූර්ණ අවබෝධය. අපරිජාන යනු පූර්ණ අවබෝධය නොමැති බවය. **බලන්න**: පරිඥාය, පරික්ඛය, පරිපූර්ණ අවබෝධය. මේ සූත්‍රයේදී, සම්පූර්ණ අවබෝධය ලැබීම ලෙසින් පෙන්වා ඇත්තේ සළායතන හා බාහිර අරමුණු පිළිබඳ යථාබව අවබෝධ කරගැනීමය. එමගින් දුක අවසන් කරගත හැකිවේ. **මූලාශ්‍ර**:සංයු.නි: (4 ): සළායතනසංයුත්ත:1.3.4 හා අ.3.5 අපරිජාන සූත්‍ර, පි.58 ESN:35: Salayathnasamyutta:III: 25.3 & 26.4 suttas, p.1225.

▲ **පරිඥාය:** පාලි**: පරිඤ්ඤා**: full understanding

පරිඥාය, යනු ධර්මපිළිබඳ පූර්ණ-යහපත්- මනා අවබෝධය ලැබීමය. අරහත්වය පිණිස රාගය, දෝසය හා මෝහය (අකුසල මුල්) ක්‍ෂය කිරීමට මේ අවබෝධය ලැබිය යුතුය. **පරිඥෙය්‍යා ධර්මතා** : රූප, වේදනා, සංඥා, සංඛාර හා විඥානය- පංච උපාදානස්කන්ධය ය. (what, bhikkhus, are the things that should be fully understood? Form, bhikkhus, is something that should be fully understood. Feeling … Perception … Volitional formations … Consciousness is something that should be fully understood). **සටහන්:** * නිවන පිස මේ ධර්මතා යහපත් ලෙසින්ම අවබෝධ කරගතයුතුවේ. ** ආරිය සත්‍ය හතර-චතුරාර්ය සත්‍ය යහපත් ලෙසින් අවබෝධ කරගැනීම පරිඥෙය්‍යා ලෙසින් පෙන්වා ඇත. **බලන්න**: සංයු.නි:සච්චසංයුත්ත:12.3.9 **පරිඥෙය්‍යා සූත්‍රය**. ** **පරිඥාව ලැබූ පුලයා:** රහතන්වහන්සේය.**බලන්න:** පරිපූර්ණ අවබෝධය: **මූලාශ්‍ර**:අංගු.නි: (2 ): 4 නිපාත: 8. රාගාදීපෙය්‍යාලය වග්ග සූත්‍ර, පි. 516, EAN:4: VIII: Lust & so forth, p. 233, සංයු.නි: (3 ): ඛන්ධසංයුත්ත: 1.3.1.4 පරිඥෙය්‍යා සූත්‍රය, පි. 303, ESN:22:106.4 To be fully understood, p. 1097.

▼ **පරිඤ්ඤෙය්‍ය ධර්මතා:** ආධ්‍යාත්මික වර්ධනය පිණිස පිරිසිඳ ලෙසින්- සම්පූර්ණයෙන්ම අවබෝධ කර ගත යුතු ධර්මතා මෙලෙසින්ද පෙන්වා ඇත. (Dhamma to be thoroughly known): **1)** ආශ්‍රව හා උපාදාන ඇතිවීමට හේතුවූ (ප්‍රත්‍ය) **ස්පර්ශය,** පිරිසිඳ දැන ගත යුතු එක් ධර්මයකි.(එසෝ සාසවො උපාදානියා අයං එකො ධම්මො පරිඤ්ඤෙය්‍යො**). බලන්න:** ස්පර්ශය, ආශ්‍රව, උපාදාන. **2) නාම රූප (**නාමක්ඛ, රූපක්ඛ - Mind and body). **බලන්න**: නාම රූප. **3) ත්‍රිවිධ වේදනා (**තිස්සො වෙදනා**) :** 1සැප වේදනාව (සුඛා වෙදනා) 2 දුක වේදනාව (දුක්ඛා වෙදනා) 3 සැපත් නොවන දුකත් නොවන වේදනාව (අදුක්ඛමසුඛා වෙදනා) **බලන්න**: වේදනා. **4) සතර ආහාර-** සිව් පෝෂණය. **බලන්න**: අහාර. **5) පංච උපාදානස්කන්ධය**: රූප, වේදනා, සංඥා, සංඛාර, විඥාණය . **6) සළායතන-** ආධ්‍යාත්මික ආයතන සය. **මූලාශ්‍ර:** දීඝ.නි : (3): 11 දසුත්තර සූත්‍රය, පි. 483, EDN: 34: Dasuttara Sutta: Expanding Decades, p. 384.

▲ **පරිප්‍රඥාව**-Paripanna: පරිප්‍රඥාව, ආධ්‍යාත්මික වර්ධනය පිණිස උපකාරවන, පස් ආකාර නුවණින් එකක්ය. **බලන්න**: ඤාණපඤ්චකය.

▲**පරිනිබ්බානය:** පාලි: **පරිනිබ්බානං**-Pari Nibbāna: ධර්මයට අනුව පරිනිබ්බානය -පරිනිර්වානය යනු සියලු ආසවයන් ප්‍රහීණකර දුකින් මිදීමය. මේ ජීවිතයේදීම ලබාගත හැකි උපරිම සුඛයය, නිවන ලබාගැනීමය. **සටහන්**: * පරිනිබ්බානය ලැබූ රහතුන්ගේ කය, මිය ඇදීම ද පරිනිබ්බානයට පත්වීම (පරිනිර්වාණය-Final nibbaana) ලෙසින්ද දක්වයි. ** දීඝ.නි: **මහා පරිනිර්වාණ සූත්‍රයේදී** පෙන්වා ඇත්තේ බුදුන් වහන්සේගේ ස්කන්ධ පරිනිර්වාණය ය. ** **බලන්න**: අනාගාමී. ** පටිසම්භිදාවේ: සම්මා ඥානය ඇත්තහුන් ගේ කෙලෙස්- ස්කන්ධ ප්‍රවෘත්ති ක්ෂය කිරීමෙහි ප්‍රඥාව, පරිනිර්වාණ ඥානලෙසින් පෙන්වා ඇත. **බලන්න**: ඛු.නි: පටිසම්භිදා1 :ඥාණකථා: 35 පරිනිබ්බාන ඥානය, පි. 212. ** සංයු.නි: (4): සළායතනවග්ග: වේදනාසංයුත්ත:ගහපතිවග්ග: 1.13.1, 1.13.2 සූත්‍රයන්හිදී, බුදුන් වහන්සේ කෙනෙක් මේ ජීවිතයේදීම පිරිනිවන් පෑමට හේතු කරුණු විස්තර කර ඇත. **ශබ්දකෝෂ: පා.සිං.ශ:** පි. 372: "**පරිනිබ්බාන: පිරිනිවින්පෑම:** කෙළෙස් පරිනිර්වානය**,** රහතුන්ගේ ස්කන්ධ පරිනිර්වානය". **B.D**: p.126: "**Pariibbāna**: Full Nirvana- is a synonym for Nirvana: this term, therefore, does not refer exclusively to the extinction of the 5 groups at the death of the Holy one.

▼**උපාදාන රහිතව පිරිනිවීම** (**අනුපාදාපරිනිබ්බානත්‍ථං**- for attaining final Nibbāna without clinging) ලෙසින් පෙන්වා ඇත්තේ මේ ජීවිතයේදීම කෙලෙසුන්ගෙන් වෙන්වී පරිනිබ්බානය ලැබීමය.ඒ පිලිබඳ පටිපදාව ආරිය අට මගය. **මූලාශ්‍ර:** සංයු.නි: (5-1):මහාවග්ග: අඤ්ඤාතිත්‍ථියා පෙය්‍යාලො සූත්‍ර: 1.5.1, 1.5.2, 1.5.3, 1.5.4, 1.5.5, 1.5.6, 1.5.7, 1.5.8**,** පි.71, ESN: V: Wanders of the other sects: 41.1 to 48.8 suttas, p. 1649.

▼ **පරිනිබ්බානය** පිළිබඳව බුදුන් වහන්සේ වදාළ ක්‍රමය, (පර්යාය) ආනන්ද තෙරුන් මෙසේ පෙන්වා ඇත: "ඇවැත්නි මේ සසුනේ මහණ...ප්‍රථම ජානයට පැමිණ වාසය කරයි…( එලෙස සිව් ජාන)

එපමණකින්ම, පරිනිබ්බානය යයි අවස්ථානුරූපව (පර්යායෙන්) බුදුන් වහන්සේ දෙසනා කරන ලදී". " මේ සසුනේ මහණ... ආකාසානඤ්චායතන සමාපත්තියට පැමිණ වාසය කරයි... (එලෙස සිව් අරූප ලැබීම) එපමණකින්ම, පරිනිබ්බානය යයි අවස්ථානුරූපව, බුදුන් වහන්සේ දෙසනා කරන ලදී.. "...මේ සසුනේ මහණ මුළුමනින්ම, නෙවසඤ්ඤානාසඤ්ඤායතනය ඉක්මවා සඤ්ඤාවෙදයිත නිරෝධයට පැමිණ වාසය කරයි. නෙවසඤ්ඤානාසඤ්ඤා විපස්සනා ප්‍රඥාවෙන් දැකීමෙන් ඔහුගේ ආසව ක්‍ෂයවේ. එපමණකින්ම, පරිනිබ්බානය යයි අවස්ථානුරූපව, බුදුන් වහන්සේ දෙසනා කරන ලදී".**මූලාශ්‍ර:** අංගු.අංනි: (5 ): 9 නිපාත: සාමඤ්ඤවග්ග: 9.1.5.8 පරිනිබ්බාන සූත්‍රය**,** පි. 566, EAN:9: 49.8 Finala Nibbāna , p. 485.

▼**බුදුන් වහන්සේ පරිනිර්වාණය** සාක්ෂාත් වීම (නිවන) ගැන වදාළ උදාන: "මහණෙනි යමෙක්හි පඨවිධාතුව...වායු ධාතුව නැද්ද... ආකසානඤ්චායතාන ...නෙවසඤ්ඤායතාන සිත නැද්ද...මේ ස්කන්ධ ලෝකය නැද්ද, මෙයින් උපදිනා අන්‍ය ස්කන්ධ ලෝකයකුත් නැද්ද, එහි අඳුරක් නැතිනිසා, අඳුර දුරලන්ට සඳහිරු නැද්ද, එසේවූ ඒ ආයතනය (මාර්ග ඵලසිතට අරමුණුබ නිවන) ඇත... එහි කිසිවෙකුගේ ඒමක් යෑමක් සිටීමක්, මරණයක්, මැරි ඉපදීමක් නැත. මෙය කිසිවෙක නොපිහිටි, ප්‍රත්‍යයයන්ගෙන නොපවත්නා, කිසිම අරමුණක නො එල්බෙන දහමකි. මෙයම දුකෙහි කෙළවර ය". "ස්වභාවයෙන් ගැඹුරු බැවින් ඉතා සියුම් බැවින් නුවණ නො මුහුකළවුන් විසින් දැකිය නොහැකි, තණ්හා රහිත, ඒකාන්තයෙන් ඇත්තා වූ නිවන නම් සුවසේ දැකිය හැකි නොවේ. ප්‍රහාණාභිසමය වශයෙන් තණ්හාව පිලිවිදුනා ලදී. අරියමගනුවණින් දන්නාහට තණ්හා පරිබෝධයක් නැත". "මහණෙනි, හේතු ප්‍රත්‍යයෙන් නොඋපන්, පහළනොවූ, කිසිවෙකින් නො කරනලද, ප්‍රත්‍යයෙන් අසංසකෘතවූ නිත ධර්මය-පරමාර්ථ වශයෙන් ඇත. ... මේ හේතු ප්‍රත්‍යයෙන් නොඋපන්, නො පහළනොවූ, නොකරනලද අසංසකෘත නිර්වාන ධාතුව අවිද්‍යමාන නම්, මෙහි හේතු ප්‍රත්‍යයෙන් උපන්, පහලවූ, කරනලද, සංසකෘතවූ, ස්කන්ධපංචකයාගේ නිස්සරණයක් නො පැනෙන්නේය (නො ලැබිය හැකිය)... යම්ලෙසකින් නොඋපන්, නො පහළනොවූ, නොකරනලද අසංසකෘත ධාතුවක් පරමාර්ථ වශයෙන් ඇත්ද, එහෙයින්, උපන්, පහලවූ, කරනලද, සංසකෘතවූ ස්කන්ධපංචකයාගේ නිස්සරනයක් පැනේ". "තණ්හාදිට්ඨි සංඛාරයන් ඇසුරු කලවුන්ට, සුව දුක් ආදිය උපන් කල් සිත්සතන් කම්පනයවේ. තණ්හාදිට්ඨි සංඛාරයන් ඇසුරු නො කලවුන්ට-විදසුන් වඩන්නාට සිත්සතන් කම්පනය නැත.කම්පනය නැති කල සිතේ සංසිඳීම වේ. සිතේ සංසිඳීම ඇති කල්හි, විදසුන්වඩන්නාට අරහත් මාර්ගක්‍ෂණයෙහිදී භවයන්හි නැමීම (හෙවත් තණ්හාව) නොවේ. භවයන්හි නැමීම නැතිකළ පිළිසිඳවීම, මේ භවයට ඒමක්, අන් භවයකට යෑමක් නොවේ. භවයෙන් භවයට එම යෑම නැති කල චුති උත්පත්ති නොවේ. චුති උත්පත්ති නැති කල මේ කාම භවයේ ද එහි-අරූප භවයේද මේ දෙක අතරේ (රූපභවයේ) ද පැවැත්මක් නැත. මෙයම දුකේ කෙළවරය." **මූලාශ්‍රය:** ඛු.නි:උදානපාළිය:8 පාටලීගාමවග්ග: නිබ්බාන සූත්‍ර 4 කි. 317.

▲**පරිනිබ්බාන ඥාන**- Pari-nibbāna Nana: පරිනිබ්බාන ඥාන- පරිනිර්වාන ඥාන ලෙසින් පෙන්වා ඇත්තේ, සම්මා ඥානය ඇති

උත්තමයා සියලු කෙළෙස් ක්‍ෂය කලබව අවබෝධ කිරීමය. **මූලාශ්‍ර:** ඛු.නි:පටිසම්භිදා 1:මහාවග්ග:ඤානකතා:35: පරිනිර්වාණ ඥානය,පි.212.

▲**පරිපූරක**-Fulfillment: පරිපූරක ලෙසින් පෙන්වා ඇත්තේ සහමුලින්ම සම්පූර්ණ බවය. ශීලය, සමාධිය හා ප්‍රඥාව අනුව කෙනෙක් පරිපූරක ද, පරිපූරක නොවේද යන්න මේ සූත්‍රයේ පෙන්වා ඇත: 1) ශීලය, සමාධිය හා ප්‍රඥාව සහමුලින්ම පරිපූරක නො කරගත් පුද්ගලයා 2) ශීලය සම්පූර්ණ කරගත්, අනිත් කරුණු 2 සම්පූර්ණ නො කරගත් පුද්ගලයා 3) ශීලය හා සමාධිය පරිපූරකරගත් එහෙත් ප්‍රඥාව සම්පූර්ණ නො කරගත් පුද්ගලයා.4) ශීලය, සමාධිය හා ප්‍රඥාව සහමුලින්ම පරිපූරක කරගත් පුද්ගලයා. **සටහන:** අටුවාවට අනුව:1 පුද්ගලයා පෘතග්ජනය, 2පුද්ගලයා සෝතාපන්න හා සකදාගාමිය, 3 පුද්ගලයා අනාගාමිය, 4 පුද්ගලයා අර්හත්ය. **බලන්න**:EAN:Note: 834, p.624. **මූලාශ්‍ර:** අංගු.නි: (2 ):4 නිපාත: පරිපූරකාරීපුග්ගල සූත්‍රය, පි.284, EAN:4: 136.6 sutta, p.197.

▲**පරිපූර්ණ අවබෝධය -** full understanding: ධර්මයේ පරිපූර්ණ අවබෝධය ලෙසින් පෙන්වා ඇත්තේ යම් ධර්මතාවයක් පිලිබඳව නුවණින් විමසා බලා පූර්ණ අවබෝධය ලබා ගැනීමය.**ශබ්දකෝෂ: පා.සිං.ශ:** පි.370**: "පරිඤ්ඤා:** අවබෝධය- මනා දැනීම...".**B.D:** p.126: "**Pariññā:** Full understanding, full comprehension-There are 3 kinds of mundane (lokiya) full understanding: 1) Full understanding of the known-**ñātapariññā** : is the knowledge consisting in the discernment of the specific characteristics of a phenomena… 2) Full understanding as investigating-**tīranapariññā-**investigating with insight wisdom… 3) Full understanding as overcoming - **pahānapariññā-**the insight wisdom which has the above mentioned general characteristics as its objects and arise after overcoming the idea of permanence etc."

▼ **බුදුන් වහන්සේ**, ධර්මය දේශනා කරනවිට ආධ්‍යාත්මික වර්ධනය පිණිස වැඩිය යුතු ධර්මතා (කුසල ධර්ම) හා ප්‍රහාණය කරගතයුතු ධර්මතා (කෙළෙස් ආදිය) පරිපූර්ණ ලෙසින් අවබෝධ කරගත යුතු යයි අවවාද අනුසාසනා වදාරා ඇත. **උදාහරණයක්** ලෙසින් 'දුක' ඇතිවීම බැලීමට හා නැතිකරගැනීම පිණිස, දුක පිලිබඳ සම්පූර්ණ දැනුම **(පරිඤ්ඤාය)** තිබිය යුතුවේ. ආරිය අට මග වඩා ගැනීමෙන් එම අවබෝධය ඇතිවේ. **මූලාශ්‍ර**: සංයු.නි: (5-1): මහාවග්ග: මග්ගසංයුත්ත: 1.15 දුක්ඛතා සූත්‍රය, පි.156, ESN: Maggasamyutta: 165.5 Suffering, p. 1710.

▼ **වෙනත් මූලාශ්‍ර: 1. "** ඤාතපරිඤ්ඤාය, තීරණපරිඤ්ඤාය, පහානපරිඤ්ඤාය යැයි ලෞකික පරිඥා 3 කි. **ඥාතපරිඥා**: රූපය, රූපයේ බිඳීම් ලක්ෂණ, වේදනාවේ විඳීම් ලක්ෂණ ආදී, ඒ ඒ ස්කන්ධ- ධාතු- ආයතන හා ඒවාට ආවේණික ලක්ෂණ පිළිබඳව (ඇති ස්වභාවය) සැලකීම ඥාතපරිඥා නම් වේ. **තීරණපරිඥා**: රූපය අනිත්‍යය, වේදනාව අනිත්‍යය ආදී ලෙසින් රූපා දී වූ ධර්මයන්ගේ අනිත්‍ය. දුක්ඛ, අනාත්ම යන සාමාන්‍ය (සියල්ලට සාධාරණ) ලක්ෂණයන් අරමුණු කොට ඇති විදර්ශනා නුවණ තීරණ පරිඥා නම් වේ. **ප්‍රහානපරිඥා:** ඒ ත්‍රිභූමික ධර්මයන් කෙරෙහි නිත්‍ය සංඥා ආදිය දුරුකිරීම් වශයෙන් ඇති ලක්ෂණ නොහැරම ස්කන්ධයන් අරමුණු කරන ලක්සනාලම්බනික විදර්ශනා

නුවණ ප්‍රහානපරිඥා නම්වේ. **සිංහල විශුද්ධිමාර්ගය:**20 පරිච්ඡේදය**:** පි. 961.

▲ **පරිබ්‍රාජික-** Wanderers: පරිබ්‍රාජික යනු බුදුන් වහන්සේ වැඩසිටි සමයේ විසූ අන්‍යආගමිකයන්ය. එවක සිටි ප්‍රසිද්ධ පරිබ්‍රාජිකයන්: අන්නභාර, වරධර හා සකුලුදායි ය. බුදුන් වහන්සේ මේ තිදෙනාට, ආරියවංශ යට අයත් සතර ධර්ම පද කරුණු පැහැදිලි කර වදාළබව මේ සූත්‍රයේ දක්වා ඇත. **බලන්න**: ආරියවංශය. **සටහන**: පරිබ්‍රාජිකයන් පිළිබඳ විස්තර පිණිස **බලන්න**: ම.නි: පරිබ්‍රාජක වග්ග. **මූලාශ්‍ර:** අංගු.නි: ( 2): 4 නිපාත: 4.1.3.9 ධම්මපද සූත්‍රය, පි. 80 , EAN:4 : 29.9 Dhamma Factors, p. 159.

▲ **පරිභව නොකළයුතු සිව් දෙනා-** Four people not to be disregarded ලාබාල- තරුණ යයි සිතා අවමන් නොකළයුතු පුද්ගලයන් 4 දෙනක් බුදුන් වහන්සේ පෙන්වා ඇත: 1) තරුණ ක්‍ෂත්‍රිය 2) ළදරු සර්පයා 3) කුඩා ගින්න 4) ලාබාල මහණ. **බලන්න**: දහර.

▲ **පරියාය**-Pariyaya: මේ සූත්‍රයේදී පරියාය ලෙසින් පෙන්වා ඇත්තේ පංචනීවරණ හා සප්ත බොජ්ඣංග පිලිබඳ ධර්මතා විග්‍රහකිරීමකි: 1) පංචනීවරණ, දස නීවරණ බවට පත්වීමේ නියාය: අභ්‍යන්තරයේ ඇති පංච නීවරණ හා බාහිර පංච නීවරණ දස නීවරණවේ. 2) බොජ්ඣංග හත, 14ක් බවට පත්වීමේ නියාය: අභ්‍යන්තරයේ සප්ත බොජ්ඣංග හා බාහිර සප්ත බොජ්ඣංග, බොජ්ඣංග 14 වේ. **සටහන**: මේ පරියාය විස්තර කර බුදුන් වහන්සේ පෙන්වා ඇත්තේ තථාගත හෝ බුද්ධ ශ්‍රාවකයෙක් හෝ තථාගත හෝ බුද්ධ ශ්‍රාවකයෙක් ගෙන් ඒ ගැන ඇසූ කෙනෙක් හැර වෙනත් කෙනෙක්හට ඒ පිළිබඳව විග්‍රහකිරීමට හැකියාව නොමැතිබවය. බුදුදහමේ හා අන්‍ය පරිබ්‍රාජක දහමේ වෙනස මින් පෙන්වා ඇත. **මූලාශ්‍ර**:සංයු.නි: (5-1): මහාවග්ග: බොජ්ඣංගසංයුත්ත: 2.6.2 පරියාය සූත්‍රය, පි.238, ESN:41:Bojjhangasamyutta:VI: 52.2 method of exposition, p.1791.

▲**පරියොගාහ ඤාණය**- Pariyogaha Nana: රූපආදී ස්කන්ධ අනිත්‍ය වශයෙන් නුවණින් දැක ලබන ප්‍රඥාව පරියොගාහ ඤාණය ලෙසින් පෙන්වා ඇත. **මූලාශ්‍රය:**ඛු.නි: පටිසම්භිදා1 : මහාවග්ග: ඤාණවග්ග: 42: පරියොගාහ ඤාණය, පි.224.

▲ **පරියත්ති අන්තරාධාන** - Disappearing of the Dhamma learning පරියත්ති අන්තරාධාන ලෙසින් පෙන්වා ඇත්තේ, ධර්මය ඉගෙනගැනීම අතුරුදහන්වීමය. මෙය සද්ධර්මය අතුරුදහන්වීමට බලපාන කරුණකි. **බලන්න**: ධර්මය අතුරුදහන්වීම.

▲**පරිළාහ**-Parilaha: පරිළාහ යනු දැවිමය. සසර දුක් ගින්නෙන් දැවීම පරිළාහ-පරිදාහ ලෙසින් බුදුන් වහන්සේ පෙන්වා ඇත. එම දැවීම මහා පරිළාහ නිරයේ ඇති ගින්නෙන් දැවීයාමට වඩා බිහිසුණුය. **මූලාශ්‍ර**: සංයු.නි: (5-2 ): මහාවග්ග: සච්චසංයුත්ත:12.5.3 පරිළාහසූත්‍රය, පි.336, ESN:56: Sacchasamyutta:V:43.3. The Great Conflagration, p. 2314.

▲ **පරිවිමංසනය-** Investigation: පරිවිමංසනය ලෙසින් පෙන්වා ඇත්තේ යහපත් ලෙසින්ම පරික්ෂාකිරීම-පිරික්සීමය. මේ සූත්‍රයේදී දුක නැතිකර ගැනීම පිණිස, දුක ඇතිවීමට හේතු පරික්ෂා කිරීම විස්තරාත්මකව පෙන්වා ඇත. **මූලාශ්‍රය:**සංයු.නි: (2) නිදානවග්ග:අභිසමයසංයුත්ත: 1.6.1 පරිවිමංසන සූත්‍රය, පි.148, ESN:12: Nidanasmayutta: VII: 51.1 Through Investigation, p.681.

▲ **පරිසදූෂණ හා පරිස ශෝභන**-People who are blemishes/ adornment an assembly: පරිසදූෂණ (පරිසස්දූසනයෝ) ලෙසින් පෙන්වා ඇත්තේ, පිරිස් සමූහයක් අතර සිටින පාපී මිනිසුන්ය. අසිල්වත් මහණ, මෙහණිය, උපාසක, උපාසිකා පරිසදූෂණයන්ය. සිල්වත් මහණ, මෙහණිය, උපාසක, උපාසිකා, පිරිස ශෝභමාන (පරිස සෝභනයෝ) කරති. **මූලාශ්‍ර**:අංගු.නි: (2 ): 4 නිපාත:4.5.2.1 පරිසසෝභන සූත්‍රය, පි.452, EAN:4:II: 211.1 Assembly, p.224.

▲ **පරිස්සාරජ්ජභය**-Parisarajjabhaya: මෙය පස්බිය වලින් එකකි, පිරිසඅතර පසුබෑමට පත්වීමේ බියය. **බලන්න**: සංග්‍රහ වත්ථු බල.

▲ **පරිශුද්ධ ධර්ම**-Purified Dhamma: පරිශුද්ධ ධර්ම ලෙසින් පෙන්වා ඇත්තේ දස ධර්මයය: ආරිය අටමග, සම්මා ඤාණය හා සම්මා විමුක්තියය. දස ධර්ම ඇත්තේ ධර්මවිනයේ පමණකි. **සටහන**: මේ සූත්‍රයේ, දස ධර්ම මගින් ආධ්‍යාත්මික ජීවිතය පිරිසිදුවන ආකරය පෙන්වා ඇත. **මූලාශ්‍ර**: අංගු.නි: (6 ): 10 නිපාත: 3 පරිශුද්ධවග්ග, පි.462, EAN:10: III Purified,p.547.

▲ **පරිහානිය ධර්ම-** Dhamma that lead to decline: පරිහානිය ධර්ම ලෙසින් පෙන්වා ඇත්තේ, ආධ්‍යාත්මික මග පරිහානියට පත් කරන අකුසලයන්ය. **බලන්න:** අපරිහානිය ධර්ම. **සටහන**:ඛු.නි: සු.නි:පරාභව සූත්‍රයේ, පරිහාණි ධර්ම විස්තරාත්මකව පෙන්වා ඇත.

▼ **සළායතන විසින් අල්ලා ගන්නා** බාහිර අරමුණු ඉවසාසිටින්නේනම්, ඒවා පහ නොකරන්නේ නම්, අකුසල දහම් ඇතිවේ, එය පරිහානියය. එහෙත්, ඒවා නො ඉවසන්නේ නම්, පහකර, කෙළෙවර කරන්නේනම්, කුසල් ධර්මය ඇතිවේ. එය අපරිහානියය. **මූලාශ්‍ර**:සංයු.නි: (4 ): සළායතනවග්ග: වේදනා සංයුත්ත:1.10.3 පරිහාන ධම්ම සූත්‍රය, පි.190, ESN:Vedanasamytta:V The sixes:96.3 Decline,p.1261.

▼ **සය කරුණු සහිතව** වාසය කරන මහණ පරිහානියට පත් වේ යයි බුදුන් වහන්සේ පෙන්වා ඇත: 1) වැඩකටයුතු වලට ඇලීම 2) කතාබහට ඇලීම 3) නින්දට ඇලීම 4) අන්‍ය ඇසුරට ඇලීම 5) අකීකරුබව 6) පාප මිත්‍ර ඇසුර. මේ ධර්මතා සහිතව වෙසෙන මහණ තුන්කාලයේදීම (අතීත, අනාගත, වර්තමාන) ආධ්‍යාත්මික මාර්ගයේ පරිහානියට පත්වේ. **මූලාශ්‍ර**: අංගු.නි: (4 ): 6 නිපාත: 6.1.3.1 සාමගාමක සූත්‍රය, පි. 70 , EAN: 6 : 21.1 Sāmaka, p. 326.

▼**අකුසල ධර්ම වැඩිවීම පරිහානියය**: රාගය දෝසය හා මෝහය (අකුසල මුල්) බහුලව තිබීම හා ස්ථාන අස්ථාන කරුණු පිලිබඳ ගැඹුරු ප්‍රඥාව නොමැතිවීම අකුසල වැඩි පරිහානිය ඇතිකරයි. එම කරුනු නොමැතිවීම කුසල් ධර්ම වැඩීමට, අපරිහානියට හේතුවේ යයි සැරියුත් තෙරුන්

පෙන්වා ඇත. **මූලාශ්‍ර:**අංගු.නි: ( 2 ): 4 නිපාත: 4.4.1.8 පරිහානි සූත්‍රය, පි.300, EAN:4: Faculties:158.8 decline, p.199.

▲**පරිහාණි හා අපරිහාණි පුද්ගලයෝ-**Persons subject to decline & not subject to decline: **ධර්ම මාර්ගයේ පරිහාණියටපත්වෙන පුද්ගලයාගේ ස්වභාවය**:1) පෙර නො ඇසූ ධර්මය ඇසීමට නොලැබීම 2) ඇසූ ධර්මය අමතකවීම 3) අසා පුරුදු කල ධර්මය සිතින් අවර්ජනා නොකිරීම 4) ඇසූ ධර්මය තුලින් තමන්ට අවබෝධ නොවූ ධර්මය කුමක්ද යයි නොදැනීම. ( Here, a bhikkhu does not get to heara teaching he has not heard before, 2 forgets those teachings he has already heard, 3 does not bring to mind those teachings with which he is already familiar, 4 and does not understand what he has not understood). **ධර්ම මාර්ගයේ පරිහාණියට පත්නොවෙන පුද්ගලයාගේ ස්වභාවය**:1) පෙර නො ඇසූ ධර්මය ඇසීමට ලැබීම 2) ඇසූ ධර්මය සිතේ දරා ගැනීම 3) අසා පුරුදු කල ධර්මය සිතින් අවර්ජනා කිරීම 4) ඇසූ ධර්මය තුලින් තමන්ට අවබෝධ නොවූ ධර්මය කුමක්ද යයි දැනීම. **සටහන්**: * මේ සූත්‍රය, සැරියුත් තෙරුන් වදාළහ. ** බුනි:ඉතිවුත්තක:3.3.10 පරිහානසූත්‍රයේ: සේඛ භික්ෂුව පරිහානියට පත්වීම හා පරිහානියට පත්නොවීම පෙන්වා ඇත: 1) කර්මාන්තයේ ඇලීම හා නිරතවීම 2) කතාවට ඇලීම හා කතාවේ නිරතවීම 3) නින්දට ඇලීම හා නිරතුරුව නිදාගැනීම. එම කරුණු නොමැති සේඛ භික්ෂුව පරිහානියට පත්නොවේ. **මූලාශ්‍ර:**අංගු.නි: (6 ): 10 නිපාත: 102.1.5 පරිහාන සූත්‍රය, පි.212, EAN:10: 55.5 Decline, p.515.

▼**පිරිහෙන හා නොපිරිහෙන** පුද්ගලයන්ගේ ස්වභාවය මෙහි විස්තරාත්මකව පෙන්වා ඇත.: **මූලාශ්‍රය:** බු.නි: සුත්තනිපාත:උරගවග්ග:- 6 පරාභව සූත්‍රය, පි.50.

▲ **පර්යාප්ති බහුල පුද්ගලයා-** Pariyapti bahula pudgala: පර්යාප්ති බහුල පුද්ගලයා ලෙසින් මෙහිදී පෙන්වා ඇත්තේ සූත්‍ර ආදීවූ නවඅංග සසුනේ ධර්මතා -ධර්ම පරියාපත්තිය ඉගෙන, එයම මුල්කර - පරියාපත්තියබහුල කරගෙන දවස ගෙවන, සමාධිය නො වඩන මහණය. එවැනි අය ධම්ම විහාරි නොවේ. **බලන්න:** ධම්ම විහාරි.

**මූලාශ්‍ර:** අංගු.නි: (3): 5 නිපාත: අනාගතභය වග්ග: 5.2.3.3 හා 5.2.3.4 සූත්‍ර, පි.160.

▲**පර්යේෂණ:** පාලි: එසනා -searches: පර්යේෂණ (පරියේසනා) යනු සෙවීමය. ලෝක සත්ත්වයෝ කම්සැප සොයායයි. නුවණ ඇති පුද්ගලයා දුකින් මිදීම පිණිස ආධ්‍යාත්මික මගක් සොයා යයි. අප බෝසතුන් ද ලෝකයේ පවතින දුක් දොම්නස්දැක ඉන් මිදීම පිණිස මගක් සොයාගියබව සූත්‍රදේශනා වල පෙන්වා ඇත. **බලන්න**: ම.නි: ආරියපර්යේෂණ සූත්‍රය, ආරිය හා අනාරිය පර්යේෂණ.

▼**පර්යේෂණ 3 කි:** බුදුන්වහන්සේ සෙවීම් 3 ක් පෙන්වා ඇත: 1) කාමෙසනා- කම්සැප සෙවීම 2) භවෙසනා- භව සෙවීම 3) බ්‍රහ්මචරියෙසනා (බඹසර සෙවීම: මිථ්‍යාදිට්ඨියඇතිව හෝ සම්මා දිට්ඨිය ඇතිව). මේ සෙවීම පිලිබඳ සත්‍ය අවබෝධය ලබාගැනීමට (අසත්‍ය බැහැර කිරීමට) අරියඅටමග ආකාර 3 ට වැඩිය යුතුවේ: i) ...මහණ තෙමේ විවේකය...විරාගය...නිරෝධය සහිත, විමුක්තියට නැඹුරුවූ සම්මා

දිට්ඨිය වඩයි... සම්මා සංකප්ප (ආදී අංග 8 ඇතුළත්) ...අරිය මග වඩයි. ii) ...මහණතෙමේ රාගය... දෝසය ...මෝහය ...දුරුකිරීම කෙළවර කොට ඇති අරිය අටමග වඩයි. iii) ...මහණතෙමේ නිවනට නැමුණු ...නිවනට යොමුවූ...නිවන කෙළවර කර ඇති අරියඅටමග වඩයි. **සටහන:** සෙවීම අවසන්වීම, සැක නැතිවීමය, ආසව ක්‍ෂය කිරීමය, නිවන ලැබීමය. **මූලාශ්‍ර:** සංයු.නි: (5-1) මග්ගසංයුත්ත: එසසානා වග්ග, පි. 150, ESN: 45: Maggasamyutta: XIV:Searches: Direct Knowledge , p. 1705, ඛු.නි: ඉතිවුත්තක: 3.1.5 හා 3.1.6 එෂණා සූත්‍ර, පි. 409.

▼ **ආරිය පරියෙසන හා අනාරිය පරියෙසන**
මේ සූත්‍රයේ ආරිය පරියේසන 4 ක් හා අනාරිය පරියේසන 4 ක් පෙන්වා ඇත: **අනාරිය පරියේසන**: මෙලොව කෙනක්හට, ජරාව ඇත, මරණයඇත, ලෙඩදුක් ඇත (ව්‍යාධි), කෙළෙස් ඇත. ඔහු ඒ කරුණුම සොයා යයි. 2) **ආරිය පරියේසන:** මෙලොව කෙනක්හට, ජරාව ඇත, මරණයඇත, ලෙඩදුක් ඇත (ව්‍යාධි), කෙළෙස් ඇත. එහෙත්, ඔහු ඒවා නොසයා, ඒවායේ ආදීනව දැක, ඉන් ගැලවීම වූ අනුත්තර යොගක්ෂේමය (බැඳීම් වලින් නිදහස්වීම) වූ නිවන සොයා යයි. **මූලාශ්‍ර**:අංගු.නි: (2 ): 4 නිපාත: 4.6.2 පරියෙසනා සූත්‍රය, පි.496, EAN:4: 255.2 Quests, p.231.

▲ **පර්යයයෙහි ඥානය-**Paryehinana: මෙය ආධ්‍යාත්මික වර්ධනය පිණිස උපදවාගතයුතු ඥානයන්ගෙන් එකකි. **බලන්න**:උත්පාදයිතව්‍ය ධර්ම.

▲ **පරාක්‍රමධාතුව-** the element of exertion: පරාක්‍රමධාතුව- පරාක්‍රම විරිය, දැඩි විරිය ලෙසින්ද දක්වා ඇත. යම්කිසි කටයුත්තක් ආරම්භකරගත් පසු එම කටයුත්ත, සියලු බාධක මග හැර අවසන් කරගැනීමට ගන්නා උත්සාහය, පරාක්‍රමධාතුවය. **බලන්න**: වීරිය.

▲ **පරාත්ථකාමී-** Unselfishness: අන්‍යයන් ගැන ද තමන් ලෙසින්ම සැලකීම පරාත්ථකාමිබවය, මෙය කුසලයකි. **බලන්න:** ආත්මාර්ථකාමී.

▲ **පරාමට්ඨ සීලය-**Paramattasila

විවිධ ශීලයන්ගෙන් එකකි, තණ්හාව හෝ දිට්ඨිය ක් ඇතිව සමාදන්වන සීලයක්ය. **බලන්න**: ශීලය.

▲**පාර-**Para: ධර්මයට අනුව 'පාර' යනු නිවන හඳුන්වන පදයකි- සසර පරතෙරය (පාරඞගමය), නිවනය. **බලන්න**: නිවන **සටහන්**: විස්තර පිණිස **බලන්න**: * සංයු.නි: (4) සළායතනවග්ග: අසංඛතසංයුත්ත:9.2 :පාර සූත්‍ර. ** සංයු.නි: (5-1) මහාවග්ග: මග්ගසංයුත්ත:3 පටිපත්තිවග්ග:1.4.4 පාරඞගම සූත්‍රය, පි.66.

▲ **පාරායන ධර්ම පරියාය-**Parayana Dhammapariyaya: මගධයේ, පාසාණක චෙතියේ වැඩවසන සමයේ බුදුන් වහන්සේ හමුවට පැමිණි බාවාරි බ්‍රාහ්මණගේ 16ක්වූ ශිෂ්‍ය පිරිසට, නිවන් මග පෙන්වා දෙමින් වදාළ දේශනා පාරයන ධර්ම පරියාය ලෙසින් පෙන්වා ඇත. එම ධර්ම කරුණු, නිර්වාන පාර වෙතට යොමු කරන හෙයින්, ඒ ධර්ම පරියාය 'පාරායන' ලෙසින් හඳුන්වා ඇත. උතුම් ආරිය මග වඩා අපාර සංඛ්‍යාත සසරින් පරතෙරට පැමිණීමේ මග (පාරගමනය) නිසා 'පාරායන' වේ. **මූලාශ්‍රය**: ඛු.නි.සුත්තනිපාත: පාරායනවග්ග:පි,326-366.

▲**පාරමී-**Parami: බුද්ධත්වය පතන බෝසත්වරු විසින් සම්පූර්ණ කරගන්නා උතුම් ප්‍රතිපත්ති පාරමිවේ - පාරමිතා. මේවා 10කි- දස පාරමිතා :1)දාන - generosity, 2) ශීල-virtue 3) නෙක්ඛම්ම-renunciation 4) ප්‍රඥා - wisdom 5) වීරිය- energy 6) ඛන්ති-forbearance/patience 7) සච්ච - truthfulness 8) අදිට්ඨාන-determination 9) මෙත්තා- goodwill/loving kindness 10) උපේක්ඛා - equanimity. **සටහන්:** * "පාරමීනම් කවරයත්: තණ්හා මාන දිට්ඨී විසින් අනුපහතවූ කරුණා උපාය කුසලඥාන දෙකින් පරිගෘහිතවූ දානාදී ගුණයෝ පාරමී නම් වේ. එබඳු ගුණ ඇති මහාබෝසත්හු 'පරම' යායි කියනු ලැබේ, ඒ පරමයන්ගේ ක්‍රියාව හෝ පරමයන්ගේ භාවය යනාදී අරුතින් 'පාරමී' යයි කියනු ලැබේ. **බලන්න**: බු.නි: චරියාපිටකය-සංඥාපනය: පි.18. ** බු.නි: චරියා පිටකය: එම පාරමිතා 10 පිළිබඳව විස්තරාත්මකව දක්වා ඇත.

▲ **පාරිචරියා අනුත්තර** - unsurpassed service: බුදුන් හා බුද්ධ ශ්‍රාවකයන්හට සේවය කිරීම පාරිචරියා අනුත්තරය, අති උතුම් සේවයය, සෙසු සේවයන්ට වඩා අග්‍රය. **බලන්න**: අනුත්තර ධර්මතා.

▲ **පාරිභෝග චෛත්‍යය** -Pariboga chetiya: පාරිභෝග චෛත්‍යය ලෙසින් පෙන්වා ඇත්තේ, බුදුන් වහන්සේ පරිහරණය කල දේය: බෝධිරුක, පාත්‍රය, සිවුර ආදියය. **බලන්න**: චෛත්‍යය.

▲ **පාරිමතිරය-** near shore: පාරිමතිරය ලෙසින් පෙන්වා ඇත්තේ සසරය, මිථ්‍යාමගය, මෙතෙරය. **බලන්න**:එතෙර මෙතෙර, ඔරිමතීරය හා පාරිමතීරය.

▲**පාරිලෙය්‍යක වනය**- Parileiyaka forest: මේ වනය කොසඹෑනුවර අවට පිහිටි වනයකි. බුදුන් වහන්සේ කොසඹෑනුවර, ඝෝෂිතාරාමයෙහි වැඩසිටින අවස්ථාවේ සංඝයා අතර පැවති අසමගිය සන්සුන් කිරීමට නොහැකිව, හුදකලාවම, පාරිලෙය්‍යක (පාරිලෙයිය) වනයට වැඩම කිරීම මේ සූත්‍රයේ පෙන්වා ඇත. **බලන්න:** සංයු.නි: (3): ඛන්ධසංයුත්ත: ඛජ්ජනියවග්ග:1.2.3.9 පාරිලෙය්‍යක සූත්‍රය,පි.188. **සටහන:** එහි, මහාසල්ගසක් මුල වැඩවාසය කළ බුදුන් වහන්සේට, ඒ වනයේ එකලාව හැසිරෙන ඇතෙක් ( පරිලේයිය ඇතා) පැන් ආදිය ගෙනදීමෙන් සත්කාර කලබව මෙහි විස්තර කර ඇත. **බලන්න:** වින:පි.මහාවග්ග 2: කොසම්බඛන්ධ:28, පි.370, බු.නි: උදානපාලිය: 4.5 නාගසූත්‍රය: මේ සූත්‍රයේදී බුදුන් වහන්සේ, තමන්වහන්සේ නාග ලෙසින් හඳුන්වා ඇත.

▲**පරුෂාවාචා:** පාලි: ඵරුසාවාචා-Harsh speech: පරුෂ වචන- අනුන්ගේ සිත් රිදවන, සැර වචන කතා කිරීම ය. දස අකුසලයන්ගෙන් එකකි. **බුදුන් වහන්සේ** පරුෂවචන කතා කරන කෙනෙකුගේ ස්වභාවය මෙසේ දක්වා ඇත: මේ ලෝකයේ කෙනෙක් පරුෂවචන කතා කරයි. රළු, කටුක, අනුන්ගේ සිත්රිදවන, අනුන්ට දොස්කියන වචන තරහින් කතාකරයි. එසේ තරහ ඇතිව කතා කිරීම සිතේ සමාධියට හිතකර පිණිස නොවේ. එසේ ඔහු පරුස වචන කථාකරයි. **"ඉධ භික්ඛවෙ එකච්චො ඵරුසාවාචො හොති, යා සා වාචා අණ්ඩකා කක්කසා පරකටුකා පරාභිසජ්ජනී කොධසාමන්තා අසමාධිසංවත්තනිකා තථාරූපිං වාචං භාසිතා හොති"** එවැනි අය ඒකාන්තයෙන්ම නිරයට යයි. **සටහන**:පරුෂවාචා නිසා කර්ම

සිව්ආකාරයකට රැස්වේ: 1) තමන් පරුෂ වචන කීම 2) අනුන්ලවා පරුෂ වචන කියවීම 3) පරුෂ වචන කීම අනුමත කිරීම 4) පරුෂ වචන කීම වර්ණනා කිරීම. **බලන්න**: අං.ගු:නි: (2) 4 නිපාත: කම්මපථවග්ග: 4.7.6 පරුෂවාචා සූත්‍රය. **මූලාශ්‍ර**: අං.ගු.නි: (6): 10 නිපාත: කරජකාය වග්ග: 10.5.1.1. පඨම නිරය සූත්‍රය, පි. 548, ජානුසොණි වගග: 10.4.2.10: **චුන්ද සූත්‍රය,** පි.508,EAN:10: The Deed-born body: 211.1 Hell, p. 556, Jāṇussoṇī: 176.10: Cunda, p.553.

▼ **වෙනත් මූලාශ්‍ර: 1. 'ඵරුසාවාචා** නම් අන්‍යයන්ට රළුබස් පහළ කරන චේතනාවෝය. මෙයට ඔමසවාදය, සැඩබස, නිට්ඨුරවාක්‍යය යයිද කියයි. අංග 3 කි: අක්‍රෝෂ කටයුතු කෙනෙක් වීම, ක්‍රෝධයෙන් යුත් සිත, අක්‍රෝෂ කිරීම': **සද්ධර්ම කෝෂය,** පි. 114.

▲ **පිරිත් සජ්ජායනා-** Pirith chanting: සංසයා වැඩමවා, සෙත් ශාන්තිය, ආරක්ෂාව ලැබීම පිණිස, පිරිත් සජ්ජායනා කිරීම, ආසියානු බෞද්ධයන් තුල ඇති චාරිත්‍රයකි. ආරක්ෂාව පිණිස, රෝගාදී පීඩාවලින් සහනයක් ලැබීම පිණිස පිරිත් දේශනා කිරීම සුදුසුය යයි බුදුන් වහන්සේ පෙන්වා ඇත.

▼**ලෙඩ දුක් වලින් සහනය ලැබීමට පිරිත් සජ්ජායනා: දස සංඥා සජ්ජායනා කිරීම:** දස සංඥා පිලිබඳ දහම් කරුණු ශ්‍රවණය කිරීමෙන් රෝග ආබධ සංසිඳේ යයි බුදුන් වහන්සේ පෙන්වා ඇත. **බලන්න**: දස සංඥා. **සටහන්: *** දසසංඥා ශ්‍රවණය කිරීමෙන්, ගිරිමානන්ද තෙරුන් සුවපත්බවට පැමිණියේය. ** In Theravāda Buddhist countries this sutta has achieved the status of a *paritta*, a 'protective discourse', which bhikkhus often recite to people afflicted with illness. **බලන්න**: EAN: note:2074, p 680 . **මූලාශ්‍ර**:අං.ගු.නි: (6 ):10 නිපාත:සචිත්ත වග්ග: 10.2.1.10. ගිරිමානන්ද සූත්‍රය, පි.222, EAN:10: 60.10. Girimananda, p. 516.

▼**සප්ත බොජ්ඣංග සිහිපත්** කිරීම මගින් කායික සුවය ඇතිවේ යයි බුදුන් වහන්සේ පෙන්වා ඇත. **සටහන**: බුදුන් වහන්සේ, මහා කාශ්‍යප හා මහා මුගලන් තෙරුන් ගේ කායික ආබධ සංසිඳවීම පිණිස සප්ත බොජ්ඣංග ධර්ම දේශනා කර වදාළහ**.** බුදුන් වහන්සේ, කායික ආබධයකින් පෙලෙන සමයේදී මහා චුන්ද තෙරුන් ලවා බොජ්ඣංග ධර්ම සජ්ජායනා කරගත්හ. බොජ්ඣංග ධර්මතා ශ්‍රවණය කිරීමෙන්, බුදුන් වහන්සේගේ, මහා කාශ්‍යප හා මහා මුගලන් තෙරුන් ගේ කායික ආබධ සංසිඳුන බව පෙන්වා ඇත. **මූලාශ්‍ර**: සංයු.නි: ( 5-1): මහාවග්ග: බොජ්ඣංග සංයුත්ත: ගිලාන වග්ග: 2.2.4 , 2.2.5 හා 2.2.6 ගිලාන සූත්‍ර, පි. 192- 193, ESN: Bojjanghasamyutta: 14.4. Ill 1-3 p. 1747.

▼**අමනුෂ්‍ය බලවේග, වසංගත රෝග දුරු කිරීම** පිණිස ත්‍රිවිධ රත්නයේ ගුණ සජ්ජායනය කිරීම මගින් ඒ උවදුරු දුරුවී යන බව බුදුන් වහන්සේ වදාළහ. **සටහන:** විසාලා මහා නුවර පැවති අමනුෂ්‍ය බලවේග, වසංගත රෝග දුරු කිරීමට, තෙරුවන් ගුණ සජ්ජායන කරන්නයයි, බුදුන් වහන්සේ ආනන්ද තෙරුන්ට උපදෙස් වදාළහ. **මූලාශ්‍ර:** ඛු.නි:ඛුද්දකපාඨ: 6 රතන සූත්‍රය, පි. 35.

▼**ආරක්ෂාව පිණිස**: යම් භයක් තැතිගැනීමක් ඇතිවූවිට ත්‍රිවිධ රත්නය සිහිකිරීම (ගුණ සජ්ජායනා කිරීම) යහපත ගෙනෙදෙන බව බුදුන් වහන්සේ පෙන්වා ඇත. **සටහන්**: ** සර්ප ආදීන්ගෙන් ආරක්ෂා වීම පිණිස **ඛන්ධ පිරිත** සජ්ජායනා කරයි. ** බියක් තැතිගැනීමක් පහ කරගැනීමට ධජග්ග පිරිත දේශනා කරයි. **මූලාශ්‍ර**: සංයු.නි: (1 ):සක්කසංයුත්ත: 11.1.3 ධජග්ග සූත්‍රය, පි. 413, ESN: Sakkasamyutta: 3.3 The Crest of the Standard, p. 461.

▲ **පිරිස**- assembly: පිරිස-පරිස- පර්ෂදය -පිරිස්මුළුව ලෙසින් පෙන්වා ඇත්තේ මිනිසුන් ගේ එකතුවීමක් හෝ සමුහවීමක්ය. ලක්ෂණ අනුව බුදුන් වහන්සේ විවිධ පිරිස් කාණ්ඩ පෙන්වා ඇත: 1) **අනුවණ පිරිස** (නොගැඹුරු- උත්තානාව පරිසා-shallow): සිත කලබලසහිතය, මානය අධිකය, අහංකාරය, වාචාලය, සිහිනුවණ අවුල්ය, සිත චංචලය, ඉඳුරන් අසංවරය, සම්පජානය,සමාධිය නැත. 2) **නුවණැති පිරිස (**ගැඹුරු-ගම්භිර පරිසා- deep):සිත ශාන්තය, මානය නැත, නිරහංකාරය, වාචාල කතා නැත, සිහිනුවණ, සම්පජානය ඇත, ඉඳුරන් සංවරය, සමාධිය ඇත. මේ පිරිස ප්‍රමුඛය. 3) **භේදකරන පිරිස**-වග්ගාව පරිසා- divided): අන්‍යයන් භේද කරයි, සණ්ඩු, ආරවුල් ඇති කරයි 4) **එකමුකරණ පිරිස**: සමගි සම්පන්නය- කිරි හා දියමෙන් ගැලපි සිටි 5) **පහත් පිරිස**-අනග්ගවතිව පරිසා-inferior: පහත් ගති ඇත. සිව්පසේ ඇලුන, ධර්මය පිළිනොපදින සංඝයාද මේ ගණයට වැටේ 6) **උසස්-අග්‍ර පිරිස:** උසස් ගුණ ඇත. මාර්ගය යහපත් ලෙසින් වඩන සංඝයාද මේ ගණයට වැටේ 7) **ආරිය පිරිස** (උතුම්-noble): ආරිය ශ්‍රාවකයන්-චතුසත්‍ය අවබෝධය ඇත (සෝතාපන්න-අරහත්) 8) **අනාරිය පිරිස** (ignoble):ධර්මය නොදත්-චතුසත්‍ය නොදත් පිරිස 9) **කසළ පිරිස (**පරිසකසටොව - dregs of scums):අගතිමගට යන අය 10) **නිකසළ පිරිස**(පරිස මණ්ඩොව- cream of, best):නිවැරදි දහම් මග යන පිරිස 11) **අවිනීත** පිරිස- නොමනා හැසිරීම ඇත, ධර්මය ඇසීමට උනන්දුව නැත 12) **විනීතපිරිස**:යහපත් හැසිරීම ඇත. ධර්මය ඇසීමට, ප්‍රශ්ණ විමසීමට උනන්දුය 13) **ආමිස පිරිස**: ආමිසයට ලැදි (සිව්පස) ධර්මයට නොලැදි පිරිස 14) **සදහම් ගරුකරන පිරිස-නිරාමිස**: ආමිසය ගරු නොකරයි, ධර්මය ගරුකරයි 15**) විෂම පිරිස (**unrighteous) :ධර්මයට විනයට අනුකූලව කටයුතු නොකරයි 16) **සමපිරිස**(righteous): ධර්මයට විනයට අනුකූලව කටයුතු කරයි 17) **ධාර්මික පිරිස**:සද්ධර්මය පිළිපදින, ගරුකරන අය 18) **අධාර්මික පිරිස**:සද්ධර්මය පිළිනොපදින, ගරුනොකරන අය 19) **ධර්මවාදී පිරිස**:ධර්මයට විනයට අනුකූලව කටයුතු කරයි 20) **අධර්මවාදී පිරිස**:ධර්මයට විනයට අනුකූලව කටයුතු නොකරයි. **සටහන**: අංගු.නි: (5) 8 නිපාත:8.2.7.9. පරිස සූත්‍රයේදී බුදුන් වහන්සේ අට පිරිසකට දහම් දේශනා කරනබව පෙන්වා ඇත: ඛත්තිය-කැත්, බ්‍රාහ්මණ, ගහපති, සමණ, චාතුර්මහාරාජික දේව පිරිස, තාවතිංස දේවපිරිස, මාරපිරිස හා බ්‍රහ්මදේව පිරිස. **බලන්න**: අටපිරිස. **මූලාශ්‍ර:** අංගු.නි: (1 ):2 නිපාත: පරිසවග්ග, පි. 174-184, EAN: 2: Assemblies, p. 63-65.

▼**පිරිස් තුන**: 1) උක්කාචිතවිනීත පරිස (දුර්විනීත පිරිස-assembly trained in vain talk) .2) පටිපුච්ඡාවිනීතා පරිස (සුවිනීත පිරිස-assembly trained in interrogation). 3) යාවතාවවිනීතා පාරිස (ප්‍රමාණවත් සේ විනීත පිරිස-assembly trained to the limits). **මූලාශ්‍ර**: අංගු.නි: (1) 3

නිපාත:යෝධාජීවවග්ග: 3.3.4.2. සූත්‍රය, පි.552, EAN:3:134.2 Assemblies, p.138.

▲**පිරිසිදුබව**- Purity: ආධ්‍යාත්මික ජිවිතයේ පිරිසිදුබව ලෙසින් පෙන්වා ඇත්තේ යහපත් ලෙසින් බඹසර ගතකිරීමය. **බලන්න**: නැම.

▲ **පිරිසිදු පරිපුර්ණ ආධ්‍යාත්මික ජීවිතය**: පාලි: **පරිපුණ්ණං පරිසුද්ධං බ්‍රහ්මචරියං චරිතුන්ති -** complete & pure spiritual life: පිරිසිදු පරිපූර්ණ ආධ්‍යාත්මික ජීවිතය ලෙසින් පෙන්වා ඇත්තේ, යහපත් බ්‍රහ්මචරියාවය. පිරිසිදු බඹසර ඇති භික්ෂුවකගේ ගුණ බුදුන් වහන්සේ මෙසේ පෙන්වා ඇත: 1) **ඉන්ද්‍රිය සංවරය තිබීම** 2) **භෝජනයෙහි මාත්‍රවීම** 3) **ජාගාරානු සතිය තිබීම** 4) **සතිසම්ප්‍රජනාය තිබීම**. **සටහන**: බුදුන් වහන්සේ මේ සූත්‍රය දේශනා කර ඇත්තේ නන්ද තෙරුන් ගේ ආධ්‍යාත්මික ජීවිතය පෙන්වාදීම පිණිසය. **මූලාශ්‍ර**:අංගු.නි: (5 ): 8 නිපාත: 8.1.1.9. නන්ද සූත්‍රය, පි. 54, EAN:8: 9.9 Nanda, p. 414.

▲**පුරාණ උපාසක**- Lay follower Purana:**බලන්න**: උපග්‍රන්ථය:3

▲ **පුරාණකස්සප**- Pūraṇa Kassapa: බුදුන්වහන්සේ වැඩසිටි සමයේ විසූ අන්‍යආගමික ගුරුවරයෙකි. ඔහුගේ ඉගැන්වීම, අකිරියවාදය ( doctrine of non-doing) හා අහේතුක වාදයය (doctrine of non-causality) . **බලන්න:** EAN: Note: 1378, p. 648. **සටහන:** ඔහු දේශනා කල පුද්ගල පන්ති 6 පිලිබඳ විස්තර පිණිස **බලන්න**: ඡළාභිජාති.

▲ **පුරාණ ශාස්තෘ -ආචාර්යවරු-**Teachers of ancient: බුදුන් වහන්සේ, යම් යම් අවස්ථාවන්හිදී, පුරාණ දඹදිව වාසය කළ උතුම් ආධ්‍යාත්මික ගුරුවරු ගැන විස්තර දක්වා ඇත. * **අරක ශාස්තෘ:** යහපත් ලෙසින් ආධ්‍යාත්මික ජීවිතය ගෙනගිය උතුම් ගුරුවරයෙකි. **බලන්න:** අරක ශාස්තෘ. ** **සුනෙත්ත ශාස්තෘ (**Sunetta**), මූගපක්ඛ ශාස්තෘ (**Mūgapakkha**), අරණෙමි ශාස්තෘ** (Aranemi),**කුද්දාලක ශාස්තෘ**(Kuddālaka), **හත්ථිපාල ශාස්තෘ**(Hatthipāla)**, ජෝතිපාල ශාස්තෘ**(Jotipāla) - මෙතුමන්හට බොහෝ ශිෂ්‍යපිරිසවූහ. ඔවුන්, බ්‍රහ්මලෝකයේ උපත ලබාගැනීම පිණිස තම ශිෂ්‍යයන්ට උපදෙස් දුන්හ. එතුමන් කෙරේ විශ්වාසී බව ඇතිකරගත් සිසුන් සුගතියේ යළි උපත ලැබූහ, විශ්වාසී බව ඇතිනොකරගත් අය දුගතියට පත්වූහ. **මූලාශ්‍ර:** අංගු.නි: (4) : 6 නිපාත:ධම්මිකවග්ග: 6.1.5.12 ධම්මික සූත්‍රය,පි.160, EAN:6: 54.12 Dhammika, p.343.

▲**පුරාණ මග**-Ancient road: පෙර බුදුවරු වැඩි මග-පුරාණ මග - පැරණිමග ලෙසින් පෙන්වා ඇත්තේ ආරිය අට මගය. **බලන්න**: දිඝ.නි:මහාපදාන සූත්‍රය, සංයු.නි:නිදානවග්ග:අභිසමයසංයුත්ත 7: 1,7,5 නගර සූත්‍රය, ආරිය අටමග.

▲**පුර්ව නිමිත්ත**-Purvanimitta: පුර්ව නිමිත්ත (පෙර නිමිත්ත) යනු යම්කිසි සිදුවීමකට පෙර ඇතිවන ලක්ෂණයන්ය. **බලන්න**: පුබ්බංගම

▲ **පූර්ව නිවාස සිහිකිරීමේ නුවණ:**පාලි: **පුබ්බෙනිවාසානුස්සතිඤාණං-** Recollection of past abodes (pubbe-nivāsāussati): පූර්ව නිවාසය සිහිකිරීම -පෙරවිසූ කඳ පිළිවෙත දන්නා නුවණ- පෙර ජාති දන්නා නුවණ

- ත්‍රිවිධ ඥාණ යන්ගෙන් එකකි, සය අභිඥාවන්ගෙන් එකකි. **බලන්න**: ත්‍රිවිධ ඥාණ. **සටහන්**: * විස්තර පිණිස බලන්න: පටිසම්භිදා 1: ඥානකතා: 53. පූර්වනිවාසානුසමෘති ඥානය, පි. 236. ** සතර සතිපට්ඨානය යහපත් ලෙසින් වර්ධනය කරගැනීමෙන්, පූර්ව නිවාස සිහිකිරීමේ නුවණ ලබාගත හැකිවේ. **බලන්න**: සංයු.නි:අනුරුද්ධ සංයුත්ත:8.2.12 පුබ්බේනිවාස සූත්‍රය. **ශබ්දකෝෂ: පා.සිං.ශ:** පි. 391: "**පුබ්බේනිවාසඤාණ:** පෙරවිසූ ස්කන්ධ පටි පාටිය දැනගන්නා නුවණ, අසවල් ජාතියෙහි මෙසේ උපන්නෙමි, එහිදී මෙසේ සැප දුක ආයුස වින්දෙමි, මෙපමණ කාලයක් ජීවත්විමි යනාදී පිළිවෙත දැන ගන්නා ඥාණය". **B.D:** p. 144: "**Pubbe-nivāsāussati:** Remembrance of former births is one of the Higher Powers (abhiññā) & factor of Threefold Knowledge (tevijjā)".

▼**පෙරවිසූ කඳ පිළිවෙත** දන්නා නුවණ ,ආධ්‍යාත්මික වර්ධනය පිණිස සච්ඡිකාතබ්බ - සාක්ෂාත් කර ගත යුතු ධර්මතාවයකි.
**මූලාශ්‍ර:** දීඝ.නි : (3) 11 දසුත්තර සූත්‍රය, පි. 483, EDN: 34: Dasuttara Sutta: Expanding Decades, p. 384.

▼**බුදුන් වහන්සේ මෙසේ වදාළහ: "** මහණෙනි, මම යම් තාක් කැමති වේ නම්, ඒ තාක් පෙර විසූ කඳ පිළිවෙල සිහි කරමි...එක් ජාතියක්...දෙකක්... නොයෙක් වැනසෙන...නොයක් වැඩෙන කප්..." (Bhikkhus, to whatever extent I wish, I recollect my manifold past abodes, that is, one birth, two births,... three births... many aeons of world-contraction, many aeons of world-expansion...) **මූලාශ්‍ර:** සංයු.නි: ( 2 ): නිදානවග්ග: කස්සපසංයුත්ත: 4.1.9 ජාන අභිඥා සූත්‍රය, පි. 342, ESN: 16: Kassapasamyutta: 9 Jhānas and Direct Knowledges, p. 817.

▼ **මහාපදාන සූත්‍රයේදී,** බුදුන් වහන්සේ, සංඝයාට පෙර විසූ කඳ පිළිවෙත ගැන දහම් කතා වදාළහ. **සටහන**: විපස්සි බුදුන් සිට කාශ්‍යප බුදුන් දක්වා පෙර වැඩසිට-අතීත කාලයේ බුදුවරු පිලිබඳ විස්තර මේ දහම් කතාවට ඇතුලත්වේ. **මූලාශ්‍ර**: දීඝ.නි: ( 2): 1: මහාපදාන සූත්‍රය, පි. 18, EDN: 14 Mahâpadāna Sutta: The Great Discourse on the Lineage, p. 151.

▼ **කාශ්‍යප බුදුන් සමයේ** විසූ ගවේසී නම් උපාසක, තමාගේ 500ක් පමණ මිතුරන් ධර්ම මාර්ගයට පමුණුවා, පසුව ඔවුන් හා පැවිදිව, අරහත්වයට පත්වීම පිලිබඳ පෙර ජාතියක සිද්ධිය බුදුන් වහන්සේ, ආනන්ද තෙරුන්හට වදාළබව මේ සූත්‍රයේ පෙන්වා ඇත. **මූලාශ්‍ර:** අංගු.නි: (3 ): 5 නිපාත: 5.4.3.10 ගවේසි සූත්‍රය, පි. 370, EAN:5: 180.10 Gavesī, p. 296.

▼ **වෙනත් මූලාශ්‍ර:**
**1**. "පූර්ව නිවාසය සිහිකිරීම -පුබ්බේනිවාසානුස්සති නුවණය- පෙර ජාතීන්හි කාම, රූප, අරූප භවයන්හි පැවති ස්කන්ධ පරම්පරාව සිහි කිරීමට සමත් ස්මෘතිය ය. **සිංහල විශුද්ධිමාර්ගය:** 13 පරිච්ඡේදය**:** පි. 599**.**
▲**පුරිස ඉන්ද්‍රිය** -Masculinity: මෙය ඉන්ද්‍රිය 22න් එක් ඉන්ද්‍රියකි. **බලන්න**:ඉන්ද්‍රිය.

▲ **පුරිසඉන්ද්‍රිය ඥානය-** knowledge of a person's faculties : මෙය තථාගතයන් සතු උතුම් නුවණක්ය: අන්‍යන්ගේ කුසල හෝ අකුසල තත්වයන් පිලිබඳ අවබෝධයය. **සටහන**: මේ සූත්‍රයේ, එම නුවණ විස්තරාත්මකව පෙන්වා ඇත. **බලන්න**: තථාගත බල. **මූලාශ්‍ර:** අං.ගු.නි: (4): 6 නිපාත: 6.2.1.8 පුරිසඉන්ද්‍රිය ඥාන සූත්‍රය, පි.210, EAN:6: 62.8 Knowledge, p. 353.

▲**පුරිස ධර්මතා-** Purisa Dharmatha: පුරිස ධර්මතා ලෙසින් පෙන්වා ඇත්තේ පුද්ගලයෙක්ගේ සිත් සතන්හි පහළවන කරුණුය. මේවා හිතකර හෝ අහිතකරවේ. සිත් සතන්හි පහළවන අහිතකර ධර්මතා නිසා සිත අසහනයට පත්වේ, දුක පිණිස පවතී යයි බුදුන් වහන්සේ පෙන්වා ඇත. මේවා ඇතිවීමට හේතු නම් අකුසල මුල්ය: ලෝභය, ද්වේශය, මෝහය. උණ ආදී බට ගස්, ඒවායේ හටගන්නා ඵලය නිසා විනාශවී යන ලෙසින්, සිතේ ඇතිවන අහිතකර දේ, කෙනකුගේ විනාශයට හේතුවේ. **බලන්න**:උපග්‍රන්ථය:5, :සංයු.නි: (1) සගාථවග්ග:කෝසලසංයුත්ත:3.1.9 පුරිස සූත්‍රය.

▲**පුරිස බන්ධන**-Purisa bandana: කාන්තාවක් විසින්, පුරුෂයෙක් වසඟයට ගැනීම පුරිස බන්ධනයවේ. **බලන්න**: බන්ධන

▲**පුරිස ලක්ෂණ**-Purisa lakshana: අයහපත් ලක්ෂණ 5 ක් ඇති පුරුෂයා, කාන්තාවට ප්‍රිය නොවේ: 1) රූමත් නොවීම 2) භෝගසම්පත් නැතිකම 3) නොසිල්වත් වීම 4) අලසබව 5) ප්‍රජාව- දරු සම්පත් නොලැබීම. එහෙත්, එම අවගුණ නොමැතිනම්, ඔහු කාන්තාවට මනාප වේ. **බලන්න:**සංයු.නි:මතුගාමසංයුත්ත:3.1.2 **පුරිස සූත්‍රය**.

▲ **පුරුෂ රූපය**-Form of a man

පුරුෂයකුගේ රූපය නිසා ස්ත්‍රිය වසඟයට පත්වේ, එනිසා සිතේ කෙළෙස් හටගනී. **බලන්න**: චිත්ත පරිදාය.

▲**ප්‍රාර්ථනා-** Wishes: ප්‍රාර්ථනා ලෙසින් පෙන්වා ඇත්තේ යම් දෙයක් ලබාගැනීමට සිතේ ඇති අදහසය. ධර්මානුකූලව ජීවත්වන පුද්ගලයෙකුට, ප්‍රාර්ථනා කර, යළි උපත සුගතියක ලබාගැනීමට හැකිබව බුදුන් වහන්සේ පෙන්වා ඇත.

▼ **යළි උපත සුගතියක ලබාගැනීමට ප්‍රාර්ථනා කිරීම**: කෙනෙක් ශ්‍රද්ධාව, ශිලය, බහුශ්‍රැතබව, ත්‍යාගසිලිබව, ප්‍රඥාවන්ත යන ගුණ යන්ගෙන් සමන්විත නම් ඔහුට තමා කැමති පරිදි මිනිස්ලෝකයේ හෝ දේවලෝකයක යළි උපත ලබාගැනීමට සිත පිහිටුවා ගත හැකිබව මේ සූත්‍රයේ පෙන්වා ඇත. **සටහන**: අටුවාවට අනුව එම ගුණයන් ඇති එහෙත් ප්‍රාර්ථනා නොකරන කෙනක් හෝ එලෙස ප්‍රාර්ථනා කරන එහෙත් ගුණ නොමැති කෙනෙකුට, නිශ්චිත මතු භවය නොමැත- One who has either the five qualities without the aspiration, or the aspiration without the qualities, does not have a fixed destination.**බලන්න:** MN:note: 1133, p.1166. **මූලාශ්‍ර:** ම.නි: (3): 3.2.10 සංඛාරඋත්පත්ති සූත්‍රය, පි. 272,EMN:120, Reappearance by Aspiration, p.882.

▼**නිවන ලබාගැනීමට ප්‍රාර්ථනා කිරීම**: කරුණු 5ක් සමන්විත භික්ෂුව ආසව ක්ෂයකර නිවන ලබා ගැනීම ප්‍රාර්ථනා කරයි: 1) ශ්‍රද්ධාවඇති 2)

අල්පආබාධ ඇති 3) අවංකවබව ඇති 4) වීරිය ඇති 5) ප්‍රඥාව ඇති. තමාගේ එම ගුණ සිහිකර නිවන ලබාගැනීමට පතයි. **සටහන**: දෙවෙනි සූත්‍රයේදී තවත් කරුණු 5 ක් ඇති භික්ෂුව ආසව ක්ෂයකර නිවන ලබා ගැනීම ප්‍රාර්ථනා කරන බව පෙන්වා ඇත: 1) ශීල්වත්බව ඇති 2) බහුශ්‍රැත 3) සතරසති පට්ඨානයට අනුව සතිය පිහිටුවා ගෙන ඇති 4) වීරිය ඇති 5) ප්‍රඥාව ඇති. **මූලාශ්‍ර:**අංගු:නි: (3):5 නිපාත: 5.3.4.5 හා 5.3.4.6 ප්‍රාර්ථනා සූත්‍ර, පි.270, EAN:5: 135.5. & 136.6 Suttas, p.280.

▲**පෙරජීවිත**-Former lives: පෙර ජීවිත යනු වර්තමාන ජීවිතයට පෙර, භවයන්හි පැවති ජීවිතයන්ය. සූත්‍ර දේශනාවන්හි, පෙර ජීවිත පිළිබඳ විස්තර පෙන්වා ඇත. පෙර ජීවිත දැකීමේ නුවණ - පූර්වනිවාස සිහිකිරීමේ නුවණ, ත්‍රිවිධ ඥානයන්ගෙන් එකකි. බුදුන් වහන්සේගේ පෙරජීවිත පිලිබඳ විස්තර ජාතක කථාවල දක්වා ඇත. **බලන්න**: බු.නි: ජාතක පාලි1 හා 2. **සටහන්**: * ම.නි: සටිකාර සූත්‍රයේ, බුදුන් වහන්සේගේ පෙර ජීවිතයකදී - කාශ්‍යප බුදුන් සමයේ, ජෝතිපාල බ්‍රහ්මණ ලෙසින් ජීවත්වූ බව පෙන්වා ඇත. **බලන්න**: බුදුන් වහන්සේ. ** සංයු.නි: (2) නිදානවග්ග: අනමතග්ගසංයුත්තයේ දී, තණ්හා ආදී කෙළෙස් නිසා, සත්‍වයෝ, අප්‍රමාණ පෙර ජීවිත ලබාසිටි බව විස්තර කරඇත.

▲ **පෙරවිසූ කඳ පිළිවෙත දැකීමේ නුවණ-** Recollection of past lives **බලන්න**: පූර්වනිවාස සිහිකිරීමේ නුවණ.

▲ **පෙර බුදුවරු-** Former Buddhas: ගෝතම බුදුන්වහන්සේට පෙර වැඩසිටි බුදුවරු පිලිබඳ විස්තර පිණිස **බලන්න**: සංයු.නි: (2) නිදානවග්ග: අභිසමයසංයුත්ත, බු.නි: බුද්ධවංශ.

▲ **පැරදීම**-Defeat

පැරදීම- පරාජය, දුක් වේදනා ඇතිකරන බව බුදුන් වහන්සේ වදාළහ. **බලන්න**: සංග්‍රාම, ජයගැනීම හා පැරදීම.

▲ **පැරණිකම්ම**-Earlier Kamma: පැරණිකම්ම- පුරාණ කර්ම ලෙසින් පෙන්වා ඇත්තේ වර්තමාන ජීවිතයට පෙර කරනලද චේතනාය. **බලන්න**:කම්ම.

▲ **පැරණි චාරිත්‍ර-** Ancient traditions: බුදුන් වහන්සේ වැඩසිටි සමයේ, සමාජයේ පැරණි චාරිත්‍ර- පුරාණ සම්ප්‍රදායන් පැවති බව සූත්‍ර දේශනාවල දක්වා ඇත. **සටහන්:** 1) මළවුන් සිහිකිරීමේ චාරිත්‍රය. **බලන්න**: ආරියධෝවනය හා ආනාරියධෝවනය. 2) බමුණු කුලයේ පැරණි ව්‍රතයක් වූ පච්චොරොහණි උත්සවය. **බලන්න:** පච්චොරොහණි. 3) ගිනිදෙවියා පිදීම. **බලන්න**: ගිනිදෙවියා. 4) යාගහෝම පූජා පැවැත්වීම. **බලන්න**: යාගහෝම. 5) පජ්ජාභූමි බ්‍රාහමණයන් කලුරිය කල පිරිස සුගතියට යැවීම. **බලන්න**: සුගතිය. 6) ජල ස්නානය මගින් පව්සේදීම . බලන්න: පව් සේදීම.

**පල**

▲ **පලගන්ඩතෙර-**Palaganda Thera: බලන්න**:** උපග්‍රන්ථය:1

▲**පලෝ්ක ධර්ම**-Palaoka Dhamma: පලෝ්ක යනු බිඳෙනසුළු ස්වභාවයය. පලෝ්ක ධර්ම ලෙසින් බුදුන් වහන්සේ පෙන්වා ඇත්තේ සළායතන හා ඒවා අල්ලා ගන්නා බාහිර අරමුණු ආදිය නිසා ඇතිවෙන ත්‍රිවිධ වේදනාවන්ටය. **බලන්න:** ලෝකය. **මූලාශ්‍ර**:සං.යු.නි: (4) වේදනාසංයුත්ත:9:1.9.1 පලෝ්කධම්ම සූත්‍රය, පි.146, ESN:35: Salayatanasamyutta:IV: Channa: 84.1 Subject to disintehration,p.1248.

▲ **පාලකයෙක්ගේ ගුණ**-Qualities of a leader: පාලකයෙක්-නායකයෙක් තුළ තිබිය යුතු යහපත් ගුණ 5 ක් මෙහි පෙන්වා ඇත: 1) දෙමාපියන්ට ආදර ගෞරව සහිතව සැලකීම. එසේකිරිම නිසා දෙමාපියන් ඔහුගේ හිත සුව පිණිස ආශිර්වාද කරති 2) තමාගේ බිරිය, දරුවන්, සේවක ආදීන්ට ආදර ගෞරව සහිතව සැලකීම. එසේකිරිම නිසා ඔවුන්, ඔහුගේ හිත සුව පිණිස ආශිර්වාද කරති . 3) තමා ගේ අසල්වැසි ගෙවතු හිමියන්ට හා සමග එක්ව වෙළඳ ගනුදෙනු ආදී කරන පිරිසට, ආදර ගෞරව සහිතව සැලකීම. එසේකිරිම නිසා ඔවුන්, ඔහුගේ හිත සුව පිණිස ආශිර්වාද කරති 4) තමාගේ පවිලේ ආරක්ෂක දෙවියන්හට, ආදර ගෞරව සහිතව සැලකීම. එසේකිරිම නිසා දෙවියෝ, ඔහුගේ හිත සුව පිණිස ආශිර්වාද කරති 5) උතුම්වූ ශ්‍රමණ බ්‍රාහ්මණයන්හට ආදර ගෞරව සහිතව සැලකීම. එසේකිරිම නිසා ඒ උතුමෝ ඔහුගේ හිත සුව පිණිස ආශිර්වාද කරති. එලෙස ආශීර්වාද ලබන ඔහු පාලකයෙක් ලෙසින් දියණුවට පත්වේ. **සටහන**: මේ සූත්‍රය දේශනා කර ඇත්තේ විසාලාවේ, මහානාම ලිච්ඡවි වජ්ජි රජුටය. **මූලාශ්‍රය**:අංගු.නි: (3): 5 නිපාත: නීවරණවග්ග: 5.2.1.8 ලිච්ඡවිකුමාර සූත්‍රය, පි.142.

▲ **පිලෝ්තික පරිබ්‍රාජක**-Pilothika Paribrajaka: **බලන්න:** උපග්‍රන්ථය:3

▲ **පාලම් පූජාකිරිම**- Offering bridges
බුදුන් වහන්සේ ඇතුළු සංඝයාගේ පහසු විහරණය තකා පාලම් සැදීම, පූජකිරිම නිසා යහපත් ඵල විපාක ලැබේ: **බලන්න**:ධොතක තෙර.

**පළ**

▲ **පළතුරු පූජා-** Offering fruits: ආරියභවතුන්ට පළතුරු ආදිය පූජාකිරීමෙන් යහපත් විපාක ඇතිවේ: **බලන්න**: ලකුණ්ටකභද්දිය තෙර.

▲ **පළමු අරහත් සංඝ-** The first Arahants**:** බුදුන් වහන්සේගෙන් පසු අරහත්වය ලැබුවේ පස්වග මහණුන් බව අනත්ත ලක්ඛණ සූත්‍රයේ දක්වා ඇත. **බලන්න:**පස්වග මහණුන්.

▲**පළමු ශ්‍රමණ -**The first ascetic: පළමු ශ්‍රමණ ලෙසින් පෙන්වා ඇත්තේ සෝතාපන්න ආරිය ශ්‍රාවකයාය. ඔහු දැකිය හැක්කේ බුදුසසුනේ පමණක්ය. **බලන්න:** ආරියඅටමග.

▲ **පළාසය:** පාලි: **පළාසො**-insolence: පළාසය -අනාදරබව-ගරුනැතිබව- යුගග්‍රාහය- අහංකාරබව ලෙසින්ද පෙන්වා ඇත. මෙය සිත කෙළෙසන අකුසලයකි, දුගතිය ඇති කරයි .**බලන්න:** උප කෙළෙස.

▼ **වෙනත් මූලාශ්‍ර**: **1.** Per Bhikkhu Bodhi: Insolence is presumption (yugaggāha) arising when one puts oneself at the same level as others who have superior qualities. See: EMN note 87, p. 1179 **2.**

"තමාට වඩා ගුණයෙන් උසස් අය හා තමා සමකොට ගන්නා ස්වභාවය පලාස වේ. මෙය එක් ආකාරයක මානයකි" **කෙලෙස් එක්දහස් පන්සියය,** පි. 83, රේරුකානේ චන්දවිමල මහානාහිමි, 2008. **3.** "පලාස යනු තමන් ගුණ හීනව සිටිමින්ම ගුණවතුන් හා සමාන කොට සළකා ගැනීම"**දිනමිණ**: අන්තර්ජාල ලිපිය: http://archives.dinamina.lk/2012/08/08/_art.asp?fn=a1208082.

▲ **පැළලුප් නුවර-**Palalup Nuwara: **බලන්න**: පාටලීපුත්‍ර නුවර

▲ **පුළවක සංඥාව-** perception of a worm-infested corpse: කයේ අසුභය පෙන්වන සංඥා 10 න් එකකි (අසුභ භාවනාවකි) : පණුවන් වැසුන මළකඳක් අරමුණුකොට වඩන භාවනාවය. විදසුන් නුවණ වඩාගැනීමට මගකි. සතිපට්ඨාන සූත්‍රයේ පුළවක සංඥා භාවනාව විස්තරාත්මකව පෙන්වා ඇත. **විස්තර පිණිස බලන්න**: භාවනාව, සංඥා, සංයු.නි: (5-1) මහාවග්ග: බොජ්ඣංගසංයුත්ත: පුළවක සූත්‍ර.

▲**පොළඟා වැනි පුද්ගලයෝ-** Persons like a poison snake: පොළඟා වැනි විසකුරු සර්පයන්ට සමාන ගති ඇති මිනිසුන් සිටිති. **බලන්න**: ආසිවිෂෝපම පුද්ගලයෝ.

▲**පොළව-**Earth: පොළොව, පෘතුවිය ලෙසින්ද පෙන්වා ඇත. **බලන්න:** පඨවි.

▲ **පිළිකුල්භාවනාව-**Meditation on repulsiveness of the body: කයේ අශුභය බලමින් සිදුකරන මේ භාවනාව, කාමරාග කෙරහි කළකිරීමට උපකාරිවේ. **බලන්න:** අසුභනිමිත්ත: භාවනා.

▲ **පිළින්දවච්ඡතෙර-**Pilindavachcha Thera: **බලන්න:** උපග්‍රන්ථය:1

▲**පිළිවෙල කතාව -**Piliwelakathawa: බුදුන් වහන්සේ ලෝකයාට ධර්මය දේශනා කරණ පිළිවෙල මින් අදහස් කෙරේ. **බලන්න**: අනුපූර්ව කථා.

▲ **පිළිකා රෝගය-** Cancer: කයේ ආදීනව බලමින් කරන භාවනාවේ, කයට ඇති පිඩාවක් ලෙසින් මෙ රෝගයද දක්වා ඇත. **බලන්න:** ගිරිමානන්ද සූත්‍රය.

▲ **පිළිසිඹියා-**Analytical knowledge: දහම විභාග කිරිමේ නුවණය. **බලන්න:** පටිසම්භිදා.

**පව**

▲ **පව්ටු දිට්ඨි-**Unwholesome views**:** ලාමක දිට්ඨි ලෙසින්ද පෙන්වා ඇත. දහමට එරෙහිව ඇති මත ආදිය නිසා අකුසල් ඇතිවේ. අරිට්ඨ භික්ෂුවට ඇතිවූ පව්ටු දිට්ඨිය බැහැර කරගැනීමට නොහැකිව ඔහු සසුනෙන් බැහැරවිය. **බලන්න**: දිට්ඨි, අරිට්ඨ භික්ෂුව.

▲**පවිත්‍රබව:** පාලි: **සොචෙය්‍ය-** purity (soceyyañ): ධර්මයේ පවිත්‍රබව (ශුචි) පිරිසිදුබව ලෙසින් පෙන්වා ඇත්තේ අකුසල නොමැති යහපත්-පිරිසිදු සිතක් ඇතිබවය. මෙත්තා සහගත සිත, ව්‍යාපාදය නැති නිසා පවිත්‍රය.

▼ **කාය, වාක් හා මනෝ** දුශ්චරිත දුරුකර -ත්‍රිවිධ දුශ්චරිතය, කාය, වාක් හා මනෝ සුචරිතය - ත්‍රිවිධ සුචරිතය ඇති කර ගැනීමෙන් කෙනෙක් පවිත්‍ර බවට පත්වේ. **බලන්න:** පටිසංඛාන බල. **මූලාශ්‍ර:** අංගු.නි: (1 ):2 නිපාත: 2.1.2.1 සූත්‍රය, පි.142. EAN: 2: Sutta 1.1, p. 57

▼**බුදුන් වහන්සේ** පවිත්‍රබව පිළිබඳව යහපත් ලෙසින් වදාරා ඇත. ඒ ධර්මතා සංඝයා එක්ව, ධර්මයේ චිරස්ථිතිය පිණිස සජ්ජායනා කිරීම සුදුසු ය යි සැරියුත් මහා තෙරුන් සංඝයාට උපදෙස් දී ඇත. **මූලාශ්‍ර:** දිඝ.නි: (3):10 සංගිති සූත්‍රය, පි. 372 , EDN: 33 Saṅgīti Sutta: The Chanting Together, p. 362.

▲ **පවිවිවේකය**: පාලි: **පවිවිවේකං** - Solitude: පවිවිවේකය- හුදකලා විවේකය ඇතිව වාසය කිරීම ධර්ම පුහුණුව ලබන භික්ෂුව සතු ගුණයකි. පවිවිවේක 3 කි: 1) භික්ෂුව අශීලය බැහැර කර ශීලසම්පන්න ව පවිවිවේකය ඇතිව සිටීම 2) භික්ෂුව මිථ්‍යාදිට්ඨිය බැහැර කර සම්මාදිට්ඨියේ පිහිටා පවිවිවේකය ඇතිව සිටීම 3) භික්ෂුව ආසව බැහැර කර නිරාසව පවිවිවේකය ඇතිව සිටීම. එවැනි භික්ෂුව අග්‍රය, ධර්මයේ හරය ලබා පවිත්‍රව වාසය කරන්නේය යයි බුදුන් වහන්සේ පෙන්වා ඇත. **සටහන**: විවේකය යනු කෙළෙස් නොමැතිව සිටීමය. **මූලාශ්‍ර**: අංගු.නි: ( 1 ): 3 නිපාත: ලොණවග්ග: 3.2.5.2 සූත්‍රය, පි. 466, EAN: 3: Lump of Salt: 93.2 Solitude, p. 125.

▼**පවිවෙකයේ** ඇලීසිටීම, හුදකලා වාසයට කැමතිවීම පවිවෙකාරාමයය. කායචිත්ත උපධි විවේකයෙහි ඇති ඇල්ම. **බලන්න**: සුඛ සෝමනස්ස.

▲**පාවචන**-Pavachana: පාවචන යනු ප්‍රධානවූ උතුම් වචනයය.

“ බුදුරජානන් වහන්සේ විසින් අර්ථයට යෝග්‍ය පදයෙන් පදයට යෝග්‍ය ව්‍යංජනයෙන් ශ්‍රෝත්‍ර යෙන්, ජනයාට යථාඅවබෝධය වන පරිදි සිතින් සිතා දේශනා කරණ ලද පර්යාප්ති නම්වූ පාලිධර්මය එයින් ප්‍රකාශවේ. එය දේශනා විෂය වූ ධර්මනිරුක්තියයි. එයින් ත්‍රිවිධ ශාසනයම ප්‍රකාශවේ. එය ශාස්තෘන් වහන්සේ ගේ ධර්මවචනය යන අර්ථයෙන් සත්ථුපාවචන (ගුරු වචන) යයිද දත යුතුය. එලෙස පාවචනය යනු ධර්ම වචනයවේ”. **මූලාශ්‍රය:** වින.පි: මහාවග්ග පාළි **1.** ප්‍රස්තාවනාව, පි 20.

▲**පවාරණ-** Pavāraṇā: වස්ස ( rains residence) අවසානයේදී සංඝයා සිදුකරන චාරිත්‍රය (කඨින පිංකම) පවාරණ ලෙසින් පෙන්වා ඇත. එම අවස්ථාවේදී, සංඝයා, තමන්ගේ ජේෂ්ඨත්වය අනුව, තමන් අතින් සිදුවූ යම්කිසි වැරදි ක්‍රියා ඇත්නම් ඒවා ගැන පෙන්වා දීමට සෙසු සංඝයාට ආරාධනා කිරීම මෙහිදී සිදුවේ. **බලන්න:** ESN:note:513,p.567, වස්කාලය **සටහන**: * විස්තර පිණිස බලන්න:වින.පි:මහාවග්ග1: **4 පවාරණඛන්ධක,** පි. 394. ** මේ සූත්‍රයේ බුදුන් වහන්සේ, පවාරණ අවස්ථාවේදී, තමන් වහන්සේ ගේ යම්කිසි කායික වාචික ක්‍රියා පිලිබඳ ගැරහීමක් ඇත්ද යයි පැවසීමට සංඝයාට ඇරයුම් කර ඇත. **මූලාශ්‍ර:** සංයු.නි: (1): සගාථවග්ග: වන්ගිසසංයුත්ත:8.1.8 පවාරණ සූත්‍රය, පි. 366, ESN:8: Vangisasamyutta: 7 Pavāraṇā,p.403.

▲**පාවානුවර-** Pava Nuwara: පාවානුවර මල්ල දේශයේ පිහිටි නගරයකි. බුදුන් වහන්සේ පාවා නුවර අජකලාපක චෛත්‍යය අසල වැඩසිටීම හා

එහිදී අජකලාපක යක්ෂයා බුදුන් වහන්සේට භය ඇතිකිරීමට ගත් උත්සාහය නිෂ්ඵලවීම පිලිබඳ සිද්ධිය මේ සූත්‍රයේ විස්තර කර ඇත. **බලන්න**: බු.නි:උදානපාලිය:1.7 පාවා සූත්‍රය. **සටහන:** පරිනිබ්බාන සූත්‍රයේ දී, බුදුන් වහන්සේ පාවානුවර, චුන්දගේ අඹඋයනේ වැඩසිටීම, අවසාන භෝජනය වැළඳීම හා අන්‍යආගමික නායකයෙක්වූ නිගණ්ඨනාථ පුත්‍ර, ඒ නුවරදී මරණයට පත්වීම විස්තර කර ඇත.

▲**පව්ක්‍රියා-** dreadful actions: පව්ක්‍රියා-පව ලෙසින් පෙන්වා ඇත්තේ අයහපත්, පාපී-අකුසල ක්‍රියාය-අපුණ්‍ය ක්‍රියාය. තුන්දොරින් පව්ක්‍රියා කිරීම නිසා මෙලොව හා පරලොව අයහපත් කම්ම විපාක විඳීමට සිදුවේ. **බලන්න**: කම්ම, පුණ්‍ය: සියලු බුදුවරුන්ගේ අනුසාසනය වන්නේ: සියලු පව්-පාපීක්‍රියා නොකලයුතුය, කුසලය වඩා ගත යුතුය.“සබ්බපාපස්ස අකරනං- කුසලස්සඋපසම්පදා...” **බලන්න**: බු.නි: ධම්මපද: බුද්ධවග්ග: ගාථාව:183.

▲ **පව් සේදීම-**Purification of unwholesome: බුදුන් වහන්සේ වැඩසිටි සමයේ අන්‍යආගමික බමුණෝ, තමන්ගේ පව්, ජාල ස්නානය මගින් සේදී යයි (water-purification) යන මතය දැරූහ (පැරණි චාරිත්‍රයකි) . එම ව්‍රතය පිළිගත් සංගාරාව බ්‍රාහමණ (2) හට බුදුන් වහන්සේ මෙසේ වදාළහ: **“ධම්මො රහදො ධම්මො සීලතිත්‍ථො- අනාවිලෝ සබ්භි සතං පසත්‍ථො- යත්‍ථ හවෙ වෙදගුනො සිනාතා- අනලලගත්‍තා’ව පාරනත්‍ති”.** ධර්මය, ශීලය නමැති නානතොටුව ඇති විලකි, පහන්වූ උතුම් සත්පුරුෂයන් පසසන ජලාශයකි. ධර්මයේ පරතෙරට ගිය අරියෝ (වෙදගු), යම් තැනක ස්නානය කළාහුද, ඔවුන් නොතෙත් සිරුර ඇතිවම නිවන නමැති පරතෙරට ඒකාන්තයෙන්ම පැමිණේ”.

(The Dhamma, brahmin, is a lake with fords of virtue—A limpid lake the good praise to the good—Where the knowledge-masters go to bathe,And, dry-limbed, cross to the far shore). **බලන්න:** විල උපමාව: උපග්‍රන්ථය:5 එම දේශනාව අවබෝධ කරගත් සංගාරාව බමුණා, බුදුන් සරණ ගිය උපාසකයෙක් විය. **මූලාශ්‍ර:**සංයු.නි: (1) සගාථවග්ග: බ්‍රාහ්මණසංයුත්ත: 7.2.11 සංගාරාව සූත්‍රය, පි.352, ESN:7: Brahmanasamyutta: 21.11. Saṅgārava, p.388.

▲ **පැවිද්ද සත් අවුරුදු වියේ-**Becoming a monk in the age of seven: බුදුන් වහන්සේ වැඩ සිටි සමයේ නුවණැති දරුවන් සත්අවුරුදු වයසේ දී මහණව අරහත්වය ලැබූහ.**බලන්න**: කුමාරකාශ්‍යප තෙර,රාහුල තෙර,සෝපාක තෙර, සීවලී තෙර:උපග්‍රන්ථය:1

▲ **පවුල් හා ආශ්‍රය-** Association with families: සංඝයා පවුල්- කුලයන් සමග කරණ ආශ්‍රයේදී, නොඇලී- කය හා සිත ඉවතට ගෙන, ආගන්තුකයෙක් මෙන්, ගැටීම් රහිතව කටයුතු කල යුතුය යි බුදුන් වහන්සේ පෙන්වා ඇත: “යම්සේ සඳ, කිසිවක් කෙරේ නොඇලෙමින් අහසට නගින ලෙසින් ද ,ගරාවැටුන ලිඳක් හෝ කඳු බෑවුමක් ලඟදි කෙනෙක්, කය හා සිත ඉවත්කොට ඒ දෙස බලන ලෙසින්ද කටයුතු කලයුතුය. යම්සේ, දික් කරන ලද අත අහසේ නො ඇලේ, නො බැඳේ. එලෙසින්, පවුල් අතරට වඩින මහා කාශ්‍යප තෙරුන් ගේ සිත ඒ කුලයන්හි නොබැඳේ:    ‘ලැබීමට කැමති අයට ලැබේවා ! පිං කැමති

අයට පිං ලැබේවා' යයි ඔහු නො සිතයි. ඔහු තමාට ලද දෙයින් සතුටුවේ, අන්‍යන්ට ලද දෙයින් සතුටුවේ, එබඳු සංඝයා, පවුල් වෙත යාමට වටින්නේය'' යයි බුදුන් වහන්සේ වදාළහ. **බලන්න**: තික භෝජනය. **මූලාශ්‍ර**:සං.යු.නි: (2): නිදානවග්ග: කස්සප සංයුත්ත: 4.1.3 චන්දූපම සූත්‍රය, පි. 324, ESN: 16: Kassapasamyutta: 3 Like the Moon, p. 809.

▲**පැවිද්ද**-Going forth: පැවිද්ද -පැවිදිවීම ලෙසින් පෙන්වා ඇත්තේ, ගිහිගෙය හැර, බුදුසසුනට ඇතුළුවීමය, ශ්‍රමණ ජීවිතය ගෙනයාමය. **බලන්න**: පබ්බජා

▼**බුදුන් වහන්සේ** පැවිද්ද පිළිබඳව ඉසිදත්ත හා පුරාණ උපාසකයන්ට * ඥාති සොහොයුරන්) මෙසේ වදාළහ: **" ගිහිගෙය පලිබෝධ සාහිතය ,කෙලෙස් නමැති දූවිලි ඇති වෙන තැනකි. පැවිද්ද- පබ්බජා එළිමහනකි (විවෘතය). එහෙයින් ඔබ, අප්‍රමාදව වාසය කිරීම සුදුසුය**''.**මූලාශ්‍ර**: සං.යු.නි: (5-2 ): මහාවග්ග: සොතාපත්ති සංයුත්ත:11.1.6 ඵපති සූත්‍රය, පි. 170,ESN:55:Sothapatthisamyutta:6.6. Chamberlains, p. 2189.

▼**පැවිදිකිරීමට සුදුසු නොවන අය**: පංච ආබාධ**:** කුෂ්ඨ, ගණ්ඩ, කිලාස, ක්ෂය, අපස්මාර ආබාධ ඇති පුද්ගලයන් පැවිදි කිරීමට නුසුදුසු අයවේ. එසේම රාජභටයන්, වයස අවුරුදු 15ට අඩු දරුවන්, මාපියන් විසින් අනුග්‍රහය නොදුන් අය පැවිදි නොකළයුතුවේ. **මූලාශ්‍ර:** වින.පි:මහාවග්ග පාලිය 1: පිටු: 258,262,270,284.

▼ **පැවිදිජීවිතයේදී** ඇතිවිය හැකි භය 4 ක් නිසා නැවත ගිහිබවට පත්වීම ගැන මෙහි දක්වා ඇත. **බලන්න**: බිය

▼ **වෙනත් මූලාශ්‍ර**: 1. ''පැවිදිවන අවස්ථාවේ-පබ්බජා තමන්ගේ ගුරුවරයා ගෙන් මෙසේ පැවිද්ද ලබාගැනීමට ආයාචනා කරයි: **''සබ්බ දුක්ඛනිස්සරණ නිබ්බානසච්ඡිකරණත්ථාය ඉමං කාසවං ගහෙත්වා පබ්බාජෙථ මං භන්තෙ අනුකම්පං උපාදය...''**. සියලු සසර දුකින් නික්මීම පිණිස, නිවන ප්‍රත්‍යක්ෂ කරගැනීම සඳහා අනුකම්පාවෙන්, පැවිදි කර වදාරනු මැනවි. **බලන්න**: අබිනික්මන: කටුකුරුන්දේ ඤාණනන්ද භික්ෂු: පහන්කනුව ධර්ම දේශනා, පි.6.

▲ **පැවිදි සුඛ** -Pavidi sukha: පැවිදි සුඛ ලෙසින් පෙන්වා ඇත්තේ ගිහිගෙයින් නික්මීම හේතුකොට සංඝයා ලබන ආධ්‍යාත්මික සුවයය. මෙය ගිහි සුඛයට වඩා අග්‍රය. **බලන්න**: සුඛය.

**පස**

▲**පසන්න චිත්ත-** Pleasant mind: පසන්න චිත්ත-පැහැදුන සිත ලෙසින් පෙන්වා ඇත්තේ තරහ දුරුකරගත් සිතය. එවැනි සිතක් ඇති පුද්ගලයා මරණින් මතු සුගතියේ උපත ලබයි. **මූලාශ්‍ර:**ඛු.නි:ඉතිවුත්තක:1.3.1 පසන්න චිත්ත සූත්‍රය, පි.366.

▲ **පංසුකූලික-**wearers of rag-robes: ඉවතදමා ඇති, පරණ වස්ත්‍රවලින් සකසා ගත් සිවුරු දරන සංඝයා පංසුකූලිකයන් (පහුල් සිවුරු දරන්නෝ) සේ දක්වා ඇත. ඔවුන් ධුතාංග පුහුණුවේ යෙදී සිටින භික්ෂූන්ය. **බලන්න**:අං.ගු.නි: 5 නිපාත: ආරඤ්ඤකවග්ග: 5.4.4.2 පංසුකූලික සූත්‍රය, පි.378.

▲ **පස් ඉන්ද්‍රිය-**Five faculties: පස් ඉන්ද්‍රිය ලෙසින් පෙන්වා ඇත්තේ: සුඛඉන්ද්‍රිය, දුක ඉන්ද්‍රිය, දෝමනස්ස ඉන්ද්‍රිය, සෝමනස්ස ඉන්ද්‍රිය හා උපේක්ඛා ඉන්ද්‍රියය**. බලන්න**: ඉන්ද්‍රිය. **මූලාශ්‍ර**: සංයු.නි: (5-1): මහාවග්ග: ඉන්ද්‍රිය සංයුත්ත: 4.4.1 - 4.4.3 සූත්‍ර, පි. 398, ESN:48: Indriyasamyutta: 31.1 -33.3 suttas, p. 1959.

▲**පස්ගෝරස**-Five milks: පස්ගෝරස යනු කිරි ආහාර පහක්ය. කිරි, දීකිරි, මෝරු, වෙඬරු, ගිතෙල්. බුදුන් වහන්සේ පස්ගොරස බෙහෙත් ආහාරයක් ලෙසින් වැළඳීමට සංඝයාට අනුදුන්හ.**මූලාශ්‍ර**:වින.පි: මහාවග්ග පාලි2: 6 භේසජ්ජඛන්ධකය,38, පි.104.

▲ **පස්කම් ගුණ** -five code of sensual pleasures: පස්කම් ගුණ යනු පංච කාම ගුණයන්ය. **බලන්න**: පංච කාම ගුණ.

▲ **පස්කම්සැප-** five sensual pleasures: සාමාන්‍ය ලෝකයා පස් ඉඳුරන් (ඇස,කණ, නාසය දිව හා කය) මගින් අල්ලා ගන්නා අරමුණු නිසා ලබන ආස්වාදය, පස්කම් සැප ලෙසින් පෙන්වා ඇත. පස්කම් සැප නිසා ඔවුන් කාමලෝකයට- සසරට බැඳී සිටී. **බලන්න**: පංච කාම ගුණ, සිව්ආහාර, ගණිකාව, ධම්ම සැපය, කාමය.**සටහන්:** සංයු.නි: (5-1) මග්ගසංයුත්ත:උත්තිය සූත්‍රයේ දී පස්කම් සැප විස්තරාත්මකව පෙන්වා ඇත. ** පස්කම් සැපයට ඇති ඇල්ම නැතිකිරීමේ මග, ආරියඅටමගය.**බලන්න**: ආරියඅටමග.

▲ **පස්බිඳ -**  bit of soil

මේ උපමාව මගින් බුදුන් වහන්සේ පෙන්වා ඇත්තේ, තමන් වහන්සේගේ නිය අග ඇති පස්බිඳ, මහා පොළොව හා සසඳන කළ ඉතා ස්වල්ප බවත්, එලෙස, මධ්‍යම ජනපදයෙහි මිනිස්බව ලබා උපන් ප්‍රමාණය සුළු බව පෙන්විමටය. එහෙත්, අප්‍රසිද්ධ, දනව්වල ඉපදෙන මිනිසුන් ප්‍රමාණය මහාපොළොව මෙන් මහත්ය. එය හේතුව ඔවුන් චතුසත්‍ය නොදුටු නිසා බව මෙහි දක්වා ඇත.**බලන්න**: උපග්‍රන්ථය:5. **සටහන**: මධ්‍යම ජනපදය, බුදුවරු උපත ලබන, ධර්මය දේශනා කරන ප්‍රදෙශයය. **මූලාශ්‍රය:** සංයු.නි: (5-2): මහාවග්ග: සච්චසංයුත්ත: 12.7.2. පච්චන්ත සූත්‍රය, පි. 356.

▲ **පස්බිය**- Five fears: 1 ආජීවකබිය (ජීවිතවෘත්තිය පිළිබඳ), 2 ගැරහුම් ලැබීමේ බිය (අසිලෝකභිය), 3 පිරිස්මැද පසුබැමේ බිය (පරිස්සාරජ්ජභය), 4 මරණභිය 5 දුගතිබිය (අපායභය). **සටහන**: සංග්‍රහවත්ථු බල ඇති පුද්ගලයා මේ පස්බිය ඉක්මවා ඇත. **බලන්න**: සංග්‍රහ වත්ථුබල.  **මූලාශ්‍රය:** අංගු.නි: (5): 9 නිපාත:සම්බෝධිවග්ග:9.1.1.5 බලසංග්‍රහ වත්ථු සූත්‍රය, පි.408.

▲**පස් ලෞකික බල-**Five material powers: පස් ලෞකික බල ලෙසින් බුදුන් වහන්සේ පෙන්වා ඇත්තේ විවාහක කාන්තාවකට (මාගම) ඇති බල පිලිබඳවය: රූප, භෝග, ඥාති, පුත්‍ර හා සීල බල. ඒ බල පසින් යුත් කාන්තාව විශාරදය, සැමියා මැඩ ගෙන සිටී. එහෙත්, සැමියාහට ඉසුරු බලය ඇත්නම් ඔහු තම බිරිඳ යටත් කොටගෙන සිටී. **බලන්න**: සංයු.නි: මාතුගාමසංයුත්ත: 3 බලවග්ග සූත්‍ර.

▲**පස්වග මහණුන්**- Five ascetic: **බලන්න**: පංචවග්ගියේ භික්ෂු.

▲ **පස්සදිය**: පාලි: **පස්සද්ධා** - tranquility: පස්සදිය (ශාන්තබව) සිත සමාධියට පත් කරගැනීමට උපකාරීවන අංගයක්ය. අකුසල පහවීම නිසා සිත නිවීම පස්සදිය ය. **බලන්න**: ප්‍රීතිය, සුඛය, සමාධිය. **සටහන:** පස්සදිය යනු නිවන හඳුන්වන පදයකි. **බලන්න**:නිවන.

▼ **සිත ප්‍රීතියට පත්වීම** නිසා පස්සදිය ඇතිවේ, සිත සංසුන්වීමෙන් සිත සුඛයටපත්වේ. **"...පීතී ඛො ආනන්ද පස්සද්ධත්ථා පස්සද්ධානිසංසා පස්සද්ධි ඛො ආනන්ද සුඛත්ථා සුඛානිසංසා"**. (The purpose and benefit of joy is tranquility... purpose and benefit of tranquility is pleasure).**මූලාශ්‍ර**: අංගු.නි: (6 ): 11 නිපාතය:නිස්සය වග්ග: 11.1.1.කිමත්ථිය සූත්‍රය හා 11.1.2 න චේතනාය කරණීය සූත්‍රය පි.611-614, EAN:11: Dependence: 1.1 What Purpose & 1-2 Volition p.566.

▲ **පස්සද්ධකායසඞ්ඛාර** (පාලි): **කායක්‍රියා සංසුන්වීම**- tranquilization of bodily activity: පස්සද්ධකායසඞ්ඛාර ලෙසින් පෙන්වා ඇත්තේ සිව්වෙනි ඣානයට පත්වීම නිසා කාය ක්‍රියාවන් සංසුන්බවට පත්වීමය. **බලන්න**: ඣාන, ආරියවාසස්ථාන.

▲ **පසේනදී කෝසල රජ**- King Pasenadi Kosala: **බලන්න**: උපග්‍රන්ථය:3

▲ **පසුතැවිල්ල**- Regret-remorse: ධර්මයට අනුව පසුතැවිල්ල- පශ්චාත්තාපය, යනු යම් පුද්ගලයෙක්, තමන් විසින් කරන ලද අකුසල්, අයහපත් ක්‍රියා ගැන ළතැවීමය- කණගාටුවට පත්වීමය. මෙය නීවරනයකි, අකුසලයකි. පසුතැවිල්ල නිසා ආධ්‍යාත්මික මාර්ගය ඇහිරේ, සමාධි සමාපත්ති ඇති කරගැනීමට හැකිනොවේ. පසුතැවිල්ල නැතිවීමෙන් (අවිප්‍රතිසාරය) සිතේ ඇතිවන ප්‍රමෝදය සිත සමාධි ගතකර ගැනීමට උපකාරිවේ.**බලන්න**: අවිප්‍රතිසාරය, නීවරන, ප්‍රමෝදය. **මූලාශ්‍ර**:අංගු.නි: (6): 11 නිපාතය:නිස්සය වග්ග: 11.1.1.කිමත්ථිය සූත්‍රය හා 11.1.2 න චේතනාය කරණීය සූත්‍රය, පි.611-614, EAN:11: Dependence: 1.1 What Purpose & 1-2 Volition p.566.

▲**පසේබුදු**- Pasebudu: **බලන්න**: පච්චේක බුද්ධ.

▲**පස්වග තවුසන්**-The Five ascetics: **බලන්න**: පස්වග මහණුන්

▲ **පෙස්ස හස්ථාරෝහ පුත්‍ර**-Pessa hastharoha puthta: **බලන්න**: උපග්‍රන්ථය:3

▲ **පොසල මානවක**-Posala Manawaka: **බලන්න**: උපග්‍රන්ථය:3

▲**පොසල මානවක තෙර**-Posala Manawaka Thera: **බලන්න**: උපග්‍රන්ථය:1

▲**ප්‍රසන්න**-pleasantness: සංඝයා ප්‍රසන්න ලෙසින් ගිහියන්ගේ අර්ථය පිලිබඳ කටයුතු කරන්නේ නම්, ඔවුන් කෙරේහි, ප්‍රසන්නබව පලකිරීමට ගිහියන්ට හැකිබව බුදුන් වහන්සේ පෙන්වා ඇත. කරුණු 8 ක් ඇතිව ඔවුන් ප්‍රසන්නව හැසිරේ: 1) ගිහියන්ට අලාභ ඇතිනොකරයි 2) අනර්ථය ඇතිනොකරයි 3) ගිහියන්ට ආක්‍රෝෂ නොකරයි 4) ගිහියන්ට පරිභව නොකරයි 5) ගිහියන් අතර භේද ඇතිනොකරයි 6) බුදුන්වහන්සේ ගැන

ගුණ පවසයි 7) ධර්මය ගැන ගුණ පවසයි 8) සංඝයා ගැන ගුණ පවසයි. **මූලාශ්‍රය:**අං.ගු.නි: (5):8 නිපාත: සතිවග්ග: 8.2.9.8 සූත්‍රය, පි.378.

▲ **ප්‍රසාදය හා අප්‍රසාදය-** Confidence & lack of confidence: ප්‍රසාදය (විශ්වාසිබව): සංඝයා සතු ගුණ 8 ක් ඇතිවිට, ගිහියන් එබඳු උතුමන්ට ගරුකිරීම හා ප්‍රසාදය දැක්වීම කරණ බව මේ සූත්‍රයේ පෙන්වා ඇත. එහෙත්, සංඝයාට අවගුණ 8 ක් ඇත්නම්, උපාසකයන්හට, එබඳු සංඝයා කෙරෙහි අප්‍රසාදය දැක්විය හැකිය, ගරු නොකර සිටිය හැකිය. **මූලාශ්‍ර:** අං.ගු.නි: (5): 8 නිපාත: 8.2.9.8 අප්‍රසාද සූත්‍රය, පි. 378, EAN: 8: 88. 8 Lack of confidence, p. 455.

▲**ප්‍රසන්න**-pleasantness: සංඝයා ප්‍රසන්න ලෙසින් ගිහියන්ගේ අර්ථය පිලිබඳ කටයුතු කරන්නේ නම්, ඔවුන් කෙරේහි, ප්‍රසන්නබව පලකිරීමට ගිහියන්ට හැකිබව බුදුන් වහන්සේ පෙන්වා ඇත. කරුණු 8 ක් ඇතිව ඔවුන් ප්‍රසන්නව හැසිරේ: 1) ගිහියන්ට අලාභ ඇතිනොකරයි 2) අනර්ථය ඇතිනොකරයි 3) ගිහියන්ට ආක්‍රෝෂ නොකරයි 4) ගිහියන්ට පරිභව නොකරයි 5) ගිහියන් අතර භේද ඇතිනොකරයි 6) බුදුන්වහන්සේ ගැන ගුණ පවසයි 7) ධර්මය ගැන ගුණ පවසයි 8) සංඝයා ගැන ගුණ පවසයි. **මූලාශ්‍රය:**අං.ගු.නි: (5):8 නිපාත: සතිවග්ග: 8.2.9.8 සූත්‍රය, පි.378.

▲ **ප්‍රසාදය හා අප්‍රසාදය-** Confidence & lack of confidence: ප්‍රසාදය (විශ්වාසිබව): සංඝයා සතු ගුණ 8 ක් ඇතිවිට, ගිහියන් එබඳු උතුමන්ට ගරුකිරීම හා ප්‍රසාදය දැක්වීම කරණ බව මේ සූත්‍රයේ පෙන්වා ඇත. එහෙත්, සංඝයාට අවගුණ 8 ක් ඇත්නම්, උපාසකයන්හට, එබඳු සංඝයා කෙරෙහි අප්‍රසාදය දැක්විය හැකිය, ගරු නොකර සිටිය හැකිය. **මූලාශ්‍ර:** අං.ගු.නි: (5): 8 නිපාත: 8.2.9.8 අප්‍රසාද සූත්‍රය, පි. 378, EAN: 8: 88. 8 Lack of confidence, p. 455.

▲ **ප්‍රසාදික පුද්ගල**: පාලි: **පාසාදිකෙ**-Inspiring person: ප්‍රසාදික පුද්ගල යනු ධර්ම මාර්ගයේ සතුට, විස්වාශය ඇති පුද්ගලයාය. අන්‍යාන්ටද ඒ පුද්ගලයාගේ චරියාව ගැන ප්‍රසාදයක් ඇතිවේ. **බලන්න**: EAN:note: , p 1222. එවැනි පුද්ගලයෙකුට ආධ්‍යාත්මික වර්ධනයට අනුසස් (benefits ) 10 ක් ලැබේ: 1) තමා කෙරහි උපවාද ඇති නොකර ගැනීමට හැකිවීම 2) ප්‍රඥාවන්තයන්ගේ ප්‍රසාදයට ලක්වීම 3) ඔහු ගැන කීර්තිය පැතිරීම 4) එළඹී සිහිය ඇතිව මරණයට පත්වීම 5) මරණින් මතු සුගතියේ යළි උපත ලැබීම 6) තහවුරු නොවූ විස්වාසය තහවුරු වීම 7) ඇතිවූ විස්වාසය වර්ධනය වීම 8) ආචාර්යවරයාගේ ඉගැන්වීම් අනුගමනය කිරීමට හැකිවීම 9) එබඳු පුද්ගලයන්ගේ යහපත් චරියාව, ඔහුගේ ගෝලයන් අනුගමනය කිරීම 10) සිත ප්‍රසන්නබවට- ශාන්තබවට පත්වීම. **බලන්න**: අප්‍රසාදික පුද්ගල. **මූලාශ්‍ර**: අං.ගු.නි: ( 3): 5 නිපාත: 5.5.2.7 අපාසාදික සූත්‍ර 2 කි, පි.434, EAN:5: 217.7 Not Inspiring confidence -2 suttas, p. 307.

▲**ප්‍රසංශාව-**praise: ගුණ 10ක් තමා තුළ ඇතිකරගෙන ඒවා ගැන සෙසු අයට වර්ණනා කිරීම මගින් ප්‍රසංශාව ඇතිවේ යයි බුදුන් වහන්සේ පෙන්වා ඇත: **බලන්න**: කතාව 1) අල්පේච්ඡතාවය (අප්පිච්ඡතා-few desires) 2) සන්තුෂ්ටිය( සන්තුට්ඨිතා- contentment) 3) විවෙකිබව (පවිවේක- solitude) 4) වෙනත් අය හා නොබැඳීම (අසංසග්ග-not bound

up with others) 5) ආරම්භක වීරිය (විරියාරම්භ-energetic) 6) ශීලය (සීල-virtuous) 7) සමාධිය 8) ප්‍රඥාව 9) විමුක්තිය (විමුත්ති- liberation) 10 විමුක්ති ඥාන දර්ශනය (විමුත්තිඤාණදස්සන- knowledge and vision of liberation). **සටහන:** ප්‍රසංසාව -නින්දාව අටලෝදහමට අයත්වේ. **බලන්න**: අටලෝදහම. **මූලාශ්‍ර**:අංගු.නි: ( 6 ): 10 නිපාත: යමක වග්ග: 10.2.2.10. දුතිය කථාවත්ථු සූත්‍රය, පි.260, EAN: 10: Pairs: 69.9. Topics of Discussion -2, p. 520.

**පශ**

▲**පාශය-** Snare: පාශය ලෙසින් පෙන්වා ඇත්තේ මාරයාගේ බන්ධනයය. බුදුන් වහන්සේ මාර බන්ධනයෙන් මිදීම මෙහිදී පෙන්වා ඇත. **බලන්න:** මාරයා.

"මාර බන්ධනයෙන් මිදුනෙමි, දෙවියන් පිලිබඳ යම් බන්ධන ඇත්ද, මිනිසුන් පිලිබඳ යම් බන්ධනඇත්ද, ඒ සියලු බැඳීම් වලින් මිදුනෙමි..." **මූලාශ්‍ර**: සංයු.නි: (1): මාරසංයුත්ත:පාස සූත්‍ර 2 කි, පි.218, ESN:4: Marasamyutta: Māra's Snare 1 & 2, p.267.

**පශ**

▲**පාශය-** Snare: පාශය ලෙසින් පෙන්වා ඇත්තේ මාරයාගේ බන්ධනයය. බුදුන් වහන්සේ මාර බන්ධනයෙන් මිදීම මෙහිදී පෙන්වා ඇත. **බලන්න:** මාරයා. "මාර බන්ධනයෙන් මිදුනෙමි, දෙවියන් පිලිබඳ යම් බන්ධන ඇත්ද, මිනිසුන් පිලිබඳ යම් බන්ධනඇත්ද, ඒ සියලු බැඳීම් වලින් මිදුනෙමි...". **මූලාශ්‍ර**: සංයු.නි: (1): මාරසංයුත්ත:පාස සූත්‍ර 2 කි, පි.218, ESN:4: Marasamyutta: Māra's Snare 1 & 2, p.267.

▲**පිශුනාවාචා**- speaks divisively: පිශුණාවාචා - කේලාම්කීම- අනුන්බිඳවීම පිණිස කරන කතාවය. දස අකුසලයන්ගෙන් එකකි, දුගතිය ඇතිකරයි . **බලන්න:** කේළාම්කීම. **සටහන**: පිශුනාවාචා නිසා කර්ම සිව්ආකාරයකට රැස්වේ: 1) තමන් කේළාම්කීම 2) අනුන්ලවා කේළාම්කීම කියවීම 3) කේළාම්කීම කීම අනුමත කිරීම 4) කේළාම්කීම වර්ණනා කිරීම. **බලන්න**: අංගු:4 නිපාත: කම්මපථවග්ග: 4.7.5 **පිශුනාවාචා සූත්‍රය.**

▼ **බුදුන් වහන්සේ** කේලාම් කියන කෙනෙකුගේ ස්වභාවය මෙසේ දක්වා ඇත: මේ ලෝකයේ කෙනෙක් කේලාම් කියයි. මෙතැනින් අසා අනිත් තැනට වැරදි කියයි, එතැනින් අසා මෙතැනට ඇවිත් වැරදි කියයි. එලෙස දෙපක්ෂය භේද කිරීම පිණිස කේළාම් කියයි. එසේ සමගි අය භේද කරියි, භේද කිරිමට අනුබල දෙයි. ඔහු එකිනෙකා භේද කරමින් ප්‍රීතියට පත්වේ, සතුටුවේ, භේද කරන වචන කතා කරයි. **"ඉධ භික්ඛවෙ එකච්චො පිසුනාවාචො හොති, ඉතො සුත්වා අමුත්‍ර අක්ඛාතා ඉමෙසං භෙදාය, අමුත්‍ර වා සුත්වා ඉමෙසං අමූසං භෙදාය. ඉති සමග්ගානං වා භෙත්තා, භින්නානං වාඅනුප්පදාතා, වග්ගාරාමො වග්ගරතො වග්ගනන්දී වග්ගකරණිං වාචං භාසිතා හොති"**. එවැනි අය ඒකාන්තයෙන්ම නිරයට යයි. **මූලාශ්‍ර**: අංගු.නි: (6 ): 10 නිපාත: කරජකාය වග්ග: 10.5.1.1. පඨම නිරය සූත්‍රය, පි. 548, ජානුසොණි වගග: 10.4.2.10: චුන්ද සූත්‍රය**,** පි.508,EAN:10:

The Deed-born body: 211.1 Hell, p. 556, Jāṇussoṇī: 176.10: Cunda, p.553.

▼**වෙනත් මූලාශ්‍ර: "පිසුණාවාචා:** අනුන් භේද කරනු කැමැත්තෙන් හෝ තමා කෙරෙහි ප්‍රියබව ඇතිකරගැනීමේ කැමැත්තෙන් හෝ අනුන්ගේ සිත් බිඳීම යන වාක් ප්‍රයෝගය. පෙසුඤ්ඤ, කේලාම්කීම යයිද කියයි. මෙයට අංග 4 කි: අන්‍යයෝ බිඳෙත්වා යන අදහස, මෙයින් ඔහුට ප්‍රියවෙමි යන අදහස, ඊට සුදුසු උත්සාහය, බිඳවීම පිණිස කියන, කරන ප්‍රයෝගය පිළිබඳ දැනීම": **සද්ධර්ම කෝෂය,** පි. 113.

▲ **ප්‍රශ්න ඇසීම**- Asking Questions: කෙනක්, වෙනත් කෙනෙක් ගෙන් ප්‍රශ්න අසන්නේ (පඤ්හාපුච්ඡා )කරුණු 5 ක් නිසා හෝ ඒ කරුණු වලින් එකක් විශේෂ කරගෙන යයි සැරියුත් මහා තෙරුන් වදාළහ: 1) මන්ද බුද්ධිය හෝ අනුවණ කම නිසා 2) පාපික ආසාව නිසා 3) ඒ පුද්ගලයාට පරිභව කිරීමට 4) ඉගෙනගැනීම පිණිස 5) තමා අසන ප්‍රශ්නයට ඔහු නිවැරදිව පිළිතුරු දෙන්නේ නම් මැනව, නො එසේනම්, මම ඔහුට නිවැරදි පිළිතුර කියා දෙන්නෙමි යන අදහස ඇතිව. මෙහිදී, තෙරුන් පෙන්වා දුන්නේ තමන්වහන්සේ ප්‍රශ්නයක් අසන්නේනම් එය කරන්නේ 5 නි කරුණ නිසා බවය. **මූලාශ්‍ර**:අං.ගු.නි: ( 3): 5 නිපාත: 5.4.2.5 පඤ්හාපුච්ඡා සූත්‍රය, පි. 332, EAN: 5: 165.5 Asking Questions, p. 290.

▼**වෙනත් මූලාශ්‍ර: "පිසුණාවාචා:** අනුන් භේද කරනු කැමැත්තෙන් හෝ තමා කෙරෙහි ප්‍රියබව ඇතිකරගැනීමේ කැමැත්තෙන් හෝ අනුන්ගේ සිත් බිඳීම යන වාක් ප්‍රයෝගය. පෙසුඤ්ඤ, කේලාම්කීම යයිද කියයි. මෙයට අංග 4 කි: අන්‍යයෝ බිඳෙත්වා යන අදහස, මෙයින් ඔහුට ප්‍රියවෙමි යන අදහස, ඊට සුදුසු උත්සාහය, බිඳවීම පිණිස කියන, කරන ප්‍රයෝගය පිළිබඳ දැනීම": **සද්ධර්ම කෝෂය,** පි. 113.

▲ **ප්‍රශ්නව්‍යාකරණ**- Dealing with questions: ප්‍රශ්නව්‍යාකරණ- පඤ්හව්‍යාකරණ- ලෙසින් පෙන්වා ඇත්තේ ප්‍රශ්න පිළිබඳ කටයුතු කිරීමේ විදියය. මෙහිදී ක්‍රම 4 ක් පෙන්වා ඇත: 1) ඒකාන්තයෙන්ම විසඳිය යුතු ප්‍රශ්න 2) බෙදා විසඳිය යුතු ප්‍රශ්න 3) ඒ පිළිබඳ විමසා (පිළිවිස) විසඳිය යුතු ප්‍රශ්න 3) තබාලිය යුතු ප්‍රශ්න (පිළිතුරු නොදෙන). **මූලාශ්‍ර**:අං.ගු.නි: ( 2 ) : 4 නිපාත: 4.1.5.2 පඤ්හව්‍යාකරණ සූත්‍රය, පි. 112.

**පහ**

▲ **පහකරගතයුතු දිට්ඨි**- Views to be aban: අපණ්ණක ධර්මය- දුකින්මිදීමේ මග පිණිස පහකරගතයුතු දිට්ඨි 5කි. **බලන්න:**දිට්ඨි.

▲ **පහළවීම**-manifestation: පහළවීම- පාතුභාව යනු ඇතිවීම- උත්පත්තිය ය. ධර්මයට අනුව ලෝකයේ 6 දෙනක් ගේ පහළවීම දුර්ලභය: 1) තථාගතයන් වහන්සේ 2) තථාගත ධම්මවිනය ඒ පරිද්දෙන්ම ඉගැන්වීමට හැකියාව ඇති උතුමන් 3 ) ආරියන් පහළවන මධ්‍යප්‍රදේශයේ උපත ලැබීම 4) ඉන්ද්‍රිය විකල නොවී උපත ලැබීම 5 ) ඥානවන්ත, නිපුණ පුද්ගලයන්ගේ උපත 5) හේතුප්‍රත්‍ය ධර්මතාව අවබෝධ කරන පුද්ගලයන්ගේ උපත. **මූලාශ්‍ර**:අං.ගු.නි: (4 ): 6 නිපාත: ආනිසංසවග්ග: 6.2.5.1 පාතුභාව සූත්‍රය, පි. 272, EAN:6: 97.2 Benefits,p. 362.

▲ **පහන-**Lamp: පහන ආලෝකය ලබාදේ. ලෝකයට ඇති පහන, ප්‍රඥාව යයි බුදුන් වහන්සේ වදාළහ. **සටහන**: ප්‍රඥා ආලෝකයෙන් අවිද්‍යා අඳුර බිඳේ. **මූලාශ්‍රය:** සං.යු.නි: (1) සගාථවග්ග: දේවතාසංයුත්ත: 1.8.10 පජ්ජතෝ සූත්‍රය, පි. 108 .

▲**පහන් පූජා-**Offering lights: පහන් පූජා කිරීම- ආලෝක පූජා බෞද්ධ චාරිත්‍රයකි. බුදුන් ප්‍රමුඛ සංඝරත්නයට පහන් පූජා කරන පුද්ගලයා ඇස් (පෙනීම) දෙන බව බුදුන් වහන්සේ පෙන්වා ඇත. **බලන්න**: දාන. සං.යු.නි: (1): සගාථවග්ග: දේවතාසංයුත්ත: කිංදද සූත්‍රය, පි.82, ESN:1: Devathasamyutta: 42.2. Giving what, p. 117.

▼ **පහන් පූජාකිරීමේ අනුසස්**: අනුරුද්ධ තෙරුන්, තම අපදානයේදී මෙසේ වදාළහ: "නර ශ්‍රේෂ්ඨවූ වූ සුමේධ භාග්‍යවතුන් වහන්සේට, මම දහසක් වැටි ඇති පහනක් පූජා කෙළෙමි. ඒ පහන සතියක් පුරා දැල්විණි. මට බලවත් චිත්ත ප්‍රසාදයක් ඇතිවිය. පහන් පූජාවේ විපාක වශයෙන් දෙව්ලොව උපන් මාහට, හාත්පස යොදුන් සියයක් බබලවන දෙව් විමනක් පහළවිය. මම තිස් කපයක් ශක්‍රදෙව් රජ වූවෙමි, බොහෝ වරක් මිනිස් ලොව සක්විති රජ වූවෙමි, පැවිදිවූ පසු මට දිවැස් ලැබුණි. ඒ බුදුරදුන්ට කල පහන් පූජාවේ විපාකය ය".**මූලාශ්‍ර**: ඛු.නි: අපදාන පාළි 1: 4 අනුරුද්ධ තෙර ගාථා 423 -437, පි. 93.

▲ **පහසුවිහරණය**-Dwelling in comfort: පහසු විහරණය ලෙසින් පෙන්වා ඇත්තේ අකුසල් සිත බැහැරකර, සමාධිය ලබා,නිවනට නැඹුරුවූ සිත ඇතිව වාසය කිරීමය.

▼**අට්ඨික භාවනාව** බහුලකරගැනීමෙන් පහසුවිහරණය ලැබේ. **බලන්න**:භාවනාව. අසුභ සංඥාව වඩා ගැනීම පහසු විහරණය පිණිසවේ. **බලන්න**: අසුභ සංඥාව. **මූලාශ්‍ර**: සං.යු.නි: (5-1)**: මහාවග්ග:** බොජ්ඣංග සංයුත්තය: ආනාපාන වග්ගය**:** 2.7.1 අට්ඨික සූත්‍ර, පි.268**,** ESN: Bojjhaṅgasaṃyutta:VII In and out Breathing, 57.1 The Skeleton, p. 1807.

▲**පහාතබ්බ ධර්ම**: පාලි: **පහාතබ්බා-** Dhamma to be abandoned: පහාතබ්බ ධර්මතා, ආධ්‍යාත්මික ජීවිතය වර්ධනය පිණිස බාධා ඇතිකරයි. ආධ්‍යාත්මික වර්ධනය පිණිස පහ කල යුතු ධර්මතා: **1) අස්මි මානය** (අසම්මානො -Ego-conceit)**2) අවිද්‍යාව** (අවිජ්ජා- Ignorance) **3) භව තණ්හාව (**භවතණ්හා) **4) ත්‍රිවිධ තණ්හා (**තිස්සො තණ්හා): කාම, භව හා විභව තණ්හාව **5) සිව් ඔඝ**: කාම, භව, දිට්ඨි හා අවිජ්ජා **6) පංච නීවරණ 7) සය තණ්හාව:** රූප, ශබ්ද, ගන්ධ, රස, පහස, ධර්ම තණ්හාව. **සටහන**: සියලු අනිච්ච ධර්මතා පහාතබ්බ ධර්මවේ. **බලන්න**: සං.යු.නි: සළායතන සංයුත්ත: 1.5.6 පහාතබ්බ සූත්‍රය. **මූලාශ්‍ර:** දීඝ.නි : (3 ): 11 දසුත්තර සූත්‍රය, පි. 483, EDN: 34: Dasuttara Sutta: Expanding Decades, p. 384.

▲ **පහාන ධර්ම**-Dhamma for abandoning : මුළුමනින්ම (සර්ව ප්‍රහාන) පහක ලයුතු (ප්‍රහීණ) ධර්මතා ලෙසින් බුදුන් වහන්සේ පෙන්වා ඇත්තේ සළායතන හා බාහිර අරමුණුවලට ඇලීම- තණ්හාවය. ඒවා මනාව-පිරිසිඳ

දැනගැනීමෙන්, ප්‍රහාණය පහසුවේ. එසේ නොමැතිනම් දුක අවසන් කර ගත නොහැකිවේ. **බලන්න**: සබ්බ ධර්ම.

**සටහන්:*** සංයු.නි: සළායතනසංයුත්තසළායතන සංයුත්ත:3 සබ්බවග්ග: පහාන සුත්‍ර 2: මේ පිළිබඳව විස්තරාත්මකව පෙන්වා ඇත. ** සළායතනසංයුත්ත: සගාථාවග්ග: 1.20.3 පහාණසූත්‍රය: ත්‍රිවිධ වේදනා පහ කරගන්නා ආකාරය මේ සූත්‍රයේ පෙන්වා ඇත. **බලන්න**: වේදනා.

▼**දිට්ඨිසම්පන්න** (සෝතාපන්න) උතුමා ධර්මතා 6ක් ප්‍රහීණය කර ඇත: සක්කායදිට්ඨිය, විචිකිච්චාව, සීලබ්බතපරාමාස, අපායගාමිණී:රාගය දෝසය හා මෝහය. **බලන්න:** සෝතාපන්න, අංගු.නි: (4) 6 නිපාත: සීතිවග්ග: 6.2.4.6 පහීණ සූත්‍රය.

▲ **පහානාය**- abandoning: පහානාය යනු ප්‍රහීණය කිරීමය. නිවන පිණිස නීවරණ ආදී අකුසල පහකර ගත යුතුවේ.

▲ **පහාන සංඥාව**: පාලි: **පහානසඤ්ඤා-** perception of abandoning පහාන සංඥාව ලෙසින් පෙන්වා ඇත්තේ කාමය, ව්‍යාපාදය, හිංසාව ආදී අකුසල සිත් පහළවූවිට ඒවා ප්‍රහාණය කරගැනීමය. නිවන සාක්ෂාත් කර ගැනීමට උපකාර කරගන්නා භාවනාකි. **බලන්න**: දස සංඥා, නිස්සරණිය ධාතු. **සටහන**: පහාන සංඥාව ඇතිකර ගැනීමට සප්ත බොජ්ඣංග ධර්මතා වැඩිය යුතුය. **බලන්න**:සංයු.නි: (5-1) මහාවග්ග: බොජ්ඣංගසංයුත්ත:නිරෝධවග්ග: පහානසූත්‍ර.

▼ **පහාන සංඥාව මෙනෙහි කිරීම. බලන්න:** භාවනා, ගිරිමානන්ද සූත්‍රය.

▲ **පහාස දේවසභාව** -Pahasa devas: ජනයා පිනවන නළුවන්, මරණින් මතු පහාස දේව සභාවේ උපත ලැබේ යන වැරදි දිට්ඨිය. **බලන්න**: සුගතිය. **මූලාශ්‍රය**: සංයු.නි: (4) සළායතනවග්ග:ගාමිණිසංයුත්ත:8.1.2 තාලපුට සූත්‍රය, පි.584.

▲ **පහාරද අසුර රජ-** Asura king Paharada: අසුරනිකායේ රජකෙනෙකි. **බලන්න**: අසුර.

▲ **පාහුණෙය්‍යා-**Pahuneyya: මෙය සංඝ ගුණයකි, බුදුන්වහන්සේගේ ශ්‍රාවක සංඝයා, ආගන්තුක සත්කාරයට සුදුසු බව මින් පෙන්වා ඇත. **බලන්න**: සංඝගුණ. **සටහන**: පාහුණෙය්‍යා ගුණය පිණිස සංඝයාට ගුණ 5ක් තිබිය යුතුය. **මූලාශ්‍රය**: අංගු.නි: (3): 5 නිපාත: ඵාසුවිහාරවග්ග: 5.3.1.7 සීලසම්පන්න සූත්‍රය, පි.236, රාජවග්ග: 5.3.4.9 අකන්ඛම සූත්‍රය, පි.277.

▲ **ප්‍රහාන ප්‍රඥාව-** Prahana panna: මෙය ආධ්‍යාත්මික වර්ධනය පිණිස ඇතිකරගත යුතු පස් ආකර නුවණින් එකකි. **බලන්න:** ඤාණපඤ්චකය.

▲ **ප්‍රහාණ පරිඥාව-** full understanding as abandonment

අභිජානය ලැබීම පිණිස, ප්‍රහාණ පරිඥාව ඇතිකර ගත යුතුවේ. **බලන්න**: අභිජාන.

▲ **ප්‍රහාණාරාම-**Prahanarama: ප්‍රහාණාරාම යනු කෙළෙස් පහ කිරීමට ඇති ඇල්මය. මෙය, මේ දිවියේදීම සැප හා සොම්නස සහිතව වාසය කිරීමට අවශ්‍ය අංගයකි. **බලන්න**: සුඛ සෝමනස්ස.

## ඵ කොටස: ඵග, ඵට, ඵල, ඵස

### ඵග

▲ **ඵග්ගුන** තෙර-Phagguṇa Thera: **බලන්න**: උපග්‍රන්ථය:1

### ඵට

▲ **ඵොට්ඨබ්බසංචේතනා-** Phottabbasanchethana: කයේ පහස නිසා ඇතිවෙන චේතනා මෙලෙසින් හඳුන්වයි. **බලන්න**: චේතනා.

### ඵල

▲ **ඵල ඥානය-**Phala Nana: ධර්මයේ ඵල ඥානය ලෙසින් පෙන්වා ඇත්තේ ආරිය මාර්ගය වර්ධනය කරගෙන, කෙළෙස් සන්සිඳුවා ගැනීමට ඇති ප්‍රඥාවය. **සටහන්**: * ඵල සතරකි: සෝතාපන්න සිට අරහත් මාර්ග සාක්ෂාත් කරගැනීම. ** විස්තර පිණිස බලන්න: ඛු.නි:පටිසම්භිදා 1: ඤාණකතා:12: ඵලඥානය, පි.154.

▲ **ඵලනානත්ථය-** difference in the fruits: ආධ්‍යාත්මික පංච ඉන්ද්‍රිය වර්ධනය වීමේ ස්වභාවය අනුව ඇතිවන විවිධ ඵල, ඵලනානත්ථය ලෙසින් පෙන්වා ඇත. **බලන්න:** ඉන්ද්‍රිය නානත්ථය.

▲**ඵලප්‍රඥාව-** Phala panna: ඵල ප්‍රඥාව යනු ප්‍රඥා විමුක්තිය ය. මෙය ඵල විමුක්තිය ලෙසින්ද දක්වා ඇත. **බලන්න:** ආධ්‍යාත්මික පංච ඉන්ද්‍රිය, අවසාන ඥාණය, ප්‍රඥා විමුක්තිය.

▲**ඵලුපජීවී**-Fruit from the effort: ඵලුපජීවී ලෙසින් පෙන්වා ඇත්තේ කෙනෙක් තමන්ගේ විරියෙන්, සිය ජීවිකාව ගෙනයාමය. ඔහුට යහපත් කම්මවිපාක ඵල නැත. තවත් කෙනෙක් විරියෙන් නොව තමන් කල යහපත් කම්මවිපාක ඵල පිහිට කොටගෙන ජීවත්වේ. තවත් කොටසක් , සිය වීරිය සමග යහපත් කම්මවිපාක ඵල පිහිට කොටගෙන ජීවත්වේ. වෙනත් කොටසක් වීරිය ද නොමැතිව, කම්මවිපාක ඵල ද නැතිව ජීවත්වේ. **සටහන**: අටුවාවට අනුව දෙවෙනි ගණයට ගැනේනේ දෙවියන්ය, තෙවෙනි ගණයට ගැනේනේ රජවරු හා ඇමතිවරුය. අවසාන ගණයට ගැනේනේ, අපාය දුක් විඳින අයය. මෙහිදී කම්ම ඵල ලෙසින් පෙන්වා ඇත්තේ යහපත් කර්ම විපාකයන්ය. **මූලාශ්‍ර**: අංගු.නි: (2 ); 4 නිපාත:4.3.4.4. ඵලුපජීවීපුග්ගල සූත්‍රය, පි. 282, EAN:4:134.4 Effort, p.196.

### ඵස

▲ **ඵස්ස**-Contact: ඵස්ස- ස්පර්ශය ලෙසින් යනු සළායතන මගින් බාහිර අරමුණු ස්පර්ශ කිරීමය. **බලන්න**: ස්පර්ශය.

▲ **ඵුස්ස බුදුන්වහන්සේ**-The Buddha Phussa: ගෝතම බුදුන් වහන්සේ ට පෙර පහළවූ, ඵුස්ස බුදුන් වහන්සේ පිලිබඳ විස්තර පිණිස **බලන්න**:බුද්ධවංශ පාලි:18: ඵුස්ස බුදුන්වහන්සේ.

▲ **ඵාසුවිහාර**-dwelling at ease: ඵාසුවිහාර-පහසු විහරණය යනු කෙළෙස් වලින් තොරව වාසය කිරීමය. පහසු විහරණ ලෙසින් ධර්මයේ පෙන්වා ඇත්තේ සිව් ජානසමාපත්ති ලැබීම හා ආසව ක්ෂය කර ලබන විමුක්ති සුවයය. බලන්න: පහසු විහරණය. **සටහන**: සංඝයාගේ පහසු විහරණය ලෙසින් පෙන්වා ඇත්තේ: සෙසු අය කෙරහි මෙත්සිත ඇතිව කාය, වචී හා මනෝකර්ම කිරීම හා නිර්මල ශිලය (ආරියකාන්තශිලය) සහිතව වාසය කිරීමය. **මූලාශ්‍ර**:අංගු.නි: (3): 5 නිපාත:5.2.5.4 , 5.3.1.5 ඵාසුවිහාර සූත්‍ර, පි.212,EAN:5: 94.4 dwelling at ease, p.272.

## බ කොටස: බක-බජ-බඩ-බත-බද-බධ, බඳ, බන, බප, බබ,බම,බඹ,බය,බර-බල-බළ-බව-බහ

**බක**

▲ **බක බ්‍රහ්ම**-Brhma Baka: බලන්න බ්‍රහ්ම දෙවියෝ.

▲**බක්කුල තෙර-**Bakkula Thera: **බලන්න**: උපග්‍රන්ථය:1

**බජ**

▲ **බීජ උපමා-**Simile of Seeds: **බලන්න:** උප ග්‍රන්ථය:5

▲ **බොජ්ඣංග ධර්මතා-**පාලි: **බොජ්ඣඞ්ගා** -factors of enlightenment: බොජ්ඣංග-බෝධිඅංග යනු විමුක්තිය ලබාගැනීමට-බෝධිය වඩාගැනීමට ඉවහල්වන අංග 7ය- සප්ත බොජ්ඣංගයන්ය. මේවා 37ක්වූ බෝධිපාක්ෂික ධර්මතාවලට ඇතුලත්වේ. විස්තර පිණිස **බලන්න**: සංයු.නි: (5-1), මහාවග්ග: බොජ්ඣංග සංයුත්තය. **සටහන්: ***
බොජ්ඣංග යනු අවබෝධය ( සම්බෝධිය පිණිස) පිණිස ඇති ධර්මතාය. (They lead to enlightenment, bhikkhu, therefore they are called factors of enlightenment) **බලන්න**: සංයු.නි: (5-1) බොජ්ඣංග සංයුත්ත: 2.3.**1 බෝධාය සූත්‍රය**, පි. 200, ESN: 46:Bojjhaṅgasamyutta: 21.1. To Enlightenment, p. 1755. **Bojjhaṅga is a compound of bodhi + aṅga...The factors of the one being enlightened are enlightenment factors. **බලන්න:** ESN: note: 52: p. 2393. **ශබ්දකෝෂ: පා.සිං.ශ:** පි.402: **"බොජ්ඣංග:** බෝධියට අංගවන ධර්ම 7 ...".පි. 485: "**වොස්සග්ගපරිණාමිං:** ත්‍යාගය පිලිබඳ මුහුකුරායාම". **B.D.S:** p.75: "Bojjhanga: the 7 factors of enlightenment…".

▼**සම්මාසම්බුදු රජාණන් වහන්සේගේ පහළවීමෙන්** සත්රුවනක් බඳු සප්ත බොජ්ඣංග පහළවේ.

**මූලාශ්‍රය**:සංයු.නි: (5-1) මහාවග්ග: බොජ්ඣංගසංයුත්ත:2.5.2 චක්කවත්ති සූත්‍රය, පි.224.

▼ **සප්ත බොජ්ඣංග වැඩීමට ශීලය පදනම්වේ**: භික්ෂුව, ශීලයේ පිහිටා සප්ත බොජ්ඣංග බහුල කරගන්නේ, මහාබවට පත්කර ගන්නේ විපුල කරගන්නේ කෙසේද? ඒ භික්ෂුව, විවේකයේ පිහිටා, විරාගයේ පිහිටා, නිරෝධයේ පිහිටා, වොස්සග්ග පරිණාමිව, සතිසම් බොජ්ඣංග ආදීවූ ....සප්ත බොජ්ඣංග ධර්මතා වඩාගනී. **"කථඤ්ච භික්ඛවෙ, භික්ඛු සීලං නිස්සාය සීලෙ පතිට්ඨාය සත්තබොජ්ඣඞ්ගෙ බහුලීකරොන්තො මහන්තත්තං වෙපුල්ලත්තං පාපුණාති ධම්මෙසු: ඉධ භික්ඛවෙ, භික්ඛු සතිසම්බොජ්ඣඞ්ගං භාවෙති විවෙකනිස්සිතං විරාගනිස්සිතං නිරොධනිස්සිතං වොස්සග්ගපරිණාමිං... ධම්මවිචය..." සටහන්: ***
විවේකයේ පිහිටා **(විවෙකනිස්සිතං)**: කාය විවේකය හා කාමවස්තූන් කෙරෙහි නොපිහිටි සිත පිහිට කරගෙන (කෙළෙසුන් නැති). ** විරාගයේ පිහිටා **(විරාගනිස්සිතං):** ඇල්ම නැති- කිසිවකට බැඳීම නැති සිත පිහිටකරගෙන ** නිරෝධයේ පිහිටා **(නිරොධනිස්සිතං):** සෑම දෙයක්ම අවසන් කිරීමට ඇති සිත පිහිටකරගෙන. **වොස්ග්ග පරිණාමිව **(වොස්සග්ගපරිණාමිං):** අත්හැරීම පිළිබඳ මුහුකුරා ගිය සිත ඇතිව : සියල්ල දීලා දැමීමට දියුණුකරගත් සිත, නිවනට නැමුන සිත, භවයන්ට (කාම, රූප, අරූප භව) නො ඇලුන සිත ඇතිව, භික්ෂුව, සප්ත බොජ්ඣංග වඩාගනී. හිමාල කඳුවැටිය ආශ්‍රිතකරගෙන නාගයෝ ඔවුන්ගේ කය පෝෂණය කර, ශක්තිමත් කරගනී. ඉන්පසු ,අසල ඇති පොකුණුවලට පැමිණේ. එහිසිට සිට කුඩා දියපාරවලට ද, කුඩා නදී, මහා නදීවලට පිනා ගොස් අවසානයේදී මහා මුහුදට පැමිණ, එහිදී මහාබවට පත්වේ. එලෙසින්, ශීලය පදනම්කොට සප්තබොජ්ඣංග වඩාගත් භික්ෂුව අවසානයේදී මහාබවට- අරහත්වයට පැමිණේ. **නාග උපමාව: බලන්න**: උපග්‍රන්ථය:5 **මූලාශ්‍ර:** සංයු.නි: ( 5-1 ): මහාවග්ග: බොජ්ඣංග සංයුත්ත: 2.1.1. හිමවන්ත සූත්‍රය, පි.168, ESN: 46: Bojjhaṅgasaṃyutta: 1.1.The Himalayas, p. 1730

▼ **සප්ත බොජ්ඣංග පෝෂණය**: කයේ පෝෂණය පිණිස ආහාර උපකාරීවන ලෙසින් සප්ත බොජ්ඣංග ද විවිධ ධර්මකරුණු උපකාරීකොටගෙන පෝෂණයට පත්වේ. **1 සතිසම්බොජ්ඣංගය**: ඇතිකරගැනීමට හා විපුලකරගැනීමට උපකාරීවන ධර්මතා පිළිබඳව නිතර නිතර නුවණින් මෙනෙහිකිරීම, යෝනිසෝමනසිකාරය. **සටහන:** සෑම කටයුත්තක්ම සතිසම්පජානයෙන් කිරීම, අසිහියෙන් කටයුතු කරන අය ඇසුරු නොකිරීම, සිහිය ඇතිව කටයුතු කරන අය හා ආශ්‍රය, සතිය ඇතිකරගැනීම පිළිබඳව නිවැරදි අදිටනක් සිතේ දරා ගැනීම යන කරුණු 4 සතිය ඇතිකරගැනීමට අවශ්‍යතාවයන් ලෙසින් අටුවාව පෙන්වා ඇත. එසේම, සතර සති පට්ඨානය, 37 ක්වූ බෝධිපාක්‍ය ධර්ම ආදිය නිතර නුවණින් මෙනෙහිකිරීම. **බලන්න:** ESN: note 58 & 85, p. 2394, 2398. **2. ධම්මවිචයසම්බොජ්ඣංගය:** කුසලඅකුසල ධර්ම, සාවද්‍ය නිරවද්‍ය ධර්ම, හීන ප්‍රණීත ධර්ම, දීප්තිමත් හා අඳුරු ධර්ම ගැන නිතර නිතර නුවණින් මෙනෙහි කිරිම. **සටහන:** අතිරේක කරුණු 7ක් අටුවාව දක්වයි: 1) ස්කන්ධ, ධාතු, ආයතන පිළිබඳ අර්ථ විමසීම

2) පුද්ගලික පිරිසිදුකම 3) ඉන්ද්‍රිය සංවරය 4) ගැඹුරු ධර්මතා ආවර්ජනය 5) අනුවණ මිනිසුන් ඇසුරු නොකිරීම 6) නුවණැති මිනිසුන් ඇසුරුකිරීම 7) ධම්මවිචය බොජ්ඣංගය ඇතිකරගැනීමට නිවැරදි අදිටනක් සිතේ දරා ගැනීම. **බලන්න:** ESN: note 59 & 86, p. 2394, 2398. **3 වීරිය**

**සම්බොජ්ඣංගය:** ධාතු 3ක් ඇතිකරගැනීම**:** ධර්මයේ යෙදීමට ආරම්භක වීරිය ඇතිකරගැනීම-සිත අවදිකරගැනීම (ආරම්භකධාතු), ධර්මයේ යෙදීමට ඇති මැලිකම පහකරගැනීමට-ඉන් නික්මීමට ගන්න වීරිය-උත්සාහය ඇතිකරගැනීම (නික්කම්මධාතු), පටන්ගත් ධර්මකටයුත්ත වර්ධනය පිණිස තදින් වෙරගැනීම (පරාක්‍රමධාතු) . **සටහන**: අටුවාව අතිරේක කරුණු 11ක් පෙන්වා ඇත: 1) දුගතියේ-අපායේ ඇති බියකුරුබව සිහිකිරීම 2) වීරිය ඇතිකරගැනීමේ යහපත්ඵල සිහිකිරීම, 3) සියලු බුදුවරු අනුගමනය කළ මග තමාද අනුගමනය කරනබව සිහිකිරීම 4) වෙනත් අය විසින් තමාට දුන් දාන හා තෑගි ආදියට ගරුකිරීම පිණිස කටයුතු කලයුතු බව සිහිකිරීම 5-8) බුද්ධවංශයේ, බුදුන්වහන්සෙගේ, ධර්මයේ හා සංඝයාගේ ශ්‍රේෂ්ඨබව සිහිකිරීම 9) අලසමිනිසුන් ආශ්‍රය නොකිරීම 10 ) ධර්මය පිළිබඳව වීරියෙන් කටයුතු කරන අය ඇසුරුකිරීම 11) එම බොජ්ඣංගය ඇතිකරගැනීමට නිවැරදි අදිටනක් සිතේ දරා ගැනීම **බලන්න:** ESN: note 60 & 87, p. 2395, 2398. **4 පීති සම්බොජ්ඣංගය:** සිතේ ප්‍රීතිය ඇතිකරන දහම් කරුණු ගැන නිතර නිතර නුවණින් මෙනෙහිකිරීම. **සටහන**: අටුවාව අතිරේක කරුණු 11ක් පෙන්වා ඇත: 1-7) බුද්ධ, ධර්ම, සංග, ශීලය, ත්‍යාගශීලිබව, දෙව්ගුණ, නිවන- උපසමය ගැන අනුසතිභාවනාව 8) රළු (ඕලාරික-අශිෂ්ඨ) මිනිසුන් ඇසුරු නොකිරීම 9) ශිෂ්ඨ මිනිසුන් ඇසුරු කිරීම 10) සිත ප්‍රබෝධමත් කරන සූත්‍ර මෙනෙහිකිරීම 11) එම බොජ්ඣංගය ඇතිකරගැනීමට නිවැරදි අදිටනක් සිතේ දරා ගැනීම **බලන්න:** ESN: note 88, p. 2398. **5 පස්සදී සම්බොජ්ඣංගය:** කාය පස්සදිය හා චිත්ත පස්සදිය පිළිබඳව නිතර නුවණින් බැලීම. වේදනා, සංඥා, සංකාර ආදී ස්කන්ධයන් (නාමකාය) සංසුන්කරගැනීම, චිත්තපස්සදිය පිණිස විඥානය සංසුන්කරගැනීම. **සටහන**: අටුවාව අතිරේක කරුණු 7ක් පෙන්වා ඇත: 1) යහපත් පෝෂණය ගෙනෙදෙන ආහාර ගැනීම 2) හිතකර දේශගුණය ඇති තැනක වාසය 3) භාවනාව පිණිස කයට පහසු ඉරියව්ව භාවිතා කිරීම 4) මධ්‍යස්තව වීරිය ඇතිකරගැනීම 5-7) කලබල කරණ මිනිසුන් මග හැරීම, ශාන්ත-නිසල මිනිසුන් ඇසුරුකිරීම, එම බොජ්ඣංගය ඇතිකරගැනීමට නිවැරදි අදිටනක් සිතේ දරා ගැනීම. කයේ සැහැල්ලුබව හා සිතේ සැහැල්ලුබව ගැන නිතර නුවණින් මෙනෙහි කිරිම. **බලන්න**: ESN: note 61 & 89, p. 2395, 2398. **6 සමාධි සම්බොජ්ඣංගය:** සිත සමතයට පත් කරගැනීමෙන් හා සිත විසිරියාම නැතිකරගැනීම පිළිබඳව නුවණින් මෙනෙහි කිරිම. සමථනිමිත්ත හා අබ්‍යග්ග නිමිත්ත වඩාගැනීම. **සටහන්:**
*** සමතනිමිත්ත (**sign of serenity): සිතේ ශාන්තබව හා එහිලා උපකාරිවූ අරමුණ (පටිභාගනිමිත්ත හෝ එයටසමානවූ නිමිත්ත).
****අබ්‍යග්ග නිමිත්ත (**the sign of nondispersal) : සිතවිසිරීයාම වලක්වන නිමිත්ත -එකාළම්භන නිමිත්ත (එක අරමුණක් අල්වාගැනීම).
****** අටුවාවට අනුව සමාධි සම්බොජ්ඣංගය ඇතිකර ගැනීමට උපකාරීවන කරුණු 11 ක් : i පුද්ගලික පිරිසිදුබව ii ඉන්ද්‍රිය සංවරය, iii භාවනා අරමුණ පිහිටුවා ගැනීමේ හැකියාව iv- vi නියම අවස්ථාවේ: වීරිය ඇතිකරගැනීම, සිත හසුරුවා ගැනීම හා සිතේ ප්‍රීතිය ඇතිකරගැනීම vii නියම අවස්ථාවේ සිත උපේක්කාවට පත්කරගැනීම viii-x සිත එකඟකරගැනීමට නොහැකි පුද්ගලයන් ආශ්‍රය නොකිරීම, සිත සමාධියට පත්කරගතහැකි පුද්ගලයන් ආශ්‍රය කිරීම, සිතේ සමාධිය ඇතිකරගැනීම පිණිස යහපත් අදිට්ඨානය ඇතිකරගැනීම xi ජාන හා විමුක්තිය පිලිබඳ

ආවර්ජනය. **බලන්න**: ESN: note 62 & 90, p. 2395, 2399. **7. උපෙක්ඛා සම්බොජ්ඣංගය:** සිත උපේක්ෂාවට පත්කරණ දහම් කරුණු පිළිබඳව නුවණින් මෙනෙහි කිරිම. **සටහන:** අටුවාවට අනුව උපෙක්ඛා සම්බොජ්ඣංගය ඇතිකර ගැනීමට උපකාරවන අතිරේක කරුණු 5: i සියලු සත්ත්‍වයන් පිලිබඳව මධ්‍යස්තබව ii සියලු සංස්කාර පිළිබඳව මධ්‍යස්තබව iii අන්අය, තමාසතුය යන හැඟීමෙන් කටයුතු කරන පුද්ගලයන් ආශ්‍රය නොකිරීම iv මධ්‍යස්තව කටයුතු කරන පුද්ගලයන් ඇසුරුකිරීම v උපේක්කාව සිතේ ඇතිකරගැනීම පිණිස නිවැරදිව අදිට්ඨාන කිරීම. **බලන්න**: ESN: note 91, p.2399. **මූලාශ්‍ර:** සංයු.නි: (5-1 ): මහාවග්ග: බොජ්ඣංගසංයුත්ත : 2.1.2 කාය සූත්‍රය පි.168, 2.6.1 ආහාර සූත්‍රය, පි. 230, ESN:46: Bojjhaṅgasaṃyutta: 2.2. The Body, p. 1731, 51.1 Nutriment, p. 1788.

**▼ කුසල ධර්ම වැඩීමෙන්, බොජ්ඣංග ධර්මතා විපුලබවට පත්වේ.** අප්‍රමාදය හා යෝනිසෝමනසිකාරය නිසා ඇතිවන කුසලයන් හේතුකොටගෙන නීවරණ යටවී, සප්ත බොජ්ඣංග ධර්මතා වැඩි, දියුණුවට පත්වේ. **බලන්න**: නීවරණ, යෝනිසෝමනසිකාරය. **මූලාශ්‍ර:**සංයු.නි: (5-1): මහාවග්ග: බොජ්ඣංග සංයුත්ත: 2.4.1 හා 2.4.2 කුසල සූත්‍රය හා 2.4.5 යොනිසෝ සූත්‍රය හා 2.4.8 අනීවරණ සූත්‍රය, පි. 212, ESN:46: Bojjangasamyutta: 31.1 & 32.1 Wholesome & 35.5 Careful Attention & 38.8 Without Hindrances p.1766 .

**▼ බොජ්ඣංග ධර්මතා ආධ්‍යාත්මික මග වර්ධනය පිණිස පවති** බොජ්ඣංග ධර්මතා හත-සප්ත බොජ්ඣංග, නුවණ නැමති ඇස ඇතිකරයි, ඥානය- අවබෝධය ඇතිකරයි, ප්‍රඥාව වඩයි, සිතේ සන්තාපය නැති කරයි, නිවන ලඟාකර දෙයි: **"...සත්ත්‍ිමෙ භික්ඛවෙ, බොජ්ඣඞ්ගා චක්ඛුකරණා ඤාණකරණා පඤ්ඤාවුද්ධියා අවිඝාතපක්ඛියා නිබ්බානසංවත්තනිකා..."**. ( These seven factors of enlightenment, bhikkhus, are makers of vision, makers of knowledge,promoting the growth of wisdom, free from vexation, leading towards Nibbāna). **මූලාශ්‍ර:** සංයු.නි: (5-1): මහාවග්ග: බොජ්ඣංග සංයුත්ත: 2.4.4 අනාවරණ සූත්‍රය හා 2.4.9 මහා රුක්ඛ සූත්‍රය, පි. 216, 1.4.10 නිවරණ සූත්‍රය, පි.222 , ESN: 46: Bojjangasamyutta: 34.4. Non-corruptions & 39.9 Trees, p.1769, 40.10 Hindrances, p.1775.

**▼ බොජ්ඣංග ධර්මතා බුද්ධිය ඇතිකරයි**: යහපත් ලෙසින් වඩන සප්ත බොජ්ඣංග ධර්මතා බුද්ධිය,නොපිරිහිම පිණිස පවතී. **මූලාශ්‍ර:** සංයු.නි: (5-1 ක): මහාවග්ග: බොජ්ඣංග සංයුත්ත: 2.4.6 බුද්ධි සූත්‍රය, පි. 216 ESN:46: Bojjangasamyutta: 36.6 Growth, p.1771 .

**▼බොජ්ඣංග ධර්මතා වැඩීමට සුදුසුහා නුසුදුසු අවස්ථා**: මේ පිළිබඳව යොදාගෙන ඇති උපමාව: ගින්නක් දැල්වීමට කටයුතු කරන ආකාරයය: **බලන්න**: උප ග්‍රන්ථය:5.

**1 සිත සැඟවුන, උදාසීනවූ අවස්ථාවේ** (ලීනං චිත්තං -sluggish mind): 1) **පස්සද්ධි, සමාධි, උපේක්ඛා** බොජ්ඣංග වැඩිමට සුදුසු නොවේ. **උපමාව:** යම්කිසි පුද්ගලයෙක් ගිනි දැල්වීම පිණිස, ශීතල සුළං ඇති තැනක, අමු දර ආදිය යොදා, වැලි දමමින් මද ගින්නක් දැල්වීමට තැත් කරත් ඔහුට ඒ

ගින්න දල්වා ගැනීමට හැකිනොවේ. 2) **ධම්මවිචය, විරිය හා පීති** බොජ්ඣංග වැඩීමට සුදුසු වේ. **උපමාව:** යම්කිසි පුද්ගලයෙක් ගිනි දැල්වීම පිණිස, සුළං මුවාවූ තැනක, වියලි දර ආදිය යොදා, වැලි දමන්නේ නැතිව, මද ගින්නක් දැල්වීමට තැත් කරයි. ඔහුට ඒ ගින්න දල්වා ගැනීමට හැකිවේ. **2 සිත නොසන්සුන්වූ අවස්ථාවේ (**උද්ධතං චිත්තං**-** excited mind) 1) **ධම්මවිචය, විරිය හා පීති** බොජ්ඣංග වැඩීමට සුදුසු නොවේ. **උපමාව:** යම්කිසි පුද්ගලයෙක් මහා ගින්නක් නිවීමට කැමතිවේ, ඒ පිණිස ඔහු වියලි දර ආදියදමයි, එහෙත්, ඔහුට ඒ මහා ගින්න නිවා ගත නො හැකිවේ. 2) **පස්සද්ධි, සමාධි, උපේක්ඛා** බොජ්ඣංග වැඩීමට සුදුසු වේ. **උපමාව:** යම්කිසි පුද්ගලයෙක් මහා ගින්නක් නිවීමට කැමතිවේ, ඒ පිණිස ඔහු අමු දර ආදිය දමමින්, ශීතල සුළං ලබාදෙමින්, වැලි ඉසිමින් කටයුතු කරයි. ඔහුට ඒ මහා ගින්න නිවා දැමිය හැකිය. **සටහන**: * බොජ්ඣංග ධර්මතා වැඩීමට සුදුසු නුසුදුසු අවස්ථා ගැන කරුණු පෙන්වීමට සමත් වන්නේ තථාගතයන් වහන්සේට හෝ උන්වහන්සේගෙන්, ධර්මය උගත් ශ්‍රාවකයෙක්හට පමණි.** මේ සූත්‍රය අවසානයේදී බුදුන් වහන්සේ පෙන්වා දුන්නේ **සති බොජ්ඣංග** ය වැඩීම, ඕනෑම අවස්ථාවකට උපකාරීවන බවය. **මූලාශ්‍ර:** සංයු.නි: (5-1): මහාවග්ග: බොජ්ඣංග සංයුත්ත: 2.6.3 අග්ගි සූත්‍රය, පි.244, ESN: Maggasamyutta: Bojjanga: 53.3 Fire, p. 1795.

▼**සප්ත බොජ්ඣංග නිවන් මගය- අසංඛත මගය**: **මූලාශ්‍ර:** සංයු.නි: ( 4 ):සළායතනවග්ග: අසංඛතසංයුත්ත: 9.1.10 බොජ්ඣංග සූත්‍රය, පි. 662, ESN: 43: Asankatasamyutta:10.10, p. 1493.

**බඩ**

▲ **බුඩ්ඪපබ්බජිත**-Gone Forth in Old Age: බුඩ්ඪපබ්බජිත ලෙසින් පෙන්වා ඇත්තේ වයසට යෑමෙන් පසුව පැවිදිවන පුද්ගලයාය. එවැනි අය කෙරෙහි මතු සඳහන් ගුණ දැකීම දුර්ලභය: 1) නිපුණබව- සියුම් කරුණු වටහා ගැනීමේ හැකියාව 2) නියම චාරිත්‍ර ඇතිබව-ආකල්ප සම්පන්න බව 3) බහුශ්‍රැතබව 4) ධර්මකථිකබව 5) විනයධරබව 6) පහසුවෙන් වැරදි නිවැරදි කරගැනීම-සුවච බව 7) උගත් ධර්මය පහසුවෙන් සිතේ දරා ගැනීමේ හැකියාව- සුගෘහීතග්‍රාහී 8) ධර්ම උපදේස ගරුසරු ලෙසින් භාර ගැනීම-ප්‍රදක්ෂිණාග්‍රාහී. **බලන්න:** අංගු.නි: (3) 5 නිපාත: නීවරණවග්ග: බුඩ්ඪපබ්බජිත සූත්‍ර 2කි.

**බත**

▲ **බත් කැඳ**: පාලි: **යාගුයා**- Rice Porridge: බත් කැඳ වැලදීමේ ගුණ 5 ක් බුදුන් වහන්සේ පෙන්වා ඇත: 1) සාගින්න නසයි 2) පිපාසය දුරුකරයි 3) වාතය අනුලොම් කරයි (වාතය පිටට යවයි- settles wind) 4) වස්තිය පිරිසිදු කරයි (cleans out the bladder) 5) ආමසයේ, නො පැසි (නොදිරවන ලද) ඇති ආහාර දිරවයි. **බලන්න**: කැඳ බත්දීම.

**මූලාශ්‍ර**: අංගු.නි: (3 ): 5 නිපාත: 5.5.1.7 යාගු සූත්‍රය, පි.424, EAN:5: 207.7 Rice Porridge p. 305.

▲**බත්මත: පාලි: භත්තසම්මදො** - Bath matha: බත්මත ලෙසින් පෙන්වා ඇත්තේ, දිවා භෝජනයෙන් පසු ඇතිවන නිදිමත-අලස බවය. මෙය නීවරණයකි. **බලන්න**: ථිනමිද්ධය.

**බද**

▲ **බද්ධවෛරය-** resentment: සිතේ ඇති තරහ දිගු කාලයක් පවත්වා ගැනීම බද්ධවෛරයය**.** අමනාපය ලෙසින්ද දක්වා ඇත, අකුසලයකි. **බලන්න**: අමනාප.

▲**බෙදාදී වැළඳීම-** Sharing one's own food: තමන්ට ලැබෙන ආහාර, අන්‍යයන් සමග බෙදාගැනීම මිත් අදහස් කරේ. මෙය දෙවියන් පවා අගයන පැරණි චාරිත්‍රයකි**. බලන්න**: දානය.

▲**බුද්ධ**-Buddha: බුද්ධ යනු සම්මා සම්බෝධිය ලැබූ උත්තමයාය. භාග්‍යවතුන්වහන්සේ ''බුද්ධ'' ලෙසින් හඳුන්වන්නේ, ජීවිතයේ යථා තත්වය අවබෝධ කරගත් නිසා හා ඒ අනුව (ජීවිතය නම්වූ සිහිනයෙන් ) අවදිවූ නිසාය. අවිද්‍යා අඳුර පහකර, විද්‍යාව උදාකළ උත්තමයා නිසාය. කෙලෙස් නින්දෙන් අවදිවූ නිසාය. **බලන්න**: සම්මා සම්බුද්ධ **සටහන්: * ධම්මපදය:**බුද්ධවග්ගයේ: බුද්ධ ගුණ විස්තරාත්මකව පෙන්වා ඇත.****** බුදුන් වහන්සේ **''**බුද්ධ'' ලෙසින් හඳුන් වන උතුමන් දෙදෙනෙක් ගැන පවසා ඇත: '' මහණෙනි, මේ බුදුවරු දෙදෙනෙකි: තථාගත සම්මා සම්බුද්ධයන් වහන්සේ හා පසේබුදුන් වහන්සේය (පච්චේක බුද්ධ). **බලන්න:** අංගු.නි: (1) 2 නිපාත: 2.2.6.5 සූත්‍රය. **** පටිසම්භිමග්ග ප්‍රකරනයට අනුව** බුද්ධ යන පදය මෙසේ විවරණය කර ඇත: ''චතුසත්‍ය අවබෝධ කළ බැවින්; චතුසත්‍ය ලෝකසත්වයාට අවබෝධ කළ බැවින්; සියල්ල දත් බැවින්; සියල්ල දක්නා බැවින්; අන්‍යයන් විසින් අවබෝධ කරවිය යුත්තකු නොවන බැවින්; විවිධවූ ගුණයන්ගෙන් යුතු බැවින්; සියලු ආසාව ක්‍ෂය කළ බැවින්; උපකෙල්ෂ විරහිත බැවින්; ඒකාන්තයෙන්ම රාගය, දෝෂය,මෝහය දුරුකළ බැවින්; ඒකාන්තයෙන්ම නිකෙළෙස් බැවින්; ඒකායන මග ගිය බැවින්; එකලාව අනුත්තර සම්බෝධිය සාක්ෂාත් කළ බැවින්; අබුද්ධිය නැසූ බැවින් බුද්ධවේ''

▲**බුද්ධ අනුසාසනා**-Buddha anusasana: සියලු බුදුවරුන්ගේ අනුසාසනය නම්: **''සබ්බපාපස්ස අකරණං කුසලස්ස උපසම්පදා-සචිත්තපරියොදපනං එතං බුද්ධාන සාසනං''**. සියලු අකුසල නොකිරීම, කුසල ධර්ම උපදවා ගැනීම, සිත පිරිසුදු කරගැනීම, මේ සියලු බුදුවරුන්ගේ අනුසාසනය වේ. **බලන්න:** ධම්මපදය:14: බුද්ධ වග්ග.

▲ **බුද්ධ අපදාන-**Buddha apadana: බුදුවරු කිනම් හේතුවකින් ලෝකයේ පහළ වෙත්ද යයි ආනන්ද තෙරුන් විසින් කල විමසීමකට අනුව බුද්ධ අපදානය, ගෝතම බුදුන් වහන්සේ වදාළ බව මෙහි විස්තරාත්මකව පෙන්වා ඇත. **බලන්න**:අපදාන පාලි 1:බුද්ධඅපදාන.

▲ **බුද්ධ ගයා**- Buddha Gaya: බුද්ධ ගයාව, බුදුන් වහන්සේ, සම්බෝධිය ලැබූ ස්ථානයය, උතුරු ඉන්දියාවේ පිහිටි මේ ස්ථානය බෞද්ධයන්ගේ පූජනිය භූමියකි. **බලන්න**: ශ්‍රද්ධාවෙන් දැකිය යුතු සිව් ස්ථාන.

▲ **බුද්ධත්වය-** Enlightenment: බුද්ධත්වය: සියළු කෙළෙස් පහකර සම්මා සම්බෝධිය ලැබීමය.

▲ **බුද්ධ අනුගාමික දිට්ඨි-** Views of Buddhist followers: බුදුන් වහන්සේ කෙරහි විස්වාසය ඇතිව, අනාථපිණ්ඩික සිටුවරයා අන්‍යඅගමිකයන්ට ප්‍රකාශ කල කරුණු මෙහි දැක්වේ **සටහන: වජ්ජියාමහිත** ගහපති දැක්වූ කරුණු ගැන **බලන්න**: උපග්‍රන්ථය:3. **මූලාශ්‍ර:** අංගු.නි:(6 ):10 නිපාත, 10.2.5.3. කිංදිට්ඨික සූත්‍රය, පි.360, EAN:10: 93-3 View, p. 534.

▲ **බුද්ධචීවරය-** Robe of The Buddha: බුද්ධ චීවරය, බුදුන් වහන්සේගේ සිවුරය. මෙය පූජනිය වස්තුවකි, පාරිභෝග චෛත්‍යයකි. බුදුන් වහන්සේ, තම චීවරය, මහා කාශ්‍යප තෙරුන් සමග හුවමාරු කරගැනීම පිලිබඳ විස්තර පිණිස **බලන්න**: සංයු.නි: (2): නිදානවග්ග: කස්සප සංයුත්ත: 4.1.11 චීවර සූත්‍රය,පි.352, ESN: 16: Kassapasamyutta: 11 The Robe, p. 821.

▲ **බුද්ධඥාන**- Buddha Nana: බුදුවරුන්ට පමණක් විශේෂවූ ඥාණ 6 කි. මේවා **ෂට් අසාධාරණ ඥාන** ලෙසින් හඳුන්වනු ලබන්නේ බුද්ධභාවයට සීමිතවූ විශිෂ්ඨ ඥාන වන නිසාය: ඉන්ද්‍රිය පරොපරියන්ත ඥාණය, ආසයානුසය ඥාණය, යමක පාටිහාරිය ඥානය, මහා කරුණා සමාපත්ති ඥානය, සබ්බඤ්ඤුත ඥාණය, අනාවරණ ඥාණය. **සටහන්**: විස්තර පිණිස බලන්න: * **පටිසම්භිදා1**: මහාවග්ග ඤාණකථා ** **සුවිසිමහා ගුණය:** රේරුකානේ චන්ද්‍රවිමල මහානාහිමි. **බලන්න**: චේතෝපරිය ඥානය.

▲**බුද්ධ දේශනා** -Buddha's discourses: බුදුන් වහන්සේ වදාළ ධර්මය බුද්ධ දේශනාය. ත්‍රිපිටකය පුරා දැකිය හැක්කේ උන්වහන්සේ මහා කරුණාවෙන් වදාළ දහමය. මෙහිදී පෙන්වා ඇත්තේ, අන්‍යආගමික දිට්ඨි පිලිබඳ බුද්ධ දේශනාවය.**බලන්න**: දිට්ඨි. **මූලාශ්‍ර:** අංගු.නි: (6):10 නිපාත, 10.2.5.5. උත්තිය සූත්‍රය,පි.374, EAN:10: 95-5 Uttiya, p.536.

▲ **බුද්ධ ධාතු**- Buddha's Relics: බුදුවරු පිරිනිවීගිය පසුව, ශාරීරික ධාතු තැන්පත්කොට චෛත්‍ය සදා ඒවාට ගරු බුහුමන් කිරීම බෞද්ධයන්යන්ගේ චාරිත්‍රයකි. **බලන්න**: චෛත්‍ය, මහාපරිනිබ්බාන සූත්‍රය. **සටහන්**: * වර්තමානයේද බුද්ධ ධාතු තැන්පත් කළ පූජනිය ස්ථාන ආසියානු රටවල දැකිය හැකිය: ශ්‍රී ලංකාවේ දළදා මාළිගාවේ, දන්තධාතු තැන්පත් කොට ඇත, බුරුමයේ-මියන්මාරයේ, ස්වේතගොන් චෛත්‍යයේ කේසධාතු තැන්පත් කොට ඇත. ** විස්තර පිණිස බලන්න: ධාතු වංශය. ** ථෙර ථෙරි අපදානයන්හි, අතීතයේ වැඩවිසූ බුදුවරුන්ගේ පිරිනිවන් ස්ථූපයන්ට පුද පූජ කිරීම් දක්වා ඇත. **බලන්න**: උපග්‍රන්ථ:1,2

▲ **බුද්ධ ධජය-** Flag of The Buddha: බුද්ධ ධජය - දහම් කොඩිය ලෙසින් පෙන්වා ඇත්තේ බුදුන් වහන්සේ වදාළ ධර්මයය. **බලන්න**: සංයු.නි: (1): දේවතාසංයුත්ත:ධජග්ග සූත්‍රය.

▲ **බුද්ධ නාම-** Titles of The Buddha: බුදුන් වහන්සේට ගරුකිරීම පිණිස දෙවියන් සහිත ලෝකයා උන්වහන්සේ විවිධ ගරු නාම වලින් හඳුන්වා ඇත: **බලන්න**: උපග්‍රන්ථය:6

▲**බුද්ධ භාසිතය-** Speech of The Buddha: බුද්ධ භාසිතය- බුද්ධ වචනය සත්‍යය, සුභාසිතය. එක් සමයක, සක්දෙවිඳු විසින් විමසනු ලදුව, උත්තිය තෙරුන් මෙසේ වදාළහ: **"එවමෙව ඛො දෙවානමින්ද, යං කිඤ්චි සුභාසිතං සබ්බං තං තස්ස භගවතො වචනං අරහතො සම්මාසම්බුද්ධස්ස, තතො උපාදායුපාදාය මයඤ්චඤ්ඤෙ ච භණාමාති"**. "දේවේන්ද්‍රය, එලෙසින් යම් සුභාෂිතයක් වේ නම් ඒ හැම බස, ඒ භාග්‍යවත් අරහත් සම්මා සම්බුදුරජාණන්වහන්සේ ගේ බුද්ධ වචන වේ. අප, ඒ බුද්ධ භාෂිතය තුලින් ගෙන අපගේ දේශනා කරන්නෙමු" **සටහන:** බුදුන් වදාළ දේවදත්ත විපත්ති සූත්‍රය (අංගු.නි:8 නිපාත), උත්තර තෙරුන් විසින්, භික්ෂූන්හට දේශනා කරනලදී. ඒ ගැන විස්තර දැනගත් සක්දෙවිඳු, එම දේශනාව, තෙරුන් ගේ ප්‍රතිභානයෙන් කළ දේශනාවක්ද? බුදුන් වහන්සේ වදාළ බසක්ද ? යයි තෙරුන්ගෙන් විමසුබව මෙහි දැක්වේ. **මූලාශ්‍ර**:අංගු.නි: (5 කාණ්ඩය): 8 නිපාත:උත්තරසූත්‍රය, පි.46, EAN :8: 8.8.Uththara , p 414.

▼**බුද්ධ භාසිතය සත්‍ය බව** බුදුන් වහන්සේ මෙසේ පෙන්වා ඇත: "මහානාම, ඉදින් මම විවස ව නොහෙනසුලු නියතවූ සම්බෝධිය පිහිට කොට ඇති සෝවාන්හ යි මේ මහා සල් රුකට පවසන්නේ නම් මේ මහා සල් රුකද සුභාසිතය හා දුර්භාසිතය දැන ගන්නේය...". **සටහන:** සරකානි ශාක්‍යයන් මියගිය පසු ඔහු සෝතාපන්න යයි බුදුන් වහන්සේ වදාළ අවස්ථාවේ, සමහර ශාක්‍යයන් ඒ පිලිබඳ සැක කිරීම, බුදුන් වහන්සේගේ ප්‍රකාශයට හේතුවිය. **බලන්න:** උප ග්‍රන්ථය:1.

▲ **බුද්ධ මාතාව-**The Buddha's Mother: බුදුන් වහන්සේගේ මෑණියන්- බුද්ධ මාතාව, මහාමායාදේවියය. විස්තර පිණිස **බලන්න**: බුදුන් වහන්සේ, බු.නි: බුද්ධ වංශය-චරියා පිටකය, ආයුෂ, අල්ප ආයුෂ, බෝධිසත්ව.

▲**බුද්ධ වංසය**- Buddha Vamsa: ලෝකයේ පහළවූ සියලුම බුදුවරුන් හා උන්වහන්සේලාගේ ආරිය ශ්‍රාවකයෝ බුද්ධ වංසය- පෙළපතට අයත්වේ. **බලන්න**: බුදුන් වහන්සේ, දස ආරිය පුද්ගලයෝ, බු.නි: බුද්ධ වංශය හා චරියා පිටකය.

▲ **බුද්ධවිෂය** - Subjects of The Buddha: සාමාන්‍ය පුද්ගලයෙකුට සිතාගත නොහැකි කරුණු පිලිබඳ අවබෝධය ඇත්තේ බුදුවරුන්ට පමණි. ඒවා බුද්ධ විෂය ලෙසින් පෙන්වා ඇත. **බලන්න**: අචින්ත ධර්මතා. **මූලාශ්‍ර:** අංගු.නි: (2): 4 නිපාත: 4.2.3.7 අචින්තෙයියා සූත්‍රය, පි. 171, EAN:4: 77.7 Inconceivable Matters, p. 178.

▲**බුද්ධ ශ්‍රාවකයෝ-**Disciples of The Buddha: සම්බෝධිය ලැබූ බුදුවරුන් කෙරහි භක්තිය ඇතිව, බුද්ධත්වය පිළිගෙන, ගිහිගෙය හැර පැවිදිවූ,: භික්ෂු භික්ෂුණී සාමනේර සාමනනේරි සංඝයා, බුද්ධ ශ්‍රාවකයෝ ලෙසින් හඳුන්වා ඇත. ගෝතම බුදුන් වහන්සේගේ ශ්‍රාවක පිරිස ගැන විස්තර පිණිස **බලන්න:** උපග්‍රන්ථය:1,2,, බු.නි: ථෙර ථෙරි ගාථා, අපදාන.

▼**එක් සමයක බ්‍රහ්ම දෙවියෙක්ගේ** විමසීමකට පිළිතුරු ලෙස මහාමුගලන් තෙරුන් මෙසේ වදාළහ: **"ත්‍රිවිද්‍යා ඇති සෘදධිවිධ ඥානයට පැමිණි පරසිත දැනීමෙහි දක්ෂවූ, ක්‍ෂය කළ ආසව ඇති රහත්වූ, බුදුන්**

**වහන්සේගේ ශ්‍රාවකයෝ බොහෝය". මූලාශ්‍රය:** සංයු.නි: (1): බ්‍රහ්මසංයුත්ත:6.1.5 අපරාදිට්ඨිසූත්‍රය, පි. 286.

▲ **බුද්ධඝෝස ආචාරි-**Venerable Buddhagosha: බුද්ධඝෝස ආචාරීන් වහන්සේ (අටුවා ආචාරී) විසින් සූත්‍ර පිටකයේ අටුවා ග්‍රන්ථ සකස් කරන ලදී: දීඝ නිකායට- **සුමංගල විලාසිනි,** මජ්ජිම නිකායට **- පපංචසූදෙසිනි,** සංයුත්ත නිකායට **- සාරඅර්ථ ප්‍රකාසිනි**, අංගුත්තර නිකායට - **මනෝරථපූරනි**. උන්වහන්සේ විසින් සකස් කල විසුද්ධිමග බෞද්ධයන් අතර ප්‍රචාලිත ග්‍රන්ථයකි. **විස්තර පිණිස බලන්න:** * අංගු.නි: 1 කාණ්ඩය: සංඥාපනය. ** විස්තරාර්ථ සන්න සහිත විශුද්ධි මාර්ගය: ප්‍රස්තාවනාව. ** The Path of Purification: Translated from the Pali by Bhikkhgu Nanamoli: Introduction.

▲ **බුද්ධිය-** Buddhiya: බුද්ධිය ලෙසින් පෙන්වා ඇත්තේ ධර්මය පිලිබඳව ඇති ප්‍රඥාවය, නුවණය. සප්ත බොජ්ඣංග යහපත් ලෙසින් දියුණු කරගැනීම බුද්ධිය පිණිස පවතී යයි බුදුන් වහන්සේ පෙන්වා ඇත**. බලන්න:** සංයු.නි: (5-1) බොජ්ඣංගසංයුත්ත:නීවරණවග්ග: 2.4.6 බුද්ධි සූත්‍රය, පි.216.

▲ **බුද්ධානුස්සති භාවනාව-** Recollection of the qualities of The Buddha: බුද්ධානුස්සති භාවනාව යනු, නවබුදු ගුණ ආදීවූ, බුදුගුණ සිහිකර සිත එකඟකර සමාධිය වඩා ගැනීමය. එම භාවනාව නිවන පිණිස පවතී යයි බුදුන් වහන්සේ වදාළහ. **බලන්න**: භාවනා-අනුසති භාවනා.

▲ **බුදුන් වහන්සේ-** The Buddha: බුදුන් වහන්සේ ලෙසින් මෙහිදී දක්වා ඇත්තේ අපගේ ගෝතම බුදුන් වහන්සේය, උන්වහන්සේ පිලිබඳ විස්තර පිණිස **බලන්න:** උපග්‍රන්ථය:6.

▲ **බුදු ගුණ-** Qualities of The Buddha: බුදු ගුණ අනන්තය, අප්‍රමාණය. බුදු ගුණ පිලිබඳ නියත වශයෙන්ම අවබෝධය ඇත්තේ බුදු වරුන්ට පමණි. සාමාන්‍ය ලෝකයාට බුදු ගුණ නවයක් පිළිබඳ- නව අරහාදී බුදුගුණ අවබෝධයක් ඇත**. බලන්න**: බුදුන් වහන්සේ, ත්‍රිවිධ රත්නය, බුද්ධානුස්සති භාවනාව, බු.නි: බුද්ධවංශ හා චරියා පිටකය.

▲**බුදුපිළිම-**Buddha statues: උද්දේසික වස්තු ලෙසින් හඳුන්වන්නේ බුදුහිමි සිහිපත් කිරීම සඳහා නෙලන ලද බුදුපිළිම වලටය.බුදුගුණ සිහිකර බුදු පිළිමයට නමස්කාර පූජා කිරීම බොදු චාරිත්‍රයකි. මේ චාරිත්‍රය ආරම්භ වුවේ බුදුන් වහන්සේ පිරිනිවන් පෑමෙන් කලකට පසුවය. **සටහන්:** විස්තර පිණිස බලන්න: * **ප්‍රතිපත්ති පූජා:** කටුකුරුන්දේ ඤාණානන්ද භික්ෂු,පහන් කනුව දේශනා. ** **විකිපීඩියා**: බුදුපිළිම- https://si.wikipedia.org/

▲ **බුදුන්ගේ ලේ සෙලවීම-** Shedding the blood of The Buddha: බුදු වරුන්ගේ ලේ සෙලවීම මහා භයානක පාප කර්මයකි. **බලන්න**: ආනන්තරිය පාපකම්ම, කම්මවිපාක,දේවදත්ත භික්ෂුව.

▲ **බුදුසසුන-** Budusasuna: බුදුසසුන - බුද්ධ ශාසනය, බුදුන් වහන්සේ වදාළ ධම්ම විනය බුද්ධ ශාසනයය. ඒ දහම අනුගමනය කරන බුද්ධ ශ්‍රාවක පිරිස (භික්ෂු, භික්ෂුණී) හා ගිහි ශ්‍රාවක පිරිස (උපාසක, උපාසිකා)

බුදුසසුනේ පිරිවරය. තථාගතයන් වහන්සේ පහළවීම සමග බුදු සසුන අරම්භවේ, බැබලේ, ව්‍යාප්තවේ. බුදු සසුනේ හැර ආරිය අටමග හා සතර ශ්‍රමණයන් වෙන තැනක දැකිය නො හැකිය. **බලන්න**: තථාගතයන්වහන්සේ, ආරිය අටමග, සතර ශ්‍රමණ,නවඅංග සාසනය.**මූලාශ්‍රය:** ඛු.නි: උදාන පාලිය: 6.10 තථාගත උත්පාද සූත්‍රය, පි. 304.

බධ

▲**බෝධිය-**Bodhi: ධර්මයේ බෝධිය ලෙසින් පෙන්වා ඇත්තේ නිවන සාක්ෂාත් කරගැනීමේ ප්‍රඥාව ලැබීමය: ලෝකෝත්තර නුවණ- නිවන ලබාදෙන සතර මග ඵල ලැබීමය.බෝධිය ඇතිකරගැනීමට උපකාරීවන ධර්මතා බෝධි පාක්ෂික ධර්මතාය. **සටහන්: *** බුදුන් වහන්සේ සම්බෝධිය ලබාගැනීම පිණිස වැඩසිටි බෝධිරුක ද බෝධිය ලෙසින් හඳුන්වයි.** ඛු.නි: උදාන පාලියේ: බෝධි සූත්‍රයන්ට අනුව බෝධිය: පටිච්චසමුප්පාදය අවබෝධ කරගැනීමය.

▲ **බෝධිරාජ කුමාර-**Prince Bodhi: **බලන්න**: උප ග්‍රන්ථය:3

▲**බෝධිසත්ත්ව:** පාලි: **බොධිසත්ත**- bodhisatta: බෝධිසත්ව: බෝසත්, බෝසතුන්වහන්සේ බුදුකුරු, මහා පුරුෂ **(**Enlightenment Being, a being destined to Buddhahood, a future Buddha) ලෙසින්ද හඳුන්වයි. ධර්මයට අනුව පෙර භවයන්හි බුද්ධත්වය ප්‍රාර්ථනා කර, එම පැතුම ඉටුකරගැනීම පිණිස බලවත් පරිශ්‍රමයක් දරන මහා පුරුෂයෙක් හඳුන්වන්නේ බෝධිසත්ව ලෙසින්ය. සම්මා සම්බුද්ධත්වය සාක්ෂාත් කරගන්නා තෙක් එම උතුම් පුරුෂයා බෝසත් ලෙසින් හඳුන්වයි. එතුමා ලෝක සත්ත්වයන් කෙරහි පතළ මහා කරුණා මයිත්‍රීය ඇතිව සම්මා සම්බුද්ධත්වය ලබාගැනීමට අනන්ත අප්‍රමාණ කල්ප ගණනක් වීරියකරමින් පාරමිතා සම්පූර්ණ කරගන්නා බව ජාතකකථා වල සඳහන්වේ. බලන්න:ඛු.නි:ජාතක,බුද්ධ වංශපාලිය. **සටහන්: *** අටුවාවට අනුව බෝධි යනු අවබෝධය-ඥානයය. එම අවබෝධය සම්පන්නවූ උතුමා බෝධිසත්වය, ප්‍රඥාවන්තය, මුණිවරයෙකි. බොහෝකාලයකට පෙර සම් බුදුවහන්සේ ගේ පාමුල, බුද්ධත්වය පැතු බෝසත්වරු සැමවිටම ප්‍රඥාවන්තව කටයතු කරන්නෝය. **බලන්න**: ESN: note 11, p, 937 ** බුද්ධත්වය පිණිස, බෝසත්වරු උතුම් පාරමිතා ධර්ම සම්පූර්ණ කරගනි. **බලන්න**: පාරමී, ඛු.නි: බුද්ධවංශ හා චරියා පිටකය.**ශබ්දකෝෂ: B.D**:p,35: "**Bodhisatt**a: 'Enlightenment being', is a being destined to Buddhahood" **P.T.S**: p, 1117: "**bodhi-being**," ...a being destined to attain fullest enlightenment or Buddhaship'.

▼**ගෝතම බුදුන්වහන්සේ** හා පෙරවැඩසිටි: **විපස්සී, සිඛි, වෙස්සභූ, කකුසඳ, කෝණාගමන, කාශ්‍යප** බුදුවරුන්, බෝසත්ව ගතකළ කාලයේදී සම්බෝධිය ලබාගැනීම පිණිස කටයුතුකළ ආකාරය මේ සූත්‍රවල විස්තරාත්මකව දක්වා ඇත. **බලන්න**:අතීතබුදුවරු

**මූලාශ්‍ර:** සංයු.නි: (2):අභිසමයසංයුත්ත-1.1.4 සිට 1.1.10 සූත්‍ර , පි. 30, 1.7.5 නගර සූත්‍රය, පි. 184, ESN: Abhisamayasamyutta- 4.4 to 10.10 Suttas p. 614, 65.5. The City, p. 701.

▼ **බෝධිසත්ව මවට** අල්ප ආයුෂ ඇත. **බලන්න**: අල්ප ආයුෂ, බුද්ධ-මාතාව. **මූලාශ්‍රය**: ඛු.නි: උදාන පාලිය: සෝණවග්ග: 5.2 අප්පායුක සූත්‍රය,පි.250.

▼ **වෙනත් මූලාශ්‍ර:1**. **ඛු.නි: බුද්ධවංශ-චරියා පිටකය**: දීපංකර සිට ගෝතම දක්වාවූ බුදුවරුන්ගේ බෝසත් ජීවිත විස්තරාත්මකව දක්වා ඇත. **2. සද්ධර්මාලංකාරය**:ශ්‍රී ලංකා ප්‍රාචීන භාෂොපකාර සමාගමේ සංස්කරණය-කල්ප ගණනාවක් මුළුල්ලේ බුද්ධත්වය ප්‍රාර්ථනා කළ බෝධිසත්‍වයන්ගේ පූර්ව චරිතාපදානය විස්තරවේ. **3. The Coming Buddha Metteyya** by Sayagyi U Chit Tim, The Wheel No. 381/383: BPS, Kandy, 1992: බෝධිසත්‍වයන් ගේ විවිධත්වය හා පාරමිතා සම්පූර්ණකරගැනීම, මෛත්‍රිය බෝධිසත්ව පිලිබඳ විස්තර දක්වා ඇත. **4**. **The Birth-stories of the Ten Bodhisattas and the Dasabodhisattuppattikathā** by Ven. H.Saddhatissa, PTS, 1975: ගෞතම බුදුන් වහන්සේගෙන් පසුව පහළවන බෝසතුන් දසදෙනෙක් පිලිබඳ විස්තර සඳහන්වේ.

▼ **බෝධිසත්ව** උපත පිලිබඳ විස්තර පිණිස **බලන්න**: බුදුන් වහන්සේ.

▲**බෝධි පාක්‍ෂිකධම්ම-බොධිපක්ඛිකධම්ම-** bodhipakkhiya-dhamma: මේවා නිවන සාක්ෂාත් කරගැනීමට අවශ්‍යවන ධර්මතාය, 37 කි (සත්තිස් බෝධි පාක්‍ෂික ධර්මතා). බෝධිය වැඩීම යනු ශීල, සමාධි, ප්‍රඥා සම්පූර්ණ කරගැනීමය. **සටහන:** සංයු.නි: (5-1) මහාවග්ග: බොජ්ඣංග සංයුත්ත, සතිපට්ඨාන සංයුත්ත, ඉන්ද්‍රිය සංයුත්ත, සතිපට්ඨාන සංයුත්ත, සම්මාපධාන සංයුත්ත, බල සංයුත්ත, ඉද්දිපාද සංයුත්ත යේ මේවා විස්තරාත්මකව දක්වා ඇත. **ශබ්දකෝෂ: පා.සි.ශ**: පි.402 : **"බොධිපක්ඛික ධම්ම' :** සර්වඥ ඥානයා ලැබීමට පක්‍ෂයෙහි වූ ධර්ම, බුද්ධත්වයට පක්‍ෂවූ ධර්ම" **B.D**: p. 72: "bodhi: to awaken, enlightenment… bodhipakkhiya-dhamma: as components of the state of enlightenment and contributory factors to its achievement are: 37 things pertaining to enlightenment". **P.T.S**: p. 1117: "**Bodhi**: knowledge, enlightenment, the knowledge possessed by a Buddha, bodhipakkhiyā dhammā qualities or items constituting or contributing to Bodhi..."

▼**බෝධි පාක්‍ෂික ධර්මතා 37:** 1) සතර සතිපට්ඨානය 2) සතර සම්‍යක් ප්‍රධාන විරිය 3) සතර ඍද්ධිපාද 4) ආධ්‍යාත්මික පංච ඉන්ද්‍රිය 5) ආධ්‍යාත්මික පංච බල 6) සප්ත බොජ්ඣංග 7) ආර්ය අෂ්ඨාංගික මාර්ගය. සසුනේ බඹසර දිගුකලක් පැවතීම පිණිස, බොහෝ දෙනාගේ හිත සුව පිණිස මේ ධර්මයන් 37, සංඝයා එක්රැස්ව යහපත්ලෙසින සජ්ජායනා කිරීම සුදුසුය යි බුදුන් වහන්සේ වදාළහ. **සටහන**: මහාපරිනිබ්බාන සූත්‍රයේදී, බුදු සසුන දිගුකලක් පවත්වා ගැනීම පිණිස, 37 ක්වූ බෝධි පාක්ෂික ධර්මතා මැනවින් වර්ධනය කරගන්න යයි බුදුන් වහන්සේ තම ශ්‍රාවකයන්ට අවවාද කර ඇත.**මූලාශ්‍ර: දීඝ:නි:** (3 ): පාසාදික සූත්‍රය, පි.210, EDN**:**29**,** The delightful discourse, p.318,දී.ස: (2) මහාපරිනිර්වාණ සූත්‍රය, ඡෙදය 80, පි.126, EDN: Mahaparinibbana sutta, p.171.

▼ **බෝධි පාක්ෂික ධර්මතා නිවන් මගය- අසංඛත මගය**: **මූලාශ්‍ර:**සංයු.නි: (4**):** අසංඛත සංයුත්ත: 9.1.5- 11සූත්‍ර, පි. 662, ESN: Asankatasamyutta: p. 1493.

▼ **බෝධි පාක්ෂික ධර්මතා** අතරින් ප්‍රඥාඉන්ද්‍රිය අග්‍රය**.** දඹදිව හටගත් රුක් අතුරින් දඹරුක අග්‍රවේ, එලෙස බෝධි පාක්‍ය ධර්මතා අතුරින්, ප්‍රඥාඉන්ද්‍රිය අග්‍රය. **බලන්න**: උපග්‍රන්ථය:5.**මූලාශ්‍රය**: සංයු.නි: (5-1): මහාවග්ග: ඉද්දිපාදසංයුත්ත:සම්බෝධිවග්ග: 4.7.7 රුක්ඛ සූත්‍ර 4 කි, පි.442.

▼ **වෙනත් මූලාශ්‍ර**: **1**. "පංචස්කන්ධයේ දුකින් මිදීමට, අපාය දුකින් මිදීමට, නිවන් සැපය ලැබීම සඳහා බුදුන්වහන්සේ විසින් ලෝකයාට දක්වා ඇති මාර්ගය බෝධිපාක්ෂික ධර්ම වැඩීමය. අතීතයෙහි යමෙක් නිවන් දුටුවේ නම් ඒ හැම දෙනා නිවන් දුටුවේ බෝධිපාක්ෂික ධර්ම වැඩීමෙන්ය. අනාගතයෙහි නිවන් දකිනවුන් එය සිදු කරගන්නේ බෝධිපාක්ෂික ධර්ම වැඩීමෙන්ය. එය හැර නිවනට තවත් මගක් නැත්තේය. තවද තමන් රකිනා ශිලයෙන් ගතයුතු උසස් ප්‍රයෝජනය ලැබීම සඳහා බෝධිපාක්ෂික ධර්ම වැඩිය යුතුවේ". **බෝධිපාක්ෂික ධර්ම විස්තරය**, පි. 7,රේරුකානේ චන්දවිමල මහානාහිමි. **2. ආර්යයවංශ ධර්ම පුස්තක මාලා 1-4,** සම්පාදනය: මොරටුවේ සිරි සාසනවංශ තෙරුන්**, 1948.**

▲**බෝධිරුක**- Bodhi Tree: බෝධිරුක (බෝධිය-බෝගස): බුදුවරු, සම්බෝධිය- නිවන ලබා ගැනීම පිණිස වැඩසිටි රුක්ය.අපගේ ගෝතම බුදුන්වහන්සේ පිට දුන් බෝධිය, ඉන්දියාවේ, බුද්ධගයාවේ, වර්තමාන කාලයේ ද දැකිය හැකිය. එහි ශාකාවකින් වැඩුන, ශ්‍රී මහා බෝධි රුක, ශ්‍රී ලංකාවේ, අනුරාධපුරයේ ස්ථාපිත කර ඇත.

▼**බුදුන් වහන්සේ**, තමන් වහන්සේට පෙර වැඩසිටි බුදුවරු 6 නම හා තමන් වහන්සේ, සම්බුද්ධත්වය ලැබූ අවස්ථාවේ වැඩසිටි බෝධිරුක් ගැන විස්තර දක්වා ඇත: **විපස්සි බුදුන් වහන්සේ**: පලොල් රුකමුල (foot of a trumpet-flower tree), **සිඛි බුදුන් වහන්සේ:** හෙළඅඹ- සුදුඅඹ රුකමුල (white-mango tree**), වෙස්සභූ බුදුන් වහන්සේ:** සල් රුකමුල (*sā l*-tree), **කකුසන්ධ බුදුන් වහන්සේ:** මහරි රුකමුල (acacia-tree), **කොණාගමන බුදුන් වහන්සේ:** දිඹුල් රුකමුල (fig-tree**), කාශ්‍යප බුදුන් වහන්සේ:** නුග රුකමුල (banyan-tree), **ගෝතම බුදුන් වහන්සේ:**ඇසතු රුකමුල (*assattha*-tree). **බලන්න:** EDN: note: 261, p. 421. **මූලාශ්‍ර**: දීඝ.නි: ( 2): 1: මහාපදාන සූත්‍රය, ඡෙදය 9, පි. 18, EDN: 14 Mahâpadāna Sutta: The Great Discourse on the Lineage, p. 151.

## බඳ

▲ **බිඳීයාම-** Shattered: බිඳීයාම ලෙසින් පෙන්වා ඇත්තේ රූපය ක්‍රමයෙන් විනාශවී යාමය. **බලන්න:** බජ්ජනීය.

▲**බිඳෙන සුළු-** Subject to Shatter: බිඳෙන සුළු ලෙසින් පෙන්වා ඇත්තේ පංච උපාදානස්කන්ධයේ ස්වාභාවයය.**බලන්න**: පංච උපාදානස්කන්ධය.

**බන**

▲ **බන්ධන-** bondage: බන්ධන-බැඳීම් යනු සසරට බැඳ තබන කෙළෙස්ය: කාමය, ක්‍රෝධය, මෝහය, මානය, දිට්ඨිය. **බලන්න**:සංයු.නි: (1) දේවතාසංයුත්ත: කතිචින්ද සූත්‍රය. **සටහන්**:* ලෝකයා රාගයෙන් බැඳී ඇත, එයට පදනම විතර්ක කිරීමය, තණ්හාව අවසන් කරගැනීමෙන් සියලු බැඳීම් සිඳී යන බව බුදුන් වහන්සේ පෙන්වා ඇත**. බලන්න**:සංයු.නි: (1) දේවතාසංයුත්ත:1.7.5 බන්ධන සූත්‍රය. ** සංයු.නි (1) දේවතා සංයුත්ත:1.2.9 කුටිකා සූත්‍රය. මාපිය,බිරිඳ, දරුවන්, පරම්පරාව ආදී සියලු තණ්හා බැඳීවලින් මිදී ඇත. ** ආසව නමැති බන්ධනයෙන් ලෝක සත්වයා බැඳී ඇත: සංයු.නි: (1) දේවතාසංයුත්ත: පිහිත සූත්‍රය. ** ධන ධාන්‍ය අඹුදරුවන් ආදිය ගැන ඇති තණ්හාව නිසා ඇති කෙලෙස් බන්ධන මහා බරපතල බන්ධනවේ (නිරයට වැටීමට වඩා). එසේවුවත්, අතිතයෙසිටි පුරාණ පඬිවරු ඒ බන්ධන බිඳ හිමවතට ගොස් තපස් දම් පිරුබව බුදුන් වහන්සේ වදාළහ. **බලන්න:** සංයු.නි: (1): කෝසල සංයුත්ත:බන්ධනසූත්‍රය.** ඉච්ඡාව, ලෝකය බැඳගෙන ඇත. **බලන්න**: ඉච්ඡාව.

▼ **ගිහි බන්ධන:** කාමලෝකයට ඇති බන්ධන ගිහි බන්ධනයන්ය. පුරිසබන්ධන හා ස්ත්‍රීබන්ධන ගිහි බැඳීම්ය, මේ තණ්හා බැඳීම් සසර දික් කරයි. පුරිසබන්ධනය යනු කාන්තවක් විසින් පුරුෂයෙක් ගේ සිත තමන් වෙත බැඳ ගැනීම ය. ස්ත්‍රීබන්ධනය යනු පුරුෂයෙක් විසින් කාන්තාව කගේ සිත තමන් වෙත බැඳ ගැනීම ය. එම බැඳීම ආකාර 5 කි: 1) රූපයෙන්2) සිනහාවෙන් 3) කතාවෙන් 4) ගීතයෙන් 5) හැඬිමෙන් 6) පෙනුමෙන් (ඇඳුම් පැළඳුම්) 7)තෑගි දීමෙන් 8) පහසින්.**මූලාශ්‍ර**:අංගු.නි: ( 5 ) :8 නිපාත:බන්ධන සූත්‍ර 2කි, පි.102, EAN:8: Bondage suttas, p. 421.

▼**වෙනත් මූලාශ්‍ර** :**1**. “ඉතාම බලගතු බන්ධනය ලෙස දක්වා ඇත්තේ: ගිහි ජීවිතය සම්බන්ධ බන්ධනයන්ය- පහත් ලෝකය කරා ඇදගෙන යන බන්ධන. ගෘහබන්ධන ලිහිල්වගේ පෙනුනත් ඒවායෙන් මිදීම අපහසුය. වරක ලිහිල් කර දැම්මද නැවත නැවත ගිහිජීවිතය කරාම-කාමලෝකයටම ඇදගෙන එති” **අබිනික්මන:** කටුකුරුන්දේ ඤාණානන්ද භික්ෂු, පහන්කනුව ධර්ම දේශනා.

**බප**

▲ **බ්‍යාපන්න චිත්ත-**Mind with Ill will: බ්‍යාපන්න චිත්ත ලෙසින් දක්වා ඇත්තේ තරහ-ව්‍යාපාදය ඇති සිතය. එම සිත ඇතිවිට අකුසල කර්මය සකස්වවේ (කම්මපථ). **බලන්න**: ව්‍යාපාදය **මූලාශ්‍රය**:අංගු.නි: (2 ) : 4 නිපාත:කම්මපථ වග්ග:4.7.9 බ්‍යාපන්න චිත්ත සූත්‍රය,පි. 513.

**බබ**

▲ **බැබලීම-**Shining : ලෝකය හිරු විසින් දිවා කලද, සඳු විසින් රාත්‍රීයේද බබලවති.සන්නාහ සන්නද්ධ වූ විට ක්‍ෂත්‍රියාද බැබලේ. එහෙත්, බුදුන් වහන්සේ ගේ තෙදින්, මුළු රෑ හා දිවාකලම බැබලේ. **මූලාශ්‍ර:** සංයු.නි: (2) නිදානවග්ග:භික්ඛුසංයුත්ත: 9.1.11 මහා කප්පින සූත්‍රය,පි.460.

**බම**

▲**බමුණා-** Brahmin: බමුණා-බ්‍රාහ්මණයා: බමුණු කුලයේ- බ්‍රාහ්මණ ගෝත්‍රයේ පුරුෂ පක්ෂයය. බැමිණිය- බ්‍රාහ්මණිය, එම කුලයට අයත් කාන්තාවය.බුදුන් වහන්සේ වැඩසිටි සමයේ ඉන්දියාවේ පැවති උසස් කුලයකි. **බලන්න:** බ්‍රාහ්මණ කුලය, ගෝත්‍රය.

▲**බමුණු පච්චරොහණ උත්සවය-** Paccorohanni Festival of Brahmins: එක්සමයක බුදුන් වහන්සේ, ජානුසෝනි බමුණාගෙන්, බමුණු කුලයේ උත්සවයක්වූ පච්චොරොහණය පිළිබඳව විමසුවිට ජානුසෝනි බමුණා මෙසේ පැවසුහ: "උපෝසත දිනයේදී (පුන්පොහෝදින),බමුණන්, හිස් සෝදා, අලුත් කොමු රෙදි පැළඳ (ලිනන්-හන වලින් කලරෙදි), බිම අමු ගොමතවරා, ඒ මත අමු හීතන (කුස-තණ) අතුරා එම මායිම හා ගිනිපුදන තැනේ මායිම අතර සයනය කරති. රාත්‍රි යේදී, ඔවුන් තුන්විටක් අවදිවී, ඇඳිලිබැඳ, ගිනි දෙවියා ට මෙසේ නමස්කාර පූජා පවත්වති: 'අපි පහත්වී, භවතුන්ට නමස්කාර කරමි! අපි පහත්වී, භවතුන්ට නමස්කාර කරමි!'. ඉන්පසු, බමුණෝ බොහෝ තෙල්, ගිතෙල් හා වෙඬරු ගින්නට (ගිනිදෙවියනට-අග්නි) පූජා කරති. පසුදින උදයේ ඔවුන්, බොහෝ බමුණන්හට, අග්‍රවූ රසැති ආහාරපාන වලින් සංග්‍රහ කරති'.මෙය පැරණි චාරිත්‍රයකි.එම විස්තරය ඇසූ බුදුන් වහන්සේ වදාළේ: 'ආරියවිනයේ පච්චොරොහණය' වෙනස් බවය. **බලන්න**: ආරිය විනයේ පච්චොරොහණය. **මූලාශ්‍ර**:අංගු.නි:(6): 10නිපාත: පච්චොරොහණි වගග,10.3.2.7.පඨම පච්චොරොහණි සූත්‍රය,පි.452, EAN:10:II Paccorohanni 119-7, Paccorohaṇī -1,p.546.

▲ **බමුණන් පිරිසිදුවීම-**Purification of Brahamin: මෙය පැරණි චාරිත්‍රයකි. බුදුන් වහන්සේ ගේ විමසීමක් අනුව, තමන් බමුණන්ගේ පිරිසිදුවීමේ ක්‍රමයට කැමති බව චුන්දකම්මාර පුත්ත පවසා ඇත: "... දියපිරුන සෙම්බු රැගෙන, මල්දම් පැළඳගෙන, පූජනිය ගිණි දල්වන, දියේගිලි ස්නානය කරණ, බටහිරදිග බමුණන්ගේ මට රුචිය.ඒ බමුණෝ, පළමුව තමන්ගේ ගෝලයන්ට මෙසේ නියම කරති: අළුයම, යහනින් නැගිට බිම අතුගාදමන්න; නැතිනම්, අමුගොම ගෙන බිම පිරිමදින්න, එසේත් නැතිනම් තණකොළවලින් බිම පිරිමදින්න; එසේත් නැතිනම්, පූජනිය ගින්න දල්වන්න; එසේත් නැතිනම්, සූර්යවන්දනය කරන්න; එසේත්නැතිනම්, හවස්වරුව ඇතුලත්ව තුන්වරක් දියේ ගිලි ස්නානය කරන්න". ඉන්පසුව බුදුන් වහන්සේ 'ආරියවිනයේ පිරිසිදුබව' පිළිබඳව වදාළහ. එම දේශනාව අසා සතුටට පත් චුන්ද, දිවිහිමියෙන් බුදුසසුනේ උපාසකයෙක් බවට පත්විය. **බලන්න**: ආරියවිනයේ පිරිසුදුබව. **මූලාශ්‍ර**: අංගු.නි:(6 කාණ්ඩය):10නිපාත,ජානුසොණිවගග,10.4.2.10,චුන්ද සූත්‍රය, පි.508,EAN:10:II, Jāṇussoṇī,176.10, Cunda,p.553.

▲**බමුණන්ගේ මළවුන් අනුස්මරණය -**Brahamin's way of remembering dead: බුදුන් වහන්සේ කළ විමසීමක් අනුව ජානුසෝනි බමුණා, බමුණන් මළවුන් අනුස්මරණය පිළිවෙල පැවසුහ. මෙය පැරණි චාරිත්‍රයකි. "තමන්ගේ, මියගිය පවුලේඅය හා ඥාතින් අනුස්මරණය කිරීම පිණිස, බමුණෝ තැගිපූජා ගෙන මෙසේ පවසති: ' අපගේ, මියගිය පවුලේඅය හා නෑදෑයන් මේ තෑගි පූජා භුක්ති විඳිත්වා!' එම පුදපූජා ඔවුන් භුක්ති විඳින්නේද? යයි බමුණා ඇසුවිට,බුදුන් වහන්සේ වදාළ පිළිතුරු

මෙහි දක්වා ඇත.සතුටට පත් ජානුසොණි බමුණා දිවිහිමියෙන් උපාසකයෙක් විය.**බලන්න**: මළවුන් අනුස්මරණය කිරීම, EAN:note 2169, p. 684. **මූලාශ්‍ර**::අංගු.නි: (6 ):10 නිපාත:10.4.2.11**,** ජානුස්සෝනි සූත්‍රය,පි.518, EAN:10: 177.11 Jāṇussoṇī,p.553.

▲**බිම්බිසාර රජ**- King Bimbisara : මගධයේ අධිපති බිම්බිසාර රජ- සේනිය බිම්බිසාර, බුදුන් වහන්සේගේ සෝතාපන්න ගිහි ශ්‍රාවකයෙකි, අජාසත් රජුගේ පියාය, ධාර්මික රජෙකි. මරණින් පසු චාතුර්මහාරාජික දෙව්ලොවෙහි ජනවසභ නම් දෙවියෙක්ව පහළව, බුදුන් වහන්සේ බැහැදකිමට පැමිණීම පිලිබඳ විස්තර මේ සූත්‍රයෙහි දක්වා ඇත. මේ රජතුමා විසින් පළමු අරණ්‍යාවූ වේළුවනය- කලන්දක නිවාපය, බුදුන් වහන්සේ ප්‍රමුඛ සංඝයාට පිරිනමන ලදී. **බලන්න:** වේළුවනය **සටහන**:බුදුන් වහන්සේ රජගහ නුවරදී බිම්බිසාර රජ හා පිරිසට දහම් දේශනා කිරීම හා බිම්බිසාර රජතුමා සෝතාපන්නවීම පිලිබඳ විස්තර පිණිස **බලන්න**: වින.පි: මහාවග්ග පාලි: 1:මහාඛන්ධක:74 බිම්බිසාර සමාගමක. **බලන්න**:උපග්‍රන්ථය:3 **මූලාශ්‍ර:**දීඝ.නි: (2 ): 5 ජනවසභ සූත්‍රය, පි. 321, EDN: 18 Janavasabha Sutta, p. 209.

**බඹ**

▲ **බඹ-**Bamba: බ්‍රහ්ම ලෝකයේ වාසය කරන උසස් දෙවියෝ, බඹ ලෙසින් ද හඳුන්වති.

▲**බඹසර -** Celibacy: බඹසර - බ්‍රහ්මචරියාව යනු කාම සේවනයෙන් වැලකි ආගමිකවූ උසස් ජීවිතයක් (holy life) ගෙනයාමය.බුදුසසුනේ බඹසර විසීම: ගිහිගෙයින් නික්ම, පැවිදිව, දුක කෙළවර කරගැනීමේ අරමුණ ඇතිව විරියෙන් යුතුව ආධ්‍යාත්මික ජීවිතය ගත කිරීමය.අරහත්වය ලැබීම බඹසර සම්පුර්ණ කරගැනිමය. **බලන්න:** බ්‍රහ්මචරියාව.

**බය**

▲**බිය-**Fear: ලෝකයාට කායික අපදා හා මානසික අපදා නිසා බිය (භය-භීතිය) ඇතිවේ. සූත්‍ර දේශනාවල විවිධවූ බිය විස්තර කර ඇත:* **සතර බිය**: 1) ජාති, ජරා, ව්‍යාධි හා මරණ බිය. 2) අග්නි බිය (ගින්දර), උදකබිය (ජලය), රාජබිය, සොර බිය (චෝර). ** **ආත්මානුවාද බිය**: තමන් ත්‍රිවිධ දුසිරිතයේ හැසිරීම නිසා ඇතිවියහැකි ආදීනව පිලිබඳ බිය. එලෙස බියපත් වන පුද්ගලයා, සුසිරිතය වඩා ගනී. ** **පරානුවාද බිය**: තමන් ත්‍රිවිධ දුසිරිතයේ හැසිරීම නිසා ලෝකයාගෙන් අපවාද ලැබේය යන බිය. එලෙස බියපත් වන පුද්ගලයා, සුසිරිතය වඩා ගනී. ** **දණ්ඩබිය**: වැරදි කිරීම නිසා දඬුවම් ලැබේය යන බිය. එලෙස බියපත් වන පුද්ගලයා, යහපත් ජිවිතයක් ඇති කර ගනී. **දුගතිබිය**: අයහපත් කර්ම නිසා දුගතිගාමි වේ යන බිය නිසා ඒ දේ නොකරයි.

4) ජලය නිසා ඇතිවන බිය: රළ පහරට ගසාගෙන යාමේ බිය, කිඹුලන් නිසා ඇතිවන බිය, දියසුළි වලට හසුවීමේ බිය, චන්ඩ මසුන් නිසා ඇති බිය. **බලන්න**: අංගු.නි: (2) 4 නිපාත:කේසිවග්ග: බිය සූත්‍ර 2කි, භයවග්ග:සූත්‍ර 2කි. ** **පස් බිය** ( පංච භය): 1) ජීවිතවෘත්තිය - ජීවිතය ගෙනයාම පිළිබඳව) 2) ගැරහුම් ලැබීමේ බිය 3) පිරිස්මැදට යාමට ඇති

බිය 4) මරණ බිය 5) දුගතියේ- අපායේ යළි උපත ලැබීමේ බිය: **බලන්න**:අංගු.නි: (5) 9 නිපාත:සම්බෝධිවග්ග:බලසංග්‍රහ වත්ථු සූත්‍රය,

▼**ධර්මය යහපත්** ලෙසින් වඩාගත් පුද්ගලයාට බිය රහිතව වාසය කලහැකිබව ම.නි:භයභෙරව සූත්‍ර යේ පෙන්වා ඇත.

▼ **බිය යන ශබ්දය** කාමයන්ට ඇති නාමයක්ය යි බුදුන් වහන්සේ පෙන්වා ඇත. **බලන්න**: අංගු.නි: (5) 6 නිපාත: 6.1.1.3 භය සූත්‍රය.

▼**සෝතාපන්න** වීමෙන් පංච බියෙන් මිදිය හැකිවේ, **බලන්න**:අංගු.නි:10 නිපාත: උපාලිවග්ග: භය සූත්‍රය.

## බර

▲**බර-**Weight: ධර්මයට අනුව බර ලෙසින් පෙන්වා ඇත්තේ පංච උපාදානස්කන්ධය - මම යයි අල්වාගෙන - ඔසවාගෙන සිටීමය. **බලන්න:**භාරය

▲**බරණැස්නුවර** -Baranas Nuwara: කාසි දේශයේ ගංගානම් නදියේ උතුරු ඉවුරේ පිහිටි ප්‍රධාන නුවරකි. බුදුන් වහන්සේගේ මංගල දේශනය: ධම්මචක්කප්පවත්තන සූත්‍රය දේශනා කළේ මෙහිදීය. වර්තමානයේ වරණාසි ලෙසින් හඳුන්වයි.**බලන්න**: උපග්‍රන්ථ:1,3.

▲ **බොරුකීම**-False speech: මෙය දස අකුසලයකි. **බලන්න**: මුසාවාදය

## බල

▲**බලය දීම-** Giving power: ආහාර දීම-දානය, කායික, මානසික බලයදීමය. **බලන්න**: දානය. **මූලාශ්‍ර**: සංයු.නි: (1) : සගාථවග්ග: දේවතා සංයුත්ත: ආදිත්ත වර්ගය, කිංදද සූත්‍රය , පි. 82, ESN: 1: Devatha samyutta: 42.2 Giving what ? , p. 117.

▲ **බල ධර්ම-**Bala dharma: ධර්මයේ බල ලෙසින් පෙන්වා ඇත්තේ නිවන සාක්ෂාත් කරගැනීමට උපකාරීවන ධර්මතාය. පංච බල ආදී. **සටහන්**: * පංච බල යහපත් ලෙසින් වැඩීම නිවන සාක්ෂාත් කරගැනීමට මගය. **බලන්න**: සංයු.නි: අසංඛතසංයුත්ත:9.1.9 බල සූත්‍රය හා 9.2.30 පංචබල සූත්‍රය. ** සංයු.නි: (4) අසංඛතසංයුත්ත:සද්ධාබල සූත්‍රයේ දී : ශ්‍රද්ධාබලය ඇතිනම් කෙනෙකුට නිවන්මග ලැබිය හැකිබව පෙන්වා ඇත.** සංයු.නි: (5-1) මග්ගසංයුත්ත:1.14.1 හා 1.14.2, 1.14.3, 1.14.4 බල සූත්‍ර: ශීලබලය, ආරියඅටමග වර්ධනයට හේතුවේ යයි පෙන්වා ඇත.

▲**බල දෙක-**Two powers: ආධ්‍යාත්මික මාර්ගය වඩා ගැනීමට පිහිටවන බල 2ක් බුදුන් වහන්සේ පෙන්වා ඇත: 1) **පටිසඞ්ඛාන බලය** - අවර්ජනාකිරීම (power of reflections).2) **භාවනා බලය** - වර්ධනය කිරීම (power of development). මේ බල සේඛ බලය ලෙසින් ද දක්වා ඇත. **බලන්න**: පටිසඞ්ඛාන බලය, භාවනා බලය.සේඛ බලය.

▲ **බල සතර-** Four Powers: ආධ්‍යාත්මික ජීවිතයට උපකාරවන, විවිධවූ සිව් බල: 1) වීරියබලය ,සතිබලය ,සමාධිබලය, ප්‍රඥාබලය.2) ප්‍රඥාබලය, සමාධිබලය, අනවද්‍යබලය,සංග්‍රාහබලය.3) පටිසංඛාන බලය,

භාවනාබලය, අනවද්‍යබලය, සංග්‍රාහබලය.**මූලාශ්‍රය:** අංගු.නි: ( 2) 4 නිපාත: ඉන්ද්‍රියවග්ග:4.4.1.2-4.4.1.5 බලසූත්‍ර.

▼ **වීරියබලය,** සතිබලය,සමාධිබලය, ප්‍රඥාබලය සිව්බල ලෙසින් මේ සූත්‍රයේ ද පෙන්වා ඇත. **මූලාශ්‍ර:** අංගු.නි: ( 2 ) 4 නිපාත 4.6.8 බල සූත්‍රය, පි. 504, EAN:6: 261.8 Powers, p. 232.

▼**ප්‍රඥාබලය,**වීරියබලය,අනවජ්ජබලය,සංග්‍රහ බලය, බල සංග්‍රහ වත්ථු ලෙසින් පෙන්වා ඇත. මේ සතර බල ඇති පුද්ගලයා **පස්බිය** ඉක්මවා ඇත: 1) ආජීවිකබිය (ජීවිතවෘත්තිය පිළිබඳව) 2) ගැරහුම් ලැබීමේ බිය (අසිලෝකභය) 3) පිරිස්මැද පසුබෑමේ බිය (පරිසසාරජ්ජභය) 4) මරණ භය 5) දුගති- අපාය භය. **බලන්න**:අංගු.නි:9 නිපාත: සම්බෝධි වග්ග:බලසංග්‍රහ වත්ථු සූත්‍රය.

▲ **බල පහ-**Five powers: බල පහ ලෙසින් පෙන්වා ඇත්තේ: ශ්‍රද්ධාබලය, හිරිබලය, ඔතප්පබලය, විරිය බලය, ප්‍රඥා බලය. **බලන්න:** අංගු.නි: (3) 5 නිපාත:කිම්බිලවග්ග:5.5.1.4 බල සූත්‍රය. **සටහන්**: * තථාගත බල, සේඛ බල ලෙසින්ද මේ බල 5 පෙන්වා ඇත. මේ අතුරින් ප්‍රඥාබලය අග්‍රය. ** අංගු.නි: (3) 5 නිපාත: බලවග්ග සූත්‍රයන්හි මේ පංච බල විස්තරාත්මකව පෙන්වා ඇත.

▲ **බල අට-** Eight powers: සාමාන්‍ය ලෝකයේ ඇති බල අට: 1) ළදරුවන්ට: කඳුළු සෙලිම 2) කාන්තාවට: තරහ ගැනීම 3) සොරාට: ආයුධය 4) රජතුමාට: රාජබලය 5) අනුවණ මිනිසාට: දොස්කීම 6) පණ්ඩිතයාට: විචාරකිරීම 7) උගතාට: ආවර්ජනය කිරීම 8) ශ්‍රමණ බ්‍රාහ්මණ යන්ට: ඉවසීම.**සටහන**: මේ බල අතරින් ඉවසීමේ බලය අග්‍රවේ. **මූලාශ්‍ර:** අංගු.නි: ( 5) 8 නිපාත: 8.1.3.7බල සූත්‍රය, පි. 146, EAN:6: 27.7 Powers, p. 426.

▲**බල අතුරින් අග්‍ර බලය-**The greatest power: පංච බල අතුරින් ප්‍රඥාබලය අග්‍රය.**උපමාව:** කූටාගරයේ මුදුන- කූටය අග්‍රය, සියල්ල එක්වන්නේ එතැනය. එලෙස,පංච බල එකතු කරන, ප්‍රඥාව අග්‍රවේ.**බලන්න**: උපග්‍රන්ථය:5, අංගු.නි: (3) 5 නිපාත:බලවග්ග: 5.1.2.6 බලඅග්ග සූත්‍රය.

▼ **ප්‍රඥා බලය මෙසේ දක්වා ඇත:**කෙනෙක් අකුසල හා කුසල ධර්ම, සාවද්‍ය හා නිරවද්‍ය ධර්ම, කළු හා සුදු ධර්ම, සේවනය හා අසේවනය කලයුතු ධර්ම, ආරියබව ලබාදෙන හා නොදෙන ධර්ම යහපත් ලෙසින් දැකීම, අවබෝධ කිරීම ප්‍රඥා බලයය. **බලන්න**:අංගු.නි:( (5) 9 නිපාත: සම්බෝධිවග්ග:බලසංග්‍රහ වත්ථු සූත්‍රය.

▲ **බල විවිධය-**Various powers: **1) අනවජ්ජ බලය-** Anawajja balaya අනවජ්ජ -අනවද්‍ය බලය: නිවැරදිවූ, කාය, වචී හා මනෝ කර්ම ඇතිව වාසය කිරීමය. **බලන්න**:අංගු.නි: (5) 9 නිපාත:සම්බෝධිවග්ග:බලසංග්‍රහ වත්ථු සූත්‍රය. **2) ඤාන බල-** Nana bala ඤානබල: තථාගත බල පහය: ශ්‍රද්ධා බලය, හිරිබලය, ඔතප්ප බලය, විරිය බලය, ප්‍රඥා බලය. **බලන්න**: තථාගත. **මූලාශ්‍රය:** අංගු.නි:(3) 5 නිපාත: බලවග්ග: තථාගතබල සූත්‍රය. **3) සේඛ බල-**Sekha bala. උතුම් පුහුණුව ලබන භික්ෂුව සතු බල 5 ය: ශ්‍රද්ධා බලය, හිරිබලය, ඔතප්ප බලය, විරිය බලය, ප්‍රඥා බලය. **බලන්න**: සේඛ,

අංගු.නි:9 නිපාත:සම්බෝධිවග්ග:බලසංග්‍රහ වත්ථු සූත්‍රය 5) **සංග්‍රහ බලය-** Sangrha balaya: සංග්‍රහ බලය: සතර සංග්‍රහ වත්ථු ලෙසින්ද පෙන්වා ඇත: දානය, ප්‍රිය වචනය, අර්ථචරියාව හා සමානාත්මතාව. **දානය** යනු ත්‍යාගශීලිබවය. දාන අතුරින් ධර්ම දානය අග්‍රය. **ප්‍රිය වචන**: අනුන්ගේ සිත් පුබුදු කරන යහපත් වචනය. ධර්මය ඇසීමට කන් යොමුකරගත් කෙනෙකුට පුන පුනා දහම් දෙසන්නේ නම් එය එම ප්‍රිය වචනය අග්‍රවේ. **අර්ථචරියාව**: තමන්ගේ හා අනුන්ගේ අර්ථය පිණිස කටයුතු කිරීමය. කෙනක් ශ්‍රද්ධාවේ පිහිටුවීම, ශීලයෙහි පිහිටුවීම, ත්‍යාගශීලිබවේ පිහිටුවීම, ප්‍රඥාවේ පිහිටුවීම අග්‍ර අර්ථචරියාවය. **සමානත්මතාවය**:සමාන ගුණ ඇති අයට සමානවීමය. සමානාත්මතාවයේ අග්‍ර වන්නේ: සෝතාපන්න, සකදාගාමී, අනාගාමී, අරහත් යන ඒ ඒ ආරියන්ට සමාන වීමය. **බලන්න**:අංගු.නි: (5) 9 නිපාත:සම්බෝධිවග්ග:බලසංග්‍රහ වත්ථු සූත්‍රය.

▲**බාලයා හා පණ්ඩිතයා-** පාලි:බාලා, **පණ්ඩිතා -** foolish man & wise man: **බාලයා:** අනුවණ මිනිසාය, අමන-මෝඩ-අඥාන ලෙසින්ද පෙන්වා ඇත. **පණ්ඩිතයා:** ප්‍රඥාවන්තයාය,ඥානවන්තයා, සුමේධ, කෝවිද, විධුර, නැණවත් ලෙසින්ද දක්වා ඇත. කෙනෙක්, බාලයෙක් වන්නේ ධර්මය නොදැනිම, නො පිළිපැදීම නිසාය. ධර්මය මැනවින් දන්නා, ධර්මානුකූලව කටයුතු කරණ පුද්ගලයා පණ්ඩිතයාය. **සටහන**: ධම්ම පදය: 5 බාලවග්ග හා 6 පණ්ඩිත වග්ග: බාල පණ්ඩිත ලක්ෂණ විස්තරාත්මකව දක්වා ඇත.

▼**බාලය හා පණ්ඩිතයා ගේ ලක්ෂණ**: **බාලයා:** 1) බාලයා, අයහපත් සිතුවිලි සිතයි, අයහපත් දේ කරයි, අයහපත් වචන කතාකරයි, ඔහු, බාල, අසත්‍ය පුද්ගලයෙක් බව සත්පුරුෂයෝ දැනගනි 2) ඔහු මෙලොවදීම ත්‍රිවිධ දුක්විඳියි: සභාවක සිටින බාලයාහට සෙසු අය පස්පව් පිලිබඳ කතා කරනවා ඇසේ, තමන් එවැනි ක්‍රියාවල යෙදෙන බව සිහිවන ඔහුට දුක්වේදනා ඇතිවේ, සොරකම් කිරීම නිසා රජතුමා විසින් මහා දඬුවම් දුන් සොරෙක් ඔහු දකියි, තමාද එවැනි ක්‍රියා කරනබව සිහිවන ඔහුට දුක්වේදනා ඇතිවේ, ඉඳගෙන හෝ ඇලවී විවේක ගන්නා බාලයාහට තමන් තුන්දොරින් කළ පව්කම් සිහිවී දුක දොම්නස ඇතිවේ. කර්මවිපාක ආදිය සිහිවීමෙන් යලි උපත පිලිබඳ බිය, සංතාපය ඇතිවේ. 3) බාලයා, ධර්මය අනුගමනය නොකර අකුසල් කළ නිසා මරණින් මතු දුගතියක-තිරිසන් ලෝකයේ යළි උපත ලබා බොහෝ දුක් විඳි. දුගතියට පත් ඔහුට මිනිසත්බව ලැබීම ඉතා දුෂ්කරය.එයට හේතුව ධර්මය සමාදන්වීමට අවස්ථාව නොමැතිනිසාය. 4) දිගුකලක් දුගතියේ කල්ගතකර යම් අවස්තාවක, අනුවණ පුද්ගලයා මිනිස් ලෝකයේ උපත ලබාගනු ඇත. එහිදී ඔහු ඉතාදුගී, පහත් කුලයක ඉපදී බොහෝ දුක්පිඩාවිඳි. ආහාරපාන, ඇඳුම්, වසස්ථාන ආදිය සැපපහසුදේ පහසුවෙන් නොලැබේ, බොහෝලෙඩදුක් විඳි, අන්ධබවට, අබ්බගාත බවට ආදී පිඩාවන්ට පත්වේ. ඔහු තුන්දොරින් අකුසල කර, මියගියපසු නැවත ද දුගතියේ උපදියි. **පණ්ඩිත ලක්ෂණ**: 1) පණ්ඩිතයා යහපත් සිතිවිලි සිතයි, යහපත කරයි, යහපත් වචන කතාකරයි. ඔහු නුවණැති සත්‍ය පුද්ගලයෙක් බව සත්පුරුෂයෝ දැනගනී 2) ඔහු මෙලොවදීම තුන්ආකාරයෙන් සුවය හා සොම්නස විඳි: පණ්ඩිතයා සිටින සභාවක මිනිසුන් පස්පව් ගැන කතාකරයි, තමා එම අකුසල බැහැර කර ඇතිබව දන්නා ඔහුට ප්‍රීති පමෝදය ඇතිවේ, සොරකම් කිරීම නිසා රජතුමා විසින් මහා දඬුවම් දුන්

සොරෙක් ඔහු දකියි, තමා එවැනි ක්‍රියා බැහැරකර ඇතිබව බව සිහිවන ඔහුට ප්‍රීති පමෝදය ඇතිවේ, ඉඳගෙන හෝ ඇලවී විවේක ගන්නා පණ්ඩිතයාට තමන් තුන්දොරින් කළ යහපත් ක්‍රියා සිහිවී ප්‍රීතිය ඇතිවේ, යහපත් කුසල කර්මවිපාක නිසා මරණින් මතු සුගතියේ උපත ලැබෙනබව සිහිකරන ඔහු ප්‍රීතියට පත්වේ. 3) පණ්ඩිතයා මෙලොවදී සිදුකල යහපත් කුසල් කර්ම විපාක නිසා මරණින් මතු සුගතියේ-දේවලෝකවල යළි උපත ලබයි. 4) දීර්සකාලයක් දෙව්සැප විඳ නැවත මිනිස්ලෝකයට පැමිණෙන පණ්ඩිතයා, සියලු සැප සම්පත් ඇති, උසස් කුලයක යළි උපත ලබායි. එහිදිද යහපත් පුණ්‍යකර්ම සිදුකර නැවත සුගතියකම උපත ලබයි. මේ පිලිබඳ දක්වා ඇති උපමාව නම් කිසියම් සූදුකාරයෙක් ඔහුගේ පළමු ක්‍රීඩාවෙන් මහා සම්පත් ජයගෙන සතුටුව සැප විඳී. ඔහු ලබන එම සැපයට වඩා පණ්ඩිතයා, තුන්දොරින් යහපත් කර්ම සිදුකර ලබන සතුට අප්‍රමාණය. ජයගත් සුදුකාරයාගේ සතුට කුඩා ගල්කැටයක් වැනිය, පණ්ඩිතයා ගේ සැපය,සුවය හිමාල කඳුවැටිය මෙන් මහත්ය. **බලන්න**: උපග්‍රන්ථය:5.**මූලාශ්‍ර**: ම.නි:(3): 3.3.9 බාල පණ්ඩිත සූත්‍රය, පි. 376, EMN: 129: Fool & Wise Men, p. 929, අංගු.නි: (1): 3 නිපාත, බාල වග්ග සූත්‍ර, පි.234, EAN: 3: The Fool, p. 80.

▼**බාලයාට ඇති නුගුණ හා පණ්ඩිතයාට ඇති ගුණ: බාලයාට:**කාය, වචී, මනෝ දුෂ්චරිත හා මිථ්‍යා දිට්ඨිය ඇත. දුගතිය හිමිය.**පණ්ඩිතයාට:** වචී, මනෝ සුචරිත හා සම්මා දිට්ඨිය ඇත. සුගතිය හිමිය. **බලන්න**:අංගු.නි: (2) 4 නිපාතය:සුචරිතවග්ග: බාල පණ්ඩිත සූත්‍ර 4කි.

▼ **ලෝකයේ පණ්ඩිතයෝ දෙදෙනෙක් හා බාලයෝ දෙදෙනෙක් දැකිය හැකිය පණ්ඩිතයෝ: 1)** තමන් අතින් යම් වරදක් සිදුවූවා නම් එය වරද බව ඔහු දකියි පිළිගනී. 2) වෙනත් කෙනෙක් වරදක් කර ඒ ගැන පපොච්චාරණය (වරද බව පිළිගැනීම) කරනවිට ධර්මයට අනුකූලව එය පිළිගනි. **බාලයෝ: : 1)** තමන් අතින් යම් වරදක් සිදුවූවා නම් එය වරද බව ඔහු නොදකියි නොපිළිගනී. 2) වෙනත් කෙනෙක් වරදක් කර ඒ ගැන පපොච්චාරණය (වරද බව පිළිගැනීම) කරනවිට එය ධර්මයට අනුකූලව නො පිළිගනි. **මූලාශ්‍ර:** අංගු.නි: (1 ): 2 නිපාත: බාලවග්ග සූත්‍ර, පි.154, EAN: 2: 21.1 Sutta, p. 60.

▼**බාල හා පණ්ඩිතයා නිසා සිදුවන යහපත හා අයහපත:** යම් භයක්, උපද්‍රවයක්, විපතක් ඇතිවෙන්නේ බාලයා නිසාය. පණ්ඩිතයා ඇසුරින් ඒ දේ සිදුවන්නේ නැතය යයි බුදුන් වහන්සේ වදාළහ. **උපමාව:** පිදුරු සෙවිලි කල වහල ඇති ගෙයක් ගිනිගත්විට, අසල ඇති ශක්තිමත්ව සාදා ඇති වෙනත් ගේදොර පවා ගිනිබත්වේ. එලෙසින් බාලයන් හා ඇසුර හානි ගෙනෙදේ. පණ්ඩිතයන් ඇසුරු කිරීමෙන් විපත් සිදුනොවේ. බුදුන් වහන්සේ ගේ අවවාදය වුවේ, පණ්ඩිතයන් ලෙසින් හැසිරීමට හා විමසීමට පුරුදු පුහුණු විය යුතු බවය. කෙනෙක් පණ්ඩිතය, ධර්මය විමසන කෙනෙක්ය යයි පැවසීමට ඔහු සතු කුසලතා 4 ක් ඇත: 1) ධාතු කුසලතාවය 2) ආයතන කුසලතාවය 3) පටිච්ච සමුප්පාදය පිලිබඳ කුසලතාවය 4) ස්ථාන අස්ථාන දන්නා කුසලතාවය.

**සටහන**: අංගු.නි: 3 නිපාතය: බාලවග්ග සූත්‍රයන්හි මෙයට සමාන විස්තර දක්වා ඇත. **මූලාශ්‍ර**: ම.නි: ( 3): 3.2.5 බහුධාතුක සූත්‍රය, පි.209, EMN: 115: The Many Kinds of Elements, p. 840.

▼ **බාලයින් සතු අවගුණ හා පණ්ඩිතයන් සතු ගුණ: බාලයන්-** අනුවන පුද්ගලයෝ : 1) තමන් වෙතට නොපැමිණි දේ -අදාළ නොවනදේ පිලිබඳ බර ඉසිලීම -වගකීම ගැනීම, තමන් වෙතට පැමිණි දේ -අදාළ දේ පිලිබඳ බර ඉසිලීම -වගකීම නො ගැනීම. 2) තමන්ට නොකැප දෙය කැපයයි ගැනීම, තමන්ට කැප දෙය නොකැපයයි ගැනීම 3) අනාපත්තිය ( නිවැරදී දේ) ගැන ආපත්ති (වැරදි) සංඥා ඇතිවීම, ආපත්තිය ගැන අනාපත්ති සංඥා ඇතිවීම. 4) අධර්මය, ධර්මය සේ ගැනීම, ධර්මය අධර්මය සේ ගැනීම.5) අවිනය, විනයය සේ ගැනීම, විනය අවිනය සේ ගැනීම. **පණ්ඩිත:**1) තමන් වෙතට නොපැමිණි දේ -අදාළ නොවනදේ පිලිබඳ බර ඉසිලීම  නොගැනීම, තමන් වෙතට පැමිණි දේ -අදාළ දේ පිලිබඳ වගකීම ගැනීම. 2) තමන්ට නොකැප දෙය නොකැපයයි ගැනීම, තමන්ට කැප දෙය කැපයයි ගැනීම. 3) අනාපත්තිය, අනාපත්තියය යන සංඥා ඇතිවීම, ආපත්තිය ගැන ආපත්තිය යන සංඥා ඇතිවීම. 4) ධර්මය, ධර්මය සේ ගැනීම, අධර්මය අධර්මය සේ ගැනීම.  5) විනය, විනයය සේ ගැනීම, අවිනය අවිනය සේ ගැනීම. **මූලාශ්‍රය:** අංගු.නි: (1) 2 නිපාත: බාලවග්ග: සූත්‍ර, පි.200.

▲ **බල්ලා** -the dog: මේ උපමාවෙන් පෙන්වා ඇත්තේ, බල්ලා ඌ ගැටගසා ඇති කනුව වටේ කැරකෙන ලෙසින්, ආරිය ධර්මය නොදත් ලෝකයා සසර වටේ කැරකෙන අන්දමය. **බලන්න**: ගද්දූලබද්ධ, උපග්‍රන්ථය:5. **මූලාශ්‍ර**:සංයු.නි: ( 3): ඛන්ධසංයුත්ත: 1.2.5.7 ගද්දූලබද්ධ සූත්‍රය, පි. 284, ESN: 22: Khandasamyutta: 99.7 The leash, p. 1090.

▲**බලිවද්ද -**Baliwadda: බලිවද්ද යනු ගොනාගේ (හරකා-වෘෂභ) හැසිරිමය,ආකාර 4කි: 1) තමන්ගේ ගොන් රැලට දරුණුව හැසිරේ, අන් ගොන් රැලට දරුණුව නො හැසිරේ. 2) තමන්ගේ ගොන් රැලට දරුණුව නො හැසිරේ, අන් ගොන් රැලට දරුණුව හැසිරේ. 3) තමන්ගේ ගොන් රැලටද, අන් ගොන් රැලටද  දරුණුව හැසිරේ. 4) තමන්ගේ ගොන් රැලටද, අන් ගොන් රැලටද  දරුණුව නො හැසිරේ. ගොනුන් ලෙසින් හැසිරෙන පුද්ගලයන් 4ක් මෙහි පෙන්වා ඇත. 1) තම පිරිසට දරුණුය, සෙසු අයට එසේ නැත. 2) අන්‍යයන්ට දරුණුය, තම පිරිසට එසේ නැත 3) සියලු දෙනාටම දරුණුය 4) සියලු දෙනටම දරුණුනැත. උපග්‍රන්ථය:5 **මූලාශ්‍ර:** අංගු.නි: (2): 4 නිපාත:4.3.1.8 බලිවද්ද සූත්‍රය, පි.232, EAN:4: 108.8 Bullas, p. 187.

▲**බලුව්‍රතය-**Dog’s duty: බුදුන් වහන්සේ වැඩසිටි සමයේ, අන්‍යආගමික නිකායන් හි සමහර පුද්ගලයන් දුකින් මිදීම පිණිස බලු ව්‍රත (බල්ලෙක් මෙන් හැසිරීම) තපස්කර්ම කර ඇත.මෙය දුගතිය ඇතිකරයි:**බලන්න**: අසුරනිකාය,කොරක්ඛත්තිය නිරුවත් තවුසා, සේනිය තවුසා. **මූලාශ්‍ර**: දීඝ.නි: (3 **):** පාථික සූත්‍රය, 8 ඡෙදය, පි. 26 , EDN: 24 Pāṭika Sutta, section 1.7, p. 287,ම.නි: කුක්කුරවත්තික සූත්‍රය.

▲ **බේලුව ගම-**Beluwa Village: විසාලා නුවර අසබඩ පිහිටි මෙ ගම්මානයේ බුදුන් වහන්සේ අවසාන වස්ස ගත කළහ. **බලන්න:** මහාපරිනිබ්බාන සූත්‍රය.

**බළ**

▲**බිළාල-**Cat: බිළාල- බළලා උපමා කොටගෙන බුදුන් වහන්සේ සංඝයාට අවවාද කර ඇත. වේලාව ඉක්මවා (අකාලයේ) පවුල් අතර හැසිරීම නිසා ශිලය බිඳීයාම, ඇවතක් කරගැනීම, යලි ගිහිබවට පත්වීම ආදී අනතුරු ඇතිවේ. බළලෙක්, ගොදුරු සොයා යන්නේ මීයෙක් අල්වා ගෙන ඌ, නොසපා ගිලීම නිසා, මියා, ඌගේ අතුනුබහන් කැමෙන් ඒ බළලා මරණයට පත්වේ. එලෙස, අකාලයේ පවුල්- කුල සම්බන්ධය සංඝයා ගේ පරිහානිය ඇතිවේ. **බලන්න**: උපග්‍රන්ථය:5. **මූලාශ්‍රය**: සංයු.නි: (2) නිදානවග්ග: ඔපම්මසංයුත්ත:බිළාල සූත්‍රය.

▲**බිළි වැද්දා උපමාව-** Simile of the fish hunter: බිළිය-ඇම ලෙසින් මෙහිදී පෙන්වා ඇත්තේ සංඝයාට ලැබෙන ලාභ සත්කාර ආදියය. ඒවා නිසා සංඝයා පරිහාණියට පත්වෙන්නේ හරියට බිලි වැද්දා විලට දමන ඇමකට හසුවන මාලුවා එ ඇම ගිලීම නිසා විනාශයට පත්වෙන ලෙසය. මෙහිදී 'බිළි වැද්දා' ලෙසින් පෙන්වා ඇත්තේ මාරයාය. **බලන්න**: උපග්‍රන්ථ:5 **මූලාශ්‍රය**:සංයු.නි:2:ලාභසත්කාර සංයුත්ත:දරුණුවග්ග: 5.1.2 බළිස සූත්‍රය, පි.366

▲**බිළි කටු සය -** Six Hooks: බිළි කටු සය ලෙසින් පෙන්වා ඇත්තේ සළායතන මගින් අල්වා ගන්නා බාහිර අරමුණු වලට යටවීමය, එමගින් ලෝකසත්වයා විවිධ දුක් පිඩා විඳි. එය හරියට බිළිවැද්දා දමන ඇම ගිලගන්නා මාළුවෝ විනාශයට පත්වෙන ලෙසය. කාමලෝකයේ ඇම ගිලගන්නා මිනිසුන් මාරයාගේ ග්‍රහණයට අසවෙ, මාරයාට කැමති පරිදි ඔවුන්ව හැසිරවිය හැකිය. **බලන්න**: උපග්‍රන්ථ:5. **මූලාශ්‍රය:**සංයු.නි: (4) :වේදනාසංයුත්ත:සමුද්දවග්ග:1.18.3 බාලිසිකොපම සූත්‍රය, පි. 340.

**බව**

▲ **බාවරි බ්‍රාහ්මණ**-Brahmin Bavari: වේදමන්ත්‍රයේ නිපුණ මොහු, සැවැත්නුවර වැසියෙකි. විවේක සුවය පතා දක්ෂිණපථයට (දකුණු ඉන්දියාවට) පැමිණ ගෝදාවරි නදිය අසබඩ-අස්සක ප්‍රදේශයේ අසපුවක වාසය කල ඔහුට ප්‍රධාන ශිෂ්‍යයන් 16ක් සිටියහ. බුදුගුණ අසා, බුදුන් වහන්සේ සොයායන ලෙස ඔහු තම ශිෂ්‍යයන් පිටත් කරයැවීම,ධර්මය අසා ඔහුද, ශිෂ්‍යයන්ද බුදුන් සරණ යෑම මෙහි විස්තර කර ඇත.**බලන්න**: ඛු.නි.සුත්තනිපාත: පාරායනවග්ග:වස්තුගාථා: පි,326.

**බහ**

▲**බාහිතපාපී**- Bahitapapai: බාහිතපාපී : සියලු පාප බහාතැබූ බවය- ප්‍රහීණ කලබවය. බුදුන්,රහතුන්, බාහිතපාපීය. **බලන්න:** කකුධ දේවපුත්‍ර.

▲**බාහිය තෙර-**Bahiya thera:**බලන්න:** උපග්‍රන්ථය: 1

▲**බාහිය දාරුචිරිය රහතන්වහන්සේ-** Arahant Bahiya darichariya

**බලන්න:** උපග්‍රන්ථය:1.

▲ **බාහිර අරමුණු- නිමිති-**External things: බාහිර අරමුණු: සළායතන මගින් අල්වා ගන්නා, පිටත ලෝකයේ වස්තුන්ය.**බලන්න**: බාහිර ආයතන.

▲ **බාහිර ආකාශධාතුව-** External Space element: පිටත ඇති ආකාසය, හිස් ඉඩකඩ බාහිර ආකාශ ධාතුවය. **බලන්න**: ආකාශ ධාතුවය.

▲ **බාහිර ආයතන:** පාලි:ඡ **බාහිරානි ආයතනානි** -external bases: බාහිර ආයතන 6කි: අභ්‍යන්තර ආයතන 6 න් අල්වා ගන්නා රූප ආදී බාහිර අරමුණුය. **බාහිර ආයතන 6:**1) **රූපායතනය**- form-base: ඇසට අරමුණුවන බාහිර ව ඇති රූප ආදිය 2) **ශබ්දායතනය**- the sound-base: කණට ඇසෙන විවිධ ශබ්ද 3) **ගන්ධායතනය-** the odor-base: නාසයට දැනෙන ගඳ සුවඳ 4) **රසායතනය**- the flavor-base: දිවට දැනෙන විවිධ රස 5) **ස්පර්ශායතනය-** the tangible-base: කයට දැනෙන විවිධ පහස 6) **ධර්මායතනය** - the mind-object-base: සිතේ ඇතිවන, දැනෙන විවිධ සිතුවිලි. බාහිර ආයතන පිළිබඳව මැනවින් දැනගැනීම සළායතන පිලිබඳ සම්පූර්ණ අවබෝධයට උපකාරිවේ: **සටහන:** බාහිර අරමුනු පිලිබඳ ඇති ඇල්ම නැතිකර ගැනීම (බහිද්ධානන්දික්‍ෂය) විමුක්තිය ලැබීමට හේතුවේ. එම අරමුණු පිළිබඳව අනිච්ච ලෙසින් බැලීම, යෝනිසෝ මනසිකාරයෙන් බැලීම එසේ ඇල්ම නැතිකර ගැනීමට උපකාරී කරුණුය. **බලන්න:** සළායතනසංයුත්ත: නන්දික්‍ඛය වග්ග: බාහිර නන්දික්‍ඛය අනිච්ච, බාහිර නන්දික්‍ඛය යෝනිසෝ සූත්‍ර. **මූලාශ්‍ර:** ම.නි: (3): 3.4.7 සළායතන විභඞග සූත්‍රය, පි. 474, EMN: 137- Saḷāyatanavibhanga Sutta- The Exposition of the Six-fold Base.

▼ **සියලු බාහිර ආයතන** අනිච්චය, දුක්ඛය, අනාත්මය යයි බුදුන් වහන්සේ පෙන්වා ඇත. **බලන්න:**සංයු.නි: (4) වේදනාසංයුත්ත :අනිච්චවග්ග, දේවදහ වග්ග.

▲ **බාහිර දිට්ඨි**- External views: බාහිර දිට්ඨි ලෙසින් මෙහිදී පෙන්වා ඇත්තේ අන්‍යආගමිකයන් දැරූ මතයන්ය. **බලන්න**: දිට්ඨි -බුදුසසුනට බාහිර.

▲ **බාහිර බන්ධන**-External bonds: අශ්‍රැතවත් පෘතග්ජනයා පංචඋපාදානස්කන්ධය හා එමගින් අල්ලා ගන්නා අරමුණු ආදිය ආත්මයක් ලෙසින් ගැනීම, අභ්‍යන්තර හා බාහිර බන්ධනවේ. **මූලාශ්‍ර**: සංයු.නි: (3): ඛන්ධසංයුත්ත: 1.3.2.5 බන්ධන සූත්‍රය, පි. 316, ESN: 22: Khandasamyutta:117.5 Bondage, p. 1101.

▲ **බාහිර සංයෝජන ඇති පුද්ගලයා -** Person with External fetters: සිල්වත්, ශාන්ත චිත්ත විමුක්තියට සිත යොමුකොට සිටින ආරිය පුද්ගලයා මින් අදහස් කෙරේ.**බලන්න**: ආධ්‍යාත්ම සංයෝජන හා බාහිර සංයෝජන.

▲**බහු උපකාර ධර්ම**:පාලි:**බහුකාරො ධම්මො-**Dhamma that greatly helps (bahukāro): ආධ්‍යාත්මික ජීවිතය වර්ධනය කරගැනීම, නිවන පිණිස, බොහෝ ලෙසින් උපකාර වන ධර්මතා බහු උපකාර ධර්ම වේ: **1) කුසලයේ අප්‍රමාද වීම** (අප්පමාදො කුසලෙසු ධම්මෙසු**) 2) සති සම්ප්‍රජන්‍යය** (සිහිය හා නුවණ- සති ප්‍රඥාව) **3) සත්පුරුෂ ආශ්‍රය 4) සද්ධර්ම ශ්‍රවණය 5) ධර්මානු ධර්ම ප්‍රතිපදාව. 6) සතර සම්පත්ති චක්‍ර:** සුදුසු රටක විසීම, සත්පුරුෂ ආශ්‍රය, ශ්‍රද්ධාව ආදී ගුණ ධර්ම ඇතිබව, පෙර කළ පින් ඇතිබව.**7) පංච ප්‍රාධානික අංග** - ප්‍රධන් වීරිය වඩන භික්ෂුන් සතු

ගුණ අංග පහ- (පඤ්ච පධානියඞ්ගානි). **8) සාරානීය ධර්ම සය -** සිහිකටයුතු ධර්මතා (ඡ සාරානීයා ධම්මා). **සටහන:**අංගු.නි: (2) 4 නිපාත: ආපත්තිය වග්ග:බහුකාර සූත්‍රයේදී,බුදුන් වහන්සේ, සතර දහම: සත්පුරුෂ සේවනය, සද්ධර්ම ශ්‍රවනය, නුවණින් මෙනහිකිරීම, ධම්මානුධම්ම ප්‍රතිපදාව, මිනිසුන්ට බොහෝ උපකාර ධර්ම බව පෙන්වා ඇත. **බලන්න**: සෝතාපන්න.**මූලාශ්‍ර:** දීඝ.නි : (3): 11 දසුත්තර සූත්‍රය, පි. 483, EDN: 34: Dasuttara Sutta: Expanding Decades, p. 384.

▼**ගිහි පැවිදි බහු උපකාර ධර්ම**: ගිහියන්,සංඝයාට සිව්පසයෙන් උපස්ථාන කිරීම, සංඝයාට ආධ්‍යාත්මික මග වඩාගැනීමට බොහෝ උපකාරවේ. එලෙසින්, සංඝයා, ගිහියන්ට සද්ධර්මය දේශනා කිරීම, පිරිසිදු බඹසර පෙන්වා දීම මගින්, සසර දුකින් මිදීම පිණිස බොහෝ උපකාරවේ. **බලන්න**: ඛු.නි: ඉතිවුත්තක:4.1.8 බහුකාර සූත්‍රය. **සටහන්**: * යම් පුද්ගලයෙක්, වෙනත් කෙනකු, ත්‍රිවිධ රත්නයේ සරණය පිණිස කරන උපකාරය බහුඋපකාරයකි. **බලන්න**:අංගු: (1) 3 නිපාත: 3.1.3.4 සූත්‍රය. ** ගුණ 5කින් යුත් සංඝයා ඔවුන් සිටිනා ආවාසයට උපකාරීවේ : සිල්වත්ය, බහුශ්‍රැතය, කැඩුම් බිඳුම් පිළිසකර කරති, ජේෂ්ඨ භික්ෂුන් පැමිණි කල, පින් කරගැනීමට ගිහියන්ට අවස්ථාව සලසති, ජාන කැමතිවිට ලබති**. බලන්න:** අංගු: (3) 5 නිපාත: 5.5.4.4.බහුපකාර සූත්‍රය.

▲ **බහුජනහිත-**Bahujanahitha: බහුජනහිත- බෝහෝ ජනයාට උපකාරීවන බවය, අනුකම්පා සහගතව කටයුතු කරන බවය. සසර දුක නැතිකිරීමට, බොහෝ ජනයාට උපකාරීවන පුද්ගලයෝ තිදෙනෙකි: සම්මා සම්බුදුන්වහන්සේ, රහතන්වහන්සේ හා සේඛ භික්ෂුව.**මූලාශ්‍රය**: ඛු.නි: ඉතිවුත්තක:3.4.5 බහුජනහිත සූත්‍රය.

▲**බහුධාතු**-Many Kinds of Elements: බහුධාතු යනු සියලුම ධාතුන් (හේතු ප්‍රත්‍ය යෙන් උපන්) හා අසංඛත ධාතුව නම්වූ නිවනය. විස්තර පිණිස **බලන්න**: සංයු.නි: (2) ධාතුසංයුත්තය, ම.නි:බහුධාතු සූත්‍රය.

▲ **බහුල කම්ම**- Bahula kamma: මේවා එදිනෙදා ජීවිතයේදී, බහුලව කරන කර්මය. යම් දෙයක් කුසල හෝ අකුසල බහුලව කර ඇතිනම්, එය පළමුව විපාක දේ.**බලන්න**: කම්ම විපාක, කටත්තා කර්ම.

▲ **බහුලකරගතයුතු හා බහුල නොකරගතයුතු ධර්ම:**පාලි: **බහුලීකත්තබ්බඤ්ච - නබහුලී ත්තබ්බඤ්ච -**the Dhamma to be cultivated and the Dhamma not to be cultivated: බහුලකරගතයුතු ධර්මය නම් කුසල් දහම්ය, අකුසල් දහම බහුල නොකරගතයුතු ධර්මයවේ. ආධ්‍යාත්මික ජීවිතයේදී වඩා ගැනීමට බහුල කරගතයුතු ධර්මය සම්මා දිට්ඨිය සහිත නිවැරදි මගය. බහුල නො කරගතයුත්තේ මිථ්‍යා දිට්ඨිය සහිත වැරදි මගය.

**මූලාශ්‍ර:** අංගු.නි: (6):10 නිපාත:10.3.5.8 බහුලිකත්තබ්බ සූත්‍රය, පි. 478, EAN:10: Noble , p. 548.

▼ **බහුලකරගතයුතු ධර්මය** දස කුසලයය. බහුල නොකරගතයුතු ධර්මය දස අකුසලයය.: **මූලාශ්‍ර:** අංගු.නි: ( 6): 10 නිපාත: 10.4.4.8. බහුලිකතතබ්බ ධම්ම සූත්‍රය, පි. 540, EAN: 10: 196 Sutta**,** p.556.

▼ **බහුලකලයුතු ධර්මතා:** බහුලීකෘත ධර්මතා 5 ක් මෙහි දක්වා ඇත. 1) අසුභය නුවණින් දැකීම 2) ආහාරයේ පිළිකුල් සංඥාව ඇතිවීම 3) අනභිරති සංඥාව ඇතිවීම 4) සර්ව සංඛාරයන්හි අනිත්‍යය නුවණින් දැකීම 5) මරණ සංඥාව තමා තුළම ඇතිකර ගැනීම. ඒවා, ඒකාන්තයෙන්ම, නිබ්ද්දාව, විරාගය, නිරෝධය, උපසමය, අභිඥාව, සම්බෝධිය, නිර්වානය පිණිස වේ. **මූලාශ්‍ර**: අංගු.නි: (3): 5 නිපාත:5.2.2.9 නිබ්ද්දා සූත්‍රය, පි.154.

▲**බහු වේදනා-**Many kind of feelings: විවිධාකාර වේදනා: 1) **වේදනා දෙක**:කායික හා මානසික 2) **වේදනා තුන**: දුක, සුබ හා මැදිහත් වේදනා . 3) **වේදනා පහ:** කායික සොම්නස, මානසික සොම්නස,කායික වේදනා, මානසික වේදනා හා උපේක්ඛා වේදනාව. 4) **වේදනා හය:** සළායතන ස්පර්ශයෙන් ඇතිවෙන වේදනා 5) **වේදනා දහඅට**: මනෝ උපවිචාර වේදනා. **බලන්න**: මනෝ උපවිචාර 6) **වේදනා තිස්හය:** ගිහි හා පැවිදි අය ට ඇතිවෙන: සොම්නස් වේදනා 6x2 , දොම්නස් වේදනා 6x2, උපේක්ඛා වේදනා 6x2. 7) **වේදනා එකසිය අට:** වේදනා 36, තුන් කාලය අනුව ගැනීම: අතීත වේදනා 36, අනාගත වේදනා 36, වර්තමාන වේදනා 36. **විස්තර පිණිස බලන්න:** වේදනා, සළායතන, ම.නි: සළායතන විභංග සූත්‍රය. **මූලාශ්‍ර:** ම.නි: (2): 2.1.9 බහුවේදනීය සූත්‍රය, පි.116, EMN:59: The many kind of feelings, p.474.

▲ **බහුභානි-**Bahubhani: බහුභානි: බොහෝ කථාකරන අනුවන පුද්ගලයාය. ඔහු, බොරුකීයයි, කේලාම් කියයි, රළුබස් කියයි, හිස්බස් කියයි, අකුසල ඇතිකරගන්නා ඔහු දුගතියේ යලි උපතක් ලබයි. **බලන්න:** අංගු.නි: (3) 5 නිපාත:අකෝකාසකවග්ග:බහුභාණි සූත්‍රය.

▲ **බහුශ්‍රැත:** පාලි: **බහුස්සුතො** -learned much: බහුශ්‍රැත: දහම යහපත් ලෙසින් ඉගෙනගෙන ඒ පිලිබඳ හසල දැනුම ඇතිබවය.මේ ගුණය, භික්ෂුවක්, 'තෙර' බවට පත්වීමට අවශ්‍ය ගුණයන්ගෙන් එකකි. සේඛ ප්‍රතිපදාව ඇති භික්ෂුන් මේ ගුණයෙන් සමන්විතය. බහුශ්‍රැතබව ලබාගැනීමට දුර්ලභ ධර්මතාවයකි. ඉගෙනගත් දේ නිතර සිහිනොකිරිම-ස්ජ්ජනා නොකිරිම, බහුශ්‍රැතබවට ඇති බාධාවකි**. බලන්න**: ඉෂ්ඨධම්ම. **මූලාශ්‍රය**: අංගු.නි: (6) 10 නිපාත:10.2.8.3 ඉෂ්ඨධම්ම සූත්‍රය, පි.270,EAN:10: 73.3 Wished for, p.522.

▼**භික්ෂුව බහුශ්‍රැත වන ආකාරය**: මුල, මැද හා අග යහපත්වූ, අර්ථ හා පදමාලා මනාව ගලපා ඇති, බඹසර ජීවිතය සම්පූර්ණ කිරීමට පිහිටවන සද්ධර්මය: 1) ධර්මය බොහෝ ලෙසින් අසා ඇත 2) මැනවින් සිහියේ දරාගෙනසිටියි (**සුතධරො** -retained in mind) 3) කටපාඩම් කර සජ්ජායනා කරයි (**වචසා පරිචිතා**- recited verbally) 4) මනසින් විමසා බලයි (**මනසානුපෙක්ඛිතා** -investigated mentally) 4) විනිවිද සහිත නුවණින් (ප්‍රඥාවෙන්) ධර්මය දැක යහපත් දිට්ඨිය ඇතිකර ගෙන ඇත (**දිට්ඨියා සුපටිවිද්ධා** - penetrated well by view).

**"බහුස්සුතො හොති සුතධරො සුතසන්නිචයො යෙ තෙ ධම්මා ආදිකල්‍යාණා මජ්ඣෙකල්‍යාණා පරියොසානකල්‍යාණා සාත්ථා සව්‍යඤ්ජනා කෙවලපරිපුණ්ණා පරිසුද්ධං බ්‍රහ්මචරියං අභිවදන්ති. තථාරූපාස්ස ධම්මා බහුස්සුතා හොන්ති ධතා වචසා පරිචිතා**

**මනසානුපෙක්ඛිතා දිට්ඨියා සුපටිවිද්ධා". සටහන්**: * යහපත් දිට්ඨිය ඇතිකරගැනීම යනු නිවන අවබෝධ කරගැනීම පිණිස, විමුක්තිය පිණිස, තමන් ඇසූ ධර්මය කෙසේ උපකාර කරගතයුතුද යන්න නුවණින් වටහා ගැනීමය. දිට්ඨියා සුප්පටිවිද්ධා යන වැටහීම බහුශ්‍රැත බවේ උපරිම තැනය. නිවන සාක්ෂාත් කරගැනීමට උපකාරිවන අංගයකි. ** මේ ගුණය සේඛ ප්‍රතිපදාවේ යෙදීසිටින භික්ෂූන් සතු ගුණයකි.**බලන්න**: සප්ත සද්ධර්ම ගුණ. ** ඒ සමාන විස්තරයක් මේ සූත්‍රයේද පෙන්වා ඇත. **බලන්න:** අං.ගු.නි: (2): 4 නිපාත: 4.4.4.6 බහුශ්‍රැත සූත්‍රය, පි.366. **මූලාශ්‍ර:** අං.ගු.නි: (2 ): 4 නිපාත: 2 .1.4.7 සූත්‍රය**,** පි.169, EAN: 4 : 38.7 Sutta, p.62, ම.නි: (2): 2.1.3 : සේඛ සූත්‍රය, පි. 44, MN 53: Sekha Sutta, p. 436

▼**කෙනෙක් බහුශ්‍රැත- ධර්මධර වන ආකාරය**: බුදුන් වහන්සේ මෙසේ වදාළහ:"...මා විසින් සූත්‍ර, ගෙය්‍ය, වෙය්‍යාකරණ, ගාථා, උදාන, ඉතිවුත්තක,ජාතක, අබ්භූතධම්ම, වෙදල්ල ආදීවූ බොහෝ දහම් දෙසන ලදහ...සිව්පද ගාථාවක අරුත දැන පෙළ දැන ධර්මානුධර්මප්‍රතිපන්නව වෙසේද, ඒ පුද්ගලයා 'බහුශ්‍රැත ධර්මධර' යයි කියන්නට නිසිවේ". **බලන්න**: අං.ගු.නි: 4 නිපාත:4.4.4.6 බහුශ්‍රැත සූත්‍රය.

▼**ධර්ම මාර්ගයේ** ගමන් කරන පුද්ගලයාහට, බහුශ්‍රැත බව, ආරක්ෂාව ලබා දෙන -නාථ කරණ ධර්මයක්ය .**බලන්න**: නාථ කරණ ධර්ම. **මූලාශ්‍ර:** අං.ගු.නි: (6): 10 නිපාත: 10.1.2.7 ප්‍රථම නාථකරණ සූත්‍රය, පි.72, EAN, 10: 17-7 Protector I, p.497.

▼ **බහුශ්‍රැතබව** සේඛප්‍රතිපදාවේ යෙදෙන ආරිය ශ්‍රාවකයා සතු ගුණයකි, එසේම සප්ත සද්ධර්ම ගුණයකි. **බලන්න**: සප්ත සද්ධර්මය, සේඛ හා අසේඛ. **මූලාශ්‍ර**: ම.නි. (2 ): 2.1.3 :සෙඛ සූත්‍රය, පි. 44, MN 53: Sekha Sutta, p. 436.

▼ **බහුශ්‍රැත පුද්ගලයන් දෙදෙනෙක් ලෝකයේ විද්‍යාමානවේ.**

එක් පුද්ගලයෙක් ධර්මය බොහෝ ලෙසින් අසා ඇත. එහෙත්, එහි අර්ථ නොදන්නා නිසා ධර්මානුධර්මයට පිළිපන් කෙනෙක් නොවේ. ඔහු ශ්‍රැතයෙන් නුපන් බහුශ්‍රැතවේ. තවත් පුද්ගලයෙක් ධර්මය බොහෝසේ අසා ඇත, එසේම එහි අර්ථ දැන ධර්මානුකූලව වාසය කරයි. ඔහු අග්‍ර පුද්ගලයෙකි, දෙවියන්, බ්‍රහ්මයන් පවා පසසන බව මෙහි පෙන්වා ඇත. **මූලාශ්‍රය**: අං.ගු.නි: (2) 4 නිපාත:භණ්ඩාගමවග්ග: 4.1.1.6 අප්පස්සුත සූත්‍රය, පි.36.

▼ **යම් පුද්ගලයෙක් ධර්මයේ බහුශ්‍රැත නම්**, මරණින් මතු ඔහු හානියට පත්නොවේ, සුගතියක යළි උපත ලබාගැනීමට වාසනාව ඇත.

**සටහන**: සංයු.නි: (4) මතුගාමසංයුත්ත: බහුශ්‍රැත සූත්‍රය: බොහෝ ඇසූපිරි දහම් ඇති කාන්තාව, සුගතියේ යළි උපත ලබන බව පෙන්වා ඇත. **මූලාශ්‍ර**: අං.ගු.නි: (6 ): 10 නිපාත: 10.2.3.5**.** මිගසාලා සූත්‍රය,පි.274, EAN: 10: 75.5. Migasala. p. 522, අං.ගු.නි: (2) : 4 නිපාත: 4.4.5.1. සොතානුධත සූත්‍රය, පි. 380, EAN:4: 191.1. Followed by ear, p. 212.

▼ **ධර්මයේ බහුශ්‍රැත** බව ලැබූ සංඝයා අතර ආනන්ද තෙරුන් අග්‍රවේ. **බලන්න**: අග්‍රතම සිව් පිරිස. **මූලාශ්‍ර:** අං.ගු.නි:(1):1 නිපාත: එතදග්ග පාළිය, පි. 84**,** EAN: 1: XIV Foremost, p. 44

▲ **බ්‍රහ්මබව:** පාළි**: බ්‍රහ්ම**-Brahma-Great: බ්‍රහ්මබව නම්: ශ්‍රේෂ්ඨබව, උදාර බව, ප්‍රමුඛබව ආදී ගුණයය. ලෝකයට අධිපති දෙවියා මහා බ්‍රහ්ම ලෙසින් පෙන්වා ඇත. ශ්‍රමණ ජීවිතය හැඳින්වීම පිණිස බ්‍රහ්ම යොදාගනී, රහතන්වහන්සේ ද උතුම් නිසා බ්‍රහ්ම ලෙසින් හඳුන්වයි. උසස් නිසා දෙමාපියන්ද බ්‍රහ්ම ලෙසින් පෙන්වා ඇත. රූප අරූප ලෝකවල දෙවිවරු බ්‍රහ්ම දෙවිවරුවේ (බඹ): **සටහන**: බ්‍රහ්මබව - ශ්‍රේෂ්ඨබව (Brahmin hood) ලබා දෙන්නේ ආරිය අටමග බව බුදුන් වහන්සේ වදාළහ. **බලන්න**: ආරියඅටමග.**ශබ්දකෝෂ:පා.සි.ශ:** පි.403: "**බ්‍රහ්ම** :තපස, බුදුරජ, බ්‍රහ්මයා, ශ්‍රේෂ්ඨ, මව්පියවරු".**P.T.S**: p.1416: "**Brahma**: highest, best thing of all'.

▲**බ්‍රහ්මචක්‍රය-** The Wheel of Brahmā: බ්‍රහ්මචක්‍රය -උතුම් චක්‍රය ලෙසින් පෙන්වා ඇත්තේ ධම්ම චක්‍රය ය-චතුරාර්ය සත්‍ය ධර්මයය. **බලන්න**: තථාගත. **මූලාශ්‍ර**: අං.ගු.නි: (6): 10 නිපාත :10.1.3.1 සිංහනාද සූත්‍රය,පි. 90, EAN: 10: 21.1 The Lion, p. 499, දිඝ.නි: (3 ): 10 සංගිති සූත්‍රය, පි, 368, EDN: 33: Saṅgīti Sutta: The Chanting Together, p. 362.

▲ **බ්‍රහ්මචාරි:** පාළි: **බ්‍රහ්මචාරි**-Celibate: ගිහිගෙයින් නික්ම, කාම සේවනය හැරදමා, ආගමික ජීවිතයක් ගෙනයන පුද්ගලයා බ්‍රහ්මචාරිවෙ. වෙනත් ආගමික බ්‍රහ්මචාරින් හා බුදුසසුනේ බ්‍රහ්මචාරින් අතර ඇති වෙනස පිළිබඳව **බලන්න**: බ්‍රහ්මචරියාව. **සටහන**: බුදුන් වහන්සේ ඇතුළු සංඝයා බ්‍රහ්මචාරින් බවත්, ඒ උතුමන්ට පිරිනමන දාන, උසස්ය, දෙවියෝ පවා සතුටුවෙති. **බලන්න**: දාන. **මූලාශ්‍ර**: වින.පි: මහාවග්ග 2: පි 70 හා දීඝ.නි: (2): මහාපරිනිර්වාන සූත්‍රය, පි.156, EDN : 16 Mahaparinibbana Sutta, p 175.

▲ **බ්‍රහ්මචරියාව-**පාළි: **බ්‍රහ්මචරියං** -the holy life: බ්‍රහ්මචරියාව, බඹසර විහරණය යනු ගිහිගෙයින් නික්මී, කාමසේවනය හැර දුක නැතිකර, නිවන ලබාගැනීම පිණිස ගතකරන ආධ්‍යාත්මික ජීවිතයය (holy life-spiritual life). මග බඹසර, මාර්ග බ්‍රහ්මචරියාව ලෙසින්ද හඳුන්වයි (බඹසර වාසය). ධර්ම මාර්ගයේ අවසාන ඉලක්කයවූ අරහත්වයට පත්වීම- නිවන සාක්ෂාත් කරගැනීම මගින් බඹසර වාසය සම්පූර්ණවේ. බුදුන් වහන්සේ වැඩසිටි සමයේ පැවති බොහෝ ආගමික නිකායන් අනුගමනය කළ පුද්ගලයෝ, ඔවුන්ගේ නිකායන්ට අනුව තමන් බ්‍රහ්මචාරි ජීවිතගත කරන බව පෙන්වා ඇත (බ්‍රහ්මචාරියාවාසය), එහෙත්, එම ප්‍රතිපදාව බුදුන් වහන්සේ ගේ ඉගැන්වීම් වලට වඩා වෙනස්ය.

**සටහන්:** * **අටුවාවට** අනුව ආරිය අටමගට අනුකූලව ආධ්‍යාත්මික ජීවිතය ගෙනයාම බ්‍රහ්මචරියාවය- බඹසර විසීමය.**බලන්න**: ESN: note 107,p. 952 and note 454, p.559. ** **බ්‍රහ්මචරිය ශබ්දයෙන්** බ්‍රහ්ම (ශ්‍රේෂ්ඨ - උතුම්) වූ ප්‍රතිපදාමාර්ගය, බ්‍රහ්ම වූ බුදුරජානන් වහන්සේගේ මාර්ගය යන අර්ථය ප්‍රකාශ වෙයි. එය මුල-මැද- අග යහපත්වූ සීලසමාධි ප්‍රඥා යන ත්‍රිවිධ ශික්ෂාවෙන් යුක්තවූ පූර්වභාග ප්‍රතිපදා යයිද, සීලවිසුද්ධි,

චිත්තවිසුද්ධි, දිට්ඨිවිසුද්ධි ආදී සප්ත විශුද්ධියෙන් සැදුම් ලත් අනු පුර්ව ප්‍රතිපදා සංඛ්‍යාත ශාසන මාර්ග බ්‍රහ්මචර්යාව යයි දත යුතුය. **බලන්න**: වින.පි:මහාවග්ග පාළි1: ප්‍රස්තාවනා පි.20. ** " **සූත්‍රවල නිතර දැක්වෙන පාඨයක් තමා**: " යසසත්ථාය කුලපුත්තා සම්මාදෙව අගාරසමා අනගාරියං පබ්බජන්ති තදනුත්තරං බ්‍රහ්මචරිය පරියොසානං දිට්ඨෙව ධම්මේ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහාසි": යම් කරුණක් සඳහා කුල පුත්‍රයෝ මැනවින් ගිහිගෙයින් නික්ම අනාගාරිකවූ ඒ පැවිද්දට ඇතුළු වෙත්ද, එම අර්ථය, එම අනුත්තරවූ බ්‍රහ්මචරිය පරියොසානාය එනම් බ්‍රහ්මචරිය අවසානය, දිටු දැම්යෙහි දීම- මේ ජීවිතයේදීම - ස්වකිය අභිඥාවෙන් සාක්ෂාත් කරගෙන- ප්‍රත්‍යක්ෂ කරගෙන- ඊට එළඹ වාසය කළා කියන එකයි ඒ පාඨයේ අදහස. මේ විදියට බ්‍රහ්මචරියාව අවසානවෙනකොට නිවන ලැබෙනවාය කීමට හේතුව කුමක්ද? මේ අරිය අට මග රිජු මගකි. දිසාව නිර්භයය. මග අවසන නිවනය. **බලන්න**: නිවනේ නිවීම දේශනා 2, කටුකුරුන්දේ ඤාණානන්ද භික්ෂුව.

▼ **බ්‍රහ්මචරියාව** ලෝකයේ ලබාගැනීමට දුර්ලභ ධර්මයකි. ඉන්ද්‍රිය අසංවරය, මෙයට ඇති බාධවකි. **බලන්න**: **ඉෂ්ඨධම්ම**.**මූලාශ්‍රය**: අංගු.නි: (6) 10 නිපාත:10.2.8.3 ඉෂ්ඨධම්ම සූත්‍රය, පි.270,EAN:10: 73.3 Wished for, p.522.

▼ **බුදුන් වහන්සේ,** බඹසර මෙසේ හඳුන්වා ඇත: "මහණෙනි, මේ බඹසර වනාහි ජනයා විස්මයට පත් කිරීමට, නැලවීමට, ලාභසත්කාර ආදිය... පිණිස නොවේ... බඹසර වනාහි සංවරය පිණිස, කෙලෙස ප්‍රහීණය පිනිස , රාගය විරාගය පිණිස, නිරෝධය පිණිස, නිවන පිණිසය.පෙර විසූ උතුම් ඉසිවරු ඒ මග අනුගමනය කළහ, බුදුන් වහන්සේ පෙන්වා ඇති පරිදි ඒ මග අනුගමනය කරන්නේ නම්, දුක කෙළෙවර කරගත හැකිවේ". **මූලාශ්‍ර:** අංගු.නි: (2) 4 නිපාත:උරුවෙලවග්ග: බ්‍රහ්මචරිය සූත්‍රය.

▼ **මේ සූත්‍රයන්හි**: බඹසර යනු අරිය අටමග බවත්, බඹසර ඵලය සෝතාපන්න- අරහත්වය ලැබීම, බඹසර විසීමේ අර්ථය-ලාභය නම් රාග දෝස මෝහ ක්ෂය කරගැනීම බව පෙන්වා ඇත.**බලන්න:** සංයු. නි: (5-1) මග්ගසංයුත්ත: පටිපත්තිවග්ග: බ්‍රහ්මචරිය සූත්‍ර 2 කි.

▼ **බ්‍රහ්මචරියාව යනු කවරේද? බ්‍රහ්මචරියාවෙහි කෙළෙවර කවරේද**? යයි භික්ෂුවක් ඇසූ පැණයකට බුදුන් වහන්සේ මෙසේ පිළිතුරු වදාළහ: "**... අයමෙව ඛො භිකඛු, අරියො අට්ඨඞ්ගිකො මග්ගො බ්‍රහමචරියං...යො ඛො භිකඛු රාගකඛයො දොසකඛයො මොහකඛයො ඉමං බ්‍රහමචරියං පරියොසානන්ති".** මේ අරිය අටමග බ්‍රහ්මචරියාවය, ...යම් රාගයක් ද්වේෂයක් මෝහයක් ක්ෂය කරගැනීම බ්‍රහ්මචරියාවේ අවසානය- කෙලෙවරයය.

(This Noble Eightfold Path, bhikkhu, is the holy life: destruction of lust, the destruction of hatred, the destruction of delusion: this is the final goal of the holy life). **සටහන:** කුක්කුටාරාම සූත්‍රයේ දී ආනන්ද තෙරුන්ද, ආරිය අටමග බ්‍රහ්මචරියාව යයි ප්‍රකාශ කොට ඇත. **මූලාශ්‍ර**: සංයු.නි: (5-1): මග්ග සංයුත්තය: 1.1.6 භික්ඛු සූත්‍රය, පි 40 හා 1.2.9 කුක්කුටාරාම සූත්‍රය, පි. 54, ESN: 45:Maggasamyutta: 6.6. A certain bhikkhu, p. 609 & 19.9 The cock's park p.1624.

▼**බඹසර වාසය** යනු මධ්‍යම ප්‍රතිපදාව නම්වූ ආරිය අටමග සම්පූර්ණ කරගැනීමය. **"...සච්චං ධම්මො සංයමො බ්‍රහ්මචරියං මජ්ඣෙසිතා බ්‍රාහ්මණ බ්‍රහ්මපත්ති, සතුජ්ජුභූතෙසු නමො කරොහි තමහං නරං ධම්මසාරීති බ්‍රෑමීති..."** -බමුණ, වාක් සත්‍යය ද, ධර්මයද, සංයමයද බඹසරය වේ. එනම් මැද ඇසුරු කළ (මධ්‍යම ප්‍රතිපදාව) ශ්‍රේෂ්ඨ ප්‍රතිපදාවය ය. (ඒ ප්‍රතිපදාව සම්පූර්ණ කල) ඍජු වූ ඔවුන්ට (රහතුන්ට) නමස්කාර කරන්න. ඒ පුද්ගලයෝ ධර්මයේ හැසිරෙන්නෝය යයි මම පවසමි- **සටහන්**: * බුදුන් වහන්සේ මේ අනුසාසනය වදාළේ සුන්දරිකභාරද්වාජ බමුණාටය. ඒ බස් අසා පැවිදිවූ ඔහු- සුන්දරික භාරද්වාජ තේරුන් ලෙසින්, පසුව අරහත්වයට පත්වූහ. ** බු.ජ.ත්‍රි.ට අනුව **වාක්සත්‍ය නම්**: සම්මා වාචාවය ය, **ධර්මය නම්:** සම්මා දිට්ඨිය, සම්මා සංකප්පය, සම්මා වායාමය, සම්මා සතිය හා සම්මා සමාධිය යය, **සංයමය නම්**: සම්මා කම්මන්ත හා සම්මා ආජීවය. එනම්, අරිය අටමගය, මැදුම් පිළිවෙත බඹසර යවේ. ** the attainment of Brahmā (බ්‍රහ්මපත්ති ) the attainment of the best (seṭṭhapatti- ශ්‍රේෂ්ඨ ප්‍රතිපදාව) Based on the middle (majjhesitā- **මජ්ඣෙසිතා**): avoiding the extremes of externalism and annihilationism. That is, based on the development of the middle way by avoiding all extremes such as sluggishness and restlessness, of which the pair eternalism and annihilationism is merely one instance...the upright ones (ujjubhūtesu- **උජ්ජුභූතෙසු**): the arahants. **බලන්න**: ESN: note: 454, p. 559. **මූලාශ්‍ර**: සංයු.නි: (1): බ්‍රාහ්මණ සංයුත්ත: 7.1.9 සුන්දරික සූත්‍රය, පි.324, ESN:7: Brahmanasamyutta: 9.9 Sundarika, p.366.

▼**බඹසර ජීවිතය ඵලදායිවූ, පරිපූර්ණවූ ජීවිතයක්ය**: බඹසර ජීවිතය**,** කිසිම දෙයක් අඩුත් නැත, වැඩිත් නැත. යහපත් ලෙසින් දේශනා කර ඇත, සියලු අංගයන්ගෙන් පරිපූර්ණය. මනාකොට පවසා තිබේ. එහි බැහැර කිරීමට දෙයක් නොමැත, එසේම, පිටතින් ගැනීමට කිසිවක් නොමැත.ඒ බඹසර දිගු කාලයක් පවත්වා ගැනීමට නම්, තථාගතයන්, විශේෂ නුවණින් අවබෝධ කර, දේශනා කරනලද ධර්මය, එනම්: සත්තිස් බෝධිපාක්ෂික ධර්මතා, සැමදෙනා එක්රැස්ව, අර්ථයට අනුකූලව, ව්‍යංජනයට අනුකූලව සජ්ජායනා කළයුතුවේ. එලෙස කටයුතු කිරීම බොහෝදෙනාට හිතසුව පිණිස, වැඩ පිණිස පවතින බව බුදුන් වහන්සේ වදාළහ. **බලන්න**: බෝධිපාක්ෂික ධර්මතා. **මූලාශ්‍ර:** දීඝ.නි: (3 ): 6.පාසාදික සූත්‍රය-(13), පි. 210, EDN**:** 29**.**The delightful discourse-(16), p. 318

▼**මුළු බඹසර ජීවිතය ගෙනයාමට කලණ මිතුරු සේවනය අවශ්‍යමය ය.**

එක්සමයක, ආනන්ද තෙරුන් විසින්, කලණ මිතුරු සේවනය බඹසර ජීවිතයේ හරි අඩක්ය යි පැවසු විට බුදුන් වහන්සේ වදාළේ, එසේ නො පැවසිය යුතුබවය. කලණ මිතුරු සේවනය- මුළු බඹසර ජීවිතයම පිණිස පවතින බවය: **"...මා හෙවං ආනන්ද...සකලමෙව හිදං ආනන්ද, බ්‍රහ්මචරියං යදිදං කල්‍යාණමිත්තතා කල්‍යාණසහායතා කල්‍යාණසම්පවඞ්කතා..."** (...Not so, Ānanda! This is the entire holy life, Ānanda, that is, good friendship, good companionship, good comradeship...). **සටහන:** සංයු. නි. **සාරිපුත්‍ර සූත්‍රයේ** දී සැරියුත් මහා

තෙරුන් විසින්: මුළු බඹසර ජීවිතය පිණිස කලණ මිතුරු සේවනය අවශ්‍යබව පැවසූ විට බුදුන් වහන්සේ එම ප්‍රකාශය අනුමත කර ඇත.**බලන්න**: කලන මිතුරු සේවනය. **මූලාශ්‍ර:** සංයු.නි: (5-1): මග්ගසංයුත්ත: 1.1.2 උපඩ්ඩ සූත්‍රය හා 1.1.3 සාරිපුත්‍ර සූත්‍රය**,** පි.32, ESN:45: Maggasamyutta: 2.2 Half the Holy life, p. 1604 & 3.3 Sariputta, p. 1604.

▼**බ්‍රහ්මචාරි ජීවිතය පිළිබඳ මූලධර්ම**: තායන නම් දෙවියෙක් බ්‍රහ්මචාරි ජීවිතය ගැන පැවසූ ගාථා (තායන දේව ගාථා)**,** ඉගෙනගන්නා ලෙස බුදුන් වහන්සේ සංඝයාට අනුසාසනා කර ඇත: එම ගාථා, ඉගනගන්න, මැනවින් දරාගන්න, සිහිපත් කරන්න ඒවා භික්ෂුවකට මහත් ලෙසින් ප්‍රයෝජනයවේ. එම ගාථාවල බ්‍රහ්මචාරි ජීවිතය පිලිබඳ **මූලධර්ම ඇතුලත්වේ**: එනම්,- බ්‍රාහ්මණය, පරාක්‍රම වීරිය ඇතිකරගෙන තණ්හාව නැමති ජල ප්‍රවාහය සිඳ දමන්න, කාමආශාව දුරු කරන්න. කාමයන් ප්‍රහීණ නොකර ජාන සමාපත්ති ලැබිය නොහැකිය (සමාධිය). කළයුතු දේ කිරීමට දන්නේ නම් (මාර්ගය සම්පූර්ණ කර ගැනීමට) මහා වීරිය (දළ පරාක්‍රමය) ඇතිව එය කරගත යුතුය. අලසලෙසින් (ලිහිල්ව) ගත කරන පැවිදි ජීවිතය නිසා බොහෝ කෙළෙස් (දූවිලි) ඇතිවේ. පසුව, පසුතැවිලි ඇති කරන, වැරදි ක්‍රියා නොකර සිටීම යහපත්ය. එහෙත්, පසුතැවිලි නොම ගෙනදෙන යහපත් ක්‍රියා කිරීම සුදුසුය. යම්ලෙසක, කුසතණපත වැරදි ලෙසින් අල්වා ගත්විට අත කැපී යයි. එලෙසින්, වැරදි ලෙසින් ගත කරණ මහණකම නිසා නිරයට යාමට සිදුවේ. යම් ලෙසකින් කර්මය ලිහිල්ව ගන්නේ නම් (වැරදි කර්ම කරයි නම්), කිලිටි-කෙළෙස් ඇති ක්‍රියා කරන්නේද, සැකකටයුතු (පිරිසිදුනැති) බඹසර ජිවිතයක් ගත කරන්නේනම්, එමගින් මහා ඵලය (නිවන) නො ලැබේ: **"ඡින්ද සොතං පරක්කම්ම කාමෙ පනුද බ්‍රාහ්මණ, නප්පහාය මුනි කාමෙ නෙකත්ත මුපපජ්ජති.කයිරා චෙ කයිරාථෙනං දළ්හමෙනං පරක්කමෙ,සිථිලො හි පරිබ්බාජො භියො ආකිරතෙ රජන්ති. අකතං දුක්කතං සෙය්‍යො යං කත්වා නානුතප්පති. කුසො යථා දුග්ගහිතො හත්ථමෙවානුකන්තති, සාමඤ්ඤං දුප්පරාමට්ඨං නිරයායුපකඩ්ඪති. යං කිඤ්චි සිථිලං කම්මං සඞ්කිලිට්ඨඤ්ච යං වතං, සඞ්කස්සරං බ්‍රහ්මචරියං න තං හොති මහප්ඵලන්ති. සටහන**: විස්තර පිණිස බලන්න: ESN: notes 153-155, p. 52. **මූලාශ්‍ර**: සංයු.නි: (1 ): සගාථවග්ග: දේවපුත්‍රසංයුත්ත: 2.1.8 තායන සූත්‍රය, පි. 118, ESN:2: Devaputta-samyutta:8.8. Tāyana p. 176

▼**මාර්ග බ්‍රහ්මචරියාවේ අවසානය අර්හත්වය ය.**බුදුන් වහන්සේ මෙසේ වදාළහ: යමක් පිණිස (දුකින් මිදීමට) කුලපුත්‍රයෝ මැනවින් ගිහිගෙදර හැර දමා පැවිදිබවට (පබ්බජාව) පත්වේද, ඔවුන් මගබඹසර අවසානය නම් වූ අනුත්තර අර්හත්බව මේ ජීවිතයේදීම, තමන්ගේ විශිෂ්ඨ නුවණින් අවබෝධ කර වාසය කරති. **"...යස්ස ඣාය කුලපුත්තා සම්මදෙව ආගාරස්මා අනගාරියං පබ්බජන්ති, තදනුත්තරං බ්‍රහ්මචරිය පරියොසානං දිට්ඨෙව ධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරතී ති".** (he is one who, by realizing it for himself with direct knowledge, in this very life enters and dwells in that unsurpassed goal of the holy life for the sake of which clansmen rightly go forth from the household life into homelessness) . **සටහන්**: * බුදුන් වහන්සේ සුජාත තෙරුන් පිළිබඳව එම ප්‍රකශය වදාළහ.** **බඹසර වැස අවසන් කිරීම** යනු මාර

සේනාව ජය ගැනීම, අන්තිම දේහය-කය දැරීම ය. **බලන්න:** අන්තිම දේහධාරී, මාර සේනාව. **මූලාශ්‍ර:** සංයු.නි: (2 ): නිදානවගග: භිකඛුසංයුත්ත: 9.1.5. සුජාත සූත්‍රය, පි.452, ESN: Nidanavagga: 21:Bhikkhusamytta: 5. Sujata, p. 926.

▼**බඹසර වාසය කරන පිළිවෙල:** බුදුන් වහන්සේ මෙසේ වදාළහ: "මහණෙනි, ශික්ෂා අනුසස් කොට ඇති, ප්‍රඥාව උතුම් කොට ඇති, විමුක්තිය හරය කොට ඇති, සමෘතිය අධිපති කොට ඇති ඒ බඹසර වසනු ලැබේ". **මූලාශ්‍ර:**අංගු.නි: (2): 4 නිපාත: 4.5.5.3 සික්ඛාපද ආනිසංස සූත්‍රය, පි.490 හා ඛු.නි: ඉතිවුත්තක: 2.2.9 ශික්ෂා ආනිසංස සූත්‍රය,පි.398.

▼**බුදුන් වහන්සේ වෙත බඹසර ජීවිතය ගතකිරීමේ අරමුණ කුමක්ද?** බුදුන් වහන්සේ වෙත බඹසර වසන්නේ ඇයි ද? යයි වෙනත් අය ඇසුවිට, දුක මනාව අවබෝධ කර ගැනීම පිණිස බුදුන් වහන්සේ වෙත බඹසර ජීවිතය ගත කරන් නේ යයි පිළිතුරු දීම නිවැරදි ය යි බුදුන් වහන්සේ භික්ෂූන්හට වදාළහ. **සටහන:** ඒ දුක අවබෝධ කිරීමේ මග නම් අරිය අට මගය. **මූලාශ්‍ර**: සංයු.නි (5-1), මග්ග සංයුත්තය, 1.1.5 කිමත්ථිය සූත්‍රය**,** පි.38, ESN:45: Maggasamyutta: 5.5. What purpose, p. 1608

▼**බුදුන් වහන්සේ වෙත** බඹසර වාසය කිරීමේ අරමුණ, සැරියුත් මහා තෙරුන් මෙසේ පෙන්වා ඇත: ඇවැත්නි,දුක පිරිසඳ දැනගැනීම පිණිස භාග්‍යවතුන් වහන්සේ වෙත බඹසර වාසය කරමි..."**දුක්ඛස්ස ඛො ආවුසො පරිඤ්ඤත්‍ථං භගවති බ්‍රහ්මචරියං වුස්සතී ති. සටහන:** දුක අවබෝධ කිරීමේ මග නම් අරිය අට මගය යි සැරියුත් මහා තෙරුන් ප්‍රකාශ කර ඇත. **මූලාශ්‍ර:** සංයු.නි:(4 ): සළායතන වග්ග: ජම්බුඛාදක සංයුත්ත:4.1.4 කිමත්ථිය සූත්‍රය, පි.502, ESN: IV: 38 Jambukhādakasaṃyutta: 4. For What Purpose? p. 1398.

▼**එක්සමයක, මහාලි ලිච්ඡවි**, බුදුන් වහන්සේගෙන් මෙසේ විමසුහ: "...දේවරූප දැකීම හා දේව හඬ ඇසීම පිණිස ආදීවූ සමාධි ලබාගැනීම පිණිස, බුදුන් වහන්සේ වෙත කෙනෙක් පැවිදි ජීවිතය ගත කරන්නේද?" බුදුන් වහන්සේ මෙසේ වදාළහ: එවැනි සමාධි පිණිස නොව, ඒවාට වඩා උසස්වූ, උතුමවූ ධර්මතා සාක්ෂාත් කර ගැනීම පිණිස, මා වෙත බඹසර ජීවිතය ගත කරති.එනම්: සෝතාපන්න, සකදාගාමි, අනාගාමී හා අරහත් මග එල සාක්ෂාත් කර ගැනීම පිණිසය, දුකින් මිදීම පිණිසය. ඒවා, ඒකාංශ ආදී සමධිවලට වඩා උසස්ය, උතුම්ය. **සටහන**: එම උතුම් මග එල සාක්ෂාත් කිරීමේ මග හා ප්‍රතිපදාව ආරිය අටමග යයි බුදුන් වහන්සේ වදාළහ. **මූලාශ්‍ර**: දීඝ.නි: (1): 6 මහාලි සූත්‍රය, පි. 340, EDN: 6: Mahāli Sutta: About Mahāli- Heavenly Sights, Soul and Body, p. 118.

▼**බුදු සසුනේ බඹසර විසීම** පිළිබඳව වෙනත් ආගමිකයන් -අන්තොටු පිරිවැජියෝ (**අඤ්ඤාතිත්ථියා පරිබ්බාජකා**- the wanderers of other sects**)** ප්‍රශ්ණ කරණවිට මෙසේ පිළිතුරු දියයුතුය යයි බුදුන් වහන්සේ භික්ෂූන්ට අවවාද වදාරා ඇත: **බඹසර වාසයකිරීමේ අරමුණු**: **1)** රාගය දුරුකිරීම පිණිස -විරාගය පිණිසය (**රාගවිරාගත්‍ථං**- the fading away of the lust) **2)** සංයෝජන ප්‍රහාණය පිණිස (**සංයොජනපහානත්‍ථං**-for the abandoning of the fetters) **3)** අනුසය -නිදිගත් කෙලෙස් නැසීම පිණිස (**අනුසය සමුග්ඝාතත්‍ථං** -uprooting of the underlying tendencies) **4)**

සසර ගමන (අදත් මග) පිලිබඳ මනා අවබෝධය ලැබීම පිණිස (**අද්ධානපරිඤ්ඤත්ථං** - for the full understanding of the saṃsāra) **5)** ආසව ක්ෂයකිරීම -ආසවක්ඛය පිණිස (**ආසවානං ඛයත්ථං** -for the destruction of the taints) **6)** විද්‍යාවිමුක්තිය පසක් කරගනු පිණිස - අරහත් මාර්ග ඥානය හා ඵලය -(**විජ්ජාවිමුත්තිඵල-සච්ඡිකිරියායාති** - for the realization of the fruit of true knowledge and liberation) **7)** ඥාන අවබෝධය හා දර්ශනය පිණිස (**ඤාණදස්සනත්ථං** - for the sake of knowledge and vision) .**8**) උපාදාන රහිතව පිරිනිවීම පිණිස (**අනුපාදාපරිනිබ්බානත්ථං**- for attaining final Nibbāna without clinging) . **සටහන:** එම කරුණු ඉටුකර ගැනීමේ පටිපදාව ආරිය අට මගය යි බුදුන් වහන්සේ වදාළහ. **මූලාශ්‍ර:**සංයු.නි: (5-1): අඤ්ඤාතිත්ථියා පෙයාාලො සූත්‍ර**:** 1.5.1, 1.5.2, 1.5.3, 1.5.4, 1.5.5, 1.5.6, 1.5.7, 1.5.8**,** පි.71, ESN: V: Wanders of the other sects: 41.1 to 48.8 suttas, p. 1649.

▼**අංගුලිමාල තෙරුන්**, ජාතිය අවසන් කිරීම, අරහත්වයට පත්වීම, බඹසර වාසය නිමාකරගැනීම යයි බුදුන් වහන්සේ පෙන්වා තිබේ: **"...ඛීණා ජාති, වුසිතං බ්‍රහ්මචරියං, කතං කරණීයං, නාපරං ඉත්ථත්තායාති අබ්භඤ්ඤාසි. අඤ්ඤතරො ච ඛො පනායස්මා අඬගුලිමාලො අරහතං අහොසි"**. ජාතිය නිමවිය, මගබඹසර වාසය නිමවන ලදී, කළයුතු දේ කරනලදී, නැවත උපතකට පැමිණීමක් නැත. අංගුලිමාල තෙරුන් අරහත්වය ලැබුහ. (Birth is destroyed, the holy life has been lived, what had to be done has been done, there is no more coming to any state of being). **මූලාශ්‍ර:** ම.නි: (2 ): 2.4.6. අංගුලිමාල සූත්‍රය, පි. 532, EMN: 86 Angulimāla Sutta, p.643.

▼**බ්‍රහ්මචරියාව යනු**, ලාභ සත්කාර කිර්ති ප්‍රශංසා අනුසස්... ශිලසම්පත්තිය අනුසස්... සමාධි සමාපත්ති අනුසස්... ඥාණ දර්ශනය අනුසස් සඳහා නොවේ. බඹසර විසීමේ සාරය-හරය නම් කුපිතවිම නොමැති- නිසලවූ චිත්ත විමුක්තිය (අකුප්පා චේතෝ විමුක්ති) ලැබීම පිණිසය. එනම්, අරහත්වය පිණිසය. එය බඹසර විසීමේ නිමාව බව බුදුන් වහන්සේ වදාළහ: **"...ඉති ඛො භික්ඛවෙ නයිදං බ්‍රහ්මචරියං ලාභසක්කාරසිලොකානිසංසං, න සීලසම්පදානිසංසං, න සමාධිසම්පදානිසංසං න ඤාණදස්සනානිසංසං. යාව ඛො අයං භික්ඛවෙ අකුප්පා චෙතොවිමුත්ති , එතදත්ථමිදං භික්ඛවෙබ්‍රහ්මචරියං එතං සාරං. එතං පරියොසානන්ති"** (this unshakeable deliverance of mind that is the goal of this holy life, its heartwood, and its end). **මූලාශ්‍ර**: ම.නි: (1 ):1.3.9.මහාසාරෝපම සූත්‍රය**,** පි.482, EMN: 29-The Greater Discourse on the Simile of the Heartwood, p.271.

▼**බඹසර වාසය කිරීම** දුක නිමා කරගැනීම පිණිස බව **බාලපණ්ඩිත සූත්‍රයේ** පෙන්වා ඇත. අනුවණ පුද්ගලයා (බාලයා) දුක නැතිකර ගැනීම පිණිස බඹසර වාසය නොකළ නිසා මරණයෙන් පසු ඔහු යළි උපතකට පැමිණේ. එහෙත් නුවණැති (පණ්ඩිතයා) උතුම් පුද්ගලයා දුක අවසන් කිරීමේ අරමුණ ඇතිව බඹසර වාසය කළ නිසා ඔහුට යළි උපතක් නොවේ. **මූලාශ්‍ර:** සංයු.නි:(2 ):නිදානවගග-1.2.9 බාල පණ්ඩිත සූත්‍රය, පි.

60, ESN: 22: Nidanavagga: 19.9- The wise man and the fool, p. 635

▼**බඹසර විසීම යනු** අරිය අටමග සම්පූර්ණ කරගැනීමය.බඹසර ජීවිතය නිසා ලැබෙන ඵලය යනු සෝතාපන්න, සකදාගාමී, අනාගාමි හා අරහත් ඵල ලැබීමය, බඹසර විසීමේ අර්ථයනම් රාග දෝස හා මෝහ යන අකුසල් සහමුලින්ම ප්‍රහීණය කිරීමය. **මූලාශ්‍ර**: සංයු.නි: (5-1): මග්ගසංයුත්ත: 1.1.6, භික්ඛු සූත්‍රය, පි. 40 හා පටිපත්තිවග්ග: බ්‍රහ්මචරිය සූත්‍ර 1.4.9 -1.4.10 සූත්‍ර, පි. 69, ESN: 45: Maggasamyutta: 6.6. A Certain Bhikkhu, p. 1609 & IV: Practice: 39.9 -40.10 suttas, p.1647.

▼ **බ්‍රහ්මචරියා වාසය** (මග බඹසර-ශාසනබ්‍රහ්මචරියාව) ජනයාගේ පැසසුම් පිණිස නොවේ යයි මෙහි දක්වා ඇත. බ්‍රහ්මචරියා වාසය, කෙළෙස් ප්‍රහීණය පිණිසය. **මූලාශ්‍රය**: ඛු.නි:ඉතිවුත්තක:ජනකුහන සූත්‍ර 2කි, පි.384.

▼**දිගුකලක් තිස්සේ** ශීලය ඇතිව, සමාධිය ඇතිව, නිවන අරමුණුකොට යහපත් ලෙසින් බඹසර වාසය කරන පැවිද්දන්ට සක් දෙවිඳුන් පවා නමස්කාර කරනබව මෙහි පෙන්වා තිබේ. **මූලාශ්‍ර**: සංයු.නි: (1 ): සක්කසංයුත්ත: සක්කනමස්සාන සූත්‍රය, පි. 44, ESN: 11: Sakkasamyutta: 18.8 Sakk’s Worship, p. 485.

▼ **වෙනත් සූත්‍ර මූලාශ්‍ර: 1. ම.නි.27**: **චූළහත්ථිපදෝපම සූත්‍රය:** බඹසර වැස නිමකිරීම අරහත්වය බව දක්වා ඇත. **2. ම.නි.28**: **මහාහත්ථිපදෝපම සූත්‍රය:** තථාගතයන් වහන්සේ, පරම සම්පූර්ණ හා පරම පිරිසුදු බ්‍රහ්මචරියා ජීවිතය ප්‍රකාශකළ බව සඳහන් වේ. **3. ම.නි.34 චූළ ගෝපාලක සූත්‍රය:** පිරිසුදු බඹසර ජීවිතය අවසන් කළ රහතන්වහන්සේ මාර ප්‍රවාහය තරණය කර සුවසේ එතෙරට (නිවනට) පැමිණිබව දක්වා ඇත. **4. ම.නි. 24**: **රථවිනීත සූත්‍රය**: බුදුන් වහන්සේ අසල බඹසර ජීවිතය ගතකිරීමේ අභිප්‍රාය, නිවන සාක්ෂාත් කරගැනීම පිණිස බව පෙන්වා ඇත.

▲ **බ්‍රහ්මජාලය**-The Supreme Net: **බ්‍රහ්මජාලය**: මහා දැල ලෙසින් පෙන්වා ඇත්තේ බුදුන් වහන්සේගේ ධර්මයට පටහැනි විවිධ දිට්ඨි හා මත වලට හසුවී සසර දික් කරගැනීමය. එවැනි මිථ්‍යාදිට්ඨි සහගත දැල් 64ක් ගැන මේ සූත්‍රයේ විස්තරාත්මකව පෙන්වා ඇත. **බලන්න**: දීඝ.නි: බ්‍රහ්මජාල සූත්‍රය.

▲ **බ්‍රහ්මදේව තෙර** -Brahmadeva Thera:**බලන්න**: උපග්‍රන්ථය:1.

▲ **බ්‍රහ්මදණ්ඩනය**-Brhmadandanaya: බ්‍රහ්මදණ්ඩනය විනය නීතියකි. අකීකරු සංඝයා කීකරු කරගැනීම පිණිස පනවා ඇත. එම දණ්ඩනය ලැබූ භික්ෂුව සමග සෙසු සංඝයා කථා බහේ නොයෙදේ. **සටහන්:*** මහා පරිනිබ්බාන සූත්‍රයේ: චන්න තෙරුන්හට බ්‍රහ්මදණ්ඩනය පැනවීම දක්වා ඇත. ** වින.පි: මහාවග්ග පාලි1: ප්‍රස්තාවනාව: චන්න තෙරුන්හට බ්‍රහ්මදණ්ඩනය පැනවීම විස්තර කර ඇත. **බලන්න**: උපග්‍රන්ථය:1.

▲**බ්‍රහ්මචරිය පංචම ශික්ඛපද-** Brahmacariyapañcamāni sikkhāpadāni බ්‍රහ්මචරිය පංචම ශික්ඛපද ලෙසින් පෙන්වා ඇත්තේ, මාර්ගඵල ලත් ගිහියෙක්, පංච ශීලයේ 3 නි ශික්ඛ පදය ( කාමේසු මිච්චාචාරා) වෙනුවට

බ්‍රහ්මචාරිව (කම්සැප හැර) වාසය කිරීමට සමාදන්වීමය. උග්ග විසාලා නුවර ගහපති හා උග්ග හත්ථිගාම ගහපති මේ ශීලය සමාදන්වූ ගිහි උපාසකයන්ය. **බලන්න**: EAN:note: 1678, උපග්‍රන්ථය:ගිහි ශ්‍රාවකයෝ, අෂ්ඨ ආශ්චර්ය අද්භූත ධම්ම. **මූලාශ්‍ර:**අංගු.නි: (5): 8 නිපාත:ගපතිවග්ග: 8.1.3.1 හා 8.1.3.2 සූත්‍ර, පි.122, EAN:8: 21.1. & 22.2 suttas, p. 423.

▲**බ්‍රහ්මචාරියෝගධ-**Grounded upon the holy life: බ්‍රහ්මචාරියෝගධ ලෙසින් පෙන්වා ඇත්තේ, බ්‍රහ්මචාරි ජීවිතයේ පදනම ලබා ඇතිබවය, එනම් සෝතාපන්නබව ලැබූබවය.**මූලාශ්‍ර:** සංයු.නි: (5-2): මහාවග්ග: සෝතාපන්නසංයුත්ත:11.1.2 බ්‍රහ්මචාරියෝගධ සූත්‍රය**,** පි. 164, ESN:55:Sothapatthisamyutta: 2.2 Grounded,p.2184.

▲ **බ්‍රහ්මයානය -**Brhmayaanaya: බ්‍රහ්මයානය යනු උත්තම යානය. බ්‍රහ්මයානය- ශ්‍රේෂ්ඨ යානය ලෙසින් පෙන්වා ඇත්තේ ආරිය අටමගය. ඒ මග යානාවක් කරගත්විට, නිවනට පැමිණිය හැකිය. **බලන්න:** ආරියඅටමග. **මූලාශ්‍ර:** සංනි: (5-1):මහාවග්ග:මග්ගසංයුත්ත:1.1.4 බ්‍රාහ්මණ සූත්‍රය, පි. 36, ESN: 45: Maggasamyutta: 4.4 The Brahmin, p. 1606.

▲ **බ්‍රහ්මරාජයෝ:** පාලි: **බ්‍රහමරාජො**-Great gods: බ්‍රහ්ම රාජයෝ ලෙසින් පෙන්වා ඇත්තේ උසස් බ්‍රහ්ම ලෝකවල වාසය කර දෙවියන්ය. ඔවුන් දේවලෝක වෙනත් දේවලෝකවල දෙවියනට වඩා අනුභාව සම්පන්නය. බුද්ධ ධර්මය පිළිගත් සමහර බ්‍රහ්ම රාජයෝ කලින් කලට කාමාවචර දේවලෝක වලට පැමිණ ධර්මය දේශනා කරන බව සූත්‍ර දේශනා වල පෙන්වා ඇත. **සටහන**: මහා බ්‍රහ්ම රාජයා,දහසක් ලෝකධාතුවට (thousand fold world system) අධිපතිය, අග්‍රය. **බලන්න**:අංගු.නි:10 නිපාත:10.1.3.9 . ප්‍රථම කොසල සූත්‍රය.

▼**සූත්‍ර දේශනාවල දක්වා ඇති බ්‍රහ්මරාජයන් ගැන විස්තර:**

**1. සහම්පති බ්‍රහ්මරාජ-** Brahma Shampathi: සහම්පති බ්‍රහ්ම, බ්‍රහ්ම ලෝකයේ වැඩසිටින, බුදුන් වහන්සේ අනුගමනය කරන උතුම් බ්‍රහ්මරාජයෙකි. බුදුන් වහන්සේ බැහැදැක, සහම්පති බ්‍රහ්මරාජ තමන් ධර්මයේ අනුගාමිකයෙක් බව මෙසේ දක්වා ඇත:

**"වහන්ස, පෙර මම කසුප් සම්මාසම්බුදුන් කෙරෙහි බඹසර කෙළෙමි. එහිදී මා 'සහක මහණ' ලෙසින් හඳුන්වා ඇත. එහිදී මම පසිඳුරන් වැඩූ බැවින් බහුල කල බැවින් කාමඡන්දය දුරු කොට, සෝභන ගති ඇති බඹලොව උපත ලැබුවෙමි. එහි, මා 'සහම්පති බඹ' යයි හඳුන්වයි".** **මූලාශ්‍ර:** සංයු.නි: (5-1): මහාවග්ග: බොජ්ඣංගසංයුත්ත:3.2.8 බ්‍රහ්මසූත්‍රය, පි.328.

▼**සහම්පති බ්‍රහ්මරාජ බුදුන් වහන්සේ බැහැදැකීම**: වින.පි.මෙසේ දක්වා ඇත:

"සම්මා සම්බෝධිය ලැබූ බුදුන් වහන්සේ ට, උන්වහන්සේ අවබෝධ කරගත චතුරාර්ය සත්‍ය ධර්මය, පංච කාමයෙන් ඇලුන පෘථග්ජන ලෝකයාට අවබෝධ කිරීම දුෂ්කර යන කල්පනාව පහළවූහ. එම අවස්ථාවේදී, එම සිතුවිල්ල දත් සහම්පති බ්‍රහ්ම රාජයා, බුදුන් වහන්සේ වෙත පැමිණ ධර්මය දහම අවබෝධ කරගත හැකි ලෝක

සත්ත්වයන් ගේ යහපත පිණිස ධර්මය දේශනා කරන්න යයි පැවසුහ. බුදුන් වහන්සේ, සහම්පති බ්‍රහ්ම රාජයාගේ ඇරයුම පිළිගත්හ''. **සටහන්: *** සංයු.නි: (1) සගාථවග්ග: බ්‍රහ්මසංයුත්ත: 6.1.1. ආයාචනා සූත්‍රයේද: සහම්පති බ්‍රහ්ම රාජයා දහම් දෙසීමට ආයාචනා කළ විස්තරය දක්වා ඇත. ****** බුදුන් වහන්සේගේ පරිනිබ්බානයෙන් පසු සහම්පති බ්‍රහ්ම රාජයා වදාළ ගාථා විස්තර පිණිස **බලන්න**: මහාපරිනිර්වාණ සූත්‍රය. **මූලාශ්‍රය**: වින.පි: මහාවග්ග: අජපාල කතා: 4: සහම්පති බ්‍රහ්ම, පි. 89.

▼**සංයු.නි: (5-1) බොජ්ඣංගසංයුත්ත**:කෝකාලික වග්ග යේ, බුදුන් වහන්සේ, සම්බෝධිය ලබා, අජපාලනුගරුක අසල වැඩවසනවිට, සහම්පති බ්‍රහ්ම රාජයා, උන්වහන්සේ බැහැදැකීම පිලිබඳව සූත්‍ර කිහිපයකම විස්තර කර ඇත. **බලන්න**:ගාරව සූත්‍රය,

▼**අංගු.නි: 10 නිපාත: 10.2.4.9 කෝකාලික සූත්‍රයේ** මෙසේ දක්වා ඇත: '' විශිෂ්ටවූ රූපාලංකාරයෙන් යුත් සහම්පති බ්‍රහ්මරාජයා, මැදියම් රැයේදී ජේතවනාරාමය ඒකාලෝක කරමින්, පැමිණ, භාග්‍යවතුන් වහන්සේ කරා එළඹ, බුදුහිමිට වැඳ එකත්පස්ව සිට මෙසේ පැවසුහ: 'වහන්ස, කොකාලික මහණ මළේය; සැරියුත් මුගලන් උතුමන් හට අපහාස කළ ඔහු පදුම නිරයේ උපත ලැබිය''.**බලන්න**: කෝකාලික භික්ෂුව.

▼ **සංයු.නි: (1) බ්‍රහ්ම සංයුත්ත**: බ්‍රහ්මදේව සූත්‍රයේදී, සහම්පති බ්‍රහ්මරාජයා, බ්‍රහ්ම හෝම කරන බැමිණියකට, ඇයගේ පුත්‍රයාවූ බ්‍රහ්මදේව රහතුන්ගේ ගුණ පවසා ඇය ධර්මයේ ස්ථාපිත කිරීම පිලිබඳ විස්තර මෙහි දක්වා ඇත. **බලන්න**: උපග්‍රන්ථය:බුද්ධ ශ්‍රාවකයෝ. **මූලාශ්‍ර:**සංයු.නි: (1) සගාථවග්ග: බ්‍රහ්මසංයුත්ත: 6.1.3 බ්‍රහ්මදේව සූත්‍රය, පි.280, ESN:6: Brhmasamyutta:3.3 Brhmadeva, p.328.

▼ **සංයු.නි: (1) බ්‍රහ්ම සංයුත්ත:**දේවදත්ත සූත්‍රයේ, සහම්පති බ්‍රහ්මරාජයා, බුදුන් වහන්සේ බැහැදැක, දේවදත්ත භික්ෂුව, පරිහානියට පත්වීම ගැන පවසා ඇත.

**2. සනං කුමාර බ්‍රහ්මරාජ-** Brahma Sanankumaara: සනං කුමාර බ්‍රහ්මරාජයා, සක්දෙවිඳු හා තව්තිසා දෙව්ලෝකයේ දෙවියන්ට ධර්මය දේශනා කල බව මේ සූත්‍රයේ විස්තරව දක්වා ඇත.**සටහන්**: සංනකුමාර යන්නෙහි තේරුම සදාකල්හිම තරුණබවය. මෙතුමා උසස් බ්‍රහ්ම රාජයෙකි. අටුවාවට අනුව, මිනිස්ලොවදී ජාන සමාපත්ති ලබා, මියයැමෙන් පසු මේ උතුමා බ්‍රහ්ම ලෝකයේ පහලවූහ. මිනිස්ලෝකයේදී ඔහු දැරූ රූපසම්පත්තිය, බ්‍රහ්මලෝකයේදී ද එතුමාට හිමිවූබව දැක්වේ. **බලන්න**: EMN: note 566, p. 1117. **මූලාශ්‍ර:** දීඝ.නි: (2) **5. ජනවසභ සූත්‍රය**, පි. 322, EDN: 18 Janavasabha Sutta, p. 209.

▼**අංගු.නි: 11 නිපාත:** 11.1.10,**මොරනිවාප සූත්‍රයේ**: බ්‍රහ්ම සංනකුමාර, බුදුන් වහන්සේ ගේ ශ්‍රේෂ්ඨබව දක්වා ඇත.

▼**සංයු.නි: (1) බ්‍රහ්මසංයුත්ත**:පරිනිබ්බාන වග්ග: සංනකුමාර බ්‍රහ්ම, බුදුන් වහන්සේ බැහැදැකීමට පැමිණීම විස්තර කර ඇත.

3. **තුදු බ්‍රහ්මරාජයා-** Brahma Thudu: බ්‍රහ්ම තුදු, පච්චේක බ්‍රහ්මරාජයෙකි (තනිව හැසිරෙන). අටුවාවට අනුව ඔහු, කොකාලික භික්ෂුවගේ උපාධ්‍යාය ය. අනාගාමී ව මනුලොවින් චුතව බ්‍රහ්මලෝකයේ පහළවූහ.

කොකාලික භික්ෂුව, අගසව්දෙනමට ආරියඋපවාදය කලබව ඇසූ බ්‍රහ්ම තුදු, කොකාලිකට සිදුවිය හැකි හානිය දැක, මනුලොවට පැමිණ, ඔහුට එසේ නොකරන ලෙසට අවවාද කිරීම පිලිබඳ විස්තරය මේ සූත්‍රයේ පෙන්වා ඇත.**බලන්න**: EAN:note 2112, p. 682. **සටහන:** සංයු.නි: (1) තුදුබ්‍රහ්ම සූත්‍රයේ මේ සමාන විස්තරයක් දක්වා ඇත. **මූලාශ්‍ර**: අංගු.නි: (6): 10: නිපාත,10.2.4.9. කොකාලික සූත්‍රය,පි.331, EAN, 10: 89.9. Kokalika, p. 530.

**4. බක බ්‍රහ්ම රාජයා-** Brahma Baka: බක බ්‍රහ්ම රාජයා, බ්‍රහ්මස්ථානය නිත්‍ය යන වැරදි දිට්ඨිය දැරීම හා බුදුන් වහන්සේ ඔහු කෙරෙහි අනුකම්පාවෙන්, බඹ ලොවට පැමිණ කරුණු දක්වා ඔහුගේ මතය නිදොස් කිරීම පිලිබඳ විස්තර මේ සූත්‍රවල පෙන්වා ඇත.**බලන්න:** සංයු.නි: (1) බ්‍රහ්මසංයුත්ත:බකබ්‍රහ්ම සූත්‍රය, ම.නි:බ්‍රහ්මනිමන්තනික සූත්‍රය. **සටහන:** බුදුන් වහන්සේ පෙර භවයකදී**,** බකබ්‍රහ්මගේ 'කප්ප' නම් අතවැසියාව සිටිබව මේ සූත්‍රයන්හි දක්වා ඇත.

**5. ඝටිකාර බ්‍රහ්ම-** Brahma Ghaṭīkāra: කස්සප බුදුන් වහන්සේ වැඩසිටි සමයේ, උන්වහන්සේගේ ප්‍රධාන දායකයා ලෙසින් දක්වා ඇත්තේ ඝටිකාර නම් වළං සාදන්නෙක්ය. ඒ ගිහි ජීවිතයේදී, ඝටිකාර ගේ මිතුරාවුවේ, ජෝතිපාල නම් බ්‍රාහමණයාය. (ගෞතම බුදුන් වහන්සේ). අනාගාමීවූ ඔහු,මරණින් මතු ඝටිකාර බ්‍රහ්ම ලෙසින් අවිහ බ්‍රහ්ම ලෝකයේ පහළවූහ. **බලන්න**: * ම.නි: ඝටිකාර සූත්‍රය. ** බ්‍රහ්මලෝකයේ සිට බුදුන් වහන්සේ බැහැදැකීමට පැමිණි විස්තරය: සංයු.නි; (1) දේවතාසංයුත්ත: ඝටිකාර සූත්‍රයේ විස්තරාත්මකව දක්වා ඇත.

6. **පච්චේක බ්‍රහ්ම සුබ්‍රහම හා සුද්ධාවාස**: සුබ්‍රහම හා සුද්ධාවාස යන පච්චේක බ්‍රහ්මයන් බුදුන් වහන්සේගේ අනුගාමිකයන්ය. **බලන්න**: සංයු.නි: (1) බ්‍රහ්මසංයුත්ත: පමාදසූත්‍රය.

▲ **බ්‍රහ්මඤ්ඤ-**Brhmancha: බ්‍රහ්මඤ්ඤ ලෙසින් පෙන්වා ඇත්තේ ශ්‍රේෂ්ඨබවය-ශ්‍රේෂ්ඨත්වය- උතුම්බවය. ශ්‍රේෂ්ඨබව යනු අරියඅටමගය, ශ්‍රේෂ්ඨබවලැබීමේ ඵලය සිව්මග සිව්ඵල ලබීමය, කෙළෙස් මුල් ක්ෂය කිරීමය. එහෙත්, ලෝකයේ ශ්‍රේෂ්ඨත්වය ලැබූවෝ ස්වල්පය. **බලන්න:** සංයු.නි: (5-1) මග්ගසංයුත්ත: පටිපත්තිවග්ග: බ්‍රහ්මඤ්ඤ සූත්‍ර 2 හා සච්චසංයුත්ත: 12.7.9 බ්‍රහ්මඤ්ඤ සූත්‍රය.

▲ **බ්‍රහ්ම විහාර:** පාලි: **බ්‍රහ්මවිහාර**- brahma-vihārā -sublime states/divine abodes: බ්‍රහ්මවිහාර යනු උත්තරිතරවූ, ශ්‍රේෂ්ඨවූ, අප්‍රමාණවූ , මහග්ගත්වූ සිතක් ඇතිව වාසය කිරීමය. බ්‍රහ්මවිහරණය උතුම්ලෙසින් සලකන්නේ, උතුම් සිතක් ඇතිව වාසය කිරීමෙන් තමන්ට මෙන්ම සියලු ලෝක සත්ත්වයන්ට සැනසීම හා ශාන්තිය ලබා දීමට හැකියාව ඇති නිසාය. **බලන්න**: මෙත්තා සූත්‍රය.

**බ්‍රහ්ම විහාර සතරකි: 1) මෛත්‍රිය**-loving-kindness - අන්‍යයන්ගේ සුභසාධනය හා සැපත පිළිබඳව කෙනෙක්තුළ ඇති කැමැත්ත **2) කරුණාව-** compassion or pity: දයාව, අනුන්ගේ දුක පිළිබඳව සිතේ ඇති සහකම්පනය-අනුකම්පාව **3) මුදිතාව-**altruistic joy- gladness at other's success - අන්‍යයන් තුළ ඇති යහපත් ගුණ පිළිබඳව හා ඔවුන්ගේ

සමෘද්ධිය පිළිබඳව සිතේ ඇති සතුටුබව **4) උපෙක්ඛාව-**equanimity, even-mindedness- අන්‍යයන් පිලිබඳව වෙනස්කමක් හෝ නොසැලකිල්ලක් නොමැතිව සිතේ ඇති අපක්ෂපාති, මධස්ථ ආකල්පය. **බලන්න**: EMN. Note 95, p.1072. **සටහන්:**අංගු.නි: (6) 11 නිපාත: 11.2.6, අට්ඨකනාගර සූත්‍රයේ: බ්‍රහ්මවිහාර වැඩීම නිවනට මගක් ය යි පෙන්වා ඇත. ** අංගු.නි: (6) 10 නිපාත: 10.5.1.9. කරජකාය සූත්‍රය: සතර බ්‍රහ්ම විහාර පරිපූර්ණත්වයට පත්කරගැනීමෙන් උපේක්ඛා සහගත චේතෝවිමුක්ති ඇතිකරගත් ආරිය ශ්‍රාවකයාට -අනාගමීබව හෙතුකොටගෙන මෙලොව විඳීමට ඇති කර්ම වලින් නිදහස් විය හැකියයි පෙන්වා ඇත. **සටහන:** මෙත්තා, කරුණා, මුදිතා, උපෙක්කා යන සතර බඹ විහරණ , හදවත තුල ඇතිකරගතයුතු අසීමිත, අපරිමිත ගුනධර්මයන්ය. කෙනෙකුට මේ විහරණ තුලින් ආධ්‍යාත්මික ශක්තිය, සිතේ සාමය හා සමාදානය ඇතිවේ. **බලන්න**: හිතක මහිම 1, කටුකුරුන්දේ ඤාණානන්ද භික්ෂුව, පහන්කනුව ධර්ම දේශනා. **ශබ්දකෝෂ: පා.සි.ශ**: පි.387: "**බ්‍රහමවිහාර:** මෙත්තා කරුණා, මුදිතා, උපෙක්‍ෂා යන උත්තම ධර්ම සතරින් යුක්තව විසීම, මහා බ්‍රහ්මහට මේ ධර්ම නොසිඳී පවතී".**B.D**: p.78: "**brahma-vihāra**: the 4 sublime state- divine abodes - 4 boundless states (appamaññā)…" **P.T.S**: p. 1122: "…**brahma vihāra**: sublime or divine state of mind, blissful meditation. There are 4 such "divine states," viz. mettā, karuṇā, muditā, upekkhā

▼**බ්‍රහ්මවිහරණය මගින් උතුම් මහඵල ලබාගැනීමේ ක්‍රම විධිය:**

> **"මෙත්තඤ්ච සබ්බලොකස්මිං - මානසං භාවයෙ අපරිමාණං**
> **උද්ධං අධො ච තිරියං ච - අසම්බාධං අවෙරං අසපත්තං"**

උඩ, යට හා සිව් දිසාවේ සිටින සියලු ලෝක සත්ත්වයන් කෙරෙහි, කිසිම බාධාවකින් තොරව, වෛරචේතනා නැතිව, සතුරු බැවින් තොරව, අප්‍රමාණවූ මෙත්තාසහගත සිත වඩාගන්න.

> **"තිට්ඨං චරං නිසින්නො වා - සයානො වා යාවතස්ස විගතමිද්ධො**
> **එතං සතිං අධිට්ඨෙය්‍ය - බ්‍රහමමෙතං විහාරං ඉධමාහු"**

හිඳගෙන සිටිනවිට හෝ සිටගෙන සිටිනවිට හෝ ඇවිදිනවිට හෝ සයනය කරණවිට මෙත්තා සහගත සිත ඇතිව වාසය කිරීමට අදිටන් කරගන්නේ නම්, ඒ තාක්කල් පහවූ අලසබව ඇතිව, උතුම් බ්‍රහ්මවිහරණයෙන් වාසය කල හැකිවේ.

> **"දිට්ඨිං ච අනුපගම්ම සීලවා- දස්සනෙන සම්පන්නො**
>
> **කාමෙසු විනෙය්‍ය ගෙධං - න හි ජාතු ගබ්භසෙය්‍යං පුනරෙතී ති"**

සම්මාදිට්ඨියට පැමිණ, ශිලසම්පන්නව, දිට්ඨිසම්පන්නව, කාමයට ඇති ගිජුබව දුරුකර (බ්‍රහ්මවිහරණයෙන්) වාසය කරනවිට, ඒකාන්තයෙන්ම නැවත මව් ගැබකට නො පැමිණෙන්නේය. **සටහන්**: * දිට්ඨියට පැමිණීම යනු ආත්ම දෘෂ්ඨිය හැරදැමීම- සෝතාපන්න බව ලැබීම ** ශිල සම්පන්න- ලෝකෝත්තර ශිලය- සේඛ ශිලය තිබීම ** දිට්ඨිසම්පන්න- බුදුන් වහන්සේ ගේ බුද්ධත්වය ස්ථිරවම පිළිගැනිම-සෝතාපන්න

වීමෙන්. ** නැවත මව් ගැබකට නොපැමිණීම- අනාගාමීව සුද්ධාවාසයක පහළවීම. **බලන්න**: දිට්ඨිසම්පන්න, සෝතාපන්න, අනාගාමි. **මූලාශ්‍රය:** ඛු.නි: ඛුද්ධක පාඨ: 9**:** මෙත්තා සූත්‍රය, පි. 47.

**▼බ්‍රහ්මවිහාර වැඩීමෙන් බ්‍රහ්ම ලෝකයේ උපත ලබා ගත හැකිය.** බ්‍රහ්මලෝකයේ උපත ලබාගැනීමේ පටිපදාව බුදුන් වහන්සේ මෙසේ පෙන්වා ඇත: **1)** නීවරණ පහකර සතුටු සිතින් සමාධිය ලබාගත් මහණ **මෙත්තා සහගත සිත ඇතිව**, සියලුම දිසාවන්හි (සතරදිසාව හා උඩ, යට) සිටින සියලු ලෝක සත්වයන් තමා හා සමාන කර සලකමින් ඔවුන් කෙරෙහි විපුලවූ, මහත්වූ, අප්‍රමාණවූ, අවෛරය සහගතවූ මෛත්‍රිය පතුරුවමින් වාසය කරයි. එම **මෛත්‍රී චෙතෝ විමුක්තිය** (ව්‍යාපාදයෙන් මිදීම- liberation of the heart through loving-kindness) නිසා ඔහුගේ කාමාවචර ලෝකය හා බැඳුන කර්ම ඉතිරිනොමැතිව ගෙවීයයි. 2)... **කරුණා සහගත සිත ඇතිව**, සියලුම දිසාවන්හි (සතරදිසාව හා උඩ, යට) සිටින සියලු ලෝක සත්වයන් තමා හා සමාන කර සලකමින් ඔවුන් කෙරෙහි විපුලවූ, මහත්වූ, අප්‍රමාණවූ, අවෛරය සහගතවූ කරුණාව පතුරුවමින් වාසය කරයි. එම **කරුණා චෙතෝවිමුක්තිය** (liberation of the heart through compassion- හිංසාකාරි බැවින් මිදීම) නිසා ඔහුගේ කාමාවචර ලෝකය හා බැඳුන කර්ම ඉතිරිනොමැතිව ගෙවීයයි. 3) ... **මුදිතා සහගත සිත ඇතිව**, සියලුම දිසාවන්හි (සතරදිසාව හා උඩ, යට) සිටින සියලු ලෝක සත්වයන් තමා හා සමාන කර සලකමින් ඔවුන් කෙරෙහි විපුලවූ, මහත්වූ, අප්‍රමාණවූ, අවෛරය සහගතවූ මුදිතාව පතුරුවමින් වාසය කරයි. එම **මුදිතා චෙතෝවිමුක්තිය** (liberation of the heart through sympathetic joy - ඉරිසියාව, අරතිය ආදී කෙළෙස් පහවේ) එමනිසා ඔහුගේ කාමාවචර ලෝකය හා බැඳුන කර්ම ඉතිරිනොමැතිව ගෙවීයයි. 4) ... **උපේක්ඛා සහගත සිත ඇතිව**, සියලුම දිසාවන්හි (සතරදිසාව හා උඩ, යට) සිටින සියලු ලෝක සත්වයන් තමා හා සමාන කර සලකමින් ඔවුන් කෙරෙහි විපුලවූ, මහත්වූ, අප්‍රමාණවූ, අවෛරය සහගතවූ උපේක්ඛාව පතුරුවමින් වාසය කරයි. එම **උපේක්ඛා චෙතෝවිමුක්තිය** (liberation of the heart through equanimity - මධ්‍යස්තබව ඇතිවේ, පටිඝය නැතිවේ) නිසා ඔහු ගේ කාමාවචර ලෝකය හා බැඳුන කර්ම ඉතිරිනොමැතිව ගෙවීයයි.

**සටහන්**: * ම.නි. වත්ථුපම සූත්‍රයේ බ්‍රහ්මවිහරන ගැන විස්තර දක්වා ඇත. **බලන්න**: ම.නි (1)1.1.7 වත්ථුපම සූත්‍රය, පි. 102,EMN:7 Vatthūpama Sutta-The Simile of the Cloth, p.103. **මූලාශ්‍ර**: දිඝ.නි: (1 ): 13 තේවිජ්ජා සූත්‍රය, පි. 610, EDN: 13 Tevijja Sutta: The Threefold Knowledge -The Way to Brahma, p.142.

**▼ සතර බ්‍රහ්ම විහාර නිස්සරණීය ධාතුන්ය**. (elements of escape) මෙත්තා කරුණා මුදිතා හා උපේක්ඛා චේතෝවිමුක්ති, නිසසරණ ධාතු ලෙසින් බුදුන් වහන්සේ පෙන්වා ඇත. එම විමුක්තියන් සාක්ෂාත් කරගැනීම පිණිස භාවනා අරමුණ: මෙත්තා හෝ කරුණා ආදීවශයෙන් සිතේ වඩාගතයුතුය; පුන පුනා බහුල කරගත යුතුය, යානාවක් කරගතයුතුය, පදනමක් කරගතයුතුය, ඉෂ්ටකරගත යුතුය, තහවුරුකරගත යුතුය, මනාව ප්‍රගුණ කළ යුතුය. **බලන්න:** නිස්සරණීය ධාතු. **මූලාශ්‍ර:** අංගු.නි: ( 4 ): 6 නිපාතය: 6.1.2.3 නිස්සාරණීය සූත්‍රය, පි. 40, EAN:6: 13.3 Escape, p. 321.

▼**සතර බ්‍රහ්මවිහාර මගින් සිත විමුක්තියට පත් කරගැනීම**: මේ පිළිබඳව අන්‍යආගමිකයන් ප්‍රශ්ණ කරනවිට මෙසේ කටයුතු කරන්න යයි, බුදුන් වහන්සේ සංඝයාට උපදෙස් වදාළහ. **ඔවුන් ගෙන් මෙලෙස ප්‍රශ්න කළයුතුය:** 1) සතර බ්‍රහ්ම විහාර (මෙත්තා, කරුණා, මුදිතා, උපේක්ඛා චේතෝවිමුක්තිය) කුමන ආකාරයට වැඩිය යුතුද- එහි ගතිය කුමක්ද? 2) කුමක් උතුම් කොට ඇත්තේද? 3) කුමන ඵලයක්- අනුසස් ඇත්තේද? 4) කුමක් කෙළවර කොට - අවසන්කර ඇත්තේද?

**"කිංගතිකා හොති කිංපරමා හොති කිම්ඵලා කිංපරියොසනා?"**

( Bhikkhus, when wanderers of other sects speak thus, they should be asked: 'Friends, how is the liberation of the mind by lovingkindness... compassion... altruistic joy... equanimity developed? What does it have as its destination, its culmination, its fruit, its final goal). **සතර බ්‍රහ්ම විහාර වැඩීම:** මේ සසුනේ මහණ, විවේකයසහිත, විරාගයසහිත, නිරෝධයසහිත වොස්සග්ගයපරිණාම කොට ඇති (නිවන අරමුණු කොට) සත් සම් බොජ්ඣංග ධර්ම වඩයි.

**1) ඉහත ආකාරයෙන් මෙත්තා චේතෝ විමුක්තිය වඩාගැනීමෙන් ලැබෙන උතුම් බව, ඵලය හා අවසානය.**

**උතුම් බව ලැබීම**: සුභ හෝ අසුභ නිමිති පිලිබඳව පස් ආකාරයකින් කටයුතු කිරීමට හැකියාව ලැබීම. 1. සුභ දෙයක, අසුභය - පිළිකුල්බව බලමින් වාසය කිරීමට - May I dwell perceiving the repulsive in the un-repulsive 2. අසුභ දෙයක, සුභය - බලමින් වාසය කිරීමට- May I dwell perceiving the un-repulsive in the repulsive. 3. සුභ හා අසුභ දේ පිළිබඳව අසුභය බලමින් වාසය කිරීමට- May I dwell perceiving the repulsive in the un-repulsive and in the repulsive 4. සුභ හා අසුභ දේ පිළිබඳව සුභය බලමින් වාසය කිරීමට - May I dwell perceiving the un-repulsive in the repulsive and in the un-repulsive 5. සුභ අසුභ දෙකම මග හරිමින්, උපේක්ඛා සහගතව, සති සම්ප්‍රජන්‍යය ඇතිව වාසය කිරීමට- Avoiding both the un-repulsive and the repulsive, may I dwell equanimously, mindful and clearly comprehending.

**" සො සචෙ ආකඞ්ඛති අප්පටිකූලෙ පටිකූලසඤ්ඤී විහරෙය්‍යන්ති පටිකූලසඤ්ඤී තත්‍ථ විහරති. සචෙ ආකඞ්ඛති පටිකූලෙ අප්පටිකූලසඤ්ඤී විහරෙය්‍යන්ති අප්පටිකූලසඤ්ඤී තත්‍ථ විහරති. සචෙ ආකඞ්ඛති අප්පටිකූලෙ ච පටිකූලෙ ච පටිකූලසඤ්ඤී විහරෙය්‍යන්ති පටිකූලසඤ්ඤී තත්‍ථ විහරති. සචෙ ආකඞ්ඛති පටිකූලෙ ච අප්පටිකූලෙ ච අප්පටිකූලසඤ්ඤී විහරෙය්‍යන්ති අප්පටිකූලසඤ්ඤී තත්‍ථ විහරති. සචෙ ආකඞ්ඛති පටිකූලෙ ච අප්පටිකූලෙ ච පටිකූලසඤ්ඤී විහරෙය්‍යන්ති පටිකූලසඤ්ඤී තත්‍ථ විහරති. සචෙ ආකඞ්ඛති අප්පටිකූලඤ්ච පටිකූලඤ්ච තදුභයං අභිනිවජ්ජෙත්‍වා උපෙක්ඛකො විහරෙය්‍යං සතො සම්පජානොති උපෙක්ඛකො තත්‍ථ විහරති සතො සම්පජානො.**

**ඵහි ඵලය**: සුභවිමෝක්ෂයක් ලැබීම- he enters and dwells in the deliverance of the beautiful.

**“ සුභපරමාහං භික්ඛවෙ, මෙත්තා චෙතොවිමුත්තිං වදාමි”**

**එහි අවසානය**: ප්‍රඥාවන්ත භික්ෂුව උතුම් විමුක්තිය නො ලැබුවහොත් (අරහත්වය) ‘සුභය’ කෙළවර කොට ඇත. (Bhikkhus, the liberation of mind by lovingkindness has the beautiful as its culmination, I say, for a wise bhikkhu here who has not penetrated to a superior liberation)

**සටහන:** මෙත්තා චේතෝ විමුක්තිය ඇතිව වාසය කරන භික්ෂුවට සුභවර්ණ කසිනයක් -නිල් පැහැය ආදීවූ (beautiful color kasiṇa) අරමුණු කොට ජාන සමාපත්තිය ලබා සුභ විමොක්ෂය ලබාගත හැකිය **බලන්න**: සිංහල විසුද්ධි මාර්ගය, 3 පරිච්ඡේදය.

**එහි අවසානය:** ප්‍රඥාසම්පන්න භික්ෂුව, අරහත්වයට පත් නොවීනම්, මෙත්තා චේතෝවිමුක්තිය ‘සුභය’ කෙළවර කොට ඇත.

**2 )** ඉහත දැක්වූ මෙත්තා චේතෝ විමුක්තිය වඩන ආකාරයෙන් **කරුණා චේතෝ විමුක්තිය වඩා** ගත යුතුය:

**උතුම්බව ලැබීම:** සුභ හෝ අසුභ නිමිති පිලිබඳව පස් ආකාරයකින් කටයුතු කිරීමට හැකියාව ලැබීම (ඉහත දක්වා ඇති පරිදි)

**එහි ඵලය:** ආකාසානඤ්චායතනයට පැමිණ වාසය කිරීම.

**සටහන:** කරුණා චේතෝ විමුක්තිය ඇතිව වාසය කරන භික්ෂුව, රූපයේ ආදීනව මෙනෙහිකර ඉන් නිදහස්වීම පිණිස ආකාසානඤ්චායතනය සංඥාව වඩා, රූපලෝකයෙන් නිදහස්වේ. **බලන්න**: සිංහල විසුද්ධි මාර්ගය, 3 පරිච්ඡේදය.

**එහි අවසානය:** ප්‍රඥාසම්පන්න භික්ෂුව, අරහත්වයට පත් නොවීනම්, කරුණා චේතෝවිමුක්තිය, ආකාසානඤ්චායතනය කෙළවර කොට ඇත.

**3)** ඉහත දැක්වූ මෙත්තා චේතෝ විමුක්තිය වඩන ආකාරයෙන් **මුදිතා චේතෝ විමුක්තිය වඩා** ගත යුතුය.

**උතුම්බව ලැබීම:** සුභ හෝ අසුභ නිමිති පිලිබඳව පස් ආකාරයකින් කටයුතු කිරීමට හැකියාව ලැබීම (ඉහත දක්වා ඇති පරිදි)

**එහි ඵලය:** විඤ්ඤානඤ්චායතනයට පැමිණ වාසය කිරීම

**සටහන:** මුදිතා චේතෝ විමුක්තිය ඇතිව වාසය කරන භික්ෂුවට පහසුවෙන්ම විඤ්ඤානඤ්චායතන සංඥාව වඩාගත හැකිය. **බලන්න**: සිංහල විසුද්ධි මාර්ගය, 3 පරිච්ඡේදය.

**එහි අවසානය:** ප්‍රඥාසම්පන්න භික්ෂුව, අරහත්වයට පත් නොවීනම්, මුදිතා චේතෝ විමුක්තිය,විඤ්ඤානඤ්චායතනය කෙළවර කොට ඇත.

**4 )** ඉහත දැක්වූ මෙත්තා චේතෝ විමුක්තිය වඩන ආකාරයෙන් **උපේක්ඛා චේතෝ විමුක්තිය වඩා** ගත යුතුය.

**උතුම්බව ලැබීම:** සුභ හෝ අසුභ නිමිති පිලිබඳව පස් ආකාරයකින් කටයුතු කිරීමට හැකියාව ලැබීම (ඉහත දක්වා ඇති පරිදි)

**එහි ඵලය:** ආකිඤ්චඤ්ඤායතනයට පැමිණ වාසය කිරීම

**සටහන:** උපේක්ඛා චේතෝ විමුක්තිය ඇතිව වාසය කරන භික්ෂුවට, සියලු සුඛ දුක වේදනා වලින් සිත මුදාගැනීමට හැකියාව ඇත. එමනිසා ඔහුට පිලිබඳව ආකිඤ්චඤ්ඤායතන සංඥාව වඩාගත හැකිය. **බලන්න:** සිංහල විසුද්ධි මාර්ගය, 3 පරිච්ඡේදය.

**එහි අවසානය:** ප්‍රඥාසම්පන්න භික්ෂුව, අරහත්වයට පත් නොවීනම්, උපේක්ඛා චේතෝවිමුක්තිය, ආකිඤ්චඤ්ඤායතනය කෙළවර කොට ඇත.

**සටහන**: ඉහත විමුක්ති 4 පිලිබඳව යහපත් ලෙසින් පිළිතුරු දීමට හැකි වන්නේ තථාගතයන් වහන්සේට හෝ උන්වහන්සේගෙන් ධර්මය උගත් ශ්‍රවකයෙක් හට පමණි. **මූලාශ්‍ර:** සංයු.නි: (5-1): බොජ්ඣංග සංයුත්ත: 2.6.4 මෙත්තා සූත්‍රය, පි.246 , ESN: Maggasamyutta: Bojjanga: 54.4 Accompanied by Lovingkindness p. 1797.

▼ **වෙනත් මූලාශ්‍ර: 1. "The Four Sublime States"** by Nanamoli Thera, Wheel 6, BPS, 1958: '...brhma-vihara, a tern which may be rendered as excellent, lofty or sublime states of mind or alternatively, as Brahma-like, god-like, or divine abodes' (**සටහන**: මෙහි සතර බ්‍රහ්මවිහාර විස්තරාත්මකව දක්වා ඇත). **2. The Practice of Loving-kindness'-as taught by the Buddha in the Pali Canon**: p.4, Complied and translated from the Pali by Nanamoli Thera, The Wheel-Selections, Vol.1, BPS, 1981. **3**. පැරණිසිංහල පොත්: **සද්ධර්මාලංකාරය**, පි. 52, '...කිරි බින්දුවක් දොවන වේලාව වැනි සුළු වේලාවක් තුලදී වුවද සියලු සතුන් කෙරෙහි මෙත් සිත් පතුරුවා මෙත්තා භාවනාව කරන්නේ නම් අපමන යහපත් විපාක ලැබේ': **4. හිතක මහිම 1, කටුකුරුන්දේ ඤාණානන්ද භික්ෂු,** පහන්කනුව ධර්ම දේශනා, පි.9, 2006: '...සිව්බඹ විහරණය යනු හදවතක් තුළ අසීමිත අපරිමිත ලෙසේ මුදාහළ යුතු ගුණ ධර්ම පෙළකි. පුළුල්ව වඩාගත් කල, සමාජය කෙෂ්ත්‍රයට අධ්‍යාත්මික ශක්තිය, සමාදානය උදාකර දෙයි...මෙත්තා, කරුණා, මුදිතා, උපෙක්කා යන සතර බඹ විහරණ , හදවත තුල ඇතිකරගතයුතු අසීමිත, අපරිමිත ගුනධර්මයන්ය. කෙනෙකුට මේ විහරණ තුලින් ආධ්‍යාත්මික ශක්තිය, සිතේ සාමය හා සමාදානය ඇතිවේ".

▲ **බ්‍රහ්මලෝක:** පාලි: **බ්‍රහමලොක**-Brahmaloka- higher worlds: උසස් බ්‍රහ්ම දෙවිවරුන් වසන **රූප ලෝක** හා **අරූප ලෝක** බ්‍රහ්මලෝක ලෙසින් හඳුන්වති. (rūpa-loka -world of form/ fine-material world, arūpa-loka-formless/ immaterial world). සූත්‍රදේශනාවන්ට අනුව රූප ලෝක හා අරූප ලෝකවල පහළවන්නේ, මේ ලෝකයේදී උසස් ජාන හා සමාපත්ති ලැබූ උතුම් පුද්ගලයන්ය. **ශබ්දකෝෂ: පා.සි.ශ**: පි.387: "**බ්‍රහ්මයන්ගේ** ලෝකය, බඹලොව".**B.D**: p. 78: "**brahma-loka**: brahma-world, is a name for the fine-material and immaterial world". **P.T.S**: p. 1121: **"brahma god**, a happy & blameless celestial being, an inhabitant of the higher heavens -brahma-loka; in which to be reborn is a reward of great merit'

▼**බ්‍රහ්ම ලෝකවල පහළවීමේ පටිපදාව:** බ්‍රහ්ම දෙවිවරු, බ්‍රහ්ම ලෝක හා එම ලෝකවලට යන පිළිවෙළද, එම පටිපදාව ( බ්‍රහ්මවිහාර) පුරුදුපුහුණු කළ කෙනෙක්, බඹලොව පහළවන්නේ නම් ඒ ගැන දන්නා බව බුදුන් වහන්සේ වදාරා ඇත:

**“ ... තථාගතස්ස බ්‍රහ්මලොකෙ වා බ්‍රහ්මලොකගාමිනීයා වා පටිපාදාය පුට්ඨස්ස දන්ධායිතත්තං වා විත්ථායිතත්තං වා, බ්‍රහ්මනඤ්චාහං ... පජානාමි බ්‍රහ්මලොකඤ්ච බ්‍රහ්මලොකගාමිනිඤ්ච පටිපදං. යථාපටිපන්නො බ්‍රහ්මලොකං උපපන්නො, තඤ්චපජානාමි’ ති”**

**බලන්න**: බ්‍රහ්මවිහාර.මූලාශ්‍ර: දිඝ.නි: (1):13 තේවිජ්ජා සූත්‍රය, ඡෙදය: 40, පි. 610, EDN: 13 Tevijja Sutta: The Threefold Knowledge -The Way to Brahma, p.142.

▼**සත්ත්වයන් යළි උපත ලබන** වාසස්ථාන 31 න් අවසාන ස්ථාන 20 බ්‍රහ්ම ලෝකවේ. **සටහන: බලන්න:** The thirty-one abodes, EDN:p. 32, සත්ත්වාවාස, විඥාන ස්ථාන. **රූපලෝක**: එම බ්‍රහ්ම ලෝක අතුරින් පළමු 16 **රූප බ්‍රහ්ම ලෝකවේ-** රූපාවචර බ්‍රහ්මලෝක. සිව්ජාන සාක්ෂාත් කරගැනීමෙන් රූප ලෝකයන්හි පහළවීමට හැකිවේ. **සටහන්**: * පළමු රූප ලෝක:1-3 **ප්‍රථමධ්‍යාන භූමි** ලෙසින්ද 4,5, 6 යන බඹ ලෝක තුන **ද්විතියධ්‍යාන භූමි** ලෙසින් ද 7.8.හා 9. **තෘතීයධ්‍යාන භූමි** ලෙසින් ද හඳුන්වයි. රූපාවචර චතුර්ථධ්‍යානය - සතරවෙනි ජානය උපදවා නොපිරිහී කලුරිය කර උපත ලබන බඹතල 10,11 **චතුර්ථධ්‍යාන භූමි** ලෙසින් හඳුන්වයි. 12-16 අනාගාමී උතුමන් පහළවන සුද්දාවාස බඹ ලොව පහ පිහිටා ඇත: ඒවා **පංච සුද්ධාවාස** ලෙසින් හඳුන්වයි. ** **පුරිසගති සූත්‍රයේ** අනාගාමී උතුමන් පංච ඕරමභාගිය සංයෝජන පහකර අනාගාමීව, සුද්දාවාසයන්හි පහළවනබව දක්වා ඇත. **බලන්න**: අංගු.නි: (4) 7 නිපාතය, පුරිසගති සූත්‍රය, පි. 402, EAN:7: 55.2. Destinations of persons, p. 387.

**රූප බ්‍රහ්ම ලෝක:**

1) **බ්‍රහ්ම පරිසජ්ජා** - බ්‍රහ්මපාරිසද්‍ය (Retinue of Brahma) : මහා බ්‍රහ්මරාජයාට පරිවාරකම් කරණ බ්‍රහ්ම දෙවියන් මේ ලෝකයේ වැඩ වසති (මහාබ්‍රහ්මානං පාරිසජ්ජා පරිවාරකාති බ්‍රහ්මපාරිසජ්ජා: **විභඞ්ගප්‍රකරණය**) ප්‍රථම ජානය වඩාගත් පුද්ගලයන්, මෙලොවින් චුතවූ පසු පහළවන්නේ මේ බඹලොවෙහිය, ඔවුන්ගේ ආයුෂ අසංඛ්‍ය කල්පයකින් 1/3 කි.

2) **බ්‍රහ්ම පුරෝහිත** (Ministers of Brahma) : මහාබ්‍රහ්මයන්ගේ පුරෝහිත භාවයෙහි සිටියා වූ බ්‍රහ්මයෝ බ්‍රහ්මපුරෝහිත ලෙසින් හඳුන්වයි. මේ බඹ ලොව පහළ වන්නේද, මේ ලොවදීම පළමු ජාන සම්පත් ලැබූ අයය, ඔවුන්ගේ ආයුෂ අසංඛ්‍යකල්පයකින් අඩකි(1/2)

3) **මහා බ්‍රහ්ම** (Great Brahmās)

මේ බඹ ලොව පහළවන අය, වර්ණයෙන් හා දීර්ඝ ආයුෂ ඇතිහෙයින් මහා බ්‍රහ්මයන් ලෙසින් හඳුන්වයි. ඔවුන් මෙලොවදී ප්‍රථම ජාන සම්පත් යහපත් ලෙසින්ම වඩා ඇත, ඔවුන්ගේ ආයුෂ අසංඛ්‍ය කල්පයකි. මේ බඹ

ලොව වසන මහාබ්‍රහ්මයන් **සහස්සබ්‍රහ්ම**- සක්වළ දහසකට අධිපති, **ද්විසහස්සබ්‍රහ්ම**- සක්වළ දෙදහසකට අධිපති ආදී වශයෙන් විවිධවේ.

4) **පරිත්තඅභා** (Devas of Limited Radiance): මෙහි වෙසෙන බ්‍රහ්ම දෙවිවරුන්ට අල්ප ආලෝකයක් ඇති නිසා පරිත්තඅභා ලෙසින් ඔවුන් හඳුන්වති (පරිත්තා ආභා එතේසන්ති පරිත්තාභා).දෙවන ජාන සමාපත්ති ලබා මෙහි පහළවන ඔවුන්ගේ ආයුෂ මහා කල්ප දෙකකි.

**5) අප්පමානඅභා දේව**(Devas of Unbounded Radiance): මෙහි වෙසෙන බ්‍රහ්ම දෙවිවරු අප්‍රමාණ ආලෝකය ඇති අයවේ. දෙවන ජාන සමාපත්ති ලබා මෙහි පහළවන ඔවුන්ගේ ආයුෂ මහා කල්ප හතරකි.

**6) ආභස්සර** (Devas of Streaming Radiance): මෙහි වෙසන බ්‍රහ්ම දෙවිවරුගේ කයෙන් ගිනිදැල් වැනි විශාල දීප්තිමත් ආලෝකධාරා නිකුත්වේ. දෙවැනි ජාන සමපත්තිය යහපත් ලෙසින් ලැබූ ඔවුන් ගේ ආයුෂ මහාකල්ප අටකි.

**සටහන්:** * යම්කලක ලෝක විනාශය සිදුවනවිට, බොහෝ සත්ත්වයෝ ආභස්සර බඹලොව උපත ලබන බව බුදුන් වහන්සේ වදාළහ. එමනිසා ඒ දේවලෝකය අග්‍ර යයි දක්වා ඇත. **බලන්න**: කල්ප. ** ආභස්සර දෙවියන් දෙවන ජාන සමාපත්ති ලබා එම දේවලෝකයේ පහලව ඇත. **බලන්න**: විඥාන ස්ථාන. **මූලාශ්‍ර:** අංගු.නි: (6 ): 10 නිපාත: 10.1.3.9.ප්‍රථම කොසල සූත්‍රය,පි.134, EAN-10: The Great Chapter, 29.9 Kosala-1, p. 505, අංගු.නි (6) 10-නිපාත- 3මහා වග්ග, 10.1.3.9. ප්‍රථම කෝසල සූත්‍රය,පි. 134 , EAN-10: The Great Chapter, 29.9 Kosala-1, p. 505 ** බ්‍රහ්ම ලෝකවල දීර්ඝ ආයුෂ ගැන **බලන්න**: කල්පය.

**7) පරිත්තසුභා** (Devas of Limited Glory) : තෙවෙනි ජාන සමාපත්තිය මෙලොව ලැබූ අය මේ බ්‍රහ්ම ලෝකයේ පහළවේ. අල්පවූ, එකසන සහිත නිශ්චල ආලෝකයක් ඇති නිසා ඔවුන් පරිත්තසුභ යයි හඳුන්වයි **(පරිත්තා සුභා එතේසන්ති පරිත්තසුභා)** ආයුෂ මහා කල්ප 16 කි.

**8) අප්පමානසුභා** (Devas of unbounded Glory): තෙවෙනි ජාන සමපත්තිය ලැබීම නිසා මේ බඹ ලොව පහලවූ මොවුන් අප්‍රමාණවූ, එකසන සහිත නිශ්චල ආලෝක දරති, ආයුෂ මහා කල්ප 32 කි.

**9) සුභකින්නා (**Devas of Refulgent Glory**):** තෙවෙනි ජාන සමපත්තිය යහපත්ලෙස ලැබූ මේ බ්‍රහ්ම දෙවිවරුන් ඉතා පැහැපත් රන් මෙන් දිලිසෙන ආලෝක ඇත, සුභවූ, රන්පැහැති ආලෝක ඇතිනිසා සුභ කින්න ලෙසින් හඳුන්වයි, ආයුෂ මහා කල්ප 64 කි.

**සටහන:** කල්පවිනාශයක් ජලයෙන් සිදුවන විට ජල මට්ටම, මේ දෙව්ලොකය තෙක් උසට පැතිරේ. **බලන්න**: කල්ප.

**10) වෙහප්ඵලා (**Vehapphalā deva- devas of great fruit): සිව් ජාන ලබා මහත්වූ යහපත් ඵල විපාක ඇතිනිසා, මේ බඹ ලොව දෙවියන් වෙහප්ඵල- විපුලවූ ඵල දරණ ලෙසින් හඳුන්වති (විපුලා ඵලා එතේසන්ති වේහප්ඵලා). ආයුෂ මහා කල්ප 500 කි. **සටහන:** කල්පවිනාශයක් සුළඟින් සිදුවන විට ඒ සුළං, මේ දෙව්ලොකය තෙක් පැතිරේ.**බලන්න**: කල්ප.

**11) අසංඥසත්තා** (Unconscious beings): සංඥා විරහිත වූ සත්ත්වයන්ගේ උත්පත්තිය සිදුවන බඹ ලෝකය අසංඥ සත්වය ලෙසින් හඳුන්වයි. කසිණ භාවනා මගින් ජාන සමාපත්ති උපදවා, සිත නිසා කෙළෙස් ඇතිවෙන බවත්, සිත නොමැතිබව යහපත්ය යයි සිතා, සිතේ දොස් දැක භාවනා වඩා මේ බ්‍රහ්ම ලෝකයේ පහළවේ. රූපස්කන්ධය පමණක් පහළ වන බැවින් මෙම අසංඥ තලය **'එක වෝකාර භවය'** ලෙස ද හැඳින්වේ. ආයුෂ මහා කල්ප 500 කි.

**12) අවිහා** (Devas not Falling Away): මෙලොව අනාගමීව සිට, චුතවීමෙන් පසු මේ බඹ ලොව පහලවේ. කාමරාග, පටිස නොමැති නිසා මේ බ්‍රහ්ම ලෝක සුද්ධාවාස ලෙසින් හඳුන්වයි. තමන් ලැබූ උතුම් ආධ්‍යාත්මික සම්පත්තියෙන් නොපිරිහෙන නිසා, මේ උතුමන් අවිහා බ්‍රහ්මදෙවියන් ලෙසින් නම්කර ඇත (අත්තනෝ සම්පත්තියා න හායන්ති න විහායන්තීති අවිහා ). සද්ධාඉන්ද්‍රිය අධික ආරිය උතුමන් මෙහි පහලවේ. මහාකල්ප 1000 ක් ආයුෂ වේ.

**13) අතප්පා** (Untroubled devas): මේ බ්‍රහ්ම ලෝකයද අනාගාමී උතුමන් පහළවන සුද්දාවාසයකි. කිසිම ආකාරයකින් අනුන් නොතවන බැවින්- කරදරපීඩා නොදෙන නිසා, මේ බ්‍රහ්ම දෙවිවරු අතප්ප ලෙසින් හඳුන්වයි (න කඤ්චි සත්තං තප්පන්තීති අතප්පා**)**. සති ඉන්ද්‍රිය අධික ආරිය උතුමන් මෙහි පහලවේ, ආයුෂ මහාකල්ප 2000ක් වේ.

**14) සුදස්සා (**Beautiful or Clearly Visible devas): සුද්දාවාසයකි.සොඳුරු වූ, දැකුම්කළු වූ, විශිෂ්ට රූප ඇති, ප්‍රසාදය ගෙනදෙන අර්ථයෙන් මේ බඹ ලොව වැසියන් සුදස්ස බ්‍රහ්ම ලෙසින් හඳුන්වති (සුන්දරා දස්සනා අභිරූපා පාසාදිකාති සුදස්සා). වීරිය ඉන්ද්‍රිය අධික ආරිය උතුමන් මෙහි පහලවේ. මෙහි මහාකල්ප 4000 ක් ආයුෂ වේ.

**15) සුදස්සි දේව ලෝකය** (Clear-Sighted devas): සුද්දාවාසයකි. යහපත් ලෙසින් අවබෝධ කර ඇති බැවින් හා සොඳුරු දැකුමක් ඇති නිසා මේ බ්‍රහ්ම දෙවිවරු සුදස්සී ලෙසින් හඳුන්වති (සුට්ඨු පස්සන්ති සුන්දර මේතේසං වා දස්සනන්ති සුදස්සී**)**. සමාධි ඉන්ද්‍රිය අධික ආරිය උතුමන් මෙහි පහලවේ. මහාකල්ප 8000 ක් ආයුෂ වේ.

**16) අකනිට්ඨා** - අකනිටා බඹලොව (Peerless devas): සුද්දාවාසයකි. සියලු ගුණ ධර්ම හා භව සම්පත්ති යෙන් ජේෂ්ඨවන නිසා, ඔවුනට පහළ කනිෂ්ඨයන් එහි නොමැතිනිසා මේ බ්‍රහ්ම ලෝකය අකනිට්ඨා ලෙසින් හඳුන්වයි. ජීවිතය නමැති දියපාරේ ඉහලට ගිය- උදංසොත - **අකනිට්ඨාගාමී** වේ. ප්‍රඥා ඉන්ද්‍රිය අධික ආරිය උතුමන් මෙහි පහලවේ. මහා කල්ප 16000 ක් ආයුෂ වේ. **සටහන: මේ සූත්‍රයේදී** අනාගාමී උතුමන් අකණිටා බඹලොව පහළවන බව දක්වා ඇත. **බලන්න:** අං.ගු.නි (6) 10 නිපාතය, 10.2.2.3 නිට්ඨඩ්ගත සූත්‍රය, පි. 244, EAN:10:64.4 Unwavering, p. 519.

**අවසාන බ්‍රහ්ම ලෝක 4 අරූප බ්‍රහ්ම ලෝකවේ.**

සූත්‍ර දේශනාවලට අනුව අරූප බ්‍රහ්ම ලෝක යනු රූපයක් නැති (අරූපි), සිත පමණක් ඇති බ්‍රහ්ම දෙවිවරු සිටින උසස්තම ලෝකයන්ය. අරූප

සමාපත්ති වර්ධනය කරගත් පුද්ගලයෝ, මරණින් මතු මේ බ්‍රහ්මලෝකවල පහළවේ. අරූප බ්‍රහ්ම ලෝක, අරූපභවය-අරූපධාතුව, අරූපලෝක ලෙසින්ද හඳුන්වයි.

**සටහන්: * අරූපකායික**:රූපය නොමැති සිත පමණක් ඇති. **අරූපාවචර** සිත යනු අරූප ලෝකවල ප්‍රතිසන්ධි (යළිඋපත) වශයෙන් හැසිරෙන සිතය. යළි උපතට හේතුවන විඥානයය .මේ බ්‍රහ්මලෝකවල රූපස්කන්ධ පහළ නොවන අතර නාමස්කන්ධ පමණක් පහළ වේ. එසේ නාමස්කන්ධ සතර පමණක් පහළ වන බැවින් මෙම අරූප භූමි: **'චතුවෝකාර භව'** ලෙස ද හැඳින්වේ. **අරූපසඤ්ඤා** යනු අරූපය කෙරෙහි පවත්නා සංඥාවය, එනම් අරූප ලෝකයේ පහළවීම පිණිස ඇතිවෙන සංඥාවය.අරූප ලෝකයන්හි පහළවීම පිණිස දියුණු කරගන්නා සමාපත්ති- **අරූප සමාධි- අරූපජාන** ලෙසින් හඳුන්වයි. **** ම.නි. සල්ලෙඛ සූත්‍රයේදී,** බුදුන් වහන්සේ අරූපසමාපත්ති ලබාගැනීම පිළිබඳව විස්තර කර තිබේ. එම සමාපත්ති ලබන පුද්ගලයන් ආරිය විනයේ 'ශාන්තවිහරනය' ලබනඅයවේ (සනතා එතෙ විහාරා අරියසස විනයෙ- peaceful abiding in the Noble One's Discipline). ම.නි (1) සල්ලෙඛ සූත්‍රය, පි. 112, EMN :8 - Effacement, P. 108.

**අරූප බ්‍රහ්ම ලෝක 4:**

**17) ආකාසානඤ්චායතනය** (Ākāsānañcâyatana- Sphere of Infinity of Space): ආකාසානඤ්චායතන සමාපත්තිය උපදවා නොපිරිහුණු ධ්‍යානයෙන් යුත් පුද්ගලයා ඒ ආකාසානඤ්චායතන විපාක චිත්තයෙන් මෙහි ප්‍රතිසන්ධි ගනී. අනන්ත වූ ආකාශප්‍රඥප්තිය අරමුණු කොට **'අනන්තො ආකාසො'** යනුවෙන් පරිකර්ම කර ආකාසානඤ්චායතනය උපදවයි. මහාකල්ප 20,000 ක් ආයුෂ වේ.

**සටහන**: මේ අරූප ලෝකය, පස්වෙනි විඥාන ස්ථානයවේ. **බලන්න**: විඥාණ ස්ථාන.

**18) විඤ්ඤාණඤ්චායතනය** (Viññāṇañcâyatana-Sphere of Infinity of Consciousness): ආකාසානඤ්චායතන චිත්තයේ අනන්ත බව අරමුණු කොට **'අනන්තං විඤ්ඤාණං'** යැයි පරිකර්ම කිරීමෙන් විඤ්ඤාණඤ්චායතනය උපදවන අතර ඒ විඤ්ඤාණඤ්චායතන සමාපත්තියෙන් නොපිරිහුණු පුද්ගලයා ඒ විපාක සිතෙන් මෙහි උපදී. මහාකල්ප 40,000 ක් ආයුෂ වේ.

**සටහන**: මේ අරූපලෝකය හයවෙනි විඥාන ස්ථානයය.**බලන්න**:විඥාණ ස්ථාන.

**19)** ආකිඤ්චඤ්ඤායතනය (Ākiñcaññâyatana- Sphere of Nothingness ) : කිසිවක් නොමැති බව හෙවත් නාස්තිප්‍රඥප්තිය අරමුණු කර **'නත්ථි කිඤ්චි'** යැයි වැඩීමෙන් ආකිඤ්චඤ්ඤායතනය උපදවන අතර ඉන් නොපිරිහී කලුරිය කර මෙහි උපත ලබයි. මහාකල්ප 60,000 ක් ආයුෂ වේ.

**සටහන්**: *මේ අරූප ලෝකය හත්වෙනි විඥාන ස්ථානයය.**බලන්න**: විඥාණ ස්ථාන.** මේ අරූප ආයතනයේ සංඥාව අග්‍රවේ. **බලන්න**: අග්‍ර දේ-අනිච්චබව.

**20) නෙවසඤ්ඤානාසඤ්ඤායතනය** (Nevasaññānâsaññâyatana-Sphere of Neither- Perception-Nor-Non- Perception): ආකිඤ්චඤ්ඤායතන ධ්‍යාන චිත්තයේ ශාන්ත ස්වභාවය සහමුලින්ම මැඩ පවත්වාගෙන මෙය "ශාන්තය, මෙය උතුම්ය" (**සන්තමේතං පණීතමේතං'**) යයි භවනා සමාපත්තිය වැඩීමෙන් නේවසඤ්ඤානාසඤ්ඤායතන සමාපත්තිය ලබයි. එම සමාපත්තිය ඇතිව සමවැදිය හැකි කලුරිය කර නේවසඤ්ඤා නාසඤ්ඤායතනයේ උපත ලබයි. මෙහි ආයුෂ මහාකල්ප 84,000 ක් වේ.

**සටහන:** * නේවසඤ්ඤානාසඤ්ඤායතන සමාපත්තිය, ආකිඤ්චඤ්ඤායතන සමාපාත්තියට වඩා විශිෂ්ඨ හා උසස්ය ය:

**"...සබ්බසො ආකිඤ්චඤ්ඤායතනං සමතික්කම්ම 'සන්තමෙතං, පණීතමෙත'න්ති-නෙවසඤ්ඤානාසඤ්ඤායතනං උපසම්පජ්ජ විහරති"**

**සටහන්:** * අරූපසමාපත්ති පිලිබඳ විස්තර පිණිස **බලන්න**අංගු.නි.(6)10 නිපාත, 10.2.5.9. උපාලි සූත්‍රය,පි.390, EAN:10: V,99.9 Upaali, p. 538 **:**අංගු.නි: (6) 11-නිපාත, 11.2.6, අට්ඨකනාගර සූත්‍රය, පි.674, EAN: 11: II Recollection, 16.6 Dasama, p.573

▼**වෙනත් මුලාශ්‍ර:** 1. **ලෝවැඩ සඟරාවේ** මෙසේ දක්වා ඇත:

**සිත මිස කය නැති බඹ ලොව සතරකි**

**සිත නැතිවම කය ඇති බඹ තලයකි**

**මෙද සත පින් කොට උපදින පෙදෙසකි**

**එහි උපනත් කුසලක් නොම කල හැකි**

සිත ඇති, රූපයක් නැති බ්‍රහ්ම ලෝක 4 ක්වේ. රූපය ඇති එක් අසඤ්ඤ බ්‍රහ්මලෝකයක්වේ. තමන් කල පිං අනුව මේ ලෝකවල ඉපදුන ද එහිදී පුණ්‍යක්‍රියා කළ නොහැකිවේ. **ලෝවැඩ සඟරාව:** වීදාගම මෛත්‍රීය හිමි (www.thirvak.org)

**2. "**බ්‍රහ්මයෝ වනාහි කාමලෝකයේ දෙවියන්, මිනිසුන් මෙන් පස්කම් සැප යෙහි ඇලුන කොටසක් නොවේ. බුදුවරුන්ගේ ධර්මය අසා දැන භාවනා යෝගීව වාසය කරති. ඔවුන්ගේ නුවණ තියුණුය, එනිසා ධර්මය වහා අවබෝධ කල හැකිවේ මගඵල ලබා නිවන අවබෝධ කරගැනීමට සමත්ය". **බෝධිපාක්ෂික ධර්ම විස්තරය,** සම්පාදක: රේරුකානේ චන්දවිමල මහනාහිමි,පි.36 3. **'ලෝකවිදූ – තිස් එක් තලය දැනගනිමු':** බ්‍රහ්ම ලෝක ගැන විස්තරාත්මකව පෙන්වා ඇත: මහාවිහාරය-අන්තර්ජාල ලිපිය https://mahaviharaya.lk/article/29325#

▲ **බ්‍රහ්මලෝක සංචාරය-**Travel to Brhmaloka: මේ සූත්‍රයේදී බුදුන් වහන්සේ හා මහා මුගලන්, මහා කාශ්‍යප, මහාකප්පින, අනුරුද්ධ ආදීවූ ශ්‍රාවක සංඝයා, බ්‍රහ්මලෝකයකට පැමිණීම, එහි තේජෝධාතු සමාපත්තියෙන් වැඩසිටීම දක්වා ඇත. යම්කිසි බ්‍රහ්මදෙවියකුට ඇතිවූ ලාමක දිට්ඨියක් පහ කිරීම පිණිස එසේ පැමිණි ඇත. බුදුන් වහන්සේ බඹලොව ප්‍රභාව මැඩ, බබළවමින් වැඩසිටිබව දැක ඒ බ්‍රහ්මදෙවියාගේ

ලාමක දිට්ඨීය පහවිය. **මූලාශ්‍ර:** සංයු.නි: (1) සගාථවග්ග: බ්‍රහ්මසංයුත්ත:6.1.5 අපරාදිට්ඨී සූත්‍රය, පි.286.

▲ **බ්‍රාහ්මණ-** A Brahmin: ධර්මයට අනුව බ්‍රාහ්මණ ලෙසින් පෙන්වා ඇත්තේ අරහත්වයට පත්වූ උත්තමයාය. ධර්මතා 7 ක් බැහැර කළ හෙයින් කකෙනෙක් බ්‍රාහ්මණ බවට පත්වෙන බව බුදුන් වහන්සේ පෙන්වා ඇත: සක්කාය දිට්ඨිය, විචිකිච්ඡාව, සීලබ්බතපරාමාසය, රාගය, ද්වේෂය, මෝහය හා මානය. **මූලාශ්‍ර:** අංගු.නි: ( 4 ): 7 නිපාත: 7.2.4.3. බ්‍රාහ්මණ ධම්ම සූත්‍රය, පි. 510, EAN:7: 87.3 A Brahmin, p. 406.

**සටහන්:** * බුදුන් වහන්සේ, 'මම බ්‍රාහ්මණයෙක්මි' යයි පවසා ඇත. **බලන්න**: ඛු.නි:ඉතිවුත්තක: 4.1.1. බ්‍රාහ්මණ සූත්‍රය. ** **ධම්මපද: බ්‍රාහ්මණවග්ගය**: . බ්‍රාහ්මණ ලෙසින් පෙන්වා ඇත්තේ අරහත්වය ලැබූ උතුමන්ය. ** **උදාන පාලියේ**: බුදුන් වහන්සේ, සැරියුත්මහා තෙරුන් හා එක්ව පැමිණි අනෙකුත් මහා තෙරුන් දැක මෙසේ වදාළහ:

**"මහණෙනි, මේ බ්‍රාහ්මණයෝ එති"**. ඉන්පසුව බුදුන් වහන්සේ ඒ ගැන උදානයක් පළකළහ:

" යම් කෙනෙක් ලාමක අකුසල් දහම් දුරුකොට, සැම විටම, සතියෙන් හැසිරෙන්නේ ද, සියලු සංයෝජන දුරුකර, සිව්සස් මනාව අවබෝධ කල ඔවුන් ඒකාන්තයෙන්ම ලෝකයෙහි බ්‍රාහ්මණයෝවෙත්". **බලන්න**: ඛු.නි" උදානපාලිය: 1:5, තෙර සූත්‍රය.** බුදුන් වහන්සේ වැඩසිටි සමයේ පැවති උසස් කුලයක උපත ලබන පුද්ගලයන් බ්‍රාහ්මණ ලෙසින් හඳුන්වා ඇත. **බලන්න**:සංයු.නි: (1) බ්‍රාහ්මණ සංයුත්ත, බමුණා.

▼**බුදුන් වහන්සේ මෙසේ වදාළහ:**

"...මම උපතින් කිසිවෙක් 'බ්‍රාහ්මණ' යයි නොකියමි. රාග ආදී සියලු ග්‍රහණ හැරදැමූ පුද්ගලයා, 'බ්‍රාහ්මණ' යයි මම කියමි"

**සටහන්**: * බ්‍රාහ්මණයෙක් ලෙසින් හැඳින්වීමට හේතු කරුණු මෙහි විස්තර කර ඇත. ** ඛු.නි:සුත්තනිපාත :මහාවග්ග:3-9 වාසෙට්ඨ සූත්‍රයේ මේ සමාන විස්තරයක් දක්වා ඇත. **මූලාශ්‍රය:** ම.නි: (2): බ්‍රාහ්මණවග්ග: 2.5.8 වාසෙට්ඨ සූත්‍රය, පි.716.

▲ **බ්‍රාහ්මණයන්ට අවවාද-** Advice to Brhamins: වයස්ගතවූ බමුණන් බුදුන් වහන්සේ බැහැදැක ඔවුන්ගේ හිත සුව පිණිස අවවාද අනුසාසනා කරන්න යයි පවසා සිටියෝය. මේ වග්ගයේ සූත්‍රයන්හි, බුදුන් වහන්සේ ඔවුන්ට ධර්මයෙන් කළ අනුසාසනා විස්තරාත්මකව දක්වා ඇත.**බලන්න**:අංගු.නි: (1) 3 නිපාත: බ්‍රාහ්මණවග්ග සූත්‍ර.

▲**බ්‍රාහ්මණ උදයගාමිණි පටිපදාව-** Brahamin's udaya gamini patipadawa: බ්‍රාහ්මණ උදය ගාමිණි පටිපදාව ලෙසින් පෙන්වා ඇත්තේ, අවදිව නැගෙනහිර-පෙරදිග බලා ගමන් කිරීමය. එම ගමනේදී, බාධා ඇති තැන් මගහැර ගමන් කලයුතුය. එම ව්‍රතය සම්පූර්න කිරීමෙන්, මරණින් මතු සුගතියේ උපත ලබා ගැනීමට හැකිවේ යයි බ්‍රාහ්මණයෝ සිතයි.

බුදුන් වහන්සේ පෙන්වා ඇත්තේ එම පටිපදාව බමුණන්ගේ බාල ගමනක් බවය. එහෙත්, කෙනෙක්, බුදුසසුනේ **'උදයගාමිණි පටිපදාව'** අනුගමනය කරන්නේ නම්, ඔහු ඒකාන්තයෙන්ම නිවන ලබාගනී. එම

පටිපදාව: ත්‍රිවිධ රත්නය කෙරේ ඇති ප්‍රසාදය, ආරිය කාන්ත ශීලයෙන් යුතුවීම. **විස්තර පිණිස බලන්න**:සංයු.නි: (5-2) සෝතාපන්නසංයුත්ත:11.2.2 බ්‍රාහ්මණ සූත්‍රය.

▲ **බ්‍රාහ්මණ ධර්මය-** Brahmana dhamma: බ්‍රාහ්මණ ධර්මය- බමුණු දහම ලෙසින් බුදුන් වහන්සේ පෙන්වා ඇත්තේ පෙරවිසූ බ්‍රාහ්මණයන් ගේ යහපත් හැසිරීමය. ඔවුන් ශීලය ඇති, ඉන්ද්‍රිය සංවරය, පංච කාමය හැරදමා වාසය කල පැරණි ඉසිවරුය.ඔවුනට ධන සම්පත්, ගවසම්පත් ආදීවූ සම්පත් නොවිය.රටවැසියෝ ඔවුන්ට් බොහෝ පූජා සත්කාර කලෝය. යාග හෝම කරනවිට සත්වයන් නො මැරහුහ. පසුව, ඔවුන් ගේ යහපත් ක්‍රියා වෙනස්වීය. එමනිසා, පැරණි බ්‍රාහ්මණ ධර්මය දැන් නොපවති ය යි බුදුන් වහන්සේ දක්වා ඇත. **සටහන්:** විස්තර පිණිස බලන්න: ඛු.නි.සුත්තනිපාත:චූලවග්ග: බ්‍රාහ්මණ ධම්මික සූත්‍රය.

▲**බ්‍රාහ්මණ ස්වභාවය-**Nature of Brahamins: එක් සමයක ජානුස්සෝනි බ්‍රාහමණයා විසින් විමසානු ලැබුව බුදුන් වහන්සේ බ්‍රාහමණයන් ගැන මෙසේ පවසා ඇත:

"ඔවුන්ගේ අභිප්‍රාය (අරමුණ-aim) නම් ධනයය (භෝග-Wealth).ඔවුන්ගේ සෙවීම (ගවේශනය-quest) ප්‍රඥාවයය, ඔවුන්ට ඇති ආධරය (support) වේද මන්ත්‍ර. ඔවුන්ගේ කැමැත්ත යාග හෝම පූජාය, ඔවුන්ගේ අවසාන ඉලක්කය බ්‍රහ්මලෝකයය.". **මූලාශ්‍රය:** අංගු.නි: (4): 6 නිපාත:ධම්මිකවග්ග: 6.1.5.10 ඛත්තිය සූත්‍රය, පි.154.

▲**බෙහෙත්**-Medicine: බෙහෙත්-අවුසද-භේසජ්ජ පිළිබඳව බුදුන් වහන්සේ මෙසේ දක්වා ඇත: "...යමක් බෙහෙතක් වන්නේද, ලෝකයා විසින් බෙහෙත යයි සම්මත කරණ ලද්දේද, අහරකිසක් සපයන්නේද, දළ ආහාරයක් සේ නො පෙනෙන්නේද එබඳු බෙහෙතක් මම භික්ෂූන්ට අනුදන්වමි..."

**සටහන**: බුදුන් වහන්සේ බෙහෙත් 5 ක් අනුමත කර ඇත: ගිතෙල්, වෙඬරු, තලතෙල්. මීපැණි, උක්සකුරු. විස්තර පිණිස **බලන්න**: මහාවග්ග පාලිය 2: 6 භේසජ්ජ ඛන්ධකය.

▲**බෙහෙත් කැඳ-**Beheth kanda: බෙහෙත් බත් කැඳ දීමේ ආනිසංස 10ක් බුදුන් වහන්සේ පෙන්වා ඇත: 1) කැඳ දෙන්නා ආයුෂ දෙයි 2) වර්ණය දෙයි 3) සැපය දෙයි 4) බලය දෙයි 5) නුවණ දෙයි 6) පානය කළ කැඳ බඩගිනි නසයි 7) පිපාසාව දුරු කරයි 8) වාතය අනුලොම් කරයි 9) වස්තිය පිරිසිදු කරයි 10) නොපැසි ඉතිරිවූ (කුසේ) අහාර පැසවයි. කැඳ බුදුන් වහන්සේ වර්ණනා කල බෙහෙතකි. මිනිස් සම්පත් හෝ දෙව් සම්පත් ලබනු කැමැත්තා නිති කැඳ දන්දීම සුදුසුය. **බලන්න:** බත් කැඳ. **මූලාශ්‍ර:** වි.න:පි:මහා වග්ග 2, පි. 56.

## භ:භක-භග-භජ-භත-භද-භණ-භම-භය-භර-භල-භව-භස-භහ

**භක**

▲**භික්ඛක බ්‍රාහ්මණ** -Brahamin Bhikkhaka:**බලන්න:** උපග්‍රන්ථය:3

▲**භික්ඛු -භික්ඛුණී-**Monks & Nuns:බුද්ධ සාසනයේ උපසම්පදාව ලැබූ පැවිදි ශ්‍රාවක සංඝයා, භික්ඛු, භික්ඛුණී වේ. බුදුන් වහන්සේ මෙසේ වදාළහ:

**"මහණෙනි, සත් කරුණු බුන් (බිඳදැමූ) හෙයින් භික්ඛු නම්වේ"**

**සත්කරුණු**:සක්කාය දිට්ඨිය, විචිකිච්ඡාව, සීලබ්බතපරාමාස, රාගය, ද්වේශය, මෝහය, මානය. **බලන්න:**අංගු.නි: (4) 7 නිපාත: සමනවග්ග: භික්ඛුධම්ම සූත්‍රය.

**සටහන**: බුදු සසුනේ, භික්ඛු භික්ඛුණියන් වඩාගතයුතු ගුණ ධර්ම පිළිබඳව,බු.නි: ධම්ම පදය**:** භික්ෂුවග්ගයේ විස්තරාත්මකව දක්වා ඇත.

**සටහන්**: * ආහාරයෙහි පමණ නොදන්නා හා ඉන්ද්‍රිය අසංවරය යන අකුසල ඇති භික්ෂුව, දිවා රෑ කායික මානසික දුක් වේදනා වලින් දැවේ, මරණින් මතු දුගතිගාමිවේ. එම අගුණ නොමැති භික්ෂුව, සැමවිටම සුවය හා සැපය ඇතිව සිටි, ඔහු සුගතිගාමිය. **බලන්න**:බු.නි: ඉතිවුත්තක: භික්ඛු සූත්‍ර:පි.376, ** බුදුසසුනේ වැඩසිටි භික්ඛු භික්ඛුණී සංඝ විස්තර පිණිස **බලන්න:**උපග්‍රන්ථය:1,2, බු.නි:ථෙර ථෙරි ගාථා, අපදාන

7: 20.10 The Mendicant, p. 388.

▲ **භික්ඛු භික්ඛුණී -අග්‍ර**: බුදුන් වහන්සේ වැඩසිටි සමයේ විසූ අග්‍රතම භික්ෂූන්- භික්ෂුණියන් ගැන විස්තර මෙ සූත්‍රයේ දක්වා ඇත. **බලන්න:**උපග්‍රන්ථය:1,2 **මූලාශ්‍ර:** අංගු.නි: (1) 1 නිපාත: එතදග්ග පාළිය සූත්‍ර, පි. 84**,** EAN:1:Foremost, p. 44.

▲ **භික්ඛු භික්ඛුණී අපරිහානිය හා පරිහානිය ධර්ම-** Dhamma for Bhikkhus :Non**-**Falling off & Falling off

භික්ෂූන්ගේ අපරිහානිය ඇතිවීම පිලිබඳ ධර්මතා-සප්ත අපරිහානිය ධර්ම මෙහිදී පෙන්වා ඇත. එම ධර්මතා ඇතිවිට භික්ෂු අපරිහානිය සිදුනොවේ. එම ධර්මතා නොමැතිවිට පරිහානය අපේක්ෂා කලයුතුවේ.

**පළමු වර්ගය**: 1) භික්ෂු සමුහය නිතර රැස්වීම 2) නිතරම සමගියෙන් කටයුතු කිරිම 3) කලින් පනවන ලද නීතිරීති ආදිය වෙනස් නොකිරීම 4) ජේෂ්ඨතම පැවිදි ස්ථවිර භික්ෂූන්හට ගරු බුහුමන් කිරීම 5) යළි උපතට හේතුවෙන තණ්හාවේ වසඟයට නො යෑම 6) ආරණ්‍ය වන සෙසුන් හි විසීමට ප්‍රියබව 7) තමන් හා වෙසන, ආගන්තුකව පැමිණෙන සියලු සබ්‍රහ්මසාරින් කෙරේ ප්‍රියශීලි බව ඇතිව වාසය කිරීම.

**දෙවන වර්ගය:** 1) වැඩකටයුතු පිලිබඳ දැඩි ඇල්ම නොමැතිබව 2) කථාබහේ යෙදීමට දැඩි ඇල්ම නොමැතිබව 3) වැඩි කාලයක් නිදාගැනීමට දැඩි ඇල්ම නොමැතිබව 4) සෙසු සංඝයා සේවනය කිරීමට දැඩි ඇල්ම නොමැතිබව 5) ලාමක ආශාවන් නොමැතිබව 6) පාප මිත්‍ර සේවනය නැතිබව 7) ආධ්‍යාත්මික මාර්ගයේ යම් වර්ධනයක් ලබා ඉන් සෑහීමට පත්නොවී දිගටම කටයුතු කිරීම.

**තෙවන වර්ගය:** 1) ශ්‍රද්ධාව යහපත් ලෙසින් පවත්වාගැනීම 2) හා 3) හිරි හා ඔතප්පය තිබීම 4) බහුශ්‍රැතබව 5) වීරිය තිබීම 6) සිහියෙන් කටයුතු කිරීම 7) ප්‍රඥාව තිබීම.

**සිව්වෙනි වර්ගය:** සප්ත බොජ්ඣංග ධර්මතා යහපත් ලෙසින් වඩාගැනීම.

**පස්වෙනි වර්ගය:** 1) අනිච්ච සංඥාව වැඩීම 2) අනාත්ම සංඥාව වැඩීම 3) අසුභ සංඥාව වැඩීම 4) ආදීනව සංඥාව වැඩීම 5) ප්‍රහාණ සංඥාව වැඩීම 6) විරාග සංඥාව වැඩීම 7) නිරෝධ සංඥාව වැඩීම.

**සටහන**: මහා පරිනිබ්බාන සූත්‍රයේදී ද බුදුන් වහන්සේ එම අවවාද සංඝයාට වදාළහ. **බලන්න:** අංගු.නි: (4) 7 නිපාත: වජ්ජිසත්තක වග්ග:භික්ඛු අපරිහාණිය සූත්‍ර 5 කි.

▲ **භික්ඛු භික්ඛුණී පිළිබඳ මිනුම් දණ්ඩ**: බුදුන් වහන්සේ මෙසේ වදාළහ:

**"**සැදැහැති මහණ මෙලෙස පැතිය යුතුය ' සැරියුත් මුගලන් මහා රහතුන් යම්බඳු වේද, මමද එසේ වේවා!' මෙය, මගේ භික්ෂු ශ්‍රාවකයන් පිණිස ඇති සම්මත මිණුම් දණ්ඩය වේ".

"සැදැහැති මෙහණ මෙලෙස පැතිය යුතුය ' ඛේමා හා උප්පලවන්නා තෙරණියන් යම්බඳු වේද, මමද එසේ වේවා!' මෙය, මගේ භික්ෂුනී ශ්‍රාවිකාවන් පිණිස ඇති සම්මත මිණුම් දණ්ඩය වේ"

**සටහන**: අටුවාවට අනුව: කෙනෙක් රන් හෝ රිදී වල බර මැනීම පිණිස තරාදියක් භාවිතා කරයි. එලෙස, බුදුන් වහන්සේ තමාගේ,ශ්‍රාවකයන් මණින තුලාව වුවේ අගසව්වන්ය. **මූලාශ්‍ර**: අංගු.නි: (1) 2 නිපාතය: 2.3.12.1 සූත්‍ර, පි. 208, 2) EAN: 2: 130.1 Suttas, p.70.

▲ **භික්ඛු භික්ඛුණී යනු කවරේද?**: බුදුන් වහන්සේ මෙසේ වදාළහ:

**" සිඟා යන පමණකින්ම භික්ෂු (භික්ෂක-Mendicant) නොවේ, දුර්ගන්ධය වූ අකුසල සමාදන්ව සිටින තාක් භික්ෂු නම් නොවේ. මේ සසුනේ කෙනෙක් පින ද පවද බැහැර කොට විසු බඹසර ඇත්තේ, ඒ බව නුවණින් දැන ලොවේ හැසිරේද, හෙතම ඒකාන්තයෙන්ම භික්ෂු යයි කියනු ලැබේ".** ( But one here who leads the holy life, Having expelled merit and evil, Who fares in the world with comprehension: He is truly called a bhikkhu).**මූලාශ්‍ර:** සංයු.නි: (1) සගාථවග්ග: බ්‍රාහමණසංයුත්ත:7.2.10 භික්ඛක සූත්‍රය, පි. 352, ESN:

▲ **භික්ඛු භික්ඛුණී විහරණ-** States of Bhikkhus: ධර්මය යහපත් ලෙසින් ප්‍රගුණ කල භික්ඛු භික්ඛුණී, සතර විහරණ සහිතව වාසය කරන බව බුදුන් වහන්සේ පෙන්වා ඇත: 1) දිව්‍යවිහාර සහිතවීම (දෙවියන් ලෙසින් වාසය කිරීම): සිව්ජාන සමාපත්ති ලබා වාසය කිරීම 2) බ්‍රහ්මවිහාර සහිතවීම: සිව් බ්‍රහ්මවිහාර සමාපත්ති ලබා වාසය කිරීම 3) ශාන්ත විහරණය (නිශ්චලප්‍රාප්ත-imperturbable state): සතර අරූප සමාපත්ති ඇතිව වාසය කිරීම 4) ආරියබව සහිතවීම- (ආර්යභාවප්‍රාප්ත): චතු සත්‍ය යහපත් ලෙසින් අවබෝධ කර වාසය කිරීම. **බලන්න**: අංගු.නි: (2) 4 නිපාත: බ්‍රාහ්මණවග්ග: භික්ඛුසංගථොමන සූත්‍රය.

▲**භික්ඛු ඕවාද -**Advice to Bhikkhus: භික්ඛු සංඝයා, වැඩිහිටි සංඝයා වෙතින් නිතර අවවාද අනුසාසනා ලැබිය යුතුය යි බුදුන් වහන්සේ පෙන්වා ඇත. සංඝයාට ඕවාද දෙසන භික්ඛුන් අතුරින් මහා කප්පින තෙර අග්‍රය. **බලන්න:** උපග්‍රන්ථය:1

▲**භික්ඛුමිත්‍ර-**Friends for Bhikkhus: කරුණු 5 ක් ඇති භික්ෂුව සමග මිත්‍රසේවනය සුදුසුවේ: 1) කර්මාන්ත නොකරවන 2) අධිකරණ කටයුතු නැති 3) ධර්මය උගන්වන උගත් භික්ෂූන්හට ගරු කරන 4) අනවශ්‍ය දීර්ඝ චාරිකා වල නොයෙදන 5) ධර්මය කතා කරන්නට, සමාදන් කරන්නට, සතුටු කරන්නට හැකිබව.එම ගුණ නැති භික්ෂුව, මිත්‍රයෙක් ලෙසින් සේවනය කිරීම නුසුදුසු වේ. **මූලාශ්‍රය:** අංගු.නි: (3) 5 නිපාත: තිකණ්ඩවග්ග: භික්ඛුමිත්ත සූත්‍රය.

▲**භික්ඛුණීන්ට ඕවාද -**Advice to Bhikkhunies: භික්ෂුණියන්ට ඕවාද දෙන භික්ෂුව තුළ ගුණ 8 ත් තිබිය යුතුය: 1)සිල්වත්බව 2) බහුශ්‍රැතබව 3) උභය පාතිමෝක්ෂය (භික්ෂු භික්ෂුණී) පිලිබඳ මනා අවබෝධය 4) ධර්ම කථිකබව 5) ධර්මය දේශනා කර, අසා සිටින භික්ෂුණියන් සතුටට පත් කිරීමේ හැකියාව 6) බොහෝ භික්ෂුණියන්ට ප්‍රියමානප, මන වඩන ස්වභාවය තිබිම 7) බුදුසසුනේ පැවිදි ජීවිතය ගතකරන කිසිම මෙහෙණියකට, කිසිවිටක කායික ආපදාවක් නො කල කෙනෙක් වීම 8) ජේෂ්ඨබවින් වසර 20 ක් හෝ ඊට වැඩි වස් ගණනක් ඇති භික්ෂුවක් වීම. **සටහන**: බුදුන් වහන්සේ වැඩසිටි සමයේ, භික්ඛුණියන්හට ඕවාද දීමේ අග්‍රබව දැරුවේ නන්දක තෙරය. **මූලාශ්‍රය:** අංගු.නි: (5) 8 නිපාත: ගෝතමී වග්ග: භික්ඛුනොවාදක සූත්‍රය.

▲ **භික්ඛුණී සංඝ ස්ථාපනය-** Establishment of Bhikkhinis: මහා ප්‍රජාපතී ගෝතමිය ගිහිකල, කපිලවස්තු නුවර, නිග්‍රෝධාරෝධාරාමයේදී, බුදුන් වහන්සේගෙන් කාන්තාවට (මාගමට) පැවිදිවීමට ආයාචනා කිරීම හා බුදුන් වහන්සේ එම ඉල්ලීම අනුමත නොකිරීම මෙහි දක්වා ඇත. ඉන්පසුව, එ උත්තමිය, කෙස්බූ ගා කසාවස්ත්‍ර පොරවගෙන, 500ක් පමණ පිරිවර කාන්තවන් සමග විසාලා නුවර, කුටාගාර ශාලාවට පැමිණීම, කරුණු දැනගත් ආනන්ද තෙරුන් එතුමියට දයාව දක්වා, බුදුන් වහන්සේ වෙත පැමිණීම, පලමුව එම ඉල්ලීමට අනුග්‍රහය නො දැක්වූහ, පසුව, ගෝතමිය අෂ්ඨගරු ධම්ම පිළිගන්නේ නම් එය එතුමියගේ උපසම්පදාව බව වදාළාහ. එම ආවවද හා අනුසසනාව පරිදි බුදු සසුනේ ප්‍රථමවරට භික්ඛුණී සංඝයා ස්ථාපිතවූහ. මහා ප්‍රජාපතී ගෝතමිය ගෝතම බුදුසසුනේ පළමු භික්ඛුනිය වූවාය, එතුමිය සමග පැමිණි කාන්තා පිරිසද, පැවිදිව මෙහෙණ සස්න ව්‍යාපත කළාය. **බලන්න**: උපග්‍රන්ථය2. **මූලාශ්‍ර**:අංගු.නි: (5) : 8 නිපාත: ගෝතමීවග්ග: 8.2.6.1 ගෝතමී සූත්‍රය, පි.242, EAN: 8: 51.1. Gothami, p.438.

**භග**

▲ **භගිනි-** Sister: භගිනි යනු සහෝදරියය. මෙහිදී බුදුන් වහන්සේ පෙන්වා ඇත්තේ, දීර්සවූ සසරේ තමන්ට, සොහොයුරිය නොවූ කෙනෙක් දැකීම සුලබ නොවන බවය. **මූලාශ්‍රය**: සංයු.නි: (2) නිදානවග්ග: අනමතග්ගසංයුත්ත:3.2.6 භාතු සූත්‍රය, පි. 314

▲**භංගානුපස්සනා ඤාණය-**Bhnaganupassana Nana: රූපස්කන්ධ ආලම්බන ප්‍රත්‍යවෙක්ෂා කොට, සිත ඉපදී බිඳී යාම පිලිබඳ විදසුන් නුවණ භංගානුපස්සනා ඤාණය වේ. **මූලාශ්‍රය:** ඛු.නි:පටිසම්භිදා1: ඤාණකථා: 7 භංගානුපස්සනා ඤාණය, පි.130.

**▲භාග්‍යවතුන් වහන්සේ-**The Blessed one: බුදුන් වහන්සේ හඳුන්වන උතුම් පදයකි. භාග්‍යවත්- වාසනාවන්ත බව, සියලු දුකින් මිදී වාසනාවන්තවූ නිසා භාග්‍යවතුන් වහන්සේ යයි කියති: **බලන්න**: බුදුගුණ, බුදුන් වහන්සේ, තථාගත.

**▲ භෝග සම්පත්**-Wealth: භෝග සම්පත් ලෙසින් පෙන්වා ඇත්තේ, ගිහියන් සතු ධන සම්පත් ආදියය.එම සම්පත් ඇතිවීම නිසා කෙනෙකුට **ආදීනව**-අන්තරා ඇතිවේ: ධන සම්පත් 1. ගින්නෙන්, 2. ජලයෙන් විනාශවිය හැකිය, 3. රජවරුන්ට පවරා ගත හැකිය, 4. සොරුන් විසින් සොරකම් කරනු ලැබේ, තම මරණයෙන් පසු, 5. අප්‍රිය නෑදෑයන්ට හිමිවිය හැකිය. භෝග සම්පත් ඇතිවීම නිසා **ආනිසංස** ද ඇත: ධන සම්පත් ඇතිවිට තමන්ට 1. සුව පහසු ජීවිතයක් ලැබිය හැක, 2. දෙමාපියන් 3. අඹු දරුවන් සුව පත් කලහැකිය 4. මිත්‍රයන් සුවපත් කලහැකිය, 5. උතුම් පුද්ගලයන්ට දන් දීමට හැකිවීමෙන් යහපත් කර්ම විපාක ඇතිකර ගත හැකිවේ. **මූලාශ්‍රය**: අංගු.නි: (3) 5 නිපාත:දීඝචාරිකවග්ග:භෝග සූත්‍රය.

**▼ධනය** භෝගයක් ලෙසින් මෙහි පෙන්වා ඇත, එය ලබා ගැනීම පහසුනොවේ, එනිසා එය ඉෂ්ඨධම්මයකි. **බලන්න**: ඉෂ්ඨධම්ම. **මූලාශ්‍රය**: අංගු.නි: (6) 10 නිපාත:10.2.8.3 ඉෂ්ඨධම්ම සූත්‍රය, පි.270,EAN:10: 73.3 Wished for, p.522.

**භජ**

**▲ භජිතබ්බ-**Bhajithabba: භජිතබ්බ (භජනය කිරීම) යනු සේවනය කිරීමය. ධර්ම මාර්ගයේ ගමන් කරනවිට සේවනය කලයුතු පුද්ගලයා වන්නේ, සම්මාදිට්ඨිය මුල් කරගත් අංග 10 කින් යුක්ත නිවැරදි මග ගත් පුද්ගලයාය. මිථ්‍යාදිට්ඨිය ඇති වැරදි මග ගත් පුද්ගලයා සේවනය නොකළ යුතුය.

**මූලාශ්‍ර**:අංගු.නි: (6 ): 10 නිපාත:10.4.1 භජිතබ්බ සූත්‍රය, පි. 480, EAN:10: Persons: 156.2 sutta, p.549.

**▲ භෝජන පිරිනැමීම-** Offering food: භෝජන පිරිනැමීම ලෙසින් පෙන්වා ඇත්තේ, උතුම් පුද්ගලයන් ඇතුළු ලෝකයාට ආහාර පාන ආදිය පිරිනැමීමය. **බලන්න**: දානය. **යහපත් ලෙසින් භෝජන පිරිනමන පුද්ගලයාට** පස් ආකාරයකින් සුවය සැපය මෙලොවදී හා පරලොවදී විඳීමට හැකිවේ: 1. යහපත් ආයුෂ ලැබීම 2. ශරීරය වර්ණවත් වීම 3. ප්‍රීතියෙන් ජීවිතය ගත කිරීමට හැකිවීම 4. කායික ශක්තිය ලැබීම 5. ප්‍රඥාව ලැබීම. **භෝජන ලබාගන්නා පුද්ගලයාට ද:** මෙලොවදී පස් ආකාරයකින් සුවය සැපය ලැබේ. 1. ආයුෂ ලැබීම 2. වර්ණය ලැබීම 3. සතුට ලැබීම 4. කායික ශක්තිය ඇතිවීම 5. ප්‍රඥාව වඩා ගැනීමට හැකිවීම. **මූලාශ්‍රය:** අංගු.නි: (3) 5 නිපාත: සුමනාවග්ග: භෝජන සූත්‍රය.

**▲භෝජනයේ මාත්‍රවීම-** පාලි**: භොජනෙ මත්තඤ්ඤු හොති** -moderate in eating: ධර්මයට අනුව භෝජනයෙහි මාත්‍රවීම: පමණ දැන සිහියෙන් යුතුව ආහාර ගැනීමය- සංඝයා ,ආහාර වැළඳීමේදී නුවණින් සලකා බලමින් අහාර අනුභව කිරීමය:

" අප අහාර අනුභව කරන්නේ :විනෝදය පිණිස නොවේ; මත්වීම පිණිස නොවේ, රූපවත් වීමට හා ඇකුම්කළු වීමට නොවේ; ආධ්‍යාත්මික

ජීවිතය මැනවින් ගෙනයාම පිණිස කය පවත්වා ගැනීමට හා අපහසුතා විඳ ගැනීම පිණිසය(අහාර නොවැළඳීම නිසාවූ ) පැරණි වේදනා නැසීමට හා අලුත් වේදනා ඇති නොවීමට සුවපත්වීමට නිදොස් ජීවිතයක් සැනසිලිදායක ලෙසින් ගතකිරීම පිණිසය”

**“...පටිසඞ්ඛා යොනිසො ආහාරං ආහාරිස්සාම: ‘නෙව දවාය න මදාය න මණ්ඩනාය න විභූසනාය, යාවදෙව ඉමස්ස කායස්ස ඨිතියා යාපනාය විහිංසුපරතියා බ්‍රහ්මචරියානුග්ගහාය. ඉති පුරාණඤ්ච වෙදනං පටිහඞ්ඛාමි නවඤ්ච වෙදනං න උප්පාදෙස්සාමි. යාත්‍රා ච මෙ භවිස්සති අනවජ්ජතා ච ඵාසුවිහාරොචා ති”**

(We will be moderate in eating. Reflecting wisely, we will take food neither for amusement nor for intoxication nor for the sake of physical beauty and attractiveness, but only for the endurance and continuance of this body, for ending discomfort, and for assisting the holy life, considering: Thus I shall terminate old feelings without arousing new feelings and I shall be healthy and blameless and shall live in comfort)

**සටහන්**: *භෝජනයෙහි මාත්‍රවීම, ධර්ම පුහුණුවේ එක් අංගයකි, එසේම ශ්‍රමණ ගුණාංගයකි . ** භෝජනයෙහි මාත්‍රවීම, අපණ්ණක පටිපදාවට - ආසව ක්‍ෂය කරගැනීම පිණිස කටයුතු කිරීමට එළඹීමය යි බුදුන් වහන්සේ පෙන්වා ඇත. **බලන්න**: අපණ්ණක ධර්මය හා පටිපදාව, සේඛ හා අසේඛ, ශ්‍රමණ. **මූලාශ්‍ර**: ම.නි: (1 ):1.4.9. මහාඅස්සපුර සූත්‍රය, පි. 652 , EMN:39: The greater discourse at Assapura , p. 344, ම.නි. (2 ): 2.1.3 සේඛ සූත්‍රය,පි. 44, MN 53: Sekha Sutta, p. 436, අංගු.නි: (1): 3 නිපාත: 3.1.2.6 සූත්‍රය, පි. 252, EAN:3: 16.6 The Unmistaken, p. 83, සංයු.නි: (4): සළායතනවග්ග: වේදනාසංයුත්ත: ආසිවිසවග්ග: 1.19.2 රථූපම සූත්‍රය, පි.370.

▼**භෝජනයෙහි මාත්‍රවීම පිළිබඳ උපමාව**: කිසියම් පුද්ගලයෙක් තමන්ට ඇති තුවාලයක් සුවකිරීම පිණිස බෙහෙත් තෙල් ආදිය ගල්වයි, එසේ නැත්නම් බර ඇදගෙන යන කරත්තය පහසුවෙන් ගෙනයාම පිණිස පුද්ගලයෙක් එහි අකුරෙහි තෙල් ගල්වයි. එලෙස, භික්ෂුව නුවණින් සලකා, කයේ පැවැත්ම පිණිස, බ්‍රහ්මචාරී ජීවිතය පහසුවෙන් ගෙනයාම පිණිස පමණ දැන, ආහාර අනුභව කරයි. **බලන්න**:උපග්‍රන්ථය:5. **මූලාශ්‍ර**: සංයු.නි: ( 4 ) සළායතනවග්ග: 1.19.2 රථූපම සූත්‍රය, පි.369, ESN: Salayatanasamyutta: 239.2 The Simile of the Chariot, p.1315.

▼ **බුදුන් වහන්සේ** භෝජනයෙහි මාත්‍රවීම පිළිබඳව යහපත් ලෙසින් වදාරා ඇත. ඒ ධර්මතාවය සංඝයා එක්ව, ධර්මයේ චිරස්ථිතිය පිණිස සජ්ජායනා කිරීම සුදුසු ය යි සැරියුත් මහා තෙරුන් සංඝයාට උපදෙස් දී ඇත. **මූලාශ්‍ර**: දිඝ.නි: (3):10 සංගිති සූත්‍රය, පි. 372 , EDN: 33 Saṅgīti Sutta: The Chanting Together, p. 362.

▼**එක්සමයක පසේනදී කෝසල රජු**, මහත් ලෙසින් අහාර ගෙන අසහනයට පත්ව සිටිනු දැක බුදුන් වහන්සේ මේ අවවාදය වදාළහ:

"හැම කල්හිම සිහිය ඇතිව, ලද බෝජුන්හි පමණ දන්නා ඒ මිනිසාගේ දුක් වේදනා තුනිවේ. වැළඳු ආහාර සෙමෙන් දිරවයි, ආයුෂ රැකේ".

ඒ අවවාදය පිළිගත් රජතුමා සුවයට පත්ව බුදුගුණ මෙසේ පවසා ඇත:

"ඒ භාග්‍යවතුන් වහන්සේ මෙලොව හා පරලොව අභිවෘද්ධිය පිණිස මට අනුකම්පා කළසේක". **මූලාශ්‍රය**: සංයු.නි (1) සගාථවග්ග: කෝසලසංයුත්ත: 3.2.3 ද්‍රෝනපාක සූත්‍රය, පි.178.

▲**භෝජනයෙහි මාත්‍රනොවීම: පාලි: භොජනෙ අමත්තඤ්ඤු හොති-** non-restraint in eating: ධර්මයට අනුව භෝජනයෙහි මාත්‍රනොවීම - පමණ නොදැන අසිහියෙන් යුතුව ආහාර ගැනීම-යනු ශ්‍රාවක සංඝයා විසින් ආහාර වැළඳීමේදී සිහි නුවණින් සලකා නො බලමින් අහාර අනුභව කිරීමය. භෝජනයෙහි මාත්‍රනොවීම ධර්ම මාර්ගයට බාධාවකි. **බුදුන් වහන්සේ** භෝජනයෙහි මාත්‍රනොවීම පිළිබඳව යහපත් ලෙසින් වදාරා ඇත. ඒ ධර්මතාවය සංඝයා එක්ව, ධර්මයේ චිරස්ථිතිය පිණිස සජ්ජායනා කිරීම සුදුසු ය යි සැරියුත් මහා තෙරුන් සංඝයාට උපදෙස් දී ඇත. **මූලාශ්‍ර**: දිඝ.නි: (3):10 සංගිති සූත්‍රය, පි. 372 , EDN: 33 Saṅgīti Sutta: The Chanting Together, p. 362.

**හත**

▲ **හත්තාදක-**Bhaththadaka: හත්තාදක ලෙසින් පෙන්වා ඇත්තේ බොහෝ බත් කෑමය. බොහෝ බත් කන රාජ ඇතාට අගුණ ඇත. ඒ පිලිබඳ උපමාව යොදාගෙන, බුදුන් වහන්සේ බොහෝ බත් වළඳන සංඝයා ට ඇතිවෙන අයහපත් ගුණ පෙන්වා ඇත: ඔහු ඉඩකඩ අවුරුවයි, ඇඳ පුටු ආදිය බර නිසා කැඩෙ, ආහාර සලාක ලබාගැනීමට යුහුසුළුවේ, නමින් පමණක් මහණ යයි හඳුන්වයි. **බලන්න:** උප ග්‍රන්ථය: 5.**මූලාශ්‍රය**: අංගු.නි: (3)  5 නිපාත:රාජ වග්ග: හත්තාදක සූත්‍රය.

▲ **හත්තුද්දේශික-**an assigner of meals: ආහර සලාක පත්‍ර බෙදා දෙන මහණ හත්තුද්දේශිකය. බුදුන් වහන්සේ වැඩසිටි සමයේ, සංඝ සමුහයක් හත්තුද්දේශික මහණ කෙනෙක් පත් කරගෙන සිටි. ඔහු, ආශාව නිසා, තරහ නිසා, මෝහය නිසා, බිය නිසා නියමිත කාර්ය අයහපත් ලෙසින් කරන්නේ නම්, ඔහු දුගතියට නැමුන කෙනෙකි. එහෙත්, තම කාර්ය වගකීම සහිතව, යහපත් ලෙසින් කරන්නේ නම් ඔහු සුගතිගාමිය. **බලන්න:**අංගු.නි: (2) 4 නිපාත: හත්තුද්දේශික සූත්‍රය. **සටහන:** අංගු.නි:5 නිපාත: හත්තුද්දේශික සූත්‍ර 3 කි: එවැනි මහණ කෙනෙක් පත් කරනවිට සැලකිය යුතු සුදුසුකම් එහි දක්වා ඇත: ඔහු සතර අගතියට නොයන කෙනකු විය යුතුය, කවර සලාකයක් නියමිතද, කවර සලාකයක් නියමිත නොවේද යන්න දැනසිටීම. එම සුදුසුකම් ඇත්තේ නම් ඔහු ඒ කාර්යෙන් බැහැර නොකල යුතුය.

▲**භාතු**- Brother: **භාතු-**බෑයා යනු සහෝදරයාය. මෙහිදී බුදුන් වහන්සේ පෙන්වා ඇත්තේ, දීර්සවූ සසරේ තමන්ට, සොහොයුරු නොවූ කෙනක් දැකීම සුලබ නොවන බවය. **මූලාශ්‍රය**: සංයු.නි: (2) නිදානවග්ග: අනමතග්ගසංයුත්ත:3.2.6 භාතු සූත්‍රය, පි. 314

▲ **භෞතික ආහාර-** physical food: මෙය සතරආකාර ආහාරයන් - සිව්පෝෂණය ගෙන් එකකි, කබලිංක ආහාර ලෙසින්ද පෙන්වා ඇත. **බලන්න**: ආහාර.

▲ **භෞතික ඇස**- physical eye: කයට අයත්, මස් ඇස, භෞතික ඇස ලෙසින් පෙන්වා ඇත. **බලන්න:** චක්ඛු තුන.

**භද**

▲ **භද්ද උපාසක-** Badda Upasaka: **බලන්න**:උපග්‍රන්ථය:3

▲ **භද්ද කච්චානා (යශෝධරාව) තෙරණිය -**Baddakacchana Thereni: **බලන්න**:උපග්‍රන්ථය:2

▲ **භද්ද තෙර-**  Badda Thera: **බලන්න**:උපග්‍රන්ථය:1

▲ **භද්දිය තෙර-**  Baddiya Thera: **බලන්න**:උපග්‍රන්ථය:1

▲ **භද්දජී තෙර**- Baddaji Thera: **බලන්න**:උපග්‍රන්ථය:1

▲ **භද්දිය කාළිගොධායපුත්ත තෙර -** Bhaddiya Kaligodha Thera: **බලන්න**: උපග්‍රන්ථය:1

▲**භද්දිය තෙර-පස්වග** -Baddiya Thera-Pasvaga: **බලන්න**: උපග්‍රන්ථය:1.

▲ **භද්දදේව තෙර**- Baddadeva Thera: **බලන්න**: උපග්‍රන්ථය:1

▲ **භද්දවග්ගිය කුමාර තෙරුන්-**Baddavaggiya Theras: **බලන්න**: උපග්‍රන්ථය:1

▲ **භද්දිය ලිච්ඡවී-**Baddiya Lichchavi: උපග්‍රන්ථය:3

▲**භද්දේකරත්ත**- One fortunate night: භද්දේකරත්ත යනු භද්‍රවූ-වසනාවන්ත- උතුම් රාත්‍රියක්- රැයක්ගත කිරීමය. ආධ්‍යාත්මික ජීවිතයේදී, එවැනි රැයක් ගත කරන්නේ කෙසේද යයි බුදුන් වහන්සේ මෙහිදී පෙන්වා ඇත. **සටහන**:ආනන්ද, මහා කච්චායන හා ලෝමසංඝික තෙරුන් මේ පිලිබඳව දේශනා කළ සූත්‍ර: **බලන්න**: ආනන්ද භද්දේකරත්ත, මහාකච්චායන භද්දේකරත්ත, ලෝමසංඝික භද්දේකරත්ත සූත්‍ර. **මූලාශ්‍රය:**ම.නි: (3) 3.4.1 භද්දේකරත්ත සූත්‍රය, පි.414.

▲ **භද්‍රක ගාමිණී-** Bhdraka Gamini: උපග්‍රන්ථය:3

▲ **භද්‍ර අජානිය අශ්වයා**- an excellent thoroughbred: භද්‍ර අජානිය අශ්වයා යනු රජෙක් සතු උතුම් අශ්වයාය. ඌ කීකරුය, බොහෝ ගුණ ඇත. උතුම් මහණ එවැනි අශ්වයෙක් බඳුය යි බුදුන් වහන්සේ වදාළහ. **බලන්න**: අශ්වයන් බඳු පුද්ගලයෝ.

▲ **භද්‍රකල්පය :** පාලි: **භද්දකප්ප -**fortunate aeon: බුදුවරු එක නමකට වඩා පහළවන කාලසීමාව, භද්‍රකල්පය (වාසනාවන්ත කල්පය) ලෙසින් හඳුන්වයි.  වර්තමාන කාලය භද්‍රකල්පය ලෙසින් හඳුන්වන්නේ බුදුවරු පස්නමක් පහළවන කාලපරිච්ඡේදයක් නිසාය. කකුසඳ, කොණාගමන,

කාශ්‍යප හා ගෝතම බුදුන්වහන්සේලා සිව්නමක්(සිව්බුදුවරු) පහළවූහ. මතු පහලවන මෛත්‍රීය බුදුන්වහන්සේ පහළවන්නේ ද මේ භද්‍රකල්පයේය. **බලන්න**: අතීත බුදුවරු, අනාගත බුදුන්වහන්සේ.

**සටහන**: සද්ධර්මාලංකාරයට අනුව: "...යම් කල්පයක පස්දෙනකුන් වහන්සේ උපදනා සේක්විනම් ඒ කල්පය බොහෝදෙනාට අභිවෘධිය කරනහෙයින් භද්‍රකල්පය නම් වේ". **මූලාශ්‍ර:** දීඝ.නි (2 ): 1.මහාපදාන සූත්‍රය, පි. 18, EDN: 14 Mahâpadāna Sutta, p. 150.

▲**භද්‍රාකපිලානි තෙරණිය**- Badra kapilaani theraniya: **බලන්න**: උපග්‍රන්ථය:2

▲**භද්‍රා කුණ්ඩලකේසි තෙරණිය**- Bhdra kundala kesi theraniya: **බලන්න**: උපග්‍රන්ථය:2

▲ **භද්‍රා දේවිය**- Queen Badra: මෙතුමිය, පාටලිපුත්‍ර නුවර මුණ්ඩක රජුගේ බිසවය. ඇයගේ මරණය නිසා රජතුමා බලවත් කම්පාවකට පත්විය. නාරද තෙරුන් දෙසු දහම ඇසීමෙන් පසු, රජතුමා ශෝකයෙන් මිදුනේය. **බලන්න**: ශෝකය හැරදමීමේ පිළිවෙල.

▲ **භද්‍රාලි තෙර**- Badrali Thera: **බලන්න**: උපග්‍රන්ථය:1

▲ **භද්‍රාවුධ තෙර-**Bhadravuda Thera: **බලන්න:** උපග්‍රන්ථය:1,3

▲ **භද්‍රමග**- excellent way: ධර්මයේ භද්‍රමග- උත්තම මග ලෙසින් පෙන්වා ඇත්තේ ආරියඅටමගය. **බලන්න**: ආරියඅටමග.

▲**භද්‍රමරණය-**Fortunate death: භද්‍රමරණය යනු යහපත් මරණයය. මේ සූත්‍රයේදී, සැරියුත් තෙරුන් යහපත් මරණයක් ලාබාගන්නා අන්දම පෙන්වා ඇත: 1) කර්මාරාමය නොමැති බව- වැඩකටයුතු කිරීමට, මහත් ආශාවක් නොමැතිවීම 2) කථාවේ නො ඇලුන බව (භාෂ්‍යාරාමය නැත) 3) නින්දේ නො ඇලුන බව (නින්ද්‍රාරාමය නැත) 4-5) පිරිස සමග සිටීමේ නො ඇලුන බව -සංඝයා හා ගිහියන් (සංසාරාමය) 6) තණ්හා මාන දිට්ඨි යන කෙළෙස් ප්‍රපංච කිරීමේ නො ඇලුන බව (නිපපංච) කෙනෙක්, එම කරුණුවල ඇලි වාසය කරන්නේනම් ඔහුගේ මරණය අවාසනාවන්ත එකකි. **මූලාශ්‍රය**: අංගු.නි: (4) 6 නිපාත:සාරාණියවග්ග: භද්දක සූත්‍රය.

▲ **භද්‍ර ශිලය-** Fortunate virtue: භද්‍ර ශිලය යනු, යහපත් ශීලයක් ඇතිව වාසය කිරීමය. එවැනි ශීලයක් ඇති පුද්ගලයා සුගතිගාමිවේ. **මූලාශ්‍රය**: ඛු.නි: ඉතිවුත්තක: 3.1.6 භද්දක ශිල සූත්‍රය.

▲ **භිදුර-**Bhidura: භිදුර යනු බිදෙනසුළු බවය. කුමක් බිදෙනසුළුද?

" **මේ කය බිදෙනසුළුය, සිත බිදෙනසුළුය**" යි බුදුන් වහන්සේ වදාළහ. ඒ බව දැන, උපධින්හි බිය දැක, මරණය ඉක්මවා ගියවිට අර්හත්වය ලබයි. **බලන්න**: බිදෙන සුළු. **මූලාශ්‍රය**: ඛු.නි: ඉතිවුත්තක: 3.3.8 භිදුර සූත්‍රය, පි.438.

**භණ**

▲ **භණ්ඩන-**Quarrel: භණ්ඩන යනු කළහ කරගැනීමය. ආධ්‍යාත්මික මග වඩා ගැනීම පිණිස මහණ දහම් පුරන භවතුන් කළහ කරගැනීම යහපත් නැතය යි බුදුන් වහන්සේ පෙන්වා ඇත. **බලන්න**: වාදවිවාද **මූලාශ්‍රය**:අංගු.නි: (6) 10 නිපාත:අක්කෝසවග්ග: භණ්ඩන සූත්‍රය.

▲ **භණ්ඩුකර්මය-**Bhandukarmaya: භණ්ඩුකර්මය යනු, ගිහියෙක්, මහණ වීමට පෙර සංඝයා විසින් කරණ කෙස් බෑමය, විනය කර්මයකි. **මූලාශ්‍රය:** වින.පි:මහාවග්ග පාලිය1: 30.පි.266.

▲ **භණ්ඩු භික්ෂුව-** Bhikkhu Bhanduka: **බලන්න:** උපග්‍රන්ථය:1

**භම**

▲**භූමිචාල-** Earthquake: භූමිචාල යනු භූමිය චලනය වීම- භූමි කම්පාවය. බුදුන් වහන්සේ, විසාලනුවර, චාපාල චෙතියේදී ආයු සංඛාර අතහැර, තෙමසකින් පිරිනිවීමට අදිෂ්ඨාන කළ අවස්ථාවේ ඇතිවූ භූමි කම්පාව පිලිබඳව මේ සූත්‍රයේ විස්තරකර ඇත. **සටහන්**: දිඝ.නි:මහා පරිනිබ්බාන සූත්‍රයේ ද එම විස්තරය දක්වා ඇත. **මූලාශ්‍රය:**අංගු.නි: (5) 8 නිපාත: භූමිචාල සූත්‍රය.

▲ **භූමිනානත්ත ඤාණය-** Bhuminanatha nana: සතර භූමි: කාමාවචර භූමිය, රූපාවචර භූමිය,අරූපාවචර භූමිය, අපරියාපන්න භූමිය පිලිබඳ පිරිසිඳ දැනීමේ නුවණ භූමිනානත්ත ඤාණයය. **මූලාශ්‍රය:**ඛු.නි:පටිසම්භිදා: ඤාණකථා: 18 භූමිනානත්ත ඤාණය, පි. 182.

**භය**

▲ **භය-**Fear: භය-භීතිය ලෙසින්ද පෙන්වා ඇත. **බලන්න**: බිය. ධර්මයට අනුව ලෝකයාට භීතිය-බිය ඇතිවන්නේ පරලොව ගැන (යළි උපත) සිහිවීම නිසාය. බුදුන් වහන්සේ මෙසේ වදාළහ: **"වාචං මනඤ්ච පණිධාය සම්මා කායෙන පාපානි අකුබ්බමානො, බව්හන්නපානං ඝරමාවසන්තො සද්ධො මුදූ සංවිභාගී වදඤ්ඤූ, එතෙසු ධම්මෙසු ඨිතො චතූසු ධම්මෙ ඨිතො පරලොකං න භායෙති".** වචනයද සිතද මනා කොට පිහිටුවා, කයින් පව් නොකරණ, බොහෝ ආහාරපාන ඇති ගෙදර වසන, සැදැහැවත්, මෘදුගුණ ඇති, බෙදාදී වළඳනසුලු, දානයට ඇලුන, චතුසත්‍යයෙහි පිහිටි පුද්ගලයා, ධර්මයෙහි පිටිටා ඇත. ඔහුට පරලොව බිය නැත. **සටහන:** බෝසතුන් ලෙසින් බිය තැතිගැනීම නැතිකර ගැනීම පිළිබඳව, බුදුන් වහන්සේ මෙහිදී විස්තර දක්වා ඇත. බලන්න: ම.නි: (1) භයභෙරව සූත්‍රය. **මූලාශ්‍රය:** සගාථවග්ග: දේවතාසංයුත්ත:1.8.5 භීත සූත්‍රය.

▼**ලෝකවාසීන්ට ඇති මහාභය**, ජාතිජරාමරණ දුක බව මෙහි පෙන්වා ඇත. **මූලාශ්‍රය**: ඛු.නි.සුත්තනිපාත: පාරායනවග්ග:වස්තුගාථා: පි,326, 5-1 අජිතමානවක, පි.336.

▼**ලෝකවාසීන්ට ඇති භය හා වෛර**: භය 5 ක් හා වෛර 5 ක් ප්‍රහීණය නොකිරීම නිසා කෙනෙක් දුස්සීලවේ, නිරය ගාමිණිය. ඒවා පහ කරගත් පුද්ගලයා සුසිල්වත්ය. භය 5 හා වෛර 5 ලෙසින් මෙහි දක්වා ඇත්තේ පස්පව්ය. පස්පව් හැර පංච ශිලය රැකීම සුගතිගාමී වේ. **මූලාශ්‍රය:** අංගු.නි: (3): 5 නිපාත: උපාසකවග්ග: 5.4.3.4 වෙර සූත්‍රය, පි.354.

**හර**

▲**භාරය-**burden: භාරය ලෙසින් පෙන්වා ඇත්තේ යම් බරක් උසුලාගැනීමය. පංච උපාදානස්කන්ධය භාරය යයි බුදුන් වහන්සේ වදාළහ. එම බර දරන්නා '**භාරහාර**' (carrier of the burden) ය, පංච උපාදානස්කන්ධය දරන පුද්ගලයාය. පංච උපාදානස්කන්ධය පිලිබඳ ඇති ත්‍රිවිධ තණ්හාව '**භාරාදාන**' ය. රූප ආදී අරමුණු පිලිබඳ ඇති ඇල්ම, නන්දිය. ඒ තණ්හාව සහමුලින්ම අවසන් කිරීම '**භාරනික්ඛෙප**' ය වේ. **බලන්න**:බර. බුදුන් වහන්සේ මෙසේ දක්වා ඇත:

**"පංච උපාදානස්කන්ධය ඒකාන්තයෙන්ම බරකි, උසුලා ගෙන යායුතුය, භාරයේ ග්‍රහණයට (භාරාදාන) පත්වූ තැනැත්තාට දුක ඇතිවේ. එම බර ඉවතලා, අන් බරක් නො ගෙන, අවිද්‍යා මුල් සහිත තණ්හාව මුලින්ම උදුරා දැමූ ඔහු භාරනික්ඛෙප ය- පිරිනිවිය-රහතන්වහන්සේ ය"**

**සටහන**:අටුවාවට අනුව කය පවත්වා ගැනීම බරකි. **බලන්න**: ESN:note:36,p.1175. **මූලාශ්‍ර**:සංයු.නි: (3): ඛන්ධසංයුත්ත: භාරවග්ග:1.1.3.1 භාර සූත්‍රය, පි.74, ESN: 22: Khandasamyutta: 22.1 Burden, p.1021.

▲ **භූරි ප්‍රඥාව**: පාලි: **භූරිපඤ්ඤා-** breadth of wisdom: ධර්මය පිලිබඳ පුළුල් අවබෝධය තිබීම -බොහෝ නුවණ තිබීම භූරි ප්‍රඥාවය. බුදුන් වහන්සේ 'භූරිපඤ්ඤ' ලෙසින් හඳුන්වයි. **බලන්න**:බුද්ධනාම

▼ **භූරි ප්‍රඥාව යනු කුමක්ද?** රාගය ද්වේශය මෝහය ක්‍රෝධය... ආදීවූ සියලු කෙළෙස්, සියලු දුශ්චරිත, සියලු අභිසංස්කාර, සියලු භවගාමී කර්ම, අභිභවනය කළබවය. සියලු කෙලෙස් ආදිය මැඩිමේ නුවණය. **මූලාශ්‍රය**: ඛු.නි: පටිසම්භිදා 2 : ප්‍රඥාවග්ග: 3.1 ප්‍රඥා කථා, පි.182.

▼ **සතර ධර්මය**: ඇති පුද්ගලයාට (සෝතාපන්න) භූරි ප්‍රඥාව ඇතිවේ.

**"...ඉමෙ ඛො භික්ඛවෙ, චත්තාරො ධම්මා භාවිතා බහුලීකතා භූරිපඤ්ඤාතාය සංවත්තනතිති"**. (these four things, when developed and cultivated lead to the breadth of wisdom).**බලන්න**: ප්‍රඥාව, සතර ධර්මය. **මූලාශ්‍ර**: සංයු.නි: (5-2): මහාවග්ග: සෝතාපන්න සංයුත්ත:11.7.6 භූරි ප්‍රඥා සූත්‍රය, පි. 280, ESN: Sotapatthisamyutta: 62.1 Greatness of Wisdom p. 2262

▼ **කායගතා සතිය වැඩීමෙන්, විපුල කරගැනීමෙන් භූරි ප්‍රඥාව ඇතිවේ** (Mindfulness directed to the body...when developed and cultivated, leads to the breadth of wisdom). **මූලාශ්‍ර:** අංගු.නි: (1): 1 නිපාත: කායගතාසති වග්ග සූත්‍ර, පි. 125 EAN:1: Mindfulness Directed to the Body, p.52.

▼ **වෙනත් මූලාශ්‍ර:1.** "රාගාදී කෙලෙසුන් ද භවගාමීකම් ද විනාශ කිරීමෙහි පැවැති දැනීම භූරිපඤ්ඤා නම් වේ"https://pitaka.lk/dhammapada/ss/katha-28.html

**හල**

▲**හල්ලුක උපාසක-**Balluka upasaka: බලන්න: උපග්‍රන්ථය:3

▲ **හල්ලික ගහපති**- Householder Ballika:බලන්න: උපග්‍රන්ථය:3

**භව**

▲ **භවය:** පාලි: **භවො**- existence: ධර්මයට අනුව භවය යනු පැවැත්මය, කාම හෝ රූප හෝ අරූප (sense-sphere being, fine-material being, and immaterial being) යන භව තුනෙන් එකක උපත ලැබීමය. කෙළෙස් ප්‍රහීණ නොකළ නිසා සසරට නැවත පැමිණීමට අවස්ථාව ඇතිකිරීමය. භවය නැතිවීම- භව නිරෝධය නම්වූ නිවන ලැබීමය. **බලන්න**: පටිච්චසමුප්පාදය, පුනර්භවය, කර්මය. **සටහන්:** * කාම භවය, රූප භවය හා අරූප භවය යන භව 3 -තුන්භවය ප්‍රහීණ කිරීම පිණිස, අධිශීල, අධිචිත්ත, අධිප්‍රඥා යන ශික්ෂා වල හික්මීය යුතුවේ. **බලන්න:** අංගු.නි; (1) ආනිසංසවග්ග: භව සූත්‍රය. ** භව තුන පිලිබඳ විස්තර පිණිස **බලන්න**: EMN: Introduction, p. 46 : … 'being should be understood both the actual planes of rebirth and the types of kamma that generate rebirth into those planes. **බලන්න**: EMN: note: 124, p. 1075. **මූලාශ්‍ර**: සංයු.නි: (2): නිදාන වගග: 1.1.2 විභඞග සූත්‍රය, පි.24, ESN: Nidanavagga: 2.2 Analysis of Dependent Origination, p.610

▼ **භවය පටිච්චසමුප්පාදයේ 10 නි පුරුකය.**: උපාදාන නිසා භවය හටගනී, උපාදාන නිරෝධ වීමෙන් භව නිරෝධයවේ:

**"…උපදාන පච්චයා භවො…"**

**"…උපාදාන නිරොධා භව නිරොධො.."**: කාම භවය, රූප භවය, අරූප භවය (sense-sphere existence, form-sphere existence, formless-sphere existence) අවබෝධ කරගැනීමට හා ඉන් නිදහස්වීමට අරියඅටමග යහපත්ලෙසින් අවබෝධ කරගත යුතුවේ.

**මූලාශ්‍ර:** සංයු.නි: (2): නිදානවග්ග: පටිච්චසමුප්පාද සූත්‍රය, පි.24, 1.1.2 විභඞග සූත්‍රය, පි.24, ESN: 11:Nidanavagga: 1.1. Dependent Origination, p. 610, 2.2 Analysis of Dependent Origination, p.610, සංයු.නි: (5-1): මග්ගසංයුත්ත: 1.15 භව සූත්‍රය, පි.154, ESN: 45: Maggasamyutta: 164.4 Existence, p. 1709, සංයු.නි: (4 ): සළායතන වග්ග: ජම්බුඛාදක සංයුත්ත: 4.1.13 භවසූත්‍රය, පි. 510 , ESN: IV: 38 Jambukhādakasaṃyutta: 913 Existence, p. 1407.

▼ **බුදුන් වහන්සේ භවය වර්ණනා නොකළහ**

"…ස්වල්පයක් වුවත්: අශුචි දුගඳය…මුත්‍රා දුගඳය… කෙළ දුගඳය … සැරව දුගඳය… ලේ දුගඳය , එලෙස, ස්වල්ප කාලයක්, අසුර සලන කාලයක් පමණක්වත්, මම භවය වර්ණනා නොකරමි".

**සටහන:** බුද්ධ දේශනාවල, වර්ණනා කරන්නේ, භවය බිඳ, සසර වටය නවතා, නිවන සාක්ෂාත් කරගැනීමය. **මූලාශ්‍රය**: අංගු.නි: (1): 1 නිපාත, 1.16.3.13- 17 සූත්‍ර, පි. 108- 110.

▼ **භවය කෙසේ ඇතිවේද?**: කර්මවිපාක ඵලනිසා කාමධාතුව...රූපධාතුව...අරූපධාතුව යන මේ තුන්ලෝකයේ භව පැවැත්ම ඇතිවේ. ඒ පිළිබඳව බුදුන් වහන්සේ මෙසේ පෙන්වා ඇත:

"මෝහයෙන් (නුවණැස) වැසුන, තණ්හාවෙන් බැඳුන සත්‍වයන්ගේ විඥානය තුන්ලෝකයෙන් එකක පිහිටයි. ඔවුන් සිදුකල කර්ම අනුව යළි උපත ලබන ස්ථානය කර්මකෙෂ්ත්‍රය ය (මේ තුන්භවය), විඥානය බීජයය. එම බීජය, කෙෂ්ත්‍රයේ-බිමේ පිහිටා වැඩීමට උපකාරීවන ජලය තණ්හාවය. එලෙස කර්මවිපාකයන්ට අනුකූලව විඥානය සුදුසු තැනක ස්ථාපිත විම භව පැවැත්මය. එලෙසින්, යළිඋපත ඇතිවේ. කෙනෙක් ගේ කාර්මික චේතනා හා අපේක්ෂා උසස් නම් උසස් භවයක් ඇතිවේ, ඒවා පහත්නම් පහත් භවයක් ඇතිවේ. **බලන්න**: කම්ම. **මූලාශ්‍ර**: අංගු.නි: (1): 3 නිපාතය: ආනන්දවග්ග: 3.2.3.6 හා 3.2.3.7 සූත්‍ර, පි. 432, EAN:3: 76.6 Existence, p. 119.

▼ **භවය යහපත් ලෙසින් අවබෝධ කරගැනීමට සම්මා දිට්ඨිය අවශ්‍යවේ** **මූලාශ්‍ර**: ම.නි: (1): 1.1.9 සම්මා දිට්ඨි සූත්‍රය, පි. 130, EMN: 9: Sammādiṭṭhi Sutta- Right View, p. 121

▼**කාම, රූප හා අරූප භවයන් අවසන් කරගැනීම පිණිස** ශික්ෂා 3 කින් හික්මිය යුතුවේ. එනම්: අධිශිල පුහුණුව, අධිචිත්ත පුහුණුව, අධි ප්‍රඥා පුහුණුව. භික්ෂුව, භව 3 හැරදමා (ඒවාට ඇති ඇල්ම), ත්‍රිවිධ ශික්ෂාව සම්පූර්ණ කරගත්විට ඔහු දුක අවසන් කරගත් කෙනෙකි යයි බුදුන් වහන්සේ වදාළහ. **මූලාශ්‍ර:** අංගු.නි: ( 4 ): 6 නිපාත: 6.2.5.10. භව සූත්‍රය, පි. 276 , EAN: 6: 105.10 . Existence, p. 364.

▼ **වෙනත් මූලාශ්‍ර: 1.** " භවය ලෙසින් දක්වන්නේ ඉපදීමක්-ජාතියක් ඇතිවීමය. පටිච්චසමුප්පාදයට අනුව- උපාදාන හේතුකොටගෙන භවය ඇතිවේ, භවය හේතුකොටගෙන ජාතිය ඇතිවේ. ජාතිය යනු දුකය. ධර්මයට අනුව භව තුනක් වේ: කාම භවය (මිනිස්ලොව, දෙව්ලොව [6 කි] , සතර අපාය); රූප භවය (රූපාවචර බ්‍රහ්ම ලෝක [16 කි]; අරූප භවය (අරූපාවචර බ්‍රහ්ම ලෝක [4කි] , භවය ඇතිවන්නේ තණ්හාව නිසාය (ත්‍රිවිධ තණ්හාව) . භවය ඇති තාක් දුක පවතී. සංසාර ගමන භව ගමනය". **බුදුසරණ අන්තර්ජාල කලාපය**: 2014 ජුලි12, 2017, දෙසැම්බර් 17.

▲**භව ආශ්‍රව-** Bava asrava: මෙය සිත කෙලෙසන ආශ්‍රවයකි, භව පැවැත්ම පිලිබඳ තණ්හාවය. **බලන්න:** ආශ්‍රව හා ආශ්‍රව ක්‍ෂය කිරීම.

▲ **භව ඔඝය-** the flood of existence: භවඔඝය, සසර ඇදගෙනයන ජල ප්‍රවාහ 4 න් එකකි. **බලන්න**: ඔඝ.

▲ **භව තණ්හාව** : පාළි: **භවතණ්හා**- craving for becoming: සසර පවත්වාගෙන යැමට ඇති ආසාවය, තුන් ලෝකයෙන් එක් ලෝකයක (කාම, රූප හා අරූප) යළි උපත ලබාගැනීමට ඇති තදබල කැමැත්ත භව තණ්හාවය ය. භව තණ්හාව, ආධ්‍යාත්මික වර්ධනය පිණිස පහකරගත යුතු ධර්මතාවයකි. **බලන්න**: තණ්හාව. **මූලාශ්‍ර:**දීඝ.නි : (3): 11 දසුත්තර සූත්‍රය, පි. 483, EDN: 34: Dasuttara Sutta: Expanding Decades, p. 384.

▼ **භවතණ්හාව පෝෂණයවීම**: භවතණ්හාව පටන්ගත් මුල්තැනක් දැකිය නොහැකිය. එමනිසා, භවතණ්හාව මෙවකට පෙර නොවිය, ඉන්පසු භවතණ්හාව පහළවී යයි කිවනොහැකිය. එසේවුවද, භවතණ්හාව ඇතිවීමට හේතු ඇත. එමගින් භවතණ්හාව පෝෂණය වේ යයි බුදුන් වහන්සේ පෙන්වා ඇත. **භවතණ්හාව පෝෂණයවන අන්දම:**

1. භවතණ්හාව,අවිද්‍යාව නිසා පෝෂණයවේ 2. අවිද්‍යාව, පංචනීවරණ ධර්ම නිසා පෝෂණයවේ. 3. පංචනීවරණ ධර්ම, ත්‍රිවිධ දුශ්චරිත නිසා පෝෂණය වේ. 4. ත්‍රිවිධ දුශ්චරිතය, ඉන්ද්‍රිය අසංවරය නිසා පෝෂණයවේ. 5. ඉන්ද්‍රිය අසංවරය, අසතිය හා අසම්ප්‍රජන්‍යය නිසා පෝෂණය වේ. 6. අසතිය හා සම්ප්‍රජන්‍යය, අයෝනිසෝමනසිකාරය නිසා පෝෂණය වේ. 7. අයෝනිසෝ මනසිකාරය, අශ්‍රද්ධාව නිසා පෝෂණය වේ 8. අශ්‍රද්ධාව, අසද්ධර්ම ශ්‍රවනය, නිසා පෝෂණය වේ. 9 අසද්ධර්ම ශ්‍රවනය,අසත්පුරුෂ ආශ්‍රය නිසා පෝෂණය වේ. **මූලාශ්‍ර**:අංගු.නි:(6):10 නිපාත: යමක වග්ග: 10.2.2.2. තණ්හා සූත්‍රය, පි.238, EAN:10: 62.2 Craving, p.518.

▲ **භව දිට්ඨිය හා විභව දිට්ඨිය:** පාලි: **භවදිට්ඨි, විභවදිට්ඨි**- Belief in continued existence and belief in non-existence (bhava-ditthi ca vibhava-diṭṭhi ca.): භව දිට්ඨිය ලෙසින් පෙන්වා ඇත්තේ, සත්ත්වයාගේ අඛන්ඩ පැවැත්මක් පිලිබඳ (eternal personality) සමහර මිනිසුන් තුල ඇති විස්වාසය ය. මෙය **සස්සතවාදය** ලෙසින්ද දක්වා ඇත. විභව දිට්ඨිය යනු, මරණින් පසු පුද්ගලයා- නැතිවීයාමය, භංග වීමය. මෙය **උච්ඡේද දිට්ඨිය** ලෙසින් ද හඳුන්වයි.

▼**බුදුන් වහන්සේ** භව දිට්ඨිය හා විභව දිට්ඨිය පිළිබඳව යහපත් ලෙසින් වදාරා ඇත. ඒ ධර්මතා සංඝයා එක්ව, ධර්මයේ චිරස්ථිතිය පිණිස සජ්ජායනා කිරීම සුදුසු ය යි සැරියුත් මහා තෙරුන් සංඝයාට උපදෙස් දී ඇත. **මූලාශ්‍ර**:දිඝ.නි: (3):10 සංගිති සූත්‍රය, පි. 372 , EDN: 33 Saṅgīti Sutta: The Chanting Together, p. 362.

▲ **භව නිරෝධය**-Bava nirodha : භව නිරෝධය යනු සියලු කෙළෙස් නැතිකර නිවන සාක්ෂාත් කරගැනීමය, අරහත්වය ලැබීමය. ඒ බව පිළිගන්නේ බුදුන් වහන්සේගේ ධර්මය විශ්වාසකරන පිරිසය. බුදුන් වහන්සේ වැඩසිටි සමයේ භව නිරෝධය -නිවන පිළිනොගත් පිරිසක්විය. **බලන්න**: දීඝ.නි: ශ්‍රමණඵල සූත්‍රය.

▲ **භවනෙත්තිය**-conduit to existence: භවනෙත්තිය ලෙසින් පෙන්වා ඇත්තේ භවය සකස්කිරීමට යෝග්‍ය තත්වය, සාධකයන්ය. බුදුන් වහන්සේ මෙසේ වදාළහ:

**"රූපෙ ඛො...වෙදනාය යො... සඤ්ඤා යො... සඞ්ඛාරෙසු..විඤ්ඤාණෙ යො ඡන්දො යො රාගො යා නන්දි යා තණ්හා යෙ උපයුපාදානා චෙතසො අධිට්ඨානාභිනිවෙසානුසයා අයං වුච්චති භවනෙත්ති..."**. රූප, වේදනා, සංඥා, සංඛාර, විඥාන (පංච උපාදානස්කන්ධය) කෙරහි ඇති ආශාව,රාගය, නන්දිය, තණ්හාව, එයට බැසගැනීම-බැඳීම, උපාදාන, සිත ස්ථාවර කරගැනීම, පිළිපැදීම, අනුසය, භවනෙත්තිය ය. ඒවායේ නිරෝධය '**භවනෙත්ති නිරෝධය**' වේ. **සටහන**: මේ සූත්‍රය දේශනා කර ඇත්තේ රාධ තෙරුන්ටය. **මූලාශ්‍ර**:සංයු.නි: (3

):ඛන්ධවග්ග: රාධසංයුත්ත: 2.1.3 භවනෙත්ති සූත්‍රය**,** පි.372, ESN: radhasamyutta: 3.3 The conduit to existence, p.1120.

▲**භව යොගය**: පාලි: **භවයොගො-** the bond of existence: භව යොගය යනු ලෝක සත්ත්‍වයා සසරට බැඳ තබන බැම්මකි, කෙලෙස් බැඳීම් 4 න් එකකි. **බලන්න:** සතර යොග.

▲ **භවරාග අනුසය** -underlying tendency to lust for existence: භවරාගය ලෙසින් පෙන්වා ඇත්තේ, සසර දිගින් දිගට පවත්වා ගැනීමට ඇති ආශාවය, මෙය අනුසයකි. අනාගාමී උතුමන් අරහත්වය ලබනවිට මේ අනුසය පහකරගනි. **බලන්න**: අනාගාමී, අනුසය.

▲ **භව සංයෝජන**-Bava sanyojana: භවය- පැවැත්ම අල්ලා ගැනීම සංයෝජනයකි- සසරට බැඳතබන කෙළෙස්ය. **බලන්න:** සංයෝජන.

▲ **භාවනාව**- meditation: භාවනාව ලෙසින් පෙන්වා ඇත්තේ යම් අරමුණක සිත එකඟ කර ගැනීම මගින් සිතේ සමාධිය ඇති කර ගැනීමය. භාවනාව යනු වැඩීමය. ආනාපානසති භාවනාවෙන් කෙරෙන්නේ සිහිය වඩා ගැනීමය. මෙත්තා භාවනාවෙන් සිතේ මෛත්‍රිය වැඩේ. අසුභ භාවනාවෙන් විරාගය වැඩේ. අනිත්‍ය භාවනාව වැඩිමෙන් යථා භූත ඥානය වැඩේ. එලෙස සිත බොහෝ වෙලාවක් එකම අරමුණක රඳවා ගැනීමෙන් සිත එකග්ගතාවයට පැමිණේ. භාවනාව, සමාධියට සමවැදීම ලෙසින්ද පෙන්වා ඇත. ආධ්‍යාත්මික ජීවිතය වර්ධනය කරගැනීම පිණිස පුහුණුකරගතයුතු මූලික කරුණු 3 න් එකකි (ශීල සමාධි ප්‍රඥා). සූත්‍ර දේශනාවන්ට අනුව භාවනා කිරීමේ අරමුණ සිතේ එකඟ බව ඇති කරගැනීමෙන් ලබන සමාධි සමාපත්ති තුලින් විදසුන් නුවණ වඩා සසර දුකින් මිදීමට කටයුතු කිරීමය. **බලන්න**: සමථ හා විපස්සනා, සමාධිය. **ශබ්දකෝෂ: පා.සිං.ශ:** පි.408: '**භාවනාව**: වැඩිම, රාග දෝස මෝහ සිතුවිලි මර්දනය කරගැනීම, යම් ධර්මයක් නැවත නැවත මෙනෙහිකිරීම'.

**B.D:** p. 31: "**Bhāvanā:** Mental Development". **සටහන්: *** භාවනාව පිණිස යොදාගන්නා අරමුණු කමටහන ලෙසින් පෙන්වා ඇත. විසුද්ධිමාර්ගයේ: කමටහන් 40 ක් පෙන්වා ඇත: 1-10 දසකසිණ, 11-20 දසඅසුභය 21-30 දසඅනුසති: (බුද්ධ, ධම්ම, සංඝ, ශීල, දාන, දේව,මරණ, කායානුසති, ආනාපානසති, උපසමානු සති) 31-34 සතර බ්‍රහ්ම විහාර, 35-38 අරූප ධ්‍යාන 39 ආහාරයේ පතිකූළ සංඥාව 40 ධාතු මනසිකාරය. **** භාවනා ක්‍රම** පිළිබඳව විස්තරාත්මක කරුණු ගැන **බලන්න**: 1) **සිංහල විසුද්ධිමග**, 3 පරිච්ඡේදය 2) **සතිපට්ඨාන භාවනා ක්‍රමය**: රේරුකානේ චන්දවිමල මහානාහිමි, 2009 3) **විදර්ශනා භවනා ක්‍රමය**: රේරුකානේ චන්දවිමල මහානාහිමි, 2006 4) **The Basic Method of Meditation** by Ajahn Brahmavamso 5) **Mediations** by Thanissaro Bhikkhu: Metta Forest Monastery 6) **Buddhist Meditation – In Theory and Practice** by Paravahera Vajiraṇãna Mahathera (P.hd Thesis: Cambridge University U.K.) 7) සමසතලිස් භාවනා:නාඋයනේ අරියධම්ම තෙර 8) The Seven stages of purification by Ven. Matara Sri Nanarama, BPS 1983, 9) Meditation a way of awakening by

Ajahn Sucitto, Amaravati publication, 2011 10) සක්මන් භාවනාව ගැන **බලන්න**: සක්මන් භාවනාවේ ආනිසංස.

▼**භාවනාව ආරම්භ කිරීමේ පිළිවෙල**: බුදුන් වහන්සේ මෙසේ දක්වා ඇත:

" ...පිඬු සිඟා පෙරලා පැමිණෙන භික්ෂුව දිවාවිහරණය පිණිස හුදකලා තැනකට යයි. ඔහු පංච නිවරණ සිතෙන් පහකරගනී. නිවරණ පහවූ සිත පිරිසිදුවේ. ඔහුට ප්‍රමෝදය ඇතිවේ. ප්‍රමෝදමත් සිත ප්‍රීතියට පත්වේ. සිතේ ප්‍රීතිය ඇතිවූවිට, කාය සුබයට- පස්සදිය ඇතිවී සිත ශාන්ත බවට පත්වේ. සිත සුවයට පත්වූ විට සමාධිය ඇතිවේ. **බලන්න**: දීඝ.නි: කෙවඩ්ඩ සූත්‍රය. **සටහන්**: * භාවනාව සඳහා සුදානම් වන යෝගියකු තුල පළමුවෙන්ම තිබිය යුතු ආකල්ප 3 ලෙසින් මිත්‍රශිලිබව (goodwill), සහකම්පනය - කරුණාව (empathy) හා අතහැරීම (letting go) . පළමු ආකල්ප දෙක ඇතිවිට සිතේ යම් තරහක්, පරුෂ බවක් ඇත්නම් ඒවා සමනයවේ, සිත ආලෝකමත්වේ. අතහැරීම මගින්- අතීතය හා අනාගතය ගැන ඇති අල්ලාගැනීම් - නිදහස හා ඉඩකඩ ඇතිවේ. එමගින් සිතට පහසුවක්-සුවයක් දැනේ. **බලන්න:** Meditation a way of awakening by Ajahn Sucitto , ** සිතේ සමාධිය ඇතිකරගැනීමට හැමවිටම, කරන කියන සිතන සැමදේ ගැනම සිහියෙන් හා නුවනින් - සති සම්ප ජානයෙන් කටයුතු කිරීම අවශ්‍යවේ. එවිට සිත අරමුණෙ පිහිටුවා ගැනීමට පහසුවේ. **බලන්න**: සප්ත විසුද්ධිය: පූජ්‍ය මාතර ශ්‍රී ඤානාරාම හිමි.

▲ **භාවනා විවිධ** -Various Meditations

**1 අනුසති භාවනා -** Anusathibhavana: බුද්ධානු සතිය, ධම්මානු සතිය, සංඝානු සතිය, ශිලානු සතිය, චාගානු සතිය, දේවතානු සතිය, කලණ මිතුරුගුණ සිහිකිරීම, උපසමානුසතිය ආදී විවිධ භාවනා ක්‍රම සූත්‍ර දේශනාවල පෙන්වා ඇත. **අනුසතිභාවනාව කරන පිළිවෙල:** අනුසති ධර්මතා වැඩීම පිණිස පළමුව **පංච ධර්මයන්හි** පිහිටා වාසය කළයුතුවේ: එනම්: ශ්‍රද්ධාව, වීරිය, සතිය, සමාධිය හා ප්‍රඥාව.

**භාවනාවේ ප්‍රතිඵල:** අනුසති භාවනා වඩන විට සිත කෙළෙස්වලින් මිදී සමනයවේ- සමාධිය ලබයි. පෘතග්ජන ලෝකයා සමග සමසිත් ඇතිව, නිදුකින් වාසය කිරීමට හැකියාව ලැබේ, නිවන් මග සාක්ෂාත්වේ. අනුසති භාවනා වලින් එක භාවනාවක් හෝ වැඩීමෙන්, බහුල කරගැනීමෙන් : සසරට කලකිරේ, සසරට නොඇලේ, කෙළෙස් ප්‍රහීණයවේ, විරාගය ඇතිවේ, නිවන පිණිස පවතීය යි බුදුන්වහන්සේ පෙන්වා ඇත. **මූලාශ්‍ර**: අංගු.නි: (6 ): 11නිපාත,අනුසති වගග,11.2.1 හා 11.2.2. මහානාම සූත්‍ර, පි.645-654, 11.2.3 නන්දිය සූත්‍රය,පි.658, EAN: 11: Recollection, 11.1 & 12.1 Mahanama , p.570, 13.3. Nandiya, p.571, අංගු.නි: (1) 16- එකධම්මපාලිය, පි. 100, EAN:1:One thing, p. 47.

▼**අනුසති භාවනා** නිවන පිණිස පවතී. "එක ධර්මයක් භාවනා දී වශයෙන් වඩන ලද්දේනම් බහුල වශයෙන් කරණ ලද්දේ නම්, (එය) ඒකාන්තයෙන්ම :නිබ්ද්දාය (Disenchantment)-සසර කලකිරීම,නොඇලීම පිණිස,විරාගය (Dispassion) -සසර වටය නිමකිරීම පිණිස නැතිනම් කෙලෙස් නිවාදැමීම පිණිස, රාගය ප්‍රහීණය පිණිස, නිරෝධය- (cessation)-රාගය නිමා කිරීම කිරීම පිණිස, සසර නිමාකිරීම

පිණිස, උපසමාය (peace) සියලු කෙලෙස් සංහිඳීම පිණිස, අභිඤ්ඤාය (direct knowledge) ත්‍රිලක්ෂණය පිලිබඳ තමන් ලබාගන්නා විශේෂ දැනුම පිණිස, සම්බෝධාය (enlightenment) - චතු සත්‍ය අවබෝධය- සම්බෝධිය පිණිස, නිබ්බානය - නිවන අවබෝධය පිණිස වේ". **මූලාශ්‍ර**: අංගු.නි: (1 ) 1 නිපාත: 16 එකධම්මපාළිය සූත්‍ර, පි. 99, EAN:1 suttas, p 46.

1) **බුද්ධානුස්සතිය භාවනාව** - Recollection of the qualities of The Buddha: බුද්ධානුස්සතිය භාවනාව- බුදුගුණ ආවර්ජනය: පළමුව **පංච ධර්මයෙහි** පිහිටා : ශ්‍රද්ධාව, වීරිය, සතිය, සමාධිය හා ප්‍රඥාව, අනතුරුව, **'ඉතිපිසො භගවා අරහං...'** ආදී වූ බුදුගුණ 9 ය සිහිපත් කරමින් සිත එකඟ කරගැනීම. එසේ බුදුගුණ සිහිකරනවිට, රාග දෝස හා මෝහ යන අකුසල සිතෙන් පහවේ, බුදුගුණ අරමුණු කොටගත් සිත සෘජුබවට පත්වේ, සෘජු සිතට තථාගත ගුණ පිලිබඳ අර්ථයන් වැටහී (අර්ථවේදී) ප්‍රමෝදය ඇතිවේ, ධර්මය පිලිබඳ ප්‍රමෝදය ඇතිවේ (ධම්මවේදී). එවිට, ධර්මය පිළිබඳව ප්‍රීතිය ඇතිවේ. ප්‍රීතිය නිසා කය නිසලබවට පත්වේ- සංසුන්වේ. කය නිසලවූවිට සුවය ඇතිවේ. සුවපත්වූ සිතේ සමාධිය ඇතිවේ. එලෙසින්, අරියශ්‍රාවකයා, කෙලෙස්බර ලෝකයේ විසම ජනයා අතර සම සිතින් (කෙලෙස්රහිතව) වෙසෙයි, දුකටපත්වූ ජනයා අතර සුවයෙන් වෙසෙයි. ධර්ම ප්‍රවාහයට ඇතුල්වූ ඔහු බුද්ධානුස්සතිය වඩාගනී:

**"යස්මිං මහානාම සමයෙ අරියසාවකො තථාගතං අනුස්සරති නෙවස්ස තස්මිං සමයෙ නරාගපරියුට්ඨිතං චිත්තං හොති, නමොහපරියුට්ඨිතං චිත්තං හොති. උජුගතමෙවස්ස තස්මිං සමයෙ චිත්තං හොති. තථාගතං ආරබ්භ උජුගතචිත්තොඛො පන මහානාම අරියසාවකො ලභති අත්ථවෙදං ලභති ධම්මවෙදං, ලභති ධම්මුපසංහිතං පාමොජ්ජං පමුදිතස්ස පීති ජායති, පීතමනස්ස කායො පස්සම්භති, පස්සද්ධකායො සුඛං වෙදියති, සුඛිනො චිත්තං සමාධියති. අයං වුච්චති මහානාම අරියසාවකො විසමගතාය පජාය සමප්පත්තො විහරති, සබ්‍යාපජ්ඣාය පජාය අබ්‍යාපජ්ඣො විහරති, ධම්මසොතසමාපන්නො බුද්ධානුස්සතිං භාවෙති"**

**සටහන:** කය ලෙසින් පෙන්වා ඇත්තේ නාමකාය හා රූප කයය. **මූලාශ්‍ර**: අංගු.නි: (6): 11 නිපාත: අනුසති වග්ග,: 11.2.1 හා11.2.2.මහානාම සූත්‍ර, පි.645-654, 11.2.3 නන්දිය සූත්‍රය,පි.658, EAN: 11: Recollection, 11.1 & 12.1 Mahanama, p.570, 13.3. Nandiya, p.571.

▼ **බුද්ධානුස්සතිය** බහුල කරගැනීම නිවන පිණිස පවතී:

**"එක ධම්මො භික්ඛවෙ, භාවිතො බහුලීකතො එකන්ත නිබ්බිදාය විරාගය නිරොධාය උපසමාය අභිඤ්ඤාය සම්බොධාය නිබ්බාණාය සංවත්තති.කතමො එකධම්මො: බුද්ධානුස්සති ..."**. බුද්ධානුස්සතිය භාවනාව, දියුණුකර, බහුල කරගත්තේ නම්, එය ඒකාන්තනම සසරට කළකිරීම පිණිස-නිබ්බිදාව,කෙළෙස් වලට නොඇලීම- විරාගය පිණිස, රාගදි කෙළෙස් නැවතීම- නිරෝධය පිණිස, සියලු කෙළෙස් සංසිඳුවා ගැනීම පිණිස- උපසමාය, ත්‍රිවිධ ඥාන ගැන විශේෂයෙන්ම අවබෝධකරගැනීම පිණිස- අභිඤ්ඤාය, චතුසත්‍ය අවබෝධය පිණිස - සම්බෝධිය පිණිස, නිවන සාක්ෂාත් කරගැනීම පිණිස පවතී. **සටහන්**: *

අටුවාවට අනුව බුද්ධානුස්සතිය වැඩීම නිසා කරුණු 2ක් ඉෂ්ඨවේ: 1) සිතේ ප්‍රමෝදය ඇතිවීම 2) විදර්ශනා නුවණ ඇතිවීම. **බලන්න**: ESN: note 161, p. 588. ** මේ විහරණය සෝතාපන්න ආරිය ශ්‍රාවකයා, නිරතුරුව යෙදී සිටින විහරණයකි. **බලන්න**: අංගු.නි: (4) 6 නිපාත: ආහුනෙය්‍යවග්ග:6.1.1.10 මහානාම සූත්‍රය, පි.32. **මූලාශ්‍ර**: අංගු.නි: (1): 1 නිපාත : එකධම්ම පාලිය, පි.100, EAN:1: XVI: One Thing, p. 47.

2) **ධම්මානුස්සති භාවනාව** - Recollection of the qualities of The Dhamma: ධම්මානුස්සති භාවනාව- ධම්ම ගුණ ආවර්ජනය**:**යනු ධර්ම ගුණ මෙනහිකර සිත එකඟ කර සමාධිය ඇති කර ගැනීමය. පළමුව **පංච ධර්මයෙහි** පිහිටා **(**ශ්‍රද්ධාව, විරිය, සතිය, සමාධිය හා ප්‍රඥාව).

‘**සවාකඛාතො භගවතා ධමෙමා…**’ ආදී වූ දහම් ගුණ සිහිපත් කරමින් සිත එකඟ කරගැනීම. එසේ දහම්ගුණ සිහිකරනවිට, රාග දෝස හා මෝහ යන අකුසල සිතෙන් පහවේ, දහම්ගුණ අරමුණු කොටගත් සිත ඍජුබවට පත්වේ...**සටහන් * : විස්තර පිණිස බලන්න:** බුද්ධානුස්සතිය භාවනාව**.** එලෙසින්, අරියශ්‍රාවකයා, කෙලෙස්බර ලෝකයේ විසම ජනයා අතර සම සිතින් (කෙලෙස්රහිතව) වෙසෙයි, දුකටපත්වූ ජනයා අතර සුවයෙන් වෙසෙයි. ධර්ම ප්‍රවාහයට ඇතුල්වූ ඔහු ධම්මානුස්සතිය වඩයි. **බලන්න**: ධම්මගුණ. * * ධම්මානුස්සතිය නිවන පිණිස පවතී . ** මේ විහරණය සෝතාපන්න ආරිය ශ්‍රාවකයා, නිරතුරුව යෙදී සිටින විහරණයකි. **බලන්න**: අංගු.නි: (4) 6 නිපාත:ආහුනෙය්‍යවග්ග:6.1.1.10 මහානාම සූත්‍රය, පි.32. **මූලාශ්‍ර**: අංගු.නි: (6 ): 11 නිපාත: අනුසතිවගග: 11.2.1 හා 11.2.2.මහානාම සූත්‍ර, 11.2.2, පි.645-654, 11.2.3 නන්දිය සූත්‍රය,පි.658, EAN: 11: Elevens: Recollection, 11.1 Mahanama, 12.1 Mahanama (2), p.570, 13.3. Nandiya, p.571.

3) **සංඝානුස්සති භාවනාව -** Recollection of the qualities of The Sangha: සංඝානුස්සති භාවනාව: සංඝ ගුණ ආවර්ජනය: සංඝානුස්සති භාවනාව යනු සංඝ ගුණ සිහිපත්කර සිත එකඟ කර ගැනීමය. පළමුව **පංච ධර්මයෙහි** පිහිටා:

‘**සුපටිපනෙනා භගවතා සාවකසඞෙසා…**’ ආදී වූ සඟ ගුණ සිහිපත් කරමින් සිත එකඟ කරගැනීම. එසේ සඟගුණ සිහිකරනවිට, රාග දෝස හා මෝහ යන අකුසල සිතෙන් පහවේ, සඟගුණ අරමුණු කොටගත් සිත ඍජුබවට පත්වේ... (**බලන්න:** බුද්ධානුස්සතිය) එලෙසින්, අරියශ්‍රාවකයා, කෙලෙස්බර ලෝකයේ විසම ජනයා අතර සම සිතින් (කෙලෙස්රහිතව) වෙසෙයි, දුකටපත්වූ ජනයා අතර සුවයෙන් වෙසෙයි. ධර්ම ප්‍රවාහයට ඇතුල්වූ ඔහු සංඝානුස්සතිය වඩයි. **සටහන්**: * සංඝානුස්සතිය නිවන පිණිස පවතී.** මේ විහරණය සෝතාපන්න ආරිය ශ්‍රාවකයා, නිරතුරුව යෙදී සිටින විහරණයකි. **බලන්න**: අංගු.නි: (4) 6 නිපාත: ආහුනෙය්‍ය වග්ග:6.1.1.10 මහානාම සූත්‍රය, පි.32. **මූලාශ්‍ර**: අංගු.නි: (6 ): 11 නිපාත: අනුසතිවගග: 11.2.1 හා 11.2.2.මහානාම සූත්‍ර, 11.2.2, පි.645-654, 11.2.3 නන්දිය සූත්‍රය,පි.658, EAN: 11: Elevens: Recollection, 11.1 Mahanama, 12.1 Mahanama (2), p.570, 13.3. Nandiya, p.571.

4) **ශීලානුස්සති භාවනාව**- Recollection of the qualities of Virtue: ශීලානුස්සති භාවනාව- ශීල ගුණ ආවර්ජනය**:** තමා අනුමොදන්ව - සමාදන්ව රැකගන්නා ශීලය සිහිකරමින් සිත එකඟ කර ගැනීමය. **බලන්න:** ශීලය.

**පංච ධර්මයෙහි** පිහිටා, තමාගේ සිල්වත්බව- සිල්ගුණ සිහිපත් කිරීම:

"මා රකින සිකපද කැඩිනැත, නිකැළැල්ය, නිදොස්ය, කෙළෙස් පැල්ලම්රහිතය, තණ්හාවෙන් මිදීඇත, බැඳීම් රහිතය, බුද්ධාදී...නුවණැතියන් ප්‍රසංසා කරන ශීලයක් මම අනුගමනය කරමි. එම ශීලය සමාධිය පිණිස පවති..." එසේ තමාගේ සිල්ගුණ සිහිකරනවිට, රාග දෝස හා මෝහ යන අකුසල සිතෙන් පහවේ, සිල්වත්බව අරමුණු කොටගත් සිත ඍජුබවට පත්වේ**... විස්තර පිණිස බලන්න: බුද්ධානුස්සතිය**. එලෙසින්, අරියශ්‍රාවකයා, කෙලෙස්බර ලෝකයේ විසම ජනයා අතර සම සිතින් (කෙලෙස්රහිතව) වෙසෙයි, දුකටපත්වූ ජනයා අතර සුවයෙන් වෙසෙයි. ධර්ම ප්‍රවාහයට ඇතුල්වූ ඔහු ශීලානුස්සතිය වඩයි. **සටහන්**: * ශීලානුස්සතිය නිවන පිණිස පවතී.** මේ විහරණය සෝතාපන්න ආරිය ශ්‍රාවකයා, නිරතුරුව යෙදී සිටින විහරණයකි. **බලන්න**: අංගු.නි: (4) 6 නිපාත: ආහුනෙය්‍ය වග්ග:6.1.1.10 මහානාම සූත්‍රය, පි.32. **මූලාශ්‍ර**: අංගු.නි: (6 ): 11 නිපාත: අනුසතිවගග: 11.2.1 හා 11.2.2.මහානාම සූත්‍ර, 11.2.2, පි.645-654, 11.2.3 නන්දිය සූත්‍රය,පි.658, EAN: 11: Elevens: Recollection, 11.1 Mahanama, 12.1 Mahanama (2), p.570, 13.3. Nandiya, p.571.

5) **ත්‍යාගානුස්සති භාවනාව -** Recollection of the qualities of Generosity: ත්‍යාගානුස්සති භාවනාව- ත්‍යාග ගුණ ආවර්ජනය**:** ලෙසින් පෙන්වා ඇත්තේ තමන් සතු ත්‍යාගශීලි ගුණ සිහිකර සිත එකඟකර ගැනීමය. පළමුව **පංච ධර්මයෙහි** පිහිටා, තමාගේ දානශීලි බව-මසුරුකම නැතිබව ආදී ගුණ සිහිපත් කරගත යුතුවේ:

" මසුරුකමින් මැඩි සිටින ජනයා අතර, මසුරුමල නොමැති සිතින් වාසයකිරීමට ලැබීම මගේ වාසනාවය, මට ලාභයකි. ලෝභය නිසා කැළල් නොවූ සිතින් දන්දීමට මට හැකිය. දුගී මගී යාචක අදින්ට නිදහසේ දීමට කැමති ත්‍යාගශීලි සිතෙන්, මම වාසය කරමි..." එසේ තමාගේ දානශීලි බව සිහිකරනවිට, රාග දෝස හා මෝහ යන අකුසල සිතෙන් පහවේ, ත්‍යාගශීලි බව අරමුණු කොටගත් සිත ඍජුබවට පත්වේ... විස්තර පිණිස **බලන්න:** බුද්ධානුස්සතිය .එලෙසින්, අරියශ්‍රාවකයා, කෙලෙස්බර ලෝකයේ විසම ජනයා අතර සම සිතින් (කෙලෙස්රහිතව) වෙසෙයි, දුකටපත්වූ ජනයා අතර සුවයෙන් වෙසෙයි. ධර්ම ප්‍රවාහයට ඇතුල්වූ ඔහු ත්‍යාගානුස්සතිය වඩයි. **සටහන්**: * ත්‍යාගානුස්සතිය නිවන පිණිස පවතී.** මේ විහරණය සෝතාපන්න ආරිය ශ්‍රාවකයා, නිරතුරුව යෙදී සිටින විහරණයකි. **බලන්න**: අංගු.නි: (4) 6 නිපාත:ආහුනෙය්‍යවග්ග:6.1.1.10 මහානාම සූත්‍රය, පි.32. **මූලාශ්‍ර**: අංගු.නි: (6 ): 11 නිපාත: අනුසතිවගග: 11.2.1 හා 11.2.2.මහානාම සූත්‍ර, 11.2.2, පි.645-654, 11.2.3 නන්දිය සූත්‍රය,පි.658, EAN: 11: Elevens: Recollection, 11.1 Mahanama, 12.1 Mahanama (2), p.570, 13.3. Nandiya, p.571.

6) **දේවතානුස්සති භාවනාව-**Recollection of the qualities of Deva's: දේවතානුස්සති භාවනාව- දේවගුණ ආවර්ජනය**:** ලෙසින් පෙන්වා ඇත්තේ දෙවියන් සතු යහපත් ධර්ම ගුණ සිහිකර සිත සමාධියට පත් කර ගැනීමය. පළමුව **පංච ධර්මයෙහි** පිහිටා, දෙවියන්ගේ ගුණ සිහිපත් කරගතයුතුය:

"දේවලෝකවල පහළවූ එම දෙවියෝ මෙලොවදී ශ්‍රද්ධාසම්පන්නව... සිල්වත්ව... දහම්නුවණ ඇතිව... දානශීලිව...ප්‍රඥාව ඇතිව වාසය කළ හෙයින් දේවලෝකයන්හි යළි උපත ලැබුහ. මටද එබඳු ශ්‍රද්ධාවක්... ශීලයක්... දහම්නුවණක්... දානශීලිබවක්...ප්‍රඥාවක් තිබේ" එසේ දේවගුණ හා තමාසතු එබඳු ගුණ සිහිකරනවිට, රාග දෝස හා මෝහ යන අකුසල සිතෙන් පහවේ, දෙවිගුණ අරමුණු කොටගත් සිත ඍජුබවට පත්වේ... විස්තර පිණිස: **බලන්න:** බුද්ධානුස්සතිය. එලෙසින්, අරියශ්‍රාවකයා, කෙලෙස්බර ලෝකයේ විසම ජනයා අතර සම සිතින් (කෙලෙස්රහිතව) වෙසෙයි, දුකටපත්වූ ජනයා අතර සුවයෙන් වෙසෙයි. ධර්ම ප්‍රවාහයට ඇතුල්වූ ඔහු දේවානුස්සතිය වඩයි. **සටහන්**: * දේවතානුස්සතිය නිවන පිණිස පවතී.** මේ විහරණය සෝතාපන්න ආරිය ශ්‍රාවකයා, නිරතුරුව යෙදී සිටින විහරණයකි. **බලන්න**: අංගු.නි: (4) 6 නිපාත:ආහුනෙය්‍යවග්ග:6.1.1.10 මහානාම සූත්‍රය, පි.32. **මූලාශ්‍ර**: අංගු.නි: (6 ): 11 නිපාත: අනුසතිවගග: 11.2.1 හා 11.2.2.මහානාම සූත්‍ර, 11.2.2, පි.645-654, 11.2.3 නන්දිය සූත්‍රය,පි.658, EAN: 11: Elevens: Recollection, 11.1 Mahanama, 12.1 Mahanama (2), p.570, 13.3. Nandiya, p.571.

7) **මනෝමයකය ඇති දෙවියන් පිලිබඳ අනුසති භාවනාව-** Recollection of the qualities of Deva's of mind-made body: මනෝමයකය ඇති දෙවියන් පිලිබඳ අනුසති භාවනාව**:** මෙහිදී, ඒ දෙවියන්ගේ ගුණ සිහිකර සිත සමාධියට පත් කර ගනී.

"කබලිංකාර ආහර ගන්නා දෙවියන්ගේ සංගතියෙන්, ඉක්මවා ගොස් මනෝමය කය ඇතිව පහලවූ දෙවියෝ ඇත: එම දෙවියෝ අධ්‍යාත්මිකව කලයුතු කිසිවක් ඇතය හෝ අහවරකළ ආධ්‍යාත්මික කටයුතු වැඩිකරගතයුතුය යයි හෝ නොමදකී (විමුක්තිය ලැබූ භික්ෂූන් මෙන්). එම දෙවියන් ගේ ගුණ තමාගේ ආධ්‍යාත්මික සතියේ ස්ථාපිත කරගත යුතුය" යයි බුදුන් වහන්සේ වදාළහ. **සටහන:** * අටුවාවට අනුව එම දෙවියෝ අරහත්මගඵල ලබා ඇත. See: EAN: note 2217, p. 686. **මූලාශ්‍ර**:අංගු.නි: (6 ): 11 නිපාතය: අනුසති වග්ග: 11.2.3 නන්දිය සූත්‍රය,පි.658, EAN: 11: II Recollection, 13.3. Nandiya, p.571.

8) **කල්‍යාණ මිත්‍රගුණ අනුස්සතිය-** recollection of the qualities of good friends: කල්‍යාණ මිත්‍රයන්ගේ ගුණ සිහිකිරීම: මේ ආකාරයෙන් අනුසතිය වඩාගනී:

"මාගේ කල්‍යාන මිතුරෝ මා කෙරහි අනුකමපා සහගතය; ඔවුන් මගේ යහපත පතති, මට අවවාද කරති; මට උපදෙස් දෙති. එවැනි මිත්‍රයන් සිටීම ඒකාන්තයෙන්ම මට ලාභයකි, වාසනාවන්ත ලැබීමකි" **මූලාශ්‍ර**:අංගු.නි: (6): 11 නිපාතය: අනුසති වග්ග: 11.2.3 නන්දිය සූත්‍රය,පි.658, EAN: 11: II Recollection, 13.3. Nandiya, p.571.

▲ **උත්තම පුරුෂයාගේ භාවනාව-** The meditation of the Noble man මේ සසුනේ උතුම් පුරුෂයෙක්, පංචනිවරණ මැඩ, බාහිර අරමුණු ඉවතලා භාවනාව වඩන අන්දම ගැන බුදුන් වහන්සේ මේ සූත්‍රයේදී විස්තරාත්මකව පෙන්වා ඇත. **මූලාශ්‍ර**: අංගු.නි: (6 ):11නිපාත: 1 නිසසය වගග,11.1.9. සන්ධ සූත්‍රය,පි.636, EAN:11:I Dependence, 9.9 Sandha, p.568.

▲ **උපසමානුස්සති භාවනාව**- Meditation on Recollection of peace-upasamānussati: උපසමානුස්සති භාවනාව ලෙසින් පෙන්වා ඇත්තේ නිවන අරමුණුකොට, කෙළෙස් සන්සිඳුවා ගැනීමය. නිවනේ ගුණ - ශාන්තබව ආවර්ජනය කිරීම මගින් සිත එකඟ කර ගැනීමය. **සටහන්**: * අංගු.නි: (1) ජාන වග්ගයේ නිවන අරමුණු කොට ඇති භාවනාව ගැන විස්තර ඇත ** **බලන්න**: **සිංහල විසුද්ධිමග:** උපසමානුස්සති භාවනාව: 8 පරිච්ඡේදය.

▼**උපසමානුස්සතිය** භාවනාවක් ලෙසින්දියුණු කර බහුල කරගන්නේ නම්, එය එකාන්තනම සසරට කළකිරීම පිණිස-නිබ්ද්දාව,කෙළෙස් වලට නොඇලීම- විරාගය පිණිස, රාගදි කෙළෙස් නැවතීම- නිරෝධය පිණිස, සියලු කෙළෙස් සංසිඳුවා ගැනීම පිණිස- උපසමාය, ත්‍රිවිධ ඥාන ගැන විශේෂයෙන්ම අවබෝධකරගැනීම පිණිස- අභිඤ්ඤාය, චතුසත්‍ය අවබෝධය පිණිස -සමෙබාධාය, නිවන සාක්ෂාත් කරගැනීම පිණිස පවතී. **බලන්න**: EAN: note 163, p. 589) **මූලාශ්‍ර**: අංගු.නි: (1): 1 නිපාතය**:** ඒකධම්ම පාලිය, පි.100, EAN:1: XVI: One Thing, p. 47.

▼ **උපසමානුස්සති භාවනාව වැඩීම පිණිස නිවෙනේ ගුණ සිහිකිරීම** බුදුන් වහන්සේ නිවන විවිධ පද වලින් හඳුන්වා ඇත: අසංඛත, සච්ච ආදී ලෙසින්. එම ගුණ/ගුණයන් සිහිකරගනිමින් සිත එකඟ කර ගැනීම මින් අදහස් කරයි. **සටහන: *** නිවනේ ගුණ සිහිපත් කරනවිට පංච නීවරණ යටපත්වේ, සිත රාග දෝස මෝහයෙන් පිඩාවට පත් නොවේ, ශාන්තවේ, එම අවස්ථාවේ උපසමාය- උපසමානුසතිය ඇතිවේ. ** නිවන් හඳුන්වන පද හා ගාථා සිහිපත් කිරීමද කලහැකිවේ. **බලන්න:** නිවන හඳුන්වන පද.

**මූලාශ්‍ර:** සංයු.නි: (4 ): සලායතනවග්ග: අසංඛත සංයුත්ත, පි. 681, ESN: Salayatanasamyutta: Asankatasamyutta: p. 1512.

▲ **කායගතාසති භාවනාව-** Kayagathasathi meditation: කායගතා සති භාවනාව ලෙසින් පෙන්වා ඇත්තේ සතරසති පට්ඨානයේ දක්වා ඇති කායානුපස්සනාවය. 1) ආනාපානසතිය 2) කයේ ඉරියව් සතර පිලිබඳ සතිය-ඉරියාපථ භාවනාව 3) කයේ හැසිරීම- සති සම්ප්‍රජන්‍යය භාවනාව 4) කයේ අසුභය (කොටස් 32) පිලිබඳ භාවනාව 5) කයේ ධාතු 4 පිලිබඳ සතිය - ධාතුමනසිකාරය 6) මළසිරුරක් ක්‍රමයෙන් දිරා යාම මෙනෙහිකරමින් වඩන සතිය (9 ආකාරවූ දිරායාම) - නවසීවථිකා භාවනාව, ආදී කරුණු පිළිබඳව සිත පිහිටුවා ගෙන භාවනාව වඩාගැනීමය. **බලන්න**: කායගතා සතිය, කායගතාසතියේ ප්‍රතිලාභ, සතිපට්ඨාන සූත්‍රය.

▼**කායගතා සති භාවනාව වැඩීමෙන් ලැබන අනුසස් 10කි:** 1) අරතිය (අධිකුසලයේ නොඇලීම) හා පස්කම් සැපයට ඇති ඇල්ම ජයගැනීමට හැකිවීම 2) බියට පත්වීම හා තැති ගැනීම ජයගැනීමට හැකිවීම 3) ශිත

උෂ්ණ සාගින්න පිපාසය මැසිමදුරු හා සර්පයන්ගෙන් ඇතිවන උවදුරු, අචිරස්නිය, සුලං, අප්‍රිය වචන, බොහෝ පීඩාගෙනදෙන කායික වේදනා ආදිය දරාගැනීමේ හැකියාව 4) තමා පතන ආකරයට සිව්ජාන මේ භවයේදීම ලබාගැනීමට හැකිවීම 5) ඉද්ධිවිධ ආදී අතිසමාන බල ලබාගැනීමට හැකිවීම 6) දිවකන් (දිබ්බසෝත) ලැබීමට හැකිවීම 7) අනුන්ගේ සිත් දැනගැනීමට හැකිවීම 8) පෙරජාති සිහිකිරීමේ හැකියාව 9) දිවැස් ලැබීමේ හැකියාව 10) මේ භවයේදීම, චේතෝවිමුක්තිය හා ප්‍රඥාවිමුක්තිය ලබා නිවන සාක්ෂාත්කර ගැනීමට හැකිවීම. **මූලාශ්‍ර:** ම.නි: (3 ): 3.2.9**.** කායගතාසති සූත්‍රය, පි. 254, EMN:119 Kāyagatāsati Sutta-Mindfulness of the Body, p.870, සංයු.නි: (4 ): සළායතනවග්ග: අසංඛත සංයුත්ත: 9.1.1.කායගතාසති සූත්‍රය, පි. 660, ESN: Asankatasamyutta: 1.1 Mindfulness directed to the body, p. 1495.

▼ **කායගතාසති භාවනාව** වැඩීමෙන් නිවන සාක්ෂාත්වේ, එම භාවනාව සිදුනොකරන අය ධර්මයේ පිරිහුණු අයවේ. **මූලාශ්‍ර:** අංගු.නි :(1) :1 නිපාතය: අමත වග්ග සූත්‍ර 1.16.8-සිට, පි. 130, EAN:1: Deathless, p.53.

▼ **කායගතාසති භාවනාව** දියුණු කර බහුල කරගන්නේ නම්, එය එකාන්තනම සසරට කළකිරීම පිණිස-නිබ්ද්දාව,කෙළෙස් වලට නොඇලීම- විරාගය පිණිස, රාගදි කෙළෙස් නැවතීම- නිරෝධය පිණිස, සියලු කෙළෙස් සංසිඳුවා ගැනීම පිණිස- උපසමාය, ත්‍රිවිධ ඥාන ගැන විශේෂයෙන්ම අවබෝධකරගැනීම පිණිස- අභිඤ්ඤාය, චතුසත්‍ය අවබෝධය පිණිස -සම්බෝධාය, නිවන සාක්ෂාත් කරගැනීම පිණිස පවතී. **මූලාශ්‍ර**: අංගු.නි: (1) 1 නිපාතය**:** එකධම්ම පාලිය සූත්‍ර, පි.100, EAN:1: XVI: One Thing, p. 47.

▲ **නවසීවථිකා භාවනාව-** Contemplation of a corpse in 9 stages: නවසීවථිකා යනු, මළකඳ දිරා යාමේ අවස්ථා 9 ගැන ආවර්ජනය කිරීමය. මෙය අසුභය මෙනෙහිකිරීම ( මළකඳක අසුභය බැලීම) ලෙසින්ද පෙන්වා ඇත. මළකඳ ක්‍රමයෙන් කුණුවී දිරා යන අවස්ථා දකිමින් තමාගේ කයද ඒ ස්වභාවයට පත්වනබව මෙනෙහිකර සිහිය පවත්වා ගැනීම මගින් සිත එකඟවේ. පංච උපාදානස්කන්ධයට ඇති ඇල්ම නැති කරගැනීමට, විරාගය ඇතිකරගැනීමට, යථාබව අවබෝධ කරගැනීමට මේ භාවනාව උපකාරවේ. **අවස්ථා 9** : 1) දෙතුන් දවසක් වූ මළකඳක, ඉදිමීගිය, නිල්වගිය, සැරව ගලන සවභාවය බැලීම2) කපුටන්, නරියන් ආදී විවිධ සතුන් විසින් කාදමා ඇති පණුවන් පිරීගිය මළකඳක සවභාවය බැලීම 3) මස් ලේ සහිත නහරවලින් බැඳුන ඇටසැකිල්ලේ ස්වභාවය බැලීම 4) මස් රහිත ලේ තැවරුණ, නහරවලින් බැඳුන ඇටසැකිල්ලේ ස්වභාවය බැලීම 5) මස් ලේ රහිත නහරවලින් බැඳුන ඇටසැකිල්ලේ ස්වභාවය බැලීම 6) පාඇට, කෙණ්ඩා, හිස්කබල ආදීවූ ඇට කැඩී සැමතැන විසිරීගිය අටසැකිල්ලේ ස්වභාවය බැලීම 7) බෙලිකටු මෙන් සුදු-දුඹුරු පැහැගත්, සුන්බුන්ව ගිය ඇට කටු ආදියේ ස්වභාවය බැලීම 8) ඇටකටු ගොඩගැසී ඇති ස්වභාවය බැලීම 9) වසරක් පරණව ගිය ඇට සුන්බුන්වී, වැලි හා පස්බවට පත්වී ඇති ස්වභාවය බැලීම . **විස්තර පිණිස බලන්න**: සංයු.නි: (5-1): මහාවග්ග: බොජ්ඣංග සංයුත්තය: ආනාපාන වග්ගය සූත්‍ර: පි.270, ESN: Bojjhaṅgasaṃyutta:In and out Breathing: p. 1809.

▲ **දස අසුභසංඥා භාවනාව-** Contemplation of foulness of a corpse: **මළකඳක දස අසුභයන් ආවර්ජනය කිරීම**: 1) **උද්ධුමාතක සංඥා භාවනාව (**meditation on bloated corpse)- ඉදිමිගිය මළකඳ**.** 2) **වීනිලක සංඥා භාවනාව (**meditation on livid corpse ) නිල්වූ මළකඳ- සිරුර නිල් පැහැගැනිම. 3) **විපුබ්බක සංඥා භාවනාව -**නවදොරින් ඕජස් ගලන සතුන් කන මල සිරුර 4) **විච්ඡිද්දක සංඥා භාවනාව (**meditation on fissured corpse)- විවරවූ-බිඳීගිය මළකඳ (කඳ මැදින් වෙන්ව ගිය) . 5) **වික්ඛායිතක සංඥා භාවනාව** - සතුන් කඩා කෑම නිසා අවයව විසිරි ගිය මල සිරුර 6) **වික්ඛිත්තක සංඥා භාවනාව** -අවයව සිදී බිඳී ගිය මල සිරුර 7) **හත්වික්ඛිත්තක සංඥා භාවනාව** - කැබලි වී ගිය මල සිරුර 8) **ලෝහිතක සංඥා භාවනාව** -ලේගලා ගිය මල සිරුර 9) **පුළවක සංඥා භාවනාව (**meditation on worm-infested corpse) පණුවන් පිරීගිය මළකඳ- නව දොර පතුවන් වැගිරෙන සිරුර අරමුණු කර භාවනාව වැඩිම. 10) **අට්ඨික සංඥා භාවනාව**: ඇට විසිරි ඇති මල සිරුර. **භාවනා ක්‍රමය**: කෙලෙස් තවන වීරිය ඇතිව, පංච නීවරණ සංසිඳුවා, මනා නුවණ ඇතිව, එළඹී සිහියෙන් යුතුව මැරිගිය සිරුර බලමින් මේසේ අවර්ජනා කරයි:

'මගේ සිරුරද මෙබඳු සවභාවය ඇත්තේය, මේවැනි ස්වභාවයට පත්වේ' යයි නුවණින් මෙනෙහිකළයුතුවේ. නැවත නැවත මෙනෙහිකළයුතුවේ. කයේ අනිත්‍ය බව, කය දුකක බව, මමය මාගේ කියා-ආත්මයක් ලෙසින් ගතයුතු කිසිවක් නැතිබව-අනාත්ම නුවණින් සිහිකළ යුතුය. **භාවනාවේ ඵල**: කයට ඇති තණ්හාව සිදී යාම, විරාගය ඇතිවීම යථාභූත ඥාණය පහළවීම. **මූලාශ්‍ර**: දීඝ.නි: (2 ): 9 මහාසතිපට්ඨාන සූත්‍රය, පි. 452, EDN: 22 Mahāsatipaṭṭhāna Sutta: The Greater Discourse on the Foundations of Mindfulness, p.246, ම.නි: (1 ): 1.1.10 සතිපට්ඨාන සූත්‍රය, පි.154, EMN: 10: Satipaṭṭhāna Sutta The Foundations of Mindfulness, p. 139.

▲ **අට්ඨික සංඥා භාවනාව -** meditation on a skeleton

ඇටසැකිල්ල ආවර්ජනය කිරීම: මෙහිදී සිදු කරන්නේ ඇටසැකිල්ල අරමුණුකොට සිත සමාධිගත කරගැනීමය, තමාගේ කයද මේ තත්වයට පත්වෙන බව මෙනහිකිරීම. මේ භාවනාව පංච උපාදානස්කන්ධයට ඇති ඇල්ම නැතිකර ගැනීමට, රාගය තුනී කරගැනීමට පිහිටවේ. **බලන්න**: සංඥා.

▼**අට්ඨික සංඥා භාවනාව වඩන අන්දම:** භික්ෂුව විවේකය... විරාගය...නිරෝධය ඇසුරු කර (**විවෙකනිස්සිතං විරාගනිස්සිතං නිරොධනිස්සිතං වොස්සග්ගපරිණාමිං)**, නිවනට සිත නැඹුරුකර, ඇට සැකිල්ල අරමුණු කොටගෙන බොජ්ඣංග ධර්මතා 7 ගැනම පිලිවෙලින් භාවනාව කරයි. **එලෙස භාවනාව වැඩීමෙන් ලැබෙන ඵල**: 1) මහාඵල මහා ආනිසංස ඇතිවේ මාර්ග ඵල ලබාගැනීමට 2) ඵල දෙකක් : මේ භවයේදීම සියලු උපාදාන හැර අරහත්බවට පත්වේ. යම් උපාදානයක් ඉතිරිව ඇත්තේ නම් අනාගාමී බව 3 ) මහා වැඩ පිණිස පවතී- බොජ්ඣංග ධර්මතා 7 වැඩි දියුණුවේ 4) යොගක්ඛෙමය (**යොගක්ඛෙමාය-**Security from bondage) සසර බැමි ගලවා ගැනීම පිණිස පවතී 5) මහා සංවේගය පිණිස පවතී- වහා සසර දුකින් මිදීමට

නිවන ලබාගැනීමට, බලවත් උනන්දුවක් ඇතිවේ 6) පහසු විහරණය- මේ දිවියේදීම, කෙළෙස් මැඩගෙන වාසය කිරීමට හැකිවේ. **සටහන**: විස්තර පිණිස **බලන්න :** සිංහල විසුද්ධිමාර්ගය, 6 පරිච්ඡේදය. **මූලාශ්‍ර**: සංයු.නි: (5-1):මහාවග්ග: බොජ්ඣංග සංයුත්තය: ආනාපාන වග්ගය: 2.7.1 අට්ඨික සූත්‍ර 6, පි. 268, ESN: Bojjhaṅgasaṃyutta:In and out Breathing: 57.1 The Skeleton, (6 suttas), p. 1807.

▲ **මරණ සති භාවනාව -** mindfulness of death meditation: මරණ සති භාවනාව - මරනාණුසති- මරණය ආවර්ජනා කිරීම**:** තම මරණය ඕනෑම වෙලාවක සිදුවිය හැකිබව සිහිකරමින්, අනිත්‍ය බව මෙනෙහිකරමින් සිත එකඟ කරගැනීම මරණ සතිභාවනාවය. සසර කළකිරීම පිණිස, නිවන ලංකර ගැනීම පිණිස උපකාරීවන භාවනාවකි.**බලන්න**: මරණය. **සටහන**: මරණසති භාවනාව පිලිබඳ විස්තර පිණිස බලන්න: සිංහල විසුද්ධිමග, 8 පරිච්ඡේදය.

▼ **මරණසති භාවනාව නිවන පිණිසවේ**: මරණ සතිය, භාවනාවක් ලෙසින් දියුණු කර බහුල කරගන්නේ නම්, එය එකාන්තයෙන්ම සසරට කළකිරීම පිණිස-නිබ්ද්දාව, කෙළෙස් වලට නොඇලීම- විරාගය පිණිස, රාගදි කෙළෙස් නැවතීම- නිරෝධය පිණිස, සියලු කෙළෙස් සංසිඳුවා ගැනීම පිණිස- උපසමාය, ත්‍රිවිධ ඥාන ගැන විශේෂයෙන්ම අවබෝධකරගැනීම පිණිස- අභිඤ්ඤාය, චතුසත්‍ය අවබෝධය පිණිස - සම්බෝධිය - නිවන සාක්ෂාත් කරගැනීම පිණිස පවතී.

**"එකධම්මො භික්ඛවෙ භාවිතො බහුලීකතො එකන්ත නිබ්බිදාය විරාගය නිරොධාය උපසමාය අභිඤ්ඤාය සම්බොධාය නිබ්බාණාය සංවත්තති: කතමො එකධම්මො : මරණසති"**. **මූලාශ්‍ර**: අංගු.නි: (1 ): 1 නිපාත: ඒකධම්ම පාලිය සූත්‍ර: 1.16.1.1.සූත්‍ර, පි.100, EAN:1:One Thing, p. 47.

▼ **මරණසති භාවනාව මහත්ඵල මහා ආනිසංස ගෙනදේ:**

මරණසති භාවනාව විපුල කරගැනීම අමතය-නිවන ලැබීමය, නිවන පරිපූර්ණ කරගැනීමය යි බුදුන් වහන්සේ වදාළහ:

**"මරණසති භික්ඛවෙ භාවිතා බහුලීකතා මහප්ඵලා හොති මහානිසංසා අමතොගධා අමත පරියොසනා..."**

**මරණසති භාවනාව වඩන අන්දම**: 1) මා ගන්නා හුස්ම, පිටවීමට යන කාලය තරම් කාලයක් මට ජිවත්වීමට ලැබේවා හෝ මා හුස්ම පිට කල පසු නැවත හුස්මක් ඇතුල්වීමට යන කාලය තරම් කාලයක් මට ජිවත්වීමට ලැබේවා, එතරම් කාලය තුළ මට, භාග්‍යවතුන්වහන්සේගේ ධර්මයට සිත යොමුකිරීමට හැකියාව ලැබේවා! එවිට මට ඉටු කරගතයුතුදේ ඉටුකරගැනීමට හැකිවේ. 2) රාත්‍රීකාලය පැමිණිවිට මෙසේ අවර්ජනා කළයුතුය: බොහෝ කරුණු නිසා මගේ මරණය සිදුවිය හැකිය: "සතෙක් සර්පයෙක් නිසා, මගේ පය හැපී බිම වැටීම නිසා , මා ගත් ආහරය එකඟ නොවිමනිසා, වාත, පිත, සෙම ආබාධයක් නිසා මගේ මරණය සිදුවිය හැකිය. එසේ අවර්ජනා කර, මෙලෙසින් සිතා බැලිය යුතුය: ප්‍රහිණය නොකළ අකුසල ධර්මතා මා සතුව තිබේද?, මේ රාත්‍රියේදී මගේ මරණය සිදුවන්නේ නම් එය මට බාධාවකි. එමනිසා මම ප්‍රහීණය

නොකළ අකුසල පහ කර ගැනීම පිණිස අසාමාන්‍ය අභිලාසයක් ඇතිව, විරිය ඇතිව, උනන්දුව ඇතිව, බලවත් උද්යෝගය ඇතිව, වෙහෙස නොසලකා, සතිය සම්ප්‍රජන්‍යය ඇතිව කටයුතු කලයුතුය. **උපමාව:** තමාගේ හිස ගිනිගත් විට හෝ තමාගේ ඇඳුම් වලට ගිනි ඇවූලුන විට වහා වහා ඒ ගින්න නිමා දමන කෙනෙක් මෙන් තමාගේ අකුසල නැතිකර ගැනීමට වහා කටයුතු කළයුතුය. ප්‍රහීණය කිරීමට කිසිම අකුසලයක් නොමැති නම් ඒ පුද්ගලයා ඒ රාත්‍රියේ ඔහුගේ මරණය සිදුවිය හැකිනම්, තමාගේ කුසල්ගැන සිතා ප්‍රීතියට හා ප්‍රමෝදයට පැමිණ වාසය කලයුතුය. ඔහු දිවා රෑ කුසල් පිළිබඳව භික්මී ප්‍රීතියෙන් වාසය කිරීමට පුහුණුවිය යුතුය. එසේ කටයුතු කරණ භික්ෂුව අප්‍රමාදය සහිතව වාසය කරයි, ඔහු සියලු ආසවයන් ප්‍රහිණය කරගැනීම පිණිස උනන්දුවෙන් මරණසතිය පුරුදු පුහුණු කරයි. එලෙස මරණසති භාවනාව වැඩිය යුතුය යි බුදුන් වහන්සේ අවවාද වදාළහ. **බලන්න**:උපග්‍රන්ථය:5 **සටහන:** අංගු.නි: 8: **මරණ සති සූත්‍රයේදී:** බුදුන් වහන්සේ මෙසේ වදාළහ:

"අපි අප්‍රමාදව වාසය කරමු, ආසව ක්ෂය කිරීම පිණිස තීක්ෂණව මරණ සතිය වඩමු. මෙසේ ඔබ හික්මිය යුතුය". **මූලාශ්‍ර:** අංගු.නි :( 4 ): 6 නිපාතය: 6.1.2.9 ප්‍රථම හා දුතිය මරණසති සූත්‍ර, පි. 60, ESN:6: Mindfulness of Death 1 & 2, p. 324, අංගු.නි :( 5):8 නිපාතය: 8.2.8.3 හා 8.2.8.4 මරණසති සූත්‍ර, පි. 324, ESN: 8: 73.3 & 74.4 Mindfulness of Death,p. 449.

▲ **ධාතුමනසිකාර භාවනාව -**Meditation on Elements: ධාතු ලක්ෂණ මෙනෙහි කොට එහි යථාබව අවබෝධය කරගැනීම තුලින් ඒවා කෙරහි නො ඇලීමට සිත පිහිටුවා ගැනීම, ධාතු මනසිකාරයය.

▼ **බුදුන් වහන්සේ** රාහුල තෙරුන්හට ධාතු 5 ක් ගැන: පඨවි, ආපො, තෙජෝ, වායෝ, අවකාශ ධාතුන් පිලිබඳ, ආවර්ජනා කලයුතු අන්දම මෙසේ පෙන්වා ඇත: 1) **පඨවි ධාතුව මෙනෙහිකිරීම-** (reflection of the earth element ). පඨවි ධාතුව ආකර 2කි. අභ්‍යන්තර හා බාහිර. මහාභූතයන් නිසා හටගත් කයේ කෙස් ලොම් නිය දත්... ආදීවූ තද-සන කොටස් ඇත, ඒවා නිසා සකස්වූ රූපය අභ්‍යන්තර පඨවි ධාතුවය.බාහිර පඨවි ධාතුව නම් මේ පොලවේ ඇති තදවූ සනවූ සවභාවයය. ඒ දෙකම, එකම දෙයකි.

'අභ්‍යන්තර හෝ බාහිර හෝ පඨවි ධාතු මම නොවේ, මගේ නොවේ, මගේ ආත්මය නොවේ යයි , පඨවි ධාතුවේ යථාබව, යහපත් නුවණින් දැකියයුතුය. එලෙස දකිනවිට පඨවිධාතුව පිලිබඳ කළකිරීම ඇතිවේ, එයට ඇති ඇලීම සිතෙන් පහවේ'.

**"නෙතං මම, නෙසොහමස්මි, න මෙසො අත්තා'ති. එවමෙතං යථාභූතං සම්මප්පඤ්ඤාය දට්ඨබ්බං. එවමෙතං යථාභූතං සම්මප්පඤ්ඤාය දිස්වා පඨවිධාතුයා නිබ්බින්දති. පඨවිධාතුයා චිත්තං විරාජෙති"**

**සටහන:** අභ්‍යන්තර පඨවි ධාතුව නම් පංච උපාදානස්කන්ධ යේ රූපය සකස්වී ඇති කොටස් 32 ය. **බලන්න**: සතර මහා භූතයෝ.

2 ) **ආපො ධාතුව මෙනෙහිකිරීම-** (reflection of the water element ): ආපොධාතුව ආකර 2කි. අභ්‍යන්තර හා බාහිර. කයේ ලේ, සොටු, සෙම,

සැරව....ආදී දියාරු-ගලන ස්වාභාවය අභ්‍යන්තර ආපො ධාතුවය. බාහිර ආපොධාතුව නම් මේ පිටත ඇති ජලය, දියාරු බවය. ඒ දෙකම, එකම දෙයකි.

"අභ්‍යන්තර හෝ බාහිර හෝ ආපො ධාතුව මම නොවේ, මගේ නොවේ, මගේ ආත්මය නොවේ යයි ආපො ධාතුවේ යථාබව, යහපත් නුවණින් දැකියයුතුය. එලෙස දකිනවිට ආපො ධාතුව පිලිබඳ කළකිරීම ඇතිවේ, එයට ඇති ඇලීම සිතෙන් පහවේ".

3 ) **තේජෝ ධාතුව මෙනෙහිකිරීම-** (reflection of the fire element ) තේජෝධාතුව ආකර 2කි. අභ්‍යන්තර හා බාහිර. මහලුබව ඇතිකරණ, ආහාර දිරවීම ආදිය කරණ, කයේ ඇති රස්නිය- උෂ්ණය, අභ්‍යන්තර තෙජො ධාතුවය. පිටත ඇති උණුසුම් ස්වභාවය බාහිර තේජෝ ධාතුවය. ඒ දෙකම, එකම දෙයකි. "අභ්‍යන්තර හෝ බාහිර හෝ තේජෝ ධාතුව මම නොවේ, මගේ නොවේ, මගේ ආත්මය නොවේ යයි තේජෝ ධාතුවේ යථාබව, යහපත් නුවණින් දැකියයුතුය. එලෙස දකිනවිට තේජෝ ධාතුව පිලිබඳ කළකිරීම ඇතිවේ, එයට ඇති ඇලීම සිතෙන් පහවේ"

4 ) **වායෝ ධාතුව මෙනෙහිකිරීම-** (reflection of the wind element ): වායෝ ධාතුව ආකර 2කි. අභ්‍යන්තර හා බාහිර. හුස්ම ඉහළ පහළ ගමන් කිරීම, බඩවැල් වල ඇති වායුව- සෙලවීම... ආදීය, කයතුළ ඇති වාතය, අභ්‍යන්තර වායො ධාතුවය. පිටත ඇති සෙලවීම්, සුළං ආදිය බාහිර වායො ධාතුවය. ඒ දෙකම, එකම දෙයකි.

"අභ්‍යන්තර හෝ බාහිර හෝ වායෝ ධාතුව මම නොවේ, මගේ නොවේ, මගේ ආත්මය නොවේ යයි වායෝ ධාතුවේ යථාබව, යහපත් නුවණින් දැකියයුතුය. එලෙස දකිනවිට වායෝ ධාතුව පිලිබඳ කළකිරීම ඇතිවේ, එයට ඇති ඇලීම සිතෙන් පහවේ".

**5) ආකාශ ධාතුව මෙනෙහිකිරීම** (reflection of the space element )

ආකාශ ධාතුව ආකර 2කි. අභ්‍යන්තර හා බාහිර. කෙනෙක්ගේ කයේ ඇති ඉඩඅවකාශය අභ්‍යන්තර ආකාශ ධාතුවය: කන්සිදුරු, නාස් සිදුරු,කට, ගුධය, මුත්‍රාපිටකරන ස්ථාන ආදිය. පිටත ඇති ආකාසය, හිස් ඉඩකඩ ආදිය බාහිර ආකාශ ධාතුවය. ඒ දෙකම, එකම දෙයකි.

"අභ්‍යන්තර හෝ බාහිර හෝ ආකාශ ධාතුව මම නොවේ, මගේ නොවේ, මගේ ආත්මය නොවේ යයි ආකාශ ධාතුවේ යථාබව, යහපත් නුවණින් දැකියයුතුය. එලෙස දකිනවිට ආකාශ ධාතුව පිලිබඳ කළකිරීම ඇතිවේ, එයට ඇති ඇලීම සිතෙන් පහවේ".

**6) සියලු ධාතු පිලිබඳ මධ්‍යස්තව මෙනෙහිකිරීම**: සියලු ධාතු පිලිබඳ සිත මධස්ථබවට පත්කර ගෙන මෙනෙහි කිරිමෙන් සිතට ප්‍රියගෙනදෙන හෝ අප්‍රිය ගෙනදෙන දේ පිලිබඳ ඇතිවන සිතුවිලි පහවී සිත මධස්ථස්වභාවයට පත්වේ යයි බුදුන් වහන්සේ පෙන්වා ඇත:

"පෘතුවිය ට දමන සුදුසු හෝ නුසුදුසු ඕනෑම දෙයක් හෝ එයට කරන ඕනෑම ක්‍රියාවක් පිළිබඳව පෘතුවිය: ප්‍රතික්ෂෙප නොකරයි, අවමානයට පත්නොවේ, උකටලීනොවේ. එලෙස ජලය...ගින්න.. සුළඟ...ආකාශය...ද. : ප්‍රතික්ෂෙප නොකරයි, අවමානයට පත්නොවේ,

උකටලීනොවේ. එලෙස ධාතු වල ඇති මධස්ථස්වභාවය, තමන් හා සමකොට මෙනෙහිකිරීමෙන්, ප්‍රසන්න හෝ අප්‍රසන්න දේ නිසා සිත කම්පානොවේ. සිත මධ්‍යස්තබවට උපේක්ඛාවට පත්වේ.”. **මූලාශ්‍ර**: ම.නි: (2): 2.2.2 මහාරාහුලෝවාද සූත්‍රය, පි. 158, EMN: 62: Mahārāhulovāda Sutta: The Greater Discourse of Advice to Rāhula, p. 494.

▲ **ආනාපානසති භාවනාව -** Ānāpāna-sati Meditation: සමාධිය වඩා ගැනීම පිණිස බහුල ලෙසින් කරන භවානා ක්‍රමයකි. ආනාපානසති භාවනාව පිලිබඳ ක්‍රම විධිය ආනාපානසති සූත්‍රය, මහා සතිපට්ඨාන සූත්‍ර හා ගිරිමානන්ද සූත්‍රයේ පෙන්වා ඇත. වැඩි විස්තර පිණිස **බලන්න:** සිංහල විසුද්ධිමග, පරිච්ඡේදය 8. **මූලාශ්‍ර**: ම.නි: (3 ): 3.2.8 අනාපානසති සූත්‍රය, පි. 240, EMN:118: Ānāpānasati Sutta- Mindfulness of Breathing, p. 861, අංගු.නි: (6): 10 නිපාත, සචිත්ත වග්ග, 10.2.1.10. ගිරිමානන්ද සූත්‍රය**,** පි.222, EAN:10: 60.10. Girimananda, p. 516, දීඝ.නි: (2): 9 මහාසතිපට්ඨාන සූත්‍රය, පි. 451, EDN:22 Mahāsatipaṭṭhāna Sutta: The Greater Discourse on the Foundations of Mindfulness, p. 246.

▼**ආනාපානසති භාවනාව නිවන පිණිසය**

**“එකධම්මො භික්ඛවෙ භාවිතො බහුලීකතො එකන්ත නිබ්බිදාය විරාගය නිරොධාය උපසමාය අභිඤ්ඤාය සම්බොධාය නිබ්බාණාය සංවත්තති: කතමො එකධම්මො ආනාපානසස්සති”**

ආනාපාන සතිය, භාවනාවක් ලෙසින්දියුණු කර බහුල කරගන්නේ නම්, එය ඒකාන්තයෙන්ම සසරට කළකිරීම පිණිස-නිබ්ද්දාව,කෙළෙස් වලට නොඇලීම- විරාගය පිණිස, රාගදි කෙළෙස් නැවතීම- නිරෝධය පිණිස, සියලු කෙළෙස් සංසිඳුවා ගැනීම පිණිස- උපසමාය, ත්‍රිවිධ ඥාන ගැන විශේෂයෙන්ම අවබෝධකරගැනීම පිණිස- අභිඤ්ඤාය, චතුසත්‍ය අවබෝධය පිණිස -සම්බෝධාය, නිවන සාක්ෂාත් කරගැනීම පිණිස පවතී. **මූලාශ්‍ර**: අංගු.නි:(1):1 නිපාත: ඒකධම්ම පාලිය සූත්‍ර, පි.100, EAN:1: XVI: One Thing, p. 47.

▼**අනාපානසති භාවනාව මහත් ඵල මහා ආනිසංස ගෙනදේ**: මේ භාවනාව යහපත් ලෙසින් දියුණු කරගත්විට අවසාන හුස්ම ගැනීම හා පිටකිරීම (මරණය) පිලිබඳව අවබෝධය ලැබේ. **සටහන:** අනාපානසති භාවනාව පිලිබඳ ක්‍රමවේදය මේ සූත්‍රයේ විස්තරාත්මකව දක්වා ඇත. **මූලාශ්‍ර**: ම.නි: (2 ) :2.2.2 මහාරාහුලෝවාද සූත්‍රය, පි. 158. E MN: 62: Mahārāhulovāda Sutta: The Greater Discourse of Advice to Rāhula, p. 494.

▲ **සතර බ්‍රහ්මවිහාර භාවනා-** Meditation on Four Sublime states: සතර බ්‍රහ්ම විහාර භාවනාව ලෙසින් පෙන්වා ඇත්තේ මෙත්තාව, කරුණාව, මුදිතාව හා උපේක්ඛාව අරමුණු කොට සිත සමථයට පත්කර ගැනීමය. **සටහන්**: භාවනා ක්‍රම විධිය පිණිස **බලන්න:** * බ්‍රහ්මවිහාර. ** සිංහල විසුද්ධිමග-9 නි පරිච්ඡේදය.

**▼සතර බ්‍රහ්ම විහාර භාවනාව කරන අන්දම :මෛත්‍රී භාවනාව, කරුණා භාවනාව, මුදිතා භාවනාව,උපේක්ඛා භාවනාව:**

මෙත්තා සහගත සිත හෝ කරුණා සහගත සිත හෝ මුදිතා සහගත සිත හෝ උපක්ඛා සහගත සිත හෝ පිහුටුවා ගත් යෝගියා, එම සිත: එක් දිශාවක් වෙත පතුරුවා වාසය කරයි; එසේම, දෙවෙනි දිශාවටද, තෙවෙනි දිශාවටද, සිව්වැනි දිශාවටද, උඩ දිශාවටද, යට දිශාවටද , සියලු තැනටම මෙත්තා... කරුණා... මුදිතා... උපේක්ඛා සහගත සිතින්, සියලු දෙනා තමන් හා සමකොටගෙන, ලොව ඇති සියලු සතුන් වෙත, විශාලලෙසින්, මහග්ගතව , අප්‍රමාණවූ අවෛරයෙන්, අව්‍යාපාදයෙන් යුත් මෛත්‍රී සගත... කරුණා... මුදිතා... උපේක්ඛා සිතපතුරුවා වාසය කරයි. එලෙස**...**භාවනාව වැඩුණු පසු ඔහු මෙසේ නුවණින් සිතයි: මේ **මෙත්තා...කරුණා... මුදිතා ... උපක්ඛා... චෙතො විමුක්තිය** උපදවන ලද්දේ චේතනා පදනම් කරගෙනය. චේතනා මගින් ඇතිවූ ඕනෑම දෙයක් අනිච්චය,නිරුද්ධවන ස්වභාවයෙන් යුතුය. ඒ පිලිබඳ ඔහුගේ සිතේ ස්ථාවරයක් ඇතිවේ නම් ඔහු ආසව ක්‍ෂය කරගනී- අරහත්වය ලබයි. එහෙත්, ධර්මයට ඇති ආලය හා ධර්මය නිසා ඇති සතුට (lust for the Dhamma-love for the Dhamma) නිසා ඔහුට ආසව ක්‍ෂය කරගැනීමට නොහැකිවුවොත්, ඔහු ඕරම්භාග සංයෝජන 5, සහමුලින්ම නැතිකොට අනාගාමී බව ලබා මෙලොව හැර,එලොව ඕපපාතිකව ඉපද එහිදී නිවන සාක්ෂාත් කරගනී. **සටහන:ධර්ම රාගය හා ධර්ම ආලය** යන මේ දෙපදයෙන් අදහස් කරන්නේ සමථ හා විදර්ශනාව ගැන ඇති කැමැත්ත හා සතුට බව අටුවාව දක්වයි. ඒ තත්වය නැතිකර ගත හැකිනම් අරහත් ඵලය සාක්ෂාත් කරගත හැකිය. **බලන්න**: EAN: note: 2226, p. 687. **මූලාශ්‍ර**: අංගු.නි: (6)11නිපාත: අනුසති වග්ග: 11.2.6 අට්ඨකනාගර සූත්‍රය, පි.674, EAN: 11: Recollection: 16.6 Dasama, p.573, ම.නි: (2 ) : 2.1.2 අට්ඨකනාගර සූත්‍රය, පි.36, EMN: 52: Aṭṭhakanāgara Sutta, p. 431.

**▼සතර බ්‍රහ්මවිහාර භාවනාව වැඩීමේ යහපත් විපාක**

මෛත්‍රිය භාවනාව වැඩීම නිසා සිතේ ඇතිවන තරහ- ව්‍යාපාදය නැතිවේ; කරුණා භාවනාව වැඩීම නිසා සිතේ ඇතිවන හිංසාකිරීම්, කෲර ක්‍රියා ආදිය නැතිවේ; මුදිතා භාවනාව වැඩීම නිසා සිතේ ඇතිවන අරතිය (කුසල්කිරීමට ඇති මැලිකම) නැතිවේ; උපෙක්කා භාවනාව වැඩීම නිසා සිතේ ඇතිවන අකමැත්ත, පිළිකුළ නැතිවේ, සිත මධ්‍යස්ත බවට පත්වේ. **මූලාශ්‍ර**: ම.නි: (2 ): 2.2.2 මහාරාහුලෝවාද සූත්‍රය, පි. 158. EMN: 62: Mahārāhulovāda Sutta: The Greater Discourse of Advice to Rāhula, p. 494.

**▼ මෙත්තාව වැඩීමෙන් සිත විමුක්තියට පත්වේ**: මෙත්තා භාවනාව දියුණු කරගැනීම පිණිස ඇතිකරගත යුතු ගුණ: 1) සිතේ නිතියෙන් මෙත්තාව සේවනය-ආශ්‍රය කළයුතුය (ආසෙවිතාය- pursued) 2) සිතේ වඩාගත යුතුය(භාවිතාය-developed 3) බොහෝලෙසින් සේවනය කල යුතුය(බහුලිකතාය- cultivated) 4) වාහනයක් සේ භාවිතා කළ යුතුය- ඕනෑම අවස්ථාවකට පිහිටවීමට (යානිකතාය- made a vehicle) 5) සිතේ පදනමක් කරගතයුතුය(වත්ථුකතාය- made a basis) 6) දිගටම කරගෙන යා යුතුය( අනුටඨිතාය-carried out) 7) සිතේ ප්‍රගුණ කළයුතුය(පරිචිතාය-

consolidated) 8) සිතේ මනාව තබාගෙන කටයුතු කලයුතුය (සුසමාරද්ධාය- properly undertaken). එලෙසින් මෙත්තාව වඩන පුද්ගලයාට ලැබෙන අනුසස් 11 කි: **මෙත්තා ආනිසංස**: 1) සුවසේ නින්දට යයි 2) සුවසේ නැගී සිටී 3) ලාමක සිහින නොදකින්නේය 4) මිනිසුන්හට ප්‍රියවේ 5) නො මිනිසුන්හට ප්‍රියවේ 6) දෙවියෝ ඔහු රකිති 7) ගින්නෙන්, වසවිෂ යෙන්, ආවුද වලින් ඔහුට අනතුරු සිදු නොවේ 8) සිත ඉක්මනින්ම සමාධියට පත් කරගත හැකිය 9) ඔහුගේ මුහුණ පැහැපත් වේ 10) මුලා සිතින් මරණයට පත්නොවේ 11) මේ දිවියේදී මගඵල නොලැබුනොත්, මතු දිවියේදී බ්‍රහ්මලෝකයේ උපත ලබයි. **මූලාශ්‍ර:** අංගු.නි:(6 ):11නිපාත:අනුසති වග්ග,11.2.5,මෙත්තානිසංස සූත්‍රය පි.672, EAN:11: II Recollection, 15.5 Loving Kindness, p.573.

▲**සතර සතිපට්ඨාන භාවනාව-** Sathipattaana Bhawana: සතර සතිපට්ඨාන භාවනාව: කායානුපස්සනාව, වේදනානුපස්සනාව, චිත්තානුපස්සනාව, ධම්මානුපස්සනාවපස්සනාව. භාවනාව වැඩීම පිළිබඳව බුදුන් වහන්සේ මෙසේ පෙන්වා ඇත:

"...මෙහි මහණ, කයෙහි කය අනුව... වේදනාවේ වේදනා අනුව...සිතේ සිත අනුව...ධර්මතාවෙහි ධර්මතා අනුව දක්නා සුලුව කෙලෙස් තවන වැර ඇතිව මනා දැනුම් ඇතිව සිහි ඇතිව ලෝකය පිලිබඳ දැඩි ලෝභ හා දැඩි දොම්නස දුරු කොට වෙසේ". **බලන්න:**සංයු.නි: සතිපට්ඨානසංයුත්ත: භාවනා සූත්‍රය. **සටහන:** විස්තර පිණිස බලන්න: දීඝ.නි: හා ම.නි: සතිපට්ඨාන සූත්‍ර.

▲ **ඉද්දිපාද භාවනාව-** Meditation on four spiritual base: ඉද්දිපාද භාවනාව (ඍද්ධිපාද) මෙසේ දක්වා ඇත. ඉද්දිපාද භාවනා 4කි: ඡන්දසමාධිපධාන සංඛාර සමන්නාගත, වීරිය සමාධිපධාන සංඛාර සමන්නාගත, චිත්ත සමාධිපධාන සංඛාර සමන්නාගත, විමංසා සමාධිපධාන සංඛාර සමන්නාගත ඉද්දි පාද භාවනා.

' **ඉද්දිපාද භාවනාගාමිනි ප්‍රතිපත්තිය'** යනු ආරිය අටමග වැඩීමය.

**බලන්න:** සංයු.නි: (5-2) ඉද්දිපාදසංයුත්ත:භාවනා සූත්‍රය.

▲**සිව් ඣාන භාවනාව -** Four Jhana meditaion: සිව්ඣාන-සතර ඣාන යනු, රූපඣාන සමාපත්තිය. **බලන්න:** ඣාන

**1) ප්‍රථම ඣානය**: මේ සසුනේ මහණ කාමයන්ගෙන් වෙන්ව, අකුසල යන්ගෙන් වෙන්ව, විතක්ක විචාර සහිත, විවේකයෙන් උපන් ප්‍රීතිය හා සුඛය ඇති,පළමු ඣානයට සමවදී. පළමු ඣානයට සමවැදුන ඔහු මෙසේ නුවණින් සිතයි: මේ පළමු ඣානය, උපදවන ලද්දේ චේතනා පදනම් කරගෙනය. චේතනා මගින් ඇතිවූ ඕනෑම දෙයක් අනිච්චය,නිරුද්ධවන ස්වභාවයෙන් යුතුය. ඒ ගැන ඔහුගේ සිතේ ස්ථාවරයක් ඇතිවේ නම් ඔහු ආසව ක්ෂය කරගනී. එහෙත්, ධර්මයට ඇති ආලය හා ධර්මය නිසා ඇති සතුට (lust for the Dhamma-love for the Dhamma) නිසා ඔහුට ආසව ක්ෂය කරගැනීමට නොහැකිවුවොත්, ඔහු ඕරම්භාග සංයෝජන 5, සහමුලින්ම නැතිකොට අනාගාමී බව ලබා මෙලොව හැර, එලොව, ඕපපාතික ව ඉපද එහිදී නිවන ලබා පිරිනිවන් පායි.

**2) දෙවන ජානය**: මේ සසුනේ මහණ, ප්‍රීතිය යටපත් කර, ආධ්‍යාත්මයේ සම්ප්‍රසාදනය (ශාන්තබව) ඇති, චිත්තයේ එකඟ බව ඇති, අවිතර්ක අවිචාරවූ සමාධියෙන් උපන් ප්‍රීති-සුඛ ඇති දෙවෙනි ජානයට පැමිණ වාසය කරයි. දෙවන ජානයට සමවැදුණු ඔහු මෙසේ නුවණින් සිතයි: මේ දෙවන ජානය, උපදවන ලද්දේ චේතනා පදනම් කරගෙනය. චේතනා මගින් ඇතිවූ ඕනෑම දෙයක් අනිච්චය,නිරුද්ධවන ස්වභාවයෙන් යුතුය. ඒ ගැන ඔහුගේ සිතේ ස්ථාවරයක් ඇතිවේ නම් ඔහු ආසව ක්‍ෂය කරගනී. එහෙත්, ධර්මයට ඇති ආලය හා ධර්මය නිසා ඇති සතුට නිසා ඔහුට ආසව ක්‍ෂය කරගැනීමට නොහැකිවුවොත්, ඔහු ඕරම්භාග සංයෝජන 5 සහමුලින්ම නැතිකොට අනාගාමී බව ලබා මෙලොව හැර, එලොව ඕපපාතික ව ඉපද එහිදී නිවන ලබා පිරිනිවන් පායි.

**3) තෙවෙනි ජානය:**මේ සසුනේ මහණ, පහවී ගිය ප්‍රීතිය ඇතිව, විරාගය හා උපෙක්කා ව ඇතිව සති සම්පජානය ඇතිව, කාය සුඛයෙන් වාසය කරයි. තෙවන ජානයට සමවැදුණු ඔහු මෙසේ නුවණින් සිතයි: මේ තෙවන ජානය, උපදවන ලද්දේ චේතනා පදනම් කරගෙනය. චේතනා මගින් ඇතිවූ ඕනෑම දෙයක් අනිච්චය,නිරුද්ධවන ස්වභාවයෙන් යුතුය. ඒ ගැන ඔහුගේ සිතේ ස්ථාවරයක් ඇතිවේ නම් ඔහු ආසව ක්‍ෂය කරගනී. එහෙත්, ධර්මයට ඇති ආලය හා ධර්මය නිසා ඇති සතුට නිසා ඔහුට ආසව ක්‍ෂය කරගැනීමට නොහැකිවුවොත්, ඔහු ඕරම්භාග සංයෝජන 5 සහමුලින්ම නැතිකොට අනාගාමී බව ලබා මෙලොව හැර, එලොව ඕපපාතික ව ඉපද එහිදී නිවන ලබා පිරිනිවන් පායි.

**4) සිව්වෙනි ජානය**: මේ සසුනේ මහණ, සුඛ වේදනාවන්ද දුක් වේදනාවන්ද පහ කර, පෙර දී අතුරුදහන් වූ සොම්නස හා දොම්නස සහිතව, ඔහු දුකත් නැති, සුඛයත් නැති සිව්වෙනි ජානයට පැමිණ, උපක්කාව නිසා ඇතිවූ පිරිසුදු සිතින් වාසය කරයි. සතරවෙනි ජානයට සමවැදුණු ඔහු මෙසේ නුවණින් සිතයි: මේ සිව්වෙනි ජානය, උපදවන ලද්දේ චේතනා පදනම් කරගෙනය. චේතනා මගින් ඇතිවූ ඕනෑම දෙයක් අනිච්චය,නිරුද්ධවන ස්වභාවයෙන් යුතුය. ඒ ගැන ඔහුගේ සිතේ ස්ථාවරයක් ඇතිවේ නම් ඔහු ආසව ක්‍ෂය කරගනී .එහෙත්, ධර්මයට ඇති ආලය හා ධර්මය නිසා ඇති සතුට නිසා ඔහුට ආසව ක්‍ෂය කරගැනීමට නොහැකිවුවොත්, ඔහු ඕරම්භාග සංයෝජන 5 සහමුලින්ම නැතිකොට අනාගාමී බව ලබා මෙලොව හැර, එලොව ඕපපාතික ව ඉපද එහිදී නිවන ලබා පිරිනිවන් පායි. **මූලාශ්‍ර:** අංගු.නි: (6 ):11නිපාත: 2 අනුසති වගග,11.2.6, අට්ඨකනාගර සූත්‍රය, පි.674, EAN:11: II Recollection, 16.6 Dasama,p.573.

▲ **කසිණ භාවනා -** meditation on kasiṇa: දස කසිණ අරමුණුකර වඩාගන්නා සමාධිය කසිණ භාවනාවය. කසිණ භාවනාව යහපත් ලෙසින් වඩා ගැනීමෙන් රූප ජාන හා අරූප සමාපත්ති ලබාගත හැකිය. **බලන්න**: කසිණ, අභිභායතන. **සටහන්:** * කසිණ භාවනාව යනු යම් ධාතුවක් හෝ වර්ණයක් කමටහන් කර සමාධිය ලබාගැනීමය. උදා: ආපෝ ධාතුව පිලිබඳ කසිණ භාවනාවට ජලබඳුනක් හෝ විලක් අරමුණු කරගැනීම. **බලන්න**: EAN: note 1995, p. 677. ** සිංහල විශුද්ධිමාර්ගයේ 4 හා 5 පරිච්ඡේද වල කසිණ භාවනා ක්‍රම විධිය විස්තර කර ඇත. **මූලාශ්‍ර**:අංගු.නි: (6 ):10 නිපාත: 10.1.3.5. කසිණ සූත්‍රය,පි.112, EAN: 10: 25-5 Kasinas, p. 502.

▲**දස සංඥා භාවනා-** Meditation on 10 perceptions: ගිරිමානන්ද සූත්‍රයේ දී, බුදුන් වහන්සේ දස සංඥා භාවනා වඩන ආකාරය විස්තර කර ඇත. **දසසංඥා**: අනිච්ච සංඥාව, අනාත්ම සංඥාව, අසුභ සංඥාව, ආදීනව සංඥාව, පහාන සංඥාව, විරාග සංඥාව, නිරෝධ සංඥාව, සබ්බලෝකේ අනභිරති සංඥාව, සබ්බසංඛාරයෙහි අනිච්ච සංඥාව හා ආනාපාන සතිය. **සටහන**: දසසංඥා ශ්‍රවනය කිරීමෙන්, ගිරිමානන්ද තෙරුන්ගේ අසනීපය සන්සිඳී යනබව බුදුන් වහන්සේ, ආනන්ද තෙරුන්ට වදාළහ. **භාවනාව පිණිස පිළියෙලවීම**: වනයට, ගසක් මුලට හෝ හිස් කුටියකට (වැනි සුදුසු ස්ථානයක) භාවනා කිරීමට පැමිණි භික්ෂුව, කැමති පරිදි, සංඥා පිළිබඳව නුවණින් ආවර්ජනය කරයි.

**1) අනිච්ච සංඥා භාවනාව:** භික්ෂුව මෙසේ නුවණින් මෙනෙහි කරයි:

"රූපය අනිත්‍යයය, වේදනා අනිත්‍යයය, සංඥා අනිත්‍යයය, සංස්කාර අනිත්‍යයය, විඥාන අනිත්‍යයය. එලෙස, පංච උපාදාන ස්කන්ධයෙහි අනිත්‍යබව මෙනෙහි කරමින් වාසය කරයි".

**"...භික්ඛු අරඤ්ඤගතොවා... ඉතිපටිසංචික්ඛති: 'රූපං අනිච්චං, වෙදනා අනිච්චා, සඤ්ඤා අනිච්චා, සඞ්ඛාරා අනිච්චා, විඤ්ඤාණං අනිච්චන්ති'. ඉති ඉමෙසු පඤ්චසුපාදානක්ඛන්ධෙසු අනිච්චානුපස්සී විහරති..."** (having gone to the forest, to the foot of a tree, or to an empty hut, a bhikkhu reflects thus: 'Form is impermanent, feeling is impermanent, perception is impermanent, volitional activities are impermanent, consciousness is impermanent', Thus he dwells contemplating impermanence in these five aggregates subject to clinging. This is called the perception of impermanence".

**2) අනත්ත සංඥා භාවනාව:** භික්ෂුව මෙසේ නුවණින් මෙනෙහි කරයි:

" ඇස අනාත්මය, රූප අනාත්මය, කණ අනාත්මය, ශබ්ද අනාත්මය, නාසය අනාත්මය, ගඳසුවඳ අනාත්මය, දිව අනාත්මය, රස අනාත්මය, කය අනාත්මය, කයට දැනෙන පහස අනාත්මය, සිත අනාත්මය, සිතට දැනෙන ධර්මතා-සිතුවිලි අනාත්මය. එලෙස, සයවැදෑරුම් අභ්‍යන්තර හා බාහිර ආයතන පිලිබඳ අනාත්ම ස්වභාවය මෙනෙහි කරමින් වාසය කිරීම අනත්ත සංඥාව වැඩීමය:

**"...භික්ඛු අරඤ්ඤගතොවා... ඉතිපටිසඤ්චික්ඛති: 'චක්ඛුං අනත්තා, රූපා අනත්තා, සොතං අනත්තා, සද්දා අනත්තා, ඝානං අනත්තා, ගන්ධා අනත්තා, ජිව්හා අනත්තා, රසා අනත්තා, කායො අනත්තා, ඵොට්ඨබ්බා අනත්තා, මනො අනත්තා, ධම්මා අනත්තා'ති. ඉති ඉමෙසු ඡසු අජ්ඣත්තික බාහිරෙසු ආයතනෙසු අනත්තානුපස්සී විහරති".** (having gone to the forest... a bhikkhu reflects thus: 'The eye is non-self, forms are non-self; the ear is non-self, sounds are non-self; the nose is non-self, odors are non-self; the tongue is non-self, tastes are non-self; the body is non-self, tactile objects are non-self; the mind is non-self, mental phenomena are non-self.' Thus he dwells contemplating non-self in these six internal and external sense bases. This is called the perception of non-self). **බලන්න:**අනත්ත ලක්ඛණ සූත්‍රය.

**3) අසුභ සංඥා භාවනාව:** භික්ෂුව මෙසේ නුවණින් මෙනෙහි කරයි:

"පා තලින් උඩ, කෙස්මතුයෙන් යට සමින් ආවරනයවූ කයේ ඇති නානා ප්‍රකාර අප්‍රචිත බව (කුණු-අශුචි- impurities) ආදී කයේ කොටස් වල අප්‍රියබව මෙනෙහි කරයි: 'මේ කයේ: හිස කෙස් ඇත; රෝමකූපයන් ඇත; නියපොතු ඇත, දත් ඇත; හම ඇත, මස් ඇත; නහර ඇත, ඇට ඇත; ඇටමිදුළු ඇත; වකුගඩුවක් ඇත; හදවතක් ඇත; අක්මාවක් ඇත (liver); දලබුවක ඇත (pleura); බඩදිවක් ඇත (spleen); පෙනහැල්ලක් ඇත; අතුනු ඇත(බඩවැල්-intestines); අතුනුබහන් ඇත (කුඩා බඩවැල්- mesentery); බඩක් ඇත (උදරය-stomach); අසුචි ඇත (excrement); පිත ඇත (bile); සෙම ඇත (phlegm); සැරව ඇත (pus); ලේ ඇත; දහඩිය ඇත (sweat); මේදය ඇත (fat); කඳුළු ඇත tears); වුරුණුතෙල් ඇත(grease); කෙළ ඇත (saliva); හොටු ඇත (snot); සඳමිදුළු ඇත (oil of the joints); මුත්‍රා ඇත". මේ අසුභ සංඥා භාවනාවය.

**සටහන:අසුභ භාවනාව** වැඩීමෙන් සිතේ ඇති රාගය- කාමය ප්‍රහීණය වේ. **බලන්න**: ම.නි: මහාරාහුලෝවාද සූත්‍රය.

**4) ආදීනව සංඥා භාවනාව:** භික්ෂුව මෙසේ නුවණින් මෙනෙහි කරයි:

" බොහෝ දුක් වේදනා ඇති මේ කයේ බොහෝ ආදීනව ඇත. කය විවිධ ලෙඩ රෝගවලට ලක්වේ: එනම්: **ඇස්රෝග**, කණේ රෝග, නාසයේ රෝග, දිවේ රෝග හා කයේ රෝග. හිසේ රෝග, බාහිර කණේ ඇතිවන රෝග, මුඛයේ රෝග, දත් රෝග, කැස්ස, ඇදුම, පීනස, දාහය, උණ, බඩේ රිදුම්, කලාන්තය, අතීසාරය, වලිප්පුව, කොළරාව, ලාදුරු, ගඩු , කඩුවේගන්, ක්‍ෂයරෝගය, අපස්මාරය, දද, කැසීම, කොරල, පැපොල, හොරි, රක්තපාතය, දියවැඩියාව, අර්ශස්, පිළිකා, ඔඩු සහිත වන, පිත සෙම වාත කිපීම නිසා ඇතිවන රෝග, සන්නිපාතය, කාලගුණ විපරියාස නිසා ඇතිවන රෝග, විෂමචාර නිසා ඇතිවන ලෙඩ, පහරදීම් නිසා ඇතිවන රෝග, කම්ම විපාක රෝග, ශීතය, උණුසුම, බඩගින්න, පිපාසය, මල හා මුත්‍රා පහකිරීමේ රෝග. එලෙසින්, කයට ඇති ආදීනව මෙනෙහි කරමින් වාසය කරයි:

**"...භික්ඛු අරඤ්ඤගතොවා... ඉතිපටිසංචික්ඛති: 'බහු දුක්ඛො බො අයං කායො බහු ආදීනවො, ඉති ඉමස්මිං කායෙ විවිධා ආබාධා උප්පජ්ජන්ති, සෙය්‍යථිද: චක්ඛුරොගො සොතරොගො ඝානරොගො ජිව්හාරොගො කායරොගො සීසරොගො කණ්ණරොගො මුඛරොගො දන්තරොගො කාසො සාසො පිනාසො ඩහො ජරො කුච්ඡිරොගො මුච්ඡා පක්ඛන්දිකා සූලා විසූචිකා කුට්ඨං ගණ්ඩො කිලාසො සොසො අපමාරො දද්දු කණ්ඩු කච්ඡු රඛසා විතච්ඡිකා ලොහිතපිත්තං මධුමෙහො අංසා පිළකා භගන්දලා පිත්තසමුට්ඨානා ආබාධා සෙම්හසමුට්ඨානා ආබාධා වාතසමුට්ඨානා ආබාධා සන්නිපාතිකා ආබාධා උතුපරිණාමජා ආබාධා විසමපරිහාරජා ආබාධා ඔපක්කමිකා ආබාධා කම්මවිපාකජා ආබාධා සීතං උණ්හං ජිඝච්ඡා පිපාසා උච්චාරො පස්සාවො' ති ඉති ඉමස්මිං කායෙ ආදීනවානුපස්සී විහරති"**

**5) ප්‍රහාණසංඥා භාවනාව:** මේ සසුනේ මහණ තමාට ඇතිවූ කාම, ව්‍යාපාද, විහිංසා සිතුවිලි, අකුසල සහගත පාපික තත්වයන් ඇතිවූවිට,

ඒවා ඉවසන්නේ (රුස්සන්නේ නැත) නැත, ඒවා දුරු කරයි, පහකර දමයි, අවසන්කර දමයි, වනසා දමයි. එය පහාන සංඥාව ය:

**“ ... භික්ඛු උප්පන්නං කාමවිතක්කං ...ව්‍යාපාදවිතක්කං...විහිංසාවිතක්කං... උප්පන්නුප්පන්නෙන පාපකෙ අකුසලෙ ධම්මෙ නාධිවාසෙති පජහති විනොදෙති බ්‍යන්තීකරොති අනභාවංගමෙති...”** (Here, a bhikkhu does not tolerate an arisen sensual thought ... thought of ill will... thought of harming... bad unwholesome states whenever they arise, he abandons them, dispels them, terminates them, and obliterates them. This is called the perception of abandoning).

**6 ) විරාග සංඥා භාවනාව:** විරාගය පිලිබඳ භාවනාව වඩන්නේ සසර පිළිබඳව නො ඇල්ම අතිකර ගැනීමටය. **බලන්න:** විරාගය.

භික්ෂුව මෙසේ නුවණින් මෙනෙහි කරයි:

“මෙය ශාන්තය, මෙය ප්‍රණීතය, එනම්, සියලු සංස්බාර යන්ගේ සංසිඳීම, සියලු අල්වාගැනීම් (උපධි) පහකිරීම, තණ්හාව ක්ෂයකර ගැනීම මගින් ඇතිවන විරාගය (නො ඇල්ම) නම්වූ නිවනය”. එසේ විරාග සංඥාව වඩාගනී.

**“...භික්ඛු අරඤ්ඤගතොවා... ඉතිපටිසංචික්ඛති: ‘එතං සන්තං එතං පණීතං යදිදංසබ්බ සඞ්ඛාරසමථො සබ්බූපධිපටිනිස්සග්ගො, තණ්හක්ඛයො විරාගො නිබ්බානන්ති’’**. (Here, having gone to the forest, to the root of a tree, or to an empty hut, a bhikkhu reflects thus: ‘This is peaceful, this is sublime, that is, the stilling of all activities, the relinquishment of all acquisitions, the destruction of craving, dispassion, nibbāna’. This is called the perception of dispassion).

**7) නිරෝධසංඥා භාවනාව:**

නිරෝධ සංඥා භාවනාවේ අරමුණ තණ්හාව දුරලා විමුක්තිය ලැබීමය. **බලන්න**: නිරෝධය

භික්ෂුව මෙසේ නුවණින් මෙනෙහි කරයි:

‘ මෙය ශාන්තය, මෙය ප්‍රණීතය, එනම්, සියලු සංස්බාර යන්ගේ සංසිඳීම, සියලු අල්වාගැනීම් (උපාදාන) පහකිරීම, තණ්හාව ක්ෂයකර ගැනීම මගින් ඇතිවන නිරොධය (නිවීම) නම්වූ නිවන’. එලෙසින් නිරොධ සංඥාව වඩයි:

**“...භික්ඛු අරඤ්ඤගතොවා... ඉතිපටිසංචික්ඛති: ‘එතං සන්තං එතං පණීතං යදිදං සබ්බ සඞ්ඛාරසමථො සබ්බූපධිපටිනිස්සග්ගො, තණ්හක්ඛයො නිරොධො නිබ්බානන්ති’ අයං වුච්චති විරාගසඤ්ඤා”** (Here, having gone to the forest, to the root of a tree, or to an empty hut, a bhikkhu reflects thus: ‘This is peaceful, this is sublime, that is, the stilling of all activities, the relinquishment of all acquisitions, the destruction of craving, cessation, nibbāna’. This is called the perception of cessation).

**8) සබ්බලෝකේ අනභිරති සංඥා භාවනාව:** භික්ෂුව මෙසේ නුවණින් මෙනෙහි කරයි:

"... ලෝකයේ ඇති සුඛආස්වාදය ගෙනදෙන අරමුණු, එනම්,1.බැඳීම් (engagement)-තණ්හා, මාන දිට්ඨි නිසා ඇතිවෙන බැඳීම් 2. අල්ලාගැනීම් (clinging)- උපාදාන: කාම උපාදාන ආදීවූ. 3. සිතින් සකස්කරගන්නා මත ආදිය (mental standpoints)- ශාශ්වත වාද, උච්ඡෙද වාද ආදීවූ. 3. විශ්වාසයන්- පිළිපැදීම් (adherences) 4. ලෝකය ගැන ඇති අනුසය ධර්මතා(underlying tendencies) ආදිය ගැන ඇල්මක් ඇතිකර ගැනීම නොමනාය". එසේ නුවණින් බලා, ඒවායේ නො එල්ලී, ඒවා පහකර ගනියි. එය සබ්බ ලෝකේ අනභිරත සංඥා භාවනාවය.

**" ... භික්ඛු යෙ ලොකෙ උපයූපාදානා චෙතසො අධිට්ඨානාභිනිවෙසානුසයා, තෙ පජහන්තො විරමති න උපාදියන්තො. අයං වුච්චති සබ්බලොකෙ අනභිරත සඤ්ඤා"** ( Here, a bhikkhu refrains from any engagement and clinging, mental standpoints, adherences, and underlying tendencies in regard to the world, abandoning them without clinging to them. This is called the perception of non-delight in the entire world)

**9 ) සබ්බලෝකේ අනභිරති සංඥා භාවනාව:** මෙහිදී භික්ෂුව සියලු සකස්වූ ධර්මතාවල අනිච්චබව දකිමින්: ඒවා, ප්‍රතික්ෂේප කරයි, ඒවාට නින්දාකරයි, ඒවා පිළිකුල් කරයි. එය සබ්බ සංඛාරෙ අනිච්ච සංඥා භාවනාවය.

**10) ආනාපානසති සංඥාව වැඩීම බලන්න:** ආනාපානසති භාවනාව. **මූලාශ්‍ර:** අංගු.නි: ( 6 ): 10 නිපාත: 10.2.1.10 ගිරිමානන්ද සූත්‍රය, පි. 221, EAN: 10: 60.10. Girimānanda, p. 516.

▲**අරූප භාවනා-** Meditation on immaterial

අරූප ආයතන 3ක් මෙනෙහි කරගනිමින් ලබන සමාපත්ති භාවනාවය. මේවා ශාන්ත විහරණ ලෙසින්ද දක්වා ඇත.

**1) ආකාසානඤ්චායතන සමාපත්තිය-** base of the infinity of space:: මේ සසුනේ මහණ, රූපසංඥා සහමුලින්ම මැඩ පවත්වාගෙන (සමතික්‍රමණයෙන්), ප්‍රතිඝ සංඥා පහවීමෙන්, නානත්ව සංඥා මෙනෙහි නොකර 'ආකාශය අන්තය' යයි අවබෝධකර ආකාසානඤ්චායතනයට පැමිණ එහි වාසය කරයි. එම සමාපාත්තියට සමවැදුණු ඔහු මෙසේ නුවණින් සිතයි: මේ සමාපත්තිය, උපදවන ලද්දේ චේතනා පදනම් කරගෙනය. චේතනා මගින් ඇතිවූ ඕනෑම දෙයක් අනිච්චය, නිරුද්ධවන ස්වභාවයෙන් යුතුය . ඒ ගැන ඔහුගේ සිතේ ස්ථාවරයක් ඇතිවේ නම් ඔහු ආසව ක්ෂය කරගනී.එහෙත්, ධර්මයට ඇති ආලය හා ධර්මය නිසා ඇති සතුට නිසා ඔහුට ආසව ක්ෂය කරගැනීමට නොහැකිවුවොත්, ඔහු ඕරම්භාග සංයෝජන 5 සහමුලින්ම නැතිකොට අනාගාමී බව ලබා මෙලොව හැර, එලොව ඕපපාතිකව ඉපද එහිදී නිවන ලබා පිරිනිවන් පායි. **සටහන:** ආකාසානඤ්චායතන සමාපත්තිය, සතරවෙනි ජාන සුවයට වඩා විශිෂ්ඨ හා උසස්ය. **බලන්න:** අංගු.නි: (6) 10 නිපාත, උපාලි වගග - 2, 10.2.5.9. උපාලි සූත්‍රය.

**2) විඤ්ඤාණඤ්චායතන සමාපත්තිය-** base of infinity of consciousness: මේ සසුනේ මහණ, ආකාසානඤ්චායතනය සහමුලින්ම මැඩ පවත්වාගෙන, 'විඥාණය අන්තය' යයි අවබෝධකර විඤ්ඤාණඤ්චායතනයට පැමිණ එහි වාසය කරයි. එම සමාපත්තියට සමවැදුණු ඔහු මෙසේ නුවණින් සිතයි: මේ සමාපත්තිය, උපදවන ලද්දේ චේතනා පදනම් කරගෙනය. චේතනා මගින් ඇතිවූ ඕනෑම දෙයක් අනිච්චය, නිරුද්ධවන ස්වභාවයෙන් යුතුය .ඒ ගැන ඔහුගේ සිතේ ස්ථාවරයක් ඇතිවේ නම් ඔහු ආසව ක්‍ෂය කරගනී. එහෙත්, ධර්මයට ඇති ආලය හා ධර්මය නිසා ඇති සතුට නිසා ඔහුට ආසව ක්‍ෂය කරගැනීමට නොහැකිවුවොත්, ඔහු ඕරම්භාග සංයෝජන 5 සහමුලින්ම නැතිකොට අනාගාමී බව ලබා මෙලොව හැර, එලොව ඕපපාතික ව ඉපද එහිදී නිවන ලබා පිරිනිවන් පායි. **සටහන:** මේ සමාපත්තිය, ආකාසානඤ්චායතන සමාපාත්තියට වඩා විශිෂ්ඨ හා උසස්ය. යයි බුදුන්වහන්සේ ප්‍රකාශකළහ. **බලන්න:** අංගු.නි: 10-නිපාත, උපාලි වගග -2, 10.2.5.9. උපාලි සූත්‍රය.

**3) ආකිඤ්චඤ්ඤායතනය සමාපත්තිය-** base of nothingness: මේ සසුනේ මහණ, විඤ්ඤාණඤ්චායතනය සහමුලින්ම මැඩ පවත්වාගෙන, ''කිසිවක් නැත' යයි අවබෝධකර ආකිඤ්චඤ්ඤායතනයට පැමිණ එහි වාසය කරයි. එම සමාපත්තියට සමවැදුණු ඔහු මෙසේ නුවණින් සිතයි: මේ සමාපත්තිය, උපදවන ලද්දේ චේතනා පදනම් කරගෙනය. චේතනා මගින් ඇතිවූ ඕනෑම දෙයක් අනිච්චය, නිරුද්ධවන ස්වභාවයෙන් යුතුය . ඒ ගැන ඔහුගේ සිතේ ස්ථාවරයක් ඇතිවේ නම් ඔහු ආසව ක්‍ෂය කරගනී. එහෙත්, ධර්මයට ඇති ආලය හා ධර්මය නිසා ඇති සතුට නිසා ඔහුට ආසව ක්‍ෂය කරගැනීමට නොහැකිවුවොත්, ඔහු ඕරම්භාග සංයෝජන 5, සහමුලින්ම නැතිකොට අනාගාමී බව ලබා මෙලොව හැර, එලොව ඕපපාතික ව ඉපද එහිදී නිවන ලබා පිරිනිවන් පායි.

**සටහන:** මේ සමාපත්තිය, විඤ්ඤාණඤ්චායතන සමාපාත්තියට වඩා විශිෂ්ඨ හා උසස්ය. **බලන්න:** අංගු.නි: 10-නිපාත, උපාලි වගග -2, 10.2.5.9. උපාලි සූත්‍රය. **මූලාශ්‍ර:** අංගු.නි:(6 ):11 නිපාත: 2 අනුසති වගග,11.2.6, අට්ඨකනාගර සූත්‍රය, පි.674, EAN:11: II Recollection, 16.6 Dasama,p.573.

▲ **ආහාරයෙහි පටිකුල සංඥා භාවනාව-** Reflection on the loathsomeness of food: ආහාරයෙහි පටිකුල සංඥා භාවනාව ලෙසින් පෙන්වා ඇත්තේ, තමන් ගන්නා ආහාරය ක්‍රමයෙන් කය තුල විවිධ ස්වභාවයන්ට පත්වීම මෙනෙහි කිරීමකි, භාවනා අරමුණකි **බලන්න:** සංඥා.

▲ **ඉන්ද්‍රිය භාවනාව** - Indriya bhawanawa: ආරියවිනයේ, ඉන්ද්‍රිය භාවනාව අනුත්තර බව බුදුන් වහන්සේ වදාළහ.

**භාවනව වඩන ආකාරය:** ඇස, කණ නාසය, දිව, කය හා මනස යන අභ්‍යන්තර ආයතන බාහිර අරමුණු ස්පර්ශ කරනවිට, ඒ පිලිබඳ ඇතිවූ කැමැත්ත හෝ අකමැත්ත හෝ කැමැත්ත අකමැත්ත ය දෙක ගැන මෙනෙහි කර ඒවා, සකස්වූ, ඕලාරික වූ හේතු ප්‍රත්‍ය නිසා ඇතිවූ බව අවබෝධකර උපේක්ඛාව ඇතිකරගතයුතුය. **සටහන:** මේ සූත්‍රයේ, ඉන්ද්‍රිය භාවනව වඩන ආකාරය විස්තරාත්මකව පෙන්වා ඇත. **බලන්න:** ම.නි. ඉන්ද්‍රිය භාවනා සූත්‍රය.

▲**භාවනා වර්ධනය-**Development in meditation: භාවනාවේ වර්ධනය- භාවනාව වැඩීම පිණිස, ඕනෑකමින්, උත්සහායෙන් කටයුතු කළයුතුවේ. 37ක්වූ බෝධිපාක්‍ෂ ධර්මතා දියුණු කරගැනීමට උත්සාහ කළ යුතුය. එමගින් භාවනාවේ වර්ධනය ඇතිවේ. මේ පිලිබඳව බුදුන් වහන්සේ පෙන්වා ඇති **උපමාව:** බිජු රකින කිකිළිය, එම කටයුත්ත නිසි ලෙස නොකර, 'අනේ මගේ පැටව්, කටුව බිඳ සුවසේ එළියට එත්වා' යයි පතයි. ඒ බිත්තර මැනවින් නො රැකි බැවින් ඇයගේ පැතුම ඉටු නොවේ. එලෙසින්, මහණ, ධර්මතා වර්ධනය නොකර 'මගේ භාවනාව මගින් ආසව බිඳී විමුක්තිය ඇතිවේවා' යයි පැතුවද එය එසේ නොවේ.වෙනත් බිජු රකින කිකිළිය, එම කටයුත්ත නිසිලෙස කර තමාගේ පැටව් සුවසේ පැමිණේවා යයි පතනවා නම් එය එසේ සිදුවේ. එලෙස, ධර්මතා යහපත් ලෙසින් දියුණු කරගන්නා මහණ ගේ භාවනාව හොඳින් සිදුවේ, ඔහුගේ ආසව අනුක්‍රමයෙන් බිඳී, අවසානයේදී විමුක්තිය ලබා ගැනීමට ඔහු සමත්වේ.**ඒ පිලිබඳ බුදුන් වහන්සේ දක්වා ඇති උපමා**: **වඩුවා උපමාව**: 1) වඩුවෙක්, වැඩ කිරීම නිසා ඔහුගේ වෑය ගෙවියයි, එහෙත්, අද මෙපමණක් ගෙවී ගියාය යන වැටහීම ඔහුට නැත. එලෙස, භාවනාව වඩා ගන්නා භික්ෂුවට, දිනෙන් දිනට කෙතක් දුරට ආසව ප්‍රහීණය වූවාද යන අවබෝධ නැත. එහෙත්, ආසාව ක්‍ෂය වූ විට, ඒ පිලිබඳ නුවණ ඇතිවේ.

2) නැවක් සයමසක් පමණ කාලයක් ජලයේ රැඳී සිටීම එය බැඳ ඇති කඹ දිරා යයි. පසුව ගොඩබිමට ගත් ඒ නැව, ශීත කාලය තුල එහි රැඳීසිටීම නිසා, එය බැඳ ඇති කඹ, වැසි සුළං නිසා දිරා වැටි යයි. එලෙස, භික්ෂුව, උත්සාහය ඇතිව ධර්මතා දියුණු කර භාවනාව වඩනවිට, ඔහුගේ කෙළෙස්මල දිරා වැටේ. බලන්න: උප ග්‍රන්ථය:5

**සටහන්**: * මේ උපමාව ආරිය අටමග බහුල කරන භික්ෂුවගේ සංයෝජන ගෙවීයාම පිණිස යොදාගෙන ඇත. බලන්න: : අංගු.නි: (4) 7 නිපාත:මහාවග්ග:7.2.2.7 භාවනානුයුත්ත සූත්‍රය, පි.482. ** භාවනාව වැඩීම පිණිස ථිනමිද්ධය පහ කර ගැනීම අවශ්‍යයය. **බලන්න**: ථිනමිද්ධය, උපග්‍රන්ථය: **මූලාශ්‍රය:** අංගු.නි: (4) 7 නිපාත:මහාවග්ග:7.2.2.7 භාවනානුයුත්ත සූත්‍රය,පි.482.

▲**භාවනාවේ නිපුනබව-**skillfulness in meditation: භාවනාවේ නිපුනබව පිලිබඳ ලක්ෂණ දෙකක් බුදුන් වහන්සේ පෙන්වා ඇත: 1) භාවනාවට ඇතුල්වීමේ දක්‍ෂබව (සමාපත්ති කුසලතා-entering meditative attainment): භාවනා අරමුණේ පිහිටා සිත එකඟ කරගෙන සමාපත්තිය ඇතිකරගැනීමේ හැකියාව. 2) භාවනාව අවසානයේදී නික්මීමට ඇති කුශලතාවය- පිටතට ඒම (සමාපත්ති වුට්ඨානකුසලතා- skillfulness in emerging form a meditative attainment)- කලින් නියමකළ වේලාවකදී භාවනාවෙන් නැගීසිටීම. **මූලාශ්‍ර:**අංගු.නි: (1 ):2 නිපාත: සමාපත්ති වග්ග සූත්‍ර, පි. 221, EAN: 2:163,1 suttas, p. 73.

▲ **භාවනාමය බලය**: පාලි: **භාවනා බලං**- the power of development: ධර්මයේ භාවනාමය බලය ලෙසින් පෙන්වා ඇත්තේ උසස් පුහුණුවේ යේදී සිටින සේඛ භික්ෂූන් සතු බලය ය. **සේඛ බලය** ලෙසින්ද හඳුන්වයි, එය සමාධිය වර්ධනය කරගැනීමෙන් ලබන බලයවේ. **බලන්න**: සේඛ හා අසේඛ.

**1. භාවනාමය බලය** බුදුන් වහන්සේ ආකාර 3 කින් පෙන්වා ඇත:

1) “මහණෙනි, භාවනාමය බලය කවරේද: එය ‘සේඛ බලය’ යය. සේඛ බලයේ පිහිටා, භික්ෂුව රාග දෝස හා මෝහ ආදී කෙළෙස් පහ කරගනි, කිසිම අකුසලයක් නොකරයි, අයහපත්- නරක දේ පසුපස නො යයි. එය භාවනාමය බලය වේ”.

2) මේ සසුනේ මහණ, ශීලයේ පිහිටා, විවේකය සහිතව (කාය හා චිත්ත), විරාගය ඇතිව (නීවරණපහකර), නිරෝධය ඇතිව, පරිණතවූ අත්හැරීම සහිතව (වොසග්ගය- නිවනට යොමුවූ සිත ඇතිව), සති සම්බොජ්ඣංග...ආදීවශයෙන් සප්තබොජ්ඣංග ධර්මතා වඩාගනී. එය භාවනාමය බලය වේ”. **බලන්න**: බොජ්ඣංග ධර්මතා.

( a bhikkhu develops the 7 enlightenment factors ( mindfulness..) that is based upon seclusion, dispassion, and cessation, maturing in release. This is called the power of development)

3) මේ සසුනේ මහණ නීවරණ පහකර පලමු ජානය - සිව්වෙනි ආදී වශයෙන්, ජාන සමාපත්ති 4 ලබාගනී. මෙය භාවනා බලයකි. **බලන්න**: ජාන. **මූලාශ්‍ර**: අං.ගු.නි: (1):2 නිපාත: 2.1.2.1, 2.1.2.2. හා 2.1.2.3 සූත්‍ර, පි.142. EAN: 2: Sutta 11.1, 12.2., 13.3, p. 57.

▼ **බුදුන් වහන්සේ** භාවනා බලය පිළිබඳව යහපත් ලෙසින් වදාරා ඇත. ඒ ධර්මතා සංඝයා එක්ව, ධර්මයේ චිරස්ථිතිය පිණිස සජ්ජායනා කිරීම සුදුසු ය යි සැරියුත් මහා තෙරුන් සංඝයාට උපදෙස් දී ඇත. **මූලාශ්‍ර**: දිඝ.නි: (3 ):10 සංගිති සූත්‍රය, පි. 372, EDN: 33 Saṅgīti Sutta: The Chanting Together, p. 362

▲**භාවනාමය ප්‍රඥාව-** Bhavanamaya Panna

භාවනාමය ප්‍රඥාව: භාවනා අරමුණක් මගින් සිත සමාධියට පත්කර ගැනීමෙන් ඇතිවන දහම් නුවණය.මෙය සමාධි භාවනාමය ඥානය ලෙසින්ද දක්වා ඇත. සමාධිය තුලින් ලබන නුවණ, විමුක්තිය ලබාගැනීමට හේතුභූතවේ.

“ ශිලයෙන් යුතුව සිත එකඟ කර ගැනීමෙන් ඇතිවන ප්‍රඥාව” සමාධි භාවනාමය ඥානය වේ**”.** මෙය ත්‍රිවිධ ප්‍රඥාවලින් එකකි. **බලන්න**: ත්‍රිවිධ ප්‍රඥා. **මූලාශ්‍රය**: ඛු,නි:පටිසම්භිදා 1: ඥානකථා:3 සමාධි භාවනාමය ඥානය, පි.112.

▼**ධර්ම මාර්ගයේදී** ලැබෙන පස් ආකාර නුවණ අතුරින්, භාවනා ප්‍රඥාව එක් නුවණකි. **බලන්න**:ඤාණපඤ්චකය.

▲ **භාවනාවාදය**: (පාලි): **භාවනාවාදං** declaration of development: මෙය, අරහත්වයට පත්වූ භික්ෂුවක් ඒ බව ප්‍රකාශ කරණ එක් ආකාරයක්ය. **බලන්න**: රහතන්වහන්සේ. **මූලාශ්‍ර**: අං.ගු.නි: (6 ):10 නිපාත: මහා වග්ග: 10.1.3.4. මහාචුන්ද සූත්‍රය,පි. 106. EAN: 10: The Great Chapter: 24.4. Cunda, p. 501.

▲**භාවනාරාම-**Bhavanarama: භාවනාරාම යනු භාවනාවට ඇල්ම ඇතිබවය. මෙය ජීවිතය සුව සතුට ඇතිව ගෙනයාමට හේතුවේ.**බලන්න:** සුඛ සෝමනස්ස.

▲ **භාවනිය-** esteem: භාවනිය යනු, උතුම්බව, ගරු සැළකිලි ලැබීමට සුදුසුබවය. **බලන්න**: අභාවනිය හා භාවනිය.

▲**භාවෙතබ්බ ධමම හා නභාවෙ තබ්බ ධමම**: පාලි: **භාවෙතබ්බො - නභාවෙතබ්බො-** Dhamma to be developed and Dhamma not to be developed: අධ්‍යාත්මික ජීවිතය වර්ධනය කරගැනීම පිණිස දියුණු කර ගත යුතු ධර්මතා භාවේතබ්බ ධර්මයන්ය (භාවයිතව්‍ය) . අධ්‍යාත්මික ජීවිතයේදී වඩා නොගත යුතු ධර්ම, නභාවේ තබ්බ ධර්මවේ.

▼ **භාවේතබ්බ ධර්ම (භාවෙතබ්බො)** වර්ධනය කරගතයුතු ධර්මය, දසකුසලයය. **නභාවේ තබ්බ ධර්මය** -වර්ධනය නොකරගතයුතු ධර්මය, දසඅකුසලයය .**බලන්න**: දසකුසල හා දසඅකුසල. **මූලාශ්‍ර**: අංගු.නි: (6 ) :10 නිපාතය:10.4.4.7. භාවේතබ්බ ධර්ම සූත්‍රය, පි. 540, EAN: 10: 194**,** p. 556.

▼ **භාවේතබ්බ ධර්ම**: **1) සුඛ වේදනාව සහිතවූ කාය ගතා සතිය (** කාය ගතාසති සාතසහගතා) **සටහන:** සුඛ වේදනාව සහිතවූ කාය ගතා සති භාවනා ලෙසින් පෙන්වා ඇත්තේ: ආනාපාන සතිය, සතර ඉරියව් පිලිබඳ සතිය පිහිටුවා ගැනීම (චතු ඉරියාපථ ), සති සම්ප්‍රජන්‍යය , කයේ අසුභය, දස අසුභය. නවසීවථිකා භාවනාව, චතුධාතුවවත්ථාන භාවනාව (සතර ධාතු) ආදීයේ සිහිය උපදවා ගැනීම. **බලන්න:** භාවනා- කායගතා සති භාවනාව, **2) සමථ හා විපස්සනාව** (Calm and insight) **3) තුන් සමාධිය**: i විතක්ක හා විචාර ඇති 1 නි ජානය (**සවිතක්කසවිචාරො සමාධි)** ii විතක්ක නොමැති විචාර ඇති 2 නි ජානය (**අවිතක්කසවිචාරො සමාධි)** iii විතක්ක හා විචාර නොමැති 3 නි ජානය (**අවිතක්ක විචාරො සමාධි) බලන්න:** ජාන, තුන් සමාධිය **4) සතර සති පට්ඨානය .බලන්න:** සතර සති පට්ඨානය**) 5) පංච අංගීක සම්මා සමාධිය -** පඤ්චඞගිකො සම්මාසමාධි.**බලන්න:** පංච අංගීක සම්මා සමාධිය) **6) අනුසති භාවනා** 6: බුද්ධානුස්සතිය, ධම්මානුස්සතිය, සංඝානුස්සතිය, ශීලානුස්සතිය, ත්‍යාගා නුස්සතිය, දේවතානුස්සතිය.**බලන්න**: භාවනා. **මූලාශ්‍ර:** දීඝ.නි : (3): 11 දසුත්තර සූත්‍රය, පි. 483, EDN: 34: Dasuttara Sutta: Expanding Decades, p. 384.

▼ **භාවෙතබ්බ ධම්ම** ලෙසින් මෙහි පෙන්වා ඇත්තේ සම්මා දිට්ඨිය ඇතුලත් නිවැරදි මගය. න භාවෙතබ්බ ධම්ම (න භාවයිතව්‍ය ධම්ම- භාවිතා නොකලයුතු) නම් මිථ්‍යා දිට්ඨිය මුල් කරගත් වැරදි මගය. **මූලාශ්‍ර**: අංගු.නි: (6 ):10 නිපාත: අරියවග්ග: 10.3.5.7.භාවෙතබ්බ සූත්‍රය,පි. 476.

**භස**

▲**භිසක්ක** -Master of knowledge: භිසක්ක-ශාස්ත්‍රයේ අධිපති. මෙය තථාගතයන් වහන්සේ හඳුන්වන ගරු පදයකි. **බලන්න**: තථාගතයන් වහන්සේ, බුද්ධ නාම.

**භභ**

▲**භිභියෝස තෙර-** Bhiyosa Thera: මේ තෙරුන්, කොනාගමන බුදුන් වහන්සේගේ අගසව් දෙනමගෙන් එක් නමකි. **මූලාශ්‍රය:**සංයු.නි: (2) :

නිදානවග්ග:අනමතග්ගසංයුත්ත: දුග්ගතවග්ග: 3.2.10 වෙපුල්ල පබ්බත සූත්‍රය, පි.314.

## ම කොටස: මක,මබ,මග,මඝ,මච,මඤ,මට,මත,මථ,මද, මධ,මන,මණ,මම,මය,මර,මල,මළ,මව,මස,මහ

**මක**

▲ **මක්ඛලිගෝසාල-**Makkali Ghosala: බුදුන් වහන්සේ වැඩසිටි සමයේ විසූ අන්‍යආගමික නායකයෙකි. අන්‍ය ආගමික වාද අතුරින් ඔහුගේ වාදය ඉතාම නරක එකක් බව දක්වා ඇත: ඔහු මෙසේ පවසයි: "කර්මයක් නැත, ක්‍රියාවක් නැත, වීරියක් නැත". **ඒ පිලිබඳ උපමාව-** කේසකම්බිලි පොරෝනය : කේසකම්බිලි නම් පොරෝනය, සියලු වස්ත්‍ර අතුරින් නරකම වස්ත්‍රයවේ. එය ශිතකාලයේ ශිතය ගෙනදේ, උෂ්ණ කාලයේ උෂ්ණය ගෙනදේ , දුගඳය, දුරුවර්ණය. එලෙසින් මක්ඛලිගෝසාල ගේ ඉගැන්වීම් සැම කාලයකම අයහපත්ය.**බලන්න**: උපග්‍රන්ථය:5 **මූලාශ්‍රය**:අංගු.නි: (1) 3 නිපාත: 3.3.4.5 සූත්‍රය, පි.554.

▼ **සියලු සම්මා සම්බුදුවරු** කර්මය ඇතිබව, ක්‍රියාව ඇතිබව, විරිය ඇතිබව දේශනා කරති. එහෙත්,මක්ඛලි, අනුවණ පුරුෂයා ඒ සත්‍ය පිළිනොගනී. ඔහුගේ වාදය බොහෝ මිනිසුන්ට අහිත පිණිස, දුක පිණිස, විනාශය පිණිස වේ. ඒ පිලිබඳ **උපමාව**: මසුන් අල්වන කෙමිණ නිසා බොහෝ මසුන්ගේ විනාශය සිදුවේ, එලෙස, ඔහුගේ වාදය නිසා බොහෝ පිරිස විපතට පත්වේ. **බලන්න:** උපග්‍රන්ථය:5 **මූලාශ්‍රය**:අංගු.නි (1) :3 නිපාත: 3.3.4.5 සූත්‍රය, පි.554.

▲ **මකුබව:** පාලි: **මක්ඛො** -contempt: මකුබව (මක්ඛය) යනු අනුන්ගේ ගුණ මකන ස්වභාවය (ගුණමකුබව ), අනුන්ට අවමන් කිරීම, හෙලාදැකීම, නිග්‍රහ කිරීමය, මෙය අකුසලයකි, සිත කෙලෙසන ධර්මයකි, දුගතිය ඇතිකරයි. **බලන්න**: උප කෙළෙස, දසඅකුසල.

▼ **බුදුන් වහන්සේ මෙසේ වදාළහ: "මහණෙනි, එක් කෙළස් ධර්මයක්...මකුබව පහකරගන්නේ නම්, මම ඔබට අනාගාමී භාවය පිණිස කැපවෙමි"**. **මූලාශ්‍රය**: ඛු.නි:ඉතිවුත්තක:1.1.5 මක්ඛ සූත්‍රය, පි.348.

▼**ආධ්‍යාත්මික මාර්ගය** වඩා ගැනීම පිණිස මකුබව විශිෂ්ඨ ඥාණයෙන් අවබෝධ කර, එය දුරුකර ගතයුතුය. එය දුක නැතිකර ගැනීමය.විදර්ශනා නුවණින්, සම්‍යක්ප්‍රඥාව ඇතිකර මකුබව පහ කරගත් අය නැවත මේ ලෝකයට පෙරළා නො එති. **මූලාශ්‍රය**: ඛු.නි:ඉතිවුත්තක: 1.2.3 මක්ඛපරිඤ්ඤා සූත්‍රය, පි.358.

▼**වෙනත් මූලාශ්‍ර: 1**. **Per Bhikkhu Bodhi**: Contempt is the devaluation of benefits conferred on one by others. See: EMN note 87,p. 1179.**2.** "මාපියන්, නෑදෑයන්, මිතුරන් ආදීන් කළ උපකාර නිසා දියුණුව, මගේ විරියෙන්ම දියුණුවුවා මිස මට කවුරුත් කළ දෙයක් නැතයයි ගුණ අවලංගු කරණ ස්වභාවය මක්ඛ නම්වේ. මෙය ද්වේෂයේම ආකාර විශේෂයකි. අසත්පුරුෂ ලක්ෂණයකි. එහි විපාක ලෙසින් ඇතැම් අය මෙලොවදීම නපුරු රෝග වැළඳී බොහෝ දුක්විඳිති". **කෙලෙස් එක්දහස් පන්සියය**, පි. 82, රේරුකානේ චන්දවිමල මහානාහිමි, 2008.

**3.** **"**අන් සතු ගුණ මකා දැමීම...අන් අයගෙන් තමන් ලද උදව් උපකාර සිහිපත් කිරීමට හෝ ප්‍රකාශ කිරීමට ඇති අකමැත්ත මින් ප්‍රකාශ වේ. එපමණක් නොවෙයි. සිතා මතාම අන්‍යයන්ගේ ගුණ හා දක්ෂතා කීමෙන් වැළකීමට ගුණමකු සිත වෙර දරනවා. එවන් අය තමයි ගුණමකුවෝ කියන්නෙ. මෙය අද සමාජයේ බහුලව දැකිය හැකි දෙයක්. විටෙක නොකියා බැරි කමට සුළු ගුණයක් පමණක් කියති. මෙම ගුණ මකා දැමීමේ විපාකය සුළුපටු නොවේ. පෙර භවයන්හි ගුණමකු වීමේ විපාක ලෙස මේ ජීවිතයේදී: තමන් කෙතරම් හොඳක් කළත් හොඳක් අහන්න නොලැබේ, නිතර අසහන කාරී ලෙස හා පීඩාකාරී ලෙස ජීවිතය ගෙවයි". **දිනමිණ**: අන්තර්ජාල ලිපිය: http://archives.dinamina.lk/2012/08/08/_art.asp?fn=a1208082

**මඛ**

▲**මඛාදේවරජ**-King Makhadeva

බුදුන් වහන්සේගේ පෙර ජීවිතයක මඛාදේව රජ ලෙසින් ධර්මානුකූල ජීවිතයක් ගතකර ඇත. **බලන්න:**ම.නි. මඛාදේව රාජ සූත්‍රය, බුදුන් වහන්සේ: පෙරජීවිත.

**මග**

▲ **මංගල කරුණු -** Factors that bring blessings: මංගල කරුණු, ශුභ කරුණු: දිනපතා යහපත් දිවි පැවැත්මකට මෙන්ම, ආධ්‍යාත්මික ජීවිතය දියුණු කරගැනීමට උපකාරීවන දහම් කරුණුය. 1) අනුවණ පුද්ගලයන් හැරදමා නුවණැති අය හා ආශ්‍රය පවත්වා ගැනීම 2) ගරු කලයුතු අයට ගරු පූජා කිරීම 3) ජීවිතය යහපත්ව ගෙනයා හැකි ස්ථානයක වාසය කිරීම 4) පෙර කරන ලද යහපත් පුණ්‍ය ක්‍රියා ඇතිබව 5) ආධ්‍යාත්මික දියුණුවට උපකාරීවන ශිල ආදී යහපත් ධර්මික ගුණ සේවනය කිරීම 6)බොහෝ ඇසූ පිරූ තැන් ඇතිබව -බහුශ්‍රැත 7) යහපත් ජීවිතයක් ගෙනයාම පිණිස උපකාරීවන ශිල්ප ශාස්ත්‍රයෙහි නිපුණබව 8) විනයට අනුකූලව තුන්දොර හික්මවා කටයුතුකිරීම 9) ප්‍රිය වචන කතා කිරීම 10)දෙමාපියන් යහපත් ලෙසින් රැක බලා ගැනීම 11 ) සැමියාට/බිරිඳට හා දරුවන්හට මැනවින් සැලකීම 12 ) යහපත් කර්මාන්ත ආදීය කරමින් නිරවුල් ජීවිකාව ගෙනයාම 13 ) දානය දීම හා ත්‍යාගශීලිබව 14) ධර්මයේ හැසිරීම 15) ඥාතිහිත මිතුරන්හට සැලකීම හා උපකාරීවීම 16) අකුසල ක්‍රියාවන්හි නොයෙදීම 17) පාපී අයහපත් ක්‍රියා හැර දැමීම 18) ප්‍රමාදය ඇතිකරන රහමෙර ආදිය ගැනීමෙන් වැළකීම 19) සසරින් එතරවීම පිණිස අප්‍රමාදව ආධ්‍යාත්මික ජීවිතය වඩා ගැනීම 20) අන්අයට ගරුකිරීම 21) මානය හැර දමා නිහතමානිව සිටීම 22) ලද දෙයින් සතුටුව වාසය කිරීම 23) සුදුසු අවස්ථාවන්හි දහම් ඇසීම 24) ක්ෂාන්තිය- ඉවසීම පුරුදු පුහුණු කර ගැනීම 25) යහපත් අවාවාද පිළිගන්නාබව-කීකරුබව 26) යහපත් සංඝයා දැකීමට යාම-සේවනය කිරීම 27) සුදුසු අවස්ථාවන්හි ධර්මය සාකච්චා කිරීම- කරුණු නිරවුල් කර ගැනීම 28) ආත්ම සංයමය ඇතිව හැසිරීම - ඉන්ද්‍රිය සංවරය හා ඒ සඳහා විරිය ඇතිබව 29) චතුරාර්ය සත්‍ය අවබෝධ කරගැනීමට උත්සාහ වීම 30) නිවන ලඟා කරගැනීමට උනන්දුවීම 31) අට ලෝදහම අවබෝධ කර, සිත කම්පා නොකර ගැනීම, ශෝක නොකර, පිරිසුදු සිත් ඇතිව, කෙළෙස්වලින් රැකවරණය ලබා සිටීම. මෙබඳු උතුම් කරුණු සහිතව වාසය කරන දෙවියෝද, මිනිසුන්ද සැමවිටම අපරාජිතව (කෙළෙස් වලට යටනොවී) වාසය කරති. **මූලාශ්‍රය:**

බු.නි: බුද්ධකපාඨ: 5 මංගලසූත්‍රය, පි. 34, සුත්තනිපාත:2 චූලවග්ග:2.4 මංගලසූත්‍රය, පි. 99.

▲**මංගල දාන-** Mangala dana: ඔටුනු පැළඳවීම්, විවාහ ආදී මංගල කරුණු නිමිති කරගෙන, බුදුන් ප්‍රමුඛ සංඝයාට පිරිනමන විශේෂ දාන මංගල දානවේ. **බලන්න**: ත්‍රිවිධ අනුමෝදනා.

▲**මංගල බුදුන් වහන්සේ-**The Buddha Mangala: ගෝතම බුදුන් වහන්සේට පෙර වැඩ සිටි, මංගල බුදුන් වහන්සේ පිලිබඳ විස්තර මෙහි දක්වා ඇත.**බලන්න**:බු.නි: බුද්ධවංශ පාලි:4 මංගල බුදුන්වහන්සේ.

▲**මගඵල සතර** -The four paths & fruits: ධර්ම මාර්ගයේ සිව් පියවර, මග ඵල සතරය: සොතාපත්ති, සකදාගාමී, අනාගාමී, අරහත්. ඒවා ලැබූ උතුමන් ආරිය පුද්ගලයෝය.

▲**මග්ග චරියාව-**Magga Chariya: මග්ග චරියාව ලෙසින් පෙන්වා ඇත්තේ සතර ආරිය මාර්ගයේ හැසිරීමය. මෙය චරියා 8න් එකකි. **බලන්න**: චරියා කථා.

▲ **මග්ග ඤාණය-**Magga Nana: සෝතාපන්න මාර්ගයෙහි, සත්‍ය දර්ශනය-සම්මා දිට්ඨිය ඇතිවීමේ නුවණ, මග්ග-මාර්ග ඥානය ය.**බලන්න:** බු.නි: පටිසම්භිදා 1: 11 මග්ග ඤාණය, පි.150.

▲**මාගධ දේවපුත්‍ර-**Magadha Devaputhra: මේ දේවපුත්‍ර, බුදුන් වහන්සේ බැහැදැක ලෝකයේ බබලන එලි පිලිබඳ විමසා ඇත. බබලන්නවුන් අතුරින් සර්වඥයන් වහන්සේ අග්‍රයයි බුදුන් වහන්සේ වදාළහ. **මූලාශ්‍රය:** සංයු.නි: (1) සගාථවග්ග: දේවපුත්‍රසංයුත්ත: 2.1.4 මාගධ සූත්‍රය, පි.114.

▲ **මගධ දේශය-** Mgada Province: ගංගානම් නදියට ගිණිකොන දෙසින් පිහිටි විසාල රාජධනියකි. බුදුන් වහන්සේ වැඩසිටි සමයේ සේනිය බිම්බිසාර රජ (මගධාදිපති) හා ඔහුගේ අවැමෙන් අජාසත් රජ මෙ දේශය පාලනය කළහ, අගනුවර රජගහ නුවරය. බුදුන් වහන්සේ ගෙ මුල්සමයේ, වැඩි කාලයක්, මෙහි පිහිටි වේළුවනාරාමයේ වැඩසිටි බව සූත්‍ර දේශනාවල දක්වා ඇත.

▲ **මාගම-**Woman: මාගම යනු කාන්තාව හඳුන්වන එක් විදියකි. ත්‍රිපිටකයේ බොහෝ තැන කාන්තාව ‘මාගම’ ලෙසින් දක්වා ඇත. මෙය එවක පැවති සමාජ ව්‍යවහාරයකි.ප්‍රජාපති ගෝතමීය, බුදුන් වහන්සේගෙන් මාගමට පැවිදිවීමට වර ඉල්ලා ඇත. **බලන්න:** මහා ප්‍රජාපති ගෝතමී තෙරණිය, සංයු.නි: (4): සළායතනවග්ග: මාතුගාමසංයුත්ත, කාන්තාව.

▼ **එක්සමයක මල්ලිකා දේවිය**, බුදුන් වහන්සේ බැහැදැක, මාගමට ඇති ලාභ හා අලාභ වලට හේතුවූ කරුණු විමසා ඇත: 1) සමහරු විරූපිව, දුගිව, ලාමකව, අල්පශාක්‍යව සිටීම 2) සමහරු විරූපි එහෙත් ධනවත් හා මහේශාක්‍යව සිටීම 3) සමහරු රූපත් එහෙත් දුගිව, ලාමකව, අල්ප ශාක්‍යව සිටීම 5) සමහරු රූපත්, ධනවත්, මහේශාක්‍යව සිටීම. එයට හේතු බුදුන් වහන්සේ මෙසේ දක්වා ඇත:1) **කරුණ පිළිබඳව**: නිතර තරහ ක්‍රෝධ සිතින් සිටීම, උතුමන්ට දන් නොදීම,ඉරිසියාවෙන් සිටීම. ඔවුන් යළි උපත ලබනවිට 1 වර්ගයට අයත්වේ.2) **කරුණ පිළිබදව**: නිතර තරහ ක්‍රෝධ සිතින් සිටීම, එහෙත් උතුමන්ට දන්දීම, ඉරිසියාව නොමැතිවීම.

ඔවුන් යළි උපත ලබනවිට 2 වර්ගයට අයත්වේ.3) **කරුණ පිළිබඳව**: තරහ ක්‍රෝධ නොමැතිබව, එහෙත්, උතුමන්ට දන් නොදීම, ඉරිසියාව තිබීම. ඔවුන් යළි උපත ලබනවිට 3 වර්ගයට අයත්වේ.4 ) **කරුණ පිළිබඳව:** තරහ ක්‍රෝධ නැත, උතුමන්ට දන් දෙති, ඉරිසියාව නොමැත. ඔවුන් යළි උපත ලබනවිට 4 වර්ගයට අයත්වේ. **සටහන**: තරහ ගැනීම අරූපී වීමට හේතුවේ, සාමයෙන් සිටීම රූපී වීමට හේතුවේ, දන්නොදීම දුගීබවට හේතුවේ, දන්දීම ධනවත් වීමට හේතුවේ, ඉරිසියාව තිබීම අල්පෙ ශාක්‍යවීමට (lacking in influence ) හේතුවේ, ඉරිසියාව නොමැතිබව මහේශාක්‍යවීමට (influential) හේතුවේ. **මූලාශ්‍රය:**අංගු.නි: (2) 4 නිපාත:4.4.5.7 මල්ලිකා සූත්‍රය, පි.410.

▼ **එක් සමයක** ජානුස්සෝනි බ්‍රාහමණයා විසින් විමසනු ලැබූව බුදුන් වහන්සේ මාගම- ගැන මෙසේ වදාළහ. “ඔවුන්ගේ අභිප්‍රාය (අරමුණ-aim) නම් පුරුෂයාය. ඔවුන්ගේ සෙවීම (ගවේශනය-quest) රූපාලංකාරයය, ඔවුන්ට ඇති ආධාරය (support) බලයය පුත්‍රයන්ය, ඔවුන්ගේ කැමැත්ත ගෙදර දෙවැනියෙක් (වෙනත් භාර්යාවක්) නොමැතිවීමය, ඔවුන්ගේ අවසාන ඉලක්කය ආධිපත්‍යය ය”. **මූලාශ්‍රය:** අංගු.නි: (4): 6 නිපාත: ධම්මිකවග්ග: 6.1.5.10 ඛත්තිය සූත්‍රය, පි.154.

▲**මාගන්දික**-māgandika: මොහු, බුදුන් වහන්සේ වැඩසිටි සමයේ සිටි අන්‍යඅගමික -තිර්ථක නිකායේ නායකයකි.

▲ **මාගන්දිය තෙර**- Magandiya Thera: **බලන්න**: උප ග්‍රන්ථය:1

▲ **මාගන්දිය බමුණා හා බැමිණිය** Magandiya **-**Brahmin & Brahmini.බලන්න: උප ග්‍රන්ථය:3

▲ **මාගන්දියා බිසව-** Queen Magandiya: බලන්න: සාමාවතී බිසව.

▲**මිගාර මාතා**-Migara Matha: විශාඛා මහා උපාසිකාව මිගාර මාතා ලෙසින්ද, ඇය පුජාකල පූර්වාරාමය, මිගාරමාතා ප්‍රසාදය ලෙසින්ද හඳුන්වයි. **බලන්න**: උප ග්‍රන්ථය:3

▲ **මිගාර සිටුවරයා-** Migara Situvaraya: **බලන්න**: උප ග්‍රන්ථය: 3

▲**මිගජාල තෙර -**Migajala Thera:**බලන්න**: උපග්‍රන්ථය: 1

▲ **මිගදාය අඳුන් වනය-** Sandalwood forest sanctuary : සාකෙත නුවර අසල මිගදාය අඳුන්වනය පිලිබඳ මෙහි දක්වා ඇත. බුදුන් වහන්සේ මේ සූත්‍රය දේශනා කළේ ඒ ස්ථානයේදීය. **මූලාශ්‍රය**: සංයු.නි: (5-1): මහාවග්ග: ඉන්ද්‍රියසංයුත්ත:ජරාවග්ග: 4.5.3 සාකෙතසූත්‍රය, පි.414.

▲ **මිගසාලා උපාසිකාව**-Upasika Migasala: **බලන්න**: උපග්‍රන්ථය: 3

▲ **මුගපක්ඛ ශාස්තෘ -**Teacher Mūgapakkha: මෙතුමා පුරාණ දඹදිව වාසය කළ ශාස්තෘවරයෙක් ය.**බලන්න**: පුරාණශාස්තෘන්

**මස**

▲ **මඝ මානවක-** Magha manawaka: සක්‍රදෙවිඳු, මිනිස් ලෝකයේ උපත ලැබූ ජීවිතයක, මඝ මානවක ලෙසින් ඉතා යහපත් ජීවිතයක් ගතකර ඇත. **බලන්න**: සක්දෙවිඳු.

▲**මාඝ දේවපුත්‍ර-** Magha Devaputhra: මේ දේවපුත්‍ර බුදුන් වහන්සේ බැහැදැකීම, හා ජීවිතය සුවපත් කරගැනීම පිලිබඳව, උන්වහන්සේ විමසීම මෙහි දක්වා ඇත. ක්‍රෝධය නැසීම නිසා ජීවිතය සුවපත්වන බව බුදුන් වහන්සේ මෙහිදී පෙන්වා ඇත. **බලන්න**: ක්‍රෝධය. **මූලාශ්‍රය**: සංයු.නි: (1): සගාථවග්ග: දේවපුත්‍ර සංයුත්ත: 2.1.3 මාඝ සූත්‍රය, පි.114.

▲**මේඝය උපමාව-** Simile of the cloud: **බලන්න:** උපග්‍රන්ථය:5

▲**මේඝිය තෙර-**Megiya Thera: **බලන්න**: උපග්‍රන්ථය: 1

▲ **මොඝරාජ තෙර-**Mogharaja Thera: **බලන්න**: උපග්‍රන්ථය:1

**මච**

▲**මච්චරිය -** Machchari: මච්චරිය- මසුරුකම (මච්ඡරියං): දැඩි ලෝභය, දස අකුසලයකි: **බලන්න**: දස අකුසල.

▲ **මච්චුධෙය්‍ය**(පාලි): **මාර විෂය -**the realm of Death: මච්චුධෙය්‍ය- මාරධෙය්‍ය යනු මාරයාගේ විෂයට- බලයට යටවීමය. එනම්, සසරය. මාර විෂය ඉක්මවා ඇත්තේ නිවනය. **බලන්න**: මාරයා. **ශබ්දකෝෂ: පා.සිං.ශ:** පි. 413: "**මච්චුධෙය්‍ය**: මාරයා විසින් දැරිය යුතු (මාරයාගේ විෂය), ත්‍රිභූමික වෘතතය (තුන්ලෝකය)".

▼ **මානය දුරුකොට,** මැනවින් එකඟ සිත ඇතිව (සමාධිය ලබා), සියලු උපධින්ගෙන් මිදුන, අප්‍රමාදව, හුදකලාව වනයේ වෙසෙන (ධර්ම පුහුණුවේ යෙදුන) පුද්ගලයාට, මාරවිෂය ඉක්මවා ගිය හැකිය (සසර පරතෙරට -නිවනට යා හැකිය) යයි බුදුන් වහන්සේ පෙන්වා ඇත:

**"මානං පහාය සුසමාහිතත්තො සුචෙතසො සබ්බධි විප්පමුත්තො, එකො අරඤ්ඤෙ විහරං අප්පමත්තො ස මච්චුධෙය්‍යස්ස තරෙය්‍ය පාරන්ති"**
**සටහන:** අටුවාවට අනුව : The *realm of Death* (*maccudheyya*) is the round with its three planes, so called because it is the domain of Death; its *beyond* or *far shore* (*pāra*) is Nibbāna. **බලන්න**: ESN: Note: 16, p. 501. **මූලාශ්‍ර**: සංයු.නි: (1) සගාථවග්ග: දේවතාසංයුත්ත:1.1.9 නමානකාම සූත්‍රය, පි.34, ESN:1 Devata samyutta: 9.9 One Prone to Conceit, p.66.

▼ **යම් කෙනෙක් ශීල සමාධි හා ප්‍රඥා** යන ත්‍රිවිධ ධර්මතා යහපත් ලෙස වඩාගත්තේනම්, ඔහු මාර විෂය ඉක්මවා ගොස් (සසර දුක), හිරු (සූර්යා) මෙන් බැබලේ යයි බුදුන් වහන්සේ වදාළහ. එනම්, අරහත්වය ලැබීමය. **මූලාශ්‍රය:** ඛු.නි: ඉතිවුත්තක: 3.1.10 මාරධෙය්‍ය සූත්‍රය, පි. 416.

▲**මුචලින්ද නාග-**Muchalinda naga: බුදුන් වහන්සේ, බුද්ධත්වය ලබා සත් සතිය ගත කළ අවස්ථාවේදී ඇතිවූ මහා වැස්සකින්, උන්වහන්සේ ආරක්ෂා කිරීමට මුචලින්ද නාග රාජයා පැමිණීමේ විස්තරය මෙහි දක්වා

ඇත. **බලන්න**: නාග. **මූලාශ්‍රය:**වින.පි: මහාවග්ග පාලිය1: මහාබන්ධක:6 මුචලින්ද කථා.

▼**ඉහත කාරණය** මේ සූත්‍රයේද විස්තර කර ඇත.: **මූලාශ්‍රය:** ඛු.නි:උදානපාලිය:මුචලින්ද වග්ග:2.1 මුචලින්ද සූත්‍රය, පි.176.

▲ **මිච්චා අටමග**-Miccha atamaga: මිච්චාඅටමග යනු ආරියඅටමගට විරුද්ධ මගය. **බලන්න**: මිථ්‍යාත්වය හා සම්‍යක්තවය.

**මඤ්ඥ**

▲**මඤ්ජුස්සරානං -** Sweet voice: මින් අදහස් කරන්නේ ධර්මය දේශනා කිරීමට මිහිරි කටහඬ ඇතිබවය. මිහිරි කටහඬ, ඇති භික්ෂූන් අතරෙන් අග්‍ර, ලකුන්ටක භද්දිය තෙරුන්ය. **බලන්න**:උපග්‍රන්ථය:1.

▲**මඤ්ඤනා**-conceiving: මඤ්ඤනා ලෙසින් පෙන්වා ඇත්තේ සිතෙහි පහළ කරගන්නා දේ-හැඟීම්-සිතීම් ආදියය. බුදුන් වහන්සේ මෙසේ වදාළහ: "මහණෙනි, '**මම වෙමි**' යි යන මෙය මඤ්ඤනාවකි. '**මේ මම** වෙමි' යි ...'**මම වන්නෙමි**' යි... '**මම නොවන්නෙමි**' යි... '**රූප ඇත්තෙක් වන්නෙමි**' යි... '**රූප නැත්තෙක් වන්නෙමි**' යි... '**සංඥා ඇත්තෙක් වන්නෙමි**' යි... '**සංඥා නැත්තෙක් වන්නෙමි**' යි... '**නොම සංඥා ඇත්තෙකුත් සංඥා නැත්තෙකුත් වන්නෙමි**' යි ... යන මෙය මඤ්ඤනාවකි... මඤ්ඤනාව රෝගයකි...ගඩුවකි... හුලකි... ඒ නිසා මෙහි ලා මඤ්ඤනා රහිත සිතින් යුතුව වාසය කරන්නෙමු යයි ඔබ විසින් හික්මිය යුතුය.". (Bhikkhus, 'I am' is a conceiving; 'I am this' is a conceiving; 'I shall be' is a conceiving; 'I shall not be' is a conceiving; 'I shall consist of form' is a conceiving; 'I shall be formless' is a conceiving; 'I shall be percipient' is a conceiving; 'I shall be nonpercipient' is a conceiving; 'I shall be neither percipient nor nonpercipient' is a conceiving. Conceiving is a disease, conceiving is a tumour, conceiving is a dart. Therefore, bhikkhus, you should train yourselves thus: 'We will dwell with a mind devoid of conceiving). **සටහන:** සළායතන, බාහිර අරමුණු අල්වා ගෙන පහළ කරන හැඟීම්-සිතිවිලි නිසා බොහෝ දුක් වේදනා ඇතිවේ. ඒවා නැතිව වාසය කිරීම සුවයකි. **මූලාශ්‍ර:** සංයු.නි: (4) සළායතනවග්ග: වේදනාසංයුත්ත: ආසිවිසවග්ග:1.19.11 යවකලාපී සූත්‍රය, පි.410, ESN:36: Vedanasamyutta:248.11 The Sheaf of Barley, p.1327.

▲**මුඤ්චිතුකම්‍යතා ඥානය**-Munnachithukammyatha nana: උත්පත්තිය මුදනු කැමතිබව, ඒ පිලිබඳ ප්‍රත්‍යවෙක්ෂාව, අධිඋපේක්ෂාව යන ත්‍රිවිධ ප්‍රඥාව, මුඤ්චිතුකම්‍යතා ඥානය වේ. **මූලාශ්‍රය:**ඛු.නි: පටිසම්භිදා 1: 9. මුඤ්චිතුකම්‍යතා ඥානය, පි.136.

**මට**

▲**මුට්ඨස්ස-** Confused Mind: මුට්ඨස්ස **-** මුට්ඨසච්චං, සිහිවිකල්බව, සමාධියට අහිතකරය. **බලන්න**: මුළාවූ සිහිය.

▲ **මැටි බඳුන්** -the clay pots: සියලු මැටි බඳුන් බිඳීම ස්වභාවය කොට ඇත, එලෙස සියලු සත්වයෝ මරණය ස්වභාවය කොට ඇත. **බලන්න:**

උපග්‍රන්ථය: 5.මූලාශ්‍ර: සංයු.නි: (1) සගාථවග්ග:කෝසලසංයුත්ත: 3.3.2 අය්‍යකා සූත්‍රය, පි. 202, ESN:3 Kosala samyutta: 22.2 Grandmother, p. 254.

**මත**

▲**මතක දාන-** Mataka dana: මළවුන් සිහිපත්කර දෙන දානය මින් අදහස්කරයි. **බලන්න**: මළවුන් අනුස්මරණය.

▲**මත්වීම-**Intoxication: සාමාන්‍ය ව්‍යවහාරයේ මත්වීම යනු සිත උමතු කරන මත්ද්‍රව ගැනීමය.ධර්මයේ,මත්වීම ලෙසින් පෙන්වා ඇත්තේ යම් කරුණු අරහයා කෙනකු මානයෙන් සිහිමුළාවීමය**. බලන්න**: මදය, මානය.

▲**මාතලී දේවපුත්‍ර-** Mathali Devaputhra: මාතලී දේවපුත්‍ර, සක්දෙව්දුගේ රියදුරාය. **බලන්න**: සක්දෙව්දු.

▲**මාත්‍රය දැනීම-**Mathrayadanima: ගිහියන් පිරිනමන සිව්පසය යහපත් ලෙසින් පිළිගැනීමට සංඝයා තුල ඇති අවබෝධය මින් හඟවයි. මෙය සංඝගුණයකි. **බලන්න:** සංඝයා.

▲**මෙත්තගු මානවක තෙර -**Mettagu Thera: **බලන්න:** උපග්‍රන්ථය:1 ,2

▲ **මෙත්තා:** පාලි: **මෙත්‍තා-** Loving kindness: ධර්මයේ මෙත්තා-මෛත්‍රිය, ලෙසින් පෙන්වා ඇත්තේ සියලු ලෝක සත්ත්වයන් කෙරහි එක සමාන ලෙසින් මිතුරුබව ඇතිව වාසය කිරීමය. අන්‍යයන්ගේ සුභසාධනය හා සැපත පිළිබඳව කෙනෙක්තුළ ඇති කැමැත්ත-හිතකාමීබව මෙත්තාවය. මෙය සතර බ්‍රහ්ම විහරණයන් ගෙන් එක් විහරණයකි, භාවනා අරමුණකි. මින් ලැබෙන යහපත් විපාක මෙලොව හා පරලොව ජීවිත සුවපත් කරයි. **බලන්න**: බ්‍රහ්මවිහාර, භාවනා,ඛු.නි:ඛුද්දකපාඨ, සුත්තනිපාත, මෙත්තා සූත්‍ර 2කි. **සටහන්**: අංගු.නි: (4) 7 නිපාත: මාපුඤ්ඤභායි සූත්‍රයේදී: බුදුන් වහන්සේ**,** සත්වසක් මෙත්සිත වඩා තමන්වහන්සේට ලැබූ යහපත් කම්ම ප්‍රතිඵල විස්තරකර ඇත. එම පින් බලයෙන් කප්සතක් මෙලොව උත්පත්තිය නොලැබූ බවද, උසස් දිව්‍ය බ්‍රහ්ම ලෝකවල උපත් ලැබූබව ද පෙන්වා ඇත. ** අංගු.නි: (5) 9 නිපාත**:** වේලාමසූත්‍රයේදී: මහා දානයන්ට වඩා කෙටි වෙලාවක්-එළදෙනකගේ බුරුලෙන් කිරිඅදින්නට යන වේලාවවැනි, මෙත්තා සහගත සිත වඩන්නේනම් ලැබෙන යහපත් විපාක මහත්බව දක්වා ඇත.**අංගු.නි: (2) 4 නිපාත:අභිමෙත්ත සූත්‍රයේදී: යම් කෙනෙක් සියලු සත්වයන් කෙරහි මෙත්සිත පතුරවන්නේ නම් ඔහුට ආරක්ෂාව හා රැකවරණය ලැබෙන බව පෙන්වා ඇත. ** අංගු.නි: (2) 4 නිපාත: හිකබුසඩසරොමන සූත්‍රයේදී: මෙත්තා සහගත සිත සෑම දිසාවන්ටම අප්‍රමාණව අසීමිතව පතුරවමින් භාවනා කරන කෙනෙකුට, බ්‍රහ්මවාසය ලබාගත හැකිබව පෙන්වා ඇත. අංගු.නි: (4) 6 නිපාත: සාරණීයවග්ග සූත්‍ර: මෙහි පෙන්වා ඇත්තේ සාරණීය ධර්මතා 6න්, 3 ක්ම, මෙත්තාව ඇසුරු කළ ධර්මයන්බවය. **ශබ්දකෝෂ**: **පා.සිං.ශ**: පි.429: “ **මෙත්‍තා:** මෛත්‍රිය”. **B.D**: p. 100: “Mettā: Loving kindness is one of the 4 sublime abodes- brahma-vihāra” .

▼ **මෛත්‍රිය ලෝකයේ සියළු සත්ත්වයන් කෙරහිම එකසේ පැතිරවිය යුතුය**: කෙනෙක්, සමසිත ඇතිව, සෑම දිසාවකම සිටින සත්ත්වයන් කෙරෙහි, බියෙන් පෙලෙන හා නොපෙලෙන, ලොකු හා කුඩා, දුටු හා නුදුටු, දුර හා ළඟ, උපන් හා නුපන් සත්ත්වයන් වෙත මෛත්‍රිය අපරිමිතව, අසීමිතව පැතිරවීම, මෙත්තාව පැතිරවීමය. **සටහන**: මේ සූත්‍රය කරණීය මෙත්ත සූත්‍රය ලෙසින්ද හඳුන්වයි. **මූලාශ්‍ර:** ඛු.නි: ඛුද්දකපාඨ: 9**.** මෙත්තා සූත්‍රය**,** පි. 47.

▼ **මෙත්තා සහගත සිත** ඇතිව- මුළු ලොවටම මෛත්‍රිය පැතිරවීමෙන් සිත කෙළෙසුන්ගෙන් මුදාගැනීමට හැකිවේ. එසේ සිත සමනයවී කෙළෙස් සහමුලින්ම ප්‍රහීනවූවේ නම් අරහත්වය ලැබේ. යම් කෙලෙසක් ඉතිරිවූවේනම් අනාගාමීබව සාක්ෂාත් වනබව ආනන්ද තෙරුන්මේ සූත්‍රයේදී විස්තරකර ඇත. **මූලාශ්‍ර**:ම.නි: 2.1.2 අට්ඨකනාගර සූත්‍රය, පි. 35, EMN: 52: Aṭṭhakanāgara Sutta, p. 432.

▼ **තරහ ඇති නොකර** මෙත්තාව වඩා ගැනීම, බුද්ධ අනුසාසනය පිළිගැනීමය. **බලන්න**: ම.නි: කකචූපම සූත්‍රය, උපග්‍රන්ථ: 5 (කකචූපම උපමාව)

▼ අංගු.නි: (1) 1 නිපාත: ප්‍රභාස්වර වග්ගයේ සූත්‍ර: මෙත්සිත වැඩීම මෙසේ දක්වා ඇත: **"...ශාසතෘන්වහන්සේ ගේ අනුසාසනා පිළිපදින සසුනට ඇතුලත් කෙනෙක්වීම, පහසුවෙන් ඡාන-සමාධි ලබාගැනීමට ඇති හැකියාව, පිණ්ඩපාතය වැළඳීමට සුදුසුවීම ආදී අනුසස්, අසුර ගහන මොහොතක් පමණ ඉතා කෙටි වෙලාවක් තුළ මෙත්තා සිතවැඩීම මගින් ලැබේ නම් බහුලව මෙත්සිත වඩන කෙනෙක් හට ලැබෙන අනුසස් කොපමණ වේද?..."**

▼ **යම්කිසි කෙනෙක්** දිවා රෑ අහිංසාව ඇතිව, සියලු සත්ත්වයන් කෙරෙහි මෛත්‍රිය වඩන්නේනම්, ඔහු කිසිවෙකුට වෛර නොකරයි. **මූලාශ්‍ර**: සංයු.නි: (1) සගාථවග්ග: යක්ඛසංයුත්ත:10.1.4 මණිභද්ද සූත්‍රය,පි.396.

▼ **මෙත්තා ආනිසංස (මෙත්තානිසංස)**: මෙත්තා චේතෝ විමුක්තිය වඩා ගැනීමෙන් ලැබෙන ප්‍රතිලාභ, මෙත්තා ආනිසංස වේ. **බලන්න**: මෙත්තා චේතෝ විමුක්තිය, මෙත්තා සූත්‍රය. **සටහන්:** * බුදුන් වහන්සේ සත්වසක් මෙත් සිත් වැඩීමේ පුණ්‍ය විපාක ලෙසින් කල්ප ගණන් දෙව්සැප ලබා ඇත. **බලන්න:** අංගු.නි: (4) 7 නිපාත: 7.2.1.9 මාපුඤ්ඤාභායි සූත්‍රය, පි. 432, EAN: 7: 62.9. Don't be afraid of merit, p. 391. ** අහි මෙත්ත සූත්‍රය (අංගු.නි: {2}4නිපාත) -ඛන්ධ පිරිත සජ්ජායනා කරමින් විෂකුරු සර්පයන් ආදීන්ට මෙත්තා කිරීමෙන්, උන් දෂ්ඨ කිරීම වලකා ගැනීමට හැකිවේ. **බලන්න**: නාග, ඛන්ධ පිරිත.

▼**වෙනත් මූලාශ්‍ර**:**1.** " කිරි බින්දුවක් දොවන වේලාව වැනි සුළු වේලාවක් තුලදී වුවද සියලු සතුන් කෙරෙහි මෙත් සිත් පතුරුවා මෙත්තා භාවනාව කරන්නේ නම් අපමන යහපත් විපාක ලැබේ" **සද්ධර්මාලංකාරය,** පි.52. **2. "The Practice of Loving Kindness**"by Nānamoli Thera, Wheel-6, BPS. **3**. "**Brahama Vihāra**" by Narada Thera, 1962. **4.** "**The Four Sublime States"** by Venerable Nyanaponika Thera,Wheel-6, BPS, 1999.

▲ **මෙත්තා චේතෝ විමුක්තිය**: පාලි: **මෙත්තා චෙතොවිමුත්ති** -liberation of the mind by loving-kindness: මෙත්තා චේතෝ විමුක්තිය යනු මෛත්‍රී භාවනාව වර්ධනය කර ගැනීමෙන් සිත ව්‍යාපාද යෙන් මුදවා ගැනීමය.මේ විමුක්තිය, මෙත්තා නිස්සාරණිය ධාතුව ලෙසින්ද පෙන්වා ඇත. **බලන්න**: මෛත්‍රිය, බ්‍රහ්ම විහාර, නිස්සාරණිය ධාතු. **සටහන්**:* තෙවනි හා සිව්වෙනි ජාන සමාපත්ති වැඩීමෙන් මෙත්තා චේතෝ විමුක්තිය ලැබේ. ** ඛු.නි:පටිසම්භිදා 2: 2.4 මෛත්‍රීකථා: මෙත්තා චේතෝ විමුක්තිය ගැන විස්තරාත්මකව දක්වා ඇත.

▼ **ව්‍යාපාද** (තරහ) යෙන් මිදීමේ මග (නිස්සරණය) මෙත්තා චේතෝ විමුක්තිය ය. **මූලාශ්‍ර:** අංගු.නි: (4 ): 6 නිපාතය: 6.1.2.3 නිස්සාරණිය සූත්‍රය, පි. 40, EAN:6: 13.3 Escape, p. 321.

▼**මෙත්තා චේතෝ විමුක්තිය වඩන අන්දම**: 1) නිරතුරුවම එළඹී සිහියෙන් යුතුව, සියලු සත්ත්වයන් කෙරෙහි අප්‍රමානවූ මෙත්තා සහගත සිතකින් යුතුව වාසයකිරීම 2) උපාදාන බිඳී යාම නිසා සංයෝජන තුනීකරගැනීම 3) ක්‍රෝධ නොමැති සිතකින් එක් පුද්ගලයෙක් කෙරෙහි වුවද මෛත්‍රිය ඇතිව සිටි නම් කුසල් ඇතිවේ. සියලු සත්ත්වයන් කෙරෙහිම මෙත්තා සහගත සිතින් වාසය කරන ආරිය පුද්ගලයා බොහෝ කුසල් රැස්කරගනී 4) බොහෝ ධන සම්පත් වැය කර දෙන දානයට වඩා, මෙත්තා සහගත සිතින් වාසය කිරීම අග්‍රවේ 5) සියලු සත්ත්වයන් කෙරෙහි අපමණ දයාවක් ඇතිව වාසය කරන නිසා, ඔවුන් ප්‍රාණඝාතය නොකරයි 6) කිසිවෙක් මැඩලීමට නො යයි 7) කිසිවෙක් කෙරෙහි සතුරුබවක් නැතිව - ව්‍යාපාදය නොමැතිව වාසය කරයි. **මූලාශ්‍ර:** අංගු.නි: (5) 8 නිපාත: 8.1.1.1 මෙත්තා ආනිසංස සූත්‍රය, පි. 24, EAN: 8: 1.1 loving kindness, p. 411.

▼ **බහුල ලෙස වඩනලද** මෙත්තා සහගත සිත මහා පහසු විහරණය පිනිස පවතී. **මූලාශ්‍රය:** සංයු.නි: (5-1): මහාවග්ග:බොජ්ඣංගසංයුත්ත: අනාපානවග්ග:2.7 මෙත්තාසූත්‍ර.

▼ **මෙත්තා චේතෝ විමුක්තියේ ආනිසංස**: මෙත්තා චේතෝ විමුක්තිය නොකඩවා සේවනය කිරීමෙන්, දියුණු කරගැනීමෙන්, විපුල කර ගැනීමෙන්, යානාවක් කරගැනීමෙන්, පදනමක් කරගැනීමෙන්, දිගටම කරගෙන යාමෙන්, තහවුරු කර ගැනීමනේ, මනාව කිරීමට බාරගැනීමෙන් ආනිසංස 8 ක් ලැබෙන බව බුදුන් වහන්සේ පෙන්වා ඇත:

**"මෙත්තාය භික්ඛවෙ චෙතොවිමුත්තියා ආසෙවිතාය භාවිතාය බහුලීකතාය යානිකතාය වත්‍ථුකතාය අනුට්ඨිතාය පරිචිතාය සුසමාරද්ධාය අට්ඨානිසංසා පාටිකඞ්ඛා..."**. (Bhikkhus, when the liberation of the mind by loving-kindness has been pursued, developed, and cultivated, made a vehicle and basis, carried out, consolidated, and properly undertaken, eight benefits are to be expected). 1) සුවසේ නිදා ගනී 2) සුවසේ අවදිවේ 3) නරක සිහින දකින්නේ නැත 4) මිනිසුන්හට ප්‍රියවේ 5) අමනුස්ස යන්හට ප්‍රියවේ 6) දෙවියෝ ආරක්ෂා කරති 7) ගිනි, විස, අවි ආදියෙන් අනතුරක් සිදුනොවේ 8) බඹ ලොවෙහි මතු උපත ලබයි:

“**සුඛං සුපති, සුඛං පටිබුජ්ඣති, න පාපකං සුපිනං පස්සති, මනුස්සානං පියො හොති, අමනුස්සානං පියො හොති, දෙවතා රක්ඛන්ති, නාස්ස අග්ගි වා විසං වා සත්ථං වා කමති, උත්තරිං අප්පටිවිජ්ඣන්තො බ්‍රහ්මලොකූපගො හොති”. මූලාශ්‍ර:** අංගු.නි: (5) 8 නිපාත: 8.1.1.1 මෙත්තා ආනිසංස සූත්‍රය, පි.24, EAN: 8: 1.1 loving kindness, p. 411.

▼ **මෙත්තා චේතෝ විමුක්තිය** මගින් සිත කෙලෙසුන්ගෙන් (වෛරය, ඊර්ෂ්‍යාව ආදී) මිදේ. මෙත්තා චේතෝ විමුක්තිය නුවණින් මෙනෙහිකරන්නාට නූපන් ව්‍යාපාද උපදින්නේ නැත, උපන් ව්‍යාපාද පහවීයයි. ව්‍යාපාදය පහවීමට, මෙත්තා චේතෝ විමුක්තිය වැඩීම වැනි වෙන එකම ධර්මයක් බුදුනුවණින් නො දකින බව බුදුන් වහන්සේ පෙන්වා ඇත. **සටහන්**: * අටුවාවට අනුව මෛත්‍රිසහගත සිත පිහිටුවා ගැනීමට ජානසමාපත්ති ඇතිකරගතයුතුවේ. **බලන්න**: EAN: no 31, p. 581. ** සංයු.නි: (5-1) බොජ්ඣංගසංයුත්ත: ආහාර සූත්‍රයේදී, මෙත්තා චේතෝවිමුත්තිය මෙනෙහිකිරීම ව්‍යාපාදයට අනාහාර බව පෙන්වා දී තිබේ. **මූලාශ්‍ර**: අංගු.නි: (1) 1 නිපාත: නීවරණ ප්‍රහාන වග්ග:1.2.7 සූත්‍රය, පි. 46, EAN:1:Abandoning the Hindrances: 17.7, p. 37.

▼**මෙත්තාචේතෝවිමුක්තිය අග්‍රබව**: 1)මෙත්තාචේතෝවිමුක්තිය සියලු පුණ්‍ය ක්‍රියාවනට වඩා අග්‍රය. 2) යම් ගිහියෙක් හෝ පැවිද්දෙක් එළඹී සිහිය ඇතිව අප්‍රමාණවශයෙන් මෛත්‍රිය වඩන්නේද-භාවනා අරමුණ ලෙසින්, නිවන දක්වා ඇති සංයෝජන තුනීකරගැනීමට ඔහු සමත්වේ. 3) යම් එක් ප්‍රාණියෙක් පිළිබඳව පිවිතුරු සිතින් මෛත්‍රිය වඩන්නේ නම් ඔහුට මහා පින් ඇතිවේ. සියලු සතුන් කෙරෙහිම මෛත්‍රිය වඩන ආරිය පුද්ගලයා බොහෝවූ පින් ලබාගනී. 4) මහා රජවරු පවත්වන විශාල යාග ආදියෙන් ලබන පින්වලට වඩා මෙත්සිතින් ජීවත්වීමෙන් ලැබෙන පින් අග්‍රය. 5) සියලු සතුන් කෙරෙහි මෙත්සිත ඇතිව, කිසිවෙකුට තමා හෝ අන්අය ලවා හෝ හිරිහැර නොකර, හනිනොකර, කිසිවෙකු පරාජ නොකරමින් ජීවත්වන පුද්ගලයාට කිසිවිට වෛර සිතක් ඇතිනොවේ. **මූලාශ්‍ර**: ඛු.නි:ඉතිවුත්තක: 1.3.7.මෙත්තාචෙතෝවිමුක්ති සූත්‍රය, පි. 374.

▲**මෙතෙර**- Near shore : මෙතෙර ලෙසින් පෙන්වා ඇත්තේ සසරය. මෙතෙරින් එතෙරට-නිවනට ගෙනයන මග ආරිය අටමගය. **බලන්න**: ආරියඅටමග, එතෙර හා මෙතෙර.

▲ **මෛත්‍රිය බුදුන්වහන්සේ**: පාලි: **මෙත්තෙයො බුද්ධො** -The Buddha Maitreya: ගෝතම බුදුන් වහන්සේගෙන් පසුව, අනාගතයේ බුදුබව ලබන උතුමා, මෛත්‍රිය බුදුන්වහන්සේය. අනාගතයේ පහළවන සම්මා සම්බුදුරජාණන් වහන්සේ පිළිබඳව, බුදුන් වහන්සේ මෙසේ වදාළහ:

“ මහණෙනි, මිනිසුන්ට අවුරුදු අසූදහසකට පරමායුෂ ඇතිකළ, අරහත්වූ සම්මා සම්බුද්ධවූ... සිව්සස් අවබෝධ කළ...මෛත්‍රිය නම් භාග්‍යවතුන් ලොව උපදින්නේය...ඒ බුදුරජ නොයෙක් සියදහස් ගණනින් භික්ෂු සංඝයා පිරිවර කර සිටින්නෝය”. **“අසීතිවස්සසහස්සායුකෙසු භික්ඛවෙ මනුස්සෙසු මෙත්තෙයො නාම භගවා ලොකෙ උප්පජ්ජිස්සති අරහං සම්මාසම්බුද්ධො... බුද්ධො භගවා...”**. **මූලාශ්‍ර:**දීඝ.නි:3 චක්‍රවර්ති සිංහනාද සූත්‍රය**,** ඡෙදය 23, පි. 112, EDN: 26 Cakkavatti-Sīhanāda Sutta: The Lion’s Roar on the Turning of the Wheel, p.300.

▲ **මුත්තා උපාසිකා-** Muttha Upasika: **බලන්න:** උපග්‍රන්ථය:3

▲**මුත්ති-**Liberation: මුත්ති (විමුක්තිය) ලෙසින් දක්වා ඇත්තේ සසර දුකින් මිදීමය, නිවන ලැබීමය. මෙය නිවන හඳුන්වන පදයකි, මුත්තීමග යනු නිවන්මගය. **මූලාශ්‍රය:** සංයු.නි: (5-1) මහාවග්ග:අසංඛතසංයුත්ත:9.2 මුත්තීසූත්‍ර, පි.690.

▲**මිත්‍රයා-**Friend: මිත්‍රයා යනු දුක සැප දෙකේදීම එකම ලෙසින් කෙනෙක්හට පිහිටවන, උපකාර කරන උතුම් පුද්ගලයාය. **බලන්න**: කල්‍යාන මිත්‍ර.

▼**සේවනය කලයුතු** මිත්‍රයකුගේ ගුණ බුදුන් වහන්සේ මෙසේ පෙන්වා ඇත: 1) දීමට දුෂ්කර දේ දෙයි 2) දුෂ්කර කාර්ය කරයි 3) නො ඉවසිය හැකිදේ ඉවසාසිටි 4) තමාගේ රහස් පවසයි 5) මිතුරාගේ රහස් සඟවා තබාගනී 6) අපදාවකදී මිතුරා අත නොහරී 7) ධනය නැතිවූ කල මිතුරා අත නොහරී, අවමන් නොකරයි . **සටහන:** අංගු.නි: (1) 3නිපාත: යොධාජීවවග්ග:3.3.4.3 සූත්‍රය,පි.552. මෙහි පළමු ගුණ 3 පෙන්වා ඇත. **මූලාශ්‍රය:** අංගු.නි: (4) 7 නිපාතය:දේවතාවග්ග: 7.1.4.5 මිත්ත සූත්‍රය, පි.350.

▼**බුදුන් වහන්සේ මෙසේ වදාළහ:** "සංචාරය කරන පුද්ගලයාට තවලම මිතුරාය; නිවසේ සිටින මිතුරා මවය, කාර්යේ යෙදී සිටින අයගේ සහායකයා මිතුරාය, පරලොව යන අයට කුසල කර්ම මිතුරාවේ, උතුම් බිරිඳ, සැමියාගේ හොඳම මිතුරිය වේ". **බලන්න:** සංයු.නි: (1) සගාථවග්ග:දේවතාසංයුත්ත: ජරාවග්ග:මිත්ති සූත්‍රය හා වත්ථු සූත්‍රය.

▼ **මිතුරන්ට අනුකම්පාකිරීම**: ඥාති හෝ මිත්‍ර හෝ තමන් සමග මිත්‍රව, සුහදව සිටින කෙනෙක් කෙරෙහි අනුකම්පා සහගත සිත ඇතිව, ඔවුන්ට, සතර සති පට්ඨානය පුරුදු පුහුණු කර, ඒ අනුව වාසය කිරීමට උපකාරී විය යුතුවේ යයි බුදුන් වහන්සේ පෙන්වා ඇත. **සටහන:** සංයු.නි: (5-2) සෝතාපත්තිසංයුත්ත:රාජකාරාමවග්ග: මිත්තාමච්ච සූත්‍රයන්හි: නෑ හිත මිතුරන් කෙරෙහි අනුකම්පාව ඇත්නම් ඔවුන් සෝතාපන්න අංගයන්හි පිහිටුවීමට උපකාරී විය යුතුය යයි පෙන්වා ඇත. **මූලාශ්‍රය:**සංයු.නි: (5-1) මහාවග්ග:සතිපට්ඨානසංයුත්ත: අමතවග්ග:3.5.8 මිත්ත සූත්‍රය, පි. 366.

▼ **හිරි ඔත්තප්ප** පිළිනොගන්නා තැනැත්තා මිත්‍රයෙක් නොවේ. **බලන්න:** හිරි ඔත්තප්ප.

**මථ**

▲**මිථ්‍යාත්වය හා සම්‍යක්තවය -**Wrong course & Right course: මිථ්‍යාත්වය ලෙසින් පෙන්වා ඇත්තේ මිථ්‍යාදිට්ඨිය පෙරටු කරගත් 10 අංගයන් සහිත වැරදි මාර්ගය. එම මග සසර දික් කරයි. සම්‍යක්තවය, සම්මා දිට්ඨිය පෙරටු කරගත් 10 අංගයන් සහිත, නිවනවෙත ගෙනයන නිවැරදිමගය. **සටහන:** ව්‍යවහාරයේදී, මිථ්‍යාත්වය; මිථ්‍යාමග ලෙසින්ද සම්‍යක්තවය; සම්මා මග ලෙසින්ද දක්වාඇත.

1) **මිථ්‍යාත්වයට (**වැරදිමගට) පැමිණීම නිසා ධර්ම මාර්ගයේ දියුණුවක් සිදු නොවේ යයි බුදුන් වහන්සේ වදාළහ:

**"මිච්ඡත්තං භික්ඛවෙ ආගමම විරාධනා හොති නො ආරාධනා"** කෙනෙක් එසේ වැරදි මගට බසින ආකාරය: මිථ්‍යාදිට්ඨිය ඇතිවිට, මිථ්‍යාසංකල්ප ඇතිවේ, මිථ්‍යාසංකල්ප ඇතිවිට, මිථ්‍යාවාචා ඇතිවේ, මිථ්‍යාවාචා ඇතිවිට, මිථ්‍යාකම්මන්ත ඇතිවේ, මිථ්‍යාකම්මන්ත ඇතිවිට මිථ්‍යාආජීවය ඇතිවේ. මිථ්‍යාආජීවය නිසා මිථ්‍යාවායාමය ඇතිවේ, මිථ්‍යාවායාමය නිසා මිථ්‍යාසතිය ඇතිවේ, මිථ්‍යාසතිය නිසා මිථ්‍යාසමාධිය ඇතිවේ, මිථ්‍යාසමාධිය නිසා මිථ්‍යාඥානය ඇතිවේ, මිථ්‍යාඥානය නිසා මිථ්‍යාවිමුක්තිය ඇතිවේ. එලෙස, මිථ්‍යාත්වයට පැමිණීමෙන් විරාධනා (නොදියුණුව)වේ, ආරාධනා (දියුණුව) නොවේ යයි බුදුන් වහන්සේ වදාළහ. **සටහන**: මේ පිළිබඳ බලන්න: EAN:note 2140: p. 683. "wrong knowledge (*micchā ñāṇa*) as the delusion (*moha*) that arises when someone, having done a bad deed or pondered a bad thought, reflects on it and thinks,"I have done good." Wrong liberation (*micchā vimutti*) arises when someone who is not liberated thinks "I'm liberated," or it is the belief that what is not liberation is true liberation.

2) **සම්‍යක්තවයට (**නිවැරදිමගට) පැමිණීම නිසා ධර්ම මාර්ගයේ දියුණුව සිදුවේ යයි බුදුන් වහන්සේ වදාළහ:

**"සම්මත්තං භික්ඛවෙ ආගමම වආරාධනා හොති නො වීරාධනා"** කෙනෙක් එසේ නිවැරදි මගට බසින ආකාරය: සම්මාදිට්ඨිය ඇතිවිට, සම්මාසංකල්ප ඇතිවේ, සම්මාසංකල්ප ඇතිවිට, සම්මාවාචා ඇතිවේ, සම්මාවාචා ඇතිවිට, සම්මාකම්මන්ත ඇතිවේ, සම්මාකම්මන්ත ඇතිවිට සම්මාආජීවය ඇතිවේ. සම්මාආජීවය නිසා සම්මාවායාමය ඇතිවේ, සම්මාවායාමය නිසා සම්මාසතිය ඇතිවේ, සම්මාසතිය නිසා සම්මාසමාධිය ඇතිවේ, සම්මාසමාධිය නිසා සම්මාඥානය ඇතිවේ, සම්මාඥානය නිසා සම්මාවිමුක්තිය ඇතිවේ. එලෙස, සම්‍යක්තවයට පැමිණීමෙන් ආරාධනා වේ, විරාධනා නොවේ. **සටහන**: මේ පිළිබඳ බලන්න: EAN:note 2141: p. 683: "right knowledge (*sammā ñāṇa*) is explained to be the nineteen kinds of reviewing knowledge. (see Vism 676,4–29, Ppn 22.20–21) and right liberation (*sammā vimutti*) to be the mental factors concomitant with fruition. I find it simpler to interpret "right knowledge" as the direct knowledge that culminates in arahantship and"right liberation" as the release of the mind from the *āsavas* and other defilements". **සටහන:** අංගු.නි: (6): 10 නිපාත: පරිසුද්ධවග්ග:10.3.3.10 ,10.3.3.11 සූත්‍ර පි.465, මිථ්‍යාත්වය හා සම්‍යක්තවය ගැන විස්තරකර ඇත. **මූලාශ්‍ර:** අංගු.නි: (6): 10 නිපාත:සමණසංඥාවග්ග: 10.3.1.3 **මිච්ඡත්ත සූත්‍රය**, පි. 408, EAN: 10: 103. 3 The wrong course, p. 540.

▼**මිථ්‍යාස්වභාවය හා සම්‍යක් ස්වභාවය:** මිථ්‍යාස්වභාවය ලෙසින් පෙන්වා ඇත්තේ මිථ්‍යාමග දැරීමය. සම්‍යක් ස්වභාවය යනු සම්මා දිට්ඨිය ඇතුළු සම්මාමග-නිවැරදිමගදැරීමය.**මූලාශ්‍රය**:සංයු.නි:(5-1)මහාවග්ග :මග්ගසංයුත්ත:මිච්ඡත්තවග්ග:1.3.1 මිච්ඡත්ත සූත්‍රය, පි.58.

▼ **මිථ්‍යාත්වය අංග 10 කින් යුක්තය.** මිථ්‍යාදිට්ඨිය, මිථ්‍යාසංකල්ප... මිථ්‍යාඥානය, මිථ්‍යාවිමුක්තිය යන අංග 10යය. **සටහන**: මෙහිදී දක්වා

ඇත්තේ අනාරිය අටමග හා නිවනට පැමිණීම වලක්වන මිථ්‍යාඥානය, මිථ්‍යාවිමුක්තිය යන අංග 2 ය, එය දස මිථ්‍යාත්වය යි මෙහි පෙන්වා ඇත. **මූලාශ්‍ර**:අං.ගු.නි: (6): 10 නිපාත: පරිශුද්ධ වග්ග:10.3.3.10 දශම සූත්‍රය, පි.466, EAN: 10: III Purified : 132.10.Tenth.p.548

▼ **සම්‍යක්තවය අංග 10 කින් යුක්තය.** සම්මාදිට්ඨිය, සම්මාසංකල්ප... සම්මාඥානය, සම්මා විමුක්තිය යන අංග 10යය. **සටහන**: මෙහිදී දක්වා ඇත්තේ ආරිය අටමග හා නිවන සාක්ෂාත් කරදෙන සම්මාඥානය, සම්මාවිමුක්තිය යන අංග 2 ය, එය දස සම්‍යක්තවය යි මෙහි පෙන්වා ඇත. **මූලාශ්‍ර**:අං.ගු.නි: (6): 10 නිපාත: පරිශුද්ධ වග්ග:10.3.3.11 එකාදශසූත්‍රය, පි.466, EAN: 10: III Purified : 132.10.Tenth.p.548

▼ **දස මිථ්‍යාත්වය නිසා අකුසලය ඇතිවේ**: අවිද්‍යාව පෙරටුකරගත්, අහිරිකය හා අනොත්තප්පය නිසා, කෙනෙක් මිථ්‍යාත්වය අනුගමනය කරමින් අකුසල් කරයි. **මූලාශ්‍ර:** අං.ගු.නි: ( 6): 10 නිපාත: 10.3.1.5 විජ්ජා සූත්‍රය, පි. 412, EAN:10: 105.5 True Knowledge, p. 541.

▼**අවිද්‍යාවෙන් යුත් අනුවණ මිනිසාට** මිථ්‍යා දිට්ඨිය ඇතිවේ. මිථ්‍යා දිට්ඨිය ඇතිවිට මිථ්‍යා සංකප්ප ඇතිවේ... එලෙසින් දස මිථ්‍යාත්වය -වැරදි මග සකස්වේ. **මූලාශ්‍ර**: සංයු.නි: (5-1): මහාවග්ග: මග්ගසංයුත්ත: 1.1.1 අවිජ්ජා සූත්‍රය, පි. 30, ESN:45: Mggasamyutta: 1.1 Ignorance, p. 1603.

▼ **මිථ්‍යාත්වය අනුගමනය කිරීමේ ආදීනව**: මිථ්‍යාත්වය - මිථ්‍යා දිට්ඨි ආදී අංග 10 පුරුදු කරන පුද්ගලයා විසින් කරන කාය කම්ම, වචී කම්ම, මනෝ කම්ම නිසා ඇතිවන චේතනා, පතනදේ, නැඹුරුවන දේ, සංස්කාර ආදීය මගින් සිදුවන්නේ, නොපැතූ, ලැබීමට නොකැමති, අහිතකර, හානියක් හා දුකක් බව බුදුන් වහන්ස පෙන්වා ඇත. එයට හේතුව ඔහුගේ දිට්ඨිය ලාමක නිසා, කරන සැම දෙයකම ප්‍රතිඵලය ලාමක වීමය. ඒ පිලිබඳ දක්වා ඇති **උපමාව:** කොහොඹ හෝ තිත්ත වැටකොළු හෝ කරවිල හෝ ඇටයක්, තෙතමනය ඇති පසේ පැල කරයි. ඒ ඇටයට, පස හා ජලය ආදියෙන් කුමන පෝෂණයක් ලැබුනත්, එම ඇටය නිසා හැදෙන ගෙඩිය තිත්ත කටුක අමිහිරි රසයෙන් යුතුවේ. එයට හේතුව එම බීජය තිත්ත නිසාය. එලෙස, වැරදි මග යන පුද්ගලයාට ඔහුගේ කටයුතු නිසා ඇතිවන්නේ අයහපතකි; දුකකි. **බලන්න**: උපග්‍රන්ථය:5 .(තිත්ත රස බීජය).**මූලාශ්‍ර**:අං.ගු.නි: (6): 10 නිපාත: සමණසඤ්ඤා වගග: 10.3.1.4. බීජ සූත්‍රය,පි.410, EAN:10: 104. 4-A Seed, p.541.

▼ **සම්‍යක්තවය අනුගනය කිරීමේ යහපත් එල**: සම්‍යක්තවය - සම්මා දිට්ඨි ආදී අංග 10 පුරුදු කරන පුද්ගලයා විසින් කරන කාය කම්ම, වචී කම්ම, මනෝ කම්ම නිසා ඇතිවන චේතනා, පතනදේ, නැඹුරුවන දේ, සංස්කාර ආදීය නිසා යහපත්වූ මනාවූ ප්‍රතිඵල ඇතිවේ.එයට හේතුව ඔහුගේ දිට්ඨිය යහපත්-භද්‍ර නිසාය. ඒ පිලිබඳ දක්වා ඇති **උපමාව:** උක්, මිදී වැනි මිහිරි රසඇති ඇටයක්, තෙතමනය ඇති පසේ පැල කරයි. ඒ ඇටයට, පස හා ජලය ආදියෙන් පෝෂණයක් ලැබී හටගන්නා එල ඉතා මිහිරි රසයෙන් යුතුවේ. එයට හේතුව එම බීජයමිහිරි රසයෙන් යුතුවූ නිසාය. එලෙස, නිවැරදි මග යන පුද්ගලයාට ඔහුගේ ක්‍රියා නිඅස නිසා ඇතිවන්නේ යහපතකි; සැපයකි.**බලන්න**: උපග්‍රන්ථය:5. (මිහිරිරස බීජය)

**මූලාශ්‍ර**:අංගු.නි: (6): 10 නිපාත: සමණසඤ්ඤා වගග: 10.3.1.4. බීජ සූත්‍රය,පි.410, EAN:10: 104. 4-A Seed, p.541.

▲**මිථ්‍යා ආජීවය**- Wrong livelihood: සම්මා ආජීවයට පටහැනි ලෙසින් ජීවිකාව ගෙනයාමය. මෙය ශ්‍රමණ හා බ්‍රාහ්මණයන්ගේ සිත් කිලිටි කරන උපකෙලෙසයක්ය. **බලන්න**: උපකෙලෙස.

▲ **මිථ්‍යා දිට්ඨිය:පාලි: මිච්ඡාදිට්ඨි** - wrong view: දස මිථ්‍යාත්වයේ, පළමු අංගය මිථ්‍යාදිට්ඨිය ය, ධර්මයට අනුකූල නොවන අදහස්, මත දැරීම - චතුසත්‍ය පිළිනොගැනීම-සම්මා දිට්ඨිය නොගැනීම, මිථ්‍යාදිට්ඨිය වේ. එමගින් මාර්ගය පරිහාණියට පත්වේ. **සටහන්:** * මිථ්‍යාදිට්ඨිය ලෙසින් පෙන්වා ඇත්තේ, 62ක් වූ දිට්ඨිගැනය. **බලන්න**: දීඝ.නි: බ්‍රහ්මජාල සූත්‍රය. **සංයු.නි: (3) ඛන්ධසංයුත්ත:දිට්ඨිවග්ග:1.3.5.5. මිථ්‍යාදිට්ඨි සූත්‍රයේ දී බුදුන් වහන්සේ මෙසේ දක්වා ඇත: **"මහණෙනි, රූපය ඇති කල්හි, රූපය ඇසුරු කොට, රූපය ප්‍රත්‍ය කොට මිථ්‍යාදිට්ඨිය ඇතිවේ..."**. (එලෙස පංච උපාදානස්කන්ධ යේ සෙසු ස්කන්ධ ඇසුරු කොට ද මිථ්‍යාදිට්ඨිය ඇතිවේ). ** මිථ්‍යාදිට්ඨිය ඇතිවීමට හේතු ලෙසින් මෙහි පෙන්වා ඇත්තේ, සළායතන හා ඒවා අල්ලාගන්නා බාහිර අරමුණු පිලිබඳ යථාබව නොදනිමය. **බලන්න**: සංයු.නි: (3):ඛන්ධවග්ග: වච්ඡගොත්ත සංයුත්තයේ සූත්‍ර.

▼ **බුදුන් වහන්සේ** මිථ්‍යාදිට්ඨිය ඇති කෙනෙකුගේ ස්වභාවය මෙසේ දක්වා ඇත: මේ ලෝකයේ කෙනෙක් මිථ්‍යාදිට්ඨිය ඇතිවසිටි: ඔහුට මෙවැනි වැරදි අදහස් ඇත: "දෙනලද දේවලින් (දානයෙහි) පලක්නැත, යාග හෝම කිරීමේ පලක්නැත, හොඳ හෝ නරක දේ කිරිමෙන් (කර්මයේ) ඵලවිපාක නැත, මෙලොවක් නැත, පරලොවක් නැත, මවෙක් නැත, පියෙක් නැත, ඕපපාතික සත්ත්වයෝ නැත, මේ ලෝකයේ, යහපත් පැවැත්ම හා පුහුණුව ඇතිව, විශේෂ නුවණින් මෙලොව හා සෙසු ලෝක පිළිබඳව අවබෝධ කල, ඒ බව අන්‍යයන්ට අවබෝධකරවන ශ්‍රමණ බ්‍රාහ්මණයන් නොමැත".

**"ඉධ භික්ඛවෙ එකච්චො මිච්ඡාදිට්ඨිකො හොති විපරිතදස්සනො, 'නත්ථි දින්නං නත්ථියිට්ඨං නත්ථිහුතං සුකට දුක්කටානං කම්මානං ඵලං විපාකො, නත්ථි අයං ලොකො, නත්ථි පර ලොකො, නත්ථිමාතා නත්ථිපිතා නත්ථි සත්තා ඔපපාතිකා, නත්ථි ලොකෙ සමණ බ්‍රාහමණා සම්මග්ගාතා සම්මාපටිපන්නා යෙ ඉමඤ්ච ලොකං පරඤ්ච ලොකං සයං අභිඤ්ඤා සච්ඡිකත්වා පවෙදෙන්ති' ති"**. එවැනි අය ඒකාන්තයෙන්ම නිරයට යයි. **සටහන:** මිථ්‍යාදිට්ඨිය නිසා 10 ආකාරයෙන් අභිනිවෙශවන අන්දම මෙහිදී විස්තරාත්මකව දක්වා ඇත**: බලන්න**: ඛු.නි: පටිසම්භිදා 1: මහාවග්ග:දිට්ඨිකතා: 2-3 මිථ්‍යාදිට්ඨිය, පි.304: **මූලාශ්‍ර**: අංගු.නි: (6) 10 නිපාත: කරජකාය වග්ග: 10.5.1.1. පඨම නිරය සූත්‍රය, පි. 548, ජානුසොණි වගග: 10.4.2.10: චුන්ද සූත්‍රය**,** පි.508, EAN:10: The Deed-born body: 211.1 Hell, p. 556, Jāṇussoṇī: 176.10: Cunda, p.553.

▼ **මිථ්‍යාදිට්ඨිය** නිසා නුපන් අකුසල ඇතිවේ, උපන් අකුසල වැඩිවේ, අකුසල් ඇතිවීමට බලපාන ප්‍රධානම කරුණ මිථ්‍යාදිට්ඨිය තිබීමය. **මූලාශ්‍ර:** අංගු.නි: (1) 1 නිපාතය:16 :1.16.2.1 සූත්‍රය, පි.100, EAN:1: 36.1 sutta, p.47.

▼ **මිථ්‍යාදිට්ඨිය** නිසා කර්ම සිව්ආකාරයකට රැස්වේ: 1) තමන් මිථ්‍යාදිට්ඨිවීම 2) අනුන් මිථ්‍යාදිට්ඨිය ට හැරවීම3) මිථ්‍යාදිට්ඨිය අනුමත කිරීම 4) මිථ්‍යාදිට්ඨිය වර්ණනා කිරීම. **මූලාශ්‍රය**:අං:ගු:නි: (2) 4 නිපාත: කම්මපථවග්ග: 4.7.10 මිථ්‍යාදිට්ඨි සූත්‍රය.

▼ **ලෝභ දෝස හා මෝහ යන අකුසල නිසා** මිථ්‍යා දිට්ඨිය ඇතිවේ. **මූලාශ්‍ර:** අං.ගු.නි: (6) 10 නිපාත: ජානුසොණි වගග: 10.4.2.8, කම්ම නිදාන සූත්‍රය**,** පි. 506, EAN:10: Jāṇussoṇī: 174.8 Causes of Kamma, p.552.

▼ **මිථ්‍යාදිට්ඨිය ඇති** පුද්ගලයා මරණින් මතු දුගතියේ- නිරයේ හෝ තිරිසන් ලෝකයේ යලි උපත ලබන බව බුදුන් වහන්සේ පෙන්වා ඇත. **සටහන:** බු.නි:ඉතිවුත්තක:3 වග්ග: මිථ්‍යාදිට්ඨිකම්මසමාදාන සූත්‍රයේ : තුන්දොරින් අකුසල කරන, මිථ්‍යාදිට්ඨිය දැඩිව ගත් ලෝකයා නිරයගාමී බව පෙන්වා ඇත. **මූලාශ්‍ර:** අං.ගු.නි: (1) 2 නිපාත: 2.1.3.8 සූත්‍රය, පි. 158 , EAN: 2: 27.7 Sutta, p.60.

▼ **මිථ්‍යාදිට්ඨිය ඇති** පුද්ගලයාගේ ස්වභාවය: නොදැන, නොවිමසා ගුණවැනිය යුතු නොවන අයගේ ගුණ වැනිම හා ගුණ වැනියයුතු අයගේ ගුණ නො වැනිම. ඔවුන්ට, මිථ්‍යා සංකල්ප, මිථ්‍යා වාචා, මිථ්‍යා කර්මාන්ත, මිථ්‍යා වායාම, මිථ්‍යා සතිය ඇත. නිරය ගාමිය. **සටහන**: එම අගුණ නොමැති පුද්ගලයාට සම්මා දිට්ඨිය ඇත. ඔහු නිරය ගාමිණී නොවේ. **මූලාශ්‍රය:** අං.ගු.නි: (3) 5 නිපාත:අන්ධකවින්දවග්ග:5.3.2.8 මිථ්‍යාදිට්ඨික සූත්‍ර 3 කි, පි.248.

▼**මිථ්‍යාදිට්ඨිය ඇති පුද්ගලයා** බොහෝ දෙනාගේ අහිත පිණිස වේ. **මූලාශ්‍රය:** අං.ගු.නි: (1) 1 නිපාත: ඒකධම්ම පාලිය: 1.16.3.1 සූත්‍රය, පි.106.

▼**මිථ්‍යාදිට්ඨිය ප්‍රහීණ කරගැනීම**: සළායතන, එමගින් අල්ලා ගන්නා බාහිර අරමුණු, ඒ නිසා ඇතිවන විඥානය, ස්පර්ශය හා වේදනාව අනිත්‍ය බව දන්නා දකිනා පුද්ගලයාගේ මිථ්‍යාදිට්ඨිය ප්‍රහීණවේ. **මූලාශ්‍රය:** සංයු.නි: (4) සළායතනවග්ග:වේදනාසංයුත්ත:නන්දික්ඛයවග්ග: 1.16.10 මිථ්‍යාදිට්ඨිප්‍රහාණ සූත්‍රය, පි.316.

▼**මිථ්‍යාදිට්ඨිය පහකරගැනීම** පිණිස මාර්ගය, සම්මා දිට්ඨිය වැඩිමය. **මූලාශ්‍රය:** අං.ගු.නි: (4) 6 නිපාත: 6.1.6 සූත්‍රය, පි.284.

▲ **මිථ්‍යා දස ධර්ම**- Wrong 10 Dhammas: ප්‍රාණඝාතය. සොරකම- අදත්තාදනය, කාමයේ වරදවා හැසිරීම- කාමමිථ්‍යාචාරය, මුසාවාදය, පිසුණාවාචය, පරුෂාවාචය, සම්ප්‍රප්ඵලාප, ලෝභය, ව්‍යාපාදය, මිථ්‍යා දිට්ඨිය, මිථ්‍යා දස ධර්ම ලෙසින් පෙන්වා ඇත.**බලන්න**: දුක්ඛුදය ධම්ම.

▲ **මිථ්‍යා ප්‍රතිපදාව හා සම්මා ප්‍රතිපදාව**- Wrong Way & the right way: සසරදුකින් මිදීම පිණිස අනුගමනය නොකළ යුතු හා අනුගමනය කලයුතු ප්‍රතිපදා 2 ක් වේ: මිථ්‍යාප්‍රතිපදාව හා සම්මා ප්‍රතිපදාව. මිථ්‍යාප්‍රතිපදාව ලෙසින් බුදුන් වහන්සේ පෙන්වා වදාළේ අවිද්‍යාව පෙරටුකරගත් පටිච්චසමුප්පාද ක්‍රියාවලියටය. අවිද්‍යාව පෙරටුකරගෙන සිදුවන හේතුප්‍රත්‍ය ක්‍රියාවලිය සසර දුක් ඇතිකරයි, නිවන දුර කරයි. විද්‍යාව පෙරටුකරගත්- පටිච්චසමුප්පාද අවසන්කිරීමේ ක්‍රියාවලිය සම්මා

ප්‍රතිපදාවය. **මූලාශ්‍ර:** සංයු.නි: (2) නිදානවග්ග:අභිසමයසංයුත්ත-1.1.3. පටිපදා සූත්‍රය, පි. 30, ESN: 13 Abhisamayasamyutta: 3.3 The Two Ways, p. 613.

▼ **සම්‍යක් ප්‍රතිපදාව වූ** ආරිය අටමග නො පිළිපැදීම මිථ්‍යා ප්‍රතිපදාවය. එනම්, මිථ්‍යා දිට්ඨිය...මිථ්‍යා සමාධිය ආදී අංග 8 කින් යුක්ත අනාරිය අටමග අනුගමනය කිරීමය. **මූලාශ්‍ර:** සංයු.නි: (5-1) මහාවග්ග:මග්ගසංයුත්ත: 1.3.3 පටිපදා සූත්‍රය, පි. 58, ESN: 45 Maggasamyutta: 23.3 The Way, p. 1629.

**මද**

▲ **මදය:** පාලි: **මදො-** infatuation/intoxication: මදය, මත්වීම ලෙසින්ද පෙන්වා ඇත. සාමාන්‍ය ලෝකයා මත්වන ආකාර 3 කි: 1) තරුණබව නිසා- යෞවන මදය, 2) යහපත් ශරීර සෞඛ්‍යයක් තිබීම නිසා- ආරෝග්‍යමදය, 3) යහපත් ආයුෂ තිබීම නිසා - ජීවිත මදය. මේවා සිත කෙලසන අකුසල්ය, දුගතිය ඇති කරයි. **බලන්න**: උප කෙලෙස, මත්වීම

▼**මදය නිසා ඇතිවෙන ආදීනව**: 1) යෞවන මදය (**යොබ්බනමදො-** youth infatuation) 2) ආරොග්‍ය මදය (**ආරොග්‍යමදො-** health infatuation) 3) ජීවිත මදය (**ජීවිතමදො**-life infatuation) යන මදයන් ගෙන් මත්වූ අශ්‍රැතවත් පෘථග්ජනයා, කයෙන්, වචනයෙන් හා සිතින් දුසිරිත් කරයි. එම අයහපත් අකුසල නිසා මරණින් මතු දුගතියේ යළි උපත ලබයි. මේ මදයෙන් මත්වූ භික්ෂුව, ශික්ෂාව අතහැර ගිහිබවට පත්වේ. බුදුන් වහන්සේ, එම මදයන් මැඩ, නිවන ලබාගත්බව මේ සූත්‍රයේ පෙන්වා ඇත. **සටහන**: ම.නි: වත්ථුපම සූත්‍රයේදී: එම මද 3 නිසා සිත මත්වීයන බව පෙන්වා ඇත.

**මූලාශ්‍ර**: අංගු.නි: (1) 3 නිපාත: 3.1.4.9. සූත්‍රය, පි. 302, EAN:3: 39.9 Delicate, p. 94.

▼**වෙනත් මූලාශ්‍ර:** 1."මදය නිසා මිනිසුන් බොහෝ අකුසල් කර දුගතියට යයි: **ජාති මදය**: කුල ගෝත්‍ර ජාති රට, ආදී වශයෙන් ඇතැම් අය උසස් ඇතැම් අය පහත් යයි සිතා කටයුතු කිරීම **ආරෝග්‍ය මදය**:තමාගේ නිරෝගී බව නිසා ඇති උඩගුබව **යොබ්බන මදය**: තරුණබව නිසා මත්වීම **ජීවිත මදය**: වැඩි ආයුෂ තිබීම නිසා මත්වීම **ලාභමදය**:තමන්ට ලැබෙන ලාභ ආදියෙන් උඩගුවීම. **සත්කාර මදය**: සත්කාර ආදිය ලැබීම නිසා ඇතිවෙන මානය. **ගරුකාර මද**: තමන්ට ලැබෙන ගෞරව ආදියෙන් අහංකාර වීම..." (විවිධ මද පිලිබඳ විස්තර මෙහි ඇත). **කෙලෙස් එක්දහස් පන්සීය**: පි.29, රේරුකානේ චන්ද විමල නාහිමි, 2008.

▲ **මුදල් පරිහරණය** Using money: සසුනේ පැවිදිබව ලැබූවිට මුදල් පරිහරණය කැපනැත. **බලන්න**: ජාතරූප, සංඝවිනය, කහවණු.

▲**මුදිතාව: පාලි: මුදිතා-** altruistic joy: මුදිතාව, බ්‍රහ්මවිහාරයකි. මුදිතාව යනු අන්‍යයන් තුළ ඇති යහපත් ගුණ පිළිබඳව හා ඔවුන්ගේ සමෘද්ධිය පිළිබඳව සිතේ ඇතිවන නියම සතුටය. තමන් තුළ ඇති යහපත් ගුණ, ක්‍රියා පිළිබඳවද සිතේ මුදිතාව ඇති කරගැනීම, කෙනෙක්ගේ ජීවිතය මුදුලෙසින් ගත කිරීමට උපකාරීවේ. මෙය භාවනා අරමුණකි. මුදිතාව

වර්ධනය කරගැනීමෙන් අරතියෙන් මිදිය හැකිය. **බලන්න**: අරතිය, බ්‍රහ්මවිහාර, භාවනා. **ශබ්දකෝෂ: පා.සිං.ශ**: පි. 428: "**මුදිත:** සතුටුවන ලද, තුටුවන ලද, තොස් වන ලද, **මුදිතා**: මුදිතාව" **B.D:** p. 101: "**Mudita**: Altruistic joy (or sympathetic) is one of the 4 sublime abodes- brahma-vihāra"

▼ **අරතිය පහ කර ගැනීමට** මුදිතාව වඩා ගත යුතුවේ. **මූලාශ්‍ර:** අංගු.නි: (4) 6 නිපාතය: 6.1.2.3 නිස්සාරණීය සූත්‍රය, පි. 40, EAN:6: 13.3 Escape, p. 321.

▲ **මුදිතා චේතෝ විමුක්තිය:** පාලි: **මුදිතා චෙතොවිමුත්ති** -the liberation of the mind by altruistic joy. සිතේ ඇති අලසබව පහ කර ගැනීමට, ධර්මයට ඇති අරතිය නැති කරගැනීමට මුදිතා චේතෝ විමුක්තිය උපකාරී වේ. මෙය, මුදිතා නිස්සාරණීය ධාතුව ලෙසින්ද පෙන්වා ඇත. **බලන්න**: මුදිතාව, භාවනා, සතර බ්‍රහ්ම විහාර, නිස්සාරණීය ධාතු, අරතිය.

▼**අරතියෙන් (**අධිකුසලයට ඇති මැලිබව**)** මිදීමේ මග, මුදිතා චේතෝ විමුක්තිය- මුදිතා නිස්සාරණීය ධාතුවය. **මූලාශ්‍ර:** අංගු.නි: (4) 6 නිපාතය: 6.1.2.3 නිස්සාරණීය සූත්‍රය, පි. 40, EAN:6: 13.3 Escape, p. 321.

▼**මුදිතාව වර්ධනය කරගන්නා ආකරය:** විවේකය, විරාගය, නිරෝධය හා ඔසග්ගය (වොසග්ගපරිණාමි-නිවනට නැඹුරු සිත) ඇතිව සප්ත බොජ්ඣංග ධර්ම වැඩීමෙන් ලබන මුදිතාව මහා පහසු විහරණය පිණිස පවති. **මූලාශ්‍රය**:සංයු.නි: (5-1) මහාවග්ග:බොජ්ඣංග සංයුත්ත:2.7 මුදිතාසූත්‍ර, පි. 271.

▲ **මුදුවචන** :පාලි: **සාඛල්‍යය** - Gentle speech

මුදුවචන-මෘදුවචන, මොළොක් වචන ඇතිබව ධර්ම මාර්ගයේ ගමන් කරන පුද්ගලයෙක් සතු ගුණයකි. තමන් සමග වාසය කරන අයගේ ප්‍රියමනාපබව ලබාගැනීමට මුදුවචන භාවිතය උපකාරීවේ. බුදුන් වහන්සේ මුදුවචන භාවිතය පිළිබඳව යහපත් ලෙසින් වදාරා ඇත. ඒ ධර්මතා සංඝයා එක්ව, ධර්මයේ චිරස්ථිතිය පිණිස සජ්ජායනා කිරීම සුදුසු ය යි සැරියුත් මහා තෙරුන් සංඝයාට උපදෙස් දී ඇත. **මූලාශ්‍ර**: දිඝ.නි:10 සංගීති සූත්‍රය, පි. 372 , EDN: 33 Saṅgīti Sutta: The Chanting Together, p. 362.

▲**මෘදුබව:** පාලි:**මුදු - සොරච්ච**-gentleness (*soracca)*: ධර්මයේ මුදුබව ලෙසින් පෙන්වා ඇත්තේ නොදැඩිව, කීකරුව, යහපත් ලෙසින්-නිහතමානිව වාසය කිරීමය. කයෙන් හා වචනයෙන් කරන ක්‍රියා මුදුලෙසින් පවත්වා ගැනීමය.මෙය ආධ්‍යාත්මික වර්ධනයට උපකාරී කරුණකි. නිවන ලබාගැනීමට කැමති පුද්ගලයන් විසින් පුරුදු පුහුණු කරගත යුතු ගුණයක් ලෙසින් මුදුබව, බුදුන් වහන්සේ පෙන්වා ඇත: **"කරණීයමත්ථකුසලෙන- යන්ත සන්තං පදං අභිසමෙච්ච-සක්කො උජූ ච සූජූ ච- සුවචො චස්ස මුදු අනතිමානී"**. **මූලාශ්‍රය:** ඛු.නි: ඛුද්දකපාඨ,මෙත්තා සූත්‍රය, පි. 47.

▼ **බුදුන් වහන්සේ** මුදු ගුණය යහපත් ලෙසින් වදාරා ඇත. ඒ ධර්මතා සංඝයා එක්ව, ධර්මයේ චිරස්ථිතිය පිණිස සජ්ජායනා කිරීම සුදුසු ය යි

සැරියුත් මහා තෙරුන් සංසයාට උපදෙස් දී ඇත. **මූලාශ්‍ර**:දිඝ.නි: 10 සංගිති සූත්‍රය, පි. 372 , EDN: 33 Saṅgīti Sutta: The Chanting Together, p. 362.

**මධ**

▲**මධ්‍යය-**Middle: අන්ත දෙකක් අතර ඇති මැද මධ්‍යයය. ඛු.නි: සුත්තනිපාත:පරායනවග්ගයේ දී: තිස්ස මෙත්තෙයිය මානවක ඇසූ පැනයකට බුදුන් වහන්සේ මෙසේ වදාළහ:

**"සො උභන්තෙ විදිත්වාන - මජ්ඣෙ මන්තා න ලිප්පති**
**තං බ්‍රෑමි මහාපුරිසොති සො'ධ සිබ්බනිමච්චගා"**

"ඒ නැණවත් භික්ෂු තෙමේ (අරහත්) උභයඅන්ත (අන්ත දෙකම) ප්‍රඥාවෙන් දැන මධ්‍යයෙහි නො ඇලේනම් ඔහු මහාපුරුෂ යයි මම කියමි. ඔහු මේ පංචස්කන්ධය සකස්කරන්නීය වූ (සිබ්බනිය) තණ්හාව ඉක්මවා ගියේය". "Having understood both ends, the wise one does not stick in the middle. I call him a great man: he has here transcended the seamstress.". භික්ෂුන් විසින් කළ ඉල්ලීමක් අනුව, බුදුන් වහන්සේ ඒ ගාථාව පැහැදිලි කර වදාළහ: "මහණෙනි, වර්තමාන ආත්මභාව (සංඛ්‍යාත) ඵස්ස එක් අන්තයකි, අනාගත ආත්මභාව සංඛ්‍යාත- ඵස්ස සමුදය දෙවන අන්තයවේ. ඵස්ස නිරෝධය මධ්‍යය වෙයි. තණ්හාව සිබ්බනිය (මහන්නිය) වේ. තණ්හාව මේ භවය හෝ වෙනත් භවය නිපදවයි (මහයි). ඒ අනුව භික්ෂුව, අභිඥාවෙන්, දැනගතයුතු දේ දැනගනී.පරිඥාවෙන් පරිජනය කලයුතුදේ අවබෝධ කරගනී. එලෙසින් ඔහු මේ ජීවිතයේදීම, දුක අවසන් කරගනී". "Contact, bhikkhus, is one end; the arising of contact is the second end; the cessation of contact is in the middle; and craving is the seamstress. For craving sews one to the production of this or that state of existence. It is in this way that a bhikkhu directly knows what should be directly known; fully understands what should be fully understood; and by doing so, in this very life he makes an end of suffering". **බලන්න**:EAN:6: notes: 1399, 1400,1401, p.649, මැහුම්කාරිය. **සටහන: තිස්ස මෙත්තෙයිය මානවකගේ ප්‍රශ්නය:**

"කවරෙක් මෙලොව සන්තුෂ්ටී වේද? කව්රෙක්හට තණ්හා දිට්ඨී කම්පනයෝ (ඉඤ්ජිතයෝ) නැද්ද? කවරෙක් අන්ත දෙක විශිෂ්ඨ ඥානයෙන් දැන මධ්‍යයෙහි, ප්‍රඥාවෙන් නො ඇලේද? කව්රෙක්හට 'මහා පුරුෂයා' යයි කියන්නේද?. කෙවරෙක් තන්හාව නමැති මැහුම්කාරිය (තණ්හා සිබ්බනිය) ඉක්මවා ගියේද? **බලන්න**:ඛු.නි: සුත්තනිපාත: පරායනවග්ග: 1044 ගාථාව, පි.338. **මූලාශ්‍ර**:අංගු.නි: (4 ):6 නිපාත: මහාවග්ග:6.2.1.7 මජ්ඣ සූත්‍රය, පි.206, EAN: 6:61.7 Middle, p.352.

▲**මධ්‍යම කාම ආස්වාදය**-Middle sensual pleasures: මෙය ත්‍රිවිධ කාම ආස්වාදයන්ගෙන් (උසස්, මධ්‍යම, හීන) එකකි. **බලන්න**: කාමආස්වාදය.

▲ **මධ්‍යම ධාතුව-**Maddyama dhathu: ධාතු අනුව කෙනෙක්ගේ පරලොව ජීවිතය වෙනස්වේ. මධ්‍යම ධාතුව ඇතිවිට, යළි උපත මධ්‍යමවේ. **බලන්න:** ගති.

▲ **මධ්‍යම ප්‍රතිපත්තිය** -the middle way of practice: තම තමන්ගේ මත අනුව ලෝකයා අනුගමනය කරන ප්‍රතිපත්ති 3කි. මධ්‍යම ප්‍රතිපත්තිය යනු, දුකින් මිදීම පිණිස බුදුන් වහන්සේ පෙන්වා දුන් ධර්ම ප්‍රතිපත්තියය. **බලන්න**: පටිපදා විධි තුන.

▲ **මධ්‍යම ප්‍රතිපදාව**: පාලි: **මජ්ඣිමා පටිපාදා-**Middle way: සසර දුකින් මිදීම පිණිස, නිවන ලබාගැනීම පිණිස අනුගමනය කළයුතු ප්‍රතිපදාව: මධ්‍යම ප්‍රතිපදාව- ආරිය අටමග යයි බුදුන් වහන්සේ පෙන්වා දී තිබේ . **බලන්න:** ධම්මචක්කප්පවත්තන සූත්‍රය.

▼ **බුදුන් වහන්සේ** පස්වග මහණුන්හට මෙසේ වදාළහ:

**"මහණෙනි, ...ලාමකවූ...කෙලෙස්කාම ආදියෙන් සුඛවූද... ශරීරයට වෙහෙස දිමක් වේද, දුක්වූද... මේ දෙකොටස පැවිද්දා විසින් සේවනය නොකට යුතුය.... මේ අන්ත දෙකට නොපැමිණ, තථාගතයන් වහන්සේ විසින් අවබෝධ කරනලද දර්ශනමාර්ගඥානය කරන්නිවූ, භාවනාමාර්ගඥානය කරන්නිවූ, මධ්‍යම ප්‍රතිපදා තොමෝ කෙලෙසුන් සංසිදීම පිණිස, සිව්සස් දහම් මොනවට දැනීම පිණිස, සිව්සස් දහම් මනාකොට අවබෝධ කිරීම පිණිස, නිවන් පිණිස පවතී... ඒ මධ්‍යම ප්‍රතිපදාව මේ ආර්ය අෂ්ඨාංගික මාර්ගය මය.": මූලාශ්‍රය**: වින.පි: මහාවග්ග පාලිය 1: 14 පංචවග්ගිය කථා, පි. 98.

▲ **මධ්‍යම ශීලය-**Middle virtue: මෙය දේවලෝක උත්පත්ති ආදිය සලකා සමාදන්වන ආනිසංස සීලයය. **බලන්න**: ත්‍රිවිධ ශීලය.

▲ **මධුභානි-**Madubhani : මෘදු , ප්‍රසන්න වචන කතා කරන අය මධුභාණී පුද්ගලයන්ය. **බලන්න**: පුද්ගල තුන් වර්ගය.

▲**මධුර නගරය-**City of Madhura: සංඝයාට මේ නගරයේ වාසය කිරීමේ දී ඇතිවිය හැකි ආදීනව මේ සූත්‍රයේ පෙන්වා ඇත. භූමිය විෂමය,බොහෝ දූවිලි ඇත, සැඩ ශුනකයන් සිටිති, නරක යක්ෂයන් සිටිති, දුර්ලභ පිණ්ඩපාතය (පිණ්ඩපාතය ලැබීම දුෂ්කරබව). **සටහන:**මේ නගරය උතුරු ඉන්දියාවේ, යමුනා නදිය අසබඩ පිහිටි, සුරසේන ජනපදයේ අග නුවරය. **බලන්න**:EAN:5:note: 1223,p.642. **මූලාශ්‍ර**: අංගු.නි: (3) 5 නිපාත:අක්කෝසකවග්ග:5.5.2.10: මධුරා සූත්‍රය, පි. 436, EAN:5: 220.10: Madhurā,p.307.

▲ **මධුරාපුරය-**Madurapuraya: ම.නි: මධුරා සූත්‍රයට අනුව එම පුරයේ පාලකයා අවන්තිපුත්‍ර රජතුමාය. බුදුන්වහන්සේගේ පරිනිබ්බානයෙන් පසු මහා කච්චාන තෙරුන් එහි වැඩ වාසය කර ඇත. මහාතෙරුන්, එහිදී මධුරා සූත්‍රය, එම රජතුමාට දේශනා කරනලදී. දහම්සවනය කිරීමෙන් පසු රජතුමා බුදුන් සරණගියහ. **බලන්න:** උපග්‍රන්ථය:3

▲ **මධුරාපුර අවන්තිපුත්‍ර රජතුමා-**King Avanthiputta of Madhura: **බලන්න**: උපග්‍රන්ථය:3

**මන**

▲ **මන ඉන්ද්‍රිය** - Mind Faculty: මන ඉන්ද්‍රිය, ඉන්ද්‍රිය 22න් එකකි, සය ඉන්ද්‍රියන්ගෙන් එක් ඉන්ද්‍රියකි. මනඉන්ද්‍රිය, සිත- මනස හසුරුවන ඉන්ද්‍රියය. **බලන්න**:ඉන්ද්‍රිය, සිත.

▲**මනස-** Mind: මනස-චිත්ත- විඥානය යනු සිතය, සය ආයතනයන්ගෙන් එකකි. **බලන්න**: චිත්ත, සිත, විඥානය, සළායතන.

▲ **මනායතනය** -mind base: මෙය ආධ්‍යාත්මික ආයතන 6 න් එකකි. **බලන්න**: ආයතන, සිත.

▲**මනසානුපෙක්ඛිතා**-Manasanupekkhata: පුරුදු පුහුණු කල ධර්මය පුන පුනා ආවර්ජනය කිරීම, මනසින් විමසා බැලීම මින් අදහස්කෙරේ. මෙය පංච විමුක්ති ආයතනවලින් එකකි, බහුශ්‍රැතවීමට පුරුදු කරගත යුතු අංගයකි. **බලන්න**: පංචවිමුක්ති ආයතන,බහුශ්‍රැත.

▲ **මනසිකාර-** attention: මනසිකාර යනු යම් කරුණක් ගැන ඇති අවධානය හෝ ඒ පිලිබඳ සිතා බැලීම- ආවර්ජනය (මෙනෙහිකිරීමය). නාමරූප විග්‍රහකරනවිට පෙන්වා ඇත්තේ, මනසිකාරය, නාමයේ අංගයක් බවය. යමක් යහපත් ලෙසින් සලකා බැලීම යෝනිසෝ මනසිකාරය වේ, යමක් ගැන අයහපත් ලෙසින් බැලීම අයෝනිසෝමනසිකාරය වේ. **බලන්න:** නාමරූප, යෝනිසෝ මනසිකාරය හා අයෝනිසෝමනසිකාරය.

▼**සියලු ධර්මතා** මනසිකාරය නිසා හටගනී: "**මනසිකාර සම්භවා සබ්බෙ ධම්මා**". **බලන්න:** සබ්බෙ ධම්මා. **මූලාශ්‍රය:** අං.ගු.නි: (1) 2 නිපාත: මූලක සූත්‍රය

▼ **ධර්මතා මනසිකාර** නො කිරීම සමාධි ප්‍රතිලාභයට හේතුවේ. ආනන්ද තෙරුන් ගේ විමසීමක් මත බුදුන් වහන්සේ මේ සූත්‍රයේ දී , සමාධිය පිණිස මනසිකාර නොකළ යුතු ධර්මතා විස්තර කර ඇත. **මූලාශ්‍ර:** අං.ගු.නි: (6) 11 නිපාත:නිස්සයවග්ග: 11.1.8 මනසිකාර සූත්‍රය, පි.632.

▲**මනසිකාර කුසලතාවය** - Skill in attention: ආධ්‍යාත්මික වර්ධනය පිණිස වැඩිය යුතු කුසලතාවයකි. **බලන්න**: කුසලතා.

▲ **මන්ඩිස්ස පරිබ්‍රාජක**-Mandissa paribrajika: මේ පරිබ්‍රජකයා, කොසඹෑනුවර, ඝෝසිතාරාමයෙහි දී, ජාලිය පරිබ්‍රාජක සමග බුදුන් වහන්සේ හමුවූ බව, උන්වහන්සේ දෙසූ ධර්මය පිලිබඳ පැහැදීමට පත්වූහ. **මූලාශ්‍රය:** දීඝ.නි: (1) 7 ජාලිය සූත්‍රය, පි.364.

▲**මන්ධාත රජ**-King Mandhātā: පුරාණයේ විසූ රජ කෙනෙකි.පංචකාමයෙහි ඇලුණ පුද්ගලයන් අතුරින් මන්ධාත (මානධාතෘ) රජ අගතැන් ගනී. **බලන්න**: අග්‍ර මිනිසුන්. **සටහන්**: * **අටුවාවට අනුව**: මන්ධාතු රජ (King Mandhātā): මහාසම්මත රාජ පරම්පරාවට අයත්වේ. ඔහු දිගුකලක් රජසැප විඳිමින් කම්සැපයේ ඇලි වාසය කර ඇත. **බලන්න**: EAN: note: 644, p. 615. ** මහාමන්ධාතු රජ, දෙව් මිනිස් සම්පත් විඳින අය අතර අග්‍රය. **බලන්න**: සද්ධර්ම කෝෂය, පි. 119. ** මේ රජු ගැන විස්තර පිණිස **බලන්න**: බු.නි: ජාතකපාලිය1: 8: මන්ධාතු ජාතකය, පි.158. **මූලාශ්‍ර:**අං.ගු.නි: (2) 4

නිපාතය: 4.1.2.5 අග්ගපඤ්ඤත්ති සූත්‍රය, පි.56, EAN:4: 15.5. Proclamations, p.153.

▲ **මානත්ථද්ධ බමුණා-** Brahmin Mānatthaddha:**බලන්න:** උපග්‍රන්ථය:3

▲ **මනුජා උපාසිකා-** Manuja Upasika:බලන්න: උපග්‍රන්ථය:3

▲**මනුෂ්‍ය ලෝකය-** Human realm: මනුෂ්‍ය ලෝකය:මිනිස් ලෝකය, කාම භවයකි, කාම ලෝකයට අයත්වේ, යළි උපත ලබන සුගතියකි. බුද්ධත්වය පතන බෝසතුන්ගේ අවසාන උත්පත්තිය, මිනිස් ලෝකයය. මිනිස් ලෝකයේ උපත ලබාගැනීම දුර්ලභ දෙයක්ය යයි බුදුන් වහන්සේ පෙන්වා ඇත. **බලන්න**:භව, බොධිසත්ව, දුර්ලභදේ.

▲ **මානය:** පාලි: **මානො-** conceit : මානය යනු මැනීමය. තමන්, වෙනත් අය හා සසඳා බලා තිරණ ගැනීමය. 'විධා' (discrimination) ලෙසින්ද දක්වයි. මානය සසරට බැඳ තබන බැම්මකි, දසසංයෝජන වලින් එකකි, අනුසය ධර්මයකි. සියලු මාන ප්‍රහීණය වන්නේ අරහත්වයට පත්විමෙන්ය. මානය දුගතියට ගෙන යයි. **බලන්න:** රහතන්වහන්සේ, උප කෙලෙස, ත්‍රිවිධ මාන.

▼**මානය නිසා** යලි උපත ඇතිවේ, සසර දික්වේ. මානය විශිෂ්ඨ ඥානයෙන් අවබෝධ කරගැනීම දුකින් මිදීමේ මගය. බුදුන් වහන්සේ මෙසේ වදාළහ:

**"මහණෙනි, එක් කෙළෙස් ධර්මයක්...මානය පහ කරගන්න. මම, ඔබට අනාගාමී භාවය පිණිස කැප වෙමි". මූලාශ්‍ර:** ඛු.නි: ඉතිවුත්තක: 1.1.6 මාන සූත්‍රය, පි.350, 1.1.8 මානපරිඤ්ඤා සූත්‍රය,පි.351.

▼**මානයෙන් මත්ව කටයුතු කිරීම නිසා අයහපත් ප්‍රතිඵල ඇතිවේ.** තමන් ගේ ප්‍රතිභානය නිසා මානයට පත්ව තමා හා වාසය කරන භික්ෂුන්හට අවමන් කිරීම ඒකාන්තයෙන්ම අලාභයක්, නපුරක් බව වටහාගත් වංගීස තෙරුන් තමන්ගේ මානය නැතිකරගැනීම පිණිස තමාට මෙසේ අවවාද කරගත්හ:

**"...මානය දුරුකර, මානයෙන් මුස්පත්වීම බැහැර කරගන්න. මානය නිසා බොහෝ කලක් පසුතැවිලිවීමට සිදුවේ. ගුණමකු, මානයෙන් වැසුන පුද්ගලයෝ, නිරයට වැටී බොහෝ කලක් දුක්විඳි. ප්‍රධාන විරිය ඇතිකර නීවරණ දුරුකොට පිරිසිදුවූ භික්ෂුන්, මානය ප්‍රහීණය කර, කෙළෙස් නසා අරහත්වයට පත්වූහ". මූලාශ්‍ර**: සංයු.නි: (1) සගාථවග්ග: වංගීසසංයුත්ත:8.1.3 පේසල අති මඤ්ඤානා සූත්‍රය, පි. 360, ESN: 8: Vaṅgīsasaṃyutta: 8.3. Well behaved, p.396.

▼**සමාධිය වඩාගැනීම මානය දුරුකරගැනීමට උපකාරිවේ**: නිවන අරමුණුකොට සමාධිය ලැබූ භික්ෂුවට, කය පිලිබඳවද, බාහිර නිමිති පිළිබඳවද ඇති අහංකාරය, මමංකාරය හා මානඅනුසය ප්‍රහීණයවේ. ඔහු චේතෝ විමුක්තියට හා ප්‍රඥාවිමුක්තියට පැමිණ වාසය කරයි -අරහත්වය ලබයි. **මූලාශ්‍ර**: අංගු.නි: (1) 3 නිපාතය: දේවදූතවග්ග: 3.1.4.2 සූත්‍රය, පි. 282, EAN:3: Divine Messengers: 32.2 Ananda, p.90.

▼**රහතුන්හට ත්‍රිවිධ මානය නොමැත**: ශ්‍රේෂ්ඨ පුද්ගලයන් කෙරෙහි හෝ හීන පුද්ගලයන් කෙරෙහි හෝ සම පුද්ගලයන් කෙරෙහි හෝ කිසිදු මානයක් නොමැති, ජාතිය අවසන් කළ, මග බඹසර නිමා කල ඒ රහතුන් සංයෝජනයන් පහකර හැසිරේ: **"... න උස්සෙසු න ඔමෙසු සමත්තෙ නොපනීයරෙ ඛිණා සඤ්ජාති වූසිතං බ්‍රහ්මචරියං චරන්ති සඤ්ඤොජන විප්පමුත්තාති...". සටහන්: *** භික්ෂුවඅරහත්වයට පත්වූ බව පවසන්නේ තමන්ට මානය නැති බව පවසමින්ය. ඒ පිළිබඳව බුදුන් වහන්සේ මෙසේ වදාළහ:

මම උසස්ය, ඔබ පහත්ය, අපි සමසමය
තරාතිරම්, මැනිම් කරන්නේ ඒ ලෙසය.

සියළු කෙළෙස් හල ගුණවත් උතුමන්,
යලි උපත හැර දමා, මිදුණි මිනුම් දණ්ඩෙන්.

ඛේම තෙර හා සුමන තෙර, අර්හත්බව ප්‍රකාශ කර ඇත්තේ තමන්ට මානය නොමැති බව හඟවමින් බව මේ සූත්‍රයේ පෙන්වා ඇත. **මූලාශ්‍ර**: අංගු.නි: (4) 6 නිපාතය: 6.1.5.7. ඛෙම සූත්‍රය, පි. 148, EAN:6: 49.7. Khema sutta, p. 341.

▼ **බුදුන් වහන්සේ මෙසේ වදාළහ**:

"**...කෙනෙක්, මම අන්‍යයන් හා සම වෙමි, හෝ විශිෂ්ට වෙමි හෝ හීනවෙමි හෝ යයි සිතන්නේද ඒ නිසා ( ඒ මානය ) ඔහු අන්‍යයන් හා විවාද කිරීමට යන්නේය. එහෙත්, ඔහු මේ ත්‍රිවිධ මානයෙන් නො සැලෙන්නේනම් ඔහු සමය, විශිෂ්ටය, හීනය යන සිතිවිලි වලින් නොපෙළේ...". බලන්න**: සංයු.නි: (1) සගාථවග්ග: දේවතාසංයුත්ත: සමිද්ධි සූත්‍රය.

▼**මානයේ විවිධබව**: **මානය**, මෙය ජාතිය-කුලය ආදීය හඟවන මානයය.(Conceit), **ඕමානය** යනු මම හීනය යි සැලකීම (inferiority complex), **අතිමානය**, මම උසස්වෙමි යන හැඟීම ( arrogance). **අධිමානය**, අනධිගතය අධිගතය යන මානය- තමන් ගැන ඕනෑවට වඩා ගැනීම (self-overestimation). **ථම්භය**, ක්‍රෝධය මානය යන දෙකින් තදබව (obstinacy) .**අතිනිපාතය**, හීනඅයටත් වඩා හීන යන හැඟීම, හීනමානය ලෙසින්ද පෙන්වා ඇත (self-abasement). මේවා ඇතිවිට අරහත්වය නොලැබේ. **සටහන**: අටුවාවට අනුව: *Conceit* (*māna*) is conceiving oneself [to be better] based on birth, etc. The *inferiority complex* (*omāna*) is the conceit, 'I am inferior' (*hīno'ham asmī ti māna*). *Arrogance* (*atimāna*) is the conceit of self-elevation. *Selfoverestimation* (*adhimāna*) is imagining oneself to have attained [what one has not really attained]. *Obstinacy* (*thambha*) is due to anger and conceit. *Self-abasement* (*atinipāta*) is the conceit 'I am inferior' occurring in one who is actually inferior."**බලන්න**: EAN:note: 1430, p.650. **මූලාශ්‍ර**: අංගු.නි: (4) 6 නිපාත: අරහන්තවග්ග: 6.2.3.2 අරහන්ත සූත්‍රය, පි.252,EAN:6: 76.2 Arahantship**,** p. 360.

▼**වෙනත් මුලාශ්‍ර:1.** **"**නාම රූප ධර්මයන්ගේ ස්වභාවය නො දැනීම නිසා පංචඋපාදානස්කන්ධය, මමය කියා ගැනීම මානයට හේතුවේ". **කෙලෙස් එක්දහස්පන්සීය**: පි. 69, රේරුකානේ චන්දවිමල නාහිමි, 2800.

▲ **මානය, අවමානය හා අතිමානය:** පාලි: **මානා, ඕමානො, අතිමානා-** Conceit, the inferiority complex, and arrogance: මානය යනු මමයන අහංකාරය යය. අවමානය ලෙසින් පෙන්වා ඇත්තේ තමන් ගැන ඇති හීන මානයය. අතිමානය යනු, අනුන්ට වඩා තමා උසස් යයි සැලකීමය. මේ ත්‍රිවිධාකාර මාන නිසා ලෝකයා සසරට බැඳී ඇත. මේවා අකුසලයන්ය. **බලන්න**: ත්‍රිවිධමාන.

▲ **මානඅනුසය-** mānānusayo: මෙය අනුසයකි, සිතයට ඇති කෙලෙසකි, අරහත්වය ලැබීමෙන් මෙය කෙලවරවේ. **බලන්න**: අනුසය.

▲ **මනාප දාන-**Ofeering things which one likes: බුදුන් වහන්සේ මෙසේ වදාළහ:

"මන වඩන දේ දෙනවිට මන වඩන දෙයක් ලැබේ. තමන්හට මනාප-කැමති දේ දීමෙන්, තමන් මානප කරන දේ ලැබේ. යමෙක් උතුමන්ට (අරියන්හට), ආදර ගරු සම්පන්නව, වස්ත්‍ර...ආහාර පාන... ආදීවූ ත්‍යාගයට දුෂ්කර දේ පිරිනමයිද, ඒ සත්පුරුෂයා මන වඩන දේ ලබයි...අග්‍රවූ දෙය දෙනවිට පෙරළා අග්‍ර සුවය ලැබේ...ශ්‍රේෂ්ඨ දේ දෙන්නා ශ්‍රේෂ්ඨවූ ස්වර්ගස්ථානයට පැමිණේ...ඔහුට දීර්ඝ ආයුෂ ද යසස්ද ඇතිවේ". **සටහන්**: * මේ සූත්‍රය දේශනා කිරීමට හේතුව, බුදුන් වහන්සේගේ අග්‍රතම ගිහි උපාසකයෙක් වූ විසල්පුර උග්ග ගහපති විසින් බුදුන් වහන්සේ ප්‍රමුඛ සංඝයාහට මනාපවූ අග්‍ර දානයක් පිරිනැමීම පිලිබඳවය. මියගිය පසුව, ඔහු සුද්ධාවාසයක දෙවියෙක්ව, බුදුන් වහන්සේ බැහැදැකීමට පැමිණ ඇත. **බලන්න**: උපග්‍රන්ථය:3 **මූලාශ්‍රය:**අංගු.නි: (3) 5 නිපාත:5.1.5.4 මනාපාදායි සූත්‍රය, පි.98.

▲ **මනාප හැසිරීම-** pleasing qualities: මනාප හැසිරීම: අන්‍යයන් හා සුහදව, ඔවුන්ට ප්‍රිය ඇතිවෙන පරිදි යහපත් ලෙසින් හැසිරීමය. එබඳු හැසිරීම ඇති පුද්ගලයාට, සෙසු අය ගරු කරති, ඔහුට කැමතිවේ. මනාප හැසිරීම නොමැති විට අන්‍යයන් ගරු නොකරති, ඔහු කෙරේ ප්‍රිය බව නැත. **බලන්න:** අංගු.නි: (5) 8 නිපාත:පිය සූත්‍රය.

▲**මානවගාමිය දේවපුත්‍රයෝ** -Manawagamiya Devaputhra: අන්‍ය දේවපුත්ත පිරිසක්, අන්‍යආගමික නායකයන් වර්ණානා කරන අවස්ථාවේදී, මේ දේව පිරිස බුදුන් වහන්සේගේ උතුම්බව පෙන්වා ඇත. **බලන්න**: නානාතිත්ථිය. **මූලාශ්‍ර:** සංයු.නි: (1) :සගාථවග්ග: දේවතා සංයුත්ත: 2.3.10 නානාතිත්ථිය සාවක සූත්‍රය, පි.152, ESN: 2: devaputtasamyutta: 30.10 Various sectarians, p. 210.

▲**මානසික සුඛය-** Mental pleasure: කායික සුඛයට වඩා මානසික සුඛය අග්‍රය. මානසික සුඛය සමාධියට උපකාරිවේ. **බලන්න**: සුඛ

▲**මානසික ශක්තිය-** Mental energy: ආධ්‍යාත්මික මග වඩාගැනීම පිණිස මානසික ශක්තිය- විරිය අවශ්‍යවේ. **බලන්න**:ශක්තිය.

▲ **මනෝ උපවිචාර**: පාලි: **මනොපවිචාරා**- Mental exploration: යම් දෙයක් පිළිබඳව සිතෙන් පරීක්ෂාකර බැලීම මනෝ උපවිචාරය වේ. ධර්මයට අනුව මනෝ උපවිචාර ලෙසින් පෙන්වා ඇත්තේ සළායතන මගින් අල්වාගන්නා බාහිර අරමුණු පිලිබඳ ඇතිවන සොම්නස, දොම්නස හා උපේක්ඛාව (වේදනා) පිළිබඳ විපරම් කිරීමය. **සටහන**: අටුවාවට අනුව මනෝ උපවිචාර විතක්ක හා විචාර කිරීමය (The mind's examination of the eighteen cases, using the 'feet' of thought and examination (vitakkavicārapādehi). **බලන්න**: EAN :note: 436, p. 602. **ශබ්දකෝෂ: BD**: p. 183: '**manopavicara**: mental indulging: 18 ways of indulging'

▼ **මනෝ උපවිචාර 18 කි (අටළොස් මනෝපවිචාර)-** eighteen mental examinations: **ඇස නිසා: 1)** ඇසෙන් සතුට ඇතිකරණ (සෝමනස්ස) රූප දැක ඒවා ගැන මනසින් විමසාබැලීම 2) ඇසෙන් අසතුට ඇතිකරණ (දෝමනස්ස) රූප දැක ඒවා ගැන මනසින් විමසාබැලීම 3) ඇසෙන් උපේක්ෂාව ඇතිකරණ රූප දැක ඒවා ගැන මනසින් විමසාබැලීම. **කණ නිසා**: 4) කණෙන් සතුට ඇතිකරණ (සෝමනස්ස) ශබ්ද අසා ඒවා ගැන මනසින් විමසාබැලීම 5) කණෙන් අසතුට ඇතිකරණ (දෝමනස්ස) ශබ්ද අසා ඒවා ගැන මනසින් විමසාබැලීම 6) කණෙන් උපේක්ෂාව ඇතිකරණ ශබ්ද අසා ඒවා ගැන මනසින් විමසාබැලීම **නාසය නිසා**: 7) නාසයෙන් සතුට ඇතිකරණ (සෝමනස්ස) ගඳ-සුවඳ විඳ ඒවා ගැන මනසින් විමසාබැලීම 8) නාසයෙන් අසතුට ඇතිකරණ (දෝමනස්ස) ගඳ-සුවඳ විඳ ඒවා ගැන මනසින් විමසාබැලීම 9) නාසයෙන් උපේක්ෂාව ඇතිකරණ ගඳ-සුවඳ විඳ ඒවා ගැන මනසින් විමසාබැලීම **දිව නිසා**: 10) දිවෙන් සතුට ඇතිකරණ (සෝමනස්ස) රස විඳ ඒවා ගැන මනසින් විමසාබැලීම 11) දිවෙන් අසතුට ඇතිකරණ (දෝමනස්ස) රස විඳ ඒවා ගැන මනසින් විමසාබැලීම 12) දිවෙන් උපේක්ෂාව ඇතිකරණ රස විඳ ඒවා ගැන මනසින් විමසාබැලීම **කය නිසා**: 13) කයෙන් සතුට ඇතිකරණ (සෝමනස්ස) පහස විඳ ඒවා ගැන මනසින් විමසාබැලීම 14) කයෙන් අසතුට ඇතිකරණ (දෝමනස්ස) පහස විඳ ඒවා ගැන මනසින් විමසාබැලීම 15) කයෙන් උපේක්ෂාව ඇතිකරණ පහස විඳ ඒවා ගැන මනසින් විමසාබැලීම **මනස නිසා**: 16) මනසින් සතුට ඇතිකරණ (සෝමනස්ස) ධර්මකරුණු ගැන සිතා ඒවා ගැන විමසාබැලීම 17) මනසින් අසතුට ඇතිකරණ (දෝමනස්ස) ධර්මකරුණු ගැන සිතා ඒවා ගැන විමසාබැලීම 18) **මනසින්** උපේක්ෂාව ඇතිකරණ ධර්මකරුණු ගැන සිතා ඒවා ගැන විමසාබැලීම. සළායතන පිලිබඳ මනා අවබෝධය පිණිස, මනෝපවිචාර 18 මනාව දතයුතුය යි බුදුන් වහන්සේ වදාළහ. **බලන්න:** සළායතන. **මූලාශ්‍ර:** ම.නි: (3) 3.4.7 සළායතන විභඞග සූත්‍රය, පි. 474, EMN: 137- Saḷāyatanavibhanga Sutta- The Exposition of the Six fold Base, p. 974.

▼ **මනෝ උපවිචාර පිලිබඳ බුදුන් වහන්සේ පෙන්වා ඇති දහම් කරුණු සත්‍ය වේ**: මනෝ උපවිචාර 18 පිළිබඳ බුද්ධ දේශනාව අසත්‍යයයි ඔප්පු කළනොහැකිය, කෙලෙසන්නට නොහැකිය, නින්දාකිරීමට නොහැකිය, විශෝධනයකිරීමට - ඉවත්කිරීමට නොහැකියයි බුදුන් වහන්සේ වදාළහ, **බලන්න**: ධර්මයේ සද්භාවය. **මූලාශ්‍ර**: අං.ගු.නි: (1) 3 නිපාතය: මහාවග්ග:

3.2.2.1 සූත්‍රය, පි. 348, EAN:3: The Great Chapter, 61.1 Sectarian, p.104.

▲ **මනෝකම්ම-** mental actions: මනසින් සිදුකරන යහපත් හෝ අයහපත් ක්‍රියා මනෝ කම්මවේ. **බලන්න**: කර්ම, කුසල හා අකුසල.

▲**මනෝමය කය-**Mind-made body: ඉද්දිබල වඩා ගැනීම මගින්, මනෝමය කය ඇතිකරගත හැකිය, මෙය අෂ්ටවිද්‍යා ඥානයන්ගෙන් එකකි. **බලන්න:** අෂ්ටවිද්‍යා ඥාන, ඉද්දිබල.

▲ **මනෝමය දේවනිකාය-**Mind-made Deva group: මනෝමය දේවනිකාය ලෙසින් පෙන්වා ඇත්තේ කබලිංකාර ආහාරගන්නා දේවලෝක ඉක්මවා ඇති ශුද්ධාවාසයකි. **බලන්න**: දේවලෝක. බුදුන් වහන්සේ පෙන්වා ඇත්තේ: මේ සසුනේ ශිලසම්පන්න, සමාධි සම්පන්න, ප්‍රඥාසම්පන්න මහණ සංඥාවේදිත නිරෝධ සමාපත්තිය ලබා ඉන් නැගිසිටිමට සමත්බවය. ඒ මහණ, මේ භවයේදී අරහත්වයට නොලැබුවේ නම්, මනෝමය දේවකාය දෙවියන් අතර පහළවන බවය. **සටහන**: මේ දෙවියන්ගේ උතුම් ගුණ සිහිකිරීම අනුසති භාවනාවකි. **බලන්න:** භාවනා. **මූලාශ්‍ර:**අංගු.නි: (3) 5 නිපාත: 5.4.2.6 නිරෝධසූත්‍රය, පි. 334, EAN:5:166.6 Cessation, p.290.

▲ **මනෝ නිවාරණය-**Restraint the mind: මනෝ නිවාරණය ලෙසින් පෙන්වා ඇත්තේ සිත සංවර කරගැනීමය. එසේ කරගැනීමට, දුක නැතිකර ගැනීමට, සියලු දෙයින්ම සිත වළකා ගත යුතුද? යයි එක් දේවතාවක් බුදුන් වහන්සේ ගෙන් විමසුහ.බුදුන් වහන්සේ මෙසේ වදාළහ:

**" සැමදෙයකින්ම සිත වළකා ගතයුතු නැත,යමකින් අකුසල ඇතිවන්නේ නම් ඒ දෙයින් සිත වළකා ගත යුතුවේ". මූලාශ්‍රය:** සංයු.නි: (1) සගාථවග්ග:දේවතාසංයුත්ත:1.3.4 මනෝ නිවාරණ සූත්‍රය, පි.52.

▲ **මනෝ සංඛාර**-Manosankhara: මනෝ සංඛාර: චිත්ත සංඛාර ලෙසින්ද පෙන්වා ඇත. සංඛාර-චේතනා පහළ කරන තුන් ආකරයෙන් (කාය, වචී, මනෝ) එක් ආකාරයකි. යහපත් සිතුවිලි, යහපත් කායික, වාචික ක්‍රියාවන්ට මුල්වේ. එමගින් ඇතිකරගන්නා යහපත් කර්ම විපාක, පරලොව සුවය පිණිසය. අයහපත් මනෝ සංඛාර, අයහපත් අයහපත් විපාක ගෙනදේ. **බලන්න**: සංඛාර, කර්ම, මනෝ උපවිචාර.

▲**මනෝසංචේතනා ආහාර** -mental volition: මෙය සිව් ආහාර-පෝෂණයන්ගෙන් එකකි**. බලන්න**:ආහාර.

▲ **මනෝ සංවරය**-Mano sanvaraya: මනෝ සංවරය යනු සිත යහපත් ලෙසින් සංවර කරගැනීමය, ආධ්‍යාත්මික වර්ධනය පිණිස අවශ්‍යතාවයකි. **බලන්න**: ම.නි: (3) ඉන්ද්‍රියභාවනා සූත්‍රය, ඉන්ද්‍රිය සංවරය.

▲**මනෝ සුචරිතය හා මනෝ දුශ්චරිතය-**Mental Good condut & Miscondut: මනසින් කරන යහපත් ක්‍රියා මනෝසුචරිතයවේ. අයහපත් ක්‍රියා මනෝදුශ්චරිතයවේ. **බලන්න**: සුචරිතක්‍රියා හා දුශ්චරිත ක්‍රියා.

▲**මිනිසත්බව-**Humanhood: මිනිසත්බව යනු මනුෂ්‍යා ලෝකයේ උපත ලැබීමය. මිනිසත් බව ලැබීම දුර්ලභ දෙයකි. බුදුන් වහන්සේ පෙන්වා ඇත්තේ, මහා පොළවේ ඇති පස් ප්‍රමාණය මහත් බවත්, නිය අග ඇති පස් පිඩ ඉතාමත් සුළු බවය. එලෙසින්, යම් සත්වයෙක්, මිනිසත්බව ලබයි නම් ඒ ඉතා අල්පය. එහෙත්, අන් සත්වයන් අතර ඉපදෙන අය මහා පොලව මෙන අධිකය. එයට හෙතුව චතුසත්‍ය අවබෝධ නොකිරීම ය යි බුදුන් වහන්සේ වදාළහ. **සටහන්:** * විස්තර පිණිස **බලන්න**: සංයු.නි: (5-2) මහාවග්ග:සච්චසංයුත්ත:පඤ්චගතිපෙයියාල වග්ග: මනුස්ස චුති සූත්‍ර. ** සංයු.නි: (2) ඔපම්මසංයුත්ත:8.1.2. නඛසිඛා සූත්‍රයේදී බුදුන් වහන්සේ වදාළේ, මිනිසත් බව ලබන සත්වයන් අල්පබවය, එමනිසා අප්‍රමාදව, හික්මිය යුතුබවය. **මූලාශ්‍රය**: සංයු.නි: (5-1) මහාවග්ග: සච්චසංයුත්ත :ආමකධඤ්ඤපෙයියාල වග්ග: 12.7.1 අඤ්ඤත්‍ර සූත්‍රය, පි.356.

▲ **මිනිස් ආයුෂ-**Human lifespan: මෙහිදී බුදුන් වහන්සේ පෙන්වා ඇත්තේ මිනිස් ආයුෂ කලින්කලට වෙනස්වියන අන්දමය:1) කකුසඳ බුදුන් සමයේ , මගධයේ මිනිසුන් **තිවර** ලෙසින් හැඳින්විය, ඔවුන්ගේ ආයුෂ වසර 40,000 කි 2) කොනාගමන බුදුන් සමයේ මගධයේ මිනිසුන් **රෝහිතස්ස** ලෙසින් හැඳින්විය, ඔවුන්ගේ ආයුෂ වසර 30,000 කි 3) කාශ්‍යප බුදුන් සමයේ, මගධයේ මිනිසුන් **සුප්පිය** ලෙසින් හැඳින්විය, ඔවුන්ගේ ආයුෂ වසර 20,000 කි 4) ගොතම බුදුන් වැඩවසන සමයේ මගධයේ මිනිසුන් **මාගධක** ලෙසින් හැඳින්විය, ඔවුන්ගේ ආයුෂ මදය, වසර 100-120 කි. **බලන්න**: වෙපුල්ල පර්වතය. **මූලාශ්‍රය:**සංයු.නි: (2): නිදානවග්ග:අන්මතග්ග සංයුත්ත: දුග්ගතවග්ග: 3.2.10 වෙපුල්ල පබ්බත සූත්‍රය, පි.314.

▲**මිනිස් ජීවිතය-**Life of human: මිනිස් ජීවිතය අල්පය, දිගු කලක් ජීවත්වුවත්, ඒකාන්තයෙන්ම වයසටපත්වී- ජරාවට, මිය ඇදේ.**බලන්න**: ජරාව, මරණය.

▲**මුන්ඩ රජ**-King Muṇḍa: **බලන්න**: උපග්‍රන්ථය:3

**මණ**

▲**මණ්ඩ-**Manda: මණ්ඩ යනු ප්‍රසන්න බවය, මිහිරි බවය. ශාස්තෘන් වහන්සේ (බුදුන් වහන්සේ) හමුවූ කල්හි ත්‍රිවිධ මණ්ඩ ඇතිවේ (ත්‍රිවිධ රස පාන) :1) **දේශනා මණ්ඩය-** සතර ආරිය සත්‍ය, බෝධිපාක්‍ය ධර්ම, ආරිය අටමග: කියාදීම, දැක්වීම, පැනවීම, නුවණ හමුවේ තැබීම, විවෘතකිරීම, විභාග කිරීම, ප්‍රකට කිරීම. 2) **ප්‍රතිගහ මණ්ඩය** :මහණ, මෙහෙණ, උවසුවෝ, උවැසියෝ, දෙවියෝ, මිනිස්සු ආදිය. 3) **බ්‍රහ්මචාර්ය මණ්ඩය**. ආරිය අටමගය. **මූලාශ්‍රය**:ඛු.නි:පටිසම්භිදා 1:මහාවග්ග: 10: මණ්ඩපකථා,පි.536.

▲ **මණිකා- චින්තාමණි-**Manika chinthamanai : **'**මණිකා- චින්තාමණි**'** නම් විද්‍යාව පුරුදු පුහුණු කළ කෙනෙකුට ද අනුන්ගේ සිත් දැනගත හැකිය. **බලන්න:** ප්‍රාතිහාර්ය.

▲**මණිචූලක ගාමිණි-** Maṇicūḷaka the headman: **බලන්න**: උපග්‍රන්ථය:3

▲ **මණිභද්ද යක්ඛ**-Yakka Manibaddha: මණිභද්ද යක්ඛ ගේ භවනයවූ, මණිමාලක චේතියෙහි (මගධයේ) බුදුන් වහන්සේ වැඩ වසන සමයේ, ඒ යක්ඛ, බුදුන් වහන්සේ සමග, සිහිය ඇතිව වාසය කිරීම පිලිබඳ වූ සංවාදය මේ සූත්‍ර යේ පෙන්වා ඇත. **මූලාශ්‍ර**: සංයු.නි: (1) සගාථවග්ග: යක්ඛසංයුත්ත:10.1.4 මණිභද්ද සූත්‍රය,පි.396.

▲**මුණි**-Muni: මුණි (මෞනෙය) යනු බුදුන් වහන්සේ හඳුන්වන පදයකි. මුණිවරු සියලු ආසව පහකර, ත්‍රිවිධ සමාචාරය (කාය වචී හා මනෝ පිරිසුදුබව) ඇතිව වැඩසිටිති . සෝදා හළ පව් ඇති ඒ රහතුන් "ආර්යයෝ" යයි බුදුන් වහන්සේ වදාළහ. **මූලාශ්‍රය:** ඛු.නි: ඉතිවුත්තක: 3.2.8 මෞනෙය සූත්‍රය, පි. 422.

▼**මුණිගුණ**: "යමෙක් උපන් කෙළෙස් නසා, මතු උපදින කෙළෙස් නුපදවාද...ලෝකයාගේ අර්ථය පිණිස හැසිරෙන ඔහු ශ්‍රෙෂ්ඨ මුණිවරයෙක් යයි බුදුවරු පවසති..." **සටහන:**මේ සූත්‍රයේ මුණිවරුන්ගේ ගුණ විස්තරාත්මකව පෙන්වා ඇත. **මූලාශ්‍රය:**ඛු.නි:සුත්තනිපාත: උරගවග්ග:මුනිසූත්‍රය,පි.82.

▼ **බුදුන් වහන්සේ මෙසේ වදාළහ: "**නන්ද (මානවක), මේ සසුනේ ස්කන්ධආදියේ දක්ෂයෝ දිට්ඨියෙන්, ඇසීමෙන් (ශ්‍රැතියෙන්) ඥානයෙන මුණි යයි නොකියති. කෙනෙක් සියලු කෙළෙස් නසා රාග ආදී ව්‍යාසන රහිතව නිරාශව (ආසව නොමැතිව) හැසිරෙන්නේ නම් ඔහු 'මුණි' ය යි මම කියමි". **සටහන**: මේ සූත්‍රය දේශනා කර ඇත්තේ නන්ද මානවකටය. **මූලාශ්‍රය**: ඛු.නි. සුත්ත නිපාත: පාරායනවග්ග:වස්තුගාථා: පි,326, 5-7 නන්දමානවක, පි.350.

▼ **කාම, භව** ආදියේ නොඇලුන, පලිබෝධ නැති උතුමා මුණිය. **මූලාශ්‍රය**: ඛු.නි.සුත්තනිපාත: පාරායනවග්ග:වස්තුගාථා: පි,326, 5-9 තොදෙය්‍යමානවක, පි.354

▲ **මුණ්ඩසාවක** -shaven-headed: මොහු, බුදුන් වහන්සේ වැඩසිටි සමයේවිසූ අන්‍යආගමික නායකයෙකි. **බලන්න**: අන්‍යආගමික.

▲ **මුණි ධජය**- The seers' banner : බුදුන් වහන්සේ මුණි ධජය ලෙසින් පෙන්වා ඇත්තේ ධර්මය යහපත් ලෙසින් කථා කිරීමය, එනම් මුණි ධජය ලෙලවීමය. පණ්ඩිතයා ගැන බාලයෝ නොදනී, එහෙත් ඔහු නිවන දක්වමින් ධර්මය පහදා දෙනවිට ඔහු, පණ්ඩිතයෙක් බව ඔවුන් දැනගනී. පණ්ඩිතයෝ ධර්මය කතා කලයුතුය, පහදා දිය යුතුය. මුණිවරයාගේ (බුදුන් වහන්සේගේ) ධර්ම ධජය නම් යහපත් ලෙසින් ධර්මය පහදාදීමය. **සටහන:** විශාඛ පංචාලිපුත්ත තෙරුන් යහපත් ලෙසින් ධර්මය දේශනාකර, ධර්ම ධජය ලෙලෙවන පණ්ඩිතයෙක් යයි බුදුන් වහන්සේ පැසසුම් කර ඇත. **මූලාශ්‍ර**: අංගු.නි: (2) 4 නිපාත: 4.1.5.8 විශාඛ සූත්‍රය, පි.122, EAN: 4: 48.8 Visākha, p. 167, සංයු.නි: (2) නිදානවග්ග: භික්ඛුසංයුත්ත: 9.1.7 විශාඛ පංචාලිපුත්ත සූත්‍රය, පි. 453, ESN: 21: Bhikkhusamyutta: 7: Visākha, p. 928.

**මම**

▲**මමංකාරය-**Mamankaraya: තණ්හාව, මානය, දිට්ඨිය ඇතිව, පංච උපාදානස්කන්ධය, මමය, මගේය, මගේ ආත්මය යයි අල්වාගැනීම මමංකාරයය. **බලන්න**: පංචඋපාදානස්කන්ධය.

**මය**

▲ **මායාව-** deceitful: මායාව -අනුන් රැවටීමය, අකුසලයකි, අවිද්‍යාව නිසා මායාව ඇතිවේ. **බලන්න** :සල්ලේඛ පරියාය.

▼**මායාව ඇතිඅය,**මරණින් මතු දුගතියේ-නිරයේ යළි උපතට පත්වෙන බව මේ සූත්‍රයේ විස්තර කර ඇත. **බලන්න**: සංයු.නි: (4) සළායතනවග්ග: ගාමිණී සංයුත්ත:8.1.13 පාටලිය සූත්‍රය.

▲**මියගිය ඥාතින්**-Dead relatives: දීර්ඝ සංසාරයේ කෙනෙක්ගේ, මිය ගිය ඥාතින්, ප්‍රේත ලෝකයේ උපත ලබා නැතය යන්න කිව නොහැකිය. ඔවුන්, පිං ලබාගැනීමට බලාසිටින නිසා ඔවුන්ට පින් අනුමෝදන් කිරීම සුදුසුය. **බලන්න:**ඛු.නි: ඛුද්ධකපාඨ: තිරෝකුඩ්ඩ සූත්‍රය, මළවුන් අනුස්මරණය.

**මර**

▲ **මරණය:** පාලි:**මරණං**-death: මරණය යනු ජීවිත ආයුෂ අවසන්වීමය. උපන් සෑම සත්ත්වයෙක්ම මරණයට පත්වීම ස්වභාවිකය. පටිච්චසමුප්පාදය විස්තර කළ බුදුන් වහන්සේ පෙන්වා දුන්නේ මරණයට පත්වීමට හේතුව ජාතිය- උපතක් ඇතිවීම බවය. **බලන්න**: ජාති ජරා හා මරණ, පටිච්චසමුප්පාදය.

▼ **බුදුන් වහන්සේ** මෙසේ වදාළහ: **"...සියලු සත්ත්වයෝ මරණය ස්වභාව කොට ඇත්තාහ. මරණය කෙළෙවර කොට ඇත්තාහ. මරණය නො ඉක්මවූවෝය". සටහන:** ඒ පිලිබඳ දැක්වූ උපමාව: අමු හෝ පුළුස්සන ලද හෝ මැටිබඳුන්, සියල්ල බිඳීමේ ස්වභාවය කොට ඇත. එලෙස සියලු සත්වයෝ මරණය ස්වභාව කොටඇත. **බලන්න**: උපග්‍රන්ථය:5 **මූලාශ්‍ර**: සංයු.නි: (1) සගාථවග්ග:කෝසලසංයුත්ත: 3.3.2 අය්‍යකා සූත්‍රය, පි. 202, ESN:3 Kosala samyutta: 22.2 Grandmother, p. 254.

▼**සියලු ධර්මතා මැරෙනසුළුය**. "...කවර සියල්ලක්ද? "ඇස, රූපය,චක්ඛු විඥානය, චක්ඛුසම්ඵස්සය,ඒම නිසා හටගන්නා වේදනාව (සුව, දුක, මධ්‍යස්ථ) සියල්ල මැරෙනසුළුය...". **සටහන:** එලෙස සෙසු ධර්මතා: කණ, ශබ්දය, සෝත විඥානය... මැරෙනසුළුය. **මූලාශ්‍රය:** සංයු.නි: (4) සළායතනවග්ග**:** වේදනාසංයුත්ත:ජතිධම්මවග්ග:1.4.4. මරණධම්ම සූත්‍රය, පි.83.

▼**වෙනත් මූලාශ්‍ර:1. "**මරණය තමන් ඉදිරියේ සිටින බව දැනෙනවිට සිත පිහිටා ගන්නා විදිය: තමන් දරුණු අසනීපයකින්, හෝ මරනාසන්නව සිටිනවිට සිත මනාව පිහිටුවා ගැනීම මගින් යහපත් ලෙසින් මියයෑමට, මතු භාවය යහපත් වීමට උපකාරවේ".

" වේදනාවෙන් කය පෙලෙනවා - එත්, සිත පෙලෙන්නේ නෑ
මේ කය කැඩිලා යාවි - මේ සිතද නැතිවියාවි

මේ හැම වෙනස්වෙනවා- කිසිදෙයක් මම නොවේ
වේදනා විදින කෙනෙක් මෙහි නැහැ

මියයන කෙනෙක් මෙහි නැහැ
ඇත්තේ මේ පස්කඳ පමණයි…
ඉපදෙනවිට ගෙන ආවේ නැහැ කිසි දෙයක්
යනවිට ගෙනයන්නේ නැ කිසිදෙයක්.:**Discourses in Brief** by Somdet Phra Wanrut-Tup Buddhasiri: Wide Angle.

▲ **මරණ බිය**- Fear of the death: මරණ බිය ලෝකයාට ඇති පස්බිය වලින් එකකි. ධර්මමාර්ගයේ ගමන් කරනවිට සිදුවිය හැකි උවදුරු නිසා ඕනෑම අවස්ථාවක මරණයට පත්විය හැකිය. මාර්ගය සාක්ෂාත් නොකරගෙන මරණයට පත්වීම භයානකය. එම කරුණු සිහිකර, විරිය ඇතිකර මාර්ගය වඩා ගත යුතුය. මරණ බිය දකින මිනිසා නිවන ලබාගැනීමට කටයුතු කලයුතුය යි බුදුන් වහන්සේ වදාළහ. **බලන්න**: පස්බිය, අනාගතභය, ජාතිය ජරාව හා මරණය.

▲ **මරණ සංඥාව**- perception of death: මරණ සංඥාව, ආසවක්‍ෂය කරගැනීමට උපකාරීවන පංචධර්මයන්ගෙන් එකකි. ගිලන් මහණ, මරණ සංඥාව වඩන්නේ නම් එය ඔහුට පහසු විහරනයක්වේ.: **මූලාශ්‍රය:** අංගු.නි: (3) 5 නිපාත: ගිලානවග්ග:5.3.3.1 ගිලානසූත්‍රය, පි.254.

▲ **මරණසතිය-** Reflection of Death: මරණසතිය- මරණානුසතිය, යනු තමාගේ මරණය පිළිබඳව සිහිය පවත්වා ගැනීමය, භාවනවකි, නිවන දක්වාම මග දියුණුකර ගැනීමට උපකාරිවේ. **බලන්න**: භාවනා.

▼**බොජ්ඣංග ධර්ම** ඇසුරු කර මරණසතිය වැඩිම, මහත් පහසු විහරණය පිණිස පවතී. **මූලාශ්‍ර:** සංයු.නි: (5-1) මහාවග්ග: බොජ්ඣංග සංයුත්ත:නිරෝධවග්ග:මරණසති සූත්‍ර, පි.273.

▼**මරණ සතිය වැඩීමට උපකාර වන වටිනා උපදෙස්:** 1. මිනිස් ජීවිතය අල්පය, සුළුය, කෙටිය, බොහෝ දුක්, කරදර වලින් යුක්තය. ඒ නිසා ප්‍රඥාවෙන් කුසල් කලයුතුය, බඹසර හැසිරිය යුතුය, උපන්කෙනෙකුට නොමැරී සිටිය නොහැකිය 2) තණ අග ඇති පිනිබින්දුව, හිරු උදාවූවිගස නැතිවී යන ලෙසින් මිනිස් දිවිය වහා නැතිවේ 3) වැසි වටින විට ඇතිවන දිය බුබුළු ඇතිවූ සැනෙන් නැතිවී යන ලෙසින් මිනිස් දිවිය වහා නැතිවේ 4) දිය මතුපිට ඉරක් ඇන්දද, ඒ ඉර වහා මැකී යන්නා සේ මිනිස් දිවිය වහා නැතිවේ 5) සැඩ වතුර පහරක් අසුවන සැම දේම රැගෙන වහා ගලා යන ලෙසින් මිනිස් දිවිය වහා නැතිවේ 6) දිව අග ඇති කෙළ පිඩක් වහා බිමට දමන ලෙසින් මිනිස් දිවිය වහා නැතිවේ 7) රත්වූ යකඩ කබලකට දමන ලද මස් පිඩක් වහා දැවී යන ලෙසින් මිනිස් දිවිය වහා නැතිවේ 8) වධක භූමියට ගෙනයන එළදෙනක්, තබන පියවරක් පාසා මරණයට ළඟාවේ, එලෙස මිනිස් ජීවිතයද වහ වහා මරනය වෙතට පිය නගයි. මෙලෙස මරණ සතිය වඩන්නේ නම්, ත්‍රි ලක්ෂණය- අනිච්ච, දුක්ඛ, අනාත්ම බව ඉතා ඉක්මනින් අවබෝධ කල හැකිවේ: **"දිවි කතර සැඳා අඳුර"**:කටුකුරුන්දේ ඤාණානන්ද භික්ෂු, පහන්කනුව ධර්ම දේශනා.

**2. "**උපතත් සමග සැමකල්හිම මරණය එනවා**": දිය සුළිය:** කටුකුරුන්දේ ඤාණානන්ද භික්ෂු, පහන්කනුව ධර්ම දේශනා.

▲**මරණාසන්න -** At the time of death: බෞද්ධයෙක් මරණාසන්න මොහොතේදී ධර්මය ඇසීම අවර්ජනා කිරීම යහපත් මරණයකට හේතුවන බව බොහෝ සූත්‍ර දේශනා වල දක්වා ඇත. අනාථපිණ්ඩික සිටු, දීඝායු උපාසක, ධනංජානි බ්‍රාහ්මණ, එග්ගුන තෙර ආදී උතුම් සංඝයා අවසාන මොහොතේ ධර්මය ශ්‍රවනය කර උතුම් මග ඵල ලැබූහ. මරණාසන්න මොහොතේ ධර්මය යහපත් ලෙසින් ඇසීමට ලැබීම ඵල දායි බව බුදුන් වහන්සේ මෙහිදී පෙන්වා ඇත. උතුමෙක් වෙතින් ධර්මය ඇසීමෙන්, සිත සතුටට පත්ව යහපත් මරණයක් ලබාගත හැකිවේ, මාර්ගඵල පවා සාක්ෂාත්කර ගැනීමට හැකිවේ. ධර්මයශ්‍රවනය කිරීමට අවස්ථාව නො ලැබේ නම්, තමන් ඇසූ, පුරුදු පුහුණු කල දහම සිතින් අවර්ජනා කරමින්, සිත ප්‍රබෝධමත් කරගැනීමෙන් ද යහපත් මරණයක් ලබාගත හැකිවේ, මාර්ගඵල පවා සාක්ෂාත්කර ගැනීමට හැකිවේ. **මූලාශ්‍රය**: අංගු.නි: (4) 6 නිපාත: මහාවග්ග: 6.2.1.2 එග්ගුන සූත්‍රය, පි.178.

▼ **මරණාසන්න සෝතාපන්න පුද්ගලයෙක්** සිව්දහමින් අස්වැසිය යුතුය යයි බුදුන් වහන්සේ වදාළහ. ත්‍රිවිධ රත්නය ගැන ඇති අචල ප්‍රසාදය, ආරිය කාන්ත ශිලය. අනතුරුව ඔහුගේ සිත ක්‍රමයෙන්, දේවලෝක, බ්‍රහ්ම ලෝක යන්හි පිහිටුවා ගැනීමට කරුණු පහදා දිය යුතුය. අවසානයේ, සත්කාය නිරෝධය කෙරහි සිත පිහිටුවාගෙන දුකින් මුදවාලීමට කටයුතු කලයුතුවේ.

**මූලාශ්‍රය:** සංයු.නි: (5-2): මහාවග්ග: සෝතාපත්තිසංයුත්ත: 11.6.4 ගිලාන සූත්‍රය, පි. 270.

▲ **මාරයා** -māra- Evil-one: ලෝක සත්ත්වයෝ කාමයට, වරදට පොළඹවන්නේ, සසරගමන දිගු කරන්නේ මාරයා විසින්ය. මාරායා, පෘථග්ජනයා බැඳ තබන කෙළෙස් බැම්ම - පංච කාමබන්ධන: මාරබන්ධනය, මාරපාශය ලෙසින් හඳුන්වයි. මාරයා පරාජය කර සම්බුද්ධත්වය ලැබූ නිසා බුදුන්වහන්සේ **'මාරජ- මාරභඤ්ජන'** ලෙසින් හඳුන්වයි. සම්ප්‍රදායට අනුව :මාරයා කාමදේවලෝක හයේ, ඉහළම දේවලෝකයවූ පරනිර්මිත වසවර්තියේ වාසය කරයි. **සටහන්**: * මාරයා පිළිබඳ විස්තර පිණිස **බලන්න**: සංයු.නි: (1) සගාථවග්ග: මාරසංයුත්ත සූත්‍ර. ** මාරයාගේ ස්වභාවය පස් ආකාරය( පංචමාරයා)1) දේවපුත්‍ර මාර- දෙවියෙක් ලෙසින් 2) කෙළේශමාර -කෙළෙස්වලට අධිපති 3) ස්කන්ධමාර- පංචඋපාදානස්කන්ධයට අධිපති 4) කම්මමාර- කර්මසකස්කිරීමට පොළඹවන 5) මාර මාර- මරණය ලෙසින්.** **මාරයා හඳුන්වන නම්:** පාපීමාර (Māra the Evil One), පමත්තබන්ධු- ප්‍රමාදයේ ඥාතියා (kinsman of the negligent) , නමුචි. ** **මාරවිෂය (**මච්චුධෙය්‍ය **-** Realm of Māra**):** මාරයාගේ ආදිපත්‍ය-බලයට යටවීම-කෙළෙස්වලට යටවීමය ** **මාරවසභය-**yoke of Death: මාරයාගේ වසඟයට-මායාවට හසුවූ අය යළි උපත ලබමින් සසර සැරිසරයි. **ශබ්දකෝෂ: පා.සිං.ශ:** පි.423: '**මාර**: වසවත්තිමාරයා- පංචමාර'. **B.D :** p. 184: 'Māra: is the Buddhist 'Tempter', the opponent of liberation. He appears in the texts both as a real person-as a deity and as personification of evil and passions, of the totality of worldly existence and of death' .

▼ **සමිද්ධි තෙරුන්**, මාරයා යනු කවරෙක්ද? යයි බුදුන් වහන්සේගෙන් ඇසුහ. බුදුන් වහන්සේ මෙසේ වදාළහ:

**"සමිද්ධි, යම්තැනක ඇස තිබේද, ඇසෙන් අල්ලා ගන්නා රූප තිබේද, එනිසා ඇතිවන චක්ඛු විඥානය තිබේද, චක්ඛු විඥානයෙන් දන්නා දේ තිබේද , එතන මාර හෝ මාරයාගේ පැනවීමක් වේ"**

**"...සමිද්ධි, යම් තැනක ඇස නො තිබේද, ඇසෙන් අල්ලා ගන්නා රූප නො තිබේද, එනිසා ඇතිවන චක්ඛු විඥානය නො තිබේද, චක්ඛු විඥානයෙන් දන්නා දේ නො තිබේද , එතන මාර හෝ මාරයාගේ පැනවීමක් නැත". සටහන:** එලෙස සෙසු සළායතන ගැනද , පෙරකී ලෙසින් දත යුතුය:කණ, ශබ්ද, සෝත විඥානය, සෝත විඥානයෙන් දන්නා දේ නාසය, ගඳ, ඝාන විඥානය , ඝාන විඥානයෙන් දන්නා දේ දිව, රස, ජිව්හා විඥානය , ජිව්හා විඥානයෙන් දන්නා දේ කය, පහස, කාය විඥානය , කය විඥානයෙන් දන්නා දේ මනස, සිතුවිලි මනෝ විඥානය , මනෝ විඥානයෙන් දන්නා දේ ආදී වශයෙන්. **මූලාශ්‍ර:** සංයු.නි: (4) සළායතනසංයුත්ත: සමිද්ධි මාර පඤ්හ සූත්‍රය, පි.112, ESN: 35: Salayathana- samyutta: 65.3 Samiddhi, p. 1238.

▲ **මාරආධිපත්‍යය**- Mara's Control: ආධිපත්‍යකරන අය අතුරින්- මිනිසුන් පාලනය කරන අය අතුරින් මාරයා ප්‍රමුඛ තැන ගනී. (Māra is the foremost of rulers).

**මූලාශ්‍ර:** අංගු.නි: (2) 4 නිපාතය: 4.1.2.5. අගගපඤ්ඤාතති සූත්‍රය, පි.56, EAN:4: 15.5. Proclamations, p. 153.

▼**සැම කල්හිම සතියඇතිව** (ස්මෘතිමත්ව) සක්කාය දිට්ඨිය දුරුකොට, ලෝකය ශුන්‍ය යයි බලන විට මාරආධිපත්‍යයට යට නොවේ. **මූලාශ්‍රය**: ඛු.නි.සුත්තනිපාත: පාරායනවග්ග:වස්තුගාථා: පි,326, 5-15 මෝඝරාජමානවක, පි.364.

▲**මාර තර්ජන-** Threats of Mara: බුදුන් වහන්සේ චාරිකාව පිණිස උරුවෙල දනව්වට වඩින අවස්ථාවේ මාරයා පැමිණ මෙසේ පැවසුහ: **"ශ්‍රමනය, මාගේ විෂයෙන් නො මිදෙන්නෙහිය"**. බුදුන්වහන්සේ මෙසේ වදාළහ: **"දෙවියන් හෝ මිනිසුන් බඳනා යම් කෙලෙස් මලපුඩු ඇද්ද, ඒ සියලු පාසයන් ගෙන් ... ඒ මහත් කෙලෙස් බැඳුමෙන් මිදුනෙහි වෙමි... සිත්කලුවූ රූපයෝද ශබ්දයෝද ගන්ධයෝද ස්පර්ශයෝද යන මේ පස්කම් කෙරෙහි පැවති මගේ ආලය වෙසෙසින්ම පහව ගියේය. මාරය ඔබව විනාශ කලෙමි".** එකල්හි පවිටු මාරයා "භාග්‍යවතුන්වහන්සේ මා දන්නා සේක, සුගතයන් වහන්සේ මා දන්නා සේක" යයි දුක් සිත් ඇතිව නොසතුටින් නොපෙනී ගියේය. **මූලාශ්‍රය**: වින.පි: මහාවග්ග පාළිය 1, මාරකතා:පි. 121- 24.

▲**මාරයාගේ දියණියෝ -** Mara's Daughters: මාරයාගේ දියණියෝ- තණ්හා, අරති හා රාගා (මාරධීතු) ය. සම්බෝධිය ලත් බුදුන් වහන්සේ පරාජය කිරීමට නොහැකිවූ මාරයා උකටිලිව සිටිනවා දැක, ඒ පිළිබඳ කරුණු දැනගත් මාර දියණියන්, බුදුන් වහන්සේ වසඟයට ගැනීමට තමන්හට හැකිය යි පවසා උන්වහන්සේ දැකීමට පැමිණියේය. බොහෝ මායාවන් දක්වා බුදුන් වහන්සේ වසඟයට ගැනීමට නොහැකිවූ ඔවුන්

පුදුමයට පත්ව ඒ ගැන, බුදුන් වහන්සේ ගෙන ප්‍රශ්න විමසා ඇත. **සටහන:** අටුවාවට අනුව: වනයේ ඇතෙක් අල්වා ගැනීමට යොදාගන්නේ පුහුණු කළ ඇතින්නක්ය. එලෙස මාර දියණියන්ද තමන්ගේ ස්ත්‍රී මායා දක්වා බුදුන් වහන්සේ දමනය කරගැනීමට සිතූහ. **බලන්න**: ESN: note 323: p. 544.

**1) තණ්හා ගේ විමසීම: "** සන්තාපය නිසා ද බවුන්දම් පුරන්නේ වනයේ- නැතිනම් ඔබගේ සම්පත් නැතිවීගිය දුකටද ? ගමේ වැරද්දක් කර වනයේ සැඟවී සිටිනවාද?- ජනයා හා මිතුරුවීමට කැමති නැද්ද?"

**බුදුන් වහන්සේගේ පිළිතුර: "** සිත වශීකර සැප ගෙනෙදෙන- කෙළෙස් මාර සේනාව පැරදුවෙමි, හුදකලාව බවුන්වඩන විට- ප්‍රමෝදය ඇතිවී හදවත සංසුන්විය. උතුම් අරමුණ ඉටු කරගත් මට- ලෝකයා හා බැඳීම් කුමටද?"

**2) අරතිගේ විමසීම: "**පැවිදිකෙනෙක් ගේ විහරණය කෙසේද?- පස් ඕසය තරණය කර, සය වැන්න දිණුවේද? හාත්පසින් එන කාම අරමුණු ඉවතලා -ඔහු, බවුන් වඩා ගන්නේ කෙසේද?" **සටහන**: පස්ඕසය: පංච ඔරම්ගිය සංයෝජන හෝ පස්දොරින් සිදුවන කෙලෙස්, සය වැන්න උද්දම්භාගිය සංයෝජන හෝ මනසින් කරණ කෙලෙස්ය. **බලන්න**: ESN: note: 326, p. 544.

**බුදුන් වහන්සේගේ පිළිතුර: "** සංසුන් කය ඇති, මිදුන සිත ඇති- සිහි ඇති ඒ මහණ, නොකරයි කම්විපාක. අනගාරිකව, දහම මැනවින් දැන- විතර්ක ඉවතලා බවුන්වඩයි මැනවින්. ඔහු නොකිපේ, රාගයෙන් නොකැළඹේ-මෝහය ඔහු වෙලාගෙන නැත. එලෙස විහරනයේ යෙදෙන ඔහු- පස් ඕසය සිඳ, සයවැන්න දිනා ඇත. සංසුන්ව බවුන්වඩන ඔහුට- කාම සිතිවිලි නොකරයි ගැහැට." **සටහන**: **සංසුන් කය**:(කායපස්සද්දිය- Tranquil in body): ජානසමාපත්තිය නිසා, **මිදුනසිත**: (සුවිමුත්තචිත්තො -mind well liberated) අරහත්වයට පත්වූ විට **කර්මපාක** නොකරයි : රහතුන් විපාක දෙන කර්ම රැස් නොකරයි .**බලන්න**: ESN: note: 327,p. 544.

**3) රාගාගේ විමසීම:** " තණ්හාව බිඳ දමා, බහුජනයා දිනාගනිමින්- නිසැකවම, ඔහු බොහෝදෙනා එතර කරනු ඇත. අහෝ! බොහෝ ලෝක වැසියෝ උදුරාගෙන- ඔවුන් මරුගේ මුවින් මුදා හරිනු ඇත"

**බුදුන් වහන්සේගේ පිළිතුර:** "නිසැකයෙන්ම තථාගතයෝ මහා වීරයෝය- ඔවුන් සත් දහමින්, ජනයා එතර කරන්නෝය සම්මා දහම මග පෙන්වන කල- මොන ඉරිසියාවක්ද? දහම දත් අයට"

බුදුන් වහන්සේ වසඟයට ගැනීමට නොහැකිවූ මාර දියණියන් ආපසු එනවා දැක මාරයා මෙසේ පැවසූහ: " නෙළුම් දණ්ඩෙන් පව්වක් බිඳින්ට-නියපොතු වලින් ගලක් හාරන්ට,දතින් යවයක් සපන්නට- බාල ඔබ හැම ගත් වෑයම අමන දෙයකි, මහා මෝඩකමකි. මහා ගලක් හිසේ දරාගෙන-ගැඹුරු වගුරක පාතබනවිට, ඔබ එරියයි වගුරේ ළය මත්තට- එලෙස බාලව හැසිරෙමින්, ආපසු අවා මහා අසතුටකින්"

**සූත්‍රය අවසානයේදී** තෙරුන් මෙසේ පවසා ඇත: "තණ්හා රති රාගා මාර දූවරු- බබළවමින් තම රූ සපුව මැනවින් පැමිණියා අප බුදුන් දමනයට.

මහා සුලං රැල්ලක් හමාඇවිත්-පුළුන් කැටියක් පාකර හරින ලෙසින් මහා මුණි, ඔවුන් ඉවතටම හැලුවා”. **මූලාශ්‍ර**: අංගු.නි: (6) 10 නිපාත :10.1.3.6.කාලී සූත්‍රය,පි. 114, EAN:10: The Great Chapter: 26.6 Kali, p. 502, සගාථවග්ග: මාරසංයුත්ත: 4.3.5.මාරධීතු සූත්‍රය, පි.252, ESN: 4 Marasamyutta: 25.5 Mara’s Daughters, p. 298.

▲ **මාරයා හා බුද්ධ පරිනිර්වානය-** Mara & the Parinibbaana of The Buddha: බුදුන් වහන්සේ විසාලාමහනුවර, චාපාල චෛත්‍යයේ වැඩවසන සමයේ එහි පැමිණි මාරයා භාග්‍යවතුන්වහන්සේට පිරිනිවන්පෑමට කාලය පැමිණ ඇතැයි පවසා ඇත. **මූලාශ්‍ර:** දීඝ.නි:3 මහාපරිනිර්වාණ සූත්‍රය, පි.126, EDN: 16: The Great Passing-The Buddha’s Last Days, p.171.

▲ **මාර විෂය -**the realm of Death: මාර විෂය යනු, සසරය, මාරයාගේ බලයට යටවූ පෙදෙස. මරුගේ වසඟය, මාරපයාස-මාරබන්ධනය ලෙසින්ද දක්වා ඇත.**බලන්න**: මච්චුධෙය්‍ය. සළායතන මගින් කාමය: ප්‍රිය රූප, ශබ්ද (ආදී බාහිර අරමුණු) ගැන කැමතිව, ආශාව ඇතිකර ගැනීම මරුගේ වසඟයට, බන්ධනයට යටවීම බව බුදුන් වහන්සේ පෙන්වා ඇත. **මූලාශ්‍ර**: සංයු.නි: (4) සළායතනවග්ග:වේදනාසංයුත්ත: ලෝකකාමගුණ වග්ග: 1.1.21. මාරපාස සූත්‍රය, පි. 220, ESN: Vedanasamyutta: II: 114.1 Mara, p.1271.

▼**කායගතා සතිය නොමැතිවිට**, සිත දූෂිතවේ, ඒ අවස්ථාවදී පහසුවෙන්ම මාර වසඟයට පැමිණේ. **බලන්න**: අවස්සුතපරියාය. **මූලාශ්‍ර:**සංයු.නි: (4) සළායතනවග්ග: වේදනාසංයුත්ත:ආසිවිසිවග්ග: 1.19.6 අවස්සුත පරියාය සූත්‍රය, පි.380, ESN:35:Salayatanasamyutta:243.6 Exposition on the Corrupted, p.1319.

▲**මාරයා වැලපීම-** Weeping of the Mara: සත්වසක් බෝසතුන් වසඟයට ගැනීමට නොහැකිව, සම්බෝධිය ලැබූ බුදුන්වහන්සේ තමාගේ විෂයට පත්කරගැනීමට අසමත්වූ මාරයා මෙසේ පවසාඇත: ‘කකුළුවෙක්ගේ සියළු අඬු බිඳදමන ලෙසින්, සසරට බැඳ තබන මගේ පොළඹවාගැනීම්, උපායන්, ක්‍රමවිධි හැම ඔබ වහන්සේ කඩාදමා සුනුවිසුනු කරනලදී. බුද්ධත්වයට පැමිණි ඔබ වහන්සේ නැවත මගේ බැම්වලට හසුකර ගත නොහැකිය, ආවේශ කරගැනීමට නොහැකිය. තදගලක්, ආහාරයක් ය යි සිතා ඒ ගල කන්නට පැමිණි කපුටා, එසේ කල නොහැකිව පැරදී යන ලෙසට, මම ද බලාපොරොත්තු සුන්කරගෙන, දොම්නසින් ගෝතමයන් වහන්සේ වෙතින් පිටත් වෙමි...’ **මූලාශ්‍ර:** සංයු.නි: (1) සගාථවග්ග:මාරසංයුත්ත: 4.3.4 සත්තවස්ස සූත්‍රය, පි. 248, ESN:4 Marasamyutta: 24.4 Seven Years of Pursuit, p. 295.

▲**මාරයාගේ වසඟයට පැමිණීම-** Coming under Mar’s influence පංචඋපාදානස්කන්ධයේ යථාබව නොදත් පුහුදුන් මිනිසා මරුගේ වසඟයට පැමිණ ඇත. **මූලාශ්‍ර**:සංයු.නි: (1) සගාථවග්ගදේවතාසංයුත්ත:.2.10: සමිද්ධි සූත්‍රය, පි. 44, ESN:1 Devatasamyutta: 20.10 Samiddhi, p. 79.

▼ **කෙනෙක් මමය මාගේය** යයි සිතන්නේ නම්, ක්‍රියාකරන්නේනම්, ඔවුන් තමාගේ ග්‍රහණයෙන් මිදෙන්නේ නැත යයි මාරයා පවසා ඇත.

අමතමග - නිවන්මග මාරයාගේ විෂයට බැහැරය. **මූලාශ්‍ර:** සංයු.නි: (1) සගාථවග්ග:මාරසංයුත්ත: 4.3.4 සත්තවස්ස සූත්‍රය, පි. 248, ESN:4 Marasamyutta: 24.4 Seven Years of Pursuit, p. 295.

▼ **රූප වේදනා ආදීවූ** පංච උපාදානස්කන්ධයට ඇලීම, 'මාරයා' යයිද, ඒ ධර්මතා 'මාරධම්ම' යයි බුදුන් වහන්සේ වදාළහ. ඉන් ගැලවීම මාරයා ගෙන් මිදීමය. මේ සූත්‍ර දේශනා කරඇත්තේ රාධ තෙරුන්ටය. **මූලාශ්‍ර:** සංයු.නි**:** (3) ඛන්ධවග්ග:රධා සංයුත්ත: 2.2.1 හා 2.2.2 සූත්‍ර,පි.380, ESN: 23: Radhasamyutta: 11.1 & 12.2 suttas, p. 1122.

▲**මාරසේනාව**-Mara's squadron: ධර්මමාර්ගය අහුරාදමන කෙළෙස්-මාර සේනාව- මාරයාගේ දසබල සේනාව ලෙසින්ද හඳුන්වයි.

▼**බෝසතුන්** නෙරංජනා නදිතිරයේ නිවන අරමුණුකොට සමාධිය වඩන අවස්ථාවේ මාරයා දසබල සේනාව සමග එහි පැමිණි බවත්, නිවනලැබීම දුෂ්කරබව පවසා පුණ්‍ය ක්‍රියා කරන්න යයි බුදුන් වහන්සේට පැවසුබව මේ සූත්‍රයේ දක්වා ඇත.

**මාරයාගේ දස බල සේනාව:** 1) කාමය-Sensual pleasures (කෙලෙස් කාම- Sense-Desires) 2) අරතිය -discontent (අධි කුසලයෙහි උදාසීනභව) 3) සාගින්න හා පිපාසය-Hunger & thirst 4) තණ්හාව -craving 5) ථිනමිද්ධය- dullness & drowsiness (කුසලයට මැලිවීම) 6) භියසුලුකම-cowardice 7) විචිකිච්චාව-doubt ( තෙරුවන් පිලිබඳ සැකය) 8) මකුබව හා තදබව -contempt & obstinacy (ගුණමකු බව හා මුරණ්ඩුකම ) 9) ලාභ සත්කාර හා ප්‍රසංශා- profit, praise & honor 10) තමාගේ ගුණ පෙන්වමින් අනුන් පහත් කිරීම- extolling of oneself & scorning others. බලන්න: "**The Life of The Buddha**" by Bhikkhu Nanamoli, p. 20. **මූලාශ්‍ර :** ඛු.නි: සූත්‍රනිපාත: 3-2 පධාන සූත්‍රය, පි.146, Suttanipata: Mhavagga: Padhanasutta: translated by Bhikkhu Sujato, Suttacentral.

▼ **බඹසර වැස අවසන් කිරීම යනු මාර සේනාව ජය ගැනීමය**: සුජාත තෙරුන් අරහත්වයට පත්වීම ගැන බුදුන්වහන්සේ මෙසේ වදාළහ: "මේ මහණ තෙමේ ඍජු සිතින්, කෙලෙසුන්ගෙන් මිදී, සංයෝජන වෙන්කර, උපාදාන රහිතව නිවීමට පත්වී මාර සේනාව දිනා අන්තිම ශරීරය දරයි" **බලන්න**: බ්‍රහ්මචරියාව. **මූලාශ්‍ර :** සංයු.නි: (1) සගාථවග්ග:භික්ඛුසංයුත්ත: 9.1.5**: සුජාත සූත්‍රය**, පි. 452, ESN: 21 Bhikkhu samytta*:* 5: Sujata, p. 926.

▲ **මාරයා විඥාණය සෙවීම**- Mara searching for consciousness: එක් සමයක් බුදුන් වහන්සේ වේළුවනාරාමයෙහි වැඩ වසන් සමයේ, වක්කලී තෙරුන් ඉසිගිළි පව්වේදී අපවත්විය. බුදුන් වහන්සේ ඒ ස්ථානයට පැමිණ අහසේ එහෙ මෙහෙ අත යන කළු දුමක් පෙන්වා මෙසේ වදාළහ:

"මහණෙනි, ඔබට, පෙරදිගට… (ආදී දස දිසාවට) යන් අඳුරු දුම පෙනේද? … ඒ පවිටු මරුය, ඔහු, වක්කලී කුල පුතුන්ගේ විඥානය සොයයි...වක්කලී කුලපුත්‍ර, නොපිහිටි විඥානයෙන් පිරිනිවීගියේය" .**බලන්න**: වක්කලී තෙර. **මූලාශ්‍ර :** සංයු.නි: (3) ඛන්ධසංයුත්ත: ථෙරවග්ග: 1.2.4.5**:** වක්කලී සූත්‍රය, පි.234.

▲**මාර්ගය-**The Path ධර්මයේ, මාර්ගය (මග්ග) ලෙසින් පෙන්වා ඇත්තේ ආරිය අටමගය. එම මාර්ගය සම්පූර්ණ කිරීම බ්‍රහ්මචරියාව නිමකර නිවන පසක් කර ගැනීමය. **සටහන්**: * දුක නැතිකිරීමේ මග, නිවන් මග, ආරිය අටමගය. **බලන්න**: ධම්මචක්කප්පවත්තන සූත්‍රය. ** කවර අර්ථයකින් මාර්ගය වේද? යන්න මෙහි විස්තරාත්මකව පෙන්වා ඇත. **බලන්න**:ඛු.නි: පටිසම්භිදා 1: මහාවග්ග: 9 මග්ග කථා, පි.530. ** ධම්මපදය: 20 :මාර්ගවග්ගයේ: මාර්ග අතුරින්, ආරිය අටමග උතුම්බව පෙන්වා ඇත.

▼ **බුද්ධත්වය** ලැබූ බුදුන් වහන්සේ ධර්ම මාර්ගය පිලිබඳ විතක්ක කිරීමේදී, සතිපට්ඨානය වැඩීම, ආරිය අටමග අවබෝධය පිණිස නිවන පිණිස එකම මග බව සංසයාට ප්‍රකාශ කිරීම පිලිබඳ විස්තරය මේ සූත්‍රයේ දක්වා ඇත. **මූලාශ්‍ර**: සංයු.නි: (5-1) මහාවග්ග:සතිපට්ඨානසංයුත්ත:අමතවග්ග: 3.5.3 මග්ග සූත්‍රය, පි.358

▼**බුදුන් වහන්සේ මාර්ගය** මෙසේ විස්තර කර ඇත: **ආරිය හා අනාරිය** මාර්ග: දසකුසලය ආරිය මගය, දස අකුසලය අනාරිය මගය. **අඳුරුමග හා දීප්තිමත්** මාර්ග: දසඅකුසලය අඳුරු මගය (කණ්හ-ක්‍රිෂ්ණ), දසකුසලය දීප්තිමත් මගය (සුක). **බලන්න**: අංගු.නි: (6) 10 නිපාත: 10.4.4.1.අරියමග්ග සූත්‍රය, 10.4.4.2. කණහමගග සූත්‍රය.

▲ **මාර්ග ඵල**-Margahaphala: මාර්ග ඵල ලෙසින් පෙන්වා ඇත්තේ සෝතාපන්නවීම, සකදාගාමී වීම, අනාගාමීවීම හා අරහත්වීම යන සතර ඵල ලැබීමය. කරුණු 5 ක් වඩාගැනීමෙන්, බහුල කරගැනීමෙන් මේ ජීවිතයේදීම අනාගාමී හෝ අරහත්වය ලබාගත හැකිබව බුදුන් වහන්සේ පෙන්වා ඇත. සිහිය ඇතිව (සමෘතිය) -එළඹී සිහියෙන් යුතුව:1) ස්කන්ධ පිළිබඳ උදය වය ප්‍රඥාව තිබීම 2) අසුභය වැඩීම 3)ආහාරයෙහි ප්‍රතිකූල සංඥාව වැඩීම 4) අනභිරති සංඥාව වැඩීම 5) සියලු සංස්කාරයන්හි අනිත්‍ය සංඥාව වැඩීම. **මූලාශ්‍රය**: අංගු.නි: (3) 5 නිපාත: ගිලානවග්ග: 5.3.3.2 සතිසූපට්ඨිත සූත්‍රය, පි.254.

▲**මාර්ග බාධා**- Obstacles'for the path: ආධ්‍යාත්මික මාර්ගයේ ගමන් කරනවිට මුහුණදීමට සිදුවන බාධා 8 ක් මෙහි පෙන්වා ඇත:1) මෙ ඉවුරට පැමිණීම- සළායතන වලට හසුවීමය 2) එහා ඉවුරට යාම - බාහිර අරමුණු 6 ට (බාහිර ෂඩායතන) හසුවීමය. 3) ගඟ මැද කිමිදීම-නන්දිරාගයට හසුවීමය. 4) ගොඩට ගැසීම- අස්මිමානයට හසුවීමය.5) මිනිසුන් ගැනීම- ගිහියන් හා බැඳීමට පත්වීමය 6) නො මිනිසුන් ගැනීම- දේවනිකායක් පතමින් මග බඹසර කිරීමය 7) සුළියකට හසුවීම- පස්කම් සැපයට යටවීම 8) ඇතුළත කුණුවීම- කෙළෙස්වලට යටවීම නිසා මග බඹසර අයහපත්වීම. **බලන්න**: උපග්‍රන්ථය:5. **මූලාශ්‍ර**: සංයු.නි: (4 ): සළායතනවග්ග:වේදනා සංයුත්ත: 1.19.4 දාරුක්ඛන්ධ උපමා සූත්‍රය, පි.1.19.4,ESN:33: Vedanasamyutta:IV Vipers:241.4 The simile of the great log, p.1317.

▲ **මාර්ග බ්‍රහ්මචරියාව**- Marga Brhamachariya: අසේඛ ශීලය, අසේඛ සමාධිය , අසේඛ ප්‍රඥාව යන ධර්මතා සම්පූර්ණ කර ගැනීම මාර්ග බ්‍රහ්මචරියාව සාක්ෂාත් කරගැනීමය, එසේ කරගත් උතුමා, රහතන්වහන්සේය. **බලන්න**: අත්‍යන්ත බ්‍රහ්මචාරී.

▲ **මාරිස-**Mārisa: මාරිස යනු දෙවියන්, බුදුන්වහන්සේ හා උතුම් සංඝයා අමතනන ගරු පදයකි (dear sir). **සටහන**: අටුවාවට අනුව එහි අර්ථය: 'නිදුකානෙනි'- දුක නොමැතිකෙනා. දෙවිවරු, එනෙකා අමතන්නේද මාරිස ලෙසිනි **බලන්න**: ESN: note 1, p. 498.

▼ **සසර තරණය කළේද**? යයි දේවියක් බුදුන් වහන්සේ විමසීම:

**"...කථනනු තවං මාරිස, ඔඝමතරීති?"**: නිදුකානෙනි, ඔබ සසර තරණය කළේද? **මූලාශ්‍ර:** සංයු.නි: (1) සගාථවග්ග: දේවතාසංයුත්ත: 1.1.1 ඔඝතරණ සූත්‍රය, පි. 28, ESN:1: Devatāsaṃyutta:1.1 Crossing the Flood, p. 59.

▼ **සක්දෙව්දු මුගලන් මහා රහතුන් ඇමතීම:**
**'සාධු ඛො මාරිස මොගගලලාන බුදධං සරණගමනං හොති...'**
**"**නිදුකානෙනි මොගගලලානනි, බුදුන් සරණ යෑම මැනවි..." **මූලාශ්‍ර:** සංයු.නි: (4) සලායතනවග්ග: මොග්ගල්ලාන සංයුත්ත: 6.1.10 -12 සක්ක සූත්‍ර 3,පි. 526, ESN: 40: Moggallānasamyutta, 10 Sakka -3 suttas, p. 1423.

▲ **මුරණ්ඩුබව:** පාලි: **ථම්භො-**obstinacy: මුරණ්ඩුබව (තද) යනු යමක් පිළිගැනීමට ඇති දැඩි අකමැතිබවය. හිතුවක්කාර කම ලෙසින්ද පෙන්වයි. ධර්මයේ, මෙය දෝවචස්සතාවයක්ය. එනම්, දහම් අවවාද අනුසාසනා පිලිගැනීමට ඇති අකමැත්ත. මෙය අකුසලයකි, දුගතියට ගෙන යයි. **බලන්න**:උප කෙලෙස, දෝවචස්සතාවය.

▼**වෙනත් මූලාශ්‍ර:1**."යහපත් දෙයට සිත දැඩිව සිටීම, නො නැමෙන ස්වභාවය ථම්භය වේ. මෙය මානයේම එක් ආකාරයකි. ගරු කළයුතු අයට ගරු නොකරයි, අවවාද අනුසාසනා නො පිළිගනී". **කෙලෙස් එක්දහස් පන්සීය**: පි. 47, රේරුකානේ චන්දවිමල නාහිමි, 2008.

▲ **මොරනිවාප ආරාමය-** Moranivapa Arannya. මේ ආරාමය, රජගහනුවර ආසන්නව පිහිටි පරිවාජක ආරමයකි. බුදුන් වහන්සේ මෙහි වැඩසිටිබව මේ සූත්‍රයේ දක්වා ඇත. **බලන්න**: අංගු.නි: (6) 11 නිපාත: අනුස්සතිවග්ග: මොරනිවාප සූත්‍රය.

**මල**

▲ **මල-**stains: මල යනු කිලිටි, අපවිත්‍ර දෙයක්ය. ධර්මයට අනුව මල යනු කෙළෙස්ය. **ත්‍රිවිධ මල : රාගමල-** කාමයට බැඳීම නිසා සිත කිලිටිවීම. **දෝසමල**- තරහනිසා සිත කිලිටිවීම. **මෝහමල -** අවිද්‍යාව නිසා සිත කිලිටිවීම. මේවා කෙළෙස්ය, මේවා ගැන අවබෝධය ලබාගැනීමට හා ඒවා පහ කරගැනීමට අරියඅටමග යහපත්ලෙසින් වර්ධනය කරගත යුතුවේ. **මූලාශ්‍ර**: සංයු.නි: (5-1) මහාවග්ග:මග්ගසංයුත්ත: 1.15 මලසූත්‍රය, පි.156, ESN: 45 Maggasamyutta: 167.7 Stains, p. 1712.

▼ **අතිරේක මල 3**: **දුසිල්වත්බව, ඉරිසියාව හා මසුරුකම** මල යයි බුදුන් වහන්සේ වදාළහ. ඒ මල- කෙළෙස් ප්‍රහීණය කර නොගන්නේ නම්, ගෙනවුත් බහා තැබුවා සේ නිරයට පැමිණේ. යම් කෙනක් මේ අකුසල 3 පහ කරගත්තේ නම් ඔහු ඒකාන්තයෙන්ම සුගතියට පැමිණේ. **සටහන:**

මල ඇත්තේ බාලයන්ටය. පණ්ඩිතයෝ ඒ මලවලින් පිරිසිදුව ඇත. **මූලාශ්‍ර**: අංගු.නි: (1) 3 නිපාත: බාලවග්ග: 3.1.1.10 සූත්‍රය, පි. 240, EAN: 3: 10.10 Stains, p. 81.

▼ **මල අට :** 1) මන්ත්‍ර-ශාස්ත්‍ර ආදිය සජ්ජායනා නොකිරීම- නො හැදෑරීම මලයකි 2) ගේදොර නඩත්තු නොකිරීම මලයකි 3) කුසිතබව පැහැපත් සිරුරට මලයකි 4) යම්කිසි දෙයක් රකිනවිට, ප්‍රමාදවීම මලයකි 5) දුශ්චරිතය, කාන්තාවට මලයකි 6) දායකයා හට මසුරුකම මලයකි 7) ලාමක අකුසල් මෙලොව හා පරලොව ජීවිතයට මලයකි 8) මේ සියලු මලයන්ට වඩා නරකම මලය අවිද්‍යාවය. **සටහන:** ධම්මපදය:18 මලවග්ගයේ, මේ මල අට පෙන්වා ඇත. **මූලාශ්‍රය:** අංගු:නි: (5) 8 නිපාත:8.1.2.5 මල සූත්‍රය, පි.98.

▲**මල්ලිකා දේවිය-**Queen Mallika: **බලන්න**: උපග්‍රන්ථ:3

▲ **මල්පූජා-**Offering flowers: බුදු පසේබුදු උතුමන්ට මල් පූජාකිරීම යහපත් විපාක ගෙනෙදේ. **බලන්න:** උප ග්‍රන්ථය:1,2.

▲ **මල් අසුන් පූජා-**Offering flower stands: බුදු පසේබුදු උතුමන්ට මල් අසුන් පූජාකිරීම යහපත් විපාක ගෙනෙදේ. **බලන්න**: උප ග්‍රන්ථය:1

▲**මල්වතු-උද්‍යාන-වනගොමු -**Gardens- Parks- Forest Groves: වෙනත් අයගේ සතුට පිණිස මල්වතු-උද්‍යාන-වනගොමු සකස්කිරීම සුගතියට මගකි. **බලන්න**: පින් වැඩෙන අන්දම.

▲**මල්ල රාජ සල්උයන-** Royal Malla Sal park: උතුරු දඹදිව, මල්ල රජුන්ගේ ප්‍රදේශයේ, කුසිනාරා නුවර පිහිටි මේ සල් උයන අපගේ ගෝතම බුදුන් වහන්සේ මහා පරිනිබ්බානයට පත්වූ ස්ථානයය. **බලන්න:** දීඝ.නි: මහා පරිනිර්වාණ සූත්‍රය, ශ්‍රද්ධාවෙන් දැකිය යුතු සිව් ස්ථාන, කුසිනාරා.

▲ **මලුවා වැල උපමාව-** Simile of Maluwa creeper: **බලන්න**: උපග්‍රන්ථය:5

▲ **මෙලොව හා පරලොව-**This world & the other world: මෙලොව යනු වර්තමානයේ අප ජීවත්වන ලෝකයය, පරලොව යනු මරණින් මතු යලි උපදිනා ස්ථානයය. ධර්මානුකූල ජීවත්වීම මෙලොව හා පරලොව (දෙලොව) සුව සැප පිණිස වේ.**බලන්න:** කර්ම විපාක, සුගතිය, දුගතිය, දෙලොව.

▼**මෙලොව හා පරලොව යහපත**: මෙලොව හා පරලොව (දෙලොව) යහපත- උභය ලෝකඅර්ථසිද්ධිය ලෙසින් පෙන්වා ඇත. ඒ යහපත ඇතිකර ගැනීම පිණිස කුසල ධර්ම පිළිබඳ සිහිය පවත්වා ගත යුතුය යි මෙහිදී පෙන්වා ඇත. පුණ්‍යක්‍රියා ගැන සිහිය ඇතිව කටයුතු කරන්නා පණ්ඩිතකි, ඔහු දෙලොවම අභිවෘද්ධිය ලබාගන්නා නැණවත් පුද්ගලයාය. **මූලාශ්‍රය:** ඛු.නි: ඉතිවුත්තක: 1.3.3. උභෝඅර්ථ සූත්‍රය, පි. 370.

▼දාන පූජාකිරීම නිසා ඇති මෙලොව පරලොව විපාක ගැන **බලන්න**: දානය.

▲**මුල-**Root: ධර්මයේ -මුල් ලෙසින් පෙන්වා ඇත්තේ කුසල මූල හා අකුසල මූලයන්ය. **බලන්න:** කුසල හා අකුසල.

▲ **මූල ධර්ම** -Mula Dharma මූල ධර්ම ලෙසින් මෙහිදී පෙන්වා ඇත්තේ බුදුදහමේ නිදානයය: පටිච්චසමුප්පාද ක්‍රියාවලියය.**බලන්න**: නිදාන.

▲**මූල පරියාය**-The root of all things: මූල පරියාය (සබ්බධර්ම මූල පරියාය) යනු සියල්ල ඇතිවීමට බලපාන කරුණුය- සත්කායධර්මයන්ට මුලය (මම මගේ මගේ ආත්මය ලෙසින් අල්ලා ගැනීමය- සක්කාය දිට්ඨිය): සියලු පෞද්ගලිකවූ හඳුනා ගැනීම්වලට මුල්වූ ධර්මතා, එනම්, පංචඋපාදාන ස්කන්ධය ට ඇතුළත් සියලු ධර්මතා: රූප, වේදනා, සංඥා, සංස්කාර, හා විඥාණ උපාදානස්කන්ධයන්ය. බුදුන් වහන්සේ පුද්ගලයන් වර්ග 4 ක් අනුව මේ ක්‍රියාවලිය සිදුවන ආකාරය විස්තරාත්මකව පෙන්වා ඇත: 1) ධර්මය නොදත් පෘතග්ජන 2) සේඛ භික්ෂුව 3) රහතන්වහන්සේ 4) තථාගතයන් වහන්සේ. **සටහන්**: * අටුවාවට අනුව මෙහි 'සබ්බ' යනු සියලු පෞද්ගලිකවූ හඳුනා ගැනීම්වලට මුල්වූ (සක්කායසබ්බ- all of personal identity) ධර්මතාය, එනම්, පංච උපාදාන ස්කන්ධයය. යලි යලි සසර උපත් ඇතිවන්නේ මේ පංචඋපාදානස්කන්ධය නිසා ඇතිවන ක්‍රියාවලිය මගින්ය. තන්හාව, මානය හා දිට්ඨි නිසා සකස්වන අඛණ්ඩවූ අනුසය ක්‍රියාවලිය හා අවිද්‍යා අනුසය, භවයෙන් භවයට සත්වයා ඇදගෙන යයි : **බලන්න** EMN: note;3 p 1061 ** ම.නි: මහා හත්තිපදොම සූත්‍රයේද මේ ක්‍රියාවලිය පෙන්වා ඇත. **මූලාශ්‍ර**: ම.නි: (1) 1.1 මූල පරියාය සූත්‍රය, පි.22, EMN:1 Mulapariyaya sutta,p.83.

▲ **මෝලිය ඵග්ගුණ භික්ෂුව**-Bhikkhu Moliya phagguna: බලන්න: උපග්‍රන්ථය:4

▲ **මෝලියසීවක පරිබ්‍රාජක-**Moliyasivaka Paribrajaka: බලන්න: උපග්‍රන්ථය:3

▲ **මාලුඞක්‍ය පුත්ත තෙර**- Malunkyapuththa Thera: බලන්න: උපග්‍රන්ථය: 1

**මළ**

▲ **මළවුන් අනුස්මරණය-** Memorial for dead: තමන්ගේ නෑදෑයන්, හිතවතුන් මියගියවිට ඔවුන් සිහිකර- මළවුන් අනුස්මරණය කිරීමට දන් දීම බෞද්ධයන්ගේ චාරිත්‍රයකි. බුදුන්වහන්සේ වැඩසිටි සමයේ විසූ බ්‍රාහ්මණයන්ද මළවුන් අනුස්මරණය කිරීමට දන් දීම කර ඇත. මළවුන් අනුස්මරණය කිරීමට දෙන දානයේ යහපත් විපාක ඇතය යි බුදුන්වහන්සේ පෙන්වා ඇත. **බලන්න**: පින්දීම, මතකදානය, මළවුන්අනුස්මරණය. **මූලාශ්‍ර**: අං.ගු.නි: 10: නිපාතය:10.4.2.11 ජාණුස්සොණි සූත්‍රය, පි. 518, EAN:10: Jāṇussoṇī,177.11, p.554.

▲ **මුළාවූ සිහිය:** පාලි: **මුට්ඨසච්චං**- muddle-mindedness: සිහිය නැතිකම, මුළාවූ සිහිය ඇතිවන්නේ ධර්ම මාර්ගය ගැන අවබෝධය නැති නිසාය, මිථ්‍යාදිට්ඨිය ඇති නිසාය. ඒ නිසා සමාධිය ඇතිකර ගැනීමට නොහැකිය. සිහිය මුළාවූ විට ආධ්‍යාත්මික වර්ධනය ඇතිකර ගැනීමට

නො හැකිවේ. **බලන්න**: උත්තරිය මනුස්ස ධම්ම. **ශබ්දකෝෂ: පා.සිංශ**: පි.427: **"මුට්ඨ: :** මුලාව, සිහි නැතිකම, **මුට්ඨස්සති:** මුලා සිහිය ඇත්තා"

▼**මුළා සිහිය** දුගතියට පත්කරයි, මුළා සිහියෙන් නින්දට යාම නිසා, නරක සිහින පෙනේ, දෙවියෝ ආරක්ෂා නොකරති. මුළා සිහිය සමාධිය ඇති නොකරයි. **බලන්න**:* සංයු.නි: (4) සළායතනවග්ග:මාතුගාම සංයුත්ත: 3.1.14 මුට්ඨස්සති සූත්‍රය, පි.484, ** අංගු.නි: (3) 5 නිපාත: කිම්බිලවග්ග: 5.5.1.10 මුට්ඨස්සති සූත්‍රය, පි.426.

▼ **මුළාවූ සිහිය නැති කර ගැනීමට:** ආරියන් දැකීම හා ඇසුරුකිරීම, ධර්මය ඇසීම, අනුන්ගේ දොස් දැකීම නතර කරගැනීම (**උපාරම්භ චිත්ත-**mind bent on criticism) උපකාරිවේ. **මූලාශ්‍ර**: අංගු.නි: (6) 10 නිපාතය: 10.2.3.6 තයොධම්ම සූත්‍රය,පි.284, EAN:10: Tens,76-6.Incapable, p. 524

▼ **බුදුන් වහන්සේ** මුලාවූ සිහිය පිළිබඳව යහපත් ලෙසින් වදාරා ඇත. ඒ ධර්මතාවය සංඝයා එක්ව, ධර්මයේ චිරස්ථිතිය පිණිස සජ්ජායනා කිරීම සුදුසු ය යි සැරියුත් මහා තෙරුන් සංඝයාට උපදෙස් දී ඇත. **මූලාශ්‍ර**: දිඝ.නි:10 සංගිති සූත්‍රය, පි. 372 , EDN: 33 Saṅgīti Sutta: The Chanting Together, p. 362.

▲**මළපුඩුව උපමාව-**Simile of the snare: **බලන්න**: උපග්‍රන්ථය:5

▲ **මීළඟ්ක උපමාව-** Simile of the worm: **බලන්න**: **බලන්න**: උපග්‍රන්ථය: 5.

**මව**

▲**මව හා පියා**: පාලි: **මාතා පිතා-** Mother & Father: මව හා පියා - දෙමාපියන් ලෙසින්ද හඳුන්වයි. ධර්මානුකූලව ජීවත්වන අය තම දෙමාපියන් හට ගරු කරති, ඔවුන් රැක බලාගනි.**මාපියන්ට ගරුකළයුතුවේ:** උපත ලැබූ අවස්ථාවේ සිට දරුවන්ට, දෙමාපියන්ගෙන් බොහෝ උපකාර කර ඇතිනිසා ඔවුන් හට සැලකීම, ගරුකිරීම සුදුසු යයි බුදුන් වහන්සේ පෙන්වා ඇත. ඔවුන්ට ආහර පාන, ඇඳුම් හා යහන් දියයුතුය, ඔවුන් ගේ පාද සේදිය යුතුය, ඇඟ පත තවා, උලා, නැවියයුතුය. මාපියනට උපස්ථාන කරණ දරුවන් මෙලොවදී සැප ලබති, නුවණැතියන් ඔවුන්ට පැසසුම් කරති. මරණින් මතු දෙව්ලොව සැප ලැබේ.

**මාපියන් හඳුන්වන ගරු පද**: 1) **බ්‍රහ්ම**: බ්‍රහ්මදෙව්වරුනට මෙන් මාපියන්ට ගරු කලයුතුය 2) **පූර්වආචාර්ය-**පුබ්බාචරිය**:** දරුවන්ගේ පළමු ගුරුවරුන් වන්නේ දෙමාපියන්ය 3) **ආහුනෙය්‍ය**: තැගි බෝග පූජාකිරීමට සුදුසු අයවේ. **සටහන්**: * ආහුනෙය්‍ය, සඟ ගුණයකි ** මව්පියන්ට උපස්ථාන කිරීම උතුම්බව **මංගල සූත්‍රයේ** පෙන්වා ඇත. **මූලාශ්‍ර**: අංගු.නි: (1) 3 නිපාත: දේවදූතවග්ග: 3.1.4.1 සූත්‍රය, පි. 282, EAN:3: Divine Messengers: 31.1 Brahma, p. 89.

▼ **මව හා පියා යන දෙදෙනාට** ප්‍රත්‍යුපකාර කිරීම පහසු නැත යයි බුදුන් වහන්සේ වදාළහ:

**"ද්වින්නාහං භික්ඛවෙ න සුප්පතිකාරං වදාමි, මාතුච්ච පිතුච්ච.** (two persons that cannot easily be repaid. What two? One's mother and father). කෙනෙක් මව හා පියා තම දෙවුරේ තබා ගෙන සියවසක් ජීවත්වූවද, ඔවුන් නවා සුවඳ තෙල් ආදිය ගලවා, පිරිමැද, ඔවුන්ගේ මලමුත්‍ර ආදිය සුද්ධ පවිත්‍ර කළද, එපමණකින්, තම දෙමාපියනට, සෑහෙන ලෙසින් සේවය කර නැත, ප්‍රතිඋපකාර කර නැත. තවද, කෙනෙක් තමන්ගේ දෙමාපියන්ට සක්විතිරජ සැප ලබාදුන්නද එය නොසෑහේ යයි බුදුන් වහන්සේ වදාළහ. එයට හේතුව නම්, දෙමාපියන්, දරුවන්ට බොහෝ ඇප උපකාර කර ඇති නිසාය. දෙමාපියන් දරුවන් මේ ලෝකයට ගෙනවිත්, ඔවුන් හදා වඩා ඔවුන්ට ලෝකය පෙන්වා ඇති නිසාය. **උතුම් ලෙසින් දෙමාපියන්ට සැලකිය යුතු ආකාරය**:

1. බුදුසසුන කෙරෙහි දෙමාපියනට ශ්‍රද්ධාව නොමැතිනම් ඔවුන් තුල ශ්‍රද්ධාව ඇති කිරීමෙන්.

2. දෙමාපියන් සිල්වත් නැත්නම් ඔවුන් තුල සිල්වත්බව ඇති කිරීමෙන්. 3. දෙමාපියන් දානශීලි නොවේනම් ඔවුන් තුල දානශීලිබව ඇති කිරීමෙන්. 4. දෙමාපියන් අනුවණනම්, ඔවුනට නුවණ ලබාදීමට කටයුතු කිරීමෙන්. ඒ ආකාරයෙන් කෙනෙකුට, තම දෙමාපියන්ට ප්‍රතිඋපකාර කලහැකිය යි බුදුන් වහන්සේ වදාළහ. **සටහන:** දෙමාපියන්ට ණය ගෙවීම, කිරිමිල ගෙවීම ලෙසින් සාමාන්‍ය ව්‍යවහාරයේ දක්වා ඇත. **මූලාශ්‍ර:** අංගු.නි: (1) 2 නිපාත: 2.1.4.2 සූත්‍රය, පි. 160 , EAN: 2: 33.2 Sutta, p.61.

▼**ආරම්භයක්** -මුල දැකිය නොහැකි මේ සසරේ තමන්ට මව හෝ පියා නොවූ කෙනක් දැකීම සුලබ නැත යයි බුදුන් වහන්සේ පෙන්වා ඇත. **මූලාශ්‍ර:** සංයු.නි: (2) නිදානවග්ග: අනමතග්ගසංයුත්ත: 3.2.4 හා 3.2.5 සූත්‍ර, පි. 312, ESN:15: Anamataggasamyutta: 14.4 suttas, p. 803.

▲**මව්පිය ඝාතනය-** Killing Mother & Father: මව හා පියා ඝාතනය, පංච ආනන්තරික කම්මයන්ගෙන් එකකි. **බලන්න**: පංච ආනන්තරික කම්ම.

▲**මෛවුන්දම් සේවනය-** Sexual intercourse: පැවිදි ජීවිතය ගතකරන සංඝයාට මෛවුන්දම් සේවනය කැපනැත. මෙය ශ්‍රමණයන්ගේ සිත කිළුටු කරන උපකෙලේසයකි. **බලන්න**: උපකෙලේස, සංඝවිනය. **සටහන**: කාමයේ ආදීනව නොදැන මෛවුන් දම් සේවනයේ යෙදුන සංඝයාට සිදුවන විපාක මෙහි විස්තර කර ඇත. මෙහිදී විස්තර කර ඇත්තේ මෙහෙණ මවක් හා මහණ පුත්‍රයෙක් ගැනය. **මූලාශ්‍රය**: අංගු.නි: (3) 5 නිපාත: 5.2.1.5 මතාපුත්‍ර සූත්‍රය, පි.128.

**මස**

▲**මසුන් අල්ලන කෙමිණය උපමාව**-Simile of the Fishing net මසුන් අල්ලන කෙමිණය නිසා බොහෝ මසුන් විනාශයට පත්වේ. මෙ උපමාව යොදාගෙන ඇත්තේ මක්ඛලිගෝසාලගෙ අයහපත් ඉගැන්වීම නිසා බොහෝදෙනාට සිදුවන අයහපත පෙන්වීමටය.**බලන්න: මක්ඛලි** ගෝසාල, උපග්‍රන්ථය:5 **මූලාශ්‍රය**:අංගු.නි (1) :3 නිපාත: 3.3.4.5 සූත්‍රය, පි.554.

▲ **මස් අනුභවය-** meat-eating: සාමාන්‍ය ලෝකයේ මස් අනුභවය- මාංශ භෝජනය පිලිබඳ විවිධ මත ඇත. **සංඝයාට, මස්අනුභවය පිළිබඳව ඇති අවවාද:** කරුණු 3 කින් යුත් මාංස පරිබෝජනය නොකට යුතුය: 1 දක්නා ලද (සතා දානය පිණිස මරණබව දැකීම) 2 අසනාලද (සතා දානය පිණිස මරණ ලද බව ඇසීම) 3 සැක කිරීම (සතා දානය පිණිස මරණ ලද බව සැකකිරීම). කරුණු 3 කින් පිරිසිදුවූ මාංස පරිබෝජනය කැපවෙ: 1 නො දක්නා ලද 2 නො අසනාලද 3 සැක නො කරන ලද බව. මෙය **ත්‍රිකොටිපාරිශුද්ධ කැප මාසං භෝජනයය**. ( Jīvaka, I say that there are three instances in which meat should not be eaten: when it is seen, heard, or suspected [that the living being has been slaughtered for oneself]. I say that meat should not be eaten in these three instances. I say that there are three instances in which meat may be eaten: when it is not seen, not heard, and not suspected [that the living being has been slaughtered for oneself]. **සටහන: *** ජීවක කොමාරභච්ච වෛද්‍යවරයා විසින් සංඝයා මස් අනුභවය කිරීම පිලිබඳ ඉදිරිපත් කල ප්‍රශ්නයකට පිළිතුරු ලෙසින්, බුදුන් වහන්සේ මේ සූත්‍රය වදාළහ. ** **බලන්න**: ආමගන්ධ: මස්භෝජනය පිලිබඳ කරුණු පෙන්වා ඇත. **මූලාශ්‍ර:** ම.නි: (2) 2.1.5 ජීවක සූත්‍රය, පි. 70, EMN: 55: Jīvaka Sutta, p. 449.

▼ **බුදුන් වහන්සේ මෙසේ වදාළහ:** "මහණෙනි, දැන දැන තමන් උදෙසා කළ මස් නො වැළඳිය යුතුය. යමෙක් වළඳන්නේ නම් දුකුළා ඇවතක් වේ... තමන් විසින් නො දුටු, නො ඇසූ, සැක නොකළ, ත්‍රිකොටිපාරිශුද්ධ මත්ස්‍යමාංස අනුදනිමි" **සටහන:** මේ ප්‍රකාශයට හේතු වුවේ, සිහ සේනාපති විසින් දෙන ලද දානයක් පිලිබඳවය **මූලාශ්‍ර:**වින.පි:මහාවග්ග පාලිය 2: භේසජ්ජඛන්ධය: 29, පි.88.

▲ **මස්පිණිස සතුන් මැරීම**-Killing animals: මස්පිණිස මාළුන්, සතුන් ආදිය මරන මස් වැද්දන්, වධක සිතින් එසේ කරන හෙයින් ඔවුන්ට අයහපත් කර්ම විපාක ඇතිවේ. මරණින් මතු අපාය නම් දුගතියේ ඔවුන් යළි උපත ලබන බව මේ සූත්‍රයේ පෙන්වා ඇත. **බලන්න**: ප්‍රාණඝාතය **මූලාශ්‍රය:**අංගු.නි: (4) 6 නිපාත:සාරාණියවග්ග:6.1.2.8 මච්ඡික සූත්‍රය, පි.58.

▲**මස්ඇස**- physical eye: මස්ඇස -භෞතික ඇසය. අභ්‍යන්තර ආයතන 6 න් එකකි. **බලන්න**: චක්ඛු තුන,සළායතන.

▲ **මසුරුකම:** පාලි: **මච්ඡරියං**- Stinginess/ avarice : මසුරුකම (මාත්සර්ය) යනු දැඩි ලෝභයය. ආත්මාර්ථකාමීබවය. තමන්ගේ දේ අනුන්ගේ යහපත පිණිස දීමට ඇති අකමැත්තය. මසුරුකම අකුසලයකි, දුගතියට ගෙන යයි. **බලන්න**: උපකෙළෙස, කුසල හා අකුසල.

▼ **නිවන් මග වඩා ගැනීම** පිණිස පහකළයුතු අකුසල ධර්ම 44න් මසුරුකම එක අකුසලයකි. **මූලාශ්‍ර**: ම.නි: (1) 1.1.8 සල්ලෙඛ සූත්‍රය, පි. 112, EMN: 8-Effacement p.108.

▼ **මිනිසුන් මසුරුකමනිසා** දන් නොදේ, බියනිසා දන් නොදේ, එමනිසා ඔවුනට පින් නොලැබේ, දුගතියේ උපත ලබයි, නොදීම නිසා මෙලොවදීද පරලොවදීද ඔවුන් බඩගින්නෙන් හා පිපාසයෙන් දුක්විඳි යයි දෙවිවරු

පැවසූ වදන් බුදුන් වහන්සේ අනුමත කළහ. **බලන්න**: දෙවිවරු, දානය. **මූලාශ්‍ර:** සංයු.නි: (1) සගාථවග්ග: දේවතාසංයුත්ත: 1.4.2 මච්ඡරි සූත්‍රය, පි. 62, ESN: 1 Devatasamyutta: 32.2 Stinginess, p. 97.

▼ **මසුරුබව පස් ආකාරවේ:** 1) වාසස්ථාන ගැන 2) පවුල ගැන 3) ලාභ ගැන 4) ප්‍රසංසා ගැන 5) ධර්මය පිළිබඳව. සතර සතිපට්ඨානය දියුණු කරගැනීමෙන්, මසුරුබව අවසාන කර ගත හැකිය. **මූලාශ්‍ර**: අංගු.නි: (5) 9 නිපාත: 9.2.2.7 මච්චරි සතිපට්ඨාන සූත්‍රය, පි. 578, EAN:9: 69.7 miserliness, p. 486.

▼ **සංඝයාට ඇතිවිය හැකි මසුරුබව**: 1) ආවාස පිළිබඳව (ආවාස මච්ඡරිය) 2) තමන්ට උපකාර කරන පවුල් ගැන (කුල මච්ඡරිය) 3) තමන්ට ලැබෙන ලාභ ආදිය ගැන (ලාභ මච්ඡරිය) 4) තමන්ට ලැබෙන වර්ණනා-ප්‍රසංසා ආදිය ගැන (වණ්ණ මච්ඡරිය) 5) ශ්‍රද්ධාව ඇතිව අන්‍යයන් දෙන දේ නාස්ති කිරීම (මසුරුකම නිසා වෙනත් අයට නොදීම). 6) ධර්මය කෙරේ ඇති මසුරු බව (ධම්ම මච්ඡරිය- තමන් දන්නා ධර්මය වෙනත් අයට නො පැවසීම) එවැනි අගුණ ඇති මහණ ඒකාන්තයෙන්ම නිරයට යයි. එම අගුණ නොමැති අය ට සුගතිය ලැබේ. **මූලාශ්‍රය:**අංගු.නි: (3) 5 නිපාත:ආවාසවග්ග: මච්ඡරිය සූත්‍ර, පි.454.

▼**මසුරුකම පහකරගැනීම**: බුදුන් වහන්සේ වදාළේ: මසුරුකම පහකරගැනීම පිණිස බඹසර වාසය කලයුතු බවය. **මූලාශ්‍රය:**අංගු.නි: (3) 5 නිපාත:උපසම්පදාවග්ග:5.6.1.5 මච්ඡරිය පහාණ සූත්‍රය, පි.468.

▼ **වෙනත් මූලාශ්‍ර**: 1."තමාගේ දෙය අනුන්ට හිමිවීම හා ඉන් අනුන්ට සුළු ප්‍රයෝජනයක් වුවත් ලැබෙනවා නම් එයට විරුද්ධවන ස්වභාවය මච්ඡරියය. මසුරා, අනුන් ඉල්ලති යන බියෙන් තමාගේ වස්තුව සඟවා තබයි. අධික මසුරුකම ඇතිවිට අනුන් දෙන දාන ආදිය වලක්වයි. එය 'කදරිය' නම්වේ. අනුන්ගේ දීම වලක්වන විට ප්‍රතිග්‍රාහකයාගේ ලාභය නැති කරයි, දායකයා ගේ පිනද වලක්වයි. මෙය මහා පාපයකි. **උදා**: ධම්ම පදය: ලෝක වග්ග, තද මසුරෝ දෙව්ලොව නොයන බව පෙන්වා ඇත. **කෙලෙස් එක්දහස් පන්සියය**:පි.84, රේරුකානේ චන්දවිමල මහානාහිමි, 2008. **2.**" මච්ඡරිය නම් තද මසුරුකමයි. තමන් යමක් භුක්ති නොවිඳින අතර අන් අය භුක්ති විඳිනවා දකින්නට කැමති නොවීම මෙහි ස්වරූපයයි. මෙය වෙන විදිහකට කියතොත් උග්‍ර ලෝභී ලක්ෂණයකි. මේ ලක්ෂණ මච්ඡරිය කෝසිය සිටාණන්ගේ, අදින්න පුබ්බකගේ චරිතයන්ගෙන් මැනවින් ප්‍රකට වෙයි. සමහර දෙමව්පියො තම වස්තුව තම දරුවො පරිහරණය කරනවා දකින්නටවත් කැමති නොවෙති. වස්තුව රැස්කර ප්‍රයෝජන නොගෙන මියැදෙන මිනිසුන් අප සමාජයේ කෙතෙක් ඇත්ද?". **දිනමිණ:** අන්තර්ජාල ලිපිය: http://archives.dinamina.lk/2012/08/08/_art.asp?fn=a1208082

▲ **මුසාවාදය:පාලි:මුසාවාදා** - False speech: මුසාවාදය: අසත්‍ය කථාකිරීම- බොරුකීම දස අකුසලයන්ගෙන් එකකි. **බලන්න**: දසකුසල හා දසඅකුසල. මුසාවාදයෙන් වැළකුණ ලෝකසත්‍වයා ටිකදෙනෙකි, මුසාවාදය ඇති සත්‍වයෝ බොහෝ ය.**මූලාශ්‍රය:**සංයු.නි: (5-2) මහාවග්ග:සච්චසංයුත්ත:12.8.4 මුසාවාද සූත්‍රය, පි.362.

▼ **බොරුකියන අය නිරයට යයි**: බුදුන් වහන්සේ බොරුකියන කෙනෙකුගේ ස්වභාවය මෙසේ දක්වා ඇත:

"මේ ලෝකයේ කෙනෙක් අසත්‍ය කතා කරයි. සභාවක දී, රැස්වීමකදී, තමාගේ ඥාතිපිරිස අතරදී, තමාගේ සමිතියේදී, රාජසභාවේ දී අසත්‍ය කථා කරයි. සාක්ෂිකරුවෙක් ලෙසින් කැඳවා මෙසේ අසනවිට ' එම්බා පුරුෂය, ඔබ දන්නා දෙය කියන්න' යයි පැවසුවිට,නොදන්නා දෙය 'දනිමි' යයි පවසයි. දන්නා දෙය 'නොදනිමි' යයි පවසයි.නොදැක 'දැක්කෙමි' යයි පවසයි, දැක 'නොදැක්කෙමි' යයි පවසයි".

**"ඉධ භික්ඛවෙ එකච්චො මුසාවාදී හොති: සභාගතොවා, පරිසගතොවා, ඤාතිමජ්ඣගතොවා, පූගමජ්ඣගතො වා, රාජකුලමජ්ඣගතො වා. අභිනීතො සක්ඛිපුට්ඨො 'එවමෙහා පුරිස, යං ජානාහි, තං වදෙහි' ති. සො අජානං වා ආහ 'ජානමි' ති. ජානං වා ආහ 'නජානාමී'ති. අපස්සං වා ආහ, 'පස්සාමී' ති, පස්සං වා ආහ, 'න පස්සාමී' ති. ඉති අත්තහෙතු වා පරහෙතු වා ආමිසකිඤ්චික්ඛහෙතු වා සම්පජානාමුසා භාසිතාහොති"**. එවැනි අය ඒකාන්තයෙන්ම නිරයට යයි. **මූලාශ්‍ර**: අං.ගු.නි: (6) 10 නිපාත: කරජකාය වග්ග: 10.5.1.1. පඨම නිරය සූත්‍රය, පි. 548, ජානුසොණි වගග: 10.4.2.10: චුන්ද සූත්‍රය, පි.508, EAN:10: The Deed-born body: 211.1 Hell, p. 556, Jāṇussoṇī: 176.10: Cunda, p.553.

▼**මුසාවාදය නිසා කර්ම** සිව්ආකාරයකට රැස්වේ: 1) තමන් බොරුකීම 2) අනුන්ලවා බොරු කියවීම 3) බොරුකීම අනුමත කිරීම 4) බොරුකීම කීම වර්ණනා කිරීම. **මූලාශ්‍රය:**අං.ගු.නි: (2) 4 නිපාත: මචලවග්ග:4.2.4.2 මුසාවාදී සූත්‍රය, පි.180, කම්මපථවග්ග: 4.7.4 මුසාවාද සූත්‍රය,පි.510.

▼ **වෙනත් මූලාශ්‍ර:** 1."**මුසාවාදය**: අභූත වස්තුවක්- සිදු නොවූ දෙයක්: සිදුවූ දෙයක් කොට අනුන්ට හැඟවීම යන ප්‍රයෝගයෙන් උපදවන්නාවූ චේතනාව මුසාවය. අභූතවාදය, මිථ්‍යා වාදය, බොරුකීම යයිද කියයි. එයට අංග 4 කි: සත්‍යනොවූ දෙයක් වීම, වංචාකරමි යන සිත,ඊට සුදුසු ව්‍යායාමය, වචනයේ අර්ථ දැන කීමය: **සද්ධර්ම කෝෂය,** පි. 113.

▲ **මූසිකා බඳු පුද්ගලයෝ** - Persons similar to Mice: මූසිකා- මීයා, සතර වර්ගයක් බව බුදුන් වහන්සේ පෙන්වා ඇත: 1) එක් වර්ගයක් ගුලක් (බිලක්) හරාගනී, එහෙත් එහි වාසය නොකරයි 2) එක් වර්ගයක් ගුලක වාසය කරයි, එහෙත් ගුලක් හදා ගෙන නැත 3) එක් වර්ගයක් ගුලක් හාරා නොගනී, එසේම ගුලක වාසය නොකරයි 4) එක් වර්ගයක් ගුලක් හාරාගෙන එහි වාසය කරයි. මීයන් ගේ ස්වභාවය ඇති පුද්ගලයන් සිව් දෙනක් බුදුන් වහන්සේ පෙන්වා ඇත: 1) එක් පුද්ගලයෙක් ධර්මය විස්තරාත්මකව හදාරයි, එහෙත්, චතුරාර්ය සත්‍ය අවබෝධ කර නොමැත. ඔහු ගුලක් හරාගත්තද එහි වාසය නොකරන මීයා වැනිය 2) එක් පුද්ගලයෙක් ධර්මය විස්තර සහිතව හදාරා නැත, එහෙත්, චතුරාර්ය සත්‍ය අවබෝධ කර ඇත. ඔහු ගුලක වාසය කරන එහෙත් ගුලක් හදා නොගත් මීයා වැනිය 3) එක් පුද්ගලයෙක් ධර්මය හදාරා නැත, එසේම, චතුරාර්ය සත්‍ය අවබෝධ කර නැත. ඔහු ගුලක් හදා නොගත්, ගුලක වාසය නොකරන මීයා වැනිය 4) එක් පුද්ගලයෙක් ධර්මය හදාරා ඇත, එසේම, චතුරාර්ය සත්‍ය අවබෝධ කර ඇත. ඔහු ගුලක් හදාගෙන එහි වාසය

කරන මීයා වැනිය. **මූලාශ්‍ර**: අංගු.නි: (2) 4 නිපාත: 4.3.1.7 මූසිකා සූත්‍රය, පි. 230, EAN:4: 107.7 Mice, p. 187.

**මහ**

▲**මහක තෙර-**Mahaka Thera: **බලන්න**: උපග්‍රන්ථය:1

▲ **මහත්ඵල මහාආනිසංස: පාලි: මහපඵලා හොති මහානිසංසා -**great fruit and great benefit: මහත්ඵල - මහා අර්ථය-මහා ලාභයය, මහාආනිසංස:මහා අනුසස් ඇතිවීමය. සෝතාපන්න සිට අරහත්මගඵල (සතර මග) ලබාගැනීම මහත්ඵලයවේ. එමගින් සසර දුක අවසන්වීම මහා ආනිසංසයකි. එසේම, කුසලයේ හැසිරීම නිසා මෙලොව ජීවිතය සුවපත් වීම මහා ඵලයකි, සුගතියක යළි උපත ලැබීම මහා ආනිසංසයකි. **සටහන්**: * සතර ඉද්දිපාද වඩා ගැනීම නිසා මහාඵල මහා ආනිසංස ඇතිවේ. **බලන්න**:සංයු.නි: (5-2) මහාවග්ග:ඉද්දිපාදසංයුත්ත:පාසාදකම්පන වග්ග සූත්‍ර.

▼**විවිධ භාවනා අරමුණු** (අට්ඨික සංඥා ආදී) දියුණු කරගැනීම මහත් ඵල මහා ආනිසංස ලබාදීමට හේතුවේ. **බලන්න**: භාවනාව. **මූලාශ්‍ර**: සංයු.නි: (5-1) මහාවග්ග:බොජ්ඣංග සංයුත්තය, ආනාපාන වග්ගය**:** 2.7.1 අට්ඨික සූත්‍රය, පි.268**,** ESN: 46 Bojjhaṅgasaṃyutta:In and out Breathing, 57.1 The Skeleton, p. 1807.

▼ **කායගතා සතිය** වඩාගැනීම මහත්ඵල මහා ආනිසංස පිණිස පවතී. **බලන්න:** කායගතා සතිය. **මූලාශ්‍ර:** අංගු.නි: (1) 1 නිපාත: කායගතාසති වග්ග, පි. 125, EAN:1: Mindfulness Directed to the Body, p.52.

▼ **සතරමග සතර ඵල** ලැබූ සංඝයාට දෙන දානය මහත්ඵල වේ යයි බුදුන් වහන්සේ වදාළහ. **මූලාශ්‍රය**: සංයු.නි: (1): සගාථවග්ග: සක්කසංයුත්ත:11.2.6 යජමානසූත්‍රය, පි.440.

▲**මහද්ගත කම්ම** -Mahdgatha kamma: කුසල කම්ම ආදිය මහද්ගත කම්ම ලෙසින් පෙන්වා ඇත. මෙය ගරුක කම්මයකි. **බලන්න**:කම්ම විපාක.

▲ **මහණදම් පිරිම**- Monkhood: බුදුසසුනේ මහණදම් පුරන්නේ චතුරාර්යසත්‍ය අවබෝධ කර දුකින් මිදීමටය. **බලන්න**: පැවිද්ද චතුසත්‍ය අවබෝධය පිණිසය.

▲ **මහලුවීම**- aging: ධර්මයට අනුව උපතක් ඇතිවිට මහලුවීම -ජරාවට පත්වීම අපේක්ෂා කළයුතුවේ. **බලන්න**: ජාතිය ජරාව හා මරණය.

▲**මහා අභිඥා**- Great direct Knowle: අභිඥා යනු ස්වකීය ප්‍රඥාවෙන්, විශේෂ නුවණින් ධර්මය අවබෝධ කිරීමය. බුදුසසුනේ, මහා අභිඥා ලත් භික්ෂුණියන් අතරින් අග්‍ර භද්ද කච්චානා (යශෝධරාව) තෙරණියය. **බලන්න**: අභිඥා, උපග්‍රන්ථය:2.

▲ **මහා අරටුව**-Great heartwood: ගසක ඇති සවිමත්, බලවත් කොටස අරටුවය. එලෙස, ධර්මයේ අරටුව වන්නේ විමුක්තියය-නිවනය. මේ සූත්‍රයේදී බුදුන් වහන්සේ, ධර්මය සොයා යන අය අරටුව ලෙසින් කොළ

අතු ගන්නා අන්දම හා ප්‍රඥාව ඇති අය අරටුව සොයා ගන්නා අන්දම විස්තරාත්මකව පෙන්වා ඇත. **බලන්න**: උප ග්‍රන්ථය:5 **මූලාශ්‍රය:** ම.නි.මහාසාරෝපම සූත්‍රය හා චූලසාරෝපම සූත්‍රය.

▲**මහා ඉද්දි**- Maha iddi: මහා ඉද්දි (**මහා ඍද්ධි** -Great psychic potency) ලෙසින් මෙහි පෙන්වා ඇත්තේ, සතර ඉද්දිපාද මහත් ලෙසින් වැඩීම නිසා ලබන මහා ආනුභාවයය. **බලන්න**: සතර ඉද්දිපාද. **මූලාශ්‍රය:** සංයු.නි: (5-2) ඉද්දිපාදසංයුත්ත: 7.2.6 මහිද්ධික සූත්‍රය, පි. 56.

▼**ඉර්දීබලයන්** විශේෂලෙසින් වර්ධනය කරගැනීමෙන් මහා ඍද්ධිමත් භාවය ලබාගත හැකිය. බුදු සසුනේ මහා ඍද්ධිමත් භාවය ලැබූ සංඝයා අතර මහා මුගලන් තෙර හා උප්පලවන්නා තෙරණිය අග්‍රය. **බලන්න**: උපග්‍රන්ථය: බුද්ධ ශ්‍රාවකයෝ.

▲ **මහා ඉර්ශි**-Maha Irshi: මහා ඉර්ශි (මහා ඍසි-මහාඉසි)- මහා මුණි, බුදුන් වහන්සේ හඳුන්වන ගරු නමකි. **බලන්න**:බුද්ධනාම. එසේ බුදුන් වහන්සේ හැඳින්වීමට හේතුව එක්තරා දෙවියෙක් මෙසේ දක්වා ඇත:

**"එක්මුලක් ඇති, දියසුළි දෙකක් ඇති, මළ (කිළුටු) තුනක් ඇති, විස්තාරණ (දිගුව) පහක් ඇති, ආවාට දොළොසක් ඇති, ආගාධ වූ සමුද්‍රය මහා ඉර්ෂි තරණය කළහ"** . **සටහන්:** අටුවාවට අනුව: සමුද්‍රය (පාතාලය) යනු තණ්හාවය. තණ්හාවට සමුද්‍රය ලෙසින් දක්වන්නේ තණ්හාව පුරවාලිය නොහැකි නිසාය (සාගරයද පුරවාලිය නොහැකිය), පාතාලය ලෙසින් දක්වන්නේ ,පය තැබීමට ඉඩක් නොමැති නිසාය. ඒක මූලය නම් අවිද්‍යාව. දියසුළි 2 නම්: ශාශ්වත දෘෂ්ටිය (externalism ) හා උච්චේද දෘෂ්ටිය ( annihilationism). ශාශ්වත දෘෂ්ටිය නිසා භව තණ්හාව කැරකි කැරකි පවතී. උච්චේද දෘෂ්ටිය නිසා තණ්හාව සහමුලින්ම විනාශ කිරීම. කිළුටු 3 වන්නේ: ලෝභය, දෝසය හා මෝහය.දිගු 5: පස්කම් සැප.දියසුළි 12:අභ්‍යාන්තර සලායතන 6 හා බාහිර සලායතන 6 ය. **බලන්න:** * ESN:note:98, p. 516. ** කටුකුරුන්දේ ඤාණානන්ද භික්ෂුන් වහන්සේ: පාතාලය යනු දුක් වේදනා බවද, සාගරය යනු සය ඉන්ද්‍රිය බවද, දිය සුළි 2 ක: සුඛ හා දුක වේදනා ලෙසද, මුල යනු ස්පර්ශය බවද සඳහන් කර ඇත: **බලන්න**: නිවනේ නිවීම දේශනා. **උප ග්‍රන්ථය:5 **මූලාශ්‍ර**: සංයු.නි: (1) සගාථවග්ග: දේවතාසංයුත්ත: ඒකමූල සූත්‍රය, පි. 84, ESN:1: Devathasamyutta: 44.4 One root, p. 119.

▲ **මහා උපදේස**-great references: මහා උපදේස-මහාපදෙස: ධර්මය නිශ්චිත කරගැනීම පිළිබඳව බුදුවරු පෙන්වාදෙන නිර්දේශ-නියම කිරීමය. ධර්මය, බුදුන් වදාළ ධර්මයද යයි නිශ්චිත කරගැනීම පිළිබඳ ආකාර 4 ක්: සතර මහා අපදේස, බුදුන් වහන්සේ මේ සූත්‍රයේ පෙන්වා ඇත. **සටහන:** EAN:Note 892 හි මේ පිළිබඳ නිර්වචන හා විස්තර දක්වා ඇත. **මූලාශ්‍ර:**අංගු.නි: (2) 4 නිපාත:4.4.3.10 මහාපදෙසදෙසනා සූත්‍රය, පි.348.

▲ **මහා උපාසිකා**- Great Lay woman follower: බුදුසසුනේ, මහා උපාසිකාව ලෙසින් පෙන්වා ඇත්තේ, මිගාර මාතාවයයි නම්ලත් විශාඛා සිටුදේවියය. **බලන්න**: උපග්‍රන්ථය:3

▲ **මහා කච්චාන තෙර-**Mamhakaccanana Thera: **බලන්න**:උපග්‍රන්ථය:1

▲ **මහා කොට්ඨිත තෙර-**Maha Kotthitha Thera: **බලන්න**:උපග්‍රන්ථය:1

▲ **මහා කප්පින තෙර-**Maha Kappina Thera: **බලන්න**:උපග්‍රන්ථය: 1

▲ **මහා කරුණාසමාපත්ති ඥානය-** Mhakarunasmapatthi nana: මහාකරුණා සමාපත්ති ඥානය බුදු වරුන්ට විශේසවූ නුවණකි. **" බහුප්‍රකාරයෙන් (නුවනැසින් හා බුදු ඇසින්) බලන්නාවූ භාග්‍යවත් බුදුවරයන්ගේ මහාකරුණාව සත්ත්වයන් කෙරෙහි බැසගනි: ලෝකසන්නිවාසය තෙම රාගාදින් විසින් ආදීප්තය... නොයෙක් කටයුත්තෙහි උත්සහා සහිතය...මරණයට නික්මගියේය... නොමගට පිළිපන්නේය... එලෙස දක්නාවූ භාග්‍යවත් බුදුවරයන්ගේ මහාකරුණාව සත්ත්වයන් කෙරෙහි බැසගනි". සටහන්**: *බුදුවරු ලෝක සත්ත්වයන් පිලිබඳ මහාකරුණාව පැම මේ සූත්‍රයේ විස්තරාත්මකව පෙන්වා ඇත. ** 'මහාකාරුණික' යනු බුදුන් වහන්සේ හඳුන්වන පදයකි. **බලන්න**:බුද්ධ නාම. **මූලාශ්‍රය:** බු.නි: පටිසම්භිදාමග්ග 1: මහාවග්ග, ඥානකතා: 71 මහාකරුණා සමාපත්ති ඥානය, පි. 258.

▲ **මහා කාශ්‍යප තෙර-**Mahakassapa Thera: **බලන්න**:උපග්‍රන්ථය:1

▲ **මහාගූථ නිරය-** Vast Hell of Excrement: අශුචි පිරුණ නිරය, අකුසල විපාක විඳින්නට ඇති දුගතියකි .**බලන්න**: නිරය.

▲ **මහා චුන්ද තෙර-** Mahācunda Thera: **බලන්න**:උපග්‍රන්ථය:1

▲**මහා දිට්ඨී-**Great views: ලෝකයේ පවතින විවිධ දිට්ඨී හා අදහස් පිළිබඳව මේ සූත්‍රයේ විස්තරාත්මකව පෙන්වා ඇත. බුදුන් වහන්සේ පෙන්වා ඇත්තේ, පංච උපාදානස්කන්ධයට ඇලීම නිසා (තමාගේ යයි) ලෝකයා තුල මෙබඳු දිට්ඨී ඇතිවේ:

"...මේ සත්කාය (සමුහය 7 ) ඇත. කවර 7 ක්ද: පඨවිකාය, ආපෝකාය, වායෝකාය,සුඛ, දුඛ හ ජීව යන සතය. මේවා නොකරන ලද... නො මවන ලද...පර්වත කූටයක් ලෙසින් සිටි...යම් කලක ආරිය ශ්‍රාවකගේ ඒවා පිලිබඳ සැකය පහවූවිට ඔහු සෝතාපන්න බවට පත්වේ". **මූලාශ්‍රය:** සංයු.නි: (3) ඛන්ධවග්ග: දිට්ඨිසංයුත්ත:3.1.8 මහා දිට්ඨි සූත්‍රය, පි.424.

▲ **මහා දානය-**Maha dana-Great offerings.: රළු හෝ ප්‍රණීත හෝ සුළු ධනයක් හෝ මහා ධනයක් කැපකර දෙන දේ මැනවින් දෙන්නේනම් එය මහා දානයක්ය, යහපත් ඵල විපාක ඇතිබව මෙහි පෙන්වා ඇත: 1) සකස්කර දියයුතුය 2) ගරුකටයුතු ලෙස දිය යුතුය 3) සියතින්ම දිය යුතුය 4) නිරතුරුව දිය යුතුය 5) කර්මය අදහමින් දිය යුතුය. එවැනි දානයක් නිසා යහපත් ඵලවිපාක තමන්ට මෙන්ම තමන් ගේ පවුලේඅයට, සේවකයින් ආදින්හටද ලැබේ. පුරාණයේ සිටි වේලාම බ්‍රාහ්මණ විසින් දෙන ලද දානය මෙහි විස්තරාත්මකව දක්වා ඇත. බුදුන් වහන්සේ පෙන්වා ඇත්තේ වේලාම බ්‍රාහ්මණයා විසින් මහා ධනයක් වැය කර දෙන ලද එම දනයට වඩා මහා ඵල ලැබෙන දාන ලෙසින් සලකන්නේ 1) සිව්මග ලැබූ ආරියන්ට (සෝතාපන්න- අරහත්) දෙන දානයය. 2) ඒ

දානයට වඩා පච්චේක බුදුන්ට දෙන දානය මහා ඵල ලබාදේ. 3) පච්චේක බුදුන් 100ට දෙන දානයට වඩා බුදුන් වහන්සේට පිරිනමන දානය අග්‍රය. 4) බුදුන් ප්‍රමුඛ සංඝයාට දෙන දානය ඊට වඩා අග්‍රය 5) සිව් දෙස සිටින සංඝයාට කැපකර දෙන ආරාම දානය ඊට වඩා අග්‍රය 6) තෙරුවන් සරණ යෑම ඊට වඩා අග්‍රය 7) පන්සිල් රැකීම ඊට වඩා අග්‍රය 8) දෙනගෙන් කිරි දෝවන මොහොතක් පමණ කලක් මෙත්තා සිත වැඩීම ඊට වඩා අග්‍රය. 9) අසුරගසන කාලය (the time of a finger snap) වැනි මොහොතකට අනිච්ච සංඥාව වැඩීම ඊට වඩා අග්‍රවේ.

**සටහන්**: * මේ සූත්‍රය දේශනා කර ඇත්තේ අනාථපිණ්ඩික සිටුවරයාටය. **බලන්න**: EAN:note no: 1876, p.671. ** බුදුන් වහන්සේ පෙර ජීවිතයක, වේලාම බ්‍රාහ්මණයා ලෙසින් උපතලබා ඇත. **බලන්න**: බුදුන් වහන්සේ-පෙර ජීවිත. **මූලාශ්‍ර:**අංගු.නි: (5): 9 නිපාත:9.1.2.10 වේලාම සූත්‍රය, පි.456, EAN:9:20.10 Velāma, p.469.

▲**මහා දීප**-Great continents: මහාදීප ලෙසින් පෙන්වා ඇත්තේ, පුරාණ දඹදිවට අයත්වූ, සක්විති රජුගේ පාලනයට නතු මහාදීප 4 ක්ගැනය. **බලන්න**: දඹදිව, සක්විතිරජ.

▲ **මහා දසධර්ම ප්‍රශ්න** -Ten Great Dhamma Questions: අන්‍යආගමිකයන් බුද්ධ ධර්මය ගැන ප්‍රශ්න කරන විය ඔවුන්ට, මහා දසධර්ම ප්‍රශ්න ගැන විමසීය යුතුය යි බුදුන් වහන්සේ සංඝයාට උපදෙස් වදාළහ:

**1) ප්‍රශ්නය**: භික්ෂුව එක් ධර්මයක් දැක: මනාව කළකිරීමට පත්වේනම්; විරාගයට පත්වේනම්, නිරෝධයට පත්වේනම්; පිරිසිඳ ලෙසින්ම දකින්නේනම්, අර්ථය නුවණින් අවබෝධකර ගැනීමෙන්, මේ ජීවිතයේදීම දුක කෙළවර කරගනී. ඒ එක ධර්මය කුමක්ද? **පිළිතුර**: සියලු සත්වයෝ අහාරනිසා පෝෂණයවේ. **2) ප්‍රශ්නය:** භික්ෂුවක්, **ධර්මතා 2 ක්** දැක: මනාව කළකිරීමට... (ඉහත මෙන්...) දුක කෙළවර කරගනී. ඒ ධර්මතා 2 කුමක්ද? **පිළිතුර**: නාම රූප. **3) ප්‍රශ්නය:** භික්ෂුවක්, **ධර්මතා 3 ක්** දැක: මනාව කළකිරීමට... (ඉහත මෙන්...) දුක කෙළවර කරගනී. ඒ ධර්මතා 3 කුමක්ද? **පිළිතුර**: ත්‍රිවිධ වේදනා (සුඛ. දුක හා මැදහත්) **4 ) ප්‍රශ්නය:** භික්ෂුවක්, **ධර්මතා 4 ක්** දැක: මනාව කළකිරීමට... (ඉහත මෙන්...) දුක කෙළවර කරගනී. ඒ ධර්මතා 4 කුමක්ද? **පිළිතුර**: සිව් ආහර (කබලිංක ආහාර, ස්පර්ශ ආහාර, මනෝසංචේතනා ආහාර, විඥානආහාර (**බලන්න**: අහාර) **5 ) ප්‍රශ්නය:** භික්ෂුවක්, **ධර්මතා 5 ක්** දැක: මනාව කළකිරීමට... (ඉහත මෙන්...) දුක කෙළවර කරගනී. ඒ ධර්මතා 5 කුමක්ද? **පිළිතුර:** පංච උපාදානස්කන්ධය. **6 ) ප්‍රශ්නය:** භික්ෂුවක්, **ධර්මතා 6 ක්** දැක: මනාව කළකිරීමට... (ඉහත මෙන්...) දුක කෙළවර කරගනී. ඒ ධර්මතා 6 කුමක්ද? **පිළිතුර:** අභ්‍යන්තර ආයතන හය-සළායතන. **7 ) ප්‍රශ්නය:** භික්ෂුවක්, **ධර්මතා 7 ක්** දැක: මනාව කළකිරීමට... (ඉහත මෙන්...) දුක කෙළවර කරගනී. ඒ ධර්මතා 7 කුමක්ද? **පිළිතුර:** විඥාන ආයතන සත (**බලන්න**: විඥානය පිහිටන ස්ථාන) **8 ) ප්‍රශ්නය:** භික්ෂුවක්, **ධර්මතා 8 ක්** දැක: මනාව කළකිරීමට... (ඉහත මෙන්...) දුක කෙළවර කරගනී. ඒ ධර්මතා 8 කුමක්ද? **පිළිතුර:** අටලෝදහම **9 ) ප්‍රශ්නය:** භික්ෂුවක්, **ධර්මතා 9 ක්** දැක: මනාව කළකිරීමට... (ඉහත මෙන්...) දුක කෙළවර කරගනී. ඒ ධර්මතා 9

කුමක්ද? **පිළිතුර:** සත්තාවාස නමය. **10 ) ප්‍රශ්නය:** භික්ෂුවක්, **ධර්මතා 10 ක්** දැක: මනාව කළකිරීමට... (ඉහත මෙන්...) දුක කෙළවර කරගනී. ඒ ධර්මතා 10 කුමක්ද? **පිළිතුර:**දස අකුසල ධර්ම.

**සටහන්: *** කජඞන්ගලා තෙරණිය,මේ මහා දස ප්‍රශ්ණ ගිහි ශ්‍රාවකයන් හට යම් වෙනස්කම් සහිතව දේශනා කර ඇත. **4 ප්‍රශ්නයට පිළිතුර**: සතර සති පට්ඨානය, **5 ප්‍රශ්නයට පිළිතුර**: පංච ඉන්ද්‍රිය **6 ප්‍රශ්නයට පිළිතුර:** නිස්සාරණිය ධාතු සය **7 ප්‍රශ්නයට පිළිතුර:** සප්ත බෝජ්ජංග ධර්ම **8 ප්‍රශ්නයට පිළිතුර:** ආරිය අටමග.**බලන්න**: අංගු.නි: (6) 10 නිපාත: 10.1.3.8. දෙවන මහාපඤ්හ සූත්‍රය,පි.128, EAN: 10: 28.8 Great Questions -2 , p. 504. ** භික්ෂුණියගේ පිළිතුරු බුදුන් වහන්සේ අනුමත කරඇත. **මූලාශ්‍ර:** අංගු.නි: (6) 10 නිපාත: 10.1.3.7. ප්‍රථම මහාපඤ්හ සූත්‍රය,පි. 116. EAN: 10: 27.7 Great Questions -1, p. 503.

▲ **මහා නිදානය-**The Great Origination: ධර්මයේ මහා නිදානය ලෙසින් පෙන්වා ඇත්තේ හේතු ප්‍රත්‍ය ධර්මයය. එමනිසා සත්‍වයෝ සසර දිගු කලක් හැසිරේ. දීඝ.නි: මහා නිදාන සූත්‍රයේ මේ පිළිබඳව විස්තරාත්මකව දක්වා ඇත. **බලන්න:**පටිච්චසමුප්පාදය.

▲**මහා නාම තෙර-පස්වග-** Mahanama Thera -Pasvaga: **බලන්න**:උපග්‍රන්ථය: 1

▲**මහා නාම තෙර-**Mahanama Thera: **බලන්න**:උපග්‍රන්ථය: 1

▲**මහානාම ශාක්‍ය-**Mahanama Sakkya:**බලන්න**:උපග්‍රන්ථය: 3

▲ **මහා නිරය-**Great Hell: අයහපත් කර්ම විපාක කළ සත්ත්වයෝ යළි උපත ලබන දුගතියකි. **බලන්න:** නිරය.

▲ **මහා ප්‍රජාපති ගෝතමී තෙරණිය-**Maha Prajapathi Gothami Theriya: **බලන්න**:උපග්‍රන්ථය:2

▲ **මහා ප්‍රඥාව** : පාලි: **මහාපඤ්ඤා-**great wisdom: ධර්මයේ මහා ප්‍රඥාව (උතුම් ප්‍රඥාව) ලෙසින් පෙන්වා ඇත්තේ ආධ්‍යාත්මික වර්ධනයේ උතුම් බව ඇතිකරන නුවණ- අනාත්මබව පිළිබඳ අවබෝධය ලැබීමය. **බලන්න**: ප්‍රඥාව.

▼**අනත්තානුපස්සනාව**, රූපයේ අනත්තානුපස්සනාව වැඩීමෙන් නැවත නැවත එහි යෙදීමෙන් මහා ප්‍රඥාව පරිපූර්ණවේ:

> **"අනත්තානුපස්සනා... රූපෙ අනත්තානුපස්සනා භාවිතා බහුලීකතා මහාපඤ්ඤං පරිපූරෙති"**

**මහා ප්‍රඥාව යනු කුමක්ද?** සිව් පිළිසිඹියාව... ශීල සමාධි හා ප්‍රඥා ස්කන්ධ... විමුක්ති ස්කන්ධය හා විමුක්ති ඥානදර්ශන ස්කන්ධය... ස්ථාන අස්ථාන නුවණ... විහාරසමාපත්තීන්... ආර්යසත්‍යය, සත්තිස් බොධිපාක්‍ය අංග... ආර්යමාර්ගය... ශ්‍රමණඵල...අභිඥා...පරම අර්ථයවූ නිවන ආදී ධර්මතා මහත් ලෙසින් උතුම් ලෙසින් පිරිසිඳ දැනගැනීමේ නුවණ, අවබෝධය මහා ප්‍රඥාව වේ. **සටහන:**සංයු.නි: (5-2) සොතාපත්තිසංයුත්තය: මහාපඤ්ඤාවග්ගයේ සූත්‍රයන්හි විවිධ ප්‍රඥා

පිළිබඳව විස්තරාත්මකව පෙන්වා ඇත. **මූලාශ්‍ර**: ඛු.නි: 1: ප්‍රඥාවග්ග: 3.1 ප්‍රඥා කථා, පි. 166-174.

▼ **සතර ධර්මය**: 1) සත්පුරුෂ සේවනය 2) සද්ධර්ම ශ්‍රවණය 3) යෝනිසෝමනසිකාරය 4) ධර්මයට අනුකූලව පිළිපැදීම (ධර්මානුධර්ම ප්‍රතිපදාව) ඇති පුද්ගලයාට මහා ප්‍රඥාව ඇතිවේ.

**"...ඉමෙ ඛො භික්ඛවෙ, චත්තාරො ධම්මා භාවිතා බහුලීකතා මහාපඤ්ඤාතාය සංවත්තනතීති"**

(... these four things, when developed and cultivated lead to the great wisdom). **බලන්න**: ප්‍රඥාව, සතර ධර්මය. **මූලාශ්‍ර**: සංයු.නි: (5-2) මහාවග්ග: සෝතාපන්න සංයුත්ත:මහාප්‍රඥා වග්ග: 11.7.1 මහා ප්‍රඥා සූත්‍රය, පි. 280, ESN:55 Sotapatthisamyutta: 62.1 Greatness of Wisdom p. 2261.

▼ **කායගතා සතිය වැඩීමෙන්,** විපුල කරගැනීමෙන් මහා ප්‍රඥාව ඇතිවේ (Mindfulness directed to the body...when developed and cultivated, leads to the great wisdom). **මූලාශ්‍ර:** අංගු.නි: (1) 1 නිපාත: කායගතාසති වග්ග: පි. 125 EAN:1: Mindfulness Directed to the Body: p.52 .

▼ **ධර්මයට අනුව** මහා ප්‍රඥා පිළිබඳ කරුණු ගැන අවබෝධය ඇත්තේ, බුදුන් වහන්සේට, බුද්ධ ශ්‍රාවකයන්ට, එම උතුමන් ගෙන් දැනගෙන අවබෝධ කරගත් අයට පමණක් බව මේ සූත්‍රයන්හි විස්තරාත්මකව පෙන්වා ඇත. **බලන්න**: මහා දසධර්ම ප්‍රශ්න. **මූලාශ්‍ර:** අංගු.නි: (6) 10 නිපාත: මහාවග්ග:මහාපඤ්ඤ සූත්‍ර, පි.116.

▼ **වෙනත් මූලාශ්‍ර:1**."මහත් වූ සීල සමාධි පඤ්ඤා විමුක්ති ඤාණ දස්සන ඨානාඨාන මහාවිහාර සමාපත්ති අරියසච්ච සතිපට්ඨාන සම්මප්පධාන ඉද්ධිපාද ඉන්‍ද්‍රිය බොජ්ඣඞ්ග අරියමග්ග සාමඤ්ඤඵල නිබ්බාණ යන ධර්‍මයන්හි පැවැති නුවණ මහාපඤ්ඤා නම්වේ". https://pitaka.lk/dhammapada/ss/katha-28.html

▲ **මහාප්‍රඥා පණ්ඩිත**- A wise person of great wisdom: බුදුන් වහන්සේ පෙන්වා ඇත්තේ: මහාප්‍රඥා පණ්ඩිත පුද්ගලයා තමන්ගේ හානිය, අනුන්ගේ හානිය පිණිස කටයුතු නොකරන බවය. ඔහු තමන්ගේ හිතසුව හා අනුන්ගේ හිත සුව පිණිස, මුළුලොව හිත සුව පිනිස කටයුතු කරන්නෙකි. **සටහන්:** අංගු.නි: (2) 4 නිපාත, 4.1.4.5 වස්සකාර සූත්‍රයේ**:** මහා ප්‍රඥාව ඇති මහා පුරුෂයා සතු ගුණ 4 ක් පෙන්වා ඇත: 1) ඔහු බොහෝදෙනාගේ හිතසුව පිණිස කටයුතු කරති, ඔවුන් ආරිය ධර්මයේ - කුසල ධර්මයේ පිහිටුවයි 2) තමන් සිතීමට කැමති දේ ඔහු සිතයි, තමන් සිතීමට අකැමති දේ ඔහු නොසිතයි. යම් සංකල්පනාවක් කැමති නම් ඒ දේ කරයි, යම් සංකල්පනාවක් අකැමති නම් ඒ දේ නොකරයි. ඔහු සිත පිළිබඳව හා සිතිවිලි පිළිබඳව අග්‍රය. 3) ඔහු, අධිචිත්තය ඇතිකරන, දිට්ඨධම්ම සුඛය ඇතිකරන සිව්ජාන සමාපත්ති, පහසුවෙන්ම, කැමති ආකාරයට ලබාගැනීමට සමත්ය. 4) ඔහු සියලු ආසවයන් ප්‍රහීණය කොට, චේතෝවිමුත්තිය හා ප්‍රඥාවිමුත්තිය ලබා වාසය කරයි. නෙක්කම්ම ආදී විතක්ක කිරීමට කැමතිවේ, කාම විතක්ක නොකරයි, මෙහි පෙන්වා

ඇත්තේ සම්මා සම්බුදුරජාණන් වහන්සේ සතු ගුණයන්ය **මූලාශ්‍ර**: අංගු.නි: (2) 4 නිපාත: 4.4.4.6 බහුශ්‍රැත සූත්‍රය, පි. 366, EAN:4: 186.6 Acumen.

▲**මහාප්‍රඥා ආලෝකය**- great light of wisdom: තථාගතයන්වහන්සේගේ පහළවීම සමග මහාප්‍රඥා ආලෝකය ඇතිවේ. **බලන්න**: තථාගතයන්වහන්සේ.

▲**මහා ප්‍රඥාචක්ෂු** - great vision of wisdom : තථාගතයන්වහන්සේගේ පහළවීම සමග මහා ප්‍රඥාචක්ෂු ඇතිවේ. **බලන්න**: තථාගතයන්වහන්සේ.

▲**මහා ප්‍රඥාදිස්නය-** great radiance of wisdom: තථාගතයන් වහන්සේගේ පහළවීම සමග මහා ප්‍රඥාදිස්නය ඇතිවේ. **බලන්න**: තථාගතයන්වහන්සේ.

▲ **මහා පන්ථක තෙර-**Maha Panthaka Thera **බලන්න**:උපග්‍රන්ථය:1

▲ **මහා පුන්නම-**Full-Moon Night: මහාපුන්නම ලෙසින් පෙන්වා ඇත්තේ පසලොස්වක දිනය- උපෝසථ දිනයය. **බලන්න:** උපෝසථ. බුදුන් වහන්සේ වැඩසිටි සමයේ දී එම දිනයේ සංඝයා, ධර්මයේ නො පැහැදිලි තැන් ආදීවූ ධර්ම ප්‍රශ්න බුදුන් වහන්සේගෙන් විමසීමට පුරුදුවී ඇතිබව සූත්‍ර පිටකයට අනුව පෙනේ. ම.නි: මහාපුන්නම සූත්‍රයේ දී පෙන්වා ඇත්තේ, පුන් පොහොදිනයේ දී, බුදුන් වහන්සේ සංඝයාට කැමති ප්‍රශ්නයක් විචාරීමට අවස්ථාව ලබාදීමය.

▲**මහා පරිනිබ්බානය-** The Great Passingaway: මහා පරිනිබ්බානය- මහා පරිනිර්වාණය ලෙසින් පෙන්වා ඇත්තේ අපගේ ගෝතම බුදුන් වහන්සේගේ ස්කන්ධ පරිනිර්වාණයය. **බලන්න: දී**ඝ.නි: මහා පරිනිබ්බාන සූත්‍රය.

▲ **මහා පරිළාහ නිරය**-Maha parilaha niraya: මෙහිදී, බුදුන් වහන්සේ මේ නිරය පිළිබඳව විස්තර කර ඇත. එම නිරයේ ඇති සෑම දෙයක්ම අනිටුය, මනාප නොවේ, මහා ගිනිකඳකි. මේ නිරයට වඩා බිහිසුණු දෙය නම්, චතුසත්‍ය නොදැන සසර දුක පවත්වා ගැනීමය**. බලන්න**: පරිළාහ, නිරය. **මූලාශ්‍ර**:සංයු.නි: (5-2) මහාවග්ග: සච්චසංයුත්ත:12.5.3 පරිළාහසූත්‍රය, පි.336, ESN:56: Sacchasamyutta:V:43.3. The Great Conflagration, p. 2314.

▲ **මහාපුරුෂ-**A Great man: මහා පුරුෂ ලෙසින් බුදුන් වහන්සේ පෙන්වා ඇත්තේ සියලු කෙළෙස් නිමා දැමූ රහතුන්ය. බුදුන් වහන්සේ මහා පුරුෂ ලෙසින් හඳුන්වයි. **බලන්න**: බුදුන් වහන්සේ: බුද්ධනාම. **මූලාශ්‍රය**: ඛු.නි.සුත්තනිපාත: පාරායනවග්ග:වස්තුගාථා: 5-2 තිස්සමෙත්තෙයිය මානවක, පි.338.

▼ **සැරියුත් තෙරුන්ගේ** විමසීමක් මත බුදුන් වහන්සේ මහා පුරිස යනු මිදුන සිත් ඇති ( With a liberated mind). පුද්ගලයා (රහතුන්) යි වදාළහ. සතිපට්ඨානය යහපත් ලෙසින් පුරුදු පුහුණු කිරීම, සිත කෙළෙසුන්ගෙන් මුදාගැනීමට පිහිටවේ. **සටහන**: මහා පුරුෂයා ගැන විස්තර පිණිස **බලන්න**:මධ්‍යය. **මූලාශ්‍ර**: සංයු.නි: (5-1) මහාවග්ග:සතිපට්ඨාන සංයුත්ත:2 නාලන්දවග්ග:3.2.1 මහාපුරිස සූත්‍රය,

පි. 314, ESN:47 Satipattanasamyutta:II Nalanda: 11.1 A great man,p.1868.

▼**මහාපුරුෂයා** යනු බුදුන් වහන්සේය:

" මග්ගාමග පිලිබඳ කුශල ඇති, කෘතකෘත්‍යවූ, අනාශ්‍රවවූ අන්තිමදේහධාරිවූ චතුසත්‍ය අවබෝධ කළ ඒ මහාප්‍රාඥයන් වහන්සේ මහා පුරුෂ යයි කියනු ලැබේ".

(...the one skilled in the path and what is not the path, the taintless one who accomplished his task; the Enlightened One bearing his final body is called "a great man of great wisdom). **මූලාශ්‍ර:**අං.ගු.නි: (2): 4 නිපාත: 4.1.4.5 වස්සකාර සූත්‍රය, පි.93, EAN:4: 35.5 Vassakāra, p.162.

▲**මහා පුරුෂ ලක්‍ෂණ-**Maha purisa lakshana: මහා පුරුෂ ලක්‍ෂණ යනු බුදුන් වහන්සේ සතු විශේෂාවූ කායික ලක්‍ෂණ 32 පිලිබඳවය. **බලන්න**: ලක්‍ෂණ, බුදුන් වහන්සේ. **මූලාශ්‍රය:**දීඝ.නි: (3):පාථිකවග්ග: 7 ලක්‍ෂණ සූත්‍රය, පි.252.

▲ **මහාපුරුෂ විතර්ක**- great reflections: මහාපුරුෂ විතර්ක ලෙසින් පෙන්වා ඇත්තේ ආධ්‍යාත්මික මාර්ගය වඩා ගැනීම පිණිස උපකාරීවන උතුම් ගුණයන්ය.**බලන්න**: උතුම් සිතිවිලි.

▲**මහා පුරුෂ විහරණය-** Great abiding: අරහත්ඵලය සාක්ෂාත් කරගත් ආරිය උතුමෝ විහරණය කරණ ශුන්‍යතා විහරණය මහා පුරුෂ විහරණය ලෙසින් පෙන්වා ඇත. **බලන්න**: ශුන්‍යතා විහරණය

▲ **මහා බ්‍රහ්ම:** පාලි: **මහාබ්‍රහ්ම**- Mahābrahmā- greater Brahma-super-god: මහාබ්‍රහ්ම ලෙසින් පෙන්වා ඇත්තේ දහසක් ලෝක ධාතුවට අධිපති බ්‍රහ්ම රාජයාටය. **බලන්න**: බ්‍රහ්මලෝක.

▼ **මහාබ්‍රහ්ම රාජයා** අග්‍ර යයි, බලවත් යයි සලකියි. එහෙත්, ඔහු විපරිනාම ධර්මයට යටවන බව බුදුන් වහන්සේ පෙන්වා ඇත. **සටහන**: ඔහු ආධ්‍යාත්මික මග සාක්ෂාත් කරගන්නා තෙක් -නිවන් දකිනාතෙක් සසරට බැඳී සිටි. **මූලාශ්‍ර**: අං.ගු.නි: (6) 10 නිපාත:10.1.3.9. ප්‍රථම කොසල සූත්‍රය, පි. 134, EAN-10: 29.9 Kosala-1, p. 505.

▲**මහාභූත** -Mahabhutha: මහාභූත ලෙසින් පෙන්වා ඇත්තේ සතර මහා භූතයන්ය**. බලන්න**: සතරමහා භූතයෝ

▼**වෙනත් මූලාශ්‍ර: 1.** "බොහෝවිට මුල අමතක වීම නිසා අප නොසන්සුන්වේ, එහෙත් මුල - එනම් පඨවි, ආපෝ, තේජෝ, වයෝ යන මහා භූතයන් ගැන අපට මතක්වන්නේනම් සිත සනසා ගත හැකිය. අප ඇතුළතද, පිටතද තිබෙන මේ මූලධාතු මෙනෙහි කිරීමෙන් අප නොසන්සුන් කරන වාදභේද ආදිය සමතයකට පත් කර ගත හැකිය. ලෝකයේ ඇති උඩඟුබව, කුඩුකේඩු ආදී සැම පිට පොත්තට පමණක් සීමාවූ පුහුදෙවල් බව ද මේ ලොව ඇත්තේ මේ මහා භූත ධර්මයන් පමණක් බව මෙනෙහි කරනවිට සියලු වෙනස්කම් අත හැර ගත

හැකිය...”. හිතක මහිම 1, කටුකුරුන්දේ ඤාණානන්ද භික්ෂුව: පහන් කනුව ධර්ම දේශනා.

▲**මහාභිය**-Great fear: ලෝකයාට ඇති මහාභිය නම් ජාති ජරා මරණ දුකය. **බලන්න**: භය.

▲**මහා භද්‍රාකපිලාණි තෙරණිය**-Maha Bhadrakapilaani Theraniya **බලන්න**:උපග්‍රන්ථය:2

▲**මහා මුගලන් තෙර**- Mugalan Thera:**බලන්න**:උපග්‍රන්ථය: 1

▲**මහා මායා දේවිය** - Maha maya devi: ගෝතම බුදුන් වහන්සේගේ මැනියෝය. **බලන්න**: බුද්ධ මාතාව.

▲**මහා යාගය**- Maha yagaya: සත්ව ඝතනය නොමැතිව, ධර්මානුකූලව, මහාඵල ආනිසංස ලබාගැනීමට මහායාගයක් (මහායඤය) කළයුතු ආකාරය මෙහි දක්වා ඇත. **මූලාශ්‍රය:** අංගු.නි: (4) 7 නිපාතය: 7.1.5.4 මහායඤ්ඤ සූත්‍රය, පි.364.

▲ **මහා රුක**: පාලි: **මහාරුක්ඛ**-huge trees: මහා රුක: මහා වෘක්ෂය-මහා ගස. කුඩා බීජයකින් ඇතිවෙන මහා ගස් ලෙසින් ඇසතු (අසසතෙථා-assattha) නුග (නිග්‍රෝධො- banyan) පුලිල (පිලකෙඛා- pilakkha) දිඹුල් (උදුම්බරො-udumbara) ඇටකසුක් (කචඡකො-kacchaka) ගිවුළු ( කපිතථනො-kapitthana) දක්වා ඇත. මේ මහා ගස්, වනයේ ඇති සෙසු ගස් වටකරගෙන වැඩේ. එමනිසා, කුඩා ගස් නැමී, ඇඹරී, පැලි විනාශවී යති. **සටහන්: * මහාරුක් උපමාව:** එවැනි මහා ගස් නිසා සෙසු ගස් විනාශවියාම උපමා කර ඇත්තේ පංච නිවරණ නිසා ආධ්‍යාත්මික ජීවිතය වැනසියාම පෙන්වා දිමටය. මහා රුක, යට ඇති මුල් මගින් අහාර උඩට ඇද මහා බවට පත්වේ. එලෙස උපාදාන නිසා, මිනිසුන් තුල ආස්වාදය වැඩි තණ්හාව මහත් බවට පත්වේ. ** භික්බු බෝධි හිමියන්ට අනුව: මේ මහා ගස් මාරාන්තික ග්‍රහණය ඇති ෆිග් (නුග වැනි) ගස්ය (fig trees) **බලන්න**: ESN note 81, p. 2397. ** මහා රුක, යට ඇති මුල් මගින් අහාර උඩට ඇද මහා බවට පත්වේ. එලෙස උපාදාන නිසා, මිනිසුන් තුල ආස්වාදය වැඩි තණ්හාව මහත් බවට පත්වේ. **බලන්න**: සංයු.නි: (2) නිදානවග්ග: අභිසමයසංයුත්ත:දුක්ඛවග්ග: මහාරුක්ඛ සූත්‍ර, පි.160. **මූලාශ්‍ර:** සංයු.නි: (5-1) මහාවග්ග:බොජ්ඣංගසංයුත්ත: නීවරණ වග්ග: 2.4.9 මහාරුක්ඛ සූත්‍රය, පි. 220, ESN: 46 Bojjhangasamyutta: The Hindrances: 39.9 Trees, p. 1774.

▲ **මහා ලෝභ:** පාලි: **මහාලොභො-** strong greed: මහාලෝභය (මහේච්ඡතාව), අකුසලයකි, ආධ්‍යාත්මික මගට හානි ගෙනදේ. එමගින් කුසල් දහම් පිරිහේ, නූපන් අකුසල ඇතිවී වැඩිවේ. **සටහන:** අටුවාවට අනුව මහා ලෝභය යනු අස්න්තුෂ්ටියය: Lack of contentment, excessive desire with regard to robes, almsfood, dwelling places, medicines, and the five objects of sensual pleasure. Such desire, desirousness, strong desire, lust, passion, mental passion, is called strong desire. **බලන්න**: EAN: Note: 52, p. 583. **මූලාශ්‍ර**: අංගු.නි: (1) 1 නිපාත: 1.7.2 සූත්‍රය, පි. 60, EAN:1: 62.2 sutta, p. 40.

▲**මහාලි ලිච්ඡවි**- Mahali lichchavi:**බලන්න**: උපග්‍රන්ථය:3

▲ **මහා වන ආරණ්‍ය**- The great woods: විසාලානුවර පිහිටි මහාවන ආරණ්‍යය, බුදුන් වහන්සේ අවසාන චාරිකාවේ දී වැඩසිටි ස්ථානයකි. මෙහිලිච්චවී රජදරුවන් සැදූ කූටාගාර ශාලාව පිහිටා ඇත. **බලන්න**: කූටාගාරය.

▲ **මහා වනය-කිඹුල්වත්නුවර**- Mahavana of Kimbulwathnuwara: මේ මහා වනය කිඹුල්වත්නුවර- කපිලවස්තු නුවර අසල පිහිටි මහා වනයකි. බුදුන් වහන්සේ, කපිලවස්තු නුවරට වැඩම කළ අවස්ථාවන් හි මෙහි වැඩසිටි බව සූත්‍රදේශනාවල සඳහන් කර ඇත. **බලන්න:** දීඝ.නි: (2) මහාසමය සූත්‍රය.

▲ **මහා වියුහ**- Huge view: මහාවියුහ-මහා දිට්ඨිය ලෙසින් පෙන්වා ඇත්තේ තම මතය දැඩිව ගෙන, අපගේ ලබ්ධිය සත්‍යයය, අන්‍ය ලබ්ධිය තුච්ඡ යයි කියමින් දරන දැඩි මතයය.එවැනි දිට්ඨියක් ඇතිවිට යථාබව අවබෝධ කරගත නොහැකිය, විමුක්තිය ලබා ගත නොහැකිය. **සටහන:** දිට්ඨිය දැඩිව ගත් අයගේ ස්වභාවය, ඛු.නි:සුත්තනිපාත:අට්ඨක වග්ග 4-12 චූලවියුහ සූත්‍රයේ විස්තර කර ඇත. **මූලාශ්‍රය**: ඛු.නි:සුත්තනිපාත:අට්ඨක වග්ග:4-13 මහාවියුහ සූත්‍රය, පි.302.

▲ **මහා සමය**-Maha samaya: මහා සමය- මහා සමගම රැස්වීම ලෙසින් මෙහිදී දක්වා ඇත්තේ බුදුන් වහන්සේ, බොහෝ සංඝයා සමග, කිඹුල්වත්නුවර අසල මහා වනයෙහි වැඩසිටින අවස්ථාවේදී, බුදුපිරිස බැහැදැකීමට, බ්‍රහ්මලෝක, දේවලෝක දෙවියන් පැමිණීමය. **සටහන**: එම දෙවපිරිසේ නම් මෙහි විස්තර කරඇත. **මූලාශ්‍රය**: දී.ස.නි: (2) මහාසමය සූත්‍රය, පි. 398.

▲ **මහා සමුද්‍රයේ අසිරිය**- Wonders of the great ocean: එක් සමයක පහාරද අසුර රජු, බුදුන් වහන්සේ බැහැදැක අසුරයන් ගේ වාසස්ථානය වූ මහා සයුරේ අසිරිමත් කරුණු 8 ක් ඇතිබව ද ඒනිසා අසුරයෝ මහා සමුද්‍රයට සිත අල්වාගෙන සිටිති යයි පැවසුහ. ඉන්පසුව, බුදුන් වහන්සේ, මහා සයුර වැනිවූ ධම්ම විනයේ සංඝයා සිත් අල්වා ගෙන සිටින බවත්, ධර්ම විනයේ අපූරු අසිරිමත් කරුණු 8ක් විද්‍යාමාන බවත් වදාළහ: 1) ධර්මවිනය ද මහා සයුර මෙන් ක්‍රම ක්‍රමයෙන් ගැඹුරු බවට පත්වේ 2) මහා සයුර වෙරළ නො ඉක්මවන ලෙසින් සංඝයා දිවිහිමියෙන් සික පද නොඉක්මවති 3) මහාසයුර, මළමිනී ආදී අපවිත්‍ර දේ තබානොගන්නා ලෙසින්, සංඝයා කෙළෙස් ඇති පුද්ගලයන් ආශ්‍රය නොකරයි 4) මහා සයුරට එක්වන සියලු නදී සමුද්‍ර ජලය බවට පත්වෙන ලෙසින්, කිනම් කුලගෝත්‍ර වලින් පැවිදිවූ සංඝයා ඒ කුලආදිය හැර අනගාරික බවට පත්වේ 5) සියලු නදී මහා සයුරට ඇදවැටීමෙන් මහා සයුර පිරි ඉතිරි යාමක් නොවෙන්නා සේ, නිවන සාක්ෂාත් කරගත් සංඝයා නිසා නිර්වාන ධාතුවේ පිරි ඉතිරියාමක් නොවේ 6) මහා සයුරේ ඇති එකම රසය ලුනු රසය මෙන්, ධර්ම විනයේ ඇති එකම රසය විමුක්ති රසයය 7) මහා සයුරේ අප්‍රමාන රුවන් ඇති ලෙසින් ධර්ම විනයේ සත්තිස් බෝධි පාක්‍ෂනම්වූ රුවනින් පිරි ඇත 8) මහා සමුදුරේ අප්‍රමාණ බලය ඇති අසිරිමත්, විවිධ සත්වයෝ වාසය කරන ලෙසින් ධර්ම විනයේද මහා බල, මහා ආනුභාව ඇති සොතපන්න- අරහත් මගඵල ලැබූ අසිරිමත් ශ්‍රාවක

සංසයා වැඩසිටි. **මූලාශ්‍ර:**අංගු.නි: (5) 8 නිපාත: 8.1.2.9 පහාරාද සූත්‍රය, පි.103, EAN:8:19.9 Pahārāda,p.421.

▲ **මහා සංවේගය**:පාලි: **මහතො සංවෙගා-**strong sense of urgency සසර දුක හා භය දැක ධර්මයේ ප්‍රමාද නොවී කටයුතු කිරීමට සිතේ ඇතිවන වේගය, තද උනන්දුව මහා සංවේගයය. **සටහන**: අටුවාවට අනුව 8 ආකාර සංවේග ඇතිවේ: 1) ජාතිය දුකක් බව වැටහීම 2) මහලුවීම- වයසට යෑමේ දුක 3) ලෙඩ රෝග ඇතිවීමේ දුක 4) මරණ දුක 5) දුගතියේ විඳීමට ඇති දුක් වේදනා 6) පෙර සසර නිසා ඇතිවී ඇති දුක 7) මතු සසරේ විඳීමට ඇති දුක 8) අහාර සොයායෑමටසිදුවන නිසා ඇතිවෙන දුක. ඒ දුක්වේදනා සිහියට එනවිට ධර්මයේ අප්‍රමාදය ඇතිවේ. **බලන්න**: EAN: note: 187, p. 590.

▼ **කායගතා සතිය** වැඩීමෙන්, විපුල කරගැනීමෙන් මහා සංවේගය ඇතිවේ: **"කායගතාසති භාවිතො බහුලී කතො: මහතො සංවෙගාය සංවත්තති"**. (leads to a strong sense of urgency). **බලන්න**: කායගතා සති ප්‍රතිලාභ. **මූලාශ්‍ර:** අංගු.නි: (1) 1 නිපාත: කායගතාසති වග්ග: 1.16.7.1 සූත්‍රය. පි. 125, EAN:1: Mindfulness Directed to the Body, p.52.

▲ **මහා සුදස්සන රජ-** King Mahasudassana: බුදුන් වහන්සේ පෙර භවයක මහාසුදස්සන නම්වූ සක්විති රජ ලෙසින් සිටි ආකාරය මෙහි දක්වා ඇත. **බලන්න**:බුදුන් වහන්සේ:පෙරජීවිත. **මූලාශ්‍ර**:දීඝ.නි: (2 ): 4. මහාසුදස්න සූත්‍රය, පි. 282, සංයු.නි (3 ): ඛන්ධසංයුත්ත: 1.2.5.4 ගොම පින්ඩූපම සූත්‍රය, පි. 274, ESN: 22: Khandasamyutta: 96.4 A Lump of Cow dung, p. 1087.

▲**මහාසාවද්‍ය**- Great falsehood: මහාසාවද්‍ය යනු මහා බොරුවය. ලෝකයේ ඇති මහාසාවද්‍යය නම් බොහෝ දොස් ඇති මිථ්‍යා දිට්ඨියය.**බලන්න**: මිථ්‍යා දිට්ඨියය. **මූලාශ්‍රය:** අංගු.නි: (1) 1 නිපාත: එකධම්ම පාලිය:1.16.3.3 සූත්‍රය, පි.106.

▲ **මහා සොරා -** the big thief: බුදුන් වහන්සේ මහා සොරා සතු ලක්‍ෂණ පෙන්වා වදාළේ, සසුනේ පාපික භික්ෂූන්ට එම ගුණ ඇතිබවය: 1) විෂමවූ කාය, වචී හා මනෝකම්ම කිරීම (විෂමනිස්ශ්‍රිතවීම) 2) මිථ්‍යා දිට්ඨි දැරීම (ගහනනිස්ශ්‍රිතවීම) 3) රජ ඇමති ආදීන් ඇසුරුකර, තමන්ගේ වැරදි ඔවුන්ගේ බලයෙන් වසාගැනීම (බලවන්තනිස්ශ්‍රිතවීම) 4) සිව්පස ලබා, ඒවා ගැන තමාට දොස් නොකීම පිණිස අන් අයට දීම (භෝගවාගී) 5) තනියම දුර පළාත් වල වාසය කරමින්, පවුල් ආශ්‍රය කරමින් ලාභ ලබාගැනීම (එකචාරිවීම). **සටහන:**අංගු.නි: (5) 8 නිපාත:සතිවග්ග: 8.2.9.4 මහාචෝරංග සූත්‍රයේ: කරුණු 8 ක් ඇති මහා සොරෙක් අවසානයට පැමිණෙන අන්දම විස්තර කර ඇත. **මූලාශ්‍රය**:අංගු.නි: (3) 5 නිපාත: පහසුවිහාරවග්ග:5.3.1.3 මහා චෝර සූත්‍රය, පි.226.

▲**මහා ස්වප්න**- Great dreams: මහා ස්වප්න- සිහින ලෙසින් මෙහි දක්වා ඇත්තේ, බුදුන් වහන්සේ, බෝධිසත්වයන් ලෙසින් දුටු ස්වප්න 5 ක් පිලිබඳ විස්තරයය. **මූලාශ්‍රය**: අංගු.නි: (3) 5 නිපාත: 5.4.5.6 මහාසුපින සූත්‍රය, පි.408.

▲**මහා ශ්‍රමණ-** Great Ascetic: මහා ශ්‍රමණ බුදුන් වහන්සේ හඳුන්වන පදයකි. **බලන්න:** ශ්‍රමණ, බුදුන් වහන්සේ:බුද්ධනාම.

▲ **මහාත්වයට පත්වීම-**Achieving greatness: ධර්මයේ මහාත්වයට (මහද්බව) පත්වීම ලෙසින් පෙන්වා ඇත්තේ අරහත්වයට පැමිණීමය. ගුණ 6 ක් ඇති භික්ෂුව ධර්මයේ මහාත්වයට, විපුලබවට පත්වේ: 1) ඥානය බහුලව තිබීම 2) භාවනාව බහුලව තිබීම 3) ප්‍රීති ප්‍රමෝදය බහුලව තිබීම 4) කුසල ධර්ම පිලිබඳ නො සෑහැම්බව බහුලව තිබීම 5) කුසල ධර්ම පිලිබඳ අත් නොහළ වීරිය බහුලව තිබීම 6) කුසල ධර්ම පිලිබඳව දැන් හා මතුවට කිරීම පිලිබඳ වීරිය බහුලව තිබීම. **මූලාශ්‍රය**: අංගු.නි: (4) 6 නිපාත: අරහත්තවග්ග:6.2.3.6 මහන්ත්ත සූත්‍රය, පි.256.

▲ **මහෙච්චතාවය-**Strong desires: මහෙච්චතාවය - මහේච්ඡතාවය යනු දැඩි ආශාවය, අකුසලයකි, ධර්ම මාර්ගය වඩාගැනීමට බාධාවකි. මහෙච්චතාවය නැතිකර ගැනීමට අල්පබව- අලෙප්ච්ඡතාවය වැඩිය යුතුය. **බලන්න**: අල්පබව. **මූලාශ්‍රය:** අංගු.නි: (4) 6 නිපාත: 6.1.8 සූත්‍රය, පි.284.

▲ **මහේශාක්‍ය**-Mahesakya: අන්‍යයන්ගේ ගරු බුහුමන් ඇතිව සමාජයේ උසස් තැනක වැජඹීම මින් අදහස් කෙරේ. **බලන්න:** කම්ම සත්ත්‍වයන්ගේ උරුමයය.

▲ **මිහිරි ඇට උපමාව-** Simile of the sweet seeds: මිහිරි ඇට වගා කලවිට ඇතිවෙන එලදාවෙ රසය මිහිරිය. මේ උපමාව යොදාගෙන ඇත්තේ, සම්මා දිට්ඨිය සහිත නිවැරදි දහම් මගේ ගමන් කිරීම නිසා යහපත් එල ලැබෙන බව පෙන්වීමටය. **බලන්න:**සම්‍යක්තවය. **මූලාශ්‍ර:**අංගු.නි: (6): 10 නිපාත: සමණසඤ්ඤා වගග: 10.3.1.4. බීජ සූත්‍රය,පි.410, EAN:10: 104. 4-A Seed, p.541.

▲ **මිහිරි කටහඬ** -Sweet voice: **බලන්න**: මඤ්ජුස්සරානං**.**

▲**මිහිරි පානය -උපමාව** - Simile of the sweet drink: **බලන්න:** ධම්ම සමාදානය, උපග්‍රන්ථය:5

▲**මෝහය-** Delusion: මෝහය යනු මුලාවීමය, යථා බව අවබෝධ නොකර ගැනීමය, අවිද්‍යාවයය. මෙය අකුසල් මුල් තුනෙන් එකකි. සත්වයෝ දුගතියට ගෙනයන මගකි. විදර්ශනා නුවණින්, සම්‍යක් ප්‍රඥාව ඇතිකර මෝහය ක්ෂය කරගත යුතුය. **බලන්න**: අකුසල මුල්. **බලන්න**: බු.නි:ඉතිවුත්තක:1.2.1 මෝහපරිඤ්ඤා සූත්‍රය, අංගු.නි:10 නිපාත: තයොධම්ම සූත්‍රය.

▼ **මෝහය නැතිකර ගැනීම අනාගාමීබවට හේතුවේ.** බුදුන් වහන්සේ මෙසේ වදාළහ:

"මහණෙනි, එක් කෙළස් ධර්මයක්...මෝහය පහකරගන්නේ නම්, මම ඔබට අනාගාමී භාවය පිණිස කැපවෙමි" **මූලාශ්‍රය**: බු.නි:ඉතිවුත්තක:1.1.3 මෝහ සූත්‍රය, පි.348.

▼**වෙනත් මූලාශ්‍ර: 1.** "**මෝහය**: මුලාවය. බිජුව තුළ වාසය කරන කුකුල් පැටවාගේ ඇස් නොපෙණෙන ලෙස, ආවරණය ව තිබෙන බිජු කබල්

මෙන් අරමුණු ස්වභාවට ඉඳුරාම විරුද්ධවූ, ශුභ සුඛ ආදී වශයෙන් තත්තවය වරදවා වටහා ගැනීම මෝහයය. **සද්ධර්ම කෝෂය.**

▲ **මෝහ ගින්න**-Fire of delusion: මෝහය, ලෝකයා දවන ගින්නක්යයි බුදුන් වහන්සේ වදාළහ. **බලන්න:** ගින්න, ආදිත්තපරියාය සූත්‍රය.

▲ **මෝහවිනය**-Mohavinaya: මෝහවිනය ලෙසින් පෙන්වා ඇත්තේ මෝහය නැතිකර ගැනීමය**. බලන්න**: ආශ්‍රව හා ආශ්‍රව ක්‍ෂය කිරීම.

▲ **මැහුම්කාරිය**- Sramstress: මැහුම්කාරිය, සිබ්බනිය ලෙසින් දක්වා ඇත. තණ්හාව මැහුම් කාරිය ලෙසින් මෙහි පෙන්වා ඇත. රහතුන්, මැහුම් කාරිය ඉක්මවා ගොස් ඇතය යි බුදුන් වහන්සේ වදාළහ. **සටහන:** රහතුන්, අන්තද්වය: අත්තකිලමතානු හා කාමසුඛල්ලිකානු යෝගයන්ට, මධ්‍යයේ ඇති ප්‍රඥාවෙන් නො ඇලී සිටීම, මැහුම්කාරිය ඉක්මවා යෑමය. ඇය අන්තදෙක එකට තබා මහනනිසා, ප්‍රඥාව වැසී යයි. **බලන්න**: මධ්‍යය. **මූලාශ්‍රය**: ඛු.නි.සුත්තනිපාත: පාරායනවග්ග:වස්තුගාථා: පි,326, 5-2 තිස්සමෙත්තෙයිය මානවක, පි.338

## ය කොටස:යක,යග,යට,යථ,යධ,යන,යම,යළ,යව,යස,යහ

▲**යක්ඛ**- Yakkha: යක්ඛ-යක්ෂ ලෙසින් පෙන්වා ඇත්තේ දෙවියන්ට වඩා පහත් කොට්ඨාශයකටය. අටානාටිය සූත්‍රයේදී, සමහර යක්ෂයන් බුදුන් වහන්සේ කෙරෙහි පැහැදී ඇතිබව, සිව් මහා රජදරුවන් පවසා ඇත. සමහර යක්ෂයන් ධර්මය පිළිනොගන්නා අතර ඔවුන් ධර්මකාමී සංඝයාහට හා ගිහි ශ්‍රාවකයන්ට හිරිහැර කරණ බව ද එවැනි අවස්ථාවල එම සූත්‍රයේ දේශනා කිරීම මගින් ඔවුන්ට ආරක්ෂාව ලැබෙන බව මෙහි පෙන්වා ඇත.**බලන්න:** සංයු.නි: සගාථවග්ග: යක්ඛ සංයුත්ත. **මූලාශ්‍රය**: දීඝ.නි: (3): අටානාටිය සූත්‍රය.

▲**යක්‍ෂයන් බුදුන් වහන්සේ හමුවීම-** Yakkas encounters with The Buddha: බුදුන් වහන්සේ හමුවී, යක්ෂයන් ධර්මය පිලිබඳ ප්‍රශ්න විමසා ඇතිබව සූත්‍ර දේශනාවල පෙන්වා ඇත. **බලන්න**: සංයු.නි: (1): සගාථ වග්ග: යක්ඛ සංයුත්තය.

▲ **යක්‍ෂ ඉන්ද්‍රක -** Indaka Yakka: එක්සමයක ඉන්ද්‍රක යක්ඛ බුදුන් වහන්සේ හමුවේ, සත්ත්වයාගේ ඇතිවීම කෙසේද? යයි විමසා ඇත:

"බුදුවරයෝ, රූපය ජීවය යයි නොකියති. එසේනම්, මේ සත්ත්වයෝ කෙසේ මේ සිරුර ලබයිද? මොහුගේ, ඇට හා අක්මාව කොහෙන් එන්නේද? මේතෙමේ, කෙසේනම් මවු කුසේ ලැගගන්නේ ද?" බුදුන් වහන්සේ මෙසේ පිළිතුරු වදාළහ: "මුලින් කලල රූපය ඇතිවේ- කලලය වැඩී අබබුදය ඇතිවේ,අබබුදයෙන් පේසි හටගනී- පේසි නිසා ඝන නම් මස්පිඩ සැකසේ, ඝනය මගින් අවයව සකස්වේ- කෙස් ලොම් නිය ඊලහට හටගනී. මව ගන්නා ඕනෑම කෑමක්, බිමක්-නන් වැදෑරුම් අහාර පානයන්, මව්කුස සිටින සත්ත්වයාට අහාර වේ ,එමගින් ඔහු පෝෂණය වී හැදී වැඩේ". **මූලාශ්‍ර:** සංයු.නි: (1) සගාථවග්ග: යක්ඛසංයුත්ත:10.1.1. ඉන්දක සූත්‍රය, පි.392,ESN: 10: yakkasammyutta, Indaka, p. 434.

**▲යක්‍ෂ සක්ක -**Yakka named Sakka: මේ යක්ෂයා විසින් අසනලද කරුණක් ගැන බුදුන් වහන්සේ මෙසේ විස්තර පෙන්වා ඇත: කෙනෙක් පහන් සිතින් අන්‍යාන්ට අනුසාසනා කරන්නේ නම් ඒ නිසා බැඳීම් ඇතිනොවේ. එසේ කිරීම අනුකම්පාවය, කරුණාවය. **මූලාශ්‍ර:** සංයු.නි: (1) සගාථවග්ග: යක්ඛසංයුත්ත: 10.1.2 සක්කසූත්‍රය, පි.394.

**▲ යක්‍ෂ සතාගිර හා හේමවත-** Sathagira & Hemawatha Yakkas බුදුන් වහන්සේගේ ගුණ පිලිබඳව මෙ දෙදෙනා  කල සාකච්චාවක විස්තර මෙහි දක්වා ඇත. ඒ දෙදනා බුදුන් වහන්සේ ගෙන් ප්‍රශ්න විමසා අවසානයේ බුදුන් වහන්සේ ගැන  මහා පැහැදීමක් ඇතිකරගත්ත්හ. **සටහන:** සතාගිර යක්ෂයා බුදුගුණ දන්නා නිසා පුන්පොහෝදින, බුදුන් වහන්සේ දැකීමට යෑම පිණිස හේමවත යක්ෂයාට ආරධනා කිරීම, ඒ යක්ෂයා බුදුන් වහන්සේගේ ගුණ ගැන විමසීම මේ සූත්‍රය දේශනා කිරීමට හේතුවී ඇත. **බලන්න**: බුදු ගුණ **මූලාශ්‍රය**:ඛු.නි:සු.නි:උරගවග්ග:1-9 හේමවත සූත්‍රය, පි.69.

**▲ යක්ඛ සූචිලෝම -** Suchiloma Yakkas: බුදුන් වහන්සේ වෙත පැමිණි මේ යක්ෂයා,උන්වහන්සේ බිය කිරීමට ගත් තැත අසාර්ථකවූ විට මෙසේ පැවසුහ: "ශ්‍රමණය, මම ඔබගෙන් ප්‍රශ්න අසමි, පිළිතුරු දීමට අසමත්නම්, මම ඔබගේ සිත අවුල්කරන්නෙමි, හදවත පලන්නෙමි, නැතිනම් දෙපයින් ඔසවා ගංගානම් ගඟ හරහා විසිකර දමන්නෙමි'. **බුදුන් වහන්සේ මෙසේ වදාළහ:** "මිත්‍රය, දෙවියන්, බඹුන්, මරුන්...මිනිසුන් සහිත මේ ලොවෙහි, මගේ සිත අවුල්කිරීමට, හදවත පලා දැමීමට හෝ මගේ දෙපයින් ඔසවා මා ගංගානම් ගඟ හරහා විසිකර දැමීමට සමත් කිසිවෙක් මම නොදකිමි. එසේවුවත්, කැමතිනම් ඔබගේ ප්‍රශ්නය අසන්න".

**සූචිලෝම ගේ ප්‍රශ්ණ**: 1 රාගය හා ද්වේෂය ට මුල කුමක්ද? 2 කුසල දහමෙහි නො ඇල්ම (අරතිය) හා පස්කම් සැපට ඇති ඇල්ම හා භීතිය කුමකින් හට ගත්තේද? 3 ගම් දරුවෝ, කපුටෙක් (කවුඩා) අල්ලාගෙන, ඌ එහාට මෙහාට විසිකරන ලෙසින්, සිතේ ඇතිවන සිතුවිලි (විතර්කයෝ)කොතැනින් ඉපිද, කුසල් සිත බැහැර කෙරෙත්ද?

**බුදුන් වහන්සේ මෙසේ වදාළහ:** 1 රාගය හා දෝෂය මේ අත්බව මුල් කර ගෙන ඇත.2 අරතිය, රාගය හා බිය එයින්ම හටගන්නේය.  3 විතර්කයෝ මෙයින්ම හටගෙන, ගම් දරුවන් කපුටෙක් බැහැර කරන ලෙසින් කුසල් සිත බැහැර කරයි. **සටහන**: එසේ සිතේ ඇතිවන සිතුවිලි (ගම් දරුවන් කපුටෙක් එහෙ මෙහෙ විසිකරන ලෙසින්) කෙනෙක් ගේ සිත එහාට මෙහාට විසිකරති. "යක්ෂය මේ අහන්න: කෙනෙක් මේ අත්බවය ට හේතුවන මුල දන්නේ නම්, ඔහු එය දුරු කරයි. ඔහු තරණය දුෂ්කරවූ, පෙර තරණය නොකළ, චතු ඔසය තරණය කර නැවත ඉපදීම අවසන් කරයි." **සටහන:** අටුවාවට අනුව මේ යක්ෂයා, කාශ්‍යප බුදුන් සමයේ භික්ෂුවක් ව සිටියහ. අපගේ බුදුන් වහන්සේ වැඩසිටි සමයේ යක්ෂයෙක් ලෙසින් යළි උපත ලැබිය. ධර්මය ශ්‍රවනය කර, සෝතාපන්න වූ මෙතෙම, යක්‍ෂ බව හැර භූමිදෙවියෙක්- භුම්මාට දේව- බවට පත්විය. **බලන්න**:ESN: notes: 563-568, p. 575. **මූලාශ්‍ර**: සංයු.නි: (1): සගාථවග්ග: යක්ඛසංයුත්ත: 10.1.3 සූචිලෝම සූත්‍රය, පි.394, ESN:10: Yakkasamyutta: Suchiloma, p. 575.

▲ **යක්ඛ පුනබ්බසු හා මව් යකින්න-** Yakka Punabbasu & mother: එක්සමයක, බුදුන් වහන්සේ සංඝයාට නිවන පිළිබඳව දෙසූ දහම අසා පුනබ්බසු හා ඔහුගේ මව් යකින්න සොතාපන්න බව ලැබූ බව මෙහි විස්තර කර ඇත. **මූලාශ්‍ර**: සංයු.නි: (1): සගාථවග්ග: යක්ඛසංයුත්ත: 10.1.7 පුනබ්බසු සූත්‍රය, පි.398.

▲ **යක්ඛ ප්‍රියංකර හා මව් යකින්න-** Yakka Piyankara & mother: ප්‍රියංකර නම් පුත්‍රයා ගේ මව් යකින්න, අනුරුද්ධ තෙරුන්, අළුයම වදාරණ දහම් පද අසමින් සිය පුතු නැළවූ බව මෙහි දක්වා ඇත. **සටහන**: තමන් පිසාච යෝනියේ (goblin realm) ඉපදී ඇතිබවත්, ඒ නිසා ධර්මය පිළිපැද ඉන්මිදීමට කටයුතු කරන්න යයි ඒ මව පවසාඇත. **මූලාශ්‍රය:** සංයු.නි: (1) සගාථවග්ග: යක්ඛසංයුත්ත: 10.1.6 ප්‍රියංකර සූත්‍රය, පි.398.

▲ **යක්ඛ මණිභද්ද -** Manibadda Yakka: බුදුන් වහන්සේ හමුවේ මෙ යක්ෂයා: "සිහිය ඇතිබව ශ්‍රෙෂ්ඨ ය, සිහිය ඇත්තා වෛරයෙන් මිදේ" යයි පැවසිය. **බුදුන් වහන්සේ මෙසේ වදාළහ:**

"සිහි ඇත්තට සැමකලකදිම යහපතවේ, සුවය ඇතිවේ, ඔහුගේ ස්වභාවය ශ්‍රෙෂ්ඨ ය, එහෙත් එපමණකින් ඔහු වෛරයෙන් නො මිදේ. යමකුගේ සිත දිවා රෑ අවිහිංසාවෙන් ඇලුනේද, ඔහු සියලු සත්‍වයන් කෙරහි මෛත්‍රිය වඩයි, ඔහුට වෛරය නොමැත". **මූලාශ්‍රය:** සංයු.නි: (1) සගාථවග්ග: යක්ඛසංයුත්ත: 10.1.4 මණිභද්ද සූත්‍රය, පි.396.

**යග**

▲**යාග හෝම-**yaaga homa: යාගය, යඥය ලෙසින්ද පෙන්වා ඇත.බුදුන් වහන්සේ වැඩසිටි සමයේ අන්‍ය ආගමික නිකායන් යාග හෝම පැවැත්වූහ. යාගය ලෙසින් පෙන්වා ඇත්තේ, විවිධ සතුන් (මිනිසුන් ඇතුළු) මරණයට පත්කර පුද පූජා පැවැත්වීමය. එවක පැවති යාග : අස්සමේධය, පුරිසමේධය, සම්මාපාසය, වජපෙය්‍යා, නිරග්ගල යන ප්‍රාණවධ ඇති, මහායාග ලෙසින් පිළිගත් යාග ගැන මෙහි විස්තර දක්වා ඇත. **බුදුන් වහන්සේ මෙසේ වදාළහ:** 1) යම්කිසි යාගයකදී ප්‍රාණීහු මරණයට පත්වේද එබඳු යාග රහතුන් හෝ රහත්මගට පිළිපන් උතුමන් අනුමත නොකරති, ඒවා මහා ඵල නොවෙති. සම්මාමග ගත් මහා ඉසිවරයන් එබඳු මහා යාග වලට සහභාගී නොවේ. 2) මේ සසුනේ ඇති යාගය (ධර්මයට අනුව- ධම්ම යාගය) කරන අයට මහා ඵල ලැබේ, පාප සිදුනොවේ, දෙවියෝද පහදී. එමනිසා, නුවණැති ජනයා, ප්‍රාණඝාත නොමැති යාග පුද පූජා සම්මාමග ගත් මහා ඉසිවරයන්ට පූජාකරන්නේ නම්, එමගින් ඔවුන්ට මහා ඵල ලබාගත හැකිය. **සටහන:** මේ සූත්‍රය දේශනා කර ඇත්තේ උජ්ජාය නම් බමුණා, බුදුන් වහන්සේ යාග පැවැත්වීම ප්‍රසංසා කරන්නේද යයි කළ විමසීමක් මතය. **මූලාශ්‍ර**:අංගු.නි: (2): 4 නිපාත: 4.1.4.9 උජ්ජාය සූත්‍රය, පි. 106, EAN:4: 39.9 Ujjaya, p. 164.

▼**පසේනදී කෝසල රජතුමා ගේ මහායාගය**: එක් සමයක මේ රජ මහා යාගයක් කිරීමට සතුන් රැස්කිරීමට කටයුතු කර ඇත. සේවක පිරිස හඬමින් යාගය සඳහා සතුන් එකතුකරනු දුටු සංඝයා ඒ බව බුදුන් වහන්සේට පැවසුහ. එවැනි යාගයකින් මහාඵල ඇතිනොවන බව බුදුන් වහන්සේ වදාළහ. සතුන් ඝාතනය නොකර පවත්වන යාගය නිසා යහපත

ඇතිවේ, දෙවියන්ද පහදින බව මෙහි පෙන්වා ඇත. **බලන්න**:සංයු.නි. (1): සගාථවග්ග:කෝසලසංයුත්ත:3.1.9 යඤ්ඤ සූත්‍රය.

▼ **කූටදන්ත** බ්‍රාහ්මණයාගේ විසින් අග්‍ර යාගය කුමක්ද? යයි කල විමසීම පිළිබඳව බුදුන් වහන්සේ වදාළ දැහැමිවූ, අග්‍ර යාග ගැන විස්තර මෙහි දක්වා ඇත. අග්‍රතම යාගය ලෙසින් පෙන්වා ඇත්තේ, බුදුසසුනේ පැවිදිව, බඹසර නිමාකරගැනීමය. එය සියලු යගයන්ට වැඩ මහත් ඵල, මහා අනුසස් ඇති යාගයකි. එම යාගයට වඩා මනොඥවූ උතුම්වූ අන් යාග සම්පතක් නැතිබව බුදුන් වහන්සේ වදාළහ. **මූලාශ්‍ර:** දීඝ:නි: (1): 5 කූටදන්ත සූත්‍රය, පි.264,EDN:5: Kūṭtadanta Sutta,p.113.

▼ **දෙවියන්ට යාග-** Yaga for Devas: ලෝකයා, ජරාව ආදී සසර දුකින් මිදීම පිනිස දෙවියන්ට යාග පවත්වති. ඔවුන් රූප ආදී ප්‍රතිලාභ ප්‍රාර්ථනා කරති, එසේ කිරීමෙන් ඔවුන්ට සසර දුකින් මිදිය නොහැකිය. රහතුන් සසර දුක තරණය කර ඇති බව මෙහිදී පෙන්වා ඇත. පුන්නක මානවක ඇසූ පැනයකට පිළිතුරු ලෙසින් බුදුන් වහන්සේ මෙ සූත්‍රය වදාළහ. **මූලාශ්‍රය**: ඛු.නි.සුත්තනිපාත: පාරායනවග්ග:වස්තුගාථා: පි,326, 5-3 පුණ්නක මානවක, පි.338.

▲ **යාගු-**Rice porridge: යාගු යනු බත්කැඳය. බත් කැඳ දානය ආනිසංස ගෙනදේ. **බලන්න**: බත් කැඳ

▲ **යුගල ධම්ම කරුණු-**Dhamma in pairs: යුගල ධම්ම (ද්වම ධම්ම) ලෙසින් මෙහිදී පෙන්වා ඇත්තේ දහම් කාරණා දෙකක් යුගලයක් ලෙසින් ගැනීමය:

1) ඵල සමාධිය ඇතුලත් චේතෝවිමුක්ති (Liberation of mind) හා ඵල ප්‍රඥාව ඇතුලත් ප්‍රඥා විමුක්තිය (liberation by wisdom). 2) වීරිය සහිත උත්සාහය හා සිතේ එකඟබව ඇති අවික්ෂේපය (Exertion and non-distraction). 3) නාමය හා රූපය 4) විද්‍යාව හා විමුක්තිය 5) භවදිට්ඨිය (ශාශ්වත දෘෂ්ටි) හා විභව දිට්ඨිය (උච්ඡේදදෘෂ්ටි) 6 ) අහිරිකය හා අනොත්තප්පය. 7) හිරි හා ඔත්තප්ප 8) දොවචස්සතාවය හා පාපමිත්‍ර සේවනය 9) සොවචස්සතාවය හා කල්‍යානමිත්‍ර සේවනය 10) ධාතු කුසලතාවය හා මනසිකාර කුසලතාවය 11) ආපත්ති කුසලතාවය හා ඇවතින් නැගීසිටීමේ කුසලතාවය. **මූලාශ්‍රය**: අංගු.නි: (1) 2 නිපාත: ධම්මවග්ග සූත්‍ර, පි.198

▲**යුගනද්ධ කථා-**Yuganadda katha: යුගනද්ධ කථා ලෙසින් පෙන්වා ඇත්තේ අරහත්වය ලැබීම පිණිස සමථ හා විදර්ශනා භාවනා වැඩීමය. **බලන්න**:සමථ හා විදර්ශනා **මූලාශ්‍රය:** ඛු.නි: පටිසම්භිදා: 2: යුගනද්ධ කථා, පි.14.

▲ **යොග-**Yoga: යොග යනු සසරට බැඳතබන අල්ලා ගැනීමය. **බලන්න**: සතර යොග.

▲ **යොගක්ෂේමය** : පාලි: **යොගක්ඛෙමය-**Security from bondage: යොගක්ෂේමය යනු යොග- කෙළෙස් බැඳීම් ක්ෂය කරගැනීම- නැතිකර ගැනීමය. සසර බැමි- යොග වලින් මිදීමය, නිවනය, අරහත්වය ලැබීමය. නිවන ලැබීම මහා යොගක්ඛෙමය ලෙසින්ද දක්වාඇත. **බලන්න**: සතර යොග.

▼ **අට්ඨික භාවනාව** විපුල කරගැනීම මගින් යොගක්ඛෙමය ඇතිකර ගත හැකිවේ - නිවන ලැබේ. **බලන්න**: අට්ඨික සංඥා භාවනාව. **මූලාශ්‍ර**: සංයු.නි (5-1): මහාවග්ග: බොජ්ඣංග සංයුත්තය: ආනාපාන වග්ගය: 2.7.4. අට්ඨික සූත්‍රය, පි.268, ESN: 46: Bojjhaṅga saṃyutta:VII In and out Breathing, 57.1 The Skeleton, p. 1807.

▼ **කායගතා සතිය වැඩීම** මහත්වූ යොගක්ෂේමය පිණිස පවති. **බලන්න**:කායගතාසතිය.

▲ **යොගක්ඛෙමී හා අයොගක්ඛෙමී:** පාලි: **යොගක්ඛෙමී, අයොගක්ඛෙමී-** one who is not secure from bondage- one who is secure from bondage: සසරබැම් වලින් නො මිදුන පුද්ගලයා යොගක්ඛෙමී වේ. සසරබැම් වලින් මිදුන පුද්ගලයා අයොගක්ඛෙමී වේ, රහතුන්ය. යොග යනු කෙළෙස් බැමිය.**බලන්න**: සතර යොග.

▼ **සිතේ කෙලෙස් ඇතිකරන**, යලි උපතක් ලබාදෙන, බොහෝපිඩා ගෙන දෙන, දුක් ඇතිකරන, ජාති ජරා මරණ උදාකරන, ලාමක අකුසල් වලින් පිරිගිය පුද්ගලයා යොගක්ඛෙමී යයි හඳුන්වයි.

**"සංයුත්තො පාපකෙහි අකුසලෙහි ධම්මෙහි සංකිලෙසිකෙහි පොනොභවිකෙහි සදරෙහි දුක්ඛවිපාකෙහි ආයතිං ජාතිජරාමරණීකෙහි, තස්මා යොගක්ඛෙමීති වුච්චති"**. ( One is fettered by bad unwholesome states that are defiling, conducive to renewed existence, troublesome, ripening in suffering, leading to future birth, old age, and death; therefore one is said to be 'not secure from bondage'). සිතේ කෙලෙස් ඇතිකරන, යලි උපතක් ලබාදෙන, බොහෝපිඩා ගෙන දෙන, දුක් ඇතිකරන, ජාති ජරා මරණ උදාකරන, ලාමක අකුසල් වලින් වෙන්වූ පුද්ගලයා අයොගක්ඛෙමී යයි හඳුන්වයි. **"විසංයුත්තො පාපකෙහි අකුසලෙහි ධම්මෙහි සංකිලෙසිකෙහි පොනොභවිකෙහි සදරෙහි දුක්ඛවිපාකෙහි ආයතිං ජාතිජරාමරණීකෙහි, තස්මා අයොගක්ඛෙමීති වුච්චති"**. ( One is detached from bad unwholesome states that are defiling, conducive to renewed existence, troublesome, ripening in suffering, leading to future birth, old age, and death; therefore one is said to be 'secure from bondage'). **මූලාශ්‍ර:**අංගු.නි: (2): 4 නිපාත:4.1.1.10 යොග සූත්‍රය, පි. 42,EAN:4: 10.10 Bonds, p. 151.

▲ **යොගක්ඛෙමී ධම්ම පරියාය-**Dhamma exposition on Secure from bondage: බුදුන් වහන්සේ යොගක්ඛෙමී ධම්ම පරියාය ලෙසින් පෙන්වා ඇත්තේ සසර බැඳතබන බන්ධන-බැඳීම්-යොග, ක්‍ෂය කර නිවන ලබාගන්නා ක්‍රම වේදයය. එනම්, සළායතන මගින් අල්ලා ගන්නා සියලු බාහිර අරමුණු (ඇස මගින් රූපය ආදී) මතු නූපදනා ස්වභාවයට පත් කරගැනීමය. මෙහිදී දක්වා ඇති **උපමාව**: තල්ගසක් මුලින්ම සිඳ විනාශ කළවිට නැවත හටගන්නේ නැත. තථාගතයන්, ඒ සියලු යොග ක්‍ෂය කරඇතිනිසා '**යොගඛෙමී**' ලෙසින් හඳුන්වයි. **බලන්න**: බුද්ධනාම, උපග්‍රන්ථය:5 **මූලාශ්‍ර:** සංයු.නි: (4): සළායතනවග්ග:වේදනාසංයුත්ත: යොගඛෙමිවග්ග:1.1.1 යොගඛෙමි සූත්‍රය, පි. 206,ESN:35: Salayathnanasamyutta: I104.1 Secure from bondage, p. 1268.

▲ **යොගාතිගා මුනී** (පාලි): **යොගයෙන් මිදුන මුණිවරයා-** the sages who have severed all bonds: කාම, භව, දිට්ඨි හා අවිජ්ජා යොග යන සසර බැම් වලින් (සතර යොගයෙන්) යහපත් ලෙසින් මිදුන උතුමා යොගාතිගා මුනිවරයා යයි බුදුන් වහන්සේ වදාළහ:

**"යෙ වෙ කාමෙ පරිඤ්ඤාය භවයොගඤ්ච සබ්බසො,**
**දිට්ඨියොගං සමූහච්ච අවිජ්ජඤ්ච විරාජයං**
**සබ්බයොග විසංයුත්තා තෙ වෙ යොගාතිගා මුනී ති"**

කාමයන් පිරිසිඳ දැන, සියලු භව යොග මැනවින් අවබෝධ කරගත්, දිට්ඨි පිලිබඳ බැඳීම් සිඳදමා, අවිජ්ජාව හැර දැමූ ඒ මුනිවරයෝ, ඒකාන්තයෙන්ම, සියලු සසර බැම් වලින් නිදහස්වූ උතුමෝය. (...having entirely understood sense pleasures and the bond of existence, having uprooted the bond of views and dissolved ignorance, the sages have severed all bonds; they have gone beyond bondage). **බලන්න**: සතරයොග, සතර විසංයෝග. **මූලාශ්‍ර:**අංගු.නි:(2): 4 නිපාත:4.1.1.10 යොගසූත්‍රය, පි. 42,EAN:4: 10.10 Bonds, p. 151.

**යට**

▲ **යටිකුරුකල කලය උපමාව-** Smile of the overturned pot: මේ උපමාව යොදගෙන ඇත්තේ, ධර්මය ශ්‍රවනය කලද,එම කරුණු සිතේ පිහිටුවා ගැනීමට අසමත් මිනිසුන් -යටිකුරු ප්‍රඥාව ඇති පුද්ගලයන් ගැන දැක්වීමටය. **බලන්න**: කලය උපමාව:උපග්‍රන්ථය:5

**යථ**

▲**යථාභූත ඥාණය** : පාලි: යථාභූතඤාණං-knowledge of things as they really are: ධර්මයේ, යථාභූත ඥාණය ලෙසින් පෙන්වා ඇත්තේ සැබෑ බව (යථාබව- ත්‍රිලක්ෂණය දැකීම)- ඒ ආකරයෙන්ම දැකීමේ නුවණ ඇතිවිමය. **ශබ්දකෝෂ: පා.සිං.ශ**:පි.432: "**යථාභූත**: සිද්ධවූ පරිදි, විද්‍යාමාන ලෙස, ඇති සැටි... **යථාභූතඤාණ**: ප්‍රත්‍ය සහිත නාමරූප පරිග්‍රහණ ඥානය". **B.D:** p.384: **"yathā-bhūta-ñāṇa-dassana:** the knowledge and vision according to reality, is one of the 18 chief kinds of insight…"

▼**යථාභූත ඥානය** : ධර්මතා පිළිබඳව සම්පූර්ණ අවබෝධය ලබාගැනීම: ඒ පිණිස කරුණු 3ක් සපුරා ගත යුතුය:1) **නාථපරින්ඥාව** (full understanding of the known) දෙයක ඇති විශේෂ ලක්ෂණ , එයින් සිදුවන කාර්ය, එයින් පෙන්වාදෙන දේ ගැන මනා දැනුමක් තිබීම - සියල්ල වෙනස්වී යන දේ බව දැකීම. 2) **තිරණ පරින්ඥා** (full understanding by scrutinyzation ): ඒ දේ මැනවින් පරික්ෂාකොට (contemplation) ලබාගත් දැනුම- එනම් මෙය අනිත්‍ය, දුක, අනාත්ම ස්වාභාවයෙන් යුතුබව දැකීම 3) **පහාන පරින්ඥා** (full understanding of abandonment) විමුක්තිය ලබාගැනීමෙන් ඒ දේ ගැන ඇති තණ්හාව, ආසාව නැතිකිරීම දැකීම. **බලන්න**:ම.නි. (1): මූලපරියාය සූත්‍රය.

▼ **යථාභූත ඥානය උත්තරිතරයයි බුදුන් වහන්සේ වදාළහ**

**"...එතදනුත්තරියං ආනන්ද ඤාණානං යදිදං තත්‍ථ තත්‍ථ යථාභූතඤාණං, එතස්මා චාහං ආනන්ද ඤාණා අඤ්ඤං ඤාණං උත්තරිතරං වා පණීතතරං වා නත්‍ථීති වදාමි".** යථාභූත ඥානයට වඩා උත්තරීතර වූ හෝ ප්‍රණීතතරවූ හෝ අන්‍ය ඥානයක් නැත. **යථාභූත ඥානය ඇතිවීම**:

**" යෙ තෙ ආනන්ද, ධම්මා තෙසං තෙසං අධිවුත්තිපදානං අභිඤ්ඤා සච්ඡිකිරියාය සංවත්තනතනති. විසාරදො අහං ආනන්ද තත්‍ර පටිජානාමි .තෙසං තෙසං තථා තථා ධම්මං දෙසෙතුං, යථා යථා පටිපන්නො සන්තං වා අත්‍ථීති ඤස්සති, අසන්තං වා නත්‍ථීති ඤස්සති, හීනං වා හීනන්ති ඤස්සති, පණීතං වා පණීතන්ති ඤස්සති. ස උත්තරං වා ස උත්තරන්ති ඤස්සති, අනුත්තරං වා අනුත්තරන්ති ඤස්සති, යථා යථා වා පන තං ඤාතෙය්‍යං වා දට්ඨෙය්‍යං වා සච්ඡිකාතය්‍යං වා තථා තථා ඤස්සති වා දක්ඛිති වා සච්ඡිකරිස්සති වා ඨාන මෙතං විජ්ජති. එතදනුත්තරියං ආනන්ද ඤාණානං යදිදං තත්‍ථ තත්‍ථ යථාභූතඤාණං..."**

තථාගතයන් වහන්සේට ධර්මයේ මූල ධර්ම-අධිවචන පද පිලිබඳ විශාරදබව ඇත. ඒ මූල ධර්ම අවබෝධය නිවන සාක්ෂාත් කර ගැනීම පිණිසය. ඒ අනුව, තථාගතයන් ලෝකයේ විවිධ පිරිසට, විවිධ ආකාරයෙන් (වැටහෙන ලෙසින්) ධර්මයේ මූලික සිද්ධාන්ත උගන්වන්නේය. එසේ උගන්වන ධර්මය, කෙනෙක් යහපත් ලෙසින්, ධර්මානුකූලව පුරුදු පුහුණු කරන්නේ නම් ඔහුට මෙවැනි අවබෝධයක් ලැබේ: සිදුවිය හැකි දේ සිදුවිය හැකිය, සිදුවිය නොහැකිදේ සිදුවිය නොහැකිය යන නුවණ. එම අවබෝධය ඇතිවිට: පහත් දේ පහත්ය, උතුම් දේ උතුම්ය යන නුවණ ඇතිවේ. එම අවබෝධය ඇතිවිට, අනුත්තර දේ අනුත්තරය, අනුත්තර නොවන දේ අනුත්තර නොවේ යන නුවණ ඇතිවේ. එවිට, කලහැකි දේ කුමක්ද යන අවබෝධය ඇතිවේ, ඒ බව නුවණින් දැකීමට හැකිවේ. ඒ අනුව, ධර්මය එලෙසින්ම (සැබෑබව) අවබෝධ කර ගැනීමට, දැකීමට හා ඉෂ්ට කරගැනීමට හැකියාව ලැබේ. එය යථාභූත ඥානය ඇතිවීමය. **මූලාශ්‍ර**: අංගු.නි: (6): 10 නිපාත: මහා වග්ග: 10.1.3.2 අධිවුත්තිපද සූත්‍රය,පි. 96. EAN: 10: Great Chapter: 22.2 Doctrinal Principles, p.500.

▼ **සමාධිය වඩාගැනීම යථාභූත ඥාණය පිණිසය**: **"...සමාධිං භික්ඛවෙ භාවෙථ. සමාහිතො භික්ඛවෙ, භික්ඛු යථාභූතං පජානාති..."**. සමාධිය වඩා ගැනීමෙන් සිත එකඟ බවට- සමතබවට පත්වේ, එවිට, යථාභූත ඥාණය ඇතිවේ. **සටහන:** සංයු.නි: (3): ඛන්ධසංයුත්ත :නකුලපිතු වග්ග:1.1.1.5 සමාධිභාවනා සූත්‍රයේ මෙසේ දක්වා ඇත: **"...සමාධිගත මහණ යථාභූතය දනී, කුමක් යථාවෙන් දනීද? රූපයේ සමුදය, අස්තගමය... දනී"** (එලෙස, මුළු පංච උපාදානස්කන්ධය අනුව බැලීම). **මූලාශ්‍ර:** සංයු.නි: (5-1): මහාවග්ග:සච්චසංයුත්ත: 12.1.1. සමාධි සූත්‍රය, පි. 284, ESN: 56: Saccha samyutta: 1.1. Concentration, p. 2265.

▼**හුදකලා විවේකයේ යෙදීම** යථාභූත ඥාණය ඇතිවීමට හේතුවේ.

**"පටිසල්ලානෙ භික්ඛවෙ, යොගමාපජ්ජථ, පටිසල්ලීනො භික්ඛවෙ, භික්ඛු යථාභූතං පජානාති..."**. **මූලාශ්‍ර:** සංයු.නි: (5-1) මහාවග්ග:සච්චසංයුත්ත: 12.1.2. පටිසල්ලාන සූත්‍රය, පි. 284, ESN: 56: Sacchasamyutta: 2.2 Seclusion, p. 2266.

**▼ යථාභූත නුවණ ඇතිවීම දුකින් මිදීමය**

බුදුසසුනේ අතීත කාලයේදී හෝ වේවා අනාගත කාලයේදී හෝ වේවා, වර්තමාන කාලයේදී හෝ වේවා වාසය කළ, වාසය කිරීමට යන, වාසය කරන යම් ශ්‍රමණ බ්‍රාහ්මණ උතුමෙක් හට යථාභූත නුවණ ඇතිවීම යනු චතුසත්‍ය අවබෝධයය. එනම්. දුකින් මිදීමය. **මූලාශ්‍ර:** සංයු.නි: (5-1): මහාවග්ග: සච්චසංයුත්ත: සමණබ්‍රාහ්මණ සූත්‍ර 1 හා 2 , පි. 284, ESN: 56: Sacchasamyutta: Ascetics and Brahmins 1 & 2 , p. 2269.

▼**යථාභූත ඥානය** ඇතිවීම නිබ්ද්දාව පිණිස වේ:

**"සමාධි ඛො ආනන්ද යථාභූතඤාණදස්සනත්ථො යථාභූතඤාණදස්සනා - නිසංසො... යථාභූතඤාණදස්සනං ඛො ආනන්ද නිබ්බිදත්ථං නිබ්බිදානිසංසං**". (The purpose and benefit of concentration is the knowledge and vision of thing as they really are ... purpose and benefit of the knowledge and vision of thing as they really are is disenchantment". **මූලාශ්‍ර**:අංගු.නි: (6): 11 නිපාතය:නිසසය වගග**:** 11.1.1.කිමත්ථිය සූත්‍රය හා 11.1.2 න චේතනාය කරණීය සූත්‍රය පි.611-614, EAN:11: Dependence: 1.1 What Purpose & 1-2 Volition p.566.

▼ **ත්‍රි ලක්ෂණය,** අවබෝධය, යථාභූත ඥාණයවේ. එසේ දකිනවිට, අවබෝධ වනවිට රූපය ගැන (මුළු පංච උපාදානස්කන්ධයම) ගැන කලකිරීම ඇතිවේ, කලකිරීම නිසා විරාගය - නොඇල්ම ඇතිවේ, විරාගය මගින් සියල්ල අත්හැර දැමීමට හැකිවීමෙන් නිරෝධය - විමුක්තිය ඇතිවේ. **මූලාශ්‍ර**: අංගු.නි: (5): 8 නිපාත: 8.1.2.1 වෙරඤජ සූත්‍රය, පි 62, EAN:8:11.1 Veranja, p 416.

▲ **යථා විමුක්ත චිත්තය-** Yatha vimutta citta: යථා විමුක්ත චිත්තය ලෙසින් පෙන්වා ඇත්තේ අරහත්මග ඵල ලැබූ භික්ෂුව, සිත කෙළෙසුන්ගෙන් මිදුන අන්දම ප්‍රත්‍යවෙක්ෂා කිරීමය. ( he reviews the extent to which his mind is liberated). **බලන්න**: සිව්පිලිසිඹියා. **මූලාශ්‍ර:** අංගු.නි: (3): 5 නිපාත: 5.2.5.5 අක්කුප්ප සූත්‍රය, පි. 214, EAN: 5: 95.5 The Unshakable, p. 272.

▲**යථාසන්ථකයෝ-**Who observes the any-bed-user's practice: ධුතාංග පුහුණුව ලෙසින් ලැබෙන සයනයක් (ඇඳක) භාවිතා කරන සංඝයා යථාසන්ථකයෝ ලෙසින් පෙන්වා ඇත. **මූලාශ්‍රය**:අංගු.නි: (3): 5 නිපාත: ආරඤ්ඤකවග්ග: 5.4.4.8 යථාසන්ථක සූත්‍රය, පි.380.

**යධ**

▲**යොධාජීව භටයෝ-** Warrior: යොධාජීව ලෙසින් පෙන්වා ඇත්තේ, යුද්ධයෙන් ජීවත්වන,රණශූර යුද්ධභටයාය (යෝධ පුරුෂයා). එවැනි යුදභටයෙක් සිටීම රජකෙනෙකුට මහා උපකාරයකි. ඔහුට යුදශිල්පය පිළිබඳව දක්ෂතා 4 ක් වේ: 1) ස්ථාන (යුදබිම) ගැන දක්‍ෂවීම 2) ඉතා දුර විදීමට (ඊතල) දක්‍ෂවීම 3) දක්ෂ කුරුමාණම් කාරයෙක් වීම (sharp-shooter) 4) මහා සෙනගක් බිඳලීමට දක්‍ෂවීම. මේ උපමාව යොදාගෙන බුදුන් වහන්සේ පෙන්වා ඇත්තේ සතර දහමක් යහපත් ලෙසින් වඩාත් මහණ, "ආහුනෙය්‍යා,පාහුනෙය්‍යා,දක්කිනෙය්‍යා,අංජලිකරනෙය්‍යා,

ලෝකයාට අනුත්තර පුණ්‍යකෙතක්" වන බවය: 1) **ස්ථාන කුසලය ඇතිවීම**: ශිලසම්පන්නවීම 2) **දුර පිලිබඳ කුසලය ඇතිවීම**: ඕනෑම රූප,වේදනා, සංඥා, සංඛාර, විඥානයක්: අතීත, අනාගත හෝ වර්තමානවේවා, බාහිර හෝ අභ්‍යන්තර වේවා, ඕලාරික හෝ සියුම් වේවා, පහත් හෝ උසස් වේවා, ළඟ හෝ දුර වේවා, ඒහැම නිවැරදි ප්‍රඥාව සහිතව: මේ මම නොවේ, මගේ නොවේ, මගේ ආත්මය නොවේ යයි දැකීමේ දක්ෂවිම. 3) **දක්ෂ කුරුමාණම් කාරයෙක් වීම:** චතු සත්‍ය පිලිබඳ ඇති තියුණු අවබෝධය. 4) **මහා සෙනගක් බිඳලීමට දක්ෂවීම**: මහා අවිජ්ජාව බිඳලීමට දක්ෂවීම. **සටහන්: *** ආහුනෙය්‍ය ආදී ගුණ සංසගුණ වේ. **බලන්න**: සංසගුණ**අංගු:3: 5 නිපාත: යොධාජීව වග්ගයේ සූත්‍රයන්හි මේ ගුණ විස්තරාත්මකව පෙන්වා ඇත.බලන්න: උපග්‍රන්ථය:5. **මූලාශ්‍රය**: අංගු.නි: (1): 3 නිපාත: යොධාජීවවග්ග: 3.3.4.1 සූත්‍රය, පි. 550.

▲ **යොධාජීව ගාමිණී-** Yodhajiva Gamini: **බලන්න**: උපග්‍රන්ථය:3

**යන**

▲**යානය-**Vehicle: යානය-රිය-රථ (යාන වාහන) බුදුන් වහන්සේ වැඩසිටි සමයේ පැවති බව සූත්‍ර දේශනාවන්හි පෙන්වා ඇත. **බලන්න**:ම.නි:රථවිනීත සූත්‍රය. **යාන වාහන** දන් දෙනතැනැත්තා දෙන සැප දෙයි, එමගින් ඔහුටද මෙලොව හා පරලොව සැප ඇතිවේ. **බලන්න**: දානය **මූලාශ්‍රය**:සංයු.නි: (1): සගාථවග්ග: දේවතාසංයුත්ත: ආදිත්තවග්ග: කිංදද සූත්‍රය , පි. 82.

▲**යෝනි**- Yoni: යෝනි යනු සත්වයෝ උපත ලබන ආකාරයය. **බලන්න**: උත්පත්තිවිධි.

▲**යෝනිසෝ මනසිකාරය හා අයෝනිසෝමනසිකාරය**: පාලි: **යොනිසො ච මසිකාරං , අයොනිසො ච මසිකාරං** - wise (careful) attention & unwise (careless )attention: යෝනිසෝමනසිකාරය යනු සිහිනුවණ ඇතිව කටයුතු කිරීමය, එමගින් කුසල ධර්ම වැඩේ, අකුසල පහවේ. අයෝනිසෝමනසිකාරය යනු සිහිනුවණ නොමැතිව කටයුතු කිරීමය, එමනිසා අකුසල ධර්ම වැඩේ, කුසල් ධර්ම යටපත්වේ. මෙය සෝතාපන්න වීම පිණිස අවශ්‍ය අංග හතරින් එකකි. **සටහන්: *** යෝනිසෝ මනසිකාරය යනු මූලික ධර්ම කරුණු පිලිබඳ සිහි නුවණ ඇතිව- පරීක්ෂාකාරීව කටයුතු කිරීමය. එනම්: අනිච්ච, දුක්ඛ, අනත්ත හා අසුභ ධර්මතා පිලිබඳ නියම අවබෝධය ඇතිව ජීවිතය පවත්වාගෙන යෑමය .(Careful attention to true characteristics: impermanence, suffering, no-self and foulness). **බලන්න**: ESN: note :553, p. 573. ** යෝනිසෝමනසිකාරය යනු නිවැරදි අවධානය ඇතිව හරිමග (right-track or right course) ගමන් කිරීමය- සත්‍ය ධර්මයට අනුව සිහිනුවණින් කටයුතු කිරීමය. අනිච්ච දේ අනිච්ච් බව, දුක ගෙනදේ සැප නොවන බව, ආත්මයක් නොමැතිය යන ධර්ම කාරණා පිලිබඳ හරි වැටහීම තිබීමය. යෝනිසෝමනසිකාරය සසර දුක නිමාකරගැනීමට මුල් පදනම ලෙසින් සලකන්නේ, එමගින් ආරිය අටමග වැඩි දියණුවට පත්වෙන බැවින්ය". **බලන්න**: EMN:note 33, p. 1065. ** අටුවාවට අනුව යෝනිසෝ

මනසිකාරය යනු විධිමත් අවධානය (උපාය මනසිකාර-right means). **බලන්න:** ESN: note: 270, p.538.

▼ **අයෝනිසෝමනසිකාරය** නිසා පංච නීවරණ වැඩේ, **යෝනිසෝමනසිකාරය** නිසා නිසා පංච නීවරණ දුබල වේ. **මූලාශ්‍රය:** සංයු.නි: (5-1) මහාවග්ග: බොජ්ඣංගසංයුත්ත: උදායිවග්ග: 2.3.4 යෝනිසෝ සූත්‍රය, පි.202 හා නීවරනවග්ග: 2.4.4 සූත්‍රය, පි.216.

▼ **යෝනිසෝමනසිකාරය** මගින් නීවරණ ධර්ම පහකරගත හැකි ආකාරය මේ සූත්‍ර වල විස්තර කර ඇත. **මූලාශ්‍ර:**අංගු.නි: (1) 1 නිපාත: නීවරණ ප්‍රහාණ වග්ග- සූත්‍ර, පි. 44, EAN:1: Abandoning the hindrances, p. 36.

▼ **කුසල් ඇතිවීමට** හා වර්ධනයට නුවණින් මෙනෙහි කිරීම තරම් වෙන එකම ධර්මයක් බුදුන්වහන්සේ නොදකිනබව වදාළහ. **මූලාශ්‍ර:**අංගු.නි: (1):1නිපාත: වීරිය ආරම්භ වග්ගය: 1.7.7 සූත්‍රය, පි.62, EAN:1: VII: Arousal of energy, p. 40.

▼**කෙනෙක්තුල බොජ්ඣංග ධර්මතා** ඇතිවීමට හා වැඩිදියුණුවීමට බලපාන මූලික හේතුව යෝනිසෝමනසිකාරයය. **මූලාශ්‍ර:**අංගු.නි: (1): 1නිපාත:කල්‍යාන මිත්‍ර වග්ග: 1.8.5 සූත්‍රය, පි. 64, EAN:1:VIII, Good friendship, 75.5 sutta, p. 41.

▼**ධර්ම මාර්ගයේ** ගමන් කරන පුද්ගලයෙකුට සිදුවන මහා ලාභය-අර්ථය නම් යෝනිසෝමනසිකාරය කිරීමය. **මූලාශ්‍ර:** අංගු.නි: (1): 1නිපාත : ප්‍රමාද වග්ගය.1.9.11 සූත්‍රය, පි.68, EAN: 1: IX: Heedlessness: 91 sutta, p. 41.

▼**යෝනිසෝමනසිකාරය,** සද්ධර්මයේ පැවැත්මට හා විනාශනොවීමට (continuation and non-decline of the good dhamma) බලපාන මූලික සාධකයක්ය. **මූලාශ්‍ර:**අංගු.නි: (1): 1 නිපාත:ආධ්‍යාත්මික වග්ගය: 1.10.18 සූත්‍රය, පි.74, EAN: 1:X: Internal, p.42.

▼ **යෝනිසෝමනසිකාරයෙන්** හා විරියෙන් කටයුතු කර බුද්ධත්වය සාක්ෂාත් කරගත් බව වදාළ බුදුන්වහන්සේ, එලෙසින් කටයුතු කර විමුක්තිය ලබාගන්නය යයි ශ්‍රාවකයනට අවවාද වදාළහ: "**...මයහං බො භිකඛවෙ යොනිසො මනසිකාරා සමමපපධානා ...අනුතතරා විමුතති සචඡිකතා. තුමෙහපි භිකඛවෙ යොනිසො මනසිකාරා... අනුතතරං විමුතතිං සචඡිකරොථාති...**". **මූලාශ්‍ර:**ස.යු.නි (1): සගාථවග්ග: මාරසංයුත්ත:4.1.4 පඨමපාස සූත්‍රය,පි.218, ESN: 4: MāraSamyutta: 4.4 Māra's Snare-1, p.267.

▼ **බුදුන්වහන්සේ** වදාළේ නුපන් අකුසල (රාග, දෝස හා මෝහය-අකුසල මූල) ඇතිනොවීමට හා උපන් අකුසල නැති කරගැනීම පිණිස යෝනිසෝමනසිකාරයෙන් කටයුතු කිරීමේ වැදගත්බවය. **මූලාශ්‍ර:**අංගු.නි: (1):3 නිපාත: 3.2.2.8 සූත්‍රය, පි.394 ,EAN: 3: 68.8 Other sects, p. 112.

▼**යෝනිසෝමනසිකාරය** වඩා ගැනීමෙන් සප්ත බොජ්ඣංග වර්ධනයවේ. **මූලාශ්‍ර:**සංයු.නි: (5-1) මහාවග්ග: බොජ්ඣංගසංයුත්ත:2.4.5

යෝනිසෝ සූත්‍රය, පි. 215, ESN:46: Bojjhaṅgasaṃyutta, 35.5.Careful attention,p.1770.

▼**යෝනිසෝමනසිකාරය** කිරීමෙන්, බෝසතුන්ට ප්‍රඥාව පහළව, පටිච්චසමුප්පාදය ධර්මය අවබෝධවූ බව බුදුන් වහන්සේ දක්වා ඇත. **මූලාශ්‍ර:**සංයු.නි: (2): නිදානසංයුත්ත:1.1.10 ගෝතම සූත්‍රය, පි.38, ESN: 12 Nidāna Samyutta: 10-10 Gothama sutta, p. 620.

▼ **උදාවන හිරුට පෙරගමන් කරන අරුණෝදය** මෙන් අරිය අටමග ඇතිකරගැනීමට පෙරටුවෙන්නේ යෝනිසෝමනසිකාරයය( careful attention is the forerunner to develop the Noble eightfold path)

**…සූරියසස භිකඛවෙ, උදයතො එතං පුබබඞගමං එතං පුබබනිමතතං යදිදං අරුණගගං. එව මෙව ඛො භිකඛවෙ, භිකඛුනො අරියසස අටඨඞගි කසස මගගසස උපපාදාය එතං පුබබඞගමං එතං පුබබනිමතතං යදිදං යොනිසොමනසිකාර සමපදා…”**. **මූලාශ්‍ර:** සංයු.නි (5-1) :මග්ගසංයුත්ත: සූර්යපෙයියාලවග්ග: 1.6.7 හා 1.6.14 යොනිසෝ සූත්‍ර,පි.80,84, ESN:45: Magga Samyutta: The sun repletion series, p. 1652.

▼**යෝනිසෝමනසිකාරය** ඇතිව ආරිය අටමග වඩාගැනීම මේ සූත්‍රයන්හි විස්තරාත්මකව පෙන්වා ඇත. **මූලාශ්‍ර:** සංයු.නි (5-1) :මග්ගසංයුත්ත: එකධම්මපෙයියාලවග්ග: 1.7.7 සූත්‍රය, පි. 88 හා 1.7.14.සූත්‍රය,පි.92.

▼ **සක්කාය දිට්ඨිය, සීලබ්බතපරාමාස හා විචිකිච්චාව යන** අකුසල ඇතිවීමට අයෝනි සෝමනසිකාරය හේතුවේ. අවුල්සහගත සිත, අසම්ප්‍රජන්‍යය හා වික්ෂිප්ත සිත පහකර ගැනීමෙන් අයෝනිසෝ මනසිකාරය නැතිකර ගත හැකිවේ. යෝනිසෝමනසිකාරයෙන් කටයුතු කරන්නේ නම් සක්කායදිට්ඨිය, සීලබ්බත පරාමාස හා විචිකිච්චාව යන අකුසල ප්‍රහීණ ය කරගැනීමට හැකිවේ, සෝතාපන්න බව ලබාගැනීමට හැකිවේ. **මූලාශ්‍ර:** අංගු.නි: (6): 10 නිපාත: 10.2.3.6. තයෝධම්ම සූත්‍රය, පි. 284, EAN:10: 76.6. Incapable, p. 524.

▼ **යෝනිසෝමනසිකාරයෙන්** කටයුතු කරනවිට නූපන් **ආසව**- taints ඇතිනොවේ, උපන් ආසව පහවේ:

“**…යොනිසො භිකඛවෙ මනසිකරොතො අනුපපනනා චෙව ආසවා න උපපජජනති, උපපනනා ච ආසවා පහීයනති…”**:
**අයෝනිසෝමනසිකාරයෙන්** කටයුතු කරනවිට ඇති නොවූ ආස්‍රව ඇතිවේ, ඇතිවී ඇති ආස්‍රව වැඩේ. **බලන්න**: ආස්‍රව **මූලාශ්‍ර:**ම.නි: (1): 1.1.2 සබ්බආසව සූත්‍රය, පි. 38, EMN:2: Sabbāsava Sutta- All the Taints, p. 73.

▼ **යෝනිසෝමනසිකාරය ආධ්‍යාත්මික වර්ධනයට හේතුවේ**: සියලු කුසල ධර්මයෝ යෝනිසෝමනසිකාරය මූලික කරගෙන ඇත. නුවණින් මෙනෙහි කරන විට පංච නීවරණ ඇති නොවේ, ආධ්‍යාත්මික මාර්ගය සම්පූර්ණ කරදෙන සප්ත බොජ්ඣංග ධර්ම යහපත් ලෙසින් වැඩේ. **මූලාශ්‍ර:** සංයු.නි: (5-1): මහාවග්ග:බොජ්ඣංග සංයුත්ත: 2.4.2 දුතිය කුසල සූත්‍රය හා 24.5 යෝනිසෝ සූත්‍රය, පි. 212, ESN:46:

Bojjangasamyutta: 32.2 Wholesome -1 & 35.5 Careful Attention, p.1767.

▼ **යෝනිසෝමනසිකාරය,** ආධ්‍යාත්මික මාර්ගයට විශේෂ බවක් ගෙන දෙන ධර්මයකි:

**" යොනිසො මනසිකාරො  අයං එකො ධම්මො විසෙසභාගීයො"** **බලන්න:** විශේෂභාගිය ධර්ම. **මූලාශ්‍ර:** දීඝ.නි: (3): 34 දසුත්තර සූත්‍රය, EDN: 34: Dasuttara Sutta: Expanding Decades, p. 384.

▼ **අරහත්වය ලැබීමට පුහුණුවන** (සේඛ) භික්ෂුවගේ සිත්සතන්හි ඇතිවන යෝනිසෝමනසිකාරය බොහෝ උපකාරී ධර්මයක් බව බුදුන් වහන්සේ පෙන්වා ඇත. නුවණින් මෙනෙහි කරනවිට අකුසල පහවී කුසලධර්ම වැඩේ. **බලන්න**:බු.නි:ඉතිවුත්තක:1.2.6 පළමුසේඛ සූත්‍රය.

▼ **වෙනත් මූලාශ්‍ර**: 1. BODHIBULLETINDHARMA NEWS FROM BODHI MONASTERY NOV/DEC 2005: Wise Attention by Venerable Xin-xing.
https://bodhimonastery.org/docs/novdec05bb.pdf

**යම**

▲ **යමක තෙර-**Yamaka Thera: **බලන්න**: උපග්‍රන්ථය:1

▲ **යමක ප්‍රාතිහාර්ය ඥානය-** Yamaka Pāṭihāriya Ñana: යමකප්‍රාතිහාර්ය ඥානය (යමකපාටිහාරිය)  තථාගතයන්ට පමණක්  ඇති විශේෂ ඥානයකි.   **ශබ්දකෝෂ: BD**: p.209: "Yamaka Pāṭihāriya Ñana:Twin miracale-'There the Perfect One performed  the twin-miracle unattainable to any disciple…"

▼**යමක මහා ප්‍රාතිහාර්ය පෑම:**

**" … තථාගත තෙම …යමකප්‍රාතිහාර්ය කෙරෙයි. උඩුකයින් ගිනිකඳ පවත්වයි, යටිකයින් දියදහර පවත්වයි…". සටහන්:** * මේ ඡේදයේ, එම ප්‍රාතිහාර්ය විස්තරාත්මකව දක්වා ඇත. ** බුදුන් වහන්සේ බුදුබව ලබා, කපිලවස්තු නුවරට වැඩිය අවස්ථාවේ, සමහර ශාක්‍යයන් , කුල මානය නිසා උන්වහන්සේට ගරු පූජා නොකළහ. ශාක්‍ය මානය බිඳ දැමීමට බුදුන් වහන්සේ යමක ප්‍රාතිහාර්ය පැවත්වූ බව ලෝමසකන්ගිය තෙර අපදානයේ විස්තර කර ඇත. **බලන්න**: උපග්‍රන්ථය:1. **මූලාශ්‍ර:** බු.නි: පටිසම්භිදාමග්ග1:මහාවග්ග,ඥානකතා:70 යමකප්‍රාතිහාර්ය ඥානය, පි.256.

▲ **යමරජ-** King Yama: සම්ප්‍රදායිකව, මරණයට අධිපති දෙවියා යමරජය. අකුසල කර්මවිපාක ලෙසින් මරණින් පසු නිරයේ ( අපායේ) පහලවූ සත්ත්වයන් හට, ඔවුන් කළ අකුසලයන්ට අනුකූලව දඬුවම් තීරණය කරන්නේ යම රජය. **සටහන්:** * අටුවාවට අනුව යමරජුට දේවවිමානයක් ඇත. සමහර කාලවලදී යමරජු ඒ විමානයේ ඉඳ දෙව්සැප ලබයි, සමහර කාලවල කර්මවිපාක විඳී. ඔහු ධාර්මික රජෙකි. **බලන්න**: EMN: note 1206, p. 1172.  ** පව් කම්කර නිරයේ දුක් විඳින සතුන් දැක, තමන්ට මිනිසත්බව ලැබ, තථාගතයන් වහන්සේ ගෙන් දහම

දැනගැනිමට ඇත්නම් එය ඉතා යහපත්ය යයි යමරජු සිතන බව බුදුන් වහන්සේ වදාළහ.**බලන්න**:අංගු.නි.(1):3 නිපාත:දේවදූතවග්ග: 3.1.4.6 සූත්‍රය. **ශබ්දකෝෂ: G.B:** p 896: "**Yama:** The King of the Yama Heaven; also regarded as the ruler of the hells. In the post-canonical Buddhist literature, Yama is depicted as the overload of the purgatory system who assigns to beings the punishments they must undergo in expiation of their karmic misdeeds"

▼ **යමරජ හා ඔහුගේ කටයතු**: මෙලොවදී තුන්දොරින් අකුසල කර්මකළ මිනිසුන් පහළලෝකයේ- නිරයේ ආදීවූ දුගතියේ පහළවේ. යම පල්ලෝ (යමරජුගේ නිලධාරීන්) ඒ පුරුෂයා, යමරජු ඉදිරියට ගෙනගොස්, ඔහු මිනිස්ලෝකයේදී මාපියනට සත්කාර නොකළබව, ශ්‍රමණ බ්‍රාහමණයන්ට ගරුනොකළබව, වැඩිහිටියන්ට ගරු නොකළබව ආදී ඔහුගේ නරකගුණ දක්වා ඔහුට සුදුසු දඬුවම් දෙන්න යයි පවසති. යමරජු, එම පුරුෂයා ගෙන් අසන්නේ මිනිස්ලෝකයේදී ඔහු දේවදූතයන් සිව්දෙනා දැක තිබේද? ඔවුන් දැකීමෙන් බිය ඇතිවී අකුසල නොකිරීමට නොසිතුවේද? යන කරුණුගැනය. **සටහන**: දේවදූතයන් සිව්දෙනා පිලිබඳව මේ සූත්‍ර දෙකේ විස්තරාත්මකව පෙන්වා ඇත. **බලන්න**: දේවදූතයෝ. **යමරජුගේ විනිශ්චය**: එම පුරුෂයා මිනිස්ලෝකයේ ජීවත්වූ කාලයේ ප්‍රමාදව, තුන්දොරින් අකුසල කර්ම කර ඇත. එම අකුසල කර්ම වෙනත් කෙනෙක් නොව ඔහු විසින් කරනලද නිසා, ඒවා පිලිබඳ නියමිත විපාක ඔහු විසින්ම විඳ දරාගත යුතුය. අවසානයේදී යමපල්ලෝ ඒ පුරුෂයා ගෙනගොස් ඔහුට ඉතා බිහිසුණුවූ, වේදනාකාරිවූ දඬුවම් කරති. **බලන්න**: නිරය. **සටහන:** මේ සූත්‍රවලදී නිරිසතුන්ට පමුණුවන විවිධ දඬුවම් විස්තරාත්මකව දක්වා ඇත. **මූලාශ්‍ර**: අංගු.නි: (1): 3 නිපාතය: දේවදූතවග්ග: 3.1.4.6 සූත්‍රය, පි. 292, EAN:3: Divine Messengers: 36. 6 Messengers, p.92, ම.නි: (3) 3.3.10 දේවදූත සූත්‍රය, පි. 400, EMN:130: The Divine Messengers, p.941.

▲ **යාමදේව ලෝකය**- Yama Devaloka: මෙය කාමාවචර දේවලෝක 6 න් එකකි: **බලන්න**: දේවලෝක.

**යළ**

▲**යළි උපත**- Rebirth: යළි උපත (මරණින් මතු ඉපදීම) අභිනිවෘත්තිය ලෙසින්ද පෙන්වා ඇත. ධර්මයේ යළි උපත ලෙසින් පෙන්වා ඇත්තේ, විඥානය, තුන්ලෝකයෙන් එක් ලෝකයක, ප්‍රතිසන්ධි ලෙසින් ඇතිවීමය, පුනර්භවය ලෙසින්ද පෙන්වා ඇත. කෙළෙස්, සහමුලින්ම විනාශ නොකළ නිසා යලි උපතක් ඇතිවේ. පටිච්චසමුප්පාදයට අනුව භවය සකස්වීම, ජාතියක්- යළි උපතක් ඇතිවීමට හේතුවේ. **සටහන:** සුගතියේ යළි උපත ලබන අය ටිකය, දුගතියේ යළි උපත ලබන අය බොහෝය. **බලන්න:**අංගු.නි: (1): 1නිපාත 1.16 සූත්‍රය, පි.114, අංගු.නි:2: 2.1.2.6 හා 2.1.2.7 සූත්‍ර, පි. 148.

▼ **සත්ත්වයන් යළි උපත ලබන ස්ථාන** 7ක් (**සත්ත්වා වාස** )හා ආයතන- භූමි 2ක් පිළිබඳ විස්තර මේ සූත්‍ර වල පෙන්වා ඇත: **සටහන්:** * විඥාන ස්ථිති ස්ථාන 7**: බලන්න**: විඥානය ස්ථාන ** භූමි 2 : නෙවසංඥා-නා සංඥා ආයතන දෙවිවරු හා අසඥ තලයේ (unconscious) දෙවිවරු මේ

ගණයට වැටේ **බලන්න**: බ්‍රහ්මලෝක. **මූලාශ්‍ර**: දීඝ:නි: මහානිදාන සූත්‍රය (40 ඡෙදය), පි. 118, EDN: 15 Mahānidāna Sutta: The Great Discourse on Origination (section 33), p. 169, අංගු.නි: (4): 7 නිපාත: 7: 7.1.5.1 විඤ්ඤාණට්ඨිති සූත්‍රය, පි. 362, EAN: 7: 44.1 Stations, p.380, අංගු.නි: (5): 9 නිපාත: 9.1.3.4 සත්තාවාස සූත්‍රය, පි. 470, EAN: 9: 24.4. Beings, p.470.

▼ **යළි උපත දුකය,** යළි උපතක් නොවීම සැපය යයි සැරියුත් මහා තෙරුන් වදාළහ. **මූලාශ්‍ර:** අංගු.නි: (6): 10 නිපාත: 10.2.2.5 පඨම සුඛ සූත්‍රය, පි. 246, EAN:10: 65.5 Happiness 1,p. 519**.**

▼ **මිනිසත්බවයේ සිට** චුතව, මිනිස් ලෝකයේ යළි උපත ලබන අය ඉතා ස්වල්පයකි යයි බුදුන් වහන්සේ පෙන්වා ඇත. බොහෝදෙනා නිරයේ, තිරිසන් ලෝකයේ, ප්‍රේතලෝකයේ උපත ලබති. දේව ලෝකයේ උපත ලබන අයද ඉතා ටිකය. ඒ පිලිබඳ දැක්වූ **උපමාව**: බුදුන් වහන්සේ නිය පොත්තට ගත් පස් ස්වල්පය මහා පොළව හා සසඳන විට ඉතාමදය. එලෙස, යළි මිනිසත්බවට පැමිණෙන්නේ ඉතා ටික දෙනෙකි. **බලන්න:** උප ග්‍රන්ථය:5. **සටහන:** දේවලෝකයේ සිට චුතවූ දෙවියන් යලි දේවලෝකයට පැමිණෙන්නේ ටික දෙනකි, මිනිසත්බවට පැමිනෙන්නේද ටික දෙනකි, බොහෝ දෙන සතර අපායේ උපත් ලබන බව බුදුන් වහන්සේ මෙහිදී පෙන්වා ඇත. එසේම සතර අපායේ සිට මිනිසත් බවට පැමිණෙන අයද , දෙවලෝකයට පැමිණෙන අයද ඉතා ටිකය. **මූලාශ්‍ර:** සංයු.නි: (5-1): මහාවග්ග:සච්චසංයුත්ත: මනුස්සචුති සූත්‍ර, පි. 374, ESN: 56: Sacchasamyutta: Passing Away as Humans, p. 2374.

▼ **ආධ්‍යාත්මික මග** යහපත් ලෙසින් වර්ධනය කරගත් පුද්ගලයා, සුගතියක යළි උපත ලබයි, ඔහු විශේෂත්වය ට පැමිණෙන බව මේ සූත්‍රයේ පෙන්වා ඇත. **සටහන:** ආධ්‍යාත්මික මග වර්ධනය කරගත් පුද්ගලයා සතු ගුණ: ත්‍රිවිධ රත්නය පිලිබඳ අවෙච්චා සහගත ප්‍රසාදය, සමාධියට තුඩු දෙන ආරිය කාන්ත ශිලය. මින් හඟවන්නේ සෝතාපන්න පුද්ගලයෙක් සතු ගුණයන්ය. **මූලාශ්‍ර:** සංයු.නි: (5-2): මහාවග්ග:සෝතාපත්තිසංයුත්ත:සරකානි වග්ග: 11.3.1 හා 11.3.2 මහානාම සූත්‍ර, පි.206.

**යව**

▲ **යෞවන මදය**: පාලි: යොබ්බනමදො**-**youth infatuation: යෞවන මදය - තරුණ මදය ලෙසින්ද පෙන්වයි. තරුණ බැවින් මත්විමය. **බලන්න**: මදය.

▲**යවමිටි-**Sheaf of Barley: යව (බාර්ලි) ධාන්‍යයකි එහි අස්වැන්න ගැනීම පිණිස, ඒවා මිටි (කලාප) කොට, බිමදමා මිනිසුන් කත්ලිවලින් තළයි. පළමුව මිනිසුන් 6 දෙනක් එකතුව මිටි තළා දමති. සත්වැනි මිනිසා පැමිණ, ඔහුගේ කත්ලියෙන් යවමිටි තළා දමනවිට, ඒවා හොඳීන්ම තැලී ඇත. මේ උපමාව ඇසුරු කර බුදුන් වහන්සේ පෙන්වා ඇත්තේ ධර්මය නොදත් පෘතග්ජන මිනිසා (අසත්පුරුෂ), කැමති හා අකමැති දේ (බාහිර අරමුණු), සළායතන මගින් අල්වාගෙන (ඇසින් රූප ආදී වශයෙන්), සයවතාවක් තැලීමට ලක්වේ. ඔහු මතු භවය ගැන සිත යොමු කරන්නේ

නම් 7 නි වතාවට ද ඔහුට තැලුම් කෑමට සිදුවේ. පංච උපාදාන ස්කන්ධයම, තමාගේ යයි අල්වාගෙන, ලෝකයා විඳින දුක් කරදර පෙන්වීම පිණිස බුදුන් වහන්සේ මේ **උපමාව** යොදාගෙන ඇත. **බලන්න:** උපග්‍රන්ථය:5. **මූලාශ්‍ර:** සංයු.නි: (4): සළායතනවග්ග: වේදනාසංයුත්ත: ආසිවිසවග්ග:1.19.11 යවකලාපී සූත්‍රය, පි.410.

**යස**

▲ **යසකුල පුත්‍ර තෙර, පවුල හා මිත්‍රයෝ**-Yaskulaputhra Thera, family & friends: **බලන්න:** උපග්‍රන්ථය:1,3

▲ **යසෝධරා තෙරණිය**-Yasodhara Theraniya: භද්‍ද කච්චානා තෙරණිය ලෙසින්ද දක්වා ඇත. **බලන්න**: උපග්‍රන්ථය:2

▲**යස හා අයස**- fame & disrepute: යස (කිර්තිය) හා අයස (අපකීර්තිය) අටලෝදහමකි. **බලන්න**: අටලෝදහම

▲ **යසොජ තෙර**-Yesoja Thera: **බලන්න**: උපග්‍රන්ථය: 1

**යහ**

▲ **යහපත් කථාව**- Good speech: යහපත් කථාව යනු සුදුසු දෙය සුදුසු වෙලාවේ කථා කිරීමය. **බලන්න**: කතාව

▲ **යහපත් ගුණධර්ම**- Good qualities: යහපත් ගුණධර්ම ලෙසින් දක්වා ඇත්තේ, ධර්මානුකූලව වාසය කිරීමය. මෙය ලෝකයේ ලබාගැනීමට දුර්ලභ ධර්මතාවයකි. ධර්මකරුණු තමාගේ ජීවිතයට නො යොදාගැනිම (අනනුයොගය) හා දහම් කරුණු නිතර ආවර්ජනා නොකිරීම-ප්‍රත්‍යවෙක්ෂණය නැතිබව, යහපත් ගුණ ධර්ම ඇතිකර ගැනීමට බාධාවකි. බලන්න: ඉෂ්ඨධම්ම. **මූලාශ්‍රය**: අංගු.නි: (6) 10 නිපාත:10.2.8.3 ඉෂ්ඨධම්ම සූත්‍රය, පි.270,EAN:10: 73.3 Wished for, p.522.

▲ **යහපත් හා අයහපත් භික්ෂුන්**: පාලි:**පෙසලා භික්ඛු, පාපීභික්ඛු** -well-behaved bhikkhus & evil bhikkhus: ධර්මයට අනුව යහපත් භික්ෂුන්යනු ධර්මානුකූලව වාසය කරන සංඝයාය. අයහපත් භික්ෂුන් යනු ධර්මානුකූලව වාසය නොකරන සංඝයාය, පාපී භික්ෂුන්ය. පාපී භික්ෂුන් බලවත්වූ විට ධර්මය පිරිහේ, යහපත් භික්ෂුන්ගේ බලය අඩුවේ, ඔවුන් ඒ ප්‍රදේශය හැර වෙනත් ස්ථානවලට පිටවේ. එම කරුණ බොහෝ දෙනාට අහිත පිණිස, දුක පිණිස, අනර්ථය පිණිස පවතී යයි බුදුන් වහන්සේ පෙන්වා ඇත. එහෙත්, යහපත් භික්ෂුන් බලවත්වූ විට ධර්මය වැඩේ. පාපී භික්ෂුන්ගේ බලය පිරිහේ. යහපත් භික්ෂුන් වැඩවිසීම, බොහෝ දෙනාට හිත පිණිස, සුවය පිණිස, අර්ථය පිණිස පවතී. **මූලාශ්‍ර:** අංගු.නි: (1): 2 නිපාත:2 .1.4.8 සූත්‍රය, පි.172, EAN: 2 : 39.8 Sutta, p.62.

▲**යහපත් ජීවිතය**- Good life: ධර්මානුකූලව ජීවිතය ගෙනයාම යහපත් ජීවිතය. පතිමෝක්ඛ සංවරය ඇතිව සිටීම සංඝයාගේ යහපත් ජීවිතයය. ගිහිපිරිසට, යහපත් ජිවිතයක් ගත කිරීමට උපදෙස් බුදුන් වහන්සේ පෙන්වා ඇත. **බලන්න**: අත්තූපනායික ධම්මපරියාය. **මූලාශ්‍ර:**සංයු.නි: (5-2) මහාවග්ග: සොතාපත්තිසංයුත්ත:වේලුද්වාර සූත්‍රය, පි.178, ESN: Sothapaththi Samyuththa:7.7 The people of Bamboo Gate p. 2191.

## ර කොටස:රක,රග,රච,රජ,රට,රත,රථ,රධ,රන,රප,රම,රය,රල,රව,රස,රහ

### රක

▲**රුක්ඛමූලකයෝ-** who dwell at the foot of a tree: ධුතාංග පුහුණුව ලෙසින් රුක්මුලක-ගසක්යට වාසය කරන සංඝයා රුක්ඛමූලකයෝ ලෙසින් පෙන්වා ඇත. **මූලාශ්‍රය:**අංගු.නි: (3): 5 නිපාත: ආරඤ්ඤකවග්ග: 5.4.4.4 රුක්ඛමූලක සූත්‍රය, පි.378.

▲ **රුක් උපමාව**-Simile of a tree: නැගෙනහිරට නැමුන ගසක් කපා දැමුවිට එය පතිත වන්නේ නැගෙනහිර දිශාවටය. එලෙස, ආරිය අටමග වර්ධනයකරගත් පුද්ගලයා නිවන දෙසට බරවේ. **බලන්න**: උපග්‍රන්ථය:5.

▲ **රුක්බඳු පුද්ගලයෝ-** People who like  trees: රුක් (ගස්) හා සමාන පුද්ගලයන් 4 දෙනක් වේ: 1) නිසරු රුක් පිරිවරාගෙන නිසරු රුකක් ඇත. එලෙස නිසරු පුද්ගලයෙක් සිටි (එලගුපුද්ගල). ඔහු දුසිල්වත්ය, පිරිවරද දුසිල්වත්ය. 2) සරු රුක් පිරිවරාගෙන නිසරු රුකක් ඇත. එලෙස, දුසිල්වත් පුද්ගලයෙක් සිටි, එහෙත්, ඔහු ගේ පරිවාර පුද්ගලයෝ සිල්වත්ය. 3) නිසරු රුක් පිරිවරාගෙන සිටින සරු රුක. එලෙස, සිල්වත් පුද්ගලයෙක් සිටි, ඔහුගේ පරිවාර පිරිස දුසිල්වත්ය. 4) සරු රුක් පිරිවරා ඇති සරු රුක්. එලෙස, සිල්වත් පුද්ගලයෙක් වටා සිල්වත් පිරිසක් සිටි. **මූලාශ්‍රය:** අංගු.නි: (2):4 නිපාත:වලාහකවග්ග: 4.3.1.9 රුක්ඛ සූත්‍රය, පි.236.

### රග

▲ **රාගය-** lust: සසර බැඳ තබන කෙලෙස් මූල තුනෙන් එකකි. **බලන්න:** රාග දෝස මෝහ. **සටහන:** මාරයාගේ එක් දියණියක් රාගා ය. **බලන්න**: මාරයාගේ දියණියන්.

▼**රාගය අවසන් කිරීමට වැඩිය යුතු ධර්මතා**: රාගය පිලිබඳව සෘජු ඥානය ලැබීම පිණිස (අභිඥාය-direct knowledge), රාගය පිලිබඳ සම්පූර්ණ ඥානය ලැබීම පිණිස (පරිඥාව -full understanding-), රාගය සම්පුර්ණයෙන්ම විනාශ කිරීමට (සමුච්චේදය-utter destruction), රාගය දුරුකිරීම පිණිස (පහානය-abandoning), රාගය වැනසීම පිණිස (destruction), රාගය අතුරුදහන්කිරීම පිණිස (vanishing), රාගය විරාගය කිරීම පිණිස, රාගයේ නිරෝධය පිණිස, රාගය දීලාදැමීම පිණිස (චාග-giving up ), රාගය අතහැරිම පිණිස (relinquishment)  වැඩිය යුතු ධර්මතා:  1අසුභ සංඥාව  2 මරණ සංඥාව 3 ආහාරයෙහි පටිකුල සංඥාව 4 සර්වලෝකය පිලිබඳ අනභිරති සංඥාව 5 අනිච්ච සංඥාව 6 අනිච්චේ දුක්ඛසංඥාව  7 දුක්ඛෙ අනත්ත සංඥාව 8 පහාන සංඥාව 9 විරාග සංඥාව 10 නිරෝධ සංඥාව 11 අස්තික සංඥාව - ඇටසැකිල්ල ගැන (අට්ඨික සංඥාව) 12 පුලවක සංඥාව 13  විනීලක සංඥාව 14 විපුබ්බක සංඥාව 15 විච්ඡිද්දක සංඥාව 16. උද්ධුමාතක සංඥාව 17 අනත්ත සංඥාව 18 සම්මා මග වඩාගැනීම. **බලන්න**: සංඥා, සම්මා මග, භාවනා. **මූලාශ්‍ර**:අංගු.නි: (6) :10 නිපාත: රාගාදී පෙයාාලය වග්ග, පි.605, EAN: 10: III Lust & so

forth, p. 563, අංගු.නි: (3):5 නිපාත: රාගාදී පෙයාාලය වග්ග, පි.487, EAN: 5: Lust & so forth, p. 315.

▲ **රාග ගින්න** -Fire of lust: රාගගින්න, කාමයෙන් මුලාවූ මිනිසුන් මේ ගින්නෙන් දැවේ, **බලන්න**: ගින්න විවිධබව. සංයු.නි: ( 4 ): සළායතනවග්ග: වේදනාසංයුත්ත: 1.18.8 ආදිත්තපරියාය ධර්ම න්‍යාය සූත්‍රය, පි. 358.

▲**රාගවිනය** - Destruction of lust: රාගවිනය යනු සිතේ ඇති රාගය විනාශකර දැමීම- ක්‍ෂයකිරීමය. **බලන්න**: ආශ්‍රව හා ආශ්‍රව ක්‍ෂය කිරීම. **මූලාශ්‍ර**: සංයු.නි: (5-1):මග්ගසංයුත්ත: 1.1.7 දුතිය භික්ඛු සූත්‍රය,පි.40, ESN: 45: Magga samyutta: Connected discourses on the Path: 6 .6 A certain bhikkhu-2, p. 1610

▲**රාගවිරාගා චෙතොවිමුත්ති**-Raga viraga chethovimuthti: රාගවිරාගා චෙතොවිමුත්ති ය යනු සමථ භාවනාව වැඩීමේ ප්‍රතිඵලයකි, එනම් රාගය පහවී සිත නිදහස්වීමය. **බලන්න**: චේතෝවිමුක්තිය. **මූලාශ්‍ර**: අංගු.නි: (1): 2 නිපාත: 2.1.3.11 සූත්‍රය, පි.158, EAN: 2: 31.11 Sutta, p.60..

▲**රාගය දෝසය මෝහය:** පාලි: **රාගං දොසං මොහං-** lust, hatred, and delusion: රාගය දෝසය හා මෝහය අකුසල මූලයන්ය. මේවා ලෝභය, ක්‍රෝධය හා අවිජ්ජාව ලෙසින්ද පෙන්වා ඇත. **බලන්න**: කුසල හා අකුසල. **මූලාශ්‍ර**: ම. නි: (1) 1.1.9.සම්මා දිට්ඨි සූත්‍රය, පි. 130, EMN: 9-Sammādiṭṭhi Sutta, p. 121.

▼ **මේ ත්‍රිවිධ අකුසල මුල්** පහකර ගැනීමට, පිලිවෙලින්, අශුභය, මෛත්‍රිය හා ප්‍රඥාව වැඩිය යුතුය.**මූලාශ්‍රය:** අංගු.නි: (4) 6 නිපාත: 6.1.1රාග සූත්‍රය, පි.280.

▼ **රාගය දෝසය හා මෝහය යන අකුසල** නිසා ජාතිය, ජරාව හා මරණය ලෝකයේ පවති. එම අකුසල 3 පහ කරගැනීමට, සක්කායදිට්ඨිය (Personal-existence view), විචිකිච්චාව (doubt) හා සිලබ්බතපරාමාස ( wrong grasp of behavior and observances) යන ධර්මතා පහ කර ගත යුතුවේ. රාගය, දෝසය හා මෝහය ප්‍රහීණය කරගැනීමෙන් ජාති ජරා මරණ ධර්මයන්ගෙන් ගැලවිය හැකි වේ. **මූලාශ්‍ර**: අංගු.නි: (6):10 නිපාත: 10.2.3.6 තයෝධම්ම සූත්‍රය,පි.284, EAN:10: Tens,76-6.Incapable, p. 524.

▼**රාගය දුරු කිරීම (රාගවිරාගත්‍ථං**- the fading away of the lust) රාගය දුරුකිරීම මග බඹසර වාසය කිරීමේ එක් අරමුණක් ය. **බලන්න**: බ්‍රහ්මචරියාව. **මූලාශ්‍ර:** සංයු.නි: (5-1) මහාවග්ග:මග්ගසංයුත්ත: අඤ්ඤතිත්‍ථියා පෙයාාලො වග්ග**:** 1.5.1 විරාග සූත්‍රය, පි. 72, ESN:45 Maggasamyutta: V: Wanders of the other sects: 41.1 The Fading Away of Lust, p.1650.

▼ **රාගය, ද්වේෂය හා මෝහය පිලිබඳ විශේෂ ලක්ෂණ**: 1) **රාගය:** සුළු දොසයන් සහිත වුවත් ප්‍රහීණවීමට කල්ගත්වේ. රාගය ඇතිවීමට හා වැඩියාමට මුල්වන්නේ සුභ නිමිත්ත පිළිබඳව අයෝනිසෝමනසිකාරය කිරීමය. රාගය ඇතිනොවීමට හා උපන් රාගය සන්සිදීමට උපකරිවන්නේ

අසුභ නිමිත්ත පිලිබඳ යෝනිසෝමනසිකාරය කිරීමය. 2) **දෝසය:** ක්‍රෝධය මහා දොස් සහිතය, එහෙත්, ඉක්මනින් ප්‍රහිනය වේ. දෝසය ඇතිවීමට හා වැඩියාමට මුල්වන්නේ පටිස නිමිත්ත පිළිබඳව අයෝනිසෝ මනසිකාරය කිරීමය. මෛත්‍රිය වැඩීම, යෝනිසෝ මනසිකාරය, මෙත්තා චෙතොසෝ විමුක්තිය ලබාගැනීමෙන් දෝසය ප්‍රහීණය කරගැනීමට හැකිවේ. 3) **මෝහය**: අවිජ්ජාව මහා දොස් සහිතය, ප්‍රහීණ වීමට දිගු කාලයක් ගතවේ. අයෝනිසෝමනසිකාරයෙන් කටයුතු කිරීම නිසා නුපන් මෝහය ඇතිවේ, උපන් මෝහය වැඩි දියුණුවේ. ධර්මතා පිලිබඳ සිහි නුවණින්- යෝනිසෝමනසිකාරයෙන් කටයුතු කරන්නේනම් මෝහය ප්‍රහීණය කරගැනීමට හැකිවේ. **මූලාශ්‍ර**:අංගු.නි: (1): 3 නිපාත, මහාවග්ග: 3.2.2.8 සූත්‍රය, පි.394, EAN: 3: 68.8 other sects, p. 112.

▼ **රාගය දෝසය හා මෝහය නිසා ඇතිවන ආදීනව**: මේ කෙළෙස් නිසා කෙනෙක් පිඩාවට පත්වේ, අනුන්හටද පීඩා කරයි, එසේම මානසික දුක්විඳි, ධර්මය වඩාගැනීමට සිතේ උනන්දුවක්, දිරියක් ඇතිනොවේ. තුන් දොරින්ම දුසිරිත් කරයි. එසේම ධර්මයේ අන්ධයෙක් බවට පත්වේ, යහපත් කල්පනා නැතිවේ, ධර්ම අවබෝධය හීනවේ, ප්‍රඥාව දුබලවේ, දුකට පත්වේ, නිවන දුරකරගනී. මේ තුන් කෙළෙස් නැතිකිරීමේ මග අරිය අටමගය. යම් කෙනෙක් අරිය අටමග අනුගමනය කර, මේ ආසවයන් ප්‍රහීණය කරගන්නේ නම් ඔහු පිඩාවට, දුකට පත් නොවේ. **මූලාශ්‍ර**:අංගු.නි: (1): 3 නිපාත: ආනන්දවග්ග: 3.2.3.1 සූත්‍රය, පි. 420, EAN:3: Ananda vagga, 71.1. Channa, p. 117.

▼**රාග දෝස මෝහ ප්‍රහීණය**: **රාගය ප්‍රහීණ කිරීමට** අශුභය (unattractive) වැඩිය යුතුය, දෝසය ප්‍රහීණ කිරීමට මෛත්‍රීය වැඩිය යුතුය, මෝහය ප්‍රහීණ කිරීමට ප්‍රඥාව වැඩිය යුතුය යි බුදුන් වහන්සේ පෙන්වා ඇත. **මූලාශ්‍ර:** අංගු.නි: (4 ): 6 නිපාත: 6.1.1. රාග සූත්‍රය, පි. 279, EAN: 6: 107.1 Lust, p. 364.

▼**රාග දෝස මෝහ ප්‍රහීණය පිණිස වැඩිය යුතු ධර්මතා දෙක**: රාගය දෝසය මෝහය සහමුලින්ම නැතිකිරිමට: සමථ හා විදර්ශනාව වැඩිය යුතුවේ. **මූලාශ්‍රය**:අංගු:නි: (1): 2 නිපාත: රාගපෙයයාල සූත්‍ර, පි.232.

▼**රග දොස මෝහය** ට යටවීම මරුගේ බන්ධනයට හසුවීමය. ඒවා දුරු කරගැනීම මරුගේ බන්ධනයෙන් නිදහස් වීමය. **මූලාශ්‍රය**:ඛු.නි: ඉතිවුත්තක: රාග සූත්‍ර 2කි, පි.422.

▲ **රෝග**-Sickness: බුදුන් වහන්සේ, ලෝකයාට ඇතිවන රෝග 2 ක් දක්වා ඇත: 1) කායික රෝග: කයේ ඇතිවන රෝග. මිනිසුන්ට උපරිම ලෙසින් නිරෝගීබව වසර 100ක් පමණ කලක් කය තබා ගත හැකිය, 2) චෙතසික රෝග (මානසික): මනස නිසා ඇතිකරගන්නා රෝග. රහතුන් හැර, මොහොතක් හෝ මානසික සුවය ලබන අය දුර්ලභය. **සටහන**: මේ සූත්‍රයේ පැවිද්දන්ට ඇති රෝග 4 ක් පෙන්වා ඇත: 1) මහෙච්ඡතාවය: ලැබෙන සිව්පසයෙන් සතුටුනොවීම 2) ලාභසත්කාර සම්මාන ආදිය ලබාගැනීමට ඇති දැඩි ආශාව 3) ඒවා ලබාගැනීමට වීරිය කිරීම 4) පවුල් වලින් යම් දේ ලබාගැනීම පිණිස කපටි ලෙසින් කටයුතු කිරීම. **මූලාශ්‍රය:** අංගු.නි: (2): 4 නිපාත: ඉන්ද්‍රියවග්ග: 4.4.1.7 රෝගසූත්‍රය, පි.298.

**රව**

▲ **රුචි උපාසිකා-**Ruchi Upasika**: බලන්න:** උප ග්‍රන්ථය:3

**රජ**

▲ **රජගහ නුවර-** City of Rajagaha**:** බුදුන් වහන්සේ වැඩසිටි සමයේ රජහගනුවර, මගධයේ අගනුවරය. ගිහිගෙය හැර සත්‍ය සොයා යන සිද්ධාර්ථ තවුසා කපිලවස්තු නුවර සිටි මේ නුවරට පැමිණීම, එහිදී, මගධයේ අධිපති බිම්බිසාර රජ හමුවීම සූත්‍ර දේශනා වල විස්තර කර ඇත. එම නුවරට බුදුන් වහන්සේ වඩින අවස්ථාවේ, සක්දෙවිඳු තරුණ මිනිස්වෙසක් ගෙන බුදුගුණ කියමින් ජනයා ඉදිරියේ ගමන්කළහ. බුදුන් වහන්සේගේ අවසාන චාරිකාව ආරම්භ කළේ රජගහනුවර සිටය. එවක, මගධයේ පාලකයා අජාසත් රාජය. **බලන්න**:වින.පි: මහාවග්ග (1) : 48: මහාඛන්ධක: 48 උරුවෙලපටිහාරිය කතා, පි. 127, මහාපරිනිර්වාණ සූත්‍රය: උපග්‍රන්ථය:6. **මූලාශ්‍රය**: වි.පි: මහාවග්ග පාලිය 1: 9 ඡෙදය, පි 158.

▲ **රජස්-**Dust: රජස් යනු දූවිලිය. ධර්මයේ රජස් ලෙසින් පෙන්වා ඇත්තේ කෙළෙස්ය. මේ සූත්‍රයේදී පෙන්වා ඇත්තේ ගිම්හානයේ ඇතිවන දූවිලි කුණාටු, මහා වැස්සකින් සේදී යන ලෙසින්, ආරිය අටමග මග දියුණු කරගැනීමෙන්, කෙළෙස් සේදී යන බවය**. බලන්න**: උපග්‍රන්ථය:5 **මූලාශ්‍රය:** සංයු.නි: (5-1): මහාවග්ග:මග්ගසංයුත්ත: බලකරණියවග්ග :මේඝසූත්‍රය, පි.142.

▲**රජවරු-**Kings: රජ යනු යම් රටක, ප්‍රදේශයක, රාජධානියක නායකයාය. බුදුන් වහන්සේ වැඩසිටි සමයේ, මගධ අධිපති බිම්බිසාර, කෝසල අධිපති පසේනදී යන රජවරු මහා සම්පත් ඇති බලවත් රජුන්ය. එහෙත්, රජ සම්පත් වලට වඩා නිවන සම්පත ලැබීම අනගිය යි බුදුන් වහන්සේ වදාළහ. **සටහන්**: * මේ සූත්‍රය දේශනා කිරීමට පසුබිමවුවේ, එක්සමයක සංඝයා ඒ රජුන් දෙදනාගේ සම්පත් ගැන කථා කිරීමය.බුදුන් වහන්සේ ඔවුන්ට පෙන්වා දුන්නේ පැවිද්දන්ට එවැනි කථා නිෂ්ඵල බවය. **බලන්න**: කථාව. ** ඒ රජවරු දෙදෙනාම බුදුන් වහන්සේ සරණ ගිය ගිහියන්ය. **බලන්න**: උපග්‍රන්ථය:3. ** **සියලුම කුඩා රජවරු**, සක්විති රජු අනුගමනය කරති, සක්විති රජු අග්‍රය. **බලන්න:** සංයු.නි: (5-1): මග්ගසංයුත්ත:අප්‍රමාදවග්ග:1.13 රාජ සූත්‍රය, පි.130. **මූලාශ්‍ර:** ඛු.නි: උදානපාලිය: 2.2 රාජසූත්‍රය, පි.176.

▲ **රජ සලකුණ-** Symbol of the king: රටකට-රාජ්‍යකට සලකුණ-සංකේතය වන්නේ ඒ රටේ රජය, රජුගේ ධජයයය. **මූලාශ්‍රය:**සංයු.නි: (1): සගාථවග්ග:දේවතාසංයුත්ත:1.8.2. රථ සූත්‍රය, පි.104.

▲ **රාජ අන්තංපුරය-**Kings Women’s quarters: රාජඅන්තංපුරය යනු රජ කෙනකුගේ බිසව්වරු හා පරිවාර කාන්තාවන් වාසය කරන රාජ මන්දිරයකි. එවැනි ස්ථාන වලට ඇතුලත් වීමෙන් සංඝයා ට සිදුවිය හැකි විපත් 10ක් මේ සූත්‍රයේ පෙන්වා ඇත. **මූලාශ්‍රය:** අංගු.නි: (6): 10 නිපාත: 10.1.5.5. රාජඅන්තංපුරවිනාස සූත්‍රය, පි.174.

▲**රාජකථා-**Talks about Kings: රජවරු පිලිබඳ කතාබහේ යෙදීම බුදුසසුනේ පැවිද්දන්ට සුදුසු නොවේ. **බලන්න:** කතාව

▲ **රාජකීය නුගගස**-Royal Banyan tree: පෙරකල සිටි කොරව්‍ය නම් රජහට යහපත් ලෙසින් ස්ථාපනය කළ ‘‘සුප්පතිට්ඨ’’ නම් මහා නුග රුකක් තිබිණි. එම ගසට පස් මහා කඳ තිබිණි, එහි හටගත් එල ඉතා මිහිරිය. එක් කඳක එල රාජ පිරිසද, දෙවෙනි කඳේ එල හමුදාවද, තෙවෙනි කඳේ එල දනව් වැසියෝද, සිව්වෙනි කඳේ එල මහණ බමුණන්ද, පස්වෙනි කඳේ එල සතුන් හා පක්ෂීන් ද සමගියෙන් අනුභව කරති. එක් වතාවක පව්ටු මිනිසක් පැමිණ මුළු ගසේ එල අනුභව කර, අතු කඩා බිම දමා ඒ නුග රුක වැනසුවේය. ඒ ගසේ සිටි දේවතාව, ඒ දැක කලකිරී, ගසේ එල හට නොගන්නේ නම් මැනවයයි සිතුවේය. ඒ අනුව නුග ගස නැවත එල නොදිනි. ගසේ ගෙඩි හට නොගන්නා බව දැක රජතුමා ඒ බව සක්දෙවිඳුට පැවසුහ. එවිට, සක්දෙවිඳු මහා කුණාටුවක් මවා ඒ ගස පෙරලා දැමුවේය. තමන්ගේ වාසස්ථානය අහිමිවූ, වෘක්ෂ දේවතාව ඒ ගැන කම්පාවන බව දැක සක්දෙවිඳු ඒ ගැන විමසා බලා ඒ දේවතාවගෙන් මෙසේ විමසිය ‘‘ඔබ, ‘**රුක්ධර්මය**’ අනුගමනය කළේද?’. එම කරුණ ගැන දේවතාව නොමදන්නා බව පැවසුවිට සක්දෙවිඳු මෙසේ පැවසුහ: ‘‘රුක්ධර්මය නම්: ගසේ මුල් අවශ්‍ය අය මුල්ගනී, අතු අවශ්‍ය අය...පොතු අවශ්‍ය අය ...මල් අවශ්‍ය අය... එල අවශ්‍ය අය ඒ ඒ දේ ගනී, ඒ ගැන දේවතාව අසතුටු නොවිය යුතුය, කෝප නොවිය යුතුය, මෙය රුක්ධර්මය- වෘක්ෂ ධර්මය ය’’. එම කරුණ අවබෝධ කරගත් දේවතාව, මින් මතු තමා රුක් දහම පිළිපදින බව පැවසිය. සක්දෙවිඳු තම් බලයෙන් ඒ ගස නැවත පිහිටුවා දේවතාවට වාසස්ථානය ලබා දුන්හ. එම සිදුවීම ආශ්‍රය කර, බුදුන් වහන්සේ ධම්මික තෙරනුට පැවසුවේ, ඔහු ශ්‍රමණ ධර්මය අනුගමනය නොකළ නිසා, ඔහුගේ ප්‍රදේශයේ ගිහි උපාසකවරු ඔහු, ආවාසවලින් නෙරපූ බවය. **ශ්‍රමණ ධර්ම**ය දේශනා කළ බුදුන් වහන්සේ වදාළේ, තමන් සමග සිටින සබ්‍රහ්මචාරින් හා උතුම් සංඝරත්නයට ක්‍රෝධ පරිභව නොකර වාසය කලයුතු බවය. **බලන්න**: ධම්මික භික්ෂුව, ක්‍රෝධය. **සටහන:** ධම්මික භික්ෂුව ගේ අයහපත් හැසිරීම ගැන අවවාද කිරීම පිණිස බුදුන් වහන්සේ මේ දේශනාව වදාළහ. **බලන්න**: උපග්‍රන්ථය:1,5. **මූලාශ්‍ර:** අංගු.නි: (4) : 6 නිපාත:ධම්මිකවග්ග: 6.1.5.12 ධම්මික සූත්‍රය,පි.160, EAN:6: 54.12 Dhammika, p.343.

▲**රාජදත්ත තෙර-** Rajadaththa Thera: **බලන්න:** උපග්‍රන්ථය: 1

▲**රාජ බටයෝ**-King’s soldiers: බුදුන් වහන්සේ මායා කාරයෙක් යයි සමහරු කරනලද අපවාදය, පැහැදිලි කිරීම පිණිස මේ සූත්‍රය, පාටලී ගාමිණිනිට වදාළහ. මෙහිදී පෙන්වා ඇත්තේ යමක් ඇසීමෙන් දකීමෙන් පමණක් කෙනක් මැනිමට නොයා යුතු බවය. **බලන්න**: උපග්‍රන්ථය:5 , බුදුන්වහන්සේට අපවාද කිරීම:උපග්‍රන්ථය:6, පාටලිය ගාමිණී: උප ග්‍රන්ථය:3.**මූලාශ්‍රය**:සංයු.නි:සළායතනවග්ග:ගාමිණී සංයුත්ත:8.1.13 පාටලිය සූත්‍රය, පි.611

රට

▲**රට්ඨ පිණ්ඩය-** Ratta pinda: රට්ඨ පිණ්ඩය, ලෙසින් පෙන්වා ඇත්තේ රටවාසීන් දෙන පිණ්ඩපාතයය (alms food given by people of the country). යම්කිසි භික්ෂුවක්, මෙත්තාසහගත සිත ඇතිව වාසය කරයි නම්, ජාන සමාපත්ති ලබන්නේ නම්, ශාස්තෘන්වහන්සේ ගේ අවවාද පිළිගෙන ඒ අනුව කටයුතු කරයි නම්, රටවැසියා දෙන පිණ්ඩපාතය,

බාධාවක් නොමැතිව වැළඳිය හැකිය. **සටහන:** යහපත් භික්ෂුවට දෙන දානය නිසා රට වැසියාට පින් ලැබේ. එනිසා, භික්ෂුව පිණ්ඩපාතය වැළඳීමට සුදුසු කෙනක් වීම අවශ්‍යතාවයකි. **මූලාශ්‍රය:** අං.ගු.නි: (1) : 1 නිපාත: ප්‍රභාස්වර වග්ග:1.6.3 සූත්‍රය, පි.58.

▲**රට්ඨපාල තෙර-**Rattapaala Thera: **බලන්න**: උපග්‍රන්ථය:1

**රත**

▲ **රත්න හත-** Seven Treasurers: රත්න 7 ලෙසින් පෙන්වා ඇත්තේ සක්විතිරජෙකුට හිමි රත්න- සම්පත් ගැනය. **බලන්න**: සක්විතිරජ.

▲ **රාත්‍රී භෝජනය වැලකීම**- Avoiding night meal: පැවදි ජීවිතය සුවසේ පවත්වා ගැනීම පිණිස රාත්‍රී ආහාරයෙන් වැලකීම සුදුසුබව, බුදුන් වහන්සේ වදාළ අනුසාසනය මෙහි දක්වා ඇත. අස්සජි හා පුන්බ්බසුක යන භික්ෂූන් එම අවවාදය පිළිගත්තේ නැත. **බලන්න**: උපග්‍රන්ථය:4. **මූලාශ්‍රය:** ම.නි:(2) 2.2.10 කිටාගිරි සූත්‍රය, පි. 252.

▼ **විකාල භෝජනය** ගැන බුදුන් වහන්සේ දුන් අවවාදය පළමුව පිළිනොගත් භද්‍රාලි තෙරුන්, පසුව තමාගේ අයහපත් ක්‍රියවා ගැන බුදුන් වහන්සේගෙන් සමාව යැදීම මෙහි දක්වා ඇත. **බලන්න**: භද්‍රාලි තෙර. **මූලාශ්‍රය:**ම.නි: (2) 2.2.5 භද්‍රාලි සූත්‍රය, පි.190.

**රථ**

▲**රථ උපමාව-**Simile of the chariot: ඉන්ද්‍රිය සංවර කරගත් ( ඉන්ද්‍රියන්හි වසනලද දොර ඇති) භික්ෂුව ගේ සංයමය පෙන්වීම පිණිස බුදුන් වහන්සේ මේ උපමාව යොදාගෙන ඇත. **උපමාව**: සමබිමක පිහිටි සතර මහාසන්ධියක (සිව්මංසල) අජානිය අසුන් ඇති රියක් ඇත. අසුන් හික්මවීමේ දක්ෂ රියැදුරු ඒ රියට නැගී, ඒ සතර දිසාවෙන් කැමති දිසාවකට ඒ රිය ගෙනයයි, එසේම කැමති ලෙස ආපසු පැමිණේ. එලෙස, ඉන්ද්‍රිය සංවර කරගත් භික්ෂුවට, සය ඉන්ද්‍රියන් මනාව සංවර කරගෙන වාසය කළ හැකිවේ. **මූලාශ්‍රය:** සංයු.නි: (4): සලායතනවග්ග: වේදනා සංයුත්ත: ආසිවිසවග්ග: 1.19.2 රථුපම සූත්‍රය, පි.370.

**රධ**

▲**රාධ තෙර-**Radha Thera: **බලන්න**: උපග්‍රන්ථය:1

**රන**

▲**රන්රිදී පිළිගැනීම-** Accepting gold & silver: රන්රිදී, ජාතරූප ලෙසින්ද පෙන්වා ඇත. රන්රිදී මුදල් ආදිය ශ්‍රමණයන්ට කැප නැත. **බලන්න:** ජාතරූප, උපකෙළෙස, විනය.

**රප**

▲ **රූපය-**Form: ධර්මයේ රූපය ආකාර දෙකකින් පෙන්වා ඇත: 1) සතර මහා භූතයන්ගෙන් සකස්වූ කයය, පංච උපාදානස්කන්ධයේ රූපස්කන්ධයය. රූපය ලෙසින් හඳුන්වනේ එය බිඳෙන, විනාශවන ස්වභාවය නිසා ය යි බුදුන් වහන්සේ පෙන්වා ඇත. **බලන්න**: බජ්ජනීය,

පංචඋපාදානස්කන්ධය. 2) ඇස විසින් අල්ලා ගන්නා බාහිර අරමුණු, රූපය ලෙසින් පෙන්වා ඇත. **බලන්න**: සළායතන. **සටහන:** සියලු රූප අනිත්‍ය වේ, එලෙස, දකිනා පුද්ගලයා **'සද්ධානුසාරි'** ය, .ඒබව, විදසුන් නුවණින්, ජානසමාපත්ති ලබා අවබෝධ කරගන්නා පුද්ගලයා **'ධම්මානුසාරි'** ය. ඔවුන් සම්බෝධිය පිහිට කරගෙන ඇත. **මූලාශ්‍රය:**සංයු.නි: (3): ඛන්ධවග්ග: ඔක්කන්ති සංයුත්තය: චක්ඛුවග්ග: 4.1.2 රූප සූත්‍රය, පි.470.

▼**රූපයේ ආස්වාදය, ආදීනවය හා නිස්සරණය-** Gratification, Danger & Escape in Material form: රූපයට වසඟවීම නිසා ඇතිවන දුක් ආදීනවද, රූපයට ඇති තන්හාව නැතිකර ගැනීමෙන් ලැබෙන නිදහසද මේ සූත්‍රයේ විස්තරාත්මකව දක්වා ඇත. **මූලාශ්‍ර:** ම.නි: ( 1 ) : 1.2.3 මහාදුක්ඛන්ධ සූත්‍රය**,** පි. 220, EMN: 13: The Greater Discourse on the Mass of Suffering, p.220.

▼**රූපය පිලිබඳ** යථා අවබෝධය නොලැබීම නිසා ලෝකයා තුළ මිථ්‍යා දිට්ඨිය ඇතිවේ.**මූලාශ්‍රය**:සංයු.නි: (3): ඛන්ධක: වච්ඡගොත්තසංයුත්ත: 12.1.1. රූප අඤ්ඤාණ සූත්‍රය, පි.548.

▼ **රූපය,** රූමත්බව-වර්ණය ලෙසින්ද පෙන්වා ඇත. මෙය ලෝකයේ ලබාගැනීමට දුර්ලභ දෙයකි. අලංකාර නොවීම හා නො සැරසීම( Not adorning and beautifying), රූමත්බවට බාධාය. **බලන්න**: ඉෂ්ඨධම්ම. **මූලාශ්‍රය**: අංගු.නි: (6) 10 නිපාත:10.2.8.3 ඉෂ්ඨධම්ම සූත්‍රය, පි.270,EAN:10: 73.3 Wished for, p.522.

▲ **රූප ආයතනය-** form-base: බාහිර ආයතන 6 න් එකකි. **බලන්න**: බාහිර ආයතන.

▲ **රූපය බිඳීයාම -** Braking of the form: රූපය බිඳීයාම ලෙසින් මෙහිදී පෙන්වා ඇත්තේ අභ්‍යන්තර හා බාහිර හේතු නිසා කය විනාශවීමය**. බලන්න**: බඥනීය.

▲ **රූප ජාන සමාපත්ති** - Rupa jana samapathti: රූප ජාන සමාපත්ති ලෙසින් පෙන්වා ඇත්තේ, අෂ්ඨ විමොක්ක යන්හි, පළමු විමුක්තියය. **බලන්න**: අෂ්ඨ විමොක්ක.

▲ **රූප තණ්හාව-** Rupa tanha: මෙය සය ආකාර තණ්හාවෙන් එකකි, ඇසෙන් දකින රූප කෙරේ ඇති ඇල්මය. **බලන්න:** තණ්හාව.

▲**රූපධාතු-** Rupadathu: රූප ලෝකය, රූප ධාතු ලෙසින්ද පෙන්වා ඇත. **බලන්න**: ධාතු. **මූලාශ්‍ර:** දීඝ.නි : (3 ): 11 දසුත්තර සූත්‍රය, පි. 483, EDN: 34: Dasuttara Sutta: Expanding Decades, p. 384.

▲ **රූප ධ්‍යාන** - Rupa dhyana: රූප ධ්‍යාන, චෙතොවිවට්ට ලෙසින්ද හඳුන්වයි. **බලන්න**: චෙතොවිවට්ට.

▲ **රූප නිස්සරණිය ධාතුව-** Rupa nissaraniya dhatu: මෙය නිස්සරණිය ධාතු 5න් එකකි, රූපයට නො ඇලි, ඒවා කෙරෙහි සිත නොයෙදවා ඉන් මිදීමට ඇති හැකියාවය. **බලන්න**: ධාතු.

▲**රූප බ්‍රහ්මලෝක**- Rupa Brhamaloka: බ්‍රහ්මදෙවියන් වාසය කරන භවය. **බලන්න**: බ්‍රහ්මලෝක.

▲ **රූප ලෝක**- Fine material abodes: රූප ලෝක, තුන් භවයෙන් එකකි, එනම්, උසස් බ්‍රහ්ම දෙවිවරු වාසය කරන බ්‍රහ්ම දේව ලෝක 16 ය. **බලන්න:** බ්‍රහ්මලෝක.

▲ **රූපඥවීම**-Rupanna: රූපඥවීම ලෙසින් මෙහිදී පෙන්වා ඇත්තේ සතරමහා භූතයන්ගෙන් හටගත් උපාදාය රූපයේ යථාභූත බව අවබෝධකිරීමය. **බලන්න**: ගෝපාල.

▲ **රූපාවචර-**Rupavacahara: සත්වයන් උපත ලබන භව 3 න් එකකි, උසස් බ්‍රහ්ම දෙවියන් පහළවන භවයය. **බලන්න**: බ්‍රහ්මලෝක.

▲ **රූප රාග**- Lust for forms: උද්ධම්භාගිය සංයෝජන 5න් එකකි. **බලන්න:** උද්ධම්භාගිය සංයෝජන.

▲ **රූපී හෝ අරූපී වීමට හේතු**-Reasons to be beautiful or ugly: තරහ-ක්‍රෝධය ඇතිව වාසය කිරීම මතු භවයේ අරූපී වීමට බලපායි, සාමයෙන් ජීවත්වන කෙනා මතු භවයේ රූපත්වේ. **බලන්න**: මාගම.

**රම**

▲ **රමණීය භූමිය-**Lovely ground: එක් සමයක් සක්දෙවිඳු විසින් විමසනු ලැබුව, බුදුන් වහන්සේ පෙන්වා ඇත්තේ, යම් භූමියක (ගමක, වනයක ආදී) ස්ථානයක රහතුන් වැඩ වසන්නේ නම් ඒ භූමිය රමණීය බවය. **මූලාශ්‍රය**: සංයු.නි: (1): සගාථවග්ග: සක්කසංයුත්ත:11.2.5 රාමනෙයියක සූත්‍රය, පි.440.

▲**රූමත්බව-** Beauty: රූමත්බව- රූපාලංකාරය, වර්ණය ලෙසින්ද පෙන්වා ඇත. රූමත්බව ලබාගැනීම පහසු නැත. **බලන්න**: ඉෂ්ඨධම්ම.

**රය**

▲ **රියට සලකුණ-**Symbol for Chariot: මෙහිදී රිය ලෙසින් පෙන්වා ඇත්තේ යුද්ධයට යන රජකෙනෙක් ගේ අශ්වරථයය. එවැනි රියක් හඳුනාගැනීමට ඇති සලකුණ ධජයය. (රජතුමාගේ කෝඩිය). **බලන්න**: සංකේතය.

▲ **රියසක** -the cart wheels: බුදුන් වහන්සේ මේ උපමාව යොදාගෙන ඇත්තේ, භික්ෂුන් ධම්ම විනයේ පරිහානියට හෝ වර්ධනයට පත්වීම පෙන්වීමටය. කෙටි කලකින් අයහපත් ලෙසින් සකස් කළ රියසක (රෝද) ඉක්මනින්ම බිඳී යයි.එලෙස, මේ සසුනේ කාය, වචී හා මනෝ ක්‍රියා අයහපත් භික්ෂු, භික්ෂුණීන් ධර්මවිනයේ පහතට වැටේ, එහෙත්, බොහෝ කලක් ගෙන, මැනවින් සලසන ලද රියසක බොහෝ කාලයක් පවතී. එලෙස, මේ සසුනේ කාය, වචී හා මනෝ ක්‍රියා යහපත් භික්ෂු, භික්ෂුණීන් ධර්මවිනයේ වර්ධනයට පත්වේ. **සටහන**: පෙර භවයක බුදුන් වහන්සේ, පචේතන රජුගේ රියකාරයා ලෙසින්, රජුගේ යුද්ධ රියට රෝද සකස්කිරීමේ විස්තරය මෙහිදී පෙන්වා ඇත. **බලන්න:** බුදුන් වහන්සේ:

පෙරජීවිත: උපග්‍රන්ථය:6.**මූලාශ්‍රය:**අං.ගු.නි: (1): 3 නිපාත: රථකාරවග්ග:3.1.2.5 සූත්‍රය, පි.250.

**රල**

▲ **රලුවචන-**Coarse words: රලුවචන යනු කණට අමිහිරි වචනය, මේවා පරුෂ වචන ලෙසින්ද හඳුන්වා ඇත, අකුසලයකි. රලුවචන කථා නොකිරීම සම්මා වාචාය. **බලන්න**:සම්මා වාචා, දසඅකුසල.

**රව**

▲**රේවත බුදුන් වහන්සේ-** The Buddha Rewatha: ගෝතම බුදුන් වහන්සේට පෙර වැඩසිටි රේවත බුදුන් වහන්සේ පිලිබඳ විස්තර මෙහි දක්වා ඇත.**බලන්න**:ඛු.නි: බුද්ධවංශ පාලි:5 රේවත බුදුන්වහන්සේ.

▲**රේවත තෙර-** Rewatha Thera: **බලන්න**: උපග්‍රන්ථය:1

▲**රේවත ඛදිරවනිය තෙර-** Rewatha Khadiravaniya Thera: **බලන්න**: උපග්‍රන්ථය:1

▲**රැවටීම**: පාලි: **මායා** -deceit: අනුන් මුලාකිරීමට කටයුතු කිරීම, මායාකාරීබව රැවටීමය. ධර්මයට අනුව තමාගේ පව්කම් සඟවා ගෙන, නිවැරදි කෙනෙකු සේ පෙන්වීමට ඇති කැමැත්ත රැවටීමය. අකුසලයකි, දුගතියට ගෙන යයි. **බලන්න**: උප කෙලෙස, සල්ලේඛපරියාය.

▼**වෙනත් මූලාශ්‍ර: 1.** " මෙවන් සිතිවිලි ඇති තැනැත්තා මායාකරුවෙකු වගෙයි. හොර රහසේ පව්කාරකම් සිදු කර සුදාන්ත අයෙකු ලෙස පෙනී සිටීම මායා කාරයාගේ ස්වභාවයයි. පාපය සැඟවීමේ චේතනාව මායාව ලෙසින් ධර්මයේ විග්‍රහ වේ. අද සමාජයේ බොහෝ අය වැරදි කළත්, එය හසු වුවත් පිළි නොගනී. තමා කළ වරද තම සිත පවා නොපිළිගන්නා ලෙසින් හැසිරෙති. කතා කරති. වරද සඟවා ගනිති. එබන්දෝ අන් අය මුලාවටද පත් කරති. මෙබඳු ආකල්ප ඇති තැනැත්තාට කවරදාකවත් නිවැරදි වීමට ඉඩක් නැත". **දිණමින:** අන්තර්ජාල ලිපිය: http://archives.dinamina.lk/2012/08/08/_art.asp?fn=a1208082

**2.** " පව්කම් කොට ඒවා සඟවන ස්වභාවය මායාව වේ. තමන් කළ වරද වසා ගැනීමට තමන් යහපත් කෙනෙක් යයි පෙන්වීමට කටයුතු කරයි. මයාකාරයන්හට බොහෝ දෙනා රැවටේ". **කෙලෙස් එක්දහස් පන්සියය**:පි. 88, රේරුකානේ චන්දවිමල මහානාහිමි, 2008.

**රස**

▲ **රස-**Flavor: රස දෙආකාර බව පෙන්වා ඇත: ආහාර පාන නිසා දිවට දැනෙන රසය, ධර්මය අවබෝධ වීම නිසා මනසට ඇතිවෙන වෙන ධම්ම රසය. ලෝකසත්‍වයාගෙන් සුළු කොටසක් පමනක් පංචභෝජනය සහිත අග්‍රරස විඳින බව මෙහි පෙන්වා ඇත. බොහෝදෙනෙක් දළඅහාර රසය ලබති. මාර්ග ඵල සාක්ෂාත් කරගැනීම නිසා ආරියෝ ලබන විමුක්ති රසය අග්‍රතම රසයවේ. මාර්ගය සාක්ෂාත් වීම නිසා ලබන අර්ථරසය හා ඵල සාක්ෂාත් වීම නිසා ලබන ධම්ම රසය, එමගින් නිවන ලැබීම විමුක්ති රසයවේ. එම රස ලබන උතුමන් ප්‍රමානය සුළුය. එමනිසා බුදුන්

වහන්සේ, සංඝයාට අවවාද වදාළේ , අප්‍රමාදව, අර්ථරසය, ධම්ම රසය, විමුක්ති රසය ලබාගැනීමට හික්මිය යුතුබවය. **සටහන**: ධර්මයේ ඇත්තේ එක් රසයකි, එනම් විමුක්ති රසයයි බුදුන් වහන්සේ වදාළහ. **මූලාශ්‍රය:** අංගු.නි: (1) 1 නිපාත:එකධම්මපාළිය: 1.16.4.14.හා 1.16.4.15 සූත්‍ර, පි. 114.

▲ **රස ආයතනය-**Rasa ayathanaya: බාහිර ආයතන 6න් එකකි. **බලන්න**: බාහිර ආයතන.

▲ **රස තණ්හාව-**Rasa tanha: දිවට දැනෙන රසයට ඇලීම රස තණ්හාවය. මේ තණ්හාව නිසා මතු තිරිසන් යෝනියේ ඉපදීම සිදුවේ. **බලන්න**: තිරිසන් ලෝකය.

▲**රාසිය ගාමිණී-**Rasiya Gamini: **බලන්න:** උපග්‍රන්ථය:3

**රහ**

▲ **රහත් මගඵල-** Arahantship: රහත් මගපල ලැබීම යනු නිවන් මගේ අවසාන පියවර සාක්ෂාත්කරගැනීමය. **බලන්න**: අරහත්වය.

▲ **රහතන් වහන්සේ: පාලි: අරහන්තො-** Arahant: බ්‍රහ්මචරියාව සම්පූර්ණ කරගත්- අරහත් මගඵල ලැබූ- නිවන ලැබූ, ආරිය උතුමා රහතන්වහන්සේය. **සටහන:** ඛු.නි: ධම්මපදය: 7 අරහත්වග්ගය: රහතන්වහන්සේගේ ගුණ විස්තර කරඇත. **බලන්න**: අරහත්.

▼**රහත්බව ලබාදෙන ජානසමාපත්ති:**: එක් සමයක දසම නම් ගහපති, මෙබඳු ප්‍රශ්නයක්, ආනන්ද තෙරුන්ගෙන් ඇසුහ:

**"...අත්‍ථි නු ඛො භාන්තෙ ආනන්‍ද තෙන භගවා ජානතා පස්සතා අරහතා සම්මා සම්බුද්ධෙන එක ධම්මො සම්ම දක්ඛාතො යත්‍ථ භික්ඛුනො අප්පමත්තස්ස ආතාපිනො පහිතත්තස්ස විහරතො අවිමුත්තං වා චිත්තං විමුච්චති. අපරික්ඛීණා වා ආසවා පරික්ඛයං ගච්ඡන්ති අනනුප්පත්තං වා අනුත්තරං යොගක්ඛෙමං අනුපාපුණාති ති".** සියල්ල දන්නා දකිනා අරහත් සම්මාසම්බුදුරජාණන් වහන්සේ විසින් යහපත් ලෙසින් විස්තර කර වදාළ එක් ධර්මයක් පිළිබඳව, යම් භික්ෂුවක්, උත්සහාවන්තව, උනන්දුව සහිතව, අදිට්ඨානයෙන් යුතුව කටයුතු කරනවිට, එම භික්ෂුවගේ අවිමුක්ත සිත විමුක්තිය ට පත්වෙනම්, විනාශ නොවූ කෙලෙස් විනාශවී යන්නේ නම්, අත්නොකරගත්, ඉක්මවා නොගිය පරාධීනබවින් මිදීයන්නේ නම් එබඳු එක් ධර්මයක් තිබේද? ඒ පැණයට පිළිතුරු වශයෙන්, අරහත්මග ඵල සාක්ෂාත් කරගැනීම පිණිස බුදුන්වහන්සේ වදාළ මාර්ග 11ක් (විමොක්ක 11): පිළිබඳව ආනන්ද තෙරුන් පෙන්වා ඇත:1-4)සිව්ජාන 5-8) සිව්බ්‍රහ්මවිහාර 9-11) අරූපසමාපත්ති. **සටහන්: *** බුදුන් වහන්සේගේ පරිනිබ්බානයෙන් පසුව ආනන්ද තෙරුන් වදාළ සූත්‍රයකි. ම.නි: අට්ඨකනාගර සූත්‍රය. **මූලාශ්‍ර:** අංගු.නි: (6): 11 නිපාත: 2 අනුසති වගග: 11.2.6 අට්ඨකනාගර සූත්‍රය, පි.674, EAN: II Recollection: 16.6 Dasama,p.573.

▼**රහතන් වහන්සේ** අසේඛය. (one beyond training): **බලන්න**: සේඛ හා අසේඛ. අසේඛ ශීලය, අසේඛ සමාධිය, අසේඛ ප්‍රඥාව ඇති උතුමා අත්‍යන්ත නිෂ්ඨ බව ලබා ඇත (අවසාන නිගමනය-ultimate

conclusion), අත්‍යන්ත යෝගක්ෂෙම් (සියලු කෙලෙස් බැඳීම් හැර දැමීම- ultimate security from bondage), අත්‍යන්ත පර්යාසනය: (බ්‍රහ්මචරියාව අවසන් කිරීම -ultimate consummation). එබඳු ගුණ ඇති රහතන්වහන්සේ සියලු දෙවි මිනිසුන් අතර ශ්‍රේෂ්ඨය යි බුදුන් වහන්සේ වදාළහ. **මූලාශ්‍රය:**අංගු.නි: (1): 3 නිපාත:යෝධාජීවවග්ග: 3.3.4.11 සූත්‍රය, පි. 562.

▼**රහතන්වහන්සේ ආධ්‍යාත්මික මග පරිපූර්ණ කර ඇත**: " අරහත්වූ, සියළු ආසවයන් ප්‍රහීණකළ, මග බඹසර සම්පූර්ණකල, විමුක්තිය පිණිස කලයුතු සියල්ල නිමාකල, සියලු බර ඉවත්කළ (පංචස්කන්ධය), සත්‍ය අරමුණ සාක්ෂාත්කල (නිවන), භව සංයෝජන සහමුලින්ම බිඳදැමූ, අවසාන ඥානය මගින් විමුක්තිය ලැබූ, භික්ෂූන්හට අප්‍රමාදයෙන් කටයුතු කරන්න යයි මම නොකියමි. එයට හේතුව, කලයුතුදේ ඔවුන් විසින් අප්‍රමාදයෙන් අවසන්කර ඇතිබැවින්ය; ප්‍රමාදවීමට ඔවුනට කරුණුනැත' යයි බුදුන් වහන්සේ වදාළහ.

**"යෙ තෙ භික්ඛවෙ, භික්ඛු අරහන්තො ඛීණාසවා වුසිතවන්තො කතකරණීයා ඔහිතභාරා අනනුප්පත්තසදත්ථා පරික්ඛීණභවසංයොජනා සම්මදඤ්ඤා විමුත්තා. තථාරූපානාහං භික්ඛවෙ, භික්ඛූනං නාප්පමාදෙන කරණීයන්ති වදාමි. තං කිස්ස හෙතු : කතං තෙසංඅප්පමාදෙන අභබ්බා තෙ පමජ්ජිතං".** **සටහන**: * රහතන්වහන්සේ අවසාන ඥානය ලබා විමුක්තිය සාක්ෂාත් කර ඇත. **මූලාශ්‍ර:** ම.නි: (2) : 2.1.1 කන්දරක සූත්‍රය, පි. 18, EMN: 51: Kandaraka Sutta, p. 425.

▼**රහතන්වහන්සේ 'ක්ෂීණාශ්‍රව'** ය.: සියලු ආසව ක්ෂය කළ හෙයින් ක්ෂීණාශ්‍රව ලෙසින් හඳුන්වයි. ක්ෂීණාශ්‍රව උතුමන්, සිංහයා, අජානීය අශ්වයා, අජානීය ඇතා මෙන්, සෙන ගුගුරු හඬට බිය නැත. ඒ සත්වයන්ට කාය බලය ඇති නිසා ඔවුන් බිය නොවේ, රහතුන් මනස හික්මවා ඇතිනිසා ඔවුන් බියපත් නොවේ. **සටහන:** රහතන්වහන්සේ **'ක්ෂිණාශ්‍රවයා'** සියලු ආසවයන් ක්ෂයකළ උතුමාය. **මූලාශ්‍ර:**අංගු.නි: (1): 2 නිපාත: පුද්ගලවග්ග: 2.2.6.6, 2.2.6.7, 2.2.6.8, සූත්‍ර, පි.186, ම.නි :(2): 2.2.10 කීටාගිරි සූත්‍රය, පි. 252, EMN: 70: Kīṭāgiri Sutta, p. 536.

▼**උත්තම පුරුෂයා යනු රහතන්වහන්සේය.**: පංච නීවරණ ප්‍රහීණය කර, පස්විධි අසේඛ අංග යන්ගෙන් සමන්විත වූ රහතන්වහන්සේ, ධර්ම විනයේ උතුම් පුරුෂයා යි බුදුන් වහන්සේ වදාළහ. **බලන්න**: උත්තම පුරුෂයා. **මූලාශ්‍ර**: අංගු.නි: (6 ):10 නිපාත,10.1.2.2 පංචඅංග සූත්‍රය, පි.58,EAN:10: 12.2 Five Factors, p. 495.

▼ **රහත්මග ඵල පිණිස ක්‍රමානුකූල පුහුණුවේ යෙදියයුතුය**: අවසාන අවබෝධය- රහත්බව පිණිස - (අඤ්ඤා- final knowledge) මුදුන්පත්කර ගැනීම එක්වරම කරගැනීමට පුළුවන් දෙයක් නොවේ, ඒ සඳහා ධර්මය ක්‍රමානුකූලව පුහුණුකරගත යුතුය යි බුදුන් වහන්සේ පෙන්වා ඇත. **බලන්න**: ධර්මය ක්‍රමානුකූලව පුහුණුවීම- gradual training. **මූලාශ්‍ර**: ම.නි :(2): 2.2.10 කීටාගිරි සූත්‍රය, පි. 252, EMN: 70: Kīṭāgiri Sutta, p. 536.

▼**රහත්බව ප්‍රකාශ කරණ ආකාරය**: අවසාන ඥාණය ලැබූ රහතන්වහන්සේ, අරහත්වයට පත්වූබව බුදුන්වහන්සේට පවසන්නේ මෙසේය:

"ජාතිය ක්‍ෂයවිය, බඹසර වසනලදී, කළයුතුදේ නිමාකරනලදී, මේ රහත්බව පිණිස කළයුතු වෙනත් දෙයක් නොමැතියයි නුවණින් දනිමි". **"...ඛීණා ජාති, වුසිතං බ්‍රහ්මචරියං කතං කරණීයං, නාපරං ඉත්ථත්තායාති පජානාමි..."**. **සටහන**: මේ සූත්‍රයේ රහත්වහන්සේ පාරිශුද්ධිය ලබන ආකාර විස්තරාත්මකව දක්වා ඇත. **මූලාශ්‍ර:** ම.නි: (3 ) 3.3.2. ඡබ්බිසෝධන සූත්‍රය, පි. 158, EMN: 112: The Six fold Purity - Chabbisodhana sutta p. 814, අංගු.නි: (6 ): 10 නිපාත:ථෙර වග්ග: 0.2.4.4. ව්‍යාකරණ සූත්‍රය,පි.304, EAN: 10: The Elders: 84.4 Declaration, p. 526.

▼ **රහතුන් ගේ ස්වභාවය**: රහතුන්: මාන- මැනීම් අත්හැර ඇත, යළි කුසයකට නොපැමිණේ, නාමරූප පිළිබඳ තණ්හාව නමැති අවුල සිඳදමා ඇත, කරදරවලින් මිදීඇත, සියලු ආසාවන් පහකරඇත, සසර බැඳීම් හැම මුදා ඇත. **මූලාශ්‍ර**: සංයු.නි: (1): සගාථවග්ග: දේවතාසංයුත්ත: 1.2.10 සමිද්ධි සූත්‍රය, පි. 44 හා 1.3.3 ජටා සූත්‍රය, පි. 52, ESN: 1: Devata samyutta: 20.10 Samiddhi, p. 79 & 23.3 Tangle, p. 84, දීඝ.නි: (3): 6.පාසාදික සූත්‍රය (19ඡෙදය), පි. 210, EDN**:** 29**.**The delightful discourse (para 26), p. 318.

▼**රහත්බව** යනු රාග, දෝස හා මෝහ යන අකුසල පහකරගැනීමය- ආසවක්ඛය. ඒ පිළිබඳ ක්‍රියා මාර්ගය: ආරිය අටමග සාක්ෂාත් කරගැනීමයයි මෙහිදී සැරියුත් තෙරුන් පෙන්වා ඇත. **මූලාශ්‍ර:** සංයු.නි: (4): සළායතන වග්ග: ජම්බුඛාදකසංයුත්ත:4.1.2අරහත්ත සූත්‍රය, පි.500, ESN: IV: 38 Jambukhādakasaṃyutta:2 Arahantship, p. 1396.

▼ **රහතන්වහන්සේගේ කතා ව්‍යවහාරය**: එක්සමයක දේවියක් බුදුන්වහන්සේ බැහැදැක මෙසේ විමසුහ: "සියලු ආසවයන් ප්‍රහීණය කළ, අන්තිම ශරීරය දරන රහතුන් : 'මම කියමි', 'මට කියති'. මෙසේ කථාකරන්නේ මානය ඇතිවද?" බුදුන් වහන්සේ මෙසේ වදාළහ:

"...රහතුන් එසේ කථාකරන්නේ ලෝක ව්‍යවහාරයට අනුවය...ඔවුන් සියලු මාන ප්‍රහීණය කර ඇත". **මූලාශ්‍ර**:සංයු.නි: (1): සගාථවග්ග:දේවතාසංයුත්ත: 1.3.5 අරහන්ත සූත්‍රය, පි. 52, ESN: 1: Devatasamyutta: 25.5 The Arahant, p. 87.

▼ **රහතන් වහන්සේ කටු නොමැතිව වාසය කරයි.** රහතුන් කටු විරහිතව, කටු නොමැතිව (කෙලෙස් බාධා නැතිව) වාසය කරති. **මූලාශ්‍ර**:අංගු.නි: (6 ): 10 නිපාත, ආකඞ්ඛ වග්ග: 10.2.3.2 කණ්ටක සූත්‍රය, පි.268. EAN: 10: 71.2. Thorns, p. 521.

▼ **උපාදාන පහවීම රහත්බවය**: පංච උපාදානස්කන්ධයේ ඇතිවීම, නැතිවීම, එහි ආස්වාදය, ආදීනව හා නිස්සරණය පිළිබඳ යථා අවබෝධය ලබා, යම් භික්ෂුවක් උපාදාන සහිතව මිදුනේ නම් ඔහු අරහත්වය ලබා ඇත, සියලු ආසව නැතිකර ඇත, බඹසර වාසය අවසන් කර ඇත, අරහත්වයට අදාළ කාර්ය නිමාකර ඇත, පංචස්කන්ධයේ බර බහාතබා ඇත, නිවන පිණිස වූ ඉලක්කය ලබා ඇත, සියලු භව සංයෝජන පහකර ඇත, සත්‍ය අවබෝධ කර විමුක්තිය ලබා ඇත:

**“ යතො ඛො භික්ඛවෙ,භික්ඛු ඉමෙසං පඤ්චන්නං උපාදානක්ඛන්ධානං සමුදයඤ්ච අත්ථගමඤ්ච අස්සාදඤ්ච ආදීනවඤ්ච නිස්සරණඤ්ච යථාභූතං විදිත්වා අනුපාදා විමුත්තො හොති. අයං වුච්චති භික්ඛවෙ,භික්ඛු අරහං ඛීණාසවො වුසිතො කතකරණීයො ඔහිතභාරො අනනුප්පත්තසදත්ථො පරික්ඛීණභවසංයොජනො සම්මදඤ්ඤා විමුත්තොති”** (When, bhikkhus, having understood as they really are the origin and the passing away, the gratification, the danger, and the escape in the case of these five aggregates subject to clinging, a bhikkhu is liberated by non-clinging, then he is called a bhikkhu who is an arahant, one whose taints are destroyed, who has lived the holy life, done what had to be done, laid down the burden, reached his own goal, utterly destroyed the fetters of existence, one completely liberated through final knowledge). **මූලශ්‍ර:** සංයු.නි: (3 ): ඛන්ධසංයුත්ත: 1.3.1.8 අරහන්ත සූත්‍රය, පි. 308, ESN: 22 : Khandasamyutta: 110.8 Arahant, p. 1098.

▼ **රහතන්වහන්සේ ලෝකයේ අග්‍ර පුද්ගලයෝය**: බුදුන් වහන්සේ මෙසේ වදාළහ:

“...මහණෙනි, සත්වාවාස යම්තාක්ද, භවාග්‍රය යම්තාක්ද ඒ තාක් ලෝකයේ මොහු අග්‍රයහ...ශ්‍රේෂ්ඨය, ඔහු කවරේද: ‘රහතුන්’ය”. එසේ වදාළ බුදුන් වහන්සේ රහතුන් ගුණ මෙසේ පවසා ඇත: 1) රහතුන් ඒකාන්තයෙන්ම- ජාන, මගඵල ලැබූ නිසා සුඛිතය... තණ්හාව නොමැත...නව ආකාර අස්මිමානය සිඳ ඇත, මෝහය නමැති දැල පළාඇත. 2)...සිත කැළඹීම් රහිතය, ලෝකයේ ඇති තණ්හා දිට්ඨි යන්ට නො ඇලි ඇත, ආසව රහිතය, ශ්‍රේෂ්ඨය. 3) පස්කඳ (පංචස්කන්ධය) ත්‍රිවිධ පරිඥාවෙන් අවබෝධ කරගති, සප්ත සද්ධර්මය, ගෝචර කොට සිටි, ප්‍රඥාවන්තයන්, පවුන් පැසසිය යුතුය, ඔවුන් සත්පුරුෂයන්ය, බුදුන් වහන්සේගේ “ඖරස” පුත්‍රයන්ය (Are the Buddha’s bosom sons). 4) සප්ත බොජ්ඣංග යෙන් යුක්තය, ත්‍රිවිධ ශික්ෂාවෙන ශික්ෂණයව ඇත, “මහාවීර” වූ ඔවුන් භය භේරව ප්‍රහීණය කොට නිසැකව හැසිරේ. 5) ඔවුන් අසේඛශිල ආදීවූ දස අංගයන්ගෙන් යුක්තය, “මහානාග” ය, සමාධිය (උපචාර හා අර්පණා) සමාහිතය, තණ්හාව නැති ඔවුන් ශ්‍රේෂ්ඨය.6) රහත්ඵල නුවන උපදවා ඇත-මේ අන්තිම භවය බව දනී, බ්‍රහ්මචරියාවේ සාරය ලැබූ ඔවුන්ට, අන් අයගේ පිහිට අවශ්‍ය නොමැත, 7) ත්‍රිවිධ මානයෙන් නො සැලේ, පුනර්භවයෙන් මිදීඇත, දමනයවූ ඔවුන් “ලෝකය දිනූ වීරයෝ’ වෙති. 8) සැම දිසාවක් ගැන (උඩ යට හාත්පස) ඔවුන් අභිනන්දන නොකරති (සියලු දිසාවන්ට බැඳීම් නැත), “රහතුන් ලෝකයේ ශ්‍රේෂ්ඨවේ’ යයි ඔවුන්හට සිංහනාදය (අභීතනාදය) කල හැකිය. **සටහන්:*** සප්තධර්මගුණ: ශ්‍රද්ධාව, හිරි හා ඔත්තප්ප, බහුශ්‍රැතබව, විරිය, සතිය,ප්‍රඥාව ** **ත්‍රිවිධ ශික්ෂාව**: අධිශිල, අධිචිත්ත, අධිප්‍රඥා. ** අසේඛ ධර්ම 10 : **බලන්න**: අසේඛ. ** සියලු දිසාවන්හි බැඳීම් නොමැතිබව: පංච උපාදානස්කන්ධයට හා කාලයන්ට: අතීත, අනාගත හා වර්තමානයට. **මූලාශ්‍ර:** සංයු.නි: (3): ඛන්ධසංයුත්ත: ඛජ්ජනියවග්ග: අරහන්ත සූත්‍ර 2කි, පි.172,ESN:22: Khandasamyutta: 76.4 & 77.5 Arhants, p.1057.

▼ **රහතුන්සතු උතුම් ගුණ -** Noble qualities of Arahant

"ඒකාන්තයෙන්ම, අවසාන නිගමනයට පැමිණි (නිවන පිළිබඳව), සියලු බැමි (කෙළෙස්) වලින් නිදහස්වූ, බ්‍රහ්මචාරි ජීවිතය සම්පූර්ණ කරගත්, (මාර්ගයේ) අවසාන සෙවීමවූ නිවන ලබාගත් මහණ (රහතන්වහන්සේ) උතුම් ගුණ ඇතිව සියලු දෙව් මිනිසුන් අතර අග්‍රවේ- උතුම්වේ ය යි බුදුන් වහන්සේ පෙන්වා ඇත:

**" අපරෙහිපි භික්ඛවෙ තීහි ධම්මෙහි සමන්නාගතො භික්ඛු අච්චන්තනිට්ඨො හොති අච්චන්තයොගක්ඛෙමී අච්චන්තබ්‍රහ්මචාරී අච්චන්තපරියොසනො සෙට්ඨො දෙව මනුස්සානං."** (possessing three qualities, a bhikkhu is best among devas and humans: one who has reached the ultimate conclusion, won ultimate security from bondage, lived the ultimate spiritual life, and gained the ultimate consummation): **ඒ උතුම් ගුණාංග මොනවාද? 1)** අසේඛශීලය, අසේඛසමාධිය හා අසේඛප්‍රඥාව සතුවීම: **"... අසෙඛෙන සීලක්ඛන්ධෙන අසෙඛෙන සමාධික්ඛන්ධෙන අසෙඛෙන පඤ්ඤාක්ඛන්ධෙන"**. (The aggregate of virtuous behavior of one beyond training, the aggregate of concentration of one beyond training, and the aggregate of wisdom of one beyond training) **බලන්න**: සේඛ හා අසේඛ. **2)** ඉද්ධිප්‍රාතිහාර්ය, ආදේසනා ප්‍රාතිහාර්ය හා අනුසසනා ප්‍රාතිහාර්ය සතුවීම. **"... ඉද්ධිපාටිහාරියෙන ආදෙසනාපාටිහාරියෙන, අනුසාසනීපාටිහාරියෙන"** (The wonder of psychic potency, the wonder of mind-reading, and the wonder of instruction) .**බලන්න**: ප්‍රාතිහාර්ය. **3**) සම්මාදිට්ඨිය, සම්මාඥානය, සම්මා විමුක්තිය සතුවීම. 4) විද්‍යාව හා චරණ ගුණයෙන් යුතුවීම **(විජ්ජාචරණසම්පන්නො-** true knowledge and conduct) **සටහන්:** මහා මුගලන් තෙරුන්හට අරහත්වය ලැබීමට උපදෙස් දුන් බුදුන් වහන්සේ වදාළේ උතුම් ගුණයෙන් සමන්විත භික්ෂුව (මතු දක්වා ඇති පරිදි) දෙවිමිනිසුන් අතර අග්‍ර බවය. **මූලාශ්‍ර:** අංගු.නි: (4 ): 7 නිපාත: 7.2.1.8 පචලායන සූත්‍රය, පි. 426, EAN:7: 61.8 Dozing, p. 391, අංගු.නි: (6): 11නිපාත: 11.1.10, මොරනිවාප සූත්‍රය**,** පි.642, EAN: 11: Dependence: 10.10 The Peacock Sanctuary, p.56.

▼**රහතුන් සතු අසේඛ ගුණ 10කි**: 1) අසෙඛ සම්මා දිට්ඨිය 2) අසෙඛ සම්මා සංකප්පය 3) අසෙඛ සම්මා වාචාය 4) අසෙඛ සම්මා කම්මන්තය 5) අසෙඛ සම්මා ආජීවය 6) අසෙඛ සම්මා වායාමය 7) අසෙඛ සම්මා සතිය 8) අසෙඛ සම්මා සමාධිය 9) අසෙඛ සම්මා ඤාණය 10) අසෙඛ සම්මා විමුත්තිය. මේ ගුණ දහයෙන් යුත් නිසා රහතන්වහන්සේ අසෙඛය **බලන්න**: දසකුමාර ප්‍රශ්න, බු.නි: ඛුද්දකපාඨ.

▼**රහතුන් දුක නොසොයන්නේය**: බුදුන් වහන්සේ මෙසේ පෙන්වා ඇත.

**"...ඔවුන් ප්‍රඥාප්තිය හළේය. විවිධ මානයන්ට නො යයි, එනම් නැවත මව්කුසයට නොයයි...පංච උපාදානස්කන්ධය පිළිබඳ තන්හාව සහමුලින්ම පහ කළෝය. සුන් කෙල කෙළෙස් ඇති, නිදුක්වූ, තණ්හා රහිතය...තුන්දොරින් පව් නොකරයි, සියලු කාම හැර, සිහිය, මනා නුවණ ඇතිව, අනර්ථය පිනිසවූ දුක නො සොයන්නේය."**
**මූලාශ්‍රය:**සංයු.නි:සගාථවග්ග:දේවතාසංයුත්ත:1.2.10 සමිද්ධි සූත්‍රය, පි.44.

▼ **රහතුන් පස් ඉඳුරන් අවබෝධ කර ඇත**

**" යම්කලක මහණ තෙමේ පස් ඉඳුරන් (සුඛ, දුක, සෝමනස්ස, දෝමනස්ස, උපේක්ඛා ඉන්ද්‍රියන්) ගැන යථා අවබෝධය ලබා (එහි ඇතිවීම, නැතිවීම, ආස්වාදය, ආදීනව හා නිස්සරණය) ඉන් මිදුනේද, අසාව ක්ෂය කළ, බඹසර වැස නිමාකළ, ස්වඅර්ථයෙන්ම භව සංයෝජනයෙන් මිදුන, විමුක්තිය ලද රහතන්වහන්සේය". මූලාශ්‍ර:** සංයු.නි: (5-2): ඉන්ද්‍රියසංයුත්ත: අරහන්ත සූත්‍රය, පි. 398, ESN:48: Indriya samyutta: 33.3 Arhant, pi. 1961.

▼ **රහතුන් තණ්හාව දුරුකළ උතුමෝය**: එක් සමයක දෙවියෙක් බුදුන් වහන්සේ ගෙන්: " ලෝකයේ තණ්හාව දුරුකළ කාමයන් සොයා නොයන්නේ කවුද ? යයි ඇසුහ. බුදුන් වහන්සේ වදාළේ රහතුන් ලෝකයේ තණ්හාව දුරුකළ කාමයන් නො සොයන උතුමන්බවය. **මූලාශ්‍රය**:සංයු.නි: (1): සගාථවග්ග:දේවතාසංයුත්ත: මහද්ධන සූත්‍රය, පි. 56.

▲**රාහු අසුරේන්ද්‍ර** -Rahu Asura King: අසුර නිකායේ රජෙක් වන රාහු අසුරේන්ද්‍ර, ආත්මභාවින් අතුරින් අග්‍රය. මහා ශරීරයකින් යුක්තය. **බලන්න**: අසුර **සටහන්**: ඉර හා සඳ රාහු අසුර විසින් අල්ලා ගනී: Rāhu is the asura chief who abducts the sun and moon, obviously representing the solar and lunar eclipses. **බලන්න**:EAN: note 643, p. 614. **මූලාශ්‍ර:**අංගු.නි: (2 ) 4 නිපාතය: 4.1.2.5. අගගපඤ්ඤාතති සූත්‍රය, පි.56, EAN:4: 15.5. Proclamations,p. 153.

▼**රාහු අසුර ගේ බලය**: මේ සූත්‍රයන්හි, රාහු අසුර විසින් ඉර හා සඳ අල්ලා ගැනීම පෙන්වා ඇත. ඒ අවස්ථවේ, ඉර හා සඳ බුදුන් වහන්සේ සිහිකර පිහිට ඉල්ලා ඇත. බුදුන් වහන්සේ, ඉර හා සඳ (දේව පුත්‍රයන්), බුදුන් සරණ ගිය නිසා ඔවුන්ට පිඩා නොකරන්න යයි, රාහු අසුරට පවසා ඇත. බුදු වදන් පිළිගත්, රාහු අසුර ඉර සඳ මුදාහරින ලදී. **බලන්න**: සූර්යා, චන්දිම. **මූලාශ්‍රය:**සංයු.නි: (1): සගාථවග්ග:දේවපුත්තසංයුත්ත:2.1.9 චන්දිම සූත්‍රය, පි.120 හා 2.1.10 සූරිය සූත්‍රය, පි.122.

▲**රාහුල තෙරුන්**-Rahula Thera: **බලන්න**: උපග්‍රන්ථය:1

▲ **රහොගත**-Rahogatha: රහොගත ලෙසින් පෙන්වා ඇත්තේ හුදකලාව (එකලාවා-තනිවම) සිටීමය. රහොගත පටිසල්ලාන: හුදකලා විවේකය. ආධ්‍යාත්මික මග වර්ධනය පිණිස, සංසයාට හුදකලා විවේකසුව විහරණය වැදගත් බව බුදුන් වහන්සේ පෙන්වා ඇත. එසේ හුදකලා විවේකය නිසා ධර්ම කරුණු අවබෝධවීම ගැන මේ සූත්‍රයන්හි විස්තර කර ඇත. **මූලාශ්‍ර:** සංයු.නි: (4): සළායතනවග්ග: වේදනාසංයුත්ත: රහොගතවග්ග: 2.2.1 රහොගත සූත්‍රය, පි. 438, සංයු.නි: (5-2): මහාවග්ග: අනුරුද්ධසංයුත්ත: රහොගතවග්ග: 8.1.1 හා 8.1.2 රහොගත සූත්‍ර, පි.86.

▲ **රෝහිතස්ස දේවියෝ**-Deva Rohitassa: රෝහිතස්ස දෙවියෝ බුදුන් වහන්සේ බැහැදැක, ඔහුගේ පෙර ජීවිතයේ ලෝකයේ අන්තය සොයමින් වෙහසවූ විස්තරය පවසා, විමසුවේ, පා ගමනින් ලෝකයේ අන්තයට පැමිණිය හැකිද ?. පිය ගමනින් ලෝකයේ අන්තය දැකිය නොහැකි යයි බුදුන් වහන්සේ වදාළහ. සංඥා හා සිත ඇති, බඹයක් පමණවූ, මේ කය

ලෝකයය. ලෝකයේ අන්තයට නොගොස් දුක නැතිකර ගත නොහැකිය. ලෝකය දත් (ලෝකවිදූ) ප්‍රඥාවන්ත උතුමා, බඹසර වැස, ලෝකයේ අන්තයට- සාමයට පැමිණියහ, නැවත ලෝකයක් නො සොයන්නේය. (The end of the world can never be reached by means of traveling [across the world]; yet without reaching the world's end there is no release from suffering. Hence the wise one, the world-knower, who has reached the world's end and lived the spiritual life, having known the world's end, at peace, does not desire this world or another). **සටහන:** ලෝකයේ අන්තය නිවනය, ලෝකවිදූවූ බුදුන් වහන්සේ , චතුසත්‍ය අවබෝධ කර ලෝකයේ යථාබව දත්හ, යළි උපත අවසන් කරන ලදී. **මූලාශ්‍ර:**අංගු.නි: (2):4 නිපාත: රෝහිතස්ස වග්ග: සූත්‍ර 2 කි, පි.114,EAN:2: Rohitassa, 2 suttas, p.166, සංයු.නි: සගාථවග්ග:දේවපුත්‍රසංයුත්ත:2.3.6 රෝහිතස්ස සූත්‍රය, පි.144.

## ල කොටස:ලක,ලස,ලජ,ලන,ලප,ලහ,ලම,ලව,ලල,ලහ

▲ **ලක්ඛණකුසලය-** Lakkhana kusala: බාලයා හා පණ්ඩිතයා ගේ ලක්‍ෂණ දැනගැනීමේ හැකියාව මින් අදහස් කරයි. **බලන්න**: ගෝපාල.

▲ **ලක්ඛණ තෙර-** Lakkhana Thera: **බලන්න**: උපග්‍රන්ථය:1

▲ **ලකුන්ටක භද්දියතෙර-** Lakuntaka bhaddiya Thera: **බලන්න**: උපග්‍රන්ථය:1

▲ **ලක්‍ෂණ-**Features: ලක්‍ෂණ (ලක්ඛණ) යනු කෙනෙකුගේ කායික ස්වභාවය- හැඩහුරුවය. මේ සූත්‍රයේ දී බුදුන් වහන්සේ ගේ 32ක් වූ මහා පුරිස ලක්ෂණ විස්තරාත්මකව පෙන්වා ඇත. **සටහන**: මහා පුරිස ලක්ෂණ 32 පිහිටන්නේ උතුම් පුද්ගලයන්ටය: බුදුවරු, සක්විති රජවරු. **බලන්න**: බුදුන් වහන්සේ: උපග්‍රන්ථය:6 **මූලාශ්‍රය:**දීඝ.නි: (3):පාථිකවග්ග: 7 ලක්‍ෂණ සූත්‍රය, පි.252.

▲ **ලෝකය-**World: සාමාන්‍ය ව්‍යවහාරයේ ලෝකය ලෙසින් හඳුන්වන්නේ අප ජීවත්වන පරිසරයටය. ධර්මයට අනුව ලෝකය ලෙසින් පෙන්වා ඇත්තේ මේ කයය. **බලන්න**: රෝහිතස්ස දෙවියෝ. **සටහන:** ඛු.නි: ධම්මපදය:13 ලෝකවග්ග: ලෝකයේ ස්වභාවයන් දක්වා ඇත.

▼**එක් සමයක ආනන්ද තෙරුන්** 'ලෝකය යනු කුමක්ද' යයි ඇසූවිට බුදුන් වහන්සේ මෙසේ වදාළහ: "...යමක් බිඳෙනසුළු ස්වභාවය ඇත්ද, ආරියවිනයෙහි එය ලෝකය යයි කියනු ලැබේ". **"යං ඛො ආනන්ද පලොක ධම්මං අයං වුච්චති අරියස්ස විනයෙ ලොකො..."** (Whatever is subject to disintegration, Ānanda, is called the world in the Noble One's Discipline). **බලන්න**: පලෝක ධම්ම. **සටහන්**: * යමක් පලුදු වේනම් (නැසේනම්-ලුජ්ජති) එය ලෝකයය. මෙහිදී පෙන්වා ඇත්තේ සළායතන බාහිර අරමුණු ස්පර්ශ කිරීමෙන් හටගන්නා, වේදනා ආදී සැම පලුදුවී යයි. **බලන්න:**සංයු.නි: (4) : සළායතනසංයුත්ත: ගිලානවග්ග: 1.8.9 ලෝකසූත්‍රය, පි.142. ** ශුන්‍යතාලෝකය (Empty is the world) ලෙසින් බුදුන් වහන්සේ පෙන්වා ඇත්තේ, අනාත්මබවය. **බලන්න**: සංයු.නි: (4): වේදනාසංයුත්ත:ඡන්නවග්ග: 1.9.2 සුඤ්ඤලෝක සූත්‍රය, පි.146. **මූලාශ්‍ර:** සංයු.නි: (4 ):සළායතනවග්ග: වේදනාසංයුත්ත:

ඡන්නවග්ග 1.9.1. පලෝකධම්ම සූත්‍රය, පි. 146, ESN: 35: Salayatana samyutta:IV: Channa: 84.1 Subject to disintegration, p.1248.

▼ **බුදුන් වහන්සේ වදාළේ** ලෝකය, තමන් වහන්සේ විසින් පසක් කරගත් බවය. එනම්, චතුරාර්ය සත්‍ය අවබෝධ කරගත් බවය.

**"ලොකො භික්ඛවෙ තථාගතෙන අභිසම්බුද්ධො"**: (Bhikkhus, the Tathāgata has fully awakened to the world) **සටහන:**අටුවාවට අනුව: ...identifies the world (*loka*) with the truth of suffering **බලන්න**: EAN: Note: 655, p. 615. **සටහන**: මෙයට සමාන ප්‍රකාශයක්, මේ සූත්‍රයේ දක්වා ඇත. **බලන්න**: සංයු.නි: (5-2) සච්චසංයුත්ත: 12.3.8 ලෝකසූත්‍රය, පි. 314, ESN: 56: Sachasamyutta: Kotigama: 28.7 The World, p. 2297. **මූලාශ්‍ර:** අංගු.නි: (2 ): 4 නිපාත: උරුවෙලවග්ග: 4.1.3.3. ලෝක සූත්‍රය, පි.69, EAN:4: Uruwela: 23.3 The World p. 156.

▼**මෙහිදී** ලෝකය ලෙසින් පෙන්වා ඇත්තේ දුක්ඛ සත්‍යයය.: **මූලාශ්‍රය:** ඛු.නි: ඉතිවුත්තක: 4.1.13 ලෝකඅවබෝධ සූත්‍රය, පි. 510.

▼**සිත ලෝකය පාලනය කරයි**: ලෝකය පාලනය කරමින්, එය එහාට මෙහාට ඇදගෙනයන්නේ සිතය... තණ්හාවය. ලෝකය තදින්ම බැඳී ඇත්තේ රාගයෙන්ය. මරණය නිසා ලෝකය දුකට පත්වී ඇත. ලෝකය, මහලුබවින් වෙලී ඇත, තණ්හා හුලෙන් වනවී ඇත, ආශාව නිසා දැවී ඇත, දුක මත පිහිටා ඇත. සළායතන ඇතිවන විට ලෝකය ඇතිවේ. **සටහන**: මේ සූත්‍රයේද මෙයට සමාන විස්තරයක් පෙන්වා ඇත. **බලන්න**: අංගු:නි: (2): 4 නිපාත: බ්‍රාහ්මණවග්ග: 4.4.4.6 බහුශ්‍රැත සූත්‍රය, පි.366. **මූලාශ්‍ර**: සංයු.නි: ( 1 ): සගාථවග්ග: දේවතාසංයුත්ත:7 අන්වවග්ග සූත්‍ර, පි. 98, ESN:1: Devatasamyutta: VII. Weighed down: p.141.

▼**ලෝකය ඇතිවීම හා නැතිවීම** (සමුදය හා අත්ථගමය) චක්ඛු...සෝත...ඝාන...ඝන්ධ...රස...පොට්ඨබ්බ...මනෝ විඥාන නිසා ඇතිවන ස්පර්ශය, වේදනා ඇති කරයි. වේදනා නිසා තණ්හාව ඇතිවේ, තණ්හාව නිසා උපාදාන.... (ආදී වසයෙන්) ජාතියද... දුක්ඛස්ඛන්ධයම ඇතිවේ. මෙය ලෝකයේ ඇතිවීමය (ලෝක සමුදය). තණ්හාව ඉතිරි නැතිවම අවසන්වීම, ලෝකය අවසන් වීමය. . (ලෝක අස්තඞගමය). **බලන්න**: පටිච්චසමුප්පාදය **මූලාශ්‍ර**: සංයු.නි: (2): නිදානවග්ග: අභිසමය සංයුත්ත:ගහපතිවග්ග: 1.5.4 ලෝක සූත්‍රය, පි. 135, ESN: 13: Abhisamayasamyutta: 44.4 The World, p. 673, සංයු.නි: (4): සලායතන වග්ග: වේදනා සංයුත්ත:යොගඛෙමිවග්ග: 1.11.4 ලෝක සමුදය සූත්‍රය, පි. 210,ESN: 36: Vedanasamyutta: 107.4 Origin of the world, p. 1269.

▲ **ලෝකය අනන්තවත්ය-** The world is Infinite: ලෝකය අනන්තවත්ය -කෙළවර රහිතය යන දිට්ඨිය බුදුන් වහන්සේ වැඩ සිටි කාලයේ පවැති දිට්ඨි 10 න් එකකි**. බලන්න**: දිට්ඨි. එම දිට්ඨිය ඇතිවන්නේ, පංච උපාදානස්කන්ධය ඇසුරුකර (රූප, වේදනා ආදිය) සියල්ල අනන්තවත්ය යන මතය නිසාය. **මූලාශ්‍ර**: සංයු.නි: ( 3): ඛන්ධකවග්ග: දිට්ඨිසංයුත්ත: 3.1.12 අනන්තවත් සූත්‍රය, පි. 436, ESN: 24: Dhittisamyutta: 12.12. The world is infinite, p. 1133.

▲**ලෝකඅන්තය-**End of the world: ලෝකයේ කෙළවර- ලෝක අන්තය, ගමන්කර දැකීමට නොහැකි බව බුදුන් වහන්සේ පෙන්වා ඇත. ලෝකයේ කෙළවර යනු දුක කෙළවරකරගැනීම බව මේ සූත්‍රයේ විස්තර කර ඇත. **සටහන්**: * බුදුන් වහන්සේ කෙටියෙන් වදාළ ඒ දේශනය, සංඝයාහට ආනන්ද තෙරුන් විසින් විස්තරාත්මකව පෙන්වා දී ඇත: " ඇසනිසා...කණ... (ආදීවූ සය ඉන්ද්‍රිය) නිසා ලෝකය යන හැඟීම...දැනීම ඇතිවේ, එය මේ සසුනේ ලෝකය යයි කියනු ලැබේ".

** රෝහිතස්ස නම් දෙවියෙක්, බුදුන් වහන්සේ හමුව ලෝකයේ අන්තය ගැන විමසා ඇත.**බලන්න:** රෝහිතස්ස දෙවියෝ. **මූලාශ්‍ර:** සංයු.නි: ( 4 ): සළායතනවග්ග: වේදනාසංයුත්ත: ලෝකකාමගුනවග්ග: 1.12.3 ලෝකන්තගමන සූත්‍රය, පි. 222, ESN: 36: Vedanasmayutta: 116.3 Going to the end of the world, p. 1272.

▼**ලෝකාන්තය**, ලෝකය කෙළවර කිරීම යනු දුක අවසන් කිරීම බව බුදුන් වහන්සේ පෙන්වා ඇත. ආරියවිනයේ ලෝකය නම් පස්කම් සැපයවේ. සිව් රූප ජාන හා අරූප සම්පත්ති ලැබූ උතුමෝ ලෝකයේ අන්තයට පැමිණ ඇත. ඔවුන් පංචඋපාදානස්කන්ධය කෙරහි ඇති තණ්හාව, තරණය කර ඇත. **මූලාශ්‍රය**: අංගු.නි: (5): 9 නිපාත: මහාවග්ග:9.1.4.7 ලෝකායාතික බ්‍රාහ්මණ සූත්‍රය, පි.518.

▲ **ලෝක අවබෝධය-**Realization of the world: ලෝකඅවබෝධය ලෙසින් පෙන්වා ඇත්තේ ලෝකයේ යථා බව අවබෝධ කිරීමය. බුදුන් වහන්සේ ලෝකය අවබෝධ කළබව මෙහි විස්තරාත්මකව පෙන්වා ඇත: " මුළු ලොව (තෛධාතුක ලෝකසන්නිවාසය) මැනවින් දැන, මුළු ලොවේ දතයුතු සියල්ල තත්වූ පරිද්දෙන දැන, සියලු ලෝකයෙන් වෙන්වූ... ඒ ධිරතෙම ඒකාන්තයෙන්ම සියලු කෙළෙස් ග්‍රන්ථයන් මුදා හරිනලදී...". **මූලාශ්‍රය:**ඛු.නි: ඉතිවුත්තක: 4.1.13 ලෝකාවබෝධ සූත්‍රය, පි.510.

▲ **ලෝකඅවලෝකනය-**Reflections of the world: ලෝකය අවලෝකනය කිරීම යනු ලෝකයේ සැබෑ තත්වය පිලිබඳ අවර්ජනා කිරීමය. මේ සූත්‍රයදී පෙන්වා ඇත්තේ බුද්ධත්වයට පත්ව රහත්ඵල සමවත් සුවයෙන් වාසය කොට ඉන් නැගීසිටි බුදුන් වහන්සේ බුදු ඇසින් ලොව දෙස බලා ලෝකයා කෙළෙස් වලින් තැවී දුක් විඳන ආකාරය දැකීමය. උපධි නිසා දුක හටගන්නා බවද, උපධි හැරදමා, නිවුන මහන, මාරයා මැඩ, සියලු භව ඉක්මවා ගොස් ඇතයයි බුදුන් වහන්සේ වදාළහ. **මූලාශ්‍රය:**ඛු.නි: උදානපාලිය: නන්දවග්ග: 3.10 ලෝකඅවලෝකන සූත්‍රය, පි.220.

▲ **ලෝක ආමිෂය** -world's bait: ලෝක ආමිෂය හෙවත් ලෝක ඇමය ලෙසින් පෙන්වා ඇත්තේ, ලෝකය පිළිබඳව සත්ත්‍වයා තුල ඇති තණ්හාව ය, ආශාවය. එනම්, සළායතන වලින් අල්ලා ගන්නා බාහිර අරමුණුවලට ඇලීමය.එය සසර අල්වා ගන්නා ඇමය.

**බුදුන් වහන්සේ මෙසේ වදාළහ:** " ජීවිතය මරණය කරා පමුණුවනු ලැබේ. ආයුෂ ස්වල්පය ය. ජරාව විසින් මරණය කරා පමුණුවන ලෝක සත්ත්‍වයන්ට පිහිටවීමට ආරක්ෂා ස්ථානයක් නොමැත. මේ ත්‍රිවිධ භය දකිනා, නිවන පතන පුද්ගලයා ලෝකාමිෂය දුරු කරගතයුතුය" (Life is

swept along, short is the life span; No shelters exist for one who has reached old age. Seeing clearly this danger in death, a seeker of peace should drop the world's bait" **සටහන**: අටුවාවට අනුව...Spk explains two denotations of *lokāmisa*, literally 'carnal things': (i)figuratively (*pariyāyena*), it denotes the entire round of existence with its three planes, the objective sphere of attachment, 'the bait of the world', (ii) literally (*nippariyāyena*), it signifies the four requisites (clothing, food, dwelling, and medicines), the material basis for survival. **බලන්න**: ESN: Note: 10, p. 500. **මූලාශ්‍ර**: සංයු.නි: ( 1 ): සගාථවග්ග: දේවතාසංයුත්ත: 1.1.3 උපනියති සූත්‍රය හා 1.1.4 අච්චෙන්ති සූත්‍රය, පි.30, ESN: 1: Devatasamyutta: 3.3 Reaching & 4.4 Time Flies by, p.60.

▲ **ලෝකකාම ගුණ**-Loka Kamguna: ලෝක කාමගුණ ලෙසින් පෙන්වා ඇත්තේ පස්කම් ගුණයන්ය. **බලන්න**: පංච කාමගුණ.

▲ **ලෝකධාතු-** Elements of the world: ලෝක ධාතු ලෙසින් පෙන්වා ඇත්තේ පංච උපාදානස්කන්ධය, ආයතන 12, ධාතු 16 ආදිය ගැනය. සියලු ලෝකධාතු පිලිබඳ යථා අවබෝධය -ධාතු ලක්ෂණ, විවිධත්වය තථාගතයන් සතු ඥාන බලයකි. **බලන්න**: තථාගත දසබලඥාන, ධාතු.

▲ **ලෝකාන්තරිකනිරය-** Lokantarikā Niraya: ලෝකාන්තරික නිරය මහා අන්ධකාරයකින් යුක්තය(ඝන අඳුර), හිරු සඳු ආලෝකය නොලබන බිහිසුණු අඳුරක් එහි ඇත.ලෝකචක්‍රවාල 3ක් අතර පවතින හිස්වූ, ආවරණ රහිතවූ,පාතාලයක් වැනිවූ (පතුලක් දැකිය නොහැකි- abysmal ) ඒ ස්ථානය ලෝකාන්තරික නිරය(world-interstice hell) ලෙසින් පෙන්වා ඇත. කෙතරම් අඳුරුද යත්, එහි චක්ෂු විඥානය (eye-consciousness) පවා ඇතිනොවේ. බුදුන් වහන්සේ පෙන්වා ඇත්තේ ඒ බිහිසුණු ඝන අඳුරට වඩා මහා අඳුරක් ලොව පවතින බවය. එනම්, චතුසත්‍ය නොදැන, සසර වටයේ, ඉපදී, මැරී, යළි ඉපදී අනන්ත දුක් වේදනා විඳින ලෝකයා , මහා අඳුරකින් වැසී සිටින බවය. **සටහන:** ලෝකචක්කවාල (three spiral world-spheres) 3ක් අතර, ලෝකාන්තරික (world-interstice) අන්ධකාරය ඇති ප්‍රදේශයක් වේ. එහි ඇති ලෝකාන්තරික නිරය, යෝජන 800ක් වේ (appx. 80,000 kilometers). **බලන්න:** ESN: note: 407, p. 2433. **මූලාශ්‍ර:**සංයු.නි: (5-2): සච්චසංයුත්ත: 12.5.6 අන්ධකාර සූත්‍රය, පි. 340, ESN: 56: Sacchasamyutta: 46.6 Darkness, p. 2317.

▲ **ලෝකෝත්තර ධර්මය-**Super mundane Dhamma: ලෝකෝත්තර ධර්මය ලෙසින් පෙන්වා ඇත්තේ: සතර සතිපට්ඨානය, සතර සම්‍යක්ප්‍රධාන, සතර ඉද්ධිපාද, පංච ඉන්ද්‍රිය, පංච බල, සප්ත බොජ්ඣංග, ආරිය අෂ්ඨමාර්ගය, සතර ආරිය මාර්ග, සතර ශ්‍රමණ ඵල, නිර්වාණයය. **මූලාශ්‍රය:** ඛු.නි: පටිසම්භිදා: 2: 8 ලෝකොත්තර කථා, පි.134.

▲ **ලෝකධර්මතා-**Worldly Dhammas: ලාභ-අලාභ, කිර්තිය-අපකීර්තිය, නින්දා-ප්‍රසංසා, සැප-දුක යන ධර්මතා -අටලෝ දහම ලෝක ධර්මතාවයක් බව බුදුන් වහන්සේ පෙන්වා ඇත.**බලන්න:** අටලෝදහම.

**මූලාශ්‍රය:** අංගු.නි: (5): 8 නිපාත: මෙත්තාවග්ග:ලෝකධම්ම සූත්‍ර 2කි, පි.35.

▼**පසේනදී කෝසල රජුගේ** විමසීමක් අනුව, අහිත පිණිස, අපහසු විහරණය පිණිස උපදින ලෝක ධර්මයෝ නම් ලෝභය, දෝෂය හා මෝහය යයි බුදුන් වහන්සේ වදාළහ. **බලන්න**: සංයු.නි: (1) සගාථවග්ග: කෝසලසංයුත්ත:3.3.3 ලෝකසූත්‍රය, පි.204.

▲ **ලෝකයේ දුර්ලභ ධර්මතා-** Rare Dhammas in the world: ලෝකයේ දුර්ලභ ධර්මතා 10ක් බුදුන් වහන්සේ පෙන්වා ඇත. එම දේ ලබා ගැනීමට මිනිසුන් කැමතිය, එහත් ඒවා ලබාගැනීම පහසු නොවේ: 1 ධනය (wealth) 2 රූපය (beauty) 3 නිරෝගීබව 4 සිල්වත්බව 5 බ්‍රහ්මචරියාව 6 මිත්‍රයෝ 7 බහුශ්‍රැතබව 8 ප්‍රඥාව 9 යහපත් ගුණ 10 දෙව්ලොව උපත.එම ධර්මතා මුදුන්පත් කරගැනීමට බාධා කරන කරුණු, හා ඒවා ලබාගැනීමට උපකාරීවන කරුණු: 1 **ධනය**: උදාසීනබව හා ආරම්භක උත්සාහය නැතිකම, ධනය රැස්කරගැනීමට බාධාවකි. උද්යෝගය හා මූලපිරීමට උත්සහාය තිබීම ධනය ලබාගැනීමට උපකාරීවේ 2 **රූපය:** අලංකාර නොකිරීම හා හැඩනොවීම රූපය පවත්වා ගැනීමට බාධාවකි. අලංකාරවීම, හැඩවීම නිසා රූපය පවත්වා ගත හැකිය. 3 **නිරෝගීබව**: සාත්තු නොකිරීම, නිරෝගිබව තබා ගැනීමට බාධාවකි . යහපත් සාත්තුව, නිරෝගිබව පවත්වාගනී. 4 **සිල්වත්බව:** පාපමිත්‍ර සේවනය සීලයට බාධාවකි. කල්‍යාන මිත්‍ර සේවනය සීලය රැකගැනීමට උපකාරීවේ 5 **බ්‍රහ්මචරියාව**: ඉන්ද්‍රිය අසංවරය බ්‍රහ්මචරියාවට බාධාවකි. ඉන්ද්‍රිය සංවරය බ්‍රහ්මචරියාවට උපකාරීවේ 6 **මිත්‍රයෝ**: දෙපිට කාට්ටුවීම, මිත්‍රයන් ඇතිකරගැනීමට බාධාවකි . අවංකබව, යහපත් මිත්‍රයන් ලබාදේ. 7 **බහුශ්‍රැතබව**: උගත්දේ කටපාඩම්-මතක්- නොකිරීම බහුශ්‍රැතබවට බාධාවකි. කටපාඩම් කිරීම, මතකයේ තබාගැනීම බහුශ්‍රැතබව ඇතිකරයි. 8 **ප්‍රඥාව**: ඇහුම්කන්දීමට අකමැත්ත හා ප්‍රශ්න නොවිසීම ප්‍රඥාව ඇතිවීමට බාධාවකි. ඇහුම්කන්දීම හා ප්‍රශ්න විමසීම ප්‍රඥාව ඇතිකරති. 9 **යහපත් ගුණ**: කුසල ධර්ම තමාට අදාළ නොකර ගැනීම, අවර්ජනා නොකිරීම, යහපත්ගුණ ඇතිකර ගැනීමට බාධාවකි. ඒවා, අදාළකරගැනීම හා අවර්ජනා කිරීම මගින් යහපත් ගුණ වැඩේ. 10 **දෙව්ලොව**: මිථ්‍යාප්‍රතිපත්තියේ (අනරිය අටමග) යෙදීම දෙව්ලොව යලි උපතට බාධාවකි. සම්මා ප්‍රතිපත්‍යය (අරියඅටමග), දෙව්ලොව යලි උපතට පිහිටවෙ .**මූලාශ්‍ර**: අංගු.නි: (6 ): 10 නිපාත, ආකන්ඛ වග්ග, 10.2.3.3 ඉට්ඨධම්ම සූත්‍රය, පි.270, EAN: 10: 73.3. Wished For. p. 522.

▼**ලෝකයාට ලබාගැනීමට** දුෂ්කරදේ මේ සූත්‍රයේ ද පෙන්වා ඇත: දීර්ඝ ආයුෂ, සුන්දර රූපය, කායික මානසික සතුට, කීර්තිය, මතු දෙව්ලොව සැප ලැබීම. එම දේ ලබාගැනීමට නම් කෙනෙක් ධර්මානුකූල ජීවිතයක් ගත කලයුතුය. ඔහු ප්‍රඥාවන්තයෙකි. **මූලාශ්‍ර:** අංගු.නි: ( 3): 5 නිපාත: 5.1.5.3 ඉට්ඨධම්ම සූත්‍රය, පි. 96 , EAN: 5: 43.3 Wished For , p. 252.

▲ **ලෝකපාලක ධම්ම**- Dhamma that governs the world: ධර්මයට අනුව හිරිය හා ඔතප්පය ලෝක පාලක ධම්මයන්ය. **බලන්න**: හිරි ඔත්තප්ප

▲ **ලෝකවාදීපටිසංයුක්ත දිට්ඨි-**Lokavadipatisanykktha Ditthi: ලෝකවාදීපටිසංයුක්ත දිට්ඨි ලෙසින් මෙහිදී පෙන්වා ඇත්තේ, බුදුන් වහන්සේ වැඩසිටි සමයේ අන්‍ය ආගමිකයන් තුළ පැවති පිළිගැනීම්ය. (ආත්මයය, ශාශ්වතය දිට්ඨි ආදී). **බලන්න**: දිට්ඨි. **මූලාශ්‍රය**:ඛු.නි:පටිසම්භිදා 1: දිට්ඨිකථා: 2-14 ලෝකවාදීපටිසංයුක්ත දිට්ඨි, පි.320.

▲ **ලෝකවිජය-**Victory in the world: මේ සූත්‍රයේදී ලෝකවිජය ලෙසින් පෙන්වා ඇත්තේ, කාන්තාවක් සතු යහපත් ගුණ නිසා වර්තමාන ලෝකය ද පරලොවද ජය ගෙන, සුවසේ වාසය කිරීමට ඇති හැකියාවය. එම ගුණ ඇති කාන්තාව, 1) කාර්යශූරවීම 2) ගෘහයේ සේවක සේවිකා ආදීන් යහපත් ලෙස පාලනය කිරීමට හැකිවීම 3) ස්වාමියාට මනාව හැසිරීම 4) ස්වාමියා සතු දේ මැනවින් ආරක්ෂා කිරීම 5) බුදුන් වහන්සේ පිලිබඳ ශ්‍රද්ධාව තිබීම 6) ශිලසම්පන්නවීම 7) ත්‍යාගශීලිබව 8) ප්‍රඥාවන්තබව (සමුදය වය ධර්මය දැකීමට ඇති නුවණ). එවැනි ගුණ ඇති කාන්තාව මතු දෙව්ලොව සැප ලබයි යයි බුදුන් වහන්සේ වදාළහ. **සටහන**: මේ සූත්‍ර දේශනා කර ඇත්තේ විසාඛා මහා උපසිකාවටය. **මූලාශ්‍රය**:අංගු.නි: (5): 8 නිපාත: උපෝසථවග්ග: ලෝකවිජය සූත්‍ර 2කි, පි. 232.

▲ **ලෝකායතික-**Lokāyatika: බුදුන් වහන්සේ වැඩසිටි සමයේ විසූ සමහර බ්‍රාහ්මණයන්, ලෝකය පිලිබඳ හදාරමින් ඒ පිලිබඳ විවාද කරමින් වාසය කළෝය. ඔවුන් ‘ලොකායත’ ලෙසින් හඳුන්වයි. අටුවාවට අනුව ඔවුන්ගේ දර්ශනය වුවේ: ‘අනාගත සුභ සාධනය, පිණිස වෙහෙස වියයුතු නොවේ, ඉදිරියට යායුතු නොවේ.මේ මතය නිසා පුණ්‍යකර්ම කිරීමට ඔවුන් සිතන්නේ නැත, වෙහෙස වන්නේද නැත.’ **බලන්න**: ESN: note: 128, p.956, දිට්ඨි. **මූලාශ්‍රය:** අංගු.නි: (5): 9 නිපාත: මහාවග්ග:9.1.4.7 ලෝකායාතික බ්‍රාහ්මණ සූත්‍රය, පි.518.

▼**මේ සූත්‍රයේදී ලෝකය** පිලිබඳ වාද 4 ක් පෙන්වා ඇත: 1) සියල්ල ඇත්තේය (All exists) 2) සියල්ල නැත්තේය (All does not exist) 3) සියල්ල ඒක ස්වභාවය ඇත්තේය (All is a unity) 4) සියල්ල නා නා ස්වභාවය ඇත්තේය (All is a plurality). මෙහිදී බුදුන් වහන්සේ පෙන්වා ඇත්තේ ඒ අන්ත කිසිවකට බර නොවී, තමන් වහන්සේ මධ්‍යම ප්‍රතිපදාවට අනුකුලව ධර්මය දේශනා කරණ බවය (අවිද්‍යාව නිසා සංඛාර ඇතිවේ... ආදී වශයෙන් පටිච්චසමුප්පාද ක්‍රියාවලිය පෙන්වා ඇත.) **සටහන:** මේ සූත්‍රය අවසානයේදී ධර්මය අවබෝධව පැහැදුන, ලෝකායාත බ්‍රාහ්මණයා, බුදුන් සරණ ගිය උපාසකයක් විය. **බලන්න**: උපග්‍රන්ථය:3. **මූලාශ්‍ර:**සංයු.නි: (2): නිදානවග්ග: අභිසමයසංයුත්ත: ගහපතිවග්ග: 1.5.8 ලෝකායාතික සූත්‍රය, පි.140, ESN: 12 Nidanasamyutta:V: 48.8. A Cosmologist, p. 677.

▲ **ලෝක විනාශය**- Destruction of the world: බොහෝ කල්ප ගණනක් ගතවීමෙන් ලෝකය විනාශවී යයි එය කල්ප විනාශය ලෙසින් පෙන්වා ඇත. කල්ප විනාශය සිදුවන්නේ ජලය, ගින්න, සුළං මගින්ය. **බලන්න:** කල්පය.

▲ **ලෝකවිෂය**- Loka visaya: **ලෝක විෂය (**speculation of the world ) ලෙසින් පෙන්වා ඇත්තේ ලෝකය නිර්මාණයවූ ආකාරය- සත්ඣයන්

ඇතිවීම ගැන විමසීමය. මෙය සාමාන්‍යලෝකයාට අවබෝධ කිරීමට පහසු නැත. අචින්ත ධර්මතා හතරින් එකකි. **බලන්න**: අචින්ත ධර්මතා.

▲ **ලෝකෝත්තර ශිලය-** Lokothtara sila: ලෝකෝත්තර ශිලය යනු ආරියන්ගේ ශීලයය**.** **බලන්න**: ශිලය.

▲ **ලෞකික-**Mundane: ලෞකික ලෙසින් පෙන්වා ඇත්තේ සාමාන්‍ය ලෝකයාගේ සිතන පතන දේය- ක්‍රියාපිළිවෙතය, එය ආමිෂ ලෙසින්ද පෙන්වා ඇත. ලෞකික කටයුතු තුලින් සසර දුක අවසන් කරගත නොහැකිය. ඒ පිණිස ලෝකෝත්තර මාර්ගය වඩා ගත යුතුවේ. **බලන්න:** ආමිෂ.

▲ **ලෞකික හා ලෝකෝත්තර ජීවිතය-** Mundane & Super-mundane life: ලෞකික ජීවිතය යනු ගිහිජිවිතය. ලෝකෝත්තර ජීවිතය ජීවිතය නම්, දුක අවසන් කරගැනීම පිණිස ශ්‍රද්ධාව, ශිලය, බහුශ්‍රැතබව, ත්‍යාගශීලිබව, ප්‍රඥාව ආදිය වර්ධනය කරගනිමින් ධර්මානුකූල ජිවිතයක් ගතකිරීමය. **බලන්න**: ආරිය වර්ධනය. **මූලාශ්‍ර**:අං.ගු.නි: (6)10 නිපාත: ආකඞ්ඛ වග්ග:10.2.3.4 වඩ්ඪි සූත්‍රය, පි.272, EAN: 10: 74.4.Growth, p.522.

▲ **ලොකොත්තර ධාතුව-** Super-mundane element: ලොකොත්තර ධාතුව, නිවනය. **බලන්න:** නිවන, ධාතු.

▲ **ලෞකික ශිලය-**Lokiya sila: ලෞකික ශිලය ලෙසින් පෙන්වා ඇත්තේ බෞද්ධයන් සමාදන්වන පන්සිල්, අටසිල්, දසසිල් ආදීයය. **බලන්න**: ශිලය.

**ලස**

▲ **ලඝු සංඥාව-** Lagu sanna: මෙය සතර ඉද්දිපාද වර්ධනය කරගැනීමෙන් ඇතිකරගත හැකි ඉර්ධිවිධ ඥානයකි. **බලන්න**: ඉර්දීවිධ ඥානය. **සටහන**: තථාගතයන් හට කය සිතට නගා, සිත කයට නාගා වාසය කලහැකිය. එවිට කයඉතා ලඝුවී, කර්මණ්‍ය වී ප්‍රභාසර බවට පත්වේ.එලෙස ඇතිවෙන ලඝුසංඥාව හා සුඛ සංඥාව නිසා තථාගත කය නිතැතින්ම පොළොවින් ඉහලට නගී, බඹලොව තෙක් කය පවත්වා ගැනීමට හැකිවේ**.** **බලන්න**: අයගෝලය උපමාව, ආශ්චර්ය ධම්ම. **මූලාශ්‍රය:**සංයු.නි: (5-2) ඉද්දිපාදසංයුත්ත:7.3.2 අයෝගුළ සූත්‍රය,පි.70

**ලජ**

▲ **ලාංජන අන්තරාධාන**- Disappearing of mark: ලාංජන අන්තරාධානය ලෙසින් පෙන්වා ඇත්තේ සංඝයා යන සලකුණ නැතිවීයාමය. මෙය ලිංග අන්තරධානය ලෙසින්ද පෙන්වා ඇත. සද්ධර්මය අතුරුදහන් දහන් වන විට සංඝයා දරන සිවුරු ක්‍රමයෙන් නැතිවියයි. අවසානයේදී, හිරියල් පාට රෙදි කැල්ලක් කරේ එල්ලා ගෙන සිටින පුද්ගලයා, සංඝයා ලෙසින් හඳුන්වයි. **බලන්න:** ධර්මය අතුරුදහන්වීම.

▲ **ලැජ්ජාව**: පාලි: **ලජ්ජවක්‍ඛ-** modesty: ධර්මයට අනුව ලැජ්ජාව යනු අකුසලයේ - වැරදි ක්‍රියාවන්හි යෙදීමට කැමතිනොවීමය, එනම්, පවට

ඇති ලැජ්ජාව හා බියය - හිරි ඔත්තප්ප තිබීමය, උඩඟුනොවන බව- විනීතබවය. **බලන්න:** හිරි හා ඔත්තප්ප. **ශබ්දකෝෂ**: **පා.සිං.ශ**: පි.446: "**ලජ්ජා:** හිරිය".

▼**බුදුන් වහන්සේ** ලජ්ජාව පිළිබඳව යහපත් ලෙසින් වදාරා ඇත. ඒ ධර්මතා සංඝයා එක්ව, ධර්මයේ චිරස්ථිතිය පිණිස සජ්ජායනා කිරීම සුදුසු යයි සැරියුත් මහා තෙරුන් සංඝයාට උපදෙස් දී ඇත. **මූලාශ්‍ර**: දිඝ.නි: (3) : 10 සංගිති සූත්‍රය, පි. 372 , EDN: 33 Saṅgīti Sutta: The Chanting Together, p. 362.

**ලන**

▲**ලෙන-**Cave: ලෙන-ගුහාව ආරක්ෂාව ලබා දෙන තැනකි. මෙය නිවන හඳුන්වන පදයකි. **බලන්න:**නිවන **මූලාශ්‍රය:** සංයු.නි: (4): සළායතන වග්ග: අසංඛතසංයුත්ත:9.2. ලෙනසූත්‍ර, පි.690.

**ලප**

▲ **ලපනං-** flattery: ලපනං යනු ඉච්චාබස්- චාටුබස් කථා කිරීමය. මෙය, ආධ්‍යාත්මික වර්ධනයට බාධා කරන කරුණකි. **බලන්න**: උත්තරීය මනුස්ස ධම්ම.

**ලභ**

▲ **ලාභය-** gain: ධර්මයට අනුව ලාභය යනු ආධ්‍යාත්මික මාර්ගය දියුණු කර ගැනීම පිණිස උපකාරීවන කරුණුය. ධර්ම මාර්ගයේ සිටින සංඝයා හට ඇති ඒකාන්ත ලාභ 16ක් බුදුන් වහන්සේ පෙන්වා ඇත: 1) අරණ්‍යවාසි වීම 2) පිණ්ඩපාතික වීම (පිඬු සිඟා පමණක් ආහාර ලබාගැනීම) 3) පංසුකූලිකව වාසය කිරීම -(rag robes wearer ) (පංසුකූල යෙන් ලැබෙන - මිනියක් ඔතා ඇති රෙදි වලින් සකස් කළ සිවුරු පමණක් පෙරවීම) 4) තෙචීවරික බව (තුන් සිවුරු පමණක් භාවිතා කිරීම- ධූතාංග පුහුණුවේ යෙදෙන සංඝයා) 5) ධර්ම කථිකබව 6) විනයධරබව 7) බහුශ්‍රැතබව 8) ස්ථාවර ප්‍රාප්ත බව (සසුනේ බොහෝ කලක් සිටීම) 9) ආකල්ප සම්පත්ති ඇතිබව -යහපත් ලීලාව ඇතිබව 10) පරිවාර සම්පත්ති ඇතිබව 11) මහපිරිවර ඇතිබව 12) කුලපුත්‍රයෙක් බව - උසස් පවුලකින් පැමිණිබව 13) රූපසම්පන්න බව 14) මියුරු කටහඬ ඇතිබව 15) අල්පේච්ච බව 16) ආරෝග්‍ය සම්පත්තිය තිබීම. **මූලාශ්‍ර:** අංගු.නි: (1): 1 නිපාත: එකධම්මපාලිය: 1.16.5 සූත්‍රය, පි. 118, EAN:7: 378.1 suttas, p. 50.

▲ **ලාභ අනුත්තර** - unsurpassed gain: මෙය උත්තරීතර ධර්මතා වලින් එකකි, බුදුන් වහන්සේ කෙරහි ශ්‍රද්ධාව ඇතිවීමෙන් නිවන් මග ලබාගැනීමට හැකිවීමය**. බලන්න**: අනුත්තර ධර්මතා.

▲**ලාභඉච්ඡා-**Desire for gains: ලාභඉච්ඡා ලෙසින් මෙහි පෙන්වා ඇත්තේ සංඝයාට, සිව්පසය ලබා ගැනීමට ඇති ආශාවය. එවැනි පුද්ගලයන් 8 ක් ගැන මෙහි විස්තර කර ඇත. ඉන් තිදෙනක් ධර්මයේ පරිහාණියට පත් නොවේ, සෙසු අය ධර්මයේ පරිහාණියට පැමිණේ.

**මූලාශ්‍රය**:අං.ගු.නි: (5) : 8 නිපාත:චාපාලවග්ග:8.2.7.1 ලාභඉච්ඡා සූත්‍රය, පි.280.

▲ **ලාභ සත්කාර කිර්තිප්‍රසංසා** - Gain honor & praise : ධර්ම මාර්ගය පුහුණු කරන අයට ලැබෙන ලාභ සත්කාර කිර්ති ප්‍රසංසා: දරුණුය, තියුණුය, රළුය, අනුත්තරවූ අරහත්වය අවබෝධය පිණිස අන්තරාකාරී යයි බුදුන් වහන්සේ වදාළහ. එමනිසා උපන් ලාභ සත්කාර නිසා සිත යටකර නොගෙන වාසය කරන්න යයි සංඝයාට උපදෙස් දී ඇත. **සටහන්:** *මේ සංයුත්තයේ සූත්‍රයන්හි ලාභ ආදිය නිසා ආධ්‍යාත්මික පරිහානිය වන අන්දම විස්තරාත්මකව පෙන්වා ඇත. ** දේවදත්ත භික්ෂුව ලාභසත්කාර ආදියට යටවී බුදුසසන හැර ගියබව මෙහි දක්වා ඇත. **මූලාශ්‍රය:** සංයු.නි: (2): නිදානවග්ග: ලාභ සත්කාරසංයුත්තය:දරුණුවග්ග: 5.1.1. දරුණු සූත්‍රය.පි.366.

▼**ලාභ සත්කාර ආදිය**ට යටවීම මාරයාගේ ඇමට හසුවීමය. **උපමාව: බිළිවද්දා**: බිළිය-ඇම ලෙසින් බුදුන් වහන්සේ පෙන්වා ඇත්තේ, ආධ්‍යාත්මික ජීවිතයේද ලැබෙන ලාභ සත්කාර සම්මාන ආදියය. ඒවා අරහත්වය ලබා ගැනීම පිණිස අනතුරුදායක කරුණුය. ඒ පිලිබඳ නියම අවබෝධය නො ලබා ඇති පුද්ගලයෝ, බිලි වැද්දෙක්, විලට දමන ඇමකට හසුවන මාලුවෙක් මෙන්, මාරයාගේ ඇමට හසුවී බොහෝ දුකට පත්වේ, 'බිළි වැද්දා' යනු මාරයාය. උපග්‍රන්ථය:5 **මූලාශ්‍රය**:සංයු.නි:2: නිදානවග්ග: ලාභසත්කාර සංයුත්ත:දරුණුවග්ග: 5.1.2 බළිස සූත්‍රය, පි.366

▼**ලාභසත්කාර** ආදිය විස පෙවූ හීයක්- ඊතලයක් ය යි බුදුන් වහන්සේ වදාළහ. ඒ හීයෙන් විදිය හැක්කේ රහත්නොවූ පුද්ගලයාටය. **මූලාශ්‍රය:** සංයු.නි: (2) නිදානවග්ග: ලාභසත්කාරසංයුත්ත:5.1.7 දිද්ධවිසල්ල සූත්‍රය, පි.370

▲**ලෝභය**- Greed: ලෝභය, රාගය ලෙසින්ද පෙන්වා ඇත. අකුසල මූලකි, අයහපත් කර්ම ඇතිකරයි, ධර්මයට ඇති උවදුරකි **බලන්න**: අකුසල මූල. **මූලාශ්‍ර:** සංයු.නි: (1 ): සගාථවග්ග: දේවතාසංයුත්ත: 1.8.6 නජිරතිසූත්‍රය, පි.106.

▼**ලෝභයෙන් මැඩුන** සත්වයෝ දුගතියට යයි. විශිෂ්ඨ ඥානයෙන් ලෝභය අවබෝධ කරගැනීමෙන් දුකින් මිදීමට හැකිවේ. බුදුන් වහන්සේ මෙසේ වදාළහ: **"මහණෙනි, එක් කෙළෙස් ධර්මයක්...ලෝභය පහ කරගන්න. මම, ඔබට අනාගාමි භාවය පිණිස කැප වෙමි". මූලාශ්‍ර:** බු.නි:ඉතිවුත්තක:1.1.1 ලෝභ සූත්‍රය, පි.346, 1.1.9 ලෝභපරිඤ්ඤා සූත්‍රය, පි.351.

▼ **වෙනත් මූලාශ්‍ර: 1. "ලෝභය:** වස්තුකාම හා කෙලෙශකාම දෙකෙහි පවත්නා ගිජුබවය. වස්තුකාමය නම්: ආලය ඇති වන්නාහු සියලු වස්තු හෝ රූප, ශබ්ද ආදී අරමුණු වේ. ඒ රූප ආදී අරමුණු කෙරෙහි ඡන්ද රාග (බලවත් ඇලීම) වශයෙන් කැමතිවීම කෙලෙශකාම ය වේ":**සද්ධර්ම කෝෂය,** පි. 104.

▲ **ලෝභ දෝස මෝහ**- Greed hate & Illusion

මේවා අකුසල ඇතිකරණ මූල්ය. නිවන සාක්ෂාත් කරගැනීමට පහකරගතයුතු කරුණුය. **බලන්න**: අකුසල මූල. **මූලාශ්‍ර:** දීඝ.නි: (3): 11 දසුත්තර සූත්‍රය, පි. 483, EDN: 34: Dasuttara Sutta: Expanding Decades, p. 384, ඛු.නි: ඉතිවුත්තක: 3.1.1 අකුසල මූල සූත්‍රය**,** පි. 406.

## ලම

▲ **ලාමක ආසාව-** Evil desire: මෙය දස අකුසලයකි, පාපික ආසාව ලෙසින්ද පෙන්වා ඇත. තමන්ට නොමැති උතුම් ගුණ පෙන්වීමට ඇති කැමැත්තය. **බලන්න**: පාපික ආසාව.

▲ **ලාමක ඊර්ෂ්‍යාව**- envy /jealousy: මෙය පාපික ඉරිසියාව ලෙසින්ද පෙන්වා ඇත. අනුන් ගේ දේ ගැන සිතේ ඇති නො පහන් බව, මෙය අකුසලයකි. **බලන්න**: පාපික ඊර්ෂ්‍යාව.

▲ **ලාමක ශීලය හා ලාමක දිට්ඨිය-**Unwholesome virtue & unwholesome views: ලාමක ශීලය (පාපික සීලය) හා ලාමක (පපික) දිට්ඨිය යනු අයහපත්වූ ශීලයේ පිහිටීම හා වැරදි දිට්ඨිය (මිථ්‍යාදිට්ඨිය) ගැනීමය. එවැනි පුද්ගලයා අනුවණය, ධර්ම මාර්ගය සාක්ෂාත් කර නොගනී, මරණින් මතු දුගතියේ යළි උපත ලබයි. **මූලාශ්‍ර:** ඛු.නි: ඉතිවුත්තක: 2.1.5 පාපක සීලසූත්‍රය, පි.380.

▲ **ලුම්බිණිය**- Lumbini: බුදුන් වහන්සේ උත්පත්තිය ලැබූ උයන පිහිටි ස්ථානය. **බලන්න**: උපග්‍රන්ථය:6.

▲**ලෝමසංඝික තෙර-** Lomasangika Thera: **බලන්න**:උපග්‍රන්ථය 1.

▲ **ලෝමහංසන ධම්ම පරියාය**-Lomahnsana Dhamma Pariyaya මේ ධම්ම පරියාය ලෙසින් පෙන්වා ඇත්තේ බුදුවරුන් සතු උත්තරීතර භාවය දක්වන කරුණුය- තථාගත දස බල, සර්වඥතාවය, මහා කාරුණික බව ආදී උතුම් කරුණුය.**සටහන්:** * මේ පරියාය දේශනා කිරීමට හේතුව, බුදුන් වහන්සේගේ උපස්ථායක ලෙසින් සිටි සුනක්ඛත්ත ලිච්ඡවී භික්ෂුව, පැවිදිබව අතහැර ගොස්, විසාල නුවර පිරිස් මැද සිට බුදුන් වහන්සේට අයහපත් ලෙසින් අගෞරවකිරීමය. සැරියුත් මහා තෙරුන් ඒ බව බුදුන් වහන්සේට දැන්වූ පසු උන්වහන්සේ බුදුවරු සතු උත්තරීතර බව පෙන්වා වදාළහ. ** මෙහිදී බුදුන් වහන්සේ, තමන් වහන්සේ බුදුවීමට පෙර සිදු කරන ලද උග්‍ර තපස්ව්‍රත ද විස්තරකර ඇත. **බලන්න:** බුදුන් වහන්සේ, සුනක්ඛත්ත ලිච්ඡවී. **මූලාශ්‍රය:** ම.නි: (1) 1.2.2 මහාසිහනාද සූත්‍රය, පි.183.

## ලව

▲ **ලොව බබලවන එළි -** Lights which illuminate the world: බුදුන් වහන්සේ ලෝකය ආලෝක කරන-බබලවන එළි 4 ක් පෙන්වා ඇත

**"චත්තාරො ලොකෙ පජ්ජොතා"**: 1) හිරු දිවාකාලය බබලවයි 2) සඳ රාත්‍රී කාලය බබලවයි 3) ගින්න දිවාකල මෙන්ම රෑකල ද එතන හෝ මෙතන ද බබලවයි 4) ලෝකය ආලෝක කරන බුදුන් වහන්සේ සියලු ආලෝකයන්ට වඩා ශ්‍රේෂ්ඨය:

**"සම්බුද්ධො තපතං සෙට්ඨො එසා ආභා අනුත්තරා'ති"**

**මූලාශ්‍ර:** සංයු.නි: (1 ): සගාථවග්ග:දේවතාසංයුත්ත: 1.3.6 පජ්ජෝජත සූත්‍රය, පි. 54,ESN:1 Devatasamyutta: 26.6. Sources of Light, p. 88.

**ලල**

▲ **ලොලෝ පුද්ගල- Lolo pudgala**: ලෝකයේ දැකිය හැකි අයහපත් ගණයට ගැනෙන ලොලෝ පුද්ගල වර්ග 2 ක් මෙහිදී පෙන්වා ඇත. 1) ලොලෝ පුද්ගල (අත්තනොමතික- චපල-capricious person): ඔහුට ශ්‍රද්ධාව, පිළිගැනීම, ආදර ගෞරවය ආදී ගුණ නැත.2 ) පුද්ගල ලොලෝ: ( මන්දබුද්ධික- dull and stupid): කුසල අකුසල පිළිබඳ අවබෝධය නැත. **බලන්න**: පුද්ගල පස් වර්ගය.

**ලහ**

▲ **ලහුප්‍රඥාව:** පාලි: **ලහුපඤ්ඤා-** buoyancy of wisdom: උද්යෝගිමත් ප්‍රඥාව ලෙසින්ද දක්වයි. යුහුව ධර්මතා අවබෝධ කරගැනීමට ඇති හැකියාව ලහු ප්‍රඥාව ය.

▼ **ලහු ප්‍රඥාව යනු කුමක්ද?** යුහුව: ශීලය, ඉන්ද්‍රිය සංවරය, භෝජනයේ පමණ දන්නා බව, ජාගරානුයෝගය පරිපූර්ණ කරගැනීමට, ශීල සමාධි ප්‍රඥා ස්කන්ධ, විමුක්ති ස්කන්ධය හා විමුක්ති ඥානදර්ශන ස්කන්ධය, ස්ථාන අස්ථාන දන්නා නුවණ ප්‍රතිවේධ කරගැනීමට, විහාරසමාපත්ති පරිපූර්ණ කරගැනීමට, ආර්යසත්‍ය ප්‍රතිවේධ කරගැනීමට, සත්තිස් බෝධිපාක්‍ය ධර්මතා වඩා ගැනීමට, ආර්යමාර්ගය වඩාගැනීමට, ශ්‍රමණඵල ප්‍රත්‍යක්‍ෂ කරගැනීමට, අභිඥාවන් ප්‍රතිවේධ කරගැනීමට, පරම අර්ථයවූ නිවන ප්‍රත්‍යක්‍ෂ කරගැනීමට ඇති නුවණ ලහු ප්‍රඥාව වේ. **මූලාශ්‍ර:** ඛු.නි: පටිසම්භිදා 2: ප්‍රඥාවග්ග: 3.1 ප්‍රඥා කථා, පි. 184.

▼**සතර ධර්මය**: සෝතාපන්න පුද්ගලයාට ලහු ප්‍රඥාව ඇතිවේ.

**"...ඉමෙ ඛො භික්ඛවෙ, චත්තාරො ධම්මා භාවිතා බහුලීකතා ලහුපඤ්ඤාතාය සංවත්තනතීති"**.(these four things, when developed and cultivated lead to the buoyancy of wisdom): **මූලාශ්‍ර**: සංයු.නි:(5-2): මහාවග්ග:සෝතාපත්තිසංයුත්ත:11.7.9 ලහු ප්‍රඥා සූත්‍රය, පි. 282, ESN: 55: Sotapatthisamyutta: Greatness of Wisdom: p. 2262

▼ **කායගතා සතිය වැඩීමෙන්, විපුල කරගැනීමෙන් ලහු ප්‍රඥාව ඇතිවේ** (Mindfulness directed to the body...when developed and cultivated, leads to the buoyancy of wisdom ). **මූලාශ්‍ර:** අංගු.නි: (1): 1 නිපාත: කායගතාසති වග්ග: පි. 125, EAN:1: Mindfulness Directed to the Body: p.52.

▲ **ලොහොකුඹු නිරය-**Red hot hell: රත්වූ අඟුරු වලින් ගිනිගත් නිරය, අකුසල් විපාක විඳීමට ඇති දුගතියකි. **බලන්න:** නිරය.

▲ **ලෝහිච්ච බ්‍රාහ්මණ1-** Lohichcha Brahamana 1

ක්‍රමානුකූල ධර්ම පුහුණුව පිලිබඳව විස්තරාත්මකව පෙන්වා ඇති මේ දේශනාව අසා, මේ බ්‍රාහ්මණයා බුදුන් සරණ ගියහ. **බලන්න**: උපග්‍රන්ථය:3 **මූලාශ්‍රය**: දීඝ.නි: (1): 12 ලෝහිච්ච සූත්‍රය, පි. 556.

▲ **ලෝහිච්ච බ්‍රාහ්මණ 2 -** Lohichcha Brahamana 2 මහා කච්චායන තෙරුන් වදාළ මේ සූත්‍රය අසා මේ බමුණා බුදුන් සරණ ගියහ. **බලන්න**: උපග්‍රන්ථය:3. **මූලාශ්‍රය:** සංයු.නි: (4): සළායතනවග්ග:වේදනාසංයුත්ත: ගහපතිවග්ග: 1.13.9 ලෝහිච්ච සූත්‍රය, පි.266.

▲ **ලෝහිතක සංඥා භාවනාව-**Lohithaka sanna bhavana: මළකඳක දස අසුභයන් ආවර්ජනය කිරීමේ එක් අවස්ථාවකි. **බලන්න**: දස අසුභසංඥා භාවනාව.

## ව කොටස: වක, වඛ,වග,වච,වජ,වඤ,වඥ,වට,වඩ වත,වද,වඳ, වන,වණ, වප,වභ,වම,වය,වල,වළ,වස, වශ,වෂ,වහ

**වක**

▲**වක්කලී තෙර-** Vakkali Thera: **බලන්න**: උපග්‍රන්ථය:1

▲ **වාක්සත්‍ය** - Speaking the Truth: වාක්සත්‍ය: සත්‍ය කථාකිරිමය. වාක්සත්‍ය ඉක්මවා ගිය පුද්ගලයා ( දැන බොරුකියන මිනිසුන්), විසින් නොකළ හැකි පාප කර්මයක් නොමැතිබවය. එබඳු පුද්ගලයාට පරලොව, සැප නොමැත, දුගතිය ඇතිවේ. **මූලාශ්‍රය:** ඛු.නි: ඉතිවුත්තක: 1.3.5 සම්පජාන මුසාවාද සූත්‍රය, පි. 372.

▲ **වාක් සංඛාර** - Verbal volitional formations: ත්‍රිවිධ සංඛාරයන්ගෙන් එකකි: වචනයෙන් සිදුවේ, එනිසා කුසල-අකුසල විපාක ඇතිවේ. **බලන්න**: සංඛාර.

▲ **වික්ඛායිතක සංඥා භාවනාව** -Vikkhayitika sanna bhavana දස අසුභ ආවර්ජනයකි: සතුන් කාදමා ඇති සිරුර අරමුණු කරගනිමින් කරන භාවනාවය. **බලන්න**: දසඅසුභය.

▲ **වික්ෂිප්ත සිත**: පාලි: **චෙතසො විකෙඛපං**-mental distraction/Muddle-mindedness: වික්ෂිප්ත : එකම අරමුණක සිත පිහිටුවා ගැනීමට (සමාධිගත) නොහැකිවීමය. වික්ෂිප්ත සිත නිසා:අලසබව, අයෝනිසෝමනසිකාරය හා වැරදි මග ගනි. වික්ෂිප්ත සිත පහකිරීමට නැතිකර, ආරියන් දැකිය යුතුය,ධර්මය ඇසිය යුතුය, අනුන් විවේචනය නතර කළ යුතුය, සමාධිය වඩා ගත යුතුවේ **මූලාශ්‍ර:**අංගු.නි:(6) :10 නිපාත:10.2.3.6.තයොධම්ම සූත්‍රය,පි.284, EAN-10: 76-6. Incapable, p. 524.

▲ **වික්ෂෝභනය**- Vikshobhna: මෙය කෙළෙස් ඇතිවීමෙන් සිතේ ඇතිවන කැළඹීම-ඉඤ්ජිතය ය. **බලන්න**: ඉඤ්ජිතය.

▲ **විකාලභෝජනය-**Vikaala bhojanaya: විකාලභෝජනය, දස සික්ඛාපදයෙන් එකකි, සංඝයා රකින ශිලයකි. එහි ගුණ ම.නි: හද්දාලි සූත්‍රයේ පෙන්වා ඇත.

▼**විකාල භෝජනයෙන්** වැලකුණු පුද්ගලයෝ අල්ප ය.: **මූලාශ්‍රය**:සංයු.නි: (5-2) මහාවග්ග: සච්චසංයුත්ත:12.8.9 විකාලභෝජන සූත්‍රය, පි.364.

▲ **වකුටු කම්ම**- Vakutu kamma: වකුටු- ඇද බව, නරක -අකුසල කර්මවල ස්වභාවයක්ය. **බලන්න:**කම්ම ක්‍රියාවලිය.

**වඛ**

▲ **වෙඛනස්ස පරිබ්‍රාජක**- Vekhanassa paribrajika: **බලන්න:** උපග්‍රන්ථය: 3

**වග**

▲**ව්‍යග්සපජ්ජ**-Vyaggapajja: **බලන්න:** උපග්‍රන්ථය: 3

▲ **වංගීස තෙර**-Vangisha Thera: **බලන්න**: උපග්‍රන්ථය:1

▲ **විග්ගාහිකකථා**- Vigghakia katha: විග්ගාහිකකථක් එකිනෙකා හා විරුද්ධවෙමින් කරන කථාය. එය මගඵඔසර පිණිස නොවේ .**බලන්න**: වාදවිවාද. **මූලාශ්‍රය**:සංයු.නි: (5-2) මහාවග්ග: සච්චසංයුත්ත:12.1.9 විග්ගාහිකකථා සූත්‍රය, පි.290.

**වච**

▲ **වංචාව -** fraud:කපටි-සාඨෙය්‍යං,උපකෙලෙසයකි.**බලන්න**: උපකෙලෙස.

▲ **වචසා පරිචිතා**- recited verbally: අසනලද ධර්මය යහපත් ලෙසින් සජ්ජායනා කිරීමය. **බලන්න**: බහුශ්‍රැත.

▲ **වච්ඡගොත්ත තෙර**-Vachchagothta Thera: **බලන්න:** උපග්‍රන්ථය:1

▲**වචී කම්ම**- verbal actions: වචනයෙන් කරන යහපත් හෝ අයහපත් ක්‍රියාය, යහපත් හෝ අයහපත් විපාක ඇතිකරයි. **බලන්න**:දස අකුසල, දස කුසල.

▲ **වචීසංඛාර**- the verbal formation: විතක්ක හා විචාරයය, ත්‍රිවිධ සංඛාරයකි. **බලන්න**:සංඛාර.

▲**වාචික සුචරිත ක්‍රියා හා වාචික දුශ්චරිත ක්‍රියා**-Verbal Good conduct & Misconduct යහපත් වාචික කම්ම සුචරිතය. අයහපත් වාචික කම්ම දුශ්චරිතය. **වාචික දුශ්චරිතය:** මුසාවාදා, පිශුනාවාචා, පරුෂාවාචා, සම්ප්‍රප්ඵලාපය ය. වාචික සුචරිතය: සත්‍යවචන, කේලාම් නොකීම: මුදු වචන, නුවණින් සිතා කරන කථාය. **මූලාශ්‍ර:**අංගු.නි: (2): 4 නිපාත: අභාවග්ග: 4.3.5.8. 4.3.5.9 සූත්‍ර, පි.294, සුචරිත වග්ග: 4.5.3.1 සූත්‍රය, පි.460.

▲**විචිකිච්චාව**- doubt: ත්‍රිවිධ රත්නය පිළිනොගැනීම, නීවරණයකි. **බලන්න**: නීවරණ.

▼ **විචිකිච්චාව ඇතිවිට,**අකුසල මූල නැතිනොවේ.මෙය පහකිරීමට අයෝනිසෝමනසිකාරය, වැරදිමග හා සිතේ ලීනත්වය නැතිකර ගත යුතුය. **මූලාශ්‍රය:** අං.ගු.නි: (6):10 නිපාත: 10.2.3.6 තයොධම්ම සූත්‍රය,පි.284.

▼ **විචිකිච්චාවෙන් මිදීම**: විචිකිච්චාව ඇති කෙනෙක්, ශ්‍රේෂ්ඨධර්මය, අවබෝධ කර ඉන් මිදිය යුතුවේ. **මූලාශ්‍රය**: ඛු.නි.සුත්තනිපාත: පාරායන වග්ග:වස්තුගාථා:ධොතකමානවක,පි.344.

▲ **විචිකිච්චා අනුසය-** vicikicchānusayo: මෙය අනුසයකි, සිතයට ඇති කෙලෙසකි. **බලන්න:** අනුසය.

▲ **විච්ඡිද්දක සංඥාව-** perception of a fissured corpse: අසුභය සංඥා වකි. බිඳීගිය මළකඳක් අරමුණුකර භාවනාව වැඩීමෙන් විදසුන් නුවණ ඇතිවේ.**බලන්න**: සතිපට්ඨාන භාවනා.

▼**විච්ඡිද්දක සංඥාව** වැඩීම පහසු විහරණය පිණිසය.: **මූලාශ්‍රය**: සං.යු.නි: (5-1): මහාවග්ග: බොජ්ඣංගසංයුත්ත:2.7.- විච්ඡිද්දක සූත්‍රය, පි.271.

**වජ**

▲ **වජ්ජි දේශය-**Vajji Province: වජ්ජීන් වාසය කරන මෙ දේශය මගධයට උතුරින් පිහිටා ඇත. බුදුන් වහන්සේ අවසාන චාරිකාවේදී වැඩසිටි ස්ථානයකි.බොහෝ වජ්ජීන් බුදුන් සරණ ගියහ. **බලන්න:** උපග්‍රන්ථය1,3.

▲ **වජ්ජියමාහිත ගහපති-** Householder Vajjiyamahita: **බලන්න**: උපග්‍රන්ථය:3

▲**වජිරා තෙරණිය-**Vajira Therani: **බලන්න**: උපග්‍රන්ථය: 2

▲**විජම්භිකා** -Vijambika: විජම්භිකා- ඇඟමැළි කැඩීම, ථීනමිද්ධයේ එක් ලක්ෂණයකි. **බලන්න**: ථීනමිද්ධය.

▲**විජය-**Victory: විජය යනු සසර ජය ගැනීමය. කය පිලිබඳ යථා අවබෝධය, රහත්මග නුවණින් අවබෝධ කිරීමය.බලන්න: ඛු.නි:සුත්තනිපාත:උරගවග්ග:1-11 විජය සූත්‍රය, පි.80.

▲**විජය ගහපති-**Householder Vijaya:**උපග්‍රන්ථය:** 3

▲**විජයා තෙරණිය-**Vijaya Therani: උපග්‍රන්ථය: 2

▲ **විජ්ජාචරණ සම්පන්න:** පාලි: **විජ්ජාචරණසම්පන්නො-** perfect in true knowledge and conduct: ත්‍රිවිධ විද්‍යා හා පසළොස් (15) චරන ගුණ සම්පන්න බවය. නව බුදු ගුණයකි, රහත්-අසේඛ ගුණයකි.**බලන්න**: බුදුගුණ, අසේඛබල, **පසළොස් චරණගුණ :** 1 ) ශිලසම්පන්නබව, 2 ) ඉන්ද්‍රිය සංවරය, 3) ආහාරයේ පමණ දැනීම 4 ) නිදිවැරිම- ජාගාරානු සතිය, 5-11) සප්ත සද්ධර්ම ගුණ : i බුදුන්වහන්සේ කෙරෙහි ඇති ශ්‍රද්ධාව, ii හිරි හා iii ඔත්තප්ප ඇතිබව, iv බහුශ්‍රැතබව, v දැඩි විරිය ඇතිබව, vi සතිය vii ප්‍රඥාව 12-15) සිව්ජාන ලබාගැනීමේ හැකියාව.

**ත්‍රිවිධ විද්‍යා (ඥාන)** : 1 පෙර ජාති සිහිකිරීමේ නුවණ (**පුබ්බෙනිවාසානුස්සතිඤාණං**)

2 දිවැස් නුවණ (**දිබ්බෙන චක්ඛුනා**) හා 3 ආසව ක්‍ෂය කිරීමේ නුවණ (**ආසවානං ඛයඤාණං**). **මූලාශ්‍ර**: ම.නි: (2 ): 2.1.3 :සේඛ සූත්‍රය, පි. 44, MN 53: Sekha Sutta, p. 436.

▲ **විජජාභාගීය ධර්ම**: පාළි: **විජ්ජාභාගියා ධම්මා-**Dhamma qualities pertain to true knowledge: අවිද්‍යාව දුරුකර, විද්‍යාව- සත්‍ය ඥාණය- නිවන සාක්ෂාත් කරගැනීමට අවශ්‍ය ධර්මයකි. සියලු අකුසල පහකර කුසලය වැඩීමට උපකාරීවන කුසල ධර්මයන්ය.

▼ **විජ්ජාභාගීය ධර්මයන්ට කායගතා සතිය ඇතුළත්වේ**: කෙනෙක්, කායගතාසතිය වඩන්නේ ද, බහුල කරගන්නේද, විද්‍යාව ඇතිකරන කුසල ධර්මතා සත්‍යඥාන අවබෝධය පිණි ඇති ධර්ම කොටස් (**විජ්ජාභාගියා ධම්මා)** කායගතා සතියට  ඇතුලත් වේ යයි බුදුන් වහන්සේ වදාළහ:

**"...එවමෙව බො භික්ඛවෙ යස්ස කස්සචි කායගතාසති භවිතා බහුලීකතා, අන්තොගධා තස්ස කුසලා ධම්මා, යෙ කෙචි විජ්ජාභාගියා". සටහන:** විජජාභාගීය ධර්මයන්ට අෂ්ඨ සත්‍ය විද්‍යා -අෂ්ඨ සත්‍ය ඥාන (eight true knowledge) ඇතුලත් බව මෙහි දක්වා ඇත:1) විපස්සනා නුවණ 2) මනෝමය කය ඇතිකරගැනීමේ නුවණ 3-8) සය අභිඥා (There are eight kinds of true knowledge: insight knowledge, the mind- made body, and the six kinds of direct knowledge). **බලන්න:** EAN: Note: 205, p.591. **මූලාශ්‍ර:** අංගු.නි: (1): 1 නිපාත: කායගතාසති වග්ග: 1.16.7.1 සූත්‍රය. පි. 126, EAN:1: Mindfulness Directed to the Body, p.52.

▼ **දීඝායු උපාසකට උපදෙස්**: **බුදුන් වහන්සේ** දීඝායු උපාසකට විජ්ජාභාගීය ධර්ම වඩා ගැනීමට මෙසේ උපදෙස් වදාළහ:

**"...තස්මාතිහ ත්වං දීඝාවු, ඉමෙසු චතුසු සොතාපත්තියඞ්ගෙසු පතිට්ඨාය ඡ විජ්ජාභාගියෙ ධම්මෙ උත්තරිං භවෙය්‍යාසි ඉධ ත්වං දීඝාවු, සබ්බසඞ්ඛාරෙසු අනිච්චානුපස්සී විහරාහි, අනිච්චෙ දුක්ඛසඤ්ඤී දුක්ඛෙඅනත්තසඤ්ඤී පහාණසඤ්ඤී විරාගසඤ්ඤී නිරොධසඤ්ඤීති. එවං හි තෙ දීඝාවු සික්ඛිතබ්බන්ති..."**: ' දීඝායු ඔබ, සෝතාපත්ති සිව් දහම පිහිටුවා ගෙන, විජ්ජාභාගීය ධර්මතා සපුරාලන කරුණු 6 ක් (සංඥා 6) පුහුණුකර වඩාගත යුතුය: 1. සියලු සංස්කාර අනිච්චබව මෙනෙහිකිරිම 2. අනිච්චදේ දුක්ඛයන  සංඥාව මෙනෙහිකිරිම 3. දුකෙහි අනාත්ම සංඥාව මෙනෙහිකිරිම 4.පහාණ සංඥාව මෙනහිකිරිම  5. විරාග සංඥාව මෙනෙහිකිරිම, 6. නිරෝධ සංඥාව මෙනෙහිකිරිම. එලෙසින් ඔබ හික්මිය යුතුය.'. **මූලාශ්‍ර**: සංයු.නි: (5-2): මහාවග්ග: සොතාපතති සංයුත්ත: 11.1.3 දීඝාවු උපාසක සූත්‍රය, පි. 164, ESN: 55: Sotapattisamyutta: 3.3 Dīghāvu, p, 2185.

▼ **විජ්ජා භාගිය ධර්ම කොටස්**: 1) අනිච්ච සංඥාව 2) අනිච්චේ දුක්ඛ සංඥාව 3) දුක්ඛේ අනත්ත සංඥාව 4) පහාන සංඥාව 5) විරාග සංඥාව 6) නිරෝධ සංඥාව. **බලන්න**: සංඥා.: **මූලාශ්‍ර:** අංගු.නි:(4 ): 6 නිපාත:6.1.4.5 විජ්ජාභාගිය සූත්‍රය, පි. 108, EAN:6: 35.5 Pertain to True Knowledge, p. 332.

▲ **විජ්ජා විමුක්තිය**: පාලි: **විජ්ජාවිමුත්ති-** Knowledge and liberation

විජ්ජා විමුක්තිය: නිවනය,අවිද්‍යාව අවසන්කිරීමය.ඒ සඳහා ත්‍රිවිධ ඥාණ ලබා ගත යුතුය. විමුක්තිය යනු චේතෝ විමුක්තිය හා ප්‍රඥා විමුක්තිය ලැබීමය. විජ්ජාවිමුක්තිය පිණිස අෂ්ට විද්‍යා ඥාන අවශ්‍යවේ. **බලන්න**: ත්‍රිවිධ ඥාණ ,අෂ්ට විද්‍යා ඥාන. **ශබ්දකෝෂ: පා.සිං.ශ:** පි.468: "**විජ්ජාවිමුත්ති:** විද්‍යාව හා විමුක්තිය". **B.D**: p.191: "**Vijjā:** Higher Knowledge- 3 fold knowledge", p. 193: **Vimutti**: Deliverance-is 2 kind: Deliverance through wisdom (paññā- vimutti) & Deliverance of mind".

▼ **බුදුන්වහන්සේ වදාළේ**, බඹසර විසීමේ අරමුණ වන්නේ අරහත් මාර්ග ඥාන විද්‍යාව හා අරහත් ඵල විමුක්තිය පසක් කිරීම බවය (විජ්ජාවිමුත්ති ඵල සච්ඡිකිරියත්ථං- realization of the fruit of true knowledge and liberation). ඒ සඳහා ඇති ක්‍රම වේදය නම් අරිය අටමග වර්ධනය කරගැනීමය. **මූලාශ්‍ර**: සංයු.නි: (5-1)මහාවග්ග: මග්ගසංයුත්ත:1.5.6. විජ්ජා විමුත්ති සූත්‍රය, පි. 74, ESN: V: realization of the fruit of true knowledge and liberation, p. 1651.

▼ **විජ්ජා විමුක්තිය**, සච්ඡිකාතබ්බ - නිවන පිණිස සාක්ෂාත් කර ගත යුතු ධර්මතාවයකි. **මූලාශ්‍ර:** දීඝ.නි : (3): 11 දසුත්තර සූත්‍රය, පි. 483, EDN: 34: Dasuttara Sutta: Expanding Decades, p. 384.

▼ **විජ්ජා විමුක්තිය** සාක්ෂාත් කරගැනීමට සමථය හා විදර්ශනා- විපස්සනාව අවශ්‍යය යි බුදුන් වහන්සේ පෙන්වා ඇත. **බලන්න**: සමථ හා විපස්සනා.

**විඤ්ඤ**

▲ **විඤ්ඤාණං අනිදස්සනං -** Vinnana anidassana

විඤ්ඤාණය අනිදස්සන වීම- හැර දැමීම, කිසිවක් ඉතිරිනොවීම ගෙවීයාම නම් නිවනය:

**විඤ්ඤාණං අනිදස්සනං අනන්තං සබ්බතො පභං**
**එත්ථ ආපො ච පඨවි තෙජො වායො න ගාධති**
**එත්ථ දීඝඤ්ච රස්සඤ්ච අණුං ථූලං සුභාසුභං**
**එත්ථ නාමඤ්ච රූපඤ්ච අසෙසං උපරුජ්ඣති**. **මූලාශ්‍ර:** දීඝ.නි: (1): 11 කෙවඩ්ඩ සූත්‍රය,ඡේදය-88, පි.500, EDN:11 Kevaddha Sutta, para-85, p. 135.

▲**විඤ්ඤානඤ්චායතනය-** the base of the infinity of consciousness: මෙය අරූප බ්‍රහ්ම ලෝකයකි, 6නි විඥාන ස්ථානයය. මෙහි පහළවීමට විඤ්ඤාන අනන්තය යන සංඥාව දියුණුකර ගතයුතුවේ. **බලන්න**: ම.නි:අට්ඨකනාගර සූත්‍රය.

▼**සැරියුත්, මුගලන්තෙරුන්** එම සම්පත්තිය වඩාගෙන ඇත. **මූලාශ්‍ර:** සංයු.නි: (3): ඛන්ධවග්ග: 7.1.6 විඤ්ඤානඤ්චායතනසූත්‍රය පි.498, සළායතනවග්ග: මොග්ගල්ලානසංයුත්ත: 6.1.6 විඤ්ඤානඤ්චායතන සූත්‍රය, පි.522.

▲ **විඤ්ඤාණඤ්චායතන ධාතුව-** Element of base of the infinity of consciousness: මෙය සප්ත ධාතු වලින් එකකි. **බලන්න**: ධාතු.

**වඥ**

▲**විඥාණය:** පාලි: විඤ්ඤාණං -consciousness: විඥාණය, පංච උපාදානස්කන්ධයේ එක් ස්කන්ධයකි, සිව් අහාර වලින් එකකි, ලෝකයා සසර සැරිසරන්නේ විඥාන ක්‍රියාවලිය නිසාය. **බලන්න**: පංච උපාදාන ස්කන්ධය, ආහාර.

▼ **විඥාණය, පටිච්චසමුප්පාදයේ 3 නි පුරුකය**: සංඛාර හේතුකොට විඥාණය ඇතිවේ, සංඛාර නැතිවීමෙන් විඥාණය නැතිවේ.

**"...සඞ්ඛාර පච්චයා විඤ්ඤාණං**
**"...සඞ්ඛාර නිරොධා විඤ්ඤාණ නිරොධො..."**

විඥාණය නිසා නාමරූප ඇතිවේ, විඥාණය නිරෝධ වීමෙන් නාම රූප නිරෝධ වේ. **විඥාණය 6 ආකරය:** ඇසේ විඥාණය(**චක්ඛුවිඤ්ඤාණං**) කණේ විඥාණය (**සොත විඤ්ඤාණං**) නාසයේ විඥාණය (**ඝාණවිඤ්ඤාණං**) දිවේ විඥාණය (**ජිව්හාවිඤ්ඤාණං**) කයේ විඥාණය (**කායවිඤ්ඤාණං**) මනසේ විඥාණය (**මනොවිඤ්ඤාණං**). **සටහන:** මනෝ විඥානය: ඇස, කණ, නාසය, දිව හා කය නිසා ඇතිවෙන පස් ආකාරවූ විඥානය හැර මනස නිසා ඇතිවෙන අනිකුත් විඥානයන්ය. එනම්, සිතේ ඇතිවන සංකල්ප රූප,අභ්‍යන්තර චිත්ත තත්වයන්ය. **බලන්න**:EMN:note:130, p. 1075. **මූලාශ්‍ර:** සංයු.නි: (2 ): නිදානවග්ග: පටිච්චසමුප්පාද සූත්‍රය, පි. 24, විභඞ්ග සූත්‍රය, පි.26,ESN: 12: Nidanavagga: 1.1. Dependent Origination, p. 610 & 1 2.2 Analysis of Dependent Origination, p.611, ම.නි: (1): 1.1.9 සම්මා දිට්ඨි සූත්‍රය, පි. 130, EMN: 9: Sammādiṭṭhi Sutta- Right View, p. 121.

▼ **සය විඥානය**: සළායතන ක්‍රියාත්මක වන අන්දම දැනගැනීමට සය විඥානය ගැන අවබෝධය අවශ්‍ය වේ. **මූලාශ්‍ර**: ම.නි: (3): 3.4.7 සළායතන විභඞ්ග සූත්‍රය, පි. 474, EMN: 137 Saḷāyatana vibhanga Sutta-The Exposition of the Six fold Base, p.974 .

▼ **සය විඥානය,** අනිත්‍යබව මෙනහිකිරීම,කළකිරීම පිණිස, නිවන පිණිස පවතී. **මූලාශ්‍රය:**සංයු.නි: (2): නිදානවග්ග:රාහුලසංයුත්ත:6.1.3 විඥාන සූත්‍රය, පි.398.

▼ **විඥානය ගැන** මනා අවබෝධය ලැබීම පිණිස සම්මා දිට්ඨිය ඇති කර ගත යුතුය. **මූලාශ්‍ර**: ම.නි: (1): 1.1.9 සම්මා දිට්ඨි සූත්‍රය, පි. 130, EMN: 9: Sammādiṭṭhi Sutta- Right View, p. 121.

▼ **විඥානයේ පිහිටීම සසර දුක පිණිසවේ**. චේතනා අරමුණු කොටගෙන විඥානය පිහිටන ආකාරය, එමගින් පුනර්භවය සැකසීම හා සසර දුක් ඇතිවීම මේ සූත්‍ර වල විස්තරාත්මකව පෙන්වා ඇත. එසේම, විඥානය නො පිහිටීම සසර දුක නිමාවය. පටිච්චසමුප්පාදය ක්‍රියාවලිය ද මෙහි දක්වා ඇත.

**මූලාශ්‍ර:** සංයු.නි: (2 ): නිදානවග්ග: අභිසමයසංයුත්ත:කළාරඛත්තිය: චේතානා සූත්‍ර 3කි. පි. 124, ESN:12: Nidanasamyutta: IV: The Karakhattiya: Volition 3 suttas p. 665.

▼ **සියලු** විඥානයන් (සය විඥානය ) අනිත්‍යය.එලෙස, දකිනා පුද්ගලයා **'සද්ධානුසාරි'** ය. ඒබව, විදසුන් නුවණින් අවබෝධ කරගන්නා පුද්ගලයා **'ධම්මානුසාරි' මූලාශ්‍රය:**සංයු.නි: (3): ඛන්ධවග්ග: ඔක්කන්තිසංයුත්තය: චක්ඛුවග්ග: 4.1.3 විඥාන සූත්‍රය, පි.472.

▼ **සියලු** විඥානයන්හි පැවැත්වීම නිසා ජරා මරණය පහලවේ, ඒවා නිරුද්ධවීම, ජරාමරණය අවසන්වීමය. **මූලාශ්‍රය:**සංයු.නි: (3): ඛන්ධවග්ග: උප්පාදසංයුත්තය:5 .1.3 විඥාන සූත්‍රය, පි.480.

▼ **විඥානය නිරුද්ධවීම**: ආධ්‍යාත්මය පිලිබඳ ඇල්ම, බාහිරදේ පිලිබඳ ඇල්ම නිසා උපදින වේදනා නොපතන, සිහිය ඇතිව හැසිරෙන පුද්ගලයාගේ විඥානය නිරුද්ධවේ. **මූලාශ්‍රය**: ඛු.නි.සුත්තනිපාත: පාරායනවග්ග:වස්තුගාථා: 5-13 උදයමානවක,පි.360.

▲ **විඥාන ආහාර**- Vinnana ahara: මෙය, සත්ත්වයන්ගේ පෝෂණය පිණිස අවශ්‍ය ආහාර 4 න් එකකි, මේ නිසා පුනර්භවය සකස්වේ. **බලන්න**: ආහාර, පුනර්භවය.

▲ **විඥාන කසිණසංඥාව-** consciousness kasiṇa: මෙය දස කසිණයන්ගෙන් එකකි. **බලන්න**: කසිණ.

▲ **විඥාන කායසය**-six classes of consciousness: විඥාන කායසය ලෙසින් පෙන්වා ඇත්තේ සළායතන, බාහිර අරමුණු ස්පර්ශ කිරීම නිසා හටගන්නා සය විඥානයන්ය. **බලන්න**: ඡ ඡක්ක ධම්මො. **මූලාශ්‍ර**: ම.නි: (3): 3.4.7 සළායතන විභඞ්ග සූත්‍රය, පි. 474, EMN: 137 Saḷāyatana vibhanga Sutta-The Exposition of the Six fold Base, p.974 .

▲ **විඥාන චරියාව-**Vinnana Chariya: මෙය චර්යානානානත්ව ඥාණයට අයත් එක් අංගයකි. **බලන්න**: චර්යානානානත්ව ඥාණය.

▲ **විඥාන ධාතුව-** Consciousness element: සය ධාතුවලින් එකකි. **බලන්න:** ධාතු.

▲ **විඥානය සකස්වීම**- Formation of Consciousness: රූප, වේදනා, සංඥා,සංස්කාර අරමුණු කොට, පිහිට කොටගෙන විඥානය සකස්වීම මෙහි විස්තර කර ඇත. මේ පිලිබඳ යොදාගෙන ඇත්තේ **බීජ උපමාවය**: බුදුන් වහන්සේ බීජ වර්ග 5 ක් පෙන්වා ඇත: මූලබීජ, ස්කන්ධබීජ, පුරුක්බීජ, අග්‍රබීජ, බීජ බීජ (germ-seeds). මේ හැම බීජයක්ම, නොකැඩී, අව්වෙන් හෝ සුළඟින් විනාශනොවී, සාරය සහිතව, තෙතමනය ඇතිව පොළවේ වගාකරන්නේ නම්, ඒවා යහපත්ව වැඩේ. ප්‍රත්‍යසහිත කර්ම විඥානය, පංච බීජ වැනි යයි බුදුන් වහන්සේ පෙන්වා ඇත. රූප, වේදනා, සංඥා,සංස්කාර අරමුණු කොට, පිහිට කොට, තණ්හාවෙන් තෙත්වූ, කර්ම විඥානය, වැඩි විපුල බවට පත්වේ. රූප, වේදනා, සංඥා,සංස්කාර නැතිව කර්ම විඥානයේ: ඒම, යැම, චුතිය, යලි උපත, වැඩීම, නැගීම හෝ පැතිරීම යන කරුණ විය නොහැකිය. ඒවායේ, ප්‍රහීණක් වේද, අරමුණු සිඳී යාමක් වේද, එවිට කර්ම විඥානයේ පිහිටීමක් නොවේ යයි බීජ උපමාව

අනුව, විඤ්ඤානය සකස්වීම විස්තර කර ඇත. **බලන්න:** උපග්‍රන්ථය:5. **මූලාශ්‍ර:** සංයු.නි: (3 ): ඛන්ධසංයුත්ත:1.2.1.2 බීජසූත්‍රය,පි.122, ESN: 22: Khanda samyutta: 54.2 Seeds, p.1038.

▲ **විඤ්ඤානය හා නාමරූප-** Consciousness & Name & Form: විඤ්ඤානය හා නාමරූප එකිනෙකට හේතු ප්‍රත්‍යවන සම්බන්ධතාවයක් ඇතිබව සූත්‍ර දේශනාවල පෙන්වා ඇත (**නාමරූප සහ විඤ්ඤාණෙන අඤ්ඤමඤ්ඤපච්චයතාය-** Relationship between Consciousness and Name & Form). පටිච්චසමුප්පාද ක්‍රියාවලියේ දී විඤ්ඤානය හේතු කොට නාමරූප ඇතිවේ යයි පෙන්වා ඇත. දීඝ.නි: මහා නිදාන සූත්‍රයේ දී විඤ්ඤානය හා නාමරූප අතර ඇති සම්බන්ධතාවය නිසා සසර පවතින අන්දම විස්තරකර ඇත.

▼ **විඤ්ඤාන හේතුකොට** නාමරූප ඇතිවේ, නාමරූප හේතුකොට විඤ්ඤාන ඇතිවේ: **1) විඤ්ඤාන ප්‍රත්‍යයෙන් නාමරූපය ඇතිවේ** යන්න මෙසේ දැන ගත යුතුවේ: විඤ්ඤානය, මව් කුසට බැස ගැනීමක් නැත්නම් (ප්‍රතිසන්ධි ලෙසින් පහළ නොවන්නේ නම්), නාමරූපය (කළලය ආදී ලෙසින්) මව් කුසේ පහළ නොවේ. එසේම, විඤ්ඤානය මව්කුසට බැස ඉන්පසු පහවී යන්නේ නම්, නාමරූපයට පරිපූර්ණ ස්කන්ධයක් ලෙසින් වැඩීමට අවස්ථාව නොමැත. ඉපදුන කුඩා දරුවෙක්ගේ විඤ්ඤානය සිඳී ගියේ නම් නාමරූපයට වැඩි,දියුණුවීමට නොහැකිවේ. එලෙස විඤ්ඤානය, නාමරූපයට හේතුවේ, නිදානයවේ, සමුදයවේ, ප්‍රත්‍ය වේ.

**"තස්මාතිහානන්ද එසෙව හෙතු එතං නිදානං එස සමුදයො එස පච්චයො නාමරූපස්ස යදිදං විඤ්ඤාණං"**

**2) නාමරූප ප්‍රත්‍යයෙන් විඤ්ඤානය ඇතිවේ** යන්න මෙසේ දැන ගත යුතුවේ: විඤ්ඤානයට, නාම රූපයේ පිහිට නො ලැබෙන්නේ නම්, මතු ජාති ජරා මරණ ආදීවූ දුක රැසේ හටගැනීමක් නොවේ. එමනිසා, නාමරූප, විඤ්ඤානයට හේතුවේ, නිදානයවේ, සමුදයවේ ප්‍රත්‍යවේ. **3)** නාමරූපය හා විඤ්ඤානය එකිනෙකට හේතු ප්‍රත්‍ය භාවයෙන් ඇති සම්බන්ධය අනුව භවය පැනවීම වේ යයි බුදුන් වහන්සේ වදාළහ:

" ආනන්ද, විඤ්ඤානය නාමරූපයට ප්‍රත්‍යය වීම, නාමරූප විඤ්ඤානයට ප්‍රත්‍යය වීම යන මෙපමණකින්ම ඉපදීම හෝ දිරායාම හෝ මියයාම හෝ චුතවීම හෝ යළි උපත ලැබීම හෝ වෙයි. මෙපමණකින්ම අධිවචන ව්‍යවහාරයට (සිරිවර්ධන ආදීවූ නාම මාත්‍ර ව්‍යවහාරය) හේතුවේ. මෙපමණකින්ම ඒ ඒ අර්ථ ප්‍රකාශ කරන වචනයන්ට හේතුවේ, මෙපමණකින්ම ඒ ඒ අදහස් හඟවන නම්වලට හේතුවේ. මෙපමණකින්ම ප්‍රඥාවෙන් දත යුතුවේ. මෙපමණකින්ම සංසාර චක්‍රය පවතී. මෙපමණකින්ම විඤ්ඤාන සහිතවූ නාම රූප යන මේ කරුණු දෙක මේ භවය පැනවීම පිණිස පවතී:

**"එත්තාවතා ඛො ආනන්ද ජායෙථ වා ජීයෙථ වා මීයෙථ වා චවෙථ වා උපපජ්ජෙථ වා, එත්තාවතා අධිවචනපථො, එත්තාවතා නිරුත්තිපථො, එත්තාවතා විඤ්ඤත්තිපථො, එත්තාවතා පඤ්ඤාවචරං එත්තාවතා වට්ටං වත්තති, (එත්තාවතා) ඉත්ථත්තං පඤ්ඤාපනාය, යදිදං නාමරූප සහ විඤ්ඤාණෙන අඤ්ඤමඤ්ඤපච්චයතාය පවත්තති"**

( Thus far then... we can trace birth and decay, death and falling into other states and being reborn, thus far extends the way of designation, of concepts, thus far is the sphere of understanding, thus far the round goes as far as can be discerned in this life, namely to mind-and-body together with consciousness). **මූලාශ්‍ර:** දීඝ.නි: ( 2 ): 2 මහානිදාන සූත්‍රය, ඡෙද: 21-22, පි. 95, EDN:15: Mahānidāna Sutta: The Great Discourse on Origination, p. 166.

▼**සංයෝජන ධර්මයන් නිතර ආස්වාදය** කරණ පුද්ගලයා, විඥානයට බැස ගනී, ඒ නිසා නාමරූප ඇතිවේ... දුක් රැසේ ඇතිවීම හටගනී. මේ පිලිබඳ යොදාගත් **උපමාව-මහාරුක**: යම්කිසි මහා රුකක් ඇතිවිට එහි යට ඇති මුල්ද, හරස්ව ඇති මුල්ද, ගසට අවශ්‍ය පෝෂණය ගෙනදේ. එමනිසා ඒ රුක බොහෝකලක් පවතී. එලෙස, නාම රූප හා විඥානය සිතේ බැසගැනීම නිසා දිගුකලක් දුක් විඳිමින් සසරේ සැරි සැරීමට සිදුවේ. **බලන්න**: නාමරූප, උපග්‍රන්ථය:5 **මූලාශ්‍රය:** සංයු.නි: (2): නිදානවග්ග: අභිසමයසංයුත්ත:1.6.9 විඥාණ සූත්‍රය, පි. 164.

▼**සය විඥානය** (චක්ඛු ආදී) පිලිබඳ සිතේ ඇතිවන ඡන්දරාගය, කෙලෙස් ඇතිවීමට මූලිකවේ. **මූලාශ්‍රය:** සංයු.නි: (3 ):ඛන්ධවග්ග: කෙලෙස සංයුත්ත : 6.1.3 විඥාණ සූත්‍රය, පි.436.

▲**විඥාන ස්ථාන:** පාලි: **විඤ්ඤාණට්ඨිති** - stations of consciousness: විඥාන ස්ථාන- විඥානස්ථිති ලෙසින් පෙන්වා ඇත්තේ යළි උපතට හේතුවන විඥාණය (ප්‍රතිසන්ධි විඥාණය) පිහිටන තැන් 7ක් හා ආයතන-ක්ෂේත්‍ර 2 ය.(**ළු ආයතනානි**). **සටහන**: These are the ‘places’ or ‘states’ in which conscious rebirth takes place. **බලන්න**: EDN: Notes: 352, 353, p. 426.

▼ **විඥාන ස්ථාන 7 හා ආයතන 2**: විඥානය පිහිටන ස්ථාන සප්ත විඥාන ස්ථාන හා ආයතන 2 (සත්ත විඤ්ඤාණට්ඨිති): **1) කයෙන් හා සංඥාවෙන් වෙනස්කම්** (කාය නානත්වය හා සංඥා නානත්වය) ඇති සත්ත්‍වයන් සිටින ස්ථාන: එනම්, මිනිසුන්, ඇතැම් දෙවියන් හා ඇතැම් ප්‍රේතයන් සිටින ස්ථාන. **සටහන:** අටුවාවට අනුව: මිනිසුන් ගේ ශරීර එකිනෙකාට වෙනස්ය (නානත්තකායා-different in body), එකම කාය ස්වරූපය ඇති මිනිසුන් දෙදෙනෙකු නැත. එමනිසා ඔවුන් කාය නානත්වය කොටසට වැටේ. ඔවුන්ගේ සංඥා ද විවිධය (නානත්තසඤ්ඤිනො - different in perception). ඔවුන්ගේ ප්‍රතිසන්ධි සංඥාව- යළි උපතට හේතුවන සංඥාව - rebirth perception විවිධය. ඇතැම් දෙවියන් ලෙසින් පෙන්වා ඇත්තේ: කාමාවචර දේවලෝක 6 වසන දෙවියෝය. ඇතැම් ප්‍රේත යනු: දුගතියෙන් පිටත සිටින සමහර යක්ෂයන් හා භූතයන්ය. **බලන්න**: EAN: Note: 1503, p. 654. **2) කයෙන් විවිධවූ, සංඥා වෙන් සමාන** සත්ත්‍වයන් සිටින ස්ථාන. එනම්, ප්‍රථම ඡානයෙන් උපන් බ්‍රහ්මකායික දෙවියන් වසන බ්‍රහ්මලෝක: බ්‍රහ්ම පරිසජ්ජා, බ්‍රහ්ම පුරෝහිත, මහා බ්‍රහ්ම ආදීවූ. **සටහන :** අටුවාවට අනුව: එම බ්‍රහ්ම දෙවිවරුන්ගේ කයේ වෙනස්කම් ඇත, එහෙත්, ඔවුන්ගේ සංඥාව සමානය. එයට හෙතුව ඔවුන් සැමදෙනාටම ප්‍රථම ඡාන සංඥාව තිබීමය. සතර දුගතියේ සිටින සත්ත්‍වයන් ද මේ ගණයට වැටේ (ප්‍රේත, තිරිසන්, අසුර, නිරය) ඔවුන් කයෙන් වෙනස්ය, එහෙත් සංඥාව සමානය: යළි

උපතට හේතුවුවේ අකුසල සංඥාවය. **බලන්න:** EAN: Note:1504, p. 654. **3) සමාන කාය** ඇති සංඥාව වෙනස් ඇති සත්ත්වයන් සිටින ස්ථාන. එනම් දෙවෙනි ජානයෙන් උපන් ආභස්සර දෙවියන් වසන ස්ථාන. **සටහන:** අටුවාවට අනුව: ආභස්සර දේවලොක තුනේ දෙවියන්ගේ කාය ස්වරූප සමානය එහෙත් සංඥා වෙනස්ය: සමහර දෙවියන් සිතුවිලි රහිතය නමුත් විචාර කිරීම ඇත (අවිතක්ක-විචාර), තවත් දෙවිවරු සිතුවිලි හා විචාර නොමැත (අවිතක්ක-අවිචාර). **බලන්න**: EAN: Note 1505, p. 654. **4) කයෙන් හා සංඥාවෙන් සමාන** සත්ත්වයන් සිටින ස්ථාන. එනම්: සුභකිණ්ණ දේවලෝකය. **සටහන:** අටුවවට අනුව: මේ දෙවිවරුන්ගේ කාය ස්වරූප සමානය. සතරවෙනි ජානය ඇති නිසා සමාන සංඥාව ඇත. **බලන්න:** EAN: Note: 1506, p. 654. **5) ආකසානාඤ්චායතන අරූප බ්‍රහ්මලෝකයේ** වසන දෙවියෝ. **6) විඤ්ඤාණඤ්චායතන අරූප බ්‍රහ්මලෝකයේ** වසන දෙවියෝ. **7) ආකිඤ්චඤ්ඤායතන අරූප බ්‍රහ්මලෝකයේ** වසන දෙවියෝ. **ආයතයන දෙක: 1) අසංඥසත්වායතනය 2) නෙවසංඥා නා සංඥා ආයතනය. සටහන:** විඥානය පිහිටන ස්ථාන 7 හා ආයතන 2 පිළිබඳ: ඇතිවීම, නැතිවීම, ආස්වාදය, ආදීනවය හා නිස්සරණය පිලිබඳ යථා අවබෝධය ලබා උපාදාන රහිතව මිදුන භික්ෂුව, **ප්‍රඥා විමුක්තය. මූලාශ්‍ර**: අං.ගු.නි: (4 ): 7 නිපාත: 7.1.5.1 විඥානස්ථිති සූත්‍රය, පි. 362, EAN: 7: 44.1 Stations, p.380, දීඝ:නි: (2): 2 මහානිදාන සූත්‍රය: 40-41 ඡෙද, පි. 118, EDN: 15 Mahānidāna Sutta: The Great Discourse on Origination, para. 33, p. 169.

▼ **සප්ත විඥානසථිතියෙන් මිදීම දුකින් මිදීමය**: විඥානය පිහිටන ස්ථාන හත පිලිබඳ යහපත් අවබෝධය ඇතිව ඒවා ගැන කළකිරී, නොඇලී, මිදී සිටීමෙන් දුක කෙළෙවර කරගැනීමට හැකියාව ලැබේ. **මූලාශ්‍ර**:අං.ගු.නි: (6):10 නිපාත: 10.1.3.7. ප්‍රථම මහාපඤ්හ සූත්‍රය,පි. 116 , EAN:10: 27.7 Great Questions -1, p. 503.

▼ **විඥානය පිහිටන ස්ථාන** හත පිලිබඳව දන්නේනම්, ඒවායේ ඇතිවීම, නැතිවීම, ආස්වාදය, ආදීනව, නිස්සරණය දන්නේනම්, එසේ දකින පුද්ගලයා ඒවා අභිනන්දනය කිරීම (මමය, මාගේ ය යන ලෙසින් අලවා ගැනීම) සුදුසු නොවේ යයි බුදුන් වහන්සේ වදාළහ. යම් කලක, කෙනෙක් එම කරුණු පිලිබඳ යථා අවබෝධය ලබා උපාදාන රහිතව මිදුනේ නම් ඔහු ප්‍රඥාවිමුක්තය (ප්‍රඥා බලයෙන් නාම රූප කයින් මිදීම) ලබාගත් උතුමෙකි. **බලන්න**: ප්‍රඥාවිමුක්ත.

**වඩ**

▲**වඩුවා උපමාව-** Simile of the carpenter: **බලන්න:** උප ග්‍රන්ථය:5.

▲ **වැඩිහිටි සංඝයා-** Elderly Sangha: වැඩිහිටි සංඝයා යනු තෙර- ථෙර, තේරී- ථෙරි , වසර 10කට වැඩිකලක් සසුනේ යහපත් ලෙසින් හැසිරෙන ජේෂ්ඨ භික්ෂු, භික්ෂුණියන්ය. මෙහි වැඩිහිටි භික්ෂුන් ගේ උතුම් ගුණ පෙන්වා ඇත. ධම්මවිනයේ වර්ධනය පිණිස, වැඩිහිටි සංඝයාට ගරුකළයුතුය, දහම් කරුණු අසා පැහැදිලි කරගත යුතුය යි බුදුන් වහන්සේ අනුසාසනා වදාළහ.

**බලන්න**: ම.නි: (1 ) 1.4.3 මහා ගෝපාලක සූත්‍රය, පි.546. **මූලාශ්‍ර**: අංගු.නි: (6 )10 නිපාත, උපාලි වග්ග: 10.2.5.8. ථෙර සූත්‍රය,පි.388, EAN:10: V,98.8. Elder. P. 538.

▲ **වැඩිහිටිබව හා තරුණබව: පාලි: වුද්ධභූමි, දහරභූමි-**stage of an elder & a youth: වහාරයේ වැඩිහිටි යනු වයසින් වැඩිමහල්අයය, තරුණ යනු වයසින් බාල යොවුන් අයය. ධර්මයට අනුව වැඩිහිටිබව හා තරුණබව නිර්ණය කරන්නේ වයසින් නොව, දහම් නුවණ මෝරා ඇති අන්දම අනුවය. වයසින් වැඩිහිටි වුවද නුවණ මද නම් ඔහු බාලයෙකි. තරුණ වුවත්, නුවණ මුහුකුරා ඇත්නම් ඔහු වැඩිහිටියෙකි. **බලන්න**: දහර

▼ **බුදුන් වහන්සේ** වැඩිහිටිබව හා තරුණබව ගැන පැවසීම, මහා කච්චායන තෙරුන් පෙන්වා අත:

"...භාග්‍යවත් වූ, සියලු දතයුතු දේ දන්නාවූ, සියලු දැකිය යුතු දේ දක්නාවූ, ඒ සම්මා සම්බුදුරජාණන් වහන්සේ විසින් වදාරන ලද **වුද්ධභූමියක්** හා **දහරභූමියක්** ඇත. ඉදින්, උපතින් වයස 80- 100ක් ඇති කෙනෙක් සිටි, ඔහු වස්තුකාම කෙලෙස්කාමයෙන් ඇලී ගැලී ඒවා ඉවසමින්, ඒවා ගැන සිතමින්, ඒවා ගැන උනන්දුවී ජීවත්වේ නම් ඔහු බාල වැඩිහිටියෙකි. එහෙත්, වයසින් බාල, කළුකෙස් ඇති තරුණ කෙනෙක් සිටි, ඔහු වස්තුකාම කෙලෙස්කාමයෙන් ඇලි ගැලී ඒවා ඉවසමින්, ඒවා ගැන සිතමින්, ඒවා ගැන උනන්දුවී ජීවත් නොවේ. ඔහු නුවණැති වැඩිහිටිකි". **සටහන්**: මේ ප්‍රකාශය බුදුන් වහන්සේ, බ්‍රහ්මණයන්හට වදාලහ. **බලන්න**: අංගු.නි: (2 ): 4 නිපාත: 4.1.3.2 උරුවෙල සූත්‍රය-2 , පි. 66,EAN: 4: 22.2 Uruwela-2, p. 155. **මූලාශ්‍ර:** අංගු:නි: (1 ):2 නිපාත: 2.1.4.7 සූත්‍රය: පි.169, EAN: 2 : 38.7 Sutta, p.62.

▼ **වේරඤ්ජ නම් බ්‍රාහ්මණයෙක්,** බුදුන් වහන්සේ හමුවට පැමිණ පවසා සිටියේ: උන්වහන්සේ වැඩිහිටියන්ට ගෞරව නොකරන බවය. ඒ ගැන බුදුන් වහන්සේ මෙසේ පිළිතුරු වදාළහ:

**"බ්‍රාහ්මණය, මේ ලොවේ, දෙවියන්, මරුන්, බ්‍රහ්මයන් අතර, මේ මිනිස් ප්‍රජාව තුල, මාවිසින් වැඳ නමස්කාර කිරීමට සුදුසු, මගේ අසුනින් නැගිට පිළිගැනීමට හෝ ඒ අසුන දීමට සුදුසු කිසිවෙක් මම නොදකිමි. යම්ලෙසකින් තථාගතයන් කෙනකුට වැඳ නමස්කාර කිරීම ආදිය... කරන්නේනම්, ඒ පුද්ගලයාගේ හිස පැලී යනු ඇත".** **සටහන:** දේශනාව අවසානයේදී වේරඤ්ජ බ්‍රාහ්මණයා බුදුන්සරණගියහ. **මූලාශ්‍ර:** අංගු.නි: (5): 8 නිපාත:8.1.2.1 වේරඤ්ජසූත්‍රය,පි.61,EAN:8:11.1Verañjā, p.416.

වට

▲ **වට්ටමූලක තණ්හාව -** Vattamulaka thnaha: මේ තණ්හාව නිසා සසර ගමන- සසරවටයේ සැරිසැරීම ඇතිවේ. **බලන්න:** තණ්හාව.

▲ **වට්ට සුඛ හා විවට්ට සුඛ**- Vatta sukha & Vivatta sukaha; වට්ට සුඛය- සාසව සුඛය ලෙසින් පෙන්වා ඇත්තේ සමාන්‍ය ලෝකයා ආසව ආදීයට යටවී ඒවා සැපය යි ගැනීමය (සංසාර සුඛය). වීවට්ට සුඛය- අනාසවසුඛය- ආසාව රහිත සුඛය, කෙළෙස් බැහැර කිරීම නිසා ආරියන්

විඳින සුවයය. **බලන්න**: සුඛ. **මූලාශ්‍රය**: අංගු.නි: (1): 2 නිපාත: සුඛවග්ග සූත්‍ර, පි.192.

▲**වට්ටගාමි සුඛ හා විවට්ටගාමි සුඛ**- Vattagami sukha & Vivatta gami sukaha: වට්ටගාමි සුඛ- සාමිස සුඛය, කම්සැප විඳීමය. විවට්ටගාමි සුඛය - නිරාමිෂ සුඛය, ලෝකෝත්තර සුවයය. **බලන්න**: සුඛ. **මූලාශ්‍රය**: අංගු.නි: (1): 2 නිපාත: සුඛවග්ග සූත්‍ර, පි.192.

▲ **වුට්ඨානකුසලය-**Vutthanakusala: වුට්ඨානකුසලය යනු ඣාන සමාපත්තියෙන් නැගීසිටීම පිලිබඳ දක්ෂ බවය. **මූලාශ්‍රය**: සංයු.නි: (3): ඛන්ධකවග්ග: ඣානසංයුත්ත:13.1.3 වුට්ඨානකුසල සූත්‍රය, පි.568.

**වත**

▲ **වත්ථු-**support: වත්ථු (වත්‍ථු) ලෙසින් පෙන්වා ඇත්තේ උපකාරය, පිහිට, සහයෝගයය. දෙවියෙක් විසින් විමසනු ලදුව, බුදුන් වහන්සේ ලෝකයාට ඇති උපකාර මෙසේ පෙන්වා ඇත: පුත්‍රයෝ මිනිසුන්ට පිහිටය, ස්වාමියාට, බිරිය උතුම් යහළුවා ලෙසින් පිහිටවේ, පොළව ඇසුරුකරගෙන ජීවත්වන සත්ත්‍වයන්ට පිහිට වැස්සය. **මූලාශ්‍රය**:සංයු.නි: (1) සගාථවග්ග: දේවතා සංයුත්ත: 1.6.4 වත්‍ථු සූත්‍රය, පි.92.

▲ **වත්ථුනානත්ත ඤාණය-** Vaththunanaththa nana: ආධ්‍යාත්මික ධර්මතා: සළායතන, පිරිසිඳව අවබෝධ කරගැනීමය. **මූලාශ්‍රය**: ඛු.නි: පටිසම්භිදා 1: 15 වත්ථුනානත්ත ඤාණය, පි.164.

▲ **විතක්ක:** පාලි: **විතක්කො-** thoughts: විතක්ක (විතර්ක) යනු සලායතන වලින් අල්වාගත් බාහිර අරමුණු පිලිබඳ සිතෙන් විමසා බැලීමය. ධර්මයට අනුව කුසල හා අකුසල යයි විතර්ක වර්ග 2කි. කාම, ව්‍යාපාද හා විහිංසා විතර්ක අකුසලය. ඒවා ප්‍රහීණය පිණිස කුසල විතක්ක: නෙක්කම්ම, අව්‍යාපාද හා අවිහිංසා විතර්ක වැඩිය යුතුය. **මූලාශ්‍රය:** අංගු.නි: (4) 6 නිපාත: 6.1.5 සූත්‍රය, පි.280.

▼ **තථාගතයන් වහන්සේට ඇති විතක්ක:** තථාගතයන්හට බහුලව පවතින විතක්ක 2 කි: 1) **ක්ෂේම විතක්ක**: අවිහිංසාවහි ඇලුන, එහි නිරතවූ තථාගතයන් මෙසේ සිතති: " මම මේ ක්‍රියාවෙන්, තස නම්වූ (තණ්හාව ප්‍රහීණ නොකළ) හෝ ථාවර නම්වූ (තණ්හාව ප්‍රහීණ කළ) හෝ කිසිවෙකු නො පෙළෙමි". 2) **ප්‍රවිවේක විතක්ක**: උතුම් විවේකයෙහි ඇලුනාවූ, එහි නිරතවූ තථාගතයන් මෙසේ සිතති: " යමක් අකුසල වේද එය ප්‍රහීණය (කරඇත) '**. මූලාශ්‍රය:**ඛු.නි: ඉතිවුත්තක: 2.2.1 විතක්ක සූත්‍රය, පි.388.

▼ **කුසල විතර්ක හා අකුසල**: සය ඉන්ද්‍රියට ගැටෙන බාහිර අරමුණු පිලිබඳව පහළ කරණ සිතිවිලි විතර්කවේ. මේවා සංකප්ප (motivation) ලෙසින්ද ධර්මයේ පෙන්වා ඇත. **කුසල විතක්ක** (wholesome thoughts) 3 කි: නෙක්කම්ම විතර්ක- thought of renunciation, අව්‍යාපාද විතර්ක - thought of good will හා අවිහිංසා විතර්ක- thought of harmlessness. නෙක්කම්ම සංකප්ප, අව්‍යාපාද සංකප්ප හා අවිහිංසා සංකප්ප මේ කොටසට වැටේ.

**අකුසල විතර්ක** 3 කි: කාම විතර්ක- Sensual perception, ව්‍යාපාද විතර්ක- perception of ill will, වීහිංසා විතර්ක- perception of harming. කාම සංකප්ප, ව්‍යාපාද සංකප්හා වීහිංසා සංකප්ප මේ ගනයට වැටේ. **මූලාශ්‍ර**:දිඝ.නි: (3 ): 10 සංගිති සූත්‍රය- ඡෙදය 10 , පි. 378 , EDN: 33 Sangīti Sutta: The Chanting Together-section 10 , p. 365.

▼**අකුසල විතක්ක බඹබසර ජීවිතයට බාධාවකි**: කාම, ව්‍යාපාද හා විහිංසා විතක්ක බඹසර ජීවිතයට වැඩදායක නොවනබව බුදුන් වහන්සේ පෙන්වා ඇත. එම විතක්ක කළකිරිම, විරාගය, නිරෝධය...නිවන පිණිස නොපවතී. වැඩදායක විතර්ක නම්: චතුසත්‍ය පිලිබඳ සිතිවිලි ඇතිකරගැනීම හා විමසා බැලීමය යි මෙහි පෙන්වා ඇත. **මූලාශ්‍ර:** සංයු.නි: (5-2):මහාවග්ග: සච්චසංයුත්ත: විතක්ක සූත්‍රය, පි.284, ESN: 56: Sacchasamyutta: 7.7 Thoughts, p. 2271.

▼ **විතර්ක පහ කරගැනීම**: කාම විතර්ක පහ කර ගැනීම පිණිස නෙක්කම්ම විතර්ක ඇතිකර ගතයුතුය. ව්‍යාපාද විතර්ක පහ කර ගැනීම පිණිස අව්‍යාපාද විතර්ක ඇතිකර ගතයුතුය. විහිංසා විතර්ක පහ කර ගැනීම පිණිස, අවිහිංසා විතර්ක ඇතිකර ගතයුතුය. **මූලාශ්‍ර:** අංගු.නි:(4 ): 6 නිපාත: විතක්ක සූත්‍රය, පි.279, EAN: 4:109.3 Thoughts, p.364.

▼ **විතක්ක පහකිරීමේ ක්‍රමවේදය**: භාවනාවේ යෙදී සිටින විට ඇතිවිය හැකි අකුසල විතක්ක පහ කර ගැනීම පිණිස යොදාගත යුතු ක්‍රම වේදය බුදුන් වහන්සේ මේ සූත්‍රයේදී විස්තරාත්මකව පෙන්වා ඇත. **මූලාශ්‍ර**:ම.නි: (1): 1.2.10 විතක්කසන්තාන සූත්‍රය, පි. 320, EMN:20: The removal of distracting thoughts, p. 205.

▼ **විතක්ක බහුල පුද්ගලයා**: විතක්ක බහුල පුද්ගලයා ලෙසින් පෙන්වා ඇත්තේ ධර්ම පරියාපත්තිය ඉගෙන ඒවා පිලිබඳ අනුවිතක්ක, විචාර කරමින් දවස ගෙවන එහෙත් සමාධිය වඩා නොගන්නා පුද්ගලයාය. ඔහු ධම්ම විහාරි නොවේ. **බලන්න:** ධම්ම විහාරි. **මූලාශ්‍ර:** අංගු.නි: (3): 5 නිපාත: අනාගතභය වග්ග: 5.2.3.3 හා 5.2.3.4 සූත්‍ර, පි.160.

▲ **විත්ථාරේන ධම්ම දේශනා** -Dhamma discourse in detail: විත්ථාරේන යනු විස්තරාත්මකව ධර්මය දේශනා කිරීමය. මෙය තථාගතයන් ධර්මය දේශනා කරණ එක් පිළිවෙතකි. **බලන්න**:තථාගතයන්වහන්සේ. **මූලාශ්‍ර:** අංගු.නි: (1): 2 නිපාත: 2.1.2.4 සූත්‍රය, පි. 144, EAN: 2: 14.4 Sutta, p. 58.

▲ **වේතරණි නරකය-** Hell of caustic water: වේතරණි නරකය යනු ගිනිගත් ගංගාව (වේතරණිය ගංගාව) ඇති නිරයය. දුගතියකි.

**වද**

▲ **වාද විවාද-** පාලි: **විග්‍ගාහිකකථං** -Disputatious Talks: තමන් ගේ මතය, පිළිගැනීම ගැන වෙනත් අය විරුද්ධ විමනිසා ඇතිවන කතාබහ වාද විවාද වලට මුලිකවේ. ධර්මයට පටහැණි කථා වාදවිවාද ඇතිකරන නිසා ඒවායෙන් වැලකීම සුදුසුය යි බුදුන් වහන්සේ පෙන්වා ඇත. **බලන්න**: විග්ගාහිකකථා, විවාද.

▼ **වාදවිවාද බඹසර ජීවිතයට බාධාවකි**

ධර්ම මාර්ගයේ හැසිරෙන විට වාදවිවාද ඇතිකරන දේ කථා නොකර සිටිය යුතුය යි බුදුන් වහන්සේ වදාළහ. වාදවිවාද කතාවන් මාර්ගය වලක්වයි. එහෙයින්, ඒවා අත්හැර සම්බෝධියට උපකාරීවන ධර්ම කථා- දුක හා දුකින් මිදීම ආදිය ගැන පමණක් කථා කළයුතුවේ. **බලන්න**: කථාව. **සටහන්:** * මේ සූත්‍රයේ වාදයන්ට මුල්වන හේතු විස්තරාත්මකව පෙන්වා ඇත. ** යම් දිට්ඨි හේතුකොටගෙන ඇතිකරගන්නා වාද විවාද නිසා ඇතිවෙන හානිගැන **බලන්න**: ඛු.නි: සුත්තනිපාත:අට්ඨක වග්ග: 4-8 පසුරසූත්‍රය. **මූලාශ්‍ර:** :සංයු.නි: (5-2 ) : මහාවග්ග:සච්චසංයුත්ත: 1.9 වීග්ගාහිකකථා සූත්‍රය, පි. 290, ESN: 56: Sacchasamyutta 9.9 Disputations Talks, p. 2273.

▼ **වාදවිවාදයන්ට හේතු**: එක්සමයක, මහා කච්චාන තෙරුන්, වරණා ප්‍රදේශයේ, කද්දමදහ තීරයේ වැඩවසන සමයේ, ආරාමදණ්ඩ බ්‍රාහ්මණ, උන්වහන්සේ බැහැදැක මෙසේ විමසුහ: 1) මිනිසුන් (බ්‍රාහ්මණ, ක්‍ෂත්‍රිය හා ගෘහපතින්) එකිනෙකා හා වාදකිරීමට හේතු 2) ශ්‍රමණ බ්‍රාහ්මණයන් එකීනෙකා හා විවාද කිරීමට හේතු. මහාතෙරුන් මෙසේ වදාළහ:

1) “ කාමරාගයට ඇති ඇලීමනිසා, එයට බැඳී ඇති නිසා, එය තහවුරුකර ගෙන සිටින නිසා, එයින් සිත උමතුකර ගෙන සිටීම නිසා, එය තරයේ අල්වා ගෙන සිටින නිසා මිනිසුන් එකීනෙකා හා විවාද කරති”. **“කාමරාග විනිවෙස විනිබන්‍ධ පලිගෙධ පරියුට්ඨානජ්‍ඣොසානහෙතු… ගහපතිකාපි ගහපතිකෙහි විවදන්‍ති ති”** ( because of adherence to lust for sensual pleasures, bondage [to it], fixation [on it], obsession [by it], holding firmly [to it],that... house holders fight with householders.”

2) ශ්‍රමණ බ්‍රාහ්මණයන් එකීනෙකා හා විවාද කිරීමට හේතුව: “ දිට්ඨියට ඇති ඇලීමනිසා, එයට බැඳී ඇති නිසා, එය තහවුරුකර ගෙන සිටින නිසා, එයින් සිත උමතුකර ගෙන සිටීම නිසා, එය තරයේ අල්වා ගෙන සිටින නිසා ශ්‍රමණ බ්‍රාහ්මණයන් එකීනෙකා හා විවාද කරති”.. ඉන්පසුව ඔහු, ඒ කාමරාග බන්ධන, දිට්ඨි බන්ධනනොමැති කෙනෙක් ලෝකයේ සිටිද? යයි විමසුවිට තේරුන් මෙසේ වදාළහ: “භාග්‍යවතුන් වහන්සේ ඒ බන්ධන වලින් මිදී වාසය කරන්නේ ය” යි, මහා තෙරුන් බුදුන් වහන්සේගේ උතුම් ගුණ වදාළහ. **බලන්න**: බුදුගුණ. **සටහන්**: එම දේශනාව අවසානයේ ආරාමදණ්ඩ බ්‍රාහ්මණ බුදුන් සරණ ගියහ. **මූලාශ්‍ර:** අංගු: (1 ): 2 නිපාත: 2.4.16 සූත්‍රය, පි.166, EAN: 2: 37.6 Sutta, p.62.

▼ **බුදුන් වහන්සේ** විවාද ඇතිවීමට බලපාන හේතු 6 ක් පෙන්වා ඇත, මේවා අකුසලයන්ය.1) කිපෙන සුළුබව- බද්ධ වෛරය තිබීම-ක්‍රෝධය 2) ගුණමැකීම- මක්ඛය-යුගග්‍රාහ 3) ඉරිසියාව 4) කපටිබව- මායාව 5) ලාමක දිට්ඨි තිබීම (සම්මා දිට්ඨියට පටහැනි) 6) ස්වදිට්ඨියේ එල්ලී සිටීම (තමාගේ මතයේ). **මූලාශ්‍ර:** අංගු:නි: (4 ): 6 නිපාත: 6.1.4.6 විවාදමූල සූත්‍රය, පි. 110, EAN:6: 36.6 Disputes, p.332.

▲ **වෙදගු**- A Master of Knowledge: වෙදගු-විදිත්තා -විශාරද ගුරුවරයාය. ධර්මයේ වෙදගු බව ලැබීම පිණිස කෙනෙක් ධර්මතා 7 ක් කඩාබිඳ දැමීය යුතුබව බුදුන් වහන්සේ පෙන්වා ඇත: සක්කාය දිට්ඨිය, විචිකිච්ඡාව, සීලබ්බතපරාමාසය, රාගය, දෝෂය, මෝහය හා මානය: එනම්, රහතුන්ය.

**සටහන**: මෙය බුදුන් වහන්සේ හඳුන්වන පදයකි. **බලන්න**: බුද්ධ නාම. **මූලාශ්‍ර:** අංගු.නි: ( 4 ): 7 නිපාත: 7.2.4.6 වෙදගු ධම්ම සූත්‍රය, පි. 510, EAN:7: 90.6 A Master of Knowledge, p. 406.

▼ **සිත කෙලෙසන**, පුනර්භවය ඇතිකරවන, කයට සිතට දුක් විපාක ලබාදෙන, මතු කල ජාති ජරා මරණ දුක් ඇතිකරවන, සියලු ලාමක අකුසල් හැම අකුසල් හැම සන්සිඳවූ නිසා ඔහු 'වෙදගු' - ඥානය ලැබූ උතුමා- යයි හඳුන්වන බව මෙහි දක්වා ඇත. **මූලාශ්‍ර:** ම.නි: (1): 1.4.9 මහා අස්සපුර සූත්‍රය, පි.652,EMN: 39 Mahā-Assapura Sutta, p.342.

▲ **වේදනා-** feelings: ධර්මයට අනුව ස්පර්ශ ආයතන 6 නිසා දැනෙන විවිධ වූ විඳීම් වේදනාය. සියලු ධර්මතා වේදනාව සම්බන්ධ කොට ඇත:

**"වෙදනා සමොසරණ සබෙබ ධම්මා"**.

**සටහන්**: * විවිධ වේදනා ගැන **බලන්න**:බහුවේදනා. ** **වේදනාකාය සය** ලෙසින් පෙන්වා ඇත්තේ, සළායතන බාහිර අරමුණු ස්පර්ශ කිරීම නිසා හටගන්නා සය වේදනාවන්ටය. **බලන්න:** ඡ ඡක්ක ධම්මො. ** **කායික හා මානසික වේදනා**: කය හා සිත මුල්කරගෙන ඇතිවෙන දුක් වේදනය. **බලන්න**: දුක.

▼ **වේදනා පටිච්චසමුප්පාදයේ 7 නි පුරුකය.** සපර්ශය නිසා වේදනා හටගනී, සපර්ශය නිරෝධ වීමෙන් වේදනා නිරෝධවේ:

**"...ඵස්සපච්චයා වෙදනා...""...ඵස්ස නිරොධා වෙදනා නිරොධො..."**

වේදනා නිරෝධ වීමෙන් තණ්හාව නිරෝධ වේ. **වේදනා සයකි**: 1) ඇසේ ස්පර්ශය නිසා 2) කණේ ස්පර්ශය නිසා 3) නාසයේ ස්පර්ශය නිසා 4) දිවේ ස්පර්ශය නිසා 5) කයේ ස්පර්ශය නිසා 6) මනසේ ස්පර්ශය නිසා ඇතිවන වේදනා 6 ය. **මූලාශ්‍ර:** සංයු.නි: (2 ): නිදාන වගග :1.1.1 පටිච්චසමුප්පාද සූත්‍රය හා 1.1.2 විභඞග සූත්‍රය, පි.24, ESN:12: Nidanavagga: 1.1 Dependent Origination & 2.2 Analysis of Dependent Origination, p.610, ම.නි: (1): 1.1.9 සම්මාදිට්ඨි සූත්‍රය: පි.130, EMN: 9: Sammādiṭṭhi Sutta- Right View, p. 121.

▼ **හේතු ප්‍රත්‍ය මුල්කරගෙන වේදනා ඇතිවේ.**: සියලු වේදනා තමාවිසින් හෝ අන්‍යයන්විසින් හෝ දෙදෙනා එකතුව කළ දෙයක් නොවේ, ඒවා හේතුප්‍රත්‍ය ධර්මය නිසා ඇතිවීඇත, ඒ හේතු නැතිවීමෙන් නැතිවේ යයි මෙහි විස්තර කර ඇත. **මූලාශ්‍රය:**සංයු.නි: (2) නිදානවග්ග: අභිසමය සංයුත්ත: 1.2.8 තිම්බරුක සූත්‍රය, පි.58.

▼ **මූලික වේදනා 3 කි**: වේදනාවෙ වෙනස, විඳීමේ ආකාර අනුව පෙන්වා ඇත: එනම්: 1) සුව-සැප වේදනා, 2) දුක් වේදනා, 3) නොදුක්නොසුව වේදනා -මැදහත්. (Pleasant feeling, painful feeling, neither-painful nor- pleasant feeling) මේ තුන් වේදනා විඳිම පිරිසිඳ දැනීම පිණිස (full understanding) අරියඅටමග වැඩිය යුතුවේ.

**"... තිසොා ඉමා භික්ඛවෙ, වෙදනා:... සුඛා වෙදනා දුක්ඛා වෙදනා අදුක්ඛමසුඛා වෙදනා... තිස්සන්නං වෙදනානං පරිඤ්ඤාය අරියො අට්ඨඞ්ගිකො මග්ගො භාවෙතබ්බො"**

**සටහන්: ***අහසේ විවිධ සුළං හමා යන ලෙසින් කයේද විවිධ වේදනා ඇතිවේ. එම වේදනා ගැන යථා අවබෝධය ලබන, කෙලෙස් රහිත උතුමා නිවන ලබාගනී. **බලන්න:** සංයු.නි. (4) : වේදනා සංයුත්ත: 2.2.2 හා 2.2.3 ආකාශ සූත්‍රය. **මූලාශ්‍ර:** සං.නි : (5-1) මහාවග්ග: මග්ගසංයුත්ත: 1.3.9 වේදනා සූත්‍රය, පි. 63, ESN:45: Maggasamyutta: 29.9 Feeling, p. 1635, මග්ගසංයුත්ත: එසානවග්ග:1.15 සූත්‍ර. පි.158, සංයු.නි: (4): සළායතන වග්ග: 4.1.7 වේදනා සූත්‍රය, පි. 506, ESN: IV: 38: Jambukhādak asaṃyutta: 7 Feeling , p. 1402.

▼ **සියලු වේදනා දුක් සහිතය, අනිච්ච ස්වභාවයෙන් යුක්තය**: අභ්‍යන්තර හෝ වේවා බාහිර හෝ වේවා සියලු වේදනා නැසෙන සුලු බිඳෙන සුළු නිසා ඒවා දුක බව නුවණින් අවබෝධ කරන්නේනම් කිසිම වේදනාවකට නො ඇලී සිටිය හැකිබව බුදුන් වහන්සේ පෙන්වා ඇත. **මූලාශ්‍ර:** සං.නි: (4 ) සළායතනවග්ග: වේදනා සංයුත්ත:සගාථා වගග: 1.20.2 සුඛ සූත්‍රය, පි.416, ESN:36: Vedanāsamyutta, 2.2 Pleasure, p. 1332.

▼ **සියලු වේදනා** අවබෝධකිරීමට සතර සතිපට්ඨානය වැඩිය යුතුය. **මූලාශ්‍රය**:සංයු.නි:(5-1):මහාවග්ග:සතිපට්ඨානසංයුත්ත:3.5.9 වේදනා සූත්‍රය, පි.366.

▼**වේදනා හා ඒවා හටගන්නා ආකාරය** සම්‍යක් ප්‍රඥාවෙන් අවබෝධ කරගන්නා, බුද්ධ ශ්‍රාවකයා, ඒ වේදනා යම් තැනක නිරුද්ධ වේ නම් ඒ නිවන බව දැන වේදනා ක්‍ෂය කර පිරිනිවන් ලබයි. **සටහන**: සැප වේදනාව වෙනස්වියන නිසා දුක බවද, දුක් වේදනාව පීඩාව ඇතිකරන නිසා උලක් ලෙසින්ද, මැදහත් වේදනාව අනිත්‍ය බවද දක්නා මහණ ආරියය, සම්මා දර්ශනය ලබා ඇත, දුක කෙළවර කරඇත යයි මෙහි පෙන්වා ඇත. **මූලාශ්‍රය**: බු.නි: ඉතිවුත්තක: 3.1.3 හා 3.1.4 වේදනා සූත්‍ර, පි.408

▼ **වේදනා 3 පිළිබඳව බුදුන් වහන්සේ දේශනා කිරීමට හේතුවූ කරුණු**: වේදනා 3 නිසා දුක ඇතිවේ: එමගින් සංඛාරයන්හි: අනිත්‍ය බව, ක්‍ෂය වන බව, වයබව- නැතිවීයාම, විරාගබව, නිරෝධ බව, විපරිණාම බව අවබෝධ කර ගත හැකිවේ. **මූලාශ්‍රය**: සංයු.නි: (4): සළායතනවග්ග:වේදනාසංයුත්ත: රහොගතවග්ග: 2.2.1 රහොගත සූත්‍රය, පි. 438.

▼ **සියලු වේදනා ක්‍ෂය කරගැනීමෙන් නිවන සාක්ෂාත්වේ**: සමාධිගතවූ, නුවණැති, බුද්ධ ශ්‍රාවකයා වේදනා තුනේ ඇතිවීම හා නැතිවීම ද වේදනා නැසීමට යන මගද මැනවින් දැන ඒ වේදනා ක්‍ෂය වීමෙන් තණ්හාව ප්‍රහීනව උතුම් නිවන ලබන බව බුදුන් වහන්සේ වදාළහ. **මූලාශ්‍ර:** සං.නි: (4 ): සළායතනවග්ග: වේදනා සංයුත්ත:සගාථා වගග: 1.20.1 සමාධි සූත්‍රය, පි.416, ESN: 36: Vedanāsamyutta, 1.1 Concentration, p. 1330.

▼ **සළායතන බාහිර ඉන්ද්‍රියන්** හා ගැටීමෙන් ඇතිවන චක්ඛුසම්ඵස්ස ආදිය නිසා හටගන්නා වේදනා අනිත්‍ය බව දැනගැනීම, කළකිරීම පිණිස වේ, සම්බෝධිය පිණිසවේ.

**මූලාශ්‍ර:** සං.නි: (2): නිදානවග්ග: රාහුලසංයුත්ත:6.1.5 වේදනා සූත්‍රය, පි.400, සංයු.නි: (3): ඛන්ධවග්ග: ඔක්කන්තිසංයුත්ත: 4.1.5 වේදනා සූත්‍රය, පි.472.

▼ **සියලු වේදනා නිසා යම් ඉපදවීමක්**, පැවැත්මක් ඇතිවේනම් ඒ ජරා මරණයෙහි පහළවීමය. **මූලාශ්‍රය:** සංයු.නි: (3): ඛන්ධවග්ග: උප්පාද සංයුත්ත: 5.1.5 වේදනා සූත්‍රය, පි.480.

▼ **සියලු වේදනා නිසා යම්** ඡන්දරාගයක් ඇතිවේනම්, එමගින් සිත කෙලෙසේ. **මූලාශ්‍රය:** සංයු.නි: (3): ඛන්ධවග්ග: කිලෙසසංයුත්ත: 6.1.5 වේදනා සූත්‍රය, පි.488.

▼ **වේදනා පහකරගැනීමට ත්‍රිවිධ අනුසය ධර්මතා නැතිකරගත යුතුය:** වේදනා නැතිකරගැනීමේ පිළිවෙත බුදුන් වහන්සේ මෙසේ පෙන්වා ඇත: * රාගානුසය (underlying tendency to lust) නැතිවිට සුව වේදනා විඳීම පහවේ. * පටිඝානුසය (underlying tendency to aversion) නැතිවිට දුක් වේදනා විඳීම පහවේ. * අවිජ්ජානුසය (underlying tendency to ignorance) නැතිවිට නොදුක් නොසුව වේදනා විඳීම පහවේ. අනුසය පහවීමෙන් නිරානුසය වූ පුද්ගලයා තණ්හාව සිඳ දමා, සියලු සංයෝජන මුලින්ම ගලවා, මනා අවබෝධය ලබා දුක අවසන් කළ උතුමෙක්ය. **මූලාශ්‍ර:** සං.නි: (4 ): සළායතනවග්ග: වේදනා සංයුත්ත:සගාථා වග්ග: 1.20.3 පහාන සූත්‍රය, පි.416, ESN:36: Vedanāsamyutta, 3.3 Abandonment, p. 1333.

▼ **කායික දුක් වේදනා පාතාලය වැනිය:** කයේ ඇතිවන දුක්වේදනා, බුදුන් වහන්සේ **උපමා-පාතාලය:** කොට ඇත්තේ පාතාලය (bottomless abyss) ලෙසින්ය. පුහුදුන් මිනිසා (පෘතග්ජන- uninstructed world-ling) කායික වේදනා ඇතිවූවිට තදබල ලෙසින් ශෝකවී මුළාවට පත්වේ. ඔහුට දහම් අවබෝධය නොමැති නිසා ඒ දුක්වේදනා පාතාලයෙන් ගොඩවීම දුෂ්කරය. එහෙත්, දහම දත් ආරිය ශ්‍රාවකයා කායික වේදනා ඇතිවිට ශෝකනොවේ, මුලාවට පත්නොවේ. ඔහු පාතාලයෙන් එගොඩවී සිටි.**බලන්න:** උපග්‍රන්ථය:5. **මූලාශ්‍ර:** සං.නි: (4 ): සළායතනවග්ග: වේදනා සංයුත්ත:සගාථා වගග: 1.20.4 පාතාල සූත්‍රය, පි.418, ESN:36: Vedanāsamyutta, 4.4. The Bottomless Abyss, p. 1335.

▼**වේදනා පිලිබඳ නියම අවබෝධය ලබාගැනීමෙන් දුක නැතිකර ගත හැකිවේ:** බුදුන් වහන්සේ වදාළේ: 1) සුඛ වේදනාව ඇතිවූවිට එය දුකක් ලෙසින් දැකිය යුතුය (වෙන්ස්වියන නිසා). 2) දුක වේදනාව ඇතිවූවිට එය උලක්ඇනුන ලෙසින් දැකිය යුතුය 3) නොදුක්නොසුව-මැදහත් වේදනා අනිච්ච ලෙසින් දැකිය යුතුය. එලෙස ධර්මානුකූලව වේදනාවන්හි යථාබව අවබෝධ කරගත් පුද්ගලයා නියම දැකීම ලබාඇත (මැනවින් දැක තිබේ). ඔහු තණ්හාව සිඳ, සංයෝජන බිඳ, මානය සහමුලින්ම ප්‍රහීණය කර දුක අවසන්කරගත් උතුමෙකි. **මූලාශ්‍ර:** සං.නි: (4 ): සළායතනවග්ග: වේදනා සංයුත්ත:සගාථා වගග: 1.20.5 දට්ඨබ්බ සූත්‍රය, පි.419, ESN:36: Vedanāsamyutta, 5.5 Should be seen, p. 1335.

▼ **පුහුදුන් මිනිසා හා අරිය ශ්‍රාවකයා වේදනා විඳින්නේ වෙනස් අයුරින්ය** බුදුන් වහන්සේ මෙසේ වදාළහ:

පුහුදුන් මිනිසාට කායික දුක් වේදනා ඇතිවිට ඔහුට වේදනා දෙකක් ඇතිවේ: කායික දුක් වේදනා හා මානසික දුක් වේදනා. මෙහිදී යොදාගෙන ඇත්තේ **උල උපමාවය**: පළමු උල යනු කායික වේදනා ඇතිවීමය. දෙවන උල යනු කායික වේදනාව නිසා මනස වේදනාවට පත්වීමය. එලෙස දුක් වේදනා විඳින ඔහු ගේ සිතේ එම වේදනා කෙරේ තරහක් ඇතිවේ- පටිඝානුසය ඇතිවේ. ධර්මානුකූලව දුක් වේදනා වලින් මිදීමේ ක්‍රමය නොදන්නා ඔහු දුක්වේදනාවලින් මිදීමට සුඛ වේදනා (පස්කම් සැප ) සොයායයි. එවිට සිදුවන්නේ රාගානුසය ඇතිවීමය. වේදනාවල යථා ස්වභාවය නොදන්නා නිසා ඒවායේ ඇතිවීම (සමුදය- origin ), නැතිවීම (වය- passing away),ආස්වාදය (gratification) ආදීනවය (danger) හා නිදහස්වීම (escape) ඔහු දන්නේ නැත. කරුණු නොදන්නා නිසා අදුකම අසුඛම වේදනා ඇතිවූවිට අවිජ්ජානුසය ඇතිවේ. මෙලෙසින් ත්‍රිවිධ වේදනාවන්ට බැඳී යන ස්වභාවය ඇති පුහුදුන් මිනිසා උපතට, වයසට යාම, මරණයට පත්වීම ආදීවූ සියලු දුකට පත්වේ (යළි උපතක් ඇතිනිසා). අරිය ශ්‍රාවකයාට කායික වේදනා ඇතිවූ විට ඔහුගේ මනස වේදනාවට පත් නොවේ. ධර්මය දන්නා ඔහු දුක් වේදනා පිළිබඳව තරහක් ඇති නොකර ගනී, පටිඝානුසය ඇතිනොවේ. සුඛ වේදනා (කම්සුව) සොයා යන්නේ නැත.එයට හේතුව දුක් වේදනා වලින් මිදීමේ මග ඔහු දන්නා නිසාය. කාමසුව සොයා නොයන නිසා ඔහුට රාගානුසය ඇතිනොවේ. එම අවබෝධය ඇතිනිසා අදුකම අසුඛම වේදනා පිලිබඳ අවිජ්ජා අනුසය ඔහුට ඇතිනොවේ. වේදනාවල යථා ස්වභාවය දන්නා නිසා ඒවායේ ඇතිවීම, නැතිවීම ආස්වාදය, ආදීනවය හා නිදහස්වීම දන්නා ඔහු ත්‍රිවිධ වේදනාවලට නොබැඳේ. නොබැඳීම නිසා ඔහු ජාති ජරා මරණ ආදීවූ දුක් ගොඩෙන් නිදහස්වූ උතුමෙකි (යළි උපත අවසන් කර ඇත). **මූලාශ්‍ර:** සං.නි: (4 ): වේදනා සංයුත්ත:සගාථා වගග: 1.20.6 සල්ල සූත්‍රය, පි.420, ESN: 36: Vedanāsamyutta, 6.6 The dart, p. 1336

▼ **ත්‍රිවිධ වේදනා පහකරගැනීමේ ක්‍රමය:**: දහමට අනුව සති සම්ප්‍රජන්‍යය (සිහිය හා නුවණ) සහිතව, මනා දැනුම ඇතිව වාසය කරන පුද්ගලයාට (ආරිය ශ්‍රාවකයා) ත්‍රිවිධ වේදනා ඇතිවූවිට ඒ ඒ වේදනා තමාට ඇතිවූබව අවබෝධවේ. ඒ වේදනා ඇතිවීමට හේතුව තමාගේ කය නිසා බව ඔහු දනී. තමාගේ කය අනිච්ච ස්වභාවය ඇති, හේතු ප්‍රත්‍ය නිසා උපන් බව ඔහු සිහි කරයි. එසේ අනිච්චවූ කයක් නිසා ඇතිවෙන වේදනා නිත්‍ය නොවන බවත් ඒවා අනිත්‍ය- වෙස්වීමේ ස්වභාවය සහිත බව ඔහු නුවණින් විමසා අවබෝධකරගනී. මෙසේ කයේ අනිච්චබව, වේදනාවල ඇති අනිච්චබව ඔහු මෙනෙහි කරයි (භාවනා කරයි). එසේම, නැතිවීම (වය-vanishing) පිළිබඳව, විරාගය පිළිබඳව, නිරෝධය පිළිබඳව, පටිනිස්සගය - අතහැරීම (relinquishment) පිළිබඳව ඔහු මෙනෙහි කරයි. එසේ මෙනෙහි කරන ඔහුට කය හා දුක් වේදනා පිළිබඳ පටිඝානුසය, කය හා සුඛවේදනා පිලිබඳ රාගනුසය, කය හා අදුකම අසුඛම වේදනා පිලිබඳ අවිජ්ජනුසය පහවේ. යම් වේදනාවක් ඇතිවූවිට (ත්‍රිවිධ වේදනා) ඒ වේදනාව අනිච්චබව දනී, තමා එම වේදනාව අල්ලා නොගත්බව දනී, එම වේදනාවෙන් සතුටක් නැතයයි දනී. ඒවේදනාවලට නොබැඳුන බව දනී. ජීවිතය අවසන් වනවිට ඇතිවන වේදනාව විඳින බවඔහු දනී. එහිදී ඔහු මෙසේ අවබෝධය ලබයි: කය බිඳීමෙන්, ජීවිතය කෙළෙවර වීමෙන්, තමන් අල්ලා නොගත් සියලු විඳීම් මෙහිදීම සිසිල්ව යන්නේය.

**“…එවමෙව ඛො භික්ඛවෙ, භික්ඛු කායපරියන්තිකං වෙදනං වෙදියමානො කායපරියනන්තිකං වෙදනං වෙදියාමීති පජානාති, ජීවිතපරියන්තිකං වෙදනං වෙදියමානො ජීවිතපරියන්තිකං වෙදනං වෙදියාමීති පජානාති, කායස්ස භෙදා උද්ධං ජීවිතපරියාදානා ඉධෙව සබ්බවෙදයිතානි අනභි නන්දිතානි සීතීවිස්සන්තිති පජානාති”.**

**සටහන:** මේ පිලිබඳව යොදාගෙන ඇත්තේ **පහන උපමාවය**: පහනක්, තෙල් හා වැටිය නිසා දැල්වේ. තෙල් හා වැටිය අවසන්වීමෙන් පහන නිවියයි. එලෙස කය බිඳී ජීවිතය කෙළවර වනවිට නො අල්ලා ගත් සියලු වේදනා මෙතැනදීම සිසිල්ව යයි.( Just as, bhikkhus, an oil lamp burns in dependence on the oil and the wick, and with the exhaustion of the oil and the wick it is extinguished through lack of fuel, so too, bhikkhus, when a bhikkhu feels a feeling terminating with the body … terminating with life … He understands: ‘With the breakup of the body, following the exhaustion of life, all that is felt, not being delighted in, will become cool right here.’ **මූලාශ්‍ර:** සං.නි: (4 ): සළායතනවග්ග: වේදනා සංයුත්ත:සගාථා වගග: 1.20.7 ගිලන්හල සූත්‍රය, පි.424 , ESN: 36: Vedanāsamyutta, 7.7 The sick ward, p. 1339.

▼ **වේදනා ඇතිවීම හා සංසුන්වීම**: 1) මිථ්‍යා දිට්ඨිය ඇතුළු මිථ්‍යා අටමග නිසා ඇතිවන වේදනා ඇත. එසේම මිථ්‍යා අටමග පහවීමෙන් ලබන වේදනා ද ඇත (මිථ්‍යා අටමග පහවීමෙන් ඇතිවෙන වේදනා යනු ආරිය අටමග අනුගමනය කිරීමය) 2) සම්මා දිට්ඨිය ඇතුළු ආරිය අටමග නිසා ඇතිවන වේදනා ඇත. එසේම ආරිය අටමග පහවීමෙන් ලබන වේදනා ද ඇත 3) ආශාව-ඡන්දය (desire) නිසා ඇතිවන වේදනා ඇත එසේම ආශාව පහවීමෙන් ලබන වේදනා ද ඇත 4 ) විතක්ක (සිතුවිලි) නිසා ඇතිවන වේදනා ඇත , එසේම විතක්ක පහවීමෙන් ලබන වේදනා ද ඇත 5 ) සංඥා (perception) නිසා ඇතිවන වේදනා ඇත, එසේම සංඥා පහවීමෙන් ලබන වේදනා ද ඇත. **සටහන:** අටුවාවට අනුව: තණ්හාව ඇසුරු කොටගෙන සිතේ ඇතිවන අට ආකාර චිත්ත (අභිධර්මයට අනුව) නිසා ඇතිවෙන වේදනා ඡන්දය නිසා ඇතිවෙන වේදනාවන්ය. විතක්ක ඇසුරු කොට සිතේ ඇතිවන වේදනා ලෙසින් පෙන්වා ඇත්තේ ප්‍රථම ඣානය නිසා ඇතිවන වේදනාවන්ය. සංඥා ඇසුරු කොට සිතේ ඇතිවන වේදනා ලෙසින් පෙන්වා ඇත්තේ දෙවන ඣානයේ සිට ආකිඤ්චඤ්ඤායතන සමාපත්තිය දක්වා ඇති 6 ආකාර සමාපත්ති නිසා ඇතිවෙන වේදනාවන්ය. **බලන්න:** ESN: note:20, p. 2391. 6) ඡන්දය, විතක්ක හා සංඥා නොසංසිඳීම නිසා ඇතිවන වේදනා ඇත 7) ඡන්දය සංසිඳී, විතක්ක හා සංඥා නොසංසිඳීම නිසා ඇතිවන වේදනා ඇත (ප්‍රථම ඣානය නිසා) 8) ඡන්දය හා විතක්ක සංසිඳී, සංඥා නොසංසිඳීම නිසා ඇතිවන වේදනා ඇත (දෙවන ඣානය හා ඉහල ඣාන නිසා) 9) ඡන්දය, විතක්ක හා සංඥා සංසිඳීම නිසා ඇතිවන වේදනා ඇත (නෙවසඤ්ඤානාසඤ්ඤායතන සමාපත්තිය නිසා) 10) නොපැමිණි අරහත්වය ලබා ගැනීමට කරන වීරිය නිසා ඇතිවෙන වේදනා ඇත 11) අරහත්වය ලැබීම නිසා ඇතිවෙන වේදනා ඇත (අරහත්වය ලැබීම නිසා ඇතිවන ලෝකෝත්තර වේදනාව). බලන්න: ESN: note 21 & 22, p. 2391 )

**මූලාශ්‍ර:** සංයු.නි: (5-1): මහාවග්ග: මග්ගසංයුත්ත: විහාර සූත්‍ර 1 හා 2, පි. 48, ESN: 45: Maggasamyutta, II Dwelling 1 & 2, p. 1616.

▼ **සියලු වේදනා පිලිබඳ මනා අවබෝධය පිණිස සම්මා දිට්ඨිය ඇති කර** ගත යුතුවේ.**මූලාශ්‍ර:** ම.නි: ( 1): 1.1.9 සම්මා දිට්ඨි සූත්‍රය, පි. 130, EMN: 9: Sammādiṭṭhi Sutta- Right View, p. 121.

▼ **ආධ්‍යාත්මික වර්ධනය පිණිස,** ත්‍රිවිධ වේදනා (තිස්සො වෙදනා) පිරිසිඳව අවබෝධ කල යුතුවේ. **බලන්න**: පරිඥෙය්‍ය ධර්ම. **මූලාශ්‍ර:** දීඝ.නි: ( 3 ): 11 දසුත්තර සූත්‍රය, පි. 483, EDN: 34: Dasuttara Sutta: Expanding Decades, p. 384.

▼ **ස්පර්ශය නිසා හටගත් සියලු වේදනා අනිත්‍යය ය**: එලෙස, දකිනා පුද්ගලයා **'සද්ධානුසාරි'** ය. ඒබව, විදසුන් නුවණින්, ජානසමාපත්ති ලබා අවබෝධ කරගන්නා පුද්ගලයා **'ධම්මානුසාරි'** ය. ඔවුන් සම්බෝධිය පිහිට කරගෙන ඇත. **මූලාශ්‍රය:**සංයු.නි: (3): ඛන්ධවග්ග: ඔක්කන්ති සංයුත්තය: චක්ඛුවග්ග:4.1.5 වේදනා සූත්‍රය, පි.472.

▼**වේදනා තුන පිරිසිඳ දැනගැනීම:** ජම්බුඛාදක පරිබ්‍රාජක විසින් විමසන ලදුව, සැරියුත් තෙරුන් වදාළේ වේදනා පිරිසිඳ දැනීමේ මග සොඳුරුවූ ආරිය අටමග බවය. **මූලාශ්‍රය:**සංයු.නි: (4):සළායතනවග්ග: ජම්බුඛාදකසංයුත්ත:4.1.7 වේදනා සූත්‍රය, පි.506.

▼ **වේදනා නානත්වය:** ධාතු නානත්වය නිසා ඵස්ස නානත්වය ඇතිවේ, ඵස්ස නානත්වය නිසා වේදනා නානත්වය උපදී. **මූලාශ්‍රය:**සංයු.නි: (2 ):නිදානවග්ග: ධාතුසංයුත්ත: 2.1.4 වේදනා සූත්‍රය, පි.246.

▼ **වේදනාරහිත හා වේදනාසහිත ධර්ම**: පාලි: **අබ්‍යාපජ්ඣා ධම්මා, සබ්‍යාපජ්ඣා ධම්මා** -non- afflictive & afflictive Dhamma: යම් කරුණු නිසා ජිවිතයට මානසික වේදනා නොමගෙනදෙන ධර්ම වේදනා රහිත ධර්ම වේ. යම් කරුණු නිසා ජිවිතයට මානසික වේදනා ඇතිවේනම් ඒ ධර්ම වේදනා සහිත ධර්ම වේ.**වේදනා රහිත ධර්ම:**1) අක්‍රෝධය 2) එදිරි නැතිබව 3) අනුන්ට අවමන් නොකිරීම 4) අහංකාරනොවීම, 5) ඉරිසියා නොවීම 6) නොමසුරුකම 7) අමායාව 8) කපටිනැතිබව 9) හිරිය 10) ඔත්තප්පය.**වේදනා සහිත ධර්ම:** 1) ක්‍රෝධය 2) එදිරිය 3) අනුන්ට අවමන් කිරීම 4) අහංකාරය, 5) ඉරිසියාව 6) මසුරුකම 7) මායාව 8) කපටිබව 9) හිරි නැතිබව 10) ඔත්තප්ප නැතිබව. **මූලාශ්‍ර:**අංගු.නි: (1):2 නිපාත:17: 1 අකුසල පෙය්‍යාලය, පි.230, EAN:2: XVII, Unwholesome, p. 74.

▼**වේදනා නිබ්ද්දාව**: ඒ සඳහා ඇති පිළිවෙත 6 ආකාරය: 1) **වේදනාව දත යුතුය-** Feelings should be understood**:** වේදනාව තුන් ආකාරයය: සුඛවේදනාව, දුකවේදනාව වේදනාව, අදුක්කමසුඛවේදනාව. 2) **වේදනාවේ නිදාන සම්භවය (උත්පත්ති කරුණ) දත යුතුය** (the source and origin of Feelings should be understood) වේදනාවේ උත්පත්ති කරුණ, ස්පර්ශයය 3**) වේදනාවේ විවිධත්වය** (වෙමත්තතාව) දත යුතුය (the diversity of Feelings be understood) සාමිස සුඛවේදනා, නිරාමිස සුඛවේදනා, සාමිස දුක්වේදනා, නිරාමිස දුක්වේදනා, සාමිස අදුක්කම සුඛවේදනා, නිරාමිස අදුක්කමසුඛවේදනා.

4) **වේදනාවේ විපාකය දත යුතුය** (the result of Feelings should be understood) තමන් අත්දකින වේදනාවට අනුරූපව කෙනෙක්, යහපත් (පුණ්‍ය) හෝ අයහපත් (අපුණ්‍ය) ආත්මභාවයක් ඇතිකරගනී.(One produces an individual existence that corresponds with whatever [feelings] one experiences and which may be the consequence either of merit or demerit). 5) **වේදනාවේ නිරෝධය දත යුතුය** (the cessation of Feelings should be understood) ස්පර්ශයේ නිරෝධය, වේදනාවේ නිරෝධයය. 6) **වේදනා නිරෝධගාමිණී ප්‍රතිපදාව දත යුතුය දත යුතුය** (the way leading to the cessation of Feelings should be understood) එනම්, ආරියඅටමගය. මේ කරුණු 6 යහපත් ලෙසින් දන්නා ආරිය ශ්‍රාවකයා, නිබ්බෙදික බ්‍රහ්මචරියාවවූ වේදනා නිරෝධය දන්නේය. **මූලාශ්‍ර**: අංගු.නි: (4) 6 නිපාත: 6.2.1.9 නිබ්බේධිකසූත්‍රය,පි.220,EAN:6: 63.9Penetrative, p.355.

▲ **වේදනානු පසස්නාව**- Vedananaupassana: සතර සතිපට්ඨාන භාවනාවකි. **බලන්න**: භාවනා.

▲**විදර්ශනා-**Insight: විදර්ශනා- විපස්සනා ලෙසින් පෙන්වා ඇත්තේ අවිජ්ජාව පහකර ගැනීම පිණිස ප්‍රඥාව වර්ධනය කරගැනීමය**.** ධර්ම කරුණු ප්‍රඥාවෙන් අවර්ජනා කිරීම විපස්සනා භාවනාවය. එමගින් අවිජ්ජාව -මෝහය පහකර ගැනීමට හැකිවේ. **බලන්න**: සමථ හා විදර්ශනා.

▼ **රාග දෝස මෝහය** ක්‍ෂය කිරීමේ නුවණ විපස්සනාව වේ. ඒ නිවන් මගය. **මූලාශ්‍රය**:සංයු.නි: (4): සළායතනවග්ග: අසංඛතසංයුත්ත:9.2.2 විපස්සනා සූත්‍රය, පි.666.

▲ **විදර්ශනා ඥානය**- insight knowledge: මෙය, විජ්ජාවිමුක්තිය ලබාගැනීම පිණිස ඇති අෂ්ටවිද්‍යා ඥානයන්ගෙන් එකකි. **බලන්න:** අෂ්ටවිද්‍යා ඥාන.

▼**අටුවාවට අනුව:** විදර්ශනා ඥානය යනු ආරිය න්‍යායයේ අංගයකි. **බලන්න**: EAN: note: 2123, p. 682.

▼**විදර්ශනා නුවණ ඇතිවීම** මෙහි විස්තරාත්මකව පෙන්වා ඇත. **මූලාශ්‍රය:** ඛු.නි: පටිසම්භිදා 2: පඤ්ඤාවග්ග: 3-9 විදර්ශනා කථා, පි.238.

▲ **විද්‍යාව:** පාලි:**විජ්ජා** True Knowledge- non delusion: ධර්මයට අනුව විද්‍යාව-විජ්ජා-අමෝහය යනු චතුරාර්ය සත්‍ය අවබෝධ කිරීමය. විද්‍යාව සත්‍ය ඥානය ලෙසින්ද පෙන්වා ඇත. එනම්, සසර දුක නැතිකරගැනීමේ නුවණය. අවිද්‍යාව යනු චතු සත්‍ය අවබෝධ නොකිරීමය**. බලන්න**: අවිද්‍යා. **ශබ්දකෝෂ: පා.සි.ශ**: පි.468: **'විජ්ජා'** : 'ශිල්පය, ත්‍රිවිද්‍යාව, විජ්ජාවිමුත්ති: විමුක්තිය". **B.D**: p.353: **'vijjā':**'higher knowledge". **P.T.S**: p.1383: **'vijjā':** "possessed of wisdom".

▼**විද්‍යාව ඇතිවීමෙන් පටිච්චසමුප්පාදය අවසන්වේ**: චතුරාර්යසත්‍ය අවබෝධයෙන්, අවිද්‍යාව ප්‍රහීණය වී විද්‍යාව පහළවේ.

**මූලාශ්‍ර**: සංයු.නි: (2 ): නිදාන වගග: 1.1.1 පටිච්චසමුප්පාද සූත්‍රය, පි.24, 1.1.2 විභංග සූත්‍රය, පි.26,ESN: 12: Nidanasamyutta: 1.1. Dependent Origination, p. 610 & 2.2 Analysis of Dependent Origination, p.61.

▼ **කුසලධර්ම ඇතිකරගැනීමේ පූර්වගාමියා** (forerunner) විද්‍යාව යයි බව බුදුන් වහන්සේ පෙන්වා ඇත: විද්‍යාව සමග හිරි ඔතප්ප ඇතිවේ, ඔහුට , සත්‍ය ඥානය අවබෝධ වේ, එමනිසා ඔහුතුල සම්මා දිට්ඨිය ඇතිවේ. සම්මා දිට්ඨිය ඇතිවිට 2 සම්මා සංකප්ප ඇතිවේ... එලෙස අනුක්‍රමයෙන් ආරිය අටමගේ සෙසු අංග ඇතිවේ. සම්මා සමාධිය ඇතිවිට, සම්මා ඥාණය-සත්‍ය ඥානය ඇතිවේ. සම්මා ඥානය මගින්, සම්මා විමුත්තිය ඇතිවේ, ඒ විද්‍යාව අවබෝධයය. **මූලාශ්‍ර**: සංයු.නි: (5-1): මහාවග්ග: මග්ගසංයුත්ත: 1.1.1 අවිජ්ජා සූත්‍රය, පි. 30, ESN:45: Mgga samyutta: 1.1 Ignorance, p. 1603.

▼ **විද්‍යාව පහළවීම:** ඇස...ඇසෙන් දකිනා රූපය...ඇසේ විඥානය, (මේ 3 එක්වීමෙන් ඇතිවන) ඇසේ ස්පර්ශය... ඇසේ ස්පර්ශය නිසා යම් වේදනාවක් ඇතිවේද: සැප වේදනා, දුක වේදනා, සැපත් නැති දුකත් නැති (මැදහත්) වේදනා ...මේ සියල්ල අනිත්‍යබව, දන්නා, දකිනා පුද්ගලයා ට විද්‍යාව පහළවේ. **බලන්න**: අවිද්‍යාව ප්‍රහීණ කරගැනීමේ පිළිවෙත. **මූලාශ්‍ර:** සංයු.නි: ( 4) සළායතන වග්ග: 1.6.1 අවිජ්ජාපහාන සූත්‍රය**,** පි. 94, ESN: 35: Salayathanasamyutta: Ignorance: 53.1 Abandoning , P. 1234.

▼ **සම්මා දිට්ඨිය විද්‍යාව ඇතිකරයි**: නිවැරදි ලෙසින් තබන ලද උලක් හෝ කූරක් (හැල්නන්ඩුව-යවනන්ඩුව) මගින් හානියක් සිදුනොවේ. එලෙස, සම්මා දිට්ඨිය ඇතිවිට යහපත-විද්‍යාව ඇතිවී සසරින් මිදීමට හැකිවේ. **බලන්න**: උපග්‍රන්ථය:5 **මූලාශ්‍ර:** සංයු.නි: ( 5-1): මග්ගසංයුත්ත :1.1.9 සූක සූත්‍රය, පි.44, ESN: 45: Magga samyutta: 9.9. The Spike, p. 1613.

▼ **සම්මා දිට්ඨිය ඇතිවිට අවිද්‍යාව නැතිවී, විද්‍යාව ඇතිවේ**: **මූලාශ්‍ර**: ම.නි: (1 ): 1.1.9 සම්මා දිට්ඨි සූත්‍රය, පි. 130, EMN: 9: Sammādiṭṭhi Sutta- Right View, p.1217.

▼ **පහාතබ්බා** ධර්මතා ප්‍රහීණ කිරීමෙන් විද්‍යාව ඇතිවේ.**බලන්න**: පහාතබ්බා ධර්ම. **මූලාශ්‍ර:** දීඝ.නි : (3 කාණ්ඩය): 11 දසුත්තර සූත්‍රය, පි. 483, EDN: 34: Dasuttara Sutta: Expanding Decades, p. 384**.**

▼**කායගතා සතිය වඩාගැනීමෙන්**, විපුල කරගැනීම විද්‍යාව ඇතිකරගැනීමට හේතුවේ. **බලන්න:** කයගතා සතියේ ප්‍රතිලාභ. **මූලාශ්‍ර:** අංගු.නි: (1): 1 නිපාත: කායගතාසති වග්ග සූත්‍ර, පි. 125, EAN:1: Mindfulness Directed to the Body, p.52.

▼ **බුදුන් වහන්සේ** විද්‍යාව ඇතිකරගැනීම පිළිබඳව යහපත් ලෙසින් වදාරා ඇත. එම ධර්මය සංඝයා එක්ව, ධර්මයේ චිරස්ථිතිය පිණිස සජ්ජායනා කිරීම සුදුසු ය යි සැරියුත් මහා තෙරුන් සංඝයාට උපදෙස් දී ඇත. **මූලාශ්‍ර**:දිඝ.නි: (3 ):10 සංගිති සූත්‍රය,පි. 372, EDN: 33 SangītiSutta: The Chanting Together, p. 362.

▼**විද්‍යාව පෝෂණය විම**

විද්‍යාව පෝෂණය වීම බුදුන් වහන්සේ මෙසේ පෙන්වා ඇත:

**"**කල්‍යාන මිත්‍ර සේවනය නිසා සද්ධර්මය ඇසීම පෝෂණය වේ, සද්ධර්මය ඇසීම නිසා ශ්‍රද්ධාව පෝෂණය වේ. ශ්‍රද්ධාව නිසා යෝනිසෝමනසිකාරය පෝෂණයවේ. යෝනිසෝමනසිකාරය නිසා සතිය හා සම්ප්‍රජන්‍යය පෝෂණයවේ. සතිය හා සම්ප්‍රජන්‍යය නිසා ඉන්ද්‍රිය සංවරය පෝෂණය වේ. ඉන්ද්‍රිය සංවරය නිසා ත්‍රිවිධ සුචරිතය පෝෂණය වේ. ත්‍රිවිධ සුචරිතය නිසා සතර සති පට්ඨානය පෝෂණය වේ. සතර සති පට්ඨානය නිසා සප්ත බොජ්ඣංග ධර්ම පෝෂණය වේ. සප්ත බොජ්ඣංග ධර්ම නිසා විද්‍යාවිමුක්තිය පෝෂණය වේ".

මේ ක්‍රියාවලිය පිලිබඳ බුදුන් වහන්සේ පෙන්වා වදාළ **උපමාව- කඳු මුදුනට වැටෙන වැස්ස**: කඳු මුදුනට වැස්ස පතිතවූ විට, එම දිය ගලා ගොස් කඳු බෑවුමෙ ඇති විවර, පැලුම් ආදිය පිරේ. ඒවා පිරී ගොස් ගලායන දිය මගින් දොළ පාර පිරී යති. ඒවා පිරී ගොස් ගලායන දිය මගින් පොකුණු පිරී යති. ඒවා පිරී ගොස් ගලායන දිය මගින් විල් පිරී යති. ඒවා පිරී ගොස් ගලායන දිය මගින් ඇල ආදී කුඩා දිය පහර පිරී යති. ඒවා පිරී ගොස් ගලායන දිය මගින් නදී පිරී යති. ඒවා පිරී ගොස් ගලායන දිය මගින් ගංගා ද අනතුරුව මහා ගංගා ද පිරී යති. මහා ගංගා පිරී ගොස් ගලායන දිය මගින් මහා සාගරය පිරී යයි. එලෙස, කුසල ධර්මතා පෝෂණය වීමෙන් නිවන- විමුක්තිය නමැති සාගරය පෝෂණය වේ. **බලන්න**: උප ග්‍රන්ථය:5. **මූලාශ්‍ර**:අංගු.නි: (6 ): 10 නිපාත: යමක වග්ග: 10.2.2.1 අවිද්‍යා සූත්‍රය, පි.232, EAN:10: II Pairs: 61.1.Ignorance, p. 517.

▼**විද්‍යා සහගතබව**: විද්‍යාසහගතබව ලෙසින් පෙන්වා ඇත්තේ යථාබව අවබෝධ කිරීමය.

ශ්‍රැතවත් ආරිය ශ්‍රාවකයා, රූප...වේදනා...සංඥා...සංඛාර ... විඥාන ආදී ධර්මතා කුමක්ද? යයි දනී, ඒ ඒ ධර්මතා ඇතිවන්නේ කෙසේද?, නැතිවෙන්නේ කෙසේද? ඒවා නැතිකර ගැනීමේ මාර්ගය කුමක්ද? යයි දනී, එය විද්‍යාව ය, ඒ පමණකින්ම විද්‍යා සහගතබව ඇතිවේ. **මූලාශ්‍ර**: සංයු.නි: ( 3 ): ඛන්ධසංයුත්ත: 1.3.2.1 අවිජ්ජා සූත්‍රය, 1.3.2.2. හා විජ්ජා සූත්‍රය, පි. 311,ESN: 22: Kahnadasamyutta: 113.1 Ignorance, 114.2 True knowledge, p. 1100.

▼**විද්‍යාව යනු චතු සත්‍ය අවබෝධයය.:** අවිද්‍යාව පහ කර විද්‍යාව ඇතිකර ගැනීමට ආරිය අටමග වැඩිය යුතුය. **මූලාශ්‍රය:** සංයු.නි: (4 ) සළායතන වග්ග: ජම්බුඛාදක සංයුත්ත: 4.1.9 අවිජ්ජා සූත්‍රය**,** පි. 506, ESN: 38: Jambukhādaka -saṃyutta: 9 Ignorance, p. 1404.

▼**විද්‍යාව ඇතිකර ගැනීම:** සැරියුත් තෙරුන් වහන්සේ මෙසේ වදාළහ:

"...යම් කලක සිට, ආරිය ශ්‍රාවකයා, ආසව (ආශ්‍රව) ගැන දනීද, ආසව සමුදය දනීද, ආසව නිරෝධය දනීද, ආසව නිරෝධ ගාමිණී පටිපදාව දනීද, හෙතෙම, සහමුලින්ම, රාග අනුසය, පටිඝ අනුසය, අසම්දිට්ඨි මාන අනුසය මුලින් උපුටා දමා, අවිද්‍යාව පහකර විද්‍යාව උපදවා මේ ජීවිතයේදීම දුක කෙළවර කරගනී..."

**මූලාශ්‍ර:** ම.නි: (1): 1.1.9 සම්මා දිට්ඨි සූත්‍රය, පි. 130, EMN: 9: Sammādiṭṭhi Sutta- Right View, p. 121.

▼ **සම්‍යක්තවය ඇතිවීම නිසා විද්‍යාව පහළවේ.**: සම්‍යක්තවය යනු සම්මා දිට්ඨිය පෙරටු කරගත් අංග 10 සම්පූර්ණ වීමය. **බලන්න**: සම්‍යක්තවය. **මූලාශ්‍ර:**අංගු.නි: (6): 10 නිපාත: සමණසඤ්ඤා වගග, 10.3.1.5. විජ්ජා සූත්‍රය,පි.412, EAN:10: 105.5 True Knowledge, p.541.

▼**විද්‍යාව සම්පූර්ණවීමට අවශ්‍ය දස කරුණු**: 1) ශ්‍රද්ධාව තිබීම 2) ශීලසම්පන්නවීම 3) බහුශ්‍රැතවීම 4) ධර්මකථිකවීම 5) පරිසාවචර වීම- පිරිස ඇසුරුකිරිම 6) ධර්මය යහපත් ලෙසින් පිරිසට දේශනාකිරීමේ හැකියාව 7) විසාරදබව-විනයධර 8 ) පූර්වනිවාස සිහිකිරීමේ නුවණ තිබීම 9) දිවැස තිබීම10) ආසවක්ෂය කිරීම. **සටහන:** ඒ 10 අංග පරිපූර්ණවීම නිසා ‘භික්ෂුව සමන්තපාසාදිකා වේ (who inspires confidence)’, සර්වආකාර පරිපූර්ණ වේ (who is complete in all aspects)’ යයි මෙහි දක්වා ඇත. **මූලාශ්‍රය**: අංගු.නි: (6): 10 නිපාත: ආනිසංසවග්ග: 10.1.1.10 විජ්ජාසූත්‍රය, පි.52, EAN:10: 10.10 True knowledge, p. 494.

▼**රූප, වේදනා, සංඥා, සංඛර, විඥානය** යන පංච උපාදානස්කන්ධය දන්නාබව, එහි සමුදය, නිරෝධය හා නිරෝධගාමිණී පටිපදාව දන්නා බව විද්‍යාව වේ. **සටහන:**සංයු.නි: (5-2): මහාවග්ග:සච්චසංයුත්ත:12.2.8 විජ්ජාසූත්‍රය, පි.308 හි මේ සමාන විස්තරයක් දක්වා ඇත. **මූලාශ්‍රය**: සංයු.නි: (3): ඛන්ධසංයුත්ත:ධම්මකථිකවග්ග:1.3.2.2. විජ්ජා සූත්‍රය, පි.312.

▲ **විද්‍යාවිමුක්ති ඥානදර්ශනය-**true knowledge and liberation: විද්‍යාවිමුක්ති ඥානදර්ශනය ලෙසින් පෙන්වා ඇත්තේ, සත්‍ය ඥානය ලබා විමුක්තිය-නිවන සාක්ෂාත් කරගැනීමය- සසර දුකින් මිදීමය. විද්‍යාවිමුක්ති පෝෂණය වන ආකාරය: සප්ත බොජ්ඣංගය වැඩීම නිසා විද්‍යාවිමුක්ති ය පෝෂණයවේ. බොජ්ඣංගපෝෂණය වන්නේ සතර සතිපට්ඨානය මගින්ය. සතර සතිපට්ඨානය පෝෂණය වන්නේ ත්‍රිවිධ සුචරිතය මගින්ය. ත්‍රිවිධ සුචරිතය පෝෂණය වන්නේ ඉන්ද්‍රිය සංවරය මගින්ය. ඉන්ද්‍රිය සංවරය පෝෂණය වන්නේ සම්ප්‍රජන්‍යය මගින්ය. සම්ප්‍රජන්‍යය පෝෂණය වන්නේ යෝනිසෝමනසිකාරය මගින්ය. යෝනිසෝමනසිකාරය පෝෂණය වන්නේ ශ්‍රද්ධාව මගින්ය. ශ්‍රද්ධාව පෝෂණය වන්නේ සද්ධර්ම ශ්‍රවනය මගින්ය. සද්ධර්ම ශ්‍රවනය පෝෂණය වන්නේ කල්‍යානමිත්‍ර ආශ්‍රය නිසාය. මේ පිලිබඳව පිලිබඳ යොදගෙන ඇති **උපමාව-කඳු මුදුනට වැටෙන වැස්ස.** කඳුමුදුනට වැස්ස වසිනවිට, ජලය බෑවුම ඔස්සේ ගලා ගොස් එහි ඇති විවර පුරවයි, ඒ විවර පිරිගියවිට, ජලය ගලාවිත් නිම්නය ද එතැන්සිට, කුඩා ගංගා ද, ඒවා පිරි කුඩා විල්ද, එතැන්සිට ගලායන ජලය මහාවිල්ද පුරවයි. මහාවිල්වල ජලය පිරි ගලා ගොස් අසල ඇති ඇල, දොළ, හා ගංගා පුරවයි. ගංගා වල ජලය ගලාවිත් මහා සයුර පුරවයි. එලෙස, කල්‍යානමිත්‍ර ආශ්‍රය නිසා, සද්ධර්ම ශ්‍රවනය...ආදී ලෙසින්, එක් කුසල දහමක්,ආසන්න කුසල දහම පුරවාලමින්... විද්‍යාවිමුක්තිය ඇතිවීම දක්වා සම්බන්ධවෙමින් පැතිරී යති. **බලන්න:** උපග්‍රන්ථය:5

**මූලාශ්‍ර**:අංගු.නි.(6):10 නිපාත, යමක වග්ග,10.2.2.1.අවිද්‍යා සූත්‍රය, පි.232, EAN:10: II Pairs .61.1.Ignorance, p. 517.

▲ **වෝදාන ඥානය-** Vodana Nana: වෝදාන ඥානය (ව්‍යවදාන ඥාන) ලෙසින් පෙන්වා ඇත්තේ අතිතය, අනාගතය හා වර්තමාන කාල 3 පිළිබඳව සිත වික්ෂිප්ත නොකර, ප්‍රභාස්වර සිත ඇතිකර ගැනීමේ නුවණය. **මූලාශ්‍රය**: ඛු.නි: පටිසම්භිදා 1: 3 ආනාපානසතිකථා: 3-4 වෝදාන ඥානය, පි.338.

වධ

▲ **විධා-**Vidha: විධා යනු මානයය. (ත්‍රිවිධ මාන), ඒවා නැතිකර ගැනීමට ආරියඅටමග වැඩිය යුතුවේ. **බලන්න**: ත්‍රිවිධ මාන. **මූලාශ්‍රය:**සංයු.නි: (5-1): මහාවග්ග: මග්ගසංයුත්ත:එසනාවග්ග:1.15- විධාසූත්‍රය, පි.154.

▼ **විධාව නැතිකිරීමට** බොජ්ඣංග ධර්මතා වැඩිය යුතුවේ. **මූලාශ්‍රය:** සංයු.නි: (5-1): මහාවග්ග:බොජ්ඣංගසංයුත්ත: චක්කවත්තිවග්ග: 2.5.4 විධාසූත්‍රය, පි.224.

▲ **විධුර තෙර-** Vidura Thera: මේ තෙරුන්, කකුසඳ බුදුන්වහන්සේගේ අගසව් දෙනමගෙන් කෙනකි. **මූලාශ්‍රය:**සංයු.නි: (2) : නිදානවග්ග: අන්මතග්ග සංයුත්ත: දුග්ගතවග්ග: 3.2.10 වෙපුල්ල පබ්බත සූත්‍රය, පි.314.

වඳ

▲**වඳුරා හා මස්වැද්දා උපමාව-** Simile of Monkey & the hunter: මෙ උපමාවෙන් පෙන්වා ඇත්තේ, සතර සතිපට්ඨානය හැර පස්කම් සැපයට යටවී මාරයාට හසුවීම, ආශාව නිසා වඳුරෙක් මස් වැද්දාගේ උගුලට හසුවී විනාශවීමය. **බලන්න**: ගෝචර භූමිය, උපග්‍රන්ථය:5

වන

▲**වනගොමු සකස්කිරීම-** Creating forests: වනගොමු සකස්කිරීම යනු වනරෝපනය- යනු ගස් සිටුවා වනභූමි ඇතිකිරීමය. යම් කෙනක්, අන්‍යයන්ගේ යහපත පිණිස වනරෝපණය කරන්නේ නම් එය පුණ්‍ය ක්‍රියාවකි, සුගතියට මග පාදයි. **බලන්න:** පින්. **මූලාශ්‍රය**: සංයු.නි: (1): සගාථවග්ග: දේවතාසංයුත්ත: 1.5.7 වනරෝප සූත්‍රය, පි.86.

▲ **වනපත්ථ-**jungle thickets: වනපත්ථ යනු ආධ්‍යාත්මික පුහුණුව පිණිස හුදකලාව ප්‍රියකරණ සංඝයා වාසය කරණ ගැඹුරු වන බිම්ය. එලෙස ජීවත්වන සංඝයා වනවාසී ලෙසින් හඳුන්වයි. වනපෙත් ආශ්‍රිතව සංඝයා වාසය කළයුතු ආකාරය මෙහිදී පෙන්වා ඇත. **මූලාශ්‍රය**:ම.නි: (1): සිහනාදවග්ග: 1.2.7 වනපත්ථ සූත්‍රය, පි.284.

▲ **වන සෙනසුන්** - Forest dwellings: වනසෙනසුන්- ආරණ්‍යසේනාසන ලෙසින්ද පෙන්වා ඇත. දුර කැලෑවල පිහිටි මේ ස්ථානවල වාසය කරන සංඝයා වනවාසීන්ය**. බලන්න**: ආරණ්‍යසේනාසන.

▲ **විනය හා අවිනය-**discipline & non-discipline

බුද්ධ දේශනාවල ඇතුලත් වී ඇත්තේ ධර්මය හා විනය පිලිබඳ උපදෙස්, අවවාද යන්ය. විනය ලෙසින් පෙන්වා ඇත්තේ, බුදුන් වහන්සේ වදාළ විනයට අනුව කටයතු කිරීමය. **අවිනය** යනු විනයට අනුකූළ නොවීමය. විනය නොතකා හැරීම නිසා බොහෝ දෙනාට අහිත සිදුවන බව, සද්ධර්මයේ පිරිහීමට හෙතුබව බුදුන් වහන්සේ වදාළහ. **සටහන්:** * අටුවාවට අනුව: By the sutta method, discipline (*vinaya*) means restraint, abandoning, reflection, and the removal of lust, hatred, and delusion. Non-discipline (*avinaya*) means non-restraint, non-abandoning, non-reflection, and the non-removal of lust, hatred, and delusion. By the Vinaya method, discipline is a proper base, motion, announcement, bounded area, and assembly. Non-discipline is a defective base, motion, announcement, bounded area, and assembly." **බලන්න:** EAN:note: 62, p.584. **මූලාශ්‍ර**: අංගු.නි: (1): 1 නිපාත:අධම්මවග්ග: සූත්‍ර 1.10 -පි.78, EAN:1: 131-34-, p.42.

▲ **විනය කම්ම**-Vinaya kamma : විනය කම්ම ලෙසින් පෙන්වා ඇත්තේ සංඝයා පිළිබඳව කටයුතුය. විනයට එරෙහිව කටයුතු කරන සංඝයාට පනවන නීතිද මෙයට ඇතුලත් වේ. වැරද්ද පිළියම් කරගත්විට විනය කම්ම අහෝසි කෙරේ. **බලන්න**: උක්ඛෙපනීයකම්ම, පටිසාරණීයකම්ම, හණ්ඩුකර්මය, වින.පි:මහාවග්ග පාලිය1.

▲**විනයධර-**expert in the discipline: විනයධර වීමට ධර්ම කරුණු 7 ක් සම්පූර්ණකරගත යුතුය: 1) වරද (ආපත්තිය) දන්නා බව 2) නිවරදය (අනාපත්තිය) දන්නා බව 3) සුළු වරද (ලහුකාපත්තිය) දන්නා බව 4) මහා වරද (ගරුකාපත්තිය) දන්නා බව 5) පාතිමෝක්ෂසංවර ශිලය, ආචාරගෝචර සම්පන්නබව 6) සිව්ජාන නිදුකින් ලබාගැනීමට හැකිබව 7) ආසව ක්‍ෂය කර විමුක්තිය ලබා ඇතිබව. **සටහන්:** * දෙවෙනි සූත්‍රයේ දී විනයධර වීමට ඉහත1-4කරුණු හා 6-7 කරුණු දක්වා ඇත, 5) කරුණ:විනය පිලිබඳ ස්ථාවරබව තිබීමය. ** තෙවෙනි සූත්‍රය: දෙවන සූත්‍රයට සමානය ** සතර වෙනි සූත්‍රය: 1-4 කරුණු සමානය, 5) කරුණ: පූර්වනිවාස සිහිකිරීමේ නුවන 6) කරුණ: දිවැස් තිබීම 7) පෙර සඳහන් 7 කරුණට සාමානය. **මූලාශ්‍ර:**අංගු.නි: (4): 7 නිපාත: විනයවග්ග: 1 2 3 4 විනයධර සූත්‍ර, පි.502, EAN:7: An expert in discipline, 4 suttas, p.404.

▼**විනයධර ශෝබන වීම** - විනය යහපත්ව අවබෝධ කර තිබීම, පිලිබඳ අවශ්‍යතාවයන් මෙහි විස්තරකර ඇත. **මූලාශ්‍රය:** අංගු.නි: (4): 7 නිපාත: විනයවග්ග: 7.2.3.5-8 දක්වා සූත්‍ර 4කි. පි.504.

▲ **විනය පැනවීමට හේතු-** Reasons for Training rules: සංඝයාට විනය නීති (සිකපද) පැනවීමට හේතු කරුණු: 1) සංඝයාගේ සුභසාධනය (well-being) හා පහසුවෙන් සිටීම පිණිස-පහසු විහරණය පිණිස. 2) දුස්සීලව හැසිරෙන සංඝයා ගැන පරීක්ෂාවෙන් සිටීම මගින් යහපත්ව හැසිරෙන (පෙශල භික්ෂුන්) සංඝයාට පහසුවෙන් වාසය කිරීමට හැකිවීම පිණිස 3) මේ ජීවිතයේ ඇති ආසවයන් (taints) සංවර කරගැනීමට හා මතු ජීවිතයේ සුභ සාධනය පිණිස ආසව පහකරගැනීම පිණිස. 4) මේ ජීවිතයේ ඇති වෛරයන් (enmities) සංසිඳවා ගැනීම පිණිස හා මතු ජීවිතයේ සුභසාධනය පිණිස වෛරය පහකරගැනීම පිණිස. 5) මේ ජීවිතයේ ඇති

දෝෂ (faults) සංසිඳවා ගැනීම පිණිස හා මතු ජීවිතයේ සුභ සාධනය පිණිස දෝෂ පහකරගැනීම පිණිස . 6) මේ ජීවිතයේ ඇති උවදුරු-බිය (perils) සංසිඳවා ගැනීම පිණිස හා මතු ජීවිතයේ සුභ සාධනය පිණිස උවදුරු පහකරගැනීම පිණිස. 7) මේ ජීවිතයේ ඇති අකුසල් සංසිඳවා ගැනීම පිණිස හා මතු ජීවිතයේ සුභ සාධනය පිණිස අකුසල් පහකරගැනීම පිණිස. 8) ගිහියන් හට අනුකම්පාව පිණිස .9) පාපි චේතනා ඇති අය විසින් ඇතිකලහැකි කළහ, භේද ආදිය වළක්වා ගැනීම පිණිස, එමගින්, ශ්‍රද්ධාව නොමැති අයතුළ ශ්‍රද්ධාව ඇතිවීම පිණිස, ශ්‍රද්ධාව ඇති අයගේ ශ්‍රද්ධාව විපුල කරගැනීම පිණිස 10) සද්ධර්මයේ අඛණ්ඩ පැවැත්ම පිණිස 11) විනයට අනුග්‍රහ පිණිස (promoting the discipline). **සටහන්:** * විනය කර්ම පිලිබඳ මෙහි විස්තර කර ඇත. ** විනය නීති- සිකපද පිලිබඳ විස්තර පිණිස **බලන්න**: වි.පි.මහාවග්ග පාලිය. **මූලාශ්‍රය:**අංගු.නි: (1):2 නිපාතය: 2 විනය පෙයියාලය: 1.10, පි. 230.

▼ **සංඝයාගේ යහපත** පිණිස සික පද පැනවීම ගැන මෙහි විස්තරාත්මකව දක්වා ඇත. **මූලාශ්‍රය**:අංගු.නි: (1): 2 නිපාත: විනයපෙයාාලය, පි.230.

▲**වීනාව -** the lute: සළායතන මගින් අල්ලා ගන්නා අරමුණු නිසා ඇතිවෙන විවිධ වේදනා, සංඥා ආදිය ට නො ඇලීම ඇතිකර ගැනීම පෙන්වීමට විනාව උපමාව යොදගෙන ඇත:

කිසිදිනක් වීනාවක් නොදුටු රජතුමෙක් වීනාවෙන් නැගෙන මිහිරි නාදය අසා එයට කැමතිවේ. ඔහු, ඒ මිහිරි නාදය ඇතිකරන වීනාව බැලීමට කැමතිව, සේවකයන් ලවා වීනාවක් ගෙන්වා ගනී. එහෙත් වීනාව ගැන සතුටට පත් නොවන ඔහු, ඉන් නැගෙන මිහිරි නාදය ගෙන එනලෙසින් සේවකයන්ට අන කරයි. වීනාවේ, ඇති අංග යොදාගෙන සංගීතකාරයා වඡ් මිහිරි නාදය ඇති කරන බව සේවකයන් රජුට පවසයි. මිහිරිනදයට මිස වීනාවට ඇලුම් නොකරන රජතුමා, ඒ වීනාව කඩා බිඳ දමා විනාශ කරයි. එලෙස, සළායතන මගින් අල්ලා ගන්නා අරමුණු නිසා ඇතිවෙන විවිධ වේදනා, සංඥා ආදිය පිලිබඳ යථා අවබෝධය ලබාගන්නා භික්ෂුව හෝ භික්ෂුණිය, ‘මමය මාගේය’ යන සංකල්පය බිඳදමයි. **සටහන**: අටුවාවට අනුව: පංචඋපාදානස්කන්ධය වීනාව වැනිය. භාවනාවේ නිරත පුද්ගලයා රජතුමා වැනිය. වීනාව බිඳ දමන රජතුමාට ඉන් කිසිම මිහිරි නාදයක් නො ඇසේ. එළෙසින්, භාවනා යෝගියාට පංචඋපාදානස්කන්ධයේ යථාබව අවබෝධව එය, මමය මගේය යන අල්ලා ගැනීම නුවණින් අත්හැර දමයි. **බලන්න**:ESN: note: 217, p.1555. **මූලාශ්‍ර:** සංයු.නි: (4): සළායතනවග්ග:වේදනාසංයුත්ත: ආසිවිසවග්ග:1.10.9 විනාඋපමාව සූත්‍රය, පි.400, ESN: Salayathna vagga: Vedanasamyutta: 246.9 The Simile of the lute, p.1324.

▲**විනාශය-**Disaster: විනාශය-වැනසීම-ව්‍යසනය ලෙසින් මෙහිදී පෙන්වා ඇත්තේ, යම් මහණ කෙනෙක් තමන් හා වාසය කරන සෙසු සංඝයාහට අයහපත් ලෙසින් පරිභව නින්දා කිරීම නිසා ඔහුට විඳීමට සිදුවන අයහපත් කර්ම ඵලයන්ය. මෙහි අයහපත් විපාක 11 ක් පෙන්වා ඇත. **මූලාශ්‍රය:** අංගු.නි: (6) :11 නිපාත: නිස්සයවග්ග: 11.1.6 ව්‍යසන සූත්‍රය, පි.624.

▼**බුදුන් වහන්සේ ව්‍යසන 5ක් පෙන්වා ඇත**

1) ඥාතිව්‍යසනය 2) භෝග (සම්පත්) ව්‍යසනය 3) රෝග ව්‍යසනය 4) ශිලව්‍යසනය 5) දිට්ඨි ව්‍යසනය. **සටහන**: ශිල හා දිට්ඨිය විනාශවීම දුගතිය ඇති කරයි, **මූලාශ්‍රය:** අංගු.නි: (3) :5 නිපාත: ගිලානවග්ග: 5.3.3.10 සම්පදා සූත්‍රය, පි.262.

▲ **විනිපාතය-** Vinipāta: විනිපාතය යනු නිරය- සතර අපායවේ, එම ස්ථානවල උපත ලබන සත්වයන් **විනිපාතක** ලෙසින් හඳුන්වති, එනම් දුගති උපතක් ලැබූ සත්වයා. **බලන්න**: නිරය, කම්මවිපාක.

▼**සිව්දහම** (සෝතාපන්න) ඇති අය විනිපාතය ඉක්මවා ඇත.**මූලාශ්‍රය:** සංයු.නි: (5-2): මහාවග්ග: සෝතාපත්තිසංයුත්ත:රාජාකාරාමවග්ග: 11.2.5 විනිපාත සූත්‍රය, පි.196.

▲ **විනිබන්ධන-**Vinibandhana: සිත වෙළා බැඳලන ධර්මතා විනිබන්ධන වේ. එවැනි ධර්මතා 5 කි: 1) කාමය පහනොවීම 2) කය පිලිබඳ අවිගත රාගය 3) බාහිර රූප පිලිබඳ අවිගත රාගය 4) බොහෝ ආහර ගැනීම හා නින්දට ඇලීම 5) බ්‍රහ්මචරියාවේ අරමුණ ලෙසින් දෙවනිකායක පහළවීම පැතීම. මේවා ඇතිවිට ධර්මය වඩා ගැනීමට විරිය නැතිවේ. **මූලාශ්‍රය:** අංගු.නි: (3): 5 නිපාත: කිම්බිලවග්ග: 5.5.1.6 විනිබන්ධ සූත්‍රය, පි.424.

▼ **විනිබන්ධන** පහකර ගැනීම පිණිස සතර සතිපට්ඨානය වැඩිය යුතුවේ. **මූලාශ්‍රය:** අංගු.නි: (5): 9 නිපාත:9.2.2.10 විනිබන්ධ සතිපට්ඨාන සූත්‍රය, පි.582.

▲ **වීනිලක සංඥාව-** perception of a livid corpse: කයේ අසුභය පෙන්වන සංඥා 10 න් එකකි. නිල්වූ මළකඳක් අරමුණුකොට වඩන භවානාවය. විදසුන් නුවණ වඩාගැනීමට මගකි. **බලන්න**: දස සංඥා, දසඅසුභ භාවනාව.

▼ **වීනිලක සංඥා භාවනාව** පහසුවිහරණය පිණිස පවතී.: **මූලාශ්‍රය:** සංයු.නි: (5-1): මහාවග්ග: බොජ්ඣංගසංයුත්ත: ආනාපානවග්ග: 2.7- විනිලක සූත්‍ර, පි.271.

▲ **වෙනයිකො-** abolitionist: බුදුන් වහන්සේ වැඩසිටි සමයේ සමහර අන්‍ය පරිබ්‍රජකයෝ:

‘ගුරු ගෝතම, සෑම දෙයක්ම අහෝසිකරන කෙනෙක්ය... ඔහු නිශ්චිත ප්‍රකාස කිරීමෙන් වැලකිසිටි’ යන මතය දැරුහ.

ඔවුන්ගේ ඒ මත පිළිබඳව චම්පා නුවර, වජ්ජියමාහිත ගහපති මෙහිදී දැක්වූ කරුණු බුදුන් වහන්සේ අනුමත කරඇත. **බලන්න**: දිට්ඨි. **මූලාශ්‍රය:** අංගු.නි: (6): 10 නිපාත: 10.2.5.4.වජ්ජියමාහිත සූත්‍රය,පි.368, EAN:10: 94-4 Vajjiyamāhita, p.535.

**වණ**

▲ **වාණිජ කටයුතු-**Business: වාණිජ කටයතු ලෙසින් මෙහිදී පෙන්වා ඇත්තේ වෙළදාම ආදී කටයුතුවල නිරතවීමය. සැරියුත් තෙරුන් විසින් විමසනු ලදුව, කෙනක් වාණිජ කටයතුවල දියුණුවීම හා පිරිහීම ගැන බුදුන් වහන්සේ මෙහිදී කරුණු පෙන්වා ඇත. ශ්‍රමණ බ්‍රාහ්මණයන්හට

අවශ්‍ය දේ පෙරදී හෝ මේ භවයේදී ලබාදන පුද්ගලයාගේ වාණිජ කටයතු සඵලවේ, එසේ නොදුන් පුද්ගලයාගේ වාණිජ කටයතු නිස්ඵලවේ යයි මෙහි පෙන්වා ඇත. **මූලාශ්‍රය:** අංගු.නි: (2): 4 නිපාත: අපණ්ණකවග්ග: 4.2.3.9 වාණිජ්ජා සූත්‍රය, පි.174.

▼**ධර්මයේ හැසිරෙන** ගිහියන් විසින් නොකළයුතු -වැරදි වාණිජ කටයුතු: 1) සත්වයන්ට හිංසාව පිණිසවූ අවි විකිණීම (ශස්ත්‍රවාණිජ්‍ජා) 2) වහල් වෙළඳාම (සත්ව වාණිජ්‍ජා) 3) මස් පිණිස සතුන් විකිණීම (මාංසවාණිජ්‍ජා) 4) මත්පැන් මත් ද්‍රව්‍ය විකිණීම (මද්‍යවාණිජ්‍ජා) 5) වස විස විකිණීම (විෂවාණිජ්‍ජා).**මූලාශ්‍රය:** අංගු.නි: (3 ): 5 නිපාත:5.4.3.7 වණිජ්ජා සූත්‍රය, පි.360.

▲**වෙණ්හු දේවපුත්‍ර-** Venahu devaputhra: බුදුන් වහන්සේ සැවැත්නුවර වැඩවසන සමයේ මේ දෙවියෝ, බුදුන් වහන්සේගේ ගුණ මෙසේ පවසා ඇත:

“ යම් මිනිස් කෙනක් බුදුරජානන් වහන්සේ පයුරුපසනා කොට, සසුනේ නොපමාව හික්මෙන්නේ නම් ඔවුන් ඒකාන්තයෙන්ම සුවපත් වූ වෝය”. **බලන්න**: බුදුගුණ. **මූලාශ්‍රය**: සංයු.නි: (1): සගාථවග්ග: දේවපුත්‍රසංයුත්ත :2.2.2 වෙණ්හු සූත්‍රය, පි. 124.

**වප**

▲ **වප්ප තෙර පස්වග -**Vappa Thera Pasvaga: **බලන්න**: උපග්‍රන්ථය:1

▲ **වප්ප ශාක්‍ය-**Vappa the Sakkyan: **බලන්න**: උපග්‍රන්ථය:3

▲ **විපුබ්බක සංඥා භාවනාව -**Vipubbaka sanna bhavana: මෙය දස අසුභ භාවනා වලින් එකකි, නවදොරින් ඕජස් ගලන සතුන් කන මල සිරුර අරමුණු කොට සිත සමාධිකර ගැනීමය. **බලන්න**: දස අසුභසංඥා භාවනාව.

▲ **විපරිනාම දුක්ඛ-** Viparinama dukka: ධර්මතා වෙනස්වීම නිසා හටගන්නා දුක මින් අදහස් කෙරේ. මෙය ත්‍රිවිධ දුක් වලින් එකකි. **බලන්න:** දුක, ත්‍රිවිධ දුක

▲ **විපුල ප්‍රඥාව:** පාලි: විපුලපඤ්ඤා- vastness of wisdom: ධර්මතා පිලිබඳ අවබෝධය මහත්බවට පත්වීම -විශාලවීම විපුල ප්‍රඥාව වේ. **බලන්න**: ප්‍රඥාව.

▼ **රූපයේ විරාගානුපස්සනාව**, වැඩීමෙන් නැවත නැවත එහි යෙදීමෙන් විපුල ප්‍රඥාව පරිපූර්ණවේ:

**“විරාගානුපස්සනා … රූපෙ විරාගානුපස්සනා භාවිතා බහුලීකතා විපුලපඤ්ඤං පරිපූරෙති”**: විපුල ප්‍රඥාව යනු කුමක්ද? : සිව් පිළිසිඹියාව… ශීල සමාධි හා ප්‍රඥා ස්කන්ධ. .. විමුක්ති ස්කන්ධය හා විමුක්ති ඥානදර්ශන ස්කන්ධය… ස්ථාන අස්ථාන නුවණ … විහාර සමාපත්තින් … ආර්යසත්‍ය… සත්තිස් බොධිපාක්‍ය අංග… ආර්යමාර්ගය… ශ්‍රමණඵල… අභිඥා…පරම අර්ථයවූ නිවන ආදී ධර්මතා පිලිබඳඇති විපුලවූ අවබෝධය, විපුල ප්‍රඥාවය.

**මූලාශ්‍ර:** බු.නි: පටිසම්භිදා : ප්‍රඥාවග්ග: 3.1 ප්‍රඥා කථා, පි. 166-176.

▼ **සතර ධර්මය** ඇති පුද්ගලයාට (සෝතාපන්න) විපුල ප්‍රඥාව ඇතිවේ.

**"...ඉමෙ ඛො භික්ඛවෙ, චත්තාරො ධම්මා භාවිතා බහුලීකතා විපුලපඤ්ඤාතාය සංවත්තනතීති".** (these four things, when developed and cultivated lead to the vastness of wisdom) **බලන්න**: ප්‍රඥාව, සතර ධර්මය. **මූලාශ්‍ර**: සංයු.නි: (5-2): මහාවග්ග: සෝතාපන්න සංයුත්ත:11.7.3 විපුල ප්‍රඥා සූත්‍රය, පි. 280, ESN: 55: Sotapatthisamyutta: 62.1 Greatness of Wisdom p. 2261

▼ **කායගතා සතිය වැඩීම විපුල ප්‍රඥාව පිණිසය**: (Mindfulness directed to the body...when developed and cultivated, leads to the vastness of wisdom). **මූලාශ්‍ර:**අංගු.නි: (1): 1 නිපාත: කායගතාසති වග්ග, පි. 125 EAN:1: Mindfulness Directed to the Body, p.52.

▼ **වෙනත් මූලාශ්‍ර**: **1**. "මහත් වූ ධර්මයන් විෂයෙහි පැවැති දැනීම විපුලපඤ්ඤා වේ"

https://pitaka.lk/dhammapada/ss/katha-28.html

▲ **විපල්ලාස-** Perversions: විපල්ලාස-විපරියාස ලෙසින් පෙන්වා ඇත්තේ ධර්මය වරදවා ගැනීමය. සම්මා දිට්ඨිය නොමැතිකම විපල්ලාස ඇතිවීමට හේතුවේ.විපල්ලාස ඇතිවිට යථාබව අවබෝධ කරගැනීමට නොහැකිවේ. සංඥා, චිත්ත, දිට්ඨි පිළිබඳව සතර ආකාරයෙන් විපල්ලාස කරයි: 1) අනිත්‍ය දේ නිත්‍ය ලෙසින් ගැනීම - නිත්‍යසංඥාව 2) දුක ගෙනදෙන දේ සුඛ යයි ගැනීම -සුඛසංඥාව3) අනාත්ම දේ ආත්මය සේ ගැනීම -අත්තසංඥාව 4) අශුභදේ ශුභ යයි ගැනීම-සුභසංඥාව. **බලන්න**: සතර විපල්ලාස. **මූලාශ්‍රය**: අංගු.නි: (2): 4 නිපාත: 4.1.5.9 විපල්ලාස සූත්‍රය, පි.122.

▼ **විපල්ලාස** මෙහි විස්තරාත්මකව දක්වා ඇත. **මූලාශ්‍රය**:බු.නි: පටිසම්භිදා 1: මහාවග්ග:8 විපරියාස කථා, පි.528.

▲ **විපචිතඤ්ඤූ** -understands through elaboration: විපචිතඤ්ඤූ පුද්ගලයා යනු ධර්මය අවබෝධ කරගැනීම පිණිස ධර්ම කරුණු විස්තරාත්මකව පැහැදිලි කරදිය යුතු පුද්ගලයාය. එලෙසින් ඔහුට, විමුක්තිය ලබාගැනීම පහසුවේ. **බලන්න**: පුද්ගලයෝ සිව්දෙන. **මූලාශ්‍ර:** අංගු.නි: ( 2): 4 නිපාත:4.3.4.3 නෙයාාපුග්ගල සූත්‍රය, පි. 281, EAN:4: 133.3 Of Quick Understanding,p.196.

▲ **විපස්සනා-** Vipassana: **බලන්න**: විදර්ශනා.

▲ **විපස්සි බුදුන්වහන්සේ**-The Buddha Vipassi: ගෝතම බුදුන් වහන්සේට පෙර වැඩසිටි විපස්සි බුදුන් වහන්සේ ගේ සම්බෝධිය පිළිබඳ මෙහි විස්තර කර ඇත. **මූලාශ්‍ර:**සංයු.නි: (2): නිදානවග්ග: අභිසමයසංයුත්ත: 1.1.4 විපස්සි සූත්‍රය, පි.30, බුද්ධවංශ පාලි:19: විපස්සි බුදුන්වහන්සේ.

▲**වේපචිත්ති අසුරරජ-** Vepachithti Asura: වේපචිත්ති අසුරරජ හා සක්දෙවිඳුන් අතර සුභාෂිතය පිළිබඳ වූ කථා බහ ගැන මෙහි දක්වා ඇත.

**සටහන**: වේපචිත්ති අසුරරජ, දෙවියන් සමගවූ යුද්ධයේදී පරාජයට පත්වීම ගැන විස්තර පිණිස **බලන්න**: සක්ඛසංයුත්ත:11.1.4 වේපචිත්ති සූත්‍රය, පි.418. **මූලාශ්‍රය:**සංයු.නි: (1): සගාථවග්ග:සක්ඛසංයුත්ත:11.1.5 සුභාෂිතජය සූත්‍රය, පි.422.

▲**වෙපුල්ල පව්ව- **Mount Vepulla: වෙපුල්ල පර්වතය, මගධයේ පිහිටි උස් කඳු වැටියකි. මේ පර්වතයේ නමද එහි උසද කලින් කලට වෙනස්වී ගිය බව බුදුන් වහන්සේ පෙන්වා ඇත්තේ සංස්කාරයන්ගේ අනිච්ච බව පෙන්වීමට පිණිසය. ගෝතම බුදුන් වහන්සේ පහළවීමට පෙර එහි නම් වෙනස්වීයාම බුදුන් වහන්සේ මෙහිදී විස්තර කර ඇත: 1) කකුසඳ බුදුන් සමයේ: නම:පාචීනවංස, එකල එම පර්වතය නැගීමට හා බැසීමට දින 8 ක් ගතවිය. 2) කොනාගමන බුදුන් සමයේ: නම: වංනික්ක, එකල එම පර්වතය නැගීමට හා බැසීමට දින 6 ක් ගතවිය. 3) කාශ්‍යප බුදුන් සමයේ:නම: සුඵස්ස, එකල එම පර්වතය නැගීමට හා බැසීමට දින 4 ක් ගතවිය. වර්තමානයේ, ගෝතම බුදුන් සමයේ වෙපුල්ල පව්ව නැගීමට හා බැසීමට යන්නේ සුළු කාලයකි. **බලන්න**: මිනිස් ආයුෂ. **මූලාශ්‍රය:**සංයු.නි: (2) : නිදානවග්ග:අන්මතග්ග සංයුත්ත: දුග්ගතවග්ග: 3.2.10 වෙපුල්ල පබ්බත සූත්‍රය, පි.314.

▲ **වෙපුල්ල පව්ව උපමාව- **Simile of Vepulla mountain: සසරේ දීර්ඝබව පෙන්වීමට මේ උපාමාව යොදාගෙන ඇත:

“ මගධරට ගිරිබ්ජ්ජ නම්වූ රජගහනුවර සමීපහි, ගිජ්කුළු පව්වට උතුරින් පිහිටි මේ වේපුල්ල පව්ව- රජගහනුවර පිරිවරා පිහිටි කඳු පහ අතුරින් මහා කන්දය. එක් කපක් තුල, රුස්කරනලද එක් පුද්ගලයෙක් ගේ ඇට ගොඩ මේ පව්වට සමානය”. **මූලාශ්‍රය:** ඛු.නි: ඉතිවුත්තක: 1.3.4 අට්ඨිපුඤ්ජ සූත්‍රය, පි.370.

**වභ**

▲**විභංග-**Analysis: විභංග යනු ධර්මතාවක් පැහැදිලි කිරීම පිණිස බෙදා දැක්වීමය.

▼ **මේ සූත්‍රයේදී පටිච්චසමුප්පාද ධර්මය** බෙදා දක්වා ඇත**. මූලාශ්‍රය:** සංයු.නි: (2): නිදානවග්ග:අභිසමයසංයුත්ත:1.1.2 විභංගසූත්‍රය, පි.26.

▼ **මේ සූත්‍රයේදී ආරිය අටමග** බෙදා දක්වා ඇත**.මූලාශ්‍රය:** සංයු.නි: (5-1):මහාවග්ග:මග්ගසංයුත්ත: අවිජ්ජාවග්ග:1.1.8 විභංග සූත්‍රය, පි.42.

▼ **මේ සූත්‍රයේදී සතිපට්ඨානය** බෙදා දක්වා ඇත**.මූලාශ්‍රය:** සංයු.නි: (5-1):මහාවග්ග:බොජ්ඣංගසංයුත්ත:3.4.10 විභංග සූත්‍රය, පි.353.

▼ **මේ සූත්‍රයේදී පංච ඉන්ද්‍රිය** බෙදා දක්වා ඇත**.මූලාශ්‍රය:** සංයු.නි: (5-1):මහාවග්ග:ඉන්ද්‍රියසංයුත්ත: 4.1.9 විභංග සූත්‍රය, පි. 377.

▼ **මේ සූත්‍රයන්හිදී:** සුඛ, දුඛ, සෝමනස්ස, දෝමනස්ස, උපේක්ඛා ඉන්ද්‍රිය 5 බෙදා දක්වා ඇත**. මූලාශ්‍රය:** සංයු.නි: (5-1):මහාවග්ග:ඉන්ද්‍රියසංයුත්ත: සුඛිඉන්ද්‍රියවග්ග:4.4.6-8 විභංග සූත්‍, පි. 400.

▼ **මේ සූත්‍රයේදී සතර ඉද්දිපාද** බෙදා දක්වා ඇත**.**

**මූලාශ්‍රය:** සංයු.නි: (5-2):මහාවග්ග:ඉද්දිපාදසංයුත්ත:7.2.10 විභංග සූත්‍රය, පි. 62.

▲ **විභජ්ජවාදය -**Vibhajja-Vada: විභජ්ජවාදය යනු කරුණු වීශ්ලේෂණාත්මකව විභාකර දැක්වීමය (Analytical or Discriminating doctrine). එමනිසා බුදුන් වහන්සේ '**විභජ්ජවාදී**' යයි හඳුන්වයි. **බලන්න:** බුද්ධනාම. **ශබ්දකෝෂ: පා.සිං.ශ:** පි.475: "**විභජ්ජ**: බෙදීම, කොටස්කිරිම; **විභජ්ජවාද:** බුද්ධවචනය, සර්වඥදේශනාව; **විභජ්ජවාදී:** විභජ්ජවාදී ඇත්තා, බුදුරජ"..**B.D**:p. 190: "**Vibhajja-Vada:** …name for the original Buddha doctrine called Theravada" **සටහන**: අටුවාවට අනුව, 3 නි සංඝායනාවේ මූලිකත්වය දැරූ මොග්ගලීපුත්තතිස්ස තෙරුන්, 'බුදුන් වහන්සේ විභජ්ජවාදී' යයි, අශෝක අධිරාජයාහට පවසා ඇත. **බලන්න**: කථාවත්ථු අටුවාව

▼ **සමහර අන්‍ය පරිබ්‍රාජකයන්ගේ** මතය වූවේ බුදුන් වහන්සේ සෑම තපස්බවක්ම ගරහන බවය. ඒ පිළබඳව වජ්ජියමාහිත ගහපති මෙසේ පැවසුහ:

**" …භාග්‍යවතුන්වහන්සේ, හැම තපස්බවක්, හැම තවුස්දමක් ගරහන්නේ නැත. යමක් ගැරහිය යුතුනම්, උන්වහන්සේ ඒදේ ගරහති; යමක් පැසසිය යුතු නම් උන්වහන්සේ ඒදේ පසසති. ගැරහියයුතු දේ ගරහන, පැසසිය යුතු දේ පසසන , භාග්‍යවතුන්වහන්සේ, විභජ්ජවාදීය, එක් පසක් පමණක් ගෙන කටයුතු නොකරන්නේය"**. **මූලාශ්‍ර:** අංගු.නි: (6): 10 නිපාත: 10.2.5.4.වජ්ජියමාහිත සූත්‍රය,පි.368, EAN:10: 94-4 Vajjiyamāhita, p.535.

▲ **විභව තණ්හාව-** Vibava tanha: විභව තණ්හාව (craving for non being) බොහෝ දුක් ඇතිකරන සසර දික් කරන ත්‍රිවිධ තණ්හාවන් ගෙන් එකකි. ආත්මය ලෙසින් සලකන දෙය සහමුලින්ම විනාශ කරගැනීමට- ( සමූලඝාතනය- Annihilation) ඇති ආශාවය. මෙය බුදුදහමේ නිරෝධයට (දුක අවසන්කරගැනීම) වඩා වෙනස් වන්නේ, ආත්මයක් ගැන විශ්වාස කරමින් එය විනාශ කරගැනීමට ආශා කිරීමය. මෙය උච්ඡෙදවාදී දිට්ඨියය, බුදුන් වහන්සේ වැඩසිටි සමයේ, සමහර අන්‍ය ආගමික නිකායන් දැරූ මතයකි. **බලන්න:** තණ්හාව, දිට්ඨි, භවදිට්ඨිය හා විභවදිට්ඨිය.

▲ **විභවදිට්ඨිය-**Belief in non-existence: විභව දිට්ඨිය යනු, මරණින් පසු පුද්ගලයා- නැතිවියාමය, භංග වීමය. මෙය උච්ඡේද දිට්ඨිය ලෙසින් ද හඳුන්වයි. **බලන්න**: භවදිට්ඨිය හා විභවදිට්ඨිය.

**වම**

▲ **විමානක ප්‍රේත-**Vimanaka Pretha: පහත් ලෝකවල (දුගතියේ) යළි උපත ලබන සමහර සත්වයන් විමානක ප්‍රේතයන් සේ හඳුන්වයි. කලින් කලට, කර්ම විපාක වලට අනුරූපව ඔවුන් සැප වේදනා ද, දුක් වේදනාද අත්දකී. විස්තර පිණිස **බලන්න**:ඛු.නි: විමානවත්ථු පේතවත්ථු.

▲**විමංසා-**Inquiry

විමංසා යනු විමසා බැලීමය, එසේ විමසා බලන්නා **විමංසක** ලෙසින් හඳුන්වයි. ධර්මය පිලිබඳ යහපත් අවබෝධය ලබා ගැනීමපිණිස ධර්ම කරුණු, නිතර විමසා බලා, පැහැදිලි අවබෝධය ලබා ගතයුතුයයි බුදුන් වහන්සේ සංඝයාට අනුසාසනා කර ඇත. අනුන්ගේ සිත් දැනගැනීමේ නුවණ නොමැති මහණ විසින් තථාගතයන් සම්බුද්ධ ද? යයි පිරික්ෂා කළයුතු යයි බුදුන් වහන්සේ මෙහිදී පෙන්වා ඇත. එතුමන්ගේ කායසමචාරය, වාක් සමාචාරය ආදීය සොයා බලා, උන්වහන්සේ හට කෙළෙස් නොමැතිබව අවබෝධ කරගතයුතුය. **සටහන:** විමංසා කිරීම ප්‍රඥාව ඇතිකරගැනීමට උපකාරිවේ. **මූලාශ්‍ර:**ම.නි: (1): 1.5.7 විමංසක සූත්‍රය, පි.764, EMN:47: Vīmaṁsaka Sutta, p.401.

▲ **වීමංසා ඉද්දිපාද-** Wimansa iIddipada : වීමංසා ඉද්දිපාද සතර ඉද්දිපාද වලින් එකකි. **බලන්න**: සතර ඉද්දිපාද **සටහන:** මේ ඉද්දිපාදය, වීමංසා සමාධිය ඉද්දිපාද ලෙසින්ද පෙන්වා ඇත: සමාධිය ලබාගැනීම පිණිස (ධර්ම විචය) ඇතිව, ප්‍රධාන විරිය ඇතිව, වීමංසා ඉද්දිපාදය පිහිට කොට, අකුසල මැඩ, සිත සමාධියට පත් කර ගැනීමය. **මූලාශ්‍ර:** සංයු.නි: (5-2): මහාවග්ග: ඉද්දිපාද සංයුත්ත:7.2.3 ඡන්ද සූත්‍රය, පි.48,ESN: 51: Iddipadasamyutta: 13.3 Concentration due to desire, p. 2073.

▲**විමුක්තිය**: පාලි: **විමුත්ති-** Liberation: ධර්මයට අනුව විමුක්තිය - විමොක්ඛය යනු සසර දුකින් නිදහස් වීමය. නිවන ලැබීමය.විමුක්තිය ආකාර 2 කට අනුව සිදුවේ: චේතෝ විමුක්තිය හා ප්‍රඥා විමුක්තිය. සියලු ධර්මතා විමුක්තිය සාරය (හරය) කොට ඇත යයි බුදුන් වහන්සේ වදාළහ.

**විමුත්තිසාරා සබ්බෙ ධම්මා (**Liberation is their core). **බලන්න**: අංගු.නි: (1) 2 නිපාත: 2.1.8 මූලක සූත්‍රය.

▼ **විමුක්තියට උපකාරී ධර්මතා-** Things which support liberation චේතෝවිමුක්තිය හා ප්‍රඥාවිමුක්තිය ලබා දෙන ධර්මතා : 1) කයේ අසුභය ආවර්ජනය 2) ආහාරයෙහි ප්‍රතිකූලසංඥාව වැඩීම 3) සබ්බලෝකේ අනභිරත සංඥාව වැඩීම 4) සබ්බසංඛාරයෙහි අනාත්ම සංඥාව වැඩීම 5) මරණ සංඥාව වැඩීම 6) අනිච්ච සංඥාව වැඩීම 7) අනිච්චේ දුක්ඛ සංඥාව වැඩීම 8) දුක්ඛේ අනත්ත සංඥාව වැඩීම 9) පහාන සංඥාව වැඩීම 10) විරාග සංඥාව වැඩීම 11) නිරෝධ සංඥාව වැඩීම හා විපුලබවට පත් කරගැනීම. **මූලාශ්‍රය**: අංගු.නි: ( 3): 5 නිපාත: 5.2.3.1හා 5.2.3.2 චේතෝවිමුක්ති ඵල සූත්‍ර 2 කි, පි. 156, EAN: 5: 71.1 & 72.2 Liberation of Mind, p. 263.

▼ **තථාගතයන් වහන්සේ,** විමුක්තිය පිළිබඳ අවබෝධය ගැන, ආනන්ද තෙරුන් මෙසේ වදාළහ:

"විමුක්තිය ලැබූ හෝ ලබන හෝ මතුවට ලබාගන්නා ලෝකයේ ඕනෑම පුද්ගලයෙක් පළමුව ප්‍රඥාව දුර්වල කරන පංච නිවරණ ප්‍රහීණය කලයුතුය; ඉන්පසු සතර සතිපට්ඨානය මනාව පිහිටුවාගත් සිතකින්, නිවැරදි ලෙසින් සප්ත බොජ්ඣංග ධර්ම වැඩිය යුතුය. මේ ක්‍රමයට සත්වයෝ ලෝකයෙන් නිකුත්ව විමුත්තිය ලබයි. **මූලාශ්‍ර:** අංගු.නි:(6 )10- නිපාත: 10.2.5.5. උත්තිය සූත්‍රය,පි.374, EAN:10: V,95-5 Uttiya, p.536.

▲ **විමුක්ති ආයතන-** Bases of liberation; විමුක්ති ආයතන: සියලු කෙළෙස් ප්‍රහීණකර නිවන ලබාගැනීම පිලිබඳ කටයුතු කරණ ආකාරයය. විමුක්ති ආයතන 5 කි. **බලන්න**: පංච විමුක්ති ආයතන. **මූලාශ්‍රය:** අංගු.නි: (3): 5 නිපාත:පංචඅන්ගිකවග්ග: 5.1.3.6 විමුත්තායතන සූත්‍රය, පි.54.

▲ **විමුක්ති ඥානය-**Vimukthi Nana: ආරිය මාර්ගයේ විමුක්තිය ලබා, ප්‍රහීණය කරගත් උප කෙලෙශයන් ගැන ආපසු බැලීම විමුක්ති ඥානය වේ. එනම් සෝතාපන්න වීමෙන් සක්කාය දිට්ටිය ආදී අංග 3 ක් පහකර ගැනීම, අනාගාමී: ඔරම්භාගිය සංයෝජන පහකිරීම, අරහත්: දස සංයෝජන පහකර ගැනීම ආදී වශයෙන්ය. **මූලාශ්‍රය**: ඛු.නි: පටිසම්භිදා 1**:** 13 විමුක්ති ඤාණය, පි.157.

▲ **විමුක්ති ඥාන දර්ශනය -**knowledge and vision: විමුක්ති ඥාන දර්ශනය ලෙසින් පෙන්වා ඇත්තේ සසර දුක නිමකර නිවන ලැබීමය, ඒ පුද්ගලයා උත්තරීතර මනුෂ්‍යයාය, ඒ සඳහා ගතයුතු මග ආරිය අටමගය. එම උතුම් බව ලැබූ පුද්ගලයා ආහුනෙය්‍ය,පාහුනෙය්‍ය බවට සුදුසුය. **බලන්න**: උත්තරීතර මනුෂ්‍යයා. **මූලාශ්‍ර:** සංයු.නි: ( 5-1):මහාවග්ග:මග්ගසංයුත්ත: 1.5.7 ඤාණදස්සන සූත්‍රය, පි. 76, ESN: 45: Maggasamyutta:42-48, knowledge and vision, p. 1651.

▲ **විමුක්ති මග-** the emancipating way: බ්‍රහ්මචරියාව- ආධ්‍යාත්මික මග, විමුක්ති මග ලෙසින්ද හඳුන්වයි**. බලන්න:** ආධ්‍යාත්මික මග, EAN: note 352,p. 597, බ්‍රහ්මචරියාව.

▲ **විමුක්ති රසය-** Vimuktirasa: ධර්මයේ ඇති එකම රසය විමුක්ති රසයය. **බලන්න**: එක රසය. **මූලාශ්‍ර:**අංගු.නි: 8 නිපාත: 8.1.2.9 පහාරාද සූත්‍රය, පි.103, EAN:8:19.9 Pahārāda,p.421.

▲ **විමුක්ති සම්පන්න-** Vimuktisampanna: විමුක්ති සම්පන්න වීම**,** සංඝයාට ආහුනෙය්‍ය,පාහුනෙය්‍ය ආදිය ලැබීමට අවශ්‍ය කරුණු 5 න් එකකි. **බලන්න**: ආහුනෙය්‍ය ආදී ගුණ. **මූලාශ්‍රය**: අංගු.නි: (3): 5 නිපාත: ඵාසුවිහාරවග්ග: 5.3.1.7 සීලසම්පන්න සූත්‍රය, පි.236, රාජවග්ග: 5.3.4.9 අකන්ඛම සූත්‍රය, පි.277.

▲ **විමොක්ඛ-** Deliverance: විමොක්ඛ -විමුක්තිය (**විමොකඛා)** යනු දුකින් නිදහස්වීමය-සසරින් ගැලවීමය-යළි උපත නිමකරගැනීමය. **විමොක්ක දොරටු තුනකි (**Doors of liberation / emancipation): විමොක්ක දොරටු තුන නිවන සාක්ෂාත්කර ගැනීමය පිණිසය. 1) **සුඤ්ඤත විමොක්ක (විමොක්ෂය) :** හිස්බව, මේ සසුනේ මහණ, පංචස්කන්ධය මමය, මාගේය, මගේ ආත්මය යයි නොගෙන අනාත්ම බව- කිසිදෙයක් නොමැතිබව- ශූන්‍ය බව මෙනෙහිකරයි. එසේ මෙනෙහි කරන භාවනා යෝගියාට උපදින මාර්ගය සුඤ්ඤත විමොක්ෂ යවේ. **2) අනිමිත්ත විමොක්ක (විමොක්ෂය)**: නිමිති රහිතබව, මේ සසුනේ මහණ, පංචස්කන්ධය අනිත්‍ය වශයෙන් බලන්නේ එහි නිත්‍ය නිමිත්තක් නැතිබව මෙනෙහිකරයි. සංඥා, දිට්ඨි, චිත්ත විපල්ලාස හෙවත් නිත්‍ය යන වැටහීමෙන් මිදෙන මග අනිත්‍ය සංඥාව වැඩීමය. එසේ මෙනෙහි කරන භාවනා යෝගියාට උපදින මාර්ගය : අනිමිත්ත විමොක්ෂයවේ. **3) අප්පණිහිත විමොක්ක :**මේ සසුනේ මහණ, පංචස්කන්ධය දුක බව මෙනෙහි කරමින් එයට ඇති ආශාව දුරුකරයි.

**'එතං මම එතං සුඛං'**: ආදීවූ පංච උපාදානස්කන්ධය 'මමය මට ඇති සැපයය' යන තණ්හාව බැහැරකරයි. එසේ අප්පණිහිත සංඥාව වඩනවිට, දුක අවබෝධව, තන්හාව පහවයයි. එසේ උපදින මාර්ගය අප්පණිහිත විමොක්ෂයවේ. **මූලාශ්‍රය**: ඛු.නි: පටිසම්භිදාමග්ග:1: මහාවග්ග-විමොක්ඛ කථා.

▲**විමොක්ඛ අට - 8** Ways to liberation: විමොක්ඛ අට: සිව් ජාන හා අරූප සමාපත්ති සතරය. **බලන්න:** අෂ්ඨ විමොක්ක.

▲**විමොක්ක මාර්ග 11 -** 11 Ways to liberation: මෙහිදී ආනන්ද තෙරුන්, අරහත්වය ලැබීම පිණිස බුදුන් වහන්සේ වදාළ. විමොක්ඛ මාර්ග 11ක් පෙන්වා ඇත: 1-4)සිව්ජාන 5-8) සිව්බ්‍රහ්මවිහාර 9-11) අරූපසමාපත්ති. **මූලාශ්‍රය:** අංගු.නි: (6): 11 නිපාත: 2 අනුසති වගග: 11.2.6 අට්ඨකනාගර සූත්‍රය, පි.674

**වය**

▲ **වයධම්ම-**Cessation: වයධම්ම යනු වෙනස්වීමය, නැතිවියාමය. හේතුප්‍රත්‍ය යෙන් හටගත් ස්කන්ධ ධර්මයන්ගේ විපරිණාමය දැකීම වයවේ**. බලන්න**:විවිධ ඥාන, උදයත්තගාමිණි ප්‍රඥාව. බුදුන් වහන්සේ මෙසේ වදාළහ: "...රූපය වයධම්මය...වේදනාව...සංඥාව... සංස්කාර...විඥාණය වයධම්මය (නැසෙනසුළුය). එසේ දකිනා ආරිය ශ්‍රාවකයාට රහත්බව පිණිස අනෙකක් නැත". **සටහන:** සංයු.නි: (4): සළායතනවග්ග: වේදනාසංයුත්ත:1.4.8 වයධම්ම සූත්‍රයේ (පි.84), මෙයට සමාන විස්තරයක් දක්වා ඇත. **මූලාශ්‍රය:** සංයු.නි: (3) ඛන්ධවග්ග: රාධසංයුත්ත: 2.2.10 වයධම්මසූත්‍රය,පි.386.

▲ **ව්‍යාධිධම්ම-** Vyadidhamma: ව්‍යාධිධම්ම යනු සියල්ල (සියලු ධර්මතා ( ලෙඩවන බවය-ආබාධයටපත්වන බවය. **මූලාශ්‍රය:**සංයු.නි: (4): සළායතනවග්ග:වේදනාසංයුත්ත:ජාතිධම්මවග්ග: 1.4.3 ව්‍යාධිධම්ම සූත්‍රය, පි.84.

▲**ව්‍යාපාදය**:පාලි: **බ්‍යාපාදො** - ill will: ව්‍යාපාදය -තරහ, සිත කෙළෙසන ධර්මයකි දස අකුසල්වලින් එකකි, ධර්ම මාර්ගය අහුරවන නීවරණයකි, අකුසල මූලයකි. මෙය කෙනෙක් දුගතියට පත්කිරීමට හේතුවේ. **බලන්න**: උපකෙළෙස, නීවරණ, දසඅකුසල.

▼ **ව්‍යාපාදය ඇතිවීමේ** ක්‍රියාවලිය හා එමගින් පුහුදුන් මිනිසා තුන් දොරින් අකුසල ක්‍රියා කිරීමට යෙදීම මේ සූත්‍රයේ විස්තර කර ඇත. **මූලාශ්‍ර:** සංයු.නි: ( 2 ): නිදානවග්ග: ධාතුසංයුත්ත: 2.2.2 සනිදාන සූත්‍රය,පි. 258, ESN: 14: Dathusamyutta: 12.2 With a source, p. 751.

▼ **බුදුන් වහන්සේ** තරහ සිත් ඇති කෙනෙකුගේ ස්වභාවය මෙසේ දක්වා ඇත:

"මේ ලෝකයේ කෙනෙක් තරහ සිත් ඇතිව සිටී. ඔහු ක්‍රෝධසිතින් මෙසේ සිතයි: 'මේ සත්‍වයෝ මැරෙත්වා, ඝාතනය වේවා, මුල්ම නැසෙත්වා, විනාශවෙත්වා, සහමුලින්ම නැතිවේවා'."

**"ඉධ භික්ඛවෙ එකච්චො බ්‍යාපන්නචිත්තො හොති පදුට්ඨමනසඞ්කප්පො,'ඉමෙ සත්තා හඤ්ඤන්තුවා බජ්ඣන්තුවා උච්ඡිජ්ජන්තුවා විනස්සන්තු වා මා වා අහෙසුනන්ති' "**. මූලාශ්‍ර:අංගු.නි: (6): 10 නිපාත: කරජකාය වග්ග: 10.5.1.1. පඨම නිරය සූත්‍රය**,** පි. 548, EAN:10: The Deed-born body: 211.1 Hell, p. 556.

▼ **වෙනත් මූලාශ්‍ර: 1.** "ව්‍යාපාද: නම් හිතේසැප විනාශයට හේතුවූ දූෂිතවූ සිතය. සිත විකාර ගත වීමය": **සද්ධර්ම කෝෂය,** පි. 104. **2.** "ද්වේෂය-ව්‍යාපාදය නිසා බොහෝ අකුසල ඇතිවේ. මෙය ලෝභයට වඩා දරුණුය. ලෝභය නිසා අකුසල ඇතිවී වැඩි එන්නේ සෙමින්ය. ද්වේෂය නිසා අකුසල වේගයෙන් නැගී එති. ද්වේෂයෙන් මඩනා ලද පුද්ගලයා පළමුව රවා බලයි, පරුෂ වචන කියයි, අනුන්ට පහර දෙයි, දේපොළ විනාශ කරයි, සිය දිවි නසා ගනී. ද්වේෂය අකුසල මූලයකි...". **කෙලෙස් එක්දහස් පන්සියය**: පි. 124, රේරුකානේ චන්දවිමල මහානාහිමි, 2008.

▲**ව්‍යාපාද ධාතුව**- Element of ill will : ව්‍යාපාදධාතුව යනු සිතේ ඇති තරහ, වෛර ස්වභාවයය. මෙය නැතිකර ගැනීමට, අව්‍යාපාද ධාතුව- මිත්‍රශීලිබව- මෛත්‍රාව වැඩිය යුතුවේ. **බලන්න:** ත්‍රිවිධ ධර්මතා. **සටහන:** ව්‍යාපාද විතර්කය යනු ව්‍යාපාදධාතුව බව මෙහි දක්වා ඇත. **බලන්න:** සංයු.නි: (2): නිදානවග්ග: ධාතුසංයුත්ත: 2.2.2 සනිදාන සූත්‍රය,පි. 258

▲ **ව්‍යාපාද නිස්සරණීය ධාතුව-** element of escape from ill will ක්‍රෝධය තරහ ආදී පටිසයෙහි සිත නොයෙදවා ඉන් මිදීම ව්‍යාපාද නිස්සරණීය ධාතුවය. **බලන්න**: නිස්සරණීය ධාතු.

▲ **ව්‍යාපාද විතක්ක-** Thoughts of ill will: ව්‍යාපාද විතක්ක යනු සිතේ ඇතිවූ තරහ, වෛරය පිළිබඳව සිතිවිලි පවත්වාගෙන යෑමය. මෙය නැතිකර ගැනීමට, අව්‍යාපාද විතක්ක- මෙත්තා සහගත සිතිවිලි වැඩිය යුතුවේ. **බලන්න:** ව්‍යාපාද ධාතුව, ත්‍රිවිධ ධර්මතා.

▲ **ව්‍යාපාද සංඥා** - Perceptions of ill will: ව්‍යාපාද සංඥා යනු සිතට ගත් තරහ, වෛරය ආදී අරමුණු පවත්වාගෙන යෑමය. මෙය නැතිකර ගැනීමට, සංඥාව වෙනස් කර අව්‍යාපාද සංඥාව- මෙත්තා සහගත අරමුණු ඇතිකර ගතයුතුය. **බලන්න:** ත්‍රිවිධ ධර්මතා.

▲ **වායෝ ධාතුව -** wind element: සතර මහා භූතයන්ගෙන් එකකි. **බලන්න:** සතර මහා භූත, ධාතුමනසිකාර භාවනාව.

**වර**

▲ **වෛරය-** Hatred: වෛරය (දොසො), අනුන්කෙරෙහි ඇති දැඩි තරහය, දසඅකුසලයන්ගෙන් එක් අකුසලයකි. **මූලාශ්‍රය:** අංගු.නි: (3): 5 නිපාත: උපාසකවග්ග:5.4.3.4 වෙරසූත්‍රය, පි.354.

▼**මේ සූත්‍රයන්හි**, වෛර 5 හා භය 5 විස්තරාත්මකව පෙන්වා ඇත.

**මූලාශ්‍රය:** අංගු.නි: (5): 9 නිපාත: වෙරභය සූත්‍ර 2 කි, පි.478.

▲**වර්ධනය-**Growth: වර්ධනය (වඩ්ඪී) යනු යම්කිසි දෙයක වැඩීමය, නැගී ඒමය. ආධ්‍යාත්මික මගේ වර්ධනයට උපකාරීවන කරුණු: 1)

ශ්‍රද්ධාවර්ධනය 2) ශීලවර්ධනය 3) ප්‍රඥාවර්ධනය. **මූලාශ්‍රය**: අංගු.නි:(1 ): 3 නිපාත: යොධාජීවවග්ග:3.3.4.7 සූත්‍රය, පි.556.

▼**කරුණු 5 ක් ඇති** ආරිය ශ්‍රාවකයා, ආරිය ශ්‍රාවිකාවය, ආරිය වර්ධනය ඇතිකර ගනි. : 1) ශ්‍රද්ධාවර්ධනය 2) ශීලවර්ධනය 3) ශ්‍රැතවර්ධනය 4) ත්‍යාග වර්ධනය 5.) ප්‍රඥාවර්ධනය. ඔවුන් මේ භවයේදීම ජීවිත සාරය (නිවන) ලබාගනී. **මූලාශ්‍ර**:අංගු.නි: (3): 5 නිපාත: සඤ්ඤාවග්ග: ප්‍රථම හා දුතිය වඩ්ඪි සූත්‍ර, පි. 150, සංයු.නි: (4): සළායතනවග්ග: මාතුගාමසංයුත්ත:බලවග්ග:3.3.10 වඩ්ඪි සූත්‍රය, පි.498.

▼**කරුණු 10 ක් ඇති** ගිහි ආරිය ශ්‍රාවකයා මේ භවයේදීම ජීවිත සාරය (නිවන) ලබාගනී. 1) කෙත්වතු වැඩේ 2) ධන ධාන්‍ය වැඩේ 3) දරුවන් වැඩේ 4) දාස ආදීන් වැඩේ 5 ) පශුසම්පත් ආදියෙන් වැඩේ (6-10) ශීලය ආදී පෙරදක්වා ඇති කරුණු 5. **මූලාශ්‍රය**:අංගු.නි: (6): 10 නිපාත: ආකංඛෙයියවග්ග:10.2.3.4 වඩ්ඪි සූත්‍රය, පි.272.

▲ **වර්ණනාකිරීම**-Praise: වර්ණනාකිරීම: ගුණ දැක ඔහුට ප්‍රසංසාකිරීමය. එහෙත්, වර්ණනාකිරීමට නුසුදුසු ගුණ ඇති අය ගැන හෝ කරුණු පිලිබඳ ගුණ කියන අය නිරයගාමීවන බව මේ සූත්‍රයන්හි දක්වා ඇත. **මූලාශ්‍ර**: අංගු.නි: (2): 4 නිපාත:මචලවග්ග: 4.2.4.3 වණ්ණ සූත්‍රය, පි. 180, අංගු.නි: (3): 5 නිපාත: 5.3.2.6 වණ්ණ සූත්‍රය, පි.246.

▲ **වැරදි ක්‍රියා**:පාලි**: වජ්ජ**- Faults: වැරදි ක්‍රියා යනු, අපරාධ, අසම්මත ක්‍රියාය (සමාජය පිලිනොගත් හැසිරීම). **බුදුන් වහන්සේ** වැරදි ක්‍රියා 2 ක් පෙන්වා ඇත: 1) **දිට්ඨධම්ම වැරදි ක්‍රියා (දිට්ඨධම්ම වජ්ජ)** : මෙලොවදීම දුක් විපාක විඳීමට සිදුවන වැරදි ක්‍රියා 2) **සම්පරායික වැරදි ක්‍රියා (සම්පරායික වජ්ජ)**: පරලොව දී දුක් විපාක විඳීමට සිදුවන වැරදි ක්‍රියා. **දිට්ඨධම්ම වැරදි ක්‍රියා:** සොරකම් කර හසුවූ කෙනෙකුට රජය විසින් දඬුවම් ලබාදේ- විශාල මුදලක් වන්දි ලෙසින් ගෙවීමට, සිරගේ සිටීමට, ආදී දඬුවම් විඳීමට සිදුවේ. වැරදි කිරීම නිසා මෙලොවදී විඳීමට සිදුවන දඬුවම් දන්නා, දකිනා නුවණැති පුද්ගලයා වැරදි ක්‍රියා දුර ලයි. වැරදි ක්‍රියා ගැන දඬුවම් **බලන්න**: EAN: note: 216: p. 591. **සම්පරායික වැරදි ක්‍රියා:** තුන් දොරින් කරන ලාමක පාපි ක්‍රියා පරලොවදී ( සතර අපායේ ආදී) දුක් විපාක දෙන වැරදි ක්‍රියාවන්ය. ධර්මය දත් නුවණැති පුද්ගලයා, වැරදි ක්‍රියා කිරීමෙන්, මතු දුගතියේ දී විඳීමට සිදුවන දුක් පීඩා සිහිපත්කර ඒවායේ නොයෙදේ. බුදුන් වහන්සේ භික්ෂූන්ට අවවාද කළේ , දිට්ඨධම්ම වැරදි ක්‍රියා හා සම්පරයික වැරදි ක්‍රියා කිරීම බිය ගෙනෙදෙන බව දැන, ඒවායින් වැළකීමට පුරුදු පුහුණු වියයුතු බවය. **සටහන:** අංගු.නි: (1): 2 නිපාත:පුග්ගලවග්ග: 4.3.4.5 වජ්ජපුග්ගල සූත්‍රයේ: වැරදි ක්‍රියා කරන පුද්ගලයන් 3 දෙනක් ගැන පෙන්වා ඇත: සාවද්‍ය, වද්‍යබහුල, අල්පවද්‍ය. **මූලාශ්‍ර:** අංගු.නි: (1): 2 නිපාත:වස්සූපනායිකාවග්ග: 2.1.1.1. වජ්ජ සූත්‍රය, පි. 133, EAN: 2: 1.1 Faults, p. 56.

▲ **විරද්ධ**-Viraddha: විරද්ධ යනු වරදවා ගැනීමය. මෙහිදී පෙන්වා ඇත්තේ ආරිය අටමග වරදවා ගැනීමෙන් සිදුවන අයහපතය**. බලන්න:**: සංයු.නි: (5-10: මහාවග්ග: මග්ගසංයුත්ත:පටිපදාවග්ග: 1.4.3 විරද්ධ සූත්‍රය, පි.66.

▼ **මෙහිදී පෙන්වා ඇත්තේ** සතරසතිපට්ඨානය වරදවා ගැනීමෙන් සිදුවන අයහපතය**. මූලාශ්‍රය**: සංයු.නි: (5-1): මහාවග්ග: සතිපට්ඨාන සංයුත්ත:අනනුස්සුතවග්ග: 3.4.3 විරද්ධ සූත්‍රය, පි.350.

▼ **මෙහිදී පෙන්වා ඇත්තේ** සතර ඉද්දිපාද වරදවා ගැනීමෙන් සිදුවන අයහපතය**. මූලාශ්‍රය**: සංයු.නි: (5-2): මහාවග්ග: ඉද්දිපාදසංයුත්ත:චාපාලවග්ග:7.1.2 විරද්ධ සූත්‍රය, පි.26.

▲ **විරාගය**- Dispassion: විරාගය (විරාගො) යනු සසරට නො ඇල්මය- පංච උපාදානස්කන්ධයට නො ඇලීමය. සංඛත හෝ වේවා අසංඛත හෝ වේවා (හේතු ප්‍රත්‍යයෙන් සකස්වූ හෝ හේතු ප්‍රත්‍යයෙන් ඇතිනොවූ) යම්තාක් ධර්මයෝ ඇත්නම්, විරාගය ඒ හැමට වඩා අග්‍රය: එමගින්, රාග ආදීවූ මද මඩන්නේය, ආශාව නම්වූ පිපාසය සංසිඳුවන්නේය, ආලය- තණ්හාව සහමුලින්ම නසන්නේය. සසර වටයේ දුක් සිඳදමන්නේය. තණ්හාව ක්‍ෂය කරන, විරාගය ඇති, නිරෝධය ඇති නිවනක් ඇත්ද එය අග්‍රය. යම්කෙනෙක් විරාග ධර්මයේ පැහැදෙන්නේ නම් ඔහු අග්‍රවූ දේ කෙරෙහි පැහැදී ඇත. අග්‍රස්ථානය කෙරෙහි ප්‍රසන්නවූ ඒ තැනැත්තාට අග්‍ර විපාක ලැබේ යයි බුදුන් වහන්සේ වදාළහ:

**“ යාවතා භික්ඛවෙ ධම්මා සඞ්ඛතා වා අසඞ්ඛතා වා, විරාගො තෙසං ධම්මානං අග්ගමක්ඛායාති. යදිදං මදනිම්මදනො පිපාසවිනයො ආලයසමුග්ඝාතො වට්ටුපච්ඡෙදො තණ්හක්ඛයො විරාගො නිරොධො නිබ්බානං. යෙ භික්ඛවෙ ධම්මෙ පසන්නා, අග්ගෙ තෙ පසන්නා, අග්ගෙ ඛො පන පසන්නානං අග්ගො විපාකො හොති”. සටහන:** විරාගය යනු නිවනය. නිවන අරමුණු කරගත් උපසමානුසති භාවනාවේ යෙදෙන යෝගියා ඉහත දැක්වූ ගාථාව මෙනෙහිකරයි. **බලන්න**: උපසමානුසති භාවනාව. **මූලාශ්‍ර:** අංගු.නි: (2 ): 4 නිපාත: 4.1.4.4. අග්ගප්පසාද සූත්‍රය, පි. 92, EAN: 4: 34.4 Confidence, p.161, අංගු.නි: (3 ): 5 නිපාතය:2 චුන්දී සූත්‍රය,පි.75, EAN: 5: 32.2 Cundi, p.247.

▼ **විරාගය හෙවත් නොඇල්ම**- සය ඉන්ද්‍රිය පිනවීමටඇති ඇල්ම-ආශාව නැතිවීයාම සසරින් එතෙරවීමේ මගය. විරාගයට පත් සිතේ විමුක්තිය ඇතිවේ. බුදුන්වහන්සේ වදාලේ විරාගය මගින් විමුත්තිඥාන දර්ශනය ඇතිවන බවය- නිවන සාක්ෂාත්වීමය. **මූලාශ්‍ර**:අංගු.නි:( 6 )11නිපාත: 1 නිසසය වගග,11.1.1.කීමත්ථිය සූත්‍රය, 11.1.2 න චෙතනාය කරණිය සූත්‍රය පි.611-614, EAN:11: I Dependence, 1-1 What Purpose,1-2 Volition p.566.

▼**විරාග ධර්මය යනු නිවනය**, ඒ පිණිස ඇති මග (නිවන්මග) මේ සූත්‍රයන්හි පෙන්වා ඇත. **මූලාශ්‍රය:** සංයු.නි: (4): සළායතනවග්ග: අසංඛතසංයුත්ත:9.2- විරාගසූත්‍ර, පි.688.

▼ **රාගය දුරුකිරීම** විරාගය බවද, ඒ පිණිස ඇති මග ආරියඅටමග ය. **මූලාශ්‍රය:** සංයු.නි: (5-1): මහාවග්ග: මග්ගසංයුත්ත:1.5.1 විරාග සූත්‍රය, පි.72.

▼**සතර සතිපට්ඨාන** වර්ධනය, විරාගය පිණිස වේ. **මූලාශ්‍රය:** සංයු.නි: (5-1): මහාවග්ග: සතිපට්ඨානසංයුත්ත:අනනුස්සුතවග්ග: 3.4.2 විරාග සූත්‍රය, පි.347.

▼ **මෙහිදී විරාගය** මාර්ගය බව, විමුක්තිය ඵලය බව පෙන්වා ඇත. **මූලාශ්‍රය:**ඛු.නි: පටිසම්භිදා 2: යුගනද්ධ: 2.5 විරාග කථා, පි.92.

▲ **විරාග සංඥාව**: පාලි: **විරාගසඤ්ඤා-** perception of dispassion: විරාග සංඥාව ලෙසින් පෙන්වා ඇත්තේ ලෝකයේ සකස්වූ ධර්මතා වලට ඇති ඇල්ම- තණ්හාව පහවියාමය. නිවන සාක්ෂාත් කර ගැනීමට උපකාර කරගන්නා භාවනා ක්‍රමයකි. **බලන්න**: දස සංඥා, භාවනාව, ගිරිමානන්ද සූත්‍රය.

▼**විරාගසංඥාව භාවිතා** කිරීම, බහුලව භාවිතා කිරීම නිසා මහත්ඵල මහා ආනිසංස ලැබෙන බව මෙහි දක්වා ඇත. **මූලාශ්‍රය:** සංයු.නි: (5-1): මහාවග්ග:බොජ්ඣංගසංයුත්ත:නිරෝධවග්ග: 2.8.- විරාග සූත්‍ර, පි. 275.

▲ **වීරාතෙරණිය-** Vira Therani: **බලන්න**: උපග්‍රන්ථය:2

▲**වීරිය**: පාලි: **විරියා** - Striving-energy : වීරිය යනු අකුසල පහ කරගැනීමට හා කුසල වඩා ගැනීමට ඇති අදිට්ඨානයය, උත්සාහයය. වීරිය, ඉන්ද්‍රියක් හා බලයක් ලෙසින් ක්‍රියා කරනවිට ආධ්‍යාත්මික වර්ධනයට විශේෂ බවක් ඇතිවේ. මෙය සේඛ පුහුණුවේ යෙදෙන භික්ෂූන් සතු ගුණයකි, ආරිය අටමගේ එක් අංගයකි, එනම්, සම්මා වායාමය. වීරිය, සප්ත බොජ්ඣංග ධර්මයකි. විරිය නොමැතිව ආධ්‍යාත්මික මග වඩා ගත නොහැකිය.**ශබ්දකෝෂ:පා.සිං.ශ:** පි.460: "**විරිය**: ශක්තිය, බලය, ආනුභාවය".**B.D**: p. 199: "**Viriya**: Energy-virility, manliness, heroism, is one of the 5 spiritual faculties… is identical with Right Effort in the 8 fold path".

▼ **වීරිය ඇතිකරගැනීම** අවස්ථා 3ක් අනුව සිදුවේ. 1) ආරම්භක ධාතුව (ආරම්භවිරිය- ආරබ්ධ විරිය) 2) නික්කම ධාතුව (නික්කම විරිය- නික්මීමේ විරිය) 3) පරාක්‍රමධාතු (පරාක්‍රම විරිය- දැඩි විරිය). යම් කටයුත්ත කරගැනීම පිණිස පළමුව ගන්නා උත්සාහය ආරම්භක ධාතුවය. එම කටයුත්ත නොනවත්වා කර ගැනීමට උත්සාහය පවත්වා ගැනීම නික්කම ධාතුවය. සියලු බාධා අවහිර මැඩගැනීම පිණිස යොදාගන්නා බලගතු විරිය පරාක්‍රමධාතුවය. ථිනමිද්ධය පහකර ගැනීම පිණිස විරිය යොදාගැනීම ගැන බුදුන් වහන්සේ මෙසේ වදාළහ:

**"මහණෙනි… නුපන් ථිනමිද්ධය නො ඉපදවීම පිණිස, උපන් ථිනමිද්ධය පහකර ගැනීම පිණිස ආරම්භක ධාතුව, නික්කම ධාතුව, පරාක්‍රමධාතුව යම් සේ වේද, එබඳු අන් එක ධර්මයක් මම (බුදු නුවණින්) නොදකිමි…"** ( Bhikkhus, I do not see even one other thing on account of which un-arisen dullness and drowsiness do not arise and arisen dullness and drowsiness are abandoned so much as the element of instigation, the element of persistence, the element of exertion). සටහන: * *Ārambhadhātu*, *nikkamadhātu*, *parakkamadhātu*. Mp explains these as three successively more powerful degrees of energy. බලන්න:EAN:note:33,p.581. මූලාශ්‍ර: අංගු.නි: (1 ): 1 නිපාත:නීවරණප්‍රහාණවග්ග: 1.2.8 සූත්‍රය, පි. 46, EAN: 1: Obsession of the mind: 18.8 sutta, p. 37.

▼ **අකුසල නැති කරගැනීමට** හා කුසල ධර්ම ඇතිකරගැනීමට, වඩා ගැනීමට, ආරම්භක විරිය (ආරද්ධවීරිය) වැනි, වෙනත් එකම ධර්මතාවයක් නොමැති බව බුදුන් වහන්සේ වදාළහ.**බලන්න:**අංගු.නි: (1): 1 නිපාත: විරියආරම්භවග්ග සූත්‍ර, පි. 60.

▼**ප්‍රධාන විරිය පිරිම**: ලෝකයේ දුකසේ වැඩිය යුතු ප්‍රධාන වීරිය 2කි:1) සංසයාට සිව්පස පිරිනැමීම පිණිස ගිහියන් දරන වීරිය 2) ගිහිගෙයින් නික්ම අනගාරික ලෙසින් (පබ්බජා), සියලු උපධි නැතිකරගැනීමට දරන වීරිය- නිවන පිණිස. දෙවන වීරිය අග්‍ර ය.. **සටහන්:** * මේ වීරිය ප්‍රධාන වීරිය ලෙසින්ද පෙන්වා ඇත. ** දෙවන වීරිය '**සබ්බඋපධි පටිනිස්සගො**': අටුවාවට අනුව උපධි 3 කි:පංච උපාදානස්කන්ධය, කෙළෙස්, සංඛාර-චේතනාය. (ස්කන්ධ, කේලේශ, අභිසංස්කාර). එම උපධි ප්‍රහීණය කිරීම **සබ්බඋපධි පටිනිස්සගොය.** මෙය නිවන හඳුන්වන පදයකි. **බලන්න:** EAN: note: 219,p. 591. **මූලාශ්‍ර**: අංගු.නි: (1): 2 නිපාත: 2.1.1.2 පධාන සූත්‍රය, පි.136, EAN:2: 2.2 Striving, p. 56.

▲ **වීරියආරම්භ ඤාණය-**Knowledge about beginning of Striving: නො හැකුළුණු සිත් ඇතිව, නිවනට මෙහෙයවූ ආත්මය ඇතිවිමය. මෙහිදී පෙන්නා ඇත්තේ සම්මා ප්‍රධන වීරියය. **මූලාශ්‍රය:** බු.නි: පටිසම්භිදා 1: 38 වීරියආරම්භ ඤාණය**,** පි.218.

▲ **වීරිය ඉන්ද්‍රිය**: පාලි: **විරියිනද්‍රියං-**faculty of energy: වීරිය ඉන්ද්‍රිය, ආධ්‍යාත්මික ඉන්ද්‍රිය පහෙන් එකකි, මාර්ගයට විශේෂතාවයක් ලබා දෙයි, බෝධි පාක්ෂික ධම්මයකි, ආරියඅටමගේ එක් අංගයකි. **බලන්න:** පංච ඉන්ද්‍රිය.

▼ **වීරිය ඉන්ද්‍රිය යනු කුමක්ද?:**

**"කතමඤ්ච භික්ඛවෙ විරියිනද්‍රියං: ඉධ භික්ඛවෙ, අරියසාවකො ආරද්ධවීරියො විහරති, අකුසලානං ධම්මානං පහානාය, කුසලානං ධම්මානං උපසම්පදාය ථාමවා දළ්හපරාක්කමො අනික්ඛිත්තධුරො කුසලෙසු ධම්මෙසු. ඉදං වුච්චති විරියිනද්‍රියං".** ආරිය ශ්‍රාවකයා අකුසල් දහම් ප්‍රහාණය පිණිස කුසල් දහම් රැස්කරගැනීමට පිරිපුන් වීරිය යොදයි. කුසල් දහම් පිණිස තිර වීරිය ඇත. දැඩි පරාක්‍රමය ඇතිව, කුසල් ඇතිකර ගැනීමට නොපැකිලිව කටයුතු කරයි. මෙය වීරිය ඉන්ද්‍රිය ය. මේ ඉන්ද්‍රිය දැකිය හැක්කේ සතර සම්‍යක් ප්‍රධාන වීරිය තුලින්ය. **මූලාශ්‍ර**: සංයු.නි: (5-1): මහාවග්ග: ඉන්ද්‍රියසංයුත්ත: 4.1.8 දට්ඨබ්බ සූත්‍රය හා 4.1.9. විභංග සූත්‍රය, පි. 377, ESN: Mahavagga: 48 : Indriyasamyutta: 8.8 To be seen & 9.9 Analysis, p. 1933.

▲ **වීරිය ඉද්දීපාද** - Viriya Iddipada: සතර ඉද්දිපාද යන්ගෙන් එකකි.වීරිය සමාධි ඉද්දිපාද ලෙසින් ද පෙන්වා ඇත. සමාධිය ලබාගැනීමට, වීරිය ඇතිකර ගනී, ප්‍රධාන විරිය ඇතිව, වීරිය ඉද්දිපාදය පිහිට කොට, අකුසල මැඩ, සිත සමාධියට පත් කර ගනී. **මූලාශ්‍ර:** සංයු.නි: (5-2 ): මහාවග්ග: ඉද්දිපාද සංයුත්ත:7.2.3 ඡන්ද සූත්‍රය, පි.48,ESN: 51: Iddipadasamyutta: 13.3 Concentration due to desire, p. 2073.

▲ **වෙරෝචන අසුරරජු-**Verochna King of Asura: බුදුන් වහන්සේ බැහැදැකීමට සක්දෙවිඳු හා මේ අසුරරජු පැමිණීම මෙහි විස්තර කර ඇත.

**මූලාශ්‍රය:** සංයු.නි: (1): සගාථවග්ග: සක්ඛසංයුත්ත: 11.1.8 වෙරෝචන අසුරින්ද සූත්‍රය, පි.428.

▲ **වේරම්භවාතය-** Verammbha wind: වේරම්භවාතය යනු උස් අහසේ ඇතිවෙන මහා කුණාටු සුළඟටය. එයට හසුවෙන පක්ෂියන්ට, උන්ගේ අවයව පාලනය කර ගත නොහැකිව මහා දුකට පත්වේ. එලෙසින්, ලාභසත්කාර ආදියට යටවෙන සංඝයාට, ඉන්ද්‍රිය සංවරය නොමැති නිසා ඔවුන්, රාගආදී මහා කෙළෙස් කුණාටුවට යටවී දුකට පත්වේ. **බලන්න**: උපග්‍රන්ථය:5. **මූලාශ්‍රය:**සංයු.නි: (2): නිදානවග්ග: ලාභසත්කාර සංයුත්ත:දුරුණවග්ග:5.1.9 වේරම්භ සූත්‍රය, පි.372.

▲ **විරුඪක හා විරූපාක්ෂ දෙවියෝ-** Virudaka * Virupaksha Devata **බලන්න**: සතර වරම් දෙවියෝ.

**වල**

▲**වලාහක දේව නිකාය-** Cloud Devas: වලාහක දේව නිකාය යනු වැස්ස ඇතිකරන දෙවියන්ය1) ශිත වලාහක දෙවියෝ 2) උෂ්ණ වලාහක දෙවියෝ 3) කුණාටු වලාහක දෙවියෝ (අබ්භවලාහක) 4) වාත (සුළං) වලාහක දෙවියෝ 5) වැස්ස වලාහක දෙවියෝ. මේ දේවනිකායේ පහළවීම පිණිස මෙලොවදී ත්‍රිවිධ සුචරිතයේ හැසිරිය යුතුවේ. පින් කළයුතුය. මේ දෙවියෝ වර්ණවත්ය, දීර්ඝ ආයුස ඇත, සුඛසම්පත් ඇත්තෝය. ඒ ඒ දෙවියන් සිතනා පරිදි ශිත, උෂ්ණ ආදී වලාකුළු ඇතිවේ. **සටහන:** වලාහක දෙවියන්ගේ කැමැත්ත පරිදි: ශිත කාලයේ හෝ ග්‍රීෂ්මකාලයේ සිසිල් බව ඇතිවේ; එසේම, කාලයේදී හෝ අකාලයේදී උණුසුම ඇතිවේ; එසේම කාලයේ හෝ අකාලයේ වලාකුළු අහසේ ඇතිවේ; කාලයේ හෝ අකාලයේ දැඩි සුළං ඇතිවේ; එසේම කලයේ හෝ අකාලයේ වැස්ස ඇතිවේ. **මූලාශ්‍ර:** සංයු.නි: (3): ඛන්ධවග්ග: වලාහක සංයුත්ත: සූත්‍ර, පි.540, ESN: 32 : valahaka- saṃyutta, p. 1158.

▲**වලාකුළු-** Clouds: වලාකුළු (මේඝය) වර්ෂාව ඇති කරයි. වලාකුළු වලට අධිපති දෙවියන් ගැන විස්තර පිණිස **බලන්න**: සංයු.නි: (3): ඛන්ධවග්ග:වලාහකසංයුත්තය

▲ **වලාකුළු බඳු පුද්ගලයෝ-** Persons similar to clouds: සිව් දෙනෙකි: 1) කෙනෙක් කථා කරයි, එහෙත් ක්‍රියා නොකරයි. ඔහු ගිගිරුම ඇති, වැස්ස නැති වලාකුළු බඳුය. ඔහු ධර්මය විස්තරාත්මකව හදාරයි එහෙත් චතුරාර්ය සත්‍ය අවබෝධ කර නොමැත. 2) කෙනෙක් කථා නොකරයි, එහෙත් ක්‍රියා කරයි. ඔහු ගිගිරුම නැති වැස්ස ඇති වලාකුළු බඳුය. ඔහු ධර්මය විස්තරාත්මකව හදාරා නැත, එහෙත්, චතුරාර්ය සත්‍ය අවබෝධකර ඇත. 3) කෙනෙක් කථා නොකරයි, එසේම ක්‍රියා නොකරයි. ඔහු ගිගිරුම නැති වැස්ස නැති වලාකුළු බඳුය. ඔහු ධර්මය හදාරන්නේ නැත, එසේම චතුරාර්ය සත්‍ය අවබෝධ කර නොමැත 4) කෙනෙක් කථා කරයි, එසේම ක්‍රියා කරයි. ඔහු ගිගිරුම ඇති වැස්ස ඇති වලාකුළු බඳුය. ඔහු ධර්මය විස්තරාත්මකව හදාරා ඇත, එසේම චතුරාර්ය සත්‍ය අවබෝධ කර ඇත. **මූලාශ්‍ර:** අංගු.නි: ( 3): 4 නිපාත: වලාහකවග්ග: 4.3.1.1. හා 4.3.1.2 සූත්‍ර, පි. 218, EAN: 4: 101.1 Clouds-1 & 2 , p. 185.

▲**විලේපන**-Vilepana: විලේපන යනු සුවඳවිලවුන් වලින් කය සැරසීමය. දසසිල් ආරක්ෂා කරන අය එවැනි දෙයින් වැළකේ. විලේපන දරන අය වැඩිය, ඒ සිකපදය ආරක්ෂා කරන අය අල්පය. **මූලාශ්‍රය**: සංයු.නි: (5-2): මහාවග්ග: සච්චසංයුත්ත:12.8.10 විලේපන සූත්‍රය, පි. 364.

## වළ

▲**වළඳ** -the pot: වළඳ යනු මැටියෙන් සැදූ භාජනයකි. මේ උපමාව යොදගෙන බුදුන් වහන්සේ පෙන්වා ඇත්තේ ආධ්‍යාත්මික වර්ධනය දියුණු කරගත් පුද්ගලයා ඉහළට - උසස්බවට පත්වීමය- උතුම් යළි උපතක් ලබිමය. ගිතෙල් වැනි තෙල් බහා ලන ලද වළඳක්, ගැඹුරු විලක පතිත කලවිට, වළඳ බිඳී, මැටි කැලි විලේ පතුලට යයි, තෙල් ඉහළට එයි. එලෙස, ධර්මානුකූල ජීවිතය ගත්කල පුද්ගලයා ගිතෙල්, මෙන් ඉහළට යයි. **මූලාශ්‍රය**: සංයු.නි: (5-2) මහාවග්ග: සෝතාපත්තිසංයුත්ත:11.3.1 මහානාම සූත්‍රය, පි.206.

▲ **වෙළෙන්දා උපමාව**-Simile of the shop keeper: ධර්ම මාර්ගයේ පරිහානියට පත්වීම හා වර්ධනය ඇතිකර ගැනීම පෙන්වා දීමට, මේ උපමාව යොදාගෙන ඇත. ධනය ලබා ගැනීමට හා ලබාගත් ධනය වර්ධනය කිරීමට දවස තුලදී කාර්යශුර නැති වෙළෙන්දා අසමත්වේ. එලෙස, උදැසන, දිවාකල හා හවස් කාලයේ ධර්මයේ කාර්යශුර නැති මහණ, මාර්ගයේ පරිහාණියට පත්වේ. එහෙත්, මුළු දවස තුල කාර්යශුරව කටයුතු කරන වෙළෙන්දා ධනය ලබාගැනීමට සමත්වේ. එලෙසින්, මුළු දවස තුල කාර්යශුරව, ධර්මයේ හැසිරෙන මහණ, කුසල ධර්ම ඇතිකර ගැනීමට හා විපුල කරගැනීමට දක්‍ෂවේ. කරුණු 3ක් ඇති වෙළෙන්දා මහා ධන සමපත් ලබාගැනීමට දක්ෂවේ: 1) වෙළඳ භාණ්ඩ පිලිබඳ තීක්‍ෂණ ඇස තිබීම- ඒවා ගැන හොඳ අවබෝධය ඇතිබව 2) වගකීමෙන් කටයුතු කිරීම- මිලදී ගැනීම හා විකිණීම පිළිබඳව ශුරබව තිබීම 3) වෙළඳ කටයුතු පිණිස අනුග්‍රාහකයන් ලැබීම- ඔහුගේ දක්ෂ බව දකින ධනවත් පුද්ගලයෝ තමන්ගේ ධනය ඒ වෙළඳ කටයුතුවලට ආයෝජනය කිරීමට කැමතිවේ. එලෙස, යහපත් ගුණ ඇති භික්ෂුව ධර්මයේ දක්ෂ වේ, මාර්ගය වඩාගනී. එම ගුණ නොමැති භික්ෂුව මාර්ගයේ පරිහාණියට පත්වේ. **බලන්න:** ධර්ම මාර්ගය. **මූලාශ්‍ර:** අංගු.නි: (2): 3 නිපාත: 3.1.2.9 -10 සූත්‍ර 2කි, පි. 256, EAN:3: 19.9 & 20.10 Shopkeeper, p. 84.

▲ **වැළඳීම**-Eating alms food: සංඝයා පිණ්ඩපාතයෙන් ලත් ආහාර අනුභවය, වැළඳීමය. මේ සූත්‍රයේදී සැරියුත් තෙරුන් අන්‍ය ආගමිකයන්ගේ හා බුද්ධ ශ්‍රාවකයන්ගේ වැළඳීමේ වෙනස පෙන්වා ඇත. 1) **යටිමුව වැළඳීම**: වාස්තුවිද්‍යාව නම්වූ මිථ්‍යා ජීවනයෙන් ජීවිතය ගෙනයන මහණ බමුණන්ගේ ආහාර ගැනීමය. 2) **උඩුමුව වැළඳීම**: නක්ෂත්‍රවිද්‍යාව නම්වූ මිථ්‍යා ජීවනයෙන් ජීවිතය ගෙනයන මහණබමුණන්ගේ ආහාර ගැනීමය. 3) **සිව්දිගට මුව ඇතිව වැළඳීම**: සිව්දිගට පණිවිඩ ගෙනයාම නම්වූ මිථ්‍යා ජීවනයෙන් ජීවිතය ගෙනයන මහණබමුණන්ගේ ආහාර ගැනීමය. 4) **සිව්අනුදිගට මුව ඇතිව වැළඳීම**: අංගවිද්‍යාව නම්වූ මිථ්‍යා ජීවනයෙන් ජීවිතය ගෙනයන මහණබමුණන්ගේ ආහාර ගැනීමය. තමන්වහන්සේ එවැනිදේ නොමැතිව දැහැමින් භික්ෂාව සොයා වළඳන බව සැරියුත් තෙරුන් වදාළහ. **සටහන:** මේ සූත්‍රය වදාළේ

සුචිමුඛ නම් පරිබ්‍රාජිකවටය. **මූලාශ්‍රය:** සංයු.නි: (3): ඛන්ධවග්ග: සාරිපුත්‍රසංයුත්ත: 7.1.10 සුචිමුඛි සූත්‍රය, පි.500.

**වළු**

▲ **වෙළුකන්ට උත්තරානන්දමාතා උපාසිකා-** Velukanta nandamatha upasika: බලන්න: උපග්‍රන්ථය:3.

▲ **වේළුවන ආරාමය- කලන්දක නිවාප-** Veluvanayaarama: මගධදේශයේ, රජගහනුවර පිහිටි මේ ආරාමය බුදුන් වහන්සේ හා සංඝයා වැඩ වාසය කළ ස්ථානයකි.මගධයේ අධිපති, බිම්බිසාර රජතුමා, බුදුන් වහන්සේට, එම උයන පූජා කළහ: "...බිම්බිසාර රජුට ගමට නොදුරවූ, ගමට නොලංවූ, යෑම ඒම පහසු වූ, බුදුන් වැදීම හා දහම් ඇසීම ප්‍රයෝජන කොට ඇති...දහවල ජනසමූහයා ගැවසීම නැති. රාත්‍රීහි නිසල...විවේකයට යෝග්‍ය යම් සෙනසුනක් වන්නේද... යන සිතක් ඇතිවිය". වේළුවන උයන එම කටයුතු පිණිස සුදුසු බව අවබෝධ කරගත් රජතුමා, ඒ උයන බුදුන් වහන්සේ ප්‍රමුඛ සංඝයාහට ... භාග්‍යවතුන් වහන්සේ ඉදිරියෙහි රන් කෙණ්ඩියකින් පැන් වත්කොට පූජා කරන ලදී. **සටහන**: වේළු- උණබට ගොමුවලින් සකස්වී ඇති නිසා වේළුවනය ලෙසින් නම් කර ඇත. බොහෝ ලේනන් වාසය කරන ස්ථානයක් හා -ඒ සතුන්ට අභය බිමක් නිසා - කලන්දක නිවාප ලෙසින්ද හඳුන්වයි. **බලන්න**: බිම්බිසාර රජ. **මූලාශ්‍රය**: වින.පි: මහාවග්ග පාලිය 1, පි.159.

▲**වේළුද්වාර ගම්වැසියෝ-** Villagers from Veluddwara: බලන්න: උප ග්‍රන්ථය:3

**වව**

▲ **විවට්ට ඤාණ-**Vivatta Nana: විවට්ට ඤාණ (විවර්තඥාන- විවට්ටඥාන ෂට්කය) යනු ඤාණ 6 ක් ය: **1)සංඥා විවට්ට ඤාණය:** නෙක්ඛම්මය අධිකකොට ඇති ප්‍රඥාවය 2) **චේතෝ විවට්ට ඤාණය:** ධර්මතාවල නා නා ස්වභාවය දන්නා ප්‍රඥාවය 3) **චිත්ත විවට්ට ඤාණය:** නෙක්ඛම්ම ආදී ධර්මතා වල සිත පිහිටුවා ගැනීමේ ප්‍රඥාව 4)**ඥානවිවට්ට ඤාණය:** ශූන්‍යතාව (අනාත්ම දර්ශනය) පිලිබඳ ප්‍රඥාවය 5) **විමෝක්ෂ විවට්ට ඤාණය:** කාමච්ඡන්ද ආදිය දුරුකරගැනීමේ ප්‍රඥාව 6) **සත්‍ය විවට්ට ඤාණය-** චතුසත්‍ය පිලිබඳ අවිපරිත ස්වභාවය අවබෝධය. **මූලාශ්‍රය:** ඛු.නි: පටිසම්භිදා 1: 44-49 විවට්ට ඤාණ, පි.226.

▲**විවාද-**Debate: විවාද යනු යම් මතයකට පැමිණ ඒ පිලිබඳ අන්‍යයන් හා වාද, කළහ කිරීමය. බ්‍රහ්ම චරියාවේ යෙදන සංඝයා විවාද වලින් බැහැරව කටයුතු කලයුතුය යි බුදුන් වහන්සේ අවවාද වදාළහ. උපාලි මහාතෙරුන් සංඝයා විවාදයන්ට එළඹීමට හේතු කරුණු බුදුන් වහන්සේ ගෙන් අසා ඇත. බුදුන් වහන්සේ එ කරුණු මෙසේ පෙන්වා ඇත: ධර්මය අධර්මය ලෙසින් පෙන්වීම, අධර්මය ධර්මය ලෙසින් පෙන්වීම , අවිනය විනය ලෙසින් පෙන්වීම, විනය අවිනය ලෙසින් පෙන්වීම, තථාගත යන් ගේ භාෂිතය, ප්‍රඥාප්ති ආදිය වැරදි ලෙසින් දැක්වීම නිසා ඇතිවන සංඝයා ගේ පහසුවිහරණයට බාධා කරයි. **බලන්න**: වාදවිවාද. **මූලාශ්‍රය:** අංගු.නි: (6): 10 නිපාත: අක්කෝසවග්ග: 10.1.5.1-3 විවාද සූත්‍ර, පි.166.

▼**විවාද මූල:** සංඝයා විවාදවලට මූලික වන කරුණු 6 කි:1) ක්‍රෝධය 2) ගුණමකුබව 3) ඉරිසියාව හා මසුරුකම 4) ලාමක ඉච්ඡා 5) මායා-කපටිකම 6) තම දිට්ඨිය දැඩිව ගැනීම නිසා. **මූලාශ්‍රය:** අංගු.නි: (4): 6 නිපාත:දේවතාවග්ග: 6.1.4.6 විවාදමූල සූත්‍රය, පි.110.

▲ **විවිධ ඥාන-** Various Knowledges: විවිධ ඥාන ලෙසින් පෙන්වා ඇත්තේ ආධ්‍යාත්මික මග වර්ධනය කරගැනීමට උපකාරීවන නුවණය, අවබෝධයය: 1) **ශ්‍රැතමය ඥානය:** (සුතමයෙ ඤාණං) : ධර්මය කණෙන් අසා, ඒ පිළිබඳව ඇතිකරගන්නා ප්‍රඥාව. 2) **ශිලමය ඥානය** (සීලමයෙ ඤාණං) : ධර්මය අසා ඒ ගැන ඇති කරගන්නා ප්‍රඥාව. 3) **සමාධි භාවනාමය ඥානය** (සමාධිභාවනාමයෙ ඤාණං): ශිලයෙන් සංවර වීම නිසා සිත එකඟබවට පත්වීමේන් ඇතිවන ප්‍රඥාව. 4) **ධර්මඨිති ඥානය** (ධම්මට්ඨිති ඤාණං): හේතු ප්‍රත්‍ය ධර්මතා පිරිසිඳලෙසින් දන්නා ප්‍රඥාව. 5) **සම්මශන ඥානය** (සම්මසනෙ ඤාණං): අතීත අනාගත වර්තමාන පංච ස්කන්ධ ධර්මයන් ගැන කලාප වශයෙන් රැස්කර නිශ්චය කිරීමේ ප්‍රඥාව. 6) **උදයවයදර්ශන ඥානය** (උදයබ්බයානුපස්සනෙ ඤාණං) හේතුප්‍රත්‍ය යෙන් හටගත් ස්කන්ධ ධර්මයන්ගේ විපරිණාමය දැකීමෙහි ප්‍රඥාව. 7) **විදර්ශනා ඥානය** (විපස්සනෙ ඤාණං) :රූපාදී ආලම්භන (අල්වාගැනීම්) ප්‍රත්‍යවෙක්ෂා කොට ඒවා යේ බිඳී යාම භඞගවශයෙන් දැකීමේ ප්‍රඥාව. 8) **ආදීනව ඥානය** (ආදීනවෙ ඤාණං ) උත්පත්ති ආදියේ භය වටහා ගැනීමේ ප්‍රඥාව. 9) **සංසකාරඋපේක්ෂා ඥානය** ( සඞ්ඛාරුපෙක්ඛාසු ඤාණං): උත්පත්ති ආදිය මුදාලන්නට ඇති කැමැත්ත, ඒ ගැන ඇති ප්‍රත්‍යවෙක්ෂාව, අධ්‍යුපෙක්ෂණය යන ත්‍රිවිධ ප්‍රඥාව. 10) **ගොත්‍රභූ ඥානය:** කාම ලෝකයෙන් එතර කරන ප්‍රඥාව. **මූලාශ්‍රය :**ඛු.නි: පටිසම්භිදා 1: මහාවග්ග, ඥානකථා, පි. 24.

▲ **විවිධ පර්ෂද**: පාලි: **නා නා පරිසා-** Various assemblies: පර්ෂදය යනු, සමුහය හෝ එකට එක්වී ඇති පිරිසය. බුදුන් වහන්සේගේ ශ්‍රාවක පිරිස, සංඝ පර්ෂදය ලෙසින් හඳුන්වා ඇත. **බුදුන් වහන්සේ, සංඝයා ගේ හැසිරීම අනුව, ඔවුන් වර්ගකර පෙන්වා ඇත**: 1) **නොගැඹුරු පිරිස**: පාලි: **උත්තානා පරිසා -** shallow assembly: **මේ ගනයට අයත්වන සංඝයා ගේ ගතිය:** කලබල සහිතය (සිත වික්ෂිප්තය), උඩඟුය, ආඩම්බරය, දොඩමළුය, නොනවත්වාම කතා කරයි, සිහිකල්පනාවෙන් කටයුතු නොකරයි, සම්ප්‍රජන්‍යය නොමැත, සමාධිය නොමැත, ඒ මේ අතට දුවන සිත් ඇතිව සිටි, ඉන්ද්‍රිය සංවරය නොමැත. මේ පිරිස උතුම් නැත. ( restless, puffed up, vain, talkative, rambling in their talk, with muddled mindfulness, lacking in clear comprehension, un concentrated, with wandering minds, with loose sense faculties). **2)** ගැඹුරු පිරිස **(ගාම්භිර):**පාලි: **ගමභීරා පරිසා** deep assembly: **මේ ගනයට අයත්වන සංඝයා ගේ ගතිය**: කලබල රහිතය, උඩඟුනැත, ආඩම්බරනැත, දොඩමළු කතා නැත, නොනවත්වාම කතා නොකරයි, සති සම්ප්‍රජන්‍යය ඇත, සමාධිය ඇත, ඉන්ද්‍රිය සංවරය ඇත. මේ පිරිස උතුම්ය. **3) බෙදුන පිරිස:** පාලි: **වග්ග පරිසා-**divided assembly **මේ ගනයට අයත්වන සංඝයා ගේ ගතිය**: වාද විවාද, කළහ කරමින් ආරාවුල් ඇති කරයි, තියුණු (දරුණු) වචන වලින් එකිනෙකාට පහරදෙයි. මේ පිරිස උතුම්නැත. (arguing and quarreling and fall into disputes, stabbing each other with piercing words). **4) සමගි පිරිස:** පාලි: **සමග්ගා පරිසා-**

harmonious assembly). **මේ ගනයට අයත්වන සංඝයා ගේ ගතිය**: එකමුතුබව, විවාද නොමැතිව සමගියෙන් හැසිරේ, කිරි හා දිය මානව මිශ්‍රවන ලෙසින් එකමුතුව සිටි, එකිනෙකා කෙරෙහි දයාවෙන් යුත් ඇස් ඇතිව හැසිරේ. මේ පිරිස උතුම්ය. (dwell in concord, harmoniously, without disputes, blending like milk and water, viewing each other with eyes of affection) **සටහන**: ම.නි. උපකිලේශ සූත්‍රයේ පෙන්වා ඇත්තේ, අනුරුද්ධ, නන්දිය හා කිම්බිල තෙරුන්, සමගි පිරිසට ඇති ගුණ සහිතව වාසය කර ඇතිබවය. **5) අග්‍ර නොවන පිරිස:** පාලි: **අනග්ගවතී පරිසා-** inferior assembly: **මේ ගනයට අයත්වන සංඝයා ගේ ගතිය:** මේ පිරිසේ ජ්‍යේෂ්ඨ භික්ෂූන් සුබෝපභෝගී, නො සැලකිලිමත් ජීවිතයක් ගතකරයි, ප්‍රතිපත්ති නොරකී, විවේකය ඇති හුදකලා වාසය ප්‍රිය නොකරයි, (මාර්ගයේ) මෙතෙක්, නොලැබූ දේ ලබාගැනීමට, ඉටු නොකරගත් දේ ඉටු කරගැනීමට, සාක්ෂාත් නොකරගත් දේ සාක්ෂාත් කර ගැනීමට වීරිය නො දරයි. ඔවුන්ගේ ගෝල පරම්පරාවද, එලෙසින් හැසිරීමට පුරුදුවේ. මේ පිරිස උතුම් නොවේ. ( elder bhikkhus are luxurious and lax, leaders in backsliding, discarding the duty of solitude; they do not arouse energy for the attainment of the as-yet-unattained, for the achievement of the as-yet-unachieved, for the realization of the as-yet-unrealized) **6) අග්‍ර පිරිස:** පාලි: **අග්ගවතී පරිසා-** Superior assembly: **මේ ගනයට අයත්වන සංඝයා ගේ ගතිය**: මේ පිරිසේ ජ්‍යේෂ්ඨ භික්ෂූන් සුබෝපභෝගී, නො සැලකිලිමත් ජීවිතයක් ගතනොකරයි, ප්‍රතිපත්ති රකී, විවේකය ඇති හුදකලා වාසය ප්‍රිය කරයි, (මාර්ගයේ) මෙතෙක්, නොලැබූ දේ ලබාගැනීමට, ඉටු නොකරගත් දේ ඉටු කරගැනීමට, සාක්ෂාත් නොකරගත් දේ සාක්ෂාත් කර ගැනීමට වීරිය දරයි. මේ පිරිස උතුම්ය. **7) ආනාරිය පිරිස:** පාලි**: අනරියා**-ignoble assembly: **මේ ගනයට අයත්වන සංඝයා ගේ ගතිය**: චතුරාර්යසත්‍ය යථා පරිදි නොදනී. මේ පිරිස උතුම්නොවේ. **8) ආරිය පිරිස:** පාලි:**අරියා-** noble assembly: **මේ ගනයට අයත්වන සංඝයා ගේ ගතිය**: චතුරාර්යසත්‍ය යථා පරිදි දනී. මේ පිරිස උතුම්ය

**9)** **වැඩකට නැති පිරිස :**පාලි:**පරිසකසටො-** dregs of an assembly: **මේ ගනයට අයත්වන සංඝයා ගේ ගතිය**: ආශාව නිසා (ඡන්දය- desire), ක්‍රෝධය නිසා (දෝසය-hate) , අවිද්‍යාව නිසා (මෝහය- delusion) , බියගුළුකම නිසා (භය- fear) අධර්ම මාර්ගය -අගතිමග ගනි . මේ පිරිස උතුම්නොවේ. **බලන්න**: අගති මාර්ගය හා අගති නොවන මාර්ගය. **10) ඉස්තරම් පිරිස (සරු)** : පාලි: **මණ්ඩො-** cream of an assembly **මේ ගනයට අයත්වන සංඝයා ගේ ගතිය**: ආශාව, ක්‍රෝධය, අවිද්‍යාව, බියගුළුකම යන සතර අගතිය ඔවුන්ට නොමැත. මේ පිරිස උතුම්ය. **11) නිෂ්ඵල කතා පුරුදු, විමර්ශනය නුපුරුදු පිරිස:**පාලි: **ඔක්කාචිතවිනීතා පරිසා නො පටිපුච්ඡාවිනීතා -** assembly trained in vain talk, not in interrogation: **මේ ගනයට අයත්වන සංඝයා ගේ ගතිය**: තථාගතයන් වහන්සේ වදාළ ගාම්භීර ධර්මය ඇසීමට හෝ ඒ ගැන අවබෝධයක් ලැබීමට කැමති නොවේ. සසුනෙන් බාහිරවූ දේශනා ආදියට කැමතිය. ඒවා ගැන අවබෝධයක් ලබා ගැනීමට කැමතිය. එහෙත් ඒවා ගැන විමසීමක් නොකරයි. මේ පිරිස උතුම් නොවේ.**12) විමර්ශනය පුරුදු, නිෂ්ඵල කතා නුපුරුදු:** පාලි: **පටිපුච්ඡාවිනීතා පරිසා නො ඔක්කාචිතවිනීතා** assembly trained in interrogation, not in vain talk: **මේ ගනයට**

**අයත්වන සංඝයා ගේ ගතිය:** සසුනෙන් බාහිරවූ දේශනා ආදිය ඇසීමට, ඉගෙන ගැනීමට ඔවුන් සිත් යොදවන්නේ නැත, එහෙත්, තථාගතයන් වහන්සේ වදාළ ගාම්භීර ධර්මය ඇසීමට, එය අවබෝධ කරගැනීමට සිත යොදවයි, ඒවා ගැන විමසා බලයි. මේ පිරිස උතුම්ය. **සටහන: ඔක්කාචිතවිනීත**: නොහික්මුණු, නොදැමුණු: පා.සිං.ශ: පි. 219, **පටිපුච්ඡාවිනීතා** : විචාරීම, විමසීම: පා.සිං.ශ: පි. 355.**13) ආමිසය ගරු කරන සදහම් ගරු නොකරන පිරිස:** පාලි: **ආමිසගරු පරිසා නො සදධම්මගරු-** assembly that values worldly things not the good Dhamma: **මේ ගනයට අයත්වන සංඝයා ගේ ගතිය:** මේ සංඝයා තමන්ගේ හා තමන් ගේ මිතුරු සංඝයා ගේ නොමැති ගුණ (මාර්ගඵල ලැබීම, සිල්වත් බව ආදී), යහපත් සංඝයා පිලිබඳ වැරදි ප්‍රකාශ ආදිය ලාභ සත්කාර ලබාගැනීම පිණිස දායකයන්ට පවසා එමගින් සිව්පසය ආදිය ලබයි. ඒවායේ ගැලී සිටින ඔවුන් සද්ධර්මයේ අගය නොදනී. මේ පිරිස උතුම් නොවේ. **14) සදහම් ගරු කරන ආමිසය ගරු නොකරන පිරිස:** පාලි: **සදධම්මගරු පරිසා නො ආමිසගරු-** assembly that values the good Dhamma, not worldly things: **මේ ගනයට අයත්වන සංඝයා ගේ ගතිය**: මේ සංඝයා තමන්ගේ හා අන්‍යයන් ගේ ගුණ, අගුණ ගිහි දයකයන්හට, ලාභ ලබාගැනීම පිණිස වර්ණනා නො කරයි. සිව්පසයට නොඇලි ඒවා පරිහරණය කරයි. ආමිසයේ ආදීනවද, නිස්සරණය දන්නා ඔවුන් සද්ධර්මය ගරු කරයි. මේ පිරිස උතුම්ය. **15) විෂම පිරිස:** පාලි: **විසම පරිසා**-unrighteous assembly  righteous assembly.**මේ ගනයට අයත්වන සංඝයා ගේ ගතිය**: මේ සංඝයා ධර්ම කර්ම නොකරයි, අධර්ම කර්ම කරයි. විනය කර්ම නොකරයි, අවිනය කර්ම කරයි, ධර්ම කරුණු, විනය කරුණු පැහැදිලි නොකරයි, අධර්ම කරුණු, අවිනය කරුණු පැහැදිලි කරයි. ඔවුන් නිසා ධර්මය විනය දීප්තිමත් නොවේ. මේ පිරිස උතුම් නොවේ. **16) සමපිරිස:** පාලි:**සමා පරිසා** righteous assembly**මේ ගනයට අයත්වන සංඝයා ගේ ගතිය**: මේ සංඝයා ධර්ම කර්ම හා විනය කර්ම පමණක් කරයි, ඒවා පැහැදිලි කරදෙයි. ඔවුන් නිසා ධර්මය විනය දීප්තිමත්වේ. මේ පිරිස උතුම්ය. **17) අධාර්මික පිරිස**: පාලි: **අධම්මික පරිසා:-** assembly that acts contrary to the Dhamma **මේ ගනයට අයත්වන සංඝයා ගේ ගතිය**: මේ සංඝයා ධර්ම විනයට අනුකූලව කටයුතු නො කරයි. මේ පිරිස උතුම් නොවේ. **18) ධාර්මික පිරිස:**පාලි: **ධම්මික පරිසා** - assembly that acts in accordance with the Dhamma**. මේ ගනයට අයත්වන සංඝයා ගේ ගතිය**: මේ සංඝයා ධර්ම විනයට අනුකූලව කටයුතු කරයි. මේ පිරිස අග්‍රය. **19) අධර්මවාදී පිරිස**:පාලි: **අධම්මවාදිනී පරිසා -** assembly that speaks non-Dhamma. **මේ ගනයට අයත්වන සංඝයා ගේ ගතිය**: මේ සංඝයා ධර්මයට අනුකූලවූ හෝ අනුකූල නොවූ විනය කරුණක් සලකා බලනවිට, ඒ ගැන ධර්මයට අනුකූලව කටයුතු නොකරයි. තමන්ට ඇති මත ආදිය වෙනස් නොකර තදින් අල්ලා ගෙන සිටි. අන්‍යයන් ගේ අදහස් නොවිමසයි. මේ පිරිස උතුම් නොවේ. **20) ධර්මවාදී පිරිස**:පාලි: **ධම්මවාදිනී පරිසා-** assembly that speaks Dhamma**. මේ ගනයට අයත්වන සංඝයා ගේ ගතිය**: මේ සංඝයා ධර්මයට අනුකූලවූ හෝ අනුකූල නොවූ විනය කරුණක් සලකා බලනවිට, ඒ ගැන ධර්මයට අනුකූලව කටයුතු කරයි. තමන්ට ඇති මත ආදිය වෙනස් නොකර තදින් අල්ලා ගෙන නොසිටි. අන්‍යයන් ගේ අදහස් විමසයි. මේ

පිරිස උතුම්ය. **මූලාශ්‍ර**: අංගු.නි: (1): 2 නිපාත: 2.1.5.1 -2.1.5.10 සූත්‍ර, පි. 174, EAN:2: 42.1- 51.10, Suttas, p. 64.

▲ **විවේචනය-** criticism: අනුන් විවේචනය කිරීම (උපාරම්භචිත්තං), දුසිල්වත් පුද්ගලයා ගේ ලක්ෂණයකි. විවේචනයට බර පුද්ගලයාට අවුල්සහගත සිත, අසම්ප්‍රජන්‍යය හා සිත විසිරීයාම යන අකුසල පහකර ගැනීමට නොහැකිය. එහෙත්, කෙනෙක් විවේචනයේ නොයෙදේනම්, ඔහුට පෙරකී අකුසල 3 පහකර ගත හැකිවේ. **මූලාශ්‍ර**: අංගු.නි: (6 ):10 නිපාත: 10.2.3.6. තයෝධම්ම සූත්‍රය,පි.284, EAN, 10: 76-6. Incapable, p. 524.

▲ **විවේකය-**Solitude: කය හා සිත නිසල කරගෙන් සුවපත්ව වාසය කිරීම විවේකයවේ. ආධ්‍යාත්මික මාර්ගය වඩා ගැනීම පිණිස විවේකිව වාසය කිරීම වැදගත් යයි බුදුන් වහන්සේ අනුසාසනා කර ඇත. මෙහිදී විවේකය පිණිස වනයට පැමිණි භික්ෂුවක්, යහපත් ලෙසින් විවේකිව නො සිටිනු දැක වන දෙවතාවක් ඔහුට අවවාද කර, සංවේගය ඇතිකිරීම විස්තර කර ඇත. **මූලාශ්‍රය:** සංයු.නි: (1): සගාථවග්ග: වනසංයුත්ත: 9.1.1.විවේකසූත්‍රය, පි.378.

▼**විවේකිව වාසය කලයුතු ආකාරය** පිලිබඳ බුද්ධ අනුසාසනා මෙහි විස්තර කර ඇත. **මූලාශ්‍රය:**ඛු.නි: පටිසම්භිදා 2: පඤ්ඤාවග්ග: 3.4 විවේක කථා, පි.214.

▼ **මෙහිදී සැරියුත් තෙරුන්** තමන්වහන්සේ විවේක සුවයෙන් වාසය කිරීම ලෙසින් පෙන්වා ඇත්තේ ප්‍රථම ජාන සමාපත්තියේ වාසය කිරීම බව පෙන්වා ඇත. **මූලාශ්‍රය:**සංයු.නි: (3): ඛන්ධකවග්ග: සාරිපුත්ත සංයුත්ත:7.1.1.විවේකජ සූත්‍රය, පි.494.

▲ **විවෙකනිඝසිතං-** Vivekanissitha: විවේකනිස්සිතං ලෙසින් පෙන්වා ඇත්තේ කාය චිත්ත විවේකය ඇතිව, බොජ්ඣංග ධර්ම වඩා ගැනීමය. **බලන්න**: බොජ්ඣංග ධර්මතා**.**

**වස**

▲**වසල-** Vasala: බුදුන් වහන්සේ වැඩසිටි සමයේ, විසූ හීන කුලයක පිරිස, හඳුන්වා ඇත්තේ වසල (චණ්ඩාල-සැඩොල්) ලෙසිනි. කුලයෙන් කිසිවෙක් වසල නොවන බවත් පහත් ක්‍රියාවන්හි නිරත වන්නෝ නම් කෙනෙක් වසල යයි හැඳින්වීමට සුදුසුය යි බුදුන් වහන්සේ මේසූත්‍රයේදී පෙන්වා ඇත:

**"ජාතියෙන් වාසල නොවේ; ජාතියෙන් බ්‍රාහ්මණ නොවේ, කර්මයෙන්වාසල වේ; කර්මයෙන් බ්‍රාහ්මණවේ"**: **සටහන:** වසලයෙක් තුල ඇති පහත් ක්‍රියා පිලිබඳ මෙහි විස්තරාත්මකව පෙන්වා ඇත. **මූලාශ්‍රය:** ඛු.නි:සු.නි: උරගවග්ග:1-7 වසල සූත්‍රය, පි. 56.

▲ **වසවත්ති දේවපුත්‍ර-** Deva Vasavatthi: එක්සමයක, මුගලන් මහා තෙරුන්, දේවලෝකයන්හි චාරිකා කරන අවස්ථවේදී, මේ දේවපුත්‍ර යන්හට ධර්මය දේශනා කිරීම මෙහි දක්වා ඇත. **මූලාශ්‍රය:**සංයු.නි:සළායතනවග්ග: මොග්ගල්ලානසංයුත්ත: 6.1 - වසවර්ති සූත්‍ර, පි.544.

▲**වස්කාලය** -rain retreat: වස්කාලය (වස්සාන) යනු ආධ්‍යාත්මික දියුණුව පිණිස, සංඝයාට කැපකර ඇති මාස 3 ක පමණ විවේක කාලයය. බුදුන් වහන්සේ වැඩසිටි සමයේ සිට පැවති එන ක්‍රමයකි. වර්ෂා සෘතුවේ ඇවිදීම හිතකර නොවන නිසා ඒ කාලය තුල , නියමිත ආරණ්‍යය, ස්ථානයක වාසය කරමින්, සංඝයා තමන්ගේ බ්‍රහ්මචාරි ජීවිතය දියුණු කරගැනීමට උත්සාහ කරයි. වස් කාලය ඇරඹෙන්නේ ඇසල පුර පසලොස්වක දිනයේය. (සාමාන්‍යයෙන් ජුලි මාසයේ අග හෝ අගෝස්තු මාසයේ මුල), අවසන්වන්නේ ඔක්තෝම්බර් හෝ නොවැම්බර් මාසයේ මුලදීය (කාර්තික පුන් පොහෝදිනය). **බලන්න**: EAN: note: 227, p. 592.

▼ **බුදුන් වහන්සේ,** වේළුවනාරාමයෙහි වැඩ වසන සමයෙහි, වස්සාන සෘතුවේ වස් එළඹීම පිණිස සංඝයාට අවසර දෙනලදී. වස් එළඹීම් 2 ක්ද ප්‍රකාශ කර ඇත:

'**පෙරවස්**' ආරම්භ වන්නේ, ඇසළ පුන් පොහෝදිනට පසු දිනයේදිය, '**පසුවස්**' ආරම්භ වන්නේ, ඇසළ පුන් පොහෝයෙන් මසක් ඉක්ම ගිය පසුය. **බලන්න**: පවාරණ. **සටහන: *** වින.පි. මහාවග්ග පාලියේ වස්ස පිළිබදව විස්තරාත්මකව දක්වා ඇත. ** පෙරවස් හා පසුවස් ගැන විස්තර පිණිස **බලන්න**: අංගු.නි: (1): 2 නිපාත: 2.1.1.10. වස්සුපනායිකා සූත්‍රය, පි. 140, EAN:2: 10.10 Entering upon the Rains, p. 57. **මූලාශ්‍ර:** වින.පි: මහාවග්ග පාලි 1: වස්සූපනායිකඛන්ධකය, පි. 424.

▲ **වස්සකාර මහාඇමති** -Chiefminister Vassakara: මොහු මගධයේ අජාසත් රජුගේ මහා ඇමතිය. බුදුන් වහන්සේගේ අවසාන චාරිකාවේදී, රජගහනුවර වැඩවසන සමයේදී, රජුගේ නියමය අනුව බුදුන් වහන්සේ බැහැදැකීමට ගිජුකුළු පව්වට පැමිණීම, බුදුන් ප්‍රමුඛ සංඝයාට දන්පූජා කිරීම ආදී විස්තර දීඝ.නි: මහා පරිනිබ්බාන සූත්‍රයේ පෙන්වා ඇත. එම දානයේ අනුසස් පිලිබඳව බුදුන් වහන්සේ වදාළ කරුණු ගැන **බලන්න**: දානය. **මූලාශ්‍ර**: වින.පි: මහාවග්ග 2: පි 70 හා දීඝ.නි: (2): මහාපරිනිර්වාන සූත්‍රය, පි.156, EDN : 16 Mahaparinibbana Sutta, p 175.

▲**වස්ත්‍රය** -Clothes: **1.** සිත කෙලෙස් වලින් කිලිටිවන අන්දම දැක්වීමට, බුදුන් වහන්සේ වස්ත්‍ර උපමාව වදාළහ. කිලිටි වස්ත්‍රයක්, වර්ණ කළද, එහි අපිරිසිදුබව නොමැකේ. එහෙත්, පිරිසිදු වස්ත්‍රයක්, වර්ණ කලවිට, ඒ වර්ණය මැනවින් පිහිටයි. කෙලෙස් නිසා සිත කිලිටිවන බව පෙන්වීමට බුදුන් වහන්සේ මේ උපමාව යොදාගෙන ඇත. **මූලාශ්‍රය:** ම.නි: (1): මූලපරියායවග්ග: 1.1.7 වත්ථූපම සූත්‍රය, පි.102.

**2.** සැරියුත් තෙරුන් වස්ත්‍ර උපමාව ආශ්‍රයකොට, සප්ත බොජ්ඣංග ධර්මතා වර්ධනයේ ආනිසංස මේ උපමාව යොදාගනිමින් පෙන්වා ඇත. රජෙක් තමාට කැමති කැමති පරිදි, කැමති කැමති වෙලාවකට සුදුසු වස්ත්‍ර හඳින පළඳින ලෙසින්, උන්වහන්සේ, කැමති කාලයක: දිවා රාත්‍රි, සිත ඇති පරිදි, සප්ත බොජ්ඣංග ධර්ම එකින් එක ගෙන වාසය කරන බවය. **මූලාශ්‍රය:**සංයු.නි; (5-1) මහාවග්ග: බොජ්ඣංගසංයුත්ත: 2.1.4 වත්ථ සූත්‍රය, පි.178.

**3.** බුදුන් වහන්සේ කසි වස්ත්‍රය උපමාකොට,අප්‍රමාදයේ අගය පෙන්වා ඇත.සියලු වස්ත්‍ර අතරින් ඉතා සිනිඳු කසීවස්ත්‍රය අග්‍රය.එලෙස කුසල් දහම්

අතරින් අප්‍රමාදය අග්‍රයය. **මූලාශ්‍රය:**සංයු.නි; (5-1) මහාවග්ග:මග්ගසංයුත්ත: 1.13 වත්ථ සූත්‍ර, පි.132.

▲ **වස්ත්‍ර දානය-** Offering clothes: වස්ත්‍ර දන්දෙන කෙනා, වර්ණය ( අලංකාරය) ලබාදේ. **බලන්න**: දානය.

▲**වසුදත්ත දේවපුත්‍ර**- Vasudaththa devaputhra: බුදුන් වහන්සේ සැවැත්නුවර වැඩවසන සමයේ මේ දෙවියෝ, සිහිය ඇතිව වාසය කිරීම ගැන බුදුන් වහන්සේ සමග සංවාදයක යෙදීම මෙහි විස්තර කර ඇත. **බලන්න:** සිහිය. **මූලාශ්‍රය**: සංයු.නි: (1): සගාථවග්ග: දේවපුත්‍රසංයුත්ත:2.2.6 වසුදත්ත සූත්‍රය, පි. 126.

▲ **වාසෙට්ඨ උපාසක** -Vasetta upasaka:**බලන්න**: උප ග්‍රන්ථය:3.

▲ **වාසෙට්ඨ බ්‍රාහ්මණ-**Vasetta Brahamin: **බලන්න**: උප ග්‍රන්ථය:3.

▲ **වැස්ස-**Rain: වැස්ස ඇතිකරන දෙවියෝ වැස්ස වලාහක දෙවියන්, සිත පිහිටුවා ගන්නා ආකරයට (කැමැත්ත පරිදි) කාලයේදී, අකාලයේද වැස්ස ඇතිවේ. **මූලාශ්‍රය**: සංයු.නි: (3): ඛන්ධවග්ග: වලාහකසංයුත්ත:11.1.57 වැස්සවලාහක සූත්‍රය, පි.546.

▼**කාලයට වැසි නොවැසීම**: වැස්සට අන්තරාදායක කරුණු (වැසි අන්තරායන්) නිසා, කාලයට වැස්ස නොවසි. වැස්ස ගැන නිමිති කියන අය (rain forecasters) ඒවා ගැන නොදන්නා බව මෙහිදී පෙන්වා ඇත. එබඳු අනතුරු 5 කි: 1) උස් අහසේ තේජෝධාතුව කිපීම නිසා, වලාකුළු විසිරියැම 2) උස් අහසේ වායෝධාතුව කිපීම නිසා, වලාකුළු විසිරියැම 3) රාහු අසුර රජු, වැසිජලය දෝතින් ගෙන මහමුහුදට හැලීම 4) වැස්ස වලාහක දෙවියන්ගේ ප්‍රමාදවීම 5) ලෝකයේ මිනිසුන් අධාර්මික වීම. මේ කරුණු නිසා නියම කාලයට වැස්ස නොවසි. **මූලාශ්‍රය:** අංගු.නි: (3): 5 නිපාත: සොනවග්ග: 5.4.5.7 වැස්සඅන්තරාය සූත්‍රය, පි.412.

▲ **වැස්ස බඳු පුද්ගලයෝ-**People who are similer to the rain: වැස්ස බඳු පුද්ගලයෝ තිදෙනක් ලෝකයේ සිටි: 1) **අවුට්ඨිකසම**: නොවස්නා වැසිවලාවක් හා සමානය: මේ පුද්ගලයා මහණ බමුණු දුගී මහි පුලන්නන් ආදී කිසිවෙකුට ආහාරපාන වස්ත්‍ර ආදිය නොදෙයි 2) **ප්‍රදේශවර්ෂි:** පළාතකට පමණක් වැස්ස ගෙනදෙන වලාවක් හා සමානය: මේ පුද්ගලයා ඇතැම් අයට දාන දෙයි, ඇතැම් අයට දාන නොදෙයි. 3) සර්වත්‍ර වර්ෂි: සැම තැනටම වැස්ස ගෙනදෙන වලාවක් හා සමානය: මේ පුද්ගලයා සියල්ලන්ටම දාන දෙයි. **බලන්න**:ඛු.නි:ඉතිවුත්තක: 3.3.6 වෘෂ්ටි සූත්‍රය, පි. 434.

▲ **වෙසමුනි රජ** -King Vesamuni: සිව්වරම් මහා (සතරවරම් දෙවියෝ) රජවරුන්ගෙන් කෙනෙකි. වෙළකන්ට උත්තරා නන්දමාතා ගේ පෙර ජීවිතයේ සහෝදරයාය. එතුමාගේ ඉල්ලීමක් අනුව ඇය අගසව් දෙනමට මහා දානයක් පිළිගන්වා ඇත. **බලන්න**: චාතුර්මහාරාජිකිය, පෙර ජීවිත. **මූලාශ්‍ර:** අංගු.නි: (4 ): 6 නිපාත: 6.1.4.7 ඡළාඞගදාන සූත්‍රය, පි. 112, EAN:6: 37.7 Giving, p. 332.

▲ **වෙසාරජ්ජ**(පාලි): විශාරද- self-confidence: වෙසාරජ්ජ- සෑම දෙයින්ම විශාරදබව, බුදුන් වහන්සේ හඳුන්වන ගරු පදයකි. **බලන්න**: බුද්ධනාම.

▼ **තථාගතයන් වහන්සේ සතර ආකාරයෙන් විශාරද වේ:** 1) තථාගතයන් වහන්සේ 'සම්මා සම්බුද්ධ' ය, උන්වහන්සේ 'අනභි සම්බුද්ධ' යයි මේ ලෝකයේ සිටින කිසිවෙකුට චෝදනා කළ නො හැකිය. 2) තථාගතයන් වහන්සේ 'ක්ෂිණාශ්‍රව'ය (සියලු ආසව ක්ෂය කර ඇත), උන්වහන්සේ 'අපරික්ෂිණයහ' යයි මේ ලෝකයේ සිටින කිසිවෙකුට චෝදනා කළ නො හැකිය. 3) තථාගතයන් වහන්සේ විසින් (ලෝකයා විපතට පමුණුවන) "අන්තරාකාරී ධර්මතා' පෙන්වා ඇත. ඒවා සේවනය කරන කෙනෙකුට, ඒවා 'අන්තරාකාරී නොවන ධර්මතා' යයි මේ ලෝකයේ සිටින කිසිවෙකුට චෝදනා කළ නො හැකිය. 4) තථාගතයන් වහන්සේ විසින් 'දුක නැතිකර ගැනීම පිණිස පෙන්වා වදාළ ධර්මය, එලෙසින් පුරුදු පුහුණු කරණ කෙනෙකුට දුක නිමකර ගත හැකිවේ", ඒ එය එසේ නොවේ යයි මේ කිසිවෙකුට චෝදනා කළ නො හැකිය. **සටහන්:** * මේ සතර කාරණා තම විශාරද ඥානයෙන් ප්‍රත්‍යවේක්ෂ කරන බුදුන් වහන්සේට උපන් සොම්නස්ස ඥානය චතු වෛසාරද නම්වේ (චතුවෙසාරජ්ජ). ** **බලන්න: පා.සි.ශ**: : "වෙසාරජ්ජ", පි. 284. **මූලාශ්‍ර:** අංගු.නි: ( 2 ): 4 නිපාත: 4.1.1.8 වෙසාරජ්ජ සූත්‍රය, පි. 40, EAN:4: 8.8 Self- confidence, p. 150.

▲ **වෙස්සභූ බුදුන්වහන්සේ**-The Buddha Vessabhu: මෙතුමන්, ගෞත්ම බුදුන් වහන්සේට පෙර පහළවූහ. වෙස්සභූ බුදුන් වහන්සේ පිලිබඳ විස්තර මෙහි දක්වා ඇත.**බලන්න**:බුද්ධවංශ පාලි:21: වෙස්සභූ බුදුන්වහන්සේ.

▼**ගෝතම බුදුන් වහන්සේට** පෙර වැඩසිටි වෙස්සභූ බුදුන් වහන්සේ ගේ සම්බෝධිය පිලිබඳ මෙහි විස්තර කර ඇත. **මූලාශ්‍රය:**සංයු.නි: (2): නිදානවග්ග: අභිසමයසංයුත්ත: 1.1.6 වෙස්සභූ සූත්‍රය, පි.35.

▲ **විසාරද බව**-skillfull: විසාරදබව යනු පන්සිල් රකිමින්, දක්ෂ ලෙසින් ගිහිගෙයි වාසය කිරීමය. එලෙස ජීවත් නොවන තැනැත්තා අවිසාරදය. **මූලාශ්‍ර:** අංගු.නි: (3): 5 නිපාත: 5.4.3.2 විසාරද සූත්‍රය, පි.352, සංයු.නි: (4): සළායතන වග්ග: මාතුගාමසංයුත්ත: 3.3.9 විසාරදවාස සූත්‍රය, පි.498.

▼**දස අකුසලයේ** නොයෙදී දැහැමින් ගිහිජීවිතය ගෙනයාම විසාරද ය. **මූලාශ්‍රය:** අංගු.නි: (6): 10 නිපාත: 10.5.1.5 විසාරද සූත්‍රය, පි.560.

▲ **විසාකා මහා උපාසිකා** - Visaka Maha upasika: **බලන්න**: උපග්‍රන්ථය:3

▲ **විසාක උපාසක** - Visaka upasak: **බලන්න**: උපග්‍රන්ථය:3

▲**විසාලා මහානුවර** -Visala Mahanuwara: වෙසාලි ලෙසින්ද හඳුන්වයි, වජ්ජී ප්‍රදේශයේ පිහිටි, ලිච්ඡවීන්ගේ අගනුවරය. ගංගානම් නදියේ උතුරු දිගින් පිහිටා ඇත.

"බුදුන් වහන්සේ වේළුවනාරාමයෙහි වැඩවසන සමයේ වේසාලි නගරය සමෘද්ධි මත් සැපතින් පිරි නගරයකි. බොහෝ මිනිසුන් ගෙන් ගැවසී, සුව සේ ලැබිය හැකි භික්ෂා ඇති තැනකි. සත්දහස්සත්සිය සතක්

ප්‍රසාදයෝ විය, සත්දහස්සත්සිය සතක් කුළුගෙවල් විය,සත්දහස්සත්සිය සතක් ආරම විය, සත්දහස්සත්සිය සතක් පොකුණු විය' **මූලාශ්‍රය**: වින.පි: මහාවග්ග පාලිය 2: 8 චීවරකන්ධය: පි.166. **සටහන්**: * විසාලා නුවර ඇතිවූ මහා වසංගතය නිසා දුකට බියට පැමිණි, නුවර වැසියන් අස්වස්නු පිණිස රතන සූත්‍රය දේශනා කර ඇත. **බලන්න**. පිරිත් සජ්ජායනා. ** බුදුන් වහන්සේ අවසාන චාරිකාවේදී, මේ නුවර අසබඩ පිහිටි මහාවනයේ කුටාගාර ශාලාවේ වැඩ වාසය කලබව දීඝ.නි: මහාපරිනිර්වාණ සූත්‍රයේ දක්වා ඇත.

▲ **විසල්පුරවැසි උග්ග උපාසක**-Ugga upasaka **: බලන්න:** උපග්‍රන්ථය:3

▲**විසිතුරු ධර්මකතා**-Visuthru Dhmmakatha: විසිතුරු ධර්මකතා (**චිත්තකථිකානං**) දේශනා කරන ඇති භික්ෂුන් අතරෙන් අග්‍ර: කුමාර කාශ්‍යප තෙරුන්ය. **බලන්න:** උපග්‍රන්ථය:1.

▲ **වොසසග්ගපරිණාමිං-** Vosaggaparinami: මින් අදහස් කරන්නේ සියල්ල හැර, නිවනට සිත යොමුකර බොජ්ඣංග ධර්ම වඩා ගැනීමය. **බලන්න**: බොජ්ඣංග ධර්මතා, ඔසග්ග.

▲ **වෛසයා කුලය (වෙළඳ)**- Vaishaya Cast: බුදුන් වහන්සේ වැඩ සිටි සමයේ පැවති ප්‍රධාන කුල 4 න් එකකි. **බලන්න**: ගෝත්‍රය.

**වශ**

▲ **වාශිෂ්ඨ තෙර**-Vasihsta Thera: **බලන්න**: උපග්‍රන්ථය:1

▲ **විශාඛපංචාලිපුත්ත තෙර-** Visākha Pañcāliputta Thera: **බලන්න**: උපග්‍රන්ථය:1

▲ **විශිෂ්ඨ මග-** the exquisite way: ආධ්‍යාත්මික මග, විශිෂ්ඨ මගය.**බලන්න**: ආධ්‍යාත්මික මග.

▲**විශිෂ්ඨ රත්න-** Best Treasurers: ධර්මයට අනුව විශිෂ්ඨ රත්න (අනගි මැණික්) ලෙසින් පෙන්වා ඇත්තේ මාර්ගය වඩා ගැනීමට උපකාරීවන දේ ගැනය. රතන සූත්‍රයෙදී, ත්‍රිවිධරත්නය අනර්ඝ යයි පෙන්වා ඇත.

▼**මිනිසුන්හට ඇති විශිෂ්ඨ**- අනගි රත්න කුමක්ද යයි? දෙවියෙක් ඇසුවිට බුදුන් වහන්සේ අනගි රත්න 4ක් පෙන්වා වදාළහ: 1) යම් කෙනක්හට ත්‍රිවිධ රත්නය කෙරෙහි **ශ්‍රද්ධාව** ඇතිනම් එය ඔහු සතු විශිෂ්ඨ රත්නයකි 2) සිතට සුවය දෙන **ධර්මය** කෙනෙක් පුරුදු පුහුණු කරන්නේ නම් එය ඔහු සතු විශිෂ්ඨ රත්නයකි 3) සියලු රස අතරින් අග්‍රවූ **සත්‍ය,** යම් කෙනෙක් සතුනම් එය ඔහු සතු විශිෂ්ඨ රත්නයකි4) ධර්මකාමී ජීවිතයක් ගතකිරීමට උපකාරීවන **නුවණ** කෙනෙක් සතුනම් එය ඔහු සතු විශිෂ්ඨ රත්නයකි. **මූලාශ්‍ර**: සංයු.නි: (1): සගාථවග්ග: දේවතාසංයුත්ත: 1.8.3 චිතත සූත්‍රය, පි. 103, ESN: 1: Devatasamyutta: 73.3. Treasure, p.155.

▲**විශේෂ අවබෝධය** :පාලි: **අභිඤ්ඤාය-** direct knowledge: ධර්මයේ විශේෂ දැනුම (අවබෝධය- අභිඥා):ලෙසින් පෙන්වා ඇත්තේ යම් ධර්මතාවයක් පිලිබඳ කරුණු නුවණින් අවබෝධ කරගැනීමය. බුදුන්

වහන්සේ, ධර්මය දේශනා කරනවිට ආධ්‍යාත්මික වර්ධනය පිණිස වැඩිය යුතු ධර්මතා (කුසල ධර්ම) හා ප්‍රහාණය කරගතයුතු ධර්මතා (කෙළෙස් ආදිය) යහපත් ලෙසින් අවබෝධ කරගත යුතු යයි අවවාද අනුසාසනා වදාරා ඇත. **උදාහරණයක්** ලෙසින් 'දුක' ඇතිවීම බැලීමට හා නැති කරගැනීම පිණිස, දුක පිලිබඳ විශේෂ දැනුම (**අභිඤ්ඤාය)** තිබිය යුතුවේ. ආරිය අට මග වඩා ගැනීමෙන් එම අවබෝධය ඇතිවේ. **බලන්න**: අනිච්ච, දුක්ඛ හා අනාත්ම, සය අභිඥා.**ශබ්දකෝෂ: පාසිං.ශ:** පි.89: **"අභිඤ්ඤාය:** දැනීම, අවබෝධය. විශේෂයෙන් දන්නා බව අභිඥා වේ. පංච අභින්ඥා හා ෂළ අභින්ඥා (6)" . **මූලාශ්‍ර**: සංයු.නි: (5-1): මග්ගසංයුත්ත: 1.15 දුක්ඛතා සූත්‍රය, පි.156, ESN: Magga samyutta: 165.5 Suffering, p. 1710.

▲ **විශේෂභාගිය ධර්ම**: පාලි: **විසෙසභාගියා ධම්මා**- Dhamma conducive to distinction: ආධ්‍යාත්මික වර්ධනයට -මාර්ගය වැඩීමට විශේෂයෙන්ම උපකාරිවන (විශේෂත්වය ගෙන දෙන) කරුණු විශේෂභාගිය ධර්ම වේ.

▼**විශේෂ බව ගෙන දෙන ධර්මතා: 1) යෝනිසෝමනසිකාරය** (යොනිසො මනසිකාරො අයං එකො ධම්මො විසෙසභාගීයො).**2) සුවචභාවය** - කීකරුබව (සොවචස්සතාවය ) **3) කල්‍යානමිත්‍ර සේවනය** 4) **ත්‍රිවිධ කුසල මූල** : අලෝභය, අදෝසය හා අමෝහය 5) **සතර විසංයෝග**: කාම, භව, දිට්ඨි හා අවිජ්ජා යන යොග 4 න් නිදහස් වීම -බැඳීම් ගලවා දැමීම. 6) **පංච ඉන්ද්‍රිය**: ශ්‍රද්ධා, වීරිය, සතිය, සමාධිය හා ප්‍රඥාව යන ඉන්ද්‍රිය 5 ය. 7) **ගෞරව ධර්මසය. මූලාශ්‍ර:** දීඝ.නි : (3 ): 11 දසුත්තර සූත්‍රය, පි. 483, EDN: 34: Dasuttara Sutta: Expanding Decades, p. 384.

**වෂ**

▲**වෘෂභ-**Bull: වෘෂභ යනු ගොනාය. හඳුන්වන විදියකි. ඇතැම් පුද්ගලයන්, ගොනුන් ලෙසින් හැසිරෙන බව මෙ උපමාවෙන් පෙන්වා ඇත. **බලන්න**:බලිවද්ද උපමාව-උපග්‍රන්ථය:5

▲ **විෂම ලෝභය** -unrighteous greed: විෂම ලෝභය ලෙසින් යනු අනුන්ගේ සම්පත් ආදිය පිළිබඳව, කෙනෙක් තුල ඇති දැඩි ආශාව-තණ්හාවය, මෙය කෙළෙසකි. **බලන්න**: කෙළෙස්.

**වහ**

▲**විහාරත්ථ ඥානය**- Viharathta Nana: මෙය අනිත්‍යදර්ශනය දන්නා නුවණ ලෙසින් පෙන්වා ඇත. **බලන්න**: ත්‍රිවිධඥාන. **මූලාශ්‍රය:** ඛු.නි:පටිසම්භිදා1:ඥාණකථා: 29-31ඥානත්‍රය,පි. 196.

▲**විහාර සමාප්‍රත්‍යත්ත ඥානය-**Vihara samapthyanana: මෙය ඥානත්‍රය- ත්‍රිවිධ ඥානයන්ගෙන් එකක් බව මෙහි දක්වා ඇත. **බලන්න**: ත්‍රිවිධඥාන. **මූලාශ්‍රය:** ඛු.නි:පටිසම්භිදා1:ඥාණකථා: 29-31ඥානත්‍රය,පි. 196.

▲ **වීහිංසා**- Cruelty: වීහිංසා, හිංසා කිරීම කායික, මානසික වධ හිංසා කිරීම. මෙය අකුසලයකි. වීහිංසාව නැතිකර ගැනීමට අවිහිංසාව වැඩිය

යුතුය. **බලන්න**: සල්ලේඛ පරියාය. **මූලාශ්‍රය:** අංගු.නි: (4) 6 නිපාත: 6.1.7 සූත්‍රය, පි.284.

▲ **විහිංසා ධාතුව -** Element of cruelty: අනුන්ට හිරිහැර කිරීම පිළිබඳව සිත්සතන්හි ඇති කැමැත්ත මින් අදහස් කෙරේ. මෙය පහ කරගැනීම පිණිස අවිහිංසාධාතුව-කරුණාසහගත බව ඇතිකර ගත යුතුවේ. **බලන්න**:ත්‍රිවිධ ධම්මතා. **මූලාශ්‍ර**:අංගු.නි: ( 4 ): 6 නිපාත**:** තික වග්ග සූත්‍ර, පි. 280, EAN:6: I Triads, p. 364.

▲ **වීහිංසා නිස්සරණිය ධාතුව** - Element of escape from cruelty අනුන්ට හිංසාව, පිඩා කිරීමආදී නපුරු සිතිවිලින් සිත මුදාගැනීම මින් අදහස් කෙරේ. **බලන්න**: ධාතු.

▲ **විහිංසා විතක්ක-** Thoughts on cruelty: විහිංසාවිතක්ක යනු කෲරබව - අනුන්ට පිඩාකිරීමට සිතේ ඇතිවන සිතුවිලිය. මෙය ප්‍රහාණය පිණිස අවිහිංසාවිතක්කය වැඩිය යුතුය. **බලන්න**:ත්‍රිවිධ ධම්මතා. **මූලාශ්‍ර**:අංගු.නි: ( 4 ): 6 නිපාත**:** තික වග්ග සූත්‍ර, පි. 280, EAN:6: I Triads, p. 364.

▲ **විහිංසා සංඥා-** Perceptions on cruelty: සිතට ගන්නා අරමුණු මගින්, හිංසාකිරීම ගැන ගන්නා සංඥා, විහිංසාසංඥාවය. මෙය ප්‍රහීණය පිණිස අවිහිංසා සංඥා වැඩිය යුතුවේ. **බලන්න**:ත්‍රිවිධ ධම්මතා. **මූලාශ්‍ර**:අංගු.නි: ( 4 ): 6 නිපාත**:** තික වග්ග සූත්‍ර, පි. 280, EAN:6: I Triads, p. 364.

▲ **වෙහප්ඵලා දේව-** Vehapphalā deva: මහාඵල ඇති (devas of great fruit): සිව්ජානසමාපත්ති ඇති උසස් බ්‍රහ්ම දෙවියන් වාසය කරන බ්‍රහ්ම ලෝකයකි. **බලන්න**: බ්‍රහ්ම ලෝක.

## ස කොටස :සක,සඛ,සග,සඝ,සච,සජ,සඤ,සඥ,සත,සඨ, සද,සඳ, සධ, සන-සප-සබ-සභ-සම-සය-සර-සල-සළ-සව, සස, සහ

**සක**

▲**සකදාගාමී**-Sakadagami: සකදාගාමී යනු ආරිය මාර්ගයේ දෙවන පියවර ලැබීමය. ඒ උතුමෝ, කාමරාග, ව්‍යාපාද යන සංයෝජන 2 හි බල හීන කර, ක්‍රෝධ, පටිස, උපනාහ යන කෙළෙස් වල බල බිඳ දමා ඇත.දුගතියෙන් මිදී ඇත, එක් වරක් පමණක් කාමලෝකයේ යළි උපත ලබා දුක කෙළවර කරගනී. **බලන්න**: සිව්මග සිව්ඵල.

▲ **සක්ක නම් යක්ඛ**-Sakka named Yakka:බලන්න**:** යක්ඛ

▲ **සංකේතය-**Symbol: සංකේතය- සලකුණ -යමක් හැදින්වීමට උපකාරී කරගන්නා දෙයකි. සංකේත 4 ක් පෙන්වා ඇත: 1. රියට සලකුණ :කොඩිය (ධජය), 2. ගින්නට සලකුණ:දුම, 3. රටට සලකුණ: රජතුමා, 4. ස්ත්‍රියට සලකුණ: සැමියාය. **මූලාශ්‍රය:**සංයු.නි: (1): සගාථවග්ග: දේවතා සංයුත්ත:1.8.2. රථ සූත්‍රය, පි.104.

▲ **සංකිලෙසධම්ම-** Sankilesa Dhamma: සංකිලෙසධම්ම යනු හේතු ප්‍රත්‍ය නිසා හටගත් සියලු ධර්මයන්ය. ඒ හැම කෙළෙස් සහගතය ය.

**මූලාශ්‍රය:**සංයු.නි: (4): සළායතනවග්ග:වේදනාසංයුත්ත:ජාතිධම්මවග්ග: 1.4.6 සංකිලෙස ධම්ම සූත්‍රය, පි.84.

▲ **සක්කාය දිට්ඨිය**: පාලි: **සක්කායදිට්ඨිං**- Identity view / Personal-existence view: සක්කාය දිට්ඨිය (සත්කාය දිට්ඨිය-සක්කාය) යනු, අවිද්‍යාව නිසා පංච උපාදානස්කන්ධය තමාය යයි ගැනීමය (තමා යයි කෙනෙක් ඇතය යන අල්වා ගැනීම). එය ආත්මය ලෙසින් අල්වා ගැනීමය, තමා කවරෙක්ද යනවග- අනන්‍යතාවයක් ඇතිකර ගැනීමය. සම්මා දිට්ඨියට නැතිවිට සක්කාය දිට්ඨිය ඇතිවේ. සෝතාපන්නබව ලැබූ විට ඒ දිට්ඨිය නැතිවේ. **බලන්න**: සෝතාපන්න.

▼ **සක්කාය යනු පංච උපාදානස්කන්ධයය**: සක්කාය සමුදය- ඇතිවීමට හේතුව තණ්හාවය. එම තණ්හාව නැතිකර ගැනීම සක්කාය නිරෝධයය. සක්කාය නිරෝධ ගාමිනි පටිපදාව, ආරිය අටමග යයි පෙන්වා ඇත. **මූලාශ්‍රය**:සංයු.නි: (3): ඛන්ධසංයුත්ත:අන්තවග්ග: 1.3.1.3 සක්කාය සූත්‍රය, පි. 302.

▼ **සැරියුත් තෙරුන් මෙසේ වදාළහ**:

**"...මේ උපාදානස්කන්ධ පස සත්කාය යයි බුදුන් වහන්සේ විසින් වදාරන ලදී".** සක්කාය දිට්ඨිය පිරිසිඳ දැනගැනීම පිණිස ආරිය අටමග සම්පූර්ණ කරගත යුතුවේ. **සටහන:** මේ සූත්‍රය දේශනා කර ඇත්තේ ජම්බුඛාදක පරිබ්‍රාජකයාටය**. මූලාශ්‍ර**: සංයු.නි :(4 ): සළායතන වග්ග: ජම්බුඛාදක සංයුත්ත:4.1.15 සක්කාය සූත්‍රය,පි. 510, ESN: IV: 38 Jambukhādaka saṃyutta: 15 Identity, p. 1410.

▼ **සක්කාය සමුදය හා නිරෝධය**: බුදුන් වහන්සේ පෙන්වා ඇත්තේ: ධර්මය නොදත් පෘතග්ජනයා, පංච උපාදානස්කන්ධය, ආත්මය ලෙසින් ගැනීම,සක්කාය සමුදය ගාමිණී ප්‍රතිපදාවය, දුක්ඛසමුදයගාමිණී සමනුදර්ශනාව බවය. සක්කාය නිරෝධය-නැතිවීම යනු, ආරිය ශ්‍රාවකයා, පංච උපාදානස්කන්ධය පිලිබඳ යථා අවබෝධය ලැබීමය- ආත්මය ලෙසින් නොගැනිමය. එය සක්කාය නිරෝධ ගාමිණී ප්‍රතිපදාවය, දුක්ඛනිරෝධ ගාමිණීසමනුදර්ශනාව යය. **මූලාශ්‍ර**: සංයු.නි: (3 ): ඛන්ධසංයුත්ත:අත්තදීපවග්ග: 1.1.5.2 පටිපදා සූත්‍රය, පි. 106, ESN: 22: Khandasamyutta: V:44.2 The Way, p.1031.

▼ **විශාක උපාසක**, ධම්මදින්නා තෙරණියගෙන්, බුදුන් වහන්සේ සක්කාය දිට්ඨිය ගැන කුමක් වදාරා තිබේද? යයි විමසුහ:

**"කතමොනු බෝ අය්‍ය සක්කායො වුත්තො භගවාතා ති?"**:

තෙරණිය මෙසේ වදාළහ: **"පඤ්ච ඛො ඉමෙ...උපාදානක්ඛන්ධා සක්කායො වුත්තො භගවාතා"**: බුදුන් වහන්සේ මේ පංච උපාදාන ස්කන්ධය, සක්කාය ලෙසින් වදාළහ. **සටහන්:** * සක්කාය ඇතිවීමට හේතුව තණ්හාව බව ද, එය නැතිකර ගැනීමේ මග ආරිය අටමග වඩා ගැනීම බවද මේ සූත්‍රයේ පෙන්වා ඇත. ** බුදුන් වහන්සේ, තෙරණියගේ දේශනාව අනුමත කර, ධම්මාදින්නා තෙරණිය ප්‍රඥාවන්ත යයි වදාරා ඇත. **බලන්න**:උපග්‍රන්ථය:1,3. **මූලාශ්‍ර:** ම.නි: (1) 1.5.4. චූල වෙදල්ල සූත්‍රය,පි. 721, EMN:44: Cūḷavedalla Sutta, p.379.

▼ **සක්කාය දිට්ඨිය පහකිරීම**: හිස ගිනිගත් කෙනෙක් එම ගින්න වහා නිමා දැමීමට කටයුතු කරන මෙන්, කඩුවකින් පහර ලදවිට වහා ප්‍රතිකාර සොයා යනලෙසින් සක්කාය දිට්ඨිය පහකර ගැනීම පිණිස සිහිය ඇතිව අප්‍රමාදව කටයුතු කළයුතුයයි බුදුන් වහන්සේ මෙහිදී පෙන්වා ඇත. **උපමා**: 1) හිසගිනි ගැනීම 2) කඩුවකින් පහර ලැබීම.**බලන්න**: උපග්‍රන්ථය:5 **මූලාශ්‍ර:** සංයු.නි:(1 ):සගාථවග්ග: දේවතාසංයුත්ත: 1.3.1 සත්ති සූත්‍රය, පි. 50, ESN:1: Devatasamyutta: 21.1 A Sword, p. 83.

▼ **සක්කායදිට්ඨිය නැතිකිරීමේ පිළිවෙත**: සක්කායදිට්ඨිය ඇතිවිට, රාගය දෝසය හා මෝහය යන අකුසල පවතී. සක්කායදිට්ඨිය නැති කරගැනීමට ධර්මතා 3 ක් පහ කර ගත යුතුවේ:අයෝනිසෝමනසිකාරය, මිථ්‍යාමග ගැනීම, චිත්තලීනත්වය: ධර්මය පිලිබඳ සිතේ ඇති උදාසීන බව ( mental sluggishness). **සටහන:** සෝතාපන්න මග ඵල ලැබීමට සක්කායදිට්ඨිය පහ කළ යුතුය. **මූලාශ්‍ර:** අංගු.නි: (6 ):10 නිපාත: ආකංඛවග්ග:10.2.3.6 තයෝධම්ම සූත්‍රය,පි.284, EAN: 10: Tens,76-6.Incapable, p. 524.

▲ **සක්කාය නිස්සරණීය ධාතුව-**Sakkaya Nissaraniyadhatu: පංච උපාදානස්කන්ධය පිලිබඳ නො ඇලි, එහි සිත නොයෙදවා ඉන් මිදීමට ඇති හැකියාවය. **බලන්න**: ධාතු.

▲ **සක්කච්චකාරී-** Sakkachchakari: සමාධිය සකස්කරන කුසලය මින් අදහස් කෙරේ. **බලන්න**: ජාන.

▲**සක්මන් භාවනාව-** Walking meditation: සක්මන, ඇවිදීම (චරනය) පිලිබඳව සිත පිහිටුවාගෙන කරන භාවනාව සක්මන් භාවනාවය. සක්මන පිලිබඳ වෙන්කරගත් මාර්ගය චංකමයය. බුදුන් වහන්සේ නිතරම සක්මන් භාවනාවේ යෙදී සිටි බවද, ශ්‍රාවක පිරිසට එම භාවනාවේ යෙදීමට අනුබල දුන් බවද සූත්‍ර දේශනාවල පෙන්වා ඇත. **බලන්න**:දීඝ.නි: (3): අග්ගඤ්ඤ සූත්‍රය,පි.152.

▼ **මෙහිදී බුදුන් වහන්සේ** හා ශ්‍රවක පිරිස සක්මන් භාවනාවේ යෙදීසිටීම විස්තර කර ඇත. **මූලාශ්‍රය:**සංයු.නි: (2): නිදානවග්ග: ධාතුසංයුත්ත: සත්තධාතුවග්ග: 2.2.5 චංකමසූත්‍රය, පි.263.

▼**සක්මන් භාවනාවේදී,** කාම, ව්‍යාපාද හා විහිංසා විතක්ක ඇතිවේ නම් ඒවා පහ කිරීමට විරිය කළයුතුවේ. එසේ කිරිමට වීරිය නැති පිරිස 'හීන වීරිය' ඇති අයය. එහෙත්, ඒවා පහකර ගැනීමට වීරිය කරණ අය 'සමථ හා විදර්ශනා' ලබාගැනීමට සිත මෙහෙයවූ අයවේ. ඔවුන් අරහත්වය ලැබීමට හැකියාව ඇති උතුමන්ය. **මූලාශ්‍රය**: අංගු.නි: (2): 4 නිපාත: චරවග්ග: 4.1.2.1 චරන්ත සූත්‍රය, පි.48.

▼ **සක්මන් භාවනාවේ ආනිසංස**: 1) චාරිකා ආදියේ යෙදීමට හැකියාව ලැබීම 2) ප්‍රධන් විරිය ඇතිකර ගැනීමට හැකිවීම 3) ශරීර සෞඛ්‍යය යහපත්වීම 4 ) අහාර පාන දිරවීමට පහසුව 5) එමගින් ලබන සමාධිය-චිත්ත ඒකග්‍රතාවය දිගු කාලයක් පවත්වා ගැනීමට හැකිවීම. **මූලාශ්‍ර:** අංගු.නි: (3): 5 නිපාත: 5.1.3.9 චඞකමානිසංස සූත්‍රය, පි. 66, EAN:5: 29.9 Walking meditation, p. 245.

▲**සක්දෙවිඳු:** පාලි: **සකක** - Sakka deva: සක්දෙවිඳු - සක්‍ර දෙවියෝ- දේවානමින්ද, තව්තිසා හා චාතුර්මහාරාජකීය දේවලෝකයන්ට අධිපති දෙවියෝය. ඉන්ද්‍ර, කෝසිය, වාසව ලෙසින්ද හඳුන්වයි. බුදුන් වහන්සේ වෙතින් ධර්මය අසා සෝතාපන්න මගඵල සාක්ෂාත් කරගත්හ. විස්තර පිණිස **බලන්න**: සංයු.නි: (1) සගාථවග්ග: සක්කසංයුත්තය.

▼**එක් සමයක** මුගලන් මහා තෙරුන් තව්තිසා දෙව්ලොවට පැමිනිම හා සක්දෙවි හා දේවසභාව සමග දහම් කතාවේ යෙදීම මෙහි දක්වා ඇත. **බලන්න**: සංයු.නි: (4): සළායතනවග්ග: මොග්ගල්ලානසංයුත්ත: සක්ක සූත්‍ර , පි.526. **ශබ්දකෝෂ: B.D**: p. 288: **"sakka**: "the king of Gods" (devānam-inda), is the lord over the celestial beings in the heaven of the Thirty Three (tāvatiṃsa)".

▼ **තමා බුදුන් වහන්සේගේ මෙහෙකරුවෙක්** යයි සක්දෙවිඳු පවසා ඇත. බුද්ධත්වය ලබා, උරුවෙල, නදී හා ගයාකාශ්‍යප ආදීවූ ජටිලයන් දමනය කර බිම්බිසාර රජතුමා හමුවීමට බුදුන් වහන්සේ රජගහ නුවරට වඩින අවස්ථාවේ සක්දෙවිඳු තරුණ මිනිස්වෙසක් ගෙන බුදුගුණ කියමින් ජනයා ඉදිරියේ ගමන්කළහ. සක්දෙවිඳුගේ ගායනය අසා, මහජනයා ඔහු කවරෙක්ද? යයි ඇසුවිට මෙසේ පැවසුහ:

**" යම් නුවණැත්තෙක් තෙමේ සියලු ස්කන්ධ ආයතනයන්හි දැමුනේද, පිරිසිදු වූයේද, අප්‍රතිපුද්ගල වූයේද, ලෝකයෙහි රහත් වූයේද, යහපත් ගමන් ඇත්තේද, මම උන්වහන්සේගේ මෙහෙකරුවෙමි". බලන්න:** බුදුගුණ. **මූලාශ්‍ර**: වින.පි: මහාවග්ග (1) : 48: මහාඛන්ධක: 48 උරුවෙල පටිහාරිය කතා, පි. 127 හා 1: 9 ඡෙදය, පි 158.

▼ **සියලු ලෝක වාසින්ද**, සතරවරම් දෙවියෝද, යසස් ඇති දෙවියෝද සක් දෙවිඳු නමදිති. සක් දෙවිඳු, බුදුන් වහන්සේටද, රහතුන්හට, ප්‍රමුඛ සිල්වත් සංඝයාහට, සිල්වත් ගිහි උවසුවන් හට නමස්කාර කරන බව මෙහි දක්වා ඇත. **මූලාශ්‍රය:** සංයු.නි: (1): සක්ඛසංයුත්ත:සක්ඛ නමස්කාර සූත්‍ර, පි.442.

▼**සක්දෙවිඳු** වරින්වර බුදුන් වහන්සේ බැහැදැක ධම්ම කරුණු විමසා ඇත: 1) දෙව් මිනිසුන් ඇතුළු සියලු සත්වයෝ සාමයෙන් ජීවත්වීමට පතයි, එහත් ඔවුන් නිතරම වාසය කරන්නේ වෛරසහගතවය; කවර සංයෝජනයකින් ඔවුන් බැඳී ඇත්ද ? එම සංයෝජන ඇතිවීම හා නැතිවීම පිළිබඳ කරුණු ගැන සක්දෙවිඳු ප්‍රශ්නමාලාවක්, බුදුන් වහන්සේගෙන් විමසුහ. ඒ පිළිබඳ විස්තර මෙහි පෙන්වා ඇත. **මූලාශ්‍ර**:දීඝ.නි: (2 ): සක්කපඤ්හ සූත්‍රය- ඡෙදය 12, පි. 430, EDN: 21: Sakkapanha Sutta- Sakka's questions, section 2.1 , p. 241.

2) ලෝකයා කුමක් දවා සුවසේ වාසය කරන්නේද? යයි සක්දෙවිඳු, විමසුවිට, බුදුන් වහන්සේ වදාළේ, කෙනක් ක්‍රෝධය දවාලන්නේ නම් ඔහු සුවපත්ව වාසය කරණ බවය. **මූලාශ්‍රය**: සංයු.නි: (1): සක්ඛසංයුත්තය: 11.3.1 ඣත්වා සූත්‍රය, පි.448.

▼**සක්දෙවිඳුගේ දේවසත්වත පද**: සක්දෙවිඳු, මිනිස් ලෝකයේ වාසය කරන සමයේ උතුම් පද 7 ක් (දේවසත්වත පද) ආරක්ෂාකළ හෙයින්, තව්තිසාවේ අධිපති බවට පත්වුහ.**බලන්න**: දේවසත්වත පද.

▼**සක්දෙවිඳු හඳුන්වන නම්**: 1) සක්දෙවිඳු, පෙර කල මිනිස් ලෝකයේ උපත ලබා මඝ මානවක ලෙසින් තම යහළුවන් සමග බොහෝ කුසල් ක්‍රියා කර ඇතිනිසා '**මඝවන්තු**' ලෙසින් හඳුන්වයි. **සටහන**: අටුවාවට අනුව, මඝ නම් බ්‍රාහ්මණ තරුණයා සිය මිතුරන් 33 දෙනා සමග කුසල කටයුතු කර, දේවසත්වත පද සම්පූර්ණ කර, සිය මිතුරුන් 31 සමග තව්තිසාදේව ලෝකයේ අධිපතිබවට පත්වුහ. තාවතිංස යනු 31ක් ක් බවය **බලන්න**: ESN: note: 636, p. 586. 2) නගරයක්, නගරයක් පාසා දන් දුන් නිසා '**පුරින්ද**' (Urban Giver) ලෙසින් **පෙන්වා ඇත.** 3) සකස්කර දන් දුන් නිසා '**සක්ක**' ය. 4) ආවාස ආදිය පුජා කළ හෙයින් '**වාසව**' ය. 5) අරුත් දහසක් මොහොතකින් සිතිය හැකි නිසා '**සහස්සඛ**' ය. (thinks of a thousand matters in a moment- Thousand-eyed) 5) සුජා නම් අසුර මානවිකාවගේ සැමියා නිසා '**සුජම්පති**' ය. 6) තව්තිසා දෙවලෝකයේ ඉසුරුමත්ව අධිපතිව වසන හෙයින් '**දේවානමින්ද**' ය (lord of the devas). **මූලාශ්‍ර:** සංයු.නි: (1): සගාථවග්ග: සක්ඛසංයුත්ත: 11.2 දේවසත්තවතපද සූත්‍රය, පි. 43, ESN: 11: Sakkasamyutta: 12.2 Sakka's names, p. 477.

▼**සක්දෙවිඳුගේ ඉවසීම**: 1) එක්සමයක, සුර අසුර සටනේදී පරාජයට පත්වූ වේපචිත්ති අසුරරජු, බැම්වලින් වෙලා, සක්දෙවිඳු වෙතට පැමිණිවුහ. ඒ අවස්ථාවේ වේපචිත්ති අසුර රජු, සක්දෙවිඳුට අපහාස වචනයෙන් බැනවැදුනි, එහෙත්, සක්දෙවිඳු ඒ ගැන නිශ්ශබ්දවුහ. ඒ දුටු මාතලී දේවපුත්‍ර, සක්දෙවිඳුගේ රියදුරා අසතුට පත්ව, අසුර රජුගේ බැනුම් අසා නිසලව සිටින් නේ ඇයිද යයි ඇසුහ. සක්දෙවිඳු මෙසේ පැවසුහ:

**" මාවැනි නුවණැති කෙනක්, අනුවණ මිනිසකුගේ අමන කතා අසා කිපෙන්නේ ඇයි? සතුරා කිපී ඇතිබව දුටුවිට, සිහියෙන් යුතුව නිසලවීම යහපත්වේ... ධර්මයෙන් රැකවරණය ලැබූවිට,ඉවසීම හා මෘදුබව පවත්වා ගත යුතුවේ".** **සටහන:** එම සිදුවීම පදනම් කොට, බුදුන් වහන්සේ සංඝයාහට අනුසාසන වදාළේ:

**" තමන්ගේ පුණ්‍ය බලයෙන් තව්තිසාවේ අධිපතිව දෙව්සැප විඳින සක්දෙවිඳු එසේ ඉවසීම හා මෘදුබව ඇතිව වාසය කරන්නේ නම්, යහපත්ලෙසින් වදාළ ධම්මවිනය පුරුදු පුහුණු කරන ඔබ කෙතරම් දුරට ඉවසීම හා මෘදුබව ඇතිකර ගත යුතුද?"** .**මූලාශ්‍ර:**සංයු.නි: (1):සගාථවග්ග: සක්ඛසංයුත්ත: 11.1.4 වේපචිත්ති සූත්‍රය**,** පි. 418, ESN: 11: Sakkasamyutta: 4.4. Vepacitti, p. 462.

2) **එක් සමයක**, අරූපි යක්ෂයෙක් සක්දෙවිඳුගේ අසුනේ හිඳ ගත්විට දේවපිරිස එසේ කිරීම ගැන ඔහුට දොස් පැවසුහ. එහි පැමිණි සක්දෙවිඳු ඔහුට තෙවරක් නමස්කාර කළහ. සක්‍රදෙවියන්ගේ ඉවසීම දැක, ඒ අසුනේ සිටීමට නොහැකිවූ යක්ෂයා අතුරුදහන්වුහ. ඒ අවස්ථාවේ දේවසභාව අමතා, සක්‍ර දෙවියෝ පැවසුවේ තමා ක්‍රෝධය නොමැතිව වාසය කරන බවය. **බලන්න**: ක්‍රෝධය. **මූලාශ්‍ර:**සංයු.නි: (1):සගාථවග්ග: සක්ඛසංයුත්ත:11.3.2 දුබ්බන්ණිය සූත්‍රය, පි.448.

▼**සක්දෙවිඳුගේ සුභාෂිතය**: සක්දෙවිඳු සැමවිටම සුභාෂිතය භාවිතා කරයි- ඉවසීම, මෘදුබව, කළහ නොකිරීම ආදීය ගැන සුභ වචනම කතා කරයි. එමනිසා සුරඅසුර අතර ඇතිවූ සුභාෂිත සටනින්, සක්දෙවිඳු ජය ගති.

**මූලාශ්‍ර:**සංයු.නි: (1) සගාථවග්ග: සක්ඛසංයුත්ත: 11.1.5 සුභාසිතජය සූත්‍රය, පි. 422, ESN: 11: Sakkasamyutta: 4.4. Vepacitti, p. 462.

▼**සක්දෙව්දුගේ දයාව**: එක් සමයක සුරඅසුර සටනේදී, පැරදුන සක්දෙව්දු පලායන්නේ, කුරුළු පැටවුන් සිටින කුඩු සහිත වනයකට පැමිණියහ. කුරුළු පැටවුන් සිටින කුඩු කඩා දමා ජයගන්නවාට වඩා පරාජය ලැබීම මැනවි යයි සිතා, රිය ආපසු හරවන්න යයි සක්දෙව්දු තම රියදුරු මාතලී හට (මාතලී දේවපුත්‍ර) පැවසුහ. සක්දෙව්දු හඹා පැමිණි අසුරයන්, සක්රිය ආපසු තමන් වෙතට එනබව දැක භියවී පලාගියෝය. ධර්මානුකුලවීමෙන්, සක්දෙව්දු ජය ලබාගති. **මූලාශ්‍ර:** සංයු.නි: (1) : සගාථවග්ග: සක්ඛසංයුත්ත: 11.1.6 කුලාවක සූත්‍රය**,** පි. 422, ESN: 11: Sakkasamyutta: 6.6 The birds nests, p. 468.

▼ **සක්දෙව්දු මහා කාශ්‍යප තෙරුන්ට දන් පිරිනැමීම**: මහා කාශ්‍යප තෙරුන්ට දන් පිළිගන්වා සතුටට පත් සක්දෙව්දු මෙසේ පවසා ඇත:

"අසිරිමත්ය! කසුප් තෙරුන් කෙරෙහි සුපිහිටි දානයකි! උතුම් දානයකි!...". **මූලාශ්‍රය:** ඛු.නි:උදානපාලිය:නන්දවග්ග: 3.7 කාශ්‍යප සූත්‍රය, පි.212.

▼**වෙනත් මූලාශ්‍ර:**

**1. 'පැරණි බෞද්ධ චින්තාවේ සංකල්පය සහ යථාර්තය'** (Concept and Reality in Early Buddhist Thought): කටුකුරුන්දේ ඤාණානන්ද භික්ඛු, කටුකුරුන්දේ ඤාණානන්ද සදහම් සෙනසුන් භාරය, 2016, වෙබ්අඩවිය: www.seeingthroughthenet.net- **2. "Sakka's Quest: Sakka-pañā Sutta:** Introduction, Translation and Comments by Sister Vajirā, Wheel- 10, BPS, 1964.

▲ **සක්විතිරජ:** පාලි: **රජා චක්කවත්ති**- Wheel-Turning Monarch: බෞද්ධ වෘත්තාන්තයන්ට අනුව සක්විතිරජ (චක්‍රවර්ති රජ) පරම පාලකයාය, සතර දීපයන්ට අධිපතිය, ඉසුරුමත්ය. **සටහන:** සතර දීප : ලෝකයේ අක්ෂය ලෙසින් සලකන සිනේරු කන්දට: දකුණින් පිහිටි ජම්බුද්වීපය, බටහිරින් පිහිටි අපරගොයානය, උතුරින් පිහිටි උත්තර කුරුදේශය හා නැගෙනහිරින් පිහිටි පුබ්බාවිදේහය. **බලන්න:** ESN: note 317, p. 2426.

▼ **සක්විති රජ** අසිරිමත් මිනිසෙක් ලෙස ලෝකයෙහි උපදී. ඔහුගේ පහළවීම, ලෝකවාසීන්ගේ හිතසුව පිණිසය. එම රජුගේ මරණය බොහෝ දෙනාට දුක පිනිසවේ. එවැනි උතුමෙකු වෙනුවෙන් දාගැබක් - ස්ථූපයක් ඉදිකිරිම වටින්නේය. **මූලාශ්‍රය**: අංගු.නි: (1): 2 නිපාත: 2.2.6.1 සූත්‍රය, පි. 184.

▼**සක්විති රජ** ධර්මයට අනුව තම රජය පාලනය කරයි. ධර්මය, ඉහළින් තබාගෙන, පුද සත්කාර ගවුරව සම්මාන කොට, ධර්මය ධජය කොටගෙන, ධර්මය ආධිපත්‍ය කොටගෙන දැහැමින් රජකරති. **සටහන:** සක්විති රජු, දස කුසල දහමට අනුව රජ කරයි. විශ්ව සම්මත යහපත්බව හා සත්‍ය පදනම් කොට රජ කරණ ඔහු, තමාගේ රටවැසියනට දැහැමිවූ රැකවරණය ලබාදෙයි. **බලන්න:**EAN, note no: 346, p. 597. **මූලාශ්‍රය**: අංගු.නි: (1): 3 නිපාත: 3.1.2.4 සූත්‍රය, පි. 246.

▼ **සක්විති රජු** කරුණු 5 ක් සහිතව තමා රාජ්‍ය පාලනය කරන නිසා, කිසිම සතුරෙකුට ඔහුගේ අණසක නැතිකළ නොහැකිය: ඔහු 1) අර්ථයදනී- එනම් කුමක් යහපත්ද? යන දැනීම 2) පාලන ධර්මය දනී 3) මාත්‍රාව දනී-කවර අන්දමේ දඬුවම් පැනවිය යුතුද? යන්න. 4) කාලය දනී- කුමන වෙලාවේ රජසැප විඳිය යුතුද: කුමන වෙලාවේ විනිශ්චය කටයුතු වල යෙදිය යුතුද? කුමන අවස්ථාවේ චාරිකා කළයුතු ද යන්න දනී. 5) තමාගේ පිරිස දනී: ශාක්‍ය, බ්‍රාහ්මණ, වෛශ්‍ය, ශුද්‍ර, ශ්‍රමණ ආදීලෙසින්. එමනිසා ඔහුගේ අණසක නැමති චක්‍රය කිසිවෙකුට ආපසු හැරවිය නොහැකිය**.** එම ලෙසින්ම රජුගේ දෙටුපුත්ද එම පස් කරුණු මානව දැන කටයුතු කරයි. **බලන්න:** ධම්මචක්‍රය. **සටහන:** ධාර්මික සක්විති රජ පවා තමාගේ චක්‍රය-අණසක පවත්වන්නේ, ඔහුට ඉහලින් ඇති ධර්මයට ගරුසත්කාර කරමින් බව මෙහි පෙන්වා ඇත. **මූලාශ්‍රය:** අංගු.නි: (3) 5 නිපාත:රාජවග්ග: 5.3.4.1, 5.3.4.2, 5.3.4.3 සූත්‍ර, පි.264.

▼**සක්විති රජ අග්‍ර රජය**: ලෝකයේ සියලු මහා හෝ කුඩා රජවරුන් අතුරින් අග්‍ර වන්නේ සක්විති රජය. **මූලාශ්‍ර**: අංගු.නි: (6 ): 10 නිපාත: 10.1.2.5 අප්‍රමාද සූත්‍රය, පි.68, EAN: 10: 15-5 Heedfulness, p.497.

▼**සක්විති රජු දුගතිය පහකොට නැත**: සක්විතිරජු සිව් දීපයන්ට අධිපතිව, ඉසුරුමත්ව රජකම් කර, මරණින් මතු දෙව්ලොවේ උපත ලැබීමට වාසනාව ඇත. එහෙත්, සෝතාපන්න ආරිය පුද්ගලයන් සතු සිව්දහම ඔහුට නොමැත. එමනිසා ඔහු දුගතියේ උපත ලැබීමෙන් මිදී නැත යි බුදුන් වහන්සේ වදාළහ. **මූලාශ්‍ර**: සංයු.නි :(5-2): මහාවග්ග: සොතාපත්ති සංයුත්ත: 11.1.1 රාජසූත්‍රය, පි. 162, ESN: 55: Sotapattisamyutta: 1.1 Wheel-turning Monarch, p, 2183.

▼ **සක්විති රජු අනිත්‍ය ස්වභාවය පහකර නැත**: සියලුම ඉසුරුඇති බලවත්වූ සක්විති රජු පවා අනිත්‍ය ස්වභාවයෙන් මිදීනැත. පෙර භවයක මහාසුදස්සන නම්වූ සක්විති රජ ලෙසින් තමන්වහන්සේ ලැබූ සැප විහරණ පෙන්වාදුන් බුදුන් වහන්සේ වදාළේ ඒ සෑම දෙයක්ම අනිත්‍යස්වභාවය ඇතිනිසා වෙනස්වූ බවය. **බලන්න**: බුදුන් වහන්සේ: පෙර ජීවිත. **මූලාශ්‍ර:** සංයු.නි (3 ): ඛන්ධසංයුත්ත: 1.2.5.4 ගොම පින්ඩුපම සූත්‍රය, පි. 274, ESN: 22: Khandasamyutta: 96.4 A Lump of Cow dung, p. 1087.

▼ **සක්විති රජුට රත්න 7ක් හා ඉර්දීසම්පත් 4 ක් ඇත**: 1) චක්‍ර රත්නය 2) හස්ති රත්නය 3) අශ්ව රත්නය 4) මානික්‍ය රත්නය 5) ස්ත්‍රී රත්නය 6) ගහපති රත්නය 7) පුරෝහිත රත්නය. **ඉර්දීසම්පත්**: 1) මනා රූප සම්පත්තිය 2) දීර්ඝ ආයුෂ සම්පත්තිය 3) නිරෝගී සම්පත්තිය 4) සෙසු අයගේ ප්‍රියමනාප බව ලැබීම. **සටහන**: සක්විති රාජසම්පත් පිලිබඳව සම්පූර්ණ විස්තර මේ සූත්‍රවල විස්තරකර ඇත. **මූලාශ්‍ර**:දීඝ.නි: (2 ): 4. මහාසුදස්න සූත්‍රය, පි. 282 හා දී.ස.නි: (3 ): 3 චක්‍රවර්ති සිංහනාද සූත්‍රය, පි.112, EDN: 17 Mahāsudassana Sutta, p.202 & 26: The Lion's Roar on the Turning of the Wheel, p. 300, ම.නි: (2): 2.5.1 බ්‍රහ්මායු සූත්‍රය, පි. 592 හා ම.නි: (3 ): 3.3.9 බාල පණ්ඩිත සූත්‍රය, පි. 376, EMN: 91: Brahmāyu Sutta, p. 672 & 129: Fool & Wise Men, p. 929, සංයු.නි: (5-1) මහාවග්ග: බොජ්ඣංගසංයුත්ත:2.5.2 චක්කවත්ති සූත්‍රය, පි.224.

▲ **සාකච්ඡා**-Discussions: ධම්ම සාකච්ඡාවක් කිරිමට සුදුසුකම් 5 ක් සැරියුත් තෙරුන් පෙන්වා ඇත: 1) ශිලසම්පන්නබව හා ශිලය පිලිබඳ ප්‍රශ්න විසඳීමට හැකිබව 2) සමාධි සම්පන්නබව හා සමාධිය පිලිබඳ ප්‍රශ්න විසඳීමට හැකිබව 3) ප්‍රඥාසම්පන්නබව හා ප්‍රඥාව පිලිබඳ ප්‍රශ්න විසඳීමට හැකිබව 4) විමුක්ති සම්පන්න බව හා විමුක්තිය පිලිබඳ ප්‍රශ්න විසඳීමට හැකිබව. 5) විමුක්ති ඥානදර්ශන සම්පන්න බව හා විමුක්ති ඥානදර්ශන පිලිබඳ ප්‍රශ්න විසඳීමට හැකිබව. **මූලාශ්‍රය:** අංගු.නි: (3): 5 නිපාත: ආඝාතවග්ග: 5.4.2.3 සාකච්ඡා සූත්‍රය, පි.330.

▲**සාක්ෂාත් කරගතයුතු ධර්මතා**-Dhamma to be realized: සාක්ෂාත් කරගතයුතු ධර්මතා- ප්‍රත්‍යක්ෂ කළයුතු ධර්ම (සච්ඡිකරණීය ධම්ම- සච්චිකාතබ්බ ධම්ම) 4 ක් මෙහි දක්වා ඇත: 1) නාමකයෙන් ප්‍රත්‍යක්ෂ කළයුතු ධර්ම (realized by the body): අෂ්ඨවිමොක්ක-eight emancipations. 2) ස්මෘතියෙන් ප්‍රත්‍යක්ෂ කළයුතු ධර්ම (realized by memory): පෙරවිසූ කඳ පිළිවෙත දැකීමේ නුවණ- පූර්වනිවාස සිහිකිරීමේ නුවණ- One's past abodes 3) ඇසින් ප්‍රත්‍යක්ෂ කළයුතු ධර්ම realized by the eye: සත්වයන්ගේ චුතිය හා උත්පත්තිය- චුතුප්පාත නුවණ (දිවැස) - passing away and rebirth of beings 4) ප්‍රඥාවෙන් ප්‍රත්‍යක්ෂ කළයුතු ධර්ම realized by wisdom: ආශ්‍රවක්ෂය-ආසවක්ෂය destruction of the taints. **මූලාශ්‍ර:** අංගු:නි: (2) : 4 නිපාත: බ්‍රාහ්මණවග්ග: 4.4.4.9 සච්ඡිකරණීය සූත්‍රය, පි. 376, EAN: 4: 189.9 Realization, p.211.

▲ **සාක්ෂාත් නොකරගතයුතු ධර්මතා-** the Dhamma not to be realized: ආධ්‍යාත්මික ජීවිතයේදී සාක්ෂාත් නොකරගතයුතු ධර්මතා ලෙසින් මෙහිදී පෙන්වා ඇත්තේ මිථ්‍යා දිට්ඨිය පෙරටු කරගත් වැරදි මගය. **බලන්න**: මිථ්‍යාත්වය. **මූලාශ්‍ර:** අංගු.නි (6): 10 නිපාතය:10.3.5.10 සච්ඡිකාතබ්බ සූත්‍රය, පි. 478, EAN:10: Noble, p. 548.

▲**සකුලුදායි පරිබ්‍රාජික-** Paribbrajaka Sakuladai: මේ පරිබ්‍රාජක බුදුන් වහන්සේ වැඩසිටි සමයේ, විශාල ශිෂ්‍ය පිරිසක් සහිතව සිටි මොහු ප්‍රසිද්ධ ආගමික නායකයෙකි. බුදුන් වහන්සේ කෙරේ පැහැදීමක් ඇතිව සිටි සකුලදායි පරිබ්‍රාජක, බුදුන් වහන්සේ වදාළ ධර්මය පිළිගෙන, උන්වහන්සේගේ ශ්‍රාවකයෙක් වීමට සූදානම් වූ අවස්ථාවේ දී, ඔහුගේ ශිෂ්‍ය පිරිස එය වලක්වාලිය. **බලන්න:** ම.නි: චූල සකුලදායි සූත්‍රය. ම.නි: මහා සකුලදායි සූත්‍රයේදී, ඔහු තමන්, බුදුන් වහන්සේට ගරු කිරීමට හේතු කරුණු පෙන්වා ඇත. **සටහන**:අටුවාවට අනුව, කර්ම විපාකයක් හේතුකොටගෙන ඔහුට එම ජීවිතයේදී බුද්ධ ශ්‍රාවකයෙක් වීමට නොහැකිවිය. එහෙත්, අශෝක අධිරාජයා ගේ සමයේදී, අස්සගුත්ත තෙර ලෙසින් අරහත්වය ලැබූ ඔහු, උතුම් මෛත්‍රී විහරණයේ යෙදී සිටියහ. **බලන්න**:EMN:note:786, p.1137. ම.නි. චූල හා මහා සකුලදායි සූත්‍ර.

▲ **සාකෙත නුවර**- Saketa Nuwara: කෝසලරාජධානියට අයත් නුවරකි. බුදුන් වහන්සේ හා සංඝයා චාරිකාවේ වඩින අවස්ථාවන්හි ඒ නුවර අසබඩ මිගදාය අඳුන්වනයේ වාසය කර ඇත. **මූලාශ්‍රය**: සංයු.නි: (5-1): මහාවග්ග: ඉන්ද්‍රියසංයුත්ත:ජරාවග්ග: 4.5.3 සාකෙතසූත්‍රය, පි.414.

▲ **සුකථා කථා -** Sukatha katha: සුකථා කථා ලෙසින් පෙන්වා ඇත්තේ කිසියම් කතාවක් අසා ප්‍රීතිමත්වීම, හා කතා කරන කෙනා ගැන ප්‍රසාදය ඇතිවීමය. එය ආකාර 5 කින් සිදුවේ: 1) ශ්‍රද්ධාවත් කෙනෙකුට ශ්‍රද්ධාව

ගැන කතාකිරීම 2) සිල්වත් කෙනෙකුට ශීලය ගැන කතාකිරීම 3) බහුශ්‍රැත කෙනෙකුට බහුශ්‍රැතබව ගැන කතාකිරීම 4) ත්‍යාගශීලි කෙනෙකුට ත්‍යාගශීලිබව ගැන කතාකිරීම 5) ප්‍රඥාව ඇතිති කෙනෙකුට ප්‍රඥාව ගැන කතාකිරීම. සුකථා කථා නොවන්නේ දුක්කථා කථාය. **බලන්න**: දුක්කථා කථා. **මූලාශ්‍ර**: අංගු.නි: (3):5 නිපාත: 5.4.1.7 දුක්කථා සූත්‍රය, පි. 316, EAN: 5: 1567.7 Wrongly Addressed Talk, p. 288.

▲ **සුක්ඛා තෙරණිය-**Sukkha therni: **බලන්න:** උපග්‍රන්ථය: 2

▲ **සූක්ෂම ලක්‍ෂණ ප්‍රතිවෙධක ඥාණ-** knowledges that penetrate subtle characteristics: සූක්ෂම ලක්‍ෂණ ප්‍රතිවෙධක ඥාණ 4 ක් මෙහි පෙන්වා ඇත: රූපය, වේදනාව, සංඥාව, සංඛාර. මේ ඥාණ සහිතව පංචස්කන්ධය යහපත් ලෙසින් දකින උතුමා ඒකාන්තයෙන්ම මාරයා ජයගෙන අන්තිම දේහය දරයි- අර්හත්ය. **බලන්න**: EAN: Note: 645:p.614. **මූලාශ්‍ර:** අංගු.නි: (2) 4 නිපාත: 4.1.2.6 සොබුම්ම සූත්‍රය, පි.58, EAN:4: 16.6 Exquisiteness, p.154.

▲ **සුකුමාල ශ්‍රමණ-**a delicate bhikkhu: සුකුමාල ශ්‍රමණ (සුකුමාර - සමණ සුකුමාල) ලෙසින් මෙහි පෙන්වා ඇත්තේ කරුණු 5 ක් සහිත භික්ෂුව පිලිබඳවය: 1) බොහෝවිට තමන් වෙනුවන්ම පිළියෙළ කල චීවර, පිණ්ඩපාත, සේනාසන, ගිලන්පස ලබයි (සිව්පසය). 2) සෙසු සංඝයා (සබ්‍රම්සරුන්) ඔහු කෙරේ මනාප කාය, වාක්, මනෝ කර්ම පවත්වති.3) ඔහුට අල්පාබාධ ඇත. 4) සිව්ජාන පහසුවෙන්ම ලබා ගත හැකිය. 4) අසාව ක්‍ෂය කොට විමුක්ති සුවයෙන් වාසය කිරීම. **සටහන**: මෙහිදී, බුදුන් වහන්සේ ඒකාන්තයෙන්ම 'සුකුමාල ශ්‍රමණ' බව පෙන්වා ඇත. **මූලාශ්‍රය**:අංගු.නි: (3): 5 නිපාත: ඵාසුවිහාරවග්ග: 5.3.1.4 සමනසුඛුමාල සූත්‍රය, පි.230.

▲ **සැකය-** doubt: සැකය, සාංකාව (kankhā) -විචිකිච්චා ලෙසින්ද දක්වා ඇත. ලෝකයේ පවතින යම් කරුණු පිළිබඳව සිතේ ඇතිවන අවිනිශ්චිතභාවය සැකයවේ. දහම් කරුණු පිළිබඳව ඇති සැකය, අවිශ්වාසය විචිකිච්චාවය, මෙය නීවරණයකි. ධර්මය නුවණින් නොදකින පුද්ගලයාට බුදුන් වහන්සේ ආදී ධර්මතා 8 ක් ගැන සැක ඇතිවේ. එවැනි සැකයන් පහ කරගැනීමට යෝනිසෝමනසිකාරයෙන් කටයුතු කලයුතුවේ. ධර්මය පිලිබඳ බොහෝ දේ ඉගෙන ගෙන තිබීම, පැහැදිලි නැති ධර්මතා ගැන ප්‍රශ්න විමසීම, විනය පිලිබඳ නිපුණබව, ත්‍රිවිධ රත්නය කෙරෙහි ශ්‍රද්ධාව තිබීම, කලණ මිතුරු සේවනය, හිස් කථා බැහැර කර යහපත් කතාවේ යෙදීම, විචිකිච්චාව නැති කර ගැනීමට උපකාරීවේ. **බලන්න**: EAN: note: 38, p.582, විචිකිච්චාව. **මූලාශ්‍රය**: අංගු.නි: (1): 1 නිපාත:නීවරණප්‍රහාණ වග්ග සූත්‍ර, පි.44.

▲ **ස්කන්ධ උපධි-** Skandha Upadhi: පංච උපාදානස්කන්ධය, මමය යි අල්වා ගැනීම, ස්කන්ධ උපධිවේ. **බලන්න:** උපධි.

▲ **ස්කන්ධ පරිනිබ්බානය-** Skandha Parinibbana: බුදුන් වහන්සේ හා රහතුන්ගේ කය, මිය ඇදීම ස්කන්ධ පරිනිබ්බානයය.

▲ **සික්ඛාපච්චක්ඛාන-**Sikkhapachchakkhana: මින් අදහස් කරන්නේ, ශික්‍ෂාව අත්හැර ගිහිබවට පත්වෙන සංඝයාය. **බලන්න**: ශික්‍ෂාව.

▲ **සික්ඛා අනුත්තර**- unsurpassed training: මෙය උත්තරීතර ධර්මතාවලින් එකකි. බුදුන් වහන්සේ හෝ ශ්‍රාවක සංඝයා වෙතින් නිවන පිණිස පුහුණුව ලැබීමය, එය අන් පුහුණුවන්ට වඩා උතුම්ය. **මූලාශ්‍ර:** අංගු.නි: ( 4 ): 6 නිපාත: 6.1.3.10 අනුත්තරිය සූත්‍රය, පි. 92, EAN:6: 30.10 Unsurpassed Things, p. 329.

▲ **සික්ඛාමානා-**Skkamana: සික්ඛාමානං යනු, ධර්ම පුහුණුව -ශික්ෂාව කෙරේ ඇති ඇල්මය. එම ගුණය ඇති සංඝයා අතුරින්, රාහුල තෙරුන් අග්‍රය. **බලන්න**: උපග්‍රන්ථය:1

▲ **සෝකසල්ලහරණ ධම්මපරියාය-** Sokasallaharana dhamma pariyaya: මෙය, නාරද තෙරුන් වදාළ, ශෝකය පහකරගැනීමේ ධම්ම පරියායය. **බලන්න**: ශෝකය.

**සඛ**

▲ **සංඛතධර්ම**- conditioned Dhamma: සංඛතධර්ම යනු හේතුප්‍රත්‍ය නිසා සකස්වූ දේටය. නිවන හැර සෙසු ධර්මතා සංඛතය, නිවන අසංඛතය ධර්මයකි.**බලන්න**: නිවන. **මූලාශ්‍රය**: ඛු.නි: ඉතිවුත්තක: 2.2.6 අජාත සූත්‍රය, පි. 393.

▲ **සංඛත ධාතු හා අසංඛත ධාතුව** : පාලි: **සඞ්ඛත ධාතු- අසඞ්ඛත ධාතු** conditioned element & un conditioned element: ධර්මයේ සංඛත ධාතු යනු හේතු ප්‍රත්‍ය නිසා සකස්වී ඇති සියලු ධර්මතාය. (පංච උපාදාන ස්කන්ධ ආදීවූ). අසංඛත ධාතුව නම් නිවනය. **බලන්න**: ධාතු කුසලතාවය, නිවන, හේතු ප්‍රත්‍ය ධම්ම. **ශබ්දකෝෂ: පා.සිං.ශ: පි. 488: "සංඛත ධාතු:** ප්‍රත්‍යයොතපන්න ධර්ම, සංස්කාරයන් විසින් කළ, සංස්කාරයන් ගෙන් උපන්". **B.D:** p.163: **"Sankhata**: The 'Formed', i.e. anything originated or conditioned, comprises, all phenomena of existence.

▼ **සංඛත ධාතු විශේෂ නුවණින් අවබෝධ කරගතයුතුය**: සංඛත ධාතු , ආධ්‍යාත්මික වර්ධනය පිණිස විශේෂ නුවණින් (ඥාතපරිඥාවෙන් විශේෂයෙන් දත යුතු) , යහපත් ලෙසින්ම අවබෝධ කරගතයුතු අභිඥෙයිය ධර්මතාවයකි. **බලන්න**: අභිඥෙයිය ධර්ම**. මූලාශ්‍ර:** දීඝ.නි:(3 ):11 දසුත්තර සූත්‍රය, පි. 483, EDN: 34: Dasuttara Sutta: Expanding Decades, p. 384.

▲**සංඛිත්ත ධර්ම**-The Dhamma in Brief: සංඛිත්ත ධර්ම ලෙසින් පෙන්වා ඇත්තේ නිවන සාක්ෂාත් කරගැනීමට උපකාරීවන ධර්මය කෙටියෙන් දැක්වීමය. එනම්, අනිච්ච, දුක්ඛ, විපරිනාම ස්වභාවය ඇති සළායතන, බාහිර අරමුණු, එනිසා ඇතිවන ත්‍රිවිධ වේදනා අදිය තමන්ගේ දෙයක් නොවන බව නුවණින් අවබෝධ කරගැනීම සංඛිත්ත ධර්මයය- ධර්මය කෙටියෙන් දැක්වීම ය යි මේ සූත්‍රයේ පෙන්වා ඇත.එසේ අවබෝධ කරගැනීම දුක අවසන්කර ගැනීමය. **මූලාශ්‍ර**: සංයු.නි: (4 ):සළායතනවග්ග: වේදනාසංයුත්ත:9 ඡන්නවග්ග: 1.9.3 සංඛිත්ත ධර්ම සූත්‍රය, පි.148: ESN:35: Salayatanasamyutta:IV: Channa:86.3 The Dhamma in brief,p.1248.

▲**සිඛි බුදුන්වහන්සේ**-The Buddha Sikhi: ගෝතම බුදුන් වහන්සේට පෙර වැඩසිටි, සිඛි බුදුන් වහන්සේ පිලිබඳ විස්තර මෙහි දක්වා ඇත**.** **බලන්න:**බුද්ධවංශ පාලි:20: සිඛි බුදුන්වහන්සේ.

▼ **සිඛි බුදුන් වහන්සේ ගේ සම්බෝධිය**: සිඛි බුදුන් වහන්සේ ගේ සම්බෝධිය පිලිබඳ මෙහි විස්තර කර ඇත. **මූලාශ්‍රය:**සංයු.නි: (2): නිදානවග්ග: අභිසමයසංයුත්ත: බුද්ධවග්ග:1.1.5 සිඛිසූත්‍රය, පි.35.

▼ **සිඛි බුදුන් වහන්සේ හා අගසව් දෙනම**: සිඛි බුදුන් වහන්සේ, අරුණාවති රාජධානියේ වැඩසිටියහ, උන්වහන්සේගේ අගසව් දෙනම:අභිභූ හා සම්භවය. සිඛි බුදුන් වහන්සේ බඹලොවට වැඩම කිරීමද, උන්වහන්සේගේ ඇරයුම පරිදි අභිභූ තෙරුන් බ්‍රහ්මදෙවියන් ඉදිරියේ උන්වහන්සේගේ සෘද්ධි බල දැක්වීම මෙහි පෙන්වා ඇත. **මූලාශ්‍රය:** සංයු.නි: (1) සගාථවග්ග: බ්‍රහ්මසංයුත්ත:6.2.4 අරුණාවති සූත්‍රය, පි.304.

▲**සංඛාර-** පාලි**: සඞ්ඛාරා**- volitional formations: සංඛාර, චේතනා ලෙසින්ද හඳුන්වයි. මෙය, පංච උපාදානස්කන්ධයේ එක් ස්කන්ධයකි. චේතනා නිසා යළි උපත ලබා දෙන කම්ම සකස්වේ.**බලන්න**:චේතනා.

▼**සංඛාර පටිච්චසමුප්පාදයේ 2 නි පුරුකය**: අවිද්‍යාව හේතුකොට සංඛාර ඇතිවේ, එම අවිද්‍යාව සහමුලින්ම නැතිවීමෙන් සංඛාර පහවේ:

**"...අවිජ්ජාපච්චයා සඞ්ඛාරා..."**
**"...අවිජ්ජායතෙත්‍ව අසෙසවිරාග නිරොධා සඞ්ඛාර නිරොධො..."**

**සංඛාර: 3 කි**: කාය සංඛාර**,** වාක් (වචී) සංඛාර, චිත්ත (මනෝ) සංඛාර. කයෙන් වචනයෙන් හා සිතින් සංඛාර චේතනා ඇතිකරයි, සසර පැවැත්ම දික්කරයි. **සටහන:** පටිච්චසමුප්පාදයේ පෙළ යෙදුමට අනුව සංඛාර, කුසල සංඛාර හා අකුසල සංඛාර වේ. **බලන්න**: EMN: note: 131, p. 1075. **මූලාශ්‍ර**: සංයු.නි: (2 ): නිදාන වගග:අභිසමයසංයුත්ත: බුද්ධවග්ග: 1.1.1 පටිච්චසමුප්පාද සූත්‍රය, පි.24, 1.1.2 විභඞ්ග සූත්‍රය, පි.26, ESN: 12: Nidanasamytta: 1.1. Dependent Origination, p. 610, 1 2.2 Analysis of Dependent Origination, p.611, ම.නි: (1): 1.1.9 සම්මා දිට්ඨි සූත්‍රය, පි. 130, EMN: 9: Sammādiṭṭhi Sutta- Right View, p. 121.

▼ **ත්‍රිවිධ සංඛාර විස්තරය**: **කාය සංඛාර** (the bodily formation): යනු ආස්වාස ප්‍රස්වාසයය. එය කය සම්බන්ධ ධර්මතාවයක් නිසා කාය සංඛාර යයි කියනු ලැබේ 2) **වචී සංඛාර** (the verbal formation) : යනු විතර්ක විචාරයය. කෙනෙක්, කතාවට පළමුව සිතයි, අනතුරුව කතාකරයි, එමනිසා එය වචී සංඛාර යයි කියනු ලැබේ 3) **චිත්ත සංඛාර** (the mental formation): යනු සංඥා හා වේදානා ය. මේවා සිත පදනම් කරගෙන ඇතිවෙන නිසා, චිත්ත සංඛාර යයි කියනු ලැබේ. **සටහන**: නිරෝධ සමාපත්තියට සමවදින විට මේ සංඛාර 3 ක්‍රියා කරන ආකාරය පිළිබඳව **බලන්න**: සංඥාවේදිත නිරෝධ සමාපත්තිය. **මූලාශ්‍ර**:සංයු.නි: ( 4 ): සළායතන වග්ග: චිත්තසංයුත්ත: 7.1.6 දුතිය කාමභූ සූත්‍රය, පි. 562, ESN:41: Chittasamyutta: 6 Kāmabhū-2, p. 1440, ම.නි: (1): 1.5.4 චූලවෙදල්ල සූත්‍රය, පි. 722, EMN: 44 Cūḷavedalla Sutta-The Shorter Series of Questions and Answers, p. 379.

▼ **සියලු සංඛාර අනිච්චය**: සියලු සංඛාර අනිච්චය, ඉපදී නැතිවී යන ස්වභාවය ඇතිය, ඒ නිසා, ඒවායින් මිදීම, සන්සිඳීම සුවය යයි බුදුන් වහන්සේ වදාළහ:

**"අනිච්චා වත සංඛාරා උප්පාදවයධම්මිනො
උප්පජ්ජිත්වා නිරුජ්ඣන්ති තෙසං වූපසමො සුඛොති"**

**සටහන**: බුදුන් වහන්සේගේ මහා පරිනිබ්බානයෙන් පසු සක්දෙවිඳු මෙම ගාථාව පැවසුහ. **මූලාශ්‍රය:**සංයු.නි: (2) : නිදානවග්ග:අනමතග්ග සංයුත්ත: දුග්ගතවග්ග: 3.2.10 වෙපුල්ල පබ්බත සූත්‍රය, පි.314.

▼ **සංඛාර ගැන රහතන්වහන්සේගේ ප්‍රකාශය**: රහතන්වහන්සේ සියලු සංඛාර පිළිබඳව පවසන්නේ මෙසේය:

**'සියලු සංඛාර අනිත්‍ය, ඉපදීම හා නැසීම ස්වභාවය කොට ඇත. සංඛාරයන්ගේ සංසිඳීම සැපය'.**

**මූලාශ්‍ර:** සංයු.නි : (1): සගාථවග්ග:දේවතා සංයුත්ත: 1.2.1 නන්දන සූත්‍රය, ESN: 1: Devatasamyutta: 11.1 Nandana, p. 70.

▼ **සංඛාර අවබෝධ කරගැනීම**: සංඛාර ගැන මනා අවබෝධය ලැබීම පිණිස සම්මා දිට්ඨිය ඇති කර ගත යුතුය **මූලාශ්‍ර**: ම.නි: (1): 1.1.9 සම්මා දිට්ඨි සූත්‍රය, පි. 130, EMN: 9: Sammādiṭṭhi Sutta- Right View, p. 121.

▼ **සත්ත්වයන්ගේ පැවැත්ම පිණිස සංඛාර හේතුවේ**: උපන් සැම සත්ත්වක්ගේම පැවැත්ම පිණිස සංඛාර හේතුවන බව බුදුන් වහන්සේ වදාළහ:

**"සබ්බෙ සත්තා සඞ්ඛාරට්ඨිතිකා"**. (All beings are maintained by conditions - sankhdratthitikā). **මූලාශ්‍ර**: දීඝ.නි: (3 ): 10 සංගිති සූත්‍රය,පි. 374, EDN: 33 Sangīti Sutta: The Chanting Together-section, p. 363.

▲**සංඛාර අනුපූර්ව නිරෝධය-** successive cessation of formations සංඛාර අනුපූර්ව නිරෝධය (අනුපුබ්බ සංකාර නිරෝධය) යනු, ඣාන සමාපත්ති ලබා අනු පිලිවෙලින් නිරෝධය- විමුක්තිය ලබා ගැනීමය: 1) පළමු ඣානයේදී වචන නිරුද්ධ වේ. 2) දෙවන ඣානයේදී විතර්ක විචාර නිරුද්ධ වේ 3) තෙවන ඣානයේදී ප්‍රීතිය නිරුද්ධ වේ 4) සිව්වන ඣානයේදී ආශ්වාසප්‍රශ්වාස නිරුද්ධ වේ, 5) ආකාසාන ඤ්චායතන සමාපත්තියේ දී, රූපසංඥා නිරුද්ධවේ 6) විඤ්ඤාණ ඤ්චායතන සමාපත්තියේ දී, ආකාසානඤ්චායතන සංඥා නිරුද්ධවේ 7) ආකිඤ්චඤ්ඤායතන සමාපත්තියේ දී, විඤ්ඤාණඤ්චායතන සංඥා නිරුද්ධවේ 8) නේවසඤ්ඤානාසඤ්ඤායතන සමාපත්තියේ දී, ආකිඤ්චඤ්ඤායතන සංඥා නිරුද්ධවේ 9) සඤ්ඤාවෙදයිත නිරෝධ සමාපත්තියේ දී, සංඥා, වේදනා නිරුද්ධවේ 10) අරහත්බව ලැබූවිට රාගය, දෝසය හා මෝහය (අකුසල මුල්) නිරුද්ධවේ. **මූලාශ්‍රය:** සංයු.නි: (4): සළායතනවග්ග: වේදනාසංයුත්ත: 2.2.1 රහොගත සූත්‍රය, පි. 438.

▲ **සංඛාර අනුපූර්ව සංසිඳීම-**successive subsiding of formations සංඛාර අනුපූර්ව සංසිඳීම : 1) පළමු ජානය මගින් වචන සන්සිඳේ 2) දෙවන ජානය මගින් විතක්කවිචාර සන්සිඳේ 3) තෙවන ජානය මගින් ප්‍රීතිය සන්සිඳේ 4) සිව්වෙන ජානය මගින් ආශ්වාසප්‍රශ්වාස සන්සිඳේ 5) ආකාසානඤ්චායතන සමාපත්තියේ දී, රූපසංඥා සන්සිඳේ 6) විඤ්ඤාණඤ්චායතන සමාපත්තියේ දී, ආකාසානඤ්චායතන සංඥා සන්සිඳේ 7) ආකිඤ්චඤ්ඤායතන සමාපත්තියේ දී, විඤ්ඤාණඤ්චායතන සංඥා සන්සිඳේ 8) නේවසඤ්ඤානාසඤ්ඤායතන සමාපත්තියේ දී, ආකිඤ්චඤ්ඤායතන සංඥා සන්සිඳේ 9) සඤ්ඤාවෙදීත නිරෝධ සමාපත්තියේ දී, සංඥා, වේදනා සන්සිඳේ 10) රහත්බව ලැබූවිට රාගය, දෝසය හා මෝහය සන්සිඳේ එනම්: නිවනය. **මූලාශ්‍රය:** සංයු.නි: (4): සළායතනවග්ග: වේදනාසංයුත්ත: 2.2.1 රහොගත සූත්‍රය, පි. 438.

▲**සංඛාර උත්පත්ති**- Reappearance by Aspiration: සංඛාරඋත්පත්ති යනු යහපත් පුද්ගලයෙකුට ප්‍රාර්ථනාකර සුගතියක යළි උපත ලබා ගැනීමේ පිළිවෙලය. **බලන්න**: ප්‍රාර්ථනා. **මූලාශ්‍ර:** ම.නි: (3): 3.2.10 සංඛාරඋත්පත්ති සූත්‍රය, පි. 272,EMN:120, Reappearance by Aspiration, p.882.

▲ **සංඛාර දුක්ඛ** -Sankhara Dukka: මෙය ත්‍රිවිධ දුක් වලින් එකකි. **බලන්න**: දුක.

▲ **සුඛ හා දුඛ-**Happiness & suffering: ධර්මයේ සුඛ- සතුට ලෙසින් පෙන්වා ඇත්තේ සසර දුකින් මිදීමය. දුක යනු සසර ගමනය. **දුක නම් යළිඋපතය**: දුක නම් යළිඋපතය (අභිනිවෘතිය- **අභිනිබ්බත්ති-** Rebirth), **සුඛ නම්** යළි උපතක් නොවීමය (අනභිනිවෘතිය **-අනභිනිබ්බත්ති)** යයි සැරියුත් තෙරුන් වදාළහ. යළි උපතක් ඇතිවිට දුක ඇතිවීම අපේක්ෂා කළයුතුවේ. ශීතය, ග්‍රීෂ්මය, බඩගින්න, පිපාසය, මළපහකිරීම, මුත්‍රා පහකිරීම, ගින්නෙන් අපදාවීම, පොලු, පිහි, වලින් අපදාවිම, නෑදෑ මිතුරන්ගේ බැණුම් ඇසීමට සිදුවීම ආදිය දුකකි. එහෙත්, යළි උපතක් නොවේ නම් පෙරකී දුක් ඇතිනොවේ. එය සුඛයවේ, සිතට සැපයකි. **සටහන්**: * මේ දේශනා වදාරා ඇත්තේ සාමණ්ඩකාණි පිරිවැජියාටය. ** දුතිය සුඛ සූත්‍රයේදී ධම්ම විනයේ අනභිරතිය දුඛය (Dissatisfaction), අභිරතිය සුඛය (Enjoyment) යි පෙන්වා ඇත. සතර ඉරියව්වේ (ඇවිදීම ආදී) දී හුදකලා තැනක සිටිනවිට අසතුට සිතේ ඇත්නම් ඉන් ඇති වෙන්නේ දුකය. එහෙත්, ඒ ක්‍රියාවල යෙදෙනවිට , ඒවා ගැන ප්‍රීතියක් ඇතිනම් එමගින් සුවය-සුඛය ඇතිවේ. **මූලාශ්‍ර:** අංගු.නි: (6 ): 10 නිපාත: 10.2.2.5 පඨම සුඛ සූත්‍රය, පි. 246, EAN:10: 65.5 Happiness 1,p. 519.

▼ **සුඛ හා දුක ඇතිවීම**: කරුණු 6 ක් සමන්විතවීම නිසා මේ ජීවිතයේදීම සුවයෙන් සතුටින් වාසය කළහැකිවේ, සුගතියේ යළි උපතට පත්වේ යයි මෙහි පෙන්වා ඇත. 1) නෙක්ඛම්මවිතක්ක 2) අව්‍යාපාද විතක්ක 3) අවිහිංසාවිතක්ක 4) නෙක්ඛම්ම සංඥා 5) අව්‍යාපාද සංඥා 6) අවිහිංසාසංඥා: (thought of renunciation, the thought of good will, the thought of harmlessness, perception of renunciation, perception of good will, and perception of harmlessness). ඉහත දැක්වූ කරුණු 6 නොමැතිව, කාමවිතක්ක... ආදී කරුණු නිසා මේ ජීවිතයේදී දුකින් වාසයකර මරණින් මතු දුගතියේ යළි උපතට පත්වේ. **මූලාශ්‍ර**: අංගු.නි:

(4): 6 නිපාත: අරහන්තවග්ග: 6.2.3.1 දුක්ඛ සූත්‍රය, පි.252,EAN:6: 75.1 Suffering, p. 359.

▲ **සුඛය**-පාලි: **සුඛං**- pleasure: සුඛය (සුවය) යනු සුවපත් සිතක් තිබීමය. මෙය සිත සමාධියට පත් කරගැනීමට උපකාරීවන අංගයකි. අකුසල පහවීම නිසා සිත සුවපත් පත්වේ (සුඛිනෝ චිත්තං සමාධියති). **බලන්න**: සමාධිය, ජාන. **සටහන:** ධම්මපදය: සුඛවග්ගයේහි සුඛය ලබාදෙන කරුණු - අවෛරබව, කෙළෙස් නැතිබව ආදී කරුණු සමූහයක්ම පෙන්වා ඇත.

▼ **පස්සදිය සුඛය ඇතිකරයි**: පස්සදිය නිසා සිතේ සුඛය ඇතිවේ, සුවපත් සිත සමාධිය ඇති කරයි:

**"පසසද්ධි බො ආනන්‍ද සුඛත්‍ථා සුඛානිසංසා... සුඛ බො ආනන්‍ද සමාධත්‍ථං සමාධා නිසංසං"**. (The purpose and benefit of is pleasure ... purpose and benefit of pleasure is stillness of mind). **මූලාශ්‍ර**:අංගු.නි: (6 ): 11 නිපාත:නිසසය වගග: 11.1.1.කීමත්ථිය සූත්‍රය හා 11.1.2 න චේතනාය කරණීය සූත්‍රය, පි.611-614, EAN:11: Dependence: 1.1 What Purpose & 1-2 Volition p.566.

▼**තෙවෙනි ජානය සුඛය**: තෙවෙනි ජානයට සමවැදීම සුඛය යි මහා මුගලන් තෙරුන් මෙහිදී පෙන්වා ඇත. **මූලාශ්‍රය**: සංයු.නි: (4): සළායතනවග්ග: මොග්ගල්ලානසංයුත්ත:6.1.3 සුඛ සූත්‍රය, පි.518.

▼ **විවිධ සුඛ**: මෙහි දක්වා ඇති විවිධ සුඛයන්: 1) ගිහි සුඛ හා පැවිදි සුඛ, පැවිදි සුඛ අග්‍රය. 2) කාම සුඛය හා නෙක්ඛම්ම සුඛය, නෙක්ඛම්ම සුඛය අග්‍රය. 3) උපධි සුඛය හා නිරුපධි සුඛය, නිරුපධි සුඛය අග්‍රය 4) සාසව සුඛය- වට්ට සුඛය හා අනාසවසුඛය (විවට්ට සුඛ- ආසව රහිත), අනාසවසුඛය අග්‍රය. 5) සාමිස සුඛය (වට්ටගාමි ) හා නිරාමිස සුඛය (විවට්ටගාමි), නිරාමිස සුඛය අග්‍රය 6) ආරියසුඛය හා අනාරිය සුඛය, ආරිය සුඛය අග්‍රය 7) කායික සුඛය හා චෛතසික සුඛය (මානසික), මානසික සුඛය අග්‍රය 8) පලමු හා දෙවෙනි ජන නිසා ලබන ප්‍රීතිසුඛය (සප්‍රීතික) හා තෙවෙනි හා සිව්වෙනි ජාන නිසා ලබන නිෂ්ප්‍රීතික (ප්‍රීතිය රහිත) සුඛය, නිෂ්ප්‍රීතික සුඛය අග්‍රය. 9) පලමු හා දෙවෙනි හා තෙවෙනි ජාන නිසා ලබන සාත සුඛය හා සිව්වෙනි ජානය නිසා ලබන උපේක්ෂා සුඛය, උපේක්ෂා සුඛය අග්‍රය. 10) සමාධි සුඛය හා අසමාධි සුඛය, සමාධි සුඛය අග්‍රය 11) පලමු හා දෙවෙනි ජන නිසා ලබන සප්‍රීතිකාලම්භන සුඛය හා තෙවෙනි හා සිව්වෙනි ජාන නිසා ලබන නිෂ්ප්‍රීතිකාලම්භන සුඛය, නිෂ්ප්‍රීතිකාලම්භන සුඛය අග්‍රය 12) පලමු හා දෙවෙනි හා තෙවෙනි ජාන නිසා ලබන සාතලම්භන සුඛය හා සිව්වෙනි ජානය නිසා ලබන උපේක්ෂාලම්භන සුඛය, උපේක්ෂාලම්භන සුඛය අග්‍රය 13) රූපාලම්භන සුඛය ( රූපාවචර ජාන- සිව්ජාන) හා අරූපාලම්භන සුඛය (අරූපාවචර ජාන), අරූපාලම්භන සුඛය අග්‍රය. **මූලාශ්‍රය**: අංගු.නි: (1): 2 නිපාත: සුඛවග්ග සූත්‍ර, පි.192.

▲ **සුඛ අනුපස්සි**- contemplating the happiness: සුඛඅනුපස්සි යනු නිවනේ සුවය ආවර්ජනා කරමින් වාසය කිරීමය. එම සුඛය ඇති පුද්ගලයන් 7 කි,ඔවුන් ආහුනෙයා... පාහුනෙයා...ආදී ගුණ ඇති

උතුමන්ය. **මූලාශ්‍රය**: අංගු.නි: (4): 7 නිපාත: 7.1.2.9 සුඛඅනුපස්සි සූත්‍රය, පි.320.

▲ **සුඛ ඉන්ද්‍රිය-** Sukha Indriya: මෙය ඉන්ද්‍රිය 22න් එකකි. **බලන්න:** ඉන්ද්‍රිය.

▲ **සුඛ** ධාතුව-Sukha Dhathu: සුඛ ධාතුව (the pleasure element) සය ධාතුවලින් එකකි. **බලන්න**: ධාතුකුසලතාවය.

▲**සුඛ ධර්මය-** Sukha Dhamma: සුඛ (ශුක්ල) ධර්ම යනු කුසල ධර්මයන්ය. හිරි හා ඔත්තප්ප සුඛ ධර්මවේ.මේවා ලෝකපාලක ධර්මතාය. **බලන්න**: හිරි ඔත්තප්ප. **මූලාශ්‍ර**: අංගු.නි: (1): 2 නිපාත: වස්සූපනායිකාවග්ග:2.1.1.8 සුක්ක සූත්‍රය,පි.140, හා 2.1.1.9 චරියා සූත්‍රය, පි.140, ඛු.නි: ඉතිවුත්තක: 2.2.5 ශුකලධම්ම සූත්‍රය, පි. 392.

▲ **සුඛ වේදනා**-Sukha Vedana: සුඛ වේදනා (Pleasurable feelings ) යනු ස්පර්ශය නිසා විඳින සැප වේදනාය. මෙය ත්‍රිවිධ වේදනාවලින් එකකි. **බලන්න**:වේදනා.

▲ **සුඛ පටිපදා-** Sukha patipada: ආධ්‍යාත්මික මාර්ගය වඩා ගැනීමට යොදාගන්නා පටිපදා 4 න් දෙකක්: සුඛාපටිපදා දන්ධාභිඤ්ඤා, සුඛාපටිපදාඛිප්පාභිඤ්ඤා ලෙසින් පෙන්වා ඇත. **බලන්න**: සතර ප්‍රතිපදා.

▲ **සුඛ ප්‍රාර්ථනා-** Wishing happiness: සුඛ ප්‍රාර්ථනා යනු මෙලොව හා පරලොව සැප පැතීමය. නුවණැති පුද්ගලයා, යහපත් ලෙසින් සිල්රකිමින් ප්‍රශංසාව, වස්තුලාභය,දෙව්ලොව සැප පතයි. **මූලාශ්‍රය**: ඛු.නි: ඉතිවුත්තක: 3.3.7 සුඛ ප්‍රාර්ථනා සූත්‍රය, පි.436.

▲**සුඛ මාර්ගය-දුක් මාර්ගය-** Happy way & unhappy way: සුඛ මාර්ගය ( ශුක්ල මග) ලෙසින් මෙහි පෙන්වා ඇත්තේ සම්මා දිට්ඨිය පෙරටු කරගත් නිවැරදි මගය. දුක ගෙනදෙන මග ( කෘෂ්ණමග) මිථ්‍යාදිට්ඨිය පෙරටු කරගත් වැරදි මගය. **මූලාශ්‍රය:** අංගු.නි: (6): 10 නිපාත: අරියවග්ග: 10.3.5.2 සුඛමග සූත්‍රය, පි. 474.

▲ **සුඛවිපාක හා දුක් විපාක-** Sukha vipaka & Dukvipaka: යහපත් කම්ම මගින් මෙලොව හා පරලොව දී සුඛවිපාක ඇතිවේ. අයහපත් කම්ම නිසා මෙලොව හා පරලොව දුක්විපාක ඇතිවේ.සුඛ විපාක ලබාදෙන ධර්මය නම් සම්මා දිට්ඨිය ප්‍රමුඛ නිවැරදි මග ගැනීමය. සසර ගමන දික්කරන වැරදිමග ගැනීම නිසා අප්‍රමාණ දුක් විපාක විඳීමට සිදුවේ. **බලන්න**: සම්‍යක්තවය, මිථ්‍යාත්වය. **මූලාශ්‍ර**:අංගු.නි:(6 )10 නිපාත සාධු වග්ග, 10.3.4.11 දුක්ඛවිපාක සූත්‍රය, පි.472.

▲ **සුඛ සෝමනස්ස-** abounds in happiness and joy: කරුණු 6 කින් සමන්විත්විම නිසා, මේ දිවියේදීම සැපය හා සොම්නස බහුලව වාසය කිරීමය: 1) ධම්මාරාමවීම 2) භාවනාරාම වීම 3) ප්‍රහාණාරාම (කෙළෙස් පහකිරීමට ඇති ඇල්ම) 4) ප්‍රවිවෙකාරාමය- පවිවිවේකය (කායචිත්ත උපධි විවේකයෙහි ඇති ඇල්ම) 5) අව්‍යාපාදරාම 6) නිෂ්ප්‍රපඤ්චාරාම (නිවනෙහි ඇල්ම). ඒ කරුණු ඇති උතුමා, මේ දිවියේදීම ආසාවක්ෂය කිරීම පරිපූර්ණකිරීම අරඹා ඇත. **මූලාශ්‍ර:** අංගුනි: (4): 6 නිපාත: අරහත්වග්ග: 6.2.3.4 සුඛ සෝමනස්සසූත්‍රය, පි.254.

▲ **සුඛ සංඥාව-** Sukha sanna: ඉර්දී වඩා ගැනීමෙන් සුඛ සංඥාව ඇතිකර ගැනීම ගැන **බලන්න**: අයගෝලය උපමාව.

▲**සුඛුද්‍රය ධම්ම**- Sukkhudraya Dhamma : සුඛුද්‍රය ධම්ම (සුවගෙනදන) ලෙසින් පෙන්වා ඇත්තේ: ප්‍රාණඝාතය, සොරකම, කාමයේ වරදවා හැසිරීම, මුසාවාදය, පිසුණාවාචය, පරුෂාවාචය, සම්ප්‍රප්ඵලාප, ලෝභය, ව්‍යාපාදය හැර දැමීම හා සම්මා දිට්ඨිය ගැනීමය. මේවා සම්මා දසධම්ම ලෙසින්ද පෙන්වා ඇත. **මූලාශ්‍රය:** අංගු.නි: (6) 10 නිපාත: සාධුවග්ග: 10.4.3.10 දුක්ඛුද්‍රය සූත්‍රය, පි.534.

▲ **සුඛල්ලිකානු යෝගය**-පාලි: **සුඛලලිකානුයොගො-** life devoted to pleasure: මෙහිදී, බුදුන් වහන්සේ ආරියහා අනාරිය යනුවෙන් සුඛල්ලිකානු යෝග දෙකක් පෙන්වා ඇත: **1. අනාරිය සුඛල්ලිකානු යෝගය:** පහත්වූ (හීන), ලාමකවූ (ග්‍රාම්‍ය), ලෞකිකවූ, පුහුදුන් මිනිසා සේවනය කරණ, අර්ථසාධනය පිණිස නොවන අයහපත් පැවැත්මය. එම පැවැත්ම මගින් විරගය, නිරෝධය, උපසමාය, අභිඤ්ඤාය සම්බෝධිය, නිවන නොලැබේ. අනාර්ය සුඛල්ලිකානු යෝග 4කි:1) සතුන් මැරීමෙන් 2) සොරකමින් 3) බොරුකියා 4) පස්කම් සැප විඳිමින් ඉඳුරන් පිනවීමය.

**" චත්තාරො 'මෙ සුඛලලිකානුයොගො හීනා ගම්මා පොථුජ්ජනිකා අනරියා අනත්‍ථසංහිතා න නිබ්බිදාය න විරාගය න නිරොධාය න උපසමාය න අභිඤ්ඤාය න සම්බොධාය න නිබ්බානාය සංවත්තතන්ති..."** (There are, Cunda, four kinds of life devoted to pleasure which are low, vulgar, worldly, ignoble and not conducive to welfare, not leading to disenchantment, to dispassion, to cessation, to tranquility, to realization, to enlightenment, to Nibbana...) **2. ආරිය සුඛල්ලිකානු යෝගය** නිවන පිණිස පවතී. එම පැවැත්ම ඒකාන්තයෙන්ම නිවන පිණිස පවතී. එමගින් සසර කළකිරිම, විරාගය, නිරෝධය, කෙලෙස් නිවීම (උපසමය), විශිෂ්ට නුවණ ලැබීම, සම්බෝධිය හා නිවන සාක්ෂාත්වේ. ආර්ය සුඛල්ලිකානු යෝග 4කි:1) ප්‍රථම ජානය2) දෙවන ජානය 3) තෙවන ජානය4) සිව්වන ජානය නිසා ලැබෙන සුව.මෙ මගින් සතර ඵල සතර ආනිසංස ලැබේ: සෝතාපන්නවීම, සකදාගාමීබව, අනාගාමිබව හා අරහත්වය ලැබීම:

**" චත්තාරො 'මෙ සුඛලලිකානුයොගො හීනා ගම්මා එකන්ත නිබ්බිදාය විරාගය නිරොධාය උපසමාය අභිඤ්ඤාය සම්බොධාය නිබ්බානාය සංවත්තතන්ති...කතමෙ චත්තාරො? ...පඨමං ඣානං...දුතියං ඣානං ...තතියං ඣානං... චතුත්‍ථං ඣානං උපසම්පජ්ජ විහරති"**. (There are, Cunda, these four kinds of life devoted to pleasure which are entirely conducive to disenchantment, to dispassion, to cessation, to tranquility, to realization, to enlightenment, to Nibbāna. What are they? Firstly, a monk, detached from all sense-desires ... enters and remains in the first jhāna... in the second jhāna...the third jhāna... the fourth jhāna...). **මූලාශ්‍ර:** දීඝ.නි:(3) 6.පාසාදිකසූත්‍රය-ඡෙදය:17,පි. 210, EDN:29.The delightful discourse-Para:23,p. 318.

▲ **සේඛ හා අසේඛ:** පාලි: **සෙඛො - අසෙඛො-** trainee & one beyond training: **සේඛ** (ශිෂ්‍ය): උසස් පුහුණුවේ නිරත - අධිශීලය, අධි චිත්තය හා

අධිප්‍රඥාව පුහුණු කරන (in higher training) එහෙත්, අරහත්වය නොලැබූ, ආරිය භික්ෂූන් සත් දෙනා ය. **අසේඛ:** පුහුණුව සම්පූර්ණ කරගත් රහතන්වහන්සේය (one beyond training). **බලන්න**: සත් ආරිය පුද්ගලයෝ, දස අසේඛිය ධර්ම. **ශබ්දකෝෂ: පා.සිංශ**:පි.534: "**සෙඛ**: හික්මීම සහිත පුද්ගලයා, රහත්ඵලය හැර ඉතිරි මගපලයන්ට පැමිණි පුද්ගලයා, සප්තවිධ ආර්යයා, පි. 114: **අසෙඛ:**අශෛක්‍ෂයා, හික්මී අවසන්කළ තැනැත්තා, රහතන්වහන්සේ. **B.D**: p: 168: "**Sekha**: A "noble Learner', a disciple in higher training, i.e.one who pursue the 3 kind of training (sikkhā), is one of those 7 kinds of noble disciples who have reached one of the super-mundane paths or the 3 lower fruition… one possessed of the 4th fruition (arahatta-phala) is called 'one beyond training**- asekha**- no more learner".

▼**සේඛ භික්ෂුව අප්‍රමාදව කටයුතු කලයුතුවේ**: සේඛ - ශිෂ්‍ය භික්ෂූන්, පුහුණුවේ අභිමාර්තය-ඉලක්කය (නිවන) ලබා නොමැත. එමනිසා ඉලක්කය සාක්ෂාත් කරගැනීමට ඔවුන් අප්‍රමාදව කටයුතු කළ යුතුවේ යයි බුදුන් වහන්සේ වදාළහ. එයට හේතු? එම ආරියන්, සුදුසු සේනාසනවල වාසය කරමින්, කල්‍යාන මිත්‍ර සේවනය කරමින්, ආධ්‍යාත්මික ඉන්ද්‍රියයන් පෝෂණය කර ගත යුතුවේ. එසේ කටයුතු කරණ ඔවුන්, විශේෂ නුවණ ඇතිකරගෙන, කුල පුත්‍රයන් ගිහිගෙයින් නික්මීමේ පරමාර්ථය වූ උතුම් බඹසර නිමාකර, නිවන ලබාගැනීම සාක්ෂාත් කර ගනී. අප්‍රමාදව පුහුණුවීම නිසා ලබන උතුම් ඵලය දැකීම නිසා, තවදුරටත් අප්‍රමාදව කටයුතු කල යුතුවෙ.

**"යෙ ච ඛො තෙ භික්ඛවෙ භික්ඛූ සෙක්ඛා අප්පත්ත මානසා අනුත්තරං යොගක්ඛෙමං පත්ථයමානා විහරන්ති. තථාරූපානාහං භික්ඛවෙ භික්ඛූනං අප්පමාදෙන කරණීය'න්ති වදාමි. තං කිස්ස හෙතු: අප්පෙවනාමිමෙ ආයස්මන්තො අනුලොමිකානි සෙනාසනානි පටිසෙවමානා කල්‍යාණ මිත්තෙ භජමානා ඉන්ද්‍රියානි සමන්නානයමානා යස්සත්ථාය කුලපුත්තා සම්මදෙව ආගාරස්මා අනගාරියං පබ්බජන්ති, තදනුත්තරං බ්‍රහ්මචරිය පරියොසානං දිට්ඨෙව ධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරෙය්‍යු'න්ති. ඉමෙ ඛො අහං භික්ඛවෙ ඉමෙසං භික්ඛූනං අප්පමාදඵලං සම්පස්සමානො අප්පමාදෙන කරණීයන්ති වදාමි"**. (... bhikkhus who are in higher training, whose minds have not yet reached the goal, and who are still aspiring to the supreme security from bondage, that they still have work to do with diligence. Why is that? Because when those venerable ones make use of suitable resting places and associate with good friends and nurture their spiritual faculties, they may by realizing for themselves with direct knowledge here and now enter upon and abide in that supreme goal of the holy life for the sake of which clansmen rightly go forth from the home life into homelessness. Seeing this fruit of diligence for these bhikkhus, I say that they still have work to do with diligence). **මූලාශ්‍ර:** ම.නි: (2): 2.2.10 කීටාගිරි සූත්‍රය,පි. 252, EMN: 70: Kīṭāgiri Sutta, p. 536.

**▼ 'සේඛ' ලෙසින් හඳුන්වන්නේ කව්රුද ? : "කිත්තාවතා නු ඛො භන්තෙ සෙඛො හොතීති? "** භික්ෂූන් ඇසූ ප්‍රශ්ණ පිළිබඳව බුදුන් වහන්සේ මෙසේ වදාළහ: පුහුණුව ලබන භික්ෂුව, සේඛ ආරිය අටමගින් සමන්විත නම් ඔහු සේඛ වේ:

**" ... ඉධ භික්ඛු සෙඛාය සම්මාදිට්ඨී සමන්නාගතො හොති, සෙඛෙන සම්මාසඞ්කප්පෙන ...සෙඛාය සම්මාවාචාය... සෙඛෙන සම්මා කම්මන්තෙන... සෙඛෙන සම්මාආජීවෙන... සෙඛෙන සම්මාවායාමෙන... සෙඛාය සම්මාසතියා... සෙඛෙන සම්මාසමාධිනා සමන්නාගතො හොති, එත්තාවතා ඛො භික්ඛු සෙඛො හොතීති"**. ( Here, bhikkhu, one possesses a trainee's right view ... a trainee's right concentration. It is in this way that one is a trainee).**මූලාශ්‍ර**: සංයු.නි: (5-1):මහාවග්ග: මග්ගසංයුත්ත:1.2.3 සේඛ සූත්‍රය, පි. 50 , ESN: Maggasamyutta, 13.3 A Trainee, p. 1618.

**▼සේඛ පුද්ගලයා හික්මී සිටී**: හික්මෙන තැනැත්තා (කීකරු) යන අරුතින් සේඛ වේ යයි බුදුන් වහන්සේ පෙන්වා ඇත:

**"සික්ඛතීති ඛො භික්ඛු තස්මා සෙඛොති වුච්චති. කිඤ්ච සික්ඛති : අධිසීලම්පි සික්ඛති, අධිචිත්තම්පි සික්ඛති, අධිපඤ්ඤම්පි සික්ඛති. සික්ඛතීති ඛො භික්ඛු තස්මා සෙඛොති වුච්චතීති".** 'කිනම් දෙයක හික්මේද? ඔහු අධිශීලයේ, අධිචිත්තයේ, අධිප්‍රඥාවේ හික්මෙයි. එසේ හික්මෙන නිසා සේඛ යයි කියනු ලැබේ'. (He trains, bhikkhu, therefore he is called a trainee. And in what does he train? He trains in the higher virtuous behavior; he trains in the higher mind; he trains in the higher wisdom. He trains, bhikkhu, therefore he is called a trainee)

මේ දේශනාව අවසානයේදී බුදුන් වහන්සේ මේ ගාථා වදාළහ:

**"සෙඛස්ස සික්ඛමානස්ස උජුමග්ගානුසාරිනො**
**ඛයස්මිං පඨමං ඤාණං තතො අඤ්ඤා අනන්තරා**
**කතො අඤ්ඤාවිමුත්තස්ස ඤාණං වෙ හොති තාදිනො**
**අකුප්පා මෙ විමුත්තීති භවසඤ්ඤොජනක්ඛයෙති**

'පුහුණුවේ යෙදෙමින්, ඍජු ආරිය මග ගමන්කරන සේඛ පුද්ගලයාට, පළමුව, කෙලෙස් ක්‍ෂය කරන නුවණ - මාර්ග ඥානය පහලවේ. අනතුරුව,  ඔහුට අරහත්ඵල ඥානය ඇතිවේ. ඒකාන්තයෙන්ම ඒ උතුම් පුද්ගලයාට 'භව සංයෝජන පහවිය, කිසිවෙකුට සෙලවිය නොහැකි විමුක්තිය ලදිමි' යන ප්‍රත්‍යවෙක්‍ෂණ ඥානය ඇතිවේ'. (As the trainee trains along the straight path, the knowledge of destruction arises first immediately followed by final knowledge. Thereafter, when the fetters of existence are destroyed, for one liberated by final knowledge, the knowledge arises: 'My liberation is unshakable'. මූලාශ්‍ර:අංගු.නි: (1): 3 නිපාත: 3.2.4.5. සූත්‍රය, පි. 446, EAN:3: 85.5. A Trainee, p.121.

**▼ අසේඛ වෙන්නේ කෙසේද?  "කිත්තාවතා නු ඛො භන්තෙ භික්ඛු සෙඛො හොතී ති?"** භික්ෂුවක් එසේ අසනලද ප්‍රශ්නයකට, බුදුන් වහන්සේ මෙසේ පිළිතුරු වදාළහ:

**“ ... ඉධ භිකඛු, භිකඛු අසෙඛාය සම්මාදිට්ඨි සමන්නාගතො හොති, අසෙඛෙන සම්මාසඞකප්පෙන ...අසෙඛාය සම්මාවාචාය... අසෙඛෙන සම්මාකම්මන්තෙන... අසෙඛෙන සම්මාආජීවෙන... අසෙඛෙන සම්මාවායාමෙන... අසෙඛාය සම්මාසතියා... අසෙඛෙන සම්මාසමාධිනා සමන්නාගතො හොති. අසෙඛෙන සම්මාඤාණෙන... අසෙඛාය සම්මාවිමුත්තියා සමන්නාගතොහොති.එවංඛො භිකඛු භිකඛු අසෙඛො හොතී ති”**. ‘යම් භික්ෂුවක් අසේඛ සම්මා දිට්ඨිය ඇති ආරිය අටමගින් සමන්විතව, අසේඛ සම්මා ඥාණය හා සම්මා විමුත්තිය පරිපූර්ණය කරගැනීමෙන්, ඔහු අසේඛ වේ". සටහන: ‘Asekha’: A term for an arahant, who has completed the training in the noble eightfold path and thus possesses, beyond the eight path factors, right knowledge (sammāñāṇa) and right liberation (sammāvimutti). බලන්න: EAN:10: note: 2147, p.683, දස අසේඛියධම්ම. **මූලාශ්‍ර:** අංගු.නි: ( 6): 10 නිපාත: සමණසඤ්ඤා වගග: 10.3.1.11. අසේඛ සූත්‍රය, පි.426 හා 10.3.1.12. අසේඛියධම්ම සූත්‍රය,පි.428 , EAN: 10: 111.11 One beyond training 1 & 2, p.543.

▼ **සේඛ පුහුණුව**: සේඛ භික්ෂුව සතර සතිපට්ඨානය (සිව් සිවටන්) ඇතිකරගෙන වාසය කලයුතුවේ.**මූලාශ්‍රය**: සංයු.නි: (5-2): මහාවග්ග: අනුරුද්ධසංයුත්ත: 8.1.4 කන්ටකී සූත්‍රය, පි.94.

▼**සේඛ ගුණ**: උසස් පුහුණුව ලබන සේඛ භික්ෂූන්ගේ ස්වභාවය බුදුන් වහන්සේ මෙසේ පෙන්වා ඇත: උසස් පුහුණුවේ යෙදෙන භික්ෂූන්: නිරතුරුවම ශිලසම්පන්නය, සිල්වත් ජිවිතයක් ගත කරයි (අධි ශිලය) , ප්‍රඥා සම්පන්නය, තියුණු නුවණ ඇතිව වාසය කරයි (අධි ප්‍රඥාව) . සතර සතිපට්ඨානයේ මානව ස්ථාපිත උසස් සිතක් ඇතිව වාසය කරයි (අධිචිත්තය):

**“...ඉමස්මිං භිකඛුසඞෙඝ සෙඛා සන්තතසීලා සන්තතවුත්තිනො නිපකා නිපකවුත්තිනො. තෙ චතුසු සතිපට්ඨානෙසු සුපට්ඨිතචිත්තා විහරන්ති...”** (... There are bhikkhus in higher training, of constant virtue, living a life of constant virtue, sagacious, living a life of constant sagacity. They abide with their minds well established in the four foundations of mindfulness). මූලාශ්‍ර: ම.නි: (2 ): 2.1.1 කන්දරක සූත්‍රය පි. 18, EMN: 51: Kandaraka Sutta, p. 425.

▼ **අසේඛ යනු උත්තම පුරුෂයාය**:පංච නීවරණ පහකර, පංච අංගයන්ගෙන් සමන්විත වූ භික්ෂුව (රහතන්වහන්සේ) ධර්ම විනයේ උතුම් පුරුෂයා ය.**බලන්න**: උත්තම පුරුෂයා.**පංචඅංග ප්‍රහීණය** යනු **පංචනිවරණ** පහකර ගැනීමය. **පංචඅංග ඇතිකර ගැනීම** යනු: **අසේඛ ශිලයය. (** virtuous behavior of one beyond training- ශිලය පරිපූර්ණබව), **අසේඛ සමාධිය** (concentration of one beyond training- සමාධිය පරිපූර්ණබව) **අසේඛ ප්‍රඥාව**- wisdom of one beyond training- ප්‍රඥාව පරිපූර්ණබව) **අසේඛ** විමුත්තිය (liberation of one beyond training) **අසේඛ විමුත්ති ඥානදර්ශනය** (the knowledge and vision of liberation of one beyond training) සම්පූර්ණ කරගැනීමය. **මූලාශ්‍ර:** අංගු.නි: (6 ): 10 නිපාත: නාථ වග්ග: 10.1.2.2 පංචඅංග සූත්‍රය, පි.58, EAN: 10: Protector: 12.2 Five Factors, p. 495.

▼ **අසේඛ ගුණ:** අසේඛ භික්ෂුව (රහතුන්) ආහුනෙය්‍යා,පාහුනෙය්‍යා ආදී ගුණයෙන් සමන්විතය. **මූලාශ්‍රය:** අංගු.නි: (3): 5 නිපාත: ඵාසුවිහාරවග්ග: 5.3.1.8 අසේඛ සූත්‍රය, පි.236.

▼ **සේඛ භික්ෂුව ආරිය පුද්ගලයෙකි:** සේඛ යනු, සසර බන්ධනයෙන් තවමත් නොමිදුන, නිවන අරමුණු කොට ඇති ධර්මයේ උසස් පුහුණුව ලබන භික්ෂුවය. එනම්, සෝතාපන්න හෝ සකදාගාමී හෝ අනාගාමී මග ඵල සාක්ෂාත් කරගත්, රහත්බව නොලැබූ ආරියන්ය.එබඳු අරිය ශ්‍රාවකයා අනිච්ච, දුක්ඛ හා අනාත්ම ධර්මතා පිලිබඳ අභිඥාලාභීයෙක්ය, එහෙත්, අරහත් මගඵල සම්පූර්ණ කරණ අවබෝධය- පරිඥාව ලබා නොමැත. රහතුන් අභිඥාව හා පරිඥාව සම්පූර්ණකර ඇත. **බලන්න**: EMN: notes: 21-24, p. 1064. **මූලාශ්‍ර**: ම.නි: (1): මූල පරියාය සූත්‍රය, පි. 22,EMN:1: Mūlapariyāya Sutta, p. 61.

▼ **සේඛ බල**: සේඛ භික්ෂුව සතු සේඛබල පහක්වේ (පංච සෙඛ බලානි): 1) ශ්‍රද්ධාබලය 2) හිරිබලය 3) ඔත්තප්ප බලය 4) වීරියබලය 5) ප්‍රඥාබලය. **මූලාශ්‍ර:** අංගු.නි : (3 ): 5 නිපාත: 5.1.1.1. සේඛබල සඞඛිත සූත්‍රය, පි. 24, EAN:5: The Trainee's Powers- 1.1.In Brief, p. 238. සේඛයන්, තම අවබෝධය හා පුහුණුව මගින් සියළු කෙලෙස්: රාග,දෝෂ,මෝහ හැර දමයි, සියලු අකුසල අත්හරි. එලෙස කටයුතු කිරීමෙන් ඔහුට ඇතිවන ආධ්‍යාත්මික ශක්තිය භාවනා බලය වේ... භාවනා බලය ඇති භික්ෂුව, විවේකය ඇසුරුකරමින්, විරාගය ඇසුරුකරමින්, නිරෝධය ඇසුරුකරමින්, කෙලෙස් හැරදැමීමෙන්, විමුක්තිය පිණිස සප්ත බෝජ්ජංග ධර්ම වඩයි... ඔහු සියලු කාමයන් ගෙන් වෙන්වී, සිව්ජාන වර්ධනය කරගනී. **සටහන්**: *සේඛබල යනු, මාර්ගය පුහුණුකරණ සත් දෙනාය: සෝතාපන්න සිට අරහත් මග දක්වා දියුණු කරන උත්තමයන්ය. රහතන්වහන්සේ මේ ගණයට නොවැටේ. එතුමන් අසේඛය. **බලන්න**: සේඛ, EAN:2: note no. 229, p.592. **මූලාශ්‍ර**:අංගු.නි: (1) 2 නිපාත: 2.1.1, 2.1.2 සූත්‍ර, පි.142, EAN:2: 11-1 sutta, p. 57.

▼ **සේඛ භික්ෂුව විශාරදවීම**: සේඛ භික්ෂුව විශාරදවීම (සේඛවෙසාරජ්ජ) පිණිස ධර්මතා 5ක් තිබිය යුතු බව මෙහි දක්වා ඇත. එනම්: පංච සේඛ බලයන්ය. **මූලාශ්‍ර:** අංගු.නි : (3 ): 5 නිපාත:ඵාසුවිහාරවග්ග:5.3.1.1 සේඛවෙසාරජ්ජ සූත්‍රය, පි.224.

▼**සේඛයන් සම්පූර්ණ කරගත් ගුණ**: 1) ශීලසම්පන්න2) ඉන්ද්‍රිය සංවරය 3) භෝජනයේ මාත්‍රවීම) 4) ජාගාරානු සතිය) 5) සප්ත සද්ධර්මය තිබීම 6) කැමති පරිදි සිව් ජාන ලබාගැනී. ඔහු එම අර්හත් මගට බැස ඇත. උතුම් නිවන -අධිගමය ලැබීමට ඔහුට හැකියාව ඇත.සේඛ ගුණ සාක්ෂාත් කරගත් ආරියශ්‍රාවකයා **විජ්ජාචරණ සම්පන්නවේ** (vijjācaraṇasampanna-perfect in true knowledge and conduct). ඔහු සතු **චරණ ගුණ:** ශීලසම්පන්නබව, ඉන්ද්‍රිය සංවරය, ආහාරයේ පමණ දැනීම, නිදිවැරිම, සප්ත සද්ධර්ම ගුණ හා සිව්ජාන ලබාගැනීමේ හැකියාව. ඔහු ලැබූ **ත්‍රිවිධ ඥාන** පෙර ජාති සිහිකිරීමේ නුවණ (පුබෙබනිවාසං අනුසසරති), දිවැස් නුවණ (දීබෙබන චකඛුනා), ආසව ක්ෂය කිරීමේ නුවණ (ආසවානං ඛය). **සටහන්**: * චරන ගුණ 15කි, විජ්ජා 3 කි. මේ ගුණ බුදුවරුන් හා රහතන්වහන්සේ සතුය. **බලන්න**: බුදුගුණ,

ත්‍රිවිධ ඥාන, විජ්ජාචරණසම්පන්න. ** බුදුන් වහන්සේගේ ඇරයුමක් මත ආනන්ද තෙරුන් මෙම ප්‍රතිපදාව ශක්‍යන්හට වදාළහ. **මූලාශ්‍ර**: ම.නි:(2 ): 2.1.3 :සෙඛ සූත්‍රය, පි. 44, MN 53: Sekha Sutta, p.436

▼ **සේඛ භික්ෂුවකගේ පරිහානියට බලපාන කරුණු**: 1) වැඩකටයුතු වලට 2) කතාබහට3) නින්දට4) අන්‍ය ඇසුරට ඇලීම 5) ඉන්ද්‍රිය අසංවරය 6) භෝජනයෙහි පමණ නොදැනීම. එම කරුණු හැර, පරිහානිය වලකා ගත හැකිය. **මූලාශ්‍ර**: අංගු.නි:(4 ):6නිපාත: 6.1.4.1සේඛසූත්‍රය, පි.102,EAN:6:31 .1Trainee, p.330 .

▼ **සේඛ භික්ෂුවකගේ පරිහානිය හා දියුණුව**: මෙහි සේඛ භික්ෂුව පරිහානියට පත්වීම හා වර්ධනයවීමට බලපාන කරුණු පෙන්වා ඇත. **මූලාශ්‍ර**: අංගු.නි: (3 ): 5 නිපාත: ථෙරවග්ග: 5.2.4.9 සේඛ සූත්‍ර 2කි, පි. 205.

▼ **සේඛ ධර්මතා සපුරා ගැනීමට හේතු කරුණු**: පවිටු මිතුරන් ඇතිවිට, සේඛ ධර්මතා සම්පූර්ණ කරගත හැකිනොවේ. කල්‍යාන මිත්‍ර සේවනය, සේඛ ධර්මතා සපුරා ගැනීමට උපකාරිවේ. සේඛ යනු අරහත්වය පිණිස පුහුණුවන උතුම් ශ්‍රාවකයාය. සේඛ භික්ෂුවහට බොහෝ උපකාරීවන ධර්මතා 2 කි: යෝනිසෝමනසිකාරය හා කල්‍යානමිත්‍ර සේවනය. **මූලාශ්‍රය:** ඛු.නි:ඉතිවුත්තක:1 හා 2 සේඛ සූත්‍ර, පි.360.

▼ **සේඛපුහුණුව පිණිස කල්‍යාන මිත්‍ර සේවනය උපකාරීවේ**: කල්‍යාන මිත්‍ර සේවනය, සේඛ ධර්මතා සපුරා ගැනීමට උපකාරිවේ. පවිටු මිතුරන් ඇතිවිට, සේඛ ධර්මතා සම්පූර්ණ කරගත හැකිනොවේ. **මූලාශ්‍රය:**අංගු.නි: (4): 6 නිපාත:අනාගාමිවග්ග. 6.2.2.3 මිත්ත සූත්‍රය, පි.238.

**සග**

▲**සංගයනා-** Sanghayana: සම්බුද්ධ පරිනිර්වාණයෙන් පසු ධර්මවිනය චිරස්ථායි වනු සඳහා සම්මුඛ ශ්‍රාවකවූ ධර්මවිනයධර අනුබුද්ධ මහාකාශ්‍යප, ධර්මභාණ්ඩාගාරික ආනන්ද, අග්‍රවිනයධර උපාලි ආදී සිවුපිළිසිඹියා පත් මහරහතුන් විසින් පවත්වනලද ප්‍රථම සංගායනාව සෙසු සියලු සංගායනාවන්ට භූමිවූ බවත්, සියලු බෞද්ධ නිකායකයින් විසින් පිළිගන්නා ලද බවත්, ත්‍රිපිටකධර්ම විනිශ්චය පිලිබඳ සතර මහාඅපදේශ (ප්‍රමාණ) යන් අතුරෙහි “ආචාර්යවාදය” වශයෙන් ගන්නා ලද බවත් අර්ථකථා ගත විස්තරයන්ගෙන් පැහැදිලිවේ. මහාකාශ්‍යප තෙරුන්ගේ සිසු පරපුර - සංයුත්තභාණක යන්වුහ. **මූලාශ්‍රය:** වින.පි: මහාවග්ග පාළි 1: ප්‍රස්තාවනා පි 26, 63.

▲**සංග්‍රාම-**Battle: සංග්‍රාම යනු එකිනෙකා සමග විරුද්ධව සටන් කිරිමය. එවැනි සටන් නිසා ඇතිවෙන අයහපත් විපාක: ජයගැනීම හා පැරදීම පිළිබඳව බුදුන් වහන්සේ මෙසේ පෙන්වා ඇත: “ දිනන අය, වෛරි ජනයා ලබයි. පැරදුන අය දුකින් වාසය කරයි. දිනුම් පැරදුම් දෙක හැර දමා සංසින්ඳුනවිට සුවයෙන් සැතපේ”. “ යම්තාක් කෙනකුට හැකියාව ඇතිද, හෙතම සෙසු අය වනසයි. යම් කලක අන්‍යයෝ තමන් වනසයිද, එවිට තමන් වැනසේ. අනුවණ අය තමන්හට වාසනාව ඇතයි සිතති, එහෙත්, නරක කම්ම එල දෙනවිට ඔවුන් බොහෝ දුක් විඳිති” ( Victory breeds enmity, The defeated one sleeps badly. The peaceful one

sleeps at ease, having abandoned victory and defeat. The fool thinks fortune is on his side So long as his evil does not ripen, but when the evil ripens the fool incurs suffering). **සටහන**: මෙහිද, පසේනදී කෝසල රජ හා මගධාධිපති අජාසත් රජ අතර වූ සංග්‍රාමයක් ගැන දක්වා ඇත. **මූලාශ්‍ර**: සංයු.නි: (1) සගාථවග්ග: කෝසලසංයුත්ත: ප්‍රථම හා දෙවනි සංග්‍රාම සූත්‍ර, පි.180, ESN:3: Kosalasamyutta, 14.4.& 15.5 suttas, p. 237.

▲**සංග්‍රාමජිත් තෙර-**Sangramajit Thera: **බලන්න**: උපග්‍රන්ථය:1

▲ **සංගාරව හද්‍රමුඛ** - Sangārava Bhdramukha: **බලන්න**: උපග්‍රන්ථය:3

▲ **සංගාරාව බ්‍රාහ්මණ 1& 2-** Brahmin Saṅgārava 1&2 : **බලන්න**: උපග්‍රන්ථය:3

▲ **සංග්‍රහ වත්ථු-** Sangrha vatu: සංග්‍රහ වත්ථු ලෙසින් මෙහි පෙන්වා ඇත්තේ දානය, ප්‍රියවචනය, අර්ථචරියාව, සමානත්ම තාවයය. **බලන්න**: සතර සංග්‍රහ වත්ථු. **මූලාශ්‍රය**: අංගු.නි: (2): 4 නිපාත:චක්කවග්ග: 4.1.4.2 සංග්‍රහ වත්ථු සූත්‍රය, පි.88 හා අභිඤ්ඤාවග්ග: 4.6.3 සංග්‍රහ වත්ථු සූත්‍රය, පි.498.

▲ **සංග්‍රහ වත්ථු බල-**Sangrha vattu bala: සංග්‍රහ වත්ථු බල ලෙසින් පෙන්වා ඇත්තේ: ප්‍රඥාබලය**,** වීරියබලය,අනවජ්ජබලය, සංග්‍රහ බලය යන **බල සතරය**. මේ සතර බල ඇති පුද්ගලයා **පස්බිය** ඉක්මවා ඇත. **ප්‍රඥාබලය:** කුසල අකුසල, සාවද්‍ය නිරවද්‍ය, කළු සුදු, සේවිතබ්බ අසේවිතබ්බ, ආරියබව කරන අනාරිය බව කරන, සියලු ධර්ම යහපත් ලෙසින් දැකීමය. **වීරියබලය**: සියලු අකුසල ප්‍රහීණය පිණිස, කුසලය වැඩීම පිණිස ප්‍රධන් වීරිය තිබීම.**අනවජ්ජබල**: කාය වචී හා මනෝ දොරටුවලින් නිවැරදි කම්ම කිරීම. **සංග්‍රහබල:** දානය, ප්‍රියවචනය, යහපත් අර්ථ චරියාව, සමානාත්මතාවය යන සතර සංග්‍රහ වස්තු සහිතවීම. **පස්බිය:** 1 ආජීවකබිය (ජීවිතවෘත්තිය පිලිබඳ), 2 ගැරහුම් ලැබීමේ බිය (අසිලෝකභිය), 3 පිරිස්මැද පසුබෑමේ බිය (පරිස්සාරජ්ජභය), 4 මරණභිය 5 දුගතිබිය (අපායභය). **මූලාශ්‍රය:** අංගු.නි: (5): 9 නිපාත:සම්බෝධිවග්ග:9.1.1.5 බලසංග්‍රහ වත්ථු සූත්‍රය, පි.408.

▲ **සුගත-** fortunate one: සුගත යනු වාසනාවන්තබවය. බුදුන්වහන්සේ හඳුන්වන ගුණ නාමයකි, බුදු ගුණයකි. රාග දෝස හා මෝහ යන සියලු කෙළෙස් සහමුලින්ම උපුටා දැමූ රහතුන් සුගත යයි සැරියුත් තෙරුන් වදාළහ. **මූලාශ්‍ර:** සංයු.නි (4 ) සළායතන වග්ග: ජම්බුඛාදක සංයුත්ත: 4.1.3 ධමමවාදී සූත්‍රය, පි. 502 , ESN: IV: 38 Jambukhādakasaṃyutta: 3 Proponents of Dhamma, p. 1398.

▲ **සුගත විනය**-Discipline of the Fortunate one තථාගතයන් විසින්, මුල, මැද හා අග යහපත්වූ ...පරිශුද්ධ බ්‍රහ්මචරියාව දෙසනසේක. එය සුගත විනය යයි මෙහි දක්වා ඇත. ලෝකයාට හිත පිණිස, සුව පිණිස අනුකම්පාව පිණිස යහපත පිණිස සුගත විනය දේශනා කර ඇත. **බලන්න**: ධම්මවිනය. **මූලාශ්‍රය**: අංගු.නි: (2): 4 නිපාත: ඉන්ද්‍රියවග්ග: 4.4.1.10 සුගතවිනය සූත්‍රය, පි.306.

▼**සුගත විනයේ දස ධම්ම** ලෙසින් පෙන්වා ඇත්තේ, සම්මා දිට්ඨිය ප්‍රමුකවූ දස අංග, සම්‍යක්තවයය. **බලන්න**: දසධම්ම. **මූලාශ්‍රය**:අං.ගු.නි: ( 6): 10 නිපාත: පරිශුද්ධ වග්ග: 10.3.3.1-10.3.3.9 සූත්‍ර, පි.462.

▲ **සුගතිය-**Favorable destinations: සුගතිය යනු යහපත් කර්ම විපාක නිසා මරණින් මතු යළි උපත ලබන සුභ ස්ථානයකි. දේවලෝක, බ්‍රහ්මලෝක හා මිනිස් ලෝකයේ සැපසම්පත් සහිතව ඉපදීම සුගතිය ලැබීමය. කෙනෙක් තුන්දොරින් කුසලක්‍රියා කරන්නේනම්, සම්මාදිට්ඨිය ඇත්නම් ඔහුට සුගතියේ ඉපදීමට වාසනාව ඇත. **බලන්න**: දුගතිය, කම්ම. **මූලාශ්‍ර:** අං.ගු.නි: (2 ): 4 නිපාත: කම්ම වග්ග සූත්‍ර, පි. 468, EAN:4: Kamma: p. 227, අං.ගු.නි (1) 3 නිපාත: දේවදූතවග්ග: 3.1.4.6 සූත්‍රය, පි. 292, EAN:3: Divine Messengers: 36. 6 Messengers, p.92, ම.නි: (3) 3.3.10, දේවදූත සූත්‍රය, පි. 400, EMN:130: The Divine Messengers, p.941.

▼**සුගතියේ යලි උපත ලැබීම ගැන මිථ්‍යා දිට්ඨි:** බුදුන් වහන්සේ වැඩ වසන සමයේ, මේ පිලිබඳ අන්‍යආගමිකයන් අතර විවිධ දිට්ඨි පැවතිනි. බුදුන් වහන්සේ පෙන්වා වදාළේ එබඳු දිට්ඨි, මිථ්‍යා දිට්ඨි නිසා යලි උපත දුගතිය බවය. **පැවති දිට්ඨි:** 1) යුද්ධයේ විරිය කරන අසරුවන් සරඤජිත දේව සභාවේ උපත ලැබීම. **බලන්න:** සං.යු.නි (4) සළායතනවග්ග: ගාමිණිසංයුත්ත: 8.1.5අස්සාරෝහගාමිණි සූත්‍රය, පි.590.2) යුද්ධයේ විරියකරන හස්තිහත්ථරෝහක හමුදාව) සරඤජිත දේව සභාවේ උපත ලැබීම.**බලන්න**: සං.යු.නි: (4) සළායතනවග්ග:ගාමිණිසංයුත්ත:8.1.4 හත්ථාරෝහගාමිණි සූත්‍රය,පි.590. 3)යොධාජීව භටයන් සරඤජිත දේවසභාවේ උපත ලැබීම.**බලන්න:**සං.යු.නි:(4) සළායතනවග්ග: ගාමිණිසංයුත්ත:8.1.3 යොධාජීව සූත්‍රය, පි.588.4) ජනයා පිනවන නළුවන් පහාස දේව සභාවේ උපත ලැබීම. **මූලාශ්‍රය:** සං.යු.නි: (4) සළායතනවග්ග:ගාමිණිසංයුත්ත:8.1.2 තාලපුට සූත්‍රය, පි.584.

5) පජ්ජාභූමි බ්‍රාහමණයන්හට, කලුරිය කල පිරිස සුගතියට යැවීමේ හැකියාව ඇතිබව. **සටහන්:** * මළමිනිය අසල සිට ඔවුන් මෙසේ පවසන බව අටුවාව පෙන්වා ඇත: “They stand around him saying, ‘Go, sir, to the brahmā world; go, sir, to the brahmā world,’ and thus make him enter (*pavesenti*) heaven.” **බලන්න:** ESN: note: 342, p. 1567. ** එම දිට්ඨි වැරදි බව පෙන්වීමට බුදුන් වහන්සේ යොදාගත් උපමා:

1) **මහාගල උපමාව**: කෙනෙක් මහා ගලක් ගැඹුරු විලකට දමා ඒ ගලට උඩට ඒමට යයි කියයි. එහෙත්, ඒ ගලට උඩට මතුවීමට නොහැකිය. එසේම අයහපත් අකුසල කරන කෙනෙක්, මරණින් මතු සුගතියේ යළි උපත ලැබීම සිදුවන දෙයක් නොවේ. 2) **ගිතෙල් කලය උපමාව**: කෙනෙක් ගිතෙල් ඇති මැටි කාලයක් ගෙන එය විලකට දමයි. කලය බිඳී කැලි යටට යයි, තෙල් උඩට මතුවේ. එලෙස යහපත් කුසල කම්ම කරන පුද්ගලයෙක් මරණින් මතු දුගතියට යන්න යයි පැතීම නිෂ්ඵල දෙයකි. **මූලාශ්‍රය:** සං.යු.නි: (4) සළායතනවග්ග:ගාමිණිසංයුත්ත:8.1.6 අසිබන්ධක සූත්‍රය, පි.592.

▲ **සුගතිගමන-**Going to a happy destination: දෙවියන්ගේ සුගති ගමන ලෙසින් බුදුන් වහන්සේ වදාළේ, දෙවියෙක්, දෙව්ලොවින් චුතව, මිනිස්

ලෝකයේ යළි උපතක් ලැබීමය. දෙවියෙක්, චුතවන අවස්ථාවේ, සෙසු දෙවියන් ඔහුවෙත පැමිණ මෙලෙසින් ඔහු අමතයි:

**"පින්වත, දෙව්ලොවින් චුතව, මිනිස් ලෝකය නැමති සුගතියට යන්න...එහිදී සද්ධර්මය කෙරෙහි ශ්‍රද්ධාව පිහිටුවා ගන්න- සුලද්ධ ලාභය ලබන්න. එම ශ්‍රද්ධාව, මුල්කරගත්විට, වෙනත් කිසිවෙකුට එය ඉවත් කිරීමට නොහැකිය. සුලද්ධ ලාභය ලැබ සුප්පතිට්ඨිත වන්න".**

**සටහන්**: * දෙවියෙක් චුතවන අවස්ථාවේ ඔහුට පෙරනිමිති 5 ක් ඇතිවේ: 1) පැළඳි මල් පරවේ 2) හැඳි වස්ත්‍ර කිළුටුවේ 3) දාඩිය වැගිරේ 4) සිරුර දුර්වර්ණවේ 5) ස්වකිය දිව්‍යආසනයේ නො ඇලේ. ** **සුලද්ධ ලාභය** යනු ධර්මය පිළිබඳව යහපත් ලෙසින් ශ්‍රද්ධාව ඇතිකර ගැනීමය ** **සුප්පතිට්ඨිත:** පිහිටුවා ගත් සැදැ හිත වෙනත් කිසිවෙකුට නොසෙල්විය හැකිබව. **මූලාශ්‍රය:** බු.නි:ඉතිවුත්තක:චතුවග්ග:3.4.4 පූර්වනිමිත්ත සූත්‍රය,පි.450.

▲ **සාගත තෙර**-Sagatha Thera: බලන්න: උපග්‍රන්ථය:1.

▲ **සොගන්ධික නිරය**- sweet-fragrance hell: අයහපත් කම්ම විපාක එලදීමට මට ඇති නිරයකි. බලන්න: නිරය.

**සඟ**

▲**සිඟාල-** the fox: 1) **උපමාව**:සිගාල (සිවලා, නරිය) උක්කන්ටක (කුෂ්ඨ) රෝගයෙන් පෙලන සිවලාට එක තැන සිටීම පහසු නත. මෙ උපමාවෙන් පෙන්වා ඇත්තේ ලාභසත්කාර වලට යටවූ මහණහට ධර්මයේ ස්ථාවර වීමට නොහැකි බවය. ඒ රෝගයෙන් පෙලෙන සිවලා ගුහාවට, රුක්මුලකට, ජලාසයකට ආදී කවර තැනකට ගියද ඌට ඇති කැසීම නතර නොවේ, දුකම ඇතිවේ. එලෙස, ලාභසත්කාර නිසා සිත මැඩිගිය මහණට, කවර තැනකට ගියද සිත සමාධියට පත් කර ගත නොහැකිවේ, දුකට පත්වේ. **මූලාශ්‍රය:** සංයු.නි: (2) නිදාන්වග්ග: ලාභසත්කාරසංයුත්ත:5.1.8 සිගාල සූත්‍රය, පි.372.

**2)** කුෂ්ඨසැදුන සිවලාට එක තැනක විසිමට නොහැකිය. එලෙස ප්‍රමාදය, කලගුණ නොමැතිකම ආදී අවගුණ ඇතිවිට සිත සමාධිය ලබා ගැනීමට නොහැකිය. **බලන්න**: උපග්‍රන්ථය:5 **මූලාශ්‍රය:** සංයු.නි: (2) නිදාන්වග්ග:ඕපම්මසංයුත්ත: සිගාල සූත්‍ර 1 හා 2 , පි.440.

▲**සිඟාලමාතා තෙරණිය-**Singalamatha Therani: බලන්න: උපග්‍රන්ථය:2

▲ **සිඟාලක ගෘහපුත්‍ර-**Singalaka the householder's son: බලන්න: උපග්‍රන්ථය:3.

**සංඝ**

▲**සංඝයා-**Sangha: බුදුන් වහන්සේ වෙත පැවිදිවූ පිරිස (මහණ, මෙහෙණි,භික්ෂු භික්ෂුණියන්) සංඝයාය. සංඝයා අෂ්ඨපුරුෂ පුද්ගලයෝ ලෙසින්ද හඳුන්වයි: එනම්, සෝතාපන්න සිට අරහත් දක්වා මාර් එල

ලැබූ උතුම් භික්ෂු භික්ෂුණියන්ය. සංඝයා ත්‍රිවිධරත්නයෙන් එක්රත්නයකි. **බලන්න**: ත්‍රිවිධ රත්නය,සංඝගුණ.

▼**වෙනත් මූලාශ්‍ර: 1. "An Introduction to the Teaching of the Buddha Gotama"** by Subhadra Bhikshu: BPS: Wheel: 152 -154: 2008 : On line edition (සංඝයා හඳුන්වාදීම, පැවිදි බව ලැබීම ආදී කරුණු මෙහි ඇතුලත්ය).

▲ **සංඝයාට අනතුරු-** Dangers to the Sangha: ධර්ම මාර්ගයේ ගමන් කරනවිට, සමහර ස්ථාන, පිරිස්, ඇසුරුකිරිම නිසා, සංඝයාට බොහෝ අනතුරු- ආදීනව ඇතිවේ. C සංඝයා රජමාළිගාව වැනි තැන් ඇසුරු කිරිමෙන් සිදුවිය හැකි හානි -උවදුරු 10 ක් මේ සූත්‍රයේ පෙන්වා ඇත. **මූලාශ්‍ර**: අංගු.නි:(6 )10 නිපාත: 10.1.5.5. අනතුරු සූත්‍රය,පි.174, EAN:10: 45.5. Entering, p. 510.

▲ **සංඝයාට ඇති භය හතර-**Four fears of the Sangha: පැවිදි ජීවිතයේදී සංඝයා මුහුණපාන බිය-බාධක 4 කි. 1**. ඌර්මිභය**: පැවිදි ජිවිතයේ දී හැසිරීම පිලිබඳ ලැබෙන අවවාද අනුසාසනා නොරිස්සිම නිසා- ඒ ගැන තරහ ඇතිකරගෙන නැවත ගිහි බවට පත්වීම. මේ බිය රළ පහරට ගසාගෙන යාම වැනිය.2. **කුම්භිල භය**: පැවිදි ජීවිතයේදී ආහාර පාන ගැනීම පිලිබඳ ඇති සිල්පද වලට කැමති නොවී නැවත ගිහි බවට පත්වීම. මේ බිය කිඹුලාට හසුවීම වැනිය. 3. **ආවට්ටභය**: ඉන්ද්‍රිය සංවරය නොමැති නිසා, ගිහියන් විඳින පස් කම් සැපයට ලොල්වී, නැවත ගිහි බවට පත්වීම. මේ බිය දිය සුලියට හසුවීම වැනිය.4. **සුසුකා භය:** අසිහියෙන් පිඬු සිඟායනවිට, කාන්තවන් දැකීමෙන් රාගය ඇවිස්සී, නැවත ගිහි බවට පත්වීම. මේ බිය චන්ඩ මසුන්ට හසුවීම වැනිය. **බලන්න**: අංගු.නි: (2) 4 නිපාත:කේසිවග්ග: බිය සූත්‍ර 2කි, භයවග්ග:සූත්‍ර 2කි. උපග්‍රන්ථය: 5

▲**සංඝයා අනුපස්සනාකලයුතු ධම්ම -**Recollection Dhamma for the Sangha

සංඝයා අනුපස්සනා කලයුතු ධර්මතා ගැන විස්තර මෙහි පෙන්වා ඇත. **මූලාශ්‍ර:**අංගු.නි:(6 ):11නිපාත: සාමඤ්ඤ වර්ගය,11.3.1 සිට 8 දක්වා සූත්‍ර, පි.704, EAN: 11: Elevens, III Similarity p.577.

▲**සංඝයාගේ අනුකම්පාව-**Compassion of the Sangha: සංඝයා ගිහියන්ට අනුකම්පාවෙන් කටයුතු කළයුතුවේ.සංඝයා, ගිහියන් පිළිබඳව පස් ආකාරයකින් අනුකම්පාවෙන් කටයුතු කරන අන්දම පෙන්වා ඇත. **බලන්න**: අනුකම්පාව **මූලාශ්‍ර**:අංගු.නි: ( 3 ): 5 නිපාත: 5.5.4.5 අනුකම්පක සූත්‍රය, පි. 450, EAN: 5: 235.5, Compassionate, p. 309.

▲ **සංඝයාට අවවාද අනුසාසනා-** Advice to the Sangha: * **ආචාරශීලිව හැසිරීම**. **බලන්න**: ආචාරශීලි බව, අංගු.නි: (3): 5 නිපාත: ථෙරවග්ග: 5.2.4.5 අකන්ඛම සූත්‍රය, පි. 202. * **භාවනාව වඩාගැනීම**: **බලන්න**: සංයු.නි: (4 ): සළායතනවග්ග:අසංඛත සංයුත්ත, 9.1.1සූත්‍ර, පි. 659. * **පබ්බජා දස ධර්මය** නිතර මෙනෙහි කිරීම. **බලන්න:** පබ්බජා දස ධර්ම * **දෙවලොක සැප නොපතා** නිවන පිණිස කටයුතු කිරීම: **බලන්න**: අංගු.නි: (1 ): 3 නිපාත: 3.1.2.8 දේවලෝකඋත්පත්ති සූත්‍රය, පි. 254 * **බිඳුන**

**සංඝයා එකමුතුකිරීම**. එම අනුසස දෙව්ලොව සැපට හේතුවේ. **බලන්න:** දේවලෝක.

▲ **සංඝයාට ආරක්ෂාව** -Protections for the Sangha: සංඝයාට යහපත් ලෙසින් ධර්ම මාර්ගය වඩාගැනීමට ආරක්ෂාව ලබාදෙන කරුණු නාථකරණ ධර්මයන්ය**. බලන්න**: නාථකරණ ධර්ම **මූලාශ්‍ර**: අං.ගු.නි: (6 )10 නිපාත, නාථ වග්ග, 10.1.2.7 නාථකරණ සූත්‍ර 2කි, පි.72.

▲ **සංඝයාට ආහාර ගැන උපදෙස් -** Advice to Sangha on food: **1) ලටුකිකොපම සූත්‍රය**ට අනුව සංඝයා උදෑසන, දහවල හා සවස දානය වැළඳූබව දක්වා ඇත. බුදුන්වහන්සේ ඔවුනට දිවාකල විකල්බෝජනය අතහැරීමට උපදෙස් දුන්විට සංඝයා බුදුන් වහන්සේ කෙරෙහි ඇති ගෞරවය නිසා එම නියමය බාරගත්හ. මේ ගැන භික්ඛු බෝධි හිමිගේ සටහන:**බලන්න:** EMN: note: 671, p.1126. **මූලාශ්‍ර:** ම.නි (2 ) 2.2.6 ලටුකිකොපම සූත්‍රය, පි. 206, EMN: 66 Laṭukikopama Sutta- The Simile of the Quail,p.514.

**2) රාත්‍රී භෝජනය අතහැරීම පිළිබඳව බුදුන් වහන්සේ සංඝයාට මෙසේ වදාළහ:** 'මහණෙනි, මම රාත්‍රී භෝජනයෙන් වැලකී සිටිමි. එමනිසා මම නීරෝගබව, කයේ සැහැල්ලු බව හා කායබලය සුඛ විහරණය ඇතිව වාසය කරමි. ඔබද රාත්‍රී භෝජනයෙන් වැලකී එම සුව පහසුව ලබාගන්න'. සංඝයා බුදුන්වහන්සේගේ අවවාදය පිළිගත්හ. **සටහන**: අස්සජි හා පුන්බ්බසුක යන භික්ෂූන් දෙදෙනා එම අවවාදය පිළි නොගන්නා ලදී. **බලන්න**: උපග්‍රන්ථය:4 **මූලාශ්‍ර**: ම.නි ( 2 ) 2.2.10 කීටාගිරි සූත්‍රය, පි. 252, EMN: 70: Kīṭāgiri Sutta, p. 536.

▲**සංඝයා උතුම්බව**-Noble Sangha: ශීල,සමාධි ප්‍රඥා සම්පන්න, විමුක්තිය හා විමුක්ති ඥාන දර්ශනය සම්මපන්න උතුම් සංඝයා ඇසුරු කිරීම නිසා බොහෝ අනුසස් ලැබේ. **මූලාශ්‍රය:** සංයු.නි: (5-1) මහාවග්ග: බොජ්ඣංගසංයුත්ත: සීල සූත්‍රය, පි.174.

▼**සංඝයා සතු උතුම් ගුණ**

සංඝයාගේ උතුම් ගුණ බුදුන් වහන්සේ මෙසේ පෙන්වා ඇත:

**"...මහණෙනි, මේ පිරිස ප්‍රලාප රහිතය...නිෂ්ප්‍රලාපය, නිර්මලය, ශිලආදිවූ හරයේ පිහිටා ඇත...එබඳු පිරිසක් ලෝකයෙහි දකින්නට දුර්ලභය...මේ පිරිස ආහුනෙය්‍යය, පාහුනෙය්‍යය, දක්ඛිනෙය්‍යය, අංජලීකරණීයය, ලෝකයට අනුත්තර පුණ්‍ය කෙතකි...මෙබඳු පිරිසකට අල්ප ලෙසින් දෙන දානය, විපාක ලෙසින් මහත්වේ, මහා කොට දෙන දානය, විපාක ලෙසින් බහුතරවේ ...යම් පිරිසක් දැකීමට මාර්ග උපකරන ගෙන, යොදුන් ගණනක් මග ගෙවා යන්නේද, මෙබඳු පිරිස, එලෙසින් දුර ගෙවා දැකීමට සුදුසුය..."**. **මූලාශ්‍රය:** අං.ගු.නි: (2): 4 නිපාත: බ්‍රාහ්මණවග්ග:4.4.4.10 භික්ඛුසංගපොමන සූත්‍රය, පි.375.

▲**සංඝයාට උපසම්පදාව**-Higher ordination of Sangha: සංඝයාට උපසම්පදාව ලබාදීමට, වැඩිහිටි භික්ෂුවක් තුළ තිබියයුතු ගුණාංග මෙහි පෙන්වා ඇත. **මූලාශ්‍ර**: අං.ගු.නි: (6 )10 නිපාත,උපාලි වග්ග, 10.1.4.4. උපසම්පදා සූත්‍රය,පි. 154, EAN: 10:IV,34.4. Full Ordination, p. 508.

▲ **සංඝයායාගේ කීකරුබව-**Obedience of the Sangha: සූත්‍ර දේශනාවන්හි බොහෝ තැන, සංඝයා බුදුන් වහන්සේගේ අවවාද අනුසාසනා කීකරු ලෙසින් පිලිගත් බව පෙන්වා ඇත. ප්‍රථම බෝධියේ සංඝයා (පළමු කාලයේ බුදුන් වහන්සේ වෙතින් පැවිද්ද ලත් අය), බුදුන් වහන්සේගේ අවවාද අනුසාසනා එලෙසින් පිළිගෙන කීකරුව කටයුතු කළ නිසා, ඔවුන් ඒකාන්තයෙන්ම, බුදුන් වහන්සේගේ සිත්ගත්හ. එනිසා ඔවුන්ට දීර්ඝ වශයෙන් අනුසාසනා කිරීම අවශ්‍යාවුවේ නැත.

**'ඒ භික්ෂූන්ට, මා විසින් කළයුතු වුවේ සිහිය ඉපදවීම පමණක්ය'** යි බුදුන් වහන්සේ වදාළහ. **සටහන්**: * මෙහිදී පෙන්වා ඇත්තේ එක්වේල භෝජනය පිලිබඳ බුදුන් වහන්සේගේ අනුසාසනය සංඝයා පිළිගැනීම ගැනය. ** එම කරුණ පැහැදිලි කිරීම පිණිස යොදාගෙන ඇත්තේ **අශ්වරථය උපමාවය**. සතර මහා සංධියක, මනාව පුහුණුකළ අශ්වයන් යෙදූ රියක් ඇත. අශ්වයන් දමනය කිරීමේ ශූර පුද්ගලයෙකුට, එම රියට නැගී ඕනෑම දිසාවකට අසුන් මෙහෙවිය හැකිය. එලෙස, මානව පුහුණු සංඝයාට, බුදුන් වහන්සේ අවවාදයක් දුන් පමණින්ම ඔවුන් එය පිළිගනිති. **බලන්න**: උපග්‍රන්ථය:5 **සටහන**: මේ සූත්‍රය දේශනා කිරීමට හේතුවුවේ, මෝලියඵහගුණ භික්ෂුව ගේ හැසිරීම ගැනය. ඔහු බුදුන් වහන්සේ වදාළ අවවාද පිළිනොගත්හ, පසුව පැවිදි බව අත්හළහ. **බලන්න**: උපග්‍රන්ථය: 4 **මූලාශ්‍රය:**ම.නි: (1): ඔපම්මවග්ග: 1.3.1 කකචූපම සූත්‍රය, පි.328.

▲**සංඝයාගෙ කුසල ධර්ම පිරිහීම දියුණුවීම-**Decline & growth of wholesomeness of the Sangha: සංඝයාගේ කුසල ධර්ම පිරිහීමට හා දියුණුවීමට බලපාන කරුණු මෙහි විස්තරකර ඇත. **මූලාශ්‍ර**:අංගු.නි:(6 ):10 නිපාත: සචිතත වග්ග, 10.2.1.3.ඨිති සූත්‍රය, පි.200, EAN: 10: 53.3.Standstill,p.513.

▼ **කුසල ධර්ම වැඩීමට උපදෙස්**: මෙහිදී සැරියුත් තෙරුන් සංඝයාට කරන ලද අනුසාසනා විස්තරය දක්වා ඇත.

**මූලාශ්‍ර**: අංගු.නි:(6 )10-නිපාත, යමක වග්ග, 10.2.2.7. පඨම නළකපාන සූත්‍රය, පි.248 හා 10.2.2.8. දුතිය නළකපාන සූත්‍රය, පි.254, EAN:10: II Pairs.67.7 Nalakapana -1, p. 519 & 68.8. Nalakapana -2, p. 520.

▲ **සංඝයාට කැප පානවර්ග-** Allowable drinks for the Sangha: බුදුන්වහන්සේ සංඝයාට කැපයයි වදාළ පාන (ගිලන්පස) -යුෂ: අඹපැන්, දඹ පැන්, ඇට කෙසෙල් පැන්, මස් කෙසෙල් පැන්, මීපැනි, මිදිපැන්, ඕලු පැන්, බොරලඑදමුනු පැන්. ධාන්‍ය එලරස හැර සියලු එලරස, පිසූ පලාකොළරස හැර දිය මුසුකොට මිරිකාගත් කොළරස, මීපුප් හැර සියලු මල්රස, උක්ඉස්ම.

**" අනුජානාමි භිකඛවෙ, අටඨපානානි: අමබපානං ජමබුපානං චොචපානං මොචපානං මධුපානං මුදදිකපානං සාලුකපානං ඵාරුසකපානං...සබබං ඵලරසං ඨපෙතවා ධඤඤ ඵලරසං, සබබං පතතරසං ඨපෙතවා ඩාකරසං... සබබං පුපඵරසං ඨපෙතවා මධුක පුපඵරසං...උචඡුරස...'** **මූලාශ්‍රය**:වින.පි: මහාවග්ග පාළිය-2: භේසජ්ජකන්ධය:43 ඡෙදය, පි.108.

▲ **සංඝ ගුණ-**Qualities of the Sangha: තෙරුවන් සරණ යන බොදු ශ්‍රාවකයන් සංඝ ගුණ මෙසේ සජ්ජායනා කරති:

**"සුපටිපන්නො භගවතො සාවකසඞ්ඝො, උජුපටිපන්නො භගවතො සාවකසඞ්ඝො, ඤායපටිපන්නො භගවතො සාවකසඞ්ඝො, සාමීචිපටිපන්නො භගවතො සාවකසඞ්ඝො යදිදං චත්තාරි පුරිසයුගානි අට්ඨපුරිසපුග්ගලා. එස භගවතො සාවකසඞ්ඝො ආහුණෙය්‍යො පාහු ණෙය්‍යො දක්ඛිණෙය්‍යො අඤ්ජලීකරණීයො අනුත්තරං පුඤ්ඤක්ඛෙත්තං ලොකස්සාති".**

**සටහන:** 1. **සුපටිපන්නය (** බ්‍රහ්මචරියා පිළිවෙතට ඇතුළුවී ඇත) 2. **උජුපටිපන්නය** (මධ්‍යම පටිපදාව නම්වූ ඍජු පිළිවෙතට ඇතුළුවී ඇත)3. **න්‍යායපටිපන්නය (**පටිච්චසමුප්පාද න්‍යාය පිළිපැදීමට ඇතුළුවී ඇත) 4. **සාමීචිපටිපන්නය** (සසරදුක නැතිකරණ පිළිවෙතට ඇතුළුවී ඇත- බෝධිපාක්‍ෂ ධර්මතා අනුගමනය කරති. සතර පුරුෂ යුගවූ, අෂ්ටපුද්ගලවූ (සතරමග ඵල ලැබූ) ඒ සංඝයා 5. **ආහුණෙය්‍ය** ( දුර බැහැර සිට පුද පූජා ගෙනවිත් පූජා කිරීමට සුදුසුය), 6. **පාහුණෙය්‍ය** ( ආගන්තුක සත්කාරයට සුදුසුය), 7. **දක්ඛිණෙය්‍ය** (දාන මාන පූජාකිරීමට සුදුසුය) 8. **අංජලිකරණීය** (දෙඅත් මුදුනේ තබා නමස්කාර කිරීමට සුදුසුය), 9. **අනුත්තරවූ පුණ්‍ය කෙතකි** ( සංඝයා, ලෝකයාට උසස් පින් ගෙනෙදෙන කෙතක් බඳුය. එතුමන්ට කරන පූජා, කෙතක වැපිරූ ධාන්‍ය මෙන් මහා ඵල ලබාදේ) ( The Saṅgha of the Blessed One's disciples is practicing the good way, practicing the straight way, practicing the true way, practicing the proper way; that is, the four pairs of persons, the eight types of individuals—this Saṅgha of the Blessed One's disciples is worthy of gifts, worthy of hospitality, worthy of offerings, worthy of reverential salutation, the unsurpassed field of merit for the world) **සටහන්**: * ආහුනෙය්‍ය,පාහුනෙය්‍ය, දක්ඛිණෙය්‍ය,අංජලිකරණීය, ලෝකයාට අනුත්තර පුණ්‍යකෙතක් යන ගුණ ඇතිවීමට සංඝයාට දක්‍ෂතා 4 ක් ඇතිවිය යුතුය. 1) ස්ථාන කුසලය ඇතිවීම දුර පිලිබඳ කුසලය ඇතිවීම **3)** දක්ෂ කුරුමාණම් කාරයෙක් වීම 4) මහා සෙනගක් බිඳලීමට දක්‍ෂවීම. **බලන්න:** යොධාජීව, අංගු.නි: (1): 3 නිපාත: යොධාජීවවග්ග: 3.3.4.1 සූත්‍රය, පි. 550. **විස්තර පිණිස **බලන්න**: ආහුනෙය්‍ය ආදී ගුණ. **මූලාශ්‍ර:** අංගු.නි: (6): 11 නිපාත: අනුසතිවග්ග: 11.2.1 & 11.2.2 මහානාම සූත්‍ර, පි. 654, 11.2.3 නන්දිය සූත්‍රය, පි.658, EAN: 11: Recollection: 11.1 Mahanama, 12.1 Mahanama (2), p.570, 13.3. Nandiya, p.571.

▼ **සංඝයාගේ ගුණ මහිමය** මෙහි දක්වා ඇත.: **මූලාශ්‍රය:** අංගු.නි: (5): 8 නිපාත: ආජඤ්ඤ සූත්‍රය, පි. 90,EAN:8: 13.3. Thoroughbred, p 420.

▼ **සංඝයාට ඇති ගුණ 5** ක් පෙන්වා දුන් බුදුන් වහන්සේ වදාළේ, එමගුණ ඇති භික්ෂුව, ඛත්තිය රජු මෙන් කැමති දිසාවක පහසු විරණය ඇතිව වාසය කරන බවය: 1) පාතිමොක්ඛ සංවර ශීලය තිබීම 2) බහුශ්‍රැතබව 3) ප්‍රධන් විරිය ඇතිබව 4) ප්‍රඥාව තිබීම 5) එම සිව් කරුණු මගින් ඔහු විමුක්තිය ලබාගැනීම. මේවා විමුක්තිය ලැබූ රහතුන් සතු ගුණයන්ය. **බලන්න**: ඛත්තිය රජ. **මූලාශ්‍රය**: අංගු.නි: (3) 5 නිපාත: රාජවග්ග: ඛත්තිය රාජ සූත්‍රය, පි.268,

▲**සංඝයාගේ ගති -**Sangha behavior: ගති පැවතුම් අනුව සංඝයා තුන් ආකාරය:1) **නිරාශ සංඝයා:** ශීලසම්පන්න නොවූ, ධර්මයට අනුකූල හැසිරීම නැති මොහු, අරහත්වයට කවදා පත්වෙම් ද යන ආශාව නොමැත. 2) **ආශංස නිරාශ සංඝයා:** ශීලසම්පන්න වූ, ධර්මයට අනුකූල හැසිරීම ඇති මොහු, අරහත්වයට කවදා පත්වෙම් ද යන ආශාව ඇතිව සිටි 3) **විගතාශ සංඝයා:** අරහත්වය ලැබූ උතුමා, ඔහුගේ ආශාවන් හැම සන්සිඳී ඇත. **මූලාශ්‍ර:**අං.ගු.නි: ( ): 3 නිපාත: 3.1.2.4. සූත්‍රය, පි. 246 , EAN:3: 13.3  A Bhikkhu, p.82.

▲ **සංඝ දානය-** Offerings to Sangha: සංඝ දානය ලෙසින් පෙන්වා ඇත්තේ බුදුන් වහන්සේ ප්‍රමුකකොටගෙන සංඝයාට පිරිනමන දානයය. සංඝ දානය පිරිනමන විට තිබිය යුතු අංග 6 ක් මෙහි පෙන්වා ඇත: **බලන්න**: දානය **මූලාශ්‍ර:** අං.ගු.නි: (4 ): 6 නිපාත: 6.1.4.7 ඡළාඞගදාන සූත්‍රය, පි. 112, EAN:6: 37.7 Giving, p. 332.

▼ **ගුණ ධර්ම 10ක්** සපුරා ඇති භික්ෂුව, සිව්පසය දීමට, නමස්කාරය ලැබීමට සුදුසු බව මෙහි දක්වා ඇත: 1 සිල්වත්බව 2 බහුශ්‍රැතබව 3 කල්‍යාණමිත්‍රයන් සිටීම  4 සම්මා දිට්ඨිය තිබීම හා සම්මා දර්ශනයෙන් යුතුවීම 5 විවිධවූ ඉද්ධිබල තිබීම 6 දිවකණ තිබීම 7 පරසිත් දැනගැනීම 8 පෙර ජාති දන්නා නුවණ තිබීම 9 දිවැස් තිබීම 10 සියලු ආසව ක්‍ෂයකර විමුක්ති සුවය විඳීම. **මූලාශ්‍ර**:අං.ගු.නි: (6):10 නිපාත, 10.2.5.7. ආහුනෙය්‍ය සූත්‍රය,පි.384, EAN:10: V,97.7 Worthy  Of Gifts. P.537.

▲**සංඝයා හා ධම්ම විනය-** Sangha & the Dhamma & Discipline: සංඝයා ධම්ම විනයේ දියුණුව පිණිස පහ කරගත යුතු කරුණු ගැන මහා මුගලන් තෙරුන් වදාළ අවවාද මෙහි පෙන්වා ඇත. **මූලාශ්‍ර**:අං.ගු.නි: (6) 10 නිපාත,ථෙර වග්ග, 10.2.4.4. ව්‍යාකරණ සූත්‍රය,පි.304, EAN:10:IV-The Elders, 84.4 Declaration, p. 526.

▼ **සංඝයා ධම්ම විනයේ අදක්ෂ හා දක්ෂ වීම**

මේ පිලිබඳ බුදුන් වහන්සේ වදාළ කරුණු 11ක් මෙහි විස්තරාත්මකව පෙන්වා ඇත. **මූලාශ්‍ර**: අං.ගු.නි: (6)10 නිපාත: අනුසති වගග,11.2.7 ගෝපාලක සූත්‍රය,පි.682, EAN: 11: II Recollection, 17.7 The Cowherd,p.574.

▲**සංඝයා ධර්මයේ දක්ෂබව හා අදක්‍ෂබව-** Skillful & unskillful of the Sangha in Dhamma: ධර්මයේ දක්‍ෂ නොවීම නිසා, භික්ෂුවකගේ පරිහාණිය ඇතිවෙන බවද, දක්ෂ විම නිසා ප්‍රගතිය ඇතිවෙන  බව මෙහි පෙන්වා ඇත. **මූලාශ්‍ර**: අං.ගු.නි:(6 )10 නිපාත, සචිත්ත වග්ග, 10.2.1.5. පරිහානසූත්‍රය, පි.212, EAN: 10: 55.5 Decline, p. 515.

▲ **සංඝයාට නින්දා කිරීම**- Insulting the Sangha: යම් මහණ කෙනෙක්, සෙසු සංඝයාහට නින්දා කරන්නේ නම් එය ආර්ය උපවාදයක්ය. ඒ නිසා නරක විපාක විඳීමට සිදුවේ. **බලන්න**: ආර්ය උපවාදය. **සටහන**: කෝකාලික භික්ෂුව, අගසව් දෙනමට නින්දා අපහාස කිරීම නිසා, නිරයේ පහළවිය. **බලන්න:**  අං.ගු.නි: (6): 10 නිපාතය: 10.2.4.9 කොකාලික සූත්‍රය, පි. 332, EAN: 10: 89.9 Kokālika, p.530, ඛු.නි:සුත්ත නිපාත: 3-

10: කෝකාලික සූත්‍රය, පි.220. **මූලාශ්‍ර**: අංගු.නි: ( 3 ): 5 නිපාත: 5.5.2.1 අකොකාසක සූත්‍රය, පි. 428, EAN: 5: 211.1 One who insults, p. 306.

▲ **සංඝයාට නිස්සයදීම-** dependence to Sangha: නිස්සය යනු වැඩිහිටි - ජ්‍යේෂ්ඨ භික්ෂුව, තමන් සමග සිටින කණිෂ්ට සංඝයාට යැපීම සැලසීමය. නිස්සය ලබාදීමට සුදුසු, භික්ෂුවක් තුළ තිබියයුතු ගුණාංග මෙහි පෙන්වා ඇත. **මූලාශ්‍ර:** අංගු.නි: (6)10 නිපාත: උපාලි වග්ග, 10.1.4.5. නිස්සය සූත්‍රය,පි. 156 , EAN: 10: IV,35.5. Dependence, p. 508.

▲ **සංඝාණිකාරාමය-** Sanghanikaramaya: සංඝාණිකාරාමය ලෙසින් පෙන්වා ඇත්තේ සංඝයා ඔවුනොවුන් නිතර ඇසුරු කරමින්, එහි නියැලී සිටීමය. එවැනි හැසිරීම, මාර්ගය වඩාගැනීමට බාධාවක්වේ. **මූලාශ්‍රය:** අංගු,නි: (4): 6 නිපාත:අනාගාමිවග්ග:6.2.2.4 සංඝාණිකාරාම සූත්‍රය, පි.240.

▲**සංඝයා හා පාතිමොක්ඛ-** Sangha & Patimokkha: සංඝයා, පාතිමොක්ඛ පිලිබඳව දතයුතු කරුණු මෙහි පෙන්වා ඇත. **මූලාශ්‍ර**: අංගු.නි: (6)10 නිපාත:උපාලි වග්ග, 10.1.4.1. උපාලි සූත්‍රය,පි. 152, හා 10.1.4.2. පාතිමොකඛටඨපන සූත්‍රය,පි.152, EAN:10:Upali,31.1. Upali-1 & Suspending, p. 508.

▲ **සංඝයාගේ පාපී ගුණ-** Evil qualities of the Sangha: බුදුන් වහන්සේ **කපුටා උපමාව** යොදාගනිමින් වදාළේ, සංඝයාට ඇති පාපීගුණ, කපුටන්ට ඇති අවගුණ හා සමාන බවය. කපුටා-කවුඩා ගේ අවගුණ: විනාශකාරී හා අවිනීතබව (destructive & impudent), ඉතා කෑදරබව හා බොහෝ බඩගිනි ඇතිබව (ravenous & voracious), කුරිරු බව හා අනුකම්පා රහිත බව (cruel & pitiless), දුබලබව හා රළු කටහඬ ඇතිබව (weak & raucous), අවුල් සිත් ඇතිබව හා රැස්කරගැනීමට කැමතිබව (muddle-minded & acquisitive). **බලන්න:** උපග්‍රන්ථය:5. **මූලාශ්‍ර**: අංගු.නි: (6 ) 10 නිපාත, ආකඩ්ඛ වග්ග, 10.2.3.7. කාකසූත්‍රය,පි.292 හා මහා වග්ග, 10.1.3.3. කාය සූත්‍රය,පි. 100, EAN:10: 77.7. The Crow, p. 525, The Great Chapter, 23.3. Body, p. 500

▲ **සංඝයාගේ පහසුවිහරණය**- Sangha dwelling at ease: පහසු විහරණයෙන් වාසය කිරීම ලෙසින් පෙන්වා ඇත්තේ තමන් සමග සිටින සෙසු සංඝයා කෙරෙහි සතර බ්‍රහ්මවිහරණය ඇතිව, ඔවුන් තුල ඇති ආරිය දිට්ඨිය තමන් තුල පිහිටුවා ගෙන සුවයෙන් වාසය කිරීමය.: **සටහන**: සංඝයා සුවයෙන් වාසය කිරීමට හේතුවන තවත් කරුණු මෙහි විස්තර කර ඇත. **බලන්න:** 5නිපාත: 5.3.1.6 ආනන්ද සූත්‍රය, පි.234. **මූලාශ්‍රය:** අංගු.නි: (3): 5 නිපාත:ඵාසුවිහාරවග්ග: 5.3.1.5 ඵාසුවිහාර සූත්‍රය, පි.232.

▲ **සංඝයා පරිපූර්ණවීම-**Full perfection of the Sangha: සංඝයා පරිපූර්ණත්වයට පත්වීමට අවශ්‍ය ගුණ මෙහි විස්තර කර ඇත. **මූලාශ්‍ර**:අංගු.නි: ( 6):10 නිපාත: ආනිසංස වග්ග,10.1.1.8 සද්ධ සූත්‍රය හා 10.1.1.9. සන්ත විමොක්ඛ සූත්‍රය පි.50, EAN:10: I Benefits, 8.8. Faith, p. 494 &8.8. Faith, 9.9 Peaceful, p. 494.

▲**සංඝයාගේ පිරිහීම-**Reasons for the decline of the Sangha: සබ්‍රම්සරුන්හට නින්දා කිරීම නිසා පිරිහීම ඇතිවේ **බලන්න**:

ආරියඋපවාදය. එබඳු භික්ෂුවකටට සිදුවිය හැකි පරිහාණ 11කි: 1) ආධ්‍යාත්මික වශයෙන් මෙතක් ලබානොගත් දේ ලබාගැනීමට නොහැකිවේ 2) කිසියම් විශේෂතාවයක් ලබාසිටියේ නම් (මාර්ගයේ) ඉන් පිරිහීමට පත්වේ 3) ඔහුගේ යහපත් ධර්මගුණ ඔපවන්නේ නැත 4) තම ගුණ පිළිබඳව ඔහු අධිතක්සේරු කරයි 5) බ්‍රහ්මචරියාව උකටලිව ගත කරයි 6) ඔහු අතින් කැළැල් සහිත වැරදි ක්‍රියා සිදුවේ 7) ආධ්‍යාත්මික පුහුණුව අතහැර ගිහිබවට පත්වේ 8) දරුණු රෝගයක් වැළඳේ 9) මානසිකත්වය අවුල්වී උන්මාදයට පත්වේ 10) සිහි විකල්ව මරණයට පත්වේ 11) මරණින් මතු දුගතියේ උපත ලබයි. **මූලාශ්‍ර**: අංගු.නි: (6) 11නිපාත, 1 නිසසය වගග,11.1.6.ව්‍යසන සූත්‍රය, පි.624, EAN:11: Dependence, 6.6 Disaster, p.567.

▼**පරිහාණිය වලක්වා ගැනීම** පිණිස සංඝයා පුහුණු කරගතයුතු ධර්මතා: 1) ශ්‍රද්ධාසම්පන්න වීම, අශ්‍රද්ධාව පහකිරීම. 2) ශීලසම්පන්න වීම, දුස්සීලය පහකිරීම 3 ) බහුශ්‍රැත වී, අල්පශ්‍රැත බව පහකර ගැනීම. 4 කීකරු අවවාද ඉවසන සුළු (සුවච) බව, අකීකරු බව පහකරගැනීම. 5) කල්‍යාණ මිත්‍ර සේවනය, පාපමිත්‍රයන්දුරුකිරීම. 6) විරිය ආරම්භකිරීම, අලස(කුසිත) බව පහකිරීම. 7 සතිය ඇතිකරගැනීම, මුලාවූ සිහිය පහකිරීම. 8) සන්තුෂ්ටිය ඇතිකර ගැනීම අසන්තුෂ්ටිය පහකර ගැනීම. 9) අල්ප චේතනා ඇතිකර ගැනීම, පාපී චේතනා පහකිරීම. 10) සම්මා දිට්ඨියට පැමිණීම, මිථ්‍යාදිට්ඨිය පහකිරීම. **මූලාශ්‍ර**: අංගු.නි: (6): 10 නිපාත: ථෙර වග්ග: 10.2.4.2 ආනන්ද සූත්‍රය,පි.296, EAN:10: IV-The Elders, 82.2. Ananda, p. 526.

▼ **සංඝයා සද්ධර්මයේ පිරිහීම හා වැඩීම**: පංච ධර්මය (ශ්‍රද්ධාව, වීරිය, හිරි, ඔතප්ප, ප්‍රඥාව) නොමැති සංඝයා, සසුනේ පිහිටන්නේ නැත (චුතවේ) යයි මෙහි දක්වා ඇත. එහෙත්, ඒ ගුණ ඇති මහණ සද්ධර්මයේ පිහිටාසිටි. **සටහන**: 5.1.1.9 හා 10 අගාරව සූත්‍රයන්හි, බුදුන් ඇතුළු ගරුකලයුතු උතුමන්ට ගරු නොකරන, පංච ධර්මය නැති පිරිස ධර්මයේ පිරිහෙන බව දක්වා ඇත.

**මූලාශ්‍ර:** අංගු.නි : (3 ): 5 නිපාත:සේඛබලවග්ග: 5.1.1.8 චවන සූත්‍රය, පි.32.

▲ **සංඝයා ගෙ පුහුණුව**-Training of the Sangha: සංඝයා ගේ පුහුණුව-ශික්ෂණය පිළිබඳව මෙහි විස්තරාත්මකව පෙන්වා ඇත. **මූලාශ්‍ර**: අංගු.නි:( 6)10 නිපාත, උපාලි වග්ග -2, 10.2.5.9. උපාලි සූත්‍රය,පි.390 , EAN: අඕ: V,99.9 Upaali, p. 538.

▼ **සංඝයා ශික්ෂාව** අත්හැරීමේ විපාක හා ශික්ෂාව පවත්වා ගැනීමේ යහපත මෙහි විස්තර කර ඇත. **බලන්න: ශික්ෂාව මූලාශ්‍ර:** අංගු.නි : (3 ): 5 නිපාත:සේඛබලවග්ග: 5.1.1.5 සික්ඛාපච්චක්ඛාන සූත්‍රය, පි.28.

▼**සංඝයා පුහුණුවීමේ අනුසස්**: බුදුන් වහන්සේ මෙසේ වදාළහ:

'... මගේ ශ්‍රාවකයන්, අප්‍රමාදව, උනන්දුවෙන්, දැඩි අදිටනින් යුතුව, දිගුකලක් (වසර 10ක්...9ක්... මාස 1 ක්... ආදීවශයෙන්) හෝ එක් දිනක්, එක් රාත්‍රියක්..ඔවුන්ගේ පුහුණුව, මගේ උපදෙස් වලට අනුකූලව කරගන්නේ නම් ඔවුන්ට විශේෂවූ සතුටක්... ඉතා දීර්ඝ කාලයක් ( වසර

100ක්... වසර 10000ක් ...දස මිලනයක්...) විදීමට හැකිවේ; ඔවුන් අනාගාමී...සකදාගාමී හෝ නිසැකවම සෝතාපන්න වේ'. **මූලාශ්‍ර:** අංගු.නි: (6)10 නිපාත: අකෝෂ වග්ග, 10.1.5.6.ශාක්‍ය සූත්‍රය,පි.176,EAN:10: V,46.6. Sakyans.p.511.

▲**සංඝයා බුද්ධ දරුවෝය-**Sangha is children of The Buddha: බුදුන් වහන්සේගේ පුත්‍රයන්-ශාක්‍යපුත්‍ර (බුද්ධ පුත්‍ර, බුද්ධ දියණිය)ලෙසින් සංඝයා හඳුන්වයි. බුදුන් වහන්සේ මෙසේ වදාළහ:

**"ඔබ වනාහි මගේ මුඛයෙන් උපන්- ධර්මජවූ, ධර්මයෙන් නිර්මිතවූ, ධර්මය දායාද කොට ඇති, ආමිසය දායාද කොට නැති ඖරස පුත්‍රයෝය"** **මූලාශ්‍රය:**බු.නි: ඉතිවුත්තක: 4.1.1. බ්‍රාහ්මණ සූත්‍රය, පි.485.

▲**සංඝයා බුදුන්වහන්සේට ලංවීම හා දුරවීම** - Sangha who are near or far to The Buddha: පස්කම් සැපයේ ඇලුන, ඉන්ද්‍රිය අසංවර වූ අයහපත් ගුණ ඇති සංඝයා, බුදුන් වහන්සේ සමීපයේ සිටියද ඔවුන් බුදුන් වහන්සේට ලංවී නැත. එහෙත්, ඉතා දුරක සිටියද කෙළෙස් වලින් මිදුන සංඝයා බුදුන් වහන්සේට සමීපව වාසය කරන බව මෙහි පෙන්වා ඇත. **මූලාශ්‍රය:**බු.නි: ඉතිවුත්තක: 3.5.3 සංඝාටිකණ්ණ සූත්‍රය,පි.469

▲**සංඝයාට බාධක-** Obstacles for the Sangha: භික්ෂුවක් තමන් සම්පූර්ණ නොකරගත් ශීලය, නොලත් මාර්ගඵල, නොලත් සමාධි, තමන් ලැබූබව ප්‍රකශ කිරීම ධර්ම මාර්ගයට බාධාවකි, ඒ නිසා පරිහාණියට පත්වන බව මෙහි පෙන්වා ඇත. **මූලාශ්‍රය:** අංගු.නි: (6): 10 නිපාත: 10.1.3.4. මහාචුන්ද සූත්‍රය, පි.106 හා 10.2.4.6. අධිමාන සූත්‍රය, පි.316.

▲ **සංඝයාගේ මිත්‍රයා-**Friend of the Sangha: කරුණු 7 ක් ඇති මහණ, සංඝයා සේවනය කලයුතු මිත්‍රයෙකි, එමගින්, යහපත් ඵල ඇතිවේ: 1) ප්‍රියබව 2) ගරුබව 3) සම්මානියබව 4) කතාවේ දක්ෂබව 5) අන්‍යයන් කතා කරනවිට ඉවසීමෙන් සවන් දෙන ගතිය 6) ගැඹුරු ධර්ම කතා පැවසීම 7) වැරදි, අකුසල ක්‍රියා කිරීමට අනුන් නො පෙළඹීම.

**මූලාශ්‍රය**:අංගු.නි: (4): 7 නිපාත:දේවතාවග්ග: 7.1.4.6 භික්ඛුමිත්ත සූත්‍රය, පි.350.

▲**සංඝයා මහත්ත්‍වයට පත්වීම-** Sangha achieving greatness: සංඝයා මහත්ත්‍වයට පත්වීම යනු මාර්ග ඵල ලබාගැනීමය. එවිට, බුදුන් වහන්සේ පවා සංඝයාහට ගරුකරනබව මෙහි දැක්වේ. **මූලාශ්‍ර**: අංගු.නි: ( 2 ): 4 නිපාත: 4.1.3.1. ප්‍රථම උරුවෙල සූත්‍රය, පි. 64, EAN: 4:1.21 Uruwela, p. 155.

▲**සංඝයා හා මුදල් පරිහරණය -** Sangha & Using of money: සංඝයාට රන් රිදී මුදල් ආදිය පරිහරණය අකැප බව මෙහි පෙන්වා ඇත. බුදුන් වහන්සේ මෙසේ වදාළහ:

"...ශ්‍රමණ ශාක්‍යපුත්‍රයන්ට රන් රිදී නොම කැපය...ඔවුන් ඒවා නො ඉවසයි...ඔවුන් ඒවා අත් හැර ඇත...". **සටහන**: රන්රිදී ආදිය පරිහරණය පස්කම් ගුණ පරිහරණයය, එවැනි අයට ශ්‍රමණ ධර්ම නොමැතිබව මෙහිදී පෙන්වා ඇත. **මූලාශ්‍රය:** සංයු.නි: (4) සළායතනවග්ග:ගාමිණිසංයුත්ත:8.1.10 මණිචූලක සූත්‍රය, පි.614.

▲ **සංඝයා- විවිධ පර්ෂද-** Sangha- different assemblies: සංඝයා ගේ හැසිරීම අනුව ඔවුන් විවිධ පර්ෂදයන්ට ගැනෙන ආකාරය මෙහි පෙන්වා ඇත. **මූලාශ්‍ර**: අංගු.නි: (1): 2 නිපාත: 2.1.5.1 -2.1.5.10 සූත්‍ර, පි. 174, EAN:2: 42.1- 51.10, Suttas, p. 64.

▲ **සංඝයාගෙ වාසස්ථාන සුදුසු බව-**Suitability of lodging for the Sangha: සංඝ වාසස්ථානය: විහාරයක, සෙනසුනක තිබිය යුතු ගුණ අංග මෙහි පෙන්වා ඇත. **මූලාශ්‍ර:** අංගු.නි: (6 )10 නිපාත, නාථ වග්ග, 10.1.2.1 සේනාසන සූත්‍රය, පි.56, EAN:10: II Protector, 11.1. Lodging, p. 495.

▲**සංඝ විනය**-Disciplinary matters for the Sangha: සංඝයාගේ විනය කරුණු විනිශ්චය-තීරණය කිරීමට සුදුසු පුද්ගලයාට තිබියයුතු ගුණාංග මෙහි දක්වා ඇත. **මූලාශ්‍ර**:අංගු.නි: (6 )10 නිපාත, උපාලි වග්ග, 10.1.4.3. උබ්බාහිකා සූත්‍රය,පි. 154, N:10:IV,33.3. Adjudication, p. 508.

▼**විනය කරුණු පිලිබඳ චෝදනාකිරීමේ පිළිවෙත** මෙහි විස්තරාත්මකව පෙන්වා ඇත. **මූලාශ්‍ර**: අංගු.නි: (6)10 නිපාත:අක්කෝෂ වග්ග, 10.1.5.4 ,කුසිනාරා සූත්‍රය,පි.168, EAN:10: V,44.4. Kusinara, p. 510.

▼ **සංඝ විනය කම්ම**: **තස්සපාපියාසිකා කර්මය** : බරපතල කර්මයක් කළ සංඝයාට පනවන විනය කර්මයකි. **මූලාශ්‍ර:** අංගු.නි: (5): 8 නිපාත: 8.2.9.10 තස්සපාපියාසිකා සූත්‍රය, 380, EAN: 5: 90.10 Behavior, p. 455.

▲**සංඝයාගේ වර්ධනයට ඇති ක්‍රමවිධිය -** The method for the growth of the Sangha: යම් භික්ෂුවක් මේ සසුනේ වර්ධනය වීමට, ප්‍රගතියක් ලැබීමට, පරිණත බවට පත්වීමට අපේක්ෂා කරන්නේනම් ඔහු විසින් දස ධර්මතාවන් වැඩිය යුතුබව මෙහිදී පෙන්වා ඇත. **මූලාශ්‍ර**: අංගු.නි: (6 )10 නිපාත: ථෙර වග්ග, 10.2.4.2 .ආනන්ද සූත්‍රය,පි.296, EAN:10: IV-The Elders, 82.2. Ananda, p. 526.

▲ **සංඝයා සාකච්ඡාවට දක්ෂවීම**- Sangha capable for discussion: සෙසු සබ්‍රහමචාරින් හා සාකච්ඡාකිරීමට සුදුසු සංඝයාට ගුණ 5 ක් තිබිය යුතු බව මෙහි පෙන්වා ඇත. **බලන්න:** සාකච්ඡා. **මූලාශ්‍රය:** අංගු.නි: (3): 5 නිපාත: ආඝාතවග්ග: 5.4.2.3 සාකච්ඡා සූත්‍රය, පි.330.

▲ **සංඝයා සැකකිරීම-**Doubting the Sangha: කරුණු 5 ක් නිසා සංඝයා ගේ චරිතය ගැන ලෝකයාට සැක ඇතිවිය හැකිනිසා ඒ කරුණු මගහැර සිටීම සුදුසු බව මෙහි පෙන්වා ඇත: මතු දැක්වෙන ආශ්‍රයන් ගෙන් වැලකි සිටිය යුතුය (නිතර නිතර එවැනි තැන් අසුරුකිරිම නොකළ යුතුය): 1) ගණිකාව 2) වැන්දඹුව 3) මහළුවූ අවිවාහක කාන්තාව 4) නපුංසක (පණ්ඩක-eunuchs) 5) මෙහෙණිය. **සටහන**: එබඳු කරුණු නිසා ආරිය බවට පත්වූ උතුමන් ගැන පවා ලෝකයා තුල සැක ඇතිවිය හැකිය. **බලන්න**:EAN: Notes: 1110, 1111. **මූලාශ්‍රය:** අංගු.නි: (3): 5 නිපාත:ඵාසුවිහාරවග්ග:5.3.1.2 සංකීත සූත්‍රය, පි.224, EAN:5: 102.2 Suspected, p.274.

▲**සංඝයාගේ සත්පුරුෂබව හා අසත්පුරුෂ බව-**Sangha: qualities of sathpurusha & asathpurusha: **අසත්පුරුෂ ලක්ෂණ** ඇති මහණ

කෙනෙක් තමාගේ උසස් කුලය (high-cast), පවුලේ ධනය(family wealth), පවුලේ බලය(family power),තමාට ඇති ප්‍රසිද්ධිය (well known) තමාට ලැබෙන **සිව්පසය** (four requisites), තමාගේ **බහුශ්‍රැත** බව (learned),**විනයධරබව** (expert in discipline),**ධර්මකථිකබව** (preacher of the Dhamma), **දුර අරණ්‍යවල වාසය** කිරීම forest dweller) හා **දුෂ්කර තාපස ව්‍රත** (ascetic practice) පිළිබඳව හා තමන් ලබාගන්නා **රූපජාන, අරූප සමාපත්ති** ආදීය පිළිබඳව උඩඟුව, සෙසු අය පහත් කර සලකයි. **සත්පුරුෂ ගුණ** ඇති මහණ කෙනෙක් ඉහත දැක්වූ කරුණු පිළිබඳව උඩඟුවන්නේ නැත, එමනිසා සෙසු අය පහත් කොට සලකන්නේ ද නැත. ධර්මය දන්නා ඔහු ලෝභ දෝස මෝහ ආදී කෙලෙස්, බාහිර කරුණු නිසා පහ කර ගත නො හැකිබව දනී. දහමට අනුව මමත්වය (identification) ඇතිතාක් තණ්හාව යට නොකළහැකිබව ඔහු අවබෝධ කර ඇත. එබඳු උසස් ගුණ ඇති සත්පුරුෂයා රූප හා අරූප සමාපත්ති ලබා, සංඥාවේදිත නිරෝධ සමාපත්තිය ලබාගනී (abides in the cessation of perception and feeling). ප්‍රඥාවෙන් සත්‍ය අවබෝධ කරගන්නා ඔහුගේ සියළු ආසව පහවේ. එබඳු මහණ කිසිම පුද්ගලයෙක් ත්‍රිවිධ මානයෙන් නොගන්නේය, එසේම කිසිදු දෙයක් නොගන්නේය, කිසිදු වස්තුවක් නොගන්නේය යයි බුදුන්වහන්සේ වදාළහ. (කිසිම දෙයකට නොඇලුන- රහතන්වහන්සේ බව).

**… අයං ඛො භික්ඛවෙ, භික්ඛු න කිඤ්චි මඤ්ඤති, න කුහිඤ්චි මඤ්ඤති න කෙනචි මඤ්ඤතී'ති. (** …this bhikkhu does not conceive anything, he does not conceive in regard to anything, he does not conceive in any way). **මූලාශ්‍ර**: ම.නි.(3): 3.2.3 සප්පුරිස සූත්‍රය, පි. 170, EMN: 113- Sappurisa Sutta, p. 820.

▼**සත්පුරුෂ සංඝයා** සම්මා මග-ආරියමග අනුගමනය කරයි. අසත්පුරුෂ සංඝයා මිථ්‍යාමග- අනාරියමග  අනුගමනය කරයි.

**මූලාශ්‍ර** :අංගු.නි (6 ):10 නිපාතය: සප්පුරිසධම්ම සූත්‍රය, පි.476, EAN: 10: V Noble-P.548.

▲**සංඝයා සොභාමානවීම-** adorn of the Saṅgha: ව්‍යක්ත, විනීත, විශාරද, බහුශ්‍රැත, ධර්මධර, ධර්මානුධර්ම ප්‍රතිපන්න සතර පුද්ගලයෝ, සංඝයා සෝභමාන කරන්නේය යයි (සඞසං සොභෙන්ති) බුදුන් වහන්සේ වදාළහ. එනම්: භික්ෂු, භික්ෂුණි, උපාසක, උපාසිකා යන සිව්පිරිස. **බලන්න**: සිව්පිරිස. **මූලාශ්‍ර:** අංගු.නි: ( 2 ): 4 නිපාත: 4.1.1.6 අප්පස්සුත සූත්‍රය, පි. 36, EAN:4: 7.7 They Adorn, p. 150.

▲ **සංඝ සමගිය හා සංඝභේදය-** Sangha harmony & division: සංඝසමගිය, බොහෝදෙනාට හිත සුව පිණිස ඇති කුසල ධර්මයකි. සංඝයා අතර සමගිය ඇතිකරන පුද්ගලයාට නිවනින් නො පිරිහෙයි, කල්පයක් දෙව්සැප ලබයි. සංඝභේදය බොහෝදෙනාට හිත සුව පිණිස නොවන අකුසල ධර්මයකි, නිවන පිණිස නොපවතී, අවීචිමහානරකයෙහි කල්පයක් දුක් විඳීමට හේතුවේ. **මූලාශ්‍ර:** ඛු.නි: ඉතිවුත්තක: 1.2.8 සංඝභේද සූත්‍රය, පි.362, අංගු.නි: (6 )10 නිපාත,  උපාලි වග්ග, 10.1.4.6.

සංඝභේද සූත්‍රය,පි. 158, හා 10.1.4.8. සංඝ සමගිය සූත්‍රය,පි.160 EAN:10: IV,37.7. Schism-1, p. 509 & 38.8. Schism-2, p. 509.

▼ **සංඝයා-භේද කිරීමේ අකුසල විපාක**: සංඝ භේදය නිසා ඇතිවන අයහපත් විපාක මෙහි පෙන්වා ඇත. **මූලාශ්‍ර**: අංගු.නි: (6 )10- නිපාත: උපාලි වග්ග, 10.1.4.9. ප්‍රථම ආනන්ද සූත්‍රය,පි.162, EAN:10: IV,39.9.Ananda,p. 509.

▼**සංඝයා සමගි කිරීමේ කුසල විපාක**: සංඝයා සමගි කිරීමේ කුසල විපාක මෙහි විස්තර කර ඇත. **මූලාශ්‍ර**: අංගු.නි:(6 )10 නිපාත: උපාලි වග්ග, 10.1.4.10. ද්විතිය ආනන්ද සූත්‍රය,පි.164, EAN:10: IV,40.10 .Ananda - 2,p. 509.

▼ **ලාභසත්කාරවලට යටවීම** නිසා දේවදත්ත සංඝභේදය කලබව මෙහි දක්වා ඇත. **මූලාශ්‍රය:** සංයු.නි: (2) : නිදානවග්ග: ලාභසත්කාර සංයුත්ත:5.4.1 සංඝභේද සූත්‍රය, පි.388.

▼**සතර අයහපත් ගුණ ඇති පව්ටු මහණ,** සංඝ භේදයෙන් සතුටුවේ යයි බුදුන් වහන්සේ වදාළහ:1.සිල්වත්නොවීම 2.මිථ්‍යා දිට්ඨිය තිබීම 3. මිථ්‍යා ආජීවය තිබීම 4. ලාභසත්කාර ආදිය ලැබීමට ඇති කැමැත්ත. **මූලාශ්‍රය:** අංගු:නි: (2) : 4 නිපාත: ආපත්තිභයවග්ග: 4.5.5.1 පාපභික්ඛු සූත්‍රය. පි.484.

▼ **සංඝයා විවාදකිරිම නිසා අසමගිය ඇතිවීම**: විවාද වලට හේතු කරුණු හා විවාද නොකිරීමේ යහපත මෙහි පෙන්වා ඇත. **මූලාශ්‍ර**: අංගු.නි:(6 )10 නිපාත: අක්කෝෂ වග්ග, විවාද සූත්‍ර,පි.166 හා 10.1.5.10 භණ්ඩන සූත්‍රය,පි. 188, EAN:10: V,41.1 Disputes & 42.2 Roots-1,509, 50.10.Arguments,p. 512.

▲**සංඝයා දිවි හානිකරගැනීම-** Sangha committing suicide: අසුභභාවනාව වඩා, නිරෝධය නොලැබූ, එහෙත්, කය ගැන මහා පිළිකුලට පත් බොහෝ සංඝයා සිය දිවි නැතිකිරීම ගැන විස්තර මෙහි දක්වා ඇත. එමනිසා සංඝයාහට ප්‍රණීත අරමුණක් ලෙසින් ගෙන ආනාපානසතිය වැඩීමට බුදුන් වහන්සේ උපදෙස් වදාළහ. **සටහන:** චන්න තෙර, වක්කලී තෙර ආදීන් බලවත් රෝගීබව නිසා දිවිහානි කරගත් බව සූත්‍ර දේශනා වල දක්වා ඇත. **බලන්න**: උපග්‍රන්ථය:1. **බලන්න**: සංයු.නි: (5-2) ආනාපානසතිසංයුත්ත:10.1.9 අසුභ සූත්‍රය, පි.128.

▲**සංඝයා සිව්පස පරිහරණය** -The 4 requisites use by the Sangha: සංඝයා පරිහරණය කරනදේ සිව්පසය. එමගින් කුසල හෝ අකුසල ඇතිවීම පිළිබඳව මෙහි පෙන්වා ඇත. **මූලාශ්‍ර**: අංගු.නි: (6 )10 නිපාත:සචිත්ත වග්ග, 10.2.1.4. සමථ සූත්‍රය, පි.204, EAN:10: 54.4 Serenity.

▲**සංඝයා සිහිපත් කළයුතු ස්ථාන 3 -** Three places that Sangha should remember: 1) තමන් ගිහිගෙයින් නික්මී පැවිදිබවට පත්වූ ස්ථානය 2) චතුසත්‍ය අවබෝධ කරගත් ස්ථානය (සෝතාපන්න බව ලැබූ ) 3) අසාව ක්ෂය කරගත් ස්ථානය (අරහත්වය ලැබූ). **මූලාශ්‍ර:** අංගු.නි: ( 1): 3 නිපාත: 3.1.2.2. සූත්‍රය, පි. 242, EAN:3: 12.2 To be remembered, p. 82.

▲ **සංඝයා ශීලසම්පන්නවීම**-Virtuous conduct of Sangha: ධර්මයේ හැසිරෙන සංඝයා ශීලසම්පන්නව වාසය කිරීම ආධ්‍යාත්මික වර්ධනය පිණිස අවශ්‍ය කරුණක් වේ. භික්ෂුවක් '**තෙර**'- වැඩිහිටි භික්ෂුවක් ලෙසින් හැඳින්වීම පිණිස අවශ්‍ය ගුණ අතරින් ශීලසම්පන්න බව එක් ගුණයකි, මෙය,සේඛ ප්‍රතිපදාව පුහුණු කරණ භික්ෂුව සතු ගුණයකි.

▼**සංඝයා ශීලසම්පන්න වන ආකාරය**: "මේ සසුනේ මහණ සිල්වත්වේයි, පාතිමෝක්ෂසංවර ශීලයෙන් සමන්විතය, ආචාරශීලිව වාසය කරයි, සුළු වරදෙහි පවා බිය දකී, ශික්ෂාපදයන්හි යහපත් ලෙසින් හික්මී සිටී".

**" ඉධ භික්ඛවෙ, භික්ඛු සීලවා හොති පාතිමොක්ඛසංවරසංවුතො විහරති ආචාරගොචරසම්පන්නො අණුමත්තෙසු වජ්ජෙසු භයදස්සාවී සමාදාය සික්ඛති සික්ඛාපදෙසු".** (Here, a bhikkhu is virtuous; he dwells restrained by the Pātimokkha, possessed of good conduct and resort, seeing danger in minute faults. Having undertaken the training rules, he trains in them.) **සටහන්:** * අටුවාවට අනුව: '**සම්පන්න සීල**' (possessed of virtue) යනු "පරිපූර්ණශීලය' (perfect in virtue) හෝ 'ශීලයසමන්නාගතව'ය. ** '**ගෝචරසම්පන්න**'ලෙසින් අදහස් වන්නේ, පිණ්ඩපාතය ලබාගැනීමට හැකි සුදුසු සේනාසනය, වාසස්ථානය. භික්ෂුව හැසිරිය යුතු ආකාරය(ලීලාව). **බලන්න**: EMN: note: 76, p. 1069. **මූලාශ්‍ර**:අංගු.නි: ( 2): 4 නිපාත: 4.1.3.2 ප්‍රථම උරුවෙල සූත්‍රය, පි. 64, EAN: 4: 21.1.Uruwela-1, p. 155. ම.නි: (1 ): 1.1.6 ආකන්ඛෙයිය සූත්‍රය, පි. 94, EMN: 6: Ākankheyya Sutta - If a Bhikkhu Should Wish, p. 99.

▼**සංඝයා ශීලය රකින අන්දම**: මේ සසුනේ 1) මහන ප්‍රාණඝාතයෙන් වලකී. දඬුමුගුරු ආයුධ නො දරන්නේය, පව පිළිකුල් කරන්නේය, මෛත්‍රිය ඇතිව, සියලු සතුන් කෙරෙහි අනුකම්පාවෙන් වාසය කරයි. 2) සොරකම් කිරීමෙන් වළකියි.දුන් දෙයපිළිගනී, ඉවසයි. 3) අබ්‍රහ්ම චරියාවෙන් වළකියි 4 ) වචනයෙන් පිරිසිදුය- බොරු කීමෙන් වලකී, සත්‍යම කියයි, ලෝකයා නො රවටයි. කේලාම් කීමෙන් වළකියි. පිරිස අතර සමගිය ඇතිකිරීමට රුකුල් දෙයි. රළු බස් කීමෙන් වළකියි. පහන් සිත් උපදන ප්‍රිය වචන කතා කරයි. හිස් කතා වල නොයෙදේ, දහම් කතාවල පමණක් දේ. 5) ඔහු බිජ-ඇට ආදී පැලවෙනදේ, පැලවුනදේ විනාශ නො කරයි. 6)නොකල්වේලාවන්හි, රාත්‍රියේ ආහාර ගැනීමෙන් වළකියි 7) නටන, ගයන විසුළු දැකුම් වලින් වැළකේ 8) කය සැරසීමට, විලවුන් ආලේප කිරීමට, මල් දැරීම ආදියෙන් වලකී 9) පමණට වඩා උස්වූ හෝ නොකැපවූ මහා අසුන් ආදියෙන් වළකියි. 10) රන්රිදී මසුරන් ආදිය නො පිළිගනී 11) අමු මස්, අමු ධාන්‍ය නොපිලිගගී 12) ස්ත්‍රීන්, දැරියන්, දැසි දාසයන් නො පිළිගනී 13) ඇතුන් අසුන් ආදී සතුන් නො පිලිගනී 14) කෙත් වාතු නොපිළිගනී 13) ගිහියන්ගේ පණිවිඩ ආදිය කිරීමෙන් වලකී 14) වෙළදාම් කිරීම, ගනුදෙනු කිරීම අනුන් රැවටීම ආදියේ නොයෙදේ 15) කෙකෙගු අත් පා සිඳීම, රැහැන් වලින් බැඳීම ආදී දේ නොකරයි. එලෙස අයහපත් අකුසල වලින් මිදී සිටිති. එම කරුණු පිලිබඳ විස්තරයක් මේ සූත්‍රයේ පෙන්වා ඇත. **මූලාශ්‍ර**: දීඝ.නි: (3): පාසාදික සූත්‍රය, පි. 210, EDN**:** 29 The delightful discourse, p. 318.

▼ **ශීලසම්පන්නබවේ ගුණඅංග**: බුදුන් වහන්සේ මෙසේ වදාළහ:

"මේ සසුනේ මහණවූ භික්ෂුව සිල්වත්ය; පාතිමොක්ඛ ශීලයෙන් සංවරය. යහපත් හැසිරීමෙන් යුතුය; ආචාර සම්පන්නය; සුළු හෝ වරදෙහි බිය ඇතිව සිටී. ශික්ෂා පද සමාදන්ව, ඒවා මැනවින් පුහුණු කරයි". **මූලාශ්‍ර:** අංගු.නි: (6 ) 11 නිපාත, සුභූති සූත්‍රය, ,පි. 661**,** EAN: 11: 14 .4 Subhuti, p 572.

▼ **ශිල සම්පන්න වීමට ගුණ 10 තිබිය යුතුවේ:**: 1) පාතිමොකඛ සංවරයෙන් සමන්විතවීම 2) ආචාරශීලිව වාසය කිරීම 3) සුළු වරදේ පවා බිය දැකීම 4) නිවැරදි කාය හා වචී කර්ම සහිතවීම 5) පිරිසිදු ජීවිත පැවත්මක් (ආජීවය) තිබීම 6) මනා ඉන්ද්‍රිය සංවරය ඇතිබව 7) පමණ දැන ආහාර ගැනීම 8) සැමවිටම සිහිනුවණ ඇතිව සිටීම 9) ලැබෙනන සිව්පසයෙන් තුටුව වාසය කිරීම- සන්තුෂ්ටිය 10) ශික්ෂාපද අනුව හික්මී වාසය කිරීම. සිල්සම්පන්නවූ තැනැත්තා කායික හා මානසික සුවයෙන් ජීවත්වේ. **සටහන:** සිල්වත්වීම: පරපණ නැසීම හැරදමා මෛත්‍රීයෙන් විසීම, නුදුන්දේ ගැනීමෙන් වැලකිම, බඹසර රැකීම, බොරුනොකීම, කේලාම්නොකීම, සැරවචන නොකීම, හිස්වචන කථා නොකිරීම... චූල ශීලය, මජ්ජිම ශීලය ආදීවශයෙන් ශීලය ආරක්ෂාකරගන්නා අන්දම පිළිබඳ විස්තර මෙම සූත්‍රවල පෙන්වාඇත. **මූලාශ්‍ර:** දීඝ.නි: (1): 2 ශ්‍රමනඵල සූත්‍රය**,** පි.98, ඡෙදය 28-පි.126 හා 11 කෙවඩ්ඪ සූත්‍රය, පි. 500, හා 13 තේවිජ්ජා සූත්‍රය, පි. 610, EDN: 2 Sāmaññaphala Sutta: The Fruits of the Homeless Life, p. 87, 11, Kewaddaha sutta, p. 136, 13 Tevijja Sutta: The Threefold Knowledge -The Way to Brahma, p.142.

▼ **ශිල සම්පන්න භික්ෂුව තුල** අසංවර බව ගැන බියක් නැත. අභිෂේක ලත් රජෙක්, සියලු සතුරන් මැඩ සුවසේ බිය රහිතව වෙසෙන ලෙසින්, ශිලසම්පන්න භික්ෂුව සුවසේ වාසය කරන බව මෙහි පෙන්වා ඇත. **මූලාශ්‍ර:** දීඝ.නි:(1 ) 11කෙවඩ්ඪ සූත්‍රය, පි.500, EDN :11 Kewaddaha.P.136.

▼ **ශිලසම්පන්නවූ විට,** ආරියන් දැකීමට ඇති අකමැත්ත, ධර්මය ශ්‍රවණය කිරීමට ඇති අකමැත්ත හා උපාරම්භ චිත්ත- විවේචනයට නැමුන සිත් (mind bent on criticism) පහකර ගත හැකිය. **මූලාශ්‍ර**: අංගු.නි: (6 ):10 නිපාත: 10.2.3.6 තයෝධම්ම සූත්‍රය,පි.284, EAN:10: Tens,76-6.Incapable, p. 524.

▲**සංඝයා ශ්‍රද්ධා සම්පන්නවීම**- manifestations of faith in Sangha භික්ෂුවක් සද්ධාසම්පන්න බව ප්‍රකටවීම පිණිස ඇතිකරගතයුතු ගුණ 11ක් (ශිලසම්පන්න ආදී) මෙහි දක්වා ඇත. **මූලාශ්‍ර**: අංගු.නි:(6 ):11 නිපාත:අනුසති වග්ග,11.2.4 සුභූති සූත්‍රය ,පි.662 ,EAN:11: II Recollection, 14.4 Subhuti , p.572.

▼ **දස ධර්ම පරිපූර්ණත්වයට** පත්කරගත් භික්ෂුව සියළු ආකාරයෙන්ම ශ්‍රද්ධාව ඇතිකිරීමට සමත්බව-සමන්තපාසාදික බව මෙහි පෙන්වා ඇත.**බලන්න**: දසධර්ම**. මූලාශ්‍රය**:අංගු.නි:(6 )10:නිපාත: 10.1.1.8 සද්ධා සූත්‍රය,පි.50.

▲ **සංඝයාට හුදකලා වාසය පිණිස අවවාද**-Advice to Sangha regarding living in seclusion: සංඝයා හුදකලාව වන සෙනසුන්වල වාසය කිරීමට

සුදුසුවීම පිළිබඳ කරුණු මෙහි විස්තර කර ඇත. **මූලාශ්‍ර**: අංගු.නි:(6 )10 නිපාත, උපාලි වග්ග2, 10.2.5.9. උපාලි සූත්‍රය,පි.390, EAN: 10: V,99.9 Upaali, p. 538.

▲ **වැඩිහිටි සංඝයා**-The elder Sangha: වැඩිහිටි සංඝයා සතු ගුණ මෙහි පෙන්වා ඇත. **මූලාශ්‍ර**: අංගු.නි: (6 )10 නිපාත, උපාලි වග්ග: 10.2.5.8. ථෙර සූත්‍රය,පි.388, EAN:10: V,98.8. Elder. P. 538.

▲**සාමණේර සංඝයා-** Novice sangha: සාමණේර සංඝයා විසින් බලාගැනීමට- උපස්ථාන කරවා ගැනීමට (to be attended upon by a novice), භික්ෂුවක් තුළ තිබිය යුතු ගුණාංග මෙහි පෙන්වා ඇත. **මූලාශ්‍ර**: අංගු.නි: (6 )10 ,නිපාත, උපාලි වග්ග, 10.1.4.6. සාමණේර සූත්‍රය,පි. 158, EAN:10: IV,36.6. Novice, p. 508.

▲ **සංඝානුස්සති භාවනාව**- Meditation on the qualities of the Sangha මෙ භාවනාව මගින් නිවන් සුවය ලැබෙදාදී.**බලන්න**: භාවනා.**මූලාශ්‍ර:** අංගු.නි: (6): 11 නිපාත: අනුසතිවග්ග: 11.2.1 & 11.2.2 මහානාම සූත්‍ර, පි. 654, 11.2.3 නන්දිය සූත්‍රය, පි.658, EAN: 11: Recollection: 11.1 Mahanama, 12.1 Mahanama (2), p.570, 13.3. Nandiya, p.571.

▼**සංඝ ගුණ සිහිකර**, සිත එකඟ කර ගැනීම අනුසති භාවනාවකි- සංඝානුස්සතිය. එම භාවනාව වැඩීම නිවන පිණිස පවතී යයි බුදුන් වහන්සේ පෙන්වා ඇත:

▲ **සීඝ්‍ර ප්‍රඥාව**: පාලි: **සීඝපඤ්ඤා-** rapidity of wisdom-quickness of wisdom: ධර්මතා සීඝ්‍ර ලෙසින් (වේගයෙන්) අවබෝධ කරගැනීමට හැකි නුවණ සීඝ්‍ර ප්‍රඥාවවේ.**ශීඝ්‍රව අර්ථ ප්‍රතිවේධ කරන හෙයින් ශීඝ්‍ර ප්‍රඥාව වේ. ශීඝ්‍ර ප්‍රඥාව යනු කුමක්ද?** වේගයෙන්: ශිලය, ඉන්ද්‍රිය සංවරය, භෝජනයෙහි පමණ දැනීම (භෝජනයෙහි මාත්‍රඥතාව), ජාගාරානු යෝගය පරිපූර්ණ කරගැනීම, ශිල සමාධි ප්‍රඥා ස්කන්ධ, විමුක්ති ස්කන්ධය හා විමුක්ති ඥානදර්ශන ස්කන්ධය පරිපූර්ණ කරගැනීම, ස්ථාන අස්ථාන නුවණ ප්‍රතිවේධ කරයි, විහාරසමාපත්ති, ආර්ය සත්‍ය ප්‍රතිවේධකරයි, සත්තිස්බෝධිපාක්‍යධර්මතා, ආර්යමාර්ගය වඩාගනී, ශ්‍රමණඵල සාක්ෂාත් කරගනි, අභිඥා ප්‍රතිවේධ කරයි, නිවන සාක්ෂාත් කරගනි, ධර්මතා සීඝ්‍ර ලෙසින් අවබෝධ කරගනියි. **මූලාශ්‍රය**:ඛු.නි: පටිසම්භිදා 3: ප්‍රඥාවග්ග: 3.1 ප්‍රඥා කථා, පි. 172-184.

▼**සතර ධර්මය නිසා** සීඝ්‍ර ප්‍රඥාව ඇතිවේ: 1) සත්පුරුෂ සේවනය 2) සද්ධර්ම ශ්‍රවණය 3) යෝනිසෝමනසිකාරය 4) ධර්මයට අනුකූලව පිළිපැදීම (ධර්මානුධර්ම ප්‍රතිපදාව) ඇති පුද්ගලයාට (සෝතාපන්න) සීඝ්‍ර ප්‍රඥාව ඇතිවේ. **"...ඉමෙ ඛො භික්ඛවෙ, චත්තාරො ධම්මා භාවිතා බහුලීකතා සීඝපඤ්ඤාතාය සංවත්තනතීති"**. (these four things, when developed and cultivated lead to the rapidity of wisdom) **බලන්න**: ප්‍රඥාව, සෝතාපන්න. **මූලාශ්‍ර**: සංයු.නි: (5-2) මහාවග්ග: සෝතාපන්න සංයුත්ත:11.7.8 සීඝ්‍ර ප්‍රඥා සූත්‍රය, පි. 280, ESN: Sotapatthisamyutta: Greatness of Wisdom : p. 2261.

▼**කායගතා සතිය වැඩීමෙන්, විපුල කරගැනීමෙන් සීඝ්‍ර ප්‍රඥාව ඇතිවේ.** (Mindfulness directed to the body...when developed and cultivated,

leads to the rapidity of wisdom) **මූලාශ්‍ර:** අංගු.නි: (1): 1 නිපාත: කායගතාසති වග්ග සූත්‍ර, පි. 125, EAN:1: Mindfulness Directed to the Body: p.52.

**සච**

▲ **සච්චක අග්ගිවෙස්සන නිගන්ඨනාථ පුත්‍ර-** Saccaka the Nigaṇṭha's son: බුදුන් වහන්සේ වැඩසිටි සමයේ විසූ ප්‍රසිද්ධ අන්‍යආගමික නායකයෙක්වූ නිගන්ඨනාථ ගේ පුත්‍රයා ලෙසින් සච්චක පෙන්වා ඇත. බුදුන් වහන්සේ හා වාදකර, උන්වහන්සේ පැරදවීමට ඔහු ගත් උත්සාහය නිෂ්ඵලවිය.**බලන්න:** EMN :note: 369, p.1099. **සටහන:** අටුවාවට අනුව, සච්චක ධර්ම මාර්ගයේ උසස් තැනක් නො ලැබුහ. එහෙත්, ශ්‍රී ලංකාව් බුදුසසුන ස්ථාපිත වූ පසු, ඔහු කාල බුද්ධරක්ඛිත නමින් මහා අරහත්නමක් බවට පත්වේ යයි දක්වා ඇත.බලන්න:ම.නි: (1) චූල හා මහා සච්චක සූත්‍ර.

▲**සච්ච-**Truth: සච්ච-සත්‍ය යනු නිවනය. විවිධ ලෙසින් නිවන සාක්ෂාත් කරගැනීමට උපකාරීවන මාර්ග-(37ක්වූ බෝධිපාක්‍ය ධර්මතා ඇතුලත්) මෙහි විස්තර කර ඇත. **මූලාශ්‍ර:** සංයු.නි: (4): සළායතනවග්ග: අසංඛතවග්ග සූත්‍ර:9.2.1 සිට, පි.666.

▲ **සච්ච කථා-** Sachha katha: සච්ච කථා ලෙසින් පෙන්වා ඇත්තේ චතු සත්‍යයය. මේ සත්‍ය සතර: යථා ස්වභාවය නිසා තථ ය, විපරිතභාවයෙන් අවිතථවේ, අන්‍යස්වභාව රහිත නිසා අනඤ්ඤථවේ. **මූලාශ්‍රය:** ඛු.නි: පටිසම්භිදා 2: යුගනද්ධ: 2 සච්ච කථා:පි.32.

▲**සච්චඤාණ-**Sachha Nana: සච්චඤාණ: චතුසත්‍ය 12 ආකාරයෙන් බැලීම පිලිබඳ නුවණය (සච්චඤාණචතුක්ක).

**මූලාශ්‍රය:**ඛු.නි:පටිසම්භිදා 1: ඤාණකථා:56-63 සත්‍යඥානචතුෂක්ද්වය, පි.244.

▲ **සච්ච විභංග-**The Exposition of the Truths: සච්ච විභංග ලෙසින් පෙන්වා ඇත්තේ චතුසත්‍ය බෙදා විස්තර කිරීමය.බුදුන් වහන්සේ ධම්මචක්කප්පවත්තන සූත්‍රයේ වදාළ සත්‍ය මෙහි දී විස්තරාත්මකව පෙන්වා ඇත. **මූලාශ්‍ර**: ම.නි: (3): සච්ච විභංග සූත්‍රය, පි.528, EMN:141: The Exposition of the Truths, p.998.

▲ **සංචේතනා-** Volition: සංචේතනා ඇතිවන්නේ තුන්දොර නිසාය. කයක් ඇති නිසා, අභ්‍යන්තරයේ සුඛ හා දුක වේදනා ඇතිවේ, කතාව නිසා අභ්‍යන්තරයේ සුඛ හා දුක වේදනා ඇතිවේ, සිත ක්‍රියා කිරීම නිසා අභ්‍යන්තරයේ සුඛ හා දුකවේදනා ඇතිවේ. සියලු සංචේතනා වන්ට මූලිකඅවිද්‍යාවය. **බලන්න**: චේතනා. **සටහන**: මෙහිදී සංචේතනා නිසා උපධි ඇතිවීම ආදී ය විස්තරාත්මකව පෙන්වා ඇත. **මූලාශ්‍ර:**අංගු.නි: (2): 4 නිපාත: 4.4.3.1 සංචේතනා සූත්‍රය, පි. 328, EAN: 4: 171.1 Volition, p. 204.

▲ **සචිත්ත පරියාය** Skilled in the ways of one's own mind: සචිත්ත පරියාය යනු තමන්ගේ මනස අවබෝධය කිරීමේ කුශලතාවයය. පරචිත්ත පරියාය යනු අනුන්ගේ  මනස අවබෝධය කිරීමේ කුශල

තාවයය. බුදුන් වහන්සේ ගේ අවවාදය වුවේ පරචිත්ත පරියාය හැර දමා, සචිත්ත පරියාය වර්ධනය කරගන්නා ලෙසය.**සචිත්ත පරියාය කුසලතාව වඩා ගන්නා අන්දම**. මතු දැක්වෙන කරුණු තමා තුල තිබේද නැද්ද? ගැන නිතර නිතර අවර්ජනා- ප්‍රත්‍යවෙක්ෂනා කලයුතුවේ: 1 අබිජ්ජාව 2 ව්‍යාපාදය 3 ථිනමිද්ධය 4 උද්දච්චය 5 විචිකිච්චාව 6 තරහ 7 සිත කිලිටිබව  8 කය ගිලන්බව 9 විරිය 10 සමාහිත බව (සමාධිය). **එසේ බලන විට**: 1) එම කරුණු තමා කෙරහි අයහපත් ලෙසින් පිහිටා ඇතිනම් ඒ අකුසල් ප්‍රහීණය කරගැනීමට කැමැත්ත (ඡන්දය), විරිය, උත්සාහය, සති සම්ප්‍රජන්‍යය ඇතිකර ගෙන ඒවා වහා පහ කර ගත යුතුය. ඒ පිලිබඳ දැක්වූ උපමා: තමන්ගේ වස්ත්‍රය හෝ හිස ගිනිගත්කල ඒ ගින්න නිමා දැමීමට යුහුසුළුවන ලෙසින් සිතේ හටගත් අකුසල පහකර ගත යුතුවේ. **උපමා**: වස්ත්‍රය ගිනිගැනීම, හිස ගිනිගැනීම.උපග්‍රන්ථය:5 2) එම කරුණු නොමැතිව, සිතයහපත් ලෙසින් පිහිටා ඇතිනම් එම කුසලතා වඩා ගනිමින් ආසව ක්‍ෂය කිරීම පිණිස (අරහත්වය) කටයුතු කලයුතුවේ. **මූලාශ්‍ර**: අංගු.නි: (6 ): 10 නිපාත: සචිත්තවග්ග: 10.2.1.1. සචිත්ත සූත්‍රය, පි. 194, EAN:10: 51.1 One’s own mind, p. 513.

▼ **සැරියුත් මහා තෙරුන් මෙසේ වදාළහ:**

**“නො වෙ භික්‍ඛු පරචිත්තපරියාය කුසලො හොති, අථ සචිත්තපරියාය කුසලො භවිස්සාමී’ති. එවං හි වො ආවුසො සික්ඛිතබ්බං”**. ‘ඔබ, අනුන්ගේ සිත් දන්නා කුසලයෙහි නොයෙදී, තමාගේ සිත දන්නා කුසලය ඇති කරගන්නෙමි යයි හික්මිය යුතුය’. **මූලාශ්‍ර**: අංගු.නි: (6 ): 10 නිපාත: සචිත්තවග්ග: 10.2.1.2 සාරිපුත්ත සූත්‍රය, පි. 196 , EAN:10: 52.2. Saruputta, p. 513.

▲**සච්ඡිකාතබ්බ** ධර්ම: පාලි**: සචඡිකාතබ්බො ධම්මො** -Dhamma to be realized

සච්ඡිකාතබ්බ ධර්ම -සච්චිකරණීය ධම්ම-සාක්ෂාත් කරගතයුතු -ප්‍රත්‍යක්ෂ කලයුතු ධර්ම ලෙසින්පෙන්වා ඇත්තේ නිවන් අවබෝධය පිණිස ප්‍රත්‍යක්ෂ කලයුතු ධර්මතාවන්ටය. **ඒ ධර්මතා:1) අකුප්ප චේතෝවිමුක්තිය** -අරහත්වය (අකුප්පා චෙතොවිමුත්ති- Unshakeable deliverance of mind)  **2) විජ්ජාව හා විමුක්තිය (**විජ්ජා ච විමුත්ති ච): විජ්ජාව යනු ත්‍රිවිධ ඥාණ අවබෝධය ය, විමුක්තිය යනු අරහත්වය ය (නිවනය) . **4) පෙරවිසූ කඳ පිළිවෙත දන්නා නුවණ 5) චුති උත්පත්ති නුවණ 6) ආශ්‍රව ක්‍ෂය කිරීමේ නුවණ. 7) සතර ඵල**-චත්තාරො සාමඤ්ඤඵලානි:සොතපන්න,සකදාගාමී,ආනගාමී අරහත් **මූලාශ්‍ර:** දීඝ.නි: (3): 11 දසුත්තර සූත්‍රය, පි.483, EDN: 34: Dasuttara Sutta: Expanding Decades, p. 384.

▼**සච්චකරණීය ධම්ම 4: ප්‍රත්‍යක්ෂ කලයුතු ධම්ම: 1)** අෂ්ඨවිමොක්ඛ. 2) සමෘතියෙන් (සිහියෙන්) ප්‍රත්‍යක්ෂ කලයුතු ධම්ම: පූර්ව නිවාස සිහිකිරීම. 3) දිවසින් (දිබ්බ චක්ෂු) ප්‍රත්‍යක්ෂ කලයුතු ධම්ම: සත්වයන්ගේ චුතුඋත්පත්තිය . 4) ප්‍රඥාවෙන් ප්‍රත්‍යක්ෂ කලයුතු ධම්ම: ආසවක්‍ෂයකිරීම. **මූලාශ්‍රය:**අංගු.නි: (2): 4 නිපාත:බ්‍රාහමණවග්ග: 4.4.4.9 සච්චිකරණීය සූත්‍රය, පි.376.

▼ **සළායතන හා බාහිර** අරමුණු ක්‍රියා වලිය විශේෂයෙන් අවබෝධ කරගැනීම සච්චිකාතබ්බ ධම්ම ලෙසින් මෙහි පෙන්වා ඇත. **මූලාශ්‍රය:** සංයු.නි: (4): සළායතනවග්ග: සබ්බානිච්චවග්ග සූත්‍ර, පි.88.

▼ **මෙහිදී සච්චිකාතබ්බ** ධම්ම ලෙසින් පෙන්වා ඇත්තේ සම්මා දිට්ඨිය පෙරටුකරගත් අංග 10 ය. සාක්ෂාත් නො කරගතයුතු ධම්ම නම් මිථ්‍යාදිට්ඨිය පෙරටුකරගත් අංග 10 ය. **බලන්න:** මිථ්‍යාත්වය හා සම්‍යක්තවය. **මූලාශ්‍රය**: අංගු.නි: (6): 10 නිපාත:ආරියවග්ග: 10.3.5.10 සච්චිකාතබ්බ සූත්‍රය, පි.478.

▼**මෙහිදී** සාක්ෂාත් කරගතයුතු ධර්ම ලෙසින් පෙන්වා ඇත්තේ දසකුසලය හා සම්මා දිට්ඨියය. සාක්ෂාත් නො කරගතයුතු ධර්ම නම් දසඅකුසලය හා මිථ්‍යාදිට්ඨිය. **මූලාශ්‍රය**: අංගු.නි: (6): 10 නිපාත:ආරියමග්ගවග්ග: 10.4.4.10 සච්චිකාතබ්බ සූත්‍රය, පි.542.

▲ **සුචරිතය හා දුශ්චරිතය -** Good conduct & Misconduct: කයෙන්, වචනයෙන් හා මනසින් (තුන්දොරින්) කරන යහපත් ක්‍රියා සුචරිතය ය, අයහපත් ක්‍රියා දුශ්චරිතයය. සුචරිතය නිසා ඇතිවන යහපත-**අනුසස්:** 1) තමන්ට උපවාද නොකරගැනීම- සිත් තැවුල් ඇති නොකර ගැනීම 2) පණ්ඩිතයන්ගේ ප්‍රසංසාව ලැබීම 3) යහපත් කීර්තියක් පැතිරීම 4) සිහියෙන් මරණයට පත්වීම 5) සුගතියක යළි උපත ලැබීම.දුශ්චරිතය නිසා ඇතිවන අයහපත-**ආදීනව:** 1) අයහපත් ක්‍රියා කිරීම් නිසා තමාට උපවාදකර ගැනීම 2) පණ්ඩිතයන්ගේ අප්‍ර සංසාවට ලක්වීම 3) අපකීර්තිය ඇතිවීම 4) සිහිමුලාවෙන් මරණයට පත්වීම 5) දුගතියක යළි උපත ලැබීම. **මූලාශ්‍රය:** අංගු.නි: (3): 5 නිපාත:දුශ්චරිත වග්ග සූත්‍ර, පි.458.

▼**ත්‍රිවිධ දුශ්චරිතය** පහ කර ගැනීමට, ත්‍රිවිධ සුචරිතය වඩා ගත යුතුවේ. **මූලාශ්‍ර:** අංගු.නි: ( 4 ): 6 නිපාත: 6.1.2. දුශ්චරිත සූත්‍රය, පි. 279 , EAN: 6: 108.2 Misconduct, p. 364.

▲**සුචිලෝම යක්‍ෂ-**Suchiloma Yakka: සුචිලෝම යක්‍ෂයා ඇසූ ප්‍රශ්ණ හා බුදුන් වහන්සේ වදාළ පිළිතුරු මෙහි දක්වා ඇත. **බලන්න**:යක්ඛ. **මූලාශ්‍ර:** සංයු.නි: (1): සගාථවග්ග: යක්ඛසංයුත්ත: 10.1.3 සුචිලෝම සූත්‍රය, පි.394, ESN:10: Yakkasamyutta: Suchiloma, p. 575.

**සජ**

▲**සජ්ඣායනා -** chanting: සජ්ඣායනා (සංගායනා) යනු වචනයෙන් ප්‍රකාශ කිරීමය. ධර්මය පුහුණුවන සංඝයා, දහම් කරුණු මතකයේ තබාගැනීම පිණිස නිතරම සජ්ඣායනා කරණ බව සූත්‍ර දේශනාවල දැක්වේ. **සටහන**: බුදුන් වහන්සේගේ පරිනිබ්බානයෙන් පසුව මහා කශ්‍යප තෙරුන් ප්‍රමුඛව පවත්වන ලද ප්‍රථම සංගායානාවේදී බුදුන් වහන්සේ වදාළ ධම්මවිනය සජ්ඣායනා කර ඇත. විස්තර පිණිස **බලන්න**:වින.පි: මහාවග්ග පාලිය 1- ප්‍රස්තාවනාව, පි 26.

▼**බුදුන් වහන්සේ වදාළ දහම්** කරුණු සංඝයා එක්ව, ඒ ධර්මයේ චිරස්ථිතිය පිණිස සජ්ඣායනා කිරීම සුදුසු ය යි සැරියුත් තෙරුන් සංඝයාට උපදෙස් දී ඇත. **මූලාශ්‍ර**: දිඝ.නි: (3):10 සංගිති සූත්‍රය, පි. 372 EDN: 33: Saṅgīti Sutta: The Chanting Together, p. 362.

▼ **බහුශ්‍රැතවීම පිණිස**, උගත් ධර්මය සජ්ජායනා කිරීම (වචිතා) සංසයා ගේ පුහුණුවකි. **බලන්න:** බහුශ්‍රැත**.**

▼**ආරක්ෂාව පිණිස**, සුවපත්බව පිණිස, ආශිර්වාදය පිණිස පිරිත් සජ්ජායනා කිරීම බෞද්ධ චාරිත්‍රයකි. **බලන්න:** පිරිත් සජ්ජායනා**.**

▲ **සජ්ජායනා බහුල පුද්ගලයා-** Sajjayanabahula pudgala: සජ්ජායනා බහුල පුද්ගලයා ලෙසින් පෙන්වා ඇත්තේ ධර්ම පරියාපත්තිය ඉගෙන ඒවා සජ්ජායනා කරමින් - වාක්පරිචයෙන් දවස ගෙවන එහෙත් සමාධිය වඩා නොගන්නා පුද්ගලයාය. ඔහු ධම්ම විහාරි නොවේ. **බලන්න:** ධම්ම විහාරි. **මූලාශ්‍ර:** අංගු.නි: (3): 5 නිපාත: අනාගතභය වග්ග: 5.2.3.3 හා 5.2.3.4 සූත්‍ර, පි.160.

▲ **සංජීව තෙර-** Sanjiva Thera: **බලන්න:** උපග්‍රන්ථය: 1.

▲ **සංජය බෙලට්ඨිපුත්‍ර**- Sañjaya Belatthaputta: **බලන්න:** අන්‍යආගමික නායකයෝ.

▲ **සුජාතා උපාසිකා-** Sujatha upasika: **බලන්න:** උපග්‍රන්ථය: 3

▲ **සුජාත තෙර-** Sujata Thera: **බලන්න:** උපග්‍රන්ථය:1

▲**සුජාත බුදුන් වහන්සේ -**The Buddha Sujatha: ගෝතම බුදුන් වහන්සේට පෙර වැඩසිටි, මේ වහන්සේ පිලිබඳ විස්තර මෙහි දක්වා ඇත. **මූලාශ්‍රය**:බු.නි: බුද්ධවංශ පාලි:12 සුජාත බුදුන්වහන්සේ.

▲ **සුජාතා සේනානි දියණිය**-Sujatha Senani's daughter: **බලන්න:** උපග්‍රන්ථය:3.

**සඤ**

▲ **සුඤ්ඤතාව-** voidness: සුඤ්ඤතාව-ශුන්‍යතාවය යනු අනත්ත ලක්ෂණයය. බුදුන් වහන්සේ මෙසේ වදාළහ:

"... ආනන්ද, ආත්මය හෝ ආත්මයට අයත් යන දෙයින් හෝ ශුන්‍ය වේද, ඒ නිසා ලෝකය ශුන්‍ය යයි කියනු ලැබේ".. ( It is, Ānanda, because it is empty of self and of what belongs to self that it is said, 'Empty is the world). මෙහිදී ඇස ආදී අභ්‍යන්තර ආයතන 6 , රූපය ආදී බාහිර ආයතන 6, චක්ඛුසම්පස්ස ආදී ස්පර්ෂ සය , ස්පර්ශය නිසා ඇතිවෙන ත්‍රිවිධ වේදනා, ඒවා ආත්මය හෝ ආත්මයට අයත් දෙයින් හෝ ශුන්‍ය නිසා ලෝකය ශුන්‍ය යයි පෙන්වා ඇත. **සටහන:** ලෝකය ශුන්‍යවන්නේ කෙසේද? යයි ආනන්ද තෙරුන්ගේ විමසීමක් මත මේ සූත්‍රය දේශනා කරඇත. **මූලාශ්‍ර:** සංයු.නි: (4) සළායතනවග්ග:වේදනාසංයුත්ත: 1.9.2 සුඤ්ඤලෝක සූත්‍රය, පි.146, ESN: Vedanasamyutta:85.2 Empty Is the World, p.1248

▲**සුඤ්ඤත විමොක්ෂය**- liberation through voidness: මෙය නිවනට දොරටුවකි, විමොක්ක දොරටු තුනෙන් එකකි. **බලන්න**: විමොක්ක.

▲ **සුඤ්ඤත විහරනය**- abide in void-ness: සුඤ්ඤත විහරනය (ශුන්‍යතා විහරණය) ලෙසින් පෙන්වා ඇත්තේ බාහිර නිමිති නොගෙන,

අභ්‍යන්තරයේ සුඤ්ඤතාවය ඇතිකරගෙන, කිසිම නිමිත්තක් ගැන අවධානය යොමු නොකර භාවනාව වැඩීම- සමාපත්තිය ඇතිකර ගැනීමය. අරහත්ඵලය සාක්ෂාත් කරගත් ආරිය උතුමෝ විහරණය කරණ සමාපාත්තියය- අරමුණු රහිතව වැඩවිසීමය. **බලන්න**: චතු කොටික සුඤ්ඤතාව, විමොක්ක දොරටු තුන . බුදුන් වහන්සේ මෙසේ වදාළහ:

“ එම විහරනයට ඇතුල්වන භික්ෂුව, ආධ්‍යාත්මයෙහි සිත මානව පිහිටුවා ගත යුතුය, සිත එකඟ කර ගතයුතුය... කාමආදී අකුසල බැහැර කර, ක්‍රමයෙන් පළමු ජානයේ සිට සිව්වෙනි ජනය දක්වා දැහැන් ඇතිකරගෙන වාසය කරයි”. මෙහිදී ආනන්ද තෙරුන්හට එම විහරණය පිළිබඳව විස්තරාත්මකව පෙන්වා ඇත. එම සමාපත්තිය ‘පරම උත්තර සමාපත්තිය’ යයි බුදුන් වහන්සේ වදාළහ. **සටහන්**: * සුඤ්ඤත විහරනය මගින් ඇතිකරගන්නා සුඤ්ඤත ඵල සමාපත්තිය- අරහත්වය ලැබීමය (fruition attainment of arahantship ). නිවනේ ශුන්‍යබව මෙනෙහි කිරීමෙන් මේ සමාපත්තිය සාක්ෂාත්වේ. **බලන්න**: EMN: Note: 1137, p. 1167 . **ම.නි: මහාවේදල්ල සූත්‍රයේ: **සුඤ්ඤත ඵල සමාපත්තිය,** අරහත්වය ලැබීමබව පෙන්වා ඇත. ** සැරියුත් තෙරුන් ශූන්‍යතා විහරණයෙන් වැඩසිටීම ගැන ප්‍රසංසා කළ බුදුන් වහන්සේ එම විහරණය “මහාපුරුෂ විහරනය’ ක් යයි වදාළහ. **බලන්න**: පිණ්ඩපාත පාරිශුද්ධිය. **මූලාශ්‍ර**: ම.නි: (3 ): 3.3.1 චූලසුඤ්ඤත සූත්‍රය, පි. 280, EMN:121: The ShorterDiscourse on Voidness,p.887 3.3.2 මහා සුඤ්ඤත සූත්‍රය, පි. 280.

▲**සුඤ්ඤත සමාධිය-**Emptiness concentration: පංච උපාදාන ස්කන්ධයේ ශුන්‍ය බව අවර්ජනා කර ලබන සමාධිය, සුඤ්ඤත සමාධියය, නිවනට මගය. **බලන්න:** විමොක්ක දොරටු තුන.

**මූලාශ්‍ර:** සංයු.නි: ( 4 ):සළායතනවග්ග: අසංඛතසංයුත්ත:9.2.6 සුඤ්ඤත සමාධි සූත්‍රය, පි. 667, ESN:43: Asnkathasamyutta: Concentration-vi, p. 1509.

▲ **සුඤ්ඤතඵල සමාපත්තිය-** attainment of voidness: සුඤ්ඤත ඵල සමාපත්තිය: කිසිම නිමිත්තක් නොගෙන, ශුන්‍යබව මෙනෙහිකර ලබාගන්නා සමාපත්තිය මගින් සිත විමුක්තියට පත්ව, අරහත්වය සාක්ෂාත්වීමය. **මූලාශ්‍ර**:ම.නි: ( 3 ): 3.3.1 චූළ සුඤ්ඤත සූත්‍රය හා 3.3.2 මහා සුඤ්ඤත සූත්‍රය, පි. 280.

**සඥ**

▲**සංඥා:** පාලි: **සඤ්ඤා-** perception: සංඥාව යනු අවබෝධය, යම් දෙයක් හඳුනාගැනීමය-සංජානනය ය. සංඥාව පංච උපාදානස්කන්ධයේ එක ස්කන්ධයකි. බුදුන් වහන්සේ, සමාධිය හා විදසුන් නුවණ වඩාගැනීම පිණිස විවිධවූ සංඥාවන් දියුණු කරගැනීමට උපදෙස් දී ඇත. **බලන්න**: භාවනා, පංච උපාදානස්කන්ධය. **ශබ්දකෝෂ: පා.සි.ශ:**පි.495: “**සඤ්ඤා**: හැඳිනීම, නාමය, චේතනාව”. **BD**: p.164: “**Saṅṅā:** perception is one of the 5 group of existence (5 aggregates)-it is the awareness of an object’s distinctive marks”. **PTS**: p. 1509: “**Saṅṅā:** sense, consciousness, perception, being the third khandha …discernment, recognition”.

▼**සියලු සංඥා** (රූප, ශබ්ද, ගන්ධ,රස,ඵොට්ඨබ්බ,ධම්ම) අනිත්‍යය ය. එලෙස, දකිනා පුද්ගලයා '**සද්ධානුසාරී**' ය,ඒබව, විදසුන් නුවණින්, ජානසමාපත්ති ලබා අවබෝධ කරගන්නා පුද්ගලයා '**ධම්මානුසාරී**' ය. ඔවුන් සම්බෝධිය පිහිට කරගෙන ඇත. **මූලාශ්‍රය:**සංයු.නි: (3): ඛන්ධවග්ග: ඔක්කන්තිසංයුත්තය: චක්ඛුවග්ග:4.1.6 සංඥාසූත්‍රය, පි.474.

▲**සංඥා තුන නම්:** කාම සංඥාව,ව්‍යාපාද සංඥාව, විහිංසා සංඥාව. කාම සංඥාව නැතිකර ගැනීමට නෙක්කම්ම සංඥාව වැඩිය යුතුය. ව්‍යාපාද සංඥාව නැතිකර ගැනීමට අව්‍යාපාද සංඥාව වැඩිය යුතුය. විහිංසා සංඥාව නැතිකර ගැනීමට අවිහිංසා සංඥාව වැඩිය යුතුය. **මූලාශ්‍රය:** අංගු.නි: (4) 6 නිපාත: 6.1.4 සංඥා සූත්‍රය, පි.282.

▲**සංඥා පහ-**Five perceptions: මළකඳක අසුභය පෙන්වන සංඥා 5 මෙනෙහිකිරීම විමුක්තිය පිණිස වේ. **1) අට්ඨික සංඥාව (අට්ඨිකසඤ්ඤා -** perception of a skeleton): ඇටසැකිල්ල අරමුණුකොට වඩන සංඥාව **2) පුළවක සංඥාව (පුළවකසඤ්ඤා -** perception of a worm-infested corpse): පණුවන් වැසුන මළකඳක් අරමුණුකොට වඩන සංඥාව **3) වීනිලක සංඥාව (වීනිලකසඤ්ඤා-**perception of a livid corpse) : නිල්වූ මළකඳක් අරමුණුකොට වඩන සංඥාව **4) විච්ඡිද්දක සංඥාව (විච්ඡිද්දකසඤ්ඤා -**perception of a fissured corpse) : කැඩී බිඳීගිය මළකඳක් අරමුණුකොට වඩන සංඥාව **5) උද්ධුමාතක සංඥාව (උද්ධුමාතකසඤ්ඤා -** perception of a bloated corpse) : ඉදිමුණ මළකඳක් අරමුණුකොට වඩන සංඥාව . මේ සංඥා 5 වඩා ගැනීමෙන් ධර්මයේ අප්‍රමාදය ඇතිවේ, සුවපත් සිත් ඇතිව වාසය කලහැකිය, විමුක්ති මාර්ගයට පැමිණේ.

**සටහන්**: * සතිපට්ඨාන සූත්‍රයේ කායානුපස්සනාව යටතේ මේ සංඥා පිළිබඳව විස්තර දක්වා ඇත ** අට්ඨික සංඥාව වඩාගැනීම මහත්ඵල මහා ආනිසංස ලබාදෙයි.**බලන්න**: මහත්ඵල මහා ආනිසංස. **මූලාශ්‍ර**: සංයු.නි: (5-1 ):මහාවග්ග: බොජ්ඣංග සංයුත්ත:ආනාපානවග්ග- සූත්‍ර, පි. 268, ESN: 46: Bojjhṅgasamyutta: VII: p. 1807.

▲**සංඥා සය-**Six perceptions: සොතාපන්න අංග දියුණු කරගත් පසු වැඩිය යුතු සංඥා හයක් ඇත. **1) සබ්බසඞ්ඛාරෙසු අනිච්චසඤ්ඤී**-සබ්බ සංඛාරේ අනිච්ච සංඥාව -සියලු සංඛාර අනිච්ච බව දැකීම. **2) අනිච්චෙ දුක්ඛසඤ්ඤී -** අනිච්චේ දුක්ඛ සංඥාව -අනිච්චස්වභාවය ඇති සියලු දේ දුක බව දැකීම. **3) දුක්ඛෙ අනත්තසඤ්ඤී -** දුක්ඛේ අනත්ත සංඥාව- දුකඇතිකරන සියලුදේහි අනත්ත ස්වභාවය දැකීම **4) පහාණසඤ්ඤී -** පහාන සංඥාව **5) විරාගසඤ්ඤී -** විරාග සංඥාව **6) නිරොධසඤ්ඤී-** නිරෝධ සංඥාව. **සටහන්**: මේ සූත්‍රය දේශනා කලේ දීඝායු උපාසකටය. මරණය ආසන්නයේ සිටි ඔහු දැකීමට පැමිණි බුදුන් වහන්සේ ඔහුට සෝතාපන්න අංග 4 හි හික්මීමට උපදෙස් වදාළහ. ඒ උපාසක, තමන්හට ඒ සිව් දහම ඇති බව පැවසුවිට: විද්‍යාභාගිය නුවණවැඩීම පිණිස, සය සංඥාව විහරණය කරන්න යයි බුදුන් වහන්සේ වදාළහ. **බලන්න**: උපග්‍රන්ථය:3. ** මේ සංඥා 6 වඩාගැනීම, සත්‍ය ඥානය ලබා ගැනීමට හේතුවේ. **බලන්න:** ESN:note:324,p.2426.**මූලාශ්‍ර**: සංයු.නි: (5-

2):මහාවග්ගය:සොතාපත්ති සංයුත්ත: 11.1.3 දීඝාවු උපාසක සූත්‍රය, පි. 164, ESN:55: Sotapattisamyutta: 3.3 Dīghāvu, p, 2185.

▲ **සංඥා සත-** Seven Perceptions: සංඥා සත,- සප්ත සංඥා, මේවා වඩාගන්නේ නම්, ධර්ම මාර්ගයේ වැඩීම මිස පිරිහීමක් නොවන බව බුදුන් වහන්සේ වදාළහ. 1) අනිත්‍ය සංඥාව- perception of impermanence 2) අනාත්ම සංඥාව- non-self 3) අසුභ සංඥාව- impurity 4) ආදීනව සංඥාව-danger 5) ප්‍රහාණ -පහාන සංඥාව - overcoming 6) විරාග සංඥාව- dispassion 7) නිරෝධ සංඥාව- cessation. **මූලාශ්‍ර:** දීඝ.නි: (2 ): 3මහා පරිනිර්වාන සූත්‍රය, පි 138, EDN :16-Mahaparinibbana Sutta, p 171.

▲**සංඥා දහය-**Ten Perceptions: විවිධ දස සංඥා පෙන්වා බුදුන්වහන්සේ වදාළේ එම සංඥා වඩාගැනීමෙන් මහත්ඵල මහා ආනිසංස ලැබෙන බවය, නිවන සාක්ෂාත් කරගැනීමට හැකිබවය. ** **පලමු දසසංඥාවන්**: මේ දස සංඥා වඩාගැනීමෙන්, විපුලබවට පත් කර ගැනීමෙන මහත්ඵල මහා ආනිසංස ඇතිවේ, නිවනට ගෙනයයි, නිවන අවසාන කොට පවතී.

**"...දසඉමා භික්ඛවෙ සඤ්ඤා භාවිතා බහුලීකතා මහප්ඵලා හොන්ති මහානිසංසා අමතොගධා අමතපරියොසනා ...."**. ( these ten perceptions, when developed and cultivated, are of great fruit and benefit, culminating in the deathless, having the deathless as their consummation) 1) **අසුභ සංඥාව** (අසුභ සඤ්ඤා**-** perception of unattractiveness **)** 2) **මරණ සංඥාව** (මරණ සඤ්ඤා - perception of death) 3) **ආහරයෙහි ප්‍රතිකූල සංඥාව-** (පිළිකුල්බව-ආහාරෙපටිකකූල සඤ්ඤා - perception of the repulsiveness of food ) 4) **සියලු ලෝකය කෙරෙහි ඇල්ම නැති සංඥාව** (සබ්බලොකෙ අනභිරථසඤ්ඤා**-** perception of non-delight in the entire world) 5) **අනිත්‍ය සංඥාව** (අනිච්චසඤ්ඤා**-** perception of impermanence) 6) **අනිච්චයයේ දුක්ඛසංඥාව-**(අනිච්චෙදුක්ඛසඤ්ඤා- perception of suffering in the impermanent) 7) **දුකපිලිබඳ අනාත්ම සංඥාව (**දුක්ඛෙඅනත්තසඤ්ඤා**-** perception of non-self in what is suffering,) 8) **ප්‍රහාණ සංඥාව** (පහානසඤ්ඤා- perception of abandoning**)** 9) **විරාග සංඥාව** (විරාගසඤ්ඤා**-** perception of dispassion**)** 10) **නිරෝධ සංඥාව** (නිරෝධසඤ්ඤා - perception of cessation). **මූලාශ්‍ර:** අංගු.නි:(6):10 නිපාත: 10.2.1.6 ප්‍රථම සංඥා සූත්‍රය, පි. 216, EAN: 10: 56.6 Perceptions-1, p. 515

** **දෙවන දසසංඥාවන්**: 1) අනිත්‍ය සංඥාව 2) අනාත්ම සංඥාව 3) මරණ සංඥාව 4) ආහරයෙහි ප්‍රතිකූල සංඥාව 5) සියලු ලෝකය කෙරෙහි ඇල්ම නැති සංඥාව 6) ඇටසැකිල්ල ගැන ඇති සංඥාව (අසතික- අට්ඨික සඤ්ඤා) 7) පණුවන් ගැසුන මළ මිණියක් පිලිබඳ සංඥාව 8) නිල්ව ගිය මළ මිණියක් පිලිබඳ සංඥාව 9) දැදුරුව ගිය මළ මිණියක් පිලිබඳ සංඥාව.10) ඉදිමුණමළ මිණියක් පිලිබඳ සංඥාව. **සටහන**: 6-10 දක්වාවූ සංඥා භාවනා පිළිබඳව විසුද්ධිමාර්ගය පොතේ 6 පරිච්ඡේදයේ විස්තරාත්මකව දක්වා ඇත. **මූලාශ්‍ර:** අංගු.නි: (6 ):10 නිපාතය: 10.2.1.7 දුතියසංඥා සූත්‍රය**,**පි.218, EAN:10: 56.7 Perceptions-2, p. 515

**** තෙවන දසසංඥාවන්**: අනිච්චසංඥාව, අනාත්මසංඥාව, අශුභසංඥාව, ආදීනවසංඥාව, ප්‍රහාණසංඥාව, විරාගසංඥාව, නිරෝධසංඥාව, සබ්බලෝකේ අනභිරතිසංඥාව, සබ්බසංඛාරයෙහි අනිච්ච සංඥාව හා ආනාපාන සතිය. **සටහන:** ගිරිමානන්ද තෙරුන්හට ඇතිවූ ආබාධයක් සුව පත් කිරීම පිණිස මේ සූත්‍ර දේශනාකර ඇත. **මූලාශ්‍ර:** අං.ගු.නි: ( 6 ): 10 නිපාත: 10.2.1.10 ගිරිමානන්ද සූත්‍රය, පි. 221, EAN: 10: 60.10. Girimānanda, p. 516.

▼**කයේ ඇති අසුභ කොටස්** 31-32 ගැන මෙනෙහිකිරීම, (**අසුභ සංඥාව-** perception of foulness ) මගින් ධර්මයේ අප්‍රමාදය ඇතිවේ, සුවපත් සිත් ඇතිව වාසය කලහැකිය, විමුක්ති මාර්ගයට පැමිණේ. **බලන්න**: භාවනා. **මූලාශ්‍ර**: සං.යු.නි: (5-1): මහාවග්ග:බොජ්ඣංග සංයුත්ත:නිරෝධවග්ග: 2.8.1 අසුභ සූත්‍රය, පි. 273, ESN: 46: Bojjhṅgasamyutta: VIII: 67.1 Foulness, p. 1819

▼**කුසල හා අකුසල සංඥා-** perception of wholesome & unwholesome: **කුසල සංඥා 3 කි:** නෙක්ඛම්ම සංඥා, අව්‍යාපාද සංඥා හා අවිහිංසා සංඥා.**අකුසල සංඥා**3 කි: කාම සංඥා, ව්‍යාපාද සංඥා හා විහිංසා සංඥා. **මූලාශ්‍ර**: දිඝ.නි: (3 ): 10 සංගිති සූත්‍රය-ඡෙදය 10, පි. 378, EDN: 33 Saṅgīti Sutta: The Chanting Together-section 10 , p. 365.

▲**සංඥාව කෙරෙහි නිබ්ද්දාව ඇතිකරගැනීම**: ඒ සඳහා ඇති පිළිවෙත 6 ආකාරය:1) **සංඥාව දත යුතුය-** Perceptions should be understood**:** සංඥාව 6 සය ආකාරවේ: රූප සංඥා, ශබ්ද සංඥා,ගන්ධ සංඥා,රස සංඥා,ස්පර්ශ සංඥා, ධම්ම සංඥා.2) **සංඥාවේ නිදාන සම්භවය (උත්පත්ති කරුණ) දත යුතුය** (the source and origin of Perceptions should be understood) සංඥාවේ උත්පත්ති කරුණ, ස්පර්ශයය.3**) සංඥාවේ විවිධත්වය** (වෙමත්තතාව) දත යුතුය (the diversity of Perceptions be understood) රූප සංඥා එක් දෙයකි. එලෙස, ශබ්ද සංඥා,ගන්ධ සංඥා,රස සංඥා,ස්පර්ශ සංඥා, ධම්ම සංඥා එකිනෙකට වෙනස්ය. 4) **සංඥාවේ විපාකය දත යුතුය** (the result of Perceptions should be understood). සංඥාවේ විපාකය -ප්‍රතිඵලය නම් කතා ව්‍යවහාරයය. යම් ලෙසකින් හඳුනාගන්නේද, (මෙබඳු සංඥා ඇතිවසිටින්නේ ය) ඒ ඒ ලෙසින් ව්‍යවහාර කරති. (that perceptions result in expression. In whatever way one perceives something, in just that way one expresses oneself, [saying:] ‘I was percipient of such and such). 5) **සංඥාවේ නිරෝධය දත යුතුය** (the cessation of perceptions should be understood) ස්පර්ශයේ නිරෝධය, සංඥාවේ නිරෝධයය. 6) **සංඥා නිරෝධගාමිණි ප්‍රතිපදාව දත යුතුය දත යුතුය** (the way leading to the cessation of perceptions should be understood) එනම්, ආරියඅටමගය. මේ කරුණු 6 යහපත් ලෙසින් දන්නා ආරිය ශ්‍රාවකයා, නිබ්බෙදික බ්‍රහ්මචරියාවවූ සංඥා නිරෝධය දන්නේය. **මූලාශ්‍ර**: අං.ගු.නි: (4) 6 නිපාත: 6.2.1.9 නිබ්බේධිකසූත්‍රය,පි.220,EAN:6: 63.9 Penetrative,p.355.

▲ **සංඥාවේදිත නිරෝධ සමාපත්තිය:** පාලි: සඤ්ඤාවෙදයිත නිරොධසමාපත්තියා-attainment of the cessation of perception and

feeling: සංඥාවේදිත නිරෝධ සමාපත්තිය, සියලු සමාපත්ති අතරින් අග්‍රය. එම සමාපත්තියට සමවදින යෝගියාහට කිසිදු සංඥාවක් හෝ වේදනාවක් ඇති නොවේ, එලෙසින් දින 7 ක් සමාධිගතව සිටිය හැකිය. එම සමාපත්තිය, නිවන මේ ජීවිතයේදීම, විදීමට ලැබෙන අත්දැකීමක් ලෙසින් සලකයි. මේ සමාපත්තියට සමවැදිමේ හැකියාව ඇත්තේ අනාගාමී උතුමන්ට හා රහතන්වහන්සේටය.

▼ **සමථ හා විදර්ශනා භාවනා** දියුණු කරගැනීම, සංඥාවේදිත නිරෝධ සමාපත්තිය වැඩීමට උපකාරවේ. එම සමාපත්තිය පිලිබඳ ලක්ෂණ: 1) එම සමාපත්තිය පිළිබඳව පළමුව සිත වඩා ගනී, ඒ අනුව සමාපත්තියට සම වැදේ. එම සමාපත්තියට සමවදින අවස්ථාවේ යෝගියාට මෙබඳු සිත් පහළ නොවේ: මම මේ සමාපත්තියට සමවදින්නෙමි හෝ මම මේ සමාපත්තියට සමවදිමි හෝ මම මේ සමාපත්තිය ලැබුවෙමි. (when a bhikkhu is attaining the cessation of perception and feeling, it does not occur to him: 'I will attain the cessation of perception and feeling,' or 'I am attaining the cessation of perception and feeling,' or 'I have attained the cessation of perception and feeling'; but rather his mind has previously been developed in such a way that it leads him to such a state) 2) එම සමාපත්තියට සම වදින විට පළමුව වචී සංඛාරද, දෙවනුව කාය සංඛාරද, අවසානයේදී චිත්ත සංඛාරද නිරුද්ධවියයි. **සටහන**: 2 න ජාන සමාධියේදී වචී සංඛාර සන්සිඳේ , සිව්වන ජාන සමාධියේදී කාය සංඛාර සන්සිඳේ, සමාපත්තියට ඇතුළුවන අවස්ථාවේ චිත්ත සංඛාර සන්සිඳේ. **බලන්න**: ESN: Note: 301, p. 1563. 3) මෙම සමාපත්තියට සම වැදුන යෝගියා මළගිය කෙනෙක් සේ පෙනේ. කෙනෙක් මිය ගියවිට ඔහුගේ ආයු පිරිහී, කාය, වචී හා චිත්ත සංඛාර නිරුද්ධ වේ. එහෙත් සමාපත්තියට සමවැදුන යෝගියාගේ කාය, වචී හා චිත්ත සංඛාර නිරුද්ධවුවත් ඔහුගේ ආයුස පිරිහීනැත, ජීවිත උණුසුම ඇත, ඉඳුරන් ශාන්තය. 4) සමාධියෙන් නික්මෙන විට, මම මේ සමාපත්තියෙන් නැගිසිටිමි ආදී සිතුවිලි යෝගියාහට පහළ නොවේ. එයට හේතුව ඒ පිලිබඳ සිත පළමුව වඩා සිටි නිසාය. **සටහන:** අටුවාවට අනුව:සමාපත්තියට සම වැදීමට පෙර, ඒ පිළබඳ කාලය අදිට්ඨාන කරගනි. **බලන්න:** ESN: Note: 303 , p. 1563. 5) සමාපත්තියෙන් නැගී සිටින යෝගියාට, පළමුව චිත්ත සංඛාරද, දෙවනුව කාය සංඛාරද, අවසානයේදී වචී සංඛාරද ඇතිවේ. 6) සමාපත්තියෙන් නැගී සිටි යෝගියා, 3 න් ආකාර වූ ස්පර්ශ (ඵස්ස) විදි: සුඤ්ඤත ඵස්ස, අනිමිත්ත ඵස්ස, අප්පණිහිත ඵස්ස. ඔහුගේ සිත විවේකයට- නිවනට නැඹුරුවී තිබේ. **බලන්න**: විමොක්ක දොරටු තුන. **මූලාශ්‍ර**: සංයු.නි: (4 ): සළායතන වග්ග: චිත්තසංයුත්ත: 7.1.6 දුතිය කාමභූ සූත්‍රය, පි. 562, ESN:41: Chitta samyutta: 6 Kāmabhū-2, p. 1440, ම.නි: (1): 1.5.4 චූලවෙදල්ල සූත්‍රය, පි. 722, EMN: 44 Cūḷavedalla Sutta-The Shorter Series of Questions and Answers, p. 379.

▼ **භාවනාවේදී** සංඥා හා වේදනා ඇතිවීම, සංඥාවේදිත නිරෝධ සමාපත්තිය ඇතිකරගැනීමට බාධාවකි. **මූලාශ්‍ර**:අංගු.නි: (6 ): 10 නිපාත: ආකන්ඛ වග්ග, 10.2.3.2 කණ්ටක සූත්‍රය, පි.268. EAN: 10: 71.2. Thorns, p. 521.

▼**බුදුන් වහන්සේ** සංඥාවේදිත නිරෝධසමාපත්තිය ලබාගැනීම මෙහි දක්වා ඇත. **මූලාශ්‍රය**: අංගු.නි: (5) 9 නිපාත: 9.1.4.10 තපුස්ස ගහපති සූත්‍රය, පි.534.

▲**සංඥාප්ති බහුල පුද්ගලයා-** Sannaptibahula puggala: සංඥාප්ති බහුල පුද්ගලයා ලෙසින් මෙහිදී පෙන්වා ඇත්තේ, ධර්ම පරියාපත්තිය ශ්‍රවණය කර, ඒ ධර්මය අන්අයට දේශනාකරන, එහෙත් සමාධිය වඩා නොගන්නා පුද්ගලයාය. ඔහු ධම්ම විහාරි නොවේ. **බලන්න:** ධම්ම විහාරි. **මූලාශ්‍ර:** අංගු.නි: (3): 5 නිපාත: අනාගතභය වග්ග: 5.2.3.3 හා 5.2.3.4 සූත්‍ර, පි.160.

**සත**

▲**සත්වයා-**Being: සාමාන්‍ය ලෝකයා සත්වයා ලෙසින් සලකන්නේ තම තමන්ගේ පංචඋපාදානස්කන්ධයය. ධර්මයේ පෙන්වා ඇත්තේ සත්වයා යන්න ලෝක ව්‍යවහාරයක් පමණක් බවය. නාම රූප ක්‍රියාවලිය හැර හුදෙක් සත්වයෙක් නොමැත. වජිරා තෙරණිය මෙසේ දක්වා ඇත:

**"...ස්කන්ධඑකතුවූවිට, සත්වයා යයි ලෝකයා ව්‍යවහාර කරති. මෙහි ඇත්තේ දුක ඇතිවීම හා දුක ඇතිවී නැතිවීයාමය.වෙනත්දෙයක් මෙහි නොමැත,ඇත්තේ දුක ඇතිවීමය, දුක නැතිවීයාම පමණි".බලන්න:** උපග්‍රන්ථය:2.**මූලාශ්‍රය:** සංයු.නි: (1): සගාථවග්ග: භික්ඛුණීසංයුත්ත:5.1.10 වජිරා සූත්‍රය, පි.272.

▼**උපදින සියලු සත්වයන්** අතරින් මිනිසත් බව ලබන සත්වයෝ අල්පය, වෙනත් ලෙසින් - දුගතියේ උපදින සත්වයෝ බහුල බව මෙහි පෙන්වා ඇත. **මූලාශ්‍රය:** අංගු.නි: (1): 1 නිපාත: 1.16.4.2 සූත්‍රය, පි.110.

▼**තණ්හාව,** සත්වයන්ගේ උපත ඇතිකරයි, ඔවුන්ගේ සිත් සෑම තැනටම දිවයයි, සසරට පැමිණි ඔවුන්ට, දුක නිසා මහා බිය ඇතිවේ, යහපත් කම්ම ඔවුන්ට පිහිටවේ. **මූලාශ්‍රය**: සංයු.නි: සගාථවග්ග: දේවතාසංයුත්ත: ජනෙති සූත්‍ර 3කි, පි.94.

▲ **සත්වයන් පහළවන ස්ථාන**- abodes of beings: මෙහිදී පෙන්වා ඇත්තේ මරණින් මතු, කම්මවිපාක අනුව සත්වයන් උපත ලබන ස්ථානා පිලිබඳවය. ධර්මයට අනුව සත්වයෝ පහළවන භව 3කි. ඒ භවයන්හි, ඇති විවිධ ස්ථාන- ලෝකයන්හි යළි උපත ඇතිවේ. **සටහන: * දීඝ.නි.** ඉංග්‍රීසි පරිවර්තනය (EDN) සම්පාදනය කළ මොරිස් වොල්සි- Maurice Walshe, පොත හැඳින්වීමේදී දක්වා ඇති "ලෝකවිස්තරය"ට (cosmology) අනුව යළිඋපත ලබන ස්ථාන ගැන සරල පරිවර්තනයක්:

"බුදුදහමේ, මරණින්පසු පහළවන ලෝක පිළිබඳව විස්තර සඳහන්වේ. ඒවා සදාකාලික දේවලෝක හෝ නිරයන් නොවේ, එහෙත් ඒවායේ ගතකිරීමට ඇති කාලසීමාව ඉතා දිගය, සැමදෙයක්ම නිරන්තරයෙන්ම වෙනස්වේ: ලෝක හා ලෝක ධාතු ඇතිවී නැතිවේ, සත්වයෝ කර්ම ශක්තියට අනුව ඉපදී, මැරී යලි ඉපදේ...එම බියකරු තත්වයෙන් මිදිමට හැකිවෙන්නේ, ධර්මය අවබෝධ කර විමුක්තිය ලැබීමෙන්ය. එතෙක්, සත්වයෝ සසර දිගින් දිගට ගමන් කරති... සසර පැවැත්ම ඇත්තේ තුන්ලෝකයෙන් ඒකකය: 1) කාම ලෝකය (World of Sense-Desires) හෝ 2) රූප ලෝකය (fine-material world) හෝ 3)

අරූප ලෝකය (Formless or immaterial world). මේ තුන්ලෝකයෙන් එකක යළි උපත සකස්වේ. ඉන් ඔබ්බට ඇත්තේ එහා ඉවුර ලෙසින් හඳුන්වන ලෝකෝත්තර නිවනය, එය විස්තරකර නොහැකිය, සිය අත්දැකිමන් විඳිය යුතුවේ".

▼ **සත්ත්වයන් ඇතිවෙන භව තුන**: කාමභව, රූප භව හා අරූප භව (kāma-bhavo, rūpa-bhavo, arūpa-bhavo). **මූලාශ්‍ර**: දිඝ.නි: (3): 10 සංගිති සූත්‍රය- ඡෙදය 10 , පි. 380 , EDN: 33 Sangīti Sutta: The Chanting Together-section 10 , p. 366.

▲**සත්ත්වයෝ යළි උපත ලබනා තැන් 31 කි**:**කාම ලෝක**: ස්ථාන 11 කි: **පහළම ස්ථාන 4 කි-සතර අපාය**: 1-4 දුගතිය (states of woe): 1 නිරය 2 අසුරලෝකය 3 ප්‍රේත ලෝකය 4 තිරිසන් යෝනිය **5** මිනිස් ලෝකය. **6-11**: **කාමාවචර දේවලෝක 6:** 6 චාතුර්මහාරාජිකය 7 තව්තිසාව 8 යාමය 9 තුසිතය 10 නිර්මාණරතිය 11 පරනිර්මිත වසර්තිය. **බලන්න:** දේවලෝක. **රූප බ්‍රහ්ම ලෝක16කි**: 12-27: 12 බ්‍රහ්ම පරිසජ්ජා 13 බ්‍රහ්ම පුරෝහිත 14 මහා බ්‍රහ්ම 15 පරිතතඅභා 16 අපපමානභා 17 ආභස්සර 18 පරිතතසුභා 19 අපපමාන සුභා 20 සුභකිනනා 21 වෙහපඵලා 22 අසංඥසතතා 23 අවිහා 24 අතප්පා 25 සුදස්සා 26 සුදස්සි 27 අකනිට්ඨා **අරූප බ්‍රහ්ම ලෝක** 4 කි:28-31: 28 ආකාසානඤචායතනය 29 විඤඤානඤචායතනය 30 ආකිඤචඤඤායතනය 31 නෙවසඤඤානාසඤඤායතනය **සටහන**: විස්තර පිණිස බලන්න: දේවලෝක, බ්‍රහ්ම ලෝක, දුගතිය, සතර අපාය. **මූලාශ්‍රය:** EDN: Introduction- Cosmology, p. 30.

▲ **සත්වාවාස-** abodes of beingsමෙහිදී, බුදුන් වහන්සේ සත්වයන් වාසය කරණ ස්ථාන 9 ක් පෙන්වා ඇත: 1) නානාත්වකාය නානාත්වසංඥා ඇති ස්ථාන 2) නානාත්වකාය ඒකත්වසංඥා ඇති ස්ථාන. 3) ඒකත්වකාය නානාත්වසංඥා ඇති ස්ථාන 4) ඒකත්වකාය ඒකත්වසංඥා ඇති ස්ථාන. 5) ප්‍රතිසංවේදනා රහිත අසංඥසත්වස්ථාන 6) ආකාසානඤ්චායතනය. 7) විඥානන්ත්‍යායතනය. 8) ආකිඤ්චඤ්චඤායතනය. 9) නෙවසඤ්ඤා නාවසඤ්ඤායතනය. මේවා නවසත්වාවාස යන්ය. **මූලාශ්‍ර**:අංගු.නි:(5):9 නිපාත:9.1.3.4 සත්තාවාස සූත්‍රය, පි. 470, EAN: 9: 24.4. Beings, p.470.

▲ **සත්වයන්ගේ කාම උත්පත්ති හා සුඛ උත්පත්ති-** Kama & Sukha uthpathti: කාමයට ඇලුන සත්ත්වයන් උපතලබන ස්ථාන කාම උත්පත්තිවේ. ජාන සමාපත්ති ලබා ඒ සුවයට ඇලුන සත්ත්වයන් උපතලබන ස්ථාන සුඛ උත්පත්තිවේ**. කාම උත්පත්ති 3 කි**: 1) නිබඳව කාමවස්තු වලට ඇලී සිටින සත්වයන් වසන තැන්: මිනිස්ලෝකය, සතර දිව්‍ය ලෝක (චාතුර්මහාරාජිකය, තව්තිසාව, යාමය,තුසිතය) හා නිරයේ හැර අන්‍ය දුගතිස්ථාන. 2) තමන් විසින් මවාගත් කාමවස්තූන් පිළිබඳව සතුටුවන දෙවියන් සිටින නිර්මාණරතිය. 3) අනුන් විසින් මවාගත් කාමවස්තූන් පිළිබඳව සතුටුවන දෙවියන් වසන පරනිර්මිත වසවර්තිය. **සුඛ උත්පත්ති 3** කි: 1) පළමු ජානය ලැබූ බ්‍රහ්මකායික දෙවියන් සිටින රූප බ්‍රහ්ම ලෝකය. 2) දෙවැනි ජානය ලැබූ දෙවියන් වසන ආභස්වර දෙවලෝකය. 3) තෙවැනි වැනි ජානය ලැබූ දෙවියන් වසන සුභකින්න

දෙවලෝකය. **මූලාශ්‍ර**:දිස.නි:(3):10 සංගිති සූත්‍රය,පි. 382,EDN: 33 Saṅgīti Sutta,p. 367.

▲ **සත්ත්වයන්ගේ විවිධත්වය -** Diversity of beings: සත්ත්වයන්ගේ විවිධත්වය පිළිබඳව බුදුන් වහන්සේ මෙසේ වදාළහ:

"මහණෙනි, සත්ත්වයෝ අදහස් වශයෙන්ම සැසඳේ: ලාමක අදහස් ඇති අය ලාමක අදහස් ඇති අය හා එකතුවේ, කලණ අදහස් ඇති අය, කලණ අදහස් ඇති අය හා එකතුවේ. අතීත කාලයේහිද සත්ත්වයෝ අදහස් වශයෙන්ම සැසඳී එක්වූහ, අනාගත කාලයේහිද සත්ත්වයෝ අදහස් වශයෙන්ම සැසඳී එකතු වේ, වර්තමානයේදිද සත්ත්වයෝ අදහස් වශයෙන්ම සැසඳී එක්වී සිටි"

" ශ්‍රද්ධාව නැති අය, ශ්‍රද්ධාව නැති අය සමග, ශ්‍රද්ධාව ඇතිඅය, ශ්‍රද්ධාව ඇති අය සමග එකතුවේ. එසේම: ලැජ්ජා නැති අය... ලැජ්ජා ඇති අය, පවට බියනැති අය... පවට බිය ඇති අය... එලෙස අවගුණ ඇති අය අවගුණ ඇති අය සමග ද, ගුණවත් අය, ගුණවත් අය සමගද එක්වේ. එලෙස, අවගුණ ඇතිව හැසිරෙන අය ඇසුර නිසා අයහපත් කර්ම ඇතිකරගනී, ගුණවත් අය එක්වී යහපත් කර්ම රැස්කර ගනී. **මූලාශ්‍ර:** සංයු.නි: ( 2): නිදානවග්ග: ධාතුසංයුත්ත: 2.2.5 චංකම සූත්‍රය, පි. 264 හා 3 කම්මපථවග්ග සූත්‍ර, පි. 280, ESN:14: Dhatusamyutta: 15.5 Walking back and forth, p. 755 & III Courses of Kasmma, p. 764.

▲**සත්ත්වඝාතනය-**Destruction of Life: සත්ත්වඝාතනය, යනු මනුෂ්‍ය, තිරිසන්සතුන් ආදී ප්‍රාණීන් ගේ ජීවිතය, චේතනා සහගතව නැතිකිරීමය. දස අකුසලයකි, අයහපත් කම්ම විපාක ඇතිකරයි.**බලන්න**: ප්‍රාණඝාතය.

▲ **සතර අග්‍ර -** Four foremost: සතර අග්‍ර ලෙසින් පෙන්වා ඇත්තේ අග්‍ර ධර්මතාවන්ය. එවැනි,කාණ්ඩ 2 ක් බුදුන් වහන්සේ පෙන්වා ඇත: 1) අග්‍ර ශීලය, අග්‍ර සමාධිය, අග්‍ර ප්‍රඥාව හා අග්‍ර විමුක්තිය. 2) අග්‍රරූපය, අග්‍ර වේදනාව, අග්‍ර සංඥාව හා අග්‍රභවය. **මූලාශ්‍ර**:අංගු.නි: (2 ): 4 නිපාත: 4.2.3.4 පඨම අග්‍ර හා 4.2.3.5 දුතිය අග්‍ර සූත්‍ර, පි. 170, EAN: 4: 74.4 & 75.5 Foremost suttas, p. 178.

▲**සතර අග්‍රප්‍රසාද-**foremost kinds of confidence: සතර අග්‍ර ප්‍රසාද නම් ධර්මය පිලිබඳව කෙනක් තුල විශ්වාසය ඇතිකරන කරුණු 4 ක්ය. 1) බුදුන් වහන්සේ පිළිබඳව 2) ආරියඅටමග ගැන 3) විරාගය නම්වූ නිවන ගැන 4) ශ්‍රාවක සංඝයා ගැන. **මූලාශ්‍ර**: අංගු.නි: (2 ): 4 නිපාත:4.1.4.4. අග්ගපාසාද සූත්‍රය, පි.92, EAN:4: 34.4 Confidence, p.161.

▲ **සතර අන්ත-** Four ends: බුදුන් වහන්සේ අන්ත (කොටස් -ends) ධර්මතා 4ක් පෙන්වා ඇත: 1**) සක්කාය අන්තය**:පංච උපාදාන ස්කන්ධයය. 2) **සක්කාය සමුදය අන්තය-** යළි උපත ඇතිකරන තණ්හාවය (කාම, භව හා විභව). 3) **සක්කාය නිරෝධ අන්තය**-තණ්හාව සහමුලින්ම නැතිවීම 4) **සක්කාය නිරෝධගාමිණී පටිපදා අන්තය-** ආරියඅටමග වැඩීම. **සටහන**: අටුවාවට අනුව, මෙහිදී පෙන්වා ඇත්තේ, චතු සත්‍ය මගින් පංච උපාදානස්කන්ධය දැක්වීමය. **බලන්න**: ESN: note: 217, p. 1198. **මූලාශ්‍ර**: සංයු.නි: ( 3): ඛන්ධසංයුත්ත: අන්තවග්ග: 1.3.1.1.

අන්ත සූත්‍රය, පි. 300, ESN:22: Khandasamyutta: 103-1 Portions, p. 1096.

▲ **සතර අපාය**-four lower hells: සතර අපාය: නිරය, තිරිසන් අපාය, ප්‍රේත යෝනිය, අසුරනිකායය. මේවා අකුසල කර්ම විපාක විඳීම පිණිස සත්ත්වයෝ යළිඋපත ලබන දුගති ස්ථානයන්ය. **බලන්න**: සුගතිය හා දුගතිය, නිරය, තිරිසන් ලෝකය, ප්‍රේතලෝකය, අසුර.

▼ **තුන්දොරින්** පාප ක්‍රියා කරන, ආරිය උතුමන්ට නිගරු කරණ, මිථ්‍යා දිට්ඨිය ඇති මිනිසුන් සතර අපායේ යළි උපත ලබයි. **මූලාශ්‍ර:** ම.නි :(3): 3.3.10, දේවදූත සූත්‍රය, පි. 400, EMN:130: The Divine Messengers, p.941.

▼ **ආර්යඋපවාද** කම්ම නිරයේ උපතට හේතුවේ. **බලන්න**: ආර්යඋපවාද,

▲ **සතර අපරිහානිය ධර්ම** - Four Non-decline Dhamma: සතර අපරිහානිය ධර්ම යනු, මාර්ගයේ පරිහාණිය වලක්වන කරුණුය. 1) ශීලසම්පන්න බව 2) ඉන්ද්‍රිය සංවරය 3) භෝජනයෙහි පමණ දැනීම 4) නිදිවැරීමේ යෙදීම. **බලන්න**: අපරිහානිය ධර්ම.

▲ **සතර අභිරාජකුල නාගයෝ-** Sathara Abhirajakula Naga: විරූපක්ඛ, එරාපථ, ඡබ්‍යාපුත්ත, කණ්හාගොතමක යන විෂ සහිත නාගයන් කුලවර්ග 4 ගැන මෙහි විස්තර කර ඇත. **මූලාශ්‍රය:** අංගු.නි: (2): 4 නිපාත: 4.2.2.7 අහි මෙත්ත සූත්‍රය, පි.156.

▲ **සතර අයහපත් ගුණ**- Four bad qualities: 1.සිල්වත්නොවීම 2.මිථ්‍යා දිට්ඨිය තිබීම 3. මිථ්‍යා ආජීවය තිබීම 4. ලාභසත්කාර ආදිය ලැබීමට ඇති කැමැත්ත සංඝයාට ඇති අයහපත් ගුණයන්ය.: **මූලාශ්‍රය:** අංගු:නි: (2) : 4 නිපාත: ආපත්තිභයවග්ග: 4.5.5.1 පාපභික්ෂු සූත්‍රය. පි.484.

▲ **සතර ආර්ය සත්‍ය-** The Four Noble Truths: දුක්ඛ සත්‍ය, දුක්ඛ සමුදය සත්‍ය, දුක්ඛ නිරෝධ සත්‍ය, දුක්ඛ නිරෝධගාමිණී පටිපදා සත්‍ය. **බලන්න**: චතුරාර්යසත්‍ය, චතුසත්‍ය.

▲ **සතර අසඞ්ඛෙය්‍ය**- Sathara Asankheiya: කල්පයක් තුල අසඞ්ඛෙය්‍ය 4 ක්ඇත. **බලන්න**: කල්පය, කප. **මූලාශ්‍ර**: අංගු.නි: ( 2): 4 නිපාත: 4.4.1.6 අසඞ්ඛෙය්‍ය සූත්‍රය, පි. 298, EAN: 4: 156.6 Eon, p. 199.

▲ **සතර ආහාර**: පාලි: **චත්තාරො ආහාරා-**Four nutriments: සතර ආහාර - සිව් පෝෂණය, මිනිසාගේ පැවැත්මට අවශ්‍ය කරුණුය : 1) **භෞතික ආහාර 2) ස්පර්ශ ආහාර** 3) **මනෝසංචේතනා ආහාර** 4) **විඥානආහාර. බලන්න:** ආහාර.

▼ **සතර ආහාර**, ආධ්‍යාත්මික වර්ධනය පිණිස පිරිසිඳව අවබෝධ කර ගත යුතු ධර්මතාය. **බලන්න**: පරිඥෙය්‍ය ධර්ම. **මූලාශ්‍ර:** දීඝ.නි: (3): 11දසුත්තර සූත්‍රය, පි. 483, EDN: 34: Dasuttara Sutta: Expanding Decades, p. 384.

▼ **සතර ආහාර,** උපන් සත්ත්වයන්ගේ පැවැත්ම පිණිස හා උපදින්නාවූ සත්ත්වයන්ට අනුග්‍රහ පිණිසවේ. සතර ආහාර තණ්හාව නිදාන කොට, තණ්හාව හේතුකොට, තණ්හාව ජාති කොට ඇත්තෝය. **මූලාශ්‍ර:** සංයු.නි:

(2 ): නිදානවග්ග: 2 ආහරවග්ග: 1.2.1 ආහාර සූත්‍රය, පි. 41, ESN: 12 Nidanasamyutta: 11.1 Nutriment, p. 623.

▲ **සතර ආශ්චර්ය අද්භූතධර්මතා -** The four astounding and amazing things: තථාගතයන් පහළවීම නිසා ඇතිවූ පුදුම, අසිරිමත් ධර්මතා 4කි.**බලන්න**: තථාගත.

▲ **සතර ඉද්දිපාද: පාලි: චත්තාරො ඉද්ධිපාදා -**Four bases of spiritual power-Iddhipādā: සතර ඉද්දිපාද, බෝධිපාක්ෂික ධර්මතාවකි. ආධ්‍යාත්මික මාර්ගය වඩා ගැනීමට උපකාරවන ඉද්දිපාද 4 කි: 1) චන්ද සමාධි ඉද්දිපාදය-ප්‍රධාන විරිය සහිත, 2) විරියසමාධි ඉද්දිපාදය- ප්‍රධාන විරිය සහිත 3) චිත්තසමාධිඉද්දිපාදය - ප්‍රධාන විරිය සහිත, 4 )වීමංසා සමාධි ඉද්දිපාදය- ප්‍රධාන විරිය සහිත (desire -chanda, energy-viriya, mind -citta and investigation vīmaṃsā). **සටහන්: *** අටුවාවට අනුව**:** ධර්මයේ ඉද්දිපාද ක්‍රියා කරන ආකාර 2 කි: ඉද්ධි ප්‍රාතිහාර්ය ලැබීම - අධිප්‍රමාණ බල ලැබීම පිණිස හා විමුක්තිය ලබා ගැනීම පිණිස. මේ විධි 2 ක අරහත්වය පිණිස වේ. **බලන්න**: ESN: note: 246, p. 2417 ** ඉද්දිපාද පිලිබඳ විස්තර පිණිස **බලන්න**: සංයු.නි: (5-2): මහාවග්ග: ඉද්දිපාද සංයුත්තය. **ශබ්දකෝෂ: පාසිශ**: පි.153: "**ඉද්ධිපාදා:** සෘධිපාදක ධර්මයන්, සතර සෘධිපාද: සෘධියට මුල්වන ධර්ම'. **B.D**: p. 126: "**iddhi**: "power", magical power"; iddhi-pāda: roads to power or success".

**P.T. S**: p.293: "**the four bases** of Iddhi, the Iddhipādā. They are the making determination in respect of concentration on purpose, on will, on thoughts & on investigation".

▼ **ඉද්දිපාද සසරින් එතරවීම පිණිසය**: සතර ඉද්දිපාද කෙනෙක් වඩන ලද්දේනම්, බහුල කර ඇත්නම්, මෙතෙරින් එතෙරට යාම පිණිස (සසරින් නිවනට) පවතී:

**"චත්තාරො මෙ භික්ඛවෙ, ඉද්ධිපාදා භාවිතා බහුලීකතා අපරා පාරං ගමනාය සංවත්තන්ති"**: **මූලාශ්‍ර**: සංයු.නි: (5-2 ): මහාවග්ග: ඉද්දිපාද සංයුතත: 7.1.1. අපාර සූත්‍රය, පි. 26, ESN: 51: Iddhipāda-samyutta:1.1 From the Near Shore, p.2057.

▼ **සතර ඉද්දිපාද** මැනවින් පුහුණුකර,වර්ධනය කරගත්විට තමන්ට කැමති කාලයක් දීර්ඝ ආයුෂ (කල්පයක් හෝ ඊට වැඩි කලක් ) විඳිය හැකිබව බුදුන් වහන්සේ වදාළහ:

**"...ඉධ භික්ඛවෙ භික්ඛු ඡන්දසමාධි...වීරියසමාධි... චිත්තසමාධි... වීමංසාසමාධි පධානසඞ්ඛාර සමන්නාගතං ඉද්ධිපාදං භාවෙති. සො ඉමෙසං චතුන්නං ඉද්ධිපාදානං භාවිතත්තා බහුලීකතත්තා ආකඞ්ඛමානො කප්පං වා තිට්ඨෙය්‍ය කප්පාවසෙසං වා. ඉදං ඛො භික්ඛවෙ භික්ඛුනො ආයුස්මිං". මූලාශ්‍ර**: දීඝ.නි:(3):චක්‍රවර්ති සිංහනාද සූත්‍රය,ඡෙදය-26,පි.11,EDN:26 Cakkavatti Sīhanāda Sutta, p.300.

▼ **ඉද්දිපාද වර්ධනය දුක නැතිකර ගැනීම පිණිසය**: කෙනෙක් සතර ඉද්දි පාද දියුණු කිරීම අත්හැර දැම්මේ නම්, ඔහු දුක නැති කරන ආරිය මග අත්

හැර ඇත. සතර ඉද්දිපාද මනාව දියුණු කරගැනීම ආරම්භ කල විට, ඔහු දුක නැතිකරන ආරිය මගට බැසගත් කෙනෙක් වේ:

**"යෙසං කෙසඤ්චි භික්ඛවෙ, ඉමෙ චත්තාරො ඉද්ධිපාදා විරද්ධා, විරද්ධො තෙසං අරියො මග්ගො සම්මාදුක්ඛක්ඛයගාමී. යෙසං කෙසඤ්චි භික්ඛවෙ, ඉමෙ චත්තාරො ඉද්ධිපාදා ආරද්ධා, ආරද්ධො තෙසං අරියො මග්ගො සම්මාදුක්ඛක්ඛයගාමීති"** **මූලාශ්‍ර**:සංයු.නි: (5-2 ) : ඉද්දිපාද සංයුත්ත: 7.1.2 විරද්ධ සූත්‍රය, පි. 26 හා 7.1.3 අරිය සූත්‍රය, පි. 28, ESN: 51: Iddhipādasamyutta: 2.2 Neglected & 3.3 Noble, p. 2058-9.

▼ **සතර ඉද්දිපාද** මනාව වඩා ගැනීමෙන්, විපුල කරගනිමෙන්, ඒකාන්තයෙන්ම සසරට කලකිරීම ඇතිවේ (නිබ්ද්දාව). එමගින්, විරාගය, නිරෝධය, උපසමය (ශාන්තිය), අභිඥාණය , සම්බෝධිය හා නිවන සාක්ෂාත් වේ:

**"චත්තාරො' මෙ භික්ඛවෙ, ඉද්ධිපාදා භාවිතා බහුලීකතා එකන්තනිබ්බිදාය විරාගාය නිරොධාය උපසමාය අභිඤ්ඤාය සම්බොධාය නිබ්බානාය සංවත්තන්ති"**. (Bhikkhus, these four bases for spiritual power, when developed and cultivated, lead to utter revulsion,to dispassion, to cessation, to peace, to direct knowledge, to enlightenment, to Nibbāna). **මූලාශ්‍ර**: සංයු.නි: (5-2) : ඉද්දිපාද සංයුත්ත: 7.1.4 නිබ්බිදා සූත්‍රය, පි. 28,ESN: 51: Iddhipādasamyutta: 4.4 Revulsion**,** p. 2060.

▼ **සතර ඉද්දිපාද පුහුණුකර**, ප්‍රබල ලෙසින් වර්ධනය කළ නිසා තමන් මහත් සෘද්ධි අනුභාවයන් ලැබූ බව සනංකුමාර බ්‍රහ්මරාජයා පවසා ඇත. ඉද්දිපාද වර්ධනය පිලිබඳව මේ සූත්‍රයේ විස්තර කරතිබේ. **මූලාශ්‍ර**:දීඝ.නි: (2): 5. ජනවසභ සූත්‍රය, පි,322, EDN: 18 Janavasabha Sutta (17), p. 209.

▼ **උද්ධම්භාගිය සංයෝජන** පහකිරීම පිණිස සතර ඉද්දිපාදයන් මනාව වැඩිය යුතුයයි බුදුන් වහන්සේ පෙන්වා ඇත. **මූලාශ්‍ර**: සං.නි: (5-2) : ඉද්දිපාදසංයුත්ත: උද්ධම් භාගිය සූත්‍රය පි. 84, ESN: Iddipada samyuththa, 51: 86 (10) Higher Fetters , p. 2108, අංගු.නි: (6) 10 නිපාත: 2 නාථ වග්ග, 10.1.2.3. සංයෝජන සූත්‍රය**,** පි.60, EAN: 10: II Protector, 13.3. Fetters, p. 496.

▼**සතර ඉද්දිපාද නිවන් මගය- අසංඛත මගය**: **මූලාශ්‍ර**: සංයු.නි: (4 ): සලායතනවග්ග: අසංඛතසංයුත්ත: ඉද්දිපාද සූත්‍රය, පි.662, ESN: 43: Asankatasamyutta: p. 7.7 Bases for Spiritual power, p.1501.

▼ **වෙනත් මූලාශ්‍ර: 1.** "The Requisites of Enlightenment by Ledi Sayadaw": BPS: Wheel: 169-172 .

▲ **සතර ඉරියව්ව-** Four postures: සතර ඉරියව්ව: කය හසුරුවන මූලික ක්‍රමයන්ය-හිඳිම, සිටීම, ඇවිදීම හා ඇලවීසිටීම. මේ ඉරියව් පැවත්වීම පිලිබඳ සිහිය පිහිටුවා ගැනීම කායානුපස්සනාව භාවනාවේ එක්ක්‍රම විධියකි. **බලන්න**: භාවනා, සතර සතිපට්ඨානය.

▲ **සතර කොට්ඨාශ:** පාලි: **චත්තාරො අන්තා-** the four portions **බලන්න:** සතර අන්ත.

▲ **සතර ඥානයෝ:** පාලි: **චත්තාරි ඤාණානි**- Four knowledges සතර ඥාණයෝ, ආධ්‍යාත්මික වර්ධනය පිණිස උපදවා ගතයුතු ධර්මතාය: **1) ධර්මයෙහි ඥානය** ( ධම්මෙ ඤාණං) **:** සතර මග සතර ඵල වේ (සෝතාපන්න සිට අරහත්බව දක්වා ඇති මගඵල) **2) අන්වයේහි ඥානය** (අනවයෙ ඤාණං): අනුමාන ඥානය ලෙසින් ද හඳුන්වයි. චතුසත්‍ය අවබෝධ කරගෙන, දැන් මෙන්ම අතීතයේදීද මෙසේ දුක ආදිය පැවති යයි අවබෝධ කිරීම. 3) **පර්යයයෙහි ඥානය** (පරියෙ ඤාණං): අනුන්ගේ සිත් පිරිසිඳ දැනගැනීමේ නුවණ. 4) **සම්මුතියෙහි ඥානය** (සම්මුතියා ඤාණං) : 1-3 දක්වා ඇති ඥාන හැර ඉතිරි සියලු දේ පිලිබඳ ඇති නුවණ. **බලන්න**: උත්පාදයිතව්‍ය ධර්මතා. **මූලාශ්‍ර:** දීඝ.නි: (3):11 දසුත්තර සූත්‍රය, පි. 483, EDN: 34: Dasuttara Sutta: Expanding Decades, p. 384.

▲**සතර දීප-**The four continents: ලෝකයේ අක්ෂය ලෙසින් සලකන සිනේරු කන්දට: දකුණින් පිහිටි ජම්බුද්වීපය, බටහිරින් පිහිටි අපරගොයානය,උතුරින් පිහිටි උත්තර කුරුදේශය හා නැගෙනහිරින් පිහිටි පුබ්බාවිදේහය සතර දීපයන්ය, සක්විති රජුගේ බල ප්‍රදේශයන්ය. **බලන්න**: සක්විතිරජ.

▲ **සතර ධර්ම**: පාලි: **චත්තාරො ධම්මා-** Four Dhammas: සතර ධර්මය - සිව්දහම: සෝතාපන්නබවට වැඩිය යුතු ධර්මතාය: 1) සත්පුරුෂ සේවනය 2) සද්ධර්ම ශ්‍රවණය 3) යෝනිසෝමනසිකාරය 4) ධර්මානුධර්ම ප්‍රතිපදාව.

**"…සප්පුරිසසංසෙවො, සද්ධම්මසවනං,යොනිසොමනසිකාරො, ධම්මානුධම්මප්පටිපත්ති"**. ( Association with superior persons, hearing the true Dhamma, careful attention, practice in accordance with the Dhamma) **බලන්න**: සෝතාපන්න, සිව් දහම.

▼**මේ සතර ධර්ම වඩා ගැනීමෙන්,** විපුල කරගැනීමෙන් ඇතිවන යහපත් ප්‍රතිඵලවන්නේ විවිධ ප්‍රඥා ඇතිවීමය:

**"…චත්තාරො මෙ භික්ඛවෙ ධම්මා, භාවිතා බහුලීකතා: සොතාපත්තිඵල සච්ඡිකිරියාය සංවත්තතනති… සකදාගාමිඵල සච්ඡිකිරියාය… අනාගාමිඵල සච්ඡිකිරියාය… අරහත්තඵල සච්ඡිකිරියාය… පඤ්ඤාපටිලාභාය… පඤ්ඤා වුඩ්ඪියා… පඤ්ඤාවෙපුල්ලාය… මහාපඤ්ඤතාය… පුථුපඤ්ඤතාය… විපුල පඤ්ඤතාය… ගම්භීරපඤ්ඤතාය… අසාමන්තපඤ්ඤතාය… භූරිපඤ්ඤතාය … පඤ්ඤාබාහුල්ලාය… සීඝපඤ්ඤතාය…ලහුපඤ්ඤතාය… හාසු පඤ්ඤතාය … ජවනපඤ්ඤතාය… තික්ඛපඤ්ඤාතාය… නිබ්බෙධික පඤ්ඤාතාය…". අනුසස්:** 1) සෝතාපන්න මගඵල - fruit of stream-entry 2) සකදාගාමි මගඵල - fruit of once returning 3) අනාගාමි මගඵල - fruit of non-returning 4) අරහත් මගඵල - fruit of arahantship 5) ප්‍රඥාව ලැබීම පිණිස (Obtaining of Wisdom 6) ප්‍රඥාව වැඩීම පිණිස (Growth of Wisdom) 7) ප්‍රඥාවේ විස්තාරණය පිණිස (Expansion of Wisdom) 8) මහා ප්‍රඥාව පිණිස- greatness of wisdom 9) පුථු ප්‍රඥාව පිණිස- ලොව්තුරු ප්‍රඥාව- extensiveness of wisdom 10) විපුල ප්‍රඥාව පිණිස - vastness of wisdom 11) ගම්භීර ප්‍රඥාව පිණිස -

ගැඹුරු ප්‍රඥාව- depth of wisdom 12) අසමන්ත ප්‍රඥාව පිණිස- සමකලනොහැකි ප්‍රඥාව- state of unequalled wisdom 13) භූරිප්‍රඥාව පිණිස- බොහෝ ප්‍රඥාව-පුළුල් ප්‍රඥාව- breadth of wisdom 14) බහුල ප්‍රඥාව පිණිස- abundance of wisdom 15) සීඝ්‍ර ප්‍රඥාව පිණිස-වහා වැටහෙන ප්‍රඥාව-quickness of wisdom 16) ලහු ප්‍රඥාව පිණිස- යුහුව ඇතිවෙන ප්‍රඥාව-buoyancy of wisdom 17) හාසු ප්‍රඥාව පිණිස- හාසබහුල ප්‍රඥාව- joyousness of wisdom 18) ජවන ප්‍රඥාව පිණිස- දුවයන ප්‍රඥාව- swiftness of wisdom 19) තික ප්‍රඥාව- තියුණු ප්‍රඥාව- sharpness of wisdom 20) නිබ්බේධික ප්‍රඥාව පිණිස- කෙලෙස් ප්‍රහාණයට ඇති ප්‍රඥාව- penetrativeness of wisdom. **සටහන:** මෙහි දක්වා ඇති ප්‍රඥාවන් පිලිබඳ විස්තර පිණිස **බලන්න**: ඛු.නි:පටිසම්භිදා 3. ප්‍රඥාවග්ග: 3.1 ප්‍රඥා කථා, පි. 166. **මූලාශ්‍ර:** සංයු.නි: (5-2): සෝතාපන්න සංයුත්ත**:** සප්ත ප්‍රඥාවග්ග හා මහා ප්‍රඥා වග්ග : 11.6.5 සූත්‍ර- පි. 276, ESN: 55: Sotapatthisamyutta: VI The Wise One- Great Wisdom, 55.5 - p. 2253.

▲ **සතර ධර්ම පද**- 4 Dhamma Factors: සතර ධර්ම පද ලෙසින් බුදුන් වහන්සේ පෙන්වා ඇත්තේ: 1 ) අනභිජ්ජාව (Non-longing) 2) අව්‍යාපාදය (Good will) 3) සම්මා සතිය (Right mindfulness) 4) සම්මා සමාධිය (Right concentration). මේවා ආරියවංශ පෙළපතට අයත් උතුමන් සතු ගුණයන්ය. **බලන්න:** ආරියවංශය.

▲ **සතර බ්‍රහ්ම විහාර-** Four sublime states: මෙත්තා, කරුණා, මුදිතා හා උපේක්ඛා යන උතුම් විහරණයන්ය.**බලන්න**: බ්‍රහ්මවිහාර.

▼**අන්‍යආගමිකයන් වඩන සතර බ්‍රහ්ම විහාර** හා බුදු සසුනේ වඩන සතර බ්‍රහ්ම විහාර අතර ඇති වෙනස දැනගැනීම පිණිස මෙසේ ප්‍රශ්න කළ යුතුය යයි බුදුන් වහන්සේ පෙන්වා ඇත:

**"කෙසේ වඩන ලද මෙත්තා…කරුණා…මුදිතා…උපක්ඛා චේතෝ විමුත්ති, කිනම් ගති ඇත්ද? කුමක් උතුම් කොට ඇත්ද? කිනම අනුසස් ඇත්ද? කුමක් කෙළවර කොට ඇත්ද?"**

1) සතර බ්‍රහ්ම විහාර වැඩිය යුතු අන්දම: විවේකය, විරාගය, නිරෝධය ඇසුරුකොට, වොසග්ගපරිනාමිව, සප්ත බොජ්ඣංග වැඩිය යුතුය. 2) එසේ වඩන විට මෙබඳු හැකියාව ඇතිවේ: 1. යම්කිසි ප්‍රිය දෙයක් කෙරෙහි, ප්‍රිය නොවන අරමුණු ඇතිව සිටීමට, 2. යම්කිසි අප්‍රිය දෙයක් කෙරෙහි, ප්‍රිය අරමුණු ඇතිව සිටීමට, 3. ප්‍රිය හෝ අප්‍රිය අරමුණුවල, ප්‍රිය අරමුණු ඇතිව සිටීමට 4. ප්‍රිය හෝ අප්‍රිය අරමුණුවල, අප්‍රිය අරමුණු ඇතිව සිටීමට 5. ප්‍රිය හෝ අප්‍රිය අරමුණුකෙරෙහි, ප්‍රිය අප්‍රිය දෙකම දුරුකොට උපක්ඛා අරමුන සහිතව සිටීම. 3) එලෙස, උපේක්ඛාව ඇතිව, සිහි ඇතිව, මනා දැනීම ඇතිව (මෙත්තාචේතෝ විමුක්තිය) විසීම නිසා ශුභ විමොක්ෂයට පැමිණිය හැකිය. මෙත්තා චේතෝ විමුක්තිය ශුභය කෙළවර කොට ඇත. (අරහත්වය ලබා නොගත්තේ නම්). 4) ) එලෙස, උපේක්ඛාව ඇතිව, සිහි ඇතිව, මනා දැනීම ඇතිව (කරුණාචේතෝ විමුක්තිය) විසීම නිසා, රූප සංඥාව ඉක්මවා ආකාසානඤ්චායතනයට පැමිණිය හැකිය. කරුණ චේතෝ විමුක්තිය, ආකාසානඤ්චායතනය කෙළවර කොට ඇත. (අරහත්වය ලබා නොගත්තේ නම්). 5) එලෙස, උපේක්ඛාව ඇතිව, සිහි ඇතිව, මනා දැනීම ඇතිව (මුදිතාචේතෝ

විමුක්තිය) විසීම නිසා, ආකාසානඤ්චායතනය ඉක්මවා, විඤ්ඤාණ ඤ්චායතනයට පැමිණිය හැකිය. මුදිතාචේතෝ විමුක්තිය, විඤ්ඤාණ ඤ්චායතනය කෙළවර කොට ඇත. (අරහත්වය ලබා නොගත්තේ නම්).6) එලෙස, උපේක්ඛාව ඇතිව, සිහි ඇතිව, මනා දැනීම ඇතිව (උපේක්ඛා චේතෝ විමුක්තිය) විසීම නිසා, විඤ්ඤාණඤ්චායතනය ඉක්මවා, ආකිඤ්චඤ්ඤායතනයට පැමිණිය හැකිය. උපේක්ඛා චේතෝ විමුක්තිය ආකිඤ්චඤ්ඤායතනය කෙළවර කොට ඇත. (අරහත්වය ලබා නොගත්තේ නම්). **සටහන**: අන්‍යආගමික පිරිසක ගේ විමසීම මේ දේශනාවට මුල්වී ඇත. බුදුන් වහන්සේ හා ශ්‍රාවක සංඝයාට මිස, වෙනත් අයට ඒ ප්‍රශ්න ගැන පිළිතුරු දීම නොහැකිය. **මූලාශ්‍රය:** සංයු.නි: (5-1): මහාවග්ග:බොජ්ඣංගසංයුත්ත, 2.6.4 මෙත්ත සූත්‍රය, පි.246.

▲ **සතර මග ඵල-** Sathra magaphala: සෝතාපන්න මග හා ඵලය, සකදාගාමි මග හා ඵලය, අනාගාමි මග හා ඵලය, අරහත් මග හා ඵලයය. මේවා ධර්ම මාර්ගයේ උතුම් පියවරයන්ය. **බලන්න**: අට්ඨපුරුෂ පුද්ගලයෝ.

▲ **සතර මාර්ග ප්‍රතිපදා:** පාලි: **චතස්සෝ පටිපදා-** Four modes of practice: සතර මාර්ග ප්‍රතිපදා (පටිපදා)ලෙසින් පෙන්වා ඇත්තේ ධර්ම මාර්ගය වඩාගැනීම පිණිස යොදාගන්නා ක්‍රමවේද 4 ගැනය.ආධ්‍යාත්මික මග දියුණු කරගැනීම පිණිස යොදාගත යුතු ප්‍රතිපදා 4 ක් බුදුන් වහන්සේ පෙන්වා ඇත: 1) **දුක්ඛාපටිපදා දන්ධාභිඤ්ඤා (**අවබෝධය කල්ගතවන, දුක් පිළිවෙත- Practice that is painful with sluggish direct knowledge): කෙනෙක් රාගයට... දෝෂයට...මෝහයට බලවත් ලෙසින් බරවූ ස්වභාවයෙන් යුක්තය, එම, කෙලෙස් -ආසව, වරින්වර පැනනැගී ඔහුට බලවත් වේදනා ගෙනදේ. සිත දොම්නස් වී විරිය අල්පවේ. එමනිසා, පංච ඉන්ද්‍රිය වර්ධනය ඉතා සෙමින් සිදුවේ. දුක කෙළවර කරගැනීමට කල්යයි. එනම්, ආසව ක්ෂය කරගැනීමට ආනන්තරික මාර්ගයට, එළඹීම ඉතා සෙමින් සිදුවේ. **සටහන්:** * ආසව ක්ෂය කරගැනීමට **ආනන්තරික මාර්ගයට**, එළඹීම සෙමින් (**ආනන්තරියං පාපුණාති ආසවානං ඛයාය-** sluggishly attains the immediacy condition for the destruction of the taints): සිතේ සමාධිය ඇතිවී විදසුන් නුවණ ලැබීම සෙමින් සිදුවේ. **බලන්න**: ආනන්තරික චිත්ත සමාධිය ** අටුවාවට අනුව 'ආනන්තරිය' යනු මාර්ගය හා ඵලය ආතර ඇති ආසන්න තත්වයය. **බලන්න**: EAN: note: 851, p.624. **2) දුක්ඛා පටිපදා ඛිප්පාභිඤ්ඤා (**අවබෝධය ඉක්මන්-ක්ෂණික, එහෙත් දුක් පිළිවෙත- practice that is painful with quick direct knowledge): කෙනෙක් රාගයට... දෝෂයට...මෝහයට බලවත් ලෙසින් බරවී සිටී. කෙලෙස් වරින්වර පැනනැගී ඔහුට බලවත් වේදනා ඇතිකරයි, සිත දොම්නස් කරයි. එහෙත්, ඔහුගේ පංච ඉන්ද්‍රිය උසස් ලෙසින් නැගී ඇත. එමනිසා, ඔහුට ඉතා ඉක්මනින්ම, අසාව ක්ෂය කිරිම පිණිස, ආනනතරික මාර්ගයට පැමිණ ආසව ප්‍රහීණය කරගත හැකිවේ. **3) සුඛාපටිපදා දන්ධාභිඤ්ඤා** (අවබෝධය කල්ගතවන, සුව පිළිවෙත-practice that is pleasant with sluggish direct knowledge): මෙහිදී, කෙනෙක් කෙළෙස් වලට තදින් බරවී නැත. එමනිසා ඔහුට දොම්නස නැත. එහෙත්, පංච ඉන්ද්‍රිය වැඩිම දුබලය. එමනිසා අසාව ක්ෂය කිරිම පිණිස, ආනනතරික මාර්ගයට පැමිණීම ප්‍රමාදය, දුක කෙළවර කිරීමට කල්

ගතවේ. **4) සුඛාපටිපදා ඛිප්පාභිඤ්ඤා** (අවබෝධය ඉක්මන්, සුව පිළිවෙත- practice that is pleasant with quick direct knowledge): කෙළෙස් අඩුය, දොම්නස නැත, පංච ඉන්ද්‍රිය මනාව වැඩි තිබේ. ඔහු ඉතා ඉක්මනින්ම ආසව ක්‍ෂය කර, දුකින් මිදෙ. මේ ප්‍රතිපදාව සෙසු ප්‍රතිපදාවන්ට වඩා අග්‍ර යයි බුදුන් වහන්සේ වදාළහ. **බලන්න**: අග්‍ර දේ විනාශවීම. **මූලාශ්‍ර:** අං.ගු.නි: (2) 4 නිපාත:පටිපදා වගග, 4.4.2.1 පටිපදා සූත්‍ර 1 හා 2, පි.310, EAN: 4: 161-162 Modes of Practice, p. 201.

▼**සතර ප්‍රතිපදා- දෙවෙනි වර්ගය**: ලෝකයා තුල ඇති වෙනත් ප්‍රතිපාදා 4 ක්, බුදුන් වහන්සේ මෙසේ දක්වා ඇත: 1) **අනධිවාසනා**(නො ඉවසීම) සංඛ්‍යාත අකඛමා පටිපදාව (the impatient practice): කෙනෙක් තමන්ට නින්දා, පරිභව, ගැටෙන, පහර දෙන අයට පෙරලා ඒ දේ කරයි. ඔහු ශිත උෂ්ණ, මැසි මදුරු සර්ප උවදුරු, බඩගින්න පිපාසය ද, අනුන්ගේ නපුරු රළු වචන, බලවත් කායික වේදනා ආදිය ඉවසන්නේ නැත. 2) **අධිවාසනා** (ඉවසීම) සංඛ්‍යාත ඛමා පටිපදාව (the patient practice): කෙනෙක් තමන්ට නින්දා, පරිභව, ගැටෙන, පහර දෙන අයට පෙරලා ඒ දේ නො කරයි. ඔහු ශිත උෂ්ණ, මැසි මදුරු සර්ප උවදුරු, බඩගින්න පිපාසය ද, අනුන්ගේ නපුරු රළු වචන, බලවත් කායික වේදනා ආදිය ඉවසා දරාගනී. 3) **දමා පටිපදාව**-(ඉන්ද්‍රියදමන සංඛ්‍යාත- the taming practice): මේ සසුනේ මහණ යහපත් ලෙසින් සය ඉන්ද්‍රිය සංවර කොටගෙන වාසය කරයි.

4) **සමා පටිපදාව** (අකුසල විතක්ක ව්‍යපශම සංඛ්‍යාත- the calming practice): මේ සසුනේ මහණ උපන් කාම, ව්‍යාපාද, විහිංසා විතක්ක, ලාමක අකුසල දහම, නො ඉවසයි, දුරු කරයි, බැහැර කරයි, සමනය කරයි, අවසන් කරයි, සහමුලින්ම නැතිකර දමයි. **මූලාශ්‍ර:**අං.ගු.නි: (2): 4 නිපාත:පටිපදා වගග, 4.4.2.4 පටිපදා සූත්‍ර 2 කි, පි.316, EAN: 4: 164-165 Patience-2, p. 202.

▲ **සතර මහා භූතයෝ**-The four Great Elements: පඨවි, ආපො, තෙජෝ, වායෝ යන ධාතුන් සතර මහා භූතයන්ය, සතර මහා ධාතු ලෙසින්ද පෙන්වා ඇත. පංච උපාදානස්කන්ධ යේ රූපස්කන්ධය සකස්වී ඇත්තේ මේ සිව් භූතයන් ගෙනි. **බලන්න**: භාවනා, ධාතු, මහාභූත. **සටහන**: ම.නි. ධාතුවිභංග සූත්‍රයේ මේ පිලිබඳ විස්තරාත්මකව දක්වා ඇත.

▲ **සතර යොග**: පාලි**: චත්තාරො යොගා**-four yokes-bonds: යොග නම් බැමිය- බැඳීමය. සසරට කෙනෙක් බැඳ තබන බැම් 4 සතර යොගසේ දක්වා ඇත: 1) කාම යොගය 2) භව යොගය 3) දිට්ඨි යොගය 4) අවිජ්ජා යොගය (The bond of sensuality, the bond of existence, the bond of views, and the bond of ignorance) මේවා කෙළෙස් බැමිය. එම යොග වලින් ගැලවීම විසංයොගය වේ. **බලන්න**: සතර විසංයොග.

▼ **සතරයොග ඇතිවීම හා ඒවා නැතිකර ගැනීම:**: 1) **කාම යොගය**: කෙනෙකුට, කාමයේ ඇතිවීම, නැතිවීයාම, ආස්වාදය, ආදීනවය හා නිස්සරණය ගැන යථා අවබෝධය නැත. එමනිසා, ඔහුට වස්තු කාමයෙහි යම් ආශාවක්, සොම්නසක්, සෙනෙහසක්, මත්වීමක්, පිපාසයක්, පරිදාහයක්, කාමයෙහි බැසගැනීමක්, තණ්හාවක් ඇතිවේද, එය කාම යොගය ය.

**"කතමො ච භික්ඛවෙ කාමයොගො? ... එකච්චො කාමානං සමුදයඤ්ච අත්ථගමඤ්ච අස්සාදඤ්ච ආදීනවඤ්ච නිස්සරණඤ්ච යථාභූතං අප්පජානතො යො කාමෙසු කාමරාගො කාමනන්දී කාමසිනෙහො කාමමුච්ඡා කාමපිපාසා කාමපරිළාහො කාමජ්ඣොසානං කාමතණ්හා සානුසෙති..."**. (Here, someone does not understand as they really are the origin and the passing away, the gratification, the danger, and the escape in regard to sensual pleasures. When one does not understand these things as they really are, then sensual lust, sensual delight, sensual affection, sensual infatuation, sensual thirst, sensual passion, sensual attachment, and sensual craving lie deep within one in regard to sensual pleasures. This is called the bond of sensuality). **සටහන:** පස්කම් සැපයට ඇති ඇල්ම කාම යොගය ය. 2 ) **භව යොගය:** කෙනෙක්හට, භවයේ ඇතිවීම, නැතිවීයාම, ආස්වාදය, ආදීනවය හා නිස්සරණය ගැන යථා අවබෝධය නැත. එමනිසා, ඔහුට භවය පිලිබඳ යම් ආශාවක්, සොම්නසක්, සෙනෙහසක්, මත්වීමක්, පිපාසයක්, පරිදාහයක්, භවයේ ගැලිසිටීමක්, භව තණ්හාවක් ඇතිවේද, එය භව යොගය ය. **සටහන:** රූප හා අරූප භවයන් පිලිබඳ ඇති කැමැත්ත භව යොගය ය. **3) දිට්ඨි යොගය:** කෙනෙක්, දිට්ඨි ඇතිවීම, නැතිවීයාම, ආස්වාදය, ආදීනවය හා නිස්සරණය ගැන යථා අවබෝධය නැත. එමනිසා, ඔහුට දිට්ඨි පිලිබඳ යම් ආශාවක්, සොම්නසක්, සෙනෙහසක්, මත්වීමක්, පිපාසයක්, පරිදාහයක්, ගැලිසිටීමක්, දිට්ඨි තණ්හාවක් ඇතිවේද, එය දිට්ඨි යොගය ය. **4) අවිජ්ජා යොගය:** කෙනෙක්, සය ආකාරවූ ස්පර්ශ ආයතනයන්, ඇතිවීම, නැතිවීයාම, ආස්වාදය, ආදීනවය හා නිස්සරණය ගැන යථා අවබෝධය නැත. එමනිසා, ඔහුට සය ස්පර්ශ ආයතන පිළිබඳව නුවණක් නොමැත. එනිසා ඔහු අවිජ්ජාවේ ගැලිසිටී, එය අවිජ්ජා යොගය වේ. (Here, someone does not understand as they really are the origin and the passing away, the gratification, the danger, and the escape in regard to the six bases for contact. When one does not understand these things as they really are, then, ignorance and unknowing lie deep within one in regard to the six bases for contact. This is called the bond of ignorance). මේ සතර යොග වලින් මිදීමේ ක්‍රමවිධිය පිළිබඳව **බලන්න:** සතර විසංයොග. **මූලාශ්‍ර:** අංගු.නි: (2 ): 4 නිපාත:4.1.1.10 යොග සූත්‍රය, පි. 42,EAN:4: 10.10 Bonds, p. 151.

▼ **සතර යොග** ආධ්‍යාත්මික වර්ධනයට හානිය ගෙන දෙන ධර්මතාය, ආපාය ගාමීය. **බලන්න**: හානභාගිය ධර්ම. **මූලාශ්‍ර:** දීඝ.නි: (3): 11 දසුත්තර සූත්‍රය, පි. 483, EDN: 34: Dasuttara Sutta: Expanding Decades, p. 384.

▼ **සතර යොග** ගැන මනා අවබෝධය ලැබීමට හා ඒවා ප්‍රහීණය කිරීමට ආරිය අටමග වර්ධනය කරගතයුතුවේ. **බලන්න**: යොගකෙඛමය. **මූලාශ්‍ර:** සංයු.නි: (5-1):මහාවග්ග: මග්ගසංයුත්ත: ඔඝවග්ග:1.16 යොග සූත්‍රය, පි.160, ESN: Maggasamyutta:45: Floods: 172.2 Bonds, p. 1719.

▼ **කායගතා සතිය** වඩාගැනීමෙන් සතර යොගයෙන් ගැලවිය හැකිවේ. **බලන්න**: කායගතා සතියේ ප්‍රති ලාභ. **මූලාශ්‍ර:** අංගු.නි: (1): 1 නිපාත:

කායගතාසති වග්ග සූත්‍ර, පි. 125, EAN:1: Mindfulness Directed to the Body, p.52.

▲**සතරවරම් දෙවියෝ-** Sathravaram Deviyo: සිව්වරම් දෙවියෝ, ලෝකපාලක දෙවියෝ ලෙසින්ද හඳුන්වති. **බලන්න**: චාතුර්මහාරාජික දෙව්ලොව

▲**සතර විපල්ලාස** - Four perversions **-** distortions-inversion : විපල්ලාස යනු ඇතිසැටිය- යථාබව නොදැකීම හෙවත් සත්‍ය වැරදි ලෙස අවබෝධ කිරීමය, විපරියාස කිරීමයය. අවිද්‍යාව නිසා මේවා ඇතිවේ. සතර විපල්ලාස ඇතිවීම: **සංඥා, චිත්ත, දිට්ඨි** නිසා සතර විපල්ලාස ඇතිවේ: 1) අනිත්‍ය දේ නිත්‍ය යයි ගන්නා සංඥා, චිත්ත, දිට්ඨි විපල්ලාසය. 2) දුක් දේ සැප (සුඛ) යයි ගන්නා සංඥා, චිත්ත, දිට්ඨි විපල්ලාසය. 3) අනාත්ම දේ ආත්ම යයි ගන්නා සංඥා, චිත්ත, දිට්ඨි විපල්ලාසය. 4) අසුභ දේ සුභය යයි ගන්නා සංඥා, චිත්ත, දිට්ඨි විපල්ලාසය.. (...there are these four inversions of perception, inversions of mind, and inversions of view. What four? (1) The inversion of perception, mind, and view that takes the impermanent to be permanent; (2) the inversion of perception, mind, and view that takes what is suffering to be pleasurable (3) the inversion of perception, mind, and view that takes what is non-self to be self; (4) the inversion of perception, mind, and view that takes what is unattractive to be attractive).

මිථ්‍යා දිට්ඨිය ඇතිවීම නිසා විපල්ලාස ඇතිවේ, ඔවුන් මාරයාගේ බැම්මට හසුවූ පුද්ගලයන්ය, ඔවුන් ඉපදී මැරී යළි ඉපදි සසර සැරිසරයි. **සතර විපල්ලාස වලින් මිදීම:** 1) අනිච්ච දේ අනිච්ච යන සංඥාව, චිත්තය හා දිට්ඨිය ඇතිවීමෙන් 2) දුක ගෙනෙදෙන දේ දුකය යන සංඥාව, චිත්තය හා දිට්ඨිය ඇතිවීමෙන් 3) අනාත්ම දේ අනාත්මය යන සංඥාව, චිත්තය හා දිට්ඨිය ඇතිවීමෙන් 4) අසුභ දේ අසුභය යන සංඥාව, චිත්තය හා දිට්ඨිය ඇතිවීමෙන්. ධර්මය යහපත් ලෙසින් අවබෝධ කරගන්නා පුද්ගලයෝ, සම්මා දිට්ඨිය ඇතිකර, විපල්ලාස වලින් මිදී දුකෙන් නිදහස්වේ යයි බුදුන් වහන්සේ වදාළහ. **සටහන:** සොතාපත්ති මගඵල ලැබූවිට - සියලු විපල්ලාස නිසා ඇතිවන නිච්චබව නැතිවී අනිච්ච බව අවබෝධ වේ, ආත්ම බව නැතිවී අනාත්ම බව අවබෝධ වේ. එසේම අසුභ දේ සුභ යයි ගැනීම හා දුක දේ සැප යයි ගැනීම තුනිවියයි. අනාගාමී මගඵල සාක්ෂාත්වූවිට සංඥා විපල්ලාස හා චිත්ත විපල්ලාස නිසා ගන්නා අසුභ දේ සුභය යන්න නැතිවේ. අරහත් මගඵල සාක්ෂාත්වූවිට සංඥා විපල්ලාස හා චිත්ත විපල්ලාස නිසා ගන්නා දුක සැපයක් යන්න සහමුලින්ම නැතිවේ. **බලන්න**: සිංහල විසුද්ධිමග, පරිච්ඡේදය: 22, පි. 1069. **මූලාශ්‍ර:** අංගු.නි: ( 2): 4 නිපාත: 4.1.5.9 විපල්ලාස සූත්‍රය, පි. 122, EAN:4: 49.9 Inversions, p. 168.

▼**වෙනත් මූලාශ්‍ර**: 1. The Manual of Insight by Ledi Sayadaw Mahathera: Wheel 31-32: BPS, 2007.

▲ **සතර විසංයොග**:පාලි: **චත්තාරො විසංයොගො-** four unyoking: සතර විසංයොග යනු සතර යොගයන් (සසරට බැඳ තබන බැම්) ගලවා දැමීමය. **බලන්න**: යොග.

▼ **සතර විසංයොග**: කාම විසංයොගය, භව විසංයොගය, දිට්ඨි විසංයොගය හා අවිජ්ජා විසංයොගය ය. සසර බැඳ තබන බැමි වලින් නිදහස්වීම ආධ්‍යාත්මික මාර්ගයට විශේෂ බවක් ගෙනෙදේ (ආධ්‍යාත්මික වර්ධනයට විශේෂයෙන්ම උපකාරිවන කරුණු විසේසභාගිය ධර්ම වේ). සතර විසංයොග විසේසභාගිය ධර්මතා වේ. **සටහන**: සෝතාපන්න මගඵල ලැබීම දිට්ඨි විසංයොගයට හේතුවේ. අසුභ භාවනාව වඩා ලබන ජාන සමාපත්ති පදනම් කර ලබන ආනගාමි මග කාම විසංයොගය ට හේතුවේ. අරහත්වයට පත්වීම නිසා භව විසංයොගය හා අවිජ්ජා විසංයොගය ඇතිවේ. **බලන්න**: විසේසභාගිය ධර්ම.**මූලාශ්‍ර:** දීඝ.නි: (3):11 දසුත්තර සූත්‍රය, පි. 483, EDN: 34: Dasuttara Sutta: Expanding Decades, p. 384.

▼ **සතර විසංයොගය පිලිබඳ ක්‍රම විධිය**:: **1) කාම යොගය විසංයොග කරගැනීම** (severance of the bond of sensuality): කෙනෙකුට, කාමයේ ඇතිවීම, නැතිවීයාම, ආස්වාදය, ආදීනවය හා නිස්සරණය ගැන යථා අවබෝධය ඇත. එමනිසා, ඔහුට වස්තු කාමයෙහි යම් ආශාවක්, සොම්නසක්, සෙනෙහසක්, මත්වීමක්, පිපාසයක්, පරිදාහයක්, කාමයෙහි බැසගැනීමක්, තණ්හාවක් නොමැත, එය කාම යොගයෙන් නිදහස්වීමය. **2) භව යොගය විසංයොග කරගැනීම** (severance of the bond of existence): කෙනෙක්හට, භවයේ ඇතිවීම, නැතිවීයාම, ආස්වාදය, ආදීනවය හා නිස්සරණය ගැන යථා අවබෝධය ඇත. එමනිසා, ඔහුට භවය පිලිබඳ යම් ආශාවක්, සොම්නසක්, සෙනෙහසක්, මත්වීමක්, පිපාසයක්, පරිදාහයක්, භවයේ ගැලිසිටීමක්, භව තණ්හාවක් ඇතිනොවේ, එය භව යොගයෙන් නිදහස්වීමය. **3) දිට්ඨි යොගය විසංයොග කරගැනීම**: (severance of the bond of views) කෙනෙක්හට, දිට්ඨි ඇතිවීම, නැතිවීයාම, ආස්වාදය, ආදීනවය හා නිස්සරණය ගැන යථා අවබෝධය ඇත. එමනිසා, ඔහුට දිට්ඨි පිලිබඳ යම් ආශාවක්, සොම්නසක්, සෙනෙහසක්, මත්වීමක්, පිපාසයක්, පරිදාහයක්, ගැලිසිටීමක්, දිට්ඨි තණ්හාවක් ඇතිනොවේ, එය දිට්ඨි යොගයෙන් නිදහස්වීමය. **4) අවිජ්ජා යොගය විසංයොග කරගැනීම** (severance of the bond of ignorance): කෙනෙක්හට, සය ආකාරවූ ස්පර්ශ ආයතනයන්, ඇතිවීම, නැතිවීයාම, ආස්වාදය, ආදීනවය හා නිස්සරණය ගැන යථා අවබෝධය ඇත. ඔහුට සය ස්පර්ශ ආයතන පිළිබඳව නුවණ ඇත. එනිසා ඔහුට අවිජ්ජාව ඇතිනොවේ, ඔහු අවිජ්ජා යොගයෙන් නිදහස් වීඇත. **මූලාශ්‍ර:** අංගු.නි: (2): 4 නිපාත:4.1.1.10 යොග සූත්‍රය,පි. 42,EAN:4: 10.10 Bonds, p. 151.

▲**සතර වොහාරධර්ම :** පාලි: **චත්තාරො වොහාරො** - four kinds of expression: ධර්මයට අනුව සතරවොහාර ලෙසින් පෙන්වා ඇත්තේ: ඇසෙන් දැකීම, කණෙන් ඇසීම, නාසය, දිව හා කයෙන් දැනීම-විඳීම හා සිතෙන් සිතිමය **"...දීටෙඨ දිටඨවාදිතා, සුතෙ සුතවාදිතා, මුතෙ මුතවාදිතා, විඤඤාතෙ වීඤඤාතවාදිතා"**

එනම්: දක්නා ලද්දෙහි , දකිනා ලද බව (දෘෂ්ටවාදිබව) , අසන ලද්දෙහි ශ්‍රැතවාදිබව, ගන්ධ රස ස්පර්ෂ (ආදී විඳීම්) මුතයෙහි මුතවාදිබව, විඥානහි විඥානවාදිබව. (One speaks of the seen as it was seen; one speaks of the heard as it was heard; one speaks of the sensed as it was sensed; one speaks of the cognized as it was cognized). සතර

වොහාරයන් උපාදාන නොකර, ආසවයන් ගෙන් මිදීම විසුද්ධිය ලැබීමය- අරහත්වයට පත්වීමය. **සටහන**: මේ ධර්මතා ක්‍ෂණිකව අවබෝධ කරගත් බහියා දාරුචාර්ය, අරහත්වය ලබාගති. **බලන්න:** උපග්‍රන්ථය:1 **මූලාශ්‍ර:** ම.නි : (3 ): 3.3.2. ඡබ්බිසෝධන සූත්‍රය, පි. 158, EMN: 112: The Six fold Purity -Chabbisodhana sutta p. 814.

▼ **පෘතජ්ජන පුද්ගලයා සතර වෝහාර ධර්ම හඳුනාගන්නා ආකාරය**: පෘතජ්ජනයා ඇසෙන් දුටු රූපය, කණට ඇසුන ශබ්දය, නාසයට, දිවට හා කයට දැනුන විඳීම (ගඳසුවඳ-රස හා පහස) තමාගේ යයි තණ්හාවෙන් හා මානයෙන් යුතුව හඳුනාගනී. සක්කාය දිට්ඨිය ඇති නිසා ඔහු සතර වෝහාර ධර්මතා තමාගේ යයි සලකයි (යථාභූත ඥානය නොමැතිනිසා). උසස් පුහුණුවේ යෙදුන භික්ෂුව (සේඛ) සතර වෝහාර ධර්මවතාවන්හි නියම ස්වභාවය දනී, එමනිසා ඒවා මගේයයි අල්වා නොගැනීමට පුහුණුවේ. රහතන්වහන්සේ එම ධර්මතා පිලිබඳව යථාඅවබෝධය ලබා ඇත. **මූලාශ්‍ර:** ම.නි:(1):1.1 මූලපරියාය සූත්‍රය,**පි**.22, EMN:1: Mūlapariyāya Sutta, p.61.

▲ **සතර සංග්‍රහ වස්තු-** four things for the welfare and happiness: සතර සංග්‍රහ වස්තු යනු ගිහියන්ට, යහපත් ජීවිතයක් පවත්වා ගැනීම පිණිස බුදුන් වහන්සේ වදාළ කරුණු 4 ගැනය: උට්ඨාන සම්පත, ආරක්ෂා සම්පත, කල්‍යාණ මිත්‍ර සම්පත, හා සමජිවිතය පවත්වා ගැනීම. **බලන්න**: ගිහිජීවිතය යහපත්ව ගතකිරීම. **සටහන**: සෙසු අය සමග යහපත් සම්බන්ධතාවයක් පවත්වාගැනීමට උපකාරීවන සංග්‍රහ වස්තු 4 ක් අංගු.නි: (2): 4 නිපාතයේ පෙන්වා ඇත: දානය (ත්‍යාගශීලිබව) , ප්‍රියවචන, යහපත් චරියාව, සමානාත්මතාවය. (...there are these four means of sustaining a favorable relationship. What four? Giving, endearing speech, beneficent conduct, and impartiality). **මූලාශ්‍ර:** අංගු.නි: (5): 8 නිපාත: 8.2.6.4 ව්‍යාගපජ්ජ සූත්‍රය, පි 256,EAN: 8: 54 .4 Dīghajāṇu, p 441, අංගු.නි: (2 ) 4 නිපාත: 4.1.4.2 සංග්‍රහ වස්තු සූත්‍රය, පි. 88, EAN:4: 32.2 Sustaining, p. 160.

▲ **සතර සතිපට්ඨානය:** පාලි: **චත්තාරො සතිපට්ඨානා-**Four foundations of mindfulness: සතර සති පට්ඨානය ලෙසින් පෙන්වා ඇත්තේ සතිය පිහිටුවා ගැනීම පිණිස බුදුන් වහන්සේ පෙන්වා වදාළ ක්‍රම විධි 4 ය: කායානුපස්සනාව, වේදනානුපස්සනාව, චිත්තානු පස්සනාව හා ධම්මානුපස්සනාවය. සතර සතිපට්ඨානය බෝධිපාක්ෂික ධර්මයකි. **මූලාශ්‍ර**:ම.නි: (1): 1.1.10 සතිපට්ඨාන සූත්‍රය, පි. ම.නි: (3): 3.2.8 අනාපානසති සූත්‍රය, පි. 240, EMN:118: Ānāpānasati Sutta-Mindfulness of Breathing, p. 861, දීඝ.නි: (2): 9 මහාසතිපට්ඨාන සූත්‍රය, පි. 451, EDN:22 Mahāsatipaṭṭhāna Sutta: The Greater Discourse on the Foundations of Mindfulness, p. 246. **ශබ්දකෝෂ: පා.සි.ශ**: පි.497 : "**සති': **සමෘතිය, සිහිය', '**සතිපට්ඨාන**': සිහිය පිහිටවීම". **B.D**: p. 307: "**sati'**: mindfulness; '**satipaṭṭhāna**: the 4 foundation of mindfulness: body, feeling, mind and mind objects". **P.T.S**: p. 1514: "four **satipaṭṭhānas**, referring to the body, the sensations, the mind, and phenomena respectively".

▼**සතර සති පට්ඨානය** ආධ්‍යාත්මික ජීවිතය වර්ධනය කරගැනීම පිණිස දියුණු කර ගත යුතු ධර්මතා ය- භාවේතබ්බ ධර්මයන්ය:

**" කතමෙ චත්තාරො ධම්මා භාවෙතබ්බා ? චත්තාරො සතිපට්ඨානා: ඉධාවුසො භික්ඛු කායෙ කායානුපස්සී විහරති ආතාපි සම්පජානො සතිමා විනෙය්‍ය ලොකෙ අභිජ්ඣා දොමනස්සං-(**පෙරමෙන්) **වෙදනානුසුපස්සී... චිත්තානුසුපස්සී... ධම්මානුසුපස්සී ..."**. ' මේ මහණ, කෙලෙස් තවන වීරිය ඇතිව, නුවණ හා සිහිය ඇතිව, ලෝකය කෙරෙහි ඇති සියලු අබිජ්ජාව- දැඩි ආශාව හා දොම්නස බැහැර කර කායානුපස්සනාව... වේදනානු පස්සනාව... චිත්තානුපස්සනාව හා ධම්මානුපස්සනාව වඩයි'. **බලන්න:** භාවේතබ්බ ධර්ම. **මූලාශ්‍ර:** දීඝ.නි : (3 ): 11 දසුත්තර සූත්‍රය, පි. 483, EDN: 34: Dasuttara Sutta: Expanding Decades, p. 384.

▼ **සතර සති පට්ඨානය නිවන් මගය- අසංඛත මගය**: **මූලාශ්‍ර:** සංයු.නි: (4 ): සළායතන වග්ග:අසංඛත සංයුත්ත: 9.1.5. සති පට්ඨානය සූත්‍රය, පි. 662, ESN: Asankatasamyutta: p. 1493.

▼ **නිවන පසක් කිරීම පිණිස ඇති එකම මග** සතර සතිපට්ඨානය යයි, බුදුව, අජපාල නුගරුක මුල වැඩසිටි බුදුන් වහන්සේට චිත්ත චිතර්කයක් ඇතිවූබව මෙහි දක්වා ඇත. ඒ අවස්ථාවේ එහි පැමිණි සහම්පති බ්‍රහ්මරාජ එය පිළිගත්බවද මේ සූත්‍රයේ පෙන්වා ඇත. **මූලාශ්‍ර:** :සංයු.නි: (5-1): මහාවග්ග: බොජ්ඣංගසංයුත්ත:3.2.8 බ්‍රහ්මසූත්‍රය, පි.328.

▲ **සතර සමාධි**: පාලි: **චත්තාරො සමාධායො**- Four Samadhi: සතර සමාධි ලෙසින් පෙන්වා ඇත්තේ, අවබෝධය පහසු නැති (දුෂ්ප්‍රතිවිධ්‍ය) සමාධි 4 ක් ගැනය: 1) **හානභාගික සමාධිය** (හානභාගීයො- conducing to decline) **:** නීවරණ පහවී නොමැති නිසා මේ සමාධිය මර්ගයේ පිරිහීම ඇති කරයි, එහෙත් ඒ බව අවබෝධ කරගැනීම පහසු නොවේ. 2) **සඨිතිභාගික සමාධිය** (ඨිතිභාගියො- conducing to stasis): පිරිහීම හෝ වැඩීම නැති ව පවතින සමාධිය 3) **විශේෂභාගික සමාධිය** (විසෙසභාගියො- conducive to distinction): මාර්ගයේ විශේෂත්වය ඇතිකර ගැනීමට හේතුවන සමාධියය. 4) **නිබ්බේදභාගික සමාධිය** ( නිබ්බෙධභාගීයො- conducive to penetration) නිවන පිණිස පවතින සමාධිය. **බලන්න**: දුෂ්ප්‍රතිවිධ්‍ය ධර්මතා. **මූලාශ්‍ර:** දීඝ.නි: (3): 11දසුත්තර සූත්‍රය, පි. 483, EDN: 34: Dasuttara Sutta: Expanding Decades, p. 384.

▲ **සතර සාන්දෘෂ්ටික දාන ඵල-** Sathra sandrustika dana phala: යහපත් ලෙසින් දෙන දානය නිසා මේ ජීවිතයේදීම, තමාටම දැකිය හැකි ඵල, ප්‍රතිලාභ, සාන්දෘෂ්ටික දාන ඵලවේ.1) බොහෝ දෙනාට ප්‍රියවීම 2) සත්පුරුෂ ඇසුර ලැබීම 3) කිර්තිය පැතිරීම 4) ඕනෑම පිරිස් මුළුවකට නිර්භයව එළඹීමට හැකියාව ඇත. **සටහන්: *** පරලොව විපාකය නම් සුගතියේ උපත ලැබීම. ** මේ දේශනාව වදාළේ, සිහසේනාපතිටය. **මූලාශ්‍රය**: අංගු.නි: (3) 5 නිපාත: 5.1.4.4. සිහසේනාපති සූත්‍රය, පි.82,

▲**සතර සම්‍යක් ප්‍රධාන වීරිය**- The four right efforts: සතර සම්‍යක් ප්‍රධාන වීරිය (පධාන-ප්‍රධන් වීරිය), බෝධිපාක්‍යධර්මතාවකි. උපන් අකුසල නැතිකරගැනීමට, නූපන් අකුසල ඇතිනොකරගැනීමට, නූපන් කුසල ඇතිකරගැනීමට, උපන් කුසල ආරකෂා කරගනිමින් දියුණු කිරීමට

ගන්නා වීරිය සතර සතර සම්‍යක් ප්‍රධාන වීරිය ලෙසින් මෙහි පෙන්වා ඇත. අරහත්වය පිණිස මේ විරිය වැඩිය යුතුය. **බලන්න**: ප්‍රධන් වීරිය.බුදුන් වහන්සේ මෙසේ වදාළහ:

"සම්‍යක් ප්‍රධාන වීරිය ඇති, සසරවටය නැමති මාරයාගේ ආදිපත්‍යය මැඩ සිටින ඒ රහතුන් අනිස්සිතය, ජාති මරණ භිය කෙළවර කර ඇත. සන්තුෂ්ටිය ඇති ඒ රහතුන් මාරසේනාව පරදවා, තණ්හාව පහ කරගත් සුඛිතයෝ වෙති". **මූලාශ්‍රය:** අංගු.නි: (2) 4 නිපාත: චරවග්ග: 4.1.2.3 පධාන සූත්‍රය, පි.52.

▼**සතර ප්‍රධන් වීරියකිරීම**: සතර ආකාරයෙන් වීරිය ඇතිකර ගතයුතුවේ: 1)සංවරප්පධාන වීරිය: සය ඉන්ද්‍රිය සංවර කරගැනීම2) පහාණප්පධාන වීරිය: උපන් අකුසල විතක්ක පහකර ගැනීම 3)භාවනාප්පධාන වීරිය: විවේකය, විරාගය, නිරෝධය නිස්සිත කරගෙන, නිවන අරමුණුකොට සප්ත බොජ්ඣංග වැඩිම . 4) අනුරක්ඛනප්පධාන වීරිය: සමාධි නිමිත්ත මැනවින් රැකීම. **සටහන**: සමාධි නිමිත්ත ලෙසින් මෙහි පෙන්වා ඇත්තේ : අට්ඨික සංඥාව, පුලවක සංඥාව, විනීලක සංඥාව, විපුබ්බක සංඥාව, විච්ඡිද්දැක සංඥාව, උද්ධුමාතක සංඥාවය. **බලන්න**: භාවනා. **මූලාශ්‍රය**:අංගු.නි (2) 4 නිපාත: චරවග්ග: 4.1.2.4 සංවරප්පධාන සූත්‍රය, පි.54.

▲ **සතර ශ්‍රමණ ඵල**: පාලි: **චත්තාරො සාමඤ්ඤඵලානි-** Four fruits of the ascetic life: සතර ශ්‍රමණ ඵල යනු ශ්‍රමණභාවය පියවරින් පියවර දියුණුකර ගැනීම නිසා ලැබෙන යහපත් ඵල විපාකයන්ය: සොතාපන්න, සකදාගාමී, ආනගාමී හා අරහත් ඵල ලැබීමය. **සටහන:** ශ්‍රමණ ඵල ගැන විස්තර පිණිස **බලන්න**: ම.නි: ශ්‍රමණඵල සූත්‍රය.

▼ **සතර ශ්‍රමණ ඵල**, සච්ඡිකාතබ්බ ධර්ම (සාක්ෂාත් කරගතයුතු - ප්‍රත්‍යක්ෂ කලයුතු) දේය, නිවන පිණිස පවතී:

**" කතමෙ චත්තාරො ධම්මා සච්ඡිකාතබ්බා ? චත්තාරි සාමඤ්ඤඵලානි: සොතාපත්තිඵලං, සකදාගාමිඵලං, අනාගාමිඵලං, අරහත්තඵලං…"** . **මූලාශ්‍ර:** දීඝ.නි : (3 ): **11 දසුත්තර සූත්‍රය**, පි. 483, EDN: 34: Dasuttara Sutta: Expanding Decades, p. 384.

▼ **කායගතා සතිය** වඩාගැනීමෙන් සතර ශ්‍රමණ ඵල ඇතිවේ.: **බලන්න**: කායගතා සතියේ ප්‍රති ලාභ. **මූලාශ්‍ර:** අංගු.නි: (1 ): 1 නිපාත: කායගතාසති වග්ග සූත්‍ර, පි. 125, EAN:1: Mindfulness Directed to the Body, p.52.

▲**සතිය**: පාලි: **සතො-** mindful: ධර්මයට අනුව සතිය-සිහිය, තිබීම ආධ්‍යාත්මික මාර්ගය වඩා ගැනීමට උපකාරිවේ. පැරණි කල කි දේ නුවණින් මතක් කිරීම සතියේ කාර්ය ය. එමගින්, යම් අකුසලයක් කරන්නට යන විට සිහිය මගින් එය නරක දෙයක්බව මතක්කර දීම නිසා අකුසලයෙන් ගැලවීමට හැකිවේ. සිහිය මානව වර්ධනය කරගෙන, ජාන සමාපත්ති ලබා ගත් කෙනෙකුට පෙර ජාති සිහිකර ගැනීමේ නුවණ ඇතිවේ. සතිය මගින් සතර සති පට්ඨාන භාවනාව දියුණු කර ගත හැකිවේ. බුද්ධානුස්සති ආදීවූ අනුසති භාවනා වඩා ගැනීමට යහපත් සතිය උපකාරිවේ. ධර්මයේ සතිය ඉන්ද්‍රියක් හා බලයක් ලෙසින් පෙන්වා ඇත. සම්මා සතිය- යහපත්ව සිහිය පවත්වා ගැනීම ආරිය අටමගේ එක්

අංගයකි, සප්ත බොජ්ඣංග ධර්මතාවයකි. සියලු ධර්මතා සිහිය අධිපති කොට ඇතයි බුදුන් වහන්සේ වදාළහ:

**" සතාධිපතෙයයා සබෙබ ධම්මා".**

**බලන්න:** සබෙබ ධම්මා, සම්ප්‍රජන්‍යය. **සටහන:** ආධ්‍යාත්මික වර්ධනය පිණිස සතිය හා සම්ප්‍රජන්‍යය එකක්ව ගෙන කටයුතු කළයුතුය. **ශබ්දකෝෂ: පා.සිං.ශ:** පි. 497: "**සති**: සමෘතිය, සිහිය". **B.D:** p. 165: "**Mindfulness**: is one of the 5 spiritual faculties and powers…"

▼ **සතිය- සිහිය**, සේඛ පුහුණුවේ යෙදෙන භික්ෂූන් සතු යහපත් ගුණ ධර්මයන්ගෙන් එකකි, එම භික්ෂුව සිහිය ඇතිව, නුවන ඇතිව, පෙර කළ දේ කියූ දේ සිහිකරයි, පුනපුනා සිහි කරයි. **බලන්න**: සප්ත සද්ධර්ම.

**" …සතිමා හොති පරමෙන සතිනෙපක්කෙන සමන්නාගතො. චිරකතම්පි චිරභාසිතම්පි සරිතා අනුස්සරිතා…"**

( He has mindfulness; he possesses the highest mindfulness and skill; he recalls and recollects what was done long ago and spoken long ago). **මූලාශ්‍ර**: ම.නි: (2 ): 2.1.3 :සේඛ සූත්‍රය, පි. 44, MN 53: Sekha Sutta, p. 436.

▼**සතිය තිබීම** ආධ්‍යාත්මික ජීවිතයට ආරක්ෂාව ලබාදේ. **බලන්න**: නාථකරණ ධර්ම. **මූලාශ්‍ර**: අංගු.නි: (6): 10 නිපාත: 2 නාථ වග්ග, 10.1.2.7 ප්‍රථම නාථකරණ සූත්‍රය, EAN:10: II Protector: 17.7 Protector I, p.497.

▼**සිහිය ඇතිව වාසය කරන්නේ කෙසේද?** බුදුන් වහන්සේ මෙසේ පෙන්වා ඇත:

"...භික්ෂුව කයෙහි කය අනුව බලමින් ... වේදනාවන්හි වේදනා අනුව බලමින්... සිතෙහි සිත අනුව බලමින් ...දහමෙහි දහම් අනුව බලමින් කෙලෙස් තවන වීරිය ඇතිව, මනා නුවණ ඇතිව සිහි ඇතිව, ලෝකය පිලිබඳ ඇති දැඩි ලෝභය හා දොම්නස දුරුකොට වාසය කරයි...එය සිහිය ඇතිව වාසය කිරීමය"

**"කථඤ්ච භික්ඛවෙ භික්ඛු සතො හොති: ඉධ භික්ඛවෙ භික්ඛු කායෙ කායානුපස්සී… වෙදනාසු වෙදනානුපස්සී… චිත්තෙ චිත්තානුපස්සී… ධම්මෙසු ධම්මානුපස්සී විහරති ආතාපී සම්පජානො සතිමා විනෙය්‍ය ලොකෙ අභිජ්ඣා දොමනස්සං; එවං ඛො භික්ඛවෙ භික්ඛු සතො හොති".**
( And how, bhikkhus, is a bhikkhu mindful? Here, bhikkhus, a bhikkhu dwells contemplating the body in the body... contemplating feelings in feelings … mind in mind …phenomena in phenomena, ardent, clearly comprehending, mindful, having put away covetousness and displeasure in regard to the world. It is in such a way that a bhikkhu is mindful). **මූලාශ්‍ර:** සං.නි: (4 ):සළායතන වග්ග: වේදනා සංයුත්ත:සගාථා වගග: 1.20.7 ගිලන්හල සූත්‍රය, පි.424 , ESN: 36: Vedanāsamyutta, 7.7 The sick ward, p. 1339.

▼**එක් සමයක මණිභද්ද නම් යක්ෂයෙක්**, බුදුන්වහන්සේ වෙත එළඹ සිහිය පවත්වා ගැනීමේ ගුණ පැවසිය:

"සිහිය ඇත්තාට හැම කල යහපත ඇතිවේ, සුවය වැඩේ, ඔවුන් සැම කාලයේදීම ශ්‍රෙෂ්ඨය, ඔහු වෛරයෙන් මිදේ".

බුදුන්වහන්සේ එම ගුණ අනුමත කරමින් වදාළේ, සිහිය ඇති පමණින්ම වෛරයෙන් මිදීමට නොහැකිබවය. දිවා රෑ අහිංසාවෙන් යුතුව, සියලු සත්ඣයන් කෙරෙහි මෙත්තා සිත වැඩීමෙන් වෛරයෙන් මිදිය හැකිය. **බලන්න**: මණිභද්ද යක්ෂ. **මූලාශ්‍ර**: සංයු.නි: (1 ): සගාථවග්ග: යක්ඛ සංයුත්ත: 10.1.4. මණිභද්ද සූත්‍රය, පි.396, ESN: 10: Yakkasamyutta: 4 Maṇibhadda, p. 438.

▲ **සති ඉන්ද්‍රිය:** පාලි: **සතිනද්‍රියං-**faculty of mindfulness: ආධ්‍යාත්මික ඉන්ද්‍රිය පහෙන් එකකි, ආධ්‍යාත්මික මාර්ගයට විශේෂතාවයක් ලබා දෙයි. බෝධි පාක්ෂික ධර්මතාවයකි. **බලන්න**: පංච ඉන්ද්‍රිය, සතිය.

▼ **සති ඉන්ද්‍රිය යනු කුමක්ද?**

**"කතමඤ්ච භික්ඛවෙ සතිනද්‍රියං: ඉධ භික්ඛවෙ අරියසාවකො සතිමා හොති පරමෙන සතිනෙපක්කෙන සමන්නාගතො චිරකතම්පි චිරභාසිතම්පි සරිතා. ඉදං වුච්චති සතිනද්‍රියං"**: ආරිය ශ්‍රාවකයා සිහිමත්ව, පරම (උතුම්) සතිය හා ප්‍රඥාව (සති ප්‍රඥා-සිහිනුවණ) ඇතිව, පෙර කලදේ, පෙර ඇසූ දේ යහපත් ලෙසින් මතක්කර ගැනීමය, සිහි එළවා ගැනීමය. මේ සති ඉන්ද්‍රියය. සති ඉන්ද්‍රිය, සතර සතිපට්ඨානය තුලින් දැකිය හැකිය. **බලන්න:** සතර සතිපට්ඨානය. **මූලාශ්‍ර**: සංයු: (5-1 ): මහාවග්ග: ඉන්ද්‍රියසංයුත්ත: 4.1.8 දට්ඨබ්බ සූත්‍රය හා 4.1.9. විභංග සූත්‍රය, පි. 377, ESN:48: Indriyasamyutta: 8.8 To be seen & 9.9 Analysis, p. 1933.

▲ **සති චරියාව-** Sati Chariya: සතිචරියාව ලෙසින් පෙන්වා ඇත්තේ සතර සතිපට්ඨානය අනුව වාසය කිරීමය. **බලන්න**: චරියා කථා.

▲**සතිමත්තාන-** Satimaththana: සතිමත්තාන-ධාරණස්මෘතිය, ලෙසින් පෙන්වා ඇත්තේ, ඇසූ දහම යහපත් ලෙසින් සිහියේ පවත්වා ගැනීමය. එම හැකියාව ඇති භික්ෂූන් අතරින් ආනන්ද තෙරුන් අග්‍රය. **බලන්න**: උපග්‍රන්ථය:1

▲**සති සම්ප්‍රජන්‍යය:** පාලි: **සතො සම්පජානො -**clear comprehension: සති සම්ප්‍රජන්‍යය ලෙසින් ධර්මයේ පෙන්වා ඇත්තේ සිහිය ඇතිව, නුවණින් කටයුතුකිරීමය - යෝනිසෝ මනසිකාරයෙන්කටයුතු කිරීමය. ආධ්‍යාත්මික වර්ධනය පිණිස සතිය හා සම්ප්‍රජන්‍යය එක්වගෙන කටයුතු කලයුතුවේ. එය සති ප්‍රඥාවය. **බලන්න**: සතිය. **ශබ්දකෝෂ: පා.සිං.ශ:** පි.497: පි.502: '**සම්පජඤ්ඤ:** මනා ප්‍රඥා ඇතිබව- මනා දැනීම, **සම්පජානකාරී**: මනා ප්‍රඥාවෙන් යුතුව ක්‍රියාකරන්නා'. **B.D**: p.159: '**Sampajañña**: Clarity of consciousness, clear comprehension. This term is frequently met with in combination with Mindfulness (sati)'.

▼ **සම්ප්‍රජන්‍යය** ඇතිවීමට මූලික වන්නේ යෝනිසෝමනසිකාරයෙන් කටයුතු කිරීමය. සති සම්ප්‍රජන්‍යය ඇතිවිට ඉන්ද්‍රිය සංවරය ඇතිවේ ය යි

බුදුන් වහන්සේ පෙන්වා ඇත. **මූලාශ්‍ර:** අංගු.නි: (6): 10 නිපාත: යමක වග්ග: 10.2.2.1. අවිද්‍යා සූත්‍රය, පි.232, EAN:10: II Pairs: 61.1.Ignorance, p. 517.

▼ **ශ්‍රමණ බව සාක්ෂාත් කරගැනීම** පිණිස සම්පූර්ණ කරගතයුතු කරුණුවලට සති සම්ප්‍රජන්‍යය ඇතුලත්වේ. **සටහන්:** * මේ සූත්‍රයේදී සති සම්ප්‍රජන්‍යය පවත්වා ගන්නා ආකරය පෙන්වා ඇත ** සති සම්ප්‍රජන්‍යය පිළිබඳව බලන්න: දීඝ.නි: මහා සතිපට්ඨාන සූත්‍රය හා ම.නි: සතිපට්ඨාන සූත්‍රය. **මූලාශ්‍ර:** ම.නි: (1): 1.4.9 මහා අස්සපුර සූත්‍රය, පි. 652, EMN :39 The greater discourse at Assapura, p. 344

▼ **සති සම්ප්‍රජන්‍යය**, ආධ්‍යාත්මික වර්ධනය පිණිස බහු උපකාර ධර්මයකි. **බලන්න:** බහු උපකාර ධර්ම. **මූලාශ්‍ර:** දීඝ.නි: (3 ): 11 දසුත්තර සූත්‍රය**,** පි. 483, EDN: 34: Dasuttara Sutta: Expanding Decades, p. 384

▼ **කායගතා සතිය වඩා ගැනීම සතිසම්ප්‍රජන්‍යය පිණිස පවතී බලන්න:** කායගතා සතියේ ප්‍රතිලාභ. **මූලාශ්‍ර:** අංගු.නි: (1): 1 නිපාත: කායගතාසති වග්ග සූත්‍ර, පි. 125, EAN:1: Mindfulness Directed to the Body, p.52.

▼**බුදුන් වහන්සේ**, සති සම්ප්‍රජන්‍යය පිළිබඳව යහපත් ලෙසින් වදාරා ඇත. ඒ ධර්මතාවය සංඝයා එක්ව, ධර්මයේ චිරස්ථිතිය පිණිස සජ්ජායනා කිරීම සුදුසු ය යි සැරියුත් මහා තෙරුන් සංඝයාට උපදෙස් දී ඇත. **මූලාශ්‍ර:** දිඝ.නි: (3):10 සංගිති සූත්‍රය, පි. 372 , EDN: 33 Saṅgīti Sutta: The Chanting Together, p. 362.

▼ **සතිසම්ප්‍රජන්‍යය වඩන ආකාරය**: 1) යම් වේදනාවක් ඇතිවූවිට, තමන්ට වේදනාවක් ඇතිවූ බව දනී 2) එම වේදනාව පවතිනතාක් කල් එම වේදනාව පවතින බව දනී 3) එම වේදනාව නැතිවූ විට වේදනාව නැතිවූ බව දනී...එලෙස සංඥා...සංඛාර පිළිබඳවද ආවර්ජනය කලයුතුවේ. **සටහන්**: * නන්ද තෙරුන් සතිසම්ප්‍රජන්‍ය වඩන ආකාරය බුදුන් වහන්සේ මේ සූත්‍රයේ පෙන්වා තිබේ. ** පිරිසිදු පරිපූර්ණ ආධ්‍යාත්මික ජීවිතය පිණිස සතිසම්ප්‍රජන්‍ය අවශ්‍යවේ. **බලන්න**: පිරිසිදු පරිපූර්ණ ආධ්‍යාත්මික ජීවිතය. **මූලාශ්‍ර**:අංගු.නි: ( 5): 8 නිපාත: 8.1.19. නන්ද සූත්‍රය, පි. 54, EAN:8: 9.9 Nanda, p. 41.

▼ **භික්ෂුවක් දැනුම ඇතිව-** සම්ප්‍රජන්‍ය ඇතිව වාසයකරන අන්දම බුදුන් වහන්සේ මෙසේ පෙන්වා ඇත:

**" මේ සසුනේ මහණ, ඉදිරියට…පසුපසට යනවිට, ඒ අනුව බලනවිට, අත්පා දිගහැරීම, හැකිලීම…සිවුරු දැරීම…ආහාර පනා ගන්නාවිට…රස විදිනවිට… මුත්‍රා…මළ පහ කරන විටද … සතර ඉරියව්වේද… නිදි වැරිමෙහිද … කතා කරනවිට, නිශ්බදව සිටිනවිට… ආදී සෑම විටකම මනානුවණින් යුතුව වාසය කරයි".** **මූලාශ්‍ර:** සංයු.නි: (4): සළායතනවග්ග: වේදනාසංයුත්ත: 7. 20 ගිලන්හල සූත්‍රය, පි. 424, ESN:36: Vedanāsamyutta, 7.7 The sick ward, p. 1339.

▼ **වෙනත් මූලාශ්‍ර:1."…**සම්ප්‍රජන්‍යය යනු ප්‍රඥාවය, කිසියම් දෙයක් පිලිබඳ නුවණින් සලකා ලබාගන්නා පැහැදිලි අවබෝධය ය. සතිය ගැන

කතා කරනවිට නුවණද සම්බන්ධ කරගත යුතුවේ. සති සම්ප්‍රජන්‍යය මගින් මහා බලයක් ඇතිවේ. සිහිය පමණක් ඇතිව නුවණ නොමැතිව ක්‍රියා කිරීමෙන් යහපත් ඵල නොලැබේ. යමක් කරනවිට ඒ දේ ගැන සිහිය හා පැහැදිලි අවබෝධය තිබීම අවශ්‍ය වේ. මේ මොහොතේ ඔබට ලැබෙන අත්දැකීම ගැන ඔබට යම් දැනීමක් ඇත. එය ඔබගේ සතියය. එම සතිය යහපත සඳහා යොදා ගැනීම පිණිස නම් ඔබ තුල ප්‍රඥාව තිබිය යුතුය: එනම්, ඒ කරන දේ (ඔබගේ හා අන්‍යයන්ගේ) යහපත පිණිසවේද? අයහපත පිණිසවේද? යයි නුවණින් සලකා බලා කටයුතු කිරීම. එලෙස සති ප්‍රඥා ව ඇතිව සකටයුතු කරනවිට, තමන් කරන දෙයින් නිසිපල ලැබිය හැකිවේ....” බුදුහිමි දක්වා ඇත්තේ මාර්ගයේ සාධක 8 ම යහපත් ලෙස ක්‍රියාත්මක කිරීමට නම් සාධක 3ක් ඒ සමග සම්බන්ධව ක්‍රියාත්මක විය යුතුය: සම්මා දිට්ඨි, සම්මා සති හා සම්මා වායාම. සම්මා සතිය අරිය අට මගේ සියලු සාධක සමග ක්‍රියාත්මක වීමෙන් මාර්ගය දියුණුවට පත්වේ. උදාහරන වශයෙන් පෙන්වා දී තිබෙන්නේ, යම් කෙනෙකු තුල සම්මා සතිය හා සම්මා දිට්ඨිය එක්ව ක්‍රියා කරනවිට , ඔහුට තුල ඇතිවන මිත්‍යා දිට්ඨිය හඳුනාගැනීමට හැකිවේ. වහා එය අතහැර දැමීමට ඔහු සමත්වේ. ඔහු තුල සම්මා දිට්ඨිය ඇතිවූ විට , සතිය නිසා ඒ බව ඔහු දැනගනී, එවිට ඒ නිවැරදි අවබෝධය ආරක්ෂා කරගැනීමට ඔහු යුහුසුලුවේ...”. **සති සම්ප්‍රජන්‍යය පුරුදු පුහුණු කිරීම:** අජාන් බ්‍රහ්මවංශෝ මහාතෙර, වස්සාන ධර්ම දේශනා- 1994, බෝධිනයාන, වන සේනාසනය, පර්ත්, බටහිර ඔස්ට්‍රේලියාව (ඉංග්‍රීසි බසින් පැවසූ දේශනයේ කෙටි අනුවාදයකි).

2. **“...**සතිය යනු කිසියම් අත්දැකීමක්- විඳීමක් (experience) ගැන සිතේ ඇතිවන නොසෙල්වෙන- අචල අවධානය ය. සම්ප්‍රජන්‍යය (clear comprehension) යනු, එවැනි අචල අවධානයක් ඇතිවූවිට ඒ බව අවබෝධ කරගැනීමේ හැකියාවය. සම්ප්‍රජන්‍යය මගින් සිතේ ඇතිවන, එහෙත් වෙනස්වීයන යම්කිසි විශේෂිත භාවයකින් යුතු යම් හැඟීමක් (sensation) , වේදනාවක් (feeling), සිතේ ගතියක් (mood), හෝ කල්පනාවක් (thought) ගැන සම්පූර්ණ වැටහීමක් ගෙනදේ. සතිය හා සම්ප්‍රජන්‍යය මගින් කෙනෙකුගේ අභ්‍යන්තර ජීවිතයේ එක් එක් මොහොතක් පාසා ඇතිවෙන සිතුවිලි පිළිබඳව දැනගැනීමට හැකියාව ඇතිවේ. මෙය බුද්දහමේ භාවනා ක්‍රමක් ලෙසින් හැඳින්විය හැකිය. අපට, අපගැනම ඍජු හා ගැඹුරු අවබෝධයක් ලබාදීමට ක්‍රමයක් සතිසම්ප්‍රජන්‍යය මගින් ඉදිරිපත් කරයි”. **“Meditation a way of awakening**” by Ajahn Sucitto,:Amaravati publications: 2011,

▲ **සති සම්බොජ්ඣංගය-** Enlightenment factor of mindfulness: මෙය සප්ත බොජ්ඣංග ධර්මයන්ගෙන් එකකි. **බලන්න**: බොජ්ඣංගධර්ම.

▲**සාතාගිර යක්ෂ-** Sathagira Yakka: සාතාගිර, බුදුන් වහන්සේ සරණගිය යක්ෂයෙකි, ඔහු බුදුන් වහන්සේගේ ගුණ වැනිම මෙහි දක්වා ඇත. **බලන්න**: යක්ෂ. **මූලාශ්‍රය**:ඛු.නි:සු.නි:උරගවග්ග:1-9 හේමවත සූත්‍රය, පි.69.

▲ **සුත ධනය** - wealth of learning: සුත ධනය (සුත=ශ්‍රවණය) ලෙසින් පෙන්වා ඇත්තේ ධර්මයේ බහුශ්‍රැතභාවයය. **බලන්න**: ධනය.

▲ **සත් ආරිය පුද්ගලයෝ**: පාලි: **සත්ත අරියපුග්ගලා -7** Noble persons: ලෝකයේ විද්‍යාමාන උතුම් පුද්ගලයන් සත් දෙනෙක් ගැන බුදුන්

වහන්සේ පෙන්වා ඇත. ඔවුන්ගේ ඉන්ද්‍රියධර්ම වර්ධනයවී ඇති ආකාරය අනුව ඔවුන් ආරිය පුද්ගලයන් ලෙසින් හඳුන්වයි. **සටහන**: උසස් පුහුණුවේ නිරත, සෝතාපන්න, සකදාගාමී, අනාගාමී මග හා ඵල ලබා ඇති, අර්හත් මගට පිවිසි භික්ෂූන් සත් දෙනාද ආරිය පුද්ගලයන් ලෙසින් පෙන්වා ඇත. **බලන්න**: සේඛ හා අසේඛ.

▼ **ඉන්ද්‍රිය ධර්ම වර්ධනය වී** ඇති ආකාරය අනුව ආරිය පුද්ගලයන් සත්දෙනා: **1) උභතෝභාග විමුක්තිය ලැබූ උතුමා** (උභතොභාග විමුත්තො- one liberated-in-both ways ) චෙතෝ විමුක්තිය හා ප්‍රඥාවිමුක්තිය ලබා අරහත්වයට පැමිණි උතුමා. **බලන්න:** උභතෝභාග විමුක්තිය, ආරිය වාසස්ථාන. **2) ප්‍රඥා විමුක්තිය** ලැබූ උතුමන්-one liberated-by-wisdom: ඇතැම් පුද්ගලයන් අරූපසමාපත්ති නොමැතිව, ප්‍රඥාවෙන් අරියසත්‍ය දැක ආසව ක්‍ෂයකර අරහත්වය සාක්ෂාත් කරගනිති. සියලු කටයුතු නිමකර ඇතිනිසා ඔවුනට ප්‍රමාදවීමට කරුණක් නැත. **සටහන්:** * අටුවාවට අනුව ප්‍රඥා විමුක්තිය ලබන ආකාර 2 කි: සුඛවිපස්සනා භාවනාව  මගින් හෝ සිව්ජාන වලින් ඕනෑම ජානසමාධියකින් එළියට පැමිණි අවස්ථාවේදී මේ තත්වය ලැබිය හැකිය**.** **බලන්න**: EMN: Note 703, p. 1129. ** විඥානය පිහිටන ස්ථාන 7 හා ආයතන 2 පිළිබඳ: ඇතිවීම, නැතිවීම, ආස්වාදය, ආදීනවය හා නිස්සරණය පිලිබඳ යථා අවබෝධය ලබා උපාදාන රහිතව මිදුන භික්ෂුව, ප්‍රඥා විමුක්තය යයි බුදුන් වහන්සේ පෙන්වා ඇත. **බලන්න**: දීඝ:නි: (2) 2 මහානිදාන සූත්‍රය: 40-41 ඡෙද, පි. 118, EDN: 15 Mahānidāna Sutta: The Great Discourse on Origination, para. 33, p. 169. **3) කායසාක්ෂිය** ලැබූ උතුමන්- a body-witness: මේ පුද්ගලයන් අරූපසමාපත්ති ඇතිව, ප්‍රඥාවෙන් ආරිය සත්‍ය දැක ඇතැම් ආසවයන් ප්‍රහීණයකර වාසයකරති. අරහත්වය ලබා නොමැතිනිසා ඔවුන් අප්‍රමාදව කටයුතු කළයුතුවේ යයි බුදුන් වහන්සේ වදාළහ. ඒ සඳහා ඔවුන් සුදුසු සෙනසුන්වල වාසය, කලණමිතුරු සේවනය, අධ්‍යාත්මික ඉන්ද්‍රිය වර්ධනය කළයුතුවේ. **සටහන**: ම.පු. අටුවාවට අනුව මේ ගණයට වැටෙන්නේ සෝතාපන්න, සකදාගාමී, අනාගාමී හා අරහත්මර්ගය ලබාගත් උතුමන්ය. **බලන්න**: EMN: note 704, p. 1129. **4) දිට්ඨිප්‍රාප්ත** ලැබූ උතුමන්-one attained-to-view : මේ පුද්ගලයන් අරූපසමාපත්ති නොලැබුවද ප්‍රඥාවෙන් ආරිය සත්‍ය දැක ඇතැම් ආසවයන් ප්‍රහීණයකර වාසයකරති. ප්‍රඥාවෙන් ධර්මය - ආරියසත්‍ය යහපත් ලෙසින්ම දැක ඇතිනිසා ඔවුන් දිට්ඨිසම්පන්න යයි හඳුන්වති. ඔවුන් අප්‍රමාදව කටයුතු කළයුය යයි බුදුන්වහන්සේ වදාළහ. ඒ සඳහා ඔවුන් සුදුසු සෙනසුන්වල වාසය, කලණමිතුරු සේවනය, අධ්‍යාත්මික ඉන්ද්‍රිය වර්ධනය කළයුතුවේ. **සටහන**: ම.පු. අටුවාවට අනුව මේ ගණයට වැටෙන්නේ සෝතාපන්න, සකදාගාමී, අනාගාමී හා අරහත්මර්ගය ලබාගත් උතුමන්ය. **බලන්න**: EMN: note 705, p. 1129. **5) ශ්‍රද්ධාවිමුක්තය** ලැබූ උතුමන්- one liberated by faith: මේ පුද්ගලයන් අරූපසමාපත්ති නොලැබුවද ප්‍රඥාවෙන් ආරිය සත්‍ය දැක ඇතැම් ආසවයන් ප්‍රහීණයකර වාසයකරති. තථාගතයන් පිළිබඳව මුල බැසගත් ශ්‍රද්ධාව ඔහුට ඇත. ඔවුන් අප්‍රමාදව කටයුතු කළයුතුවේ යයි බුදුන් වහන්සේ වදාළහ. ඒ සඳහා ඔවුන් සුදුසු සෙනසුන්වල වාසය, කලණමිතුරු සේවනය, අධ්‍යාත්මික ඉන්ද්‍රිය වර්ධනය කළයුතුවේ. **සටහන**: මේ පුද්ගලයන්, දිට්ඨිසම්පන්න පුද්ගලයන් ලෙසින්ම තථාගතයන්වහන්සේගේ ධර්මය ප්‍රඥාවෙන් විමසා

නොමැත. **බලන්න**: EMN: note 707, p. 1129. **6) ධම්මානුසාරී** ලැබූ උතුමන්-a Dhamma-follower: මේ පුද්ගලයන් අරූපසමාපත්ති ලබා නොමැත. ප්‍රඥාවෙන් දැක ආසව ප්‍රහීණය කර නැත. ඔවුන් තථාගතයන්වහන්සේගේ ධර්මය, යහපත්ලෙසින් සලකාබලා පිළිගෙන ඇත. එසේම ඔවුන්ට පංචඉන්ද්‍රිය ධර්ම ඇත: ශ්‍රද්ධාව, වීරිය, සතිය, සමාධිය හා ප්‍රඥාව. ඔවුන් අප්‍රමාදව කටයුතු කළයුතුය යයි බුදුන් වහන්සේ වදාළහ. ඒ සඳහා ඔවුන් සුදුසු සෙනසුන්වල වාසය, කලණමිතුරු සේවනය, ආධ්‍යාත්මික ඉන්ද්‍රිය වර්ධනය කළයුතුවේ. **සටහන:** ම.පු. අටුවාවට අනුව මේ පුද්ගලයන් සෝතාපන්න මාර්ගය ලබා ඇත. මොවුන්ගේ ප්‍රඥා ඉන්ද්‍රිය බලවත්ය. **බලන්න**: EMN: note 707, p. 1129. **7) ශ්‍රද්ධානුසාරී උතුමන්**- a faith-follower: මේ පුද්ගලයන් අරූපසමාපත්ති ලබා නොමැත. ප්‍රඥාවෙන් දැක ආසව ප්‍රහීණය කර නැත. එහෙත්, ඔවුනට තථාගතයන්වහන්සේ පිළිබඳව යම්බඳු ශ්‍රද්ධාවක් හා ප්‍රේමයක් ඇත. එසේම ඔවුන්ට පංචඉන්ද්‍රිය ධර්ම ඇත: ශ්‍රද්ධාව, වීරිය, සතිය, සමාධිය හා ප්‍රඥාව. ඔවුන් අප්‍රමාදව කටයුතු කළයුතුය යයි බුදුන් වහන්සේ වදාළහ. ඒ සඳහා ඔවුන් සුදුසු සෙනසුන්වල වාසය, කලණමිතුරු සේවනය, ආධ්‍යාත්මික ඉන්ද්‍රිය වර්ධනය කළයුතුවේ. **සටහන:** ම.පු. අටුවාවට අනුව මේ පුද්ගලයන් සෝතාපන්න මාර්ගය ලබා ඇත. මොවුන්ගේ ශ්‍රද්ධාඉන්ද්‍රිය බලවත්ය. **බලන්න**: EMN: note 707, p. 1129. **මූලාශ්‍ර**: ම.නි: ( 2): 2.2.10 කීටාගිරි සූත්‍රය, පි. 252, EMN: 70: Kīṭāgiri Sutta, p. 536.

▼**සත් ආරිය පුද්ගලයෝ** ආහුනෙය්‍යා, පාහුනෙය්‍යා, දක්ඛිනෙය්‍යා, අංජලිකරණීය ගුණ ඇතිව ලෝකයාට උතුම් පිං කෙතක්ය (අනුත්තර පුණ්‍යක්ෂේත්‍රයකි). **මූලාශ්‍රය:** අංගු.නි: (4) 7 නිපාත:අනුසයවග්ග:7.1.2.4 ආහුනෙය්‍යපුග්ගල සූත්‍රය,පි.314.

▲ **සත්කාය නිරෝධය**- The cessation of personal existence- *Sakkāyanirodhaṃ*: සත්කාය නිරෝධය ලෙසින් පෙන්වා ඇත්තේ සක්කාය දිට්ඨිය (මම, මගේ, මගේ ආත්මය යන හැඟීම් ) පහවීමය. **බලන්න**: සක්කායදිට්ඨිය. **සටහන**: අටුවාවට අනුව, සත්කාය නිරෝධය යනු තුන්ලෝකයේ භව පැවැත්ම (සසර) අවසන්වීමය, එනම් නිවන ලැබීමය. **බලන්න:** EAN: Note: 889, p. 627. මේ සූත්‍රයේදී, සත්කාය නිරෝධය ලබාගන්නා ක්‍රමවිධිය බුදුන් වහන්සේ පෙන්වා ඇත. **මූලාශ්‍ර:** අංගු.නි: (2): 4 නිපාත: 4.4.3.8 චේතෝවිමුත්ති සූත්‍රය, පි. 342, EAN: 4: The Reservoir, 178.

▲ **සත්කාර-** Sathkaara: සත්කාර යනු සැලකිලි දැක්වීමය. බුදුන් වහන්සේ හා සංඝයා කෙරෙහි පැහැදුන ජනයා ඔවුන්ට සිව්පස යෙන් සත්කාර කළෝය. අන්‍ය ආගමික පිරිසට සත්කාර නොකළ නිසා ඔවුන් බුදුපිරිසට බොහෝ දොස් තැබූහ.ඒ ගැන සංඝයා බුදුන් වහන්සේට දැන්වූ විට, උන්වහන්සේ පෙන්වා දුන්නේ, එබඳු සත්කාර ආදිය ගැන උපධි රහිත පුද්ගලයෝ නොසැලවෙනබවය. **මූලාශ්‍ර:** ඛු.නි: උදානපාළිය: 2.4. සත්කාර සූත්‍රය, පි.180.

▼**සත්කාර යෙන්** යටවෙන සත්ත්වයෝ දුගතියට පත්වෙන බව මෙහි දක්වා ඇත. සත්කාර හෝ අසත්කාර ගැන රහතුන්ගේ සැලකීමක් නොමැත. **මූලාශ්‍ර:** ඛු.නි: ඉතිවුත්තක: 3.4.2 සත්කාර සූත්‍රය, පි.444.

▼ **ශාස්තෘන් වහන්සේට,** ධර්මයට, ශික්ෂාවට, අප්‍රමාදටය, පටිසන්ථාරය ආදීන්ට සත්කාර කිරීමෙන් අකුසල දුරුවී කුසල වැඩිඑන බව මෙහිදී පෙන්වා ඇත. **මූලාශ්‍ර:** අංගු.නි: (4): 7 නිපාත:මහාවග්ග:7.2.2.6 සත්කාර ගරුකාර සූත්‍රය, පි.472.

▲ **සත්තක පරම** - Saththakaparama: සත්තක පරම යනු සෝතාපන්න ආරිය පුද්ගලයා අරහත්වය ලබන ආකාරයකි. උත්පත්ති 7 ක් තුල නිවන ලබාගැනීම. **බලන්න:** සෝතාපන්න.

▲ **සතුල්ලප්කායික දෙවියෝ-** Satullapkayika Deva: මේ දෙවිවරු බුදුන් වහන්සේ කෙරෙහි විස්වාශය ඇති දේව කණ්ඩායමකි. **බලන්න**: දේවලෝක.

▲ **සත්පුරුෂධම්ම- අසත්පුරුෂධම්ම-** Sathpurusha & Asathpurusha Dhamma: සත්පුරුෂධම්ම-සප්පුරිෂධම්ම ලෙසින් මෙහි දක්වා ඇත්තේ සම්මා දිට්ඨිය පෙරටුකරගත් නිවැරදි මගය. අසත්පුරුෂධම්ම-අසප්පුරිෂධම්ම යනු මිථ්‍යාදිට්ඨිය පෙරටුකරගත් වැරදි මගය. **බලන්න**: මිථ්‍යාත්වය හා සම්‍යක්තවය. **මූලාශ්‍රය:** අංගු.නි: (6): 10 නිපාත: අරියවග්ග: 10.3.5.4 සප්පුරිෂධම්ම සූත්‍රය, පි. 476.

▼ බුදුන්වහන්සේ වදාළ ධර්මය, සත්පුරුෂ ධර්මයය, අසත්පුරුෂ ධර්මයය ඊට විරුද්ධ ධර්මයය. සත්පුරුෂ ධර්මය නිවැරදි මග ගැනීමය. අසත්පුරුෂ ධර්මය නම් වැරදිමග ගැනීමය. **බලන්න:** මිථ්‍යාත්වය හා සම්‍යක්තවය. **මූලාශ්‍ර:**අංගු.නි:(6 ):10 නිපාත:10.3.5.4 සප්පුරිසධම්මසූත්‍රය,පි.476, EAN:10:Noble, p.548.

▼ **සත්පුරුෂයා ධර්මයේ හැසිරේ, අසත් පුරුෂයා ධර්මයේ නොහැසිරේ**: සත්පුරුෂයකුගේ ස්වාභාවය : ඔහු උඩඟු නැත, අන් අය පහත් නොකරයි, ධර්මය යහපත් ලෙස පිළිපදි, ධර්මය අවබෝධ කර දුක නිවා ගනී. අසත්පුරුෂයාට එවැනි යහපත් ගුණ නැත. ඔහු උඩඟුය, අනුන් හෙලා දකී, ධර්ම අවබෝධය නොමැති නිසා සසර දික්කරගනි. **මූලාශ්‍ර:** ම.නි: (3): 3.2.3 සප්පුරිස සූත්‍රය, පි. 170, EMN: 113-Sappurisa Sutta, p. 820.

▼ **සත්පුරුෂයා** අනුගමනය කරන සත්පුරුෂ ධර්මය : සම්‍යක්තවය, නිවැරදී මගය යයි මෙහි පෙන්වා ඇත. අනුවණ අසත් පුරුෂයාගේ මග වැරදි මගය - මිථ්‍යාත්වය**. බලන්න**: මිථ්‍යාත්වය හා සම්‍යක්තවය. **මූලාශ්‍ර**: අංගු.නි: (6 ):10 නිපාත: සප්පුරිසධම්ම සූත්‍රය, පි.476, EAN: 10: V Noble-P.548.

▼ **දසකුසලයේ යෙදීම** සත්පුරුෂ ධර්මයය. දසඅකුසලය අසත්පුරුෂ ධර්මයය.**මූලාශ්‍ර**:අංගු.නි:(6):10 නිපාත:10.4.4.4.සප්පුරිසධම්ම සූත්‍රය,පි.538,EAN:10:192, p. 556.

▼ **දෙවිවරු සත්පුරුෂ ඇසුර අගයකරති**: සතුල්ලපකායික දේවතාවන් බුදුන් වහන්සේ බැහැදැක සත්පුරුෂ ඇසුරේ අනුසස් ගැන මෙසේ පැවසුහ:

“සත්පුරුෂයන් නිසා සද්ධර්මය අවබෝධ කරණ අය: පිරිහීමට පත් නොවේ, දියණුව ලබයි, ප්‍රඥාව ලබයි, ශෝකය ඇතිකරණ කරුණු නිසා

ශෝකයට පත්නොවේ, නැදෑ පිරිස අතර බබලයි, මරණින් මතු සුගතියේ පහළවේ, ඔවුන් බොහෝකලක් සුවසේ ජීවත්වේ”.

බුදුන්වහන්සේ එම ප්‍රකාශය අනුමත කර මෙසේ වදාළහ:

“ සැමවිටම සත් පුරුෂයන් ඇසුරු කලයුතුය - ඔවුන් හා මිත්‍රත්වය පෝෂණය කරගතයුතුය, සත්පුරුෂයන්ගෙන් සද්ධර්මය දැනගෙන - සියලු දුක කෙළෙවර කර ගනී.” **මූලාශ්‍ර**: සංයු.නි: (1): සගාථවග්ග: දේවතා සංයුත්තය: සබ්භි සූත්‍රය, පි.58, ESN:1: Devatha samyutta: 31-1 With the good, p. 94.

▼ **අසත්පුරුෂ ආශ්‍රය** නිසා සද්ධර්මය ශ්‍රවණයට ඉඩ නොලැබේ, අසද්ධර්මය පෝෂණයවේ. සත්පුරුෂ ආශ්‍රය නිසා සද්ධර්මය ශ්‍රවණයට ඉඩකඩ ලැබේ, ආධ්‍යාත්මික මග දියුණුවේ. **මූලාශ්‍ර**: අංගු.නි : (6 ): 10 නිපාත: යමක වග්ග: 10.2.2.1**.** අවිද්‍යා සූත්‍රය, පි.232, EAN:10: II Pairs: 61.1.Ignorance, p. 517.

▼ **ආධ්‍යාත්මික මාර්ගය** වර්ධනය පිණිස සත්පුරුෂ ආශ්‍රය බොහෝ උපකාරී වේ . **බලන්න**: බහු උපකාර ධර්ම. **මූලාශ්‍ර:** දීඝ.නි:(3):11 දසුත්තර සූත්‍රය, පි. 483, EDN: 34: Dasuttara Sutta: Expanding Decades, p. 384.

▼ **අසත් පුරුෂ ආශ්‍රය** නිසා අයහපතද, සත්පුරුෂ ආශ්‍රය නිසා යහපතද සිදුවේ. මේ පිලිබඳ දක්වා ඇති **උපාමා**: 1) **විෂපෙවූ ඊතලය උපමාව**: විෂ පෙවූ ඊතලයක්, අනික් ඊතල හා එකතු කළහොත්, ඒවාටද විෂ ආලේපනවේ. එලෙස අසත්පුරුෂ ඇසුර අයහපත ගෙනදේ. 2) **කුණුමස් උපමාව:** එසේම කුණුවූ මස් කුසතණ යෙන් එතුවත් එහි දුගඳ නතර කළ නොහැකිය. එලෙස අසත්පුරුෂයා සේවනය කරනවිට අයහපත පැතිරේ. තුවරලා නම් සුවඳ විහිදෙන ද්‍රව්‍ය, කොළයකින් ඔතා තැබුවද ඉන් සුවඳ විහිදේ. එලෙස, සත් පුරුෂ ආශ්‍රය යහපත ගෙනදේ. **මූලාශ්‍රය**: බු.නි: ඉතිවුත්තක: 3.3.7 සුබ ප්‍රාර්ථනා සූත්‍රය, පි.436.

▲ **සත්පුරුෂයා හා අසත්පුරුෂයා:** පාලි**: සපපුරිසො, අසපපුරිසො** -True man and Un-true man/ Superior man & Inferior man: ධර්මයේ සත්පුරුෂයා ලෙසින් පෙන්වා ඇත්තේ ධර්මය දත් නුවණැති පුද්ගලයාය. ඔහු සත්පුරුෂ ධර්මය-ආරිය ධර්මය පිළිපදි. අසත්පුරුෂයා යනු ආරිය ධර්මය නොදත් අනුවණ පුද්ගලයාය. **බලන්න**: ශ්‍රැතවත් ආරිය ශ්‍රාවක හා අශ්‍රැතවත් පෘතග්ජන. **ශබ්දකෝෂ : පාසිශ**: පි.112: “**අසන්ත**: අසත්පුරුෂයා, නොසන්සුන් තැනැත්තා;**අසප්පුරිස:** දුෂටයා; පි. 501: ‘**සප්පුරිස**: සත්පුරුෂයා, ලෝවැඩකරන්නා”. **B.D**: p.298: “**asappurisa:** bad men- through companionship with bad men comes listening to bad advice’; **sappurisa:** good men: companionship with good men comes listening to good advice…” **P.T.S**: p.217: “**Asappurisa**: low, bad or unworthy man-anariya’; p.1533: “**Sappurisa**- a good, worthy man**-** equal to ariya”.

▼ **සත්පුරුෂයා හා අසත් පුරුෂයා කවරේද:** යම්කෙනෙක් සම්මා දිට්ඨිය... සම්මා සමාධිය (ආරිය අටමග) ඇතිව සිටි නම් ඔහු සත් පුරුෂයා - උසස් පුද්ගලයායයි බුදුන් වහන්සේ වදාළහ. යම්කෙනෙක් මිථ්‍යා

දිට්ඨිය...මිථ්‍යා සමාධිය ඇතිව සිටින්නේ නම් ඔහු අසත් පුරුෂයා- පහත් පුද්ගලයාය. **මූලාශ්‍ර:**සංයු.නි (5-1):මහාවග්ග: මග්ගසංයුත්ත: 1.3.5 අසප්පුරිස සූත්‍රය, පි. 60, ESN: Maggasamyutta: 45: 25.5 The Inferior Person p. 1631.

▼ **අවවාද කරන, අනුසාසනා** කරණ, අනුන් පාපයෙන් වළකන තැනැත්තා සත්පුරුෂයන්ට ප්‍රියවේ, එවන් අය අසත්පුරුෂයන්ට ප්‍රිය නොවේ

**“ ඔවදෙය්‍යානු සාසෙය්‍ය - අසබ්භා ච නිවාර යෙ**
**සතං හි සො පියො හොති - අසතං හොති අප්පියො”**

**සටහන:** සතං= සත්පුරුෂ ; අසතං = අසත්පුරුෂ: **මූලාශ්‍රය**: ධම්මපදය: 6 පණ්ඩිත වගග, 2 ගාථාව.

▲ **සත්පුරුෂතරයා හා අසත්පුරුෂතරයා:** පාලි: **සප්පුරිසතරො- අසප්පුරිසතරො-** Great True Person and Inferior un-true Person බුදුන්වහන්සේ සත්පුරුෂතරයා ලෙසින් හඳුන්වා ඇත්තේ සත්පුරුෂයාට වඩා උතුම් පුද්ගලයාටය. එනම් සම්මා ඥානය හා සම්මා විමුක්තිය ලැබූ උතුමාටය (රහතන්වහන්සේ). අසත්පුරුෂතරයා යනු අසත්පුරුෂයාට වඩා පහත් පුද්ගලයාටය. ඔහු වැරදි මග ගමන් කර තමන් විමුක්තිය ලබා ඇතයි අනුවණ ලෙසින් සිතයි. **මූලාශ්‍ර:** සංයු.නි: (5-1): මහාවග්ග:මග්ගසංයුත්ත: 1.3.6 දෙවන සප්පුරිස සූත්‍රය, පි. 62, ESN: 45: Maggasamyutta: 26.6 The Inferior Person-2 p. 1632.

▲ **සත්පුරුෂයා ගේ ලක්ෂන**: ඔහු අනුන්ගේ අගුණ ප්‍රචාරනොකරති, අනුන්ගේ ගුණ කියයි, තමාගේ අගුණ සඟවා නොගනී, තමාගේ ගුණ ප්‍රචාර නොකරති. **මූලාශ්‍රය:** අංගු.නි: (2) 4 නිපාත:4.2.3.3. අස්ප්පුරිස වධුකා සූත්‍රය, පි.166.

▲**සත්පුරුෂ දාන හා අසත්පුරුෂ දාන** - sathpurisa dana & asathpurisa dana: සකස් කර, ගරුසරුඇතිව දෙන යහපත් දානය සත්පුරිසදානයය, එසේ නොකර පිළිගන්වන දානය අසත් පුරුෂ දානයකි. **බලන්න**: දාන. **මූලාශ්‍රය:**අංගු.නි: (3) 5 නිපාත:තිකන්ඩකවග්ග:5.3.5.7 අසත්පුරිසදාන,පි.300.

▲ **සත්පුරුෂ භූමි හා අසත්පුරුෂ භූමි-** පාලි: **සප්පුරිසභූමි, අසප්පුරිසභූමි** - the plane of the good person & the plane of the bad person. බුදුන් වහන්සේ සත්පුරුෂ භූමි හා අසත්පුරුෂ භූමි මෙසේ දක්වා ඇත: කෘතඥතාවය ඇති කෙළෙහිගුණ දන්නා යහපත්- හොඳ- (grateful and thankful) පුද්ගලයන් වාසය කරන තැන සත්පුරුෂ භූමියය. අකෘතඥතාවය ඇති කෙළෙහිගුණ නො දන්නා අයහපත් -නරක (ungrateful and unthankful) පුද්ගලයන් වාසය කරන තැන අසත්පුරුෂ භූමියය. **බලන්න:** සත්පුරුෂ හා අසත්පුරුෂ, කෘතඥබව හා අකෘතඥබව. **මූලාශ්‍ර:** අංගු.නි: (1): 2 නිපාත: 2.1.4.1 සූත්‍රය, පි.157,EAN: 2: 32.11 Sutta, p.61 .

▲ **සත් සම්බුදුවරු-** The seven Enlightened Buddhas’: සත් සම්බුදුවරු ලෙසින් දක්වා ඇත්තේ ගෝතම බුදුන් වහන්සේ ඇතුළු පෙර වැඩසිටි බුදුවරුන්ය: විපස්සි, සිඛි,වෙස්සභූ, කකුසඳ, කෝණාගමන, කස්සප හා

ගොතම සම්මා සම්බුදුරජාණන් වහන්සේලාය. **මූලාශ්‍ර**: බු.නි:බුද්ධවංසය, 19-25, සංයු.නි: (2): නිදානවග්ග:අභිසමයසංයුත්ත, බුද්ධවග්ග: සූත්‍ර 1.1.4 විපස්සි සූත්‍රය, පි.30 - 1.1.10 ගෝතම සූත්‍රය, පි.37.

▼**අභිමෙත්ත සූත්‍රයේ** (බන්ධ පිරිත) අවසාන ඡෙදයේ, සත් සම්බුදුවරුන්ට නමස්කාර කිරීම පිළිබඳව සඳහන් කර ඇත:

**"...මම ඒ භාග්‍යවතුන්වහන්සේට නමස්කාර කරමි, සත් සම්බුදුවරුන්ට නමස්කාර කරමි". සටහන:** ත්‍රිවිධ රත්නයේ ගුණ සිහිකර, සතුන්, සර්පයෙන්. අමනුෂ්‍යා ආදීන්ගෙන් ආරක්ෂාව ලබා ගැනීම පිණිස මෙම පිරිත සජ්ජායනා කරයි. **බලන්න**: මෙත්තා ආනිසංස, නාග. **මූලාශ්‍රය:** අංගු.නි: (2): 4 නිපාත: 4.2.2.7 අභි මෙත්ත සූත්‍රය (බන්ධ පිරිත), පි. 156.

▲**සත්‍ය-** truth: රස අතුරින් සත්‍ය රසය අග්‍රයයි-බුදුන් වහන්සේ පෙන්වා ඇත. **බලන්න:** ඉතාම මිහිරිදේ. **මූලාශ්‍ර:** සංයු.නි: ( 1): සගාථවග්ග:දේවතාසංයුත්ත: 1.8.3 චිත්ත සූත්‍රය, පි. 104, ESN: 1: Devatasmyutta: 1: 73.3. Treasure, p.155.

▲**සත්‍ය අවබෝධය :** පාලි**: සච්චානුබොධො** - awakening to truth - Saccānubodha: ධර්මයට අනුව සත්‍ය අවබෝධය යනු විමුක්තිය (නිවන) සාක්ෂාත් කරගැනීමය.

**සත්‍ය අවබෝධ කරගන්නා ක්‍රම විධිය:**ශ්‍රද්ධාව පෙරටුකරගත් කරුණු 13 ක්, ක්‍රමානුකූලව පිළිපැදීමෙන් පරම සත්‍ය හෙවත් නිවන අවබෝධ කරගත හැකිබව බුදුන් වහන්සේ පෙන්වා ඇත. එම ක්‍රියා පරිපාටිය පිළිබඳව **බලන්න**: ධර්මය ක්‍රමානුකූලව පුහුණුවීම- gradual training.**මූලාශ්‍ර:** ම.නි :( 2):2.5.5. චංකී සූත්‍රය, පි. 661, EMN:95-Cankī Sutta, p. 704.

▲ **සත්‍ය ඥානය-**true knowledge : ධර්මයට අනුව සත්‍ය ඥානය යනු විද්‍යාව ඇතිකර විමුක්තිය-නිවන ලබාදෙන නුවණය, විජ්ජාභාගිය ධර්ම අවබෝධයය. **බලන්න:** විජ්ජාභාගිය ධර්ම.**සටහන:** * අටුවාවට අනුව: සත්‍ය ඥාන 8 කි: 1) විපස්සනා නුවණ - insight knowledge 2) මනෝමය කය ඇතිකරගන්නා නුවණ- the mind-made body 3-8 ) සය අභිඥා- six kinds of direct knowledge **බලන්න**: සය අභිඥා. ** The qualities associated with these eight are the things that pertain to true knowledge. Or, if one of the eight is taken to be true knowledge, the others are 'qualities that pertain to true knowledge'. **බලන්න**: EAN:1: note: 205, p. 591.

▼ **කායගතා සතිය වඩා ගැනීම සත්‍ය ඥාන අවබෝධය පිණිස පවතී මූලාශ්‍ර:** අංගු.නි: (1 ): 1 නිපාත: කායගතාසති වග්ග: 1.16.7.1 සූත්‍රය. පි. 125, EAN:1: Mindfulness Directed to the Body, p.52.

▲**සොතානුධත ධර්ම-**Teaching followed by ear: සොතානුධත ධර්මය නම්, කණෙන් අසා (ශ්‍රවණයකර) , සජ්ජායනා කරමින්, සිතින් පරික්ෂා කර, නුවණින් පිරික්සන ලද (ප්‍රතිවේධකල) ධර්ම ඉගැන්වීමය:

**"සොතානුධතානං භික්ඛවෙ ධම්මානං වචසා පරිචිතානං මනසානු පෙක්ඛිතානං දිට්ඨියා සුප්පටිවිද්ධානං..."**.(...followed the teachings by

ear, recited them verbally, examined them with the mind, and penetrated them well by view). එලෙස ධර්මය දන්නාවිට ආනිසංස (අනුසස්) 4 ක් ඇතිවේ: 1) එසේ ධර්මය මැනවින් ප්‍රගුණකර, සිහිය පවත්වා නොගෙන මරණයට පත්වූවහොත්, දේවනිකායක පහළවේ. එහිදී අන්‍ය දෙවියන් ධර්මය පවසනවිට ඔහුගේ සිහිය අවදිවේ, එනිසා විශේෂභාගිබව ඉක්මනින්ම ලබා ගනී. 2) එසේ ධර්මය මැනවින් ප්‍රගුණකර, සිහිය පවත්වා නොගෙන මරණයට පත්වූවහොත්, දේව නිකායක පහළවේ. එහිදීධර්මය ප්‍රගුණ කල, ඉද්දිබල ඇති අරහත් දෙවියෙක් ධර්මය දේශනා කරනවිට ඔහුගේ සිහිය අවදිවේ, එනිසා විශේෂභාගිබව ඉක්මනින්ම ලබා ගනී. මෙහිදී දැක්වූ **උපමාව: බෙර සද්ද උපමාව**: බෙර සද්ද හොඳින් දන්නා පුද්ගලයෙක්, ගමනක් යැමට මාර්ගයට පැමිණේ. එහිදී ඔහුට බෙර සද්දයක් ඇසේ, එවිට ඒ සද්දය කුමන බෙරයකින් ඇතිවෙන්නේද යයි ඔහු යහපත් ලෙසින්ම දනී. එලෙස, ධර්මය පෙර පුරුදු කළනිසා, ඊළඟ උපතේදී, ධර්මය ඇසෙන විට පෙර සිහිය ඇතිවේ. 3) එසේ ධර්මය මැනවින් ප්‍රගුණකර, සිහිය පවත්වා නොගෙන මරණයට පත්වූවහොත්, දේවනිකායක පහළවේ. එහි සිටිනා තරුණ දෙවියෙක් දේවසභාවේ ධර්මය උගන්වනවිට ඔහුගේ සිහිය අවදිවේ, එනිසා විශේෂභාගිබව ඉක්මනින්ම ලබා ගනී. 4) එසේ ධර්මය මැනවින් ප්‍රගුණකර, සිහිය පවත්වා නොගෙන මරණයට පත්වූවහොත්, දේවනිකායක පහළවේ. ඔහුගේ පෙර භවයේ ඇසුරු කල දෙවියෙක් එහිදී හමුවී, පෙරදී උගත් ධර්මය සිහිපත් කරදෙයි. එවිට, ඔහුගේ සිහිය අවදිවේ, එනිසා විශේෂභාගිබව ඉක්මනින්ම ලබා ගනී. **සටහන**: ධර්මයේ බහුශ්‍රැත වීම පිණිස, සොතානුධතබව එක් අංගයකි. **මූලාශ්‍රය**: අංගු.නි: (2): 4 නිපාත: මහාවග්ග: 4.4.5.1 සොතානුධත සූත්‍රය, පි.380.

▲ **සොත්ථිය**- A Scholar: සොත්ථිය ලෙසින් පෙන්වා ඇත්තේ විද්වතාය, පඬිවරයාය, ප්‍රඥාවන්තයාය, ආරිය පුද්ගලයාය.**බුදුන් වහන්සේ මෙසේ වදාළහ:**

**"මහණෙනි, සත් කරුණු නොමැති හෙයින් 'සොත්ථිය' නම්වේ"**

**සත්කරුණු**:සක්කාය දිට්ඨිය, විචිකිච්ඡාව, සීලබ්බතපරාමාස, රාගය, ද්වේශය, මෝහය, මානය. **මූලාශ්‍රය:** අංගු.නි: (4):7 නිපාත: සමනවග්ග:7.2.4.4.සොත්ථියධම්ම සූත්‍රය, පි.509.

▼ **සිත කෙලෙසන**, පුනර්භවය ඇතිකරවන, කයට සිතට දුක් විපාක ලබාදෙන, මතු කල ජාති ජරා මරණ දුක් ඇතිකරවන, සියලු ලාමක අකුසල් හැම අකුසල් හැම සන්සිඳවූ නිසා ඔහු 'සොත්තියො - උතුම් විද්වතා' - යයි හඳුන්වන බව මෙහි පෙන්වා ඇත. **මූලාශ්‍ර:** ම.නි: (1): 1.4.9 මහා අස්සපුර සූත්‍රය, පි.652,EMN: 39 Mahā-Assapura Sutta, p.342.

▲ **සෝතය**- stream: සෝතය යනු දිය පහරය. ධර්මයේ 'සෝතය' ලෙසින් පෙන්වා ඇත්තේ ආරිය අටමගය. බුදුන් වහන්සේ විසින් විමසනු ලැබුව, සැරියුත් තෙරුන් මෙසේ වදාළහ:

"...වහන්ස, මේ ආරියඅටමගම සෝතයය. එනම්: සම්මා දිට්ඨි..." (පෙරටුකරගත් ආරිය අටමගය). (This Noble Eightfold Path, venerable sir, is the stream; that is, right view...). **සටහන:** ඒ මගට

වැටුන පුද්ගලයා ආරිය අටමගින් යුක්තය, ඔහු සෝතාපන්නය. **මූලාශ්‍ර:** සංයු.නි:(5-2) සෝතාපතති සංයුත්ත: වේලුද්වරවග්ග:11.1.5 සාරිපුත්‍ර සූත්‍ර, පි. 170, ESN: Sotapattisamyutta: Sāriputta 2, p.2187.

▲ **සෝත ඉන්ද්‍රිය-** Ear faculty: සෝත ඉන්ද්‍රිය- කණ, සය ඉන්ද්‍රියන්ගෙන් එකකි, මෙය සෝතආයතනය ලෙසින්ද දක්වා ඇත. **බලන්න**: ඉන්ද්‍රිය, සළායතන.

▲ **සෝතාපන්නා:** පාලි: **සොතාපනෙනා**-stream-entry: නිවන සාක්ෂාත් කර ගැනීම පිණිස ධර්ම මාර්ගයේ සාක්ෂාත් කර ගතයුතු පළමු උතුම් පියවර සෝතාපන්න (සෝවාන්) මග ඵල ලැබීමය, එම පියවර සාක්ෂාත් කරගත් පුද්ගලයා සෝතාපත්ති ය. (stream winner). ධර්ම ප්‍රවාහයට (stream of the noble path) සොතයට- ඇතුළුවූ නිසා ඔහු සෝතාපත්ති වේ. සෝතාපන්න ආරිය පුද්ගලයාට, බුදුන්වහන්සේ කෙරේහි නියත විශ්වාසය ඇත. සොතාපත්ති පුද්ගලයන්ගේ විවිධත්ව පිණිස **බලන්න**: ත්‍රිවිධ සෝතාපන්න පුද්ගලයෝ. **මූලාශ්‍ර**:සංයු.නි (5-2): මහාවග්ග: සොතාපත්ති සංයුත්ත: වේලුද්වාරවග්ග: 11.1.4 හා 11.1.5 සාරිපුත්‍ර සූත්‍ර, පි. 168, ESN: 55: Sotapattisamyutta: Sāriputta 1 & 2, p.2187.

▼ **සොත්පන්න මග** පසක් කර ගැනීම් පිණිස කරුණු 6ක් සපුරා ගත යුතුවේ: 1) සක්කායදිට්ඨිය පහකිරීම 2) විචිකිච්චාව පහකිරීම 3) සීලබ්බත පරාමාස පහකිරීම 4) අපායගමනිය රාගය 5) අපායගමනිය දෝසය 6) අපායගමනිය මොහය. ඒ කරුණු පහ කලවිට දිට්ඨිසම්පන්න වේ.**බලන්න:** දිට්ඨිසම්පන්න. **මූලාශ්‍රය:**අංගු.නි: (4): 6 නිපාත:6.2.4.5 අප්පහාය සූත්‍රය, පි.266.

▼**සෝතාපන්න ආරිය පුද්ගලයා සතර කරුණු ඇතිව වාසය කරයි.** 1-3: ත්‍රිවිධ රත්නය පිලිබඳ විශ්වාසය ඇතිව ජීවත්වීම හා 4. පරි පූර්ණ ශිලය (ආරිය කාන්ත ශිලය) තිබීම. ඔහු කිසිවිටක දුගතියක යළි උපතක් නොලබයි, ඒකාන්තයෙන්ම සම්බෝධිය (නිවන) ලබා ගනී. ශ්‍රද්ධාව, ශිලය ඇතිව ධර්මයේ ප්‍රසාදයට - විශ්වාසී බවට පැමිණෙන පුද්ගලයා, බ්‍රහ්මචාරි ජීවිතය පදනම් කරගෙන, යථා කාලයේදී සැපත ලබයි (නිවන) යයි බුදුන් වහන්සේ වදාළහ:

**"යෙසං සද්ධා ච සීලඤ්ච පසාදො ධම්මදස්සනං
තෙ වෙ කාලෙන පච්චන්ති බ්‍රහ්මචරියොගධං සුඛන්ති"**

**සටහන්: *** අටුවාවට අනුව: **'බ්‍රහ්මචරියොගධං සුඛන්ති'**: එම සැපය නම් සෝතාපන්න බැවින් ඉහළ මගඵල (සකදාගාමි - අරහත්) ලැබීමේ ප්‍රීතිය ය. ** ඉහත ගාථාවේ සඳහන් **'පසාදො ධම්මදස්සනං'** ධර්ම මාර්ගයට අනුබද්ධ වූ ප්‍රසාදය, එනම් **'මග්ගපසාදය'**(මාර්ගය පිලිබඳ නියතබව) හෝ මාර්ගයට පැමිණි කෙනෙක් ඒ පිළිබඳ සමාලෝචනය කිරිමෙන් ඇතිවන ප්‍රසාදය - සතුට ය. (**ආගතමග්ගස්ස පච්චවෙක්ඛණපසාදා**) **බලන්න**:ESN: note: 323, p. 2426. **මූලාශ්‍ර:** සංයු.නි: (5-2): මහාවග්ග: සොතාපත්ති සංයුත්ත:11.1.2 බ්‍රහ්මචරියෝගධ සූත්‍රය, පි. 164, ESN:55: Sotapattisamyutta: 2.2 Grounded, p. 2184.

▼**සෝතාපන්න පුද්ගලයා සිව්දහමෙන් යුක්ත නිසා අපාය බිය හැර දමා ඇත.**

**"...භික්ඛවෙ, අරියසාවකො පිණ්ඩියාලොපෙන යාපෙති. නන්තකානි ධාරෙති. සො චතුහි ධම්මෙහි සමන්නාගතො. අථ ඛො සො පරිමුත්තො නිරයා, පරිමුත්තො තිරච්ඡාන යොනියො, පරිමුත්තො පෙත්තිවිසයා, පරිමුත්තො අපායදුග්ගතිවිනිපාතා..."**. 'මහණෙනි, ආරිය ශ්‍රාවකයා පිඬු සිඟිමෙන් යැපේ, කඩමලු දරා සිටි, එහෙත්, ඔහු සිව් දහමින් යුක්තය. එමනිසා, ඔහු නිරයෙන්, තිරිසන් ලෝකයෙන්, ප්‍රේත ලෝකයෙන්, අපාය-දුගතිය-විනිපාත යෙන් මිදුනේය'. (අයහපත් ස්ථාන වල යලි උපතෙන් මිදුනේය).

**"...කතමෙහි චතුහි: ඉධ භික්ඛවෙ, අරියසාවකො බුද්ධෙ අවෙච්චප්පසාදෙන සමන්නාගතො හොති: 'ඉතිපි සො භගවා...', ධම්මෙ අවෙච්චප්පසාදෙන සමන්නාගතො හොති: 'ස්වක්ඛාතො භගවතා ධම්මො...', සඞ්ඝෙ අවෙච්චප්පසාදෙන සමන්නාගතො හොති: 'සුපටිපන්නො භගවතො සාවකසඞ්ඝො...', අරියකාන්ත සීලෙහි සමන්නාගතො හොති අඛණ්ඩෙහි අච්ඡිද්දෙහි අසබලෙහි අකම්මාසෙහි භුජිස්සෙහි විඤ්ඤුප්පසත්ථෙහි අපරාමට්ඨෙහි සමාධිසංවත්තනිකෙහි. ඉමෙහි චතුහි සමන්නාගතො හොති"**. එම ආරිය ශ්‍රාවකයාහට බුදුන්වහන්සේ කෙරෙහි, ධර්මය කෙරෙහි සංඝයා කෙරෙහි අචල විශ්වාසය ඇත, පැහැදීම ඇත. නව බුදුගුණ, දහම් ගුණ හා සඟ ගුණ ඔහු පිළිගනී). පරිපූර්ණ ආරිය කාන්ත ශිලය ඔහුට ඇත. ඔහු එම සිව්දහමෙන් යුතුව සිටි. **මූලාශ්‍ර:** සංයු.නි: (5-2 ): මහාවග්ග: සොතාපත්තිසංයුත්ත: වේළුද්වාරවග්ග: 11.1.1 රාජ සූත්‍රය, පි. 162, ESN: Sotapattisamyutta: 1.1 Wheel-Turning Monarch, p. 2183.

▼**සෝතාපන්නවීම, සක්විතිරජකම ලැබීමට වඩා උතුම්ය**: බුදුන්වහන්සේ මෙසේ වදාළහ:

**" යො ච භික්ඛවෙ, චතුන්නං දීපානං පටිලාභො, යො චතුන්නං ධම්මානං පටිලාභො, චතුන්නං දීපානං පටිලාභො චතුන්නං ධම්මානං පටිලාභස්ස කලං නාග්ඝති සොළසින්ති"**.'සිව් දිවයින් ලැබීමෙන් ලබන සක්විතිරජකම, සිව් දහම මගින් ලැබෙන සෝතාපන්න බව, හා සසඳන්නේ නම්, එහි අගය 16 න් එකක වටිනාකම බඳුය. (සොළොස් කලාවෙන් එක් කලාවක පමණ වටිනාකම ඇත) . එනම්, සෝතාපත්තියට පැමිණීම සක්විති රජකමට වඩා අති උතුම් ලැබීමකි'. ( bhikkhus, between the obtaining of sovereignty over the four continents and the obtaining of the four things, the obtaining of sovereignty over the four continents is not worth a sixteenth part of the obtaining of the four things): **මූලාශ්‍ර**:සංයු.නි:(5-2): මහාවග්ග: සොතාපත්ති සංයුත්ත: 11.1.1 රාජසූත්‍රය. පි. 162, ESN: 55: Sotapattisamyutta: 55: 1.1 Wheel-turning Monarch, p, 2183.

▼**මෙලොවදී පංචභය හා වෛර** නැතිකරගන්නා ආරිය පුද්ගලයාට සෝතාපන්න බවට අවශ්‍ය ධර්මතා ඇතිකරගැනීමට හැකියාව ඇත. **බලන්න**: පංචභය හා වෛර, සිව්දහම.: **මූලාශ්‍ර**:අංගු.නි: (6 ): 10 නිපාත, 10.2.5.2. භය සූත්‍රය,පි.354, EAN:10: 92-2. Enmity, p.533.

▼ **සෝතාපන්න ආරිය පුද්ගලයා** අපාය භය අවසන්කොට ඇත.: **මූලාශ්‍ර:** සංයු.නි: (5-2): මහාවග්ග: සච්චසංයුත්ත:සිංසපාවනවග්ග:12.4.6 පාණ සූත්‍රය, පි.322.

▼ **පංච ඉන්ද්‍රිය අවබෝධය** නිසා සෝතාපන්න මගඵල ඇතිවේ

**"පඤ්චිමානි භික්ඛවෙ ඉනද්‍රියානි...යතො බො භික්ඛවෙ, අරියසාවකො ඉමෙසං පඤ්චන්නං ඉනද්‍රියානං සමුදයඤ්ච අත්ථගමඤ්ච අස්සාදඤ්ච ආදීනවඤ්ච නිස්සරණඤ්ච යථාභූතං පජානති අයං වුච්චති භික්ඛවෙ, අරියසාවකො සොතාපන්නො අවිනිපාතධම්මො නියතො සම්බොධි පරායණොති".**'යම්කලක, ආරිය ශ්‍රාවකයා, මේ පංච ඉන්ද්‍රියයන් ගේ ඇතිවීම, ප්‍රහාණය, ආස්වාදය, ආදීනවය හා නිස්සරණය, පිළිබඳ යථා අවබෝධය ලබන්නේ නම්, එවිට ඔහු නිරය, විනිපාතිකය ආදී දුගතියන් හැරදමා, නියත සම්බෝධිය පිහිට කොට ඇති සෝතාපන්න බව ලබාගන්නේය'. **මූලාශ්‍ර:** සංයු: නි: (5-1): මහාවග්ග: ඉන්ද්‍රියසංයුත්ත: 4.1.2 සෝත සූත්‍රය, පි. 374, ESN: Mahavagga: Indriyasamyutta: 2.2 Stream Enterer, p. 192.

▼**ආරිය ශ්‍රාවකයා**, පංච උපාදානස්කන්ධයේ, ඇතිවීම, නැතිවීම, ආස්වාදය, ආදීනව හා නිස්සරණය යහපත් ලෙසින් අවබෝධ කරගත්විට ඔහු සෝතාපන්න වේ යයි බුදුන් වහන්සේ වදාළහ. **මූලාශ්‍ර:** සංයු.නි : (3 ): ඛන්ධසංයුත්ත: 1.1.7 සෝතාපන්න සූත්‍රය, පි. 306, ESN:22: 109.7 Stream Enterer, p. 1098.

▼ **සෝතාපන්න ආරිය ශ්‍රාවකයාගේ විහරණය**: සෝතාපන්න ආරිය ශ්‍රාවකයා, නිරතුරුව යෙදී සිටින විහරණ: බුද්ධ, ධම්ම හා සංඝ අනුසති, ශිලානුසතිය, ත්‍යාගානුසතිය, දේවානුසතිය. **බලන්න**: අනුසති භාවනා. **මූලාශ්‍රය:**අංගු.නි:(4): 6 නිපාත:ආහුනෙය්‍යවග්ග:6.1.1.10 මහානාම සූත්‍රය, පි.32.

▼**සෝතාපන්න පුද්ගලයන් නිවන් දකින ආකරය**: සෝතාපන්නවූ පුද්ගලයෙක් එම ජීවිතයේදී නිවන සාක්ෂාත් නොකර ගත්තේ නම්, ඔහු ආකාර තුනකට මෙලොවට යළි පැමිණ අරහත්වය ලබයි: **1) එක බීජ** (එකබීජී- one-seeder): එක බීජ සෝතාපන්න පුද්ගලයා යනු, මරණින් මතු උපදින එක් ආත්ම භාවයක් තුලදී අරහත්වය ලබන ආරිය පුද්ගලයාය.(Stream-enterer who attains arahantship after only one more existence). **2) කොලංකොල** (කොලංකොලො**):** කොලංකොල සෝතාපන්න පුද්ගලයා යනු මරණින් මතු ජීවිත 2 ක් හෝ තුනක් ගතකර අවසානයේදී, අරහත්වය ලබන ආරිය පුද්ගලයාය (one who fares on in saṃsāra for 2 or 3 existences and then makes an end to suffering). **3) සත්තක පරම (**සත්තක්ඛත්තුපරමො) : සත්තක පරම සෝතාපන්න පුද්ගලයා යනු මරණින් මතු උපරිමවශයෙන් ජීවිත 7 ක් ගතකර අවසානයේදී, අරහත්වය ලබන ආරිය පුද්ගලයාය (one who is reborn seven times at most, without taking an eighth existence and then makes an end to suffering). ඒ ඒ සොතපන්න පුද්ගලයාගේ ඉන්ද්‍රිය ධර්මතා- පංච ඉන්ද්‍රිය පරිපූර්ණ වන ආකාරය අනුව මෙසේ වර්ග කර තිබේ. **මූලාශ්‍ර:** සංයු.නි : (5-1): මහාවග්ග: ඉන්ද්‍රිය සංයුත්තය: 4.3.4 ඒක

බීජී සූත්‍රය, පි. 394, ESN: 48: Indriyasamyutta: 24.4 One-Seeder, p. 1951.

▼**සෝතාපන්න පුද්ගලයාට අභව්‍ය දේ**: සෝතාපන්න ආරිය පුද්ගලයාට කළ නොහැකි දේ- Incapable things by a Stream winner: 1) සක්කායදිට්ඨිය, විචිකිච්චාව,සීලබ්බතපරාමාස, අපායගාමිණී රාගය, දෝසය හා මෝහය යන ධර්මතා නැවත උපදවා ගත නොහැකිය. 2) කාමලෝකයේ අටවැනි උපතක් ලැබීම 3) ත්‍රිවිධ රත්නය කෙරෙහි හා ශික්ෂාව කෙරෙහි අගෞරව සහිතව වාසය කිරීමට නොහැකිය 4) පන්සිල් කඩාගැනීම හා මිථ්‍යාදිට්ඨි දැරීම නොහැකිය 5) සතර විපල්ලාස (නිත්‍ය, සුඛ, ආත්ම, සුභ) පිළිගැනීම නොහැකිය 6) බුදුන් වහන්සේ හැර සසුනෙන් බැහැර වෙනත් ගුරුවරයෙක් පිළිගැනීම නොහැකිය 7) ආනන්තරිය පාප කර්ම කිරීමට නොහැකිය 8) ධර්මයේ හේතු ඵල නියාය හැර දැමීමට නොහැකිය. **මූලාශ්‍ර:** අංගු.නි: (4 ): 6 නිපාත: සීතිවග්ග: 6.2.4.6 - 6.2.4.11 සූත්‍ර, පි.268, EAN: 6: 91.7 Incapable - 95.11 suttas, p. 362.

▼**සෝතාපන්නවීමේ අනුසස්**: සෝතාපන්න මග ඵල සාක්ෂාත් කරගැනීම නිසා ඇතිවන අනුසස් 6කි: සද්ධර්මය පිලිබඳව නියතබව ඇත, ධර්මයේ පරිහානියක් සිදුනොවේ-වීරියඇත, කෙළවරකරනලද කෙළෙස් පිලිබඳ නැවත දුක් ඇතිනොවේ, පෘතජනයා හට නොමැති ධම්ම ඥානයක් ඇත (අසාධාරණඥාන), හේතු ධම්ම හා හේතුඵල ධම්ම යහපත්ලෙසින් දැකීමට හැකිවීම. **මූලාශ්‍ර:** අංගු.නි: (4 ): 6 නිපාත: ආනිසංසවග්ග: 6.2.5.2 සූත්‍රය, පි.272.

▲**සෝතාපන්න අංග**:පාලි: **සොතාපත්තියඞ්ගං**- factors for stream-entry ධර්මයේ සෝතාපත්ති අංග ලෙසින් පෙන්වා ඇත්තේ සෝතාපන්නබව සඳහා පරිපූර්ණ කරගතයුතු ගුණයන්ය. මේවා සෝතාපත්ති අංග, සතර ධර්ම සිව්දහම ලෙසින්ද පෙන්වා ඇත.

▼**සෝතාපන්න අංග 4**: සෝතාපත්ති අංග ගැන බුදුන් වහන්සේ ඇසූ පැණයකට, සාරිපුත්ත මහා තෙරුන් මෙසේ කරුණු පෙන්වා ඇත:

**"...කතමන්නුඛො සාරිපුත්ත, සොතාපත්තියඞ්ගන්ති?..."**
**"...සප්පුරිසසංසෙවොහි භන්තෙ, සොතාපත්තියඞ්ගං, සද්ධම්මසවනං සොතාපත්තියඞ්ගං, යොනිසොමනසිකාරො සොතාපත්තියඞ්ගං, ධම්මානුධම්මප්පටිපත්ති සොතාපත්තියඞ්ගන්ති"**

සත්පුරුෂ සේවනය, සද්ධර්ම ශ්‍රවණය, යෝනිසෝමනසිකාරය, ධර්මයට අනුකූලව පිළිපැදීම (ධර්මානුධර්ම ප්‍රතිපදාව) යන සතර කරුණු සෝතාපත්ති අංගය.: (Association with superior persons... Hearing the true Dhamma… Careful attention… Practice in accordance with the Dhamma are factors for stream-entry) **සටහන**: සැරියුත් මහා තෙරුන්ගේ ප්‍රකාශනය බුදුන් වහන්සේ සාධුකාර දී අනුමත කළහ. **මූලාශ්‍ර:** සංයු.නි: ( 5-2): මහාවග්ග: සෝතාපත්තිසංයුක්ත: 11.1.5 දුතිය සාරිපුත්ත සූත්‍රය, පි. 170, ESN: Sottapattisamyutta: 5.5 Sāriputta-2, p. 2188.

▼ **සෝතාපත්ති** ධර්ම වඩා ගැනීමෙන්, විපුල කර ගැනීමෙන් මහා ප්‍රඥාව ඇතිවේ යයි බුදුන් වහන්සේ පෙන්වා ඇත. **බලන්න:** මහා ප්‍රඥාව. **මූලාශ්‍ර:** සංයු.නි: (5-2): මහාවග්ග: සෝතාපන්න සංයුත්ත11.7.1 පි. 279, ESN: Sotapatthisamyutta: VII Great Wisdom: p. 2259.

▼ **සොතපන්න** ගුණ දරන දෙවියෝ හෝ මනුෂ්‍යයෝ, ආයුෂ, වර්ණ, සුවය, යසස, අධිපති බැවින් යුකත්ය යයි පෙන්වා දුන් බුදුන් වහන්සේ මෙසේද වදාළහ:

"...නන්දක...එබව මවිසින්ම දන්නා ලද්දේය, අවබෝධ කරන ලද්දේය..."

**සටහන**: මේ සූත්‍රය දේශනාකොට ඇත්තේ විසල්පුර නන්දක නම් ලිච්චවී මහා ඇමතිටය. දේශනාව අවසානයේදී ඔහුගේ සේවකයා, දිය නෑමට කල් බව දැන්වූ විට, ඔහු පැවසුවේ:

"භාග්‍යවතුන් වහන්සේ කෙරෙහි යම් පැහැදීමක් වේ නම් එය ඇතුලත නෑම පමණ වන්නේය". එලෙස බුදුන් වහන්සේ කෙරහි, නන්දක ශ්‍රද්ධාව පිහිටුවා ගැනීම පෙන්වා ඇත. **බලන්න**: උපග්‍රන්ථය:3. **මූලාශ්‍රය:** සංයු.නි: (5-2) මහාවග්ග: සෝතාපතිවග්ග: 11.3.10 නන්දක සූත්‍රය, පි.238.

▲ **සේතරාජ හස්තියා**-White elephant Setha: පසේනදී කෝසල රජුගේ සේත (සුදු) නම් රාජ හස්තියා, මහා නාග ලෙසින් ජනයා හඳුන්වා ඇත. එහෙත්, තුන්දොරින් අකුසල නොකරන උතුමා 'මාහානාග' යයි බුදුන් වහන්සේ වදාළහ. **බලන්න**: නාග.

▲ **සේතව්‍යා නුවර-**Sethawya Nuwara: කෝසලරාජධානියේ පිහිටි නුවරකි, එහි රජ,පායාසිය. **බලන්න**: පායාසි රජ.

▲ **සිත**: පාළි: **චිත්තං** -citta – Mind: සිත: මනස, සන්තානය, චිත්තය, විඥානය ආදී විවිධ නම් වලින් හඳුන්වයි. (Mentality, consciousness, knowing). ධර්මයට අනුව, ආධ්‍යාත්මික ජීවිතය වඩා ගැනීමට සිත ප්‍රධානවේ. කෙනෙකුගේ සාමාන්‍ය ජීවිතයේ සාර්ථක අසාර්ථකබවට හේතුව සිතය. සිත මුල් කරගෙන කරන කටයුතු අනුව පුද්ගලයෙක් සැප හෝ දුක ලබයි. සිත මුල්කරගෙන උපත ලබන සත්ත්වයා, සිත නිසාම සසර සැරිසරයි, සිත දියුණු කරගෙන සසරින් මිදේ. ලෞකික ජීවිතය යහපත් ලෙසින් ගත කිරීමට හා ලෝකොත්තර ජීවිතය සාර්ථක කරගැනීමට සිත ප්‍රධාන බව බුදුන් වහන්සේ පෙන්වා ඇත. ආධ්‍යාත්මික වර්ධනය ඇතිකර ගැනීමට, සසර දුකින් මිදීමට, නිවන සාක්ෂාත් කරගැනීමට උපකාරීවන මූලික දේ සිතය. **ශබ්දකෝෂ : 1. පාසිශ**: පි.287: 'චිත්ත: සිත, සිතුවම, චිතතතත: සිතෙහි ස්වභාවය, සිතේ ආකාරය'. **2**. **BD**: p. 85: 'citta: mind, consciousness (viññāṇa, state of consciousness-mana'. 3. **PTS**: p. 615: 'Citta: the center & focus of man's emotional nature ...'

▼**කෙළෙස් නොමැති සිත ප්‍රභාස්වරය**: සිත ස්වභාවයෙන්ම පිරිසිදුය-පබාසර බවය (ප්‍රභාස්වර- දීප්තිමත්- luminous). බාහිර කෙළෙස් නිසා (රාග, දෝස හා මෝහ) සිත කිලිටිවේ. අනුවණ පුද්ගලයා **(**අශ්‍රැතවත් පෘතග්ජන) සිතේ නියම ස්වරූපය අවබෝධ කරගැනීමට සමත් නොවන නිසා සිත වර්ධනය කර දුකින් මිදීමට ඔහු දක්ෂ නැත. නුවණැති

පුද්ගලයා (ශ්‍රැතවත් ආරිය ශ්‍රාවකයා) යථා බව අවබෝධ කරගැනීමට සමත් නිසා ඔහුට, සිත දියුණුකර දුකින්මිදීමට ශක්තිය ඇත. **මූලාශ්‍ර**:අංගු.නි: (1): 1 නිපාතය: ප්‍රභාස්වර වග්ග, 1.6.1 හා 1.6.2 සූත්‍ර, පි. 58, EAN: 1: Luminous, 51.1 & 52.2 suttas, p. 39.

▼**සිත සියලු දෙයටම අධිපතිය**.

සිත ලෝකය හසුරුවයි- එහාට මෙහාට ඇදගෙන යයි
සෑම දෙයකම අදිපතියා සිතය- සියලුදෙනා සිතේ වසඟයට යටවේ
**(... චිතෙතන නීයති ලොකො, චිතෙතන පරිකසසති- චිතතසස එක ධමමසස සබෙබව වසමතවගූති)**

**සටහන**: අනුවණ පුද්ගලයා පහසුවෙන්ම සිතේ වසඟයට පත්වේ, එහෙත්, නුවණැති පුද්ගලයාට සිත පාලනය කරගැනීමට හැකිනිසා කෙළෙස් වලින් මිදීමට ඔහු සමත්වේ **බලන්න**: ESN: note-122, p. 519. **මූලාශ්‍ර**:සංයු.නි: (1) : සගාථවග්ග: දේවතා සංයුත්තය: චිත්ත සූත්‍රය, පි. 98, ESN: Devathasamyutta , 62-2 Mind, p. 143.

▼**සිතිවිලි වලට පෙරටුව ඇත්තේ සිතය**: කෙනෙකුගේ සිතිවිලි වලට මුල, පෙරටුව ගමන් කරන්නේ සිතය. සිතිවිලිවලට සිත ශ්‍රේෂ්ඨවේ.

**"මනො පුබබං ගමා ධමමා මනො සෙටඨා මනොමායා ..."**

**මූලාශ්‍රය:**ඛු.නි: ධම්මපදය:යමක වගග:ගාථාව: 1.

▼ **සියලුම අකුසල හෝ කුසල** ක්‍රියාවන්ට, සිත පෙරටුව සිටි. **මූලාශ්‍ර**:අංගු.නි: (1):1 නිපාත:ප්‍රභාස්වර වග්ග සූත්‍ර, පි.58, EAN: 1:Luminous, p. 39.

▼ **සිත සංවර කරගැනීම ඵලදායකවේ**: සිත තනිවම හැසිරේ, සිරුරක් නොමැත, කය නමැති ගුහාවේ වාසය කරයි, නිතරම වෙනස්වේ, දුර ඇති අරමුණු කරා විගසින් ගමන් කරයි. එබඳු සිත සංවර කරගන්නේ නම් මාරයාගේ බැම්මෙන් ගැළවිය හැකිය.

**"... දූරංගමං ඒක වරං අසරීරං ගුහාසයං යෙ චිතතං සයංමෙසසනතී මොකඛනතී මාර බනධනා". මූලාශ්‍රය**: ඛු.නි:ධම්මපදය: චිත්ත වග්ග: ගාථාව: 37.

▼**දමනය කරගත්,** ආරක්ෂා කරගත් සිත ආධ්‍යාත්මික ජීවිතයට අර්ථදායකය. **මූලාශ්‍ර**: අංගු.නි: (1):1 නිපාත: අදාන්ත වගග සූත්‍ර, පි.50, EAN: 1: Untamed, p.38.

▼**සිත වහා වෙනස්වේ, චංචලය**: ජලයෙන් ගොඩට ගත් මාළුවෙක් මෙන් සිත හැමඅතටම සැලේ- චංචලය. **මූලාශ්‍රය**:ඛු.නි: ධමමපදය: චිත්ත වග්ග: ගාථාව: 34.

▼**සිත තරම් වහා වෙනස්වන** වෙනත් එකම ධර්මතාවයක් බුදුඇසට නොපෙනේ යයි බුදුන් වහන්සේ වදාළහ:

**"...නාහං භිකඛවෙ අඤඤං එකධමමමපි සමනුපසසාමි, යං එවං ලහුපරිවතතං, යථයිදං චිතතං. යාවඤචිදං භිකඛවෙ උපමාපි න සුකරා යාව ලහුපරිවතතං චිතතනති"**

**මූලාශ්‍ර:** අංගු.නි: (1): 1 නිපාත: ශුක වග්ග සූත්‍ර, පි.54, EAN: 1: Spike, p. 38.

▼**සිත මනාව පිහිටුවා ගැනීම ජීවිතය යහපත්කරයි**: යහපත් සිතින් කරණ කුසල නිසා මෙලොව හා පරලොව ජීවිත යහපත් කරයි, පාපි සිතින් කරන අකුසල දුගතියට ගෙනයයි. මෙහිදී යොදාගත් **උපමාව**: සඳුන් ගස: ගස් අතුරින් සඳුන් ගස මෘදු බවින් හා නැමෙනසුළු බැවින් අග්‍රය. මානාව පිහිටුවා ගත් සිත අග්‍රවේ. **බලන්න**: උපග්‍රන්ථය:5 **මූලාශ්‍ර:** අංගු.නි: (1): 1 නිපාත: ශුක වග්ග සූත්‍ර, පි.54, EAN: 1: Spike, p. 38.

▼**මනාව දියුණු කල සිත අර්ථය පිණිසය**: මනාව දියුණු කල සිත- වැඩූ සිත (භාවිතං චිතතං -developed mind) කෙනෙක්ගේ අර්ථය- ලාභය (great good) පිණිස පවති, සුවපත්බව ලබාදෙයි. එහෙත්, නොවැඩූ සිත මහා හානි, විනාශ (great haram) හා දුක (suffering) ළඟා කරදේ:

**...චිතතං භිකඛවෙ අභාවිතං...මහතො අනතථාය සංවතති...දුකඛාවහං හොතීති ...චිතතං භිකඛවෙ භාවිතං... මහතො අතථාය සංවතති... සුකඛාවහං හොතීති**: **මූලාශ්‍ර:** අංගු.නි: (1): 1 නිපාත: අකම්මනිය වග්ග සූත්‍ර:පි.47, EAN: 1: Unwieldy, p.37.

▼**සිත තමා විසින්ම පිහිටුවා ගත යුතුවේ**

**"... න තං මාතා පිතා කයිරා - අඤ්ඤෙ වා'පි ච ඤාතකා සමමා පණිහිතං චිතතං - සෙය්‍යසො නං තතො කරෙ".** මවට හෝ පියාට හෝ වෙනත් කෙනෙකුට සිත පිහිටුවා දීමට නොහැකිය. **මූලාශ්‍රය**: ඛු.නි: ධමම පදය: චිත්ත වග්ගය: ගාථාව 43.

▼**සිත විවිධ ස්වභාවයෙන් යුක්තය**: මහා සතිපට්ඨාන සූත්‍රයේදී සිතේ විවිධ බව මෙසේ පෙන්වා ඇත:

"සරාගී සිත, වීතරාගී සිත, සදොස් සිත, වීතදෝස සිත, සමෝහ සිත, වීතමෝහ සිත, සංඛිත්ත සිත (අලසකමින් හැකුලුණු), වික්ඛිත්ත සිත (නොසන්සුන්), මහග්ගත සිත (ජාන නිසා උසස්බවට පත්), අමහග්ගත සිත(කාමලෝකයට ඇදීගිය-කාමාවචර සිත), සඋත්තර සිත (වර්ධනය නොවූ), අනුත්තර සිත (වර්ධනයවූ), සමාහිත සිත (සමාධියට පත්වූ), විමුත්ත සිත (කෙලෙස් නැති-ජාන අවස්ථාව), අවිමුත්ත සිත (කෙලෙස් සහිත)".

සතරසති පට්ඨානයේ චිත්තානුපස්සනා භාවනාව යහපත් ලෙසින් පුරුදු පුහුණු කරගත් පුද්ගලයා තමන්ගේ සිත අවබෝධ කරගැනීමට දක්ෂයෙක්වේ; සිත අවබෝධ කරගත්විට නොමග නොයා යහමග ගමන්කිරීමට නුවණ පහලවේ. **මූලාශ්‍ර:**දීඝ.නි: (1 ) මහා සතිපට්ඨාන සූත්‍රය,පි.436,EDN: 22Mahāsatipaṭṭhāna Sutta, p. 246.

▼ **පංච කාමයට යටවීම නිසා** සිත මුළුමනින්ම මැඩියයි- යටවී යයි. පංච කාමයෙන් නිදහස් වූවිට සිතේ මැඩීමක් නොමැත. **මූලාශ්‍ර**: අංගු.නි: (1): 1 නිපාත: චිත්ත පරියාදාන: 1.1.- 1.1.10 සූත්‍ර , පි.40, EAN:1: Obsession of the mind: 1.1 to 10.10, p. 36.

▼ **සිතට ඇති ආධාරය අරිය අටමගය**: බුදුන්වහන්සේ වදාළේ සිතට ඇති ආධරය අරිය අටමගබවය. අරිය අටමග ආධර කරගත් සිත මනාව පවත්වා ගත හැකිවේ. මේ පිලිබඳ **උපමාව: දරනුව උපමාව**: කළයක් දරනුවක් මත පිටුවා ඇත්නම් එය පහසුවෙන් පෙරලිය නොහැකිය. එලෙස සිත අරිය අටමගේ මනාව පිහිටුවාගෙන ඇත්නම් ඒ සිත පහසුවෙන් පෙරළිය නොහැකිය. **බලන්න:** උප ග්‍රන්ථය:5 **මූලාශ්‍ර:** සංයු.නි: (5-1):මහාවග්ග: මග්ගසංයුත්ත: 1.3.7 කුම්භ සූත්‍රය, පි. 62, ESN: Maggasamyutta: 27.7.The Pot, p. 1633.

▼**අවිද්‍යාව පහකර ගැනීමට, නිවන ලබා ගැනීමට සිත පිහිටවෙ**: මානාව යොමුකළ සිත අවිද්‍යාව පහකරගැනීමට, නිවන සාක්ෂාත් කරගැනීමට ඉවහල්වේ:

**"... එවමෙව බො භිකඛවෙ සො වත භිකඛු සමමා පණිහිතෙන චිතෙතන අවිජජං භෙචජති, විජජං උපපාදෙසසති, නිබබාණං සචඡිකරිසසතීති ඨානමෙතං වීජජති....** (With a well-directed mind one could would pierce ignorance, arouse true knowledge, and realize nibbāna). කැළඹුන සිත (නිවරණ නිසා නොපහන් සිත- **ආවිලෙන චිත්ත**- cloudy mind) ඇතිකෙනෙකුට සවඅර්ථය හෝ පරාර්ථය ගැන කටයුතු කිරීමට නොපිළිවන, එසේම නිවන ලබාගැනීමට පිහිටවන උතුම් ඥානය ලබාගැනීමට නොහැකිවේ. එහෙත්, පහන් සිතක් (**අනාවිලෙන චිතත**- transparent mind) ඇතිවිට සවඅර්ථය හා පරාර්ථය ගැන කටයුතු කිරීමට, ධර්මය විනිවිදව දැකගැනීමට හැකියාව ඇති නිසා එවැනි පුද්ගලයා **උත්තරීතර මනුෂ්‍ය ධර්මය** අවබෝධ කරගැනීමට (උත්තම මිනිස්බව- ආරියබව) ලබාගැනීමට සමත්වේ:

**"... එවමෙව බො භිකඛවෙ සො වත භිකඛු අනාවිලෙන චිතෙතන අතතතථං වා ඤසසති, පරතථං වා ඤසසති, උතතරිං වා මනුසසධමමා අලමරියඤාණදසසනවිසෙසං සචඡිකාරිසසතීති, ඨානමෙතං විජජති..."** **මූලාශ්‍ර:** අංගු.නි: (1): 1 නිපාත: ශුක වග්ග සූත්‍ර, පි.54, EAN: 1: Spike, p. 38.

▼**අකුසලයෙන් සිත මුදාගතයුතුය**: එක්සමයක දේවතාවියක් බුදුන්වහන්සේ බැහැදැක මෙසේ පැවසුහ: 'සැමදෙයකින්ම සිත මැඩ පවත්වාගැනීමෙන් දුකින් මිදීමට හැකිය'. එය එසේ නොවන බව බුදුන් වහන්සේ පෙන්වා ඇත:

"සිතෙන් සැමදෙයක්ම වැළක්වීම අවශ්‍යනැත, එහෙත් අකුසල ඇතිවේනම් සිතෙන් ඒවා වළක්වා ගතයුතුය". **සටහන**: අටුවාවට අනුව මෙහිදී බුදුන්වහන්සේ පෙන්වා ඇත්තේ: හසුරුවා ගතයුතු සිත හා වර්ධනය කළයුතු සිත අතර ඇති වෙනසය. කෙළෙස් ඇතිනොවීම පිණිස සිත පාලනය කරගතයුතුය .**බලන්න**: ESN: note 47, p. 507. **මූලාශ්‍ර:** සංයු.නි (1 ): සගාථවග්ග: දේවතාසංයුත්ත: 1.3.4 මනොනිවාරණ සූත්‍රය, පි. 52, ESN: 1: Devatasamyutta: 24.4 Reining in the Mind, p. 86.

▼ **නීවරණ නිසා සිත ආවරණය වේ**. නීවරණ ප්‍රහීණය කරගැනීමෙන් නිරාවරනයවූ සිත, සමාධිය ඇතිකරගැනීමට මුලිකවේ. **මූලාශ්‍ර**: අංගු.නි: (1 ): 1 නිපාත: නීවරණ ප්‍රහාන වග්ග සූත්‍ර: පි.40, EAN:1: Abandoning the hindrances: p. 36.

▼**බුදුන් වහන්සේ** වදාළේ නිතරම තමන්ගේ සිත බලමින්, ආවර්ජනය කරමින් වාසය කලයුතු බවය:

"....දීර්ඝකාලයක් තිස්සේ මේ සිත  රාගය දොසය හා මෝහය නිසා කිලිටිවී ඇත. එම කෙළෙස් නැති නම් සිත පිරිසිදුවේ... මේ සිත 'චරණ චිත්‍රය' ට වඩා විවිධය, තිරිසන් ලෝකයේ ඇති විවිධ සතුන්ට වඩා විවිධය...එමනිසා, සිත පිරිසුදු කරගැනීමෙන් සත්ත්වයා පිරිසුදුවේ යයි ආවර්ජනය කලයුතුය..."

**සටහන**: මෙහිදී යොදගත් උපමාව චරණ චිත්‍රයය. බුදුන් වහන්සේ වැඩ වාසය කල සමයේ පැවති මේ චිත්‍රය ඉතා අලංකාර විසිතුරු දෙයක් ලෙස සලකා ඇත**. බලන්න**: චරණ චිත්‍රය. **මූලාශ්‍ර**:සං.යු.නි: ( 3 ): ඛන්ධසංයුත්ත: 1.2.5.8 දුතිය ගද්දුලබද්ධ සූත්‍රය, පි. 286, ESN: 22: Khandasamyutta: 100.8  The leash-2 , p. 1090.

▼ **සිත ගිලන් නොකරගැනීම**: සුවපත් සිත (un afflicted mind) ආධ්‍යාත්මික දියුණුව පිණිස අවශ්‍යවේ. **සිත ගිලන් වන ආකාරය:** ධර්මය නොදත් අනුවණ පුද්ගලයා, පංච උපාදානස්කන්ධය 'මම, මගේ, මගේ ආත්මය' යයි අල්වාගෙන සිටි. පංච උපාදානස්කන්ධයේ ස්වභාය වෙනස්වී යාමය. එම වෙනස්වීම් ඇතිවනවිට, අනුවණ පුද්ගලයා දුකට, කම්පාවට පත්වේ. එසේ සිත ගිලන් කරගනි. එහෙත්, ධර්මය දත් නුවණැති පුද්ගලයා පංච උපාදානස්කන්ධය තමාගේ දෙයක් ලෙසින් අල්වාගෙන නැත. එහි වෙනස්කම් ඇතිවන විට ඔහු දුක් නොවේ. එලස, නුවණැති පුද්ගලයා, කය ගිලන්වුවත්, සිත ගිලන් නොකර වාසය කිරීමට දක්ෂවේ. **සටහන්:** * සැරියුත් මහා තෙරුන් මේ අවවාදය වදාළේ නකුල පිතා උපාසකටය. **මූලාශ්‍ර:**සං.යු.නි: (3): ඛන්ධ වග්ග, 1.1.1.1. නකුල පිතු සූත්‍රය**,** පි 30, ESN:22: Khandasamyutta: 1.1 nakulapita, p. 1007.

▼ **වෙනත් මූලාශ්‍ර:1. Taming the Mind** by Nyanaponika Thera: BPS: Wheel -51 .**2. The City of the Mind** by Nyanaponika Thera-: BPS: Wheel -25 **3. නිසල සිත ගෙනයි සෙත**-ධර්ම දේශනාව: සුමනජෝති නා හිමි: බුදුසරණ පුවත්පත: 2007 වසර වටිනා දහම් දෙසුම් සියයක්-සම්පාදක: පි.එස්.ගමගේ.

▲ **ස්ත්‍රිය-**Woman: ස්ත්‍රිය, කාන්තාව, මාගම ලෙසින්ද පෙන්වා ඇත. **බලන්න**: මාගම.

▲ **ස්ත්‍රී ඉන්ද්‍රිය-**Female faculty: මෙය ඉන්ද්‍රිය 22න් එකකි. **බලන්න**: ඉන්ද්‍රිය.

▲ **ස්ත්‍රී බන්ධන-**Female bondage: ස්ත්‍රීබන්ධනය යනු පුරුෂයෙක් විසින් කාන්තාවකගේ සිත තමන් වෙත බැඳ ගැනීම ය. එම බැඳීම ආකාර 5 කි: 1) රූපයෙන්2) සිනහාවෙන් 3) කතාවෙන් 4) ගීතයෙන් 5) හැඬීමෙන් 6) පෙනුමෙන් (ඇඳුම් පැළඳුම්) 7) තෑගි දීමෙන් 8) පහසින්. **බලන්න**: බන්ධන, ඉත්ථිබන්ධන. **මූලාශ්‍ර**: අං.ගු.නි: ( 5 ):8 නිපාත:බන්ධන සූත්‍ර 2කි, පි.102, EAN:8: Bondage suttas, p. 421.

▲ **සුතධරො** -retained in mind: සුතධරෝ ලෙසින් පෙන්වා ඇත්තේ දහම මැනවින් සිහියේ දරාගෙන සිටීමය. මෙය බහුශ්‍රැත බවේ එක් අංගයකි. **බලන්න**: බහුශ්‍රැත.

▲ **සුතමය ප්‍රඥාව-**Wisdom based on learning: සුතමය ප්‍රඥාව-ඤාණය යනු ධර්මය ඇසීමෙන් ලබාගන්නා නිරවුල් අවබෝධයය- පිරිසිඳ දැනීම. **බලන්න**: ත්‍රිවිධ ප්‍රඥා. **මූලාශ්‍රය**: ඛු.නි: පටිසම්භිදා1 :ඤාණකථා: 1 සුතමය ඤානය, පි. 32.

**සථ**

▲ **ස්ථවිර හා ස්ථවිරි-**Sthavira & Sthaviri: උපසම්පදාව ලැබ, සසුනේ වසර 10කට වැඩිකලක් ගතකළ භික්ෂු හා භික්ෂුණියන් මෙලෙසින් හඳුන්වති. **බලන්න**: තෙර.

▲ **සථිතිභාගික සමාධිය** - Samadhi conducing to stasis: සථිතිභාගික සමාධිය (ඨිතිභාගියො) ලෙසින් පෙන්වා ඇත්තේ කෙනෙක් ලබාගත් සමාධිය පිරිහීම හෝ වැඩිම නැති ව පැවතීමය. **මූලාශ්‍ර:** දීඝ.නි: (3): 11දසුත්තර සූත්‍රය, පි. 483, EDN: 34: Dasuttara Sutta: Expanding Decades, p. 384.

▲ **ස්ථාන හා අස්ථාන දන්නා නුවණ-**Knowledge of the possible and the impossible: ස්ථාන හා අස්ථාන දන්නා නුවණ, තථාගතයන් දස බල ඥානයෙන් එකකි. බුදුන් වහන්සේ ස්ථාන හා අස්ථාන දන්නා නුවණ (කුසලතාව) පිළිබඳව යහපත් ලෙසින් වදාරා ඇත. ඒ ධර්මතා සංඝයා එක්ව, ධර්මයේ චිරස්ථිතිය පිණිස සජ්ජායනා කිරීම සුදුසු ය යි සැරියුත් මහා තෙරුන් සංඝයාට උපදෙස් දී ඇත. **මූලාශ්‍ර**: දිඝ.නි: (3 ):10 සංගිති සූත්‍රය, පි. 372 , EDN: 33 Saṅgīti Sutta: The Chanting Together, p. 362.

▲ **ස්ථාන අස්ථාන කුසලතාවය:**පාලි**: ඨානඨාන කුසලො-** skilled in what is possible and what is impossible: ස්ථාන අස්ථාන පිළිබඳ කුසලතාවය පණ්ඩිතයන් සතු ගුණයක් ය යි බුදුන් වහන්සේ පෙන්වා ඇත. **බලන්න**: බාලයා හා පණ්ඩිතයා. **ස්ථාන අස්ථාන පිළිබඳ කුසලතාවය කවරේද? 1)** සම්මාදිට්ඨිය ඇති පුද්ගලයෙකු, කිසිම සංස්කාරයක් නිත්‍ය ලෙසින් නොගන්නා බවට ඇති අවබෝධය (there is no such possibility, that a person possessing right view could treat any formation as permanent). **සටහන**: අටුවාවට අනුව සම්මාදිට්ඨිය ඇති පුද්ගලයා - දිට්ඨිසම්පන්න යනු අවම වශයෙන් සෝතාපන්න ආරිය උතුමාය. මෙහිදී සංස්කාර ලෙසින් පෙන්වා ඇත්තේ හේතු ප්‍රත්‍යයෙන් සකස්වූ සංස්කාරය (සඞ්ඛතසඞ්ඛාර) **බලන්න**: EMN: note: 1084, p. 1162. **2)** සාමාන්‍ය පෘතග්ජන පුද්ගලයෙක් සංස්කාර නිත්‍ය ලෙසින් සැලකීමට හැකියාව ඇතය යන අවබෝධය. (It is possible that an ordinary person might treat some formation as permanent). **3)** සම්මාදිට්ඨිය ඇති පුද්ගලයෙකු, කිසිම සංස්කාරයක් සුඛ ලෙසින් නොගන්නා බවට ඇති අවබෝධය .(It is impossible, it cannot happen that a person possessing right view could treat any formation as pleasurable). **සටහන:** අරහත්වයට නොපැමිණි, ආරිය පුද්ගලයන්, මිථ්‍යා දිට්ඨියෙන් වෙන්ව සුඛය ගෙනෙදෙන සංස්කාර වටහා ගනී, එහෙත් ඔවුන් සංස්කාර සුඛය යි නොගනී, එය වැරදි ආකල්පයක් බව ඔවුන් දනී. **බලන්න**: EMN: note: 1085, p. 1162. 4) සාමාන්‍ය පෘතග්ජන පුද්ගලයෙක් සංස්කාර සුඛ ලෙසින් සැලකීමට හැකියාව ඇතය

යන අවබෝධය (It is possible that an ordinary person might treat some formation as pleasurable).**5)** සම්මාදිට්ඨිය ඇති පුද්ගලයෙකු අතින් පංච ආනනන්තරික කර්ම සිදුනොවනබව. **බලන්න**: පංච ආනනන්තරික කර්ම. **6)** සාමාන්‍ය පෘතග්ජන පුද්ගලයෙක් අතින් පංච ආනනන්තරික කර්ම සිදුවිය හැකිබව. **7)** සම්මාදිට්ඨිය ඇති පුද්ගලයෙකු කිසිවිටක බුදුන් වහන්සේ හැර වෙනත් ආගමික නායකයෙක් සිය ගුරුවරයා ලෙසින් නො ගන්නා බව.**8)** සාමාන්‍ය පෘතග්ජන පුද්ගලයෙක්, බුදුන් වහන්සේ හැර වෙනත් ආගමික නායකයෙක් සිය ගුරුවරයා ලෙසින් ගැනීමට හැකියාව ඇති බව.**9)** එකම ලෝකධාතුවේ, එකම අවස්ථාවේ සම්මා සම්බුදුවරු දෙදෙනක් පහළ නොවන බවට ඇති අවබෝධය. (It is impossible, it cannot happen that two Accomplished Ones, Fully Enlightened Ones, could arise contemporaneously in one world-system) **10)** එක් ලෝකධාතුවක, සම්මා සම්බුදුන් වහන්සේ පහළ වීමට හැකිය යන අවබෝධය. (It is possible that one Accomplished One, a Fully Enlightened One, might arise in one world-system). **11)** එක් ලෝකධාතුවක, චක්‍රවර්ති රජවරු 2 ක් ඇතිවිය නොහැකිය යන අවබෝධය. එහෙත්, එක් ලෝක ධාතුවක, එක චක්‍රවර්ති රජෙක් ඇතිවිය හැකිය යන අවබෝධය. **12)** කාන්තාවක්, සම්මා සම්බුදුරජාණන් වහන්සේ ලෙසින් පහළවීමට හැකියාව නොමැතිබව. **සටහන:** ඒ අනුව පෙනීයන්නේ සම්මා සම්බුදුවරයෙක් සෑම විටම පුරුෂයෙක් බවය. කාන්තාවකට බුදුවිය නොහැකිය යන අදහස මින් නො පැනවේ. කාන්තාවකට අනාගතයේ, පුරුෂයෙක් ලෙසින් උපත ලබා සම්මා සම්බුදුබව ලැබිය හැකිය. **බලන්න**: EMN: note: 1090, p. 1162. **13)** කාන්තාවක් ලෙසින් චක්‍රවර්ති රජවීම, මහා බ්‍රහ්මබවට පත්වීම, මාරයා බවට පත්වීම, සක්දෙව්රජ වීමට නොහැකිබව. එහෙත්, පුරුෂයෙකුට, ඒ තත්ථයන් ලබාගත හැකිබව. **14)** අයහපත් කාය, වචී හා මනෝ කර්ම මගින්, යහපත් ප්‍රතිඵල ලැබේවා යයි කැමතිවීමෙන්, පැතීමෙන් එය සිදු නොවන බව, අයහපත් කාය, වචී හා මනෝ කර්ම සිදුකර, පැතීම් නොමැතිව වුවද අයහපත් විපාක සිදුවන බව පිලිබඳ අවබෝධය. **15)** යහපත් කාය, වචී හා මනෝ කර්ම මගින්, අයහපත් විපාක ලැබීම සිදු විය නොහැකි බව, එහෙත්, පැතුලෙසින්, යහපත් කාය, වචී හා මනෝ කර්ම මගින්, යහපත් විපාක ලැබීම සිදුවිය හැකිබව. **16)** යහපත් කාය, වචී හා මනෝ කර්ම කරන පුද්ගලයෙක්, මරණින් මතු දුගතියේ උපතක් ලැබීම සිදු විය නොහැකිය යන අවබෝධය, එහෙත්, එවැනි පුද්ගලයෙක්, මරණින් මතු සුගතියේ, දේවලෝකයේ උපත ලැබීමට හැකියාව ඇතිබව. එසේම, අයහපත් කාය, වචී හා මනෝ කර්ම කරන පුද්ගලයෙක්, මරණින් මතු දුගතියේ උපතක් ලැබීම හැකිබව යන අවබෝධය. **සටහන: ම.නි.** මහාකම්මවිභංග සූත්‍රයේ දී බුදුන් වහන්සේ මෙසේ පෙන්වා ඇත: අයහපත් ක්‍රියා නිසා පුද්ගලයෙක් සුගතියේද, යහපත් ක්‍රියා කල පුද්ගලයෙක් දුගතියේද යලි උපත ලබාගත හැකි බව. එලෙස සිදුවන්නේ, යලි උපතට පත්වන අවස්ථාවේ ඔහු විසින් සාමාන්‍යයෙන් කරන කර්ම නොව, වෙනත් කර්මයක් විපාක ඇතිවීම නිසාය. **බලන්න**: EMN: note: 1091, p. 1162. **මූලාශ්‍රය**: ම.නි: ( 3): 3.2.5 බහුධාතුක සූත්‍රය, පි.209, EMN: 115: The Many Kinds of Elements, p. 840.

▲ **ස්ථූප-** Stupa: ස්ථූප යනු උතුම් පුද්ගලයන් සිහිකිරීම පිණිස ගොඩ නංවන සිහිවටනයන්ය. දාගැබ, චෛත්‍යය ලෙසින්ද දක්වා ඇත. **සටහන:** * දී.ස.නි: මහා පරිනිබ්බාන සූත්‍රයේ දී බුදුන් වහන්සේ ගේ මහා පරිනිබ්බානයෙන් පසු ධාතු රැස්කර සකස් කරනලද ස්ථූප ගැන විස්තර සඳහන්වේ.

▼ **ස්ථූප සෑදීමට සුදුසු උතුම් පුද්ගලයන් දෙදෙනෙක්**: තථාගතයන් වහන්සේ, සක්විති රජු ආදී උතුමන් ගැන මේ සූත්‍රයේ විස්තර පෙන්වා ඇත.**මූලාශ්‍ර:** අංගු.නි: (1 ): 2 නිපාත: 2.2.6.4 සූත්‍රය, පි. 185, EAN:2: 55.4 Sutta, p. 66.

▼ **ස්ථූප සෑදීමට සුදුසු උතුම් පුද්ගලයන් සිව්දෙනක්**: තථාගතයන්, පසේබුදුවරු, තථාගත ශ්‍රවක, සක්විති රජවරු. **සටහන**: දී.ස.නි: මහා පරිනිබ්බාන සූත්‍රයේ ද මේ විස්තරය පෙන්වා ඇත. **මූලාශ්‍ර:**අංගු.නි: (2): 4 නිපාත: 4.5.5.5. ථුපාරහ සූත්‍රය, පි. 492, EAN:4: 247.5 Worthy of Stupa, p. 230.

**සද**

▲ **සද්ධර්මය හා අසද්ධර්මය:** පාලි: **ධම්මං-** Dhamma & Asaddhamma (the good Dhamma and the bad Dhamma): බුදුන් වහන්සේ ගේ ඉගැන්වීම්, අනුසාසනා ධර්මය- සද්ධර්මය වේ. සද්ධර්මය අග්‍රය. අසද්ධර්මය, අසත්‍යවූ දහම නම් මිථ්‍යාදිට්ඨිය ඇතිව වැරදි මග ගැනීමය. **සටහන:** සද්ධර්මය-සත්‍ය ධර්මය යනු බුදුන් වහන්සේ වදාළ චතුරාර්ය සත්‍යයය. චතුරාර්ය සත්‍යයය පිලිනොගැනීම අසද්ධර්මය ය.

▼**සූත්‍ර දේශනාවල සද්ධර්මය හා අසද්ධර්මය විවිධ නම් වලින් හඳුන්වාඇත**: **සද්ධර්මය** :1) සාධු ධර්මය-good 2) ආරිය ධර්මය-noble 3) කුසල ධර්මය- wholesome 4) අත්ථ ධර්මය-beneficial 5) ධර්මය-dhamma 6) අනාශ්‍රව (අනාසව) ධර්මය-taintless 7) අනවද්‍ය ධර්මය-blameless 8) අතපනීය ධර්මය-untormenting 9) අපචයගාමි ධර්මය-leads to dismantling 10) සුවයදෙන ධර්මය- bring happiness 11) සුඛවිපාක ධර්මය- bring good results.

**අසද්ධර්මය:** 1) අසාධු ධර්මය-bad 2) අනාරිය ධර්මය-ignoble 3) අකුසල ධර්මය- unwholesome 4) අනර්ථ ධර්මය-harmful 5) අධර්මය-non- dhamma 6) සාශ්‍රව (සාසව) ධර්මය-tainted 7) සාවද්‍ය ධර්මය-blameworthy 8) තපනීය ධර්මය-tormenting 9) ආචයගාමි ධර්මය-leads to building up 10) දුකදෙන ධර්මය- bring suffering 11) දුක්විපාක ධර්මය- bring bad results. **මූලාශ්‍ර:** අංගු.නි: (6 ):10 නිපාත:සාධුවග්ග හා ආරිය වග්ග සූත්‍ර, 10.3.4.5 ධම්ම සූත්‍රය, පි.470 හා 10.3.5.3 සද්ධම්ම සූත්‍රය**,**පි.474, EAN:10: 138 sutta, P.548

▼ **සද්ධර්ම හත**: 1) ශ්‍රද්ධාව 2-3) හිරි ඔතප්ප 4) බහුශ්‍රැත 5) විරිය 6) සතිය 7) ප්‍රඥාව. **මූලාශ්‍රය**: අංගු.නි: (4) 7 නිපාත:සමණවග්ග:7.2.4.9 අසද්ධර්ම සූත්‍රය, පි.512.

▼**සියලු බුදුවරු** (අතීත, අනාගත හා වර්තමාන) සද්ධර්මය ගුරු තනතුරේ තබා වැඩවාසය කරන බව මෙහි පෙන්වා ඇත. තමන් වහන්සේද,

සම්බුද්ධත්වයට උපකාරීවූ, සද්ධර්මයට සත්කාර කරමින්, ගරුකරමින්, විශ්වාසීව වාසය කරන බව බුදුන් වහන්සේ වදාළහ:

**"තස්ස මය්හං එතදහොසි: යන්නූනාහං යොපායං ධම්මො මයා අභිසම්බුද්ධො තමෙව ධම්මං සක්කත්වා ගරුකත්වා උපනිස්සාය විහරෙය්‍යන්ති"**. (...I honored, respected, and dwelled in dependence only on the Dhamma to which I had become fully enlightened) **මූලාශ්‍ර**: අංගු.නි: ( 2 ): 4 නිපාත: 4.1.3.1 ප්‍රථම උරුවෙල සූත්‍රය, පි. 64,EAN: 4: 21.1.Uruwela-1, p. 155.

▼ **සද්ධර්මය** යනු සම්මා දිට්ඨිය පෙරටුකරගත් නිවැරදි මගය. මිථ්‍යාදිට්ඨිය ඇති වැරදි මග අසද්ධර්මය ය. **මූලාශ්‍ර:** අංගු.නි: (6 ) :10 නිපාත:ආරියවග්ග: 10.3.5.3 සද්ධම්ම සූත්‍රය, පි. 474, EAN:10: Noble , p. 548.

▼ **දසකුසලයේ** යෙදීම සද්ධර්මයය. දසඅකුසලය අසද්ධර්මයය. **මූලාශ්‍ර**: අංගු.නි: (6) :10 නිපාත: 10.4.4.3. සද්ධර්ම සූත්‍රය, පි. 536, EAN:10: 191 sutta, p. 556.

▼ **සම්මාදිට්ඨිය ඇතිවීම** නිසා කෙනෙක් සද්ධර්මයට- සත්‍ය ධර්මයට පැමිණේ (arrived at this true Dhamma). **මූලාශ්‍ර**: ම.නි: (1 ): 1.1.9 සම්මා දිට්ඨි සූත්‍රය, පි. 130, EMN: 9: Sammādiṭṭhi Sutta- Right View, p. 121.

▲**සද්ධර්ම ශ්‍රවනය**: පාලි: **සද්ධම්මසවනං** -To hear the noble Dhamma බුදුන්ව හන්සේ වදාළ ධර්මය, සැදැහිතින් ඇසීම සද්ධර්ම ශ්‍රවනය ය. සෝතාපන්නවීමට මෙය අවශ්‍යතාවයක්ය. **සද්ධර්ම ශ්‍රවනයට බාධා:** දූසිරිතය, උද්දච්චය, සිත සංවර නොකරඇති පුද්ගලයා සද්ධර්ම ශ්‍රවනයට කැමති නොවේ**.** සද්ධර්මය ශ්‍රවනය කිරීමෙන් සති සම්ප්‍රජන්‍යය ඇතිවේ, සිතේ අවුල් සහගතබව හා සිත විසිරියාම නැතිවේ, සමාධිය ඇතිකර ගත හැකිවේ, කෙනෙක්, ශීලසම්පන්නවූවිට සද්ධර්මය ශ්‍රවණය කිරීමට කැමැත්ත ඇතිවේ. **මූලාශ්‍ර**:අංගු.නි:(6):10 නිපාත:10.2.3.6 තයොධම්ම සූත්‍රය,පි.284, EAN:10: Tens,76-6.Incapable, p. 524.

▼ **ආධ්‍යාත්මික වර්ධනය** පිණිස සද්ධර්මය ශ්‍රවණය බොහෝ උපකාරී වේ. **බලන්න**: බහු උපකාර ධර්ම. **මූලාශ්‍ර:** දීඝ.නි: (3):11 දසුත්තර සූත්‍රය, පි. 483, EDN: 34: Dasuttara Sutta: Expanding Decades, p. 384.

▲ **සද්ධර්මයේ පැවැත්ම හා විනාශය**: පාලි: **සද්ධම්මස්ස ඨිතියා හා සම්මොසාය** -continuation & decline of the good Dhamma සද්ධර්මයේ පැවැත්ම පිණිස, අතුරුදහන් නොවීම පිණිස කරුණු 2 ක් බලපායි: මැනවින් (නිවැරදිව) දක්වා ඇති වචන හා වාක්‍ය ප්‍රකාශය- පෙළදහම හා යහපත් ලෙසින් අර්ථ දැක්වීම. (**සුනික්ඛිත්තඤ්ච පදබ්‍යඤ්ජනං, අත්‍ථො ච සුනීතො**- Well-set down words and phrases and well-interpreted meaning). සද්ධර්මයේ පරිහානිය පිණිස, අතුරුදහන් වීම පිණිස කරුණු 2 ක් බලපායි: වැරදි ලෙසින් දක්වා ඇති වචන හා වාක්‍ය ප්‍රකාශය හා වැරදි ලෙසින් අර්ථ දැක්වීම. (**දුන්නික්ඛිත්තඤ්ච පදබ්‍යඤ්ජනං, අත්‍ථො ච දුන්නීතො** Badly set down

words and phrases and badly interpreted meaning) **මූලාශ්‍ර:**අංගු.නි: (1): 2 නිපාත: 2.1.2.10 සූත්‍රය, පි. 154 , EAN: 2: 20.10 Sutta, p.60.

▼ **සද්ධර්මය පිරිහීමට හේතු** ලෙසින් සතිපට්ඨානය නො වැඩීම පෙන්වා ඇත. මෙහිදී පෙන්වා ඇත්තේ සතිපට්ඨානය වඩන්නේ නම් සද්ධර්මය නොපිරිහෙනබවය. **සටහන**: ආනන්ද තෙරුන් මේ කරුණු භද්දිය තෙරුන්හට වදාළහ. **මූලාශ්‍රය:** සංයු.නි: (5-1): මහාවග්ග: සතිපට්ඨාන සංයුත්තය:3.3.3 පරිහානිය සූත්‍රය.

▲ **සද්ධා-** Confidence : ත්‍රිවිධ රත්නය පිළිගැනීම- විශ්වාසය, සද්ධාවය. "සදහති තථාගතස්ස බොධිං", තථාගතයන් වහන්සේගේ සම්බෝධිය පිළිගැනීම. **බලන්න**: ශ්‍රද්ධාව. **මූලාශ්‍ර**: ම.නි: (2 ): 2.1.3 :සේඛ සූත්‍රය, පි. 44, MN 53: Sekha Sutta, p. 436.

▲ **සද්ධා ඉන්ද්‍රිය හා බල-** Faculty of Faith & Power:ආධ්‍යාත්මික මාර්ගය පිණිස, සද්ධා ඉන්ද්‍රිය හා බලය වර්ධනය කරගැනීම අවශ්‍යවේ. **බලන්න**: ආධ්‍යාත්මික පංච ඉන්ද්‍රිය, පංච බල.

▲ **සඬාපබ්බජිතානා-** Saddapabbajithena: සඬාපබ්බජිතානා යනු ශ්‍රද්ධාවෙන් පැවිදිවීමය. එලෙස පැවිදිවූ භික්ෂූන් අතුරින් රට්ඨපාල තෙරුන් අග්‍රය. **බලන්න**: උපග්‍රන්ථය:1

▲ **සද්ධානුසාරී-** a faith-follower: බුදුන් වහන්සේ කෙරහි අපමණ භක්තිය- විශ්වාසය ඇතිව, ආධ්‍යාත්මික මාර්ගය වඩා ගන්නා පුද්ගලයා සද්ධානුසාරිය, සත් ආරිය පුද්ගලයන්ගෙන් කෙනෙකි. **බලන්න**: සත් ආරිය පුද්ගලයෝ.

▲**සද්ධාවිමුක්ත-** one liberated by faith: සත් ආරිය පුද්ගලයන්ගෙන් කෙනෙකි. **බලන්න**: සත් ආරිය පුද්ගලයෝ.

▲**සදාචාරය-** Sadachara: සදාචාරය යනු ධර්මානුකූල යහපත් පැවැත්මය. හිරි ඔත්තප්ප, සදාචාරය පවත්වාගැනීමට මූලික කරුණුය. **බලන්න**: හිරි ඔත්තප්ප.

▲ **සදෙව්ලෝකය-** Six Heaven's :කාමාවචර දේවලෝක 6, සදෙව්ලෝකය ය. **බලන්න**: දේවලෝක.

▲ **සිදුරු-** fissures: සිදුරු-හිල්-විද්දානි ලෙසින් මෙහි දක්වා ඇත්තේ සිත එකඟකරගැනීමට-සමාධියට ඇති බාධාය, එවැනි සිදුරු 6ක්ය: අලසබව, ප්‍රමාදය, නැගීසිටීමට විරිය නැතිබව, අසංවරය, නින්ද, මැලිකම. **සටහන**: The Pāli terms for the six fissures (*chiddāni*) are: *ālassa, pamāda, anuṭṭhāna, asaṃama, niddā,tandi*. Spk-pṭ: These six things are called fissures because they do not give an opportunity for wholesome states of mind to occur. **බලන්න**: ESN: note:135, p.521 **මූලාශ්‍ර**: සංයු.නි: (1) සගාථවග්ග:දේවතාසංයුත්ත:1.8.6 නජීරති සූත්‍රය, පි.106, ESN:1: Devatasamyutta: 76.6. Does Not Decay, p.158.

▲ **සුදිට්ඨ -** clearly seen: ධර්මයට අනුව සුදිට්ඨ යනු ප්‍රඥාවෙන්, ධර්මය යහපත්ව- මනාව දැකීමය. **බලන්න**: ආරියනාය.

▲ **සුදත්ත සිටුවරයා-** Sudathta Situwaraya: සුදත්ත, අනාථපිණ්ඩික සිටුවරයා හඳුන්වන නමකි. **බලන්න**: උපග්‍රන්ථය:3

▲ **සුදස්ස හා සුදස්සි දේවලෝක-**Sudassa & Sudassi Devaloka: මේවා බ්‍රහ්ම දේවලෝකයන්ය. **බලන්න:** බ්‍රහ්මලෝක.

▲ **සුද්ධික භාරද්වාජ තෙර-**Suddika Bharadvaja Thera: **බලන්න:** උපග්‍රන්ථය:1

▲ **සුද්ධාවාස**-Pure abodes: සුද්ධාවාස යනු අනාගාමී උතුමන්, යළි උපත ලබන බ්‍රහ්ම ලෝකයන්ය. **බලන්න**: අනාගාමී, බ්‍රහ්ම ලෝක.

▲ **සුද්ධෝදන රජ-** King Suddhodana :ගෝතම බුදුන් වහන්සේගේ පියතුමාය, ශාක්‍යයන්ගේ රාජ්‍යවූ කපිලවස්තු නුවර රජය (කිඹුල්වත්පුරය). මහාමායා දේවිය අග බිසවය, ප්‍රජාපති දේවිය අනු බිසවය. **බලන්න**: උපග්‍රන්ථය:6 **සටහන්**: * **බු.නි: සුත්තනිපාත**:නාලක සූත්‍රයේදී, අසිත තවුසා, බෝසතුන් උපත ලැබූ බව දෙවියන්ගෙන් දැනගෙන කුමරා බැලීම පිණිස සුදොවුන් රජුගේ මාළිගයට ගිය බව දක්වා ඇත. ** **බු.නි:බුද්ධවංශපාලියේ**, ගෝතම බුද්ධවංශයේදී: බුදුන් වහන්සේ, තමන් වහන්සේගේ පියා සුදොවන් රජය ය, මව මහමායා දේවිය යයි දක්වා ඇත. ** **වින.පි.මහාවග්ගපාලි1**: රාහුල කථා (පි.282): සුද්ධෝදන රජ, සිදුහත් කුමරා, නන්ද කුමරා හා රාහුල කුමරා පැවිදිවීම නිසා තමන්ට හටගත් ශෝකය මෙසේ පවසා ඇත: "...ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ පැවිදුවූ කල්හි මට මහත් දුකක් උපන්නේය, නන්ද කුමරු පැවිදුවූ කල්හිද එසේම විය. රාහුල කුමරු පැවිදිවූ කළහු එයට වැඩි දුකක් විය... පුත්‍රප්‍රේමය සිරුරෙහි සිවිය සිඳී යි, සිවිය සිඳ සම සිඳී යි, සම සිඳ මස් සිඳී යි, මස් සිඳ නහර සිඳී, නහර සිඳ ඇට සිඳී යි, ඇට සිඳ ඇටමිදුළු හැපී පැතිර සිටී යි..."

▲ **සුදුකම්ම**- White kamma: සුදුකම්ම- දීප්තිමත් කම්ම යනු, තුන් දොරින් කරන යහපත් කුසල කර්මයන්ය. **බලන්න**: කම්ම.

▲ **සූදු කෙළීම**-Gambling: මෙය, ගිහියන්ගේ ධන සම්පත් ආදිය විනාශ වීමේ එක් කරුණක් ලෙසින් බුදුන් වහන්සේ පෙන්වා ඇත. **බලන්න**: ගිහිජීවිතය යහපත්ව ගතකිරීම.

▲**සුදු කසිණ**-White Kasina: සුදු කසිණය -ඕදාත කසිණය, දස කසිණයන්ගෙන් එකකි. බලන්න:දස කසිණ.

▲ **සුදු ධම්ම**-White Dhamma: සුදු ධම්ම ලෙසින් පෙන්වා ඇත්තේ ලෝකපාලක ධම්ම ලෙසින් හඳුන්වන හිරි ඔත්තප්ප කුසල ධර්මයන්ය. **බලන්න**: හිරි ඔත්තප්ප.

▲ **සුදු මග**- The white path: සුදුමග- ශුක්ලමග ලෙසින් පෙන්වා ඇත්තේ දස කුසලයේ යෙදීමය. **බලන්න**:දීප්තිමත් මග හා අඳුරු මග.

▲ **සුදුසු කතා-** Suitable Talks: ධර්මයේ සුදුසු කතා ලෙසින් පෙන්වා ඇත්තේ පැවිදි ජීවිතයට ආදාළ කතාය, එනම්, දශකථා වස්තුය. **බලන්න**: කතාව.

▲ **සුදුසුබව-** able: සුදුසුබව-අලං (හැකිබවයනු තමාට මෙන්ම අන්අයටද ධර්මමාර්ගයේ පිහිටවීමට හැකිබවය. **බලන්න**: අලං.

▲ **සිද්ධාර්ථ ගෝතම-**Siddhartha Gothma: අපගේ බුදුන් වහන්සේගේ ගිහිනමය. පෙළපත්නම ගෝතමය, නම් කිරීමේ මංගල්‍යයේදී දුන් නම: සිද්ධාර්ථය,වංශය:ශාක්‍ය. **බලන්න**: උපග්‍රන්ථය1

▲ **සිද්ධාර්ථ බුදුන්වහන්සේ-**The Buddha Siddhartha: ගෝතම බුදුන් වහන්සේට පෙර වැඩ සිටි, සිද්ධාර්ථ බුදුන් වහන්සේ පිලිබඳ විස්තර මෙහි දක්වා ඇත. **මූලාශ්‍රය**:බු.නි: බුද්ධවංශ පාලි:16: සිද්ධාර්ථ බුදුන්වහන්සේ.

**සඳ**

▲ **සඳ-**Moon: සඳ-හඳ, චන්දිම දෙව්පුත් (සඳදෙවි) ලෙසින්ද පෙන්වා ඇත. සඳු බුදුන් සරණ ගිය දේවියක් බවද පෙන්වා ඇත. සඳකිරණ - චන්ද්‍රාආලෝකය, ලෝකයේ ඇති දීප්තිමත් ආලෝක 4 න් එකකි.**බලන්න**: චන්දිම, චන්දඅභා. **සටහන්**:* බුදුන් වහන්සේ, මහාසමය සූත්‍රය දේශනා කළ අවස්ථාවේ, හිරු හා සඳු දෙවියෝ සෝතාපන්න වූ බැවින් බුදුන් වහන්සේ ඔවුන් "මගේ දරුවන්" ලෙසින් වදාළහ. **බලන්න:** ESN: Note: 159, p. 524. **මූලාශ්‍ර:** සංයු.නි: (1 ): සගාථවග්ග: දේවපුත්‍රසංයුත්ත: 2.1.9. චන්දිම සූත්‍රය හා 2.1.10 සුරිය සූත්‍රය, පි. 119, ESN:2: Devaputtasamyutta: 9.9 Chndima & 10.10 Suriya, p. 178.

▼**සඳ එලිය,** තරකා එලියට වඩා මහත්‍ය, එනිසා තරුවලට, සඳ අග්‍රවේ. **මූලාශ්‍ර:** සංයු.නි: (5-1): මහාවග්ග:මග්ගසංයුත්ත: අප්පමාදවග්ග: 1.13-චන්දිම සූත්‍රය, පි.130,ESN: 45: Maggasamyutta: XIII: Diligence: 146.8: The Moon, p. 1688.

▲ **සඳ උපමා-** Simile of the moon:1) බුදුන් වහන්සේ සඳ උපමාව යොදාගෙන මෙහිදී පෙන්වා ඇත්තේ, කිසිවක් කෙරහි නො ඇලි අහසට නගින සඳ ලෙසින්, සංඝයා, ආගන්තුකයෙක් විලසින්, පවුල්කරා පිඬුසිගා යෑම කළයුතු බව පෙන්වීමටය. **මූලාශ්‍ර:** සංයු.නි: (2) නිදානවග්ග: කස්සපසංයුත්ත: 4.1.3 චන්දඋපමා සූත්‍රය, පි.324. 2) නාගති-ධර්මානුකූල මග (ආරිය අටමග) ගමන් කරන පුද්ගලයා ගේ කිර්තිය පසලොස්වක දින පායන පුරසඳ මෙන් බැබලේ, එහෙත් වැරදි මග - අගතිමග ගමන්කරන පුද්ගලයාට කීර්තියක් නොමැත, හරියට අමාවක දින මෙන් සඳ එළියක් නොමැත- තද කළුවර සාහිතය. ජීවිතයේ බැබලීමක් නැත. **මූලාශ්‍ර:** අංගු.නි: (2): 4 නිපාත: 4.1.2.7, 4.1.2.8 හා 4.1.2.9 අගති-නාගති සූත්‍, පි. 58, EAN:4: 17.7, 18.8 and 19.9 Wrong course, p. 154.

▲**සඳුන්ගස උපමාව-** Simile of the sandalwood tree: මනාව පිහිටුවා ගත් සිත සඳුන් ගස වැනිය යයි බුදුන් වහන්සේ මේ උපමාවෙන් පෙන්වා ඇත. ගස් අතුරින් සඳුන් ගස මෘදු බවින් හා නැමෙනසුළු බැවින් අග්‍රය. මානාව පිහිටුවා ගත් සිත ද එලෙස අග්‍රවේ. **මූලාශ්‍ර:** අංගු.නි: (1): 1 නිපාත: ශුක වග්ග සූත්‍, පි.54, EAN: 1: Spike, p. 38.

**සධ**

▲ **සාධු ධර්මය හා අසාධු ධර්මය-**Good Dhamma & Bad Dhamma: ධර්මයට අනුව සාධු යනු හොඳ දේය, යහපත් දේය. අසාධු යනු නරක දේය, අයහපත් දේය. සාධු ධර්මය යනු නිවැරදි මගය, අසාධු ධර්මය නම් වැරදි මග ගැනීමය. **බලන්න:** සම්‍යක්තවය, මිථ්‍යාත්වය.
**මූලාශ්‍ර**:අං.ගු.නි:(6):10 නිපාත: සාධුවග්ග:10.3.4.1 සාධු සූත්‍රය, පි. 468, EAN:10: IV: 134.1 Good, p. 548.

▼ **මේ සූත්‍රයේදී** සාධුධර්ම ලෙසින් පෙන්වා ඇත්තේ**:** දසකුසල්ය; දස අකුසල අසාධු ධර්මයය. **බලන්න**: දස කුසල හා දස අකුසල.
**මූලාශ්‍ර**:අං.ගු.නි ( 6): 10 නිපාත:10.4.3.1 සාධු සූත්‍රය, පි.528, EAN: 10:178.1. Good, p.555.

▲ **සුධර්මා දේව සභාව**- Sudhamma Deva Hall: සක්‍රදෙවියන් ප්‍රමුක, දෙවිවරු රැස්වෙන දේව සභාවය. **බලන්න**: දීඝ.නි:ජනවසභ සූත්‍රය.

▲ **සුධර්ම භික්ෂුව-** Bhikkhu Sudharma: **බලන්න**: උපග්‍රන්ථය:1

▲ **සංධාන ගහපති**- Householder Sandana: **බලන්න**: උපග්‍රන්ථය:3

**සන**

▲ **සනං කුමාර බ්‍රහ්මරාජ-** Brahma Sanankumara: මේ බ්‍රහ්මරාජයා බුදුන් වහන්සේගේ අනුගාමිකයෙක්ය.**බලන්න**: බ්‍රහ්ම රාජ

▲ **සන්තුෂ්ටිය:** පාලි: **සන්තුට්ඨො** - Contentment: සන්තුෂ්ටිය යනු ලදදෙයින් සැහීමට පත්ව වාසය කිරීමය. බ්‍රහ්මචරියාවේ යෙදුන භික්ෂුව ලැබෙන සිව්පසයෙන් සැහීමට පත්වීමේ ගුණය ආධ්‍යාත්මික ජීවිතයට ආරක්ෂාව ගෙන දෙන බව බුදුන් වහන්සේ පෙන්වා ඇත. අසන්තුෂ්ටිය නැතිකර ගැනීමට සන්තුෂ්ටිය වැඩිය යුතුය. **බලන්න**: නාථකරණ ධර්ම, සිව්පසය, අසන්තුෂ්ටිය.**සටහන්: *** සන්තුෂ්ටිය ශුභ කරුණක් යයි මංගල සූත්‍රයේ පෙන්වා ඇත. ** නිවන අවබෝධය පිණිස අවශ්‍යතම ගුණයක් බව මෙත්තා සූත්‍රයේ දක්වා ඇත. **මූලාශ්‍රය:** සං.යු.නි: (4) 6 නිපාත: 6.1.8 සූත්‍රය, පි.284.

▼**මෙලොව, සන්තුෂ්ටිය** ඇතිව වාසය කරන්නේ පහවූ තණ්හාව ඇති රහතුන්ය. **මූලාශ්‍රය**: ඛු.නි.සුත්තනිපාත: පාරායනවග්ග:වස්තුගාථා: පි,326, 5-2 තිස්සමෙත්තෙයිය මානවක, පි.338

▲ **සන්දක පරිබ්‍රාජික-**Sandaka Patribrajaka: **බලන්න**: උපග්‍රන්ථය:3

▲ **සන්දිට්ඨිකො- Sandittiko**: ධම්ම ගුණයකි: **බලන්න:** ධම්ම ගුණ.

▲**සන්දිට්ඨික ධම්ම**- Directly Visible Dhamma: ධර්මය සන්දිට්ඨිකය, තමා විසින්ම දැකිය යුතුය. මෙය ධර්මයේ එක් ගුණයකි. **ධර්මය සන්දිට්ඨික** බව බුදුන් වහන්සේ දේශනා කර ඇති ආකාරය ආනන්ද තෙරුන් මෙහිදී පෙන්වා ඇත. "ඇවැත්නි, මේ සසුනේ මහණ...ප්‍රථම ජානයට පැමිණ වාසය කරයි…( එලෙස සිව් ජාන) එපමණකින්ම, ධර්මය සන්දිට්ඨික යයි අවස්ථානුරූපව (පර්යායෙන්) බුදුන් වහන්සේ දෙසනා කරන ලදී"

" මේ සසුනේ මහණ... ආකාසානඤ්චායතන සමාපත්තියට පැමිණ වාසය කරයි... (එලෙස සිව් අරූප) එපමණකින්ම, ධර්මය සන්දිට්ඨික යයි අවස්ථානුරූපව, බුදුන් වහන්සේ දෙසනා කරන ලදී"

"...මේ සසුනේ මහණ මුළුමනින්ම, නෙවසඤ්ඤා නාසඤ්ඤායතනය ඉක්මවා සඤ්ඤාවෙදයිත නිරෝධයට පැමිණ වාසය කරයි. නෙවසඤ්ඤානාසඤ්ඤා විපස්සනා ප්‍රඥාවෙන් දැකීමෙන් ඔහුගේ ආසව ක්ෂයවේ. එපමණකින්ම, ධර්මය සන්දිට්ඨික යයි අවස්ථානුරූපව,බුදුන් වහන්සේ දෙසනා කරන ලදී". **මූලාශ්‍ර:** අංගු.නි: (5 ): 9 නිපාත: සාමඤ්ඤවග්ග: 9.1.5.5 සන්දිට්ඨික ධම්ම සූත්‍රය, **පි.** 564 , EAN:9: 46.5 Directly Visible Dhamma, p. 485.

▲ **සන්දිට්ඨික නිබ්බාන**- Directly Visible Nibbāna: සන්දිට්ඨික නිබ්බානය ලෙසින් පෙන්වා ඇත්තේ තමා විසින්ම දැකිය යුතු නිවනය. සන්දිට්ඨික නිබ්බානය පිළිබඳව බුදුන් වහන්සේ මෙසේ පෙන්වා ඇතිබව ආනන්ද තෙරුන් වදාළහ:

"ඇවැත්නි, මේ සසුනේ මහණ...ප්‍රථම ජානයට පැමිණ වාසය කරයි…( එලෙස සිව් ජාන) එපමණකින්ම, සන්දිට්ඨික නිබ්බානය යයි අවස්ථානුරූපව (පර්යායෙන්) බුදුන් වහන්සේ දෙසනා කරන ලදී" " මේ සසුනේ මහණ... ආකාසානඤ්චායතන සමාපත්තියට පැමිණ වාසය කරයි... (එලෙස සිව් අරූප) එපමණකින්ම, සන්දිට්ඨික නිබ්බානය යයි අවස්ථානුරූපව, බුදුන් වහන්සේ දෙසනා කරන ලදී" "...මේ සසුනේ මහණ මුළුමනින්ම, නෙවසඤ්ඤානාසඤ්ඤායතනය ඉක්මවා සඤ්ඤාවෙදයිත නිරෝධයට පැමිණ වාසය කරයි. නෙවසඤ්ඤානාසඤ්ඤා විපස්සනා ප්‍රඥාවෙන් දැකීමෙන් ඔහුගේ ආසව ක්ෂයවේ. එපමණකින්ම, සන්දිට්ඨික නිබ්බානය යයි අවස්ථානුරූපව, බුදුන් වහන්සේ දෙසනා කරන ලදී" **මූලාශ්‍ර:** අංගු.නි: (5 ): 9 නිපාත: සාමඤ්ඤවග්ග: 9.1.5.6 සන්දිට්ඨික නිබ්බාන සූත්‍රය, පි. 564, EAN:9: 47.6 Directly Visible, p. 485.

▲ **සානු හා මව-** Sanu & mother : පැවිද්ද හැර දමා යළි ගිහිගෙයට පැමිණි පුතු ගැන සානුගේ මව වැළපීම මෙහි විස්තර කර ඇත. බලන්න: **උපපැවිදි.** සංයු.නි: (1) සගාථවග්ග: යක්ඛසංයුත්ත: සානු සූත්‍රය

▲ **සෙනසුන-**Senasuna: සෙනසුන, සංඝයා වාසය කරන ආවාසයය. වාසය පිණිස සෙනසුනක තිබිය යුතු ගුණ මෙහි පෙන්වා ඇත. **සටහන:** සේනාසන පණවන භික්ෂූන් අතරෙන් අග්‍ර දබ්බ මල්ල පුත්‍ර තෙරුන් ය. **මූලාශ්‍ර:** අංගු.නි: (6 )10 නිපාත, නාථ වග්ග, 10.1.2.1 සේනාසන සූත්‍රය, පි.56, EAN:10: II Protector, 11.1. Lodging, p. 495.

▲**සේනිය බිම්බිසාර රජතුමා**- King Seniya Bimbisāra: සේනිය බිම්බිසාර රජතුමා මගධ රටේ රජතුමාය. බුදුන්වහන්සේගේ දායකයෙකි. අජාසත් රජුගේ පියාය. **මගධාදිපති බිම්බිසාර රජු** දැහැමෙන් රට පාලනය කළ නිසා මගධවාසීන් රජතුමාට ප්‍රියබව දැක්වූහ. මේ රජතුමා බුදුන්වහන්සේ ගේ ධර්මය අසා සොතපන්න මගඵල ලැබූහ. මියයාමෙන් පසු චතුර්මහා රාජකීය දෙවියන් අතර ජනවසභ නමින් පහළවිය. එම දෙවියන් බුදුන්වහන්සේ බැහැදැක, තමන් පිළිබඳව හා දේවසභාව පිළිබඳව කළ විස්තරය මෙහි දක්වා ඇත. **බලන්න**: උපග්‍රන්ථය:3. **මූලාශ්‍ර:**

දීඝ.නි: (2 ) 5. ජනවසභ සූත්‍රය, පි,322, EDN: 18 Janavasabha Sutta (17), p. 209.

▲**සේනිය තවුසා-** Ascetic Seniya: නිවන ලබා ගැනීම පිණිස දුෂ්කර බලු ව්‍රතය පුරුදු කල මොහු, බුදුන් වහන්සේ, පෙන්වා දුන් මග අවබෝධකර, බුදුන් සරණ ගියහ. **බලන්න**: ම.නි: කුක්කුරවත්තික සූත්‍රය, බලු ව්‍රතය, උපග්‍රන්ථය:3

▲ **සේනිය (කෝලිය) තෙර**-Seniya Kolita Thera: **බලන්න:** උපග්‍රන්ථය:1

▲ **සේනානිගේ දියණිය සුජාතා**: Senani's daughter Sujatha: **බලන්න:** උපග්‍රන්ථය:3

▲ **සුන්දරිකභාරද්වාජ තෙර 1 හා 2** -Sundarika Bhradvaja Thera1&2 **බලන්න**: උපග්‍රන්ථය: 1

▲ **සුනක්ඛත්ත ලිච්චවී -** Sunakkhatta the Licchavi: **බලන්න:** උපග්‍රන්ථය: 4

▲ **සුනෙත්ත ශාස්තෘ -** The teacher Sunetta: පුරාණ දඹදිව වාසය කල ප්‍රසිද්ධ ශාස්තෘවරයෙකි. **බලන්න**: පුරාණ ශාස්තෘ -ආචාර්යවරු.

▲**සුනිධ මහා ඇමති-** Minister Sunidha: මොහු මගධයේ අජාසත් රජුගේ මහාඇමතිවරයෙකි. බුදුන් වහන්සේගේ අවසාන චාරිකාවේදී, පාටලිපුත්‍ර නුවරදී වස්සකාර මහා ඇමති සමග බුද්ධ ප්‍රමුඛ සංඝයාට දානය පිරිනැමීමේ විස්තර මෙහි දැක්වේ.**බලන්න**: වස්සකාර මහා ඇමති,දානය. **මූලාශ්‍ර**: වින.පි: මහාවග්ග 2: පි 70 හා දීඝ.නි: (2): මහාපරිනිර්වාන සූත්‍රය, පි.156, EDN : 16 Mahaparinibbana Sutta, p 175.

▲ **සිනෙරු කන්ද-** Mount Sineru: සක්විති රජගේ ආධිපත්‍යය ඇති සතර දීප පිහිටා ඇත්තේ, ලෝකයේ අක්ෂය ලෙසින් සලකන සිනෙරු කන්දට, උතුරින්, නැගෙනහිරෙන්, දකුණින් හා බටහිරෙන්ය. **බලන්න**:සක්විතිරජ.

**සප**

▲**සප්ත අනුසය-** 7 Underlying tendencies: අනුසය ධර්ම (නිදිගත් කෙලෙස්) හතකි: කාමරාග, පටිඝ, දිට්ඨි, විචිකිච්චා, මාන, භවරාග, අවිජ්ජා. නිවන ලබා ගැනීමට ඒ හැම පහකර ගතයුතුවේ. **බලන්න:** අනුසය.

▲ **සප්තඅපරිහානිය ධර්ම-**Saptha aparihani dhamma**: බලන්න:** අපරිහානිය ධර්ම.

▲ **සප්ත ධර්මතා -** Seven Dhammas: සප්ත ධර්මතා ඇති ආරිය ශ්‍රාවකයා, මාරයාහට පරාජය කල නොහැකිය: 1) ශ්‍රද්ධාසම්පන්නබව 2) ශිලසම්පන්නබව 3) හිරිඔතප්ප තිබීම 4) බහුශ්‍රැතබව 5) වීරිය ඇතිබව 6) සිහිනුවණ 7) ප්‍රඥාව. බුදුන් වහන්සේ මේ ගුණ උපමා කර ඇත්තේ රජෙක් සතු ශක්තිමත් නගරයකටය. **නගරය උපමාව:** ශක්තිමත් නගරයක් කරුණු 7 ක් ඇතිනිසා පරාජය කළ නොහැකිය. එලෙස, සප්ත සද්ධර්මය සහිත භික්ෂුව, මාරයා හට පරාජය කල නොහැකිය. **බලන්න:**

උපග්‍රන්ථය:5 **මූලාශ්‍ර**:අංගු.නි:(4):7 නිපාත:7.2.2.3 නගරූපමසූත්‍රය, පි.454, EAN:7: 67.3 Simile of the Fortress, p. 397.

▲ **සප්ත සද්ධර්ම ගුණ**: පාලි: **සත්ත සද්ධම්මා-** Seven dhamma qualities: සප්ත සද්ධර්ම ගුණ ලෙසින් පෙන්වා ඇත්තේ, සේඛ ප්‍රතිපදාව අනුගමනය කරණ භික්ෂුව ( disciple in higher training) තුළ ඇති යහපත් ගුණ හතය: **බලන්න**: සේඛ.

▼**සේඛ ප්‍රතිපදාවේ යෙදෙන භික්ෂූන් සතු යහපත් ගුණ 7**කි: 1) **ශ්‍රද්ධාව:** බුදුන් වහන්සේගේ සම්බෝධිය පිළිගැනීම. 2) **හිරි** ඇතිබව- තුන් දොරින් පව් කිරීමට-අකුසල් කිරීමට ලැජ්ජාවීම 3) **ඔත්තප්ප** ඇතිබව- තුන් දොරින් පව් කිරීමට, අකුසල් ඇති 4) **බහුශ්‍රැතබව**- ධර්මය බොහෝ අසාතිබීම හා සිහියේ රඳවා ගෙන් තිබීම, සජ්ජායනා කිරීම, ආවර්ජනය කිරීම, මැනවින් සලකා දිට්ඨියට පැමිණසිටීම 5) **විරිය ඇතිබව-**අකුසල් පහකිරීමට හා කුසල් වඩාගැනීම පිණිස ඔහුට සම්මා ප්‍රධාන වීරිය ඇත 6) **සතිය** ඇතිබව (ස්මෘතිය) පෙරදී කරණ ලද දේ, කියන ලද දේ පිලිබඳ යහපත් සිහිය හා නුවණ ඇතිබව 7) **ප්‍රඥාව ඇතිබව**- දුක නැතිකරගැනීමට සහායවන, ඇතිවීම හා නැතිවීම පිලිබඳ විදසුන් නුවන ඇතිබව. **මූලාශ්‍ර**: ම.නි: (2): 2.1.3 :සේඛ සූත්‍රය, පි. 44, MN 53: Sekha Sutta, p. 436.

▲ **සප්ත පුරිසගති-**seven destinations of persons: සප්ත පුරිසගති ලෙසින් පෙන්වා, ධර්මානුකූල ජීවිතයක් ගත කළ උතුම් පුද්ගලයෙක්- අනාගාමී උතුමෙක්, මරණින් මතු උපත ලබන ස්ථාන 7 ක් පිලිබඳවය.**බලන්න:**අනාගාමී.

▲ **සප්ත බොජ්ඣංග-** seven factors of enlightenment: බෝධිය ලබාගැනීමට- නිවන සාක්ෂාත් කර ගැනීමට උපකාරී අංගය 7 ය: සති, ධම්මවිචය, වීරිය, පිති, පස්සදී, සමාධි, උපේක්ඛා. **බලන්න:** බොජ්ඣංග ධර්මතා.

▲**සප්ත විඥාන ස්ථාන- 7** stations of consciousness: විඥාන ස්ථාන- විඥානස්ථිති ලෙසින් පෙන්වා ඇත්තේ යළි උපතට හේතුවන විඥාණය පිහිටන තැන් 7 ය. **බලන්න:** විඥාන ස්ථාන,

▲ **ස්පර්ශය:** පාලි: **ඵසස- ඵස්සො**- contact: ස්පර්ශය: පහස, ගැටීම (touching base) ලෙසින්ද පෙන්වා ඇත. ධර්මයේ ස්පර්ශය ලෙසින් පෙන්වා ඇත්තේ සළායතන මගින් බාහිර අරමුණු ස්පර්ශ කිරීමය. සියලු ධර්මතා ස්පර්ශය නිසා උපත ලබයි:

**"ඵස්ස සමුදයා සබ්බෙ ධම්මා". බලන්න**: සබ්බෙ ධම්මා.

▼**ස්පර්ශය පටිච්චසමුප්පාදයේ 6 පුරුකය**: සළායතන ඇතිවීම නිසා ස්පර්ශය ඇතිවේ, සළායතන නිරුද්ධවීමෙන් ස්පර්ශය නිරුද්ධ වේ:

**"...සළායතන පච්චයා ඵසෙසා..."**
**"...සළායතන නිරොධා ඵසස නිරොධා.."**

ස්පර්ශය නිසා වේදනා ඇතිවේ. ස්පර්ශය නිරෝධවීමෙන් වේදනා නිරෝධවේ. **ස්පර්ශය ආකාර 6 කි:**

**“…ඡයිමෙ භිකඛවෙ, ඵසසකායා: චකඛු සමඵසෙසා, සොත සමඵසෙසා, සාණ සමඵසෙසා, ජිව්හා සමඵසෙසා, කාය සමඵසෙසා, මනො සමඵසෙසා…”**. **1) චකඛු සමඵසෙසා:** ඇස බාහිර රූප හා ගැටීමෙන් ඇතිවන පහස 2) **සොත සමඵසෙසා:** කණ බාහිර ශබ්ද හා ගැටීමෙන් ඇතිවන පහස 3) **සාණ සමඵසෙසා:** නාසය බාහිර ගඳ සුවඳ හා ගැටීමෙන් ඇතිවන පහස 4) **ජිව්හා සමඵසෙසා**: දිව බාහිර රස හා ගැටීමෙන් ඇතිවන පහස 5) **කාය සමඵසෙසා:** කය බාහිර ස්පර්ශ හා ගැටීමෙන් ඇතිවන පහස 6) **මනො සමඵසෙසා:** මනස බාහිර සිතුවිලි හා ගැටීමෙන් ඇතිවන පහස **(**eye-contact, ear-contact, nose-contact, tongue-contact, body-contact, and mind-contact). **මූලාශ්‍ර:** සංයු.නි: (2 ) : නිදානවග්ග: 1.1.1. පටිච්චසමුප්පාද සූත්‍රය හා 1.1.2 විභඞ්ග සූත්‍රය, පි.26, ESN: Nidanavagga: 1.1. Dependent Origination & 1 2.2 Analysis of Dependent Origination, p.611, ම.නි: (1): 1.1.9 **සම්මා දිට්ඨි සූත්‍රය**, පි. 130, EMN: 9: Sammādiṭṭhi Sutta- Right View, p. 121.

▼ **ස්පර්ශ ආයතන සය** (**ඡ ඵසසායතනා**-six bases for contact) 1) චක්ඛු **ස්පර්ශ ආයතනය 2) සෝත ස්පර්ශ ආයතනය 3) සාණ ස්පර්ශ ආයතනය 4) ජිව්හා ස්පර්ශ ආයතනය 5) කය ස්පර්ශ ආයතනය 6) මනෝ ස්පර්ශ ආයතනය** (the eye as a base for contact, the ear as a base for contact, the nose as a base for contact, the tongue as a base for contact, the body as a base for contact, and the mind as a base for contact. සය ආකාරවූ ස්පර්ශ ආයතන පිලිබඳ බුද්ධ දේශනාව අසත්‍යයයි ඔප්පු කළනොහැකිය, කෙලෙසන්නට නොහැකිය, නින්දාකිරීමට නොහැකිය, විශෝධනයකිරීමට - ඉවත්කිරීමට නොහැකියයි බුදුන් වහන්සේ වදාළහ.**බලන්න**: ධර්මයේ සද්භාවය. **මූලාශ්‍ර**: අංගු.නි: (1): 3 නිපාතය:මහාවග්ග: 3.2.2.1 සූත්‍රය, පි. 348, EAN:3: The Great Chapter, 61.1 Sectarian, p.104 .

▼ **ස්පර්ශය ඇතිවීම**: ඇස, බාහිර අරමුණක්වූ රූපය හා ගැටීම නිසා ඇසේ විඤානය ඇතිවේ, මේ තුන එකතුවීම නිසා ඇසේ ස්පර්ශය ඇතිවේ (චකඛු සමඵසෙසා)

**“…චකඛුඤච පටිචච රූපෙ ච උපපජති චකඛුවිඤඤාණං තිණණං සඞගති ඵසෙසා…”**

**එලෙස**: කණ, බාහිර අරමුණක්වූ ශබ්දය හා ගැටීම නිසා කණේ විඤානය ඇතිවේ, මේ තුන එකතුවීම නිසා කණේ ස්පර්ශය ඇතිවේ… නාසය, බාහිර අරමුණක්වූ ගඳසුවඳ හා ගැටීම නිසා නාසයේ විඤානය ඇතිවේ, මේ තුන එකතුවීම නිසා නාසයේ ස්පර්ශය ඇතිවේ… දිව, බාහිර අරමුණක්වූ රස හා ගැටීම නිසා දිවේ විඤානය ඇතිවේ, මේ තුන එකතුවීම නිසා දිවේ ස්පර්ශය ඇතිවේ… කය, බාහිර අරමුණක්වූ පහස හා ගැටීම නිසා කයේ විඤානය ඇතිවේ, මේ තුන එකතුවීම නිසා කයේ ස්පර්ශය ඇතිවේ… මනස, බාහිර අරමුණක්වූ ධර්මයන් (mind-object) හා ගැටීම නිසා මනසේ විඤානය ඇතිවේ, මේ තුන එකතුවීම නිසා මනසේ ස්පර්ශය ඇතිවේ . **සටහන්**: මේ සූත්‍රයට අනුව ස්පර්ශය නිසා වේදනා ඇතිවේ (ත්‍රිවිධ වේදනා), යමක් විඳිනවිට, එය හඳුනාගනී, යමක් හඳුනාගන්නේද, ඒ ගැන විතර්ක කරයි (සිතා බලයි). දිගින් දිගට එම සිතිවිලි පවත්වා

ගැනීම (ප්‍රපංචකිරීම), සසර දික්කර ගැනීමය. **මූලාශ්‍ර:** ම.නි: (1):1.2.8 මධුපිණ්ඩික සූත්‍රය**,** පි. 292,EMN:18:Madhupiṇḍika Sutta-The Honey ball,p.196.

▼**ධාතු නානත්වය** නිසා ස්පර්ශයේ විවිධත්වය ඇතිවන බව පෙන්වා ඇත. **මූලාශ්‍රය**: සංයු.නි: (2): නිදානවග්ග: ධාතුසංයුත්තය: 2.1.2. ඵස්සනානාත්ව සූත්‍රය, පි.244

▼ **ස්පර්ශය නිසා යම් චන්දරාගයක්** ඇතිවන්නේ නම් එමගින් සිත කෙලෙසේ. **මූලාශ්‍රය**:සංයු.නි: (3): ඛන්ධවග්ග: කිලෙසසංයුත්ත:6.1.4 ඵස්ස සූත්‍රය,පි.488.

▼ **ස්පර්ශය යහපත් ලෙසින් අවබෝධ** කරගැනීමෙන් සසර දුකින් මිදිය හැකිය

**" තෙසං ඵසසපරෙතානං - භවසොතානුසාරිනං,**
**කුමමගගපටිපනනානං - ආරා සංයොජනකඛයො**
**යෙච ඵසස පරිඤඤාය - අඤඤාය උපසමෙ රතා**
**තෙ වෙ ඵසසාභිසමයා - නිචඡාතා පරිනිබබුතා" ති**

**සුත්ත නිපාත ගාථා:** 739, 740**.**

ස්පර්ශයෙන් මැඩිගිය, එයට ගැතිවූ තණ්හාව අනුව ගලායන, භවය නමැති දියපහරට හසුව කුම්මගට (වැරදි මග) පිළිපන් ලෝකයාට, සංයෝජන ක්‍ෂය කරගැනීම දුරය (දුෂ්කරය). එහෙත්, කෙනෙක් ස්පර්ශය යහපත් ලෙසින්ම අවබෝධ කර (පිරිසිඳ දැන), ධර්මය නමැති දියපහරට හසුව, තණ්හාව රහිතව, භව නිරෝධය නම්වූ නිවන වෙතට ළඟා වේ. **සටහන:** ස්පර්ශයේ නියම ස්වභාවය යහපත් ලෙසින් අවබෝධ කරගැනීම නිවනට මගය. **මූලාශ්‍ර:** ඛු.නි. සුත්තනිපාත: 3-12 ද්වයතානුපසසනා සූත්‍රය, පි.249.

▼**සය ආකාරවූ ස්පර්ශයන්** පිළිබඳව මනා අවබෝධය ලබාගතයුතුය යි බුදුන්වහන්සේ වදාළහ. **මූලාශ්‍ර:** ම.නි (3) 3.4.7 සළායතන විභඞ්ග සූත්‍රය, පි. 474, EMN: 137- Saḷāyatanavibhanga Sutta- The Exposition of the Six fold Base, p. 974 .

▼**ස්පර්ශ ආයතන 6** මනාව අවබෝධ කරගැනීමේ මග අරියඅටමගය. ස්පර්ශ ආයතන සයේ ඇතිවීම (සමුදය) නැතිවීම (අසතඞගමය), ආස්වාදය, ආදීනවය හා නිස්සරණය තතු ලෙසින් අවබෝධ කරගැනීමට අරියඅටමග සම්පූර්ණකරගත යුතුවේ. **මූලාශ්‍ර:** සංයු.නි: (4 ): සළායතන වග්ග: ජම්බුඛාදක සංයුත්ත: 4.1.5 අසසාස සූත්‍රය, පි. 504 , ESN: IV: 38 Jambukhādakasaṃyutta: 5 Consolation, p. 1400.

▼**ස්පර්ශය පිලිබඳ මනා අවබෝධය** ලබාගැනීමට සම්මා දිට්ඨිය ඇති කර ගත යුතුවේ. **මූලාශ්‍ර**: ම.නි: (1): 1.1.9 සම්මා දිට්ඨි සූත්‍රය, පි. 130, EMN: 9: Sammādiṭṭhi Sutta- Right View, p.121.

▼ **ආශ්‍රව හා උපාදාන** ඇතිවීමට හේතුවූ (ප්‍රත්‍ය) ස්පර්ශයය, පිරිසිඳ දැන ගත යුතු (පරිඥෙයා ධර්ම) ධර්මයකි. **මූලාශ්‍ර:** දීඝ.නි : (3):11 දසුත්තර

සූත්‍රය,පි. 483, EDN: 34: Dasuttara Sutta: Expanding Decades, p. 384.

▼ **ස්පර්ශය නිසා ත්‍රිවිධ වේදනා ඇතිවේ**: 1) සුඛ වේදනාව 2) දුක් වේදනාව 3) නොදුක් නොසුව වේදනාව. ඒ ඒ වේදනාවට හේතුවූ කරුණු නිරෝධවීමෙන්, වේදනා නැතිවේ. බුදුන් වහන්සේ මේ පිලිබඳ දැක්වූ **උපමාව**: ගිනිදඬු උපමාව:

"යම්සේ දඬු දෙකක් ගැටීමෙන්, උණුසුම ඇතිවේ, ගිනි හටගනී.ඒ දඬු දෙක වෙන්වීමෙන් හටගත් උණුසුමද ගින්නද නැතිවේ". **මූලාශ්‍රය:** සංයු.නි: (4) සළායතනවග්ග:වේදනාසංයුත්ත:සගාථවග්ග:1.20.10 ඵස්සමූලක සූත්‍රය,පි. 436.

▼**ස්පර්ශයේ අනිත්‍ය බව දැකීම ආරියබව ඇති කරයි**: ස්පර්ශයන් 6 හි අනිත්‍ය බව දකිනා පුද්ගලයා '**සද්ධානුසාරි**' ය, .ඒබව, විදසුන් නුවණින්, ඡානසමාපත්ති ලබා අවබෝධ කරගන්නා පුද්ගලයා '**ධම්මානුසාරි**' ය. ඔවුන් සම්බෝධිය පිහිට කරගෙන ඇත. **මූලාශ්‍රය:**සංයු.නි: (3): ඛන්ධවග්ග: ඔක්කන්තිසංයුත්තය: චක්ඛුවග්ග: 4.1.4 ඵස්ස සූත්‍රය, පි.472.

▼**වෙනත් මූලාශ්‍ර:**1. "...සම්මා සම්බුදුරජාණන් වහන්සේ ලෝකයා හමුවේ තැබූ ධර්මය පටිසෝතගාමී ධර්මයක්. භවසෝත නම්වූ විපරිත පටු භව දියවැලට එරෙහිව ගලා යන ඒ ධර්මය භව නිරොධය කරා ගෙන ධමම සොත නම්වූ මහ දිය කඳයි. භව දිය වැලට හසුවුණ ලෝක සත්වයා සංසාර දිය සුළි තුළම කැරකේ. ධමම සොතයට වැටුණු ආරිය පුද්ගලයා භව නිරෝධය නම්වූ නිවනට ලඟාවේ. මේ දෙක අතර සනධිස්ථානය ස්පර්ශයයි' සටහන: මෙහිදී විස්තර කර ඇත්තේ සුත්තනිපාත ගාථා: 739, 740 ගැනය. **"ස්පර්ශයේ ආශචර්ය",** සම්පාදක: කටුකුරුන්දේ ඤාණානන්ද භික්ෂු, 2016.

▲ **සුපටිපන්න-**Supatipanna: සුපටිපන්න යනු සංඝ ගුණයකි**. බලන්න**: සංඝගුණ. කෙනෙක් රාගය, දෝසය හා මෝහය යන අකුසල් ප්‍රහාණය පිණිස යහපත් ලෙසින් පුරුදු පුහුණුවෙන්නේ නම් ඔහු 'සුපටිපන්න' යයි සැරියුත් තෙරුන් පෙන්වා ඇත. **මූලාශ්‍ර:** සංයු.නි: (4 ) සළායතන වග්ග: ජම්බුඛාදක සංයුත්ත: 4.1.3 ධම්මවාදී සූත්‍රය, පි. 502 , ESN: IV: 38 Jambukhādakasaṃyutta: 3 Proponents of Dhamma, p. 1398.

▲ **සුපපටිවීදෙධා:පාලි: යහපත් ප්‍රතිවේදය-** thoroughly penetrated: ධර්මයට අනුව සුපපටිවීදෙධා යනු ප්‍රඥාවෙන්, ධර්මය මනාව ප්‍රතිවේදය කිරීමය (සූක්ෂම අවබෝධය). **බලන්න:** ආරිය න්‍යාය.

▲**සුප්පතිට්ඨිත-**Suppathitthatha: සුප්පතිට්ඨිත යනු, ධර්මය පිහිටුවා ගත් සැදැ හිත වෙනත් කිසිවෙකුට නොසෙල්විය හැකිබවය. **බලන්න:** සුගතිගමන.

▲ **සුපණ්ණ** -Supaṇṇas: සුපණ්ණ ලෙසින් පෙන්වා ඇත්තේ ගුරුළන් - විශාල පක්ෂියෙක් බඳු සත්ව කොට්ඨාශයක් ගැනය. බුදුන් වහන්සේ ගුරුළන් සතර ආකාර උත්පත්ති ලබන බව පෙන්වා ඇත: බිත්තරයකින්, මව් ගැබයකින්, තෙතමනය නිසා, ඕපපාතිකව. නාගයන්, ගුරුළන් සතුරන් ලෙසින් සලකයි. **සටහන**: සුපණ්ණසංයුත්තයේ ගුරුළන් ගැන විස්තරාත්මකව පෙන්වා ඇත. **මූලාශ්‍ර**: සංයු.නි: ( 3): ඛණ්ධවග්ග: 9

සුපණ්ණසංයුත්තය, පි. 522, ESN: Khanda: 30: Supaṇṇasamyutta, p. 1154.

▲ **සැප විපාක ධර්ම හා දුක්විපාක ධර්ම**: පාලි: **සුඛවිපාකා ධම්මා, දුක්ඛවිපාකා ධම්මා -** Dhamma which brings happiness as their outcome**,** Dhamma which brings suffering as their outcome යහපත් විපාක (මෙලොව හා පරලොව) ලබාදෙන ධර්ම, සැප විපාක ධර්මවේ. අයහපත් විපාක (මෙලොව හා පරලොව) ලබාදෙන ධර්ම, දුක්විපාක ධර්මවේ. සැප විපාක ධර්ම සුගතියට ගෙන යයි, දුක්විපාක ධර්ම දුගතියට ගෙනයයි.

▼ **සැප විපාක ධර්ම**: 1) අක්‍රෝධය 2) එදිරි නැතිබව 3) අනුන්ට අවමන් නොකිරීම. 4) අහංකාරනොවීම, 5) ඉරිසියා නොවීම 6) නොමසුරුකම 7) අමායාව 8) කපටිනැතිබව 9) හිරිය 10) ඔත්තප්පය. (non-anger, non-hostility, non-denigration, non-insolence, non-envy, non-miserliness, non-deceitfulness, non- craftiness, moral shame, moral dread). **දුක්විපාක ධර්ම**:1) ක්‍රෝධය 2) එදිරිය 3) අනුන්ට අවමන් කිරීම 4) අහංකාරය, 5) ඉරිසියාව 6) මසුරුකම 7) මායාව 8) කපටිබව 9) හිරි නැතිබව 10) ඔත්තප්ප නැතිබව. **මූලාශ්‍ර:** අංගු.නි: (1):2 නිපාත:17: 1 අකුසල පෙයයාල සූත්‍ර, පි.230, EAN:2: XVII, Unwholesome R. , p. 74.

▲ **සෝපාදිශේෂ නිර්වාන ධාතුව-** Sopadhisesha Nirvana Dhathu .මේ සසුනේ මහණ, පහකළ ආසව ඇතිව, වැස නිමවූ බඹසර ඇතිව, සිව්මග කිස සම්පූර්ණකර, කෙළෙස් බර බහා තබා , රහත්බවට පත්ව, කෙළෙසුන්ගෙන් මනාව මිදුනබව දැන, පංච ඉන්ද්‍රිය නිරුද්ධ නොකළ හෙයින් ඉටු අනිටු අරමුණු ලබා සැප දුක් විඳිමින් පස් ඉඳුරන් පවත්වමින් වාසය කරති. ඒ රහතුන්ගේ රාගක්‍ෂය, ද්වේෂක්‍ෂය, මෝහක්‍ෂය එනම් කෙලෙස් පරිනිර්වාණය, සෝපාදිශේෂ නිර්වාන ධාතුව වේ. **මූලාශ්‍රය:** ඛු.නි: ඛුද්දකපාඨ: ඉතිවුත්තක: 2.2.7 නිර්වානධාතු සූත්‍රය, පි. 396.

**සබ**

▲**සබ්බ**-All: සබ්බ හෙවත් සියල්ල- සියලුදේ ලෙසින් බුදුන් වහන්සේ පෙන්වා ඇත්තේ සළායතන හා ඒවා අල්ලා ගන්නා බාහිර අරමුණුය: ඇස හා රූපය, කණ හා ශබ්දය...ආදීවශයෙන්. මේ සියලුදේ හැර වෙනත් සියල්ලක් පැනවීමට නො හැකිය. **සටහන**: ආදිත්‍යපරියාය සූත්‍රයේ මේ පිළිබඳව විස්තර පෙන්වා ඇත. **මූලාශ්‍ර:** සංයු.නි: (4 ): සළායතනවග්ග: වේදනාසංයුත්ත: 1.3.1 සබ්බ සූත්‍රය, පි. 56, ESN: 35: Vedanasamyutta: 23.1 The All, p. 1225.

▼**දතයුතු සියල්ල**-සබ්බ, විශිෂ්ඨ ඥානයෙන් අවබෝධ කරගැනීමෙන් සියලු කෙළෙස් දුරුකර, දුක නිමාකර ගත හැකිය. **මූලාශ්‍රය:** ඛු.නි: ඉතිවුත්තක:1.1.7 සබ්බ පරිඤ්ඤා සූත්‍රය.

▲ **සබ්බේ ධම්මා**: පාලි: **සබ්බෙ ධම්මා** -all dhammas: සබ්බේ ධම්මා ලෙසින් පෙන්වා ඇත්තේ ලෝකයේ ඇති සියලු ධර්මතාය (හැම දේමය- all things). ආධ්‍යාත්මික මාර්ගය වඩන සංසයා, ඒ ධර්මතා පිලිබඳ මානා අවබෝධය ඇතිකර ගැනීම අවශ්‍යයයි බුදුන් වහන්සේ පෙන්වා ඇත.

▼ **සියලු ධර්මතා 10 ආකාරයකින් අවබෝධ කර ගත හැකිය:**

1) සියලු ධර්මතා කැමැත්ත( ඡන්දය-desire) මුල් කරගෙන ඇතිවේ - **ඡන්දමූලකා සබ්බෙ ධම්මා** 2) සියලු ධර්මතා සිත යොමුකිරීම (අවධානය- attention) නිසා හටගනී **(මනසිකාර සම්භවා සබ්බෙ ධම්මා)** 3) සියලු ධර්මතා ස්පර්ශය (contact) නිසා උපත ලබයි **(ඵස්ස සමුදයා සබ්බෙ ධම්මා )** 4) සියලු ධර්මතා වේදනාව සම්බන්ධ කොට ඇත **(වෙදනා සමොසරණා සබ්බෙ ධම්මා)** 5) සියලු ධර්මතා සමාධිය ප්‍රමුඛ කොට ඇත **(සමාධිපමුඛා සබ්බෙ ධම්මා)** 6) සියලු ධර්මතා සිහිය අධිපති කොට ඇත **(සතාධිපතෙය්‍යා සබ්බෙ ධම්මා)** 7) සියලු ධර්මතා ප්‍රඥාව උතුම් කොට ඇත **(පඤ්ඤුත්තරා සබ්බෙ ධම්මා)** 8) සියලු ධර්මතා විමුක්තිය සාරය (හරය) කොට ඇත **(විමුත්තිසාරා සබ්බෙ ධම්මා)** 9) සියලු ධර්මතා අමරණිය බව මුදුන් කොට ඇත **(අමතොගධා සබ්බෙ ධම්මා)** 10 ) සියලු ධර්මතා නිවන අවසාන කොට ඇත **(නිබ්බාන පරියොසනා සබ්බෙ ධම්මාති). මූලාශ්‍ර**:අං.ගු.නි:(6):10 නිපාත: සචිත්තවග්ග:10.2.1.8. මූලක සූත්‍රය, පි.218, EAN:10: 58.8. Roots, p. 516.

▲**සබ්බ උපධි පටිනිස්සගය**: පාලි: **සබ්බූපධිපටිනිස්සග්ගො-** the relinquishment of all acquisitions: සබ්බ යනු සියල්ල, උපධි යනු මමය මාගේයයි, තණ්හාවෙන්, දිට්ඨියෙන් හා මානයෙන් අල්වා ගැනීමය. යනු ඒ සියලු ගැනීම් හැර දැමීමය (විසිකර දැමීමය). අරහත්වය ලැබීමට, නිවන සාක්ෂාත් කරගැනීමට මෙය අත්‍යඅවශ්‍ය දෙයකි, දුෂ්කර ක්‍රියාවකි, ප්‍රධාන වීරිය ඇතිව කලයුතු දෙයකි. මේ වීරිය උතුම් යයි බුදුන් වහන්සේ වදාළහ.**බලන්න**: වීරිය, උපධි. **සටහන්: *** ආනාපාන සූත්‍රයේ අවසාන පියවරේදී : අනිච්චය, විරාගය, නිරෝධය පිලිබඳ අනුපස්සනා කර අවසානයේදී **"පටිනිස්සග්ගානුපස්සී විහරති"** යයි පෙන්වා ඇත. සියල්ල අතහැරීම පිළිබඳව නුවණින් මෙනෙහිකිරීම- නිවනට සිත පිහිටුවා ගැනීමය.* * සියලු උපධි ලෙසින් පෙන්වා ඇත්තේ ස්කන්ධ (පංච උපාදානස්කන්ධය), සියලු කෙලේස, අභිසංස්කාර හා සඞ්ඛ්‍යාත ධර්මතා වන්ය. ** Sabbūpadhipaṭinissagga. Mp specifies three types of 'acquisitions' (upadhi): the five aggregates, the defilements, and volitional activities (khandha, kilesa, abhisaṅkhārā). The relinquishment of these is a synonym for nibbāna. The striving for this is the energy arisen along with insight and the path **මූලාශ්‍ර:**අං.ගු.නි:(1): 2 නිපාත:2.1.1.2පධාන සූත්‍රය**,**පි.133,EAN:2: 2.2 Striving, p.56.

▲**සබ්බඤ්ඤුත අනාවරණඤාණය-**Sabbannutha anavarana nana: සබ්බඤ්ඤුත අනාවරණඤාණය- සර්වඥතා අනාවරණ ඥාණ ලෙසින්ද පෙන්වා ඇත. "තථාගතයන්ගේ සර්වඥතා ඥානය නම්: සෑම සංඛත අසංඛත ධර්ම නිරවශේෂ කර දැනගැනීම, අතීතය, අනාගතය හා වර්තමාන කාල (තුන් කාලය) පිලිබඳ සියල්ල දැනීම, හේතුප්‍රත්‍ය ධර්මතා සියල්ල දැනීම, අභ්‍යන්තර, බාහිර ආයතන සියල්ල දැනීම, අනිච්ච, දුක්ඛ හා අනාත්ම ස්වභාවය දැනීම, සියලු අභිඥා දැනීම, සියලුම ස්කන්ධ දැනීම, සියලු කුසලය හා අකුසලය දැනීම, සියලු කාමාවචර, රූපාවචර, අරූපාවචර ධර්ම දැනීම, සිව්පිළිසිඹියා දැනීම, ඉන්ද්‍රියපරෝපරිය ආදිවූ සියලුම ඤාණ දැනීම, මරුන්, බඹුන් ආදීවූ සියලුම ප්‍රජාව විසින් දකින,

සොයන රූපායතන ආදිය දැනීම, තුන්ලෝකය පිලිබඳ, තුන්කාලයේ තතු දැනීම. ඒ නිසා තථාගතයෝ **සමන්තචක්ඛුවේ**. එම අවබෝධයේ ආවරණයක් නැතිනිසා අනාවරණ ඤාණය වේ. **බලන්න**: බුද්ධ නාම. **මූලාශ්‍ර:**ඛු.නි:පටිසම්භිදා 1: ඤාණකථා: 72-72 සර්වඥතා අනාවරණ ඥාණ. පි.264.

▲ **සබ්බ පරිඤ්ඤා-**Sabba parinna: සබ්බ පරිඤ්ඤා ලෙසින් පෙන්වා ඇත්තේ සියලුම ධර්මතා- දතයුතු දේ ගැන විශිෂ්ඨ ඥානයෙන් අවබෝධ කර ගැනීමය. එමගින් සිතේ ඇලීම් දුරුවේ, කෙළෙස් දුරු වේ දුක කෙලවර කරගත හැකිවේ:

**"යො සබ්බං සබ්බතො ඤත්වා සබ්බතෙසුපු න රජ්ජති, ස වෙ සබ්බං පරිඤ්ඤාය සො සබ්බදුක්ඛමුච්චගා'ති". මූලාශ්‍රය:**ඛු.නි: ඉතිවුත්තක: 1.1.7 සබ්බ පරිඤ්ඤා සූත්‍රය, පි.350.

▲ **සබ්බලෝකේ අනභිරති සංඥාව**: පාලි: **සබ්බලොකෙ අනභිරතසඤ්ඤා-** perception of non-delight in the entire world සබ්බලෝකේ අනභිරති සංඥාව ලෙසින් පෙන්වා ඇත්තේ ලෝකයේ සකස්වූ ධර්මතා පිලිබඳ කිසිම සුඛාස්වදයක්- කුල්මත්වීමක්, අල්වාගැනීමක් නැතිබවය. නිවන සාක්ෂාත් කර ගැනීමට උපකාරවන භාවනා ක්‍රමයකි. **බලන්න**: දසසංඥා.

▼ **සබ්බලෝකේ අනභිරති සංඥාව මෙනෙහි කිරීම:** මේ සසුනේ මහණ, ලෝකය සම්බන්ධ කිසිම බැඳීමකට (තණ්හාව සහිත), උපාදානයකට, මත දිට්ඨි ආදියට, විශ්වාස-පිළිපැදීම් ආදියට, අනුසය ඇති කෙළෙස් ධර්මතාවන්ට නොඇලී, ඒවා පහකර වාසය කරයි. මෙය සබ්බලෝකේ අනභිරති සංඥාවය.

**" ... භික්ඛු යෙ ලොකෙ උපයුපාදානා චෙතසො අධිට්ඨානාභිනිවෙසානුසයා, තෙ පජහන්තො විරමති න උපාදියන්තො. අයං වුච්චති සබ්බලොකෙ අනභිරත සඤ්ඤා"**. ( Here, a bhikkhu refrains from any engagement and clinging, mental standpoints, adherences, and underlying tendencies in regard to the world, abandoning them without clinging to them. This is called the perception of non-delight in the entire world). **මූලාශ්‍ර:** අං.ගු.නි: (6): 10 නිපාත:10.2.1.10 ගිරිමානන්ද සූත්‍රය, පි. 221, EAN: 10: 60.10. Girimānanda, p. 516.

▲ **සබ්බ සංඛාරෙහි අනිච්ච සංඥාව**: පාලි: **සබ්බ සඞ්ඛාරෙසු අනිච්ච සඤ්ඤා-**perception of impermanence in all conditioned phenomena: සබ්බ සංඛාරෙහි අනිච්ච සංඥාව ලෙසින් පෙන්වා ඇත්තේ සියලු සකස්වූ ධර්මතා- සංඛත ධර්ම වල අනිච්ච ස්වභාවය දැකීමය. නිවන සාක්ෂාත් කර ගැනීමට උපකාරවන භාවනා ක්‍රමයකි. **බලන්න**: දසසංඥා.

▼ **සබ්බ සංඛාරෙහි අනිච්ච සංඥාව මෙනෙහි කිරීම:** මේ සසුනේ භික්ෂුව, හේතුප්‍රත්‍ය නිසා උපන් සෑම ධර්මතාවයක්ම බැහැර කරයි, ඒවා නොසලකයි, ඒවා ගැන බලවත් කලකිරීමක් -පිලිකුලක් ඇතිව සිටී. මෙය සබ්බ සංඛාරෙහි අනිච්ච සංඥාවය. **"...භික්ඛු සබ්බ සඞ්ඛාරෙහි අට්ටීයති හරායති ජිගුච්ඡති. අයං වුච්චති සබ්බසඞ්ඛාරෙසු අනිච්ච සඤ්ඤා"** ( Here,

a bhikkhu is repelled, humiliated, and disgusted by all conditioned phenomena. This is called the perception of impermanence in all conditioned phenomena). **මූලාශ්‍ර:**අංගු.නි: (6):10 නිපාත:10.2.1.10 ගිරිමානන්ද සූත්‍රය,පි. 221,EAN: 10: 60.10 Girimānanda, p. 516.

▼ **සබ්බසංඛාරයෙහි අනිච්ච සංඥාව** වැඩීමෙන්, අවිද්‍යාව පහවේ, රහත්මග නුවණ ඇතිවේ යයි බුදුන් වහන්සේ පෙන්වා ඇත. **මූලාශ්‍ර**:ඛු.නි:ඉතිවුත්තක:3.4.6 අශුභානුදර්ශි සූත්‍රය, පි. 453.

**සහ**

▲**සෝභිත බුදුන් වහන්සේ-**The Buddha Sobhitha: ගෝතම බුදුන් වහන්සේට පෙර වැඩසිටි, සෝභිත බුදුන් වහන්සේ පිළිබඳ විස්තර මෙහි දක්වා ඇත. **මූලාශ්‍රය**:ඛු.නි: බුද්ධවංශ පාලි:6 සෝභිත බුදුන්වහන්සේ.

▲ **සුභකිණ්ණ දේව-** Subhakinna Deva: බ්‍රහ්ම දේවලෝකයකි. **බලන්න**: බ්‍රහ්මලෝක.

▲ **සුභධාතුව-** the beauty element: සුභධාතුව- පිරිසිදු ධාතුව-Pure element, සප්ත ධාතු වලින් එකකි. අසුභය නිසා සුභධාතුව අවබෝධ කරගත හැකිය. සංඥා සමාපත්තිය මගින් සුභධාතුව ඇතිකරගත හැකිය. **බලන්න**: ධාතු හත-සප්ත ධාතු. **සටහන:** අටුවාවට අනුව: සුභ ධාතුව යනු, සුභ කසිණය (beautiful *kasiṇa*) නිසා ඇතිවෙන ජානසමාපත්තියකි**.** The *beauty element* (*subhadhātu*) is just the jhāna together with its object, namely, the jhāna arisen on the basis of a beautiful *kasiṇa*. **බලන්න**: ESN: Note: 231, p. 972. **මූලාශ්‍රය:** සංයු.නි: (2): නිදානවග්ග:ධාතු සංයුත්ත:2.2.1 සත්තධාතු සූත්‍රය, පි.256, ESN: 14: Dhathusamyutta: 11.1 Sevwn elements, p.750.

▲**සුභ නිමිත්ත**: පාලි: සුභනිමිත්තං- Subhanimitta (The mark of the attractive): සිතේ කාමය (lust) ඇතිකිරීමට (රාගය ඇතිවීමට) හේතුවන කරුණුය. එනම්, කාම ආශාව (sexual desire) -ලිංගික ආසාව ඇතිකරණ බාහිර අරමුණු සුභ නිමිත්ත ලෙසින් දක්වා ඇත . එලෙස සුභ නිමිත්ත ගැනීම නිසා, පංචකාම වස්තූන් සුන්දරය යයි සිතා ඒවා ගැන සිතමින් අකුසලයට පත්වේ. ඒවා සිතෙන් අල්වා ගැනීම- ඒවා ගැන රාගයෙන් මත්වීමය. ඇස, කණ, නාසය, දිව,කය යන අභ්‍යන්තර ඉන්ද්‍රියන් මගින් අල්ලා ගන්නා බාහිර වස්තුවක්- පංචකාම අංගයක් : රූපයක්,ශබ්දයක් , ගඳසුවඳක්, රසයක් හෝ පහසක්, සුන්දරය යයි සලකමින්, එයට වසඟවීම නිසා සිතේ රාගය ඇතිවේ. කාමච්ඡන්දයට ආහාරය සුභ නිමිත්තය. **බලන්න**: නීවරණ. **සටහන්**: * අංගු.නි: (1): 1 නිපාත: නීවරණ ප්‍රහාන වග්ගයේ දී (පි.44) සුභ නිමිත්ත පිළිබඳව විස්තරාත්මකව පෙන්වා ඇත. ** සංයු.නි: (5-1) මහාවග්ග, බොජ්ඣංගසංයුත්ත: 2.6.1 ආහාර සූත්‍රය**,** පි.230 හා 2.1.2 කාය සූත්‍රය, පි.168**,** සුභ නිමිත්ත පෝෂණය වන අන්දම දක්වා ඇත. **ශබ්දකෝෂ : පාසිශ**: පි.114: 'සුභනොවන, අයහපත්'. **BD**: p. 323: 'subha-nimitta: beautiful or attractive object of mind, it may become an inducement to arising of sense-desire' . **PTS: p.1626: '**shining, bright, beautiful, pleasant**…'.**

▼**සුභ නිමිත්ත** අයෝනිසෝමනසිකාරය කිරීම කාමච්ඡන්දය ඇතිවීමට මූලික හේතුවය, එමගින් ඇතිනොවූ කාමච්ඡන්දය ඇතිවේ, ඇතිවූ කාමච්ඡන්දය බහුලබවට පත්වේ. **මූලාශ්‍ර:** අංගු.නි: (1):1 නිපාත: 1.2.1 නීවරණ ප්‍රහාණ වග්ග සූත්‍ර, පි. 44, EAN:1: Abandoning the hindrances, p. 36, සංයු.නි: (5-1 කාණ්ඩය): බොජ්ඣංග සංයුත්ත- 2.6.1 ආහාර සූත්‍රය, පි. 230, ESN: Bojjhaṅgasaṃyutta-51.1 Nutriment, p.1788.

▲ **සුභරොච-E**asy to support: සුභරොච ලෙසින් පෙන්වා ඇත්තේ, පහසුවෙන් පෝෂණය කලහැකිබවය. සංඝයා තුල තිබිය යුතු ගුණයකි. අකුප්ප බව ලබාගැනීම පිණිස දියුණු කලයුතු ගුණයකි. **බලන්න**: අක්කුප්ප. **සටහන**: කරණීය මෙත්ත සූත්‍රයේ, මේ ගුණය නිවන පිණිස වැඩිය යුතු ධර්මයක් ලෙසින් පෙන්වා ඇත.

▲ **සුභසංඥාව**- The perception of beauty: සුභසංඥාව යනු, දුකඇතිකරන දේ සැප (සුබ) යයි සිතා ගන්නා සංඥාවය. සතර විපල්ලාස වලින් එකකි **බලන්න**: සතර විපල්ලාස.

▲ **සුභාෂිතය-**well-spoken speech: බුදුන් වහන්සේගේ භාෂිතය සුභාෂිතවේ. කරුණු 5 කින් සමන්විතය: 1) සුදුසු අවස්ථාවේ කතාකිරීම 2) සත්‍ය කතා කිරීම 3) මුදු වචන භාවිතය 4) අන්‍යන්ට යහපත සැලසෙන ලෙස කතා කිරීම 5) මෙත්තා සහගත සිතින් කතා කිරීම. එලෙස කතා කරයි නම් ඒ සුභාෂිතයය, දුර් භාෂිතය නොවේ, නිවැරදිය, ප්‍රඥාවන්තයන් පසසයි. **බලන්න:** කතාව. **සටහන**: සුභාෂිතය මංගල කරුණකි. **බලන්න**: මංගල සූත්‍රය. **මූලාශ්‍රය:** අංගු:නි: (3): 5 නිපාත: සොනවග්ග: 5.4.5.8 සුභාෂිත වාචා සූත්‍රය, පි.414.

▼**බුදුන් වහන්සේ මෙසේ වදාළහ**: "...කරුණු 4 ක් ඇති වචන සුභාෂිතයය, දුර්භාෂිත නොවේ, අනවද්‍යවේ, නුවණැතියන් විසින් ගැරහිය නොයුතුය ..." 1) සුභාෂිතය පමණක් කථාකිරීම, දුර්භාෂිතයෙන් වැලකීම 2) ධර්මය පමණක් කීම, අධර්මය නොකීම 3) ප්‍රියවචන පමණක් කීම, අප්‍රියවචන නොකීම 4) සත්‍යම කීම, අසත්‍ය (බොරුව-අලික) නොකීම. බුද්ධ ආදී සත්පුරුෂයෝ සුභාෂිතයම පවසන්නෝය. **මූලාශ්‍රය:** බු.නි: සුත්තනිපාත: 3-3- සුභාසිත සූත්‍රය, පි.150.

**සම**

▲ **සමචිත්ත:**පාලි: **සම චිත්තං**-peaceful mind-samacittā: සමචිත්ත ලෙසින් පෙන්වා ඇත්තේ එක සමාන ලෙසින් ආධ්‍යාත්මික සිත වර්ධනය කරගැනීමය.මෙය ශාන්ත සිත ලෙසින්ද හඳුන්වයි. '**සමචිත්තෝ**' යනු බුදුවරු හඳුන්වන ආකාරයකි. **බලන්න:** EAN: note: 267, p. 594, බුද්ධ නාම.

▼ **බුදුන් වහන්සේ මෙසේ වදාළහ:** "...අප මෙසේ හික්මිය යුතුය යි ඔබ හැම පුරුදු විය යුතුය. සන්සුන් ඉඳුරන් ඇතිව, සංසුන් සිත් ඇතිව සිටින විට ඔබ හැම ගේ කාය, වචී හා මනෝ කම්ම ශාන්ත වන්නේය. එවිට, 'අපි, අප සමග වාසය කරන සෙසු සංඝයාට ශාන්තවූ සේවයක් පමණක් කරමු' යන සිතිවිල්ල ඇතිවේ". **සටහන**: මේ සූත්‍රය ශ්‍රවනය කළ දෙවියෝ

සමසිත් ඇති දෙව්වරු ලෙසින් පෙන්වා ඇත. **මූලාශ්‍ර:** අංගු.නි: (1 ): 2 නිපාත: 2.1.4.5 සූත්‍රය, පි. 162 , EAN: 2: 36.5 Sutta, p.61.

▲ **සමථ හා විපස්සනාව:**පාලි: **සමථො, විපස්සනා-** Calm/tranquility and insight: ධර්මයේ සමථ ලෙසින් පෙන්වා ඇත්තේ ධර්ම අරමුණක සිත එකඟ කරගැනීමෙන් ලබාගන්නා සමාධියය. සමාධි සමාපත්ති ලැබීමෙන් පසු, සිතේ ඇතිවන ප්‍රඥාව, විපස්සනාවය- විදර්ශනා. විපස්සනාව ලැබීම පිණිස සිත සමාධිගතවීම අවශ්‍යවේ. **ශබ්දකෝෂ**: **B.D**: 157: "**Samatha-Vipassanā:** Samatha: serenity is a synonym of Samadhi- one pointedness of mind & wisdom. Samatha-Vipassanā are identical with Samadhi. They are 2 branches of mental development"

▼**සමථ හා විපස්සනාව**, ආධ්‍යාත්මික මාර්ගය වඩා ගැනීම පිණිස වැඩියයුතු ධර්මතාවකි -භාවේතබ්බ ධර්මයකි**. බලන්න:** භාවෙතබ්බ ධම්ම. **මූලාශ්‍ර:** දීඝ.නි:(3):11 දසුත්තර සූත්‍රය, පි. 483, EDN: 34: Dasuttara Sutta: Expanding Decades, p. 384.

▼ **සමථ හා විපස්සනා ධර්මතා** විජජාභාගීය ධර්මතාය, විද්‍යාව හා විමුක්තිය ලබාගැනීමට උපකාරීවන ධර්මතා යයි බුදුන් වහන්සේ වදාළහ: "සමථ භාවනාව වැඩීමෙන් කවර ප්‍රතිලාභයක් අත් දකින්නේද? **සිත දියුණුවීමය**. සිත දියුණුවීම මගින් කවර ප්‍රතිලාභයක් අත් දකින්නේද? **රාගය පහවීම**. විපස්සනාව මගින් කවර ප්‍රතිලාභයක් අත් දකින්නේද? **ප්‍රඥාව දියුණුවීමය.** ප්‍රඥාව දියුණුවීම මගින් කවර ප්‍රතිලාභයක් අත් දකින්නේද? **අවිජ්ජාව පහවේ**...රාගයෙන් වෙළුන සිතක් ඇතිවිට විමුක්තිය ඇතිනොවේ. අවිජ්ජාවෙන් වැසුන විට ප්‍රඥාව ඇති නොවේ.එමනිසා රාගය පහවුවිට-විරාගය ඇතිවී සිත විමුක්තියට පත්වේ (චේතෝවිමුක්ති), අවිද්‍යාව පහවීමෙන්, ප්‍රඥාව ඇතිවී විමුක්තිය ලැබේ (ප්‍රඥාවිමුක්ති)".

**"ද්වෙමෙ භික්ඛවෙ ධම්මා විජ්ජාභාගියා. කතමෙ ද්වෙ? සමථො ච විපස්සනා ච. සමථො භික්ඛවෙ භාවිතො කමත්ථමනුභොති? චිත්තං භාවීයති. චිත්තං භාවිතං කමත්ථමනුභොති? යො රාගො, සො පහීයති. විපස්සනා භික්ඛවෙ භාවිතා කමත්ථමනුභොති? පඤ්ඤා භාවීයති. පඤ්ඤා භාවිතා කමත්ථමනුභොති? යා අවිජ්ජා, සා පහීයති. රාගුපක්කිලිට්ඨං වා භික්ඛවෙ චිත්තං න විමුච්චති. අවිජ්ජුපක්කිලිට්ඨා වා පඤ්ඤා න භාවීයති. ඉති ඛො භික්ඛවෙ රාගවිරාගා චෙතොවිමුත්ති, අවිජ්ජාවිරාගා පඤ්ඤාවිමුත්තීති".** (Bhikkhus, these two things pertain to true knowledge. What two? Serenity and insight. When serenity is developed, what benefit does one experience? The mind is developed. When the mind is developed, what benefit does one experience? Lust is abandoned. When insight is developed, what benefit does one experience? Wisdom is developed. When wisdom is developed, what benefit does one experience? Ignorance is abandoned...A mind defiled by lust is not liberated, and wisdom defiled by ignorance is not developed. Thus, bhikkhus, through the fading away of lust there is liberation of mind, and through the fading away of ignorance there is liberation by wisdom). **මූලාශ්‍ර:**

අංගු.නි: (1): 2 නිපාත: 2.1.4.1 සූත්‍රය, පි. 157, EAN: 2: 31.11 Sutta, p.60.

▼ **බුදුන් වහන්සේ** සමථය හා විපස්සනාව පිළිබඳව යහපත් ලෙසින් වදාරා ඇත. ඒ ධර්මතා සංඝයා එක්ව, ධර්මයේ චිරස්ථිතිය පිණිස සජ්ජායනා කිරීම සුදුසු යයි සැරියුත් මහා තෙරුන් සංඝයාට උපදෙස් දී ඇත. **මූලාශ්‍ර**: දිඝ.නි: (3 ):10 සංගීති සූත්‍රය, පි. 372, EDN: 33 Sangīti Sutta: The Chanting Together, p.362.

▼ **සමත හා විපස්සනාව නිවන් මගය- අසංඛත මගය**: **මූලාශ්‍ර:** සංයු.නි: (4**):** සළායතනවග්ග: අසංඛත සංයුත්ත: 9.1.2 සමථ විපස්සනා සූත්‍රය, පි. 659, ESN: 43: Asankatasamyutta:2.2 Serenity and Insight p. 1496.

▲ **සමන්ත චක්ඛු-** Samantha chakkhu: බුදුන් වහන්සේ හඳුන්වන පදයකි. **බලන්න:**බුද්ධනාම. **මූලාශ්‍ර:**ඛු.නි:පටිසම්භිදා 1: ඤාණකථා: 72-72 සර්වඥතා අනාවරණ ඥාණ. පි.264.

▲ **සමණසංඥා**: පාලි: **සමණසඤ්ඤා-**Perceptions of Ascetic: සමණසංඥා ලෙසින් පෙන්වා ඇත්තේ, ධර්ම පුහුණුවේ යෙදෙන සංඝයා විසින් දියුණු කරගත යුතු සංඥා ගැනය.

▼ **සමණසංඥා තුනක් මෙහි පෙන්වා ඇත: 1**. මම පන්තිභේදයකින් තොර සමූහයකට පිවිසි වාසය කරමි- විවර්ණභාවයට පැමිණ වෙසෙමි. **2.** මම අන්‍යයන්ගේ උපකාරයෙන් දිවිපැවැත්ම ගෙනයමි. **3.** මගේ හැසිරීම-ගිහියන්ගේ හැසිරීම මෙන් නොවිය යුතුය. **සටහන**: පබ්බජා විසින් ආවර්ජනා කලයුතු ධර්මතා 10 ට මේ කරුණු 3 ඇතුලත්වේ. **බලන්න**: පබ්බජා. එම සංඥා දියුණු කරගත්විට, බහුල කරගත්විට කරුණු 7 ක් සම්පූර්ණවේ: 1) නිරන්තරයෙන්ම ශිලසම්පන්නව හැසිරීම 2) අභිජ්ජාව (ආසාව) නැතිවීම 3) ව්‍යාපාදය නැතිවීම 4) අතිමානය නැතිවීම 5) පුහුණුවට-ශික්ෂාවට ඇල්ම තිබීම 6) සිව්පස භාවිතා කිරීමේදී, ඒවා තමන්ගේ ආධ්‍යාත්මික ජීවිතය වඩා ගැනීම සඳහා යන අරමුණ ඇතිව කටයුතුකිරීම 7) ආරද්ධ විරිය තිබීම. **මූලාශ්‍ර:** අංගු.නි: (6): 10 නිපාත: 10.3.1.1. සමණසංඥා සූත්‍රය, පි.406, EAN: 10: 101.1 An Ascetic's Perceptions, p. 540.

▲ **සමන්තපාසාදිකා**- who inspires confidence: ධර්මයේ දස ආකරයෙන් පරිපූර්ණ භික්ෂුව 'සමන්තපාසාදිකා' වේ යයි බුදුන් වහන්සේ වදාළහ. **සටහන:** මෙහිදී ඒ දස කරුණු විස්තරාත්මකව පෙන්වා ඇත. **මූලාශ්‍ර**: අංගු.නි: (6): 10 නිපාත: ආනිසංසවග්ග: 10.1.1.10 විජ්ජාසූත්‍රය, පි.52, EAN:10: 10.10 True knowledge, p. 494.

▲ **සමවයසට්ඨෙසනො** (පාලි): සෙවීම අතහැරීම **-**renounced seeking: ධර්මයේ සමවයසට්ඨෙසනො ලෙසින් දක්වා ඇත්තේ සෙවීම- ගවේෂණය අතහැරීම ය. එනම්: කාමයන් සෙවීම, සසර පවත්වා ගැනීම ආදී කරුණු සෙවීම අත හැරීමය. ආරියෝ සත්‍ය අවබෝධකර ඇති නිසා සියලු සෙවීම් අත හැර ඇත. **බලන්න**: ආරිය වාසස්ථාන.

**"කථඤ්ච භික්ඛවෙ, භික්ඛු සමවයසට්ඨෙසනො හොති: ඉධ භික්ඛවෙ, භික්ඛුනො කාමසනා... භවෙසනා...පහීනා හොති, බ්‍රහමචරියෙසනා පටිප්පස්සද්ධා. එවං ඛො භික්ඛවෙ භික්ඛු සමවයසට්ඨෙසනො හොති"**

(Here, a bhikkhu has abandoned the search for sensual pleasures and the search for existence and has allayed the search for a spiritual life. It is in this way that a bhikkhu has totally renounced seeking). **මූලාශ්‍ර**: අංගු.නි.(6 ):10 නිපාත: 10.1.2.9 පඨමාරියවාස සූත්‍රය, 10.1.2.10 හා දෙවෙනි  අරියවාස සූත්‍රය, පි.82-84, EAN:10: I19.9 & 20.10  Abodes of the Noble Ones 1 & 2 , p. 498-499.

▲ **සමසීසට්ඨ ඤාණය-**Samasishtta Nana: සමසීසට්ඨ ඤාණය- සමශිර්ෂාර්ථ ඥානය ලෙසින් පෙන්වා ඇත්තේ, ත්‍රිභූමික ධර්මතා ( කාමාවචර, රූපාවචර, අරූපාවචර)  යහපත් ලෙසින්ම නිරුද්ධ කිරීමෙහිදී, ඒ නිරුද්ධ කළ කරුණු නැවත නො ඉපදීමක් -ඇතිවීමක් නොවන බව දන්නා නුවණය. **මූලාශ්‍රය**: ඛු.නි: පටිසම්භිදා 1: 36 සමසීසට්ඨ ඤාණය, පි.214.

▲ **සමා පටිපදාව-** the calming practice: ලාමක අකුසල දහම, දුරු කර, සමනය කර අවසන් කිරීම සමා පටිපදාවය. **මූලාශ්‍ර:**අංගු.නි: (2): 4 නිපාත:පටිපදා වගග, 4.4.2.4 පටිපදා සූත්‍ර 2 කි, පි.316, EAN: 4: 164-165 Patience-2,  p. 202.

▲ **සම්මා දිට්ඨිය:** පාලි: **සම්මාදිට්ඨි-**Right view: ආරිය අටමගේ පළමු අංගය සම්මා දිට්ඨිය ය. චතුරාර්ය සත්‍ය අවබෝධ වීම තුලින් සම්මා දිට්ඨිය ඇතිවේ.  **බලන්න**: ආරිය අටමග. **සටහන්: *** අටුවාවට අනුව සම්මා දිට්ඨිය දෙයාකාරය ය: ලෞකික හා ලෝකෝත්තර (mundane and supramundane). **ලෞකික සම්මා දිට්ඨිය දෙයාකාරය ය:** 1) කර්ම නිසා විපාක ලැබේ යන පිළිගැනීම බුදුසසුනේ මෙන්ම වෙනත් ආගමිකයන් ද දරන විස්වාශයකි. 2) චතුසත්‍යට අනුකූලව කාර්ම විපාක පිලිබඳ ඇති විශ්වාසය බුදුදහමට පමණක් සිමාවේ. ලෝකෝත්තර සම්මා දිට්ඨිය: ආධ්‍යාත්මික පිරිසුදුබව ඇති කරන සතර මග ඵල (සෝතාපන්න ආදී) ලැබීම තුලින් චතුසත්‍ය පිලිබඳ මනා අවබෝධය ලැබීමය. **බලන්න**: EMN:note:114, p. 1074) ** සම්මාදිට්ඨිය, ආරිය අටමගේ සෙසු අංග වර්ධනයට උපකාරීවේ. කෙනෙකුට සම්මා දිට්ඨිය ඇතිවිට ඔහුට සම්මා සංකප්ප ඇතිවේ. මේ අංග 2,  සම්මා වාචා, සම්මා කම්මන්ත හා සම්මා අජිවය ඇතිවීමට පදනම් වේ. එම අංග දියුණුවීම, සම්මා වායාම හා සම්මා සතිය ඇතිවීමට මූලික වේ. සම්මා වායාම හා සම්මා සතිය, සම්මා සමාධිය ඇතිවීමට බලපායි. සම්මා ඥාණය (එම අංග වර්ධනය නිසා ඇතිවන) අරහත්වයට මූලිකවන ප්‍රඥාව ඇතිකරයි. සම්මා ඥාණය ඇතිවීමෙන් ආසව පහකර ගැනිමේ අවබෝධය මගින් සම්මා විමුක්තිය ඇතිවේ. අවසාන ප්‍රතිඵලය වන්නේ අරහත්වය ලැබීමය: ආසව පහකිරිමෙන් චේතෝ විමුක්තිය  (අනාසාව චෙතෝවිමුත්තිය) හා ප්‍රඥාවිමුක්තිය ලැබීමය. (taint less liberation of mind, liberation by wisdom) . **බලන්න**: EAN: note: 2144, p. 683.

▼**නුපන් කුසල් ඇතිකරගැනීමට හා උපන් කුසල් විපුල කරගැනීමට** සාධකවන මූලික කරුණ සම්මා දිට්ඨිය ඇතිවීමය. **මූලාශ්‍ර:** අංගු.නි: (1 ): 1 නිපාත:16 :1.16.2.1 සූත්‍රය, පි. 100, EAN:1: 307.2 sutta, p.47

▼**සම්මා දිට්ඨිය යනු**: ආරිය ශ්‍රවකයෙක් තුල ඍජු දිට්ඨිය ඇතිවීමය. එමගින් අවෙච්චා සහගත ප්‍රසාදය ඇතිවේ, ඔහු සත්‍ය ධර්මය ට පැමිණේය යි සැරියුත් මහා තෙරුන් වදාළහ:

**"...කිං තාවතා නු ඛො ආවුසො අරියසාවකො සම්මාදිට්ඨි හොති. උජුගතස්ස දිට්ඨි ධම්මෙ අවෙච්චප්පසාදෙන සමන්නාගතො ආගතො ඉමං සද්ධම්මන්ති ".** **මූලාශ්‍ර**: ම.නි: (1 ): 1.1.9 සම්මා දිට්ඨි සූත්‍රය, පි. 130, EMN: 9: Sammādiṭṭhi Sutta- Right View, p.121.

▼ **සම්මා දිට්ඨිය ඇතිවීම:** කච්චාන ගොත්ත තෙරුන් ගේ විමසීමක් අනුව, බුදුන් වහන්සේ සම්මා දිට්ඨිය ඇතිවීම මෙහි දී පෙන්වා ඇත. "ලෝකයේ ඇති ශාශ්වතවාදය, උච්චේඡද වාදය ආදී දිට්ඨි හැර ලෝකසමුදය, නිරෝධය මනා නුවණින් දකින තැනැත්තාට සම්මා දිට්ඨිය ඇතිවේ". **මූලාශ්‍ර:** සංයු.නි: (2 ):නිදානවග්ග: අභිසමයසංයුත්ත: 1.2.5 කච්චාන ගොත්ත සූත්‍රය, පි.50.

▼ **ආරිය ශ්‍රාවකයා (සේඛ) සම්මා දිට්ඨිය ට පැමිණෙන ආකාරය**: මතු දක්වා ඇති කරුණු පිළිබඳව මනා අවබෝධය ලබා ගැනීමෙන් ආරිය ශ්‍රාවකයා සම්මා දිට්ඨියට පැමිණේ: 1) කුසලය හා අකුසලය 2) සිව් ආහාර (සිව් පෝෂණය) 3) චතුරාර්ය සත්‍ය 4) ජාති ජරා මරණ 5) භවය 6) උපදාන 7) තණ්හාව 8) වේදනා 9) ස්පර්ශය 10) සළායතන 11) නාමරූප 12) විඥාණය 13) සංඛාර 14) අවිද්‍යාව 14) ආස්‍රව. **මූලාශ්‍ර**: ම.නි: (1): 1.1.9 සම්මා දිට්ඨි සූත්‍රය, පි. 130, EMN: 9: Sammādiṭṭhi Sutta- Right View, p. 121.

▼ **සම්මා දිට්ඨිය ඇති පුද්ගලයා** මරණින් මතු සුගතියේ- දේව ලෝකයේ හෝ මිනිස් ලෝකයේ යලි උපත ලබන බව බුදුන් වහන්සේ පෙන්වා ඇත. **මූලාශ්‍ර:** අංගු.නි: (1): 2 නිපාත: 2.1.3.8 සූත්‍රය, පි. 158 , EAN: 2: 27.7 Sutta, p.60.

▲**සම්භව අග්‍රශ්‍රාවක-** The Chief Disciple Sambhava: සිඛි බුදුන් වහන්සේගේ අගසව් දෙනමගෙන් එක් නමකි. **බලන්න**: සිඛි බුදුන්වහන්සේ.

▲**සම්මශ්සන ඥාණය-**Sammassana nana: අතීත, අනාගත, වර්තමාන පංචස්කන්ධ ධර්මයන් රැස්කොට අනිච්ච, දුක්ඛ, අනාත්ම ලෙසින් නිශ්චය කරගැනීමේ ප්‍රඥාව සම්මශ්සන ඥාණය වේ. **මූලාශ්‍රය**: ඛු.නි: පටිසම්භිදා 1: 5 සම්මශ්සන ඥාණය, පි.122.

▲**සම්මුතියෙහි ඥානය-** Sammuthiyehi Nana: මෙය සතර ඥානයන්ගෙන් එකකි. **බලන්න:** සතර ඥාන.

▲**සම්පන්නපාතිමොක්ඛා-**Sampannapathimokkha: මින් පෙන්වා ඇත්තේ පාතිමොක්ෂසංවරයෙන් යුක්තව වාසය කිරීමය. **බලන්න**: පාතිමොක්ෂසංවර ශිලය. **මූලාශ්‍රය**:ඛු.නි:ඉතිවුත්තක: 4.1.12 සම්පන්නසීල සූත්‍රය, පි.506 හා පි.620.

▲ **සම්‍යක්තවය-**Right path: සම්‍යක්තවය ලෙසින් පෙන්වා ඇත්තේ: සම්මා දිට්ඨිය ප්‍රමුඛ ආරිය අටමග හා නිවන ලබාදෙන සම්මා ඥාණය හා සම්මා විමුක්තියය- නිවැරදි මගය. ආධ්‍යාත්මික දියුණුව පතන කෙනෙක්, නිවැරදි මග පුද්ගලයා ඇසුරු කලයුතුය, සේවනය කලයුතුය,උවැටන් කලයුතුය, පුදසැලකිලි කලයුතුය, ප්‍රසංසා කලයුතුය, ගරු කලයුතුය, සමාදරය දැක්විය යුතුය. එබඳු පුද්ගලයා, මාර්ගය සඵල කරගෙන ඇත,

පිරිසිදුබව ලබා ඇත, මානය හැරදමා ඇත, ප්‍රඥාව වර්ධනය කරගෙන ඇත, බොහෝ පින් වඩාගනීති. එම මගට විරුද්ධ මග මිථ්‍යාත්වයය. ඒ වැරදි මග ගන්නා පුද්ගලයන් සේවනය... නොකලයුතුය, ඔහුට යහපත් ගුණ නො මැත. **බලන්න:** මිථ්‍යාත්වය. **මූලාශ්‍රය**:අං.ගු.නි: (6): 10 නිපාත:පුග්ගලවග්ග: සෙවිත්බ්බ සූත්‍ර.

▼**සම්මාදිට්ඨිය ඇතිවීම** සම්‍යක්තවයට මූලිකවේ. **මූලාශ්‍රය:** ඛු.නි: පටිසම්භිදා 1: 9 මාර්ගකථා, පි.530

▼**නිවැරදි මග- ආරිය මගය:** එම මග ගැනීම අර්ථදායකය (ඵලදායකය- beneficial), විමුක්තිය ලබාදේ. **මූලාශ්‍ර:** අං.ගු.නි.( 6):10 නිපාත:සාධු වග්ග සූත්‍ර, පි.468, EAN: 10: IV Good: 134.1 Good, p.548, සං.යු.නි: (5-1): මහාවග්ග: මග්ගසංයුත්ත: 1.3.1 මිච්ඡතත සූත්‍රය, පි. 58, ESN: Maggasamyutta: 21.1 Wrongness, p. 1628.

▼ **නිවැරදි මග සඵලත්වය ඇති කරයි**: කෙනෙකුට, සම්මා දිට්ඨිය ඇතිවිට, සම්මා සංකප්ප ඇතිවේ. සම්මා සංකප්ප ඇතිවිට, සම්මා වාචා ඇතිවේ. සම්මා වාචා ඇතිවිට, සම්මා කම්මන්ත ඇතිවේ. සම්මා කම්මන්ත ඇතිවිට, සම්මා ආජීවය ඇතිවේ. සම්මා ආජීවය ඇතිවිට, සම්මා වායාමය ඇතිවේ. සම්මා වායාමය ඇතිවිට, සම්මා සතිය ඇතිවේ. සම්මා සතිය ඇතිවිට, සම්මා සමාධිය ඇතිවේ. සම්මා සමාධිය ඇතිවිට, සම්මා ඤාණය ඇතිවේ. සම්මා ඤාණය ඇතිවිට, සම්මා විමුක්තිය ඇතිවේ, එලෙසින් නිවැරදි මග සකස්වේ**. මූලාශ්‍ර:**අං.ගු.නි:(6):10 නිපාත:10.3.1.3 මිච්ඡත්තසූත්‍රය,පි. 408,EAN:10: 103.3.The wrong course,p.540.

▼**නිවන ලබාදෙන නිවැරදි මග ඇත්තේ බුදුන් වදාළ ධම්ම විනයේ පමණි**: දස ධර්මයන් ගෙන් සමන්විත, නිවැරදි මග ඇත්තේ ධම්ම විනයේ පමණක්ය. **මූලාශ්‍ර:** අං.ගු.නි (6):10 නිපාත:පාරිශුද්ධවග්ග,පි.462,EAN:10: Purified, p. 547.

▼ **නිවැරදි මග ගැනීමෙන් ආරිය ධෝවනය සිදුවේ**: ආරිය ධෝවනය ලෙසින් පෙන්වා ඇත්තේ අකුසල සිත, නිවැරදි මග ගැනීම නිසා පිරිසිදු බවට පත්වීමය. **බලන්න**: ආරියධෝවනය. **මූලාශ්‍ර**:අං.ගු.නි:(6 ):10 නිපාත:සමණසඤ්ඤා වගග: 10.3.1.7. ධොවන සූත්‍රය, පි.416, EAN:10: 107-7 Dhovana, p.542.

▼ **විද්‍යාව පෙරටුකරගත්**, හිරිඔත්තප්ප නිසා නිවැරදි මග ගන්නා පුද්ගලයා අතින් කුසල් ක්‍රියා සිදුවේ. **මූලාශ්‍ර:** අං.ගු.නි:(6): 10 නිපාත:10.3.1.5 විජ්ජා සූත්‍රය, පි. 412, EAN:10: 105.5 True Knowledge, p. 541.

▼**නිවැරදි මග සුව සෙත පිණිසය**: නිවැරදි මග ගන්නා කෙනෙක් සිදු කරන කාය, වචී හා මනෝ කර්ම නිසා සුව සෙත ඇතිවේ. එයට හේතුව සම්මා දිට්ඨිය ඇතිව කටයුතු කිරීමය.ඒ පිළිබඳව දක්වා ඇති **උපමාව**: මිහිරි රස ඇති බිජුවකින් හටගන්නා ඵලය මිහිරි රසයෙන් යුක්තවේ. මිදී වැනි මිහිරි රස ඇති ඇටවලින් ඇතිවෙන ඵල මිහිරිය.බලන්න: උපග්‍රන්ථය:5 **මූලාශ්‍ර:** අං.ගු.නි:( 6 ): 10 නිපාත: 10.3.1.4 බීජ සූත්‍රය, පි. 410 , EAN:10: 104.4 A seed, p. 541.

▲ **සම්පරායික** ධර්ම:පාලි:**සම්පරායික ධම්ම-**Dhamma regarding the future life: සම්පරායික ධර්ම යනු පරලොව දී විපාක දෙන ධර්මතාවයන්ය. උදාහරණයක් ලෙසින් ත්‍රිවිධ දුෂ්චරිතයේ හැසිරෙන පුද්ගලයෝ ඒකානත්යෙන්ම මරණින් මතු දුගතියේ උපත ලබයි. මෙලෙව විපාක දෙන කර්ම දිට්ඨධම්ම ලෙසින් පෙන්වා ඇත. **බලන්න**: දිට්ඨධම්ම කම්ම.

▲**සම්පප්ප්‍රලාප:** පාලි: **සම්ඵප්පලාපා-**Idle chatter: සම්පප්ප්‍රලාප- හිස්වචන කතාකිරීම, ධර්මයට අනුකූල නොවන, අහිතකර දේ කතා කිරීම දස අකුසලයන් ගෙන් එකකි . **බලන්න**: දසඅකුසල.

▼**බුදුන් වහන්සේ** හිස්වචන කියන කෙනෙකුගේ ස්වභාවය මෙසේ දක්වා ඇත: මේ ලෝකයේ කෙනෙක් හිස්වචන කතා කරයි: කාලයට නොගැලපෙන, අභූතවූ (සත්‍ය නොවන), අනර්ථය පිණිස පවතින, ධර්මවිනයට නොගැලපෙන, නොවටිනා හිස්වචන කතාකරයි. නුසුදුසු වේලාවන්හිදී ඔහු, ඵලරහිත, අසාධරණ, අනර්ථය ගෙනෙදෙන වචන කතා කරයි:

**"ඉධ භික්ඛවෙ එකච්චො සම්ඵප්පලාපි හොති අකාලවාදී අභූතවාදී අනත්ථවාදී අධම්මවාදී අවිනයවාදී අනිධානවතිං වාචං භාසිතා හොති අකාලෙන අනපදෙසං අපරියන්තවතිං අනත්ථසංහිතං"**

එවැනි අය ඒකාන්තයෙන්ම නිරයට යයි. **මූලාශ්‍ර**: අංගු.නි: (6 ): 10 නිපාත: කරජකාය වග්ග: 10.5.1.1. පඨම නිරය සූත්‍රය**,** පි. 548, ජානුසොණි වගග: 10.4.2.10: චුන්ද සූත්‍රය**,** පි.508, EAN:10: The Deed-born body: 211.1 Hell, p. 556, Jāṇussoṇī: 176.10: Cunda, p.553.

▼ **වෙනත් මූලාශ්‍ර: 1**. "**සම්ඵප්පලාප:** තමාහටද අන්‍යයාහටද අහිත පිණිස අනුපකාරය පිණිස පවත්නා නිෂ්ඵල කතාය. ප්‍රලාප, හිස්බස, අර්ථරහිත වචන යයිද කියයි. අංග 2 කි: නිෂ්ඵල කතාව බවය, එය කතාකිරීමය" :**සද්ධර්ම කෝෂය,** පි. 114.

▲ **සම්ප්‍රජන්‍යය** Clear comprehension: සම්ප්‍රජන්‍යය යනු යෝනිසෝමනසිකාරය ඇතිව නුවණින් කටයුතු කිරීමය. එසේ කටයුතු කිරීමට යහපත් සිහිය අවශ්‍යවේ. අසම්ප්‍රජන්‍ය නැතිකර ගැනීමට සම්ප්‍රජන්‍ය වැඩිය යුතුය. **බලන්න**: අසම්ප්‍රජන්‍යය. **මූලාශ්‍රය:** සංයු.නි: (4) 6 නිපාත: 6.1.8 සූත්‍රය, පි.284.

▲ **සම්බෝධිය**- enlightenment: ධර්මයට අනුව සම්බෝධය - සම්බෝධිය යනු චතුරාර්යසත්‍ය යහපත්ලෙසින්ම අවබෝධ කර නිවන සාක්ෂාත් කර ගැනීමය. එසේ අවබෝධ කරගත් බුදුවරු සම්බුද්ධ ය. බුද්ධානුස්සතිය ආදී අනුසති භාවනා වැඩීම සම්බෝධය ඇතිකරගැනීමට හේතුවේ. **බලන්න**:භාවනා. **මූලාශ්‍ර**:අංගු.නි (1) 1 නිපාතය**:** එකධම්ම පාලිය: පි.100, EAN:1: XVI: One Thing, p. 47.

▲ **සම්මා ඤාණය හා සම්මා විමුක්තිය** -right knowledge & right liberation. සම්මා ඤාණය හා සම්මා විමුක්තිය ලෙසින් පෙන්වා ඇත්තේ, අංග 10කින් යුක්ත සම්මා චරියාවේ - නිවැරදි මගේ අවසාන අංග 2 ය.

**සටහන: *** අටුවාවට අනුව: සම්මා ඥාණය යනු අරහත්මගට පැමිණීමට ඇති නුවණය, සම්මා විමුක්තිය යනු ආසව යන්ගෙන් විමුක්තිය ලැබීමය. එයට හේතුවන්නේ සම්මා ඥාණය තිබීමය. එමගින්, රහතන්වහන්සේ ගේ අනාසව චේතෝවිමුක්තිය හා ප්‍රඥාවිමුක්තිය මුදුන්පත්වේ. (Right knowledge (*sammā ñāṇa*) is the wisdom of the path of arahantship, and right liberation (*sammā vimutti*) is the liberation from the *āsavas* that occurs through right knowledge. Its culmination is the arahant's *anāsava cetovimutti paññā vimutti* (taintless liberation of mind, liberation by wisdom) **බලන්න**: EAN: Note: 2144, p. 683. ** **භික්ඛු බෝධි හිමියන්ට** අනුව: සම්මා ඥාණය, අරහත්වය මුදුන්පත්කරන විශේෂ ඥාණයන්ය (direct knowledge that culminates in arahantship). සම්මා විමුක්තිය: යනු සිත ආසව හා අනිකුත් කෙලෙසුන්ගෙන් මිදීමය (as the release of the mind from the *āsavas* and other defilements). **බලන්න**: EAN: Note: 2141, p. 683. **මූලාශ්‍ර:**අංගු.නි: (6): 10 නිපාත:සමණසංඥාවග්ග:10.3.1.5 විජ්ජාසූත්‍රය, පි.412 හා 10.3.1.3 මිච්ඡත්ත සූත්‍රය, පි. 408, EAN:10: 105.5 True Knowledge, p.541 & 103. 3 The wrong course, p. 540.

▼**පටිසම්භිදාවට අනුව: සම්මා ඥාණය** (right knowledge) යනු 19 ක්වූ පච්චවෙක්ඛනා ඥාණයන්ය. **සම්මා විමුක්තිය** (right liberation) යනු චෛතසික සාධක හා අනුබද්ධවූ, ඵලය (රහත්ඵලය) ලැබීමය. **මූලාශ්‍රය:** ඛු.නි: පටිසම්භිදා 1: මහාවග්ග:ඤාණකතා:13 විමුක්ති ඥාණය,14 ප්‍රත්‍යවෙක්ෂා ඥාණය, පි. 158-160.

▲ **සම්පත්-** Accomplishments: සම්පත් (සම්පදා) ලෙසින් බුදුන් වහන්සේ පෙන්වා ඇත්තේ ආධ්‍යාත්මික ජීවිතය වඩා ගැනීමට උපකාරීවන අංගයන්ය: 1) උට්ඨාන සම්පත 2) ආරක්ෂා සම්පත 3) කල්‍යානමිත්‍ර සම්පත 4) සමජීවිත සම්පත 5) ශ්‍රද්ධා සම්පත 6) ශිල සම්පත, 7) ත්‍යාග සම්පත 8) ප්‍රඥාසම්පත. **මූලාශ්‍ර:** අංගු.නි: ( 5 ): 8 නිපාත: 8.2.8.5 හා 8.2.8.6 සම්පාදා සූත්‍ර 2 කි, පි.336, EAN:8: 75.5 & 76.6 Accomplishments , p.451.

▼**සම්පත් තුන**: ධර්ම මාර්ගයේ ගමන් කරන කෙනෙකුට ඇති තවත් සම්පත්: 1) ශ්‍රද්ධාව 2) ශිලය 3) ප්‍රඥාව. **මූලාශ්‍රය**:අංගු.නි: (1): 3 නිපාත: යෝධාජීවවග්ග:3.3.4.6 සූත්‍රය.

▼**බුදුන් වහන්සේ සම්පත් 5ක් පෙන්වා ඇත**: 1) ඥාති සම්පත2) භෝග (සම්පත්) සම්පත 3) ආරෝග්‍ය සම්පත 4) ශිල සම්පත 5) දිට්ඨි සම්පත. **සටහන**: ශිල හා දිට්ඨි සම්පත් සුගතිය ඇතිකරදේ. **මූලාශ්‍රය:** අංගු.නි: (3) :5 නිපාත: ගිලානවග්ග: 5.3.3.10 සම්පදා සූත්‍රය, පි.262.

▲ **සම්මා පටිපදාව: පාලි: සම්මාපටිපත්තිං:** Right practice: සම්මා පටිපදාව (සම්‍යක්ප්‍රතිපදාව - නිවැරදි පිළිවෙත, නිවැරදි මග) ලෙසින් ධර්මයේ පෙන්වා ඇත්තේ සම්මා දිට්ඨිය...සම්මා සමාධිය ඇතුලත් ආරිය අටමග අනුගමනය කිරීමය. **බලන්න**: ආරියඅටමග. **මූලාශ්‍ර:** සංයු.නි: (5-1): මහාවග්ග: මග්ගසංයුත්ත: 1.3.3 පටිපදා සූත්‍රය, පි. 58, ESN: Maggasamyutta: 23.3 The Way, p. 1629.

▼**සසරදුකින් මිදීම පිණිස** අනුගමනය නොකළ යුතු හා අනුගමනය කලයුතු ප්‍රතිපදා 2 ක් වේ: මිථ්‍යාප්‍රතිපදාව හා සම්‍යක්ප්‍රතිපදාව (wrong way and the right way). සම්මා ප්‍රතිපදාව ඇතිවිට අවිද්‍යාව ප්‍රහීණයවී පටිච්චසමුප්පාදයේ සියලු පුරුක් බිඳවැටේ. එය සසර දුක නැතිවීමය. **මූලාශ්‍ර:** සංයු.නි :( 2 ): නිදානවග්ග: අභිසමයසංයුත්ත-1.1.3. පටිපදා සූත්‍රය, පි. 30, ESN: Abhisamayasamyutta- 3.3 The Two Ways, p. 613.

▲ **සම්මා ප්‍රධාන වීරිය -** පාලි: **සම්මප්පධාන විරියං**- right strivings: සම්මා ප්‍රධාන වීරිය ලෙසින් පෙන්වා ඇත්තේ, ආරිය අටමගේ 6 අංගය වූ සම්මා වායාමය. මෙය සත්තිස් බෝධිපාක්‍ය ධර්මතාවකි, ආධ්‍යාත්මික වර්ධනය පිණිස වැඩිදියුණු කර ගත යුතු විශේෂ කරුණකි. ප්‍රධන් විරිය ලෙසින්ද දක්වා ඇත. කුසල් ඇතිකර ගැනීමට හා අකුසල් පහ කර ගැනීමට මූලිකවන්නේ සම්මා ප්‍රධාන වීරියය. සම්මා ප්‍රධාන විරිය සතර ආකාරයෙන් සිදුවේ. **මූලාශ්‍ර:** සංයු.නි: (5-1 ): 1.1.8 විභංග සූත්‍රය, පි 42, ESN: Maggasamyutta: 8.8 Analysis, p 1611, ම.නි: (2 ): 2.1.3 :සේඛ සූත්‍රය, පි. 44, MN 53: Sekha Sutta, p. 436.

▲ **සම්මා සම්බුද්ධ**-Samma sambuddha-Perfect Enlightenment සියල්ල (ලෝකයේ ඇති සියලු ධර්මතා) මනාව අවබෝධ කර බුද්ධත්වය ලැබූ හෙයින් බුදුන් වහන්සේ සම්මා සම්බුද්ධය- සර්වඥයන් වහන්සේය. එක් ලෝක ධාතුවක සමමා සම් බුදුහිමිවරු දෙනමක් පහළ නොවේ. **මූලාශ්‍රය**:අංගු.නි: (1):1 නිපාත, 1.15.10 සූත්‍රය,පි. 94.

▼**සම්මා සම්බුද්ධ යනු**, අනුත්තර සම්මා සම්බෝධිය (unsurpassed perfect enlightenment) සාක්ෂාත් කරගත්, බුදුදහමේ ආදී කතෘවූ, බුදුන්වහන්සේ හඳුන්වන ගරු නමකි. **සටහන**: භික්ඛු බෝධි හිමිට අනුව, සමහර අවස්ථාවල සම්බෝධිය ලැබූ රහතුන් සම්බුද්ධ (enlightened) ,ලෙසින් හඳුන්වයි..බලන්න: EAN: 1: note no. 154, p. 588. **මූලාශ්‍ර**: අංගු.නි: (1): 1 නිපාත: 1.15.10 සූත්‍රය, පි. 94.

▼**බුදුවරු සම්‍යක් සම්බෝධිය අවබෝධ කරඇත**: එක් සමයක පසේනදී කෝසල රජ බුදුන් වහන්සේ නිරුත්තර සම්‍යක් සම්බෝධිය අවබෝධ කළේද? යයි බුදුන් වහන්සේ විමසූ අවස්ථාවේ, උන්වහන්සේ මෙසේ වදාළහ:

“...මහරජ, මම වනාහි නිරුත්තර සම්‍යක් සම්බෝධිය අවබෝධ කෙළෙමි”. **“අහං හි මහාරාජ අනුත්තරං සම්මා සම්බොධිං අභිසම්බුද්ධොති”.**

**සටහන්: *** ධම්මචක්කප්පවත්තන සූත්‍රයේදී, බුදුන් වහන්සේ චතුරාර්ය සත්‍ය අවබෝධ කොට සම්මා සම්බුද්ධත්වයට පැමිණිබව පෙන්වාඇත. ** කොසොල් රජ එසේ විමසා ඇත්තේ, බොහෝකල් පැවිදි ජීවිතය ඇති, වයසින් වැඩි අන්‍ය ආගමික නායකයන් වන: පුරණකස්සප, මක්ඛලි ගෝසාල, නිගණ්ඨනාතපුත්ත, සංජයබෙල්ට්ටිපුත්ත, පකුධකච්චායන, අජිතකෙසකම්බල ආදින් එම අවබෝධය නොලැබූ බව තමාහට පවසා ඇති නිසාත්, බුදුන් වහන්සේ තරුණවියේ පසුවන නිසාත්, පැවිදිබවට නවක නිසාය. **බලන්න**: දහර **මූලාශ්‍ර:** සංයු.නි: (1 ): කෝසලසංයුත්ත

:3.1.1. දහර සූත්‍රය,පි. 156, ESN:3: Kosalasamyutta: 1.1 Young, p. 216.

▼**අතීතයේද පහලවූ**, අනාගතයේ පහළවන, වර්තමානයේ වැඩසිටින, සිව්සස් අවබෝධ කර සම්බෝධිය ලැබූ සියලු බුදුවරු (සම්මාසම් බුද්ධ), තමන්ගේ ශ්‍රාවක සංඝයාහට නියම පුහුණුව (දුකින්මිදීම පිනිස) ලබාදෙන්නේය යයි බුදුන් වහන්සේ වදාළහ. **මූලාශ්‍ර**: ම.නි (2) 2.1.1 කන්දරක සූත්‍රය, පි. 18, EMN: 51: Kandaraka Sutta, p. 425.

▼ **තථාගත අරහත් සම්මා සම්බුදුන් වහන්සේ** බොහෝ දෙනාගේ හිත සුව පිණිස, ලොවට අනුකම්පාව පිණිස ලෝකයේ උපත ලබති. සම්මා සම්බුදුවරුන්ගේ උපත ලොව දුර්ලභ දෙයකි. සම්මා සම්බුදුවරු අසිරිමත් මිනිසුන්ය (ආශ්වර්යමත් මනුෂ්‍යයෝ). සම්මා සම්බුදුවරුන්ගේ පරිනිර්වාණය- කාලක්‍රියාව බොහෝදෙනාට දුක් ඇතිකරති. සම්මා සමබුදුවරු: අද්විතීයය, අසාහයය, අප්‍රතිමය, අප්‍රතිසමය, අප්‍රතිභාගය, අප්‍රතිපුද්ගලය, අසමය, අසමසමය, දෙපා ඇති අයට අග්‍රය. සම්මා සම්බුදුවරු පහළවීම නිසා අග්‍රවූ උත්තරවූ දේ ලෝකයේ පහලවේ: මහා ප්‍රඥා චක්ෂු, මහා ප්‍රඥා ආලෝකය...එසේම, සතර මග සතර ඵල, විද්‍යා විමුක්ති ඵල සාක්ෂාත් කර ගැනීමට හැකිවීම ආදී උතුම් දේ. **මූලාශ්‍රය**: අංගු.නි: 1 නිපාත:13 ඒකපුග්ල වග්ග: 1.13.1 - 1.13. සූත්‍ර, පි.80.

▲**සමුදය ධම්ම**-Samudaya Dhamma: සමුදය යනු හටගන්නා සුළු බවය. යම් හේතු නිසා හටගන්නා ධර්මතාය. බුදුන් වහන්සේ මෙසේ වදාළහ:

**"...රූපය සමුදය ධම්මය...වේදනාව...සංඥාව... සංස්කාර...විඥාණය සමුදය ධම්මය . එසේ දකිනා ආරිය ශ්‍රාවකයාට රහත්බව පිණිස අනෙකක් නැත". සටහන:** සියල්ල හටගන්නා සුළුය යයි මේ සූත්‍රයේ පෙන්වා ඇත. **මූලාශ්‍ර:** සංයු.නි: (4): සළායතනවග්ග: වේදනාසංයුත්ත :ජාතිධම්මවග්ග: 1.4.9 සමුදයධම්ම සූත්‍රය, පි.84, සංයු.නි:ඛන්ධවග්ග (3): රාධසංයුත්ත: 2.2.11 සමුදයධම්මසූත්‍රය,පි.386.

▲**සමුද්‍ර තරණය උපමාව-**Simile of crossing the ocean: බුදුන් වහන්සේ සසර සාගරය තරණය කිරීම ගැන එක්තරා දේව්යෙක් මෙ උපමාව දක්වාඇත. සසර සමුද්‍රය තරණය කල බුදුන්වහන්සේ, මහා ඉර්ෂි- මහා සෘෂි ලෙසින් මෙහිදී හඳුන්වා ඇත. **බලන්න**: බුද්ධ නාම, උපග්‍රන්ථය:5

**"එක්මුලක් ඇති, දියසුළි දෙකක් ඇති, මළ (කිළුටු) තුනක් ඇති, විස්තාරණ (දිගුව) පහක් ඇති, ආවාට දොළොසක් ඇති, ආගාධ වූ සමුද්‍රය මහා ඉර්ෂි තරණය කළහ"**

**සටහන්:** අටුවාවට අනුව: සමුද්‍රය (පාතාලය) යනු තණ්හාවය. තණ්හාවට සමුද්‍රය ලෙසින් දක්වන්නේ තණ්හාව පුරවාලිය නොහැකි නිසාය (සාගරයද පුරවාලිය නොහැකිය), පාතාලය ලෙසින් දක්වන්නේ ,පය තැබීමට ඉඩක් නොමැති නිසාය. ඒක මුලය නම් අවිද්‍යාව. දියසුළි 2 නම්: ශාශ්වත දෘෂ්ටිය (external ism ) හා උච්ඡේද දෘෂ්ටිය ( annihilation ism). ශාශ්වත දෘෂ්ටිය නිසා භව තණ්හාව කැරකි කැරකි පවතී. උච්ඡේද දෘෂ්ටිය නිසා තණ්හාව සහමුලින්ම විනාශ කිරීම. කිළුටු 3 වන්නේ: ලෝභය, දෝසය හා මෝහය. දිගු 5 : පස්කම් සැප. දියසුළි 12: අභ්‍යන්තර සලායතන 6 හා බාහිර සලායතන 6 ය. **බලන්න: ***

ESN:note:98, p. 516. ** කටුකුරුන්දේ ඤාණානන්ද භික්ෂුන් වහන්සේ: පාතාලය යනු දුක් වේදනා බවද, සාගරය යනු සය ඉන්ද්‍රිය බවද, දිය සුළි 2 ක: සුඛ හා දුක වේදනා ලෙසද, මුල යනු ස්පර්ශය බවද සඳහන් කර ඇත: **බලන්න**: නිවනේ නිවීම දේශනා. **මූලාශ්‍ර**: සංයු.නි: (1) සගාථවග්ග: දේවතාසංයුත්ත: ඒකමූල සූත්‍රය, පි. 84, ESN:1: Devathasamyutta: 44.4 One root, p. 119.

▲**සුමේධ බුදුන් වහන්සේ-** The Buddha Sumedha: ගෝතම බුදුන් වහන්සේට පෙර පහළවූ, සුමේධ බුදුන් වහන්සේ පිලිබඳ විස්තර මෙහි දක්වා ඇත. **මූලාශ්‍රය**:බු.නි: බුද්ධවංශ පාලි:11 සුමේධ බුදුන්වහන්සේ.

▲**සුමන බුදුන් වහන්සේ-** The Buddha Sumana: ගෝතම බුදුන් වහන්සේට පෙර පහළවූ, සුමන බුදුන් ගැන විස්තර මෙහි දක්වා ඇත. **මූලාශ්‍රය:**බු.නි: බුද්ධවංශ පාලි:3 සුමන බුදුන්වහන්සේ.

▲ **සමාධිය:** පාලි: **සමාධි-**Samadhi-Stillness of the mind: ධර්මයට අනුව සමාධිය යනු සිත යහපත් ලෙසින් එකඟ කරගැනීමය, සමතයට පත් කර ගැනීමය. ධර්ම අරමුණක් -කමටහනක් අනුව සිත එකඟ කරගැනීමෙන් සමාධි භාවනාව සිදුවේ, එම භාවනාව සමථ භාවනාව ලෙසින් දක්වයි. නිවන සාක්ෂාත් කර ගැනීම පිණිස, සමාධිය ඇතිකර ගැනීම අවශ්‍යතාවයක්ය. සමාධිය, ඉන්ද්‍රිය ධර්මයක්ය, බල ධර්මයක්ය, බොජ්ඣංග ධර්මයක්ය, ආරිය අටමගේ එක් අංගයක්ය. සියලු ධර්මතා සමාධිය ප්‍රමුඛ කොට ඇත: "**සමාධිපමුඛා සබ්බෙ ධම්මා". බලන්න**: භාවනා, ජාන, සබ්බේ ධම්මා. **සටහන:** අප්‍රමාන සමාධිය (Measureless Samadhi ) ගැන විස්තර පිණිස **බලන්න**: අප්‍රමාන. **ශබ්දකෝෂ: පා.සිං.ශ:** පි.508: "**සමාධි**: සිත එක් තැන් කිරීම" . **B.D:** p.155: **"Samādhi**: Concentration: state of being firmly fixed… is the fixing of the mind on a single object. One pointedness of mind …"

▼ **සමාධිය චතුරාර්ය සත්‍ය අවබෝධය පිණිසය**: බුදුන් වහන්සේ, සංඝයාට අනුසාසනය කළේ සමාධිය වඩාගන්නා ලෙසය. සිත එකඟ වූ විට යථාබව, මානව අවබෝධ කර ගනී. එනම්: මේ දුකය, මේ දුක ඇතිවීම, මේ දුක නැතිවීම, මේ දුක නැතිකිරීමේ මගය:

**"...සමාධිං භික්ඛවෙ භාවෙථ. සමාහිතො භික්ඛවෙ, භික්ඛු යථාභූතං පජානාති. කිඤ්ච යථාභූතං පජානාති: ඉදං දුක්ඛන්ති යථාභූතං පජානාති. අයං දුක්ඛසමුදයොති... දුක්ඛනිරොධොති... දුක්ඛනිරොධගාමිණි පටිපාදාති යථාභූතං පජානාති..."**. (....Bhikkhus, develop concentration. A bhikkhu who is concentrated understands things as they really are: This is suffering... origin of suffering ... cessation of suffering... the way leading to the cessation of suffering). **සටහන**: අටුවාවට අනුව: සමාධිගත භික්ෂුව, චතු සත්‍ය පිලිබඳ දැනීමක් ලබා ඇති නිසා, වීරිය ඇතිකර, යථාභූත නුවණින් සත්‍ය අවබෝධ කර සසර දුක නිමා කර ගැනීමට කටයුතු කල යුතුය. **බලන්න**: ESN: note: 376, p. 2431. **මූලාශ්‍ර:** සංයු.නි: (5-2):මහාවග්ග: සච්ච සංයුත්ත: 12.1.1. සමාධි සූත්‍රය, පි. 284, ESN: 56: Sacchasamyutta: 1.1. Concentration, p. 2265.

▼ **සමාධිය යථාභූත ඥානය පිණිසය**: සිත සුවපත්වීම- සුඛය ට පැමිණීම නිසා සමාධිය ඇතිවේ. සිත සමාධි ගතවූ විට යථාභූත ඥානය ඇතිවේ:

**"සුඛ බො ආනන්ද සමාධත්ථං සමාධානිසංසං...සමාධි බො ආනන්ද යථාභූත ඤාණදස්සනත්ථො යථාභූතඤාණදස්සනානිසංසො"** (The purpose and benefit of pleasure is concentration ... purpose and benefit of concentration is the knowledge and vision of thing as they really are) **මූලාශ්‍ර**:අංගු.නි: (6): 11 නිපාත :නිස්සය වග්ග: 11.1.1.කිමත්ථිය සූත්‍රය හා 11.1.2 න චේතනාය කරණිය සූත්‍රය, පි.611-614, EAN:11: Dependence: 1.1 What Purpose & 1-2 Volition p.566.

▼ **සමාධියට ඇතුළුවීම හා පිටවීමේ කුසලතාවය-** Skill in entering and returning from jhana. බුදුන් වහන්සේ සමාධි සමාපත්තියට එළඹීම හා ඉන් නැගීසිටීම (සමාපත්ති කුසලතාවය හා සමවතින් නැගීසිටීමේ කුසලතාවය ) යහපත් ලෙසින් වදාරා ඇත. ඒ ධර්මතා සංඝයා එක්ව, ධර්මයේ චිරස්ථිතිය පිණිස සජ්ජායනා කිරීම සුදුසු ය යි සැරියුත් මහා තෙරුන් සංඝයාට උපදෙස් දී ඇත. **මූලාශ්‍ර**: දිඝ.නි: (3):10 සංගිති සූත්‍රය, පි. 372 , EDN: 33 Saṅgīti Sutta: The Chanting Together, p. 362.

▼ **ධර්මය පිලිබඳ** සිතේ සැකයක් ඇතිවූවිට, එය පහකර ගැනීමට '**ධම්ම සමාධිය**' හා '**චිත්ත සමාධිය**' වඩා ගත යුතුය යි බුදුන් වහන්සේ වදාළහ. **ධම්ම සමාධිය** ඇතිකර ගැනීම: දස අකුසල, මිථ්‍යා දිට්ඨිය පහකර සම්මා දිට්ඨිය වඩා ගත යුතුය. අබිජ්ජාව හා ව්‍යාපාදය අත්හළ, ආරිය ශ්‍රාවකයා, සති සම්පජානය ඇතිව, සෑම දිසාවකටම මෙත්සිත පතුරුවාහරි. එසේ මෙත්සිත වඩන ඔහුට, තමන් කිසිවෙක් නොපෙළෙන බව දැනේ. තමන්ගේ කාය, වචී හා මනෝ සුචරිතය දකිනා ඔහු, මරණින් මතු තමා සුගතියක උපතලබන බව පෙනීයාම නිසා ප්‍රමෝදය ඇතිවේ. ප්‍රමෝදය නිසා ප්‍රීතියද, ප්‍රීතිය නිසා නාම කායේ සංසිඳීම ඇතිවේ. සන්සුන් කය ඇතිවිට සුවය ඇතිවේ, සුව ඇතිවිට, සිත එකඟවේ. එය ධම්ම සමාධියය.ධම්ම සමාධිය තුලින් ලබන '**චිත්තසමාධිය**' මගින් සැකය දුරුවේ. **සටහන:** ඒ පිලිබඳව අටුවාව ආකාර 3 ක්පෙන්වා :1) ධම්ම සමාධිය යනු දස කුසලයය, චිත්ත සමාධිය: විදසුන් නුවණ ඇති මගඵල සතරය. 2) ප්‍රමෝදය, ප්‍රීතිය, සංසුන්බව, සුඛය හා සමාධිය යන ධර්මතා 5 ධම්ම සමාධියය, චිත්ත සමාධිය: විදසුන් නුවණ ඇති මගඵල සතරය. 3) දසකුසල හා සතර බ්‍රහ්ම විහාර ධම්ම සමාධියය, ධම්ම සමාධියය සම්පූර්ණ කරගැනීම චිත්ත සමාධිය ඇතිවීමය. **බලන්න:**ESN:note:363, p.1569. **මූලාශ්‍රය**:සංයු.නි: (4): සළායතනවග්ග:ගාමිණී සංයුත්ත:8.1.13 පාටලිය සූත්‍රය, පි.611.

▼ **සංඝයා පුරුදුකර ඇති විවිධ සමාධි**: 1) **ඒකාංශ සමාධිය** (**එකංසභාවිතො සමාධි) :** භික්ෂුවක්, සය දිසාවෙන් එක් දිසාවකට මුහුණලා, සමාධිය වඩන විට ඔහු දේවරූප දකි. එහත් දෙවි හඬ නොඇසේ. එයට හේතුව එම සමාධිය මග පෙන්වන්නේ දේවරූප දැකීම පිණිස පමණි. තවත්, භික්ෂුවක්, සය දිසාවෙන් එක් දිසාවකට මුහුණලා, සමාධිය වඩන විට ඔහුට දෙවිහඬ ඇසේ, එහෙත්, දේව රූප නොපෙණේ. එයට හේතුව එම සමාධිය මග පෙන්වන්නේ දේවරූප දැකීම පිණිස පමණි. **සටහන**: එම සමාධිය කැමති දිසාවකට මුහුණලා වැඩිය හැකිය.

**2) ද්විපාර්ශව සමාධිය (**උභයංසභාවිතො සමාධි): භික්ෂුවක්, සය දිසාවෙන් එක් දිසාවකට මුහුණලා, සමාධිය වඩන විට ඔහු දේවරූප දකි, දෙව් හඬ අසයි. එයට හේතුව එම සමාධිය මග පෙන්වන්නේ දේවරූප දැකීම හා දෙව් හඬ ඇසීම යන කරුණු දෙකම පිණිසය. **මූලාශ්‍ර**: දීඝ.නි: (1): 6 මහාලි සූත්‍රය, පි. 340, EDN: 6: Mahāli Sutta: About Mahāli- Heavenly Sights, Soul and Body, p. 118.

▼ **වෙනත් මූලාශ්‍ර: 1**. **සමාධිය:** "සමාධි නානාවිධ ය. සමාධිය නම් කුසල් සිත් පිළිබඳ ඒකාග්‍රතාවය ය. චිත්ත චෛතසික විසිරී යාමට නොදී මනා කොට එකම අරමුණේ පිහිටුවා ගැනීමය. **සමාධියේ ස්වභාවය**: 1) විවිධ අරමුණු වල නො විසිරෙනබව (අවික්ෂේප)- මෙය සමාධියේ ලක්ෂණය වේ 2) නොසන්සුන්බව නැතිකිරීම-මෙය සමාධියේ රසය ය. 3) අවිකම්පනය- උද්දච්චය නැතිබව- කම්පා නැතිබව . මෙය සමාධියේ පච්චුපට්ඨාන හෙවත් සමාධි ඵලය ය. 4) සුඛිනො චිත්තං සමාධියති: සම්ධියේ පද්ට්ඨාන- ආසන්න කරුණ සුඛය ය .**බලන්න**: **සිංහල විශුද්ධිමාර්ගය:** 3 පරිඡේදය**:** පි. 172.

▲**සමාධි ඉන්ද්‍රිය**: පාලි: **සමාධින්ද්‍රියං-** faculty of Samadhi: ආධ්‍යාත්මික ඉන්ද්‍රිය පහෙන් එකකි, ආධ්‍යාත්මික මාර්ගයට විශේෂතාවයක් ලබා දෙයි. බෝධි පාක්ෂික ධර්මතාවයකි, **බලන්න**: පංච ඉන්ද්‍රිය.

▼ **සමාධි ඉන්ද්‍රිය යනු කුමක්ද?**: "**කතමඤ්ච භික්ඛවෙ සමාධින්ද්‍රියං: ඉධ භික්ඛවෙ, අරියසාවකො වොස්සග්ගාරම්මණං කරිත්වා ලභති සමාධිං, ලභති චිත්තස්ස එකග්ගතං. ඉදං වුච්චති සමාධින්ද්‍රියං**". ආරිය ශ්‍රාවකයා නිවන අරමුණු කොට සමාධිය වඩති, සිතේ එකඟබව ලබාගනී, එය සමාධි ඉන්ද්‍රියවේ. **සටහන**: සතර ජාන -සිව්ජාන තුල සමාධි ඉන්ද්‍රිය දැකිය හැකිය. **මූලාශ්‍ර**: සංයු.නි: (5-1): මහාවග්ග: ඉන්ද්‍රියසංයුත්ත: 4.1.8 දට්ඨබ්බ සූත්‍රය හා 4.1.9. විභංග සූත්‍රය, පි. 377, ESN: 48: Indriyasamyutta: 8.8 To be seen & 9.9 Analysis, p. 1933.

▲ **සමාධි කුසලය-**Samadhi skills: බුදුන් වහන්සේ මෙහිදී සමාධි කුසලතා 6 ක් පෙන්වා ඇත:1) සමාධියට සමවැදීමේ කුසලය(skilled in the attainment of concentration). 2) සමාධි ස්ථිතියේ කුසලය (skilled in the duration of concentration) 3) සමාධියෙන් නැගීසිටීමේ කුසලය (skilled in emergence from concentration). 4) සමාධි කල්‍යතා කුසලය (සමාධියේ සිත පහදවා ගැනීම- skilled in fitness for concentration). 5) සමාධි ගෝචර කුසලය (කුසල අරමුණෙහි පිහිටා සිටීම- skilled in the area of concentration) 6) සමාධි අභිනීහාර කුසලය ( මතුවේහිද සමවැදුම පිණිස- skilled in resolution regarding concentration). එම කරුණු සමන්විත මහණ හට හිමවත් පව්ව බිඳලීමට වැනි ශක්තියක් ඇත. මේ කරුණු පිලිබඳ අටුවාව දක්වා ඇති විස්තර පිණිස **බලන්න**:EAN: note: 1291: p.644. **මූලාශ්‍ර:**අංගු.නි: (4) : 6 නිපාත: අනුත්තරියවග්ග: 6.1.3.4 හිමවන්ත සූත්‍රය, පි. 74, EAN:6:24.4 Huimalayas, p.326.

▲ **සමාධි පරික්ඛාර** (පාලි): **සමාධි පරික්ඛාර-** Accessories for Samadhi සමාධිපරිකඛාර ලෙසින් පෙන්වා ඇත්තේ පරිපූර්ණවූ සමාධිය ඇතිකර ගැනීමට පදනම් වන කරුණුය- සමාධිය ලබාගැනීමට සහායවන

අංගයන්ය. **ශබ්දකෝෂ: පා.සිං.ශ:** පි.508: "**සමාධිපරික්ඛාර**: සමාධිය ලබා ගැනීමට උවමනා ප්‍රත්‍යය (හේතු) "

▼ **සමාධි පරිකඛාර ධර්ම හතකි**: එනම්: සම්මා දිට්ඨිය, සම්මා සංකප්පය, සම්මා වාචා, සම්මා කම්මන්ත, සම්මා අජීවය, සම්මා වායාමය හා සම්මා සතිය යන ආරිය අටමගේ 1-7 දක්වා ඇති අංගය. සම්මා දිට්ඨිය නිසා සම්මා සංකප්පය ඇතිවේ. සම්මාසංකප්ප නිසා සම්මා වාචා ඇතිවේ. සම්මා වචා නිසා සම්මා කම්මන්ත ඇතිවේ. සම්මා කම්මන්ත නිසා සම්මා අජීවය ඇතිවේ. සම්මා ආජීවය නිසා සම්මා වායාමය ඇතිවේ. සම්මා වායාමය නිසා සම්මා සතිය ඇතිවේ. සම්මා සතිය නිසා සම්මා සමාධිය ඇතිවේ. සම්මා සමාධිය පරිපූර්ණත්වයට පත්වීමෙන් සම්මා ඥාණය ඇතිවේ. සම්මා ඥාණය නිසා සම්මා විමුක්තිය පහලවේ. **සටහන:** ජනවසභ සූත්‍රයේදී, සනංකුමාර බ්‍රහ්ම රාජයා, බුදුන් වහන්සේ වදාළ සමාධිපරිකඛාර ධර්මයන් දේවසභාවට දේශනාකලබව දක්වා ඇත. **බලන්න:** සනංකුමාර බ්‍රහ්ම රාජයා. **මූලාශ්‍ර**: දීඝ.නි: (2): 5. ජනවසභ සූත්‍රය, පි,322, EDN: 18 Janavasabha Sutta, p. 209.

▲ **සමාධි ප්‍රතිලාභ:** පාලි: **සමාධිපටිලාභො-** Fruits of Samadhi: සමාධි ප්‍රතිලාභ ලෙසින් පෙන්වා ඇත්තේ යහපත් ලෙස සිත එකඟ කර, කෙලෙස්වලින් මිදී සමාධියට සමවැදීමෙන් ලැබෙන යහපත් ඵල විපාකය. එනම්. මාර්ග ඵල ලබා ගැනීමට හැකිවීමය.

▼**සමාධි ප්‍රතිලාභ** පිළිබඳව, ආනන්ද තෙරුන් මෙලෙස, බුදුන් වහන්සේ විමසා ඇත:

**1) ප්‍රශ්ණය: "...සියා නු ඛො භන්තෙ භික්ඛුනො තථාරූපො සමාධිපටිලාභො, යථා ඉමස්මිඤ්ච සවිඤ්ඤාණකෙ කායෙ අහිඞ්කාර මමිඞ්කාර මානානුසයා නාස්සු, යඤ්ච චෙතොවිමුත්තිං පඤ්ඤාවිමුත්තිං උපසම්පජ්ජ විහරතො අහිඞ්කාර මමිඞ්කාර මානානුසයා න හොන්ති, තං ච චෙතොවිමුත්තිං පඤ්ඤාවිමුත්තිං උපසම්පජ්ජ විහරෙය්‍යා ? ති"**

භික්ෂුවක් හට 1) සවිඥනක කය-ශරීරය පිළිබඳව, මමය (අහංකාරය) යන්න, මාගේය (මමංකාරය) යන්න හා මානඅනුසය නොමැතිනම් 2) එසේම, බාහිර නිමිති පිළිබඳව මමය, මාගේය යන්න හා මානඅනුසය නොමැතිනම් 3) මමය, මාගේය, මානඅනුසය නැතිවීම මගින් ඔහු චේතෝවිමුක්ති, ප්‍රඥාවිමුක්ති යට සමවැදී ඒ අනුව වාසය කරයිනම්, එබඳු, භික්ෂුවට යම් සමාධි ප්‍රතිලාභ ලැබේද? **සටහන්: *** සවිඥනක කය (සචේතනික කය- conscious body) **චේතෝවිමුක්තිය (liberation of mind) යනු ඵල සමාධියය, ප්‍රඥාවිමුක්තිය (liberation by wisdom) යනු ඵල ප්‍රඥාව යය. ** **අටුවාවට අනුව**: අහංකාරය යනු දිට්ඨි සහගතව මම ය කියා අල්වා ගැනීමය (I-making by views); මමංකාරය යනු තණ්හාවෙන් මගේ කියා අල්වා ගැනීමය (mine-making by) මාන අනුසය යනු- මානය පිලිබඳ ඇති අනුසයන් ය (underlying tendency to conceit). මේවා තමන් ගැන හා අනුන් ගැන කෙනෙකුගේ සිතේ ඇති කෙළෙස්ය. සියලු බාහිර නිමිති යනු: පංච කාම අංගයන්, ලෝකය සදාකාලිකය යන විවිධ දිට්ඨී, පුද්ගලයා හා ධර්මතා ගැන ඇති මත. විස්තර පිණිස **බලන්න**: EAN: note: 366, p. 598, **බලන්න**: අහංකාරය, මමංකාරය හා මානඅනුසය, දිට්ඨී)

**2) බුදුන් වහන්සේගේ පිළිතුර:**

**“ …සියා ආනන්ද භික්ඛුනො තථාරූපො සමාධිපටිලාභො…”**: ඒ ආකාරයට සමාධියට සමවැදී වාසය කරන භික්ෂුවට සමාධි ප්‍රතිලාභ ඇත යයි බුදුන් වහන්සේ වදාළහ.

**3) ප්‍රශ්ණය:** එලෙස සමාධියට සමවැදී වාසය කරන භික්ෂුවට,කෙසේ සමාධි ප්‍රතිලාභයක් ලැබේද?

**4) පිළිතුර:**

**“ඉධානන්ද භික්ඛුනො එවං හොති: එතං සන්තං, එතං පණීතං, යදිදං සබ්බසඞ්ඛාර සමථො සබ්බූපධිපටිනිස්සග්ගො තණ්හක්ඛයො විරාගො නිරොධො නිබ්බාණන්ති”**

එම භික්ෂුව මෙලෙස සිතයි: ‘සියලු සංඛාරයන් සංසිඳීමෙන්, සියලු උපාදාන දුර ලීමෙන්, තන්හාව ක්‍ෂය කිරීමෙන්, නො ඇලීම ඇතිවීමෙන්, යම් නිරෝධයක්, නිවීමක් - නිවනක් ඇත්ද, එය ශාන්තය එය උතුම්ය (ප්‍රණීතය). එලෙසින්, සමාධිය ලබාගන්නා භික්ෂුවට, සවිඥනක කය ගැන හෝ බාහිර නිමිති ගැන අහංකාරයක්, මමංකාරයක් හා මානඅනුසය නොමැත. ඔහු, චේතෝවිමුක්තියට හා ප්‍රඥාවිමුක්තයට සමවැදී වාසය කරයි. එබඳු භික්ෂුවකට අහංකාරය ... ආදීවූ කෙළෙස් නොමැත. එලෙසින් භික්ෂුවහ එබඳු වූ සමාධි ප්‍රතිලාභයක් ලබාගන්නේය යයි බුදුන් වහන්සේ වදාළහ. **සටහන: *** ඒ අනුව ලබන සමාධි ප්‍රතිලාභය නම් අරහත්වයට පත්වීමය. (අරහත් ඵල සමාපත්ති) **බලන්න**: EAN: note: 366, p. 598 ** නිවන අරමුණු කොට සමාධිය වඩා ගැනීම පිළිබඳව **බලන්න**: භාවනා -උපසමානුසති භාවනාව, අවසාන ඥානය.

**5)** සූත්‍රය අවසානයේදී බුදුන් වහන්සේ ආනන්ද තෙරුන්ට වදාළේ, මේ කරුණ පිළිබඳව පාරායානයේ දී පුණ්ණක මානවක පුත්‍ර ඇසූ පැණයට, බුදුන් වහන්සේ වදාළ පිළිතුර මේ ගාථාවෙන් පෙන්වා ඇති බවය:

**“ ඉදං ච පන මෙතං ආනන්ද සන්ධාය භාසිතං පරායණෙ පුණ්ණකපඤ්හෙ:‘සඞ්ඛාය ලොකස්මිං පරොවරානි- යස්සිඤ්ජිතං නත්‍ථි කුහිඤ්චි ලොකෙ සන්තො විධූමො අනීඝො නිරාසො - අතාරි සො ජාතිජරන්ති බ්‍රූමී’ති”**

“ලෝකයේ ඇති ‘මගේ ආත්මය’, ‘අනුන්ගේ ආත්මය’ ආදිය ගැන මනා නුවණින් වටහා ගන්නා පුද්ගලයා, ලෝකයේ කිසිම අරමුණක් ගැන කම්පාවට පත්නොවේ. ශාන්තවූ ඔහු කිපෙන්නේ නැත; සියලු කරදර වලින් මිදී ඇත, ආශාවන් දුරුකර ඇත. එබඳු ඔහු ජාති ජරාවෙන් මිදී ඇත ය යි මම පවසමි” යයි බුදුන් වහන්සේ වදාළහ.

**සටහන**: පුණ්ණක මානවක පුත්‍රයා**,** ඇසූ ප්‍රශ්ණය:“…දෙව් මිනිස් ලෝකයේ කවරෙක් ජාතිය ජරාව තරණය කෙළේද?” **බලන්න**: ඛු.නි: සූත්‍රනිපාතය: පරායන වග්ග: පුන්ණක, ගාථා: 1051-1052,පි. 340. **මූලාශ්‍ර**: අංගු.නි: (1): 3 නිපාත: දේවදූතවග්ග: 3.1.4.2 ආනන්ද සූත්‍රය, පි. 282, EAN:3: Divine Messengers: 32.2 Ananda, p.90.

▲ **සමාපත්ති:** පාලි: **සමාපත්ති**- attainments: සිත එකඟ කරගැනීමෙන් ලබන සමාධිය-ජාන ලබාගැනීම සමාපත්තියට පත්වීමය. සංයු.නි: ජානසංයුත්තයේ සමාපත්ති පිළිබඳ විස්තරාත්මකව පෙන්වා ඇත.

▼ **බුදුන් වහන්සේ**, සමාපත්තියට ප්‍රවේශවීම හා ඉන් නැගීසිටීම (සමාපත්තිකුසලතා, සමාපත්තිවුට්ඨානකුසලතා ( Skill in entering and returning from jhāna) යහපත් ලෙසින් දක්වා ඇත. **මූලාශ්‍ර**:දිඝ.නි: (3):10 සංගිති සූත්‍රය, පි. 372, EDN: 33 Sangīti Sutta: The Chanting Together, p. 362.

▼ **සමාපත්ති කුසලතා** -ධ්‍යාන ලාභ ලබන පුද්ගලයන් සතර ආකාර බව බුදුන් වහන්සේ පෙන්වා ඇත: 1) සමාධිය පිළිබඳ කුසලතාවය ඇති එහෙත් සමාපත්තියට සම වැදීමේ කුසලතාවය නැති. 2) සමාධිය පිළිබඳ කුසලතාවය නැති එහෙත් සමාපත්තියට සම වැදීමේ කුසලතාවය ඇත. 3) සමාධිය පිළිබඳ කුසලතාවය හෝ සමාපත්තියට සම වැදීමේ කුසලතාවය නැත. 4) සමාධිය පිළිබඳ කුසලතාවය හා සමාපත්තියට සම වැදීමේ කුසලතාවය ඇත. ඒ පුද්ගලයා අග්‍රය යි බුදුන් වහන්සේ වදාළහ. **මූලාශ්‍ර:** සංයු.නි: (3): ඛන්ධවග්ග: ජානසංයුත්ත: 13.1.1.සමාපත්ති කුසල සූත්‍රය, පි. 566, ESN: Jhānasaṃyutta: 1 Attainment in relation to Concentration, p. 1163.

▲**සාමණ්ඩකාණි පිරිවැජියා**- Paraibbrajika Samandakani : **බලන්න:** උප ග්‍රන්ථය:3

▲ **සාමිසය**-Samisa: සාමිසය (carnal) ලෙසින් පෙන්වා ඇත්තේ ආධ්‍යාත්මික නොවන දේ පිළිබඳ ඇලීමය- පස්කම් සැප විඳීමය. ආධ්‍යාත්මික ඇලීම නිරාමිසයය. **බලන්න:** නිරාමිසය. ලෝකයා සාමිසයේ ඇලි ලබන සුවය, සැපය විවිධය: 1) **සාමිස ප්‍රීතිය**-carnal rapture: පස්කම් ගුණයේ ඇලි ලබන ප්‍රීතිය. ඇසෙන් රූප දැක... ආදීවශයෙන් සළයාතන, බාහිර අරමුණු අල්වා ගැනීම මගින් විඳින ප්‍රීතිය 2) **සාමිස සුවය**-carnal happiness: පස්කම් ගුණ හේතුකොටගෙන ඇතිවන සුවය, සොම්නස. 3) **සාමිස උපේක්ඛාව**-carnal equanimity**:** පස්කම් ගුණ හේතුකොටගෙන ඇතිවන උපේක්ඛාව. 4) **සාමිස විමොක්ෂය**- carnal deliverance: රූපලෝකය ආශ්‍රිතව ලැබෙන විමුක්ති සුවයය. **මූලාශ්‍ර:** සංයු.නි: (4): සළායතනවග්ග: වේදනා සංයුත්ත:2.3.11 නිරාමිස සූත්‍රය, පි. 470, ESN: 36: Vedanasamyutta: 31.11. Spiritual, p. 1368.

▲ **සම්‍යක් ප්‍රධාන වීරිය සතර**-Four right strivings: සම්‍යක් ප්‍රධාන වීරිය සතර (සතර සම්‍යක් ප්‍රධන් වීරියෝ- සම්මා පධාන- සිවුසම්පදහන්) ප්‍රධන් විරිය ලෙසින්ද දක්වා ඇත. මේවා බෝධිපාක්‍ය ධර්මතාය. සම්මා ප්‍රධාන වීරිය ලෙසින් පෙන්වා ඇත්තේ, ආරිය අටමගේ 6 වෙනි අංගය වූ සම්මා වායාමයය. කුසල් ඇතිකර ගැනීමට හා අකුසල් පහ කර ගැනීමට මූලිකවන්නේ සම්මා ප්‍රධාන වීරියය. මේ වීරිය නිවනට නැඹුරුවේ, මේ විරිය කරන මහණ, මාරයාගේ ග්‍රහණයෙන් මිදී, යළි උපත හා මරණය නොමැති නිවන ලබාගනී. මේ පිළිබඳ දක්වා ඇති **උපමාව: ගංගානම් ගඟ:** යම්සේ ගංගානම් ගඟ, නැගෙනහිරට (පෙරදිගට) නැමී බරවී ඇත. එලෙස, ප්‍රධන් වීරිය නිවනට නැඹුරුව ඇත. **බලන්න**: පධාන, පධාන

සතර. **සටහන**: සංයු.නි: සම්මප්පධාන සංයුත්තයේ සූත්‍ර වල මෙ ගැන විස්තර පෙන්වා ඇත. **මූලාශ්‍ර:** සංයු.නි: (5-1): මහාවග්ග: සම්මප්පධාන සංයුත්ත: 5.1.1.පාචිනනින්න සූත්‍රය, පි.454,අංගු.නි: (2) : 4 නිපාත: 4.1.2.3 සූත්‍රය, පි. 52, EAN:4: 13.3 Striving, p. 153.

▼**සම්මා ප්‍රධාන වීරිය කිරීම**

**"චත්තාරො' මෙ භික්ඛවෙ සම්මප්පධානා"** .සම්මා ප්‍රධන වීරිය සතර ආකාරය: 1) මේ සසුනේ මහණ නූපන් ලාමක අකුසල නූපද්දවා ගැනීම පිණිස කැමැත්ත ඇතිකර ගෙන සිත දැඩි කර ගෙන වීරිය අරඹයි:

**"...ඉධ භික්ඛවෙ, භික්ඛු අනුප්පන්නානං පාපකානං අකුසලානං ධම්මානං අනුප්පාදාය. ඡන්දං ජනෙති වායමති විරියං ආරභති චිත්තං පග්ගණ්හාති පදහති..."** ( a bhikkhu generates desire for the non-arising of un-arisen evil unwholesome states; he makes an effort, arouses energy, applies his mind, and strives)

2) උපන් ලාමක අකුසල පහකර ගැනීම පිණිස කැමැත්ත ඇතිකර ගෙන සිත දැඩි කර ගෙන වීරිය අරඹයි: **"...උප්පන්නානං පාපකානං අකුසලානං ධම්මානං පහානාය. ඡන්දං ජනෙති වායමති විරියං ආරභති චිත්තං පග්ගණ්හාති පදහති..."** (He generates desire for the abandoning of arisen evil unwholesome states; he makes an effort, arouses energy, applies his mind, and strives).

3) නූපන් කුසල් ඇතිකර ගැනීම පිණිස කැමැත්ත ඇතිකර ගෙන සිත දැඩි කර ගෙන වීරිය අරඹයි: **"...අනුප්පන්නානං කුසලානං ධම්මානං උප්පාදාය. ඡන්දං ජනෙති වායමති විරියං ආරභති චිත්තං පග්ගණ්හාති පදහති..."** (He generates desire for the arising of un-arisen wholesome states; he makes an effort, arouses energy, applies his mind, and strives).

4) උපන් කුසල් දහම් පවත්වා ගැනීම පිණිස, නොමුලාව පිණිස, බොහෝබව පිණිස, විපුල බව පිණිස, වැඩීම පිණිස, පිරිපුන් බව පිණිස, කැමත්ත ඇතිකරගනී, වැයම් කරයි, සිත දැඩි කර ගෙන වීරිය අරඹයි.

**"...උප්පන්නානං කුසලානං ධම්මානං ඨිතියා අසම්මොසාය භියොය්‍යාභාවාය වෙපුල්ලාය භාවනාය පාරිපූරියා ඡන්දං ජනෙති වායමති විරියං ආරභති චිත්තං පග්ගණ්හාති පදහති..."**. ( He generates desire for the maintenance of arisen wholesome states, for their non- decay, increase, expansion, and fulfilment by development; he makes an effort, arouses energy,applies his mind, and strives). **මූලාශ්‍ර:** සංයු.නි: (5-1):1.1.8 විභංග සූත්‍රය,පි 42,ESN: Maggasamyutta: 8.8 Analysis, p 1611, ම.නි: (2): 2.1.3 :සේඛ සූත්‍රය, පි. 44, MN 53: Sekha Sutta, p. 436.

▼**ප්‍රධාන වීර්යයන් 2 ක් ඇතිකර ගැනීම** දුෂ්කර බව බුදුන් වහන්සේ පෙන්වා ඇත: 1) **ගිහියන් කරන විරිය**: සංඝයාට සිව්පසය යහපත් ලෙසින් සැපයීම පිණිස ගිහියන් විසින් දරන වෙහෙස- වීරිය.2) **සියලු උපධි අත්හැරීම පිණිස ඇති වීරිය**: (**සබ්බුපධිපටිනිස්සග්ගො**-the relinquishment of all acquisitions) සංඝයා දරන වීරිය. මෙ වීරිය 2 අතරින් සියලු උපධි

අත්හැරීම පිණිස කරන විරිය උතුම්ය. **මූලාශ්‍ර:** අංගු.නි: (1): 2 නිපාත: 2.1.1.**2 පධාන සූත්‍රය,** පි. 133, EAN: 2: 2.2 Striving, p. 56.

▼**සම්මාප්‍රධාන වීරිය නිවන් මගය- අසංඛත මගය**: **මූලාශ්‍ර:**සංයු.නි: (4 **)**සළායතනවග්ග: අසංඛත සංයුත්ත: 9.1.6 සම්මා ප්‍රධාන වීරිය සූත්‍රය, පි. 662, ESN: Asankatasamyutta: p. 1493.

▲**සිම්බලි උල්කටුගස් නිරය** -Hell of Simbali Thorns Tress: අයහපත් කර්ම විපාක නිසා යළි උපත ලබන දුගතියකි. උල්කටු ඇනීමෙන් මහා දුක් වේදනාඇතිකරයි. **බලන්න**: නිරය.

**සය**

▲ **සය අනුත්තර ධර්ම** - Six unsurpassed Dhamma: අනුත්තර යනු උතුම්බවය, ශ්‍රේෂ්ඨ බවය. අනුත්තර ධර්ම 6 ක් මෙහි පෙන්වා ඇත: 1) **දස්සන අනුත්තරිය** (The unsurpassed sight): තථාගතයන් හෝ තථාගත ශ්‍රාවකයන් දැකීම. 2) **සවන අනුත්තරිය** (the unsurpassed hearing): තථාගත ධර්මය ශ්‍රවනය කිරීම 3) **ලාභ අනුත්තරිය** (the unsurpassed gain): තථාගතයන් හෝ තථාගත ශ්‍රාවකයන් කෙරෙහි අචල විශ්වාසය ඇතිවීම 4) **සික්ඛා අනුත්තරිය** (the unsurpassed training ): අධිශීලය, අධි චිත්තය, අධි ප්‍රඥාව යන ධර්ම පුහුණුව ලැබීම. 5) **පාරිචරියා අනුත්තරිය** (the unsurpassed service): තථාගතයන් හෝ තථාගත ශ්‍රාවකයන් හට සේවය කිරීම 6) **අනුස්සතා අනුත්තරිය** (the unsurpassed recollection): තථාගතයන් හෝ තථාගත ශ්‍රාවකයන් පිලිබඳ අනුසතිය වඩා ගැනීම. කෙනෙක් ශ්‍රද්ධාව පිහිටුවාගෙන මේ 6 අනුත්තර ධර්ම ලබා ගන්නේ නම් ඔහු දුක නැතිකරගන්නේය, විමුක්තිය ලබන්නේය යයි බුදුන් වහන්සේ වදාළහ. **සටහන**: තථාගතයන් ගේ පහළවීම නිසා සය අනුත්තර ධර්ම ඇතිවේ. **බලන්න**: තථාගතයන් වහන්සේ. **මූලාශ්‍ර:**අංගු.නි: (4) 6 නිපාත: 6.1.3.10 අනුත්තරිය සූත්‍රය, පි. 92, EAN: 6: 30.10, Unsurpassed Things, p. 329.

▲**සය අභිඥා**: පාලි: **ඡළභිඤ්ඤා** : six direct knowledge: ධර්මයේ, සයඅභිඥා ලෙසින් දක්වා ඇත්තේ නිවන සාක්ෂාත් කරගැනීම පිණිස- විජ්ජාවිමුක්තිය පිණිස අවශ්‍යවන විශේෂ ඥානයන් 6 ය **ශබ්දකෝෂ : 1. පාසිශ**: පි.89: "**අභිඤ්ඤා**: නිපුනබව, දැනීම, අවබෝධය, පඤ්ඤාභිඤ්ඤා සහ ඡළභිඤ්ඤා. 'විසෙසන ජානාතීති අභිඤ්ඤා' විශේෂයෙන් දැනගනී යනු අභිඤ්ඤා නම් වේ" **2. BD**: p. 2: "**abhiññā**: the 6 higher powers/supernormal Knowledge…" **3. PTS**: p. 158: "abhijña: knowing, possessed of knowledge, esp. higher or supernormal knowledge -intelligent; thus in chalabhiññā one who possesses the 6 abhiññās"

▼**ආධ්‍යාත්මික මාර්ගය සාක්ෂාත් කරගැනීම පිණිස ලබාගත යුතු සය අභිඥා**: **1) ඉද්දි ප්‍රාතිහාර්ය ඥානය-** විවිධාකාර ආශ්චර්යමත් දේ කළහැකි බලය (various supernatural powers) 2) **දිබ්බසෝත** -දිවකන් (divine ear )- පොළොවේ හෝ දෙව්ලොව හෝ ළඟ හෝ දුර සිදුවෙන කතාබහ ඇසීමට ඇති හැකියාව.3) **චෙතොපරිච්ච ඥානය-** අනුන්ගේ හිත් දැකීමේ නුවණ (ability to know the other's minds) 4) **පුබ්බේ නිවාසානුස්සති**

**ඥානය-** පෙරවිසූ කඳ පිළිවෙත-පෙර ජාති දන්නා නුවණ (ability to know one's previous existence) 5) **දිබ්බ චක්ඛු/දිවැස් (** divine eye ) දුර හෝ ලඟ ඇති දේ දැකීමට ඇති හැකියාව, කර්මයට අනුව සත්‍වයන් මරණයට පත්වීම හා යලි උපතට පැමිණීම දැකිය හැකි ඥානය.මෙය චුතඋත්පත්ති ඥාණය ලෙසින්ද දක්වයි. 6) **ආසවක්ඛය ඥානය-** සියළු ආසව - තණ්හාව ප්‍රහිනය කලබව දන්නා නුවණ -විමුක්තිය ලැබූ බව (knowledge of the destruction of all fetters). අරහත්වය ලැබීම. **සටහන්:** * 1-5 දක්වාවූ ඥානයන් ලෝකඥානවේ; ජාන සමාපත්ති සාක්ෂාත් කරගැනීමෙන් ලබාගත හැකිය. 6- ආසවක්‍ෂය කිරීමේ ඥානය ලෝකෝත්තර ඥානයකි; අරහත්වය මගින් ලැබෙන විශේෂ නුවණකි. ** 4-6 ඥානයන් තෙවිජ්ජා ලෙසින්ද හඳුන්වයි. **මූලාශ්‍ර**: දීඝ.නි: (3) 11 දසුත්තර සූත්‍රය**,** පි. 484, EDN: 34- Dasuttara Sutta: Expanding Decades, p.383.

▼ **සය අභිඥා සාක්ෂාත්කරගැනීමට ශීලසම්පන්නබව පදනම්වේ**: පිරිපුන් සිල්ඇති, පාතිමොක්‍ෂසංවරයෙන් යුතු, යහපත් හැසිරීම හා වාසය ඇති, ශික්ෂාපදයන්හි මනාව හික්මුන සංඝයාට කැමති පරිදි සය අභිඥාවන් ලබාගත හැකිබව බුදුන්වහන්සේ වදාළහ. **මූලාශ්‍ර:**ම.නි (1 ) 1.1.6 ආකඬ්ඛෙය්‍ය සූත්‍රය, පි.94, EMN:6 -Ākankheyya Sutta If a Bhikkhu Should Wish, p.99.

▼ **බුද්ධානුස්සතිය ආදී අනුසති භාවනා** වැඩීම අභිඥාව ලැබීමට හේතුවේ. **බලන්න**: අනුසති භාවනා. **මූලාශ්‍ර:** අංගු.නි:(1) :1 නිපාත: එකධම්ම පාලිය, පි.100, EAN:1: XVI: One Thing, p. 47.

▲ **සය ඉන්ද්‍රිය**: පාලි: **ඡ ඉන්ද්‍රියානි** the six faculties: සය ඉන්ද්‍රිය (සළායතන) යනු: 1) **චක්ඛු ඉන්ද්‍රිය (**eye faculty**):** ඇස හා ඇස් දොර නිසා ඇතිවන රූප ආදිය පාලනය කරන්නේ චක්ඛු ඉන්ද්‍රිය මගින්ය.**2) සෝත ඉන්ද්‍රිය** (ear faculty): කණ හා කනදොර නිසා ඇසෙන ශබ්ද ආදිය පාලනය කරන්නේ සෝත ඉන්ද්‍රිය මගින්ය **3) ඝාන ඉන්ද්‍රිය** (nose faculty): නාසය හා නාසයේ දොර නිසා දැනෙන ගඳ සුවඳ ආදිය පාලනය කරන්නේ ඝාන ඉන්ද්‍රිය මගින්ය **4) ජිව්හා ඉන්ද්‍රිය** (tongue faculty ): දිව හා දිවට දැනෙන රස ආදිය පාලනය කරන්නේ ජිව්හා ඉන්ද්‍රිය මගින්ය. **5) කායඉන්ද්‍රිය** (body faculty ) කය හා කයට දැනෙන පහස ආදිය පාලනය කරන්නේ කාය ඉන්ද්‍රිය මගින්ය **6) මන ඉන්ද්‍රිය** (mind faculty): සිත හා සිතට ඇතුළුවන සිතිවිලි පාලනය කරන්නේ මන ඉන්ද්‍රිය මගින්ය**. බලන්න**: සළායතන. **සටහන**:සංයු.නි: (4): සළායතනසංයුත්තයේ සූත්‍රයන්හි සය ඉන්ද්‍රිය විස්තරකර ඇත.

▼**සය ඉන්ද්‍රියන්ගේ ඇතිවීම, නැතිවීම, ආස්වාදය, ආදීනවය හා නිස්සරණය** යථා ලෙසින් අවබෝධ කරගන්නා පුද්ගලයා සෝතාපන්න බව ලබාගනී. අවබෝධය සහිතව උපදාන රහිතව, ආසව ක්‍ෂය කල භික්ෂුව, රහතන් වහන්සේය. **මූලාශ්‍ර:** සංයු.නි : (5-1): මහාවග්ග: ඉන්ද්‍රිය සංයුත්තය: 4.3.5 සුද්ධක සූත්‍රය හා 4.3.6 සෝතාපන්න සූත්‍රය, 4.3.7 අරහන්ත සූත්‍රය, පි. 394, ESN: Indriyasamyutta: 25.5 Simple Version & 26.6 Stream Enterer, 27.7 Arahant, p. 1952.

▼**සය ඉන්ද්‍රිය ධර්ම අනුපස්සනා කිරීම නිවන පිණිසය**: **සය ඉන්ද්‍රිය** - ඇස,කණ,නාසය,දිව,කය,මනස පිලිබඳ, අනුපස්සනාකිරීම: අනිච්ච බව, දුකබව, අනත්තබව, ක්ෂයවීම, නැතිවීම (වය), විරාගය, නිරොධය, අතහැරීම. **සය ඉන්ද්‍රිය මගින් ගන්නා බාහිර අරමුණු** -රූප,ශබ්ද, ගන්ධ,රස,ස්පර්ශ, ධර්ම පිලිබඳ අනුපස්සනා: අනිච්ච බව, දුකබව, අනත්තබව, ක්ෂයවීම, නැතිවීම (වය), විරාගය, නිරොධය, අතහැරීම. **මූලාශ්‍ර:**අංගු.නි.(6 ): 11නිපාත,සාමඤ්ඤවග්ග සූත්‍ර, පි.704, EAN:11: III Similarity p.577.

▲**සය සංඥා--** six perceptions: සයසංඥා ලෙසින් පෙන්වා ඇත්තේ සත්‍ය ඥානය - විද්‍යාවිමුක්තිය ලබාගැනීම පිණිස වැඩිය යුතු සංඥාවන්ටය: සබ්බ සංඛාරේ අනිච්ච සංඥාව, අනිච්චේ දුක්ඛ සංඥාව, දුක්ඛේ අනත්ත සංඥාව, පහාන සංඥාව, විරාග සංඥාව, නිරෝධ සංඥාව. **බලන්න**: සංඥා. **මූලාශ්‍ර**: සංයු.නි: (5-2):මහාවග්ගය:සොතාපත්ති සංයුත්ත: 11.1.3 දීඝාවු උපාසක සූත්‍රය, පි. 164, ESN:55: Sotapattisamyutta: 3.3 Dīghāvu, p, 2185.

▲ **සංයෝජන හා සංයෝජනීය ධර්මතා :** පාලි: **සඤ්ඤොජනා, සඤ්ඤොජනීයා ධම්මා** - Fetters & the things that fetter: සංයෝජන හා සංයෝජනිය ධර්ම වෙනස් වෙනස් අර්ථ ඇතිබව හා වෙනස් වෙනස් ව්‍යඤ්ජන (වාක්‍යය ප්‍රකාශය-phrase) ඇති බව මේ සූත්‍රයේ පෙන්වා ඇත: ඇස, ඇසින් දකින රූපයට සංයෝජනය නොවේ, එසේම රූප, ඇසට සංයෝජනය නොවේ. එහෙත්, මේ දෙක නිසා යම් ඡන්දරාගයක් (ආසාවක්) ඇතිවන්නේ නම් එය සංයෝජනයය. මේ පිලිබඳ දක්වා ඇති **උපමාව: සුදුගොනා හා කළු ගොනා:** සුදු ගොනෙක් හා කලු ගොනෙක් වියදණ්ඩකින් එකට ගැට ගසා ඇත. සුදුගොනා, කලු ගොනාගේ බැඳුම නොවේ, කලු ගොනා සුදු ගොනාගේ බැඳුම නොවේ. එහෙත් උන් දෙන්නා ගැටගසා ඇති වියදණ්ඩ උන්ගේ බැඳීමය. **සටහන්: *** එලෙස, සෙසු සළායතන 5 හා බාහිර අරමුණු ගැටීමෙන් ඇතිවෙන රාගය සංයෝජන ය. ** සංයෝජන යන්ට හිතකර වන ධර්මතා එනම්: රූප, වේදනා, සඥා, සංඛාර, විඥාන කෙරහි, යම් තණ්හාවක් (ඡන්ද රාගයක්) ඇතිවීම සංයෝජන යය. **බලන්න**: සංයු.නි: (3): ඛන්ධසංයුත්ත: 1.3.2.8 සංයෝජනීය සූත්‍රය, පි. 320, ESN: 22: 120.8, Things That Fetter, p. 1103. ** සංයෝජනීය ධර්මතා ලෙසින් පෙන්වා ඇත්තේ රූපය, වේදනාව, සංඥාව, සංඛාර හා විඥාන ය. මේවා කෙරේ ඇති ආශාව, තණ්හාව (ඡන්ද රාගය) සංයෝජන වේ. **මූලාශ්‍ර**: සංයු.නි: ( 4 ): සළායතන වග්ග: 7.1.1 සංයෝජන සූත්‍රය**,** පි. 546 , ESN:35: Salayathana samyutta: 41: 1. The Fetters, P. 1431. **ශබ්දකෝෂ : 1. පාසිශ**: පි.489: "**සංයොජන:** එකට බැඳීම, ඇදීම..." **2**. **BD**: p.300: "**saṃyojana**: there are 10 fetters tying beings to the wheel of existence…' **3. PTS**: p.1475: "**saṃyojana:** bond, fetters that bind man to the wheel of transmigration"

▼සංයෝජන දහය-දස සංයෝජන: **" දස ඉමානි භික්ඛවෙ සංයොජනානි, කතමෙ දස: පඤ්චොරම්භාගියානි සංයොජනානි, පඤ්චුද්ධම්භාගියානි සංයොජනානි… කතමානි පඤ්චොරම්භාගියානි සංයොජනානි: සක්කායදිට්ඨී, විචිකිච්ඡා, සීලබ්බතපරාමාසො, කාමච්ඡන්දො,**

**බ්‍යාපාදොති......කතමානි පඤ්චුද්ධම්භාගියානි සංයොජනානි: රූපරාගො, අරූපරාගො, මානො, උද්ධච්චං, අවිජ්ජා"**

**ඕරම්භාගිය සංයෝජන** 5කි -The five lower fetters: 1) සක්කායදිට්ඨිය- personal-existence view 2) විචිකිච්ඡාව- doubt 3) සීලබ්බත පරාමාසය- wrong grasp of behavior and observances 4) කාමච්ඡන්දය- sensual desire 5) ව්‍යාපාදය- ill will.

**උද්ධම්භාගිය සංයෝජන** 5කි - the five higher fetters: 1) රූපරාග- lust for form 2) අරූපරාග- lust for the formless 3) මානය- conceit 4) උද්ධච්චය- restlessness 5) අවිජ්ජාව- ignorance. **මූලාශ්‍ර**:අංගු.නි :(6):10 නිපාත: 10.1.2.3 සංයෝජන සූත්‍රය,පි.60, EAN:10: 13.3. Fetters, p. 496.

▼ **සංයෝජන ඇතිවීමට** බලපාන කරුණු ලෙසින් මෙහිපෙන්වා ඇත්තේ සළායතන ක්‍රියාකාරිත්වය නිසා ඇතිවන ඡන්දරාගයය. **මූලාශ්‍ර:** සංයු.නි: (4 ): සළායතනවග්ග: වේදනාසංයුත්ත:යොගකඛෙමිවග්ග: 1.11.6:සංයෝජන සූත්‍රය, පි. 214, ESN: Vedanasamyutta: 109.6 Things that fetter, p. 1270.

▼**බඹසර විසීම සංයෝජන ප්‍රහාණය පිණිසය**: වෙනත් ආගම්කයන් (අන්තොටු පිරිවැජියෝ- අන්‍යතිර්තක පරිබ්‍රාජකයෝ) බුදුන් වහන්සේ වෙත බඹසර විසීමේ පරමාර්ථය කුමක්ද? යයි ඇසුවිට මෙසේ පිළිතුරු දියයුතුය යයි බුදුන් වහන්සේ තම ශ්‍රාවකයනට වදාළහ.

**"බඹසර වාසය සංයෝජන ප්‍රහාණය පිණිසය... සංයෝජන ප්‍රහාණයට ඇති මග අරියඅටමගය". මූලාශ්‍ර:**සංයු.නි**:** (5-1):මහාවග්ග: මග්ග සංයුත්ත: 1.5.2 සංයෝජන සූත්‍රය, පි.71, ESN: 45: Maggasamyutta: 42.2 The Abandoning of the Fetters, P. 1651.

▼**සංයෝජන ප්‍රහාණය**: සළායතන මගින් අල්ලාගන්නා බාහිර අරමුණු නිසා ඇතිවන විඥාණය, ස්පර්ශය හා වේදනා ආදී සියල්ල අනිච්ච බව දන්නා, දකිනා තැනැත්තාට සංයෝජන ප්‍රහීණය කර දුකින් මිදිය හැකිවේ. **මූලාශ්‍ර:** සංයු.නි : (4 ): සළායතන වග්ග: 1.6.2 හා 1.6.3 සංයෝජන පහාන සූත්‍ර**,** පි. 96, ESN: 35: Salayathanasamyutta: Ignorance: 54.2 & 55.3 Abandoning Fetters, P. 1234.

▼**කායගතා සතිය වඩාගැනීමෙන්**, විපුල කරගැනීමෙන් සංයෝජන ප්‍රහීණය වේ යයි බුදුන් වහන්සේ වදාළහ. **බලන්න**: කායාගතා සතියේ ප්‍රතිලාභ. **මූලාශ්‍ර:** අංගු.නි: (1): 1 නිපාත: කායගතාසති වග්ග සූත්‍ර, පි. 125, EAN:1: Mindfulness Directed to the Body, p.52.

▼**සංයෝජන පිළිබඳව බලන ආකාර 2** කි: **1) ආස්වාදය ඇතිකරන දේ පිළිබඳව ආවර්ජනය කිරීම** නිසා සංයෝජන ඇතිවේ. (Contemplation of gratification in things that can fetter). එලෙස කටයුතු කරන පුද්ගලායා, රාගය දෝසය හා මෝහය පහකර ගෙන නැත. ඒවා පහ නොකර ගැනීම නිසා ඔහු සසර දුකින්- ජාති ජරා මරණ සෝක වැලපීම්... ආදිවූ මහා දුකින් මිදී නැත. 2) **සංයෝජන ඇති කරන දේ පිළිබඳව කලකිරීම** - නිබ්ද්දාවට පත්වන පුද්ගලයා (One who dwells contemplating disenchantment in things that can fetter) රාගය

දෝසය හා මෝහය පහකර ඇත. ඒ නිසා ඕහු සසර දුකින්- ජාති ජරා මරණ සෝක වැලපීම්... ආදියෙන් මිදී ඇත. **මූලාශ්‍ර:** අංගු.නි: (1): 2 නිපාත: 2.1.1.6 සංයෝජනිය සූත්‍රය**,** පි. 133, EAN: 2: 6.6 Fetter, p. 56.

▼**සංයෝජන හේතුවෙන්** සත්වයෝ දීර්ඝ කාලයක් සසරේ හැසිරේ. එම සංයෝජන අතුරින් තණ්හා සංයෝජනය (බොහෝ දුක් ආදීනව ඇති කරයි. තණ්හාව, පහකළවිට, සසර දුකින් මිදේ. **සටහන**: තණ්හාව පුරුෂයාගේ සහායිකාව ලෙසින් පෙන්වා ඇත. **මූලාශ්‍ර: :** ඛු.නි: ඉතිවුත්තක: 1.2.5 තණ්හා සංයෝජන සූත්‍රය.

**සර**

▲ **සරඤජිත දේවසභාව-**Saranjitha Deva: බුදුන් වහන්සේ වැඩසිටි සමයේ සමහර අන්‍යආගමිකයන්, යුද්ධ කරන භට පිරිස මරණින් මතු සරඤජිත දේවසභාවේ යළි උපත ලබන්නේය යනමතයදැරුහ. ඒ මතය වැරදි බව බුදුන් වහන්සේ වදාළහ, **බලන්න**: සුගතිය. **මූලාශ්‍ර:** සංයු.නි: (4) සළායතනවග්ග:ගාමිණිසංයුත්ත:8.1.3, 8.1.4 , 8.1.5 සූත්‍ර, පි. 588- 590.

▲ **සාරය-**Essences: සාරය යනු යම්කිසි දෙයක ඇති අගනා කොටසය. ධර්මයේ සාරයන් 4 ක් ඇත: ශීලසාරය, සමාධිසාරය, ප්‍රඥාසාරය, විමුක්තිසාරය. **මූලාශ්‍රය:**අංගු.නි: (2): 4 නිපාත: අභාවග්ග:4.3.5.10 සාරසූත්‍රය, පි.294.

▲**සර්වආකාර පරිපූර්ණ** -who is complete in all aspects: දස කරුණු වලින් සමන්විත භික්ෂුව සර්වආකාර පරිපූර්ණ යයි බුදුන් වහන්සේ වදාළහ. **සටහන:** එම කරුණු මෙහි විස්තරාත්මකව පෙන්වා ඇත. **මූලාශ්‍ර:** අංගු.නි: (6): 10 නිපාත: ආනිසංසවග්ග: 10.1.1.10 විජ්ජාසූත්‍රය, පි.52, EAN:10: 10.10 True knowledge, p. 494.

▲ **සර්වඥතා ඥානය-** Sarvannatha nanna: සර්වඥතා ඥානය, තථාගත සම්මා සම්බුදුවරුන්ට විශේෂවූ නුවණකි, සියල්ල දන්නා නුවණය. **බලන්න**: අනාවරණ ඥානය, තථාගතයන් වහන්සේ.

▲ **සර්වඥයන් වහන්සේ-**Sarvanna: බුදුන් වහන්සේ හඳුන්වන ගරු පදයකි. **බලන්න:** බුදුන් වහන්සේ.

▲ **සර්වත්‍රගාමිනීප්‍රතිපාදා ඥානය-** the ways leading everywhere: සියලු මාර්ග පිලිබඳ තථාගතයන්යට ඇති යථා අවබෝධය මේ ඥානයය. **බලන්න:** තථාගත දසබල ඥාන.

▲ **සරුගස උපමාව-** Simile of the fertile tree : ගසක, කොළඅතු මනාව වැඩුනවිට, එහි මුල් වැඬේ, මුල් වැඩුන විට ගසේ පොත්ත, හරය වැඬේ, එමගින්, ගස සරු ගසක් බවට පත්වේ. එලෙස, ඉන්ද්‍රිය සංවරය ඇතිවිට, ශීලය, සමාධිය, යථාභූත ඥානය ඇතිවී, ක්‍රම ක්‍රමයෙන් නිවන සාක්ෂාත් වන අන්දම මෙහිදී පෙන්වා ඇත. **බලන්න**: ඉන්ද්‍රිය සංවරය, උපග්‍රන්ථය:5 **මූලාශ්‍රය:** අංගු.නි: (4): 6 නිපාත:ධම්මිකවග්ග: 6.1.5.8 ඉන්ද්‍රියසංවර සූත්‍රය, පි.150.

▲ **සාරම්භය:**පාලි: **සාරම්භො** -rivalry: සාරම්භය අකුසලයකි, අනුන් පරදවා කටයුතු කිරීම, එකට එක කිරීම ලෙසින්ද පෙන්වා ඇත. **බලන්න:** උපකෙලෙස.

▼ **වෙනත් මූලාශ්‍ර: 1.** "සෑම දෙයක්ම අනුන් කළාට වඩා ඉහළින් කරන ස්වභාවය, අනුන්ට ඉහළින් සිටීමට ඇති කැමැත්ත සාරම්භ නම් වේ. මෙය මානයේ එක් ආකාරයකි. මෙය ඇතිවිට, අනුන් එකක් කරනවිට තමා දෙකක් (හෝ ඊට වැඩි ගණනක්) කිරීමට තැත් කරයි…" **කෙලෙස් එක්දහස් පන්සීය**, පි. 47, රේරුකානේ චන්දවිමල මහා නාහිමි, 2008.

▲ **සාරානීය ධර්ම සය**: පාලි: **ඡ සාරානීයා ධම්මා-** Six dhammas to be remembered: ආධ්‍යාත්මික මාර්ගය වඩන භික්ෂුවක් තුළ තිබිය යුතු ගුණ 6, සාරානීය ධර්ම සය ය. සාරානීය ධර්ම සිහියේ තබාගත යුතු, නිතර කල්පනා කලයුතු ධර්මතාවේ. මාර්ගය දියුණුකර ගැනීමට බොහෝ ආකාරයෙන් පිහිට වන නිසා මේ ධර්මතා බහු උපකාර ධර්ම ලෙසින් ද පෙන්වා ඇත. **බලන්න:** බහු උපකාර ධර්ම.

▼**සාරනිය ධර්මතා** ප්‍රියබව ඇතිකිරීම පිණිස, ගරුබව පිණිස, සංග්‍රහය පිණිස, අවිවාදය පිණිස, අවිහිංසාව පිණිස, සමගිය පිණිස, එකමුතුබව පිණිස පවතී යයි බුදුන් වහන්සේ පෙන්වා ඇත.

**"…අයම්පි ධම්මො සාරානියො පියකරණො ගරුකරණො සඞගහාය අවිවාදය  අවිහෙසාය සාමග්ගියා එකීභාවාය සංවත්ති".**

**සාරාණීය ධර්ම 6:** 1) තමන් සමග වාසය කරන අය කෙරහි ප්‍රකටව මෙන්ම අප්‍රකටව ද මෛත්‍රී සහගත කාය කර්ම යෙහි යෙදීම 2) තමන් සමග වාසය කරන අය කෙරහි ප්‍රකටව මෙන්ම අප්‍රකටව ද මෛත්‍රී සහගත වාක් කර්ම යෙහි යෙදීම 3) තමන් සමග වාසය කරන අය කෙරහි ප්‍රකටව මෙන්ම අප්‍රකටව ද මෛත්‍රී සහගත මනෝ කර්ම යෙහි යෙදීම

4) තමන්ට දැහැමි ලෙසින් ලැබුන පිණ්ඩපාතය හෝ වෙනත් ලාභයක් තමන් සමග වාසය කරන සෙසු අය හා සාධාරණව බෙදා ගැනීම 5) තමන් හා වාසය කරන සෙසු භික්ෂුන් ආරියකාන්ත ශිලය ඇතිව වාසය කරන්නේනම්, තමාද ප්‍රකටව මෙන්ම අප්‍රකටවද එබඳු ශිලයෙන් ඔවුන් හා සමාන බවට පැමිණ වාසය කිරීම 6) තමන් හා වාසය කරන සෙසු භික්ෂුන් දුක නැතිකර ගැනීම පිණිස ඇති යම් දිට්ඨියක්- පිළිවෙතක් ඇතිව වාසය කරන්නේනම්, තමාද ප්‍රකටව මෙන්ම අප්‍රකටවද එබඳු දිට්ඨියක් ඇතිව ඔවුන් හා සමාන බවට පැමිණ වාසය කිරීම. **මූලාශ්‍ර:** දීඝ.නි: (3): 10 දසුත්තර සූත්‍රය, පි.483, EDN: 34: Dasuttara Sutta: Expanding Decades, p. 384.

▲**සාරාණීය දස ධර්ම**- ten principles of cordiality: සාරාණීය දස ධර්ම ඇතිකර ගැනීම මගින් භික්ෂුව, අන්‍යයන්ට ප්‍රියවේ, ගරුසැලකිලි ලැබීමට හේතුවේ, සමගියෙන් ජීවත්වීමට හැකිවේ, විවාද කළහ ඇතිනොවේ, එකමුතුභාවයෙන් වාසය කිරීමට උපකාරිවේ යයි බුදුන් වහන්සේ පෙන්වා ඇත. **සාරාණීය දස ධර්ම**: 1) සිල්වත්බව 2) බහුශ්‍රැතබව 3) කල්‍යාන මිත්‍ර සේවනය 4) සුවච- කිකරුබව 5) තමන් හා එක්ව වෙසෙන සෙසු සංඝයා පිලිබඳ කටයුතු මනා ලෙසින් කිරීමේ හැකියාව  6) ධම්ම විනය ප්‍රිය කිරීම 7) වීරිය තිබීම 8) ලැබෙන සිව්පසයෙන් තුටුවීම 9) යහපත් සිහිය තිබීම

10) ආරිය නිවේදය-සමුදය හා වය පිලිබඳ මනා අවබෝධය තිබීම. **මූලාශ්‍ර:** අංගු.නි: (6): 10 නිපාත:10.1.5.10 භණ්ඩන සූත්‍රය, පි. 188, EAN:10: 50.10 Arguments, p.512.

▲**සැරියුත් මහා තෙර-**Sariuth Maha Thera: **බලන්න:** උපග්‍රන්ථය:1, අගසව්.

▲**සුර අසුර** -Sura Asura: සුර ලෙසින් පෙන්වා ඇත්තේ දෙවියන්ය, අසුර යනු දෙවියන්ට එදිරි, පහත් නිකායක්ය. සුර හා අසුර සටන් පිලිබඳ සූත්‍ර දේශනාවල දක්වා ඇත. **බලන්න**: දෙවියෝ, අසුර, සක්දෙවිඳු, ධජග්ග සූත්‍රය. **සටහන**: දීඝ.නි: ජනවසභ සූත්‍රයේදී, බුදුන් වහන්සේ පහළවීම නිසා අසුරයන් පිරිහීම හා දේව පිරිස වැඩිවීම විස්තර කර ඇත. **මූලාශ්‍ර**:අංගු.නි: (2) 4 නිපාත: අසුරවග්ග:4.2.5.1 අසුර සූත්‍රය, පි.196, සංයු.නි: සගාථවග්ග: සක්ඛසංයුත්ත.

▲ **සුරඅම්බට්ඨ සිටුවරයා-** Suraambattha Situ**:** **බලන්න:** උපග්‍රන්ථය:3

▲ **සුරාමේරය** – intoxication**:** සුරාමෙරය- සුරාපානය නිසා සිහිය මුළාවීමෙන් නොයක් අකුසල ක්‍රියා සිදුවේ. මෙය උප කෙළසකි, පැවිද්දන් විසින් හැරිය යුතු දෙයකි. මෙයින් වැලකීම, ආධ්‍යාත්මික දියුණුව සලසන නිසා, බෞද්ධයන් ඉන් වැලකීමේ ශික්ෂා පද: පන්සිල්, අටසිල්, දස්සිල් ලෙසින් රකිති. **බලන්න**: ශීලය, උපකෙළෙස. **මූලාශ්‍ර:** අංගු.නි: (2): 4 නිපාත: 4.1.5.10 උපකෙලෙස් සූත්‍රය, **පි**. 124, EAN:4: 50.10 Defilements, p. 168.

▲ **සූර්යා**- sun: සූර්යා නම්, දිවාකල ලෝකයට ආලෝකය දෙන හිරුය, හිරුදෙව්පුත් (සූර්ය දිව්‍යරාජ) ලෙසින්ද පෙන්වා ඇත. එක් සමයක හිරු, රාහු නම් අසුරයා විසින් යටපත් කරගත් අවසථාවේ, බුදුන් වහන්සේගෙන් ආරක්ෂාව පැතිය. හිරු බුදුන් සරණ ගිය දෙවියෙක් නිසා ඔහු රාහුගේ ග්‍රහණයෙන් මුදාහරින්න යයි බුදුන් වහන්සේ වදාළහ. එසේ නොකොළොත් තම හිස සත් කඩකට පැළෙන බව දන්නා, රාහු, හිරු මුදාහැරියේය. **බලන්න:** හිස සත්කඩකට පැලීම. **සටහන:** සූර්යඅභා (හිරු රශ්මිය), ලෝකය බබලන ආලෝක 4න් එකකි. **බලන්න:** අභා. **මූලාශ්‍ර**:සංයු.නි: (1): සගාථවග්ග: දේවපුත්‍ර සංයුත්ත: 2.1.9 චන්දිම සූත්‍රය, පි. 119 , ESN:2: Devaputtasamyutta: 9.9 Chandima, p. 178.

▼ **දිවාකල සූර්ය ආලෝකය අග්‍රය**: සරත් ඍතුවේ, වලාකුළු නැති, වැස්ස නැති අහසේ ඇති ආලෝකය, සියලු අඳුර නසා බැබලේ, ඒ නිසා සූර්ය ආලෝකය අග්‍රය. **මූලාශ්‍ර:** සංයු.නි: (5-1): මහාවග්ග: මග්ගසංයුත්ත: අප්පමාදවග්ග: 1.13සුරිය සූත්‍රය, පි.130,ESN: 45: Maggasamyutta: XIII: Diligence: 147.9 : The Sun, p. 1688.

▲ **සොරකම-**Stealing: සොරකම්කිරීම, අදත්තා දානය ලෙසින්ද පෙන්වා ඇත. අනුන්ගේ දේ සොරසිතින් ගැනීම අකුසලයකි, දස අකුසලයන්ගෙන් එකකි, දුගතිය ඇතිකරයි. ලෝකසම්මතයට අනුව අනුන්ගේ දේ සොරාගැනීම දඬුවම් ලැබීමට හේතුවන අපරාධයකි. **බලන්න**:අදත්තාදානය.

▼**සොරකම නිසා කර්ම සිව්ආකාරයකට රැස්වේ:** 1) තමන් සොරකමේ යෙදීම : 2) අනුන්ලවා සොරකම්කරවීම 3) සොරකම අනුමත කිරීම 4)

සොරකම වර්ණනා කිරීම. **මූලාශ්‍රය:** අං:ගු:නි: (2): 4 නිපාත: කම්ම පථවග්ග: 4.7.2 අදින්නාදාන සූත්‍රය.

▲**සොරකම් කිරීමේ දඬුවම් උපමාව-** Simile of punishments for stealing: සොරකම් කිරීම නිසා රජතුමා ඉදිරියට පමුණුවන ලද සොරෙකුට බොහෝ දඬුවම් විඳීමට සිදුවේ. එම උපමාව යොදාගනිමින් බුදුන් වහන්සේ පෙන්වා ඇත්තේ, විඥාන ආහාර නිසා විඳීමට සිදුවන දුක් වේදනා අපමණ බවය. **බලන්න:** සිව් ආහාර. **මූලාශ්‍ර :**සංයු.නි: (2): නිදානවග්ග: අභිසමය සංයුත්ත: 1.7.3 පුත්තමංස සූත්‍රය, පි. 174, ESN: 13 :  Abhisamyasamyutta: 63.3 Son’s Flesh, p. 697.

▲ **සොරුන්ගේ ස්වභාවය -**Nature of thieves: එක් සමයක ජානුස්සෝනි බ්‍රාහ්මණ විසින් විමසානු ලැබුව බුදුන් වහන්සේ සොරුන් ගැන මෙසේ පවසා ඇත: “ඔවුන්ගේ අභිප්‍රාය (අරමුණ-aim) නම් සොරකමය-ආදානයය.ඔවුන්ගේ සෙවීම (quest) මුවාවූ තැන- රහස් තැන්ය, ඔවුන්ට ඇති ආධරය උපායශීලිබවය, ඔවුන්ගේ කැමැත්ත අන්ධකාරයය, ඔවුන්ගේ අවසාන ඉලක්කය හසුනොවී සැඟවීසිටීමය”. **මූලාශ්‍රය:** අංගු.නි: (4): 6 නිපාත:ධම්මිකවග්ග: 6.1.5.10 ඛත්තිය සූත්‍රය, පි.154.

**සල**

▲ **සල්ගස් උපමාව-** Simile of Sala trees**:** උපෝසථ අටසිල් රැකීමේ යහපත පෙන්වා දීම පිණිස මේ උපමාව යොදාගෙන ඇත.

“ ...මේ සල් ගස් වලට සිතක් ඇතිව, උපෝසථ අටසිල් යහපත් ලෙසින් රැකීමට නියම කරගන්නේ නම් එය, මේ ගස් වලට දිගුකලක් හිත සුව පිණිස වේ. එසේනම්, (අටසිල් ගැනීමෙන් මිනිසුන්ට වන යහපත ගැන) මිනිසුන් ගැන කවර කතාද.” **බලන්න:** අටසිල්. **මූලාශ්‍ර:** අංගු.නි: (5 ): 8 නිපාත:8.1.5.4. වාසෙට්ඨ උපෝසථ සූත්‍රය, පි.212. EAN: 8: 44.4 Vāseṭṭha p. 434.

▲ **සල්ලාල හැසිරීම-** Indulgence in sensual pleasures**:** සල්ලාල හැසිරීම යනු රාගෙයන් මත්ව, දුස්සීල ලෙස හැසිරීමය. එම හැසිරීම, ධනය ආදී සම්පත් විනාශවීමට හේතුවේ. **බලන්න:** ගිහිජීවිතය යහපත්ව ගතකිරීම.

▲ **සල්ලේඛ පරියාය**: **පාලි: සලෙලඛ පරියායං** -modes of effacement of defilements: ධර්මයේ සල්ලේඛ පරියාය ලෙසින් පෙන්වා ඇත්තේ ආධ්‍යාත්මික වර්ධනය ට හානිකරන කෙළෙස් -අකුසල් නැතිකර ගැනීමේ ක්‍රමය- පටිපදාවය. **ශබ්දකෝෂ: ප.සිං.ශ**: : පි.514: “**සලෙලඛ**: කෙළෙස් සිඳීම, නැසීම, තුනී කිරීම”

▼**ආරිය විනයේ සල්ලේඛ පරියාය**: බුදුන් වහන්සේ කෙළෙස් - අකුසල ඇති කරන කරුණු 44 ක් පෙන්වා, උපදෙස් දී ඇත්තේ, අන් අය ඒවා යේ යෙදුනත්, ආරිය විනය අනුගමනය කරන අය, ඒ කෙළෙස් නොකර සිටිමට පුරුදු පුහුණු කලයුතු බවය:

**“වෙනත් අය හිංසා කටයුතු කරති, අපි ඒවායින් වැලකී අවිහිංසා වෙන් සිටීමට පුහුණුවෙමු”**

**පහ කරගතයුතු කෙළෙස් 44 හා පුහුණු කර ගත යුතු ගුණ 44:** 1) **අනුන්ට හිංසාකිරීම** (පරෙ විහිංසකා: cruel-harmful ) - **අවිහිංසාව** (විහිංසකා- non-cruelty) 2) **පරපණ නැසීම** (පාණාතිපාතා-killing living beings) - **පරපණ නොනැසීම (**පාණාතිපාතා පටිවිරතා- abstain from killing) 3) **සොරකම** (අදින්නාදානා-stealing)- **සොරකම් නොකිරීම** (අදින්නාදානා පටිවිරතා- abstain from stealing) 4) **අබ්‍රහ්මචරියාව**-අබ්‍රහමචාරී- un-celibate)- බ්‍රහ්මචරියාව (බ්‍රහමචාරී- celibate) 5) **බොරුකීම** (මුසාවදා- speak falsehood)- **බොරුනොකීම** (මුසාවදා පටිවිරතා- abstain from false speech) 6) **කේලාම්කීම**(පිසුණාවාචා- malicious speech) - **කේලාම්නොකීම** (පිසුණාවාචා පටිවිරතා -abstain from malicious speech) 7) **පරුෂ වචන කීම (**ඵරුසාවාචා- harsh speech)- **පරුෂ වචන නොකීම** (ඵරුසාවාචා පටිවිරතා- abstain from harsh speech) 8) **හිස්වචන කීම** (සම්ඵප්පලාපා-gossip) - **හිස්වචන නොකීම** (සම්ඵප්පලාපා පටිවිරතා -abstain from gossip) 9) **අබිජ්ජාව**: දැඩි ලෝභය (අභිජ්ඣා- covetous)- **අනබිජ්ජාව**: නිර්ලෝභීබව (අනභිජ්ඣා- uncovetous) 10) **ව්‍යාපාදය** (බ්‍යාපන්නචිත්තා- ill-will) - **අව්‍යාපාදය** (අබ්‍යාපන්නචිත්තා- without ill will) 11-20) **මිථ්‍යා දිට්ඨිය සිට මිථ්‍යා විමුක්තිය**, එනම් වැරදිමග - **සම්මා දිට්ඨිය සිට සම්මා විමුක්තිය** එනම් නිවැරදි මග. 21) **ථිනමිද්ධය** සහිතබව: අලසබව (ථීනමිද්ධපරියුට්ඨිතා- overcome by sloth and torpor)- **පහවූ ථිනමිද්ධය** (විගතථීනමිද්ධා- free from sloth and torpor) 22 **උද්දච්චය**: සසල සිත (උද්ධතා- restless) -**පහවූ උද්දච්චය:** නිසල සිත (අනුද්ධතා- free from restlessness) 23) **විචිකිච්චාව**: සැකය (විචිකිච්ඡා- doubt)- **පහවූ විචිකිච්චාව** (තිණ්ණවිචිකිච්ඡා- free from doubt) 24) **ක්‍රෝධය**: තරහ (කොධනා- angry) - **අක්‍රෝධය** (අක්කොධනා-without anger ) 25) **අමනාප**: නුරුස්සන බව ( උපනාහ- resentful) **මනාප:**රුචිබව (අනුපනාහ- without resent) 26) **ගුණමකුබව (**මක්ඛ- contempt) - **ගුණමකුබව නොවන බව** (අමක්ඛ- without contempt) 27) **අහංකාරය** (පළාස - insolent) - **නිරහංකාර(අපළාස- without insolent) (28) ඉරිසියාව (ඉස්සා -envious) - ඉරිසියාව නැති බව (අනිස්සා- none-envious) 29) මසුරුබව (මච්ඡරී- avaricious)- නොමසුරු බව(අමච්ඡරී- none -avaricious)** 30) **කපටි:** කූට (සඨා- fraudulent) - **කපටි නොවන (**අසඨා- none- fraudulent) 31) රැවටීම (මායාවී- deceitful) -**නොරැවටීම (**අමායාවී -none- deceitful) 32) **මුරණ්ඩුබව**: තදගතිය (ථද්ධා- obstinate) - **මුරණ්ඩු නැතිබව**: මුදු (අත්ථද්ධා - without obstinate) 33) **අධිමානය**: අතිමාන (අතිමානි-arrogant) - **නිහතමානි** (අනතිමානි**-** none-arrogant) 34) අකීකරු (දුබ්බාචා- difficult to admonish)- **කීකරු:** සුවච (සුබ්බාචා-easy to admonish) 35) **පාප මිත්‍ර සේවනය (**පාපමිත්තා- have bad friends) - **කලණ මිත්‍ර සේවනය** (කල්‍යාන මිත්තා- have good friends) 36**)** **ප්‍රමාදවීම** (පමත්තා- negligent)- **අප්‍රමාදවීම (** අප්පමත්තා- diligent) 37) **අශ්‍රද්ධාව** (අස්සද්ධා- faithless)- **ශ්‍රද්ධාව (**සද්ධා- faithful) 38-39) **හිරි ඔතප් නැතිබව** (අහිරික අනොත්තාපි- shameless & no fear of wrongdoing) - **හිරි ඔතප් ඇතිබව (** හිරි ඔත්තාපි- shameful & afraid of wrongdoing) 40) **අල්පශ්‍රැත (**අප්පස්සුතා- little learning)- **බහුශ්‍රැත** (බහුස්සුතා- great learning) 41) **කුසිතබව**: ආරම්භ විරිය නැතිබව (කුසීතා -lazy) - **කුසිත**

**නැති බව (**ආරද්ධාවිරියා- energetic) 42) **සතිය නැතිබව** (මුට්ඨස්සති- unmindful) - **සතිසම්පන්න** ( උපට්ඨිතසති-mindful) 43) **අනුවණබව** : බාල (දුප්පඤ්ඤා- lack of wisdom) - **නුවණැතිබව-** පණ්ඩිත (පඤ්ඤා සම්පන්නා- possess wisdom) 44) **ස්ව දිට්ඨිය තදින් ගෙන සිටීම** (සන්දිට්ඨිපරාමාසී - adhere to their own views ) - දිට්ඨී හැර දැමිය හැකි බව (අසන්දිට්ඨිපරාමාසී- relinquish their own views easily). **මූලාශ්‍ර:** ම.නි: (1): 1.1.8 සල්ලේඛ සූත්‍රය, පි. 112, EMN: 8. Sallekha Sutta- Effacement, p.108.

▲**සල්ලේඛට්ඨ ඤාණය-**Sallekhatta nana: රාග, ද්වේශය, මෝහය, ක්‍රෝධය, බද්ධවෛරය (උපනාහ), ගුණමකුබව (මක්ඛ), යුගග්‍රාහ (පළාස), ඉරිසියාව, මසුරුකම, මායාව, සටකපටබව, සිත ඉදිමුනුබව (ස්ථම්භ) , සාරම්භ, මානය, අතිමානය, මදය, ප්‍රමාදය යන සියලු කෙලෙස්, දුශ්චරිත , සියලු අභිසංඛාර, සියලු භවගාමි කර්ම ආදීය ක්ෂය කිරීමේ ප්‍රඥාව, සල්ලේඛට්ඨ ඤාණය වේ. **බලන්න**:සල්ලේඛපරියාය. **මූලාශ්‍රය:** ඛු.නි: පටිසම්භිදා 1: 37 සල්ලේඛට්ඨ ඤාණය, පි.216.

▲ **සීලබ්බත පරාමාස:** පාලි: **සීලබ්බතපරාමාසං** - wrong grasp of behavior and observances: ධර්මයට අනුව සීලබ්බත පරාමාස යනු, නිවන ලබාගැනීමට හැකිවේය යි සිතා, බුද්ධ දේශනාවන්ට අනුකූල නොවන වැරදි සීල හා ව්‍රත සමාදන්වීමය, අනුගමනය කිරීමය. මෙය දස සංයෝජනයන්ගෙන් එකකි, උපාදානයකි, සෝතාපන්න බව ලැබීමට පහකර ගතයුතු කෙලෙසකි.**බලන්න:** සෝතාපන්න.**ශබ්දකෝෂ:පා.සිං.ශ:** පි. 525: **"සීලබ්බත**: ශිල හා ව්‍රත". **B.D**. p.171: **"Sīlabbata-parāmasā:** Attachment or clinging to mere Rules & Rituals, is the 3rd of the 10 fetters and one of the 4 kinds of clinging. It disappears on attaining to Stream-entry.

▼**සීලබ්බත පරාමාස ඇතිවීමට** අකුසල මූල හේතුවේ (රාග දෝස මෝහ). කෙනෙක් යෝනිසෝ මනසිකාරයෙන් කටයුතු කරන්නේනම්, නිවැරදි මග අනුගමනය කරන්නේනම්, සිතේ මැලිකම පහකරගත්විට සීලබ්බත පරාමාස ප්‍රහීණය කරගත හැකිය. **මූලාශ්‍ර:**අංගු.නි: (6 කාණ්ඩය):10 නිපාත: 10.2.3.6 තයෝධම්ම සූත්‍රය,පි.284, EAN:10: Tens,76-6.Incapable, p. 524.

▼ **වැරදි ශිල හා ව්‍රත** නිසා අයහපත් කම්ම සකස්වීම හා ඒ නිසා දුගතියක යළි උපත ලැබීමට සිදුවන බව මෙහිදී බුදුන් වහන්සේ පෙන්වා ඇත. **සටහන:** කෝලිය රටේ වාසය කල ගෝව්‍රතය දරන කෝලිය පුත්‍ර පුණ්ණ (the ox-duty ascetic) හා බලුව්‍රතය දරන නිගණ්ඨ සේනිය (Seniya, a naked dog-duty ascetic) යන දෙදනා බුදුන් වහන්සේ හමුවට පැමිණ ඔවුන් සමාදන් වී ඇති ව්‍රත ගැන පවසා ඔවුන්ගේ මතු උපත ගැන ඇසීම මේ සූත්‍රය දේශනා කිරීමට මුලිකවිය. ඒ ව්‍රත පිළිබඳව මෙහි විස්තරාත්මකව දක්වා ඇත. දේශනය අවසානයේදී කෝලිය පුත්‍ර පුණ්ණ බුදුන් සරණ ගිය උපසකයෙක් විය, නිගණ්ඨ සේනිය, බුදුන් වහන්සේ වෙත පැවිදිව නිවන අවබෝධ කරගත්හ. **බලන්න**: උපග්‍රන්ථය:1,3 **මූලාශ්‍ර:** ම.නි: (2): 2.1.7 කුක්කුරවතිය සූත්‍රය, පි.100, EMN: 57: Kukkuravatika Sutta, p.466.

▲ **සිල්වතා හා දුසිල්වතා**:පාලි:**සීලවතො, දුස්සීලස්ස** - virtuous person & immoral person: ධර්මයේ සිල්වතා ලෙසින් පෙන්වා ඇත්තේ යම් ශීලයක් සමාදන්ව එය යහපත් ලෙස රකින පුද්ගලයාය, සදාචාරාත්මක පුද්ගලයාය. සුසිල්වතා ලෙසින් ද හඳුන්වයි. දුසිල්වතා යනු සදාචාරය නොමැති, අයහපත් ගුණ ඇති, සීලයක් නොරකින පුද්ගලයාය. දුශ්ශීලයා ලෙසින්ද දක්වයි. **බලන්න**: ශීලය.

▼**සිල්වතා** මරණින් මතු දෙව්ලොව හෝ මිනිස්ලොව - සුගතියක යලි උපත ලබන බව බුදුන් වහන්සේ පෙන්වා ඇත. දුස්සීල පුද්ගලයෝ මරණින් මතු දුගතියේ: නිරයේ හෝ තිරිසන් ලෝකයේ උපත ලබති.: **මූලාශ්‍ර:** අංගු.නි: (1 ): 2 නිපාත: 2.1.2.3.9 සූත්‍රය, පි. 157, EAN: 2: 29.9 Sutta, p.60.

▼ **බුදුන් වහන්සේ** පෙන්වා ඇත්තේ සිල්වතා, නිවන් මග සාක්ෂාත් කරගන්නා බවය. සිල්වතාට තමාගේ, පරිපූර්ණ ශීලය නිසා පසුතැවීම නැතිවේ (no non-regret), එමනිසා සිතේ ප්‍රමෝදය (joy) ඇතිවේ. ප්‍රමෝදමත් සිත ප්‍රීතියට (rapture) පත්වේ, එමගින් සිතේ පස්සදිය (ශාන්තබව- tranquility) ඇතිවේ. සිත ශාන්තවූ විට සුවය ඇතිවේ. සුවපත් සිත සමාධිය ලබාගැනීමට පිහිටවෙ. සම්මා සමාධිය ඇතිවීම නිසා යථාභූත ඥාන දර්ශනය පහලවේ. එලෙස, මාර්ගය දියුණු කරගන්නා ඔහු, අනුක්‍රමයෙන් නිබ්ද්දාව, විරාගය ලබා, විමුක්ති ඥාන දර්ශනය සාක්ෂාත් කරගෙන නිවන්සුව අත්පත් කරගනි. බුදුන් වහන්සේ සිල්වතා උපමා කලේ හොඳින් කොළ අතු ඇති ගසක් ලෙසටය.**මහාරුක උපමාව.** එවැනි ගසේ මුලද, පොත්තද, අරටුවද සම්පූර්ණනිසා, එම ගස මහා රුකක් වේ. යහපත් ශීලයක් නොමැති දුසිල්වතාට මාර්ග අංග සම්පූර්ණ කරගැනීමට නොහැකි නිසා ඔහු නිවනට දුරය. බුදුන් වහන්සේ දුසිල්වතා උපමා කලේ කොළ අතු නැති ගසක් ලෙසින්ය. **දුබල රුක උපමාව**, එබඳු ගසක මුලද, පොත්තද, අරටුවද නොවැඩි ඇති නිසා එම ගස කිසිවිටක මහා රුකක් වන්නේ නැත. **බලන්න**: උපග්‍රන්ථය:5. **මූලාශ්‍ර**: අංගු.නි:(6):11 නිපාත:11.1.3.පඨම උපනිස සූත්‍රය,11.1.4 දුතිය උපනිස සූත්‍රය,11.1.5 තතිය උපනිස සූත්‍රය, පි.618-621, EAN:11: I Dependence, 3.3 & 3.4 & 3.5. Proximate Cause, p.567.

▼**දුසිල්වතාට,** අරියන් දැකීමේ අකමැත්ත, අරිය දහම් ඇසීමට ප්‍රියනොකිරීම, හා විවේචනයට නැමුණු සිත, යන අකුසල ඇති නිසා දහම් මග දියුණු කරගැනීම හැකිනොවේ. එහෙත්, සිල්වතාට, එම අගුණ පහකර ගැනීමට හැකිවේ. **මූලාශ්‍ර**: අංගු.නි:(6 ):10 නිපාත: 10.2.3.6. තයෝධම්ම සූත්‍රය,පි.284, EAN, 10: 76-6. Incapable, p. 524.

▲ **සුලද්ධ ලාභය**-Suladda labha: සුලද්ධ ලාභය ලෙසින් පෙන්වා ඇත්තේ ත්‍රිවිධ රත්නය ගැන යහපත් ලෙසින් ශ්‍රද්ධාව ඇතිකර ගැනීමය. එමගින් මාර්ගය වඩා ගත හැකිවේ. දෙව්ලොවින් චුතවන දෙවියෙක්හට, සෙසු දේවියන් දෙන අවවාදයකි. **බලන්න**: සුගතිගමන.

**සළ**

▲ **සළායතන:**පාලි: **සළායතනනං** - six sense bases: ධර්මයේ සළායතන: අභ්‍යන්තර ආයතන (ඡ අජ්ඣත්තිකානි ආයතනානි- six internal bases) ලෙසින් දක්වා ඇත. සය ෂඩායතන, සය ආයතන, සය

ඉන්ද්‍රිය, ආධ්‍යාත්මික ආයතන 6 ලෙසින්ද හඳුන්වයි. බුදුන් වහන්සේ, ආධ්‍යාත්මික වර්ධනය පිණිස පිරිසිඳ (පරිඥෙය්‍යා) ව අවබෝධ කර ගත යුතු ධර්මතාවයන් ලෙසින් සළායතන පෙන්වා ඇත.**බලන්න**: පරිඥෙය්‍යා ධර්ම. සළායතන ක්‍රියාකාරීවීමනිසා ඇතිවෙන සුව දුක් වේදනා නිසා කර්ම සකස් වීම පෙන්වා දීම පිණිස **අත් පා උපමාව**-(The Simile of Hands and Feet) යොදාගෙන ඇත. මේ උපමාව යොදාගෙන ඇත්තේ, සය ඉන්ද්‍රිය ක්‍රියාකාරීවීම නිසා ස්පර්ශය ඇතිවීම, ඒ නිසා ඇතිවන වේදනා නිසා කර්ම සකස්වීම පෙන්වීමටය. අත් ඇතිවිට ගැනීම හා බහාතැබීමට පුරුදුවේ, පා ඇති කල්හි යෑම ඒම සිදුවේ. පුරුක් (සන්ධි) ඇති කල්හි හැකිලීම දිග හැරීම සිදුවේ. කුසය ඇති කල සාගින්න හා පිපාසය ඇතිවේ. එලෙස සය ඉන්ද්‍රිය ඇති කල: ඇස නිසා ඇසේ ස්ප්ර්ශය, කණ නිසා කණේ ස්පර්ශය ... ආදී වශයෙන් ඉන්ද්‍රිය ක්‍රියාකිරීම නිසා සුව දුක් ඇතිවේ. යම්හෙයකින්, අත් පා ආදී ශරීර අවයව නැත්නම්, ගැනීම බහාතැබීම ආදී ක්‍රියා සිදු නොවේ.එලෙස ඇස නැති කල- ඇස මගින් බාහිර අරමුණු අල්ලා නොගන්නා විට ස්පර්ශය-පහස ඇතිනොවේ, සුව දුක් ඇතිනොවේ. (එලෙස සෙසු ඉන්ද්‍රියන් පිළිබඳවද...). **මූලාශ්‍ර**: සංයු.නි: (4) වේදනාසංයුත්ත: සමුද්දවග්ග: 1.18.9 හ 1.18.10 සූත්‍ර, පි.362, ESN: 35: Salayathnanasamyutta: 236.9 & 10 suttas, p.1313.

▼**සළායතන, පටිච්චසමුප්පාදයේ 5 නි පුරුකය**: නාමරූප හේතුකොට සළායතන ඇතිවේ, නාමරූප නිරෝධ වීමෙන් සළායතන නිරොධවේ.

**"...නාමරූප පච්චයා සළායතනං..."**
**"...නාමරූප නිරොධා සළායතන නිරොධො..."**

සළායතන නිසා ස්පර්ශය ඇතිවේ, සළායතන නිරෝධ වීමෙන් ස්පර්ශය නිරෝධ වේ.

**සළායතන නම්:** චක්ඛු ආයතනය, සොත ආයතනය, ඝාණ ආයතනය, ජිව්හා ආයතනය, කායආයතනය, මන ආයතනය (චක්ඛායතනං , සොතායතනං , ඝාණායතනං ,ජිව්හායතනං කායායතනං, මනායතනං (the eye-base, the ear-base, the nose-base, the tongue-base, the body-base, and the mind base). **මූලාශ්‍ර:** සංයු.නි: (2 ): නිදාන වග්ග: 1.1.1 පටිච්චසමුප්පාද සූත්‍රය හා 1.1.2 විභඞග සූත්‍රය, පි.24, ESN:12: Nidanavagga: 1.1. Dependent Origination & 1 2.2 Analysis of Dependent Origination, p.610, ම.නි: (1): 1.1.9 සම්මා දිට්ඨි සූත්‍රය, පි. 130, EMN: 9: Sammādiṭṭhi Sutta- Right View, p. 121.

▼**සළායතන පිළිබඳව මනා අවබෝධය ලබා ගැනීම**: සළායතන පිලිබඳ සම්පූර්ණ අවබෝධය ලබා ගැනීම පිණිස (විභාග කර බැලීම- සළායතන විභංග) : බාහිර ආයතන 6, සය ආකර විඥාණ, සය ආකාර ස්පර්ශය, 18 ක්වූ මනෝ උපවිචාර, 37 ක් වූ සත්ව උත්පත්ති ස්ථාන පිළිබඳව අවබෝධය තිබීම අවශ්‍යවේ. **බලන්න**: බාහිර ආයතන, විඥාණ, ස්පර්ශය, මනෝ උපවිචාර, සත්ව උත්පත්ති ස්ථාන. **මූලාශ්‍ර:** ම.නි: (3): 3.4.7 සළායතන විභඞග සූත්‍රය, පි. 474, EMN:35: 137- Saḷāyatana vibhanga Sutta - The Exposition of the Six fold Base, p. 974 .

▼**සළායතන පිලිබඳ මනා අවබෝධය පිණිස සම්මා දිට්ඨිය ඇති කර ගත යුතුවේ: මූලාශ්‍ර**: ම.නි: (1): 1.1.9 සම්මා දිට්ඨි සූත්‍රය, පි. 130, EMN: 9: Sammādiṭṭhi Sutta- Right View, p. 121.

▼ **සළායතන අවබෝධය මගින් ආරියබව ලබාගත හැකිවේ.**: ඇස ආදිවූ සළායතන 6 ම අනිත්‍යයයි දකිනා පුද්ගලයා '**සද්ධානුසාරී**' ය, ආර්ය මාර්ගයට පිවිස ඇත, සත්පුරුෂ භූමියට බැස ඇත, පෘතග්ජන බව ඉක්මවා ඇත, සෝතාපන්නය, දුගතිය නිමාකර ඇත යි බුදුන් වහන්සේ වදාළහ.ඒබව, විදසුන් නුවණින්, ජානසමාපත්ති ලබා අවබෝධ කරගන්නේ '**ධම්මානුසාරී**' ය.ඔවුන් සම්බෝධිය පිහිට කරගෙන ඇත. **මූලාශ්‍රය:**සංයු.නි: (3): ඛන්ධවග්ග: ඔක්කන්තිසංයුත්තය: චක්ඛුවග්ග සූත්‍ර, පි.470.

**සව**

▲ **සංවර ප්‍රධාන වීරිය -** Striving by restraint: සතර ප්‍රධානවිරියන් ගෙන් එකකි,අකුසල ඇතිනොවීමට විරිය කිරීමය.**බලන්න**:පධාන සතර

▲ **සංවිභාග-** Sharing: සංවිභාග යනු තමන් සතු දෙයක් කැමැත්තෙන් අන්‍යන් හා බෙදාගැනීමය. බුදුන් වහන්සේ වදාළේ ආමිෂ සංවිභාගයට (material things) වඩා ධම්ම සංවිභාගය අග්‍රබවය. **බලන්න**: අග්‍රදේ. **මූලාශ්‍ර:**ඛු.නි: ඉතිවුත්තකපාලිය: 3.5.9 දාන සූත්‍රය, පි. 480, **The Itivuttaka: 98 The Gift sutta, p. 83, Translated by Peter Masefield, PTS, 2001.**

▲**සාවද්‍ය ධර්ම- the blameworthy Dhamma**: සාවද්‍ය ධර්ම ( වැරදි ධම්ම) ලෙසින් පෙන්වා ඇත්තේ වැරදිමග ගැනීමය. සම්මා දිට්ඨිය නැතිවිට සාවද්‍ය ධර්මය ඇතිවේ. **බලන්න:** අනවද්‍ය ධර්ම හා සාවද්‍ය ධර්ම.

▲ **ස්වර්ගය-**Heaven: ස්වර්ගය යලි උපත ඇතිවෙන සුගතියකි, ලබාගැනීමට දුර්ලභ ධර්මයකි. මෙලොවදී වැරදි මග ගැනීම, ස්වර්ගය ලබාගැනීමට බාධාවකි. **බලන්න**: ඉෂ්ඨධම්ම: **මූලාශ්‍රය**: අංගු.නි: (6) 10 නිපාත:10.2.8.3 ඉෂ්ඨධම්ම සූත්‍රය, පි.270,EAN:10: 73.3 Wished for, p.522.

▲ **සෙවිතබ්බ පුද්ගලයෝ-**Sevithabba puggala: සෙවිතබ්බ ලෙසින් පෙන්වා ඇත්තේ ආශ්‍රයය-භජනයය. ධර්ම මාර්ගයේ ගමන් කරනවිට ආශ්‍රය කලයුතුවන්නේ සම්මා දිට්ඨිය පෙරටුකරගත් නිවැරදි මග ගත් පුද්ගලයන්ය. වැරදිමග ගත් පුද්ගලයෝ ආශ්‍රය නො කලයුතුය. **මූලාශ්‍රය:** අංගු.නි: (6): 10 නිපාත:පුග්ගල වග්ග: 10.4.1.1.සෙවිතබ්බ සූත්‍රය, පි. 480.

▼**සේවනය කලයුතු පුද්ගලයන් 2ක්** මෙහි පෙන්වා ඇත: 1) ශිල සමාධි ප්‍රඥා සම්පන්න පුද්ගලයා. 2) තමන්ට වඩා වැඩිදියුණු කරගත්, ශිල සමාධි ප්‍රඥා සම්පන්න පුද්ගලයා. මොහු ගරුකර සේවනය කලයුතුවේ. එම පුද්ගලයන් දෙදෙනා භජනය කිරීම් නිසා කෙනෙක්ගේ ධර්ම මාර්ගය දියුණුවේ. **බලන්න:** නසෙවිතබ්බධම්ම. **මූලාශ්‍රය:** අංගු.නි: (1) 3 නිපාත: 3.1.3.6 සූත්‍රය, පි.270.

▲**සෙවියයුතු ධර්මය හා නොසෙවියයුතු ධර්මය:** පාලි: ආසෙවිතබබ- නසෙවිතබබ- the Dhamma to be pursued and the Dhamma not to be pursued: ආධ්‍යාත්මික ජීවිතයේදී සෙවියයුතු ධර්මය සම්මා දිට්ඨිය සහිත නිවැරදි මග බව බුදුන්වහන්සේ පෙන්වා ඇත. නොසෙවියයුතු ධර්මය නම් වැරදි මගය. **මූලාශ්‍ර:** අංගු.නි (6): 10 නිපාතය:අරියවග්ග: 10.3.5.6 ආසෙවිතබ්බ සූත්‍රය, පි. 476, EAN:10: Noble , p. 548.

▲ **සේවනය කලයුතු පුද්ගලයෝ-**People to be associated with: ධර්ම මාර්ගයේ ගමන් කරනවිට සම්මා දිට්ඨිය ඇති නිවැරදි මග ගන්නා පුද්ගලයන් පමණක් ඇසුරු කළයුතුය, වැරදිමග ගන්නා පුද්ගලයන් නො ඇසුරු කිරීම යහපත්වේ: 1) ආශ්‍රය පිණිස-සේවනය කිරීමට හා නොකිරීමට (**සෙවිතබ්බො- න සෙවිතබ්බො**) 2) එක්ව වාසය කිරීමට හා නොකිරීමට (**භජිතබ්බො- න භජිතබ්බො**) 3) උවැටන් කිරීමට හා නොකිරීමට (**පයිරුපාසිතබ්බො- න පයිරුපාසිතබ්බො**) 4) පුජා කිරීමට (පුද සැලකිලි) හා නොකිරීමට (**පුජ්ජො හොති- න පුජ්ජො හොති**) 5) ප්‍රසංසා කිරීමට හා නොකිරීමට (**පාසංසො හොති- න පාසංසො හොති**) 6) ගෞරව කිරීමට හා නොකිරීමට (**සගාරවො හොති- අගාරවො හොති**) 7) වැදගත් ලෙසින් සැලකීමට හා එසේ නොකිරීමට (**සප්පතිස්සො හොති- අප්පතිස්සො හොති**). **සටහන**: නිවැරදි මග ගන්නා පුද්ගලයෝ සාර්ථකබව ලබයි, පාරිසුද්ධිය ලබයි, මානයෙන් මිදේ, ප්‍රඥාව වර්ධනය කරගනී, බොහෝ කුසල රැස්කරගනී. වැරදි මග ගත්විට එම කරුණු ඇතිනොවේ යයි මේ සූත්‍රයේ පෙන්වා ඇත. **මූලාශ්‍ර:** අංගු.නි: (6 ): 10 නිපාත: පුග්ගලවග්ග: සූත්‍ර, පි.480, EAN: 10: I Persons: p. 549.

▲ **සුවය හා සොම්නස**- happiness and joy: සුවය හා සොම්නස යනු මානසික සතුටින් වාසය කිරීමය.මේ ජීවිතයේදීම ලබා ගත හැකි සුවය හා සොම්නස ලෙසින් බුදුන් වහන්සේ පෙන්වා ඇත්තේ ආසව ක්ෂය කර, නිවන ලබාගැනීමය. ඒ සඳහා ධර්මතා 6ක් පරිපූර්ණ කරගත යුතුවේ: 1) ධර්මයෙහි ඇලීම- ධර්මාරාම 2) භාවනාවේ ඇලීම-භාවනාරාම 3) කෙළෙස් ප්‍රහීණය කිරීමට ඇල්ම ඇතිබව- ප්‍රහාණාරාම 4) කාය චිත්ත උපධි විවේකයට ඇල්ම ඇතිබව- ප්‍රවිවෙකාරාම 5) අව්‍යාපාදයට ඇල්ම ඇතිබව- අව්‍යාපාදාරාම 6) ප්‍රපංච නොකිරීමට ඇල්ම ඇතිබව- නිවනට ඇති ඇල්ම- නිප්පපඤ්චාරාම. **මූලාශ්‍ර:** අංගු.නි: (4 ): 6 නිපාත: 6.2.3.4. සුඛසෝමනස්ස සූත්‍රය, පි. 253, EAN:6: 78.4 Happiness, p. 360.

▲**සුවදෙන ධර්ම හා දුකදෙන ධර්ම**: පාලි: **සුඛුද්‍රයා ධම්මා, දුකඛුද්‍රයා ධම්මා** - the Dhamma with happiness as its outcome and the Dhamma with suffering as its outcome: සුවදෙන ධර්ම නම් යහපත්වූ ජීවිතයක් ගතකිරීමට සහායවන ධර්මයන්ය. දුකදෙන ධර්ම නිසා ජීවිතය අයහපත්වේ, දුගතියට හේතුවේ. කෙනෙකුට සුවය සැපය උදාකරණ ධර්ම ලෙසින් බුදුන් වහන්සේ පෙන්වා ඇත්තේ නිවැරදි මග ගැනීමය. විමුක්තිය ලබාදෙන ප්‍රතිපදාව නිසා සසර ගමන නැවතී සුවය ලැබේ. වැරදි මග ගැනීම, දුකදෙන ධර්මයවේ. එමගින් සසර ගමන දික්වී අප්‍රමාණ දුක් ඇති කරයි. **මූලාශ්‍ර**: අංගු.නි: ( 6 ):10 නිපාත: සාධු වග්ග, 10.3.4.10 දුක්ඛුද්‍රය සූත්‍රය, පි.472, EAN: 10: Good: p.548. **සුවදෙන ධර්ම:** 1) අක්‍රෝධය 2) එදිරි නැතිබව 3) අනුන්ට අවමන් නොකිරීම 4) අහංකාරනොවීම, 5) ඉරිසියා නොවීම 6) නොමසුරුකම 7) අමායාව 8) කපටිනැතිබව 9) හිරිය 10) ඔත්තප්පය. (non-anger, non-hostility, non-

denigration, non-insolence, non-envy, non-miserliness, non-deceitfulness, non- craftiness, moral shame, moral dread) **දුකදෙන ධර්ම:** 1) ක්‍රෝධය 2) එදිරිය 3) අනුන්ට අවමන් කිරීම 4) අහංකාරය, 5) ඉරිසියාව 6) මසුරුකම 7) මායාව 8) කපටිබව 9) හිරි නැතිබව 10) ඔත්තප්ප නැතිබව. **මූලාශ්‍ර:** අංගු.නි: (1): 2 නිපාත:17: 1 අකුසල පෙයාාලය සූත්‍ර, පි.230, EAN:2: XVII, Unwholesome R. , p. 74.

▲**සුවිදූර විදූර**-Suvidura vidura: සුවිදූර විදූර ලෙසින් පෙන්වා ඇත්තේ යම් ස්ථාන දෙකක් අතර ඇති දුර ප්‍රමාණයය. සුවිදූර විදූර ස්ථාන 4 කි: 1) අහස හා පොළොව 2) සාගරයේ එතෙර හා මෙතෙර 3) හිරු නගින ස්ථානය හා බසින (අස්තයට යන) ස්ථානය 4) සත්පුරුෂ හා අසත්පුරුෂ ධර්මය. **මූලාශ්‍රය:** අංගු.නි: (2): 4 නිපාත: 4.1.5.7 සුවිදූර විදූර සූත්‍රය, පි.120.

▲**සුවිමුත්ත චිත්ත:** පාලි: **සුවිමුත්තචිත්තො-** well liberated in mind: සුවිමුත්ත චිත්තෝ යනු මනාව විමුක්තවූ සිතක් තිබීමය. සියළු කෙලෙස් නැතිවී සිත පිරිසිදුබවට පත්වීමය. චේතෝ විමුක්තිය ලැබීම. බුදුන් වහන්සේ හා රහතුන් '**සුවිමුත්තචිත්තො**' ලෙසින් හඳුන්වති. **බලන්න**: බුද්ධ නාම.ආරිය වාසස්ථාන,

▼**ආරියෝ, සියලු කෙළෙස් හැර,** පිරිසිදු සිතින් විමුක්තිය ලබා ඇතය යි බුදුන් වහන්සේ පෙන්වා ඇත:

**"කථඤ්ච භික්ඛවෙ, භික්ඛු සුවිමුත්තචිත්තො හොති: ඉධ භික්ඛවෙ, භික්ඛුනො රගා චිත්තං... දෝසා චිත්තං...මොහා චිත්තං විමුත්තං හොති, එවං ඛො භික්ඛවෙ භික්ඛු සුවිමුත්තචිත්තො හොති".** (Here, a bhikkhu's mind is liberated from lust, hatred, and delusion. It is in this way that a bhikkhu is well liberated in mind). මූලාශ්‍ර: අංගු.නි: (6 ):10 නිපාත: 10.1.2.9 පඨමාරියවාස සූත්‍රය, 10.1.2.10 හා දෙවෙනි අරියවාස සූත්‍රය, පි.82-84, EAN:10:19.9 & 20.10 Abodes of the Noble Ones, p. 498-499.

▲ **සුවිමුත්තප්‍රඥා:**පාලි: සුවිමුත්තපඤ්ඤා**-** well liberated by wisdom ධර්මයේ සුවිමුත්තප්‍රඥා ලෙසින් පෙන්වා ඇත්තේ**,** රාගය දෝසය හා මෝහය සහමුලින්ම සිඳ දැමීමය. මේ පිළිබඳ උපමාව: තල් ගසක මුල නැවත ඇති නොවෙන ලෙසින් සිඳදමන ලෙසින් සියලු ප්‍රහීණය කර ගැනීමය. අරහත්වයට පත්වීමය. **සටහන**: සුවිමුත්තපඤ්ඤා යනු බුදුන් වහන්සේ හා රහතුන් හඳුන්වන පදයකි. ආරියෝ සුවිමුත්තප්‍රඥා ඇත්තෝය, ආරියවාසස්ථාන ලබා සිටි යයි බුදුන් වහන්සේ වදාළහ:

**"කථඤ්ච භික්ඛවෙ, භික්ඛු සුවිමුත්තපඤ්ඤො හොති: ඉධ භික්ඛවෙ භික්ඛු රාගො... දොසො... මොහො මෙ පහීනො උච්ඡින්නමූලො තාලා වත්‍ථුකතො අනභාවකතො.ආයතිං අනුප්පාද ධම්මොති පජානාති. එවං ඛො භික්ඛවෙ, භික්ඛු සුවිමුත්තපඤ්ඤො හොති"** (Here, a bhikkhu understands: 'I have abandoned lust, cut it off at the root, made it like a palm stump, obliterated it so that it is no more subject to future arising; I have abandoned hatred … abandoned delusion, cut it off at the root, made it like a palm stump, obliterated it so that it is no more subject to future arising.' It is in this way that a bhikkhu

is well liberated by wisdom). **මූලාශ්‍ර**: අංගු.නි: (6 ):10 නිපාත: 10.1.2.9 පඨමාරියවාස සූත්‍රය, 10.1.2.10 හා දෙවෙනි අරියවාස සූත්‍රය, පි.82-84, EAN:10:19.9 & 20.10 Abodes of the Noble Ones, p. 498-499.

▲ **සුව නින්ද**: පාලි: **සුඛං සෙති -** sleeps well: ධර්මයට අනුව සුව නින්ද යනු, සියලු කෙළෙස් හැර දැමූ ආරිය උතුමන් සැතපෙන අන්දමය.**ලෝභ, දෝස හා මෝහ** අකුසල සහමුලින්ම පහකර ඇතිනිසා තථාගතයන්, ලෝකයේ සුවනින්ද ලබන අය අතුරින් එක් උතුමෙකි. කිසියම් ගිහියෙකුට නිදාගැනීම පිණිස සියලු සැපතැනක් තිබුනත්, ලෝභ, දෝස හෝ මෝහය නිසා යම් කායික, මානසික වේදනා ඇතිවුවහොත් ඔහු සුවසේ නිදා නොගනී. එහෙත්, සියලු කෙළෙස් පහකළ ආරිය උතුමෝ සුවසේ නිදාගනි යයි බුදුන් වහන්සේ වදාළහ:

**"සබ්බදා වෙ සුඛං සෙති බ්‍රාහ්මණො පරිනිබ්බුතො, යො න ලිම්පති කාමෙසු සීතිභූතො නිරූපධි. සබ්බා ආසත්තියො ඡෙත්වා විනෙය්‍ය හදයෙ දරං, උපසන්තො සුඛං සෙති සන්තිං පප්පුය්‍ය චෙතසො'ති"** 'කෙළෙස් නිවා, පිරිනිවන්ලැබූ (නිවන ලැබූ) රහතුන්, සියලු උපධි හැර දමා නිවීඇත, කාමඅසාවලින් ඔවුන් කිලිටිවී නොමැත. සියලු බැඳීම් (සසරට ඇති) කඩාදමා, හදවත පෙළෙන සන්තාප දුරුකර, සිත ශාන්තියට පත් කරගත් ඒ උතුමෝ, සුවෙසේ සතැපේ'. (the brahmin who has attained nibbāna, cooled off, without acquisitions, not tainted by sensual pleasures. Having cut off all attachments, having removed anguish in the heart, the peaceful one sleeps well, having attained peace of mind) **සටහන්:** * **බ්‍රාහ්මණො**: ලෙසින් පෙන්වා ඇත්තේ රහතුන්ය. ** මේ සූත්‍රය දේශනා කර ඇත්තේ හත්තක ආලවක කුමරාටය**. බලන්න:** උපග්‍රන්ථය:3. **මූලාශ්‍ර**: අංගු.නි: (1): 3 නිපාත: දේවදූතවග්ග: 3.1.4.5 සූත්‍රය, පි. 290, EAN:3: Divine Messengers: 35.5 Hatthaka, p.91.

▲ **සීවලී තෙර-** Sivali Thera: බලන්න: උපග්‍රන්ථය:1

▲**සිව් උපකාර :** පාලි: **චතුරාපස්සෙනො-** four supports: ධර්මයේ සිව් උපකාර ලෙසින් පෙන්වා ඇත්තේ ආධ්‍යාත්මික ජීවිතය මැනවින් පවත්වාගෙන යෑම පිණිස භික්ෂුවකට උපකාරීවන කරුණු 4 ක්ය: 1) එක් දෙයක් නුවණින් සලකා සේවනය කරයි- සිව්පසය. 2) එක් දෙයක් නුවණින් සලකා ඉවසා සිටි- කායික හා මානසික වේදනා 3) එක් දෙයක් නුවණින් සලකා මගහරි- නුසුදුසු ස්ථාන- චන්ඩ සතුන් සර්පයන්, පාප මිත්‍රයන් ආදී 4) එක් දෙයක් නුවණින් සලකා අත හරි- සිතට එන ලාමක අකුසල් ආදිය. (having reflected, a bhikkhu uses some things, patiently endures other things, avoids still other things, and dispels still other things. It is in this way that a bhikkhu has four supports). විස්තර පිණිස **බලන්න**: ආස්‍රව හා ආස්‍රව ක්ෂය කිරීම.

▼**ආරිය වාසස්ථාන ලබාගැනීමට** සුදුසු ආරියෝ, සිව් උපකාර ඇතිව සිටින බව බුදුන් වහන්සේ පෙන්ව ඇත. ඔවුන් එක් දෙයක් සේවනය කරයි, එක් දෙයක් ඉවසයි, එක් දෙයක් මගහරි, එක් දෙයක් දුරලයි.

**"කථඤ්ච භික්ඛවෙ, භික්ඛු චතුරාපස්සෙනො හොති: ඉධ භික්ඛවෙ, භික්ඛු සඞ්ඛායෙකං පටිසෙවති ... අධිවාසෙති... පරිවජ්ජෙති...විනොදෙති. එවං**

**බො භික්ඛවෙ, භික්ඛු චතුරාපස්සෙනො හොති"**: **සටහන:** දීඝ.නි: 34. සංගිති සූත්‍රයේ සිව් උපකාර ගැන සඳහන් කර ඇත. **මූලාශ්‍ර**: අංගු.නි: (6 ):10 නිපාත: 10.1.2.9 පඨමාරියවාස සූත්‍රය, 10.1.2.10 හා දෙවෙනි අරියවාස සූත්‍රය, පි.82-84, EAN:10:19.9 & 20.10 Abodes of the Noble Ones, p. 498-499.

▲ **සිව් ඉරියව්ව-**Four ways: සිව් ඉරියව් -ඉරියාපථ ලෙසින් මෙහි පෙන්වා ඇත්තේ ඇවිදීම (සක්මන), සිටගෙන සිටීම, වාඩිවීසිටීම, ඇලවීමය. මේ ඉරියව් සතර භාවනා පුහුණුවට යොදාගත හැකිය. සිව් ආකාරයෙන් භාවනා කරනවිට කෙනෙකුට කාම, ව්‍යාපාද හා විහිංසා විතක්ක ඇතිවේ නම් ඒවා පහ කිරීමට විරිය කළයුතු වේ. එසේ කිරීමට වීරිය නැති පිරිස 'හීන වීරිය' ඇති අයය. එහෙත්, ඒවා පහකර ගැනීමට වීරිය කරණ අය 'සමථ හා විදර්ශනා' ලබාගැනීමට සිත මෙහෙයවූ අයවේ. ඔවුන් අරහත්වය ලැබීමට හැකියාව ඇති උතුමන්ය. **සටහන:** මෙය සතර සති පට්ඨානයේ කායානුපස්සනාවට අයත්වේ. **මූලාශ්‍රය**: අංගු.නි: (2) 4 නිපාත: චරවග්ග: 4.1.2.1 චරන්ත සූත්‍රය.

▲ **සිව් ඕඝ:** පාලි: චත්තාරො ඔඝා- four floods: සිව් ඕඝ -සතර ඕඝ: කාමඔඝය, භවඔඝය, දිට්ඨිඔඝය හා අවිජ්ජාඔඝය. මේවා සසර පවත්වන කරුණුය. ආධ්‍යාත්මික වර්ධනය පිණිස ප්‍රහාණය කලයුතු ධර්මතාය. **බලන්න**: ඕඝ, පහාතබ්බ ධර්ම. **මූලාශ්‍ර:** දීඝ.නි :(3): 11 දසුත්තර සූත්‍රය,පි. 483, EDN: 34: Dasuttara Sutta: Expanding Decades, p. 384.

▲ **සිව් ජාන**: පාලි: **චතු ඣානං**-four jhānas-4 absorptions: ජාන, ධ්‍යාන ලෙසින්ද දක්වා ඇත. සිව් ජාන ලෙසින් පෙන්වා ඇත්තේ, සිත එක් අරමුණකට පත්කරගෙන ක්‍රම ක්‍රමයෙන්, පළමු ජානයේ සිට සතරවෙනි ජාන අවස්ථාව දක්වා සිත සමථයට ( සමථ භාවනාව මගින්) පත්කර ගැනීමය. සම්මා සමාධිය යනු සතර ජාන සමාපත්ති ඇතිකර ගැනීමය. **බලන්න**: ජාන. බෝධිසත්වයන් ලෙසින් තමන් වහන්සේ අනුක්‍රමයෙ න් සිව් ජාන සමාපත්ති ලබාගැනීම පිළිබඳව, බුදුන් වහන්සේ වදාළ විස්තරය මෙහි දක්වා ඇත. **බලන්න:** අංගු.නි: (5) 9 නිපාත: 9.1.4.10 තපුස්ස ගහපති සූත්‍රය, පි.534. **ශබ්දකෝෂ: පා.සිං.ශ:** පි.299: "**ඣාන**: ධ්‍යානය, චින්තාව, ධ්‍යානවැඩීම... **ඣා:** ධ්‍යානකරයි... **ඣාතික:** ධ්‍යානවඩන්නා..." **B.D**: p. 137: "**jhāna:** absorption (meditation)…" **P.T.S**: p. 660: '…It is the technical term for a special religious experience, reached in a certain order of mental state… (from jhāyati)…from meditation on objects & from burning up anything adverse"

▼**සම්මා සමාධිය, සිව්ජාන ජාන සමාපත්ති ලැබීමය. ප්‍රථම ජානය:** මේ සසුනේ මහණ කාමයන්ගෙන් වෙන්ව, අකුසල ධර්මයන්ගෙන් වෙන්ව, විතර්ක සහිත, විචාර සහිත, විවේකය නිසා උපන් ප්‍රීතිය හා සැප ඇති පළමු ජාන සමාපත්තිය ලබාගනී.

**"ඉධ භික්ඛවෙ, භික්ඛු විවිච්චෙව කාමෙහි විවිච්ච අකුසලෙහි ධම්මෙහි සවිතක්කං සවිචාරං විවෙකජං පීතිසුඛං පඨමංඣානං උපසම්පජ්ජ විහරති"** (Here, bhikkhus, secluded from sensual pleasures, secluded from unwholesome states, a bhikkhu enters and dwells in the first jhāna,

which is accompanied by thought and examination, with rapture and happiness born of seclusion.)

**දෙවන ඣානය:** විතර්ක හා විචාර සංසිඳීමෙන් අභ්‍යන්තරයේ ඇතිවූ විශ්වාසය ඇතිව, සිතේ එකඟබව ඇතිව, විතර්ක හා විචාර රහිතවූ සමාධිය නිසා ඇතිවූ ප්‍රීතිය හා සැපය ඇති දෙවෙනි ඣාන සමාපත්තිය ලබාගනී. **"... විතක්කවිචාරානං වූපසමා අජ්ඣත්තං සම්පසාදනං චෙතසො එකොදිභාවං අවිතක්කං අවිචාරං සමාධිජං පීතිසුඛං දුතියංඣානං උපසම්පජ්ජ විහරති**" (With the subsiding of thought and examination, he enters and dwells in the second jhāna, which has internal confidence and unification of mind, is without thought and examination, and has rapture and happiness born of concentration)

**තෙවන ඣානය**: ප්‍රීතිය පහවීමෙන් ඔහු උපේක්ෂාව සහිතව, සතිය හා සම්ප්‍රජන්‍යය ඇතිව, කායික සුවය විඳී. 'උපේක්ෂාව ඇති, සිහිය හා සම්ප්‍රජන්‍යය ඇති, සුව විහරණය ඇත්තේ ය යි' ආරියෝ පවසන තෙවෙනි ඣානය ඔහු ලබාගනී. **"...පීතියා ච විරාගා උපෙක්ඛකො ච විහරති, සතොච සම්පජානො සුඛඤ්ච කායෙනපටිසංවෙදෙති. යන්තං අරියා ආචික්ඛන්ති උපෙක්ඛකො සතිමා සුඛවිහාරීති තං තතියංඣානං උපසම්පජ්ජ විහරති**" (With the fading away as well of rapture, he dwells equanimous and, mindful and clearly comprehending, he experiences happiness with the body; he enters and dwells in the third jhāna of which the noble ones declare: 'He is equanimous, mindful, one who dwells happily.'

**සතරවන ඣානය:** සුවය හා දුක පහකර, පෙරදී සොම්නස හා දොම්නස පහව යාමෙන් ඇතිවූ දුකත්නැති, සැපත් නැති උපේක්ෂාවෙන් හටගත් පිරිසිදු සති සම්ප්‍රජන්‍යයෙන් යුත් සතරවෙනි ඣානය ඔහු ලබාගනී. **"...සුඛස්ස ච පහානා දුක්ඛස්ස ච පහානා පුබ්බෙව සොමනස්ස දොමනස්සානං අත්ථගමා අදුක්ඛං අසුඛං උපෙක්ඛාසතිපාරිසුද්ධිං චතුත්ථං ඣානං උපසම්පජ්ජ විහරති**" (With the abandoning of pleasure and pain, and with the previous passing away of joy and displeasure, he enters and dwells in the fourth jhāna, which is neither painful nor pleasant and includes the purification of mindfulness by equanimity) **සටහන:** සිව් ඣාන සමාපත්ති පිළිබඳ විස්තර පිණිස **බලන්න**: සංයු.නි: ( 2 ): නිදානවග්ග: කස්සපසංයුත්ත: 4.1.9 ඣාන අභිඤ්ඤා සූත්‍රය, පි. 342, ESN: Nidanavagga: Kassapasamyutta: 9 Jhānas and Direct Knowledges, p. 817. **මූලාශ්‍ර:** සංයු.නි: (5-1):මහාවග්ග: මග්ගසංයුත්ත: 1.1.8 විභංග සූත්‍රය, පි 42, ESN: Maggasamyutta: 8.8 Analysis, p 1611.

▼**සිව් ඣාන**, රූප ඣාන සමාපත්තීන්ය. මේවා සාක්ෂාත් කරගැනීමෙන් අරහත්මග ඵල සක්ෂාත්වේ. **මූලාශ්‍ර:**ම.නි: (2) අට්ඨකනාගර සූත්‍රය හා අංගු.නි: (6): 11 නිපාත: අට්ඨකනාගර සූත්‍රය.

▼**ප්‍රථම ඣාන සම්පත්තිය** ලබාගැනීම පිණිස ක්‍රමවේදය: 1) පංච නීවරණ ප්‍රහීණය කර, සම්මාප්‍රඥාවෙන් කාමයන්ගේ ආදීනව පිළිබඳ යථාභූත දැකීම 2) කාම,ව්‍යාපාද, විහිංසා විතක්ක, කාම, ව්‍යාපාද, විහිංසා සංඥා

ප්‍රහීණය කිරීම. **මූලාශ්‍ර**: අංගු.නි: (4 ): 6 නිපාත: 6.2.2.9 ප්‍රථමජාන හා දුතියජාන සූත්‍ර, පි.248, EAN:6: Anagami: 73.9 & 74.10 First jhāna, p.359.

▼ **සතරවෙනි ජානය** සාක්ෂාත් කරගැනීම, අරිය වාසස්ථානයක් ඇතිව සිටීම බව බුදුන් වහන්සේ පෙන්වා ඇත. ඒ ආරිය පුද්ගලයා කාය ක්‍රියා සංසුන් කරගෙන සිටී.(පසසදධකායසංඛාර) එනම්,සුඛ දුඛ වේදනා පහකර, පෙරදී අත්හළ සොම්නස හා දොම්නස ඇතිව, සැප හෝ දුක නැති උපෙක්කාවෙන පිරිසුදුවූ සිත ඇති සිව්වෙනි ජානයට සමවැදී සිටිති. **බලන්න**: අරියවාස. **මූලාශ්‍ර**:අංගු.නි:(6 ):10 නිපාත: නාථ වග්ග, 10.1.2.9 පඨමාරියවාස සූත්‍රය, 10.1.2.10 දෙවෙනි අරියවාස සූත්‍රය පි.82-84, EAN:10: II Protector, 19.9 & 20.10 Abodes of the Noble Ones 1 & 2 , p. 498-499.

▼**පලමු, දෙවෙනි හා තෙවෙනි** ජාන ආධ්‍යාත්මික දියුණුව පිණිස වර්ධනය කරගතයුතු ධර්මතාය. මේවා තුන්සමාධි ලෙසින්ද පෙන්වා ඇත. **බලන්න**: භාවේතබ්බ ධර්ම. **මූලාශ්‍ර:**දීඝ.නි: (3):11 දසුත්තර සූත්‍රය, පි. 483, EDN: 34: Dasuttara Sutta: Expanding Decades, p. 384.

▼**තමන් කැමති පරිදි සිව්ජාන** ලබාගැනීමේ හැකියාව, සේඛ ප්‍රතිපදාව අනුගමනය කරණ අරිය ශ්‍රාවක සතු ගුණයකි.**බලන්න**: සේඛ හා අසේඛ. **සටහන**: මේ සූත්‍රයේදී ද සිව්ජාන ලබාගැනීම පිලිබඳ විස්තරාත්මකව දක්වා ඇත. **මූලාශ්‍ර**:ම.නි: (2 ): 2.1.3 :සෙඛ සූත්‍රය, පි. 44, MN 53: Sekha Sutta, p. 436.

▼ **සිව්ජාන නිවන් මගය- අසංඛත මගය**. **මූලාශ්‍ර:** සංයු.නි: (4): සළායතනවග්ග: අසංඛත සංයුත්ත**:** 9.1.3 සවිතක්කසවිචාර සූත්‍රය, පි. 659, ESN: 43: Asankatasamyutta: p. 1493.

▲ **සිව්දහම**: පාලි: **චතු ධම්මා-**four Dhammas: සූත්‍රදේශනාවල සිව්දහම **-සතර ධර්ම** ආකර 2 කින් පෙන්වා ඇත: 1) **සෝතාපන්න බව ලැබීම පිණිස** වැඩිය **යුතු ධර්මතා 4**: සත්පුරුෂ සේවනය, සද්ධර්ම ශ්‍රවනය, යෝනිසෝමනසිකාරය, ධර්මානුධර්ම ප්‍රතිපත්තියය. 2) **සෝතාපන්න ආරිය ශ්‍රාවකයා සතු ධර්මතා 4 :** 1-3 ත්‍රිවිධ රත්නය කෙරෙහි අචල විශ්වාසය තිබීම. 4 පරිපූර්ණ ආරිය කාන්ත ශිලය තිබීම. **බලන්න**: සෝතාපන්න අංග. **සටහන:** සංයු.නි: (5-2): මහාවග්ග: සෝතාපත්තිසංයුත්තයේ සූත්‍ර යන්හි මේ කරුණු විස්තර කර ඇත.

▲ **සිව් පූජනිය ස්ථාන-** Four holy places: සිව් පූජනිය ස්ථාන ලෙසින් පෙන්වා ඇත්තේ බොදුසැදැතියන් වැඳ පුදා ගතයුතු ස්ථානයන්ය. **බලන්න:** ශ්‍රද්ධාවෙන් දැකිය යුතු සිව් ස්ථාන.

▲ **සිව්පිළිසිඹියා-** Four analytical knowledge: සිව්පිළිසිඹියා ලෙසින් පෙන්වා ඇත්තේ අරහත් මහඵල සාක්ෂාත් වීමේදී ඇතිවෙන සිව් නුවණය. පටිසම්භිදා ඥාන-ප්‍රතිසංවිද්ධඥාන- චතුපටිසම්භිදා ලෙසින්ද දක්වයි: අර්ථ, ධම්ම, නිරුත්ති, ප්‍රතිභාන සිව්පිළිසිඹියා වේ. (analytical knowledge of meaning, analytical knowledge of Dhamma, analytical knowledge of language, analytical knowledge of discernment).**බලන්න**: පටිසම්භිදා.

▼**පටිසම්භිදා ඥානප්‍රභේදයය**: 1) අත්‍ථෙඤාණං- අත්‍ථ පටිසම්භිදා - අර්ථය ප්‍රකට කිරීම, නිශ්චය කිරීමේ නුවණ 2) ධම්මෙ ඤාණං-ධම්ම පටිසම්භිදා- ධර්මය ප්‍රකට කිරීම, නිශ්චය කිරීමේ නුවණ3) තත්‍රධම්මනිරුත්‍තා භිලාපෙ ඤාණං- නිරුත්ති පටිසම්භිදා - නිරුත්ති ප්‍රකට කිරීම, නිශ්චය කිරීමේ නුවණ 4) ඤාණෙසු ඤාණං පටිභාන පටිසම්භිදා- ප්‍රතිභානය ප්‍රකට කිරීම, නිශ්චය කිරීමේ නුවණ. **මූලාශ්‍රය**: ඛු.නි:පටිසම්භිදා 1**:** සංඥාපනය: පි.50, ඤාණකථා: 25-28 ප්‍රතිසංවිද්ධඥාන, පි.190.

▼ **සැරියුත් තෙරුන් මෙසේ වදාළහ:** "...සිව් පිළිසිඹියා පිලිබඳ කරුණු ගැන ප්‍රශ්න ඇත්නම් මා විමසන්න...යම් ශාස්තෘවරක් අපගේ දහම් පිලිබඳ අතිශය සමර්ථ වී ද, ඒ ශාස්තෘවරයා (බුදුන් වහන්සේ) අප හමුවේ වැඩසිටි. ( anyone who is perplexed or uncertain [approach] me with a question; I [will satisfy him] with my answer. Our teacher, who is highly skilled in our teachings, is present). **මූලාශ්‍ර**: අංගු:නි: (2): 4 නිපාත: 4.4.3.2 සාරිපුත්‍ර-පටිසම්භිදා සූත්‍රය, පි.332, EAN:4: 172.2 Analysis, p. 204.

▼ **තථාගතයන් ගේ** පහළවීම නිසා සිව් පිළිසිඹියාවන්ගේ සාක්ෂාත් වීම සිදුවේ.(realization of the four analytical knowledges). **බලන්න**: තථාගතයන් වහන්සේ.

▼ **මහා කොට්ඨිත තෙරුන්** සිව් පිළිසිඹියා ලද භික්ෂූන් අතරින් අග්‍රය. **බලන්න**: අග්‍රතම ශ්‍රාවකයන්.

▼ **සිව් පිළිසිඹියා** යහපත් ලෙසින් වර්ධනය කරගැනීමෙන් අකුප්පබව (නොකිපෙන)- අරහත්වය ලැබේ. **බලන්න**: අක්කුප්ප.

▲ **සිව්පසය -**The four requisites: සිව්පසය යනු සංඝයාට කැප මූලික දේ, එනම්: චීවර, පිණ්ඩපාත, සේනාසන, ගිලන්පසය.

▼**බුදුන් වහන්සේ මෙසේ වදාළහ:**

"...පැවිද්ද **සිඟාලත් බත්පිඩු** නිසාය, ඔබ විසින් දිවිතෙක් ඒ පිණ්ඩපාත භෝජනයෙහි උත්සාහ කට යුතුය... සංඝයා පිණිස දෙන බත, ආරාධනා කොට දෙන බත... මෙය අතිරේක ලාභයය. පැවිද්ද **පංසුකූල සිවුරනිසාය,** ඔබ විසින් දිවිතෙක් ඒ පංසුකූල චිවරයෙහි උත්සාහ කට යුතුය... කොමු, කපු, කම්බිලි... ආදිය මෙය අතිරේක ලාභයය . පැවිද්ද **රුක්මුල් සෙනසුන** නිසාය, ඔබ විසින් දිවිතෙක් ඒ රුක්මුල් සෙනසුනයෙහි උත්සාහ කට යුතුය...වෙහෙර, වහල ඇති ගෙය...ගුහා මෙය අතිරේක ලාභයය. පැවිද්ද **ගොමමුත්‍ර බෙහෙත්** නිසාය. ඔබ විසින් දිවිතෙක් ඒ බෙහෙත්හි උත්සාහ කට යුතුය, ගිතෙල්, වෙඬරු, තෙල්, මී, උක්සකුරු... අතිරේක ලාභයය". **මූලාශ්‍රය**: වි.පි: මහාවග්ග පාලි 1: සතරනිස: පි. 316.

▼ **ස්වල්පවූද සුලභවූද, නිදොස්වූද** සිව් ප්‍රත්‍යයෙන් (චතුරනවජ්ජ) සතුටුවීම, මහණකම පිලිබඳ එක් යහපත් අංගයක් ය: 1) පංසුකූලචිවරය 2) පිඬු සිඟා ලබන භෝජනය 3) රුක්මුල් සේනාසනය 4) පූතිමුත්‍ර නම් බෙහෙත (ගොමමුත්‍ර බෙහෙත). **මූලාශ්‍ර:** ඛු.නි: ඉතිවුත්තක: 4.1.2 චතුරනවද්‍යා සූත්‍රය, පි. 488.

▲ **සිව්පිරිස**: පාලි: **චතුනනාඤ්ව පරිසා**-four assemblies: ධර්මයට අනුව සිව් පිරිස යනු බුදුන් වහන්සේ අනුගමනය කරන පිරිසය. එනම්, භික්ෂු භික්ෂුණී සංඝ හා ගිහි උපාසක හා උපසිකවන්ය. **බලන්න:** අග්‍රතම සිව් පිරිස. **සටහන්:** * four assemblies are bhikkhus, bhikkhunīs, male lay followers, and female lay followers බලන්න: ESN: Note: 1654, p. 2408 ** අගසව් දෙනමගේ ගුණ වැනූ බුදුන් වහන්සේ වදාළේ:

“...**සිව් පිරිසටම ඔවුන් ප්‍රියවූවෝය, සිව් පිරිසම ඔවුන්ට ගරුබුහුමන් දැක්වූහ**...”. මූලාශ්‍ර: සංයු.නි: (5-1): සතිපට්ඨානසංයුත්ත:2.4. උක්කචේල සූත්‍රය,පි. 322, ESN:47: Satipattāna samyutta: 14.4 Ukacelāsutta, p. 1873.

▲ **සිව්මග සිව්ඵල**: පාලි: **චතුමග්ගං, චතුඵලං**- Four paths & four fruits සිව්මග හා සිව්ඵල (සතර මග හා සතර ඵල) බුදුදහමට පමණක් විශේෂවූ ධර්මතාවයකි. බුදුන් වහන්සේ පෙන්වා දුන් ආරිය අෂ්ඨාංගික මාර්ගයේ ගමන් කරන ශ්‍රාවකයා හට ධර්ම අවබෝධය මගින් ඇති වන නුවණින් හා බලය නිසා, සසරට බැඳී තබන කෙළෙස් ක්‍රමයෙන් තුනීකර ගත හැකි බවය. එසේ අනුක්‍රමයෙන් මාර්ගය වැඩියාම නිසා: ශීලය සමාධිය හා ප්‍රඥාව දියුණුවීම මගින් සතර මග හා සතර ඵල ලබාගැනීමට ඔහු සමත්වේ. **සතර මග හා ඵල:** සෝතාපන්න, සකදාගාමී, අනාගාමී, අරහත්. මාර්ගයේ ඒ ඒ කොටස සම්පූර්ණ කරගැනීම ඵලය වේ. සෝතාපන්න මග ගමන් කරන ශ්‍රාවකයා, සෝතාපත්ති අංග සම්පූර්ණ කර සෝතාපන්න ඵලය ලබා ගනී....එලෙස ක්‍රමයෙන් අරහත්වය ලබා උතුම් නිවන සාක්ෂාත් කර සසර දුකින් මිදේ.

**සටහන:** දීඝ.නි: (1): ශ්‍රමණඵල සූත්‍රයේ, ක්‍රමානුකූල පුහුණුවේ යෙදන භික්ෂුව ක්‍රමයෙන් සිව්මග ඵල ලබාගන්නා අන්දම විස්තරාත්මකව පෙන්වා ඇත.

▼ **වෙනත් මූලාශ්‍ර:**1.“The breakthrough to the transcendental is achieved in four stages, each of which is subdivided into two: path (*magga*) and fruition *(phala).* By attaining the first of these stages one ceases to be a mere ‘worldling’ *(puthujjana)* and becomes a noble person *(ariya-puggala).* The stages or ‘path-moments’ are designated in terms of the successive breaking of ten fetters. Standard descriptions of these stages are given at many places…” **EDN**: Introduction: Stages on the Path: p. 21.

▲ **සිව් ශ්‍රමණ-** The four ascetics: එක් සමයක, චුන්ද කර්මකාර පුත්‍ර විසින් විමසනු ලදුව, බුදුන් වහන්සේ ඔහුට සිව් ශ්‍රමණයන් ගැන මෙහිදී විස්තර වදාළහ: 1) **මාර්ගජින:** සියලු කෙළෙස්වලින් මිදුන, සදෙව්ලොවට නායක, බුදුවරු. 2) **මාර්ගදේශි**: ප්‍රඥාවෙන් නිවනේ උතුම්බව දන්නා, මාර්ග ධර්මය දේශනා කරන මුණිවරු. 3) **මාර්ගජීවි:** නිවන් මග හික්මුන, සිහිනුවණ ඇතිව වාසය කරන, සත්‍ය සොයන උතුමෝ. 4) **මාර්ග දූෂක:** බුදු පසේ බුදුවරුන්ගේ වෙස් ගෙන, මායාකරිව, ශිල සංයමය නැති හිස් වදන් ඇති, අසත්පුරුෂයෝ. **මූලාශ්‍රය**: ඛු.නි:සුත්තනිපාත:උරගවග්ග:1-5 චුන්ද සූත්‍රය, පි.48.

▲ **සිවුරු-** Robes: සිවුරු, සංඝයාට කැප සිව්පසයෙන් එක් අංගයකි. **බලන්න**:චීවර.

▲ **සිවුරු හැරීම-** Disrobe: පැවිද්ද හැර නැවත ගිහිබවට පත්වීම සිවුරු හැරීමය. මෙය ජිවිතයේ පහතට වැටීමකි. **බලන්න:** උපපැවිදිවීම.

▲**සොවචස්සතාවය**: පාලි: **සොවචස්සතා** - Gentleness: සොවචස්සතාවය යනු සුවචභාවය, මුදුබවය, කීකරුබවය. දහම් අවවාද පිළිගැනීමට කීකරුවීම ආධ්‍යාත්මික මග වඩා ගැනීමට උපකාරීවන කරුණකි. **සටහන**: කරණීයමෙත්ත සූත්‍රයේ, සුවචබව, නිවන පිණිස ඇති අංගයක් බව පෙන්වා ඇත.

▼**සුවචභාවය** ඇතිවිට දුර්වචභාවය (අකිකරුබව) නැතිවේ.**බලන්න**: දෝවචස්සතාවය. **මූලාශ්‍ර**: අංගු.නි: (4 ):6 නිපාත: තික වග්ග: 6.1.9 දෝවචස්සතා සූත්‍රය, පි. 285,  EAN: 6: 115.9. Difficult to correct, p. 365.

▼**සුවචභාවය,** ආධ්‍යාත්මික වර්ධනයට විශේෂ බවක් ගෙනදේ. **බලන්න:** විශේෂභාගිය ධර්ම. **මූලාශ්‍ර:** දීඝ.නි : (3 ): 11 දසුත්තර සූත්‍රය, පි. 483, EDN: 34: Dasuttara Sutta: Expanding Decades, p. 384.

▼ **බුදුන් වහන්සේ** සුවචභාවය පිළිබඳව යහපත් ලෙසින් වදාරා ඇත. ඒ ධර්මය  සංඝයා එක්ව, ධර්මයේ චිරස්ථිතිය පිණිස සජ්ජායනා කිරීම සුදුසු ය යි සැරියුත් මහා තෙරුන් සංඝයාට උපදෙස් දී ඇත. **මූලාශ්‍ර**: දිඝ.නි: (3 ):10 සංගිති සූත්‍රය, පි. 372 , EDN: 33 Sangīti Sutta: The Chanting Together, p. 362.

▼**සොවචස්සතාවය,** ධර්ම මාර්ගයේ ගමන් කරන පුද්ගලයෙක් හට ආරක්ෂාව ලබාදේ, උපකාරීවේ. බුදුන් වහන්සේ මෙසේ වදාළහ:

**"…භික්ඛු සුවචො හොති සොවචස්සකරණෙහි ධම්මෙහි සමන්නාගතො ඛමො පදක්ඛිණග්ගාහී අනුසාසනිං…"**. '…මහණ කිකරුය, අවවාද කිරීමට පහසුය. ඉවසීම ඇතිව, ගෞරවය සහිතව අවවාද අනුශාසනා පිළිගනී'. (a bhikkhu is easy to correct and possesses qualities that make him easy to correct; he is patient and receives instruction respectfully). **මූලාශ්‍ර**: අංගු.නි: (6): 10 නිපාත: 2 නාථ වග්ග, 10.1.2.7 ප්‍රථම නාථකරණ සූත්‍රය පි.72, EAN:10:Tens: Protector, 17.7 Protector I, p.497.

▲**සෝවාන්**-Sovan: සෝවාන් යනු සෝතාපන්නවීමය. සෝවාන්පුද්ගලයා, දුගතියට නොවැටේ, නියතවූ සම්බෝධිය පිහිට කොටඇත. ඔහු සෝවාන් යයි බුදුන් වහන්සේ වදාළහ. **බලන්න**: සෝතාපන්න. **මූලාශ්‍රය:**සංයු.නි: (5-2):මහාවග්ග: සෝතාපත්ති සංයුත්තය: වේළුද්වාරවග්ග:11.1.4 සාරිපුත්ත සූත්‍රය, පි.168.

▲ **සෞචෙය**-(පාලි) **සුචි-** Pure: සෞචෙය- සෝචෙයිය: සුචි- පිරිසිදුබවය. සුචි යනු ආසව රහිතව කාය, වචී හා මනෝ ද්වාරයන් ගේ පිරිසුදුබවය. තුන්දොරින් යහපත් ක්‍රියා පමනක් සිදුවන බවය. පව් හැර, එබඳු පිරිසිදු බව ලැබූ අය "ආර්යයෝ" යයි බුදුන් වහන්සේ වදාළහ. **මූලාශ්‍ර:** ඛු.නි : ඉතිවුත්තක: 3.2.7 සෞචෙය සූත්‍රය, පි. 422.

**සස**

▲ **සංසප්පනිය ධර්ම පරියාය:**පාලි: **සංසප්පනිය ධම්ම පරියාය-** exposition of the Dhamma on creeping: සංසප්පනිය ධර්ම පරියාය යනු දස අකුසල් කර මියගිය කෙනෙක්, තිරිසන් ලෝකයේ යලි උපතට පැමිණිවිට, බඩගාගෙන යන සත්ත්ව කොට්ඨාශයට වැටෙන අන්දමය. **බලන්න**: තිරිසන් ලෝකය. **මූලාශ්‍ර**: අංගු.නි: ( 6 ):10 නිපාත: කරජකාය වගග:10.5.1.6. සංසප්පනිය පරියාය සූත්‍රය, පි.560, EAN:10: The Deed Born Body, 216.6, Creeping , p.558.

▲ **සංසේදිත උත්පත්ති** - Sanseditha: සංසේදිත යනු තෙතමනය ඇසුරු කොට ලබන උපත, එනම්, පණුවන් වැනි සතුන් උපත ලබන ආකාරය ය.**බලන්න:** උත්පත්ති විධි.

▲ **සසර-**Sasara: සසර-සංසාරය යනු, කෙළෙස් අහවර නොකරගැනීම නිසා සත්ත්වයෝ නැවත නැවත උපත් ලබමින් දුක්විඳීමය.

▼**සසර මුල (ආරම්භය) දැකිය නොහැකිය**: බුදුන් වහන්සේ මෙසේ වදාළහ: "මහණෙනි, මේ සසරේ පටන්ගත් තැනක් දැකිය නොහැකිය. අවිද්‍යාව නිසා ආවරනයවී, තණ්හාව සංයෝජන කර ගෙන බැඳී ඇති, භවයෙන් භවයට හැසිරෙන සත්ත්වයන් ගේ මුල් කෙලවර නො පෙනේ... යම් කලක මහා සාගරය වියළි යනු ඇත...සිනෙරු පව්ව වැනසී යනු ඇත... මහා පොලව දැවී වැනසෙනු ඇත...එහෙත් කෙළෙස් වලින් බැඳුන සත්ත්වයන් ගේ දුක කෙළෙවර කිරීමක් කිව නොහැකිය..."

**"අනමතග්ගොයං භික්ඛවෙ, සංසාරො. පුබ්බාකොටි න පඤ්ඤායති**

**අවිජ්ජානීවරණානං සත්තානං තණ්හාසංයොජනානං සන්ධාවතං සංසරතං"** ( Bhikkhus, this saṃsāra is without discoverable beginning. A first point is not discerned of beings roaming and wandering on hindered by ignorance and fettered by craving...). **සටහන:** සසර ගමනේ දිග පෙන්වීම සඳහා බුදුන් වහන්සේ දක්වා ඇති **උපමා**: 1) **වේපුල්ල පව්ව උපමාව:** එක් කපයක තුල එසේ සැරිසරන කෙනෙක්, ඉපදී මැරී නැවත ඉපදී... තබායන ඇටගොඩ, මගධයේ වේපුල්ල කන්දට වඩා උසය. **2) බල්ලා උපමාව:** කෙළෙස් වලින් බැඳුන මිනිසුන් සසර වටේ දිවයාම පිණිස යොදාගත් උපමාව: කණුවක ගැට ගසා ඇති බල්ලෙක් කණුව වටේ දුවන ආකාරයට කෙළෙස් වලින් බැඳුන මිනිසුන් සසර වටේ දුවයයි. **බලන්න:**උපග්‍රන්ථය:5 **මූලාශ්‍ර:** සංයු.නි: (2): අනමතග්ගසංයුත්ත: 3.1.10 : ඒකපුග්ගල සූත්‍රය, පි. 308, ESN: 15: Anamataggaa samyutta: 10.10 Person, p. 796, සංයු.නි: ( 3): ඛන්ධසංයුත්ත: 1.2.5.7 ගද්දූලබද්ධ සූත්‍රය, පි. 284, ESN: 22: Khandasamyutta: 99.7 The leash, p. 1090.

▼ **සසරේ ස්වභාවය:**: **1) සසර මහා ප්‍රවාහයකි** (ඕඝය-great flood) එනම්: කාමඕඝය, භවඕඝය, දිට්ඨිඕඝය හා අවිජ්ජාඕඝය, සත්ත්වයෝ සසර ජලකඳේ ඇදී යති (flood of sensuality, the flood of existence, the flood of views, the flood of ignorance). **බලන්න**: ඕඝය. **2) සසර මහා බන්ධනයකි** (යොග-bonds). බන්ධන 4 කින් සත්වයෝ සසරට බැඳී ඇත: **කාම යෝගය** (පංච කාමයට ඇති ආශාව), **භව යෝගය** (රූප අරූප

ලෝක පිලිබඳ ආශාව), **දිට්ඨි යෝගය** (62 ක්වූ දිට්ඨි, මත වලින් බැඳීසිටීම), **අවිජ්ජා යෝගය** (මෝහය). **3) සසර ගැට ගොඩකි (ගන්ථ- ගැටගැසීම්-ගෙතීම් -knots)** ගැට **4ක් මගින් සත්‍වයෝ සසරට ගැටගසා ඇත:අබිජ්ජාව covetousness (යළි උපත ඇතිකරණ තණ්හාව), ව්‍යාපාදය (ද්වේෂය- ill will), සීලබ්බතපරාමාස (distorted grasp of rules and vows),** වැරදි **දිට්ඨිය ( තමාගේ දිට්ඨිය සත්‍යයයි ගැනීම).** සතර ප්‍රවාහ වලින් මිදීමපිණිස, බන්ධනවලින් නිදහස්වීම පිණිස, ගැට වලින් ලිහිල්වීම පිණිස ආරියඅටමග යහපත් ලෙසින් සම්පූර්ණ කරගත යුතුය යි බුදුන්වහන්සේ පෙන්වා වදාළහ. **සටහන**: අටුවාවට අනුව කායගන්ථ (කායගැට-bodily knot) යනු නාමකාය නිසා ඇතිවන කෙළෙස්ය. එමගින් පාපකර්ම ඇතිවී සසර දික්වේ. **බලන්න:** ESN: note 47, p.2393. **මූලාශ්‍ර:** සංයු.නි. (5-1): මහාවග්ග: මගගසංයුතත:ඕස වග්ග සූත්‍ර, පි.160, ESN: 45: Maggasamyutta: Floods, p. 1718.

▼**සසර දික්විමට හේතු:** අවිජ්ජා නීවරනය හා තණ්හා සංයෝජනය, සසර දීර්ඝ කිරීමට හේතුවන ධර්මතාය. **මූලාශ්‍රය:** ඉතිවුත්තක:1.2.4 අවිජ්ජා නීවරන සූත්‍රය හා 1.2.5 තණ්හා සංයෝජන සූත්‍රය.

▼ **සසර ගමන අවිනිශ්චිතය**: සසරේ ඒ මේ අත සැරිසරණ සත්ත්වයෝ, වරක්, මෙලොවින් පරලොවට යති, වරක් පරලොවින් මෙලොවට පැමිණේ එසේ ඒ මේ අත දුව යයි. ඒ පිලිබඳ **උපමාව**: **දණ්ඩ උපමාව**: යම්සේ අහසට විසිකල දණ්ඩ, වරකට මුල පැත්ත බිමට වැටේ, වරකට මැද පැත්ත බිමට වැටේ, වරකට අග පැත්ත බිමට වැටේ. ඒ වැටීම හරියාකාරව පෙන්විය නොහැකිය. එලෙස, සසර ගමන අවිනිශ්චිතය. **බලන්න**: උපග්‍රන්ථය:5

**මූලාශ්‍ර**:සංයු.නි: (2): අනමතග්ගසංයුත්ත: 3.1.9 : දණ්ඩ සූත්‍රය, පි. 308, ESN: 15: Anamataggaa samyutta: 9.9 The Stick, p. 796.

▼**සසර සැඩ පහර:** සසර සැඩ පහර ලෙසින් පෙන්වා ඇත්තේ, තණ්හාව නිසා ප්‍රිය- කැමති දේ සොයායමින්, ලෝකයා දුක්විඳින අන්දමය. ඒ පිළිබඳව බුදුන් වහන්සේ මේ උපමාව දක්වා ඇත: **සැඩපහර උපමාව:**

"...ප්‍රියදේ, සැපදේ (රන් වැනි වස්තු ආදිය) සොයායමින් මිනිසෙක් ගඟේ සැඩ පහරට වැටී පහළට ගලා යයි. ගංඉවුරේ සිටින ඇස් ඇති පුද්ගලයෙක්, ඒ මිනිසා දැක මෙසේ පවසයි: '...ඔබ, ප්‍රියදේ, සැපදේ සොයමින් යන්නේ, සැඩ පහරට හසුවී ගඟ පහළට යයි. ගඟ පහළ විශාල බිහිසුනු විලක් ඇත. එහි රළ සහිත දියසුළි ඇත, චණ්ඩ මසුන්, දිය රකුසන් ආදිය සිටී. ඒ විලට වැටුනොත් ඔබ මරණයට හෝ මරණ දුකට පැමිණේ'. එම වදන් අසා බියට පත් ඒ මිනිසා, අතින් පයින් වෑයම් කර දියපහර ඉහළට තරණය කරගනී". **සටහන්: * උපමා විස්තරය**: සැඩ පහර= තණ්හාව, බිහිසුනු විල= ඔරම්භාගිය සංයෝජන 5, රළ= සිතේ ඇතිවන ක්‍රෝධය, උපායාස, දියසුළිය= පංචකාම ගුණ, දියරකුසා= ස්ත්‍රිය, දියපහර ඉහළ= නෙක්ඛම්මය, අතින් පයින් වෑයම් කිරීම= සතර සම්‍යක් ප්‍රධාන වීරිය, ඇස්ඇති පුරුෂයා= තථාගතයන් වහන්සේ.

** මේ සූත්‍රය අවසානයේදී බුදුන් වහන්සේ මෙසේ වදාළහ:

**“ මතු අනාගාමී, අරහත් ඵල පතන භික්ෂුව, දුක්සහිතවම කාමය දුරු කරයි. සම්‍යක් ප්‍රඥාව ඇතිව, කෙළෙසුන්ගෙන් මිදුන සිත් ඇතිව, මාර්ගඵල ලබමින්, විමුක්තිය නම්වූ නිවන ස්පර්ශ කරයි. මාර්ග ඥානය ලබා, චතුසත්‍ය අවබෝධ කර, බඹසර නිමකර, ඒ භික්ෂුව, ලෝකයෙහි අන්තයට, සසර පරතෙරවූ නිවනට ගියේ යයි කියනු ලැබේ”. මූලාශ්‍රය:** ඛු.නි: ඉතිවුත්තක:4.1.10 පුරුෂ ප්‍රිය සූත්‍රය, පි.500.

▼ **දීර්ඝ සසරේදී මිනිසුන් නොයෙක් වේදනා විඳ ඇත:** බුදුන් වහන්සේ මෙසේ වදාළහ:

**“ ඔබ, දිළිඳුව දුක් විඳින කෙනෙක් දකින්නේ නම්, නම්, ධනවත්ව සැප විඳින කෙනෙක් දකින්නේ නම්, මෙසේ සිතිය යුතුය: අප විසින් ද මේ දීර්ඝ සසරේ එබඳු, දුක් වේදනා සැප වේදනා ලබා තිබේ. එමනිසා, සසර නිමා කරගැනීම ට යුහුසුළු වීම යහපත්වේ”. මූලාශ්‍ර**:සං.යු.නි: (2 ): අනමතග්ගසංයුත්ත: 3.2.1 දුග්ගත සූත්‍රය හා 3.2.2. සුඛිත සූත්‍රය, පි. 310 ESN: 15: Anamataggaasamyutta: 11.1 Unfortunate & 12.2 Happy, p. 800.

▼**සසර නිමාවීම නිවනය**: බුදුන් වහන්සේ මෙසේ වදාළහ:

**“මානය දුරලා මැනවින් එකඟවූ සිත් ඇති, සියලු උපධින්ගෙන් මිදුන, අප්‍රමාදව හුදකලාව වනයෙහි වෙසන භෙතෙම, සසර පරතරයට පැමිණෙන්නේය’. මූලාශ්‍රය:** සං.යු.නි: (1): සගාථවග්ග: දේවතාසංයුත්තය :1.1.9 නමානකාම සූත්‍රය.

▼**සසර ගමන නවතින අන්දම**: සංසාර ප්‍රවාහය නවතින්නේ කෙසේද? සසර වටය අවසන්වන්නේ කෙසේද? නාමරූප ඉතිරියක් නොමැතිව අවසන්වන්නේ කෙසේද? යයි දේවියක් බුදුන්වහන්සේ විමසුහ:

**“කුතො සරා නිවත්තන්ති කත්ථ වට්ටං න වත්තති**
**කත්ථ නාමඤ්ච රූපඤ්ච අසෙසං උපරුජ්ඣතී ති”**

බුදුන්වහන්සේ මෙසේ වදාළහ:

**“ යත්ථ ආපො ච පඨවී තෙජො වායො න ගාධති**
**අතො සරා නිවත්තන්ති එත්ථ වට්ටං න වත්තති**
**එත්ථ නාමඤ්ච රූපඤ්ච අසෙසං උපරුජ්ඣතී ති”** යම් තැනක සතර ධාතුන් නො පිහිටයිද, එතැන සසර ප්‍රවායහ නවතී, සසරවටය නවතී, නාමරූපය ඉතිරි නැතිවම අවසන්වේ. **බලන්න:** නිවන. **මූලාශ්‍ර**: සං.යු.නි: (1): මහාවග්ග: දේවතාසංයුත්ත: 1.3.7 සර සූත්‍රය, පි. 56, ESN: 1: Devatasamyutta: 27.7 Streams, p. 90.

▲ **සසර අදන් මග**: සසර අදන් මග (අද්ධාන) යනු සසර ගමන ය. ***සං.යු.නි: අද්ධාන සූත්‍රයේදී** බුදුන්වහන්සේ වදාළේ බඹසර ජීවිතයේ අරමුණ වන්නේ සසර අදන් මග පිලිබඳ අවබෝධය ලබාගැනීම බවය. (අද්ධානපරිඤ්ඤත්ථං- Addhānapariññattham- understanding of the course). ඒ සඳහා ඇති ක්‍රම වේදය නම් අරිය අටමග වර්ධනය කරගැනීමය. * අටුවාවට අනුව, කෙනෙක් නිවන සාක්ෂාත් කරගත්විට සසර ගමන පිළිබඳව සම්පූර්ණ අවබෝධය ලැබේ, එමනිසා, නිවන හඳුන්වන්නේ සසර ගමන සම්පූර්ණයෙන් අවබෝධ කිරීමය. **බලන්න:**

ESN: note no 31, p. 2392. **මූලාශ්‍ර**: සංයු.නි: (5-1 ) මග්ගසංයුත්ත: 1.5.4. අදධාන සූත්‍රය, පි. 74, ESN: Maggasamyuthta: the full understanding of the course p. 1651

▲ **සසංඛාරපරිනිබබායි** (attainer of nibbāna through exertion): සසංඛාරපරිනිබබායි යනු අනාගාමි උතුමන් අරහත්ව, පරිනිබ්බනය ලබන ආකාරයය. **බලන්න:** අනාගාමි. ඔරම්භාගිය සංයෝජන පහකරගත් ආරිය උතුමා මෙලොවින් චුතව, ශුද්ධාවාසයේ පහළව, ආයාසයෙන් යුතුව පරිනිබ්බනයට පත්වීම. ඒ පිලිබඳ දක්වා ඇති **උපමාව: ගිනිපුපුර උපමාව:** දවස මුළුල්ලේ ගින්නෙන් රත්වුණ යකඩගුලියක්, තළනවිට, ගිනිපුපුරක් මතුවී, ඉහලට ගොස්, නැවත පොළොවට පහත්වී, දර ගොඩක් හෝ පිදුරු ගොඩක් ඇති තැනකට වැටි ලොකු ගින්නක් ඇවිලි දුම් පිටකරයි. එලෙස ගිනි ඇවිලී, ඉන්ධන ප්‍රමාණය අවසන්වූ පසු, නැවත දර හෝ පිදුරු නොමැති නිසා ගින්න නිවී යයි. ඒ ලෙසින්, ඒ උතුමා අරහත්වයට-පරිනිබ්බානයට පත්වේ. උප ග්‍රන්ථය:5 **මූලාශ්‍ර:** අංගු.නි: (4): 7 නිපාත: 7.2.1.2. පුරිසගති සූත්‍රය, පි. 402, EAN:7 : 55.2 Destinations of Persons, p. 387.

▲**සසස්තවාදය හා අසස්සතවාදය-** View of the world is eternal or view of the world is not eternal: සසස්තවාදය (ශාශ්වතවාදය) නම් ලෝකය සදාකාලිකය යන මතය දැරීමය. අසස්සතවාදය (අශාශ්වතවාදය) නම් ලෝකය සදාකාලික නොවේ යන මතය දැරීමය. බුදුන් වහන්සේ වැඩසිටි සමයේ අන්‍යආගමික කණ්ඩායම් අතර පැවති ප්‍රධාන මත 10 ට මේ මත දෙක ද ඇතුලත්වේ. **බලන්න**: දිට්ඨි. **ශබ්දකෝෂ: පා.සිං.ශ:**පි.515: '**සසස්ත**: ශාස්වතය, නොනස්නා දෙය'.

**BD:** p. 165: '**Sassata-Diṭṭhi:** (vāda): Eternity belief is the belief in a soul or personality existing independently of the 5 groups of existence and continuing after death.

▼**ලෝකය** සදාකාලිකය හෝ ලෝකය සදාකාලිකනොවේ යන මත දැරීම අකුසල සිතිවිලි ඇතිකරයි. ඒවා යහපත පිණිස නොවේ, ආධ්‍යාත්මික ජීවිතයට අදාල නොවේ, නිවන් මග පිණිස නො පවතී. **බලන්න**: දිට්ඨි, ආරිය වාසස්ථාන. **මූලාශ්‍ර:** සංයු.නි: (5-2): මහාවග්ග: සච්චසංයුත්ත: 12.1.8 චින්තා සූත්‍රය, පි. 290, ESN: 56: Sacchasamyutta: 8.8 Reflection, p. 2272.

▲ **සාසව ධර්ම** - the tainted Dhamma: සාසව ධර්ම යනු කෙළෙස් ඇති කරන ධර්මතාය, එනම් මිථ්‍යා දිට්ඨිය ඇතුළු වැරදි මග ගැනීමය. ආසව නිසා කෙලෙස් ඇතිවේ. **බලන්න:** අනාසව ධර්ම හා සාසව ධර්ම.

▲ **සසුන-**Sasuna: සසුන ලෙසින් මෙහිදී පෙන්වා ඇත්තේ බුදුසසුනය-බුදුන් වහන්සේගේ ඉගැන්වීමය. සසුන දිගුකලක් **පවත්වා** ගැනීම පිණිස, බොහෝදෙනාට වැඩ පිණිස, අවිජ්ජාව හා භවතණ්හාව යන ධර්මතා 2 යහපත් ලෙස අවබෝධ කර ගත යුතුවේ, එක්ව සජ්ජායනා කලයුතුවේ. **මූලාශ්‍ර:** දීඝ.නි: (3 ): 10 සංගීති සූත්‍රය, පි. 368, EDN: EDN: 33: Saṅgīti Sutta: The Chanting Together, p. 362.

▲**සොසානිකයෝ-** who dwell in a charnel ground: ධුතාංග පුහුණුව ලෙසින් සොහොනේ-සුසානභූමියේ වාසය කරන සංඝයා සොසානිකයෝ ලෙසින් පෙන්වා ඇත. **මූලාශ්‍රය:** අංගු.නි: (3): 5 නිපාත: ආරඤ්ඤකවග්ග: 5.4.4.5 සොසානික සූත්‍රය, පි.380.

▲ **සුසිල්වතා-** moral person: සුසිල්වතා යනු ශීලසම්පන්න පුද්ගලයාය. **බලන්න**: දුසිල්වතා හා සුසිල්වතා.

**සහ**

▲ **සහකාරයා-** Partner**:** සසර ගමන් කරන මිනිසාගේ සහකාරයා ලෙසින් පෙන්වා ඇත්තේ තණ්හාවය. **බලන්න:** දුතියා. **මූලාශ්‍ර:** අංගු.නි: ( 2): 4 නිපාත: 4.1.1.9 තණ්හා සූත්‍රය, පි. 42, EAN:4: 9.9 Craving, p. 150.

▼**ධර්ම මාර්ගයේ** ගමන් කරන සත් පුරුෂයා ගේ සහකාරයා ශ්‍රද්ධාවය. **මූලාශ්‍රය:** සංයු.නි: (1): සගාථවග්ග: දේවතාසංයුත්ත:1.6.9 දුතියා සූත්‍රය, පි. 96.

▲ **සහම්පති බ්‍රහ්මරාජ-** Sahampathi Brahmaraja: මෙතුමා බුදුන් වහන්සේගේ අනුගාමිකයෙකි. **බලන්න:** බ්‍රහ්මරාජයෝ.

▲ **සහෝපකාරි මග-** the conducive way: මෙය ආධ්‍යාත්මික මග හඳුන්වන එක් විධියකි. **බලන්න**:ආධ්‍යාත්මික මග

▲ **සිංහ නාදය-**Lion's roar: තථාගතයන් වහන්සේගේ දහම් දේශනාව සිංහ නාදයක් වැනිය. අනිත්‍ය පිළිබඳව උන්වහන්සේ ප්‍රකාශ කරනවිට, සිංහ නාදය ඇසි සියලු සතුන් බියට පත්වෙන ලෙසින්, තමන්ගේ පැවැත්ම නිත්‍ය ලෙසින් සලකන දිව්‍ය ලෝකවාසි දෙවියන්, බියට හා සංවේගයට පැමිණේ. **මූලාශ්‍ර**:අංගු.නි: (2 ): 4 නිපාත: 4.1.4.3 සීහ සූත්‍රය, පි.88, EAN:4: 33.3 The Lion, p. 160.

▲ **සිංහසෙය්‍යාව:** පාලි: **සීහසෙය්‍යා-** Lion's pose: සිංහසෙය්‍යාව යනු සිංහයා නිදාගන්නා පරිදි සයනය කිරීමය. එනම්, දකුණු පයපිට වම්පය තබා දකුණු අතපිට හිසතබා දකුණු ඇලයෙන් නිදා ගැනීම. මෙය ආරිය උතුමන් සයනය කරන ආකාරය වේ. **ශබ්දකෝෂ: පා.සි.ශ**: පි. 526: "**සීහසෙය්‍යා:** සිංහයාගේ සයනය වැනි සයනය..."

▼**බුදුන් වහන්සේ සැත පෙන්නේ** සිංහසෙය්‍යාවෙන්ය. උන්වහන්සේ සයනයට පෙර සිංහසෙය්‍යාවෙන් ඉරියව් තබාගෙන, සිහි ඇතිව, සති සම්ප්‍රජන්‍යය ඇතිව, උත්ථාන සංඥාව මෙනෙහිකොට සයනය කරයි. නිදිවැරීමේ යෙදෙන අරිය ශ්‍රාවකයාද මේ ඉරියව්වෙන් සයනය කරයි. **බලන්න**: උත්ථාන සංඥාව, නිදිවැරීම, -ජාගාරනු සතිය. **මූලාශ්‍ර**:ම.නි: (2 ): 2.1.3 :සෙඛ සූත්‍රය, පි. 44, MN 53: Sekha Sutta, p. 436.

▲**සිංහ -සිහ සාමණේර-** novice Sīha: **බලන්න:** උපග්‍රන්ථය:1

▲ **සිහ සේනාපති-** General Siha: **බලන්න**: උපග්‍රන්ථය:3

▲ **සිහිය**-Mindfulness: සිහිය-සතිය-මතකය සේඛ පුහුණුවේ යෙදෙන භික්ෂුව සතු යහපත් ගුණයකි. සිහිය ඇතිනිසා, පෙර කළ කි දේ

සිහිපත්වේ. මාර්ගය වඩා ගැනීමට සිහිය සමග නුවණ එක්ව කටයුතු කලයුතුවේ. **බලන්න**: සතිය. **මූලාශ්‍ර**: ම.නි: (2 ): 2.1.3 :සේඛ සූත්‍රය, පි. 44, MN 53: Sekha Sutta, p. 436.

▲**සිහිකළයුතු ධර්මය හා සිහිනොකළයුතු ධර්මය:** පාලි: අනුසසරිතබබඤ්ච- නානුසසරිතබබඤ්ච- the Dhamma to be recollected and the Dhamma not to be recollected. ධර්මමාර්ගයේ දියුණු කරගැනීම පිණිස සිහිකළයුතු- නිතර නිතර මතකයේ තබාගතයුතු ධර්මය සම්මා දිට්ඨිය ප්‍රමුඛ මගේ අංග 10 යය. සිහි නොකළයුතු ධර්මය මිථ්‍යාදිට්ඨිය ඇති මගය, **මූලාශ්‍ර:** අංගු.නි:(6 ):10 නිපාත:10.3.5.9 අනුස්සරිතබ්බ සූත්‍රය, පි. 478, EAN:10: Noble , p. 548.

▲ **සිහි මුලාව**- Muddle-mindedness: සිහිමුළාව (- මුට්ඨසච්චං) යනු සිහිය නොමැතිව ක්‍රියා කිරීමය, එනිසා සමාධිය ඇතිකරගැනීමට හැකි නොවේ. උත්තරීමනුස්සධම්මය ලබාගැනීමට මෙය බාධාවකි. **මූලාශ්‍ර:** අංගු.නි: (4): 6 නිපාත: අරහත්වග්ග: 6.2.3.3 උත්තරීමනුස්සධම්ම සූත්‍රය, පි.254, EAN:6: 77.3 Superior, p.360.

▲ **සොහොන වැනි පුද්ගලයා**-Person who is like a charnel ground සොහොන වැනි පුද්ගලයා (සීවථිකූපම): ඔහු සොහොන (සුසාන භූමිය) මෙන් අපවිත්‍රය, දුගඳ සහිතය, බිය ගෙනදේ, අමනුෂ්‍යයන් ලෙසින් හැසිරේ, බොහෝ දෙනාට විලාප (වැළපීම්) ඇති කරති. බුදුන් වහන්සේ පෙන්වා ඇත්තේ එබඳු පුද්ගලයා අපවිත්‍ර කාය කර්ම, වචී කර්ම,මනෝ කර්ම ඇත. ඒ නිසා ඔහු ගැන අපකීර්තිය පැතිරේ, ඔහු ආරියන් ඇසුරු නොකරයි. ඔහු ඇසුරු කරන්නේ තමන් වැනි, අයහපත් ගති ඇති අය පමණි. එබඳු කෙනක් හා ඇසුරු කිරීමට සිදුවුව හොත්, අනිත් පුද්ගලයාට විලාප තැබීමට සිදුවේ.

**මූලාශ්‍රය**: අංගු.නි: (3); 5 නිපාත: දුශ්චරිතවග්ග:5.5.5.9 සීවථිකා සූත්‍රය, පි. 462.

## ශ කොටස: ශ: ශක,ශත,ශද,ශන,ශම,ශර,ශල,ශව,ශශ, ශෂ

**ශක**

▲ **ශක්තිය-** energy: ආධ්‍යාත්මික මග වඩාගැනීමට කායික හා මානසික ශක්තිය අවශ්‍යවේ. කය යහපත් ලෙසින් නිරෝගිව තබාගැනීම මගින් කායික ශක්තිය ලැබේ. මානසික ශක්තිය වීරිය ලෙසින්ද දක්වා ඇත, ත්‍රිවිධාකාරය: ආරම්භකධාතුව, නික්කමධාතුව, පරාක්‍රමධාතුව. **බලන්න:** ප්‍රධන්වීරිය, EAN:note 33: p 581.

▲ **ශික්ෂාව-ශික්ෂාපද- ශික්ෂා අනුසස්-** Training-training rules & benefits ශික්ෂාව යනු පුහුණුවය, ශික්ෂා පද (සික්ඛාපද-සිඛපද) යනු ඒ පුහුණුව පිණිස රැකිය යුතු කරුණුය. සංඝයාට බඹසර යහපත් ලෙසින් වාසය කිරීම පිණිස බුදුන් වහන්සේ, ශික්ෂා පද පනවා ඇත. ඒවා මැනවින ආරක්ෂා කිරීම නිසා ලැබෙන අනුසස් මෙහි විස්තරකර ඇත. **සටහන්: *** ශික්ෂාව ත්‍රිවිධය- ත්‍රිවිධ ශික්ෂාව : ශීල සමාධි ප්‍රඥා. ගිහි ශික්ෂාපද ලෙසින් මෙහි පෙන්වා ඇත්තේ පන්සිල්ය (පංච ශිලය). **බලන්න**: අංගු.නි: (2): 4

නිපාත: 4.2.5.9 සික්ඛාපද සූත්‍රය, පි.210. **මූලාශ්‍රය**: අංගු.නි: (2): 4 නිපාත:අපාතිකවග්ග: 4.5.5.3 සික්ඛාපදආනිසංස සූත්‍රය, පි. 490.

▼ **ශික්‍ෂාව අත්හැරීමේ විපාක හා ශික්‍ෂාව පවත්වා ගැනීමේ යහපත** ශික්‍ෂාව අත්හැර ගිහිබවට පත්වෙන ( සික්ඛාපච්චක්ඛාන) මහණ හෝ මෙහෙණිය කරුණු 5 ක් නිසා මේ දිවියේදීම විවේචනයට ලක්වේයයි බුදුන් වහන්සේ මෙහිදී පෙන්වා ඇත. එහෙත්, බොහෝ දුක් විඳිමින්, කඳුළු පෙරාගෙන උවද ශික්‍ෂාව සම්පූර්ණ කරගන්නා පුද්ගලයා පැසසුමට ලක්වේ. **මූලාශ්‍ර:** අංගු.නි : (3 ): 5 නිපාත:සේඛබලවග්ග: 5.1.1.5 සික්ඛාපච්චක්ඛාන සූත්‍රය, පි.28.

▼ **ශික්‍ෂා ආනිසංස-**Benefits of training: මෙහිදී ත්‍රිවිධ ශික්‍ෂාව යහපත් ලෙසින් සපුරා ගැනීමේ ආනිසංස ලෙසින් දක්වා ඇත්තේ අරහත් හෝ අනාගාමි මගඵල ලැබීමය.එම ආනිසංස ලබාගැනීම පිණිස ප්‍රඥාව ප්‍රධාන කොට ගෙන, විමුක්තිය හරය කොට ගෙන, සිහිය අධිපති කොට වාසය කලයුතුවේ. **සටහන**: මෙහිදී පෙන්වා ඇත්තේ බ්‍රහ්මචරියාව සම්පූර්ණ කරගැනීමය. **බලන්න:** බ්‍රහ්මචරියාව **මූලාශ්‍රය**: ඛු.නි: ඉතිවුත්තක: 2.2.9 ශික්‍ෂා ආනිසංස සූත්‍රය,පි.398.

▲**ශික්‍ෂා බල-**Powers of training: ආධ්‍යාත්මික පුහුණුව නිසා ඇතිවෙන බල 5 ශික්‍ෂා බලවේ. මේවා සේඛබල- පංච සේඛබල ලෙසින්ද පෙන්වා ඇත. **බලන්න**: සේඛ. **මූලාශ්‍ර:** අංගු.නි : (3 ): 5 නිපාත: 5.1.1.1. සේඛබල සඞ්ඛිත සූත්‍රය, පි. 24, EAN:5: The Trainee’s Powers- 1.1.In Brief, p. 238.

▲**ශෝකධම්ම-**Shoka Dhamma: ලෝකයේ ඇති සියලු දේ ශෝක ස්වභාවය සහිතය, දුක ගෙනදේ. **මූලාශ්‍රය:**සංයු.නි: (4): සළායතන වග්ග:වේදනාසංයුත්ත:ජාතිධම්මවග්ග: 1.4.5සෝකධම්ම සූත්‍රය, පි.84.

▲ **ශෝකය හැරදම්මේ පිළිවෙල-** The way to remove sadness: එක් සමයක පාටලිපුත්‍ර නුවර මුන්ඩික රජු, ඔහුගේ ප්‍රිය දෙවිය හද්‍රා, මරණයට පත්වීම නිසා බොහෝ ශෝකයට පත්විය. නාරද තෙරුන් වදාළ මේ දේශනය අසා ඔහු ශෝකය දුරුකරගත්බව මෙහි දැක්වේ. එම දේශනාව සෝකසල්ලහරණ පරියායය. **සටහන:** මහලුවීම, රෝගිවීම, මරණයට පත්වීම කිසිවෙකුට පාලනය කළනොහැකි ධර්මතා යයි මේ සූත්‍රයේ පෙන්වා ඇත. **මූලාශ්‍රය**: අංගු.නි: (3) 5 නිපාත: 5.1.5.10 සෝකසල්ලහරණ සූත්‍රය, පි.112.

**ශත**

▲ **ශ්‍රැතවත් ආරිය ශ්‍රාවක හා අශ්‍රැතවත් පෘතග්ජන**: පාලි: **සුතවා අරිය සාවකො**-well-taught noble disciple; **අසසුතවා පුථුජ්ජනො** -untaught ordinary person-world ling: ධර්මයට අනුව ශ්‍රැතවත් ආරිය ශ්‍රාවක යනු බුද්ධාදී ආර්යන් දන්නා, ධර්මය අසා ඒ අනුව පිළිපදින ආරිය ශ්‍රාවකයාය. අශ්‍රැතවත් පෘතග්ජන යනු ධර්මය නොඇසූ, බුද්ධාදී ආර්යන් නොදුටු, ධර්ම අවබෝධය නැති, සාමාන්‍ය පොදු මිනිසාය. **බලන්න:** සත්පුරුෂ හා අසත්පුරුෂ. **සටහන්**: * අශ්‍රැතවත් පෘතග්ජන අදහන්නේ අසත්පුරුෂ ධර්මයය, ශ්‍රැතවත් ආරිය ශ්‍රාවකගේ ධර්මය සත්පුරුෂ ධර්මයයි මෙහි පෙන්වා ඇත**. බලන්න**: ම.නි**:**(3)**:**3.2.3 සප්පුරිස සූත්‍රය, පි. 170. ** බුදුන්

වහන්සේගේ දහම අනුගමනය කිරීමට කැපවූ පුද්ගලයා ශ්‍රැතවත් ආරිය ශ්‍රාවකයාය. ** භික්ඛු බෝධි හිමිට අනුව: අරිය ශ්‍රාවක යනු අවශ්‍යයෙන්ම සෝතාපන්න කෙනෙකු නොවේ. **බලන්න:** EAN:note: 47, p. 583. **මූලාශ්‍රය:**අං:ගු:නි: (1): 2 නිපාත: 1.6.1 සූත්‍රය, පි. 58 හා 1.1.5.2 සූත්‍රය, පි. 92. **ශබ්දකෝෂ: පා.සි.ශ**: පි.111: "**සුත:** අසනලද ; **අසසුතවනතු**: අශ්‍රැතවත්, ඇසූ පිරූ තැන් නැති, ප්‍රඥාව නොමැති'. **B.D**: p. 313: "**noble disciple:** only the 8 kind of noble disciples-ariya-puggala'. 'The worldling-**puthujjana i**s called: neither a noble learner nor perfected in learning". **P.T.S**: p.1063: "**puthujjana-** assutavā: a common worldling, an ordinary man opposite to **ariyasāvaka".**

▼ **වෙනත් මූලාශ්‍ර: 1. "**Discourse on the Root of Existence: The Mūlapariyāya sutta and its Commentaries" by Bhikkhu Bodhi: BPS, 2006 pp. 40–46. **2. "**චතුරාර්ය සත්‍ය අවබෝධයට ධර්ම දේශනා: පූජ්‍ය කිරිබත්ගොඩ ඤාණානන්ද හිමි: මහමෙව්නා සදහම් ප්‍රකාශන.

▼ **ශ්‍රැතවත් ආරිය ශ්‍රාවකයා** ආරිය ධර්මය දනී, අශ්‍රැතවත් පෘතග්ජනයා ආරිය ධර්මය නොදනී. ආරිය ශ්‍රාවකයා ධර්මය අවබෝධ කර ඒ අනුව කටයුතු කරයි, ඔහුගේ අකුසල පිරිහියයි, කුසල ධර්මයෝ දියුණුවේ. ඔහු ප්‍රඥාවන්තයෙකි. ඔහු නිවන අසලය. අශ්‍රැතවත් පෘතග්ජනයා ධර්මයේ අදක්ෂය, ධර්මය අනුව කටයුතු නොකරයි. එමනිසා ඔහුගේ අකුසල් ධර්ම වැඩේ, කුසල ධර්ම පිරිහේ. ඔහු අනුවණ පුද්ගලයෙකි. ඔහු සසරේ ගැලී සිටි, ඔහුට නිවන දුරය. **මූලාශ්‍ර:** ම.නි:(1): 1.1 මූලපරියාය සූත්‍රය, පි. 22, හා 1.5.6 මහා ධම්මසමාදාන සූත්‍රය, පි.748, EMN: 46: Mahādhamma samādāna Sutta, p.394, 1:Mūlapariyāya Sutta, p. 61.

▼ **ශ්‍රැතවත් ආරිය ශ්‍රාවකයා** පංච උපාදානස්කන්ධයේ යථා බව දනී, අශ්‍රැතවත් පෘතග්ජනයා ඒ බවනොදනී,අනුවණ පොදු මිනිසා ධර්ම අවබෝධයක් නැතිනිසා පංච උපාදානස්කන්ධය:

'මමය, මාගේය, මගේ ආත්මය'යි අල්වාගනී, පංච උපාදානස්කන්ධය වෙස්වීම්වලට ලක්වනවිට යථා අවබෝධය නොමැති ඔහු මහා දුකකට පත්වේ. එහෙත්, ධර්මය යහපත් ලෙසින් දන්නා ආරිය ශ්‍රාවකයා පංච උපාදානස්කන්ධයේ යථාබව අවබෝධකර ඇතිනිසා, එහි වෙනස්වීම් ඇතිවනවිට දුක් දොම්නස් පිඩාවන්ට හසුනොවේ. **මූලාශ්‍ර**: සංයු.නි: (3): ඛන්ධ වග්ග, 1.1.1.1.නකුල පිතු සූත්‍රය, පි 30, ESN: 22: Khandasamyutta, 1.1 Nakulapita, p. 1007.

▼ **අශ්‍රැතවත් පෘතග්ජනයා** අභ්‍යන්තර හා බාහිර බන්ධන යෙන් බැඳී ඇත. රූප, වේදනා, සංඥා, සංඛාර, විඥාන ආදී ධර්මතා පිළිබඳව ඔහුගේ අවබෝධය මෙලෙසින්වේ: 1) රූපය... වේදනාව... ආත්මය ලෙසින් සැලකීම 2) ආත්මය, රූපය...වේදනා… හිමිකරගෙන සිටියයි සැලකීම 3) රූපය... වේදනා ආත්මය ය යි සැලකීම 4) ආත්මය ඇත්තේ රූපය... වේදනාව...තුළය යයි සැලකීම. මෙසේ වටහාගත් ඔහු: ඔරම්භාගිය හා උද්ධම්භාගිය සංයෝජන වලින් බැඳී (දසසංයෝජන-කෙලෙස්වලින් බැඳී) සසර ගැන නොදනී, සසරින් එතර වීම ගැන නොදනී. එලෙස බැඳීම් වලින්- අභ්‍යන්තර හා බාහිර බන්ධන, යෙන් බැඳුන ඔහු මරණින් මතු යළි උපතක් ලබයි. (සසර සැරි සරයි). ( regards form as self, or self as

possessing form, or form as in self, or self as in form... This is called, bhikkhus, an uninstructed worldling who is bound by bondage to consciousness … who in bondage goes from this world to the other world). **ශ්‍රැතවත් ආරිය ශ්‍රාවකයා බන්ධනන් මිදී ඇත:** පෙරකී ලෙසින් ආත්මයක් පිළිගන්නේ නැත. ඔහු බැඳීම් වලින් බැඳී නැත (දස සංයෝජන වලින්). සසර ද නිවනද දන්නා දකිනා ඔහු දුකින් මිදී ඇත. ( bhikkhus, the instructed noble disciple … does not regard form as self, or self as possessing form, or form as in self, or self as in form. This is called, bhikkhus, an instructed noble disciple who is not bound by bondage to form, who is not bound by inner and outer bondage, who sees the near shore and the far shore. He is freed from suffering). **මූලාශ්‍ර**: සංයු.නි: (3): බන්ධසංයුත්ත: 1.3.2.5 බන්ධන සූත්‍රය, පි. 316, ESN: 22: Khandasamyutta:117.5 Bondage, p. 1101.

▼ **අශ්‍රැතවත් පෘතග්ජන** තෙමේ බොහෝකලක් මුල්ලේ සතර මහා භූතයන්ගෙන් සැදුන කය(පඨවි ආපෝ තේජෝ වායෝ) - රූප ආදී ස්කන්ධයන් (පංච උපාදානස්කන්ධය) , තමාගේ දෙයක් ලෙසින් අල්ලා ගැනීම නිසා ඒ ගැන කලකිරීම ඇති කරගන්ට සමත් නොවේ යයි මෙහි පෙන්වා ඇත. මේ පිලිබඳ යොදාගෙන ඇති **උපමාව-වඳුරා:** වනයේ සිටින වඳුරෙක්, ගසින් ගසට යන්නේ එක් අත්තක් අල්ලාගෙන, එය අතහැර වෙනත් අත්තක් අල්ලා ගනිමින්ය. එලෙස, පෘතග්ජනයා, යථාබව නොදැන, දුක් සහිතව සසර සැරිසරන්නේ, තමාය යි අල්වා ගනිමින්ය. එහෙත්, ශ්‍රැතවත් ආරිය ශ්‍රාවකයා, හේතු ඵල ක්‍රියාවලිය**-** පටිච්ච සමුප්පාදය මනාකොට නුවණින් අවබෝධ කරගනී. එම අවබෝධය තුළින් ඔහු පංච උපාදානස්කන්ධය කෙරහි කළකිරේ. එසේ කළකිරුණු විට නො ඇල්ම ඇතිවේ...දුකින් මිදේ. **මූලාශ්‍රය**: සංයු.නි: (2) නිදානවග්ග: අභිසමයසංයුත්ත: මහාවග්ග:අස්සුතවන්තු සූත්‍ර 2කි, පි.170.

▲ **ශ්‍රැතවත් මහණ**: පාලි: **සුතවතාවූසො-** an instructed bhikkhu: ශ්‍රැතවත් මහණ ලෙසින් පෙන්වා ඇත්තේ, ධර්මය ශ්‍රවණය කර, දුක නැතිකර ගැනීම පිණිස බුදුසසුනේ, බ්‍රහ්මචාරී ජීවිතය ගෙනයන භික්ෂුවටය. එම භික්ෂුව සෝතාපන්න හා ඉහළ මාර්ග ඵල ලබාගැනීම පිණිස පංච උපාදානස්කන්ධය දෙස 11 ස් ආකාරයෙන් යෝනිසෝ මනසිකාරයෙන් බලා සම්මා ප්‍රඥාව ඇති කර ගත යුතුවේ. **බලන්න:** පංචඋපාදානස්කන්ධය. **මූලාශ්‍ර**: සංයු.නි: (3 කාණ්ඩය): බන්ධවග්ග: 1.3.2.11සුතවන්ත සූත්‍රය, පි.323, ESN:Khandasamyutta:123.11 Instructed, p. 1103.

▲**ශ්‍රෝතධාතු විසුද්ධි ඤාණය-**Knowledge of purification of ear element:ශ්‍රෝතධාතුව- කණින් අසන ශබ්දයය. නනාවිධිවූ, ඒකීයවූ ශබ්ද නිමිති වලට බැසීමට, සතර ඉද්දිපාද පිහිටකරගෙන ඇති ප්‍රඥාව ශ්‍රෝතධාතු විසුද්ධිඤාණය සේ දක්වා ඇත. **මූලාශ්‍රය:** ඛු.නි: පටිසම්භිදා 1: 51 ශ්‍රෝතධාතු විසුද්ධි ඤාණය, පි.234.

**ශද**

▲ **ශ්‍රද්ධාව හා අශ්‍රද්ධාව -**Faith & lack of faith: ධර්මයට අනුව **ශ්‍රද්ධාව** (සැදැහැබව-සද්ධා) යනු ත්‍රිවිධ රත්නය පිළිගැනීම හා ඒ පිලිබඳ ඇති විශ්වාසයය. මෙය කුසල් ඇතිකර ගැනීමට පදනමකි. සෝතාපන්න මාර්ග ඵලය ලබාගැනීමට ශ්‍රද්ධාව අවශ්‍යතාවයකි. ශ්‍රද්ධාව ඇතිවීම, ආධ්‍යාත්මික වර්ධනයට හේතුවේ. ශ්‍රද්ධාව, ඉන්ද්‍රියක් ලෙසින් හා බලයක් ලෙසින් වඩා ගත්විට, ආධ්‍යාත්මික මගේ විශේෂයක් ඇති කරගත හැකිවේ. සෝතාපන්න වීමෙන් ශ්‍රද්ධාව පරිපූර්ණබවට පත්වේ **අශ්‍රද්ධාව** යනු ත්‍රිවිධ රත්නය හා ධර්මය පිලිනොගැනීමය, සැක කිරීමය. අශ්‍රද්ධාව නිසා ආධ්‍යාත්මික මාර්ගය ඇතිකර ගැනීමට හැකි නොවේ. **බලන්න**: සෝතාපන්න, ත්‍රිවිධරත්නය. **සටහන:** ශ්‍රද්ධාව, බෝධිපාක්‍ය ධර්මතා වූ ඉන්ද්‍රිය හා බල ධර්මයන්ට ඇතුලත්වේ.ප්‍රභේද වශයෙන් ශ්‍රද්ධාව, ආකාර 2කි: **ආකාරවතී ශ්‍රද්ධාව**: ස්ථිරය, වෙනස්නොවේ, අචලය. **මුල්බැසගත් ශ්‍රද්ධාවය**. මෙය මග ඵල ලැබූ ආරියන්ට පිහිටන ශ්‍රද්ධාවවේ. **අමූලිකා ශ්‍රද්ධාව**, ලෙසින් පෙන්වා ඇත්තේ, ධර්මයට එළඹී එහෙත්, මුල් බැස නොගත් ශ්‍රද්ධාව තිබීමය, අස්ථිර ශ්‍රද්ධාවය. වෙනත් බලපෑම් නිසා වෙනස් විය හැකිය. **ශබ්දකෝෂ**: **පා.සිං.ශ**: පි. 498: "**සද්ධා**: ශ්‍රද්ධාව, තුනුරුවන් කෙරෙහි ඇදහිල්ල". **B.D:** p. 154: "**Saddhā**: Faith-confidence: A Buddhist is said to have faith if he believes in the Perfect One's enlightenment or in the ThreeJewells- (ti-ratana) …"

▼**පුද්ගලයෙක් තුල ශ්‍රද්ධාව**, තිබීම ඔහුට ශක්තියකි. ශ්‍රද්ධාව කෙනෙකුගේ සහකාරයා-හිතවතා (දෙවැන්නා) ලෙසින් ද පෙන්වා ඇත. **මූලාශ්‍රය**:සංයු.නි: (1): සගාථවග්ග: දේවතාසංයුත්ත:ජරාවග්ග: දුතියා සූත්‍රය, පි. 96.

▼ **උසස් ධර්ම පුහුණුව ලබන බුද්ධ ශ්‍රාවකයකු** තුළ ඇති ගුණ ධර්ම 7න් එකක් ලෙස ශ්‍රද්ධාව පෙන්වා ඇත. **බලන්න**: සප්ත සද්ධර්මය.

තථාගතයන් වහන්සේගේ බුද්ධත්වය පිළිගැනීම- නව ගුණ විස්වාස කිරීම ශ්‍රද්ධාව වේ:

**"…සද්දහති තථාගතස්ස බොධිං: ඉතිපි සො භගවා අරහං…"**

**මූලාශ්‍ර**: ම.නි: (2 ): 2.1.3 :සේඛ සූත්‍රය, පි. 44, MN 53: Sekha Sutta, p. 436.

▼ **අශ්‍රද්ධාව නිසා** උද්දච්චය, අසංවරය හා දුෂ්චරිතබව (දුසිල්වත්) ඇතිවේ. පාපමිත්‍ර සේවනය, අන්‍යයන්ට අගරු කිරීම- අනාදරය හා වැරදි දේ නිවරැදී කිරීමට ඇති අපහසුව (හිතුවක්කාරබව-මුරණ්ඩුකම) අශ්‍රද්ධාව ඇතිවීමට හෙතුවේ. අන්‍යයන්ට ගරුකිරීමට පුරුදුවීම, වැරදි නිවැරදි කරගැනීමට ඇති කැමත්ත හා කල්‍යාන මිත්‍ර සේවනය වැනි ගුණ මගින් අශ්‍රද්ධාව පහකරගත හැකිබව මෙහි දක්වා ඇත. **මූලාශ්‍ර:** අංගු.නි:(6)10 නිපාත:10.2.3.6.තයොධම්ම සූත්‍රය, පි.284, EAN: 10: 76-6. Incapable, p. 524.

▼ **ශ්‍රද්ධාව ප්‍රකටවීම**: බුදුන් වහන්සේ කෙරෙහි ස්ථිර ලෙසින්ම විස්වාසය ඇතිව සිටින කෙනෙකුගේ ශ්‍රද්ධාව ප්‍රකටව පෙනීම පිණිස ඔහු තුල උතුම් ගුණ 11ක් තිබිය යුතුයයි මෙහි දී දක්වා ඇත. **මූලාශ්‍රය:** අංගු.නි: (6): 11 නිපාත: 11.2.4 සුභූති සූත්‍රය, පි. 661.

▲ **ශ්‍රද්ධාසම්පන්නබව**- Having faith: බුදුගුණ (නව අරහාදී), බුදුන් වහන්සේගේ බුද්ධත්වය පිළිගැනීම ශ්‍රද්ධාසම්පන්නවීමය (සැදැ ඇතිබවය). මෙය ගිහි උපසකයෙක් සතු ගුණයක් බව මෙහි පෙන්වා ඇත. **මූලාශ්‍රය:** සංයු.නි: (5-2) මහාවග්ග: සෝතාපත්තිසංයුත්ත:පුඤ්ඤාභිසන්දවග්ග: 11.4.7 මහානාම සූත්‍රය.

▲ **ශ්‍රද්ධා ඉන්ද්‍රිය**: පාලි: **සද්ධිනද්‍රියං -**faculty of faith: ශ්‍රද්ධා ඉන්ද්‍රිය, ආධ්‍යාත්මික ඉන්ද්‍රිය පහෙන් එකකි, ආධ්‍යාත්මික මාර්ගයට විශේෂතාවයක් ලබා දෙයි. බෝධිපාක්ෂික ධර්මතාවයකි. සෝතාපන්න ආරිය ශ්‍රාවකයා ශ්‍රද්ධා ඉන්ද්‍රිය පරිපූර්ණ කර ඇත. **බලන්න**: පංච ඉන්ද්‍රිය. **සටහන**: සංයු.නි: (5-1) මහාවග්ග: ඉන්ද්‍රිය සංයුත්තයේ සූත්‍රයන්හි, ශ්‍රද්ධා ඉන්ද්‍රිය විස්තරාත්මකව පෙන්වා ඇත.

▼ **ශ්‍රද්ධා ඉන්ද්‍රිය කුමක්ද?** බුදුන් වහන්සේ මෙසේ වදාළහ:

**"කතමඤ්ච භික්ඛවෙ සද්ධිනද්‍රියං: ඉධ භික්ඛවෙ අරියසාවකො සද්ධො හොති, සද්දහති තථාගතස්ස බොධිං: "ඉතිපි සො භගවා අරහං සම්මාසම්බුද්ධො, විජ්ජාචරණසම්පන්නො, සුගතො, ලොකවිදූ, අනුත්තරො පුරිසදම්මසාරථී, සත්ථා දෙවමනුස්සානං බුද්ධො භගවා'ති ඉදං වුච්චති සද්ධිනද්‍රියං"**: ආරිය ශ්‍රාවකයා තථාගතයන් වහන්සේ ගේ බුද්ධත්වය පිළිගනී: නව බුදුගුණ අදහයි. එලෙස, විශ්වාසීව, නිශ්චිත වශයෙන් බුදුන් වහන්සේගේ සම්බෝධිය පිළිගැනීම ශ්‍රද්ධා ඉන්ද්‍රිය ය. සෝතාපන්නබව තුලින් ශ්‍රද්ධා ඉන්ද්‍රිය දැකිය හැකිය. **මූලාශ්‍ර**:සංයු: (5-1): මහාවග්ග: ඉන්ද්‍රියසංයුත්ත: 4.1.8 දට්ඨබ්බ සූත්‍රය හා 4.1.9. විභංග සූත්‍රය, පි. 377, ESN: Mahavagga: 48: Indriyasamyutta: 8.8 To be seen & 9.9 Analysis, p. 1933.

▲ **ශ්‍රද්ධාබලය-**Power of faith

ශ්‍රද්ධා බලය, ආධ්‍යාත්මික මාර්ගයට විශේෂතාවයක් ලබා දෙයි. බෝධි පාක්ෂික ධර්මතාවයකි. **බලන්න**: පංචබල. **සටහන**: සංයු.නි: (5-1) ඉන්ද්‍රිය සංයුත්තයේ සූත්‍රයන්හි, ශ්‍රද්ධාබලය විස්තරාත්මකව පෙන්වා ඇත.

▼**ශ්‍රද්ධාබලය,** සේඛබල පහඅතුරින් එකකි. **මූලාශ්‍ර:** අංගු.නි (3 ) 5 නිපාත: 5.1.1.1.සේඛබල සන්ඛිත්ත සූත්‍රය හා 5.1.1.2. සේඛබලවිත්ථ සූත්‍රය,පි. 24, EAN:5: The Trainee's Powers 1.1 & 2.2 , p. 238.

▲**ශ්‍රද්ධානු සාරී**: පාලි: **සද්ධානුසාරී-** faith-follower : ශ්‍රද්ධානු සාරී පුද්ගලයා හට තථාගතයන් වහන්සේ කෙරෙහි දැඩි ශ්‍රද්ධාවක්, ප්‍රේමයක් ඇත. ඔහු ආරිය පුද්ගලයන් සත් (7) දෙනාගෙන් කෙනෙකි. ධර්මානුසාරී පුද්ගලයාට මෙන් ධර්මය නිරුත්සාහයෙන් අවබෝධවේ නොවේ. විරිය ඇතිව ඔහු කෙළෙස් නිවාගනී. **බලන්න**: ESN: note: 198, p. 2412, සත්ආරිය පුද්ගලයෝ.

▼**අභ්‍යන්තර ආයතන 6** (චක්ඛු ආදී) -අනිත්‍යය, වෙනස්වේ, විපරිනාමවේ. ඒ බව යථා ලෙසින් දකින ආරිය පුද්ගලයෝ සෝතාපන්න නොවී කලුරිය නොකරයි, ඔහු ශ්‍රද්ධානු සාරී ආරිය පුද්ගලයෙකි. **මූලාශ්‍ර:** සංයු.නි: (3): ඛන්ධවග්ග: ඔක්කන්තිසංයුත්ත:4.1.1. චක්ඛු සූත්‍රය,පි. 470, ESN: 25: Okkantisamyutta: 1 The eye, p. 1140.

▼ **ශ්‍රද්ධානු සාරී:** අනුත්තරවූ දස දෙනා අතරින් එක් පුද්ගලයෙකි. ඔහු ප්‍රඥාවෙන් චතුසත්‍ය දැක ආසව ප්‍රහීණය කොට නැත, සෝතාපන්න මාර්ගයට පැමිණ සිටි, ඔහුගේ පංච ඉන්ද්‍රිය ධර්ම වැඩිඇත. අප්‍රමාදව ධර්ම මාර්ගයේ කටයුතු කරගන්නේ නම් මේ භවයේදීම අරහත්බව සාක්ෂාත් කරගැනීමට හැකියාව ඇත. **මූලාශ්‍රය**:ම.නි. (2) 2.2.10. කීටාගිරි සූත්‍රය,පි. 251.

▲**ශ්‍රද්ධාවිමුක්ත-** one liberated-by-faith: තථාගතයන් පිළිබඳව මුල් බැසගත් ශ්‍රද්ධාව ඇති (ආකාරවතී ශ්‍රද්ධාව) ආරිය ශ්‍රාවකයා මෙලෙසින් හඳුන්වයි. විස්තර පිණිස **බලන්න**: සත් ආරිය පුද්ගලයෝ.

▼**ශ්‍රද්ධා විමුක්ති** උතුමා අරහත් මාර්ගයට පිළිපන් කෙනෙක් බව මෙහි පෙන්වා ඇත. සද්ධා ඉන්ද්‍රිය බලවත් මෙතෙම, අරූප විමුක්තියාතන නොලබයි. සද්ධා විමුක්ති පුද්ගලයා අරහත් මගඵල නොලැබූ නිසා ඔහු සේඛ ලෙසින් හඳුන්වයි, ඔහු අරහත්බව ලබන්නේ ප්‍රඥා විමුක්තිය තුලිනි. **මූලාශ්‍රය:**අංගු.නි:1: 3 නිපාත,3.1.3.1,සූත්‍රය, පි. 260.

▲ **ශ්‍රද්ධාවෙන් දැකිය යුතු සිව් ස්ථාන-** four places to be seen with faith: සැදැහැති බොදුපිරිස විසින් දැකිය යුතු ස්ථාන 4 ක් (පූජනිය ස්ථාන) පිළිබඳව බුදුන් වහන්සේ විස්තර කර ඇත:1) තථාගතයන් වහන්සේ උපන් ස්ථානය 2) තථාගතයන් වහන්සේ අනුත්තරවූ සම්මා සම්බෝධිය අවබෝධ කල ස්ථානය 3) තථාගතයන් වහන්සේ අනුත්තර ධර්මචක්‍රය පැවැත්වූ- පළමු ධර්ම දේශනාව පැවැත්වූ ස්ථානය. 4) තථාගතයන් වහන්සේ පරිනිර්වාණයට පත්වූ ස්ථානය. බුදුන් වහන්සේ මෙසේද වදාළහ:

"ආනන්ද, සැදැහැවත් මහණ, මෙහෙණි, උපාසක උපාසිකාවන් (පෙරකී කරුණු සතර සලකා) මේ තැන් කරා පැමිණෙන්නේය. යම් කෙනෙක්, එම චෛත්‍ය චාරිකාව කරනවිට පහන් සිත් ඇතිව කලුරිය කරන්නේ නම්, ඒ හැම මරණින් මතු මනාප ගති ඇති දෙව්ලොව පහලවේ". (Ananda, the faithful monks and nuns, male and female lay-followers will visit those places. And any who die while making the pilgrimage to these shrines with a devout heart will, at the breaking-up of the body after death, be reborn in a heavenly world) **සටහන්:** * ස්ථාන 4 පිලිවෙලින්: 1) ලුම්බිණි උයන, රුම්මින්දී, නේපාලය, 2) බුද්ධගයාව (උරුවෙල) බිහාර්, ඉන්දියාව, 3) ඉසිපතන මිගදාය, සාරනාත්, බරණැස, ඉන්දියාව, 4) මල්ල රජදරුවන්ගේ සල් උයන, කුසිනාරා නුවර, ඉන්දියාව. ** මේ ස්ථාන දැක දහම් සංවේගය ඇතිකරගෙන - ධර්මයේ හැසිරීමට අප්‍රමදාවිමට කටයුතු කල යුතුවේ. **මූලාශ්‍ර:** අංගු.නි: (2 ):4 නිපාත: 4.3.2.8. සංවේජනීය සූත්‍රය, පි. 254, EAN:4: 118.8 Inspiring, p. 191, බු.ජ.ත්‍රි:දීඝ.නි (2 කාණ්ඩය): 2 මහාපරිනිර්වාණ සූත්‍රය, පි. ඡේදය 34. පි. 158, EDN: 16 : Mahāparinibbāna Sutta: The Great Passing, The Buddha's Last Days, p. 176.

▼ **වෙනත් මූලාශ්‍ර:1**."Buddhist Pilgrimage" by Chan Khoon San, Buddha Dharma Education Association Inc., 2002 (ලුම්බිණි, බුද්ධගයාව, සාරනාත් හා කුසිනාරා පිලිබඳ චාරිකා විස්තරය මෙහි ඇතුලත්වේ).

▲**ශ්‍රාද්ධ-**Shraddha: මියගිය ඥාතීන්ට ගරු කිරීම පිණිස බමුණන් විසින් කරණ වත්පිළිවෙත මෙලෙසින් හඳුන්වයි. (Ceremony in honor for the benefit of dead relatives). **බලන්න**: මළවුන් අනුස්මරණය. **මූලාශ්‍රය**: අං.ගු.නි:( 6):10 නිපාත,ජානුසොණි වගග,10.4.2.11, ජානුස්සෝනි සූත්‍රය**,**පි.518.

**ශන**

▲ **ශාන්ත-**serene: ධර්මයට අනුව ශාන්ත යනු සිතේ නිමුණබව- සංසුන්බවය. බුදුන් වහන්සේ 'ශාන්තමුණි' ලෙසින් හඳුන්වයි. **බලන්න**: බුද්ධනාම. **සටහන:** ජානසමාපත්ති ලබා නිවුන සිත ශාන්ත-පස්සදිය ලෙසින්ද දක්වා ඇත.

▼ **වනදෙවියෙක්** ඇසූ පැණයකට පිළිතුරු ලෙසින් බුදුන් වහන්සේ පෙන්වා ඇත්තේ වනයේ වාසයකරන-වනවාසී, ධර්මානුකූලව වෙසෙන භික්ෂූන්ගේ ස්වභාවය ශාන්තය, ඔවුන්හට පහන් ශරිර වර්ණය ඇත. **බලන්න:**ශරීර වර්ණය. **මූලාශ්‍ර:** සංයු.නි: (1): සගාථවග්ග: දේවතාසංයුත්ත: 1.1.10: අරඤ්ඤ සූත්‍රය, ESN: 1: Devatasamyutta: 10.10 Forest, p. 67.

▲ **ශාන්ත විහරණ-**Peaceful attainments: අරූපසමාපත්ති ලබා ගැනීම ශාන්ත විහරණයවේ. එනම්: ආකසානඤ්ච, විඤ්ඤාණඤ්ච, ආකිඤ්චඤ්ඤා, නෙවසඤ්ඤානාසඤ්ඤා යන අරූප සමාපත්ති 4 ලබා ගැනීමය. මේවා අෂ්ඨ සමාපත්තින්ට ඇතුලත්වේ. **බලන්න:** අෂ්ඨ සමාපත්ති, අරූපසමාපත්ති.. **සටහන**: අං.ගු.නි: (2): 4 නිපාත: බ්‍රාහ්මණවග්ග: භික්ඛුසංගපොමන සූත්‍රයේදී සතර අරූප සමාපත්ති විස්තර කර ඇත.

**මූලාශ්‍ර**: ම.නි: (1):1.1.8 සල්ලේඛ සූත්‍රය, පි. 112, EMN: 8- Effacement,p.108.

▼ **අරූපධ්‍යාන හෝ අරූපසමාපත්තිය** ලැබීම ශාන්ත විමොක්ෂය වේ. එම සමාපත්තිය දසධර්මතා වලින් එක් කරුණකි. **බලන්න**: දසධර්ම. **මූලාශ්‍රය**:අං.ගු.නි: (6): 10:10.1.1.8 සද්ධා සූත්‍රය,10.1.1.9. සන්ත විමොක්ඛ සූත්‍රය,පි.50.

▲ **ශූන්‍යතාව -** Emptiness: ශූන්‍යතාවය යනු හිස්බව- කිසිවක් නැතිබවය. **බලන්න**:සුඤ්ඤතාව.

▲ **ශූන්‍යතා විහරණය-**abide in void-ness: බුදුන් වහන්සේ හා රහතුන්ගේ විහරනයය. **බලන්න:** සුඤ්ඤත විහරනය.

**ශම**

▲**ශ්‍රමණ:** පාලි: සාමඤ්ඤ- Ascetic: ශ්‍රමණ (සමණ) ගිහිගෙය හැර, බ්‍රහ්මචරියාවේ යෙදන, බුදුන් වහන්සේගේ ශ්‍රාවක සංඝයා හඳුන්වන ආකාරයය. බුදුන් වහන්සේ, ශ්‍රමණ ගෝතම, මහා ශ්‍රමණ ලෙසින්ද හඳුන්වයි. ශ්‍රමණ ලෙසින් හැඳින්වීම පිණිස, පංච උපාදානස්කන්ධය මැනවින් අවබෝධ කරගත යුතුවේ. එහි, ආස්වාදය, ආදීනවය හා නිස්සරණය මැනවින් දැන වාසය කලයුතු වේ යයි බුදුන් වහන්සේ

වදාළහ. **මූලාශ්‍ර:** සංයු.නි: (3 ): ඛන්ධසංයුත්ත: 1.3.15**.** **සමණ සූත්‍රය,** පි. 306, ESN: Khandasamyutta: 107.5 Ascetic , p. 1097.

▼ **ශ්‍රමණ යනු කවරේද?**: ධර්මතා 7 ක් කඩාබිඳ දැමීමෙන් කෙනෙක් ශ්‍රමණ බවට පත්වෙන බව බුදුන් වහන්සේ පෙන්වා ඇත: සක්කාය දිට්ඨිය, විචිකිච්ඡාව, සීලබ්බතපරාමාසය, රාගය, දෝෂය,මෝහය (අකුසල්මුල්) හා මානය. **මූලාශ්‍ර:** අංගු.නි: ( 4 ): 7 නිපාත: 7.2.4.2 සමණ ධම්ම සූත්‍රය, පි. 510, EAN:7: 86.2  An Ascetic,  p. 406.

▼ **එක් සමයක** ජානුස්සෝනි බ්‍රාහමණයා විසින් විමසානු ලැබුව බුදුන් වහන්සේ ශ්‍රමණයන්- බුද්ධ ශ්‍රාවකයන් ගැන මෙසේ පවසා ඇත:

"ඔවුන්ගේ අභිප්‍රාය (අරමුණ-aim) නම් ක්ශාන්ති-ඉවසීම හා මුදුබවය, ඔවුන්ගේ සෙවීම (ගවේශනය-quest)  ප්‍රඥාවයය, ඔවුන්ට ඇති ආධරය ශිලසම්පන්නබවය, ඔවුන්ගේ කැමැත්ත ග්‍රහණය නැතිබව- ශුන්‍යබවය, ඔවුන්ගේ අවසාන ඉලක්කය නිවනය". **මූලාශ්‍රය:** අංගු.නි: (4): 6 නිපාත:ධම්මිකවග්ග: 6.1.5.10 ඛත්තිය සූත්‍රය, පි.154.

▼ **ශ්‍රමණ සුඛය හා දුක**: යම් ශ්‍රමණයෙක් තමනට ලැබෙන සිව්පසින් සෑහිමට පත්ව වාසය කරයි නම්, ඔහුට නෙක්කම්ම සංකල්පනා ඇත්නම්, බඹසරඇත්නම්,  ඔහු සුවයෙන් වාසය කරයි. එහෙත්, සිව්පසයෙන් ඉන් සෑහිමට පත්නොවී සිටින්නේ නම්, අරතිය, කාමවිතක්ක බහුල නම් එය දුකය. **මූලාශ්‍රය:** අංගු.නි: (3) 5 නිපාත: ගිලානවග්ග: 5.3.3.7 හා 5.3.3.8 සූත්‍ර, පි.260.

▼**බුදුන් වහන්සේ මෙසේ වදාළහ**:

" මේ ලෝකයේ ශ්‍රමණයෝ කෙළෙස් රහිතය, ශාන්තය (ගැටීම රහිතව වාසය කරයි), ඔවුන්ගේ ජීවිතය ඵල දායිය. ඔවුන් තණ්හාව පිරිසිඳ අවබෝධ කර ඇත. සැම කල්හිම ඔවුන් නිදහස් සුවය විඳී. ශිල සම්පන්න වූ ඔවුනට, මවද, පියාද ,සොහොයුරෝද වන්දනා කරති. පහත් කුලයක උපන්නාවුවද, ශ්‍රමණබව ලත් උතුමෙකුට, ශාක්‍යයන් ද ගරු කරති. **මූලාශ්‍ර**: සංයු.නි: (1): සගාථවග්ග: දේවතාසංයුත්ත: 1.8.11 අරණ සූත්‍රය, පි. 110, ESN:1: Devathasamyutta: 81.11. Without conflict, p. 164.

▼**ශ්‍රමණ ධර්ම**: පව්-අකුසල සමනය කරන නිසා -පහකරගන්නා නිසා ශ්‍රමණ යයි මෙහිදී පෙන්වා ඇත. කෙනෙක් ශ්‍රමණ බවට පත්කරන ධර්මතා (හිරිඔත්තප්ප, ඉන්ද්‍රිය සංවර ආදී ගුණ) මේ සූත්‍රයේදී විස්තරාත්මකව පෙන්වා ඇත. සියලු කෙළෙස් හැර, ජරාමරණ අවසන් කල, විමුක්තිය ලැබූ ආරිය උතුමා, ශ්‍රමණය. **මහණ කෙනෙක් ශ්‍රමණ වීම පිණිස තිබිය යුතු ගුණ-ශ්‍රමණ ගුණ:** 1) හිරිඔතප් තිබීම (shame and fear) 2) පිරිසිදු කාය, වාක්, මනෝ සමාචාරය හා ආජීවය (purified bodily, verbal, mental conduct, and livelihood) 3) ඉන්ද්‍රිය සංවරය (restraint of the senses) 4) භෝජනයේ මාත්‍රඥබව(moderation in eating) 5)නිදිවැරීම (wakefulness) 6) සති සම්ප්‍රජන්‍යය (mindfulness and full awareness) 7) නීවරණ ප්‍රහීණකර තිබීම (abandoning of the hindrances) 8) සිව්ජාන ලබාගැනීමේ හැකියාව 9) ත්‍රිවිධඥාන ලැබීම (තෙවිජ්ජා-the three true knowledges). මේ ගුණාග සතු භික්ෂුව **ශ්‍රමණ-බ්‍රාහමණ** ලෙසින් හඳුන්වයි. ඔහු සියළු කෙලෙසුන්ගෙන් පිරිසිදුවී ඇත,

ධර්මය අවබෝධකර ඇත, ධාර්මික පඬිවරකි, ආරිය උතුමෙකි, රහතන්වහන්සේය. ඔහු සියලු කෙලෙස් නිසලකරඇත, දුක ගෙනෙදෙන යළි උපත නිමාකර ඇත එමනිසා ඔහු ශ්‍රමණය ය. **සටහන**: ශ්‍රමණ හා බ්‍රාහ්මණ යනු විමුක්තියලැබූ ආරියන් හඳුන්වන පද බව මෙහි පෙන්වා ඇත. **මූලාශ්‍ර**: ම.නි (1) 1.4.9. මහාඅස්සපුර සූත්‍රය, පි. 652, EMN: 39: Mahā-Assapura Sutta-The Greater Discourse at Assapura, p. 340.

▼ **ශ්‍රමණ ධර්මය** නම් ආරිය අටමගය.: **මූලාශ්‍රය**: සංයු.නි: (5-1) මහාවග්ග: මග්ගසංයුත්ත: සාමඤ්ඤ සූත්‍රය, පි.68.

▲**ශ්‍රමණ ඵල**: ශ්‍රමණ ඵල (පැවිදිවීමේ ප්‍රතිලාභ- **සාමඤ්ඤඵල** -fruit of the homeless life) යනු සිව්මගඵල (සෝතාපන්න සිට අරහත් දක්වා) සාක්ෂාත් කරගැනීමට හැකියාව ලැබීමය යි මෙහි දක්වා ඇත. **මූලාශ්‍රය:** සංයු.නි: (5-1) මහාවග්ග: මග්ගසංයුත්ත: සාමඤ්ඤ සූත්‍රය, පි.68

▼**මෙහිදී බුද්ධ ශාසනයේ ශ්‍රමණබව** ලැබීමේ යහපත විස්තරාත්මකව පෙන්වා ඇත: 1) ගිහිජීවිතයේ සේවකයෙක්, යටත් වැසියෙක් ආදිලෙසින් පහත් තත්වයක සිටි කෙනෙක් පසුව ගිහිගෙය හැර මහණවී යහපත් ලෙසින් මහණදම් පුරන්නේ නම් පෙරදී ඔහුට වඩා ඉහළ තත්වයක සිටි අය පවා ඔහුට ගරු කරයි, සිව්පස පූජාකරයි. 2) එමප්‍රතිලාභ වලට වඩා අග්‍ර ප්‍රතිලාභ නම්: සීලසම්පන්නවීම නිසා කායික හා මානසික සුවය ඇතිව කිසි බියක් නැතිව ලදදෙයින් සැහීමට පත්ව සාමකාමී ජීවත්වීමට ගෙවීමට ඇති වාසනාව; සිත එකඟකර නීවරණ පහකරගැනීමෙන් සමාධිසුවය ලැබීමට හැකි වාසනාව, කෙළෙස් බැහැර කරගැනීමෙන් පිරිසිදුවූ සිතෙන් විදසුන් නුවණ වඩා ඉර්දිබල, දිවැස් වැනි අතිසාමාන්‍ය බල ලැබීමට හැකිවීම, සියළු කෙළෙස් නසා උතුම් විමුක්තිය ලැබීමට ඇති වාසනාව ආදී විවිධවූ යහපත් ඵල ලැබීම. **මූලාශ්‍ර**: දිඝ.නි: (1 ): 2 ශ්‍රමණඵල සූත්‍රය, පි.98, EDN:2 Sāmaññaphala Sutta: The Fruits of the Homeless Life, p. 87.

▼**සතර ශ්‍රමණඵල** යනු ශ්‍රමණභාවය පියවරින් පියවර දියුණුකර ගැනීම නිසා ලැබෙන යහපත් ඵල විපාකයන්ය: සොතාපන්න, සකදාගාමී, ආනගාමී හා අරහත් ඵල ලැබීමය. සතර ශ්‍රමණ ඵල, සච්ජිකාතබ්බ ධර්මයකි. **බලන්න**: සතර ශ්‍රමණඵල. **මූලාශ්‍ර:** දීඝ.නි : (3 ): 11 දසුත්තර සූත්‍රය, පි. 483, EDN: 34: Dasuttara Sutta: Expanding Decades, p. 384.

▲ **ශ්‍රමණදූෂක**: පාලි: **සමණදූසී-** Shramana dushaka: යහපත් භික්ෂූන් අතරට පැමිණ අයහපත් ලෙසින් හැසිරෙන පුද්ගලයෙක් ශ්‍රමණදූෂක යයි ධර්මයේ පෙන්වා ඇත. ඒම පුද්ගලයා ශ්‍රමණවේශය ගෙන, ශ්‍රමණ ඉරියව් ඇතිව හැසිරුනද ඔහු ගේ අභ්‍යන්තරය යහපත් නැත (ඔහු වෙනත් ගුරුවරයෙකු පිළිපදින කෙනෙකි). ඔහුගේ වැරදි ක්‍රියා එළි දකිනවිට - කෝපය, ද්වේශය ආදී ලක්ෂණ නිසා, ඔහු යහපත් ශ්‍රමණයෙක් නොවන බව අන්‍යයන්ට අවබෝධ වේ. එවිට ඔහු සංඝයා වෙතින් බැහැර කලයුතුය යයි බුදුන් වහන්සේ වදාළහ. මේ පිළිබඳ දක්වා ඇති **උපමාව:** යව කෙත **උපමාව**. කුඹුරක (යව කෙතක) වගා කර ඇති හොඳ යව (බාර්ලි) අතර නරක යව පැල ඇතිවූ විට, ඒවා නිසා හොඳ යව පැලද විනාසවේ. එලෙස, යහපත් සංඝයා අතරට ශ්‍රමණවේශය ගෙන

පැමිණෙන නරක පුද්ගලයන්ගෙන් සංඝයාට හානි විපත් සිදුවේ යයි බුදුන් වහන්සේ වදාළහ. **මූලාශ්‍ර**:අංගු.නි: (5): 8 නිපාත: 8.1.1.10 කාරණ්ඩව සූත්‍රය, පි. 56, EAN:8: 10.10 Trash, p. 411.

▲**ශ්‍රමණ කාර්ය-**duty of an ascetic: ශ්‍රමණ කාර්ය (මහන දහම) කුමක්ද? ''මේ සසුනේ මහණ ආක්‍රෝශ කරන අයට පෙරළා ආක්‍රෝශ නොකරයි, ක්‍රෝධ කරන අයට පෙරළා ක්‍රෝධ නොකරයි, දබර කරන අයට පෙරළා දබර නොකරයි... එහෙයින්, මෙසේ හික්මිය යුතුය: ස්වකිය සබ්‍රහ්මචාරින් කෙරහි දුෂ්ඨ සිත් නොමැතිව වාසය කලයුතුය. දිට්ඨිසම්පන්න එක භික්ෂුවකට හෝ පරිභාව කිරීම බොහෝ පව් රැස්වීමට හෙතුවේ. එහෙයින් , අනුන්ට හිංසා නොකිරිමෙන්, අනුන්ට මෙන්ම තමන්ට ද ආරක්ෂාව ලැබේ''. **මූලාශ්‍ර:** අංගු.නි: (4) : 6 නිපාත:ධම්මිකවග්ග: 6.1.5.12 ධම්මික සූත්‍රය,පි.160, EAN:6: 54.12 Dhammika, p.343.

**ශර**

▲ **ශරීරය-** body: ශරීරය යනු සතර මහාභූතයන්ගෙන් (පඨවි ආදී) සකස්වූ කයය. **බලන්න**: කය, සතරමහාභූත.

▲**ශරීර යානය-**The body vehicle: මෙහිදී ශරීරය රියක්- යනාවක් ලෙසින් දක්වා ඇත. ඒ යානයේ සක් (රෝද) සතරකි, දොරවල් 9 ක්වේ, අශුචියෙන් පිරිඇත, ලෝභයෙන් බැඳී ඇත, මඬේ ඉපදී ඇත. **බලන්න:** උපග්‍රන්ථය:5 **සටහන**: අටුවාවට අනුව රෝද 4 : කයේ සිව් හැසිරිමය- ඇවිදීම, සිටගැනීම, හිඳගැනීම, ඇලවීසිටීම. නව දොර: ඇස් 2, කන් 2, නාසයේ සිදුරු 2, මුව, මුත්‍රාපිටකරන ස්ථානය, ගුදය. අශුචියෙන් පිරිඇත: කයේ ඇති 32ක්වූ අපවිත්‍ර කොටස්. යානය ලෝභයෙන් බැඳීම: තණ්හාවෙන් බැඳී ඇත. මඬේ ඉපදී ඇත: මවගේ ගැබය. **බලන්න**: ESN :note 55, p 509. එවැනි යානයක් හැර දමන්නේ කෙසේද යයි දෙවියෙක්, විමසූ විට බුදුන් වහන්සේ මෙසේ වදාළහ:

'' රැහැන හා වරපට කපා දමා, ලාමක ආශාවන් හා ලෝභය සිඳ දමා, තණ්හාව මුලින්ම ගලවා දැමූවිට, කයෙන් (කය නමැති යානයෙන්) මිදිය හැකිය''. **සටහන:** රැහැන ලෙසින් පෙන්වා ඇත්තේ ක්‍රෝධයය (උපනාහ), වරපට: ඉතිරි කෙළෙස්ය. ආශාවන් යනු, තමන්ට නොලැබුණ දේ ලබාගැනීමට ඇති කැමැත්ත (ලාමක ඉච්චා), ලෝභය, දැඩි ආශාවය. තණ්හාව මුලින්ම ගලවා දැමීම යනු අවිද්‍යාව සහමුලින්ම පහ කර ගැනීමය. **බලන්න**: ESN :note 56, p 509. **මූලාශ්‍ර:** සංයු.නි: (1): සගාථවග්ග: දේවතාසංයුත්ත: 1.3.9 චතුචක්ක සූත්‍රය, පි.56, ESN:1: devathasamyuththa: 29.9. Four wheels, p. 92.

▲ **ශරීර වර්ණය-** Body color: ශරීර වර්ණය ලෙසින් පෙන්වා ඇත්තේ සමේ පැහැයය. බුදුන් වහන්සේ වැඩසිටි සමයේ වර්ණය අනුව කුල-පංති බෙදාඇත. **බලන්න**: කුලය.

▼ **වනයේ වාසයකරන භික්ෂූන්ගේ** ශරීර වර්ණයේ පැහැපත්බව දැක ඒ ගැන වනදෙවියෙක් බුදුන් වහන්සේ විචාළහ. බුදුන් වහන්සේ මෙසේ වදාළහ:

" අතීතය ගැන ශෝක නොකරන, අනාගතය නොපතන, වර්තමානයේ ලද දෙයින් සෑහීමට පත්ව (වනයේ) වාසය කරන භික්ෂුන්ගේ ශරීර වර්ණය පැහැපත්ය, ශාන්තය". එහෙත්, අනාගතය පතන, අතීතය ගැන දුක් වන, අනුවණ පුද්ගලයෝ, කපා දැමූ නිල් බට දණ්ඩක් වියලී යන ලෙස දුර්වර්ණව වියලී යති. **මූලාශ්‍ර**: සංයු.නි: (1) සගාථවග්ග, අරඤ්ඤ සූත්‍රය පි. 36, ESN: 1: sagatha vagga, 10.10 Forest, p 68.

▲ **ශරීරස්ථ ධර්ම**: පාලි: **සරීරට්ඨා ධම්මා-**Dhamma that subsist through the body: ශරීරස්ථ ධර්ම යනු කය නිසා පැවතෙන ධර්මතාය. බුදුන් වහන්සේ ශරීරස්ථ ධර්ම 10ක් පෙන්වා ඇත: **1** ශිත **2** උෂ්ණය **3** බඩගින්න **4** පිපාසය **5** මලපහකිරීම **6** මුත්‍රාකිරීම **7** කාය සංවරය **8** වචීසංවරය **9** ආජීව සංවරය-**10** පුනර්භවය ඇතිකරන චේතනා ( භව සංඛාර).

**" දස ඉමෙ භික්ඛවෙ ධම්මා සරීරට්ඨා: සීතං, උණ්හං, ජිඝච්ඡා, පිපාසා, උච්චාරො, පස්සාවො, කායසංවරො, වචීසංවරො, අජීව සංවරො, පොනොභවිකො භවසඞ්ඛාරො"**: ( Bhikkhus, these ten things subsist through the body... Cold, heat, hunger, thirst, defecation, urination, bodily restraint, verbal restraint, restraint in one's livelihood, and the formative activity of existence that leads to renewed existence) **මූලාශ්‍ර**:අංගු.නි: (6):10 නිපාත: අක්කෝෂ වග්ග: 10.1.5.9**.** ශරිරස්ථ ධර්ම සූත්‍රය,පි.186, EAN: 10: 49.9 subsisting through the body, p. 512.

▲**ශාරීරික ධාතු**-Body relic's: බුදුන් වහන්සේ හා රහතුන් ගේ ස්කන්ධ පරිනිබ්බානයෙන් පසු දේහය දවා අවසන් කළවිට ඉතිරිවී ඇති කාය කොටස්, ශාරීරික ධාතු ලෙසින් පෙන්වා ඇත. එම ධාතු තැන්පත් කර ස්තුප- චෛත්‍ය ඉදිකිරීම එවැනි උතුමන්ට කරන ගරු සැලකිල්ලකි. **බලන්න**: ස්ථූප. **සටහන**: මහාපරිනිබ්බාන සූත්‍රයේදී, බුදුන් වහන්සේගේ ශාරීරික ධාතු තැන්පත් කිරීම ගැන විස්තර පෙන්වා ඇත.

**ශල**

▲ **ශිල සමාධි ප්‍රඥා:** පාලි: **සීල සමාධි පඤ්ඤා**-Virtue Samadhi Wisdom ශිල සමාධි ප්‍රඥා: ත්‍රිවිධ ශික්ෂාව, ත්‍රිවිධ කල්‍යාන ශාසනය ලෙසින්ද පෙන්වා ඇත. බ්‍රහ්මචරියා වාසය, මේ කරුණු තුන පදනම් කොටඇත. ශිල සමාධි ප්‍රඥාව සම්පුර්නවීම, මග බඹසර වැස නිමාකිරීමය, නිවන ලැබීමය. **බලන්න**: අධිශිලශික්ෂාව, අධිචිත්තශික්ෂාව, අධිප්‍රඥාශික්ෂාව, බ්‍රහ්මචරියාව.

▼ **වෙනත් මූලාශ්‍ර**: **1**. "ත්‍රිවිධ කල්‍යාන ශාසනය නම්: සසුනේ ආදී කල්‍යාන වූ ශිලය, මජ්ඣ කල්‍යාන වූ සමාධිය, පරියෝසාන කල්‍යාන වූ ප්‍රඥාව. සීලසම්පත්ති නිසා ත්‍රිවිද්‍යාව ලබයි, සමාධිය නිසා සය අභිඥා ලබයි, ප්‍රඥාව නිසා සිව්පිළිසිඹියාව ලබයි". **බලන්න:** සිංහල විසුද්ධි මාර්ගය, 1 පරිච්ඡේදය, පි. 49-50.

▲ **ශිලය:** පාලි: **සීල**- Virtue-Morality: ශිලය ලෙසින් ධර්මයේ පෙන්වා ඇත්තේ සදාචාර පැවැත්මය, එනම්, කායික වාචික හා මානසික සංවරය ඇතිව-ත්‍රිවිධ සංවරය ඇතිව යහපත් ජිවිතයක් ගත කිරීමය. ධර්ම මාර්ගයේ පදනම ශිලය වේ. යහපත් පැවැත්ම ඇතිකර ගැනීම පිණිස

ශිලයක පිහිටා-සමාදන්ව ඒ ශිලය රකිමින් වාසය කලයුතුවේ. බොදු ගිහියන් පන්සිල් නිත්‍ය ශිලය ලෙසින් රකී, උපෝසථ දිනයන්හි අටසිල් හෝ දසසිල් සමාදන්වේ. ගිහිජිවිතය අතහැර පන්සල් හෝ අසපුවල වාසය කරන අනගාරික හෝ අනගාරිකාවන් අටසිල් රකිති. සාමණේර සාමණේරියන් දස සිල් රකිති. උපසම්පදාව ලැබූ භික්ෂූන් හා භික්ෂුණියන් පාතිමෝක්ෂ සංවරශිලය- අධිශිලයේ පුහුණුවේ. **බලන්න:** කුසලශිලය හා අකුසලශිලය, ශිලසම්පන්න, පාතිමොක්ඛ සංවර ශිලය. **සටහන්**: * ශිලානුස්සති භාවනාව, නිවන පිණිස පවතී. **බලන්න**: භාවනා ** ශිලය ලෞකික හා ලෝකෝත්තර ලෙසින්ද පෙන්වා ඇත. **ලෞකික ශිලය**: පන්සිල්, අටසිල්, දසසිල්, සාමනේර ශිලය හා උපසම්පදා ශිලය. **ලෝකෝත්තර ශිලය**: සම්මා වාචා, සම්මා කම්මන්ත, සම්මා අජීවය. ලෝකෝත්තර ශිලය නිවන් දකින ජාතිය තෙක්ම පවතින දෙයකි.ඒ ශිලය ඇති පුද්ගලයා කිසිවිට දුෂ්ශිලයෙක් නොවේ.

▼ **වෙනත් මූලාශ්‍ර**: 1. "**සීලය නම්**: ප්‍රාණඝාතය ආදී අකුසලයෙන් වැළකීම හෝ වත් පිළිවෙත් පිරිම හෝ චේතනා, චෛතසික, සංවර, අව්‍යතික්‍රම (මර්ගය අවහිර කරන අකුසලයෙන් මිදීම-non-transgression) යන මේවාය. **මූලාශ්‍රය:** සිංහල විසුද්ධිමාර්ගය, පරිච්ඡේදය1, පි. 51. **2**. "නිවන ලබාදෙන බෝධි පාක්ෂික ධර්ම වැඩීමට නම් ශිලය සමාධිය හා ප්‍රඥාව ඇතිකරගත යුතුවේ. බෝධිපාක්ෂික ධර්මතා වැඩිම පිණිස අවශ්‍යවන ශිලය ලෙසින් දක්වන්නේ නිත්‍ය ශිලයටය. ගිහියන් නිත්‍යශිලය ලෙසින් පංචසීලය රැකිය යුතුය. එසේම, උපෝසථ අට ශිලය, දස ශිලයද නිත්‍ය ශිලය ලෙසින් ගිහියන් විසින් රැකීම සුදුසුය. පුහුදුන් මිනිසා ගේ ශිලය ස්ථිර නැත, ඇතැම් සික පද ඔහු අතින් බිඳිය හැකිය. එසේ වූ විට, සිල් අත් නොහැර, නැවත සීලය පිහිටුවා ගැනීමට ඉටා ගත යුතුවේ. කෙළෙස් තුනී කරගත්විට සිල් රැකීම පහසුවේ. **මූලාශ්‍රය:** බෝධිපාක්ෂික ධර්ම විස්තරය: රේරුකානේ චන්දවිමල මහානාහිමි, පි.16-21.**ශබ්දකෝෂ: පා.සිං.ශ:** පි. 525: "**සීල**: යහපත් පැවැත්ම". **B.D**: p.170: "**Sīla:** Morality, virtue: is a mode of mind & volition manifested in speech or bodily action. It is the foundation of the whole Buddhist practice…"

▼**ශිලය යහපත් ලෙසින් ආරක්ෂා** කරනවිට (කුසල ශිලයක් වූ විට), ධර්ම මාර්ගය වැඩි දියුණුවට පත්වේ. සිල්වත් පුද්ගලයා ප්‍රාර්ථනා නොකලත් ඔහු ධර්මය අනුක්‍රමයෙන් සපුරාගෙන අග්‍ර ස්ථානය- නිවන ලබා ගන්නා බව (එතරට යනබව) බුදුන් වහන්සේ පෙන්වා ඇත:

**" …ඉති බො ආනන්ද කුසලානි සීලානි අනුපුබ්බේන අග්ගාය පරෙන්ති**". **බලන්න:** කුසල ශිලය හා අකුසල ශිලය. **මූලාශ්‍ර**: අංගු.නි: (6): 10 නිපාත: 10.1.1.2 න චෙතනාය කරණිය සූත්‍රය,පි.34 හා 11 නිපාත: 11.1.1.කිමත්ථිය සූත්‍රය**,** 11.1.2 න චෙතනාය කරණිය සූත්‍රය**,** පි.611-614, EAN: 10: 2.2. Volition p.492 & 11:1-1 What Purpose 1-2 Volition*,* p.566.

▼**ශිලය පූර්ණ පුද්ගලයා** යහපත් ලෙසින් නිවන සපුරා ගන්නා බව මෙහි දක්වා ඇත. ශිලය නොමැතිනම් නිවන ලබා ගත නොහැකිය. මේ පිළිබඳ යොදාගෙන ඇති **උපමාව:** කොළ අතු නොමැති ගසක කඳ, පොත්ත හා අරටුව පූර්ණබවට පත් නොවෙන ලෙසින් සිල් නැති කෙනාට නිවන් මග

සපුරා ගත නොහැකිය. එහෙත්, කොළ අතු මනාව ඇති ගසක කඳ, පොත්ත හා අරටුව පූර්ණබවට පත්වන ලෙසින් සිල්වතාට නිවන් මග සපුරා ගත හැකිවේ. **බලන්න**: උපග්‍රන්ථය:උපමා. **මූලාශ්‍රය**:අංගු.නි.(6 ) 10 නිපාත: 10.1.1.3. ප්‍රථම උපනිස සූත්‍රය, පි.36.

▼**ආරිය අටමග උපදවා ගැනීමට ශීලය අවශ්‍යවේ.**: සිව් පිරිසිදු ශීලය: 1) පාතිමෝක්ෂ සංවරශීලය 2) ඉන්ද්‍රිය සංවරශීලය 3) ආජීව පාරිශුද්ධි ශීලය 4) ප්‍රත්‍යසන්නිශ්‍රිත ශීලය, ආරිය අටමග උපදවා ගැනීමේ පූර්ව නිමිත්ත යයි මෙහි පෙන්වා ඇත. ශීලය ඇතිවිට සම්මා දිට්ඨිය ඇතිවේ, එමගින්, සම්මා සමාධිය දක්වා මාර්ග අංග සම්පූර්ණවේ. **මූලාශ්‍ර:**සංයු.නි: (5-1) මහාවග්ග: මග්ගසංයුත්ත: සීලසූත්‍රය, පි. 78, ESN: 45: Maggasamyutta: 50. 55 virtue, p 1654.

▼**ශීලයේ විවිධත්වය**: 1) **චාරිත්ත සීලය**: බුදුන් වහන්සේ පනවා වදාළ ශික්ෂාපද එලෙසින් පිළිපැදීම. 2) **වාරිත්ත සීලය:** බුදුන් වහන්සේ යමක් ප්‍රතික්ෂේප කර ඇත්නම් ඒවා නොකිරීම. 3) **අභිසමාචාරික සීලය:** උත්තම හැසිරීමෙන් යුක්තවීම: සෝතාපන්න ආදී මගඵල පිණිස නියම කර ඇති සීලය. 6) **ආදීබ්‍රහ්මචරියක සීලය:** බ්‍රහ්මචරියාව පිණිස ඇති සීලය. මෙය **ආජීවාෂ්ටමක ශීලය** ය. එනම් ත්‍රිවිධ කාය අකුසල, සතර වචී අකුසල හා මිථ්‍යාඅජීවයෙන් වැලකිමය.7) **විරති සීලය:** ප්‍රාණඝාත ආදී අකුසලයෙන් මිදීම: සම්මා වාචා සම්මා කම්මන්ත සම්මා අජීව යන සීලය. 8) **අවිරති සීලය:** විරති කුසල සිතේ ඇතිවන සෙසු චේතනා. 9) **නිස්සිත සීලය**: කොටස් 2 කි: **තණ්හා නිස්සය**: භව සම්පත් පැතීම (දෙව්ලොව) **දිට්ඨි නිස්සය:** සීලය මගින් පාරිශුද්ධ බව පැතීම. 10) **අනිස්සිත සීලය:** නිස්සිත සීලයෙන් වෙන්ව පුරන ලෞකික ලෝකෝත්තර සීල. 11) **කාලපරියන්ත සීලය:** කාලසීමාවක් ඇතිව රකින සීලය (අටසිල් වැනි) 12) **ආපාණකොටික සීලය:** දිවිහිමි ලෙස රකින සීලය (පන්සිල් වැනි) 13) **සපරියන්ත සීලය:** යම් සීමාවක් ඇතිව සමාදන්වන සීලය ( ලාභ, කීර්ති ආදීය පතමින්), මෙය නිවන පිණිස නොවේ.14) **අපරියන්ත සීලය:** යම් සීමාවක් නැතිව සමාදන්වන සීලය. නිවන පිණිස වේ.15) **ලෞකික සීලය**: පෘතග්ජනය, භව සම්පත් පිණිසය. මෙය නිස්සරණයට ද පිහිටවෙ.16) **ලෝකෝත්තර සීලය:**.ආසව නැති, ආරියන්ගේ සීලය. 17) **ත්‍රිවිධ ශීල:** 1. හීන සීලය: කීර්තිය පිණිස සමාදන්වේ 2. මධ්‍යම සීලය: දේවලෝක උත්පත්ති ආදිය සලකා සමාදන්වන ආනිසංස සීලය 3. ප්‍රණීත සීලය: ප්‍රඥාව ඇතිව සමාදන්වන සීලය. 18) **පරාමට්ඨ සීලය**: තණ්හාව හෝ දිට්ඨිය ක් ඇතිව සමාදන්වන සීලය. 19) **අපරාමට්ඨ සීලය**: පෘතග්ජන සීලවන්තයන් ආරිය මාර්ග ලබා ගැනීමට සමාදන්වන සීලය. 20) **පටිප්පස්සද්ධ සීලය**: කෙළෙස් සංසිඳුවීම පිණිස ආරියන් සතු සීලය. 21) **පාතිමොක්ඛ සංවර ශීලය** 22) **ඉන්ද්‍රිය සංවර ශීලය.**23) **ආජීව පාරිසුද්ධි ශීලය.** විස්තර පිණිස **බලන්න:** විසුද්ධිමාර්ගය, පරිච්ඡේදය1.

▲**ශීලමය ඥාණය-**Knowledge of virtues: ශීල සංවරය නිසා, පිරිසිදු ශීලයක් පවත්වා ගැනීම නිසා ඇතිවන ප්‍රඥාව, ශීලමය ඥාණය ලෙසින් මෙහි පෙන්වා ඇත. **මූලාශ්‍රය**: ඛු.නි:පටිසම්භිදා1: ඥාණකථා: 2 ශීලමය ඥාණය, පි.102.

▲**ශිලසම්පන්න-**Virtuous: ධර්මයේ හැසිරෙන සංඝයා ශිලසම්පන්නව වාසය කිරීම ආධ්‍යාත්මික වර්ධනය පිණිස අවශ්‍ය කරුණක් වේ. ශිලසම්පන්නබව ශ්‍රමණ ඵලයක් (ශ්‍රමණබව නිසා ලැබෙන ලාභයක්) යයි බුදුන් වහන්සේ පෙන්වා ඇත. භික්ෂුවක් **'තෙර'**- වැඩිහිටි භික්ෂුවක් ලෙසින් හැඳින්වීම පිණිස අවශ්‍ය ගුණ අතරින් ශිලසම්පන්න බව එක් ගුණයකි, සේඛ ප්‍රතිපදාව පුහුණු කරණ භික්ෂුව සතු ගුණයකි. **බලන්න:** සංඝයා, සේඛ. ගිහියන්, ශිලසම්පන්නබවට පත්වන්නේ පංච ශිලය රැකීමෙන්ය.මෙය ගිහි උපසකයෙක් සතු ගුණයකි. **මූලාශ්‍රය:** සංයු.නි: (5-2) මහාවග්ග: සෝතාපත්තිසංයුත්ත:පුඤ්ඤාභිසන්දවග්ග: 11.4.7 මහානාම සූත්‍රය, පි.248.

▼**ශිලසම්පන්න වීමේ අනුසස.** ශිලසම්පන්න අයට ඇති අනුසස් 5කි: 1) මහා භෝග සම්පත් ලැබීම 2) යසස පැතිරීම 3) ඕනෑම පිරිසක් මැදට බිය නැතිව එළඹීමට හැකිවීම 4) නොමුලාව කලුරිය කිරීම 5) සුගතියේ-දෙව්ලොව යළි උපත ලැබීම. අසිල්වත් පුද්ගලයාට මේ අනුසස් නොමැත. **මූලාශ්‍රය:** ඛු.නි: උදානපාලිය:8.6 පාටලීගාමිය සූත්‍රය.

**ශව**

▲**ශ්‍රාවක සංඝයා-** Sangha disciples: බුදුන් වහන්සේගේ ශ්‍රාවක සංඝයා යනු බුදුන් වහන්සේ ගේ ධර්මය අනුගමනය කරන පැවිදි පිරිසය: භික්ෂු, භික්ෂුණි, මහණ හා මෙහෙණි. **බලන්න**:සංඝයා. උපග්‍රන්ථය:1,2.

**ශශ**

▲**ශාශ්වත දිට්ඨිය-**View of the world is eternal: බුදුන් වහන්සේ වැඩසිටි සමයේ ලෝකයා අතර පැවති දිට්ඨි 10කින් එකක් ලෙස ශාශ්වත දිට්ඨිය පෙන්වා ඇත. ලෝකය සදාකාලිකය යන මතය දැරීම. මෙය, අස්සාදදිට්ඨි ලෙසින්ද පෙන්වා ඇත.**බලන්න:** දිට්ඨි.එම දිට්ඨිය නැතිකර ගැනීම පිණිස අනිත්‍ය සංඥාව වැඩිය යුතුය. **මූලාශ්‍රය:** අංගු.නි: (4) 6 නිපාත: 6.1.6 සූත්‍රය, පි.284.

▼ **කෙනක්, රූපය, වේදනාව,** සංඥා,සංඛාර, හා විඥානය ඇසුරුකොට ගත් කල්හි ලෝකය ශාශ්වතය, යන දිට්ඨිය ඔවුන් තුළ ඇතිවෙන බව බුදුන් වහන්සේ මේ සූත්‍රයේ විස්තර කර ඇත. සෝතාපන්නවූ විට සියලු දිට්ඨි වලට ඇති බැඳීම අවසන්වේ. **සටහන:** සක්කාය දිට්ඨිය නිසා මෙවැනි දිට්ඨි ඇතිවීම ගැන විස්තර පින්ස බලන්න:සංයු.නි: (4) සළායතනවග්ග: චිත්තසංයුත්ත: 7.1.3 ඉසිදත්ත සූත්‍ර පි.552. **මූලාශ්‍රය:** සංයු.නි: (3): ඛන්ධක වග්ග: දිට්ඨිසංයුත්ත:3.1.9 සස්සත සූත්‍රය, පි.430.

**ශෂ**

▲**ශිෂ්‍යයා-** Student: බුදුන් වහන්සේ වෙත පැවිදිව පුහුණුවලබන සංඝයා ශිෂ්‍ය-සේඛ (trainee) ලෙසින් පෙන්වා ඇත. අරහත්වය ලබනතෙක් ඔහු ශිෂ්‍ය-සේඛය. **බලන්න:** සේඛ, අසේඛ.

## ෂ කොටස:

**▲ෂට් අසාධාරණ ඥාන-** Six special knowledge's: ෂට් අසාධාරණ ඥාන ලෙසින් පෙන්වා ඇත්තේ බුදුවරුන්ට සීමිතවූ විශිෂ්ඨ ඥාණ 6 ක් ය. **බලන්න**: බුදුන්වහන්සේ. **මූලාශ්‍රය:** බු.නි: පටිසම්භිදා1: මහාවග්ග ඤාණකථා.

## හ කොටස: හත,හද,හඳ,හන,හම,හර,හල,හස

**හත**

**▲ හත්තක අලාවක කුමාර-** Prince Hatthaka of Āḷavī: **බලන්න**: උපග්‍රන්ථය:3

**▲ හත්ථිගාම ගහපති උග්ග -** Ugga Householder of Hatthigāma: බුදුන් වහන්සේගේ අග්‍ර උපාසකයෙක් වූ මොහු උග්ග හත්ථිගාම ගහපති ලෙසින්ද හඳුන්වා ඇත**. බලන්න**: උප ග්‍රන්ථය: 3

**▲ හත්ථරෝහක හමුදාව-** Elephant battalion: හත්ථරෝහක හමුදාව- හස්තිහමුදාව, රජකෙනෙක්ගේ සේනාවේ එක් අංගයකි. එවැනි හමුදාවක විරියෙන් සටන් කරන සෙබළුන් සුගතියක උපත ලබන්නේ යයි වැරදි දිට්ඨියක් පැවතිනි. **බලන්න**: සුගතිය. **මූලාශ්‍රය:** සංයු.නි: (4) සළායතනවග්ග:ගාමිණිසංයුත්ත:8.1.4 හත්ථාරෝහගාමිණි සූත්‍රය, පි.590.

**▲ හත්ථිසාරිපුත්‍ර චිත්ත තෙර-**Hatthisāriputta Citta Thera: **බලන්න**: උප ග්‍රන්ථය: 1

**▲ හත්ථාරෝහගාමිණි** -Hatthāroha the Elephant Warrior:**බලන්න**: උපග්‍රන්ථය:3

**▲හිතානුකම්පාව-**Compassionate: හිතානුකම්පාව ලෙසින් පෙන්වා ඇත්තේ කෙනෙක් දුකට පත්වී සිටින විට ඔහු ගැන අනුකම්පාවෙන්, දයාවෙන් කටයුතු කිරීමය. තථාගතයන් ලෝකයාට ධර්මය දේශනා කරන්නේ ඔවුන් කෙරේ ඇති හිතානුකම්පාව නිසා බව මෙහි පෙන්වා ඇත. **සටහන්**:* ලෝකයා ගේ ශුභසිද්ධිය තකා; ඔවුන්ට දුකින් මිදීමට මග පෙන්වීමට, තථාගතයන් ධර්මය දේශනා කරති. ** ධර්මය දේශනා කරනවිට, ධර්ම කථිකයන් තුල රාගය හා පටිඝය ඇතිවේ (අනුරෝධ හා විරෝධ- Attraction and repulsion). එමනිසා තථාගතයන් ලෝකයාට ධර්මය දේශනා නොකළයුතු යයි මාරයා පැවසූ විට බුදුන් වහන්සේ වදාළේ, තථාගතයන් සම්පූර්ණයෙන්ම රාගයෙන් හා පටිඝයෙන් මිදී ඇතිබවය. **බලන්න**: ESN:note:286. p.540. **මූලාශ්‍ර**: සංයු.නි: (1 ): සගාථවග්ග: මාරසංයුත්ත: 4.2.4 පතිරූප සූත්‍රය, පි. 230, ESN:4: Marasamyutta:14.4 Suitable, p.280.

**▲හිතුවක්කාර-** stubborn: හිතුවක්කාරයනු අකීකරුබවය- දොවචස්සතාවය, අවවාද ආදිය පිළිපැදීමට ඇති අකමැත්ත. ධර්ම මාර්ගයේ පරිහාණිය ඇතිකරන කරුණකි. **බලන්න:** දොවචස්සතාවය.

**▲ හේතු ප්‍රත්‍ය ධම්ම-**Conditioned Dhamma: හේතුප්‍රත්‍ය ධම්ම, සංඛත ධම්ම- සකස්වූ ධම්ම ලෙසින්ද පෙන්වා ඇත. බුද්ධ දේශනාවන්ට අනුව, නිවන හැර සෙසු ලෝක ධම්මතා හැම හේතු ප්‍රත්‍ය නිසා හටගත්, සකස්වූ

ධර්මතාවේ. පටිච්චසමුප්පාදය ක්‍රියාවලියේ, ඒ ගැන පැහැදිලිව පෙන්වා ඇත. **බලන්න**: සංඛතධර්ම, පටිච්චසමුප්පාදය.

▼**හේතු ප්‍රත්‍ය ධර්මතා** හැම අනිච්ච ස්වභාවය සහිත බව මෙහි පෙන්වා ඇත. එය යහපත් ලෙසින් අවබෝධ කරන පුද්ගලයා අරහත්වයට පත්වේ. **මූලාශ්‍රය:**සංයු.නි: (3): ඛන්ධසංයුත්ත:අනිච්චවග්ග: 1.1.2.10 - හේතු සූත්‍ර 3කි, පි.68.

**හද**

▲ **හුදකලාවිවේකය**: පාලි: **පටිසල්ලානා**- Patisallaana—Solitude: ධර්මයට අනුව හුදකලාවිවේකය යනු කායවිවේකය හා චිත්තවිවේකය ඇතිව, ආධ්‍යාත්මික මාර්ගය වඩා ගැනීමට කටයුතු කිරීමය, හුදකලාව වාසය කිරීමය- එකලා විහරනය - ඒක විහාර ලෙසින්ද පෙන්වා ඇත. එලෙස වාසය කරන පුද්ගලයා ඒක විහාරිය. බුදුන් වහන්සේ, ධර්මය පුහුණුවන සංඝයාට හුදකලාවිවේකය සහිතව වාසය කරන්න යයි අනුසාසනා කර ඇත. **සටහන:** එකලාව වසනසුළු හෙවත් ඒකවිහාරි වාසය ගැන මිගජාල තෙරුන්ට බුදුන් වහන්සේ මෙහිදී පෙන්වා ඇත. **බලන්න:** සංයු.නි: (4): සළායතනවග්ග: වේදනාසංයුත්ත: මිගජාල වග්ග: මිගජාල සූත්‍ර 2කි, පි.106.

▼ **බුදුන් වහන්සේ මෙසේ වදාළහ:**

"මහණෙනි, හුදකලාබවේ ඇලී, හුදකලාබව නිරතව වාසය කරන්න, සිත එකඟකොට (සමථ භාවනාවේ), ජාන සමාපත්ති ඇතිව, විදර්ශනාවේ නිරතව, හිස්තැන්වල (ශුන්‍යාගාර), වැඩිය යුතු කමටහන් වඩමින් වාසය කරන්න. එසේ වාසය කරනවිට අරහත්වය හෝ අනාගාමී යන ඵල දෙකින් එකක් මේ අත්භවයේදීම ලැබේ".. **මූලාශ්‍රය**: ඛු.නි:ඉතිවුත්තක: 2.2.8 පතිසංලයන සූත්‍රය, පි. 398.

▼**හුදකලා විහරණය සම්පූර්ණ වීම**: පංච උපාදානස්කන්ධය ගැන: අතීතයේ පැවති යම් ඡන්දරාගයක්, අනාගතයේ ඇතිවිය හැකි යම් ඡන්දරාගයක්, වත්මානයේ දී පවතින යම් ඡන්දරාගයක් වේ නම් ඒ හැම දුරුකර, සිත මැනවින් හික්මවා ගැනීම, එකලා විහරණය පිරිපුන් වීමයයි මෙහි පෙන්වා ඇත. බුදුන් වහන්සේ මෙසේ වදාළහ:

"සියල්ල (ස්කන්ධ, ධාතු, ආයතන, භව), මැඩගත්, ඒ සැම දන්නා, මනා නුවණ ඇති, ඒ ධර්මතාවල නො ඇලුන, ඒ හැම දුරු කළ, තණ්හාවක්‍ෂය කිරීම යන නිවන අරමුණු කොට මිදුන-විමුක්තිය ලැබූ, ඒ පුද්ගලයා, එකලා විහරණ ඇත්තේ යයි මම කියමි". **මූලාශ්‍රය:** සංයු.නි: (2): නිදානවග්ග:භික්ඛුසංයුත්ත:9.1.10 ථෙරනාම සූත්‍රය, පි.456.

▼ **වෙනත් මූලාශ්‍ර**: **1.** " දිවාරැ නොමැලිව, කෙලෙසුන් තවමින් වෙසෙන මහණ, පරම හුදකලාවේ ඇලුන කෙනෙක්ය යයි මුනිසමිඳු වදාළේය". **මූලාශ්‍රය**: **"**උත්තරීතර හුදකලාව": කටුකුරුන්දේ ඤාණානන්ද භික්ෂු, පහන්කනුව ධර්ම දේශනා.

**හඳ**

▲**හොඳ නරක**- good and bad: හොඳ-යහපත් යයි පෙන්වා ඇත්තේ කුසලයය. මේවා සාධුධම්ම (**සාධුකූව**) ලෙසින්ද පෙන්වා ඇත. නරක ධම්ම, අයහපත් විපාක ඇතිකරයි, ඒවා අසාධු ධම්මවේ (**අසාධුකූව**). හොඳ ධම්ම දසකුසලයේ යෙදීමය, දස අකුසලය, නරක ධම්මවේ. **මූලාශ්‍ර:** අංගු.නි:( 6)10 නිපාත,සාධු වග්ග,10.4.3.1, සාධු සූත්‍රය**,**පි.528, EAN:10: III Good,178.1, Good,p.555.

**හන**

▲**හානභාගිය ධර්ම:** පාලි: **හානභාගීයො ධම්මො-** Dhmma which brings decline: ආධ්‍යාත්මික මාර්ගයට හානිය ගෙනදෙන කරුණු හානභාගිය ධර්ම ලෙසින් පෙන්වා ඇත. ඒ ධර්මතා ඇතිතාක් ආධ්‍යාත්මික මග පිරිහිමට පත්වේ. මේවා අපායගාමී ධර්මවේ.**හානභාගිය ධර්මතා**: **1**) **අයෝනිසෝමනසිකාරය** (අයොනිසො මනසිකාරො- Unwise attention) **2**) **දෝවචස්සතාවය** -දුර්වචභාවය - අකිකරුබව (දොවචස්සතා) **3**) **පාප මිත්‍ර සේවනය** ( පාපමිත්තතා**. 4**) **ත්‍රිවිධ අකුසල මූල** (තීනි අකුසලමූලානි): ලෝභය, දෝසය හා මෝහය. **5**) **සතර යොග**: කාම, භව, දිට්ඨි හා අවිජ්ජා. **6**) **පංච චේතෝඛිල** (පඤ්ච චෙතොඛිලා) . **7**) **අගෞරව ධර්මතා. මූලාශ්‍ර:** දීඝ.නි : (3 ): 11 දසුත්තර සූත්‍රය, පි. 483, EDN: 34: Dasuttara Sutta: Expanding Decades, p. 384.

▲ **හීනසීලය**-Low virtue: කීර්තිය පිණිස සමාදන්වන ශිලය, හීන සිලයය. **බලන්න:** ශිලය, සිංහල විසුද්ධිමාර්ගය, පරිච්ඡේදය1.

▲ **හෙන ගැසීම**-Thunder striking**: බලන්න:** අසනි, උපග්‍රන්ථය:5.

**හම**

▲**හිමාල කන්ද -**Himalaya Mountains: හිමාල කන්ද පිහිටකර ගෙන මහා සල් ගස් පස් ආකාරයට වැඩේ. එලෙසින්, සැදැහැඇති කුලපති- කුලයේ නායකයා නිසා ඔහුගේ පවුලේ උදවිය පස් ආකාරයකින් ධර්මයේ වර්ධනය වේ යයි බුදුන් වහන්සේ පෙන්වා ඇත: ශ්‍රද්ධාව,ශිලය, ශ්‍රැතය, ත්‍යාගය,ප්‍රඥාව යන ගුණ 5 කින්- පංචගුණ. **බලන්න**: උපග්‍රන්ථය:උපමා. **මූලාශ්‍රය:** අංගු.නි: (3) 5 නිපාත: සුමනාවග්ග: 5.1.4.10 මහාසාල සූත්‍රය, පි.90.

▲ **හේමක තෙර-**Hemaka Thera: **බලන්න:**උපග්‍රන්ථය:1

▲ **හේමවත යක්ෂයා**-Yakka Hemawatha: මේ යක්ෂයා ඔහුගේ මිත්‍ර සාතාගිරි යක්ෂයා වෙතින් උතුම් බුදුගුණ අසා දැන බුදුන් වහන්සේ බැහැදැකීමට යාම මෙහි දක්වා ඇත. **බලන්න:** යක්ඛ. **සටහන**: බුදුන් වහන්සේගේ උතුම් ගුණ මේ සූත්‍රයේ විස්තරාත්මකව පෙන්වා ඇත. **මූලාශ්‍රය**:ඛු.නි:සු.නි:උරගවග්ග:1-9 හේමවත සූත්‍රය.

**හර**

▲ **හිරි ඔත්තප්ප**- Sense of moral shame & moral dread: හිරි ඔත්තප්ප යනු පවට ඇති ලැජ්ජාව හා බියය, ධර්ම මාර්ගය වඩා ගැනීමට උපකාරීවන ගුණයකි.මේවා කුසල (සුබ) ධර්මයන්ය, **බලන්න:** සුබ ධර්මය. හිරි හා ඔත්තප්ප යන සුබ ධර්මතා දෙක ලොව පාලනය කරන

ධර්මයන්ය (ලෝකපාලක ධම්ම) . මේවාට විරුද්ධ ධර්ම නම් අහිරිකය හා අනොත්තප්පය. **මූලාශ්‍ර**: අංගු.නි: (1): 2 නිපාත: වස්සුපනායිකාවග්ග: 2.1.1.9 චරියා සූත්‍රය, පි.140, ඛු.නි: ඉතිවුත්තක: 2.2.5 ශුකලධම්ම සූත්‍රය, පි. 392.

▼ **හිරි ඔත්තප්ප** යන කුසල ධර්මතා ලෝකය රකින, ලෝක පාලක ධම්ම (the guardians of the world) යයි බුදුන් වහන්සේ වදාළහ. මේවා දීප්තිමත් ධම්ම, සුදු ධම්ම, දේවධම්ම ලෙසින්ද පෙන්වා ඇත.හිරි ඔත්තප්ප ඇතිවිට, මිනිසුන්ගේ චර්යාවන් රැකේ: මව, සුලුමව, ආදී වශයෙන්, වෙනස දැනගෙන යහපත් හැසිරීමක් ඇතිව සිටී. එහෙත්, ලෝක පාලකයන් දෙදනා වැනි මේ ධර්මතා නොසලකන අය කාමය ඇතිවූවිට තිරිසන් සතුන් මෙන්- වෙනස නොදැන, නොතකා අයහපත් ලෙසින් කටයුතු කරන බව මෙහි දක්වා ඇත. ලෝකයේ සදාචාරය හා සංවරය පවතින්නේ මේ ධර්මතා 2 නිසාය. **මූලාශ්‍ර:** අංගු.නි: (1) 2 නිපාත:කණ්හ සූත්‍රය, සුක්ක සූත්‍රය, චරියා සූත්‍රය, පි. 140, EAN:2: 7.7.Dark, 8.8. Bright, 9.9.Behavior, p. 57.

▼**හිරි ඔත්තප්ප නැතිකම** නිසා උපදින අවිද්‍යාව, අකුසල් ඇතිකිරීමට පෙරටුවන බව මෙහි පෙන්වා ඇත. **මූලාශ්‍ර**:සංයු.නි: (5 ): අවිජ්ජා සූත්‍රය, පි. 30, ESN: 45: Mggasamyutta: 1.1. Ignorance, P 1603.

▼**හිරි ඔත්තප්ප** නැති පුද්ගලයෙකුට ඉන්ද්‍රිය සංවරය කරගත නොහැකි නිසා ශිලය රැකිය නොහැකිය. එවිට සමාධිය නොලැබේ. සමාධිය නොමැතිනම් යථාභූත ඥාණය නොලැබේ, එවිට උතුම් නිවන්මග සාක්ෂාත් කරගැනීමට අවශ්‍ය සෙසු අංග සපුරා ගත නොහැකිය. **මූලාශ්‍ර**: අංගු.නි: (4):7 නිපාත: 7.2.2.1. හිරිඔත්තප්ප සූත්‍රය, පි. 446, EAN:7: 65.1. Moral shame, p. 395.

▼**හිරි ඔත්තප්ප දෙක** තිබීම ශ්‍රමණ ධර්මතාවයක් බව බුදුන්වහන්සේ වදාළහ. **මූලාශ්‍ර**:ම.නි: (1) 1.4.9. මහා අස්සපුර සූත්‍රය,පි.652, EMN: 39-Maha Asssapura sutta, p.342.

▼ **හිරි ඔත්තප්ප දෙක** සේඛ බලයන්ය, **බලන්න**: සේඛබල. ආරිය ශ්‍රාවකයට හිරිඔත්තප්පබලයකි, ඒ නිසා තුන්දොරින් අකුසල කිරීම ඔහු පිළිකුල් කරයි, එමගින්, කුසල ධර්ම වර්ධනය කරගැනිමට ඔහු සමත්වේ. **මූලාශ්‍ර**: අංගු.නි (3) 5 නිපාතය: සේඛබල වග්ග:5.1.1.1. හා 5.1.1.2 සූත්‍ර, පි. 24, EAN: 5: The Trainee Powers, 1.1. & 1.2, p. 238.

▼ **හිරි ඔත්තප්ප දෙක** උතුම් ධර්ම යයි මෙහි පෙන්වා ඇත. මේ ගුණ, සප්ත සද්ධර්ම ගුණ යන්ට ඇතුලත්වේ. **මූලාශ්‍ර**: ම.නි. (2 ): 2.1.3 :සේඛ සූත්‍රය, පි. 44, MN 53: Sekha Sutta, p. 436.

▼**ගුණ හතකින් සමන්විත** භික්ෂුව පරිහාණියට නොපැමිණෙන බවත් නිවනට ලංව සිටින බව මෙහි පෙන්වා ඇත. හිරි ඔත්තප්ප තිබීම ඒ ධර්මතා හතෙන් දෙකකි. ඒවා නැති භික්ෂුව පරිහානියට පත්වේ. **මූලාශ්‍ර**: අංගු.නි (4) 7 නිපාත: 7.1.4.2 හිරිගාරව සූත්‍රය, පි. 346, EAN:7: 33.2.Moral Shame, p. 377.

▼**හිරිඔත්තප්ප ඇතිව**, පව් වළකාගත් පුද්ගලයෝ මිනිස් ලෝකයේ සිටිනවාද? යයි දේවියක් ඇසූ පැණයකට පිළිතුරු ලෙසින් බුදුන්වහන්සේ

මෙසේ වදාළහ: මේ විෂම ලෝකයේ, හිරිඔත්තප්ප සහිතව, සිහිය ඇතිව, දුක කෙළෙවර කරගෙන (රහතුන්) සමව හැසිරෙන පුද්ගලයන් ඇත්තේ ඉතා ස්වල්පයකි.

**"හිරීනිසෙධා තනුයා යෙ චරන්ති සදා සතා අන්තං දුක්ඛස්ස පපප්පුයා චරන්ති විසමෙ සමන්ති". මූලාශ්‍ර**:සංයු.නි (1) සගාථවග්ග: දේවතාසංයුත්ත, 1.2.8 හිරි සූත්‍රය, පි. 41, ESN:1: Devatasamyutta, A sense of shame p.77.

▼**හිරි ඔත්තප්ප නැතිවිට**: පාපමිත්‍ර සේවනයට පුරුදුවේ, අනුන්ට ගරු නොකරයි, හිතුවක්කාර වේ, ධර්මයේ ප්‍රමාදවේ. **මූලාශ්‍ර**:අංගු.නි:(6)10 නිපාත:10.2.3.6.තයොධම්ම සූත්‍රය**,**පි.284, EAN:10:76.6. Incapable, p. 524.

▼**හිරි ඔත්තප්ප නැති පුද්ගලයා** පිරිස් මුළුවකට කැළලක් බව මෙහි පෙන්වා ඇත.එහෙත් හිරි ඔත්තප්ප ඇති පුද්ගලයා පිරිස් සමූහයකට අලංකාරයක්ය. හිරිඔත්තපප නැතිවීම නිසා සිදුකරණ අකුසල කෙනෙක් දුගතියට යොමු කරයි, එහෙත්, හිරිඔත්තප්ප ඇති පුද්ගලයා සුගතියට පැමිණේ. **මූලාශ්‍ර:** අංගු.නි (2) 4 නිපාත: පරිසසෝභන වග්ග සූත්‍ර, පි.451, EAN: 4: Adornments of the assembly, p. 224.

▼**හිරි ඔත්තප්ප** පිළිනොගන්නා තැනැත්තා මිත්‍රයෙක් නොවේ යයි, පණ්ඩිතයා දන්නා බව මෙහි පෙන්වා ඇත. **මූලාශ්‍රය**:ඛු.නි:සු.නි:චුල්ලවග්ග:2-3 හිරි සූත්‍රය, පි.98.

**හල**

▲ **හාලිද්දකානි උපාසක**-householder Hāliddakāni **බලන්න**: උපග්‍රන්ථය:3

▲ **හැල්නන්ඩුව උපමාව-**Simile of the spike **බලන්න**: උපග්‍රන්ථය:5

**හස**

▲ **හංසවති නුවර**-Hansavathi Nuwara: පෙර වැඩසිටි පදුමුත්තර බුදුන් වහන්සේ උපන් නුවරය. **බලන්න**: උපග්‍රන්ථය:1,2, ඛු.ණි:ථෙර අපදාන

▲ **හාසු ප්‍රඥාව:** පාලි: **හාසුපඤ්ඤා-** joyousness of wisdom: ප්‍රමෝදිත ලෙසින් ධර්මතා අවබෝධ කරගැනීමට ඇති හැකියාව හාසුප්‍රඥාව ය. වඩාගතයුතු ප්‍රඥාවකි. **බලන්න**: ප්‍රඥාව

▼**හාසුප්‍රඥාව පරිපූර්ණවීම**: ජවන, නිබ්බේධික, මහා, තීක්ෂණ, විපුල, ගාම්භීර හා අසාමන්ත, පණ්ඩිත හා පෘථු යන නව ප්‍රඥාවන් වැඩීමෙන් නැවත නැවත එහි යෙදීමෙන් හාසුප්‍රඥාව පරිපූර්ණවේ:

**"ඉමා නවපඤ්ඤා භාවිතා බහුලීකතා හාසපඤ්ඤං පරිපූරෙති"**

හාසුප්‍රඥාව ඇති ආරිය පුද්ගලයා අර්ථ, ධම්ම, නිරුත්ති, ප්‍රතිභාන යන සිව්පිළිසිඹියා (4 analytical knowledge) යහපත් ලෙසින් අවබෝධ කරයි. **හාසුප්‍රඥාව නම් කුමක්ද?** මේ සසුනේ කිසියම්කෙනෙක් ප්‍රීතිය, ඥානය, තුෂ්ටිය බහුලව ඇතිව: ශීලය, ඉන්ද්‍රිය සංවරය, භෝජනයේ

මාත්‍රඥතාවය, ජාගාරානුයෝගය, ශීල සමාධි ප්‍රඥා ස්කන්ධ, විමුක්ති ස්කන්ධය හා විමුක්ති ඥාන දර්ශන ස්කන්ධය පරිපූර්ණ කිරීම, ස්ථාන අස්ථාන නුවණ ප්‍රතිවේධ කරගැනීම, විහාරසමාපත්ති පරිපූර්ණය කිරීම, ආර්යසත්‍ය, සත්තිස්බෝධිපාක්‍ය ධර්මතා ප්‍රතිවේධ කරගැනීම, ආර්යමාර්ගය වඩාගැනීම, ශ්‍රමණඵල ප්‍රත්‍යක්‍ෂ කරගැනීම, අභිඥා ප්‍රතිවේධ කරගැනීම, පරම අර්ථයවූ නිවන ප්‍රත්‍යක්‍ෂ කරගැනීම පිණිස ඇති අවබෝධය, නුවණ හාසුප්‍රඥාව වේ. **මූලාශ්‍රය**:ඛු,නි: පටිසම්භිදා 2 : ප්‍රඥාවග්ග: 3.1 ප්‍රඥා කථා, පි. 166-186.

▼**සතර ධර්මය ඇතිවිට හාසු ප්‍රඥාව ඇතිවේ**: සතර ධර්මය: 1) සත්පුරුෂ සේවනය 2) සද්ධර්ම ශ්‍රවණය 3) යෝනිසෝමනසිකාරය 4) ධර්මයට අනුකූලව පිළිපැදීම (ධර්මානුධර්ම ප්‍රතිපදාව) ඇති පුද්ගලයාට - සෝතාපන්න උතුමාට හාසුප්‍රඥාව ඇතිවේ.

**"...ඉමෙ බො භික්ඛවෙ, චත්තාරො ධම්මා භාවිතා බහුලීකතා හාසුපඤ්ඤාතාය සංවත්තනතීති"**. (these four things, when developed and cultivated lead to the joyousness of wisdom). **මූලාශ්‍ර**:සංයු.නි: (5-2 ): මහාවග්ග: සෝතාපන්න සංයුත්ත:11.7.10 හාසුප්‍රඥා සූත්‍රය, පි. 282, ESN: Sotapatthisamyutta:  Greatness of Wisdom: p. 2262.

▼**කායගතා සතිය වැඩීමෙන්, විපුල කරගැනීමෙන් හාසු ප්‍රඥාව ඇතිවේ**: (Mindfulness directed to the body...when developed and cultivated, leads to the joyousness of wisdom ) **මූලාශ්‍ර:** අංගු.නි: (1): 1 නිපාත: කායගතාසති වග්ග: පි. 125 EAN:1: Mindfulness Directed to the Body: p.52 .

▲ **හිස ගිනි ගැනීමේ උපමාව**-Simile of the head on fire: **බලන්න:** උපග්‍රන්ථය:5

▲ **හිංසාව**- Cruelty: හිංසාව යනු අන් අය තළා පෙළා දැමීමය, දඬුවම් දීමය, කෲර බවය. මෙය අකුසලයකි **බලන්න:** සල්ලේඛ පරියාය, ධම්මපදය: 10. දණ්ඩවග්ග.

▼ **එක්සමයක**, කුඩා දරුවන් පිරිසක් දණ්ඩක්ගෙන, නයෙකුට හිංසා කරණ ආකාරය දුටු බුදුන් වහන්සේ මෙසේ වදාළහ:

" තමාගේ සතුට පිණිස, සුව කැමති සතුන් හට හිංසා කරණ අයට පරලොව සුවයක් නැත. එහෙත්, එසේ නොකරන අය පරලෝව සුව ලබයි". **මූලාශ්‍රය**:ඛු.නි: උදාන පාලිය: 2.3 දණ්ඩසූත්‍රය, පි. 178.

▲ **හිස සත්කඩකට පැලීම**- Head split in seven parts: ධර්මයට අනුව යම්කිසි බරපතල අකුසලයක් කිරීම නිසා, බුදුන් වහන්සේට අගෞරව කිරීම වැනි කරුණු නිසා ඒ දේ කළ පුද්ගලයාගේ හිස සත්කඩකට පැලීයන බව පෙන්වා ඇත. සුත්තනිපාත: පාරයනවග්ගයේ හිස සත්කඩකට පැලියාම ලෙසින් පෙන්වා ඇත්තේ, අවිද්‍යාව අවසන්වී විද්‍යාව ඇතිවීමය. **බලන්න:** බවාරි බ්‍රාහ්මණ.

▼ **හිරු දෙවියන්** හා සඳ දෙවියන් ග්‍රහණය කරගත් රාහු සුරයා, බුදුන් වහන්සේගේ අවවාදය අසා ඔවුන් නිදහස් කර ඇත. ඒ පිළිබඳව, වේපචිත්ති අසුර රජු විමසුවිට රාහු අසුරයා මෙසේ පවසා ඇත:

“ බුදුන් වහන්සේගේ අවවාද ගාථා අසා, හිරු...සඳු ග්‍රහණයෙන් මුදා නොහැරියේ නම් මගේ හිස සත් කඩකට පැලෙනු ඇත”.

**සටහන්:*** බුදුන් වහන්සේ, මහාසමය සූත්‍රය දේශනා කළ අවස්ථාවේ, හිරු හා සඳු දෙවියෝ සෝතාපන්න වූ බැවින් බුදුන් වහන්සේ ඔවුන් “මගේ දරුවන්” ලෙසින් වදාළහ. **බලන්න:** ESN: Note: 159, pi. 524. **මූලාශ්‍ර:** සංයු.නි: (1 ): සගාථවග්ග: දේවපුත්‍රසංයුත්ත: 2.1.9. චන්දිම සූත්‍රය හා 2.1.10 සූරිය සූත්‍රය, පි. 119, ESN:2: Devaputtasamyutta: 9.9 Chndima & 10.10 Suriya, p. 178.

▼ **එක්සමයක**, නිගන්ථනාථපුත්‍රගේ ශ්‍රාවකයෙක්වූ සච්චක, බුදුන් වහන්සේ හා විවාදයට පැමිණ, උන්වහන්සේ ඇසූ ප්‍රශ්නයකට පිළිතුරුනොදී සිටියහ. ඒ අවස්ථාවේ, බුදුන් වහන්සේ මෙසේ වදාළහ: “...දැන් ඔබ පිළිතුරු නොදෙන්නට කාලය නොවේ... යම් කෙනෙක් තථාගත විසින් කරුණු සහිතව, තෙවරක් ප්‍රශ්ණයක් අසන ලද්දේද, ඒ ගැන පිළිතුරු නොදී සිටින්නේ නම් මෙහිම ඔහුගේ හිස සත්කඩකට පැලෙන්නේය”. ඒ අවස්ථාවේ වජ්‍රපාණී යක්ෂ (සක්දෙව් තෙම) ගිනිගෙන දිලිසෙන... වජ්‍රායුධය ගෙන අහසේ සිට, සච්චක පිළිතුරු නො දෙන්නේනම් මෙහිම ඔහුගේ හිස සත් කඩකොට පලන්නට සූදානම්ව සිටිබව මෙහි දක්වා ඇත. **මූලාශ්‍ර:** ම.නි: (1) 1.4.5 චූලසච්චක සූත්‍රය, පි. 560.EMN:35:Cūḷasaccaka Sutta,p.300.

▼ **බාවරී නම් බ්‍රාහ්මණයා ගෙන්** දන් ඉල්ලා පැමිණි බමුණෙක් රන්මිල 500ක් ඉල්ලා සිටියේය. එවැනි වස්තුවක් තමා සතුව නැති බව පැවසූවිට, ඒ බමුණා තරහගෙන මෙසේ ශාප කර ඇත:

‘ඉදින් මා ඉල්ලූ දේ නොදන්නේ නම් ඔබගේ හිස සත්කඩකට පැලේවා’

ඒ නිසා දොම්නසට පත්වූ බාවරී නම් බ්‍රාහ්මණයා ගැන, අනුකම්පා සහගතවූ දේවතාවක් පැවසුවේ, පෙරකී බමුණා කුහකයෙක් බවත්, ඔහු හිස පැලීම ගැන නොදන්නා බවය. ඉන්පසු ඒ පිලිබඳ විස්තර අසා, ‘හිස පැලීම’ ගැන විස්තර දැනගන්න යයි, ඔහු තම සිසුන් බුදුන් වහන්සේ වෙත යැව්ය. බුදුන් වහන්සේ මෙසේ වදාළහ:

“අවිද්‍යාව නම් හිස්මුදුන, විද්‍යාව සමග ඇතිවෙන ශ්‍රද්ධාව, සතිය, සමාධිය, ඡන්දය, විරිය, අරහත්මග මග මගින් පැලෙන්නේයය”.

**“අවිජ්ජා මුද්ධාති ජානාහි විජ්ජා මුද්ධාධිපාතිනි, සද්ධා සතිසමාධීහි ඡන්දවිරියෙන සංයුතා”**: 1030 ගාථාව **සටහන:** බවාරි බ්‍රාහ්මණ හා ඔහුගේ සිසුන් බුදුන් සරණ යෑම මෙහි විස්තරකර ඇත. **බලන්න:** උපග්‍රන්ථය: 3 **මූලාශ්‍ර:** ඛු.නි:සූත්ත නිපාත: පාරායන වග්ග, වත්තු ගාථා, පි. 325.

▲**හිස්කථා**-Empty talks: හිස්කථා ලෙසින් පෙන්වා ඇත්තේ, ධර්මයට පටහැනි අකුසලය ඇතිකරන අනවශ්‍ය කථාවන්ටය. සම්ප්‍රප්ඵලාප- ඕපාදූප ලෙසින්ද පෙන්වා ඇත. මෙය දස අකුසලයකි. **බලන්න**: කථාව, දසඅකුසල.

**ලලල**

# සුචිය:Index

## අ

**අක**
අකත,1
අකෘතඥ,6
අකනිට්ඨගාමී,1
අකණිටාබඹ ලොව,1
අකර්මන්‍ය,1
අක්‍ෂාන්තිය,3
අක්‍ෂණය,3
අක්කුප්ප,2
අක්කුප්ප චේතෝ විමුත්තිය,3
අක්කුප්ප ඥානය, 3
අක්කුප්ප පුද්ගල,3
අක්කෝෂ භාරද්වාජ තෙර,8
අකුසල,4
අකුසල ඇතිවීම,5
අකුසල ධර්ම, 4,239
අකුසල නවපද,23
අකුසල ප්‍රහිණය,4
අකුසලමූල,4
අකුසලරාශිය,5
අකුසල සමාපත්තිය,6
අකාපුරිසෝ,8
අකාලික,2
අක්‍රෝධය,6
අක්‍රියාවාදය,8
ආකඩෙබයා,8
ආකාරපරිවිතක්ක, 6
ආකාරවති ශ්‍රද්ධාව,6,950
ආකාශ ධාතුව,7
ආකාසානඤ්චායතනය,7,101
ආකිඤ්චඤ්ඤායතනය,7,101
ආක්‍රෝශ පරිභව,8
**අග**
අංගන,17
අංගුලිමාල තෙර, 17
අගතිමග,9
අගසව්-අග්‍ර ශ්‍රාවක- ,9
අගසව් පිරින්වන්පෑම,10
අගෝචර භූමි,17
අගෞරවය,261
අගෞරව ධර්ම,17
අග්ගිකභාරද්වාජ තෙර,9
අග්ගිකභාරද්වාජ- බ්‍රාහ්මණ,9
අග්නි,9
අග්‍ර,10
අග්‍ර ආත්ම භාවියා,13
අග්‍රඅධිපති,13
අග්‍ර උපාසක උපාසිකා,16
අග්‍රකරුණු,10
අග්‍රගෝත්‍රය,13
අග්‍රදේ විනාශවීම,17
අග්‍ර දැහැමි දානය,13
අග්‍රධර්මය,12
අග්‍රධර්මතා,12
අග්‍රධර්ම දාන,12
අග්‍රපුද්ගල,11
අග්‍රපින,13
අග්‍ර භික්ෂුව,13
අග්‍ර මිනිසුන්,13
අග්‍ර සමුහය,13
අග්‍ර සිව්පිරිස,13
අග්‍ර ශිලය,16
අග්‍රශ්‍රාවක භික්ෂු- භික්ෂුණි,14,15
අග්‍රශ්‍රාවිකා,10
අගාරික,9
ආගාඪ ප්‍රතිපත්තිය,9
අගාරික,49
**අස**
අසමූල,17
ආසාතවත්ථු,18
ආසාතපටිවිනය, 18
**අච**
අචේලකස්සප තෙර,18
අචින්ත ධර්මතා,18
අචිරවතඅග්ගීවෙස්සන සාමණේර, 19
ආචයගාමී ධර්ම, 19,73
ආචාරශීලිබව,19
ආචාරියාඅද්භූත ආශ්චර්ය ධර්මතා, 19
**අජ**
අංජලිකරණිය,20
අජපාල නුගරුක, 20
අජර,20
අජිතමානවක තෙර,19
අජාත,20
අජානිය අශ්වයා,20
අජාසත් රජ,20
අජ්ඣත්ත,20
අජිත කේසකම්බිලි,48
ආජීවක,21
ආජීවකබිය,21
ආජීවපාරිසුද්ධි ශිලය,21
ආජීවාෂ්ටමක ශිලය,21
**අඤ**
අඤ්ඤා,21
අඤ්ඤාකොණ්ඩඤ්ඤ තෙර,21
අඤ්ඤාන චරියා,21

අඤ්ඤඤාතවින්ද්‍රි
ය,22
අඤඤාව්‍යාකරණ,
22
අඤඤා
විමොක්ඛ,22
අඤ්ඤි ඉන්ද්‍රිය,22
අට
අටපැන්,22
අටපිරිස,22
අටලෝදහම,23
අටලොස් ධාතු,23
අටලොස්
මූලපද,23
අටලොස්
මනෝපවිචාර,24
අටසිල්,24
අට්ඨඅංගික
පුද්ගල,25
අට්ඨ
අභිභායතන,26
අට්ඨකනුවර
දසමගහපති,26
අට්ඨ ධම්ම,25
අට්ඨපුරුෂ
පුද්ගල,25
අට්ඨ විමොක්ඛ,26
අට්ඨීක සංඥාව,26
අට්ඨසත
ධම්මපරියාය,26
අට්ඨිකසංඥා
භාවනාව,26,
637
අට්ඨිනං නගරං,25
ඇටගොඩ,27
අත
අතප්ප දේව,27
අතපනීය ධර්ම,27
අතවැසියා,27
අතීත බුදුවරු,28
අතිමානය,28
අතිනිවාස,27
අත්ත,30
අත්තකිලමතානු
යෝගය,29
අත්තන්තප
පුද්ගල,28
අත්තන්තප-
පරන්තප පුද්ගල,
28
අත්තවාදී
උපාදාන,28
අත්තදීප,28
අත්තවාද පටි
සංයුත්ත දිට්ඨි ,28
අත්තරක්ඛිත,29
අත්තවධ,29
අත්ත සංඥාව,29
අත්ත සම්පදා,29
අත්තහිත,30
අත්තුපනායික
ධම්ම පරියාය,30
අත්ථදස්සී බුදුන්,
30
අත්‍යන්තබ්‍රහ්මචාරි
,30
ආත්මය,30
ආත්ම දිට්ඨිය,29
ආත්මාර්ථකාමී,32
ආත්මප්‍රේමය,33
ආත්මවිපත්ති,33
ආත්මසම්පත්,33
ආතාපි,34
ඇතා,34
ඇතා හා
අන්ධයෝ,35
ඇත් පියසටහන,
35
අද
අදත්තාදානය,35
අදන්මග,36
අදාන්ත,35
අදළිද්ද,35
අද්ධව,35
අද්ධාන මග,36
අදැහැමි
දානයය,36
අදෝස,36
අද්භූතධම්ම,36
ආදිත්‍යබන්ධු,36
ආදිත්තපර්යාය
ධර්ම න්‍යායය,36
ආදීනවය,37
ආදීනවසංඥා,37
ආදිබ්‍රහ්මචරියා
ප්‍රඥාව,37
ආදිබ්‍රහ්මචරියා
ශික්ෂාව,37
ආදේශනා
ප්‍රාතිහාර්ය,38
අදුකම සුඛ
වේදනා,38
අධ
අධම්ම චරියාව,38
අධර්මය
අනර්ථය,38
අධාර්මික,38
අධිකරණ,38
අධිගමය,38
අධිගමය
අතුරුදහන්වීම,38
අධිදේව ඤාණ
දස්සන,38
අධිප්‍රමාන බල,38
අධිමානය,38
අධිමානුෂික
පුද්ගල,40
අධිවචන,40
අධිශීලශික්ෂා
අධිචිත්ත ශික්ෂා
අධිප්‍රඥාශික්ෂා,40
ආධ්‍යාත්මික
ආයතන,41
ආධ්‍යාත්මික
ඉන්ද්‍රිය,41
ආධ්‍යාත්මික
ධනය,41
ආධ්‍යාත්මික
බල,41
ආධ්‍යාත්මික
පරිහානිය,41
ආධ්‍යාත්මික
පංචඉන්ද්‍රිය,42
ආධ්‍යාත්මික
පංචබල,45
ආධ්‍යාත්මික
මග,42,45
ආධ්‍යාත්මික
වර්ධනය ,45
ආධ්‍යාත්ම

සංයෝජන බාහිර
සංයෝජන,46
**අන**
අනංගණ,48
අන්‍යආගමික
නිකායන්,47
අන්‍යආගමික
නායකයෝ, 48
අනඅසාත,47
අනගාරික,49
අනඤ්ඤාත-
ඤ්ඤාතස්සාමීති
ඉන්ද්‍රිය,22,49
අනත්ත සංඥාව,
49
අනත්තානුපස්සනා
ව,49
අනත්තානුපස්සි,
50
අනධිගත කුසලය,
47
අනභිනිවෘතිය,47,
86
අනභිරතිය,89
අනවජ්ජබල,47
අනවද්‍ය ධර්ම,50
අනවද්‍ය සුඛ,51
අනර්ඝය,47
අනවකාසය,47
අනාගතභය,51
අනාගාමී,1,47,50,
51
අනාත්ම:53
අනාතාපි,53
අනාථපිණ්ඩිකසිටු,
53
අනාදරය,54
ආනන්තරික
කම්ම,54
ආනන්තරික චිත්ත
සමාධිය,54 ,125
ආනන්ද තෙර,
10,55
අනාපත්ති,55
ආනාපානසතිය,55
ආනාපානසති
භාවනා,641
අනායුෂ,55
අනාවරණ
ඥානය,56
අනාවරණ
ධම්ම,56
අනාවිල
සඞකප්පො,56
අනාරියමග,56,
116
අනාරිය අටමග,56
අනාරිය ධම්ම,113
අනාරියධොවනය,
56,114
අනාරියපරියේෂණ
,57,115
අනාරිය වෝහාර,
57
අනාරිය සුඛය,57
අනාරියසුඛල්ලිකා
නු යෝගය,57
අනාසව ධම්ම,58
අනාසවසුඛය,57
අන්තරාපරිනිබ්බායි
, 50
අනිකේතසාරි,60
අනිච්ච දුක්ඛ
අනාත්ම,58
අනිච්ච,59
අනිච්ච සංඥාව,59
අනිච්චානුපස්සි,60
අනීතික ධම්ම,60
අනිදර්ශන
විඥානය,60
අනිමිත්ත චෙතෝ
විමුක්තිය, 60
අනිමිත්ත සමාධිය,
61
අනිමිසලෝචන
පූජාව,61
අනිස්සිත සීලය,61
අනිස්සිතෝච
විහරති,61
අනුකම්පාව,61
අනුධර්ම,62
අනුවණ,62
අනුසතිය,62
අනුසති භාවනා,
62,630
අනුසය,62
අනුසොතගාමී,66
අනුත්තර ධම්ම,66
අනුත්තර
පුණ්‍යකෙත,66
අනුත්තර
යොගක්ෂේමය,66
අනුසාසන
ප්‍රාතිහාර්ය,67
අනුත්පාදයිතව්‍ය
ධර්මය,67
අනුප්පාද ඥානය,
68
අනුපාද
පරිනිර්වානය,68
අනුපාදිසේස
පරිනිබ්බාන
ධාතුව,69
අනුපුබ්බ කථා-
අනුපූර්ව කථා,**67**
අනුපුබ්බ
නිරෝධ,69
අනුපුබ්බ විහාර,69
අනුපුබ්බ සංකාර
නිරෝධය,67
අනුපුබ්බසික්ඛා
අනුපුබ්බ කිරියා
අනුපුබ්බපටිපාදා,
70
අනුරුද්ධතෙර,70
අනුස්සති
ස්ථානසය,70
අනුස්සරිතබ්බ
ධර්ම,70
අන්ඩජ,71
අන්ත,70
අන්ත දෙක,70
අන්ත දිට්ඨි
සතර,70
අන්තරාමල,71

අන්තරාකාරී
ධර්ම,71
අන්තරවාසක
අඳනය,71
අන්තිම
දේහධාරී,73
අන්ණසුඛය,71
අන්ධකරණ හා
අන්ධනොකරණ,
71
අන්ධකාරය,72
අනොත්තප්ප,72
අනෝමදස්සි
බුදුන්,72
අනේකධාතු
නුවණ,73
ආනෙඤ්ඤජාභි
සංස්කාර,73
**අඳ**
අඳුන්වනය
මිගදාය,73
අඳුරෙන් අඳුරට,73
අඳුරෙන් එළියට,
73
**අප**
අපචයගාමී
ධර්ම,73
අපදාන,73
අපණ්ණක දහම
හා පටිපදාව,74
අපරගොයානය,75
අපරිජාන,75
අපරිහානිය
දහම,75
අපාය,76
අපායකුසලය,76
අපරාපරියවේදනීය
කම්ම,76
අපාර හා පාර,76
අපරාමට්ඨ
සීලය,77
ආපාණකොටික
සීලය,77
අපරියන්ත
සීලය,77
අපලෝකිත
දහම,77
අප්පකිච්ච,77
අප්පබාධා,78
අප්පටිච්ඡන්න
කම්ම,497
අප්පණිහිත
විමොක්ඛ,78
අප්පණිහිත
සමාධිය,78
අප්පමානභා
දේව,78
අප්පමානසුභා
දේව,78
අපුණ්‍යාභිසංස්කාර
,78
අප්‍රමාන සමාධිය,
82
අප්‍රසන්න ක්‍රියා,82
අප්‍රසාදිකපුද්ගලයා
, 82
ආපෝ ධාතුව,
ඇපකාර නොවන
දහම,83

**අබ**
අබ්‍යාකතාවත්ථු,8
3,123
අබ්‍යාපජ්ජ ධම්ම,
83
අබ්භවලාහක
දෙවියෝ,83
අබ්බභෝකාසික,
83
අබ්භූත,83
අබිජ්ජාව හා විෂම
ලෝභය,83
අබ්‍රහ්මචරියාව,84
**අභ**
අභය,84
අභයරාජ කුමාර,
84
අභයරාජ කුමාර
තෙර,84
අභබ්බ,84
අභබ්බාගමන,84
අභව්‍ය,84
අභ්‍යන්තර
ආකාශධාතුව,90
අභ්‍යන්තර
ආයතන සය,90
අභ්‍යන්තර
බන්ධන,90
අභූත,84
අභිජාන,84
අභිඥා,86
අභිඥෙයිය ධම්ම,
86
අභිනන්දන,86
අභිරතිය,89
අභිනිවෙස,86
අභිනිවෘතිය,86
අභිනිහාර
කුසලය,88
අභිභායතන,88
අභිභූ අගසව්,89
අභිසංඛාර,89
අභිසන්ද,89
අභිසමය,89
අභිසම්බුද්ධ,90
අභා,84
අභාවනිය හා
භාවනිය,84
ආභිසමාචරික
ධම්ම,90
ආභස්සර දෙවියෝ
**අම**
අමත හා
අමතගාමිමග,90
අමනාපය,91
අමූලිකා
ශ්‍රද්ධාව,7,92,950
අමෝහය,91
අමායාව,91
අම්බට්ඨ බ්‍රාහ්මණ
මානවක,91
අම්බපාලි
තෙරණිය,92
ආමගන්ධ,92
ආමච්ඡ,92
ආමිෂ,92
**අඹ**
අඹ,92
අඹ බඳු

පුද්ගලයෝ,93
**අය**
අයෝනිසෝමනසි
කාරය,93,717
ආයකුසලය,95
ආයතන,95
ආයතන
කුසලතාවය,96
ආයතන දෙක,96
ආයුෂ,96
ආයුසංඛාර,97
**අර**
අරක ශාස්තෘ,97
අරතිය,98
අරණ,98
අරණවිභංග
ප්‍රතිපදාව,99
අරණවිහාර
ඥාණය,99
අරහත්,2,99
අරූප තල,101
අරූප නිස්සාරණිය
ධාතුව,102
අරූප භාවනා,648
අරූපලෝක,7,
102
අරූපරාග,102
අරූප
සමාපත්ති,102
අර්ථය හා
අනර්ථය,101
අර්ථ සංදර්ශන
ඤාණය,101
අරිට්ඨ තෙර,102
අරිට්ඨ භික්ඛු,102
ආරඤ්ඤ
සේනාසන,104
ආර්ය උපවාදය,
8,103
ආරබ්ධ විරිය,106
ආරාම,105
ආරිය,106
ආරියඅටමග,106
ආරිය උතුමා,111
ආරියකාන්තශිලය
, 17,112
ආරිය ඥානය,112
ආරිය
තුෂ්නිම්භාවය,112
ආරිය දර්ශනය,
113
ආරිය ධම්ම,113
ආරියධෝවනය,1
14
ආරිය න්‍යාය,115
ආරිය ප්‍රඥාව,115
ආරිය
පුද්ගලයෝ,116

ආරිය
පරියෙසනය,115
ආරියමග,116
ආරිය විනය,116
ආරියවිනයේ
දිළිඳු,116
ආරියවිනයේ පච්ච
රෝහිනී,
116
ආරියවිනයේ
පිරිසිදුඅපිරිසුදු,
116
ආරිය වමනය,116
ආරිය වර්ධනය,
117
ආරිය විරේචනය,
102
ආරිය වෝහාර,
117
ආරිය වාසස්ථාන,
117
ආරිය වංශය,117
ආරිය සත්‍ය,119
ආරිය සම්‍යක්
සමාධිය,119
ආරිය ශ්‍රාවකයා,
120
ආරෝග්‍ය,120
ආරොග්‍යමදය,
120
**අල**
අලං,120
අලජ්ජී,120
අලබ්භනීය ධම්ම,
121
අලමරියඤාණද
ස්සනය,121
අලසකම,121
අලික:120
අලින චිත්ත,120
අල්ප ආයුෂ,
97,121
අල්ප අහාර,121
අල්පභාවය,121
අල්පශ්‍රැත,122
අලෝභ,122
ආලාරකාළාම
තවුසා,122
ආලෝකය,122
ආලෝක
කසිණය,122
ආලෝක
ධාතුව,122
ආලෝක
සංඥාව,123
**අව**
අවෛරය,123,
126
අවකන්ති,123
අව්‍යාකෘත
ධම්ම,123
අවකාසය,123
අවකාශ ධාතුව,
124
අවකාශාධිගම
මග,124
අවකාශාධිගමය,
124
අවකුජ්ජ
පඤ්ඤා,124
අවජානි,124
අවදඤ්ඤුතාවය,
125
අවදිකළයුතු
ධම්ම,125
අවදි නොකළයුතු
ධම්ම,125
අවබෝධය දුෂ්කර
ධම්ම, 125
අවභාසයෝ,125
අවමන් කිරීම,125
අවමන්

නොකිරීම,125
අව්‍යාපාද,127
අව්‍යාපාදරාම,127
අව්‍යාපාද
විතක්ක,127
අව්‍යාපාද
සංඥා,127
අවසාන
ඥානය,126
අවස්සුතපරියාය,
127
අවශ්‍ය මග,128
අවික්ෂේප
සමාධිය,128
අවිතක්ක
අවිචාර,128
අවීචි නිරය,128
අවිජ්ජාඅනුසය,
128
අවිජ්ජාඔඝය,128
අවිජ්ජා
නීවරණ,128
අවිජ්ජා
යොගය,128
අවිද්‍යාව,128
අවිධිමත්
අවධානය,131
අවිප්‍රතිසාරය,131
අවිරති ශිලය,132
අවිරුද්ධ මග,132
අවිසාරද,132
අවිහ
බ්‍රහ්මලෝකය,132
අවිහිංසාව,132
අවුල,34
අවුල නිරවුල්
කිරීම,132
අවුල්සිත,132
අවෙච්චාසහගත
ප්‍රසාදය, 132
ආවරණ ධම්ම,132
ආවාස,127
ඇවත්,132
**අස**
අසංඛත,134
අසංඛත
ධාතුව,134
අසංඛත මග,134
අසංඛාරපරිනිබ්බා
යි,134
අසනිචක්ක,135
අසංන්ඛෙයිය
පුණ්‍ය,135
අසංඥසත්ත,135
අසංවරය,135
අසත්‍ය,135
අසේඛ,135
අසතිය හා
අසම්ප්‍රජන්‍යය,136
අසත්පුරුෂ,137
අසත්පුරුෂ
දාන,137
අසත් පුරුෂ
ධම්ම,137
අසත්පුරුෂ
භූමිය,137
අසද්ධම්ම,138
අසන්තුෂ්ටිය,138
අසපත්තං,136
අසමය හා
සමය,137
අසම්බාධං,137
අසමාහිත-
සමාහිත,137
අස්තිසුඛය,138
අස්මිමාන,138
අස්වැසිල්ල,138
අස්සජි (පස්වග
මහණ) තෙර,139
අස්සජි භික්ෂුව
(කිටාගිරිය),138
අස්සලායන
බ්‍රාහමණ මානවක,
138
අස්සාරෝහගාමිණි
,138
අසස්සත,138
අසාමන්ත
ප්‍රඥාව,139
අස්සුත,137
අසිබන්ධකපුත්ත
ගාමිණි,146
අසිත තවුසා,138
අසිපත්ගස්
නිරය,146
අසිලෝම
ප්‍රේත,146
අසිසකකවන්ධ
ප්‍රේත,146
අසුභ නිමිත්ත,146
අසුභ
භාවනාව,147
අසුභ සංඥාව,147
අසුර,147
අසුරින්දක
භාරද්වාජ තෙර,
148
ආසයඅනුසය
ඥාණය,140
ආස්වාදය,
ආදීනවය,
නිස්සරණය,140
ආසිවිෂෝපම
පුද්ගලයෝ, 140
ආසෙවිතබ්බ
ධම්ම,146
ආස්‍රව හා ආස්‍රව
ක්‍ෂයකිරීම,141
**අශ**
අශ්වයන් බඳු
පුද්ගලයෝ,148
ආශාව,148
ආශ්චර්ය
ධම්ම,148
අශාශ්වත
දිට්ඨිය,149
අශ්‍රද්ධාව,149
අශ්‍රැතවත්
පෘතග්ජ,150
**අෂ**
අෂ්ඨ ආශ්චර්ය
අද්භූතගුණ,
150
අෂ්ඨ ආශ්චර්ය
ධම්මගුණ,150
අෂ්ඨගරුධම්ම,
151
අෂ්ටවිද්‍යා ඥාන,
151
අෂ්ඨ විමොක්ක,
152

අෂ්ඨ සමාපත්ති, 153
අෂ්ටපුද්ගල,153
**අහ**
අහංකාරය-මමංකාරය-මානඅනුසය,153
අහිරිකය හා අනොත්තප්පය, 153
අහිංසාව,154
අහෝසි කම්ම,154
ආහාර,154
ආහාර දානය,158
අහාර අල්පව ගැනීම:158
ආහාරයෙහි පටිකුල සංඥාව, 158
ආහාරයෙහි පටිකුල සංඥා භාවනාව,650
ආහාරයේ පමණ දැනිම,158
ආහුනෙයා ආදී ගුණ,158
ආහුනෙයා පුග්ගල,159
**ඉ**
**ඉච**
ඉච්ඡාව,160
ඉච්චාකථාව,160
**ඉඤ**
ඉඤ්ජිත,160
**ඉත**
ඉතාමිහිරි,161
ඉතිවුත්තක,161
ඉත්ථිබන්ධන,161
**ඉද**
ඉදපච්චයා න්‍යාය,161
ඉද්දිපාද,161
ඉද්දිබල,93,161
ඉද්දිපාද භාවනාව,643
**ඉන**
ඉන්දක යක්ෂ,162
ඉන්ද්‍රකීලය,162
ඉන්ද්‍රිය,162
ඉන්ද්‍රිය අසංවර:163
ඉන්ද්‍රිය ධම්ම,164
ඉන්ද්‍රිය නානත්‍වය-ඵලනානත්‍වය-පුද්ගල නානත්‍වය, 164
ඉන්ද්‍රිය පරෝපරියත්ත ඥාන,164
ඉන්ද්‍රිය භාවනාව, 165,651
ඉන්ද්‍රිය භූමි,165
ඉන්ද්‍රිය සංවරය,165
ඉන්ද්‍රිය සංවර ශිලය,167
ඉන්ද්‍රිය සම්පන්න,167
ඉන්‍ද්‍රියෙසු අගුත්තද්වා රොහොති,167
ඉන්‍ද්‍රියෙසු ගුත්තද්වා රොහොති,167
**ඉණ**
ඉණ,167
**ඉප**
ඉපදවියයුතු ධම්ම,167
**ඉර**
ඉරියාපථ,168
ඉරිසියාව,168
ඉර්දී ප්‍රාතිහාර්ය,168
ඉර්දීබල,168
ඉර්දීවිධ ඥානය,169
ඉර්දී සම්පත්,169
**ඉව**
ඉවසීම,169
**ඉස**
ඉසිදත්ත තෙර,169
ඉසිදත්ත හා පුරාණ උපාසකයන්,169
ඉසිපතනය,169
ඉසිවරු,169
**ඉෂ**
ඉෂ්ඨධම්ම,170
**උ**
**උක**
උක්කන්ටක රෝගය,170
උකෙඛපනීයකම්ම ,170
**උග**
උග්ගහ මෙණ්ඩක සිටුපුත්, 170
උග්ග විසාලානුවර ගහපති, 170
උග්ග හත්ථිගාම ගහපති, 170
උග්ඝටිතඤ්ඤු, 170
**උඩ**
උඩගුකම,170
**උච**
උච්චාසයන මහාසයන,171
උච්චේද දිට්ඨීය,171
උච්ඡඩ පඤ්ඤා,171
උච්ඡින්න භවනෙත්තති,171
**උජ**
උජුපටිපන්න,171
**උට**
උට්ඨාන වීරිය,171
උට්ඨාන සම්පත,171
**උත**
උත්තම ආචාරධර්ම,172
උත්තම ඥානය,172
උත්තම-නීච පුද්ගල,172

උත්තම-උත්තම
පුද්ගල,172
උත්තම
දසපුද්ගලයෝ,
172
උත්තම
ප්‍රතිපදාව,173
උත්තම
පුරුෂයා,172
උත්තම
පුරුෂයාගේ
භාවනාව,635
උත්තම මග,173
උත්තරකුරු
ප්‍රදේශය,173
උත්තිය-උත්තර
තෙර,33,173
උත්තරා
උපාසිකාව,173
උත්තර
දේවපුත්‍ර,173
උත්තර
මානවක,173
උත්තරීය මනුස්ස
ධම්ම,173
උත්තරීතර
මනුෂ්‍ය,174
උතුම්,174
උතුම්
අස්වැසිල්ල,174
උතුම්
ගුරුවරයා,174
උතුම්දේ,174
උතුම් නුවණ,174
උතුම් පුද්ගල,175
උතුම් සිතිවිලි,175
උතුම් සැපය,175
උතුම් සෙවීම,175
උතුපරිණාම,175
උත්ථාන
සංඥාව,175
උත්පාදයිතව්‍ය
ධර්ම,176
උත්පත්ති විධි,176
උත්සහාය,176
**උද**
උද්‍යාන,176
උද්දකරාමපුත්‍ර
තවුසා,176
උද්ධංසොතසඝ,1
උදයත්තගාමිණී
ප්‍රඥාව,177
උදයමානවක
පුත්‍ර,177
උදාන,177
උදායි තෙර,178
උද්දච්චය,178
උද්ධම්භාගිය
සංයෝජන,
178
උද්ධුමාතක
සංඥාව,178
උදේන-උදේනි
රජ,179
**උණ**
උණබටගස්,179
උණ්ණාභ
බ්‍රාහ්මණ,179
උණුඅළු නිරය,179
**උප**
උපකතෙර,179
උපකෙළෙස,179
උපඝාතාක
කර්ම,180
උපතිස්ස,9,180
උපස්ථායක,27
උපසිවතෙර,7
උපාදධ්‍යායයා,180
උපධි,180
උපනාහ,182
උපපැවිදි,182
උපපිඩක
කර්ම,182
උපවනය,182
උපවාන තෙර,182
උපසමාය,182
උපසමානුස්සති
භාවනාව,635
උපසම්පදාව,182
උපස්තම්භක
කර්ම,182
උපස්ථායක,182
උපසේන වංගනාථ
පුත්ත තෙර,184
උපහච්චපරිනිබ්බා
යි,184
උපාදානඋපාදානීය
ධර්ම,184
උපාදානස්කන්ධය
,185
උපාය
කුසලය,185
උපාරම්භ
චිත්ත,185
උපාලි මහාතෙර,
185
උපාලි ගහපති,185
උපාසක
උපාසිකා,185
උප්පථමනසිකාර
ය,186
උප්පාදේතබ්බ
ධම්ම,186
උප්පජ්ජවේදනීය
කර්ම,186
උප්පලවන්නා
තෙරණිය,10,
186
උපෙක්ඛාව,186
උපෙක්ඛා
චේතෝවිමුක්තිය,
187
උපොසථ,187
උපොසථ
අටසීලය,24,187
**උපමා**
* අජානිය
අශ්වයා,20
* අතදරුවා,216
*අඹඅත්ත,79
*අයගෝලය,93
* ඇතා හා
අන්ධයෝ,34
*ඇත්පිය
සටහන,79
* ඇඳුම
ගිනිගැනීම,639
* උණබටගස්,179
*උල,188
* එළකිරි,193
* එළදෙන,193

* ඔඩොක්කුවේ ප්‍රඥාව,195
* කකවූපම,198
* කඩුවකින් පහරදීම,201, 639
*කටුවනය,200
*කූටගාරය,79, 200,585
* කැටකිරිල්ලි හා ගිජුලිහිණියා,200, 253
* කඳුමුදුනට වැටෙන වැස්ස, 98,131
*කණ කැස්බෑවා,286
* කපුටා,207
* කලය,232
*කලදරනුව,109,235
* කේසකම්බිලි පොරෝනාව,247, 653
* කෙසල්ගස,247
* කැසබුවා,247
* ගංගානම් ගඟ, 45,252,918
* ගඩුව,252
* ගිතෙල් කලය,824
* ගිනිදඬු,897
*ගිනිපුපුර,1,50,134,184, 944
* ගෝපාල,259
* ගොමපිඩුව,260
*ගවදෙන,98,263
*ගොවියා,238
* ගස ,264
* ගුහාව,267
*ජනපද කල්‍යාණි, 222,294
*තැගීදීම,8
* තිත්ත ඇට,306
* තිත්මුවා,306
*තනඅග පිනි බිංදුව,97,318
* තරුණ රුක,325
*තල්ගස,171
* තාලාවත්‍ථු,327
*තෙල් ගැම,621
*දක්ෂ දුනුවායෝ, 97,402
*දණ්ඩ,942
* දාදු කැටය,360
*දියේඇඳි ඉර, 98,370
* දාරුක්ඛන්ධ,372
*දියබුබුල,97,370
* දිවඅගඇති කෙළ පින්ඩුව,98
* දුවිලි,214
*දැවකොටය,232, 383
*නගරය,26,895
*නඛසිඛා,435
* නදිය,440
නළකලාප,459
* නැව,460,651
*නිසරුගස,164,468
* පඨවිය,505
* පුත්‍ර මාංශ,509
* පුන්සඳ,525
* ප්‍රාණීන්,527
* ප්‍රපාතය,533
* පබ්බතය,535
*පුළුන්කැටිය,93
* පස්බිඳ,561
*බීජ,2,145,569
* බිජු රකින කිකිළිය,651
*බටමිටිය,79
* බටගාල කැපීම,132
*බල්ලා,256,588, 942
* බලිවද්ද,588
* බිළාල,589
* බිළි කටු සය, 589
* බිළි වැද්දා,589
* මේසය ,657
* මැටි බඳුන් ,659
* මලුවා වැල ,690
* මළපුඩුව,691
* මීළග්ක ,691
* මසුන් අල්ලන කෙමිණය 693
* මූසිකා ,696
* මහා ඉර්ශි,697
*මහාගල,824
* මහා රුක,704
* මහා සමුද්‍රය,705
* මිහිරි ඇට,707
* මිහිරි පානය ,708
* යටිකුරුකල කලය,713
*යානය-රිය, 110,227
*යවකෙත,956
* යවමිටි,722
* රුක් ,723
*රත්වූයකඩ තැටිය,98
* රථය,728
* රජස්,726
* රාජකීය නුගගස,727
* රියසක,731
* වඩුවා,651,759
*විදුලිඅකුණ,135
* වඳුරා හා මස්වැද්දා 773
* විනාව ,775
*වේපුල්ල පව්ව ,27,779, 942
*වේරම්භවාතය, 789
* වළඳ,790
* වෙළෙන්දා උපමාව,790
* වස්ත්‍රය,797
* වෘෂභ,800
*සක්විති රජ,79
*සාගරය ,150

* සිගාල,824
* සැඩ පහර,942
* සුදුගොනා හා කළු ගොනා,920
*සඳ,9,79,282, 891
* සඳුන්ගස ,891
* සමුද්‍ර තරණය, 911
*සරුගස,166,923
*සොරකම,926
*සල්ගස්,24,926
*සිවලා,170,248
* ශරීර යානය,956
* හිමාල කන්ද, 963
*හැල්නන්ඩුව/උල ,130,966
* හිස ගිනි ගැනීම,967

**උභ**
උභතෝභාග විමුක්තිය,187
උභයලෝක අර්ථසිද්ධිය, 188

**උර**
උරුවෙලකස්සප තෙර,188

**උල**
උල,189

**උස**
උසස්ඥානය,189

**ඌ**

**ඌජ**
ඌජුබව,189

**ඌද**
ඌද්ධි,189

**එ**

**එක**
එකග්ගත,189
එකධර්මය,189
එක පුද්ගලයෙක් පහළවීමේ අසිරිය,191
එකම පුත්‍රයා - එකම දියණිය, 191
එකලා විහරණය,190
එකලාව හැසිරීම, 191
එකාරකෙබා,190
එක රසය,191
එකාසනිකයෝ, 192
ඒක ධර්ම ප්‍රශ්න,190
ඒකබීජ,190
ඒකවිහාරි,190
ඒක වෝකාර භවය,191
ඒකායන මග,191

**එජ**
එජා,192

**එත**
එතෙර හා මෙතෙර,192

**එද**
එදිරිය හා එදිරිය නැතිබව,192
ඒදඬු පාලම්,192

**එන**
එන්දිත,193

**එණ**
එණිමුවා,193

**එළ**
එළකිරි,193
එළදෙන,193

**එස**
එසිකාස්ථම්භයය, 193
ඒසුකාරී බ්‍රාහ්මණ,193

**එහ**
එහිපස්සිකෝ,193
එහි භික්ඛු,193

**ඔ**

**ඔක**
ඔකය,194
ඔකාසාධිගමා,194

**ඔස**
ඔසය හා ඔස තරණය,194
ඔසතිණණන,194
ඔසසතර,194

**ඔඩ**
ඔඩොක්කුවේ ප්‍රඥාව,195

**ඔත**
ඔත්තප්ප,196

**ඔද**
ඔදාතකසිණය,196
ඔනතොනත පුද්ගල,196
ඔනතුන්නත පුද්ගල,196

**ඔප**
ඔපනයික,196
ඕපපාතික,196

**ඔභ**
ඔභා,196

**ඔම**
ඔමානය,196

**ඔර**
ඔරිමතීරය හා පාරිමතීරය,196
ඔරම්භාගිය සංයොජන,196

**ඔල**
ඕලාරික,197

**ඔව**
ඕවාද,197

**ඔස**
ඔසග්ග- වොසග්ගය,198

**ක**

**කක**
කකචූපම,198
කක්කට තෙර,198
කකුධ දේවපුත්‍ර,198
කකුසඳ බුදුන්,198
කීකරුපුත්‍ර,199
කොකනදා දේවතාවිය,199
කෝකාලික භික්ෂුව,199

කුක්කුල
නිරය,199
කුක්කුච්ච,199
කුක්කුටාරාමය,
199
**කඟ**
කඟවේනා,249
**කච**
කච්චාන
මහාතෙර,199
කච්චාන ගොත්ත
තෙර,199
**කජ**
කජඩනගලා
තෙරණියය,199
කජඩන්ගලා
නියම්ගම,199
කුජ්ජුත්තරා
උපාසිකා,199
**කට**
කටත්තා
කම්ම,199
කටුව,199
කටුවනය,200
කටිස්සභ
උපාසක,200
කිටාගිරිය,200
කුටි පුජාකිරීම,200
කූටාගාරය,200
කූටදන්ත
බ්‍රාහ්මණ,200
කැටකිරිල්ලි හා
ගිජුලිහිණියා,200
**කය**
කය තෙර,201
කයීන විවරය,201
කයීම්භ තෙර,201
කයීස්සංස
තෙර,201
**කඩ**
කඩුවකින්
පහරදීම,201
කොඩිය,201
**කඬ**
කඬබාරේවත
තෙර,201
**කත**
කෘතඥ,6
කෘතඥ හා
අකෘතඥ,203
කෘත ඥානය,203
කෘත්‍ය ඥානය,203
කෘතවේදී,203
කතාව,201
කතපුඤ්ඤ,203
කතමොරක තිස්ස
භික්ෂු,
203
**කධ**
ක්‍රෝධය,203
**කන**
කන්දරක
පරිබ්‍රාජක,205
කාන්තාව,205
**කණ**
කණ්ටකීවනය,20
5
කණ්ණකත්ථල
මිගදාය,205
කණ්හධර්ම,205
කණ්හමග,205
කණ්හසප්ප,205
කුණ්ඩධාන
තෙර,205
කුණ්ඩලිය
පරිබ්‍රාජක,205
කොණ්ඩඤ්ඤ
බුදුන්,206
කොණාගමන
බුදුන්,206
**කප**
කපය-කල්ප,206
කපටිබව-
කපටිනැතිබව,206
කපිලවස්තු
නුවර,206
කප්ප මානවක-
තෙර,206
කාපටික භාරද්වාජ
බ්‍රාහ්ම,206
කපුටා,207
කිප්පාභින්ඥා,207
**කබ**
කබලිංකආහාර,
207
**කම**
කම්සැපය,216
කම්ම-කර්ම,207
කම්ම
ක්‍රියාවලිය,211
කම්ම නිදාන,209
කම්මපථ,210,383
කම්ම හා භවය,
214
කම්ම හා
විඥානය,214
කම්ම විපාක,212
කම්ම විපාක
ඥානය,214
කම්ම විවිධ,214
කම්ම විෂය,19
කම්ම සත්ත්ව
යන්ගේඋරුමය,
207
කාමය,216
කාමආස්වාදය,
216
කාමආසාව,217
කාම ඕසය,217
කාම ගුණ,217
කාමගුණ
උපධි,217
කාමචන්දය,217
කාමතණ්හාව,217
කාම ධාතුව,217
කාම නිබ්ද්දා
ප්‍රතිපදාව,217
කාමපරිදාහය,218
කාම
පර්යේෂණය,218
කාමභවය,218
කාමභෝගී
පුද්ගල,218
කාම-
මිථ්‍යාචාරය,220
කාමයොගය,220
කාම රාගය,220
කාමරාගඅනුසය,
220
කාමලෝකය,220
කාමවිතක්ක,221

කාමසංකල්පනා, 221
කාමසංඥාව,221
කාමසුඛය,221
කාමසුඛල්ලිකානු යෝගය,9,221
කාමාවචර,221
කාමාවචරධර්ම, 221
කිම්බිල තෙර,221
කුම්භ,221
කුම්භ වැනි පුද්ගල,221
කුමාරකාශ්‍යප තෙර,222
**කය**
කය,222
කායකම්ම,222
කායගතා සතිය,222
කායගතාසති භාවනාව,636
කායගන්ථ,226
කායසක්ඛි,226
කාය සංඛාර,227
කාය සංඛාර පස්සද්දිය,227
කාය සංවරය,227
කාය සුචරිතක්‍රියා,227
කාය දුශ්චරිත ක්‍රියා,227
කායානුපස්සනාව, 227
කයේ ගිලන්බව,227
කයේ ස්වභාවය,228
කායික ශක්තිය,228
කායික සුඛ,228
ක්‍රියාවාදය- අක්‍රියාවාදය,228
**කර**
කරුණාව,229
කරුණා චේතෝ විමුක්තිය,229
කර්මන්‍ය,1
කර්මන්‍යසිත,229
කිර්තිය,229
කුරු ජනපදය,229
කුරරසරවැසිකාලි උපාසිකා,229
කොරක්ඛත්තිය නිරුවත් තවුසා, 229
**කල**
කලය,232
කලදරනුව,235
කලහ විවාද,232
කල්‍යාන කථා,230
කල්‍යාන කම්ම,230
කල්‍යාන ධම්ම,230
කල්‍යාන කථා,230
කල්‍යාන ප්‍රඥාව,230
කල්‍යාන මිත්‍ර,230
කල්‍යාණ මිත්‍රගුණ අනුස්සතිය,635
කල්‍යාන ශිලය,232
කල්පවිනාශය හා කල්ප ඇතිවීම, 233
කලිඞග,232
කාලය අකාලය,3
කාලකඤ්ජ අසුර නිකාය,233
කාලදාන,232
කාලය,232
කාලපරියන්ත සීලය,232
කාලසිමා තුන,35,233
කෝලිත,9,235
කොලංකොල,234
කේලාම්කීම,234
කුලය,234
කුලපති,235
**කළ**
කෙළෙහිගුණ,235
කෙළෙස්,235
කෙළෙස් කටු,237
කෙළෙස් භුමි,237
කෙළේස පරිනිබ්බානය,237
කැළල,237
**කළු**
කළුකම්ම,237
කළුධම්ම,237
කාළුදායි තෙර, 238
**කව**
කවියෝ,238
කෙවඩ්ඩ ගහපති,238
**කස**
කසිණ,238
කසිණ භාවනා,645
කස්සක,238
කාසි කෝසල දේශය,239
කුසල නවපද,23
කුසලතා,239
කුසල අකුසල ධම්ම,239
කුසලධම්ම ප්‍රතිලාභ,242
කුසලනදී,243
කුසලමග හා අකුසල මග,243
කුසල මූලිකය,243
කුසල මුල්-අකුසල මුල්,243
කුසල් ලැබීම- නොලැබීම, 243
කුසල ශිලය- අකුසල ශිලය,244
කුසල්පද-අකුසල් පද,245
කුසල් භූමිය- අකුසල් භූමිය, 245
කුසලයේ අපරිමාණවීම,246
කුසීතබව,246
කුසිනාරා,246

කිසාගෝතමී
තෙරණිය,247
කේසකම්බිලි
පොරෝනාව,247
කෙසල්ගස,247,
653
කැසබුවා,247
කොසඹෑනුවර,
247
**කශ**
කාශ්‍යප
දේවපුත්‍ර,247
කාශ්‍යප බුදුන්,247
කාශ්‍යප මහා
තෙර,248
**කෂ**
ක්‍ෂත්‍රිය,248
ක්‍ෂණය,3,248
ක්‍ෂණසම්පත්තිය,3
,248
ක්‍ෂණික
අභිඥා,248
කෘෂ්ණමග,248
ක්‍ෂය නුවණ,248
ක්‍ෂාන්තිය,248
කුෂ්ඨ සැදුන
සිවලා,249
**කහ**
කහවනු,249
කුහකබව,249
**ඛ**
**ඛග**
ඛග්ග,249
**ඛජ**
ඛජ්ජනීය,249
**ඛත**
ඛත්තිය,250
ඛත්තිය රජ,250
**ඛන**
ඛන්ති,250
ඛන්තිඥානය,250
ඛන්ධ,250
ඛිනාසවබල,250
**ඛණ**
ඛීණාසවො,250
**ඛප**
ඛිප්පාභිඤ්ඤා,250
ඛිප්පනිසන්ති,250
**ඛම**
ඛේම,250
ඛේම තෙර,250
ඛේමා
තෙරණිය,10,250
ඛේමදේවපුත්‍ර,250
ඛේමකතෙර,250
ඛේමිය
අඹවනය,250
ඛෝමදුස්ස
ගම,250
**ඛය**
ඛය-ක්‍ෂය,251
ඛයඤාණං,251
ඛයධම්ම,252
**ඛල**
ඛලුපච්ඡාභත්තික
යෝ,252
ඛීල,252
**ග**
**ගග**
ගංගානම් ගඟ,252
**ගච**
ගෝචර
කුසලතා,252
ගෝචරනානත්ත
ඤාණය,253
ගෝචර භූමිය,253
ගෝචරසම්පන්න,
41
**ගජ**
ගිජ්ජකූට
පර්වතය,253
**ගඩ**
ගඩුව,253
**ගත**
ගති,254
ගීතස්වරයෙන්
දහම
සජ්ජායනාකිරීම,
254
ගෝත්‍රභූ,254
ගෝත්‍රය,255
ගෝතම
තිර්ථය,255
ගෝතම
ද්වාරය,255
ගෝතම බුදුන්
වහන්සේ,255
ගෝතමී
තෙරණිය,255
**ගථ**
ගාථා,255
ගූථකූප,255
ගූථබාදී,255
ගූථභාණි,255
**ගද**
ගොදත්ත
තෙර,256
ගද්දූලබද්ධ,256
**ගධ**
ගොධික තෙර,256
ගොධා ශාක්‍ය හා
කාලි ගොධා,256
**ගන**
ගන්ථ,256
ගාන්ධර්ව
දේවනිකාය,256
ගන්ධබ්බකායික
දේව නිකාය,256
ගින්න,256
ගින්න-විවිධ,258
ගිනිකන්ද,258
ගින්නේ
ආදීනව,258
ගිනිදෙවියන්
පිදීම,258
ගුන්දාවනය,258
**ගණ**
ගණකමොග්ග
ල්ලාන බ්‍රාහ්මණ,
259
ගණිකාව,259
ගුණමකුබව,259
**ගප**
ගෝපක
තෙර,259
ගෝපක
මොග්ගලාන
බ්‍රාහ්මණ,259
ගෝපාල,259

**ගම**
ගම්භිර ප්‍රඥාව,260
ගොමපිඬුව,260
**ගය**
ගයාකාශ්‍යප
තෙර,260
ගයිහ,260
**ගර**
ගර්භිණිය,261
ගෞරව ධම්ම,261
ගෞරවය හා
අගෞරවය,261
ගරුක කම්ම,261
ගරු පුද්ගල,262
ගරුබව-
අගරුබව,262
ගුරුලා,262
ගිරිමානන්ද
තෙර,262
**ගල**
ගිලන්බව,262
ගිලාන
උපස්ථානය,263
ගුලිස්සානි
භික්ෂුව,263
**ගව**
ගවදෙන,263
ගවම්පති
තෙර,264
ගවේසී භික්‍ෂුව,264
ගොවියා,264
**ගස**
ගස උපමා,264
ගෝසිංග සාල
වනය,264
**ගහ**
ගහපති,264
ගිහියන්ට
උපදෙස්,30,264
ගිහි උපාසක
උපාසිකා,265
ගිහිජීවිතය යහපත්
කරගැනීම,266
ගිහිසාමීචිපටිපදාව,
266
ගිහිසුඛ,267
ගුහාව,267
**ඝ**
**ඝට**
ඝටිකාර
බ්‍රහ්ම,267,601
ඝොටමුඛ
බ්‍රාහ්මණ,267
ඝොටමුඛ
ශාලාව,267
**ඝස**
ඝෝසිත
ගහපති,267
ඝෝසිතාරාමය,
267
**ච**
**චක**
චංකම,267
චංකි බ්‍රාහ්මණ,267
චක්ඛායතන,267
චක්ඛු,267
චක්ඛු ඉන්ද්‍රිය,267
චක්ඛු තුන,267
චක්ඛුපාල
තෙර,267
චක්ඛු
විඤ්ඤාණය,268
චක්‍රවර්ති රජ,268
චක්‍ර සතර,269
**චග**
චාගය,269
චාගානුසතිය,269
**චට**
චාටුකතා,269
**චත**
චෛත්‍ය,269
චෛතසික
සුඛය,270
චතුආරක්ෂක
භාවනා,273
චතුඉද්දිපාද,273
චතු ඕඝය,273
චතුකොටික
සුඤ්ඤතාව,274
චතු දිසා,273
චතු ධාතු,273
චතුධාතු
වවත්ථාන,274
චතු බ්‍රාහ්මණ
සත්‍ය,274
චතුරනවජ්ජ,275
චතුවෙසාරජ්ජ,275
චතුවොකාර
භව,275
චතුවොහාර,275
චතුසතිපට්ඨාන,27
5
චතුසත්‍යය-
චාතුරාර්ය
සත්‍ය,34,276
චතුසත්‍ය හා
දහම,279
චතුසම්මප්පධාන,
276
චාතුර්මහාරාජිකය,
276,377
චේතනා,270
චේතෝඛිල,270
චේතෝපරිය
ඥානය,271
චේතෝවිනිබන්ධ,
272
චෙතෝ
විමුක්තිය,272
චෙතොවිවට්ට,
273
චුතිය හා
උත්පත්තිය,279
චුතුප්පාතනුවණ,
279
චුතධර්ම පහ,280
චිත්ත,280
චිත්ත
ඉද්දිපාද,280
චිත්ත
එකග්ගතා,280
චිත්තකථික,280
චිත්ත ගහපති-
මචඡිකාසණ්ඩයේ,
280
චිත්ත පරිදාය,280
චිත්තලීනත්වය,
281
චිත්තවික්ෂෙප,

281
චිත්ත
විමුක්තිය,281
චිත්තවිවේකය,
282
චිත්ත සංඛාර,282
චිත්ත සමාධි
ඉද්දිපාද,282
චිත්තානුපසසනා,
282
චිත්තස්ස
උපක්කිලෙසා,282
**චද**
චෝදනාකිරීමේ
ක්‍රමය,282
**චන**
චන්ඩ ගාමිණී,282
චන්ඩප්‍රද්‍යෝත
රජ,282
චන්දඅභා,282
චන්දන
දේවපුත්‍ර,282
චන්දිම,282,890
චන්දිමස
දේවපුත්‍ර,283
චන්දනංගලික
උපාසක.283
චන්ද්‍රභාගා
නදිය,283
චින්තාමණී,283
චින්තාමය
ප්‍රඥාව,283
චුන්ද
අඹවනය,283
චුන්ද කර්මාකාර
පුත්‍ර,283
චුන්දී
රජකුමරිය,283
චුන්ද රාජ
කුමාර,283
චුන්ද
සාමනේර,283
**චණ**
චණ්ඩාල,283
**චප**
චාපා
තෙරණිය,284
චාපාල
චෛත්‍යය,284
**චම**
චම්පා නුවර,284
**චර**
චරණ චිත්‍ර,284
චරපුරුෂ,284
චරියාව,284
චරියා කථා,284
චර්යානානානත්ව
ඥාණය,284
චාරිත්ත සීලය,284
**චල**
චාල තෙර,284
චාලාතෙරණිය,
284
චුල්ලකොට්ඨිත
නියම්ගම,284
චුල්ලපන්ථක
භික්ෂුව,284
**චව**
චීවර,284
**ඡ**
**ඡඡ**
ඡ ඡක්ක ධම්මා
,285
**ඡග**
ඡිග්ගල,286
**ඡන**
ඡන්දය,286
ඡන්ද රාගය,286
ඡන්ද ඉද්දිපාද,286
ඡන්දසමාධි
ඉද්දිපාද,286
ඡන්දසමාධි විමංසා
ඉද්දිපාද,287
ඡන්න (කපිලවස්තු
නුවර) තෙර,287
ඡන්න (රජගහ
නුවර) තෙර,287
**ඡඵ**
ඡඵස්ස
ආයතන,287
**ඡබ**
ඡබ්බිසොධන,287
**ඡළ**
ඡළඅංග
දානය,287
ඡළඞගසමන්නාග
තො,287
ඡළඅභිජාති,288
**ඡව**
ඡවිය,288
**ජ**
**ජග**
ජාගරානුසතිය,289
**ජට**
ජටා,289
ජටිල,289
**ජත**
ජතුකන්නි
මානවක
තෙර,290
ජාතරූප,290
ජාතිය ජරාව හා
මරණය,291
ජාතිධම්ම,293
ජෝතික
ගහපති,293
ජෝතිපාල
බ්‍රාහ්මණ,293
ජෝතිතමපරායන,
293
ජෝතිජෝතිපරාය
න,293
ජේතවනාරාමය,
293
**ජන**
ජෛන ආගම,294
ජනකකර්මය,294
ජනපදකල්‍යාණී,
294
ජනප්‍රසාදය,294
ජනවසභ
දේව,294
ජානඅනාගාමී,295
ජාන-ධ්‍යාන,294
ජානවිෂය,19
ජානවිමොක්ෂ
සමාධි
සම්පත්තිය,296
ජානුස්සොනි
බ්‍රාහ්මණ,297

ජන්තුදේවපුත්‍ර,
297
**ජම**
ජම්බුද්වීපය,297
ජම්බුඛාදක
පරිබ්‍රාජක,297
**ජය**
ජයගැනීම හා
පැරදීම,297
ජයසේන
රාජකුමාර,297
**ජර**
ජරාව,297
ජරාධම්ම,298
ජරාමරණ,298
**ජල**
ජලංග
බ්‍රාහ්මණ,298
ජලස්නානය,298
ජලාභුජ,298
ජාලිය
පරිබ්‍රාජක,298
ජාලිනි
දෙව්දුව,298
**ජව**
ජවන ප්‍රඥාව,299
ජීවකකොමාරභ
ච්ච,300
ජීවිකාව,300
ජීවිතය,300
ජීවිතයේ
කෙටිබව,97,300
ජීවිත ඉන්ද්‍රිය,300
ජීවිතය හා
ශරීරය,300
ජීවිත මදය,301
ජිව්හාඉන්ද්‍රිය,301
ජිව්හා
විඥාණය,301
**ජෂ**
ජ්‍යොෂ්ඨ භික්ෂුව-
භික්ෂුණිය,301
**ඤද**
**ඤත**
ඤාතගම,301
**ඤණ**
ඤාණය,301
ඤාණචක්ඛු,301
ඤාණචරියාව,301
ඤාණත්‍රය,301
ඤාණදර්ශන,302
ඤාණපඤ්චකය,
302
ඤාණරාසිජක්කං,
302
ඤාණවත්ථු,302
ඤාණවාදය,303
**ඥ**
**ඥත**
ඥාතපරිඥා,303
**ඥණ**
ඥාණය,303
**ඨ**
**ඨත**
ඨිති කුසලය,303
ඨිතත්ත
පුද්ගලයා,303
**ඨන**
ඨාන,304
**ත**
**තක**
තක්ෂිලා
නුවර,304
තිකභෝජනය,304
තීක්ෂණ
ප්‍රඥාව,305
**තග**
ත්‍යාගසම්පන්බව,
305
ත්‍යාගානුස්සති
භාවනාව,305,633
ත්‍යාගශීලි,305
ත්‍යාගශීලිනොවීම,
306
**තජ**
තේජෝ ධාතු,306
තේජෝ ධාතු
සමාපත්තිය,306
**තට**
තුට්ට
උපාසක,306
**තත**
තිත්ත ඇට,306
තිත්මුවා,306
**තථ**
තථාගත,11,306
**තද**
තදංග
නිබ්බාන,316
තාදීගුණ,316
තෙදන්ඩික,316
තොදෙය්‍ය
තෙර,316
තොදෙය්‍ය
මානවක,317
තුදු බ්‍රහ්මරාජ,
317,601
**තන**
තාන,317
තුන්කාලය,317
තුන්කාලය දන්නා
නුවණ,317
තුන්දොර,317
තුන් භවය,317
තුන්ලෝකය,318
තුන් සමාධිය,318
**තණ**
තණඅග
පිනිබිඳුව,318
තණ්හාව,318
තණ්හාකාය
සය,322
තණ්හා
නිස්සය,322
**තප**
තපනීය ධර්ම,323
තපස්කර්ම,323
තපස්සු භල්ලුක
උපාසකයන්,323
තපුස්ස ගහපති,
324
තෘප්තිමත්බව,325
ත්‍රිපිටකය,324
ත්‍රිපරිවෘත්ත,324
**තඹ**
තුඹස
ප්‍රහේලිකාව,324
**තම**
තමෝතමපරායන,

324
තමෝජෝති
පරායන,324
තිම්බරුක
පරිබ්‍රාජක,324
**තය**
තායනගාථා,325
තායන
දේවපුත්‍ර,325
**තර**
තරහ,325
තරුණ රුක,325
තෙර,325
තෙරවාදය,325
තෙරුවන්
සරණ,326
තීරණපරිඥා,326
තිරිසන් කතා,326
තිරිසන්
ලෝකය,326
තිර්ථක,327
තිරෝකුඩ්ඩ
සූත්‍රය,327
**තල**
තාලපුපුත්‍ර
තෙර,327
තාලාවත්‍ථු,327
තිලෝක,328
තිලෝගුරු,328
ත්‍රිලක්ෂණය,328
තුලාව,328
**තව**
තාවතිංස
දේවලෝකය,328,
377
තෙවෙනි
ශ්‍රමණ,328
ත්‍රිවිද්‍යා,328
ත්‍රිවිධ අකුසල
මූල,329
ත්‍රිවිධ අගති,329
ත්‍රිවිධ
අනුමෝදනා,329
ත්‍රිවිධ ආස්‍රව,329
ත්‍රිවිධ කල්‍යාන
ශාසනය,329
ත්‍රිවිධ කුසල
මූල,330
ත්‍රිවිධ ඉන්ද්‍රිය,330
ත්‍රිවිධ චක්ෂු,330
ත්‍රිවිධ ඥාණ,330
ත්‍රිවිධ තණ්හා,331
ත්‍රිවිධ දුක,331
ත්‍රිවිධ
ධම්මඅංග,331
ත්‍රිවිධ ධම්මතා,332
ත්‍රිවිධ නිස්සාරණීය
ධාතු,332
ත්‍රිවිධ ප්‍රඥා,332
ත්‍රිවිධ පුණ්‍යක්‍රියා
වස්තු,333
ත්‍රිවිධ
පිරිසිදුබව,333
ත්‍රිවිධ භය,333
ත්‍රිවිධ භව,333
ත්‍රිවිධ මාන,333
ත්‍රිවිධ මල,334
ත්‍රිවිධ රත්නය,334
ත්‍රිවිධ වේදනා,335
ත්‍රිවිධ
සුචරිතය,335
ත්‍රිවිධ
දුෂ්චරිතය,335
ත්‍රිවිධ
සෝතාපන්න
පුද්ගල,335
ත්‍රිවිධ සංඛාර,336
ත්‍රිවිධ සමාධි,336
ත්‍රිවිධ ශ්‍රමණ
කාර්ය,336
ත්‍රිවිධ ශික්ෂාව,337
ත්‍රිවිධ ශීලය,337
**තස**
තිසරණය,338
තිස්ස
තෙරුන්:338
තිස්ස බුදුන්,338
තිස්ස බ්‍රහ්ම,338
තිස්නවයක්
භික්ෂුන්,339
තුසිත
දේවලෝකය,339,
377
**ථ**
**ථන**
ථිනමිද්ධ,339
**ථප**
ථූප,340
**ථම**
ථම්භය,341
**ථර**
ථෙර-ථෙරි,341
ථෙර ගාථා ථෙරී
ගාථා,341
ථෙර නම්
භික්ෂුව,341
**ථල**
ථුල්ල තිස්සා
මෙහෙණ,341
ථුල්ල නන්දා
මෙහෙණ,341

**ද**
**දක**
දක්ඛිණාව,341
දක්ඛිණෙය්‍යා,342
දක්ඛිණෙය්‍ය
අග්නි,342
දක්ෂිණාගර්භ
ගින්න,342
දක්ඛිණගිරිය,342
දක්ඛිණාවිසුද්ධි,342
දක්ෂිණ
දේශය,343
දුක,343
දුක්ඛානුපස්සි,348
දුක්ඛ ආරිය
සත්‍ය,348
දුක්ඛ සමුදය
ආරියසත්‍ය,348
දුක්ඛ නිරෝධ
ආරියසත්‍ය, 348
දුක්ඛ නිරෝධ
ගාමිණී පටිපදා
ආරියසත්‍ය,348
දුකඉන්ද්‍රිය,348
දුක්ඛුද්‍රය
ධම්ම,348
දුක්ඛධම්ම,348
දුක්වේදනා,349
දුකින් විසීම-
සැපෙන් වීසීම,

349
දුක්කථා කථා,349
දුක්ඛාපටිපදා දන්ධා
භිඤ්ඤා,349
දුක්ඛාපටිපදා ඛිප්පා
භිඤ්ඤා,349
දුක්විපාක,349
**දග**
දාගැබ,349
දුගතිය,350
දුගීබව,350
**දඟ**
දැඟුල් නුවණ,350
**දස**
දීස චාරිකා,351
දීඝායු
උපාසක,351
දීඝජානු කෝලිය
පුත්‍ර,351
දීඝපරාජන
යක්සෙනවි,351
**දඩ**
දැඩි ආශාව,351
**දට**
දට්ඨබ්බා,351
දිට්ඨි,352
දිට්ඨි අනුසය,356
දිට්ඨි ආස්‍රව,356
දිට්ඨිගතවීම,356
දිට්ඨි ඔඝය,356
දිට්ඨධම්ම,357
දිට්ඨධම්ම
වේදනීය
කර්ම,357
දිට්ඨධම්ම
නිබ්බාන,357
දිට්ඨධම්මසුඛ
විහරණය,357
දිට්ඨිනිජ්ජානඛ
න්ති,358
දිට්ඨිනිස්සය,358
දිට්ඨිප්‍රාප්ත,358
දිට්ඨි යොගය,358
දිට්ඨිසම්පන්න,
358
**දත**
දූත කර්ම,359
දූත සේවය,359
දුතිය ජානය,360
දුතියා,360
දෙතිස් මහාපුරිස
ලක්ෂණ,360
**දද**
දාදු කැටය,360
**දන**
දානය,361
දාන්ත,366
දන්ඩපාණී
ශාක්‍ය,366
ද්‍රෝන
බ්‍රාහමණ,366
**දණ**
දණ්ඩ,366
**දප**
දීප්තිමත්
කම්ම,367
දීප්තිමත්
ධම්ම,367
දීප්තිමත් මග-
අඳුරු මග,
367
දීපය,367
දීපංකර බුදුන්,367
දුප්පඤ්ඤ,367
දුප්පටිවිනොදය,
367
දෙපිටකාට්ටු,368
දෙපත් කියත,368
**දබ**
දබ්බමල්ල පුත්ත
තෙර,369
දිබ්බචක්ඛු
ඥාණය,369
දිබ්බසෝත
ඥාණය,369
දුබ්බන්ණිය මිටි
යක්ෂයා,370
**දඹ**
දඹදිව,370
**දම**
දූම,370
දෝමනස්ස
ඉන්ද්‍රිය,370
**දය**
දයාව,370
දායකයා,370
දියනෑම,370
දියබුබුල
උපමාව,371
දියේඇඳි ඉර
උපමාව,371
**දර**
දර්ශන
අනුත්තර,372
දර්ශනවිසුද්ධි
ඤාණය,372
දාරුකම්මික
ගහපති,372
දාරුක්ඛන්ධ,372
දරුණුබව,373
දුර්භාෂිතය,373
දුර්ලභ දේ,373
දුර්වචභාවය,374
**දල**
දෙලොව,374
**දළ**
දළචීවර,374
දළිද්ද,374
**දව**
ද්විපාද,11
දෙවන ශ්‍රමණ,374
දෙවහිත
බමුණා,374
දේවඅසුර
සංග්‍රාමය,374
දේවචාරිකා,375
දේවතානුසතිය,
375,634
දේවචුති,374
දේවදත්ත
භික්ෂුව,33,375
දේවදූතයෝ,375
දේවධම්ම,376
දේවධම්මික,376
දේවනිකාය,376
දේවපාද,376
දේවප්‍රසාද,376
දේවප්‍රිය,376
දේවලොක,376
දේවසත්වත
පද,378

දේවශබ්ද,378
දේවියෝ,379
ද්වයධර්ම,380
ද්වයතානුපස්සනාව,380
ද්විපාද,380
ද්විධාපථ,381
ද්විදා විතක්ක,381
ද්වේශය,381
දිවකණ,381
දිවැස්,381
දිව්‍යයානය,383
දෝවචස්සතාවය,383
දැවකොටය උපමාව,383
**දස**
දසඅකුසල,5, 385
දස කුසල,
දස අංග හා 385කම්මපථ,383
දස අසේඛියධම්ම,19, 384
දස අසුභභාවනාව, 637
දසකටු,384
දසකතා වස්තු,384
දසකම්මපථ,384
දස කුමාර ප්‍රශ්න,384
දසකසිණ,385
දසධර්ම,386
දස පාරමිතා,386
දස පුණ්‍ය ක්‍රියා වස්තු,386
දසබලඥාන,387
දසබල මාර සේනාව,387
දසවාසස්ථාන,387
දස සංඥා,387
දස සංඥාභාවනා,645
දස සංයෝජන,387
දසසිල්,388
දසසුත්තර ධර්මය,388
දස්සනආධිපත්‍ය, 388
දාසදාසි,388
දුසිරිතය හා සුසිරිතය,389
දුසිල්වතා හා සුසිල්වතා,389
දෝසය,389
**දශ**
දශ්සන විසුද්ධි ඥානය,390
දේශනා වාර,390
දුශ්චරිත,390
**දෂ**
දුෂ්කරදේ,390
දුෂ්කර ක්‍රියා,390
දුෂ්ප්‍රඥා,391
දුෂ්ප්‍රතිවිධ්‍ය ධර්ම,4,391
**දහ**
දහම්කතා,391
දහම් කැඩපත,391
දහර,391
දහසක් ලෝක ධාතුව,392
දැහැටි,393
දැහැමි හා අදැහැමි,393
**ධ**
**ධජ**
ධජය,393
ධජ පූජා,394
**ධත**
ධෘතරාෂ්ට්‍ර දෙව්රජ,394
ධෘතිමත්,394
ධාතු,394
ධාතු කුසලතාවය,396
ධාතු නානත්වය,398
ධාතුමනසිකාර භාවනාව,639
ධුතාංග පුහුණුව,398
ධොතක -මානවක තෙර, 399
**ධන**
ධ්‍යාන,294,401
ධ්‍යානවිෂය,19, 402
ධනංජනි උපාසිකාව,399
ධනඤජානි බ්‍රාහ්මණි,399
ධනඤජානි බ්‍රාහ්මණ,399
ධනය,399
ධනවත්,400
ධනිය ගොපල්ලා,402
ධනුශිල්පින්,402
**ධම**
ධම්ම අනුග්‍රහය,403
ධම්ම අනුසාසනා,403
ධම්ම අනුශ්‍රවනය,403
ධම්ම හා අධම්ම,402
ධම්ම ආයතනය,403
ධම්මය හා අර්ථය,402
ධම්ම අසිරිය,403
ධම්ම ඉගෙනීම,404
ධම්ම උගැන්වීම,403
ධම්මික උපාසක,402
ධම්ම කථික,404
ධම්මික තෙර,402
ධම්මගුණ,2
ධම්ම කාමය,405
ධම්මය ක්‍රමානුකූලව පුහුණුවීම,405
ධම්මානුකූලවාසය ,408
ධම්ම ගුණ,408

ධම්ම ගුරුවරු,411
ධම්ම චක්‍රය,411
ධම්ම චක්ඛු,412
ධම්ම චේතිය,413
ධම්ම චරියාව හා
අධම්ම චරියාව,
413
ධම්ම ඤාණය,414
ධම්මඤ්ඤු,414
ධම්මට්ඨිති
ඤාණය,414
ධම්ම
තණ්හාව,414
ධම්මස්ථ,414
ධම්ම
දූතසේවය,414
ධම්මදින්න
උපාසක,414
ධම්මදින්නා
තෙරණිය,414
ධම්මමගේ
දියුණුව,414
ධම්ම දායාදය,415
ධම්මදේශනාව,
415
ධම්මදස්සි
බුදුන්,416
ධම්ම ධාතුව,416
ධම්ම
නානත්වඥානය,
416
ධම්මානුසාරී,416
ධම්මානුස්සති
භාවනාව,417,
632
ධම්මානුපස්සනාව,
417
ධම්මානුධම්ම
පටිපන්න,417
ධම්මානුධම්ම
ප්‍රතිපදාව,417
ධම්මපරියාය,418
ධම්ම පරියාය -
ඉන්ද්‍රිය,418
ධම්මපරියාය
සෝකසල්ල
හරණ,419
ධම්ම ප්‍රවාහය,419
ධම්ම යුගල,419
ධම්මයෝගී,419
ධම්ම යානය,419
ධම්මරාජ,420
ධම්මරත්නය,420
ධම්මාරාම,420
ධම්මරසය,420
ධම්මය වරදවා
ගැනීම,420
ධම්ම විග්‍රහය,420
ධම්මවාදීන්,421
ධම්මවේදය,421
ධම්මවිනය,422
ධම්මයේ
විශේෂභාවය,425
ධම්ම විහාරි,425
ධම්ම
සාකච්ඡා,425
ධම්ම
සංචේතනා,426
ධම්ම
සජ්ජායනා,426
ධම්මපද සතර,426
ධම්මයේ යේ
සද්භාවය,426
ධම්ම සැපය,427
ධම්ම
සමාදානය,427
ධම්ම ශ්‍රවනය,429
**ධය**
ධ්‍යායි,430
**ධර**
ධර්මය
අතුරුදහන්වීම,
430
ධර්ම දානය,431
ධර්මය නිවැරදි හා
වැරදි,431
ධර්මය
පහළවීම,431
ධර්මය පැහැදිළි
කිරීම,431
ධර්මිෂ්ඨ හා
අධර්මිෂ්ඨ,431
ධර්මයේ
මූලධර්ම,432
ධාරණස්මෘතිය,
432
ධාර්මික,432
**ධව**
ධ්‍රැව,432
ධෝවන ගම,432
**න**
**නළ**
නඋප්පාදේතබ්බ
ධම්ම,186,432
**නඉ**
නොඉපදවියයුතු
ධම්ම,167
**නක**
නකුලමාතා හා
නකුල පිතා,433
නිකෙළෙස්
මුණි,235,433
නිකට්ඨ
පුග්ගල,433
නික්කම
ධාතුව,433
නික්ඛ
උපාසක,433
නිකේතසාරි,433
නෙක්ඛම්මය,433
නෙක්ඛම්මධාතු,
434
නෙක්ඛම්ම
විතක්ක,434
නෙක්ඛම්මසංක
ල්ප,434
නෙක්ඛම්ම
සංඥා,434
නෙක්ඛම්ම
සුඛය,434
නොකිපීම,434
**නඛ**
නඛසිඛා,435
**නග**
නගරය,435
නගර
ශෝභනිය,435
නාග,435
නාගතිමග,9,437
නාගදත්ත

තෙර,437
නාගසමාල
තෙර,437
නාගිත තෙර,437
නාගිත කාශ්‍යප
තෙර,437
නිගණ්ඨ,437
නිගණ්ඨනාථ
පුත්‍ර,48,438
නිග්‍රෝධකප්ප
තෙර,438
නිග්‍රෝධාරාමය,
438
**නස**
නීස,438
**නච**
නච්චගීත,438
නචේතනා,439
**නජ**
නජිරති,439
නිජ්ජර,439
**නට**
නටසිහිය,439
නිට්ඨංගත,439
**නත**
නත්ථි කිඤ්චි,8
නතුම්භාක,440
නෙත්තිප්‍රකරන,
439
නිත්‍ය,440
**නථ**
නාථ කරණ
ධර්ම,440
නාථ පරිඥා,440
**නද**
නදිය,440
නදීකස්සප
තෙර,440
නාදික ගම,441
නිදිවැරීම,441
නිද්දාතන්දී,442
නිදාන,442
නිද්ධමනිය
ධර්ම,442
නිද්දස වස්තු,442
නිද්දේස,443
**නධ**
නිධානය,443
**නන**
නන්දක තෙර,443
නන්ද තෙර,443
නන්ද ගෝතම
තෙර,443
නන්දා
තෙරනිය,443
නන්දා ගොතම
තෙරණිය,443
නන්දගෝපාල,
443
නන්දාරාමය,443
නන්ද
දේවපුත්‍ර,443
නන්දන
දේවපුත්‍ර,444
නන්දමානවක
තෙර,444
නන්දමාතා,444
නන්දිය
පරිබ්‍රාජක,444
නන්දක
ලිච්චවී,444
නන්දිය
ශාක්‍ය,444
නන්දිවිසාල
දෙවි,444
නන්දන
උයන,444
නන්දීති,445
නන්දික්ෂය,445
නින්ද,445
නානත්තකාය,446
නානත්තසඤ්ඤා,
446
නානාතිත්ථිය,446
නානාධර්ම,446
නානාධාතු
නුවණ,446
නානාධිමුත්ති
ඥානය,446
**නප**
නපටිසනත්‍ථාරො,
447
නිපපඤ්ච,447
නිපුණ,447
නිපුණතාවය හා
අනලස්බව,447
**නබ**
නිබ්ද්දාව,447
නිබ්ද්දානුපස්සනා,
448
නිබ්බේධභාගිය
මාර්ගය,448
නිබ්බේධිකධර්ම
පරියාය, 449
නිබ්බේධික
ප්‍රඥාව,449
**නභ**
නභාවෙතබ්බ
ධම්ම,450
**නම**
නමස්කාරය,450
නාමය,450
නාමරූප,450
නිමොක්ඛය,
පාමොක්ඛය හා
විවේකය,452
නිර්මාණරති දේව
ලෝකය,377
නොමග,452
නොමළමිනිසුන්,
452
නොමසුරුකම,
452
නෑම,452
**නය**
න්‍යායපටිපන්න,
453
නෙයාය පුග්ගල,
453
**ණය**
ණයගැති,453
**නර**
නාරද තෙර,453
නාරද බුදුන්,453
නිරය,453
නිරයගාමිණි හා
නිරය ගාමිණි
නොවන,455
නිරහංකාර,455
නිර්මල,455
නිර්මාණරති

දේවලෝකය,455
නිර්වාන ධාතු,455
නිර්වේද
ප්‍රඥාව,456
නිරෝගී,456
නිරෝධය,456
නිරෝධ ධාතුව,
456
නිරෝධ ධම්ම,456
නිරෝධ
නිස්සාරණිය
ධාතුව,457
නිරෝධ
සංඥාව,457
නිරෝධ
සමාපත්තිය,457
නිරෝධානුපස්ස
නාව,457
නිරාමිසය,458
නිරාශ සංසයා,458
නිරුත්තරසිංහ,
458
නිරුපධිසුඛ,458
**නල**
නාලක ගම,458
නාලක තවුසා,458
නාලන්දා නුවර,
459
නිලවාසි තෙර,459
**නළ**
නළකලාප,459
**නව**
නවඅංග
උපෝසථය,459
නවාංග
ශාසතෲශාසනය,
459
නවකම්මික
භාරාද්වාජ
බමුණා,459
නවබුදුගුණ,460
නව ප්‍රඥා,460
නව සංඥා,460
නවසීවථිකා
භාවනාව,460,
636
නිවන,8,460
නිවන දක්වන
පද,463
නිවන හඳුන්වන
පද,1,463
නිවන හා
සසර,463
නීවරණ,464
නුවණ,468
නුවණැත්තෝ,468
නෙවසඤ්ඤානාස
ඤ්ඤායතනය,101
, 468
නැව,460
නොවැරදිය හැකි
මග,468
**නස**
නසෙවිතබ්බ
ධම්ම,146,468
නොසෙවියයුතු
පුද්ගලයා,468
නාස්තික
දිට්ඨී,468
නිසරු ගස,469
නිස්සය,469
නිස්සයසම්පන්න,
469
නිස්සරණය,469
නිස්සාරණිය
ධාතු,470
නිස්සිත සීලය,470
නෙසජ්ජිකයෝ,
470
නුසුදුසු කතා,470
**නශ**
නිශ්චිතබව,470
**නෂ**
නිෂ්ප්‍රීතික
සුඛය,471
නිෂ්ප්‍රීතිකාලම්භන
සුඛය,471
නිෂ්ප්‍රපඤ්චාරාම,
471
**නහ**
නහතක,471
නිහතමානිබව,471
**ප**
**පක**
පකුධ
කච්චායන,48,471
පොක්ඛරසාතිබ්‍ර
හ්මණ,471
පොකුණු බඳු
පුද්ගලයෝ,472
පුක්කුසාතිභික්ෂුව,
472
**පග**
පිංගලකොච්ච
බ්‍රාහමණ,472
පිංගියමානවක
තෙර,472
පිංගීයානි
බ්‍රාහ්මණ,472
**පංච**
පංචඅංග,472
පංචඅංගීක සම්මා
සමාධිය,472
පංච ආධ්‍යාත්මික
ඉන්ද්‍රිය,473
පංච ආධ්‍යාත්මික
බල,473
පංච ආනන්තරික
කම්ම,473
පංච ඉට්ඨ
ධර්ම,474
පංච
ඉන්ද්‍රිය,41,474
පංච
උපාදානස්කන්ධය
,475
පංචකාම ගුණ,478
පංච
චේතෝඛීල,479
පංච චේතෝ
විනිබන්ධන,479
පංච ඤාණ,479
පංච ඥාණ සම්මා
සමාධිය,479
පංච ධන,480
පංච ධම්ම
පුද්ගලයෝ,480
පංච නීවරණ,481
පංච
ප්‍රාධානිකඅංග,482
පංච බැමි,483

පංච භය හා
වෛර,483
පංච රාජ,483
පංචාලචන්ඩ
දේවපුත්‍ර,483
පංච වග්ගිය
භික්ෂු,483
පංච විමුක්ති
ආයතන,484
පංචසිඛ ගාන්ධර්ව
පුත්‍ර,485
පංච සම්පදා,485
පංචශීලය,485
පංච සේඛබල,485
පංචස්කන්ධය,485
**පච**
පචලායමානං
නිසින්නං,485
පච්චෙකබුද්ධ,486
පච්චේක
බ්‍රහ්ම,487
පච්චේක බ්‍රහ්ම
සුබ්‍රහම,601
පච්චේක බ්‍රහ්ම
සුද්ධාවාස,601
පච්චත්තං
වේදිතබ්බො,487
පච්චනීකසාත
බ්‍රාහ්මණ,487
පච්චවෙක්ඛණ
ඤාණය,487
පච්චාසමණ,487
පච්චොරොරොහණී,
488
පච්චිම
ජනතාව,488
පාචීනනින්න,488
**පජ**
පජ්ජාභූමි
බ්‍රාහ්මණ,488
පජ්ජතෝ,489
පජ්ජුන
දේවතා,489
පූජනීය
ස්ථාන,489
ප්‍රජාපති
ගෝතමිය,489
**පඤ**
පඤ්චවත්ත,489
පඤ්චඞ්ගවිප්පහී
නො,490
පඤ්චඞ්ග
සමන්නාගතො,
490
පඤ්ඤාපරිචිත,
490
**පඥ**
ප්‍රඥාව,490
ප්‍රඥාකථා,492
ප්‍රඥා
ආලෝකය,492
ප්‍රඥා ඇස,492
ප්‍රඥා ඉන්ද්‍රිය,492
ප්‍රඥාගති,493
ප්‍රඥාගරුක
පුද්ගල,493
ප්‍රඥා ධනය,493
ප්‍රඥාපරිචිත,493
ප්‍රඥා පටිලාභ,493
ප්‍රඥා ප්‍රභේදය,494
ප්‍රඥා පරිහාණී,494
ප්‍රඥාබලය,494
ප්‍රඥා
බහුලත්වය,494
ප්‍රඥා වෘද්ධිය,495
ප්‍රඥා විපුලබව,495
ප්‍රඥා
විමුක්තිය,496
ප්‍රඥාසම්පන්න,
496
ප්‍රඥාවන්ත,497
ප්‍රඥාවන්තයාගෙ
හැසිරීම,497
**පඬ**
පිඬුසිඟායෑම,497
**පට**
පටාචාරා
තෙරණිය ,497
පාටලියගාමිණී,
497
පාටලීපුත්‍ර
නුවර,497
පටිච්චසමුප්පාදය,
28
පටිසන්ථාරො,19
පටිසඅනුසය,497
පටිස නිමිත්ත,497
පටිච්ඡන්න
කම්ම,497
පටිපත්ති
අන්තරධාන,498
පටිපදාව,498
පටිපදා විධි
දෙක,499
පටිපදා විධි
තුන,499
පටිනිස්සග්ග,499
පටිනිස්සග්ගානුප
ස්සනාව,499
පටිප්පස්සද්ධ
සීලය,499
පටිභාන,499
පටිභානකතා,500
පටිසම්භිදා
නුවණ,500
පටිච්චසමුප්පාදය,
500
පටිච්චසමුප්පාද
කුසලතාවය,502
පටිසංඛානබල,
503
පටිසෝතගාමි
පුද්ගලයා,503
පටිසන්ථාරො,
504
පටිසාරණියකම්ම,
504
පටිසල්ලාන,504
පොට්ඨපාද
පරිබ්‍රාජක,504
**පඨ**
පඨවි,504
පඨවි උපමා,505
පඨවි ධාතුව,504
**පත**
පෘතග්ජන,505
පතන දේ ලබා
ගැනීම,505
පත්තිචරියාව,506
පත්තනික්කුජ්ජන

කම්මය,506
පත්තපිණ්ඩික,507
පතිකූලය,507
පතිතවීම,507
පතිට්ඨිත,507
පතිරූපදෙසවාසො
ච, 507

පතිලීන,507
පාතුභාව,508
පාතිමොක්ඛ,508
පාතිමොක්ඛ
සංවර ශීලය,509
පාතාලය,509
පුත්‍රයා,509
පුත්‍ර මාංශ,509
ප්‍රතිග්‍රාහක,509
ප්‍රතිභාන,509
ප්‍රතිසන්ධි
චිත්ත,509
ප්‍රත්‍යවේක්ෂණ
ප්‍රඥාව,511
ප්‍රත්‍යසන්නිශ්‍රිත
ශීලය,511
ප්‍රාතිහාර්ය,511
ප්‍රීතිය,512
ප්‍රේත,512
ප්‍රේතලෝකය,513
පොතලිය
ගෘහපති,513
පොතලිය
පරිබ්‍රාජක,513

**පඨ**

ප්‍රථම ජානය,513
පුථු ප්‍රඥාව,513

**පද**

පදුට්ඨ පුග්ගල,514
පදුමා
උපාසිකා,514
පදුම නිරය,514
පදුම බුදුන්,514
පදුමුත්තර
බුදුන්,514
පදෙස විහාර
ඥානය,515
පුදපූජා,515
පුද්ගල අයහපත්
කරුණු,515
පුද්ගල
දෙවර්ගය,515
පුද්ගල තුන්
වර්ගය,515
පුද්ගල සිව්
වර්ගය,518

පුද්ගල පස්
වර්ගය,519
පුද්ගල සය
වර්ගය,520
පුද්ගල අට
වර්ගය,520
පුද්ගල දස
වර්ගය,520
පුද්ගල
නානත්‍වය,520
පුද්ගලික
ප්‍රසාදය,520
පුද්ගලික
සත්‍යයන් පහ
කිරීම,521

**පධ**

පධාන,521
පධාන සතර,521
පධානිය අංග,521

**පන**

පන්සිල්-
පංචශීලය,522
පාන වර්ග,522
පානාතිපාතා,522
පින් - පිං -
පුණ්‍ය,522
පින් කිරීම-
පුණ්‍යක්‍රියා,523
පින්දීම,523
පින් වැඩෙන
අන්දම,523
පින්ගිය තෙර,524
පුන්නජි තෙර,524
පුන්ණිකා
තෙරණිය,524
පුන්බ්බසුක
භික්ෂුව,524
පුනබ්බසු
යක්ඛ,524
පුන්සඳ,525
පුනර්භවය,525
පැන්හල් හා
පැන්පොකුණු,525
පැනස,526

**පණ**

පණ්ඩිතයා,526
පණ්ඩිත
ප්‍රඥාව,526
පාණ්ඩුකම්බල
ශෛලාසනය,526
පිණ්ඩපාත,526
පිණ්ඩපාත
පාරිශුද්ධිය,527
පිණ්ඩොල
භාරද්වාජතෙර,
527
ප්‍රාණඝාතය,527
ප්‍රාණීන්,527
පුණ්‍ය ක්‍රියා,527
පුණ්‍ය කෙත,528
පුණ්‍යක්‍රියා හා
පුණ්‍යක්‍රියාවස්තු,
528
පුණ්‍යනදි,528
පුණ්‍යනිධාන,529
පුණ්ණ තෙර,529
පුණ්ණමන්තානිපු
ත්ත තෙර,529
පුණ්ණක මානවක
තෙර,529
පුණ්ණියතෙර,529
පුණ්‍යාභිසංස්කාර,
529
පුණ්ඩරික නිරය,
529
ප්‍රණීත-පණීත,530
ප්‍රණීතඅධිමුක්තිය,
530
ප්‍රණීත කාම,530
ප්‍රණීත ධාතුව,530
ප්‍රණීත සීලය,530

**පප**

පාපය,530

පාපික (ලාමක) ආසාව,530
පාපික (ලාමක) ඊර්ෂ්‍යාව,530
පාපික කම්ම,531
පාපික ධම්ම,531
පාපික පුද්ගල,531

පාපමිත්‍ර සේවනය,531
පපඤ්චිතය,532
පපඤ්චක්ඛය,532
ප්‍රපංච,532
ප්‍රපාතය,533පිප්පි ලි සිටුවරයා,533

පබ

පබ්බජා,533
පබ්බජා පුහුණුවියයුතු දසසංඥා,534
පබ්බාජනිය කම්ම,534
පබ්බතය,535
පුබ්බංගම,535
පුබ්බෙවකතපුඤ්ඤතා,535
පුබ්බෙනිවාසානුස්සති ඥානය,536
පුබ්බාවිදේහය, 536

පහ

පහංන්භූ,536
පභා-ප්‍රභාව,536
ප්‍රභාස්වර,536

පම

පාමොක්ඛය,536
ප්‍රේමය,536
ප්‍රමාදය,78,537
ප්‍රමාදවිහාරි හා අප්‍රමාදවිහාරි,537
ප්‍රමෝදය,537

පය

පායාසි රජ,537
පියඋරුමය,538
පියක භාන්ඩාගාරික,540
පියදස්සි බුදුන්,538
පියා,537
ප්‍රියංකර,539
ප්‍රියබව හා අප්‍රියබව,538

පර

පරචිත්ත පරියාය,539
පරචිත්ත විජානන ඥානය,539
පරදාරසේවනය, 539
පරම අස්වැසීම,539
පරම උත්තර සමාපත්තිය,539
පරම දිට්ඨ ධම්ම නිර්වානවාදය,539
පරනිර්මිතවසවත්ති දේවලෝකය,377, 540
පරලොව,540
පරවාදය,540
පරවිපත්ති,33
පරවිපත්ති හා පරසතු මල් රුක,540
පරසම්පත්,540
පරසම්පත්,33
පරහිත,541
පරික්ඛයාය,541
පරිකුප්ප,541
පරිජාන හා අපරිජාන,541
පරිඥාය,541
පරිනිබ්බාන ඥාන,544
පරිනිබ්බානය - පරිනිර්වාන, 542
පරිප්‍රඥාව,541
පරිපූරක,544
පරිපූර්ණ අවබෝධය,544
පරිබ්‍රාජික,544
පරිභව නොකළයුතු සිව් දෙනා,545
පරියාය,545
පරියොගාහ ඥාණය,546
පරියත්ති අන්තරාධාන,546
පරිළාහ,546
පරිවිමංසනය,546
පරිසදූෂණ,546
පරිස ශෝභන,546
පරිස්සාරජ්ජභය, 546
පරිශුද්ධ ධර්ම,546
පරිහානිය ධර්ම,546
පරිහාණි හා අපරිහාණි පුද්ගල,547
පර්යාප්ති බහුල පුද්ගල,547
පර්යේෂණ,547
පර්යයයෙහි ඥානය,547
පරාත්ථකාමි,547
පරාමට්ඨ සීලය,548
පාර,549
පාරමී- පාරමිතා,549
පාරායන ධර්ම පරියාය,549
පාරාශරිය බ්‍රාහ්මණ,173
පාරිචරියා අනුත්තර,549
පාරිභෝග චෛත්‍යය,549
පාරිමතිරය,549
පාරිලෙය්‍යක වනය,549
පරුෂාවාචා,550
පිරිත් සජ්ජායනා,550

පිරිස-පරිස,551
පිරිසිදුබව,552
පිරිසිදු පරිපූර්ණ ආධ්‍යාත්මික ජීවිතය,552
පුරාණ උපාසක,552
පුරාණ කාශ්‍යප,48,552
පුරාණ මග-මාවත,108,553
පුරාණ ශාස්තෘ -ආචාර්යවරු,552
පූර්ව නිමිත්ත,553
පූර්ව නිවාස සිහිකිරීමේ නුවණ,553
පුරිස ඉන්ද්‍රිය,554
පුරිසඉන්ද්‍රිය ඥානය,554
පුරිස ධර්මතා,554
පුරිස බන්ධන,554
පුරිස ලක්ෂණ,554
පුරුෂ රූපය,554
ප්‍රාර්ථනා,555
පෙර ජීවිත,555
පෙරවිසූ කඳ පිළිවෙත දැකීමේ නුවන,555
පෙර බුදුවරු,555
පැරදීම,555
පැරණිකම්ම,556
පැරණි චාරිත්‍ර,556
**පල**
පලගන්ඩතෙර, 556
පලෝක ධර්ම,556
පාලකයෙක්ගේ ගුණ,556
පිලෝතික පරිබ්‍රාජක,556
පාලම් පුජාකිරිම,556
**පළ**
පළතුරු පුජා,557
පළමු අරහත් සංඝ,557
පළමු ශ්‍රමණ,557
පළාසය,557
පැළලුප් නුවර,557
පුළවක සංඥාව,557
පොළභා වැනි පුද්ගල,557
පොළොව-පෘතුවි,557
පිළිකුල්භාවනාව, 557
පිළින්දවච්ඡතෙර, 557
පිළිවෙල කතාව,558
පිළිකා රෝගය,558
පිළිසිඹියා,558
**පව**
පවිටු දිට්ඨි,558
පවිත්‍රබව,558
පවිවිවේකය,558
පාවචන,558
පවාරණ,559
පාවානුවර,559
පවික්‍රියා,559
පව් සේදීම,559
පැවිද්ද,560
පැවිද්ද සත් අවුරුදු වියේ,560
පැවිදි සුබ,561
පවුල් හා ආශ්‍රය,560
**පස**
පසන්න චිත්ත,561
පස් ඉන්ද්‍රිය,561
පස්ගෝරස,561
පස්කම් ගුණ,561
පස්කම් සැප,561
පස්බිඳ,561
පස්බිය,562
පස්වග තවුසන්,563
පස්වග මහණුන්,562
පස් ලෞකික බල,562
පස්සදිය,562
පඝසද්ධකායසඞ්ඛාර,562
පසේනදී කෝසල රජ,562
පසේබුදු,563
පසුතැවිල්ල,562
පංසුකූලික,561
පෙස්ස හස්ථාරෝහ පුත්‍ර,563
පෝසාලමානවක තෙර, 8,563
ප්‍රසන්න,563
ප්‍රසාදය හා අප්‍රසාදය,563
ප්‍රසාදික පුද්ගල,564
ප්‍රසංශාව,564
**පශ**
පාශය,564
පිශුණාවාචා,565
ප්‍රශ්න ඇසීම,565
ප්‍රශ්නව්‍යාකරණ,566
**පහ**
පහකරගතයුතු දිට්ඨි,566
පහන,566
පහළවීම-පාතුභාව,566
පහසු විහරණය,566
පහන් පූජා,566
පහාතබ්බ ධර්මතා,567
පහාන ධර්ම,567
පහානාය,567
පහාන සංඥාව,567
පහාස දේව සභාව,568
පහාරද අසුර රජ,568
පාහුණෙය්‍යා,568
ප්‍රහාන ප්‍රඥාව,568

ප්‍රභාණ
පරිඥාව,568
ප්‍රභාණාරාම,568
**ඵ**
**ඵග**
ඵග්ගුන තෙර,568
**ඵට**
ඵොට්ඨබ්බසංවේ
තනා,568
**ඵල**
ඵල ඥානය,568
ඵලනානත්‍වය,568
ඵල ප්‍රඥාව,569
ඵලූපජීවී,569
**ඵස**
ඵස්ස,569
ඵුස්ස බුදුන්,569
ඵාසුවිහාර,569
**බ**
**බක**
බක
බ්‍රහ්ම,569,601
බක්කුල තෙර,569
**බජ**
බීජ උපමා,569
බොජ්ඣංග,569
**බඩ**
බුඩ්ඪපබ්බජිත,573
**බත**
බත් කැඳ,574
බත්මත,574
**බද**
බද්ධවෛරය,574
බෙදාදී
වැළඳීම,574
බුද්ධ,574
බුද්ධ
අනුසාසනා,575
බුද්ධ අනුගාමික
දිට්ඨී,575
බුද්ධ අපදාන,575
බුද්ධආයුෂ,**96**
බුද්ධ ගයාව,575
බුද්ධ චිවරය,575
බුද්ධඥාන,575
බුද්ධත්වය,575
බුද්ධ දේශනා,575
බුද්ධ ධාතු,576
බුද්ධ ධජය,576
බුද්ධනාම,**36,576**
බුද්ධ භාසිතය,576
බුද්ධ මාතාව,576
බුද්ධවංශ,**28,576**
බුද්ධවිෂය,19,577
බුද්ධ ශ්‍රාවක,577
බුද්ධඝෝස
ආචාරි,577
බුද්ධිය,577
බුද්ධානුස්සති
භාවනාව,577,
631
බුදුන්
වහන්සේ,577
බුදුගුණ,577
බුදුපිළිම,578
බුදුසසුන,578
බුදුන්ගේ ලේ
සෙලවීම,578
**බධ**
බෝධිය,578
බෝධිරාජ
කුමාර,578
බෝධිසත්‍ව-
බෝසත්,578
බෝධි පාක්‍ෂික
ධම්ම,579
බෝධිරුක,580
**බද**
බිඳීයාම,581
බිදෙන සුළු,581
**බන**
බන්ධන-
බැඳීම,581
**බප**
බ්‍යාපන්න
චිත්ත,582
**බබ**
බැබලීම,582
**බම**
බමුණා-
බ්‍රාහ්මණ,582
බමුණු
පච්චරොහණ,582
බමුණන්
පිරිසිදුවීම,582
බමුණන්ගේ
මළවුන්
අනුස්මරණය,583
බිම්බිසාර
රජ,20,583
**බව**
බවාරිබ්‍රාහ්මණ,8
**බඹ**
බඹ,583
බඹසර,583
**බය**
බිය-භය,583
**බර**
බර,584
බරණැස්නුවර,584
බොරුකීම,584
බල ධර්ම,584
බල දෙක,585
බල සතර,585
බල පහ,585
බල අට,585
බල අතුරින් අග්‍ර
බලය,585
බලය දීම.584
බල විවිධය,586
බාලයා හා
පණ්ඩිතයා,586
බල්ලා,588
බලිවද්ද,588
බලූ වුත,588
බේලුව ගම,589
**බළ**
බිළාල,589
බිළි වැද්දා,589
බිළි කටු සය,589
**බව**
බාවරි
බ්‍රාහ්මණ,589
**බස**
බෝසත් මව, **121**
**බහ**
බහු උපකාර
ධර්ම,590

බහුජනහිත,590
බහුධාතු,591
බහුල කම්ම,591
බහුලකරගතයුතු
ධම්ම,591
බහුලකර
නොගතයුතු
ධම්ම,590
බහු වේදනා,591
බහුහානි,592
බහුශ්‍රැත,592
බාහිතපාපී,589
බාහිය තෙර,590
බාහිය දාරුචීරිය
රහතුන්,590
බාහිර අරමුණු,590
බාහිර ආකාශ
ධාතුව,590
බාහිර
ආයතන,590
බාහිර දිට්ඨී,590
බාහිර
බන්ධන,590
බාහිර සංයෝජන
ඇති
පුද්ගලයා,590
බ්‍රහ්මචක්‍රය,594
බ්‍රහ්මචාරි,594
බ්‍රහ්මචරියාව,592
බ්‍රහ්මචරිය පංචම
ශිඛපද,601
බ්‍රහ්මචාරියෝගධ,
601
බ්‍රහ්මජාලය,600
බ්‍රහ්මඤ්ඤ,603
බ්‍රහ්මදණ්ඩනය,
601
බ්‍රහ්මදේව
තෙර,600
බ්‍රහ්මබව,594
බ්‍රහ්මයානය,601
බ්‍රහ්ම
රාජයෝ,601
බ්‍රහ්මලෝක,8,607
බ්‍රහ්මලෝක
සංචාරය,614
බ්‍රහ්මවිහාර,604
බ්‍රහ්ම
සනංකුමාර,11,
604
බ්‍රාහ්මණ,614
බ්‍රාහ්මණයන්ට
අවවාද,615
බ්‍රාහ්මණ උදය
ගාමිණි
පටිපදාව,615
බ්‍රාහ්මණ
ධර්මය,20,615
බ්‍රාහ්මණ
ස්වභාවය,615
බෙහෙත්-
අවුසද,615
බෙහෙත් කැඳ
,616

**භ**

**භක**

භික්ඛක
බ්‍රාහ්මණ,616
භික්ඛු,
භික්ඛුණී,616
භික්ඛු භික්ඛුණී -
අග්‍ර,616
භික්ඛු භික්ඛුණී
අපරිහානිය හා
පරිහානිය
ධර්ම,616
භික්ඛු භික්ඛුණී
පිළිබඳ මිනුම්
දණ්ඩ,617
භික්ඛු භික්ඛුණී
යනු කවරේද?,617
භික්ඛු භික්ඛුණී
විහරණ,618
භික්ඛු ඕවාද,618
භික්ඛුමිත්‍ර,618
භික්ඛුණීන්ට
ඕවාද,618
භික්ඛුණී සංඝ
ස්ථාපනය,618

**භග**

භගිනි,619
භංගානුපස්සනා
ඤාණය,619
භාග්‍යවතුන්
වහන්සේ,619
භෝග සම්පත්,619

**භජ**

භජිතබ්බ,619
භෝජන
පිරිනැමීම,620
භෝජනයේ
මාත්‍රවීම,620
භෝජනයෙහි
මාත්‍රනොවීම,
621

**භත**

භත්තාදක,621
භත්තුද්දේශික
622
භාතු,622
භෞතික
ආහාර,622
භෞතික ඇස,622

**භද**

භද්ද උපාසක,622
භද්ද කච්චානා
තෙරණිය,622
භද්ද තෙර,622
භද්දිය තෙර-,622
භද්දිය
කාළිගොධායපු
ත්ත තෙර,622
භද්දජි
තෙර,10,622
භද්දිය තෙර-
පස්වග,622
භද්දදේව
තෙර,622
භද්දවග්ගිය කුමාර
තෙරුන්,622
භද්දිය ලිච්චවී,623
භද්දේකරත්ත,623
භද්‍ර අජානිය
අශ්වයා,623
භද්‍රකල්පය,623
භද්‍රාකපිලානි
තෙරණිය,623
භද්‍රා කුණ්ඩලකේසි
තෙරණිය,623
භද්‍රා දේවිය,623
භද්‍රක ගාමිණී,623

හද්‍රාලි
තෙර,20,623
හද්‍රාවුධ තෙර,623
හද්‍රමග,623
හද්‍රමරණය,623
හද්‍ර ශිලය,624
භිදුර,624
**හණ**
භණ්ඩන,624
භණ්ඩුකර්මය,624
භණ්ඩු
භික්ෂුව,624
**හම**
භූමිචාල,624
භූමිනානත්ත
ඥාණය,624
**හය**
භය,624
**හර**
භාරය,625
භූරි ප්‍රඥාව,625
**හල**
භල්ලුක
උපාසක,626
භල්ලික
ගහපති,626
**හව**
භවය,626
භව ආශ්‍රව,628
භවඔසය,628
භව තණ්හාව,628
භව දිට්ඨිය හා
විභව දිට්ඨිය,628
භව නිරෝධය,629
භවනෙත්තිය,629
භව යොගය,629
භවරාග
අනුසය,629
භව
සංයෝජන,629
භාවනාව,629
භාවනා- විවිධ,630
භාවනාවේ
නිපුනබව,651
භාවනාවේ
වර්ධනය,651
භාවනාමය
ප්‍රඥාව,651
භාවනාමය
බලය,651
භාවනාවාදය,652
භාවනාරාම,652
භාවනිය,652
භාවෙතබ්බ ධම්ම-
නභාවෙ තබ්බ
ධම්ම,652
**හස**
භිසක්ක,653
**හහ**
භිහියෝස
තෙර,653
**ම**
**මක**
මක්ඛලි
ගෝසාල,21,48,
653
මකුඛව,654
**මබ**
මඛාදේව රජ,654
**මග**
මංගල
කරුණු,**6,654**
මංගල දාන,655
මංගල බුදුන්,655
මග ඵල සතර,655
මග්ග චරියාව,655
මග්ග ඥාණය,655
මගධ දේශය,656
මාගධ
දේවපුත්‍ර,655
මාගන්දික,656
මාගන්දිය
තෙර,656
මාගන්දිය බමුණා
හා බැමිණිය,656
මාගන්දියා
බිසව,657
මාගම,656
මිගාරමාතා,657
මිගාර
සිටුවරයා,657
මිගජාල තෙර,657
මිගදාය
අඳුන්වනය,657
මිගසාලා
උපාසිකාව,657
මුගපක්ඛ
ශාස්තෘ,657
**මස**
මස මානවක,657
මාස දේවපුත්‍ර,657
මේසය
උපමාව,657
මේසිය තෙර,657
මොසරාජ
තෙර,657
**මච**
මච්චරිය,657
මචුධෙයා,657
මුචලින්ද
නාග,658
මිච්චාඅටමග,658
**මඤ**
මඤ්ජුසසරානං,658
මඤඤනා,658
මුඤචිතුකමයතා
ඥානය,
659
**මට**
මුට්ඨස්ස,659
මැටි බඳුන් ,659
**මත**
මතක දාන,659
මත්වීම,659
මාතලී
දේවපුත්‍ර,659
මාත්‍රය දැනීම,659
මෙත්තගු
තෙර,659
මෙත්තා-
මෛත්‍රිය,659
මෙත්තා චේතෝ
විමුක්තිය,661
මෙතෙර,663
මෛත්‍රිය
බුදුන්,663
මුත්තා
උපාසිකා,663
මුත්ති,663
මිත්‍රයා,663

**මථ**
මිථ්‍යාත්වය-
සම්‍යක්තවය,
4,664
මිථ්‍යා ආජීවය,666
මිථ්‍යා දිට්ඨිය,666
මිථ්‍යා දස
ධර්ම,668
මිථ්‍යා ප්‍රතිපදාව හා
සම්මා
ප්‍රතිපදාව,668
**මද**
මදය-මත්වීම,668
මුදල්
පරිහරණය,669
මුදිතාව,669
මුදිතා චේතෝ
විමුක්තිය,
669
මුදුවචන,669
මෘදුබව-මුදු,670
**මධ**
මධ්‍යය,670
මධ්‍යම කාම
ආස්වාදය,
671
මධ්‍යම ධාතුව,671
මධ්‍යම
ප්‍රතිපත්තිය,671
මධ්‍යම
ප්‍රතිපදාව,671
මධ්‍යම ශිලය,671
මධුභානි,671
මධුර නගරය,672
මධුරාපුරය,672
මධුරාපුර
අවන්තිපුත්‍ර රජ,
672
**මන**
මන ඉන්ද්‍රිය,672
මනස-චිත්ත,672
මනසිකාර,672
මනායතනය,672
මනසානුපෙක්ඛතා
,672
මනසිකාර
කුසලතාව,673
මනුජා
උපාසිකා,673
මනුෂ්‍ය
ලෝකය,673
මන්ඩිස්ස
පරිබ්‍රාජක,673
මන්ධාත-
මාන්ධාතෘ,13,673
මනෝමයකය
ඇති දෙවියන් -
අනුසති
භාවනාව,634
මානත්ථද්ධ
බමුණා,673
මානය,673
මානඅනුසය,675
මානය, අවමානය
හා අතිමානය,675
මනාප දාන,675
මනාප
හැසිරීම,676
මානවගාමිය
දේවපුත්‍රයෝ,
676
මානසික
සුඛය,676
මානසික
ශක්තිය,676
මනෝඋපවිචාර,
676
මනෝ කම්ම,677
මනෝමය
දේවනිකාය,677
මනෝ
නිවාරණය,677
මනෝ සංඛාර,678
මනෝසංචේතනා
ආහාර,678
මනෝ
සංවරය,678
මනෝ
සුචරිතය,678
මනෝ
දුශ්චරිතය,678
මිනිසත්බව,678
මිනිස් ආයුෂ,678
මිනිස් ජීවිතය,678
මුන්ඩ රජ,678
**මණ**
මණ්ඩ,679
මණිකා-
චින්තාමණි,679
මණිචූලක
ගාමිණී,679
මණිභද්ද
යක්ඛ,679
මුණි,679
මුණි ධජය,680
මුණ්ඩසාවක,679
**මම**
මමංකාරය,680
**මය**
මායාව,680
මියගිය
ඥාතීන්,680
**මර**
මරණය,680
මරණ බිය,680
මරණ සංඥාව,680
මරණසතිය,680
මරණ සති
භාවනාව,638
මරණාසන්න,682
මාරයා,13,682
මාරආධිපත්‍යය,
683
මාර තර්ජන,683
මාරයාගේ
දියණියෝ,684
මාරයා හා බුද්ධ
පරිනිර්වානය,685
මාරයා
වැලපීම,685
මාරයාගේ
වසභය,686
මාරයා විඥාණය
සෙවීම,
687
මාර විෂය,685
මාරසේනාව,98,
686
මාර්ගය ,687
මාර්ග ඵල,687
මාර්ග බාධා,688

මාර්ග
බ්‍රහ්මචරියාව,688
මාරිස,688
මුරණ්ඩුබව,688
මොරනිවාප
ආරාමය,689
**මල**
මල,689
මල්ලිකා
දේවිය,689
මල් පූජා,689
මල් අසුන්
පූජා,689
මල්වතු-උද්‍යාන-
වනගොමු,
689
මල්ලරාජ
සල්උයන,689
මලුවා වැල
උපමාව,690
මෙලොව හා
පරලොව,690
මුල්,690
මූල ධර්ම,690
මූල පරියාය,690
මෝලිය එග්ගුණ
භික්ෂුව,690
මෝලියසීවක
පරිබ්‍රාජක,
690
මාලුඬක්‍ය පුත්ත
තෙර,691
**මළ**
මළවුන්
අනුස්මරණය,691
මුළාවූ සිහිය,691
මළපුඩුව
උපමාව,691
මීළහ්ක
උපමාව,691
**මව**
මව හා පියා,691
මව හා පියා
ඝාතනය,693
මෙවුන්දම්
සේවනය,693
**මස**
මසුන් අල්ලන
කෙමිණය
උපමාව,693
මස් අනුභවය,693
මස්පිණිස සතුන්
මැරීම,694
මස්ඇස,694
මසුරුකම,694
මුසාවාදය,695
මූසිකා බඳු
පුද්ගලයෝ,
696
**මහ**
මහක තෙර,696
මහත්ඵල
මහාආනිසංස,
696
මහද්ගත
කම්ම,697
මහණදම්
පිරිම,697
මහාමුගලන්
තෙර,7,8,9,
704
මහාමායා
දේවිය,97,704
මහලුවීම,697
මහා අභිඥා,697
මහා අරටුව,697
මහා ඉද්දි,697
මහා ඉර්ශි,697
මහා උපදේස-
මහාපදෙස,
698
මහා උපාසිකා,698
මහා කච්චාන
තෙර,698
මහා කොට්ඨිත
තෙර,698
මහා කප්පින
තෙර,698
මහාකරුණා
සමාපත්ති
ඥානය,698
මහා කාශ්‍යප
තෙර,698
මහාගුථ නිරය,698
මහා චුන්ද
තෙර,698
මහා දිට්ඨි,698
මහා දානය,699
මහාදීප,699
මහා දසධර්ම
ප්‍රශ්න,699
මහා නිදානය,700
මහා නාම තෙර-
පස්වග,700
මහා නාම
තෙර,700
මහානාම
ශාක්‍ය,700
මහා නිරය,700
මහා ප්‍රජාපති
ගෝතමී
තෙරණිය,701
මහා ප්‍රඥාව,701
මහාප්‍රඥා
පණ්ඩිත,702
මහාප්‍රඥා
ආලෝකය,702
මහා
ප්‍රඥාදිස්නය,702
මහා පන්ථක
තෙර,702
මහාපුන්නම,702
මහා
පරිනිබ්බානය,702
මහා පරිළාහ
නිරය,702
මහා පුරුෂ,703
මහා පුරුෂ
ලක්‍ෂ,703
මහාපුරුෂ
විතර්ක,703
මහා පුරුෂ
විහරණය,703
මහා බ්‍රහ්ම,703
මහාභූත,704
මහාභිය,704
මහා භද්‍රාකපිලාණි
තෙරණිය,704
මහායාගය,704
මහා රුක,704
මහාලෝභය,705

මහාලි ලිච්ඡවි,705
මහා වන
ආරණ්‍ය,705
මහා වනය-
කිඹුල්වත්නුවර,
705
මහාවියුහ,705
මහා සමය,705
මහා සමුද්‍රයේ
අසිරිය,705
මහා
සංවේගය,705
මහාසුදස්සන
සක්විති රජ,
706
මහාසාවද්‍ය,706
මහා සොරා,707
මහා ස්වප්න-
සිහින,707
මහා ශ්‍රමණ,707
මහාත්වයට
පත්වීම,707
මහෙච්චතාවය,
707
මහේශාක්‍ය,707
මිහිරි ඇට
උපමාව,707
මිහිරි කටහඬ,707
මිහිරි පානය -
උපමාව,708
මෝහය,708
මෝහ ගින්න,708
මෝහවිනය,708
මැහුම්කාරිය-
සිබ්බනිය,708
**ය**
**යක**
යක්ඛ-යක්ෂ,708
යක්‍ෂයන් බුදුන්
වහන්සේ
හමුවීම,709
යක්‍ෂ ඉන්ද්‍රක,709
යක්‍ෂ සක්ක,709
යක්‍ෂ සතාගිර හා
හේමවත,709
යක්ඛ
සූචිලෝම,709
යක්ඛ පුනබ්බසු හා
මව් යකින්න,710
යක්ඛ ප්‍රියංකර හා
මව් යකින්න.710
යක්ඛ
මණිභද්ද,710
**යග**
යාග හෝම,710
යාගු,711
යුගල ධම්ම
කරුණු,711
යුගනද්ධ
කථා,712
යොග,712
යොගක්ෂේමය,71
2
යොගක්ඛෙමි හා
අයොගක්ඛෙමි,71
2
යොගක්ඛෙමි
ධම්ම පරියාය,
713
යොගාතිගා
මුනී,713
**යට**
යටිකුරුකල කලය
උපමාව,713
**යථ**
යථාභූත
ඥාණය,713
යථා විමුක්ත
චිත්තය,715
යථාසන්ථකයෝ,
716
**යධ**
යොධාජීව
ගාමිණී,716
යොධාජීව
භටයෝ,716
**යන**
යානය-රිය,716
යෝනි,716
යෝනිසෝ
මනසිකාරය,717
**යම**
යමක තෙර,719
යමකප්‍රාතිහාර්ය
ඥානය,719
යමරජ,720
යාමදේවලෝකය,
377,721
**යළ**
යළි උපත,721
**යව**
යෞවන මදය,722
යවමිටි,722
**යස**
යසකුල පුත්‍ර තෙර,
පවුල හා
මිත්‍රයෝ,722
යසෝධරා
තෙරණී,722
යස හා අයස,722
යසොජ තෙර,722
**යහ**
යහපත්
කථාව,722
යහපත්
ගුණධර්ම,722
යහපත් හා
අයහපත්
භික්ෂූන්,723
යහපත්
ජීවිතයය,723
**ර**
**රක**
රුක්ඛමූලකයෝ,
723
රුක් උපමාව,723
රුක්ධර්මය,727
රුක්ඛඳු
පුද්ගලයෝ,723
**රග**
රාගය,724
රාගගින්න,724
රාග දොස
මෝහ,**4,724**
රාගවිනය,724
රාගවිරාගා
චෙතොවිමුත්ති,
724
රෝග,726
**රච**

රුචි උපාසිකා,726
**රජ**
රජහගනුවර,726
රජස්,726
රජවරු,726
රජ සලකුණ,727
රාජ
අන්තඃපුරය,727
රාජකථා,727
රාජකීය
නුගගස,727
රාජදත්ත
තෙර,728
රාජ බටයෝ,728
**රට**
රට්ඨ පිණ්ඩය,728
රට්ඨපාල
තෙර,728
**රත**
රත්න හත,728
රාත්‍රී භෝජනය
වැලකීම,
728
**රථ**
රථ උපමාව,728
**රධ**
රාධ තෙර,729
**රන**
රන්රිදී
පිළිගැනීම,729
**රප**
රූපය,729
රූප
ආයතනය,729
රූප ජාන
සමාපත්ති,730
රූපඥවීම,730
රූප තණ්හාව,730
රූපධාතු,730
රූප ධ්‍යානය,730
රූප නිස්සරණිය
ධාතුව,730
රූපය බිඳීයාම,730
රූප
බ්‍රහ්මලෝක,730
රූප රාග,730
රූප ලෝක,730
රූපාවචර,730
රූපී හෝ අරූපී
වීම,730
**රම**
රමණිය භූමිය,730
රූමත්බව,731
**රය**
රියට
සලකුණ,731
රියසක,731
**රල**
රලුවචන,731
**රව**
රේවත බුදුන්,731
රේවත තෙර,731
රේවත බදිරවනිය
තෙර,731
රූවටීම,731
**රස**
රස,732
රස ආයතනය,732
රස තණ්හාව,732
රාසිය ගාමිණී,732
**රහ**
රහත් මගඵල,732
රහතන්වහන්සේ,7
32
රහොගත,738
රාහුඅසුර,**13,737**
රාහුල
තෙරුන්,738
රෝහිතස්ස
දේවියෝ,738
**ල**
**ලක**
ලක්ෂණ
(ලක්ඛණ),738
ලක්ඛණකුසලය,7
38
ලක්ඛණ
තෙර,738
ලකුන්ටක
භද්දියතෙර,738
ලෝකය,739
ලෝකඅන්තය,74
0
ලෝකවිෂය,**19,74
4**
ලෝකය
අනන්තවත්ය,
740
ලෝකඅවබෝධය,
740
ලෝකය
අවලෝකනය,741
ලෝක
ආමිෂය,741
ලෝක
කාමගුණ,741
ලෝක ධාතු,741
ලෝකාන්තරික
නිරය,741
ලෝකෝත්තර
ධර්මය,742
ලෝකධර්මතා,
742
ලෝකයේ දුර්ලභ
ධර්මතා,742
ලෝක පාලක
ධම්ම,743
ලෝකවාදීපටිසංයු
ක්ත දිට්ඨී,
743
ලෝකවිජය,743
ලෝකායතික,743
ලෝකය
විනාශය,744
ලෝකෝත්තර
ශිලය,744
ලෞකික,744
ලෞකික
ශිලය,744
ලෞකික හා
ලෝකෝත්තර
ජීවිතය,744
ලොකොත්තර
ධාතුව,744
**ව**
**වක**
වක්කලී තෙර,749
වකුටු කම්ම,750
වාක්සත්‍ය,749

වාක් සංඛාර,749
වික්ඛායිතක සංඥා
භාවනාව,750
වික්ෂිප්ත සිත,750
වික්ෂෝභනය,750
විකාලභෝජනය,7
50
වඛ
වෙඛනස්ස
පරිබ්‍රාජක,750
වග
ව්‍යග්ඝපජ්ජ,750
වංගීස තෙර,750
විග්ගාහිකකථා,75
0
වච
වච්චගොත්ත
තෙර,**32,750**
වංචාව,750
වචී කම්ම,751
වචී සංඛාර,751
වාචික සුචරිත
ක්‍රියා,751
වාචික දුශ්චරිත
ක්‍රියා,751
විචිකිච්චාව,751
විචිකිච්චා
අනුසය,751
විච්ඡිද්දක
සංඥාව,751
වජ
වජ්ජි දේශය,751
වජ්ජියමාහිත
ගහපති,751
වජිරා
තෙරණිය,751
විජම්භිකා,751
විජය,752
විජය ගහපති,752
විජ්ජාචරණ
සම්පන්න,752
විජජාභාගීය
ධර්ම,752
විජ්ජා
විමුක්තිය,753
වඤ
විඤ්ඤාණං
අනිදස්සනං,753
විඤ්ඤාණඤ්චායත
නය,101,
754
විඤ්ඤාණඤ්චාය
තන ධාතුව,754
වඥ
විඥාණය,754
විඥාන ආහාර,755
විඥාන
කසිණසංඥාව,755
විඥාන
කායසය,755
විඥාන
චරියාව,755
විඥාන ධාතුව,755
විඥානස්ථාන,7,75
7
විඥානය
සකස්වීම,756
විඥානය හා
නාමරූප,756
වඩ
වඩුවා
උපමාව,759
වැඩිහිටි
සංසයා,759
වැඩිහිටිබව හා
තරුණබව,759
වට
වට්ටමූලක
තණ්හාව,760
වට්ටගාමි සුඛ,760
විවට්ටගාමි
සුඛ,760
වුට්ඨානකුසලය,7
60
වත
වත්ථු -වස්තු,760
වත්ථුනානත්ත
ඤාණය,760
විතක්ක -
විතර්ක,760
විත්ථාරේන ධම්ම
දේශනා,761
වේතරණී
නරකය,762
වද
වාද විවාද,762
වේදනා,38,763
වේදනානු
පසස්නාව,769
විදර්ශනා-
විපස්සනා,769
විදර්ශනා
ඥානය,769
විද්‍යාව-විජ්ජා,769
විද්‍යාවිමුක්ති ඥාන
දර්ශනය,772
වෙදගු-
විදිත්තා,763
වෝදාන
ඥානය,773
වධ
විධා,773
විධුර තෙර,773
වද
වඳුරා හා මස්වැද්දා
උපමාව,773
වන
වනගොමු
සකස්කිරීම,773
වනපත්ථ,773
වනසේනාසන,10
5,773
විනය හා
අවිනය,773
විනය කම්ම,774
විනයධර,774
විනය
පැනවීම,774
විනාව
උපමාව,775
විනාශය-
වැනසීම,775
විනිපාතය,776
විනිබන්ධන,776
වීනිලක
සංඥාව,776
වෙනයිකො,776
වණ
වාණිජ
කටයුතු,776
වෙණහු

දේවපුත්‍ර,777
**වප**
වප්ප තෙර
පස්වග,777
වප්ප ශාක්‍ය,777
විපුබ්බක සංඥා
භාවනාව,777
විපරිනාම
දුක්ඛ,777
විපුල ප්‍රඥාව,777
විපල්ලාස-
විපරියාස,778
විපචිතඤ්ඤු,778
විපස්සනා,778
විපස්සි බුදුන්,778
වේපචිත්ති
අසුරරජ,778
වෙපුල්ල
පර්වතය,778
වෙපුල්ල පව්ව
උපමාව,779
**වභ**
විභංග,779
විභජ්ජවාදය,779
විභජ්ජවාදි,779
විභව
තණ්හාව,780
විභව දිට්ඨිය,780
**වම**
විමානක
ප්‍රේත,780
විමංසා,780
වීමංසා
ඉද්දිපාද,781
විමුක්තිය,781
විමුක්ති
ආයතන,782
විමුක්ති
ඥානය,782
විමුක්ති ඥාන
දර්ශනය,782
විමුක්ති මග,782
විමුක්ති රසය,782
විමුක්ති
සම්පන්න,782
විමොක්ඛ,783
විමොක්ඛ අට,783
විමොක්ක මාර්ග
11,783
**වය**
වයධම්ම,783
ව්‍යාධිධම්ම,783
ව්‍යාපාදය,784
ව්‍යාපාදධාතුව,784
ව්‍යාපාද
නිස්සරණිය
ධාතුව,784
ව්‍යාපාද
විතක්ක,784
ව්‍යාපාද සංඥා,784
වායෝ ධාතුව,785
**වර**
වර්ධනය -
වඩ්ඩී,785
වර්ණාකිරීම,785
වැරදි ක්‍රියා,785
විරද්ධ,786
විරාගය,786
විරාග සංඥාව,787
වීරාතෙරණිය,787
වීරිය,787
වීරියආරම්භ
ඤාණය,788
වීරිය ඉන්ද්‍රිය,788
වීරිය ඉද්දිපාද,789
විරූඪක හා
විරූපාක්ෂ
දෙවියෝ,789
වෛරෝචන
අසුරරජු,789
වේරම්භවාතය,
789
**වල**
වලාහක දේව
නිකාය,789
වලාකුළු,789
වලාකුළු බඳු
පුද්ගලයෝ,790
විලේපන,790
**වළ**
වළඳ,790
වෙළෙන්දා
උපමාව,790
වැළඳීම,791
**වළු**
වෙළුකන්ට
උත්තරානන්ද
මාතා
උපාසිකා,791
වේළුවනාරාමය,1
05,791
වේළුද්වාර
ගම්වැසියෝ,791
**වට**
විවට්ට ඤාණ,791
**වව**
විවාද,792
විවිධ ඥාන,792
විවිධ පර්ෂද,792
විවේචනය,795
විවේකය,795
විවේකනිස්සිතං,
795
**වස**
වසල,795
වසවත්ති
දේවපුත්‍ර,796
වස්කාලය -
වස්සාන,796
වස්සකාර
මහාඇමති,796
වස්ත්‍රය,797
වස්ත්‍ර දානය,797
වසුදත්ත
දේවපුත්‍ර,797
වාසෙට්ඨ
උපාසක,797
වාසෙට්ඨ
බ්‍රාහ්මණ,797
වැස්ස,797
වැස්ස බඳු
පුද්ගලයෝ,797
වෙසමුනි රජ,798
වෙසාරජ්ජ,798
වෙස්සභූ
බුදුන්,798
වොසග්ගය,198
වොස්සගපරිණා
මිං,799
විසාරද බව,798

විසාකා මහා
උපාසිකා,799
විසාක
උපාසක,799
විසාලා
මහානුවර,799
විසල්පුරවැසි
උග්ග
උපාසක,799
විසිතුරු
ධර්මකතා,799
වෛසයා
කුලය,799
**වශ**
වාශිෂ්ඨ තෙර,799
විශාඛපංචාලිපුත්ත
තෙර,799
විශිෂ්ඨ මග,799
විශිෂ්ඨ රත්න,799
විශේෂ
අවබෝධය,800
විශේෂභාගිය
ධර්ම,800
**වෂ**
වෘෂභ,800
විෂම ලෝභය,801
**වහ**
විහාරත්ථ
ඥානය,801
විහාර
සමාප්‍රත්‍යත්ත
ඥානය,
801
වීහිංසා,801
විහිංසාධාතුව,801
වීහිංසා
නිස්සරණීය
ධාතුව,
801
විහිංසාවිතක්ක,
801
විහිංසා සංඥා,801
වෙහප්ඵලා
දේව,801
**ස**
**සක**
සකදාගාමී,802
සක්ක නම්
යක්ඛ,802
සක්දෙවිඳු,**6,33**
ස්කන්ධ
පරිනිර්වානය,9
සංකේතය,802
සංකිලෙසධම්ම,
802
සක්කාය
දිට්ඨිය,802
සක්දෙවිඳු,804
සක්කාය
නිස්සරණීය
ධාතුව,803
සක්කච්චකාරී,803
සක්මන්
භාවනාව,803
සක්විතිරජ -
චක්‍රවර්ති රජ,806
සාකච්ඡා,808
සාක්ෂාත්
කරගතයුතු ධර්ම,
808
සාක්ෂාත්
නොකරගතයුතු
ධර්මතා,808
සාකෙත
නුවර,809
සකුලුදායි
පරිබ්‍රාජික,809
සුකථා කථා,809
සුක්ඛා
තෙරණිය,809
සූක්ෂම ලක්ෂණ
ප්‍රතිවෙධක
ඥාණ,809
සුකුමාල
ශ්‍රමණ,809
සැකය-
සාංකාව,810
ස්කන්ධ උපධි,810
ස්කන්ධ
පරිනිබ්බානය,810
සික්ඛාපච්චක්ඛාන
,810
සික්ඛා
අනුත්තර,810
සික්ඛාමානා,810
සෝකසල්ලහරණ
ධම්ම පරියාය,810
**සඛ**
සංඛතධර්ම,810
සංඛත ධාතු හා
අසංඛත
ධාතුව,810
සංඛිත්ත ධර්ම,811
සංඛාර,811
සංඛාර අනුපූර්ව
නිරෝධය,
813
සංඛාර අනුපූර්ව
සංසිඳීම,813
සංඛාරඋත්පත්ති,
813
සංඛාර දුක්ඛ,813
සිඛි බුදුන්,811
සුඛ හා දුඛ,813
සුඛය-සුවය,813
සුඛඅනුපස්සි,815
සුඛ ඉන්ද්‍රිය,815
සුඛ ධාතුව,815
සුඛ ධර්මය,815
සුඛ වේදනා,815
සුඛපටිපදා,815
සුඛ ප්‍රාර්ථනා,815
සුඛ මාර්ගය-දුක්
මාර්ගය,815
සුඛවිපාක හා දුක්
විපාක,816
සුඛ
සෝමනස්ස,816
සුඛ සංඥාව,816
සුඛුද්‍රය ධම්ම,816
සුඛල්ලිකානු
යෝගය,816
සේඛ හා
අසේඛ,817
**සංඝ**
සංඝගුණ,20
සංඝානුස්සති
භාවනා,632
සංගයනා,822
සංග්‍රාම,822
සංග්‍රාමජිත්

තෙර,822
සංගාරව
හද්‍රමුඛ,822
සංගාරාව බ්‍රාහ්මණ
1 &2,822
සංග්‍රහ වත්ථු,822
සංග්‍රහ වත්ථු
බල,822
සුගත,823
සුගති ගමන,824
සුගත විනය,823
සුගතිය,823
සාගත තෙර,824
සොගන්ධික
නිරය,824
**සඟ**
සිඟාල,824
සිඟාලමාතා
තෙරණිය,825
සිඟාලක
ගෘහපුත්‍ර,825
**සංඝ**
සංඝයා,825
සංඝයාට
අනතුරු,825
සංඝයාට ඇති
හය,825
සංඝයා
අනුපස්සනාකලයු
තු ධම්ම,825
සංඝයාගේ
අනුකම්පාව,826
සංඝයාට අවවාද
අනුසාසනා,826
සංඝයාට
ආරක්ෂාව,826
සංඝයාට ආහාර
ගැන උපදෙස්,826
සංඝයා
උතුම්බව,826
සංඝයාට
උපසම්පදාව,827
සංඝයායාගේ
කීකරුබව,827
සංඝයාගෙ කුසල
ධර්ම පිරිහීම
දියුණුවීම,827
සංඝයාට කැප
පාන,828
සංඝ ගුණ,828
සංඝයාගේ
ගති,829
සංඝ දානය,829
සංඝයා හා ධම්ම
විනය,829
සංඝයා ධර්මයේ
දක්ෂබව හා
අදක්‍ෂබව,830
සංඝයාට නින්දා
කිරීම,830
සංඝයාට
නිස්සයදීම,830
සංඝාණිකාරාමය,
830
සංඝයා හා
පාතිමොක්ඛ,830
සංඝයාගේ පාපී
ගුණ,830
සංඝයාගේ
පහසුවිහරණය,
831
සංඝයා
පරිපූර්ණවිම,831
සංඝයාගේ
පිරිහීම,831
සංඝයා ගෙ
පුහුණුව,832
සංඝයා බුද්ධ
දරුවෝ,832
සංඝයා
බුදුන්වහන්සේට
ලංවීම හා
දුරවීම,832
සංඝයාට
බාධක,832
සංඝයාගේ
මිත්‍රයා,832
සංඝයා
මහත්ත්‍වයට
පත්වීම,
833
සංඝයා හා මුදල්
පරිහරණය,833
සංඝයා- විවිධ
පර්ෂද,833
සංඝයාගෙ
වාසස්ථාන සුදුසු
බව,833
සංඝ විනය,833
සංඝයාගේ
වර්ධනයට ඇති
ක්‍රමවිධිය,833
සංඝයා
සාකච්ඡාවට
දක්ෂවීම,834
සංඝයා
සැකකිරීම,834
සංඝයා-
සත්පුරුෂබව හා
අසත්පුරුෂ
බව,834
සංඝයා
සොභාමානවීම,
835
සංඝ සමගිය හා
සංඝභේදය,835
සංඝයා දිවි
හානිකරගැනීම,
835
සංඝයා සිව්පස
පරිහරණය,836
සංඝයා සිහිපත්
කළයුතු ස්ථාන
3,836
සංඝයා
ශිලසම්පන්නවිම,
836
සංඝයා ශ්‍රද්ධා
සම්පන්නවීම,838
සංඝයාට හුදකලා
වාසය පිණිස
අවවාද,838
සංඝයා-
වැඩිහිටි,838
සංඝයා-
සාමණේර,838
සංඝානුස්සති
භාවනාව,838
සීඝ්‍ර ප්‍රඥාව,838
**සච**
සච්චක

අග්ගිවෙස්සන
නිගන්ඨනාථ
පුත්‍ර,839
සච්ච-සත්‍ය,839
සච්ච කථා,839
සච්චඤාණ,839
සච්ච විභංග,840
සංචේතනා,840
සචිත්ත
පරියාය,840
සච්ඡිකාතබ්බ
ධර්ම,840
සුචරිතය හා
දුශ්චරිතය,841
සුචිලෝම
යක්‍ෂ,842
**සජ**
සංජය
බෙලට්ටිපුත්‍ර,48
සජ්ජායනා -
සංගායනා,842
සජ්ජායනා බහුල
පුද්ගලයා,842
සංජීව තෙර,842
සංජය
බෙලට්ටිපුත්‍ර,842
සුජාතා
උපාසිකා,842
සුජාත
තෙර,72,842
සුජාත බුදුන්,842
සුජාතා සේනානි
දියණිය,842
**සඤ**
සුඤ්ඤතාව-
ශූන්‍යතාවය,843
සුඤ්ඤත
විමොක්ෂය,
සුඤ්ඤත
විහරනය,843
සුඤ්ඤත සමාධිය
843
සුඤ්ඤතඵල
සමාපත්තිය,844
**සඥ**
සංඥා,844
සංඥා තුන,844
සංඥා පහ,844
සංඥා සය,845
සංඥා සත,845
සංඥා දහය,845
සංඥාව කෙරෙහි
නිබිද්දාව,
846
සංඥාවේදිත
නිරෝධ
සමාපත්තිය,847
සංඥාප්ති බහුල
පුද්ගලයා,848
**සත**
සත්‍වයා,11,848
සත්‍වයන්
පහළවන ස්ථාන,
849
සත්‍වයෝ යළි
උපත ලබනා
තැන්,849
සත්‍වාවාස,849
සත්‍ව කාම
උත්පත්ති හා සුඛ
උත්පත්ති,850
සත්‍වයන්ගේ
විවිධත්වය,850
සත්‍වඝාතන,850
සතර අග්‍ර,850
සතර
අග්‍රප්‍රසාද,851
සතර අන්ත,851
සතර අපාය,851
සතර අපරිහානිය
ධර්ම,851
සතර අභිරාජකුල
නාග,851
සතර අයහපත්
ගුණ,851
සතර ආර්ය
සත්‍ය,852
සතර
අසඞ්ඛ්‍යය,852
සතර ආහාර,852
සතර ආශ්චර්ය
අද්භූතධර්ම,852
සතර ඉද්දිපාද,852
සතර ඉරියව්ව,854
සතර
කොට්ඨාශ,854
සතර ඥාන,854
සතර දීප,854
සතර ධර්ම,854
සතර ධර්ම
පද,855
සතර බ්‍රහ්ම
විහාර,855
සතර බ්‍රහ්ම විහාර
භාවනාව,
642,855
සතර මග ඵල,856
සතර මාර්ග
ප්‍රතිපදා,856
සතර මහා
භූතයෝ,858
සතර යොග,858
සතරවරම්
දෙවියෝ,859
සතර
විපල්ලාස,859
සතර
විසංයොග,860
සතර
වොහාරධර්ම,861
සතර සංග්‍රහ
වස්තු,861
සතර
සතිපට්ඨාන,862
සතර සතිපට්ඨාන
භාවනාව,
643,862
සතර සමාධි,863
සතර සාන්දෘෂ්ටික
දාන ඵල,
863
සතර සම්‍යක්
ප්‍රධාන වීරිය,
863
සතර ශ්‍රමණ
ඵල,864
සතිය-සිහිය,864
සති ඉන්ද්‍රිය,865
සතිචරියාව,866
සතිමත්තාන,866
සති

සම්ප්‍රජන්‍යය,866
සති
සම්බොජ්ඣංගය,
868
සත් ආරිය
පුද්ගලයෝ,868
සත්කාය
නිරෝධය,870
සත්කාර,870
සත්තක පරම,870
සත්පුරුෂධම්ම හා
අසත්පුරුෂධම්ම,
870
සත්පුරුෂයා හා
අසත්පුරුෂයා,872
සත්පුරුෂතරයා හා
අසත්පුරුෂතරයා,8
72
සත්පුරුෂයා ගේ
ලක්ෂන,
873
සත්පුරුෂ දාන හා
අසත්පුරුෂ
දාන,873
සත්පුරුෂ
භූමිය,137,873
සත්සතිය,20,61
සත්
සම්බුදුවරු,873
සත්‍ය,873
සත්‍ය
අවබෝධය,873
සත්‍ය ඥානය,874
සාතාගිර යක්ෂ,868
සතුල්ලප්කායික
දෙවියෝ,870
සුත ධනය,868
සොතානුධත
ධර්ම,874
සොත්ථිය,875
සෝතය,875
සෝත ඉන්ද්‍රිය,875
සෝතාපන්න,875
සෝතාපන්න
අංග,879
සේතරාජ
හස්තියා,879
සේතව්‍යා
නුවර,880
සිත- චිත්ත,880
ස්ත්‍රිය-
කාන්තාව,884
ස්ත්‍රී ඉන්ද්‍රිය,884
ස්ත්‍රී බන්ධන,884
සුතධරෝ,884
සුතමය
ප්‍රඥාව,884
**සථ**
ස්ථවිර හා
ස්ථවිරි,884
සපීතිභාගික
සමාධිය,884
ස්ථාන හා අස්ථාන
දන්නා නුවණ,884
ස්ථාන අස්ථාන
කුසලතාවය,885
ස්ථූප,886
**සද**
සද්ධර්මය හා
අසද්ධර්මය,886
සද්ධර්මයේ
පැවැත්ම හා
විනාශය,888
සද්ධර්ම
ශ්‍රවනය,888
සද්ධා,888
සද්ධානුසාරි,888
සද්ධාපබ්බජිතානා,
888
සද්ධාවිමුක්ත,889
සදාචාරය,889
සදෙව්ලෝකය,
889
සුදත්ත
සිටුවරයා,889
සුදස්ස හා සුදස්සි
දේවලෝක,889
සුදීට්ය,889
සුද්ධික භාරද්වාජ
තෙර,889
සුද්ධාවාස,**1,889**
සුද්ධෝදන
රජ,889
සුදුකම්ම,890
සුදු කසිණ,**890**
සුදු කෙළිම,890
සුදු ධම්ම,890
සුදුමග-
ශුක්ලමග,890
සුදුසු කතා,890
සුදුසුබව-අලං,890
සිද්ධාර්ථ
ගෝතම,890
සිද්ධාර්ථ
බුදුන්වහන්සේ,
890
සිදුරු,889
**සධ**
සාධු ධර්මය හා
අසාධු ධර්ම,
8912
සුධර්මා
දේවසභාව,**6,891**
සුධර්ම
භික්ෂුව,891
සංධාන
ගහපති,891
**සඳ**
සඳ-හඳ,890
සඳ උපමා,891
සඳුන්ගස
උපමාව,891
**සන**
සනංකුමාර
බ්‍රහ්ම,602,892
සන්තුෂ්ටිය,892
සන්දක
පරිබ්‍රජික,892
සන්දිට්ඨිකො,892
සන්දිට්ඨික
ධම්ම,892
සන්දිට්ඨික
නිබ්බානය,892
සානු හා මව,893
සෙනසුන,893
සේනිය බිම්බිසාර
රජ,893
සේනිය
තවුසා,893
සේනිය (කෝලිය)
තෙර,893

සේනානිගේ
දියණිය
සුජාතා,893
සුනක්ඛත්ත
ලිච්චවී,893
සුන්දරිකභාරද්වාජ
තෙර 1හා2,893
සුනිධ මහා
ඇමති,893
සිනෙරු
කන්ද,894
**සප**
සප්ත
අනුසය,62,894
සප්තඅපරිහානිය
ධර්ම,894
සප්ත ධර්මතා,894
සප්ත
පුරිසගති,894
සප්ත
බොජ්ඣංග,35,89
5
සප්ත විඥාන
ස්ථාන,895
සප්ත සද්ධර්ම
ගුණ,894
ස්පර්ශය,895
සුපටිපන්න,898
සුපපටිවීදෙධා,898
සුප්පතිට්ය,898
සුපණ්ණ,898
සැප විපාක ධර්ම
හා දුක්විපාක
ධර්ම,898
සෝපාදීශේෂ
නිර්වාන
ධාතුව,898
**සබ**
සබ්බ,899
සබ්බේ ධම්මා,899
සබ්බ උපධි
පටිනිස්සගය,
899
සබ්බඤ්ඤුත
අනාවරණ
ඤාණ,900
සබ්බ
පරිඤ්ඤා,900
සබ්බලෝකේ
අනභිරති
සංඥා,900
සබ්බ සංඛාරෙහි
අනිච්ච
සංඥාව,901
**සභ**
සෝභිත බුදුන්,901
සුභකිණ්ණ
දේව,901
සුභධාතුව,901
සුභ නිමිත්ත,902
සුභරොච,902
සුභසංඥාව,902
සුභාෂිතය,902
**සම**
සමචිත්ත,903
සමථ හා
විපස්සනා,903
සමණසංඥා,904
සමන්ත චක්ඛු,904
සමන්තපාසාදිකා,
905
සමවයසටෙඨස
නො,905
සමසීසට්ය
ඤාණය,905
සමා පටිපදා,905
සම්මා දිට්යීය,905
සම්භව
අග්‍රශ්‍රාවක,906
සම්මශ්සන
ඤාණය,906
සම්මුතියෙහි
ඥානය,906
සම්පන්නපාතිමො
ක්ඛා,906
සම්පරායික
ධර්ම,907
සම්පප්ප්‍රලාප,907
සම්ප්‍රජන්‍යය,909
සම්බෝධිය,909
සම්මා ඥාණය හා
සම්මා
විමුක්තිය,909
සම්පත් -
සම්පදා,910
සම්මා
පටිපදාව,910
සම්මා ප්‍රධාන
වීරිය,910
සම්මා
සම්බුද්ධ,910
සමුදය ධම්ම,911
සම්‍යක්තවය,906
සම්‍යක් ප්‍රධාන
වීරිය සතර,918
සමුද්‍ර තරණය
උපමාව,911
සුමේධ තාපස,367
සුමේධ බුදුන්,912
සුමන බුදුන්,912
සුලද්ධ ලාභය,930
සමාධිය,912
සමාධි ඉන්ද්‍රිය,914
සමාධි
කුසලය,915
සමාධිපරිකඛාර,91
5
සමාධි
ප්‍රතිලාභ,915
සමාපත්ති,917
සාමණ්ඩකාණි
පිරිවැජියා,917
සාමිසය,917
සිම්බලි
උල්කටුගස්
නිරය,919
**සය**
සය අනුත්තර
ධර්ම,919
සය අභිඥා,87,920
සය ඉන්ද්‍රිය,921
සයසංඥා,921
සංයෝජන හා
සංයෝජනීය
ධර්මතා,921
**සර**
සරඤ්ජිත
දේවසභාව,923
සාරය,923
සාරම්භය,924
සාරානීය ධර්ම

සය,924
සාරාණීය දස
ධර්ම,925
සර්වආකාර
පරිපූර්ණ,923
සර්වඥතා
ඥානය,923
සර්වඥයන්
වහන්සේ,923
සර්වත්‍රගාමිනීප්‍රති
පාදා ඥානය,923
සරුගස
උපමාව,924
සැරියුත් මහා
තෙර,**7,8,9,47,**
**925**
සුර අසුර,925
සුරඅම්බට්ඨ
සිටුවරයා,925
සුරාමෙරය-
සුරාපානය,925
සූර්යා,925
සූර්ය දිව්‍යරාජ,925
සොරකම,926
සොරකම් කිරීමේ
දඬුවම්
උපමාව,926
සොරුන්ගේ
ස්වභාවය,926
**සල**
සල්ගස්
උපමාව,926
සල්ලාල
හැසිරීම,927
සල්ලේඛ
පරියාය,927
සල්ලේඛට්ඨ
ඤාණය,928
සීලබ්බත
පරාමාස,928
සිල්වතා හා
දුසිල්වතා,929
**සළ**
සළායතන,930
**සව**
සංවර ප්‍රධාන
වීරිය,931
සංවිභාග,931
ස්වර්ගය,932
සාවද්‍ය
ධර්ම,50,931
සීවලී තෙර,935
සිව් ඉරියව් -
ඉරියාපථ,935
සිව් උපකාර,935
සිව් ඕඝ,935
සිව් ජාන,935
සිව් පූජනිය
ස්ථාන,938
සිව්පිරිස,**9,939**
සිව්ජාන භාවනාව,
**644,**
**937**
සිව්දහම,938
සිව්පිළිසිඹියා,938
සිව්පසය,939
සිව්මග හා
සිව්ඵල,939
සිව් ශ්‍රමණ,940
සිවුරු,940
සිවුරු හැරීම,940
සෙවිතබ්බ
පුද්ගල,932
සෙවියයුතු ධර්ම-
නොසෙවියයුතු
ධර්ම,932
සේවනය කලයුතු
පුද්ගලයෝ,932
සුවදෙන ධර්ම හා
දුකදෙන ධර්ම,933
සුව නින්ද,934
සුවිදූර විදූර,933
සුවිමුත්ත
චිත්ත,933
සුවිමුත්තප්‍රඥා,934
සොවචස්සතාවය,
940
සෝවාන්,941
සෞචෙය,941
**සස**
සංසප්පනිය ධර්ම
පරියාය,941
සංසේදිත
උත්පත්ති,941
සසර-
සංසාරය,941
සසර අදන්
මග,944
සසංඛාරපරිනිබ්බා
යි,944
සසස්තවාදය හා
අසස්සතවාදය,944
සසුන,945
සාසව
ධම්ම,58,945
සොසානිකයෝ,
945
සුසිල්වතා,945
**සහ**
සහකාරයා,945
සහම්පති
බ්‍රහ්ම,601,945
සහෝපකාරි
මග,945
සිංහ නාදය,945
සිංහසෙය්‍යාව,946
සිංහ -සිහ
සාමණේර,946
සිහ
සේනාපති,946
සිහිය-සතිය,946
සිහිකළයුතු
ධර්ම,946
සිහිනොකළයුතු
ධර්මය,946
සිහි මූලාව,946
සොහොන වැනි
පුද්ගල,946
**ශ**
**ශක**
ශක්තිය,947
ශාක්‍ය-
කැත්,13,25
ශික්ෂාව-ශික්ෂාපද-
ශික්ෂා අනුසස්,947
ශික්ෂා බල,947
ශෝකධම්ම,947
ශෝකය
හැරදම්මේ
පිළිවෙල,948

**ශත**
ශ්‍රැතවත් ආරිය ශ්‍රාවක හා අශ්‍රැතවත් පෘතග්ජන,948
ශ්‍රැතවත් මහණ,950
ශ්‍රෝතධතු විසුද්ධි ඥාණය,950
**ශද**
ශ්‍රද්ධාව-අශ්‍රද්ධාව,6,950
ශ්‍රද්ධාසම්පන්න,951
ශ්‍රද්ධා ඉන්ද්‍රිය,951
ශ්‍රද්ධාබලය,951
ශ්‍රද්ධානු සාරී,952
ශ්‍රද්ධාවිමුක්ත,952
ශ්‍රද්ධාවෙන් දැකිය යුතු සිව් ස්ථාන,952
ශ්‍රාද්ධ,953
**ශන**
ශාන්ත,953
ශාන්තමුණි,953
ශාන්ත විහරණ,953
ශුන්‍යතාවය,954
ශුන්‍යතා විහරණය,954
**ශම**
ශ්‍රමණ -සමණ,954
ශ්‍රමණ කාර්ය,956
ශ්‍රමණදූෂක,956
ශ්‍රමණ ධර්මය,727,955
ශ්‍රමණ ඵල,955
**ශර**
ශරීරය,956
ශරීර යානය,956
ශරීර වර්ණය,957
ශරීරස්ථ ධර්ම,957
ශාරීරික ධාතු,957
**ශල**
ශිලය,958
ශිලමය ඥාණය,960
ශිලසම්පන්න,960
ශිල සමාධි ප්‍රඥා,958
ශිලානුස්සති භාවනාව,633
**ශව**
ශ්‍රාවක සංඝයා,960
**ශස**
ශාශ්වත දිට්ඨිය,960
**ශශ**
ශිෂ්‍ය-සේඛ,961
**ෂ**
**ෂට**
ෂට් අසාධාරණ ඥාන,961
**හ**
**හත**
හත්තක අලාවක කුමාර,961
හත්ථිගාම ගහපති උග්ග,961
හත්ථරෝහක හමුදාව,961
හත්ථිසාරිපුත්‍ර චිත්ත තෙර,961

**ααα**

## ආශ්‍රිත ග්‍රන්ථ හා ත්‍රිපිටක විස්තරය

**සිංහල**

1 බුද්ධජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා- දීඝනිකාය- කාණ්ඩ 1,2,3.

2 බුද්ධජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා- මජ්ජිමනිකාය- කාණ්ඩ 1,2,3.

3 බුද්ධජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා-සංයුත්තනිකාය-කාණ්ඩ 1,2,3,4,5-1,5-2

4 බුද්ධජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා-අංගුත්තරනිකාය-කාණ්ඩ 1,2,3,4,5,6.

5 බුද්ධජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා-සුත්ත නිපාත.

6 බුද්ධජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා-ඛුද්දකනිකායේ-විමානවත්ථු, පේතවත්ථු.

7 බුද්ධජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා-ඛුද්දකනිකායේ-ථෙර ගාථා, ථෙරි ගාථා.

8 බුද්ධජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා-පෙටකොපදෙසො.

9 බුද්ධජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා-නෙත්තිපපකරණ.

10 බුද්ධජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා-ඛුද්දකනිකායේ-ඛුදදකපාඨ, ධම්මපද, උදාන.

11 බුද්ධජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා-ඛුද්දකනිකායේ- ජාතක පාළි 1,2,3.

12 බුද්ධජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා-විනයපිටකයේ-චුලලවගගපාළි 1,2.

13 බුද්ධජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා-විනයපිටකයේ-මහාවගගපාළි 1,2.

14 බුද්ධජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා-ඛුද්දකනිකායේ-මහානිදෙදසපාළි.

15 බුද්ධජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා-ඛුද්දකනිකායේ-චූලනිදෙදසපාළි.

16 බුද්ධජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා- ඛුද්දකනිකායේ-බුද්ධවංස හා චරියාපිටකය

17 බුද්ධජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා- ඛුද්දකනිකායේ-අපදාන පාළි1,2-1,2-2.

18 තිසරණ මහිම, කටුකුරුන්දේ ඤාණානන්ද භික්ෂු,පහන් කනුව දහම් දේශනා.

19 අභිනික්මන, කටුකුරුන්දේ ඤාණානන්ද භික්ෂු, පහන්කනුව ධර්ම දේශනා.

20 විකි පීඩියා - නිදහස් විශ්ව කෝෂය.

21 සංයුත්තනිකාය- පරිවර්තනය- පූජ්‍ය කිරිබත්ගොඩ ඤාණානන්ද හිමි, මහ මෙව්නා දහම් ප්‍රකාශන.

22 නිබ්බාන දේශනා-15,කටුකුරුන්දේ ඤාණානන්ද භික්ෂු, නිවනේනිවීම, පහන් කනුව ධර්ම දේශනා.

23 බෝධිපාක්ෂික ධර්ම විස්තරය-රේරුකානේ චන්දවිමල මහානාහිමි.

24 දිවි කතරේ සැන්දෑ අඳුර, කටුකුරුන්දේ ඤාණානන්ද භික්ෂු, පහන්කනුව ධර්ම දේශනා.

25 සිතක මහිම 1, කටුකුරුන්දේ ඤාණානන්ද භික්ෂු, පහන් කනුව ධර්ම දේශනා

26 ආර්යාවංශ ධර්ම පුස්තක මාලා **1-4,** අංක **1** සප්තබෝජ්ජංගය- පි. සම්පාදනය- මොරටුවේ සිරි සාසනවංශ තෙරුන්**, 1948.**

27 සද්ධර්මාලංකාරය- පූජ්‍ය ජයබාහු ධර්මකිර්ති මහා හිමි- ශ්‍රී ලංකා ප්‍රාචීන භාෂාපකාර සමාගමේ සංස්කරණය.

28 සුවිසිමහා ගුණය, සම්පාදක-රේරුකානේ චන්ද්‍රවිමල මහානාහිමි.

29 සිංහල දීපවංශය-සම්පාදක: චන්ද්‍රදාස කහඳවආරච්චි.

**30** අංගුත්තර නිකාය **1,2,3,4-**සිංහල පරිවර්තනය**,** ආචාර්ය අධිනිතිඥ ඒ.පි.ද සොයිසා.

**31** දීඝ නිකාය **1,2,3 -**සිංහල පරිවර්තනය**,** ආචාර්ය අධිනිතිඥ ඒ.පි.ද සොයිසා.

32 ඛුද්දක නිකාය**1,2,3,4,5,6,7-**සිංහල පරිවර්තනය**,** ආචාර්ය අධිනිතිඥ ඒ.පි.ද සොයිසා.

**33** මජ්ජිමනිකාය **1,2,3,4,5 -**සිංහල පරිවර්තනය**,** ආචාර්ය අධිනිතිඥ ඒ.පි.ද සොයිසා.

**34** සංයුත්ත නිකාය **1,2,3,4,5,6,7-**සිංහල පරිවර්තනය**,** ආචාර්ය අධිනිතිඥ ඒ.පි.ද සොයිසා.

**35** විනය පිටකය**1,2,3,4-**සිංහල පරිවර්තනය**,** ආචාර්ය අධිනිතිඥ ඒ.පි.ද සොයිසා.

**36** කර්ම විපාක-පූජ්‍ය රිදියගම සුධම්මාභිවංශ හිමි.

**37** පාලි-සිංහල ශබ්දකොෂය-සම්පාදක- මඩිතියවෙල සිරි සුමංගල ස්ථවිර.

**38** පූජාවලිය- මයුරපාද පිරිවෙණාධිපති බුද්ධපුත්‍ර හිමි- සංස්කරණය- පණ්ඩිත කිරිඇල්ලේ ඥානවිමල නාහිමි.

39 ධර්මසේන හිමිගේ සද්ධර්ම රත්නාවලිය- සංස්කරණය- පණ්ඩිත කිරිඇල්ලේ ඥානවිමල නාහිමි.

40 සිංහල විශුද්ධි මග- පණ්ඩිත බටුවිට නන්දාරාම මහාහිමි.

41 බුදුසරණ - අන්තර්ජාල කලාප.

42 දිය සුලිය, කටුකුරුන්දේ ඥාණානන්ද භික්ෂු, පහන්කනුව ධර්ම දේශනා.

43 ප්‍රතිපත්ති පූජා**,** කටුකුරුන්දේ ඥාණානන්ද භික්ෂු, පහන් කනුව දේශනා

44 විශුධිමාගගය (සිංහල) ප්‍රථම භාගය-සංස්කරණය-කඹුරුපිටියේ ධම්මරතන ස්ථවිර, 1847.

45 මහාවංස

46 චතුරාර්ය සත්‍ය අවබෝධයට ධර්ම දේශනා, පූජ්‍ය කිරිබත්ගොඩ ඥාණානන්ද හිමි මහමෙව්නා සදහම් ප්‍රකාශන.

47 පටිච්චසමුප්පාද ධර්මය, කටුකුරුන්දේ ඥාණනන්ද භික්ෂු.

48 : ජිනචරිතම්- මේධංකර තෙර, සස්කරණය- ආනන්දජෝති භික්ඛු.

49 ලෝවැඩසහරාව

50 සමසතලිස් භාවනා, නාඋයනේ අරියධම්ම තෙරුන්.

51 ස්පර්ශයේ ආශ්චර්ය, කටුකුරුන්දේ ඥාණානන්ද භික්ෂු, පහන්කනුව ධර්ම දේශනා.

52 තෙරුවණ ,පූජ්‍ය කිරිබත්ගොඩ ඥාණානන්ද හිමි.

53 සතිසම්පජන්‍ය පුරුදු පුහුණු කිරීම, අජාන් බ්‍රහ්මවංසෝ මහාතෙර, වස්සාන ධර්ම දේශනා- 1994 -බෝධිනියාන වන සේනාසනය, පර්ත්, බටහිර ඔස්ට්‍රේලියාව.

**English**

1 The Connected Discourses of The Buddha –A Translation of the Samyutta Nikā by Bhikkhu Bodhi, Wisdom Publication, 2003.

2 The Middle Length Discourses of the Buddha: A Translation of the Majjhima Nikaya by Bhikkhu Nanamoli & Bhikkhu Bodhi, Wisdom Publication, 1995.

3 Long Discourses of the Buddha Translation of the "Digha-Nikaya" by: Maurice O'C. Walshe, Wisdom Publication, 1996.

4 The Numerical Discourses of the Buddha A Complete Translation of the Anguttara Nikaya by: Bhikkhu Bodhi, Wisdom Publication,2012.

5 In the Buddha's Words An Anthology of Discourses from the Pali Canon by: Bhikkhu Bodhi, Wisdom Publication, 2005.

6 The Great Disciples of The Buddha, Nyanaponika Thera and Helmuth Hecker, edited by Bhikkhu Bodhi, Wisdom Publication. 2003.

7 The Buddha's Teaching on Social and Communal Harmony, The Teachings of the Buddha by: Bhikkhu Bodhi, Wisdom Publication, 2016.

8 The Suttanipata An Ancient Collection of Buddha's Discourses by: Bhikkhu Bodhi, Wisdom Publication, 2017.

9 The Buddha’s Words – Ithiyutthaka-ඉතිවුත්තක [Translated from Pali by Thanissaro Bhikkhu

10 Encyclopedia of Buddhism, Robert E Buswell Jr Editor in Chief, 2004.

11 Pali Buddhist Dictionary by Ven. Nanathiloka Bhikkhu.

12 A Manual of Abhidhamma by Narada Maha Thera, Buddha Dhamma Education Association Inc. 1979.

13 Buddhist Shrines in India-Issued by The Publications Division, Ministry of Information & Broadcasting, Government of India ,march 1951.

14 Stillness Flowing –The Life and Teachings of Ajahn Chah.

15 Treasures of The Buddha’s Teachings by Ajahan Thiradhammo, Aruna Publications, 2013)

16 :  Treasury of the Truth- Dhammapada, Ven. Weragoda Sarada Thero, Buddha  Dhamma Education Association

17 Guide through the Abhidhamma pitaka by Ven. Nyanatiloka Bhikkhu.

18 Sutta Nipatha, Translated by Laurence Khantipalo Mills, published in SuttaCentral, 2015.

19 The natural character of awakening by Tan Chao Khun Upali Gunupamajahn)

20 Khuddakapatha, Vipassana Research Institute.

21 Ten Contemplations with the Commentary from the Saratthasamuccaya by Nanamoli Bhikkhu, BPS –Wheel 177.

22 Discourse to Girimananda Thera by Ven. Piyadassi Thera.

23 Girimanands sutta by Piya Tan.

24 Wings to awakening by Thannissaro Bhikkhu, Metta Forest Monastery, USA.

25 Verses of the Senior Monks, Bhikkhu Sujato etc.

26 Going forth by Sumana samanera (PBS Wheel 27-28).

27 Ordination in Theravada Buddhism (PBS Wheel 56).

28 A Comprehensive Manuala of Abhidhamma – The Abhidhammattha Snagha of Ăcariya Anuruddha, Generala editor Bhikkhu Bodhi, revised and edited by Alla R. Bomhard – Charleston Buddhist Fellowship, Advanced Study Series, Charleston 2007.

29 Maps of Ancient Buddhist Indaia, drawn and compiled by Ānandajoti Bhikkhu.

30 The Seven stages of purification by Ven. Matara Sri Nanarama, BPS 1983.

31 Meditation a way of awakening by Ajahn Sucitto , Amaravati publication, 2011

32 : Discourses in Brief by Somdet Phra Wanrut-Tup Buddhasiri (born 1806) (Wide Angle).

33 THE LIFE OF THE BUDDHA ACCORDING TO THE PALI CANON by BHIKKHU NANAMOLI.

34 Mamhakaccanana, the master of doctrinal exposition by Bhikkhu Bodhi.

## ත්‍රිපිටක විස්තරය

**ත්‍රිපිටකය** -තුන්පිටකය: සූත්‍රපිටකය, විනයපිටකය, අභිධර්මපිටකය.

▲**සූත්‍රපිටකය:** නිකාය පහකින් සමන්විතය:

1) දීඝනිකාය 2) මජ්ජිම නිකාය 3) සංයුත්ත නිකාය

4) අංගුත්තර නිකාය 5) ඛුද්දක නිකාය

▼ **දීඝනිකාය** වග්ග 3 කින් සමන්විතය:

1) සීලක්ඛන්ධ වග්ග 2) මහා වග්ග 3) පාථිකවග්ග

▼ **මජ්ජිම නිකාය** පණ්ණාසක (කොටස්) 3 කින් සමන්විතය:

1) මූල පණ්ණාස 2) මජ්ජිම පණ්ණාස 3) උපරි පණ්ණාස

▼ **සංයුත්ත නිකාය** කොටස් 5 කින් සමන්විතය:

1) සගාථ වග්ග සංයුත්ත 2) නිදාන වග්ග සංයුත්ත 3) ඛන්ධ වග්ග සංයුත්ත

4) සළායතන වග්ග සංයුත්ත 5) මහාවග්ග සංයුත්ත

** **සගාථ වග්ග සංයුත්තය** කොටස් 11 කින් සමන්විතය:

1. දේවතා 2. දේවපුත්ත 3. කෝසල 4. මාර 5. භික්ඛුණී

6. බ්‍රහ්ම 7. බ්‍රාහ්මණ 8. වංගීස 9. වන 10. යක්ඛ 11. සක්ඛ

** **නිදාන වග්ග සංයුත්තය** කොටස් 10 කින් සමන්විතය:

1.නිදාන 2. අභිසමය 3. ධාතු 4.අනමතග්ග 5.කස්සප

6. ලාභසත්කාර 7. රාහුල 8. ලක්ඛණ 9. ඔපම්ම 10.භික්ඛු

** **ඛන්ධ වග්ග සංයුත්තය** කොටස් 13 කින් සමන්විතය:

1.ඛන්ධ 2. රාධ 3. දිට්ඨි 4. ඔක්කන්තික 5. උප්පාද 6. කිලෙස 7.සාරිපුත්ත 8. නාග

9. සුපණ්ණ 10. ගන්ධබ්බකාය 11.වලාහක 12.වච්ඡගොත්ත 13 ඣාන (ජාන)

** **සළායතන වග්ග සංයුත්තය** කොටස් 10 කින් සමන්විතය:

1. සළායතන 2. වේදනා 3. මාතුගාම 4. ජම්බුඛාදක 5. සාමණ්ඩක

6. මොග්ගල්ලාන 7. චිත්ත 8. ගාමිණී 9. අසංඛත 10. අව්‍යාකත

** **මහා වග්ග සංයුත්තය** කොටස් 12 කින් සමන්විතය:

1.මග්ග 2.බොජ්ඣංග 3.සතිපට්ඨාන 4.ඉන්ද්‍රිය 5.සම්මාපධාන 6.බල

7.ඉද්දිපාද 8.අනුරුද්ධ 9.ඣාන (ජාන) 10.අනාපාන 11.සොතාපත්ති 12.සච්ච

▼ **අංගුත්තර නිකාය** නිපාත 11කි.

1) එකනිපාත 2) දුකනිපාත 3) තිකනිපාත 4) චතුක්ක නිපාත 5) පඤ්චක් නිපාත

6) ඡක්ක නිපාත 7) සත්තක නිපාත 8) අට්ඨක නිපාත 9) නවක නිපාත 10) දසක නිපාත

11) එකාදසක නිපාත.

▼ **ඛුද්දක නිකාය කොටස් 15 කි.**

1) ඛුද්දකපාඨ 2) ධම්මපද 3) උදාන 4) ඉතිවුත්තක 5) සුත්තනිපාත 6) විමානවත්ථු

7) පෙතවත්ථු 8) ථෙරගාථා 9) ථෙරීගාථා 10) ජාතක 11) නිද්දේස 12) පටිසම්භිදා

13) අපදාන 14) බුද්ධවංස 15) චරියාපිටකය

▲ **විනය පිටකය:** කොටස් 3 කි

1) විභංග 2) ඛන්ධක 3) පරිවාර

**සටහන:** වර්තමාන කාලයේ විනය පිටකය පොත් 5 ක් ලෙසින් බෙදා ඇත:

1. පාරාජික 2. පාචිත්තිය 3. මහාවග්ග 4. චූලවග්ග 5. පරිවාර

▲ **අභිධම්ම පිටකය:** ප්‍රකරණ 7 කි:

1.ධම්මසංගිණී 2. විභංග 3. ධාතුකථා 4. පුග්ගල පඤ්ඤත්ති

5.කථාවත්ථු 6. යමක 7. පට්ඨාන.

**ৡৡৡ**

## උපග්‍රන්ථය 1: බුද්ධ ශ්‍රාවක භික්ඛු සංඝ- Buddha’s disciple Bhikkhus

**සටහන:** සූත්‍ර පිටකය, විනය පිටකය, ථෙර ගාථා හා අපදාන ඇසුරෙන් ලබාගත් විස්තර අනුව පිළියෙළ කර ඇත. මෙහි දක්වා නැති තෙරුන්ගේ ගේ විස්තර පිණිස බලන්න: බු.නි: ථෙර ගාථා, අපදාන පාලිය1 හා 2-1.

**====**

අ

අක: * අක්කෝෂ භාරද්වාජ තෙර- Akkosha bharadvaja Thera

අග: * අග්ගික භාරද්වාජ තෙර- Aggikabhradvaja Thera
*අංගුලිමාල තෙර- Angulimala Thera

අච: * අචේලකස්සප තෙර 1-Achelakassapa Thera 1
* අචේලකස්සප තෙර 2-Achelakassapa Thera 2 * අචිරවත අග්ගිවෙස්සන සාමණේර-Samanera Achiravata aggivessana

අජ: * අජිත (මානවක) තෙර-Ajitha (manawaka) Thera

අඤ: * අඤ්ඤාකොණ්ඩඤ්ඤ තෙර- Aññākoṇḍañña Thera

අන: *ආනන්ද තෙර- Ānanda Thera* අනුරුද්ධ මහා තෙර- Anuruddha Thera * අනුරාධ තෙර-Anurādha Thera

අභ: * අභය (රාජකුමාර) තෙර – Abhaya ( Prince) Thera
* ආභිඥජික භික්ෂුව- Abhignaka Bhikkhu

අර: * අරිට්ඨ තෙර-Ariṭṭha Thera

අස: * අස්සජි තෙර -Assaji Thera * අස්සජි තෙර-පස්වග- Assaji Thera- pasvaga * අසුරින්දක භාරද්වාජ තෙර-Asurindika bhradvaja Thera

අශ: * අශෝක තෙර- Asoka Thera

අහ: * අහිංසක භාරද්වාජ තෙර- Ahinsaka Bharadvaja Thera

ඉ

ඉස: * ඉසිදත්ත තෙර-Isidattha Thera * ඉසිදාස හා ඉසිභද්ද තෙරුන්-Isidasa & Isibhadda Theras

උ

උත: * උත්තිය තෙර- Uttiya Thera

උද: * උදායි තෙර-Udayi Thera * උදෙන තෙර- Udena Thera

උප: *උපක තෙර- Upaka Thera * උපචාල තෙර- Upachala Thera
* උපනන්ද තෙර-Upananda Thera * උපාලි මහා තෙර- Upāli

Maha Thera * උපවාන තෙර- Upavāṇa Thera * උපසේන වංගනාථපුත්ත තෙර- Upasena Vaṅgantaputta Thera * උපසීව තෙර- Upasiva Thera

උර: උරුවෙල කස්සප තෙර -Uruvelakassapa Thera

ක

කක: * කක්කට තෙර- Kakkaṭa Thera * කෝකාලික භික්ෂුව- Bhikkhu Kokālika

කච: * කච්චාන ගොත්ත තෙර -Kachchana Thera

කඨ : * කඨ තෙර-Kaṭa Thera * කඨිම්භ තෙර-Kaṭimbha Thera * කඨිස්සංඝ තෙර- Kaṭissaṅga Thera

කඩ: * කඞ්ඛාරේවත තෙර- Kaṅkhārevata Thera

කණ: * කුණ්ඩධාන තෙර- Kuṇḍadhāna Thera

කප: *කප්ප (මානවක) තෙර- Kappa Thera

කම: * කුමාර කාශ්‍යප තෙර-Kumāra Kassapa Thera * කිම්බිල තෙර- Kimbila Thera

කළ: * කළාර ඛත්තිය තෙර- Kalarakattiya Thera

කළු: * කාළුදායි තෙර- Kāludāyi Thera

කස: * කස්සප ගොත්ත තෙර-Kassapa Gothta Thera

ඛ

ඛම: * ඛේම තෙර- Khema Thera * ඛෙමක තෙර -Khemaka Thera

ග

ගද: * ගොදත්ත තෙර- Godaththa Thera

ගධ: * ගොධික තෙර- Godikha Thera

ගය: * ගයාකස්සප තෙර-Gayakassapa Thera

ගර: * ගිරිමානන්ද තෙර- Girimananda Thera

ගල: *ගුලිස්සානි භික්ෂුව- Gulissani Bhikku

ගව: * ගවම්පති තෙර- Gavampathi Thera

ච

චක: * චක්ඛුපාල තෙර- Chakkhupaala Thera

චන: * චුන්ද සාමනේර-Chunda Samanera

චල: * චාල තෙර- Chala Thera * චුල්ලපන්ථක භික්ෂුව- Cullapanthaka Bhukkhu

ඡ

ඡන: * ඡන්න (කපිලවස්තුනුවර)තෙර -Channa Thera * ඡන්න (රජගහනුවර) තෙර - Channa Thera

ජ

ජට: * ජටා භාරද්වාජ තෙර- Jata Bharadvaja Thera

ජත: * ජතුකන්නි තෙර - Jathukanni Thera

ත

තද: *තොදෙය්ය තෙර-Todeyiya Thera

තල: * තාලපුත්‍ර තෙර- Talaputta Thera

තස: * තිස්ස තෙර- Tissa Thera *තිස්ස කපිලවස්තු තෙර- Tissa Kapilavatthu Thera *තිස්සමෙත්තෙයිය තෙර- Tissametteiya Thera

ථ

ථර: * ථෙර නම් භික්ෂුව- Bhikkhu Threa

ද

දබ: *දබ්බ මල්ල පුත්‍ර තෙර- Dabba Mallaputta Threa

දස: * දාසක තෙර- Dāsaka Thera

ධ

ධත: * ධොතක තෙර-Dhothaka Thera

ධම: * ධම්මික තෙර- Dammika Thera

න

නග: * නාගසමාල තෙර- Nagasamala Thera * නාගදත්ත තෙර- Nagadattha Thera * නාගිත කාශ්‍යප තෙර- Nagita Kassapa Thera * නිග්‍රෝධකප්ප තෙර- Nigrodhakappa Thera

නද: *නදී කාශ්‍යප තෙර- Nadikassayapa Thera

නන: * නන්ද (ගෝතම) තෙර -Nanda Thera * නන්දක තෙර- Nandaka Thera *නන්දක (මානවක) තෙර- Nandaka manawaka Thera * නන්දිය තෙර- Nandiya Thera

නර: *නාරද තෙර- Narada Thera

ප

පක: * පුක්කුසාති භික්ෂුව - Bhikkhu Pukkusāti

පග: * පිංගිය (මානවක) තෙර -Pingiya (manawaka) Thera

පණ: *පුණ්ණක තෙර - Punnaka Thera * පුණ්ණ තෙර - Punna Thera * පුණ්ණජි තෙර-Punnaji Thera * පුණ්ණිය තෙර- Punniya Thera * පුණ්ණ මන්තානි පුත්‍ර තෙර- Puṇṇa Mantāṇiputta Thera * පිණ්ඩොල භාරද්වාජ තෙර- Piṇḍola Bhāradvāja Thera

පල: * පලගන්ඩ තෙර- Palaganda Thera* පිලින්දවච්ඡ තෙර- Pilindavachcha Thera

පස: * පෝසාල (මානවක) තෙර-Posala Thera

ඵ

ඵග: * ඵග්ගුන තෙර-Phagguṇa Thera

බ

බක: * බක්කුල තෙර -Bakkula Thera

බල: * බිලන්ගික භාරද්වාජ තෙර- Bilangika Bharadvaja Thera * බෙලට්ඨිසීස තෙර- Belatthisisa Thera

බහ: * බාහිය තෙර-Bahiya thera * බාහිය දාරුචිරිය රහතන්වහන්සේ- Arahant Bahiya darichariya * බාහුන තෙර- Bahuna Thera * බ්‍රහ්මදේව තෙර -Brahmadeva Thera

භ

භග: *භගු තෙර- Bhagu Thera

භද * භද්ද තෙර- Bhadda Thera * භද්දිය (පස්වග) තෙර- Bhaddiya Thera * භද්දිය කාළිගොධායපුත්ත තෙර - Bhaddiya Kāḷigodhāyaputta Thera* භද්දජි තෙර-Baddaji Thera * භද්‍රාලි තෙර- Badrali Thera * භද්දවග්ගිය තෙරුන්- Bhaddavaggiya Theras * භද්‍රාවුධ (මානවක) තෙර-Badrawuda Thera

භණ: * භණ්ඩු භික්ෂුව-Bhikkhu Bhandu

භර: * භාරද්වාජ තෙර- Bharadvaja Thera * භාරද්වාජ (රජගහනුවර) ගෝත්‍රික තෙර- Bharadvaja gothrika Thera * භාරද්වාජ (කෝසලදනව්වේ) ගෝත්‍රික තෙර- Bharadvaja gothrika Thera

ම

මග: * මාගන්දිය තෙර- Magandiya Thera * මිගජාල තෙර- Migajala Thera

මඝ: * මේඝිය තෙර- Megiya Thera * මෝඝරාජ තෙර- Mogharaja Thera

මත: * මෙත්තගු (මානවක) තෙර-Mettagu Thera

මල: * මාලුන්ක්‍යයපුත්ත තෙර-Mālunkyāputta Thera

මහ: * මහක තෙර-Mahaka Thera * මහා කච්චායන තෙර -Mahākaccāna Thera * මහා කොට්ඨිත තෙර -Mahākoṭṭhita Thera * මහා කප්පින තෙර- Mahākappina Thera * මහා කාශ්‍යප තෙර-Mahakassapa Thera * මහා චුන්ද තෙර-Mahachunda Thera * මහාපන්ථක තෙර- Mahāpanthaka Thera * මහා මුගලන් තෙර- Maha Mugalan Thera * මහානාම (පස්වග) තෙර- Mahanama (pasvaga) Thera

ය

යම: * යමක තෙර -Yamaka Thera

යස: * යසකුල පුත්‍ර තෙර -Yasakulaputtha Thera * යසොජ තෙර-Yesoja Thera

ර

රජ: * රාජදත්ත තෙර- Rajadatta Thera

රට: * රට්ඨපාල තෙර- Raṭṭhapāla Thera

රධ: * රාධ තෙර -Radha Thera

රව: *රේවත ඛදිරවනිය තෙර- Rewatha Khadiravaniya Thera

රහ: * රාහුල තෙර-Rahula Thera

ල

ලක: * ලක්ඛණ තෙර- Lakkhana Thera *ලකුණ්ටකභද්දිය තෙර-Lakuntakabaddhiya Thera * ලෝමසකන්ගිය තෙර-Lomasakangiya Thera

ව

වක: * වක්කලි තෙර- Vakkali Thera

වග: * වංගීස තෙර - Vaṅgīsa Thera

වච: * වච්ඡගොත්ත තෙර- Vachchagothta Thera

වජ: *වජ්ජිපුත්‍ර තෙර- Vajji Thera

වප: * වප්පතෙර-පස්වග -Vappa Thera -pasvaga

වම: * විමල තෙර- Vimala Thera

වශ: * වාශිෂ්ඨ තෙර හා භාරද්වාජ තෙර- Vasettha Thera & Bharadvaja Thera * විශාඛ පංචාලිපුත්ත තෙර- Visākha pamchaliputta Thera

ස

සග: * සංග්‍රාමජිත් තෙර -Sangramajit Thera * සාගත තෙර- Sagatha Thera

සජ: * සුජාත තෙර- Sujata Thera

සද: * සද්ධා තෙර- Saddha Thera * සුද්ධික භාරද්වාජ තෙර- Suddika Bharadvaja Thera

සධ: * සුධර්-ම භික්ෂුව-Bhikkhu Sudharma

සන: * සේනිය (කෝලියරටේ) තෙර-Seniya Thera * සුන්දරික භාරද්වාජ තෙර *Sundarika Bhradvaja Thera 1 *සුන්දරික භාරද්වාජ තෙර **2** - Sundarika Bhradvaja Thera 2

සණ: * සෝණකුටිකන්න තෙර- Soṇa Kuṭikaṇṇa Thera * සෝණ කොළිවීස තෙර- Soṇa Koḷivīsa Thera

සප: * සෝපාක සාමණේර -Samanera Sopaka

සබ: *සුබාහු තෙර-Subahu Thera

සභ: *සභිය කච්චාන තෙර-Sabhiya Kaccāna Thera * සුභූති තෙර- Subhūti Thera * සුභද්‍ර භික්ෂුව-Bhikkhu Subhadra * සුභද්‍ර මහලු භික්ෂුව- Subhadra elderly Bhikkhu * සෝභිත තෙර- Sobhita Thera

සම: * සමිද්ධි තෙර- Samiddhi Thera * සුමන තෙර-Sumana Thera

සර: * සැරියුත් මහා තෙර- Sāriputta Maha Thera * සුරාධ තෙර- Suradha Thera

සල: * සේල තෙර-**Sela Thera**

සළ: * සාළ තෙර- Sala Thera

සව: * සීවලී තෙර- Sivali Thera

සහ: * සීහ සාමණේර- novice Sīha

හ

හත: * හත්ථිසාරිපුත්‍ර චිත්ත තෙර -Hatthisāriputta Citta Thera

හම: *හේමක තෙර- Hemaka Thera

====

**අ**

**අක**

▲**අක්කෝෂ භාරද්වාජ තෙර-** Akkosha bharadvaja Thera: ගිහිකල රජගහනුවර වාසි බ්‍රාහ්මණයකුවූ මෙතුමා, තමන්ගේ ගෝත්‍රයේ අය බුදුසසුනේ පැවිදිවීම ගැන කෝපයට පත්ව බුදුන් වහන්සේට ක්‍රෝධයෙන් පරිභව කළහ. ඒ අවස්ථාවේදී බුදුන් වහන්සේ ඔහුගෙන් මෙසේ ඇසිය:

**"ඔගේ නිවසට පැමිණෙන නෑදැයන්, ආගන්තුකයන්ට කෑම බීම ඔබ දෙන්නේද?"** එසේ කරන බව ඔහු පැවසිය. ඒවා ඔවුන් පිළිනොගන්නේ නම් කුමක් කරන්නේද? යයි බුදුන් වහන්සේ ඇසූවිට ඔහු පැවසුවේ, ඒවා ඔවුන් පිළිනොගනී නම් තමන් ඒවා බුදින බවය. ඒ අවස්ථාවේදී බුදුන් වහන්සේ වදාළේ, ඔහු ක්‍රෝධයෙන් පැවසූ වදන් තමන් වහන්සේ පිළිනොගන්නා නිසා ඒවා ආපසු ඔහුටම ගැනීමට සිදුවන බවය. ඉන්පසු බුදුන් වහන්සේ මෙසේ වදාළහ:

**"යමෙක් කිපුන කෙනකුට පෙරලා කිපේද, එමගින් ඔහුට පව් සිදුවේ. එහෙත්, එසේ නොකරන්නා, ඉවසා සිටිමෙන් දෙදෙනාටම වැඩ සලසයි…"** ඒ වදාළ දහම අවබෝධ කර, භක්තිය ඇතිකරගෙන, පැවිදිවූ මෙතුමා අරහත්වයට පත්වූබව මෙහි දක්වා ඇත. **මූලාශ්‍රය:** සංයු.නි: (1): සගාථවග්ග:බ්‍රාහ්මණසංයුත්ත:7.1.2 අක්කොස සූත්‍රය, පි.314.

**අග**

▲**අග්ගික භාරද්වාජ තෙර-** Aggikabhradvaja Thera**:** අඩගණික භාරද්වාජ ලෙසින්ද හඳුන්වා ඇත**.**මෙතුමන් ගිහි ජීවිතයේදී රජගහ නුවර විසූ තෙවිජ්ජාව දත් බ්‍රාහ්මණයෙකි. මෙතුමාට බුදුන් වහන්සේ හමුවීම හා බුදු සසුනේ තෙවිජ්ජාව ගැන බුදුන් වහන්සේ වදාළ මේ ධර්මය අවබෝධ කරගෙන, සැදැහැ ඇතිකර, පැවිදිව, අරහත්වය ලැබිම මෙහි දක්වා ඇත. බුදුන් වහන්සේ මෙසේ වදාළහ:

**"… ජාතියෙන් කෙනෙක් බමුණෙක් නොවේ…යමෙක් පෙර විසූ කඳපිළිවෙත දනීද, ස්වර්ගය හා අපාය දනීද, ජාතිය ක්ෂය කර අරහත්වය ලබා ගත්තේද, සියලු කටයුතු නිම කරන ලද්දේද, මුණිවුතයෙන් යුතුද… ඒ ත්‍රිවිද්‍යාවෙන් බමණුතෙමේ ත්‍රිවිද්‍යා වේ…"**

**මූලාශ්‍රය:** සංයු.නි: (1) සගාථවග්ග: බ්‍රාහ්මණසංයුත්ත: 7.1.8 අග්ගික සූත්‍රය, පි. 322.

▼ **මේ තෙරුන්ගේ ථෙර ගාථා**: ඛු.නි: ථෙරගාථා :3.1.1.,පි.116.

"පෙරදී ජාතිය නිසා බ්‍රාහ්මණ වූවෙමි…දැන් පාපයන් බහා තැබූ නිසා බ්‍රාහ්මණ වෙමි, ත්‍රිවිද්‍යා ඇත්තෙමි… චතුසත්‍ය අවබෝධ කළහෙයින් වෙගු වෙමි".

▲ **අංගුලිමාල තෙර-** Angulimala Thera**:** මෙතුමා, අහිංසක යන නම ඇතිව, ගිහිකල කුමාර සැපයෙන් සිට පසුව, අංගුලිමාල නම් මහා දරුණු සොරකු ව, බුදුන් වහන්සේ දෙසූ දහම අසා සැදැහැ උපදවා පැවිදිව, අරහත්වය ලබා ගැනීම මෙහි විස්තර කර ඇත.

**"දෙව්මිනිසුන් පුජිත මේ මහාඉසි මහණ බොහෝ කලක් ඇවෑමෙන් මට වැඩ පිණිස මහාවනයට වැඩියහ. මම ඔබගේ ධර්ම යුක්ත ගාථා අසා පව් හැරදමමි". මූලාශ්‍රය:** ම.නි: (2) 2.4.6 අංගුලිමාල සූත්‍රය, පි.532. **සටහන්**: * බුදුන් වහන්සේ වදාළ ගාථාවක් සජ්ජායනා කිරීමෙන්, මේ තෙරුන් ගැබිණි මවකට දරුවා සුවපත් ලෙසින් බිහිකිරීමට උපකාරී වූහ. 'අංගුලිමාල පිරිත' ලෙසින් හඳුන්වන එම ගාථා, වර්තමානයේදී, ගැබිණිමව්වරුන්ගේ සුව සෙත පිණිස සජ්ජායනා කරති. **බලන්න:** අංගුලිමාල පිරිත. ** මෙතුමා පැවිදිබවට පත්වූ පසු, ජනයා, ප්‍රකට සොරුන් මහණ කරන්නේය යයි සංඝයාට අවමන්කළහ. ඒ බව සංඝයා බුදුන් වහන්සේට දැන්වූ පසු 'ප්‍රකට සොරුන්' පැවිදි කිරීම දුකුළා ඇවතක් යයි බුදුන් වහන්සේ වදාළහ. **බලන්න:** වින.පි: මහාවග්ග පාලි 2-2: 21,පි.262.

▼ **මේ තෙරුන්ගේ ථෙර ගාථා**: ඛු.නි: ථෙරගාථා :20.1.8 ,පි.244.

" යම් කෙනෙක් දෙවියන් සහිත සත්ලෝකයාට කාරුණික වෙත්ද, මහා ඉර්ෂි වෙත්ද, ඒ බුදුහු 'එව මහණ' යයි වදාළහ. එයම, (මගේ) භික්ෂුභාවය (එහිභික්ෂු උපසම්පදාව) විය...මා විසින් ශාස්තෘන් වහන්සේ ඇසුරු කරන ලදී...ගුරුබර බහා තබන ලදී, තණ්හාව උදුරා දමන ලදී".

**අච**

▲**අචේලකස්සප තෙර 1-**Achelakassapa Thera 1: මෙතුමා, මච්ඡිකාසණ්ඩයේ චිත්ත ගහපති ගේ ගිහිකල මිත්‍රයෙක්ය, එවක ඔහු නිරුවත් තපස් ව්‍රතය දැරුහ. චිත්ත ගහපතිගෙන් ධර්ම ය අසා පැහැදී, බුදුසසුනේ පැවිදිව අරහත්වය ලබා ගත්බව මෙහි දක්වා ඇත. **සටහන:** අචේල යනු සළු නැතිබවය, නිරුවත් බවය. **මූලාශ්‍රය:** සංයු.නි: (4) සළායතනවග්ග: චිත්තසංයුත්ත: 7.1.9 අචේල සූත්‍රය, පි.574.

▲**අචේලකස්සප තෙර 2 -**Achelakassapa Thera 2.: පැවිදිවීමට පෙර නිරුවත් තපස්ව්‍රතය දැරූ මෙතුමාට රජගහනුවරදී බුදුන් වහන්සේ හමුවී ධර්මය අවබෝධ කරගැනීමට අවස්ථාව ලැබුනි. දහම් දේශනාව අවසානයේදී, බුදුන් සරණ ගොස්, පැවිද්ද ලබා අවසානයේදී අරහත්වය ලැබූහ. **මූලාශ්‍රය:** සංයු.නි: (2) නිදානවග්ග: අභිසමයසංයුත්ත: 1.2.7 අචේලකස්සප සූත්‍රය, පි. 52. **සටහන: දීඝ.නි:** (1) 8 සිංහනාද සූත්‍රය, පි. 372:බුදුන් වහන්සේ මෙතුමාට දේශනා කරඇතිබව මෙහි දක්වා ඇත.

▲ **අචිරවත අග්ගිවෙස්සන සාමණේර-**Samanera Achiravata aggivessana: මේ සාමනේරයන්හට ජයසේන කුමාරයා රජගහනුවරදී හමුවීම, ඔහු සාමනේරයන් දෙසූ දහම් කරුණු ගැන එකඟ නොවීම, පසුව ඒ ගැන බුදුන් වහන්සේට පැවසීම පිලිබඳ විස්තර මෙහි දක්වා ඇත. ඉන්පසු, ක්‍රමානුකූලව ධම්ම පුහුණුව ලබන අන්දම බුදුන් වහන්සේ මේ තෙරුන්ට වදාළහ. **බලන්න:** ම.නි: (3) 3.3.5 දන්තභූමි සූත්‍රය, පි.320.

**අජ**

▲ **අජිත (මානවක) තෙර-**Ajitha Thera: මෙතුමා පැවිදිවීමට පෙර, බාවරී බ්‍රාහ්මණ ගේ සිසුවෙකි. බුදුන් වහන්සේගෙන් දහම් කරුණු විමසා, දහම අවබෝධ කර පැවිදි වූහ.

**සටහන**: මෙතුමා, අවිද්‍යාව, තණ්හාව, නාමරූප, අසේඛ, ආදීන් පිළිබඳව විමසූ ප්‍රශ්න හා බුදුන් වහන්සේ වදාළ පිළිතුරු මෙහි පෙන්වා ඇත. **බලන්න**: භය, තණ්හාව. **මූලාශ්‍රය:** ඛු.නි.සුත්තනිපාත: පාරායනවග්ග :වස්තුගාථා: පි,326, 5-1 අජිතමානවක,පි.336.

▼ **මේ තෙරුන්ගේ ථෙර ගාථා**: ඛු.නි: ථෙරගාථා: 1.2.10, පි.44.

"මට මරණයෙහි බියක් නැත, ජීවිතය ගැන අපේක්ෂාවක් නැත, සම්මා ඥානය ඇත්තෙමි, එළඹී සිහිය ඇතිව සිරුර බහා තබන්නෙමි".

▼ **මේ තෙරුන්ගේ අපදානය**: ඛු.නි:අපදාන පාළිය 1: 400, පි.652. හිමවතදී පදුමුත්තර බුදුන් වහන්සේ හමුවීම, උන්වහන්සේ ගැන පැහැදී පහන් පූජාවක් කිරීම, පුණ්‍ය කම්ම බලයෙන් බොහෝ වාරවල දෙව් මිනිස් සැප ලැබීම, ගෝතම බුදුන් දවස , ගිහිගෙය හැර බාවරි බ්‍රාහ්මණගේ සිසුවෙක් වීම, බුදුන් වහන්සේ දෙසූ දහම අසා පැහැදී පැවිදිවීම මෙහි දක්වා ඇත.

"බුද්ධ ශ්‍රේෂ්ඨයන් වෙත පැමිණීම, ඒකාන්තයෙන්ම යහපත්විය, ත්‍රිවිද්‍යා ලැබීමි, බුදු සසුන කරන ලදී".

**අඤ**

▲ **අඤ්ඤාකොණ්ඩඤ්ඤ තෙර-** Aññākoṇḍañña Thera: බුදුන් වහන්සේ, බෝසත්ව (සිදුහත් තවුසා) ඉසිපතනයේ වැඩවසන සමයේ උන්වහන්සේට උපස්ථානය කළ පස්වග තවුසන් අතරින් වැඩිමහල්ලා මේ තෙරුන්ය. මෙතුමා ධම්මචක්කප්පවත්තන සූත්‍රය දේශනා කරණ අවස්ථාවේ පළමුව චතුසත්‍ය අවබෝධකර සෝතාපන්න බව සාක්ෂාත් කරගති. ශ්‍රාවක සංඝයා අතුරින් පළමුව සසුනට ඇතුළුවූ හෙයින් ජ්‍යෙෂ්ඨ භික්ෂූන් අතුරෙන් ප්‍රමුඛ තැන ලැබූවේය. **බලන්න** EAN: note: 74,p.584. අනත්තලක්ඛන සූත්‍රය දේශනා කරන අවස්ථාවේ උතුම් අරහත්වය ලබාගති. **මූලාශ්‍ර:** අංගු.නි: (1) 1 නිපාත: එතදග්ග පාළිය සූත්‍ර, පි. 84**,** EAN:1:Foremost, p. 44.

▼ **අඤ්ඤාකොණ්ඩඤ්ඤ නාමය ලැබීම**

"... මේ වෙය්‍යාකරණ ධර්-මය දෙසන කල්හි ආයුෂ්මත් කොණ්ඩඤ්ඤයන්ට 'යම්කිසි දහමක් ප්‍රත්‍යයෙන් උපන්නේවේද, ඒ සියල්ල නිරුද්ධ වීමේ ස්වභාවය කොට ඇතය' යන රාගාදීරජස් රහිතවූ පහවූ දිට්ඨිවිචිකිච්ඡා මල ඇති සෝතාපත්ති මග්ගඤාණය පහළ වූයේය". **"ඉමස්මිඤ්ච පන වෙය්‍යාකරණස්මිං භඤ්ඤමානෙ ආයස්මතො කොණ්ඩඤ්ඤස්ස විරජං වීතමලං ධම්මචක්ඛුං උදපාදි: 'යං කිඤ්චි සමුදයධම්මං, සබ්බං තං නිරොධධම්ම'න්ති"**. ඒ අවස්ථාවේදී බුදුන් වහන්සේ මේ උදානය (ප්‍රීතිවාක්‍ය) වදාළහ: **"භවත් කොණ්ඩඤ්ඤ තෙමේ ඒකාන්තයෙන්ම (චතුරාර්යසත්‍ය ධර්මය) දත්තේය..."**. මෙසේ ආයුෂ්මත් කොණ්ඩඤ්ඤයන්ට 'අඤ්ඤාකොණ්ඩඤ්ඤ' කියා නමක් වූයේය. **මූලාශ්‍රය**:වින.පි:මහාවග්ග පාළිය 1: මහාඛන්ධක:22,පි.1021.

▼ **මේ තෙරුන්**, බුදුන් වහන්සේ බැහැදැකීම හා වංගීස තෙරුන්, එතුමන් ගැන කරන ලද ගුණ වණුම පිළිබඳව බලන්න: සංයු.නි: (1) වංගීසසංයුත්ත :කොණ්ඩඤ්ඤ සූත්‍රය, පි.372.

▼ **මේ තෙරුන්ගේ ථෙර ගාථා**: ඛු.නි: ථෙරගාථා:16.1.1. පි.214.

"මම (බුදුන් වහන්සේගේ) ඉතා රසවත් දහම අසා බෙහෙවින් පැහැදුනෙමි, උන්වහන්සේ, සර්වප්‍රකාරයෙන්ම උපාදාන රහිත විරාග ධර්මය දේශනා කරන ලදී".

▼ **මේ තෙරුන්ගේ අපදානය:** ඛු.නි: අපදානපාලි 1: 7, පි.116. "බුද්ධත්වයට පත් පදුමුත්තර බුදුන් වහන්සේ මම දුටුවෙමි, තුසිත දෙව්ලොව සිට පැමිණ උන්වහන්සෙට ආහාර පූජා කෙළෙමි. බුදුන් වහන්සේ අනුමෝදනා වදාරන විට, මගේ අනාගත ජීවිත ගැන පැවසූහ. ගෝතම බුදුන් වහන්සේ පහළවන සමයේ, කොණ්ඩඤ්ඤ නම් බ්‍රාහ්මණයෙක්ව, පළමුව දහම අවබෝධ කරගන්නේය යි වදාළහ".

▲**ආනන්ද තෙර-** Ānanda Thera: බුදුන් වහන්සේගේ ඥාති සහෝදරයෙක් වූ ආනන්ද තෙරුන් ගේ ගිහිනම, ආනන්ද ගෞතමය. ධර්-ම භාණ්ඩාගාරිකවූ, ආනන්ද තෙරුන් ගේ උතුම් ගුණයන්වූ, බුදුන් වහන්සේට උපස්ථානකිරීම, බහුශ්‍රැතබව, කරුණාව, නිහතමානිකම, සෙසු සංඝයා හා සුහදව විසීම ආදීය ඇතුලත් ගුණ සමුදායක්ම සූත්‍රපිටකය පුරාම පැතිරී ඇත. මෙතුමා, බුදුන් වහන්සේගේ අවසාන වසර 25 තුල උපස්ථායක ධූරය දැරූහ.

▼ **බොහෝ ඇසූ පිරූ තැන් ඇති** (බහුශ්‍රැත) යහපත් සිහිය (ධාරණස්මෘති), ක්ෂණික අවබෝධය ඇති (ප්‍රඥාගති-quick grasp), නිශ්චිත බව ඇති (ධෘතිමත්-resolute) භික්ෂූන් හා භාග්‍යවතුන් වහන්සේගේ උපස්ථායකයන් අතරෙන් අග්‍ර, ආනන්ද තෙරුන්ය යයි බුදුන් වහන්සේ වදාළහ. **බලන්න**: අග්‍රතම ශ්‍රාවක භික්ෂූන්, EAN:notes:102-105, p.585. **මූලාශ්‍ර:** අංගු.නි: (1) 1 නිපාත: එතදග්ග පාළිය සූත්‍ර, පි. 84**,** EAN:1:Foremost, p. 44. **සටහන**: ආනන්ද තෙරුන් 'වේදෙහි මුණි'- (Videhan sage, wise sage) පණ්ඩිත ලෙසින්ද හඳුන්වයි. එනම්, දැනුම-ඥානය පිළිබඳව,පණ්ඩිතව (ප්‍රඥාවන්තව), උත්සහාවන්තව, බහුශ්‍රැතව කටයුතු කරනබවය. ආනන්ද තෙරුන්ගේ මව වේදේහ ප්‍රදේශයේ උපන් නිසා 'වේදේහමුණි' ලෙසින් හඳුන්වන බවද දැක්වේ.**බලන්න:** ESN: note 288, p. 978.

▼**බුදුන් වහන්සේ මේ තෙරුන් ගැන අනාගත වාක්‍යයක් මෙසේ වදාළහ:** "...ආනන්ද අවිතරාගීව කාලක්‍රියා කළහොත් ඔහු එම චිත්ත ප්‍රසාදය නිසා සත්වරක් දෙව්ලොව රජ කරයි, සත්වරක් දඹදිව මහා රාජ්‍ය කරයි. එනමුත්, ආනන්ද මේ භවයේදීම පිරිනිවන් පාන්නේය"**. මූලාශ්‍ර:** අංගු.නි: (1): 3 නිපාත: ආනන්දවග්ග: 3.2.3.10 සූත්‍රය, පි. 440, EAN:3: Ānanda: 80.10, p. 120.

▼ **ආනන්ද තෙරුන් සෝතාපන්න බවට පත්වුවේ,** පුණ්ණ මන්තාණි පුත්‍ර තෙරුන් පංච උපාදානස්කන්ධය පිළිබඳව කළ දේශනය අසා, අවබෝධය ලබා ගැනීමෙන් බව මෙහි දක්වා ඇත. **මූලාශ්‍ර**: සංයු.නි: (3 ): ඛන්ධසංයුත්ත: තෙර වග්ග: ආනන්ද සූත්‍රය, පි.208, ESN: 22: Kahndasamyutta: Elders: 83.1 Ananda, p. 1069.

▼**ආනන්ද තෙරුන්** සතු අසිරිමත් ගුණ බුදුන් වහන්සේ මෙසේ පෙන්වා ඇත: ආනන්ද තෙරුන් දැකීමට එන භික්ෂු සංඝයා...භික්ෂුණි

සංඝයා...උපාසක පිරිස … උපාසිකා පිරිස, ඔහු දැකීමෙන් සතුටුවේ, ඔවුන්ට ආනන්ද තෙරුන් දහම දේශනා කරනවිට ඔවුන් සතුටුවේ, ආනන්ද තෙරුන් නිසලවූවිට ඔවුන් අතෘප්තිමත්ය (තවදුරටත් දහම ඇසීමට ඔවුන් බලා සිටි). **සටහන:** මහා පරිනිබ්බාන සූත්‍රයේදී ද, බුදුන් වහන්සේ, ආනන්ද තෙරුන්ගේ එම ගුණ වදාළහ. **මූලාශ්‍ර:** අංගු.නි: (2 ): 4 නිපාත: 4.3.3.9 ආනන්ද අච්ඡරිය සූත්‍රය, පි. 275, EAN:4: 129.9 Astounding- 3, p. 195.

▼ **ආනන්ද තෙරුන් සම්බන්ධ අනිකුත් සූත්‍ර: සංයු.නි:** (1): **දේවපුත්ත සංයුත්තය**: * 2.2.10 අනාථපිණ්ඩික සූත්‍රය, පි.130, අනාථපිණ්ඩික දෙව්පුත්, ජේතවනාරාමයට පැමිණි අවස්ථාව, ** 2.3.9 සුසීම සූත්‍රය, පි.148, සැරියුත් තෙරුන්ගේ ගුණ වර්ණනා කිරීම, **කෝසල සංයුත්තය**: 3.2.8 කල්‍යානමිත්ත සූත්‍රය, පි.186, බුදුන් වහන්සේ කල්‍යාන මිත්‍ර අගය පැවසීම, **බ්‍රහ්මසංයුත්තය**: * 6.2.5 පරිනිබ්බාන සූත්‍රය, පි.308, මහාපරිනිබාන අවස්ථාවේදී ශෝකයට පත්වීම (**බලන්න**: දීඝ.නි:මහා පරිනිබාන සූත්‍රය). **බ්‍රාහ්මණසංයුත්ත**: *7.2.11 සංගාරව සූත්‍රය, පි.352, ජල ස්නානයෙන් විසුද්ධිය ලැබීම ගන බුදුන් වහන්සේ ගෙන් විමසීම. **වංගීසසංයුත්ත:** *8.1.4 ආනන්ද සූත්‍රය, පි.362, වංගීස තෙරුන්ට රාගය ගැන අනුසාසනා කිරීම.**වනසංයුත්ත**:9.1.5 ආනන්ද සූත්‍රය, පි.382. බුදුන් වහන්සේගේ අපවත්වීමෙන් පසුව ආනන්ද තෙරුන් වනයේ විසීම හා ගිහියන් එහි පැමිණීම, වන දේවතාවක් තෙරුන්ට සංවේගය අතිකිරීම.

▼ **ථෙර ගාථා පාලියේ, ආනන්ද තෙරුන් අරහත්වය ලැබීම මෙසේ දක්වා ඇත:**

“පෙළපතින් ගෝතම වෙමි -හසලය, වියත් කතා ඇත්තෙමි,

උතුම් බුදුහිමිගේ කැපකරු වූ වෙමි-කෙළෙස් මළ මුළුමනින් සිඳිමි

බුදුපුතුට, සුවසේ නිදිය හැකිය දැන්”. **ගාථා:** 1026

**සටහන්**: * ආනන්ද තෙරුන් උගත් දහම් ස්කන්ධය, 84,000කි: 82,000 ක් බුදුන් වහන්සේ වෙතින්, 2000 ක් සැරියුත් මහා තෙරුන් ආදී භික්ෂු සංඝයා වෙතින් ලබා ඇත. **බලන්න**: ගාථාව: 1029. ** ආනන්ද තෙරුන්ගේ, ථෙර ගාථා විස්තර: **බලන්න**: ඛු.නි. ථෙර ගාථා පාළි, 1017-1048 ගාථා, පි. 267.

▼ **ඛු.නි: අපදාන පාළි** 1 : ආනන්දතෙර -10, පි. 124: පදුමුත්තර බුදුන් වහන්සේ වැඩ සිටින සමයේ, රජෙක්ව සිටි මෙතුමා, බුදුන් වහන්සේ ගැන පැහැදී, ඇතා පිටින් බැස, බුදුන් වහන්සේට සෙවන දීම පිණිස තමන්ගේ රිදී සේසත දරා සිටියහ. බුදුන් වහන්සේ අනුමෝදනා වදාරනවිට, අනාගත උපත් පවසා අවසාන උපතේදී, ගෝතම බුදුන් වහන්සේගේ ආනන්ද නම් උපස්ථායකයා වන බව වදාළහ.

▼ **වෙනත් මූලාශ්‍ර: 1. ආනන්ද තෙරුන්ගේ විශිෂ්ඨ බව** සද්ධර්මාලංකාර යේ මෙසේ දක්වා ඇත: “ එක් කලක, බමුණෙක් බුදුහිමි වෙත පැමිණ මෙසේ පැවසුහ:

' ස්වාමිනි, රූපිව සිටින නිසා බුද්ධ රත්නයට සංඝරත්නයට පූජා සත්කාර කරමි. එහෙත් අරූපි වූ ධර්-ම රත්නයට කෙසේ පූජා කරන්නේද?' එකල, බුදුන් වහන්සේ මෙසේ වදාළහ:

" ධර්මය දන්නා අයට පූජා කලේනම් ධර්මයට පූජා කළා නම් වේ".

එවිට ඒ බමුණා "ධර්මය දන්නෝ කවුරුද?" යයි විචාළේය. බුදුන් වහන්සේ "සංඝයා ගෙන් අසාදැනගන්න" යයි වදාළහ. ඉන්පසුව, ඒ බමුණා සංඝයා වෙත පැමිණ මේ සසුනේ ධර්ම රාශියක් දරා සිටින්නේ කවුරුද යැයි විමසුහ. එකල සංඝයා මෙසේ පිළිතුරු දුන්හ:

"බමුණ, මේ සසුනේ සුවාසු දහසක් ධර්මය නිරවශේෂවශයෙන් ධාරා ගෙන සිටින්නේ ආනන්ද තෙරුන් බවද...බුදුන් වහන්සේ විසින්, ආනන්ද තෙරුන් පංච ස්ථානයෙහි අග්‍රස්ථානයට පමුණුවන ලද බවද...සාරිපුත්ත මහා රහතුන් විසින් 'ආයස්මා ආනන්දෝ අත්ථකුසලො ධම්මකුසලො ව්‍යඤ්ජනකුසලො නිරුත්ති කුසලො පුබ්බාපරකුසලෝ' ආදී වශයෙන්, ආනන්ද තෙරුන් දහමේ පිළිඹුවක් යයි පැවසුහ. ඒ බස් අසා බමුණා 'දහම් රත්නයට පූජා කරමි' යයි මහත් වූ ආදර බහුමානයෙන් යුතුව ආනන්ද තෙරුන්ට උදාරතර පූජා කෙළේය". **මූලාශ්‍රය: සද්ධම්ම අලංකාරය**, පි. 65: ශ්‍රී ලංකා ප්‍රාචීන භාෂාපකාර සමාගමේ සංස්කරණය.

**2. ආනන්ද මහා රහතුන්ගේ පරිනිබ්බානය**: සද්ධර්-මරත්නාවලිය කතු මේ සේ දක්වා ඇත:

"අනඳ මහ තෙරුන් වහන්සේ එක් සිය විසි හැවිරිදි (120) අවස්ථාවෙහි දී ආයු ශක්තිය බලන සේක් ආයු ගෙවී ගිය නියාව දැන 'මෙයින් සත් වන දවස් පිරිනිවන් පාමි' යි වදාළ සේක. ඒ අසා රෝහිණී නම් ගඟ එතෙර මිනිස්සු 'අපි මහ තෙරුන් වහන්සේට උපකාරීවූහ, අපට ළංව පිරිනිවන් පානා සේක'යි කියති. මෙතර මිනිස්සු 'අපි උපකාරීවූහ. අපට ළංව පිරිනිවන් පානා සේක'යි කියති. මහ තෙරුන් වහන්සේ ඒ අසා ' දෙතෙර ඇත්තෝම උපකාරිවූය. මූ උපකාරිහ, … මූ අනුපකාරිහ යයි කියන්නට බැරිය. ඉදින් මම මෙ තෙරදී වුවත් එතෙරදී වුවත් පිරිනිවියෙම් නම් ධාතු නිසා දෙතෙර ඇත්තෝ කළහ කෙරෙති. කලහයෙක් උපදී නම් මා නිසාම උපදී. සන්හිඳේ නම් මා නිසාම සන්හිඳේ 'යි වදාරා ලා 'මෙ තෙර ඇත්තවුන් මෙ තෙරට ම රැස්වුව මැනව. එ තෙර ඇත්තවුන් එ තෙරට ම රැස්වුව මැනව' යයි වදාළ සේක. ඉක්බිත්තෙන් සත් වන දවස් ගං මැද සත් තලක් පමණ අහස පලක් බැඳ ගෙන වැඩහිඳ බොහෝ දෙනහට බණ වදාරා: ' මගේ ශරීර ධාතු භාගයක් මෙ තෙර වැගිරේව, භාගයක් එ තෙර වැගිරේව' යයි සිතාලා වැඩ හුන්සේක-තෙජො ධාතුවට සමවන් සේක. පිරිනිවෙන්නා ම ශරීරයෙන් නැඟී ගිනි දැලින් ම සම් මස් නහර දා, ධාතු පමණක් වෙන්ව මැන ලුවාක් මෙන් ඉද්ද මල් රැසක් සේ ධාතු භාගයක් මෙ තෙර වැගිරිනා. භාගයක් එ තෙර වැගිරිනා. බොහෝ දෙනාත් හඬා වැගුරුණුවුය. පොළොව පැළි යන කලක් මෙන්විය. බුදුන් පිරිනිවි දවසටත් වඩා වලප් වලාම් මහත් විය. මිනිස්සු ත් 'බුදුන් පිරිනිවියත් අනඳ මහ තෙරුන් වහන්සේ ජීවත්ව සිටි සේක් වී නම් බුදුන් ජීවත් වුවා හා සරිය. බුදුන් පිරිනිවියේ අද' යයි කිය කියා සාර මසක් මුළුල්ලෙහිම හැඬුය."

**මූලාශ්‍රය: සද්ධර්ම රතනාවලිය**, 71 වනවාසික තිස්ස තෙරුන්වහන්සේගේ වස්තුව, පි. 526.

▲**අනුරුද්ධ මහා තෙර-**Anuruddha Thera: දිවැස් ලැබූ භික්ෂූන් අතරෙන් අග්‍ර, මහා අනුරුද්ධ තෙරුන්ය. **මූලාශ්‍ර:** අංගු.නි: (1) 1 නිපාත: එතදග්ග පාළිය සූත්‍ර, පි. 84**,** EAN:1: Foremost, p. 44. **සටහන:** මෙතුමා කපිලවස්තු නුවර, මහානාම ශාක්‍යයන්ගේ බාල සොහොයුරාය, බුදුන් වහන්සේගේ ඥාති සොහොයුරාය, කුමාර සැප ඇති ගිහි ජීවිතයක් ගත කළහ, භද්දිය කාලිගොධා පුත්‍ර, ආනන්ද ආදී ශාක්‍යයන් සමග ගිහිගෙයින් නික්මව පැවිදිවූහ.

▼ **අනුරුද්ධ තෙරුන් සම්බන්ධ අනිකුත් සූත්‍ර**: * සංයු.නි: (1): **බ්‍රහ්මසංයුත්ත:** * 6.1.4 අපරාදිට්ඨි සූත්‍රය, පි:286, බුදුන් වහන්සේ බඹ ලොවට වැඩම කළ අවස්ථාවේ, තෙරුන් එහි පැමිණීම. * 6.2.5 පරිනිබ්බාන සූත්‍රය, පි.308, මහාපරිනිබාන අවස්ථාවේදී බුදුන් වහන්සේ ගේ ගුණ වර්ණනාකිරිම, (**බලන්න**: දීඝ.නි:මහාපරිනිබාන සූත්‍රය). **වනසංයුත්ත**: * 9.1.6 අනුරුද්ධ සූත්‍රය, පි:382, පෙර භවයේ බිරිඳ වූ ජාලිනි නම් තව්තිසා වැසි දෙව්දුව, දෙව්ලොව සැපත් වර්ණනා කරනවිට, තමන් පුනර්භවය අවසන් කලබව පවසා, ඇයට අවවාද කිරීම.

▼ **මේ තෙරුන්** හා කිම්බිල ,නන්දිය තෙරුන් ගෝසිංග වනයේ සුභදව වාසය කිරීම හා උතුම් ආරිය බව ලැබීමේ විස්තර මෙහි දක්වා ඇත. **බලන්න**: නන්දිය තෙර. **මූලාශ්‍රය:** ම.නි: (1) චූළගෝසිංග සූත්‍රය, පි.514.

▼ **මේ තෙරුන්ගේ ථෙර ගාථා**: ඛු.නි: ථෙරගාථා:20.1.10, පි.251

මාපිය, සොහොයුරු, සොහොයුරියන්ද-බොහෝ සැප සම්පත් හා ගිහි ගෙදරද, පෙර ඇලුන පස්කම් සැපද හැර දමා, අනුරුද්ධ, බවුන් වඩයි සතුටින් මහා.

පෙරදී,නැටුම්,ගැයුම්,වැයුම් වල ඇලුනෙමි,ගෙජ්ජි, තාලම් හඬින් පිබුදුනෙමි. මාර පායාස බඳුවූ ඒ කාමයන් තුල, සිතේ නිමල බව නොදිටීමි.

ජාන සුවයෙන් විඳීමි නිරාමිස සතුට.තන්හාව නම්වූ, දෙවැනියා, හැරදමා, මුනි පිඩු සිඟා යයි. වැරහැලි ගෙන, කුණු ගොඩින්, සෝදා, සායම් පොවා මැනවින් ඒ සිවුර පොරවමි, තුටින්,පහකර සියලු ආසාවන්.

ලෝක උත්තර බුදුහිමි, ඉදි බලයෙන්,මා වෙතට පැමිණ අපමණ දයාවෙන්, ලොව්තුරු දහම දෙසුවා මාසිත පහදමින්.

බුදු ඔවා පිළිපදිමින්, තුන් නුවණ ලැබූවෙමි. බුදුසසුන කරනලදී, නිදහසේ, සතුටින් වෙසෙමි.

▼ **අනුරුද්ධ තෙර අපදාන**

"නර ශ්‍රේෂ්ඨ වූ සුමෙධ භාග්‍ය වතුන් වහන්සේට, මම දහසක් වැටි ඇති පහනක් පූජා කෙළෙමි. ඒ පහන සතියක් පුරා දැල්විණි. මට බලවත් චිත්ත ප්‍රසාදයක් ඇතිවිය. පහන් පූජාවේ විපාක වශයෙන් දෙව්ලොව උපන් මාහට, හාත්පස යොදුන් සියයක් බබලවන දෙව් විමනක් පහළවිය. මම තිස් කපයක් ශක්‍ර දෙව් රජ වූවෙමි, බොහෝ වරක්

මිනිස් ලොව සක්විති රජ වූවෙමි, පැවිදිවූ පසුව මට දිවැස් ලැබුණි. ඒ බුදුරදුන්ට කල පහන් පූජාවේ විපාකය ය… මම සියලු කෙළෙස් දවා ත්‍රිවිද්‍යා, අෂ්ට විමොක්ක, ෂඩ්අභිඥා සාක්ෂාත් කරගතිමි. බුදුසසුන කරණ ලදී. **මූලාශ්‍රය:** ඛු.නි: අපදාන පාළි:1: 4 -අනුරුද්ධ තෙර අපදාන, පි. 93.

▲ **අනුරාධ තෙර-**Anurādha Thera: එක්සමයක අන්‍යඅගමිකයන්, මේ තෙරුන්ගෙන් එවක පැවති දිට්ඨි පිළිබඳව විමසා, තෙරුන් පැවසූ කරුනු පිළිනොගෙන, අපවාද කියා පිටව ගියහ. පසුව, මේ තෙරුන් බුදුන් වහන්සේ හමුව එම සිදුවීම ගැන පැවසූ අවස්ථාවේ, බුදුන් වහන්සේ, එම කරුණු පැහැදිලි කිරීම මෙහි විස්තර කර ඇත. **මූලාශ්‍රය:**සංයු.නි: (4): සලායතනවග්ග: 10.1.2 අනුරාධ සූත්‍රය, පි.702.

▼ **තථාගත ගුණ-** ලක්ෂණ පිළිබඳව බුදුන් වහන්සේ මේ සූත්‍රයේදී, අනුරාධ තෙරුන්ට පහදා දී ඇත. **මූලාශ්‍රය:**සංයු.නි: (3): ඛන්ධසංයුත්ත: ථෙරවග්ග:1.2.4.4.අනුරාධ සූත්‍රය, පි.228.

**අභ**

▲ **අභය (රාජකුමාර) තෙර –** Abhaya ( Prince) Thera: මගධයේ බිම්බිසාර රජතුමාගේ පුතෙකි, මුල්කල නිගණ්ඨනාථ පුත්‍රගේ අනුගාමිකයෙකි. බුදුන් වහන්සේ , වදාළ මේ සූත්‍රය අසා බුදුන් සරණගියහ, පැවිදිව අරහත්වය ලැබුහ. **සටහන:** මෙතුමා ගිහිව සිටිකාලයේ ජීවක කෝමාරභච්ච වෛද්‍යවරයා, ළදරු කාලයේදී හදාවඩා ගෙන ඇත. **මූලාශ්‍ර:** ම.නි: (2) අභයරාජකුමාර සූත්‍රය, EMN:58 Abhayarājakumāra Sutta.

▼ **බුදුන් වහන්සේ වදාළ** බොජ්ඣංග ධර්මය අසා, කයේ හා සිතේ විඩාව පහවූ බවද, ධර්මය අවබෝධ කළබවද මෙහි දක්වා ඇත. **මූලාශ්‍රය:** සංයු.නි: (5-1): මහාවග්ග: බොජ්ඣංග සංයුත්ත:2.6.6. අභය සූත්‍රය, පි. 262.

▼ **මේ තෙරුන්ගේ ථෙර ගාථා:** ඛු.නි: ථෙර ගාථා:1.3.6, පි.48.

“ සූරිය බන්ධු වූ බුදු රජාණන්වහන්සේගේ සුභාෂිතය අසා, දක්‍ෂ දුනුවායෙක් වලග හීයෙන් විදුනාක් මෙන් සියුම් වූ නිරෝධ සත්‍ය අවබෝධ කෙළෙමි”.

▼ **මේ තෙරුන්ගේ අපදානය:** ඛු.නි: අපදාන පාලිය; 2-1: 547, පි.398: හංසවතී නුවර වේදයේ පරතෙරට පත් බ්‍රාහ්මණයෙක්ව, පදුමුත්තර බුදුන් වහන්සේ දැක පැහැද පැවිදිවීම, බුදුගුණ වැනිම, යහපත් පිං බලයෙන් නොයෙක්වර දෙව් මිනිස් සැප ලැබීම, ගෝතම බුදුන් දවස රජගහ නුවර බිම්බිසාර රජුගේ පුතෙක්ව උපත ලැබීම ආදී විස්තර මෙහි දක්වා ඇත.

“පාප මිත්‍ර ආශ්‍රය නිසා නිගණ්ඨනාථ විසින් මෙහෙය වනු ලදුව මම බුදුන් වහන්සේ වෙත එළඹ බුදුන් වහන්සේගෙන් ප්‍රශ්න විචාරා, උන්වහන්සේගේ උතුම් විසඳිම අසා පැවිදිව, නොබෝ කලකින්ම රහත්බවට පැමිණියෙමි”.

▲ **ආභිඥජික භික්ෂුව-** Abhignaka Bhikkhu: ආභිඥජික භික්ෂුව අනුරුද්ධ තෙරුන්ගේ ශිෂ්‍යයෙකි. ඔහුට දහම් කථා කිරීම ගැන මානයක්

තිබුනබවද, බුදුන් වහන්සේගේ අවවාද අසා, සමාව ගෙන යහපත්වූ බව මෙහි දක්වා ඇත. **මූලාශ්‍ර**: සංයු.නි: (2): නිදානවග්ග:කස්සපසංයුත්ත: ඕවාද සූත්‍ර 3 කි, පි. 332, ESN:16: Kassapasamyutta: Ekhortation 3 suttas, p. 813.

**අර**

▲**අරිට්ඨ තෙර-**Ariṭṭha Thera: අනාපාන සතිය වඩාගැනීමෙන් මේ තෙරුන් අනාගාමී මගඵල ලබාගත් බව මෙහි පෙන්වා ඇත. බුදුන් වහන්සේ, ඔහුට අරහත් මගඵල ලබාගැනීම පිණිස ආනාපානසතිය විදර්ශනාව ලෙසින් පුහුණු කලයුතු ආකාරය පෙන්වා ඇත. **බලන්න:** ESN:note: 294, p. 2423. **සටහන**: මේ තෙරුන්**,** අලගද්දූපම සූත්‍රයේ සඳහන්, සසුන හැර ගිය අරිට්ඨ භික්ෂුව නොවේ. **මූලාශ්‍රය:**සංයු.නි: (5-2): මහාවග්ග: අනාපානසංයුත්ත:ඒකධම්මවග්ග:10.1.6 අරිට්ඨසූත්‍රය, පි.120, ESN:54: Anapanasathisamyutta:6.6. Ariṭṭha, p.2157.

**අස**

▲ **අස්සජි තෙර -**Assaji Thera: මේ සූත්‍රයේ දී, මේ තෙරුන් බලවත් ලෙසින් ගිලන්ව සිටින අවස්ථාවේ, බුදුන් වහන්සේ, එම තෙරුන්ට දහම් දේශනා කල බව පෙන්වා ඇත. **සටහන්:** * අටුවාවට අනුව, ත්‍රිලක්ෂණය පිලිබඳ දහම අවබෝධ කරගත් මේ තෙරුන් අරහත්වයට පත්විය. **බලන්න:** ESN:note:175, p.1193. **මූලාශ්‍ර**:සංයු.නි: (3):ඛන්ධසංයුත්ත: ථෙරවග්ග: 1.2.4.6 අස්සජි සූත්‍රය, පි.242, ESN: 22: Kahndasamyutta: 88.6 Assaji, p.1078.

▲**අස්සජි තෙර-පස්වග-** Assaji Thera- pasvaga: මෙතුමා, පස්වග මහණුන්ගෙන් බාලයාය. සිදුහත් තවුසන්ට ඉසිපතනයේදී සත්කාර කළහ. අනත්තලක්ඛන සූත්‍රය අසා අරහත්වයට පත්වුහ. උපතිස්ස පරිබ්‍රාජකයා (සැරියුත් මහා තෙර), අස්සජි තෙරුන් දෙසු ගාථාවක් අසා සෝතාපන්න බවට පත්වුහ. උන්වහන්සේ වදාළ උතුම් ගාථාව:

**"යෙ ධම්මා හෙතුප්පභවා තෙසං හෙතුං තථාගතො ආහ**

**තෙසඤ්ච යො නිරොධො එවංවාදී මහාසමණො"**

හේතුවෙන් උපදින යම් ධර්මයක් වෙත්ද, ඔවුන්ගේ හේතුව තථාගතතෙමේ වදාළේය. ඒ ධම්මතාවල යම් නිරෝධයක් වේද, එයද වදාළේය.මහා ශ්‍රමණතෙමේ මෙබඳු වාද ඇත්තේය. **බලන්න**: මහාවග්ග 1: 84 සාරිපුත්ත මොග්ගල්ලාන පබ්බජා, පි. 160. **මූලාශ්‍රය:** වි.පි:මහා වග්ග :1: මහාඛන්ධක: 14 පංච වග්ගිය කථා, පි. 90.

▲ **අසුරින්දක භාරද්වාජ තෙර-**Asurindika bhradvaja Theraල: රජගහනුවර බ්‍රාහ්මණ කුලයක උපත ලැබූ මොහු, තම කුලයේ අය බුදුන් වහන්සේ සමීපයෙහි පැවිදිවූ බව අසා නොසතුටුවිය. තමන්ගේ කෝපය පලකිරිමට බුදුන් වහන්සේ වෙත පැමිණි මොහුට බුදුන් වහන්සේ මෙසේ වදාළහ: **" අනුවණ තැනැත්තා පරුෂ වචන කියමින් එය තමාට ජයක් ලෙස සලකයි. ඉවසීමේ ගුණ දන්නා අය ඉවසීම නිසා ජය ගනී"**

බුදුන් වහන්සේගේ දේශනාව අසා පැහැදුන මෙතුමා, පැවිදිව අරහත්වය ලබා ගත්බව මෙහි දක්වා ඇත. **මූලාශ්‍රය:** සංයු.නි (1) :සගාථවග්ග: බ්‍රාහ්මණ සංයුත්ත: අසුරින්දක සූත්‍රය, පි.318.

**අශ**

▲ **අශෝක තෙර-** Asoka Thera:බුදුන් වහන්සේ වැඩසිටි සමයේ, ඤාතගමේ විසූ මේ තෙරුන් අරහත්ව, පිරිනිවන් පෑ බව මෙහි දක්වා ඇත. **මූලාශ්‍රය**:සංයු.නි: (5-2) මහාවග්ග: සෝතාපත්තිසංයුත්ත:11.1.8 හා 11.1.9,11.1.10 ගිඤ්ජකාවසථ සූත්‍ර, පි.184.

**අහ**

▲ **අහිංසක භාරද්වාජ තෙර-** Ahinsaka Bharadvaja Thera**:** සැවැත්නුවර බ්‍රාහ්මණයෙක් වූ මෙතෙම බුදුන් වහන්සේ බැහැදැක තමාගේ නම අහිංසක බව පැවසිය, එවිට බුදුන් වහන්සේ මෙසේ වදාළහ:

" ඔබ ගේ නම යම්සේද, ඔබත් එසේම් වන්නේ නම් ඔබ අහිංසකම වේ. කෙනෙක් කයෙන්, වචනයෙන් හා සිතින් හිංසා නොකරන්නේද, හෙතම ඒකාන්තයෙන්ම අහිංසකයෙක් වේ". බුදුවදන් අසා බැති උපදවාගත් මෙතුමා පැවිදිව, අරහත්වය ලැබුබව මෙහි දක්වා ඇත. **මූලාශ්‍රය:** සංයු.නි (1) :සගාථවග්ග: බ්‍රාහ්මණසංයුත්ත: 7.1.5 අහිංසක සූත්‍රය, පි.320.

**ඉ**

**ඉස**

▲ **ඉසිදත්ත තෙර-**Isidattha Thera: අවන්ති දනව්වේ ඉසිදත්ත තෙරුන් ධම්ම කථික බව, ආරියබව ලබාගෙන ඇතිබව, එතුමන් හා මච්ඡිකාසණ්ඩයෙ චිත්ත ගහපති අතර දහම පිලිබඳ පැවති සාකච්ඡා වලින් පෙන්වා ඇත. ඉසිදත්ත තෙරුන්, ඒ ගහපතිගේ නුදුටු මිත්‍රයෙක් බව වටහා ගත් චිත්ත ගහපති, ඔහු විසින් සංඝයාහට පූජාකල අම්බාටක වනයේ වාසය කිරීමට, උන්වහන්සේට, සිව්පසයෙන් සංග්‍රහ කිරීමට ආරාධනා කළහ. එහෙත්, ඉසිදත්ත තෙරුන් පසුදිනම, මච්ඡිකාසණ්ඩ පෙදෙසින් ආපසු ගිය බව මෙහි දක්වා ඇත. **සටහන**: මෙහි, ඉසිදත්ත තේරුන්: ධාතු නානත්වය, ශාස්වත දිට්ඨිය, සක්කාය දිට්ඨිය ගැන කරන ලද ධර්ම දේශනා විස්තරාත්මකව දක්වා ඇත. **මූලාශ්‍රය**: සංයු.නි: (4) සළායතනවග්ග: චිත්තසංයුත්ත:ඉසිදත්ත සූත්‍රය2,පි.550.

▼ **මේ තෙරුන්ගේ ථෙර ගාථා**: ඛු.නි: ථෙරගාථා:1.12.10, පි.84.

"පංචස්කන්ධය මාවිසින් පරිඥාවෙන් අවබෝධ කරගතිමි, ඔවුන්ගේ මුල් සුන්කර ඇත, මා විසින් දුකක්‍ෂය කර, නිවන ලබනලදී, ආසව ක්‍ෂය කර අරහත්වය ලබනලදී".

▲ **ඉසිදාස හා ඉසිභද්ද තෙරුන්**-Isidasa & Isibhadda Theras: සැවැත්නුවර විසූ මෙ තෙරුන් දෙසොහොයුරන් බව මෙහි දක්වා ඇත. **මූලාශ්‍ර:** වි.පි:මහාවග්ග:චීවරඛන්ධ: 29, පි.224.

**උ**

**උත**

▲ **උත්තිය තෙර-** Uttiya Thera: මේ තෙරුන් බුදුන් වහන්සේගෙන් පංචකාම ගුණ පිලිබඳ විමසීම මෙහි දක්වා ඇත. **මූලාශ්‍ර:** සං.නි:(5-1 ): මග්ග සංයුත්ත: 1.3.10 උත්තිය සූත්‍රය, පි. 63 හා 1.16 කාමගුණ සූත්‍රය**,** පි. 162, ESN: 45: Maggasamyutta: 30.10 Uttiya, p. 1636 & 176.6 Cords of Sensual pleasures, p. 1723.

▼ **මේ තෙරුන්ගේ ථෙර ගාථා**: ඛු.නි: ථෙරගාථා:1.3.10 පි.48, 2.1.1, පි.86: " මට ආබාධයක් උපන් කල්හි 'මට ආබාධයක් ඇතිවිය, නො පමාවන්ට කල් පැමිණ ඇත' යයි මට සිහිය ඇතිවිය".

උද

▲**උදය (මානවක)** තෙර- Udaya Thera: බාවරී බ්‍රාහ්මණ ගේ සිසුවූ මෙතුමා, නිවනගැන බුදුන් වහන්සේ විමසීම හා උන්වහන්සේ වදාළ පිළිතුරු මෙහි දක්වා ඇත.

**"උදය, ලෝකසත්‍වයා තණ්හාව සංයෝජන කොට සිටිති, විතර්-ක ඔහුට විචාරණය වේ, ඒ තණ්හාවේ වීප්‍රහාණය නිවන යයි කියනු ලැබේ".**

**සටහන:** මෙතුමා ඇතුළු, බවාරි බ්‍රාහ්මණගේ සිසුන් හැම දෙන දහම අසා පැවිදිවූහ. **මූලාශ්‍රය:** ඛු.නි.සුත්තනිපාත:පාරායනවග්ග:වස්තුගාථා: පි,326, 5-13 උදයමානවක, පි.360.

▲**උදායි තෙර-**Udayi Thera: බුදුන් වහන්සේගේ මුල් සමයේ ශ්‍රාවකයෙකි. මේ තෙරුන් බුදුගුණ වැනිම, අංගු.නි:6 නිපාතය: ධම්මික වග්ග: 6.1.5.1 නාගසූත්‍රයේ (පි.126 )පෙන්වා ඇත. එම ගාථා පෙල, තෙරුන්ගේ ථෙරගාථාවල ද දක්වා ඇත.

▼ **උදායි තෙරුන්** විසින් අරහත්වය පිලිබඳ වදාළ දේශනය අසා, වෙරහච්චානි බ්‍රාහ්මණිය බුදුන් සරණ ගිය උපාසිකාවක් වුවාය. **මූලාශ්‍රය**: සංයු.නි: (4): සළායතනසංයුත්ත: ගහපතිවග්ග:1.13.10 වෙරහච්චානි සූත්‍රය, පි. 272.

▼ **බුදුන් වහන්සේ, මේ තෙරුන්ට,** අනුස්මෘති ස්ථාන 6 ගැන මෙහිදී පෙන්වා ඇත. **බලන්න**: අනුස්සති ස්ථාන සය. **මූලාශ්‍රය**: අංගු.නි: (4) 6 නිපාත:අනුත්තරිය වග්ග: 6.1.3.9 උදායි සූත්‍රය, පි.88.

▼ **මේ තෙරුන්ගේ ථෙර ගාථා**: ඛු.නි: ථෙරගාථා:16.1.2 , පි.216.

"ඒ බුද්ධනාග තෙමේ ඒ කාන්තයෙන්ම අන්‍ය පර්වත ඉක්මා ඇති හිමවත පව්ව මෙන් අත්‍යයන්තෙයින්ම බබලයි, නාග නාමය ඇති සියල්ල අතරින් නිරුත්තර සත්‍ය නාමය ඇත්තේය".

▲ **උදෙන තෙර-** Udena Thera: බුදුන් වහන්සේගේ මහා පරිනිර්වාණයෙන් පසු මේ තෙරුන්, බරණැස්නුවර ඛේමිය අඹවනයේ වැඩවිසූ බව මෙහි දක්වා ඇත. එහිදී, ඝොටමුඛ බ්‍රාහ්මණයාට මේ සූත්‍රය දේශනාකර ඔහු ගිහි ශ්‍රාවකයකු බවට පත්කරනලදී. **මූලාශ්‍රය:** ම.නි: (2) 2.5.4 ඝොටමුඛ සූත්‍රය, පි.644.

▼**මේ තෙරුන්ගේ අපදානය:** 410:පි.70.

පදුමුත්තර බුදුන් සමයේ හිමවත තපස්කම් කිරීම, බුදුන් වහන්සේ බැහැදැක අමතපදය පිලිබඳ වදාළ දේශනාව අස මහා සතුටට පත්වීම, බොහෝ සැපවත් ජීවිත ගතකර අවසානයේදී ගෝතම බුදුන් වහන්සේ වෙත පැවිදිව නිවන සාක්ෂාත් කරගැනීම මෙහි විස්තර කර ඇත.

**උප**

▲ **උපක තෙර-** Upaka Thera: බුද්ධත්වය ලබා, පස්වග තවුසන්හට දහම් දෙසීමට ඉසිපතනයට යන අතර මග දී බුදුන් වහන්සේ හමුවූ උපක ආජීවක, බුදුන් වහන්සේගේ උතුම්බව ගැන පැහැදුනද, ඒ අවස්ථාවේ දහම අවබෝධකිරීමට නොහැකිව ගිහි ජීවිතයකට පත්විය. ගිහි ගෙදර දුක් දැක, ආපසු පැමිණ බුදුන්වහන්සේ වෙත පැවිදිවුහ. අනාගාමිව අපවත්වූ මේ තෙරුන්, අවිහ බ්‍රහ්මලෝකයේ උපත ලැබූ බව සටිකාර බ්‍රහ්මරාජ බුදුන් වහන්සේට පවසා ඇත. **මූලාශ්‍ර:** වින.පි: මහාවග්ග පාලිය: 1: පංචවග්ගියකථා, පි.17, සංයු.නි: (1): දේවතා සංයුත්ත:1.5.10 සටිකාරසූත්‍රය, පි.88, දේවපුත්‍රසංයුත්ත:2.3.4 සටිකාර සූත්‍රය, පි.140, ම.නි: (1) ආරියපරියේසන සූත්‍රය.

▲ **උපචාල තෙර-** Upachala Thera: මේ තෙරුන් බුදුන් වහන්සේගේ ජේෂ්ඨ ශ්‍රාවකයෙක්ය, උන්වහන්සේ විසාලානුවර, මහවනයේ කූටාගාර ශාලාවේ වැඩවසන සමයේ එහි වාසය කලබව මෙහි දක්වා ඇත. මෙතුමන් හා පිරිස, නිසලබව අගය කරන,ධ්‍යාන වඩන සංඝයාය. **මූලාශ්‍රය:**අංගු.නි: (6) 10 නිපාත:යමකවග්ග: 10.2.3.2 කණ්ටක සූත්‍රය, පි.268.

▲ **උපනන්ද තෙර**-Upananda Thera: මේ තෙරුන් වස්වසා අවසන් කර, ගමින් ගමට යමින් බොහෝ සිවුරු රැස්කරගැනීම හා ඒ පිලිබඳව බුදුන් වහන්සේ අවවාද කිරීම මෙහි දක්වා ඇත.**මූලාශ්‍රය:**වි.පි:මහාවග්ග පාලිය2,චීවරඛන්ධ,32,පි.226.

▲ **උපාලි මහා තෙර-** Upāli Maha Thera: මෙතුමා, විනයධර භික්ෂූන් අතරෙන් අග්‍රය යි බුදුන් වහන්සේ වදාළහ. කපිල්වස්තුවේ, කරණවැමියෙක්ව සිට, අනුරුද්ධ, ආනන්ද ආදී ශාක්‍යයන් හා එක්ව පැවිදිවුහ. මෙතුමන්ගේ විනය පිලිබඳ කුසලතාවය, විනය පිටකයේ විස්තර කර ඇත. **බලන්න:**EAN:note: 109,p.586. **මූලාශ්‍ර:** අංගු.නි: (1) 1 නිපාත: එතදග්ග පාළිය සූත්‍ර, පි. 84**,** EAN:1: Foremost, p. 44.

▼ **මේ තෙරුන්ගේ ථෙර ගාථා**: ඛු.නි: ථෙරගාථා:3.1.11, පි.122. "සැදැහයෙන් ගිගිගෙයින් නික්ම පැවිදිවූ නවක මහණ සම්මා ආජීවය ඇතිව, ආරබ්ධ වීරිය ඇතිව කලණ මිතුරන් සේවනය කරමින්...සංඝයා අතර වෙසෙමින් විනය ඉගෙන ගන්නේය".

▼ **මේ තෙරුන්ගේ අපදානය:** ඛු.නි: අපදානපාලි 1: 6, පි.96.

"පදුමුත්තර බුදුන් වහන්සේ වැඩසිටි කල, හංසවතී නුවර මම, බොහෝ ධනය ඇති සුජාත නම් බ්‍රාහ්මණයෙක්වූ වෙමි. එහිදී සුනන්ද නම් තවුසෙක්, බොහෝ මල් ගෙන බුදු පිරිස වැඩසිටි තැන් මලින් වැසුහ. අනුමෝදනා වදාළ බුදුන් වහන්සේ, ඒ තවුසා මතුකල ගෝතම බුදුන් සමයේ පුණ්ණ මන්තානි පුත්ත ලෙසින් බුද්ධ ශ්‍රාවකයෙක් වෙන බව පැවසුහ. ඒ අසා මටද ඒ බුදුන් වහන්සේ දැකීමට සිත් ඇතිව බුදුන්

වහන්සේට සුන්දර ආරාමයක් පූජා කෙළෙමි. අනුමෝදානා වදාරන අවස්ථාවේදී, බුදුන් වහන්සේ මම උපාලි නම් බුද්ධ ශ්‍රාවකයෙක් වන බවද විනයෙ කෙළපැමිණෙන බවද පැවසූහ" **සටහන**: පෙර භවයකදී , රාජ කුමරෙයෙක්ව, දේවාල නම් පසේබුදුන් වහන්සේටට හිංසා කිරීම නිසා, පාප කම්ම විපාක ලෙසින් මේ ජාතියේදී තමා කරණවැමි (කපු) කුලයක උපත ලද බව මේ තෙරුන්ගේ අපදානයේ දක්වා ඇත.

▲**උපවාන තෙර**- Upavāṇa Thera: මේ තෙරුන්, බුදුන් වහන්සේගේ පැවිදි උපස්ථායෙක්වූහ. බුදුන් වහන්සේ ගිලන්වූ අවස්ථාවක උන්වහන්සේ උණුදියෙන් නාවා සාත්තුකර, සුවපත් කිරීමේ විස්තරය මේ සූත්‍රයේ පෙන්වා ඇත. **බලන්න**:සංයු.නි: බ්‍රාහ්මණසංයුත්ත:7.2.3 දෙවහිත සූත්‍රය, පි.338. **සටහන්:** බුදුන් වහන්සේ පරිනිබ්බානයට පත්වෙන අවස්ථාවේදී උපවාන තෙර, උන්වහන්සේ අසල සිටිබව මහාපරිනිබ්බාන සූත්‍රයේ දක්වා ඇත. ** මේ තෙරුන් සම්බන්ධ **වෙනත් සූත්‍ර**: සංයු.නි: සළායතන සංයුත්ත: 1.7.8 උපවාන සූත්‍රය, පි. 118.

▼ **මේ තෙරුන්ගේ ථෙර ගාථා**: බු.නි: ථෙරගාථා:2.4.8 පි.104. " ඒ බුදුරජුන්, පූජ්‍යයන් විසින් පුදන ලදහ, සත්කාර කරන්නන් විසින් සත්කාර කරන ලදහ, වඳින අය විසින් වන්දනා කරන ලදහ".

▼ **මේ තෙරුන්ගේ අපදානය**: බු.නි:අපදාන පාළිය1: 22,පි.154.

"පදුමුත්තර බුදුන් වහන්සේ පිරිනිවිගිය කල දෙවියන් ඇතුළු මිනිසුන්, එතුමන්ගේ ධාතු තැන්පත් කිරිමට අගනා ස්තූප ඉදිකලහ. එකල්හි මම හංසවතී නුවර සේවකයෙක්ව සිටියෙමි. සතුටුවන ජනයා දැක මමද ඒ බුදුන් වහන්සේගේ ස්තූපයට, මගේ උතුරු සළුව සෝදා, උණබටයක එල්වා කොඩියක් ලෙසින් සිටුවා තැබිය. එම අවස්ථාවේ, අභිසම්මත නම් යක්ෂයෙක්, ඒ ධජය අහසෙහි එල්වා තැබිය, මට බොහෝ සතුටක් ඇතිවිය. එහිසිටි භික්ෂුන්වහන්සේ සමීපයට පැමිණ, උන්වහන්සේගෙන් මගේ ධජ දානයේ විපාක ඇසුවෙමි. දෙව් මිනිස් සැප බොහෝ කලක් ලැබෙන බව පැවසූ එතුමා, මතු පහළවන ගෝතම බුදුන් සමයේ බොහෝ සම්පත් හැර බුද්ධ ශ්‍රාවකයකු වන බව වදාළහ".

▲ **උපසේන වංගනාථපුත්ත තෙර**- Upasena Vaṅgantaputta Thera: සැම ආකාරයෙන්ම විශ්වාසය ඇති කරන-සමන්තපාසාදීකානං -භික්ෂුන් අතරෙන් අග්‍ර මේ තෙරුන්ය. මෙතුමා, සැරියුත් මහා තෙරුන්ගේ බාල සොහොයුරෙකි. **බලන්න**:EAN: note: 96,p.585. **මූලාශ්‍ර:** අංගු.නි: (1) 1 නිපාත: එතදග්ග පාළිය සූත්‍ර, පි. 84**,** EAN:1: Foremost, p. 44.

▼ **මේ තෙරුන්** බුදුන් වහන්සේගේ ගුණ, තමන් ලබා ගත් අරහත්වය ගැන ආවර්-ජනා කරන අවස්ථාවේදී, ඒ බව දත් බුදුන් වහන්සේ මේ උදානය වදාළහ:

" මුල් සුන් කළ භව තන්හාව ඇති, සංසුන් සිත් ඇති මහණගේ ජාති ආදී සංසාරය වෙසෙසින්ම ක්ෂීණවිය, ඔහුට පුනර්භවයක් නැත". **මූලාශ්‍රය:**බු.නි:උදාන පාළිය: 4.9 උපසේන සූත්‍රය, පි. 246.

▼ **මේ තෙරුන්,** විසකුරු සර්පයෙක් දෂ්ඨ කර මියයාම මෙහිදී දක්වා ඇත. ඒ අවස්ථාවේ දී මේ තෙරුන්, සෙසු සංඝයා අමතා මෙසේ වදාළහ:

“ඇවත්නි, මෙහි පැමිණෙන්න, මේ කය බොල්මිටක් මෙන් විසිරිමට පෙර මගේ මේ කය ඇඳක තබා බැහැරට ගෙනයන්න”.ඒ අවස්ථාවේ එහි වැඩසිටි සැරියුත් මහා තෙරුන්, උපසේන තෙරුන්ගේ කයේ හෝ ඉන්ද්‍රියන් ගේ වෙනස්කමක් පෙනීමට නැති නිසා ඒ පිළිබඳව විමසුවිට, උපසේන තෙරුන් මෙසේ වදාළහ”

“ඇවැත් සාරිපුත්‍රයෙනි, කෙනක්, ඇස මමය, මාගේය කියා (එලෙස සෙසු ඉන්ද්‍රියන්ද) එබඳු සිතක් ඇත්නම්, ඉඳුරන්ගේ වෙනස්වීම ඒකාන්තයෙන්ම වන්නේය. මට එබඳු සිතක් නොමැත, එනිසා ඉඳුරන්ගේ වෙනස්වීමක් නොවන්නේය”. සැරියුත් තෙරුන් මෙසේ වදාළහ:

“ ඒ එසේමය, ආයුෂ්මත් උපසේනයන් විසින් දිගු කලක සිට, අහංකාර දිට්ඨිය, මමංකාර තණ්හාව, හා මානඅනුසය මැනවින් නසන ලදහ.ඒ නිසා ඇස ආදිය… මමය මාගේ කියා දිට්ඨියක් ඔබට නැත”. **මූලාශ්‍රය:** සංයු.නි: (4) සළායතනසංයුත්ත: මිගජාලවග්ග: 1.7.7. උපසේන සූත්‍ර, පි.116.

▼ **මේ තෙරුන්ගේ ථෙර ගාථා**: ඛු.නි: ථෙරගාථා:10.1.6. පි.194.

“ … මහණ තෙම ජනශූන්‍ය… වනසේනාසනයන්හි වාසය කරයි...කසළ ගොඩින් ද සොහොනින්ද… අසුලා ගෙනවුත් රළු සිවුරු දරන්නේය…’

▼ **මේ තෙරුන්ගේ අපදානය**: ඛු.නි:අපදාන පාලිය 1: 17, පි. 139.: පදුමුත්තර බුදුන් වහන්සේට බැතියෙන් කිණිහිරි මලක් හා දන් පූජා කිරීමේ කුසල විපාක ලෙසින් බොහෝ ජාතිවල දෙව් සැප විඳ ඇත.

▲ **උපසීව තෙර**-Upasiva Thera: බාවරී බ්‍රාහ්මණ ගේ සිසුවූ මොහු, චතුඕඝතරණය ගැන බුදුන් වහන්සේ ගෙන් විමසුහ. බුදුන් වහන්සේ වදාළ දහම අසා පැහැදී බුදුන් සරණ ගියහ. **බලන්න**: අනුපාදාපරිනිර්වාණය, ආකිඤ්චඤ්ඤායතන සමාපත්තිය. **මූලාශ්‍රය**: ඛු.නි.සුත්තනිපාත: පාරායනවග්ග:වස්තුගාථා: පි,326, 5-6 උපසීවමානවක, පි.348.

▼ **මේ තෙරුන්ගේ අපදානය**: ඛු.නි:අපදාන පාලිය 2-1: 405, පි.36. පදුමුත්තර බුදුන් වහන්සේ දවස, හිමවත අනෝම නම් පව්වේ බොහෝ සිසුන් ඇති තවුසෙක් ලෙසින් වාසය කිරීම, බුදුන් වහන්සේට දාන පූජා කිරීම, ඒ පින් බලයෙන් බොහෝ සැප විඳ ගෝතම බුදුන් සමයේ උපත ලැබීම, පැවිදිවීම මෙහි දක්වා ඇත.

“මම ඒ ලෝකනායකයන් වහන්සේ දිටිමි, මා විසින් මැනවින් ලැබියයුතු ලාභය ලබන ලදී...බුදු සසුන කරන ලදී”.

උර

▲ **උරුවෙල කස්සප තෙර** -Uruvelakassapa Thera: මහා පිරිවර **-**මහා පිරිස-ඇති භික්ෂූන් අතරෙන් මෙතුමා අග්‍රයයි බුදුන් වහන්සේ වදාළහ. බුදුන් සරණයෑමට පෙර මෙතුමා ජටිල තවුසෙකි, දහසක් පිරිවර සිටියහ, නදී කාශ්‍යප හා ගයා කාශ්‍යප බාල සොහොයුරන්ය. පළමුව, මානය නිසා බුදුන් වහන්සේ පිළිනොගත්හ. පසුව බුදුන් වහන්සේගේ අසිරිමත්බව දැක, බැතිසිත උපදවා, තම සොහොයුරන් හා මහා පිරිසක් සමග පැවිදිවූහ.**බලන්න**: EAN: note: 105, p.585.

**මූලාශ්‍ර:** අංගු.නි: (1) 1 නිපාත: එතදග්ග පාළිය සූත්‍ර, පි. 84**,** EAN:1: Foremost, p. 44, වින.පි.මහාවග්ග: උරුවෙල පටිහාරිය කථා, පි.127.

▼ **මේ තෙරුන්ගේ ථෙර ගාථා:** ඛු.නි: ථෙරගාථා:6.1.1. පි.152.

"පෙරදී, පතළ කීර්තිය ඇති ගොයුම්ගොත් බුදු රදුන්ගේ පෙළහර දැක ඉරිසියාවෙන් හා මානයෙන් පෙලුනෙමි...මම යම් අර්ථයක් පිණිස සසුනේ පැවිදිවිද, සියලු සංයෝජන ක්ෂයවූ ඒ නිවන මා විසින් ලබනලදී".

▼ **මේ තෙරුන්ගේ අපදානය:** ඛු.නි: අපදාන පාලිය 2-1:538, පි.350. පදුමුත්තර බුදුන් දවස හංසවති නුවර බ්‍රාහ්මණයෙක්ව සිට, බුදුන් වහන්සේ බැහැදැක දහම් අසා සතුටට පත්වීම, මහා පිරිසට අග්‍ර තෙරනමක් දැක ඒ තනතුර පැතීම, ඵුස්ස බුදුන් වහන්සේ ට සොහොයුරන් සමග උපස්ථානය කිරීම, පුණ්‍ය කම්ම බලයෙන් බොහෝ දෙව් මිනිස් සැප ලබා අන්තිම භවයේදී, බරණැස මහා බමුණු කුලයක උපත ලබා ජටිල තවුසෙක්වීම, ගෝතම බුදුන් වහන්සේගේ දහම අසා සසර දුක නිමාකර ගැනීම මෙහි විස්තර කර ඇත.

**ක**

**කක**

▲**කක්කට තෙර-** Kakkaṭa Thera: මේ තෙරුන් බුදුන් වහන්සේගේ ජේෂ්ඨ ශ්‍රාවකයෙක්ය, උන්වහන්සේ විසාලානුවර, මහවනයේ කූටාගාර ශාලාවේ වැඩවසන සමයේ එහි වාසය කලබව මෙහි දක්වා ඇත. මෙතුමන් හා පිරිස, නිසලබව අගය කරන,ධ්‍යාන වඩන සංඝයාය. **මූලාශ්‍රය**:අංගු.නි: (6) 10 නිපාත:යමකවග්ග: 10.2.3.2 කණ්ටක සූත්‍රය, පි.268.

▲ **කෝකාලික භික්ෂුව-** Bhikkhu Kokālika: මේ භික්ෂුව, අගසව් දෙනමට ආරිය උපවාදය කිරීම නිසා නිරයේ යළි උපත ලැබිය. **බලන්න**: ආරිය උපවාදය. **මූලාශ්‍ර**: අංගු.නි: (6 ): 10 නිපාතය: 10.2.4.9 කොකාලික සූත්‍රය, පි. 332, EAN: 10: 89.9 Kokālika, p. 530.

**කච**

▲**කච්චාන ගොත්ත තෙර -**Kachchana Thera:මේ තෙරුන්, බුදුන් වහන්සේගෙන් සම්මා දිට්ඨිය පිලිබඳ විමසීම මෙහි දක්වා ඇත. **මූලාශ්‍ර:** සංයු.නි: (2 ):නිදානවග්ග: අභිසමයසංයුත්ත: 1.2.5 කච්චාන ගොත්ත සූත්‍රය, පි.50.

**කඨ**

▲ **කඨ තෙර-**Kaṭa Thera: මේ තෙරුන් බුදුන් වහන්සේගේ ජේෂ්ඨ ශ්‍රාවකයෙක්ය, උන්වහන්සේ විසාලානුවර, මහවනයේ කූටාගාර ශාලාවේ වැඩවසන සමයේ එහි වාසය කලබව මෙහි දක්වා ඇත. මෙතුමන් හා පිරිස, නිසලබව අගය කරන,ධ්‍යාන වඩන සංඝයාය. **මූලාශ්‍රය:**අංගු.නි: (6) 10 නිපාත:යමකවග්ග: 10.2.3.2 කණ්ටක සූත්‍රය, පි.268.

▲**කටිම්භ තෙර-**Kaṭimbha Thera: මේ තෙරුන් බුදුන් වහන්සේගේ ජේෂ්ඨ ශ්‍රාවකයෙක්ය, උන්වහන්සේ විසාලානුවර, මහවනයේ කූටාගාර ශාලාවේ වැඩවසන සමයේ එහි වාසය කලබව මෙහි දක්වා ඇත. මෙතුමන් හා පිරිස, නිසලබව අගය කරන,ධ්‍යාන වඩන සංඝයාය. **මූලාශ්‍රය:**අංගු.නි: (6) 10 නිපාත:යමකවග්ග: 10.2.3.2 කණ්ටක සූත්‍රය, පි.268.

▲**කටිස්සංඝ තෙර-** Kaṭissaṅga Thera: මේ තෙරුන් බුදුන් වහන්සේගේ ජේෂ්ඨ ශ්‍රාවකයෙක්ය, උන්වහන්සේ විසාලානුවර, මහවනයේ කූටාගාර ශාලාවේ වැඩවසන සමයේ එහි වාසය කලබව මෙහි දක්වා ඇත. මෙතුමන් හා පිරිස, නිසලබව අගය කරන,ධ්‍යාන වඩන සංඝයාය. **මූලාශ්‍රය:**අංගු.නි: (6) 10 නිපාත:යමකවග්ග: 10.2.3.2 කණ්ටක සූත්‍රය, පි.268.

**කඞ**

▲ **කඞ්ඛාරේවත තෙර-** Kaṅkhārevata Thera

: සැවත්නුවර ධනවත් පවුලක උපත ලබා, පැවිදිවිය. ආනන්ද හා අනුරුද්ධ තෙරුන්ගේ මිත්‍රයෙකි. ධ්‍යානයෙහි ඇලුන භික්ෂූන් අතරෙන් කඞ්ඛා රේවත තෙරුන් අග්‍රවේ. **බලන්න**: EAN:note: 87, p.585. **මූලාශ්‍ර:** අංගු.නි: (1) 1 නිපාත: එතදග්ග පාළිය සූත්‍ර, පි. 84**,** EAN:1:Foremost, p. 44. **සටහන්**: * ඛු.නි: උදානපලිය:සෝණවග්ග:5.7 රේවතසූත්‍රයේදී: බුදුන් වහන්සේ මේ තෙරුන් සියලු සැක දුරුකොට වාසය කරණ බව වදාළහ.

▼ **මේ තෙරුන්,** සැරියුත්, මහා මුගලන්, මහා කාශ්‍යප, අනුරුද්ධ හා ආනන්ද තෙරුන් සමග ගොසින්ස සාලවනයේ වාසය කල බව මෙහි දක්වා ඇත. එහිදී සැරියුත් මහා තෙරුන්

‘කෙබඳු ස්වරූප ඇති භික්ෂුවක් ගොසින්ස වනය හොබවන්නේද?’ යයි විමසූ අවස්ථවේ රේවත තෙරුන් මෙසේ වදාළහ:

“...මෙහි යම් මහණෙක් පල සමවතෙහි ඇලුනේ වේද, චිත්ත සමාධිය ඇතිව බැහැර නොකළ ධ්‍යාන ඇත්තේද…ඇවත් සාරිපුත්‍රයෙනි, මෙබඳු භික්ෂුව ගොසින්ස වනය හොබවන්නේය”. **මූලාශ්‍රය:** ම.නි: (1) මහා සෝසින්ග සූත්‍රය.

▼ **මේ තෙරුන්ගේ ථෙර ගාථාවේ** බුදුගුණ අසිරිය පෙන්වා ඇත: ඛු.නි: ථෙරගාථා:1.1.3 පි.38.

“යම් කෙනෙක් තමන් වෙත පැමිණෙන අයගේ සැක දුරලා, නුවණ එළිය ලබා දෙන්නේද, ප්‍රඥාව නමැති ඇස දෙන්නේද, මැදියම් රෑ ඇවිළෙන මහා ගින්නක් බඳු ඒ තථාගතවරුන්ගේ ප්‍රඥා මහිමය බලනු මැනවි!”

▼ **මේ තෙරුන්ගේ අපදානය:** ඛු.නි: අපදානපාලිය 2-1: 542, පි.372. පදුමුත්තර බුදුන් දවස, හංසවති නුවර වේදය සමත් බමුණෙක්ව සිටීම, බුදුන් වහන්සේ ගේ දහම් අසා සතුටට පත්වීම, ධ්‍යානයේ ඇලුන අග්‍ර තෙරනමක් දැක ඒ තනතුර පැතීම, කළ පිං බලයෙන් බොහෝ දෙව්සැප ලැබ, ගෝතම බුදුන් සමයේ කෝලිය නගරයේ මහා ධන ඇති කැත් කුලයක උපත ලබා, බුදුන් වහන්සේ කපිලවස්තු නුවර දෙසූ දහම අසා පැවිදි බව ලැබීම මෙහි විස්තර කර ඇත.

**කණ**

▲ **කුණ්ඩධාන තෙර-** Kuṇḍadhāna Thera: පළමුව සලාකපත් ලබාගන්නා භික්ෂූන් අතරෙන් අග්‍රය. **බලන්න**: EAN:Note:94, p.585. **මූලාශ්‍ර:** අං.ගු.නි: (1) 1 නිපාත: එතදග්ග පාළිය සූත්‍ර, පි. 84, EAN:1: XIV : Foremost, p.

▼ **මේ තෙරුන්ගේ ථෙර ගාථා**: ඛු.නි: ථෙරගාථා:1.2.5 පි.42.

" ඕරම්භාගිය සංයෝජන පහ සිඳ දමා, උද්ධම්භාගිය සංයෝජන පහ දුරලා, ඉන්ද්‍රිය පහ වඩාගෙන, රාග ආදීවූ පස් කෙළෙස් ඉක්මවූ මහණ ඕඝතින්න යයි කියයි".

▼ **මේ තෙරුන්ගේ අපදානය**: ඛු.නි: අපදාන පාලි1:31,පි, 174. පදුමුත්තර බුදුන් වහන්සේ වැඩසිටි කළ උපත ලැබූ මෙතුමා, බුදුන් වහන්සේ නිරෝධ සමාපත්තියෙන් නැගිසිටි පසුව උන්වහන්සේට දානය පිළිගන්වා ඇත. එම් යහපත් කම්ම විපාක ලෙසින් දිගු කලක් දෙව් මිනිස් සැප ලබා, ගෝතම බුදුන් සමයේ බුද්ධ ශ්‍රාවකයෙක් වන්නේය යයි බුදුන් වහන්සේ අනුමෝදනා වදාළහ.

**කප**

▲**කප්ප (මානවක) තෙර-** Kappa Thera**:** බවාරි බ්‍රාහ්මණ ගේ සිසුවෙක් වූ මෙතුමා, බුදුන් වහන්සේගෙන්, ජරා මරණය නොමැති නිවන පිලිබඳව ඇසූ ප්‍රශ්නය හා බුදුන් වහන්සේගේ පිළිතුරු මෙහි විස්තර කර ඇත.

**" කප්ප,...රාගදිය රහිත, තණ්හා රහිත, ජරාමරණ අවසන් කිරීම නිවනය යයි කියමි".** දහම අවබෝධ කරගත් මෙතුමා බුදුසුනේ පැවිදිවූහ. **මූලාශ්‍රය:** ඛු.නි: සුත්තනිපාත:පාරායනවග්ග: 5-10 කප්ප මානවක, පි.356.

▼ **මේ තෙරුන්ගේ ථෙර ගාථා**:ඛු.නි: ථෙරගාථා:10.1.5, පි.192.

"යම් ශ්‍රැතවත් කෙනෙක්, අසූචි වැකුණු මේ කය සර්පෙයෙක් ලෙසින් (සැව හරින ලෙසින්) හැර දමයිද, ඔහු භවමූලවූ තණ්හාව හැර, ආසව නැතිව පිරිනිවීයන්නේය"

**කම**

▲**කුමාර කාශ්‍යප තෙර-**Kumāra Kassapa Thera: විසිතුරු දහම්කතා-චිත්තකථිකානං ඇති භික්ෂූන් අතරෙන් මේ තෙරුන් අග්‍රය. මෙතුමාගේ මෑණියෝ, කුසතුල දරුවෙක් සිටින බව නොදැන මහණවිය. පසේනදී කෝසල රජතුමා විසින් හදාවඩාගත් හෙතෙම,සත් හැවිරිදි වියේදී පැවිදිවිය. **බලන්න:** EAN:note: 100. **මූලාශ්‍ර:** අං.ගු.නි: (1) 1 නිපාත: එතදග්ග පාළිය සූත්‍ර, පි. 84**,** EAN:1: Foremost, p. 44.

▼ **බුදුන් වහන්සේ,** තුඹස පිලිබඳ ධම්ම ප්‍රහේලිකාව, කුමාර කාශ්‍යප තෙරුන්ට පැහැදිලි කර වදාළ බව මෙහි පෙන්වා ඇත. එම දේශනය අසා මේ තෙරුන් අරහත්වය ලැබුහ. **මූලාශ්‍ර:** ම.නි: (1): 1.3.3 වම්මික සූත්‍රය, පි.374, EMN:23 Vammika Sutta, p.228.

▼**මේ තෙරුන්,** පයාසි රජු ගේ පරලොව නැතය වැරදි දිට්ඨි නැතිකර ගැනීම පිණිස වදාළ විසිතුරු උපමා ආදියෙන් යුත් දිගු ධම්ම දේශනාව

පිලිබඳව මෙහි විස්තර කර ඇත. මේ දේශනාව අසා රජතුමා බුදුන් සරනගියහ. **මූලාශ්‍රය**: දීඝ.නි: (2) 10 පායාසි රාජන්‍ය සූත්‍රය, පි.520.

▼ **මේ තෙරුන්ගේ ථෙර ගාථා**: ඛු.නි: ථෙරගාථා:2.5.1, පි.110.

" යම් ශාස්තෘ කෙනෙක් වෙත, මේ බඳු ශ්‍රාවක්යෙක් ලොව්තුරු දහම සාක්ෂාත් කරගන්නේද, ඒ බුදුහු අසිරිමත්ය, දහම අසිරිමත්ය, අපගේ ශාස්තෘන් වහන්සේගේ දසබල ආදියෙන් අසිරිමත්ය".

▼ **මේ තෙරුන්ගේ අපදානය**: ඛු.නි: අපදාන පාලිය 2-1:535, පි.334. පදුමුත්තර බුදුන් දවස වේදය ප්‍රගුණ කළ බ්‍රාහ්මණයෙක්ව සිටීම, බුදුන් වහන්සේ බැහැදැක පහන් සිතින් අගනා පුද පූජා කිරීම, විචිත්‍රකථිකත්වය පැතීම, දෙව්ලොව් සැප විඳ, ශාඛා නම් මුවා ගේ පුතුවීම, ඒ මුවරාජයා විසින් අත්හළ මව නිග්‍රෝධ නම් මුවරජ විසින් ආරක්ෂා කිරීම ආදී විස්තර මෙහි ඇතුලත්වේ. **සටහන්: *** කාශ්‍යප බුදුන් වහන්සේ සමයේ පව්වකට නැගී මියගිය භික්ෂූන් පස් දෙනා අතුරින් මෙතුමාද එක් නමකි. **බලන්න**: දබ්බ මල්ල තෙර.** මෙතුමන් කුස තුලසිටියදී මව දෙව්දත් භික්ෂුව වෙත පැවිදිවූවාය. ඇයගේ ගැබ ගැන දත් මෙහෙණියන් එබව දේවදත්ත භික්ෂුවට සැලකලවිට ඇය ට සිවුරු හැරීමට පැවසූහ. ඒ අවස්ථාවේදී බුදුන් වහන්සේ ඇය භික්ෂුණී ආරාමයට යවා ඇයගේ නිදොස් බව පෙන්වා දුන්හ. කොසොල් රජ විසින් පෝෂණය කරන ලද නිසා කුමාර කාශ්‍යප නම් විය.

▲ **කිම්බිල තෙර-** Kimbila Thera: මේ තෙරුන්, කිම්බිලා නුවර අසබඩ, මිදෙල්වනයේ වාසය කළහ. බුදුන් වහන්සේ මේ දේශනාවේදී බුදුසසුන පැවතීමට හා පරිහානියට පත්වීමට බලපාන හේතු මේ තෙරුන්ට විස්තර කර ඇත. **සටහන:** එම කරුණ මෙහිදිද විස්තර කර තිබේ: **බලන්න:** අංගු.නි: (3): 5 නිපාත: 5.5.1.1. කිම්බිල සූත්‍රය, පි.420,(5) 7 නිපාත: 7.2.1.6, කිම්බිල සූත්‍රය,පි.424. **මූලාශ්‍රය**: අංගු.නි: (4): 6 නිපාත:6.1.4.10 කිම්බිල සූත්‍රය, පි.118.

▼ **සංයු.නි: (5-2) මහාවග්ග:** ආනාපානසති සංයුත්ත: 10.1.10 කිම්බිල සූත්‍රයේ දී, පි.150, බුදුන් වහන්සේ මේ තෙරුන්ට ආනාපානසතිසමාධිය විස්තර කර ඇත.

▼ **මේ තෙරුන්** හා අනුරුද්ධ හා කිම්බිල තෙරුන්, ගෝසිංග සාලවනයේ සුහදව වාසය කිරීම හා උතුම් ආරිය බව ලැබීමේ විස්තර මෙහි දක්වා ඇත. **බලන්න**: නන්දිය තෙර. **මූලාශ්‍රය:** ම.නි: (1) චූළගෝසිංග සූත්‍රය, පි.514.

▼ **මේ තෙරුන්ගේ ථෙර ගාථා**: ඛු.නි: ථෙරගාථා:1.12.8, පි.84.

"යොවුන් බව වහා ඇදවැටේ, විද්‍යාමාන රූපය වෙනත්කෙනකුගේ වැනිය. වීප්‍රවාසයක් නැති ඒ මගේ ආත්මය අනිකෙකු සතු දෙයක් මෙන් සිහි කරමි".

**කළ**

▲ **කළාර ඛත්තිය තෙර-** Kalarakattiya Thera: මේ තෙරුන්, සැරියුත් තෙරුන් සමග සැවැත්නුවර වාසය කළහ.සැරියුත් තෙරුන් හා මෙතුමන් අතර වූ සංවාදයක විස්තර මෙහි දක්වා ඇත. සැරියුත් තෙරුන්ගේ උසස්

දහම් අවබෝධය ගැන, බුදුන් වහන්සේ මෙතුමාට වදාළ බව මෙහි දක්වා ඇත. **මූලාශ්‍රය**: සංයු.නි: ( 2) නිදානවග්ග: අභිසමයසංයුත්ත: 1.4.2 කාළාර සූත්‍රය, පි.100

**කළු**

▲**කාළුදායි තෙර-** Kāludāyi Thera: පවුල් අතර ශ්‍රද්ධාව ඇතිකරණ -කුලපාසාදික-භික්ෂූන් අතරෙන් මෙතුමා අග්‍රය. සුද්ධෝදන රජුගේ ඇමතිවරයෙක් ගේ පුත්වූ මෙතුමා, ගිහිකල, කපිලවස්තු නුවරදී, සිදුහත් කුමාරාගේ මිත්‍රයෙකි. රජ තුමාගේ ඉල්ලීමක් අනුව බුදුන් වහන්සේට කපිලවස්තු නුවරට වැඩම කිරීමට ආරධනා කළහ. බුදුන් වහන්සේ එහි වැඩි අවස්ථාවේ, ශාක්‍යයන් තුළ උන්වහන්සේ ගැන බැති ඇති කරගැනීමට උපකාරීවුහ. **බලන්න:** EAN:note:106, p.585. **මූලාශ්‍ර:** අංගු.නි: (1) 1 නිපාත: එතදග්ග පාළිය සූත්‍ර, පි. 84**,** EAN:1:Foremost, p. 44.

▼ **මේ තෙරුන්ගේ ථෙර ගාථා**: ඛු.නි: ථෙරගාථා:10.1.1., පි. 186.

"… වහන්ස, සිත්කළු වෘක්ෂයෝ පිපුණු මල් ඇත්හ, … මහාවීරයන්වහන්ස, ශාක්‍යයන්ට උපකාර පිණිස මේ කල්ය…මහා ඍෂි ගේ පිය තෙමේ සුද්ධෝදන නම්වේ, මායා දේවිය මවය…".

▼ **මේ තෙරුන්ගේ අපදානය**: ඛු.නි: අපදානපාළිය1: 34, පි.181, අපදාන පාළිය 2-1: 546, පි.394. පදුමුත්තර බුදුන් වහන්සේට පිපුන උපුල්, බෝලිද්ද මල් හා කිරිබත් පූජා කිරීමේ යහපත් ඵල නිසා දිගු කලක් දෙව් රජ සැප ලැබූහ. කෙලෙස් තවන විරියෙන් හා ප්‍රඥාවෙන් යුතුව බුදුන් වහන්සේ සතුටු කර බුදු සසුන කරන ලද බව මෙහි දක්වා ඇත.

" ...බෝසත් සිදුහතුන් සමගම වැඩුනෙමි. ඔහුට ප්‍රියවූ දායවූ නීතිදක්ෂ සහායකයෙක් වීමි...වයසින් එකුන්තිස් හැවිරිදු වූ බෝසත් තෙමේ ගිහි ගෙයින් නික්මුනේය...සුදොවුන් රජ විසින් යවන ලදුව මම බුදුන් හමුව පැවිදිව රහත්වීමි".

**කස**

▲ **කස්සප ගොත්ත තෙර**-Kassapa Gothta Thera: මේ තෙරුන් කෝසල දනව්වේ වනයක වාසය කරන අතරදී, වන දෙවතාවක් දුන් අවවාද අසා සංවේගය ඇති කරගත් බව මෙහි දක්වා ඇත. **මූලාශ්‍රය:** සංයු.නි:වනසංයුත්ත: 9.1.3 කස්සප ගොත්ත සූත්‍රය, පි.380.

**ඛ**

**ඛම**

▲ **ඛේම තෙර**- Khema Thera

ඛේම තෙර අරහත්වය ප්‍රකාශ කර ඇත්තේ තමන්ට මානය නොමැති බව හඟවමින් බව මෙහි දක්වා ඇත. **මූලාශ්‍ර**: අංගු.නි: (4) 6 නිපාතය: 6.1.5.7. ඛෙම සූත්‍රය, පි. 148, EAN:6: 49.7. Khema sutta, p. 341.

▲ **ඛෙමක තෙර -**Khemaka Thera: මේ තෙරුන් බලවත් ලෙසින් ගිලන්ව, කොසඹෑ නුවර අසල බදරිකාරාමයෙහි වාසය කරන අවස්ථාවේ,

කොසඹෑ නුවර ඝෝසිතාරාමයෙහි වැඩසිටි තෙරුන් ඔහු ගේ ගිලන්බව අසා, අනුකම්පාවෙන් දහම් පනිවිඩ යවා ඇත, පසුව ඛෙමක තෙරුන් පංච උපාදානස්කන්ධය පිළිබඳව බුද්ධ දේශනාව 60 ක් පමණවූ ඒ තෙරුන්ට විස්තර කිරීම මෙහි දක්වා ඇත. එම දේශනාව අසා 60ක් පමණ තෙරුන් අරහත්වයට පත්වුහ. දේශනාව වදාරන අවස්ථාවේ, ඒ දහම් කරුණු යහපත් ලෙස අවබෝධ විමෙන් ඛේමක තෙරුන්ද සියලු කෙළෙස් නසා අරහත්වයට පත්විය. **මූලාශ්‍රය**: සංයු.නි: (3): ඛන්ධසංයුත්ත:ථෙරවග්ග: 1.2.4.7 ඛෙමක සූත්‍රය, පි.246.

**ග**

**ගද**

▲ **ගොදත්ත තෙර-** Godaththa Thera: මේ තෙරුන් හා චිත්ත ගහපති (මච්ඡිකාසන්ඩ) අතර, අප්‍රමාන චේතෝවිමුක්තිය, ආකිඤ්ච චේතෝ විමුක්තිය, සුඤ්ඤතා චේතෝවිමුක්තිය, අනිමිත්ත චේතෝවිමුක්තිය ආදී දහම් කාරුණු පිලිබඳ වූ සංවාදය ගැන මෙහි විස්තර කර ඇත. චිත්ත ගහපතිගේ දහම් අවබෝධය ගැන තෙරුන් මෙසේ ප්‍රසංසා වදාළහ:

"ගැහැවිය, යම්බඳු ඔබගේ පැනස ගැඹුරු බුදුවදනෙහි පවතී නම්, ගැහැවිය ඒ ඔබට ලාභයකි, මනා ලැබීමකි". **මූලාශ්‍රය:**සංයු.නි: (4) සළායතනවග්ග:චිත්තසංයුත්ත: 7.1.7 ගොදත්ත සූත්‍රය, පි.566.

▼ **මේ තෙරුන්ගේ ථෙර ගාථා**: ඛු.නි: ථෙරගාථා:14.1.2,පි.210.

"අනුවණ අය කරන ප්‍රසංසාවද, නුවණැතියන් කරන ගැරහීම් ගත් කළ, බාලයන්ගේ ප්‍රසංසාවට වඩා, නුවණැතියන් කරන ගැරහීම් උතුම්වේ".

**ගධ**

▲ **ගොධික තෙර-** Godikha Thera: මේ තෙරුන්, රජගහනුවර අසබඩ ඉසිගිලි පව්වේ වැඩසිට, සමවත් පිරිම හා 7 වරක් ලෞකික සමවත් ලබා ඒවා පිරිහීම ගැන කළකිරී, සියදිවි නසා ගැනීමට සිතීම හා ඒ ගැන මාරයා බුදුන් වහන්සේට දැන්වීම ගැන විස්තර මෙහි දක්වා ඇත. පසුව තෙරුන් සැතක් ගෙන දිවිනසා ගත්හ. එහි පැමිණි බුදුන් වහන්සේ, ඒ තෙරුන් සියලු තණ්හාව හැර ස්කන්ධ පරිනිර්වාණයෙන් පිරිනිවී ගිය බව වදාළහ. **මූලාශ්‍රය**: සංයු.නි: (1) මාරසංයුත්ත: 4.3..3 ගොධික සූත්‍රය, පි.246.

▼ **මේ තෙරුන්ගේ ථෙර ගාථා**: ඛු.නි: ථෙරගාථා:1.6.1 පි.58.

" වැස්ස, සොඳුරු ගායනයක් ලෙසින් වසි, මගේ කුටිය මැනවින් ආවරණය කර ඇත, මගේ සිත, නිවන් අරමුණෙහි යහපත් ලෙසින් පිහිටා ඇත. වැස්ස, දැන් ඔබට රිසිසේ වසින්න!"

**ගය**

▲ **ගයාකස්සප තෙර**-Gayakassapa Thera : උරුවෙල කාශ්‍යප තෙරුන්ගේ බාල සොහොයුරාය. බුදුන් සරණ යෑමට පෙර ජටිල ප්‍රතිපදා අනුගමනය කළහ. දහම අවබෝධ කර පැවිදිවිය. ආදිත්තපරියාය සූත්‍රය අසා අරහත්වයට පත්විය.

▼ **මේ තෙරුන්ගේ ථෙර ගාථා**: ඛු.නි: ථෙරගාථා:5.1.7 , පි.142.

"පෙර මම ගයාවෙහි, නානතොටේ උදය, දවාල හා සවස යයි තුන් වරක් ජල ස්නානය කළෙමි...දැන්, සෝදා හළ සියලු පව් ඇතිව නිමලව, ප්‍රවිත්‍රව, මම පරිශුද්ධවූ බුදුන්ගේ දයාදය වූ ඖරසපුත්‍ර යෙක්මි".

ගර

▲ **ගිරිමානන්ද තෙර-** Girimananda Thera: මේ තෙරුන් හට වැළදී ආබධයක් සුවපත් කිරීම පිණිස දසසංඥා සජ්ජායනා කිරීමට බුදුන් වහන්සේ, ආනන්ද තෙරුන්ට උපදෙස් වදාළ බව මෙහි දැක්වේ. එම දේශනාව අසා එතුමන් සුවපත්විය. **බලන්න:** දස සංඥා. **මූලාශ්‍රය:** අංගු.නි: (6) 10 නිපාත: 10.2.1.10 ගිරිමානන්ද සූත්‍රය, පි.222.

▼ **මේ තෙරුන්ගේ ථෙර ගාථා:** ඛු.නි: ථෙරගාථා:5.1.3, පි.140.

"වැසි වසි...පහව ගිය රාග ඇත්තෙමි, මේසය, ඔබට රිසිනම් වැස්ස වසින්න".

▼ **මේ තෙරුන්ගේ අපදානය:** ඛු.නි: 397, පි.641.: සුමේධ බුදුන් වහන්සේ වැඩසිටි සමයේ වාසය කිරීම, ළඟ ඥාතීන් මියගිය ශෝකය නිසා වනගතවීම, බුදුන් වහන්සේ හමුවීම හා උන්වහන්සේ ඔහුගේ දුක නැතිකිරීම පිණිස දහම් දෙසීම මෙහි විස්තර කර ඇත.

" තමන්ගේ සයි සලකන සියලු දෙනා කැඳ වීමක් නොමැතිව පැමිණියාහුය, අනුදැන්වීමක් නොමැතිව පරලොව ගියහ, එසේහෙයින් ඔවුන් ගැන කවර නම් වැලපීමක්ද. වැසි වසින විට මගින් වැසි නොවැටෙන තැනකට යති, වැසි නැවතුනු කළ කැමති තැනකට යති...". බුද්ධ වචනය අසා ශෝකය දුරු කර ගත්හ, ඉන්පසු සසර සැරිසරමින් ගෝතම බුදුන් වහන්සේ පහළවූ සමයේ උපත ලබා බුද්ධ ශ්‍රාවකයෙක්විය. බුදු සසුන කරන ලදහ.

ගල

▲ **ගුලිස්සානි භික්ෂුව-** Gulissani Bhikku: බුදුන් වහන්සේ රජගහනුවර වැඩ වසන සමයේ අරණ්‍ය භික්ෂුවක් වූ මෙතෙම, වේළුවනාරාමයට පැමිණි අවස්ථාවක, අරණ්‍ය නොවන සංඝයා ට අයහපත් ලෙසින් හැසිරීම නිසා, අරණ්‍ය සංඝයා වාසය කලයුතු ආකාරය පිලිබඳව සැරියුත් තෙරුන් මෙහිදී අවවාද අනුසාසනා වදාළහ. එම අවවාද,ආරණ්‍ය නොවන සංඝයාටද අදාළ බව මෙහි දක්වා ඇත. **මූලාශ්‍රය:** ම.නි: (2) 2.2.9 ගුලිස්සානි සූත්‍රය, පි.244.

ගව

▲ **ගවම්පති තෙර-** Gavampathi Thera: බරණැස්නුවර සිටු පුතෙක් වූ මෙතුමා යසකුල පුත්‍ර තෙරුන්ගේ ගිහිකල මිතුරෙකි. තම මිතුරා පැවිදිවූ බව අසා සෙසු මිතුරන් තිදෙනා සමග පැමිණ, බුදුන් වහන්සේ වෙතින් දහම අසා පැවිදිව, උපසම්පදා ලැබ අරහත්වයට පත්වූහ. **මූලාශ්‍රය:** වින.පි:මහාවග්ගපාලි1: සිව්ගිහි යහළුවන්ගේ පැවිද්ද කථා, පි.116.

▼ **මේ තෙරුන්,** චතුසත්‍ය පිළිබඳව, බුදුන් වහන්සේ වෙතින් ලබාගත් අවබෝධය, සංඝයාට විස්තර කිරීම මෙහි දක්වා ඇත.

**මූලාශ්‍රය:**සංයු.නි: (5-2) මහාවග්ග: සච්චසංයුත්ත: 12.3.10 ගවම්පති සූත්‍රය, පි.316.

▼**මේ තෙරුන් ඉද්දි බලයෙන්** දිවාවිහරණය පිණිස දේව විමානයකට වැඩම කිරීම පිලිබඳ විස්තර මෙහි දක්වා ඇත. එහිදී පයාසි රජගේ ඉල්ලීමක් පරිදී, මේ තෙරුන් මිනිස්ලොවට පැමිණ, දානය සකසා දීමේ අගය වර්ණනා කර ඇත. **මූලාශ්‍රය:** දීඝ.නි: (2) 10 පායාසි රාජන්‍ය සූත්‍රය, පි.520.

▼ **මේ තෙරුන්ගේ ථෙර ගාථා**:ඛු.නි: ථෙරගාථා: 1.4.8 ,පි.52.

" යමෙක් ඉද්දිබලයෙන් 'සරභූ' නම් ගඟ නැවත්විද, ඒ ගවම්පති තෙම තණ්හා දිට්ඨිය රහිතව නිකෙලෙස් විය. සියලු රාගආදී කෙළෙස් ඉක්මවා ගිය භවපරතෙරයට පැමිණි ඒ මහාමුණිහට, දෙවියන්ද නමස්කාර කරති".

**ච**

**චක**

▲ **චක්ඛුපාල තෙර-** Chakkhupaala Thera: මේ තෙරුන් ගේ පෙරකම්ම විපාකයක් ලෙසින් මේ භවයේදී ඇස් නැතිවී අන්ධබවට පත්විය. එහෙත්, බොහෝ වීරිය කර අරහත්වය ලබා ගති.

▼ **මේ තෙරුන්ගේ ථෙර ගාථා**: ඛු.නි: ථෙරගාථා:1.10.5, පි.74.

" මගේ නෙත් නටවිය, මම අන්ධවෙමි. කතර අදන් මගට පැමිණියෙමි, පාපමිත්‍ර යෙක් සමග ගමන් නො කරමි".

**චන**

▲ **චුන්ද සාමණේර**-Chunda Samanera: සැරියුත් මහා තෙරුන්ගේ බාල සොහොයුරා වූ මෙතුමා, උන්වහන්සේ රෝගාතුරව සිටි අවස්ථාවේ උවැටන් කර, පිරිනිවීගිය පසු ධාතු බුදුන් වහන්සේට පිළිගැන්වූ බව මහා පරිබ්නිබ්බාන සූත්‍රයේ දක්වා ඇත. නිගණ්ඨනාථ පුත්‍රයන් පාවා නුවරදී පිරිනිවීම පිලිබඳව බුදුන් වහන්සේට විස්තර දැන්වූවේ මෙතුමාය. පාසාදික සූත්‍රය, වදාළේ මේ තෙරුන්ටය. බුදුන් වහන්සේ අවසාන චාරිකාව වූ පාවා නුවර සිට කුසිනාරාවට  වැඩම කළ අවස්ථාවේ මේ තෙරුන් බුදුන් වහන්සේ සමීපයෙහි සිටි බව මහා පරිනිබ්බාන සූත්‍රයේ පෙන්වා ඇත.

▼ **මේ තෙරුන්ගේ අපදානය**: ඛු.නි: අපදාන පාලිය1: 50, පි.210.

"මගේ සිත කෙළෙසුන්ගෙන් මැනවින් මිදුනේය, සිව් පිළිසිඹියා ලැබිණ… බුදු සසුන කරන ලදී".

**චල**

▲ **චාල තෙර-** Chala Thera: මේ තෙරුන් බුදුන් වහන්සේගේ ජේෂ්ඨ ශ්‍රාවකයෙක්ය, උන්වහන්සේ විසාලානුවර, මහවනයේ කුටාගාර ශාලාවේ වැඩවසන සමයේ එහි වාසය කලබව මෙහි දක්වා ඇත. මෙතුමන් හා පිරිස, නිසලබව අගය කරන,ධ්‍යාන වඩන සංඝයාය. **මූලාශ්‍රය**:අංගු.නි: (6) 10 නිපාත:යමකවග්ග: 10.2.3.2 කණ්ටක සූත්‍රය, පි.268.

▲ **චුල්ලපන්ථක භික්ෂුව-** Cullapanthaka Bhukkhu :මනෝමයකය මැවීමට (mind-made body) හා රූපධ්‍යානයෙහි- (චෙතොවිවට්ට-mental transformation) දක්ෂ භික්ෂුන් අතරෙන් මෙතුමා අග්‍රය. මෙතුමා මහාපන්ථක තෙරුන්ගේ බාල සහෝදරයාය. ගාථා ඉගෙන ගැනීමට අසමත් නිසා සොහොයුරු මහාපන්ථක තෙර මෙතුමාට විහාරයෙන් පිටවී යාමට නියම කරනලදී. බුදුන් වහන්සේ ඒ අවස්ථාවේ ඔහුට භාවනාව පිණිස සුදු රෙදි කඩක් දී, ගාථාවක් උගන්වනලදී. පිරිමැදීමෙන් සුදු රෙදිකඩ කිලිටුවූ බව දැක යථාබව අවබෝධ කර අරහත්වය ලබාගති. **බලන්න**: EAN:notes:83 & 84, p.585. **මූලාශ්‍ර:** අංගු.නි: (1) 1 නිපාත: එතදග්ග පාළිය සූත්‍ර,පි. 84**,** EAN:1:Foremost, p. 44.

▼ **බුදුන් වහන්සේ** මේ තෙරුන් ගැන මෙසේ උදාන වදාළහ:

“ (මේ මහණ) මනා සිහි ඇතිව, සමථ හා විදර්ශනා භාවනා ලබා, අරහත්ව, මාරයාට දැකිය නොහැකි තැනට යන්නේය”. **මූලාශ්‍රය**: ඛු.නි: උදානපලිය: 5.10 පන්ථක සූත්‍රය, පි.276

▼ **මේ තෙරුන්ගේ ථෙර ගාථා**: ඛු.නි: ථෙරගාථා:10.1.4 ,පි.189.

“...මම (සොහොයුරු විසින් නෙරපන ලදුව) විහාර දොරටුව ළඟ අසතුටින් සිටිමි. බුදුහු එහි වැඩියහ. මා හිස පිරිමැදී සේක...මට අනුකම්පාවෙන් පාපිස්නකඩක් දුන්හ… බුදුන් ගේ බස් අසා සසුනේ ඇලුනෙමි, උත්තමබවට පැමිණීම පිණිස සමාධිය ඉපදවීමි”.

▼ **මේ තෙරුන්ගේ අපදානය**: ඛු.නි: අපදාන පාළිය1: 14, පි.132.
“ පදුමුත්තර බුදුන් වහන්සේ හිමවත වැඩ සිටි සමයේ, තවුසෙක්ව මම උන්වහන්සේට මල් කූඩයක් පූජා කෙළෙමි. බුදුන් වහන්සේ අනුමෝදනා වදාරා මගේ අනාගත උපත් පැවසුහ. අවසාන ජාතියේදී ගෝතම බුදුන් වහන්සේ පහළවූ සමයේ පන්ථක නම් ලබා නිවන ලබා ගන්නේය යි වදාළහ”.

**ඡ**

**ඡන**

▲ **ඡන්න (කපිලවස්තුනුවර)තෙර -**Channa Thera: අටුවාවට අනුව මේ තෙරුන් ගිහිකල, සිදුහත් කුමරුගේ රථාචර්යයාය (charioteer). බුදුන් වහන්සේ වෙත පැවිදු වුවද, පෙර සම්බන්ධය නිසා, ඔහු මානයෙන් මත්ව සෙසු සංඝයාට අමිත්‍ර ලීලාවෙන් කතාකිරීමට පුරුදුවිය. බුදුන් වහන්සේ, පරිනිබ්බානයට පෙර, ඡන්න තෙරුන් කීකරු කිරීම පිණිස ඔහුට බ්‍රහ්මදණ්ඩය පැනවීමට උපදෙස් වදාළහ. එබව අසා දහම් සංවේගය ඇතිකරගෙන, ආනන්ද තෙරුන් වෙතට පැමිණ දහම අවබෝධ කර ගත්හ. **බලන්න**: ESN:note:179, p. 1194, බ්‍රහ්මදණ්ඩය, දීඝ.නි: මහාපරිනිබ්බානසූත්‍රය. **මූලාශ්‍ර**: සංයු.නි: (3): ඛන්ධසංයුත්ත:ථෙරවග්ග:1.2.4.8 ඡන්න සූත්‍රය, පි.254, ESN: 22: Kahndasamyutta, 90.8 Channa, p.1082.

▲ **ඡන්න (රජගහනුවර)තෙර -**Channa Thera: මේ තෙරුන් දැඩිසේ ගිලන්ව ගිජුකුළු පව්වේ වැඩ වසන අවස්ථාවේ සැරියුත් තෙරුන් හා මහාචුන්ද තෙරුන්, උන්වහන්සේට දහමින් අනුසාසනා කළබව මෙහි

දැක්වේ. මෙතුමන් සැතක් ගෙන සියදිවි නසාගත්හ. එතුමන්, අවසාන අවස්ථාවේ අරහත්වය ලැබූ බව බුදුන් වහන්සේ වදාළහ. **මූලාශ්‍ර:** සංයු.නි: (4) සළායතනසංයුත්ත: 1.9.4 ඡන්න සූත්‍රය, පි.150,ම.නි: (3) 3.5.2 ඡන්න ඕවාද සූත්‍රය,පි.554.

▼ **මේ තෙරුන්ගේ ථෙර ගාථා**: බු.නි: ථෙරගාථා:1.7.9.පි.64.

" උතුම්වූ සර්වඥතා ඥානයෙන් දෙසන ලද උදාරවූ විමුක්ති රස ඇති චතුසත්‍ය, භාග්‍යවතුන් කෙරෙන් අසා නිවන් අධිගමය පිණිස මගට පිළිපන්නෙමි. ඒ භාග්‍යවතුන් වහන්සේ, යොගක්ෂේම (නිවන) මගෙහි නිපුණය".

**ජ**

**ජට**

▲ **ජටා භාරද්වාජ තෙර-** Jata Bharadvaja Thera**:** ගිහිකල, සැවැත්නුවර වාසී බ්‍රාහ්මණයෙක් වූ මෙතුමා, බුදුන් වහන්සේ බැහැදැක මෙසේ විමසීය:

" ඇතුළත අවුල්ය, පිටත අවුල්ය. ප්‍රජාව අවුලෙන් බැඳී ඇත… කවරෙක් මේ අවුල නිරවුල් කරන්නේද?" බුදුන් වහන්සේ මෙසේ වදාළහ:

"ප්‍රතිසන්ධි ප්‍රඥා ඇති, කෙළෙස් තවන වීරිය ඇති, ප්‍රඥාව ඇති, සසර බිය දකින සත්‍යා, ශීලයෙහි පිහිටා සමාධිය හා ප්‍රඥාව වඩමින්, මේ තණ්හාව නැමති අවුල නිරවුල් කරන්නේය...ඔවුන් ආසව ක්ෂය කල රහතුන්ය…". බුදුවදන් අසා බැති උපදවාගත් මෙතුමා පැවිදිව, අරහත්බව ලැබූහ **බලන්න**:අවුල නිරවුල්කිරීම. **මූලාශ්‍රය**: සංයු.නි (1) :සගාථවග්ග: බ්‍රාහ්මණසංයුත්ත: 7.1.6 ජටා සූත්‍රය, පි.320.

**ජත**

▲ **ජතුකන්නි තෙර -** Jathukanni Thera: බාවරී බ්‍රාහ්මණ ගේ සිසුවූ මෙතුමා, ශාන්තිය හා ශාන්තිපද නම් නිවන ලබාගැනීම පිණිස බුදුන් වහන්සේ විමසූහ. බුදුන් වහන්සේ මෙසේ වදාළහ.

"ජතුකන්නි, ...නෙක්කම්මය, ක්ෂේම (ආරක්ෂාව) ලෙසින් දැක, වස්තුකාම, කෙළෙසකාම ගැන ඇති තණ්හාව දුරලන්න...". දහම අසා පැහැදී බුදුන් සරණ ගියහ. එතුමා මෙසේ වදාළහ: " මම සන්සුන් වූවෙමි, උපධි රහිත වූවෙමි, විවේකිව වාසය කළෙමි, ඇත් රජෙක් මෙන් බැඳුම් සිඳ දමා ආසව රහිත වූවෙමි". **මූලාශ්‍රය**: බු.නි.සුත්තනිපාත: පාරායනවග්ග:වස්තුගාථා: පි,326, 5-11 ජතුකන්නි මානවක,පි.358.

▼ **මේ තෙරුන්ගේ අපදානය:** බු.නි:අපදාන පාලිය 2-1: 409: පි.62. හංසවති නුවර ධනවත් සිටුවරයෙක්ව කම් සැපයෙහි ඇලිසිටීම, පදුමුත්තර බුදුන් ප්‍රමුඛ මහා සංඝරත්නයට මහා දාන පූජා කිරීම, එම පින් බලයෙන් සක්විති රජ ආදී බොහෝ සැප ලැබීම, ගෝතම බුදුන් වහන්සේ හමුවී දහම් අසා පැවිදිවීම මෙහි විස්තර කර ඇත.

**ත**

**තද**

▲ **තොදෙය්ය තෙර-**Todeyiya Thera: බාවරී බ්‍රාහ්මණ ගේ සිසුවූ මෙතුමා , මුණිගුණ ගැන බුදුන් වහන්සේ විමසුහ. උන්වහන්සේ මෙසේ වදාළහ: "...මුණි තෙමේ තණ්හා රහිතය, ආශා රහිතය, ප්‍රඥාව ලබා ඇත, කාම, භව යන්හි නො ඇලුණහ, පලිබෝධ නොමැත…". දහම අවබෝධ කර ගත් මෙතුමා බුදු සසුනේ පැවිදිවූහ. **මූලාශ්‍රය**: ඛු.නි.සුත්තනිපාත: පාරායනවග්ග:වත්ථුගාථා: පි,326, 5-9 තොදෙය්‍යමානවක,

පි.354.

▼ **මේ තෙරුන්ගේ අපදානය:** ඛු.නි:අපදාන පාලිය 2-1: 408: පි.54. පෙර කේතුමතී නම් පුරයේ මහා බල ඇති විජය නම් රජෙක්ව, සතුරන් මරාදමා ඒ ගැන කම්පාවට පත්ව රජ ඉසුරු හැර ගිහිගෙය හැර යාම, සුමේධ බුදුන් වහන්සේ බැහැදැක, බොහෝ දන් පුජා කර සතුටුව මරණයෙන් පසු බොහෝ සැප සම්පත් විඳීම, ගෝතම බුදුන් වහන්සේගේ සමයේ උපත ලබා බුදුන් සරණ යෑම මෙහි විස්තර කර ඇත.

"බුදුරජාණන්වහන්සේ වෙත පැමිණීම මට ඒකාන්තයෙන්ම යහපතක්විය...බුදු සසුන කරන ලදී".

**තල**

▲ **තාලපුත්‍ර තෙර**- Talaputta Thera: ගිහිකල රජගහනුවර නාට්‍යය සංවිධානයක නායකව (නටගාමිණී) සිටි මොහු බුදුන් වහන්සේ දෙසූ දහම අසා පැහැදී පැවිදිව අරහත්වය ලැබූහ. **සටහන්: *** අටුවාවට අනුව ඔහු, බුදුන්දවස ඉන්දියාවේ ප්‍රසිද්ධ නළුවෙක්විය. **බලන්න** ESN: note: 334,335, p.1566. ** ජනයා සතුටුකරන නළුවෙක් නිසා මරණින් මතු 'පහාස දෙවියන්' ගේ සභාවේ යලි උපත ලැබේය යන විශ්වාසය මොහු දැරිය. බුදුන් වහන්සේ පෙන්වා වදාළේ, එය මිථ්‍යා දිට්ඨියක් බවත්, ඒ නිසා දුගතියක යළි උපත ලබන බවය. **මූලාශ්‍රය:** සංයු.නි: (4) සළායතන වග්ග:ගාමිණිසංයුත්ත:8.1.2 තාලපුට සූත්‍රය, පි.584.

▼ **මේ තෙරුන්ගේ ථෙර ගාථා**: ඛු.නි: ථෙරගාථා:50.1.1, පි.284.

"නොමග යන ඉඳුරන්, ප්‍රඥාවෙන් සිඳ, යොග යෙන් දමනය කර, මග විදර්ශනාවෙහි පිවිසවා, සමුදය, විභවය, සම්භවය දැක අග්‍රවාදී සම්බුදුන් ගේ ඖරසපුත්‍ර වන්නෙහිය".

**තස**

▲ **තිස්ස තෙර -** Tissa Thera: බුදුන් වහන්ස්ගේ ශ්‍රාවකවූ මේ තෙරුන් අපවත්ව බ්‍රහ්ම ලෝකයේ තිස්ස බ්‍රහ්මණ ලෙසින් පහළව, මහා ඍද්ධි බල සහිතවූ බව මේ සූත්‍රයේ පෙන්වා ඇත. **බලන්න**: තිස්ස බ්‍රහ්ම. **මූලාශ්‍රය:** අංගු.නි: 6 නිපාතය:දේවතාවග්ග:6.1.4.4 මොග්ගල්ලාන සූත්‍රය.

▲**තිස්ස කපිලවස්තු තෙර-** Tissa Kapilavatthu Thera: ගිහිකල සාක්‍ය කුමාරයෙක්වූ, මේ තෙරුන් සුද්දෝධන රජුගේ නැගණියගේ පුතාය. පැවිදිවුවද ඔහුට දහම යහපත් ලෙස අවබෝධ කරගැනීමට නොහැකිව, ගිහිවීමට ඉටාගෙන සිටි අවස්ථාවේදී, බුදුන් වහන්සේ ඔහුට මේ සූත්‍රය දේශනා කරනලදී. තිස්ස තෙරුන් බුදුන් වහන්සේගේ අවවාද අනුසාසනා සතුටින් පිළිගත්හ.

**සටහන්:** * මේ සූත්‍රයේදී බුදුන් වහන්සේ මාර්ගයේ දක්ෂ පුද්ගලයා කටයුතු කරන ආකාරය පෙන්වා ඇත. ** අටුවාවට අනුව, බුදුවදන් පිළිගත් ඔහු අරහත්වය ලබා ගති. **මූලාශ්‍රය**: සංයු.නි: (3): ඛන්ධසංයුත්ත: ථෙරවග්ග: 1.2.4.2 තිස්ස සූත්‍රය, පි.210.

▼ **මෙහිදී** බුදුන් වහන්සේ මේ තෙරුන්ට නොකිපී, බඹසර වාසය කිරීමට උපදෙස් වදාළහ. **බලන්න**: සංයු.නි: (2) නිදානවග්ග: භික්ඛුසංයුත්ත: 9.1.9 තිස්ස සූත්‍රය, පි.456.

▼ **මේ තෙරුන්ගේ ථෙර ගාථා**: ඛු.නි: ථෙරගාථා:1.10.7, පි.76.

" සියක් අගනා රන්මුවා තලිය හැරදමා මැටිමුවා පාත්‍රය ගතිමි, ඒ මගේ දෙවනි අභිෂේකයය".

▲ **තිස්සමෙත්තෙයිය තෙර-** Tissametteiya Thera: පැවිදි වීමට පෙර, බාවරී බ්‍රාහ්මණ ගේ සිසුවූ මෙතුමන්, දහම් කරුණු පිළිබඳව බුදුන් වහන්සේ විමසා ඇත.

" කවරෙක් මෙලොව සන්තුෂ්ටියෙන් සිටීද?...කවරෙක්හට තණ්හා දිට්ඨි කම්පන නැද්ද?...කවරෙක් මහා පුරුෂද?...කවරෙක් තණ්හා සිබ්බනිය (මැහුම්කාරිය) ඉක්මවා ගියේද?..." . **සටහන:** බුදුන් වහන්සේගේ පිළිතුරු මේ සූත්‍රයේ පෙන්වා ඇත. **බලන්න:**මැහුම්කාරිය. **මූලාශ්‍රය**: ඛු.නි.සුත්තනිපාත: පාරායනවග්ග:වත්ථුගාථා: පි,326, 5-2 තිස්සමෙත්තෙයිය මානවක, පි.338.

▼ **මේ තෙරුන්ගේ අපදානය** : ඛු.නි: අපදාන පාලිය 2-1: 401, පි.22. පදුමුත්තර බුදුන් දවස සෝභිත නම් තවුසෙක්ව, බුදුන් වහන්සේ දැක පැහැද, බොහෝ පින් කර, දෙව් මිනිස් සැප ලබා අවසානයේදී ගෝතම බුදුන් වහන්සේගෙන් දහම් අසා පැවිදිවූහ: " උතුම්වූ සසුනට පැමිණියෙමි, රාග දෝස වනසා දැමුවෙමි, ආසව ක්ෂය කළෙමි, දැන් නැවත ඉපදීමක් නැත".

ථ

ථර

▲ **ථෙර නම් භික්ඛුව-** Bhikkhu Threa: රජගහනුවර, වේළුවනාරාමයෙහි වැඩසිටි මේ තෙරුන් හුදකලා වාසයෙහි නිරතව, එහි අගය නිරතුරුවම පවසා ඇත. බුදුන් වහන්සේ එම තෙරුන්ට, හුදකලාවිහරණය සම්පූර්ණ වන අන්දම මේ සූත්‍රයේදී පෙන්වා ඇත. **බලන්න**: හුදකලාවිවේකය. **මූලාශ්‍රය**:සංයු.නි: (2): නිදානවග්ග:භික්ඛුසංයුත්ත:9.1.10 ථෙරනාම සූත්‍රය, පි.456.

ද

දබ

▲ **දබ්බ මල්ල පුත්‍ර තෙර-** Dabba Mallaputta Threa: සෙනසුන් - සේනාසන පණවන භික්ෂූන් අතරෙන්, මේ තෙරුන් අග්‍රවේ. අටුවාවට අනුව මෙතෙම, සත් හැවිරිදි වියේදී ධර්මය අවබෝධ කර අරහත්වය ලබා ගත්හ. **බලන්න**: EAN:note:97.

**මූලාශ්‍ර:** අංගු.නි: (1) 1 නිපාත: එතදග්ග පාළිය සූත්‍ර, පි. 84**,** EAN:1: Foremost, p. 44.

▼ **දබ්බමල්ල තෙරුන්**, බුදුන් වහන්සේ බැහැදැක, පිරිනිවන් පෑමට අවසර පැතීම, අහසට නැග තේජෝධාතු සමාපත්තියෙන් පිරිනිවන් පෑම, එතුමන් ගැන ප්‍රසංසා කරමින් බුදුන් වහන්සේ වදාළ උදාන මෙහි විස්තරාත්මකව පෙන්වා ඇත. **මූලාශ්‍රය**: ඛු.නි: උදානපාලිය: දබ්බ සූත්‍ර 2කි, පි.342.

▼ **මේ තෙරුන්ගේ ථෙර ගාථා**: ඛු.නි: ථෙරගාථා:1.1.5 පි.38.

"දමනයට දුෂ්කර කෙනෙක් ආරියමග නොහොත් පුරුෂධම්මසාරථී (බුදුන් වහන්සේ) විසින් දමනය කරන ලද්දේද, භව්‍යවූ, සන්තුෂ්ටියඇති, සැක දුරුකළ, දිනන ලද කෙළෙස් ඇති, පහවූ බිය ඇති, අචලස්වභාවයට පැමිණි ඒ 'දබ්බ' මහණ කෙළස් පරිනිර්වාණයෙන් පිරිනිවීයෙ ය."

▼ **මේ තෙරුන්ගේ අපදානය:** ඛු.නි: අපදානපාලිය 2-1: 534, පි.328. පදුමුත්තර බුදුන් දවස හංසවති නුවර ධනවත් සිටු පුතෙක්වීම, බුදුන් වහන්සේ ඇතුළු සංඝරත්නයට මහා දන් පුජාකිරීම, ඒ පින් බලයෙන් බොහෝ කල් දෙව්මිනිස් සැප ලැබීම, විපස්සි බුදුන් හමුවීම, කාශ්‍යප, බුදුන් වහන්සේ කෙරහි බැති උපදවා පැවිදිව, උන්වහන්සේ පිරිනිවන් පෑ පසු, සත්නමක් භික්ෂූන් පව්වකට නැග, ඉනිමග බිමහෙලා, එහි සිට මහා වීරිය ඇතිව භාවනා කිරීම, ඉන් දෙනමක් අරහත් හා අනාගාමී වීම, ඉතිරි පස්දෙනා මියගොස් දෙව්ලොව පහළවීම මෙහි විස්තර කර ඇත. **සටහන්**: * දබ්බ මල්ල තෙරුන් හා එක්වසිටි අනිත් භික්ෂූන් නම්, මේ භවයේ, පුක්කුසාති, සභිය, බාහිය හා කුමාර කාශ්‍යප යන්ය.** ගෝතම බුදුන් සමයේ මල්ල රට කුසිනාරවේ උපත ලැබීම, මව ගැබිණිව මියගිය විට, මළකඳ දරසෑයෙ තැබූවිට දරුවා, කුසින් නික්ම කුසතණ පඳුරකට වැටී ජීවත්වීම, ඒ නිසා දබ්බ යයි නම් කිරීම, සත් අවුරුදු වියේදී සසරින් මිදීම මෙහි පෙන්වා ඇත.

**දස**

▲ **දාසක තෙර**- Dāsaka Thera: මේ සූත්‍රයට අනුව මේ තෙරුන්, කොසඹෑ නුවර ඝෝසිතාරාමයෙහි වැඩසිටි බව පෙන්වා ඇත. ගිලන්වූ ඛේමක තෙරුන්ට දහම් පණිවිඩ හුවමාරු කරගැනීමට උපකාරී වුවේ මේ තෙරුන්ය. **සටහන:** සූත්‍රයට අනුව ඛේමක තෙරුන් වදාළ බුද්ධ භාසිතය ශ්‍රවණය කල 60ක් පමණ ඝෝසිතාරාමයෙ වැඩවිසූ තෙරුන් අරහත්වයට පත්වුහ. දාසක තෙරුන්, ඔවුන්ගෙන් කෙනක් බව දක්වා නැත. **බලන්න:** ඛේමක තෙර. **මූලාශ්‍රය**: සංයු.නි: (3): ඛන්ධසංයුත්ත:ථෙරවග්ග: 1.2.4.7 ඛෙමක සූත්‍රය, පි.246.

▼ **මේ තෙරුන්ගේ ථෙර ගාථා**: ඛු.නි: ථෙරගාථා:1.2.7,පි. 44.

"මද නුවණ ඇති, ථිනමිද්ධයෙන් මඩනා ලද, බොහෝ ආහාර ගන්නා, නිදනසුළු, පෙරලි නිදාගන්නා ඉතම බත් බුදිනලද මහා ඌරෙක් මෙන් නැවත නැවත ගැබට වදී (සසර උපත ලබයි)".

**ධ**

**ධත**

▲ **ධොතක තෙර-**Dhothaka Thera: බාවරී බ්‍රාහ්මණ ගේ සිසුවූ මොහු, දහම් කරුණු පිළිබඳව බුදුන් වහන්සේගෙන් විමසූ විට උන්වහන්සේ මෙසේ වදාළහ:

"ධොතකය, නුවණ ඇතිව සිහිය ඇතිව විරිය ඇතිව, මගේ වදන් අසා මේ සසුනේ, තමාගේ නිවන පිණිස හික්මෙන්න". **සටහන:** විචිකිච්චවෙන් තමා මුදවාලන්න යයි ඔහු විමසුවිට බුදුන් වහන්සේ මෙසේ වදාළහ:

"...ලෝකයේ විචිකිච්චා ඇති කිසිවෙකු මුදන්නට නො හැක්කෙමි. ඔබ, ශ්‍රේෂ්ඨධර්මය අවබෝධ කර ඉන් මිදිය යුතුය". **මූලාශ්‍රය:** ඛු.නි. සුත්ත නිපාත: පාරායනවග්ග:වස්තුගාථා:පි,326, 5-5ධොතකමානවක, පි.344.

▼ **මේ තෙරුන්ගේ අපදානය:** ඛු.නි: අපදානපාලිය 2-1: 404, පි.32.: හංසවතී නුවර අසබඩ භාගිරථී (ගංගානම් නදිය) නදිය අසල, සෝභිත ආරාමයේ පදුමුත්තර බුදුන් වහන්සේ වැඩසිටි සමයේ, ජලංග නම් ප්‍රසිද්ධ බ්‍රාහ්මණ ගුරුවරයෙක් ලෙසින් ඒ නුවර වාසය කිරීම, බුදුන් වහන්සේට ගංගාව තරණය කිරීම පිණිස හේයක්- පාලමක් තනා පුජාකිරීම, එම යහපත් කම්ම විපාක නිසා බොහෝකල් දෙව් මිනිස් සැප ලබා අවසානයේදී ගෝතම බුදුන් දවස උපත ලබා පැවිදිබවට පත්වීම විස්තර කර ඇත. " සිව්පිළිසිඹියා, අෂ්ඨවිමොක්ඛ, ෂඩ්අභිඥා සාක්ෂාත් කරගෙන බුදු සසුන කරන ලදී".

**ධම**

▲ **ධම්මික තෙර-** Dammika Thera: මෙතුමා පැවිදිව තමන් උපන් ප්‍රදේශයේ පිහිටි ආවාස 7 කම වරින්වර වාසය කලබව මෙහි දක්වා ඇත. ඒ ආවාසයන්වෙත පැමිණි ආගන්තුක භික්ෂුන් හට ඔහු, ආක්‍රෝෂ පරිභව කළ නිසා ඒ භික්ෂුන් ඒ ආවසයන්හි නොරැඳී පිටවගියහ. ඒ ගැන විමසා බැලූ ගිහියන්, ධම්මික භික්ෂුවගේ අයහපත් හැසිරීම දැක ඔහුට පිටවීමට නියම කරනලදී. වාසය කිරීමට තැනක් නොමැතිවූ ඔහු රජගහනුවරට පැමිණ බුදුන් වහන්සේ බැහැදැක තමාට වාසය කිරීමට තැනක් නොමැති බව පැවසුහ. ඔහුගේ අයහපත් හැසිරීම ගැන තොරතුරු දැන, බුදුන් වහන්සේ ඒ භික්ෂුවට, තමන් ගේ සබ්‍රහ්මචාරින්ට දූෂ්ටනොවී වාසය කිරීමට හික්මිය යුතුය යයි අවවාද අනුසාසනා වදාළහ:

"මේ සසුනේ මහණ, තමන්ට ක්‍රෝධ කරන අයට පෙරලා ක්‍රෝධ නොකරති, දබර කරන අය හා දබර නොකරති, ඔවුන් මහණදම් යහපත් ලෙසින් ආරක්ෂා කරති".

**සටහන්**: * මේ සූත්‍රයේ බුදුන් වහන්සේ, එම භික්ෂුවට, බ්‍රාහ්මණ ධම්මික ලෙසින් අමතා ඇත. ඒ ගැන භික්ඛු බෝධි හිමි මෙසේ දක්වා ඇත: This may be the only place in the Nikāyas where the Buddha refers to a bhikkhu as a brahmin followed by his personal name**. බලන්න**: EAN:6:Note:1360, p.647. ** මේ පිලිබඳ දක්වා ඇති **උපමාව:** රාජකීය නුගගස . **මූලාශ්‍ර:** අංගු.නි: (4) : 6 නිපාත:ධම්මිකවග්ග: 6.1.5.12 ධම්මික සූත්‍රය,පි.160, EAN:6: 54.12 Dhammika, p.343.

▼ **මේ තෙරුන්ගේ ථෙර ගාථා**: ඛු.නි: ථෙරගාථා:4.1.10, පි.134.

"ධර්මය අධර්මය යන දෙදෙනා සමවිපාක නොදේ, අධර්මය නිරයට ගෙනයයි, ධර්-මය සුගතියට පමුණුවයි".

න

නග

▲ **නාගදත්ත තෙර-** Nagadattha Thera: මේ තෙරුන් වනයේ වාසය කලද, පිණ්ඩපාතය පිණිස ගමට පිවිසි එහි දිගු කාලයක් ගතකරන බව දැක, වනදෙවියෙක් ඔහුට අවවාද කළ බව හා ඒ තෙරුන් ඒ අවවාද පිලිගත් බව මෙහි දැක්වේ. **මූලාශ්‍රය**: සංයු.නි: (1) සගාථවග්ග: වනසංයුත්ත: 9.1.7 නාගදත්ත සූත්රය, පි.384.

▲ **නාගසමාල තෙර-** Nagasamala Thera: මේ තෙරුන් බුදුන් වහන්සේගේ අතවැසියෙක් ලෙසින් පෙරදී කටයුතු කර ඇත. එක් සමයක බුදුන් වහන්සේ, අතවැසි නාගසමාල තෙරුන් හා කොසොල් රට සැරිසරන අවස්ථාවේ, දෙමංසන්ධියකට පැමිණියහ. නාගසමාල තෙරුන් එහි ඇති මාර්ග දෙකින් එක් මගක් පෙන්වා එම මගින් යැම පිණිස බුදුන් වහන්සේට ඇරයුම් කළහ. ඒ අවස්ථාවේදී බුදුන් වහන්සේ නිවැරදි මග පෙන්වූවද, එය පිළිනොගත්, ඔහු බුදු පාත්‍ර සිවුරු බිම තබා ගිය බවක් මෙහි දක්වා ඇත. පසුව සොරුන්ට හසුවී දුකට පත් ඔහු ආපසු බුදුන් වහන්සේ වෙතට පැමිණ ඇත. **බලන්න**: ද්විධාපථ. **මූලාශ්‍ර:**ඛු.නි: උදාන පාලි: 8.7 ද්විධාපථ සූත්‍රය, පි.338.

▼ **බුදුන් වහන්සේ,** සැරියුත් මහා තෙරුන්ට මහා සිහනාද සූත්‍රය දේශනා කරන අවස්ථාවේ, බුදුන් වහන්සේට පවන් සලමින් ඒ අසල සිටි මේ තෙරුන් මෙසේ පවසා ඇත:

"...වහන්ස ආශ්චර්ය, ...අද්භූතය...මේ ධම්ම ක්‍රමය අසා මගේ ලෝමයෝ දහගත්හ… මේ ධම්ම ක්‍රමයේ නම කුමක්ද?" බුදුන් වහන්සේ මෙසේ වදාළහ:

"....නාගසමාල, එසේ නම් ඔබ මේ ධම්ම පරියාය 'ලෝමහංසනපරියාය' යන නමින් දැනගන්න". **බලන්න:** ලෝමහංසන ධම්ම පරියාය. **මූලාශ්‍රය:** ම.නි: (1) 1.2.2 මහාසිහනාද සූත්‍රය, පි.183.

▼ **මේ තෙරුන්ගේ ථෙර ගාථා**: ඛු.නි: ථෙරගාථා:4.1.1 පි.128.

" පිඩු පිණිස යන මට, අබරණින් සැරසුන, මනා වස්ත්‍ර හැඳි නළඟනක්, මාවත මැද නටනු පෙනිණි, මට යෝනිසෝමනසිකාරය ඇතිවි ආදිනව දිටිමි, නිබ්බිද්දා නුවණ පහළවිය, කෙළෙසුන් පහවිය...බුදුසසුන කරනලදී".

▼ **මේ තෙරුන්ගේ අපදානය**: ඛු.නි: අපදාන පාලිය1: 71, පි.237. සිඛි බුදුන්වහන්සේ පහළවූ සමයේ උපත ලබා, ඒ බුදුන් වහන්සේට කළ ස්තූපයට පළොල් මල් පූජා කිරීම, ඒ අනුසසින් බොහෝ දෙව් මිනිස් සැප විඳ ගෝතම බුදුසසුනේ දී අරහත්වය ලැබීම මෙහි පෙන්වා ඇත.

▲ **නාගිත කාශ්‍යප තෙර-** Nagita Kassapa Thera: මෙතුමා බුදුන් වහන්සේගේ උපස්ථායක ලෙසින් කටයුතු කර ඇත. **මූලාශ්‍රය:** දීඝ.නි: (1) මහාලි සූත්‍රය, අංගු.නි: (4) 6 නිපාත: නාගිත සූත්‍රය, පි.120, අංගු.නි: (5) 8 නිපාත: 8.2.9.6 නාගිත සූත්‍රය, පි.370.

▼ **මේ තෙරුන්ගේ ථෙර ගාථා**: ඛු.නි: ථෙරගාථා:1.9.5,පි.70.

" මේ නිවන්ගාමී මග යම්සේද, එබඳු මගක් මෙයින් බැහැර (මේ සසුනෙන්) නැතය යයි භාග්‍යවත් ශාස්තෲන් වහන්සේ, තමන්ගේ අත්ලෙහි තැබූ දෙයක් පෙන්වන ලෙසින් සංඝයාට අනුසාසනා කරන සේක".

▲**නිග්‍රෝධකප්ප තෙර**-Nigrodhakappa Thera:මේ තෙරුන්, වංගීස තෙරුන්ගේ උපාධ්‍යායය. උන්වහන්සේ අග්ගලාව චෙතියේදී අපවත්වූහ. වංගීස තෙරුන්, තමන්ගේ උපාධ්‍යායා පිරිනිවීගියාද යනවග නොදැන ඒ පිලිබඳ බුදුන් වහන්සේගෙන් විමසීම, හා නිග්‍රෝධකප්ප තෙරුන්, අරහත්වය ලබා පිරිනිවන්පෑබව බුදුන් වහන්සේ විස්තරකිරීම මෙහි දක්වා ඇත. **මූලාශ්‍රය:** ඛු.නි: සුත්තනිපාත: චූලවග්ග: 2-12 නිග්‍රෝධකප්ප සූත්‍රය, පි.122, සංයු.නි:(1) වංගීසසංයුත්ත:8.1.1. නික්ඛන්ත සූත්‍රය, පි.356.

**නද**

▲ **නදී කාශ්‍යප තෙර-** Nadikassayapa Thera**:**උරුවෙල කාශ්‍යප තෙරුන්ගේ බාල සොහොයුරාය. බුදුන් සරණ යෑමට පෙර ජටිල ප්‍රතිපදා අනුගමනය කළහ. දහම අවබෝධ කර පැවිදිවිය. ආදිත්තපරියාය සූත්‍රය අසා අරහත්වයට පත්විය.

▼ **මේ තෙරුන්ගේ ථෙර ගාථා**: ඛු.නි: ථෙරගාථා:5.1.6 , පි.142.

"මගේ මිසදිටුබව ප්‍රහීණය, මෝහය ප්‍රහීණය, භව තණ්හාව නසන ලදී, ජාති සංසාරය ක්ෂිණවිය, දැන් පුනර්භවයක් නැත".

**නන**

▲ **නන්ද (ගෝතම) තෙර** -Nanda Thera: ඉන්දීය සංවරය-ඉන්ද්‍රියේ ගුත්තද්වාර ඇති භික්ෂුන් අතරෙන්, මේ තෙරුන් අග්‍රය. **බලන්න**: EAN:note:111,p.586 **මූලාශ්‍ර:** අංගු.නි: (1) 1 නිපාත: එතදග්ග පාළිය සූත්‍ර, පි. 84**,** EAN:1: Foremost, p. 44.

▼ **නන්ද තෙරුන්,** බුදුන් වහන්සේගේ ගිහිකල සුළුමව්වූ ප්‍රජාපති ගෝතමියගේ හා සුද්දෝධන රජුගේ පුතුනුවන්ය. මේ සූත්‍රයේ නන්ද තෙරුන්, විවාහ ගිවිසගත් ජනපද කල්‍යාණි නම් ශාක්‍ය දියණිය සිහිකර ගිහිවීමට සිතීම හා ඒ බව දත් බුදුන් වහන්සේ (ඉද්දි බලයෙන්) ඔහු, තව්තිසාවට කැඳවා ගෙන යාම, එහිදී, ජනපද කල්‍යාණියට වඩා අග්‍ර රූපයෙන් යුත් දෙව්අඟනන් 500ක් පෙන්වීම, සසුනේ සිත අලවා වාසය කරන්නේනම්, ඒ දෙව්අඟනන් ලැබීමට ඇප වීම ආදී විස්තර දක්වා ඇත. පසුව විරිය කර නන්ද තෙරුන් අරහත්වයට පත්වූහ. **මූලාශ්‍රය:** ඛු.නි:උදානපාලිය:නන්දවග්ග: 3.2 නන්ද සූත්‍රය, පි.198.

▼ **මෙහිදී නන්ද තෙරුන්** සතිසම්ප්‍රජන්‍ය වඩන ආකාරය ගැන බුදුන් වහන්සේ පැසසුම් කර ඇත. **මූලාශ්‍ර**:අංගු.නි: ( 5): 8 නිපාත: 8.1.19. නන්ද සූත්‍රය, පි. 54, EAN:8: 9.9 Nanda, p. 41.

▼ **නන්දතෙරුන්** හට සියුම් සිවුරු ආදිය පරිහරණය කිරීම පැවිද්දන්ට නුසුදුසු බව බුදුන් වහන්සේ අවවාද වදාළ පසු ඒ තෙරුන් පාංසුකූලිකව, පිඩුසිගායැම ගැන මෙහි දක්වා ඇත. **මූලාශ්‍රය:**සංයු.නි: (2) නිදානවග්ග: භික්ඛුසංයුත්ත:9.1.8 නන්ද සූත්‍රය, පි.454

▼ **මේ තෙරුන්ගේ ථෙර ගාථා**: ඛු.නි: ථෙරගාථා:2.2.9, පි.96.

" කයපිලිබඳව අයෝනිසෝමනසිකාරයෙ යෙදුනෙමි, කාමරාගය නිසා සිත නොසන්සුන්විය...උපායෙහි දක්‍ෂවූ සූර්-යබන්ධු වූ බුදුරදුන් ගේ අවවාද නුවණින් පිලිපැද සසරෙහි ගිලුන සිත නංවාගතිමි".

▼ **මේ තෙරුන්ගේ අපදානය**: ඛු.නි: අපදාන පාලිය1: 13,පි.130: " මම පදුමුත්තර බුදුන් වහන්සේට අනගි වස්ත්‍රයක් පුජා කෙළෙමි. අනුමෝදනා වදාරන බුදුන් වහන්සේ මගේ අනාගත උපත් පවසා, අවසාන උපතේ ගෝතම බුදුන් වහන්සේගේ බාල සොහොයුරා වනබව වදාළහ".

▲ **නන්දක තෙර-** Nandaka Thera: මෙහෙණියන්ට ඔවාදෙන-භික්ෂුණි ඔවාද, භික්ෂුන් අතරෙන් මේ තෙරුන් අග්‍රය. ගිහිකල, සැවැත්නුවර වාසයකළ ගෘහපතියෙකි. **බලන්න**: EAN:note: 110.p.586. **මූලාශ්‍ර:** අංගු.නි: (1) 1 නිපාත: එතදග්ග පාළිය සූත්‍ර, පි. 84**,** EAN:1: Foremost, p. 44.

▼ **නන්දක තෙරුන්,** භික්ෂුණි සංඝයාට ඕවාද දීම පිලිබඳව, **බලන්න:** ම.නි: (3) නන්දඕවාද සූත්‍රය.

▼ **මේ තෙරුන්ගේ ථෙර ගාථා**: ඛු.නි: ථෙරගාථා:2.3.7, පි.100.

"යම්සේ භද්‍ර අජානිය වෘෂභ තෙමේ පැකිල, යළි නැගී සිටිද, බෙහෙවින් සංවෙගව, ධුරය උසුලා සිටීද... එලෙසින්, දර්ශන සම්පන්න සම්‍යක් සම්බුද්ධයන්ගේ, ශ්‍රාවක, ඖරස පුත්‍ර මා පුරුෂජානියෙක් ලෙසින් සලකන සේක්වා".

▼ **මේ තෙරුන්ගේ අපදාන**: ඛු.නි:අපදානපාලිය: 2-1: 545, පි.390.: පදුමුත්තර බුදුන් වහන්සේ දැක පැහැද, භික්ෂුණින්ට ඔවාද දෙන අග්‍ර තෙරනමක් දැක ඒ තනතුර පැතීම, බුදුන් වහන්සේ අනුමෝදනා වදාරන විට මතු ගෝතම බුදු සසුනේදී, ඒ පදවිය ලැබෙන බව පැවසීම, සැවත්නුවර ධනවත් සිටුකුලයක උපත ලබා, ජේතවනාරාමය පිළිගන්වන අවස්ථාවේ පැවිදිවීම මෙහි දක්වා ඇත.

"බුදුරජාණන්වහන්සේ වෙත මාගේ පැමිණීම ඒකාන්තයෙන්ම ස්වාගතවිය... බුදු සසුන් කරන ලදී".

▲ **නන්දක මානවක තෙර-** Nandaka manawaka Thera: නන්ද ලෙසින්ද හඳුන්වා ඇත. බාවරී බ්‍රාහ්මණ ගේ සිසුවූ මොහු, මුණි යනු කවරේද? යයි බුදුන් වහන්සේ විමසීම උන්වහන්සේ වදාළ පිළිතුරු මෙහි දක්වා ඇත. දහම අසා බුදුන් සරණ ගියහ. **බලන්න**: මුණි. **මූලාශ්‍රය**: ඛු.නි.සුත්තනිපාත: පාරායනවග්ග:වස්තුගාථා: පි,326, 5-7 නන්දමානවක, පි.350.

▼ **මේ තෙරුන්ගේ අපදානය:** ඛු.නි:අපදාන පාලිය 2-1:406, පි.46.: අනුරුද්ධ පසේ බුදුන් සමයේ, වැද්දෙක් ලෙසින් ජීවත්වීම, බුදුන් වහන්සේ මහා වනයේදී හමුවීම, බුදුන් වහන්සේට කුටියක් සදා නෙලුම් මලින් අතුරා පුජාකිරීම, සසුනේ පැවිදිව නොබෝකලකින් රෝගීව මිය යාම, යහපත් පුණ්‍යකම්ම විපාක ලෙසින් බොහෝ කල් සැප විඳ ගෝතම බුදුන් දවස උපත ලැබීම. බුදුන් වහන්සේගෙන් ගැඹුරු නිවන පදය අසා, පැහැදී, ආසව ක්ෂය කර නිවන ලැබීම මෙහි විස්තර කර ඇත.

▲ **නන්දිය තෙර-** Nandiya Thera: මේ තෙරුන් අනුරුද්ධ හා කිම්බිල තෙරුන් සමග නිතර හැසිරෙන මිත්‍ර තෙරකි. එතුමන් සෝසිංග වනයේ, සුහද ලෙසින් වාසය කිරීම හා ඒ ගැන බුදුන් වහන්සේ ප්‍රසාදයට පත්වීම මෙහි විස්තර කර ඇත. සෙසු තෙරුන් දෙනම හා මේ තෙරුන් ගේ උත්තමබව පිළිබඳව දීඝපරජාන නම් යක්සෙනවියෙක් බුදුන් වහන්සේට පැවසීම, ඒ බව දේවලෝක හා බ්‍රහ්ම ලෝක පුරා පැතිරීම ගැනද මෙහි දක්වා ඇත. ඒ ගැන බුදුන් වහන්සේ මෙසේ වදාළහ:

"...දිඝය, මේ කුලපුත්‍රයෝ තිදෙනා යම් තාක් බොහෝ දෙනාට හිත පිණිස... දෙවි මිනිසුන්ට හිත පිණිස සැප පිණිස පිළිපන්ණාහු යායි දකින්න". **මූලාශ්‍රය:** ම.නි: (1) චූළගෝසිංග සූත්‍රය, පි.514.

**නර**

▲ **නාරද තෙර-** Narada Thera: නාරද තෙරුන් පැළලුප් නුවර (පාටලීපුත්‍ර නුවර) කුක්කුටාරාමයේ දී මේ සූත්‍රය, දේශනා කරනලදී. ඒ නුවර මුන්ඩ රජුගේ භාණ්ඩාගාරික (කෝෂාරක්ෂක) පියක, තෙරුන් ගේ ගුණ මෙසේ පවසා ඇත: "ආයුෂ්මත් නාරද තෙරුන්... පණ්ඩිතය, ව්‍යක්තයහ, ප්‍රශස්තබුද්ධිය ඇත, බහුශ්‍රැතය, චිත්‍ර කථිකයහ, කලන වැටහීම් ඇත, මහලුය, අර-හත්ය..." **සටහන:** නාරද තෙරුන් වදාළ මේ සූත්‍රය අසා, මුණ්ඩ රජ බුදුන් සරණ ගියහ.: **මූලාශ්‍රය**: අංගු.නි: (3) 5 නිපාත: 5.1.5.10 සෝකසල්ලහරණ සූත්‍රය, පි.112.

**ප**

**පක**

▲ **පුක්කුසාති භික්ෂුව** - Bhikkhu Pukkusāti: මෙතුමා ගිහිකල තක්ෂිලා නුවර රජවුහ. මගධයේ බිම්බිසාර රජ ගේ මිතුරෙකි. බිම්බිසාර රජ, ත්‍රිවිධ රත්නය හා දහම ගැන තොරතුරු මෙතුමාට ලියා දැන්වුහ. ඒ තොරතුරු අසා දහම ගැන ප්‍රමෝදය ඇතිකරගෙන රාජ්‍ය හැර ගිහිගෙය හැර, බුදුන් වහන්සේ හමුවීමට පැමිණියහ. එතුමන් බුදුන් වහන්සේ හමුවීම, දහම අසා අනාගාමීබව ලැබීම, මරණය හා සුද්ධාවාසයක උපත ලැබීම මෙහි විස්තර කර ඇත. **බලන්න**:EMN:note: 1264, p. 1178. **මූලාශ්‍රය:** ම.නි: (2) ධාතුවිභංග සූත්‍රය.

▼**මේ සූත්‍රයන්හිදී,** සටිකාර බ්‍රහ්මරාජයා, පුක්කුසාති භික්ෂුව අනාගාමීව, අවිහ බ්‍රහ්ම ලෝකයේ උපත ලබා ඇතය යි බුදුන් වහන්සේට පවසා ඇත. **මූලාශ්‍ර:** සංයු.නි: (1): දේවතා සංයුත්ත:1.5.10 සටිකාරසූත්‍රය, පි.88, දේවපුත්‍රසංයුත්ත:2.3.4 සටිකාර සූත්‍රය, පි.140.

**පග**

▲ **පිංගිය (මානවක) තෙර -**Pingiya (manawaka) Thera: බාවරී බ්‍රාහ්මණ ගේ සිසුවූ මොහු, තමන් මහළු, දුබල බව පවසා ජරාමරණයෙන් මිදීම -පුනර්භවය නැතිකිරීම ගැන බුදුන් වහන්සේ විමසීම හා උන්වහන්සේ වදාළ පිළිතුරු මෙහි දක්වා ඇත:

"පිංගිය, ...ඔබ කුසලධර්මයෙහි අප්‍රමාදව, පුනර්භවය ඇති නොවන පිණිස රූපය (ඇති ඇල්ම) දුරු කරගන්න. තණ්හාවෙන් ගැලී සිටින සත්වයන් ගේ සිත් ජාරා ආදියෙන් මැඩි සිටින සැටි දැක...පුනර්භවය නොවනු

පිණිස තණ්හාව දුරුකරන්න". ආයුෂ්මත් පිංගිය, බුද්ධ දේශනාව අසා සතුටුව, බාවාරි බ්‍රාහ්මණ හමුවී මෙසේ පැවසුහ:

"...පක්ෂියෙක් කුඩා වනය හැර, බොහෝ පලතුරු ඇති වනයකට පැමිණිසේ, මහාවිලකට පැමිණි හංසයෙක් මෙන් බුද්ධසාසනයට පැමිණියෙමි…". **මූලාශ්‍රය:** ඛු.නි.සුත්තනිපාත: පාරායනවග්ග:වස්තුගාථා: පි,326, 5-16 පිංගියමානවක, පි.364. **සටහන:** බුදුන් වහන්සේ වෙතින් දහම අසා පැවිදිවූ මෙතුමා, අනාගමිව අවිහ බ්‍රහ්ම ලෝකයේ පහළවූ බව මෙහි දක්වා ඇත. **මූලාශ්‍ර:** සංයු.නි: (1): දෙවපුත්ත සංයුත්තය: 2.3.4 ඝටිකාර සූත්‍රය, පි. 40, ESN: 2: Devaputta samyutta: 24.4 Ghaṭīkāra, p. 201.

**පණ**

▲ **පුණ්ණක තෙර -** Punnaka Thera: ගිහිකල බාවරී බ්‍රාහ්මණ ගේ සිසුවූ මෙතුමා  බුදුන් වහන්සේ දැක පැහැද පැවිදිවිය. බුදුන් වහන්සේගෙන් ඇසූ ප්‍රශ්නය: "...යාගකරුවෝ...ජාතිය ජරාව තරණය කළාහුද?..." සියලු ආසාවන් පහකල රහතුන්, ජාති ජරාව තරණය කලබව බුදුන් වහන්සේ වදාළහ. **මූලාශ්‍ර**ය: ඛු.නි.සුත්තනිපාත: පාරායනවග්ග:වස්තුගාථා: පි,326, 5-3 පුන්නක මානවක, පි.340

▼ **මේ තෙරුන්ගේ අපදානය:** ඛු.නි:අපදාන පාලිය 2-1: 402, පි.26.: පෙර දිවියක, වනගතව වාසය කරනවිට අපවත්වූ පසේබුදුන් වහන්සේගේ සිරුර ගරුසරු ඇතිව ආදාහන කරන අවස්ථාවේදී ඒ ගැන සතුටට පත්වූ යක්ෂයෙක් අහසේ සිට සැම කල්හිම ඔහුගේ නම පුණ්ණක වන බව පැවසිය. ඒ යහපත් කම්මය  නිසා බොහෝකල් දෙව් මිනිස් සැප ලබා ගෝතම බුදුන් දවස පුණ්ණක මානවක ලෙසින් ඉපදී දහම අසා බුදුන් සරණ ගියහ: " කෙලෙශයෝ දවන ලදී, සියලු භවයෝ නසන ලදී, අනාසව, සුවපත්ව වෙසෙමි".

▲ **පුණ්ණ තෙර** -Punna Thera: මේ තෙරුන් බුදුන් වහන්සේගෙන් ඉන්ද්‍රිය සංවරය ඇතිව වාසය කිරීම පිණිස අවවාද ලබාගැනිම,  පසුව සුනාපරන්ත දනව්වට වැඩම කර එහිදී 500 ක් පමණ උපාසකයන්ට දහම අවබෝධ කරවීම, අරහත්වය හා පරිනිබ්බානය පිලිබඳ විස්තර මෙහි දක්වා ඇත. **සටහන:** මේ තෙරුන්ගේ ඉවසීම පිළිබඳව බුදුන් වහන්සේ පැසසුම් කර ඇත:

"සාධු සාධු පුණ්ණ, දහම හා උපසමය යන දෙකම ඇති ඔබට, සුනාපරන්ත දනව්වේ වාසය කිරීමට හැකිය". **සටහන:**එසේ පැවසීමට හේතුව වුවේ සුනාපරන්ත දනව්වේ වාසින් දරුණු අය බව ප්‍රසිද්ධ නිසා බුදුන් වහන්සේ ඒ ගැන තෙරුන්ගෙන් විමසුවිට, තමාට ඕනෑම කරදරයක් විඳීමට හැකිබව එතුමා පැවසූ නිසාය. **මූලාශ්‍ර**: සංයු.නි: (4) සළායතනසංයුත්ත: 1.9.5 පුණ්ණ සූත්‍රය, පි.158, ම.නි: (3) 3.5.3 පුණ්ණඕවාද සූත්‍රය, පි.562.

▼ **මේ තෙරුන්ගේ ථෙර ගාථා**: ඛු.නි: ථෙරගාථා:1.7.10.පි.64.

" ශිලය අග්‍රය, උතුම් මිනිසුන්ටද දෙවියන්ටද ශිලප්‍රඥා ඇත. එමගින්, කෙළෙසුන් දිනා ගතිමි".

▲ **පුණ්ණජී තෙර**-Punnaji Thera: බරණැස්නුවර සිටු පුතෙක් වූ මෙතුමා යසකුල පුත්‍ර තෙරුන්ගේ ගිහිකල මිතුරෙකි. තම මිතුරා පැවිදිවූ බව අසා සෙසු මිතුරන් තිදෙනා සමග පැමිණ, බුදුන් වහන්සේ වෙතින් දහම අසා පැවිදිව, උපසම්පදා ලැබ අරහත්වයට පත්වූහ. **මූලාශ්‍රය:**වින.පි: මහාවග්ගපාලි1: සිව්ගිහි යහළුවන්ගේ පැවිද්ද කථා, පි.116.

▲ **පුණ්ණිය තෙර-** Punniya Thera: මේ තෙරුන්,දහම් දේශනා අවබෝධය ගැන, බුදුන් වහන්සේගෙන් විමසීම මෙහි විස්තරකර ඇත. **මූලාශ්‍රය:** අංගු.නි: (5) 8 නිපාත: 8.2.9.2 පුණ්ණිය සූත්‍රය, පි. 364, (6) 10 නිපාත: 10.2.4.3 පුණ්ණිය සූත්‍රය, පි. 302.

▲**පුණ්ණ මන්තානි පුත්‍ර තෙර-** Puṇṇa Mantāṇiputta Thera: ධර්මකථික භික්ෂූන් අතරෙන් අග්‍රය. **සටහන**: ගිහිකල කපිලවස්තු නුවර වාසය කල බ්‍රාහ්මණයෙකි, අඤ්ඤාකොණ්ඩඤ්ඤ තෙරුන්ගේ බෑණාය. **බලන්න:** EAN: note:82: p.585. **මූලාශ්‍ර:** අංගු.නි: (1) 1 නිපාත: එතදග්ග පාළිය සූත්‍ර, පි. 84**,** EAN:1:Foremost, p. 44.

▼**පුණ්ණ මන්තානිපුත්ත** තෙරුන් ගේ අවවාද අනුසාසනා, ආනන්ද තෙරුන්හට සෝතාපන්න වීමට උපකාරිවිය. **මූලාශ්‍රය:** සංයු.නි: (3): ඛන්ධසංයුත්ත:ථෙරවග්ග: 1.2.4.1 ආනන්ද සූත්‍රය, පි. 208.

▼ **මේ තෙරුන්** අරහත්වය ලබා බුදුන් වහන්සේ දැකීමට සැවැත්නුවරට පැමිණියහ. එහිදී, සැරියුත් තෙරුන් සමග පැවති ධම්ම සාකච්චාව ගැන මෙහි විස්තරාත්මකව පෙන්වා ඇත. **බලන්න:** ම.නි: (1) රථවිනීත සූත්‍රය.

▼ **මේ තෙරුන්ගේ ථෙර ගාථා**: ඛු.නි: ථෙරගාථා:1.1.4 පි.38.

" ප්‍රඥාවන්ත, යථාබව දකින සත්පුරුෂයන් සේවනය කරන්න. අප්‍රමාදව, විචක්ෂණව, මහා ප්‍රඥාවෙන්, ගැඹුරුවූ, දුකසේ දැකියයුතු, නිපුනවූ, සියුම් අරුත – සිව්සස් අවබෝධ කරගනිති".

▼ **මේ තෙරුන්ගේ අපදානය:** ඛු.නි: අපදානපාලි 1: 3, පි.94. "පදුමුත්තර බුදුන් වහන්සේ වැඩසිටි සමයේ මම වේදයේ පරතෙරට ගිය බ්‍රාහ්මණයෙක් වුහ. මම බුදුන් වහන්සේ කෙරේ පහැදී පෙර දිට්ඨිය පහකළෙමි". **බලන්න**: උපාලි මහා තෙර.

▲ **පිණ්ඩොල භාරද්වාජ තෙර-** Piṇḍola Bhāradvāja Thera: සිංහ නාද කරන භික්ෂූන් අතරෙන් අග්‍ර තැන ලැබූහ. **සටහන**: ගිහිජීවිතයේදී මෙතුමන්, කොසම්බියේ උදෙන රජුගේ පුරෝහිත බමුණාගේ පුතාය. **බලන්න**: EAN: note: 81, p.585. **මූලාශ්‍ර:** අංගු.නි: (1) 1 නිපාත: එතදග්ග පාළිය සූත්‍ර, පි. 84**,** EAN:1: XIV : Foremost, p. 44.

▼**මේ තෙරුන්**, පිරිපුන් බඹසර ජීවිතය ගෙනයාම පිළිබඳව බුදුන් වහන්සේ පෙන්වා දුන් කරුණු, කොසඹෑ නුවර උදේන (උදේනි) රජුට දේශනා කොට වදාළහ. එම දේශනාව අවසනයේදී, රජතුමා බුදුන් සරණ ගියබව මෙහි පෙන්වා ඇත. **මූලාශ්‍රය:** සංයු.නි: (4): සළායතනසංයුත්ත: ගහපතිවග්ග: 1.13.4 භාරද්වාජ සූත්‍රය,පි.254.

▼**මේ තෙරුන්** ආරණ්‍යකබව, පිණ්ඩපාතිකබව, පාංශුකූලිකබව, තුන්සිවුරු දරනබව, අල්පේච්ඡබව, සන්තුෂ්ටිකබව, විරිය ඇතිබව,

ධුතවාද බව අරහත් බව ආදී ගුණ මෙහි පෙන්වා ඇත. බුදුන් වහන්සේ එම තෙරුන්ගේ ගුණ ගැන උදානයක් වදාළහ. **මූලාශ්‍රය:** ඛු.නි: උදානපාලිය: 4.6 පිණ්ඩොල සූත්‍රය, පි.238.

▼ **මේ තෙරුන්ගේ ථෙර ගාථා**: ඛු.නි: ථෙරගාථා:2.1.2, පි.86.
" කුලයන්හි යම් වන්දනා පූජා තිබේද, බුදුවරු ඒවා පිළිකුල්කටයුතු දේ ලෙසින් පෙන්වා ඇත, ඒවා උදුරාලිය නොහැකි සියුම් උලක් වැනිය. එයට හේතුව, සත්කාර ආදිය අනුවණ පුද්ගලයාට ඉවත දැමීමට නොහැකි නිසාය".

▼ **මේ තෙරුන්ගේ අපදානය:** ඛු.නි:අපදාන පාලිය1:8, පි.120.
"පදුමුත්තර බුදුන් වහන්සේ හිමවතේ වැඩසිටින සමයේ අභීත සිහංයෙක්වූ වෙමි. මම බුදුන් වහන්සේට පියුමක් පුදා නමස්කාර කළෙමි. ඉන්පසු අනුමෝදනා වදාළ බුදුරදුන් මගේ අනාගත උපත් පවසා, අන්තිම ජාතියේ, ගෝතම බුදුන් සමයේ බ්‍රාහ්මණ කුලයේ උපත ලබා පැවිදිව පිරිනිවන් පාන බව වදාළහ".

**පල**

▲ **පලගන්ඩ තෙර-** Palaganda Thera: මෙ තෙරුන් අනාගාමිව අවිහ බ්‍රහ්මලෝකයේ පහළවූ බව මෙහි දක්වා ඇත. **මූලාශ්‍ර:** සංයු.නි: (1): දෙවපුත්ත සංයුත්තය: 2.3.4 ඝටිකාර සූත්‍රය, පි. 40, ESN: 2: Devaputta samyutta: 24.4 Ghaṭīkāra, p. 201.

▲ **පිලින්දවච්ඡ තෙර-** Pilindavachcha Thera: දෙවියන්ට ප්‍රිය මනාපවූ- දේවප්‍රිය- භික්ෂූන් අතරෙන්, පිළින්දවච්ඡ තෙරුන් අග්‍රය. **මූලාශ්‍ර:** අංගු.නි: (1) 1 නිපාත: එතදග්ග පාළිය සූත්‍ර, පි. 84, EAN:1: Foremost, p. 44.

▼ **මේ තෙරුන්,** තමන් හා වාසය කරන සෙසු අයට වසල වාදයෙන් කථාකිරීම ගැන සංඝයා බුදුන් වහන්සේට පැමිණිලිකරඇත. ඒ අවස්ථාවේ බුදුන් වහන්සේ පෙන්වා දුන්නේ: ඒ තෙර, පෙරපුරුද්ද නිසා එසේ කතා කරන බවද, එතුමන් අරහත්බව ලැබූ නිසා, සිතේ ද්වේශයක් නැතිබවය. **සටහන:** අටුවාවට අනුව පෙර ජීවිත 500 ක දී පමණ, බ්‍රාහ්මණ කුලයේ ඉපදී සිටි නිසා පුරුද්දට සෙසු අයට 'වසල' යයි ඇමතීමට පුරුදුවී ඇත. **බලන්න:** EAN:note:98.p.585. **මූලාශ්‍රය**:ඛු.නි: උදානපාලිය: 3.6 පිලින්දවච්ඡ සූත්‍රය, පි.212.

▼ **මේ තෙරුන්ගේ ථෙර ගාථා**: ඛු.නි: ථෙරගාථා:1.1.9 පි.40.

" ස්වාගත බව ලබා, දුරාගතය හැර දමාඇත. වරදවාගත් සිතිවිලි මට නොමැත. එයට හේතුව, ශ්‍රෙෂ්ඨවූ සිව්සස් දහම ලැබූ නිසාය".

▼ **මේ තෙරුන්ගේ අපදානය**: ඛු.නි: අපදාන පාලිය1: 15, පි. 136, හා 391, පි.582. මෙතුමා, සුමේධ බුදුන් වහන්සේ පිරිනිවන් පෑ කල කරනලද ස්තූප පූජාව හා රහතුන්ට දන් දීම නිසා බොහෝ ජාතිවල දිව්‍ය ලෝක සැප සම්පත් ලැබූ බව, පදුමුත්තර බුදුන් වහන්සේ ට මහා දන් දීම ආදී විස්තර මෙහි දක්වා ඇත.

**පස**

▲ **පෝසාල (මානවක) තෙර-**Posala Thera**:** බවාරි බ්‍රහ්මණ ගේ සිසුවෙක් මෙතුමා, ආකිඤ්චඤ්ඤායතන ලාභීන් ගේ අධිමුත්තිය ගැන බුදුන් වහන්සේගෙන් විමසිය. උන්වහන්සේ වදාළ පිළිතුරු මෙහි විස්තර කර ඇත.

"...පොසාලයනි, තථාගතයන්, ආකිඤ්චඤ්ඤායතනයෙහි අධිමුක්තවූ එයම පරායන කොට ඇති පුද්ගලයා ගැන දනී...ඒ ආයතනයේ සංයෝජන විශිෂ්ඨ නුවණින් දැන නිමවූ බ්‍රහ්මචරියාව ඇති ...ඒ රහතුන්ගේ අරහත්ව ඥානය අවිපරිතය". **සටහන:**බුදුන් වහස්නේ වදාළ දහම අසා මෙතුමා ඇතුළු සෙසු සිසුන් හැමදෙනා බුදුසසුනේ පැවිදිවූහ.**මූලාශ්‍රය**: බු.නි.සුත්තනිපාත: පාරායනවග්ග:වස්තුගාථා: පි,326, 5-14 පොසාලමානවක,පි.362.

**ඵ**

**ඵග**

▲ **ඵග්ගුන තෙර**-Phagguṇa Thera: සැවැත්නුවර වාසය කරන අවස්ථාවේ මේ තෙරුන් බොහෝ සෙයින් ගිලන්වූ නිසා ආනන්ද තෙරුන් ගේ අයැදීම අනුව බුදුන් වහන්සේ එහි පැමිණ දහම් අනුසාසනා වදාළහ. ඒ දේශනාව අසා සතුටට පත් තෙරුන් අනාගාමිබව ලබා අපවත්වූහ. **සටහන:** සංයු.නි: (4) සළායතනසංයුත්ත:1.8.10 ඵග්ගුන සූත්‍රය, පි,144 මේ තෙරුන් ගැන දක්වා ඇත. **මූලාශ්‍රය**: අංගු.නි: (4) 6 නිපාත: මහාවග්ග: 6.2.1.2 ඵග්ගුන සූත්‍රය, පි.178.

**බ**

**බක**

▲**බක්කුල තෙර -**Bakkula Thera: නිරෝගිසුවය ඇති -අප්පාබාධා- භික්ෂුන් අතරෙන් බක්කුල තෙරුන් අග්‍රවේ. ළදරු වියේදී මාළුවෙක් විසින් ගිල ගත්තද අරුම පුදුම ලෙසින් ජීවිතය රැකුණි. වයස අවුරුදු 80 දී පැවිදිව,දින 7 කින් අරහත්බවට පැමිණියහ. **බලන්න**: EAN:note:107, p.585. **මූලාශ්‍ර:** අංගු.නි: (1) 1 නිපාත: එතදග්ග පාළිය සූත්‍ර, පි. 84**,** EAN:1:Foremost, p. 44.

▼ **ම.නි: බක්කුල සූත්‍රයේදී,** මේ තෙරුන් ඔහුගේ මිත්‍ර අචේල කස්සප හා පැවති සාකච්චාව පෙන්වා ඇත.

▼ **මේ තෙරුන්ගේ ථෙර ගාථා**: බු.නි: ථෙරගාථා:3.1.3 , පි.116.

"යම් තැනක සසරදුක නිරුද්ධ වේ නම් සම්බුදුන් විසින් දෙසන ලද ඒ ශෝකරහිත වූ රාගාදී රජස් රහිතවූ නිරුපද්‍රවූ නිවන ඒකාන්තයෙන්ම මනා සුවය වේ".

▼**ථෙර** අපදානයේ, මෙතුමන් අනෝමදස්සි බුදුන් වහන්සේ සරණ යැම, ඒ බුදුන් වහන්සේට බෙහත් ලබාදීමේ විපාක ආදිය විස්තරාත්මකව පෙන්වා ඇත. **මූලාශ්‍රය:** බු.නි:අපදානපාලි1: 366, පි.638.

**බල**

▲ **බිලන්ගික භාරද්වාජ තෙර-** Bilangika Bharadvaja Thera

රජගහනුවර වැසි මෙතෙම, තම ගෝත්‍රයේ පිරිස බුදුන් වහන්සේ වෙත පැවිදිවීම ගැන කිපි උන්වහන්සේ හමුවට පැමිණ නිහඬව සිටියේය. ඔහුගේ සිත, තම සිතින් දුටු බුදුන් වහන්සේ මෙසේ වදාළහ:

**"යමෙක් නිරපරාධ, නිකෙලෙස් කෙනෙකුට අපරාධ කරන්නේ නම්, උඩු සුළඟට විසි කල සියුම් දූවිලි මෙන් එය ඔහු කරාම පැමිණේ..."**

බුදුන් වහන්සේගේ දේශනාව අස පැහැදුන මෙතුමා, පැවිදිව අරහත්වය ලබා ගත්බව මෙහි දක්වා ඇත. **මූලාශ්‍රය:** සංයු.නි (1) :සගාථවග්ග: බ්‍රාහ්මණ සංයුත්ත: 7.1.4 බිලන්ගික සූත්‍රය, පි.318.

▲ **බෙලට්ඨිසීස තෙර-** Belatthisisa Thera**:** මේ තෙරුන්, ආනන්ද තෙරුන්ගේ උපාද්දායා බව, එතුමන් බලවත් පිළිකා රෝගයකින් පෙළුන බව මෙහි දක්වා ඇත. **මූලාශ්‍රය:**වි.පි.මහාවග්ග පාළිය1, චීවරඛන්ධ, 7:පි.218

**බහ**

▲**බාහිය තෙර-**Bahiya thera: මේ තෙරුන් දහම ශ්‍රවනය කිරීමෙන් රහත්වුබව මෙහි දක්වා ඇත. **සටහන**: * මේ තෙරුන් බාහිය දාරුචාරිය රහතන්වහන්සේ නොවේ. **මූලාශ්‍ර:** සංයු.නි: (4) සළායතනවග්ග: වේදනාසංයුත්ත:ඡන්නවග්ග: බාහිය සූත්‍රය, සංයු.නි: (5-1-) මහාවග්ග: සතිපට්ඨානසංයුත්ත:නාලකවග්ග: බාහිය සූත්‍රය.

▲ **බාහිය දාරුචිරිය රහතන්වහන්සේ-** Arahant Bahiya darichariya ක්‍ෂණික අභිඥා - **ඛිප්පාභිඤ්ඤා** ලත් භික්ෂුන් අතරෙන් බාහිය දාරුචිරිය රහතුන් අග්‍රවේ. **බලන්න**: අග්‍ර ශ්‍රාවක භික්ෂුන්, EAN:note: 99. p.585. **මූලාශ්‍ර:** අංගු.නි: (1) 1 නිපාත: එතදග්ග පාළිය සූත්‍ර, පි. 84**,** EAN:1:Foremost, p. 44.

▼ **බුදුන් වහන්සේ** වැඩසිටි සමයේ, තපස්ව්‍රතය දැරූ මොහු තමන් රහත්යයි සිතාගෙන ජීවත්විය. පෙර භවයක මිත්‍ර දෙවියෙක් ඔහු ගැන අනුකම්පා කර, බුදුන් වහන්සේ බැහැදැකීමට අනුබල දුන්හ. බුදුන් වහන්සේ දෙසු කෙටි දහම් පදයකින් අරහත් මගඵල ලැබ, කෙටි වේලාවකදී ගවදෙනක් ඇන අපවත්වුහ. චාරිත්‍ර අනුකූළව, පැවිදි බව නො ලැබුවද, මෙතුමා අරහත් භික්ෂුවක් බවද, එතුමන් වෙනුවෙන් ස්ථූපයක් සාදන්න යයි බුදුන් වහන්සේ අවවාද වදාළහ. **බුදුන් වහන්සේ මේ තෙරුන්ට වදාළ කෙටි ගාථාව:**

**"තස්මාතිහ තෙ බාහිය, එවං සික්ඛිතබ්බං: 'දිට්ඨෙ දිට්ඨමත්තං භවිස්සති, සුතෙ සුතමත්තං භවිස්සති, මුතෙ මුතමත්තං භවිස්සති, විඤ්ඤාතෙ විඤ්ඤාතමත්තං භවිස්සති'ති. ...යතො ඛො බාහිය, දිට්ඨෙ දිට්ඨමත්තං... විඤ්ඤාතෙ විඤ්ඤාතමත්තං භවිස්සති, තතො ත්වං බාහිය න තෙන. යතො ත්වං බාහිය න තෙන, තතො ත්වං බාහිය න තත්‍ථ. යතො ත්වං බාහිය න තත්‍ථ, තතො ත්වං බාහිය නෙවිධ, න හුරං, න උභයමන්තරෙ. එසෙවන්තො දුක්ඛස්සා" ති.**

"...බාහිය, ඔබ මෙසේ හික්මිය යුතුය: 'දකිනා ලද දේහි (රූපයෙහි) දක්නා ලද්ද පමණකි, අසන ලද දේහි (ශබ්දයෙහි) අසන ලද්ද පමණකි,දන්නා ලද්දෙහි (ගන්ධ, රස, කයේ පහස) දන්නා ලද්ද පමණකි, සිතෙන් සිතන

ලද්දෙහි, සිතන ලද්ද පමනකි... යම් කල්හි බාහිය, දකිනා ලදදෙයේ (රූපයෙහි) දක්නා ලද්ද පමණක් වන්නේද....ඒ හෙතුවෙන් ඔබ එහි නො බැඳුනු කෙනෙක් වේ. යම් කල්හි (ඒ ආයතන යන්හි) නො බැඳුන කෙනෙක් වේද, එම හේතුවෙන්, ඔබ මේ ලොව නො උපදින්නේය, පරලොව ද නො උපදින්නේය, දෙලොවම නො උපදින්නේය. මෙයම දුක කෙළෙවර වීමය''. බුදුන් වහන්සේ මේ රහතුන් ගැන මෙසේ වදාළහ:

**'' අර්ථ විරහිත ගාථාවෝ දහසක් වුවත් උතුම් නොවේ. එක් ගාථාවක් අසා,යම් පුද්ගලයෙක් සන්සිඳුනේද, ඒ බඳු එක ගාථා පදය ශ්‍රේෂ්ඨය''. බලන්න:** බු.නි: උදාන පාලිය: 1.10 බාහිය සූත්‍රය, පි.170.

▼ **අපදාන පාළියට අනුව** බාහිය රහතුන්, බුදුන්වහන්සේ වෙතින් දහම් අසා, රහත්මග ඵල ලබා, සැවත්නුවර සැරිසරන විට, ගවදෙනක විසින් ඇන පහරදී කසල ගොඩකට වැටුනහ. මරණාසන්නවූ, එඋතුමන්, එම තැන සිට, තම පෙර ජීවිතය පිලිබඳ තොරතුරු පැවසුහ.

'' පදුමුත්තර බුදුරජානන් වහන්සේ පහලවූ කළ, මිනිසත්බව ලැබූ මම ඒ මුනිඳු දැකගැනීමට වාසනාවන්ත විය. ක්ෂනිකව දහම අවබෝධ කරගත් භික්ෂුවක් ගේ ගුණ, බුදුහිමි විසින් පසසමින් කල දේශනාව අසා මගේ සිත ඔද වැඩිණි. ඒ සතුටින් මම මහර්ෂි වූ, ඒ උතුම් බුදුන්වහන්සේ හා ශ්‍රාවක සංඝයාට වත්පිළිවෙත් කර, සතියක් දන්පැන් පිලිගන්නවා, බුදුහිමි පා නැමැද එම තනතුර පැතුවෙමි. කාශ්‍යප බුදුහිමි දවස, පැවිදිවූ මම, බුදුහිමි පිරිනිවීමෙන් පසු සසුන පිරිහියන බව දැක, තවත් මිතුරු භික්ෂුන් සත් දෙනෙක් සමග පර්වතයකට නැග, මහා විරියෙන් යුතුව බවුන් වැඩූවෙමු. පිරිසිදු සිල් ඇතිව එසේ බුදුසසුන කල අප ඒ භවයෙන් චුතවී දෙව්ලොව පහළවූහ. **සටහන**: අටුවාවට අනුව, කස්සප බුදුන් වහන්සේ වැඩසිටි කල එකට මහණ දහම් පුහුණුකළ මිතුරන් ලෙසින් පෙන්වා ඇත්තේ: බාහිය, පුක්කුසාති, සභිය, දබ්බමල්ල පුත්ත කුමාර කස්සප තෙරුන්ය. **මූලාශ්‍රය:** බු.නි: අපදාන පාළි 2-1:536- බාහිය තෙර, පි. 338.

▲**බාහුන තෙර-** Bahuna Thera: තථාගතයන් කෙළෙස් වලින් මිදී වාසය කරන අන්දම ගැන, මේ තෙරුන් කළ විමසීමක් මත බුදුන් වහන්සේ මෙසේ වදාළහ:

''බාහුනය, දස දහමින් යුත්ව...1) රූපය 2) වේදනාව 3) සංඥා 4) සංස්බාර 5) විඥානය 6) ජාතිය 7) ජරාව 8) මරණය 9) දුක 10) කෙලෙශයන් ගෙන් වෙන්වී තථාගතයෝ වාසය කරති''. **බලන්න:** තථාගත. **මූලාශ්‍රය:** අංගු.නි: (6) 10 නිපාත: ථෙරවග්ග:10.2.4.1 බාහුන සූත්‍රය, පි.296.

▲ **බ්‍රහ්මදේව තෙර -**Brahmadeva Thera**:** සැවැත්නුවර බ්‍රාහ්මණ කුලයේ උපත ලබා, බුදුන් වහන්සේ සරණ ගිය මේ තෙරුන් අරහත්වය ලැබීම මෙහි දක්වා ඇත. **සටහන**: එම තෙරුන්ගේ මව බ්‍රහ්මදෙවියන් උදෙසා යාග හෝම පවත්වයි, ඒ බව දුටු සහම්පති බ්‍රහ්ම රාජයා, බ්‍රහ්මදේව තෙරුන් ගේ අරහත් ගුණ වර්-ණනා කර, එම තෙරුන්ට අග්‍ර භෝජනය පිරිනමා මතු සැප පිණිස පින් කිරීමට අවවාද කර ඇත. **මූලාශ්‍ර:**සංයු.නි: (1) සගාථවග්ග: බ්‍රහ්මසංයුත්ත: 6.1.3 බ්‍රහ්මදේව සූත්‍රය, පි.280, ESN:6: Brhmasamyutta:3.3 Brhmadeva, p.328,

හ

හග

▲ **හගු තෙර-** Bhagu Thera: මේ තෙරුන් කිම්බිල හා අනුරුද්ධ තෙරුන් හා එක්ව වාසය කර ඇත. බුදුන් වහන්සේ බාලකලොණකාර ගමට වැඩි අවස්ථාවේ මේ තෙරුන්හට අවවාද අනුසාසනා වදාළහ. **බලන්න**: ම.නි: (3) 3.3.8 උපකිලේශ සූත්‍රය, පි.360.

▼**සක්මන් භාවනාව** කරන අවස්ථාවේ නිදිමත ගතිය නිසා බිම පතිතවූ මෙතුමා, වීරිය ඇතිකර සක්මනේ යෙදිසිටින විට සිත සමාහිතව අරහත්වය ලැබූහ. **මේ තෙරුන්ගේ ථෙර ගාථා**: ථෙරගාථා1: 4.1.2 , පි.128. "...මගේ සිත කෙලේසුන්ගෙන් මිදුනේය, දහමේ සුදර්-මත්වය බලන්න, මා විසින් ත්‍රිවිධ විද්‍යාවෝ ලබනලදී, බුදුසසුන කරන ලදී". **සටහන:** මෙ තෙරුන්, නීලවාසි, සානවාසි, ගොපක, එළිකසන්දාන යන තෙරුන් සමග, පාටලීපුත්‍ර නුවර, කුක්කුටාරාමයේ වැඩ වාසය කල්බව මෙහි පෙන්වා ඇත. **මූලාශ්‍රය**: වි.පි:මහාවග්ග පාලි2,චීවරඛන්ධ,31,පි.224.

හද

▲**හද්ද තෙර-** Bhadda Thera: මේ තෙරුන්, ආනන්ද තෙරුන් සමග පැළලුප්නුවර (පටලිපුත්‍ර) කුක්කුටාරාමයේ වැඩ වාසය කිරීම හා ආනන්ද තෙරුන් මෙතුමාට බ්‍රහ්මචරියාව හා අබ්‍රහ්මචරියාව පැහැදිලි කිරීම මෙහි දක්වා ඇත. **සටහන:** 3.3.1 සිල සූත්‍රය, පි.334, ආනන්ද තෙරුන්, මේ තෙරුන්ට කුසලසීලය පැහැදිලි කර ඇත. 3.3.2 ධිති සූත්‍රයේදී ධර්මයේ චිරස්ථායිබව පිණිස අදාළ කරුණු පැහැදිලි කර ඇත. **මූලාශ්‍රය**: සංයු.නි: (5-1) මග්ගසංයුත්ත:1.2.8 කුක්කුටාරාම සූත්‍රය, පි.54.

▲ **හද්දිය (පස්වග) තෙර-**Bhaddiya (Pasvaga) Thera: මෙතුමා පස්වග මහනුන්ගෙන් එක් නමකි. සිදුහත් තවුසා, ඉසිපතනයේ වැඩසිටි සමයේ සෙසු තවුසන් පස් දෙනා සමග එතුමන්ට ඇප උපස්ථානය කළහ. බුදුන් වහන්සේ පළමු දේශනාව වදාළ අවස්ථාවේ ඉසිපතන මිගදායේ වැඩසිටියහ, අනත්තලක්ඛණ දේශනාව අසා අරහත්වය ලැබූහ.පළමුව අරහත්වය ලැබූ ආරිය සංඝයා පස්දෙනාට ඇතුලත්වේ. **බලන්න**: පස්වග මහණුන්.

▲ **හද්දිය කාළිගොධායපුත්ත තෙර -**Bhaddiya Kāḷigodhāyaputta Thera: උසස්කුලවලින් පැවිදි භික්ෂූන් අතරෙන්, හද්දිය කාළිගොධාය පුත්ත අග්‍රවේ. එතුමන්, කපිලවස්තුනුවර කාළිගොධා නම් ශාක්‍ය කුල කාන්තාවගේ පුතණුවන්ය. අනුරුද්ධ තෙරුන් ගේ ගිහිකල මිතුරාය. ඔවුන් දෙනම එකමවර පැවිදි ජීවිතයට ඇතුල්වූහ. **බලන්න**: EAN: note no 79, p. 585. **සටහන**: කාළිගොධා ශාක්‍ය කුල කාන්තාව ගැන **බලන්න**: උපග්‍රන්ථය:3. **මූලාශ්‍ර:** අංගු.නි: (1) 1 නිපාත: එතදග්ග පාළිය සූත්‍ර, පි. 84**,** EAN:1 Foremost, p. 44.

▼ **හද්දිය තෙරුන්**, ගිහිකල ශාක්‍ය රජෙක්වූහ. මහණ වීමෙන් තමන ලැබූ සුවය, ආරක්ෂාව පිළිබඳව කළ විස්තරය මෙහි දක්වා ඇත. **මූලාශ්‍රය:** ඛු.නි:උදාන පාලිය: හද්දිය සූත්‍රය.

▼ **මේ තෙරුන්ගේ ථෙර ගාථා**: ඛු.නි: ථෙරගාථා:20.1.7, පි.242.

“මා විසින් ඇත්කඳ නැගී සැරිසරනලදය, සියුම් වස්ත්‍ර දරන ලදය, මනා මසින් හැනු හැල් බත් වළඳන ලදී...අද, ශිලාදී ගුණයෙන් හදුවූ, ශ්‍රමණ ධර්මයෙහි නිරතවූ පින්ඩආහාරයෙහි ඇලුන, උපාදාන රහිතවූ කාළිගොධාපුත්‍ර ඒ භද්දිය තෙමේ ධ්‍යාන කරති” .

▼ **අපදාන පාලියේදී**: පළමුව පදුමුත්තර බුදුන් සරණ යාම ආදී පෙර ජීවිත විස්තර දක්වා ඇත. බුදුන් වහන්සේට අහාර දාන, ආසන, ඇතිරිලි ආදී මහා දාන පින්කම් කළ බලයෙන් දිගු කලක් දෙව් මිනිස් සැප ලැබුහ. **මූලාශ්‍රය:** බු.නි: අපදාන පාලිය1: 43 කාළිගොධාපුත්‍ර භද්දිය ථේර අපදානය, පි. 198.

▲ **භද්දජි තෙර-** Baddaji Thera: මේ තෙරුන්, කොසඹෑනුවර, ඝෝසිතාරාමයේ ආනන්ද තෙරුන් හා වැඩ වාසය කිරීම, ආනන්ද තෙරුන්, ඔහුට ආසව ක්‍ෂයකිරීමේ උතුම්බව-අග්‍රබව දේශනා කිරීම මෙහි දක්වා ඇත. **මූලාශ්‍රය:**අංගු.නි: (3) 5 නිපාත: 5.4.2.10 භද්දජි සූත්‍රය, පි.348.

▼ **මේ තෙරුන්ගේ ථෙර ගාථා**: බු.නි: ථෙරගාථා:2.3.2 ,පි.98.

“ පෙරකල ‘පනාද’ නම් ප්‍රසිද්ධ රජෙක්විය. ඔහුගේ ප්‍රසාදය රනින් කර ඇත… ( බොහෝ විසිතුරුය)… ධජ බහුලය...සදහසක් නළුවෝ නැටුහ… ඒ රජ තෙමේය”.

▲**භද්‍රාලි තෙර-** Badrali Thera: බුදුන් වහන්සේ සංඝයාට, එකවේල භෝජනය- පෙර බත් වැළඳීම ට අවවාද වාදාළ අවස්ථාවේදී, මේ තෙරුන් එම අවවාදය පිළිනොගැනීම, පසුව ඒ ගැන පසුතැවිලිවී, බුදුන් වහන්සේගෙන් සමාව අයැදීම පිළිබඳ විස්තර මෙහි දක්වා ඇත. **සටහන:** මෙහිදී බුදුන් වහන්සේ, අජානිය අශ්ව උපමා ධම්ම පරියාය වදාළහ. **මූලාශ්‍රය:**ම.නි: (2) 2.2.5 භද්‍රාලි සූත්‍රය, පි.190.

▼ **මේ තෙරුන්ගේ අපදානය:** බු.නි: අපදානපාලිය 2-1: 411, පි.78.: සුමේධ බුදුන් වහන්සේ හිමවතට වැඩම කළ අවස්ථවේදී, උන්වහන්සේගේ කුටිය පිරිසිදු කර මල් අතුරා අලංකාර කිරීම, ඒ පින් බලයෙන් බොහෝ කල් දෙව්මිනිස් සැප විඳ, ගෝතම බුදුන් වහන්සේ වෙත පැවිදිවීම මෙහි විස්තර කර ඇත.

“බුද්ධශ්‍රේෂ්ඨයන් වෙත පැමිණීම මට ස්වාගාතවිය...බුදු සසුන් කරන ලදී”.

▲ **භද්දවග්ගිය ( කුමාර) තෙරුන්-** Bhaddavaggiya Theras: තමන් සෙවීම- තමා ගැන සොයා බැලීම උතුම් සෙවීම යයි බුදුන් වහන්සේ මේ කුමාරවරුන්ට වදාළහ. බුදුන් වහන්සේ කෙරෙහි ප්‍රසාදය ඇතිකරගත් ඔවුන් පැවිදිවුහ. **මූලාශ්‍ර:**වින.පි : මහවග්ග පාලිය1: භද්දවග්ගිය කුමාරවරු, පි. 127.

▲ **භද්‍රාවුධ (මානවක) තෙර-**BadrawudaThera: බාවරී බ්‍රාහ්මණ ගේ සිසුවූ මෙතුමා ලෝකෝත්තර දහම ගැන බුදුන් වහන්සේ විමසීම හා උන්වහන්සේ වදාළ පිළිතුරු මෙහි දක්වා ඇත:

“භද්‍රාවුධ, අතීත අනාගත වර්තමානය පිළිබඳ සැමදේටම ඇති තන්හාව දුරලන්න, ඒවාට ඇති බැඳීමනිසා මාරයාගේ බැඳීමට හසුවේ”.

**බලන්න:** තණ්හාව. **සටහන:** බුදුන් වහන්සේ වදාළ දහම අවබෝධ කරගත් මෙතුමා හා අනිකුත් සිසු පිරිස බුදුසසුනේ පැවිදිවූහ. **මූලාශ්‍රය:** ඛු.නි.සුත්තනිපාත: පාරායනවග්ග:වස්තුගාථා: පි,326, 5-12 භද්‍රාවුධ මානවක, පි.358.

**භණ්**

▲ **භණ්ඩු භික්ෂුව**-Bhikkhu Bhandu: ආනන්ද තෙරුන්ගේ ශිෂ්‍යයෙකි. ඔහුට දහම කථා කිරීම ගැන මානයක් තිබුබවද, බුදුන් වහන්සේගේ අවවාද අසා, සමාව ගෙන යහපත්වූ බව මෙහි දක්වා ඇත. **මූලාශ්‍ර:** සංයු.නි: (2): නිදානවග්ග:කස්සපසංයුත්ත: ඔවාද සූත්‍ර 3 කි, පි. 332, ESN:16: Kassapasamyutta: Ekhortation 3 suttas, p. 813.

**භර**

▲ **භාරද්වාජ තෙර-** Bharadvaja Thera: මේ තෙරුන් බුදුන් සරණයෑම, පැවිදිවීම, රහත්බව ලැබීම ආදී විස්තර පිණිස. **බලන්න:** වාශිෂ්ඨ තෙර.

▲ **මේ තෙරුන්ගේ ථෙර ගාථා:** ඛු.නි:ථෙරගාථා:2.3.9, පි.102.

" මාර සේනාව දිනන ලද අග්‍ර මාර්ගයේ ප්‍රඥාව ලැබූ වීරයෝ (බුද්ධ ශ්‍රාවකයෝ) ගිරිගුහාවේ සිංහයන් ලෙසින් අභීත නාදය කරති".

▲ **භාරද්වාජ (රජගහනුවර) ගෝත්‍රික තෙර**- Bharadvaja gothrika Thera: රජගහනුවර බ්‍රාහ්මණයෙක්වූ මොහු, තම බිරිඳ ධනංජනි බැමිණිය බුදුගුණ පැවසීම නිසා කිපී බුදුන් වහන්සේ බැහැදකිමට පැමිනිණ මෙසේ ඇසූහ: " කුමක් නසා සුවසේ සිටීද…?" බුදුන් වහන්සේ මෙසේ වදාළහ:

"...ක්‍රෝධය නසා සුවසේ සිටි, ක්‍රෝධය නසා ශෝක නොකරයි, දුක් විපාකයට මුල්වූ, මිහිරි අග ඇති ක්‍රෝධය නැසීම අරියෝ පසසති..." බුදුන් වහන්සේ වදාළ දහම් කරුණු අවබෝධව, පැවිදිවූ මෙතුමා , අරහත්වයට පත්වූ බව මෙහි දක්වා ඇත. **මූලාශ්‍රය**: සංයු.නි: (1) සගාථවග්ග: බ්‍රාහ්මණසංයුත්ත: 7.1.1 ධනඤ්ජානි සූත්‍රය, පි.312.

▲ **භාරද්වාජ (කෝසලදනව්වේ) ගෝත්‍රික තෙර**- Bharadvaja gothrika Thera: ගිහිකල කොසොල් දනව්වේ කෘෂිකර්මාන්තයෙන් ජීවත්වූ මොහුගේ ගව රැල වනයේ ආතරමංවිය. උන් සොයමින් යන ඔහුට වන ලැහැබක වැඩ හුන් බුදුන් වහන්සේ දැකීමට ලැබිණ. තමන්ට ගිහිගෙදර ඇති කරදර: ගවයන් අතරමංවීම, ධාන්‍යාගාරය හිස්බව හා එහි බොහෝ මියන් ඇතිබව, බොහෝ දරුවන් ඇතිබව, බිරිය ගරු සැලකිලි නොකරන බව… ගැන බුදුන් වහන්සේට පැවසූ ඔහු, "මේ මහණ තෙමේ සුව ඇත්තෙක් ය යි' පැවසිය. ඉන්පසුව බුදුන් වහන්සේ එවැනි ගිහිගෙදර කරදර බැඳීම් තමන්ට නොමැතිබව පෙන්වා දුන්විට, බුදුන් වහන්සේ කෙරහි මහා සැදැහැබවක් ඇතිකරගත් ඒ බමුණා මෙසේ පැවසිය:

" ...මං මුලාවූ කෙනෙකුට මග පෙන්වා දෙන සේ….අඳුරෙහි සිටින කෙනෙකුට පහන් එළියක් දෙන සේ...ඔබ වහන්සේ මට දහම පෙන්වා දෙනලදී, මම තිසරණය සරණ යමි….". මෙතුමා පැවිදිව, අරහත්වය ලැබූ බව මෙහි දක්වා ඇත.

**මූලාශ්‍රය**: සංයු.නි: (1) සගාථවග්ග: බ්‍රාහ්මණසංයුත්ත: 7.1.10 බහුධිති සූත්‍රය, පි.328

**ම**

**මග**

▲ **මාගන්දිය තෙර**- Magandiya Thera: කුරුජනපදයේ, පරිබ්‍රාජකයෙක් ලෙසින් පෙරදී වාසය කල සමයේ බුදුන් වහන්සේ ගැන පැහැදීමක් නොවිය, උන්වහන්සේ සැතපුන තණ ඇතිරිය පවා දැකීම ප්‍රසන්න නොවේ යයි පැවසුහ. මේ සූත්‍රයේ බුදුන් වහන්සේ ඔහුට වදාළ දහම් කරුණු අවබෝධ කර, උන්වහන්සේ කෙරහි ශ්‍රද්ධාව පිහිටුවා පැවිදි බවට පත්වී, අරහත්වය ලබා සසර දුකින් මිදුනේය. **මූලාශ්‍රය:** ම.නි: (2) මාගන්දිය සූත්‍රය, පි.304.

▲**මිගජාල තෙර-**Migajala Thera: විසාකා සිටුදුවගේ (උපාසිකාව) හා මිගාර සිටුවරයාගේ පුතෙකි. බුදුන් වහන්සේ:

**"තණ්හා නිරෝධය, දුක්ඛ නිරෝධය"**. යයි දේශනා කරනලද දහම පසක් කොට අරහත්මග ඵල ලබාගති. එකලාව වසනසුළු හෙවත් ඒකවිහාරි වාසය ගැන මිගජාල තෙරුන්ට බුදුන් වහන්සේ මෙහිදී පෙන්වා ඇත **මූලාශ්‍රය:** සංයු.නි (4) සළායතනසංයුත්ත: මිගජාල වග්ග:මිගජාල සූත්‍ර 2, පි.106.

▼ **මේ තෙරුන්ගේ ථෙර ගාථා**: ඛු.නි: ථෙරගාථා:6.1.8, පි.158.

"පසැස් ඇති සුරියබන්ධුවූ බුදුරදුන් විසින් හැම සංයෝජනයන් ඉක්මගිය, සසර වටය නසනසුලු ආරියමග මොනවට දෙසන ලදී..."

**මස**

▲ **මේඝිය තෙර-** Megiya Thera: බුදුන් වහන්සේගේ ගේ උපස්ථායකවූ මේ තෙරුන්, උන්වහන්සේගේ අවවාද නොසලකා භාවනාව පිණිස වෙනත් තැනකට වැඩම කල විස්තරය මේ සූත්‍රයේ දක්වා ඇත. **සටහන:** මෙයට සමාන විස්තරයක් මේ සූත්‍රයේ ද පෙන්වා ඇත:ඛු.නි: උදානපාලිය: 4.1 මේඝිය සූත්‍රය. **මූලාශ්‍රය**: අංගු.නි: (5) 9 නිපාත: සම්බෝධිවග්ග: 9.1.1.3 මේඝිය සූත්‍රය, පි.394.

▼ **මේ තෙරුන්ගේ ථෙර ගාථා**: ඛු.නි: ථෙරගාථා:1.7.6.,පි.64,

" සියලු ධර්මයන්ගෙන් පරතෙරට ගිය මහාවීරවූ සර්වඥයන් වහන්සේ මට අවවාද කළහ, මම උන්වහන්සේගේ ගේ දහම අසා සිහිය ඇතිකර ගතිමි. මා විසින් ත්‍රිවිද්‍යාව ලබනලදී, බුදුසසුන කරනලදී".

▲ **මෝසරාජ තෙර-** Mogharaja Thera: **දළචීවර දරන** භික්ෂුන් අතරෙන් අග්‍ර මොසරාජ තෙරුන්ය. මෙතුමා බාවෙරි බ්‍රාහ්මණ ගේ සිසුන් 16 දෙනාහෙන් කෙනෙකි. බුදුන් වහන්සේ හමුවී, දහම් පැන අසා සැදැහැව ඇතිකරගෙන පැවිදිවුහ. බලන්න: EAN: note:115, p.586. **මූලාශ්‍ර:** අංගු.නි: (1) 1 නිපාත: එතදග්ග පාළිය සූත්‍ර, පි. 84**,** EAN:1: Foremost, p. 44.

▼**මෝඝරාජ තෙරුන්**, පැවිදිවීමට පෙර, මෝඝරාජ මානවක පුත්‍ර ලෙසින් බුදුන් වහන්සේගෙන්, මාරයා ඉක්මවා යාම පිළිබඳව විමසීම දක්වා ඇත- මාරආධිපත්‍යයෙන්- මෘතරාජ මිදීම ගැන බුදුන් වහන්සේ විමසීම හා උන්වහන්සේ වදාළ පිළිතුරු මෙහි දක්වා ඇත:

"මෝඝරාජ, ...සෑම කල්හිම සතියඇතිව (ස්මෘතිමත්ව) සක්කාය දිට්ඨිය දුරුකොට, ලෝකය ශුන්‍ය යයි බලන විට මාරආධිපත්‍යය ඉක්මවා ඇත". **මූලාශ්‍රය**: ඛු.නි.සුත්තනිපාත: පාරායනවග්ග:වස්තුගාථා: පි,326, 5-15 මෝඝරාජ මානවක,පි.364.

▼ **බුදුන් වහන්සේ** මේ තෙරුන්ට සර්වඥයන් ගේ ගුණ හා එතුමන් නමස්කාර කරන භික්ෂූන් පැසසිය යුතුය යි වදාළහ. **මූලාශ්‍රය:** සංයු.නි: (1) දේවතාසංයුත්ත: 1.4.4. නසන්ති සූත්‍රය, පි.66.

▼ **මේ තෙරුන්ගේ ථෙර ගාථා**: ඛු.නි: ථෙරගාථා:2.5.4. පි.112.

"රළු සමක් ඇති, හදුවූ සිතක් ඇති, මෝඝරාජ, සමාහිත සිත් ඇතිව, පැවිදිව, සෙනසුන්වලට නොපිවිස හිමවැටෙන සීතවූ රැය මුළුල්ලේ කෙසේනම් ජීවිතය පවත්වා ගත්තේද?".

▼ **මේ තෙරුන්ගේ අපදානය**: ඛු.නි: අපදානපාලිය 1: 35, පි.183, අපදාන පාලිය 2-1: 540, පි.362. අත්ථදස්සී බුදුන් වහන්සේගේ සමයේ බ්‍රාහ්මණ ගුරුවරයෙක්ව්ය, බුදුන් වහන්සේ , සහ පිරිස සමග වීථි සංචාරය කරන අවස්ථාවේ උන්වහන්සේ දැකීමෙන් සිත පහදවා මෙසේ බුදුගුණ පැවසිය:

"… අඳුරෙන් ගැවසීගත් මේ ලෝකය ඔබ වහන්සේ නගා සිටුවනසේක, ඔබ වහන්සේගේ දහම අසා සැකය නමැති සැඩපහර තරණය කරති…" ඉන්පසු බුදුන් වහන්සේට දඹුවෙල්බෑ මීපැණි පූජා කළහ. බුදුන් වහන්සේ ගැන ප්‍රසාදයට පත්වීම, උන්වහන්සේට සුමධුර දාන පිළිගැන්වීම ආදී යහපත් කම්ම ඵල විපාක නිසා බොහෝ ජීවිතවල දෙව්, මිනිස්, රජ සැප ලැබෙන බව, අවසානයේදී ගෝතම බුදු සසුනේ බුද්ධ ශ්‍රාවකයෙක් වෙනබව බුදුන් වහන්සේ අනුමෝදනා වදාළහ. **සටහන:** ගෝතම බුදුන් දවස, කැත් කුලයේ උපත ලැබූ මෙතුමා, පිය රජගේ ඇවෑමෙන් රජවිය, දරුණු කුෂ්ඨ රෝගයක් නිසා ශරීරයේ දොස් දැක රජසැප හැර බාවරී බ්‍රහ්මණගේ සිසුවෙක් විය. මෙතුමා මෙසේ වදාළහ:

" ක්ෂිනවූ පුණ්‍ය පාප ඇත්තෙමි, සියලු රෝගයන්ගෙන් වෙන්වූවෙමි, දර නොමැති ගින්නක් මෙන් ආසව රහිතව පිරිනිවන් පාමි".

**මත**

▲ **මෙත්තගු (මානවක) තෙර-**Mettagu Thera: ගිහි ජීවිතයේ බාවරී බ්‍රාහ්මණ ගේ සිසුවූ මොහු, දහම් කරුණු පිළිබඳව බුදුන් වහන්සේ විමසුහ:

"...ඔබවහන්සේ...ඥානයේ පරතෙරට පැමිණියහ...ලෝකයේ ඇති දුක කෙසේ උපන්නේද?..." සියලු දුක් තණ්හාව මුල් කර ඇත යයි බුදුන් වහන්සේ පෙන්වා ඇත. දහම අවබෝධ කර පැවිදිවුහ. **මූලාශ්‍රය**: ඛු.නි.සුත්තනිපාත: පාරායනවග්ග:වස්තුගාථා: 5-4 මෙත්තගුමානවක, පි,364.

▼ **මේ තෙරුන්ගේ අපදානය**: ඛු.නි: අපදානපාලිය 2-1:403, පි.28.: සුමේධ බුදුන් දවස හිමවතේ තවුසෙක් ලෙසින් වාසය කිරීම, එහිදී බුදුන් වහන්සේ දැක පැහැදී ගිතෙල් දානයක් පිරිනැමීම, ඒ පුණ්‍ය කම්මය හේතුකොට දිගු කාලයක් දෙව් මිනිස් සැප විඳ ගෝතම බුදුන් දවස උපත ලැබීම. "බුද්ධශ්‍රේෂ්ඨයන් වෙත පැමිණීම මට ස්වාගතවිය, ත්‍රිවිද්‍යා ලබනලදී, බුදු සසුන කරන ලදී".

**මල**

▲ **මාලුන්ක්‍යපුත්ත තෙර-**Mālunkyāputta Thera: මේ තෙරුන් බුදුන් වහන්සේ සමීපයෙහි වැඩ වාසය කිරීම, අරහත්වය ලබා ගැනීම ආදී විස්තර මේ සූත්‍රයන්හි දක්වා ඇත. **මූලාශ්‍ර:** අං.ගු.නි: (2) 4 නිපාත: 4.6.4 මාලුඞක්‍ය පුත්ත සූත්‍රය, පි.498., සං.යු.නි: (4) සළායතනවග්ග: වේදනාසංයුත්ත:1.10.2 මාලුඞක්‍ය පුත්ත සූත්‍රය, පි.181,ම.නි: (2) 2.2.4 මහා මාලුන්ක්‍යපුත්ත සූත්‍රය,පි.104 හා 2.2.3 චූල මාලුන්ක්‍යපුත්ත සූත්‍රය,පි.167.

▼ **මේ තෙරුන්ගේ ථෙර ගාථා**: ඛු.නි: ථෙරගාථා:6.1.5 පි.156,2015, පි.234. "ප්‍රමාදවූ සත්වයාගේ තණ්හාව මාලුවා වැලක් මෙන් වැඩේ. හෙතම වනයෙහි එල සොයායන වඳුරාමෙන් හවයෙන් හවයට දිව යයි".

**මහ**

▲**මහක තෙර-**Mahaka Thera: මහක තෙරුන්, මචඡිකාසණ්ඩයේ, චිත්ත ගහපතිගේ, අම්බාටක නම් වනයේ වැඩවසන සමයේ සෘද්ධි පෙළහර පෑ බව මේ සූත්‍රයේ පෙන්වා ඇත. **මූලාශ්‍රය**: ස.නි:චිත්තසංයුත්ත:7.1.4 මහක සූත්‍රය, පි.558.

▲ **මහා කච්චායන තෙර -**Mahākaccāna Thera: මහා කච්චිචාන තෙරුන් අවන්ති ප්‍රදේශයේ බ්‍රාහමණ කුලයක් උපත ලබා ඇත. සියලු යස ඉසුරු හැර බුද්ධ ශ්‍රාවකයෙක්වූහ. බුදුන් වහන්සේ කෙටියෙන් වදාළ දහම විස්තරාත්මකව අරුත් දැක්වීමේ කුශලතාවය ඇති ( සංඛිත්තෙන භාසිතස්ස විත්ථාරෙන අත්ථං විභජන්තානං) භික්ෂූන් අතරින්, මේ තෙරුන් අග්‍රය. **මූලාශ්‍ර:** අං.ගු.නි: (1) 1 නිපාත: එතදග්ග පාළිය සූත්‍ර, පි. 84**,** EAN:1: Foremost, p. 44. **සටහන්:** * මහා කච්චිචාන තෙරුන් අරුත් විග්‍රහ කරනලද ප්‍රසිද්ධ සූත්‍ර දේශනා: ම.නි: මධුපිණ්ඩික සූත්‍රය. සං.යු.නි: (3): ඛන්ධවග්ග: නකුලපිතුවග්ග: 1.1.1.3 හලිද්දාකාණි සූත්‍රය: මෙහිදී බුදුන් වහන්සේ, මාගන්දිය බ්‍රාහ්මණට දේශනා කරනලද දහම් කරුණු, මහාකච්චායන තෙරුන් විසින් විස්තරාත්මකව පෙන්වා ඇත. **බලන්න:** ඛු.නි:සු.නි: අට්ටකවග්ග:4-9 මගන්දිය සූත්‍රය, පි.284.,අං.ගු.නි:10 නිපාත: 10.1.3.6.කාලී සූත්‍රය. ** **ම.නි**: **මධුර සූත්‍රයේ**: මහා කච්චිචාන තෙරුන් හා මධුරාපුර, අවන්තිපුත්‍ර රජතුමා හා සතර කුලයන් පිලිබඳ වූ සංවාදයක් දක්වා ඇත. මහා කච්චිචාන තෙරුන් ගේ දේශනය අවසානයේ දී රජතුමා බුදුන් සරණ ගියහ. **බලන්න:**ම.නි: මධුරා සූත්‍රය.

▼ **මහා කච්චිචාන තෙරුන්ගේ ගුණ කථනය**: එක් සමයක, මහා කච්චිචාන තෙරුන්, මධුරා පුරයේ, ගුන්දා වනයේ වැඩ සිටින සමයේ, ඒ රට රජවසිටි අවන්තිපුත්‍ර රජතුමා මෙසේ පැවසුහ:

**"...ශ්‍රමණ කච්චාන තෙරණුවන් ගැන මෙවන් කල්‍යාන කිර්ති ශබ්දයක් උස්ව පැතිරේ: එතුමන්, පණ්ඩිතය, ව්‍යක්තායහ, නුවණැතියහ, බහුශ්‍රැතයහ, චිත්‍රකථිකය, කල්‍යාන වදන ඇතියහ. වැඩිහිටි අරහත්ය...".** **සටහන**: මේ සූත්‍රය මහා කච්චාන තෙරුන් දේශනා කර ඇත්තේ බුදුන් වහන්සේගේ පරිනිබ්බානයෙන් පසුවය.**බලන්න:**ම.නි: මධුරා සූත්‍රය.

▼ **විස්තර පිණිස බලන්න:** මහා කච්චායන භද්දේකරත්ත සූත්‍රය, ම.නි, මහා කච්චායන සූත්‍රය.

▼ **මෙතුමා,** ලෝහිච්ච බමුණාට ධර්මය දේශනා කොට ඔහු ගිහි උපාසකයෙක් කිරීම මෙහි විස්තරකර ඇත. **මූලාශ්‍රය:** සංයු.නි: (4): සළායතනවග්ග:වේදනාසංයුත්ත: ගහපතිවග්ග: 1.13.9 ලෝහිච්ච සූත්‍රය, පි.266.

▼ **මෙතුමා සංඝයාට** අවකශාධිගමය- ෂඩ් අනුස්මෘති පිළිබඳව වදාළ විස්තරය මෙහි දක්වා ඇත. **බලන්න**: අවකාශාධිගමය. **මූලාශ්‍රය:** අංගු.නි: (4) 6 නිපාත:අනුත්තරියවග්ග: 6.1.3.6 මහා කච්චාන සූත්‍රය, පි.78.

▼ **මේ තෙරුන්ගේ ථෙර ගාථා**: ඛු.නි: ථෙරගාථා:8.1.1. පි.176.

"සප්‍රාඥ තෙමේ ධනයෙන් පිරිහුණද ජිවත්වේ, එහෙත්, ප්‍රඥාව නොලැබ ධනය ඇතිවිට එය ජීවත්වීම නොවේ".

▼ **මේ තෙරුන්ගේ අපදානය**: ඛු.නි: අපදාන පාලිය 1:33, පි.178, අපදානපාලිය 2-1, පි.312.: පදුමුත්තර බුදුන් දවස, උන්වහන්සේට සත් රුවනින් කළ අසුනක් හා රන් ධජ පූජා කළහ, එම පුණ්‍ය කම්මයේ මහිමයෙන් දිගුකලක් දෙව් සැප හා රජ සැප ලැබූහ. ගෝතම බුදු සසුනේ සැකෙවින් දෙසන ලද දහම් පද විස්තරාත්මකව දැක්වීමට අග්‍ර වන්නේය යයි පදුමුත්තර බුදුන් වහන්සේ අනුමෝදනා වදාළහ.ගෝතම බුදුන් දවස, උදේනි නුවර, චන්ඩප්‍රදෝත රජුගේ ත්‍රිවච්ඡ පුරෝහිත බමුණාගේ හා චන්දිමා බැමිණියගේ පුතුව, රන්පැහැ සමක් ඇතිනිසා කච්චායන ලෙසින් හැඳින්වීම, වේදයේ පර තෙරට යාම, රජුගේ නියමයෙන් බුදුන් වහන්සේ බැහැදැකීම, නිමල බුදු වදන් අසා තමන් කැටිව ආ සත්දෙනා සමග පැවිදිවීම විස්තර කර ඇත.

▲ **මහා කොට්ඨිත තෙර** -Mahākoṭṭhita Thera: බුදුන් වහන්සේ, පිළිසිඹියා (පතිසම්භිදා -analytical knowledge) ලත් භික්ෂූන් අතරෙන් මහා කොට්ඨිත තෙරුන්, අග්‍ර යයි වදාළහ. **බලන්න**: අග්‍රතම ශ්‍රාවකයන්, EAN:note:101, p.585.**මූලාශ්‍ර:** අංගු.නි: (1) 1 නිපාත: එතදග්ග පාළිය සූත්‍ර, පි. 84**,** EAN:1:Foremost, p. 44. **සටහන:** ම.නි. මහාවේදල්ල සූත්‍රයේ, මෙතුමන් හා සැරියුත් තෙරුන් අතරවූ දහම් කතාවක විස්තර දක්වා ඇත.

▼ **මේ තෙරුන්ගේ ථෙර ගාථා:** ඛු.නි: ථෙරගාථා:1.1.2 පි.35.

"සන්සුන් ඉඳුරන් ඇති පවින් වැලකුණු නුවණින් පිරික්සා බලන සුළු, උඩඟු නැති මේ මහණ, සුළඟින් රුක් පතක් පතිත කරන ලෙසින්, පාප ධම්ම දුරු කර ඇත"

▼ **මේ තෙරුන්ගේ අපදාන:** ඛු.නි: අපදාන පාලිය 2-1:537, පි.346.

පදුමුත්තර බුදුන් දවස, හංසවතිනුවර, වේදයේ පර තෙරට පැමිණි බ්‍රාහ්මණයෙක්වී සිටීම, බුදුන් වහන්සේ බැහැදැක දහම් අසා සතුටට පත්වීම, පිළිසිඹියාවෙන් අග්‍ර ශ්‍රාවකයෙක් දැක ඒ තනතුර පැතීම, බුදුන් වහන්සේ හා සංඝරත්නයට මහා දාන පූජා කිරීම, ඉන් පසු පුණ්‍ය බලයෙන් බොහෝ වාරවල දෙව් මිනිස් සැප ලැබීම, ගෝතම බුදුන් දවස ධනවත් බමුණු කුලයක උපත ලැබීම, පියා අස්සල්යාන බ්‍රහ්මණ දහම අසා අරහත්වීම, බුදුන් වහන්සේ වෙත පැවිදිවීම, මහා මුගලන් තෙර ආචාර්-යවරයාවීම, සැරියුත් මහා තෙරුන් උපාධ්‍යායා වීම ආදී විස්තර දක්වා ඇත.

▲ **මහා කප්පින තෙර-** Mahākappina Thera: භික්ෂුන්හට ඔවාද-අවවාද දෙන භික්ෂුන් අතුරින් මේ තෙර අග්‍ර වේ. ගිහි ජීවිතයේදී ප්‍රත්‍යන්ත ජනපදයක්වූ කුක්කුටවත්ති යේ රජෙක්ව සිට, දහම අසා පැහැදී රාජ්‍ය හැරදමා, බොහෝ පිරිස හා අගබිසව අනෝජා සමග බුදුන් වහන්සේ බැහැදැක පැවිදිවූහ. මෙතුමා, 'එහි භික්ඛු' බවින් පැවිද්ද හා උපසම්පදාව ලැබූහ. **බලන්න**: EAN: note no.112, p.586, ESN: note: 400, p.991. **මූලාශ්‍ර:** අංගු.නි: (1) 1 නිපාත: එතදග්ග පාළිය සූත්‍ර, පි. 84**,** EAN:1:Foremost, p. 44.

▼**බුදුන් වහන්සේ** මහා කප්පින තෙරුන් ගේ ගුණ මෙසේ වදාළහ:

"...මහණෙනි, තෙල මහණ මහත් ඍද්ධි ඇත්තෙකි, මහා ආනුභාව ඇත්තෙකි, ඔහු විසින් නොලත් සමාපාත්තියක් දැකීම සුලභ නොවේ... මග බඹසර අවසන්කොට මේ අත් බවයේදීම, විශිෂ්ඨ ඥානය ලබා අරහත්වය සාක්ෂාත් කර ඇත...". **මූලාශ්‍ර:** සංයු.නි: (2) නිදානවග්ග:භික්ඛුසංයුත්ත: 9.1.11 මහා කප්පින සූත්‍රය, පි.460.

▼ **මහා කප්පින තෙරුන්** ආනාපානසති සමාධිය බහුල කළනිසා, කාය කම්පනයක් නොමැතිව වැඩසිටින බව මෙහි දක්වා ඇත. **මූලාශ්‍රය**: සංයු.නි: (5-2 ) මහාවග්ග: භික්ඛුසංයුත්ත:10.1.7 කප්පින සූත්‍රය, පි.395.

▼සංයු.නි: (1): **බ්‍රහ්මසංයුත්ත:** 6.1.4 අපරාදිට්ඨි සූත්‍රය, පි:286, බුදුන් වහන්සේ බඹ ලොවට වැඩම කළ අවස්ථාවේ, මේ තෙරුන් ඉදූ බලයෙන් එහි පැමිණීම දක්වා ඇත.

▼ **මේ තෙරුන්ගේ ථෙර ගාථා**: ඛු.නි: ථෙරගාථා:10.1.3 ,පි.188.

"...යමකු විසින බුදුන් වහන්සේ දෙසූ පරිදි ආනාපානසතිය සම්පූර්න කොට වඩන ලද්දේද, හෙතම වලාකුළු වලින් මිදුන සඳ මෙන් මෙලොව බබලවයි".

▼ **මේ තෙරුන්ගේ අපදානය**: ඛු.නි: අපදාන පාලිය 2-1:533. පි.322. පදුමුත්තර බුදුන් දවස හංසවතී නුවර නීතිවිශාරද ඇදුරෙක්ව සිටීම, බුදුන් වහන්සේ, භික්ෂුන්ට ඕවාද දෙන අයගෙන් අගතැන්පත් ශ්‍රාවකයෙකුගේ ගුණ වනනාණු අසා ඒ තනතුර ලැබීමට කැමතිවීම, බුදුන් වහන්සේට මහා දාන පිංකම් කර එම තනතුර පැතීම ආදී විස්තර මෙහි දක්වා ඇත. බොහෝ සැප ජීවිත ලැබ බරණැස් නුවර පේෂකාර කුලයක උපත ලබා , පවුල හා දහසක් පිරිවර සමග, 500ක් පසේ බුදුවරුන්ට උපස්ථාන කිරිම, ඒ භවයෙන් චුතව, ඔවුන් සැම තව්තිසාවෙහි පහළවීම, ඉන්පසු ගෝතම බුදුන් දවස හිමවත අසල කුක්කුට පුරයේ කප්පින නම් රජ වීම, පෙරසිටි

පිරිස එහි ඇමතිවරුවීම, ඒ රටට පැමිණි වෙළඳුන් බුදුගුණ අසා ගිහිගෙයින් නික්මීම, මහා ගැඹුරු චන්ද්‍රභාගා නදිය බුදුගුණ මෙනෙහිකර තරණය කිරීම, බුදුන් වහන්සේ බැහැදැක පිරිස සමග පැවිදිවීම, ඒ දහසක් සංඝයාට, අනුසාසනා කර ඔවුන්ටද අරහත් ඵලය ලැබීමට උපකාරිවීම ආදී විස්තර මෙහි දක්වා ඇත.

▲ **මහා කාශ්‍යප තෙර-**Mahakassapa Thera: භාග්‍යවතුන් වහන්සේ ධුතාංග පුහුණුව (ධුතවාද-තපස්කම්-ascetic practices) ලැබූ භික්ෂූන් අතරෙන්, මහා කාශ්‍යප තෙරුන් අග්‍රබව වදාළහ. බුදුන් වහන්සේගේ ගේ පිරිනිවීමෙන් පසු, සාසනය ආරක්ෂා කිරීම පිණිස, ප්‍රථම සංඝායනාව පැවැත්වීමට මුලිකව කටයුතු කලේ මහා කස්සප රහතුන්ය. ගිහිකල මහා ධනය ඇති පිප්පිලි සිටුවරයාවිය. භික්ෂුණියන් අතර, පෙර ජීවිත දැකීමේ නුවණින් අග්‍රවූ මහා භද්දකපිලානි තෙරණිය, මෙතුමන්ගේ ගිහි ජීවිතයේ බිරිඳ වුවාය. **බලන්න:** EAN, notes: 77, p 584. **මූලාශ්‍ර:** අංගු.නි: (1) 1 නිපාත: එතදග්ග පාළිය සූත්‍ර, පි. 84**,** EAN:1 : Foremost, p. 44.

▼ **මහා කාශ්‍යප තෙරුන්** දෙවියන් දෙන දානය නොගෙන, දුගී ජනයා ගෙනෙන් දානය ගැනීම පිලිබඳව මෙහි දක්වා ඇත. බුදුන් වහන්සේ එම කරුණ දැන, තෙරුන්ගේ ගුණ මෙසේ වදාළහ:

**"අනෝකුන් පෝෂණය නොකරන, ප්‍රසිද්ධවූ, ඉන්ද්‍රය සංවරය ඇති, විමුක්ති සාරය ලැබූ, ක්ෂිණ ආශ්‍රව ඇති, රාග දෝස ආදිය දුරුකල, ඒ උතුමා බ්‍රාහ්මණයෙක්ය". මූලාශ්‍රය:** ඛු.නි:උදානපාලිය:බෝධිවග්ග: 1.6 කාශ්‍යප සූත්‍රය, පි.164.

▼ **එක්සමයක කාශ්‍යප තෙරුන්**, පින්ඩපාතය පිණිස දුගී ජනයා සිටින ප්‍රදේශයේ සැරිසරන විට, පින් ගැනීම පිණිස, සක්දෙවිඳු, මිනිස් වෙසක් ගෙන එහි පැමිණි දානය පූජාකළහ. දුගී මිනිසුන් ගේ අවස්ථාව, සක්දෙවින්දු පැහැර ගැනීම ගැන, කාශ්‍යප තෙරුන්, සක් දෙවිඳුට අවවාද කිරීම මෙහි පෙන්වා ඇත. එම සිදුවීම දැක බුදුන් වහන්සේ, තෙරුන්ගේ ගුණ වදාළහ:

**"පින්ඩපාතිකඅංග පුරන, තමාම පූස්නා, ආමිෂයෙන් අනුන් නොපූස්නා, අටලෝ දහමින් නොසැලෙන උප ශාන්තවූ හැම කල්හි සිහි ඇති මහණ හට දෙවියෝ ආදර උපදවති". මූලාශ්‍රය:** ඛු.නි:උදානපාලිය: නන්දවග්ග: 3.7 කාශ්‍යප සූත්‍රය, පි.212.

▼**මෙහිදී බුදුන්වහන්සේ**, මේ තෙරුන්හට, ඔහු මහලුවියේ පසුවන නිසා, තමන්වහන්සේ ළඟ වාසය කරන්න යයි පවසා ඇත. ධුතාංග පුහුණුවේ බොහෝ කලක් වාසය කර එහි ගුණ දකින තෙරුන් තමන් අරණ්‍යවාසය ප්‍රියකරන බව දක්වා ඇත. **මූලාශ්‍රය:** සංයු.නි: (2) නිදානවග්ග: කස්සපසංයුත්ත: 4.1.5 ජින්ණසූත්‍රය, පි.330.

▼සංයු.නි: (1): **බ්‍රහ්මසංයුත්ත:** 6.1.4 අපරාදිට්ඨි සූත්‍රය, පි:286, බුදුන් වහන්සේ බඹ ලොවට වැඩම කළ අවස්ථාවේ, මේ තෙරුන් ඉද්දී බලයෙන් එහි පැමිණීම දක්වා ඇත.

▼ **මේ තෙරුන්ගේ ථෙර ගාථා**: ඛු.නි: ථෙරගාථා: 40.1.1.,පි. 276.

"සම්මා සම්බුදු පියාණන් හැර, තපස්බවින් මා හා සම කෙනෙක් නැත. මම උග්‍ර තපස් දම් (ධුතංග) පුරන්නෙමි. මම බුදුහිමි පිදුවෙමි, උපදෙස් මැනවින් පිලිපැද්දෙමි. මේ පස්කඳ බර බහා තැබුවෙමි, උතුම් දහම අසා මම විමුක්තිය ලැබුවෙමි, මින් මතු යලි උපතක් නම් නැත."

▼ **කාශ්‍යප තෙරුන්ගේ අපදානය:** ඛු.නි:අපදාන පාලි 1: 3, පි. 89. "පෙර පදුමුත්තර බුදුන් වහන්සේ පිරිනිවන් පෑ කල්හි දෙව් මින්සුන් බොහෝ පුජා කලෝය. මම, නෑදෑයන් සමග මහා ස්තුපයක් ඉදි කලෙමි. ඒ පිනෙන් බොහෝ වාර ගණනක් සක්විති රජව සැප වින්දෙමි. අන්තිම භවයේ මහා ධන සම්පත් ඇති බමුණු කුලයක උපත ලබා ඒ සම්පත් හැර පැවිදිවීමි".

▲ **මහා චුන්ද තෙර-** Mahachunda Thera: බුදුන් වහන්සේගේ ජේෂ්ඨ ශ්‍රාවකයෙකි. බුදුන් වහන්සේ ගිලන්ව සිටි අවස්ථාවක, මහා චුන්ද තෙරුන් ලවා බොජ්ඣංග පිරිත දේශනාකරවාගත්හ. **බලන්න**: අංගු.නි: 4, 122 මහා චුන්ද සූත්‍රය.

▼ **එක්සමයක** මහා චුන්ද තෙරුන් චේතිය ජනපදයේ, සහජාති නුවර වාසය කරණ සමයේ භික්ෂුන්හට රහත්බව ප්‍රකාශකිරීම පිලිබඳ උපදෙස් වදාළහ. **බලන්න**: ඥානවාදය. **මූලාශ්‍රය**: අංගු.නි.(6 ) 10 නිපාත: 10.1.3.4. මහාචුන්ද සූත්‍රය,පි. 106.

▼ **මහා චුන්ද තෙරුන්,** මේ සූත්‍රයේදී ධම්ම කථිකබව හා ධ්‍යානයට පැමිණීම ගැන සංඝයාට අනුසාසනා වදාළහ. **බලන්න**: අංගු.නි: (4) 6 නිපාත:122 මහා චුන්ද සූත්‍රය, පි.142.

▼ **මේ තෙරුන්ගේ ථෙර ගාථා**: ඛු.නි: ථෙරගාථා: 2.2.1, පි.92.

"(දහම) අසනු කැමැත්ත නිසා බහුශ්‍රැතබව වැඩේ, ශ්‍රැතය, ප්‍රඥාව වඩයි. ප්‍රඥාවෙන් අර්ථය වටහාගෙන, දැන ගන්නා ලද අරුත සුව ගෙනදේ".

▲ **මහානාම (පස්වග) තෙර-**Mahanama (pasvaga) Thera: පංච වග්ගිය භික්ෂුන් (පස්වග මහණ) අතුරින් එක් නමකි. බුදුන් වහන්සේගේ පළමු දේශනාව- ධම්මචක්කපවත්වන සූත්‍රය වදාරන අවස්ථාවේදී සෙසු පස්වග මහණුන් සමග ඉසිපතනයෙ මිගදායෙ වැඩ සිටියහ. අනත්තලක්ඛණ සූත්‍රය අසා අරහත්වයට පත්විය. **බලන්න: පස්වග මහණුන්**

▲ **මහාපන්ථක තෙර-** Mahāpanthaka Thera: අරූප ධ්‍යානයෙහි (සඤ්ඤාවිවට්ට- transformation of perception) දක්ෂ භික්ෂුන් අතරෙන් මෙතුමා අග්‍රවේ. **සටහන:** අටුවාවට අනුව මහාපාරේ උපත ලැබූ නිසා නම පන්ථක විය, බාල සොහොයුරාද (චූල පන්ථක තෙර) මහාපාරේ උපත ලබුනිසා මෙතුමන් මහා පන්ථක ලෙසින් හඳුන්වන ලදී. මෙතුමා විදර්ශනා නුවණ යහපත් ලෙසින් වඩා ඇත. විස්තර පිණිස **බලන්න**: EAN:note:84, p.585. **මූලාශ්‍ර:** අංගු.නි: (1) 1 නිපාත: එතදග්ග පාළිය සූත්‍ර, පි. 84**,** EAN:1:Foremost, p. 44.

▼ **මේ තෙරුන්ගේ ථෙර ගාථා:**ඛු.නි: ථෙරගාථා: 8.1.3, පි 180.

"යම් දවසක බියනැති ශාස්තෲන් වහන්සේ පළමු කොට දිටිම්ද, ඒ පුරුෂඋත්තමයා දැක මට සංවේගය ඇතිවිය...මා විසින් ත්‍රිවිධ විද්‍යාලබන ලදී, බුදුන්ගේ අනුසසුන් කරනලදී".

▲ **මහා මුගලන් තෙර-** Maha Mugalan Thera: මහා මොග්ගල්ලාන තෙර, ලෙසින්ද හඳුන්වයි. ගිහිනම කෝලිතය.බුදුන් වහන්සේගේ අගසව් දෙනමගෙන් එක නමකි, මහා සෘද්ධිමත් භික්ෂූන් අතරෙන් අග්‍රස්ථානය ගනී. **මූලාශ්‍ර:** අංගු.නි: (1) 1 නිපාත: එතදග්ග පාළිය සූත්‍ර, පි. 84**,** EAN:1:Foremost, p. 44.

▼ **බුදුන් වහන්සේ මේ තෙරුන්ගේ ඉද්දිබල ගැන මෙසේ වදාළහ**:

"...මහණෙනි, ඔබහැම සංවේගයට පමුණුවන කැමති මුගලන් මහණහු විසින් පයේ මහාපටඇඟිල්ලෙන් මේ මුවරමාපාය (පූර්-වාරාමය-මිගාරමාතා ප්‍රසාදය) කම්පිත කරන ලදී...සතර ඉද්ධිපාද වැඩූ හෙයින් ...ඔහුට...මහා සෘද්ධි ඇත... මහා ආනුභාව ඇත...". **සටහන**: සංයු.නි: (5-2) ඉද්දිපාදසංයුත්ත:අයෝගුලවග්ග:7.3.11 මොග්ගල්ලාන සූත්‍රයේද මෙයට සමාන විස්තරයක් ඇත. **මූලාශ්‍රය**: සංයු.නි: (5-2) ඉද්දිපාද සංයුත්ත:පසාදකම්පනවග්ග: 7.2.4 මොග්ගල්ලාන සූත්‍රය.

▼**සංයු.නි: භික්ඛුසංයුත්තය**:9.1.1 මොග්ගල්ලාන සූත්‍රය: මුගලන් තෙරුන් රහත්බව ලැබීමේ විස්තරය දක්වා ඇත:

"...සත්‍ය කියන කෙනක් 'ශාස්තෲන්වහන්සේ විසින් අනුගෘහිත වූ ශ්‍රාවකක් ෂඩ්අභිඥා ඇතිබවට පැමිණියේය'යි පවසන්නේ නම් ඒ මා සඳහා එය කියන්නේය".

▼ **සංයු.නි: මොග්ගල්ලානසංයුත්තය:** මුගලන් තෙරුන් විසින් වදාළ දේශනා පෙන්වා ඇත: **සවිතක්ක, විතක්ක, සුඛ, උපේක්ඛා සූත්‍රයන්හිදී:** සිව් ජානලබාගැනීම දක්වා ඇත. **අරූපසමාපත්ති සූත්‍රයන්හි**: අරූපසමාපත්ති 4 ලබා ගැනීම දක්වා ඇත. **අනිමිත්ත සූත්‍රයේදී:** ඒසමාපත්තිය ලබාගැනීම පෙන්වා ඇත. **සක්ක සූත්‍රයන්හිදී**: තව්තිසා දෙව්ලොවට පැමිණීම හා තිසරණ ගුණ හා සොතාපත්ති අංග පිලිබඳ දේශනා කිරීම දක්වා ඇත.

▼**අංගු.නි: 6 නිපාතය**:දේවතාවග්ග:6.1.4.4 මොග්ගල්ලාන සූත්‍රයේ. මුගලන් තෙරුන් සෘද්ධිබලයෙන් බ්‍රහ්මලෝකයට වැඩමකිරීම දක්වා ඇත.

▼ **සංයු.නි:භික්ෂුසංයුත්ත:**10.1.3 මහානාග සූත්‍රයේ: මුගලන් තෙරුන් ගේ සෘද්බල ගැන දක්වා ඇත. දිවකණ හා දිවඇස යන සෘද්ධි බලයෙන් දුර සිට බුදුන් වහන්සේ සමග දහම කථාකිරීමේ හැකියාව.

▼**මේ සූත්‍රයේදී**: සැරියුත් තෙරුන්, මුගලන් තෙරුන්ගේ සෘද්ධිමත්බව, හිමාල කන්දේ මහාබවට උපමාකරඇත. මහා ආනුභාව ඇති නිසා උන්වහන්සේට, කැමතිනම් කල්පයක් ආයුෂ විඳිය හැකිබව ද දක්වා ඇත. (හිමාල කන්ද උපමාව). **මූලාශ්‍ර**:බු.නි: ඉතිවුත්තක: 4.4. ජුන්හසූත්‍රය, පි.232

▼ **මේ තෙරුන්ගේ ථෙර ගාථා**: බු.නි: ථෙරගාථා:60.1.1. පි. 296.

"වඩනා ලද සිත් ඇති, අන්තිම සිරුර දරන, මම ශාස්තෘන් වහන්සේගේ නියමෙන්, පයේ මහා පට ඇඟිල්ලෙන් මුවරමාපය සැලීමි… බුද්ධ ශ්‍රේෂ්ඨයන්ගේ ඖරසපුත්‍ර තෙමේ බඹහු විසින් අභිවාදනය කරන ලද්දේය".

▼ **මුගලන් තෙරුන්ගේ අපදානය:** ඛු.නි:අපදාන පාලි 1: 2, පි. 85. "අනෝමදස්සි බුදුන් වහන්සේ වැඩසිටින සමයේ, වරුණ නම් නාග රාජයෙක් ව හිමවත වාසය කළාහ. මම බුදුන්වහන්සේ නාග භවනයට වැඩමවා පුද පූජාවන් කළෙමි. පසුව බුදුන් වහන්සේ, අනුමෝදන වදාරන අවස්ථාවේ, මගේ අනාගතය පැවසූහ. ගෝතම බුදුන් ගේ දෙවෙනි අගසව්වන බව, ඉද්දිබල ඇතිව අරහත්වය ලබන බව වදාළහ".

▲ **මහානාම (පස්වග) තෙර-**Mahanama (pasvaga) Thera: මෙතුමා පස්වග මහනුන්ගෙන් එක් නමකි. සිදුහත් තවුසා, ඉසිපතනයේ වැඩසිටි සමයේ සෙසු තවුසන් පස් දෙනා සමග එතුමන්ට ඇප උපස්ථානය කළහ. බුදුන් වහන්සේ පළමු දේශනාව වදාළ අවස්ථාවේ ඉසිපතන මිගදායේ වැඩසිටියහ, අනත්තලක්ඛණ දේශනාව අසා අරහත්වය ලැබූහ.පළමුව අරහත්වය ලැබූ ආරිය සංඝයා පස්දෙනාට ඇතුලත්වේ. **බලන්න**: පස්වග මහණුන්. **සටහන:** මේ තෙරුන්ගේ ථෙර ගාථා,ඛු.නි: ථෙරගාථා: 1.12.5 දක්වා ඇත. එම ගාථා මේ තෙරුන්ගේද නැතහොත් වෙනත් මහානාම තෙරකගේද යන්න පැහැදිලි කර නැත.

**ය**

**යම**

▲**යමක තෙර -**Yamaka Thera: මේ මහණට ඇතිවූ ලාමක දිට්ඨිය නැතිකරගැනීමට පිණිස සැරියුත් තෙරුන් මේ සූත්‍රය දේශනා කරඇත. දේශනාව අවසානයේ සත්‍ය ධර්මය අවබෝධ කර අරහත්වයට පත්වූහ. **මූලාශ්‍රය:** සංයු.නි: (3):ඛන්ධසංයුත්ත:ථෙරවග්ග: 1.2.4.3 යමක සූත්‍රය, පි.216.

**යස**

▲ **යසකුල පුත්‍ර තෙර -**Yasakulaputtha Thera: ගිහිකල, බරණැස්නුවර විසූ ධනවත් සිටු පුත්‍රයෙකි. සෘතු තුන ගතකිරීම පිණිස ඔහුට ප්‍රසාද 3 ක් විය. එක් දිනයක අලුයම පිබිදුන ඔහුට නිදාසිටි තම සේවක පිරිසගේ විකාර ස්වභාවය දැක කාමලෝකය ගැන කලකිරීම ඇතිවිය. නිවසින් පිටත්ව, ඉසිපතන මිගදායට ගියවිට, බුදුන් වහන්සේ හමුවිය. පළමු දහම් දේශනාව අසා සෝතාපන්න වූහ. ඉන්පසුව තමා සොයාගෙන පැමිණි පියාට, බුදුන් වහන්සේ වදාළ ධර්-මය අසා අරහත්වය ට පත්වූහ. එහි භික්ඛුභාවයෙන් පැවිදිවූහ. **සටහන්**: * යසකුල සිටු පුතුගේ පියා, මව හා පෙර බිරිඳ පළමු තේවාචික (**තිසරණ සරණ ගිය**) උපාසක හා උපාසිකාවන්ය. **බලන්න**: උපග්‍රන්ථය: ගිහි ශ්‍රාවකයෝ ** යසකුල පුත් තෙරුන්ගේ ප්‍රාදේශීය මිතුරෝ 50 ක් දෙනක් පමණද, බුදුන් වහන්සේ වෙත පැවිදිවූහ. **බලන්න**: වින.පි:මහාවග්ගපාලි1: යසකුල පුත්ත පබ්බජා කථා, පි.118. **මූලාශ්‍රය:**වින.පි:මහාවග්ගපාලි1: යසකුල පුත්ත පබ්බජා කථා, පි.108.

▼ **මේ තෙරුන්ගේ ථෙර ගාථා**: ඛු.නි: ථෙරගාථා:1.12.7, පි.84.

"මම (පෙරදී) මනා සුවඳ ආලේපන, මහා කසීසළු පරිහරණය කළෙමි, සියලු ආබරණින් සැරසුනෙමි. ත්‍රිවිද්‍යාව ලදිමි, මා විසින් බුදුසසුන කරන ලදී".

▲ **යසොජ තෙර**-Yesoja Thera: මේ තෙරුන්ගෙ ඍද්ධි බල හා අරහත්වයට පත්වීම මෙහි විස්තර කර ඇත. **සටහන:** තෙරුන් සමගවූ 500ක් භික්ෂුන්ද අරහත්වයට පත් උතුමෝවුහ. **මූලාශ්‍ර**:ඛු.නි: උදානපාලිය1: නන්දවග්ග:3.3. යසොජ සූත්‍රය, පි.204.

▼ **මේ තෙරුන්ගේ ථෙර ගාථා**: ඛු.නි: ථෙරගාථා:3.1.9 , පි.120.

" හුදකලාව විසීම බ්‍රහ්ම බඳුය, දෙදෙනෙක් හා වාසය දේවියෙක් බඳුය, තිදෙනෙක් හා වාසය ගමක් බඳුය, කෝලහාල ආදිය ඇත".

ර

රජ

▲**රාජදත්ත තෙර-** Rajadatta Thera: පිළිකුල් භාවනාව පිණිස සොහොනට ගිය මේ තෙරුන්ට, සොහනේ දැමු පණුවන් වැගිරෙන මළ ස්ත්‍රියක් දැක කාම රාගය ඇතිවීය. වහා සංවේගය උපදවා, අරහත්වයට පත්වුහ.

▼ **මේ තෙරුන්ගේ ථෙර ගාථා**: ඛු.නි: ථෙරගාථා:5.1.1 , පි.138.

"...මට යෝනිසෝමනසිකාරය ඇතිවී, ආදීනව පහළවිය, නිබ්ද්දාව ඇතිවිය. සිත කෙලේසුන්ගෙන් මිදිණි".

රට

▲**රට්ඨපාල තෙර-** Raṭṭhapāla Thera: ශ්‍රද්ධාවෙන් පැවිදිවූ භික්ෂුන් අතරෙන් රට්ඨපාල තෙරුන් අග්‍රවේ. **බලන්න:** EAN:note: 93: p. 585. **මූලාශ්‍ර:** අංගු.නි: (1) 1 නිපාත: එතදග්ග පාළිය සූත්‍ර, පි. 84**,** EAN:1: Foremost, p. 44.

▼ **කුරුජනපදයේ** ථුල්ලකොට්ඨිත නියම් ගමේ කුලදෙටුපුත්වූ මෙතුමා බුදුන් වහන්සේ දෙසූ දහම අසා,ගිහිගෙයි විසීමේ ආදීනව දැක පැවිදිවීමට ඉටාගති. මව්පියන් ගේ අවසර ලබා ගැනීමට නොහැකි නිසා, තමන්ගේ මරණය ලැබීම යහපත්ය සිතා අහාර නොගන බිම ඇලවීය. ඔහුගේ මිතුරන්ගේ බස් අසා, දෙමාපියන් අවසරදීම, අරහත්වය මෙහි විස්තර කර ඇත. **සටහන:** මේ තෙරුන්හට, කුරුදේශයේ කොරව්‍ය රජු හමුවීම මෙහි දක්වා ඇත. රජතුමා ඇසූ පැණයකට පිළිතුරු ලෙසින් මේ තෙරුන් තමන් පැවිදිවීමට හේතුවූ කරුණු 4ක් - බුදුන් වහන්සේ පෙන්වා දුන් ධම්ම නිද්දේස 4 ක්, පෙන්වා ඇත: 1) ලෝකය අස්ථිරය, ජරා මරණය කරා දිව යයි 2) ලෝකයේ ආරක්ෂාවක් නැත, ආරක්ෂාව සැලසීමට කෙනෙක් නැත 3) ලෝකයේ තමාට කියා දෙයක් නැත, සියල්ල හැර දමා යා යුතුවේ 4) ලෝකය හිස්ය, තෘපත්තියක් නැත. තණ්හාවට දාසවී ඇත. **මූලාශ්‍රය**: ම.නි: (2) 2.4.2 රට්ඨපාල සූත්‍රය, පි.436.

▼ **මේ තෙරුන්ගේ ථෙර ගාථා**: ඛු.නි: ථෙරගාථා:20.1.4 , පි.229.

"නරපතිය, යම් හෙයකින් කාමයෝ විසිතුරුද, මිහිරිද, මනරම්ද, විවිධ ස්වරූපයෙන් සිත් අලවයිද, ඒ කාම ගුණයෙහි ආදීනව දැක පැවිදි වූයෙමි".

▼ **මේ තෙරුන්ගේ අපදානය**: බු.නි: අපදාන පාලි1: 18, පි.142. මෙතුමා පදුමුත්තර බුදුන් වැඩසිටි සමයේ උපත ලබා උන්වහන්සේට ඇත් ගොව්වෙක් සහිත උතුම් ඇතෙක් පූජා කර ඇතා ගේ වටිනාකමට සරිලන ආවාසයක් කරවා, මහා දානයක් පුදා ඇත. එම පුද පූජා වල කම්ම විපාක ලෙසින් දෙව්ලොව සැප හා රජ සැප ලබා ඇත.

රධ

▲**රාධ තෙර -**Radha Thera: ධර්ම දේශනාවේ ප්‍රතිභානය ඇති (පටිභානකතා**-** eloquent discourses), අන්‍ය භික්ෂූන් තුළ දහම පිලිබඳ කුසලතාව ඇතිකරලීම පිණිස ඔවුන් උනන්දු කිරීමට හැකියාව ඇති භික්ෂූන් අතරින් මේ තෙරුන් අග්‍රය. රාධ තෙරුන්, ගිගිකල රජගහනුවර විසූ බ්‍රාහ්මණයෙකි. වයස්ගතව පැවිදිබවට පත්විය. **බලන්න**:EAN: note: 114: p.586 **මූලාශ්‍ර:** අංගු.නි: (1 ) 1 නිපාත: එතදග්ග පාළිය, පි. 84**,** EAN:1: Foremost, p. 44.

**සටහන්**: * සංයු.නි: රාධසංයුත්තයේ, මේ තෙරුන් පිලිබඳ විස්තර දක්වා ඇත. ** රාධ තෙරුන් රහත්වීම මේ සූත්‍රයේ පෙන්වා ඇත. **බලන්න:**සංයු.නි: (3): ඛන්ධක: අරහන්තවග්ග: 1.2.2.9 රාධ සූත්‍රය, පි. 166.

▼ **මේ තෙරුන්ගේ ථෙර ගාථා:**බු.නි: ථෙරගාථා: 2.1.7 ,පි.88.

"මොනවට සෙවෙණි කළ ගෙයක් යම්සේ වැස්ස විනිවිද නොයන්නේද, එලෙස, රගයට, සුභාවිත සිත විනිවිද යා නොහැකිය".

▼ **මේ තෙරුන්ගේ අපදානය:**බු.නි: අපදාන පාලිය 2-1: 539, පි.356. පදුමුත්තර බුදුන් දවස හංසවති නගරයෙ ත්‍රිවේදය දත් බමුණෙක්ව, බුදුන් වහන්සේගේ දහම අසා පැහැද, පටිභානයෙ අග්‍ර වීමට පැතීම, මහා දාන පූජා පවත්වා ඒ පින්බලයෙන් සුගතියේ සැප විඳීම, ගෝතම බුදුන් සමයේ, ගිරිබජ්ජ -රජගහනුවර නුවර දිළිඳු බමුණු කුලයක උපත ලැබීම, සැරියුත් තෙරුන්හට බත් හැන්දක් පමණ පිඩු පූජාකිරීමට වාසනාව ලැබීම මෙහි විස්තර කර ඇත. බොහෝ වයස් ගතව සිටීම නිසා පැවිද්ද ලබා ගැනීමට නොහැකිව දුකින් වෙසෙනවිට දුටු බුදුන් වහන්සේ මෙසේ ඇසුහ:

"පුතා, කුමක් පිණිස සොවින් සිටීද? ඔබගේ චිත්ත පීඩාව කියන්න". මගේ දුක පැවසූ විට බුදුන් වහන්සේ සංඝයා කැඳවා මොහුගෙන් යම් උපකාරයක් ලැබුනේද යයි විමසූහ. ඒ අවස්ථවේ කලගුණ දත් සැරියුත් මහා තෙරුන් මගේ පින්ඩපාතය ගැන පැවසූහ. ඒ ගැන සාධුකාර දුන් බුදුන් වහන්සේ මට පැවිද්ද ලබාදුනි".

රව

▲**රේවත ඛදිරවනිය තෙර-** Rewatha Khadiravaniya Thera

ආරණ්‍යවාසි භික්ෂූන් අතරෙන් රේවත ඛදිරවනිය තෙර අග්‍ර බව බුදුන් වහන්සේ වදාළහ. මෙතුමා සැරියුත් හිමියන්ගේ බාල සහෝදරයාය.

තමන්ගේ විවාහ දිනයේදී පැනගොස් මහණ වුහ. **බලන්න:** EAN:note:no 86, p. 585. **මූලාශ්‍ර:** අංගු.නි: (1) 1 නිපාත: එතදග්ග පාළිය සූත්‍ර, පි. 84**,** EAN:1:Foremost, p. 44.

▼ **මේ තෙරුන්ගේ ථෙර ගාථා:**බු.නි: ථෙරගාථා: 1.5.2 ,පි.54.

"චලා, උපචාලා, සිසූපචලා, මෙහෙණියනි, ඔබ සිහි ඇතිව වාසය කරන්නේද? තියුණු නුවණ ඇති… ඔබගේ සොහොයුරු සැරියුත් තෙරුන් වැඩම කර ඇත". **සටහන:** ඒ මෙහිණියන් තිදෙනා, සැරියුත් තෙරුන්ගේ නැගණිවරුය.

▼ **මේ තෙරුන්ගේ අපදානය:** බු.නි: අපදාන පාලි 1: 9, පි.122. "පදුමුත්තර බුදුන් වහන්සේ වැඩ සිටින සමයේ මම භාගිරථී නම් ගංගාවේ නැවියෙක් වී වෙමි. බුදුන් වහන්සේට එතෙර වීමට යහපත් ලෙසින් නැවක් සාදා පුජා කළෙමි. බුදුන් වහන්සේ අනුමෝදනා වදාරන්නේ මගේ අනාගත උපත් ගැන පැවසුහ. අන්තිම උපතේදී රේවත නම් බ්‍රාහ්මණ යෙක්ව, ගෝතම බුදුසසුනේ පැවිදිව පිරිනිවන් පාන බව වදාළහ".

**රහ**

▲**රාහුල තෙර**-Rahula Thera: පුහුණුව කැමති ( **ශික්ෂාව-**සික්ඛාමානං) භික්ෂුන් අතරෙන් රාහුල තෙර අග්‍රවේ. බුදුන් වහන්සේගේ, ගිජීවිතයේ පුතණුවන්ය, වයස අවුරුදු 7 දී පැවිදිවිය, සැරියුත් මහා තෙරුන් ගුරුවරයාය. **බලන්න**: EAN:note:no 92, p. 585. **මූලාශ්‍ර:** අංගු.නි: (1) 1 නිපාත: එතදග්ග පාළිය සූත්‍ර, පි. 84**,** EAN:1:Foremost, p. 44.

▼ **රාහුල තෙරුන්ට,** බුදුන් වහන්සේ දේශනා කළ වැදගත් සූත්‍ර: ම.නි: අම්බලට්ඨිකරාහුලඕවාද සූත්‍රය, මහා රාහුල ඕවාද සූත්‍රය, චුලරාහුල ඕවාද සූත්‍රය. **සටහන්**: * සංයු.නි: (3): ඛන්ධසංයුත්ත: ථෙරවග්ග: 1.2.4.9 හා 1.2.4.10 සූත්‍රයන්හි, බුදුන් වහන්සේ මානය නැතිකිරීම ගැන රාහුල තෙරුන්ට විස්තර කර ඇත. අංගු.නි: (2): 4 නිපාත: 4.4.3.7 රාහුල සූත්‍රයේදී: බුදුන් වහන්සේ මේ තෙරුන්ට ධාතු මනසිකාරය දේශනා කළහ. බු.නි:සුත්තනිපාත:චූලවග්ග:2-11 රාහුල සූත්‍රය, පි.120: බුදුන් වහන්සේ රාහුල තෙරුන්ට කල අවවාද. සංයු.නි: (4): සළායතනවග්ග: වේදනා සංයුත්ත: ලෝකකාමගුණවග්ග: 1.12. 8 රාහුලොවාද සූත්‍රය;පි.246, රාහුල තෙරුන් අරහත්වීම. සංයු.නි: (2): නිදානවග්ග: රාහුල සංයුත්ත: සූත්‍ර.

▼ **තෙරුන්ගේ ථෙර ගාථා**: බු.නි: ථෙරගාථා:4.1.8, පි.132.

" යම් හෙයකින් මම බුදුන්ගේ පුත්‍ර වේද, සිව්සස් දහමෙහි මග නුවණ ඇත්තේය, ආසව ක්ෂය කර, පුනර්භවය අවසන් කළෙමි...ත්‍රිවිද්‍යා ලැබුවෙමි, ජාතිසම්පත් ප්‍රතිපත්ති සම්පත් යන දෙකම ඇති මට, 'රාහුල භද්‍ර' යයි අමතති".

▼ **මේ තෙරුන්ගේ අපදානය**: බු.නි: අපදාන පාලිය: 16, පි. 138. "මම පදුමුත්තර බුදුන් වහන්සේට කැඩපතක් මෙන් පැහැපත් ඇතිරියක් පුජා කෙළෙමි. අනුමෝදනා වදාරන බුදුන් වහන්සේ, මගේ අනාගත උපත් පවසා, අවසන උපතේදී ගෝතම බුදුන් වහන්සේගේ රාහුල නම් ඇති පුතණුවන් වනබව වදාළහ".

ල

ලක

▲ **ලක්ඛණ තෙර-** Lakkhana Thera: මෙතුමා, මහා මුගලන් තෙරුන් සමග ගිජුකුළු පව්වේ වාසය කිරීම, මහා තෙරුන් එහිදී දුටු ප්‍රේතයන් ගැන උන්වහන්සේගෙන් විමසීම, මහා තෙරුන් ඒ විස්තර බුදුන් වහන්සේ හමුවේ පැවසීම මෙහි විස්තර කර ඇත. **බලන්න**: සංයු.නි: (2) නිදානවග්ග:ලක්ඛණ සංයුත්ත සූත්‍ර, පි.412.

▲ **ලකුණ්ටකභද්දිය තෙර-**Lakuntakabaddhiya Thera: මිහිරි කටහඬ - මඤ්ජුස්සරානං ඇති භික්ෂූන් අතරෙන් අග්‍ර, ලකුන්ටක භද්දිය තෙරුන්ය. සැවැත්නුවර මහා ධන ඇති පවුලක උපත ලබා, බුදුන් වහන්සේ දැක බැතිය උපදවා පැවිදිව අරහත්වය ලබා ගත්හ. **බලන්න:** EAN: note: 80, p.585. **මූලාශ්‍ර:** අංගු.නි: (1) 1 නිපාත: එතදග්ග පාළිය සූත්‍ර, පි. 84**,** EAN:1:Foremost, p. 44.

▼**බුදුන් වහන්සේ මේ තෙරුන්ගේ ගුණ වැනිම**: ලකුණ්ටකභද්දිය තෙරුන් ගේ රූපය පියකරු නැතිබව හා මිටිබව මෙහි සඳහන්කර ඇත. අප්‍රිය රූපය නිසා බොහෝ පුහුදුන් මහණුන් ඔහු හෙලාදකී. බුදුන් වහන්සේ, සංසයා අමතා මෙසේ වදාළහ:

**"...මේ මහණ තෙමේ මහත් ඍද්ධි ඇත, මහත් ආනුභාව ඇත...රහත්බව මේ අත්බවෙහි ලබා වෙසේ".**

**සටහන්: *** අටුවාවට අනුව මේ තෙරුන් ගේ විරූපී බවට හෙතුව පෙර කරනලද අයහපත් කම්ම විපාකයක් නිසාය: පෙර ජාතියක රජෙක්ව සිටි කාලයේ මහළු මිනිසුන්ට ගරහා ඇත. පෙර ජාතියක, ලිහිණියෙක්ව සිටියදී, විපස්සි බුදුන් වහන්සේට මිහිරි රස ඇති අඹයක් පිරිනැමීමේ විපාක වශයෙන් මේ තෙරුන්ට මිහිරි කටහඬක් ඇත. **බලන්න**: ESN:note:390, p.990. ** මේ තෙරුන්, සැරියුත් මහා තෙරුන්ගේ ශිෂ්‍යයෙකි. **මූලාශ්‍ර:**බු.නි: උදාන පාලිය: චුල්ලවග්ග: 7.1, 7.2, 7.5 ලකුණ්ටකභද්දිය සූත්‍ර3කි, පි.306, සංයු.නි: (2): නිදානවග්ග: භික්ඛුසංයුත්තය: 9.1.6. 5 ලකුණ්ටකභද්දිය සූත්‍රය, පි.452.

▼ **මේ තෙරුන්ගේ ථෙර ගාථා**: බු.නි: ථෙරගාථා: 7.1.2 පි.168.

"යම් කෙනෙක් විරූප රූපය නිසා මට අවමන් කළාහුද, යම් කෙනෙක් මධුර ස්වරය නිසා මට බුහුමන් කළාහුද, චන්දරාග වශියට පැමිණි ඒ දෙපිරිස මා නොදනී".

▼ **මේ තෙරුන්ගේ අපදානය**: බු.නි: අපදාන පාලිය 2-1:344, පි.368. පදුමුත්තර බුදුන් දවස, හංසවති නුවර, මහා ධන ඇති සිටුපුතෙක්ව, සක්මන් කරන්නේ (ජංගා විහරණය) බුදුන් වහන්සේ වැඩසිටි ආරාමයට පැමිණීම, මධුර ස්වරය ඇති අග්‍ර තෙරනුවක් දැක ඒ තනතුර පැතීම, පුණ්‍ය කම්ම බලයෙන් දෙව්ලොව සැප විඳීම, ඵුස්ස බුදුන් සමයේ නන්දාරාම නම් බුදුන් වැඩසිටි රජ උයනේ කොකිලෙක්ව උපත ලබා බුදුන් වහන්සේ පැහැද වීමට මිහිරි හඬින් ගායනා කිරීම, බුදුන් වහන්සේට රන් අඹයක් පූජා කිරීම ඒ ගැන සතුටුව මිය ගොස් තුසිත දෙව්ලොව පහළවීම, කාශ්‍යප බුදුන් කළ කිකී රජුගේ සේනානායකව, බුදුන් වහන්සේ පිරිනිවී ගිය පසු,

උන්වහන්සේ වෙනුවෙන් සත් යොදුන් සෑයක් කිරීමට පිරිස සැදී සිටින අවස්ථාවේ, එහි ප්‍රමාණය විසාල යයි පැවසූ විට, ඔහුගේ වචනය මත ඔවුන් යොදුනක් උස සෑයක් සෑදීම, ඒ කම්ම විපාකය නිසා ගෝතම බුදුන් සමයේ මිටි සිරුරක් ඇතිවීම ආදී විස්තර මෙහි දැක්වේ.

**ලම**

▲ **ලෝමසකන්ගිය තෙර-** Lomasakngiya Thera: මේ තෙරුන් ලෝමසවංගීස ලෙසින්ද හඳුන්වා ඇත. කපිලවස්තු නුවර අසබඩ නිග්‍රෝධාරාමයෙහි වැඩ වසන අවස්ථාවේදී චන්දන නම් දේවපුත්‍ර පැමිණ, හද්දෙකරත්ත සූත්‍රයේ දක්වා ඇති දහම් කරුණු ගැන විමසා ඇත. ඒ ගැන නොදත් මේ තෙරුන්, සැවත් නුවරට පැමිණ, බුදුන් වහන්සේ බැහැදැක ඒ සූත්‍ර දේශනාව පැහැදිලි කරන ලෙසින් ඉල්ලා සිටියහ. දේශනාව අවසානයේදී , චන්දන දෙවියා දහමේ අප්‍රමාදව, යහපත් ලෙසින් දහම ආවර්ජනය කරන බව බුදුන් වහන්සේ වදාළහ. **සටහන්:** * බුදුන් වහන්සේ තව්තිසා දෙව්ලොව වැඩ වසන සමයේ , දෙවියන්ට , එම සූත්‍රය දේශනා කලබව චන්දන දේවපුත්‍ර පවසා ඇත. ** අටුවාවට අනුව, මේ තෙරුන් හා ඔහුගේ සහායක චන්දන, කාශ්‍යප බුදුන් වහන්සේ වෙත පැවිදිව වැඩ වසන සමයේදී ඒ බුදුන් වහන්සේ හද්දෙකරත්ත සූත්‍රය වදාළහ. **බලන්න**: EMN: note 1221, p.1174. **මූලාශ්‍රය:** ම.නි: (3) ලෝමසකන්ගිය හද්දෙකරත්ත සූත්‍රය.

▼ **මෙහිදී මේ තෙරුන්,** මහානාම ශාක්‍යයන්ට, සේඛ හා අසේඛ බවේ වෙනස්කම් පැහැදිලි කර ඇත. **බලන්න:** සංයු.නි:(5-2) මහාවග්ග:අනාපානසංයුත්ත:10.2.2 කංඛෙයිය සූත්‍රය, පි.138.

▼ **මේ තෙරුන්ගේ ථෙර ගාථා:**ඛු.නි: ථෙරගාථා:1.3.7 , පි.48.

"වනයේ විවේක සුවය වඩනු පිණිස හීතණ, කුසතන ආදිය උරයෙන්ද බැහැර කරමි, ඒවා මත නො ඇලවෙමි". **සටහන:** මේ තෙරුන්ගේ අපදානයේ හි, වනගතව, ඉඳීම, සිටීම, ඇවිදීම යන් තුන් ඉරියව්වෙන් භාවනා කරන බව, කුස තණ ආදියේ, නො නිදන බව පෙන්වා ඇත.

▼ **මේ තෙරුන්ගේ අපදානය:**ඛු.නි: අපදානපාලිය 2-1: 548, පි.404. කාශ්‍යප බුදුන් දවස සහායක චන්දන සමග පැවිදිවීම, බොහෝකල් දෙව් මිනිස් සැප විඳ ගෝතම බුදුන් දවස කපිලවස්තු නුවර ශාක්‍ය පුත්‍රයෙක් ලෙසින් උපත ලැබීම, බුදුන් වහන්සේ ඒ නුවරට පැමිණි විට මානයෙන් යුත් ශාක්‍ය පිරිස උන්වහන්සේට නොවැඳීම, ඒ අවස්ථාවේදී බුදුන් වහන්සේ පෙළහර පා ඤාතීන් දමනය කිරීම මෙහි දක්වා ඇත. බුදුන් වහන්සේ ගේ අනුහාවය දැක මේ තෙරුන් පැවිදිවූහ. බුදුන් වහන්සේ හද්දෙකරත්ත සූත්‍රය වදාළ විට, එම දහම් කරුණු ආවර්ජනය කිරීම පිණිස වනගතව, එහිදී අරහත්වය ලැබූහ.

**ව**

**වක**

▲**වක්කලි තෙර-** Vakkali Thera: බලවත් ශ්‍රද්ධාව ඇති භික්ෂූන් අතරින් මෙතුමා අග්‍රය.**බලන්න:** EAN:note:91, p.585.

**මූලාශ්‍ර:** අංගු.නි: (1) 1 නිපාත: එතදග්ග පාළිය සූත්‍ර, පි. 84**,** EAN:1: Foremost, p. 44.

▼ **මේ සූත්‍රයේ දී** වක්කලී තෙරුන් රෝගීවීම, බුදුන් වහන්සේ වෙතින් දහම අසා අරහත්ව පිරිනිවන් පෑම විස්තර කර ඇත. **සටහන:** දරුණු රෝගාබාධය නිසා මේ තෙරුන් සැතකින් ගලනලය සිඳගෙන මියගියහ. **මූලාශ්‍රය:**සංයු.නි: (3): ඛන්ධසංයුත්ත:ථෙරවග්ග: 1.2.4.5 වක්කලී සූත්‍රය, පි.234.

▼ **මේ තෙරුන්ගේ ථෙර ගාථා**: ඛු.නි: ථෙරගාථා:5.1.8, පි.144.

" අග්‍රවූ දාන්තවූ සමාහිත වූ සම්බුද්ධයන් සිහි කැරෙමින් රෑ දවල් නොමැළිව වනයේ වෙසෙමි".

▼ **මේ තෙරුන්ගේ අපදානය:** ඛු.නි:අපදාන පාළිය 2-1: 532.පි.316.

පදුමුත්තර බුදුන් දවස, හංසවතී නුවර බ්‍රාහ්මණ පුතෙක්ව, බුදුන් වහන්සේ වක්කලී නම් භික්ෂුවක් සැදැහැයෙන් අග බව වදාළ අවස්ථාවේ ඒ ගැන කැමත්ත ඇතිකර,බුදුන් වහන්සේට දන් පූජා කර ඒ තනතුර පැතීම, බොහෝ ජීවිත සුවයෙන් විසීම, ගෝතම බුදුන් දවස සැවැත්නුවර නුවර උපත ලැබීම, පිශාචයන් විසින් බිය කරනු ලැබුව , දෙමාපියන් දරුවාගේ ආරක්ෂාව පතා බුදුන් වහන්සේට පිරිනැමීම මෙහි දක්වා ඇත.

"එකල්හි බියපත් වූවන්ට පිහිටවූ ඒ බුදුරජ තෙමේ ජාලාඅංගුලි ඇති සක්ලකුණුයුත් මුදු කෝමල හස්තයෙන් මා පිලිගත්තේය.මම එතැන් පටන් බුදුන් වහන්සේ විසින් රක්නා ලදුව සුවයෙන් වැඩුනෙමි… බුදු සසුන කරන ලදී".

වග

▲ **වංගීස තෙර -** Vaṅgīsa Thera: දහම ගැන පැහැදීම ඇතිකරණ ගී පැදි **(පටිභානවන්තානං-**composing inspired verses**)** සකස් කරණ භික්ෂූන් අතරෙන් මෙතුමා අග්‍රය. දහම්පද කවියෙන් වණා ඇත. **බලන්න**: EAN:note:95:p.585. **මූලාශ්‍ර:** අංගු.නි: (1) 1 නිපාත: එතදග්ග පාළිය සූත්‍ර, පි. 84**,** EAN:1:Foremost, p. 44. **සටහන:** මේ තෙරුන් පිලිබඳ විස්තර, සංයු.නි: (1) : සගාථවග්ග:වංගීසසංයුත්තයේ සූත්‍ර යන්හි දක්වා ඇත.

▼ **මේ තෙරුන්ගේ ථෙර ගාථා**: ඛු.නි: ථෙරගාථා:මහා නිපාත: ගාථා 1220 සිට ,පි.308.

" සියල්ලෝ භාග්‍යවතුන් වහන්සේගේ පුතුන්ය,මෙහි අසාර දෙයක් නොමැත. තණ්හාව උදුරා දමන සූර්ය බන්ධු මම වදිමි".

▼ **මේ තෙරුන්ගේ අපදානය:** ඛු.නි:අපදාන 2-1: 544, පි. 382.
පදුමුත්තර බුදුන් දවස හංසවති නුවර ප්‍රසිද්ධ බ්‍රාහ්මණයෙක්ව, බුදුන් දැක, උන්වහන්සේගේ ගුණ වයමින් මහා සතුටකට පත්වීම, බොහෝ කලක් දෙව් මිනිස් සැප ලබා අන්තිම භවයේ වංග රටේ පරිබ්‍රාජක කුලයක උපත ලබා සත් හැවිරිදි වියේදී වාද පිලිබඳ විශාරද වීම මෙහි දක්වා ඇත. මේ තෙරුන් පැවිදි වීමට පෙර රජගහනුවරදී සැරියුත් මහා තෙරුන් හමුවිය. උන්වහන්සේගේ ශාන්ත බවින් පැහැදී, පැවිදි වීමට අයැදිය. මහා තෙරුන් බුදුන් වහන්සේ වෙත ඔහු කැඳවා ගියවිට බුදුන් වහන්සේ මෙසේ වදාළහ:

"වංගීස, කීම, යම් ශිල්පයක් දන්නේද?". හිස්කබලක් ගෙන, මළ ගිය පුද්ගලයා උපත ලබන ස්ථානය පැවසීමට හෙතෙම දක්ෂ විය. බුදුන් වහන්සේ හිස් කබල් තුනක් ඔහුට දුන්විට ඒ ඒ අය යළි උපත ලැබූ ස්ථාන නිවැරදිව පැවසිය. ඉන්පසු බුදුන් වහන්සේ පසේබුදු වරයෙකුගේ හිස් කබල දුන්විට, යළි උපත ගැන පැවසීමට ඔහු අපොහොසත් විය.

"ඉක්බිති මම උන්වහන්සේ උපන් තැන කියා ගැනීමට නොහැකිව, නෂ්ඨවූ විද්‍යා ඇත්තේ පැවිද්ද ඉල්ලීමි...කවි පද බැඳීම ගැන සමහර භික්ෂූහු මට දොස් පවරුහ… බුදුන් වහන්සේ මෙසේ ඇසූහ: 'මේ ගාථා කල් ඇතිව සිතා මතා ගොතන ලදද? නැතිනම්, ඒ අවස්ථාවේදීම පවසන ලද්දේද?'

කවි පද ගාථා එකෙණිහිම තමන්හට ඇතිවෙන බව පිළිතුරු දුන්විට, බුදුන් වහන්සේ මෙසේ වදාළහ: "දැන් සිටිවනම මට තුති කරන්න" . "මම එතුමන් ගේ ගුණ කවි පදයෙන් පැවසූ විට බුදුන් වහන්සේ ප්‍රතිභානවත් භික්ෂුන් අතර මා අගතැන තැබූහ".

**වච**

▲ **වච්ඡගොත්ත තෙර-** Vachchagothta Thera: පෙර දී පරිබ්‍රාජකව සිට (වච්ඡගොත්ත අග්ගිවෙස්සන), බුදුන් වහන්සේ වෙතින් දහම අසා පැහැදී, පැවිදිවූ මේ තෙරුන් අරහත්වය ලබා ගැනීම පිළිබඳ විස්තරය ම.නි:**මහා වච්ඡගොත්ත සූත්‍රයේ** දක්වා ඇත. පරිබ්‍රාජකව වාසය කරන සමයේ බුදුන් වහන්සේ වෙතින් දහම ශ්‍රවනය කිරීම පිළිබඳව **බලන්න**:ම.නි. තෙවිජ්ජා වච්ඡගොත්ත සූත්‍රය. **ම.නි:අග්ගි වච්චගොත්ත සූත්‍රයේ**, වච්ඡගොත්ත පරිබ්‍රාජක, බුදුන් වහන්සේ කෙරේ සැදැහැ උපදවා ගිහි ශ්‍රාවක බවට පත්වීම විස්තර කර ඇත.

▼**අංගු.නි: 3 නිපාත**: 3.2.1.7 සූත්‍රයේදී, බුදුන් වහන්සේට දානය පිරිනැමීමේ ආනිසංස, මේ තෙරුන් දක්වා ඇත. **සටහන්**: * අරහත්වයට පත්වූ වච්ඡගොත්ත තෙරුන් පිළිබඳව බුදුන් වහන්සේ මෙසේ වදාළහ:

**"වච්ඡගොත්ත මහණට ත්‍රිවිද්‍යා ඇත, මහත් සෘද්ධි ඇත, මහත් ආනුභාව ඇත…". බලන්න:** ම.නි:මහා වච්චගොත්ත සූත්‍රය. ** සංයු.නි: (3): ඛන්ධවග්ග: වච්ඡගොත්ත සංයුත්තයේ, මේ තෙරුන්ට දේශනා කළ සූත්‍ර දක්වා ඇත.

▼ **මේ තෙරුන්ගේ ථෙර ගාථා**: ඛු.නි: ථෙරගාථා:1.12.2, පි.82.

" ත්‍රිවිද්‍යා ඇත්තෙමි, මහා ධ්‍යාන ඇත්තෙමි, චිත්ත සමථයෙහි දක්ෂ වීමි, මා විසින් ස්වාඅර්ථය (අරහත්බව) ලබනලදී, බුදුන්ගේ අවවාදය කරන ලදී".

**වජ**

▲**වජ්ජිපුත්‍ර තෙර-** Vajjiputhta Thera: විසාලාවේ වජ්ජි කුමාරයෙක් ලෙසින් ගිහිකල විසූ මේ තෙරුන්, පැවිදිව වනයේ හුදකලාව වාසය කිරීම ගැන වන දෙවතාවක් ප්‍රසංසා කිරීම, එමගින් තෙරුන් දහම් සංවේගය ඇතිකර ගැනීම ගැන මෙහි විස්තරකර ඇත.

**මූලාශ්‍රය:** සංයු.නි: (1) සගාථවග්ග: වනසංයුත්ත:9.1.9 වජ්ජිපුත්‍ර සූත්‍රය, පි.386.

▼ **මේ තෙරුන්ගේ ථෙර ගාථා**: ඛු.නි: ථෙරගාථා:1.7.2.,පි.62.

"වනයෙහි හැර දමන ලද දරකඩක ලෙසින් අපි හුදකලාව වනයේ වසන්නෙමු, ස්වර්ගයට යාමට කැමති, නිරීසතුන් මෙන් බොහෝදෙනා මට කැමති වෙති".

▼ **මේ තෙරුන්ගේ අපදානයේ**, සිද්ධාර්ථ බුදුන් වහන්සේ දැකීමෙන් සතුටුව පළතුරක් පූජාකිරිම, ගෝතම බුදුන් වහන්සේ වෙත පැමිණීම, අරහත්වය ලබා ගැනීම විස්තර කර ඇත. **බලන්න**: ඛු.නි:අපදාන:2-1: 555 වජ්ජිපුත්‍ර ථෙරඅපදානය, පි.426. **මූලාශ්‍රය:** සංයු.නි: (1) සගාථවග්ග: වනසංයුත්ත:9.1.9 වජ්ජිපුත්‍ර සූත්‍රය, පි.386.

**වප**

▲ **වප්පතෙර-පස්වග -**Vappa Thera -pasvaga: මෙතුමා පස්වග මහනුන්ගෙන් කෙනෙකි, පළමුව අරහත්වය ලැබූ ආරිය සංඝයා පස්දෙනාට ඇතුලත්වේ. **බලන්න**: පස්වග මහණුන්.

▼ **මේ තෙරුන්ගේ ථෙර ගාථා:**ඛු.නි: ථෙරගාථා: 1.7.1, පි.62.

" දර්ශනසම්පන්න ආරිය උතුමා, ආරියන්ද, පෘතජ්ජනයන්ද හඳුනයි. එහෙත් අන්ධබාල පෘතජ්ජන, ආරියන් හා අනාරියන් හඳුනන්නේ නැත".

**වම**

▲ **විමල තෙර-** Vimala Thera: බරණැස්නුවර සිටු පුතෙක් වූ මෙතුමා යසකුල පුත්‍ර තෙරුන්ගේ ගිහිකල මිතුරෙකි. තම මිතුරා පැවිදිවූ බව අසා සෙසු මිතුරන් තිදෙනා සමග පැමිණ, බුදුන් වහන්සේ වෙතින් දහම අසා පැවිදිව, උපසම්පදා ලැබ අරහත්වයට පත්වුහ. **මූලාශ්‍රය:**වින.පි:මහාවග්ග පාලි1: සිව්ගිහි යහළුවන්ගේ පැවිද්ද කථා, පි.116.

▼ **මේ තෙරුන්ගේ ථෙර ගාථා:**ඛු.නි: ථෙරගාථා: 3.1.10, පි.126.

" ...කුසිත, හීන වීරිය ඇති අය දුරලන්න, කාය විවේකය ඇති , නිවනට මෙහෙයවූ සිත් ඇති, ධ්‍යාන කරන, නිරතුරු රුකුලු වීරිය ඇති නුවණැති අය හා එක්ව වෙසෙන්න".

**වශ**

▲**වාශිෂ්ඨ තෙර හා භාරද්වාජ තෙර-** Vasettha Thera & Bharadvaja Thera: බුදුන් වහන්සේ ඉච්චානගල ප්‍රදේශයේ චාරිකාවේ යෙදී සිටින විට, වාශිෂ්ඨ බ්‍රහ්මණ මානවක හා භාරද්වාජ බ්‍රහ්මණ මානවකහට බුදුන් වහන්සේ හමුවීමට හා දහම් ප්‍රශ්න සාකච්චා කිරීමට අවස්ථාව ලැබිණි. දේශනාවෙන් පසු ඔවුන් දෙදෙන බුදුන් සරණ ගියහ. බුදුන් වහන්සේ කෝසල ජනපදයේ සැරිසරන අතර, මනසාකට නම් බ්‍රාහ්මණ ගමට වැඩි අවස්ථවේදී, දෙවන වරටද බුදුන් වහන්සේ හමුවීමට හා දහම ඇසීමට අවස්තාව සැලසිනි. තෙවිජ්ජා සූත්‍ර දේශනාව ඇසූ ඒ දෙදෙනා නැවතද බුදුන් සරණ ගිය බව පෙන්වා ඇත. පසු කල මහණවූ ඒ දෙදෙනා, උපසම්පදාව බලාපොරොත්තුවෙන්, සැවැත්නුවර, මිගාරමාතා ප්‍රසාදයේ

වාසය කරන අවස්ථාවේදී, බුදුන් වහන්සේ වදාළ අග්ගඤ්ඤ සූත්‍ර දේශනාව ශ්‍රවණය කර, උපසම්පදාව ලබා අරහත්වය සාක්ෂාත් කරගත්හ. **බලන්න**: EDN: note:258, p.421. **මූලාශ්‍ර**: ම.නි: (2): 2.5.8 වාශිෂ්ඨ සූත්‍රය, පි.716, දීඝ.නි: (1):13 තේවිජ්ජා සූත්‍රය, පි.610, දීඝ.නි: (3) 4 අග්ගඤ්ඤ සූත්‍රය, පි.152, EMN:98: Vāseṭṭha Sutta,p.722, EDN: 13 Tevijja sutta, p. 143 & 27 Aggañña Sutta, p. 306

▲ **විශාඛ පංචාලිපුත්ත තෙර-** Visākha pamchaliputta Thera: විශාඛ පංචාලිපුත්ත තෙරුන්, ධම්ම කථිකය,යහපත් ලෙසින් දහම දේශනාකර, ධර්-ම ධජය ලෙලවන පණ්ඩිතයෙක් යයි බුදුන් වහන්සේ පැසසුම් කර ඇත. **බලන්න**: මුණිධජය. **මූලාශ්‍ර**: අංගු.නි: (2) 4 නිපාත: 4.1.5.8 විශාඛ සූත්‍රය, පි.122, EAN: 4: 48.8 Visākha, p. 167, සංයු.නි: (2) නිදානවග්ග: භික්ඛුසංයුත්ත: 9.1.7 විශාඛ පංචාලිපුත්ත සූත්‍රය, පි. 453, ESN: 21: Bhikkhusamyutta: 7: Visākha, p. 928.

▼ **මේ තෙරුන්ගේ ථෙර ගාථා**: ඛු.නි: ථෙරගාථා:2.5.5. පි.112.

"තමා හුවා දක්වන්නේ නැත, අනුන් හෙළා දකින්නේ නැත… රහතුන් හා නොගැටෙන්නේය, තම ගුණ පිරිස මැද නොකියන්නේය, සන්සුන්ය, පමණ දැන කථාකරයි, මනාපැවතුම් ඇත".

**ස**

**සග**

▲ **සංග්‍රාමජිත් තෙර -**Sangramajit Thera: එක්සමයක මේ තෙරුන් ජේතවනාරාමයේ  වාසය කරන සමයේ ඔහුගේ පෙර බිරිඳ අත දරුවා සමග පැමිණ, තෙරුන් හමුවට පැමිණ කථාකලද, තෙරුන් නිහඬව සිටියහ. දරුවා පෝෂණය කරන්න යයි කියා ඇය දරුවා එහි තබා ගියාය. එහෙත්, තෙරුන් ඒ දෙස නො බැලුහ. ඒ බව දුටු ඇය පෙරලා පැමිණ දරුවා රැගෙන ආපසු ගියාය. එම සිදුවීම දිවැසින් දුටු බුදුන් වහන්සේ මෙසේ උදානයක් වදාළහ:

"එන්නීය ගැනද (ඔහු) සතුටු නොවේ, බැහැර යන්නිය ගැන ශෝක නොකරයි. රාගාදී බැම්වලින් මිදුන ඒ සංග්‍රාමජිත් භික්ෂුව 'බ්‍රාහමණයෙක්' යයි මම කියමි". **සටහන:** එතුමන් අරහත්ය. කෙළෙස් සංග්‍රාමය දිනූ නිසා සංග්‍රාමජිත් ය. **මූලාශ්‍රය**:ඛු.නි: උදානපාළිය:බෝධිවග්ග: 1.8 සංග්‍රාමජිත් සූත්‍රය, පි.166.

▲ **සාගත තෙර-** Sagatha Thera: තේජෝධාතු සමාපත්තියට සම වැදීමෙහි දක්ෂ භික්ෂූන් අතරෙන් සාගත තෙරුන් අග්‍ර බව බුදුන් වහන්සේ වදාළහ.බුදුන් වහන්සේගේ උපස්ථායකයා ලෙසින්  කටයුතු කර ඇත. මේ තෙරුන් කෝසම්බි නුවර, අම්බතොට අසල සිටි බිහිසුණු, ගිණි විහිදුවන නාගයෙක්, තේජෝ ධාතු සමාපත්තියෙන් දමනය කරණ ලදබව දැක්වේ. **බලන්න**:EAN:note:113, p.586. **මූලාශ්‍ර:** අංගු.නි: (1 ) 1 නිපාත: එතදග්ග පාළිය**,** පි. 84**,** EAN:1:Foremost, p. 44.

▼**මේ තෙරුන්ගේ අපදානය:** ඛු.නි:අපදානපාළිය1: 32, පි.176.

පදුමුත්තර බුදුන් වහන්සේ වැඩසිටින සමයේ සෝභිත නම් ප්‍රකට බ්‍රාහ්මණක් විය. බුදුන් වහන්සේ දැක, සිත පිනාගිය හෙතෙම මෙසේ පැවසිය: " ...පිණින් හා නුවණින් යුත් පිරිස, ඔබ වහන්සේ අලංකාර කරති, හිරු උදාවන කල මෙන් ඔබ වහන්සේගේ ප්‍රභාව පැතිරේ". පහන් සිත් ඇති ඔහු දුටු බුදුන් වහන්සේ, ඔහුගේ බුද්ධ ප්‍රසාදය නිසා මතුවේ දිගු කලක් දෙව්ලොව සැප ලබන බවද, ගෝතම බුද්ධ සසුනේ ශ්‍රාවකබව ලැබේය යි අනුමෝදනා වදාළහ.

**සජ**

▲ **සුජාත තෙර-** Sujata Thera: මේ තෙරුන්ගේ අරහත්වය බුදුන් වහන්සේ මෙහිදී ප්‍රකාශ කරඇත. **මූලාශ්‍ර**:සංයු.නි: (2 ): නිදානවගග, භිකඛුසංයුත්ත-9.1.5. සුජාත සූත්‍රය, පි.452, ESN: 21: Bhikkhusamytta: 5-Sujata, p. 926.

▼ **බුදුන් වහන්සේ මෙසේ වදාළහ:**

"ඉතා සෝභනවූ රූපයකින් දිලෙන මේ භික්ෂුවගේ සිත මුළුමනින්ම ඍජුය. (කෙළෙසුන්ගෙන්) වෙන්වූ සිතකින් යුතුව, සංයෝජන වලින් නිදහස්ව, උපදාන රහිතව ඔහු නිවන සාක්ෂාත් කර ගෙන ඇත. මාර සේනාව පරාජය කළ ඔහු අන්තිම සිරුර දරයි: **මූලාශ්‍ර**:සංයු.නි: (2): නිදානවගග, භිකඛුසංයුත්ත-9.1.5. සුජාත සූත්‍රය, පි.452, ESN: Nidanasamytta: 21: Bhikkhusamytta: 5-Sujata, p. 926.

**සද**

▲ **සද්ධා තෙර-** Saddha Thera: සද්ධා තෙරුන් හට, ශ්‍රද්ධාව ප්‍රකටවන ගුණ 11ක් ඇතිබව මෙහි දක්වා ඇත. උන්වහන්සේ උතුම් අරහත්වය ලබා ඇත. සුභූති තෙරුන් සද්ධා භික්ෂුව ගේ ගුණ ප්‍රකාශ කලවිට බුදුන් වහන්සේ එය අනුමත කර මෙසේ වදාළහ:

" සුභූති, මැනව... ඒ කරුණෙන්ම ඔබ මේ සද්ධා භික්ෂුව සමග වාසය කරන්න,... යම් කලක ඔබට තථාගතයන් දැකීමට කැමතිවන්නේ නම්, ඒ පිණිස මේ සද්ධා භික්ෂුව සමග පැමිනෙන්න" **මූලාශ්‍ර**: අංගු.නි:(6 ):11 නිපාත:අනුසති වග්ග,11.2.4 සුභූති සූත්‍රය ,පි.662 ,EAN:11: II Recollection, 14.4 Subhuti , p.572. **සටහන**: මෙහිදී, සද්ධා තෙරුන්, බුදුන් වහන්සේගේ සැදැහැවත් ගිහි උපාසකයෙක් ගේ පුතෙක් බව දක්වා ඇත. අනාථ පිණ්ඩික සිටුවරයාගේ පුතෙක් විය හැකිය. මේ සූත්‍රයට අනුව මෙතුමා බුදුන් වහන්සේ හමුවට පැමිණියේ සුභූති තෙරුන් සමගය.**බලන්න:** EAN: 11: note: 2220, p.687.

▲**සුද්ධික භාරද්වාජ තෙර-** Suddika Bharadvaja Thera: සැවැත්නුවර බ්‍රාහ්මණයෙක්වූ මෙතෙම, බුදුන් වහන්සේ බැහැදැක, බමුණන් ගේ පිරිසිදුවීම ගැන පැවසුහ. බුදුන් වහන්සේ මෙසේ වදාළහ:

"...පටන් ගන්නා ලද වීරිය ඇති, නිවන පිණිස මෙහෙයවූ සිත් ඇති, දැඩි පරාක්‍රමය ඇති, ක්ෂත්‍රියාද, බ්‍රාහ්මණයාද, වෛශ්‍යයාද, ශුද්‍රයාද, චන්ඩාලයාද, පුප්සඩුවාඩ උත්තම සුද්ධිය නම් නිවනට පැමිණේ..." .එම දේශනාව අසා සැදැහැ ඇතිකරගත් එතුමා, පැවිදිව අරහත්වය ලැබූ බව මෙහි දක්වා ඇත.

**මූලාශ්‍රය**: සංයු.නි: (1) සගාථවග්ග: බ්‍රාහ්මණසංයුත්ත: 7.1.7 සුද්ධික සූත්‍රය, පි.322.

**සධ**

▲ **සුධර්ම භික්ෂුව**-Bhikkhu Sudharma: මේ භික්ෂුව, මචඡිකාසන්ඩන්ඩ නගරයේ, චිත්ත ගපති විසින් පුජා කල, ඇඹල්ල (අම්බාටක වනය) වනයේ, ආවාසයක වාසය කරන කල, සැරියුත් මහා තෙරුන් එම නගරයට වැඩම කර ඇත. ඒ අවස්ථාවේදී, චිත්ත ගහපති, මහා තෙරුන්ට දානය පිණිස සිය නිවසට වඩින ලෙස ආරාධනා කළහ. තමන්ගෙන් නොවිමසා, තම දායකයා එසේ මහා තෙරුන් ඇතුළු සංඝයාට අරධනා කිරීම ගැන කිපුන මෙ භික්ෂුව, චිත්ත ගහපතිට බොහෝ පරිභවකරනලදී. බුදුන් වහන්සේ ඒ පුවත දැන, චිත්ත ගපතිගෙන් සමාව ලබා ගැනීමට අවවාද වදාළහ. ඒ අනුව සංඝයා එම භික්ෂුවට 'පටිසාරණීය කර්මය' පනවනලදී.**බලන්න**: පටිසාරණීය කර්මය. **මූලාශ්‍රය**: වින.පි.චුලවග්ග 1: කම්මක්ඛන්ධය- පටිසාරණියකම්ම,පි. 84.

**සන**

▲**සේනිය (කෝලියරටේ) තෙර**-Seniya Thera: බුදුන් වහන්සේ හමුවට පැමිණි බලුව්‍රතය දරන නිගණ්ඨ සේනිය, උන්වහන්සේ වෙතින් දහම අසා පැහැදී බුදු සසුනට ඇතුළු වී, අරහත්වයට පත්වූ බව මෙහි දක්වා ඇත. **මූලාශ්‍ර:** ම.නි: (2): 2.1.7 කුක්කුරවතිය සූත්‍රය, පි.100, EMN: 57: Kukkuravatika Sutta, p.466.

▲ **සුනිත තෙර-** Sunitha Thera: මගධයේ දුගී පහත් කුලයක (චන්ඩාල) උපත ලැබූ මෙතුමාට බුදුන් වහන්සේ, රජගහනුවර දී දැකීමට අවස්ථාව ලැබුණි. මහා කාරුණිකයන් විසින් පැවිදි කරණු ලැබුව අරහත්වයට පත්විය. **මෙතුමාගේ ථෙරගාථා**: ඛු.නි: ථෙරගාථා:12.1.2, පි.202.

"...මම එකලාව ආරණ්‍යයෙහි වසන්නේ, නො මැළිව බුදුන් වහන්සේගේ අවවාද කළෙමි...උත්තම පුරුෂබව ලැබූ මට ඉන්ද්‍ර බ්‍රහ්ම දේවියෝ නමස්කාර කළහ. … ඒ දුටු බුදුන් වහන්සේ සිනා පහළකර මෙසේ වදාළහ:

'තපසින්ද බඹසරින්ද ශිලයෙන්ද ප්‍රඥාවෙන්ද යන මේ කරුණින් බ්‍රාහ්මන වේ, මේ උතුම් බමුණෙක් ය'".

▲ **සුන්දරික භාරද්වාජ තෙර 1**- Sundarika Bhradvaja Thera 1: බුදුන් වහන්සේ වත්ථුපම සූත්‍රය දේශනා කරන අවස්ථාවේදී එහි සිටි සුන්දරික භාරද්වාජ බ්‍රාහ්මණ, දිය නෑම පිළිබඳව බුදුන් වහන්සේගෙන් විමසුහ. එම සුන්දරිකා නදියේ දිය නෑමෙන් විසුද්ධිබව ඇතිවේයයි බ්‍රාහ්මණ පිළිගැනීමක් විය. බුදුන් වහන්සේ ජල ස්නානයෙන් කෙනෙක්ගේ ආධ්‍යාත්මය පිරිසිදු නොවන බව, ධම්මාකුලව, මෙත්සිත ඇතිව දහමේ ස්නානය කිරීමෙන් විසුද්ධිය ඇතිවේ යයි වදාළහ. ඒ දේශනාව අසා පැහැදුන මෙතුමා, පැවිදිව, අරහත්වය ලැබූ බව මෙහි දක්වා ඇත. **මූලාශ්‍රය:** ම.නි: (1) වත්ථුපම සූත්‍රය, පි.112.

▲ **සුන්දරික භාරද්වාජ තෙර 2** - Sundarika Bhradvaja Thera 2

ගිහි කල කොසොල් දනව්වේ බමුණෙක්වූ මෙතෙම, එක් සමයකදී සුන්දරිකා නදිය අසල අග්නිහෝම පූජාවක් කර එම පූජාව දීමට සුදුස්සෙක් සෙවිය. ඒ අවස්ථාවේ, බුදුන් වහන්සේ නදිය අසබඩ රුක්මුලක් අසල හිසවටා පොරවාගත් සිවුර ඇතිව වැඩසිටිසේක. එතුමන් දුටු මොහු, බුදුන් වහන්සේ බ්‍රාහ්මණ උතුමෙක් සේ සලකා, පූජාව පිරිනැමීමට ඒ අසලට පැමිනියහ. ඔහුගේ පිවර හඬ අසා බුදුන් වහන්සේ හිස විවර කලවිට මෙතෙම මෙසේ සිතිය. ' සමහර විට මොහු මුඩු බ්‍රාහ්මණයෙක් විය හැකිය, මම ඔහුගෙන් ජාතිය විචාරමි''. ඔහු ජාතිය ගැන විමසුවිට බුදුන් වහන්සේ මෙසේ වදාළහ''

'' ජාතිය ගැන නොඅසන්න, ශිලාදී චරන දහම් ගැන අසන්න. ඕනෑම වියලි දණ්ඩක් යොදා ඒකාන්තයෙන්ම ගිනි හටහත හැකිය. එලෙස, පහත් හෝ උසස් කුලයේ උපන්නේද, වීරිය ඇතිව, කරුණු දැන, හිරි ඔතප්ප මගින් පව් වළකා ගන්නේද හෙතෙම, ආසාව ක්ෂය කල මුනිවරයාය… බමුණ, මම දර දැවීම අත්හැර ස්වාසන්තානයෙහිම ඥාන ගින්න දල්වමි, අරහත්වූ මම නීති දැල්වූ ගිනි ඇත්තෙමි, නීති සංයත සිත් ඇත්තේමි, බඹසර කෙරමි…''. බුදුන් වහන්සේ වදාළ දහම් දෙසුම අසා සතුටට පත් මෙතුමා, පැවිදිව, අරහත්වය ලැබූ බව මෙහි දක්වා ඇත. **මූලාශ්‍රය:** සංයු.නි: (1): සගාථවග්ග:බ්‍රාහ්මණසංයුත්ත:7.1.9 සුන්දරික සූත්‍රය, පි.324.

**සණ**

▲ **සෝණකුටිකන්න තෙර-** Soṇa Kuṭikaṇṇa Thera: කලණබස් තෙපලන භික්ෂුන් අතරෙන් මෙතුමා අග්‍රවේ.**බලන්න:** EAN:note:88, p.585. **මූලාශ්‍ර:** අංගු.නි: (1) 1 නිපාත: එතදග්ග පාළිය, පි. 84**,** EAN:1:Foremost, p. 44.

▼ **අවන්තිරටේ, ගිහි උපාසකව වාසය කළ** මෙතුමා, කාලි උපාසිකාවගේ පුතුය, මහා කච්චයාන රහතුන්ගේ උපස්ථායකය. එහිදී මෙතුමන් පැවිදිබව ලැබීමට කළ උත්සාහය, බුදුන් වහන්සේ බැහැදැකීමට සැවත් නුවරට පැමිණිම් ආදී මෙහි විස්තර කර ඇත. බුදුන් වහන්සේ මේ තෙරුන්ට, උන්වහන්සේගේ කුටියේ රාත්‍රිය ගත කිරීමට ඇරයුම් කළහ. එහිදී, මේ තෙරුන් අට්ඨකවග්ග සජ්ජායනා කරනලදී. ඒ ගැන සතුටට පත් බුදුන් වහන්සේ මේ උදානය වදාළහ.

''ආරිය තෙමේ...උපධි රහිත නිර්වාන ධර්මය දැන...කිලිටි දෙයෙහි නොඇලේ''. **මූලාශ්‍රය:** ඛු.නි: උදානපාලිය: 5.6 සෝණ සූත්‍රය, පි.266. **සටහන:** මෙහිදී මේ තෙරුන් බුදුන් වහන්සේට**,** අවන්ති ප්‍රදේශයේ භික්ෂු සංඝයා අඩු නිසා තමන්හට පැවිදි බව ලබාගැනීමට දුෂ්කරවූ බව විස්තර කර ඇත. ඛු.නි: වින.පි: මහාවග්ග පාලිය 1, පි.583.

▼ **මේ තෙරුන්ගේ ථෙර ගාථා**: ඛු.නි: ථෙරගාථා:5.1.11 පි.148.

''බුදුහු බොහෝ රෑ බොහෝ වේලාවක් අභ්‍යවකාශයෙහි විසූහ, සිව් විහරණයෙහි දක්ෂ ශාස්තෘහු ගඳ කිළියට පිවිසියහ...ඉක්බිති සම්බුද්ධ ශ්‍රාවකවූ මම බුද්ධ ශ්‍රේෂ්ඨයන් හමුවේ දහම සජ්ජායනා කළෙමි''.

▼ **මේ තෙරුන්ගේ අපදානය**: ඛු.නි: අපදානපාලිය1: 42, පි.193.

අනෝමදස්සි බුදුන් වහන්සේට රන් ආලේප කළ සක්මන් මළුවක් කරවා එය මල් වලින් වසා, වියන් බැඳ, බුදුන් වහන්සේට පූජා කර, අහාර දානයද පූජා කර ඇත. එම පුණ්‍ය කම්මයේ මහිමයෙන් දිගුකලක් දෙව් රජ සැප විඳ අවසාන උත්පත්තියේදී ගෝතම බුදු සසුනේ බුද්ධ ශ්‍රාවකයෙක් විය.

▲ **සෝණකොළිවීස තෙර-** Soṇa Koḷivīsa Thera: **ආරද්ධ වීරිය-** සම්පූර්ණ විරිය- ඇති භික්ෂූන් අතරෙන් මෙතුමා අග්‍රයයි බුදුන් වහන්සේ වදාළහ. **බලන්න:** EAN: note:88, p.585. **මූලාශ්‍ර:** අංගු.නි: (1) 1 නිපාත: එතදග්ග පාළිය, පි. 84**,** EAN:1: Foremost, p. 44.

▼ **මෙතුමා,** ගිහිකල, චම්පා නුවර වාසය කළ, කොලිවිස ගෝත්‍රයේ, ධනවත් සිටුපුතෙකි. සියුමැලි වූ ඔහුගේ යටිපතුල් හි ලොම්හටගෙන තිබූ නිසා ඔහුට පාවහන් නොමැතිව ඇවිදීම දුෂ්කරවිය. මෙතුමන්, සේනිය බිම්බිසාර රජ හමුවීම, ඒ මගින් බුදුන් වහන්සේ දැකීම, පැවිද්ද හා වීරිය කිරීම, අරහත්වය ලැබීම මෙහි විස්තරාත්මකව පෙන්වා ඇත. **සටහන:** මේ තෙරුන්ගේ පාද ප්‍රශ්නය හේතු කොටගෙන, සංඝයාට පාවහන් පැළඳීමට බුදුන් වහන්සේ අනුමත කර ඇත. **මූලාශ්‍රය:** වින.පි: මහාවග්ගපාලි 1: සෝණකොලිවිසවත්ථු 474, පි.594.

▼ **බුදුන් වහන්සේ** ගිජ්ජකූට පර්වතයේ වැඩ වසන සමයේ, සෝණ තෙරුන්, රජගහනුවර අසබඩ සීත වනයේ වාසය කළහ. එහිදී උන්වහන්සේට ඇරඹූ වීරිය වඩා ගත නොහැකිව සිත විපරියාසයට පත්ව ගිහිබවට පත්වීමට සිතුනි. ඒ බව සිතින් දැනගත් බුදුන් වහන්සේ ඉර්දියෙන් එහි පැමිණ **විණාව උපමාව** පෙන්වා වදාළහ: විණාවේ තත් දැඩිලෙස තද කිරීමෙන් හෝ ලිහිල් කිරීමෙන් යහපත් ස්වරය ගත නොහකිය. එහෙත් තත් සමගුණයෙන් පිහිටවා ගත් කළ ස්වරය යහපත්වේ. එලෙස, පමණට වැඩි වීරිය නිසා උද්දච්චය ඇතිවේ, අඩු වීරිය නිසා අලසකම ඇතිවේ. එමනිසා, වීරිය ආදී ඉන්ද්‍රිය සමතත්වයේ පිටුවාගෙන කටයුතු කරන්න යයි බුදුන් වහන්සේ වදාළහ. ඒ අනුව ක්‍රියා කළ සෝණ තෙරුන් අරහත්වය ලැබුහ. **සටහන:** මෙතුමා ගිහිකල විණා වාදනයෙහි දක්ෂවිය. **මූලාශ්‍රය:** අංගු.නි: (4) 6 නිපාත: 6.2.1.1. සෝණසූත්‍රය, පි.172.

▼ **මේ තෙරුන්ගේ ථෙර ගාථා**: ඛු.නි: ථෙරගාථා:13.1.1., පි.489.

"අඟුරජායාගේ පිරිවරයෙහි වූ ඒ සෝණ තෙමේ අද දහමේ උතුම්ව දුකේ පරතෙරට ගියේය".

**සප**

▲ **සෝපාක සාමණේර** -Samanera Sopaka: සත් හැවිරිදි වියේදී පැවිදිව, බුදුන් වහන්සේ ඇසූ දස කුමාර ප්‍රශ්න වලට යහපත් පිළිතුරු පැවසූ නිසා, බුදුන් වහන්සේ වෙතින් උපසම්පදාව ලැබුහ. **බලන්න**: ඛු.නි: ඛුද්දක පාඨ, දස කුමාර ප්‍රශ්ණ.

▼ **මේ තෙරුන්ගේ ථෙර ගාථා:**ඛු.නි: ථෙරගාථා: 7.1.4 ,පි.172.

"...පැන විසඳූ කළ, තථාගතයන් වහ්සේ අනුමෝදන් වූහ. මෙසේ වදාළහ:

'මේ සෝපාක යම් කෙනෙකුගේ සිව්පස වළඳන ලදිනම් එය අංග මගධ දනවු වැසියන්ට ලාභයකි'...මම අන්තිම ශරීරය දරමි. ධර්මයේ සුධර්මතාවවේ ආශ්චර්ය නිසාය."

▼ **මේ තෙරුන්ගේ අපදානය:**ඛු.නි:19, පි.144: "මම සිද්ධාර්ථ බුදුන් වහන්සේට ඇතිරියක අතුරා මල් අසුනක් පුජා කෙළෙමි. උන්වහන්සේ එම අසුනේ වැඩහිඳ මගේ මතු උත්පත්ති ස්ථානය දැන මෙසේ වදාළහ:

'ඒකාන්තයෙන්ම සංස්කාරයෝ අනිත්‍යයහ, ඉපදීම හා විනාශය ස්වාභාවය කොට ඇත, ඉපදී නැතිවේ, ඔවුන්ගේ සංසිඳීම සැපය'. මම මගේ ලබ්ධිය හැර අනිත්‍ය සංඥාව වැඩුවෙමි. කුසල විපාක අනුව දෙව් මිනිස් සැප විඳ අන්තිම ආත්ම භාවයේදී සෝපාක (ස්වකිය පාකය වූ බත අනුන් අනුභව නොකරන බැවින් සපාක නම්වූ) චණ්ඩාල කුලයේ උපත ලැබීමි, සත් හැවිරිදි වියේදී අරහත්වය ලැබුවෙමි".

**සබ**

▲ **සුබාහු තෙර-**Subahu Thera: බරණැස්නුවර සිටු පුතෙක් වූ මෙතුමා යසකුල පුත්‍ර තෙරුන්ගේ ගිහිකල මිතුරෙකි. තම මිතුරා පැවිදිවූ බව අසා සෙසු මිතුරන් තිදෙනා සමග පැමිණ, බුදුන් වහන්සේ වෙතින් දහම අසා පැවිදිව, උපසම්පදා ලැබ අරහත්වයට පත්වුහ. **මූලාශ්‍රය:**වින.පි:මහාවග්ග පාලි1: සිව්ගිහි යහළුවන්ගේ පැවිද්ද කථා, පි.116.

▼ **මේ තෙරුන්ගේ ථෙර ගාථා**: ඛු.නි: ථෙරගාථා:1.6.2 පි.58. " සොඳුරු ගායනයක් ලෙසින් වැස්ස වසී, මගේ කුටිය හොඳින් ආවරණය වී ඇත, (පරිභෝග සුඛ ආදියට ඒමට නොහැකිසේ ) කවුළු වසා ඇත. මගේ සිත කායගතා සිහියේ යහපත් ලෙසින්ම එකඟව ඇත. වැස්ස, ඔබ කැමති ලෙසින් වසින්නට හැකිය".

**සභ**

▲ **සභිය කච්චාන තෙර-**Sabhiya Kaccāna Thera: මෙහිදී මේ තෙරුන්, වච්චගොත්ත පරිබ්‍රාජක විමසු ප්‍රශ්න පිලිබඳව, එතුමන් වදාළ පිළිතුරු පෙන්වා ඇත. දේශනාව අවසානයේදී ඒ ගැන පැහැදුන වච්චගොත්ත පරිබ්‍රාජක, සභිය තෙරුන්හට ප්‍රසංසා කළහ. **සටහන**: තථාගතයන් මරණින් පසු සිටින්නේද: ආදීවූ එවක පැවති දිට්ඨි 10 ගැන මෙහි දක්වා ඇත. **බලන්න:** දිට්ඨි. **මූලාශ්‍රය:** සංයු.නි: (4) සළායතනවග්ග:අබ්‍යාකතසංයුත්ත:10.1.11 සභියසූත්‍රය, පි.730.

▼ **මේ තෙරුන්ගේ ථෙර ගාථා**: ඛු.නි: ථෙරගාථා:4.1.3 පි.128.

"කෙනකුට, සබ්‍රහ්මසරුන් කෙරෙහි ගෞරවය නැද්ද, ඔවුන් පොළවට අහස මෙන් සද්ධර්මයෙන් දුරුවේ".

▲ **සුභූති තෙර-** Subhūti Thera: අරණවිහාරි- ගැටීම් රහිත විහරණය ඇති, දක්ෂිණාවට-දක්ඛිණෙය්‍යා -තැගී පුජාආදිය ලැබීමට සුදුසු භික්ෂුන් අතරෙන් අග්‍ර, සුභූති තෙරුන්යයි බුදුන් වහන්සේ වදාළහ. **මූලාශ්‍ර:** අංගු.නි: (1 ) 1 නිපාත: එතදග්ග පාළිය, පි. 84**,** EAN:1: Foremost, p. 44.

▼ **මේ තෙරුන්** අනාථපිණ්ඩික සිටුවරයාගේ බාල සොහොයුරාය, ජේතවනාරාමය බුදුන් වහන්සේට පුජා කරන අවස්ථාවේදී පැවිදි වුහ.

මෙත්තා භාවනාව තුලින් ජානසම්පත් ලබා අරහත්වයට පත්වූහ. **බලන්න:** EAN: note: 85, p.585 **මූලාශ්‍ර**: අංගු.නි:(6 ):11 නිපාත:අනුසති වග්ග,11.2.4 සුභූති සූත්‍රය ,පි.662 ,EAN:11: II Recollection, 14.4 Subhuti , p.572.

▼ **සුභූති තෙරුන්** අවිතක්ක සමාධියෙ වැඩ සිටිනු දුටු බුදුන් වහන්සේ මේ උදානය වදාළහ:

" ...මිථ්‍යා විතක්ක පලවාහැර...සතර යොගයන් ඉක්මවා ගිය ආරිය පුද්ගලයා, ඒකාන්තයෙන්ම පුනර්භවයකට නො එයි". **මූලාශ්‍රය:** ඛු.නි:උදානපාලිය:6.7. සුභූති සූත්‍රය, පි.300.

▼ **මේ තෙරුන්ගේ ථෙර ගාථා:** ඛු.නි: ථෙරගාථා:1.1.1 පි.35.

" මගේ කුටිය මැනවින් සොයනලද නිසා සුව එළවයි… (එනිසා) මේඝය (වැස්ස) රිසිසේ වසින්න! මගේ සිත යහපත්ලෙසින්ම සමාහිතව ඇත, කෙලෙසුන් ගෙන් මිදී ඇත, මම ආරබ්ධ වීරිය ඇතිව වාසය කරමි…"

▼ **මේ තෙරුන්ගේ අපදාන:** ඛු.නි: අපදාන පාලිය1:21, පි.148. "පදුමුත්තර බුදුන් වහන්සේ වැඩසිටි සමයේ මම, කෝසිය නම් ජටිලයෙක්ව, හිමවතේ උග්‍ර තපස්කම් කළෙමි. බුදුන් වහන්සේ මා සිටි ස්ථානයට වැඩ අහසේ සක්මන් කලසේක. මම මල් අසුනක් පූජා කර බුදුන් වහන්සේට එහි වැඩම කිරීමට ආරාධනා කර සතියක් මුළුලේ උන්වහන්සේට නමස්කාර කරමින් සිටියෙමි. සමාධියෙන් නැගිට, බුදුන් වහන්සේ මෙසේ වදාළහ:

' භාවනා අතුරෙන් ශ්‍රේෂ්ඨවූ බුද්ධානුස්සතිය වඩන්න, එහි ඵල ලෙසින් දිගු කලක් දෙව් සැප, රජ සැප විඳින්නේය. ඔබ, බොහෝ සම්පත් හැර, මතු පහළවන ගෝතම බුදු සසුනේ සුභූති නම් බුද්ධශ්‍රාවකයෙක් වෙන්නේය'".

▲**සුභද්‍ර භික්ෂුව**-Bhikkhu Subhadra: බුදුන් වහන්සේ වෙතින් පැවිද්ද ලැබූ අන්තිම ශ්‍රාවක භික්ෂුව මේ උතුමාය. පෙරදී සුභද්‍ර පරිබ්‍රාජිකවූ මෙතෙම, ඉතා ඉක්මනින්ම දහම අවබෝධ කර අරහත්වය ලබා ගත්හ. විස්තර පිණිස **බලන්න**: දීඝ.නි: මහා පරිනිබ්බාන සූත්‍රය.

▼ **මේ තෙරුන්ගේ අපදාන:** ඛු.නි: අපදාන පාලිය1: 19, පි.206. "මින් කල්ප ලක්ෂයකට පෙර පදුමුත්තර බුදුන් වහන්සේ පිරිනිවන් පෑ කළ ඒ ස්තූපයට මනහර ධජයක් පිදිවෙමි. කාශ්‍යප බුදුන් වහන්සේගේ තිස්ස නම් අග්‍ර ශ්‍රාවකයන්ට මම ලාමක වචන පැවසූ නිසා ගෝතම බුදුන් වහන්සේ දැකීම පමාවිය. එතුමන්, උපවර්-තන සාල වනයේ දී පිරිනිවන් මඤ්චකයේහිදී මා පැවිදි කළසේක. බුදුන් වහන්සේ ඉදිරියේම මගේ පැවිද්ද...උපසම්පදාව...පිරිනිවීම විය… බුදු සසුන කරනලදී".

▲ **සුභද්‍ර මහලු භික්ෂුව-** Subhadra elderly Bhikkhu: මහා කාශ්‍යප තෙරුන්ගේ පිරිසේ සිටි මේ භික්ෂුව මහළු කල පැවිද්ද ලැබූවෙකි. බුදුන් වහන්සේ පිරිනිවන් පෑම අසා මහා කාශ්‍යප තෙරුන්ගේ පිරිස සංවේගයට පත්වූවිට, මොහු මෙසේ පවසා ඇත:

" ඇවැත්නි කම් නැත, ශෝක නොකරන්න, නොවැළපෙන්න, අපි ඒ මහා

ශ්‍රමණයා ගෙන් මොනවට මිදුණම්හ...මෙය තොපට කැපය... නොකැපය… ආදී ලෙසින් ඔහුගේ අවවාද වලින් මිදුනොවෙමු...දැන් අපට කැමති දේ කළහැකිය'' ආදිලෙසින් ඔහු බුදුන් වහන්සේ ගැන අගරු ලෙසින් කථාකර ඇත. **බලන්න:** දීඝ.නි: මහාපරිනිබ්බාන සූත්‍රය.

▲ **සෝභිත තෙර-** Sobhita Thera: පෙර විසු කඳපිළිවෙත සිහිකරණ- පුබ්බේනිවාසානුස්සතිය- භික්ෂූන් අතරෙන්, මේ තෙරුන් අග්‍රය. ගිහිකල, සැවත්නුවර වාසයකළ බ්‍රාහ්මණයෙක්විය. **බලන්න:** EAN: note: 108,p.585 **මූලාශ්‍ර:** අංගු.නි: (1) 1 නිපාත: එතදග්ග පාළිය සූත්‍ර, පි. 84**,** EAN:1: Foremost, p. 44.

▼ **මේ තෙරුන්ගේ ථෙර ගාථා:** ඛු.නි: ථෙරගාථා:2.3.3, පි.98. " සිහිය ඇතිව, අභිඥා නුවණින්, බල හා වීරිය ඇති මහණකු වූ මම පන්සියක් කල්ප (පෙරජීවිත) එක් රැයකින් සිහි කෙළෙමි''.

▼ **මේ තෙරුන්ගේ අපදානය :** ඛු.නි: අපදාන පාළිය:1: 131, පි.311. පදුමුත්තර බුදුන් වහන්සේ සමයේ උපත ලබා බුදුන් වහන්සේ වෙත පැහැදී බුදු ගුණ වැනිම, එමනිසා දිගු කාලයක් දුගතියෙන් තොරව සැප ලැබීම, අවසාන උත්පත්තියේදී, ගෝතම බුදුන් වහන්සේ වෙත පැවිදිව කෙළෙස් හැර නිවන ලබා ගැනීම මෙහි දක්වා ඇත.

**සම**

▲ **සමිද්ධි තෙර-** Samiddhi Thera: එක්සමයක දේවතාවියක් සමිද්ධි තෙරුන්හට: මෙලොව දැකිය හැකි පස්කම් සුවය විඳීම සුදුසුයයි පැවසුහ. එවිට සමිද්ධි තෙරුන් මෙසේ පැවසුහ: **" කම්සැප කාලික බව (කෙටිබව) එහි බොහෝ දෝස ඇතිබව, මේ දහම තමන් විසින්ම දැකිය යුතුය, කල්නොයවා විපාක දෙන සුළුය, එව බලව යයි කීමට සුදුසුය, තමන්ගේ සිතේ දරාගෙන සිටීමට සුදුසුය. නුවණැත්තන් විසින්ම අවබෝධ කරගතයුතුය' යි බුදුන් වහන්සේ වදාළහ''. මූලාශ්‍ර:**සංයු.නි:(1 ): සගාථවග්ග: දේවතාසංයුත්ත: 1.2.10 සමිද්ධි සූත්‍රය, පි. 44, ESN: Devatasamyutta: 20.10 Samiddhi, p. 79.

▼ **සමිද්ධි තෙරුන්**, බුදුන් වහන්සේගෙන් මාරයා ගැන විමසීම මෙහි විස්තරකර ඇත. **මූලාශ්‍ර:** සංයු.නි: (4) සළායතනසංයුත්ත: සමිද්ධි මාර පඤ්හ සූත්‍රය, පි.112, ESN: 35: Salayathana- samyutta: 65.3 Samiddhi, p. 1238.

▼ **මේ තෙරුන්ගේ ථෙර ගාථා:**ඛු.නි: ථෙරගාථා: 1.5.6 ,පි.56.

"මම සැදැහැයෙන් ගිහිගෙයින් නික්ම සසුනට පැමිණියෙමි. මගේ සතිප්‍රඥාව අරහත්වය තෙක් වර්ධනයවිය, සිත යහපත් ලෙසින් සමාහිතය. මාරයා, ඔබට කැමති ලෙසින් විකාර කරන්න, ඔබට මා පෙළිය නොහැකිය''.

▲ **සුමන තෙර**-Sumana Thera: සුමන තෙර, අරහත්වය ලැබීම මෙහි විස්තර කර ඇත. එතුමන්, ඒ බව ප්‍රකාශ කර ඇත්තේ තමන්ට මානය නොමැති බව හඟවමින්ය.

**මූලාශ්‍ර**: අං.ගු.නි: 6 නිපාතය: 6.1.5.7. ඛෙම සූත්‍රය, පි. 148, EAN:6: 49.7. Khema sutta, p. 341.

▼ **මේ තෙරුන්ගේ ථෙර ගාථා**: ඛු.නි: ථෙරගාථා:5.1.4 , පි.140,6.1.10,පි.160

"ආරිය ව්‍රතයෙන් මට අනුසාසනා කළහ, අනුකම්පා කළහ, අනුග්‍රහ කළහ. ඔබගේ (බුදුන් වහන්සේ) අවවාදය, හිස්නොවිය, මම භික්මුණු අතවැසියෙක් වීමි". **සටහන:** සත් හැවිරිදි වියේදී පැවිදිව, ඉද්දිබලයෙන් මහා නාගයෙක් දමනය කිරීම ගැන විස්තර ථෙර ගාථාවල දක්වා ඇත.

▼ **මේ තෙරුන්ගේ අපදාන**: ඛු.නි: අපදාන පාලිය1: 69,පි.236. මෙහිදී සුමන නම් මල්කරුවෙක්ව, සිඛි බුදුන්වහන්සේට සමන්පිච්ච මල් පූජාකිරීම, ඒ පූජාවේ මහිමයෙන් බොහෝ කල් දෙව් මිනිස් සැපවිඳ ගෝතම බුදු සසුනේදී අරහත්වය ලැබීම දක්වා ඇත.

**සර**

▲**සැරියුත් මහා තෙර-** Sāriputta Maha Thera: සාරිපුත්ත තෙරුන් ලෙසින්ද හඳුන්වා ඇත. බුදුන් වහන්සේගේ අග්‍ර ශ්‍රාවක දෙනමගේ, ජේෂ්ඨතම තෙරුන්ය. දහම් සේනාපති ලෙසින්ද හඳුන්වයි. **බලන්න**: අග්‍රශ්‍රාවක. මහා ප්‍රඥාවෙන් අග්‍ර: සැරියුත් තෙරුන් යයි බුදුන් වහන්සේ වදාළහ. **මූලාශ්‍ර:** අං.ගු.නි: (1) 1 නිපාත: එතදග්ග පාළිය සූත්‍ර, පි. 84**,** EAN:1: XIV : Foremost, p. 44.

▼ සැරියුත් තෙරුන් අරහත්වය ලැබීම මෙහි විස්තර කර ඇත. **මූලාශ්‍රය:** ම.නි: (2) 2.3.4 දීඝනඛ සූත්‍රය, පි.296.

▼**බුදුන්වහන්සේ** සැරියුත් තෙරුන් දහම්දූත සේවයට අනගි යයි මෙහිදී පෙන්වා ඇත. **මූලාශ්‍ර**: අං.ගු.නි: (5) 8 නිපාත: 8.1.2.6 දූතෙය්‍ය සූත්‍රය, පි.100, EAN:6: 16.6.Mission, p.421.

▼ **බුදුන් වහන්සේ සැරියුත් තෙරුන්ගේ ගුණ මෙසේ වදාළහ:**

**"මහණෙනි, සැරියුත් තෙමේ තථාගතයන් වහන්සේ විසින් පවත්වන ලද අනුත්තරවූ ධර්-ම චක්‍රය මනා කොටම, තථාගතයන්ට අනුවම පවත්වයි"** **මූලාශ්‍රය**: අං.ගු.නි: (1): 1 නිපාත: ඒකපුග්ගලවග්ග:1.13.26 සූත්‍රය. පි.84.

▼ **සංයු.නි:භික්ෂුසංයුත්ත:**මහානාග සූත්‍රයේ දී, මුගලන් තෙරුන්, මෙලෙසින් සැරියුත් තෙරුන්ගේ ගුණ වදාළහ:

" සැරියුත් තෙරුන්ගේ ප්‍රඥාවේ මහත්බව මහා සාගරය බඳුය. උන්වහන්සේ, බුදුන්වහන්සේ විසින් නොයෙක් ලෙසින් වර්ණනා කර ඇත...ප්‍රඥාවෙන් ද ශීලයෙන් ද උපසමයෙන්ද (ශාන්තබව) සැරියුත් තෙරුන් ශ්‍රේෂ්ඨයහ. නිවනට පැමිණි යම් කෙනෙක් සිටීද, සැරියුත් තෙරුන්ට වඩා උත්තරිතර මහණකෙනෙක් නැත" (සාගරය උපමාව).

▼ **සැරියුත් තෙරුන් ගේ** උතුම් ගුණ පිළිබඳව, වංන්ගීස තෙරුන් මේ ගාථාව වදාළහ:

'ගැඹුරු පැණති නුවණැත්තාවූ මග නොමග දැනීමෙහි දක්ෂ මහත් ප්‍රඥා ඇති ශාරීපුත්‍ර ස්ථවිරයන් වහන්සේ භික්ෂූන්ට දහම් දෙසති.

උන්වහන්සේගේ මධුර ස්වරය සැළලිහිණියකගේ මෙනි. වැටහීම මුහුදු රල මෙන් පැන නගී. ඇලුම් කටයුතු ඇසියයුතු සිත්කලු ස්වරයෙන් දහම් දේශනා කරන උන්වහන්සේගේ ඒ මිහිරි තෙපුල් භික්ෂුහු අසති. ඔදවැඩි සිත් ඇත්තාහු ප්‍රමුදිත සිත් ඇත්තාහු කන් යොමු කරති'. **බලන්න**: සංයු.නි: වංගීසසංයුත්ත:8.1.6 සාරිපුත්‍ර සූත්‍රය.

▼ **ආනන්ද තෙරුන්** විසින් සැරියුත් මහා තෙරුන් විමසන ලද පැණයකට ලැබූ පිළිතුර බුදුන් වහන්සේ දුන් පිළිතුරට එකහා සමානවූ නිසා ආනන්ද තෙරුන් එතුමාගේ ශ්‍රාවක ගුණ මෙසේ වණන ලදී:

"ඔබ වහන්සේ, භාග්‍යවතුන් වහන්සේ මෙන් එම පද, ව්‍යඤ්ජන අර්ථය එලෙසින්ම විසඳු සේක... යම් කරුණක් පිළිබඳව ශාස්තෘන් වහන්සේ ගේ හා ශ්‍රාවකයාගේ විසඳුම, අග්‍ර පදය වූ නිවන පිළිබඳව සැසඳෙන්නේනම්, සමාන වන්නේනම්, නිවැරදි නම් එය ආශ්චර්-යමත්ය! අද්භූතය!" ( අචඡරියං ආවුසො, අබභූතං..., යත්‍ර හි නාම සතථු ච සාවකසස ච අතෙථා බ්‍යඤජනෙන බ්‍යඤජනං සංසංදීසසති, සමෙසසති, න විගගහිසසති, යදිදං අගගපද සමිනති). **මූලාශ්‍ර**: අංගු.නි: (6 )11-නිපාත, 1 නිසසය වගග,11.1.7 පඨම සංඥා සූත්‍රය, පි.626. EAN- Elevens, I Dependence, 7.7 Perception, p.567)

▼ **මෙහිදී බුදුන් වහන්සේ**, සැරියුත් තෙරුන්ගේ ප්‍රඥාමහිමය පෙන්වා ඇත. ධර්ම ධාතුව, සම්පූර්ණයෙන්ම හේතුප්‍රත්‍යය ඇතිව දැකීමට සමත් ශ්‍රාවකපාරමී ඥානය, සැරියුත් තෙරුන් හට ඇතිබව බුදුන් වහන්සේ මෙහිදී වදාළහ. **සටහන:** සැරියුත් තෙර, අරහත්වය ලැබීමද මෙහි විස්තරකර ඇත. **මූලාශ්‍රය**: සංයු.නි: ( 2) නිදානවග්ග: අභිසමයසංයුත්ත: 1.4.2 කාළාර සූත්‍රය, පි.100

▼ **සැරියුත් තෙරුන්** ගේ හිසට යකෙක් පහර දීම හා එහි කම්ම විපාක ලෙසින්, ඒ යකා ක්ෂණයෙන්ම මැරී අවීචිනිරයේ උපත ලැබීම මෙහි දක්වා ඇත. ඒ බව දිවැසින් දුටු මහා මුගලන් තෙරුන්, සැරියුත් තෙරුන් වෙත පැමිණ උන්වහන්සේ සුවපත්ද?යයි විමසා ඇත. එතුමන් සුවපත්ව වෙසන බව පැවසුවිට මුගලන් තෙරුන්, සැරියුත් තෙරුන්ගේ ගුණ මෙසේ පවසා ඇත:

"ඇවත්නි, සැරියුත් තෙරුන් කොතරම් මහා ඉර්-දීමත්ද, මහා ආනුභාව ඇත්ද?.... ඒ යකා දුන් පහරින් ඇතෙක්වුවද බිම වැටේ...එහෙත්, මුන්වහන්සේ පැවසුවේ, මට යැපිය හැකිබවය". **සටහන:** එම සිදුවීම දිවඇසින් දුටු, බුදුන් වහන්සේ පෙන්වා ඇත්තේ කිසිවක් ගැන නොකිපෙන, මැඩුන සිතක් ඇති අය කෙරේ දුක නොපැමිනිනෙන බවය. **මූලාශ්‍ර**:ඛු.නි: ඉතිවුත්තක: 4.4. ජුන්හසූත්‍රය, පි.232.

▼ **සැරියුත් තෙරුන්ගේ ථෙර ගාථා:** ඛු.නි: ථෙරගාථා පාලිය:30.1.2, පි.262.

"...ඉදින් ගමෙහි හෝ වේවා වනයෙහි හෝ වේවා පහත් බිමේ හෝ උස් බිමේ හෝ වේවා යම් තැනක් රහතුන් වෙසේත් නම් ඒ බිම රමණීයය… පසැස් ඇති බුදුන් වහන්සේ අනෙකුහට දහම් දෙසුහ, එකල්හි මම අරුත් අවබෝධ කරමින් සවන් දුනිමි. මගේ ඒ ශ්‍රවණය හිස්දෙයක් නොවිය, මම ආශ්‍රව රහිතව විමුක්තියට පත්වූවෙමි".

▼ **සැරියුත් තෙරුන්ගේ අපදානය:** ඛු.නි:අපදාන පාලි 1: 1, පි. 54.: පෙර හවයක 'සුරුචි' නම් තවුසෙක්ව, බොහෝ සිසුන් ඇතිව, හිමාල වනයේ වාසය කර ඇත. එකල, අනෝමදස්සි බුදුන් වහන්සේ හිමවතට වැඩියහ, "මම උන්වහන්සේට ගරු පුජා කළෙමි. එතුමන් වහන්සේ, අනාගතයේදී , ගෝතම බුදුන්ගේ අගසව්ව, අරහත්වය ලබන බව වදාළහ".

▲ **සුරාධ තෙර-**Suradha Thera: සුරාධ තෙරුන් අරහත්වය ලැබීම ගැන මේ සූත්‍රයේ පෙන්වා ඇත. **මූලාශ්‍රය**: සංයු.නි: (3): ඛන්ධක: අරහන්තවග්ග: 1.2.2.10 සුරාධ සූත්‍රය, පි. 168.

▼ **මේ තෙරුන්ගේ ථෙර ගාථා:** ඛු.නි: ථෙරගාථා:1.1.1 පි.35.

" ගිහිගෙන් නික්ම සසුනෙහි යමක් සඳහා පැවිදිවීද, මා විසින් සියලු සංයෝජන ක්‍ෂයකර, ඒ අර්ථය නිවන ලබන ලදී".

**සල**

▲ **සේල තෙර-**Sela Thera: අංගුත්තරපාන දනව්වේ ප්‍රසිද්ධ වැසියෙක්වූ, කේනිය ජටිල ගේ ගිහිකල මිත්‍රයෙක් වූ මේ තෙරුන් ආපන නියම් ගමේ විසූ වේදයේ පරතෙරට ගිය, මහා සිසු පිරිසක් සහිත බ්‍රාහ්මණයෙකි. මොහු කේනිය ජටිල හමුවීමට පැමිණි අවස්ථාවේ බුදුන් වහන්සේ එහි වැඩ වාසය කරන බව දැන 'බුද්ධ' යන වචනය අසා මහා ප්‍රමොදයකට පැමිණ ඔහුට මෙසේ සිත්විය:

" බුද්ධ යන ඝෝෂය පවා ලෝකයේ දුලබය. අපගේ වේදයට අනුව දෙතිස් මහා පුරුෂ ලක්ෂණ ඇති මහා පුරුෂයන් දෙදෙනකි: සක්විති රජ … අරහත් සම්මා සම්බුද්ධ".. ඉන්පසු බුදුන් වහන්සේ බැහැදැක, අප්‍රමාණ සැදැහැ උපදවා, බුදුගුණ මාලාවක් පවසා, තම පිරිස සමග පැවිදිව අරහත්බව ලැබූ අන්දම මෙහි විස්තරාත්මකව පෙන්වා ඇත. **මූලාශ්‍රය:** ම.නි (2) 2.5.2 සේල සූත්‍රය, පි.614.

▼ **මේ තෙරුන්ගේ ථෙර ගාථා:** ඛු.නි: ථෙරගාථා:20.1.6 පි.238.

"භාග්‍යවතුන් වහන්සේ, මේ තුන්සීයක් බ්‍රාහ්මණයෝ ඇඳිලි බැඳ බඹසර යදි, අපි ඔබ වෙත බඹසර රකින්නෙමු'.

▼ **මේ තෙරුන්ගේ අපදානය:** ඛු.නි: අපදාන පාලිය:3091: පි.612. පදුමුත්තර බුදුන් වැඩසිටි සමයේ හංසවතී නුවර උපත ලබා, නෑදෑයන් හා සෙසු අය එක් රැස්කර මහා දානයක් පිරිනැමීම, එම පුණ්‍ය කම්මය නිසා දිගු කලක් දෙව් මිනිස් සැප විඳීම, අවසාන භවයේ වාසෙට්ට නම් ධනවත් බ්‍රාහ්මණ ගේ පුතෙක් වීම, ගෝතම බුදුන් වහන්සේ දැක පැහැද තම පිරිවර සමග උන්වහන්සේ වෙත පැවිදිව අරහත්වය ලැබීම මෙහි විස්තර කර ඇත.

**සළ**

▲ **සාළ තෙර-** Sala Thera: බුදුන් වහන්සේ වැඩසිටි සමයේ, ඤාතගමේවිසූ මේ තෙරුන් අරහත්ව, පිරිනිවන් පෑ බව මෙහි දක්වා ඇත. **මූලාශ්‍රය**:සංයු.නි: (5-2) මහාවග්ග: සෝතාපත්තිසංයුත්ත:11.1.8 හා 11.1.9,11.1.10 ගිඤ්ජකාවස්ථ සූත්‍ර, පි.184.

**සව**

▲ **සීවලී තෙර-** Sivali Thera: සිව්පස මනාව ලබන භික්ෂුන් අතරෙන්, මෙතුමා අග්‍රය යි බුදුන් වහන්සේ වදාළහ. **මූලාශ්‍ර:** අංගු.නි: (1 ) 1 නිපාත: එතදග්ග පාළිය, පි. 84, EAN:1:Foremost, p. 44.

▼ **සුප්පාවසා කෝලිය දේවිය** මෙතුමාගේ මෑණියෝය. පෙර කම්ම විපාක ලෙසින් සත්වසක් මවගේ කුසේ සිටියහ. මෙතුමාගේ පියා, මවගේ අයැදුම පරිදි බුදුන් වහන්සේ වෙත පැමිණ, ඇයගේ නමස්කාර ගරු පුජා කළ විට, බුදුන් වහන්සේ එතුමිය සුපත්වේවා! යයි වදාළ අවස්ථාවේ, ළදරු කුමරා බිහිවිය. උපන් සැනයෙන් සෝතාපන්නවී, හිසකෙස් බානවිට, සකදාගාමී බවට පත්විය.**බලන්න:** EAN:note: 90. **මූලාශ්‍රය:** ඛු.නි: උදානපාලිය: 2.8 සුප්පාවසා සූත්‍රය, පි.186.

▼ **මේ තෙරුන්ගේ ථෙර ගාථා:**ඛු.නි: ථෙරගාථා: 1.6.10,පි.60.

“ යමක් ප්‍රයෝජන කොට ඇත්තෙමි යයි කුටියට පිවිසිමි, මගේ ඒ සංකල්පයෝ ඉටුවිය, ත්‍රිවිද්‍යා අරහත් පහළ විමුක්ති සොයමින්, මාන අනුසය හැර දැමීමි”.

▼ **මේ තෙරුන්ගේ අපදානය:**ඛු.නි: අපදාන පාලිය 2-1: 543,පි.376. පදුමුත්තර බුදුන් දවස හංසවති නුවර, ක්‍ෂත්‍රියෙක්ව, බුදුන් වහන්සේ ගැන පැහැදී, පුණ්‍යශෝභා ඇති මහා ලාභ ලබන තෙරනමක් දැක ඒ තනතුර පැතීම, සිදු කරනලද පුණ්‍ය කම්ම නිසා බොහෝ කල් දෙව් මිනිස් සැප විඳීම, විපස්සි බුදුන් පහළවූ කළ බන්ධුමති නුවර උපත ලැබීම, කර්මාන්තයක සේවය කිරීම, උපාසක සමුහයක්, බුදුන් වහන්සේට මහා දනක් පවත්වනවිට ඔවුන්ට දී හා මීපැණි සොයා ගැනීමට නොහැකිව සිටින විට තමන් සතුවූ දී හා මීපැණි, ඔවුන් විශාල මුදලක් දී ලබාගැනීමට කැමත්ත දැක්වූ අවස්ථාවේ ඒ ගැන සිතා තමන් විසින්ම ඒ දේ බුදුන් වහන්සේට පිළිගැන්වීම, බරණැස් නුවර රජකම් කරනවිට සතුරු රජෙක් ගැන කිපී ඔහු හා පිරිසට නුවරින් පිටවීමට නොදී සත් දිනක් හිරකර තැබීම, ඒ අයහපත් කම්ම විපාක නිසා නිරයේ දුක් විඳීම ආදී විස්තර මෙහි දක්වා ඇත. අවසාන භවයේ, ගෝතම බුදුන් දවස කෝලිය රටේ මේ තෙරුන් උපත ලැබීය. පියා මහලි ලිච්චවි රජය, මව සුප්පාවාස දේවිය, පෙර කළ අකුසලය නිසා සත් අවුරුද්දක් මව්කුස තුල සිටීමට සිදුවිය. බුදුන් වහන්සේගේ අනුකම්පාව නිසා උපත ලබා සතියකින් පැවිදි වූහ, සැරියුත් මහා තෙරුන් උපාධ්‍යාය, මෙතුමන්ගේ කෙස් බැවේ මහා මුගලන් තෙරුන්ය, ඒ අවස්ථාවේදී අරහත්වය ලැබූහ. පෙර කල් පුණ්‍ය කම්ම බලයෙන් දෙවියෝ, නාගයෝ හා මිනිසුන් මේ තෙරුන්ට සිව්පස නිරතුරුවම පුජා කළෝය.

**සහ**

▲ **සීහ සාමණේර-** novice Sīha: බුදුන් වහන්සේ වැඩසිටි සමයේ, උන්වහන්සේ හා වාසය කළ සාමණේර නමකි. සහජ දක්ෂතාවය ඇති මේ සාමණේර නම, ජ්‍යෙෂ්ඨතම භික්ෂුන් විසින් බුහුමන් සහිතව පිළිගත් කෙනෙක් බව දක්වා ඇත. **බලන්න**: EDN: note: 180, p. 415. **මූලාශ්‍ර**: දීඝ.නි: (1): 6 මහාලි සූත්‍රය, පි. 340, EDN: 6: Mahāli Sutta: About Mahāli- Heavenly Sights, Soul and Body, p. 11.

▼ **මේ තෙරුන්ගේ ථෙර ගාථා**: ඛු.නි: ථෙරගාථා:1.9.3,පි.70.

" එම්බා සිහ, අප්‍රමත්තව (සති සම්පජන්‍යය ඇතිව) වාසය කරන්න, දිවා රෑ කුසිත නොවී කුසල දහම වඩාගන්න, ආත්ම භාවය වහා දුරුකරන්න".

**හ**

**හත**

▲ **හත්ථිසාරිපුත්‍ර චිත්ත තෙර -**Hatthisāriputta Citta Thera: මේ තෙරුන් පැවිදිවීම හා අරහත්වය ලැබීම මෙහි දක්වා ඇත. **මූලාශ්‍රය**: දීඝ.නි: (1) 9 පොට්ඨපාද සූත්‍රය, පි. 404.

▼ **මේ තෙරුන්** බරණැස, ඉසිපතන මිගදායේ වාසය කිරීම හා මහා කොට්ඨිත තෙරුන් ඔහුට අවවාද කිරීම, පසුව වීරිය වඩා අරහත්වය ලැබීම මෙහි දක්වා ඇත. **සටහන**: අටුවාවට අනුව,මේ තෙරුන් 7 ත් වතාවක් සිවුරු හැර ගිහිබවට පත්විය, කම්ම විපාකයක් නිසා- කාශ්‍යප බුදුන් සමයේ, භික්ෂුවකට, පැවිද්ද හැර දැමීමට බලකිරීම නිසා එසේ සිදුවූ බව මෙහි දක්වා ඇත. **බලන්න:** EAN: note: 1393, p.649. **මූලාශ්‍ර**: අංගු.නි: (4) : 6 නිපාත:මහාවග්ග: 6.2.1.6 හත්ථිසාරිපුත්‍ර සූත්‍රය, පි.198. EAN:6: 60.6 Hatthi, p.350.

**හම**

▲ **හේමක තෙර-** Hemaka Thera: බාවරී බ්‍රාහ්මණ ගේ සිසුවූ මෙතුමා, තණ්හාව තරණය කිරීම ගැන බුදුන් වහන්සේ විමසුහ. බුදුන් වහන්සේ මෙසේ වදාළහ:

"අනිත්‍ය ආදී දහම් සතිමත්ව දැන, මගනුවණින් කෙළෙස් පිරිනිවිමෙන් නිවුනාවූ, සංසුන්වූ රහතුන්, ලෝකයෙහි වීසත්තිකා නම්වූ තණ්හාව තරණය කළ අයය." දහම අවබෝධ කර පැවිදිවූහ. **මූලාශ්‍රය**: ඛු.නි.සුත්තනිපාත: පාරායනවග්ග:වස්තුගාථා: පි,326, 5-8 හෙමක මානවක, පි.354.

▼ **මේ තෙරුන්ගේ අපදානය:** ඛු.නි:අපදාන පාලිය 2-1: 407,පි.48. පියදස්සි බුදුන් සමයේ අනෝම නම් බොහෝ ඉද්දිබල ඇති තවුසෙක් ලෙසින් වාසය කිරීම, බුදුන් වහන්සේට රුවන් ආසනයක් මවා පුජාකිරීම, දාන පුජා කිරීම, ඒ යහපත් කම්ම විපාක ලෙසින් බොහෝ කල් දෙව් මිනිස් සැප ලැබ, ගෝතම බුදුන් දවස උපත ලබා දහම අසා පැවිදිවීම මෙහි දක්වා ඇත.

"...මේ මගේ අන්තිම භවයය, සියලු ආසව ක්‍ෂය කරනලදී, දැන් නැවත ඉපදීමක් නැත".

**ඥඥඥ**

## උපග්‍රන්ථය 2: බුද්ධ ශ්‍රාවක භික්ෂුණී සංඝ- Buddha's disciple Bhikkhuni

**සටහන:** සූත්‍ර පිටකය, විනය පිටකය, ථෙරී ගාථා හා අපදාන ඇසුරෙන් ලබාගත් විස්තර අනුව පිළියෙළ කර ඇත. මෙහි දක්වා නැති තෙරණියන් ගේ විස්තර පිණිස බලන්න: ඛු.නි: ථෙරී ගාථා, අපදාන පාලිය 2-2: ථෙරී අපදාන.

අ: * අම්බපාලි තෙරණිය-Ambapali Thereniya * ආලවිකා තෙරණිය- Alavika Thereniya *අශෝකා තෙරණිය- Asoka Thereniya

උ: * උපචාලා තෙරණිය- Upachala Thereniya * උප්පලවන්නා තෙරණිය- Uppalavaṇṇā Thereniya

ක: *කජඞගලා තෙරණිය-Kajangala Thereniya * කිසාගෝතමී තෙරණිය- Kisa Gotami Thereniya

ඛ: * ඛේමා තෙරණිය- Khema Thereniya

ච: * චලාතෙරණිය-Chala Theraniya

ධ: *ධම්මදින්නා තෙරණිය- Dhammadinnā Thereniya

න: * නන්දා තෙරණිය- Nanda Theraniya * නන්දා (ගොතම) තෙරණිය- Nanda Theraniya

ප: * පටාචාරා තෙරණිය- Paṭācārā Theraniya* පුන්ණා තෙරණිය- Punna Theraniya

භ: * භද්ද කච්චානා (යසෝධරා) තෙරණිය -Baddakacchana (Yasodharā) Theraniya* භද්‍රා කුණ්ඩලකේසි තෙරණිය- Bhaddā Kuṇḍalakesā Theraniya

ම: * මහා ප්‍රජාපති ගෝතමී තෙරණිය-Maha Prajapathi Gothami Theraniya * මහා භද්‍රාකපිලාණි තෙරණිය-Maha Bhaddā Kāpilānī Theraniya

ව: * වජිරා තෙරණිය- Vajira Theraniya* විජයා තෙරණිය- Vijaya Theraniya * වීරාතෙරණිය- Vira Theraniya

ස: * සකුලා තෙරණිය-Sakulā Theraniya *සුක්ඛා තෙරණිය- Sukkha Theraniya * සිඟාලමාතා තෙරණිය- Sigālamātā Theraniya * සෝණා තෙරණිය- Soṇā Theraniya* සෝමා තෙරණිය- Soma Theraniya * සේලා තෙරණිය- Sela Theraniya* සිසුපචාලා තෙරණිය- Sisupachala Theraniya

====

අ

අම

▲ **අම්බපාලි තෙරණිය-**Ambapali Therniya: විසාලා මහා නුවර ප්‍රසිද්ධ නගර ශෝභනියක්වූ අම්බපාලිය, ගිහිකල බුදුන් වහන්සේගේ දායිකාවක් වූවාය. ඇය විසින් අම්බපාලි අඹ උයන බුදුන් වහන්සේ ඇතුළු මහා සංඝයාට පූජා කරන ලදී. පසුකල, ඕතොමෝ, ගිහිගෙය හැර දමා, භික්ෂුණියක්ව, අරහත්වය ලැබූවෝය. විස්තර පිණිස **බලන්න**: සංයු.නි: (5-1) සතිපට්ඨාන සංයුත්ත:අම්බපාලි වග්ග. **සටහන්:** * ගිහි ජීවිතයේදී අම්බපාලිය, ඉතා රූමත් තරුණියක් වූ නිසා, විසාලා නුවර පිරිස ඇය නගර ශෝබනිය තනතුරේ තැබූහ. **බලන්න**: වින.පි: මහාවග්ග පාලිය 2: 8 චීවරකන්ධය: පි.166. **දී.ස.නි: මහා පරිනිබ්බාන සූත්‍රයේ, බුදුන් වහන්සේ අවසාන චාරිකාවේදී, එම අඹ වනයේ වැඩසිසිටියහ. ගිහිජීවිතයේදී, බුදුන් වහන්සේ මෙතුමියට අනුසාසනා වදාළහ.

▼ **මේ තෙරණියගේ ගාථා:** ඛු.නි: ථෙරිගාථා:20.1, පි. 426.

"පෙර මගේ කේශයෝ කළු පැහැ විය, ඇස්බැමි බඹරුන් බඳු පැහැවිය, දැන් ජරා හේතුවෙන් ඔවුන් දිරාගිය පිදුරු බඳුය, සත්‍යවාදී සම්බුදුන්ගේ වචනය අන් පරිදි නොවේ. … මාගේ සිරුර මෙසේ දැදුරු වී ජරාවට පත්ව බෝහෝ දුක් ඇති කරන වාසස්ථානයක් වැනිය".

▼ **මේ තෙරණියගේ අපදානය:** ඛු.නි: අපදාන පාලිය 2-2:4-9, පි.227. ඵුස්ස බුදුන් වහන්සේ පහළවූ සමයේ මෙතුමිය, උන්වහන්සේගේ නැගණිය වූවාය. උන්වහන්සේට මහා දන් දී රූප සම්පත්තිය පැතුවාය, ඉන්පසු අරුණ නුවර උපත් ලබා එහිදී රහත් මෙහෙනියකට නිරපරාදේ පරිභව කොට නිරයේ බොහෝ දුක් වින්දාය. ඒ පාපය නිසා මිනිස් ලොව උපන් දසදහසක් ජාතිවල ගණිකාවක් වූහ. කාශ්‍යප බුදුන් සමයේ බඹසර විසීම නිසා දෙව්ලොව උපත ලැබූහ. අවසාන ජාතියේදී, අඹයකින් ඕපපාතික උපතක් ලැබූහ. ගෝතම බුදුන් වහන්සේ දැක පැහැද ගිහි දායිකාවක්ව, පසුව පැවිදිබව ලබා, නිවන ලැබ බුදුන් වහන්සේගේ ඖරෂ දියණියක් බවට පත්වූවාය.

අල

▲ **ආලවිකා තෙරණිය-** Alavika Thereniya: **මේ තෙරණිය** සැවැත්නුවර අසල අන්ධවනයේ දිවා විහරණයෙ වැඩසිටි අවස්ථාවේ , මාරයා එතුමිය වසඟ කරගැනීමට ගත් උත්සාහය නිෂ්ඵල වූ බව මෙහි පෙන්වා ඇත. **තෙරණිය මෙසේ වදාළහ:**

**" ලොවේ නිවනක් ඇත, මා විසින් එය නුවණින් දන්නා ලදී. පව්වූ මරුව, ඔබ ඒ නිවන් පදය නොදනී". මූලාශ්‍රය:** සංයු.නි: (1) සගාථවග්ග: භික්ඛුණිසංයුත්ත: 5.1.1 ආලවිකා සූත්‍රය. පි.258.

අශ

▲ **අශෝකා තෙරණිය-** Asoka Theriya: ඤාතගමේ විසූ මේ තෙරණිය, අනාගාමිව, සුද්ධාවාසයක ඕපපාතික උපත ලැබූ බව මෙහි දක්වා ඇත. **මූලාශ්‍රය**:සංයු.නි: (5-2) මහාවග්ග: සෝතාපත්තිසංයුත්ත:11.1.8, 11.1.9,11.1.10 ගිඤ්ජකාවස්ථ සූත්‍ර, පි.184.

උ

**උප**

▲ **උපචාලා තෙරණිය-** Upachala Thereniya: මෙතුමිය සැරියුත් මහා තෙරුන්ගේ නැගණියකි. මේ තෙරණිය සැවැත්නුවර අසල අන්ධවනයේ දිවා විහරණයෙ වැඩසිටි අවස්ථාවේ , මාරයා ඒ අසලට පැමිණ මෙසේ පැවසිය: “ ඔබ කුමන තැනක ඉපදීමට කැමතිද?”

තෙරණිය: “මම කිසිතැනක් ඉපදීමට කැමති නැත”.

එවිට මාරයා, සදෙව්ලෝක දෙව් සැප වණන ලදී.ඒ අවස්ථවේ තෙරණිය මෙසේ පැවසුවාය:

“ යම් තැනක් අකම්පිතද, අචලිතද, පුහුදුන් අය විසින් නො සොයන ලදද, මරුගේ පිහිට නැද්ද, ඒ තැන (නිවන) මගේ සිත ඇලුනේය”.

තෙරණිය මා දන්නේය යි, මාරයා අතුරුදහන්විය. **මූලාශ්‍රය:** සංයු.නි: (1) සගාථවග්ග: භික්ඛුණිසංයුත්ත: 5.1.7 උපචාලා සූත්‍රය. පි.266.

▼ **මේ තෙරණියගේ ගාථා:**ඛු.නි:ථෙරි ගාථා: 7.3, පි.412.

“ … මම බුදුන් වහන්සේගේ වදන් අසා සසුනෙහි ඇලුම් ඇතිව වාසය කළෙමි, ත්‍රිවිද්‍යා ලැබුවෙමි, බුදු සසුන කරන ලදී”.

▲ **උප්පලවන්නා මහා තෙරණිය-** Uppalavaṇṇā Thereniya: මහා ඍද්ධිමත් (ඉද්දි බලඇති- psychic potency) භික්ෂුණියන් අතරෙන් මෙතුමිය අග්‍ර යයි බුදුන් වහන්සේ වදාළහ. සැවැත්නුවර, ධනපති සිටුවරයෙකුගේ දියණිය වූවාය. දහම අසා බැතිසිත්ඇති කර, පැවිදිව, මහා ඍද්ධි බල සහිතව අරහත් මගඵල ලැබුවාය. අග්‍ර ශ්‍රාවිකා දෙනමගෙන් මෙතුමිය එක් නමකි. **බලන්න: E**AN: note: 118, p.586. **මූලාශ්‍ර:** අංගු.නි: (1) 1 නිපාත: එතදග්ග පාළිය සූත්‍ර, පි. 84**,** EAN:1:Foremost, p. 44.

▼ **මේ තෙරණිය** සැවැත්නුවර අසල අන්ධවනයේ දිවා විහරණයෙ වැඩසිටි අවස්ථාවේ , මාරයා එතුමිය වසඟ කරගැනීමට ගත් උත්සාහය නිෂ්ඵල වූ බව මෙහි පෙන්වා ඇත. තෙරණිය මෙසේ වදාළහ:

**“ මම සිත වශීකරගෙන ඇත්තෙමි, ඉද්දි පාදයෝ මැනවින් වඩන ලදහ, සියලු බැම්මෙන් මිදුනි, ඔබට, මා භිය කළ නොහැකිය”.**

**මූලාශ්‍රය:** සංයු.නි: (1) සගාථවග්ග: භික්ඛුණිසංයුත්ත: 5.1.5 උප්පලවන්නා සූත්‍රය. පි.264.

▼ **මේ තෙරණියගේ ගාථා:** ඛු.නි:ථෙරිගාථා 12.1, පි.420.

“ … මා විසින් අසාවක්‍ෂය කරන ලදී… නිවන ලබන ලදී… බුදුන්ගේ අනුසස් කරන ලදී”.

▼ **මේ තෙරණියගේ අපදානය:** ඛු.නි:අපදාන පාළිය2-2: 19.පි.99. පෙර ජතිවල මේ තුමිය හා රාහුල තෙරුන් එකම පවුලේ උපත ලැබීම, පදුමුත්තර බුදුන් වහන්සේ පහළවූ සමයේ නාග කන්‍යාවක් ලෙසින් උපත ලබා, තම පියා, බුදුන් වහන්සේට දුන් මහාදානයට සහභාගීව, උන්වහන්සේ කෙරෙහි පැහැදුනහ. එකල, බුදුන් වහන්සේගේ,

ශ්‍රාවිකාවක් මහා ඉද්දී දැක්වූ අවස්ථාවේ, එබඳු ඉද්දී ලබාගැනීමට කැමතිව, බුදුපිරිසට මහා දානයක් පූජා කළහ. විපස්සි බුදුන්සමයේ, බරණැස සිටුදුවක්ව, උන්වහන්සේට මහා දන්දී උපුල් මල් පූජා කළහ. කාශ්‍යප බුදුන් දවස කිකී රජුගේ දෙවන දියණියවී, බුදුන් වහන්සේට ගරුපූජා කළහ. ඒ රජුගේ දියණියන් සත්දෙනා පැවිදිවීමට කැමති වුවද රජු එයට කැමත්ත නුදුන් නිසා බඹසර ජීවිතයක් ගතකර දෙව්ලොව මිනිස් ලොව සැප විඳිමින් සසර සැරිසරා ඇත. (**බලන්න**: ඛේමා තෙරණිය). අවසාන උපතේදී, ගෝතම බුදුන් දවස, සැවැත්නුවර මහාධන සිටු කුලයක රූමත් දියණියක ලෙස උපත ලබා, පෙර කළ යහපත් කම්ම බලයෙන් පැවිදිව බුදුන් වහන්සේගේ උතුම් දියණියක් වූහ.

**ක**

**කජ**

▲ **කජඞන්ගලා තෙරණිය**-Kajangala Thereniya: කජඞන්ගලා ප්‍රදේශයේ වාසි ගිහි උපාසක උපාසිකා වන්ගේ ඇරයුම පරිදි මේ තෙරණිය, බුදුන් වහන්සේ දේශනා කළ මහා දස ප්‍රශ්ණ, යම් වෙනස්කම් සහිතව දේශනා කර ඇත. **බලන්න:** මහා දස ප්‍රශ්න. භික්ෂුණියගේ පිළිතුරු බුදුන් වහන්සේ අනුමත කර වදාළහ. **මූලාශ්‍ර:** අං.ගු.නි: (6) 10 නිපාත: 10.1.3.7. ප්‍රථම මහාපඤ්හ සූත්‍රය,පි. 116. EAN: 10: 27.7 Great Questions -1, p. 503, 10.1.3.8. දෙවන මහාපඤ්හ සූත්‍රය,පි.128, EAN: 10: 28.8 Great Questions -2 , p. 504.

**කස**

▲ **කිසාගෝතමී තෙරණිය**- Kisa Gotami Thereniya: දළ චීවර-රලු සිවුරුදරන භික්ෂුණියන් අතරෙන් මෙතුමිය අග්‍රයයි බුදුන් වහන්සේ වදාළහ. තම එකම පුතු මියගිය පසු එය අදහා ගත නොහැකිව, ඔහු සුවපත් කිරීමට වෙදෙක් සොයා යන්නේ, බුදුන් වහන්සේ හමුවට පැමිණියාය. කිසිවෙක් නොමළ ගෙයකින් අබඇට ගෙනත් දෙන්නේ නම්, දරුවා සුවපත් කිරීමට හැකිවේ යයි බුදුන් වහන්සේ පැවසූ පසු, ගම-නගරය පුරා ඇවිද්ද ඇයට කිසිවෙක් නොමළ ගෙයක් හමුනොවිය. අවසානයේදී, යථාබව අවබෝධ කර, මළපුතු සොහනේ දමා බුදුන් වහන්සේ වෙත පැමිණ දහම් අසා , මහා ප්‍රජාපති ගෝතමී තෙරණිය සමිපයේ පැවිදිව, බවුන් වඩා අරහත්වය ලබා ගත්තාය. **බලන්න**: EAN: note: 127: p.586. **මූලාශ්‍ර:** අං.ගු.නි: (1) 1 නිපාත: එතදග්ග පාළිය සූත්‍ර, පි. 84**,** EAN:1:Foremost, p. 44.

▼ **මේ තෙරණිය** සැවැත්නුවර අසල අන්ධවනයේ දිවා විහරණයෙ වැඩසිටි අවස්ථාවේ , එතුමිය අසලට පැමිණි මාරයා මෙසේ පැවසිය:

"කිම, මළපුතුන් ඇතිව කඳුළු ඇතිව සිට දැන් එකලාව වණ මැදට පැමිණ, ඔබ පුරුෂයෙක් සොයන්නේද?" තෙරණිය මෙසේ වදාළහ:

**" පුතුන්ද, ස්වාමියන්ද අවසන් කර ඇත. ශෝක නොකරමි, නො හඬමි, මම ඔබට භිය නොවෙමි... සියලු තණ්හා නසන ලදී, මරසෙන් දිනා නිකෙළෙස්ව වාසය කරමි".**

තෙරණිය මා දන්නේය යි, මාරයා අතුරුදහන්විය.

**මූලාශ්‍රය:** සංයු.නි: (1) සගාථවග්ග: භික්ඛුණිසංයුත්ත: 5.1.3 ගෝතමී සූත්‍රය. පි.262.

▼ **මේ තෙරණියගේ ගාථා:** ඛු.නි:ථෙරිගාථා: 11.1 ,පි.418.

"… මා විසින් අමතගාමී මගවූ ආරිය අටමග කරන ලදී, නිවන පසක්විය, මම දහමේ යහපත දිටිමි… බහා තැබූ කෙළෙස් බර ඇත…".

▼**තේරී අපදානය:** එතුමිය, පළමුව පදුමුත්තර බුදුන් සරණ යෑම, ගෝතම බුදු සසුනේ පැවිදිවීම හා අරහත්වය ලැබීම ආදී විස්තර දක්වා ඇත. මෙහිදී මෙතුමියද කිකී රජුගේ සත් දියණියන් ගෙන් කෙනෙක් බව දක්වා ඇත. **බලන්න**: ඛු.නි: අපදානපාලි 2:2: 22 කිසාගෝතමී අපදානය, පි. 129.

ඛ

▲ **ඛේමා තෙරණිය-** Khema Thereniya**:** මහා ප්‍රඥාව ඇති භික්ෂුණියන් අතරෙන් අග්‍රය, බුදුන් වහන්සේගේ අග්‍ර ශ්‍රාවිකා දෙනමගෙන් පළමු නමය. ගිහි ජීවිතයේදී, බිම්බිසාර රජුගේ අග බිසව වූවාය. තම රූපය ගැන මත්වී සිටි නිසා බුදුන් වහන්සේ බැහැදැකීමට මැලිවූවාය. පසුව බුදුන් වහන්සේ වෙත පැමිණ දහම අසා යථාබව අවබෝධ කර, පැවිදිව අරහත්වය ලැබුවාය. **බලන්න:** EAN:note: 117: p.586 **මූලාශ්‍ර:** අංගු.නි: (1) 1 නිපාත: එතදග්ග පාළිය සූත්‍ර, පි. 84**,** EAN:1:Foremost, p. 44.

▼ **එක්සමයක,** පසේනදී කෝසල රජු, ඛේමා තෙරණිය බැහැදැක, එවක පැවති දිට්ඨි දහය ….සත්‍වයා මරණින් මතු සිටීද නැද්ද ආදිය ගැන විමසීම හා තෙරණියගේ පිළිතුරු, මෙහි විස්තර කර ඇත. පසුව, රජතුමා, බුදුන් වහන්සේ බැහැදැක එම ප්‍රශ්න මාලාවම විමසුහ. බුදුන් වහන්සේ පිළිතුරු වදාළ පසු රජතුමා මෙසේ පැවසිය:

"වහන්ස මෙය අසිරිමත් දෙයකි...යම්හෙයකින් දේශනා කිරීමේදී, ශාස්තෘන් වහන්සේ ගේ ද ශ්‍රාවිකාවගේ ද අරුතින් අරුත, ව්‍යජනයෙන් ව්‍යජනය සැසඳේ, සමවේ …" යයි තෙරණිය ගේ ප්‍රඥාව ගැන පැසසුම් කළහ. **මූලාශ්‍රය**: සංයු.නි: (4) සලායතනවග්ග: අබ්‍යාකතසංයුත්ත:10.1.1. ඛෙමා සූත්‍රය, පි.694.

▼ **මේ තෙරණියගේ ගාථා:** ඛු.නි: ථෙරිගාථා:6.3, පි.404.

"… හැම තැනම ඇති තණ්හාව නසන ලදී, මෝහඅඳුර නසුවෙමි, මාරය, මෙසේ දනුව, ඔබව නැති කළෙමි...මම පුරුෂ උත්තමවූ සම්මා සම්බුද්ධයන් වඳිමින් බුදුන්ගේ අනුසාසනා පිළිපැද හැම දුකින් මිදුනෙමි".

▼ **මේ තෙරණියගේ අපදානය:** ඛු.නි:අපදාන පාලිය 2-2: 18,පි.86. පදුමුත්තර බුදුන් දවස, හංසවති නුවර ධනවත් සිටු පවුලක දියනියක්ව, බුදුන් වහන්සේ වෙත පැමිණ දහම අසා ප්‍රසාදයට පැමිණ බුදුන් සරණ ගිය බව මෙහි දැක්වේ. බුදුන් වහන්සේ එක්තරා මෙහෙණියක් අග්‍රස්ථානයේ තබන අවස්ථාවේ, එ ගැන පැහැදී මතුකළ ඒ තනතුර අපේක්ෂා කළහ. බුදුපිරිසට සත්දවසක් මහා දනය පිළිගන්වා තමාගේ පැතුම පැවසුවාය. එතුමන් වහන්සේ ඇයගේ පැතුම, ගෝතම බුදු සසුනේදී ඉටුවන බව වදාළහ.

විපස්සි බුදුන් වහන්සේගේ සසුනේ පැවිදිබව ලැබූහ. කෝනාගම බුදුන් වහන්සේ දවස, ඇයගේ මිතුරියන් වණ සුමේධා හා ධනංජනී හා එක්ව සංඝාරාමයක් පූජා කළහ. කාශ්‍යප බුදුන් සමයේ, උන්වහන්සේගේ අග්‍රදායකවූ කසිරට කිකී රජුගේ දියණී වරු සත් දෙනාගෙන් වැඩිමල් දියණිය වූවාය. **සටහන්: *සත් දියණියන්:** සමනි, සමන්ගුත්තා, භික්ඛුනි, භික්ඛුදාසික, ධම්මා, සුධම්මා, සංඝදාසි. ගෝතම බුදුන් වහන්සේ සමයේ ඔවුන් විවිධ පවුල්වල උපත ලැබූ බව මෙහි පෙන්වා ඇත: ඛේමා, උප්පලවන්නා,පටාචරා,භද්‍රා කුණ්ඩලකේසි, කිසාගෝතමී, ධම්මදින්නා හා විසාකා. ගෝතම බුද්ධ සසුනේ පැවිදිවූ සය දෙනා අරහත්වය ලැබුවෝය. විසාකා, සෝතාපන්නව, බුදුන් වහන්සේගේ අග්‍ර දායිකාව වූවාය (බලන්න: උපග්‍රන්ථය :3). ** මෙතුමිය සාගල නුවර මද්ද රජුගේ දියණියව උපන් අවස්ථවේ ඒ නුවර, ක්ෂේමවූනිසා- නිර්භය වූ නිසා ඛේමා යයි නම් තබන ලදී.** සුමේධා, මෙ භවයේ රාජකුමරියක්ව උපත ලබා යොවුන්වියේ ගිගිගෙය හැර පැවිදි වුවාය. විස්තර පිණිස **බලන්න:** ථෙරිගාථා.

**ච**

**චල**

▲ **චලාතෙරණිය**-Chala Theraniya: සැරියුත් මහා තෙරුන්ගේ නැගණියකි. අන්ධ වනයේ බවුන් වඩන මෙතුමිය සමීපයට පැමිණි මාරයා මෙසේ ඇසිය?

"ඔබ කුමකට අකමැති ද''

තෙරණිය: 'මම ජාතියට කැමති නැත"

මාරයා: " කුමක් නිසා ජාතියට අකමැතිද?, උපන් හැමදෙන කම් සැප විඳි, කවර අන්ධ බාලයෙක් මේ දිවියීය ඔබට උගැන්විද?"

තෙරණිය: " උපන්තැනත්තාට මරණය වේ, උපත් නිසා බොහෝ උවදුරු, දුක් ඇත... සර්වඥයන්වහන්සේ මා සත්‍යයෙහි පිටුවාලිය, ජාතිය ඉක්මවන දහම, දුක් නැසීම පිණිස මට දෙසූ සේක..."

මෙහෙණිය මා ගැන දන්නේය යයි දුකට පත් මාරයා අතුරුදහන්විය. **මූලාශ්‍රය:** සංයු.නි: (1) සගාථවග්ග: භික්ඛුණිසංයුත්ත: 5.1.6 චලා සූත්‍රය. පි.266.

▼ **මේ තෙරණියගේ ගාථා**: ඛු.නි:ථෙරිගාථා:7.2, පි.410. " … මම බුදුන් වහන්සේගේ බස් අසා සසුනේ ඇලුනෙමි, ත්‍රිවිධ විද්‍යා ලබ්වෙමි, බුදුන්ගේ අනුසාසනා කරන ලදී''.

**ධ**

**ධම**

▲ **ධම්මදින්නා තෙරණිය-** Dhammadinnā Thereniya

ධම්ම කථික භික්ෂුණියන් අතරෙන් මේ තුමිය අග්‍ර යයි බුදුන් වහන්සේ වදාළහ. ගිහි ජීවිතයේදී අනාගාමී විශාක උපාසකගේ බිරිය වූවාය.

**බලන්න:** EAN: Note:120, p.586, උපග්‍රන්ථය:3 **මූලාශ්‍ර:** අං.ගු.නි: (1) 1 නිපාත: එතදග්ග පාළිය සූත්‍ර, පි. 84**,** EAN:1:Foremost, p. 44.

▼**චූලවේදල්ල සූත්‍රය,** මේ තෙරණිය දෙසූ දහම් දේශනාවකි. බුදුන් වහන්සේ, තෙරණියගේ දේශනාව අනුමත කර, ධම්මාදින්නා තෙරණිය ප්‍රඥාවන්ත යයි වදාරා ඇත. **මූලාශ්‍ර:** ම.නි: (1) 1.5.4. චූල වෙදල්ල සූත්‍රය,පි. 721, EMN:44***:*** Cūḷavedalla Sutta, p.379.

▼ **මේ තෙරණියගේ ගාථා**: ඛු.නි: ථෙරිගාථා:1.12, පි. 372

"අග්‍ර ඵලය පිණිස උපන් චන්දය ඇති, මහණව, අවසානය- නිවන පතන්නි, සිතින් නිවන් ස්පර්ශය කළාය. කාමය පිලිබඳ සිත නැත්තිය උද්ධංසෝතා යයි කියනු ලැබේ".

▼**තේරී අපදානය:** පදුමුත්තර බුදුන් සමයේ දාසියකව උපත ලබා, බුදුන් සරණ යෑම, ගෝතම බුදු සසුනේ පැවිදිවීම හා අරහත්වය ලැබීම ආදී විස්තර දක්වා ඇත. මෙහිදී මෙතුමියද කිකී රජුගේ සත් දියණියන් ගෙන් කෙනෙක් බව දක්වා ඇත. **බලන්න**: ඛු.නි: අපදානපාලි 2:2: 22 ධම්මදින්නා අපදානය, පි. 135.

**න**

**නන**

▲ **නන්දා තෙරණිය-** Nanda Theraniya: ඤාතගමේ විසූ මේ තෙරණිය, අනාගාමිව, සුද්ධාවාසයක පහළවූ බව මෙහි දක්වා ඇත. **මූලාශ්‍රය**:සංයු.නි: (5-2) මහාවග්ග: සෝතාපත්තිසංයුත්ත:11.1.8 හා 11.1.9,11.1.10 ගිඤ්ජකාවස්ථ සූත්‍ර, පි.184.

▲ **නන්දා (ගොතම) තෙරණිය- Nanda Theraniya:** ධ්‍යානයට ඇලුණ- භාවනාමය- භික්ෂුණියන් අතරෙන් මේ තෙරණිය අග්‍රය. ගිගිකල, සුද්ධෝදන රජ හා ප්‍රජාපති ගෝතමියගේ දියණිය වූවාය, බුදුන් වහන්සේගේ හා නන්ද තෙරුන් ගේ බාල සොහොයුරිය වූවාය. නිතර ඇයගේ රූපය ගැන සිතමින් සිටි බව දැක බුදුන් වහන්සේ මෙතුමියට අවවාද අනුසාසනා කළහ. රූපයේ අනිච්චබව දැක, කෙළෙස් නසා අරහත්වය ලැබුවාය. **බලන්න**: EAN:note: 121, p.586. **මූලාශ්‍ර:** අං.ගු.නි: (1) 1 නිපාත: එතදග්ග පාළිය සූත්‍ර, පි. 84**,** EAN:1:Foremost, p. 44.

▼ මේ තෙරණිය ගේ තෙර ගාථාවේ, බුදුන් වහන්සේ ඇයට දුන් ඕවාද දක්වා ඇත:

"නන්දාවෙනි, ආතුරවූ, අප්‍රවිත්‍රවූ, පිළිකුල්බවට ගිය මේ කය දෙස බලන්න! සිත එකඟ කර, සුසුමාසිතින් අසුභය වඩන්න...නිත්‍ය හැර අනිමිත්ත විපස්සනාව වඩා මානය දුරුකර උපශාන්තව වාසය කරන්න". **බලන්න**: ඛු.නි: ථෙරිගාථා:2.1, පි.376.

**ප**

**පට**

▲ **පටාචාරා තෙරණිය-** Paṭācārā Theraniya: **විනයධර** භික්ෂුණියන් අතරෙන් මෙතුමිය අග්‍රය. ගිහිකල ධනවත් සිටු පවුලක රූමත් දියණියක්ව, මැදුරේ සිටි සේවකයෙක් සමග ප්‍රේම සම්බධයක් ඇතිකරගෙන, නිවසින් පිටව ගොස් දුර පළාතක දිළිඳු ජීවිතයක් ගතකලාය. ස්වාමියා ද බල පුතුන් දෙදෙනාද, මව් පිය ඥාතීන් ද එකම දින සෝචනීය ලෙසින් මියයෑම නිසා ඇය සිහිවිකල්වූවාය. ඇඳි වස්ත්‍ර බිම දමමින් සැවත් නුවර සැරිසරන ඇයට බුදුන් වහන්සේ දැකීමට වාසනාව ලැබී සිත සුවපත් කරගෙන, මහා ප්‍රජාපති ගෝතමී තෙරණිය සමීපයෙහි පැවිදිවූවාය. **බලන්න:** EAN:note: 119: p.586. **මූලාශ්‍ර:** අංගු.නි: (1) 1 නිපාත: එතදග්ග පාළිය සූත්‍ර, පි. 84**,** EAN:1: Foremost, p. 44.

▼ **මේ තෙරණියගේ ගාථා**: ඛු.නි: ථෙරිගාථා:5.10, පි.398.

“...සයනය පහන්එලියෙන් බලා ඇඳෙහි හිඳගත්තෙමි, එසේ සිට පහන නිවන්නට වැටිය ඇද්දෙමි, එවිට, පහන නිවිගියා මෙන් සිත විමොක්ෂයට පත්විය”.

▼**මේ තෙරණියගේ අපදාන**: ඛු.නි: අපදාන පාලිය 2-2:20, පි.114.: පදුමුත්තර බුදුන් දවස හංසවතී නුවර මහා ධන සිටු කුලයක උපත ලබා, බුදුන් සරණ ගියහ. විනයධර බැවින් අග්‍ර මෙහෙණියක් දැක එසේ වීමට කැමත්ත ඇති කරගත්හ. කාශ්‍යප බුදුන් සමයේ බරණැස්නුවර, කිකී රජුගේ තෙවෙනි දියණිය වූවාය. ( ඛේමා උප්පලවන්ණා තෙරණියන්ගේ විස්තර යන්ට සමානය). ගෝතම බුදුන් සමයේ සැවත් නුවර සිටු පවුලක ඉපදීම, දනවුවැසි මිනිසෙක් හා පලායාම, පුතුන් දෙදනා හා සැමියා මිය යෑම ආදී විස්තර දක්වා ඇත:

“සිහිවිකල්ව ඔබ මොබ දුවන මම නරසාරථවූ මුණිඳුන් දුටිමු...බුදුන් වහන්සේ මෙසේ වදාළහ: ‘මරහු විසින් මඩනා ලද සත්වයාට ආරක්ෂා පිණිස පුතුන්...නෑයෝ නොමැත’. බුදුන් වහන්සේගේ අනුසාසනා පිලිපැද, කෙළෙස් මළ රහිතව විසුද්ධිය ලැබුවෙමි.

**පන**

▲ **පුන්ණා තෙරණිය-** Punna Theraniya: ගිහිකල, අනේපිඩුමහසිටානන් ගේ නිවසේ දාසියක් ලෙසින් සේවය කළහ. දහම අසා සෝතාපන්නවූ මෙතුමිය ගැන ප්‍රසාදයට පත්වූ සිටුතුමා, ඇය දාසිබවින් මුදවා පැවිදිවීමට අවස්ථාව සලසා දුන්හ. මෙතුමිය උදක සුද්ධක බමුනාට දිය නැමෙන් පව් සේදෙන්නේ නැති බව විස්තර කර, ඔහු බුදුන්වහන්සේ වෙත යැවීම, එහිදී ඔහු බුදුන් සරණ යෑම පිලිබඳ විස්තර එතුමියගේ ථෙරිගාථා වේ පෙන්වා ඇත. **බලන්න**: ඛු.නි: ථෙරිගාථා: 16.1, පි.422.

▼ **මේ තෙරණියගේ අපදානය:** ඛු.නි: අපදානපාලිය 2-2: 8, පි.226. විපස්සි සිට කාශ්‍යප ආදී ලොව පහළවූ බුදුවරු වෙත පැවිදිවීම, දහම ප්‍රගුණ කිරීම නිසා ඒ පිළිබඳව මානයක් ඇතිවීම, ඒ අකුසල කම්මය නිසා අනේපිඩුමහසිටානන් ගේ නිවසේ දාසියකගේ කුස උපත ලැබීම මෙහි විස්තර කර ඇත. උද්දකසොධක බමුණාට බුදුසසුනේ පැවිදිව අරහත්වය ලබා ගැනීමට උපකාර කරඇත. පැවිදිව අරහත්වය ලැබුවාය.

**හ**

**හද**

▲ **භද්ද කච්චානා (යසෝධරා) තෙරණිය -**Baddakacchana (Yasodharā) Theraniya**:** මහා අභිඥා ලද භික්ෂුණියන් අතරින්. මේ තෙරණිය අග්‍රය. යශෝධරා, බිම්බාදේවිය, රාහුල මාතා ලෙසින්ද හඳුන්වා ඇති මෙතුමිය, බුදුන් වහන්ස්ගේ ගිහිකල බිරිඳ වූවාය, රාහුල තෙරුන්ගේ මවය. **බලන්න:** EAN:note:126, p.586. **මූලාශ්‍ර:** අංගු.නි: (1) 1 නිපාත: එතදග්ග පාළිය සූත්‍ර, පි. 84**,** EAN:1: XIV : Foremost, p. 44.

▼ **ථෙරී අපදානයේ දී**, තෙරණිය මෙසේ වදාළහ:

**"…වීරයන් වහන්ස, ශාක්‍යකුලයෙහි උපන්…මම යශෝධරා වෙමි, ගිහිගෙයදී ඔබගේ භාර්යාව වීමු".** පිරිනිවන් පෑමට පෙර, බුදුන් වහන්සේගේ අනුදැනීමෙන්, අහසට නැගී නොයක් ඍද්දි පෙලෙහර පෑම පිලිබඳ විස්තර ද මෙහි දක්වා ඇත. **බලන්න:** බු.නි: අපදානපාලි2: 28 යසෝධරා අපදානය, පි. 172.

▲**භද්‍රා කුණ්ඩලකේසි තෙරණිය-** Bhaddā Kuṇḍalakesā Theraniya**:** ක්ෂණික අභිඥා (direct knowledge) ලැබූ භික්ෂුණියන් අතරෙන් මේ තෙරණිය අග්‍රවේ. ධනවත් සිටු මැදුරක රූපත් දියණියක ලෙස වාසය කල ඇය, සොරෙක් දැක ඔහු කෙරේ ආලය බැඳ, දෙමාපියන්ට බල කර ඔහු විවාහ කරගති. සොරා ඇය නසා, ආභාරන ගෙන යෑමට තැත්කළ අවස්ථවේ නුවණින් කටයුතු කර ජීවිතය රැකගත්තාය. පසුව තාපසියක්ව, විවාදයෙ දක්ෂව ගමින් ගම හැසිරුනාය. **බලන්න**: EAN, note no. 124, p. 586. **මූලාශ්‍ර:** අංගු.නි: (1) 1 නිපාත: එතදග්ග පාළිය සූත්‍ර, පි. 84**,** EAN:1:Foremost, p. 44.

▼ **එතුමියගේ පැවිදිවීම** පිළිබඳව ථේරී ගාථාවේ මෙසේ දක්වා ඇත:

"ගිජ්කුළු පව්වෙහි දිවාවිහාරස්ථානයෙන් නික්ම භික්ෂුසංඝයා විසින් පිරිවරනලද, කෙලෙස්රජස් රහිතවූ බුදුන් දුටිමි. බුදුන් හමුයෙහි දෙදණ බිම පිහිටුවා වැඳ ඇදිලි කළමු. 'එව භද්‍රාවෙනි'යි බුදුහු මට වදාළහ. ඒ මට උපසම්පදාව විය". **බලන්න**: ඛු.නි.ථෙරී ගාථා: 5.9, පි.398.

▼**ථේරී අපදානයේ**: එතුමිය, පළමුව පදුමුත්තර බුදුන් සරණ යෑම , ගෝතම බුදුන් හමුවීම හා අරහත්වය ලැබීම ආදී විස්තර දක්වා ඇත. මෙහිදී මෙතුමියද, කිකී රජුගේ සත් දියණියන් ගෙන් කෙනෙක් බව දක්වා ඇත. **බලන්න**: ඛේමා තෙරණිය. **මූලාශ්‍රය**:ඛු.නි: අපදානපාලි 2:2: 21කුණ්ඩලකේසි අපදානය, පි. 122.

**ම**

**මහ**

▲ **මහා ප්‍රජාපති ගෝතමි තෙරණිය-**Maha Prajapathi Gothami Theriya

ජ්‍යෙෂ්ඨ භික්ෂුණියන් අතරෙන් ප්‍රමුඛ- අග්‍ර ස්ථානය හොබවන්නේ මෙතුමියය. භාග්‍යවතුන් වහන්සේ වෙත පැවිදිවූ පළමු භික්ෂුණිය වූ ඒ උත්තමිය, කාන්තාවන්ට මහනදම් පිරීමට මග විවෘත කිරීමට (භික්ෂුණි සංඝ ස්ථාපනය) මුලිකව කටයුතු කළාය. ගිහිකල, සුද්ධෝදන රජුගේ බිසව වුවාය, බුදුන් වහන්සේගේ සුළු මව වුවාය, නන්ද ගෝතම තෙරුන් ගෙ හා නන්දා ගොතම තෙරණියගේ මවය. **බලන්න**: EAN, note no. 116, p. 586. **මූලාශ්‍ර:** අංගු.නි: (1) 1 නිපාත: එතදග්ග පාළිය සූත්‍ර, පි. 84**,** EAN:1: Foremost, p. 44.

▼ **මහාප්‍රජාපති ගෝතමිය,** බුදුන් වහන්සේ වෙතින් කාන්තවන් හට පැවිද්ද ලබා ගැනීම ඉල්ලීම, ඒ ගැන කටයුතු කිරීම, ඒ පිළිබඳව ආනන්ද තෙරුන් දැක්වූ සහයෝගය පිලිබඳ විස්තර මෙහි දක්වා ඇත. **සටහන**: ප්‍රජාපති ගෝතමිය, බුදුන් වහන්සේ වදාළ අෂ්ඨ ගරු ධම්ම පිළිගෙන පැවිදිබව ලබා ගත්හ. එම පිළිගැනිම , එතුමියට උපසම්පදාව ලැබීමය යි බුදුන් වහන්සේ වදාළහ. **බලන්න**: අෂ්ඨගරුධම්ම. **මූලාශ්‍රය**:අංගු.නි: (5) : 8 නිපාත: ගෝතමීවග්ග: 8.2.6.1 ගෝතමී සූත්‍රය, පි.242.

▼**උතුම් තෙරණියට** මග සාක්ෂාත් කරගැනීම පිණිස බුදුන් වහන්සේ වදාළ අවවාද අනුසාසනා මෙහි දක්වා ඇත. **මූලාශ්‍රය**:අංගු.නි: (5) : 8 නිපාත: ගෝතමීවග්ග: 8.2.6.3 ගෝතමී ඕවාද සූත්‍රය, පි.254.

▼**මේ තෙරණියගේ ගාථා:** බු.නි:ථෙරිගාථා: 6.6, පි.406.

"… මා විසින් ඒ භාග්‍යවතුන් වහන්සේ නුවණැසින් දක්නා ලදහ, මේ අන්තිම දේහය වේ, ජාති සංසාර ක්ෂිණ විය, දැන් පුනර්භවයක් නැත".

▼**මේ තෙරණියගේ අපදානය:** බු.නි:අපදාන පාලිය2-2: 2-7, පි.54. පෙර පදුමුත්තර බුදුන් වහන්සේ වැඩසිටි සමයේ මහාධන ඇති ඇමති කුලයක උපත ලබා තම පිරිවර සහිතව උන්වහන්සේට සත්දිනක් මහා දන් පිරිනැමූහ. ඒ පුණ්‍ය බලයෙන් බොහෝ ජීවිතයන්හි දෙව් මිනිස් සැපලබා, ගෝතම බුදුන් වහන්සේ පහළවූ කල, බුදුන් වහන්සේගේ ගිහි ජීවිතයේ සුලුමව ව, පසුව බුද්ධ ශ්‍රාවිකාවක වීම ආදිය මෙහි දක්වා ඇත. බුදුන් වහන්සේ විසාලා නුවර කුටාගාර ශාලාවේ වැඩසිටින සමයේ, ඒ නුවර ආරාමයක වැඩසිටි මෙතුමිය තම පිරිනිවීම ගැන ආවර්-ජනා කරනවිට, තමන්හට බුදුන් වහන්සේ, හෝ අගසව් දෙනම හෝ ආනන්ද, නන්ද, රාහුල තෙරුන්ගේ හෝ පිරිනිවීම දැකීමට නොලැබේ යන සිහිය ඇතිවිය. ආයුසංස්කාර හැර දැමීමට සිතා ගත්හ, එසැනින් භූමි කම්පාවක් ඇතිවිය, ආරාමයට අරක්ගත් දේවතාවෝ ශෝකයට පත්වුහ. එතුමිය හා වාසය කළ 500ක් මෙහිණියන් ද ඒ උතුමිය සමග පිරිනිවන් පෑමට ඉටාගත්හ. ඉන්පසුව බුදුන් වහන්සේ බැහැදැක අවසර ලබ ගත්හ. බුදුන් වහන්සේ මෙසේ වදාළහ:

" කාන්තාවන්ගේ ධර්ම අභිසමය ගැන යම් අනුවණ කෙනක් විමතියට පත්වීද, ඔවුන්ගේ දිට්ඨිය පහකිරීම පිණිස ඉද්දී දක්වන්න".

එතුමිය පිරිනිවන් පෑ පසු ධාතු පාත්‍රයක බහා ආනන්ද තෙරුන් විසින් බුදුන් වහන්සේට පිළිගන්වන ලදී. ඒ අවස්ථාවේ බුදුන් වහන්සේ මෙසේ වදාළහ:

" අහෝ ආශ්චර්-යකි , සිරුර පමණක් ඉතිරි කර මව පිරිනිවීගියද මට ශෝක පරිදෙවයක් නොමැත...ඕ පණ්ඩිතය, මහා ප්‍රඥාව, පුථු ප්‍රඥාව ඇතිය, මෙහෙනන් අතර රාත්‍රඥය- පැවිදිබවින් ජේෂ්ඨය..."

▲ **මහා භද්‍රාකපිලාණි තෙරණිය**-Maha Bhaddā Kāpilānī Theraniya**:** පෙරවිසූ කඳ පිළිවෙත සිහිකරන (**පුබ්බේනිවාසානුස්සතිය)** භික්ෂුණීන් අතරෙන් මේ තෙරණිය අග්‍ර බව බුදුන් වහන්සේ වදාළහ. මෙතුමිය ගිහිකල පිප්පලි (මහා කස්සප තෙරුන් ) සිටුවරයාගේ බිරියවූවාය. මහා කස්සප තෙරුන් ගිහිගෙය හැර දමන අවස්ථාවේදී, මෙතුමිය ද ගිහිසැප හැර, බුදුන් වහන්සේ දකින තෙක් තපස් ව්‍රතයේ යෙදී සිටියාය. **බලන්න**: English AN, note no. 125, p. 586. **මූලාශ්‍ර:** අංගු.නි: (1) 1 නිපාත: එතදග්ග පාළිය සූත්‍ර, පි. 84**,** EAN:1: Foremost, p. 44.

▼ **මේ තෙරණියගේ ගාථා**:ඛු.නි: ථෙරිගාථා:4.1 පි,388.

" සම්‍යක්සම්බුද්දයන්ගේ අනුජාත පුත්‍ර...යම් කශ්‍යප නම් තෙර කෙනෙක් පෙර විසූ කඳ පිළිවෙත ආදිය දන්නේද...ත්‍රිවිධවිද්‍යා බ්‍රාහ්මණ වේද...එලෙසින් මම, ත්‍රිවිද්‍යා ඇත්ති, මරු පළවාහැර...අන්තිම ශරීරය ධරයි...අප දෙදෙන මේ ලොව ආදීනව දැක උත්තම දමනයෙන් දැමුනෝය, ක්ෂිනාශ්‍රව වූවෙමු".

▼ **මේ තෙරණියගේ අපදාන**:ඛු.නි: අපදාන පාලිය 2-2: 27, පි.160. පදුමුත්තර බුදුන්දවස, හංසවති නුවර විදේහ නම්වූ ධනවත් සිටුකෙනෙකුගේ බිරිඳවීම, බුදුන් සරණ ගොස්, මහා දාන පිරිනැම්ම, උන්වහන්සේ පිරිනිවිගිය පසු මහා ස්ථූපයක් තනවා පුජාකිරීම, විදර්ශී බුදුන් සමයේ බන්දුමතීනුවර, දිළිඳු බමුනෙකුගේ බිරියවී, තම සැමියා ඔවුන්ට ඇති එකම සාලුව පුජා කිරිම නිසා මහා සතුටක් ඇතිකරගෙන එම පුණ්‍ය කම්මය අනුමොදන්වීම, පසු භවයකදී, පෙර සැමියා බරණැස් පුර රජවූවිට මෙතුමිය අගමෙහෙසිය වුවාය. ගෝතම බුදුන් සමයේ පැවිදිව දුක අවසන් කිරීම ආදී විස්තර මෙහි දක්වා ඇත.

**වජ**

▲ **වජිරා තෙරණිය-** Vajira Theraniya**:** මේ තෙරණිය සැවැත්නුවර අසල අන්ධවනයේ දිවා විහරණයෙ වැඩසිටි අවස්ථාවේ, ඒ අසලට පැමිණි මාරයා මෙසේ පැවසිය:

" මේ සත්ව්යා කවරකු කෙළේද, ඔහු කොහිද? මේ සත්ව්යා කොහි හටගත්තේද? කෙසේ නිරුද්ධ වේද?" තෙරණිය මෙසේ වදාළහ:

**"කිනනු සත්තොති පච්චෙසි මාරදිට්ඨිගතනනු තෙ,**
**සුද්ධසඞ්ඛාරපුඤ්ජොයං නයිධ සත්තුපලබ්භති.**
**යථා හි අඞ්ගසම්භාරා හොති සද්දො රථො ඉති, එවං ඛන්ධෙසු සන්තෙසු හොති සත්තොති සම්මුති.දුක්ඛමෙව හි සම්භොති දුක්ඛං තිට්ඨති වෙති ච, නාඤ්ඤත්‍ර දුක්ඛා සම්භොති නාඤ්ඤත්‍ර නිරුජ්ඣතීති".**

'මාරය, කිම සත්වයෙක් යයි අදහන්නේද? එය ඔබගේ දිට්ඨියක් නොවේද? මේ (සත්වයා) නම් හුදෙක් සංඛාර ගොඩකි:මෙහි සත්වයෙක් දැකිය නොහැකිය. අවයව සමුහය හේතු කොටගෙන 'රථය' යයි කියති.

එලෙස පංචස්කන්ධයන් ඇති කල්හි 'සත්‍වයා' යන ලෝක ව්‍යවහාරය වේ. මෙහි ඇත්තේ දුක ඇතිවීමය, දුක ඇතිවී නැතිවී යාමය. වෙනත් දෙයක් මෙහි නොවේ, ඇත්තේ දුක ඇතිවිමය, දුක නැතිවීමය'. (...It's only suffering that comes to be, Suffering that stands and falls away. Nothing but suffering comes to be, Nothing but suffering ceases). මෙහෙණිය මා ගැන දන්නේය යයි දුකට පත් මාරයා අතුරුදහන්විය. **මූලාශ්‍රය:** සංයු.නි: (1) සගාථවග්ග: භික්ඛුණිසංයුත්ත: 5.1.10 වජිරා සූත්‍රය. පි.271.

▲**විජයා තෙරණිය-** Vijaya Theraniya**:** මේ තෙරණිය සැවැත්නුවර අසල අන්ධවනයේ දිවා විහරණයෙ වැඩසිටි අවස්ථාවේ, මාරයා එතුමිය වසඟ කරගැනීමට මෙසේ පැවසිය:

"ආරිය දියණියෙනි, ඔබ සුරූපී දැරියක්ය, මම ද යොවුන්වියේ කෙනෙකි, ඒව පස්කම් සැප විඳිමු". තෙරණිය මෙසේ වදාළහ:

**"මාරය, සිත්කළු රූප ශබ්ද... ඇත්නම් ඒවා ඔබම තියා ගන්න, මට ඒවායින් වැඩ නැත. බිඳෙන වැනසෙන මේ කුණු කය නිසා මම පීඩාවට පත්වෙමි, ලජ්ජිත වෙමි, කාම තණ්හාව මවිසින් නසන ලදී".**

මෙහෙණිය මා ගැන දන්නේය යයි දුකට පත් මාරයා අතුරුදහන්විය. **මූලාශ්‍රය:** සංයු.නි: (1) සගාථවග්ග: භික්ඛුණිසංයුත්ත: 5.1.4 විජයා සූත්‍රය. පි.262.

▼**මේ තෙරණියගේ ගාථා:** ඛු.නි: ථෙරිගාථා:6.8, පි. 408.

"සිතේ ශාන්තිය නොලැබ සතර පස්වරක්ම විහාරයෙන් නික්මගියෙමි. ඛේමා මෙහෙන වෙත එළෙඹියෙමි,ඕ තොමෝ, නිවන් මග පිණිස දහම දෙසුවාය. එතුමිය පැවසු දහම ආවර්-ජනා කළෙමි... පළමු යාමයේ පූර්-ව නිවාස නුවණ...මැදියම් රැයේ දිවැස් නුවණ...අලුයම මෝහස්කන්ධය බිඳ දමනලදී".

▼ **මේ තෙරණියගේ අපදාන:** ඛු.නි:අපදාන පාලිය2-2: 24, පි.142. පදුමුත්තර බුදුන් දවස, හංසවතී නුවර කැත් කුලයක උපත ලැබිම, බුදුන් වහන්සේ සරණ යෑම, කාශ්‍යප බුදුන් දවස, බුදුන් වහන්සේ උදෙසා පහන් පූජා කිරීම, කුසල කම්ම නිසා දෙව් මිනිස් සැප විඳ, ගෝතම බුදුන් දවස, රාජකීය බ්‍රාහ්මණ කුලයක උපත ලබා, බුදුන් වහන්සේ දැක පැහැද පැවිදිවීම ආදී විස්තර දක්වා ඇත.

වර

▲ **වීරාතෙරණිය-** Vira Theraniya**:** බුදුන් වහන්සේ, රජගහනුවර වැඩවසන සමයේ වීරාතෙරණිය එහි වාසය කළබව මෙහි දක්වා ඇත. එක් උපාසකයෙක්, ඒ උතුමියට සිවුරක් පූජා කරනලදී. ඒ තෙරණිය ගැන ප්‍රසාදයට පත් යක්ෂයෙක්, ඒ බව රජගහනුවර සැරිසරමින් මෙසේ පවසා ඇත:

"යමෙක් සියලු යොගවලින් මිදුනු වීරා මෙහෙණහට සිවුරක් පුදනලදී. ඒකාන්තයෙන්ම නුවණැති ඒ උපාසක තෙමේ බොහෝ පින් රැස්

කරගත්හ'. **මූලාශ්‍රය:**සංයු.නි: (1): සගාථවග්ග: යක්ඛසංයුත්ත: 10.1.11. වීරාසූත්‍රය, පි.406.

**ස**

**සක**

▲ **සකුලා තෙරණිය-**Sakulā Theraniya**:** දිවැස් ඇති භික්ෂුණියන් අතරින්, මේ තෙරණිය අග්‍රය.සැවැත්නුවර බ්‍රාහ්මණ පවුලක උපත ලබා,දහම අසා පැහැදී බුදු සසුනේ පැවිදි වූවාය. **බලන්න:**EAN: note no. 123, p. 586. **මූලාශ්‍ර:** අංගු.නි: (1) 1 නිපාත: එතදග්ග පාළිය සූත්‍ර, පි. 84, EAN:1: Foremost, p. 44.

▼ **මේ තෙරණියගේ ගාථා:**බු.නි: ථෙරිගාථා:5.7, පි.396.

"මම පෙර ගිහිව සිටින කළ, රහතන්වහන්සේ ගෙන් දහම් අසා ඒ … අසංඛත දහම් ඇසින් දුටුවෙමි…දරුවෝ...ආදී සම්පත් හැර කෙස්බා පැවිදි වූවෙමි...සංස්කාරයන්හි අනාත්ම බව දැක සියලු ආසව දුරුකර… සිහිල්ව කෙළෙස් පිරිනිවනින් පිරිනිවුණුමි"

▼ **මේ තෙරණියගේ අපදාන:**බු.නි: අපදාන පාලිය:2-2:24.පි.142. පදුමුත්තර බුදුන් සරණ යෑම, බොහෝ කුසල්කර, සැපසම්පත් ලැබීම, ගෝතම බුදුන් දවස ප්‍රසිද්ධ බ්‍රාහ්මණ කුලයක උපත ලබා, බුදුන් වහන්සේ සරණයෑම ආදී විස්තර පෙන්වා ඇත.

▲ **සුක්ඛා තෙරණිය-**Sukkha Theraniya**:** රජගහ නුවර විසූ මේ තෙරණිය මහත් පිරිසකට දහම් දෙසූ බව මෙහි දැක්වේ. එතුමිය ගේ දහම් දේශනාව අසා පැහැදුන යක්ෂයෙක්, එය අගයකරමින්, රජගහනුවර වටා යමින් මෙසේ පැවසුහ:

"යම් කෙනෙක් නිවන් පදය දෙසන සුක්ඛා මෙහෙන වෙත නො පැමිණේද, රජගහනුවර වෙසන මේ මිනිසුන් කුමක් කරන්නේද? ඔවුන් සුරාපානය කළවුන් සේ නිදා සිටි". **සටහන:** දෙවෙනි සූත්‍රයේදී (10.1.10 ) ඒ තෙරණියට උවසුවෙක් දන්දීම ගැන පැහැදුන යක්ෂයෙක්, ඒ උපාසක බොහෝ පින්රැස්කරගත් බව පවසා ඇත. **මූලාශ්‍රය:** සංයු.නි: (1): සගාථවග්ග: යක්ෂසංයුත්ත: 10.1.9 පඨම සුක්ඛා සූත්‍රය, පි.404.

▼ **මේ තෙරණියගේ ගාථා:**බු.නි: ථෙරිගාථා:3.6, පි. 384.

"සුක්ඛා මෙහෙණ කුසල දහමින් යුතුව, පහ කළ රාග ඇතිව, අරහත්ව මාරයා පරදවා අන්තිම දේහය දරයි".

▼ **මේ තෙරණියගේ අපදාන:**බු.නි: අපදාන පාලිය:2-2:4-5පි. 214. විපස්සි බුදුන් දවස, උපත ලබා බුදුන් වහන්සේගේ දහම අසා පැවිදිවීම, සිඛි වෙස්සභූ, කකුසඳ, කෝනාගමන, කාශ්‍යප ආදී බුදුවරු දැක පහන් සිත් ඇතිව පැවිදිවීම, ගෝතම බුදුන් දවස රජගහනුවර සිටු කුලයක උපත ලබා, ධම්මදින්නා තෙරනිස සමීපයේ පැවිදිවීම, අරහත්වය ලැබීම ආදී විස්තර මෙහි දක්වා ඇත.

**සඟ**

▲ **සිඟාලමාතා තෙරණිය-** Sigālamātā Theraniya**:** ශ්‍රද්ධා අධිෂ්ඨානය ලැබූ භික්ෂුණියන් අතරෙන් මේ තෙරණිය අග්‍රවේ. මෙතුමිය ශ්‍රද්ධාව ප්‍රමුඛ කොටගෙන අරහත් මගඵල ලැබුවාය. **බලන්න:**EAN: note no. 128, p. 586. **මූලාශ්‍ර:** අංගු.නි: (1) 1 නිපාත: එතදග්ග පාළිය සූත්‍ර, පි. 84**,** EAN:1:Foremost, p. 44.

▼ **මේ තෙරණියගේ අපදාන**:ඛු.නි: අපදාන පාලිය:2-2:4-4පි. 210. පදුමුත්තර බුදුන් කෙරහි පැහැදී පැවිදිවීම, උන්වහන්සේ ගේ අනුසාසනාව:

" තථාගතයන් කෙරෙහි කෙනක් නොසැලෙන ශ්‍රද්ධාවේ පිහිටියේද, ආරිය කාන්ත ශිලය තිබේද, සංඝයා කෙරහි ප්‍රසාදය තිබේද, ඍජු ධම්ම දස්සනය ඇත්ද, ඔහු දිළින්දෙක් නොවේ, ඔහුගේ ජීවිතය හිස් නැත". ගෝතම බුදු සසුනේ සිගාලක සිටු කුලයේ උපත ලැබීම, ගෝතම බුදු සසුනේ අරහත්වය ලැබීම ආදී විස්තර මෙහි දක්වා ඇත.

**සණ**

▲ **සෝණා තෙරණිය-** Soṇā Theraniya**:** සම්පූර්ණ විරිය ඇතිකරණ - **ආරද්ධ වීරිය** ඇති භික්ෂුණියන් අතරෙන් මෙතුමිය අග්‍රය. **බලන්න:** EAN:note:122, p.856 **මූලාශ්‍ර:** අංගු.නි: (1) 1 නිපාත: එතදග්ග පාළිය සූත්‍ර, පි. 84, EAN:1:Foremost, p. 44.

▼ **මේ තෙරණියගේ ගාථා:** ඛු.නි: ථෙරිගාථා:5.8, පි.396.

"...දස දරුවන් වදා, දුබලවූ, දිරා ගිය මම මෙහෙණියක් වෙත පැමිණියෙමි. ඒ උත්තමිය, මට නිවන් මග දේශනා කළාය, දහම අසා, කෙස්බා පැවිදිවූවෙමි...පංච ස්කන්ධය සුන්මුල් කරනලදී, ලාමකවූ ජරාව තිට, නිගාවේවා. දැන් පුනර්භවයක් නැත".

▼ **මේ තෙරණියගේ අපදානය:** ඛු.නි: අපදානපාලිය:2-2: 26, පි.155. පදුමුත්තර බුදුන් හමුවීම, ආරද්ධ වීරියෙන් අග්‍ර මෙහෙණියක් දැක ඒ තනතුර ලබාගැනීමට පැතීම, ගෝතම බුදුන්සමයේ, සැවැත්නුවර, ධනවත් සිටු පවුලක උපත ලබා බුදුසසුනේ පැවිදිවීම ආදී විස්තර මෙහි දක්වා ඇත.

**සම**

▲ **සෝමා තෙරණිය-** Soma Theraniya**: මේ තෙරණිය** සැවැත්නුවර අසල අන්ධවනයේ දිවා විහරණයෙ වැඩසිටි අවස්ථාවේ , ඇයගේ සමාධිය බිඳ දැමීම පිණිස මාරයා මෙසේ පැවසිය:

" ඉසිවරුන් විසින් ලැබිය යුතු දුලබ පදවියක් (සමාධිය) ඇද්ද, එය ඇඟිලි දෙකේ නුවණ ඇති (දැඟුල් නුවණ) ඇති ස්ත්‍රියකට නො ලැබිය හැකිය",තෙරණිය මෙසේ වදාළහ:

**"සිත මනාව සමාධිගතව පවතින විට දහම දක්නා කෙනකුට ස්ත්‍රීබව කුමක් පිණිසද? මම ස්ත්‍රීයෙක්මි හෝ පුරුෂයෙක්මි හෝ අන්කිසිවෙක් වෙමි යයි කෙනෙකුට අදහස් වන්නේ නම් එවැන්නා, මාරයාටම සුදුසු කෙනෙකි".**

මෙහෙණිය මා ගැන දන්නේය යයි දුකට පත් මාරයා අතුරුදහන්විය. **සටහන**: මේ තෙරණියගේ ථෙර ගාථාවේද මාරයා හා පැවති සංවාදය දක්වා ඇත. **බලන්න**: ඛු.නි: ථෙරිගාථා:3.8, පි.386. **මූලාශ්‍රය:** සංයු.නි: (1) සගාථවග්ග: භික්ඛුණිසංයුත්ත: 5.1.2 සෝමා සූත්‍රය. පි.260.

**සල**

▲ **සේලා තෙරණිය-** Sela Theraniya**:** අන්ධ වනයේ බවුන් වඩන මෙතුමිය සමීපයට පැමිණි මාරයා මෙසේ පැවසිය:

" මේ අත්බව කවරකු කළේද...එය කෙසේ නිරුද්ධ වේද?"

තෙරණිය මෙසේ පැවසුවාය:

" මේ අත්බව තමා විසින් හෝ වෙනත් කෙනක් විසින් කරන ලද දෙයක් නොවේ, හේතු නිසා හට ගති, හේතු බිඳීමෙන් නිරුද්ධ වේ...කෙතෙහි වැපුරූ බීජ, පස, ජලය යන දෙක නිසා පැල හටගනී. එලෙස, ස්කන්ධ ධාතු ආයතන… හේතු නිසා හටගනී, හේතු බිඳීයාමෙන්, නිරුද්ධ වේ" මෙහෙණිය මා ගැන දන්නේය යයි දුකට පත් මාරයා අතුරුදහන්විය. **මූලාශ්‍රය:** සංයු.නි: (1) සගාථවග්ග: භික්ඛුණිසංයුත්ත: 5.1.9 සේලා සූත්‍රය, පි.270.

**සස**

▲ **සිසුපචාලා තෙරණිය-** Sisupachala Theraniya**:** සැරියුත් මහා තෙරුන්ගේ නැගණියකි. අන්ධ වනයේ බවුන් වඩන මෙතුමිය සමීපයට පැමිණි මාරයා මෙසේ පැවසිය:

"… මෙහෙණක මෙන් පෙනේ, කවරකු උදෙසා හිස මුඩු කළේද? දිට්ඨි නුරුස්සන්නේද: කුමක් නිසා මුලාවීගිය කෙනෙක්සේ හැසිරෙන්නේද?" තෙරණිය මේ පැවසුවාය:

"දිට්ඨි මේ සසුනෙන් පිටතය, මිථ්‍යා දිට්ඨි දහම මට ප්‍රිය නැත... සියලු මරුන් නෙරපූ...සියලු තැන නොපැරදුන තණ්හා දිට්ඨි නොමැති සර්වඥයන් වහන්සේ වැඩසිටි.පසැස් ඇති ඒ භාග්‍යවතුන් වහන්සේ මගේ ශාස්තෘන් වහන්සේය". මෙහෙණිය මා ගැන දන්නේය යයි දුකට පත් මාරයා අතුරුදහන්විය. **මූලාශ්‍රය:** සංයු.නි: (1) සගාථවග්ග: භික්ඛුණිසංයුත්ත: 5.1.8 සිසුපචාලා සූත්‍රය. පි.268.

▼මේ තෙරණියගේ ගාථා: ඛු.නි: ථෙරිගාථා:8.1, පි.414.

" … සැම තණ්හාව නසන ලදී, මෝහස්කන්ධය බිඳින ලදී, පවිටු මාරයා මෙය දැනගන්න, ඔබව නැති කෙළෙමි".

**ఆఆఆ**

## උපග්‍රන්ථය 3: බුදුන්වහන්සේ සරණ ගිය ගිහි පිරිස:උපාසක උපාසිකා- The Lay followers of The Buddha

======

අ: * අග්ගික භාරද්වාජ බ්‍රාහ්මණ-Brahmin Aggika Bhradvaja *අට්ඨක නුවර දසම ගහපති-householder Dasama of Aṭṭhakanāgara *අජිත මානවක-Ajitha Manawaka *අජාසත් රජ-King Ajasaththu *අනාථ පිණ්ඩික-සුදත්ත සිටුවරයා- Sudatta Anāthapiṇḍika * අරිට්ඨ උපාසක -Arittha Upasaka * ආරාමදණ්ඩ බ්‍රාහ්මණ- Brahmin Aramadanda *අසිඛන්ධක පුත්ත ගාමිණී- Asikhandaka putta gamini *අස්සලායන බ්‍රාහමණමානවක-Assalāyana brahmin student *අස්සාරෝහ ගාමිණී - The Cavalry Warrior Gamini * අශෝක උපාසක- Asoka upasaka *අශෝකා උපාසිකා- Asoka upasika

ඉ: *ඉසිදත්ත උපාසක- Isidatta upasaka

උ: * උග්ගතසරීර බ්‍රාහ්මණ- Brahmin Uggathasarira *උග්ගහ මෙණ්ඩක සිටුපුත්- Uggaha Medakasituputhra *උග්ග- විසාලානුවර ගහපති- householder Ugga of Vesālī * උග්ග- උග්ගත හත්ථිගාම ගහපති- Ugga Householder of Hatthigāma * උත්තරා නන්දමාතා- Uttara Nandamatha *උත්තර බ්‍රාහ්මණ මනවක-Uttara Brahamin student* උදය මානවක- Udaya manawaka *උදේන රජ-King Udena*උණ්ණාභ බ්‍රාහ්මණ- Brahmin Uṇṇābha *උපාලිගහපති- Upāli householder

ඒ: * ඒසුකාරී බ්‍රාහ්මණ- Esukari Brahmin

ක: * කකුධ උපාසක-Kakuda Upasaka *කුජ්ජුත්තරා උපාසිකා- Khujjuttarā Upasika * කටිස්සභ උපාසක-Katissabha Upasaka * කූටදන්ත බ්‍රාහ්මණ-Brahmin Kutadanta * කාතියානි උපාසිකා - Kātiyānī upasika*කාණා උපාසිකා - Kana Upasika *කාණාය මාතා උපාසිකා- Kanamatha Upasika * කුණ්ඩලිය පරිබ්‍රාජක- Kundalia paribrajaka *කප්ප මානවක-Kappa manawaka *කාපටික භාරද්වාජ බ්‍රාහ්මණ- Kapatika Bharadvaja Brahamin * කුරරඝර වැසි කාලි උපාසිකාව- Kāḷī upasika of Kuraraghara* කාලිංග උපාසක - Kalinga upasaka *කෝලිය පුත්‍ර පුණ්ණ-Koliyaputhta Punna * කේවඩ්ඩ ගහපති-Householder Kevadda*කසීභාරද්වාජ බ්‍රාහ්මණ- Brahmin Kasibharadvaja

ඛ: * ඛේමා උපාසිකාව- Khema Upasika *ඛෝමදුස්ස බමුණෝ- Khomadussa Brahmins

ග: * ගොධා ශාක්‍ය හා කාලි ගොධා ශාක්‍ය දියණිය- Godha Sakya & Kali Godha *ගණකමොග්ගල්ලාන බ්‍රාහ්මණ- Brahmin

Ganakamoggallana *ගෝපක මොග්ගලාන බ්‍රාහ්මණ- Brahmin Gopakamoggallana

ඝ: * ඝොටමුඛ බ්‍රාහ්මණ-Brahmin Ghotamukha *ඝෝසිත ගහපති- Householder Ghositha

ච: * චිත්ත ගහපති මච්ඡිකාසණ්ඩයේ -householder Citta of Macchikāsaṇḍa * චන්ඩ ගාමිණි උපාසක- Chanda Gamini upaaska* චන්දනංගලික උපාසක- Chandanangalika upaaska * චුන්ද කර්මකාර පුත්‍ර-Chunda karmakaraputhta *චුන්දී රජකුමරිය හා චුන්ද රාජ කුමාර- Princess Chundi & Prince Chunda

ජ: * ජතුකන්නි මානවක- Jathukanni manawaka * ජාණුස්සෝනි බ්‍රාහ්මණ-brahmin Jāṇussoṇī* ජම්බුඛාදක පරිබ්‍රාජක-wanderer Jambukhdaka * ජීවක කෝමාරභච්ච-Jīvaka Komārabhacca

ත: * තුට්ට උපාසක-Thutta Upasaka *තොදෙය්‍ය මානවක- Todeyiya manawaka *තපුස්ස ගහපති-Householder Thapussa * තපස්සු හා භල්ලුක සොහොයුරෝ- Thapassu & Balluka Brothers *තිම්බරුක පරිබ්‍රාජක-Thimbaruka a paribrajaka *තවකන්ණික ගහපති- Householder Thavakannik *තිස්සා උපාසිකාව- Tissa Upasika *තිස්ස මාතා උපාසිකා- Tissamatha Upasika

ද: * දීඝජානු කෝලිය පුත්‍ර - Dighajaanu Koliya putta * දීඝනක පරිබ්‍රාජක-Diganaka paribrajaka * දීඝාවු උපාසක-Dīghāvu upasaka *ද්‍රෝන බ්‍රාහමණ- Brahmin Doṇa *දාරුකම්මික ගහපති- Householder Darukammika * දෙවහිත බමුණා- Brahmin Devahitha

ධ: * ධොතක මානවක-Dhothaka manawaka*ධනිය ගොපල්ලා- Dhaniya cowherd * ධනංන්ජානි උපාසිකාව-Dhānañjānī Upasika*ධනඤජානි බ්‍රාහ්මණ- Dananjani Brahamin *ධනංජනී බැමිණිය- Brahmini Dhananjani *ධම්මික උපාසක- Dhammika upasaka *ධම්මදින්න උපාසක-Dhammadinna upasaka

න: * නකුල පිතා හා නකුල මාතා- Nakulapitā & Nakulamatā *නික්ඛ උපාසක-Nikkha upasaka * නන්දක ලිච්චවී -Nandaka Lichchavi* නන්දිය පරිබ්‍රාජක- Nandiya paribrajika *නන්දිය ශාක්‍ය- Nandiya sakya * නවකම්මික භාරාද්වාජ බමුණා- brahmin Navakammika Bhāradvāja

ප: * පොක්ඛරසාති බ්‍රාහ්මණ- Brahamin Pokkharasati* පිංගියානි බ්‍රාහ්මණ - Brahamin pingiyaani *පිංගලකොච්ච බ්‍රාහමණ- Brahamin Pingalakochcha *පච්චනීකසාත බ්‍රාහ්මණ- Brahamin Pacchanikasatha * පාටලිය ගාමිණි- Pāṭaliya the

headman* පොට්ඨපාද පරිබ්‍රාජක- Pottapada paribrajaka * පොතලිය ගෘහපති- Householder Pothaliya * පොතලිය පරිබ්‍රාජක- Pothaliya Paribrajaka *පදුමා උපාසිකා- Paduma Upasika * පයාසි රජතුමා- King Payasi*පුරාණ උපාසක- Purana upasaka *පිලොතික පරිබ්‍රාජක- Pilothika Paribrajaka *පසේනදී කෝසල රජ- King Pasenadi Kosala *පෙස්ස හස්ථාරෝහ පුත්‍ර - Pessa hastharoha putta * පොසාල මානවක- Posala manawaka

බ: * බොජ්ඣා උපාසිකා- Bojjhā Upasika *බෝධිරාජ කුමාර- Prince Bodhi * බිම්බි උපාසිකා- Bimbi Upasika * බිම්බිසාර රජතුමා-King Bimbisara * බාවරි බ්‍රාහ්මණ-Brahamin Bawari

භ: * භික්ඛක බ්‍රාහ්මණ -Brahamin Bhikkhaka * භද්ද උපාසක - Bhadda Upasaka * භද්දිය ලිච්චවි-Bhaddiya the Licchavi * භද්‍රක ගාමිණි- Badraka gamini * භද්‍රාවුධ මානවක- Badrawuda manawaka * භාරද්වාජ බ්‍රාහ්මණ-Bhāradvāja brahmin *භාරද්වාජ බ්‍රාහ්මණ කෝසල-Bhāradvāja Brahmin Kosala *භල්ලික ගහපති- Householder Ballika

ම: * මාගන්දිය බ්‍රාහ්මණ හා බ්‍රාහ්මණිය-Brahmin Magandiya & Wife * මිගාර සිටුවරයා- Migara Situvaraya *මිගසාලා උපාසිකාව-Upasika Migasala * මුත්තා උපාසිකා- Muttha Upasika * මධුරාපුර අවන්තිපුත්‍ර රජතුමා-King Avanthiputta of Madhura * මනුජා උපාසිකා- Manuja Upasika * මුන්ඩක රජ- King Muṇḍa *මානත්ථද්ධ බමුණා- Brahmin Mānatthaddha *මණිචූලක ගාමිණි- Maṇicūḷaka the headman * මල්ලිකා දේවිය-Queen Mallika *මෝලිය සීවක පරිබ්‍රාජක- Moliyasivaka Paribrajaka *මහානාම ශාක්‍ය- Mahanama Sakya *මහාලි ලිච්චවී- Mahāli the Licchavi *මහාසාල බමුණා- Brahmin Mahasala

ය: *යොධාජීව ගාමිණී- Yodhajiva Gamini *යසකුල පුත් තෙරුන්ගේ දෙමාපියන් හා පෙර බිරිඳ--Parents & former wife of Yaskaulaputtha Thera

ර: * රුචි උපාසිකා-Ruchi Upasika *රාසිය ගාමිණි-Rasiya Gamini

ල: * ලෝකායාත බ්‍රාහ්මණ- The cosmologist Brahamana *ලෝහිච්ච බ්‍රාහමණ (1) - Lohichcha Brahamana-1*ලෝහිච්ච බ්‍රාහමණ (2) Lohichcha Brahamana 2

ව: * වෙඛනස්ස පරිබ්‍රාජක-Vekhanassa paribrajika *වජ්ජියමාහිත ගහපති- Householder Vajjiyamāhita * විජය ගහපති- Householder Wijaya *වප්ප ශාක්‍ය-Vappa the Sakkyan *වෙරඤ්ජ බ්‍රාහ්මණ-Brahmin Veranja * වෙරඤ්ජ බමුණු

පිරිස- Brahmins of Veranja*වෙරහච්චානි බ්‍රාහ්මණිය- Verahaccāni the Brahmin lady * වේළුද්වාර බ්‍රාහ්මණ ගම් වැසියෝ-Villagers of Veludvara* වස්සකාර බ්‍රාහ්මණ- brahmin Vassakāra * වාසෙට්ඨ උපාසක- Vāseṭṭha Upasaka * වාසෙට්ඨ බ්‍රාහ්මණ- Vāseṭṭha brahmin * විසාක උපාසක- Visaka Upasaka * විසාකා මහා උපාසිකා-Visaka Maha Upasika

ස: * සංගාරව භද්‍රමුඛ - Sangārava Bhdramukha *සංගාරාව බ්‍රාහ්මණ 1- Brahmin Saṅgārava 1* සංගාරාව බ්‍රාහ්මණ 2- Brahmin Saṅgārava 2 *සිඟාලක ගෘහ පුත්‍ර-Singalaka the householder's son *සුජාතා උපාසිකාව- Sujatha upasika * සුතනා උපාසිකා- Suthana Upasika *සුදත්ත උපාසක- Sudatta upasaka * සන්තුට්ට උපාසක- Santutta Upasaka *සන්දක පරිබ්‍රාජක- Sandaka paribrajaka* සංධාන ගහපති- Householder Sandhana*සේනානිගේ දියණිය සුජාතා- Senani's daughter Sujatha * සෝණ ගෘහපුත්‍ර-Sona the househoder's son * සොණා උපාසිකා-Sona Upasika *සෝණමාතා උපාසිකා-Sonamatha Upasika* සුප්පියා උපාසිකා-Suppiya Upasika * සුප්පාවාසා දේවිය - Suppawasa Deviya * සුභද්ද උපාසක- Subadda Upasaka *සුභ බ්‍රාහ්මණ මානවක-Subha Brahamin Youth*සාමාවතී බිසව- Queen Samawathi * සෝමා හා සකුලා රාජ කුමාරින් - Princesses Soma & Sakula *සෝමා උපාසිකාව-Soma Upasika * සුමණා රාජකුමරිය- Princess Sumana* සරකානි ශාක්‍ය- Sarakani Sakyan * සාරග්ග උපාසක- Saragga Upaska*සුර අම්බට්ඨ සිටු-Sura Ambatta Situ

හ: * හත්තක ආලවී රාජ කුමාර-Hatthaka Alavai Prince *හත්ථාරෝහ ගාමිණී - Hatthāroha the Elephant Warrior

===

අ

අග

▲ අග්ගික භාරද්වාජ බ්‍රාහ්මණ-Brahmin Aggika Bhradvaja: සැවැත්නුවර වැසි, අග්ගික භාරද්වාජ බ්‍රාහ්මණ, බුදුන් වහන්සේ වදාළ වසල සූත්‍රය අසා බුදුන් සරණ ගිය ගිහි උපාසකයෙක් විය. මූලාශ්‍රය: ඛු.නි:සු.නි: උරගවග්ග:1-7 වසල සූත්‍රය, පි. 56.

අට

▲අට්ඨක නුවර දසම ගහපති-householder Dasama of Aṭṭhakanāgara: පාටලීපුත්‍ර නුවර වාසය කළ මේ ගහපති, ආනන්ද තෙරුන් බැහැදැකීමට, වෙසාලියේ බේලුව ගමට පැමිණි අවස්ථාවේ මේ සූත්‍රය ඔහුට දේශනා කරනලදී. අරහත්බව ලබන මාර්ග11ක් ගැන මෙහි

දක්වා ඇත. දේශනාව අවසානයේදී, සතුටට පත් දසම ගහපති, ආනන්ද තෙරුන් ඇතුළු සංඝයාහට මහා දානයක් පිරිනමා, ආනන්ද තෙරුන්හට කුටියක් සදා පුජා කළහ. **සටහන**: මේ ගහපති ආනන්ද තෙරුන් හමුවීම, බුදුන් වහන්සේගේ පරිනිබ්බානයෙන් පසුව වූ සිදුවීමක්ය. **මූලාශ්‍ර:** ම.නි: (2): 2.1.2 අට්ඨකනාගර සූත්‍රය, පි.35, EMN:52: Aṭṭhakanāgara Sutta,p.432.

▲**අජිත මානවක**-Ajitha Manawaka**:** **බලන්න**: උපග්‍රන්ථය1: අජිත තෙර.

▲**අජාසත් රජ-**King Ajasaththu: බිම්බිසාර රජතුමාගේ පුත්‍රයාය. වෙදෙහි පුත්‍ර, මගධයේ අධිපති ලෙසින්ද හඳුන්වයි. මුල්කාලයේ, දේවදත්ත භික්ෂුව හා මිත්‍රව, රජකම ගැනීම පිණිස තම පියා මරණයට පත් කළේය, බුදුන් වහන්සේට එදිරිව ක්‍රියා කළහ. පසුව බුදුන් සරන ගියහ. **සටහන්:** * අජාසත් කුමරා රජවීමට පෙරසමයේ දේවදත්ත භික්ෂුවට මහා දාන ආදියෙන් සංග්‍රහ කලබව මෙහි විස්තර කර ඇත: සංයු.නි: (2)**:** ලාභසත්කාර සංයුත්තය: 5.4.6 පංච රථ සූත්‍රය, පි.390. ** අජාසත් රජ, ලිච්ඡවීන් ජයගැනීම මෙහි දක්වා ඇත: සංයු.නි: (2)**:** ඔපම්ම සංයුත්තය: 8.1.8 කාලිංගරුපධාන සූත්‍රය, පි.436.** දීඝ.නි:සමනඵල සූත්‍රයේදී, අජාසත් රජ පළමුවරට බුදුන් වහන්සේ පිළිබඳ විස්වාසය ඇතිකර ගැනීම පෙන්වා ඇත. ** දීඝ.නි: මහාපරිනිබ්බාන සූත්‍රයේ අජාසත් රජු, තම ඇමැතින් දෙදනා, බුදුන් වහන්සේ වෙත එවීම, බුදුන් වහන්සේගේ පරිනිබ්බානයෙන් පසු බුද්ධ ධාතු ලබාගැනීමට කුසිනාරාවට පැමිණීම ආදී විස්තර ඇතුලත්වේ. මහා කාශ්‍යප තෙරුන් ගේ මුලිකත්වයෙන් සිදු කළ පළමු ධම්ම සංඝායනාව, මේ රජුගේ අනුග්‍රහය ඇතිව කරන ලදී. ** බුදුන් වහන්සේ කෙරෙහි රජතුමා තුල පැවති ගෞරවය මෙහිදී පෙන්වා ඇත. **බලන්න**: අංගු.නි: (2): 4 නිපාත: බ්‍රාහ්මණවග්ග: 4.4.4.8 උපක සූත්‍රය, පි.374.

**අන**

▲ **අනාථ පිණ්ඩික-සුදත්ත සිටුවරයා-** Sudatta Anāthapiṇḍika: අනේපිඩු සිටු -සුදත්ත සිටු ලෙසින්ද හඳුන්වා ඇත. ගිහි දායක අතරෙන් මෙතුමා අග්‍ර යයි බුදුන් වහන්සේ වදාළහ. **බලන්න:** EAN: note: 130, p.587. **සටහන:** මෙතුමා බුදුන් වහන්සේ ඇතුළු සංඝයාට, ජේතවනාරාමය පුජා කරන අවස්ථාවේදී එතුමාගේ බාල සොහොයුරා-සුභූති තෙර පැවිදි වුහ. **බලන්න**: උපග්‍රන්ථය 1. **මූලාශ්‍ර:** අංගු.නි: (1) 1 නිපාත: එතදග්ග පාළිය, පි. 84**,** EAN:1:Foremost, p. 44.

▼**යම් පුද්ගලයෙක් ගේ ධනය, යහපත් ලෙසින්** පරිහරණය කර ධන සම්පත් අවසන්වුවත් ඒ පිලිබඳ ඔහුට තැවීමක් නොමැත යයි බුදුන් වහන්සේ මේ සිටුවරයාට වදාළහ. **සටහන:** මේ සිටු වරයාගේ බොහෝ සම්පත් විනාශවී ගියද මෙතුමා තමන්ගේ දාන පුජා කටයුතු එලෙසම පවත්වා ගෙන ඇත. **මූලාශ්‍ර:** අංගු.නි: ( 3): 5 නිපාත: 5.1.5.1 භෝගආදිය සූත්‍රය, පි. 92, EAN: 5: 41.21 Utilization, p. 251.

▼ **අන්‍ය ආගමික යන්,** මෙතුමාගේ දිට්ඨිය පිළිබඳව විමසීම හා ඔහුදුන් පිළිතුරු පිළිබඳව බුදුන් වහන්සේ ප්‍රසංසා කිරීම මෙහි විස්තර කර ඇත.

**බලන්න**: දිට්ඨී. **මූලාශ්‍ර**: අංගු.නි:(6 ):10 නිපාත: 10.2.5.3. කිංදිට්ඨීක සූත්‍රය,පි.360.

▼ **බුදුන් වහන්සේ** පංච ඉට්ඨ ධම්ම පිලිබඳ මෙතුමාට කරුණු පෙන්වා ඇත. **මූලාශ්‍රය**: අංගු.නි: (3): 5 නිපාත:5.1.5.3 ඉට්ඨ ධර්ම සූත්‍රය, පි. 96.

▼ **තම නිවසේ දාසියක්** ලෙසින් කටයුතු කළ පුන්ණා ගේ දහම් නුවණ ගැන පැහැදුන මෙතුමා ඇය දාසිබවින් මුදා පැවිදිබවට පත්වීමට උපකාර කර ඇත. **බලන්න**: උපග්‍රන්ථය:2- පුන්ණා තෙරණිය.

▼ **මෙතුමා** කරුණු 6ක් සහිතව, නිවන සාක්ෂාත් කොට ඇතිබව බුදුන් වහන්සේ වදාළහ: 1-3) තිසරණය පිලිබඳ අවෙච්චාසහගත ප්‍රසාදය තිබීම, 4) ආරියශීලය තිබීම 5) ආරිය ඥානය තිබීම 6) ආරිය සේඛ ඵල විමුක්තිය. **සටහන්**: එම ගුණ ඇති අනිකුත් උපාසකයන් ගැන විස්තර මෙහි දක්වා ඇත. **මූලාශ්‍රය:** අංගු.නි: (4): 6 නිපාත: සාමඤ්ඤ වග්ග: 6.2.17 – සිට 36 දක්වා සූත්‍ර, පි.290.

▼ **අනාථ පිණ්ඩික සිටුවරයා** ගේ අවසාන මොහොත, සැරියුත් තෙරුන් ගේ අනුසාසනා හා එම අනුසාසනා ආවර්ජනය කර, අනාගාමී බව ලැබ් සුද්ධාවාසයක පහළවීම මෙහි විස්තර කර ඇත. **බලන්න**: ම.නි. (3) අනාථ පිණ්ඩික ඕවාද සූත්‍රය.

▼ **අනාථපිණ්ඩික දෙව්පුත්,** ජේතවනාරාමයට පැමිණ, බුදුගුණ, සැරියුත් තෙරුන්ගේ ගුණ වැනිම මෙහි විස්තර කර ඇත. **සංයු.නි:** (1): දේවපුත්ත සංයුත්තය: 2.2.10 අනාථපිණ්ඩික සූත්‍රය, පි.130.

අර

▲ **අරිට්ඨ උපාසක** -Arittha Upasaka**: මෙතුමා** කරුණු 6ක් සහිතව, නිවන සාක්ෂාත් කොට ඇතිබව බුදුන් වහන්සේ වදාළහ: 1-3) තිසරණය පිලිබඳ අවෙච්චාසහගත ප්‍රසාදය තිබීම, 4) ආරියශීලය තිබීම 5) ආරිය ඥානය තිබීම 6) ආරිය සේඛ ඵල විමුක්තිය. **සටහන්**: එම ගුණ ඇති අනිකුත් උපාසකයන් ගැන විස්තර මෙහි දක්වා ඇත. **මූලාශ්‍රය**: අංගු.නි: (4): 6 නිපාත: සාමඤ්ඤ වග්ග: 6.2.17 – සිට 36 දක්වා සූත්‍ර, පි.290.

▲ **ආරාමදණ්ඩ බ්‍රාහ්මණ-** Brahmin Aramadanda: වරණා ප්‍රදේශයේ වැසි මේ බ්‍රාහ්මණයාහට, මහා කච්චායන තෙරුන්, බුදුන් වහන්සේගේ උතුම් ගුණ වදාළ අවස්ථාවේදී, තෙරුවන් සරණ ගිය උපාසකයෙක් වූ බව මෙහි විස්තර කර ඇත. **බලන්න:** වාදවිවාද. **මූලාශ්‍ර:** අංගු: (1 ): 2 නිපාත: 2.4.16 සූත්‍රය, පි.166, EAN: 2: 37.6 Sutta, p.62.

අස

▲ **අසිඛන්ධක පුත්ත ගාමිණි-** Asikhandaka putta gamini: නාලන්දානුවර වාසය කළ මොහු, නිගණ්ඨනාථපුත්‍ර ගේ අනුගාමිකයෙකි. මේ සූත්‍ර දේශනා අසා ධර්මය අවබෝධ කරගත් ඔහු බුදුන් සරණ ගිය උපාසකයෙක් විය. **සටහන**: කුල සූත්‍රයේදී, නිගණ්ඨනාථපුත්‍ර, මොහුට බුදුන් වහන්සේ හා වාදකිරීමට උපදෙස් දෙන ලද බව පෙන්වා ඇත.

**මූලාශ්‍රය:** සංයු.නි: (4) සළායතනවග්ග:ගාමිණිසංයුත්ත:8.1.6 අසිබන්ධක සූත්‍රය, 8.1.7 ඛෙතුපම සූත්‍රය, 8.1.8 සංඛධම සූත්‍රය හා 8.1.9 කුල සූත්‍රය, පි.592.

▲ **අස්සලායන බ්‍රාහමණමානවක-**Assalāyana brahmin student: සැවැත්නුවර වාසය කල අස්සලායන බ්‍රාහමණ මානවක, එහිසිටි බ්‍රාහ්මණයන්ගේ ඉල්ලීමක් අනුව බුදුන් වහන්සේ හා වාදකිරීමට පැමිණ, උන්වහන්සේගෙන් දහම අසා පැහැදී බුදුන් සරණ ගිය ගිහියෙක් වූ බව මෙහි දක්වා ඇත. **මූලාශ්‍රය:** ම.නි: (2): අස්සලායන සූත්‍රය.

▲**අස්සාරෝහගාමිණි** - The Cavalry Warrior Gamini: අශ්වාරෝහක හමුදාවේ නායකයෙක්වූ මොහු, බුදුන් වදාළ දහම අසා පැහැදී බුදුන් සරණ ගිය බව මෙහි දක්වා ඇත. **සටහන:** අසරුවෙක් වූ මොහු තමාගේ යුද සේවය නිසා මරණින් මතු සරඤජිත දේවසභාවේ උපත ලැබේ යන මිථ්‍යා දිට්ඨිය දැරිය. බුදුන් වහන්සේ මෙහිදී පෙන්වා දී ඇත්තේ මිථ්‍යා දිට්ඨිය ඇතිවිට, යළි උපත දුගතිය බවය. **මූලාශ්‍රය:** සංයු.නි: (4) සළායතනවග්ග:ගාමිණිසංයුත්ත:8.1.5 අස්සාරෝහගාමිණි සූත්‍රය, පි.590.

**අශ**

▲ **අශෝක උපාසක-** Asoka upasaka: ඤාතගමේ විසූ මේ උපාසක සකදාගාමීව, මරණයට පත්ව, යලි එක්වරක් මේ ලෝකයට පැමිණ දුක කෙලවර කර ගන්නා බව මෙහි දක්වා ඇත. **මූලාශ්‍රය**:සංයු.නි: (5-2) මහාවග්ග: සෝතාපත්තිසංයුත්ත:11.1.8 හා 11.1.9, 11.1.10 ගිඤ්ජකාවස්ථ සූත්‍ර, පි.184.

▲ **අශෝකා උපාසිකා-** Asoka upasika: ඤාතගමේ විසූ මේ උපාසිකාව සෝතාපන්නව, මරණයට පත්වූ බව මෙහි දක්වා ඇත. **මූලාශ්‍රය**:සංයු.නි: (5-2) මහාවග්ග: සෝතාපත්තිසංයුත්ත:11.1.8 හා 11.1.9 ගිඤ්ජකාවස්ථ සූත්‍ර, පි.184.

**ඉ**

**ඉස**

▲ **ඉසිදත්ත උපාසක-** Isidatta upasaka: සැවැත්නුවර වාසි, මේ උපාසක හා ඔහුගේ සොහොයුරා පුරාණ, බුදුන් වහන්සේ පිලිබඳ මහා ශ්‍රද්ධාවකින් යුත් සෝතාපන්න ආරිය උතුමන්ය. ඔවුන් පසේනදී කෝසල රජගේ, රාජසේවකයන්ය. ඔවුන් අපවත්වූ පසු, සකදාගාමී වූ බව බුදුන් වහන්සේ වදාළහ. **මූලාශ්‍රය**: සංයු.නි: (5-2) මහාවග්ග: සෝතාපත්තිසංයුත්ත: 11.1.6 ථපති සූත්‍රය, පි.170. **සටහන:** ඉසිදත්ත ගේ දියණිය මිගසාලා, තම පියාගේ ආරියබව ගැන, ආනන්ද තෙරුන් විමසීම පිලිබඳ විස්තරය ගැන **බලන්න:** අංගු.නි:6 නිපාත: 6.1.5.2 මිගසාලා සූත්‍රය, පි.130, අංගු.නි:10 නිපාත:10.2.3.5 මිගසාලා සූත්‍රය, පි.274.

▼ **මෙතුමා** කරුණු 6ක් සහිතව, නිවන සාක්ෂාත් කොට ඇතිබව බුදුන් වහන්සේ වදාළහ: 1-3) තිසරණය පිලිබඳ අවෙච්චාසහගත ප්‍රසාදය තිබීම, 4) ආරියශීලය තිබීම 5) ආරිය ඥානය තිබීම 6) ආරිය සේඛ ඵල විමුක්තිය. **සටහන්**: එම ගුණ ඇති අනිකුත් උපාසකයන් ගැන විස්තර

මෙහි දක්වා ඇත. **මූලාශ්‍රය:** අංගු.නි: (4) 6 නිපාත: සාමඤ්ඤ වග්ග: 6.2.17 – සිට 36 දක්වා සූත්‍ර, පි.290.

**උ**

උග

▲ **උග්ගතසරීර බ්‍රාහ්මණ- Brahmin Uggathasarira:** සැවැත්නුවර වාසි මේ බ්‍රාහ්මණයා, බුදුන් වහන්සේ හමුවී යාග පිලිබඳ විමසා, උන්වහන්සේ දෙසූ දහම අසා සත්වඝාතන සහිත යාග කිරීම හැරදමා, බුදුන් සරණගිය බව මෙහි දක්වා ඇත. **මූලාශ්‍රය:** අංගු.නි: (4) 7 නිපාතය: 7.1.5.4 මහායඤ්ඤ සූත්‍රය, පි.364.

▲ **උග්ගහ මෙණ්ඩක සිටුපුත්-** Uggaha Mendakasituputhra: භද්දිය නගරයේ විසූ මේ සිටු පුත්‍රයා බුදුන් සරණ ගිය ගිහියෙක්ය. ඔහුගේ ඉල්ලීමක් අනුව බුදුන් වහන්සේ, මොහුගේ දියණියන්ට, විවාහයෙන් පසු පතිකුලයේ වාසය කලයුතු යහපත් ආකාරය පිලිබඳ කරුණු පෙන්වා ඇත. **බලන්න**: පතිකුලයට යන යුවතියට අවවාද. **මූලාශ්‍රය:**අංගු.නි: (3) 5 නිපාත:සුමණාවග්ග: 5.1.4.3 උග්ගහ සූත්‍රය, පි.78.

▼ **මෙතුමා** කරුණු 6ක් සහිතව, නිවන සාක්ෂාත් කොට ඇතිබව බුදුන් වහන්සේ වදාළහ: 1-3) තිසරණය පිලිබඳ අවෙච්චාසහගත ප්‍රසාදය තිබීම, 4) ආරියශීලය තිබීම 5) ආරිය ඥානය තිබීම 6) ආරිය සේඛ ඵල විමුක්තිය. **සටහන්**: එම ගුණ ඇති අනිකුත් උපාසකයන් ගැන විස්තර මෙහි දක්වා ඇත. **මූලාශ්‍රය:** අංගු.නි: (4) 6 නිපාත: සාමඤ්ඤ වග්ග: 6.2.17 – සිට 36 දක්වා සූත්‍ර, පි.290.

▲ **උග්ග-විසාලානුවර ගහපති**- householder Ugga of Vesālī: විසාලා නුවර වැසි, මොහු බුදුන් වහන්සේගේ අග්‍රතම ගිහි උපාසකයකි: මනාප දේ දෙන අය අතරෙන් අග්‍රය.**බලන්න:** අග්‍රතම උපාසකයන්, EAN: note: p, 587. **මූලාශ්‍ර:** අංගු.නි: (1 ) 1 නිපාත: එතදග්ග පාළිය, පි. 84**,** EAN:1: Foremost, p. 44. **සටහන්:** * මේ උපාසක විසින් බුදුන් වහන්සේට මානප දේ පූජාකිරීම ගැන විස්තර පිණිස **බලන්න**: අංගු.නි: (3): 5 නිපාත:5.1.5.4 මනාපාදායි සූත්‍රය, පි.98. අනාගාමී, එතුමා, පසුකල සුද්ධාවසයේ උපත ලබා බුදුන් වහන්සේ දැකීමට මනුලොවට පැමිණීමද එහි දක්වා ඇත. ** සංයු.නි: (4): සළායතනවග්ග: වේදනාසංයුත්ත: ගහපතිවග්ග: 1.13.1, සූත්‍රය, මේ උපාසකහට පිරිනිවීම ගැන කරුණු, බුදුන් වහන්සේ දේශනා කර ඇත.

▼ **මේ උපාසක සතු අසිරිමත් ගුණ 8** ක් ගැන මෙහි විස්තරාත්මකව දක්වා ඇත. **මූලාශ්‍රය**: අංගු.නි: (5): 8 නිපාත: ගහපතිවග්ග: 8.1.3.1 වේසාලික උග්ග සූත්‍රය, පි.122.

▼ **මෙතුමා** කරුණු 6ක් සහිතව, නිවන සාක්ෂාත් කොට ඇතිබව බුදුන් වහන්සේ වදාළහ: 1-3) තිසරණය පිලිබඳ අවෙච්චාසහගත ප්‍රසාදය තිබීම, 4) ආරියශීලය තිබීම 5) ආරිය ඥානය තිබීම 6) ආරිය සේඛ ඵල විමුක්තිය. **සටහන්**: එම ගුණ ඇති අනිකුත් උපාසකයන් ගැන විස්තර මෙහි දක්වා ඇත. **මූලාශ්‍රය:** අංගු.නි: (4) 6 නිපාත: සාමඤ්ඤ වග්ග: 6.2.17 – සිට 36 දක්වා සූත්‍ර, පි.290

▲ **උග්ග -උග්ගත හත්ථිගාම ගහපති-** Ugga Householder of Hatthigāma: වජ්ජිප්‍රදේශයේ, හත්ථිගාමයේ විසූ මොහු බුදුන් වහන්සේගේ අග්‍රතම ගිහි උපාසකයකි: සංඝයාට ආවතේව කරන ගිගියන් අතුරින් අග්‍රතැන ලබා ඇත, අනාගාමිය. **බලන්න**: EAN: note:135 p. 587. **මූලාශ්‍ර:** අංගු.නි: (1) 1 නිපාත: එතදග්ග පාළිය, පි. 84**,** EAN:1: Foremost, p. 44. **සටහන:**සංයු.නි: (4): සළායතනවග්ග:වේදනාසංයුත්ත: ගහපතිවග්ග: 1.13.2 සූත්‍රය, මේ උපාසක හට පිරිනිවීම ගැන කරුණු දේශනා කර ඇත.

▼ **මේ උපාසක සතු** අසිරිමත් ගුණ 8 ක් ගැන මෙහි විස්තරාත්මකව දක්වා ඇත. **සටහන**: තමන් නාගවන උයනේ ඉඳුරන් පිනවමින් හැසිරෙන අවස්ථාවේ බුදුන් වහන්සේගේ පළමු දැකීම වූ බව මෙහි දැක්වේ. ඒ දැකීමෙන් සිත පහන්වීමෙන්, ඔහුගේ සුරාමදයද පහවූ බව මෙහි පෙන්වා ඇත. **මූලාශ්‍රය**: අංගු.නි: (5): 8 නිපාත: ගහපතිවග්ග: 8.1.3.2 හත්ථිගාමක උග්ග සූත්‍රය, පි.128.

▼ **මෙතුමා** කරුණු 6ක් සහිතව, නිවන සාක්ෂාත් කොට ඇතිබව බුදුන් වහන්සේ වදාළහ: 1-3) තිසරණය පිලිබඳ අවෙච්චාසහගත ප්‍රසාදය තිබීම, 4) ආරියශීලය තිබීම 5) ආරිය ඥානය තිබීම 6) ආරිය සේඛ ඵල විමුක්තිය. **සටහන්**: එම ගුණ ඇති අනිකුත් උපාසකයන් ගැන විස්තර මෙහි දක්වා ඇත. **මූලාශ්‍රය:** අංගු.නි: (4) 6 නිපාත: සාමඤ්ඤ වග්ග: 6.2.17 – සිට 36 දක්වා සූත්‍ර, පි.290.

උත

▲ **උත්තරා නන්දමාතා-** Uttara Nandamatha: මේ උපාසිකාව- වේලුකන්ඨකි නන්දමාතා ලෙසින්ද දක්වා ඇත. ධ්‍යාන ලබන උපාසිකාවන් අතරෙන් අග්‍රය.**බලන්න:** EAN:note:143: p.587. **මූලාශ්‍ර:** අංගු.නි: (1): 1 නිපාත: එතදග්ග පාළිය-සූත්‍ර, පි. 84**,** EAN:1:Foremost, p. 44.

▼**ඇය සතු අසිරිමත් ගුණ 7ක්** (ආශ්චර්යමත් අද්භූත) පිළිබඳව මේ සූත්‍රයේ විස්තරකර ඇත. **සටහන්**: * චාතුර්මහාරාජික දෙව්ලොවේ, වෙසමුණි දිව්‍යරාජයා, මිනිසත්භවයේදී ඇයගේ සහොදරයා බව මෙහිදී පෙන්වා ඇත. ඔහුගේ ඉල්ලීම පරිදි, නන්දමාතාව, සැරියුත් මුගලන් අග්‍රශ්‍රාවක දෙපළ ඇතුළු සංඝයාට, දක්ඛිණගිරියේදී මහා දානයක් පූජා කරන ලදී. ** සැරියුත් තෙරුන්ගේ විමසීමකට අනුව, ඇය තමා සතු අසිරිමත් ගුණ පවසා ඇත. ** නන්දමාතාව අනාගාමී මගඵල ලබාඇත**.** **බලන්න**: EAN:Note: 1520-1528, p.654 **මූලාශ්‍ර:** අංගු.නි: (4 ): 7 නිපාත: 7.1.5.10 නන්දමාතු සූත්‍රය, පි. 39,EAN: 7: 53.10 Nandamatha, p.385.

▼ **සැදැහැවත් උපාසිකාවකට** එකම දියණියක් සිටි නම් ඇය, කුජ්ජුත්තරා උපාසිකාව හා නන්ද මාතාව බඳු බුදුන් වහන්සේගේ අග්‍ර උපාසිකාවන් ලෙසින් ජීවත්වෙවා යයි පැතීම සුදුසු බව බුදුන් වහන්සේ වදාළහ. **බලන්න**: එකම පුත්‍රයා හා එකම දියණිය.

**මූලාශ්‍ර:**සංයු.නි: ( 2): නිදානවග්ග:ලාභසත්කාර සංයුත්ත: 3.3.3. එකපුත්ත සූත්‍රය හා 5.3.4 එකධීතු සූත්‍රය, පි.380, ESN:17: Labasakkarasamyutta: 23.3. Only son & 24.4 Only daughter, p. 848.

▼**මේ උපාසිකාව**, අගසව් දෙනම ඇතුළු සංඝයාට පිරිනැමූ දානය අග්‍රයයි බුදුන් වහන්සේ වදාළහ. **බලන්න**: සංඝදානය **මූලාශ්‍ර:** අංගු.නි: (4 ): 6 නිපාත: 6.1.4.7 ඡළාඞගදාන සූත්‍රය, පි. 112, EAN:6: 37.7 Giving, p. 332.

▼ **මේ උපාසිකාව** හා විසාකා මහා උපාසිකා ඇතුළු උපාසිකාවන් උපෝසථ අටසිලයේ පිහිටි අය බව මෙහි පෙන්වා ඇත**. බලන්න:** අංගු.නි: (5): 8 නිපාත: සාමඤ්ඤවග්ග සූත්‍ර, පි.381.

▲**උත්තර බ්‍රාහ්මණ මනවක-**Uttara Brahamin student**:** මොහු විදේහ දනව්වෙහි වාසය කළ වයස්ගත ප්‍රසිද්ධ බ්‍රාහ්මණයෙක්වූ බ්‍රාහ්මායු ගේ සිසුවෙකි. වේදය පරිපූර්ණ කරසිටි මේ මානවකයා, බුදුන් වහන්සේ ගේ දෙතිස් මහා පුරුෂ ලක්ෂණ හා ඉරියව් ගැන දැනගැනීම පිණිස තම ගුරුවරයා ගේ නියමය පිට මාස 7 ක් තිස්සේ, බුදුන් වහන්සේ යන එන තැන් කරා පසුපස ගියහ. බුදුන් වහන්සේ ගැන මහත් ලෙසින් පැහැදුන ඔහු ආපසු සිය ගුරුවරයා ගේ නිවසට පැමිණ, බුදු ගුණ පැවසු පසු ඒ බ්‍රාහ්මණයා බුදුන් වහන්සේ වැඩසිටින දිසාව බාලා නමස්කාර කලබව මෙහි දැක්වේ. **මූලාශ්‍රය:** ම.නි: (2) 2.5.1බ්‍රහ්මායු සූත්‍රය, පි.592.

**උද**

▲**උදය මානවක-** Udaya manawaka: **බලන්න:** උපග්‍රන්ථය 1: උදය තෙර.

▲**උදේන රජ-**King Udena: උදේනි රජ ලෙසින්ද පෙන්වා ඇත. මේ රජු කොසඹෑ නුවර පාලකයාය. පින්ඩොල භාරද්වාජ තෙරුන්, පිරිපුන් බඹසර ජීවිතය ගෙනයාම පිළිබඳව බුදුන් වහන්සේ පෙන්වා දුන් කරුණු ශ්‍රවණය කර, බුදුන් සරණ ගිය බව මෙහි දක්වා ඇත. **බලන්න:** ESN:note:117, p.1545. **සටහන**: මෙතුමාගේ බිසව සාමාවතී, බුදුන් වහන්ස්ගේ අග්‍ර උපාසිකාවකි. **මූලාශ්‍ර:** සංයු.නි: (4): සළායතනසංයුත්ත: ගහපතිවග්ග: භාරද්වාජ සූත්‍රය, පි.254, ESN: Salayathnasamyutta: Householders: 127.4 Bhāradvāja, p. 1278.

**උණ**

▲ **උණ්ණාභ බ්‍රාහ්මණ-**Brahmin Uṇṇābha: සැවැත්නුවර වාසි මොහු අනාගාමිය, බුදුන් වහන්සේ කෙරහි අචල ශ්‍රද්ධාව ඇත්තකි. බුදුන් වහන්සේ ඔහුගේ ගුණ මෙසේ වදාළහ:

"උණ්ණාභ බ්‍රාහ්මණහට තථාගතයන් කෙරෙහි ඇති ශ්‍රද්ධාව ස්ථිරව, ගැඹුරුව පිහිටා ඇත...වෙනත් ශ්‍රමණ බ්‍රාහමණ හෝ දෙවියෙකුට... එය වෙනස් කලනොහැකිය. මේ සමයේදී ඔහු මියයන්නේ නම්, නැවත මේ ලොවට පැමිණීමට හේතුවන සංයෝජන ඔහුට නොමැත". **සටහන:** අටුවාවට අනුව ඔහු 'ජානඅනාගාමිය'- (jhāna non returner). **බලන්න**: ESN: note: 229, p.2415, ජානඅනාගාමී.

**මූලාශ්‍ර:** සංයු.නි: (5-1): මහාවග්ග: ඉන්ද්‍රියසංයුත්ත: 4.5.2 උණ්ණාභ බ්‍රාහ්මණ සූත්‍රය, පි.412,ESN:48:Indriyasamyutta: 42.2. Brahmin Uṇṇābha, p.1973.

**උප**

▲ **උපාලිගහපති-** Upāli householder: මොහු නාලන්දා නුවර ප්‍රසිද්ධ, ධනවත් ගහපතියෙකි. පෙර කාලයේ නිගණ්ඨනාථ පුත්‍රගේ ශ්‍රාවකයෙකි. නිගණ්ඨනාථ පුත්‍ර ඔහුට බුදුන් වහන්සේ හා විවාදයට ගොස් උන්වහන්සේ පැරදවීමට උපදෙස් දුනි. බුදුන් වහන්සේ හමුවී, උන්වහන්සේගේ ශ්‍රේෂ්ඨබව දැක, විශ්වාසය ඇතිකර බුදුන් සරණ ගියහ. බුදු ගුණ කවි මාලාවකින් ගායනා කර ඇත. **මූලාශ්‍රය:** ම.නි: උපාලි සූත්‍රය. **සටහන :**සංයු.නි: (4): සළායතනවග්ග: වේදනාසංයුත්ත:ගහපතිවග්ග: 1.13.3 නාලන්දා සූත්‍රයේදී, බුදුන් වහන්සේ, උපාලි ගහපති හට පිරිනිවීම ගැන කරුණු දේශනා කර ඇත.

**එ**

**එස**

▲ **ඒසුකාරී බ්‍රාහ්මණ-** Esukari Brahmin: සැවැත්නුවර වැසි මේ බ්‍රාහ්මණයා, බුදුන් වහන්සේ දේශනා කළ මේ සූත්‍රය අසා පැහැදී බුදුන් සරණ ගියහ. **මූලාශ්‍රය**:ම.නි: (2) 2.5.6 ඒසුකාරීසූත්‍රය, පි.684.

**ක**

**කක**

▲ **කකුධ උපාසක-**Kakuda Upasaka: ඤාතගමේ විසූ මේ උපාසක, අනාගාමීව, සුද්ධාවාසයක ඕපපාතික උපත ලැබූ බව මෙහි දක්වා ඇත. **මූලාශ්‍රය**:සංයු.නි: (5-2) මහාවග්ග: සෝතාපත්තිසංයුත්ත:11.1.8 හා 11.1.9,11.1.10 ගිඤ්ජකාවසථ සූත්‍ර, පි.184.

**කජ**

▲ **කුජ්ජුත්තරා උපාසිකා-** Khujjuttarā Upasika: බහුශ්‍රැත උපාසිකාවන් අතරෙන් මෙතුමිය අග්‍රයයි බුදුන් වහන්සේ වදාළහ. බුදුන් වහන්සේ දෙසූ දහම සිහියේ දරාගෙන විත්, උදේනි -උදේන රජුගේ බිසවවූ සාමාවතී හා පිරිසට ඉගැන්වූවාය. ඇය ගේ කුදු ස්වභාවය නිසා කුදු උත්තරා- කුජ්ජුත්තරා ලෙසින් හඳුන්වා ඇත. බු.නි: ඉතිවුත්තකයේ දක්වාඇත්තේ මෙතුමිය පැවසූ බුදුන් වහන්ස්ගේ ඉගැන්වීම්ය. **බලන්න**: EAN:note:141. p.587, සාමාවතී බිසව, ඉතිවුත්තක. **මූලාශ්‍ර:** අංගු.නි: (1) 1 නිපාත: එතදග්ග පාළිය, පි. 84, EAN:1:Foremost, p. 44.

▼ **සැදැහැවත් උපාසිකාවකට** එකම දියණියක් සිටි නම් ඇය, කුජ්ජුත්තරා උපාසිකාව හා නන්ද මාතාව බඳු බුදුන් වහන්සේගේ අග්‍ර උපාසිකාවන් ලෙසින් ජීවත්වෙවා යයි පැතීම සුදුසු බව බුදුන් වහන්සේ වදාළහ. **බලන්න**: එකම පුත්‍රයා හා එකම දියණිය. **මූලාශ්‍ර:**සංයු.නි: ( 2): නිදානවග්ග:ලාභසත්කාර සංයුත්ත: 3.3.3. එකපුත්ත සූත්‍රය හා 5.3.4

එකධිතු සූත්‍රය, පි.380, ESN:17: Labasakkarasamyutta: 23.3. Only son & 24.4 Only daughter, p. 848.

▼**මේ උපාසිකාව** හා විසාකා මහා උපාසිකා ඇතුළු උපාසිකාවන් උපෝසථ අටසීලයේ පිහිටා වාසය කරනබව මෙහි පෙන්වා ඇත**.** **මූලාශ්‍රය:** අං.ගු.නි: (5): 8 නිපාත: සාමඤ්ඤවග්ග සූත්‍ර, පි.38.

**කට**

▲ **කටිස්සභ උපාසක**-Katissabha Upasaka: ඤාතගමේ විසූ මේ උපාසක, අනාගාමිව, සුද්ධාවාසයක ඕපපාතික උපත ලැබූ බව මෙහි දක්වා ඇත. **මූලාශ්‍රය**:සංයු.නි: (5-2) මහාවග්ග: සෝතාපත්තිසංයුත්ත:11.1.8 හා 11.1.9,11.1.10 ගිඤ්ජකාවසථ සූත්‍ර, පි.184.

▲ **කූට්ටදන්ත බ්‍රාහ්මණ-**Brahmin Kutadanta: මගධයේ, ඛානුමත නම් සාරවත් ගමේ වාසය කල කූට්ටදන්ත (කුළුදත්) බ්‍රාහ්මණයාහට, ඒ ගම සේනිය බිම්බිසාර රජු විසින් තැගිකල රාජදායාදයක්ය. බුදුන් වහන්සේ බැහැදැක, ඔහු මහා යාගයක් කිරීම පිළිබඳව විමසුහ. අග්‍රතම, උතුම් දැහැමි යාගය නම් ගිහිගෙය හැර බුදුසසුනේ පැවිදිව, යහපත් ලෙසින් බඹසර වාසය සම්පූර්ණ කර දුකින් මිදීම යයි, බුද්ධ දේශනාව අසා, දහම අවබෝධ කර සෝතාපන්න වූ මෙතුමා, බුදුන් සරණ ගිය ගිහි උපාසකයෙක්විය. **මූලාශ්‍ර:** දීඝ:නි: (1): 5 කූටදන්ත සූත්‍රය, පි.264, EDN:5: Kūṭtadanta Sutta,p.113.

**කත**

▲ **කාතියානි උපාසිකාව** - Kātiyānī upasika: තෙරුවන් කෙරහි අවෙච්චා සහගත ප්‍රසාදය ඇති උපාසිකාවන් අතරෙන් මෙතුමිය අග්‍රය. කුරරඝර කාලි උපසිකාවගේ දහම් මිතුරියකි. ඇය දහම් දේශනාවක් අසන අවස්ථාවේ නිවසට හොරුන් ඇතුල්වී ඇත. ඒ ගැන නොසලකා දහමට ඇලවුන සිතින් යුත් ඇය දැක විස්මයට පත් සොරුන් මෙතුමියගෙන් සමාව ඇයදිය. පසුව ඇය ගේ උපකාර ඇතිව පැවිදිවූ ඔවුන් අරහත් බව ලබා ගත්හ. **බලන්න:** EAN:note: 146, p.587. **මූලාශ්‍ර:** අං.ගු.නි: (1 ) 1 නිපාත: එතදග්ග පාළිය, පි. 84**,** EAN:1:Foremost, p. 44.

**කණ**

▲ **කාණා උපාසිකාව-** Kana Upasika

මේ උපාසිකාව හා විසාකා මහා උපාසිකා ඇතුළු උපාසිකාවන් උපෝසථ අටසීලයේ පිහිටා වාසය කරන බව මෙහි පෙන්වා ඇත**.**

**මූලාශ්‍රය:** අං.ගු.නි: (5): 8 නිපාත: සාමඤ්ඤවග්ග සූත්‍ර, පි.381.

▲ **කාණාය මාතා උපාසිකාව-** Kanamatha Upasika: මේ උපාසිකාව හා විසාකා මහා උපාසිකා ඇතුළු උපාසිකාවන් උපෝසථ අටසීලයේ පිහිටා වාසය කරන බව මෙහි පෙන්වා ඇත**.** **මූලාශ්‍රය:** අං.ගු.නි: (5): 8 නිපාත: සාමඤ්ඤවග්ග සූත්‍ර, පි.381.

▲ **කුණ්ඩලිය පරිබ්‍රාජක**- Kundalia paribrajaka: සාකේත නුවර විසූ මොහු බුදුන් වහන්සේ, සප්තබොජ්ඣංග වඩා විජ්ජා විමුත්තිය ලබාගන්නා අන්දම වදාළවිට, දහම අවබෝධවී, බුදුන්සරණ ගිය බව මෙහි දක්වා ඇත. **මූලාශ්‍රය:** සංයු.නි: (5-1) මහාවග්ග:බොජ්ඣංගසංයුත්ත: 2.1.6 කුණ්ඩලිය සූත්‍රය, පි.182.

▲ **කප්ප මානවක-**Kappa manawaka: **බලන්න:** උපග්‍රන්ථය1: කප්ප තෙර.

▲ **කාපටික භාරද්වාජ බ්‍රාහ්මණ**- Kapatika Bharadvaja Brahamin: කොසොල්දනව්වේ, ඔපසාද බමුනුගමේ වාසි මොහු, එහි විසූ ප්‍රසිද්ධ බ්‍රාහ්මණ ගුරුවරයෙක් වූ චංකි බ්‍රාහමණ සමග බුදුන් වහන්සේ හමුවීම ගැන මෙහි දක්වා ඇත. සත්‍ය අවබෝධ කරගන්නේ කෙසේද? යයි ඔහු කළ විමසීමක් අනුව බුදුන් වහන්සේ මේ සූත්‍රය දේශනා කර වදාළහ. දහම අවබෝධව සතුටට පැමිණි ඔහු බුදුන් සරණ ගිය උපාසකයෙක්විය. අවසානයේදී ඔහු මෙලෙස බුදුන් වහන්සේට ප්‍රසංසා කර ඇත:

"භවත්ගෝතමයන් වහන්ස, අපි වනාහි පෙරදී මුඩු ශ්‍රමණයෝ... බඹහුගේ පිටිපයින් උපන් ඔවුන් ධර්මය කෙසේ දන්නේද: යයි සිතුහ. ... ඒකාන්තයෙන්ම මට ශ්‍රමණයන් කෙරෙහි, ...ප්‍රේමය...ප්‍රසාදය... ගෞරවය ...ඇතිවිය...". **සටහන:** ක්‍රමාණුකූල ධම්ම පුහුණුව මෙහි විස්තරකර ඇත. **මූලාශ්‍රය**:ම.නි: (2) 2.5.5 චංකිසූත්‍රය, පි.662.

**කර**

▲ **කුරරඝර වැසි කාලි උපාසිකාව-** Kāḷī upasika of Kuraraghara: දහම අනු-ශ්‍රවනයෙන් (hearsay) උපන් ප්‍රසාදය ඇති උපාසිකාවන් අතරෙන් මෙතුමිය අග්‍රය. මහා කච්චායන රහතුන්ගේ දායිකාවකි. අහසේ සැරිසරන යක්ෂයන් දෙදෙනක් ත්‍රිවිධ රත්නයේ ගුණ කථා කරනු අසා සෝතාපන්න වුවාය. **බලන්න**:EAN:148.note: p.587. **මූලාශ්‍ර:** අංගු.නි: (1) 1 නිපාත: එතදග්ග පාළිය, පි. 84**,** EAN:1:Foremost, p. 44.

▼**බුදුන් වහන්සේ** මාරයාගේ දියණියන් හට වදාළ දේශනාව, මහා කච්චායන තෙරුන්, මෙතුමියට පැහැදිලිකර වදාළහ. **බලන්න**: මාරයාගේ දියණියෝ. **මූලාශ්‍ර**: අංගු.නි: (6) 10 නිපාත :10.1.3.6.කාලී සූත්‍රය,පි. 114, EAN:10: The Great Chapter: 26.6 Kali, p. 502.

**කල**

▲ **කාලිංග උපාසක -**Kalinga upasaka:ඤාතගමේ විසූ මේ උපාසක, අනාගාමිව, සුද්ධාවාසයක ඕපපාතික උපත ලැබූ බව මෙහි දක්වා ඇත. **මූලාශ්‍රය**:සංයු.නි: (5-2) මහාවග්ග: සෝතාපත්තිසංයුත්ත:11.1.8 හා 11.1.9,11.1.10 ගිඤ්ජකාවසථ සූත්‍ර, පි.184.

▲**කෝලිය පුත්‍ර පුණ්ණ-**Koliyaputhta Punna: කෝලියරටේ වාසය කළ, ගෝව්‍රතය දරන (ගවයෙක් ලෙසින් හැසිරෙන) කෝලිය පුත්‍ර පුණ්ණ, බුදුන් වහන්සේ වදාළ දහම අසා පැහැදී බුදුන් සරණ ගිය බව මෙහි දක්වා ඇත.

**මූලාශ්‍ර:** ම.නි: (2): 2.1.7 කුක්කුරවතිය සූත්‍රය, පි.100, EMN: 57: Kukkuravatika Sutta, p.466.

**කස**

▲ **කසීභාරද්වාජ බ්‍රාහ්මණ-** Brahmin Kasibharadvaja: මගධ දේශයේ ඒකනාළා බමුණු ගමේ වාසි මොහු, බුදුන් වහන්සේ දේශනා කළ මේ සූත්‍රය අසා පැහැදී බුදුන් සරණ ගිය උපාසකයෙක් විය. **මූලාශ්‍ර:**සංයු.නි: (1) බ්‍රාහමණසංයුත්ත: උපාසකවග්ග: 7.2.1 කසීසූත්‍රය: පි.332, ඛු.නි: සුත්ත නිපාත: උරගවග්ග: 1-4 කසීභාරද්වාජ සූත්‍රය, පි.42.

▲**කේවඩ්ඩ ගහපති-**Householder Kevadda**:** නාලන්දා නුවර වාසි මොහු, බුදුන් වහන්සේ සරණගිය උපසකකි. එක් සමයක, මොහු බුදුන් වහන්සේ හමුව, නාලන්දාවේ විශාල ජනකායක් සිටින නිසා ඔවුන් පැහැදවීම පිණිස ඉද්දි ප්‍රාතිහාර්ය දැක්වීමට ආයාචනා කර ඇත. එම අයැදීම ප්‍රතික්ෂේප කළ බුදුන් වහන්සේ පෙන්වා ඇත්තේ ධර්මය අනුසාසනා කිරීම – අග්‍ර ප්‍රාතිහාර්ය බවය. **මූලාශ්‍රය**: දීඝ.නි: (1) 11 කේවඩ්ඩ සූත්‍රය, පි.499.

**ඛ**

**ඛම**

▲**ඛේමා උපාසිකාව-** Khema Upasika: මේ උපාසිකාව හා විසාකා මහා උපාසිකා ඇතුළු උපාසිකාවන් උපෝසථ අටසීලයේ පිහිටා ඇතිඅය ය. **මූලාශ්‍රය:** අංගු.නි: (5): 8 නිපාත: සාමඤ්ඤවග්ග සූත්‍ර, පි.381.

▲ **ඛෝමදුස්ස බමුණෝ-**Khomadussa Brahmins: බුදුන් වහන්සේ ශාක්‍ය ජනපදයේ ඛෝමදුස්ස ගමට වැඩි අවස්ථවේ, සභාවක (රැස්වීමක) සිටි ඒ ගම්වාසීන් නින්දිත මුඩු මහණහු කවරහුද, කවර කෙනක් සභාධර්මය දන්නේද යයි බුදුන් වහන්සේට නින්දා කළහ. ඒ අවස්ථාවේදී බුදුන් වහන්සේ මෙසේ වදාළහ:

**"යම් තැනක සත්පුරුෂයෝ නැද්ද, එහි සභාවක් නැත. කෙනෙක් ධර්මය නො පවසන්නේ නම් ඔහු සත් පුරුෂ නොවේ. රාග ද්වේශ මෝහ දුරු කට ධර්මය පවසන අය සත් පුරුෂ වේ"**. ඒ දේශනාව අවබෝධ කරගත් ඛෝමදුස්ස බමුණෝ, බුදුන් සරණ ගිය උපාසකයන් වුහ. **මූලාශ්‍රය:**සංයු.නි:(1) බ්‍රාහ්මණසංයුත්ත: 7.2.12 ඛෝමදුස්ස සූත්‍රය, පි.354.

**ග**

**ගධ**

▲ **ගොධා ශාක්‍ය හා කාලි ගොධා ශාක්‍ය දියණිය-** Godha Sakya & Kali Godha: ගොධා ශාක්‍ය හා ඔහුගේ බිරිඳ කාලිගොධා, බුදුන් වහන්සේ වැඩසිටි සමයේ උන්වහන්සේ සරණගිය, කපිලවත්තු පුර විසූ ශාක්‍ය පවුලක්ය. බුදුන් වහන්සේගේ අග්‍ර ශ්‍රාවකයන් අතරට ගැනෙන, කාලි ගොධා පුත් භද්දිය තෙරුන් ඔවුන්ගේ පුතාය.

**සටහන**: කාලි ගොඩාව, සෝතාපන්න උතුමියකි. **බලන්න**: සෝතාපන්න සංයුත්ත: පුඤ්ඤාභිසන්දවග්ග:11.4.9 කාලි ගොඩා සූත්‍රය, පි.250. **මූලාශ්‍රය:** සංයු.නි: (5-2 ): මහාවග්ග: සෝතාපන්නසංයුත්ත:මහානාම වග්ග: 11.3.3 මහානාම සූත්‍රය, පි.210.

**ගණ**

▲ **ගණකමොග්ගල්ලාන බ්‍රාහ්මණ**- Brahmin Ganakamoggallana: සැවැත්නුවර වාසි මොහුට, බුදුන් වහන්සේ, සංඝයා ගේ ක්‍රමානුකුල ධම්ම පුහුණුව පිලිබඳ වදාළහ. මෙතුමා, දහම් කරුණු අසා පැහැදී බුදුන් සරණ ගිය බව මෙහි දක්වා ඇත. **මූලාශ්‍රය:**ම.නි: (3) 3.1.7 ගණකමොග්ගල්ලාන සූත්‍රය, පි.106.

▲**ගෝපක මොග්ගලාන බ්‍රාහ්මණ**- Brahmin Gopakamoggallana: රජගහනුවර වැසි, බුදුන් සරණ ගිය උපාසකයෙක් වූ මොහුට, ආනන්ද තෙරුන්, බුදුන් වහන්සේගේ සර්වඥතාඥානය පිළිබඳව මෙහිදී විස්තරාත්මකව පෙන්වා දී ඇත. **සටහන්**: * මේ සූත්‍රය දේශනා කර ඇත්තේ බුදුන්වහන්සේගේ මහා පරිනිබ්බානයෙන් පසුවය. ** ඒ අවස්ථාවේදී, අජාසත් රජුගේ මහා ඇමති වස්සකාර බ්‍රාහ්මණද එහි පැමිණ බුදුන් වහන්සේගේ ගුණ වනා ඇත. **මූලාශ්‍රය**:ම.නි: (3) 3.1.8 ගෝපක මොග්ගල්ලාන සූත්‍රය, පි.116.

**ඝ**

**ඝට**

▲ **ඝොටමුඛ බ්‍රාහ්මණ**-Brahmin Ghotamukha: උදෙන තෙරුන්, බරණැස්නුවර, ඛේමිය අඹවනයේ වැඩ වසන සමයේදී, මේ බ්‍රාහ්මණයා, එම තෙරුන් හමුවී, එතුමන් දේශනා කළ මේ සූත්‍රය අසා පැහැදී බුදුන් සරණ ගියබව මෙහි දක්වා ඇත. **සටහන්**: * මේ සූත්‍රය දේශනා කර ඇත්තේ, බුදුන් වහන්සේගේ මහා පරිනිබ්බානයෙන් පසුවය. ** ධර්මය අසා පැහැදුන මොහු, තෙරුන්ට 500ක් කහවණු පුජාකිරිමට ඉදිරිපත්විය. 'අපට රන්රිදී පිළිගන්නට කැප නොවේ' යයි තෙරුන් වදාළහ. ඉන්පසු තෙරුන්ගේ උපදෙස් අනුව ඔහු, පාටලීපුත්‍ර නුවර (පැළලුප් නුවර) සංඝයා පිණිස උපස්ථාන ශාලාවක් ඉදිකරන ලදී. ඒ ශලාව 'ඝොටමුඛ' යයි හඳුන්වාඇත.** මොහු අංග දේශයේ වැසියෙකි. **මූලාශ්‍රය:** ම.නි: (2) 2.5.4 ඝොටමුඛ සූත්‍රය, පි.644.

**ඝස**

▲ **ඝෝසිත ගහපති**- Householder Ghositha: කොසඹෑනුවර වාසි මේ ගහපති, බුදුන් සරණගිය ගිහි උපාසකයෙකි. ආනන්ද තෙරුන්, කොසඹෑනුවර,ඝෝසිතාරාමයෙහි වැඩ වසන සමයේ, මොහුට ධාතුනානත්වය පහදා දීම පිණිස මේ සූත්‍රය වදාළහ. **සටහන**: කොසඹෑනුවර,ඝෝසිත ආරාමය පුජා කර ඇත්තේ මෙතුමාය. **මූලාශ්‍රය:** සංයු.නි: (4) සළායතනවග්ග: වේදනාසංයුත්ත:1.13.6 ඝෝසිත සූත්‍රය, පි.260

**ච**

**චත**

▲ **චිත්ත ගහපති මච්ඡිකාසණ්ඩයේ -**householder Citta of Macchikāsaṇḍa: මච්ඡිකාසණ්ඩ පෙදෙසේ වාසය කළ මෙතුමා ගිහි ධර්ම කථිකයන් අතරෙන් අග්‍ර යයි බුදුන් වහන්සේ වදාළ. මච්ඡිකාසණ්ඩ පෙදෙසේ, අම්බාටකවනය සංඝයාට වාසය කිරීම පිණිස මෙතුමා පූජා කර ඇත. **බලන්න**:EAN: note: 131, p.587. **මූලාශ්‍ර:** අංගු.නි: (1 ) 1 නිපාත: එතදග්ග පාළිය, පි. 84, EAN:1:Foremost, p. 44. **සටහන**: සංයු.නි: (4) සළායතනවග්ග: චිත්ත සංයුත්තයේ, මෙතුමන් ගැන විස්තර දක්වා ඇත.

▼ **මෙතුමා** කරුණු 6ක් සහිතව, නිවන සාක්ෂාත් කොට ඇතිබව බුදුන් වහන්සේ වදාළහ: 1-3) තිසරණය පිලිබඳ අවෙච්චාසහගත ප්‍රසාදය තිබීම, 4) ආරියශීලය තිබීම 5) ආරිය ඥානය තිබීම 6) ආරිය සේඛ ඵල විමුක්තිය. **සටහන්**: එම ගුණ ඇති අනිකුත් උපාසකයන් ගැන විස්තර මෙහි දක්වා ඇත. **මූලාශ්‍රය:** අංගු.නි: (4) 6 නිපාත: සාමඤ්ඤ වග්ග: 6.2.17 – සිට 36 දක්වා සූත්‍ර, පි.290

**චන**

▲ **චන්ඩ ගාමිණි උපාසක-** Chanda Gamini upaaska: සැවැත්නුවර වාසි, ග්‍රාමනායකයෙක් වූ මොහු, බුදුන් වහන්සේ වදාළ මේ සූත්‍රය අසා දහම අවබෝධකර බුදුන් සරණ ගිය උපාසකයෙක් වූහ. **මූලාශ්‍රය:** සංයු.නි: (4) සළායතනවග්ග:ගාමිණිසංයුත්ත:8.1.1 චන්ඩගාමිණි සූත්‍රය, පි.582.

▲ **චන්දනංගලික උපාසක**-Chandanangalika upaaska: එක් සමයක පසේනදී කෝසල ඇතුළු රජවරුන් පස් දෙනෙක්, බුදුන් වහන්සේ හමුව, කාමවස්තූන් පිළිබඳව විමසූහ. බුදුන් වහන්සේ වදාළ ධර්මය, එම පිරිසේ සිටි චන්දනංගලික උපාසකයාට අවබෝධවී, ඒතුමා බුදුගුණ වර්ණනා කිරිමද, ඔහු ගැන  ප්‍රසාදයට පත්, රජවරු පස්දෙනා, ඔහුට උතුරු සළු 5ක් දීම, ඒ උපාසක, එම උතුරුසළු බුදුන් වහන්සේට පූජාකිරිම මෙහි විස්තර කර ඇත.

"සුවඳ ඇති රත් පියුම අලුයම පිපුනේ යම්සේ පහනොවූ සුවඳ ඇත්තේද, එලෙසින්, අහසෙහි බබලන් හිරුමෙන් විරාජමානවූ බුදුරජානන් වහන්සේ දෙස බලන්න". **මූලාශ්‍රය**: සංයු.නි: (1) සගාථවග්ග: කෝසලසංයුත්ත:3.2.2 පංචරාජ සූත්‍රය, පි.174.

▲ **චුන්ද කර්මකාර පුත්‍ර-**Chunda karmakaraputhta: පාවානුවර වැසි මොහු බුදුන් වහන්සේ ගැන පැහැදීම ඇතිකරගත් ගිහි උපාසකයෙකි. අවසාන චාරිකාවේදී බුදුන් වහන්සේ මොහු විසින් පූජා කළ අඹ වනයේ වැඩසිටියහ, ඔහු විසින් සකස්කර පූජා කරනලද අහාර වැළඳූහ. බුදුන් වහන්සේගේ අවසාන ආහාරය පූජා කිරීම නිසා ඔහු විසින් මහා පුණ්‍ය කම්මයක් කරගෙන ඇතයයි බුදුන් වහන්සේ වදාළහ. **බලන්න**: දීඝ.නි. මහාපරිනිබ්බාන සූත්‍රය.

▼ **බුදුන් වහන්සේ** 'ආරියවිනයේ පිරිසිදුබව' ගැන වදාළ දේශනාව අසා සතුටට පත් චුන්ද, දිවිහිමියෙන් බුදුසසුනේ උපාසකයෙක් බවට පත්විය. **බලන්න**: ආරියවිනයේ පිරිසුදුබව.**මූලාශ්‍ර**: අංගු.නි:(6 ):10 නිපාත,

ජානුසොණි වගග,10.4.2.10,**චුන්ද** සූත්‍රය, පි.508, EAN:10:II, Jāṇussoṇī,176.10, Cunda,p.553.

▼ **මෙහිදී බුදුන් වහන්සේ,** චුන්දහට, ලෝකයේ සිටින ශ්‍රමණ වර්ග 4 ක් පෙන්වා ඇත: මාර්ග ජින, මාර්ග දේශක, මාර්ග ජීවි, මාර්ග දූෂක. **බලන්න**: සිව් ශ්‍රමණ. **මූලාශ්‍රය**: ඛු.නි:සුත්තනිපාත:උරගවග්ග:1-5 චුන්ද සූත්‍රය, පි.48.

▲ **චුන්දී රජකුමරිය හා චුන්ද රාජ කුමාර-** Princess Chundi & Prince Chunda: රජහග නුවර විසූ මේ දෙදෙනා සහෝදර සහෝදරියන්ය. ඔවුන් තෙරුවන් සරණ ගිය බව මෙහි පෙන්වා ඇත. **සටහන:** චුන්දී රජකුමරිය හා විසාකා මහා උපාසිකා ඇතුළු උපාසිකාවන් උපෝසථ අටසීලයේ පිහිටි අය බව මෙහි පෙන්වා ඇත**. බලන්න:** අංගු.නි: (5): 8 නිපාත: සාමඤ්ඤවග්ග සූත්‍ර, පි.381. **මූලාශ්‍රය:**අංගු.නි: (3) 5 නිපාත: සුමණාවග්ග: 5.1.4.2 චුන්දීසූත්‍රය, පි.76.

**ජ**

**ජත**

▲ **ජතුකන්නි මානවක-** Jathukanni manawaka: **බලන්න:** උපග්‍රන්ථය1: ජතුකන්නි තෙර.

**ජන**

▲ **ජාණුස්සෝනි බ්‍රාහ්මණ-**brahmin Jāṇussoṇī: සැවැත්නුවර මහා ධනවතෙක් වූ මොහු බුදුන් වහන්සේ සරණගිය උපසකයෙකි. ම.නි: චූලහත්තිපදෝපම සූත්‍රය දේශනා කර ඇත්තේ මෙතුමාටය.

▼**එක්කලක** මේ බ්‍රාහ්මණයාට මරණය පිලිබඳ වෙවැනි දිට්ඨියක් විය:

'මරණයට විෂයවූ සැම දෙනාම මරණය ගැන බියපත්වේ'. බුදුන් වහන්සේ මෙහිදී පෙන්වා ඇත්තේ: මරණය ගැන බියපත් හා මරණය ගැන බියනැති කොටස් 2 ක් සිටින බවය. අකුසල හැර නොදැමූ පුද්ගලයා මරණය ගැන බියපත්වේ. එහෙත්, අකුසල හැරදැමූ පුද්ගලයා මරණය ගැන බියනොවේ. එම දේශනාව අසා සතුටුවූ මෙතෙම බුදුන් සරණගිය උපාසකයෙක් විය**. මූලාශ්‍රය:** අංගු.නි: (2): 4 නිපාත: බ්‍රාහ්මණවග්ග:4.4.4. ජාණුස්සෝනි සූත්‍රය, පි.358.

▼ **බුදුන් වහන්සේ** ආරියවිනයේ පච්චරෝහණි පිලිබඳව මොහුට විස්තර වදාළහ. **මූලාශ්‍ර**: අංගු.නි: ( 6):10 නිපාත, 10.3.2.7 හා 10.3.2.8 පච්චොරොහණි සූත්‍ර, පි.452, EAN: 10: 119-7 & 120-8, Paccorohaṇī, p.546.

▼**මේ සූත්‍රයේ දී** බුදුන් වහන්සේ මොහුට ක්‍ෂත්‍රිය, බ්‍රාහ්මණ, ගෘහපති, ස්ත්‍රිය, සොරු හා ශ්‍රමණ ස්වභාවයන් ගැන කරුණු වදාළහ. **මූලාශ්‍රය:** අංගු.නි: (4): 6 නිපාත:ධම්මිකවග්ග: 6.1.5.10 ඛත්තිය සූත්‍රය, පි.154. **සටහන්**: * මෙහිදී, මේ බ්‍රාහ්මණයාගේ ගිහිජීවිතයේ සම්පත් ආදිය දක්වා ඇත. සංයු.නි: ( 5-1) මග්ගසංයුත්ත: 1.1.5 බ්‍රාහ්මණ සූත්‍රය, පි. 36.** මේ

බ්‍රාහ්මණයා, බුදුන් වහන්සේගෙන් දිට්ඨි පිලිබඳ විමසීම:සංයු.නි: (2) නිදානවග්ග: අභිසමයසංයුත්ත: 1.5.7 ජානුස්සෝනිසූත්‍රය,පි.140.

**ජම**

▲**ජම්බුඛාදක පරිබ්‍රාජක**-wanderer Jambukhdaka: මොහු සැරියුත් තෙරුන්ගේ බෑණාය, මගධයේ නාලක ගමේ වාසය කරඇත. ගැඹුරු දහම පිලිබඳ (නිවන ආදී), මොහු ඇසූ ප්‍රශ්න හා ඒ ගැන සැරියුත් තෙරුන් වදාළ පිළිතුරු පිළිබඳව **බලන්න:** සංයු.නි: (4): සළායතනවග්ග: ජම්බූඛාදක සංයුත්ත සූත්‍ර, පි.500.

**ජව**

▲ **ජීවක කෝමාරභච්ච**-Jīvaka Komārabhacca: පුද්ගලික ප්‍රසාදයෙන් සමන්විත (බුදුන්වහන්සේ ගැන ඇති ප්‍රසාදය)ගිහි උපාසකයන් අතරෙන් ජීවක කොමාරභච්ච අග්‍ර බව බුදුන් වහන්සේ වදාළහ. මෙතුමා සෝතාපන්නය. **බලන්න**:EAN, note no. 137p.587. **මූලාශ්‍ර:** අංගු.නි: (1) 1 නිපාත: එතදග්ග පාළිය, පි. 84**,** EAN:1:Foremost, p. 44.

▼**රජගහ නුවර පුරඅඟනවූ** සාලවතී (පෙර සාලවති කුමරිය) පුතකු වැදූ පසු සේවිකාවක් අත ඒ දරුවා යවා කසල ගොඩක තැබුවාය. රජමැදුරට යන අභය රාජකුමාරයා ඒ දරුවා දැක ඔහු රජ මාලිගෙහි පෝෂණය කිරීමට යැව්ය. ජීවත් වේය යන අරුතින් "ජීවක" ද අභය කුමරුන් විසින් පෝෂණය කරනලද හෙයින් "කොමාරභච්ච" යයි නම් කළහ. තරුණ වයසට පැමිණි ඔහු තක්සිලාවට ගොස් එහි වෛද්‍ය අදුරුගෙන් ශිල්ප ඉගෙන ගත්හ. වෙදකමෙහි දක්ෂවූ ජීවක බිම්බිසාර රජුගේ හා බුදුන් ප්‍රමුඛ සංඝයාගේ වෛද්‍යවරයා වුහ. **මූලාශ්‍රය**: වින.පි: මහාවග්ග පාලිය 2: 8 චීවරකන්ධය: පි.168.

▼**මේ සූත්‍රයේදී** බුදුන් වහන්සේ ජීවකට, උපාසක ගුණ විස්තර කර ඇත. **මූලාශ්‍රය:** අංගු.නි: (5): 8 නිපාත:ගහපතිවග්ග:8.1.3.6 ජීවකසූත්‍රය, පි.144.

▼**ජීවක**, බුදුන් වහන්සේගෙන්, සංඝයා මස් අනුභව කිරීම් ගැන විමසූ අවස්ථාවේදී, බුදුන් වහන්සේ ඒ ගැන කළ පැහැදිලිකිරීම මෙහි විස්තරාත්මකව පෙන්වා ඇත. **මූලාශ්‍රය:** ම.නි: (2): 2.1.5 ජීවක සූත්‍රය, පි.70.

▼ **මෙතුමා** කරුණු 6ක් සහිතව, නිවන සාක්ෂාත් කොට ඇතිබව බුදුන් වහන්සේ වදාළහ: 1-3) තිසරණය පිලිබඳ අවෙච්චාසහගත ප්‍රසාදය තිබීම, 4) ආරියශිලය තිබීම 5) ආරිය ඥානය තිබීම 6) ආරිය සේඛ ඵල විමුක්තිය. **සටහන්**: එම ගුණ ඇති අනිකුත් උපාසකයන් ගැන විස්තර මෙහි දක්වා ඇත. **මූලාශ්‍රය:** අංගු.නි: (4) 6 නිපාත: සාමඤ්ඤ වග්ග: 6.2.17 – සිට 36 දක්වා සූත්‍ර, පි.290

**ත**

තට

▲ **තුට්ට උපාසක**-Thutta Upasaka: ඤාතගමේ විසූ මේ උපාසක, අනාගාමිව, සුද්ධාවාසයක ඕපපාතික උපත ලැබූ බව මෙහි දක්වා ඇත.

**මූලාශ්‍රය:**සංයු.නි: (5-2) මහාවග්ග: සෝතාපත්තිසංයුත්ත:11.1.8 හා 11.1.9,11.1.10 ගිඤ්ජකාවස්ථ සූත්‍ර, පි.184.

**තද**

▲ **තොදෙය්‍ය මානවක-**Todeyiya manawaka : **බලන්න:** උපග්‍රන්ථය 1: තොදෙය්‍ය තෙර.

**තප**

▲ **තපුස්ස ගහපති**-Householder Thapussa: මේ උපාසකතැන, දහම් කරුණු 6ක් සහිතව, නිවන ප්‍රත්‍යක්ෂ කරගෙන ඇතිබව බුදුන් වහන්සේ වදාළහ. 1-3) බුද්ධ ධම්ම හා සංඝ කෙරේ අවෙච්චාසහගත ප්‍රසාදය 4) ආරිය ශිලය තිබීම5) ආරිය ප්‍රත්‍යාවෙක්ෂා නුවණ තිබීම 6) ආරිය සේඛඵල විමුත්තිය. **මූලාශ්‍රය:** අංගු.නි: (4) 6 නිපාත: සාමඤ්ඤවග්ග: 6.2.16 තපුස්ස සූත්‍රය, පි.290. **සටහන**: පැවිද්ද- නෙක්කම්මය පිලිබඳ බුදුන් වහන්සේ මෙතුමාට වදාළහ. **බලන්න**: අංගු.නි: (5) 9 නිපාත: 9.1.4.10 තපුස්ස ගහපති සූත්‍රය, පි.534

▲ **තපස්සු හා හල්ලුක සොහොයුරෝ-** Thapassu & Balluka Brothers: පළමුව බුදුන් හා දහම් සරණ ගිය උපාසකයන් අතර මේ දෙදනා අග්‍ර බව බුදුන් වහන්සේ වදාළහ. ඒ අවස්ථාවේ සංඝරත්නය ස්ථාපිත කර නොමැති නිසා ඔවුන් ද්විරත්නය සරණ ගියහ. බුද්ධත්වය ලැබූ බුදුන් වහන්සේට, ප්‍රථම දානය පිලිගැන්වුවේ මේ සොහොයුරන් දෙදෙනාය. **බලන්න:** EAN: note: 129, p.587 **මූලාශ්‍ර:** අංගු.නි: (1) 1 නිපාත: එතදග්ග පාළිය, පි. 84**,** EAN:1:Foremost, p. 44.

▼ **තපස්සු හා හල්ලුක** යන වෙළඳ දෙබෑයෝ උක්කලා ජනපදයේ සිට සංචාරය කරමින්, බුදුන් වහන්සේ බුද්ධත්වය ලබා සිටි ස්ථනය අසලට පැමිණියහ. ඒ අවස්ථාවේදී පෙර භවයක ඔවුන්ගේ ඥාති දේවතාවක් ඔවුන්ට මෙසේ පැවසුහ:

"නිදුකානෙනි, භාග්‍යවතුන් වහන්සේ අභිසම්බෝධියට පැමිණ කිරිපලුරුක්මුල වැඩ වසන සේක, යන්න, එතුමන්වහන්සේට අත්සුණු හා මීපිඩු පුජාකරන්න, එය ඔබට බොහෝ කලක් මුළුල්ලේ හිත පිණිස සැප පිණිස වන්නේය". **සටහන්**: * එම දානය පිරිනමන අවස්ථවේ එය ගැනීමට බුදුන් වහන්සේට පාත්‍රයක් නොතිබූ නිසා සතරවරම් රජදරුවන් පාත්‍ර පිළිගැන්වූ බව මෙහි දක්වා ඇත. ** අටුවාවට අනුව බුදුන් වහන්සේ මේ දෙසොහෝයුරන්ට, කේශ ධාතුවක් පිළිගැන්වූහ. බුරුමයේ (මියන්මාරයේ) ස්වේතගොන් (රන්විහාරය) විහාරයේ එම කේශධාතුව තැන්පත් කර ඇතයි යයි එරට බෞද්ධයන් විස්වාසකරති. **මූලාශ්‍රය:** වින.පි:මහාවග්ග පාලිය 1: රාජායතනකථාව, පි.86.

**තම**

▲**තිම්බරුක පරිබ්‍රාජක**-Thimbaruka paribrajaka: සැවැත්නුවර වාසි මොහු බුදුන් වහන්සේ වදාල දහම අසා පැහැදී බුදුන් සරණ ගිය බව මෙහි දැක්වේ.

**මූලාශ්‍රය:**සංයු.නි: (2) නිදානවග්ග: අභිසමයසංයුත්ත: 1.2.8 තිම්බරුක සූත්‍රය, පි.58.

**තව**

▲ **තවකන්ණික ගහපති-** Householder Thavakannika**:** **මෙතුමා** කරුණු 6ක් සහිතව, නිවන සාක්ෂාත් කොට ඇතිබව බුදුන් වහන්සේ වදාළහ: 1-3) තිසරණය පිලිබඳ අවෙච්චාසහගත ප්‍රසාදය තිබීම, 4) ආරියශිලය තිබීම 5) ආරිය ඥානය තිබීම 6) ආරිය සේඛ ඵල විමුක්තිය. **සටහන්**: එම ගුණ ඇති අනිකුත් උපාසකයන් ගැන විස්තර මෙහි දක්වා ඇත. **මූලාශ්‍රය:** අංගු.නි: (4) 6 නිපාත: සාමඤ්ඤ වග්ග: 6.2.17 – සිට 36 දක්වා සූත්‍ර, පි.290.

**තස**

▲ **තිස්සා උපාසිකාව-** Tissa Upasika: මේ උපාසිකාව හා විසාකා මහා උපාසිකා ඇතුළු උපාසිකාවන් උපෝසථ අටසීලයේ පිහිටි අය බව මෙහි පෙන්වා ඇත**. බලන්න:** අංගු.නි: (5): 8 නිපාත: සාමඤ්ඤවග්ග සූත්‍ර, පි.381.

▲ **තිස්ස මාතා උපාසිකා-** Tissamatha Upasika: මේ උපාසිකාව හා විසාකා මහා උපාසිකා ඇතුළු උපාසිකාවන් උපෝසථ අටසීලයේ පිහිටි අය බව මෙහි පෙන්වා ඇත. **බලන්න:** අංගු.නි: (5): 8 නිපාත: සාමඤ්ඤවග්ග සූත්‍ර, පි.381.

**ද**

**දස**

▲ **දීඝජානු කෝලිය පුත්‍ර -** Dighajaanu Koliya putta: දීඝජානු කෝලිය පුත්‍ර -ව්‍යග්ඝපජ්ජ ලෙසින්ද හඳුන්වා ඇත, කෝලියදේශයේ, කක්කරපත්ත නියම්ගමේ වැසියෙකි. මොහු හා පවුලේ සැමදෙන බුදුන් වහන්සේ සරණ ගිය පිරිසකි. බුදුන් වහන්සේ, ඔහුගේ ඉල්ලීමක් මත, මෙලොව හා පරලොව සුවය පිණිස දැහැමි ගිහිජිවිතය ගතකලයුතු ආකාරය මෙහි විස්තර කර ඇත. **මූලාශ්‍රය**: අංගු.නි: (5): 8 නිපාත: ගෝතමීවග්ග: 8.2.6.4 ව්‍යග්ඝපජ්ජ සූත්‍රය, පි.256.

▲ **දීඝනක පරිබ්‍රාජක-**Diganaka paribrajaka: රජගහනුවර වාසි, මොහු දැරූ වාදය හා බුදුන් වහන්සේ ඒ පිළිබඳව දහම් කරුණු විස්තර කිරීම මෙහි දක්වා ඇත. එම සූත්‍ර දේශනාව අවසානයේ මෙතුමා සෝතාපන්නබව- ධම්මචක්ඛු ලැබුවේය. **සටහන:** මෙතුමා සැරියුත් මහා තෙරුන්ගේ ඥාතියෙකි, මේ සූත්‍ර දේශනාව අසා, මහා තෙරුන් අරහත්වය ලැබුහ. **මූලාශ්‍රය**: ම.නි: (2) 2.3.4 දීඝනඛ සූත්‍රය, පි.296.

▲ **දීඝාවු උපාසක-**Dīghāvu upasaka: රජගහනුවර විසූ ජෝතික ගහපතිගේ පුත් වූ දීඝාවු උපාසක ගේ මරණාසන්න අවස්ථාවේ මේ සූත්‍රය බුදුන් වහන්සේ ඔහුට දේශනා කර ඇත. ඔහු බුදුන් සරණ ගිය සෝතාපන්න ගිහියෙකි. අනාගාමීව මියගොස් සුද්දාවාසයක පහළවීය. ඔහු ගැන බුදුන් වහන්සේ මෙසේ වදාළහ:

**"...මහණෙනි, දීඝාවු උවසු තෙමේ පණ්ඩිතයෙක්ය, ධම්මානුකූලව පුහුණුව ගෙනගියහ. දහම දත් නිසා මා වෙහෙසට පත් නොකළේය. පංච ඔරම්භාගිය සංයෝජන ක්‍ෂය කිරීමෙන් ඔපපාතිකවූ ඔහු ඒ ලොවදී පිරිනිවන් පාන්නේය (අරහත්වය ලබා), නැවත මොලොවට ඔහුගේ පැමිණීමක් නැත."** **මූලාශ්‍ර**:සංයු.නි: (5-1) වග්ග:සොතාපත්ති සංයුත්ත: 11.1.3 දීඝාවු උපාසක සූත්‍රය. පි. 164, ESN:55: Sotapattisamyutta: 3.3 Dīghāvu, p, 2185.

දන

▲ **ද්‍රෝන බ්‍රාහමණ**- Brahmin Doṇa: බුදුන් වහන්සේ උක්කට්ඨා හා සෙතව්‍යා දෙනුවර අතර චාරිකාවක යෙදිසිටින අවස්ථාවේ එතුමන්ගේ පිය සටහන් දැක විමතියට පත්වූ මේ බ්‍රාහ්මණයා, බුදුන් වහන්සේ දෙවියෙක්ද...ගාන්ධර්-වයෙක් ද ආදී ලෙසින් උන්වහන්සේ කවරෙක්ද යයි විමසුහ. බුදුන් වහන්සේ මෙසේ වදාළහ:

"බමුණ, යම්සේ නෙලුම් මලක් දියේ ඉපදි, වැඩි, දියෙන් බැහැරව පැනනැගී සිටිද, ඒ පරිද්දෙන් මම ලොවේ උපත ලබා...හැදීවැඩි, ලොව මැඩගෙන, ලෝකයෙන් බැහැරව වෙසෙමි, මා බුදුන් යයි දැනගන්න". **බලන්න:** බුදුන් වහන්සේ. **මූලාශ්‍රය**:අංගු.නි: (2) 4 නිපාත: 4.1.4.6 ද්‍රෝනලෝක සූත්‍රය, පි.98.

▼ **බ්‍රාහ්මණයන්** පිළිබඳව බුදුන් වහන්සේ දෙසු දහම් කරුණු ගැන පැහැදී, මොහු බුදුන් සරණ ගිය බව මෙහි පෙන්වා ඇත. **මූලාශ්‍රය**: අංගු.නි: (3) 5 නිපාත:සොනවග්ග: 5.4.5.2 ද්‍රෝන සූත්‍රය, පි.386. **සටහන:** මහා පරිනිබ්බානයෙන් පසුව, බුදුන් වහන්සේගේ ධාතු, සාමකාමීව බෙදාදීමට ඉදිරිපත් වූවේ මේ බ්‍රාහ්මණයාය. **බලන්න:** දීඝ.නි: මහාපරිනිබ්බාන සූත්‍රය.

දර

▲ **දාරුකම්මික ගහපති**- Householder Darukammika: නාදික ගම්වාසි මොහු හා පවුලේ උදවිය සංඝයාට නිතර දානය පිරිනමති. දානය පිරිනැමීමට සුදුසු සංඝයා තෝරාගන්නේ කෙසේද යයි බුදුන් වහන්සේ මෙහිදී මොහුට උපදෙස් වදාළහ. **මූලාශ්‍ර**: අංගු.නි: (4 ): 6 නිපාත: මහාවග්ග:6.2.1.5 දාරුකම්මික සූත්‍රය,පි.194.

දව

▲ **දෙවහිත බමුණා**- Brahmin Devahitha: එක් සමයක බුදුන් වහන්සේ ආබාධව සිටි අවස්ථාවේ උන්වහන්සේ සුවපත් කිරීම පිණිස උණුදිය හා සකුරු පූජා කල මෙතෙම,කවරෙකුහට දීම මහත් ඵලවේද යයි බුදුන් වහන්සේගෙන් විමසුහ. බුදුන් වහන්සේ මෙසේ වදාළහ:

**"පෙරජාති දන්නා, ස්වර්ගය හා අපාය දකින, යළිඋපත ක්‍ෂය කළ, අවසාන නුවණ ලැබූ මුණිවරයාට, කෙනෙක්, යහපත් ලෙසින් දිය යුතුය, ඒමගින් මහා ඵල ලැබේ..."**

දහම අවබෝධකරගත් ඒ බමුණා බුදුන් සරණගිය උපාසකයෙක් විය.

**මූලාශ්‍රය**:සංයු.නි: බ්‍රාහ්මණසංයුත්ත:7.2.3 දෙවහිත සූත්‍රය, පි.338.

**ධ**

**ධත**

▲ **ධොතක මානවක-**Dhothaka manawaka: **බලන්න:** උපග්‍රන්ථය 1: ධොතක තෙර.

**ධන**

▲ **ධනිය ගොපල්ලා**-Dhaniya cowherd: උපධි නොමැතිවීමේ සුවය පිළිබඳව බුදුන් වහන්සේ දේශනා කොට වදාළ මේ සූත්‍රය අසා පැහැදුන මොහු තම බිරිඳ සමග බුදුන් සරණගිය බව මෙහි විස්තර කර ඇත. **මූලාශ්‍රය:** ඛු.නි: සුත්තනිපාත: 1-2 ධනිය සූත්‍රය, පි.28.

▲**ධනංන්ජානි උපාසිකාව-** Dhānañjānī Upasika: කෝසල ජනපදයේ, මණ්ඩලකප්ප යෙහි වාසය කල බ්‍රාහ්මණ කාන්තාවක් වූ මෙතුමිය ත්‍රිවිධ රත්නය සරණ ගිය, සෝතාපන්න උපාසිකාවකි. තමා සැමියාගේ සොහොයුරා වන සංගාරව හඳුමුඛ බ්‍රාහ්මණයාට බුදුන් සරණ යැමට මෙතුමිය උපකාර කලබව, මෙහි දැක්වේ. **බලන්න**:EMN: note: 917, p.1148. **මූලාශ්‍ර:** ම.නි: (2): 2.5.10 සංගාරව සූත්‍රය, පි.752, EMN: 100: Sangārava, p.744.

▲**ධනඤ්ජානි බ්‍රාහ්මණ-** Dananjani Brahamin: රජගහනුවර වැසි ධනවත් බ්‍රාහ්මණයෙක්වූ මොහු, බුදුන් සරණ ගිය ගිහියෙකි. ඔහුගේ ජීවිතයේ අවසාන අවස්ථාවේදී, සැරියුත් මහා තෙරුන් වදාළ සතර බ්‍රහ්මවිහාර දේශනය අසා පැහැදී, බ්‍රහ්මලෝකයේ යළි උපත ලැබීම මෙහි විස්තරාත්මකව දක්වා ඇත. **මූලාශ්‍රය:** ම.නි: (2): 2.5.7 ධනඤ්ජානි සූත්‍රය, පි.696.

▲**ධනංජනී බැමිණිය-** Brahmini Dhananjani: බුදුන් වහන්සේ පිළිබඳ සැදැහැ ඇතිකරගත් මේ උපාසිකාව නිසා ඇයගේ සැමියා, පැවිදිව අරහත්වය ලැබූ බව මෙහි දක්වා ඇත: **බලන්න:** භාරද්වාජ ශ්‍රෝත්‍රික තෙර. **මූලාශ්‍රය**: සංයු.නි: (1) සගාථවග්ග: බ්‍රාහ්මණසංයුත්ත: 7.1.1 ධනඤ්ජානි සූත්‍රය, පි.312.

**ධම**

▲ **ධම්මික උපාසක-** Dhammika upasaka: බුදුන් සරණ ගිය මේ උපාසක හා ඔහුගේ 500 ක් පිරිසට, බුදුන් වහන්සේ ධම්මානුකූල ජීවිතය ගතකිරීම ගැන කරුණු වදාළහ. **මූලාශ්‍රය**:ඛු.නි: සුත්තනිපාත: චූලවග්ග: 2-14 ධම්මික සූත්‍රය, පි.132.

▲ **ධම්මදින්න උපාසක-**Dhammadinna upasaka: බරණැස්නුවර විසූ බුදුන් සරණ ගිය සෝතාපන්නබව ලැබූ ගිහි ශ්‍රාවකකි. ඔහුට 500ක් පමණ බුදුන් සරණ ගිය කණ්ඩායමක් සිටි බව මෙහි දක්වා ඇත. **මූලාශ්‍රය:** සංයු.නි: (5-2): මහාවග්ග: සෝතාපත්තිසංයුත්ත: 11.6.3 ධම්මදින්න සූත්‍රය, පි.268.

**න**

**නක**

▲ **නකුල පිතා හා නකුල මාතා-** Nakulapitā & Nakulamatā: නකුල පිතා තෙරුවන් කෙරේ විශ්වාසය ඇති අය අතුරින් අග්‍රතම උපාසකය, තෙරුවන් කෙරෙහි විස්වාස කථා ඇති අය අතරෙන් අග්‍ර නකුලමාතා උපාසිකාවය. මේ දෙපොල, තෙරුවන් සරණ ගිය ගිහියන්ය. අටුවාවට අනුව, පෙරජාති 500 කදී පමණ ඔවුන්, බුදුන් වහන්සේගේ දෙමාපියන් වූහ. මේ භවයේදී, පෙර ජාති පුරුද්ද නිසා බුදුන් වහන්සේ දුටු සැනයෙන්ම, පුතා යයි අමතා ඇත. **බලන්න:** EAN: note:138 p. 587. **මූලාශ්‍ර:** අංගු.නි: (1) 1 නිපාත: එතදග්ග පාළිය, පි. 84**,** EAN:1: Foremost, p. 44.

▼ **බුදුන් වහන්සේ**, මේ උපාසකහට, පිරිනිවන පිළිබඳව කරුණු විස්තර කිරීම මෙහි දක්වා ඇත. **බලන්න**: සංයු.නි: (4): සළායතනසංයුත්ත: ගහපතිවග්ග: 1.13.8 නකුලපිතු සූත්‍රය, පි.264.

▼ **සැරියුත් තේරුන්,** මේ උපාසකහට සිත ගිලන් නොකර ගෙන සිටීමේ ක්‍රමවේදය වදාළහ. **බලන්න**: සංයු.නි: (3): ඛන්ධ වග්ග, 1.1.1.1. නකුල පිතු සූත්‍රය, පි 30, ESN:22: Khandasamyutta: 1.1 nakulapita, p. 1007.

▼ **මෙතුමා** කරුණු 6ක් සහිතව, නිවන සාක්ෂාත් කොට ඇතිබව බුදුන් වහන්සේ වදාළහ: 1-3) තිසරණය පිළිබඳ අවෙච්චාසහගත ප්‍රසාදය තිබීම, 4) ආරියශීලය තිබීම 5) ආරිය ඥානය තිබීම 6) ආරිය සේඛ ඵල විමුක්තිය. **සටහන්**: එම ගුණ ඇති අනිකුත් උපාසකයන් ගැන විස්තර මෙහි දක්වා ඇත. **මූලාශ්‍රය:** අංගු.නි: (4) 6 නිපාත: සාමඤ්ඤ වග්ග: 6.2.17 – සිට 36 දක්වා සූත්‍ර, පි.290

▼ **නකුල මාතාව** හා විසාකා මහා උපාසිකා ඇතුළු උපාසිකාවන් උපෝසථ අටසීලයේ පිහිටි අය බව මෙහි පෙන්වා ඇත**. බලන්න:** අංගු.නි: (5): 8 නිපාත: සාමඤ්ඤවග්ග සූත්‍ර, පි.381.

▼**බුදුන් වහන්සේ,** නකුල මාතාවගේ සිල්වත්බව හා යහපත් බිරිඳක් වීම ගැන ප්‍රසංසා වදාළහ. **බලන්න**: අංගු.නි: (4) 6 නිපාත: නකුල සූත්‍රය.

▼ **සම සැදැහැ ඇතිව,** සමසිල්ඇතිව, සමත්‍යාග ඇතිව, සම ප්‍රඥා ඇතිව, සැමියා හා බිරිඳ සම ජීවිත ගත කරන්නේනම් මෙලොවදී එක්ව වාසය කලහැකිය, පරලොවදී එක්ව වාසය කළ හැකිබව බුදුන් වහන්සේ මේ දෙදෙනාට වදාළහ. **මූලාශ්‍රය:**අංගු.නි: (2) 4 නිපාත: 4.2.1.5 හා 4.2.1.6 සමජීවී සූත්‍ර, පි.138.

▲ **නික්ඛ උපාසක-**Nikkha upasaka: ඤාතගමේ විසූ මේ උපාසක, අනාගාමීව, සුද්ධාවාසයක ඕපපාතික උපත ලැබූ බව මෙහි දක්වා ඇත. **මූලාශ්‍රය**:සංයු.නි: (5-2) මහාවග්ග: සෝතාපත්තිසංයුත්ත:11.1.8 හා 11.1.9,11.1.10 ගිඤ්ජකාවස්ථ සූත්‍ර, පි.184.

**නද**

▲ **නන්දක ලිච්චවී -**Nandaka Lichchavi

විසාලානුවර මහාඇමති නන්දක ලිච්චවී බුදුන් වහන්සේ සරණ ගිය ගිහියෙකි. බුදුන් වහන්සේ ඔහුට සෝතාපන්න ගුණ විස්තර කිරීම මෙහි

දක්වා ඇත. **මූලාශ්‍රය:** සංයු.නි: (5-2) මහාවග්ග: සෝතාපතිවග්ග: 11.3.10 නන්දක සූත්‍රය, පි.238.

▲ **නන්දිය පරිබ්‍රාජක**-Nandiya paribrajika: බුදුන් වහන්සේ නිවන පිලිබඳ වදාළ දහම් කරුණුවලින් පැහැදුන මොහු, බුදුන් සරණ ගිය උපාසකයෙක් වූ බව මෙහි දක්වා ඇත. **මූලාශ්‍රය:**සංයු.නි: (5-1) මහාවග්ග: මග්ගසංයුත්ත: 1.1.10 නන්දිය සූත්‍රය, පි. 46.

▲ **නන්දිය ශාක්‍ය-** Nandiya sakya: කපිලවස්තු නුවර වාසි මෙතුමා බුදුන් සරණ ගිය උපාසකයෙක්ය. බුදුන් වහන්සේ මෙහිදී ඔහුට අනුසති භාවනා ගැන විස්තර වදාළහ. **මූලාශ්‍රය**: අංගු.නි.(6 )11 නිපාත,අනුසති වගග, 11.2.3,නන්දිය සූත්‍රය,පි.658,

▼ **සෝතාපන්න** අරිය ශ්‍රාවක දහමේ ප්‍රමාදනොවන බව වදාළ, බුදුන් වහන්සේ මොහුට සෝතාපන්න ගුණ පෙන්වා ඇත. **මූලාශ්‍රය**: සංයු.නි: (5-2) මහාවග්ග: සෝතාපත්තිසංයුත්ත: 11.5.7 නන්දිය සූත්‍රය, පි. 262.

▲ **නවකම්මික භාරාද්වාජ බමුණා**-brahmin Navakammika Bhāradvāja: බුදුන් වහන්සේ එක් සමයක කෝසල දනව්වේ වනලැහැබක වැඩ වසන අවස්ථාවේ, ඒ වනයේ දැව කර්-මාන්තයේ නිරතවූ නවකම්මික භාරාද්වාජ බමුණා බුදුන් වහන්සේ දැක උන්වහන්සේ වෙත එළඹ මෙසේ ඇසුවේය:

'මේ වනයේ හුදකලාවේ, කුමක් ගැන ඔබ සතුටු වෙන්නේද?' බුදුන් වහන්සේ මෙසේ වදාළහ:

**"මගේ කෙළෙස් වනය මුළුමනින්ම සුන් කර ඇත, මෙහි මට කිරීමට කටයුත්තක් නැත. මම කෙළෙස් කටු, රාගාදී උල්, හැර, අරතිය මුදා හැර දැමීමි. එනිසා, මේ වනයේ හුදකලාව සිත අලවා වෙසමි".**

බුදු වදන්, අවබෝධ කරගත් ඒ බමුණා, බුදුන් සරණ ගිය උපාසකයෙක් විය. **මූලාශ්‍රය:**සංයු.නි: (1) බ්‍රාහ්මණසංයුත්ත: 7.2.7 නවකම්මික සූත්‍රය, පි.346.

**ප**

**පක**

▲ **පොක්ඛරසාති බ්‍රාහ්මණ-** Brahamin Pokkharasati: කෝසල දනව්වේ, උක්කට්ඨා නුවර වාසි මහාධනවත් බ්‍රාහ්මණකි. බුදුන් වහන්සේ වෙතින් දහම අසා සෝතාපන්න බව ලබා බුදුන් සරණ ගිය ගිහි උපාසකයෙක් විය. **මූලාශ්‍රය**:දීඝ.නි: (1): 3 අම්බට්ඨ සූත්‍රය පි.166.

**පග**

▲ **පිංගියානි බ්‍රාහ්මණ -** Brahamin pingiyaani: විසාලානුවර (වේසාලිය) විසූ මේ බ්‍රාහ්මණයා, බුදුන් වහන්සේ පිලිබඳ ශ්‍රද්ධාව ඇතිව, බුදුගුණ වර්නානා කිරීම මෙහි දක්වා ඇත:

"උදැසන පිබිදී සුවඳැති කොකනද -රත්පියුමක් වැනි, අහසේ බැබලෙන හිරු මෙන් අංගීරස (සිරුරේ රැස් විහිදෙන) බුදුන් වහන්සේ දෙස බලන්න"

**සටහන:** එම ගාථාව ඇසූ 500ක් ලිච්ඡවී කුමරුන්, ඔහුට 500ක් උතුරුසළු දෙනලදී. ඒ බ්‍රාහ්මණයා, ඒ සළු පෙරලා, බුදුන් වහන්සේට පූජා කළහ. **මූලාශ්‍රය**: අංගු.නි: (3) 5 නිපාත: 5.4.5.5. පිංගියානි සූත්‍රය, පි.406.

▲**පිංගලකොච්ච බ්‍රාහමණ- Brahamin Pingalakochcha:** සැවැත්නුවර වාසි මොහුට බුදුන් වහන්සේ, දහමේ සාරය-හරය නම් බඹසර සම්පූර්ණ කර අක්කුප්ප චේතෝ විමුත්තිය ලැබීමය යි පෙන්වා දුන් දේශනය අසා බුදුන් සරණගිය උපාසකයෙක් විය. **මූලාශ්‍රය**: ම.නි: (1) 1.3.10 චූලසාරොපම සූත්‍රය, පි.498.

**පච**

▲ **පච්චනීකසාත බ්‍රාහ්මණ-** Brahamin Pacchanikasatha: සැවත් නුවර විසූ මේ බමුණා, බුදුන් වහන්සේ ගේ දහමට විරුද්ධව කතා කිරීමට සිතා ගෙන උන්වහන්සේ වෙත පැමිණ මෙසේ පැවසිය: 'ශ්‍රමණයෙනි, දහම් දෙසුව මැනව" බුදුන් වහන්සේ මෙසේ වදාළහ:

**" එරෙහිව සිටින කෙනෙකුට, සිත කෙලෙසින් බර කෙනෙකුට යහපත් ලෙසින් පවසන උපදෙස් අවබෝධකිරිම දුෂ්කරය. කළහබව මුදා, අරුචිය හැරදමා, සැකය අත්හළ කෙනෙකුට සුභාසිතය අවබෝධ කල හැකිවේ".**

මේ සූත්‍රයේ වදාළ ධර්මය අසා පැහැදී බුදුන් සරණගිය උපාසකයෙක් විය. **මූලාශ්‍රය**: සංයු.නි: (1) සගාථවග්ග: බ්‍රාහ්මණසංයුත්ත: 7.2.6 පච්චනීක සූත්‍රය, පි. 346.

**පට**

▲**පාටලිය ගාමිණි-** Pāṭaliya the headman: කෝලිය දනව්වේ, උත්තරක ගම් වාසි මොහු බුදුන් වහන්සේ වදාළ මේ සූත්‍රය අසා දහම අවබෝධ කර බුදුන් සරණ ගියබව මෙහි දක්වා ඇත. **මූලාශ්‍රය:** සංයු.නි: (4): සළායතනවග්ග: ගාමිණිසංයුත්ත:8.1.13 පාටලිය සූත්‍රය, පි. 636.

▲ **පොට්ඨපාද පරිබ්‍රාජක-** Pottapada paribrajaka: සැවැත්නුවර වාසි මේ පරිබ්‍රජකයා, බුදුන් වහන්සේ ගේ දහම අසා අවබෝධකර බුදුන් සරණ ගිය උපාසකයෙක් වූ බව මෙහි දක්වා ඇත. **මූලාශ්‍රය**: දීඝ.නි: (1) 9 පොට්ඨපාද සූත්‍රය, පි. 404.

**පත**

▲ **පොතලිය ගෘහපති-** Householder Pothaliya: අංගුත්තරපාන ජනපදයේ, ආපණ නම් නියම් ගමේ ගෘහපතියෙක්වූ මොහු, තමන් සියලු ගිහි කටයුතු හැරදමා ඇතය සිතා සිටි නිසා බුදුන් වහන්සේ ඔහුට ගහපතිය යයි ඇමතීම ගැන අසතුටුවිය. ඉන්පසු බුදුන් වහන්සේ ආරිය විනයේ කටයුතු හැරදැමීම ගැන කරුණු විස්තරකර වදාළහ. බුදුන් වහන්සේ වදාළ දහම අවබෝධ කර බුදුන් සරණ ගිය උපාසකයෙක් වූ බව මෙහි දක්වා ඇත. **මූලාශ්‍රය**: ම.නි: (2) 2.1.4 පොතලිය සූත්‍රය, පි.54.

▲ **පොතලිය පරිබ්‍රාජක-** Pothaliya Paribrajaka

බුදුන් වහන්සේ මේ සූත්‍රයේදී වදාළ දහම අවබෝධ කරගත් මොහු, ප්‍රසාදය ඇතිකර, බුදුන් සරණගියහ.

**මූලාශ්‍රය**: අංගු.නි: (2) 4 නිපාත: 4.2.5.10 පොතලිය සූත්‍රය, පි.212.

**පද**

▲**පදුමා උපාසිකා-** Paduma Upasika: මේ උපාසිකාව හා විසාකා මහා උපාසිකා ඇතුළු උපාසිකාවන් උපෝසථ අටසීලයේ පිහිටි අය බව මෙහි පෙන්වා ඇත**. බලන්න:** අංගු.නි: (5): 8 නිපාත:සාමඤ්ඤවග්ග සූත්‍ර, පි.381.

**පය**

▲ **පයාසි රජතුමා-** King Payasi: මොහු අභිසේඛ නොලත් රජෙකි. පසේනදී කෝසල රජු විසින් තෑගි කළ සේතව්‍යා නුවර රජකම් කළහ. පරලොව නැත ආදී වැරදි දිට්ඨියක් දැරූ මොහු, කුමාර කාශ්‍යප තෙරුන් මේ සූත්‍රයේදී වදාළ දහම් කරුණු අසා එම දිට්ඨිය බැහැර කොට, බුදුන් සරණ ගියහ. දුගී මගී ආදීන්ට දානය පිරිනැමීමට කටයුතු කරනලදී. එහෙත්, යහපත් ලෙසින් සකසා දන් නොදුන් නිසා මරණින් මතු චාතුර්මහා රාජකිය දෙව්ලොව පහළවිය. එහදී, ගවම්පති තෙරුන් හමුවී, දානය සකසා දීම, සිය අතින්නම දීමේ යහපත් ආදීනව ගැන මිනිස් ලෝකයට පැවසීමට තෙරුන්ගෙන් ඉල්ලා සිටියහ. **සටහන**: මේ රජුගේ සේවක උත්තර, සකසා දන්දීම අගය කළහ. ඔහු මරණින් මතු තව්තිසාවේ පහළවිය. **මූලාශ්‍රය**: දීඝ.නි: (2) 10 පායාසි රාජන්‍ය සූත්‍රය, පි.520.

**පර**

▲ **පුරාණ උපාසක-**Purana upasaka: ඉසිදත්ත උපාසක ගේ සහෝදරයාය, සෝතාපන්නවූ උපාසකයෙක් වූ මෙතුමා අපවත්වන අවස්ථාවේ, සකදාගාමී බව ලැබිය. **බලන්න**: ඉසිදත්ත උපාසක. **මූලාශ්‍රය:** සංයු.නි: (5-2) මහාවග්ග: සෝතාපත්තිසංයුත්ත: 11.1.6 ථපති සූත්‍රය, පි.170.

▼ **මෙතුමා** කරුණු 6ක් සහිතව, නිවන සාක්ෂාත් කොට ඇතිබව බුදුන් වහන්සේ වදාළහ: 1-3) තිසරණය පිලිබඳ අවෙච්චාසහගත ප්‍රසාදය තිබීම, 4) ආරියශිලය තිබීම 5) ආරිය ඥානය තිබීම 6) ආරිය සේඛ ඵල විමුක්තිය. **සටහන්**: එම ගුණ ඇති අනිකුත් උපාසකයන් ගැන විස්තර මෙහි දක්වා ඇත. **මූලාශ්‍රය:** අංගු.නි: (4) 6 නිපාත: සාමඤ්ඤ වග්ග: 6.2.17 – සිට 36 දක්වා  සූත්‍ර, පි.290.

**පල**

▲**පිලොතික පරිබ්‍රාජක-** Pilothika Paribrajaka**:** ජානුසෝනි බ්‍රාහ්මන විසින් විමසනු ලැබුව, මෙතෙම බුදුන් වහන්සේ කෙරහි තමන් වෙසෙන්ම පැහැදීමට හේතු කරුණු මෙසේ පෙන්වා ඇත:

"...ඇතුන්වෙසෙන වනයට ඇතුළුවන දක්ෂ පුරුෂයෙක්, දික්වූ පුළුල්වූ මහා ඇත් පිය සටහනක් දැක...මේ නම් මහා ඇතෙක් යයි නිශ්චයට පැමිණෙන්නේය. එලෙස මම ශ්‍රමණ ගෝතමයන් වෙත ඤාණ පද සතරක් දිටිමි, ඉන්පසු මම භාග්‍යවතුන් වහන්සේ සම්‍යයක්සම්බුද්ධය, උන්වහන්සේගේ ධර්-මය ස්වක්ඛාතය, ශ්‍රාවක සංඝයා සුපටිපන්නය යයි නිෂ්ඨාවට පැමිණියෙමි..."

**සටහන:** බුදුන් වහන්සේගේ ඥාන පදසතර: 1) බුදුන් වහන්සේ වෙත විවාද පිණිස පැමිණෙන ක්‍ෂත්‍රිය පණ්ඩිතයෝ... 2) බුදුන් වහන්සේ වෙත විවාද පිණිස පැමිණෙන බමුණු පණ්ඩිතයෝ... 3) බුදුන් වහන්සේ වෙත විවාද පිණිස පැමිණෙන ගහපති පණ්ඩිතයෝ... 4) බුදුන් වහන්සේ වෙත විවාද පිණිස පැමිණෙන ශ්‍රමණ පණ්ඩිතයෝ...බුදුන් වහන්සේ දැහැමි කථාවෙන් සතුටු කරවති. ඉන්පසු ඔවුන් ප්‍රශ්න නො විමසති, උන්වහන්සේගේ ශ්‍රාවක යෝ වෙති. **මූලාශ්‍රය:** ම.නි: (1) 1.3.7 චූළහත්ථිපදෝපම සූත්‍රය, පි.446

**පස**

▲ **පසේනදී කෝසල රජ-** King Pasenadi Kosala: මේ රජතුමා කාසිකෝසල විජිතයට අග්‍ර අධිපතිය, මල්ලිකා දේවිය, මේ රජුගේ ප්‍රියතම බිසවය. බුදුන් වහන්සේ සරණ ගිය මෙතුමා ගැන විස්තර පිණිස **බලන්න:** සංයු.නි: කෝසලසංයුත්ත, අංගු.නි: (6 ): 10 නිපාත: කෝසල සූත්‍ර, ඛු.නි:උදානපාලිය: 5.1 රාජ සූත්‍රය, පි.248. **සටහන්:** මේ රජතුමාට තිබූ මහා රාජ සම්පත් පිළිබඳව **බලන්න**:රජවරු.

▲**පෙස්ස හස්ථාරෝහ පුත්‍ර** - Pessa hastharoha putta: චම්පානුවර වැසි හස්තීන්- ඇතුන් පුහුණුකරන ගහපති ගේ පුතෙක් වූ මොහු බුදුන් වහන්සේ සරණ ගිය ගිහියෙකි. ඔහු ප්‍රඥාවන්ත බව බුදුන් වහන්සේ මෙහි දක්වා ඇත. **සටහන.** ඔහුගේ මිත්‍ර කන්දරක පරිබ්‍රාජක බුදුන් වහන්සේ ගැන පැහැදුන චම්පා නුවර විසූ අන්‍යආගමිකයෙකි. **මූලාශ්‍රය**: ම.නි: (2) 2.1.1. කන්දරක සූත්‍රය,පි.18.

▲**පොසාල මානවක-**Posala manawaka: **බලන්න:** උපග්‍රන්ථය 1: පොසාල තෙර.

**බජ**

▲ **බොජ්ඣා උපාසිකා-** Bojjhā Upasika: සැවැත්නුවර වැසි මේ උපාසිකාවට උපෝසථ ශීලයේ ආනිසංස බුදුන් වහන්සේ පෙන්වා වදාළහ. **සටහන:** මේ උපාසිකාව හා විසාකා මහා උපාසිකා ඇතුළු උපාසිකාවන් උපෝසථ අටසීලයේ පිහිටි අය බව මෙහි පෙන්වා ඇත. **බලන්න:** අංගු.නි: (5): 8 නිපාත: සාමඤ්ඤවග්ග සූත්‍ර, පි.381. **මූලාශ්‍රය:** අංගු.නි: (5): 8 නිපාත: 8.1.5.5. බොජ්ඣා උපෝසථ සූත්‍රය, පි. 214.

බධ

▲ **බෝධිරාජ කුමාර-**Prince Bodhi: භග්‍ගරට සුංසුමාරගිරි නුවර වාසි ධනවත්, මේ කුමාරයා, බුදුන් වහන්සේ හමුවීම, දහම ඇසීම, බුදුන් වහන්සේ සරණ යාම පිලිබඳ විස්තර මෙහි දක්වා ඇත. **මූලාශ්‍රය**: ම.නි: (2) 2.4.5 බෝධිරාජ කුමාර සූත්‍රය, පි.496.

**බම**

▲ **බිම්බි උපාසිකා-** Bimbi Upasika

මේ උපාසිකාව හා විසාකා මහා උපාසිකා ඇතුළු උපාසිකාවන් උපෝසථ අටසීලයේ පිහිටි අය බව මෙහි පෙන්වා ඇත. බලන්න: අං.ගු.නි: (5): 8 නිපාත: සාමඤ්ඤවග්ග සූත්‍ර, පි.381.

▲ **බිම්බිසාර රජතුමා-**King Bimbisara: මගධ දේශයේ අධිපති මෙතුමා බුදුන් සරණ ගිය සෝතාපන්න උපාසකයෙකි. මගධයේ වැසියන් එතුමන් ප්‍රිය කලබව මහාපරිනිබ්බාන සූත්‍රයේ දක්වා ඇත.

▼**සිදුහත් තවුසා** රජගහනුවරට වැඩිය අවස්ථවේදී එතුමා දැක මේ රජතුමා පැහැදීම, තමන් සමග රජ සැප විඳීමට ඇරයුම් කිරීම ආදී විස්තර මෙහි පෙන්වා ඇත. **බලන්න**: බුදුන් වහන්සේ. **මූලාශ්‍රය**: ඛු.නි: සුත්තනිපාත: මහාවග්ග:3-1 පබ්බජා සූත්‍රය, පි.142.

▼ **සම්බෝධිය ලැබූ** බුදුන් වහන්සේ, බිම්බිසාර රජතුමා දැකීමට රජගහනුවරට වැඩම කිරිම, දහම අසා සෝතාපන්නවීම, වෙළුවන උයන බුදුන් ප්‍රමුඛ සංඝයාට පූජකිරීම ආදී විස්තර මෙහි පෙන්වා ඇත. **බලන්න:** වින.පි: මහාවග්ග පාලිය1: 74 බිම්බිසාර සමාගම කථා, පි.156. **සටහන්**: * අජාසත් රජුගේ පියාය. ** සිය අගමෙහෙසියවූ ඛේමාවට බුදුන්වහන්සේ සරණ යැමට, පැවිදිවීමට අනුග්‍රහ කර ඇත. ** මේ රජතුමාට තිබූ මහා රාජ සම්පත් පිළිබඳව **බලන්න**:රජවරු. ** මරණින්මතු දෙවලෝකයේ ජනවසභ නම් දෙවියෙක්ව බුදුන් වහන්සේ බැහැදකිමට පැමිණීම පිලිබඳ විස්තර දීඝ.නි: ජනවසභ සූත්‍රයෙ පෙන්වා ඇත.

**බව**

▲**බාවරි බ්‍රාහ්මණ-**Brahamin Bawari: ත්‍රිවේදයේ පරතෙරට පැමිණි, බොහෝ සිසුන් ඇති මේ බ්‍රාහ්මණ, හිස සත්කඩකට පැලීම ගැන පැහැදිලි කරගැනීමට තමාගේ ජේෂ්ඨතම සිසුන් 16 දෙනා බුදුන් වහන්සේ වෙත යැවීම, දහම අවබෝධ කර බුදුන් සරණ යාමේ විස්තර මෙහි දක්වා ඇත. **මූලාශ්‍රය**: ඛු.නි.සුත්තනිපාත: පාරායනවග්ග:වස්තුගාථා: පි,326.

**භ**

**භක**

▲ **භික්ඛක බ්‍රාහ්මණ -**Brahamin Bhikkhaka: පිණ්ඩපාතයෙන් යැපෙන මේ බමුණා, බුදුන් වහන්සේ හා ඔහු අතර වෙනස විමසූ අවස්ථාවේදී, බුදුන් වහන්සේ මේ සූත්‍රය දේශනාකොට වදාළහ, අවසානයේදී මොහු බුදුන් සරණ ගිය උපාසකයෙක් විය. **මූලාශ්‍රය**:සංයු.නි: (1) සගාථවග්ග: බ්‍රාහ්මණසංයුත්ත: 7.1.10 භික්ඛක සූත්‍රය, පි.352.

**භද**

▲ **භද්ද උපාසක -** Bhadda Upasaka: ඤාතගමේ විසූ මේ උපාසක, අනාගාමීව, සුද්ධාවාසයක ඕපපාතික උපත ලැබූ බව මෙහි දක්වා ඇත.**මූලාශ්‍රය**:සංයු.නි: (5-2) මහාවග්ග: සෝතාපත්තිසංයුත්ත:11.1.8 හා 11.1.9,11.1.10 ගිඤ්ජකාවස්ථ සූත්‍ර, පි.184.

▲ **භද්දිය ලිච්ඡවි-**Bhaddiya the Licchavi

විසාලා නුවර, භද්දිය ලිච්චවි, බුදුන් වහන්සේ වදාළ මේ සූත්‍රය අසා පැහැදී බුදුන් සරණ ගියහ. **මූලාශ්‍රය**: අං.ගු.නි: (2): 4 නිපාත: 4.4.5.3 භද්දිය සූත්‍රය, පි.392.

▲ **භද්‍රක ගාමිණි**- Badraka gamini: මල්ලව දනව්වේ, උරුවෙලාකප්ප නියම් ගමේ, ගම් ප්‍රධානියා වූ මොහු, බුදුන් වහන්සේ හමුවී දුක හටගැනීම හා නැතිවීම ගැන කරුණු විමසීම මෙහි දක්වා ඇත. ඔහු බුදුන් සරණ ගිය උපාසකයෙකි. **මූලාශ්‍රය**: සංයු.නි: (4) සළායතනවග්ග: ගාමිණිසංයුත්ත:8.1.11 භද්‍රක සූත්‍රය, පි.616.

▲**භද්‍රාවුධ මානවක**-Badrawuda manawaka: **බලන්න:** උපග්‍රන්ථය 1: භද්‍රාවුධ තෙර.

**හර**

▲ **හාරද්වාජ බ්‍රාහ්මණ**-Bhāradvāja brahmin: බුදුන් වහන්සේ වැඩසිටි සමයේ, ඉච්ඡානංගල ගමෙහි විසූ, හාරද්වාජ බ්‍රාහ්මණ, එවක ප්‍රසිද්ධ බ්‍රාහ්මණ ඇදුරෙක්වූ තාරුක්ඛ බ්‍රාහ්මණ ගේ ශිෂ්‍යකි. බුදුන් වහන්සේ වදාළ මේ සූත්‍රය අසා පැහැදී ගිහි උපාසකයෙක් විය. **මූලාශ්‍රය:** ම.නි: (2): බ්‍රාහ්මණවග්ග: 2.5.8 වාසෙට්ඨ සූත්‍රය, පි.716, EMN: 98 Vāseṭṭha Sutta, p.720.

▲ **හාරද්වාජ බ්‍රාහ්මණ කෝසල**-Bhāradvāja Brahmin Kosala: කෝසල දනව්වේ වාසය කල මේ බ්‍රාහ්මණ, බුදුන් වහන්සේ වදාළ දහම අවබෝධ කර ගිහි උපාසක බවට පත්විය. **මූලාශ්‍රය:** සංයු.නි: (1) බ්‍රාහමණසංයුත්ත: 7.2.8 කට්ඨහාර සූත්‍රය, පි.348.

**හල**

▲**හල්ලික ගහපති**- Householder Ballika: මේ ගහපති ඇතුළු අනිකුත් උපාසකයන්, කරුණු 6ක් සහිතව, නිවන්මග ප්‍රත්‍යක්ෂ කර ඇතිබව බුදුන් වහන්සේ වදාළහ: 1-3) තිසරණය පිළිබඳ අවෙච්චාසහගත ප්‍රසාදය තිබීම, 4) ආරියශීලය තිබීම 5) ආරිය ඥානය තිබීම 6) ආරිය විමුක්තිය. **සටහන්**: එම ගුණ ඇති අනිකුත් උපාසකයන් ගැන මෙහි දක්වා ඇත. **මූලාශ්‍රය**: අං.ගු.නි: (4) 6 නිපාත: සාමඤ්ඤ වග්ග: 6.2.17 – සිට 36 දක්වා සූත්‍ර, පි.290

**ම**

**මග**

▲ **මාගන්දිය බ්‍රාහ්මණ හා බ්‍රාහ්මණිය**-Brahmin Magandiya & Wife: බුදුන් වහන්සේගේ කුරු දේශයේ චාරිකාවේ වඩින අවස්ථාවක, මේ බමුණාට බුදුන් වහන්සේ හමුවිය. පිය සටහන් දැක උත්තම පුරුෂයෙක් බව හඳුනා ගත් මේ බ්‍රාහ්මණයා, තමන්ගේ රූමත් දියණිය කැඳවා ගෙනවිත්, උන්වහන්සේට විවාහ කරදීමට යෝජනා කළහ. තමන් වහන්සේ කාමය හැරදමා ඇතිබව පවසා එම යෝජනාව ප්‍රතික්ෂේප කළ බුදුන් වහන්සේ ඔවුන්ට දහම් දෙසුහ. දහම අවබෝධ කරගත් මාගන්දිය බ්‍රාහ්මණය හා ඔහුගේ බිරිඳ බුදුන් සරණ ගියහ, ඔවුන් අනාගමි මගඵල ලැබූහ.

**සටහන:** රූපත්බව නිසා මානයෙන් මත්වූ මාගන්දියා යුවතිය, අසූචි පිරුණු කයක් ලෙසින් තම රූපත්බව බුදුන් වහන්සේ පිළිකුල් කිරීම ගැන උන්වහන්සේ හා වෛර බැඳ ගති. පසුව කොසඹෑ නුවර උදේන රජුගේ බිසවබවට පත්වී, බුදුන් වහන්සේ ව නුවරට වැඩිය අවස්ථාවේ, මිනිසුන් යොදවා උන්වහන්සේට හා සංඝයාට කරදර කිරීමට උත්සාහ කරනලදී. උදේන රජුගේ අගබිසව සාමාවතී දේවිය බුදුන් සරණ ගිය නිසා එතුමිය හා පිරිවර ගිනිබත් කර විනාශ කරන ලදී. **බලන්න:** සාමාවතී බිසව. **මූලාශ්‍ර:** බු.නි: සුත්තනිපාත:අට්ඨකවග්ග: 4-9 මාගන්දිය සූත්‍රය, පි.284.

▲ **මිගාර සිටුවරයා-** Migara Situvaraya: සැවැත්නුවර මහා ධන සිටුවරක්වූ මොහු, විශාඛා මහා උපාසිකාවගේ, ස්වාමිපුරුෂයාගේ පියාය, මිගජාල තෙරුන්ගේ අත්තාය. අන්‍යආගමිකයන් ඇදහු මොහු හා පවුලේ සෙසු අය, විසාඛාවගේ අනුග්‍රහයෙන් බුදුන් සරණ ගියහ, එනිසා ඕතොමෝ මිගාරමතා යන නමින්ද හඳුන්වා ඇත. **සටහන:** * පසේනදී කෝසල රජුගේ උග්ග මහාඇමති, බුදුන් වහන්සේ බැහැදැක, රෝහණ සිටුවරයාගේ මුනුපුරු, මිගාර සිටුවරයා මහා ධනසම්පත් ඇතිබව පවසා ඇත. ඒ අවස්ථාවේදී, බුදුන් වහන්සේ වදාළේ ඒවා පහසුවෙන්ම විනාශවනබවය. එහෙත්, ධර්-ම ධනය එසේ විනාශයට නොයන බවය. **සටහන:** විස්තර පිණිස බලන්න: "**Treasures of the Noble'**: by Soma Thera, Bodhi Leaves: Vol II (B), BPS, 1965. **මූලාශ්‍ර:** අං.ගු.නි: (4 ): 7 නිපාත: 7.1.1.5. හා 7.1.1.6 ධන සූත්‍ර හා 7.1.1.7.උග්ග සූත්‍රය, පි.303, EAN: 7: 5.5 &6.6 Wealth & 7.7. Ugga, p. 370.

▲**මිගසාලා උපාසිකාව**-Upasika Migasala:L මිගසාලා, බුදුන් වහන්සේගේ ගිහි උපාසකවූ ඉසිදත්ත ගේ දියණියය. බ්‍රහ්මචාරිබව පිලිබඳ ඇය ගේ විමසුමක් අරභයා මේ සූත්‍ර දේශනාකර ඇත. **බලන්න:** ඉන්ද්‍රිය වර්ධනය අනුව පුද්ගලවෙනස්කම්, පුරාණ හා ඉසිදත්ත උපාසකවරු.**මූලාශ්‍ර:** අං.ගු.නි:6 නිපාත: 6.1.5.2 මිගසාලා සූත්‍රය, පි.130, අං.ගු.නි:10 නිපාත:10.2.3.5 මිගසාලා සූත්‍රය, පි.274.

**මත**

▲ **මුත්තා උපාසිකා-** Muttha Upasika: මේ උපාසිකාව හා විසාකා මහා උපාසිකා ඇතුළු උපාසිකාවන් උපෝසථ අටසීලයේ පිහිටි අය බව මෙහි පෙන්වා ඇත.**බලන්න:** අං.ගු.නි: (5): 8 නිපාත:සාමඤ්ඤවග්ග සූත්‍ර, පි.381.

**මධ**

▲ **මධුරාපුර අවන්තිපුත්‍ර රජතුමා-**King Avanthiputta of Madhura: මධුරාපුර අවන්තිපුත්‍ර රජතුමා, මහා කච්චාන තෙරුන් මුන ගැසීම හා බුදුන් සරණයාම මේ සූත්‍රයේ විස්තර කර ඇත. **බලන්න:** ම.නි: මධුරා සූත්‍රය.

**මන**

▲ **මනුජා උපාසිකා-** Manuja Upasika

මේ උපාසිකාව හා විසාකා මහා උපාසිකා ඇතුළු උපාසිකාවන් උපෝසථ අටසීලයේ පිහිටි අය බව මෙහි පෙන්වා ඇත. **බලන්න:**අංගු.නි: (5):8 නිපාත:සාමඤ්ඤවග්ග සූත්‍ර, පි.381.

▲ **මුන්ඩ රජ-** King Muṇḍa: පාටලිනුවර රජවූ මොහු තමාගේ ප්‍රියතම දේවියවූ භද්‍රාගේ මරණය නිසා මහා ශෝකයකට පත්විය. නාරද තෙරුන් දේශනා කල සෝකසල්ලහරණ ධම්ම පරියාය අසා, බුදුන් සරණ ගොස්, දහම අවබෝධ කර ශෝකය පහ කරගත් බව මෙහි දැක්වේ. **මූලාශ්‍රය:** අංගු.නි: (3) 5 නිපාත: 5.1.5.10 සෝකසල්ලහරණ සූත්‍රය, පි.112.

▲ **මානත්ථද්ධ බමුණා-** Brahmin Mānatthaddha: සැවැත්නුවර වැසි මානත්ථද්ධ බමුණා, තමදෙමාපියන්ට, වැඩිහිටියන්ට ගරු නොකළ අධිකවූ මානයෙන් යුත් කෙනෙකි. එක් සමයක බුදුන් වහන්සේ ධර්-මය දේශනා කරනු අසා ඒ අසලට පැමිණි ඔහු මෙසේ සිතිය: "ශ්‍රමණ ගොතම පළමුව මා අමතන්නේ නම්, මම ඔහු හා කතා කරමි". බුදුන් වහන්සේ ඔහු දැක ඔහුට කතා නොකළ නිසා ඔහු ආපසු යාමට පිටත්විය. ඒ අවස්ථාවේදී, බුදුන් වහන්සේ ඔහු අමතා මෙසේ වදාළහ:

**"තමාගේ යහපත පතන කෙනෙක් මානය දැරීම සුදුසුනැත, ඔබ යම් ප්‍රයෝජනයක් හේතු කොට මෙහි පැමිණියේ නම් එය සිදුකරගන්න".**

තමාගේ සිත බුදුන් වහන්සේ දුටුබව අවබෝධ කළ ඒ බමුණා බුදුන් පාමුල වැටි, උන්වහන්සේගේ පාදය සිඹමින් තමා, මානත්ථද්ධ බව පැවසිය. ඒ බව දුටු පිරිස පවැසුවේ:

'ඒ නම් අසිරිමත් සිදුවීමකි, තමාගේ දෙමාපියන්, වැඩිහිටියන් ගරු නොකරන ඒ බමුණා, බුදුන් වහන්සේට යටහත් පහත්ව ගරුකරයි'. බමුණාගේ සිත බුදුන් වහන්සේ කෙරෙහි පහන්වූ බව දුටු උන්වහන්සේ ඔහුට, කවරෙකුට ගරු කිරීම සුදුසුද යන්න වදාළහ. ඒ දේශනාව අවසානයේ ඒ බමුණා බුදුන් සරණ ගිය උපාසකයෙක් විය. **මූලාශ්‍රය:** සංයු.නි:බ්‍රාහ්මණසංයුත්ත:7.2.5 මානත්ථද්ධ සූත්‍රය, පි.342.

**මණි**

▲ **මණිචූලක ගාමිණී**- Maṇicūḷaka the headman: රජගහනුවර වැසි මොහු බුදුන් වහන්සේ හා සංඝයා පිළිබඳ විශ්වාසය ඇති ගිහියෙක්ය. රාජසේවක පිරිසක් බුද්ධ ශ්‍රාවකයන්, රන් රිදී ආදිය ගන්නේය යන මතයට එරෙහිව මොහු කතා කර ඇත. ඔහුගේ කියමන බුදුන් වහන්සේ අනුමත කර ඇති බව මෙහි පෙන්වා ඇත. **මූලාශ්‍රය:** සංයු.නි: (4) සළායතනවග්ග:ගාමිණිසංයුත්ත:8.1.10 මණිචූලක සූත්‍රය, පි.614.

▲ **මෙණ්ඩක ගහපති-**Householder Mendaka: මෙතුමා කරුණු 6ක් සහිතව, නිවන සාක්ෂාත් කොට ඇතිබව බුදුන් වහන්සේ වදාළහ: 1-3) තිසරණය පිලිබඳ අවෙච්චාසහගත ප්‍රසාදය තිබීම, 4) ආරියශීලය තිබීම 5) ආරිය ඥානය තිබීම 6) ආරිය සේඛ ඵල විමුක්තිය. **සටහන්:** එම ගුණ ඇති අනිකුත් උපාසකයන් ගැන විස්තර මෙහි දක්වා ඇත. **මූලාශ්‍රය:** අංගු.නි: (4): 6 නිපාත: සාමඤ්ඤ වග්ග: 6.2.17 – සිට 36 දක්වා සූත්‍ර, පි.290.

**මල**

▲ **මල්ලිකා දේවිය-**Queen Mallika

පසේනදී කෝසල රජුගේ අග බිසවය, බුදුන් වහන්සේ සරණ ගිය උපාසිකාවකි. **බලන්න:** * සංයු.නි: කෝසලසංයුත්තය, මල්ලිකා සූත්‍රය, ** අංගු.නි: 4 නිපාත: මල්ලිකා සූත්‍රය. **සටහන:** මෙතුමිය හා විසාකා මහා උපාසිකා ඇතුළු උපාසිකාවන් උපෝසථ අටසිලයෙ පිහිටි අය බව මෙහි පෙන්වා ඇත. **බලන්න:** අංගු.නි: (5): 8 නිපාත: සාමඤ්ඤවග්ග සූත්‍ර, පි.381.

▲ **මෝලියසීවක පරිබ්‍රාජක-**Moliyasivaka Paribrajaka: රජගහනුවර වාසි පරිබ්‍රාජකයෙක් වූ මොහු, බුදුන් වහන්සේ ධර්මයේ සන්දිට්ඨික ගුණය පෙන්වමින් වදාළ මේ සූත්‍රය අසා බුදුන් සරණගියහ. **සටහන:** මොහුගේ නම සිවකය, කෙස් මුදුනේ ගැටගසා ගෙන සිටි නිසා මෝලිය සීවක ලෙසින්ද දක්වා ඇත. **මූලාශ්‍රය:** අංගු.නි: (4): 6 නිපාත:ධම්මිකවග්ග: 6.1.5.5 ප්‍රථම සන්දිට්ඨික සූත්‍රය, පි.144.

▼**සියළු වේදනා, කර්මය නිසා** ඇතිවන්නේද? යයි මොහු ඇසූ පැනයකට පිළිතුරු ලෙසින් බුදුන් වහන්සේ මේ සූත්‍රය, මොහුට වදාළහ. **මූලාශ්‍රය:** සංයු.නි: (4) සළායතනවග්ග: වේදනාසංයුත්ත: 2.3.1මෝලිය සිවක සූත්‍රය, පි.461.

**මහ**

▲ **මහානාම ශාක්‍ය-** Mahānāma the Sakyan: අග්‍රවූ ප්‍රනීතවූ දේ දෙන උපාසකයන් අතරෙන් මෙතුමා අග්‍රය යි බුදුන් වහන්සේ වදාළහ. **සටහන:** කපිලවස්තු නුවර, ශාක්‍ය කුමාරයෙක් වූ මොහු, බුදුන් වහන්සේගේ ඥාති සහෝදරයෙකි, අනුරුද්ධ තෙරුන්ගේ වැඩිමහල් සහෝදරයාය. සෝතාපන්න මෙතුමාට බුදුන් වහන්සේ පිලිබඳ අචල ශ්‍රද්ධාවක් පැවතිනි. **බලන්න:** EAN: Note:133, p.587. **මූලාශ්‍:** අංගු.නි: (1 ) 1 නිපාත: එතදග්ග පාළිය, පි. 84, EAN:1: Foremost, p. 44.

▼**මහානාම ශාක්‍යයන්**, ආධ්‍යාත්මික වර්ධනය ලැබූ නිසා මරණින් මතු ඔහු විශේෂබවට පත්වන බව බුදුන් වහන්සේ දක්වා ඇත. ඔහු සිව්දහම ඇති හෙයින් (සෝතාපන්න) නිවනට බරවී සිටි. ඒ පිලිබඳ බුදුන් වහන්සේ දක්වා ඇති උපමා: 1) තෙල්කළය උපමාව. තෙල් පිරුන කළයක් විලට වැටුන විට, වලං කැලි යට යයි, තෙල් ඉහල එයි 2) රුක් උපමාව: නැගෙනහිරට නැමුන ගසක් කපා දැමුවිට එය පතිත වන්නේ නැගෙනහිර දිශාවටය. එලෙස, සොතපන්න උතුමා, යළි උපතක් ලබන්නේ සුගතියකය. **මූලාශ්‍රය:**සංයු.නි: (5-2): මහාවග්ග: සෝතාපත්තිසංයුත්ත: සරකානි වග්ග: 11.3.1 හා 11.3.2 මහානාම සූත්‍ර, පි.206.

▼**ගිහිඋපාසකයෙක්** වන අන්දම පිළිබඳව බුදුන් වහන්සේ මහානාම ශාක්‍යයන්ට මෙහිදී විස්තර කර ඇත. **බලන්න:** සංයු.නි: (5-2) සෝතාපත්ති සංයුත්ත**:** සගාථ පුඤ්ඤාභිසන්ද වග්ග: මහානාම සූත්‍රය.

▼**මහානාම ශාක්‍යයන්**, තමන්ට බුදුන් වහන්සේ කෙරෙහි ඇති විස්වාසය හා ප්‍රසාදය ගැන මෙසේ පවසා ඇත:

"...මෙහි කිසියම් කරුණක් උපදෙන්නේය. භාග්‍යවතුන් වහන්සේ එක පසෙක වන සේක...ලෝකයා එක් පසෙක වන්නාහ. භාග්‍යවතුන් වහන්සේ යම් පසෙක නම් මමත් එහිම වෙනේනෙමි...මෙසේ පහන්වූ මා

භාග්‍යවතුන් වහන්සේ දරන සේක්වා”. **මූලාශ්‍රය:** සංයු.නි:(5-2 ) සෝතාපත්තිසංයුත්ත: සරකානි වග්ග:මහානාම සූත්‍ර 3, පි. 206.

▼**සෝතාපන්න** ආරිය ශ්‍රාවකයා ගේ විහරණය, පිළිබඳ බුදුන් වහන්සේ මේ සූත්‍රය, මහානාම ශාක්‍යයන්හට දේශනා කර ඇත. **මූලාශ්‍ර:**අංගු.නි: 6 නිපාත:ආහුනෙය්‍යවග්ග:6.1.1.10 මහානාම සූත්‍රය, පි.32.

▼ **මහානාම ශාක්‍යයන්හට,** බුදුන් වහන්සේ, අනුසති භාවනා ගැන දේශනා කර ඇත. **බලන්න**: අංගු.නි: (6 ): 11 නිපාත: අනුසති වගග: 11.2.1, මහානාම සූත්‍රය,11.2.2 දුතිය මහානාම සූත්‍රය, පි.645-654.

▼ **ත්‍රිවිධරත්නය සරණයෑම** පමනකින්ම උපාසක වේ යයි බුදුන් වහන්සේ මේ සූත්‍ර යේදී මහානාම ශාක්‍යයන්හට වදාළහ. **සටහන**: උපාසකයෙක් තුල තිබිය යුතු යහපත් ගුණ මෙහි දක්වා ඇත. **මූලාශ්‍ර:**අංගු.නි: (5): 8 නිපාත: ගහපතිවග්ග: 8.1.3.5 මහානාම සූත්‍රය, පි.142.

▼ **මෙතුමා** කරුණු 6ක් සහිතව, නිවන සාක්ෂාත් කොට ඇතිබව බුදුන් වහන්සේ වදාළහ: 1-3) තිසරණය පිලිබඳ අවෙච්චාසහගත ප්‍රසාදය තිබීම, 4) ආරියශීලය තිබීම 5) ආරිය ඥානය තිබීම 6) ආරිය සේඛ ඵල විමුක්තිය. **සටහන්**: එම ගුණ ඇති අනිකුත් උපාසකයන් ගැන විස්තර මෙහි දක්වා ඇත. **මූලාශ්‍රය:** අංගු.නි: (4): 6 නිපාත: සාමඤ්ඤ වග්ග: 6.2.17 – සිට 36 දක්වා  සූත්‍ර, පි.290.

▲ **මහාලි ලිච්ඡවී-** Mahāli the Licchavi: මහාලි ඔට්ඨද්ධ ලිච්ඡවී, විසාලා නුවර විසූ බුදුන් සරණ ගිය ලිච්ඡවී කුමාරයෙකි. කලින් කල බුදුන් වහන්සේ බැහැදැක බොහෝ දහම් ප්‍රශ්න අසා ඇතිබව සූත්‍රදේශනාවල දක්වා ඇත. **බලන්න:** අංගු.නි: 9 නිපාත: 10.1.5.7  මහාලි සූත්‍රය, දීඝ.නි: මහාලි සූත්‍රය, සංයු.නි: සක්කසංයුත්ත:11.1.3 මහාලි සූත්‍රය හා ඛන්ධසංයුත්ත:උපයවග්ග: 1.2.1.8 මහාලි සූත්‍රය.

▲ **මහාසාල බමුණා-** Brahmin Mahasala: පෙරදී ධනවත්ව ජීවත්වූ මහාසාල නම් වයස්ගත බමුණෙක් බුදුන් වහන්සේ හමුව තම දරුවන් ඔහු නිවසින් නෙරපා දැමීම නිසා තමන් ඉතා දිළිඳු ජීවිතයක් ගත කරන බව පැවසූහ. බුදුන් වහන්සේ, ඒ බමුණාහට ගාථාවක් උගන්වා, එය ප්‍රසිද්ධ ස්ථානවල දී සජ්ජායනා කිරීමට උපදෙස් දුන්හ. ඉන්පසු ඔහුගේ දරුවන්, පියාට මැනවින් සාත්තුකලෝය. ඉන්පසුව ඒ බමුණා සතුටින් තමාලත් දේ බුදුන් වහන්සේට පූජා කර, බුදුන් සරණ ගිය උපසකයෙක්විය. **මූලාශ්‍රය:** සංයු.නි:(1)  බ්‍රාහ්මණසංයුත්ත: උපාසකවග්ග:7.2.4 මහාසාළ සූත්‍රය, පි.340.

**ය**

**යධ**

▲ **යොධාජීව ගාමිණී-** Yodhajiva Gamini**:** යොධාජීව ගාමිණී, බුදුන් වහන්සේ වැඩසිටි සමයේ, යුද්ධභටයෙක් ලෙසින් ජීවිකාව කරගත් පුද්ගලයෙකි. පෙරසිටි ඇජර පැජර නම්ලත් යොධාජීවයන් විසින් දැරූ දිට්ඨිය වූ:

"මරණින් මතු යොධාජීවයන්, සරඤජිත දේව සභාවේ යළි උපත ලබති" යන අදහස මොහුටදවිය. ඒ පිළිබඳව විමසනු ලදුව, එම දිට්ඨියේ ලාමක බව බුදුන් වහන්සේ ඔහුට පෙන්වා දී ඇත: සතුරෝ වැනසීම, තරහ නපුරු සිතින් කරන අකුසලයකි, ඒ නිසා යළි උපත දුගතියය-නිරය හෝ තිරිසන් යෝනියය. බුද්ධ දේශනාව අසා මිථ්‍යාදිට්ඨිය පහ කර ඔහු බුදුන් වහන්සේ සරණ ගිය උපාසකයෙක් විය.

**මූලාශ්‍රය**:සළායතනවග්ග:ගාමිණිසංයුත්ත:8.1.3 යොධාජීව සූත්‍රය, පි. 588.

**යස**

▲**යසකුල පුත් තෙරුන්ගේ දෙමාපියන් හා පෙර බිරිඳ-** Parents & former wife of Yaskaulaputtha Thera**:** තමන්ගේ පුතා සොයමින් ගිය, යස සිටුවරයාට, ඉසිපතන මිගදායේ දී බුදුන් වහන්සේ සම්මුඛයෙහි දහම අසා සෝතාපන්න බව ලබා ගැනීමට වාසනාව ඇතිවිය. ඔහු තිසරණ සරන ගිය පලමු ගිගි උපාසක විය. බුදුන් වහන්සේ ඇතුළු සංඝයාට යස සිටුවරයා විසින් දෙන ලද දානය අවසානයේ, බුදුන් වහන්සේ වෙතින් දහම අසා සිටුවරයාගේ බිරිය හා ලේලිය සෝතාපන්න වුහ. ඔවුන් තිසරණ සරණ ගිය පළමු ගිහි උපාසිකාවෝය. **බලන්න:** උපග්‍රන්ථය 1:යසකුල පුත්‍ර තෙර. **මූලාශ්‍රය:**වින.පි:මහාවග්ගපාළි1: යසකුල පුත්ත පබ්බජා කථා, පි.108.

**ර**

**රච**

▲**රුචි උපාසිකා-**Ruchi Upasika: මේ උපාසිකාව හා විසාකා මහා උපාසිකා ඇතුළු උපාසිකාවන් උපෝසථ අටසීලයේ පිහිටි අය බව මෙහි පෙන්වා ඇත**. බලන්න:** අංගු.නි: (5): 8 නිපාත:සාමඤ්ඤවග්ග සූත්‍ර, පි.381.

**රස**

▲**රාසිය ගාමිණී-**Rasiya Gamini: රාසිය ගාමිණී, බුදුන් සරණ යෑම මේ සූත්‍රයේ දී පෙන්වා ඇත. **මූලාශ්‍රය:** සංයු.නි: (4): සළායතනවග්ග: ගාමිණිසංයුත්ත:8.1.12. රාසිය සූත්‍රය, පි.620.

**ල**

**ලක**

▲ **ලෝකායාත බ්‍රාහ්මණ-** The cosmologist Brahamana: බුදුන් වහන්සේ මධ්‍යම ප්‍රතිපදාව පිලිබඳ වදාළ දහම් දේශනය අසා මේ බමුණා බුදුන් සරණ ගිය උපාසකයෙක් විය. **බලන්න**: ලෝකායතික. **මූලාශ්‍ර:** සංයු.නි: (2): නිදානවග්ග:අභිසමයසංයුත්ත:ගහපතිවග්ග: 1.5.8 ලෝකායාතික සූත්‍රය, පි.140, ESN: 12 Nidanasamyutta:V: 48.8. A Cosmologist, p. 677.

▲**ලෝහිච්ච බ්‍රාහමණ (1) -** Lohichcha Brahamana-1

ලෝහිච්ච බ්‍රාහමණයාට ඇතිවූ ලාමක දිට්ඨීය පහ කිරීම පිණිස බුදුන් වහන්සේ වදාළ දහම් දේශනය අසා පැහැදුන ඒ බ්‍රාහ්මණයා, මෙසේ පවසා බුදුන් සරණ ගිය උපාසකයෙක් බවට පත්විය:

"භවත් ගෝතමයන් වහන්ස, යම්සේ අශුචි වළක වැටුන මිනිසෙක් ගේ හිස් කෙසින් ගෙන ඔසවා ගොඩට ගන්නා සේ, නිරය නම් වළට වැටීමට ගිය මා, ඔබ වහන්සේ ගොඩට ගත්තේය... භවත් ගෝතමයන් වහන්ස, අභිකාන්තය..." **සටහන:** මේ බමුණා කොසොල්රට, සාලවතිකා ගමේ අධිපතිය. **මූලාශ්‍රය**: දීඝ.නි: (1): 12 ලෝහිච්ච සූත්‍රය, පි. 556

▲ **ලෝහිච්ච බ්‍රාහමණ 2 -** Lohichcha Brahamana 2: අවන්තිදේශයේ, මක්කරකට නුවර වාසය කළ මේ බමුණා, මහා කච්චයන තෙරුන් වදාළ දහම අසා පැහැදී ගිහි උපාසකයෙක් බවට පත්විය. **මූලාශ්‍රය:** සංයු.නි: (4): සළායතනවග්ග:වේදනාසංයුත්ත: ගහපතිවග්ග: 1.13.9 ලෝහිච්ච සූත්‍රය, පි.266.

**ව**

**වඛ**

▲**වෙඛනස්ස පරිබ්‍රාජක-**Vekhanassa paribrajika: වෙඛනස්ස පරිබ්‍රාජක අන්‍ය ආගමික ගුරුවරයෙකි, සකුලදායි පරිබ්‍රාජක ගේ ගුරුවරයා ලෙසින්ද දක්වා ඇත. බුදුන් වහන්සේ වදාළ මේ සූත්‍රය අසා දහම අවබෝධ කරගත් මොහු බුදුන් සරණ ගිය උපාසකයෙක් විය. **මූලාශ්‍රය:** ම.නි: (2): 2.3.10 වෙඛනස්ස සූත්‍රය, පි.410.

**වජ**

▲**වජ්ජියමාහිත ගහපති-** Householder Vajjiyamāhita: චම්පා නුවර විසූ මෙතුමා බුදුන් වහන්සේගේ ගිහි උපාසකයෙකි. අන්‍යආගමිකයන් බුදුන් වහන්සේ පිලිබඳ අභූත චෝදනා ප්‍රකාශ කළවිට, ධම්මානුකූලව කරුණු පෙන්වා ඔවුන් නිහඬ කිරීමට සමත්විය. බුදුන් වහන්සේ මේ උපාසක පිලිබඳ කළ ප්‍රසංසා මේ සූත්‍රයේ පෙන්වා ඇත. **මූලාශ්‍ර:** අංගු.නි: (6): 10 නිපාත: 10.2.5.4.වජ්ජියමාහිත සූත්‍රය,පි.368, EAN:10: 94-4 Vajjiyamāhita, p.535.

▼ **මෙතුමා** කරුණු 6ක් සහිතව, නිවන සාක්ෂාත් කොට ඇතිබව බුදුන් වහන්සේ වදාළහ: 1-3) තිසරණය පිලිබඳ අවෙච්චාසහගත ප්‍රසාදය තිබීම, 4) ආරියශීලය තිබීම 5) ආරිය ඥානය තිබීම 6) ආරිය සේඛ ඵල විමුක්තිය. **සටහන්**: එම ගුණ ඇති අනිකුත් උපාසකයන් ගැන විස්තර මෙහි දක්වා ඇත. **මූලාශ්‍රය:** අංගු.නි: (4): 6 නිපාත: සාමඤ්ඤ වග්ග: 6.2.17 – සිට 36 දක්වා සූත්‍ර, පි.290.

▲**විජය ගහපති-**Householder Wijaya: මෙතුමා කරුණු 6ක් සහිතව, නිවන සාක්ෂාත් කොට ඇතිබව බුදුන් වහන්සේ වදාළහ: 1-3) තිසරණය පිලිබඳ අවෙච්චාසහගත ප්‍රසාදය තිබීම, 4) ආරියශීලය තිබීම 5) ආරිය ඥානය තිබීම 6) ආරිය සේඛ ඵල විමුක්තිය. **සටහන්**: එම ගුණ ඇති අනිකුත් උපාසකයන් ගැන විස්තර මෙහි දක්වා ඇත.

**මූලාශ්‍රය:** අංගු.නි: (4): 6 නිපාත: සාමඤ්ඤ වග්ග: 6.2.17 – සිට 36 දක්වා සූත්‍ර, පි.290.

**වප**

▲ **වප්ප ශාක්‍ය**-Vappa the Sakkyan: කපිලවස්තු- කිඹුල්වත් නුවර විසූ වප්ප ශාක්‍ය, නිගණ්ඨනාථ පුත්‍රගේ ශ්‍රාවකයෙකි. බුදුන් වහන්සේ වදාළ මේ සූත්‍රය අසා බුදුන් සරණ ගියහ. ඒ අවස්ථාවේදී තමන් පෙර ඇදහූ ලාමක දිට්ඨිය ගැන මෙසේ පැවසූහ:

" යම්කෙනක්, ලාභ ලබාගැනීම පිණිස අශ්වයන් ඇති කරයි, එහෙත් ඉන් ඔහුට වෙහෙස මිස ලාභයක් නොවේ. එලෙස, පෙර මම අනුවණ නිගණ්ඨනාථයන් ඇදහුයෙමි, ඉන් වෙහෙස මිස ලාභයක් මට නොවිය, අද දින සිට ඔහු කෙරේ පැවති සැදැහැව වේගවත් සුළං රැල්ලකින් ඉවතට ගෙන ගිය සේ, නැතිනම්, ගඟේ පාකර ඇරිය ලෙසින් අවසන්විය''. **මූලාශ්‍රය**: අංගු.නි: (2): 4 නිපාත: 4.4.5.5. වප්පසූත්‍රය, පි.400.

**වර**

▲ **වෙරඤ්ජ බ්‍රාහ්මණ**-Brahmin Veranja: වෙරඤ්ජ නුවර වැසි මේ බ්‍රාහ්මණයා, බුදුන් වහන්සේ හමුව, උන්වහන්සේ වැඩිහිටියන්ට ගරු නොකරන්නේය, යයි පවසා ඇත. ඒ පිළිබඳව බුදුන් වහන්සේ වදාළ දහම අසා සතුටුව් බුදුන් වහන්සේ සරණ ගිය උපාසකයෙක් විය. **මූලාශ්‍රය**: අංගු.නි: (5): 8 නිපාත:මහාවග්ග: 8.1.2.1 වෙරඤ්ජ සූත්‍රය, පි.62.

▲**වෙරඤ්ජ බමුණු පිරිස**- Brahmins of Veranja: මේ බමුණු පිරිස, බුදුන් වහන්සේ ජේතවනාරාමයේ වැඩ වසන සමයේ උන්වහන්සේ බැහැදකිමට පැමිණීම හා බුදුන් වහන්සේ වදාළ දහම අසා පැහැද, බුදුන් සරණයාම මෙහි විස්තර කර ඇත. **මූලාශ්‍රය**:ම.නි: (1): 1.5.2 වෙරඤ්ජක සූත්‍රය, පි:692.

▲**වෙරහච්චානි බ්‍රාහ්මණිය**-Verahaccāni the Brahmin lady: කාමන්ඩා නුවර, බ්‍රාහ්මණ ගුරුවරියක් වූ මෝ තොමෝ, උදායි තෙරුන් විසින් අරහත්වය පිලිබඳ වදාළ දේශනය අසා බුදුන් සරණ ගිය උපාසිකාවක් වූවාය. **මූලාශ්‍රය:** සංයු.නි: (4): සළායතනසංයුත්ත: ගහපතිවග්ග:1.13.10 වෙරහච්චානි සූත්‍රය, පි. 272.

**වළ**

▲ **වේළුද්වාර බ්‍රාහ්මණ ගම් වැසියෝ**-Villagers of Veludvara : බුදුන් වහන්සේ, ගිහියන් ධම්මානුකූල ජීවිතයක් ගත කරන්නේ කෙස්ද යයි මේ බ්‍රාහ්මණ ගම් වැසි පිරිසට වදාළ දේශනාව අසා පැහැදුන ඔවුන්, බුදුන් සරණ ගිය උපාසකයන් වූ බව මෙහි දක්වා ඇත. **බලන්න**: අත්තුපනායික ධම්මපරියාය. **මූලාශ්‍රය:** සංයු.නි: (5-2): මහාවග්ග: සොතාපත්තිසංයුත්ත: වේළුද්වාරවග්ග:11.1.7 වේළුද්වාර සූත්‍රය, පි.178.

**වස**

▲ **වස්සකාර බ්‍රාහ්මණ**-brahmin Vassakāra

මොහු මගධයේ අජාසත් රජුගේ මහා ඇමැතියාය. මහා පරිනිබ්බාන සූත්‍රයේදී: වස්සකාර බ්‍රාහ්මණ බුදුන් වහන්සේ බැහැදැකීමට පැමිණීම, බුදුන් ප්‍රමුඛ සංඝයාට දන් පිරිනැමීම පිළිබඳ විස්තර දැක්වේ. මහා පුරුෂයා කව්ද? යයි ඔහු ඇසූ පැණයට පිළිතුරු වශයෙන් බුදුන් වහන්සේ මේ සූත්‍රය වදාළහ. **බලන්න:**අංගු.නි: (2): 4 නිපාත: 4.1.4.5 වස්සකාර සූත්‍රය, පි.93.

▼ **දිට්ඨි** පිළිබඳ, බුදුන් වහන්සේ වදාළ මේ දේශනාව අසා මොහු සතුටට පත්වූ බව මේ සූත්‍රයේ දක්වා ඇත. **බලන්න**: අංගු.නි: (2): 4 නිපාත: බ්‍රාහ්මණ වග්ග: 4.4.4.3 වස්සකාර සූත්‍රය, පි.356.

▼ **මේ සූත්‍රයේදී බුදුන් වහන්සේ** මොහුට, සත්පුරුෂ ලක්ෂණ පෙන්වා ඇත. **බලන්න:**අංගු.නි: (2): 4 නිපාත: බ්‍රාහ්මණ වග්ග: 4.4.4.7 දුතිය වස්සකාර සූත්‍රය, පි.368.

▲ **වාසෙට්ඨ උපාසක-** Vāseṭṭha Upasaka: කොසඹෑනුවර වැසි මේ උපාසක බුදුන් සරණගිය අටසීලයේ පිහිටි ගිහියෙක් බව මේ සූත්‍රයේ පෙන්වා ඇත. **මූලාශ්‍රය**: අංගු.නි: (5): 8 නිපාත: උපෝසථවග්ග: 8.1.5.4 වාසෙට්ඨඋපෝසථ සූත්‍රය, පි.212.

▼ **මෙතුමා** කරුණු 6ක් සහිතව, නිවන සාක්ෂාත් කොට ඇතිබව බුදුන් වහන්සේ වදාළහ: 1-3) තිසරණය පිළිබඳ අවෙච්චාසහගත ප්‍රසාදය තිබීම, 4) ආරියශීලය තිබීම 5) ආරිය ඥානය තිබීම 6) ආරිය සේඛ ඵල විමුක්තිය. **සටහන්**: එම ගුණ ඇති අනිකුත් උපාසකයන් ගැන විස්තර මෙහි දක්වා ඇත. **මූලාශ්‍රය:** අංගු.නි: (4): 6 නිපාත: සාමඤ්ඤ වග්ග: 6.2.17 – සිට 36 දක්වා සූත්‍ර, පි.290.

▲ **වාසෙට්ඨ බ්‍රාහ්මණ-** Vāseṭṭha brahmin: බුදුන් වහන්සේ වැඩසිටි සමයේ, ඉච්ඡානංගල ගමෙහි විසූ, වාසෙට්ඨ බ්‍රාහ්මණ, එවක ප්‍රසිද්ධ බ්‍රාහ්මණ ඇදුරෙක්වූ පොක්ඛරසාති බ්‍රාහ්මණගේ ශිෂ්‍යකි. බුදුන් වහන්සේ වදාළ මේ සූත්‍රය අසා පැහැදී ගිහි උපාසකයෙක් විය. **මූලාශ්‍රය:** ම.නි: (2): බ්‍රාහ්මණවග්ග: 2.5.8 වාසෙට්ඨ සූත්‍රය, පි.716,EMN: 98 Vāseṭṭha Sutta, p.720.

▲ **විසාක උපාසක-**Visaka Upasaka: අනාගාමී ගිහි උපාසකයෙක් වූ මෙතුමා, ධම්මදින්නා තෙරණියගේ ගිහිකල ස්වාමියාය. මෙතුමා හා තෙරණිය අතර පැවති ධම්ම ප්‍රශ්න සාකච්ඡාව මෙහි විස්තරකර ඇත. **මූලාශ්‍ර:** ම.නි: (1) 1.5.4. චූල වෙදල්ල සූත්‍රය,පි. 721, EMN:44**:** Cūḷavedalla Sutta, p.379.

▲ **විසාකා මහා උපාසිකා-** Visaka Mahaupasika: විසාකා සිටුදුව, මිගාර මාතා ආදී නම් වලින්ද මෙතුමිය හඳුන්වා ඇත. සොතපන්න වූ මෙතුමිය, දායිකාවන් අතරෙන් අග්‍රය යි බුදුන් වහන්සේ වදාළහ. **බලන්න:**EAN: note: 140, p. 587. **මූලාශ්‍ර:** අංගු.නි: (1) 1 නිපාත: **එතදග්ග පාළිය**, පි. 84, EAN:1: Foremost, p. 44.

▼ **පෙර ජීවිතයක** මෙතුමිය කිකී රජුගේ සත්දියණියන් ගෙන් කෙනෙකි. **බලන්න**: උ.ග්‍ර:2:ඛේමා තෙරණිය.

▼**මේ උපාසිකාව** හා ඇතුළු උපාසිකාවන් උපෝසථ අටසිලයේ පිහිටි අය බව මෙහි පෙන්වා ඇත. **බලන්න:** අංගු.නි: (5): 8 නිපාත: සාමඤ්ඤවග්ග සූත්‍ර, පි.381.

▼ **මෙහිදී, බුදුන් වහන්සේ,** විසකාවට, යහපත් කාන්තාවක් සතු ගුණ පෙන්වා ඇත. **මූලාශ්‍රය**:අංගු.නි: (5): උපෝසථවග්ග: ලෝකවිජය සූත්‍ර 2කි, පි. 232.

▼ **විසාඛාවාට දේශනා කරනලද සූත්‍ර**: * ඛු.නි: උදාන පාලිය: 2.9 විසාඛාසූත්‍රය, පි. 192: අනුන්ට අයත් සියල්ල දුක බව. ** ඛු.නි: උදාන පාලිය: 8.8 විසාඛාසූත්‍රය, පි. 340 :ප්‍රිය දේ නිසා දුක ඇතිවෙන බව. ** අංගු.නි: (5): 8 නිපාත: උපෝසථවග්ග: 8.1.57 විසාඛාමනාපකායික සූත්‍රය, පි.228 හා 8.1.5.3 විසාඛා උපෝසථ සූත්‍රය, පි.208 :මනාපකායික දේවසභාවේ යළි උපත ලබාගන්නා අන්දම පිලිබඳ උපදෙස් හා අටසිල් ගැනීමේ ආනිසංස දක්වා ඇත.

**ස**

**සග**

▲ **සංගාරව භද්‍රමුඛ** - Sangārava Bhdramukha: කෝසල ජනපදයේ, මණ්ඩලකප්ප යෙහි වාසය කල මොහු වේදයේ පරතෙරට පැමිණි බ්‍රාහ්මණ මානවකයෙක්ය. **බලන්න**:EMN: note: 917, p.1148. බ්‍රහ්මචරියාව පිලිබඳ මොහු ඇසූ ප්‍රශ්ණවලට බුදුන් වහන්සේ වදාළ දහම් කරුණු අවබෝධකරගත් මෙතුමා බුදුන් සරණ ගිය ගිහි උවසුවෙක්වූහ. **මූලාශ්‍ර**: ම.නි: (2): 2.5.10 සංගාරව සූත්‍රය, පි.752, EMN: 100: Sangārava, p.744.

▲ **සංගාරාව බ්‍රාහ්මණ 1-** Brahmin Saṅgārava 1: සැවැත්නුවර වාසි මේ බ්‍රාහ්මණයාට නීවරණ ගැන බුදුන් වහන්සේ වදාළ මේ සූත්‍ර අසා බුදුන් සරණගිය බව මෙහි දක්වා ඇත. **සටහන**: අංගු.නි: (3): 5 නිපාත: සොණවග්ග: 5.4.5.3 සූත්‍රය (පි.396), EAN:5: 193.3 sutta, p.300: පංචනීවරණ පිළිබඳව, බුදුන් වහන්සේ මේ බ්‍රාහ්මණයාට දේශනා කර ඇත. **බලන්න:**ESN: note: 112, p.2401. **මූලාශ්‍ර:** සංයු.නි: (5-1): මහාවග්ග: බොජ්ඣංගසංයුත්ත: 2.6.5 සංගාරාව සූත්‍රය, පි.256, ESN:46: Bojjhangasamyutta: 55.5 Sangārava,p.1801.

▲ **සංගාරාව බ්‍රාහ්මණ 2 -** Brahmin Saṅgārava 2: සැවැත්නුවර වාසි මේ බ්‍රහ්මණයා දිය නෑමෙන් පව් සෝදාගැනීමේ ව්‍රතය පිළිගත් කෙනෙකි. ආනන්ද තෙරුන් ගේ ඉල්ලීමක් අනුව, බුදුන් වහන්සේ ඔහුගේ නිවසට පැමිණ මේ සූත්‍රය දේශනා කරනලදී. දහම අසා අවබෝධ කර වැරදි දිට්ඨිය පහකරගත් ඔහු බුදුන් සරණ ගියබව මෙහි දක්වා ඇත. **බලන්න**:පව් සේදීම. **මූලාශ්‍ර:**සංයු.නි: (1) සගාථවග්ග: බ්‍රාහ්මණසංයුත්ත: 7.2.11 සංගාරාව සූත්‍රය, පි.352, ESN:7: Brahmanasamyutta:21.11. Saṅgārava, p.388.

**සඟ**

▲ **සිඟාලක ගෘහ පුත්‍ර-**Singalaka the householder’s son

රජගහනුවර වාසි මොහු බුදුන් වහන්සේ වදාළ සිඟාල සූත්‍ර දේශනාව අසා බුදුන් සරණ ගියහ. **බලන්න**: ගිහියන්ට උපදෙස් **මූලාශ්‍රය:** දීඝ.නි: (3): 8 සිඟාලක සූත්‍රය, පි.304.

**සජ**

▲ **සුජාතා උපාසිකාව-** Sujatha upasika: ඤාතගමේ විසූ මේ උපාසිකාව සෝතාපන්නව, මරණයට පත්වූ බව මෙහි දක්වා ඇත. **මූලාශ්‍රය**:සංයු.නි: (5-2) මහාවග්ග: සෝතාපත්තිසංයුත්ත:11.1.8 හා 11.1.9 ගිඤ්ජකාවස්ථ සූත්‍ර, පි.184.

**සත**

▲ **සුතනා උපාසිකා-** Suthana Upasika: මේ උපාසිකාව හා විසාකා මහා උපාසිකා ඇතුළු උපාසිකාවන් උපෝසථ අටසීලයේ පිහිටි අය බව මෙහි පෙන්වා ඇත. **බලන්න**:අංගු.නි:(5): 8 නිපාත සාමඤ්ඤවග්ග සූත්‍ර, පි.381.

**සද**

▲**සුදත්ත උපාසක**- Sudatta upasaka: ඤාතගමේ විසූ මේ උපාසක සකදාගාමීව, මරණයට පත්ව, යලි එක්වරක් මේ ලෝකයට පැමිණ දුක කෙලවර කර ගන්නා බව මෙහි දක්වා ඇත. **මූලාශ්‍රය:**සංයු.නි: (5-2) මහාවග්ග: සෝතාපත්තිසංයුත්ත:11.1.8 හා 11.1.9, 11.1.10 ගිඤ්ජකාවස්ථ සූත්‍ර, පි.184.

**සන**

▲ **සන්තුට්ට උපාසක-** Santutta Upasaka: ඤාතගමේ විසූ මේ උපාසක, අනාගාමිව, සුද්ධාවාසයක ඕපපාතික උපත ලැබූ බව මෙහි දක්වා ඇත. **මූලාශ්‍රය**:සංයු.නි: (5-2) මහාවග්ග: සෝතාපත්තිසංයුත්ත:11.1.8 හා 11.1.9,11.1.10 ගිඤ්ජකාවස්ථ සූත්‍ර, පි.184.

▲**සන්දක පරිබ්‍රාජක-** Sandaka paribrajaka**:** කොසඹෑනුවර වාසි මේ පරිබ්‍රාජකහට 500ක් පිරිවර සිටියහ. ආනන්ද තෙරුන්, බ්‍රහ්මචරියා වාසය පිලිබඳ දේශනා කළ මේ සූත්‍රය අසා පැහැදුන මෙතෙම, තමන් වයස්ගත නිසා පැවිදිවීමට අපහසු බව පවසා තමාගේ පිරිවරට, බුදුන්වහන්සේ වෙත බඹසර වාසය කිරිමට අවවාද කර ඇත. **මූලාශ්‍රය:** ම.නි (2) 2.3.6 සන්දක සූත්‍රය, පි.324.

▲**සංධාන ගහපති**-Householder Sandhana: මෙතුමා කරුණු 6ක් සහිතව, නිවන සාක්ෂාත් කොට ඇතිබව බුදුන් වහන්සේ වදාළහ: 1-3) තිසරණය පිලිබඳ අවෙච්චාසහගත ප්‍රසාදය තිබීම, 4) ආරියශිලය තිබීම 5) ආරිය ඥානය තිබීම 6) ආරිය සේඛ ඵල විමුක්තිය. **සටහන්**: එම ගුණ ඇති අනිකුත් උපාසකයන් ගැන විස්තර මෙහි දක්වා ඇත. **මූලාශ්‍රය:** අංගු.නි: (4): 6 නිපාත: සාමඤ්ඤ වග්ග: 6.2.17 – සිට 36 දක්වා සූත්‍ර, පි.290.

▲ **සේනානිගේ දියණිය සුජාතා**-Senani's daughter Sujatha**:** පළමුව සරණයෙහි පිහිටි, සේනානි ගේ දියණිය වන සුජාතාව, ගිහි උපාසිකාවන් අතරින් අග්‍රය යි බුදුන් වහන්සේ වදාළහ. උරුවෙල දනව්වේ, ගයාවේ

(වර්තමාන බෝධිගයාව), සේනානි නම් කුල දෙටුවෙක්ගේ, දියණිය වූ මේ තුමිය, බෝධිසත්වයන් සම්බෝධිය ලැබීමට පෙර, කිරිබත් ආහාරය පූජා කරන ලදී. **බලන්න:** EAN:note:139 p. 587. **මූලාශ්‍ර:** අංගු.නි: (1 ) 1 නිපාත: **එතදග්ග පාළිය,** පි. 84**,** EAN:1: XIV : Foremost, p. 44.

**සණ**

▲ **සුමණා රාජ කුමරිය-** Princess Sumana: සැවැත්නුවර විසූ මේ රජකුමරිය හා ඇයගේ 500ක් පිරිස බුදුන් සරණ ගිය, නිති දාන පූජා කරන ගිහි උපාසිකාවෝ බව මෙහි පෙන්වා ඇත. දන්දීමේ හා නොදීමේ විපාක පිළිබඳව බුදුන් වහන්සේ මෙහිදී ඇයට කරුණු විස්තර කර ඇත. **මූලාශ්‍රය:**අංගු.නි: (3): 5 නිපාත: සුමණාවග්ග:5.1.4.1. සුමණා සූත්‍රය, පි.72.

▲ **සෝණ ගෘහපුත්‍ර-**Sona the househoder's son: රජගහ නුවර වාසි මොහු, බුදුන් වහන්සේගෙන්, පිරිනිවීම පිලිබඳ කරුණු විමසා ඇතිබව මේ සූත්‍රයේ දක්වා ඇත. **මූලාශ්‍රය:** සංයු.නි: (4): සළායතන සංයුත්ත: ගහපතිවග්ග: 1.13.5 සෝණසූත්‍රය, පි.258.

▲ **සොණා උපාසිකා-**Sona Upasika: මේ උපාසිකාව හා විසාකා මහා උපාසිකා ඇතුළු උපාසිකාවන් උපෝසථ අටසිලයේ පිහිටි අය බව මෙහි පෙන්වා ඇත**. බලන්න:** අංගු.නි: (5): 8 නිපාත: සාමඤ්ඤවග්ග සූත්‍ර, පි.381.

▲**සෝණමාතා උපාසිකා-**Sonamatha Upasika: මේ උපාසිකාව හා විසාකා මහා උපාසිකා ඇතුළු උපාසිකාවන් උපෝසථ අටසීලයේ පිහිටි අය බව මෙහි පෙන්වා ඇත**.බලන්න:** අංගු.නි: (5): 8 නිපාත: සාමඤ්ඤවග්ග සූත්‍ර, පි.381.

**සප**

▲ **සුප්පියා උපාසිකා-Suppiya Upasika:** ගිලාන උපස්ථායිකාවන් අතරෙන් මෙතුමිය අග්‍රයයි බුදුන් වහන්සේ වදාළහ. එක්සමයක රෝගීවූ භික්ෂුවක් සුවපත් කිරීම පිණිස, තමාගේ කලවයෙන් මස් කපා පිළිගන්වා ඇත. **සටහන:** එම සිදුවීම මත, මිනිස්මස් අහාර ලෙසින් වැළඳීම තහනම් කිරීමේ විනය නිතිය පනවා ඇත. **බලන්න:** EAN:note:145. p.587. **මූලාශ්‍ර:** අංගු.නි: (1) 1 නිපාත: එතදග්ග පාළිය,පි. 84**,** EAN:1: Foremost, p. 44.

▼ මේ උපාසිකාව හා විසාකා මහා උපාසිකා ඇතුළු උපාසිකාවන් උපෝසථ අටසීලයේ පිහිටි අය බව මෙහි පෙන්වා ඇත**. මූලාශ්‍රය:** අංගු.නි: (5): 8 නිපාත: සාමඤ්ඤවග්ග සූත්‍ර, පි.381.

▲ **සුප්පවාසා කෝලිය දේවිය-** Suppavāsā Koliyan Devi: ඉතා ප්‍රනීතවූ අහාර පූජා කරණ දායිකාවන් අතරෙන් මෙතුමිය අග්‍ර යයි බුදුන් වහන්සේ වදාළහ. මෙතුමිය සීවලි රහතුන්ගේ මවය. පෙර කම්ම විපාකයක් නිසා ඇය දිගුකලක් ගැබ් දරා ගෙන සිට, බුදුන් වහන්සේගේ ආශිර්වාදයෙන් දරුවා බිහිකළාය. **බලන්න**: උප ග්‍රන්ථය1: සීවලී තෙර, EAN:note:144: p.587.

**මූලාශ්‍ර:** අංගු.නි: (1) 1 නිපාත: එතදග්ග පාළිය, පි. 84, EAN:1: XIV: Foremost, p. 44.

▼ **ප්‍රණීතවූ, සකසා දෙන** දන් දීමේ විපාක ලෙසින් දායකයා මෙලොව සතුටින් වාසය කරයි, සුගතියෙ යළි උපතක් ලබයි යයි බුදුන් වහන්සේ මෙතුමියට වදාළහ. **මූලාශ්‍රය:** අංගු.නි: (2) 4 නිපාත: 4.2.1.7 සුප්පාවසා සූත්‍රය, පි.142.

▼ **මේ උපාසිකාව** හා විසාකා මහා උපාසිකා ඇතුළු උපාසිකාවන් උපෝසථ අටසිලයේ පිහිටි අය බව මෙහි පෙන්වා ඇත**. බලන්න:** අංගු.නි: (5): 8 නිපාත: සාමඤ්ඤවග්ග සූත්‍ර, පි.381.

**සභ**

▲**සුභද්ද උපාසක-**Subadda Upasaka: ඤාතගමේ විසු මේ උපාසක, අනාගාමිව, සුද්ධාවාසයක ඕපපාතික උපත ලැබූ බව මෙහි දක්වා ඇත. **මූලාශ්‍රය**:සංයු.නි: (5-2) මහාවග්ග: සෝතාපත්තිසංයුත්ත:11.1.8 හා 11.1.9,11.1.10 ගිඤ්ජකාවස්ථ සූත්‍ර, පි.184.

**සම**

▲ **සාමාවතී බිසව-**Queen Samawathi: මෛත්‍රී විහරණය ඇති උපාසිකාවන් අතරින් මෙතුමිය අග්‍ර යයි බුදුන් වහන්සේ වදාළහ. දෙමාපියන් නොමැතිව අනාථබවට පත් මෙතුමිය, කොසඹෑ නුවර උදේන රජුගේ අග මෙහෙසිය වූවාය. කුජ්ජුත්තරාවගෙන් දහම් අසා ඇය හා පිරිස තිසරණ සරණ ගියෝය. රජුගේ වෙනත් මෙහෙසියක් වූ මාගන්දියා, බුදුන් වහන්සේ කෙරෙහි වෛර බැඳ සිටිනිසා, ඇයගේ ඥාතින්ගේ උපකාර ඇතිව සාමාවතී බිසව හා පිරිවර සිටි මාළිගාව ගිනිබත් කලාය. **බලන්න:** EAN:note: 142,p. 587, කුජ්ජුත්තරා උපාසිකාව, මාගන්දිය බ්‍රාහ්මණ. **මූලාශ්‍ර:** අංගු.නි: (1 ) 1 නිපාත: එතදග්ග පාළිය, පි. 84**,** EAN:Foremost, p. 44.

▼ **බුදුන් වහන්සේ** කොසඹෑනුවර සෝසිතආරාමයේ වැඩවසන සමයේ, සාමාවතී බිසව හා 500ක් පිරිවර ගින්නෙන් දැවී කලුරිය කලහ. සංඝයා ඒ බව බුදුන් වහන්සේට පවසා ඔවුන්ගේ යළි උපත ගැන විමසුහ. ඔවුන් අතුරෙහි සෝතාපන්න, සකදාගාමී, අනාගාමී උවැසියන් සිටිබවත්, එමනිසා ඔවුන්ගේ කලුරිය කිරීම නිෂ්ඵල නොවන බව බුදුන් වහන්සේ වදාළහ. **මූලාශ්‍රය:** ඛු.නි: උදානපාලිය: 7.10 උදේන සූත්‍රය, පි.316.

▼**සාමාවතී බිසව** හා විසාකා මහා උපාසිකා ඇතුළු උපාසිකාවන් උපෝසථ අටසීලයේ පිහිටි අය බව මෙහි පෙන්වා ඇත**. මූලාශ්‍රය:** අංගු.නි: (5): 8 නිපාත: සාමඤ්ඤවග්ග සූත්‍ර, පි.381.

▲ **සෝමා හා සකුලා රාජ කුමාරින් -**Princesses Soma & Sakula: බුදුන් වහන්සේ සරණ ගිය මෙතුමියන්, පසේනදී කෝසල රජුගේ නැගණියන්ය. (බුහුනියන්). **මූලාශ්‍රය:** ම.නි: (2): 2.4.10 කණ්ණකත්ථල සූත්‍රය, පි.578.

▲ **සෝමා උපාසිකා-**Soma Upasika

මේ උපාසිකාව හා විසාකා මහා උපාසිකා ඇතුළු උපාසිකාවන් උපෝසථ අටසිලයේ පිහිටි අය බව මෙහි පෙන්වා ඇත. **මූලාශ්‍රය:**අංගු.නි: (5): 8 නිපාත: සාමඤ්ඤවග්ග සූත්‍ර, පි.381.

▲ **සරකානි ශාක්‍ය-** Sarakani Sakyan: මෙතෙම බුදුන් වහන්සේ වැඩසිටි සමයේ කපිලවත්තු පුරයේ වාසය කළ, බුදුන් සරණගිය කෙනෙකි. සුරාපානයට ඇබ්බැහිවීම නිසා ගිලන්ව සිටියහ. ඔහු කලුරිය කලපසු, බුදුන් වහන්සේ එතුමා සෝතාපන්න යයි වදාළහ.ඒ කරුණ පිලිබඳ ශාක්‍යයන් අතර විවාදයක් විය. එයට හේතුව, සරකානි ශාක්‍ය, බොහෝ කලක් මත්පැන් ගත් නිසාය (පන්සිල් නොරැකි නිසා). ඒ පිළිබඳව බුදුන් වහන්සේ දක්වා ඇත්තේ සරකානි ශාක්‍ය දිගුකලක් ත්‍රිවිධ රත්නය කෙරෙහි අචල ප්‍රසාදය ඇතිව වාසය කළබවත්, ඔහු මැරෙන අවස්ථාවේ ත්‍රිවිධ ශික්ෂාව සම්පූර්ණ කරගගෙන සෝතාපන්නව සිටිබවය. **සටහන:** අටුවාවට අනුව ඔහු මරණ අවස්ථාවේදී මත්පැන් පානය අතහැර, ශිල, සමාධි හා ප්‍රඥා යන ත්‍රිවිධ ශික්ෂාව සම්පූර්ණ කරගෙන සිටියහ. **බලන්න**:ESN:note:347, p.2428. **මූලාශ්‍ර:**සෝතාපත්තිසංයුත්ත: සරකානි වග්ග:සරකානි සූත්‍ර 2, පි. 214.

▲ **සාරග්ග උපාසක-**Saragga Upaska: **මෙතුමා** කරුණු 6ක් සහිතව, නිවන සාක්ෂාත් කොට ඇතිබව බුදුන් වහන්සේ වදාළහ: 1-3) තිසරණය පිලිබඳ අවෙච්චාසහගත ප්‍රසාදය තිබීම, 4) ආරියශිලය තිබීම 5) ආරිය ඥානය තිබීම 6) ආරිය සේඛ ඵල විමුක්තිය. **සටහන්**: එම ගුණ ඇති අනිකුත් උපාසකයන් ගැන විස්තර මෙහි දක්වා ඇත. **මූලාශ්‍රය:** අංගු.නි: (4): 6 නිපාත: සාමඤ්ඤ වග්ග: 6.2.17 – සිට 36 දක්වා සූත්‍ර, පි.290.

▲ **සූර අම්බට්ඨ සිටුවරයා-** Sūra Ambaṭṭha Situ: බුදුන් වහන්සේ ගැන අවෙච්චා ප්‍රසාදය ඇති උපාසකයන් අතරින් මෙතුමා අග්‍රය. එක්සමයක, මාරයා බුදුන් වහන්සේගේ රූපය මවාගෙන මොහු අසලට පැමිණ අධර්මය පවසන අවස්ථාවේදී, එය දහම නොවන බව අවබෝධකර මාරයා හඳුනාගෙන ඇත. **බලන්න**: EAN: note: 136p. 587. **මූලාශ්‍ර:** අංගු.නි: (1) 1 නිපාත: එතදග්ග පාළිය, පි. 84**,** EAN:1: Foremost, p. 44.

▼ **මෙතුමා** කරුණු 6ක් සහිතව, නිවන සාක්ෂාත් කොට ඇතිබව බුදුන් වහන්සේ වදාළහ: 1-3) තිසරණය පිලිබඳ අවෙච්චාසහගත ප්‍රසාදය තිබීම, 4) ආරියශිලය තිබීම 5) ආරිය ඥානය තිබීම 6) ආරිය සේඛ ඵල විමුක්තිය. **සටහන්**: එම ගුණ ඇති අනිකුත් උපාසකයන් ගැන විස්තර මෙහි දක්වා ඇත. **මූලාශ්‍රය:** අංගු.නි: (4): 6 නිපාත: සාමඤ්ඤ වග්ග: 6.2.17 – සිට 36 දක්වා සූත්‍ර, පි.290.

**හ**

**හත**

▲**හත්ථක ආලවී රාජ කුමාර**- Prince Hatthaka of Āḷavī: සතර සංග්‍රහ වස්තුවලින් පිරිස ඇදගන්නා හා පවත්වා ගන්නා උපාසකයන් අතරෙන් හත්තක ආලවී රාජකුමාර අග්‍රය. මෙතුමා ආලවිරට රජුගේ පුතාය. බුදුන්වෙතින් දහම් අසා අනාගාමී බවට පත්වුහ, ගිහියන් අතර ආදර්ශමත් උපාසක ලෙසින්ද ප්‍රසිද්ධය. බුදුන් වහන්සේ වෙතින් පැසසුම් ලැබූ මෙතුමා මෙලොව හැර ගොස් දෙව් උපතක් ලබා බුදුන් නැමදීමට

දෙව්ලොව සිට පැමිණිඇත. **බලන්න:** EAN note 132, p.587. **මූලාශ්‍රය:** අංගු.නි: (1) 1 නිපාත: එතදග්ග පාළිය, පි. 84**,** EAN:1 Foremost, p. 44.

▼**මේ සූත්‍රයේදී** බුදුන් වහන්සේ මොහු සතු අසිරිමත් ගුණ 7 ක් දක්වා ඇත: ශ්‍රද්ධාව, ශීලසම්පන්නවීම, හිරි හා ඔතප් ඇතිබව, බහුශ්‍රැතවීම, ත්‍යාගශිලිබව, ප්‍රඥාව. **මූලාශ්‍රය:** අංගු.නි: (5): 8 නිපාත: ගහපතිවග්ග: 8.1.3.3 හත්ථක අලාවක සූත්‍රය, පි.136.

▼ **මේ සූත්‍රයේදී** මෙතුමා සතර සංග්‍රහ වස්තුවෙන්, මහා පිරිසක්හට සංග්‍රහ කරන බව පෙන්වා ඇත. බුදුන් වහන්සේ ඔහුට අසිරිමත් ගුණ 8ක් ඇතිබව වදාළහ. ඉහත දක්වා ඇති කරුණු 7 හා අල්ප ආශාඇතිබව-අපිස්ගුණය 8 වැන්නය. **මූලාශ්‍රය:** අංගු.නි: (5): 8 නිපාත: ගහපතිවග්ග: 8.1.3.4 හත්ථ අලාවක සූත්‍රය, පි.138.

▼ **ආරිය උතුමෝ** සුව නින්ද ලබන බව විස්තර කරන මේ සූත්‍රය දේශනා කර ඇත්තේ මෙතුමාටය. **මූලාශ්‍ර:** අංගු.නි: (1): 3 නිපාත: දේවදූතවග්ග: 3.1.4.5 සූත්‍රය, පි. 290, EAN:3: Divine Messengers: 35.5 Hatthaka, p.91.

▼ **මෙතුමා** කරුණු 6ක් සහිතව, නිවන සාක්ෂාත් කොට ඇතිබව බුදුන් වහන්සේ වදාළහ: 1-3) තිසරණය පිලිබඳ අවෙච්චාසහගත ප්‍රසාදය තිබීම, 4) ආරියශිලය තිබීම 5) ආරිය ඥානය තිබීම 6) ආරිය සේඛ ඵල විමුක්තිය. **සටහන්:** එම ගුණ ඇති අනිකුත් උපාසකයන් ගැන විස්තර මෙහි දක්වා ඇත. **මූලාශ්‍රය:** අංගු.නි: (4): 6 නිපාත: සාමඤ්ඤ වග්ග: 6.2.17 – සිට 36 දක්වා සූත්‍ර, පි.290.

▲ **හත්ථාරෝහ ගාමිණී** -Hatthāroha the Elephant Warrior: හස්තිහමුදාවේ නායකයෙක්වූ මොහු, බුදුන් වදාළ දහම අසා පැහැදී බුදුන් සරණ ගිය බව මෙහි දක්වා ඇත. **මූලාශ්‍රය:** සංයු.නි: (4) සළායතනවග්ග:ගාමිණිසංයුත්ත:8.1.4 හත්ථාරෝහගාමිණි සූත්‍රය, පි.590.

**හල**

▲**හාලිද්දකානි ගෘහපති-**Hāliddakāni the householder: අවන්ති දනව්වේ ගිහි උපාසකයෙක් වූ මොහු, මහාකච්චායන තෙරුන්ගෙන් ධාතු නානාත්වය ගැන විමසීම පිළිබඳව මේ සූත්‍රයේ පෙන්වා ඇත. **මූලාශ්‍රය**: සංයු.නි: (4): සළායතනසංයුත්ත: ගහපතිවග්ග: 1.13.7 හාලිද්දකානි සූත්‍රය, පි.262.

▼ **බුදුන් වහන්සේ,** වදාළ මාගන්දිය සූත්‍රය පිලිබඳව පැහැදිලි කරගැනීම පිණිස මේ ගහපති, මහාකච්චායන තෙරුන් හමුවීම මෙහි විස්තර කර ඇත. **බලන්න**: මහාකච්චායන තෙර. **මූලාශ්‍රය:** සංයු.නි: (3): නකුලපිතුවග්ග: 1.1.1.3 හලිද්දාකාණි සූත්‍රය,පි.42.

**ಬಬಬ**

## උපග්‍රන්ථය: 4: බුදුන්වහන්සේ වැඩසිටි සමයේ බුදුසසුන අත්හල සංඝයා - The Sangha who disrobed during the dispensation of The Buddha (ත්‍රිපිටකයට අනුව)

අ

▲**අරිට්ඨ භික්ෂුව-** Bhikkhu Ariṭṭha: ධර්මයට පටහැනි දිට්ඨියක් ඇතිවසිටි මොහු, බුදුන් වහන්සේ වදාළ අවවාද අනුසාසනා පිළිනොගත්හ. පසුව සසුන අත්හළේය. මොහු ලාමක දිට්ඨිය අත් නොහළ හෙයින් ඔහුට උකෙක්ඛපනීයකම්මය (විනයකම්ම) පනවනලදී. **බලන්න**: වින.පි:චූලවග්ගපාලිය1: 7 පව්වුදිට්ඨි නො දුරුලීමේ උකෙක්ඛපනීයකම්ය, පි.146. **මූලාශ්‍ර:**ම.නි: (1): 1.3.2 අලගද්දූපම සූත්‍රය, **පි.**344, EMN:22 The Simile of the Snake,p.214.

▲**අස්සජි භික්ෂුව (කිටාගිරිය)** – Bhikkhu Assaji (Kitagiri): බුදුන් වහන්සේ කසීරට කිටාගිරියේ වැඩවසන සමයේ සංඝයාට රාත්‍රී භෝජනය හැරදමා නිරෝග සුවයෙන් වාසය කරනලෙසින් අවවාද අනුසාසනා වදාළහ. කිටාගිරි ආවසයේ වාසය කළ මේ භික්ෂුව හා පුන්බ්බසුක භික්ෂුව එම අවවාදය පිළිගැනීමට අකමැතිවූ බව මෙහි පෙන්වා ඇත. පසුව ඔවුන් දෙනම උප පැවිදිවුහ. **මූලාශ්‍රය:** ම.නි:(2) 2.2.10 කිටාගිරි සූත්‍රය, පි. 252.

ථ

▲ **ථුල්ල නන්දා මෙහෙණ**-Meheni Thulla Nanda: බුදුන් වහන්සේගේ පරිනිබ්බානයෙන් පසුව, ආනන්ද තෙරුන්, දක්කිනගිරියේ 30 ක් පම නවක මහණුන් හා චාරිකාවේ යෙදීසිටියහ. සිල්පද රැකීමට අපහසුවූ නවක මහණුන් ගිහිබවට පත්වුහ. චාරිකාව අවසන් කර වේළුවනාරාමයට පැමිණි තෙරුන්ට මහා කාශ්‍යප තෙරුන් අවවාද වදාළහ. ළදරු වෙක්මෙන්, බාලයන් සමග හැසිරීමේ අනතුරු බව මහා තෙරුන් පවසා ඇත. එබව ඇසූ මේ මෙහෙණිය මහා තෙරුන්ට අපවාද කරඇත:

"..පෙර අන්‍යඅගම්කවූ මහා කස්සප තෙරුන්, වෙදෙහිමුණිවූ, ආනන්ද තෙරුන්ට කුමාර වාදයෙන් කථාකිරීම නුදුදුසුය". එලෙස මහා තෙරුන්ට අපවාද කළ ඇයට සිව්රු දරා ගැනීමට නොහැකිව සසුනෙන් බැහැර වූ බව මෙහි දක්වා ඇත. **මූලාශ්‍රය:** සංයු.නි: (2) කස්සපසංයුත්ත: 4.1.11 චීවර සූත්‍රය, පි.352.

▲ **ථුල්ලතිස්සා මෙහෙණ-**Meheni Thulla Tissa: එක් සමයක, මහා කාශ්‍යප තෙරුන් හා ආනන්ද තෙරුන් භික්ෂුණියන්ට අවවාද අනුසාසනා කිරීම පිණිස සැවැත්නුවර අසබඩ ආරාමයකට වැඩියහ. එහිදී මහා කාශ්‍යප තෙරුන් දහම් දේශනා කරනු දැක ඒ ගැන අකමැතිවූ මේ මෙහෙණිය මෙසේ පවසා ඇත:

"මහා කාශ්‍යප තෙරුන්, වෙදෙහි පුත්‍ර ආනන්ද තෙරුන් සිටින අවස්ථවේ ධර්-මය දේශනා කිරීම, හරියට ඉදිකටු විකුණන වෙළෙන්දා, ඉදිකටු හදන කෙනාට, ඉදිකටු විකිණීමට තැත් කිරීම වැනි දෙයකි"

එලෙස මහා තෙරුන්ට අපවාද කළ ඇයට සිව්රු දරා ගැනීමට නොහැකිව සසුනෙන් බැහැර වූ බව මෙහි දක්වා ඇත. **බලන්න**: ESN: Kassapa

samyutta:Note 292, p.979. **මූලාශ්‍ර:** සංයු.නි: (2) කස්සපසංයුත්ත: 4.1.10 භික්ඛුණි උපස්සය සූත්‍රය, පි.348, ESN: Kassapasamyutta:10 The Bhikkhuni Quarters, p.819.

**ද**

▲**දේවදත්ත භික්ෂුව-** Bhikkhu Devadathta: බුදුන් වහන්සේගේ ඥාතියෙකි, ගිහිකල කපිලවස්තු නුවර, ශාක්‍යකුමාරයෙක්ව, ආනන්ද, අනුරුද්ධ ආදී ඥාතීන් සමග බුදු සසුනේ පැවිදිවිය. පසුකල ලාභසත්කාර ආදියෙන් මත්වීම නිසා බුද්ධත්වය ලබාගැනීම පිණිස අජාසත් කුමරු හා බොහෝ අකුසල ක්‍රියා සිදු කරනලදී. පසුව සංඝභේදය කොට, බුද්ධසසුන හැර දැමිය. දේවදත්ත භික්ෂුව විසින් කරන ලද අකුසල ක්‍රියා නිසා ඔහුගේ ආධ්‍යාත්මික ජීවිතයේ පරිහානිය පිළිබඳව, ම.නි: මහාසරෝපම සූත්‍රයේ පෙන්වා ඇත.

▼**දේවදත්ත භික්ෂුව,** සංඝභේදය කොට, බුදු සසුනෙන් නික්මීගිය පසු, ඔහුට විදීමට සිදුවන අයහපත් විපාක පිළිබඳව බුදුන් වහන්සේ මේ සූත්‍රයේ දී පෙන්වා ඇත. **මූලාශ්‍ර:** අංගු.නි: ( 5):8 නිපාත: 8.1.1.7 දේවදත්ත විපත්ති සූත්‍රය, පි.42.EAN:8: 7.7. Devadatta's falling, p. 413.

▼**දෙව්දත් භික්ෂුව**, ආත්මවිපත්ති 8 ඇතිව වාසය කර ඇත. **බලන්න**: ආත්මවිපත්ති.

▼**ලාභ සත්කාර** සම්මාන ආදියෙන් සිත යටපත්වීම නිසා දෙව්දත්, සංඝ භේදය කළබව. ඔහු ගේ කුසල මූල සහමුලින්ම සිඳී ගිය බව, සෝභනධර්-ම බිඳී ගිය බව, ඔහුගේම විනාශය ඇතිකරගත් බව මේ සූත්‍රයන්හි දක්වා ඇත. **සටහන**: දෙව්දත් තම විනාශය ලභා කරගත්තේ කෙසෙල් ගස්, උණබට ගස් තමාගේම ඵලය නිසා විනාශ වන ලෙසිනි. **උපමාව:** කෙසල් හා උණබට ගස්. **මූලශ්‍ර**:සංයු.නි: (2) නිදානවග්ග:ලාභසත්කාරසංයුත්ත: 5.4.1 සංඝභේද සූත්‍රය, 5.4.2 කුසලමූල සූත්‍රය, 5.4.3 කුසලධම්මසමුච්චේද සූත්‍රය, 5.4.4. සුක්ඛධම්මසමුච්චේද සූත්‍රය,5.4.5 අත්තවධ සූත්‍රය.

▼**අජාසත් කුමාරයා,** දෙව්දත් භික්ෂුවට උදය, සවස රිය 500 බැගින් දානය පිරිනැමීම ගැන මේ සූත්‍රයේ දක්වා ඇත. **මූලාශ්‍ර**: සංයු.නි: (2) නිදානවග්ග:ලාභසත්කාරසංයුත්ත:5.4.6 පංචරථසත සූත්‍රය, පි.390.

**ප**

▲ **පුන්බ්බසුක භික්ෂුව-(කිටාගිරිය) -**Bhikkhu Punabasukha (Kitagiri)**බලන්න**: අස්සජි භික්ෂුව (කිටාගිරිය).

**ම**

▲ **මෝලියඵග්ගුන භික්ෂුව-**Bhikkhu Moliyaphagguna: බුදුන් වහසේගේ ශ්‍රාවකව සිට, උන්වහන්සේගේ අනුසාසනා පිළිගැනීමට අකමැතිව පැවිදිබව අත්හළහ. **සටහන:** අටුවාවට අනුව: මෝලිය ලෙසින් හඳුන්වා ඇත්තේ ගිහිකල, කෙස්වැටිය හිස මුදුනේ (topknot) ගැටගසා ගෙන තිබීම නිසාය.**බලන්න:** ESN: note: 21, p.938.

▼ **මොහු පිලිබඳ විස්තර සඳහන් සූත්‍ර**: * සංයු.නි: අභිසමයසංයුත්ත :ආහාරවග්ග: 1.2.3 මෝලියඵග්ගුන සූත්‍රය. ** ම.නි: කකචූපම සූත්‍රය: භික්ඛුණී සංඝයා හා කිට්ටු සම්බධයක් පවත්වා ගෙන ඇතිනිසා බුදුන් වහන්සේ මොහුට අවවාද කිරීම ගැන මෙහිදී පෙන්වා ඇත. ** සංයු.නි: අභිසමයසංයුත්ත:කළාරවග්ග: 1.4.2 කළාර සූත්‍රයේදී මොහු සසුන අතහැර ගිහිබවට පත්වූ බව සඳහන් කර ඇත.

**ස**

▲ **සුනක්ඛත්ත ලිච්චවී -** Sunakkhatta the Licchavi: ගිහිකල විසාලාවේ ලිච්චවී කුමාරයෙක්වූ මොහු , බුදුන් වහන්සේගේ පැවිදි උපස්ථායකයෙක් වුහ. පසුකල, බුදුන් වහන්සේ ඉද්දී ප්‍රාතිහාර්ය නොදක්වන්නේ යයි අසතුටුව ගිහි බවට පත්විය**. සටහන:** දීඝ.නි: මහලි සූත්‍රයේ හා පාථික සූත්‍රයේ සුනක්ඛත්ත ලිච්චවී පිලිබඳ විස්තර සඳහන්වේ.

**ᨀᨀᨀ**

## උපග්‍රන්ථය:5-උපමා- Similes

**දහම් කරුණු පැහැදිලි කිරීමට යොදාගත් උපමා මෙහි දක්වා ඇත( සූත්‍ර පිටකයට අනුව)**

**අ**

**අක**

▲ **අකුසලයෙහි යෙදීමේ දුක් විපාක හා කුසලයේ යෙදීමේ සැප විපාක පිළිබඳ උපමා-** Similes regarding bad results from unwholesome actions & good results from wholesome actions: **මූලාශ්‍රය**:ම.නි: (1), මහා ධම්ම සමාදාන සූත්‍රය.

**1) වස සහිත තිත්ත පානය උපමාව-**Simile of a bitter tasted poisonous drink : කෙනක් වස සහිත තිත්ත පානයක් පානය කරන්නේ නම් ඔහුට, එම පානයේ තිත්ත රසය නිසා එ අවස්ථාවේ දුක ඇතිවේ, වස, නිසා පසුව මරණීය වේදනා හෝ මරණය ඇතිවේ. මෙහිදී පෙන්වා ඇත්තේ, අකුසල් කිරීමෙන් ,මෙකල දුක් විපාක ඇතිවනබව හා මතු කල (පරලොව) දුක් විපාක ඇතිවන බවය.

**2) වස සහිත මිහිරි පානය උපමාව-**Simile of a sweet tasted poisonous drink : කෙනක් වස සහිත මිහිරි පානයක් පානය කරන්නේ නම් ඔහුට, එම පානයේ මිහිරි රසය නිසා එ අවස්ථාවේ සැප ඇතිවේ, එහෙත් වස නිසා පසුව මරණීය වේදනා හෝ මරණය ඇතිවේ. මෙහිදී පෙන්වා ඇත්තේ, අකුසල් කිරීමෙන් ඔහු සතුටුවන බවය. එහත්,මරණින් මතු දුගතියක දුක් විදීමට සිදුවන බවය.

**3) අමිහිරි බෙහෙත් පානය උපමාව-**Simile of the bitter tasted medicinal drink: පාණ්ඩු රෝගය ඇති කෙනෙක් සිටි, අරළු ආදී තිත්ත බෙහෙත් පානය කරයි නම් ඔහු සුවපත්වේ යයි කෙනෙක් කියයි. එම පානය ගන්නාවිට අමිහිරි වුවද, බෙහෙත් ගුණයෙන් ඔහු සුවයට පත්වේ. මෙහිදී පෙන්වා ඇත්තේ අකුසලයේ නොයෙදීම නිසා එ අවස්ථාවේ දුක්වේදනා ඇතිවිය හැකිබවය, එහෙත්, කුසලයේ යෙදීම නිසා පරලොව සැප ලැබේ.

**4) මිහිරි බෙහෙත් පානය උපමාව-** Simile of the sweet tasted medicinal drink: රක්තඅතිසාර රෝගය ඇති කෙනෙක් සිටි, ගිතෙල් මීපැණි ආදී මිහිරි බෙහෙත පානය කරයි නම් ඔහු සුවපත්වේ යයි කෙනෙක් කියයි. එම පානය ගන්නාවිට ද මිහිරි වේ, බෙහෙත් ගුණයෙන් ඔහු සුවයට පත්වේ. මෙහිදී පෙන්වා ඇත්තේ කුසලයේ යෙදීම නිසා මෙලොව හා පරලොව සැප ලැබෙන බවය.

▲**ආකාශය උපමාව-** Simile of the sky: ආකාශය මහා විශාල දෙයකි. යම් පුද්ගලයෙක්, වර්ණ ගෙන, අහසේ රූප ඇඳීමට උත්සහ කරයි, එහෙත් ආකාශයේ ඇති ස්වභාවය නිසා එසේ කිරීමට ඔහු අසමත්වෙ. එලෙස, මෙත්තා සහගත සිත අප්‍රමාණය, කිසිවකට සැලෙන්නේ නැත. අප්‍රමාණ මෙත්සිත පතුරුවා වාසය කරන කෙනෙකුගේ සිත, වෙනත් කෙනෙකුගේ අයහපත් වචනයෙන් සෙලවිය නොහැකි බව මෙහි

පෙන්වා ඇත. **මූලාශ්‍රය:**ම.නි: 1: ඔපම්මවග්ග: 1.3.1 කකචූපම සූත්‍රය, (ඡෙදය 19), පි.327.

**අජ**

▲ **අජානිය අශ්වයා උපමා**-Simile of the Thoroughbred horse

**1)** මැනවින් පුරුදු කල අජානිය අශ්වයා රාජ සේවය පිණිස උතුම්ය. එලෙසින්, දස දහම් මැනවින් පුහුණු කළ මහණ බුදුසසුනේ උතුම් බවට පත්වෙන බව මින් පෙන්වා ඇත. **මූලාශ්‍රය:**ම.නි: (2) 2.2.5 භද්‍රාලි සූත්‍රය, පි.190, EMN: Bhadrali Sutta.

**2)** අජානිය අශ්වයා වර්න, බල, ජව හා ආරෝහපරිණාහ යන සතර කරුණු නිසා රාජකීය වේ, එලස, ආහුනෙය්‍ය, පාහුනෙය්‍ය, දක්ඛිනෙය්‍ය, අංජලීකරණිය ආදී ගුණයන් ගෙන් සමන්විත මහණ අග්‍රය. **මූලාශ්‍ර:** අංගු.නි: ( 2) 4 නිපාත: 4.6.6. හා 4.7.7 අජානිය සූත්‍ර, පි. 502, EAN:4: 259.6 & 260.7 Thoroughbred, p. 232, අංගු.නි: (3) 5 නිපාත: 5.5.1.3 සූත්‍රය, පි. 422, EAN:5: 203.3 Thoroughbred, p. 304.

**අට**

▲ **ඇට ගොඩ උපමාව-** Simile of Heap of bones**:** වේපුල්ල පව්ව දඹදිව පිහිටි උස කන්දකි. දීර්ඝ සංසාරේ ඉපදී මැරී යළි ඉපදෙන සත්වයන්ගේ ඇට ගොඩ, වේපුල්ල පව්වට වඩා උස බව මෙහිදී පෙන්වා ඇත. **මූලාශ්‍ර:** ඛු.නි: ඉතිවුත්තක: 1.3.4 අට්ඨිපුඤ්ජ සූත්‍රය, පි.370, සංයු.නි:(2) නිදානවග්ග: අනමතග්ග සංයුත්ත: දුග්ගතවග්ග: 3.2.10 වෙපුල්ල පබ්බත සූත්‍රය, පි.314.

▲ **ඇට වලින් සැදුන නගරය උපමාව-** Simile of a city made of bones මේ කය-ශරීරය: ජරාව, මරණය, මානය ආදීවූ අයහපත් දෙයින් සැදී ඇතිබව පෙන්වීමට මේ උපමාව යොදාගෙන ඇත. **බලන්න:** අට්ඨීනං නගරං. **මූලාශ්‍රය:** ධම්ම පදය: ජරා වග්ගය: 150 ගාථාව, Dhamma Pada, Jaravagga, verse 150.

**අත**

▲ **අත් පා උපමාව**-The Simile of Hands and Feet**:** සළායතන විවිධ ලෙසින් ක්‍රියාකාරීවීම නිසා කම්ම සකස්වන අන්දම පෙන්වීමට මේ උපමාව යොදාගෙන ඇත. **බලන්න:**සළායතන **මූලාශ්‍ර**: සංයු.නි: (4) වේදනාසංයුත්ත: සමුද්දවග්ග: 1.18.9 හ 1.18.10 සූත්‍ර, පි.362, ESN: 35: Salayathnanasamyutta: 236.9 & 10 suttas, p.1313.

▲ **ඇතුන් දමනය කිරීමේ උපමාව**- Simile of taming Elephants: සංඝයා ක්‍රමානුකුලව පුහුණුව ලබාගන්නා අන්දම පෙන්වා දීමට මේ උපමාව යොදාගෙන ඇත. **මූලාශ්‍ර:** ම.නි: දන්තභූමි සූත්‍රය,EMN: Dhantabumi Sutta.

▲ **ඇතා හා අන්ධයන් පිලිබඳ උපමාව**-Simile of the Elephant & the Blind men: කෙනක්, අන්ධ මිනිසුන් කිහිප දෙනකුට ඇතෙක් ගෙ විවිධ අංග අතගා බලා ඇතා යනු කවුරුද? යයි විමසයි. ඒක් එක් අන්ධ මිනිසා තමන් ඇතාගේ අල්වා බැලූ අංග අනුව ඇතා මෙවැනි ස්වරූපයක් ඇතැයි

පවසයි. ඔවුන්හට සම්පූර්ණ ඇතා ගැන දැනුමක් නැත. එලෙස, විවිධ දිට්ඨි දරන අන්‍යආගමිකයන් හට යථා අවබෝධය නොමැති බව මෙහි දක්වා ඇත. **මූලාශ්‍ර:** ඛු.නි: උදානපාලි: නානාතිත්ථික සූත්‍ර 3කි**,**පි.286.

**▲ඇත් පිය සටහන උපමාව**- Simile of the Elephant footprint: ලෝකයේ සිටින සියලු සතුන්ගේ පිය සටහන්, ඇත් පියසටහනට ඇතුලත් කලහැකිය. එලෙස, සියලු කුසල් දහම් චතුරාර්යසත්‍යට ඇතුලත්වි ඇතිබව මෙහි පෙන්වා ඇත. **මූලාශ්‍ර:** ම.නි:(1):1.3.8 මහාහත්ථිපදෝපම සූත්‍රය, පි. 468, EMN:28: The Greater Discourse on the Simile of the Elephant's Footprint, p.264.

අධ

**▲ ආධ්‍යාත්මික ජීවිතය** ගෙන යන සංඝයාට ඇති මාර්ග බාධා - Obstacles for the Sangha in training

**දාරුක්ඛන්ධ උපමාව-**The simile of the great log**:** නදියක පාවියන මහා කඳක්, සාගරයට පැමිණීමට පෙර බාධා 8 කට හසුවේ. එලෙස, දහම් මග යන පුද්ගලයාටද, නිවන අවහිර කරන බාධා ඇත. 1. දරකඳ මෑත ඉවුරට (මෙතෙර) ගසාගෙන යන ලෙසින්, ඔහු සළායතන යන්ට හසුවේ. 2. දරකඳ ඈත ඉවුරට (පරතෙර) ගසාගෙන යන ලෙසින්, ඔහු බාහිර අරමුණු වලට හසුවේ.3. දරකඳ පාවෙන්නේ නැතිව නදිය යටට ගිලීයන ලෙසින් (මැදකිමිදීම) ඔහු බාහිර නන්දි රාගයට යටවේ 4. දර කන්ද ගොඩට ගැසීම යනු අස්මිමානයට යටවිමය. 5. දරකඳ මිනිසුන් ගැනීම යනු, පාවියනවිට මිනිසුන් එය ගොඩට ගන්නා ලෙසින් ඔහු ගිහියන් හා අනවශ්‍ය බැඳීම්වලට හසුවේ 6.නොමිනිසුන් ගැනීම යනු දරකඳ පාවි යනවිට නො මිනිසුන් වැනි අය ගැනීම, එනම් මහන, දේවලෝක උත්පත්ති පතමින් මග බඹසර කරයි 7. දරකඳ සුළියකට හසුවීමෙන් ගසාගෙන යැම නතර වන ලෙසින් ඔහු පස්කම් සැපයට යටවී යයි. 8.දරකඳ පාවි නොගොස් මග රැඳීම නිසා කඳේ ඇතුල කුණුවී යන ලෙසින්, කෙළෙස් වලට හසුවී මාර්ගය විනාශවේ. **මූලාශ්‍ර:** සංයු.නි: (4 ): සළායතනවග්ග:වේදනා සංයුත්ත: 1.19.4 දාරුක්ඛන්ධ උපමා සූත්‍රය, පි.1.376, ESN:33: Vedanasamyutta:IV Vipers:241.4 The simile of the great log, p.1317.

අන

**▲ අනාගාමී උතුමන් සුද්ධාවාසයක උපත ලබන ආකාර පෙන්වීමට යොදාගත් උපමා-**Similes about the way in which Anagami's reach pure abodes

**ගිනිපුපුර උපමාව:** Simile of fire sparks: මේ ගැන යොදාගෙන ඇත්තේ දවස මුළුලේ රත්වී ඇති යකඩගුලියක්, තළනවිට, ගිනිපුපුරක් මතුවී විවිධ ලෙසින් පැතිරී යන ආකාරයය. එලෙස, පස් ආකාරයකින් අනාගාමී උතුමන් සුද්ධාවසයක උපත ලබති. **මූලාශ්‍ර:**අංගු.නි: (4): 7 නිපාතය: 7.2.1.2. පුරිසගති සූත්‍රය, පි. 402, EAN: 7 : 55.2 Destinations of Persons, p. 387.

අප

▲ **අප්‍රමාදය නම් එක ධර්මය වඩා ගැනීමෙන් මෙලොව පරලොව සුවය ලැබෙන බව පෙන්වන උපමා-** Similes used to show that developing one Dhamma- heedless, that one is able to get welfare in this life and after life. **මූලාශ්‍රය**: අං.ගු.නි: (4): 6 නිපාත:ධම්මිකවග්ග: 6.1.5.11 අප්පමාද සූත්‍රය, පි.156.

**1.** සියලු සතුන්ගේ පාසටහන් එක් **ඇත්පා සටහනට** ඇතුල් කලහැකිය. එලෙස, අප්‍රමාදය නම් එක ධර්මය වඩාගැනීමෙන් මෙලොව පරලොව සුවය ලැබේ.

2. **කුටාගාර නිවසේ** සියලු පරාල, එහි මුදුන් වහලේ එක්තැන්වේ. එලෙස, අප්‍රමාදය නම් එක ධර්මය වඩාගැනීමෙන් මෙලොව පරලොව සුවය ලැබේ.

**3. බටකොළ කපන්නා**, බටමිටියක් කපාගෙන එය උඩින් අල්වාගෙන, පහළද, දෙපසද මැනවින් තළා ගන්නාලෙස, අප්‍රමාදය නම් එක ධර්මය වඩාගැනීමෙන් මෙලොව පරලොව සුවය ලැබේ.

**4. අඹ අත්තක්** කැපුවිට එහි ඇති ගෙඩි හැම ඒ අත්තේ එකතුව තිබේ. එලෙස අප්‍රමාදය නම් එක ධර්මය වඩාගැනීමෙන් මෙලොව පරලොව සුවය ලැබේ.

**5.** සියලු සුළු කුමාරවරු-පාලකයන්, **සක්විතිරජුගේ** පාලනයට නතුවී සිටින ලෙසින්,අප්‍රමාදය නම් එක ධර්මය වඩාගැනීමෙන් මෙලොව පරලොව සුවය ලැබේ.

**6.** සියලුම තරකා එලියට වඩා **සඳ එලිය** ආලෝකමත්ය, එලෙස අප්‍රමාදය නම් එක ධර්මය වඩාගැනීමෙන් මෙලොව පරලොව සුවය ලැබේ.

## උ

▲ **උඩුසුළගට විසිකරන දූවිලි උපමාව-** Simile of the dust thrown to upper wind: යම්කෙනක් සියුම් දූවිලි උඩුසුළඟට විසිකළවිට ඒ දූවිල්ල ඒ තැනැත්තා ගේ ඇඟටම වැටේ. එලෙස, නිර්දෝෂී, පිරිසිදු ජීවිතයක් ඇති, කෙළෙස් රහිත පුද්ගලයෙකුට කෙනෙක් ද්වේශ කරන්නේ නම් වැරදි කරන්නේ නම්, එමගින් අයහපත් කර්ම විපාක ඇතිවන බව මෙහි පෙන්වා ඇත. **මූලාශ්‍ර:** සංයු.නි: (1) සගාථවග්ග:දේවතාසංයුත්ත: 1.3.2 ඵුසති සූත්‍රය, පි. 50, ESN:1: Devatasamyutta: 22.2. It Touches, p. 84.

▲ **උල උපමා-** Simile of the spike

**1)** යම්කිසි උලක් වැරදි ලෙසින් තබා ඇත්නම් එමගින් අනතුරු සිදුවේ. එලෙස, මිථ්‍යාදිට්ඨිය ගැනීමෙන් බොහෝ අනතුරු ඇතිවෙනබව මෙහිදී පෙන්වා ඇත. **මූලාශ්‍ර:**සංයු.නි: ( 5-1): මහාවග්ග: මග්ගසංයුත්ත:1.1.9 සූක සූත්‍රය, පි.44, ESN: 45: Maggasamyutta: 9.9. The Spike, p. 1613.

**2)** උල මුවහත් නිසා එය ඇනුන විට බලවත් වේදනා ඇතිවේ, එනිසා සිතේ තරහක් ඇතිවේ. එලෙස, පුහුදුන් මිනිසාට කායික මානසික වේදනා ඇතිවීම උලකින් ඇනීම වැනිය. ඔහුට තරහ ඇතිවේ, බලවත් වේදනා

ඇතිවෙන බව මෙහි පෙන්වා ඇත. කායික වේදනා එක් උලක් ඇනීම වැනිය, මානසික වේදනා උල් දෙකක් ඇනීම වැනිය. **මූලාශ්‍ර:** සං.නි: (4 ): වේදනා සංයුත්ත:සගාථා වගග: 1.20.6 සල්ල සූත්‍රය, පි.420, ESN: 36: Vedanāsamyutta, 6.6 The dart, p. 1336.

**එ**

▲ **එළකිරි උපමාව-** Simile of the cow's milk

එළකිරි වලට වඩා ඉන් සකස් කරන දීකිරි අග්‍රය, දිකිරිවලට වඩා, ගිතෙල්...වෙඬරු ආදිය අග්‍රවෙ. එලෙස සමාධිසමාපත්තිය ලබා ගැනීමේ දක්ෂතම පුද්ගලයා අග්‍ර යයි පෙන්වීම පිණිස මේ උපමාව යොදාගෙන ඇත. **මූලාශ්‍ර**: සංයු.නි: (3): ඛන්ධකවග්ග: ජානසංයුත්ත:13.1.1. සමාපත්ති කුසල සූත්‍රය, පි.566, ESN: 34 Jhānasaṃyutta: 1 Attainment in relation to Concentration, p.1163.

**ක**

**කක**

▲ **කකචූපම උපමාව-** Simile of the doubled edge knife: මෙහිදී පෙන්වා ඇත්තේ දෙපැත් කැපෙන පිහියකින් තමන්ගේ දෙපා කපන විට ද තරහ නොගෙන සිටිම බුද්ධ අනුසාසනය පිළිගැනීම බවය. **බලන්න:** කකචූපම,ම.නි:කකචූපම සූත්‍රය.

**කට**

▲ **කටු වනය උපමාව-**Simile of the thorn bush: කයේ බොහෝ තුවාල ඇති මිනිසක් කටුවනයකට පිවිසේ. ඒ වනයේ ඇති විවිධ කටු සහිත ගස් ඔහුගේ තුවාල වලට ඇනිම නිසා ඔහුට බොහෝ දුක් වේදනා ඇතිවේ. එලෙසින්, අසංවර මහණ ගමකට ගිය විට ඔහු නිසා ගමේ වැසියන්ට අයහපත සිදුවන බව මෙහි දී පෙන්වා ඇත. **මූලාශ්‍ර:** සංයු.නි: (4): සළායතනවග්ග:වේදනාසංයුත්ත: අසිවිසවග්ග:1.19.10 ඡප්පානක සූත්‍රය, පි.404.

▲**කැටකිරිල්ල හා ගිජු ලිහිණියා පිලිබඳ උපමාව-**Simile of the Quail & the Eagle: කැටකිරිල්ල ගේ වාසස්ථානය මඩ ගොඩක්ය. ඌ එ ස්ථානයෙන් පිටවී ගියහොත් ගිජු ලිහිණියාට ගොදුරු කර ගැනීමට පහසුවේ. එලෙස, සතර සතිපට්ඨානය හැර පස්කම් සැපයේ යෙදෙනවිට, පහසුවෙන්ම මාරයාට හසුවෙන බව මෙහිදී පෙන්වා ඇත. **බලන්න:** ගෝචර භූමිය. **මූලාශ්‍රය**:සංයු.නි: (5-1): මහාවග්ග: සතිපට්ඨානසංයුත්ත :අම්බපාලි වග්ග: සකුනග්ඝී සූත්‍රය, පි.296.

**කඳ**

▲ **කඳු මුදුනට වසින වැස්ස උපමා -**Simile of the rain falling down to a mountain

කඳුමුදුනට වැස්ස වසිනවිට, ජලය බෑවුම ඔස්සේ ගලා ගොස් ක්‍රමයෙන් මහා සාගරයට එක්වේ. එලෙස, විද්‍යාවිමුක්තිය පෝෂණයවීම, ක්‍රමානුකූලව සිදුවන ආකාරයද, එසේම, අවිජ්ජාව පෝෂණය වන

අන්දමද මෙහි විස්තර කර ඇත.**බලන්න:** විද්‍යාවිමුක්ති ඥානදර්ශනය, අවිද්‍යාව. **මූලාශ්‍ර:**අංගු.නි: (6 ): 10 නිපාත: යමක වග්ග: 10.2.2.1 අවිද්‍යා සූත්‍රය, පි.232, EAN:10: II Pairs: 61.1.Ignorance, p. 517.

**කණ**

▲ **කණ කැස්බෑවා උපමාව-** Simile of the blind Turtle

මෙහිදී පෙන්වා ඇත්තේ එක් ඇසක් ඇති කැස්බෑවෙක් ගැනය.එක් ඇසක් ඇති කැස්බෑවා, අවුරුදු 100 කට වරක් මුහුද පතුලේ සිට ගොඩට එයි, එම අවස්ථාවේදී එක් සිදුරක් ඇති වියදණ්ඩක් මුහුදේ පාවී එයි. ඒ කැස්බෑවාට, වියදන්ඩේ ඇති එක් සිදුර, පෙනෙන ඇසින් බලා, උගේ ගෙල එ තුලට දමා ගැනීමට හැකිනම් එය දුර්ලභ දෙයකි. එලෙස, මිනිසත් බව ලබාගැනීම දුර්ලභ දෙයක් බව මෙහි පෙන්වා ඇත. **මූලාශ්‍ර**: ම.නි :(3) : 3.3.9 බාල පණ්ඩිත සූත්‍රය, පි. 376, EMN: 129: Fool & Wise Men, p. 929, සංයු.නි: (5-2 කාණ්ඩය): මහාවග්ග: සච්චසංයුත්ත: 12.5.7 හා 12.5.8 ඡිග්ගල සූත්‍රය, පි. 341, ESN: 56: Sacchasamyutta: 47.7 Yoke with a Hole, p. 2318.

**කප**

▲ **කපුටා උපමාව-**Simile of the Crow**:** කපුටන්ට අවගුණ 10 ක් ඇතිනිසා උන් වැදහත් යයි සලකන්නේ නැත. එලෙස අවගුණ 10ක් ඇති ලාමක සංඝයාද සසුනට වැදගත් නොවේ. **මූලාශ්‍ර**: අංගු.නි: (6 ) 10 නිපාත, ආකඩ්ඛ වග්ග, 10.2.3.7. කාකසූත්‍රය,පි.292, EAN:10: III-77.7. The Crow, p. 525.

**කම**

▲**කම්ම හා භවය පිලිබඳ උපමාව-**Simile of Existence & kamma
කෙනක් කරන කම්ම හා භවය සකස්වීම අතර ඇති සම්බන්ධය කෙතක වැපුරු බීජ වැනිය. එම උපමාව මෙසේ දක්වා ඇත:

“ කර්මය නම් කෙතය (පොළවය), විඥාණය බීජය (ඇටය) වේ, තණ්හාව එම බීජය පෝෂණය කරන ජලය (උදක) වේ. අවිද්‍යාවෙන් වැසුන, තණ්හාවෙන් බැඳුන, සත්ත්‍වයන්ගේ විඥානය,කාම ලෝකයේ (කාම ධාතුවේ) පිහිටයි. එලෙස සත්ත්‍වයන්ගේ පුනර්භවය ඇති කරණ භවය සකස්වේ”. **මූලාශ්‍ර:**අංගු.නි:(1):3 නිපාත:3.2.3.6 සූත්‍රය,පි.432,EAN:3:76.6 Existence, p.119.

**කර**

▲ **කර්ම විපාක යහපත් වීම නිසා ඇතිවෙන හොඳ ප්‍රතිඵල පෙන්වීමට යොදාගෙන ඇති උපමා-** Similes used to show the good effects on good deeds

**සූදුකාරයා උපමාව-** Simile of the gambler: කිසියම් සූදුකාරයෙක් ඔහුගේ පළමු ක්‍රීඩාවෙන් මහා සම්පත් ජයගෙන සතුටුව සැප විඳී. ඔහු ලබන එම සැපයට වඩා පණ්ඩිතයා, තුන්දොරින් යහපත් කර්ම සිදුකර දෙව් මිනිස් සැප ලබා ගන්ණා සතුට අප්‍රමාණබව මෙහි දක්වා ඇත. සූදුකාරයාගේ සතුට කුඩා ගල් කැටයක් වැනිය, එහෙත් පණ්ඩිතයා ලබන

සතුට හිමාල පව්ව වැනිය. **මූලාශ්‍ර**: ම.නි:(3): 3.3.9 බාල පණ්ඩිත සූත්‍රය, පි. 376, EMN: 129: Fool & Wise Men, p. 929, අංගු.නි: (1): 3 නිපාත, බාල වග්ග සූත්‍ර, පි.234, EAN: 3: The Fool, p. 80.

**▲ කර්ම විපාක කෙනෙක් පසුපස එන අන්දම පෙන්වන උපමා-** Similes used to show that Kamma follows the person

කරත්තයක් ඇදගෙන යන ගොනාගේ කුර පිටිපස කරත්ත රෝදය නිරතුරුවම පැමිණේ, රෝදය තමාගේ පය පිටිපස එනබව දන්නාවිට එය අපහසුවකි. අයහපත් කම්ම විපාක, එලෙසින් පුද්ගලයා පිටිපසින් එයි. සෑම සතකුගේ සෙවනැල්ල ඔවුන් පසුපසින් සිටි, එය කෙනකුට කරදරයක් නොවේ. එලෙස, යහපත් කම්ම, සෙවනැල්ල ලෙසින් මිනිසා පසුපසින් එයි. **මූලාශ්‍රය**: ධම්මපදය:යමකවග්ග.

**කල**

**▲ කල්පයක් යනු දීර්ඝ කාල පරිච්ඡේදයක් බව පෙන්වන උපමා-**Similes used to show the great length of a Kalpa: **මූලාශ්‍ර:**සංයු.නි: (2 ): නිදානවග්ග: අනමතග්ගසංයුත්ත:3.1.5 පබ්බත සූත්‍රය, පි.301, ESN:15: Anamataggasamyutta:5.5 The Mountain, p. 301.

**1) යොදුනක් දිග,** පළල හා උස ඇති මහා ගල් පව්වක්, සිනිදු සළුවකින් සෑම වසරකට එක්වරක් මැදීමෙන් ගෙවීඅවසන්විය හැකිය. එහෙත්, කල්පයක් ගෙවී යාමට දීර්ඝ කාලයක් ගතවේ.

**2)** යොදුනක් උස, දිග හා පළල ඇති , යකඩ පවුරකින් වටවුන නුවරක් ඇත. එහි, අබ ඇට පුරවා ඇත. සෑම වසර 100ක් ගිය විට, පුද්ගලයෙක් පැමිණ ඒ නුවරින් අබ ඇටයක් ගනී, එසේ සෑම සියවසක් ඇවෑමෙන් ඒ මහා අබඇට ගොඩ අවසන්වේ, එහෙත්, කල්පය අවසන් නොවෙන්නේය.

**කළ**

**▲ කොළ අතු ඇති හා කොළ අතු නැති ගස උපමා-** Simile of the Tree with branches and leaves & the Tree without branches and leaves: **මූලාශ්‍ර**:අංගු.නි: (3 ):5 නිපාත: 5.1.3.4 දුස්සීල සූත්‍රය, පි. 52, EAN:5: 24.4 Immoral,p. 243.

**1) අතු කොළ ඇති ගසක** පොත්ත, හරය මනාව වැඩේ. එලෙස සුසිල්වතා ශිලසම්පන්න වීම නිසා සමාධිය ලබාගනී. එනිසා යථාභූතඥානදර්ශනය ඇතිවේ, එමගින් නිබ්ද්දාව හා විරාගය ඇතිවේ. නිබ්ද්දාව හා විරාගය ඇතිතිවිට විමුක්තිඥානදර්ශනය ඇතිවේ.

**2) අතු කොළ නැති ගසක** පොත්ත, හරය මනාව නොවැඩේ. එලෙස දුසිල්වතා, ශිලසම්පන්න නොවීම වීම නිසා සමාධිය .... විමුක්තිඥානදර්ශනය ඇතිකරගැනීමට ඔහුට හැකියාව නැත.

**සටහන**: එම උපමාවම මෙ සූත්‍රයේද පෙන්වා ඇත. **බලන්න:** අංගු.නි: (4): 6 නිපාත:ධම්මිකවග්ග: 6.1.5.8 ඉන්ද්‍රියසංවර සූත්‍රය, පි.150.

**▲ කළදරනුව උපමාව-**Simile of the Potholder

කළයක් මනාව තබා ගැනීමට දරනුව උපකාරීවේ. එලෙස, ආරිය අටමග වැඩීම සිතට ආධාරයක් බව මෙහි පෙන්වා ඇත. **මූලාශ්‍ර**: සංයු.නි: (5-1):මහාවග්ග: මග්ගසංයුත්ත: 1.3.7 කුම්භ සූත්‍රය, පි. 62, ESN: 45: Maggasamyutta:27.7.The Pot, p. 1633.

▲ **කළාමැදිරියා උපමාව-** Simile of the Glowworm: හිරු උදාවන තෙක් කළාමැදිරියා ගෙ එළිය බබලයි. එලෙස, තථාගතයන් පහළ වෙනතෙක් අන්‍ය ආගමික දහම බබලයි.එහෙත්, තථාගතයන් පහළවූ විට බුදුසසුන, හිරු එළිය මෙන් ලෝකයේ බබලයි. **මූලාශ්‍ර:** ඛු.නි: උදාන පාලිය: 6.10 තථාගත උත්පාද සූත්‍රය, පි. 304.

**කස**

▲ **කොස්වාලිහිණියා උපමාව-** Simile of Koswalihiniya: කොස්වාලිහිණියා (හංසයෙක් බඳු පක්ෂියෙක්), දියමුසු කිරි ලැබුන විට, දිය හැර කිරිපමණක් පානය කරයි. එලෙස, නුවණැති ආරියන් ලාමක දේ බැහැර කිරීමට සමත්වන අන්දම මෙහිදී පෙන්වා ඇත. **මූලාශ්‍ර**: ඛු.නි: උදානපාලිය: 8.7 ද්විධාපථ සූත්‍රය, පි. 338.

**ග**

**ගග**

▲ **ගංගානම් නදිය උපමා**-Simile of Ganges River

**1)** ගංගානම් ගඟ ගලන්නේ නැගෙනහිරට බරවය. එලෙස, ආරියඅටමග වඩන පුද්ගලයා නිවන දෙසට බරවී සිටින බව මෙහිදී පෙන්වා ඇත. **මූලාශ්‍රය:**සංයු.නි: (5-1) මහාවග්ග:මග්ගසංයුත්ත: පාචීනනින්න සූත්‍ර, පි.102.

**2)** ගංගානම් ගඟ  නැගෙනහිරට බරවය. එලෙස, පංචබල වඩන පුද්ගලයා නිවන දෙසට බරවී සිටින බව මෙහිදී පෙන්වා ඇත. **මූලාශ්‍ර:** සංයු.නි: ( 5-1 ): මහාවග්ග: බලසංයුත්ත: පචිනනින්නාදී සූත්‍රය, පි. 462, ESN: 50: Balasamyutta: The river Ganges,  p. 2038.

**3) ගංගානම් නදියේ** ජල ප්‍රමානය විශාලය.  ගිනිසූලක් රැගෙන එන පුද්ගලයක්, ගංගා නදියේ ජලය උණුකිරීමට තැත් කරයි, එහෙත්, නදියේ මහා බව නිසා ඔහුට එසේ කළ නොහැකිය. එලෙස, අප්‍රමාණයවූ මෙත්තා සහගත සිත ඇති පුද්ගලයා, අනුන්ගේ අයහපත් වචනයෙන් නොසෙල්වේ. **මූලාශ්‍රය:**ම.නි: 1: ඔපම්මවග්ග: 1.3.1 කකචූපම සූත්‍රය, (ඡෙදය 20) පි.327

▲ **ගංගා හා දූපත උපමාව**-Simile of the rivers & the Island

පංච ඉන්ද්‍රිය හා පංච බල අතර ඇති අන්‍යෝන්‍ය සම්බන්ධයය දැක්වීමට මේ උපමාව යොදාගෙන ඇත. ගංගාවක මැද දූපතක් ඇත. එම ගංගාව එකම ගංගාව හෝ ගංගා දෙකක් ලෙසින් සලකිය හැකිය:1) මැද දූපත දෙපස ගලන ජලය නැගෙනහිර ගංගාව හා බටහිර ගංගාව ලෙසින් ගැනීම 2) දූපතට උතුරින් ඇති ජලය උතුරු ගංගාව ලෙසින්ද, දකුණේ ඇති ජලය දකුණු ගංගාව ලෙසින් ගැනීම. කුමන ක්‍රමයකට සැලකුවද සියලුම ගංගා

එකම ජල කඳකි. එලෙස, පංච ඉන්ද්‍රියඇත්නම් පංච බල තිබේ, පංච බල ඇත්නම් පංච ඉන්ද්‍රිය තිබේ යයි ඒවා අතර ඇති සම්බන්ධය අවබෝධ කර ගත හැකිවේ. **මූලාශ්‍ර:** සංයු.නි: (5-1): මහාවග්ග: ඉන්ද්‍රියසංයුත්ත: ජරාවග්ග: 4.5.3 සාකෙත සූත්‍රය, පි.414.ESN:48: Indriyasamyutta: 43.3. Saketha, p.1975.

**ගද**

▲ **ගද්දූලබද්ධ උපමාව**- Similes of The leash

ගද්දූලබද්ධ යනු බල්ලෙක් ගැට ගසා තබන කනුවය. එසේ ගැට ගසා ඇති බල්ලා, බැඳුමෙන් මිදිය නොහැකිව කනුව වටා දුවයයි. එලෙස, තණ්හාව පහ නොකළ සත්ත්වයෝ, ආරිය ධර්මය නොදත් නිසා, පංච උපාදානස්කන්ධය තමාගේ යයි අල්වාගෙන සසර වටේ කැරකෙන බව පෙන්වීමට මෙ උපමාව යොදාගෙන ඇත. **මූලාශ්‍ර:**සංයු.නි: ( 3 ): ඛන්ධ සංයුත්ත: 1.2.5.7 ගද්දූලබද්ධ සූත්‍රය, පි. 284, ESN: 22: Khanda samyutta: 99.7 The leash, p. 1090.

**ගන**

▲ **ගිනිඅඟුරු වල උපමාව-**Simile of Hot coal pit

ගිනිඅඟුරු පිරි වලකට වැටීම නිසා බොහෝ දුක් වේදනා ඇතිවේ. ජීවත්වීමට කැමති කෙනක්, තවත් අය විසින් එවැනි වලකට දැමීමට යන්නේ නම්, ඉන් ඇතිවෙන වේදනා දන්නා පුද්ගලයා ඉන් මිදීමට උත්සාහ කරයි. එලෙස, චේතනා පහළ කිරිමෙන් ඇතිවන කර්ම විපාක නිසා සසර දික්වේ. සසරින් ගැලවීමට කැමති කෙනක්, චේතනා ගැන අවබෝධය ඇතිව කටයුතුකිරීම ගැන මෙහි දක්වා ඇත. **මූලාශ්‍ර :**සංයු.නි: (2): නිදානවග්ග: අභිසමය සංයුත්ත: 1.7.3 පුත්තමංස සූත්‍රය, පි. 174, ESN: 13 : Abhisamyasamyutta: 63.3 Son’s Flesh, p. 697.

▲ **ගිනිදඬු උපමාව-**Simile of Fire sticks

ගිනිදඬු දෙකක් ගැටීමෙන් ගිනි ඇතිවේ, ඒවා වෙන්කල විට ගින්නක් ඇති කිරීමට බැරිය. එලෙස, ස්පර්ශය ඇතිවිට වේදනා ඇතිවේ, ස්පර්ශය නැතිවිට වේදනා ඇතිනොවන බව මෙහි පෙන්වා ඇත. **මූලාශ්‍රය:** සංයු.නි: ( 5-1): මහාවග්ග: ඉන්ද්‍රියසංයුත්ත: 4.4.9 කට්ඨෝපම සූත්‍රය, පි.404.

▲ **ගිනිදැල්වීමේ හා නිවීමේ උපමා**-Similes of lightening & extinguishing a fire**:** බොජ්ඣංග ධර්මතා වැඩීමට සුදුසුහා නුසුදුසු අවස්ථා පෙන්වීමට මේ උපමාව යොදාගෙන ඇත. **මූලාශ්‍ර:** සංයු.නි: (5-1): බොජ්ඣංග සංයුත්ත: 2.6.3 අග්ගි සූත්‍රය, පි.244, ESN: Maggasamyutta: Bojjanga: 53.3 Fire, p. 1795.

**1)** යම්කිසි පුද්ගලයෙක් ගිනි දැල්වීම පිණිස, ශීතල සුළං ඇති තැනක, අමු දර ආදිය යොදා, වැලි දමමින් මද ගින්නක් දැල්වීමට තැත් කලත් ඔහුට ඒ ගින්න දල්වා ගැනීමට හැකිනොවේ. එලෙස, සිත උදාසීනව ඇතිවිට පස්සද්ධි, සමාධි, උපේක්ඛා බොජ්ඣංග වැඩිමට සුදුසු නොවේ.

**2)** යම්කිසි පුද්ගලයෙක් ගිනි දැල්වීම පිණිස, සුළං මුවාවූ තැනක, වියලි දර ආදිය යොදා, වැලි දමන්නේ නැතිව, මද ගින්නක් දැල්වීමට තැත් කරයි. ඔහුට ඒ ගින්න දල්වා ගැනීමට හැකිවේ. එලෙස, සිත උදාසීනවූ අවස්ථාවේ ධම්මවිචය, විරිය හා පීති බොජ්ඣංග වැඩිමට සුදුසු වේ.

**3)** යම්කිසි පුද්ගලයෙක් මහා ගින්නක් නිවීමට කැමතිවේ, ඒ පිණිස ඔහු වියලි දර ආදියදමයි, එහෙත්, ඔහුට ඒ මහා ගින්න නිවා ගත නො හැකිවේ. එලෙස, සිත නොසන්සුන්වූ අවස්ථාවේ, ධම්මවිචය, විරිය හා පීති බොජ්ඣංග වැඩිමට සුදුසු නොවේ.

**4)** යම්කිසි පුද්ගලයෙක් මහා ගින්නක් නිවීමට කැමතිවේ, ඒ පිණිස ඔහු අමු දර ආදිය දමමින්, ශිතල සුළං ලබාදෙමින්, වැලි ඉසිමින් කටයුතු කරයි. ඔහුට ඒ මහා ගින්න නිවා දැමිය හැකිය.එලෙස, සිත නොසන්සුන්වූ අවස්ථාවේ, පස්සද්ධි, සමාධි, උපේක්ඛා බොජ්ඣංග වැඩිමට සුදුසු වේ.

**ගම**

**▲ ගොමපිඩුව උපමාව**-Simile of lump of cow dung

ගොම පිඩුව ඉතා දුබල, අස්ථිර දෙයකි. පංච උපාදානස්කන්ධයට එවැනි ශක්තියක් නොමැතිබව වටහාගෙන සසරින් මිදීම පිණිස අප්‍රමාදව කටයුතු කිරීමේ වැදගත්කම මෙහිදී පෙන්වා ඇත. **මූලාශ්‍ර:**සංයු.නි: (3): ඛන්ධසංයුත්ත: 1.2.5.4 ගොම පින්ඩුපම සූත්‍රය, පි. 274, ESN:22: Khandasamyutta: 96.4 A Lump of Cow dung, p. 1087.

**ගල**

**▲ ගලායන නදිය නතරකිරීමේ උපමාව**- Simile of stopping a running river

ගලායන නදියක් නතර කිරීමට නම් ශක්තිමත් බැම්මක් බැඳිය යුතුය. එලෙස,තණ්හාව නමැති ගලායන නදිය නතර කිරීමට, ඉන්ද්‍රිය සංවරය, සිහිය හා මාර්ග ප්‍රඥාව තිබිය යුතු බව මෙහි පෙන්වා ඇත. **මූලාශ්‍ර**ය: ඛු.නි.සුත්තනිපාත: පාරායනවග්ග:වස්තුගාථා: පි,326, 5-1 අජිතමානවක, පි.336

**ගව**

**▲ ගොවියා උපමාව-**Simile of the farmer: කුඹුරක් වපුරන ගොවියා, පළමුව ගොනුන් ලවා කුඹුර හාරා, වල් පැල ගලවා, බීජ වපුරයි. මෙහිදී පෙන්වා ඇත්තේ, ධර්මය නම් කෙත, බුදුන් වහන්සේ සකස්කළ අන්දමය.

"කෙතේ වපුරන බිජු නම් ශ්‍රද්ධාවය, වැස්ස නම් තපසය, ප්‍රඥාව වියදණ්ඩ හා නගුලය, හිරිය (ලජ්ජාව) නම් රිටය, සිහිය යොත-නගුල්දත හා කෙවිටය. කාය වචී සුචරිතය ඇතිව, ආහරයේ සංවරය ඇතිව, සත්‍ය නම් අංකුසයෙන් වල් උදුරා දමමි, අරහත්වය මගේ විමුක්තියය ( වියගහෙන් මිදීම). ප්‍රධන් වීරිය (නගුල ඇදගෙන යන) ගොනුන්ය, එය නොනැවතීම නිවනවෙතට ගෙනයයි. එලෙසින් ධර්ම කෙත සානලදී, වපුරන ලදී, ව අස්වැන්න අමත ඵලයය, ඒ සීසෑම සියලු දුකින් මිදීමය".

**සටහන**: සු.නි: උරගවග්ග: 1-4 කසීභාරද්වාජ සූත්‍රය, පි.42 හි මේ සමාන විස්තරයක් ඇත. **මූලාශ්‍රය:**සංයු.නි: (1) බ්‍රාහමණසංයුත්ත: උපාසකවග්ග: 7.2.1 කසීසූත්‍රය: පි.332.

▲**ගෙය උපමාව-** Simile of the house

වෙලිගිය වහලක් ඇති ගෙයක් වහා ගින්නට හසුවේ. එහෙත් ගල් ආදියෙන් කල ගෙයක් ගිනි තැබීමට අපහසුය. එලෙස, කෙලෙස් ඇති සිතට පහසුවෙන් ම මාරයාට පැමිණිය හැකිය, කෙළෙස් රහිත සිත මාරයාගෙන් නිදහස්ය. **මූලාශ්‍ර:**සංයු.නි: (4) සළායතනවග්ග: වේදනාසංයුත්ත:ආසිවිසිවග්ග: 1.19.6 අවස්සුත පරියාය සූත්‍රය, පි.380, ESN:35:Salayatanasamyutta:243.6 Exposition on the Corrupted, p.1319.

**ජ**

**ජන**

▲ **ජනපදකල්‍යාණි උපමා-** Simile of Most beautiful woman in the province

1) **කිසියම් ප්‍රදේශයක** සිටින ශෝභාමත් රූ සපුව ඇති කාන්තාව ජනපද කල්‍යාණියය. ඇයගේ රූපය වසඟවී, මත්වී මිනිසුන් පරිහානියට පත්වේ. එලස, ලාභ සත්කාර ආදියෙන් මත්වන සංසයා මාර්ගය විනාශ කරගන්නා අන්දම මෙහි දක්වා ඇත. **මූලාශ්‍රය**:සංයු.නි: (2) නිදානවග්ග: ලාභසත්කාරසංයුත්ත: 3.3.2 ජනපදකල්‍යාණි සූත්‍රය, පි.380.

2) **ජීවත්වීමට කැමති මිනිසකුට**, පිරුණ තෙල්බඳුනක් හිසේ තබාගෙන ජනපදකල්‍යාණිය බැලීමට රැස්වී සිටින මහා ජනසමුහය මැදින් ගමන් කිරීමට නියෝගදෙන්නේය. ඔහු පසුපස කඩුගත් මිනිසක් ගමන් කරයි. යම්හෙයකින්, තෙල් බඳුන ස්වල්ප ලෙසින් හෝ විසිරීගිය හොත් ඔහුගේ හිස කපා දමන බව ඔහුට දන්වා ඇත. එලෙස, අණකල පුද්ගලයෙක්, මරණ භය නිසා පමාවට නොපැමිණ, සිහියෙන් කටයුතු කරයි. එලෙස, සසර භය දැක කායගතා සිහිය ඇතිව මාර්ගයේ ගමන් කලයුතු බව මෙහිදී පෙන්වා ඇත. **මූලාශ්‍රය:** සංයු.නි: (2) නිදානවග්ග: සතිපට්ඨානසංයුත්ත: නාලන්දවග්ග: 3.2.10 ජනපදකල්‍යාණි සූත්‍රය, පි.331.

**ත**

**තග**

▲ **තෑගී දීමේ උපමාව**- Simile of giving gifts

කෙනෙක්, වෙනත් කෙනක්හට යම් තෑගී ආදී දෙයක් ගෙනයයි. එහෙත්, ඒ පුද්ගලයා ඒවා භාර නොගන්නේ නම්, පළමු පුද්ගලයා ඒවා ආපසු ගෙනයායුතුය. එලෙස, කෙනෙක් වෙනත් කෙනෙකුට අක්‍රෝෂ පරිභව කරනවිට, අනිත් තැනැත්තා ඒවා බාර ගන්නේ නැත්නම්, ඒවා දුන් තැනැත්තාටම හිමිවේ. **මූලාශ්‍රය:** සංයු.නි: (1): සගාථවග්ග: බ්‍රාහ්මණ සංයුත්ත:7.1.2 අක්කොස සූත්‍රය, පි.314.

**තර**

▲ **තරුණ රුක උපමාව**-Simile of the young tree

පළමුව සැදු කුඩා පැලයක් නිතර පොහොර වතුර දමා සාත්තු කිරීම නිසා තරුණ රුකක් බවට පත්වේ. එලෙස, නිතර නිතර සංයෝජන ධර්මතා ආස්වාදය කරනවිට, තණ්හාව හොඳින් වැඩි එයි. තරුණ කාලයේදීම, පළමු කි ගස, මුලින්ම ගලවා, ගින්නෙන් දවා, අළු ගඟේ පාකර හැරියොත්, එ ගස නැවත හැදෙන්නේ නැත. එලෙස, සංයෝජන හටගත් විගස, ඒවායේ ආදීනව සිහිකර පහකර ගන්නේ නම් තණ්හාව වැඩි නොයන බව මෙහිදී පෙන්වා ඇත. **මූලාශ්‍ර:** සංයු.නි: (2): නිදානවග්ග: අභිසමයසංයුත්ත:1.6.7 තරුණරුක සූත්‍රය,පි. 162, ESN:12: Nidanasamyutta: 57.7. The sapling, p.689.

**තල**

▲ **තල් ගස උපමාව**-Simile of the Palm tree: කරටිය මුලින්ම සිඳිනලද තල් ගසක් (තාලාවත්‍ථු) නැවත හටගන්නේ නැත. එලෙස, බුදුන් වහන්සේ, රූපය, ශබ්දය ...ආදී සියලුම තණ්හා-කෙළෙස් මුළුමනින්ම සිඳ දමා ඇතිබව මෙහිදී පෙන්වා ඇත. **මූලාශ්‍ර:** අංගු.නි: ( 5 ): 8 නිපාත: 8.1.2.1 වේරඤ්ජ සූත්‍රය, පි. 62, EAN: 8: The 11 .1 Verañjã, p 416.

▲**තෙල්පහන උපමාව**-Simile of the oil lamp

තෙල් පහනක් දැල්වීමට තෙල් හා වැටියක් අවශ්‍යවේ. ඒවා අවසන්වූ විට පහන නිවී යයි. එලෙස, ත්‍රිවිධ වේදනා පිලිබඳ යථා අවබෝධය ලැබූ ආරිය ශ්‍රාවකයා ගේ කය බිඳී ජීවිතය කෙළවර විමේන්, සියලු විඳීම් අවසන්වීයන බව මෙහිදී පෙන්වා ඇත. **මූලාශ්‍ර:** සං.නි: (4 ): සළායතන වග්ග: වේදනා සංයුත්ත:සගාථා වගග: 1.20.7 ගිලන්හල සූත්‍රය, පි.424 , ESN: 36: Vedanāsamyutta, 7.7 The sick ward, p. 1339.

**ද**

▲**දක්‍ෂ ගොපල්ලා උපමාව**- Simile of the skillful Cowherd

කරුණු 11කින් සමන්විත දක්ෂ ගොපල්ලා තම ගවරැල යහපත් ලෙසින් බලාගනී. එලෙස, ගුණ 11කින් සමන්විත භික්ෂුව, ධම්ම විනය වර්ධනය කර ගැනීමට සමත්වේ. **සටහන**: එම කරුණු මෙ සූත්‍රයේ විස්තරාත්මකව පෙන්වා ඇත. **මූලාශ්‍ර**: ම.නි: (1 ) 1.4.3 මහා ගෝපාලක සූත්‍රය, පි.546, EMN:33: The greater discourse on the cowherd, p.292.

▲**දක්‍ෂ හා අදක්ෂ වෙළෙන්දා උපමාව**- Simile of the skillful & un skillful Shopkeeper

වෙළඳාමට **තීක්‍ෂණ** ඇසඇති, වගකීම ඇති, අනුග්‍රාහකයන් ඇති වෙළෙන්දා දක්ෂය, ඔහුට මහා ධනයක් උපයාගැනීමට හැකිවීම නිසා ජීවිතය දියුණු කරගත හැකිය. එහෙත්, එම කරුණු නැති අදක්ෂ වෙළෙන්දා ගෙ ජීවිතය අසාර්ථක වේ. මෙහිදී පෙන්වා ඇත්තේ භික්ෂුවකට එම ගුණ 3 ඇත්නම් මාර්ගය සාර්ථක කරගැනීමට හැකිබවය. එම ගුණ නැති භික්ෂුව මාර්ගයේ පිරිහේ. **තීක්‍ෂණ ඇස**: චතු සත්‍ය

යහපත්ව දැකීම. **වගකීම:** අකුසල පහකොට කුසලය වඩාගැනීමට විරිය තිබීම. **අනුග්‍රාහකයන් ලැබීම:** උතුම් ජ්‍යේෂ්ඨ භික්ෂූන් නිතර හමුවී දහම් කරුණු පහදා ගැනීම. **මූලාශ්‍ර**: අංගු.නි: (2): 3 නිපාත: 3.1.2.9 -10 සූත්‍ර 2කි, පි. 256, EAN:3: 19.9 & 20.10 Shopkeeper, p. 84.

**දද**

**▲ දාදු කැටය උපමාව**-Simile of the Gambler's dice

කෙනෙක් උඩට විසිකරන දාදු කැටය බිමට වැටෙන විට, එ වැටෙන ස්ථානයේම සිටී. එලෙස, නරක ක්‍රියාකරණ අය නියතලෙසින්ම දුගතියකට වැටේ, හොඳ ක්‍රියාකරණ අය, නියතලෙසින්ම සුගතියේ පහළවේ යයි මෙහි දක්වා ඇත. **මූලාශ්‍ර:** අංගු.නි:(6) 10 නිපාත: කරජකාය වගග,10.5.1.7.පඨම සඤ්චෙතනික සූත්‍රය හා 10.5.1.8 දුතිය සඤ්චෙතනික සූත්‍රය, පි.566, EAN: 10:The Deed Born Body: Volitional 1 & 2, p.558.

**දණ**

**▲ දණ්ඩ උපමාව**-Simile of the Stick

අහසට විසිකරන දණ්ඩක්, බිමට පතිත වන ආකාරය වරින් වරට වෙනස්වේ. යම් අවස්ථාවක දණ්ඩේ මුල පලමුවෙන්ම බිමට වැටිය හැකිවේ. තවත් අවස්ථවක දණ්ඩේ අග පළමුව පතිත විය හැකිය. එලෙස, දීර්ඝ සසරේ ගමන් කරන සත්ත්‍වයෝ වරක මෙලොවින් පරලොවට යයි, වරක පරලොවින් මෙලොවට පැමිණේ යයි සසරෙ ඇති බිය මෙහි දක්වා ඇත. **සටහන:** මේ උපමාව: සංයු.නි: මහාවග්ග: සච්චසංයුත්තයේ: සිංසපාවග්ගයේ: දණ්ඩ සූත්‍රයේ ද දක්වාඇත. **මූලාශ්‍ර:**සංයු.නි (2): නිදානවග්ග: අන්මතග්ගසංයුත්ත:3.1.9 දණ්ඩ සූත්‍රය, පි. 306, ESN:15: Anamataggasamyutta:9.9. The stick, p. 795.

**දඹ**

**▲ දඹරුක උපමාව**-Simile of the Rose apple tree

දඹදිව හටගත් රුක් අතුරින් දඹරුක අග්‍රවේ. එලෙස , බෝධිපාක්‍ය ධර්මතා අතුරින්, ප්‍රඥාඉන්ද්‍රිය අග්‍ර බව පෙන්වීමට මෙ උපමාව යොදාගෙන ඇත. **මූලාශ්‍රය**: සංයු.නි: (5-1): මහාවග්ග: ඉද්දිපාද සංයුත්ත:සම්බෝධිවග්ග: 4.7.7 රුක්ඛ සූත්‍ර 4 කි, පි.442.

**දර**

**▲ දොරවල් 11ක් ඇති ගෙදර උපමාව**-Simile of the House with 11 doors

ගෙයකට දොරවල් 11ක් ඇතිවිට, යම් ගින්නක් ඇතිවුවහොත්, ගෙහිමියාට ගින්නෙන් ගැලවීයාමට මං 11ක් ඇත. කෙනෙක් සමාපත්ති 11ක් වඩන්නේ නම් ඔහුට සසර ගින්නෙන් මිදියාමට ක්‍රම 11ක් ඇත. **බලන්න:** අමතද්වාර. **මූලාශ්‍ර:** ම.නි: (2): 2.1.2 අට්ඨකනාගර සූත්‍රය, පි.35, EMN:52: Aṭṭhakanāgara Sutta,p.432.

දල

▲ **දැල උපමාව-Simile of the Net**

දැලක් යොදා විශාල ප්‍රදේශයක් වටකර දැමිය හැකිවේ. එලෙස, ආධ්‍යාත්මික තණ්හාව හා බාහිර තණ්හාව දැලක් ලෙසින් මිනිසා වටලාගෙන ඇති අන්දම මෙහි විස්තර කර ඇත. **මූලාශ්‍ර:** අංගු.නි: (2): 4 නිපාත: 4.4.5.9 තණ්හාජාලිනි සූත්‍රය, පි.424.

දව

▲ **දැව කොටය උපමාව-** Simile of the block of log

ශක්තිමත් දැවකොටයක් පහසුවෙන් කපා දැමිය නොහැකිය. එලෙස, ප්‍රධන් වීරිය වඩන සංසයා මාරයාගේ වසඟයට ගැනීම අපහසු බව මෙහි පෙන්වා ඇත. **මූලාශ්‍ර:**සංයු.නි: (2) නිදානවග්ග:ඔපම්මසංයුත්ත:8.1.8 කලිඞගරූප සූත්‍රය,පි.436, ESN:20: Opammasamyutta: 8 Blocks of wood, p.915.

ධ

ධර

▲**ධර්මය ශ්‍රවනය ආකාරය පිළිබඳ උපමා-** Similes about listening to Dhamma: **මූලාශ්‍ර:**අංගු.නි: (1): 3 නිපාත: 3.1.3.10 සූත්‍රය, පි. 277, EAN: 3: 30.10 sutta, p. 88.

ධර්මය ශ්‍රවනය කරන ආකාරයේ විවිධ බව පෙන්වීමට මෙ උපමා යොදාගෙන ඇත

**1) යටිකුරු ප්‍රඥාව ඇති** අයට, යහපත් දහම ඇසුනද, එය සිතේ දරා ගැනීමට සමත් නැත. හරියට යටිකුරු කොට තැබූ කලයකට දමන ජලය ඒ තුලට නොයන ලෙසය.

**2)** වෙනත් කෙනක් දහම් දේශනාව පවත්වෙන තෙක් අසාසිටි. අසුනෙනේ නැගිට ගත් පසු එය අමතකවේ. එය හරියට, වාඩිවීසිටින විට දූන් කෑම ආදිය **ඔඩොක්කුවේ** තබාගෙන සිට, නැගිට ගත් සැනෙන් බිම වැටෙන ලෙසින්ය.

**3)** තව කෙනෙක් දහම යහපත් ලෙසින් අසයි, මතකයේ තබාගනී. එය හරියට **උඩුකුරුව** තබා ඇති කලයට වතුර පුරවනවා වැනිය

න

නග

▲ **නගර උපමාව-** Simile of the city: සියලු කරුණු වලින් සම්පූර්ණවූ ශක්තිමත් නගරයක්, සතුරන්ට පරාජය කළ නොහැකිය. එලෙස, සප්ත සද්ධර්මය සමන්විත භික්ෂුව, මාරයා හට පරාජය කල නොහැකිය. **මූලාශ්‍ර**: අංගු.නි: ( 4 ): 7 නිපාත: 7.2.2.3 නගරූපම සූත්‍රය, පි. 454, EAN:7: 67.3 Simile of the Fortress, p. 397.

▲ **නාගයෝ උපමාව-**Simile of Snakes

හිමාල කඳුවැටිය ආශ්‍රිතකරගෙන නාගයෝ ඔවුන්ගේ කය පෝෂණය කර, ශක්තිමත් කරගනි. ඉන්පසු ඔවුන් එහි ඇති පොකුණු වලට පැමිණේ, එහි සිට ක්‍රම ක්‍රමයෙන් මහා මුහුදට පැමිණ මහා නාග යෝ බවට පත්වේ. එලෙස ශීලය පදනම්කොට සප්ත බොජ්ඣංග වඩන භික්ෂුව ක්‍රම ක්‍රමයෙන් මහාබවටඅරහත්වයට පැමිණෙන අන්දම මෙ උපමාව යොදාගෙන පෙන්වා ඇත. **මූලාශ්‍ර:** සංයු.නි: ( 5-1 ): මහාවග්ග: බොජ්ඣංග සංයුත්ත: 2.1.1. හිමවන්ත සූත්‍රය, පි.168, ESN: 46: Bojjhaṅgasaṃyutta: 1.1.The Himalayas, p. 1730

**නද**

▲**නදිය උපමා-**Simile of the river

1) මහා වේගයෙන් ගලන නදියකට වැටුන මිනිසකුට ගොඩට ඒම පහසු නැත. එලෙස සසර ප්‍රවාහයට අසුවූ ලෝක සත්වයාට ඉන් ගොඩඒම පහසු නොවන බව මෙහි පෙන්වා ඇත. **මූලාශ්‍ර**: සංයු.නි: (3 ): ඛන්ධ සංයුත්ත:5: 1.2.5.1 නදීසූත්‍රය, පි.264, ESN:22: Khandasamyutta:V: 93.1 The River, p.1084.

▼වේගයෙන් ගලා යන නදියක පිනා යන මිනිසාට පහසුවෙන් මුහුදට පැමිණිය හැකිය. එලෙස, ආරිය අටමගට බැසගත් පුද්ගලයා වේගයෙන් නිවනට පැමිණේ. **මූලාශ්‍රය:**සංයු.නි:මග්ගසංයුත්ත:14 බලකරනියවග්ග: 1.14නදී සූත්‍රය,පි.146

**නය**

▲ **නිය අග ඇති පස්බිඳ උපමාව-** Simile of bit of soil in the finger nail

මහා පොළවේ ඇති පස් ප්‍රමාණය හා සසඳනවිට, නිය අග ඇති පස් බිඳ ඉතා සුළුය. එලෙස, අප්‍රසිද්ධ, දනව්වල ඉපදෙන මිනිසුන් ප්‍රමාණය මහා බව හා බුදුවරු උපත ලබන මධ්‍ය ප්‍රදේශයේ උපත ලබන ජනයා ස්වල්පබව මෙහිදී පෙන්වා ඇත. **මූලාශ්‍රය:** සංයු.නි: (5-2): මහාවග්ග: සච්චසංයුත්ත: 12.7.2. පච්චන්ත සූත්‍රය, පි. 356.

▲ **නිවරණ පහෙන් සිත වැසියාම පිලිබඳ උපමා-** Similes showing how hindrances obstruct the mind: **මූලශ්‍ර:** අංගු.නි: (3 ): 5 නිපාත: 5.4.5.3 සන්ඩගාරව සූත්‍රය, පි. 396, EAN:5:193.3 Saṅgārava sutta, p.300.

1) **වර්ණ මිශ්‍ර ජලය ඇති බඳුන උපමාව-** Simile of color water bowl: දිය බඳුනක් විවිධ පාට ඇති ජලය මිශ්‍රව ඇත්නම් එහි පතුල දැකීම අසිරුය. එලෙස, කාමයෙන් යටවූ සිතට දහම යහපත්ව දැකිය නොහැකිය.

**2) බුබුළු දමන උණු වතුර ඇති බඳුන උපමාව-** Simile of hot bubling water bowl**:** බුබුළු දමන උණුවතුර ඇති දිය බඳුනක් ස්පර්ශය කිරීමෙන් පිඩා ඇතිවේ. එලෙස තරහ සිත තමාටද අනුන්ටද පිඩා කරයි.

**3) දිය සෙවෙල පිරි ඇති බඳුන උපමාව-** Simile of bowl filled with algae**:** දිය සෙවෙල නිසා බඳුනේ පතුල පැහැදිලිව දැකීම අපහසුවේ. එලෙස, ථිනමිද්ධයෙන් සිත වැසීගිය විට මාර්ගය වඩා ගැනීමට දිරිය නැත.

**4) කැළඹුන ජලය පිරි ඇති විල උපමාව-** Simile of a lake filled water waves**:** විලක ජලය කැළඹී ඇතිවිට එහි පතුල පැහැදිලි නැත. එලෙස උද්ධච්චකුක්කුච්චය ඇති සිත නිසල කර සමාධිය ඇතිකර ගැනීම පහසු නොවේ.

**5) මඩ ආදියෙන් පිරි ඇති විල උපමාව-** Simile of a lake filled mud**:** මඩ ආදී අපවිත්‍ර දේ ඇති විලක පතුල පැහැදිලිව දැකීමට අපහසුවේ. එලෙස, විචිකිච්ඡාවට යටවූ සිතේ ශ්‍රද්ධාව ආදී කුසලයන් ඇතිකර ගැනීම පහසු නොවේ.

**නර**

▲ **නරක බීජ උපමාව-** Simile of bad seeds

හොඳ බීජ නිසා ඇතිවන අස්වැන්න අතර නරක බීජ නිසා ඇතිවූ අස්වැන්න එකට තිබීම නිසා හොඳ අස්වැන්නද විනාශවී යයි. එලෙස යහපත් සංඝයා අතරට අයහපත් සංඝයා එක්වීම නිසා හානි සිදුවන බව මෙහිදී පෙන්වා ඇත. **මූලාශ්‍ර**:අංගු.නි: (5): 8 නිපාත: 8.1.1.10 කාරණ්ඩව සූත්‍රය, පි. 56, EAN:8: 10.10 Trash, p. 411.

**නල**

▲ **නෙළුම් මල උපමාව**- Simile of the Lotus flower

මඩේ උපත ලබා, මඩේම සැදී වැඩී, මඩ දියෙන් නැගීසිටින නෙලුම් මල, පිරිසිදු ලෙසින් සිටී. එලෙස කෙළෙස් පිරි ලෝකයේ උපත ලබා හැදුන වැඩුන තථාගතයන්, සියලු කෙළෙස් පහකර, පිරිසිදු සිතින් වැඩසිටින ආකාරය මෙහිදී පෙන්වා ඇත. **මූලාශ්‍ර**:අංගු.නි: (6):10 නිපාත: 10.2.4.1. බාහුන සූත්‍රය,පි.296, EAN:10: The Elders: 81.1. Bahuna, p. 526.

**නළ**

▲ **නළ කලාප උපමාව-**Simile of the bamboo bundles

නළ කලාප -බටමිටි දෙකක් එකිනෙකට හෙත්තුව තබා ඇත්නම් ඒවා බිම නොවැටේ. එකක් අස් කලහොත් අනික බිමට වැටේ. එම උපමාව යොදාගෙන සැරියුත් මහා තෙරුන් පෙන්වා ඇත්තේ නාම රූප හා විඤ්ඤාණය අතර ඇති අන්‍යෝන්‍ය සම්බන්ධයය. **නාමරූප හේතුකොට විඤ්ඤාණය ඇතිවේ, විඤ්ඤාණය හේතුකොට නාමරූප ඇතිවේ. නාම රූප නැතිවිට විඤ්ඤානය නොපවතී, විඤ්ඤානය නැතිවිට නාම රූප නොපවතී** **මූලාශ්‍ර**: සංයු.නි: (2 ): නිදානවග්ග: අභිසමයසංයුත්ත:1.7.7. නළකලාප සූත්‍රය.

**නව**

▲**නැවඋපමාව**-Simile of the ship

වේවැල්වලින් බඳිනා ලද නැවක්, මාස 6ක් මුළුල්ලේ ජලයට යටවී තිබේ නම් එය දිරායයි. එලෙස, ආරිය අටමග බොහෝකලක් බහුල කරනලද භික්ෂුවගේ සංයෝජන දිරා, ක්ෂයවී යන ආකාරය මෙහිදී පෙන්වා ඇත. **මූලාශ්‍ර:** සංයු.නි: (5-1):මග්ගසංයුත්ත:14 බලකරණීය: 1.14. නාවා සූත්‍රය, පි. 144, ESN:45: Maggasamyutta:158.10 The ship, p.1701.

**නස**

**▲ නිසරු ගස උපමාව-** Simile of the Barren Tree

ගසක, කොළඅතු නො වැඩුනවිට, එහි මුල් නොවැඩේ, මුල් නොවැඩුන විට ගසේ පොත්ත, හරය නොවැඩේ, එනිසා ගස නිසරු ගසක් බවට පත්වේ. එලෙස, ඉන්ද්‍රිය අසංවරය ඇතිවිට අසිල්වත්වේ, අසිල්වත් බව සම්මා සමාධියට බාධාවකි, සම්මා සමාධිය නොමැතිවිට, යථාභූත ඥානදර්ශනය ඇතිනොවේ, යථාභූත ඥානදර්ශනය නොමැතිවිට, නිබ්ද්දාව හා විරාගය ඇතිනොවේ, නිබිද්දාව හා විරාගය නොමැතිවිට විමුක්තිය- නිවන සාක්ෂාත් නොවන බව මෙහි පෙන්වා ඇත. **මූලාශ්‍රය:** අංගු.නි: (4): 6 නිපාත:ධම්මිකවග්ග: 6.1.5.8 ඉන්ද්‍රියසංවර සූත්‍රය, පි.150.

**ප**

**පංච**

**▲ පංච උපාදානස්කන්ධය තමාගේ නොවන බව පෙන්වා දෙන උපමා-** Similes showing that the Five aggregates are not belonged to one self

ජේතවනආරාමයේ (හෝ තමන්ට අයිති නැති තැනක) ඇති දර ආදිය මිනිසුන් රැගෙන යනවිට, සංඝයාට ඒ ගැන අකැමත්තක් ඇති නොවේ. එලෙස, පංච උපාදානස්කන්ධය, තමාට අයිති දෙයක් නොවන බව සලකා එයට ඇති ඇල්ම පහකර ගතයුතුවෙ. **සටහන:** විස්තරපිණිස බලන්න: සංයු.නි: (4) සළායතනවග්ග:වේදනාසංයුත්ත: 1.10.8 හා1.10.9 සූත්‍ර. පි. 198. **මූලාශ්‍ර:** සංයු.නි: ( 3): ඛන්ධසංයුත්ත:4 නතුම්හාකවග්ග:සූත්‍ර 3 කි, පි.88, ESN:22:Khnadasamyutta:IV Not yours, 3 suttas, p. 1026.

**පත**

**▲පාතාලය උපමාව-**Simile of the bottomless abyss

පාතාලය යනු පතුලක් දැකීමට නොහැකි මහා ගැඹුරකි (ආගාධයකි). පුහුදුන් මිනිසාට ඇතිවන දුක් වේදනා පාතාලය වැනිය. ධර්මය නොදත් නිසා ඔහුට දුකින් ගොඩවීම නොහැකිය. **මූලාශ්‍ර:** සං.නි: (4 ): සළායතන වග්ග: වේදනා සංයුත්ත:සගාථා වගග: 1.20.4 පාතාල සූත්‍රය, පි.418, ESN:36: Vedanāsamyutta, 4.4. The Bottomless Abyss, p. 1335.

**▲ පුත්‍රමාංශ උපමාව-** Simile of Son’s Flesh

කාන්තාරයකින් එතර වීමට යන දෙමාපියන්, ආහාර නොමැති නිසා කාන්තාරයෙන් එතර වීමට නොහැකිවේය යන බියෙන්, ඔවුන්ගේ එකම

පුත්‍රයා මරා, ඔහුගේ මස් මහා දුකින් යුතුව, විලාප කියමින් අනුභව කරයි. එලෙස, කය පෝෂණය පිණිස ගන්නා ආහාර ගතයුත්තේ, විනෝදය පිණිස නොව සසර කතර තරණය කිරීම පිණිස බව මෙහිදී පෙන්වා ඇත. **මූලාශ්‍ර:**සංයු.නි: (2): නිදානවග්ග: අභිසමයසංයුත්ත: 1.7.3 පුත්‍රමාංශ සූත්‍රය, පි. 174, ESN: 12: Nidanasamyutta: VII: 63.3. Son’s Flesh, p. 696.

**පණ**

▲ **ප්‍රාණීන් පිලිබඳ උපමා-** Simile of the beings

**1) පොළොව** පිහිට කරගෙන, සියලුම ප්‍රාණීන්, සිව් ඉරියව්ව පවත්වයි. එලෙස, ශීලයේ පිහිටා සප්ත බොජ්ඣංග වැඩියයුතු බව මින් පෙන්වා ඇත. **මූලාශ්‍රය**: සංයු.නි: (5-1) මහාවග්ග: බොජ්ඣංගසංයුත්ත:2.2.1 පාණ සූත්‍රය, පි.190.

**2) මහාමුහුදේ** බොහෝ ප්‍රාණීන් සිටිති. යම් පුද්ගලයෙක්, මුළු දඹදිව ඇති ලි රැගෙන, ඒවා උල්කර, මුහුදේ ඇති සියලු ප්‍රාණීන් ඇල්ලීමට උත්සාහ කලද, ඔහුට එ සියලු ප්‍රාණීන් අල්ලා ගාථා නොහැකිය.එලෙස, අත්භවය සියුම්ය, ආපය දුක මහත්ය. එම දුකෙන් ගැලවීම පිණිස චතුසත්‍ය අවබෝධ කර විරිය කළයුතුබව මෙහිදී පෙන්වා ඇත. **මූලාශ්‍රය**: සංයු.නි: (5-2 ) මහාවග්ග:සච්චසංයුත්ත: 12.4.6 පාණ සූත්‍රය, පි. 322.

**පර**

▲ **පරසතු මල් රුක උපමාව**-Simile of coral tree

පරසතු රුක ක්‍රම ක්‍රමයෙන් වැඩි මල් හටගත්විට සුවඳ දසඅත හමායයි. එලෙස,ගිහිගෙය හැර, ශ්‍රමණබව ලබා, ක්‍රමානුකුලව පුහුණුව ලබන භික්ෂුව, සියලු කෙළෙස් හැර, උතුම් විමුක්තිය ලැබීම දහම් සුවඳ දස අත හමා යාම වැනිය. **මූලාශ්‍ර**:අංගු.නි: (4): 7 නිපාත:7.2.2.5 පාරිචඡත්‍රක සූත්‍රය, පි.468, EAN:7: 69.5 Pāricchattaka, p.400.

▲ **පැරණි තුවාලය උපමා-** Simile of the old wound

**1) බොහෝකල් ගිය තුවාලයක්** පිළියම් කිරීම පහසු නොවේ. එලස, කිපෙන ගති ඇති පුද්ගලයන් අතින් සිදුවන අයහපත් කම්ම විපාකවලට පිළියම් නොමැතිබව මෙහිදී පෙන්වා ඇත. **මූලාශ්‍රය:** අංගු.නි: (3): 5 නිපාත:ගිලානවග්ග: 5.3.3.9 පරිකුප්ප සූත්‍රය, පි.262. EAN: 5: 129.9 Lesions, p. 279.

**2) බොහෝකල් ගිය තුවාලයකින් (ගඩුව)** සැරව ආදී අපවිත්‍ර දේ ගලායයි, පිළිකුල් සහගතය. එලෙස, නව දොරකින් ජරාව ගලයන කය, පරණ තුවාලයක් වැනිය. එනිසා, කයට ඇති ඇල්ම හැරදමා මාර්ගය වඩා ගැනීම ගැන මෙහි දක්වා ඇත. **සටහන:**නවදොර:ඇස්2, කන්2, නාසයේ සිදුරු2,මුව,මුත්‍රාපිටකරන තැන, ගුදය. **මූලාශ්‍ර:** අංගු.නි: ( 5 ): 9 නිපාත: 9.1.2.5 ගන්ඩෝපම සූත්‍රය, පි. 446, EAN: 9: 15.5 Boil, p. 467.

**පස**

▲**පැසුන ගොයම උපමාව**-Simile of the ripen harvest

ගවපල්ලා නොපෙනෙන අවස්ථාව බලා ගොනා පැසුන ගොයම කන්ට කෙතට බසී. ඒ බව දකිනා ගවපල්ලා ඌට දණ්ඩකින් පහරදේ. ඒ පහර දැඩි දුක් වේදනා ඇතිකළ නිසා, ඉන්පසු ගොනා, ගොයමට බසින්නේ නැත. එලෙස, ස්පර්ශ ආයතන පිලිබඳ සංවරයය නොමැති පෘතජ්ජන මිනිසා පංචකාම ගුණ යන්ට යටවේ. එහෙත්, ස්පර්ශ ආයතන වලින් ඇතිවෙන වේදනා අවබෝධ කරගත් සංසයා, ඒවාට යටනොවී, යථාබව අවබෝධ කර සමාධියට සිත පත්කරගන්නා බව මෙහි පෙන්වා ඇත. **මූලාශ්‍ර:** සංයු.නි: (4): සළායතනවග්ග:වේදනාසංයුත්ත: අසිවිසවග්ග: 1.10.9 විනාඋපමාව සූත්‍රය, පි.400, ESN: Salayathnavagga: Vedanasamyutta: 246.9 The Simile of the lute, p.1324.

**එ**

**එල**

▲ **එලය නිසා විනාශවීම පෙන්වන උපමාව-**Simile of destruction by own fruit

උණ, බට, කෙසල් ආදීය, ඒවා තුළ හටගන්නා එල නිසා විනාශවේ. එලෙස, සිත තුළ හටගන්නා අකුසල මිනිසාගේ විනාශයට හේතුවන බව මෙ උපමාවෙන් පෙන්වා ඇත. **මූලාශ්‍ර:** සංයු.නි: (1): සගාථවග්ග: කෝසල සංයුත්ත: 3.1.2 පුරිස සූත්‍රය, පි. 158, ESN: 3: Kosala samyutta: 2.2 A Person, p. 219.

**බ**

**බජ**

▲ **බීජ උපමාව-**Simile of the seeds

ලාමක දිට්ඨියෙන් කටයුතු කරනවිට ලැබෙන්නේ අමිහිරි ප්‍රතිඵලය. සම්මා දිට්ඨිය ඇතිව කටයුතු කරනවිට ලැබෙන්නේ මිහිරි ප්‍රතිඵලය. මේ උපමාවෙන් පෙන්වා ඇත්තේ තිත්ත ඇටයක් පැල කිරීමෙන් ලැබෙන එලය අමිහිරිය, මිහිරි ඇටයක් පැල කිරීමෙන් ලැබෙන එලය මිහිරිය. එලෙස, සම්මා දිට්ඨිය යහපතද, මිථ්‍යාදිට්ඨිය අයහපතද ගෙනදෙන බවය. **මූලාශ්‍ර:**අංගු.නි: (6): 10 නිපාත: සමණසඤ්ඤා වගග: 10.3.1.4. බීජ සූත්‍රය,පි.410, EAN:10: 104. 4-A Seed, p.541.

**බර**

▲ **බෙර ශබ්දය උපමාව-** Simile of the drum sound

බෙර සද්ද හොඳින් දන්නා පුද්ගලයෙක්, ගමනක් යැමට මාර්ගයට පැමිණේ. එහිදී ඔහුට බෙර සද්දයක් ඇසේ, එවිට ඒ සද්දය කුමන බෙරයකින් ඇතිවෙන්නේද යයි ඔහු යහපත් ලෙසින්ම දනී. එලස, ධර්මය, මේ භවයේ පුරුදු පුහුණු කලවිට, ඊළඟ භවයේ ධර්මය කෙනෙක් පවසයි නම්, සිහිය අවදිවේ එනිසා ධර්ම මාර්ගය ඒ භවයේදී වඩා ගැනීමට හැකිවනබව මෙහි පෙන්වා ඇත. **මූලාශ්‍ර:** අංගු.නි: (2): 4 නිපාත: මහාවග්ග: 4.4.5.1 සොතානුධත සූත්‍රය, පි.380,

**බල**

▲ **බාලයා හා පණ්ඩිතයා නිසා සිදුවන යහපත හා අයහපත පෙන්වීමට යොදාගත් උපමා-** Similes used to show the benefits & non- benefits by association with foolish & wise: මූලාශ්‍ර: ම.නි: ( 3): 3.2.5 බහුධාතුක සූත්‍රය, පි.209, EMN: 115: The Many Kinds of Elements, p. 840.

**1) පිදුරු සෙවිලි කල නිවස උපමාව-**Simile of the roof covered with hay: පිදුරු වහල ඇති ගෙයක් පහසුවෙන් ගින්නට අසුවේ, එ අසල ගෙවල් තිබේ නම් ඒවාද ගින්නට යටවේ. එලෙස බාලයන් ආශ්‍රය කිරීම නිසා විපත් සිදුවේ යයි මෙහිදී පෙන්වා ඇත.

**2) උළු සෙවිලි කල නිවස උපමාව-**Simile of the roof covered with tiles: උළු වහල ඇති ගෙයක් පහසුවෙන් ගින්නට හසු නොවේ. එ නිසා අසල ඇති ගෙවල් වලට කරදර ඇති නොවේ. එලෙස පණ්ඩිතයන් ආශ්‍රය කිරීම නිසා සිදුවන්නේ යහපතක් යයි මෙහිදී පෙන්වා ඇත. පත්වේ.

**බළ**

▲ **බළලා උපමාව-**Simile of the cat

බළලා (බිළාල), ගොදුරු සොයා යන්නේ මීයෙක් අල්වා ගෙන ඌ, නොසපා ගිලිම නිසා, බඩේ සිටින මියා, ඌගේ අතුනුබහන් කැමෙන් ඒ බළලා මරණයට පත්වේ. මේ උපමාව යොදාගෙන ඇත්තේ අවෙලාවේ, සංඝයා පවුල් අතර හැසිරීම නිසා ශිලය බිඳීයාම ආදී අනතුරු ඇතිවෙන බව පෙන්වීමටය. **මූලාශ්‍රය**: සංයු.නි: (2) නිදානවග්ග: ඔපම්මසංයුත්ත:බිළාල සූත්‍රය.

▲**බළල්සමින් කල පසුම්බිය උපමාව-**Simile of the cat skin bag

බළල්සමින් කල පසුම්බිය ඉතා මෘදුය-සිනිදුය, ඒ නිසා සර සර වැනි සද්ධ ඇති කිරීමට නොහැකිය. යම්කෙනක්, ගල් කැටයක් ගෙ, ඒ පසුම්බියට ගසා එමගින් සර බර සද්ධ ඇතිකිරීමට උත්සාහ කළද ඉන් එලක් නොවේ. එලෙස, මෙත්තාසහගත සිත වඩාගත විට අන්‍යයන්ගේ රළු වචනයෙන් සිත සසල නොවන බව මෙහිදී පෙන්වා ඇත. **මූලාශ්‍රය:**ම.නි: 1: ඔපම්මවග්ග: 1.3.1 කකචූපම සූත්‍රය,(ඡේදය 21) පි.327.

**භ**

**භජ**

▲ **භෝජනයෙහි මාත්‍රවීම පිලිබඳ දැක්වූ උපමා-** Similes for moderate in eating: **මූලාශ්‍ර**: සංයු.නි: ( 4 ) සලායතනවග්ග: 1.19.2 රථූපම සූත්‍රය, පි.369, ESN: Salayatanasamyutta: 239.2 The Simile of the Chariot, p.1315.

**තෙල් ගැල්වීමේ උපමාව-**Simile of applying oil

1) යම් පුද්ගලයෙක් තමන්ට ඇති තුවාලයක් සුවකිරීම පිණිස බෙහෙත් තෙල් ආදිය ගල්වයි. එලෙස, නුවණින් සලකා කයේ පැවත්ම පිණිස පමණක් අහාර ගැනීම.

2) බර ගෙනයන කරත්තයක්, පහසුවෙන් ගෙනයාම පිණිස රෝද කූරවල තෙල් ගාන ලෙසින්, කය පහසුවෙන් පවත්වා ගැනීම පිණිස ආහාර ගත යුතුවේ.

▲**භාවනා වර්ධනය පිලිබඳ උපමා-** Similes on Development in meditation: **මූලාශ්‍රය:** අංගු.නි: (4) 7 නිපාත:මහාවග්ග: භාවනානුයුත්ත සූත්‍රය,පි.482

**1) කිකිළිය හා බිත්තර උපමාව-** Simile of the hen and eggs

කිකිළිය, තමාගේ බිත්තර රකින්නේ නැතිව, පැටව් කටුව බිඳ හොඳින් එළියට ඒවා! යයි පැතුවද එය ඉෂ්ඨනොවේ. එලෙස, භාවනාවෙ නොයෙදුන කෙනෙකුට, සිතින් පතා සිත විමුක්තියට පත් කර ගත නොහැකි බව මෙහි දක්වා ඇත. එහෙත්, කිකිළිය තම බිත්තර මැනවින් රැකුවහොත්, පැටව් නිසිලෙස උපදිවා යයයි පැතුවත් නොපැතුවත්, ඇගේ පැටව් යහපත් ලෙසින් කටුව බිඳ ගෙන එළියට එයි. එලෙස, භාවනාව යහපත් ලෙසින් වඩාගන්නා කෙනෙකුට, සිතින් නො පැතුවත් අවිද්‍යාව බිඳ, විමුක්තිය ඇතිකර ගත හැකිය.

**2) වඩුවා උපමාව-** Simile of the carpenter

වඩුවෙක්, වැඩ කිරීම නිසා ඔහුගේ වෑය ගෙවියයි, එහෙත්, අද මෙපමණක් ගෙවී ගියාය යන වැටහීම ඔහුට නැත. එලෙස, භාවනාව වඩා ගන්නා භික්ෂුවට, දිනෙන් දිනට කෙතක් දුරට ආසව ප්‍රහීණය වූවාද යන අවබෝධ නැත. එහෙත්, ආසාව ක්‍ෂය වූ විට, ඒ පිලිබඳ නුවණ ඇතිවේ.

**3) ශිත කාලයේ ඉවුරේ රඳවන ලද ඔරුව පිලිබඳ උපමාව-** Simile of the boat landed on the beach during winter

ශිත ඍතුවේ වැල්ලේ තබා ඇති ඔරුව, සුළං, හිරු එළිය ආදියෙන් ක්‍රම ක්‍රමයෙන් විනාශයට යයි. එලෙස, භාවනාව වඩා ගන්නා භික්ෂුවට, දිනෙන් දිනට කෙතක් දුරට ආසව ප්‍රහීණය වූවාද යන අවබෝධ නැත. එහෙත්, ආසාව ක්‍ෂය වූ විට, ඒ පිලිබඳ නුවණ ඇතිවේ.

**ම**

**මක**

▲ **මක්ඛලිගෝසාල** ගේ අයහපත් ඉගැන්වීම් නිසා මින්සුන්ට සිදුවෙන අයහපත පෙන්වීමට මේ උපමා යොදාගෙන ඇත:

**1) කේසකම්බිලි පොරෝනය උපමාව-**The simile of Matted hair blanket: සියලු වස්ත්‍ර අතුරින් නරකම එකය, එලෙස, සියලු ඉගැන්වීම් අතරින් නරකම ඉගැන්වීම මක්ඛලිගෝසාල ගේ වාදයය. **මූලාශ්‍රය**:අංගු.නි (1) :3 නිපාත: 3.3.4.5 සූත්‍රය, පි.554.

**2) මසුන් අල්වන කෙමිණ උපමාව**- Simile of the fishing net: මසුන් අල්වන කෙමිණ නිසා බොහෝ මසුන්ගේ විනාශය සිදුවේ, එලෙස, ඔහුගේ වාදය නිසා බොහෝ පිරිස විපතට පත්වේ. **මූලාශ්‍රය:** අංගු.නි: (1) 1 නිපාත:ඒක ධම්ම පාලිය: 1.16.3.4 සූත්‍රය, පි.106.

මට

▲ **මැටි බඳුන් උපමාව**-Simile of the clay pots

සියලු මැටි බඳුන් බිඳීම ස්වභාවය කොට ඇත, එලෙස සියලු සත්වයෝ මරණය ස්වභාවය කොට ඇත. **මූලාශ්‍ර**: සංයු.නි: (1) සගාථවග්ග: කෝසලසංයුත්ත: 3.3.2 අය්‍යකා සූත්‍රය, පි. 202, ESN:3 Kosala samyutta: 22.2 Grandmother, p. 254.

▲**මේඝය උපමාව-**The simile of rain cloud

ගිම්හානයේ- ඇසළ මාසයේ මහා දූවිලි ඉහළ නගී. ඒ අවස්ථාවේ මහා අකල් වැස්සක් ඇතිවී, ඒ දූවිලි සෝදා හරී. එලෙස, ආරිය අටමග වර්ධනය කරගැනීමෙන්, යම් අකුසල ධර්ම- කෙළෙස් ඇත්නම් ඒවා පහවී යන බව මෙහි පෙන්වා ඇත. **බලන්න**: සංයු.නි: (5-1): මහාවග්ග: මග්ගසංයුත්ත:බලකරණියවග්ග:මේඝසූත්‍රය, පි.142.

මර

▲ **මරණසතිය වඩනවිට** අප්‍රමාදව කටයුතු කිරීම ගැන මේ උපමා වලින් පෙන්වා ඇත.

**හිස හෝ හැඳිවත ගිනි ගැනීමේ උපමාව**-Simile of head or cloth on fire: හිස ගිනිගත් විට හෝ හැඳි වත ගිනිගත්විට,අප්‍රමාදව එම ගින්න නිවා දැමීමට කටයුතු කරණ ලෙස මරණ සතිය වැඩිය යුතුවේ. **මූලාශ්‍ර:** අංගු.නි :( 4 ): 6 නිපාතය: 6.1.2.9 ප්‍රථම හා දුතිය මරණසති සූත්‍ර, පි. 60, ESN:6: Mindfulness of Death 1 & 2, p. 324, අංගු.නි :( 5):8 නිපාතය: 8.2.8.3 හා 8.2.8.4 මරණසති සූත්‍ර, පි. 324, ESN: 8: 73.3 & 74.4 Mindfulness of Death,p. 449.

▲ **මාර්ගයේ දක්ෂ පුද්ගලයා පිලිබඳ උපමාව-** Simile of the person who is skillful in the Path

මාර්ගය නොදත් පුද්ගලයා, මාර්ගයෙහි දක්ෂ පුද්ගලයාගෙන් සම බිමකට යන මාර්ග සලකුණු ගැන අසයි. එවිට, මාර්ගය දන්නා පුද්ගලයා මෙ පවසයි:

'මේ මගේ යන්න, එවිට දෙමං සන්ධියක් හමුවේ, වමට නො ගොස් දකුණට යන්න. එසේ යනවිට ඝන වනලැහැබක් හමුවේ. ඉන් ඔබ්බට යනවිට මඩවගුරක් ඇත. ඉන් ඔබ්බට දළ බෑවුමක් වේ. ඉන් එහාට ගියවිට සිත්කලු සම බිමක් දැකිය හැකිය'

**උපමා විස්තරය:** 1) මාර්ගය නොදත් පුද්ගලයා =දහම නොදත් පෘතග්ජනයා 2) මාර්ගයෙහි දක්ෂ පුද්ගලයා= තථාගතයන් වහන්සේ 3) දෙමංසන්ධිය= සැකය (විචිකිච්චාවය) 4) වමට යන මග = මිථ්‍යා අටමගය 5) දකුණට යන මග= සම්මා අරිය අටමගය 6) ඝන වනලැහැබ= අවිජ්ජාව 7) මඩවගුර=කාමයට ඇලීමය 8) දළ බෑවුම= ක්‍රෝධය හා උපායසය 9) සිත්කලු සම බිම= නිවනය. **මූලාශ්‍රය**: සංයු.නි; (3): ඛන්ධසංයුත්ත: ථෙරවග්ග: 1.2.4.2 තිස්ස සූත්‍රය, පි.210.

▲**මළපුඩුව උපමාව -** Simile of the snare

ලිහිණියා, මළපුඩුව- උගුල තුළ ඇති යම් කෑමක් කෙරේ ආසාව ඇතිකර එය ගන්න යනවිට පුඩුවට හසුවේ. එලෙස, තණ්හාවෙන් බැඳුන සත්වයෝ  සසරට බැඳී සිටින් අන්දම මෙහි දක්වා ඇත.   **මූලාශ්‍ර:**සංයු.නි: (1 කාණ්ඩය): දේවතාසංයුත්ත: 1.8.9 පාථෙයිය සූත්‍රය, පි. 108, ESN:1: Devathasamyutta: 79.9 sutta, p. 162.

**මහ**

▲ **මහා අරටුව උපමාව-** Simile of the Great heartwood

ගසක ඇති සවිමත්, බලවත් කොටස අරටුවය. එලෙස, ධර්මයේ අරටුව වන්නේ විමුක්තියය-නිවනය. ගසක අරටුව සොයායන අනුවණ මිනිසෙක් අරටුව වෙනුවට කොළ අතු ආදිය ගනී. අරටුව දන්නා මිනිසා, අරටුවම සොයාගනී. එලෙස නුවණැති පුද්ගලයාට දහමේ අරටුව- විමුක්තිය ලබා ගැනීමට හැකිවේ. **මූලාශ්‍රය:** ම.නි.මහාසාරෝපම සූත්‍රය හා චූලසාරෝපම සූත්‍රය.

▲ **මහා ඉර්ෂි -ඉසි උපමාව-** Simile of the Maha Irsi

මේ උපමාව යොදාගෙන ඇත්තේ බුදුන් වහන්සේ, අගාධයවැනි සසර සාගරය තරණය කර මහා ඉසී- සම්බුද්ධ බවට පත්වීම පෙන්වා දීමටය. **මූලාශ්‍ර:** සංයු.නි: (1) සගාථවග්ග: දේවතාසංයුත්ත: ඒකමූල සූත්‍රය, පි. 84, ESN:1: Devathasamyutta: 44.4 One root, p. 119.

▲ **මහා ගල් පව්ව උපමා-**Simile of the great rock

**1) සියලු දිශාවන් සිට** පෙරලි එන පර්වත, සියල්ල යට කර දමයි.එලෙසින්, සෑම අතින්ම පැමිණෙන, ජරා මරණය මිනිසුන් යට දමන බව මෙහිදී පෙන්වා ඇත. **මූලාශ්‍ර:**සංයු.නි: (1):සගාථවග්ග: කෝසල සංයුත්ත:3.3.5 පබ්බතඋපමා සූත්‍රය, පි.210, ESN:3:Kosalasamyutta:III:25.5 The simile of the mountain, p.259.

**2) සෝතාපන්න බව ලැබීම,** දිට්ඨිසම්පන්නවීම (දහම් ඇස ලැබීම) නිසා ඇති ලාභය හිමලයා, සිනෙරු පර්වත වලට වඩා අති මහත්බව මෙහිදී පෙන්වා ඇත. **මූලාශ්‍ර:**සංයු.නි: (2) නිදානවග්ග: අභිසමයසංයුත්ත:1.10.9-1.10.11 සූත්‍ර3කි, පි. 240, ESN:13:Abhisamayasamyutta: 9-11 suttas, p.733.

**3) පටිභාන පව්වේ,** බෑවුම් බිහිසුණුය, ඉන් ඇදවැටීම බියජනකය. එහෙත්,චතුසත්‍ය අවබෝධ නො කර  සසර දුක් ප්‍රපාතයට ඇදවැටීම ඊටවඩා බිහිසුණු යයි මෙහිදී පෙන්වා ඇත. **මූලාශ්‍ර:**සංයු.නි: (5-2 ): මහාවග්ග: සච්චසංයුත්ත:පබ්බතවග්ග:12.5.2 පපාත සූත්‍රය, පි. 332, ESN:56:Sacchasamyutta:42.2 The Precipice, p.2312.

**4) උස ගල්පව්වක්** මුදුනේ සිටගෙන සිටින පුද්ගලයෙකුට හාත්පස යහපත් ලෙසින්ම පෙනේ. එලෙස, සුන්දර ප්‍රඥාව ඇති, සමතැස් ඇති, පහවූ ශෝක ඇති බුදු රජාණන් වහන්සේ ඒ සෙල්පව්ව නම් දහම පහයට නැගී, ජාති ජරාවෙන් මඩනා ලද ශෝකයෙහි ගැලුනු ජන සමූහයා බලන සේකයයි මෙහිදී පෙන්වා ඇත. **මූලාශ්‍රය:**ඛු.නි: ඉතිවුත්තක: 2.2.1 විතක්ක සූත්‍රය, පි.388.

▲**මහා පොළොව උපමා-** Simile of the great earth

**1) මහා පොළොවේ** ප්‍රමාණය මැනීය නොහැකිය. එලෙස, දහම් අස ලැබීම- සෝතපන්න බව ලැබීමෙන් සිදුවන අර්ථය අප්‍රමාණ යයි මෙහි දක්වා ඇත. **මූලාශ්‍ර**: සංයු.නි: (2): නිදානවග්ග:අභිසමය සංයුත්ත:1.10.5 හා 1.10.6 පඨවි සූත්‍ර 2කි, පි. 238, ESN:13: Abhisamyutta: 5-1 & 6.2 Earth, p.729.

**2) දීර්ඝ කාලයක්** ඇවෑමෙන් මහා පොළව අවසන්වේ. එහෙත්, දීර්ඝ සසර ගමන අවසන්වීමට බොහෝ කල් ගතවේ යයි මෙහි දක්වා ඇත. **මූලාශ්‍ර**: සංයු.නි: (2 කාණ්ඩය) අනමතග්ගසංයුත්ත: 3.1.2 පඨවි සූත්‍රය,පි.298, ESN:15: Anamataggasamyutta: 2.2 The earth, p. 788.

**3) කායබලයෙන්** කලයුතු කටයුතු හැම පොළව ආධාර කරගෙන කරනු ලැබේ. එලෙස, ආරිය අටමග, අකුසල ප්‍රහීණයට හා කුසලය වඩා ගැනීමට ආධාර වන අන්දම මෙහිදී පෙන්වා ඇත. **මූලාශ්‍ර:** සංයු.නි: (5-1): මහාවග්ග: මග්ගසංයුත්ත:බලකරණීය: 1.14.1 බලසූත්‍ර 4කි, පි. 134, ESN: 45: Maggasamyutta: XIV: 149.1 - 4 suttas, p. 1692.

**4) මහා පොලවේ** ප්‍රමාණය අප්‍රමානය. එලෙස, සෝතාපන්න ආරිය ශ්‍රාවකයා නිමකල දුක අප්‍රමානවේ, ඉතිරිව ඇත්තේ පස් ගුලි 7ක් වැනි සුළු ප්‍රමාණයක් බව මෙහි දක්වා ඇත. **මූලාශ්‍ර**: සංයු.නි: (5-2): මහාවග්ග: සච්චසංයුත්ත: 12.6.5 පඨවි සූත්‍රය**,**පි. 350,ESN:56: Sacchasamyutta: VI:55.5 The Earth, p.2327.

**5)** යම්කිසි පුද්ගලයෙක් මහා පොළව නැති කරන්න යයි සිතා උදැල්ලක් ගෙන පොළොව හාරයි. එහෙත්,පොළොව මහා ගැඹුරු නිසා එසේ කිරීමට ඔහු අපොහොසත් වේ. එලෙස,මෙත්තාසහගත සිත ඇතිපුද්ගලයා, අනුන්ගේ රළුවචන ආදියෙන් සසල නොවන බව මෙහිදී පෙන්වා ඇත. **මූලාශ්‍රය:**ම.නි: 1: ඔපම්මවග්ග: 1.3.1 කකචූපම සූත්‍රය, (ඡෙදය 18), පි.327.

▲ **මහා රුක උපමා**-Simile of huge trees

**1) වනයේ ඇති මහා රුක,** යට ඇති මුල්වලින් පෝෂණය වේ. එලෙස, උපාදාන නිසා, මිනිසුන් තුල ආස්වාදය වැඩි, තණ්හාව මහත් බවට පත්වෙන අන්දම මෙහිදී පෙන්වා ඇත. **මූලාශ්‍රය:**සංයු.නි: (2) නිදානවග්ග: අභිසමයසංයුත්ත:දුක්ඛවග්ග: මහාරුක්ඛ සූත්‍ර, පි.160.

**2)** වනයේ මහා ගස් නිසා සෙසු ගස් විනාශවියයි. මේ උපමාවෙන පෙන්වා ඇත්තේ පංච නිවරණ නිසා ආධ්‍යාත්මික ජීවිතය වැනසියාමය. **මූලාශ්‍ර:** සංයු.නි: (5-1) මහාවග්ග:බොජ්ඣංගසංයුත්ත: නීවරණ වග්ග: 2.4.9 මහාරුක්ඛ සූත්‍රය, පි. 220, ESN: 46 Bojjhangasamyutta: The Hindrances: 39.9 Trees, p. 1774.

**3) වනයේ ඇති මහා රුක,**යට ඇති සියලුම මුල් නිසා ආහාර ලැබ දිගු කලක් පවති. එලෙස,සංයෝජන ධර්මතා වල ආස්වාදය නැවත නැවත දකිමින් වාසය කරනවිට නාමරූපයන්හි බැසගැනීම සිදුවේ, නාමරූප නිසා සලායතණ ආදී වශයෙන් පටිච්චසමුප්පාද ක්‍රියා වලිය නිසා දීර්ඝ කාලයක් සසරේ සැරිසරන අන්දම මෙහිදී පෙන්වා ඇත.

**මූලාශ්‍ර**: සංයු.නි: (2 ): නිදානවග්ග: අභිසමයසංයුත්ත:1.6.8 නාමරූප සූත්‍රය, පි. 164, ESN:12: Nidanasamyutta: Fetters, p.685.

▲ **මහා සමුද්‍රයේ අසිරිය පිළිබඳ උපමාව-** Simile of the Wonders of great ocean

මහා සමුද්‍රයේ අසිරිමත් කරුණු 8 ක් ඇත. එලෙස, ධම්ම විනයට අසිරිමත් බව ගෙනදෙන කරුණු 8ක් මෙහි විස්තර කර ඇත. **බලන්න:**මහා සමුද්‍රයේ අසිරිය. **මූලාශ්‍ර:**අංගු.නි: (5) 8 නිපාත: 8.1.2.9 පහාරාද සූත්‍රය, පි.103, EAN:8:19.9 Pahārāda,p.421.

▲ **මහා සල්ගස් උපමාව-** Simile of the great Sala trees

හිමාල කන්ද පිහිටකර ගෙන මහා සල් ගස් පස් ආකාරයට වැඩේ. එලෙසින්, සැදැහැඇති කුල නායකයෙක් නිසා ඔහුගේ පවුලේ උදවිය පස් ආකාරයකින්: ශ්‍රද්ධාව,ශීලය, ශ්‍රැතය, ත්‍යාගය,ප්‍රඥාව වර්ධනය වේ. **මූලාශ්‍රය:** අංගු.නි: (3) 5 නිපාත: සුමනාවග්ග: 5.1.4.10 මහාසාල සූත්‍රය, පි.90.

**ය**

**යක**

▲ **යකඩ ගුලිය උපමාව-** Simile of the Iron ball

රත්වූ යකඩ ගුලිය ඇල්ලීම හෝ එය මුවේ තාබාගැනීම නිසා මහා වේදනා ඇතිවේ. එලෙස, අසංවර සංඝයා රට වැසියන් විසින් ලබාදෙන අහර වැළඳීමේ අකුසලය, රත්වූ ලෝ ගුලියක් අනුභව කිරීම වැනිය යි මෙහි පෙන්වා ඇත. **මූලාශ්‍රය:**ඛු.නි: ඉතිවුත්තක: 3.5.2 ජීවිකා සූත්‍රය, පි.468

**යන**

▲ **යානය උපමාව-**Simile of the Vehicle

යානයකට රෝද (සක්) 4 ක් ඇත, දොරවල් ඇත. මෙහිදී ශරීරය අසුචි ආදී අපවිත්‍ර දේ පිරුන යානයකට සමකර ඇත. සක් 4 යනු කය හැසිරෙන ආකාර 4: ඇවිදීම, සිටගැනීම, හිඳගැනීම හා ඇලවීසිටීම. නව දොර: කයේ වැගිරීම් ඇති දොරටු 9 -ඇස් 2, කන් 2, නාස්පුඩු 2, කට, ලිංගය, මල මාර්ගය, අශුචි: 32ක්වූ කාය කොටස්වේ. **මූලාශ්‍ර:**සංයු.නි: (1 ): දේවතාසංයුත්ත: 1.3.9 චතුචක්ක සූත්‍රය, පි. 56, ESN: 1: Devata samyutta: 29.9 Four Wheels, p. 91. **සටහන:** කය පිලිබඳ මේ සමාන විස්තරයක් : ඛු.නි:සුත්තනිපාත:උරගවග්ග:1-11 විජය සූත්‍රය, පි.80 ද පෙන්වා ඇත.

**ර**

**රය**

▲ **රියසක උපමාව-**Simile of the cart wheels

කෙටි කලකින් අයහපත් ලෙසින් සකස් කළ රියසක (රෝද) ඉක්මනින්ම බිඳී යයි. එලෙස, මේ සසුනේ කාය, වචී හා මනෝ ක්‍රියා අයහපත් සංඝයා

ධර්මවිනයේ පහතට වැටේ, එහෙත්, බොහෝ කලක් ගතකර මැනවින් සලසන ලද රියසක බොහෝ කාලයක් පවතී. එලෙස, මේ සසුනේ කාය, වචී හා මනෝ ක්‍රියා යහපත් සංඝයා ධර්මවිනයේ වර්ධනයට පත්වේ. **මූලාශ්‍රය:**අංගු.නි: (1): 3 නිපාත: රථකාරවග්ග:3.1.2.5 සූත්‍රය, පි.250.

**ල**

**ලභ**

▲ **ලාභ සත්කාර නිසා විනාශය ඇතිවීම පෙන්වා ඇති උපමා-** Similes on downfall of the path due to Gain & honor

**1) අශ්වතරිය උපමාව-**Simile of the Mule

අශ්වතරිය යනු, කොටළුවකුට දාව, වෙළඹකුස උපන් තිරිසන් සත්‍වයාය. ඌ ගේ උපත නිසා මව විනාශයට පත්වේ. ලාභසත්කාරවලට යටවන පුද්ගලයාද එසේ තමාගේ විනාශයට ලංකරගැනීම පෙන්වීමට මේ උපමාව යොදාගෙන ඇත. **බලන්න**:සංයු.නි: නිදානවග්ග :ලාභසත්කාරසංයුත්ත: 5.4.5 අත්තවධ සූත්‍රය.

**2) බිළී වැද්දා උපමාව-** Simile of the fish hunter

බිළිය -ඇම යොදා බිළිවැද්දා මසුන් අල්ලාගනී, ඇමට හසුවන මාළුවා බොහෝ දුක් විඳ මරණයට පත්වේ. එලෙස, ලාභ සත්කාර වලට යටවෙන සංඝයා මාර්ගය විනාශ කරගන්නා බව පෙන්වීමට මේ උපමාව යොදා ගෙන ඇත. **සටහන**: ‘බිළී වැද්දා’ යනු මාරයාය. **මූලාශ්‍රය**:සංයු.නි:2: ලාභසත්කාර සංයුත්ත:දරුණුවග්ග: 5.1.2 බළිස සූත්‍රය, පි.366

**3) සිගාල උපමාව-**Simile of the fox

සිගාලයා (සිවලා, නරියා) උක්කන්ටක (කුෂ්ඨ රෝගයක්) රෝගයෙන් පෙලන විට ඌට එකතැන සිටීම අපහසුය, ඌ කවර ස්ථානයකට ගියද උගේ කැසීම නතර නොවේ. එලෙස, ලාභසත්කාර නිසා සිත මැඩිගිය මහණට, කවර තැනකට ගියද සිත සමාධියට පත් කර ගත නොහැකිවේ, දුකට පත්වේ. **මූලාශ්‍රය:** සංයු.නි: (2) නිදානවග්ග: ලාභසත්කාරසංයුත්ත:5.1.8 සිගාල සූත්‍රය, පි.372.

**4) කැසබුපියා හා පුතා උපමාව-**Simile of Father Turtle & son

පෙර කල විලක සිටි කැසබු පියා, තම පුතාගේ ආරක්ෂාව ගැන සිතා, එම විලෙන් පිටතට නොයන ලෙස සිය පුතාට අවවාද කර ඇත. එම අවවාදය නොපිළිගත් පුතා, එක් දිනක් විලෙන් බැහැරට ගියේය. එහිදී මස් වැද්දා යකඩකටුවක් සහිත හුයකින් (ලනුව) ඒ කැසබු පුතාට විද ඌ විනාශට පත් කරන ලදී. එලෙස, ලාභසත්කාර නිසා සංඝයා විනාශවීයාම මෙහි පෙන්වා ඇත. වැද්දා යනු මාරයාය, යකඩ කටුව ලාභ සත්කාර ආදියය, හුය තණ්හාවය. තණ්හාව නිසා ලාභආදියට ගිජුවන මහණ මාර්ගයේ පරිහානියට පත්වේ. **මූලාශ්‍රය:**සංයු.නි: (2): නිදානවග්ග: ලාභසත්කාර සංයුත්ත:5.1.3 කුම්මසූත්‍රය, පි.368.

**5) විදුලි අකුණ උපමාව-**Simile of lightening: විදුලි අකුණක් පතිතවූ ස්ථානය විනාශවී යයි. එලෙස, ලාභ සත්කාර නිසා සංසයා මාර්ගය විනාශ කරගැනීම මෙහි දක්වා ඇත. **මූලාශ්‍රය:** සංයු.නි: (2): නිදානවග්ග: ලාභසත්කාරසංයුත්ත: 5.1.6 අසනිවක්ක සූත්‍රය, පි.370.

**6) නපුරු බල්ලා උපමාව-** Simile of the Cruel dog: නපුරු බල්ලා යනු දමනය වී නැති සතාය. උගේ නාසය ලඟට මස්කෑලි ලංකරන්නේ නම් ඒවා ගැනීමට ඇති ආසාව නිසා ඌ තවත් නපුරු වේ. එලෙස, ලාභ සත්කාර ආදියට යටවූ පුද්ගලයා ඒවා වැඩි වැඩියෙන් ලබන විට මහා විනාශයට පත්වේ. **මූලාශ්‍රය:** සංයු.නි: (2): නිදානවග්ග: ලාභසත්කාරසංයුත්ත: 5.4.6 පංචරථසත සූත්‍රය.

**7) මීළහ්ක උපමාව-** Simile of the worm

මීළහ්ක යනු අශුචි ආදීයෙන් ජීවත්වන පණුවාය. උන්,අන්‍යයන් ගැන නොතකා, ඔවුන්ගේ අශුචිද කෑමට ගනී. එලෙස, ලාභ සත්කාර ආදිය ලබන අනුවණ භික්ෂුව, අනුන්ගේ දේ ද ගනිමින් වාසය කරති. එය ඔවුනට බොහෝ කාලයක් දුක පිණිස වේ යයි මෙහි පෙන්වා ඇත. **මූලාශ්‍රය:**නිදානවග්ග**:**ලාභසත්කාරසංයුත්ත:5.1.5 මීළහ්ක සූත්‍රය, පි.370.

▲ **බිළි සය උපමාව-**Simile of the Six Hooks

බිළිසයක් සහිත ඇමක් යොදාගෙන බිළිවැද්දා, එය විලට දමයි, බොහෝ මාළුවෝ එම ඇම ගිලගෙන විනාශයට පත්වේ. එලෙස, සළායතන මගින් අල්ලාගන්නා බාහිර අරමුණු වලට හසුවන් ලෝක සත්වයා, මාරයාගේ ඇමට හසුවී සිටින බව පෙන්වීමට මේ උපමාව යොදාගෙන ඇත. **මූලාශ්‍රය**:සංයු.නි:2:ලාභසත්කාර සංයුත්ත:දරුණුවග්ග: 5.1.2 බළිස සූත්‍රය, පි.366

**ව**

**වඳ**

▲ **වඳුරා උපමාව-** Simile of the monkey

වනයේ සිටින වඳුරෙක්, ගසින් ගසට යන්නේ එක් අත්තක් අල්ලාගෙන, එය අතහැර වෙනත් අත්තක් අල්ලා ගනිමින්ය. එලෙස, අශ්‍රැතවත් පෘතග්ජනයාහට යථාභූත ඥානය නැතිනිසා ඔහු පංච උපාදානස්කන්ධය තමන්ගේ යයි අල්වාගෙන සසර සැරිසරන අන්දම මෙහිදී විස්තර කර ඇත. **මූලාශ්‍රය**: සංයු.නි: (2) නිදානවග්ග: අභිසමයසංයුත්ත: මහාවග්ග:අස්සුතවන්තු සූත්‍ර 2කි, පි.170.

▲**වස්ත්‍ර උපමා-**Simile of Clothes

**1)** කිලිටි වස්ත්‍රයක්, වර්ණ-සායම් කළද, එහි අපිරිසිදුබව නොමැකේ. එහෙත්, පිරිසිදු වස්ත්‍රයක්, වර්ණ කලවිට, ඒ වර්ණය මැනවින් පිහිටයි. එලෙස,කෙලෙස් ඇතිවිට සිත කිලිටිවේ, කෙළෙස් නොමැතිනම් සිත යහපත් ලෙසින් පිරිසිදු බව මෙහි පෙන්වා ඇත. **මූලාශ්‍රය:** ම.නි: (1): මූලපරියායවග්ග: 1.1.7 වත්ථුපම සූත්‍රය, පි.102,

2) රජෙකුට බොහෝ අලංකාර වස්ත්‍ර ඇත. එනිසා කැමති කැමති පරිදි, කැමති කැමති වෙලාවකට, ඔහු සුදුසු වස්ත්‍ර අඳී. එලෙස, සප්ත බොජ්ඣංග දියුණු කරගත් මහණහට ඒ ධර්මතා එකින් එක ගෙන වාසය කල හැකිබව මෙහි දක්වා ඇත. **මූලාශ්‍රය:**සංයු.නි; (5-1) මහාවග්ග: බොජ්ඣංගසංයුත්ත: 2.1.4 වත්ථ සූත්‍රය, පි.178.

**3)** සියලු වස්ත්‍ර අතරින් ඉතා සිනිඳු කසී වස්ත්‍රය අග්‍රය. එලෙස කුසල් දහම් අතරින් අප්‍රමාදය අග්‍ර බව මෙහි පෙන්වා ඇත. **මූලාශ්‍රය:**සංයු.නි; (5-1) මහාවග්ග:මග්ගසංයුත්ත: 1.13 වත්ථ සූත්‍ර, පි.132.

**ස**

**සග**

▲ **සුගතියේ හා දුගතියේ යළි උපත උපමාව**-Simile of rebirth in a good place or a bad place: **මූලාශ්‍රය:** සංයු.නි: (4) සළායතනවග්ග:ගාමිණිසංයුත්ත:8.1.6 අසිබන්ධක සූත්‍රය, පි.592.

1) මහා ගලක් විලකට දැමුවිට එය යයට ගිලේ, ගලට උඩට එන්න යයි කිවත්, එය කල නොහැකි දෙයකි. එලෙස අකුසල් කල මිනිසුන් නිතැතින්ම දුගතියකට යයි.

2) ගිතෙල් කළයක් විලකට දැමුවිට එහි කැට කැබිලිති යටට යයි, තෙල් උඩට එයි. ඒ තෙල් යයට යන්න කියා, පැවසුවත් එය එසේ නොවන්නේය. එලෙස, කුසල් කල පුද්ගලයා නිතැතින්ම සුගතියට යයි.

**සත**

▲ **සත්පුරුෂ සේවනයේ යහපත හා අසත්පුරුෂ සේවනයේ අයහපත පෙන්වීමට යොදා ඇති උපමා:**Similes used to show the benefits & non benefits by associating Good people & Bad people: **මූලාශ්‍රය:** ඛු.නි: ඉතිවුත්තක: 3.3.7 සුබ ප්‍රාර්ථනා සූත්‍රය, පි.436.

**1)** විෂ පෙවූ ඊතලයක්, අනික් ඊතල හා එකතු කළහොත්, ඒවාටද විෂ ආලේපනවේ. එලෙස අසත්පුරුෂ ඇසුර අයහපත ගෙනදේ.

**2)** කුණුවූ මස් කුසතණ යෙන් වේලුවද එහි දුගඳ නතර කළ නොහැකිය. එලෙස අසත්පුරුෂයා සේවනය කරනවිට අයහපත පැතිරේ.

**3)** තුවරලා නම් සුවඳ විහිදෙන ද්‍රව්‍ය, ගසක කොළයකින් ඔතා තැබුවද ඉන් සුවඳ විහිදේ. එලෙස, සත් පුරුෂ ආශ්‍රය යහපත ගෙනදේ.

▲ **සතුන් හය දෙනාගේ උපමාව-**Simile of the six animals

මිනිසෙක් සතුන් 6 දෙනක්: නයෙක්, කිඹුලෙක්, කුරුල්ලෙක්, බල්ලෙක්,නරියෙක් හා වඳුරෙක් අල්ලා ඔවුන් දැඩි කඹවලින් ගැට ගසයි. ඉන් පසු කඹ 6 එකතුකර මැද ගැටයක් ගසා, උන් අත් හරි. එවිට නයා තමාගේ ගොදුරු බිමට යෑමට තැත් කරයි. එලෙස, සෙසු සතුන්ද තමන්ගේ පුරුදු බිමට යාමට දඟලයි. එහෙත් මැද ගැටය නිසා ඔවුන්ට උවමනා දේ කරගත නොහැකිවේ, එනිසා උන් වෙහෙසවේ. එහිසිටින බලවත්ම සතා ගේ යටතට අනින් සතුන් පත්වේ. මේ උපමාව

යොදාගෙන ඇත්තේ කායගතා සතිය යහපත් ලෙස නො වඩනා භික්ෂුවගේ ඇස මනවඩනා රූපවලට ඇදේ, මන නොවඩන රූප කෙරෙහි පිළිකුල ඇතිකරගනී. එලෙස සෙසු අංගද: කණ, නාසය, දිව, කය හා සිත. එසේ ඔහු අසංවරයෙන් කටයුතු කරන් බව පෙන්වීමටය. **මූලාශ්‍ර:** සංයු.නි: (4): සළායතනවග්ග:වේදනාසංයුත්ත: අසිවිසවග්ග:1.19.10 ඡප්පානක සූත්‍රය, පි.404.

**සඳ**

▲**සඳ උපමාව-** Simile of the moon

පසළොස්වක දින පායන පුන්සඳ එළිය සෑම අත පැතිරේ. එලෙස,නාගතිමග- දහම් මගගමන් කරන පුද්ගලයාගේ කිර්තිය සෑම අත පැතිරේ. අමාවක දින සඳ එළිය නොමැත. එලෙස, අගතිමග ගමන් කරන පුද්ගලයාට කීර්තියක් නොමැත. **මූලාශ්‍ර:** අංගු.නි: (2): 4 නිපාත: 4.1.2.7, 4.1.2.8 හා 4.1.2.9 අගති-නාගති සූත්‍ර, පි. 58, EAN:4: 17.7, 18.8 and 19.9 Wrong course, p. 154.

**සර**

▲**සරු කෙත උපමාව-**Simile of the fertile land

සරුබිමක වගා කරන්නේ නම් සරු අස්වැන්නක් ලැබවේ. එලෙස ආරිය උතුමන්ට දාන පුජාකිරීමෙන් මහා ඵල ඇතිවේ. දානය දෙන්නාට ලැබෙන පුණ්‍ය මෙලොව හා පරලොව සැප ඇතිකිරීමට හේතුවේ. **සටහන්**: ආරියෝ සරු කෙතක් වැනිය. **මූලාශ්‍ර**: අංගු.නි: ( 5): 8 නිපාත: 8.1.4.4 ඛෙත්තූපම සූත්‍රය, පි. 174, EAN:8: 34.4 The Field, p. 430.

▲ **සොරාට විඳීමට ඇති දඬුවම් පිලිබඳ උපමාව-**Simile of he punishments for a Thief

සොරකම් කිරීමේ දඬුවම් ලෙසින් සොරෙක්හට උල් වලින් ඇනීමට නියමවේ. ඒ නිසා ඔහු මහා දුක් පිඩා විඳී. එලෙස, විඤානයේ ක්‍රියා කාරිත්වය, නිසා බොහෝ දුක් වේදනා විඳීමට සිදුවන බව මෙහි පෙන්වා ඇත. **මූලාශ්‍ර :**සංයු.නි: (2): නිදානවග්ග: අභිසමය සංයුත්ත: 1.7.3 පුත්තමංස සූත්‍රය, පි. 174, ESN: 13 : Abhisamyasamyutta: 63.3 Son’s Flesh, p. 697.

**සල**

▲**සල්වනය උපමාව-**Simile of Salatree grove

සල්වනයක වර්ධනය කැමති පුද්ගලයෙක්, එහි පැමිණ, පිළිල රෝග ඇති සල්ගස් බැහැර කර ඒ වනය මැනවින් පිරිසිදු කරයි. එමගින් සල්වනය යහපත් ලෙස වැඩේ. මේ උපමාවෙන් දක්වා ඇත්තේ: සංසයා අකුසල දුරුකර, කුසලයේ පිහිටා ගන්නේ නම් සසුනේ දියුණුව ඇතිවන බවය. **මූලාශ්‍රය:**ම.නි: 1: ඔපම්මවග්ග: 1.3.1 කකචූපම සූත්‍රය (ඡෙදය 11), පි.327.

▲**සෙවනැල්ල උපමාව-** Simile of the shadow

ගසක් ඇතිනිසා එයට සෙවනැල්ලක් ඇත. යම් පුද්ගලයෙක්, පැමිණ උදැල්ලක් ගෙන් ඒ ගස උදුරා සහමුලින්ම විනාශ කළහොත්, සෙවනැල්ලක් දැකිය හැකි නොවේ. එලෙස, මේ කය නිසා ඇතිවන කුසල හා අකුසල කර්ම සෙවනැල්ල ලෙසින් එහි බැඳී ඇත. දහම දත් පුද්ගලයා, ප්‍රඥාව (නම් උදැල්ල) ඇතිකර සියලු ආසව ප්‍රහීණ කරගත්විට යලි උපතක් -සෙවනැල්ලක් දැකිය නොහැක. **මූලාශ්‍රය**: අංගු.නි: (2): 4 නිපාත: 4.4.5.5. වප්පසූත්‍රය, පි.400.

**හ**

**හම**

▲ **හමගැසූ එළදෙන උපමාව-** Simile of the Cow without skin

එළදෙනකගේ හම ගලවා ඇත්නම්, ඌ කුමන ස්ථානයකට ගියද මැසිමදුරු කරදර ඇත. එලෙස, ස්පර්ශ ආයතනයන්ට යටවූ පුද්ගලයාට බොහෝ දුක් වේදනා ඇතිවේ. **මූලාශ්‍ර :**සංයු.නි: (2): නිදානවග්ග: අභිසමය සංයුත්ත: 1.7.3 පුත්තමංස සූත්‍රය, පි. 174, ESN: 13 : Abhisamyasamyutta: 63.3 Son’s Flesh, p. 697.

**ᦶᦶᦶ**

## උපග්‍රන්ථය: 6- බුදුන් වහන්සේ -The Buddha the Blessed One (ත්‍රිපිටකයේ සඳහන් ගෝතම බුදුන් වහන්සේ පිලිබඳ විස්තර ඇසුරින් සකස්කර ඇත)

1) බුදුන් වහන්සේගේ ජීවිතයේ වැදගත් සැතපුම් කණු- Significant Mile Stones of The Buddha's Life 2) බුද්ධ උත්පත්තිය- Birth of The Buddha **3)** බුද්ධ දෙමාපියන් -Parents of The Buddha **4)** සිද්ධාර්ථ කුමරා ගේ තරුණ විය- Younger days of Prince Siddhartha 5) ගිහිගෙය අත්හැරීම- Renouncing the lay life **6)** සිද්ධාර්ථ තවුසා- Ascetic Siddhartha 7) සම්බෝධිය ලැබීම-Enlightenment 8) සද්ධර්මය දේශනා කිරීම ඇරඹීම-Commencing the Dhamma 9) බුදුගුණ- Qualities of The Buddha 10) බුදුන් වහන්සේගේ උත්තරීතර බව-Greatness of The Buddha 11) බුදුන් වහන්සේ උන්වහන්සේ හඳුන්වා ඇති ආකාරය- The way The Buddha addressed himself 12) බුදුන්වහන්සේගේ කුසලතා-Skills of The Buddha 13) බුදුන් වහන්සේගේ පෙරජීවිත- Former lives of The Buddha 14) බුදුන් වහන්සේට තිබූ දෙතිස් මහා පුරුෂ ලක්ෂණ -Thirty two marks of the Great Man 15) බුදුන් වහන්සේ හඳුන්වන නාමපද- Titles names for The Buddha 16) දෙවියෝ හා බ්‍රහ්මදෙවියෝ බුදුන්වහන්සේගේ ගුණ වැනීම- Praising The Buddha by Devas & Brahmas 17) බුද්ධ ශ්‍රාවකයෝ බුදුගුණ පැවසීම- Praising The Buddha by his disciples 18 ) අන්‍යආගමිකයන් බුදුගුණ පැවසීම- Praising The Buddha by other religious sects 19) මාරයා බුදුගුණ පැවසීම- Praising The Buddha by Mara 20) රජවරු බුදුගුණ වැනීම- Praising The Buddha by Kings 21) යක්ෂයෝ බුදුගුණ වැනීම Praising The Buddha by the Yakkas 22) බුදුන් වහන්සේට අපවාද කිරීම- Accusing The Buddha 23) ශ්‍රාවක සංඝයාට ඇතිවිස්වාසය- Faith of the Disciples 24) බුදුන් වදාළ ධර්මය- The teachings of The Buddha 25) බුදුන් වහන්සේගේ වාදය- What The Buddha declared 26) බුදුන් වහන්සේ පිලිබඳ අන්‍යආගමිකයන් ගේ මත-Views of Other sectarians about The Buddha 27) බුද්ධ ශ්‍රාවකයෝ-පැවිදි හා ගිහි- Disciples of The Buddha: Sangha & Lay people 28) බුදුන් වහන්සේ ගේ විහරණ- Abiding s of The Buddha 29) බුදුන් වහන්සේ ධර්මය දේශනා කිරීමේ පිළිවෙල - Teaching methods of The Buddha 30) බුදුන් වහන්සේ ශ්‍රාවකයන් හික්මවීමේ පිළිවෙල - Training methods of The Buddha 31) බුදුන් වහන්සේ දැක්වූ ප්‍රාතිහාර්යන්- The miracles performed by The Buddha 32) බුදුන් වහන්සේ වස් විසූ ස්ථාන- Rain retreats abodes of The Buddha 33) බුදුන් වහන්සේ මහළුවීම-The Buddha becoming old 34) බුද්ධ ආයුෂ- Lifespan of The Buddha 35 ) බුදුන් වහන්සේගේ පරිනිබ්බානය- Final Passing away of The Buddha

## 1) **බුදුන් වහන්සේගේ ජීවිතයේ වැදගත් සැතපුම් කණු-** Significant Mile Stones of The Buddha's Life

▲ **උපත සිට මහා පරිනිබ්බානය තෙක්-**From the Birth to the Final Passing

* **උපත:** ලුම්බිණි ක්‍රි.පු 624 (Birth (Lumbini) - 624 B.C.E.)

* **විවාහය**: යසෝධරා කුමරිය සමග, කපිලවස්තු නුවර ක්‍රි.පු. 608 (Marriage (Kapilavastu) - 608 B.C.E)

* **මහා අභිනිෂ්ක්‍රමණය**: කපිලවස්තු නුවර ක්‍රි.පු 595 (Renunciation (Kapilavastu) - 595 B.C.E)

* **සම්බෝධිය:** බුද්ධ ගයාව ක්‍රි.පු. 589 (Enlightenment (Bodh Gaya) - 589 B.C.E)

***ප්‍රථම ධර්ම දේශනාව**: ධම්මචක්කප්පවත්තන බරණැස, සූත්‍රය, සාරානාථය ක්‍රි.පු.588 (First sermon at Saranath, Varanasi 588 B.C.E)

***මහාපරිනිර්වාණය: කුසිනාරාව** ක්‍රි.පු. 544 ( The Greatpassingaway - 544 B.C.E).

**මූලාශ්‍ර:** මහාවංශය ඇතුළු ඉතිහාස ග්‍රන්ථ ආශ්‍රිතව.

## 2) **බුද්ධ උත්පත්තිය-** Birth of The Buddha

▲ බුද්ධ උත්පත්තිය යනු, බෝසතුන්, තුසිත දේවලෝකයේ සිට මිනිස් ලෝකයේ මහමායා දේවියගේ කුස තුලට පැමිණීම හා ලුම්බිණි උයනේ දී උපත සිදුවීමය.

▼**මිනිස් ලොව උපත** ලැබීමට පෙර බෝධිසත්ව ලෙසින් බුදුන් වහන්සේ තුසිත දේවලෝකයේ වැඩසිටීම මෙසේ විස්තර කර ඇත:

**“ ආනන්දය, බෝසත්හු සිහිනුවණින් යුතුව තුසිත දෙව්ලොව ට පැමිණියහ... සිහි නුවණින් යුතුව, ආයු ඇති තාක් කල් තුසිත දෙව්ලොව සිටියහ... සිහිනුවනින් යුතුව තුසිත දෙව්ලොවින් චුතව, මව් කුස පිලිසඳ ගත්හ. ඒ අවස්ථාවේදී, දේවඅනුභාව ඉක්මවූ,**

**අප්‍රමානවූ, දිප්තිමත්වූ මහා ආලෝකයක් ලෝකය පුරා පැතිර ගියේය..."**

**සටහන:** බුදුන් වහන්සේ තුසිතයේ පහළවීම, මිනිස්ලොව උත්පත්තිය ලැබීම පිලිබඳ අසිරිමත් විස්තර ම.නි: (3) 3.3.3 ආචාරියඅද්භූත සූත්‍රයෙහි (පි.302) දක්වා ඇත. **මූලාශ්‍ර:** අංගු.නි: (2 ) 4 නිපාත: 4.3.3.7. තථාගත අච්ඡරිය සූත්‍රය, පි. 272, EAN:4: 127.7. Astounding, p. 195.

▼ **බුදුන් වහන්සේ**, බෝසතුන් ලෙසින් තුසිතදෙව්ලොව සිට මිනිස්ලෝකයේ මව් කුසයට පැමිණීම ගැන, ආනන්ද තෙරුන්හට මෙසේ වදාළහ:

**“...බොධිසත්තො තුසිතා කායා චවිත්වා මාතුකුච්ඡිං ඔක්කමි...”**

**මූලාශ්‍ර:** ම.නි: (3): 3.3.3. ආචාරියා අද්භූත සූත්‍රය, පි.302, EMN: 123-Wonderful and marvelous, p. 896.

▼**මේ සූත්‍රයේදී ආනන්ද තෙරුන් මෙසේ පවසා ඇත:** "...මාවිසින් මෙම කරුණ භාග්‍යවතුන් සමීපයේදී අසනලදී:

**'ආනන්ද, යම්සේ සෙසු ස්ත්‍රීන්, ඉඳගෙන (වැද) , ඇලවී (හොත්තාවවූ) හෝ (දරුවන්) ප්‍රසව කරති, එහෙත් බෝසත්මව එලෙස බෝසතුන් ප්‍රසව නොකරයි...සිටගෙන (සිටිලෙසින්) බෝසතුන් ප්‍රසව කරති' "**.

මූලාශ්‍රය: ම.නි: (3) 3.3.3 ආචාරියාඅද්භූත සූත්‍රය, පි.302.

▼ **බුද්ධ උත්පත්තිය** ගැන දෙවියන් සතුටුවීම, අසිත තවුසා, ළදරු කුමාරයා දැකීමට සුද්දෝධන රජුගේ මැඳුරට පැමිණීම, බෝසත් කුමරා නියතයෙන්ම සම්බෝධිය ලැබීම ප්‍රකාශ කිරීම ආදිය මේ සූත්‍රයේ විස්තරාත්මකව දක්වා ඇත:

* **අසිතතවුසා විමසූ විට** දෙවියන් තමන් සතුටට පත්වීමට කරුණු මෙසේ පවසා ඇත:

**"සම්‍යක් සම්බෝධියට උත්තම රත්නය වූ...අතුල්‍යවූ ඒ බෝධිසත්ව තෙමේ දෙව්මිනිසුන්ට හිතසුව පිණිස මිනිස්ලොව ශාක්‍යජනපදයෙහි ලුම්බිණි නම් ගම්හි උපන. එහෙයින්, අතිශයින් කල්‍යරූප වූවොමෝ, තුටුවම්හ"**

* දෙවියන්ගේ එ දේවවාක්‍යය අසා අසිත තෙමේ ත්වරිතව -දෙව්පුරයෙන් බටුයේය. සුදොවුන් රජුගේ භවනයට එළැඹියේය. එහි පැමිණ **'කුමර කොහිද? මම ද ඔහු දක්නා කැමත්තෙමි"** යන බස ශාක්‍යයනට කිහ.

* ලක්ෂණ ශාස්ත්‍රයෙහිත් වේදමන්ත්‍රයන්හිත් කෙළ පැමිණි එ තවුසා ශාක්‍ය ශ්‍රේෂ්ඨයා පිළිගෙන පිරික්සනුයේ පහන් සිත් ඇතිව **"ද්විපාදොත්තම මේ කුමර අනුත්තර"** යන බස් පල කෙළේය..."**මෙ කුමර අනුත්තර සම්බෝධියට පැමිණෙයි. පරම විශුද්ධ නිර්වාණය දක්නා සුළු මෙතෙම බහුජන හිතානුකම්පා ඇතියේ දම්සක් පවත්වන්නේය. මොහුගේ ශාසනය පතළ වන්නේය"**. **මූලාශ්‍ර:**ඛු.නි:සු.නි:මහාවග්ග:3-11 නාලක සූත්‍රය, පි.232.

▼ **ලුම්බිණියේ තමන්වහන්සේගේ උපත**, මෙලෝකයේ අවසාන උපත බව බුදුන් වහන්සේ වදාළහ:

**"...ආනන්දය, උපන් ඇසිල්ලෙහි බෝසතුන් සමපාදයෙන් බිම සිට උතුරුදිශාවට සත් පියවර තබති...අභීත බස් පවසති:**

**'මං ලොවට අග්‍රවෙමි, මම ලොවට ශ්‍රේෂ්ඨවෙමි, මමලොවට ජ්‍යේෂ්ඨවෙමි, මේ අන්තිම ජාතියය, පුනර්භවයක් නැත...'". (අගෙගා හමසමි ලොකසස - සෙටෙඨාහමසමි ලොකසස, ජෙටෙඨා හමසමි ලොකසස - අයමනතිමා ජාති, නතපීදානි පුනබභවො ති.)**: **මූලාශ්‍රය**: ම.නි: (3) 3.3.3 ආචාරියාඅද්භූත සූත්‍රය, පි.302. **සටහන්:** * නේපාලයේ පිහිටි ලුම්බිණි උයන 'රුම්මින්දෙයි' ලෙසින් මෙවක හඳුන්වති. බුදුඋපතෙන් වසර 316 ක් කල් ගතවූ පසු එහි පැමිණි අශෝක අධිරාජයා, ඒ උතුම් සිදුවීම

අනුස්මරණය කරනුවස්, ස්ථම්භයක් ගොඩනගා එම ගලේ (අශෝකස්ත්ම්භයේ) මෙලෙස අකුරුකොටවා තිබේ:

**"මේ ස්ථානයේ ශාක්‍ය මුණිවූ බුදුන් වහන්සේගේ උපත සිදුවිය'. (හිද බුද්ධෙ ජාතේ ශාක්‍ය මුණි).** ඒ කුළුණ, අදද, ලුම්බිණි උයනේ අභිමානවත්ව වැජඹේ. ** 7 නි සියවසේ මැද භාගයේදී පමණ, චීනයේ සිට පැමිණි හියුන් ෂියන් (Hiuen Tsiang) භික්ෂුව විසින් තමාගේ පූජනීය වන්දනා ගමන පිළිබඳ රචනා කරන ලද පොතේ, එතුමන් ලුම්බිණි උයනට පැමිණි බව හා එහිදී අශෝක කුළුණ දුටුබව සඳහන් කර ඇත. ** කීර්තිමත් පුරාවිද්‍යාඥ යෙකුවූ, ඉංග්‍රීසි ජාතික සෙන්පති කනින්හැම් විසින් 1896 වසරේදී කරනලද පුරාවිද්‍යා කැනීම් වල ප්‍රතිඵලයක් ලෙසින් වර්තමාන ලෝකයාට,ලුම්බිණි උයන පිළිබඳ තොරතුරු දැනගැනීමට හැකිවිඇත.

**▼වෙනත් මූලාශ්‍ර:**

**1.** " දඹදිව මධ්‍යදේශයෙහි (උත්තර භාරතයට අයත්) හිමාල පර්වත ප්‍රාන්තයෙහි සාධුජන නිකෙතනයක් වූ ශාක්‍යජනපදයෙහි කපිල ආදී මහා ඉර්ෂින්ගේ වාසභූමියවූ කපිලවස්තු නගරයෙහි උභයකුල පාරිශුද්ධ ශුද්ධෝදන ශාක්‍ය රාජයාගේ අගමෙහෙසියවූ මහාමායා දේවිය කුස පිළිසඳ ගත් අප මහා බෝසතාණෝ වික්‍රමපූර්ව 566 වන වර්ෂයෙහි වෙසක් පුන් පොහෝදින ලුම්බිණි නම් සාලවන උද්‍යානහි දී මව්කුසින් බිහිවූහ". **සටහන:** ඉපදුන වර්ෂය : වික්‍රම වර්ෂය ආරම්භ වූයේ ක්‍රි.පු. 58 වැන්නේහිය. වී.පු.566 නි වර්ෂය ක්‍රි.පු. 624 වන වර්ෂයවේ. මෙය වර්තමාන ක්‍රිස්තුවර්ෂයට එකතුවීමෙන් 2581 ක් වෙයි. මෙය ලක්දිව ව්‍යවහාර වන බුද්ධවර්ෂයට සරිලයි. ඒ අනුව මිට වර්ෂ 2580 කට පෙර බුදුරජානන් වහන්සේ උපත් සේක. බුද්ධජන්මවර්ෂය ක්‍රි.පු, 583 වන වර්ෂයයි යුරෝපිය පඬුවෝ කියති. **මූලාශ්‍රය:**වින.පි:මහාවග්ග පාලි 1: ප්‍රස්තාවනාව,පි 16:අතිගරු පරවාහැර ශ්‍රී වජිරඥාන හිමි.

2. "Siddhattha Gotama who became the Buddha, the Enlightened One, may have lived from about 563-483 B.C., through many modern scholars suggest a later dating. Oriental traditions offer a number of alternative dating's, that favored in Sri Lanka and south-east Asia being 623-543...". **බලන්න:** EDN: The life of The Buddha:p.13.

3. **බුදුන් වහන්සේගේ උපත කෙටි හැඳින්වීමක්:** මිට වසර 2600ට පෙර,වෙසක් පුර පසළොස්වක පොහෝදින ලුම්බිණි සල්උයනේදී (වර්තමානයේ රුමෙන්දී, නේපාලයේ (modern Rumindei in Nepal), කපිලවස්තුපුර, සුද්දෝධන රජුගේ අග මෙහෙසිය, මහාමයා දේවිය, තම දෙමාපියන් ගේ නිවසපිහිටි දේවදහ කරා යන අතරමගදී, ළදරු කුමාරයෙක් බිහිකාලාය. ඒ කුමරා සිද්ධාර්ථ ලෙසින් නම් කරන ලදී. ඒ අපගේ බුදුන් වහන්සේගේ ගිහි නමය. **මූලාශ්‍රය:** http://www.beyondthenet.net/buddha/gallery/desc1a.htm

**4. The Light of Asia**

Thus came he to be born again for men.

Below the highest sphere four Regents sit

Who rule our world, and under them are zones

Nearer, but high, where saintliest spirits dead

Wait thrice ten thousand years, then Eve again;

And on Lord Buddha, waiting in that sky,

Came for our sakes the five sure signs of birth

So that the Devas knew the signs, and said

”Buddha will go again to help the World.”

”Yea!” spake He, “now I go to help the World

This last of many times; for birth and death

End hence for me and those who learn my Law.

I will go down among the Sākyas,

Under the southward snows of Himalay,

Where pious people live and a just King.”

**මූලාශ්‍රය:** The Light of Asia by Edwin Arnold, PBS:Wheel no29, 1980.

**5. අශ්වගෝෂ ගේ ‘බුද්ධ චරිත’ කාව්‍යයේ ‘බුදුහිමි උපත’ ඇසුරෙන්:**

1 කපිල මහා ඉසි වැඩසිටි- උස් කඳු වැටිවලින් වටවූ,
නුවරක් විය අසිරිමත්- කපිලවත්තු යයි නමිලත්.

2 දිළිඳු අඳුර යටපත් කරමින්- සිරිසරෙන් ඒ නුවර ලෙලදේ,
ඒ පුර දනගේ සතුටු සිනාරැලි,- පුරය බබලයි, අසිරිමත්ලෙසින්.

3 හිරු පෙළපතට බන්ධුවූ, සුද්දෝධන නම්වූ නිරුඳු,
පාලනය කරා නුවර මැනවින්- උතුම් සක්විති රජෙක් විලසින්.

4 උතුම් අග මෙහෙසිය- සිල්වත් මායා දේවිය,
භූපති තුටු කරමින් -හැමට දයාව පාමින්,
බබලන පහනක් මෙන්- විසුවා රජ මැදුරේ සතුටින්.

5 වසමින් තුසිත දිව් විමනේ- උතුම් බෝසතුන් අපගේ,
එනලෙසින් මහා නාරජු , තම නිවසවූ නන්ද බෙනයට,
පිවිසුනා දේවිය කුසතුළට- තුන් ලොව එළිය කරමින්.

6 දළ හයක් ඇතුව සැරිසරන- සුදු ඇතෙකු මෙන් හිමවතේ,
පවිටු අදහම් නසාලන්නට- දෙව් මිනිසුන්ගේ පිහිටට,
පෙර උතුම් පැතුමන් ඉටුවී- බෝසතුන් වැඩියාය මෙලොවට.

7 ලෝක පාලක දෙවියන්- උතුම් මව පුතු සුරකින්ට,

දසත එළිය කරමින්- වැඩියෝය දෙව්ලොව සිට.

8 රුවියක් ඇතිවුනා රජ බිසවට- ලුම්බිණි සල් උයන දකින්නට,
රජ වරම ඇති මහාපෙරහරක්- පිටත්වුවා රජ මැදුර සිට.

9 සුපිපි සල්මල් දැක සතුටින්- සොම්නසට පත් දේවිය,
මලින් බර සල් අත්තක්- අල්ලා ගත්තා තුටියෙන්,
ඒවිට, බෝසත් දරු කැටියා- සැනෙන් මව් කුසින් පිටවුවා.

10 වලාකුළු මැඩ නැගී එන හිරු,- අඳුර පහකර එළිය දෙන සේ,
පහසුවෙන්, මනා සුවයෙන්- වැඩියා ලොවට මහා බෝසතුන්.

11 සතරවරම් දෙව් රජවරුන්- පිළිගත්තා කුමරු දිව සළුවෙන්,
පතිතවිය සිසිල්, උණු දිය දහරා- මව පුතු දෙදෙන නහවා.

12 දේවියගේ උකුලේ සිට- බෝසතුන් බැස්සා බිමට,
සුමුදු දෙපතුල සිපගනිමින්- සත් නෙලුම් මල් පැනනැගිනි.

13 රන් පියුම් මත සුමුදු පා තබා- සතක් පියවර උතුරුට තබා,
පැවසුවා මෙලෙස සතුටින්- සුමදුර හඬ පතුරුවමින්.

14 මම ලොවට අගවෙමි, දෙටුවෙමි- උතුම්ව, සසරින් එතර වෙන්නෙමි,
දෙසමින් අමා සදහම් ලොවට- විමුක්තියේ මග දක්වමි,මේ අන්තිම
උපතය මාගේ - යලි භවයක් නැත මාහට.

**සටහන:** ආචාරියා අශ්වගෝෂ, ක්‍රි.ව. පලවෙනි සිවසේ, ඉන්දියාවේ, රජ කළ කනිෂ්ක රජුගේ ආධ්‍යාත්මිකඋපදේශකයාය. ‘බුද්ධ චරිත කාව්‍ය’ ඔහු විසින් රචිත සංස්කෘත කවිපෙළකි.

## 3) **බුද්ධ දෙමාපියන් -**Parents of The Buddha

▲ **බුදුන් වහන්සේගේ** පියා සුද්ධෝදන රජ, වැදූ මව මායා දේවිය, රාජධානිය කිඹුල්වත් නුවර යයි මෙහි විස්තර කර ඇත. **මූලාශ්‍ර:** දීඝ.නි: ( 2 ): 1: මහාපදාන සූත්‍රය,ඡෙද:11 හා13, පි. 18, EDN: 14 Mahâpadāna Sutta: The Great Discourse on the Lineage, p. 151.

▼ **බුද්ධ මාතාව,** මහාමායාදේවිය, අල්ප ආයුෂ ඇතිබවත්, බෝසතුන් උපන් සත්දවසකින් පසුව කලුරිය කර තුසිත දේවනිකායේ යළිඋපත ලබන බව මෙහි දක්වා ඇත. **සටහන**: මහාමායා දේවියගේ නැගණිය, ප්‍රජාපති ගෝතමී දේවිය, බුදුන් වහන්සේගේ සුළුමව ලෙසින් ළදරු කුමරා පෝෂණය කළාය. **මූලාශ්‍රය**: බු.නි: උදානපාලිය: 5.2 අප්පායුක සූත්‍රය, පි.250.

▼ **ප්‍රජාපති ගෝතමී දේවිය**, පැවිදිව, මහා ප්‍රජාපති ගෝතමිය ලෙසින් හඳුන්වා ඇත. එතුමිය බුදුසසුනේ ජේෂ්ඨතම භික්ෂුනිය වුවාය. **බලන්න**:උපග්‍රන්ථය:2. **එතුමියගේ අපදානයේ මෙසේ දැක්වේ:**

“සුගතයන් වහන්ස, මම ඔබගේ කිරි මව්ය.
සදහම් මාහට පෙවූ, ඔබ මගේ පියාණන්ය.
මහා වීරයාණෙනි, මා විසින් ඔබ ඇතිදැඩි කළේය

මගේ මේ උතුම් දහම් කය ඔබ විසින් නිම කළේය.

ඔබගේ සා පවස, මගේ කිරි පොවා සංසිඳුවෙමි,
ඔබ පෙවූදහම් පැණියෙන්, මගේ බව පවස නිමවිනි.

'රජමාතා', 'රජ බිසව' තනතුරු මහිලාවන්ට වටිනේය.
ඒ හැමට වඩා 'බුද්ධ මාතා' පදය, උතුම්ය, මාහැඟිය.

**මූලාශ්‍රය**: බු.නි: අපදාන පාළි, ථෙරි අපදාන, 7 මහා පජාපති ගෝතමී අපදානය, පි. 54.

## 4) **සිද්ධාර්ථ කුමරා ගේ තරුණ විය-** Younger days of Prince Siddhartha

▲ තමන් වහන්සේ තරුණ කාලය රජසැප ඇතිව වාසය කළබව බුදුන් වහන්සේ මෙසේ පෙන්වා ඇත:

"මාගේ පියාගේ වාසස්ථානයේ දී මා පෝෂණය කළේ, රැකබලාගත්තේ ඉතා සියුමැලි ලෙසින්ය, සුකුමාර ලෙසින්ය ...මගේ ආස්වාදය පිණිසම නිවසේ නෙලුම් පොකුණු නිර්මාණය කොට තිබුණි...මා පරිහරණය කලේ කාසි රටේ (බරණැස් නුවර) සකස්කළ සඳුන් පමණි...මගේ ඇඳුම් නිමකොට තිබුනේ කසීසළු වලින්ය....ගිම්හාන, හේමන්ත හා වස්සාන ඍතු තුනේදී කල්ගෙවීම පිණිස මට ප්‍රසාද තුනක් විය: හේමන්ත පාය, ගිම්හාන පාය හා වස්සාන පාය... කාන්තාවන් ගෙන් පමණක් සැදුම්ලත් සංගීත කණ්ඩායම් වල සංගීත ප්‍රසංගයන් නරඹමින්, විනෝදවෙමින් සිව්මස් වැසි කාලය මා ගතකළේ වස්සාන පායතුළදිය...". **මූලාශ්‍රය:** අංගු.නි: (1) 3 නිපාත:3.1.4.9 සූත්‍රය, පි.302, EAN:3: 39.9 Delicate, p.94.

▼ **සිදුහත් කුමරුගේ ජීවිතය**

"මම එකුන්තිස්වසක් ගිහිගෙයි වාසය කෙළෙමි. මට රම්‍ය, සුරම්‍ය, සුභ යන උතුම් තුන් පහයන් විය. මොනවට සැරසුණු සතළිස් දහසක් පරිවාරස්ත්‍රීහු වූහ. හද්ද කච්චනාව (යශෝධරාව) අග මෙහෙසිය විය. පුත්‍ර තෙමේ රාහුල නම් විය". **මූලාශ්‍රය:** බු.නි: බුද්ධවංශ පාලිය: චරියා පිටකය, ගෝතම බුද්ධවංශය, පි.264

▼ **යශෝධරා උතුම් රහත් තෙරණිය**, තම පරිනිබ්බානය පිණිස අවසර ලබගනුවස්, බුදුන් වහන්සේ වෙත පැමිණ මෙසේ වදාළහ:

මහා විරයනි, උතුම් සම්බුදු හිමියනි- කැත් කුමරියවූ යශෝධරා මම වෙමි,
ගිහි කල ඔබගේ ප්‍රජාපතිය වූ වෙමි- දයාවෙන්, කරුණාවෙන් හිමිපිදුවෙමි.
**මූලාශ්‍රය:** බු.නි: අපදාන පාලිය: ථෙරිඅපදාන: 28 යශෝධරා අපදානය, පි.172.

## 5) **ගිහිගෙය අත්හැරීම-** Renouncing the lay life

▲ තමන්වහන්සේ ගිහිගෙය අත්හැරීම- අභිනිෂ්ක්‍රමණයට පසුබිම්වූ කරුණු බුදුන් වහන්සේ මෙසේ පෙන්වා ඇත.

"තරුණවියේ, එවන් අසිරිමත්, සිව්මැලි, සියළු සැපපහසු ඇති ජීවිතයකට මැදිව සිටියද, මගේ සිතට මෙවන් සිතුවිලි පහළවිය: සාමාන්‍ය ලෝවැසියෙක් (පෘථග්ජන පුද්ගලයෙක්) සැමදෙනාම මහළුව

දිරායනබව, ලෙඩවී බොහෝ දුක් විඳිනබව හා මරණයට පත්වියනබව දැන සිටියද, තමන්ද, ඒ සවභාවයෙන් නිදහස් නොවනබව නොසිතා, මහළුවියට පත්වූවෙක්, රෝගියෙක් හෝ මියැදුන කෙනෙක් දැකීමෙන් (ලෝකසවභාවය නුවණින් නොදුටු හෙයින්) පිළිකුලක් ඇතිකර ගනී; සිත අප්‍රසන්න කරගනි, අපහසුතාවයකට පත්වෙයි. මමද (සිදුහත් කුමරා) මේ ලෝක ස්වභාවයෙන් නිදහස්වී නොමැත; එසේනම්, වයසට ගිය කෙනෙක්; රෝගියෙක් නැත්නම් මියගිය කෙනෙක් දුටුවිට, පිළිකුලක්, අප්‍රසන්නබවක්, නොකැමැති බවක් මට ඇතිවේනම් එය සුදුසුනැත.. ඒ ගැන ආවර්ජනා කරනවිටදී, තරුණ මදය, ආරෝග්‍ය මදය, ජීවන මදය මා සිතින් සහමුලින්ම පහවිණි...". **මූලාශ්‍රය:** අංගු.නි: (1) 3 නිපාත:3.1.4.9 සූත්‍රය, පි.302, EAN:3: 39.9 Delicate, p.94.

▼ **බුදුන් වහන්සේ මෙසේ වදාළහ**

"මගේ සම්බෝධියට පෙර, බෝසතුන් සේ සිටියදි මට මෙවැනි සිතුවිල්ලක් ඇතිවිය: ගිහිජිවිතය, මිනිසුන්ගෙන් පිරුන තදබදවූ , (කෙල්ස්) දුවිලි සහිත තැනකි; අනගාරික ජීවිතය විවෘතවූ, පුළුල් එකකි. ගිහි ගෙයි ජිවත් වෙමින්, පිරිසිදු- ඔපකල සිප්පිකටුවක් වැනි නිමල - තපස් ජීවිතයක් ගත කිරීම පසුනොවේ. මගේ කෙස් මුඩුකර , රැවුල බා, කහ සිවුරක් දරා ගිහිගෙයින් නික්මෙන්නේ නම් සුදුසුය යන සිතිවිල්ල මට ඇතිවිය. **මූලාශ්‍ර**: ම.නි: (1) මහාසච්චක සූත්‍රය, පි. 579, EMN: 36 Maha Sacchaka sutta, p. 309.

▼ **ගිහිගෙයින් නික්මීම**

**"**තරුණ වියෙහි, කළු කෙස් ඇති, සොඳුරු යොවුන් වියේ පසුවන කල.. මගේ දෙමාපියන් නො කැමතිව, කඳුළු පිරුන මුහුණු ඇතිව, හඬමින් වැලපෙමින් සිටියදී, කෙස් රැවුල් බා කහවත් හැඳ ගිහි ගෙයින් නික්ම පැවිද්දට පැමිණියෙමි. එලෙස පැවිදිව 'සත්‍ය කුමක්ද?' (කිං කුශලගවේෂී) - උතුම් ශාන්ත පදය (නිවන)සොයමින් ඇවිද්දෙමි". **සටහන:** මේ හා සමාන විස්තරයක්, ම.නි: (2) බෝධිරාජකුමාර සූත්‍රයේ පෙන්වා ඇත. **මූලාශ්‍ර**: ම.නි: (1) ආරිය පර්යේෂණ සූත්‍රය, පි. 413, EMN,:26 The Noble Search, p.242.

▼ **සිදුහත්** කුමරු ගිහිගෙන් නික්මීම ගැන කාලුදායි තෙරුන් මෙසේ පවසා ඇත.

" ...බෝසත් සිදුහතුන් සමගම වැඩුනෙමි. ඔහුට ප්‍රියවූ දයාබරවූවූ නීතිදක්ෂ සහායකයෙක් වීමි...වයසින් එකුන්තිස් හැවිරිදූ වූ බෝසත් තෙමේ ගිහි ගෙයින් නික්මුනේය...": **මූලාශ්‍රය**: බු.නි: අපදානපාලිය1: 34, පි.181, අපදාන පාලිය 2-1: 546, පි.394.

▼ **බුදුන් වහන්සේ මෙසේ වදාළහ**

**"**සතර පෙර නිමිති දැක අශ්ව යානයකින් අභිනිෂ්ක්‍රමණය කෙළෙමි, මම සවසක් දුෂ්කර වූ ප්‍රධන් විරිය කෙළෙමි".: **මූලාශ්‍රය:** බු.නි: බුද්ධවංශ පාලිය:චරියා පිටකය: ගෝතම බුද්ධවංශ, පි.264.

▼ **මහා පරිනිබ්බාන සූත්‍රයෙදී,** බුදුන් වහන්සේ , සුභද්‍ර පරිබ්‍රජකයාට මෙසේ වදාළහ:

"...කුසල නම්වූ නිවන් මග සොයා මම පැවිදිවූවෙමි..වයසින් එකුන්තිසක් (31) වූවෙමි... යම් කලක මම පැවිදිවිද, එදා සිට මේ දක්වා පනස් පස් වසරක් ඉකුත් විය..."

## 6) සිද්ධාර්ථ තවුසා- Ascetic Siddhartha

▲ ගිහිගෙය හැරදැමූ සිදුහත් තවුසා, සත්‍ය සොයා යන්නේ, හිමවතේ සිට රජගහනුවරට පැමිණියහ.එහිදී බිම්බිසාර රජතුමාට, සිදුහත් තවුසා හමුවීම මෙසේ දක්වා ඇත:

"පසැස් ඇස් ඇති උතුම් මුණිඳුන් - මහා රජ සැප ඉවත දමමින්,
ජරා, මරණ හැම ලෙඩදුකින් - ලෝසත යටවූ බව දැක නුවණින්,
මනරම් කපිලවස්තු පුරයෙන් - පිටත්වූ සැටි කියමි මෙලෙසින්.

කටයතු බහුල, බොහො දෙන ගැවසුනු,තැනකි ගිහිගෙය කෙලෙස් දූවිලි පිරුණු.
විවේකය ගෙනදෙන, පබ්බජාව ට ඇලි, කුමරු නික්මුනා, කම් සැපට නොම ඇලි.
පැවිදිව, ඉවත දැම්මා තුන් දුසිරිතය,දිවිය පිරිසුදු කළා ලබමින් සුචරිතය.
පිඩු සිඟා යමින් සතුටුව ලද දෙයින්, හුරුවුණා තපස් දිවියට මැනවින්.

නිල් පැහැති උස් කඳු වැටි පසුකරමින්, පලාවන් ලඳු බිමේ විහරනය ලබමින්,
විවේකය සුවය නොමදවම විඳිමින් බෝසතුන් පිය තැබුවා සිහිනුවණින්.
තනිව හැසිරෙන මහා ඇතකු විලසට, මගධයේ බිම්සර රජුගේ රජගහ නුවරට,

ශාන්තව පිය තබමින්, බිමට නැමුන දෙනතින්,
වැඩියා උතුම් මුණි නුවරට,එහි දන මචිත කරමින්.

මාලිගාවේ සිව්මැදුර කවුළුව ළඟ සිටි, නිරිඳු දුටුවා, සිදුහත් මුණි වඩින සැටි,
මහා පුරිස් ලකුණු යුත් මනරම් රුව දැකලා,
තුටුව, පැවසුවා මෙලෙස රජ පිරිස අමතලා.

සබඳයනි, බලන්න මේ අසිරිමත් දැකුම! රජ කුමරෙක් වැනි තෙද ඇති, දැකුම්කළු,

පිවිතුරු රන් පැහැති මන බඳන රුවක් ඇති, තවුසෙක් නුවර සැරිසරයි, සංසුන් විලසින්.

ඔහුගේ චත පැහැපත්ය, ගමන ශාන්තය,නිසැකයෙන් මොහු ගේ උපත කුලවත්ය.

ලැබුන ලෙස තම දෙටු පුතු දැකගන්නට, බෝසතුන් දැක රජු පත්විය සොම්නසට.

වහා රාජ බටයන් අමතා,-මුණි වඩින තැන විමසා, හනික ආපසු එන ලෙසට-දුන්නා අණ රජ පිරිසට.

ගෙයින් ගෙයට වඩිමින්, පිඩු සිඟමින්, දැමුණු ඉඳුරන් ඇතිව, සංසුන් විලසින්,

සිදුහත් තපසුන් නුවර සැරිසරමින්, දන් ලබා පිටත්විය නුවර දොරටුවෙන්. පාන්ඩව පව්ව දෙසට දිවාවිහරණයට.

සිදුහත් තපසුන් නික්මුණ බව දැක, පසුපසින් පැමිණි රාජ දූතයන් සැම, නතරවී කතිකා කලෝය මෙලෙසින්.

ඒ තපස් බවතුන්, පව්වේ වැඩ වසනා බවට, අපගෙන් කෙනෙක් පිටවී, ගොස් රජ මැදුරට,

දන්වන්න ඒ පුවත අප නිරිඳුන්හට නොවලහා, සෙසු අපි මෙහි රැඳෙමු, රජු එනතෙක් මග බලා.

රජ දූතයා සැනින් දිව ගියා නුවරට,පැවසුවා ඒ පුවත බිම්සර මහා රජුට,

"දේවයිනි, ඒ මුණි, පාන්ඩව පව්වේ, වැඩ සිටිති, සිහරජෙක් සේ, ගල්ගුහාවේ".

විගසින් රජ වාහනය හා පිරිවර කැඳවමින්, නිරිඳු නොපමාව පව්වට අසලට පැමිණෙමින්,

යානයෙන් බැස සැනෙන්, කන්ද නැග්ගා විගසින්, බැහැදැක්කා උතුම් තපසුන් ගරු බුහුමනින්,

විමසා සුවදුක්, ඇමතුවා බෝසතුන් මෙලෙසින්.

'ඔබ  තවමත් තරුණ සුකුමාල මානවකයකි, නව යොවුන් වියේ කඩවසම් තරුණයෙකි,

ඔබගේ පෙනුම, හැසිරීම හා පැවැතුමෙන්, පෙනේ, ඇතිබව උසස් කුලවත් මාපියන්.

රටක් රජයක් පාලනයට ඔබ සුදුසුබව, රජ පිරිස, යුද හමුදාව නතු කරගන්න,

ඔබ සමත්බව පෙනේ මට නිසැකයෙන්ම, මා සතු රජ සැප විඳමින් මෙහි රැඳෙනු මැන, උතුමානෙනි, පවසන්න ඔබේ වත ගොත.

" රජතුමනි, සුන්දර හිමාල කඳු පාමුල, නුවරක් තිබේ කෝසල ජනයා වෙසන,

සූරිය පෙළපතට නෑයන් වූ  ඒ හැමදෙන, කැත් කුල වැසියන්ය, ඒ මගේ උපන් බිමය.

බලවත් නිරිඳුනි  මේ අසන්න දයාවෙන්, අත් හලෙමි ගිහිගෙය, කම්සැප නොපතමින්,

මිනිසුන් පෙලන බොහෝවූ  දුක් ආදීනව දුටුවෙමි, දුකින් මිදෙන මග සොයා යමි, අන් සැප නොපතිමි".

**මූලාශ්‍රය**: ඛු.නි: සුත්තනිපාත: මහාවග්ග:3-1 පබ්බජා සූත්‍රය, පි.142.
**සටහන:** සත්‍ය සොයගතහොත් තමන්ටද ඒ බව පැවසීමට සිදුහත් තවුසාට පැවසූ ඒ මහා රජ, උතුම් තවුසාට රජගහනුවරින් පිටවීමට ඉඩ සැලසුවේය.

▼ **ආලාර කාළාම හා උද්දක රාමපුත්‍ර හමුවීම**

බෝසතුන් පිළිබඳව අතිශයෙන් පැහැදී තමා සමග එක්ව රට පාලනය කරමින් රජ සැප විදින ලෙසින්, මගධ යේ පාලකයවූ බිම්බිසාර රජතුමාගේ ඉල්ලීම ප්‍රතික්ෂේප කළ සිදුහත් තවුසා සත්‍ය සොයමින් මගධ ජනපදයේ සැරිසැරුවෝය. එසේ යන බෝසතුනට , එවක ප්‍රසිද්ධ ගුරුවරුන් ලෙස පතළ ආලාර කාළාම හා උද්දක රාමපුත්‍ර සමුවිම පිළිබඳව, අරිය පර්යේසන සූත්‍රයේ මෙසේ දක්වා ඇත.

“ එලෙස (ගිහිගෙය හැර) පැවිදි වූ මම “කුශලය කුමක්ද? යයි සොයමින්, උතුම්වූ ශාන්තිපදය සොයමින් යන්නේ ආලාරකාළාම තපසුන් ගේ අරනයට පැමිණියෙමි”. ( සො එවං පබ්බජිතො සමනො කිංකුසලගවේසී අනුත්තරං සනතිවරපදං පරියෙසමානො).

“අලාරකාළාම තවුසා ගේ අනුමැතිය ඇතිව මම එහි බඹසර විසුවෙමි. නොබෝකලකින්ම, මම අලාරකාළාම තවුසා දේශනාකරන ධර්මය ප්‍රගුණ කෙළෙමි. අලරකාළාම, හුදෙක් ඇදහීම් පමණකින් ‘තමන් විශේෂ නුවනින් මේ ධර්මය දැන එයට පැමිණ වාසය කරමි ‘යයි ප්‍රකාශ නොකරයි, නිසැකයෙන්ම ඔහු මේ ධර්මය දැනගෙන, එය මනාව ප්‍රත්‍යක්ෂ කර වාසය කරයි යන සිතුවිල්ල මට ඇතිවිය.ඉන්පසු ඔහු වෙත ගොස් මෙසේ ඇසීමි:

‘ ඇවත් කාළාමයනි, කුමන ලෙසකින් මේ ධර්මය තමන්ගේ විශේෂ ඥානයෙන් දැන, සාක්ෂාත් කොට, එයට සමවැදී එහි වසන්නේ යැයි ඔබ පවසන්නේද?”.

එවිට ඔහු ආකිඤ්චඤ්ඤායතනය (අරූප ජානය) ගැන මට පැවසුහ. යම් ධර්මයක් විශේෂ නුවණින් දැන, එයට පැමිණ වාසය කළහැකිනම්, ඒ ධර්මය මම ද අවබෝධ කරගැනීම පිණිස උත්සාහ කරන්නේ නම් මැනවයි මට සිතුනි. නොබෝකලකින්ම මම ඒ ධර්මය අවබෝධ කොට එහි වාසය කළෙමි. ඉන්පසු ඒ බව අලාරකාළාමට පැවසුවිට, සතුටට පත් ඔහු, ඔහුගේ සම තත්වයේ මා තබමින්, ඔහු සමග, එහි සිටි ශිෂ්‍ය පිරිස ට ධර්මය ඉගැන්වීමට මට ඇරයුම්කළහ. එහෙත් මට මේ අදහස ඇතිවිය:

‘ මේ ධර්මය සසර කලකිරීම පිණිස, නො ඇලීම පිණිස කෙලෙස් සංසිඳුවිම පිණිස...නිවන පිණිස පිහිට නොවේ’. එමනිසා මම ආලාරකාළාම ගේ අරණින් නික්මිණි”.

**සටහන**: එලෙස ආලාරකාළාම ගේ ඉගැන්වීම් ගැන කලකිරීමට පත් සිදුහත් තවුසා, සත්‍ය සොයා යන්නේ උද්දක රාමපුත්‍ර ගේ අරණයට පැමිණියහ. එහිදී උද්දක තවුසා ප්‍රකාශ කරණ ධර්මයවූ නෙවසඤ්ඤානාසඤ්ඤායතනය (අරූපජානය) මුළුමනින්ම අවබෝධ කරගත්, බෝසතුනට ඒ ධර්මයද සසරින් මිදීම පිණිස, නිවන පිණිස නො පවතින බව පසක්වුහ. එමනිසා, සිදුහත් තවුසා උද්දක රාමපුත්‍රගේ අරණින් ද පිටවිය. **සටහන**: * ම.නි: (1) මහාසච්චක සූත්‍රයේ ද, බෝසතුන්, ඒ තවුසන් දෙදනා හමුවීම විස්තර කර ඇත. ** මේ හා සමාන විස්තරයක්, ම.නි; (2) බෝධිරාජකුමාර සූත්‍රයේ පෙන්වා ඇත. **මූලාශ්‍ර:** ම.නි: (1) ආරිය පර්යේෂණ සූත්‍රය, පි. 413, EMN,:26 The Noble Search, p.242.

▼**දුෂ්කර තපස් ක්‍රියා**

උද්දකරාමපුත්‍ර යන්ගේ අරණින් නික්ම ක්‍රම ක්‍රමයෙන් සැරිසරන සිදුහත් තවුසා ඉසිපතනයට වැඩියේය. එහිදී, පස්වග තවුසන් උන්වහන්සේට උපස්ථාන කළහ. එහිසිට, සම්බෝධිය පිණිස උග්‍ර තපස්කම් කිරීම- අත්තකිලමතානු යෝගයේ යෙදීම මෙහි විස්තරාත්මකව දක්වා ඇත: **බලන්න:** පස්වග මහණුන්.

**බුදුන් වහන්සේ මෙසේ වදාළහ:** "...මට මෙසේ සිත්විය. යටි දතෙහි උඩු දත් තබා, දිව තල්ලේ මැඩගෙන කුසල් සිතින් අකුසල සිත යටකර ගන්නේ නම් (කෙළෙස්තවන වීරියෙන්) මැනවි...එලෙස වීරිය කරනවිට කයේ ඇතිවන බොහෝ දුක්වේදනා, දරාගෙන සිටියෙමි..." **.** එලෙස හුස්ම ගැනීම පිටකිරීම නවත්වා ගැනීම... මද ආහාර ගැනීම ආදී බොහෝ දුෂ්කර තපස් ව්‍රතවල බෝසතුන් යෙදී සිටි බව මෙහි පෙන්වා ඇත. **සටහන:** මේ හා සමාන විස්තරයක්, ම.නි; (2) බෝධිරාජකුමාර සූත්‍රයේ පෙන්වා ඇත. **මූලාශ්‍ර**: ම.නි: (1) මහාසච්චක සූත්‍රය, පි. 579, EMN: 36 Maha Sacchaka sutta, p. 309.

** **මෙහිදී බුදුන් වහන්සේ බුදුවීමට** පෙර සිදුකල උග්‍ර තපස්ව්‍රත විස්තර කර ඇත.

"සාරිපුත්ත, මම උදරයේ සිවිය පිරිමදින්නෙමි යි පිටකටුව අල්ලා ගනිමි, පිටකටුව පිරිමදින්නෙමි යි උදර සිවිය අල්ලා ගනිමි...අල්පආහාර නිසාම උදර සිවිය පිටකටුව හා ඇලුනේවේ...සිරුර අස්වසන්නෙමි යයි අවයව අතින් පිරිමදිනවිට මගේ සිරුරේ දිරූ මුල් ඇති ලොම්යෝ ගිලිහි වැටෙති..." **බලන්න**: ම.නි: (1) 1.2.2 මහාසිහනාද සූත්‍රය, පි.183.

▼ **දුෂ්කර තපස්කම්ම අත් හැරීම**

කයට කටුක වේදනා දීමෙන් උතුම් ආරිය බව ලබා ගැනීමට නොහැකි බව අවබෝධ කරගත් බෝසතුන්, සම්බෝධිය පිලිබඳ වෙනත් මගක් ගැන මෙසේ සිතා බලනලදී:

" ...මට මෙසේ සිත්විය, (පෙරදී) පිය රජු සිසාන විට, මම සිහිල් දඹරුක් සෙවනේ (පලඟ බැඳ) සිටිනවිට, කාමයෙන් වෙන්වූ සිතේ ප්‍රථම ජානය නිසා විවේක ප්‍රීති සුඛය ඇතිව වාසය කෙළෙමි...මේ සම්බෝධිය පිණිස මග විය හැකිය... මේ සම්බෝධය පිණිස මාර්ගය යයි යන මතකය මට ඇතිවිය... එම සුඛය කාමය නොවන බව අකුසල නොවන බව මට අවබෝධ විය".

**සටහන**: අටුවාවට අනුව: සිදුහත් කුමරාගේ බාලවියේ, එක් අවස්ථාවක, පියරජු, ශාක්‍යයන්ගේ සම්ප්‍රදායික සිසාන මංගල්‍යයේ නායකත්වය ගෙන ක්‍රියාකරන ලදී. එම උත්සවය පිණිස ලාබල කුමරාද කැටිව පැමිණි ඔහුගේ සේවක පිරිස දඹගසක් මුල කුමරා ඉන්දවා උත්සවය නැරඹීමට පිටවිය. හුදකලා විවේක සුවයෙන් සිටි කුමරා නිතැතින්ම, භාවනාව පිණිස අසුන්ගෙන ප්‍රථම ජානය ලැබුහ. ඒ බව දුටු සේවක පිරිස රජතුමාට එම පුවත දැන්වූ පසු එහි පැමිණි පියරජ, කුමාරයාට නමස්කාර කරන ලදී. **බලන්න**: EMN: note: 389, p.1101.

දුර්වලවූ කයක් සහිතව ඒ සුවය (ජානසමාපත්ති) වඩා ගැනීම අපහසු බව අවබෝධ කරගත සිදුහත් තවුසා, බත් කැඳ වැනි ආහාර වැළඳුහ. එබැවි දුටු පස්වග තවුසන්, සිදුහත් තවුසා අත්හැර ගියහ:

"...මගේ උග්‍ර තපස්කම්ම මගින් මාහට උසස් බවක් ලැබේ නම්, එය ඔවුන්ගේද යහපත පිණිස විය හැකිය යයි සිතූ තවුසන් පස් දෙනක් ඒ සමයේ මට උපකාරිව කටයුතු කළහ. එහෙත්, මම බත් ආදී ආහර ගැනීම දැක කළකිරුන ඔවුන්, ගෝතම තවුසා, උත්සාහය හැරදමා සුඛෝපභෝගී ජීවිතයකට පත්වී ඇතය සිත මා හැරදමා පිටත්වූහ"

**සටහන:** එම තවුසන් පස්දෙනා, පසුව පස්වග මහණුන් ලෙසින් හඳුන්වා ඇත. බුදුන් වහන්සේගේ බුද්ධත්වයෙන් පසු උන්වහන්සේ වෙත පැවිදිවූ ඒ උතුමන් අරහත්වය ලැබූහ. **සටහන:** මේ හා සමාන විස්තරයක්, ම.නි; (2) බෝධිරාජකුමාර සූත්‍රයේ පෙන්වා ඇත. **මූලාශ්‍ර:** ම.නි: (1) මහාසච්චක සූත්‍රය, පි. 579, EMN: 36 Maha Sacchaka sutta, p. 309.

## 7) **සම්බෝධිය ලැබීම**-Enlightenment

▲ අත්තකිලමතානු යෝගය අත්හළ බෝසතුන් උරුවෙල දනව්වේ සේනානි නියම් ගමට පැමිණීමේ විස්තරය:

**" අනුත්තර උතුම් නිවන් පදය සොයමින් මගධ දනව්වේ සැරිසරමින් මම උරුවෙල දනව්වේ සේනානි නියම් ගමට පැමිණියෙමි. එහි සිත්කළු භූමියද, පහදවන වන ලැහැබද, වැලිතලා ඇති...සිත්කළු ගලාබස්නා නදියද (නේරංජනා ගඟ) , හාත්පස ගොදුරුගම්ද දිටිමි...ප්‍රධන් විරිය කරනු කැමති කුලපුත්‍රයෙකුට මෙය සුදුසුය..."**

**සටහන:** මේ හා සමාන විස්තරයක්, ම.නි; (2) බෝධිරාජකුමාර සූත්‍රයේ පෙන්වා ඇත. **මූලාශ්‍ර:** ම.නි: (1) ආරිය පර්යේෂණ සූත්‍රය, පි. 413, EMN,:26 The Noble Search, p.242.

▼ **බෝසතුන් ප්‍රධන් විරිය වැඩීම**

නේරංජනා ගඟබඩ, බොරුක සෙවනේ වැඩසිට ප්‍රධන් විරිය කරන බෝසතුන් වෙත පැමිණී මාරයා මෙසේ පවසා ඇත:

**"...ඔබ වැහැරී ගොස්ය, දුර්වර්ණවී සිටි, දැන් මරණය ඔබ හමුවේය... භවත්නි, ජිවත්වන්න, ජීවිතය උතුම්ය, ජීවත්ව පින් කරන්න"**
ඒ අවස්ථාවේදී, බෝසතුන් මෙසේ වදාළහ:

**"...පුණ්‍ය කිරීමෙන් මට අර්ථයක් නැත...මට ශාන්තිපදය ගැන ශ්‍රද්ධාව ඇත, විරිය ඇත, ප්‍රඥාව ඇත.මෙසේ නිවනට සිත් ඇති මා කවර හෙයින් 'දිවි රැකගන්න" යයි සිතන්නේද..."**

එසේ සිතා බෝසතුන් ප්‍රධන් විරිය කර, මාර සේනාව දිනා සම්බෝධිය සාක්ෂාත් කරගත් බව මෙහි දක්වා ඇත. **මූලාශ්‍රය:** ඛු.නි: සුත්තනිපාත: මහාවග්ග: 3-2 පධාන සූත්‍රය, පි.146.

▼ **පධන්විරිය වැඩීම** ගැන උපඤ්ඤාත සූත්‍රයේ මෙසේ දක්වා ඇත.

**"... ඒකාන්තයෙන්ම සිරුරේ සම නහර හා ඇට ඉතිරිවේවා, මස් ලේ වියළී යත්වා, යම්දෙයක් පුරුෂ : ශක්තියෙන්, වීරියෙන්, පරාක්‍රමයෙන් ලැබිය යුතු වේ නම් එය නොලැබ වීරිය නැවතීමක් නොකරමි... යයි වෙර වැඩිමි... මා විසින් සම්බෝධිය අප්‍රමාදයෙන් ලබන ලදී, අරහත් ඵල-නිවන නම්වූ යොගකෙෂේමය අප්‍රමාදයෙන් ලබන ලදී".**

**සටහන:** මේ සූත්‍රයේදී බුදුන් වහන්සේ මෙසේ වදාළහ:

"බෝසතුන් ලෙසින් මම කරුණු 2ක් අත්දැක්කෙමි: 1) කුසල් ධර්මයන් ගැන පමණක් සන්තුෂ්ටියට නොපැමිණියුතුබව,ජාන සමාධි පමණක් ලබා සෑහීමට පත් නොවිය යුතු බව, එහෙයින්, අරහත් ඵල ලැබෙනතෙක් දිරියෙන් විරියෙන් කටයුතු කිරීමට අදිටන් කරගතයුතු බව 2) දිරිය නිසා ඇතිවෙන වෙහෙස නොසලකා, ආපස්සට නොගොස්, වීරිය අත නොහැරම- විමුක්තිය ලැබෙන තෙක් කටයුතු කිරීමට කැමැත්තෙන්ම අදිටන් කිරීම"

**"ද්වින්නාහං භික්ඛවෙ ධම්මානං උපඤ්ඤාසිං: යා ච අසන්තුට්ඨිතා කුසලෙසු ධම්මෙසු, යා ච අප්පටිවානිතා පධානස්මිං.**

**මූලාශ්‍රය**: අං.ගු.නි: (1) 2 නිපාත: 2.1.1.5 උපඤ්ඤාත සූත්‍රය, පි.138.

▼ **සම්බෝධිය ලැබීම**

බුද්ධත්වය- සම්බෝධිය ලෙසින් පෙන්වා ඇත්තේ, බුදුන් වහන්සේ සියලු කෙළෙස් ප්‍රහීණ කොට- දස මාර සේනාව පරදවා, නිවන සාක්ෂාත් කරගැනීමය. සත්වසක් තමන්වහන්සේ පසුපස පැමිණි මාරයා පරදවා බුද්ධත්වය ලැබූ බුදුන් වහන්සේ මෙසේ වදාළහ**:**

"දුකේ මුල් ගලවාදමා, භව තන්හාව බිඳ, සියලු ආසව පහකර, නිර්දෝෂීවූ මම, නිදුක්සිතින් බවුන් වඩමි... මමය, මගේය යන හැමදේ මම හැරදමා ඇත. මගේ මග (නිවන්මග), මාරයා නොදනී..."

**" සොකසස මූලං පලිඛාය සබබං අනාගු ඣායාමි අසොවචමනො ඡෙතවාන සබබං භවලොභජපපං අනාසවො ඣායාමි..."**

**" යං වදනති නතං මයහං යෙ වදනති න තෙ අහං එවං පාපිම ජනාති න මෙ මගගමපි දකඛසිති".**

**මූලාශ්‍ර:** සංයු.නි: (1 ) මාරසංයුත්ත: 4.3.4 සත්තවස්ස සූත්‍රය, පි. 248, ESN:4: rasamyutta: 24.4 Seven Years of Pursuit, p. 295.

▼ **සම්බෝධිය ලැබූ බුදුන් වහන්සේගේ විහරණය**

" එකල්හි භාග්‍යවත් බුදුරජාණන්වහන්සේ උරුවෙල් දනව්වෙහි, නේරංජනා ගංඉවුර සමීපයෙහි බෝරුක්මුලෙහි අභිසම්බෝධියට පැමිණ වැඩ වාසය කරන සේක".

එලෙස සත්දවසක් බුදුන් වහන්සේ ඵලසමවත් සුවයෙන් වාසය කළහ. අනතුරුව, බුදුන්වහන්සේ පටිච්චසමුප්පාදය ධම්මය අවර්ජනා කලබව මෙහි පෙන්වා ඇත. **මූලාශ්‍රය**: වින.පි: මහවග්ග පාළි1: මහාඛන්ධක: බෝධිකථා, පි.80

▼ **සම්බෝධිය ලැබූ බුදුන් වහන්සේ** පළමු සතියේ රහත්ඵල සමවත් සුවය විඳිමින් වැඩසිටි බව මෙහි දක්වා ඇත. ඒ සතිය ඇවෑමෙන් පසු මෙසේ ආවර්ජනය කලෝය:

"...මෙසේ මේ අයුරින් මේ ප්‍රත්‍ය ඇතිවේ, මේ ඵලය වේ. මේ ප්‍රත්‍ය ඉපැද්මෙන් මේ ඵලය උපදේ" යයි පටිච්චසමුප්පාදය මෙනෙහි කර මෙවන් උදාන වදාළහ.

**පළමු උදානය:**
**"යදා හවෙ පාතුභවන්ති ධම්මා- ආතාපිනො ඣායතො බ්‍රාහ්මණස්ස, අථස්ස කඞ්ඛා වපයන්ති සබ්බා - යතො පජානාති සහෙතුධම්මන්ති".**

කෙළෙස් තවන වැරඇති, ධ්‍යාන වඩන බ්‍රාහ්මණයාට යම් ක්‍ෂණයකින් බෝධිපාක්‍ෂ ධර්ම උපදිත්ද, සහේතුකවූ දුක්ඛස්කන්ධ ධර්මය එලෙසින් අවබෝධවී, ඔහුගේ සැම සැකයක්ම දුරුවේ.

**දෙවන උදානය:**
**"යදා හවෙ පාතුභවන්ති ධම්මා- ආතාපිනො ඣායතො බ්‍රාහ්මණස්ස, අථස්ස කඞ්ඛා වපයන්ති සබ්බා- යතො ඛයං පච්චයානං අවෙදීති".**

කෙළෙස් තවන වැරඇති, ධ්‍යාන වඩන බ්‍රාහ්මණයාට යම් ක්‍ෂණයකින් බෝධිපාක්‍ෂ ධර්ම උපදිත්ද, ප්‍රත්‍යයන්ගේ නිරෝධය අවබෝවේ, එකල්හි ඔහුගේ සැම සැකයක්ම දුරුවේ,

**තෙවන උදානය:**
**"යදා හවෙ පාතුභවන්ති ධම්මා- ආතාපිනො ඣායතො බ්‍රාහ්මණස්ස, විධූපයං තිට්ඨති මාරසෙනං - සූරියො'ව ඔභාසයමන්තළික්ඛන්ති'.**

කෙළෙස් තවන වැරඇති, ධ්‍යාන වඩන බ්‍රාහ්මණයාට යම් ක්‍ෂණයකින් බෝධිපාක්‍ෂ ධර්ම උපදිත්ද, එකල ඔහු අඳුර දුරලා හිරු මෙන් අහසේ බබලමින්, මාර සේනාව කම්පනය කරමින් සිටී. **මූලාශ්‍ර**:බු.නි: උදානපාලිය: බෝධිසූත්‍ර 3කි , පි.158, වින.පි: මහාවග්ගපාලිය 1: මහාඛන්ධකය: බෝධිකථා, පි.80.

▼ **සම්බුද්ධත්වය ලබා** සති 7 ක් (සත් සතිය) බුදුන් වහන්සේ විවේක සුවයෙන් වැඩසිටියහ.

**පළමු සතිය**: බෝධිරුකමුල පටිච්චසමුප්පාදය ආවර්ජනය කළහ. සිදුහත් තවුසා බුද්ධත්වය ලබාගත්තේද යයි සමහර දෙවියන් තුල ඇතිවූ සැක පහ කිරීමට යමාමහා පෙළහර දැක්වීම. **දෙවන සතිය:** තමන් වහන්සේ බුද්ධත්වය පිණිස වැඩමකරසිටි බෝධි රුකට අනිමිස ලෝචන පූජාව කිරීම. **තෙවනසතිය:** ජයසිරි මහා බෝධිය හා අනිමිස ලොචන පූජාව කළ ස්ථානය අතර සක්මන් භාවනාවේ යෙදීම. මෙය රුවන් සක්මන ලෙසින්ද හඳුන්වයි. **සිව්වණ සතිය:** කිරිපලු රුක්මුල වැඩව සිටිම, මෙය රුවන් ගෙය- රාජායතනයෙ වැඩසිටීම ලෙසින් පෙන්වා ඇත. **පස්වන සතිය:** ධර්මය ගුරුතනතුරේ තබා, ධර්මයට පූජා කරමින් වාසය කිරීමට තීරණය කිරීම. මාර දියණියන් බුදුන් වහන්සේ වසඟ කරගැනීමට තැත් දැරීම සිදුවුවේ මේ අවස්ථාවේ බව දක්වා ඇත. **සයවෙනි සතිය**: මිදෙල්ලරුක්මුල වැඩසිටීම. ඒ අවස්ථාවේදී මහා වැස්සක් පතිත වූ නිසා මුචලින්ද නාගරාජයා බුදුන් වහන්සේ ආරක්ෂා කිරීම. **සත්වෙනි සතිය:**

නැවත, රාජයතන නම් කිරිපලු නුගරුක මුල වැඩසිටීම. මේ අවස්ථාවේ තපස්සු භල්ලුක දානය පළමු දානය පූජා කිරීම. ඉන්පසුව අජපාල නුග රුක්මුළ වැඩසිටිමින් ධර්මය දේශනා කිරීම ගැන අවර්ජනා කිරීම. සහම්පති බ්‍රහ්මරාජයා එහි පැමිණ ලෝකයාට දහම් දෙසීමට ආරාධනා කිරීම. **සටහන්:** අටුවාව හා වින.පි: මහාවග්ගපාලිය1: මහාඛන්ධක, පි.80. මෙහිදී යම් වෙනස්කම් පෙන්වා ඇත. ** මහාඛන්ධකයට අනුව: **පළමු සතිය**: බෝරුකමුල පටිච්චසමුප්පාදය ආවර්ජනය, **දෙවන සතිය:** අජපාල නුගරුකමුල: මෙහිදී බමුණෙකුට, බ්‍රාහමණ ධර්මය ගැන පැහැදිලි කිරීම. **තෙවනසතිය**: මිදෙල්ල රුක්මුල- රාජයතනය, මුචලින්ද නාගයා පැමිණීම. **සිව්වෙනි සතිය:** කිරිපලුරුක්මුල, තපස්සු හා භල්ලුක බුදුන් දහම් සරණ යෑම.**ඉන්පසුව:** අජපල් නුගරුකමූල සිට දහම දේශනා කිරීම ගැන සිතීම, සහම්පති බ්‍රහ්ම රාජයාගේ පැමිණීම. මෙහිදී පස්වෙනි, හයවෙනි හා සත්වෙනි සති ගැන පැහැදිලි සටහන් නොමැත.

▼**සම්බෝධිය අවබෝධ කිරීම පිළිබඳව** බුදුන් වහන්සේ මෙසේ වදාළහ:

"මහණෙනි, මම යම් කලෙක මේ පංච ඉන්ද්‍රියයන්ගේ සමුදය, අස්තගමය (නැතිවීම), ආස්වාදය, ආදිනවය හා නිස්සරණය තතු සේ දැනගත් විට....අනුත්තරවූ සම්මා සම්බෝධිය අවබෝධ කරගත්තෙමි. ඥානදර්ශනය මට පහළවිය. ඒ චිත්ත විමුක්තිය නො සෙල්විය හැකිය, මේ මගේ අවසාන උත්පත්තිය වේ, නැවත භවය සකස්වීමක් නොමැත".

**"යතොච ඛො හං භික්ඛවෙ, ඉමෙසං පඤ්චන්නං ඉන්ද්‍රියානං සමුදයඤ්ච අත්ථගමඤ්ච අස්සාදඤ්ච ආදීනවඤ්ච නිස්සරණඤ්ච යථාභූතං අබ්භඤ්ඤාසිං, ... අනුත්තරං සම්මාසම්බොධිං අභිසම්බුද්ධො පච්චඤ්ඤාසිං. ඤාණඤ්ච පන මෙ දස්සනං උදපාදී, අකුප්පා මෙ චෙතොවිමුත්ති, අයමන්තිමා ජාති, නත්ථිදානි පුනබ්භවොති"**. ("...when I directly knew all this as it really is: the origin and the passing away, the gratification, the danger, and the escape in the case of these five faculties, then I claimed to have awakened to the unsurpassed perfect enlightenment... The knowledge and vision arose in me: 'Unshakable is my liberation of mind; this is my last birth; now there is no more renewed existence'")

**සටහන:** සංයු.නි: (5-1) ඉන්ද්‍රිය සංයුත්ත:බුද්ධ සූත්‍රයේදී: සය ඉන්ද්‍රිය පිළිබඳ පස්විකුම් නුවණ පහළවීම, අරහත්වය ලැබීම බවද, ඉපදීම කෙළෙවර කළ බවද - බුද්ධත්වයද බව පෙන්වා ඇත. **මූලාශ්‍ර:** සංයු.නි : (5-1): මහාවග්ග: ඉන්ද්‍රිය සංයුත්තය: 4.3.1 පුනර්භව සූත්‍රය, පි. 392, ESN: Indriyasamyutta: 21.1. Renewed Existence, p. 1948.

▼ **බුද්ධ ගයාව**, බුදුන් වහන්සේ, සම්බෝධිය ලැබූ ස්ථානයය, උතුරු ඉන්දියාවේ පිහිටි මේ ස්ථානය බෞද්ධයන්ගේ පූජනීය භූමියකි. **බලන්න**: බුද්ධ ගයාව.

▼ **බුදුන් වහන්සේ බුද්ධත්වය** ලැබීම මෙහි විස්තරාත්මකව පෙන්වා ඇත. **මූලාශ්‍රය:**සංයු.නි: (2): නිදානවග්ග: අභිසමයසංයුත්ත: 1.1.10 ගෝතම සූත්‍රය, පි.38.

▼ **බෝධිසත්වයන්** ලෙසින් බඹසර ජීවිතය ගතකර, විමුත්තිය ලැබීමෙන් (සම්බෝධිය), මග බඹසර අවසාන කළබව බුදුන් වහන්සේ මෙසේ පෙන්වා ඇත:

" ...මේ දුකය, මේ දුක ඇතිවීමේ හේතුව, මේ දුක නැතිවීමය, මේ දුක නැති කිරීමේ මග ය යි මම තත්වූ පරිදි දැන ගතිමි. මේ ආසවයන්ය...මේ ආසව ඇතිවීම... නැතිකර ගැනීම...නැතිකර ගැනීමේ පටිපදාව යයි මම තත්වූ පරිදි දැන ගතිමි. එසේ දන්නා දකිනා විට මගේ සිත, කාම... භව...අවිද්‍යා ආසවයන්ගෙන් මිදුනේය. මිදුන විට සිත ආසවයන්ගෙන් මිදුනේය යන ප්‍රත්‍යවෙක්ෂා ඥානය පහළ වීය. ජාතිය මුළුමනින්ම අහවර විය. මාර්ග බ්‍රහ්මචරියාව වැස නිමවන ලදී. සිවුමග කිස කරන ලදී. මේ අරහත්වය පිණිස වෙනත් කලයුතු කිසිත් නොමැති බව දැන ගතිමි..."

**සටහන:** බුදුන් වහන්සේ මේ දේශනාව වදාළේ, ජාණුස්සෝණි බ්‍රහ්මණයටය. දේශනාව අවසානයේ ඔහු බුදුන් සරණ ගිය උපාසකයෙක් වීය. **මූලාශ්‍ර:** ම.නි: (1): 1.1.4. භයභෙරව සූත්‍රය, පි. 58, EMN: 4. Fear and dread, p. 89.

## 8) සද්ධර්මය දේශනා කිරීම ඇරඹීම-Commencing the Dhamma

▲ **සම්බෝධිය ලබා** පලසමවතින් යුක්තවූ බුදුන් වහන්සේට දහම ලෝකයාට දේශනා කිරීම ගැන මෙබඳු කල්පනාවක් ඇතිවුහ:

"...මාවිසින් අවබෝධ කළ මේ චතුරාර්ය සත්‍යධර්මය ගැඹුරුය, දැකීමට දුෂ්කරය, අවබෝධය දුෂ්කරය, ශාන්තය, ප්‍රණීතය, තර්කයෙන් නො දත හැකිය, සියුම්ය, පණ්ඩිතයන් විසින්ම දතයුතුය. මේ ප්‍රජා තොමෝ පංචකාමගුණයෙහි සතුටුවූවාය ...ඇලුනිය...ඇඩිසේ මුදිතය...එවැනි ප්‍රජාවකට මේ හේතුප්‍රත්‍ය දහම දැකීම දුෂ්කරය, යම් සංස්කාර සංසිඳීමක්වේද, සකල උපධින්ගේ බැහැර ලිමක්වේද, තණ්හාවේ ක්‍ෂය වීමක් වේද, නො ඇල්මක් වේද, සකල දුක්ඛනිරෝධයක් වේද, නිවනක් වේද...මෙය දැකීම ඉතා දුෂ්කරය. ඉදින් මම දහම් දෙසන්නේ නම්, අන්‍යයෝ මගේ දහම දැන නො ගන්නේ නම්, එය මට වෙහෙස පිණිස වන්නේය".

දහම් දෙසිම පිණිස භාග්‍යවතුන් වහන්සේගේ සිත නො නැමී ගිය බව දුටු සහම්පති බ්‍රහ්ම රාජයාට මෙසේ සිත්විය: "සම්මාසම්බුදුන් දහම දේශනා කිරීමට නො නැමෙන්නේනම් ලෝකය වැනසීයනු ඇත". එසේ සිතා සහම්පති බ්‍රහ්මරාජයා බුදුන් වහන්සේ ඉදිරියෙහි පහළවී මෙසේ පැවසුහ:

"පෙර මගධ දනව්වේ රාගආදී කෙළෙස් මලින් යුතු අය විසින් සිතන ලද අපිරිසිදු වූ මිථ්‍යාදිට්ඨිය පහළවිය. නිවන් දොරටුව වූ මේ ආර්ය මාර්ගය විවෘත කළ මැනවි...දිනූ මාර සංග්‍රාමය ඇති... වීරයන් වහන්ස,... දහම් දෙසන සේක්වා, දහම අවබෝධ කරන්නෝ ඇත...".

බ්‍රහ්ම ආරධනාව ඉවසූ බුදුන් වහන්සේ සත්වයන් කෙරෙහි කරුණාව නිසා බුදු ඇසින් ලෝකය බැලුවෝය. ... අල්ප වූ රාගාදී කෙළෙස් ඇති අයද, මහත්වූ රාගාදී කෙළෙස් ඇති අයද, ශ්‍රද්ධා ඉන්ද්‍රිය අඩු අයද, වැඩි අයද, සුවයෙන් හෝ දුකින් දහම අවබෝධ කරගත හැකි අයද, පරලොව බිය දන්නාසුළු සත්වයෝද දුටුහ. එසේ දැක, මෙලස වදාළහ:

" බ්‍රහ්මය, නොදන්නවුන්ට දෙසීම කයට වෙහෙස ගෙනදෙන යන කල්පනා ඇතිව, ප්‍රගුණ වූ උතුම් වූ චතුසත්‍ය ධර්මය මිනිසුන් අතර නොකීමට සිත්විය, යම් කෙනෙක් කන් ඇත්තෝ වෙත්ද, ඔවුන් ශ්‍රද්ධාව මුදාහරිත්වා, ඔවුන්ට දැන් නිර්වාන ද්වාරයෝ (ආරිය මග) විවෘත කරණ ලදී". **මූලාශ්‍රය**: වින.පි: මහාවග්ග පාළි1: 10 බ්‍රහ්මආයාචනා කථා: පි. 88.

**▼ ධර්මය දේශනා කිරීමට සුදුසු අය සෙවීම**

ගැඹුරු දහම් අවබෝධ කරගැනීමට සුසුසු අය විමසන බුදුන් වහන්සේ පළමුව ආළාරකාම තවුසා ගෙ පණ්ඩිත බව හා මද කෙළෙස් ඇතිබව සලකා ඔහුට දහම දෙසීමට තීරණය කළහ. එ තවුසා මිය ගොස් බව දැන උද්දකරාම පුත්‍ර තවුසාට දහම් දෙසීමට ඉටගති. ඔහුද එ වනවිට මරණයට පත්වසිටිබව දැන,තවුස්දම් පුරන අවස්ථාවේ තමන්හට උපකාර කළ පස්වග තවුසන්ට දහම පලමුව දේශනා කිරීමට සිතාගත්හ. **සටහන්: *** බුදුන් වහන්සේ පළමු දේශනාවූ ධම්මචක්කප්පවත්තන සූත්‍රයය. එම දේශනාව ඉසිපතන මිගදායේදී පස්වග තවුසන්ට වදාළහ, එ අවස්ථවේදී, අඤ්ඤා කොණ්ඩඤ්ඤයන් දහම් ඇස ලැබුහ.එතැන් සිට, උතුරු දඹදිව නොයෙක් නොයෙක් ජනපදයන්හි චාරිකාවේ යෙදී, විවිධවූ, බොහෝවූ ජනකායකට ආරිය මාර්ගය විවෘත කළහ. ** අසුහැවිරිදි වියේදී අවසානා චාරිකාව රජගහනුවරින් ආරම්භ කොට, මල්ල රජදරුවන්ගේ කුසිනාරාවෙන් අවසන් කළහ. එහිදී, සුභද්‍ර භික්ෂුවට අවසාන දහම් දේශනය වදාළහ, බුදුන් වහන්සේගේ අවසාන ශ්‍රාවකයා වූ, උන්වහන්සේ එහිදී, අරහත්වය ලැබුහ. **බලන්න:** මහාපරිනිබ්බාන සූත්‍රය.

## 9) බුදුගුණ- Qualities of The Buddha

**▲ නව අරහාදී බුදුගුණ-9** Qualities of The Buddha: බුදුන් සරණ යන බොදුපිරිස, බුදුන් වහන්සේගේ ගුණ 9 ක් (නවඅරහාදී ගුණ) සිහිකරමින් සජ්ජායනා කරති. ආරිය ශ්‍රාවක, ශ්‍රද්ධාව ඇතිව බුදු ගුණ මෙසේ සිහි කරයි:

**“ ඉතිපි සො භගවා අරහං සම්මාසම්බුද්ධො විජ්ජාචරණසම්පන්නො සුගතො ලොකවිදූ අනුත්තරො පුරිසදම්මසාරථී සත්ථා දෙවමනුස්සානං බුද්ධො භගවා’ති”**

“ඒ භාග්‍යවතුන්වහන්සේ අරහත්ය, සම්මා සම්බුද්ධය, විද්‍යාචරණ සම්පන්නය, සුගතය, ලෝකයදත්හ, පුරිසයන් දමනය කිරීමේ අනුත්තරය, බුද්ධය, භාග්‍යවත්ය”.

මෙහිදී බුදුගුණ සිහිකිරීමෙන් ලැබෙන යහපත් එල පෙන්වා ඇත. **සටහන**:බුදුගුණ සිහිකිරිම- බුද්ධානුසතිය භාවනාවකි, එම භාවනාව වැඩීම නිවනට මගකි. **බලන්න**: බුද්ධානුසතිය භාවනාව. **මූලාශ්‍රය:**අං.ගු.නි: (6) 11 නිපාත: 11.2.1 මාහනාම සූත්‍රය, 11.2.3 නන්දිය සූත්‍රය.

**▼වෙනත් මූලාශ්‍ර:**

**1. ආර්‍ය්‍යවංශ ධර්ම පුස්තක මාලාවේ** නව බුදු ගුණ මෙසේ දක්වා ඇත: **1) අරහං:** අප බුදුහිමි සසර පුරුදු වන වාසනා දෝෂ සහිත සියළු කෙලෙස්වලින් දුරුවුහ**;** සංසාර චක්‍රය සිඳ බිඳ දැමුහ**;** යලි උපත නැති කළහ**;** දෙවි මිනිසුන්ගේ පුජා සත්කාර ලැබීමට සුදුසුවුහ. **2) සම්මා**

**සම්බුද්ධ**:බුදුන්වහන්සේ අන් කිසිවෙකුගේ උපදෙස් නොමැතිව ස්වයංභූ ඥානයෙන් නිවන සාක්ෂාත් කරගත්හ, චතුසත්‍ය මනාව අවබෝධ කරගත්හ; මෝහ නමැති මහා නින්දෙන් අවදිවූහ; සර්වඥතා ඥානය ලැබූහ.**3) විජ්ජාචරණ සම්පන්න**: අෂ්ට විද්‍යා හා පසළොස් චරණ ධර්මතා වලින් යුක්තවූහ. **අෂ්ට විද්‍යා :1** පූර්වනිවසානුසති ඥානය, **2** දිවඇස් ඥානය, **3** ආසවක්කය ඥානය (ආසව ඇතිවන අන්දම හා ප්‍රහිනය) **4** විදර්ශනා ඥානය (නාම රූප ස්කන්ධ ධාතු ආදිය පිළිබඳව ඇති ප්‍රඥාව) **5** මනෝමය ඉර්දී ඥාන, **6** විවිධ ඉර්දී බල ( සෘඩිවිකුර්ව ඥානය) **7** දිවකණ, **8** චෙතෝපරිය ඥානය (අන් අයගේ සිත- රාග සිතක්ද දෝෂ සිතක්ද ආදී ලෙසින් දැකීමේ හැකියාව). **පසළොස් චරණ ගුණ**: අධි ශීලය, ඉන්ද්‍රිය සංවරය, පමණ දැන අහාර ගැනීම( භෝජනයේ මාත්‍රඥතාව), ජාගරානුයෝගය (නිදිවැරිම), ශ්‍රද්ධාදී චරණ ධර්ම- හිරිඔතප්, බහුශ්‍රැත බව, දැඩි විරිය, සති සම්පජානය, මහා ප්‍රඥාව, චතු ජාන වල හැසිරීම. **4) සුගත**:රහත්මග නම්වූ සෝබන ගමනින් නිවනට පැමිණිනිසා, බෝසත් කල සිටම අරියමග ප්‍රතිපත්ති වල වැඩ සිටිනිසා, සෝබමාන රුවක් දරන නිසා, සෝබමාන ගමනක් ඇතිනිසා, නිවන නමැති සුන්දර තැනට පිවිසිනිසා, බ්‍රහ්ම ස්වරයෙන් ධර්මය දේශනා කරන නිසා සුගත වනසේක. **5) ලෝකවිදූ:** ලෝකයේ ලක්ෂණය වන දුක් ආදී ස්වභාව මනාව අවබෝධ කල නිසා, සර්වඥතා ඥානයෙන් සත්වයන් ගේ චරිත දන්නා නිසා, සියලු ලෝක ධර්මතාවයන් මනාව දන්නා නිසා, සත්ව ලෝක සංස්කාර ලෝක යහපත් ලෙසින් දන්නා නිසා ලෝකවිදූය. **6) අනුත්තරෝපුරුසදම්ම සාරථී**: ශීල සමාධි ප්‍රඥා ගුණයන්ගෙන් අසමසම නිසා, දමනය කළහැකි පුද්ගලයන දමනය කල නිසා, සත්ත්වයන් අරිය මගට යොමුකළ නිසා අනුත්තරෝ පුරිසධම්ම සාරථී වන සේක.**7) සත්ථා දේව මනුස්සානං**:සසර කතරින් ලෝක සත්වයන් එතර කල නිසා, දෙවි මිනිසුන්හට අනුසාසනා කළනිසා. **8) බුද්ධෝ**: ගුරුඋපදෙස නොමැතිව චතුසත්‍ය අවබෝධ කළනිසා, සර්වඥ නිසා, දසවිධ තථාගත බල ඇතිනිසා, ලෝක සත්වයන්ට චතුසත්‍ය අවබෝධ කළ නිසා, කෙල්ස් ප්‍රහිනකොට කෙල්ස්බර නින්දෙන් පළමුව පිබිදී ගත් නිසා බුද්ධවනසේක. **9) භගවා**:භාග්‍යවත් ධර්මයෙන් යුක්ත නිසා, මාර බලය බිඳ දමා කෙලෙස් ප්‍රහිනය කළනිසා, සියලු භාග්‍යයන් ලද නිසා භගවා වන්නේය. **බලන්න**: **ආර්යාවංශ ධර්ම පුස්තක මාලාව:1-4,** අංක **1** සප්තබෝජ්ජංගය- පි. **77,** සම්පාදනය- මොරටුවේ සිරි සාසනවංශ තෙරුන්, **1948.**

2. **සුවිසිමහාගුණ** කෘතියේ, නව අරහාදී බුදුගුණ විස්තරාත්මකව දක්වා ඇත. **බලන්න:** සුවිසි මහ ගුණය:රේරුකානේ චන්දවිමල මහානාහිමි, 2005.

## 10) බුදුන් වහන්සේගේ උත්තරීතරබව-Greatness of The Buddha

▲ බුදුන් වහන්සේ ට සමාන කිසිවෙක්, දෙවියන් හෝ මිනිසුන් ලෝකයේ නොමැති බව සූත්‍ර දේශනා වල පෙන්වා ඇත.

▼**සියලු ලෝක සත්ඣයන් අතර**, වැඳ නමස්කාර කිරීමට, වෙනත් උතුම් කෙනෙක් තමන් වහන්සේ නොදකින බව ද, එමනිසා, ධර්මයට ගරු පූජා කරමින් වාසය කරන බව මෙහි පෙන්වා ඇත.

**සටහන**: සංයු.නි (1) සගාථවග්ග:බ්‍රහ්මසංයුත්ත:6.1.2 ගාරව සූත්‍රයේ ද මෙයට සමාන විස්තරයක් පෙන්වා ඇත. **මූලාශ්‍ර**:අංගු.නි: (5): 8 නිපාත: 8.1.2.1 වේරඤ්ජ සූත්‍රය, පි. 61, EAN:8: 11.1 Verañjā, p. 416.

**▼ලෝකයා අතර බුදුන් වහන්සේ ශ්‍රේෂ්ඨතමය**

**" මම...අවිද්‍යාව නමැති බිත්තරය තුලසිටින, අවිද්‍යාව නමැති බිත්තර කටුවෙන් හාත්පස බැඳී සිටින සත්වවර්ගයා අතුරෙන්, අවිද්‍යාව බිඳගෙන සියලු ලෝකයෙහි අද්විතීය වූ යෙමි, නිරුත්තර වූ සම්මා සම්බෝධිය ප්‍රතිවේධ කෙළෙමි...මම ලෝකයේ ජේෂ්ඨතම වෙමි, ශ්‍රේෂ්ඨතමවෙමි".**
**සටහන**: විස්තර පිණිස බලන්න:අංගු.නි: (5) 8 නිපාත: වේරඤජ සූත්‍රය.
**මූලාශ්‍ර**:වින.පි:පාරාජිකපාලිය:1 වේරඤජකාණ්ඩය, පි.26.

**▼ ත්‍රිවිධ ක්‍රියා පිලිබඳ දක්‍ෂබව**

පෙර භවයකදී, රජුගේ රථකාරයා (chariot maker) ලෙසින්, තමන් දැව පිලිබඳ නිපුණත්වය ලබාසිටි බව විස්තර කර බුදුන් වහන්සේ මෙසේ වදාළහ: "...එවක මම දැව (ලී) වල ඇති ඇද ,පලුදු හා දොස් ගැන දක්ෂවූ වෙමි. නමුත්, මේ කල මම අරහත් සම්මා සම්බුද්ධය, කාය ක්‍රියා පිලිබඳ, වචී ක්‍රියා පිලිබඳ, මනෝ ක්‍රියා පිලිබඳ : ඇද, පලුදු, හා දොස් ගැන දක්ෂතම වෙමි." **මූලාශ්‍රය:**අංගු.නි: (1): 3 නිපාත: රථකාරවග්ග:3.1.2.5 සූත්‍රය, පි.250.

▼**ලෝකයේ** කථාකරන අය අතුරින් බුදුන් වහන්සේ ශ්‍රේෂ්ඨය යි මෙහි පෙන්වා ඇත. **බලන්න**: සංයු.නි: (1) දේවතාසංයුත්ත: වුට්ඨට් සූත්‍රය.

▼ **විජ්ජාචරණ** (ත්‍රිවිධ විද්‍යා හා 15ස් චරණ ධර්ම) ධර්මයන්ගෙන් සමන්විත, බුදුන් වහන්සේ, දෙවිමිනිසුන් අතර ශ්‍රෙෂ්ඨය යි මෙහි සඳහන් වේ. **බලන්න**:සංයු.නි: (2) නිදානවග්ග:භික්ඛුසංයුත්ත: මහා කප්පින සූත්‍රය.

**▼සර්වඥතා ඥාණ ධර්මයෙන් බුදුන් වහන්සේ අග්‍රය.**
බුද්ධපරිනිර්වාණයෙන් පසුව, ගෝපක මොග්ගාල්ලන බ්‍රාහ්මණයා, ආනන්ද තෙරුන් ගෙන් මෙසේ විමසා ඇත:

"අර්හත් සම්මා සම්බුද්ධ වූ ඒ භවත් ගොතමයන් වහන්සේ යම් ධර්මයකින් සමන්විත වූ වේද, ඒ සර්වඥතා ඥාන ධර්මයන් සියල්ල දත් එක භික්ෂුනමක් හෝ සිටීද?" ආනන්ද තෙරුන් මෙසේ වදාළහ:

"භාග්‍යවතුන් වහන්සේගේ සර්වඥතා ඥාන ධර්මයන් සියල්ල දත්, එබඳු ගුණයෙන් සමන්විත එක භික්ෂුනමක් හෝ නැත. භාග්‍යවතුන් වහන්සේ, නුපන් මාර්ගය උපදවාගත්හ; නො ඉපදුන මග ඉපදූවෝහ; ප්‍රකාශ නොකළ මග ප්‍රකාශ කළෝහ; මාර්ගය දත්තෝය (the knower of the path),මාර්ගය සොයාගත්තෝය, මාර්ගයේ නිපුනවූවෝය (the one skilled in the path). ඒ බුදුරජාණන්වහන්සේ විසින් හෙළිකළ මග අනුගමනය කරමින්, ඒ අනුව පිළිපදින උන්වහන්සේගේ ශ්‍රාවකයෝ, පසුව ඒ මග හිමිකරගනිති". **බලන්න**:ම.නි: ගෝපක මොග්ගල්ලාන සූත්‍රය.

**▼බුදුන් වහන්සේ උතුම් අසිරිමත් දහම් ගුණයෙන් සමන්විතය.**

බුදුන් වහන්සේ මෙසේ වදාළහ:

**“ආනන්ද, තථාගතයන්, වේදනා…සංඥා…සිතිවිලි…ඇතිවෙනවිට ඒ ගැන දන්නේය, ඒවා තිබෙනවිට ඒ ගැන දන්නේය, ඒවා අතුරුදහන් වනවිට ඒ ගැන දන්නේය … මෙයද තථාගතයන් සතු අසිරිමත් ගුණයක් බව සිහිපත්කරගන්න”.**

**සටහන:** බෝසතුන්ගේ උපත් පිලිබඳ අද්භූත අසිරිමත් සිදුවීම් ගැන ආනන්ද තෙරුන් විස්තර කළ අවස්ථාවේදී, බුදුන් වහන්සේ එලෙස වදාළබව මෙහි දක්වා ඇත. **මූලාශ්‍ර:** ම.නි: (3) 3.3.3 ආචාරියාඅද්භූත සූත්‍රය, පි. 301, EMN:123 Wonderful and Marvellous,p.897.

## 11) බුදුන් වහන්සේ තමන්වහන්සේ හඳුන්වා ඇති ආකාරය- The way The Buddha addressed himself

▲ බොහෝ අවස්ථාවන්හි, බුදුන් වහන්සේ, ශ්‍රාවකයන් හා අනිකුත් ලෝකයා හට තමන් වහන්සේ හඳුන්වා ඇත්තේ **‘තථාගත’** ලෙසින්ය**.**

* " මහණෙනි, දෙවියන් සහිත... ප්‍රජාව විසින් යම් රූප.. .ශබ්ද... ගන්ධ...රස... ස්පර්ශ ... ආයතනයක්, ධර්මයට ඇලීමක් ලබන ලදද , සොයන ලදද, සිතින් ලුහුබැඳ ගන්නාලදද, ඒ හැම තථාගතයන් විසින් අවබෝධ කරණ ලදී. ඒ නිසා ‘තථාගත’ යයි කියනු ලැබේ"

* “...යම් රැයක තථාගතයන් චතුසත්‍ය අවබෝධ කරයිද, යම් රැයක තථාගතයන් පිරිනිවන් පානා සේක්ද, ඒ අතර තුර කාලයේදී තථාගතයන් විසින් යමක් කථා කර ...පවසා... විස්තර කර තිබේද, ඒ හැම ඒ පරිද්දෙන්ම වේ, වෙනස් නවේ. එනිසා, ‘තථාගත’ යයි කියනු ලැබේ”

* “තථාගතයන්, කියන දේ කරයි, කරන දේ කියයි. තථාගතයන් තමන් කියන දේ කරන, කරන දේ කියන හෙයින් ‘තථාගත’ යයි කියනු ලැබේ”.

* “දෙවියන්... සහිත ප්‍රජායෙහි තථාගතයන් හැම මැඩ (අභිභවා) සිටිති, අන්‍යයන්, තථාගතයන් මැඩ නොසිටි, ඒකාන්තයෙන්ම, සෑම දෙයක්ම තථාගතයන් දකින්නේය (අවබෝධ කලහ), විශාරදය, ඒ නිසා, ‘තථාගත’ යයි කියනු ලැබේ”.

**බලන්න**: තථාගතයන් වහන්සේ. **මූලාශ්‍ර**: අංගු.නි:(2):4 නිපාත :උරුවෙලවග්ග: 4.1.3.3 ලෝක සූත්‍රය,පි.69, EAN:4: Uruwela:23.3 The World p.156, ඛු.නි:ඉතිවුත්තක:4.1.13 ලෝක අවබෝධ සූත්‍රය, පි. 510.

### ▼බ්‍රාහමණ ලෙසින් හැඳින්වීම

“මහණෙනි, ධර්ම දානය සඳහා පිරිසිදු කළ අත් ඇති, අන්තිම සිරුර දරන, සසර දුක් රෝගයන්ට පිළියම් කරන උසස් වෛද්‍යවරයෙක්වූ, රාග ආදී අකුසල උල් උපුටා දමන හෙයින් ශල්‍යකතෘ වෛද්‍යවරයෙක්වූ, බැහැර කළ පව් ඇතිහෙයින් පරමාර්ථවූ මම බ්‍රාහ්මණයෙක්මි. ඔබ වනාහි, ධර්ම දේශනා තුලින් උපන්නිසා-මගේ මුඛයෙන් උපන්- ධර්මජවූ, ධර්මයෙන්

නිර්මිතවූ, ධර්මය දායාද කොට ඇති, ආමිසය දායාද කොට නැති ඖරස පුත්‍රයෝය''. **බලන්න:** ඛු.නි: ඉතිවුත්තක: 4.1.1. බ්‍රාහ්මණ සූත්‍රය.

▼ **ජින ලෙසින් හැඳින්වීම**: ගයා සිට ඉසිපතනය බලා වඩින බුදුන් වහන්සේ දැක, උන්වහන්සේගේ උත්තම බවින් සිත පහන්වී ගිය උපක ආජීවක, උන්වහන්සේ කවරේද? යයි විමසුවිට, බුදුන් වහන්සේ මෙසේ වදාළහ:

**''සබ්බාභිභූ සබ්බවිදූ'හමස්මි - සබ්බේසු ධම්මේසු අනූපලිත්තො සබ්බඤ්ජහො තණ්හක්ඛයෙ විමුත්තො- සයං අභිඤ්ඤාය කමුද්දිසෙය්‍යං. න මෙ ආචරියො අත්ථි සදිසො මෙ න විජ්ජති-සදෙවකස්මිං නත්ථි මෙ පටිපුග්ගලො. අහං හි අරහා ලොකෙ අහං සත්ථා අනුත්තරො-එකො'ම්හි සම්මාසම්බුද්ධොසීතිභූතොස්මි නිබ්බුතො. ධම්මචක්කං පවත්තෙතුං ගච්ඡාමි කාසිනං පුරං, අන්ධභූතස්මිං ලොකස්මිං ආහඤ්ඤං අමතදුන්දුභි ... මා දිසා වෙ ජිනා හොන්ති යෙ පත්තා ආසවක්ඛයං, ජිතා මෙ පාපකා ධම්මා තස්මා'හං උපකා ජිනො'ති''.**

''මම සියල්ල මැඩ සිටියෙමි, සියල්ල දන්නේවෙමි. සියලු ධර්මයන්හි නො ඇලුනෙමි. සියලු කෙලෙස් හැර සිටිමි.තණ්හාවක්ෂය කර නිමාවට ගියෙමි. එලෙස, සියල්ල දන්නා මම වෙනත් කවරකු ආචාර්යවරයා ලෙසින් කියන්නේද? මට ලෝකෝත්තර ධර්මයෙහි ඇදුරෙක් නැත, මට සමාන කෙනෙක්ද විද්‍යාමාන නොවේ, දෙවියන් සහිත ලෝකයේ මට සමාන පුද්ගලයෙක් නැත. ලෝකයෙහි මම රහත්වෙමි, මම අනුත්තර ශාස්තෘ වෙමි.සම්මා සම්බුද්ධවෙමි. සියලු කෙලෙස් නිවීමෙන් සිසිල් බවට පත්වූයෙමි, එලෙසින් මම නිවුනෙමි. මම දම්සක් පැවැත්වීමට (ධර්ම චක්‍රය) කාසීපුරයට යමි. අවිද්‍යාවෙන් අන්ධවූ ලෝකයෙහි අමාදහම් බෙරය ගසන්නෙමි. යම් කෙනෙක් කාමආදී ආසවයන් ක්ෂය කර ඇත්ද, මා වනාහි ඒකාන්තයෙන්ම 'ජින' වෙති...මා විසින් පාපධර්ම ජය ගන්නා ලදී, එහෙයින් මම 'ජින' නම් වෙමි. **බලන්න:** උපක තෙර. **මූලාශ්‍ර:**වින.පි: මහාවග්ග පාලි1: ඛන්ධක:14 පඤ්ඤවවග්ගිය කථා:4 ඡෙදය, පි.94.

▼ **සම්මාසම්බුද්ධ ලෙසින් හැඳින්වීම**

* දුෂ්කර තපස්ව්‍රත අත් හැරීම ගැන කලකිරිසිටි පස්වග තවුසන්ට අමා දහම දේශනා කර ඔවුන් සසර දුකින් මුදවා ගැනීමට බුදුන් වහන්සේ ඉසිපතනයට වැඩි අවස්ථාවේ, ඔවුන්, උන්වහන්සේගේ සම්බුද්ධත්වය පිලිබඳව සැක සහිතවූහ.ඒ අවස්ථාවේ, බුදුන් වහන්සේ මෙසේ වදාළහ:

''...තථාගත තෙමේ රහත්ය, සම්මා සම්බුද්ධය... නිවන ලබන ලදී...මම අනුසාසනා කරමි, දහම් දෙසමි...ඒ අනුසාසනය ඒ පරිද්දෙන්ම පිළිපදින ඔබහැම නොබෝකලකින්ම... ඒ නිරුත්තරවූ නිවන මේ ආත්මයේදීම විශිෂ්ඨ ඥානයෙන් දැන, එයට පැමිණ වාසය කරන්නේය''.

**සටහන**: පස්වග තවුසන්, බුදුන් වහන්සේ වෙතින් දහම් අසා පස්වග රහතුන් බවට පත්වූහ. **බලන්න**: පස්වග මහණුන්. **මූලාශ්‍රය:** වින.පි: මහාවග්ග පාලි1: ඛන්ධක:14 පඤ්ඤවවග්ගිය කථා:9 ඡෙදය, පි.98.

* ''චුන්ද, තථාගතයන් වූ මම මේ සමයෙහි පහලවූ අරහත් සම්මා සම්බුද්ධ වෙමි. මම ධර්මය යහපත් ලෙසින්ම...ප්‍රකාශ කොට ඇත; මගේ

ශිෂ්‍යයන් ධර්මය මනාව ප්‍රගුණය කර ඇත; පිරිසිදුවූ යහපත්වූ බ්‍රහ්මචරියාව ඔවුනට මනාව පැහැදිලිය, අවබෝධ කර ඇත...”

**සටහන**: මේ සූත්‍රය දේශනා කර ඇත්තේ චුන්ද සාමණේරයන්ටය. **මූලාශ්‍ර:** දීඝ.නි: (3), පාසාදික සූත්‍රය, පි. 210, EDN**:** 29**,** The delightful discourse, p. 318.

**▼විශාරද ලෙසින් හැඳින්වීම**

වස්සකාර බ්‍රාහ්මණ (මහා ඇමති) විසින් විමසනු ලදුව බුදුන් වහන්සේ, තමන් 'විශාරද' යයි වදාළහ:

**“අහං හි බ්‍රාහමණ බහුජනහිතාය පටිපනෙනා බහුජනසුඛාය, බහු’සස ජනතා අරියෙ ඤායෙ පතිට්ඨාපිතා, යදිදං කල්‍යාණධම්මතා කුසලධම්මතා. සො යං විතක්කං ආකඞ්ඛති විතක්කෙතුං. තං විතක්කං විතක්කෙති යං විතක්කං නාකඞ්ඛති විතක්කෙතුං, න තං විතක්කං විතක්කෙති. යං සඞ්කප්පං ආකඞ්ඛති සඞ්කප්පෙතුං, තං සඞ්කප්පං සඞ්කප්පෙති. යං සඞ්කප්පං නාකඞ්ඛති සඞ්කප්පෙතුං, න තං සඞ්කප්පං සඞ්කප්පෙති. ඉති චෙතොව සිප්පත්තො හොති විතක්කපථෙසු. චතුන්නං ඣානානං ආභිචෙතසිකානං දිට්ඨධම්මසුඛවිහාරනං නිකාමලාභි හොති අකිච්ඡලාභි අකසිරලාභි. ආසවානං ඛයා අනාසවං චෙතොවිමුත්තිං පඤ්ඤාවිමුත්තිං දිට්ඨෙව ධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වාඋපසම්පජ්ජ විහරති.”**

“...බමුණ මම වනාහි බහුජනහිත පිණිස, බහුජනසුඛ පිණිස පිළිපන්නෙමි, මා විසින් බොහෝ දෙනා, කල්‍යාන ධර්මය වන කුසලධර්මය වන ආරියන්‍යායයෙහි පිහිටුවන ලදී...යම් දෙයක් සිතන්නට (විතක්ක) කැමතිනම් මම ඒ දේ සිතමි, සිතන්නට අකමැති දේ මම සිතන්නේ නැත, යම්දෙයක් සංකල්ප කරන්නට කැමතිනම් මම ඒ දේ සංකල්ප කරමි, සංකල්ප කරන්නට අකමැති දේ මම සංකල්ප නොකරමි... මම සිතිවිලි පිළිබඳව විශාරදවෙමි. මේ දිවියේම සුඛ විහරණය පිණිස, මම පහසුවෙන්ම සිව් ජාන ලබමි. සියලු ආසවයන් ප්‍රහීණය කොට, චේතෝවිමුක්තිද ප්‍රඥාවිමුක්තියද ලබා මම වාසයකරමි.”

**සටහන:** වස්සකාර බ්‍රාහ්මණ, මගධයේ අජාසත් රජුගේ මහා ඇමතියාය. **බලන්න**:උපග්‍රන්ථය:3. **මූලාශ්‍ර:**අංගු.නි: (2): 4 නිපාත: 4.1.4.5 වස්සකාර සූත්‍රය, පි.93, EAN:4: 35.5 Vassakāra, p.162.

**▼බුද්ධ ලෙසින් හැඳින්වීම**

* එක්සමයක, චාරිකාවේ වඩින බුදුන්වහන්සේගේ පිය සටහන් දැක උන්වහන්සේ කවරෙක්ද යයි ද්‍රෝන බ්‍රාහ්මණයා, ඇසූ පැනයකට පිළිතුරු ලෙසින් බුදුන් වහන්සේ මෙසේ වදාළහ:

**“යෙන දෙවූපපත්‍යස්ස ගන්ධබ්බො වා විහඞ්ගමො**
**යක්ඛත්තං යෙන ගච්ඡෙය්‍යං මනුස්සත්තඤ්ච අබ්බජෙ,**

**තෙ මය්හං ආසවා ඛීණා විද්ධස්තා විනලීකතා.**
**පුණ්ඩරීකං යථා වග්ගු තොයෙන නූපලිප්පති,**
**නූපලිත්තොම්හි ලොකෙන තස්මා බුද්ධොස්මි බ්‍රාහමණාති”.**

“යම් කාමආදී අසාව නිසා: දෙව්ලොව දෙවියෙක් ලෙසින්, ගාන්ධර්වයෙක් ලෙසින්, යක්ෂයෙක් ලෙසින්, මිනිසෙක් ලෙසින් පහළවේ නම්, මම දේවියක් නොවෙමි, ගාන්ධර්වයෙක් නොවෙමි, යක්ෂයෙක් නොවෙමි, මිනිසෙක් ද නොවෙමි. ඒ සියලු ආසව මම ප්‍රහීණය කරන ලදී. පොකුණේ පිබිදුන පියකරු සුදු නෙලුම් මලක්, දියෙන් කිලිටි නොවෙන ලෙසින්, මම ලෝකයෙන් කිලිටි නොවෙමි, එමනිසා බ්‍රාහ්මණය, මම ‘බුද්ධ’ වෙමි”.

**සටහන්: *** අටුවාවට අනුව මේ සූත්‍ර දේශනාව අවසානයේදී ද්‍රෝන බ්‍රාහ්මණයා, තුන්මග ඵල ලබාගති. බුදුගුණ වර්ණනා කරමින් ඔහු විසින් 12,000ක් පද්‍යය ගායනා කරන ලදී. ** දීඝ:නි: මහා පරිනිබ්බාන සූත්‍රයේ, බුදුන් වහන්සේගේ පරිනිබ්බානයෙන් පසු ශේෂවූ ධාතු, මේ බමුණා විසින් බෙදාදෙන ලද බව විස්තර කර ඇත. **බලන්න**: ද්‍රෝනබ්‍රාහ්මණ. **මූලාශ්‍ර**:අංගු.නි: ( 2): 4 නිපාත: 4.1.4.6 ද්‍රෝන සූත්‍රය, පි.98, EAN:4: 36.6 Dona, p. 162.

***එක්සමයක**, සේල බ්‍රාහ්මණ, බුදුන් වහන්සේ දැක පැහැද උන්වහන්සේගේ, ගුණ මාලාවක් ගායනා කළහ. එ අවස්ථාවේ බුදුන් වහන්සේ, ඔහුට මෙසේ පැවසුහ:

"මා විසින් දතයුතු දෙ (විද්‍යාවිමුක්තිය) දන්නා ලදහ, වැඩිය යුතු දෙ (භාවිත කලයුතු දේ -මාර්ගසත්‍ය) භාවිත කළහ, ප්‍රහීණය කලයුතිදේ (කෙළෙස්) ප්‍රහිණය කළහ, බ්‍රාහ්මණය, එහෙයින් මම බුද්ධවෙමි".

**"අභිඤෙඤයයාං අභිඤඤාතං භාවෙතබබඤච භාවිතං, පහාතබබං පහීනං මෙ තසමා බුදෙධාසමි බ්‍රාහමණ"**

**මූලාශ්‍රය:**ම.නි: (2) 2.5.2 සේල සූත්‍රය, පි.614.

**සටහන**: **පටිසම්භිමග්ග ප්‍රකරනයට අනුව** බුද්ධ යන පදය මෙසේ විවරණය කර ඇත: “චතුසත්‍ය අවබෝධ කළ බැවින්; චතුසත්‍ය ලෝකසත්වයාට අවබෝධ කළ බැවින්; සියල්ල දත් බැවින්; සියල්ල දක්නා බැවින්; අන්‍යයන් විසින් අවබෝධ කරවිය යුත්තකු නොවන බැවින්; විවිධවූ ගුණයන්ගෙන් යුතු බැවින්; සියලු ආසාව ක්‍ෂය කළ බැවින්; උපකෙල්ෂ විරහිත බැවින්; ඒකාන්තයෙන්ම රාගය, දෝෂය,මෝහය දුරුකළ බැවින්; ඒකාන්තයෙන්ම නිකළෙස් බැවින්; ඒකායන මග ගිය බැවින්; එකලාව අනුත්තර සම්බෝධිය සාක්ෂාත් කළ බැවින්; අබුද්ධිය නැසූ බැවින් බුද්ධවේ”

## 12) **බුදුන්වහන්සේගේ කුසලතා-**Skills of The Buddha

▲ බුදුවරයකුගේ කුසලතා අප්‍රමාණය, අසිමිතය, පුහුදුන් පුද්ගලයෙකුට අවබෝධය අසීරුය, අචින්ත දහමකි, බුද්ධ විෂය අවබෝධ කරගත හැක්කේ තවත් බුදුවරයෙකුට පමණි. ත්‍රිපිටකයේ තැනින් තැන දක්වා ඇති කරුණු ඇසුරුකරගෙන මතු දැක්වෙන කුසලතා මෙහි දක්වා ඇත:

▼**බුද්ධ ඥාන**

* බුදුන් වහන්සේ සතු විශේෂ ඥාන - දසබල ඥාන පිලිබඳව **බලන්න**: තථාගතයන් වහන්සේ. මේ සූත්‍ර යන්හි එම ඥාන විස්තරාත්මකව පෙන්වා

ඇත. අංගු.නි: (6):10 නිපාත: 10.1.3.1 සිංහනාද සූත්‍රය, පි. 90, EAN:10: 21.1. The Lion, p. 499, ම.නි: (1): 1.2.2. මහාසීහනාද සූත්‍රය, පි. 184, EMN: 12: The Greater Discourse on the Lion's Roar, p.160.

*** ෂට් අසාධාරණ ඥාන-** බුදුවරුන්ට සීමිතවූ විශිෂ්ඨ ඥාණ 6 ක් ය.

ඉන්ද්‍රිය පරොපරියන්ත ඥාණය, ආසයානුසය ඥාණය, යමක පාටිහාරිය ඥානය, මහා කරුණා සමාපත්ති ඥානය, සබ්බඤ්ඤුත ඥාණය, අනාවරණ ඥාණය. විස්තර පිණිස **බලන්න:** ඛු.නි: පටිසම්භිදා1: මහාවග්ග ඤාණකථා.

**▼දිර්ඝවූ අතීතය දැකීමේ හැකියාව**

බුදුන් වහන්සේට කප් 91ක් අතීතය දැකීමේ හැකියාව ඇති බව මෙහි පෙන්වා ඇත.

"...මම යමක් සිහි කරන්නේ නම් එය මෙයින් එක් අනුවක (91) කපය..." (I recollect ninety-one aeons back...).

**සටහන:** 91 කපයක් තරම් දීර්ඝ කාලයක් බුදුන් වහන්සේට අතීතය දැකීමේ හැකියාව මින් පෙන්වා ඇත. මෙහිදී පෙන්වා ඇත්තේ, කප් 91 ක කාලයක් තුලදී, දන්දීම නිසා කිසිම කුලයක් පරිහානියට පත් නොවූ බව බුදුනුවණින් දැකීමය. එලෙස පෙන්වා දීමට හේතුවුවේ, නාලන්දා නුවර දුර්භික්ෂය ඇති කාලයේ බුදුන් වහන්සේ මහා සංඝ පිරිසක් සමග එහි වාසය කිරීම, ජනතාව ගැන අනුකම්පාව නැතිව කටයුතු කිරීමයයි නිගණ්ඨනාථ පුත්‍රගේ චෝදනාව නිසාය. **මූලාශ්‍රය:** සංයු.නි: (4) සළායතනවග්ග:ගාමිණිසංයුත්ත:8.1.9 කුල සූත්‍රය, පි.610.

**▼ මහා ඉද්දි බල පෑමෙ හැකියාව**

මෙහිදී, බුදුන් වහන්සේට බඹලොව තෙක් කයෙන් විවිධ ඉර්දි ප්‍රතිහාර්ය පෑමට ඇති හැකියාව විස්තර කර ඇත.

**මූලාශ්‍ර:** සංයු.නි: (5-2 ): මහා වග්ග: ඉද්දිපාදසංයුත්ත: 7.3.2 අයගෝලසූත්‍රය, පි. 70, ESN: 51: Iddipadasamyutta: 22.2 The Iron Ball, p. 2087.

**▼දහසක් ලෝකධාතු පිලිබඳ අවබෝධය**

බුදුන් වහන්සට, දහසක් ලෝක ධාතු පිලිබඳ අවබෝධය ඇත.අංගු.නි (1) 3 නිපාතයේදී: ලෝකධාතු තුල සිටින සත්ත්ඣයන් හට ඇසෙන පරිදි බුදුන් වහන්සේට හඬ පැතිරීවිය හැකිබව පෙන්වා ඇත.**බලන්න:** අංගු.නි: (6): 10 නිපාත: 10.1.3.9.ප්‍රථම කොසල සූත්‍රය,පි. 134 , EAN: 10: The Great Chapter, 29.9 Kosala-1, p. 505, අංගු.නි: (1): 3 නිපාත:ආනන්දවග්ග: 3.2.3.10 සූත්‍රය,පි.440,EAN:3: Ānanda: 80.10 Abhibhū, p. 120.

**▼ ලෝකයේ ඇති සියලු මූල ධර්ම පිලිබඳ විශාරද බව**

බුදුන් වහන්සේට, සියලු ධර්මතා ගැන නිසැක අවබෝධය ඇතිනිසා විවිධ පුද්ගලයන්හට විවිධ ලෙසින් ධර්මය ඉගැන්වීමට හැකියාව ඇත. විස්තර පිණිස **බලන්න:** අංගු.නි: (6 ): 10 නිපාත: 10.1.3.2 අධිවුත්තිපද සූත්‍රය,පි.

96, EAN: 10: III The Great Chapter: 22.2 Doctrinal Principles, p. 500.

## 13) **බුදුන් වහන්සේගේ පෙරජීවිත-** Former lives of The Buddha

▲ සූත්‍ර දේශනාවන්ට අනුව , යම් යම් විශේෂ අවස්ථාවන්හිදී බුදුන් වහන්සේ, තමන්ගේ පෙර ජාති පිලිබඳ විස්තර පෙන්වා ඇත. **සටහන:** ඛු.නි: බුද්ධ වංශ චරියා පිටකය, ජාතක පාලිය ආදී කෘතින්, බුදුන් වහන්සේ බෝසතුන් ලෙසින් ජීවිත ගෙනයාම විස්තරාත්මකව පෙන්වා ඇත.

▼**ජාතක කථා** විස්තර පිණිස **බලන්න:**

1. **බුද්ධවංශය සහිත පන්සීයපණස් ජාතක පොත,** සම්පාදක: ජී.එෆ්. මුණසිංහ අප්පුහාමි හා ඩි. ඩබ්ලියු. සිරිවර්ධන අප්පුහාමි, ලංකාව-1928.

2. **සිතුවම් සහිත පන්සීය පණස් ජාතක පොත** (1 හා 2): ශ්‍රීලංකා ප්‍රකාශක සමාගම, කොළඹ-1961.

3. **Buddhist Birth-Stories** (Jataka Tales): Translated from Pali Text by T.W.Rhys Davidds.

▼**ජෝතිපාල බ්‍රාහ්මණයා:** කාශ්‍යප බුදුන් සමයේ, ගිහි ජීවිතයේ ජෝතිපාල නම් බ්‍රාහ්මණව සිට, පසුව එම බුදුන් වහන්සේ වෙත පැවිදිවීමේ විස්තරය මෙහි දක්වා ඇත. **මූලාශ්‍ර:** ම.නි: (2 ): 2.4.1: ඝටිකාර සූත්‍රය, පි. 419, EMN: 81-Ghaṭīkāra Sutta, p, 607.

▼ **ජෝතිපාල මානවක:** දිසම්පති රජුගේ, පුරෝහිතවූ ගෝවින්ද බ්‍රාහ්මණ ගේ පුතණුවන්- ජෝතිපාල මානවක, බුදුන් වහන්සේගේ පෙර ජීවිතයක්ය. පියාගේ මරණින් පසු පුරෝහිත තනතුරට පත්කරනු ලැබුව, මහා ප්‍රඥාවෙන් සිය කාර්ය කිරීම නිසා ඔහු 'මහා ගෝවින්ද' යන නම ලැබුහ. **මූලාශ්‍ර:** දිඝ.නි: (2) 6 මහාගෝවින්ද සූත්‍රය,පි.350.

▼ **පචේතන රජුගේ රථකාරයා:** බුදුන් වහන්සේ මේ සූත්‍රයේ, රජුගේ දක්ෂ රථ කාරයා ලෙසින් කටයුතු කල ආකාරය පෙන්වා ඇත. **මූලාශ්‍රය:**අංගු.නි: (1): 3 නිපාත: රථකාරවග්ග:3.1.2.5 සූත්‍රය, පි.250.

▼ **බක බ්‍රහ්මණ ගේ** 'කප්ප' නම් අතවැසියා ලෙසින් වාසය කිරීම මෙහි විස්තර කර ඇත. **බලන්න:** සංයු.නි (1) :බ්‍රහ්මසංයුත්ත:බකබ්‍රහ්ම සූත්‍රය.

▼ **මඛාදේව රජ:** පෙර ජීවිතයක, බුදුන් වහන්සේ මිථිලා නුවර, මඛාදේව රජව, උපෝසථ ශීලයේ පිහිටා වාසය කිරීම, පැසුන කෙස් දැක, ලෞකික ජීවිතය හැර දැමීම මෙහි විස්තර කර ඇත. **මූලාශ්‍රය:** ම.නි: මඛාදේව සූත්‍රය.

▼ **මහා විජිත රජුගේ පුරෝහිත:** මෙහිදී, බුදුන් වහන්සේ, අතීතයේ දඹදිව විසූ මහාවිජිත රජුගේ පුරෝහිත බ්‍රාහ්මණ ලෙසින්, සත්ව ඝාතන නොමැති, දැහැමි යාගයක් කිරීමට රජතුමාට උපකාරී වූ අන්දම විස්තර කර ඇත.**මූලාශ්‍ර:**දීඝ:නි: (1): 5 කූටදන්ත සූත්‍රය, පි.264, EDN:5: Kūṭtadanta Sutta,p.113.

▼**වේලාම බ්‍රාහමණයා:** බුදුන් වහන්සේ, පෙර ජාතියක, වේලාම නම් බමුණෙක්ව, මාහා දානයක් යහපත් ලෙසින් පිරිනැමීම ගැන මෙහි විස්තර දක්වා ඇත. **බලන්න:** මහාදානය **මූලාශ්‍රය:**අංගු.නි: (5): 9 නිපාත:9.1.2.10 වේලාම සූත්‍රය, පි.456.

▼ **මහා සුදස්සන සක්විති රජ**: පෙර ජීවිතයක සක්විති රජෙක් ලෙසින් විඳිනලද අප්‍රමාණ සැප සම්පත් ගැන පෙන්වා දුන් බුදුන් වහන්සේ වදාළේ , අවසනයේදී ඒ සියලු සැප සම්පත් නැතිවී යනබවය. **සටහන:** මහා පරිනිබ්බාන සූත්‍රයේ දී, මහසුදර්සන රජු, කුසිනාරාවෙ (එවක, කුසාවති නුවර) ධර්මිකව රජ කල විස්තරය පෙන්වා ඇත. **මූලාශ්‍ර:** සංයු.නි (3 ): ඛන්ධසංයුත්ත: 1.2.5.4 ගොම පින්ඩූපම සූත්‍රය, පි. 274, ESN: 22: Khandasamyutta: 96.4 A Lump of Cow dung, p. 1087, දීඝ.නි: (2): 4. මහාසුදස්න සූත්‍රය, පි. 282 හා EDN: 17 Mahāsudassana Sutta, p.202.

## 14) **බුදුන් වහන්සේට තිබු දෙතිස් මහා පුරුෂ ලක්ෂණ** -Thirty two marks of The Buddha

▲ සියලු මහා පුරුෂයන්හට ඇති උතුම් කායික ලක්ෂණ දෙතිස් මහා පුරුෂ ලක්ෂණ ලෙසින් පෙන්වා ඇත. මහා පුරිස ලක්ෂණ 32 පිහිටන්නේ, බුදුවරු, සක්විතිරජවරු වැනි උතුම් පුද්ගලයන්ටය. මේ සූත්‍රයේ දී බුදුන් වහන්සේ ගේ 32ක් වූ මහා පුරිස ලක්ෂණ විස්තරාත්මකව පෙන්වා ඇත. **මූලාශ්‍රය:**දීඝ.නි: (3):පාථිකවග්ග: 7 ලක්‍ෂණ සූත්‍රය, පි.252.

▼**බාවාරි බ්‍රාහ්මණයා,** තම ශිෂ්‍යයන්ට බුදුන් වහන්සේගේ 32 ක්වූ, මහා පුරුෂ ලක්ෂණ ගැන පවසා ඇත. ඔහුගේ ශිෂ්‍යයන්ගේ සැකය දුරුකර තමන්වහන්සේ බුද්ධ බව පෙන්වීමට, උන්වහන්සේ දෙතිස් මහා පුරුෂ ලක්ෂණ ඔවුන්හට පෙන්වා ඇතිබව මෙහි දැක්වේ. **මූලාශ්‍රය:** ඛු.නි.සුත්තනිපාත: පාරායනවග්ග:වස්තුගාථා: පි,326.

▼ **සේල බ්‍රහ්මණට** මහා පුරිෂ ලක්ෂණ ගැන ඇතිවූ සැකය පහකිරීමට, බුදුන් වහන්සේ දෙතිස් මහා පුරුෂ ලක්ෂණ ඔහුට පෙන්වා ඇතිබව මෙහි දැක්වේ. **මූලාශ්‍රය:** ම.නි: (2) 2.5.2 සේල සූත්‍රය, පි.614.

▼ **බ්‍රහ්මායු බ්‍රහ්මණගේ** ශිෂ්‍ය උත්තර මානවකට මහා පුරිෂ ලක්ෂණ ගැන ඇතිවූ සැකය පහකිරීමට, බුදුන් වහන්සේ දෙතිස් මහා පුරුෂ ලක්ෂණ ඔහුට පෙන්වා ඇතිබව මෙහි දැක්වේ. **මූලාශ්‍රය:** ම.නි: (2) 2.5.1 බ්‍රහ්මායු සූත්‍රය, පි.592. **සටහන:** බුදුන් වහන්සේ තමන්ගේ මහා පුරුෂ ලක්ෂණ දක්වා ඇත්තේ, යම් පුද්ගලයන් ට ඇතිවූ සැකය පහකොට ඔවුන් තුළ ශ්‍රද්ධාව ඇතිකර ගැනීමට හා ආරිය මග විවෘත කර දීමටය. ඉහත සඳහන් පුද්ගලයන් සැම සැකය දුරුකොට බුද්ධ අනුගාමිකයන් වුහ.

## 15) **බුදුන් වහන්සේ හඳුන්වන නාමපද**- Titles names for The Buddha

▲බුද්ධනාම ලෙසින් මෙහිදී පෙන්වා ඇත්තේ දෙව් මිනිසුන්, බුදුන් වහන්සේට ගරු කිරීම පිණිස උන්වහන්සේ හැඳින්වූ ආකාරයය.

ත්‍රිපිටකයට අනුව බුදුන් වහන්සේ: භාග්‍යවතුන් වහන්සේ, බුදුරජාණන්වහන්සේ, සුගතයන් වහන්සේ, සර්වඥයන් වහන්සේ ආදීවූ උතුම් නම්වලින් හඳුන්වා ඇත. අන්‍ය ආගමිකයන් බොහෝ අවස්ථාවල බුදුන් වහන්සේ හඳුන්වා ඇත්තේ 'ගුරු ගෝතම' ලෙසින්ය.

▼**සූර්යබන්ධු**- ආදිච්චබන්ධු- (Kinsman of the Sun): සූර්යවංශිකබව- හිරුගේ පෙළපතින් උපන්බව. **මූලාශ්‍රය**:ඛු.නි.සුත්තනිපාත: අට්ඨකවග්ග: 4.14 තුවටක සූත්‍රය, පි. 307.

▼ **විජිතසඞ්ගාමනං**-සංග්‍රාම ජයගත් (victor in battle-මාරයා ජයගත්නිසා), **අනුත්තරං සත්ථවාහං** (unsurpassed caravan leader-සසර නමැති වැලිකතරේ මිනිසුන් එතර කරන තවලම් නායකයා), **තණ්හාසල්ලස්ස හන්තාරං**-Destroyer of the dart of craving), **ආදිච්චබන්ධු**- (Kinsman of the Sun). **සටහන:** වන්ගිස තෙරුන්, එම පදවලින් බුදුන් වහන්සේ හඳුන්වා ඇත. **මූලාශ්‍රය:** සංයු.නි: (1) වන්ගිසසංයුත්ත:8.1.8 පවාරණ සූත්‍රය.

▼ **සුජාත** (well born-යහපත් උපතක් ඇති), **චක්ඛුමා** (man of vision- පසැස් ඇත්තෝය**)**, **සල්ලකත්තො** (the physician-ශල්‍ය වෛද්‍යවරයා), **මහාවීර** (mighty hero). **සටහන:** සේල බ්‍රාහ්මණ **(**පසුව සේල තෙර), මේ පදවලින් බුදුන් වහන්සේ හඳුන්වා ඇත. **බලන්න:** ම.නි: (2) සේල සූත්‍රය.

▼ **උපාලි ගහපති බුදුගුණ පෙන්වීමට මෙ පද යොදාගෙන ඇත.**

**ධීරස්ස (**Wise One-පණ්ඩිත),**විගතමොහස්ස (**cast off delusion-මෝහය දුරුකල**)**, **පභින්නඛිලස්ස (**abandoned the heart's wilderness- පංචචේතඛිල පහකල**)**, **විජිතවිජයස්ස (**victor in battle-මාරසංග්‍රාමය දිනූ**)**, **අනීඝස්ස (**He knows no anguish-නිදුක්වූ**)**, **සුසමචිත්තස්ස** (perfectly even-minded-සමමෙත්සිත් ඇති), **වුද්ධසීලස්ස (**mature in virtue-වැඩුන සිල්-ආචාර ශීල ඇති),**සාධුපඤ්ඤස්ස** (excellent wisdom- සුන්දර ප්‍රඥාව ඇති), **වෙස්සන්තරස්ස (**Beyond all temptations- සියලු පෙළඹීම්- රාගයන් ඉක්මවූ**)**, **විමලස්ස (**without stain-නිර්මලවූ-(මල නැති- කෙලෙස්නැති), **අකථංකථීස්ස** (Free from perplexity- චිත්ත වික්ෂේප නොමැති), **තුසිතස්ස (**abides contented-තුටුසිත් ඇති**)**, **වන්තලොකාමිසස්ස** (spurning worldly gains- ඉවත්කල (වැමැරූ) කාමගුණඇති**)**, **මුදිතස්ස (**vessel of gladness-මුදිතාවෙන් තුටුවූ**)**, **කතසමණස්ස (**who has done the recluse's duty-මහණදම් පිරූ**)** **මනුජස්ස-**මනුජවූ-උතුම් මිනිස්වූ, **අන්තිමසාරීරස්ස (**who ඇති**)**, **වන්තලොකාමිසස්ස (**spurning worldly gains- ඉවත්කල (වැමැරූ) කාමගුණඇති), **මුදීතස්ස (**vessel of gladness-මුදිතාවෙන් තුටුවූ), **කතසමණස්ස (**who has done the recluse's duty-මහණදම් පිරූ**)** **මනුජස්ස-**මනුජවූ-උතුම් මිනිස්වූ, **අන්තිමසාරීරස්ස (**who bears his final body- අන්තිම දේහය දරන**)**, **නරස්ස-**උත්තම නරවූ, **අනොපමස්ස** (peerless-අනුපමවූ-අසමසම**)**, **විරජස්ස (**spotless-කෙළෙස් පහකරඇති**)**, **අසංයස්ස (**free from doubt-සැකයෙන් මිදුන**)**, **කුලස්ස**(skillful-නිපුනවූ**)**, **වෙනයිකස්ස**(the discipliner-හික්මවන්නාවූ**)**, **සාරථීවරස්ස (**excellent leader-උතුම් නායකයාවූ**)**, **අනුත්තරස්ස (**None

can surpass his resplendent qualities-අනුත්තරවූ-කිසිවෙකුට ඉක්මවා යා නොහැකි), **රුචිරධම්මස්ස-**පවිත්‍රධර්මය ඇති, **නික්කඞ්ඛස්ස** (without hesitation-දෙගිඩියාව නොමැති), **පභාසකරස්ස** (illuminator-ප්‍රදීපවූ-ඔභාසකරවූ), **මානච්ඡිදස්ස**(severed conceit- සිඳින ලද මාන ඇති), **වීරස්ස** (hero-වීරයා), **නිසභස්ස** (leader of the herd- රැලේ නායකවූ), **අප්පමෙය්‍යස්ස** (cannot be measured-මැනියනොහැකිවූ-අප්‍රමාණවූ), **ගම්භීරස්ස (depths are unfathomed-ගම්භීරවූ-ගැඹුරුවූ), මොනපත්තස්ස (attained to the silence-මොනවූ-ශාන්ත මුණි), ඛෙමඞ්කරස්ස (Provider of safety-සුරක්ෂිතබව ගෙනදෙන-නිවන ලබාදෙන), දෙවස්ස (possessor of knowledge-වේදවූ-ඥානයෙන් සමන්විතවූ), ධම්මට්ඨස්ස (stands in the Dhamma-ධර්මයේ පිහිටියාවූ, සංවුතත්තස්ස (inwardly restrained-සංවර සිත් ඇතියාවූ), සඞ්ගාතිගස්ස (Having overcome all bondage-කෙලෙස් බැඳීම් ඉක්මවූ), මුත්තස්ස (he is liberated-විනිමුක්ත), නාගස්ස (immaculate tusker- නාගවූ-නිර්මල ඇත් රාජයාවූ), පන්තසෙනස්ස (living in -හුදකලාව වසන්නාවූ), ඛීණසංයොජනස්ස (with fetters all shattered-ක්ෂීණ සංයෝජනවූ-සංයෝජන ක්‍ෂය කල), පටිමන්තකස්ස (Skilled in discussion-ප්‍රතිමන්ත්‍රණ ප්‍රඥාව ඇති- සාකච්ඡාවේ විශාරදවූ),ධොනස්ස (imbued with wisdom- ද්‍රෝනවූ-කාවැදුන ප්‍රඥාවඇති) , පන්නධජස්ස (his banner lowered-මාන ධජය පතිත කල), විතරාගස්ස (he no longer lusts-විතරාගීවූ), දන්තස්ස(Having tamed himself -නිර්විශෙවනවූ-තමන් දමනය කරගත්තාවූ),නිප්පපඤ්චස්ස (he no more proliferates - නිපපංච-කෙලෙස් ප්‍රපංච නැති), ඉසිසත්තමස්ස(The best of seers-උතුම් ඉර්ශිවූ-සප්තමඉර්ශි- සත්වැනි ඉසිවරයාවූ), අකුහස්ස (with no deceptive schemes කුහනනොවූ- වාටුනැති-අමායාකාරී), තෙවිජ්ජස්ස(gained the triple knowledge-ත්‍රිවිද්‍යාඇති), බ්‍රහ්මපත්තස්ස (attained to holiness-ශ්‍රේෂ්ඨස්ථානයට පැමිණි-පූර්ණත්වය ලැබූ), නහාතකස්ස (heart cleansed- කෙලෙස්වලින් පිරිසිදුවූ- දෙවූ කෙලෙස් ඇති), පදකස්ස (master of discourse- දේශනයේ විශාරදවූ- ගාථා පද කරණයෙහි කුශලවූ), පස්සද්ධස්ස (lives ever tranquil -සන්හුන කය සිත් ඇති-ශාන්තවූ-නිසලවූ), විදිතවෙදස්ස (the finder of knowledge-විදිත ඥානඇති-, පුරින්දදස්ස (The first of all givers-හැමට පළමුකොට ධර්මදාන දායකවූ- පළමුවම දහම දුන්නාවූ), සක්කස්ස (he is ever capable-නිති සමත්වූ- ශක්‍යවූ), අරියස්ස (the Noble One-ආරියවූ-මහොත්තමවූ), භාවිතත්තස්ස(developed in mind- වැඩුසිත් ඇති-සමෘද්ධ චිත්ත), පත්තිපත්තස්ස (who has gained the goal-පැමිණියයුතු ගුණයට පැමිණි-අභිමතාර්ථය සඵල කරගත්- දිනුම් කනුව ලැබූ, වෙය්‍යාකරණස්ස (expounds the truth -සත්‍ය විභාගකර පෙන්වන-විස්තරකොට අර්ථ දක්වන, සතීමතො(Endowed with mindfulness-සමෘතිමත්- සතිමත්), විපස්සිස්ස(penetrative insight විදර්ශකවූ- තීක්ෂණ බුද්ධිය ඇති), අනභිනතස්ස (he leans neither forwards nor back-අර්හත්වූ- බැඳීම් පිළිකුල් නොමැති, නො අපනතස්ස(Free from perturbation- කැළඹීම් නැති- අදූෂ්ය වූ), අනෙජස්ස (තණ්හා රහිතවූ-තන්හාව ජයගත්), වසිප්පත්තස්ස- (attained to mastery -වශීප්‍රාප්තවූ), සම්මග්ගතස්ස (He has fared rightly-**

**සම්‍යග්ගතවූ-මැනවින් හැසිරවූ), ඣායිස්ස (abides in meditation-ධ්‍යායීවූ-ධ්‍යානධාරී) අනනුගතන්තරස්ස (inwardly undefiled-නිකෙලෙස්වූ), සුද්ධස්ස (purity perfect-පරිශුද්ධවූ), අසිතස්ස (independent- අබද්ධවූ- නිවහල්වූ), අප්පහීනස්ස (altogether fearless-අප්‍රහීණවූ- පූර්ණ අභයවූ), පවිවිත්තස්ස (living secluded-පවිවිවේකවූ-හුදකලාව වසන), අග්ගපත්තස්ස (attained to the summit-අග්‍රප්‍රාප්තවූ- අග්‍රතැනට පැමිණි), තිණ්ණස්ස (Having crossed over himself- තරණයකල- සිව් ඕඝය-සසර තරණය කල), තාරයන්තස්ස (he leads us across - අනුන් තරණය කරවන), සන්තස්ස-Of supreme serenity-පරම ශාන්තවූ), භූරිපඤ්ඤස්ස (with extensive wisdom -භූරිප්‍රඥ- පොළොව මෙන් ප්‍රඥාව ඇති) මහාපඤ්ඤස්ස (man of great wisdom- මහා ප්‍රඥාවූ), වීතලොභස්ස (devoid of all greed-ලෝභය පහකල), තථාගතස්ස (the Tathāgata- තථාගතයන්ය), සුගතස්ස (the Sublime One-සුගතයන්ය), අප්පටිපුග්ගලස්ස (the person unrivalled- අප්‍රති පුද්ගල-ඉක්මවා යා නොහැකි'), අසමස්ස (the one without equal-අසමසමවූ), විසාරදස්ස (He is intrepid- නිර්භිතවූ- විශාරදවූ), නිපුණස්ස (proficient in all-නිපුණවූ), තණ්හච්ඡිසස්ස (He has severed craving-තණ්හාව සිඳලූ), බුද්ධස්ස (the Enlightened One-බුද්ධය- චතුසත්‍ය අවබෝධ කල, වීතධූමස්ස(cleared of all fumes-කෙලෙස් දුම පහකළ), අනුපලිත්තස්ස (completely untainted-කෙළෙසුන් ගෙන් දූෂිතනොවූ), ආහුණෙය්‍යස්ස (Most worthy of gifts- පිළිගැනීමට අතිශයින් සුදුසුවූ),යක්ඛස්ස (most mighty of spirits- යක්ඛවූ- ප්‍රබල භූතවූ) , උත්තමපුග්ගලස්ස (most perfect of persons- අති උත්තම පුද්ගල), අතුලස්ස (beyond estimation-අතුලවූ, මහතො (The greatest in grandeur-අගපත්-විභූතියෙන් අග්‍රතමවූ- මහිමයෙන්), යසග්ගපත්තස්ස (attained the peak of glory-අග්‍රවූ යසස් ඇති).**

සටහන: උපාලිගහපති බුදුන් සරණ යැමෙන් පසු, බුදුන් වහන්සේ පිළිබඳ උතුම් නාම පද, පෙර ගුරුවූ, නිගණ්ඨනාථපුත්‍ර හට එසේ පවසා ඇත. **මූලාශ්‍ර:** ම.නි: (2 ): 2.1.6 උපාලි සූත්‍රය, පි.76, EMN:56: Upāli,p.452.

▼**සමන්තචක්ඛු**: සියල්ල දන්නා නිසා, දකිනා නිසා බුදුන් වහන්සේ එසේ හඳුන්වා ඇත. පටිසම්භිදාව මේ පිළිබඳව විස්තරාත්මකව පෙන්වා ඇත. මූලාශ්‍රය:ඛු.නි: පටිසම්භිදා 1:ඤාණ කථා: 72-73 සර්වඥතා-අනාවරණ ඥානයෝ, පි.264.

▼ **මෙහිදී,** අස්සජි තෙර (පස්වග) බුදුන් වහන්සේ '**මහා ශ්‍රමණ**' ලෙසින් හඳුන්වා ඇත. මූලාශ්‍ර:වින.පි: මහාවග්ග පාලි1**:** 84 සාරිපුත්ත මොග්ගල්ලාන පබ්බජා. පි.161.

▼**මේ සූත්‍රයේදී බුදුන් වහන්සේව** මෙසේ හඳුන්වා ඇත.

'ධිරය': රූප ආදී' අරමුණු මැඩ පැවැත්වූ නිසා, '**ක්ෂිනාශ්‍රව**': සියලු කර්මයන් ක්‍ෂය කළ නිසා, '**බුද්ධය**': චතුසත්‍ය අවබෝධ කළ නිසා, '**නිරුත්තර සිංහ**': උපද්‍රව ඉවසන නිසා හා කෙළෙස් නසන නිසා,

**'වීතසාරද' (**චතුවෛශාරාද), 'අනුන් දමනය කරන්නවුන් අතරින් ශ්‍රේෂ්ඨය', 'අනුන් ශාන්ත කරන්නවුන් අතරින් **සෘෂිය**', 'අනුන් මුදන්නවුන් අතරින් **උතුම්ය**'. **මූලාශ්‍රය:**ඛු.නි: ඉතිවුත්තක: 4.1.13 ලෝකාවබෝධ සූත්‍රය, පි.510.

**▼වෙනත් මූලාශ්‍ර:**

**1. ජින චරිතයේ** බුදුන් වහන්සේ ගුණ පද මාලාවකින් වර්ණනා කර ඇත:

1) අංගීරස- නෙලුම් මල් මෙන් දෙපාඇති 2) අදන්තදමක- දමනය නොවූ අය දමනය කරන, 3) අතුල - අසහාය (සමානකල නොහැකි), 4) අරහතෝ - ගරුකිරීමට සුදුසු, 5) ඉසි- මුනිවරයා 6) උල්ලාරප්‍රඥා -විපුලවූ ප්‍රඥාව ඇති 7) උත්තම- උත්තරීතර 8) ගුනාකරා- සිල් ආකරයක් බඳු 9) ගුනන්නවා -සාගරයක් බඳු සිල් ඇති 10) ගුනසේඛර - සීලයේ මුල බඳු 11) චක්ඛුමා - සියලු ඇස් ඇති 12) ජනින්දානම් ඉන්ද- මිනුසුන්ට අධිපතිවුවන්ගේ අධිපති 13) ජින- ජයග්‍රාහික 14) ජිනඅංකුර - බෝධිසත්ව 15) ජිනපක්ඛිරාජා - ජයග්‍රාහික පක්ෂි රාජයා 16) ජුතින්ද්‍ර- ජෝතිමත් 17) තපොධාන - මහා මුනි 18) තථාගත 19) තිභවෙකනාථ- තුන්ලෝකයේ අසහාය ආරක්ෂකයා 20) තිභවෙකනායක- තුන්ලෝක යේ අසහාය නායකයා 21) තිලෝකගුරු- තුන්ලොවට ගුරුවූ 22) තිලෝකහිතාද- තුන්ලෝකයට ප්‍රතිලාභ ගෙනදෙන 23) තිලෝකමහිත- තුන්ලොවම ගරුකරන 24) තිලෝක නාථ - තුන්ලොව ආරක්ෂාකරන 25) තිලෝකතිලක - තුන්ලොවට තිලකයක් බඳු, 26) තිලෝකනෙත්ත- තුන්ලොවට ඇස බඳු/ අධිපති 27) තිලෝකවිලොචන - තුන්ලොවට ඇති එකම ඇස 28) දන්ත- දමනයවූ/ පුහුණුවූ 29) දයාලය - දයාව තමන්ගේ වාසය කරගත් බඳු 30) දේවාතිදේව- දෙවියන්ට දෙවිවූ 31) දිපදානම් ඉන්ද - මිනිසුන්ට අධිපති 32) දීපදුත්තම- ශ්‍රේෂ්ඨපුරුෂ 33) දිමාත- ධාර්මික 34) ධර්මරාජා - ධර්මයේ රජු 35) ධම්මිස්සර - ධර්මයේ හිමියා 36) ධිර- වීරයා 37) දිට්ඨිමා - තිරසර, අචල, තාදී 38) නරධිප - මින්සුන්ගේ පාලකයා 39 නරාසභ- උත්තරීතර පුරුෂයා 40) නරසිහරාජ - මින්සුන්ගේ සිංහරාජයා 41) නරින්ද්‍ර- මිනිසුන්ට අධිපති 42) නරිස්සර - මිනිස් පාලකයා 43) නරඋත්තම - මිනුසුන් අතරින් උතුම් පුරුෂයා 44) නාථ-ආරක්ෂකයා 45) පබංකර - ආලෝකය පතුරුවන 46) පරමංරාජී- මරු පැරදවූ උතුම්වීරයා 47) පවාර - උත්තමයා 48) බුද්ධ- අවදි වූ 49) භගවා- වසනවන්ත 50)භූහුපාල - පෘථිවියේ ආරක්ෂකයා -මිහිපාල 51) භූරිපන්න- පුළුල් ප්‍රඥාවෙන් යුතු, 52) මහාබල- අතිමහත් බල ඇති 53) මහාදයා - මහා කාරුනිකවූ 54) මහිපති- පොලවේ අධිපති 55) මහා පන්නා - විශිෂ්ට ප්‍රඥාව ඇති 56) මහාවීර- විශිෂ්ට ජයග්‍රාහකයා 57) මහායස - මහා කීර්තිමත් 58) මහේසි- උතුම් මුනිවරයා 59) මහාඉද්දි- මහාබල ඇති මුනිවරයා 60) මුනින්ද- මුනිවරුනට අධිපති 61) මුනිමේඝ- වැහි වලාකුළු මුනි 62) මුනි පුන්ගව - උතුම් මුනිවරයා 63) මුනිරාජා - මුනිවරුන්ගේ රජු 64) මුනිසිහරාජා- මුනිවරුනට සිහ රජු 65) මුනිවර- උත්තරීතර මුනි 66) යසස්සින- කීර්තිමත් 67) ලෝකහිත- ලෝකයාට ලැබෙන ලාභයෙන් සතුටුවන 68) ලෝකහිතෙකනාථ- ලෝකයාට ලැබෙන ලාභ ආරක්ෂා කරන 69) ලොකාලොකාර- ලෝකය ආලෝකකරන 70) ලෝකනාථ- ලෝකය ආරක්ෂා කරන 71) ලොකනායක- ලෝකයට අධිපති 72) ලෝකාන්තදස්සි- ලෝකයේ අන්තය දුටු 73) ලෝකත්තයෙකසරණ- තුන් ලොවට ඇති එකම සරණ

74) ලෝකවිදූ - ලෝකයදන්නා 75) ලෝකබන්ධු- ලෝකයාට ඇති එකම බන්ධුවරයා 76) ලෝකේනායක -ලෝකයාට ඇති එකම නායකයා 77) ලෝක රාජා-ලෝකයට ඇති එකම රජු 78) ලෝකුත්තම - ලෝකයේ සිටින උත්තමයා 79) වීර- ජයග්‍රාහකයා 80) වර්ධම්මරාජා - ධර්මයේ උත්තරීතර රජු 81) විපුලයස- මහා යසස් ඇති 82) විශාලපන්නා- මහා ප්‍රඥාවෙන් යුත් 83) විසුද්ධ- නිර්මල- පරම පවිත්‍ර 84) සබ්බඅන්නු- සියල්ල දන්නා -සර්වඥ 85) සජ්ජන - ගුණවත් පුරුෂයා 85) ශාක්‍යමුනි- ශාක්‍යයන්ගේ මුනිවරයා 86) ශාක්‍යමුනි කේසරි- ශාක්‍යයන්ගේ මුනි සිංහයා 87) සම්බුද්ධ - සම්බුදු 88) සම්මාසම්බුද්ධ - ශ්‍රේෂ්ඨ සම්බුදු 89) ශාන්ත- ශාන්තිනායක 90) ශාන්තමන- ශානත්වූ සිතක් ඇති 91) සත්තා-ගුරු 92) ශිවන්කර - සුරක්ෂිත බව සකස්කරන 93) සුභග - ප්‍රියතම 94) සුගත- වාසනාවන්ත 95) හිතෙෂි- හිතවතා 96) මහේසිනෝ - මහා ඉසි ඇති . **මූලාශ්‍රය:** ජිනචරිතය: මේධංකර තෙර: පරිවර්තනය:ආනන්දජෝති භික්ඛු.

**2. සද්ධර්මාලංකාරයට අනුව:**සමන්තභද්‍ර, සකලලෝකානන්දකර, සමස්තජනශේඛර, සධර්ම ගංගාප්‍රවාහ, පරදුඃඛදුඃඛිත, ශරණාගත වජ්‍රපඤ්ජර, ත්‍රිභුවන චන්ද්‍ර, අභිධර්මාමෘත ප්‍රශව, දේවාතිදේව, ශක්‍රාතිශක්‍ර, බ්‍රහමාතිබ්‍රහ්ම.

## **16)** දෙවියෝ හා බ්‍රහ්මදෙවියෝ බුදුන්වහන්සේගේ ගුණ වැනිම- Praising The Buddha by Devas & Brahmas

▲ **බ්‍රහ්ම රාජයන්** හා සක්‍රදෙවියන් ඇතුළු දේවසමුහය බොහෝ අවස්ථාවල බුදුන් වහන්සේගේ උතුම් ගුණ වර්ණනා කර ඇත.

▼ **සහම්පති බ්‍රහ්ම රාජ**

*** බුදුන් වහන්සේ** බුදුව, අජපාල නුගරුක මුල වැඩසිටින අවස්ථාවේදී, සහම්පති බ්‍රහ්මරාජයා මෙසේ පවසාඇත:

“ ...නිවන දක්නාවූ හිතානුකම්පා ඇති, භාග්‍යවතුන්වහන්සේ එකම මග දන්නා සේක...”

**මූලාශ්‍රය**: විනා.පි: මහාවග්ග පාලි1: 10 බ්‍රහ්මආයාචනා කථා: පි. 88.

* **සංයු.නි:** (1) බ්‍රහ්මසංයුත්ත:අන්ධකවින්ද සූත්‍රයේ සහම්පති බ්‍රහ්ම, බුදුන් වහන්සේ ගේ ගුණ මෙසේ පවසා ඇත:

“ගැඹුරු වනසේනාසන විහරණය කරති...සංසයා අතර රක්නා ලද සිත ඇතිව වැඩසිටි...ගෝපනය කරනලද ඉඳුරන් ඇතිව, තීරණ ප්‍රඥාව ඇතිව, සිහි ඇතිව කුලයන් අතර පිඩුසිහා යති...සසරබිය මුදා, නිවනේ අධිමුත්තකව වාසය කරති...යම් තැනක බිහිසුණු බව ඇත්ද, සර්පයෝ සිටිද, විදුලිය ලෙළදෙයිද, මේඝය ගිගිරි හඬ දෙයිද, මහණ තෙමේ ඒ රෑ ගණඅඳුරේ පහවූ ලොමුදැහැගැනීම ඇතිව හුන්නේය...”

* **බුදුන් වහන්සේගේ මහා පරිනිබ්බානයෙන්** පසුව සහම්පති බ්‍රහ්මරාජයා මෙසේ පැවසුහ:

“ලෝකයේහි අප්‍රතිපුද්ගල වූ තථාගතවූ බලයට පැමිණිවූ සියලු ධර්මයන් අවබෝධ කළාවූ මෙබඳු ශාස්තෘන් වහන්සේ පවා යම්සේ පිරිනිවීසේක්ද...”

**මූලාශ්‍ර:**සංයු.නි: (1) බ්‍රහ්මසංයුත්ත:6.2.5 පරිනිබ්බාන සූත්‍රය, පි.308,ESN: 6: Brhmasamyutta: 15.5 Finala Nibbana, p. 350.

**▼සහම්පති බ්‍රහ්ම රාජ හා සක්දෙවිඳු**

එක්සමයක බුදුන් වහන්සේ විවේක සුවයෙන් වාසය කරන අවස්ථාවක, සහම්පති බ්‍රහ්මරාජ හා සක්දෙවිඳු, උන්වහන්සේ වැඳ නමස්කාර කිරීමට පැමිණ මෙසේ ගාථා වදාළහ:

**සක්දෙවිඳු ගේ ගාථාව:** “දිනනලද සංග්‍රාම ඇති, බහා තබන ලද බර ඇති, ණය නැති, වීරයන් වහන්ස නැගීසිටිනු මැනවි, ලොව හැසිරෙනු මැනවි, ඔබ වහන්සේ, පුන්පොහෝදින සඳ මෙන් මැනවින් මිදුනේය”.

**සටහන්:** * ඒ අවස්ථාවේදී බ්‍රහ්ම සහම්පති, සක්දෙවිඳු අමතා එලෙසින් නොව, මෙසේ තථාගතයන් වැඳිය යුතුයයි පැවසුහ:

“වීරයන් වහන්ස, දිනනලද සංග්‍රාම ඇති, ණය නැති, සාස්තෘන් වහන්ස, නැගිසිටිනු මැනවි, භාග්‍යවතුන් වහන්සේ ධර්මය දේශනා කරණු මැනවි, අවබෝධ කරන්නො ඇත.”.

**මූලාශ්‍ර:** සංයු.නි: (1) සගාථ වග්ග: සක්කසංයුත්ත:11.2.7 වන්දනා සූත්‍රය, පි.440, ESN:1: Sakkasamyutta:17.7 Veneration of the Buddha,p.484.

**▼සක්දෙවිඳු**

* බුද්ධත්වය ලබා, බුදුන් වහන්සේ රජගහ නුවරට වඩින අවස්ථාවේ සක්දෙවිඳු තරුණ මිනිස්වෙසක් ගෙන බුදුගුණ කියමින් ජනයා ඉදිරියේ ගමන්කළහ. සක්දෙවිඳුගේ ගායනය අසා, මහජනයා ඔහු කවරෙක්ද? යයි ඇසුවිට මෙසේ පැවසුහ:

**“ යම් නුවණැත්තෙක් තෙමේ සියලු ස්කන්ධ ආයතනයන්හි දැමුනේද, පිරිසිදු වුයේද, අප්‍රතිපුද්ගල වුයේද, ලෝකයෙහි රහත් වුයේද, යහපත් ගමන් ඇත්තේද, මම උන්වහන්සේගේ මෙහෙකරුවෙමි”.**

**බලන්න**: වින.පි: මහාවග්ග (1) : 48: මහාඛන්ධක: 48 උරුවෙලපටිහාරිය කතා, පි. 127.

* එක් සමයක, සක්දෙවිඳු තව්තිසා දේව සභාවේදී බුදුන් වහන්සේගේ විද්‍යමාන ගුණ 8 ක් ගැන පවසා ඇත : 1) භාග්‍යවතුන් වහන්සේ, බොහෝදෙනාට සුව පිණිස, ලොවට අනුකම්පාව පිණිස, දෙව්මිනිස් වැඩ පිණිස පිළිපන්නෝය 2) භාග්‍යවතුන් වහන්සේගේ ධර්මය ස්වාක්ඛාතය 3) භාග්‍යවතුන් වහන්සේ කුසල අකුසල යහපත් ලෙසින්ම පෙන්වා ඇත 4) භාග්‍යවතුන් වහන්සේ, තම ශ්‍රාවකයන්ට නිවන් මග යහපත් ලෙසින්ම පෙන්වා ඇත 5) භාග්‍යවතුන් වහන්සේ සේඛයන්ද, අසේඛයන්ද මැද පලසමවතින් වැඩ වාසය කරති, එසේම, ඔවුන් බැහැරකොට ඒකාරාමතාහිද වැඩ වසති 6) භාග්‍යවතුන් වහන්සේ කීර්තිය සියලු

දෙව්මිනිස් පිරිසට ප්‍රියවේ, උන්වහන්සේ පහවූ මද ප්‍රමාද ඇතිව ආහාර ගනිති 7) භාග්‍යවතුන් වහන්සේ යථාවැඩි තථාකාරිය, යථාකාරී තථාවාදීය- කියන දේ කරන, කරනදේ කියන 8) ආරියමාර්ගයේ සංකා නොමැති, පරිපූර්ණ මනෝරථ ඇතිව වැඩ සිටිති… මේ අංගයන්ගෙන් සමන්විත ශාස්තෘවරයෙක්, අතීතයේද, දැන්ද දකින්නට නොමැත. **සටහන්**: * ඒ අවස්ථාවදී බොහෝ සම්මා සම්බුදුවරු පහළවන්නේ නම්, එය ලොවට කොපමණ සෙතක්ද යයි දේවසභාවේ දී කථාබස් කරන ලදී. ඒ අවස්ථාවේ, සක්දෙව්ඳු පැවසුවේ 'ලෝක ධාතුවේ සම්මා සම්බුදුවරු දෙනමක් එකවිට පහළ නොවන බවය''.

** අවසානයේදී සක්දෙව්ඳු මෙසේ පැවසුහ: ''භාග්‍යවතුන් වහන්සේ ලෝකයාගේ හිත සුව පිණිස, බොහෝ කලක්, දිගුකලක්, ලෙඩ නැතිව නිරෝගීව වැඩ සිටිනසේක්වා!'' ** එම දෙව්සභාවට පැමිණි සනංකුමාර බ්‍රහ්ම රාජයාද , බුදුන් වහන්සේගේ පෙරකී ගුණ අට වර්ණනා කළෝය. ** එම අවස්ථවේදී, සනංකුමාර බ්‍රහ්ම රාජයා, බුදුන් වහන්සේ, පෙර ජීවිතයක, දිසම්පති රජුගේ, ගෝවින්ද පුරෝහිත බ්‍රාහ්මණ ගේ පුතා: ජෝතිපාල මානවක ලෙසින් වාසය කිරීම ගැන විස්තර පැවසුහ. **බලන්න**: බුදුන්වහන්සේගේ පෙර ජීවිත.

**මූලාශ්‍රය**:දීඝ.නි: (2) 6 මහා ගෝවින්ද සූත්‍රය, පි.350.

**▼ බක බ්‍රහ්මරාජ**

''…ඔබවහන්සේ බුද්ධය, ඔබගේ දිලිසෙන ආනුභාවයෙන් මුළු බඹලොවම බැබළුනී''. **මූලාශ්‍රය:** සංයු.නි: (1) බ්‍රහ්මසංයුත්ත:බකබ්‍රහ්ම සූත්‍රය.

**▼ දෙවියන් බුදුගුණ වැනිම**

* දේවියෝ මෙසේ බුදු ගුණ පවසා ඇත:

''කෙණ්ඩා එණිමුවෙක් ගේ මෙන්ය; කය සිහින්දැරිය; ලෝභරහිතය; ස්වල්ප ආහරයක් ගනී; කම් සැප නොතකයි, සිංහයෙක් මෙන්, ඇතෙක් මෙන් මහාවීරයන් වහන්සේ එකලාව හැසිරේ'.

**සටහන**: එණිමුවා: විශේෂ මුව වර්ගයකි. **මූලාශ්‍ර**:සංයු.නි:(1): දේවතා සංයුත්ත: 1.3.10 එණිජඩ්ඝ සූත්‍රය, පි. 58, ESN: 1:Devatasamyutta: 30.10 Antelope Calves, p. 93.

*** එක් සමයක බුදුන් වහන්සේ ගේ** පාදය ගල්පතුරකින් තුවාලවී බලවත් ශාරීරික වේදනා ඇතිවිය, උන්වහන්සේ ඒ තියුණු අමිහිරි වේදනාවන් සිහියෙන් හා නුවණින්යුතුව ඉවසුහ. එදින රෑ පෙරයම සතුල්ලපකායික දේවතාවෝ මේ ගාථාවලින් බුදුගුණ ප්‍රකාශ කළහ:

''ශ්‍රමණ භවත් ගෝතම තෙමේ ඒකාන්තයෙන්ම **නාගයෙකි**… **සිංහයෙකි**… **ආජානිය අශ්වයෙකි**… **නිසභයෙකි** (නායක වෘෂභයෙකි)… **ධොරය්හයෙකි**( ධුර- බර ,දුක් කරදර ඉසිලීමට සමත්)… **දාන්තයෙකි** (දමනයවූ)… දැඩිවූ, කටුකවූ, අමිහිරිවූ ශාරීරික සිහිනුවනින් යුතුව, පිඩාවට පත්නොවී ඉවසා දරා සිටි''.

"ශ්‍රමණ භවත් ගෝතමයන් වහන්සේ සමාධිය මැනවින් වඩනලදී, සිත **සුවිමුක්තය**.මානව විමුක්තියට පත්ව ඇත... සියළු කෙලෙස්, බලයන් නොව විරියෙන් ප්‍රහිනය කොට ඇත:

එම අවස්ථාවේ දී වෙනත් දෙවියෙක් මෙසේ පැවසුහ:

"යමෙක් , එබඳු උතුමෙක්, පුරුෂ නාගයකු, පුරුෂ සිංහයෙකු, පුරුෂ අජානියකු, පුරුෂ වසභයකු, පුරුෂ ධොරය්හකු, පුරුෂ දාන්තයකු ලෙස හඳුන්වන් නේ නම් ඒ ඔවුන්ගේ නුනුවණ කම නිසාය. වේද පස දරන, සිය වසක් මුළුල්ලේ තපස් රකිමින් හැසිරෙන බ්‍රාහ්මණයෝ සිටීද, ඔවුන්ගේ සිත් මැනවින් නො මිදුනේය. ලාමක ඔවුන් පරතෙරට (නිවනට) නොයන්නෝය. තණ්හාවෙන් කිඳී සිටින, ව්‍රත හා ශිල වලින් බැඳුන, සිය වසක් මුල්ලේ දුෂ්කර තපස් කම් කරන යම් බමුණෝ සිටීද, ඔවුන්ගේ සිත මැනවින් නොමිදුනේය. ඒ පහත් ස්භාවය ඇති ඔවුන් ද පරතෙරට නොයන්නෝය. මානය ට ඇල්ම ඇති අයට දමනයක් නැත. සමාධියක් නැති අයට මුණිබව ලැබිය නොහැකිය. ප්‍රමාද සහිතව වනයේ හුදකලාව වෙසන ඔවුන්ට සසර පරතෙරට- නිවනට පැමිණිය නොහැකිය".

**සටහන්: *** ඒ අවස්ථාවේදී බුදුන් වහන්සේ මෙසේ වදාළහ:

"මානය දුර ලා , මනාව එකඟවූ සිතක් ඇති, සියලු උපධීන්ගෙන් මිදුන, අප්‍රමාදව, හුදකලාව, වනයේ වෙසන තැනැත්තා , මරණය ජයගෙන, සසර පරතෙරට- නිවනට පැමිණෙන්නේය".

** බුදුන් වහන්සේ ඝාතනය කිරීම පිණිස දේවදත්ත විසින්, ගිජ්ජ කූටයේදී පෙරලන ලද මහා ගල් කුලකින් කැඩීගිය ගල් පතුරක් වැදීමෙන් බුදුන් වහන්සේගේ සිරි පතුල තුවාලවිය. **විස්තර පිණිස** බලන්න:1) ESN, devatha samyuththa, note 86, p 513,

2), භික්ඛු ඥානමොලී විසින් සම්පාදනය කළ :'Life of the Buddha', 13 නි පරිච්ඡේදය. **මූලාශ්‍ර**:සංයු.නි: (1): දේවතා සංයුත්තය, සකලික සූත්‍රය,පි.74, ESN:1: devatha samyuththa:38.8 The stone splinter,p. 111.

*** අනෝම සූත්‍රයේ දී** දෙවියෙක් මෙසේ බුදු ගුණ වර්ණනා කර ඇත:
**"අනොමනාමං නිපුණත්‍ථදස්සිං පඤ්ඤාදදං කාමලයෙ අසත්තං**
**තං පස්සථ සබ්බවිදූං සුමෙධං අරියෙ පථෙ කම්මානං මහෙසින්ති"**

පිරිපුන් යයි නම් ඇති (අනෝම), සියුම් අරුත් දන්නා (**නිපුණත්‍ථදස්සිං**), නුවණදෙන (**පඤ්ඤාදදං**), කාමවස්තූන්ට නොඇලුන (**කාමලයෙ අසත්තං**), සියල්ල දන්නා (**සබ්බවිදූං**) මනා නුවණ ඇති (**සුමෙධං**), ආරියමාර්ගයේ ගියාවූ ඒ මහා ඉර්සිවරයා (**මහෙසින්ති**) බලන්න!. **මූලාශ්‍ර:** සංයු,නි: (1):දේවතාසංයුත්ත:1.5.5 අනෝම සූත්‍රය, පි. 84, ESN:1: devatha samyuththa 45.5.perfect , p. 120.

*** ▼ බවාරි බ්‍රාහ්මණට දේවතාවක් බුදුගුණ පැවසීම**

"පෙර කිඹුල්වත්පුරයෙන් නික්ම ගිය ලෝකනායක වූ ඔක්කාක රජ පරපුරෙහි, ලොව හෙළි කරන ශාක්‍ය පුත්‍රයෙක් විය... හේ සම්බුද්ධය...

ධර්මයන්ගේ පරතෙරට ගියහ, සියලු අභිඥා බල ලැබූහ, සියලු ධර්මයන්හි නුවණැස ඇත, හැම කම්ම ක්‍ෂය කර ඇත...භවවිමුක්තිය ලැබූහ. උන්වහන්සේට පසැස් ඇත...පස් මරු දිනූහ, මහා ප්‍රාඥයය, අප්‍රතිමය, අනාසවවූහ...". **බලන්න**: උපග්‍රන්ථය:3. **මූලාශ්‍රය**: ඛු.නි.සුත්තනිපාත: පාරායනවග්ග:වස්තුගාථා: පි,326.

## 17) **බුද්ධ ශ්‍රාවකයෝ බුදුගුණ පැවසීම-** Praising The Buddha by the disciples

▲බුදුන් වහන්සේගේ උතුම් ශ්‍රාවක සංඝයා උන්වහන්සේගේ ගුණ වර්ණනා කිරීම විස්තර පිණිස **බලන්න**: ථේරගාථා, ථේරීගාථා, අපදාන.

**▼අඤ්ඤාකොණ්ඩඤ්ඤ තෙරුන්**

"මම (බුදුන් වහන්සේගේ) ඉතා රසවත් දහම අසා බෙහෙවින් පැහැදුනෙමි, උන්වහන්සේ, සර්වප්‍රකාරයෙන්ම උපාදාන රහිත විරාග ධර්මය දේශනා කරන ලදී". **බලන්න:** ඛු.නි: ථෙරගාථා:16.1.1. පි.214.

**▲ අංගුලිමාල තෙරුන්**

**"දෙවිමිනිසුන් පූජිත මේ මහාඉසි මහණ බොහෝ කලක් ඇවෑමෙන් මට වැඩ පිණිස මහාවනයට වැඩියහ. මම ඔබගේ ධර්ම යුක්ත ගාථා අසා පව් හැරදමමි".**

**මූලාශ්‍රය**: ම.නි: (2) 2.4.6 අංගුලිමාල සූත්‍රය, පි.532.

**▼ ආනන්ද තෙරුන්**

1)" ඇවැත්නි, තථාගතවරයෝ අසිරිමත්ය, අසිරිමත් ධර්මයන්ගෙන් සමන්විතය; ... අද්භූත ද වෙති, අද්භූත ධර්මයන්ගෙන් සමන්විතය". **බලන්න**:ම.නි: ආචාරියා අද්භූත සූත්‍රය.

2) "තථාගතයන් වහන්සේ චක්ඛුසම්පන්නය; ඥාණ සම්පන්නය; ධර්මසම්පන්නය; ශ්‍රේෂ්ඨය; වක්තෘහ, ප්‍රකාශයෙහි සමර්ථය; අර්ථ මැනවින් පහදාදෙන්නෝය; අමරණියබව ලබාදෙන්නෝය; ධර්මස්වාමියෝය,ඒ තථාගතයන් වහන්සේය" **මූලාශ්‍ර**: අං.ගු.නි:( 6):10 නිපාත:10.4.2.6, දුතිය අධම්ම සූත්‍රය,පි.494, EAN:10: 172-6 non-Dhamma-2, p.551 .

**▼ අභය (රාජකුමාර) තෙර**

" සූරිය බන්ධු වූ බුදු රජාණන්වහන්සේගේ සුභාෂිතය අසා, දක්‍ෂ දුනුවායෙක් වලග හීයෙන් විදුනාක් මෙන් සියුම් වූ නිරෝධ සත්‍ය අවබෝධ කෙළෙමි". **බලන්න:** ඛු.නි: ථෙර ගාථා:1.3.6, පි.48.

**▼ උදායි තෙරුන්**

" මනුෂ්‍යවූ, තමන් විසින් දමනයවූ, සමාහිතවූ, ධ්‍යානයෙන් නිවන්මග වසන, චිත්තඋපසමයෙහි නියැලුනු, සර්වධර්මඥානයෙහි පාරප්‍රාප්තවූ යම් බුද්ධනාගයකු මනුෂ්‍යයෝ නමදිත් නම්, ඒ බුදුන්, දෙවියෝද නමදි...සත්‍ය වූ නාගනාම ඇති බුදු තෙම අනුත්තරය.... දියෙහි උපන් හෙළ පියුම යම් සෙයින් වැඩේද, පිවිතුරු සුවඳ ඇතිව, සිත්කලුව, දියේ නො තැවරේ,

...මේලොවේ මොනවට උපන් බුදුරජ, නොමඇලේ... වීතරාගිවූ, වීතදෝසවූ, වීතමෝහවූ ආශ්‍රව නැති නාග තෙමේ සිරුර හැරලමින්, අනාශ්‍රව වූයේ පිරිනිවේ" **මූලාශ්‍රය**:අංගු.නි: (4) 6 නිපාතය: ධම්මික වග්ග: 6.1.5.1 නාගසූත්‍රය, පි.126.

▼ **උත්තිය (උත්තර) තෙරුන්:**

"දේවේන්ද්‍රය, එලෙසින් යම් සුභාෂිතයක් වේ නම් ඒ හැම බස, ඒ භාග්‍යවත් අරහත් සම්මා සම්බුදුරජාණන්වහන්සේ ගේ බුද්ධ වචන වේ. අප, ඒ බුද්ධ භාෂිතය තුලින් ගෙන අපගේ දේශනා කරන්නෙමු" **සටහන**: සක්දෙවිඳු ඇසු පැනයකට, උත්තර තෙරුන් එසේ වදාළහ. **මූලාශ්‍ර**:අංගු.නි: (5 කාණ්ඩය): 8 නිපාත:උත්තරසූත්‍රය, පි.46, EAN :8: 8.8.Uththara , p 414.

▼ **උපවාන තෙරුන්**

**" ...ලෝකයේ අරහත්වූ සුගතවූ මුනින්ද්‍රයන් වහන්සේ ට ආබාධ ඇතිසේක... පිදිය යුත්තන් විසින් පුදනලද, සත්කාර කටයුත්තන් විසින් සත්කාර කරනලද, ගරු කටයුත්තන් විසින් ගරු කරන ලද ඒ බුදු රජාණන්වහන්සේට ගෙනයන්නට උණුදිය ලැබීමට කැමැත්තෙමි"**

**මූලාශ්‍රය**:සංයු.නි: (1) බ්‍රාහ්මණසංයුත්ත:7.2.3 දෙවහිත සූත්‍රය, පි.338.

▼**කඞ්ඛාරේවත තෙරුන්**

**"යම් කෙනෙක් තමන් වෙත පැමිණෙන අයගේ සැක දුරලා, නුවණ එළිය ලබා දෙන්නේද, ප්‍රඥාව නමැති ඇස දෙන්නේද, මැදියම් රෑ ඇවිළෙන මහා ගින්නක් බඳු ඒ තථාගතවරුන්ගේ ප්‍රඥා මහිමය බලනු මැනවි!"**

**බලන්න**: ඛු.නි: ථෙරගාථා:1.1.3 පි.38.

▼ **කුමාර කාශ්‍යප තෙරුන්**

" යම් ශාස්තෘ කෙනක් වෙත, මේ බඳු ශ්‍රාවකයෙක් ලොව්තුරු දහම සාක්ෂාත් කරගන්නේද, ඒ බුදුහු අසිරිමත්ය, දහම අසිරිමත්ය, අපගේ ශාස්තෘන් වහන්සේගේ දසබල ආදියෙන් අසිරිමත්ය".

**බලන්න**: ඛු.නි: ථෙරගාථා:2.5.1, පි.110.

▼**මෝසරාජ තේරුන්**

"...මිනිසුන්ට හිත වැඩ සලසන නරශ්‍රේෂ්ඨවූ ඒ සර්වඥයන් වහන්සේට යම් කෙනෙක් නමස්කාර කරන්නේ නම්, ඔවුන් පැසසිය යුතුද?"

බුදුන් වහන්සේ මෙසේ වදාළහ:

"මොසරාජය, යම් කෙනෙක් එසේ, මිදුණු ඒ සර්වඥයන් වහන්සේට නමස්කාර කරයිද, එබඳු භික්ෂුන් පැසසිය යුතුය. ඒ භික්ෂුහු ධර්මය දැන,විචිකිච්චාව දුරුකර, රාගාදී බැඳුම් වලින් මිදුන අයවේ".

**මූලාශ්‍රය:** සංයු.නි: (1) දේවතාසංයුත්ත:1.1.1. නසන්ති සූත්‍රය.

▼**මහා කච්චාන තෙරුන්**

**1)** "...ඒ භාග්‍යවතුන්වහන්සේ සියල්ල දන්නෝය; සියල්ල දකින්නෝය... චක්ඛු සම්පන්නය; ඥාණ සම්පන්නය; ධර්මසම්පන්නය; ශ්‍රේෂ්ඨය (බ්‍රහ්ම සම්පන්නය) ; වක්තෘහ, ප්‍රකාශයෙහි සමර්ථය; අර්ථ මැනවින් පහදාදෙන්නෝය; අමරණියබව ලබාදෙන්නෝය; ධර්ම ස්වාමියෝය..."

**"...භගවා ජානං ජානාති,පස්සං පස්සති, චක්ඛුභූතො ඤාණභූතො ධම්මභූතො බ්‍රහ්මභූතො වත්තා පවත්තා අත්ථස්ස නින්නෙතා අමතස්ස දාතා ධම්මස්සාමී තථාගතො..."**

**සටහන:**ම.නි: මහාකච්චාන භද්දේකරත්ත සූත්‍රයේ දී ද මෙම ගුණ වර්ණනාව කර ඇත. **මූලාශ්‍ර:** අංගු.නි:(6 ):10 නිපාත:10.4.2.6, දුතිය අධම්ම සූත්‍රය,පි.494, EAN:10:172-6 non-Dhamma-2, p.551.

2) "...පෙරදිග දනව්වෙහි සැවත් නම් නුවරක් ඇත. එහි, ඒ අරහත් සම්මා සම්බුද්ධවූ භාග්‍යවතුන් වහන්සේ දැන් වැඩවසනසේක. ඒ භාග්‍යවතුන් වහන්සේ වනාහි මේ කාමරාග ... දිට්ඨිරාග බැඳීම් හැම ඉක්මවා වැඩසිටිති"

**"...පුරත්ථිමෙසු සාවත්ථි නාම නගරං. තත්ථ සො භගවා එතරහි විහරති අරහං සම්මාසම්බුද්ධො... භගවා ඉමඤ්චෙව කාමරාග... ඉමඤ්ච දිට්ඨිරාග විනිවෙස විනිබන්ධ පලිගෙධ පරියුට්ඨානජ්ඣොසානං සමතික්කන්තොති".**

**මූලාශ්‍ර:** අංගු.නි: (1): 2 නිපාත: 2.1.4.6 සූත්‍රය, පි. 166 , EAN: 2: 37.6 Sutta,p.62.

▼ **මහා මුගලන් තෙරුන්**

එක්සමයක බ්‍රහ්මදේවරාජයෙක් ඇසූ පැනයකට පිළිතුරු ලෙසින් මුගලන් මහා තෙරුන් මෙසේ වදාළහ:

**"ත්‍රිවිද්‍යා ඇති ඍද්ධිවිධ ඥානයට පැමිණි පරසිත දැනීමෙහි දක්ෂවූ, ක්‍ෂය කළ ආසව ඇති රහත්වූ, බුදුන් වහන්සේගේ ශ්‍රාවකයෝ බොහෝය".**

**මූලාශ්‍රය:** සංයු.නි: (1): බ්‍රහ්මසංයුත්ත:6.1.5 අපරාදිට්ඨිසූත්‍රය, පි. 286.

▼ **වංගීස තෙරුන්**

1. එක්සමයක බුදුන් වහන්සේ, චම්පා නුවර අසල පිහිටි ගග්ගාරා පොකුණ තෙර , 500ක් සංඝයා, 700ක් පමණ ගිහි උවසුවන් හා දහස්ගණන් දෙවියන් සමග වැඩවසන අවස්ථාවේ, උන්වහන්සේගේ ශරීර වර්ණය හා යසස සෙසු හැම අබිබවා බබලන සේක. ඒ බව දුටු වංගීස තෙරුන් මෙසේ වදාළහ:

"පහව ගිය වලාකුළු ඇති අහසේ සඳද, හිරුද යම්සේ බබලයිද, මහාමුනිවූ බුදුන් වහන්සේ, එලෙස යසසින් සියලු ලෝකයා අබිබවා බබලන සේක".

**මූලාශ්‍රය**:සංයු.නි: (1) සගාථවග්ග: වංගීසසංයුත්ත:8.1.11 ගග්ගාරා සූත්‍රය, පි.374.

2. "...ත්‍රිවිද්‍යා ඇති, මරු නැසුවා වූ ශ්‍රාවකයෝ, දිනූ සංග්‍රාම ඇති නිරුත්තර වූ 'සත්ථවාහ' නම් බුදුරාජානන් වහන්සේ පයුරුපාසනය

කරති. සියල්ලෝම භාග්‍යවතුන් වහන්සේගේ පුත්තුය... තෘෂ්ණාශල්‍යය නසන සූර්යබන්ධු වූ සර්වඥයන් වහන්සේ වඳිමි".

**බලන්න:** සංයු.නි: (1) වංගීසසංයුත්ත:පවාරණ සූත්‍රය,පරොසහස්ස සූත්‍රය.

**▼ සේල තෙරුන්**

"...මුනින්ද්‍රයාණෙනි, ඔබ වහන්සේ බුද්ධය...ශාස්තෘයහ...මරුන් මැඩුසේක... අනුසයන් සිඳ උතතිණි වූ සේක...ප්‍රජාව තරණය කරවන්නේහය...උපධි සමතික්‍රාන්තකළහ, ආශ්‍රව බිඳුණලදහ, සිංහක් සෙයින් උපාදාන රහිතව සිටි, සියලු භය භෛරව පහකළහ..."
**බලන්න**:ම.නි:සේලසූත්‍රය.

**▼සැරියුත් තෙරුන්**

බුදුන් වහන්සේ, අවසාන චාරිකාවේ දී නාලන්දා නුවර , පාවාරික අඹවනයෙහි වැඩ වසන  අවස්ථාවේදී, සැරියුත් මහා තෙරුන්, බුදුන් වහ්සේ වැඳ නමස්කාර කර මෙසේ පවසා ඇත:

"...වහන්ස, සම්බෝධි (රහත්මග නුවණ) නම්වූ යම් දෙයක් ඇත්ද. එයින් භාග්‍යවතුන් වහන්සේට වඩා අභිඥතරවූ (උත්තරීතර ඥානයෙන් යුක්තවූ) අන් මහණෙක් හෝ බමුණෙක් හෝ ඉකුත් කල්හි නොවිය, මතුත් නොවන්නේය, දැනුදු නැතයයි මම මෙසේ භාග්‍යවතුන් වහන්සේ කෙරහි ප්‍රසන්නවූවෙමි"

**මූලාශ්‍රය**: දීඝ.නි: මහාපරිනිබ්බාන සූත්‍රය:17 ශාරිපුත්‍ර සිංහනාදය, පි.144.

**▼ ඛේමා තෙරණිය**

" බාලයෝ නක්ෂත්‍රයට වඳී, වනයෙහි ගිනිදෙවි පුදයි, ඔවුන් යථාභූතය නොදත් නිසා, ඒවා ශුද්ධිය ලෙස සිතති. මම පුරුෂඋත්තමවූ සම්‍යක් සම්බුදුන් වඳිමින්, බුදුන් ගෙ අනුසස් කර, හැම දුකින් මිදුනෙමි"

**මූලාශ්‍රය:** ඛු.නි:ථෙරිගාථා:6.3  ,පි.404

**▼ භද්‍රාකුණ්ඩල කේසි තෙරණිය**

"ගිජුකුලු පව්වේ දිවාවිහාරස්තානයෙන් නික්ම, භික්ෂු සංඝයා විසින් පිරිවරණලද, කෙළෙස් රහිත වූ බුදුන් දුටිමු. බුදුන් හමුයේ දෙදණ බිම පිහිටුවා ඇඳිලි බැඳ වැන්දෙමි.    'ඒව, භද්‍රාවෙනි යයි බුදුන් වහන්සේ වදාළහ, එය මගේ උපසම්පදාව විය".**මූලාශ්‍රය:** ඛු.නි:ථෙරිගාථා:5.9 ,පි.398.

**▼ වසේටයී තෙරණිය**

" මම පුත්‍ර ශෝකයෙන් පීඩිතව, එනිසාම සිහිනොමැතිව, නග්නව, මුදාහල කෙස් ඇතිව එ එ තැන හැසිරුනෙමි. කසළ ගොඩේද, සොහොනේද, මාවතේද තුන්වසක් සා පිපාසෙන් හැසිරුනුමි. අදාන්තයන් දමනය කරන, කිසිම බියක් නොමැති සුගතවූ සම්බුද්ධයන් වහන්සේ, මියුලු නුවර බලා යන ගමනේදී මට හමුවිය. පියවි සිහි ලැබූ මම බුදුන් වහන්සේ වෙත එළඹ උන්වහන්සේට නමස්කාර කෙළෙමි. එ ගෝතම බුදුන් වහන්සේ මට අනුකම්පාවෙන් දහම දෙසුසේක, එ දහම අසා

සසුනේ පැවිදිවූවෙමි, බුද්ධ වචනයෙහි යෙදෙමින් නිවන පදය පසක් කරගතිමි". **මූලාශ්‍රය:** ඛු.නි:ථෙරිගාථා:6.2 ,පි.402

## 18) අන්‍යආගමිකයන් බුදුගුණ පැවසීම- Praising The Buddha by the other religious sects

▲බුදුන් වහන්සේ සරණ නොගියද, උන්වහන්සේ වැඩසිටි සමයේ විසූ බොහෝ අන්‍යආගමිකයෝ එතුමන්ගේ ගුණ පවසා ඇත. එ සමයේ බ්‍රාහමණ වංශය බලගතුව සිටි නිසා බොහෝ බ්‍රාහ්මණයන් බුදුන් වහන්සේට එරෙහිව කටයුතු කළහ. එහෙත්, ධර්මය අසා අවබෝධ කරගත් බ්‍රාහ්මණයන් බොහොමයක් බුදුන් සරණ ගියහ. **බලන්න:** උපග්‍රන්ථය:1,3.

▼**උපක ආජීවක**: බුදුන් වහන්සේ දැක ප්‍රසාදයට පත් උපක ආජීවක මෙසේ පැවසුහ:

**“විප්පසන්නානි ඛො තෙ ආවුසො ඉන්‍ද්‍රියානි පරිසුද්ධො ඡවිවණ්ණො පරියොදාතො...”**

“ඇවැත්නි, ඔබ වහන්සේගේ චක්ෂුආදී ඉන්ද්‍රියෝ විශේෂයෙන්ම ප්‍රසන්නය, සිරුර පැහැය පිරිසිදුය, අතිශයින්ම නිර්මලය’’.

**සටහන:** පසුකලෙක, උපක බුදුන් වහන්සේ දැකීමට පැමිණ පැවිදිබව ලබාගති. **මූලාශ්‍ර:** වින.පි: මහාවග්ග පාලි1: ඛන්ධක:14 පඤ්චවග්ගිය කථා:4 ඡෙදය, පි.94.

▼ **වෙරඤ්ජකවැසි බ්‍රාහ්මණ පිරිස**

බුදුන් වහන්සේ දැකීමට ජේතවනයට යෑමට සූදානම්වූ, වෙරඤ්ජකවැසි බ්‍රහ්මණයන් තම පිරිසට බුදුන් වහන්සේ ගෙ ගුණ මෙසේ පවසා ඇත:

"...ඒ භවත් ගොතුවන් ගැන මෙවන් කලණ යසස් උස්ව නැගී ඇත: ඒ භවත්හු මේ කරුනින්ද අරහත්ය, සම්මාසම්බුද්ධය...දෙවියන් සහිත...මෙලොව හා...ප්‍රජාව තමාවිසින්ම දැන, පසක් කොට දන්වති...ආදී කල්‍යාන...මධ්‍ය කල්‍යාන...පරියාසාන කල්‍යාන...දහම දෙසති...කෙවල පරිපූර්ණ පාරිශුද්ධ බ්‍රහ්මචරියාව පවසති. එබඳු රහතුන්ගේ දර්ශනයක් වේ නම් එය මානවය". **මූලාශ්‍ර:**ම.නි:(1) 1.5.2 වෙරඤ්ජක සූත්‍රය, පි.692

▼ **කෝසලදනව්වේ සාලා බමුණු ගම් පිරිස**

බුදුන් වහන්සේ වදාළ ධර්මය අසා පැහැදුන මෙ පිරිස මෙසේ පවසා ඇත:

"...භවත්ගෝතමයිනි, ඉතා මැනවි...යම් පරිදි යටිකුරු කළයක් උඩුකුරුකරන ලෙසින්, ආවරණය කළ දෙයක් විවර කරන ලෙසින්, මග මුලාවූ කෙනෙකුට හරිමග පෙන්වාදෙන ලෙසින්...ඇස්ඇති අය රූප දකින ලෙසින්... අඳුරමකා තෙල් පහනක් දල්වන ලෙසින්...භවත් ගොත්මයන් අපට නන් අයුරින් දහම පැවසුහ...අපි භවත් ගොත්මයන් සරණ කොට යම්හ". **මූලාශ්‍රය:** ම.නි: (1) 1.5.1 සාලෙයියක සූත්‍රය, පි.682.

▼**උපාලි ගහපති**

පෙරදී නිගණ්ඨනාථ පුත්‍රගේ අනුගාමිකවූ, නාලන්දාවේ ප්‍රසිද්ධ ගපතිවූ, උපාලි හට, මහණ ගොයුම් ගෙ මායාවට (ආවර්තිති මායාව) හසුවී බුදුසරණ යෑම ගැන නිගණ්ඨනාථ පුත්‍ර ඔහුට දොස් පවසන විට උපාලි ගහපති මෙසේ පවසා ඇත:

"... ආවර්තිති මායාව හද්‍රය... කල්‍යානය, මගේ ප්‍රිය නෑදැයෝ එම මායාවෙන් ආවර්තිත වෙන්නේ නම්..හැම ක්ෂත්‍රියෝ... බමුණෝ... වෛශ්‍යයෝ... ශුද්‍රයෝ...එම මායාවෙන් ආවර්තිත වෙන්නේ නම් එය ඔවුන්ට බොහෝ කල් හිත සුවපිණිස වේ... භගවත් අරහත් සම්මා සම්බුද්ධයන් වහන්සේගේ කථා බාලයන්ට නොව පණ්ඩිතයන්ටම සුදුසු, යෝග්‍ය දහමකි".

ඉන්පසු නිගණ්ඨනාථ පුත්‍ර, උපාලි කවරෙකුගේ ශ්‍රාවකද? යයි විමසුවිට උපාලි ගහපති මෙසේ පැවසුහ:

**"ධිරවූ-පාණ්ඩිත්‍යයවූ, විගත මෝහවූ, පංචචේතෝඛිල බිඳීනලද, මාරවිජය කල, කෙලෙස් දුකින්, විපාක දුකින් නිදුක්වූ, දෙවියන් හා මිනිසුන් කෙරහි යහපත්වූ සමමෙතෑ ඇති,වැඩු ශිලය ඇති, සුන්දර ප්‍රඥා ඇති, රාගාදී විෂම හැරදැමූ, විගත රාගමල ඇති, ඒ භාග්‍යවතුන් වහන්සේට මම ශ්‍රාවක වෙමි..."**

**සටහන:** උපාලි සූත්‍රයේ සම්පූර්ණ විස්තර වර්ණනාව දක්වා ඇත. **මූලාශ්‍රය**:ම.නි: (2) 2.1.6 උපාලි සූත්‍රය, පි.76.

### ▼ චංකි බ්‍රාහ්මණ

බුදුන් වහන්සේ තම ප්‍රදේශයට පැමිණිබව අසා උන්වහන්සේ බැහැදැකීමට එ බමුණා කැමත්ත පලකලවිට, ඔහුගේ පිරිස, මහණ ගොතමට වඩා ඔහු උසස් යයි කියා එ ගමන නතර කිරීමට උත්සාහ කල අවස්ථවදී ඔහු මෙසේ පවසා ඇත:

"...මහණ ගොයුම් වූකලි විශිෂ්ඨ රූප ඇත, දර්ශනීයය ප්‍රසාද එළවනු සුළුය, පරම වර්ණ සුන්දරත්වයෙන් සමන්වාගතය, රන්වන්ය, මහාබඹු බඳු සිරුර ඇත... සිල්වත්ය ...ආරිය ශිලය ඇත... කලණබස ඇත, මධුර ස්වරය ඇත, ... එ උතුමා අප දක්නට පැමිනෙන්නට නුසුදුසු ය... අප එ උතුමන් දකින්නට යාම සුදුසුය...". **මූලාශ්‍රය**:ම.නි: (2) 2.5.5. චංකි සූත්‍රය, පි.662.

### ▼ කාපටික බ්‍රාහ්මණ මානවක

බ්‍රාහ්මණ වේදයේ පරතෙරට ගිය, බ්‍රාහ්මණයන්ට වඩා සෙසු අය පහත්ය යන මතය දැඩිව දැරූ මොහු, බුදුන් වහන්සේ විසින් වදාළ ක්‍රමානුකූලව පුහුණුව යහපත් ලෙසින් අවබෝධ කර ශ්‍රද්ධාව පිහිටුවා ගෙන මෙසේ පවසා ඇත:

"...අපි සත්‍ය ආරක්ෂා කරගන්නා අන්දම...සත්‍ය අවබෝධ කරගන්නා අන්දම... සත්‍යයට පැමිණීම...භවත් ගෝතමයන් වෙතින් ඇසුවෙමි...භවත් ගෝතමයෝ ඒ ගැන කරුණු ප්‍රකාශ කළහ...ඒවා අපට රුස්සන්නේ වෙයි... පිලිගත හැකිවෙයි... එයින් අපි සතුටු විය...අපි ඇසූ යම් යම් කරුණු ගැන භවත් ගෝතමයෝ ප්‍රකාශ කලදේ ට අප කැමතිය, සතුටුය...භවත් ගෝතමයෝ මට ශ්‍රමණයන් කෙරහි...ප්‍රේමය...ප්‍රසාදය...

ගෞරවය... ඉපදවූහ..." **බලන්න:** උපග්‍රන්ථය:3 .**මූලාශ්‍රය**:ම.නි: (2) 2.5.5. චංකි සූත්‍රය, පි.662.

**▼ සකුලුදායි පරිබ්‍රාජක**

බොහෝ ශිෂ්‍යයන් ඇති, ප්‍රසිද්ධ ගුරුවරයෙක් වූ මොහුට බුදුන් වහන්සේ ගැන ප්‍රසාදයක් පැවතිනි. එවක, සිටි අන්‍යආගමික ගුරුවරුන් හට ඔවුන්ගේ සිසුන්ගෙ ගරුසැලකිලි නොමැති බව පැවසූ මොහු, බුදුන් වහන්සේගේ ශ්‍රාවක පිරිස, උන්වහන්සේ කෙරෙහි ශ්‍රද්ධාව ඇතිව, ගෞරව භක්තිය ඇතිව හැසිරෙන බව පවසා ඇත:

"...ශ්‍රමණ ගෝතම... ප්‍රසිද්ධය, යසස් ඇත. බොහෝ දෙන විසින් සාධු සම්මතය ... ශ්‍රාවකයන් විසින් ගුරුපූජා ඇත්හ..ඔවුන් ශ්‍රමණ ගෝතම සත්කාර කොට ගරුකාර කොට වෙසති... යම් කලක ශ්‍රමණ ගෝතමයන් නොයක් සිය ගණන් පිරිසට දහම දෙසයිද...ශ්‍රාවකයන් ගෙ කිවිසී හඬක් හෝ උගුර පාදන හඬක් හෝ නැත..."

**සටහන:** ම.නි. චූලසකුලදායි සූත්‍ර දේශනාව අවසානයේ, මෙතෙම බුදුන් වහන්සේ ගැන ශ්‍රද්ධාව උපදවා පැවිදිවීමට කැමත්ත පලකළද, ඔහුගේ සිසුන් මැදහත්ව එයට බාධා කළහ.. **මූලාශ්‍රය**:ම.නි: (2) 2.3.7 මහා සකුලුදායි සූත්‍රය, පි.348.

▲ **සේල බ්‍රාහ්මණයා** (පසුව සේල තෙර) බුදුන් වහන්සේ පළමු දැක්මෙන් පැහැදී, උන්වහන්සේගේ ගුණ ලක්ෂණ වර්ණනාකිරීම:

"භාග්‍යවතුන්වහන්ස ඔබ වහන්සේ පිරිපුන් සිරුර ඇතියහ...මහා පුරිස ලක්ෂණ ඇතියහ...පස්පැදිස්නා නුවණ ඇතියහ...ඔබ වහන්සේ සක්විතිරජවන්නට නිසියහ....". **බලන්න**: ම.නි. සේල සූත්‍රය.

## 19) **මාරයා බුදුගුණ පැවසීම-** Praising The Buddha by Mara

▲ බුදුන් වහන්සේ මාර සේනාව පරදවා සම්බෝධිය ලැබීම ගැන දුකට පත් මාරයා දැක ඔහුගේ දියණියන් එ පිලිබඳව විමසුවිට ඔහු මෙසේ පවසා ඇත:

**" අරහං සුගතො ලොකෙ න රාගෙන සුවානයො,**
**මාරෙධෙය්‍යමතිකකනෙතා තසමා සොචාමහං භුසසනති"**

සුගතයන් වහන්සේ අර්හත්ය, රාගයෙන් බැඳ ගත නොහැකිය, මාරවිෂය ඉක්මවා ඇත,එමනිසා මම බලවත් සංතාපයෙන් පෙළෙමි.

**මූලාශ්‍ර**: සංයු:නි:(1 ):මාරසංයුත්ත: 4.3.5.මාරධිතු සූත්‍රය, පි .252, ESN: Marasamyutta: 25.5 Mara's Daughters, p. 298.

## 20) **රජවරු බුදුගුණ වැනිම-** Praising The Buddha by Kings

▲**රජවරු බුදුගුණ වැනිම-** Praising The Buddha by the Kings

බුදුන් වහන්සේ වැඩසිටි සමයේ වාසය කළ මහා රජවරුන්: රජගහනුවර සේනිය බිම්බිසාර, ඔහුගේ පුත් අජාසත් රජ, මගධයේ පසේනදී කෝසල රජ ආදී රජවරුන් හා ඔවුන්ගේ බිසවුන් බුදුගුණ වර්ණනා කර ඇතිබව

සූත්‍ර දේශනාවල පෙන්වා ඇත. කප්පින රජ, පුක්කුසාති රාජ, බුදුගුණ අසා පැහැදී පැවිදිබවට පත්වුහ. **බලන්න:** උපග්‍රන්ථය:1,3.

▼**පසේනදී කෝසල රජතුමා**

බුදුන් වහන්සේට ගෞරව සම්මාන පුදකිරීමට, මෛත්‍රිය සම්ප්‍රයුක්ත උපහාර දැක්විමට හේතු කරුණු 10ක් පසේනදී කෝසල රජතුමා පෙන්වා ඇත**:** 1) බුදුන් වහන්සේගේ: ප්‍රතිපදාව බොහෝ දෙනාගේ හිත සුව පිණිස කටයුතු කිරීමය-ඔවුන් කල්‍යාණ ධර්මය-කුශල ධර්මය වූ අරිය මාර්ගයේ පිහිටුවති 2) උන්වහන්සේ සිල්වත්ය;පරිණත හැසිරීමෙන් යුක්තය. 3) උන්වහන්සේ, දීර්ඝ කාලයක්ම, ආරණ්‍ය සේනාසනවල ඝන කැලෑ වාසස්ථාන වල වැඩ සිටිති. 4) උන්වහන්සේ, තමන්ට ලැබෙන ඕනෑම සිව්පසයකින් සතුටුවෙති.5) උන්වහන්සේ, තෑගි ලැබීමට, ආගන්තුක සත්කාරයට, පුද පූජා ලැබීමට, උත්තමාචාරය ලැබීමට සුදුසුය, ලෝකයට අනුත්තර පින් කෙතකි. 6) උන්වහන්සේ, සිතැති පරිදි, තපස් ජීවිතයට අදාළවන, කෙළෙස් ප්‍රහීණය කිරීමට මගපෙන්වන, සිත්සන්තානය විවෘත කිරීමට හේතුභූතවන කථා දේශනා කරති. 7) උන්වහන්සේ, පහසුවෙන්ම සිව් ජාන සම්පත් ලබති 8) උන්වහන්සේ, අප්‍රමාණවූ පෙර ජාති සිහිකරති. 9) උන්වහන්සේ, චුත උත්පති නුවණින්, සත්වයන්ගේ මරණය හා යළි උපත දකිති. 10) උන්වහන්සේ, සියලු ආසව ක්‍ෂය කර, මේ ජීවිතයේදීම සුවයෙන් සැපයෙන් වැඩ සිටිති. **මූලාශ්‍ර**: අංගු.නි:(6 ):10 නිපාත: මහා වග්ග, 10.1.3.10. ද්විතීය කොසල සූත්‍රය,පි. 144, EAN:10: 30.10 Kosala-2, p. 507.

**21) යක්ෂයෝ බුදුගුණ වැනිම -**Praising The Buddha by the Yakkas

▲ **පුන්නබුසු හා ඔහුගේ යක්මැණියෝ**

එක්සමයක බුදුන් වහන්සේ නිවන පිළිබඳව සංඝයාට වදාළ දේශනය අසා පුන්නබුසු හා ඔහුගේ යක්මැණියන් බුදුගුණ වර්ණනා කර ඇත.

" මැණියෙනි, සදහම නොදත් නිසා දුකසේ හැසිරෙමු, ප්‍රභාකරවූ පසැස් ඇති පසුලු අත්බව දරණ මේ බුදුරජාණන්වහන්සේ අතිශයින් මුළාවූ දෙව්මිනිසුන්ට දහම් දෙසන සේක"

**මූලාශ්‍ර**: සංයු.නි: (1): සගාථවග්ග: යක්ඛසංයුත්ත: 10.1.7 පුනබ්බසු සූත්‍රය, පි.398.

▼**සතාගිර යක්ෂ** ඔහුගේ මිතුරු හේමවත යක්ෂයාට පුර පසලොස්වක දින බුදුන් වහන්සේ බැහැදැකීමට ඇරයුම් කර, මිතුරා තුල ශ්‍රද්ධාව ඇතිකරලීමට මෙසේ බුදුගුණ පවසා ඇත:

**"...සියලු සතුන් කෙරෙහි සමසිත් ඇති බුදුන් වහන්සේගේ සිතද යහපත් ලෙසින් සමාහිතය...නුවණින් පිරිසිඳ දැන අර්ථයම පවසති...බුදුරජට සියලු දහම්හි නුවණැස ඇත්තේය..."**

**සටහන:** එම යක්ෂ මිතුරන් දෙදන බුදුන් වහන්සේ දැක දහම් අසා අපමණ සතුටට පත්ව මෙසේ පැවසුහ:

"සෘද්මත්...යසස්වූ දහසක් යක්ෂයෝ හැම ඔබ සරණ කොටයති, ඔබ වහන්සේ අපගේ නිරුත්තර ශාස්තෘය..අපි සම්බුදුන් නමදීමින් ධර්මය

වණමින් ගමින් ගමට යමු". **මූලාශ්‍රය**:ඛු.නි:සු.නි:උරගවග්ග:1-9 හේමවත සූත්‍රය, පි.69.

▼ **අලාවක යක්ෂයා බුදුගුණ වැනිම**

පළමුව බුදුන් වහන්සේට එරෙහිව බස් කථාකළ මොහු පසුව බුද්ධ දේශනාව අසා සතුටට පත්ව මෙසේ පවසා ඇත:

"ඒකාන්තයෙන්ම බුදුන් වහන්සේ මගේ යහපත් පිණිස අළව්පුරයට වැඩියහ... මහත් එල ඇති පින්කෙත මම දැනගතිමි, මම බුදුන් නමදිමින්, ධර්මයේ සුධර්මත්‍වය කියමින් ගමින් ගමට නුවරින් නුවරට හැසිරෙමි".

**මූලාශ්‍රය**:ඛු.නි:සු.නි:උරගවග්ග:1-10 ආළවක සූත්‍රය, පි.74.

## 22) **බුදුන් වහන්සේට අපවාද කිරීම-** Accusations to The Buddha

▲ සංජය පරිබ්‍රාජක වෙතින් ඉවත්ව උපතිස්ස හා කෝලිත පරිබ්‍රාජකයන්, බුදුන් වහන්සේ වෙත සැරියුත්, මුගලන් ලෙසින් පැවිදිබවට පත්වීම ගැන මිනිසුන් බුදුන් වහන්සේට අපවාද කලෝය:

" මහා ශ්‍රමණ තෙමේ සංජය අතවැසි සියල්ලන් තමන් වෙත පමුණුවා ගෙන රජගහ නුවරට ආයේය; දැන් කවරකු ගෙනයන්නේද?"

" ...ශ්‍රමණ ගෞතම තෙමේ දරුවන් නැතිකිරීම පිණිස පිළිපන්නේය, වැන්දඹුබව පිණිස පිළිපන්නේය. දැන් ඔහු ජටිලයෝ දහසක් පැවිදිකරණලදී. සංජය පරිබ්‍රාජකයාගේ අතවැසි 250 ක් ද පැවිදිකරනලදී. ඉතා ප්‍රසිද්ධවූ මේ මගද දනව්වැසි කුලපුත්‍රයෝ ද ශ්‍රමණ ගෞතම වෙත බ්‍රහ්මචරියාවේ හැසිරෙති..."

**සටහන:** එම අපවාද ගැන සංඝයා, බුදුන් වහන්සේට දැන්වූ විට උන්වහන්සේ වදාළේ එවැනි කතා වැඩිකලක් නොපවතින බවය. එසේ මිනිසුන් කතා කරනවිට මෙලෙසින් පවසන ලෙස බුදුන් වහන්සේ අනුසසනය කළහ:

"මහා වීරිය ඇති තථාගතවරයෝ ඒකාන්තයෙන්ම හික්මවිය හැකි ජනයා සගමොක් සැපයට පමුණුවති. එසේ ධර්මයෙන් පමුණුවන කල්හි තතු දන්න අයගේ කවර දොස් පළ කිරීමක් වේද?"

සතියක් ඇවැමෙන් ඒ කතාබහ අතුරුදහන් විය. **මූලාශ්‍රය**:වින.පි: මහාවග්ග පාලි 1: 84. සාරිපුත්‍ර මොග්ගල්ලාන පබ්බජා කතා, පි.168.

▼**බුදුන් වහන්සේ** වෙතින් ධර්මය අසා පැහැදුන උපාලි ගහපති (පෙර නිගන්ඨනාථ පුත්‍රගේ ශ්‍රාවකයකි) බුදුන් සරණ ගිය බව ඇසූ නිගන්ඨනාථ පුත්‍ර පවසා ඇත්තේ බුදුන් වහන්සේ මායා කාරයෙක් බවත්, මායාවෙන්, අන්‍ය ආගමික පිරිස වශී කරගන්නා බවය. **බලන්න**: ම.නි: උපාලි සූත්‍රය.

**සටහන:** බුදුන් වහන්සේ විසාලානුවර වැඩවාසය කරන සමයේ භද්දිය ලිච්චවී ද, අන්‍ය ආගමිකයන් බුදුන් වහන්සේ 'මායාකාරයෙක්ය' යයි කියන බව, උන්වහන්සේට දන්වා ඇත. **බලන්න:** අංගු.නි: (2): 4 නිපාත: 4.4.5.3 භද්දිය සූත්‍රය, පි.392.

▼ **බුදුන් වහන්සේ,** කෝලිය දනව්වේ වැඩ වාසය කරන සමයේ, පාටලිය ගාමිණී නම් ග්‍රාමනායකයා, බුදුන් වහන්සේ බැහැදැක මෙසේ පවසාඇත:

"වහන්ස, මහණ ගොයුම් (ගෝතම) 'මායා දනිති, ඔහු මායාකාරයෙකි'යි මෙය මා විසින් අසන ලදී..."

බුදුන් වහන්සේ මෙසේ වදාළහ:

**"ගාමිණී, මම මායාවත් මායාවේ විපාකයත් දනිමි. මායාකාරයා, යම්සේ කටයුතුකර සැප නැති, දුක ඇති නිරයට පැමිණේ නම් එයද දනිමි"**

**සටහන:** බුදුන් වහන්සේ මායාව පිලිබඳ අවබෝධ කර ඇත, එහෙත්, මායා කාරයෙක් නොවේ. ඒ පිළිබඳව පෙන්වා දුන් උපමාව. කෝලිය රජුගේ ලම්භචූලක සෙබළුන් (භටයන්) සිටිති. පාටලිය ගාමිණී, ඔවුන් දුස්සීල බව දනී. ඔවුන්ගේ පාපී ස්වභාවය දැනගත් පමණින්, ඔහු දුස්සීල කෙනෙක් නොවේ. **මූලාශ්‍රය:**සංයු.නි:සළායතනවග්ග:ගාමිණී සංයුත්ත:8.1.13 පාටලිය සූත්‍රය, පි.611

▼ **බුදුන් වහන්සේ,** වෙරඤ්ජ නුවර අසබඩ නලේරු නම් කොසඹ ගස මුල වැඩ සිටින සමයේ, වෙරඤ්ජ බ්‍රාහ්මණයා, උන්වහන්සේ , වැඩිහිටියන්ට ගරු නොකරන බව ආදී කරුණු 8 කින් උන්වහන්සේට අපවාද කරනලදී. ඒ පිලිබඳ මෙහි විස්තරාත්මකව පෙන්වා ඇත.

**සටහන:** මේ සූත්‍රය අවසානයේදී, වෙරඤ්ජ බ්‍රාහ්මණයා, බුදුන් සරණ ගිය උපාසකයෙක් විය. **බලන්න:** උපග්‍රන්ථය: ගිහි ශ්‍රාවකයෝ. **මූලාශ්‍රය:** අංගු.නි: (5): 8 නිපාත:මහාවග්ග: 8.1.2.1 වෙරඤ්ජ සූත්‍රය, පි.62.

## 23) **ශ්‍රාවක සංඝයාට ඇතිවිස්වාසය-** Faith of the Disciples

▲ එක්සමයක බුදුන් වහන්සේ කුසිනාරා ප්‍රදේශයේ වාසය කරන අවස්ථාවක සංඝයා ගෙන්, ඔවුන් බුදුන් වහන්සේ ගැන කෙසේ සිතන්නේද? යයි විමසූහ. සංඝයා මෙසේ පිළිතුරු වදාළහ:

**" භාග්‍යවතුන් වහන්සේ... චීවර...පිණ්ඩපාත... සේනාසන හේතුවෙන් හෝ. එ එ භවයන්හි සුව විඳීම යන හේතුවෙන් හෝ දහම් දෙසති යයි අපට සිත් නොවේ... භාග්‍යවතුන් වහන්සේ, අනුකම්පා ඇත, හිතේෂිහ, අනුකම්පා පිණිස දහම් දෙසන සේක යයි අපට සිත්වේ...**

**මූලාශ්‍රය:** ම.නි: (3) 3.1.3 කින්තිසූත්‍රය, පි.60.

▼ එක් අවස්ථාවක මිගාරමාතා ප්‍රසාදයේ, 500ක් පමණ භික්ෂු සංඝයා සමග වස් පාවරණ යෙහි වැඩ සිටියහ. එහිදී, බුදුන් වහනේ, සංඝයා අමතා, උන්වහන්සේගේ කායික හෝ වාචික ක්‍රියා කිසිදෙයකට සංඝයා අගෞරව කරන්නේද ? යයි විමසූහ.

*ඒ අවස්ථාවේදී, සැරියුත් තෙරුන් බුදුන් වහන්සේට වැඳ නමස්කාර කොට මෙසේ පැවසූහ:

"...භාග්‍යවතුන් වහන්සේගේ කායිකවූ හෝ වාචිකකවූ හෝ කිසිවකට අපි නොම ගරහමු. භාග්‍යවතුන් වහන්සේ වනාහි කාශ්‍යප බුදුන්ගෙන් පසු නූපන් මග උපදවන සේක.නො හටගත් මග දනවන සේක. නො දෙසූ

මග දෙසන සේක. මාර්ගය දන්නා සේක. මාර්ගය දත් සේක... බුදුන් වහන්සේට පසුව, මාර්ගය අනුව ගිය (මාර්ග ඥානයෙන් සමන්විත) ශ්‍රාවකයෝ දැන් වෙසෙත්".

* එ අවස්ථාවේදී, වංගීස තෙරුන් මෙසේ පැවසුහ:

" සංයෝජන නම්වූ ද බන්ධන නම්වූද කෙලෙස් සිඳලූ දුක් රහිතවූ ක්‍ෂය කළ පුනර්භව ඇති ඍෂිවූ පන්සියක් භික්ෂූහු අද පුණ්පොහෝ දින විශුද්ධි පවාරණය පිණිස එක් රැස්වූහ. සක්විති රජ තෙමේ ඇමති සමූහයා විසින් පිරිවරන ලදුව සතර සයරු හිම් කොට ඇති මෙ පොළොව හාත්පස යම්සේ පිලිවෙලින් පරිගමානය කෙරේද... එලෙස ත්‍රිවිද්‍යා ඇති, මරු නැසුවාවූ, ශ්‍රාවකයෝ දිනූ සංග්‍රාම ඇති, නිරුත්තර්වූ, සත්ථවාහ නම් බුදුන් වහන්සේ පයුරුපාසනය කෙරෙති. සියල්ලෝම භාග්‍යවතුන් වහන්සේගේ පුත්තුය. මෙහි හිස් පුහුලෙක් නැත. තන්හාශල්‍ය නසන, සූරියබන්ධවූ සර්වඥයන් වහන්සේ වඳිමි"

**මූලාශ්‍රය:** සංයු.නි: (1) වංගීසසංයුත්ත:8.1.7 පවාරණ සූත්‍රය,පි.366.

## 24) බුදුන් වදාළ ධර්මය-The teachings of The Buddha

▲බුදුන් වහන්සේ, තමන් වහන්සේ විසින්ම අවබෝධ කරගත් සත්‍ය, බුද්ධ ධර්මයය: චතුරාර්ය සත්‍ය, පටිච්චසමුප්පාදය, බෝධිපාක්‍ය ධර්මතා ආදීයය, දුකින් මිදීම පිණිස, විමුක්තිය පිණිසය.බුදුන් වහන්සේ වෙතින් ධර්මය ඉගෙන ඒ පිළිබඳව ශ්‍රාවකයන් දේශනා කළ ඉගැන්වීම් ද බුද්ධ ධර්මයමය. ධර්මය දැකීම බුදුන් වහන්සේ දැකීම බව මෙහිදී පෙන්වා ඇත:

"වක්කලී, ...යමෙක් ධර්මය දකීනම් හේ මා දකියි, යමෙක් මා දකීන්නේ නම් හේ ධර්මය දකියි..."

**"...යො බො වක්කලි ධම්මං පස්සති සො මං පස්සති,**
**යො මං පස්සති සො ධම්මං පස්සති..."**

**සටහන:** මේ දේශනාව වදාළේ වක්කලී තෙරුන්ටය. **මූලාශ්‍රය:** සංයු.නි: (3): ඛන්ධසංයුත්ත:ථෙරවග්ග: 1.2.4.5 වක්කලී සූත්‍රය, පි.234.

▼ අග්‍ර ධර්මය අරහත්වය යයි බුදුන් වහන්සේ වදාළහ. අග්‍ර ධර්මය පිණිස කරුණු 6 ක් සපුරා ගත යුතුය: ශ්‍රද්ධාව, හිරි හා ඔත්තප්ප, වීරිය, ප්‍රඥාව, තම ජීවිතය හා කය පිලිබඳ අපේක්ෂා නැතිබව.

**මූලාශ්‍ර:** අංගු.නි: (4 ): 6 නිපාත: 6.2 3.9 අග්ග ධම්ම සූත්‍රය, පි. 258, EAN:6: 83.9 The Foremost state, p. 361.

▼ බුදුන් වහන්සේ වදාළ ධර්මවිනය සත්‍යයය:

**" අයං බො පන භික්ඛවෙ මයා ධම්මො දෙසිතො අනිග්ගහිතො අසඞ්කිලිට්ඨො අනුපවජ්ජො අප්පතිකුට්ඨො සමණෙහි බ්‍රාහ්මණෙහි විඤ්ඤූහි".** (මා විසින් (බුදුන් වහන්සේ විසින්) උගන්වා වදාළ ධර්මය: වැරදිය යි (අසත්‍යයයි) ඔප්පු කල නොහැකිය, නොකිළිටිය (කෙළෙස් රහිතය), කෙනෙකුට නින්දා කිරීමට (ගැරහීමට) නොහැකිය, නුවණැති

ශ්‍රමණබ්‍රහ්මණයන් විසින් විවේචන නොකළ (සංසෝධනය නොකල ) ධර්මයකි.

**මූලාශ්‍ර**: අංගු.නි: ( 1): 3 නිපාත: මහාවග්ග: 3.2.2.1 සූත්‍රය, පි. 348, EAN:3: The Great Chapter, 61.1 Sectarian, p. 104.

▼ බුදුන් වහන්සේ වදාළ ධර්මයේ ඇත්තේ එක් රසයකි, එනම් විමුක්ති රසය යි බුසුන් වහන්සේ පෙන්වා ඇත. මාර්ග ඵල සාක්ෂාත් කරගැනීම නිසා ආරියෝ ලබන විමුක්ති රසය අග්‍රතම රසයවේ. මාර්ගය සාක්ෂාත් වීම නිසා ලබන අර්ථරසය හා ඵල සාක්ෂාත් වීම නිසා ලබන ධම්ම රසය, මගින් විමුක්ති රසය ඇතිවේ. **මූලාශ්‍රය:** අංගු.නි: (1) 1 නිපාත: එකධම්ම පාළිය: 1.16.4.15 සූත්‍රය, පි. 114.

## 25) **බුදුන් වහන්සේගේ වාදය**- What The Buddha declared

▲ බුදුන් වහන්සේගේ වාදය නම් උන්වහන්සේගේ ඉගැන්වීමය. **උපතිස්ස පරිබ්‍රාජක** (සැරියුත් තෙරුන් මහණ වීමට පෙර ගිහිනම), අස්සජි තෙරුන් (පස්වග මහණ) දැක පැහැද, එතුමන්ගේ ගුරුවරයා ගේ වාදය කුමක්ද? යයි විමසූ අවස්ථාවේ, ඒ තෙරුන් මෙසේ වදාළහ:

**"යෙ ධම්මා හෙතුප්පභවා තෙසං හෙතුං තථාගතො ආහ,**
**තෙසඤ්ච යො නිරොධො එවංවාදී මහාසමණො'ති"**

"හේතුවෙන් උපදින යම් ධර්මයක් වෙත්ද, ඒ හේතුව තථාගත තෙමේ වදාළහ. ඒ වායේ යම් නිරෝධයක් වේද, එයද වදාළේය. මහා ශ්‍රමණතෙමේ මෙබඳු වාද ඇත්තේය".

**මූලාශ්‍ර**:වින.පි: මහාවග්ග පාලි1**:** 84 සාරිපුත්ත මොග්ගල්ලාන පබ්බජා. පි.161.

▼**එක් අවස්ථාවක බ්‍රාහ්මණයෙක්**, බුදුන් වහන්සේ කෙබඳු වාදයක් ඇත්තේද? කුමක් කියා පාන්නේද? යයි විමසිය:

**" කිංවාදී භවං ගොතමො කිමක්ඛායීති?"**

"ගෝතමයන් වහන්සේ කෙබඳු වාද ඇතිසේක්ද? කුමක් වදාරන්නේද?" (What does Master Gotama assert, what does he declare?).

බුදුන් වහන්සේ මෙසේ පිළිතුරු වදාළහ:

**"කිරියාවාදී චාහං බ්‍රාහමණ අකිරියාවාදී චාති"**

"බ්‍රාහ්මණය, මම ක්‍රියාවාදීත් වෙමි, අක්‍රියාවාදීත් වෙමි" (Brahmin, I assert a doctrine of deeds and a doctrine of non-doing)

**සටහන:** කයෙන්, වචනයෙන් හා සිතින් කරණ දුසිරිත් ක්‍රියා, හා විවිධවූ ලාමක අකුසල් නොකරණ ලෙසින් ප්‍රකාශ කරන නිසා බුදුන් වහන්සේ අක්‍රියවාදීය. කයෙන්, වචනයෙන් හා සිතින් කරණ සුසිරිත් ක්‍රියා හා විවිධ කුසල ධර්ම කරන්න යයි ප්‍රකාශ කරන නිසා බුදුන් වහන්සේ ක්‍රියාවාදීය.

**මූලාශ්‍ර**: අංගු.නි: (1 ) 2 නිපාත: 2.1.4.3 සූත්‍රය, පි.160, EAN:2: 34.3 sutta, p. 61.

▼**දණ්ඩපානි ශාකයන්** බුදුන් වහන්සේගේ වාදය පිලිබඳ විමසීමක් කල අවස්ථාවේදී බුදුන් වහන්සේ මෙසේ වදාළහ:

**"යථාවාදී ඛො ආවුසො සදෙවකෙ ලොකෙ...පජාය සදෙවමනුස්සාය න කෙනචි ලොකෙ විග්ගය්හ තිට්ඨති, යථා ච පන කාමෙහි විසංයුත්තං විහරන්තං තං බ්‍රාහ්මණං අකථංකථිං ඡින්නකුක්කුච්චං භවාභවෙ වීතතණ්හං සඤ්ඤා නානුසෙන්ති. එවංවාදී ඛො අහං ආවුසො එවමක්ඛායී'ති"**

"යම් බඳු දිට්ඨියක් ඇත්තෙක් ලෝකයා හා කළහ නොකර සිටීද, යම් කරුණින් කාමයෙන් වෙන්ව වාසය කරන, සැකය සහිත, කුකුස් රහිත, සියලුම භවපිලිබඳ පහවූ තණ්හාව ඇති, ඒ ක්ෂීණාසව බ්‍රාහමණයා වෙත කෙළෙස් සංඥාවෝ ලැග නොසිටිත්ද, මිත්‍රය, මම එබඳු වාද ඇත්තෙක්මි, එසේ ප්‍රකාශ කරන්නෙක් වෙමි"

**සටහන:** අටුවාවට අනුව දණ්ඩපානි ශාකයන්, දේවදත්ත භික්ෂුවගේ අනුගාමිකයෙකි. **බලන්න:** EMN:note:226:p.1085. **මූලාශ්‍ර:** ම.නි: (1 ):1.2.8 මධුපිණ්ඩික සූත්‍රය, පි.291,EMN:18: The Honeyball, p.196.

▼ **එක්සමයක උත්තිය පරිබ්‍රාජික** ගුරු ගෝතම කුමක් ප්‍රකාශ කර තිබේද? යයි විමසුවිට බුදුන් වහන්සේ මෙසේ වදාළහ:

**"අභිඤ්ඤා ඛො අහං උත්තිය සාවකානං ධම්මං දෙසෙමි සත්තානං විසුද්ධියා සොකපරිදෙවානං සමතික්කමාය දුක්ඛදොමනස්සානං අත්ථඞ්ගමාය ඤායස්ස අධිගමාය නිබ්බානස්ස සච්ඡිකිරියායාති"**

" උත්තිය, මම විශිෂ්ඨ ඥානයෙන් දැන, සත්වයන්ගේ විශුද්ධිය පිණිස, සෝක විලාප මැඩපවත්වා ගැනීම පිණිස, දුක්වේදනා හා දොම්නස අභවරකරගැනීම පිණිස, මාර්ගය ලැබීම පිණිස, නිවන සාක්ෂාත් කරගැනීම පිණිස, ශ්‍රාවකයනට ධර්මය දේශනා කරමි".

**මූලාශ්‍ර:** අංගු.නි: (6):10 නිපාත, 10.2.5.5. උත්තිය සූත්‍රය,පි.374,EAN:10: 95.5 Uttiya, p.536.

▼ **බුදුන් වහන්සේ මෙසේ වදාළහ:**

"මගේ ඉගැන්වීමේ අරමුණ වන්නේ, ඒ ඉගැන්වීම් පුරුදු පුහුණු කරන අය, දුක සහමුලින්ම විනාශකර දැමීමය".. **මූලාශ්‍රය:** දීඝ.නි: පාථික සූත්‍රය.

## 25 බුදුන් වහන්සේ පිලිබඳ අන්‍යආගමිකයන් ගේ මත-Views of Other sectarians about The Buddha

▲සමහර අන්‍ය ආගමිකයන් බුදුන් වහන්සේ මෙබඳු මත දැරුහ:

1) ශ්‍රමණ ගෝතම, හැම තපස්බවක්, හැම උග්‍ර තවුස්දමක් ගරහනෝනේය.
2) ශ්‍රමණ ගෝතම, සැමදෙයක්ම අහෝසිකරන්නෙකි (වෙනයිකො - abolitionist), ඔහු නිශ්චිත ප්‍රකාස කිරීමෙන් වැලකිසිටින්නෙකි.

ඒ පිළිබඳව බුදුන් වහන්සේ මෙසේ දක්වා ඇත: **1.**සැම උග්‍ර තපස් ව්‍රතයක්ම පුහුණු කලයුතුය යයි මම නො පවසමි. **2.**සැම උග්‍ර තපස් ව්‍රතයක්ම පුහුණු නො කලයුතුය යයි මම නො පවසමි. **3.** සැම ව්‍රත චාරිත්‍රයක්ම (observance) කළයුතු යයි මම නො පවසමි. **4**. සැම ව්‍රත

චාරිත්‍රයක්ම නොකළයුතු යයි මම නො පවසමි. **5**.කෙනෙක් සැමආකාරයකම ප්‍රධන් වීරිය කළයුතු යයි මම නො පවසමි. **6**. කෙනෙක් ඕනෑම ආකාරයකම ප්‍රධන් වීරිය නොකළයුතු යයි මම නො පවසමි. **7**. කෙනෙක් සැම ආකාරයකම අත්හැරීම (relinquishment) කළයුතු යයි මම නො පවසමි.**8.** කෙනෙක් සැම ආකාරයකම අත්හැරීම නො කළයුතු යයි මම නො පවසමි.**9**.කෙනෙක් සැම ආකාරයකම විමුත්තිය ලබාගත යුතුය යයි මම නො පවසමි. **10**. කෙනෙක් සැම ආකාරයකම විමුත්තිය ලබානොගතයුතුය යයි මම නො පවසමි.

**සටහන්**: * කෙනෙක් යම්කිසි උග්‍ර තපසක් කරනවිට...ව්‍රත චාරිත්‍රයක යෙදීසිටිනවිට... ප්‍රධාන විරියකරනවිට... කිසියම් අත්හැරීමක් කරනවිට... යම්කිසි විමුත්තියක් ලද විට ඔහුගේ අකුසල ගුණ වැඩිවේනම්, කුසල ගුණ පිරිහේනම්, ඒ දේ පුහුණු නොකලයුතුය. බුදුහිමි වදාළහ. ** ඉහත කරුණු වල යෙදෙනවිට ඔහුගේ කුසල ගුණ වැඩිවේනම්, අකුසල ගුණ පිරිහේනම්, ඒ දේ පුහුණු කලයුතුවේ. ** මේ සූත්‍රය, බුදුන් වහන්සේගේ ගිහි ශ්‍රාවකයකු වූ වජ්ජියමාහිත ගහපතිහට දේශනා කර ඇත.

**මූලාශ්‍ර**: අංගු.නි: (6 ):10 නිපාත:10.2.5.4. වජ්ජියමාහිත සූත්‍රය,පි.368, EAN:10: V: 94-4 Vajjiyamāhita, p.535.

## **26) බුද්ධ ශ්‍රාවකයෝ-පැවිදි හා ගිහි-** Disciples of The Buddha: Sangha & Lay people

▲ බුදුන් වහන්සේ වැඩසිටි සමයේ උන්වහන්සේගේ අනුගමනය කල, පැවිදි පිරිස:සංඝයා (භික්ෂු, භික්ෂුණී, මහණ හා මෙහෙණියන්), ගිහි පිරිස; උපාසක හා උපාසිකා, සිව් පිරිස ලෙසින් ත්‍රිපිටකයේ සඳහන්ව ඇත. විස්තර පිණිස **බලන්න**: උපග්‍රන්ථ:1,2,3.

▼**මෙහිදී බුදුන් වහන්සේ,** තමන්වහන්සේගේ අග සව්දෙනම: සැරියුත් හා මුගලන් තෙරුන් බව දක්වා ඇත. **බලන්න:** අග්‍ර ශ්‍රාවකයෝ. **මූලාශ්‍රය:**සංයු.නි: (2) : නිදානවග්ග:අන්මතග්ග සංයුත්ත: දුග්ගතවග්ග: 3.2.10 වෙපුල්ල පබ්බත සූත්‍රය, පි.314.

▼**බුදුන් වහන්සේ** වැඩසිටි සමයේදී, උන්වහන්සේට 1250 ක් වූ රහත් ශ්‍රාවක පිරිසක් (assemblies of disciples) සිටිබව මේ සූත්‍රයේ පෙන්වා ඇත. **මූලාශ්‍ර**: දීඝ.නි: ( 2 ): 1: මහාපදාන සූත්‍රය,ඡෙද:11 හා13, පි. 18, EDN: 14 Mahâpadāna Sutta: The Great Discourse on the Lineage, p. 151.

▼ **බුදුන් වහන්සේ** තමන්ගේ සිව් පිරිස, ධර්මයේ ව්‍යක්ත, විනිත, විශාරද බහුශ්‍රැත, ධර්මධර වෙනතක්, ධම්මානුධම්ම ප්‍රතිපන්න...සම්‍යක් ප්‍රතිපන්න... අනුධර්මචාරී වෙනතෙක්, ස්ව ආචාර්යවාදය (බුදුන්ගේ දහම) ඉගෙන...දේශනා කරනතෙක්... දහම යහපත්ලෙසින් විභාගකර දක්වනතෙක්, දහම යහපත් ලෙසින් නියානිකව දේශනා කරන තෙක් තමන් වහන්සේ පිරිනිවන් නොපාන බව මරයහට පවසා ඇත. **මූලාශ්‍ර**: දීඝ.නි: මහාපරිනිබ්බාන සූත්‍රය:73 මාර අයාචනය, පි.192.

## 28) **බුදුන් වහන්සේ ගේ විහරණ-** Abiding s of The Buddha

▲**බුදුන් වහන්සේ ගේ විහරණ-** Abiding s of The Buddha

**සංයු.නි. විහාරවග්ගයේ** බුදුන්වහන්සේ හුදකලා විවේක සුවයෙන් ධර්මය ආවර්ජනය කරමින් වාසය කළබව දැක්වේ:

**" මහණෙනි, මම බුද්ධත්වයෙන් පසු පළමු විහරණයක යේදී සිටියේ නම් ඉන් කොටසක් පමණක් පරික්ෂා කරමින් වාසය කෙළෙමි..."**

**සටහන්:** * අටුවාවට අනුව බුදුන්වහන්සේ බුද්ධත්වය ලබා, සමාධි සුවයෙන් වැඩසිටි සති 7 තුළදී පංචඋපාදානස්කන්ධය, සළායතන, ධාතු, චතුසත්‍ය ආදී ධර්මතා පරික්ෂා කරමින් වැඩවිසුහ. * මේ සූත්‍රදී බුදුන් වහන්සේ ,'**වේදනාව'** ආවර්ජනය කරමින් වාසය කළබව පෙන්වා ඇත.බලන්න: ESN: note 19, p. 2390. **මූලාශ්‍ර:** සංයු.නි:(5-1 ):මග්ගසංයුත්ත:විහාර සූත්‍ර 1,2, පි. 48, ESN: Maggasamyutta, Dwelling 1 & 2, p. 1616.

▼ **බුදුන් වහන්සේ වනසේනාසන සේවනය කිරීම**: බුදුන් වහන්සේ මෙසේ වදාළහ:

**"ද්වාහං භික්ඛවෙ අත්ථවසෙ සම්පස්සමානො අරඤ්ඤෙ වනපත්ථානි පන්තානි සෙනාසනානි පටිසෙවාමි... අත්තනො ච දිට්ඨධම්මසුඛවිහාරං සම්පස්සමානො, පච්ඡිමඤ්ච ජනතං අනුකම්පමානො".**

"මහණෙනි, අර්ථ දෙකක් දකිමින් මම ආරණ්‍ය ද, වන්පෙත්ද, ගැඹුරු වනසේනාසනද හා සන සේවනය කරමි : 1) මාහට මේ ජීවිතයේදීම සුවයෙන් වාසය කිරීමට පිණිස 2) මතු ඇතිවෙන ජනතාවට (පශ්චිමජනතාව) අනුකම්පා කිරීම පිණිස" (අතතනො ච දිට්ඨ ධමම සුඛවිහාරං) 2) මතු ඇතිවෙන ජනතාව ගැන ඇති අනුකම්පාව නිසා ( පච්ඡිමඤ්ච ජනතං අනුකමපමානො).

**සටහන**: අටුවාවට අනුව, මතු කළ ගිහිගෙය හැර මහණදම් පුරන තරුණ භික්ෂූන්, සියල්ල දත් බුදුන් වහන්සේ වනයේ වාසය කිරීම පැහැර නොහැරිය බව දකිමින්, වනවාසයට පැමිණේ. එබඳු නිසල පියසක වසන ඔවුනට පහසුවෙන් බවුන් වැඩිය හැකිය, එලෙස ඉතා ඉක්මනින්ම දුකින් ගැලවීමට ඔවුන්ට හැකිවේ. මේ කරුණ දකිමින් බුදුන් වහන්සේ වනවාසය ප්‍රිය කලහ, භික්ෂූන්හටද වනවාසය කිරීමට අනුබල දුන්හ.බලන්න: EAN:2: note no. 248, p. 593. **මූලාශ්‍රය:** අංගු.නි: (1): 2 නිපාත: 2.1.3.10 සූත්‍රය, පි. 158.

## 29) බුදුන් වහන්සේ ධර්මය දේශනා කිරීමේ පිළිවෙල - Teaching methods of The Buddha

▲ කෙටියෙන් ද, විස්තරාත්මකව ද, කෙටියෙන් හා විස්තරාත්මකව ද තමන්වහන්සේට ධර්මය දේශනා කල හැකිය යි බුදුන් වහන්සේ වදාළහ.

**"සඞ්ඛිත්තෙනපි ඛො අහං සාරිපුත්ත ධම්මං දෙසෙය්‍යං, විත්ථාරෙනපි ඛො අහං සාරිපුත්ත ධම්මං දෙසෙය්‍යං, සඞ්ඛිත්ත විත්ථාරෙනපි ඛො අහං සාරිපුත්ත ධම්මං දෙසෙය්‍යං, අඤ්ඤාතාරො ච දුල්ලභොති.**

**සටහන්: *** එහෙත්, ධර්මය අවබෝධ කරගන්නා අය දුර්ලභය ** මේ සූත්‍රය දේශනා කර ඇත්තේ සැරියුත් තෙරුන්ටය. **මූලාශ්‍ර**: අංගු.නි :(1 ): 3 නිපාත: දේවදූතවග්ග: 3.1.4.3 සාරිපුත්ත සූත්‍රය, පි. 284, EAN:3: Divine Messengers: 33.3 Sariputta, p.90.

▼**බුදුන් වහන්සේ ඇතැම් අයට සකසා දහම් දෙසයි,** ඇතැම් අයට සකසා දහම් නො දෙසයි, එයට හේතුව කවරේද? යයි, අසිබන්ධපුත් ගාමිණි විසින් අසන ලද ප්‍රශ්නයක් පිළිබඳව මේ උපමා යොදාගනිමින් බුදුන් වහන්සේ විස්තර කර ඇතිබව මෙහි පෙන්වා ඇත. 1. **කෙත උපමාව:** එක් ගොවියෙකුට කෙත් 3 ක් ඇත: 1) යහපත් බිමක් ඇත 2) මැදිහත් බිමක් ඇත 3) මුඩුබිමක් ඇත. සරු අස්වැන්න බලාපොරොත්තු වෙන් ගොවියා පළමු කෙත වපුරන්නේය, ඉන්පසු දෙවෙනි කෙත වපුරයි, අවසානයේදී, ගොනුන්ට කැම පිණිස තුන්වෙනි කෙත වපුරයි. එලෙස, බුදුන් වහන්සේ අග්‍ර කෙත ලෙස සලකන මහණ, මෙහිණි පිරිස, ඔවුන් බුදුන් වහන්සේ ගේ රැකවරණය යටතේ සිටින නිසා ඔවුන්ට පළමුව අරුත් සහිතවූ බ්‍රහ්මචරියාව ගැන දහම් දෙසයි. මැදුම් කේත නම් උපාසක උපාසිකවන්ය. ඔවුන් බුදුන් සරණ ගිය පිරිස නිසා ඔවුන්ට අරුත් සහිතවූ බ්‍රහ්මචරියාව ගැන දහම් දෙසයි. තෙවනි කෙත බඳු අන්‍යආගමික පිරිසටද, අරුත් සහිතවූ බ්‍රහ්මචරියාව ගැන දහම් දෙසයි. ඔවුන් ඒ එක් දහම් පදයක් හෝ දැනගන්නේ නම්, එය ඔවුන්ට දීර්ඝ කාලයක් හිත සුව පිණිස වන නිසාය.

2. **දිය බඳුන උපමාව**: දිය බඳුන් 3 ක් ඇත. 1) සිදුරු නැති හොඳ බඳුන 2) සිදුරු නැතිවුවත් මදක් දිය වැගිරෙන  බඳුන 3) සිදුරු ඇති, වැගිරෙන, සිඳෙන බඳුන. ජලය තබා ගැනීමට කැමති කෙනෙක් පළමුවම කරන්නේ හොඳ බඳුනේ වතුර පිරිවීමය. ඉන්පසු දෙවනි බඳුන භාවිතා කරයි. ඔහු තුන්වෙනි බඳුනේ දිය පිරිවීමට කැමති හෝ අකමැතිවේ. සමහරවිට, භාජන සේදීම පිණිස දිය රැස්කිරීමට ඒ බඳුන ඔහු භාවිතා කරනු ඇත. එලෙස පළමුව සංඝයාටද, දෙවනුව උපාසක පිරිසටද දහම් දෙසයි. දිගු කලක් ඔවුන්හට සුවය ලබ්දීමේ අදහසින්, තෙවෙනි පිරිසටද ඒ ධර්මයම බුදුන් වහන්සේ දේශනා කරයි.

**සටහන**: මෙහිදී පෙන්වා ඇත්තේ සියලු පිරිසටම එක සමාන ධර්මය බුදුන් වහන්සේ දේශනා කරණ බවය. **මූලාශ්‍රය:** සංයු.නි: (4) සළායතනවග්ග:ගාමිණිසංයුත්ත:8.1.7  ඛෙතූපම  සූත්‍රය, පි.596.

## 30) බුදුන් වහන්සේ ශ්‍රාවකයන් හික්මවීමේ පිළිවෙල - Training methods of The Buddha

▲ සිහසේනාපති විසින් විමසනු ලැබුව, බුදුන් වහන්සේ, තම ශ්‍රාවකයන් හික්මවන අන්දම මෙසේ පෙන්වා ඇත: 1)  කාය, වචී, මනෝ දුශ්චරිත නොකිරීම පිණිස දහම් දෙසමි. 2) කාය, වචී, මනෝ සුචරිත කිරීම හා නානාවිධ කුසල දහම් කිරීම පිණිස දහම් දෙසමි.  3) රාගයේ දෝෂයේ මෝහයේ සිඳීම පිණිස, නානාවිධ අකුසල ධර්මයන් සිඳීම පිණිස දහම් දෙසමි.  4) කාය වචී මනො දුශ්චරිත හා නානාවිධ අකුසලයන් ඇතිකිරීම පිළිකුල් කරමි. 5) රාගය දෝසය මෝහය හා නානාවිධ අකුසල් වැනසීම පිණිස දහම් දෙසමි 6) කාය වචී මනෝ දුශ්චරිත තැවිය යුතු ලාමක අකුසල් ධර්ම යයි මම කියමි- යමෙකුගේ තැවිය යුතු ලාමක අකුසල් ධර්ම ප්‍රහිනවේද, සිඳින ලද මුල් ඇත්තාහුද, මුදුන සිඳ දැමූ -නැවත

නොවැඩෙන තල් ගසක් සේ කරන ලද්දාහුද, මතුව නුපදනා ස්වභාවය ඇත්තේද, මම ඔහු තපස්සි යි කියමි. මෙලස මම තැවීම පිණිස දහම් දෙසමි. 7) යමෙකු මතු ගැබයක විසීම -නැවත භවයක ඉපදීම ප්‍රහීණවේද...අභාවයට පමුණුවන ලද්දේද, මතුව ඉපදෙන ස්වබාවය නැත්තේද, මම ඔහු අපගබ්භ යයි කියමි. එලස ගැබ් නසනු පිණිස දහම් දෙසමි 8) මම උතුම්වූ සිවුමගපල අස්වැසීමෙන් සැනසුනේ වෙමි. අස්වැසීම පිණිස දහම් දෙසමි, එලෙස ශ්‍රාවකයන් හික්මවමි. **මූලාශ්‍රය:** වි.න.පි: මහාවග්ග පාලිය2: භේසජ්ජඛන්ධ:පි 80.

**සටහන**: බුදුන් වහන්සේ සංඝයා ක්‍රමානුකූලව් පුහුණු කරන ආකාරය පිලිබඳ මෙ සූත්‍රයන්හි විස්තරාත්මකව පෙන්වා ඇත: දීඝ:නි: ශ්‍රමණ ඵල සූත්‍රය, ම.නි: වංකි සූත්‍රය, දන්තභූමි සූත්‍රය.

## 31) බුදුන් වහන්සේ දැක්වූ ප්‍රාතිහාර්යන්- The miracles performed by The Buddha

▲**බුදුන් වහන්සේ දැක්වූ ප්‍රාතිහාර්යන්-** The miracles performed by The Buddha: ප්‍රාතිහාර්ය-පෙළහර ලෙසින් පෙන්වා ඇත්තේ යම් අවස්ථාවන්හිදී, බුදුන් වහන්සේ තමන්ගේ විශේෂ නුවණින් හා බලයෙන්, අන්‍යයන්ගේ යහපත පිණිස සිදුකරනලද විශේෂවූ, අසිරිමත් වූ සිදුවීම්ය.

▼**යමක මහා ප්‍රාතිහාර්ය**: බුදුන් වහන්සේ, කිඹුල්වත්පුරයේදී තමන්වහන්සේගේ ඥාතින් දමනය කිරීම පිණිස යමක මහා ප්‍රාතිහාර්යදක්වා ඇත**. බලන්න:** යමකමහා ප්‍රාතිහාර්ය.

▼**ගංගානම් ගඟ තරණය**

"සංඝයා පිරිවරා ගෙන පාටලිපුත්‍ර නගරයෙන් බැහැරව වඩින බුදුන් වහන්සේ ගංගානම් ගඟ අසලට පැමිණියහ. එකල ඒ මහා ගඟ උතුරා යමින් පැවතිනි. ගඟින් එතෙර වීම සඳහා මිනිසුන් ඔරු සොයමින් පහුරු, බඳිමින් සිටයහ. භාග්‍යවතුන්වහන්සේ ඉර්දී බලයෙන් මෙගොඩ සිට එගොඩට සංඝායා සමග පහලවූසේක. තවමත් ඔරු පාරු සොයමින් ගඟින් එතෙරවීමට උත්සාහ කරණ මිනිසුන් දැක මෙවැනි උදානයක් වදාළහ:

"යම් කෙනෙක් දියවතුර හැර ගැඹුරුවූ තණ්හා නදිය, ආර්ය මග පාලමක් (හෙය) කොටගෙන තරණය කරයි. එහෙත් සාමාන්‍ය ජනයා (තණ්හාවෙන් වෙලි) දියත්තක් තරණය කිරීමට පහුරු බඳිති. නුවණැති බුද්ධආදී උතුමන් පහුරක් නොමැතිව එතෙර වුහ.

**මූලාශ්‍රය**: වින.පි:මහා වග්ගපාලි2: භේසජ්ජඛණ්ධ:40-41, පි.72.

▼**ජටිල දමනය**: උරුවෙල කස්සප ආදී ජටිලයන් දමනය කිරීම පිණිස බුදුන් වහන්සේ පෑ ආශ්චර්යන් මෙහි විස්තරාත්මකව පෙන්වා ඇත.

**මූලාශ්‍රය**: වින.පි:මහා වග්ගපාලි1 : මහාඛණ්ධක:50 උරුවෙලපටිහාරිය කථා, පි.127.

▼**යසකුල පුත්‍රයා ගේ පියාට දැක්වූ ප්‍රාතිහාර්ය.**

ගිහිගෙයින් නික්මී, බුදුන් වහන්සේ වෙතින් දහම් අසා සොතාපත්ති මගඵල ලැබූ යසකුලපුත්‍රයාගේ පියාණන් ඔහු සොයා එනු දැක ඉර්දී බලයෙන් යසකුලපුත්‍රයාව, පියාට නොපෙනේවා යයි අදිටන් කළහ.

**මූලාශ්‍රය**: වින.පි:මහා වග්ගපාලි1 : මහාඛණ්ධක:9 යසකුල පුත්‍ර, පි.112.

▼**බුදුන් වහන්සේගේ ඉද්දිබල**

මෙහිදී බුදුන් වහන්සේ ලඝු සංඥාව හා සුඛ සංඥාව ඇතිකර ගෙන, බඹලොව දක්වා කය ගෙනයාම විස්තර කර ඇත. **බලන්න:** අයගෝල, ආශ්චර්ය ධම්ම. **මූලාශ්‍රය:**සංයු.නි: (5-2) ඉද්දිපාදසංයුත්ත:7.3.2 අයෝගුළ සූත්‍රය,පි.70.

▼ බුදුන් වහන්සේ ඉදුබලයෙන්, අට පිරිස වෙත පැමිණ, ඔවුන් බඳු රූප ඇතිව, කටහඬ ඇතිව දැහැමි කතාවෙන් ඔවුන් තුටුපහටු කළහ, ඉන්පසු අතුරුදහන්වූහ.එ අවස්ථාවේදී, එ එක් එක් කණ්ඩායම මෙසේ සිතූහ:

" කවරෙක් එලෙස අතුරුදහන් විද? එ දෙවියෙක්ද? මිනිසක්ද?"

**සටහන**: අට පිරිස ලෙසින් මෙහි දක්වා ඇත්තේ: කැත්පිරිස, බමුණු පිරිස, ගෘහපති පිරිස, මහණ පිරිස, චාතුර්මහාරාජික දේව පිරිස, තව්තිසා දේව පිරිස, මාරපිරිස, බ්‍රහ්මදේව පිරිස. **මූලාශ්‍රය:**දීඝ.නි: මහාපරිනිබ්බාන සූත්‍රය,70 පිරිස්අට, පි.186.

▼ අවසාන චාරිකාවේ යෙදුන බුදුන් වහන්සේ, දැඩිසේ ගිලන්ව කුසිනාරාවට යන අතරමග පිපාසය ඇතිවී, පානය කිරීමට ජලය ඉල්ලා සිටි අවස්ථාවේදී, එ කුඩා දිය පහරෙ ජලය බොහෝ ගැල් ගමන්කිරීම නිසා අපිරිසුදු බව ආනන්ද තෙරුන් පවසා ඇත. බුදුන් වහන්සේ තෙවරක්ම දිය පානය පිණිස ඉල්වා සිටි නිසා ආනන්ද තෙරුන්, එ කුඩා නදිය වෙත පැමිණි විට එහි ජලය ඉතා පිරිසිදුව පැවති බව දැක, පැන් රැගෙන විත් බුදුන් වහන්සේට පුජාකර, උන්වහන්සේගේ අසිරිය මෙසේ වදාළහ:

" ... තථාගතයන් ගේ මහා ඉර්දීබව, මහත් ආනුභාව ඇතිබව අසිරියකි! අද්භූතය! ...ගැල් සකවලින් සිඳී ගිය...බොරවූ ජලය...පැහැදුන දියවූ වේය...". **මූලාශ්‍රය:** දීඝ.නි: මහා පරිනිබ්බාන සූත්‍රය,87, පි.217.

## 32) බුදුන් වහන්සේ වස් විසූ ස්ථාන- Rain retreats abodes of The Buddha

▲ **ත්‍රිපිටකයට අනුව:** බුද්ධත්වය ලබා පළමු වස්ස ගතකර ඇත්තේ බරණැස ඉසිපතනයේදිය. එතැන් සිට 45 ස වසරක් දහම් සේවයේ යෙදමින් උතුරු ඉන්දියාවේ විවිධ ස්ථානවල බුදුන් වහන්සේ වස් වසා ඇත. අවසාන වස්ස ගතකලේ විසාලා නුවර අසබඩ බේලුව ගමේහිය.

**1 වස්ස: ඉසිපතනය, 2, 4, 17 හා 20 රජගහනුවර, 11 මගධ-නාලක 5 හා 45 විශාලානුවර, 16 අලාවි, 9,10, 12 කෝසම්බි, 15 කපිලවත්තුනුවර 14 හා 20-44 සැවැත්නුවර.**

▼ **වෙනත් මූලාශ්‍ර:**

බුදුන් වහන්සේ වස් විසූ ස්ථාන පිලිබඳ සිතියමක් සකස් කල ආනන්ද ජෝති භික්ෂුව මෙසේ පවසයි. **බලන්න:** සිතියම්

"බුද්ධවංස අටුවාවට අනුව හා ජීනවරිතය (මේධංකර හිමි සකස් කල) හා සූත්‍ර පිටකයේ බොහෝ සූත්‍රවලට අනුව බුදුන් වහන්සේ බොහෝ වස් කාලයන් ගත කලේ මජ්ජිමදේශයේ ය.(Middle Land), සමහර ස්ථාන හඳුනා ගත නොහැකිය. ඒවානම්: 6 වන වස් ස්ථානය- **මාන්කුල කන්ද**; 8 වන වස් ස්ථානය-**බග්ග ප්‍රදේශයේ භේසකලා වනය**; 13, 18 හා 19 වන වස් ස්ථාන - **වාලිය කන්ද**. තවත් ස්ථාන ගැන පැහැදිලි විස්තර නැත: **කෝසම්බි ප්‍රදේශ**යේ -සිල්ක්-කපු වනය, පාරිලේයිය වනය හා වෙරන්ජනාව. තවද අලාවිය පිහිටි නියම ස්ථානය ගැන දන්නේ නැත. මෙය බොහෝ යක් පූජාභූමි ඇති වජ්ජි ප්‍රදේශයේ විය හැකිය. සම්ප්‍රදායට අනුව 7 නි වස් ගථකලේ තාවතිංස දෙව්ලොකයේය (මාතෘ දිව්‍ය රාජයාට අභිධර්මය දේශනා කළ බව). අටුවාව, බුදුන් වහන්සේ අවසන් වස් ගත කල බෙළුව ගම ගැන දක්වා නැත. මේ ස්ථානය විසාලා නුවර ට ආසන්න බව මහා පරිනිබ්බාන සූභා 4නි වස් වැසුවේ රජහගනුවර වේළුවනා රාමයෙහිය. 5නි වස් වසුවේ විසාල නුවර මහා වනයේ කූටාගාර ශාලාවේය. 6 මන්කුල කන්ද.7 නි වස් තව්තිසා දෙව්ලොවය. 8නි වස් බග්ග ප්‍රදේශයේ, සුංසුමාර ගිරි (කිඹුල් කන්ද) අසල භේසකළා වනයේය. 9 කෝසම්බි ප්‍රදේශයේය.10 පාරිලේයිය වනයේය. 11 මගධ ප්‍රදේශයේ නාල නම් බමුණු ගමේය.ත්‍රයේ සඳහන්වේ. ඉසිපතන මිගදායේ පළමු වස් වැසි තැනය. 2නි 3නි 12 වෙරන්ජනා ව අසබඩය. 13 වාලිය කන්දේය. 14 සැවැත්නුවර ජේතවනාරාමයේය. 15 කපිලවස්තු නුවරය.16 අලාවියක්ෂයාගේ වාසස්ථාන ය අසලය.17 රජගහනුවර- වේළුවනා රාමයේ විය හැකිය. 18 වාලිය කන්දේය. 19 හා 20 රජගහ- වේළුවනාරාමයේ විය හැකිය. ඉන්පසු අවසාන වස් දක්වා සැවැත්නුවර වස් වැසුහ- ජේතවනාරාමයේ හා පූර්වාරාමයේ (මිගාරමතා ප්‍රසාදයේ). **මූලාශ්‍රය:** Maps of Ancient Buddhist India, drawn and compiled by Ānandajoti Bhikkhu, p. 31.

2) **සද්ධර්මාලංකාරයට අනුව: 1** වන අවුරුද්ද (බුද්ධත්වය ලබා)- බරණැස, ඉසිපතනාරාමය,.**2 -4** වන අවුරුදු- රජගහනුවර, වේළුවනාරාමයෙහිදිය. **5** වන අවුරුද්ද - විශාලානුවර කූටාගාර ශාලාවෙහිදිය **6** වන අවුරුද්ද-කොසඹෑ නුවර කොසම්බිය ආරාමයේය. **7** වන අවුරුද්ද- තව්තිසා දෙව්ලොවය. **8** වන අවුරුද්ද- සුංසුමාරගිරි පර්වතයේය. **9** වන අවුරුද්ද කොසඹෑ නුවර ඝෝෂකාරාමයෙහිය. **10** වන අවුරුද්ද- පරාලිය වනයේය. **11**වන අවුරුද්ද- නාලක බමුණාගේ නාලකාරාමයෙහිය. **12** වන අවුරුද්ද- වෙරඤජා ගම නලෙරු නම් කොසඹ රුක්මුල ශාලාවේදිය.**13** වන අවුරුද්ද- වාලිය පර්වතයේය (දෙවියන්ගේ ආරධනාව නිසා).**14** වන අවුරුද්ද- සැවැත්නුවර දෙව්රම් වෙහෙරය. **15** වන අවුරුද්ද- කිඹුල්වත්නුවර නිග්‍රෝධා රාමයෙහිය. **16** වන අවුරුද්ද- අලවුනුවරය. **17** වන අවුරුද්ද- රජගහනුවර, වේළුවනා රාමයෙහිදිය. **18-36** (අවුරුදු 19 ක්) සැවැත්නුවර දෙව්රම් වෙහෙරය. **37-40** අවුරුදු සැවැත් නුවර පූර්වාරමයෙහිය.**41-44** අවුරුදු අනිබඩ වාසයය (අන්‍යප්‍රදේශ) **45** වසර, විසාලානුවර බේලුව ගමය.

## 33) **බුදුන් වහන්සේ මහළුවීම-**The Buddha becoming old

▲ බුදුන් වහන්සේ සැවැත්නුවර පුර්වාරාමයේ වැඩ වසන සමයේදී, ආනන්ද තෙරුන් උන්වහන්සේගේ කය ජරාවට පත්වීම-මහලුවීම පිලිබඳ කළ ප්‍රකාශනය මෙහි දක්වා ඇත. යොවුන් බවේ දිරන ස්වභාවය ඇත,නිරෝගී බවේ රෝගී ස්වභාවය ඇත, දිවියෙහි මරණ ස්වභාවය ඇතයයි, යථාබව ගැන ආනන්ද තෙරුන්ට පෙන්වා දුන් බුදුන් වහන්සේ මෙසේ වදාළහ:

"...යමෙක් සියවසක් ජිවත්වුවද, හෙතෙම මාරු ගේ වසඟයට යන්නේය… මරණය කිසිවෙක් අත් නොහරී, සැම මැඩ ගනී" ( One who might live a hundred years, Also has death as destination. Death spares none along the way but comes crushing everything).

**මූලාශ්‍ර**: සංයු.නි: (5-1): මහාවග්ග: ඉන්ද්‍රියසංයුත්ත:ජරාවග්ග: 4.5.1 ජරාසූත්‍රය, පි.412, ESN:48: Indriyasamyutta: 41.1 Subject to aging, p. 1972.

▼ **මෙහිදී බුදුන් වහන්සේ** තමන්වහන්සේ මහලුවියේ සිටින බව චුන්ද සාමණේරයන් හට පවසා ඇත:

"...මම බොහෝ කලකට පෙර පැවිදිවූවෙමි, දැන් මම බොහෝකලක් මහණ දම් පිරූ, වයස්ගත ගුරුවරයෙකි, මගේ ජීවිතය අවසන්වීමට ආසන්නය". **මූලාශ්‍ර:** දීඝ.නි: (3), පාසාදික සසූත්‍රය, පි. 210, EDN**:** 29**,** The delightful discourse, p. 318.

▼ බේලුව ගමේ වස්වසන අවස්ථාවේදී දැඩිව ගිලන්වූ බුදුන් වහන්සේ, ක්‍රමයෙන් සුවපත්බවට පැමිණෙනු දැක ආනන්ද තෙරුන් මෙසේ පවසා ඇත:

"... භාග්‍යවතුන් වහන්සේගේ පහසුව...සහනය මා විසින් දක්නා ලදී, එහෙත්, මගේ සිරුර හටගත් තදබව ඇත්තක්හු මෙන්විය...භාග්‍යවතුන් වහන්සේගේ ගිලන්බව හේතුකොටගෙන දිශාවෝ ද මට නොපෙනේ ...සතිපට්ඨාන ධර්මයෝ ද මට නො වැටහේ..." .ඒ අවස්ථාවේදී, ආනන්ද තෙරුන්ට අනුසාසනා වදාළ බුදුන් වහන්සේ, මෙසේ වදාළහ:

" ආනන්දයෙනි, මම දැන් දිරාගියෙමි, වෘද්ධවූවෙමි, මහළුවූවෙමි, දික් කලක් ගතකෙළෙමි, පසුම් වියට පැමිණියෙමි. මට දැන් වයස අසූවක්ය... දිරූ ගැලක් (කරත්තයක්) වක්‍රබන්ධන ආදියෙන් (ගැටගසා) පිළියම් කර යැපෙන්නේද, එලෙස, තථාගතයන් ගේ කය රහත්පල සමවත් නමැති පිලියමෙන් යැපෙන්නේය... තථාගතයෝ රූපාදි සියලු නිමිති නො මෙනෙහි කිරීමෙන් ඇතැම් වේදනාවන්ගේ නිරෝධයෙන් නිමිති රහිත චිත්ත විමුක්තියට පැමිණ වෙසෙති...එ සමයෙහි තථාගතයන්ගේ කයට අතිශයින් පහසු ඇතිවේ..."

**සටහන:** එ පලසමවත ලබා ගැනීම පිණිස, තමන් දීපයක් ලෙසින් පිහිට කොටගෙන, තමන්ම සරණය කරගෙන, අන්‍යසරණයක් නැතිව, ධර්මය දීපය ලෙසින් ගෙන, ධර්මය සරණය කරගෙන වාසය කරන ලෙසින් බුදුන් වහන්සේ, ආනන්ද තෙරුන්ට අවවාද අනුසාසනා වදාළහ. **මූලාශ්‍රය**:දීඝ.නි: මහාපරිනිබ්බාන සූත්‍රය, ඡෙදය 50-53, පි.173.

## 34) **බුද්ධ ආයුෂ**- Lifespan of The Buddha

▲ **මහාපදාන සූත්‍රයේදී** පෙර වැඩ විසූ සම්මා සම්බුදුවරු දීර්ඝආයුෂ වැළඳු බවත්, තම ආයුෂ කෙටි බව බුදුන් වහන්සේ පෙන්වා ඇත:

" මහණෙනි, මෙකල මගේ ආයුෂ ප්‍රමාණය අල්පය, ස්වල්පය, ලඝුය. යමෙක් මේ සමයෙහි බොහෝ කල් ජීවත් වන්නේ නම් හෙතෙම අවුරුදු 100ක් හෝ ස්වල්පයක් වැඩියෙන් හෝ ජීවත් වන්නේය"

**මූලාශ්‍ර**: දීඝ.නි: ( 2): 1: මහාපදාන සූත්‍රය, ඡේදය 8, පි. 18, EDN: 14 Mahâpadāna Sutta: The Great Discourse on the Lineage, p. 151.

▼ **බුදුන් වහන්සේ**, විසාලානුවර, චාපාලචෛත්‍ය යේදී ආයුසංඛාරය අත්හලසෙක. **විස්තර පිණිස බලන්න**: දීඝ.නි: මහා පරිනිර්වාණ සූත්‍රය.

▼ **උදාන පාලියේ** බුදුන් වහන්සේ ආයුසංඛාර හැරදැමීම මෙසේ දක්වා ඇත:

" ඉක්බිත්තෙන් භාග්‍යවතුන් වහන්සේ චාපාල චෛත්‍යයේ දී එළැඹී සිටි සිහි ඇත්තාහු නුවණින් පිරිසිඳ දන්නාහු ආයුසසංඛාරය හළ සේක. භාග්‍යවතුන් වහන්සේ ආයුසසංඛාරය හළ කල්හි ම බිහිසුණු ලොමුදහ ගන්වන මහද්භූමිකම්පනයක් විය. දෙව්බෙර නද දුන්හ... එකල්හි භාග්‍යවතුන් වහන්සේ මේ කරුණ සලකා ඒ වේලෙහි උදන් ඇනූහ:

'පුනර්භවය සකස් කරන, භවොත්පත්තියට කාරණවූ කාමාවචර රූපාවචර කර්මද අරූපාවචර කර්මද බුද්ධමුණි තෙමේ හළේය. නිජකාධ්‍යාත්මයෙහි ඇලුණේ (හෙවත් උපචාරපිණිස සමාධි විසින්) සමහිත වූයේ තමා කෙරෙහි වූ කෙළෙස් කවචයක් (සන්නාහයක්) මෙන් බිඳ දැමීය. නොහොත් පස්කඳ අනිසෑ යි නිවන නිත්‍ය යෑ යි ආදීන් තුලනය (තිරණය) කරනුයේ, බුද්ධමුණි තෙමේ භවගාමී කර්මයන් (කර්මක්ෂයකර) ආර්යමාර්ගයෙන් හළේය. කෙසේද? විවසුන් විසින් සිය පස්කඳේහි ඇලුණේ ශමථ විසින් සමාහිත වූයේ, තමා කෙරහි වූ කෙළෙස් නමැති කවචය බෝමුලදීම හළ භවසංඛාර ඇත්තේ, සමාපත්ති බලයෙන් රැඳවූ අත්බව මෙයින් මතු එයට නො සමවදිමි යි ආයුසසංඛාරය හළේය'". **මූලාශ්‍රය:** ඛු.නි: උදාන පාලිය: 6.1 ආයුසංඛාරවොස්සජ්ජන සූත්‍රය, පි. 278.

▼ **බුදුන් වහන්සේ** ආයුසංඛාර හැර දමා පරිනිබ්බානය අදිටන් කරගත් පසු, ආනන්ද තෙරුන් උන්වහන්සේට, කපක් වැඩ සිටින් ලෙස ආයාචනා කළහ. එ අවස්ථාවේ බුදුන් වහන්සේ මෙසේ වදාළහ:

" ආනන්දයෙනි, ප්‍රියවූ මනවඩනවූ සියලු දෙ කෙරෙන් වෙන්වීම, ඉවත්වීම, අන් සැටියෙකින් වීම යන් මෙය මාවිසින් පවසා ඇත...යමක් උපන්නේද, සලසුනේද, පලුදුවන සුළුද , එය පලුදු නොවේවා යන මෙය කෙසේ ලැබිය හැකිද?... යමක් තථාගතයන් විසින් හරන ලදද....පහ කරන ලදද...යම් ආයුසංඛාරයක් හරන ලදද, නොබෝ කලකින්.... මෙයින් තෙමසකින් තථාගතයෝ පිරිනිවේ... යි යම් ඒකාන්ත වචනයක් තථාගතයන් විසන් කියන ලදද... එ වචනය තථාගතයෝ, දිවි හෙයින් නුමුදු වලක්වන්නේ නැත...". **මූලාශ්‍රය:** දීඝ.නි: මහා පරිනිබ්බාන සූත්‍රය,75 ආනන්ද ආයාචනා, පි.196.

## 35) බුදුන් වහන්සේගේ පරිනිබ්බානය- Final Passing away of The Buddha

▲ **බුදුන් වහන්සේ** ආයුසංඛාර හැර දමා පරිනිබ්බානය අදිටන් කර, විසාල නුවර, මහාවනයේ. කූටාගාර ශාලාවේදී සංඝයා අමතා බොහෝ අනුසාසන වදාරා මෙසේද පැවසූහ:

"මහණෙනි, ඔබ අමතමි...සංස්බාරයෝ නැසෙන සුළුය, නොපමාව කටයුතු කරගන්න... මෙයින් තුන්මස් අවෑමෙන් තථාගතයෝ පිරිනිවෙන්නාහය...."

"මගේ වයස මුහුවිය...ජීවිත කාලය ස්වල්පයකි...ඔබ හැර යන්නෙමි, මාවිසින් තමහට පිහිට කර ගන්නේ ලදය... නොපමාව, සිහි ඇතිව, සිල්වත්ව, යහපත් කල්පනාවෙන් සිත රැකගන්න...යමෙක් නොපමා ව වෙසෙන්නේ නම්, හෙතෙම ජාති සංසාරය හැර දුක කෙලවර කර ගන්නේය". **මූලාශ්‍රය:** දීස.නි: මහා පරිනිබ්බාන සූත්‍රය,80 බ්‍රහ්මවිහාරස්ථායි දහම් දේශනා, පි.202

▼ **එලෙස අවසාන චාරිකාවේ** එළඹුන බුදුන් වහන්සේ, විසාලානුවරින් පිටව **හන්ඩගම** කරා පිටත්වූහ. එ එ ස්ථානයන්හිදී, මහා කරුණාවෙන් ශ්‍රාවකයන් පුබුදුවා, දිරිමත් කර විමුක්ති මග දේශනා කර වදාළහ. එතැන් සිට **හස්තිගමට...අම්බගමට....ජම්බුගමට... භෝග නුවරට** ක්‍රම ක්‍රමයෙන් වැඩියෝය.  භෝග නුවරදී ආනන්ද චෛත්‍යයෙහි වැඩසිටි සේක. එහිදී සතරමාහාඋපදේශ සංඝයාට වදාළහ. එහිසිට, **පාවනුවරට** වැඩ, චුන්ද කර්මකාර පුත්‍ර ගෙ අඹවනයේ වැඩසිටිසේක. බුදුන් වහන්සේ බැහැදැකීමට පැමිණි චුන්දට දෙලොව වැඩ පිණිස කටයුතු කිරීමට දහම් දෙසුසේක. ඉන්පසු, චුන්ද්ගේ ආරාධනාව ඉවසා, පසුදින දානය පිණිස සංඝයා සමග චුන්දගේ නිවාසට වැඩිසේක. එම දානයෙන් පසුව, බුදුන් වහන්සේට ලෝහිත පක්ඛන්දිකා යන දරුණු ආබාධය ඇතිවිය. මරණය කෙලවර කොට ඇති දැඩි දුක් වේදනා සිහිනුවණින් දරාගත් බුදුන් වහන්සේ, එහිසිට කුසිනාරාවට වැඩිසේක. අතර මගදී පිපාසය ඇතිවී.කුඩා දියපහරකින් දිය පානය කිරීම, ඉන්පසු කකුක්ථා නදියෙන් දියනෑම, ඉන්පසුව හිරන්‍යවති නදියෙන් එතරව මල්ල රජුන්ගේ උපවර්තන නම් සල් උයනට වැඩිසේක. එහි යමා සල් රුක් අතර පැනවූ ඇඳක , සිහි නුවණ ඇතිව සැතපුන සේක. එ අවස්ථවේදී, අකාලය වුවද එ සල් රුක් බුදුන් වහන්සේගේ අසිරියෙන් මලින් ගැවසිනි, තථාගතයන්ට පුද පූජා කරන ලෙසින්, සල්මල් වැස්සක් මෙන් බුදු සිරුරේ පතිත විය. එ අවස්තාවිදී බුදුන් වහන්සේ මෙසේ වදාළහ:

**"...යම් මහණක්, මෙහෙණියක්, උවසුවෙක් හෝ උවැසියෙක්.. ධර්මානුධර්මව ප්‍රතිපන්නව, සම්‍යක් ප්‍රතිපන්නව, අනුධර්මචාරිව වෙසෙයි නම් ඔවුන්, පරම පූජාවෙන්  තථාගතයන්ට පුද සත්කාර කරන්නේය" බලන්න:** මහාපරිනිබ්බාන සූත්‍රය.

▼ **බුදුන් වහන්සේගේ අවසාන අවවාද අනුසාසනා**

* බුදුන් වහන්සේ වදාළ ධම්ම විනය, උන්වහන්සේගේ පරිනිබ්බනයෙන් පසු ශාස්තෘ ලෙසින් සැලකිය යුතුවේ.

* කනිෂ්ඨ භික්ෂූන්, ජ්‍යේෂ්ඨ භික්ෂූන්ට ආවුසො යයි ආමන්ත්‍රණය නොකලයුතුය, වහන්ස හෝ ආයුෂ්මතුන් යයි ඇමතිය යුතුය.

* සංඝයා කැමතිනම්, කුඩා සික පද අස්කර ගත හැකිය.

* චන්න මහණට බ්‍රහ්ම දණ්ඩනය පැනවීම.

**සටහන**: බුදුන් වහන්සේගේ පිරිනිවන් අවස්ථාවේදී, 500ක් සංඝයා උන්වහන්සේ අසල රැඳී සිටිබව. එ සියලු උතුමන් සම්බෝධිය නියත කරගෙන සිටිබව මෙහි දක්වා ඇත. **බලන්න:** මහා පරිනිබ්බාන සූත්‍රය, පි.260.

ඉන්පසුව බුදුන් වහන්සේ අවසාන වදන් වදාළා පිරිනිවීගිගිය සේක:

" සියලු සංසකාරයෝ නැසෙන සුළුය, නොපමාව සිහි ඇතිව රහත්බව පිණිස කටයුතු කරගන්න".

**" ...වයධම්මා සංඛාරා අප්පමාදෙන සම්පාදේථ"**

**බලන්න**: මහාපරිනිබ්බාන සූත්‍රය.

**▼ භාග්‍යවතුන් වහන්සේ පිරිනිවීම**

මහා පරිනිබ්බාන සූත්‍රයට අනුව බුදුන් වහන්සේ පළමුව, ප්‍රථම ජාන සමාපත්තියේ සිට අනු ක්‍රමයෙන් සිව්වන සමාපත්තියට එළඹ, ඉන්පසු අනුපිලිවෙලින් අරූප සමාපත්ති: ආකාසානඤ්චායතනය, විඤ්ඤානඤ්චායතනය, ආකිඤ්චඤ්ඤායතනය, නෙවසඤ්ඤා-නාසඤ්ඤායතනය සමාපත්තින්ට සමවැදුනහ, ඉන්පසු, සංඥාවෙදයිත නිරෝධ සම්පත්තියට එළඹුනහ. ඉන්පසු, එ සමාපත්තියෙන් නැගීසිට, අනුක්‍රමයෙන් අරූප සමාපත්තන්ට සම වැදී එහිසිට, සිව්වෙනි ජානයේ සිට ක්‍රමයෙන් ප්‍රථම ජානයට එළඹුනහ. අවසානයේදී, පලමු ජාන සමාපත්තියේ සිට ක්‍රමයෙන් සිව්වෙනි ජානයට සමවැදී, ඉන් නැගී සිට පිරිනිවන් පෑසේක.

**සටහන**: බුදුන් වහන්සේගේ සමාපත්තින්ට සමවැදීම, පිරින්වන් පෑම, අනුරුද්ධ තෙරුන් දිවැස් නුවණින් අවබෝධ කල බව මාහා පරිනිබ්බාන සූත්‍රයේ දක්වා ඇත.

එ අවස්ථාවේදී, මහා භූමි කම්පා ඇතිවිය, දෙව් බෙර පැලි ගියහ.

* බුදුන් වහන්සේ පිරිනිවන් පෑ විට සහම්පති බ්‍රහ්මරාජයා මෙසේ පැවසුහ:

> **" සබ්බෙව නික්ඛිපිස්සන්ති භූතා ලොකෙ සමුස්සයං**
>
> **යථා එතාදීසො සත්ථා ලොකෙ අප්පටිපුග්ගලො**
>
> **තථාගතො බලප්පත්තො සම්බුද්ධො පරිනිබ්බුතෝ" ථ.**

ලෝකයේ සෑම සත්ත්වයෙක්ම, යම්සේ ජීවිතඉන්ද්‍රිය පරිහානියෙන් සිරුර හැර දමති, එසේම, දස බල ඥාන ඇති, බුදුන් වහන්සේට සම පුද්ගලයෙක් මෙ ලෝකයේ නැත. එබඳු තථාගත සම්මාසම්බුද්ධ වූ ශාස්තෘන් වහන්සේ පිරිනිවි සේක"

* එ අවස්ථාවෙ, සක්දෙවිඳු මෙසේ පැවසුහ:

**" අනිච්චා වත සංඛාරා උප්පාදවයධම්මි නො,**

**උප්පජ්ජිත්‍වා නිරුජඣන්ති තෙසං වූපසමො සුඛො" ති**

සංඛාරයෝ ඒකාන්තයෙන්ම ඉපදී, නැසෙනසුළුය. ඔවුන් ඉපදී නැසී යති, ඔවුන්ගේ සංසිඳීම සුවය ගෙනදේ.

* අනුරුද්ධ තෙරුන් මෙසේ වදාළහ:

**" නාහු අස්සසපස්සාසො ඨිතචිත්තස්ස තාදීනො,**

**අනෙජො සන්තිමාරබ්භ යං කාලමකරි මුණි.**

**අස්ලලීනෙන චිත්තෙන වෙදනං අජඣවාසයි,**

**පජ්ජොතසෙසව නිබ්බානං විමොක්ඛො චෙතසො අහු"ති**

තහවුරු වූ සිතක් ඇති, අටලොදහමින් නොසැලෙන බුදුරදුන් ගේ ආශ්වාස ප්‍රශ්වාසයෝ නැවතුනහ. එ මුනින්ද්‍රයන්, තණ්හාව නැතිව නිවන අරමුණු කොට කලුරිය කළහ. ඔබ වහන්සේ, නො හැකුළුන සිතින් මාරාන්තික වේදනා ඉවසුහ . පහනක් නිවීයන ලෙසින් ඔබවහන්සේගේ සිත මිදීම විය.

* ආනන්ද තෙරුන් මේ ගාථාව වදාළහ:

**"තදාසි යං භිංසනකං තදාසි ලොමහංසනං**

**සබ්බාකාරවරූපෙතෙ සම්බුද්ධෙ පරිනිබ්බුතෙ" ති**

සියලු උතුම් කරුණින් සමන්වාගත සම්මා සම්බුදු රජුන් පිරිනිවිගිය කල, මහා බිහුසුණු ලෙසින් පොළොව කම්පාවී ගියේය, එ කෙනෙහිම මහා ලොමුදැහැගැනීමක් විය.

* එ අවත්වේදී පහනොවූ රාග ඇති සංඝයා මෙලෙස පවසමින් හඬන්නට විය:

" භාග්‍යවතුන් වහන්සේ... සුගතයන් වහන්සේ ඉතා යුහුව පිරිනිවී සේක, ලොවේ ඇස ඉතා යුහුව අතුරුදහන් විය"


එහිදී, අනුරුද්ධ තෙරුන් දයාවෙන්, දහම සිහිපත්කර ඔවුන් සැනසුහ. පහවූ රාග ඇති භික්ෂූන් දහම සිහිපත් කොට ඉවසා වැඩසිටියහ.

* එ අවස්ථාවේදී අහසේ සිටින දේවතා වෝද, පොළවේ සිටින දේවතාවෝද දුකින් වැළපුනෝය, රාගය පහවූ දෙවියෝ සංස්කාරයන්හි අනිත්‍ය ස්වභාවය සිහිකර ඉවසා දැරූහ.

* බුදුන් වහන්සේ පිරිනිවිගිය පුවත සැලවූ මල්ල රජදරු පිරිසද බොහෝ දුකින් හඬා වැලපුනහ.

අවිද්‍යාවෙන් අඳුරුවූ ලෝකය, සත්‍ය ධර්මයෙන් බබලවාවූ , ලෝකජනයාගෙ සුව සෙත පතා මහා කරුණාවෙන් දහම් දෙසූ බුදුන් රජාණන්වහන්සේ, සුගතයන් වහන්සේ එසේ පිරිනිවන් පෑ සේක.

**ලලල**


බුදුසමයේ දඹදිව
කයිලාස කඳු
ටිබටය
මනොසාරොව විල
රකස්තල විල
බ්‍රහ්ම පුත්‍ර නදිය
හිමවත
හිමාල කඳු
ශාක්‍ය
කුරු
කපිලවස්තු
කොළිය
කෝසල
කුසිනාරාව
මල්ල
යමුනා නදිය
ගංගා නදිය
වංස
විදේහ- වජ්ජි
විසාලා නුවර
කාශි
බරණැස
පාටලීපුත්‍ර
කෝසම්බි
ගංගා නදිය
අංග
උරුවෙල
රජගහ
මගධ
වංග
උදේනි
බුද්ධගයා

**සිතියම 1**

**සිතියම 2 බුදුන් වහන්සේ වස් වැසූ ස්ථාන**

Drawn by Anandajthi Bhikkhu: Maps of Ancient Buddhist India






Map4: Ancient India by Sutta Central

